

පපඤ්ච දීපිකා

නම් වූ

පපඤ්ච සූදනී මජ්ඣිමනිකාය
අට්ඨකථා සිංහල අනුවාදය

අභිනව හෙළවුවා අඩක 2.

ප්‍රපඤ්ච දීපිකා

නම් වූ

පපඤ්ච සූදනී මජ්ඣිමනිකායඨ්ඨ කථා

— සිංහල අනුවාදය —

පූර්ව භාගය.

මොල්ලිගොඩ "ප්‍රවචනොදය,, පරිවෙණාධිපති සුවිසුඩ
සඩමී වාගීශ්වර ශ්‍රී දෙවරක්ෂිත

ස ඩ්ඪි ච්චා භි ධා න එ ල් ලා ව ල නා ය ක

මාහිමියන් වහන්සේ විසින් සංශොධනමාරයෙන්

ප්‍ර කා ශ ය ට ය.

"ප්‍රවචනොදය,, පිරිවෙන්හි ආචාර්‍ය්‍ය පණ්ඩිත

ලබුගම ලඩ්කානන්ද සවාමීන් වහන්සේ

විසින් ලියනලදී.

"ප්‍රවචනාධාර" සභාවේ භාණ්ඩාගාරිකත්වයෙන් පත් මොල්ලිගොඩ

කේ. ඩී. විලියම් සිල්වා මහතාණන් විසින්

මුද්‍රණය කරවනලදී.

2479

1936



මොල්ලිගොඩ "ප්‍රුවවචනොදය" පරිවෙණාධිපතිව වැඩවසූ
ශ්‍රී මහා විහාර වංශාලඞ්කාර විමලකිත්ති ශ්‍රී ඉන්ද්‍රජෝතිස්ස්‍රීමහා
රසිගම නායක මාහිම්යාණන් වහන්සේ.



මොල්ලිගොඩ "ප්‍රවචනෝදය" පරිවෙණාධිපති
සුවිසුද්ධ සඞ්ගී වාගීසවර
ශ්‍රී දෙවරක්ඛිත සඞ්ඝකිච්චාභිධාන එල්ලාවල
නාහඝ මාහිම්යන් වහන්ෂස්.

සඳ්‍ය පන්න ය.

ශ්‍රී සඛම්මී රත්නය. ශ්‍රී ඝනඝාක්‍ය මුනීන්ද්‍රයන් වහන්සේ සම්මාර මථනය කොට බුඩ රාජශ්‍රියට පැමිණ වදුළතැන් පටන් නිරුපධිශෙෂ පරිනිර්‍වාණ ධාතුවෙන් පිරිනිවීම දක්වා පන්සාළිස්වසක් මුලුල්ලෙහි අමෘතමහා ගඩගාප්‍රවාහයක් සෙයින් සකලදෙව් මිනිසුන්ගේ කෙලෙස් ගිනි නිවමින්. දෙශනා කර වදුළ **ශ්‍රී සඛම්මරත්නය** එක ම විමුකතිරසය ඵලවන හෙයින් **එකවිධ** වේ. ධම් විනය වශයෙන් ත්‍රිවිධවේ **එහි විනය** නම්? විනයපිටකයයි. තදවශෙෂ වූ සියලු බුඩවචනය **ධම් නම්.**

ප්‍රථම-මධ්‍යමාවශාන වශයෙන් ත්‍රිවිධ වේ. **සූත්‍රාභිධම් විනය පිටක** යන්ගේ වශයෙන් ද ත්‍රිවිධවේ. එහි "උභයප්‍රාතිමොක්‍ෂය උභය් විභඩගය දෙවිසි ඛන්ධකය සොළොස් පරිවාරය,, යන මේ **විනය පිටක නම්.** හෙ ද- පාරාජික- පාචිත්තිය- මහාවගග- චූලවගග පරිවාර,යයි ග්‍රන්ථ පසකින් හෙබියේය **සූත්‍රාන්තපිටකය**- දීඝනිකාය මජ්ඣිමනිකාය සංයුත්තනිකාය අඩගුත්තර නිකාය සහ ඛුද්දකනිකායයෙහි ඛුද්දක පාඨ- ධම්මපද- උදාන- ඉතිවුත්තක සුත්තනිපාත-විමානවත්ථු-පෙතවත්ථු ථෙරගාථා- ථෙරීගාථා- ජාතක- නිදෙස- පටිසම්භිදා- අපදාන- බුඩවංස- චරියා පිටක යන ග්‍රන්ථ පහළොසින් ද පරිමිත විය. **අභිධම් පිටකය** ධම්මසඩගණී- විභඩග- ධාතුකථා- පුග්ගලපඤ්ඤත්ති- කථාවත්ථු- යමක-පට්ඨාන යන සප්තප්‍රකරණයෙන් ප්‍රතිමණ්ඩිත වූයේය.

නවද- මෙහි **විනය පිටකය**- ආඥුබාහුල්‍යයෙන් දෙශනා කළ හෙයින් **ආණාදෙශනා** යි ද බහුලවූ ව්‍යතික්‍රම ඇති සෙය්‍යසකාදීහු? අපරාධය වූ පරිදි මෙහිලා අනුශාසනා කරනලද හෙයින් **යථාපරාධ සාසන** යි ද, අධ්‍යාචාරයන්ට ප්‍රතිපක්‍ෂවූ කුදුමහත් සංවරය වදුළහෙයින් සංවරා"සංවරකථා"යි ද කියනු ලැබේ. **සූත්‍රපිටකය**- ලොකව්‍යවහාරය බහුලවශයෙන් දෙශනා කළ හෙයින් **වොහාර දෙසනා** යි ද, විවිධ ආසයානුසය චරිතාධිමුත්ති ඇති සත්ත්වයෝ අධ්‍යාශයාදීන්ට අනුරූපවශයෙන් අනුශාසනා කරනලද හෙයින් **යථානුලොමසාසන**'යිද, දෙසැට දෘෂ්ටීන්ගේ දුරලීම වදුළහෙයින් **දිට්ඨිනිවෙඨනකථා**' යි ද කියනුලැබේ. **අභිධම්මපිටකය**- සකඛාදි පරමාර්ථ බාහුල්‍යයෙන් වදුළ හෙයින් **පරමත්ථදෙසනා**'යි ද, සකඛාදි ධම් මාත්‍රයෙහි මම ය මාගේ යයි සංඥ ඇත්තාහු ධම්සවභාවයට අනුරූපවශයෙන් අනුශාසනා කරනලද හෙයින් **යථාධම්මසාසන**'යි ද, රාගාදීන්ට ප්‍රතිපක්‍ෂවූ නාම රූපයන්ගේ පිරිසිදීම වදුළ හෙයින් **නාමරූප පරිච්ඡදකථා**'යි ද කියනු ලැබේ,

මෙසේ පිටක වශයෙන් ත්‍රිවිධ වූ බුඩවචනය නිකාය වශයෙන් පඤ්චවිධ වේ. එහි- වගීතූනක සංග්‍රහ වූ බ්‍රහමජාලාදි දීඝිප්‍රමාණ සූත්‍ර සූතිස **දීඝිනිකාය** නම් වේ. මධ්‍යම ප්‍රමාණ සූත්‍රයන්ගෙන් යුකත වූ වගී පසලොසක සඩග්‍රහ කරනලද මූලපරියායාදි සූත්‍ර එක්සිය දෙප නස **මධ්‍යමනිකාය** නම් වේ. දෙවතාසංයුත්තාදි වශයෙන් පිහිටි ඔඩ තරන සූත්‍රය ප්‍රමුඛ කොට ඇති සත්දහස් සත්සිය දෙසැටක් පමණ සූත්‍රයෝ **සංයුත්තනිකාය** නම් වේ. එකක නිපාතාදි එකොලොස් නිපාතයක සංග්‍රහ වූ චිත්තපරියාදාන සූත්‍රය ආදි කොට ඇති නව දහස් පන්සිය සත්පනසක් සූත්‍රයෝ **අඩගුත්තර නිකාය** නම් වේ. මෙකී නිකාය සතර හැර විනයපිටකයෙහි පාරාජිකපාලි ආදි ග්‍රන්ථ පස ද සූත්‍රපිටකයෙහි ම ඇතුලත්වූ බුදුඋපාඩාදි පළමු දුක්වූ ග්‍රන්ථ පසලොස ද- අභිධම් පිටකයෙහි ධම්මසඩගණී ආදි සප්තප්‍රකරණය ද යන මොවුහු **බුදුඋනිකාය** නම් වේ.

නැවත- අඩගවශයෙන් සියලු බුඩවචනය නවවිධ වේ. සුත්ත- ගෙය්‍ය- වෙය්‍යාකරණ- ගාථා- උදාන- ඉතිවුත්තක- ජාතක- අබ්භූත ධම්ම- වෙදල්ල යයි කියායි. මෙසේ අඩගවශයෙන් නවවිධ වූයේ ධම්සකඩ වශයෙන් අසූසාර දහසකට ප්‍රභෙද වේ. මෙ කී තාක් බුඩ වචනය සඞ්ඝයන් වහන්සේ ජීවමාන සමයෙහි ග්‍රන්ථාරූඪ කළ කිසි වෙක් නැත.

ප්‍රථම සඩගායනාව. බුදුරජාණන් වහන්සේ පිරිනිවිකල්හි සුභද්‍රනම් මහලු පැවිද්දෙකු ප්‍රකාශ කළ අගාරවවචනය නිමිති කොට අනුබුඩ වූ මහාකාශ්‍යපසථවිරයන් වහන්සේ භික්ෂූන් රැස් කරවා ශාසනය අවුරුදු පන්දහසක් නිරුපද්‍රැත ව පවත්නා පිණිසත් අධම්වාදී- අවිනයවාදීන් මදීනය කරනු පිණිසත් ධම්ය සඩගායනා කළ මැනවැයි දැන්වූහ. භික්ෂූන් යෙහෙකැයි පිළිගත් කල්හි කාශ්‍යපසථවිරයන් වහන්සේ ත්‍රිපිටක පයත්‍යාපත්තිප්‍රභෙදධර වූ ප්‍රතිසංවිත්ප්‍රාප්ත වූ මහානුභාව ඇති බොහෝසෙයින් තථාගතයන් වහන්සේ එතදග්ගයෙහි තැබුවා වූ ශෛක්ෂ වූ ආනන්දසථවිරයන් ද සමග ක්ෂීණාශ්‍රවභික්ෂූන් පන්සියයක් නියම කළහ. මහාකාශ්‍යපසථවිර ප්‍රමුඛ ඒ භික්ෂූහු රජගහනුවර වස්වෙසෙමින් වෙභාරපර්ත්‍යප්‍රාන්තයෙහි සප්තපර්ණිගුහාවාරයෙහි අජාසත් රජු විසින් කරවනලද මනහර ධම්මණ්ඩපයෙහි රැස් ව සියලු ධම්විනය සඩගායනා කළහ.

එහි දී සථවිරභික්ෂූහු ඒ ධම්විනය පිටකාදිවශයෙන් විභාග කොට සඩගායනාවට නැගූහ. මෙසේ පාලිධම්ය සඩගායනාකොට භාග්‍යවතුන් වහන්සේ විසින් ම ඒ ඒ තැන්හි දී වදාළ ප්‍රකීර්ණකධම්කොඨාශයන්ගෙන ත්‍රිපිටකඅර්ථකථාව ද සඩගායනා කළහ. එහෙයින් සියලු අර්ථකථා තථාගතයන් වහන්සේ විසින් වදාළාහු යයි සැලකිය යුතුයි.

තවද- උදානසංග්‍රහ- වගීසංග්‍රහ- පෙය්‍යාලසංග්‍රහ- නිපාතසංග්‍රහ- සංයුත්තසංග්‍රහ- පණ්ණාසසංග්‍රහාදි පිටකත්‍රයෙහි පෙනෙන නො එක් සංග්‍රහභෙද ව්‍යවස්ථා කොට මෙසේ බුදුන් පිරිනිවි වෂීයෙහි ම මේ ප්‍රථම සඞ්ගායනාව සත්මසකින් නිමවූහ. ඒ සියල්ල තථාගතයන් ධර්මය දෙශනා කළ ශුඛමාගධිකභාෂාවෙන් ම තබා නලදී. සඞ්ගායනා රූඪ වූ සාර්ථකත්‍රිපිටකධර්මය මහා කාශ්‍යපස්ථවිරාදීන්ගේ ශිෂ්‍යානුශිෂ්‍යපරම්පරාව විසින් මුඛපාඨවශයෙන් ම ගෙන එන ලද්දේය.

ද්විතීය සඞ්ගායනාව. තථාගත පරිනිර්වාණයෙන් වෂීසියයක් ඉක්ම ගිය කල්හි විශාලානුවර වැසි වජ්ජිපුත්‍රකභික්ෂූහු "සිඞ්ගලොණකප්පා,,දි අකාර්‍ය දශවස්තුවක් ප්‍රකාශ කළහ. ඒ බැව් දත් **කාකණ්ඩපුත්‍රයශස්ථවිරයන්** වහන්සේමෙබඳු ශාසනමලයක් දැක දැක උපෙක්ෂාවීම නො මැනවැයි සලකා **රෙවතස්ථවිරප්‍රමුඛ** භික්ෂූන් සැට දහසක් රැස්කරවූහ. රෙවතස්ථවිරයන් විසින් විචාරනලදුව **සබ්බකාමි** නම් තෙරණුවෝ විනය විසඳූ දශවස්තු විනිශ්චය කළහ. මෙසේ ඒ අධිකරණය සමථයට පමුණුවනලදී. අනතුරුව ඒ සප්තවිරභික්ෂූහු ඒ අධිකරණය ම නිමිති කොට නැවතත් ධර්මවිනය සඞ්ගායනා කළ මැනවැයි සලකා **කාකණ්ඩපුත්‍රයශස්ථවිරප්‍රමුඛ** ත්‍රිපිටකපර්‍යාපන්නධර ප්‍රතිසංවිත්ප්‍රාප්ත වූ සත්සියයක් ක්ෂීණාශ්‍රවයන් නියම කොට විශාලානුවර **වාලුකාරාමයෙහි** රැස් ව **කාලාශොක** රජුගේ සහායයෙන් ප්‍රථමසඞ්ගායනාවෙහි සෙසින්ම පිටකාදිවශයෙන් සංග්‍රහකරමින් මේ දෙවන සඞ්ගායනාව අටමසකින් නිමකළහ.

තෘතීය සඞ්ගායනාව. සම්බුධපරිනිර්වාණයෙන් දෙසිය අටළොස්වසක් ඉක්ම ගිය සඳ ධර්මාශොකමහරජාණෝ දඹදිව ඓපවක්‍රවර්ත්තී වූහ. ඒ රජතෙම බුදුසසුන්හි පැහැද පැළලුප්නුවර අශොකාරාමය ආදි සුවාසූදහසක් විහාර කරවා සසුන්හි මහත්පූජා පැවැත් විය. එකල ප්‍රත්‍යයලාභයෙහි ගිජුවූ තීර්ථිකයෝ සසුන් වැද තමතමන්ගේ විෂම දෘෂ්ටින්ම ධර්මය විනය කොට දක්වමින් ශාසනයෙහි මහත් අර්බුද ඉපදවූහ. මේ අධිකරණය අතිශයින් බලවත්වූයෙන් ධර්මයෙන් විනයෙන් ශමථයට නො පැමිණවිය හැකිවිය. එහෙයින් ධර්මාශොකරජුගේ බලවත් සහායයෙන් සියලු භික්ෂූන් අශොකාරාමයට රැස් කරවා ශ්‍රමණවෙශ ධාරී වූ සැටදහසක් පමණ තීර්ථිකයන් නෙරපා ශාසනය ශුඛ කරන ලද්දේය.

මේ අධිකරණය නිමිතිකොට නැවතත් ධර්මය සඞ්ගායනා කළ මැනවැයි සැලකූ සප්තවිරභික්ෂූහු **මොග්ගලිපුත්තතිස්ස** සප්තවිරප්‍රමුඛ දහසක් ක්ෂීණාශ්‍රවයන් නියම කොට බුදුන් පිරිනිවි දෙසියපන්තිස්වන වෂීයෙහි **පැළලුප්නුවර අශොකාරාමයෙහි** රැස්ව **ධර්මාශොකරජුගේ** ආරක්ෂා ඇතිව පූර්වසඞ්ගායනා දෙකෙහි දී මෙන් ම පිටකාදිවශයෙන් සාර්ථකධර්මවිනය සඞ්ගායනා කොට නවමසකින් නිමවූහ.

මහින්ද්‍රාගමනය. සියලු ශාසනකර්ණවක විශෝධනය කොට තෘතීය මහාධර්මසඞ්ගායනාව නිමවා විදෙශයන්හි ධර්ම්ප්‍රචාරය සඳහා ධර්ම්දූතභික්ෂූන් යවන්නාවූ **මොග්ගලිපුත්ත තිස්ස සථවිරයන්** වහන්සේ ලඞ්කාබුද්ධශාසනප්‍රතිෂ්ඨාපනය සඳහා සඞ්ඝයා අතවැසි වූ **ඉට්ඨිය** **උත්තර සම්බල මහාමහින්ද්‍රසථවිර** ප්‍රමුඛ පඤ්චවර්ගික භික්ෂූන් නියම කළහ ඒ මහින්ද්‍රසථවිරයන් වහන්සේ ද සඞ්ගායනාත්‍රයෙහි ඇතුලත් වූ සාර්ථ කථාන්ත්‍රිපිටකධර්මය ද සියලු ආචාර්‍යවාදය ද සිංහල භූරුම්මුඛයෙන්ම ඉගෙන ධාරණය කරනසේක. උන්වහන්සේ බුදුන් පිරිනිවි දෙසිය‍යසක්ස්වන වර්ෂයෙහි පොසොන්මස පුණුපොහෝදවස් ලක්දිව් පැමිණ අඹතලා ගල්හි වැඩහිඳ ලඞ්කාධීශ්වර **දෙවානම්පියතිස්ස** මහරජාණන් දහම් දෙසිමෙන් **තිසරණ** ගන්වා නොබෝකලකින් සියලු සිංහලජනතාව ම බුද්ධාගමය පිළිගැන්වූහ. එසේ ම නොඑක් දහස්ගණන් සිංහල ජනයා පැවිදි- උපසපන් කරවා ඔවුනට වාර්ත්තාරයෙන් ම සාර්ථකථා ත්‍රිපිටකධර්මය ඉගැන්වූහ.

චතුර්ථසඞ්ගායනාව. එක් දිනක් ලක්දිව බුදුසසුන් පිහිටියේ හෝ නො වේ හෝ දැ?යි විචාළ රජුට **මහින්ද්‍රසථවිරයන්** වහන්සේ මහරජ! මේ දිවයින්හි ම උපන් මවුපියන්ගේ දරුවෙක් මෙහි මැ මහණ- උපසපන් වැ මෙහි මැ ධර්ම්චිනය ඉගෙන මෙහිදී මැ විනය දෙශනාකරන තෙක් ශාසනය මූලප්‍රතිෂ්ඨා නො වන්නේය යි ද, මේ කාර්‍යයෙහි **මහාඅරිෂ්ට** නම් භික්ෂුව ප්‍රබල යයි ද දැන්වූහ. ඊට පසු රජු විසින් **සතුපාරම විහාරයෙහි** කරවූ ධර්ම්මණ්ඩපයෙහි රැස් වූ මහා මහින්ද්‍රසථවිරප්‍රමුඛ අටසැටදහසක්භික්ෂූන්මධ්‍යයෙහි **මහාඅරිෂ්ට** නම් සථවිරයන් වහන්සේ ධර්ම්සනාරූඪ ව විනයපිටකය දෙශනා කළහ. මෙය පළමු දැක්වූ සඞ්ගායනාත්‍රයට අසමානවුව ද ලඞ්කාසම්බුද්ධශාසනයාගේ මූලප්‍රතිෂ්ඨාව සඳහා කළ හෙයින් ද- සඞ්ගායනාසදෘශ හෙයින් ද- **සනරවෙනි ධර්ම්සඞ්ගායනාව** වශයෙන් සලකනුලැබේ.

අර්ථකථා සිංහල භාෂාවෙන් ලිවීම. තථාගතපරිනිර්ව්‍රාණයෙන් සාර්ධශතවර්ෂීයක් ඉක්ම යන තුරු ද ත්‍රිපිටකපාලිය හෝ අර්ථකථා මාගධ භාෂාවෙන් හෝ අන්‍යභාෂාවකට පරිවර්ත්තනය කිරීමෙන් පදව්‍යඤ්ජනමාත්‍රයකුදු ලියනලද්දහු නො වෙති. මහින්ද්‍රසථවිරයන් වහන්සේ විසින් අර්ථකථා සහිත අචාර්‍යවාදය ද ලාඞ්කිකය අතවැසිගණයාට ඉගැන්වූබැව් යට කියනලදී. ඒ දූරදර්ශී වූ **සිංහල භික්ෂූහු** මාගධීඅර්ථකථා සහිත ථෙරවාදය මතාන්තරසංකලනයෙන් වලකනු සඳහා කඞ්ඩුකයකින් වසා තබන්නාක් මෙන් සිංහලයෙන් පරිවර්ත්තනය කොට ලියූහ. තථාගතධර්මය භාෂාන්තරපරිවර්ත්තිත වූ ප්‍රථමවාරය මෙය වේ. හෙද අර්ථකථා පමණෙකි. මේ ධර්ම්ලේඛනයෙහි ලා යම් ගෞරවයෙක් වේ නම්? එය සිංහලජනතාවට හා සිංහල භාෂාවට ද හිමි වේ. මේ අටුවා සමූහය **අනුරාධපුර මහා විහාරීය**

භික්ෂූන් විසින් ලියූ හෙයින් මහාවිහාරඅටුවා යි ද, හෙළටුවා යි ද ප්‍රකටවිය.

අවශෙෂ අර්ථකථා. මෙකී මහා අටුවාව හැර "මහාපච්චරියඅර්ථකථා, කුරුන්දියඅර්ථකථා, අන්ධකඅර්ථකථා, සඞ්ඛෙපඅර්ථකථා,, යයි අන්‍යඅර්ථකථා සතරක් ද වූහ. එහි පසුරෙක්හි වෙසෙමින් ලියූ අටුවාව **මහාපච්චරිය** නම් විය. එය යට දැක්වේ. කුරුටුවැලි නම් විහාරයෙහි වෙසෙමින් ලියූ අටුවාව **කුරුන්දිය** නම් වේ. අර්ථකථාවල "කුරුන්දවෙලලි,, යි ද මහාවංශයෙහි "කුරුන්දපාසක,, යි ද පෙනෙන මේ විහාරය බු: ව: 433 දී, රජපැමිණි **බලලාටනාග** රජු විසින් කරවූ හෙයින් කුරුන්දියඅටුවාව ඉන් පසු කලක ලියනලද්දක් වේ. ත්‍රිපිටක ධර්මයාගේ සංක්ෂෙපයෙන් අරුත් දැක්වීම පිණිස ලියනලද්දේ **සඞ්ඛෙප අර්ථකථා** නම් වූය. මේ අටුවා සියල්ල ම සිංහලයෙන් ම ලියනලද් දුහුයි. **අන්ධකඅර්ථකථා** නම්? "ආන්ධ,, යයි ප්‍රසිද්ධ වූ ද්‍රවිඩභාෂාවිශෙෂ යෙන් හෝ තදෙදෙශීය ආචාර්‍යවරයෙකුවිසින් සිංහලයෙන් ම ලියන ලද්දක් බව හැගේ.

බ්‍රාහ්මණතිස්සභය හා මහාපච්චරියඅටුවාව. වට්ටගාමණි අභයරජතෙම බු: ව: 439 වැන් නෙහිප්‍රථම වරට රජ විය. මෙකල **තිස්ස** නම් බමුණෙක් රාජ්‍යය සඳහා දැමරිකව හැසිරෙන්ට විය. බමුණුතෙම මහාජනයා විසින් **තිස්සොණ්ඩ** යයි හඳුන්වනුලැබිය. **පුලහත්‍ථාදි** ද්‍රවිඩයන්ගේ පැමිණීම ද මෙකල්හි ම විය. රජතෙම සිංහාසනය හැර වල්වැදුනේය මේ සොරබිය හා පරසතුරුබිය පවත්නාකල්හි මිහත් නියඟයකින් සස්‍යවිනාශයද විය. මේ නියඟය දෙළොස්වසක් පැවතුනේය. මේ කාලයෙහි ලක්‍ෂගණන් මහාජනයා ද දහස් ගණන් භික්ෂූන් ද මළහ. ලඞ්කාඉතිහාසයෙහි මෙපමණ අදුරුකාලයක් දැක්විය නොහැකි තරම්විය. මේ කල ඇතැම් භික්ෂූහු පරදෙස ගියහ. කිසිවෙක් පලාතොල කමින් ජීවත්වූ මිනිසුන් අතර ඉතා දුකසේ ජීවත්වූහ. කිසිවෙක් ශක්‍රයාගේ අනුදැනීම පරිදි දඹකොලපටුණ සමීපසාගරයෙහි හසුරක් කොට එහි වසූහ. මේ සියල්ලන්ගේ ම පරමාධ්‍යාශය වූයේ එතෙක් කල් ශ්‍රුතාරූඪ නොවූ ත්‍රිපිටකපරියාපත්තිය රැකගැනීමයි. එහෙයින් පසුරෙහි වසූ භික්ෂූහු පිටකත්‍රය සිත්හි ධරමින් සිංහලයෙන් අටුවා ලියූහ. ඕ **මහාපච්චරිඅර්ථකථා** නම් වූය. මේසියලු අටුවා අතුරෙහි මහාවිහාරීය අටුවාවම අතිශයින් ප්‍රශස්තද සම්පූර්ණ ද වූවාය.

පඤ්චම සඞ්ගායනාව හා ත්‍රිපිටකය ශ්‍රුතාරූඪකිරීම දෙළොස්වසක් පමණ ඉක්ම යන කල්හී බ්‍රාහ්මණතිස්සභය (බැමිණිටියාසාය) ක්‍රමයෙන් සංසිඳුනේය. බුදුන් පිරිනිවි වසී 454 ක් ඉක්මුනු කල්හි "පිතුමහාරාජ,, යයි ප්‍රසිද්ධ වළගම්බාතෙම නැවත රාජ්‍යයට පත්විය. පරදෙස ගිය භික්ෂූහු ද පෙරලා පැමිණි

යහ. මේ කල්හි ම මහාවිහාරයෙන් භින්නව අන්‍යනිකායක් අභයගිරි විහාරයෙහි පහළවිය. දුර්භික්ෂාදි මහාවිපත්තියෙන් පීඩිත වූ මහා විහාරීයභික්ෂූහු ලක්දිව නිකායාන්තරයන්ගේ සම්භවය හෙතුකොට සඞ්ඝායනාත්‍රයට පැමිණි අතිපරිශුඛ බුඛවචනය නිකායාන්තරසං සර්ගයෙන් කාලුෂ්‍යයට පැමිණියය හැකියයි ද අනාගතශාසනධාරීන්ගේ ධාරණ ප්‍රඥව අල්ප යයි ද සලකා ත්‍රිපිටකධර්මය ග්‍රන්ථාරූඪ කිරීමට නිශ්චය කරගත්හ. එහෙත් ලඞ්කාධිපති වළගම්බාහුරජු අභයගිරිපක්ෂය ගෙන සිටිහෙයින් ද අභයගිරිනිකායිකයින්ගෙන් පීඩා ඇතිවිය හැකි හෙයින්ද මහාවිහාරය හැර මාතුල (=මාතලේ) ජනපදයෙහි අලුවිහාරයට රැස්ව ධර්මසඞ්ගායනාව සඳහා ත්‍රිපිටකපර්‍යාපන්නධර පන්සියයක් ක්ෂීණාශ්‍රවයන් වහන්සේ නියම කළහ. ඒ භික්ෂූහු **මාතුලජනපදාධිපතිහුගේ** ආරක්ෂාඇතිව සියලු ධර්මවිනය පූර්ණසඞ්ගායනාවන්හි සෙයින් පිටකාදි වශයෙන් පිළිවෙළින් සඞ්ගායනා කොට ග්‍රන්ථයන්හි ලෙඛනය ද කළහ. මේ සේ බුදුන්පිරිනිවි සාරසිය සූපන්සවසක් ගතවූ කල්හි මුඛ පාඨවශයෙන් ගෙනා සියලු බුඞ්වචනය ප්‍රථම්වරට ග්‍රන්ථාරූඪ විය. මෙහි ගෞරවය ද ලක්දිවට ම හිමි වේ.

සූත්‍රපිටකය සිංහලයට නැඟීම ඒ පඤ්චම සඞ්ගායනා වෙහි පටන් ත්‍රිපිටකය මාගධ භාෂාවෙන් ද අර්ථකථා සිංහලභාෂාවෙන් ද පඨන පාඨන ලෙඛනාදි වශයෙන් පැවැත් තේය. බු: ව: 882 දී **රජ පැමිණි බුඛදාසරජු සමයෙහි මහාඛම්මකථි නම් සථවිරකෙනෙක් සූත්‍රපිටකය සිංහලට නැඟුහ. එය මේකල සම්පූර්ණයෙන් ම අභාවප්‍රාප්තයැ.**

මාගධ අර්ථකථා බු: ව: 953 දී **රජ** වූ **මහානාමරජු දවස** මෙහි **පැමිණි බුඛඝෝෂ** සථවිරයන් වහන්සේ සිංහල භාෂාවෙන් ලියා තුබූ සියලු අටුවා සසඳමින් මහාවිහාරඅටුවාව ප්‍රමුඛස්ථානයෙහි තබා මාගධභාෂාවෙන් පරිවර්තනය කළහ. **සමහර** අටුවා **බදරතීර්ථ ධර්මපාල- බුඛදත්ත- උපසේන- මහානාම** ආචාර්‍යවරයන් විසින් පරිවර්තිතවූහ. මෙතැන් සිට **සාර්ථකථා** ත්‍රිපිටකධර්මය ග්‍රන්ථාරූඪවූයේ ලක්දිව හා විදෙශයන්හි ද ව්‍යාප්තවිය.

අර්ථකථාග්‍රන්ථ පද හෙළටුවා පරිවර්තනය කළ පසු මාගධභාෂාමය අටුවාවන්ට ගිහිපැවිදි පඬිවරයන් විසින් **මහාගණ්ඨිපද-මජ්ඣිමගණ්ඨිපද- චූලගණ්ඨිපද** යයි සිංහලයෙන් ලියූ ගැට පද ග්‍රන්ථසමූහයක් ද විය. හෙද පොළොන්නරු සමයෙහි **ශාරිපුත්‍රසථවිරයන්** වහන්සේ විසින් ටීකානිපදවීමෙන් පසු අභාවයට ගියබැවි පෙනේ. එයින් ශෙෂව පවත්නා බු: ව: 473 දී **රජපැමිණි 5 වෙනි කශ්‍යපරජු** විසින් ලියනලද **දම් පියා අටුවා ගැටපදය** ධර්මාර්කාමින්ගේ සිත් දිනමින් සිංහල සාහිත්‍යයෙහි අභිෂෙක ලැබ පවතී.

හෙළටුවා විනාශය. බුඩසෝෂ තෙරුන්ගේ හෙළටුවා පරිවර්තනයෙන් පසු ද ඒවා බොහෝ කලක් නිරූපද්‍රවව පැවැත් තේය. "මාගධී පරිවර්තනයෙන් හෙළටුවා විනාශය විය,, යනු සාවද්‍යමත යෙකි. දම්පියා අටුවා ගැටපද විසුඩිමග්ගසන්නා ආදියෙහි පාඨ ප්‍රදේශ දක්නා ලැබෙන හෙයිනි. කාලිඩගමාඝාදීන්ගේ දුෂ්ටක්‍රියා මාගීය නිසා අන්‍ය වැදගත් සිංහලග්‍රන්ථයන් සමග හෙළටුවා ද විනාශවූ බව සැල කිය යුතුයි.

අට්ඨකථාසංරක්ෂණය. මාගධියට නැඟූ අටුවා විදෙශයන්හිද ගෙන ගියබැව් යට කියනලදී. ලක්දිව මාගධී අටුවා ද හෙළටුවා සමග බොහෝ සෙයින් අභාවයට ගියේය. එසේ අභාවයට ගිය බොහෝ ග්‍රන්ථ පිටරටින් ගෙන්වූ වාර ද සඳහන් වේ. යම් හෙයකින් මාගධී පරිවර්තනය නො වී නම් අද ත්‍රිපිටකාරූඪ කථාවලින් වැඩිකොටසක් ලොකයෙන් අතුරුදහන් වනු නියතයි. එහෙයින් බුඩ ඝෝෂක්‍රියා මාගීය අටුවා රැකීමෙහි ලා අතිශයින් උදාරවිය. ඒ මාගී යෙන් ම දැනුදු හැකිතාක් හෙළටුවා නිපදවා ගැනීමට ඉඩ තිබේ. විශෙෂයෙක් නම්? දූරාතීතයෙහි පැවති (දැනට සෙල්ලිපිවල) භාෂා වෙන් නො ලැබීම පමණකි. අවුරුදු දහසකින් මෙපිට කවර ශත වර්ෂයක නමුත් භාවිත වූ හෙළුවට සම්වන පරිදි නිපදවා ගැනීමට ඇති බාධාව කුමක් ද? ධම්මපදඅඨකථා ජාතකඅඨකථා ආදිය මාගධී අටු වාවෙන් පරිවර්තිතව දැනුදු පවතී. එහෙත් ඒ විශෙෂ ධර්මග්‍රන්ථ වශයෙනි.

අභිනව හෙළටුවා. දැනට සිංහලයට නහා තිබෙන අටුවා කිප යෙන් සිංහලජනතාවට ලැබී තිබෙන ප්‍රයොජනය මහත් වේ. සෙසු අටුවා ද සිංහලයට නහාලීමෙහි යොග්‍යකිය සැලකූ ඡින්වත්තේ සොමාතඤතිස්සා'භිධාන මහාසථවිරයන් වහන්සේ විසින් ආරාධිත වැ **මොල්ලිගොඩ ප්‍රවච්නොදය පරිවෙණාධිඡවරව** වැඩවිසූ අපගේආචාර්‍ය්‍ය **ශ්‍රී මහාවිහාරවංශාලංකාර විමලකිත්ති ශ්‍රී ඉඤ ජොත්‍යභිධාන රසිගම නායකතෙරාණන් වහන්සේ මනොරථපූරණී** නම් අඞ්ගුත්තරනිකායාර්ථකථාව පරිවර්තනවාරයෙන් **මනොරඤජනී** නම් සිංහල අටුවා නිපදවූහ. එයින් කොටසක් මුද්‍රිත වැ තදනිලා ඡින්ගේ ඉෂ්ටාර්ථසිඩිය කෙරේ. (තත්කර්තව්‍යාධිකාරීන්ගේ ප්‍රමාදයෙන් ඉතිරි කොටස මේ තාක් මුද්‍රණය වී නැත.) **පපඤචසූදනී** නම් මධ්‍යම නිකායාර්ථකථාව ද හෙළටුවාවක් කිරීමෙහි අභිලාෂී වූ ඡිටි නායක මාහිමියාණන් තත්කාර්‍ය්‍යසිඩිය අනිෂ්පත්තිනව ම සවගී පරායණ වූහ. තදඩ්ගාශය පූරණයෙහි ලා අපගේ මේ ව්‍යාපාරය වන්නේය.

පපඤචසූදනී. සඩ්ගායනාත්‍රයට ම ආරොපිත වූ මධ්‍යමනිකායාර්ථකථාව යට කී ලෙසින් හෙළබසින් තබනලද්දී පසුව මාගධියට නගනලද්දීය. ඔතොමෝ ධම්මෙහකින් ධර්මයාගේ විසතරාර්ථ

ප්‍රසවය කරන්නී ද එහෙයින් **පපඤ්චසූදනී** නම් වූය. මෝ අට්ඨවාව ලඞ්කා-සියම්-බුරුමාදි රටවල ආචාර්‍යවරයන් විසින් සංශොධිත වැ මුද්‍රිතවූවා පවතී. එයින් ශ්‍රීමත් අතිගරු **සර් රොබට් චාම්බර්ස්** උතුමාණන් විසින් ආරාධිතවැ කරනලද විද්‍යාලඞ්කාරපරිවෙණාධිශ්වර වැ විසූ **ඛමී කිත්තිනි ශ්‍රී ධම්මාරාමාධිඛාන නායකසඞ්ඝස්වාමීන්ද්‍රයන් වහන්සේගේ** සංශොධනය ම අතිශයින් අනාකුල ද ප්‍රශස්ත ද වන්නේය.

ප්‍රපඤ්චදීපිකා. ඒ පපඤ්චසූදනී නම් මගධී අට්ඨවා නැවත සරල වූ සිංහලභාෂාවට නගනලද්දී ඒසත්‍යරාර්‍යයන් ප්‍රකාශ කරන්නී නු යි **ප්‍රපඤ්චදීපිකා** නම් වූය. මේ පරිවර්තනයෙහිදී ශ්‍රී ධම්මාරාම නායකසඞ්ඝස්වාමීන්ද්‍රයන්ගේ සංසඤ්ඤරණය මූලස්ථානයෙහි තබා සුදුසු තැන්හි සෙසු අට්ඨකථා හා බම්බලපිටියේ වජිරපුඤ්ඤකාලයඤ්ඤ ටීකාව ද අපවිසින් ඇසුරු කරනලදී.

උපඤ්ඤඤ්ඤ. අපගේ මේ සද්ව්‍යාපාරය **"ප්‍රවචනොදය,, පරිවෙණාධිපති පණ්ඩිතාවාර්‍ය ශ්‍රී සඞ්ඝරක්ඛිතාභිධාන නායකස්වාමීන්ගේ** සංශොධනපූර්‍වක වැ ප්‍රතිග්‍රහණය කිරීමෙන් ද-තත්පරිවෙණාධිපප්‍රධානාචාර්‍ය **මොල්ලිගොඩ ඔබේ අරියවංසාභිධාන මහා ස්ථවිර සඞ්ඝරාජයන් වහන්සේ** ද- **පරිවෙණාපාචාර්‍ය පණ්ඩිත හල්ලොට ගිරිමානඤ්ඤාභිධාන** මහාස්ථවිරයන් වහන්සේ ද- **කළුතර දෙවානඤ්ඤාභිධාන** ස්ථවිරයන් වහන්සේ ද යන අසමදෘශ්‍යෝත්තමයන් විසින් දුරවබෝධ වූ සියලු ස්ථානයන් කරුණාපූර්‍වඞ්ඛ මාධ්‍යාශයයෙන් සුබෝධ කරදීමාදිවශයෙන් ද අතිශයින් සාර්‍ථක කළ බැව් අත්‍යන්තගෞරවාවනත වැ ප්‍රකාශ කරම්හ. තවද **වවුලුගල සිරිධම්මරක්ඛිතාරාමාධිපති අසමදෘශ්‍යාර්‍ය එල්ලාවල විමලරතනාභිධාන මහාස්ථවිරපාදයන්වහන්සේ** හා **දළදාවත්තේ මහාවිහාරාධිපති පණාගොඩ ශ්‍රී රෙවත ධම්මරත්නාභිධාන නායක සඞ්ඝස්වාමීන්ද්‍රයන් වහන්සේ** හා **මඩපාත සුමනඤ්ඤති ආයුඤ්ඤමනාණන්** ද මෙහි ලා අතිශයින් ආධාර කළ බැව් ද, විශෙෂයෙන් ම අප ප්‍රියසබ්‍රහ්මචාරී වූ **සිරි ධම්මරක්ඛිතාරාමවාසී මොල්ලිගොඩ පියරතන ආයුඤ්ඤමනාණන්** විසින් මුද්‍රණයෙහි දී ශුද්ධිපත්‍ර බැලීම් ආදිවශයෙන් සම්ප්‍රකාරයෙන් උපසඤ්ඤම්භක වූ බැව් ද කෘතවෙදී වැ සඳහන් කරම්හ.

එසේ ම විශෙෂ උනන්දුවක් දක්වමින් මෙහි මුද්‍රණකාර්‍යය ඉතා සිත්කලුලෙස කරවාදුන් හොරණ විද්‍යාශෙඛර යන්ත්‍රාලයාධිපති **ඒ. ඩී. බර්නාඩ් අප්පුහාමි** ද ඒ සඳහා ආධාර කළ අප භ්‍රාතෘභූත ලබුගම **පී. දැවිත් පෙරේරා** මහතාණන් හා අන්‍යත් සියලු පින්වතුන් ද මෙහිදී කෘතඥතා පූර්‍වක වැ පුණ්‍යානුමොදනාචාරයෙන් සිහිපත් කරමු.

ප්‍රයොජන. ඉතා සවිස්තර වූ ද ගම්භීර වූ ද දුරවබෝධ වූ ද ධර්ම පදවීයන් සරලවූ හෙළදිව් බසින් දක්වා තිබෙන හෙයින් ධර්මාභිලාෂීන්ට මේ **ග්‍රන්ථරත්නය** විනා**මාණික්‍යයක් සම්මාන වන්නේය.**

සිංහල සාහිත්‍යයට ද මහත්වූ උපසථමහයෙක් වන්නේය. එසේ ම අපගේ මේ උත්සාහය සම්බුඩපයත්‍රීපති ශාසනයාගේ අභිවෘඩියට ඉවහල් වේවා යි ප්‍රාර්ථනා කරමු.

තවද- දැනට සිංහලයට පරිවර්තනය නොවී පවත්නා සියලු අටුවා ම යථාවකාශයෙන් පරිවර්තනයකොට අභිනවහෙළවුවා සුලභකිරීමඅපගේ බලාපොරොත්තුව වේ. මීට සැදැහැවත් බෞඩමහාජනයාගේ විශෙෂා ධාරය ලැබේවා යි බලාපොරොත්තු වෙමු.

නැවත මුද්‍රණය "ප්‍රවවනොදය,, පරිවෙණාධිපතීන් වහන්සේට අභිමතපරිදි වියයුතුයි.

ලබුගම ලඩකානන්ද.

ශ්‍රී බුඩවර්ෂ දෙදහස්සාරසිය එකුන්අසූ (2479) ක් වැ
බිනරමස අමාවක් ලත් ක්‍රි: වර්ෂ 1936 ක් වැ සැප්තැම්බර් මස
15 වෙනි කුජදින මොල්ලිගොඩ ප්‍රවවනොදය පිරිවෙන්හිදීය.

ප්‍රපඤ්චසූදනී වර්ණනීත විෂය.

ග්‍රන්ථාරම්භය. 1–5

1 ග්‍රන්ථප්‍රමාණය. 5

1 මූලපරියාය සූත්‍රවර්ණනා. 6–69

1 නිදානවර්ණනා. 6–19
2 "එවං" ශබ්දාර්ථය. 6
3 "මේ" ශබ්දය. 7
4 "සුත" ශබ්දය. "
5 "එවමේව සුතං" 8
6 "සමය" ශබ්දය. 11
7 "භගවා" යන පදය. 13
8 "උක්කට්ඨා" නගරය. 14
9 සුභගවනය. 15
10 "සාල" ශබ්දය. "
11 "මූල" ශබ්දය. 16
12 "භික්ඛු" ශබ්දය. 17
13 දෙශනාකාලයෙහි භික්ෂූන් ඇමතීම. 18
14 සූත්‍රනික්ෂෙපය චතුර්විධ වේ. 19
15 මූලපරියාය සූත්‍රයෙහි අර්ථාපත්තිය. 20
16 "සබ්බ" ශබ්දය. 21
16 "ධම්ම" ශබ්දය. "
18 "පරියාය" ශබ්දය. "
19 "වෝ" ශබ්දය. 22
20 "සාධුකා, සාධු" ශබ්දවය. "
21 "ඉධ" ශබ්දය. 24
22 පෘථග්ජනයා. 25
23 ආර්‍යයෝ. 26
24 සත්පුරුෂයෝ. "
25 මහලුපැවිද්ද. 27
26 විවිධවිනය. "
27 සංවරවිනය. 28
28 ප්‍රහාණවිනය. "
29 චතුර්විධ දෙශනාව. 30
30 චතුර්විධ පෘථිවිය. "
31 පෘථිවිය පිළිබඳ ත්‍රිවිධමණ්ඩනා. 31
32 ත්‍රිවිධපරිඥ 35
33 ලක්ෂණහාරය. 36
34 "භූත" ශබ්දය. 37
35 දෙවියෝ 39
36 ප්‍රජාපති හෙවත් මාරයා. "
37 "බ්‍රහ්ම" ශබ්දය. 40
38 පරමදෘෂ්ටධර්ම නිර්වාණය. 44
39 ශෛක්ෂයා. 48
40 "මානස" ශබ්දය. 49
41 විවිධ ප්‍රාර්ථනා. "
42 "තථාගත" ශබ්දය. 54
43 ප්‍රතීත්‍යසමුත්පාදය. 63
44 "බෝධි" ශබ්දය. 64
45 මූලපරියාය ජාතකය 67
46 "ගොතමක" සූත්‍රය. 69

2. සබ්බාසව සූත්‍රවර්ණනා. 70–98

1 සැවැත්නුවර. 70
2 ජේතවනය. 71
5 සංවරය. 73
6 ආශ්‍රවක්ෂය. 74
7 "මහාතිස්ස භූති,, තෙරවත 77
8 "වා,, ශබ්දය. 78
9 තමා ඇතිබව සැකකිරීම. 80
10 තමා නැතිබව සැකකිරීම ,,
11 චතුස්සත්‍ය කර්මස්ථානික යාගේ යොනිසෝ මනසිකාරය 83
3 අනේ පිඬු සිටාණෙනි. 71
4 ආශ්‍රව. 72
12 "සඞ්ඛා,, ශබ්දය. 85
13 "ලොමසනාග,, තෙරවත 88
14 "පධානිය,, තෙරවත 89
15 "දීඝභාණක අභය,, තෙරවත ,,
16 සිතුල්පව්වැසි "පධානිය,, තෙරවත. 90
17 නවමහා විතර්ක 92
18 බොධ්‍යඞ්ග වර්ණනා 93

3. ධම්මදායාද සූත්‍රවර්ණනා. 99–120

1 ධම්මදායාද සූත්‍ර අවෝත්පත්තිය 99
2 විවිධ ධර්ම හා ආමිෂය 100
3 ආමිෂදායාදය හා ධම්මදායාදය 102
4 ආමිෂදායාදයෙහි ආදීනව 103
5 ධම්මදායාදයෙහි ආනිශංස 104
6 චතුර්විධපවාරණය ,,
7 "සිහා,, ශබ්දය 105
8 "වුත්ත,, ශබ්දය 106
9 පිණ්ඩපාතය නො වැලඳිය යුතු කරුණු පස ,,
10 පිණ්ඩපාත ප්‍රතික්ෂේපකළ මහණ පැසසියයුතු බැව් 107
11 දශකථාවස්තු 109
12 ත්‍රිවිධශික්ෂාව ,,
13 බුදුහු දෙසුම් නො නිමවා විහාරයට පිවිසීම 110
14 "ඨාන,, ශබ්දය 113
15 මධ්‍යමප්‍රතිපදාව 116
16 ක්‍රෝධාදිහු ලක්ෂණාදි වශයෙන් 117
17 මධ්‍යමප්‍රතිපදාව භෙදාදි වශයෙන් 119

4. භයභෙරව සූත්‍රවර්ණනා. 121–150

1 භාග්‍යවත්හු දෙවිමිනිසුන් විසින් එලඹිය යුතුබව 121
2 නිමිත්තලක්ෂණ 122
3 විවිධකුලප්‍රත්‍රයෝ ,,
4 බොධිසත්ව 124
5 පියගාමිකාවස්තුව 127
6 දෙවැදෑරුම් සිහිය 128
7 "මඟ,, ශබ්දය. 130
8 "ගොදත්ත,, තෙරවත. 133
9 "කාළදෙව,, තෙරවත ,,
10 සතරධ්‍යානය. 134
11 ත්‍රිවිද්‍යාව. 135
12 ප්‍රත්‍යවෙක්ෂා ඥානය. 137
13 "අභික්කන්ත,, ශබ්දය. 139

14 ආමෙඬිතය. 140
15 දෙශනාප්‍රශංසා 141
16 සරණය සරණගමනය හා සරණගතයා. 143
17 සරණගමනප්‍රභෙද ,,
18 ලොකොත්තර සරණගමනානිශංස. 146
19 ලෞකිකසරණ ගමනානිශංස 147
20 සරණගමනයාගේ කෙලෙසීම හා බිඳීම. 148
21 උපාසකවිධිකෞශල්‍යය පිණිස ප්‍රකීර්ණක කථා. ,,
22 "අඤ්ඤ,, ශබ්දය. 150

5 අනඞ්ගණ සූත්‍රවර්ණනා. 151–167

1 විවිධදෙශනාව. 151
2 පුද්ගලකථා. 152
3 "අඞ්ගණ,, ශබ්දය. 153
4 "අහොවත,, ශබ්දය. 158
5 ත්‍රිවිධලූඛතා. 163
6 "නාඟ,, ශබ්දය. 166

6 ආකඞ්ඛෙය්‍ය සූත්‍රවර්ණනා. 168–179.

1 "සම්පන්න,, ශබ්දය. 168
2 ක්ෂෙත්‍රදෙශ සතර ,,
3 ශීලදෙශ සතර. 169
4 විෂකණ්ටකවාණිජයා. 170
5 සපත්නානුපස්සනා. 171
6 චිත්තෙකාග්‍රතාවය හා සංසකාරපරිග්‍රදය සීලය රක්නාබව. 172
7 අරියකොටියවාසී මහා දත්ත තෙරවත. 174

7 වස්ස සූත්‍රවර්ණනා. 180-194

1 උපමාදෙශනා. 180
2 විවිධදුගීතිය. 182
3 විවිධසුගතිය ,,
4 කළඟුණ නසන්නා. 183
5 කෙරාටිකයා. 184
6 සාරම්භය. ,,
7 කෙලශප්‍රහාණය. 185
8 "වෙද,, ශබ්දය. 187
9 "උක්කා,, ශබ්දය. 188
10 ත්‍රිවිධඅනුසන්ධි. 189
11 විවිධකුලපුත්‍රයෝ. 193

8. සල්ලෙඛ සූත්‍රවර්ණනා. 195–219

1 අභිවාදනය 195
2 අධිමානිකයා 197
3 තළඟුරුවැසි ධම්මදින්න තෙරණුවෝ 198
4 සල්ලෙඛය 200
5 චිත්තොත්පාදය 205
6 විහිංසාදීන්ගේ දුරලීම 206
7 ධම්මපිටකයෝ පැසසුම් පමණක් ලබත් 207

9. සම්මාදිට්ඨි සුත්‍රවණ්ණනා 210-239

1 සම්‍යග්දෘෂ්ටිය 210
2 සම්‍යග්දෘෂ්ටිකයා ,,
3 කර්මපථවර්ණනා 211-220
4 ප්‍රාණඝාතය 212
5 අදත්තාදානය ,,
6 කාමමිථ්‍යාචාරය 213
7 මෘෂාවාදය ,,
8 පෛශුන්‍ය-පරුෂවචන-සම්ප්‍රලාප 214
9 ගම්දරුවෙකුගේ වස්තුව 215
10 අභිධ්‍යා-ව්‍යාපාද-මිථ්‍යා දෘෂ්ටි ,,
11 දශඅකුශලකර්මපථ විභාගය 216
12 ත්‍රිවිධචරිතය 217
13 වක්කනඋපාසකයා 218
14 උතුරුවඩමන්වැසි උපාසකයා ,,
15 කුශලවිභාගය 219
16 ආහාරවර්ණනා 220-228
17 කබළීඞ්කාරාහාරය 222
18 ඵස්සාදිආහාර 223
19 පුත්තමංසූපමා 225
20 නිච්චමගාවූපමා 226
21 අඞ්ගාරකාසූපමා 227
22 සත්තිසතාහතූපමා ,,
23 සත්‍යවර්ණනා 229
24 ජරාමරණවර්ණනා ,,
25 විවිධජරා 230
26 ජාතිවර්ණනා 231
27 භවවර්ණනා 232
28 උපාදානවර්ණනා ,,
29 තෘෂ්ණාවර්ණනා 233
30 වේදනාවර්ණනා 235
31 ස්පර්ශවර්ණනා ,,
32 ෂඩායතනවර්ණනා ,,
33 නාමරූප වර්ණනා 236
34 විඥානවර්ණනා ,,
35 සංස්කාරවර්ණනා 237
36 අවිද්‍යාවර්ණනා ,,
37 ආශ්‍රවවර්ණනා 238

10. සතිපට්ඨාන සුත්‍රවණ්ණනා. 239-320

1 කුරුජ්ජනපදය 239
2 කම්මාසධම්ම 240
3 කුරුවැසියන්ගේ ඥානබලය 241
4 ඒවට්ටන් මෙනෙහී කළ සුව පොතකයා 242
5 එකායන්මාර්ගය පිළිබඳ විරුද්ධමත නිරාකරණය 244
6 එකායනමාර්ගය පිළිබඳ ධර්මාකාරය 245
7 තිස්සතෙර 249
8 තිසරණිකභූහු 250
9 පීතම්බලතෙර 251
10 සක්දෙවිරජ 252
11 සුබ්‍රහ්මදෙවිපිත් ,,
12 එකායනමාර්ගය 254
13 සතිපට්ඨාන 255
14 සතිපට්ඨානඅනුස්මෘතිය 256
15 උද්දේශවාර කථා 258-265
16 "කාය" ශබ්දය 259
17 නිද්දේශවාරකථා 265-320
18 කායානුපස්සනා 265-294
19 සේනාසනපරිග්‍රහය 266
20 ආනාපානපර්ව 268-270

21	ඒඝ්‍යාපථපඥය	270-273
22	චතුර්විධසම්ප්‍ර ජන්‍යය	273-290
23	අශුභදශීන්‍යවස්තුව	274
24	හරණප්‍රහාරණ චතුක්කය	275
25	ගතප්‍රත්‍යාගතික්‍රවත	277
26	ආළින්දකවැසි මහාඵුස්ස දෙවතෙර	277
27	කළුවැල්මඩුවැසි මහා නාගතෙර	278
28	ගලඔතොට පන්සක් භික්ෂූහු	,,
29	මහතෙරවත	285
30	ප්‍රතිකූලමනස්කාර පඥය	290-291
31	ධාතුමනස්කාර පඥය	291-292
32	සිවථිකපඥය	292-293
33	වෙදනානුපස්සනා	294-298
34	සිතුල්පව්වැසි තෙරණුවෝ	429
35	විවිධකර්මස්ථානය	295
36	අරූපකර්මස්ථානය	,,
37	චිත්තානුපස්සනා	299
38	ධම්මානුපස්සනා	300-320
39	නීවරණ පඥය	300-306
40	සඤ්ඤාපඥය	305-306
41	ආයතනපඥය	306-308
42	බොධ්‍යඞ්ගපඥය	308-319
43	සම්‍යතිසම්බොධ්‍යඞ්ගය	308
44	ධම්මවිචය ,,	309
45	වස්තුවිශදක්‍රියා	,,
46	ඉන්ද්‍රියසමතාය	310
47	වීර්‍යසම්බොධ්‍යඞ්ගය	311
48	මහාමිත්තතෙර	312
49	ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය	315
50	ප්‍රශ්‍රබ්ධි ,,	316
51	සමාධි ,,	,,
52	සංවෙගවස්තු	317
53	උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය	,,
54	චතුස්සත්‍යපඥය	319

ප්‍රපඤ්චදීපිකා මැදුම්සඟී අටුවාවෙහි අවොධාන පදානුක්‍රමණිකා.

උධෘතපද.	පිට.
අකසිරලාභී	175
අකිඤ්චලාභී	,,
අකුසලඤ්ච පජානාති	211
අකුසලමූලඤ්ච පජානාති	,,
අකුසලං	125
අගාරසමා	122-193
අගොචරෙ	91
අඝං	159
අඝපිණ්ඩං	,,
අඝාසනං	,,
අඝෙහාදකං	,,
අඩඝණං අඩඝණං	157
අචිරපක්කන්තස්ස	111
අචඡං	188
අඤ්ඤතණඝං	97
අඤ්ඤතඝෙන	150
අඤ්ඤතඤ්ඤතබ්භිඛ්වා	269-272
අඤ්ඤතං කතංකම්පි හොති	80
අඤ්ඤතං වෙතොසමථ මනුයුත්තෙහා	171
අඤ්ඤතං වා	290
අඤ්ඤතරො	194
අඤ්ඤමඤ්ඤස්ස	167
අඤ්ඤි	320
අඤ්ඤුණං	238
අඤ්ඤුතුං	112
අඤ්ඤෙසා	163
අඤ්ඤෙඤ්ඤන	293
අඤ්ඤෙඤ්ඤුපි පරියායො	221
අඪඪගිකා	116-246
අණුමත්තෙසු	169
අතික්කමම රූපෙ	176
අතිමානී	203

උධෘතපද	පිට.
අතිමාන	184
අතිරෙකධම්ම	105
අත්තනාව අත්තානං සඤ්ඣානාමි	81
අත්තනො ච දිඨධම්ම සුඛවිහාරං	139
අත්තමනවාචං නිච්ඡාරෙසි	165
අත්තමනා තෙ භික්ඛු	98
අත්තමනො	165
අත්තවාදපටිසංයුත්තා	195
අත්තනාව අත්තානං	81
අත්තවාදූපාදාන	233
අත්තුක්කංසකා පරවම්භී	127
අත්ථවස	139
අත්ථවෙදං	187
අත්ථාය	133
අත්ථාය හිතාය සුඛාය දෙව මනුස්සානං	,,
අත්ථි ඉදං	190
අත්ථි කායොති වා පනස්ස	269-272
අත්ථි මේ අඤ්ඤතං අඩඝණන්ති යථාභූතං පජානාති	154
අත්ථි මේ අත්තා	81-82
අත්ථි මේ තුමෙහාසු-පෙ-නො ආමිසදායාදා	102 103
අථ	105-121-164
අථ ඛො අසුයෙව මෙ පුරිමො භික්ඛු	107
අථ ඛවාහං	164
අථ දුකියස්ස	106
අදන්න	208
අදින්නාදාන	212

අදිස්නාදුකී 201
අඩානං 80
අඩිකාකකං 191
අනගාරියං 122-193
අනධිවාසයතෝ 90
අනභාවං ගමේනි 92
අනභිසම්බුඩසස 124
අනාගාමිතා 320
අනාවතනිධමේමා තසමා
ලොකා 178
අනාසනෙ 91
අනිරාකතජඣානො 171
අනිසසිතො ච විහරති 270
අනුකම්පිතරූපා 139
අනුකම්පං උපාදාය 209
අනුගහාය 221
අනුතතරං 49-64-299
අනුබංසෙසසති 156
අනුපපතතසදතො 51
අනුපපන්නා ච ආසවා
උපපජජනති 76
අනුමොදෙයයං 160
අනුරහො මං 158
අනුසම්බතො 181
අනුසෙනති 196
අනෙකවිහිතං ඉඞ්ඛිධං 178
අනෙකවිහිතා 195
අනෙකසූපං අනෙක
බ්‍යඤ්ජනං 164
අනොත්තාපී 204
අනතමකාසි දුකඛසස 98
අනතරධානං 231
අනතරාපණං 163
අනතරෙන සිනානෙන 190
අනිකාරෙ 141
අපවිසෙවතො 88
අපරිඤඤතං තසස 39
අපරිනිබබුත 208
අපරිසුඩකායකමමනත
සනෙතුසහෙතු 124
අපරිසුඩකායකමමනතා 124
අපරිසුඩමනොකමමනතා 126
අපරිසුඩවචිකමමනතා 125
අපරිසුඩතතා භිකඛවෙ
වතථසස 181
අපරිසුඩවණණමෙවසස ,,
අපරිසුඩාජීවා 126
අපරෙන සමයෙන 130
අපපටිපුගගලො 158
අපපතතමානස 49
අපපමතතසස 136
අපපමතතා 203
අපපසසුතා 204
අපපහරිතෙ 105
අපපාණකෙ 106
අපෙපවනාම පයෙසයයං 130
අබුහමචාරී 202
අභික්කනතෙන පටික්කනතෙන 273
අභිඤඤා 183-215
අභිඤඤාලූ 126-202
අභිඤඤාලු බ්‍යාපන්නචිතතා 203
අභිසඤඤතා 129
අභිසඤඤය සංවතතති 116
අභිනීහාරමෙසිං 135
අභිනිබබතති 231
අභිභූ 41
අභිලක්ඛිතා 129
අභිසම්බුඩො 65
අමනසිකාරණීයානං ධම්මානං
මනසිකාරා 79
අමනසිකාරණීයෙ 78
අමහගගතං 299
අමුත්‍ර උපපාදිං 135
අයමෙව 116
අයං ඛො ආවුසො 157
අයං ඛො මේ බ්‍රාහමණ 135-138
අයං වුච්චතාවුසො ජාති 232
අයං වො අම්හාකං
අනුසාසනී 209

අයොනිසොමනසිකාරෙ 75
අයොනිසොමනසිකරොතො 76
අරඤ්ඤගතො වා 266-267
අරඤ්ඤ වනපත්ථානි 123
අරඤ්ඤ විහාරාය 125
අරති 174
අරතිරතිසහො අසසං ,,
අරහතා 194
අරහං 50
අරහං සම්මා සම්බුඩ්ඩො 62
අරියධම්මස්ස අකොවිදෙ 27
අරියධම්මෙ අවිනීතො 27-96
අරියා 125
අරියානං අදස්සාවී 26
අරිය 116
අලොභො කුසලමූලං 219
අවාපුරිතා 163
අවිජ්ජං පහාය 220
අවිජ්ජා 136-137-138
අවිජ්ජාසමුදයා 237-238
අවිජ්ජාසවො 78
අවිනිපාතධම්මො 177
අවිනීත 27-208
අවිපරිණාමධම්මො 82
අවිමුත්තං 299
අවීචිං 182
අවුපසන්තා 127
අවෙච්චපසාදෙන 186
අවහයන්ති 125
අසන්තං 300-309
අසමාහිතං 299
අසමාහිතා 128
අසමපජානා ,,
අසම්මොහධම්මො 133
අසාරඩ්ඩො 134
අසිතෙ 287
අසිති දිඝිමානානුසයං
සමූහනිත්වා 220
අස්සඩා 165-203
අස්සුතවා පුථුජ්ජනො 24
අහං ඛො පන බ්‍රාහ්මණ
-පෙ-සඤ්ඤාතාම් 132
අහං තෙසං අඤ්ඤතමො 125
අහං නු ඛො සම් 80
අහම්පි තෙන ආදිස්සෙ
භවෙය්‍යං 103-104
අහො වත 158
අහොසිං නුඛො න නු ඛො 79
අහිරිකා 203
ආකඞ්ඛෙය්‍ය වෙ 170
ආකාසානඤ්චායතනං 42
ආචාරගොචරසම්පන්නා 169
ආජීවිකො 165
ආතාපිනො 136
ආතාපී 193-261-263
ආදිමෙව 196
ආධානභාගී 204
ආපං ආපතො 35
ආපණා වා කම්මාරකුලා වා 155
ආපන්නා අස්සං 157
ආපාදිං 125
ආහතා 155
ආහස්සර 41
ආභිවෙතසිකානං 175
ආමන්තෙසි 17
ආමිසඤ්ඤතරං 106
ආයතනානං 232
ආයස්මන්තං යෙව
සාරිපුත්තං පටිභාතු 112
ආයස්මා 111
ආයුනො සංහානි ඉන්ද්‍රියානං
පරිපාකො 230
ආරඩ්ඩං ඛො පන මෙ
බ්‍රාහ්මණ විරියං අහොසි 134
ආරඩ්ඩ විරියා 204
ආරම්මගතානං 160

ආරාමවෙතියානි 130
ආරුප්පා 176
ආලොකො 136
ආවුසො භික්ඛවෙ 111
ආසවසම්භවා 238
ආසවානං ඛයං 74–178
ආසවානං ඛයඤාණාය 137
ආසවානං ඛයා 178
ආසවා විඝාතපරිළාහා 87
ආහාරං 221
ඉඤ්ජාවචරානං 157
ඉති අජ්ඣත්තං වා 269–272
290–291–292–293–298–299
ඉති අයං ච ජරා ඉදං ච
මරණං ඉදං වුච්චතාවුසො 231
ඉති බොධි වුත්ථ 209
ඉතිපි සො භගවා 186
ඉති සන්තං වුත්තං 179
ඉති රූපං 305
ඉති රූපස්ස අත්ථඞ්ගමෝ 306
ඉති රූපස්ස සමුදයෝ ,,
ඉති වදමි 65
ඉති විදිත්වා 62–65–185
ඉති සල්ලෙඛො කරණීයො 201
ඉති සො කුපිතො 158–159
ඉති සො කුපිතො හොති
අපපතිතො 157
ඉතිහ තෙ 166
ඉත්ථත්තාය 138–194
ඉදං 82
ඉදං දුක්ඛන්ති යථාභූතං
පජානාති 319
ඉදං වත්වා සුගතො 110
ඉදමවොච භගවා 65
ඉදමවොචායස්මා
සාරිපුත්තො 239
ඉදමහං 132
ඉධ 24–85–104–112–158
ඉධ භික්ඛවෙ අස්සුතවා
පුථුජ්ජනො 30–77
ඉධභික්ඛවෙ භික්ඛු 266
ඉද්ධිපපත්තියා 135–136
ඉධෙව සිනාති 192
ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරා 165
ඉම්මෙවකායං 290
ඉමෙ වුච්චන්ති ආසවා
සංවරා පහාතබ්බා 88
ඉමෙ වුච්චන්ති-දස්සනා
පහාතබ්බා 84
ඉමෙ වුච්චන්ති- අධිවාසනා
පහාතබ්බා 90
ඉමෙ වුච්චන්ති- භාවනා
පහාතබ්බා 97
ඉමෙ වුච්චන්ති- පටිසෙවනා
පහාතබ්බා 88
ඉමෙ වුච්චන්ති- විනොදනා
පහාතබ්බා 92
ඉමෙසං ඛො ආවුසො 162
ඉස්සා 184
ඉස්සුකී 203
උක්කට්ඨායං විහරති 6–14
උක්කා 14
උක්කාමුඛං 188
උක්කුජ්ජෙය්‍ය 141
උච්චාරපස්සාවකම්මෙ 288
උට්ඨායාසනාවිහාරං පාවිසි 110
උණ්හං 89
උත්‍රස්තං 252
උඩතා 127–203
උඬුම්බරක 292
උපඨිතසතී 204
උපඨිතා සති අසම්මුට්ඨා 134
උපනාහී 203
උපනාහ 1[illegible]3
උපමා මං ආවුසො
සාරිපුත්තෙන පටිභාති 164

උපසඞ්කමි 121
උපසංහරෙය්‍ය 181
උපසමාය සංවත්තති 116
උපසම්පජ්ජ විහරෙය්‍යං 179
උපසම්පජ්ජ විහාසි 193
උපාදානං 232-233
උපාදානසමුදයා 232
උපාදාය 236
උපාසකං මං භවං ගොතමෝ ධාරෙතු 148
උපාසකානං 161
උපාසිකානං ,,
උපෙක්ඛා 95
උපොසථෝ සද්ධ 192
උපපජ්ජන්ති 195-196
උපපජ්ජෙය්‍යුං 87
උපපත්තිං 174
උපපන්නුපපත්තෙන 92
උභතෝ මුඛා 290
උභෝ මහානාගා 166
එකං 11
එකං සමයං 11-12-13-14
එකත්තං 44
එකත්තං නානත්තං ,,
එකත්තෙන 124
එකමන්තං 122
එකමිදාහං 164
එකායනෝ 243
එකායනෝ අයං භික්ඛවෙ මග්ගෝ 241-243
එකාභමත්තං 292
එකෝ 193
එතං නූන තං භය භෙරවං ආගච්ඡති 131
එතං මම 196
එතරහි වා පච්චුප්පන්නං අඞ්ගානං 80
එතෙ 200
එත්තාවතාපි 211-221-228
එලමූගා 128
එවං 6-8-9-106-123
එවං අකුසලං පජානාති 219
එවං අනාගතෝ 292
එවං ඛෝ භික්ඛවෙ 293
එවං ගොතමෝ 136
එවං ධම්මෝ 292
එවං ධම්මෝ එවං පසෙදෙය්‍ය 188
එවං භාවී 292
එවං භාවෙය්‍ය 320
එවං මෙ සුතං 7-9-10
එවං වණ්ණෝ 136
එවං වුත්තෙ 193
එවං ස තෙ 87
එවං සීලෝ 188
එවං සුඛදුක්ඛපටිසංවෙදී 136
එවම්‍යුපරියන්තෝ ,,
එවම්භාරෝ ,,
එවමෙතං බ්‍රාහ්මණ 123-124
එවමෙතං 197
එවමෙතාසං ,,
එවමෙව 181
එවමෙව ඛෝ 155
එවමෙව ඛෝ චුන්ද විහිංසකස්ස -පෙ-පරිනිබ්බානාය 208
එවම්පි 270
එසාහං 141
එසෝ මෙ අත්තා 197
එසොහමස්මි 196
ඔකප්පෙය්‍යුං 91
ඔකඤ්ඤති 231
ඔකක්කමනෙ පුබ්බඞ්ගමා 113
ඔත්තාපී 204
ඔධි 187
ඔපපාතිකෝ 178
ඔපිලාපෙස්සාමි 106

ඔරංභාගියානං 178
ඔලාරිකෝ වා සුඛුමෝ වා 222
ඔලිගල්ලං 91
ඔරුඛමානසෝ 250
ඔහිතභාරෝ 51
කංසපාති 155
කඩ්ඪී වෙවිකිච්ඡී 127
කණ්ටකාධානං 91
කණණවා 68
කතං කරණීයං 138–194
කතං වෝ තං මයා 209
කතකරණීයෝ 51
කතකිබ්බිසං 192
කතමෝ චතතාරෝ 258
කථඤ්ච භික්ඛවෙ 266–294
කථනනු ඛෝ 80
කථනනු ඛෝසම් 81
කනතාර 82
කබලිඞ්කාරෝ ආහාරෝ 222
කම්මාරකුලා වා 155
කම්මාසසදම්මං නාම කුරුනං නිගමෝ 240
කල්‍යාණමිත්තතා 203
කාමභවෝ 232
කාමාසවා 137
කාමාසවෝ 78
කාමූපාදානං 232
කාමෙසු 213
කාමෙසු නිබබසාරාගා 226
කාමෙසු මිච්ඡාචාරෝ 213
කායසඞ්ඛාරෝ 237
කායානුපසසී 259
කායෙ ,,
කායෙන එසසිත්වා 176
කායෝ පසසම්භති 188
කාලංකරිසසති 155
කාලකතා 174
කාලකිරියා 231
කලෝ 67–68
කිං කාහසි ගයං ගනත්වා උදපානොපි තෙ ගයා 192
කිං සුන්දරිකා කරිසසති 191
කිං හුත්වා කිං අහොසිං 80
කිඤ්චාපි 107–162–164
කිත්තාවතා 111
කි භනතු ඛෝ 80
කිනනු ඛෝ අහං භයපාටිභෝඛ්ඛි විහාරාමි 131
කිනනු ඛෝ අහොසිං 80
කුණපං 163
කුතෝ ආගතෝ සෝ කුහිං ගාමි භවිසසති 81
කුපිතෝ 159–160–161–162
කුරූසු විහරති 239
කුලපුත්තා 122–193
කුසලඤ්ච කුසලමූලඤ්ච 211
කුසිතා 128–166–204
කෙවුහිතෝ 165
කොධ 116–183
කොධනා 203
ඛජජමානං 292–293
ඛණ්ඩිච්චං 229
ඛත්තියානං 232
ඛත්තියානං හෙදෙ 231
ඛයා 64
ඛයා රාගසස විතරාගතතා 52
ඛාණුං 91
ඛාසිතෙ 287
ඛිණා ජාති 137
ඛිණාසවෝ 51
ඛෙමතං 192
ඛෝ 17–111–121
ඛෝ පන 187
ගතමලං 1
ගතෙ 289
ගයා 191

ගරු 171
ගරුකරෙය්‍යුං 161
ගහණ 82
ගාථාහි අජ්ඣභාසි 191
ගාරය්හා 113
ගීවාසු පටිච්ඡකානි 68
චක්ඛායතනං 235
චක්ඛුකරණී 115
චක්ඛුඤ්ච පජානාති 306
චක්ඛුන්ද්‍රිය සංවරසංවුතෝ විහරති 86
චක්ඛුන්ද්‍රියසංවරසංවුත 87
චක්ඛුවිඤ්ඤාණං 236
චක්ඛුසම්ඵස්සෝ 235
චණ්ඩං 91
චතුත්‍ථං 236
චතුරොපදා 246
චත්තං 187
චත්තාරි 236
චත්තාරෝ 151–255
චන්දනීකං 91
චපලා 165
චචනතා 230
චාගෝ 21
චාතුද්දසී 129
චිත්තං අභිනීහාරමේසිං 137
චිත්තං සමාධියති 188
චිත්තසඞ්ඛාරෝ 236
චිත්තුපපාදම්පි ඛෝ අහං 205
චිත්තෙන සඞ්කිලිට්ඨේ 181
චුණ්ණකජාතානි 293
චුති 230
චුති චචනතා ,,
චෙතොවිමුත්තිං පඤ්ඤා විමුත්තිං 170
ඡඩ්ඩියඩමේමා 105
ඡමායි 127
ඡසු අජ්ඣත්තිකබාහිරේසු ආයතනේසු 306
ජඤ්ඤාජඤ්ඤං විය 163
ජනතා 139
ජරා 229
ජරාජීරණතා ,,
ජරාමරණ 62
ජාගරිතෙ 289
ජාගරියං අනුයුත්තතා 165
ජාති 62–231
ජාති සඤ්ජාති 231
ජානතෝ 74
ජානුසෙසාණී 121
ජීඝච්ඡාදුබ්බල්‍ය පරෙතෝ 105
ජීඝච්ඡිතානමපි 164
ජීමහ 165
ජීරණතා 229
ජීවිකත්ථා 165
ජෙතුවෙත්‍ථා 46
ජෙතවනෙ 71
ඣායථ 209
ඤාණකරණී 116
ඤාණස්ස අධිගමාය 253
ඤානං 160–161–162
ඤානං ඛෝ පනෙතං 158–197
ඤිකියා 221
ඤිකෙ 289
තං 136–163
තං කිස්ස හෙතු 107–163–181
තං කිස්ස හෙතු අපරිඤ්ඤූ තං තස්සාති වදාමි 34
තං නෙතං මම 196
තං සුණාථ 23
තං ච පජානාති 300
තණ්හානං 64
තණ්හානිරොධා ආහාර නිරොධෝ 228

තණ්හාසමුදයා 233
තණ්හාසමුදයා ආහාර සමුදයෝ 228
තතියෙන 114
තත්ථ ච මේ බ්‍රාහ්මණ විහරතෝ 130
තත්ථ පරිනිබ්බායි 178
තත්‍ර 17-113-115-154
තත්‍ර තත්‍ර 82
තත්‍රාපාසිං එවං නාමෝ 136
තත්‍රාවුසෝ 113-115-154
තත්‍රෙකස්ස 106
තථාගතොපි භික්ඛවෙ 54
තථාතථා 165
තථාභූතතථාභූතා 131
තථාරූපාසු 130
තදනුත්තරං 193
තපසා 253
තමෝ 136
තමහි තමහි 229
තස්මාතිහ 64
තස්ස එවං මනසිකරොතෝ ඡන්නං දිට්ඨං 81
තස්ස එවං ජානතෝ එවං පස්සතෝ 190
තස්ස මයහං 124-129
තස්ස මෙ එවං ජානතෝ එවං පස්සතෝ 137
තස්ස සහදස්සනෙනඅමනාපතාව ඝරඤ්ඤෙයය 163
තස්ස සුභනිමිත්තස්ස අමනසිකාරා 156
තස්සෙතං පාටිකඞ්ඛං 154
තීණණං සංයොජනානං 176
තීහමතං 292
තීහි ඨානෙහි 113
තූණ්හී භාවෙ 289
තුමෙහපි තෙන ආදිස්සා භවෙය්‍යාථ 103-112
තෙජං තෙජතෝ 36
තෙන 112
තෙනහි ,,
තෙ භික්ඛු 19
තෙරොවස්සිකානි 293
තෙසං තං 174
තෙසං තෙ කාරා 173
තෙසං තෙසං 229
ත්‍යාහං 105
ථඩා 203
ථමහ 184
ථිනම්ඛ පරියුට්ඨිතා 127-203
දණ්ඩං 258
දන්තෙහා ,,
දම්මං 267
දස්සනස්ස 246
දස්සනා පහාතබ්බා 77-85
දහරෙ 166
දළහං 267
දිට්ඨං 21-42
දිට්ඨං දිට්ඨතෝ 42
දිට්ඨං මඤ්ඤති ,,
දිට්ඨධම්ම 175
දිට්ඨ ධම්මසුඛවිහාරානං ,,
දිට්ඨසම්ං මඤ්ඤති 43
දිට්ඨානුගතිං ආපජ්ජති 123
දිවිසං යොජනසංයුත්තෙහා 82
දිට්ඨිපාදුන්න 233
දිට්ඨෙව ධම්මෙ 179-193
දිවාති සංඥානති 131
දිවායෙව සම්ානං ,,
දිස්සන්ති වෙව සුයන්ති ච 162
දුක්කරං පවිවෙකං 124
දුක්ඛං 62
දුක්ඛදොමනස්සානං අත්ථඞගමාය 249
දුක්ඛස්ස 246
දුක්ඛස්සන්තං කරෙය්‍යං 178

දුග්ගති පාටිකඞ්ඛා 181
දුප්පඤ්ඤ 128-204
දුප්පටිනිස්සග්ගී 204
දුබ්බච්ච 203
දුරත්තවණ්ණමේවස්ස 181
දුරභිරමං 124
දුරභිසම්භවානි හි 123
දූරතොපි 112
දෙවෙ දෙවතො 39
දෙසෙස්සාම් 22
දෙස 217
දෙසං 165
විහම්තං 292
වෙ ඛො අහං බ්‍රාහ්මණ අත්ථවසෙ 139
ධම්ම 141-187
ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච ,,
ධම්මදායාද මේ භික්ඛවෙ භවථ මා ආමිසදායාද 100-102-103
ධම්මපරියායෙන 166
ධම්මවිචය 94
ධම්මවෙදං 187
ධම්මූපසංහිතං පාමුජ්ජං 188
ධම්මෙන 21
ධාරෙස්සන්ති 112
ධ්‍රුවෙ 82
න ඛො පනාහං-පෙ- පටිසෙවාමි 125
න ඛො පනාහං භ්‍යාපන්න විඤ්ඤු 127
න ඛො පනෙතං බ්‍රාහ්මණ එවං දට්ඨබ්බං 139
න ච කිඤ්චි ලොකෙ උපාදියති 270
න ච නං රජ්ජාපථෙ 156
න ච පරියොදපෙයුං 155
න ච මං අරති සෙහෙය්‍ය 174
න ච මං භික්ඛු ජානෙය්‍යුං 157
නචිරස්සෙව 193
න වෙව පරිභුඤ්ජෙය්‍යුං 155
න ඡන්දං ජනෙස්සති ,,
නත්ථි මෙ අජ්ඣත්තං අඞ්ගණන්ති යථාභූතං නපජානන්ති 154
නත්ථි මෙ අත්තා 81
නන්දි 62-63
නපපජ්ජනන්ති 113
න හොත්තුකාම්‍යතා අස්ස 164
න මෙසො අත්තා 197
න වායම්ස්සති 155
න වා 114
න විරියං ආරභිස්සති 155
න සඞ්ඛා 165
න සුජ්ඣති 191
න සො භික්ඛු ලභෙය්‍ය 160
න හි නං සොධයෙ 192
නානත්තං 44
නාම 236
නාමරූපසමුදයා 235
නානාවිහිතස්ස 290
නාපරං ඉත්ථත්තාය 188-193
නිකාමයමානා 127
නිකාමලාභී 175
නිකෘතිජීවිතං 141
නිකිත්තඛුරා 113
නිච්චෙ 82
නිබ්බානං 44
නිබ්බානං මෙති මඤ්ඤති 45
නිබ්බානතො මඤ්ඤති ,,
නිබ්බානස්ස සච්ඡිකිරියාය 253
නිබ්බානයමිං මඤ්ඤති 45
නිබ්බානාය සංවත්තති 116
නිම්මංසලොහිතමක්ඛිතං 293
නියතො 258
නිරොධ 97
නිවාසෙත්වා 165
නිසින්නෙ 209
නිසිදි 122

නෙතං මම 197
නෙමන්තණීකෝ 164
නෙවස්ස නං හොති අනන්තරායාය 188
නෙසෝ හමස්මි 197
නෝ අජානතෝ නෝ අපස්සතෝ 74
නෝ නු ඛෝස්මි 80
පකතනෙත්තා 191
පක්ඛස්ස 129
පගෙවසුහිතානං 164
පච්චුපඨිතෝ 165
පජිමඤ්ඤ ජනතං අනුකම්පමානෝ 139
පජහති 185
පජානති 39
පජාපතිතෝ 40
පජාපතිස්මිං ,,
පජාපතිං මේ ,,
පඤ්චදසී අඨමී 129
පඤ්චසුපාදානක්ඛන්ධේසු 305
පඤ්ඤසම්පන්නා 204
පඤ්ඤසම්පන්නෝ 129
පටිකුජ්ජිකා 163
පටිච්ඡන්නං 141
පටිසානුසයං පටිවිනෝදෙත්වා 220
පටිනිස්සග්ගී 204
පටිනිස්සඨං 187
පටිපූජෙය්‍යුං 163
පටිභාතු තං 164
පටිලාභෝ 232
පටිසඩ්ඛා . 85
පටිසඩ්ඛායෝනිසෝ 86
පටිසඩ්ඛායෝනිසෝ උපපන්නං කාමවිතක්කං නාධිවාසෙති 91
පටිසඩ්ඛායෝනිසෝ චක්ඛුං හත්ථිං පරිවජ්ජෙති ,,
පටිසඩ්ඛායෝනිසෝ චීවරං 88
පටිසඩ්ඛායෝනිසෝ සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති 92
පටිසල්ලාණා වුට්ඨිතෝ 195
පටිසෙවතෝ 88
පඨවිං 50
පඨවිංඅභිනන්දති 34
පඨවිං පඨවිතෝ 30
පඨවිං පඨවිතෝ අභිජානාති 50
පඨවිං පඨවිතෝ සඤ්ඤත්වා 31
පඨවිං මඤ්ඤති 33–34
පඨවිං මෙතිමඤ්ඤති 34
පඨවිතෝ මඤ්ඤති 33
පඨවියා මඤ්ඤති ,,
පඨවී 31
පණීතානං ගිලානපච්චය භෙසජ්ජපරික්ඛාරානං 162
පණීතානං පිණ්ඩපාතානං ,,
පණීතානං සෙනාසනානං ,,
පණ්ඩුපුත්තෙහා 165
පත්තචීවරමාදාය ,,
පත්ථයමානෝ 49
පදුට්ඨමනසඞ්කප්පා 126
පනාහානි 124
පපාතං 91
පබ්බජන්ති 193
පබ්බජිතා 123
පමාද 184
පමත්තා 203
පමුදිතස්ස පීති ජායති 188
පයාගෝ 191
පරික්ඛයා 176
පරික්ඛීණභවසංයොජනෝ 51–52
පරිඤ්ඤාතං තස්ස 52–53
පරිඤ්ඤාතං තං තථාගතස්ස 62
පරිඤ්ඤෙය්‍යං තස්ස 50
පරිපුණ්ණා 105
පරියොදපෙය්‍යුං 156
පරියොනඛා 155

පරියොසිතො 105
පරියොදතං 188
පරිසුඛං ,,
පරිසුඛකාය කම්මඤ්ඤතා 125
පරෙ 201
පරෙ මච්ඡාදිඨී ,,
පලාස 183
පලිපං 207
පලිපඤ්ඤා ,,
පලිපපලිපඤ්ඤා ,,
පලෙලාමං 125
පවාරිතො 104
පවාහෙති 191
පවිවෙකෙ 113
පසසතො 74
පසසඛකායො සුඛං 188
පසසඛි 94
පසසඛො කායොඅසාරඛො 134
පහානං පටිනිසසඝෙහා 197
පහිතතතසස 136
පහිතතෙතා 193
පහීනං 187
පහිනො හොති 185
පාටිකඛං 320
පාණාතිපාත 212
පාණාතිපාතා වෙරමණී කුසලං 217
පාණාතිපාතී 201
පාණාතිපාතො ඛො ආවුසො අකුසලං 211
පාණුපෙතං 150
පාතිමොකඛසංවරසංවුතා 169
පාතුභාවො 232
පාපකම්මනං 192
පාපකෙ අකුසලෙ ධමෙම 92
පාපකෙ මිතෙත 91
පාපකෙසු ඨානෙසු ,,
පාපමිතතා 203
පාලිචවං 229
පි 48
පිණඩපාතං 188
පිවනතී මඤ්ඤඳු ඝසනති මඤ්ඤඳු 166
පියොචසසං 170
පිසුණාවාචා 202-214
පිති 94
පිතිමනසස 188
පිතෙ 287
පුගගලා 151
පුඤඤසමමතා 191
පුනවපරං 270-290-291-292
පුබබඛහමෙ 123
පුබබණහසමයං 164
පුබෙබ 248
පුබෙබව සමෙබාධා 124
පුරකඛතා පුරකඛතා 159
පුරාණයානකාරපුතෙතා 165
පූජෙයයුං 161
පූතීනි 293
පෙතා 174
ඵරුසාවාචා 202-214
ඵසසසමුදියා 235
ඵසෙසා දුතියො 218
බහිඛා වා 269-272
බහුකාරො 123
බහුජනසුඛාය 133
බහුජනහිතාය ,,
බහුසසුතා 207
බාලිසෙ 47
බාලො 46-191
බාහුකං 191
බාහුකා-බාහුමතී 191
බහුලිකා 112-113-166
බොජඣඞග 93-94-253
බොජඣඞඞෙගසු 308
බොධිසතතසෙසව සතො 124
බ්‍යාපජ්ජානවිතතා 126
බ්‍යාපාදෙ 215

ब्रह्मचरियपरियोसानं 193
ब्रह्मचरियं 138–194
ब्रह्मचारी 202
ब्रह्मं ब्रह्मतो 40
ब्रूहेतासुसूसूगारानं 171–172
भगवतो पच्चस्सोसुं 19
भगवतो भासितं अभिनन्दुं 98
भगवन्तं अभिवादेत्वा 195
भगवा 13–17
भत्तगेह 159
भदन्ते 19
भय 174
भयदस्सावी 169
भयभेरवं 125
भवतण्हा 234
भवन्तं गोतमं
सरणं गच्छामि 141
भव समुदया 232
भवं तेसं गोतमो
समादपेता 123
भवा 62
भवासवो 78
भविस्सामि नुखो न नुखो 80
भावनीयो 171
भावेति 96
भासिते 289
भासिस्सामि 23
भिक्खवे 22–24=258
भिक्खवो 18
भिक्खुनीनं 161
भिक्खुसङ्घस्स 142
भिक्खू 17–189–258
भिदुरो 46
भियस्सा 125
भिंसनकानि 130
भीरुकजातिका 127
भूतानी 104
भूतस्स मसूसति 39
भूतस्स 62
भूतपवनं 67–68
भूता 221
भूतानी 67-68
भूते अभिनन्दति 39
भूते भूततो सञ्जानाति 37–38
भूते मसूसति 38
भेरव 174
भोजने अमत्तञ्ञुतो 165
मक्ख 183
मक्खी 203
मगो वा आगच्छति 130
मगस्स 246
मगेस्स ,,
मग्गं आचिक्खिस्स 141
मच्चुमरणं 231
मच्छरिय 184
मच्छरी 184–203
मज्झिमा 114–115
मज्झिमा पटिपदा 115
मञ्चे 248
मण्डूकजातिको 166
मद 184
मनसिकरणीये धम्मे
नप्पजानाति 78
मनसिकरिस्सति 156
मनसिकरोथ 23
मन्दापो 171
मनो 124
मनोविसूसूरणं 236
मनोसञ्चेतनाय 218
मनोसमुट्ठानेसु 235
ममं उद्दिस्स 123
मयमेत्थ अविहिंसका
भाविस्साम 201
मलेन 155
महग्गतं महप्फलं
महानिसंसं 173

මහානාගා 167
මහාභූතානි 236
මහාසාලා 15
මාන 124-184
මානසං 49
මානාභිසමයා 98
මානෙය්‍යං 161
මා පච්ඡා විපටිසාරිනෝ අනුවත්ථ 209
මා පමාදත්ථ ,,
මායා 184
මායාවී 203
මිච්ඡාඤාණී 202
මිච්ඡාදිට්ඨි 202-215
මිච්ඡාසඞ්කප්පා 202
මිච්ඡාවාචා ,,
මිච්ඡාවිමුත්ති ,,
මුඛරා 165
මුච්ඡිස්සති 128-204
මුත්තං 43
මුත්තතං 187
මුසා 213
මුසාවාදී 202
මුසාවාදෙ 213
මූලං 16
මූලතෝ ඉති විදිත්වා 62
මූළ්හස්ස 141
මූළ්හා 260
මෙ 7-8-131-136
මොරෝ වා කඨං පාතෙති 131
මෝහ 217
යතෝ 185-186
යතෝ ඛෝ 97-211
යතෝපි ඛෝ පනස්ස 186
යත්ථ ච 196
යත්ථ වෙතා දිසිදිසෝ උපපජ්ජන්ති 196
යථා 136
යථා ච 300
යථා ච අනුපපන්නස්ස 307
යථා ච උපපන්නස්ස ,,
යථා ච පහීනස්ස ,,
යථා තං 136
යථා තං අරහතා සම්මා සම්බුද්ධෙන 139
යථාභූතයථාභූතස්ස 131
යථාභූතං 197-249
යථායථා 165
යදිදං 106-255
යදිනීලකාය 181
යන්නූනාහං 106
යස්ස 78
යං ඉධෙකච්චස්ස 157
යං තං භික්ඛූ ජානෙය්‍යුං ,,
යං හිස්ස 78-88-90-91-97
යා ඉමා 195
යා තා 129
යානකාරපුත්තෙතා 165
යාවදත්ථෝ 105
යාවදෙව 269
යාවදෙව ඤාණමත්තාය 276
යුවා 166
යෙ තෙ ආසවා දස්සනා 97
යෙ ඛෝ කෙචි සමණා වා බ්‍රාහ්මණා වා 124
යෙන භගවා තෙනුපසඞ්කම් 121
යෙනිමෙසා 154
යෙ මෙ 122
යෙසඤ්ච ධම්මානං 112-113
යෙසාහං 173
යෙහි වෝ 125
යෝ 48-167
යෝගකෙඛම 49
යෝ ච කාලඝසෝ භූතෝ 68

යො චේව ඛො ආවුසො කොපෙයො ච අපපච්ච යො උභය මෙතං අඞ්ගණං 158
යොනිසො ච ඛො භික්ඛවෙ 77
යොනිසො ච මනසිකාරං 75
යොපි 50
යො හි කොචි භික්ඛවෙ 320
යථායං 154
රඞ්ගජාතෙ 180
රචයිත්වා 163
රජාපථෙ 155
රජෙන ,,
රති 174
රතතීති සඤ්ඤා භාගති 131
රතතිං යෙව සම්භතං ,,
රාගදොසමොහනං තතතා 177
රාජගහෙ විහරති ගිරිබ්බජෙ 164
රුක්ඛවෙතියානි 130
රුක්ඛමූලානි 209
රූපතණ්හා-පෙ-ධම්මතණ්හා 233
රූප 236
රූපෙ ච පජානාති 306
ලාභසක්කාර සිලොකං 127
ලූඛචීවරධරො 163
ලොකවාදපටිසංයුත්තා 195
ලොකාමිසං 153
ලොකානුකම්පාය 133
ලොකෙ 133-167-266
ලොකෙ උපපජ්ජන්ති 195
ලොකඛ්‍යසම්මතා 191
ලොභස්ස ච පහානාය 115
ලොභ 217
ලොභො අකුසලමූලං ,,
ලොභො ච පාපකො දොසො ච පපකො 115
ලොමසානි 68
වඩ්ඪ 187
වනපත්ථං 123
වයධම්මානුපසසී වා 269
වලිත්තවතා 171
වාද 233
වායං වායතො 36
වා වත්තතී සංයොජනං 97
වාතො වා පණ්ණසටංඑරෙති 131
වි 6
විකිණණවාචා 165
විකිත්තතං 299
විචිතකාලකං 164-188
විජ්ජං උපපාදෙත්වා 220
විජ්ජා 136-137-138
විඤ්ඤණං 223
විඤ්ඤාණ සම්භවා 236
විඤ්ඤාතං 43
විඤ්ඤූ සබ්‍රහමචාරී 91
විනාළීකතං 49
විනීලකං 292
විනෙය්‍ය 262
විපසසනායසමන්නාගතො 171
විපසසිසං 249
විපුබ්බක 292
විපුබ්බකජාතං ,,
විප්ඵන්දිත 82
විබභනතචිත්තා 128
විභවතණ්හා 234
විමුච්චිථ 137
විමුත්තසමිං විමුත්තා මිතිඤාණං 137
විමුත්තං 299
විමුත්තෙතා 52-167
විමොක්ඛා 176
විරාග 97
විරාගො 142-246
විරිය 94
විවරෙය්‍ය 141
විවෙක 97

විවෙකං නානුසිඤ්ඤන්ති 111–112
විවෙකනිස්සිතං 96
විසූක 82
විහරන්ති 14–81–261–263
විහිංසකා භවිස්සන්ති 201
වීතදෝසං 299
වීතමෝහං ,,
වීතරාගං ,,
වීතරාගා 64
වීතිනාමෙය්‍යං 106
වුත්තං ඛෝ පනෙතං ,,
වුසිතවා 51
වුසිතං 138–194
වූපකට්ඨෝ 193
වෙචිකිච්ඡී 203
වෙදනා 200–264
වෙදනාකායා 235
වෙදනාසමුදයා 234
වෙරමණී 219
වෙදනාසුවෙදනානුපස්සී 264
වෙරිං 192
වෙහප්ඵල 41
වෝ 21
වොස්සජ්ජනං 282
වොස්සඟ්ගපරිනාමිං 96–97
ව්‍යාපන්නචිත්තා 202
සඋත්තරං 299
සකදාගාමී 177
සකිදෙව ඉමං
ලෝකං ආගන්ත්වා ,,
සක්කරෙය්‍යුං 161
සක්කාය 45–46
සක්කාර 127
සංකිලිට්ඨතරා අස්ස
මලඝට්ඨිතා 155
සංකිලිට්ඨචිත්තෝ ,,
සංකිලිට්ඨචිත්තෝ
කාලං කරිස්සති 156
සංකිලිට්ඨං මලඝට්ඨිතං 180
සංකිලිට්ඨෙන 247
සඞ්ඛාර 237
සඞ්ඛාරසමුදයා 236
සඞ්ඛිත්තං 299
සඞ්ඝාටිපත්තචීවරධරණෙ 285
සචෙ ආකඞ්ඛථ 105
සච්චතෝ ථෙතතෝ 81
සච්චං 21
සච්චානං 246
සඤ්ජානාති 231
සඤ්ඤමිස්සාහං 249
සඤ්ඤා 236
සට්ඨා 203
සට්ඨාමායාවිනෝ 165
සති 28
සතිමා 261–263
සතිපට්ඨානා 255
සතියා 267
සතිසම්බොජ්ඣඞ්ගං 93–94
සතිවාඋපාදිසෙසෙ 320
සත්තනිකායෙ 229
සත්තානං විසුද්ධියා 247–253
සත්තුපච්චිත්තස්ස 112
සත්තුපච්චිත්තස්ස විහරතෝ 111
සදත්ථ 51
සදත්ථඞ්ගු 192
සදිසමපජ්ජතෙ වතං ,,
සදෙසං 299
සද්දහානෝ අමච්චරි 142
සද්ධා 122–123–203
සද්ධා අගාරස්මා 166
සන්තං 300–308
සන්තා 176
සන්ති 131
සන්තිකෙ 112
සන්ති ඛෝ පන බ්‍රාහ්මණ 131
සන්තෙනා 258
සන්තෝ සංවිජ්ජමානා 153
සන්ධිපරිමාසි 204

සපපටිපුග්ගලෝ 158
සපපුරිසං 26
සබ්බභූතෙසුකාරොහිඛෙමතං 192
සබ්බධම්මමූලපරියායං 21
සබ්බසෝ 64
සබ්බසෝ රාගානුසයං පහාය 211
සබ්බසම්මිං මඤ්ඤති 44
සබ්බං මඤ්ඤති ,,
සබ්බානෙව සහත්තනා 68
සබ්බාසවසංවරසංවුතෝ 74
සබ්බාසවසංවරපරියායං 72–74
සබ්‍රහ්මචාරී 166
සමංචරෙය්‍ය 258
සමංසලොහිතං 293
සමනුමොදිංසු 167
සමයං 11
සමාදාය 169
සමාදාය සික්ඛථ සික්ඛාපදෙසු 170
සමාධි 94
සමාධිං අලභමානස්ස 124
සමාහිතං 299
සමාහිතං චිත්තං එකග්ගං 134
සමුදයධම්මානුපස්සී 290
සමුදයධම්මානුපස්සී වා 269
සමුදයවයධම්මානුපස්සී 269–272
සමුදයෙ අඤ්ඤාණං 237
සමුදාහරන්ති 196
සමොහං 299
සම්පජානකාරී හොති 273
සම්පජානෝ 261–263
සම්පටිච්ඡනං 282
සම්පන්නසීලා 168–169
සම්ඵප්පලාපී 202–215
සම්ඵප්පලාපෝ 214
සම්බොධාය සංවත්තන්ති 116
සම්බොධිපරායනෝ 177
සමාහෙසීනං 221
සම්මදඤ්ඤාවිමුත්තෝ 52
සම්මප්පඤ්ඤාය පස්සතෝ 197
සම්මා 98
සම්මාඤාණී 202
සම්මාදිට්ඨි 116–210
සම්මාදිට්ඨිහොති 211
සම්මාසඞ්කප්ප 116
සම්මාසමාධිං 64
සම්මිඤ්ජිතෙ පසාරිතෙ 284
සම්මොදනීය 121–122
සම්මොහවිහාරස්මිං වදාමි 132
සයං අභිඤ්ඤාසච්ඡිකත්වා 193
සරාගං 299
සරීරං 292
සලොමහංසානි 130
සලෙඛ 201
සලෙඛපරියායෝ 209
සස්සති සමං 82
සස්සතෝ ,,
සළායතනසමුදයා 235
සංයොජන 82
සංයොජනානං 178
සාඛල්‍යෙණ 155
සාජන තා 123
සාඨෙය්‍ය 184
සාථලිකා 113
සාධාවුසෝ 220–229
සාධුකං මනසිකරොථ 22–23
සාධු වත 166
සාමඤ්ඤං අනපෙක්ඛවතෙතා ,,
සාමිසං වා සුඛං 298
සා යණ්හ සමයං 195
සාසිතෙ 287
සාරම්භ 184
සාරාණීය 121–122
සාරිපුත්තෝ 111
සාලරාජ මූලෙ 15
සල්‍ලීනං 188
සාලොහිතා 174

සික්ඛථ සික්ඛාපදෙසු 169
සික්ඛාය න තිබ්බගාරවා 166
සිනාසිතුං 191
සියා 105
සියා ඛො පන තෙ 139
සිලොක 127
සීලබ්බතුපාදාන 233
සීලසම්ඵස්සෙන 169
සීලෙසෙව 177–178
සීලෙසෙව වස්ස පරිපූරකාරී 171
සීවථිකාය ඡඩ්ඩිතං 292
සුඛං වෙදනං 294
සුඛං වෙදනං වෙදියාමීති පජානාති 297
සුඛාය 134
සුඤ්ඤාගාරන්ති 209
සුතං 7–8–9 43
සුත්තෙන 289
සුඛස්ස 192
සුඛස්ස වෙ සදා ඵගු ,,
සුඛස්ස සුවිකම්මස්ස ,,
සුන්දරිකභාරද්වාජෙ 190
සුබ්බචා 203
සුභකිණ්ණ 41
සුභගවණ්ණ 15
සුභනිමිත්තං 156
සුභනිමිත්තං න මනසිකරිස්සති 157
සුභරතාය 107
සුභිතො 105
සෙඛො 48
සෙය්‍යථාපි 155–163–188–206
සෙය්‍යථාපිපස්සෙය්‍ය 292
සෙය්‍යථාපි භික්ඛවෙ වත්ථං 180
සෙය්‍යථිදං 166
සො 48–135–167–207
සො අත්ථි ඉදං 190
සො ඉදං දුක්ඛං 137
සො ඉදං දුක්ඛන්ති යොනිසො මනසිකරොති 83
සො එවං සමාහිතෙ චිත්තෙ 135–137
සොකපරිදෙවානං සමතික්කමාය 247–254
සො තතො චුතො 135–136
සො තං පිණ්ඩපාතං 106
සොතාපන්නො 176
සොඛහං 91
සො බුද්ධෙ අවෙච්චපසාදෙන සමන්නාගතො 185
සො මෙත්තාසහගතෙන චෙතසා 189
සො සබ්බසො රාගානුසයං පහාය 220
හත්ථිකං 293
හදයා හදයං මඤ්ඤෙ අඤ්ඤය 165
හරති 6
හරන්ති මඤ්ඤෙ 124
හවෙ 125
හි 112
හිතාය 133
හිරිමත 204
හීනවීරිය 128

ප්‍රපඤ්චදීපිකා වර්ණිත විෂය.

1. චූලසීහනාද සූත්‍ර වර්ණනා. 321—340.

1	චතුෂ්කාප්‍රමාණයෝ	321	7	දෘෂ්ටිනාශය	332
2	තීර්ථකයන්ගේ විලාපය	324	8	ඍෂිවිප්‍රගුප්සකශාශකයා	334
3	පරප්‍රවාදයෝ	326	9	අනෛයාණික ශාසන ඥෙහි ප්‍රසාදය	,,
4	ආර්‍යකාන්තශීලය	329	10	සුරාපානය කළ සිවලා	336
5	සහධාර්මිකයෝ	,,	11	කොසිය වස්තුව	337
6	දෘෂ්ටිසමුදය	332			

2. මහාසීහනාද සූත්‍ර වර්ණනා. 341—374.

1	වෛශාලී නගරය	341	12	"යොනි" ශබ්දය	356
2	ඥානදර්ශනය	343	13	චතුර්යෝනි	,,
3	සුනක්ඛත්තගේ කෝපය	345	14	"ගති" ශබ්දය	357
4	තථාගතයන් කෙරෙහි උතුරුම්නිස්දහම් ඇතිබව	346	15	පඤ්චගති	,,
5	අසභාවසථානය	348	16	"කාසු" ශබ්දය	358
6	සිංහනාදය	,,	17	"බ්‍රහ්මචරිය" ශබ්දය	361
7	"වක්ක" ශබ්දය	349	18	මහාවික්‍රෘතභෝජනය	367
8	චම්මක්‍රය	,,	19	උපෙක්ෂාවිහරණය	369
9	දශබලඥානය	350	20	තථාගතයන්ගේ ප්‍රඥව්‍යක්තභාවය	372
10	චතුර්වෛශාරද්‍යය	354	21	තථාගතයන්ගේ ප්‍රශ්නව්‍යාකරණය	373
11	අභවපත්ති අකම්ප්‍ය භාවය	355			

3. මහාදුක්ඛක්ඛන්ධ සූත්‍ර වර්ණනා. 375—380.

1	කාමාදීන්ගේ ප්‍රහාණය	375	2	"ගුණ" ශබ්දාර්ථය	376

4. චූලදුක්ඛක්ඛන්ධ සූත්‍ර වර්ණනා. 381—384.

1	තථාගතයන්ගේ ඥතීහු	381	3	ආර්‍යශ්‍රාවකයාගේ සන්දෙහය	381
2	"පරියාදාන" ශබ්දය	,,			

5. අනුමාන සූත්‍ර වර්ණනා. 385—386.

6. වෙතොඛිල සූත්‍ර වර්ණනා. 387—390.

1	වෙතොඛිල	387	3	කුක්කුටපොතකොපම්‍ය	388
2	වෙතොවිනිබන්ධ	388			

7. වනපත්ථ සූත්‍ර වර්ණනා. 391.

8. මධුපිණ්ඩ සූත්‍ර වර්ණනා. 392—397.

1 දණ්ඩපාණිශාක්‍යයා 392
2 දෙවදත්තපාක්ෂිකයෙක් ,,
3 තථාගතයන් විවාද නො කරනබව 393

9. මෙඛාවිතක්ක සූත්‍ර වර්ණනා. 398—404.

1 විතර්කනිග්‍රහය 398
2 මහසත්ත්වයන්ගේ විතර්කෝත්පාදය 399
3 ගොපාලකොපමාව 400
4 බෝසත්හුගේ විදර්ශනාරම්භය 401
5 මිගලුද්දකොපමාව 403

10. විතක්කසණ්ඨාන සූත්‍ර වර්ණනා. 405—412.

1 අධිවිත්තයෙහි යෙදීම 405
2 විතර්කෝත්පාදය ,,
3 අන්‍යනිමිත්තාපනීය ,,
4 ආදීනවපනීය 407
5 අසන්තිපනීය 408
6 "නිස්සඤ්ඤාමණ්ඩෝර" වත 409
7 විතර්කමූලභෙදපනීය ,,
8 දද්දභජාතකය 410
9 අභිනිග්‍රහණපනීය 411

සිහනාදවර්ගීය සමාප්තයි.

——:o:——

1. චක්කවූපම සූත්‍ර වර්ණනා. 413—419.

1 "වෙලා" ශබ්දය 413
2 ප්‍රථමබෝධියෙහි භික්ෂූහු 415
3 විකාලභොජනය ,,
4 නො ඉවසීමෙහි දෝස 416
5 පඤ්ච වචනපථය 417

2. අලගද්දූපම සූත්‍ර වර්ණනා. 420—436.

1 අන්තරායිකා ධර්මයෝ 420
2 අරිෂ්ටභික්ෂුහුගේ උල්බණය 423
3 නවාඛ්‍යශාසනය 423
4 ත්‍රිවිධපර්‍යාපන්නය 424
5 ත්‍රිපරිවර්තනය 430
6 උත්තානගාම්නීවිදර්ශනාව 431

3. වම්මික සූත්‍ර වර්ණනා. 437—449.

1 කුමරකස්සප්තෙර 437
2 අක්ඛ්‍යානය 438
3 "අභික්කන්ත" ශබ්දය 440
4 "වණ්ණ" ශබ්දය 441
5 "කෙවල" ශබ්දය ,,
6 "කපප" ශබ්දය 441
7 පෙර යහළුවෙක් 442
8 "ධූම" ශබ්දය 445
9 ක්‍රෝධය 447

4, රථවිනීත සූත්‍ර වර්ණනා. 450—473.

1 රාජගහ 450
2 කලන්දකනිවාප ,,
3 ජාතිභූමි ,,
4 සඞ්ඝයන්ගේ ධර්මගරුත්වය 451
5 පුණ්ණාමෙහෙණ 452
6 ප්‍රතිපන්නකයෝ 453
7 මන්ත්‍රානිපුත්තපුණ්ණ තෙර ,,
8 ඉච්ඡාභෙද 454
9 අතෘප්තිකරවස්තු ,,
10 මඤ්ඣන්හික තෙර 455
11 චතුර්විධ අලෝභජ්ඣෝ ,,
12 ද්වාදශවිධ සත්ත්වාශය 457
13 ත්‍රිවිධප්‍රවිවේකය 458
14 පඤ්චවිධසංසර්ගය 459
15 පසඟුල්ලෙන් වැසි තිස්සදහරයා 459
16 අන්‍යතර තරුණ භික්ෂුවක් ,,
17 පරතෙර ගිය මහණ මෙහෙණදෙදෙනෙක් 460
18 ගාහගාහකාදි පුද්ගලයෝ සතරදෙන 461
19 චුල්ලපිණ්ඩපාතික තිස්සතෙර ,,
20 බුදුවරයන්ගේ විරවාසය 463
21 බුදුවරයන්ගේ චාරිකාව ,,
22 වනවැසි තිස්ස සාමණේර 464
23 ත්‍රිවිධමණ්ඩලය 465
24 විවිධඋපාදානයෝ 470

5. නිවාප සූත්‍ර වර්ණනා. 474—477.

1 නිවාපතෘණ 474
2 බ්‍රාහ්මණධර්මික පැවිද්ද 476

6. පාසරාසි සූත්‍ර වර්ණනා. 478—504.

1 සඞ්ඝයන් දුරුසද බැව් 478
2 සැවැත්නුවර විහාරය 480
3 අවලස්ථානයෝ ,,
4 පුබ්බාරාමකය ,,
5 තථාගතයන්ගේ සත්‍යාර්ථය 481
6 පැවිදිවත්ක් ,,
7 බුදුනට පැනවූ අස්න 482
8 මහාභිනිෂ්ක්‍රමණය 484
9 ආලාරකාලාම තවුසා කරා එළඹීම ,,
10 උරුවෙලා 486
11 සේනා නිගම ,,
12 සබ්බඤ්ඤුතඤ්ඤාණලාභය 487
13 ධර්මාභිසම්බෝධිය 487
14 සහම්පති 490
15 බ්‍රහ්මාරාධනාව ,,
16 වෛනෙයයන්දැකීම 492
17 උද්ඝටිතඥාදි පුද්ගලයෝ 493
18 දහම්දෙසීම පිළිබඳ විතර්කෝත්පාදය 495
19 දහම්දෙසියයුත්තන් විමසීම 498
20 පස්වගපැවිද්දෝ 499
21 අඤ්ඤාකොණ්ඩඤ්ඤ තෙර ,,
22 උපකාජීවකයා 501

7. චූලහත්ථිපදෝපම සූත්‍ර වර්ණනා. 505—526.

1 මිච්ඡරථය 505
2 ජානුසෝණි බමුණු තුවරපැදකුණුකිරීම ,,
3 හත්ථිපදෝපමාව 509
4 "ඉධ" ශබ්දය 510
5 ලොකය ,,
6 මැදුම්පියස ,,
7 ආදිමධ්‍යාවසානය 512
8 කම්කලක්ඛණ 513
9 දශවිධව්‍යඤ්ජනය ,,
10 ගෘහපතියාගේ නිහතමානබව 514
11 වැද්දෙකුරුවටීම 520
12 අටපිරිකර 521
13 සකුණෝපමාව 523

8. මහාහත්ථිපදෝපම සූත්‍ර වර්ණනා. 527—538.

1 චතුර්විධසඞ්ග්‍රහය 527
2 රාජපුත්‍රෝපමාව 529
3 දෙශනාක්‍රමයක් 531
4 පෘථිවියමහත් බව හා අනිත්‍යබව 532
5 කය මදකලක් පවත්නාබව 532
6 කෙත්හිමියෙක් 534

9. මහාසාරෝපම සූත්‍ර වර්ණනා. 539.

10. චූලසාරෝපම සූත්‍ර වර්ණනා. 540—542.

1 පූරණකාශ්‍යප 540
2 මක්ඛලිගොසාල ,,
3 අජිතකෙසකම්බලී 541
4 පකුධකාත්‍යායන 541
5 සඤ්ජයබෙලට්ඨපුත්‍ර ,,
6 නිගණ්ඨනාථපුත්‍ර ,,

ඖපම්‍යවර්ගය සම්පූර්ණයි.

—:o:—

1. චූලගොසිඞ්ග සූත්‍ර වර්ණනා. 543—551.

1 ගිඤ්ජකාවසථය 543
2 සමගිරසය ,,
3 ආතමකාම්හු 544
4 මෛත්‍රීසහගත කායකර්මාදිය 546
5 දීඝපරජනයක්ෂයා 550

2. මහාගොසිඞ්ග සූත්‍ර වර්ණනා. 552—562.

1 සැරියුත්තෙර 552
2 මහමුගලන්තෙර ,,
3 මහකසුප්තෙර 553
4 අනුරුත්තෙර ,,
5 රෙවතතෙර ,,
6 අනඳතෙර ,,
7 සඞ්ඛ්‍යාවක් 554
8 රමණීයත්වය 555
9 ධර්මරත්නයට පූජාවක් 557
10 පරිමණ්ඩල කථා 558
11 අප්‍රබඳ කථා 559

"ප්‍රපඤ්චදීපිකා" වර්ණිතවිෂය.

3. මහාගොපාලකසූත්‍රවර්ණනා 563-568.

1 ත්‍රිවිධ කථා 563
2 නො වියත් ගොපල්ලා 563
3 පැවරීම 568

4. චූලගොපාලකසූත්‍රවර්ණනා 569-571.

1 උක්කවෙලානුවර 569 | 2 බාලගොපල්ලෙක් 569

5. චූලසච්චකසූත්‍රවර්ණනා 572-586.

1 මහාවනය 572
2 සච්චකනිගණ්ඨපුත්‍ර 572
3 සච්චකඅසඝාතීතෙරුන් කරාඑළඹීම 574
4 සණදෙවුන්කෙළි 575
5 සච්චක මහවන වෙහෙරව පිවිසීම 576
6 සච්චක බුදුන් කරා පැමිණීම 576
7 විවිධපුදාලයෝ 579
8 සච්චකයාගේ වාදබිඳීම 580
9 යක්ෂවෙස් ගත් සක්දෙවිරජ 581
10 දුර්මුඛයා උපමා එළවීම 584

6. මහාසච්චකසූත්‍රවර්ණනා 587-597.

1 සච්චක එකලාවැ බුදුන් වෙත පැමිණීම 587
2 භාග්‍යවතුන්ගේ දූෂකරක්‍රියාව 590
3 වප්මඟුල 592
4 ශුනඛවෘතිය 594
5 සච්චකනුවටහුගේ අනාගත වාසනාව 595
6 කළුබුඩරකඬිතතෙර 595
7 කාලකාරාමසූත්‍රදෙශනාව 596

7. චූලතණ්හාසඞ්ඛයසූත්‍රවර්ණනා 598-605.

1 විසාඛාව හා පූර්වාරාමය 598
2 ශක්‍රයා බුදුන් කරා එළඹීම 599
3 අනිත්‍යය 600
4 විරාගය 600
5 නිරෝධය 600
6 චොස්සග්ගය 600
7 බුදුරජුන්ගේ ශබ්දය 601
8 පඤ්චාඞ්ගිකතූර්‍ය 601
9 දෙවියන්ගේ කවයුතු 602
10 දෙවිඳන්ගේ මූලාඛව 603
11 මඝමානවක 603

8. මහාතණ්හාසඞ්ඛයසූත්‍රවර්ණනා 606-611.

1 සාතිගික්ෂුවගේ දෘෂ්ටිය 606
2 විඤ්ඤාණ සප්‍රත්‍යයව 607
3 පඤ්චස්කන්ධය සප්‍රත්‍යයව 607
4 "ගබහ" ශබ්දය 610
5 දරුඹ 610

9. මහාඅස්සපුරසූත්‍රවර්ණනා 612-624.

1 අහුදනව්ව 612
2 අහුදනව්වැසියෝ 612
3 ශ්‍රමණකරණධම් 613
4 හිරි-ඔතප් 613
5 කායසමාචාරය 615
6 වාක්සමාචාරය 615
7 මනස්සමාචාරය 615
8 ආජීවය 616
9 ත්‍රිවිධශය්‍යා 615
10 කාමච්ඡන්දය 618
11 ව්‍යාපාදය 618
12 ථීනමිද්ධය 618
13 උද්ධච්චකුක්කුච්චය 619
14 විචිකිච්ඡා 619
15 නීවරණප්‍රහාණය 620

10. චූලඅස්සපුරසූත්‍රවර්ණනා 625-626.

මහායමකවග්ගවර්ණනා නිමි.

1. සාලේය්‍යකසූත්‍රවර්ණනා 627-633.

1 කොසලජනපදය 627
2 විවිධපෘච්ඡා 628
3 නිග්‍රෝධධම්මකථිකයා 631
4 දිව්‍යලෝක 632

2. වෙරඤ්ජකසූත්‍රවර්ණනා 633.

3. මහාවේදල්ලසූත්‍රවර්ණනා 634-652.

1 පඤ්චවිධපෘච්ඡා 634
2 මහාප්‍රාඥයෝ 634
3 චතුස්සත්‍ය
කම්මස්ථානිකයා 637
3 ඉන්ද්‍රියයන්ගේ විෂය 639
5 සංඥා-විඥාන-ප්‍රඥාවන්ගේ
විශෙෂය 642
6 සංඥාදීන්ගේ විශෙෂය
දුෂ්කරබව 643
7 ශීලාදියෙන් අනුගෘහීතවූ
සම්‍යග්දෘෂ්ටිය 645
8 වාරවිෂය 646
9 ජීවිතෙන්ද්‍රියය හා
කම්ජතෙජස 647
10 මෘතශරීරය 648
11 නිරොධසමාපත්තියා 649

4. චූලවේදල්ලසූත්‍රවර්ණනා 653-666.

1 විසාඛඋපාසක හා
ධම්මදින්නාමෙහෙණ 653
2 සක්කායදිට්ඨි 656
3 සීලස්කන්ධය 658
4 සමාධිස්කන්ධය 658
5 ප්‍රඥාස්කන්ධය 659
6 නිරොධසමාපත්තිය 660
7 සඤ්ජීවතෙර 662
8 ශූන්‍යතාදිසපශ්‍ර 663
9 ආගමානීයකථා 663
10 ආළින්දකවැසි මහා
දාරුණතෙර 664

5. චූළධම්මසමාදානසූත්‍රවර්ණනා 667-669.

1 මාලුවාලතා 667 | 2 කම්මනියමඤ 668

6. මහාධම්මසමාදානසූත්‍රවර්ණනා 670-673.

පඬුරවෙහෙර තරුණභික්ෂුව 672

7. විමංසනසූත්‍රවර්ණනා 674-686.

1 කල්‍යාණමිත්‍රොපනිශ්‍රය 674
2 තථාගතයන්ගේ ත්‍රිවිධසමාචාර 677
3 ගඞ්ගාරජාතකය 679
4 මුලුපුලෑවෙහෙර තෙරුන්වහන්සේ 682
5 සුරම්බඨයාගේ ශ්‍රද්ධාව 685

8. කොසම්බකසූත්‍රවර්ණනා 687-699.

1 කොසඹෑනුවර 687
2 ඝෝෂිතසිටුමැණි 687
3 පන්සියයක්තාපසයෝ 688
4 අඩපෙහෙවස් රැකි මිනිසෙක් 688
5 කොසම්බිකභික්ෂූහු 690
6 මෛත්‍රිය 691
7 සාරාණීයවත 692
8 ලුණුගලතිස්සතෙර 693
9 නාගසඵවිරින්වහන්සේ 695
10 ආර්‍යශ්‍රාවකයාගේ කුසලවර්ධය 698

9. බ්‍රහ්මනිමන්තනියසූත්‍රවර්ණනා 700-709.

1 මාරයා බඹුන් අතරට පැමිණීම 700
2 බකබ්‍රහ්මජාතකය 703
3 නිර්‍වාණය 707
4 බකබ්‍රහ්මයා දමනයවීම 708

10. මාරතජ්ජනියසූත්‍රවර්ණනා 710-716.

1 වසවත්මරු මුගලන් තෙරුන් වෙහෙසීම 710
2 දූසිමාරයාගේ දූඵක්‍රියා 712
3 සතරසාමටහන් 713
4 නාගාපලොකනය 714
5 මහාතිරය 714

මූලපර්‍යායවර්ණනා නිමි.

පපඤ්චසූදනී දීපිකා

නම් වූ

මධ්‍යම නිකායාට්ඨකථා.

("පපඤ්චසූදනී" සිංහලානුවාදය.)

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස.

1. කරුණාසිනලහදයං පඤ්ඤාපජ්ජොතවිහතමොහතමං
සනරාමරලොකගරුං වන්දෙ සුගතං ගතිවිමුත්තං.
2. බුද්ධෝපි බුද්ධභාවං භාවෙත්වා වෙව සව්ඡිකත්වා ච
යං උපගතෝ ගතමලං වන්දෙ තමනුත්තරං ධම්මං.

කරුණාපුසිනහදයං බුද්ධං නෙත්වා සුදෙසිනං ධම්මං
වඤ්චිත්වාරියසඞ්ඝං වාසෙත්වානාථ හදයභවනෙ.
සාවත්තොදයකාරී පවිපතතිමහි ච සද්ධරාසතෙන
යෙති පතිඨං ලබ්ධා වන්දෙහතෙන ගරුමිසභං.
ඉවෙවවං විහනාසෝ අඨකථං මජ්ඣිමාගමවරස්ස
අත්ථාය සිහලානං ආරභපෙසසං සභාසාය.

කරුණාසිනලහදයං = දයාවෙන් සිහිල් වූ ළයඇති; **පඤ්ඤාපජ්ජොතවිහතමොහතමං** = ප්‍රඥා නමැති ප්‍රදීපයෙන්; **විහත** = වෙසෙසින් නසනලද; **මොහතමං** = මොහ නමැති අඳුකාරය ඇති; **සනරාමරලොකගරුං** = දෙව්මිනිසුන් සහිත ලොකයාහට හෙවත් මිනිසුන් සහිත දිව්‍යසමූහයාහට ආචාර්‍ය්‍ය වූ; **ගතිවිමුත්තං** = (ආර්‍ය්‍යමාර්ගාඞ්ගමයෙන් සියලු භවගාමී කම් නැසූහෙයින්) නිරයාදි පඤ්චගතියෙන් මොනොවට මිදුනා වූ; **සුගතං** = (සොභනගමනබවාදිකාරණයෙන්) සුගත නම්වූ භාග්‍යවතුන් වහන්සේ; **වන්දෙ** = (භක්තිශ්‍රද්ධාකිශයෙන් නැමී) අභිවාදනය කෙරෙමි.

2. **බුද්ධෝපි** = (සවාසනාඝකලකෙලඝයන් නිරවශෙෂයෙන් විධවංසනය කොට සර්ව්වඥයන් සර්ව්වාකාරයෙන් සවයම්භූඥානයෙන් අවබොධ කළ භාග්‍යවත්) බුදුරජාණන් වහන්සේ ද; **යං** = යම් ආර්‍ය්‍යමාර්ගසඞ්ඛ්‍යාත ධර්‍මයක්; **භාවෙත්වා වෙව** = උපදවා ද නොහොත් වඩා ද; **සව්ඡිකත්වා ච** = (ඵලනිර්‍වාණය) ප්‍රත්‍යක්ෂ කොට ද; **බුද්ධභාවං** = (අනුත්තර වූ) සම්‍යක් සම්බොධියට; **උපගතෝ** = පැමිණිසේක් ද; **ගතමලං** = පහවූ රාගාදි කෙලෙස්මලඇති නොහොත් නිර්‍දෝෂ වූ; **අනුත්තරං** = ලොකොත්තර වූ; **තං ධම්මං** = ඒ ප්‍රතිවෙධ සඞ්ගීය (හා තත්ප්‍රකාශක හෙයින් පර්‍යාප්ති සඞ්ගීය ද;) **වන්දෙ** = ප්‍රණාමය කෙරෙමි.

3. සුගතස්ස ඔරසානං පුත්තානං මාරසෙනමථනානං
අඤ්ඤාසිකොණ්ඩඤ්ඤත්ථෙරස්ස සමූහං සිරසා වන්දෙ අරියසඞ්ඝං,

4. ඉති මෙ පසන්නමතිනො රතනත්තයවන්දනාමයං පුඤ්ඤං
යං සුචිභතනතරයො හුත්වා තස්සා'නුභාවෙන.

5. මජ්ඣිමපමාණසුත්ත ඛකිනස්ස ඉධ මජ්ඣිමා'ගමවරස්ස
බුධා'නුබුධසංවණ්ණි තස්ස පරවාදමථනස්ස.

6. අත්ථපකාසනත්ථං අඤ්ඤථා ආදිතො වසිසතෙහි
පඤ්චහි යා සඞ්ගීතා අනුසඞ්ගීතා ච පච්ඡා'පි.

7. සීහළදීපං පන ආභතා'ථ වසිනා මහාමහින්දෙන
ථපිතා සීහළභාසාය දීපවාසීනමත්ථාය.

---

3. **සුගතස්ස**= සම්බුදුන්ගේ; **ඔරසානං පුත්තානං**= ඔරසපුත්‍ර වූ; **මාරසෙනමථනානං**= (ලොභාදි කෙලෙස්) මරසෙනග වෙළපන්නා වූ; **අඤ්ඤාසිකොණ්ඩඤ්ඤත්ථෙරස්ස සමූහං**= (මාගීසථවිලසථයන්ගේ වශයෙන්) අටවැදෑරුම් පුද්ගලයන්ගේ සමූහය වූ; **අරියසඞ්ඝං**= ආර්‍ය්‍ය සඞ්ඝයා; **සිරසා**= උත්තමාඞ්ගයෙන්; **වන්දෙ**= වඳිමි.

4. **ඉති**= මෙසේ; **පසන්නමතිනො**= ප්‍රසන්න බුද්ධි ඇති; **මෙ**= මාගේ; **රතනත්තය වන්දනාමයං**= (රතිජනනාද්‍යර්ථයෙන් රතන නම් වූ බුදාදි) රත්නත්‍රයට නමස්කාර කිරීමෙන් ජනිත වූ; **යං පුඤ්ඤං**= යම් පුණ්‍යයක් වේද; **තස්ස**= (රත්නත්‍රය නමස්කාරජනිත) ඒ පුණ්‍යයාගේ; **ආනුභාවෙන**= බලයෙන්; **සුචිභතනතරයො හුත්වා**= මොනොවට නසන්නේ උපදුව ඇති ව-

5. **ඉධ**= මෙහි; **මජ්ඣිමපමාණසුත්තඛකිනස්ස**= මධ්‍යමප්‍රමාණසූත්‍රයන්ගෙන් අඩංකිත වූ; **බුධානුබුධසංවණ්ණිනස්ස**= අග්‍රශ්‍රාවකාදි ආර්‍යයන් විසින් (අවීසංවණ්ණනා වශයෙන් හා ගුණසංවණ්ණනා වශයෙන්) සංවර්ණිතා කරන්නේද නොඉක්ත සම්‍යක් සම්බුදුන් විසින් හා (සංඝායනාදි වශයෙන් අනුබුද්ධ නම් වූ) ශ්‍රාවකයන් විසින් ද මොනොවට වර්ණිතා කරනලද; **පරවාදමථනස්ස**= පරවාදයන් විලොඩනය කරන්නා වූ; **මජ්ඣිමාගමවරස්ස**= මධ්‍යමනිකායවරයාගේ-

6. **අත්ථපකාසනත්ථං**= අර්ථයන් ප්‍රකාශකරනු සඳහා; **යා අඤ්ඤථා**= යම් අර්ථකථාවක් නොමෝ; **පඤ්චහි වසිසතෙහි**= (පරමවිත්ත වසිභාවයෙන් යුක්ත හෙයින් වසී නම් වූ මහාකාශ්‍යපාදි) පන්සියයක් මහරහතුන් විසින්; **ආදිතො**= ආදියෙහි වූ ප්‍රථමසඟිතියෙහි; **සඟීතා**= (අරුත් පළකළයුතු තැන්හි මේ මෙහි අර්ථයයි) සඞ්ග්‍රහ කොට වදරන ලද්දී ද; **පච්ඡා+අපි**= පසුව (ද්විතීය තෘතීය සඞ්ගීතීන්හි) ද; **අනුසඞ්ගීතා ච**= (යශසථවිරාදීන් විසින්) අනුසඞ්ගායනාත් කරනලද්දීද-

7. **අථ**= පසුව; **වසිනා මහාමහින්දෙන**= වසිවූ මහාමහෙන්‍ද්‍රසථවිරයන් වහන්සේ විසින්; **සීහළදීපං**= සිංහල ද්වීපයට; **ආභතාපන**=

8. අපනෙත්වාන තතෝ'හං සිහළභාසං මනොරමං භාසං
තන්තිනයා'නුලෝමිකං ආරොපෙනෙතා විගතදොසං.

9. සමයං අවිලොමෙනෙතා ථෙරානං ථෙරවංසදීපානං
සුනිපුණවිනිච්ඡයානං මහාවිහාරාධිවාසීනං.

10. භිත්වා පුනපපුනාගතමත්ථං අත්ථං පකාසයිස්සාමි
සුජනස්ස ච තුට්ඨත්ථං චිරඨිතත්ථඤ්ච ධම්මස්ස.

11. සීලකථා ධුතධම්මා කම්මට්ඨානානි වෙව සබ්බානි
චරියාවිධානසහිතො ඣානසමාපත්තිවිත්ථාරො.

12. සබ්බා ච අභිඤ්ඤායො පඤ්ඤාසඛ්කලනනිච්ඡයො වෙව
ඛන්ධා ධාතා'යතනින්ද්‍රියානි අරියානි වෙව චත්තාරි.

(දඹදිවින්) ගෙන එනලද්දී වනාහි; **දීපවාසිනං + අත්ථාය**= ලඞ්කාවීප වාසීන්ගේ ප්‍රයොජනය පිණිස; **සිහළභාසාය**=හෙළදිව්බසින්; **ඵපිතා**= (ලියා) තබනලද්දී ද-

8. **අහං**= (බුඬඝොෂ නම් වූ) මම; **තතෝ**= ඒ අර්ථ කථාවෙන්; **සිහළභාසං**= (කඤ්චුකයක් වැනි වූ) සිංහල භාෂාව; **අපනෙත්වාන**= පහ කොට; **විගතදෙසං**= (අසභාව නිරුත්ති භාෂානන්තර රහිත හෙයින්) පහවූ දොෂ ඇති; **තන්තිනයානුලොමිකං**= පාලිධර්මනයානුකූල වූ; **මනොරමං**= සිත්කලු වූ; **භාසං**= මාගධ භාෂාවට; **ආරොපෙනෙතා**= නඟන්නෙම්-

9. **ථෙරවංසදීපානං**= (මහා කාශ්‍යපස්ථවිරාදි) ආචාර්‍ය්‍ය (ස්ථවිර) පරම්පරාවට ප්‍රදීපයන් බඳු වූ; **සුනිපුණවිනිච්ඡයානං**= ඉතා සියුම් වූ ධර්මනිර්ණය ඇති; **මහාවිහාරාධිවාසීනං**= (අනුරාධපුරයෙහි) මහා විහාරවාසී වූ; **ථෙරානං**= ස්ථවිරවරුන්ගේ; **සමයං**= සිද්ධාන්තය හෝ ලබ්ධියට; **අවිලොමෙනෙතා**= අවිරුද්ධ වෙමින්-

10. **සුජනස්ස**= සාධුජනයාගේ; **තුට්ඨත්ථං ච**= තුෂ්ටිය පිණිස ද; **ධම්මස්ස**= සද්ධර්මයාගේ; **චිරඨිතත්ථං ච**= චිරකාල ප්‍රවෘත්තිය පිණිස ද; **පුනපපුනාගතං**= නැවත නැවත පැමිණියා වූ හෙවත් නැවත නැවත කියනලද; **අත්ථං**= අර්ථය; **භිත්වා**= හැර; **අත්ථං**= මධ්‍යමනිකායාර්ථකථාව; **පකාසයිස්සාමි**= ප්‍රකාශ කරන්නෙමි.

11. **සීලකථා**= (චාරිත්‍රවාරිත්‍රාදි වශයෙන්) ශීලයාගේ විස්තාරකථාව ද; **ධුතධම්මා**= (පිණ්ඩපාතිකාඞ්ගාදි තෙළෙස්) ධුතාඞ්ග ධර්මයෝ ද; **සබ්බානි කම්මට්ඨානානි වෙව**= (යොගකර්මයාගේ වැඩීමට ප්‍රවෘත්තිස්ථාන වූ) නිරවශෙෂ කර්මස්ථානයෝ ද; **චරියාවිධාන සහිතො**= (රාග චර්‍ය්‍යාදීන්ගේ සභාවාදි) චර්‍ය්‍යාවිධානය සහිත වූ; **ඣානසමාපත්තිවිත්ථාරො**= ධ්‍යාන සමාපත්තීන්ගේ විස්තාරය ද-

13. සච්චානි පච්චයාකාරදෙසනා සුපරිසුඛනිපුණනයා
අච්මුත්තතනතිමඟහා විපස්සනාභාවනා චෙව.

14. ඉති පන සබ්බං යසමා විසුඛිමඟෙඝ මයා සුපරිසුඛං
වුත්තං තසමා භීයෝ න තං ඉධ විචාරයිස්සාම්.

15. මජ්ඣිම විසුඛිමඟෙහා එසවතුත්තනමපි ආගමානං හි
ඨනා පකාසයිස්සති තත්ථ යථාභාසි තං අත්ථං.

16. ඉච්චෙව කතෝ තසමා තමපි ගහෙත්වාන සඛිමෙතාය
අඨකථාය විඤ්ඤූ මජ්ඣිමසඛගිතියා අත්ථනති.

---

12 – 13. **සබ්බා ච අභිඤ්ඤායෝ**= (ලෞකික ලොකොත්තර හෙද ඇති) සියලු අභිඥාවෝ ද; **පඤ්ඤාසඛකලනනිච්ඡයෝ චෙව**= එකවිධාදි හෙදනිත්තා ප්‍රඥාවන් සඛකලනය (සම්පිණ්ඩනය) කොට කරනලද නිණ්ණය ද; **ඛන්ධා**= (රූපාදි පඤ්චවිධ) සකඛඛෝ ද; **ධා තා ය න නි ඳ්‍රි ය ානි**= (පෘථිව්‍යාදි) ධාතුය (චක්ඛවාදි) ආයතනය (චක්ඛවාදි ඉන්ද්‍රියය යන මොහු ද; **අරියානි චෙව චත්තාරිසච්චානි**= (දුඃඛාදි) චතුරාර්‍ය සත්‍ය යෝ ද; **සුපරිසුඛ නිපුණනයා**= (නිකායාන්තර ලබ්ධීන් හා සඛකර රහිත හෙයින් ද එකත්ථනයාදි නය සහිත හෙයින් ද) අති පරිශුඛ සියුම් නයඇති; **පච්චයාකාරදෙසනා**= (ප්‍රත්‍යය ප්‍රත්‍යුත්පන්න ධ ර්‍ම ය න් ගේ හෙතු ප්‍රත්‍යයාදිභාව සඛ්‍යාත) ප්‍රත්‍යයාකාර දෙශනාව ද; **අච්මුත්තත නනතීමඟහා**= (ප්‍රතිසංවිදාදියෙහි ආගතනය නො හැර විචාරණය කළ හෙයින්) නො හරනලද දෙශනාමාගී ඇති; **විපස්සනාභාවනා චෙව**= විදර්‍ශනා භාවනාව ද-

14. **ඉති පන**= මෙසේ වනාහි; **සබ්බං**= (මේ) සියල්ල; **යසමා**= යම්හෙයකින්; **මයා**= මා විසින්; **සුපරිසුඛං**= ඉතා පිරිසුදු කොට; **විසුඛි මඟෙඝ**= විශුඛිමාගී යෙ හි; **වුත්තං**= කියනලද්දේ ද; **තසමා**= එසේ හෙයින්; **තං**= ඒ (පූර්‍වොක්ත සියල්ල); **ඉධ**= මේ මධ්‍යමනිකායාර්‍ථ කථා වෙහි ලා; **භීයෝ**= බොහෝ සෙයින් (නැවත); **න විචාරයිස්සාම්**= විමසීම නො කරන්නෙමි.

15. **හි**= යම්හෙයකින්; **එසෝ විසුඛිමඟෙහා**= මේ විසුඛිමාගී ය තෙම; **චතුන්නම්පි ආගමානං**= (දීඝනිකායාදි) නිකාය චතුෂ්කයාගේ ම; **අත්ථං**= අර්‍ථකථාව; **යථාභාසිතං**= බුඛදෙශිත වූ අදහස නො ඉක්ම; **තත්ථ මජ්ඣිම**= ඒ නිකාය චතුෂ්කයාගේ මධ්‍යයෙහි; **ඨනා**= සිට; **පකාසයිස්සති**= ප්‍රකාශ කරන්නේ ද-

16. **ඉච්චෙව**= (යම්හෙයකින්) මෙසේ සාධාරණ බැව්හි ම සිට; **කතෝ**= කරනලද්දේ ද; **තසමා**= එසේ හෙයින්; **තම්පි**= ඒ විසුඛිමාගී ය ද; **එතාය අඨකථාය සඛිං**= මේ (පපඤ්චසූදනී නම්) අර්‍ථකථාව සමග; **ගහෙත්වාන**= ගෙන; **මජ්ඣිම සඛගිතියා**= මධ්‍යම නිකාය පිළිබඳ වූ; **අත්ථං**= අර්‍ථකථාව; **විඤ්ඤූ**= දැන ගනිවු.

ග්‍රන්ථප්‍රමාණය.

ම ඛ්‍යම නිකායාළු ප්‍රකාශ කිරීමෙහි ළා " මඛ්‍යම සඞ්ගීති " තොමෝ නම් පණ්ණාසා වශයෙන් මූල පණ්ණාසකය මඛ්‍යමපණ්ණාසකය උපරිපණ්ණාසක ය 'යි පණ්ණාසාත්‍රයකින් සඞ්ග්‍රහ වන්නීය, වගී වශයෙන් එකෙකී පණ්ණාසායෙහි පසක් පසක් වගීයන් කොට පසළොස් වගකින් යුක්ත වන්නීය; සූත්‍ර වශයෙන් යෙල සියයක් සූත්‍රාන්ත ද සූත්‍රාන්ත දෙකක් ද වෙති; (එක්සිය දෙපණසක් සූත්‍රාන්තයෝ යැයි සේයි.) පද විසින් තෙවිස්සක් වැඩි වූ පන්සියයක් අධික කොට ඇති අසූපදදහසක් වෙති; එසින් කීහු පොරණැදුරෝ–

17. අසීති පදසහස්සානි භිය්‍යෝ පඤ්චසතානි ච
පුන තෙවීසති වුත්තා පදමෙවං වවත්ථිතන්ති.

(අසූදහස් පන්සිය තෙවිසි පද කොනෙකැ'යි (පුරාණයන් විසින්) කියන ලද්දාහුය; මෙසේ පදව්‍යවස්ථා කරනලද- යනු භාවයි.)

අකුරු විසින් අකුරු සත්සිය දහසක් ද සතළිස් දහසක් ද තෙපණස් අකුරු කෙනෙක් ද වෙති; (අකුරු සත්ලක්ෂ සතළිස් දහස් තෙපණසකැයි සේයි.) බණවර විසින් අසූබණවරක් ද තෙවිසි පදයක් අධික කොට ඇති අඩබණවරක් ද වේ; අනුසන්ධි වශයෙන් පෘච්ඡානුසන්ධි අධ්‍යාශයානුසන්ධි යථානුසන්ධි වශයෙන් සංක්ෂෙපයෙන් ත්‍රිවිධ වූ අනුසන්ධි යෙකි; විස්තාර වශයෙන් වනාහි මෙහි අනුසන්ධීහු තුන්දහසක් ද නව සියයක් ද වෙති; එසින් කීහු පොරණැදුරෝ–

18. තීණි සන්ධිසහස්සානි කථා නවසතානි ච
අනුසන්ධිනයා එතෙ මජ්ඣිමස්ස පකාසිතා.

(මඛ්‍යමනිකාය පිළිබඳ වූ මේ තුන්දහස් නවසියයක් අනුසන්ධි ක්‍රමයෝ ප්‍රකාශ කරන ලදහු. යනු භාවයි)

එහි පණ්ණාසකයන් අතුරෙහි මූලපණ්ණාසකය ආදි වෙයි; වගී යන් අතුරෙහි මූලපරියාය වගීය (ආදි වෙයි); සූත්‍රයන් අතුරේහි මූල පරියාය සූත්‍රය (ආදි වෙයි.) ඒ සූත්‍රයාගේ ද **එවමෙමසුතං** යනාදි වූ ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් වහන්සේ විසින් ප්‍රථම මහා සඞ්ගීතිකාල යෙහි වදාරනලද නිදානය ආදි වෙයි.

හෝ මෝ ප්‍රථම මහා සඞ්ගීති වනාහි "සුමඞ්ගලවිලාසිනී" දීඝනිකා යාළු කථාවෙහි ආදියෙහි විස්තාර කරන ලද්දීය; එහෙයින් හෝ එහි විස්තාරකළනයින් ම දතයුත්තීය.

---

17. **අසීතිපද සහස්සානි**= අසූ පද දහසක් ද; **භිය්‍යෝ**= තැවත; **පඤ්චසතානි ච**= පන්සියයක් ද; **පුන**= තැවත; **තෙවීසති**= තෙවිස්සක් ද; **වුත්තා**= කියන ලද්දාහුය; **එවං**= මෙසේ; **පදං වවත්ථිතං**= පද ව්‍යවස්ථා කරනලද;

18. **මජ්ඣිමස්ස**= මඛ්‍යමනිකායයාගේ; **තීණි සන්ධි සහ ස්සා නි**= අනුසන්ධි තුන්දහසක් ද; **කථා**= එසේ; **නවසතානි ච**= නවසියයක් ද යන; **එතෙ අනුසන්ධිනයා**= මේ අනුසන්ධි ක්‍රමයෝ; **පකාසිතා**= ප්‍රකාශ කරන ලදහු,

මූලපරියාය සූත්‍ර වර්ණනා.

නිදාන වර්ණනා. යම් මේ එවමේමයා සුතං යනාදි නිදානයක් වේ ද එහි එවං යනු නිපාත පදය; මෙ යනාදීහු නාම පදයෝයි; **උකකට්ඨායං විහරති** යන මෙහි වි යනු උපසර්ග පදය; **හරති** යනු ආඛ්‍යාත පදය; යන මෙම නයින් පදවිභාගය දතයුත්තේය.

එවං ශබ්දාර්ථය. අර්ථ වශයෙන් වනාහි එවං= ශබ්දය තෙම උපමා, උපදෙශ, සම්ප්‍රහර්ෂණ, ගර්හණ, වචන සම්ප්‍රතිග්‍රහණ, ආකාර, නිදර්ශන, අවධාරණාදි නොයෙක් අර්ථප්‍රභේද ඇත්තේ වෙයි. ඒ එසේ මය- මේ "එවං" ශබ්ද **"එවං ඛෝ නෙ තුම්හෙහි වෙවචන කතතබබං කුසලෙන බහුං"** යන මේ ආදි තැන්හි උපමායෙහි ආයේය; **"එවං තෙ අභික්කමිතබබං, එවං පටික්කමිතබබං"** යනාදීන්හි උපදෙශ යෙහිය. **"එවමෙතං භගවා! එවමෙතං සුගත!"** යනාදීන්හි සම්ප්‍රහර්ෂණ යෙහිය; **"එවමෙවමපනායං වසලී යඤ්ඤං වා තඤ්ඤං වා තඤ්ඤ මුණ්ඩකඤ්ඤ සමණකඤ්ඤ වණ්ණං භාසති"** යනාදීන්හි ගර්හා යෙහිය. **"එවමහනෙතනි ඛෝ තෙ භික්ඛු භගවතෝ පච්චසෙසාසුං"** යනාදීන්හි වචනසම්ප්‍රතිග්‍රහණයෙහිය; **"එවං ව්‍යා ඛෝ අහං භනෙන භගවතා ධම්මං දෙසිතං ආජානාමි"** යනාදීන්හි ආකාර යෙහියැ; **"එහි තං මාණවක! යෙන සමණෝ ආනන්දෝ තෙනුපසඞ්කම, උපසඞ්කමිත්වා මම වචනෙන සමණං ආනන්දං අප්පාබාධං අප්පාතඞ්කලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡ සුභෝ මාණවෝ නොදෙය්‍යපුත්තෝ භවන්තං ආනන්දං අප්පාබාධං —පෙ— ඵාසුවිහාරං පුච්ඡතීති; එවඤ්ච වදෙහි, සාධු කිර භවං ආනන්දෝ යෙන සුභස්ස මාණවස්ස තොදෙය්‍යපුත්තස්ස නිවෙසනං තෙනුපසඞ්කමතු අනුකම්පං උපාදාය** යනාදීන්හි නිදර්ශන යෙහිය; **"තඤ්කිම්මඤ්ඤථ? ආලාමා! ඉමෙ ධම්මා කුසලා වා අකුසලා වාති? අකුසලා භනෙන සාවජ්ජා වා අනවජ්ජා වාති? සාවජ්ජා භනෙන! විඤ්ඤූගරහිතා වා විඤ්ඤූපසත්ථා වාති? විඤ්ඤූගරහිතා භනෙන! සමත්තා සමාදිනනා අහිතාය දුක්ඛාය සංවත්තන්තීති? නො වා කථං වා එත්ථ හොතීති? සමත්තා භනෙන! සමාදිනනා අහිතාය දුක්ඛාය සංවත්තන්තීති; එවං නො එත්ථ හොති"** යනාදීන්හි අවධාරණ යෙහිය; හේ මේ (එවං ශබ්ද) මෙහි ආකාර නිදර්ශනාව ධාරණාර්ථයන්හි දතයුත්තේය. ඔවුනතුරෙහි ආකාරාර්ථ "එවං" ශබ්දයෙන් මේ අර්ථය දක්වයි; විවිධනය නිපුණ වූ අනෙකාධ්‍යාශය සමුත්පන්න වූ අව්‍යාසඥාන සම්පන්න වූ විවිධ ප්‍රාතිහාර්‍ය යුක්ත වූ ධර්මාර්ථ දෙශනා ප්‍රතිවෙධ වශයෙන් ගැඹුරු වූ සියලු සත්වයන්ගේ සවාසවභාෂානුරූප වශයෙන් ශ්‍රොතපථයට පැමිණෙන්නා වූ ඒ භාග්‍යවතුන් වහන්සේගේ වචනය සර්ප්‍රකාරයෙන් දූනගන්ට කවරෙක් සමර්ථ

වන්නේ ද; සියලු ශකතියෙන්ම අසනු කැමතිබව උපදවා ද **එවමෙම සුතං**= මා විසින් ද එක් ආකාරයකින් අසනලදුයි, නිදර්‍ශනාර්ථ (එවං ශබ්ද) යෙන්- මම සවයමභූ නො වෙමි මා විසින් මේ පසක් නො කරන ලදුයි තමන් වහන්සේ මුදන සේක්, **එවමෙමසුතං**= මා විසින් ද මෙසේ අසන ලදුයි දැන් කියයුතු සියලු සූත්‍රය නිදර්‍ශනය කෙරෙයි (දක්වයි). අවධාරණාර්ථ (එවං ශබ්ද) යෙන්- "මහණෙනි! මාගේ ශ්‍රාවක වූ බහුශ්‍රැත භික්‍ෂූන් අතුරෙන් යම් මේ ආනන්‍දයෙක් වේද, සමෘතිමත් භික්‍ෂූන් අතුරෙන් ප්‍රඥගති ඇති භික්‍ෂූන් අතුරෙහි, ධෘතිමත් භික්‍ෂූන් අතුරෙන්, උපසථායක භික්‍ෂූන් අතුරෙන් යම් මේ ආනන්‍දයෙක් වේ ද මේ තෙම අග්‍රය" යි මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් ද— "ආයුෂ්මත් ආනන්‍ද යෝ අර්‍ථයෙහි දක්‍ෂයහ, ධර්‍මයෙහි දක්‍ෂයහ, ව්‍යඤ්ජනයෙහි (අක්‍ෂරපද යන්හි) දක්‍ෂයහ, නිරුක්තියෙහි දක්‍ෂයහ, පූර්‍වාපරසන්‍ධියෙහි දක්‍ෂයහ"යි මෙසේ දම්සෙනෙවියන් විසින් ද පසස්නා ලදබවට යොග්‍ය වූ තමන් වගන්සේගේ ධාරණශකතිය දක්වන සේක් සර්‍වඥයන්ට අසනුකැමතිබව උපදවන සේක; **එවමෙමසුතං**= හෙද වනාහි අර්‍ථ විසින් හෝ ව්‍යඤ්ජන විසින් හෝ නො අඩු නො වැඩි වූයේ ය; මෙසේමැය; අන්පරිද්දෙකින් නො දතයුතු යයි (ප්‍රකාශකරන සේක.)

"මෙ" ශබ්දය. **මෙ**= ශබ්දය තෙම අර්‍ථත්‍රයෙක්හි දක්නා ලැබෙයි, ඒ එසේ මැයි- මේ ("මෙ" ශබ්දයාගේ) **"ආථාහි ගිනං මෙ අනොජ්ජනෙය්‍යං"** යනාදීන්හි මා විසින් යන අර්‍ථයි; **"සාධු මෙ භනෙන භගවා සඞඛිත්තෙනෙව ධම්මං දෙසෙතු"** යනාදීන්හි මවිසි යන අර්‍ථයි; **"ධම්මදායාදා මෙ භික්ඛවෙ! භවථ"** යනාදීන්හි මාගේ යන අර්‍ථයි; මෙහි වනාහි මා විසින් අසන ලදුයි ද මාගේ ඇසීම යයි ද අර්‍ථ දෙකෙක් යෙදෙයි.

"සුත" ශබ්දය. **සුතං**= යන මේ ශබ්දය තෙම උපසර්‍ගී සහිතව ද උපසර්‍ගී රහිතව ද ගමනය, විශ්‍රැතය, කල්‍පිතය, උපචිතය, අනුයොගය, ශ්‍රොතවිඥෙය්‍යය, ශ්‍රොතවාරානුසාර විඥානයයි, යනාදි නො එක් අර්‍ථ ප්‍රභෙද ඇත්තේය. ඒ එසේමය- මේ "සුත" ශබ්දයාගේ **"සෙනාය පසුනො"** යනාදීන්හි යන්නේ යන අර්‍ථයි; **"සුතධම්මස්ස පස්සතො"** යනාදි තැන්හි විශ්‍රැත ධර්‍මයාගේ යන අර්‍ථයි; **"අවසුතානවසුනස්ස"** යනාදීන්හි කල්‍පිතා කල්‍පිතා (තෙත් වූ තෙත් නො වූ) වනුගේ යන අර්‍ථයි; **"තුමෙහනි පුඤ්ඤං පසුතං අනපපකං"** යනාදීන්හි රැස්කරන ලද්දේය යන අර්‍ථයි; **"යෙ ඣානපසුතා ධීරා"** යනාදීන්හි ධ්‍යානයෙහි යෙදුනාහු යන අර්‍ථයි; **"දිඨං සුතං මුතං"** යනාදීන්හි ශ්‍රොතවිඥෙය්‍ය යන අර්‍ථයි; **"සුතධරෙ සුතසන්නිචයො"** යනාදීන්හි ශ්‍රොතවාරානුසාරයෙන් විඥානය කරන (=දැන ගන්නා) ලද්ද ධරන්නේ යන අර්‍ථයි; මෙහි වනාහි ශ්‍රොතවාරානුසාරයෙන් ධරන ලදුයි හෝ ධාරීම යැයි හෝ යන මේ පදයාගේ අර්‍ථය වන්නේය; "මෙ" ශබ්දයාගේ මා විසින් යන අර්‍ථය ඇති කල්හි මෙසේ

මා විසින් අසනලද ශ්‍රොතචාරානුසාරයෙන් ධරන ලද්දේය යනු යෙදේ; මාගේ යන අර්ථය ඇති කල්හි මෙසේ මාගේ ඇසීමය ශ්‍රොතචාරානුසාර යෙන් ධැරීමය යනු යෙදේ.

"එවමෙම සුතං"

මෙසේ මේ පදත්‍රයෙහි **එවං** යනු ශ්‍රොත්‍රවිඥානාදි විඥානකෘත්‍යයාගේ දූක්වීමයි; **මෙ** යනු කියනලද විඥානයෙන් යුත් පුද්ගලයා දූක්වීමයි; **සුතං** යනු අශ්‍රවණභාව ප්‍රතික්ෂේපයෙන් නො අඩු නො වැඩි අවිපරීතව ඉගෙන ගත්බව දූක්වීමයි. එසේ ම **එවං** යනු ඒ ශ්‍රොත චාරානුසාරයෙන් පැවති විඥානවීථිහුගේ නානාප්‍රකාරයෙන් අරමුණෙහි පවත්නාබව ප්‍රකාශ කිරීමයි; **මෙ** යනු තමන් වහන්සේ ප්‍රකාශ කිරීමයි; **සුතං** යනු ධර්මය ප්‍රකාශ කිරීමයි. මේ වනාහි මෙහි සංක්ෂේපයයි- නානාප්‍රකාර යෙන් අරමුණෙහි පැවති විඥානවීථිය කරණකොට ගෙන මා විසින් අනෙකක් නො කරනලද මෙය ම කරන ලද්දේය, මේ ධර්මය අසන ලද්දේය; යනුයි. එසේ ම **එවං** යනු දූක්විය යුත්ත ප්‍රකාශ කිරීමයි; **මෙ** යනු පුද්ගලයා ප්‍රකාශ කිරීමයි; **සුතං** යනු පුද්ගලයාගේ කෘත්‍යය ප්‍රකාශ කිරීමයි; මේ කියනලද වෙයි, යම් සූත්‍රයක් දක්වන්නෙම් ද ඒ මා විසින් මෙසේ අසනලදුයි. එසේ ම **එවං** යනු යම් චිත්තසන්තාන යක්හුගේ නානාප්‍රකාරයෙන් පැවැත් ම හෙතුකොට ගෙන නානාර්‍ථ ව්‍යඤ්ජනයන්ගේ ගැනීම වේද ඒ චිත්තසන්තානයාගේ අනෙකාකාරය දූක්වීමයි; **එවං** යන මේ පදය තෙමේ ආකාර ප්‍රඥප්ති නම්. **මෙ** යනු කර්‍තෘ නිර්දේශයි; **සුතං** යනු විෂය නිර්දේශයි. මෙතෙකින් නානාප්‍රකාර යෙන් පැවැති චිත්තසන්තානයෙන් එයින් සමන්විත වූ කර්‍තෘ විෂයෙහි ගැනීම සනිටුහන් කරනලද වෙයි, නොහොත් **එවං** යනු පුද්ගල කෘත්‍ය නිර්දේශයි; **සුතං** යනු විඥාන කෘත්‍යය නිර්දේශයි; **මෙ** යනු උභයකෘත්‍ය යුක්ත වූ පුද්ගල නිර්දේශයි. මේ වනාහි මෙහි සංක්ෂේප යයි. **ශ්‍රවණ කෘත්‍යය සමන්විත පුද්ගලයා වූ මා විසින් විඥාන වශයෙන් ලත් ශ්‍රවණ කෘත්‍ය ව්‍යවහාරයෙන් අසනලද, යනුයි.**

එහි එවං යනු ද **මෙ** යනු ද භූතාර්‍ථ - උත්තමාර්‍ථ විශයෙන් අවිද්‍යමාන ප්‍රඥප්ති යයි. කිම මෙහි **එවං** යි හෝ **මෙ** යි හෝ යම් නිර්දේශයක් ලබන්නේ ද එය පරමාර්‍ථ වශයෙන් ඇත් ද? (නැත්මය.) **සුතං** යනු විද්‍යමාන ප්‍රඥප්ති යයි. යම් ඒ (ශ්‍රැතියක්) මෙහි කතින් ලබනලද ද එය පරමාර්‍ථ වශයෙන් විද්‍යමාන වේ යයි. එසේ ම **එවං** යනු ද **මෙ** යනු ද ඒ ඒ (ධර්මයන්) ග්‍රහණය කොට කියයුතු හෙයින් උපාදාය ප්‍රඥප්ති නම්. **සුතං** යනු දිඨසුතාදීන් සම්පසඨ කොට කියයුතු හෙයින් උපනිධාය ප්‍රඥප්ති නම්. මෙහි දු **එවං** යන වචනයෙන් නො මුළාබව දක්වයි; සම්මූඪ වූයේ නානාප්‍රකාර ප්‍රතිවෙධයෙහි සමර්‍ථ නො වේ මැයි. **සුතං** යන වචනයෙන් ශ්‍රැතයාගේ අවිනාශය ප්‍රකාශ කෙරෙයි; ඒ එසේ මය, යමෙකුගේ ශ්‍රැතය නැසුනේ වේද හෙතෙම කාලාන්තරයෙහි මා විසින් අසනලදුයි පිළින නො කෙරෙයි. මෙසේ ඒ ශ්‍රැතයාගේ අසම්මොහ

යෙන් (නො මුළා බැවින්) ප්‍රඥසිඩිය වෙයි; අසම්මොසයෙන් (=නො නැසීමෙන්) සමෘති සිඩිය වෙයි; එහි ප්‍රඥපූර්ඩගම සමෘතියෙන් ව්‍යඤ්ජනාව ධාරණයෙහි සම්ඵබව වෙයි; සමෘති පූර්ඩගම ප්‍රඥවෙන් අර්ථ ප්‍රතිවෙධ යෙහි සම්ඵබව වෙයි; තවයයාගේ සම්ඵතා යොගයෙන් අර්ථව්‍යඤ්ජන යෙන් පරිපූණී වූ ධර්මභාණ්ඩාගාරය පාලනයෙහි සමර්ථ බැවින් ධර්ම භාණ්ඩාගාරික භාවයාගේ සිඩිය වෙයි.

අනිත් ක්‍රමයෙක් නම්- **එවං** යන වචනයෙන් යොනිසොමනසිකාරය ප්‍රකාශ කෙරෙයි; නුනුවණින් මෙනෙහි කරන්නහුට නානාප්‍රකාර යෙන් ප්‍රතිවෙධය නොවන හෙයිනි. **සුණාං** යන වචනයෙන් අවික්ඛෙපය දක්වයි; විසිරුනු සිත්ඇත්තහුට ශ්‍රවණයක් නොවන හෙයිනි. ඒ එසේ මය- වික්ඛිපත සිත්ඇති පුද්ගල තෙම (අර්ථව්‍යඤ්ජනාදි) සියලු සම්පත්ති යෙන් කියනු ලබන්නේත් "මා විසින් නො අසනලද යලි වදුල මැනවැ" යි කියයි. තවද මෙහි යොනිසොමනසිකාරයෙන් ආත්මසම්‍යක් ප්‍රණිධිය ද පූර්ඩකෘත පුණ්‍යත්වය ද සිඩකෙරෙයි; මොනොවට නො පිහිටූ සිත් ඇත්තහුට හෝ පෙර නො කළ පින්ඇත්තහුට හෝ ඒ (යොනිසොමනසකාරය) නැති හෙයිනි. අවික්ඛෙපයෙන් සඩම් ශ්‍රවණය ද සත්පුරුෂාශ්‍රය ද සිඩ කෙරෙයි. වික්ඛිපත වූයේ ශ්‍රවණය කරන්ට නො මැහැකිවෙයි; සත්පුරුෂයන් නො ඇසුරුකරන්නහුට ශ්‍රවණයක් නොද ඇත්තේ යයි.

අනිකුදු ක්‍රමයෙක් වේ- යම් හෙයකින් **එවං** යනු යම් **චිත්තසන්තානයක්හුගේ නානාප්‍රකාරයෙන් පැවැත්ම හෙතුකොට ගෙන නානාර්ථ ව්‍යඤ්ජන ග්‍රහණය වේද, ඒ චිත්තසන්තානයාගේ නානාකාර නිර්දේශ යයි කියන ලද්දේය;** හේ සුන්දර වූ ආකාරය ද මනාකොට නො පිහිටි සිත් ඇත්තාහට හෝ පෙර නො කළපින් ඇත්තාහට හෝ නො වේද; **එහෙයින් එවං** යන මේ සොඳුරු ආකාරයෙන් තමන් වහන්සේගේ **(අත්තසම්මාපණිධි - පුබ්බකත පුඤ්ඤතා සඩ්ඛ්‍යාත) පශ්චිම චක්‍රුවය සම්පත්තිය දක්වනසේක; සුණාං** යන **ශ්‍රවණයොගයෙන් පූර්ව චක්‍රුවය සම්පත්තිය (දක්වන සේක;) ප්‍රතිරූපදෙශයෙහි නො වසන්නහුට හෝ** සත්පුරුෂොපාශ්‍රය විරහිතයනට හෝ ශ්‍රවණයක් නො මැ ඇත් ද; එහෙයින් ඔහුගේ පශ්චිම චක්‍රුවය සිඩියෙන් ආශය ශුඩිය සිඩ වූවා වෙයි; පූර්ව චක්‍රුවයාගේ සිඩියෙන් ප්‍රයොග ශුඩිය (සිඩ වූවා වෙයි;) ඒ ආශය ශුඩියෙන් ද අධිගමව්‍යක්ති සිඩිය වෙයි; ප්‍රයොග ශුඩියෙන් ආගමව්‍යක්ති සිඩිය වෙයි; මෙසේ ප්‍රයොගාශය ශුඩ වූ ආගමාධිගම සම්පන්නයාගේ වචනය සුඛෝදයට අරුණෝද්ගමය මෙන් ද කුශලකර්මයට යොනිසොමනසකාරය මෙන් ද භගවත්හුගේ වචනයට පූර්ඩගමවන්ට සුදුසු යයි යුක්ත සථානයෙහි නිදානය තඩනසේක් **එවමේම සුණාං** යනාදිය කීහ.

අනිත් ක්‍රමයෙක් කියනු ලැබේ- **එවං** යන මේ නානාප්‍රකාර ප්‍රතිවෙධදීපක වූ වචනයෙන් තමන් වහන්සේගේ අර්ථප්‍රතිභාන ප්‍රතිසම්භිදා සම්පත්ති සද්භාවය දක්වන සේක; **සුණාං** යන මේ ශ්‍රොතව්‍ය විශෙෂ

ප්‍රතිවේධදීපක වූ (වචනයෙන්) ධම්මනිරුත්ති ප්‍රතිසම්භිදා සම්පත්ති සද්ධාවය (දක්වන සේක;) **එවං** යන මේ යොනිසොමනසිකාරදීපක වූ වචනය වදාරන සේක් මා විසින් මේ ධර්මයෝ සිතින් සලකා බලනලද්දාහුය දෘෂ්ටියෙන් මනාකොට ප්‍රතිවේධ කරනලද්දාහු යයි දක්වනසේක; **සුතං** යන මේ ශ්‍රවණයොගදීපක වචනය වදාරනසේක් මා විසින් බොහෝ ධර්මයෝ අසනලද්දාහුය සිත්හි ධරනලද්දාහුය වචනයෙන් ප්‍රගුණකරන ලද්දාහු යයි දක්වන සේක; ඒ වචනවයෙන් ම අව්‍යුත්පන්නයන්ගේ පරිපූර්ණතාය දක්වන සේක් ශ්‍රවණයෙහි ආදරය උපදවන සේක; යම් හෙයකින් අව්‍යුත්පන්න පරිපූර්ණ වූ ධර්මය ආදරයෙන් නො අසන්නේ මහත් වූ හිතයෙන් පරිබාහිර වේද එහෙයින් ආදරය උපදවා සකස් කොට ධර්මය ඇසිය යුත්තේය.

එවමේම සුතං යන මේ සියලු වචනයෙන් ම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ තථාගත ප්‍රවේදිත වූ ධර්මය තමාගේ වශයෙන් (මේ මාගේ ධර්ම යයි තමා කෙරෙහි) නො පිහිටුවන සේක් අසත්පුරුෂභූමිය ඉක්මවන සේක; ශ්‍රාවකබව ප්‍රතිඥකරන සේක් සත්පුරුෂභූමියට බසිනසේක; එසේ ම අසඛ්‍යයෙන් සිත නැඟිටුවන සේක; සඛ්‍යයෙහි සිත පිහිටුවන සේක; හුදෙක් මේ ධර්මය මා විසින් අසනලද මය ඒ භාග්‍යවතුන් වහන්සේගේ ම වචන යයි දක්වන සේක් තමන් වහන්සේ (දෙශක බැවින්) මුදන සේක; ශාස්තෘන් වහන්සේ (ප්‍රමුඛ කොට) දක්වන සේක; ජිනවචනය වෙසෙසින් දක්වන සේක; ධර්මනෙත්තිය පිහිටුවන සේක.

වැලිදු **එවමේම සුතං** සි තමන් වහන්සේ විසින් ඉපදවූබව පිළිනො කරන සේක් පෙර ඇසූබව ප්‍රකටකරන සේක් මේ ධර්මය මා විසින් චතුවෛශාරද්‍ය විශාරද වූ දශබලධාරී වූ උත්තම ස්ථානයෙහි පිහිටියා වූ **ශ්‍රේෂ්ඨ නාදය නාදකරන්නා** වූ **සර්වඥෝත්තම** වූ **ධර්මේශ්වර** වූ **ධර්මරාජන්** වූ **ධර්මාධිපති** වූ **ධර්මප්‍රදීප** වූ **ධර්මශරණ** වූ **සර්වඥවර චක්‍රවර්ති** වූ **සම්‍යක් සම්බුද්ධ** වූ භාග්‍යවතුන් වහන්සේගේ සම්මුඛයෙන් පිළිගන්නා ලද්දේය; **එහි** අර්ථයෙහි හෝ ධර්මයෙහි හෝ පදයෙහි හෝ ව්‍යඤ්ජනයෙහි හෝ සැකයක් හෝ විමතියක් හෝ නො කටයුත්තී යයි මේ ධර්මයෙහි සියලු දෙවිමිනිසුන්ගේ අශ්‍රද්ධාව නසන සේක, ශ්‍රද්ධාසම්පත්තිය උපදවන සේක, එහෙයින් මේ කියනු ලැබේ.

19. **"විනාසයති අස්සද්ධං සද්ධං වඩ්ඪති සාසනෙ**
එවමේම සුතම්වෙවං වදං භොතමසාවකො" යි.

---

19. **භොතමසාවකොඃ**= ගෞතම ශ්‍රාවක වූ (ආනන්දස්ථවිරතෙම;) **එවං** මේ **සුතං ඉති** + **එවං**= "එවමේම සුතං" යි මෙසේ; **වදං**= කියන්නේ; **සාසනෙ**= සස්නෙහි; **අස්සද්ධං**= අශ්‍රද්ධාව; **විනාසයති**= නස්වයි; **සද්ධං**= ශ්‍රද්ධාව; **වඩ්ඪති**= වඩවයි;

ගෞතම ශ්‍රාවක වූ (ආනන්දස්ථවිරයන් වහන්සේ) එවමේ සුතං යි මේසේ (මේ පදත්‍රය) කියන්නාහු සසුන්හි අශ්‍රද්ධාව නස්වන සේක. ශ්‍රද්ධාව වඩවන සේක. යනු භාවයි.

එකං= යනු සඛ්‍යා පරිවෙජ්ද නිදේශයි; **සමයං**= යනු පරිච්ඡින්න නිදේශයි; **එකං සමයං** යනු අතියමින් දැක්වීමයි; එහි සමය ශබ්දය-

සමය ශබ්දය. 20. **"සමවායෙ බණෙ කාලෙ සමූහෙ හෙතු දිට්ඨි පටිලාභෙ පහානෙ ච පටිවෙධෙ ච දිස්සති."**

ඒ එසේමැයි, "සමය" ශබ්දයාගේ **"අපෙපවනාම සෙඛපි උපසඞ්ඛමෙය්‍යාම කාලඤ්ච සමයඤ්ච උපාදාය"** යන මේ ආදීන්හි එක්වීම අර්ථයි; **"එකොව බො හික්ඛවෙ! බණෙ ච සමයෝ ච බ්‍රහ්මචරිය වාසාය"** යනාදීන්හි ක්ෂණයයි; **"උණ්හසමයෝ පරිළාහසමයෝ"** යනාදීන්හි කාලයයි; **"මහාසමයෝ පවනස්මිං"** යනාදීන්හි සමූහාර්ථයි; **"සමයොපි බො නෙ භද්‍රාලි! අප්පටිවිඩ්ඩෝ අහොසි භගවා බොසාවකේහි විහරති භගවාපි මං ජානිස්සති භද්‍රාලිනාම භික්ඛු සඤ්ඤාසනෙ භික්ඛාය න පරිපූරකාරීති අයම්පි බො නෙ භද්‍රාලි! සමයෝ අප්පටිවිඩ්ඩෝ අහොසි"** යනාදීන්හි හෙතුවර්ථයි; **"නෙන බො පන සමයෙන උග්ගාහමානෝ පරිබ්බාජකෝ සමණමණ්ඩිකාපුත්තෝ සමයප්පවාදකෙ තින්දුකාචීරෙ එකසාලකෙ මල්ලිකාය ආරාමෙ පටිවසති"** යනාදීන්හි දෘෂ්ටාර්ථයි;

21 **"දිට්ඨෙව ධම්මෙ යෝ අත්ථෝ යෝ වත්ථෝ සම්පරායිකෝ අත්ථාභිසමයා ධීරෝ පණ්ඩිතොති පවුච්චති"** යන ආදි තන්හි ප්‍රතිලාභාර්ථයි; **"සම්මා මානාභිසමයා අනන්තමකාසි දුක්ඛස්ස"** යනාදීන්හි ප්‍රහාණාර්ථයි; **"දුක්ඛස්ස පීළනට්ඨෝ සඞ්ඛතට්ඨෝ සන්තාපට්ඨෝ විපරිණාමට්ඨෝ අභිසමයට්ඨෝ"** යනාදීන්හි ප්‍රතිවෙධාර්ථයි. මෙහි වනාහි මේ "සමය" ශබ්දයාගේ කාලය (යනු) අර්ථයි. එහෙයින් සංවත්සර ඍතු මාසාඩ්ඩ මාස දිවාරාත්‍රි පූර්වාහ්ණ මධ්‍යාහ්ණ සායාහ්ණ ප්‍රථම මධ්‍යම පශ්චිමයාම මුහූර්තාදි වූ කාල ප්‍රභෙද භූත සමයයන් අතුරෙන් එක් සමයක් යයි දක්වන සේක. එහි කිසිසේත් මේ සංවත්සරාදි සමයයන් අතු

---

20. **සමවායෙ**= එක්වීමෙහි ද; **බණෙ**= ක්ෂණයෙහි ද; **කාලෙ**= කාලයෙහි ද; **සමූහෙ**= සමූහයෙහි ද; **හෙතු දිට්ඨි**= හෙතු දෘෂ්ටි යන දෙක්හි ද; **පටිලාභෙ**= ප්‍රතිලාභයෙහි ද; **පහානෙ ච**= ප්‍රහාණයෙහි ද; **පටිවෙධෙ**= ප්‍රතිවෙධයෙහි ද; (යන මෙතෙක් අර්ථයන්හි) **දිස්සති**= ("සමය" ශබ්දය තෙම) දක්නා ලැබේ.

21 **දිට්ඨෙව ධම්මෙ**= ඉහතම්යෙහි ම; **යෝ අත්ථෝ**= යම් අර්ථයෙක් වේද; **සම්පරායිකෝ**= සාම්පරායික වූ; **යෝ වත්ථෝ**= යම් අර්ථයකුත් වේද; **අත්ථාභිසමයා**= (මෙකී විවිධ) හිතාර්ථ ප්‍රතිලාභය හෙතුකොට ගෙන; **ධීරෝ**= ධීර යයි ද; **පණ්ඩිතොති**= පණ්ඩිත යයි ද; **පවුච්චති**= (බුදුරජාණන් වහන්සේ විසින්) කියනු ලැබේ.

රෙහි යම් යම් සූත්‍රයක් යම් යම් අවුරුද්දක හෝ ඍතුවක හෝ මාසයක හෝ පක්ෂයක හෝ රාත්‍රිභාගයෙහි හෝ දිවාභාගයෙහි හෝ වදාරනලද ද ඒ සියල්ල තෙරුන් විසින් මොනොවට දන්නා ලද්දේය, ප්‍රඥාවෙන් ව්‍යවසථාපිත කරන ලද්දේය; යම්හෙයකින් අසවල් අවුරුද්දෙහි අසවල් ඍතුවෙහි අසවල් මාසයෙහි අසවල් පක්ෂයෙහි අසවල් රාත්‍රිභාගයෙහි අසවල් දිවසභාගයෙහි හෝ මා විසින් මෙසේ අසනලදුයි මෙසේ කිසිකල සුවසේ ධරන්ට හෝ උදෙසන්ට හෝ උදෙසවන්ට හෝ නො හැකි ද? බොහෝ කියයුතුත් වේද; එහෙයින් එක ම පදයකින් ඒ අර්ථය පිඬු කොට **"එකං සමයං"** යි වදාළහ.

ගබ්භාවක්‍රාන්ති සමය ජාති සමය සංවෙග සමය අභිනිෂක්‍රමණ සමය දුෂ්කරක්‍රියා සමය මාරවිජය සමය අභිසම්බෝධි සමය ධර්මචක්‍රප්‍රවර්තන සමය දෙශනා සමය පරිනිර්වාණ සමය යන මේ ආදී වූ භාග්‍යවතුන් වහන්සේගේ දෙව්මිනිසුන් අතර අතිශයින් ප්‍රකාශ වූ නො එක් කාල ප්‍රභෙද වූ ම යම් මේ සමය කෙනෙක් වෙත් ද ඒ සමයයන් අතුරෙන් දෙශනා සමය සඞ්ඛ්‍යාත වූ එක් සමයක යයි දක්වන සේක. ඥාන කරුණාකෘත්‍ය සමයයන් අතුරෙන් යම් මේ කරුණාකෘත්‍ය සමයක් හෝ වේද; ආත්මහිත පරහිත ප්‍රතිපත්ති සමයයන් අතුරෙන් පරහිත ප්‍රතිපත්ති සමයක් හෝ වේ ද; රැස්වූවන්ගේ කෘත්‍යවය සමයයන් අතුරෙන් ධර්මකථා සමයක් හෝ වේද; දෙශනා ප්‍රතිපත්ති සමයයන් අතුරෙන් දෙශනා සමයක් හෝ වේද ඒ සමයයන් අතුරෙහි දු එක්තරා සමයක් සඳහා **"එකං සමයං"** යි වදාළහ.

යලි කුමක් හෙයින් මෙහි යම් සේ අභිධර්මයෙහි **"යස්මිං සමයෙ කාමාවචරං"** යි ද මෙයින් අන්‍ය සූත්‍රපදයන්හි **"යස්මිං සමයෙ භික්ඛවෙ භික්ඛු විවිච්චෙවකාමෙහි"** යි ද සප්තමීවිභක්තීන් නිර්දිශ කරන ලදද; වනයෙහිත් **"තෙන සමයෙන බුද්ධො භගවා"** යි කරණ විභක්තීන් (දක්වන ලදද;) එසේ නො කොට **එකං සමයං** යි කර්මවිභක්තීන් දක්වන ලදද යත්? එහි එසේ ද මෙහි අන්පරිද්දෙකින් ද අර්ථය ලැබෙන හෙයිනි. යම්හෙයකින් ඒ අභිධර්මයෙහිත් මෙයින් අන්‍ය සූත්‍රපදයන්හිත් ආධාරාර්ථය ද භාවසඞ්ඛ්‍යාත ක්‍රියාවෙන් ක්‍රියා ලක්ෂණාර්ථයක් ලැබේද; ආධාරය වනාහි කාලාර්ථ වූ ද සමූහාර්ථ වූ ද සම යයි; එහි කියනලද සප්තම්‍යාදි ධර්මයන්ගේ ද ක්ෂණසමවාය හෙතු සඞ්ඛ්‍යාත වූ සමයයාගේ ද භාවයෙන් (= ක්‍රියාවෙන්) ඒ එසඤාදීන්ගේ භාවය ලකුණු (= ප්‍රකාශ) කරනු ලැබේ ද; එහෙයින් ඒ අර්ථය ප්‍රකාශකරනු පිණිස එහි ආධාර විභක්ති නිර්දිශය කරන ලද්දේය. වනයෙහි ද හෙළුවිය ද කරණාර්ථය ද ලැබෙයි; යම්හෙයකින් යම් ඒ ශික්ෂාපද ප්‍රඥප්තිසමයක් ශාරිපුත්‍ර සප්තවිරුදීන් විසිනුදු දුර්ඥෙය වූයේ ද හෙතු වූ ද කරණ වූ ද එසමයෙහි ශික්ෂාපද පනවවමින් ශික්ෂාපද ප්‍රඥප්ති හෙතුව ද අපෙක්ෂා කරන්නා වූ භාග්‍යවතුන් වහන්සේ ඒ ඒ තැන්හි විසූ සේක්ද; එහෙයින් ඒ අර්ථය

ප්‍රකාශකරනු පිණිස එහි (=විනයෙහි) කරණ වචනයෙන් නිර්දේශකරන ලදී. මෙහි වනාහි අන්‍යවූත් මෙබඳු තැන්හි අත්‍යන්ත සංයොගාර්ථය ලැබෙයි; යම්හෙයකින් යම් සමයක භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය හෝ අන්‍ය සූත්‍රාන්තයක් හෝ දෙසූ සේක් ද අත්‍යන්තයෙන් ම එසමය කරුණාවිහාරයෙන් විසූ සේක් ද; එහෙයින් ඒ අත්‍යන්ත සංයොගාර්ථය දැක්වීම පිණිස මෙහි කාර්‍යවචන නිර්දේශය කරන ලද්දේ යයි. එහෙයින් මේ කියනු ලැබෙයි–

22. **"නං නං අත්ථමවෙක්ඛිත්වා භුම්මේන කරණේන ච**
අයඤ්ඤත්‍ර සමයෝ වුත්තෝ උපයෝගේන සෝ ඉධ" යි.

ඒ ඒ අර්ථ අපේක්ෂා කොට මෙයින් අන්‍ය වූ අභිධර්ම – විනය දෙක්හි ආධාරයෙන් ද කරණයෙන් ද සමය ශබ්දය කියනලදී; හේ මෙහි කාර්‍යයෙන් කියනලද්දේ යයි–

පුරාණයෝ වනාහි (මෙසේ) වර්ණනා කෙරෙත්- **"නඤ්ඤං සමයෙ** කියා හෝ **නේන සමයේන** කියා හෝ **එකං සමයං** කියා හෝ වචන මාත්‍රයෙන් වූ විශේෂයකි, මේ සැමතැන්හි ආධාරාර්ථ මැයි; එහෙයින් **එකං සමයං** යි කිවද "එකස්මිං සමයෙ" (= එක් සමයෙක්හි) යන අර්ථය දතයුත්තේ" යයි.

"භගවා" යන පදය.

භගවා= යනු ගරු යන අර්ථයි; යම් හෙයකින් ලෙව්හි ගරුකළ යුත්තාහට "භ ග ව ත්" යි කියත් ද; මේ (සම්‍යක් සම්බුද්ධ) ද සර්වගුණ විශිෂ්ට හෙයින් සියලු සත්වයන්ට ගරු වේද; එහෙයින් භගවත් යයි දතයුත්තේය. පොරණාචාර්‍යවරුන් විසින් ද කියනලදී–

23. **"භගවාති වචනං සෙට්ඨං භගවාති වචනමුත්තමං**
ගරු ගාරවයුත්තෝ සෝ භගවා තේන වුච්චති" යි.

භගවා යනු ශ්‍රේෂ්ඨවාචක වචනයෙකි, භගවා යනු උත්තමවාචක වචනයෙකි. ගෞරවාර්හ වූ ඒ (සම්‍යක් සම්බුද්ධ සියලු ගුණයෙන් විශිෂ්ට හෙයින් සියලු සත්ත්ව) ගරු වේ ද; එහෙයින් භගවත් යයි කියනු ලැබේ, යනු භාවයි–

---

22. **නං නං අත්ථං**= ඒ ඒ අර්ථය; **අවෙක්ඛිත්වා**= පරීක්ෂා කොට; **අයඤ්ඤත්‍ර**= මෙයින් පිටත් අභිධර්ම – විනය දෙක්හි; **භුම්මේන**= ආධාර යෙන් ද; **කරණේන ච**= කරණයෙන් ද; **සමයෝ**= සමය ශබ්දයතෙම; **වුත්තෝ**= කියන ලද්දේය; **ඉධ**= මෙහි; **සෝ**= ඒ සමය ශබ්දය; **උප යෝගේන**= කාර්‍යයෙන් කියනලද්දේය;

23. **භගවා + ඉති**= "භගවා" යනු; **සෙට්ඨං**= ශ්‍රේෂ්ඨවාචක වූ; **වච නං**= වචන යෙකි; **භගවා + ඉති**= "භගවා" යනු; **උත්තමං වචනං**= උත්තම වාචක වචනයෙකි; **ගාරවයුත්තෝ**= ගෞරවාර්හ වූ (= ගරුභාව යට යොග්‍ය වූ); **සෝ**= ඒ (සම්‍යක් සම්බුද්ධ තෙම); **ගරු**= (සර්වගුණ විශිෂ්ට හෙයින්) ගරු වේද; **තේන**= එහෙයින්; **භගවා**= භගවත් යයි; **වුච්චති**= කියනු ලැබේ.

තවද-

24. **"භාග්‍යවා භගවා සුතෙනා භගෙහි ච විභත්තවා**
භත්තවා වනතගමනෝ භවෙසු භගවා තනෝ" යි.

(පිනැහි හෙයින් ද කෙලෙසුන් නැසූ හෙයින් ද භගධර්මයෙන් යුකත හෙයින් ද සම්‍යක්ධර්මයන් බෙදූ ප්‍රකාශ කළ හෙයින් ද උතුරු මිනිස්දම් සෙවූ හෙයින් ද භවයෙහි වමනය කළ ගමන් ඇති හෙයින් ද භගවත් නම් වෙයි; යනු භාවයි.)

මේ ගාථාවගේ වශයෙන් ("භගවා" යන) මේ පදයාගේ විස්තර යෙන් අර්ථය දතයුත්තේය; හේ විශුද්ධිමාර්ගයෙහි බුද්ධානුස්මෘති නිද්දේශ යෙහි කියන ලද්දේ මය.

මෙතෙකින් මෙහි **එවමෙම සුතං** යන වචනයෙන් ඇසූ පරිදි ධර්මය දෙශනාකරන සේක් භාග්‍යවතුන් වහන්සේගේ ධර්මශරීරය ප්‍රත්‍යක්ෂ කරන සේක; එහෙයින් "මේ ප්‍රවචනය ඉක්ම වූ ශාස්තෘන් වහන්සේ ඇත්තේ නො වේ, මේ තොපගේ ශාස්තෘ" යයි ශාස්තෘන් වහන්සේ නො දැක්මෙන් උකටලී වූ ජනයා අස්වසනසේක. **එකං සමයං භගවා** යන වචනයෙන් එසමයෙහි භාග්‍යවතුන් වහන්සේගේ අවිද්‍යමානබව දක්වන සේක් රූපකාය පරිනිර්වාණය ඔහිකරවන සේක. එයින් මෙබඳු වූත් ආර්‍යධර්මය දෙශනාකළා වූ දශබලධාරී වූ විදුරුසමූහයන් සමාන රූපකාය ඇති ඒ භාග්‍යවතුන් වහන්සේ ද පිරිනිවි සේක; අන් සත්වරෙකු විසින් ජීවිතයෙහි ආශා ඉපදවිය යුත්තීදැයි ජීවිතමදයෙන් මත් වූ ජනයා සංවෙග කරවන සේක; සඛර්මයෙහි ද ඔහුගේ උත්සාහය උපදවති; **එවං** යි ද වදුරමින් දෙශනා සම්පත්තිය දක්වති; **මෙ සුතං** යි ශ්‍රාවක සම්පත්තිය (දක්වති;) **එකං සමයං** යි කාලසම්පත්තිය (දක්වති;) **භගවා** යි දෙශක සම්පත්තිය (දක්වන සේක.)

"උකකට්ඨා" නගරය.

උක්කට්ඨායං විහරති යන මෙහි **උක්කා**= යනු හිතිහුල යනාවයි; ඒ නගරය ද මඩහුලදින යෙහි යහපත් ලක්ෂණය ගුහනක්ෂත්‍රයොගය නො ඉක්මේවයි කියා රාත්‍රියෙහි දඬුවැට පහන් ධරමින් සිටිකල්හි නිර්මාණය කළ හෙයින් "උක්කට්ඨා" යයි කියනු ලැබේ. දඬුවැට පහන් දල්වා ධරන කල්හි මවනලද බැවිනැයි කියනලද වෙයි; ඒ උක්කට්ඨා නගරයෙහි (යනාවයි.) සම්පාවියෙහි ආධාර වචනයි; **විහරති**= යනු අවිශෙෂ යෙන් මෙය ඊර්‍යාපථ දිව්‍යබ්‍රහ්ම ආර්‍ය විහරණයන් අතුරෙන් එක්තරා

---

24. **භාග්‍යවා**= (යම් හෙයකින් දැන සීලාදි කොටිප්‍රාප්ත) භාග්‍යය ඇත්තේ ද; **භගහවා**- (රාගාදි කෙලෙශයන්) භග්න කෙළේ ද; **භගෙහි ච සුතෙනා**= (ඓශ්වර්‍යාදි) භගධර්මයන්ගෙන් යුක්ත වූයේ ද; **විභත්ත වා**= (සතර ධාතාදි සම්‍යක්ධර්මයන්) විභාග කොට ප්‍රකාශ කෙළේ ද; **භත්තවා**= (ලෞකික - ලොකොත්තර උත්තරි මනුෂ්‍ය ධර්මයන්) භජනය කෙළේ ද; **භවෙසු**= (කාමාදි) භවයන්හි; **වනතගමනෝ**= වමනය කළ ගමන් ඇත්තේ ද; **තනෝ**= එහෙයින්; **භගවා**= භගවත් නම් වේ.

විහරණයකින් යුක්තබව දැක්වීමයි; මෙහි වූ කලි සථාන ගමන ආසන ශයන ප්‍රභෙද වූ ඊර්‍යාපථයන් අතුරෙන් එක්තරා ඉරියව්වකින් යුක්ත බව දැක්වීමයි; එහෙයින් සිටියේ ද යන්නේ ද හුන්නේ ද හෝනේ ද භගවත් තෙමේ වාසය කෙරෙයි කියා ම දතයුතුයි; යම් හෙයකින් ඒ භාග්‍යවතුන් වහන්සේ එක් ඉරියව් පිඛාවක් අනිත් ඉරියව්වකින් සිඳ ආත්මභාවය වැටිය නොදී පරිහරනය කරන සේක් ද පවත්වන සේක් ද එහෙයින් **විහරති** යයි කියනු ලැබේ.

සුභගවනෙ= යන මෙහි ප්‍රිය බැවින් "සුභග" නම්;

සුභග වනය. සොඳුරු සිරිඇති බැවින් ද සුන්දර කාම බැවින් දැයි කියන්නද වෙයි; එසේ මය ඒ වනයාගේ ශ්‍රී සම්පත්ති යෙන් මනුෂ්‍යයෝ ආහාර පානාදිය ගෙන රෑ දාවල් එහි ම සැණකෙළි උත්සවයන් කරමින් හොඟසුව අනුභව කෙරෙත්. මෙහි දි පුතෙක් ලබමු දුවක් ලබමු යයි සුන්දර සුන්දර කාමයන් ද ප්‍රාර්‍ථනා කෙරෙත්. ඔවුන්ගේ ඒ ප්‍රාර්‍ථනාව එසේ ම වෙයි; මෙසේ ඒ වනය සොඳුරු සිරි ඇති බැවින් ද සොඳුරු කාමයන් ඇති බැවින් ද "සුභග" නම් වේ; වැලිදු බොහෝ දෙනාට කැමති බැවින් ද "සුභග" නම් වේ; සෙවනය කෙරේනුයි "වන" නම් වේ. ආත්ම සම්පත්තිය පිණිස සත්‍වයන්ගේ භක්තිය කෙරෙයි; තමා කෙරෙහි සෙනහය උපදවයි, යන අර්‍ථයි; යාඥ කෙරේනුයි හෝ "වන" නම් වේ; අනෙකවිධ වූ මල් සුවඳින් සතුටුව මත්වූ කොකිලාදි පක්‍ෂීන්ගේ නාදයෙන් ද මදපවනින් සැලෙනරුක්සා වෙළෙප්පලුපතින් ද එනුමැන මා පරිභොග කරවූ යයි සියලු සත්‍වයන් යාඥාකරන්නාක් මෙන යනාර්‍ථයි; සුභග වූයේත් හේයැ වන වූයේත් හේනුයි **සුභගවන** නම් වේ. ඒ සුභගවනයෙහි යනාර්‍ථයි, වනය නම් රෝපිමය සචයඤ්ඤාත යයි විවිධවේ, ඒ වෛවිධ්‍යයෙහි වෙළුවන ජේතව නාදීහු රොපණය කරන ලද්දහු වෙති; අඹුවන මහාවන අඤ්ඤන වනාදීහු සචයඤ්ඤාතයෝයි; මේද සචයඤ්ඤාත යයි දතයුතු.

සාලරාජමූලෙ= යන මෙහි ශාලවෘක්‍ෂය ද "සාල" යී

"සාල" ශබ්දය. කියනු ලැබේ; කියේමැයි– **"සෙය්‍යථාපි භික්ඛවෙ! ගාමස්ස වා නිගමස්ස වා අවිදූරෙ මහන්තං සාල වනං තස්සුව'ස්ස ඵලූපඛිහි සඤ්ඡන්නං"** යී ද **"අන්තරෙන යමක සාලානං"** යී ද වාසභක්ෂි වූ දෙවුරුක ද ("සාල" යයිකියනු ලැබේ.) කියේ මැනු-

25. **"තවෙව දෙව විජිතෙ තවෙවුය්‍යානභූමියා**
උජුවංසා මහාසාලා නිලොභාසා මනොරමා" යි.

---

25. **දෙව**= දෙවයිනි; **තවෙව**= ඔබගේ ම; **විජිතෙ**= රටෙහි; **තවෙව**= ඔබගේ ම; **උය්‍යානභූමියා**= උයන් බිම්හි; **උජුවංසා**= සෘජු වූ කඳඇති; **මහාසාලා**= මහත් වූ වාසදෙවු වෘක්‍ෂයෝ; **නිලොභාසා**= නීල වර්‍ණයෙන් බබලන්නාහු; **මනොරමා**= සිත්කලු වූවාහුය.

යම් කිසි රුකක් ද ("සාල" යයි කියනු ලැබේ.) නියේ මැය— **"අථ ඛෝ තං භික්ඛවෙ මාලුවාබීජං අඤ්ඤතරස්මිං සාලමූලෙ නිපජ්ජෙය්‍ය"** යි. මෙහි වනාහි වනස්පති වූ ජ්‍යෙෂ්ඨවෘක්ෂය අදහස් කරන ලද්දේය. "රුජ" ශබ්දය වනාහි ඒ වෘක්ෂයාගේ ඒ දෙටුබව ම සිඳ කෙරෙයි; අන් තැන්හි දී මෙසේ කියන ලදී- **"සුප්පතිට්ඨිතස්ස වො බ්‍රාහ්මණ ධම්මස්ස නිග්‍රොධරාජස්ස"** යි. එහි දෙපරිද්දෙකින් සමාසය වේ; "සාලයන්ගේ රජ" යි ද 'සාලරාජ' නම් වේ; සාල වූයේත් හේයැ දෙටුඅටින් රාජ වූයේත් හේ නුයි ද "සාලරාජ" නම් වේ.

"මූල" ශබ්දය. මූලං= යනු සමීප යයි; ඒ එසේ මැයැ මේ මූල ශබ්දය තෙම **"මූලානි උබරෙය්‍ය අණතමසෝ උසිර නාලමත්තානිපි"** යනාදීන්හි මූල මූලයෙහි දක්නා ලැබේ; **"ලොහො අනුසලමූලං"** යනාදි තැන්හි අසාධාරණ හෙතු වෙහි (දක්නා ලැබේ;) **"යාව මජ්ඣන්තිකෙ කාලෙ ඡායා එරති නිවාතෙ පණ්ණානි පතන්ති එතානවනා රුක්ඛමූලං"** යනාදීන්හි සමීප යෙහි (දක්නාලැබේ;) මෙහි වූ කලි සමීපයෙහි යයි අදහස් කරනලදි; එහෙයින් වනදෙටු වෘක්ෂ (=සාලරුජ) යාගේ සමීපයෙහි යයි මෙසේ මෙහි අර්ථය දතයුතුයි. ඒ (උක්කඨායං විහරති සුභගවනෙ සාලරුජ මූලෙ යන) වචනයෙහි ලා කිසිවෙකුට මෙබඳු විතර්කයක් වන්නේය; වක්ෂ්‍යමානාකාරයෙන් චොදනා හෝ කරන්නේය; ඉදින් භාග්‍යවත් තෙමේ උක්කඨානුචර වෙසේ නම් "සුභගවනෙ සාලරුජමූලෙ" යි නො කිය යුතුය; නැතහොත් ඒ සුභගවනයෙහි වූ සාලරුජමූලයෙහි වෙසේ නම් "උක්කඨායං" යි නො කියයුතුය (කියයි.) යම්හෙයකින් දෙතැන්හි ම එක්සමයෙක්හි වාසය කරන්ට නො හැකිද (එහෙයිනි.) මේ වචනය මෙසේ නො දත යුත්තේය, සම්පාප්‍යයෙහි ආධාර වචන යයි නො කිවමෝද? එහෙයින් ගඞ්ගා යමුනාදීන් සමීපයෙහි හැසිරෙන ගවසමූහයෝ "ගඞ්ගාය චරන්ති යමුනාය චරන්ති" යි යම්සේ කියනු ලැබෙන්ද; එපරිද්දෙන් මෙහි ද උක්කඨානුචර සමීපයෙහි යම් මේ සුභගවනයක් සාලරුජයාගේ මූලයක් වේද එහි වාසය කරන්නේ **"උක්කඨායං විහරති සුභගවනෙ සාලරුජමූලෙ"** යි කියනු ලැබේ.

උක්කඨා (යන) වචනය ඒ භාග්‍යවතුන් වහන්සේගේ ගොචරග්‍රාමය දැක්වීම පිණිස මැයි; ("සුභගවනෙ" යනාදි) ශෙෂ වචනය ප්‍රව්‍රජිතානුරූප නිවාසස්ථානය දැක්වීම පිණිසයි; එහි උක්කඨා කීර්තනයෙන් ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ ගෘහස්ථයන්ට අනුග්‍රහ කිරීම දක්වන සේක; සුභගවනාදිය කීර්තනයෙන් ප්‍රව්‍රජිතයන්ට අනුග්‍රහ කිරීම (දක්වන සේක;) එසේ ම පූර්වවචනයෙන් සිව්පසය ගැනීමෙන් ආත්මක්ලමථානුයෝගය දුරුකිරීමයි; පශ්චිමවචනයෙන් වස්තුකාමය පහකිරීමෙන් කාමසුඛල්ලිකානුයෝගය දුරුකිරීමෙහි උපාය දැක්වීමයි; යලි පූර්වවචනයෙන් ධර්මදේශනාභියෝගයයැ; පශ්චිම වචනයෙන් විවේකාධ්‍යාශයයැ; පූර්වවචනයෙන් කරුණාවෙන් ඵලබිමයැ;

පශ්චිම වචනයෙන් ප්‍රඥාවෙන් පහව යාමයැ; පූර්ව්වනයෙන් සත්‍යයන්ට හිතසුව නිපදවීමෙහි අධ්‍යාශය ඇතිබවයැ; පශ්චිම වචනයෙන් පරනට හිතසුවකිරීමෙහි තෘෂ්ණාවශයෙන් නො ඇලුනුබවයැ; පූර්ව්වනයෙන් ධාම්මික (=නිවරද) සැපය නො හැරීම නිමිති කොට ඇති ඵාසුවිහරණයයැ; පශ්චිම වචනයෙන් උතුරු මිනිස්දහම්හි යෙදීමෙහි නිමිත්තයැ; පූර්ව්වනයෙන් මිනිසුන්ට උපකාර බහුලබවයැ; පශ්චිම වචනයෙන් දෙවියන්ට (උපකාර බහුලබවයැ;) පූර්ව්වනයෙන් ලෙව්හි උපන්නහු ලෙව්හි වැඩුනු බවයැ; පශ්චිම වචනයෙන් ලොකයා හා නො ඇලුනු බවයැ; පූර්ව්වනයෙන් **''එකපුග්ගලෝ භික්ඛවෙ! ලොකෙ උප්පජ්ජමානෝ උප්පජ්ජති බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං කතමෝ එකපුග්ගලෝ තථාගතෝ අරහං සම්මාසම්බුද්ධෝ''** යි වදළබැවින් යම් අසීයක් සඳහා භාග්‍යවතුන් වහන්සේ උපන්සේක්ද ඒ ලොකාර්ථ සඞ්ඛ්‍යාත් බුඩකෘත්‍යය නිෂ්පාදනයැයැ; පශ්චිම වචනයෙන් යම් තැනක උපන්සේක්ද ඊට අනුරූප වූ විහරණයයැ; සැබව භාග්‍යවතුන් වහන්සේ පළමුකොට ලුම්බිනී වනයෙහියැ දෙවනවර බොධිමණ්ඩයෙහි සැසි ලෞකික ලොකොත්තර උත්පත්තියෙන් වනයෙහි ම උපන්සේක; එහෙයින් උන්වහන්සේගේ වනයෙහි ම විසීම දක්වන සේක, යන මේ ආදිනයින් මෙහි අරුත් යෙදීම දතයුත්තිය.

නත්‍ථු= යනු දෙශය හා කාලය ප්‍රකාශ කිරීමයි; එසේමැය, **යම්** සම් යෙක්හි වාසය කෙරේද එසමයෙහි යයි ද යම් සාලරාජ මූලයෙක්හි වාසය කෙරේද ඒ සාලරාජ මූලයෙහි යයි ද දක්වනසේක; කියයුතු වූ දෙශකාලයන් හෝ දක්වන සේක්; සැබව භාග්‍යවතුන් වහන්සේ අයොග්‍ය වූ දෙශයෙහි හෝ කාලයෙහි හෝ දහම් නො දෙසන සේක; **අඤ්ඤාලො ඩො නාම ඛාහිය** යනාදිය ද මෙහි සාධකයි. **ඩො**= යනු පදපූරණමාත්‍රයෙහි අවධාරණයෙහි ආදි කාලාර්ථයෙහි හෝ නිපාතයි; **භගවා**= යනු ලොක ගුරුහු දැක්වීමයි.

භික්ඛු= යනු (මූලපරියාය දෙශනා) කථා ශ්‍රවණයෙහි යොග්‍ය පුද්ගලයන් දක්වන වචන යයි: වැලිදු මෙහි "භික්ෂණය කෙරේ නුයි භික්ෂු නම් වේ, භික්ෂාචාරයෙහි එලඹියේ නුයි භික්ෂු නම් වෙයි" යනාදි නයින් වචනාර්ථය දතයුත්තේය. **ආමන්තෙසි**= යනු ආලපනය (= ආමන්ත්‍රණය) කෙළේය කථාකෙළේය සම්බොධනය කෙළේය යනු මේ මෙහි අර්ථයි; පිටත්තැන්හි වනාහි දැන්වීමෙහි ද වෙයි; කියේ මැනු- **"ආමන්තයාමි වො භික්ඛවෙ! පවිවෙදයාමි වො භික්ඛවෙ!"** යි කැඳවීමෙහි ද වේ; කියේමැයි- **"එහි තවං භික්ඛු මම වචනෙන සාරිපුත්තං ආමන්තෙහි"** යි, **භික්ඛවො**= යනු ආමන්ත්‍රණය කරන අයුරු දැක්වීමයි; හෙද භික්ෂණ ශීලතාදි ගුණයොගයෙන් සිඛ හෙයින් කියන ලද්දේය; භික්ෂණ ශීලතා ගුණයෙන් යුකත වූයේත් භික්ෂු නම් වෙයි; භික්ෂණ

ධර්මතා (සිඟීම ව්‍රතයකොට ඇති) ගුණයෙන් යුක්ත වූයේත් (භික්ෂු නම් වෙයි,) භික්ෂණයෙහි සාධුකාරිත්ව ගුණයෙන් (=සකස් කොට කිරීමෙන්) යුක්ත වූයේත් (භික්ෂු නම් වේ) යයි ශබ්දශාස්ත්‍රඥයෝ දනිත්; ඔවුන්ගේ භික්ෂණ ශීලත්වාදි ගුණයොගයෙන් සිඩ වූ ඒ වචනයෙන් ද හීනාධික ජනයන් විසින් සෙවුනාලද වෘත්තිය ප්‍රකාශකරන සේක් උඩඟු දීනභාව යන්ට නිග්‍රහ කරන සේක; **භික්ඛවෝ** යන මේ කුළුණින් පතළ සොම්සිත්තෙත් හෙළීම පෙරදැරි කොට ඇති වචනයෙන් ද ඔවුන් තමන් වහන්සේගේ මුහුණට අභිමුඛ වූවන් කරන සේක් කියනු කැමතිබව දක්වන ඒ වචනයෙන් ම ඔවුන්ගේ අසනු කැමතිබව උපදවන සේක; නැවත සම්බොධනාර්ථ වූ ඒ වචනයෙන් ම සකස් කොට ඇසිමෙහි හා මෙනෙහි කිරීමෙහි ද ඔවුන් යොදවන සේක, ඒ එසේ මැය, ශාසන සම්පත්තිය තොමෝ මනාකොට ඇසීම මෙනෙහි කිරීම අයත් කොට ඇත්තිය.

දේශනා කාලයෙහි භික්ෂූන් ඇමතීම.

අන්‍යවූත් දිව්‍යමනුෂ්‍යයන් විද්‍යමාන කල්හි කුමක් හෙයින් භික්ෂූන් ම ඇමතූ සේක් ද යත්? ජ්‍යෙෂ්ඨ ශ්‍රෙෂ්ඨාසන්න සදෘසන්නිහිත භාවයෙනි; ඒ එසේ මැය, භාග්‍යවතුන් වහන්සේගේ ධර්මදේශනා තොමෝ සියලු (=සිව්) පිරිසට සාධාරණ වන්නිය; එතකුදු වුවත් පිරිස් අතුරෙන් භික්ෂූහු ජ්‍යෙෂ්ඨ වෙති; පළමු උපන් බැවිනි; අන භාරියබව ආදි කොට ශාස්තෘන් වහන්සේගේ චරිතයට අනුකූල ක්‍රියා ඇතිබැවින් ද සියලු ශාසනය පිළිගත් බැවින් ද ශ්‍රෙෂ්ඨ වෙති; එහි හුන් නවුන් අතුරෙන් ශාස්තෘන් වහන්සේට සමීප බැවින් ආසන්න වූවාහු වෙති; ශාස්තෘන් වහන්සේගේ සමීපයෙහි හැසිරෙන බැවින් සදෘසන්නිහිත වෙත් යයි; තවද ඔවුහු ධර්මදේශනාවට භාජනවෙති- අනුශාසනා පරිදි නො ඉක්ම පිළිපැදීම සිඩවන හෙයිනි; විශේෂයෙන් භික්ෂූන් සඳහා ම මෝ දෙශනා චිත්‍රයි ද ඔවුන් ඇමතූසේකැයි කිසිවෙක් කියත්; එහි (මෝ වොදනා) වන්නිය කුමක් හෙයින් භාග්‍යවතුන් වහන්සේ දම් දෙසන සේක් පළමුකොට භික්ෂූන් ඇමතූසේක් ද දහම් ම නො දෙසූ සේක්ද? යි, සිඟි උපදවනු පිණිසයි; සැබව භික්ෂූහු අනිකාක් සිතමින් ද වික්ෂිප්ත සිත් ඇත්තාහු ද ධර්මය ප්‍රත්‍යවෙක්ෂා කරමින් ද කර්මට්ඨාන මෙනෙහි කරමින් ද හුන්නාහු වෙත්; ඔවුන් නො අමතා දහම් දෙසන ලබන කල්හි මෝ දෙශනා කුමක් කරුණු කොට ඇත්තී ද කුමක් ප්‍රත්‍යය කොට ඇත්තී ද කවර අර්ථාපත්තියෙක්හි දෙශනා කරන ලද්දී ද? යි සලකන්ට නො හැකිවන්නාහු වරදවා හෝ ගන්නාහුය, නොගන්නාහු හෝ වෙති; එහෙයින් ඔවුන්ට සිඟිඋපදවනු පිණිස භාග්‍යවතුන් වහන්සේ පළමුකොට අමතා පසුව ධර්මය දෙශනා කරන සේක.

භදන්තෙ= යනු මේ ගෞරව වචනයෙකි; ශාස්තෘන් වහන්සේට පිළිවදන්දීම හෝ වෙයි; වැලිදු මෙහි "භික්ඛවෝ" යි වදාරන්නා වූ භාග්‍යවත් තෙමේ ඒ භික්ෂූන් ආමන්ත්‍රණය කෙරෙයි; (=අඩගා වදාරයි;)

"භදන්තෙන" යි කියන්නා වූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට ප්‍රත්‍යාලප නය කෙරෙත්; (=පිළිවදන් දෙති;) එසේම "භික්ඛවෝ" යි භාග්‍යවතුන් වහන්සේ පළමුකොට වදාරන සේක; "භදන්තෙන" යි ඔවුහු පිළිවදන් කියත්; "භික්ඛවෝ" යි පිළිවදන් දෙවන සේක; "භදන්තෙන" යි පිළි වදන් දෙති; **භෝ භික්ඛූ**= යනු භාග්‍යවතුන් වහන්සේ යම් භික්ෂුකෙනෙ කුන් ඇමතුසේක් ද (ඒ භික්ෂූහු යනාදීයි;) **භගවතෝ පච්චස්සොසුං**= යනු භාග්‍යවතුන් වහන්සේගේ ආමන්ත්‍රණයට පිළිවදන් ඇස්වූහ, අභි මුඛව ඇසූහ, සතුටුවූහ, පිළිගත්හ යන අර්ථයි; **භගවා එතදවොච**= යනු භාග්‍යවතුන් වහන්සේ මේ දැන් කියයුතු සියලු සූත්‍රය වදාළසේක.

මෙතෙකින් ආයුෂ්මත් ආනන්ද සථවිරයන් වහන්සේ විසින් කමලු පුලුදුලවිමල් මිහිරිරස සිලිල්ඇති පොකුරුණියකට සුවසේ බසිනු පිණිස නිමලගලතල රචනා විලස්සුතු පියගැට පෙළැති විසුළුමුතුලැල්සදිසි වැලි යෙන් ගැවසුනු පඩෙර බිම්පෙදෙසැති තොටක් වැනි වූ මොනොවට බෙදනලද බිතින් විසිතුරු වූ පිල්කඩින් පිරිකෙව් කළ න ක ත් ම ග (=අහස) පහරනුරිසින් මෙන් වෙසෙසින් පැලඹෙන තුඟුපහවරයකට සුවසේ නැඟෙනු පිණිස දළමුවාමටසිලිටුමුදුපුවරියෙන් හා කසුන්ලියෙහි අවුණනලද මිණිගණරස් රැසිනුදුලදුලඟිණිපෙතක් වැනි වූ රන්වලලු නුරුවලාඇ ගැවෙන නදින් මුසු කියනසෙන මිහිරිසරඇති ගෙ (භිමි) දනහැසිරුම්ඇති විපුලඉසුරු සැපතින් හොබන මහගෙයකට සුවසේ පිවිසෙනු පිණිස රන් රිදී මිණි මුතු පබළු ඇ රැසින් බබලන සුපිහිටි විසල් දෙරබා ඇති මහදොරක් වැනි වූ අව්‍යඤ්ජනයෙන් සම්පූණී වූ බුදුරජාණන් වහන්සේගේ දෙශනා ඥනයෙහි ගම්භීරභාවය මොනොවට හඟවන්නා වූ මේ **"මූලපරියාය"** සූත්‍රයට සුවසේ බැසගැනීම පිණිස කාල දෙශ දෙශක පණිත් යන කාරණයන්ගෙන් ප්‍රතිමණ්ඩිත වූ යම් නිදානයෙක් වදාරන ලද්දේ ද; ඒ නිදානයාගේ අර්ථවණීනා තොමෝ සමාපතවූය.

නිදානවණ්ණනා නිමි.

සූත්‍රනික්ෂෙපය චතුර්විධ වේ.

සඛඛධම්ම මූලපරියායං යනාදි නයින් භාග්‍යවතුන් වහන්සේ විසින් නික්ෂිපත වූ සූත්‍රයාගේ වණීනාවට දැන් අවකාශ පැමිණියේය; හෝ මෝ සූත්‍රවණීනා වනාහි යම් හෙයකින් සූත්‍රනික්ෂෙපය විචාරා කියනු ලබන්නී ප්‍රකට වන්නී ද එහෙයින් පළමු කොට සූත්‍රනික්ෂෙපය විමසන් නෙමු; සූත්‍රනික්ෂෙප සතරක් වෙති, ආතමාධ්‍යාශයය පරාධ්‍යාශ්‍යය පෘච්ඡාවශිකය අථොතපත්තික යයි කියායි; ඔවුන් අතුරෙහි යම් සූත්‍ර කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ අන්‍යයන් විසින් අධ්‍යෙෂණය නොකරන ලද්දාහු හුදු තමන් වහන්සේගේ අදහසින් ම වදාළසේක් ද; ඔහු කවරහුද යත්? ආකඞ්ඛෙය්‍ය සූත්‍රය වත්ථ සූත්‍රය මහාසතිපට්ඨාන සූත්‍රය මහාසළායතන විභඞග සූත්‍රය අරියවංස සූත්‍රය සම්මප්පධාන සූත්‍රාදීන්

හාරකය ඉඩිපාද ඉන්ද්‍රියබල බොජ්ඣඞ්ගමග්ගඞ්ග සුත්‍රාන්තහාරකය යන මේ ආදීහුයි; ඔවුන්ගේ ආතමාධ්‍යාශය නික්ෂේපයි; යම් සූත්‍රකෙනෙක් වනාහි **"පරිපක්කා බො රාහුලස්ස විමුත්තිපරිපාචනියා ධම්මා යන්නූනාහං රාහුලං උත්තරිං ආසවානං ඛයෙ විනෙය්‍යං"** යි මෙසේ අන්‍ය යන්ගේ අදහස ද කැමැත්ත ද සිතද ප්‍රාර්ථනාව ද අවබෝධ කරනබව ද දැන පරාධ්‍යාශය වශයෙන් වදාරන ලද්දාහු ද; ඔහු කවරහු ද? චූළරාහුලොවාද සූත්‍රය මහාරාහුලොවාද සූත්‍රය ධම්මචක්ක්‍රප්‍රවර්තනය ධාතුවිභඞ්ග සූත්‍රය යන මේ ආදීහුයි; ඔවුන්ගේ පරාධ්‍යාශය නික්ෂේපයි; භාග්‍යවතුන් වහන්සේ සම්පයට එලඹ සිවිපිරිසය චතුර්ණිකායෝය නාගයෝය ගරුඩයෝය ගන්ධර්වයෝය අසුරයෝය යක්ෂයෝය සතරවරම් මහරජදරුවෝය තාවතිංසාදි දෙවියෝය මහාබ්‍රහ්මය යන මේ ආදීහු **"බොජ්ඣඞ්ගා බොජ්ඣඞ්ගාති භගවෙන වුච්චති"** **"නීවරණා නීවරණා ති භගවෙන වුච්චති"** **"ඉමෙ නුඛො භගවෙන පඤ්චුපාදානක්ඛන්ධා"** **"කිංසූධ චිත්තං පුග්ගලස්ස සෙට්ඨං"** යනාදිනයින් ප්‍රශ්නවිචාරති; මෙසේ විචාරන ලද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාළ යම් බොධ්‍යඞ්ග සංයුක්තාදීහු වෙත් ද අන්‍යවූත් දෙවතා සංයුක්ත මාරසංයුක්ත බ්‍රහ්මසංයුක්ත සක්ක පඤ්හ චූළවෙදල්ල මහාවෙදල්ල සාමඤ්ඤඵල ආළවක සූචිලොම සූත්‍රාදි යම් සූත්‍රකෙනෙක් හෝ වෙත්ද; ඔවුන්ගේ පෘච්ඡාවශික නික්ෂේප යයි; යම් මේ සූත්‍රකෙනෙක් වනාහි උපන් කාරණය සඳහා වදාරන ලද්දාහු ද; ඔහු කවරහ ? ධම්මදායාදය චූළසීහනාදය චන්‍දූපමය පුත්තමංසූපමය දාරුක්ඛන්ධූපමය අග්ගික්ඛන්ධූපමය ඵෙණපිණ්ඩූපමය පාරිච්ඡත්තකූපමය යන මේ ආදීහුයි, ඔවුන්ගේ අපොතපත්තික නික්ෂේපයයි. ඒ එසේමැය-

මූලපරියාය සූත්‍රයෙහි අපොත්පත්තිය.

මේ සූත්‍රය භාග්‍යවත්හු විසින් අපොතපත්ති යෙක්හි වදාරනලද කවර අපොතපත්තියෙක් හිද යත්? පඤ්ඤාපනිය නිසා උපන් මානයෙහිය පන්සියයක් බ්‍රාහ්මණයෝ ත්‍රිවෙදයාගේ පර තෙර ගියාහු පසුකලෙක භාග්‍යවතුන් වහන්සේගේ ධම්දෙශනාව අසා පස්කම්හි ආදීනව හා නෙෂ්කම්‍යයෙහි අනුසස් ද දක්වමින් භාග්‍යවතුන් වහන්සේ සම්පයෙහි පැවිදිව නො බෝකලකින් ම සියලු බුදුවදන් ඉගෙන පඤ්ඤාපනිය නිසා මානය ඉපදවූහ; යමක් යමක් භාග්‍යවත් නෙමේ කියාද ඒ ඒ දෙය ඇපි වහාම දනිමු; භාග්‍යවතුන් වහන්සේවූ කලි ත්‍රිලිඞ්ගයන් චතුර්විධ පදයන් සප්තවිභක්තීන් මුඛත කොට කිසිවක් නො වදාරති; මෙසේ වදාළකල්හි ද අපට ග්‍රන්ථපදයක් නම් නැතැයි ඒ කරණකොට ගෙන භාග්‍යවතුන් කෙරෙහි අගෞරව ඇතිව එතැන් පටන් භාග්‍යවතුන් වහන්සේට උපස්ථානයට ද ධම්ශ්‍රවණයට ද නිතර නො යති; භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ගේ ඒ සිත්හසර දැන මොවුහු මේ මානහුල නො උගුලුවා මාගියක් හෝ ඵලයක් හෝ පසක් කරන්ට අභව්‍යයෝ යයි ඔවුන්ගේ ශ්‍රැතපඤ්ඤාපනිය නිසා උපන් මානය අපොතපත්ති කොට දෙශනා කුශල වූ භාග්‍යවතුන් වහන්සේ මන් බිඳිනු **පිණිස සබ්බධම්මමූලපරියායං** යි දෙශනාවට පටන්ගත් සේක.

එහි **සබ්බධම්මමූලපරියායං**= යනු සියලු ධර්‍ම

"සබ්බ" ශබ්දය. යන්ට මුල්වූ අසාධාරණ හෙතුව යනාඊයි; **සබ්බ සං** (=සියලු) යනු අනවශෙෂ වූ යනාඊයි; මේ "සබ්බ" ශබ්දය අනවශෙෂවාචක මැයි; හේ යම් යම් පදයක් හා සම්බන්ධ යට පැමිණේ ද ඒ ඒ පදයා ගේ අනවශෙෂඵය ප්‍රකාශ කෙරෙයි; මෙසේයි, **"සබ්බං රූපං අනිච්චං සබ්බා වෙදනා අනිච්චා"** **"සබ්බ සක්කාය පරියාපන්නෙසු ධම්මෙසු"** යි. මේ **ධම්ම** ශබ්දය වනාහි පර්‍යාපතිය සත්‍යය සමාධිය ප්‍රඥාවය ප්‍රකෘතිය සවභාවය

"ධම්ම" ශබ්දය. ශූන්‍යතාය පුණ්‍යය ආපත්තිය ඥෙය්‍යය යනාදි අර්‍ථ යන්හි දක්නාලැබේ; ඒ එසේමැය– **"ඉධ භික්ඛු ධම්මං පරියාපුණාති සුත්තං ගෙය්‍යං"** යනාදි තැන්හි "ධම්ම" ශබ්දය පර්‍යාපතියෙහි වැටේ; **"දිට්ඨධම්මා විදිතධම්මා"** යනාදීන්හි සත්‍ය යෙහිය; **"එවං ධම්මා නෙ භගවතෙනා"** යනාදීන්හි සමාධියෙහිය;

26. **"යස්සෙතෙ චතුරෝ ධම්මා වානරින්ද! යථා තව සවචං ධම්මා ධිති චාගෝ දිට්ඨං සෝ අතිවත්තති"** යන ආදි තැන්හි ප්‍රඥයෙහිය; **"ජාතිධම්මා ජරාධම්මා"** යනාදීන්හි ප්‍රකෘති යෙහිය; **"කුසලාධම්මා"** යනාදීන්හි සවභාවයෙහිය; **"කස්මිං බෝ පන සමයෙ ධම්මා හොන්ති"** යනාදීන්හි ශූන්‍යතායෙහිය; **ධම්මා සුචිණ්ණා සුඛමාවහන්ති"** යනාදීන්හි පුණ්‍යයෙහිය; **"මෙ අනියතා ධම්මා"** යනාදීන්හි ආපත්තියෙහිය; **"සබ්බෙ ධම්මා සබ්බාකාරෙන බුධස්ස භගවතෝ ඤාණමුඛෙ ආපාථං ආගච්ඡන්ති"** යනාදීන්හි ඥෙය්‍යයෙහිය; මෙහි වනාහි හේ සවභාවයෙහි වැටෙයි; එහි මේ වචනාර්‍ථයි; සවකීය ලක්‍ෂණය ධරත්නුයි ධර්‍ම නම් වෙත්; "මූල" ශබ්දය විස්තර කරන ලද්දේමය; මෙහි වනාහි මේ "මූල" ශබ්දය අසාධාරණ හෙතුවෙහි දතයුතුයි.

"පරියාය" ශබ්දය තෙම **"මඤ්ඤපිණ්ඩිකපරියා**

"පරියාය" ශබ්දය. **ගොති නං ධාරෙහි"** යනාදීන්හි දෙශනාවෙහි වැටෙයි; **"අත්ථිබෙවස බ්‍රාහ්මණ! පරියායෝ යෙන මං පරියායෙන සම්මා වදමානෝ වදෙය්‍ය අකිරියවාදෝ සමණෝ ගොතමෝ"** යනාදීන්හි කාරණයෙහි වැටෙයි; **"කස්ස නු බෝ ආනන්ද! අජ්ජ පරියායෝ භික්ඛුනියෝ ඔවදිතුං"** යනාදීන්හි වාරයෙහි වැටේ; මෙහි වූ කලි කාරණයෙහි ද දෙශනාවෙහි ද වැටෙයි; එහෙයින් **සබ්බධම්මමූලපරියායං**=යන මෙහි සියලු ධර්‍මයන්ට (=සවභාව

---

26. **වානරින්ද**= වානරෙන්‍ද්‍රය; **යස්ස**= යම්කිසි පුද්ගලයෙකුට; **යථා තව**= ඔබට යම්සේ ද (එපරිද්දෙන්;) **සවචං**= වාක් සත්‍යය; **ධම්මා**= විචාරණ ප්‍රඥවය; **ධිති**= නො සුන් වියයිය; **චාගෝ**= ආත්මපරිත්‍යාගය යන; **එතෙ චතුරෝ ධම්මා**= මේ සතර ගුණයෝ වෙත් ද; **සෝ**= හෙතෙම; **දිට්ඨං**= පඤ්චතුරා; **අතිවත්තති**= ඉක්මවා සිටියි.

යන්ට) අසාධාරණ හෙතු නම් වූ කාරණය කියා හෝ සියලු ධර්මයන්ට කාරණ වූ දෙශනාවය කියා හෝ මෙසේ අර්ථය දතයුතුයි; මේ (මූලපරියාය) සූත්‍රය තමා නෙය්‍යාර්ථ (= පමුණුවා කියයුතු අර්ථ ඇති) බැවින් ද චාතුර්භූමක වූ ම සවභාව ධර්මයෝ සර්වධර්මයෝ යයි නො දත යුතුයි; සවකාය පර්‍යාපන්නවූ ත්‍රෛභූමක ධර්මයෝ ම අනවශෙෂ හෙයින් දත යුත්තාහුය; මේ මෙහි අදහසයි.

"වෝ" ශබ්දය.

වෝ= යනු මේ "වෝ" ශබ්දය තෙම ප්‍රථමා, කර්ම, කරණ, සම්ප්‍රදාන, සවාමි වචනයන්හී හා පදපූරණ යන මෙහි දක්නා ලැබේ; **කච්චි පන වෝ අනුරුධා! සමගහා සමෙම්මාදමානා** යනාදි තැන්හි වනාහි ප්‍රථමායෙහි දක්නා ලැබේ. **"හච්ඡථ තුම්හෙවෙ! පණාමෙම් වෝ"** යනාදීන්හි කර්මයෙහි ය; **"න වෝ මම සන්තිකෙ වත්ථබ්බං"** යනාදීන්හි කරණ (= තෘතීයා) යෙහි ය; **"වනපත්ථවරියායං වෝ භික්ඛවෙ! දෙසෙස්සාමි"** යනාදීන්හි සම්ප්‍රදානයෙහි ය; **"සබ්බෙසං වෝ සාරිපුත්තා! සුභාසිතං"** යනාදීන්හි සවාමි වචනයෙහි ය; **" යෙහි වෝ අභියා පරිසුද්ධාහ කම්මනනා"** යනාදීන්හි පදපූරණ මාත්‍රයෙහි දක්නා ලැබේ; මේ මෙහි සම්ප්‍රදානයෙහි දතයුතුයි; **භික්ඛවෙ**- යනු ප්‍රතිඥවෙන් අභිමුඛවූවන්ට නැවත ඇමතීමයි; **දෙසෙස්සාමි**= යනු දෙශනාව ප්‍රතිඥ කිරීමයි; මේ කියනලද වෙයි. මහණෙනි! අනවශෙෂ (=ත්‍රෛභූමක) ධර්මයන්ට මුල් වූ අසාධාරණහෙතුව තොපට දෙසනා කරන්නෙමි" යි දෙවෙනි ක්‍රමයෙන් " කාරණදෙශනාව තොපට දෙශනා කරන්නෙමි " යි; **තං සුණාථ**= මා විසින් කියනු ලබන්නා වූ ඒ අර්ථය ඒ කාරණය ඒ දෙශනාව ශ්‍රවණය කරවු; **සාධුකං මනසි කරොථ**= යන මෙහි වනාහි

"සාධුක, සාධු" ශබ්දමය.

"සාධුකං සාධු" යන මේ එකාර්ථයි; මේ සාධු ශබ්ද ද ආයාචන සම්ප්‍රතිවර්ජන සම්ප්‍රහර්ෂණ සුන්දර දෘඪකම් ආදි අර්ථයන්හි දක්නා ලැබේ.; **"සාධු මෙ භන්තෙ භගවා සඞ්ඛිත්තෙන ධම්මං දෙසෙතු"** යනාදි තැන්හි වනාහි ආයාචන යෙහි දක්නාලැබේ; **"සාධු භන්තෙති ඛො තෙ භික්ඛු භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා"** යනාදීන්හි සම්ප්‍රතිවර්ජනයෙහි ය; **"සාධු සාධු සාරිපුත්ත"** යනාදීන්හි සම්ප්‍රහර්ෂණයෙහි ය;

27. **"සාධු ධම්මරුචී රාජ සාධුපඤ්ඤතවා නරෝ**
සාධු මිත්තානමදුබ්භො පාපස්ස කරණං සුඛං" යන

---

27. **ධම්මරුචී**= ධර්මය රුචිකරන්නා වූ; **රාජ**= රජතෙමේ; **සාධු**= සුන්දර වෙයි; **පඤ්ඤතවා නරෝ**= ප්‍රඥවත් මනුෂ්‍ය තෙම; **සාධු**= සුන්දර වෙයි; **මිත්තානං**= මිත්‍රයන්ට; **අදුබ්භො**= ද්‍රෝහ නො කරන්නා වූ (යමෙක් වේද) හෙතෙම; **සාධු**= සුන්දර වෙයි; **පාපස්ස + අකරණං**= පාපය නො කිරීම; **සුඛං**= සැපවෙයි;

ආදි තැන්හි සුන්දරයෙහි ය; **"නෙන හි බ්‍රාහ්මණ! සාධුකං සුණාහි"** යනාදීන්හි "සාධුක" ශබ්දය ම දෘඪකම්යෙහි වේ; ආණත්තියෙහි යයි ද කියනු ලැබේ; මෙහි ද මේ (සාධුක)ශබ්දය මෙම දෘඪකම්යෙහි ද ආණත්තියෙහි ද අර්ථය දතයුතුයි; සුන්දරාර්ථයෙහි ද වටී; එසේමැය– දළහිකරණාර්ථයෙන්, මේ ධර්මය දෘඪකොට අසවු මනාකොට ගන්නෝ (වවු;) ආණත්‍යර්ථයෙන් මාගේ ආඥාවෙන් අසවු; සුන්දරාර්ථයෙන් සුන්දර වූ භද්‍ර වූ මේ ධර්මය අසවු යයි මෙසේ දක්වනලද වෙයි. **මනසි කරොථ** යනු ආවර්ජනා කරවු රැස්කොට ගනිවු යන අර්ථයි; අවික්ෂිප්ත වූ සිත් ඇතිව අසවු සිත්හි කරවු යනු අදහසයි.

දැන් මෙහි **තං සුණාථ** යන මෙය ශ්‍රොත්‍රෙන්ද්‍රියයාගේ වික්ෂේප නිවාරණ යයි; **සාධුකං මනසි කරොථ** යනු මෙනෙහි කිරීමෙහි දෘඪ කිරීමෙහි යෙදීමෙන් මනෝන්ද්‍රියයාගේ වික්ෂේපය වැළකීමයි; නැවත මෙහි පූර්වපදය ව්‍යඤ්ජනයන්ගේ විපර්‍යාස ග්‍රහණය වැළකීමයි; පශ්චිමපදය අර්ථවිපර්‍යාස ග්‍රහණය වැළකීමයි; නැවත පූර්ව වචනයෙන් ධර්මශ්‍රවණයෙහි යොදවයි; පශ්චිම වචනයෙන් ඇසූ ධර්මයන්ගේ ධාරීම් නැවත පරීක්ෂා කිරීම් ආදියෙහි යොදවයි; යලි පළමු වචනයෙන් මේ ධර්මය සව්‍යඤ්ජනය එහෙයින් ඇසියයුතු යයි දක්වයි; පසුව කී වචනයෙන් (යම්හෙයකින්) අර්ථසහිතද එහෙයින් මෙනෙහි කළයුතු යයි (දක්වයි;) සාධුක යන පදය හෝ පදවය සමග යොදා යම් හෙයකින් මේ ධර්මය ධර්මහෙයින් ගැඹුරුත් දෙශනාව හෙයින් ගැඹුරුත් වේද එහෙයින් මනාකොට අසවු; යම් හෙයකින් අර්ථ හෙයින් ගැඹුරුත් ප්‍රතිවෙධ හෙයින් ගැඹුරුත් වේද එහෙයින් මනාකොට මෙනෙහි කරවු යයි මෙසේ යෙදීම දතයුත්තියි; **භාසිස්සාමි**= දෙශනා කරන්නෙමි; **තං සුණාථ**= මෙහි ප්‍රතිඥා කරනලද දෙශනාව සංක්ෂේපයෙන් ම නො දෙසන්නෙමි; වැලිදු වනාහි විස්තාරයෙන් ම එය කියන්නෙමි යයි කියනලද වෙයි; මේ පදයෝ **සංක්ෂේප විස්තාර වාචක** මැයි; කියේ මැය, වඛ්ඛිසසථවිර තෙමේ–

28. **"සඞ්ඛිත්තෙනපි දෙසෙති විත්ථාරෙනපි භාසති**
සාළිකාසිව නිග්ගෙය්‍හසො පවිභානං උදීරයි" යි.

("චත්තාරිමානි ආවුසො! අරියසච්චානි කතමානි චත්තාරි? දුක්ඛං අරියසච්චං —පෙ— ඉමානි ඛො ආවුසො! චත්තාරි අරියසච්චානි තසමා තිහාවුසො ඉදං දුක්ඛන්ති යොගො කරණීයො" යි මෙසේ) සංක්ෂේපයෙන් ද දෙශනා කරයි ("කතමඤ්චාවුසො! දුක්ඛං අරියසච්චං ජාතිපි

---

28. **සඞ්ඛිත්තෙනපි**= සංක්ෂේපයෙන් ද; **දෙසෙති**= දෙශනා කෙරෙයි; **විත්ථාරෙනපි**= විස්තාර ක්‍රමයෙන් ද; **භාසති**= කියයි; **සාළිකාය**= (මධුර නාදකරන්නා වූ) සාරිකා පක්ෂියාගේ; **නිග්ගෙය්‍හසො විය**= මිහිරි අවියත් හඬ මෙන්; **පවිභානං උදීරයි**= (කථෙතු කම්‍යතාව ඇතිකල්හි මුහුදින් රළ මෙන් මතුමත්තෙහි අනන්තවූ) වැටහීම පහළ කෙරෙයි.*

දුක්ඛා" යනාදි නසින් එය ම විභාගකරමින්) විස්තාරයෙන් ද දෙශනා කරයි (මිහිරි අඹපක් රස විඳ මධුරස්වර නිකුත්කරන්නාවූ) සාරිකා පක්ෂියෙකුගේ මිහිරිඅවියත් හඬමෙන් (කියනු කැමැත්ත ඇතිකල්හි මුහුදින් රළ මෙන් මතුමත්තෙහි අනන්ත වූ) වැටහීම පහළකරයි, යනු භාවයි.)

"ඉධ" ශබ්දය.

මෙසේ වදාළ කල්හි හටගත් උත්සාහ ඇතිව "එසේය වහන්ස" කියා ඒ භික්ෂුහු භාග්‍යවතුන් වහන්සේට ප්‍රතිවචන දුන්හ, ශාස්තෘවචනයට සතුටුවූහ, පිළිගත්හ" යි කියනලද වෙයි; ඉක්බිති ඒ භික්ෂූන්ට භාග්‍යවතුන් වහන්සේ මේ වදාළසේක. දැන් කියයුතු වූ **ඉධ භික්ඛවෙ!** යනාදී මේ සියලු සූත්‍රය වදාළසේක. ඒ සූත්‍රයෙහි **ඉධ**= යනු දෙශය දැක්වීමෙහි නිපාතයි; හේ මේ ("ඉධ" ශබ්ද) කිසිතැනෙක ලොකය ගෙන කියනු ලැබේ; කීයේමැනු- **"ඉධ තථාගතෝ ලොකෙ උප්පජ්ජති"** යි, කිසිතැනෙක ශාසනය (ගෙන කියනු ලැබේ;) කීයේ මැය- **"ඉධෙව භික්ඛවෙ! සමණෝ ඉධ දුතියෝ සමණෝ"** යි, කිසිතැනෙක අවකාශය (කියනු ලැබේ.) කියේ මැනෝ—

29. **"ඉධෙව භික්ඛමානස්ස දෙවභූතස්ස මෙ සතෝ**
පුනරායු ච මෙ ලද්ධෝ එවං ජානාහි මාරිස!" යි.

කිසිතැනෙක පදපූරණමාත්‍ර ම වෙයි; කියේ මැනු- **"ඉධාහං භික්ඛවෙ! භූතනාම් අස්සං පවාරිතෝ"** යි. මෙහි වූ කලි ලොකය ගෙන වදාරන ලදැයි දතයුතු.

භික්ඛවෙ= යනු ප්‍රතිඥකළ පරිදි දෙශනාව දෙශනා කරනු පිණිස නැවත භික්ෂූන් ආලපනය කරන සේක; ශබ්දවයෙන් ම "මහණෙනි! මේ ලොකයෙහි" යන අර්ථය කියනලද වෙයි; **අස්සුතවා පුථුජ්ජනෝ**= යන මෙහි වනාහි ආගමාධිගම රහිත හෙයින් ඥෙය්‍ය පුද්ගල තෙමේ අශ්‍රැතවත් යයි (දතයුතුයි;) ඒ එසේමැයි- යම්කිසි සක්කාධාතුආයතන ප්‍රත්‍යයාකාර සතිපට්ඨානාදියෙහි උද්ග්‍රහපරිපෘච්ඡා විනිශ්චය රහිත බැවින් මඤ්ඤනා ප්‍රතිෂේධක වූ ආගම නොමැත්තේ ද; පිළිවෙතින් පැමිණිය යුතු වූ (මාර්ගඥනය) අධිගමය නොකළ බැවින් අධිගමය නොමැත්තේද ආගමාධිගම රහිත බැවින් ඒ ඥෙය පුද්ගල තෙමේ අශ්‍රැතවත් යයි (දතයුතුයි.) හේ මේ අශ්‍රැතවත් තෙම-

---

29. **මාරිස**= නිදුකාණෙනි! **ඉධෙව**= මේ අවකාශයෙහි ම; **භික්ඛමානස්ස**= සිටින්නා වූ; **දෙවභූතස්ස මෙ සතෝ**= දිව්‍යවූ මාගේ; **පුනරායු ච**= නැවත ජීවිතය ද; **මෙ**= මා විසින්; **ලද්ධෝ**= (අන්‍යකර්ම විපාකීයකින්) ලබනලදේද්ය; **එවං**= මෙසේ; **ජානාහි**= දනගනු-මැන.

පෘථජ්ජනයා. 30. "පුථූනං ජනනාදිහි කාරණේහි පුථුජ්ජනෝ
පුථුජ්ජනෙනොඝධම්මතා පුථු වායං ජනෝ ඉති"

(බොහෝ වූ කෙලෙස් ඉපදවීමාදි කාරණයෙන් පෘථජ්ජන නම් වේ; බොහෝ වූ අනාර්‍ය්‍ය ජනයන් කෙරෙහි ඇතුලත් බැවින් ද යථොක්ත මේ ජනතෙමේ ආර්‍ය්‍යයන් කෙරෙන් වෙන්වූයේ හුයි ද පෘථජ්ජන නම් වේ. යනු භාවයි.)

සැබව හෙතෙම බොහෝ වූ නානාප්‍රකාර වූ කෙලෙසුන්ගේ ඉපදවීමාදි කරුණෙන් ද පෘථජ්ජන නම් වේ; කියේ මැනු- "බොහෝ වූ කෙලෙසුන් උපදවත් හුයි පෘථජ්ජන නම් වෙති; බොහෝ වූ නො නස නලද සත්කායදෘෂ්ටිය ඇත්තාහු හුයි පෘථජ්ජන නම් වෙති; බොහෝ ශාස්තෘවරයන්ගේ මුහුණු බලත් හුයි පෘථජ්ජන නම් වෙති; බහුල වූ සියලු ගතිවලින් නො නැඟිටින ලද්දාහු හුයි පෘථජ්ජන නම් වෙති; බොහෝ වූ (පුණ්‍යාභිසංස්කාරාදි) විවිධ සංස්කාරයන් රැස්කෙරෙත් හුයි පෘථජ්ජන නම් වෙති; බොහෝ වූ (කාමාදි) විවිධ ඔඝයන්ගෙන් උල්පවත්හුයි සන්තාපයන් ගෙන් තැවෙත් හුයි පෘථජ්ජන නම් වෙති; බොහෝ වූ නානාවිධ පරිදාහයන් විසින් දවනු ලැබෙත් හුයි පෘථජ්ජන නම් වෙති; බොහෝ වූ පඤ්චකාම ගුණයන්හි ඇලුනාහු ගිජුවූවාහු ගෙතුනාහු මුසපත් වූවාහු බැසගත්තාහු ලැගුනාහු නැවත නැවත ලැගුනාහු උපදුන වූවාහු හුයි පෘථජ්ජන නම් වෙති; බොහෝ වූ පඤ්චනීවරණයන් විසින් ආවරණය කරනලද්දාහු නීවරණය කරනලද්දාහු වැළඳගන්නාලද්දාහු වසනලද්දාහු ඡාදනය කරනලද්දාහු යටිමුවවූවාහු හුයි පෘථජ්ජන නම් වෙත්" යයි; බොහෝ වූ සඛ්‍යා පථාතික්‍රාන්ත වූ ආර්‍ය්‍ය ධර්‍මයන්ට පරාඞ්මුඛ වූ නිවඩමීයෙහි හැසිරෙනජනයන්ට ඇතුලත් වූවාහු හුයි හෝ පෘථජ්ජන නම් වෙති; බොහෝ වූ මේ (ජනතෙමේ) ශීලශ්‍රුතාදි ගුණයුක්ත ආර්‍ය්‍යයන් කෙරෙන් වෙන්ව ම සඛ්‍යාවට ගියාවූ විගත සංඝී ඇති ජනතෙමේ හුයි හෝ පෘථජ්ජන නම් වේ; මෙසේ මේ "අස්සුතවා පුථුජ්ජනෝ" යන පදදෙකින් ඒ යමෙක්තුමූ-

31. "දුවෙ පුථුජ්ජනා වුත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා
අන්ධෝ පුථුජ්ජනෝ එකෝ කල්‍යාණෙකෝ පුථුජ්ජනෝ" යි

(ආදිත්‍යබන්ධු වූ බුදුහු විසින් අන්ධ පෘථජ්ජන වූ එකෙක කල්‍යාණ පෘථජ්ජන වූ එකෙකැයි පෘථජ්ජනයෝ දෙදෙනෙක් වදුරන ලද්දාහු යයි-)

---

30. පුථූනං= බොහෝ කෙලෙසුන්ගේ; ජනනාදිහි කාරණේහි= ඉපදවීමාදිය හෙතුකොටගෙන; පුථුජ්ජනෝ= පෘථජ්ජන නම් වේ; පුථුජ්ජනෙනොඝධම්මතා= බොහෝ වූ අනාර්‍ය්‍ය ජනයන්ට ඇතුලත් බැවින් ද; අයං ජනෝ= යථොක්ත මේ ජනතෙමේ; පුථු එව ඉති= ආර්‍ය්‍යයන් ගෙන් වෙන් වූයේ ම යයි;

31. ආදිච්ච බන්ධුනා= ආදිත්‍ය බන්ධු වූ; බුද්ධෙන= බුදුහු විසින්; පුථුජ්ජනා= පෘථජ්ජනයෝ; දුවෙ= දෙදෙනෙක්; වුත්තා= වදුරන ලද්දාහුය; එකෝ= එකෙක්; අන්ධෝ පුථුජ්ජනෝ= අන්ධපෘථජ්ජන නම් වේ එකෝ= එකෙක්; කල්‍යාණෝ පුථුජ්ජනෝ= කල්‍යාණපෘථජ්ජන නම් වේ

පෘථජ්ජනයෝ දෙදෙනෙක් කියන ලද්දාහු ද ඔවුනතු
ආර්‍යයෝ. රෙන් අනි පෘථජ්ජන තෙමේ කියන ලද්දේ යයි දතයුත්
තේය. **අදිස්සානං අදස්සාවී**= යනාදි තැන්හි කෙලෙසුන්
කෙරෙන් දුරුවූ හෙයින් ද අනවයෙහි නො පවත්නා හෙයින් ද අවි
යෙහි පවත්නා හෙයින් ද දෙවියන් සහිත ලොකයා විසින් අරණය කළ
යුතු හෙයින් ද බුදුවරයෝ ද පසේබුදුවරයෝ ද බුඩශ්‍රාවකයෝ ද ආර්‍ය්‍ය
යෝ යයි කියනු ලැබෙත්; බුදුවරයෝ ම හෝ මෙහි ආර්‍ය්‍ය යයි කියනු
ලැබෙත්; වදාළේ මැනු- **"සදෙවකෙ භික්ඛවෙ! ලොකෙ —පෙ— තථා
ගතො අරියොති වුච්චති"** යි.

සපුරිසා= යන මෙහි වනාහි පසේබුදුහු ද තථා
සත්පුරුෂයෝ. ගත ශ්‍රාවකයෝ ද සත්පුරුෂයෝ යයි දතයුත්තාහුය;
ඔහු වනාහි ලොකොත්තර ගුණ යොගයෙන් ශොභ
න වූ පුරුෂයෝ නුයි සත්පුරුෂ නම් වෙති; දෙපරිද්දෙන් කියනලද
මොවුහු සියල්ලෝම හෝ (සත්පුරුෂ නම් වෙති;) ඒ එසේමැයි බුදුහු ම
ආර්‍යයෝත් සත්පුරුෂයෝත් වෙති; ප්‍රත්‍යෙක බුඩ බුඩ ශ්‍රාවකයෝ ද
(ආර්‍යයී ද සත්පුරුෂ ද වෙත්.) කියේ මැනු-

32. "යො වෙ ඤාණඤ්ඤු ඤාතවෙදි ධීරො
කල්‍යාණමිත්තොදළහභත්තී ච හොති
දුඛිතස්ස සක්කච්ච කාරොති කිච්චං
තථාවිධං සපුරිසං වදන්ති" යි.

(එකාන්තයෙන් යමෙක් තෙමේ කළගුණ දන්නේ කළගුණ ප්‍රකට වශයෙන් දන්
නේ ධීර වූයේ කල්‍යාණමිත්‍ර වූයේ දැඩභක්ති ඇත්තේත් වේද දුක්පත් වූවහු ට කළ
යුතු සකස් කොට කෙරේද එබදු පුද්ගලයා සත්පුරුෂයා යි බුඩාදීහු කියත්; යයි.)

"කල්‍යාණමිත්තොදළහභත්තී ච හොති" යන මෙතෙකින් මේ බුඩ
ශ්‍රාවක තෙමේ කියනලද්දේය කෘතඥතාදීන් කරණකොට ගෙන පසේ
බුදු-බුදුවරයෝ කියනලද්දාහු යයි; දැන් යමෙක් ඒ ආර්‍යයන්ගේ නො
දැක්ම සවභාව කොට ඇත්තේ ද දර්‍ශනයෙහි සක්කච්චකාරීත් නො වේද
හෙතෙම ආර්‍යයන් නො දක්නේ යයි දතයුත්තේය; (ආර්‍යයන් නො
දක්නාසුලු වූ) හෙතෙමේත් ඇසින් නො දක්නේය නුවණින් නො දක්
නේ යයි විවිධ වේ; ඔවුනතුරෙහි නුවණින් නො දක්නේ මෙහි අදහස්

---

32. **වෙ**= එකාන්තයෙන්; **යො**= යමෙක් තෙම; **ඤාණඤ්ඤු**= කළ
ගුණ දන්නේ; **ඤාතවෙදි**= කළගුණ ප්‍රකට වශයෙන් දන්නේ; **ධීරො**=
ධීර වූයේ; **කල්‍යාණමිත්තො**= කල්‍යාණමිත්‍රවූයේ; **දළභභත්තී ච හොති**=
දැඩභක්ති ඇත්තේත් වේද; **දුඛිතස්ස**- දුක්පත්වූවහුට; **සක්කච්ච**=
සකස්කොට; **කිච්චං කරොති**= කටයුතු කෙරේද; **තථාවිධං**= එබදුවූ
ඔහු; **සපුරිසං**= සත්පුරුෂ යයි; **වදන්ති**= (බුඩාදීහු) කියත්;

කරනලදී; ඒ එසේමැයි– මසැසින් හෝ දිවැසින් ආර්‍යයෝ දක්නාලද්දාහු ද නො දුටුවාහු ම වෙති; ඒ චක්ෂූන්ට වණ්ණමාත්‍ර ග්‍රහණය කරන හෙයින් හා ආර්‍යභාවය ගොවර නො වන හෙයිනි; බලු සිවල් ආදීහු ද ඇසින් ආර්‍යයන් දකිති, ඔවුහු ආර්‍යයන් නො ද දක්නාහු වෙත්; එහි මේ වසතුව වේ.

මහලු පැවිද්ද. සිතුල්පව් වැසි ඛීණාශ්‍රවස්ථවිර කෙනෙකුන්ගේ උපස්ථායකවූ මහලු පැවිද්දෙක් එක්දිනක් තෙරුන් සමග සිහා හැසිර තෙරුන් වහන්සේගේ පාසිවුරු ගෙන පිටිපසින් එනුයේ තෙරුන් වහන්සේ විචාළේය. "වහන්ස! ආර්‍යයෝ නම් කෙබඳු වෙත් දැයි ? තෙරුන් වහන්සේ වදාළහ. "මෙලොව ඇතැම් මහල්ලෙක් ආර්‍යයන්ගේ පාසිවුරු ගෙන වත්පිළිවෙත් කොට සමග හැසිරෙන්නේ ද ආර්‍යයන් නො ම දනිසි; ඇවැත්නි! ආර්‍යයෝ මෙසේ නො දනහැක්කාහු ය" යි; මෙසේ වදාළකල ද හෙතෙම නො මී දත් තේය.

එහෙයින් ඇසින් දැක්ම දැක්මක් නො වෙයි; නුවණින් දැක්ම ම දර්‍ශනය වෙයි; වදාළේ මැනු– **"කිනෙන වක්කලි! ඉමිනා පූතිකායෙන දිට්ඨෙන යො ධො වක්කලි! ධම්මං පස්සති සො මං පස්සති"** යනුවෙන් "වක්කලිය! තට මේ කුණුකය දැක්මෙන් කිම? වක්කලිය! යමෙක් දහම් දකී නම් හෙතෙම මා දකී" යයි. එහෙයින් ඇසින් දක්නේ ද නුවණින් ආර්‍යයන් විසින් දක්නාලද අනිත්‍යාදි ලක්ෂණය නො දක්නේ ආර්‍යයන් විසින් අධිගතධර්මයට ද නො පැමිණෙන්නේ ආර්‍යකර ධර්මයන් ද ආර්‍යභාවය ද නො දක්නාලද බැවින් "ආර්‍යයන් නො දක්නේ" යයි දත යුත්තේය. **අරියධම්මස්ස අකොවිදෙ**= සතිපට්ඨානාදිභෙද වූ ආර්‍ය ධර්මයෙහි අදක්ෂවූයේ; **අරියධම්මෙ අවිනීතො**= යන මෙහි වනාහි–

විවිධ විනය. 33. "දුවිධො විනයො නාම එත්ථමෙකෙකස්ස පඤ්චධා අභාවතො තස්ස අයං අවිනීතොති වුච්චති"

විනය තෙමේ සංවර විනය පහාන විනයයි කියා විවිධ වේ මෙහි එකෙකී විනය පඤ්චප්‍රකාර වේ, ඒ විනයාගේ අභාවයෙන් මේ අශ්‍රැතවත් පෘථජ්ජන තෙමේ "අවිනීත" යයි කියනු ලැබේ. යනු භාවයි.

ඒ එසේමැය– මේ විනය තෙමේ සංවර විනය පහාන විනය යයි විවිධ වේ; මේ දෙවැදෑරුම් විනයෙහි ම එකෙකී විනය පස්ප්‍රකාරයකින් හෙදයට යෙයි; සැබව සංවර විනය සීලසංවරය සතිසංවරය ඤාණසංව

---

33. **විනයො නාම**= විනය නම්; **දුවිධො**= විවිධ වේ; **එත්ථ**= මෙහි; **එකමෙකස්ස**= එකි එකි විනයක්; **පඤ්චධා**= පස්ප්‍රකාරයකින් වේ; **තස්ස**= ඒ විනයාගේ; **අභාවතො**= අභාවයෙන්; **අයං**= මේ (අශ්‍රැතවත් පෘථජ්ජන) තෙම; **අවිනීතොති වුච්චති**= අවිනීත යයි කියනු ලැබේ;

සංවර විනය.

රය ඛන්තිසංවරය විරියසංවරය කියා පඤ්චවිධ වේ; ප්‍රහාණ විනය ද තදඞ්ග ප්‍රහාණය විෂ්කම්භන ප්‍රහාණය සමුච්ඡේද ප්‍රහාණය ප්‍රතිප්‍රශ්‍රබ්ධි ප්‍රහාණය නිඃශරණ ප්‍රහාණ යයි පඤ්චවිධ වේ; ඔවුන් අතුරෙහි **"ඉමිනා පාතිමොක්ඛ සංවරෙන උපෙතො හොති සමුපෙතො"** යන මේ තෙමේ සීලසංවර යයි; **"රක්ඛති චක්ඛුන්ද්‍රියං චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති"** යන මේ සතිසංවර යයි;

34. "යානි සොතානි ලොකස්මිං (අජිතාති භගවා)
සතිතෙසං නිවාරණං
සොතානං සංවරං බ්‍රූමි පඤ්ඤායෙතෙ පිථියරෙ"

ලෙව්හි යම් තෘෂ්ණාදි ශ්‍රොතස් කෙනෙක් වෙත්ද ස්මෘති නොමෝ ඔවුන්ව ආවරණයි ශ්‍රොතසුන්ට එම ස්මෘතිය සංවර යයි කියමි, මාගී ප්‍රඥාවෙන් ඒ ශ්‍රොතස්හු වසනු ලැබෙත්; යන-

මේ ඡතමේ ඥානසංවර යයි; **"ඛමො හොති සිතස්ස උණ්හස්ස"** යන මේ ක්ෂාන්ති සංවර යයි; **"උප්පන්නං කාමවිතක්කං නාධිවාසෙති පජහති"** යන මේ වීර්‍යසංවර යයි; වැලිඳු මේ සියලු ම සංවරය තෙමේ යථාසව වූ පරිදි සංවරකළයුතු වූ ද භික්මියයුතු වූ ද කායදුශ්චරිතාදීන් සංවරණය කළයුතු හෙයින් සංවර යයි ද විනයනය කළයුතු හෙයින් විනය යයි ද කියනු ලැබේ; මෙසේ පළමුකොට සංවර විනය පස්පරිදි දෙකින් විභාග කරනු ලැබේ යයි දතයුතුයි.

ප්‍රහාණ විනය.

එසේ ම නාම රූප පරිච්ඡේදාදි වූ විදර්‍ශනා ඥානයන් අතුරෙන් ප්‍රතිපක්ෂ භාවයෙන් පහන් එලියෙන් අඬකාරය මෙන් ඒ ඒ විදසුන් නැණින් ඒ ඒ අඞ්ගයාගේ **යම් ප්‍රහාණයක් වේද;** ඒ කෙසේ ද? නාමරූපව්‍යවස්ථානයෙන් සත්කාය දෘෂ්ටියගේ ද; ප්‍රත්‍යය පරිග්‍රහයෙන් අහෙතුවිෂම හෙතු දෘෂ්ටීන්ගේ ද? ඒ ප්‍රත්‍යය පරිග්‍රහයාගේ ම අපරභාගය වූ කාඞ්ක්ෂාවිතරණ ඥානයෙන් කථංකථී භාවයාගේ ද? කලාපසම්මර්‍ශනයෙන් මමය මාගේය යන ග්‍රාහයාගේ ද; මාගීමාගී ව්‍යවස්ථාවෙන් අමාගීයෙහි මාගීය යන සංඥාවගේ ද; උදයදර්‍ශනයෙන් උච්ඡේද දෘෂ්ටියගේ ද; ව්‍යයදර්‍ශනයෙන් ශාස්වත දෘෂ්ටියගේ ද; භයදර්‍ශනයෙන් භයසහිත වූ (උපාදානස්කන්ධයෙහි) අභය සංඥාවගේ ද; ආදීනව දර්‍ශනයෙන් ආශ්වාද සංඥාවගේ ද; නිර්වේදානුදර්‍ශී

---

34. (**අජිත** යනු ආමන්ත්‍රණය **භගවා** යනු ප්‍රතිවචනයි;) **ලොකස්මිං**= ලොකයෙහි; **යානි සොතානි**= තෘෂ්ණා දෘෂ්ට්‍යාදි යම් ශ්‍රොතස් කෙනෙක් වෙත්ද; **සති**= විදර්‍ශනාසම්ප්‍රයුක්ත සම්‍යක් ස්මෘති නොමෝ; **තෙසං**= ඒ තෘෂ්ණාදෘෂ්ට්‍යාදි ශ්‍රොතසුන්ට; **නිවාරණං**= ආවරණයි; **සොතානං**= ශ්‍රොතසුන්ට; **සංවරං**= (එම සම්‍යක් ස්මෘතිය) සංවර යයි; **බ්‍රූමි**= කියමි; **පඤ්ඤායෙ**= (රූපාදීන් කෙරෙහි අනිත්‍යතා ප්‍රතිවෙධ සාධක වූ) මාගී ප්‍රඥාවෙන්; **එතෙ**= මේ ශ්‍රොතස්හු; **පිථියරෙ**= සඞ්වරයෙන් වසනු ලැබෙත්.

නයෙන් අභිරති සංඥාවගේ ද; මුඤ්චිතුකම්‍යතා ඥානයෙන් අමුඤ්චිතු කම්‍යතාවගේ ද; උපෙක්ෂා ඥානයෙන් අනුපෙක්ෂාවගේ ද; අනුලෝම ඥානයෙන් ධම්මට්ඨිතියෙහි හා නිබ්බාණයෙහි ද; ප්‍රතිලෝම භාවයාගේ ද; ගොත්‍රභූඥානයෙන් සංඝකාරනිමිත්තග්‍රාහයාගේ ද; ප්‍රහාණය වෙයි; මේ තෙමේ තදඞ්ගප්‍රහාණ නම් වෙයි.

උපචාර අප්පණාභෙද වූ සමාධිය කරණකොට ගෙන ප්‍රවෘත්තිභාව යාගේ නිවාරණයෙන් ඝටපහරින් දියපිට සෙවෙල් මෙන් ඒ ඒ නීවරණාදි ධම්මයන්ගේ යම් ප්‍රහාණයක් වේද මේ තෙමේ විෂ්කම්භණ ප්‍රහාණ නම් වේ.

සතර ආර්‍යමාර්ගයන් වැඩූකෙයින් ඒ ඒ මාර්ගවත් වූ තමාගේ සන්තානයෙහි **"දිට්ඨගතානං පහානාය"** යනාදීනයින් වදාළ සමුදය පක්ෂයෙහි වූ ක්ලේශසමූහයාගේ අත්‍යන්ත වූ නො පවත්නා භාවයෙන් යම් ප්‍රහාණයෙක් වේ ද මෙය සමුච්ඡේද ප්‍රහාණ නම් වෙයි.

ඵලක්ෂණයෙහි කෙලෙසුන්ගේ යම් සංසිඳෙනබවක් වේ ද මෙය පටිපස්සඞ්ධිප්පහාන නම් වෙයි. සියලු සංස්කෘත ධම්මයන්ගෙන් බැහැර වූ හෙයින් ප්‍රහීණ වූ සියලු සංස්කාරයන් ඇති යම් නිවනක් වේ ද මෙය නිස්සරණ ප්‍රහාණ නම් වෙයි, මේ සියලු ම ප්‍රහාණය යම් හෙයකින් ත්‍යාගාර්ථයෙන් ප්‍රහාණ ද විනයනාර්ථයෙන් විනයත් වේ ද, එහෙයින් ප්‍රහාණ විනය යයි කියනු ලැබේ; නොහොත් ඒ ඒ ප්‍රහාණය ඇත්තහුට ඒ ඒ විනයාගේ සම්භවය වන හෙයින් ද මෙය ප්‍රහාණ විනය යයි කියනු ලැබේ; මෙසේ ප්‍රහාණ විනය ද පස්පරිද්දෙකින් භෙද වේ යයි දත යුතුයි.

මෙසේ මේ සංක්ෂේපයෙන් විවිධ වූ ද භෙදයෙන් දශවිධ වූ ද විනය නිත්‍යසංවර ඇති හෙයින් ද ප්‍රහීණ කළයුත්ත ප්‍රහීණ නො කළ හෙයින් ද යම් හෙයකින් මේ අශ්‍රැතවත් පෘථග්ජනයාහට නැත්තේ ද එහෙයින් "අභාවතෝ තස්ස අයං අවිනීතොති වුච්චති" යනු කියනලදී. **සප්පුරිසානං අදස්සාවී සප්පුරිස ධම්මස්ස අකොවිදෝ, සප්පුරිසධම්මෙ අවිනීතෝ** යන මෙහි ද මේ නයයි; මෙය අර්ථයෙහින් නානාත්වයක් නැත්තේ මැයි. කියේමය– "ඒ ආර්‍යයෝ යමෙක් ම වෙත්ද ඒ සත්පුරුෂයෝත් ඔහු මය; ඒ සත්පුරුෂයෝ යමෙක් ම වෙත්ද ඒ ආර්‍යයෝත් ඔහු මය; යමෙක් ම ආර්‍යයන්ගේ ඒ ධම්මය වේද; සත්පුරුෂයන්ගේ ඒ ධම්මයත් හේමය; යමක් ම සත්පුරුෂයන්ගේ ධම්මයත් වේද; ඒ ආර්‍යයන්ගේ ධම්මයත් හේ මය; යම් ඒ ආර්‍ය විනයයෝ වෙත් ද; සත්පුරුෂ විනය යෝත් ඔවුහු මය; යම් ඒ සත්පුරුෂ විනයයෝ වෙත් ද; ආර්‍ය විනය යෝත් ඔවුහු මය; ආර්‍යයෝ යයි ද සත්පුරුෂයෝ යයි ද ආර්‍ය ධම්මයි ද සත්පුරුෂ ධම්මයි ද ආර්‍ය විනය යයි ද සත්පුරුෂ විනය යයි ද එකාංශයෙහි වූ එක් වූ එකාර්ථ වූ සම වූ සමභාග වූ තජ්ජාත වූ හෙම් වූයේ" යයි.

කුමක් හෙයින් වනාහි භාග්‍යවතුන් වහන්සේ **"සබ්බධම්මමූලපරියායං වෝ භික්ඛවෙ! දෙසිස්සාමි"** යි වදාරා එය දෙශනා නො කොට ම **"ඉධ භික්ඛවෙ! අස්සුතවා පුථුජ්ජනෝ අරියානං අදස්සාවී"** යි මෙසේ පෘථජ්ජනයා දුක් වූ සේක් දැ? යි පුද්ගලාධිෂ්ඨාන ධර්මදේශනාවෙන් ඒ අර්ථය පහළ කරනු පිණිසය; ඒ එසේමැයි- භාග්‍යවතුන් වහන්සේ

චතුර්විධ දෙශනාව.

ගේ ධර්මාධිෂ්ඨාන ධර්මදේශනා යැ ධර්මාධිෂ්ඨාන පුද්ගල දෙශනා යැ පුද්ගලාධිෂ්ඨාන පුද්ගල දෙශනා යැ පුද්ගලාධිෂ්ඨාන ධර්මදේශනා යැයි ධර්ම පුද්ගල වශයෙන් ම පළමුකොට දෙශනා තොමෝ චතුර්විධ වන්නීය; එහි **"තිස්සො ඉමා භික්ඛවෙ! වෙදනා කතමා තිස්සො? සුඛාවෙදනා දුක්ඛාවෙදනා අදුක්ඛමසුඛා වෙදනා ඉමා බො භික්ඛවෙ! තිස්සො වෙදනා"** යන මෙබඳු වූවා ධර්මාධිෂ්ඨාන ධර්මදේශනා යයි දතයුත්තීය. **"ඡධාතුරෝ අයං භික්ඛු පුරිසෝ ඡඵස්සායතනෝ අඤ්ඤතරෙනෝ පච්චාරෝ චතුරාධිඤ්ඤෝ"** යන මෙබඳු වූවා ධර්මාධිෂ්ඨාන පුද්ගල දෙශනායි; **"තයෝ මෙ භික්ඛවෙ! පුග්ගලා සන්තෝ සංවිජ්ජමානා ලොකස්මිං කතමෙ තයෝ? අන්ධෝ එකච්චකුඞ්ච්චකුඞ්ච කතමෝ ච භික්ඛවෙ! පුග්ගලෝ අන්ධෝ?** යන මෙබඳු වූවා පුද්ගලාධිෂ්ඨාන පුද්ගල දෙශනායි. **"කතමඤ්ච භික්ඛවෙ! දුග්ගතිභයං? ඉධ භික්ඛවෙ! එකච්චෙවා ඉති පටිසඤ්චික්ඛති කායදුච්චරිතස්ස බො පාපකෝ විපාකෝ අභිසම්පරායං -පෙ- සුඛමත්තානං පරිහරති ඉදං වුච්චති භික්ඛවෙ දුග්ගතිභයං"** යන මෙබඳු වූවා පුද්ගලාධිෂ්ඨාන ධර්මදේශනායි. ඒ මේ පෘථජ්ජන තෙමේ මෙහි යම් හෙයකින් අපරිඥතවස්තු වුයේ ද මෙහි අදහස් කළ සියලු ධර්මයන්ට මුල් වූ මඤ්ඤනා තොමෝත් අපරිඥතමූලික වූවා.ද එහෙයින් පෘථජ්ජනයා දක්වා පුද්ගලාධිෂ්ඨාන දෙශනාව පිළිබඳ ඒ අර්ථය පහළකරනු පිණිස **"ඉධ භික්ඛවෙ! අස්සුතවා පුථුජ්ජනෝ අරියානං අදස්සාවී"** යි මෙසේ පෘථජ්ජනයා දක්වූසේකැයි දතයුත්තේය.

චතුර්විධ පෘථිවිය.

මෙසේ පෘථජ්ජනයා දක්වා ! දැන් ඔහුගේ පෘථිවි ආදි වස්තූන්හි සියලු සඛකාය ධර්මයෙන් උපන් මඤ්ඤනාව දක්වනසේක් **පඨවිං පඨවිතො** යනාදිය වදාළහ. එහි ලක්ෂණ පෘථිවි සසම්භාර පෘථිවි ආරම්මණ පෘථිවි සම්මුති පෘථිවි යයි පෘථිවි තොමෝ චතුර්විධ වන්නීය. ඔවුන් අතුරෙහි **"කතමා ච ආවුසො! අජ්ඣත්තිකා පඨවිධාතු? යං අජ්ඣත්තං පච්චත්තං කක්ඛළං ඛරිගතං"** යනාදි තැන්හි ප්‍රකාශකරන ලද්දී ලක්ෂණ පෘථිවි නමු; **"පඨවිං ඛණෙය්‍ය වා ඛණාපෙය්‍ය වා"** යනාදි තැන්හි වදාරනලද්දී සසම්භාර පෘථිවි නමු; යම් කෙශාදි විංශති කොට්ඨාසයකුත් වෙත්ද බාහිර වූ අයොලොහාදියකුත් වෙත්ද හෝ පෘථිවි ධාතු වනාහි වණ්ණාදි සම්භාරයන් සමග පෘථිවි වූවා නුයි සසම්භාර පෘථිවි නමු; **"පඨවිකසිණමෙකෝ සඤ්ජානාති"** යනාදි තැන්හි ආවා වනාහි ආරම්මණ පෘථිවි නමු; "නිමිත්ත" පෘථිවි යයි ද කියනුලැබේ; පෘථිවිකසිණ ධ්‍යාන

ලාභී වූයේ දෙව්ලොව උපන්නේ ආගමන වශයෙන් "පඨවී දෙවතා" යි නම ලබයි, මෝ සම්මුති පෘථිවී යයි දතයුත්තීය; හෝ චතුර්ධ පෘථිවී තොමෝ ම මෙහි ලැබෙයි; ඔවුනතුරෙන් 'යම්කිසි පෘථිවියක් මේ පුහු දුන්තෙමේ පෘථිවී වශයෙන් හඳුනයි, පෘථිවිය යයි හඳුනයි, පෘථිවී භාග යෙන් හඳුනයි, ලොකව්‍යවහාරය ගෙන; සංඥ විපර්‍යාසයෙන් හඳුනයි; **පඨවිං** යනු මේ පෘථිවී භාවය නො හරින්නේ ම හෝ මෙය සත්‍යයා යයි කියා හෝ සත්‍යයාගේ යයි කියා හෝ මේ ආදිනයින් හඳුනයි; කුමක් හෙයින් මෙසේ හැඳිනගනී ද? යි නො කිය යුතුයි; යම් හෙයකින් පෘථ ජ්‍ජන තෙමේ උමතුවෙකු මෙන් වේද (එහෙයිනි;) හෙතෙම යම්කිසිවක් යම් කිසි ආකාරයකින් ගනීද; ආර්‍ය්‍යයන්ගේ නො දක්නාබව යනාදි හෙදය ම හෝ මෙහි කරුණු වේ; යමක් හෝ මත්තෙහි **"අපරිඤ්ඤාතං තස්ස"** යි වදරන භාග්‍යවත්හු විසින් ම වදරන ලදද (එය හෝ කරුණුයි.)

පඨවිං පඨවිතෝ සඤ්ඤත්වා= හෙතෙම ඒ පෘථිවිය මෙසේ විපරීත සංඥාවෙන් හැඳින; **"සඤ්ඤානිදානා හි පපඤ්චසඞ්ඛා"** යි වදළ හෙයින් අපරභාගයෙහි ඨාමයට පැමිණියා වූ මෙහි මඤ්ඤනා නාමයෙන් වදරන ලද තෘෂ්ණාමානදෘෂ්ටි ප්‍රපඤ්චයන් හෙතුකොටගෙන කල්පනය කෙරෙයි විකල්පනය කෙරෙයි, නානාප්‍රකාරයෙන් අන්‍යථා ග්‍රහණය කෙරෙයි; **පඨවිං මඤ්ඤති** යනු එහෙයින් වදරනලදී.

පෘථිවිය පිළිබඳ ත්‍රිවිධ මඤ්ඤනා.

මෙසේ සිතන්නා වූ ද ඔහුගේ ඒ මඤ්ඤනා ඖදරික නයින් දක්වනුට යම් මෝ 'කෙසා ලොමා" යනාදි නයින් විංශතිභෙද වූ ආධ්‍යාත්මික පෘථිවී ධාතුවක් කියනලද්දී ද; විභඞ්ගයෙහි **"තත්ථ කතමා බාහිරා පඨවී ධාතු? යං බාහිරං කක්ඛළං ඛරිගතං කක්ඛළත්තං කක්ඛළභාවෝ ඛණ්ඩා අනුපාදිණ්ණං සෙය්‍යථිදං? අයෝ ලෝහං තිපු සිසං සජ්ඣු ඔත්තා මණී වෙළුරියං සඞ්ඛා සිලා පවාළං රජතං ජාතරූපං ලෝහිතඞ්කා මසාරගල්ලං තිණං කට්ඨං සක්ඛරං කඨලා භූමි පාසාණා පබ්බතෝ"** යි මෙසේ යම් මෝ බාහිර පෘථිවීධාතුවකුත් වදරන ලද්දීද; අධ්‍යාත්මාරම්මණත්‍රිකයෙහි යම් නිමිත්ත පෘථිවියකුත් වේද; එය ගෙන මේ අර්‍ථයොජනා කියනු ලැබේ. **පඨවිං මඤ්ඤති** ත්‍රිවිධමඤ්ඤනාවෙන් මම පෘථිවිය වෙමියි සිතයි, මාගේ පෘථිවී යයි සිතයි: පරා පෘථිවිය යයි සිතයි, පරාගේ පෘථිවිය යයි සිතයි. නොහොත් ආධ්‍යාත්මික පෘථිවිය තෘෂ්ණාමඤ්ඤනාවෙන් සිතයි; මානමඤ්ඤනාවෙන් සිතයි; දෘෂ්ටිමඤ්ඤනාවෙන් සිතයි; කෙසේ ද? මේ තෙම වනාහි කෙසාදීන් කෙරෙහි ඡන්දරාගය උපදවයි, කෙශයන් ආස්වාදනය කෙරෙයි, සතුටු වෙයි, සතුටුව වචන කියයි, තෘෂ්ණාවෙන් ඇතුලත්ව සිටියි; ලොම නිය දත් සිවි හෝ අන්‍යතර වූ ඇලුම්කටයුතු වස්තුවක් හෝ (ආස්වාදනාදිය කෙරෙයි,) මෙසේ ආධ්‍යාත්මික පෘථිවිය තෘෂ්ණාමඤ්ඤනාවෙන් සිතයි;

මෙසේ මාගේ කෙශයෝ අනාගතකාලයෙහි වන්නාහු නම් මේසේ රොම යෝ වන්නාහු නම් යනාදි නයින් හෝ එහි තෘෂ්ණාව පිහිටුවයි; මම මේ ශීලයෙන් හෝ —පෙ— බඹසරින් හෝ මෙසේ සිතිදුමුදු සියුම් නිල් කෙස් ඇත්තෙක් වන්නෙමි යි යනාදි නයින් හෝ නො ලැබූවන්ගේ ලැබීම පිණිස සිත පිහිටුවයි; මෙසේත් ආධ්‍යාත්මික වූ පෘථිවිය තෘෂ්ණා මස්කන්ධයාවෙන් සිතයි; එසේ ම තමාගේ කෙශාදීන් පිළිබඳ සම්පත්තිය හෝ විපත්තිය හෝ නිසා මම ශ්‍රේෂ්ඨයෙක් වෙමියි හෝ මම සමානයෙක් වෙමියි හෝ මම හීනයෙක් වෙමියි හෝ මානය උපදවයි; මෙසේ ආධ්‍යාත්මික පෘථිවිය මානමස්කන්ධයාවෙන් සිතයි. **"අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං"** යි ආවාවූ නයින් කෙශයෝ ජීවයයි මොනොවට ගනියි; ලොමාදීන්හි ද මේ නයයි; මෙසේ ආධ්‍යාත්මික පෘථිවිය දෘෂ්ටිමස්කන්ධයාවෙන් සිතයි. නොහොත් **"යා චෙව බෝ පන අජ්ඣත්තිකා පඨවිධාතු යා ච බාහිරා පඨවිධාතු පඨවිධාතුරේවෙසා නං නෙතං මම"** (යම් ආධ්‍යාත්මික පෘථිවිධාතුවකුත් වේද යම් බාහිර පෘථිවී ධාතුවකුත් වේද මෝ නොමෝ පෘථිවී ධාතු ම වන්නීය ඒ මේ පෘථිවී ධාතුව මාගේ නොවෙයි) යන මේ පැවැත්මට විරුද්ධයෙන් කෙශාදි හෙද වූ පෘථිවිය මෙය මාගේය මේ තෙම මම වෙමි මේ තෙම මාගේ ආත්ම යයි මොනොවට ගනී; මෙසේත් ආධ්‍යාත්මික පෘථිවිය දෘෂ්ටිමස්කන්ධයාවෙන් සිතයි. මෙසේ පළමුකොට ආධ්‍යත්මික පෘථිවිය ත්‍රිවිධමස්කන්ධයාවෙන් සිතයි. ආධ්‍යත්මික පෘථිවිය යම්සේද එසේ බාහිර පෘථිවිය ද සිතයි; කෙසේද? මේ තෙම වනාහි අයලොහාදීන්හි ඡන්දරාගය උපදවයි, අයලොහාදිය ආස්වාදනය කෙරෙයි, සතුටුවෙයි, වෘඩිවවන කියයි, තෘෂ්ණාවෙන් ඇතුලත්ව ගෙන සිටියි, මාගේ යකඩය මාගේ ලොහය යනාදි නයින් අයසාදිය මමායනය කෙරෙයි, රක්‍ෂා කෙරෙයි, ගොපනය කෙරෙයි, මෙසේ බාහිර පෘථිවිය **තෘෂ්ණාමස්කන්ධයාවෙන් ගනියි;** මෙසේ මාගේ අයලොහාදිහු අනාගතකාලයෙහි වන්නාහු නම් මැනවැයි හෝ මේ අයලොහාදියෙහි තෘෂ්ණාව මොනොවට පිහිටුවයි; **මම මේ ශීලයෙන් හෝ වෘතයෙන් හෝ තපසින් හෝ බ්‍රහ්මචර්‍යාවෙන් හෝ** මෙසේ සම්බන්ධ වූ අය ලොහාදි උපකරණ ඇත්තෙමි වන්නෙමි යි හෝ නො ලත් අයලොහාදි උපකරණයාගේ ලැබීම පිණිස සිත පිහිටුවයි; මෙසේත් බාහිර පෘථිවිය තෘෂ්ණා මස්කන්ධයාවෙන් ගනියි. එසේම තමාගේ අයලොහාදි උපකරණයන්ගේ සම්පත්තිය හෝ විපත්තිය හෝ නිසා මානය උපදවයි; මම මේ කරණ කොටගෙන ශ්‍රේෂ්ඨ වෙමියි හෝ මම සමානයෙක් වෙමියි හෝ මම හීනයෙක් වෙමියි හෝ මෙසේ බාහිර පෘථිවිය මානමස්කන්ධයාවෙන් සිතයි. යකඩයෙහි ජීවය යන සංඥා ඇතිව වනාහි මේ තෙමේ ජීවයයි මොනොවට සිතයි; මේ ක්‍රමය ලොහාදීන්හිද වේ; මෙසේ බාහිර පෘථිවිය දෘෂ්ටිමස්කන්ධයාවෙන් සිතයි. නොහොත් **"ඉධෙකච්චෙ පඨවිකසිණං අත්තතො න සමනුපස්සති යං පඨවිකසිණං තෙ අහං තෙ අහං තං පඨවිකසිණන්ති පඨවිකසිණඤ්ච අවයං සමනුපස්සති"** (මේ ලොකයෙහි

කිසිවෙක් පෘථිවීකෘත්ස්නය ආත්මවශයෙන් දකියි, යම් පඨවිකසිණයක් වේ ද හේ මම වෙමි මම යමෙක්ද පාථිවීකෘත්ස්නයත් එයයි පෘථිවී කෘත්ස්නයද ආත්මයද අවයකොට දකී) යයි ප්‍රතිසම්භිදායෙහි වදාළ නයින් ම නිමිත්ත පෘථිවිය ආත්ම යයි අභිනිවේෂය කෙරෙයි; මෙසේත් බාහිර පෘථිවිය දෘෂ්ටිමස්කන්ධයාවෙන් ගනියි. මෙසේ බාහ්‍ය පෘථිවිය ත්‍රිවිධ මස්කන්ධයාවන්ගෙන් ගනියි; මෙසේ වනාහි **පඨවිං මඤ්ඤති** යන මෙහි ත්‍රිවිධමස්කන්ධයාවෝ ම දතයුත්තාහුය. මෙයින් මතු සංක්ෂේපයෙන් ම කියන්නෙමු.

පඨවියා මඤ්ඤති යන මෙහි **පඨවියා**= යනු මේ භූමි (=ආධාර) වචනයෙකි; එහෙයින් මම පෘථිවියෙහි සිටියෙමි'යි සිතයි; මාගේ කිඤ්චනයයි සේයි පළිබෝධය තෙමේ පෘථිවිධාතුවෙහි වූයේ යයි සිතයි; මෙරමා පෘථිවීධාතුවෙහි වූයේ යයි සිතයි; මෙරමා පිළිබඳ කිඤ්චන යයි සේයි පළිබෝධය පෘථිවීධාතුවෙහි වූයේ යයි සිතයි; මෙසේ මේ කියනලදුයේ ("පඨවියා මඤ්ඤති" යන) මෙහි අර්ථයයි; නොහොත් **"කථං රූපසමිං අත්තානං සමනුපස්සති? ඉධෙකච්චෙවා වේදනං සඤ්ඤං සඞ්ඛාරෙ විඤ්ඤාණං අත්තතෝ සමනුපස්සති අයං වෝ පන මේ අත්තා සෝ වෝ පන මේ අත්තා ඉමස්මිං රූපෙති එවං රූපසමිං වා අත්තානං සමනුපස්සති"** (රූපයෙහි ආත්මය කෙසේ දකිද යත්? මෙලොව කිසි වෙක් වේදනාව ද සංඥාව ද සංස්කාරයන් ද විඥානය ද මේ මාගේ ආත්ම යයි ආත්ම වශයෙන් දකී, හේ මාගේ ආත්මය වනාහි රූපයෙහි පිහිටියේ යයි මෙසේ රූපයෙහි හෝ ආත්මය දකී) යයි මේ දෙශනාවගේ යම් මේ අර්ථක්‍රමයක් වේද එය වදාරන ලද්දේය; මේ නයින් ම වේදනාදි ධර්මයන් ආත්මවශයෙන් ගෙන නැවත ආධ්‍යාත්මික බාහිර පෘථිවී ධාතූන් අතුරෙන් යම් කිසි පෘථිවී ධාතුවක් ඊට අවකාශ භාවයෙන් පරිකල්පනය කොට හේ මේ මාගේ ආත්මය වනාහි මේ පෘථිවියෙහි වූයේ යයි සිතන්නේ පෘථිවියෙහි ආත්මය පිහිටියේ යයි සිතයි; මෝ ඔහුගේ දෘෂ්ටිමස්කන්ධයාවයි. ඒ පෘථිවිගත ආත්මයෙහි ම සෙනහය ද එය වසතුකොට ඇති මානය ද උපදවන්නා වූ ඔහුගේ තෘෂ්ණාමානමස්කන්ධයාවෝ ද දතයුත්තාහුය. යම්විටක වනාහි ඒ නයින් ම හේ ආත්මය තෙම වනාහි පෘථිවියෙහි වූයේ යයි සිතා ද එවිට දෘෂ්ටිමස්කන්ධයාව ම යෙදෙයි අනිත් මස්කන්ධයාවෝත් කැමතිවෙත්.

පඨවිතෝ මඤ්ඤති= යන මෙහි වනාහි **පඨවිතෝ**= යනු නිස්සක්ක (=පඤ්චමී) වචනයි; එහෙයින් උපකරණ සහිත වූ තමාගේ හෝ මෙරමාගේ හෝ යථොක්ත ප්‍රභේද ඇති පෘථිවියෙන් ඉපදීම හෝ නිර්මිම හෝ පෘථිවිය කෙරෙන් අන්‍යවූ ආත්මය හෝ වේ යයි සිතන්නේ "පෘථිවී ධාතු කෙරෙන් අනෙකෙක් ආත්මය වේ යයි සිතයි, මෙසේ දතයුතුයි; මෝ ඔහුගේ දෘෂ්ටිමස්කන්ධයාවයි. දෘෂ්ටිමස්කන්ධයාවෙන් ගනිනු ලැබූ ඒ වසතුවෙහි ම සෙනහය ද මානය ද උපදවන්නා වූ ඔහුගේ තෘෂ්ණා

මාන මඤ්ඤනාවෝ ද දතයුත්නාහුය. අන්‍ය ආචාර්‍ය්‍ය කෙනෙක් මෙසේ කියත්- පඨවීකසිණය අල්පගුණයෙන් යුක්තව වඩා එයිනුදු අන්‍ය වූ අප්‍රමාණ වූ ආත්මය ගෙන පෘථිවීධාතුවෙන් පිටත ද මාගේ ආත්මය වේ යයි සිතන්නේ පෘථිවීධාතුවෙන් (පිටත ආත්මය වේ යයි) හඟින්නේ යයි කියායි. **පඨවිං මෙනි මඤ්ඤති**= යන මෙහි වනාහි හුදු මහා පෘථිවිය ම තෘෂ්ණා වශයෙන් මමායනය කෙරේනුයි මේ නයින් පැවැති එකලා තෘෂ්ණා මඤ්ඤනාව ම ලැබේ යයි දතයුත්තීය; හෝ මෝ (තෘෂ්ණා මඤ්ඤනා) ද මාගේ කෙශයෝය මාගේ ලොමයෝය මාගේ යකඩය මාගේ ලොහය කියා මෙසේ යථොක්ත ප්‍රභෙද වූ සියලු ආධ්‍යාත්මික බාහිර පෘථිවීධාතුව සමග යෙදිය යුත්තී යයි. **පඨවිං අභිනන්දති**= යනු උක්තප්‍රකාර වූ ම පෘථිවීධාතුව තෘෂ්ණාදෘෂ්ටීන් හෙතුකොට ගෙන සතුටු වෙයි, ආස්වාදනය කෙරෙයි, පරාමර්ශනය ද කෙරේ යයි වදාරනලද වේයි.

පඨවිං මඤ්ඤති යන මේ වචනයෙන් ම මේ අර්ථය සිද්ධකල්හි කුමක් හෙයින් මෙසේ කියනලද්දේද යත්? මේ යුක්තිය පොරණාචාර්‍යයන් විසින් විචාරණය නො කරන ලද්දේය; මේ වනාහි මාගේ "අත්තනෝ මති" යයි; දෙශනා විලාශ්‍රයයෙන් හෝ ආදීනව දර්‍ශනයෙන් හෝ (මෙසේ වදාරනලදුයි;) ඒ එසේමැය- යම් ධර්‍මධාතුවකුත් මනාකොට ප්‍රතිවෙධ කරනලද බැවින් (භාග්‍යවත් තෙමේ) නානානය විචිත්‍ර වූ දෙශනා විලාශයෙන් යුක්ත වූයේ වන්නේ ද හෝ ධර්‍ම ධාතු තොමෝ භාග්‍යවත්හු විසින් (යම් හෙයකින්) මොනොවට ප්‍රතිවෙධ කරන ලද්දී ද; එහෙයින් ප්‍රථමකොට මඤ්ඤනා වශයෙන් කෙලශොතපත්තිය දක්වා මෙවිට අභිනන්දනා වශයෙන් දක්වනසේක් දෙශනා විලාශ හෙයින් මේ වදාළහ; නොහොත් යමෙක් පෘථිවී ධාතුව (තෘෂ්ණාමාන දෘෂ්ටි විසින්) හඟිද පෘථිවියෙහි ආත්මය ඇතැයි සිතාද පෘථිවියෙන් පිටත ආත්මය ඇතැයි සිතාද පෘථිවීධාතුව මාගේ යයි සිතාද හෙතෙම යම් හෙයකින් පෘථිවී නිශ්‍රිත වූ තෘෂ්ණාව හෝ දෘෂ්ටිය හෝ හරින්ට අසමර්ථ වේද එහෙයින් පෘථිවී ධාතුවට සතුටුවේ මැයි; යමෙක් පෘථිවී ධාතුවට සතුටුවේද හෙතෙම දුඃඛයට සතුටුවෙයි දුඃඛය ද ආදීනවයකැයි ආදීනව දක්නා හෙයින් ද මේ වදාළහ. භාග්‍යවතුන් වහන්සේ විසින් මේ වදාරනලදද වෙයි- **"යො භික්ඛවෙ! පඨවිධාතුං අභිනන්දති දුක්ඛං සො අභිනන්දති යො දුක්ඛං අභිනන්දති අපරිමුත්තෙතා සො දුක්ඛස්මාති වදාමි"** මහණෙනි! යමෙක් පෘථිවී ධාතුවට සතුටුවේද හෙතෙම දුකට සතුටු වෙයි. යමෙක් දුකට සතුටුවේද හෙතෙම දුකින් නොමිදුනේ යයි කියමියි.

මෙසේ පෘථිවීවසතුක වූ හැඟීම ද සතුටුවීම ද වදාරා මේ අවසරයෙහි යම් කරුණකින් හෙතෙම හඟිද, සතුටුත් වේද, ඒ කරුණ පහළකරන සේක් **නං කිස්සහෙතු? අපරිඤ්ඤාතං තස්සාති වදාමි** යනු වදාළහ. ඒ වචනයාගේ අර්ථය (මෙසේයි;) ඒ පෘථග්ජන තෙම ඒ පෘථිවී ධාතුව කුමක් හෙතුකොට (තෘෂ්ණාදී විසින්) සිතාද, කවර කරුණකින් සිතාද,

සතුටුවේදයත්? **අපරිඤ්ඤාතං නස්සාති වදාමි**= යම්හෙයකින් ඒ වස්තුව ඔහු විසින් පිරිසිඳ නො දන්නා ලද ද එහෙයිනැයි වදාරන ලද වෙයි. ඒ සැබව– යමෙක් පෘථිවිය පිරිසිඳ දනීද හෙතෙම ඥාතපරිඥාවෙන් ද තීරණ පරිඥාවෙන් ද ප්‍රහාණ පරිඥාවෙන් ද යන ත්‍රිවිධ

ත්‍රිවිධ පරිඥා. පරිඥාවන්ගෙන් පිරිසිඳ දනී. ඔවුන් අතුරෙහි ඥාත පරිඥා කවරීද? මෝ ආධ්‍යාත්මික පෘථිවී ධාතුය මෝ බාහිර පෘථිවී ධාතුය මේ ඇගේ ලක්ෂණය, මොවුහු රසප්‍රත්‍යුපස්ථාන පද ස්ථානයෝ යැයි පෘථිවී ධාතුව පිරිසිඳ දැනගනී; මෝ ඥාතපරිඥාවයි. තීරණපරිඥා කවරීද? මෙසේ (ඥාතපරිඥාවෙන් ලක්ෂණාදි වශයෙන්) දන්නාලද කොට පෘථිවී ධාතුව අනිත්‍ය වශයෙන් දුඃඛ වශයෙන් රෝග වශයෙන් යන (මේ ආදි) දෙසාළිස් අයුරින් තීරණය කෙරෙයි, මෝ තොමෝ තීරණ පරිඥා නමු. ප්‍රහාණ පරිඥා කවරීද? මෙසේ (අනිත්‍යාදි වශයෙන්) තීරණය කොට අගමඟින් පෘථිවී ධාතුවෙහි ඡන්දරාගය දුරු කෙරෙයි, මෝ තොමෝ ප්‍රහාණ පරිඥා නමු. නොහොත් නාමරූප යන්ගේ පිරිසිඳ දැනීම ඥාතපරිඥා නම් වා; කලාප සම්මර්ශනය ආදිකොට අනුලෝම ඥානය අවසන්කොට ඇත්තී තීරණ පරිඥා නම් වා; ආර්‍ය්‍ය මාර්ගයෙහි ඥානය ප්‍රහාණ පරිඥා නම් වන්නී යයි. යමෙක් පෘථිවී ධාතුව පිරිසිඳ දනී ද හෙතෙම මේ ත්‍රිවිධ පරිඥාවන් හෙතුකොට ගෙන පිරිසිඳ දැනගනී; මේ පෘථග්ජනයාට ද ඒ පරිඥාවෝ නැති; ඒ අපරිඥාත භාවයෙන් අද ඇති බැහැරි පොළෝ ධාතුව (තෘෂ්ණාදි විසින්) මඤ්ඤනය ද කෙරෙයි අභිනන්දනය ද කෙරේ යයි. එසින් වදාළහ භාග්‍යවත්හු– **"ඉධ භික්ඛවෙ! අස්සුතවා පුථුජ්ජනෝ** –පෙ– **පඨවිං මඤ්ඤති පඨවියා මඤ්ඤති පඨවිතෝ මඤ්ඤති පඨවිං මෙති මඤ්ඤති පඨවිං අභිනන්දති තං කිස්ස හෙතු? අපරිඤ්ඤාතං නස්සාති වදාමි"** යි.

පෘථිවීවාරය නිමි.

ආපං ආපතෝ= යන මෙහි ද ලක්ෂණ සසම්භාරාරම්මණ සම්මුති වශයෙන් අබ්ධාතුව චතුර්විධ වෙයි; **"තත්‍ථ කතමා අජ්ඣත්තිකා ආපොධාතු? යං අජ්ඣත්තං පච්චත්තං ආපෝ ආපොගතං සිනෙහෝ සිනෙහගතං බන්ධනත්තං රූපස්ස අජ්ඣත්තං උපාදිණ්ණං"** යනාදි තැන්හි වදාරන ලදුයේ ලක්ෂණ ආපයයි; **"ආපොකසිණං උග්ගණ්හනෙනෝ ආපස්මිං නිමිත්තං ගණ්හාති"** යනාදි තැන්හි වදාරන ලද්දේ සසම්භාර ආපයයි; සෙසු සියල්ල පෘථිවී වාරයෙහි කියන ලද්දට සමාන මැයි. හුදෙක් යොජනා ක්‍රමයෙහි වනාහි **"පිත්තං සෙම්හං"** යනාදි නයින් වදාරනලද චාදශ ප්‍රභෙද වූවා ආධ්‍යාත්මික අබ්ධාතුවය; **"තත්‍ථ කතමා බාහිරා ආපොධාතු? යං බාහිරං ආපෝ ආපොගතං සිනෙහෝ සිනෙහගතං බන්ධනත්තං රූපස්ස බහිද්ධා අනුපාදිණ්ණං; සෙය්‍යථීදං? මූලරසෝ ඛන්ධරසෝ තචරසෝ පත්තරසෝ පුප්ඵරසෝ ඵලරසෝ ඛීරං දධි සප්පි නවනීතං තෙලං මධු ඵාණිතං හුම්මානි වා උදකානි**

අනනලිඤ්ඣානි වා'' යයි මෙසේ (ධාතුවිභඞ්ගයෙහි) වදරනලද්දී වූ ද බාහිර අබ්ධාතු තොමෝ දනයුත්තීය. අධ්‍යාත්ම ආරම්මණත්‍රිකයෙහි යම් නිමිත්තාපයකුත් වේ ද (හෙද බාහ්‍ය අබ්ධාතු යයි දනයුතු.)

තෙජං තෙජතෝ= යන මේ තෙජොවාරයෙහිදු කී නියෙන් ම විසතා රය දනයුත්තේය. යොජනා ක්‍රමයෙහි වනාහි මෙහි **''යෙන ච සන්තප්පති යෙන ච ජරීයති යෙන ච පරිඩය්හති යෙන ච අසිතපීතඛායිත සායිතං සම්මාපරිණාමං ගච්ඡති''** යි මෙසේ වදරනලද වතුෂ්ප්‍රභෙද වූවා ආධ්‍යාත්මික තෙජොධාතු නමුදු; **''තත්ථ කතමා? බාහිරා තෙජෝ ධාතු යං බාහිරං තෙජෝ තෙජොගතං උණ්හා උණ්හගතං උසුමං උසුම ගතං බහිධා අනුපාදිණ්ණං; සෙය්‍යථිදං? අග්ගිග්ගි සඞ්කලිකග්ගි නිග්ගහි ගොමය්හග්ගි ඵුසග්ගි සඞ්කාරග්ගි ඉන්ධග්ගි අසනීනා පොග්ගි සුරියස්සනා පෝ ඝාතස්සනීචය සනීනා පෝ තිණස්සනීචය සනීනා පෝ ඛණ්ඩස්සනීචය සනීනා පෝ භණ්ඩස්සනීචය සනීනා පෝ''** යි මෙසේ (ධාතුවිභඞ්ග පාලියෙහි) වදරන ලද්දී ද බාහ්‍ය වූ තෙජොධාතු යයි දන යුත්තීය.

වායං වායතෝ යන මේ වායවාරයාගේ ද යොජනා ක්‍රමයෙහි වනාහි **''උඩ්ඪගමා වාතා අධොගමා වාතා කුච්ඡිසයා වාතා කොෂ්ඨ සයා වාතා අඞ්ගමඞ්ගානුසාරිනෝ වාතා සත්ථකා වාතා බුරකා වාතා උප්පලකා වාතා අස්සාසෝ පස්සාසෝ''** යි මෙසේ වදරන ලද්දී ආධ්‍යා තමික වායොධාතු නම් වා; **''තත්ථ කතමා බාහිරා වායොධාතු? යං බාහිරං වායෝ වා යෝ ගතං ථම්භිතත්තං රූපස්ස බහිධා අනුපා දිණ්ණං; සෙය්‍යථිදං? පුරත්ථිමා වාතා පච්ඡිමා වාතා උත්තරා වාතා දක්ඛිණා වාතා සරජා වාතා අරජා වාතා සීතා වාතා උණ්හා වාතා පරිත්තා වාතා අධිමත්තා වාතා ඛාලා වාතා වෙරම්භවාතා පක්ඛ වාතා සුපණ්ණ වාතා තාලවණ්ට වාතා විධූපන වාතා''** යි මෙසේ වදරනලද්දී බාහ්‍ය වායොධාතු යයි ද දනයුත්තීය. සෙස්ස කී නය මැයි. මෙතෙකින් ද යම් මේ—

ලක්ඛණහාරය.

35. **''වුත්තමහි එකධම්මෙ යෙ ධම්මා එකලක්ඛණා තෙන වුත්තා භවන්ති සබ්බෙ ඉති වුත්තෙතා ලක්ඛණෝ හාරෝ''**

(එක ධර්මයක් කීකල්හි ඒ කථිත ධර්මය හෙතුකොට ගෙන සමාන ලක්ෂණ ඇති යම් ධර්මකෙනෙක් වෙත්ද ඒ සියලු ධර්මයෝ කියනලද්දාහු වෙති; මෙසේ කියනලද්දේ ''ලක්ඛණහාර'' නමැයි කියනලද්දේය.) යි-

---

35. **එකධම්මෙ=** එක් ධර්මයක්; **වුත්තමහි=** කී කල්හි; **තෙන=** ඒ කථිත ධර්මය හෙතුකොට ගෙන; **එකලක්ඛණා=** සමාන ලක්ෂණ ඇති; **යෙ ධම්මා=** යම් ධර්මකෙනෙක් වෙත්ද; **සබ්බෙ=** ඒ සියලු ධර්මයෝ; **වුත්තා භවන්ති=** කියනලද්දාහුවෙති; **ලක්ඛණෝහාරෝ=** ලක්ෂණහාරය තෙම; **ඉති=** මෙසේ; **වුත්තෙතා=** කියනලද්දේය.

මෙසේ නෙත්තිප්‍රකරණයෙහි ලක්ෂණ නම් හාරයෙක් කියනලද්දේ ද; ඔහුගේ වශයෙන් යම්හෙයකින් සතර භූතයන් ගත්කල්හි උපාදා රූපයත් ගන්නාලද ම වේද, රූපලක්ෂණය නො ඉක්මවූ හෙයිනි. යම් භූතොපාදායරූපයකුත් වේද, හේ රූපසකන්ධයයි; එහෙයින් අශ්‍රැතවත් පෘථග්ජන තෙමේ පෘථිවී ධාතුව අබ් ධාතුව තෙජෝ ධාතුව වායෝ ධාතුව (තෘෂ්ණාදි වශයෙන්) හඟි යයි වදාරන භාග්‍යවත්හු විසින් අවී වශයෙන් රූපය ආත්ම හෙයින් දකී යයි ද වදාරනලද වෙයි; පෘථිවී ධාතුවෙහි අබ් ධාතුවෙහි තෙජෝ ධාතුවෙහි වායෝ ධාතුවෙහි (නිත්‍යාත්මය වෙයි කියා) හඟී යයි වදාරන්නහු විසින් රූපයෙහි ආත්මය (ඇතැයි) දකී යයි ද වදාරනලද වෙයි; පාථිවී ධාතුවෙන් අබ් ධාතුවෙන් තෙජෝ ධාතුවෙන් වායෝ ධාතුවෙන් (පිවත එය ඇසුරුකොට මාගේ ආත්මය ඇතැයි කියා) හඟී යයි වදාරන්නහු විසින් රූපයෙන් අන්‍ය වූවක් ආත්ම යයි සිඩහෙයින් ආත්මය රූපවත් යයි හෝ ආත්මයෙහි රූපය වෙයි හෝ දකී යයි ද වදාරනලද්දේ වෙයි.

මෙසේ (දැක්වූ) මොහු සිවිදෙන රූපවසතුක වූ සක්කායදෘෂ්ටි මඤ්ඤනාවෝ වෙති. ඔවුනතුරෙන් එකක් උච්ඡෙදදෘෂ්ටි යැ තිදෙනෙක් ශාශ්වතදෘෂ්ටීහු යැයි දෘෂ්ටීහු දෙනක් ම වෙත් නුයි මෙහි මේ විශෙෂය ද දත යුත්තේය. මෙසේ රූපවාරයෙන් සංඝකාර වසතුක වූ මඤ්ඤනාව වදාරා මේවිට සංඝකාරයන් ග්‍රහණය කොට යම් සත්ව කෙනෙක් පනවනු ලැබෙත් ද ඒ සත්වයන් අතුරෙහි දු යම්හෙයකින් පෘථග්ජන තෙමේ (තෘෂ්ණාදි වශයෙන්) මඤ්ඤනය කෙරේද එහෙයින් ඒ සත්වයන් නිදේශ කරනසේක් **භූතෙ භූතතො සඤ්ජානාති** යනාදිය **"භූත" ශබ්දය.** වදාළහ. එහි මේ "භූත" ශබ්දය තෙම පඤ්චඝකන්ධය අමනුෂ්‍ය ය ධාතු ය විද්‍යමාන ය ක්ෂීණාශ්‍රව ය සත්ව ය වෘක්ෂ ය යනාදි අර්ථයන්හි දක්නා ලැබේ. **"භූතමිදන්ති භික්ඛවෙ! සමනුපස්සථ"** යනාදි තැන්හි වනාහි මේ "භූත" ශබ්දය පඤ්චඝකන්ධ යන්හි දක්නා ලැබේ; **"යානීධ භූතානි සමාගතානි"** යන මෙහි අමනුෂ්‍යයන් කෙරෙහි දක්නා ලැබේ; **"චත්තාරෙ ඛො භික්ඛු! මහාභූතා හෙතු"** යන මෙහි ධාතූන්හි යැ; **"භූතස්මිං පාචිත්තියං"** යනාදීන්හි විද්‍යමානයෙහිය යැ; **"යො ච කාලඝසො භූතො"** යන මෙහි ක්ෂීණාශ්‍රවයාකෙරෙහි යැ; **"සබ්බෙඛව නික්කිපිස්සන්ති භූතා ලොකෙ සමුස්සයං"** යන මෙහි සත්වයන් කෙරෙහි යැ; **"භූතගාමපාතව්‍යතාය"** යන මෙහි වෘක්ෂාදියෙහි යැ; මෙහි වනාහි මෙය සත්වයන් කෙරෙහි වැටෙයි; (එහෙත්) අවිශෙෂයෙන් නො ද වෙයි; චාතුම්මහාරාජිකයන්ගේ යට භාගයෙහි සත්වයෝ ම මෙහි භූතයෝ යයි අදහස්කරන ලද්දාහුය.

එහි භූතෙ භූතතො සඤ්ජානාති යනාදිය කි නයමැයි; **භූතෙ මඤ්ඤතී**= යනාදියෙහි වනාහි ත්‍රිවිධ මඤ්ඤනාවෝ ම දතයුත්තාහුය; කෙසේ ද? මේ තෙම වනාහි **"සො පඤ්ඤති ගහපතිං වා ගහපති පුත්තං වා පඤ්චහි කාමගුණෙහි සමප්පිතං සමඞ්ගිභූතං"** (හෙතෙම පස්කම්ගුණෙන් සමර්පිත වූ සමඞ්ගී වූ ගැහැවියෙක් හෝ ගැහැවිතන යෙක් හෝ දකී) යයි වදළතසින් භූතයන් ශුභයෝ ය සුඛිතයෝ යයි ගෙන ඇලෙයි; දුක ද අසා ද ආඝ්‍රාණය කොට ද රස විඳගෙන ද සපගීකොට ද දුන ද (ඇලෙයි;) මෙසේ භූතයන් තෘෂ්ණා මඤ්ඤනා වෙන් සිතයි. "මම ක්ෂත්‍රිය මහාසාරයන්ගේ සහභාවයට ප්‍රතිසන්ධි වශ යෙන් පැමිණෙන්නෙම් නම් ඉතා යෙහෙක" යනාදි ක්‍රමයෙන් හෝ නො ලත්හුගේ ප්‍රතිලාභය පිණිස සිත පිහිටුවා ද; මෙසේ ද භූතයන් තෘෂ්ණාමඤ්ඤනාවෙන් හඟියි. තමාගේ ද භූතයන්ගේ ද සම්පත්තිය ද විපත්තිය ද නිසා තමා හෝ ශ්‍රෙෂ්ඨකොට පිහිටුවයි; භූතයන් අතුරෙන් යම් කිසි භූතයෙක් හීන කොට පිහිටුවයි; තමා හෝ හීන කොට; යම් කිසි භූතයෙකු ශ්‍රෙෂ්ඨ කොට පිහිටුවයි; තමා හෝ භූතයෙකු හා භූතයා ද තමා හා සමාන කොට පිහිටුවයි; වදළේ මැනු- **"ඉධෙකච්චෙවා ඛත්තියා වා —පෙ— අඤ්ඤතරඤ්ඤතරෙන වත්ථුනා පුබ්බඤ්ඤාලං පරෙහි සදිසං අත්තානං දහති අපරඤ්ඤාලං අත්තානං සෙය්‍යං දහති පරෙ හීනෙ දහති යො එවරූපො මානො -පෙ- අයං වුච්චති මානාතිමානො"** යි මෙසේ භූතයන් මානමඤ්ඤනාවෙන් සිතයි. භූතයෝ (=චාතුමීහාරාජි කයෙන් යට සත්වයෝ) වනාහි නිත්‍යයෝ යැ ධ්‍රැවයෝ යැ ශාශ්වතයෝ යැ නො පෙරළෙන සුභාව ඇත්තාහු යයි හෝ (ඔටුගවගඩඹාදි) අනවශෙෂ සත්වයෝ ද (එකිඳ්‍රිය විඉඳ්‍රියාදි) අනවශෙෂ ප්‍රාණීහු ද (අණ්ඩකොෂ වස්තිකොෂාදියෙහි හටගත්) සියලු භූතයෝ ද (ශාලියවගොධුමාදි) අන වශෙෂ ජීවයෝ ද (තමාගේ) වශභය නැත්තාහු බලය නැත්තාහු වීර්‍යය නැත්තාහු නියමයෙන් ද ෂඩභිජාතීන්ගේ ඒ ඒ තැන්හි ග මනින් ද සුභාවයෙන් ද නානාප්‍රකාරබවට පමුණුවන ලද්දාහු ෂඩභිජාතීන්හි ම සිට සුවදුක් විඳිත් යයි හෝ හඟින්නේ දෘෂ්ටිමඤ්ඤනාවෙන් හඟියි, මෙසේ භූතයන් ත්‍රිවිධමඤ්ඤනාවෙන් (නිත්‍ය යයි) සිතයි.

(**භූතෙසු මඤ්ඤති** යන තැන්හි) භූතයන් කෙරෙහි (නිත්‍යාත්මයක් ඇතැයි) කෙසේ සිතා ද යත්? ඒ භූතයන් කෙරෙහි තමාගේ උත්පත්තිය හෝ සුඛප්‍රාප්තිය හෝ කැමතිවෙයි; මෙසේ පළමුකොට තෘෂ්ණාමඤ්ඤ නාවෙන් භූතයන් කෙරෙහි (නිත්‍යාත්මය ඇතැයි) සිතයි; නොහොත් භූතයන් කෙරෙහි උත්පත්තිය ප්‍රාර්‍ථනාකරමින් දන් දෙයි සිල් සමාදන් වෙයි පෙහෙවස්කම් කෙරෙයි; මේසේත් භූතයන් කෙරෙහි (නිත්‍යාත්මය ඇතැයි) තෘෂ්ණාමඤ්ඤනාවෙන් සිතයි. භූතයන් වනාහි සමූහග්‍රාහ යෙන් ගෙන ඔවුන් අතුරෙහි ඇතැම් භූතයෙක් ශ්‍රෙෂ්ඨ වශයෙන් පිහිටු වයි නිසිවෙක් සමාන වශයෙන් හෝ හීන වශයෙන් හෝ (පිහිටුවයි;)

මෙසේ භූතයන් කෙරෙහි (නිත්‍යාත්මය) මානමඤ්ඤනාවෙන් සිතයි. එසේම ඇතැම් භූතයන් නිත්‍යයෝ යැ ධ්‍රැවයෝ යැයි සිතයි, කිසිවෙක් අනිත්‍යයෝ යැ අධ්‍රැවයෝ යැයි (සිතයි;) මම ද භූතයන් අතුරෙන් එක්තරා කෙනෙක් වෙමි යි හෝ සිතයි; මෙසේ භූතයන් කෙරෙහි (නිත්‍යාත්මය) දෘෂ්ටිමඤ්ඤනාවෙන් සිතයි.

භූතානං මඤ්ඤති යන මෙහි වනාහි උපකරණ සහිත වූ තමාගේ හෝ මෙරමාගේ හෝ උත්පත්තිය යම් කිසි භූතයෙකු කෙරෙන් (වියයි) සිතන්නේ භූතයන් කෙරෙන් (පිටත් නිත්‍යාත්මය ඇතැයි) හඟී යයි දතයුතුයි; මෝ ඔහුගේ දෘෂ්ටිමඤ්ඤනාවයි. දෘෂ්ටිමඤ්ඤනාවෙන් සිතන ලද ඒ වස්තුවෙහි ම සෙනහය ද මානය ද උපදවන්නා වූ ඔහුගේ තෘෂ්ණා මානමඤ්ඤනාවෝ ද දතයුත්තාහුය. **භූතෙ මෙති මඤ්ඤති** යන මෙහි වනාහි කෙවල තෘෂ්ණාමඤ්ඤනාව ම ලැබෙයි; හෝ ද මේ මාගේ පුතාය මාගේ දූය මාගේ එළුතිරෙළුවෝය කුකුළුහූරෝය ඇත්ගවඅස්හුය යන මේ ආදිනයින් මමත්වය කරන්නහුට පවතී යයි දතයුත්තීය. **භූතෙ අභිනන්දති** යන මෙය කී නයමැයි. **අපරිඤ්ඤාතං තස්ස** යන මෙහි වනාහි යම් සංස්කාර කෙනෙක් දැඩිකොට ගෙන භූතයන්ගේ ප්‍රඥප්තිය වූවාද ඒ සංස්කාරයන් අපරිඥත (= පිරිසිඳ නොදත්) බැවින් භූතයෝ අපරිඥත වූවාහු වෙත් යයි දතයුත්තාහුය; යෙදීම වනාහි කී නියෙන් ම කළයුත්තීය.

මෙසේ සංක්ෂෙප හෙයින් සංස්කාර වශයෙන් ද සත්ව වශයෙන් ද මඤ්ඤනා වස්තුව දක්වා මෙවිට භූමි විශෙෂාදි හෙදයෙන් විස්තාර හෙයින් ද එය දක්වන සේක් **දෙවෙ දෙවත්තං** යනාදිය වදළහ. ඒ දෙශනා වෙහි පඤ්චකාම ගුණයන් කරණ කොටගෙන ක්‍රීඩාකෙරෙත් තමාගේ සෘඩියෙන් හෝ (ක්‍රීඩා කෙරෙත්) හුයි **"දෙව"** නම් වෙයි; ක්‍රීඩාකරත් හෝ බබලත් යන අර්ථයි. ඒ දෙවියෝ **සම්මුති** දෙවියෝ යැ උත්පත්ති දෙවියෝ යැ විශුද්ධි දෙවියෝ යැයි ත්‍රිවිධ වෙත්; රජවරු ද දෙව්හු ද කුමාරයෝ ද **"සම්මුතිදෙව"** නම් වෙති; සිව්මහරජයෙහි දෙවියන් පටන් ඉන් උඩ දෙවියෝ "උත්පත්ති දෙව" නම් වෙති; අහත් ක්ෂීණාශ්‍රවයෝ "විශුද්ධිදෙව" නම් වෙති; මෙහි වනාහි උත්පත්ති දෙවියෝ යයි දතයුත්තාහුය; අවිශෙෂයෙන් නො ද වෙයි; පරනිර්මිත වශවර්ත්තී දිව්‍යලොකයෙහි පිරිස් සහිත මාරයා තබා සෙසු ෂට්කාමාවචරයෝ මෙහි දෙවියෝ යයි අදහස්කරන ලද්දාහුය; එහි සියලු අර්ථවර්ණනා තොමෝ භූතවාරයෙහි කී නියෙන් ම දතයුත්තීය.

ප්‍රජාපති හෙවත් මාරයා.

පජාපති යන මෙහි වනාහි මාරතෙමේ "පජාපති" යයි දතයුත්තේය; කිසිවෙක් වනාහි ඒ ඒ දෙවියන්ගේ අධිපති මහා රාජාදින්ට මේ නමෙකැයි කියති; දෙවග්‍රහණයෙන් ම ඔවුන් ගත් හෙයින් එය අයුතු යයි මහාඨ කථාවෙහි ප්‍රතික්ෂෙප කරනලදී. මාරතෙමේ ම සත්ත්වසඞ්ඛ්‍යාත වූ පජාවට අධිපති භාවයෙන් මෙහි "පජාපති" යයි අදහස්කරන ලද්දේය. හෙතෙම

කොහි වෙසේද යත්? පරනිර්මිත වසවත්තීහි දිව්‍යලොකයෙහිය; එහි වූ කලි වසවත්තීහි දිව්‍යරාජ තෙමේ රාජ්‍යය කරවයි; මාර තෙමේ එක් පෙදෙසෙක තම පිරිසට ඉසුරුබැව් පවත්වමන් රාජ්‍යප්‍රත්‍යන්තයෙක්හි දුම්රික රාජපුත්‍රයෙකු මෙන් වාසයකෙරේ යයි කියත්. මෙහි ද මාරඉහනින් ම මරපිරිසගේ ද ගැනීම දතයුතුයි. මෙහි යොජනා ක්‍රමය ද මාරදිව්‍ය පුත්‍රයා වණ්ණවත් වූවහු දීඝායුෂ්ක වූවහු සුවඛහුල වූවහු දූක හෝ අසා හෝ සිත්ඇලවන්නේ තෘෂ්ණාමඤ්ඤනාවෙන් සිතයි; මම මාරයාගේ සහ භාවයට පැමිණෙන්නෙම් නම් ඉතා යෙහෙකැ'යි ආදිනයින් හෝ නොලත් සම්පත්හුගේ ලැබීම පිණිස සිත පිහිටුවන්නේ ද මරදෙව්පුත් තෘෂ්ණාමඤ්ඤනාවෙන් සිතයි. ප්‍රජාපති (=මාර) භාවයට පැමිණියෙම් මම සත්‍රියන්ට ඊශ්වර වෙමි අධිපති වෙමි යි මානය උපදවන්නේ මරහු මානමඤ්ඤනාවෙන් සිතයි ප්‍රජාපති තෙම නිත්‍යයෑ ධ්‍රැව යැයි හෝ උච්ඡේදයට පැමිණෙන්නේය විනාශවන්නේය යි හෝ (තමාගේ) වශභය නැත්තේය බලය නැත්තේය වීර්‍යය නැත්තේ ය නියතිසඞ්ගති සවභාව යෙන් නානාත්වයට පමුණුවන ලද්දේය සවැදෑරුම් අභිජාතීන්හි ම සුව දුක් විඳින්නේ යයි හෝ් හඟින්නේ වනාහි ප්‍රජාපතිහු දෘෂ්ටිමඤ්ඤනාවෙන් හඟී යයි දතයුතු.

පජාපතිඤ්ච යන මෙහි වනාහි හුදු දෘෂ්ටිමඤ්ඤනාව ම යෙදෙයි. ඇගේ පැවැත්ම මෙසේ දතයුත්තීය. මෙලෙව්හි කිසිවෙක් මරදෙව් පිත් කෙරෙහි යම් ධර්මකෙනෙක් විද්‍යමාන වෙත්ද ඒ සියලු ධර්මයෝ නිත්‍යයහ ධ්‍රැවයහ ශාශ්වතයහ වෙනස් නොවන සවභාව ඇතියහ යි සිතයි; නොහොත් ප්‍රජාපතිහු කෙරෙහි පාපයක් නැත, ඔහු කෙරෙහි පාපකර්මයෝ නො ගැල්වෙති'යි සිතයි; **පජාපතිනෝ** යන මෙහි ත්‍රිවිධ මඤ්ඤනාවෝ ම ලැබෙත්; කෙසේදයත්? මෙලෙව්හි එකෙක් උපකරණ සහිත වූ තමාගේ හෝ පරාගේ හෝ ප්‍රජාපතිහු කෙරෙන් උත්පත්තිය හෝ නික්මීම හෝ සිතයි; **මේ** ඔහුගේ **දෘෂ්ටිමඤ්ඤනාවයි. දෘෂ්ටිමඤ්ඤනාවෙන්** සිතනලද ඒ වස්තුවෙහි ම සෙනහය ද මානය ද උපදවන්නා වූ ඔහුගේ තෘෂ්ණාමානමඤ්ඤනාවෝ ද දතයුත්තාහුය. **පජාපතිං** මෙ යන මෙහි වනාහි හුදු තෘෂ්ණාමඤ්ඤනාව ම ලැබෙයි; හෝ ද මේ ප්‍රජාපති මාගේ ශාස්තෘය මාගේ සවාමිය යනාදි නයින් මමත්වය කරන්නහුට පවතී යයි දතයුත්තීය. සෙස්ස කී නයමැයි.

"බ්‍රහ්ම" ශබ්දය.

බ්‍රහ්මං බ්‍රහ්මනෝ යන මෙහි ඒ ඒ ගුණ වෙසෙසින් වඩනලද්දේ නුයි "බ්‍රහ්ම" නම් වේ; වැලිදු බ්‍රහ්ම යයි මහබඹ ද තථාගත ද බමුණු ද මව්පිය දෙදෙන ද ශ්‍රේෂ්ඨය ද කියනු ලැබෙයි. **"සහසෙය්‍යා බ්‍රහ්මා විසහසෙය්‍යා බ්‍රහ්මා"** යනාදි තැන්හි වනාහි මහා බ්‍රහ්ම තෙමේ බ්‍රහ්ම යයි කියනු ලැබේ; **"බ්‍රහ්මාති භික්ඛවෙ! තථාගතස්සෙතං අධිවචනං"** යන මෙහි තථාගත තෙමේ (කියනු ලැබේ.)

36. "තමොනුදෙ බුඩො සමනතවකඛු
ලොකනනගූ සබ්භවාතිවතතෙතා
අනාසවො සබ්බදුකඛපහිනො
සචචවහයො බ්‍රහෙම උපාසිතො මෙ" යි.

මෙහි බ්‍රාහ්මණ (=බමුණු) තෙමේයි; **"බ්‍රහමාති මාතාපිතරෙ පුබබාචරියාති වුචචරෙ"** යන මෙහි මවු පිය දෙදෙනායි; **"බ්‍රහමවකඛකං පවතතති"** යන මෙහි ශ්‍රෙෂ්ඨය (යන අර්ථයි;) මෙහි වනාහි පළමුකොට උපන් කල්පායුෂ්ක වූ බ්‍රහ්මතෙමේ අදහස්කරනලදී; ඔහුගේ ගැනීමෙන් ම බ්‍රහ්මපුරොහිත බ්‍රහ්මපාරිෂද්‍යයෝ ද ගන්නාලද්දාහු යයි දතයුත්තාහුය මෙහි අර්ථවර්ණනා වනාහි ප්‍රජාපති වාරයෙහි කී නියෙන් ම දතයුත්තීය.

ආභස්සර වාරයෙහි දඬුවැට පහනකින් (= පන්දමකින්) ගිනිසිළ මෙන් මොවුන්ගේ සිරුරින් කාන්තිය සිදිසිදී වැටෙන්නාක් මෙන් නික්මෙයි, වෙසෙසින් නික්මෙයි, එහෙයින් "ආභස්සර" නම් වෙති; ඔවුන්ගේ ගැනීමෙන් සියලු ම ද්විතීයධ්‍යාන භූමිය ගන්නා ලද්දීය; මොහු සියලු ම පරිත්තාභ අප්පමාණාභ ආභස්සරයෝ එකතලවාසීහු ම යයි දතයුත්තාහුය.

සුභකිණ්හ වාරයෙහි ශුභයෙන් අවකීර්ණ වූවාහු විකීර්ණ වූවාහු ශොභන වූ ශරීරකාන්ති වර්ණයෙන් එකඝන වූවාහු රන්මදෙසෙහි තැබූ දිලියෙන කසුන්පිඩක් මෙන් සන්‍ථිත වූවාහු නුයි "සුභකිණ්හ" නම් වෙති; ඔවුන්ගේ ගැනීමෙන් සියලු ම තෘතීයධ්‍යාන භූමිය ගන්නා ලද්දීය; පරිත්තසුභ අප්පමාණසුභ සුභකිණ්හ යන මොහු සියල්ලෝ ද එක්තෙලෙහි වසන්නාහු ම යයි ද දතයුත්තාහුය.

වෙහප්ඵල වාරයෙහි විපුල වූ ඵලඇත්තාහු නුයි "වෘහත්ඵල" නම් වෙති; සතරවන ද්‍යානභූමිහි බ්‍රහ්මයෝ කියනු ලැබෙත්; (ආභස්සර-සුභකිණ්හ- වෙහප්ඵල යන) මේ වාරත්‍රයෙහි ම අවියොජනා කොමෝ භූතවාරයෙහි කී නයින් ම දතයුත්තීය.

අසඤඤ වාරයෙහි අභිභවනය (= මැඩපැවැත්වීම්) කෙළේනුයි අභිභූ නම්; කුමක් අභිභවනය කෙළේද යත්? සතර අරූපිසකාය්‍යෝයි; (අභිභූ යනු) අසඤඤභවයට මේ නමකි; අසඤඤසත්ව දෙවියෝ වෘහත්ඵල යන් සමග එකසඵල වූවාහු මය; එක් අවකාශයෙක යම් ඉරියව්වකින්

---

36. බ්‍රහෙම= (බාවාරී) බ්‍රාහ්මණය; මෙ= මා විසින්; තමොනුදෙ= (අවිද්‍යාසඞ්ඛ්‍යාත(තම සු දුරු කළා වූ; සමනතචකඛු= සර්ව්ඥ තාඥෙන සඞ්ඛ්‍යාත) සමතැස් ඇත්තා වූ; ලොකනනගූ= (ලොකාත්තා යයි කියන ලද) නිවනට පැමිණියා වූ; සබ්බභවාතිවතතෙතා= කාමාදි සියලු භවයන් ඉක්මවා සිටියා වූ; අනාසවො= ආශ්‍රව රහිත වූ; සබ්බදුකඛපහිනො= සියලු දුක් ප්‍රහීණකළා වූ; සචචවහයො= "බුඩ" යන සත්‍ය නාමයකින් යුක්ත වූ; බුඩො= සර්ව්ඥතෙම; උපාසිතො= උපාසනය කරනලද්දේය.

උපන්නාහු ද ඒ ඉරියව්වෙන් ම ආයු ඇතිතෙක් සිත්තම්රූසමාන වූවාහු සිටිති, මෙහි ඔහු සියල්ලෝ ම "අභිභූ" යන වචනයෙන් ගන්නා ලද්දාහුය. කිසිවෙක් "අභිභූ" නම් සහස්සබ්‍රහ්මයාය යනාදිනයින් ඒ ඒ තැන්හි අධිපති බ්‍රහ්මයා වණ්ණනා කෙරෙත්; බ්‍රහ්මග්‍රහණයෙන් ම ඔහු ගත්බැවින් මේ අයුතු යයි දතයුතු. මෙහි යොජනානය ද අභිභූ (=අසඤ්ඤසත්ත බ්‍රහ්ම) තෙමේ වණ්ණවත්ය දීඝායුෂ්ක යයි අසා එහි ඡන්දරාගය උපදවන්නේ අසඤ්ඤසත්ත දෙවියා තෘෂ්ණාමඤ්ඤනාවෙන් සිතයි; මම අසඤ්ඤසත්ත දෙවියාගේ සහභාවයට යන්නෙම් නම් ඉතා යෙහෙක යනාදිනයින් හෝ ප්‍රතිලාභය නො කරනලද සම්පත්හුගේ ප්‍රතිලාභය පිණිස සිත පිහිටුවන්නේද අසඤ්ඤසත්ත දෙවියා තෘෂ්ණාමඤ්ඤනාවෙන් සිතයි; තමා හීන වශයෙන් ද අසඤ්ඤසත්ත දෙවියා ශ්‍රේෂ්ඨවශයෙන් ද පිහිටුවන්නේ වනාහි අසඤ්ඤසත්ත දෙවියා මානමඤ්ඤනාවෙන් සිතයි; අභිභූ තෙමේ නිත්‍යය ධ්‍රැවය යනාදි ක්‍රමයෙන් පරාමර්ශනය කරන්නේ අසඤ්ඤසත්ත දෙවියා දෘෂ්ටිමඤ්ඤනාවෙන් හඟී යයි දතයුත්තේය. සෙස්ස ප්‍රජාපති වාරයෙහි කී නියෙන් ම දතයුතු.

මෙසෙයින් භාග්‍යවතුන් වහන්සේ පිළිවෙළින් දිව්‍යලෝකයන් දක්වනසේක් අභිභූ යන වචනයෙන් අසඤ්ඤභවය දක්වා මෙවිට යම් හෙයකින් මෝ වෘත්තකථා වන්නීද ශුද්ධාවාසයෝ විවෘත්ත පක්ෂයෙහි සිටියාහුද ඒ දෙවියෝත් අනාගාමී ක්ෂීණාශ්‍රවයෝ ම වෙත් ද; යම්හෙයකින් හෝ ඒ දෙවියෝ කිහිපකල්පදහස් ගණනක් ආයු ඇත්තාහු බුඩොතපාද කාලයෙහි ම වෙත්ද බුදුවරු වනාහි අසඞ්ඛ්‍යකල්පයෙහිද නො උපදිත් එකල ඕ ශුද්ධාවාස භූමි තොමෝ ශූන්‍ය වූවා වෙයි. සැබව බුදුවරයන්ට ශුද්ධාවාස භවය රජුගේ සකඞ්වාර ස්ථානයක් මෙන් වෙයි; එකරුණෙන් ම විඥානස්ථිති වශයෙන් ද සත්ත්වාවාස වශයෙන් ද නො ගන්නා ලදී; මේ මඤ්ඤනාවෝ සර්වකාලික වන්නාහුය, එහෙයින් ඔවුන්ගේ විද්‍යමාන භූමිය දක්වනසේක් ශුද්ධාවාසයන් ඉක්මවා **අකාසානඤ්චායතනං** යනාදිය වදළහ.

එහි ආකාසානඤ්චායතනං යනු තද්භූමික වූ සතර කුශලවිපාක ක්‍රියා සඤ්ඤයෝයි; ඒ කුශලවිපාක සඤ්ඤයෝ ද භාවනා පරිචේඡද කථා මෙමැයි කොට එහි උපන්නහු පිළිබඳව ම යයි දතයුත්තාහුය. විඤ්ඤාණඤ්චායතනාදියෙහි ද මේ ක්‍රමයයි. මේ සතරවාරයන්හි ම අර්ථ යොජනා වනාහි අභිභූවාරයෙහි කී නයින් ම දතයුත්තාහුය. මෙහි මානමඤ්ඤනා ද පජාපතිවාරයෙහි කී නයින් ද යෙදෙයි.

මෙසේ භූමි විශෙෂාදි භෙදයෙන් විසතර වශයෙන් ද මඤ්ඤනා වස්තුව දක්වා මෙවිට සියලු මඤ්ඤනාවන්ට වස්තු වූ සවකාය පර්‍යාපන්න වූ ත්‍රෛභූමක ධර්ම භෙදය දෘෂ්ටාදිඝතර සමග සඞ්ග්‍රහ කොට දක්වනසේක් **දිට්ඨං දිට්ඨතෝ** යනාදිය වදළහ. එහි **දිට්ඨං**= මසැසින් දක්නා ලද්ද ද දිවැසින් දක්නාලද්ද ද; මේ රූපායතනයට නමකි. **එහි දිට්ඨං**

මඤ්ඤති= දක්නාලද්ද (හෙවත් රූපායතනය) ත්‍රිවිධමඤ්ඤනාවන්ගෙන් සිතයි; කෙසේද යත්? රූපායතනය ශුභය යන සංඥාවෙන් ද සැපය යන සංඥාවෙන් ද දක්නේ එහි ඡන්දරාගය උපදවයි; එය ආශ්වාදනය කෙරෙයි (ඊට) සතුටුවෙයි; මේ වදාරනලදමැයි. භාග්‍යවත්හු විසින්– **"ඉත්ථිරූපෙ හිකඛවෙ! සත්තා රත්තා ගිධා ගථිතා මුච්ඡිතා අජ්ඣොපන්නා තෙ දීඝරත්තං සොචන්ති ඉත්ථිරූපවසානුගා"**

("මහණෙනි! යම් සත්වකෙනෙක් ස්ත්‍රීරූපයෙහි රාගවශයෙන් ඇලුනාහු ගිජුවූවාහු ගෙතුනාහු මුසපත්වූවාහු බැසගත්නාහු වෙත්ද ස්ත්‍රීරූපයෙන් වසඟවූ ඔව්හු බොහෝ කලක් ශොක කෙරෙති") යී මෙසේ (චතුසමුට්ඨානික) රූපායතනය තෘෂ්ණාමඤ්ඤනා වෙන් සිතයි.

"ඉති මෙ රූපං සියා අනාගතමධානන්ති වා පනෙව තණ්හං සමන්නානෙති රූපසම්පදං වා ආකඞ්ඛමානො දුනං දෙති" යී.

("මෙසේ මාගේ රූපය අනාගතකාලයෙහි වන්නේ යයි කියා හෝ තෘෂ්ණාව පිහිටුවයි රූපසම්පත්තිය හෝ කැමතිවෙමින් දන්දෙයි" යනාදීන්) විසතර වේ.

මෙසේත් රූපායතනය තණ්හාමඤ්ඤනාවෙන් සිතයි. තමාගේ ද පරාගේ ද රූපයෙහි සම්පත්තිවිපත්තිය නිසා මම මේ රූපය කරණකොට ගෙන ශ්‍රේෂ්ඨවෙමි යි හෝ සදෘශවෙමි යි හෝ හීනවෙමි යි හෝ මානය උපදවයි; මෙසේ රූපායතනය මානමඤ්ඤනාවෙන් සිතයි. රූපායතනය ඛනාහි නිත්‍ය යැ සතතයෙන් පවත්නේ යැ ශාශ්වත යැයි සිතයි; ආත්මය ආත්මීය යයි සිතයි; මඟුලය අමඟුල යයි සිතයි; මෙසේ රූපායතනය දෘෂ්ටිමඤ්ඤනාවෙන් සිතයි; මෙසේ රූපායතනය ත්‍රිවිධ මඤ්ඤනාවෙන් සිතයි. **දිඨ්ඨෙ මඤ්ඤති** යනු කෙසේ ද? රූපයෙහි ආත්මය දක්නා නයින් සිතන්නේ රූපායතනයෙහි (ආත්මය පිහිටියේ යයි) සිතයි; නොහොත් සතනයෙහි සතන්‍යය (= කිරි) යම්සේද එසේ රූපයෙහි රාගාදීහු වෙතැයි සිතන්නේ ද රූපායතනයෙහි ආත්මය ඇතැයි සිතයි; මෝ ඔහුගේ දෘෂ්ටිමඤ්ඤනාවයි. දෘෂ්ටිමඤ්ඤනාවෙන් සිතනලද ඒ වස්තුවෙහි ම සෙනහය ද මානය ද උපදවන්නා වූ ඔහුගේ තෘෂ්ණා මානමඤ්ඤනාවෝද දතයුත්තාහුය. මෙසේ දෘෂ්ටි (=රූපායතනයෙහි) ආත්මය ඇතැයි සිතයි. සෙස්ස පෘථිවීවාරයෙහි කී නියෙන් ම දතයුතුයි.

සුතං= මාංශශ්‍රොතයෙන් ද අසනලද දිව්‍යශ්‍රොතයෙන් ද අසනලද; මේ ("සුත" යනු) ශබ්දායතනයට නමකි. **මුතං**= පැමිණ ද දැන ද ගන්නාලද්ද; ගැටී එලඹ යන අර්ථයි; ඉන්ද්‍රියයන්ගේ ද ආලම්බණයන්ගේ ද අන්‍යොන්‍ය සංශ්ලේෂයෙහි (= එක්වීමෙහි) දන්නාලද යයි කියනලද වෙයි; මේ (මුතං යනු) ගන්ධරසඵොට්ඨබ්බායතනයන්ට නමකි. **විඤ්ඤාතං**= සිතින් දන්නාලද්ද; සෙසු සප්තායතනයන්ට මේ නමකි; ධම්මාරම්මණයට හෝ නමකි; මෙහි වූ කලි සඛකාය පර්‍යාපන්න වූයේ ම ලැබෙයි. මෙහි විසතරය ඛනාහි දිඨ්ඨවාරයෙහි කී නියෙන් ම දතයුත්තේය.

මෙසේ සියලු සඞ්කාය භෙදය දෘෂ්ටාදි සතර සමග දක්වා මෙවිට එය ම සමාපන්නකවාරයෙන් ද අසමාපන්නකවාරයෙන් ද දෙපරිද්දෙකින් දක්වනසේක් **එකත්තං නානත්තං** යි වදාළහ. **එකත්තං** යන මෙයින් වනාහි සමාපන්නකවාරය දක්වන සේක; **නානත්තං** යන මෙයින් අසමාපන්නකවාරය දක්වති. ඔවුන්ගේ වචනාර්ථය නම්? එක භාවය එකත්වය විවිධභාවය නානාත්වය කියා වේ; මෙහි යොජනා වනාහි සමාපන්නකවාරය සතරසඞ්ඛ්‍යයන්ගෙන් ද අසමාපන්නකවාරය පඤ්ච සඞ්ඛ්‍යයන්ගෙන් ද වෙන්කොට **"රූපං අත්තතෝ සමනුපස්සති"** යනාදි වූ ශාසන (දෙශනා) ක්‍රමයෙන් ද පෘථිවීවාරාදියෙහි කියනලද අර්ථ කථා නයින් ද සුදුසු පරිද්දෙන් විමසා දතයුත්තාහුය. කිසිවෙක් වනාහි එකත්වනය "එකත්ව" යයි කියත්, නානාත්වනය "නානාත්ව" යයි කියත්; අනිකෙක් **"එකත්තසඤ්ඤී අත්තා හොති අරොගො පරම්මරණා නානත්තසඤ්ඤී අත්තා හොති"** යි මෙසේ දිළිහිනිවෙ සඟ දක්වති; ඒ සියල්ල මෙහි අදහස් නො කළබැවින් නො යෙදෙන්නේ ම වෙයි.

මෙසේ සියලු සඞ්කාය දෙපරිද්දෙකින් දක්වා දැන් හේම එක්පරිද්දෙකින් පිඬුකොට දක්වනසේක් **සබ්බං සබ්බතෝ** යනාදිය වදාළහ. මෙහි යොජනාක්‍රමය වනාහි (ආඛ්‍යාතඞ්කබාහ්‍ය වූ) සියලු රූපා රූප ධර්මය ආස්වාදනය කරන්නේ සියල්ල තෘෂ්ණාමඤ්ඤනාවෙන් සිතයි; මා විසින් ම මේ සඞ්ඛ්‍යෝ මවනලද්දාහු යයි මේ ආදිනයින් තමා විසින් මවනලදුයි සිතන්නේ සියල්ල මානමඤ්ඤනාවෙන් සිතයි; සියල්ල පූර්ව්වෙහි කළකර්ම හෙතුවෙන් වෙයි, සියල්ල ඊශ්වරනිර්මාණ හෙතුවෙන් වෙයි, සියල්ල අහෙතු අප්‍රත්‍යයෙන් වෙයි, සියල්ල ඇත සියල්ල නැතයි මේ ආදි ක්‍රමයෙන් සිතන්නේ සියල්ල දෘෂ්ටිමඤ්ඤනාවෙන් සිතා යයි දතයුතුයි; **සබ්බසම්ං මඤ්ඤති** යනු කෙසේද යත්? මේලෙව්හි එකෙක් මාගේ ආත්මය මහත් යයි මෙසේ දෘෂ්ටිඇත්තේ වෙයි; හෙතෙම සියලු ලොකසන්නිවාසය ඔහුගේ අවකාශභාවයෙන් කල්පනා කොට ඒ මේ මාගේ ආත්මය වන්හි සියලු රූපා රූප ධර්මයෙහි පිහිටියේ යයි සිතයි; මෙ ඔහුගේ දෘෂ්ටිමඤ්ඤනාවයි; ඒ (සියල්ල ඇසුරුකළ) ආත්මයෙහි ම සෙනහස ද එය වසඟ කොට ඇති මානය ද උපදවන්නා වූ ඔහුගේ තෘෂ්ණා මඤ්ඤනාවෝ ද දතයුත්තාහුය. සෙස්ස පෘථිවීවාරයෙහි කී නියෙන් ම දතයුතුයි.

පරමදිට්ඨ ධම්ම නිබ්බානය.

මෙසේ සියලු සඞ්කාය එක්පරිද්දෙකින් දක්වා මෙවිට අන්‍යත් ක්‍රමයකිනිදු එය එක් පරිද්දෙකින් දක්වන්නාහු **නිබ්බානං නිබ්බානතෝ** යනාදිය වදාළහ. එහි **නිබ්බානං** යනු **"යතෝ ඛෝ භෝ අයං අත්තා පඤ්ච කාමගුණෙහි සමප්පිතෝ සමඞ්ගිභූතෝ පරිචාරෙති එත්තාවතා ඛෝ භෝ අයං අත්තා පරමදිට්ඨධම්ම නිබ්බානං පත්තෝ හොති"**

(පින්වත! යම්තැනක පවත් මේ ආත්මය (මනාපඛ්‍ර රූපාදි) පඤ්චකාම ගුණයෙන් මොනොවට යුකත වූයේ සමන්විත වූයේ ඒ ඒ කාමගුණයන්හි කැමති පරිද්දෙන් ඉඳුරු යන් හසුරුවාද; පින්වත! මෙතෙකින් වනාහි මේ ආත්මය පරමදෘෂ්ට ධම්මනිබ්බාණයට හෙවත් උත්තම වූ ඉහාත්මයෙහි දුක් සන්සිඳුවිමට පැමිණියේ වෙයි.)

යන මේ ආදිනයින් පස්පරිද්දෙකින් ආයේ පරමදෘෂ්ට ධම්මනිබ්බාණ යයි දතයුතුයි; එහි දෘෂ්ටධම්මි නිබ්බාණය ආස්වාදනය කරන්නේ තෘෂ්ණා මස්කන්ධනාවෙන් සිතයි; ඒ නිබ්බාණයෙන් මම නිබ්බාණයට පැමිණියෙමි වෙමියි මානය උපදවන්නේ මානමස්කන්ධනාවෙන් සිතයි. නිබ්බාණ නොවූ ම එය නිබ්බාණ වශයෙන් ද නිත්‍යාදි වශයෙන් ද ග්‍රහණය කරන්නේ දෘෂ්ටිමස්කන්ධනාවෙන් සිතා යයි දතයුතුයි. නිවන කෙරෙන් අන්‍ය වූ ආත්මයක් ගෙන මේ නිවන යැ මේ ආත්ම යැ හේ මේ මාගේ ආත්මය වනාහි මේ නිබ්බාණයෙහි වියයි සිතන්නේ **නිබ්බානස්මිං මඤ්ඤති** (යනු වේ;) මෝ ඔහුගේ දෘෂ්ටිමස්කන්ධනාවයි; ඒ ආත්මයෙහි ම සෙනහය ද තවත්හුක වූ මානය ද උපදවන්නා වූ ඔහුගේ තෘෂ්ණාමානමස්කන්ධනාවෝ ද දතයුත්තාහුය. මේ ක්‍රමය නිබ්බාණයෙන් පිටත එය ඇසුරුකොට ආත්මය පිහිටියේ යයි සිතීමෙහි ද වෙයි.

ඒ එසේමැයි- මෙහි ද නිබ්බාණය කෙරෙන් අන්‍ය වූ ආත්මය ගෙන මේ නිබ්බාණ යැ මේ ආත්ම යැ හේ මේ මාගේ ආත්මය වනාහි මේ නිබ්බාණය කෙරෙන් අන්‍ය වූයේ යයි සිතන්නේ **නිබ්බානතෝ මඤ්ඤති** (=නිබ්බාණය ඇසුරු කොට ඉන් පිටත ආත්මය පිහිටියේ යයි සිතයි;) යනු වේ; මෝ තොමෝ ඔහුගේ දෘෂ්ටිමස්කන්ධනාවයි, ඒ (නිබ්බානයෙන් පිටත පිහිටි) ආත්මයෙහි ම සෙනහය ද තවත්හුක වූ මානය ද උපදවන්නා වූ ඔහුගේ තෘෂ්ණාමානමස්කන්ධනාවෝ ද දතයුත්තාහුය. මාගේ පරම දෘෂ්ටධම්මි නිබ්බාණය ආශ්වයීය සැප යයි සිතන්නේ වනාහි **නිබ්බානං මෙති මඤ්ඤති** යි (=මාගේ නිබ්බාණ යයි සිතා යයි) දතයුත්තේය. සෙස්ස කී නයමැයි. මෝ තොමෝ වනාහි මෙහි අනුගීතිය වන්නීය.

37. "යාදිසෝ එසසකකායෝ තථා නං අවිජානතෝ
පුථුජ්ජනස්ස සකකායෝ ජායතී සබ්බමඤ්ඤනා.

37. මේ අශුභාදි සවභාවයෙන් විද්‍යමාන වූ කෙශාදීන්ගේ සමූහය හෙයින් සත්කාය නම් වූ පඤ්චුපාදානසකකාය තෙම ප්‍රතිකූලතාදි ආකාරයෙන් යම්බඳු වේද එපරිද්දෙන් එය වෙසෙසින් නොදන්නා වූ පෘථග්ජනයාහට සත්කායයෙහි තෘෂ්ණාදි සියලු මස්කන්ධනාවෝ උපදිත්.

---

37. **එසෝ සකකායෝ**= මේ පඤ්චුපාදානසකකාය තෙම; **යාදිසෝ**= යම්බඳු වේද; **තථා**= එපරිද්දෙන්; **නං**= එය; **අවිජානතෝ**= නොදන්නා වූ; **පුථුජ්ජනස්ස**= පෘථග්ජනයාහට; **සකකායෝ**= සත්කාය යෙහි; **සබ්බමඤ්ඤනා**= (තෘෂ්ණාදි) සියලු මස්කන්ධනාවෝ; **ජායන්ති**= උපදිත්.

38. **ජේගුවෙජ්ජා භිදුරෙ වා'යං දුක්ඛෙඛා අපරිණායකෙඛා**
නං පවවනිකතනෙ බාලෙ ගණ්හං වඩ්ඪති මඤ්ඤනා.

39. **සුභතෙ සුඛතෙ චෙව සක්කායං අනුපස්සතෙ**
සලභසෙසෙව අගහිමහි හොති තණ්හාය මඤ්ඤනා.

40. **නිවවසඤ්ඤං අධිඨාය සමපත්තිං තස්ස පස්සතෙ**
ගුථාදී සාව ගුථසමිං හොති මානෙන මඤ්ඤනා.

41. **අත්තා අත්තනියෙ වෙති පස්සතෙ නං අබුධිතෙ**
ආදාසෙ විය මන්දස්ස දිඨියා හොති මඤ්ඤනා.

38. මේ සත්කාය තෙම පිළිකුල් කවයුතු වූයේ බිඳෙනසුලු වූයේ දුක් වූයේ පරිනායකයෙකු රහිත වූයේ ද වෙයි, එය විරුඬ වශයෙන් ගන්නා වූ බාලතෙම මඤ්ඤනාවන් වඩයි.

39. පඤ්චුපාදානස්කන්ධය ශුභ වශයෙන් ද සුඛ වශයෙන් ද දක්නහුට ගින්නෙහි පළහැටියාට මෙන් තෘෂ්ණාමඤ්ඤනාව වෙයි.

40. සත්කායයෙහි නිත්‍යය යන සංඥව ඵලවා ඒ සත්කායයාගේ සම්පත්තිය දක්නහුට මලබුදිනසුලු ශුනකයෙක් ගුථයෙහි මෙන් මාන මඤ්ඤනාව වෙයි.

41. ඒ සත්කාය තමා යයි ද තමාඅයත් යයි ද දක්නා වූ නුවණ්ඳ පෘථජ්ජනයාහට කැඩපතෙහි (සිය පිළිබිඹුව දැක කැඩපත හිමියා යයි සිතන) අඥානයෙකුට මෙන් දෘෂ්ටිමඤ්ඤනාව වෙයි.

---

38. **අයං**= මේ පඤ්චුපාදානස්කන්ධය තෙම; **ජේගුවෙජ්ජා**= පිළිකුල් කව යුතු වූයේ ද; **භිදුරෙ ච**= කෙණෙහි කෙණෙහි බිඳෙනසුලු වූයේ ද; **දුක්ඛෙඛා**= දුක් වූයේ ද; **අපරිණායකෙඛා**= පරිනායකයෙකු රහිත වූයේ දවෙයි; **නං**= එය; **පවවනිකතනෙ**= (අනිත්‍යතාදි සවභාවයට) විරුඬ වශයෙන්; **ගණ්හං**= ගන්නා වූ; **බාලෙ**= බාල තෙමේ; **මඤ්ඤනා**= මඤ්ඤනාවන්; **වඩ්ඪති**= වඩයි.

39. **සක්කායං**= පඤ්චුපාදානස්කන්ධය; **සුභතෙ**= ශුභ වශයෙන් ද; **සුඛතෙ චෙව**= සුඛ වශයෙන් ද; **අනුපස්සතෙ**= බලන්නහුට; **අගහිමහි**= ගින්නෙහි; **සලභසෙසෙව**= පළහැටියාට මෙන්; **තණ්හාය**= තෘෂ්ණාවෙන්; **මඤ්ඤනා හොති**- මඤ්ඤනාව වෙයි.

40. **නිවවසඤ්ඤං**= (සත්කායයෙහි) නිත්‍ය සංඥව; **අධිඨාය**= ඵලවා; **තස්ස**= ඒ සත්කායයාගේ; **සම්පත්තිං**= සම්පත්තිය; **පස්සතෙ**= දක්නහුට; **ගුථාදී**= මලබුදිනසුලු වූ; **සා**= ශුනකයෙක්; **ගුථසමිං ඉව**= ගූථයෙහිමෙන්; **මානෙන**= මානයෙන්; **මඤ්ඤනා හොති**= මඤ්ඤනාවවෙයි

41. **නං**= ඒ සත්කායය; **අත්තා**= ආත්ම යයි ද; **අත්තනියෙ වෙති**= ආත්මායත්ත යයි ද; **පස්සතෙ**= දක්නාවූ; **අබුධිතෙ**= බුද්ධිරහිතයහට; **ආදාසෙ**= කැඩපතෙහි; **මන්දස්ස විය**= බාලයෙකුට මෙන්; **දිඨියා**= දෘෂ්ටියෙන්; **මඤ්ඤනා හොති**= මඤ්ඤනාව වෙයි.

42. මඤ්ඤනාති ච නාමෙතං සුඛුමං මාරබන්ධනං
සිලිටං දුප්පමුඤ්චඤ්ච යෙන බද්ධෝ පුථුජ්ජනෝ.

43. බහුං විපඤ්ඤමානොපි සක්කායං නාති වත්තති
සමුසසිනං දළහ ථම්භං සාව ගඳුලබන්ධනෝ.

44. සෙසෝ සක්කාය මලීනෝ ජාතියා ච ජරාය ච
රොගාදිහි ච දුක්ඛෙහි නිච්චං හඤ්ඤති බාලිසෝ.

45. තං වෝ වදාමි භද්දං වෝ සක්කායං අනුපස්සථ
අඤාතතෝ අසුභතෝ භෙදතෝ'ථ අනත්තතෝ.

42 – 43. "මඤ්ඤනා" යන නමක් ඇත්තා වූ ද මේ සියුම් වූ මාර බන්ධනය ලිහිල් වූයේ ද නො මිදිය හැක්කේ ද වෙයි. යම් මාරබන්ධනය කින් බඳනාලද පුහුදුන් තෙමේ බොහෝ කොට සැලෙන්නේ නමුදු බලුදමින් බඳනාලද ගුනකයෙකු ඔසවනලද දැඩිවූ ටැඹක් සෙයින් සත්කායය නො ඉක්මවාද–

44. සත්කායදෘෂ්ටිය වැලඳගත්තා වූ ඒ මේ බාලතෙම ජාතිදුකින් ද ජරාදුකින් ද රොගාදි දුක්වලින් ද නිතර පෙළනු ලබයි.

45. එහෙයින් තොපට කියමි, තොපට යහපතක් වේවා, මේ පඤ්ච සංඛ්‍ය සඞ්ඛ්‍යාත සත්කායය නො සැප වශයෙන් ද අශුභ වශයෙන් ද බිඳීම් වශයෙන් ද යලි අනාත්ම වශයෙන් ද යථාභූත විදර්ශනා ප්‍රඥාසහිත වූ මාර්ගප්‍රඥාවෙන් දකිවු.

---

42 – 43. **එතං**= මේ; **ම ඤ්ඤ නා ති ච නා ම**= ම ඤ්ඤ නා යන නමක් ඇත්තාවූ ද; **සු බු මං**= සියුම් වූ; **මාරබන්ධනං**= මාරබන්ධනය; **සිලිටං**= ලිහිල් වූයේ ද; **දුප්පමුඤ්චඤ්ච**= මිදීමට දුෂ්කරවූයේ ද වෙයි; (**කෙබදු මාරබන්ධනයක්ද යත්?**) **යෙන**= යම් මා ර බ න්ධ න ය කින්; **බද්ධෝ**= බඳනාලද; **පුථුජ්ජනෝ**= පෘථග්ජන තෙම; **බහුං**= බොහෝ කොට; **විපඤ්ඤමානොපි**= වෙ සෙ සින් සැලෙන්නේ නමුදු; **ගඳුල බන්ධනෝ**= බලුදමින් බඳනාලද; **සා**= ගුනකයෙක්; **සමුසසිනං**= ඔස වනලද; **දළහථම්භං**= දැඩිවූ ටැඹක් මෙන්; **සක්කායං**= සත්කාය; **නාතිවත්තති**= නො ඉක්මවාද– (එබදුවූ මාරබන්ධන යයි.)

44. **සක්කායං**= සක්කායය; **අලීනෝ**= (තෘෂ්ණාදි වශයෙන්) වැළඳගත්තා වූ; **සෝ + එසෝ බාලිසෝ**= ඒ මේ බාලතෙම; **ජාතියා ච**= ජාති දුකින් ද; **ජරාය ච**= ජරා දුකින් ද; **රොගාදිහි ච දුක්ඛෙහි**= රෝ ගාදි දුක්වලින් ද; **නිච්චං**= සියලු කල්හි; **හඤ්ඤති**= පීඩා කරනු ලබයි.

45. **තං**= එසේ හෙයින්; **වෝ**= තොපට; **වදාමි**= කියමි; **වෝ**= තොපට; **භද්දං**= කල්‍යාණයෙක් වේවා; **සක්කායං**= සක්කායය; **අඤා තතෝ**= නො සුව වශයෙන් ද; **අසුභතෝ**= නො සුබ වශයෙන් ද; **භෙදතෝ**= බිඳීම් වශයෙන් ද; **අථ**= නැවත; **අනත්තතෝ**= අනාත්ම වශයෙන් ද; **අනුපස්සථ**= විදර්ශනා සහිත මාර්ග ප්‍රඥාවෙන් බලවු.

46. එසො සභාවො හෙතස්ස පස්සං එවම්මං බුධො
පහාය මඤ්ඤනාසඛා සඛඛදුකඛා පමුච්චති" ති.

46. මේ තෙම මේ සත්කායයාගේ සභාවය මැයි, මේ (අසාතත්වාදි) සභාවය මෙසේ දක්නා වූ පණ්ඩිත තෙම තෘෂ්ණාදි සියලු මඤ්ඤනාවන් දුරුකොට සියලු වෘත්තදුඃඛයෙන් මිදෙන්නේය, යි,

පෘථජ්ජනයාගේ වශයෙන් සුඛාභිපත්තියක් ඇති
ප්‍රථමනයඝථා නිමි.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ පෘථිවී ආදි වස්තූන්හි සියලු සත්කාය ධර්මයන්ට මුල්වූ පෘථජ්ජනයාගේ ප්‍රවෘත්තිය දක්වා මෙවිට ඒ වස්තූන් විෂයෙහි ම ශෛක්ෂයාගේ ප්‍රවෘත්තිය දක්වනසේක් **යොපි සො භික්ඛවෙ! භික්ඛු සෙඛො** යනාදිය වදාළහ. එහි **යො** යනු උද්දෙශ වචනයි; **සො** යනු නිර්දේශ වචනයි; **"පි"** කාරය තෙම සම්පිණ්ඩනාර්ථයි; **"අයම්පි ධම්මො අනියතො"** යනාදියෙහි මෙනි; හෙද ආරම්මණ සභාගයෙන් පුද්ගලයා සම්පිණ්ඩනය කෙරෙයි; පුද්ගල සභාගයෙන් සම්පිණ්ඩනය නො කෙරෙයි, ඒ එසේ මැය- යට දෙශනාවෙහි පුද්ගලයෝ දෘෂ්ටිවිප්‍රයුක්තයෝ වෙති; මෙහි දෘෂ්ටිසම්ප්‍රයුක්තයෝ වෙති; ඔවුන්ගේ සභාගබවක් නැති; (පෘථිව්‍යාදි) ආරම්මණය වනාහි යට දැක් වූ පුද්ගලයන්ට ද හේ මය මොවුන්ට ද හේ මයයි. එහෙයින් කියනලදී- **"ආරම්මණ සභාගෙන පුග්ගලං සම්පිණ්ඩෙතීතො පුග්ගලසභාගෙන"** යි. **යොපි සො** යන මේ සියලු වචනයෙන් දැන් කියයුතු ශෛක්ෂයා දක්වනසේ කැයි දතයුතුයි.

භික්ඛවෙ භික්ඛු යන මේ කී නයමැයි. **සෙඛො** යනු **ශෛක්ෂයා.** කවර අර්ථයකින් "සෙඛ" නම් වෙද? ශෛක්ෂ ධර්මයන් ප්‍රතිලාභය කළ හෙයින් "සෙඛ" නම් වේ; මේ වදාරන ලද මැයි- **"කිත්තාවතා නු ඛො භන්තෙ! සෙඛො හොතීති? ඉධ භික්ඛවෙ! භික්ඛු සෙඛාය සම්මාදිට්ඨියා සමන්නාගතො හොති —පෙ— සෙඛෙන සම්මාසමාධිනා සමන්නාගතො හොති එත්තාවතා ඛො භික්ඛු සෙඛො හොති"** යි. තවද භික්මෙයි නුයි ද "සෙඛ" නම් වේ; මේ වදාරනලද මැයි- **"සික්ඛතීති සික්ඛතීති ඛො භික්ඛු! තස්මා සෙඛොති වුච්චති කිඤ්ච සික්ඛති අධිසීලම්පි සික්ඛති අධිචිත්තම්පි සික්ඛති අධිපඤ්ඤම්පි සික්ඛති; සික්ඛතීති සික්ඛතීති ඛො භික්ඛු තස්මා සෙඛොති + වුච්චති"** යි. යම් කල්‍යාණ පෘථජ්ජනයෙකුත් අනුලොම ප්‍රතිපදාව සම්පූර්ණීකරණ සුලු වූයේ සීලයෙන් සම්පූර්ණ වූයේ (චක්ෂුරාදි) ඉන්ද්‍රිය

---

46. **එසො**= මේ තෙම; **එතස්ස**= මේ සත්කායයාගේ; **සභාවො හි**= සභාවය මැයි; **ඉමං**= මේ සභාවය; **එවං**= මෙපරිද්දෙන්; **පස්සං**= දක්නාවූ; **බුධො**= පණ්ඩිත තෙම; **සබ්බා මඤ්ඤනා**= සියලු මඤ්ඤනාවන්; **පහාය**= දුරුකොට; **සබ්බදුක්ඛා**= සියලු සසර දුකින්; **පමුච්චතීති**= මිදේයයි.

යන්හි වසනලද දෙර ඇත්තේ හොජනයෙහි පමණ දන්නේ නිදි දුරු කිරීමෙහි යෙදුනේ පූර්වරාත්‍රි අපරරාත්‍රියෙහි බොධිපාක්ෂිය ධර්මයන්ගේ භාවනානු යොගයෙහි යෙදුනේ අද හෝ සෙට හෝ එක්තරා ශ්‍රාමණ්‍ය ඵලයකට පැමිණෙන්නෙමි' යි වාසය කෙරේද ඒ කල්‍යාණ පෘථජ්ජන තෙමේද හික්මේ නුයි සෙඛ නමැයි කියනු ලැබේ; මේ අර්හත්ත්වයෙහි වනාහි ප්‍රතිවෙධයට පැමිණියා වූ ම ශෛක්ෂ තෙමේ අදහස් කරන ලද්දේය. පෘථජ්ජන (ශෛක්ෂ) තෙමේ අදහස් නොකරන ලද්දේය.

"මානස" ශබ්දය.

නො පැමිණියා වූ අර්හත්ත්වය ඇත්තේ මොහු විසින් නුයි **අප්පත්තමානස** නම් වේ; **මානසං**= සිතුරුගය ද සිත ද රහත්බව ද කියනු ලැබේ; **"අනන්තලිකාවරෝ පාසෝ සඤ්ඤායං චරති මානසෝ"** යන මෙහි වනාහි රූගය මානස නම්; **"චිත්තං මනෝ මානසං"** යන මෙහි සිත (මානස නම්;) **"අප්පත්තමානසෝ සෙඛෝ කාලං කයිරා ජනෙසුනා"** යන මෙහි අර්හත්ත්වයයි; මෙහි ද අර්හත්ත්වය ම (මානස යි) අදහස් කරනලදී; එහෙයින් නො පැමිණි රහත්බව ඇත්තේ යයි කියනලද වෙයි. **අනුත්තරං**= යනු ශ්‍රේෂ්ඨ වූ අසදෘශ වූ යන අර්ථයි; සතර යොගයන්ගෙන් ක්ෂෙමය උපද්‍රව රහිත නුයි **යොගක්ඛෙමං** නම් වේ; (මෙයිනුදු) රහත්බව ම අදහස්කරන ලදී. **පත්ථයමානෝ** යනු ප්‍රාර්ථනා දෙකක් වෙති,

විවිධ ප්‍රාර්ථනා.

තෘෂ්ණා ප්‍රාර්ථනා ව ද ඡන්ද ප්‍රාර්ථනාව ද කියායි; **"පත්ථයමානස්ස හි ජප්පිතානි පවෙධිතං වාපි පකප්පිතෙසු"** යන මෙහි තෘෂ්ණා ප්‍රාර්ථනාවයි.

47. **"ජිනනං පාපිමතෝ සොතං විධ්‍වංසනං විනළීකනං පාමුජ්ජබහුලා හොථ ඛෙමං පත්ථෙථ භික්ඛවෝ"** යන

(මාරයාගේ ශ්‍රෝතය සිදිනලද්දේය විධ්වංසනය කරනලද්දේය පහවූ බන්ධන ඇති කරනලද්දේය; මහණෙනි! සතුටු බහුලකොට ඇත්තෝ වවු; ක්ෂෙමසංඛ්‍යාත නිර්වාණය කත්තුකම්‍යතා කුසලච්ඡන්දයෙන් ප්‍රාර්ථනා කරවු.)

මෙහි කත්තුකම්‍යතා කුසලච්ඡන්ද ප්‍රාර්ථනාවයි; මෙය මේ ("පත්ථයමානෝ"යන) මෙහි අදහස්කරන ලද්දීය; එහෙයින් **පත්ථයමානෝ**=යනු ඒ යොගක්ෂෙමය කරන්ට කැමැත්තේ පැමිණෙන්ට කැමැත්තේ ඊට කැමුනේ ඊට අවනතවූයේ ඊට ඇත්පසින් අවනත වූයේයයි දතයුතුයි. **විහරති**= අනිත් ඉරියව්පිඩාවක් අනිත් ඉරියව්වකින්සිඳ කය වැටියනොදී පවත්වයි; නොහොත් **"සබ්බෙ සඞ්ඛාරා අනිච්චාති අධිමුච්චනෙනා සඞ්ඛාරෙ විහරති"** යනාදි වූ නිර්දේශනයින් ද මෙහි අර්ථය දතයුත්තේය.

---

47. **පාපිමතෝ**= මාරයාගේ; **සොතං**= ශ්‍රෝතස; **ජිනනං**– සිදින ලද්දේය; **විධ්වංසනං**= විධ්වංසනය (=විසුරුවා හැරීම) කරනලද්දේය; **විනළීකනං**= විඝතනළ (=පහවූ බන්ධන) ඇතිකරන ලද්දේය; **භික්ඛවෝ**= මහණෙනි; **පාමුජ්ජබහුලා හොථ**= ප්‍රමුදිතභාවය බහුලකොට ඇත්තෝ වවු; **ඛෙමං**= නිර්වාණය; **පත්ථෙථ**= කත්තුකම්‍යතා කුසලච්ඡන්දයෙන් ප්‍රාර්ථනා කරවු.

පඨවිං පඨවිතො අභිජානාති= (වතුර්ධ) පෘථිවී ධාතුව පෘථිවී භාග යෙන් (නිත්‍යාත්මයක් නැතැයි) මොහොවට දැනගනියි, පෘථග්ජනයා මෙන් සම්භාරයෙන් විපරීත සංඥාවෙන් නො හඳුනයි; වැලිදු වනාහි අභිවිශිෂ්ඨඥානයෙන් දැනගනියි; **පඨවිං** යනු මේ පෘථිවී භාගය නො හරින්නේ ම ඒ පෘථිවී ධාතුව අනිත්‍ය යයි ද දුඃඛ යයි ද අනාත්ම යයි ද මෙසේ මනාකොට දැනගනී යයි කියනලද්දේ වෙයි. මෙසේත් ඒ පෘථිවිය අභිඥානය කොට පෘථිවී ධාතුව (පෘථග්ජනයා මෙන් දෘෂ්ටිවශයෙන්) නො සිතන්නේ වෙයි; (මෙයින්) කුමක් කියනලද්දේ වේද යත්? සිතනුයි "මඤ්ඤදී" නම් වෙයි, මේ තෙම වනාහි සිතන්නේ යයි ද නො සිතන්නේ යයි ද නො කියයුත්තේ යයි; ඒ එසේමැය- මේ අර්ථයෙහි මේ පදය හෙලා කියනලද්දේ යයි දතයුතුයි. මෙහි අභිප්‍රාය කිමෙක්ද? යන (චොදනාවෙහිලා පරිහාර) කියනුලැබේ. පෘථග්ජන තෙමේ වූකලි සියලු මඤ්ඤනාවන් ප්‍රහීණ නො කළ බැවින් **මඤ්ඤතීති** යනු වදරන ලද්දේය; **ක්ෂීණාශ්‍රව** තෙම ප්‍රහීණ කළ බැවින් **න මඤ්ඤතීති** යනු (වදරන ලද්දේය;) ශෛක්ෂයාගේ වනාහි දෘෂ්ටිමඤ්ඤනා තොමෝ ප්‍රහීණ වූවාය, අන්‍යයෝ තුනීබවට ගියාහුය, එහෙයින් හෙතෙම පෘථග්ජනයා මෙන් "සිතයි" කියාද නො කියයුත්තේය; ක්ෂීණාශ්‍රවයා මෙන් "නො සිතයි" කියාද නො කියයුත්තේය; යනුයි.

පරිඤ්ඤෙය්‍යං නාසස යනු ශෛක්ෂයා විසින් ඒ මඤ්ඤනා වසතුව බැසගත් මාඝීනියාමය ඇති හෙයින් ද සම්බෝධිය පිහිටකොට ඇති බැවින් ද ත්‍රිවිධ පරිඥාවන්ගෙන් පිරිසිඳ දත්බව යනාවීයි; පෘථග්ජනයා විසින් මෙන් පිරිසිඳ නො දත්බව ද පිරිසිඳ නො දන්නාලද ද නො වෙයි; ක්ෂීණාශ්‍රවයා විසින් මෙන් නො ද පිරිසිඳ දන්නා ලද්දේ වෙයි. **සෙස්ස** සියලු තැන්හි කී නයමැයි.

ශෛක්ෂයාගේ වශයෙන් විනිශ්චයකථා නිමි.

මෙසේ පෘථිවී ආදී වස්තූන් විෂයෙහි ශෛක්ෂයාගේ ප්‍රවෘත්තිය දක්වා මේ ප්‍රාප්තාවසරයෙහි ක්ෂීණාශ්‍රවයාගේ පැවැත්ම දක්වන්සේක් **යොපි සො භික්ඛවෙ! භික්ඛු අරහං** යනාදිය වදළහ.

එෂි යොපි යනු සම්පිණ්ඩනාර්ථයි; මෙහි උභයසභාගත්වය ද ලැබෙයි; ඒ එසේ මැයි- ශෛක්ෂතෙමේ ආර්‍යපුද්ගල බැවින් ක්ෂීණාශ්‍රවයා හා සභාග වෙයි; එහෙයින් පුද්ගලයන්ගේ සමානබව ලැබෙයි, ආරම්මණ සභාගත්වය කී නයමැයි. **අරහං** යනු වෙන්වූ කෙලෙස් ඇත්තේ දුරුවූ කෙලෙස් ඇත්තේ පහවූ කෙලෙස් ඇත්තේ යන අර්ථයි; මේ වදරන ලද මැයි භාග්‍යවත්හු විසින්- **"කථඤ්ච භික්ඛවෙ! භික්ඛු අරහං හොති? ආරකාසස හොනති පාපකා අකුසලා ධම්මා සංකිලෙසිකා පොනොභවිකා සදරා දුක්ඛවිපාකා ආයති ජාතිජරාමරණියා එවං ඛො භික්ඛවෙ! භික්ඛු අරහං හොති"** යි. (=මහණෙනි! කෙසේ නම්

මහණ තෙමේ අහිත් වේද? ඔහුගේ සංකෙලෙසික වූ පුනර්භවය ඇති කරන්නා වූ දුක්සහිත වූ දුඃඛවිපාක වූ මත්තෙහි ජාති ජරා මරණ පිණිස පවත්නා වූ ලාමක අකුශල ධර්මයෝ දුරුවූවාහු වෙත් ද; මහණෙනි! මෙසේ වනාහි මහණ තෙමේ අහිත් නම් වෙයි.) කියායි. **ඛීණාසවො** යනු ආශ්‍රවයෝ සතරදෙනෙක් වෙති, කාමාශ්‍රවය —පෙ— අවිද්‍යාශ්‍රවය (යන මොහුයි) රහත්හු විසින් මේ සතර ආශ්‍රවයෝ ක්ෂයකරන ලද්දාහුය ප්‍රතිණකරන ලද්දාහුය සමූලයෙන් සිඳින ලද්දාහුය පියන ලද්දාහුය උතුප තනියට අභව්‍යකරන ලද්දාහුය ඥානග්නින්නෙන් දවන ලද්දාහුය; එහෙයින් ක්ෂීණාශ්‍රව යයි කියනු ලැබේ. **වුසිතවා**= ගුරුසංවාසයෙහි ද ආර්‍ය්‍ය මාර්ගයෙහි ද දශවිධ ආර්‍ය්‍යවාසයන්හි ද විසි හාත්පසින් විසි වැසනිමවන ලද්දේ හාත්පසින් වැසනිමවන ලද්දේය. හෙතෙම වැසනිමවනලද (ගුරුසංවාසාදි) වාස ඇත්තේ පුරුදුකළ චරණඇත්තේ නුයි **වුසිතවා** නම් වේ; **කතකරණීයො**- කල්‍යාණ පෘථජ්ජනයා පටන් සප්තශෛක්ෂයෝ සතරමඟින් කළයුතු කෙරෙත් නම් වේ; ක්ෂීණාශ්‍රවයා විසින් සියලු කළයුතු කරන ලද්දාහුය අවසන්කරන ලද්දාහුය ඕහට මත්තෙහි දුකඛකඛය සඞඛ්‍යාත අහිත්ඵලය පිණිස කළයුතු නැති, එහෙයින් **කතකරණීය** නම් වේ; මේ වදාරනලදමැයි-

48. **"කතස්ස සම්මාවිමුත්තතස්ස සතතචිත්තතස්ස භික්ඛුනො**
කතස්ස පතිවයො නත්ථි කරණීයං න විජ්ජති" යි.

ඔහිතභාරෙ යන (මෙහි) **භාර** යනු සඤ්ඣාරයැ කෙලෙශභාර යැ අභිසංඛාරභාර යැයි භාරයෝ තිදෙනෙක් වෙති; ඒ ක්ෂීණාශ්‍රවයා විසින් මේ ත්‍රිවිධභාරයෝ හරිනලද්දාහුය, බහා තබනලද්දාහුය, බැහැර කරන ලද්දාහුය; හෙලන ලද්දාහුය, එහෙයින් **ඔහිතභාර** යයි කියනු ලැබේ; **අනුප්පත්තසදත්ථො** යනු අනුප්‍රාප්ත වූ (=පැමිණෙනලද) සදර්ථය සර්වාර්ථය ඇත්තේ යයි කියනලද වෙයි; (සදත්ථො යන තැන්හි) සකාර යට මේ දකාරය කරන ලද්දේය; "සදත්ථ" යි ද අහිත්වචය දතයුතුයි; ඒ අහිත්වචය ම තමා කෙරෙහි උපනිබන්ධනාර්ථයෙන් ද තමා නො හරින අර්ථයෙන් ද තමාගේ උත්තමාර්ථය යන අර්ථයෙන් ද තමාගේ අර්ථයබැවින් **සත්ථ** යයි කියනු ලැබේ; **පරික්ඛීණභවසංයොජනො= සංයොජනානි** යි කාමරාග සංයොජනය පටිඝ —පෙ— මාන- දිට්ඨි- විචිකිච්ඡා- සීලබ්බතපරාමාස- භවරාග- ඉස්සා- මච්ඡරිය සංයොජනය අවිජ්ජා සංයොජනයයි සංයොජන දසයක් වෙති, මොහු වනාහි සත්‍යයන් භවයන්හි සංයොජනය කෙරෙත්, භවය හෝ ළං කොට බන්ධනය කෙරෙත්, භවය

---

48. **සම්මා විමුත්තතස්ස**= මනාකොට කෙලෙසුන් කෙරෙන් මිදුනා වූ; **සතතචිත්තතස්ස**= (එහෙයින් ම) සන්සිඳුනු සිත් ඇති; **තස්ස භික්ඛුනො**= ඒ භික්ෂුහට; **කතස්ස**= කරන ලද්දාහුගේ; **පතිවයො**= නැවත රැස්කිරීමක්; **නත්ථි**= නැත; **කරණීයං**= සිව්මගින් කටයුතු; **න විජ්ජති**= විද්‍යමාන නො වේ.

සමග සංයොග කෙරෙත් නුයි, එහෙයින් භවසංයොජනයෝ යයි කියනු ලැබෙති, මේ භවසංයොජනයෝ රහත්හු විසින් ක්ෂය කරන ලද්දාහුය, ප්‍රහීණ කරන ලද්දාහුය, නැණහින්නෙන් දවනලද්දාහුය, එහෙයින් **පරික්ඛීණභවසංයොජනෝ** යි කියනු ලැබේ.

සම්මදඤ්ඤාවිමුත්තෙනා යන මෙහි **සම්මදඤ්ඤා**= මොනොවට දැන; (මෙයින්) කුමක් කියනලද වේද යත්? සක්කායන්ගේ රාශ්‍යර්ථය ආයතනයන්ගේ ආයතනාර්ථය ධාතූන්ගේ ධාත්වර්ථය දුඃඛසත්‍යයාගේ පීඩනාර්ථය සමුදයසත්‍යයාගේ ප්‍රභවාර්ථය නිරොධසත්‍යයාගේ ශාන්තාර්ථය මාර්ග සත්‍යයාගේ දර්ශනාර්ථය, සියලු සංඝස්කාරයෝ අනිත්‍යයෝය යන මේ ආදි හෙදය හෝ මනාකොට තත්වූ පරිද්දෙන් අවබොධකොට දැන තීරණය කොට තුලනය කොට විභාවනය කොට විභූත කොට (යන අර්ථයි.) **විමුත්තෙනා** යනු විමුක්ති දෙකක් වෙති; චිත්තයාගේ විමුක්තිය ද නිර්‍වාණය ද කියාසි; රහත්තෙම සියලු කෙලෙසුන් කෙරෙන් මිදුනු සිත් ඇති බැවින් චිත්තවිමුක්තියෙන් ද මිදුනේය, නිර්‍වාණයෙහි ඇලුනු බැවින් නිර්‍වාණයෙහි ද විමුක්තය එහෙයින් **සුසම්මදඤ්ඤා විමුත්තෙනා** යි කියනු ලැබේ.

පරික්ඛයානං නාසා= රහත්හු විසින් ඒ ඤාණනා වසතුව ත්‍රිවිධපරිඥාවන්ගෙන් පිරිසිඳ දන්නාලද්දේය; එහෙයින් ඒ ක්ෂීණාශ්‍රව තෙමේ ඒ (ඵස්සාදි) වසතුව (තෘෂ්ණාදි වශයෙන්) නො සිතයි, ඒ (තෘෂ්ණාදිවූ) ඤාණනාව නො සිතා යයි කියනලද වෙයි; සෙස්ස කී නයමැයි.

නිර්‍වාණවාරයෙහි වනාහි **ඛයා රාගස්ස** යනාදි වාරත්‍රයක් වදුරනලද්දාහුය; මේ පරික්ඛයවාරයත් නිර්‍වාණවාරයෙහි ද විසතරකළ යුත්තේය; විසතර කරන්නහු විසින් ද **පරික්ඛයානං නාසා** යනු සියලු පදයන් සමග යොදා නැවත **ඛයා රාගස්ස විනරාගත්තා** යනු යෙදිය යුතුයි; සෙස්සෙහිදු මේ ක්‍රමයයි. දෙශනාව වනාහි එක්තැනෙක කියනලද්ද සියලු තැන්හි කියනලද්දේ ම වේයයි සංක්ෂෙපකරන ලද්දීය.

ඛයා රාගස්ස විනරාගත්තා යන මෙහි ද යම්හෙයකින් ශාසනයෙන් බාහිර වූ කාමයන්හි වීතරාගී තෙමේ රාගයාගේ ක්ෂයකිරීමෙන් වීතරාග නො වූයේ ද; රහත්හු වනාහි රාගක්ෂය කිරීමෙන් ම වීතරාග වූහු ද; එහෙයින් වදුරනලදී **ඛයා රාගස්ස විනරාගත්තා** යි. දෙස මොහයන්හි ද මේ ක්‍රම යයි. යම් පරිද්දෙකින් **පරික්ඛයානං නාසාති වදුමි** යී කීකල්හි ද පිරිසිඳ දන්හෙයින් හෙතෙම ඒ (ඵස්සාදි) වසතුව හෝ (තෘෂ්ණාදි) ඒ ඤාණනාව හෝ නො සිතයි යන අර්ථය වේද; එපරිද්දෙන් මෙහි ද පහවූ රාග ඇතිබැවින් ඒ ක්ෂීණාශ්‍රව තෙම ඒ වසතුව හෝ ඒ ඤාණනාව හෝ නො සිතා යයි දතයුතුයි.

මෙහි **දිට්ඨසුතමුතං නාසස** යන මේ වාරය තෙම මාඝීභාවනාවගේ සම්පූර්ණත්වය දැක්වීම පිණිස වදාරන ලද්දේය අන්‍යවාරයෝ ඵලපසක් කිරීම පිළිබඳ සම්පූර්ණත්වය දැක්වීම පිණිස වදාරන ලද්දාහු යයි දතයුත්තාහුය. නොහොත් කරුණු දෙකකින් රහතුන් වහන්සේ (තෘෂ්ණාදි වශයෙන්) නොසිතයි, (පෘථිව්‍යාදි) වස්තුව පිරිසිඳ දත්හෙයින් ද අකුශල මූලයන් මුල්සුන්කළ බැවින් ද (යන කරුණු දෙකිනි;) එහෙයින් පරිසුසුතවාරයෙන් ඔහුගේ වස්තුපරිඥනය දක්වයි, සෙසු වාරයන්ගෙන් අකුසල්මුල් සිඳීම දක්වා යයි; ඒ වාරයන් අතුරෙන් පශ්චිමවාරත්‍රයෙහි මේ වෙසෙස දතයුතුයි.

යම්හෙයකින් දෙෂත්‍රය අතුරෙන් රාගයෙහි ආදීනව දැක දැක අනුව බලමින් වාසය කරන්නේ අප්‍රණිහිත විමොක්ෂයෙන් (කෙලෙසුන් කෙරෙන්) මිදුනේ රාගයාගේ ක්ෂයකිරීමෙන් වීතරාග වේද; ෙෂයෙහි ආදීනව දැක අනිත්‍යානුදර්ශීව වාසයකරන්නේ අනිමිත්තවිමොක්ෂයෙන් විමුක්ත වූයේ ෙෂයාගේ ක්ෂයකිරීමෙන් වීතදෙෂ වේද; මොහයෙහි ආදීනව දැක අනාත්මානුදර්ශීව වාසයකරන්නේ ශූන්‍යත විමොක්ෂයෙන් විමුක්ත වූයේ මොහයාගේ ක්ෂයකිරීමෙන් වීතමොහ වේද; මෙසේ ඇති කල එකෙක් විමොක්ෂත්‍රයෙන් නො මිදෙයි නොයි වාරවයක් කියයුත්තාහු නො වෙත්ද? නො කියයුතු වෙත්; කුමක් හෙයින යත්? නියම නො කළ හෙයිනි; ඒ සැබව- **යොපි සෝ භික්ඛවෙ! අරහං** යි අනියම යෙන් කියනලදී; අප්‍රණිහිත විමොක්ෂයෙන් විමුක්ත යයි හෝ අන්‍ය විමොක්ෂයකින් විමුක්ත යයි හෝ නො කියනලදද; එහෙයින් යමක් රහත්හට යෙදේද ඒ සියල්ල කියයුතු ම යයි; අවිශෙෂයෙන් හෝ යම් කිසිවෙක් රහත් වූයේ ම රාගාදීන්ගේ ක්ෂයකිරීමෙහි විපරිණාම දුඃඛය පිරිසිඳ දත්හෙයින් රාගයාගේ ක්ෂයකිරීමෙන් වීතරාග යයි කියනු ලැබේද; දුඃඛ දුඃඛය පිරිසිඳ දත්හෙයින් ෙෂයාගේ ක්ෂයකිරීමෙන් වීතදෙස යයි ද; සංඝකාර දුඃඛය පිරිසිඳ දත්හෙයින් මොහයාගේ ක්ෂයකිරීමෙන් වීතමොහ යයි කියනු ලැබේද නොහොත් ඉෂ්ටාරම්මණය පරිඥත හෙයින් රාගක්ෂය කිරීමෙන් වීතරාග යිද; අනිෂ්ටාරම්මණය පරිඥත හෙයින් ෙෂක්ෂයකිරීමෙන් වීතදෙස යිද; මධ්‍යස්ථාරම්මණය පරිඥත බැවින් මොහක්ෂය කිරීමෙන් වීතමොහ යිද; නොහොත් සුඛවෙදනා වෙහි රාගානුසය සමුච්ඡේදකළ හෙයින් රාගයාගේ ක්ෂයකිරීමෙන් වීතරාග යිද; ඉතර වෙදනාවන්හි ප්‍රතිඝ මොහානුසයයන්ගේ සමුච්ඡේදය කළබැවින් වීතදෙස වීතමොහ යයි ද, යම්හෙයකින් කියනු ලැබේද, එහෙයින් ඒ විශෙෂය දක්වනසේක් **ඛයා රාගස්ස විතරාගත්තා- විත දෙසත්තා- විතමොහත්තා** යි වදාළහ.

කණ්ණාත්‍රවයාගේ වශයෙන් තෘතීය වතුර්ථ පඤ්චම ෂෂ්ඨනය කථා නිමි.

මෙසේ පෘථිව්‍යාදි වස්තූන් විෂයෙහි ක්ෂීණාශ්‍රවයාගේ ප්‍රවෘත්තිය දක්වා මෙවිට තමන් වහන්සේගේ ප්‍රවෘත්තිය දක්වනසේක් **තථාගතෝ පි භික්ඛවෙ!** යනාදිය වදාළහ.

"තථාගත" ශබ්දය.

එහි **තථාගතෝ** යනු අවකරුණකින් භාග්‍යවතුන් වහන්සේ තථාගත නම් වනසේක. තථා ආගත (=එපරිද්දෙන් ආයේ) නුසි තථාගත නම් වූහ; තථා ගත (=එපරිද්දෙන් ගියේ) නුසි තථාගත නම් වූහ; තථ ලක්ෂණයට (=ඥනගතියෙන්) පැමිණියේ නුසි තථාගත නම් වූහ; (චතුරාර්‍යසත්‍ය සඞ්ඛ්‍යාත) තථධර්මයන් තත්වූ පරිද්දෙන් අභිසම්බුද්ධ නුසි තථාගත නම්වූහ; තථදර්ශීභාවයෙන් තථා ගත නම්වූහ; තථවාදී බැවින් තථාගත නම්වූහ; තථකාරී බැවින් තථාගත නම්වූහ; අභිභවනාර්‍යයෙන් තථාගත නම් වූහසි. කෙසේ භාග්‍යවතුන් වහන්සේ තථා ආගත නුසි තථාගත නම් වූහ යත්? යම්සේ සියලු ලොවට හිත පිණිස උත්සාහයට පැමිණි පූර්‍ව සම්‍යක් සම්බුද්ධයෝ ආවාහුද; යම්සේ විදර්ශී භාග්‍යවතුන් වහන්සේ ආසේක් ද, යම්සේ සිඛීභාග්‍යවතුන් වහන්සේ- යම්සේ වෙස්සභූ භාග්‍යවතුන් වහන්සේ- යම්සේ කකුසඞ්ඛ භාග්‍යවතුන් වහන්සේ- යම්සේ කෝණාගමන භාග්‍යවතුන් වහන්සේ- යම්සේ කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ ආසේක් ද; (එපරිද්දෙනි. මෙයින්) කුමක් කියනලද්දේ වේද යත්? මේ භාග්‍යවතුන් වහන්සේ (මනුෂ්‍ය භවාදි අෂ්ටාඞ්ගසමුපෙත) යම් අභිනීහාරයකින් ආවාහු ද ඒ අභිනීහාරයෙන් ම අපගේ භාග්‍යවත්හුද ආවාහුය; නොහොත් යම්සේ විදර්ශී භාග්‍යවතුන් වහන්සේ —පෙ— යම්සේ කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ දානපාරමිතාව පුරා ශීල = නෛෂ්කාම්‍ය - ප්‍රඥා - වීර්‍ය්‍ය - ක්ෂාන්ති - සත්‍ය- අධිෂ්ඨාන- මෛත්‍රී- උපෙක්ෂාපාරමිතාව පුරා මේ දශපාරමිතාවන් ද දශ උපපාරමිතාවන් ද දශපරමාර්‍ථ පාරමිතාවන් ද යන සමතිස් පැරුම් පුරා අඞ්ගපරිත්‍යාගය නයන- ධන- රාජ්‍ය- පුත්‍රදාර පරිත්‍යාගය මේ පඤ්ච මහා පරිත්‍යාගයන් පරිත්‍යාග කොට (ගතපච්චාගතික වත්තසඞ්ඛ්‍යාත පූර්‍වභාග ප්‍රතිපදාව සමග අභිඥසමාපත්ති නිෂ්පාදන යයි කියනලද) පූර්‍ව යොගය (ධ්‍යානාදියෙහි ම සාතිශය ප්‍රතිපත්ති නිෂ්පාදන යයි කියනලද) පූර්‍වචර්‍යාවය ධර්මකථාවය (නැයන්ට වැඩ පිණිස හැසිරීම යයි කියනලද) ඥාතාර්‍ථචර්‍යාවය යනාදිය පූරණය කොට බුද්ධචර්‍යාවගේ කෙළවරට පැමිණ ආසේක්ද එපරිද්දෙන් අපගේ භාග්‍යවතුන් වහන්සේද ආසේක; යලිදු යම්සේ විදර්ශී භාග්‍යවතුන් වහන්සේ —පෙ— කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ සතර සතිපට්ඨානයන් ද සතර සම්‍යක් ප්‍රධානයන් ද සතර ඍර්ධිපාදයන් ද පඤ්චේන්ද්‍රියයන් ද පඤ්චබලයන් ද සප්තබොධ්‍යඞ්ගයන් ද ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය ද උපදවා වඩා ආසේක් ද එපරිද්දෙන් අපගේ භාග්‍යවතුන් වහන්සේ ද ආසේක; මෙසේ "තථා ආගත" නුසි තථාගත නම් වනසේක.

49. "යථේව ලොකමහි විපස්සිආදයෝ
සබ්බඤ්ඤුභාවං මුනයෝ ඉධාගතා
තථා අයං සක්‍යමුනිපි ආගතෝ
තථාගතෝ වුච්චති තේන චක්ඛුමා" ති.

(යම්සේ මේ ලොකයෙහි විදර්ශිආදි වූ බුදුවරයෝ සර්ව්ඥබවට පැමිණියාහු ද එපරිද්දෙන් මේ ශාක්‍යමුනීන්ද්‍රයන් වහන්සේ ද බුදුබවට පැමිණියේක; එහෙයින් චක්ෂුමත්වූ (ගෞතම සර්ව්ඥයන් වහන්සේ) තථාගත නම්වූසේක.)

මෙසේ එපරිද්දෙන් (ඥානගතියෙන්) ආයේනුයි තථාගත නම්වූසේක. කෙසේ තථා ගත (=එසේ ගියේ) නුයි තථාගත නම් වූහ යත්? යම්සේ උපන් ක්‍ෂණය ඇති (= මව්කුසින් නික්මුනු ඇසිල්ල ක්ඇත්තේ) විදර්ශි භාග්‍යවතුන් වහන්සේ ගියසේක්ද —පෙ— කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ ගියසේක්ද; උන්වහන්සේ කෙසේ ගියසේක්ද යත්? මෙසේ දතයුතු– ඒ කාශ්‍යප මුනීන්ද්‍රයන් වහන්සේ උපන් ඇසිල්ලක් ඇත්තාහු ම සම්පාදයෙන් පෘථිවියෙහි පිහිටා උතුරුදෙසට අභිමුඛවූවාහු සත් පියවරක් ගියසේක. වදාළේමැනු— **"සම්පතිජාතෝ ආනන්ද! බෝධිසත්තෝ සමේහි පාදේහි පතිට්ඨහිත්වා උත්තරෙනාමුඛෝ සත්ත පදවීති හාරෙ ගච්ඡති සෙතම්හි ඡත්තෙ අනුධාරියමානෙ සබ්බා ච දිසා අනුවිලොකෙති ආසභිඤ්ච වාචං භාසති අග්ගොහමස්මි ලොකස්ස ජේට්ඨොහමස්මි ලොකස්ස සෙට්ඨොහමස්මි ලොකස්ස අයමන්තිමා ජාති නත්ථි දානි පුනබ්භවෝ"** ති. (=ආනන්දය! එකෙණෙහි උපන් බෝසත් තෙමේ සම්පයින් (පොළොවෙහි) පිහිටා උතුරු දෙසට අභිමුඛවූයේ දිව්‍යමය සේසත් ධරන ලබන කල්හි සත්පියවරක් යෙහි, දසදිගුන් ද අනුවිලොකනය කෙරෙයි, අසීතවචන ද කියයි, මම ලොවට පළමුවැනි වෙමි මම ලොවට දෙවු වෙමි මම ලොවට සෙට වෙමි මෝ අන්තිමජාතිය වන්නිය දැන් පුනර්භවය නැත්තේය.) බෝසත්හුගේ ඒ ගමන්ද නොයෙක් විශෙෂ ගුණයන්ගේ අධිගමයට පෙරනිමිති බැවින් සත්‍ය වූයේ වෙයි නිබොරු වූයේ වෙයි; සැබව ඒ බෝසත් තෙමේ උපන් ඇසිල්ලක් ඇත්තේ ම සම්පයින් පොළොවෙහි පිහිටියේය යන යමක් ඇද්ද මේ කරුණ ඔහුගේ සතරඍද්ධිපාද ප්‍රතිලාභයට පෙරනිමිති වෙයි; උත්තරාභිමුඛ භාවය වනාහි සර්ව්ලොකොත්තම භාවයට (= සියලු ලොවට උතුම්බවට) පෙරනිමිති වෙයි; සප්තපදවීතිහාරයෝ සප්තබොධ්‍යඞ්ග රත්නයන්ගේ ප්‍රතිලාභයට පෙරනිමිති වෙයි; **"සුවණ්ණදණ්ඩා වීතිපතන්ති චාමරා"**

---

49. **යථේව**= යම් පරිද්දෙකින්; **ඉධ ලොකමහි**= මෙලෙව්හි; **විපස්සිආදයෝ**= විදර්ශි ආදී වූ; **මුනයෝ**= සර්ව්ඥමුනීහු; **සබ්බඤ්ඤුභාවං**= සර්ව්ඥබවට; **ආගතා**= පැමිණියාහුද; **තථා**= එපරිද්දෙන්; **අයං සක්‍ය මුනිපි**= මේ ශාක්‍යමුනීන්ද්‍ර තෙමේ ද; **ආගතෝ**= සර්ව්ඥබවට පැමිණියේය; **තේන**= එකරුණෙන්; **චක්ඛුමා**= පසැස් ඇති සර්ව්ඥ තෙම; **තථාගතෝ වුච්චති**= තථාගත යයි කියනුලැබේ.

යන මෙහි කියනලද වාමර එසවීම වනාහි සියලු තීර්ථකයන්ගේ නිමිථ්‍ය නයට පෙරනිමිති වෙයි; සේසත් ඛැරීම අර්හත්ඵල විමුක්ති නැමැති උත්තම නිමිල ශ්වෙතවජ්‍රයාගේ ප්‍රතිලාභයට පෙරනිමිති වෙයි; සියලු දිශාව ලොකන්‍ය සර්ව්‍වඥතාඥාන අනාවරණ ඥානයන්ගේ ප්‍රතිලාභයට පෙරනිමිති වෙයි; ශ්‍රේෂ්ඨවචන භාෂණය අප්‍රතිවත්තියවරධම්මචක්‍රයාගේ ප්‍රවර්ත්තනයට පූර්වනිමිති වෙයි; එපරිද්දෙන් මේ භාග්‍යවත්හු ද ගියහ; උන්වහන්සේගේ ඒ ගමන ද ඒ (පූර්වෝක්ත) විශෙෂාධිගමයන්ට ම පෙර නිමිති බැඳින් සත්‍ය වී නිබොරු වූයේය. එයින් කීහු පුරාණයෝ-

50. **"මුහුත්තජාතොව ගවම්පති යථා**
සමේහි පාදෙහි ඵුසි වසුන්ධරං
සොවික්කමිංසත්තපදානි ගොතමෝ
සෙතඤ්ච ජත්තං අනුධාරයුං මරූ"

51. **"ගන්ත්වාන සෝ සත්ත පදානි ගොතමෝ**
දිසා විලොකෙසි සමා සමන්තතෝ
අඞ්ගුපෙනං ගිරමබ්භුදීරයි
සීහෝ යථා පබ්බතමුද්ධනිට්ඨිතෝ" යි.

(ඒ ගෞතම බොධිසත්වයන් වහන්සේ උපන් ඇසිල්ලක් ඇත්තේ ම වෘෂභරාජයෙකු මෙන් සම්බු පතුල් යුග්මයෙන් පෘථිවිය සපඝිකාළහ. සත්පියවරක් (උතුරු දිගට) ගියහ; දෙවියෝ ශ්වෙතවජ්‍ර ධාරුහ,

(ඒ ගෞතම බොධිසත්වයන් වහන්සේ සත්පියවරක් (උතුරුදිගට) ගොස් හාත්පස සියලු දිගුන් අවලොකනය කළහ; පර්වත මස්තකයෙක්හි සිටි සිංහරාජයෙක් යම්සේ ද එමෙන් අෂවාඛහසමූපෙත උත්තම වාක්‍යය පහළ කළහ.)

මේසේ තථා ගත (=එපරිද්දෙන් ගියේ) නුසි ද තථාගත නම්හ; නොහොත් විදර්ශි භාග්‍යවතුන් වහන්සේ යම්සේ ද —පෙ— කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ යම්සේ ද එසේ ම අපගේ භාග්‍යවත්හු ද නෛෂ්ක්‍රම්‍යයෙන් කාම්චජ්‍රඳය දුරුකොට ගියහ; අව්‍යාපාදයෙන් ව්‍යාපාදය ද

---

50. **සෝ ගොතමෝ**= ඒ ගෞතම බොධිසත්ව තෙමේ; **මුහුත්ත ජාතෝ + එව**= උපන් මොහොතක් ඇත්තේ ම; **ගවම්පති යථා**= වෘෂභ රාජයෙක් මෙන්; **සමේහි පාදෙහි**= සම්බු පාදයුගමයෙන්; **වසුන්ධරං**= පෘථිවිය; **ඵුසි**= සපඝිකෙළේය; **සත්ත පදානි**= සත්පියවරක්; **වික්කමි**= ගියේය; **මරූ**= දෙවියෝ; **සෙතඤ්ච ජත්තං**= ධවලඡත්‍රයක් ද; **අනු ධාරයුං**= ධැරුහ.

51. **සෝ ගොතමෝ**= ඒ ගෞතමයන් වහන්සේ; **සත්ත පදානි**= සත්පියවරක්; **ගන්ත්වා න**= ගොස්; **ස ම න්ත තෝ**= හාත්පස; **සමා**= (විලොකන සමත්වයෙන්) සමාන වූ; **දිසා**= සියලු දිගුන්; **විලොකෙසි**= බැලූහ; **පබ්බතබ්භුධනි**= ගලතල මුදුනෙක්හි; **ඨිතෝ**= සිටියා වූ; **සීහෝ යථා**= සිංහයෙක් මෙන්; **අඞ්ගුපෙනං**= අටගින් යුතු වූ; **ගිරං**= නෙපුල; **අබ්භුදීරයි**= ප්‍රකාශකළහ.

ආලෝක සංඥවෙන් ඊනම්ඛනීවරණය ද අවික්ඛෙප (= සමාධි) යෙන් උඛ්ඛවකුක්කුවවනීවරණය ද (කුශලාදි) ධම්යන්ගේ යථාභූතනිශ්චයෙන් විචිකිච්ඡානීවරණය ද දුරුකොට ගියහ; ඤනයෙන් අවිද්‍යාව ප්‍රදාලණය කොට ගියහ; ප්‍රමොද්‍යයෙන් අරතිය (=අධිකුශලයෙහි නො ඇල්ම) දුරු කොට ප්‍රථමධ්‍යානයෙන් නීවරණ නමැති කවුළුවහැර චිතියධ්‍යානයෙන් විතක්කවිචාර නමැති ධූමය සංසිදුවා තෘතීය ධ්‍යානයෙන් ප්‍රීතිය දුරුකොට චතුර්ථ ධ්‍යානයෙන් සුවදුක් දුරුකොට ආකාසානඤ්චායතන සමාපත්ති යෙන් රූපසංඥ ප්‍රතිඝසංඥ නානාත්ව සංඥවන් ඉක්මවා විඤඤානඤ්චා යතන සමාපත්තියෙන් ආකාසානඤ්චායතන සංඥව ද ආකිඤඤඤඤා යතන සමාපත්තියෙන් විඤඤානඤ්චායතන සංඥව ද නෙවසඤඤා නා සඤඤායතන සමාපත්තියෙන් ආකිඤඤඤඤායතන සංඥව ද ඉක්මවා ගියහ; අනිත්‍යානු දර්ශනයෙන් නිත්‍ය සංඥව දුරුකොට දුඃඛානු දර්ශන යෙන් සුඛසංඥව ද අනාත්මානු දර්ශනයෙන් ආත්මසංඥව ද නිබ්බිදානු පස්සනාවෙන් සප්‍රීතික තෘෂ්ණාව ද විරාගානු පස්සනාවෙන් රාගය ද නිරොධානු පස්සනාවෙන් සමුදය ද පටිනිස්සග්ගානු පස්සනාවෙන් නිත්‍යාදි වශයෙන් ගැනීම ද ඛයානු පස්සනාවෙන් (සන්තති සමූහ කෘත්‍යාරම්මණයන්ගේ වශයෙන් එකත්වග්‍රහණ යයි කියනලද) ඝනසංඥව ද ව්‍යයානු පස්සනාවෙන් ආයූහනය (= කර්මයන්ගේ රැස්කිරීම) ද විපරිණාමානුපස්සනාවෙන් ස්ථිරභාවග්‍රහණ සංඥව ද අනිමිත්තානුපස්ස නාවෙන් නිමිත්තසංඥව් ද අප්‍රණිහිතානුපස්සනාවෙන් රාගාදි ප්‍රණිධිය ද ශූන්‍යතානු පස්සනාවෙන් අභිනිවේශ යයි කියනලද ආත්මානු දෘෂ්ටිය ද (අනිත්‍ය දුඃඛාදි වශයෙන් සියලු ධම්යන්ගේ තීරණ යයි කියනලද) අධි ප්‍රඥධම්ම විදර්ශනාවෙන් (අසාරයෙහි) සාර යයි ගන්නා විපල්ලාසය ද යථා භූත ඤනදර්ශනයෙන් (ඊශ්වරාදීන්ගේ වශයෙන් ලෝවැසි තෙමේ උපන් නේය යන) සම්මොහාභිනිවේශය ද ආදීනවානු පස්සනාවෙන් (සංස්කාර යන් විෂයෙහි ලෙණත්‍රාණභාවයෙන් ගැනීම යයි කියනලද) ආලයාභිනි වේශය ද පටිසඞ්ඛානු පස්සනාවෙන් අප්‍රතිසඞ්ඛාව ද විවට්ටානුපස්සනා වෙන් සංයෝගාභිනිවේශය ද (ප්‍රහාණය කොට) ශ්‍රෝතාපත්ති මාර්ගයෙන් දෘෂ්ටිකාම කෙලෙසයන් බිඳ සකෘදාගාමි මාර්ගයෙන් ඕළාරික කෙලෙස යන් දුරුකොට අනාගාමි මාර්ගයෙන් අනුසහගත කෙලෙසයන් සමුදඝාත නය කොට අර්හත්මාර්ගයෙන් සකල කෙලෙසයන් සමූලඝ්ඝ කොට ගියහ; මෙසේත් "තථා ගතෝ" යන අර්ථයෙන් තථාගත නම්වූසේක.

කෙසේ තථලක්ෂණයට ආගත නුයි තථාගත නම්වූහ යත්? පෘථිවී ධාතුහුගේ කර්කශත්ව ලක්ෂණය සත්‍යවෙයි, නිබොරුවෙයි; අබ්ධාතුහුගේ වැගිරීම් ලක්ෂණය –පෙ– තෙජෝධාතුහුගේ උෂ්ණත්ව ලක්ෂණය– වායෝ ධාතුහුගේ විසඨභාන (තදබැව්) ලක්ෂණය– ආකාශධාතුහුගේ අපගීරණ ලක්ෂණය– විඤ්ඤාණධාතුහුගේ විජානන ලක්ෂණය– රූපයාගේ රූපන ලක්ෂණය– වෙදනාවගේ වෙදයිත ලක්ෂණය– සංඥවගේ හැඳිනීම් ලක්ෂ ණය– සංස්කාරයන්ගේ සඞ්ඛතකිරීම් ලක්ෂණය– විඤ්ඤානයාගේ විජානන

ලක්ෂණය- විතර්කයාගේ අරමුණට නැඹීම් ලක්ෂණය- විචාරයාගේ අරමුණ පිරිමැදීම් ලක්ෂණය- ප්‍රීතියගේ පැතිරීම් ලක්ෂණය- සුඛයාගේ සාත ලක්ෂණය- චිත්තෙකාග්‍රතාවගේ අවික්ඛෙප ලක්ෂණය- සජ්ඣායාගේ සජ්ඣ ලක්ෂණය- ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ අධිමොක්ෂ ලක්ෂණය- වීර්‍යේන්ද්‍රියයාගේ දැඩි කොට ගැනීම් ලක්ෂණය- සමෘතීන්ද්‍රියයාගේ උපස්ථාන ලක්ෂණය- සමාධින්ද්‍රියයාගේ අවික්ඛෙප ලක්ෂණය- ප්‍රඥෙන්ද්‍රියයාගේ පජානන ලක්ෂණය- ශ්‍රද්ධාබලයාගේ අශ්‍රද්ධිය හෙතුවෙහි කම්පානොවීම් ලක්ෂණය- වීර්‍යබල යාගේ කුසීතබැව්හි- සමෘතිබලයාගේ සිහිමුළාබැව්හි- සමාධිබලයාගේ ඔද්ධත්‍ය හෙතුවෙහි- ප්‍රඥාබලයාගේ අවිද්‍යාව නිමිතිකොට කම්පානොවීම් ලක්ෂණය- සමෘතිසම්බොධ්‍යඞ්ගයාගේ උපස්ථාන ලක්ෂණය- ධර්මවිචය සම්බොධ්‍යඞ්ගයාගේ පවිචය ලක්ෂණය- වීර්‍යසම්බොධ්‍යඞ්ගයාගේ ප්‍රග්‍රහ ලක්ෂණය- ප්‍රීතිසම්බොධ්‍යඞ්ගයාගේ පැතිරීම් ලක්ෂණය- ප්‍රශ්‍රබ්ධි සම්බොධ්‍යඞ්ගයාගේ උපශම (කායචිත්ත පරිදාහයන්ගේ සංසිඳීම්) ලක්ෂණය- සමාධිසම්බොධ්‍යඞ්ගයාගේ අවික්ඛෙප ලක්ෂණය- උපෙක්ඛා සම්බොධ්‍යඞ්ග යාගේ මධ්‍යස්ථවීම් ලක්ෂණය- සම්‍යග්දෘෂ්ටියගේ දර්ශන ලක්ෂණය- සම්‍යක් සංකල්පයාගේ අභිනිරොපණ ලක්ෂණය- සම්‍යග්වචනයාගේ පරිග්‍රහ ලක්ෂණය- සම්‍යක්කර්මාන්තයාගේ සමුත්ථාන ලක්ෂණය- සම්‍යගාජීවයාගේ (ආජීවශුද්ධි සඞ්ඛ්‍යාත) වොදාන ලක්ෂණය- සම්‍යග් ව්‍යායාමයාගේ ප්‍රග්‍රහ ලක්ෂණය- සම්‍යක් සමෘතියගේ උපස්ථාන ලක්ෂණය- සම්‍යක් සමාධියගේ අවික්ඛෙප ලක්ෂණය- අවිද්‍යාවගේ අඥාන ලක්ෂණය- සංස්කාරයන්ගේ චෙතනා ලක්ෂණය- විඥානයාගේ විජානන ලක්ෂණය- නාමයාගේ (චතුර් ස්කන්ධයන්ට අභිමුඛව) නැමීම් ලක්ෂණය- රූපයාගේ රූපන ලක්ෂණය- ෂඩායතනයාගේ (චිත්තචෛතසිකයන් පැවැත්ම යසි කියනලද) ආයතන ලක්ෂණය- සජ්ඣායාගේ සජ්ඣකිරීම් ලක්ෂණය- වෙදනාවගේ වෙදයිත ලක්ෂණය- තෘෂ්ණාවගේ හෙතු ලක්ෂණය- උපාදානයාගේ ගැනීම් ලක්ෂණය- භවයාගේ ආයූහන ලක්ෂණය- ජාතියගේ නිර්වෘත්ති ලක්ෂණය- ජරාවගේ දිරීම් ලක්ෂණය- මරණයාගේ චුති ලක්ෂණය- ධාතූන්ගේ ශූන්‍යතා ලක්ෂණය- ආයතනයන්ගේ ආයතන ලක්ෂණය- සමෘතිප්‍රස්ථාන (-සිවවන්) යන්ගේ උපස්ථාන ලක්ෂණය- සම්‍යක් ප්‍රධානයන්ගේ පදහන ලක්ෂණය- ඍද්ධිපාදයන්ගේ ඉජ්ඣන ලක්ෂණය- ඉන්ද්‍රියයන්ගේ අධිපති ලක්ෂණය- බලයන්ගේ කම්පානොවීම් ලක්ෂණය- බොධ්‍යඞ්ගයන්ගේ නෛර්‍යාණ ලක්ෂණය- මාර්ගයාගේ හෙතු ලක්ෂණය- සත්‍යයන්ගේ අවිපරීතස්වභාව (=තථ) ලක්ෂණය- සමථයාගේ අවික්ඛෙප ලක්ෂණය- විදර්ශනාවගේ අනුපස්සනා ලක්ෂණය- සමථ විදර්ශනාවන්ගේ එකරස ලක්ෂණය- සමථවිදර්ශනා සඞ්ඛ්‍යාත යුගනඬයන්ගේ අනතිවත්තන ලක්ෂණය- ශීලවිශුද්ධියගේ සංවර ලක්ෂණය- චිත්තවිශුද්ධියගේ අවික්ඛෙප ලක්ෂණය- දෘෂ්ටිවිශුද්ධියගේ දර්ශන ලක්ෂණය- ක්ෂයඥානයාගේ සමුච්ඡේද ලක්ෂණය- අනුත්පාදඥානයාගේ ප්‍රශ්‍රබ්ධි ලක්ෂණය- ඡන්දයාගේ මූල (ප්‍රතිඥා

භාව) ලක්ෂණය- මනසිකාරයාගේ සමුඵාන ලක්ෂණය- සඳ්ධියාගේ සමෝධාන ලක්ෂණය- වෙදනාවගේ සමොසරණ ලක්ෂණය- සමාධියගේ ප්‍රමුඛ ලක්ෂණය- සමෘතිහුගේ අධිපතිභාව ලක්ෂණය- ප්‍රඥාවගේ තතුත්තරි ලක්ෂණය- විමුක්තියගේ සාරලක්ෂණය-අමතොගධනිර්ඕණයාගේ පර්‍යවසාන ලක්ෂණය- සත්‍යයෙයි, නිබ්බොරුවෙයි, මෙසේ අවිපරීත ලක්ෂණයට ඥාන ගමනින් ආවහ, නො වරදවා පැමිණියහ, අනුප්‍රාප්තයහයි තථාගත නම් වූහ; මෙසේ "තථ ලක්ෂණයට පැමිණියාහු නුයි තථාගත" නම් වන සේක.

කෙසේ තථධර්මයන් යථාභූතයෙන් අභිසම්බුද්ධ නුයි තථාගත නම්වූහ යත්? තථධර්මයෝ නම්? චතුරාර්‍ය සත්‍යයෝයි. වදාළේමැනු- **"චත්තාරිමානි භික්ඛවෙ! තථානි අවිතථානි අනඤ්ඤථානි යානිමානි චත්තාරි? ඉදං දුක්ඛන්ති භික්ඛවෙ! තථමෙතං අවිතථමෙතං අනඤ්ඤථමෙතං."** යි විස්තරය වේ. භාග්‍යවතුන් වහන්සේ ඒ තථධර්මයන් ද අවබොධ කළහ. ඒ තථධර්මයන් අභිසම්බුද්ධ බැවින් තථාගත යයි කියනු ලැබේ; මෙහි "ගත" ශබ්දය අභිසම්බුද්ධාර්ථ මැයි; තවද ජරාමරණයාගේ ජාති ප්‍රත්‍යයෙන් සම්භූතාර්ථය හා සමුදාගතාර්ථය සත්‍යවේ, නිබ්බොරුවේ, අනාකාරරහිත වේ, —පෙ— සංඝකාරයන්ගේ අවිද්‍යාප්‍රත්‍යයෙන් සම්භූතාර්ථය හා සමුදාගතාර්ථය සත්‍ය වේ, අමෘෂා වේ, අන්‍යත්ප්‍රකාර නො වේ; එසේම අවිද්‍යාවගේ සංඝකාරයන්ට ප්‍රත්‍යයාර්ථය — සංඝකාරයන්ගේ විඥානයට ප්‍රත්‍යයාර්ථය —පෙ— ජාතියගේ ජරාමරණයට ප්‍රත්‍යයාර්ථය සත්‍ය වේ, අමෘෂා වේ, අනන්‍යථා වෙයි; ඒ සියල්ල භාග්‍යවතුන් වහන්සේ අවබොධ කළසේක; එහෙයින් ද තථධර්මයන් අභිසම්බුද්ධ බැවින් තථාගත යයි කියනු ලැබේ. මෙසේ තථධර්මයන් යථාභූතයෙන් අවබොධ කෙළේ නුයි තථාගත නම්වූහ.

කෙසේ තථදර්ශී බැවින් තථාගත නම්වූහ යත්? භාග්‍යවතුන් වහන්සේ දෙවියන් සහිත වූ —පෙ— දෙවිමිනිසුන් සහිත වූ ලොකයෙහි අප්‍රමාණ වූ ලොකධාතූන්හි අප්‍රමාණ වූ සත්ත්වයන්ගේ චක්ෂුර්ගෝචරයෙහි ආපාථයට පැමිණෙන්නා වූ යම් රූපාරම්මණයක් නම් ඇත් ද එය සර්‍වාකාරයෙන් දනිති, දකිති; මෙසේ දන්නා වූ ද දක්නා වූ ද ඒ භාග්‍යවත්හු විසින් ඒ රූපාරම්මණය ඉෂ්ටානිෂ්ටාදි වශයෙන් හෝ දිඨසුතමුත විඤ්ඤාතයන් අතුරෙහි ලැබෙන්නාවූ පදයන්ගේ වශයෙන් හෝ **"ඛනමං තං රූපං රූපායතනං යං රූපං චතුන්නං මහාභූතානං උපාදාය වණ්ණනිභං සනිදස්සනං සප්පටිඝං නීලං පීතකං"** යනාදි නයින් නො එක් නාමයන්ගෙන් තෙළෙස්වාරයකින් දෙපණස්නයින් විභාගකරනු ලබන්නේ සත්‍යම වෙයි, මෘෂාවාදයෙක් නැති, ශ්‍රොතවාරාදියෙහි ආපාථයට පැමිණෙන්නාවූ ශබ්දාදියෙහි ද මේ නයයි; මේ වදාරනලද ද වෙයි භාග්‍ය

වත්හු විසින්- **යං භික්ඛවෙ! සදෙවකස්ස ලොකස්ස —පෙ— සදෙව මනුස්සාය දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා තමහං ජානාමි තමහං අබභඤ්ඤාසිං තං තථාගතස්ස විදිතං තං තථාගතො න උපට්ඨාසි”** යි. මේසේ තථදර්ශී බැවින් තථාගත නම් වූහ. මෙහි අවිපරීතයෙන් දක්නාසුලුය (=තථදස්සි) යන අර්ථයෙහි “තථාගතො” යන පදයාගේ සම්භවය දතයුතුයි.

කෙසේ තථවාදී බැවින් තථාගත නම් වූහ යත්? භාග්‍යවතුන් වහන්සේ යම් රාත්‍රියක බෝමැඩ අපරාජිත පර්‍යඞ්කයෙහි වැඩහුන් සේක් (කෙලශාභි සංසකාර දෙවපුත්‍ර සඞ්ඛ්‍යාත) ත්‍රිවිධමාරයන්ගේ මස්තකය මැඩ නිරුත්තර වූ සම්‍යක් සම්බොධියට පැමිණි සේක්ද; යම් රාත්‍රියක යමාසලඅතර අනුපාදිශෙෂ නිර්‍වාණධාතුවෙන් පිරිනිවිසේක්ද; මේ අතර පන්සාළිස් වසක් පමණ කාලයෙහි ප්‍රථම බොධියෙහි ද මධ්‍යම බොධියෙහි ද පශ්චිම බොධියෙහි ද භාග්‍යවත්හු විසින් වදාරනලද යම් සූත්‍රය ගෙය්‍යය —පෙ— වෙදල්ලය යන (නවඟසසුත්) ධර්මයක් වේද ඒ සියල්ල අර්ථ හෙයින් ද ව්‍යඤ්ජන හෙයින් ද (නිර්දෝෂ බැවින් උපවාදරහිතය අනූනය අනධිකය (අර්ථව්‍යඤ්ජනාදි සම්පත්තියෙන්) සර්‍වාකාරයෙන් පරිපූර්ණය රාගමදය නිර්මදකරන්නේය, වෙෂ මොහමදයන් නිර්මදකරන්නේය, එහි වලගක් පමණකුදු අපඝබලිතයක් නැති, ඒ සියලු ධර්මය එක් මුද්‍රණයකින් ලස් තබනලද්දක් මෙන් ද එක්නැළියකින් මිණනලද්දක් මෙන් ද එක්තුලාවකින් කිරනලද්දක් මෙන් ද තථ්‍ය ම වෙයි, අවිතථ්‍ය ම වෙයි; එසින් වදාළහ- **“යං භන්තෙ! රත්තිං තථාගතො අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුජ්ඣති යඤ්ච රත්තිං අනුපාදිසෙසාය නිබ්බානධාතුයා පරිනිබ්බායති යං එතස්මිං අන්තරෙ භාසති ලපති නිද්දිසති සබ්බං තං තථෙව හොති නො අඤ්ඤථා තස්මා තථාගතොති වුච්චති”** යි. මෙහි “ගත” ශබ්දය ගදුර්‍ව මැයි; මෙසේ තථවාදී බැවින් තථාගත නම්වූහ. තවද ඤීම ආගද නම් වේ වචනය යන අර්ථයි; තථ්‍යවූ අවිපරීත වූ ආගද (=වචන) ය මොහුගේය යන අර්ථයෙහි දකාරයට තකාරය කොට තථාගත යයි මෙසේ මේ අර්ථයෙහි පදසිද්ධිය දතයුත්තිය.

කෙසේ තථකාරිත්වයෙන් තථාගත නම් වූහ යත්? යම් හෙයකින් භාග්‍යවත්හුගේ වචනයට කය අනුලොම් වේද, කයට ද වචනය අනුලොම් වේද; එහෙයින් යම්සේ කියනසුලුද එපරිද්දෙන් කරනසුලුහ. යම්සේ කරනසුලුද එපරිද්දෙන් කියනසුලුහු ද වෙති. මෙබඳුවූ ද උන් වහන්සේගේ තෙපුල යම්සේද කයත් එපරිද්දෙන් ගියේය, පැවැත්තේය, යන අර්ථයි. කය යම්සේ පවතීද තෙපුලත් එසේ ගියේ නුයි තථාගත නම්වෙති; එසින් ම වදාළහ- **“යථාවාදී භික්ඛවෙ! තථාගතො තථාකාරී යථාකාරී තථාවාදි ඉති යථාවාදි තථාකාරී යථාකාරී තථාවාදි තස්මා තථාගතොති වුච්චති”** යි. මෙසේ තථාකාරී බැවින් තථාගත නම් වූසේක.

කෙසේ අභිභවනාර්ථයෙන් තථාගත නම්වූහ යත්? මත්තෙහි භවාග්‍රය යට අවීචිය පිරියත් කොට සරස අපමණ ලෝධාතූන්හි සියලු සත්ව යන් අභිභවනය කරනසේක; ශීලයෙන් ද සමාධියෙන් ද ප්‍රඥාවෙන් ද විමුක්තියෙන් ද උන්වහන්සේට තුල්‍යයෙක් හෝ ප්‍රමාණයෙක් හෝ නැති (එහෙයින් භාග්‍යවතුන් වහන්සේ) අතුල්‍ය සේක අප්‍රමේය්‍ය සේක අනුත්තර සේක රාජ රාජ වූසේක දෙවියන්ට දෙවි වූසේක ශක්‍රයන්ට අධිශක්‍ර වූසේක බ්‍රහ්මයන්ට අධිබ්‍රහ්ම වූසේක; එසින් වදළහ- **"සදෙවකෙ. හික්ඛවෙ! ලොකෙ -පෙ- සදෙවමනුස්සාය තථාගතෝ අභිභූ අනභිභූතෝ අඤ්ඤදත්ථු දසෝ වසවත්ති තස්මා තථාගතොති වුච්චති"** යි. එහි මෙසේ පදසිඩි දත්‍යුත්තීය; අගද වැනිනුයි අගද නම් වේ; හේ කවරේද යත්? දෙශනා විලාශය ද පුණ්‍යාධික්‍යය ද වෙයි; ඒ එසේමැයි- භාග්‍යවතුන් වහන්සේ මහානුභාව ඇති වෙදෙක් දිවබෙහෙදකින් සමී යන් මෙන් සියලු පරවාදීන් ද දෙවියන් සහිත ලොකයා ද අභිභවනය කරනසේක; මෙසේ සියලු ලොකයා මැඩපැවැත්වීමෙහි තථ්‍ය වූ අවිපරීත වූ දෙශනා විලාශමය වූ ද පුණ්‍යාධික්‍යමය වූ ද අගදය (= බෙහෙද) මොහුගේය යන අර්ථයෙහි දකාරයට තකාරය කොට "තථාගතෝ" යනු දතයුත්තේය; මෙසේ අභිභවනාර්ථයෙන් තථාගත නම්වූහ.

වැලිදු තථභාවයෙන් ගියේ නුයි පැමිණියේ නුයි ද තථාගත නම්වේ; තථභාවයට ගියේ නුයි ද තථාගත නම්වේ; ඉක්මවා ගියේය ඉක්මවූ යේය පැමිණියේය පිළිපන්නේය යන අර්ථයි; එහි සියලු ලොකය (=දුඃඛ සත්‍යය) තීරණ ප්‍රඥාවෙන් තථභාවයෙන් ගියේ නුයි අවබොධ කෙළේ නුයි තථාගත නම් වේ; ලොකසමුදය ප්‍රහාණ ප්‍රඥාවෙන් තථ්‍යයෙන් ගියේ නුයි ඉක්මවූයේ නුයි තථාගත නම් වේ; ලොකනිරොධය පසක් කිරීමෙන් තථ්‍යයෙන් ගියේ නුයි පැමිණියේ නුයි තථාගත නම් වේ; ලොකනිරොධගාමිනී ප්‍රතිපදාව තථත්වයට ගියේ නුයි පිළිපන්නේ නුයි තථාගත නම් වේ; එහෙයින් යමක් වදරනලදද භාග්‍යවත්හු විසින්- **"ලොකො භික්ඛවෙ! තථාගතෙන අභිසම්බුද්ධො ලොකස්මා තථාගතෝ විසංයුත්තෝතා ලොකසමුදයෝ භික්ඛවෙ! තථාගතෙන අභිසම්බුද්ධො ලොකසමුදයෝ තථාගතස්ස පහීනෝ ලොකනිරොධෝ භික්ඛවෙ! තථාගතෙන අභිසම්බුද්ධෝ ලොකනිරොධෝ තථාගතස්ස සච්ඡිකතෝ ලොකනිරොධගාමිනී පටිපදා භික්ඛවෙ!. තථාගතෙන අභිසම්බුද්ධා ලොකනිරොධගාමිනී පටිපදා තථාගතස්ස භාවිතා යං භික්ඛවෙ! සදෙවකස්ස ලොකස්ස -පෙ- සබ්බං තං තථාගතෙන අභිසම්බුද්ධං තස්මා තථාගතොති වුච්චති"** යි.

(මහණෙනි! දුඃඛසත්‍යය තථාගතයන් විසින් පසක් කරන ලද්දේය, තථාගත තෙමේ දුඃඛසත්‍යයෙන් විසංයුක්තය, මහණෙනි! දුඃඛ සමුදයසත්‍යය තථාගතයන් විසින් පසක් කරන ලද්දේය, තථාගතයාගේ දුඃඛ සමුදය ප්‍රහීණවූවිය, මහණෙනි! දුඃඛ නිරොධසත්‍යය තථාගතයන් විසින් අවබොධකරන ලද්දේය, දුඃඛනිරොධය තථාගතයන් විසින් ප්‍රත්‍යක්ෂකරන ලද්දේය, මහණෙනි! දුඃඛ නිරොධගාමිනී ප්‍රතිපදාව

සත්‍යය තථාගතයන් විසින් පසක් කරන ලද්දේය, දුඃඛ නිරෝධගාමිනී ප්‍රතිපදාව තථාගතයන් විසින් වඩන ලද්දීය, මහණෙනි! යම්බඳුවූ දෙවියන් සහිත ලොකයා විසින් -පෙ- ඒ සියල්ල තථාගතයන් විසින් දන්නා ලද්දේය එහෙයින් තථාගත යයි කියනු ලැබේ'' යි.)

මෙසේත් ඒ "තථාගත" ශබ්දයාගේ අර්ථය දතයුතුයි; මේද තථාගත යන්ගේ තථාගත භාවය දැක්වීමෙහි දිඞ්මාත්‍රයෙක් මැය. සම්භාරයෙන් තථාගතයෙක් ම තථාගතයාගේ තථාගත භාවය වර්ණනා කරන්නේය.

අරහං සම්මාසම්බුද්ධෝ යන දෙපදෙහි වනාහි කෙලෙසුන් කෙරෙන් දුරු හෙයින් ද කෙලෙස් සතුරන් හා (සංසාර චක්‍රයෙහි) අර නැසූ හෙයින් ද ප්‍රත්‍යයාදීන්ට සුදුසු හෙයින් ද පව්කිරීමෙහි රහසක් නැති බැවින් ද යන මේ කාරණයන්ගෙන් අර්හත් යයි දතයුතුයි; අවිපරීත කොට තමන් වහන්සේ විසින් ම නිරවශේෂ ධර්මයන් අවබෝධ කළ බැවින් වනාහි සම්‍යක් සම්බුද්ධ යයි දතයුතුයි; මේ මෙහි සංක්ෂේප යයි. විස්තාර හෙයින් වනාහි මේ පදවය විශුද්ධිමාර්ගයෙහි බුද්ධානුස්මෘති වර්ණනා වෙහි ප්‍රකාශකරන ලද්දේය. **පරිඤ්ඤානංතං තථාගතස්ස** යන මෙහි වනාහි මේ ස්කන්ධාදී වස්තුව තථාගතයන් විසින් පරිඥාත අන්තය ඇත්තේ යයි ද තථාගතයන් විසින් පිරිසිඳ දන්නේ යයි ද අර්ථය දතයුතුයි; පරිඥාතාන්තය නම් පරිඥාතපාරය ඇත්තේය, පිරිසිඳ දන් අවසානය ඇත්තේය; අනවශේෂයෙන් පිරිසිඳ දන්නේ යයි කියනලද වෙයි; ඒ එසේමැයි- ශ්‍රාවකයන් හා බුදුවරයන්ගේ කිසිසේත් ඒ ඒ මහින් කෙලෙස් පැහීමෙහි විශේෂයෙක් නැති; පරිඥාවෙහි විශේෂ ඇති; සැබවශ්‍රාවකයෝ සතර ධාතූන්ගේ එකදෙශයක් ම සම්මර්ශනය කොට නිවනට පැමිණෙති, බුදුවරයන්ට වනාහි අල්පප්‍රමාණවූ ද නුවණින් නො දක්නා ලද තුලනය නො කරනලද තීරණය නො කරනලද පසක් නො කරන ලද සංස්කාරගතයෙක් නැත්තේය.

නන්දි දුක්ඛස්ස මූලං යනාදියෙහි ද **නන්දි** යනු පුර්ව තෘෂ්ණාවයි; **දුක්ඛං** යනු පඤ්චස්කන්ධයෝයි; **මූලනති ඉති විදිත්වා**= ඒ පුර්ව භව තෘෂ්ණාව මේ පඤ්චස්කන්ධයට මූල යයි මෙසේ දැන; **භවා**= කර්මභවයෙන්; **ජාති** යනු විපාක ස්කන්ධයෝයි; ඔවුන් හෙතුකොට හෙන යම්හෙයකින් උපදින්ද එහෙයින් ජාති යයි කියනලද්දීය; ජාතිශීර්ෂයෙන් හෝ මෝ දෙශනා වන්නීය; මෙද **ඉති විදිත්වා** යන මේ පදය හා යෙදිය යුතුයි. මේ ම මෙහි අර්ථ යයි; කර්ම භවයෙන් උපප්‍රාප්ති භවය වෙයි, මෙසේ ද දැන යි. **භූතස්ස**= සත්වයාහට; **ජරාමරණං**= ජරාව ද මරණය ද; මෙය කියනලද්දේ වෙයි; ඒ උපප්‍රාප්ති භවය හෙතුකොට ගෙන හටගත් සත්වයා පිළිබඳ ස්කන්ධයන්ගේ දිරීම ද මැරීම ද වේ යයි මෙසේත් දැන යි. මෙතෙකින් බොධිවෘක්ෂමූලයෙහි අපරාජිතපර්‍යඞ්කයෙහි වැඩහුන්සේක් යම්ක් සම්මර්ශනය කොට සර්වඥභවට පැමිණිසේක්ද ඒ ප්‍රතීත්‍යසමුත්පාදයාගේ ප්‍රතිවෙධයෙන් ස්කන්ධාවන්ගේ අභාවය කිරීම දක්වනසේක් සතර සංක්ෂේපයක් ත්‍රිසන්ධියක් කාලක්‍රියක් විංශති ආකාරයක් ඇති ඒ ප්‍රතීත්‍යසමුත්පාදය ම දක්වනසේක.

ප්‍රතීත්‍යසමුත්පාදය. කෙසෙසින් වනාහි මෙතෙකින් මේ සියල්ල දක් වනලද්දේ වේද යත්? මේහි වනාහි **නන්දි** යනු මේ එක් සංක්ෂේපයකි; **දුක්ඛස්ස** යනු කි හෙයින් දුක දෙවැනි සංක්ෂේප යයි; **භවා ජාති** යි කි හෙයින් භවය තෙවැනි සංක්ෂේප යයි; ජාති ජරා මරණ සතරවැනි සංක්ෂේප යයි; මෙසේ පළමු කොට සතර සංක්ෂේපයෝ දතයුත්තාහුය; කොඨාසයෝ යන අර්ථයි. තෘෂ්ණා දුඃඛයන්ගේ අතර එක් සන්ධියෙක; දුඃඛයාගේ ද භවයාගේ ද අතර දෙවැනි සන්ධි යයි; භවයාගේ ද ජාතියගේ ද අතර තෙවැනි සන්ධි යයි; මෙසේ සිව්ඇඟිලි අතර වැනි වූ සතර සංක්ෂේපයන්ගේ අතර සන්ධි ත්‍රය දතයුත්තාහුය; එහි තෘෂ්ණාව අතීත කාල යයි; ජාති ජරා මරණ අනාගත කාල යයි; දුක ද භවය ද ප්‍රත්‍යුත්පන්න කාල යයි මෙසේ කාල ත්‍රය දතයුත්තාහුය.

අතීතයෙහි වනාහි පඤ්චාකාරයන් අතුරෙන් නන්දි යන වචනයෙන් එකලා තෘෂ්ණාව ආය; ඒ තෘෂ්ණාව කරණකොට ගෙන අනාගත වූ ද අවිද්‍යා සංඝස්කාර උපාදාන භවයෝ ප්‍රත්‍යය ලක්ෂණයෙන් ගන්නාලද්දාහු ම වෙති; ජාති ජරා මරණ යන වචනයෙන් වනාහි යම් සකඛකෙනෙකුන්ට ඒ ජාති ජරා මරණ වේද ඔවුහු කියනලද්දාහු ම යයි කොට මත්තෙහි විඥාන නාම රූප ෂඩායතන ස්පර්ශ වේදනාවෝ ගන්නාලද්දාහු ම වෙති; මෙසේ මොවුන් අතුරෙහි "පූර්වකර්ම භවයෙහි මෝහය අවිද්‍යාවයි, ආයූහනය සංඝස්කාරයෝයි, නිකාන්තිය තෘෂ්ණාවයි, උපගමනය උපාදාන යයි, චේතනාව භව යයි, මෙසේ මේ පඤ්චධර්මයෝ පූර්වකර්ම භවයෙහි මෙහි **ප්‍රතිසන්ධියට ප්‍රත්‍යය වූහ; මේ භවයෙහි ප්‍රතිසන්ධි** තොමෝ විඥාන යයි; **අවක්‍රාන්තිය නාම රූප යයි, (චක්ෂුඃප්‍රසාදාදි) ප්‍රසාදය තෙම ආයතන යයි; අරමුණෙහි ගැටෙමින් උපදනාබව ස්පර්ශ යයි, අරමුණු රසවිඳිනබව වේදනාවයි, මෙසේ මේ පඤ්චධර්මයෝ මේ උපප්‍රාප්ති භවයෙහි පූර්වභවයෙහි කරනලද කර්මයට ප්‍රත්‍යය වූහ; මේ භවයෙහි ආයතනයන් පිරිපැසුනු බැවින් මෝහය අවිද්‍යාවයි, ආයූහනය සංඝස්කාරයෝයි, නිකාන්තිය (=අරමුණෙහි පවත්නා අභිරතිය) තෘෂ්ණාවයි, උපගමනය (=අරමුණු දැඩි කොට ගැනීම) උපාදාන යයි, චේතනාව භව යයි, මෙසේ මේ පඤ්චධර්මයෝ මේ කර්මභවය ඇතිකල්හි මත්තෙහි ප්‍රතිසන්ධියට ප්‍රත්‍යය වෙති; මතු භවයෙහි ප්‍රතිසන්ධිය විඥාන යයි, අවක්‍රාන්තිය (=මව්කුස පිළිසිඳ ගැනීම) නාමරූප යයි; ප්‍රසාදය ආයතන යයි, අරමුණු ස්පර්ශකිරීම ස්පර්ශ යයි, අරමුණුරස විඳීම වේදනාවයි, මෙසේ මේ පඤ්චධර්මයෝ මත්තෙහි උපප්‍රාප්ති භවය ඇතිකල්හි මේ භවයෙහි කළකර්මයට ප්‍රත්‍යය වන්නාහ" යි මෙසේ දක්වනලද ලක්ෂණ ඇති විංශති ආකාරයෝ දතයුත්තාහුය.

මෙසේ **"නන්දි දුක්ඛස්ස මූලනති ඉති විදිත්වා භවා ජාති භූතස්ස ජරාමරණං"** යි මෙතෙකින් මේ සියලු ම චතුස්සත්‍යප්‍රකාශක නිදානය නියඩය ස්ථානාකාරය (යන නම් ඇති) පටිච්චසමුප්පාදය දක්වනලද්දේ

වේ යයි දතයුතු. මෙවිට **තඤ්ඤාතිහ යිඤ්ඤවෙ!** -පෙ- **අභිසම්බුඩ්ඣතීති වදාමි** යන මෙහි අපූර්ව පද වර්ණනාව කොට පදයොජනාවෙන් අර්ථ නිගමනය කරන්නෙමු. **තඤ්ඤාතිහ** යනු එහෙයින් යන මේ අර්ථය ම කියන ලද වෙයි; නිඤ්ඤාර හඤ්ඤාරයෝ නිපාත යෝයි; **ඤඞ්ඛෙ** යනු මේ අනවශෙෂ වචනයකි; **තණ්හාඛයං**= නැති යි මෙසේ වදාරනලද සියලු තෘෂ්ණාවන්ගේ; **ඛයා**= ලොවුතුරාමඟින් අත්‍යන්තයෙන් ක්ෂයකිරීමෙන්. **විරාගා** යනාදිය "ඛය" ශබ්දයාගේ සමානාර්ථ වචනයෝ මැයි; ඒ එසේමැයි- යම් තෘෂ්ණාවෝතුමූ ක්ෂය වූවාහු නො ඇලුනාහු ද ඔවුහු නිරුඬ වූවාහු ද හරින ලද්දාහු ද දුරුකරන ලද්දාහු ද වෙති; නොහොත් **ඛයා** යනු මේ සතරමාගී කෘත්‍යයට සාධාරණ වචනයකි; එහෙයින් ප්‍රථම මාගීයෙන් නො ඇලුනාහු ද්විතීයමාගීයෙන් නිරුඬ වූවාහු තෘතීයමාගීයෙන් ත්‍යාගකළාහු චතුර්ථමාගීයෙන් දුරුකළාහු යයි යෙදිය යුතුයි.

යම් තෘෂ්ණාවකින් පෘථිවී ධාතුව පෘථිවී භාවයෙන් හැඳිනගන්නේ හෝ වේ ද ඔවුන්ගේ ක්ෂයකිරීමෙන් යම් තෘෂ්ණාවකින් පෘථිවී ධාතුව ආත්ම යයි සිතන්නේ ද; ඔවුන්ගේ නො ඇල්මෙන්; යම් තෘෂ්ණාවකින් ආත්මය පෘථිවී ධාතුවෙහි පිහිටියේ යයි සිතන්නේ ද ඔවුන්ගේ නිරොධයෙන් යම් තෘෂ්ණාවකින් පෘථිවියෙන් පිටත නිත්‍යාත්මය පිහිටියේ යයි සිතන්නේ ද ඔවුන්ගේ ත්‍යාගයෙන්; යම් තෘෂ්ණාවකින් පෘථිවිය මාගේ යයි සිතන්නේ ද ඔවුන්ගේ දුරලීමෙන්; නොහොත් යම් තෘෂ්ණාවකින් පෘථිවිය ආත්ම යයි සිතන්නේ ද ඔවුන්ගේ ක්ෂයකිරීමෙන් —පෙ— යම් තෘෂ්ණාවකින් පෘථිව්‍යාශ්‍රිත ආත්මයට සතුටුවන්නේ ද ඔවුන්ගේ දුරලීමෙන් යයි මෙසේ මෙහි යොජනා දතයුත්තීය; කිසිවක් විරුඬ නොවේ, (දක්වන ලද්දෙහි කිසිත් විරුඬාර්ථයක් නොවෙයි සේයි.) **අනුත්තරං**= **උත්තර විරහිත වූ සර්ශ්‍රෙෂ්ඨ වූ; සම්මාසම්බෝධිං**= **අවිපරීතකොට තමා විසින් ම ඥානාවබොධයට නොහොත් ප්‍රභසර වූ ද සුන්දර වූ ද බොධියට; බොධි යි වෘක්ෂය ද ඥානය ද සර්ශ්‍රැතාඥන ය ද නිර්ණය ද කියනු ලැබේ;** **"බොධිරුක්ඛමූලෙ පඨමාභි සම්බුඩ්ඣෝ"** යි ද **"අනුත්තරා ච බොධිං අනුත්තරා ච භයං"** යි ද ආ තැන්හි වනාහි වෘක්ෂය බොධි යයි කියනු ලැබේ; **"බොධි වුච්චති චතූසු මග්ගෙසු ඤාණං"** යි ආ තැන්හි ඥානී යයි; **"පපොති බොධිං වරභූමිමොඛෙ"** යි ආ තැන්හි සර්ශ්‍රැතාඥන යයි; **"පඩාන බොධිං අමතං අසඞ්ඛතං"** යි ආ තැන්හි නිර්ණය යයි; මෙහි වනාහි භාග්‍යවත්හුගේ අර්හත්මාගී ඥානය අදහස් කරන ලදී. කිසිවෙක් සර්ශ්‍රැතාඥන යයි ද කියත්.

ශ්‍රාවකයන්ට අර්හත්මාගීය අනුත්තර වූ බොධිය වෙයි ද නො වෙයි ද යත් හොත්, නො වෙයි; කුමක් හෙයිනයත්? සියලු ගුණදායක නොවන බැවිනි. සැබව,- ඔවුන් අතුරෙන් කිසිවෙකුට ! රහත්මඟ රහත්ඵල ය ම ගෙනදෙයි; කිසිවෙකුට ත්‍රිවිද්‍යාවන් ද; කිසිවෙකුට ෂඩභිඥාවන් ද;

කිසිවෙකුට සිව්පිළිසිඹියා ද; කිසිවෙකුට ශ්‍රාවක පාරමී ඥානය ද ගෙන දෙයි; පසේබුදුවරයන්ට ද ප්‍රත්‍යෙක බොධි ඥානය ම ගෙනදෙයි; බුදු වරයන්ට වනාහි සියලු ගුණසම්පත්තිය ගෙනදෙයි; අභිෂෙකය තෙම රජුට සම්ලොකෙශ්වර භාවය මෙනි. එහෙයින් අන්‍ය කිසිවෙකුට ද අනුත්තර වූ බොධිය නො වේ යයි.

අභිසම්බුඩො යනු මොනොවට දැනගත්තේය ප්‍රතිවෙධ කෙළේය පැමිණියේය අධිගත යයි කියනලද වෙයි; **ඉති වදුම්**– මෙසේ කියම් ප්‍රකාශ කරම් දෙශනා කරම් පනවම් පිහිටුවම් විවෘතකරම් විභාගකරම් නො ගැඹුරු කරම් යයි; මෝ එහි යොජනායි– **"තථාගතොපි භික්ඛවෙ! –පෙ– පඨවිං න මඤ්ඤති පඨවිං නාභිනඤති තං කිස්සහෙතු? නන්දි දුක්ඛස්සමූලං භවා ජාති භූතස්ස ජරාමරණන්ති ඉති විදිත්වා"** යි එහි **ඉති විදිත්වා** යි ඉතිකාරය කාරණවියි; එහෙයින් මේ ප්‍රතීත්‍යසමුත්පාදය දත්බැවින් ප්‍රතිවෙධය කළ බැවිනැයි කියනලද වෙයි; අධික කොට කිමෙන් කිම? තවද යම් හෙයකින් මෙසේ මේ ප්‍රතීත්‍යසමුත්පාදය දැන තථාගතයාහට නන්දි යයි කියනලද යම් තෘෂ්ණාවක් වූවා ද සම්ප්‍රර වූ ද (ඒ තෘෂ්ණාව) ප්‍රහීණවූය, තථාගත තෙමේ සම්ප්‍රකාරයෙන් ඒ තෘෂ්ණාවන්ගේ ක්ෂයකිරීමෙන් –පෙ– අනුත්තර වූ සම්‍යක් සම්බොධිය අවබොධ කෙළේ ද එහෙයින් පෘථිවිය ආත්ම යයි නො සිතයි –පෙ– පෘථිව්‍යාශ්‍රිත ආත්මයට සතුටු නො වෙයි; **වදුම්** යනු මෙසේ අභිසම්බුඩ හෙයින් පෘථිවිය ආත්ම යයි නො සිතයි සතුටු නොවේ ඇයි කියම්'යි කියනලද වෙයි. නොහොත්–

යම් හෙයකින් නන්දි දුක්ඛස්ස මූලං යනාදිනයින් ප්‍රතීත්‍ය සමුත්පාදය දැන සම්ප්‍රකාරයෙන් තෘෂ්ණාක්ෂයට පැමිණියේද; මහණෙනි! එහෙයින් තථාගත තෙමේ සම්ප්‍රකාරයෙන් තෘෂ්ණාවන්ගේ ක්ෂයකිරීමෙන් –පෙ– අභිසම්බුඩ යයි කියම්; ඒ තථාගත තෙම මෙසේ අභිසම්බුඩ බැවින් පෘථිවිය ආත්ම යයි නො සිතයි —පෙ— පෘථිව්‍යාශ්‍රිත ආත්මයට සතුටු නො වේ යයි; යම් යම් තැනෙක්හි ම "යසමා" යි නො කියා "තසමා" යි කියනු ලැබේද ඒ ඒ තැන්හි "යසමා" යනු පමුණුවා ගෙදිය යුතුයි; මෝ ශාසන යුක්ති යයි; සියලු තැන්හි මේ ක්‍රම යයි.

ඉදමවොච භගවා යන මෙය නිදානාවසානය පවත් **අභිසම්බුඩොති වදුම්** යනු අවසන් කොට සියලු සූත්‍රානන්තය භාග්‍යවතුන් වහන්සේ අන්‍යයන්ගේ ප්‍රඥවට නො ලැබිය හැකි ප්‍රතිඥා ඇති අතිශයින් ගම්භීර වූ සම්ඥභාවය දක්වනසේක් එක් පෘථග්ජනවාරයකින් ද එක් ශෛක්ෂවාරයකින් ද ක්ෂීණාශ්‍රවවාර සතරකින් ද තථාගතවාර දෙකකින් දැයි මහාවාර අටකින් ද එකොළු වාරයෙහිත් පෘථිව්‍යාදී සූචිසිඅතුරු වාරයකින් ද ප්‍රතිමණ්ඩිත කොට **දෙඛණවරක්** පමණ වූ **පාලියෙන්** වදාළසේකි.

මෙසේ විචිත්‍රනය දෙශනා විලාශ යුකත වූ ද මේ මූලපරියාය සූත්‍රය කරවීකතාදයක් මෙන් මනොහර වූ කණීසුඛ වූ පණ්ඩිතජන හෘදයන්ට අමෘතාභිෂෙකයක් සමාන වූ බ්‍රහ්මස්වරයෙන් වදුරන්නා වූ ද භාග්‍ය වතුන් වහන්සේගේ භාෂිතයට ඒ භික්ෂූහු සතුටු නො වූහ, ඒ පන්සිය යක් භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ මේ වචනය නො අනුමෝදන් වූහ; කුමක් හෙයින ගත්? අඥන බැවිනි. ඔවුහු වනාහි මේ සූත්‍රයාගේ අර්ථය යම්හෙයකින් නො දත්තාහු ද එහෙයින් නො සතුටුවූහ; ඒ එසේ මැයි- ඒ භික්ෂූන්ට එසමයෙහි මෙසේ විචිත්‍රනය දෙශනාවිලාශ යුකතවූද මේ සූත්‍රය ඝනපුලුල් වූ රෙදිපටකින් මුඛබන්ධනය කොට අභිමුඛයෙහි තැබූ මනහර බොදුනක් මෙන් විය.

භාග්‍යවතුන් වහන්සේ තමන් වහන්සේ විසින් දෙසූ ධර්මය අන්‍ය යන්ට අවබොධකරවනු පිණිස කල්පලක්ෂයක් අධික කොට ඇති චතුර සඞ්ඛ්‍යයක් පැරුම් පුරා සම්භෘතවීමට පැමණියෝ නො වෙත්ද? උන්වහන්සේ කුමක් හෙයින් යම්සේ ඒ භික්ෂූහු නො දනිත් ද එපරිද්දෙන් දෙශනා කළෝ දැ? යි මේ සූත්‍රයා ගේ නික්ෂෙප විචාරණයෙහි ම යම්හෙයකින් මේ කියනලද ද **"මානභඤ්ඤනඤ්ච සබ්බධම්මමූල පරියායන්ති දෙසනං ආරභි"** යි එහෙයින් යලි මෙහි කියයුත්තක් නැති; මෙසේ මන් බිඳිනු පිණිස දෙසූ ද මේ සූත්‍රය අසා ඒ භික්ෂූහු ඒ පෘථිවිය ම දෘෂ්ටිගතික තෙමේ දනී ද; ශෛක්ෂ තෙමේ ද රහත් තෙමේ ද තථාගත තෙමේ ද විශිෂ්ට ඥානයෙන් දනී ද; මේ කිනම් ද? මේ කෙසේ දැ? යි සිතන්නාහු පෙර අපි භාග්‍යවතුන් විසින් වදුරනලද යම් කිසිවක් වහා ම දැනගනිමු, දැන් වූ කලි මේ මූලපරියාය දෙශනාවගේ අන්තය හෝ කෙළවර හෝ නො දනිමු, නො දකිමු, ආඛ්‍යෙය බුදුවරයෝ නම් අප්‍රමෙය්‍යයන අතු ල්‍යයනයි උපුළ දළඇති සපුන් මෙන් මදරහිතව බුබොපසථානයට ද ධර්ම ශ්‍රවණයට ද සකස්කොට ගියාහුය.

එසමයෙහි වනාහි ධර්මසභායෙහි රැස් ව හුන් භික්ෂූහු මේ කථාව ඇසිදවූහ; බුදුවරයන්ගේ ආනුභාවය ආශ්චර්‍යය; ඒ එසේ මානමදයෙන් මත්වූ බමුණු පැවිද්දෝ නම් භාග්‍යවත්හු විසින් මූලපරියාය දෙශනාවෙන් නැසූ මාන ඇතිකරනු ලැබූහයි; එකල්හි ඒ භික්ෂූන්ගේ මෝ අතුරුකථා තොමෝ කොට නො නිම වූය; එකල්හි භාග්‍යවතුන් වහන්සේ ගඳකිළියෙන් නික්ම එසමයට සුදුසු වූ පෙළහරකින් යුකත ව ධර්මසභායෙහි පැනවූ උතුම් බුද්ධාශනයෙහි වැඩහිඳ ඒ භික්ෂූන්ට මෙසේ වදුළහ- "මහණෙනි! දැන් මෙහි කිනම් අතුරු කථාවකින් යුකත ව රැස්ව හුන්නාහු දැ? යි" ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට එකරුණ දැන්වූහ; භාග්‍යවතුන් වහන්සේ මේ වදුළහ; "මහණෙනි! දැන් මතු නො වෙයි පෙර ද මම මෙසේ මානය දැඩිකොට ගත් හිස ඇති ව හැසිරෙන මොවුන් නැසූ මන් ඇත්තවුන් කෙළෙමියි; ඉක්බිති මේ අතීතාපපත්තියෙහි මේ අතීත කථාව ගෙනහැර දැක්වූසේකි.

මූලපරියාය ජාතකය.

මහණෙනි! පෙර දවස බරණැස් නුවර දිසාපාමොක් ඇදුරු වූ එක්තරා බමුණාණ කෙනෙක් වෙසෙති, ත්‍රිවේදයන්ගේ පරතෙරට ගියාවූ (නිඝණ්ඩුකෙටුභ ශාස්ත්‍රයන් සහිත වූ අථර්‍වනවෙදය සතරවන කොට පුරාණ කථා සඞ්ඛ්‍යාත ඉතිහාසය පස්වනකොට ඇති සඞ්ගයපුස්සාමන් යන වෙදත්‍රයාගේ පරතෙරට ගියා වූ පදක වූ වෛය්‍යාකරණ වූ ලොකායත ශාස්ත්‍රයෙහි හා මහාපුරුෂ ලක්‍ෂණයෙහි) අනූන පරිපූරකාරිත්වය ඇති ඒ බමුණාණෝ පන්සියයක් පමණ මෙණෙවියන්ට මන්ත්‍ර හදාරවති; පණ්ඩිත වූ මාණවකයෝ බොහෝ කොට ද ලස්ව ද ඉගෙනගනිති; මොනොවට සිත්හි ලා ධරති; ඔවුන් විසින් ගන්නාලද්ද ද නො නැසෙයි; ඒ බමුණු තෙමේ ද ආචාර්‍යමුෂ්ටියක් නො කොට කළෙහි ජලය වගුරුවන්නාක් මෙන් සියලු ශිල්පය උගන්වා ඒ මාණවකයන්ට මෙපවත් කීය; දෘෂ්ටධාර්මී සම්පරාය හිතවූ මේ ශිල්පය මෙපමණෙක් යයි; ඒ මාණවකයෝ අපගේ ඇදුරුණෝ යමක් දනිත්ද අපිදු එය දනුම්හ, අපිත් මෙවිට ආචාර්‍යයෝ ම යයි මන් උපදවා එතැන් පටන් ආචාර්‍යයන් කෙරෙහි ගෞරව රහිත වූවාහු බහාතැබූ වත්ඇතිව විසූහ; ආචාර්‍යතෙම (ඒ බැව්) දැන ඔවුන්ගේ මන් නිගාකරන්නෙමැයි සිතීය; හෙතෙම දිනක් උපස්ථානයට අවුත් වැඳ හුන්නාවූ ඒ මාණවකයන්ට මෙසේ කීය. "දරුවෙනි! පැනයක් පුළුවුස්මි, කිම විසඳන්ට සමර්‍ථයෝ දැ? සි" ඔවුහු "ඇදුරනි! විචාරනු මැන ඇදුරනි! විචාරනු මැනවැ" සි එක්පැහැර ම ශ්‍රැතමදයෙන් මත්වූවෝ යම් සේ ද එමෙන් කීවාහුය; ඇදුරුතෙමේ මේ කීය–

52. "කාලෝ ඝසති භූතානි සබ්බානෙව සහත්තනා
යෝ ච කාලඝසෝ භූතෝ ස භූතපචනිං පචි" සි.

(පෙරබත් ආදිකාලය තෙමේ එකෙකුදු නො හැර තමා සමග සියලු සත්වයන් කෑයි; මත්තෙහි ප්‍රතිසන්ධි සඞ්ඛ්‍යාත කාලය ක්‍ෂය කළාවූ යම් ක්‍ෂීණාශ්‍රවයෙක් වේද හෙතෙම අපායෙහි සත්වයන් පැසවන්නා වූ යම් තෘෂ්ණාවක් වේද එය කෑණගින්නෙන් දැවියයි)

දරුවෙනි! මේ ප්‍රශ්නය විසඳවු යයි; ඔවුහු සිතාබලා නො දන්නාහු තූෂ්ණීම්භූත වූහ; ඇදුරුතෙම මෙසේ කී, දරුවෙනි! කම් නැත අද යවු සෙට කියන්නහු යයි යැවූයේය; ඔවුහු දසදෙන ද විසිදෙන ද පිඬුව ගෙන ඒ ප්‍රශ්නයාගේ ආදිය නො දුටුවාහුය; නැවත පෙරලා ගොස් මේ ප්‍රශ්නයාගේ අර්‍ථය නො දනිමු යයි ආචාර්‍යයන්ට දැන්වූහ; ඇදුරුතෙම ඔවුන්ට නිගා පිණිස මේ ගාථාව කීය–

---

52. **කාලෝ**= පුරෙභත්තාදි කාලය තෙම; **සබ්බානෙව**= (එකෙකුදු නො හැර) සියලු ම; **භූතානි**= සත්වයන්; **අත්තනා සහ**= තමා සමග; **ඝසති**= (ආයු වර්‍ණ බල ක්‍ෂයකරමින් යොවුන්බව මඬිමින් නිරොගිබව නසමින්) කාදමයි; **කාලඝසෝ**= මත්තෙහි ප්‍රතිසන්ධිකාලය ක්‍ෂය කළා වූ; **යෝ ච භූතෝ**= යම් ක්‍ෂීණාශ්‍රවයෙකුත් වේද; **සෝ**= ඒ ක්‍ෂීණාශ්‍රවතෙම; **භූතපචනිං**= සතර අපායෙහි සත්වයන් පස්වන්නා වූ යම් තෘෂ්ණාවක් වේද එය; **පචි**= ඥානතමැති ගින්නෙන් දැවී.

53. "බහූනි නරසීහානි ලොමහානි බ්‍රහානි ච
සීවාසු පවිමුක්කානි කොවිදෙවෙථ කණ්ණවා" යි.

ගාථාවෙහි අර්ථය මෙසේ දතයුතු; බොහෝ වූ මනුෂ්‍යසිංහයෝ දක්නා ලැබෙති; ඒ සියලු සිංහයෝ ම රොමසහිතයෝය; ඒ සියල්ලෝ මහත් වූවාහු ද වෙති; ග්‍රීවයෙහි ම පිහිටියාහුය තල්ඵලයක් මෙන් අතින් නොගත්තාහුය; ඒ සිංහයන්ගේ මේ ධර්මයන්ගෙන් නානාත්වයක් නැති; මෙහි වනාහි කිසිවෙක් ම කන්ඇත්තේ වේ යයි; තමන් සඳහා කියේය. **කණ්ණවා** යනු නුවණැත්තේ යන අර්ථයි; කන්සිදුර වූකලි කිසිවෙකුට නැත්තේ නොවෙයි.

ඒ අසා ඒ මාණවකයෝ මකු වූවාහු නැමූකඳ ඇත්තාහු යට බැලූ මුහුණු ඇත්තාහු ඇඟිල්ලෙන් බිම අඳිමින් තූෂ්ණීම්භූත වූහ; ඉක්බිති ආචාර්‍යයී තෙම ඔවුන්ගේ ලජ්ජා සහිත භාවය දැක දරුවෙනි! ප්‍රශ්නය උගනිවු යයි ප්‍රශ්නය විසඳී.

කාලෝ යනු පෙරබත් කාලය ද පසුබත් කාලය ද යන මේ ආදියයි; **භූතානි** යනු මේ සත්වයන්ට නමෙකි; කාලය තෙම සත්වයන්ගේ සම් මස් ආදිය නොකයි වැලිදු වනාහි ඔවුන්ගේ ආයු වර්ණ බලයන් ක්ෂය කරමින් යොවුන්බව මඬිමින් නිරොගිබව නසමින් කයි, භක්ෂණය කෙරේ යයි කියනුලැබේ; **සබ්බානෙව සහතනා** යනු මෙසේ කන්නේද කිසිවෙක් නොහරියි සියල්ලන් ම කයි; හුදු භූතයන් ම නොවේ; වැලිදු තමා සමග තමා ද කයි; පෙරබත් කාලය තෙම පසුබත් කාලයට නොපැමිණෙයි; පසුබත් කාලාදියෙහි ද මේ නයයි; **යො ච කාලඝසො භූතානං**= ක්ෂීණාශ්‍රවයාහට මේ නමකි; ඒ එසේමැයි- ඒ ක්ෂීණාශ්‍රව තෙම මත්තෙහි ප්‍රතිසන්ධි කාලය ක්ෂය කොට කා සිටිහෙයින් "කාලඝසො" යි කියනු ලැබේ; **ඝ භූතපචනිං පචි**= ඒ ක්ෂීණාශ්‍රව තෙම යම් මෝ තෘෂ්ණාවක් අපායයන්හි සත්වයන් පස්වාද ඒ තෘෂ්ණාව ඥානාග්නියෙන් දැවී හලු කෙළේය; එහෙයින් **භූතපචනිං පචි** යි කියනු ලැබේ; **පජනිං** යි ද පාඨයි; උපද්‍රවන්නා නිර්භීනය කරන්නා යන අර්ථයි.

ඉක්බිති ඒ මාණවකයෝ පහන් දහසක ආලෝකයෙන් රාත්‍රියෙහි සම්විඡමණ්ඩිය මෙන් ආචාර්‍යයන්ගේ විසඳීමෙන් ප්‍රශ්නයාගේ අර්ථය ප්‍රකට ව දැක මෙවිට අපි දිවිඇතිතෙක් ගුරුවාසයෙහි වසන්නෙමු මේ ආචාර්‍යයෝ නම් මහත් වූවාහුය. යම් හෙයකින් අපි බහුශ්‍රැතයෙමුයි යන මානය උපද්‍රවා සිව්පද ගාථාවකගේ ද අර්ථය නොදැන ගනුම්හද එහෙයි නැයි, නිහතමාන වූවාහු පෙර මෙන් ම ආචාර්‍යයන්ට වත් පිළිවෙත් කොට සවගීපරායණ වූහ.

---

53. **බහූනි**= බොහෝ වූ; **නරසීහානි**= මනුෂ්‍ය සිංහයෝ දක්නා ලැබෙති; **ලොමහානි**= (ඔවුහු) රොම සහිත වූවාහු ද; **බ්‍රහානි** ච= මහත් වූවාහු ද වෙති; **සීවාසු පවිමුක්කානි**= ග්‍රීවයන්හි පිහිටියාහුය: **එත්ථ**= මෙහි; **කොවිදෙව**= කිසිවෙක් ම; **කණ්ණවා**= ප්‍රඥව ඇත්තේ වෙයි.

මහණෙනි! මම එසමයෙහි ආවාඨ්‍ය වීමි; මේ භික්ෂූහු මාණවකයෝ වූහ; මෙසේ පෙර ද මම මොවුන් මෙපරිද්දෙන් මානය දුඩි කොට ගත් හිස ඇති ව හැසිරෙන්නවුන් නැසූ මාන ඇත්තවුන් කෙළෙමි, යි. මේ ජාතකය ද අසා ඒ භික්ෂූහු පෙර ද අපි මානයෙන් ම නටුම් හයි බොහෝ සෙයින් නිහතමානයෝ වී තමහට උපකාර වූ කමටහන් පිහිට කොට ඇත්තෝ වූහ.

නැවත භාග්‍යවතුන් වහන්සේ එක් කලෙක ජනපදචාරිකාවෙහි හැසිරෙන සේක් විසල් නුවරට පැමිණ ගොතමක චෛත්‍යයෙහි වාසය කරන්නාහු මේ පන්සියයක් භික්ෂූන්ගේ ඤාණපරිපාකය දුන මේ ගොතමක සූත්‍රය වදාළසේක.

"ගොතමක" සූත්‍රය.

"අභිඤ්ඤෙය්‍යාහං භික්ඛවෙ! ධම්මං දෙසෙමි නො අනභිඤ්ඤෙය්‍ය; සනිදානාහං භික්ඛවෙ! ධම්මං දෙසෙමි නෝ අනිදානං සප්පටිභාරියාහං නෝ අප්පාටිහාරියං කස්ස මයහං භික්ඛවෙ! අභිඤ්ඤෙය්‍ය ධම්මං දෙසයතෝ –පෙ– නෝ අප්පාටිහාරියං කරණීයෝ ඔවාදෙ කරණීයා අනුසාසනී; අලඤ්ච පන වෝ භික්ඛවෙ! තුණ්හීයා අලං අත්තමනතාය අලං සොමනස්සාය සම්මාසම්බුද්ධෝ වත සෝ භගවා සඞ්ඛිත්තෝ ධම්මෝ සුප්පටිපන්නෝ සඞ්ඛෝති; ඉදමවොච භගවා, ඉමස්මිංඤ්ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ සහසසී ලොකධාතු අකම්පිත්ථ" යි.

මේ සූත්‍රය ද අසා ඒ පන්සියයක් භික්ෂූහු ඒ අස්නෙහි ම සිව්පිළිසිඹියා සමග අර්හත්වයට පැමිණියාහුය. මෙසේ මෝ දෙශනා තොමෝ මේ තැන්හි නිෂ්ඨාවට පැමිණියා යයි.

මූලපරියාය සූත්‍රවර්ණනා නිමි.

සබ්බාසව සූත්‍ර වණ්ණනා.

එවමේම සුතං – **සාවත්ථියං** යි සබ්බාසව සූත්‍ර යයි. එහි **සැවැත් නුවර.** **මේ** (කියනු ලබන්නී) අපූර්වපද වණ්ණනාවයි. **සාවත්ථි** යනු "සවත්ථ" නම් ඍෂිහුගේ නිවාසස්ථාන වූ නගර යයි "කාකන්දී මාකන්දී" යනු යම්සේ ද එමෙනි; මෙසේ පළමුකොට අක්ෂර චින්තකයෝ කියති; යලි අර්ථකථාචාර්‍යහු මෙසේ කියති. මිනිසුන්ගේ යම්කිසි උපභෝග පරිභෝගයක් වේ ද ඒ සියල්ල මෙහි ඇත්නුයි "සාවත්ථි" නම් වේ; නොහොත් සාර්‍යයන් රැස්වූ කල්හි කිනම් භාණ්ඩ යක් ඇත්දැයි විචාළවිට සියල්ල ඇත යන වචනය ගෙන සාවත්ථි නම්වේ යයි.

54. **"සබ්බඤ සබ්බූපකරණං සාවත්ථියං සමොහිතං**
තස්මා සබ්බමුපාදාය සාවත්ථීති පවුච්චති"

55. **"කොසලානං පුරං රම්මං දස්සනෙය්‍යං මනොරමං**
දසහි සද්දෙහි අවිවිත්තං අන්නපාන සමායුතං"

56. **"වුඩ්ඪං වෙපුල්ලතං පත්තං ඉඛං ඵීතං මනොරමං**
ආළකමන්දව දෙවානං සාවත්ථිපුර මුත්තමං" යි.

(ශ්‍රාවස්තීපුර යෙහි සියලු කල්හි සියලු උපකරණ යම් හෙයකින් මොනොවට රැස් වූයේ ද එහෙයින් "සබ්බං" යනු ගෙන ශ්‍රාවස්ති යයි කියනු ලැබේ.)

(කොසල වාසීන්ගේ රම්‍ය වූ දර්‍ශනීය වූ සිත්කලුවූ ශ්‍රාවස්තිපුරයතෙම හස්‍යාඛවාදි දශවිධ ශබ්දයෙන් නොසිස් විය ආහාරපානයෙන් සැදුම්ලද.)

(සමෘඩ්ධ වූ පිණාගියා වූ සිත්කලු වූ උතුම් වූ ශ්‍රාවස්තිපුරයතෙම දෙවියන්ගේ ආළක මන්දව මෙන් වෘඩියට ද විපුලත්වයට ද පැමිණියේ වී යයි.)

---

54. **සාවත්ථියං**= සැවැත් නුවර; **සබ්බඤ**= සියලු කල්හි; **සබ්බූපකරණං**= සියලු උපකරණ; **සමොහිතං**= (යම් හෙයකින්) මොනොවට රැස්වූ යේ ද; **තස්මා**= එහෙයින්; **සබ්බං + උපාදාය**= "සබ්බං" යනු ගෙන; **සාවත්ථීති පවුච්චති**= සැවැත් යයි කියනු ලැබේ.

55. **කොසලානං**= කොසොල් වාසීන්ගේ; **රම්මං**= රම්‍යවූ; **දස්සනෙය්‍යං**= දර්‍ශනීය වූ; **මනොරමං**= සිත්කලු වූ; **පුරං**= ශ්‍රාවස්තිපුරය තෙම; **දසහි සද්දෙහි**= (හස්‍යාඛවාදි) දශවිධ ශබ්දයන් ගෙන්; **අවිවිත්තං**= නො සිස් විය (විවේකරහිත විය;) **අන්නපානසමායුතං**= ආහාරපානයෙන් සැදුම් ලද්දේය.

56. **ඉඛං**= සමෘඩ්ධ වූ; **ඵීතං**= පිණාගියා වූ; **මනොරමං**= සිත්කලු වූ; **උත්තමං**= ශ්‍රෙෂ්ඨ වූ; **සාවත්ථිපුරං**= ශ්‍රාවස්තිපුරය තෙම; **දෙවානං**= දෙවියන්ගේ; **ආළකමන්දව**= ආළකමන්දු නම් රාජධානිය මෙන්; **වුඩ්ඪං**= වෘඩියට ද; **වෙපුල්ලතං**= විපුලබවට ද; **පත්තං**= පැමිණියේ විය.

ජේතවනය.

ඒ ශ්‍රාවස්ති නගරයෙහි යනාම්සි; **ජේතවනෙ** යන මෙහි තමාගේ පසම්තුරු ජනයා දිනාගනුයි ජේත නම්; නොහොත් රජු විසින් තමාගේ පසම්තුරු ජනයා දිනූකල්හි උපන්නේ නුයි ජේත නම්; මඩහල කැමැති බැවින් හෝ ඔහට මෙසේ නාමය ම කරනලදුයි ජේත නම්; ජේතයාගේ වනය ජේතවන නම්; යම් හෙයකින් ඒ දෙව්රම ජේත නම් රාජකුමාරයා විසින් රොපණය කරන්ා ලද්දේ වඩිනය කරන ලද්දේ පරිපාලනය කරන ලද්දේ වී ද; හෙතෙම ඒ ජේතවනයාගේ සාමීත් වී ද; එහෙයින් ජේතවන යයි කියනු ලැබේ. ඒ ජේතවනයෙහි (යනාම්සි.)

අනේපිඬු සිටාණෝ.

අනාථපිණ්ඩිකස්ස ආරාමෙ යනු මෙහි ඒ ගෘහපති තෙම මවුපියන් විසින් කළනම් විසින් සුදත්ත නම් වේ; සියලු කාමගයෙන් සමෘඩ බැවින් ද පහවූ මසුරුබැව් ඇතිබැවින් ද කරුණාදි ගුණයෙන් සමන්විත බැවින් ද සියලු කාලයෙහි අනාථයන්ට පිණ්ඩදානය කෙළේය; එහෙයින් අනාථපිණ්ඩික යයි ප්‍රසිද්ධයට ගියේය; මෙහි ප්‍රාණීහු විශෙෂයෙන් ප්‍රව්‍රජිතයෝ හෝ සිත් අලවා වෙසෙත් නුයි ආරාම නම් වේ; ඒ ආරාමයාගේ පුෂ්පඵලාදි ශොභා වෙන් ද ඉතා නො දුරු ඉතා නො ළංබැව් ආදිවූ පස්වැදෑරුම් සෙනසුන් සපුවෙන් ද ඒ ඒ දිගින් අවුත් රමණය කෙරෙති අභිරමණය කෙරෙති උකටලී නොව වාසය කෙරෙති යන අර්ථයි; නොහොත් උක්තප්‍රකාර සම්පත්තිය කරණකොට ගෙන ඒ ඒ තැන ගියවුන් ද තමාගේ අභ්‍යන්තරයට ම පමුණුවා රමණය කරවා නුයි ආරාම නම් වේ; යම් හෙයකින් ඒ ආරාමය තෙම **අනාථපිණ්ඩික** ගෘහපතිහු විසින් **ජේත** නම් **රාජකුමාරයා අතින් අෂ්ටාදශහිරණ්‍ය** කොටියකින් කොටිසංඛ්‍යාරයෙන් විකොට ගෙන **අෂ්ටාදශහිරණ්‍ය** කොටියකින් සෙනසුන් කරවා අටලොස්කෙළක් අමුරනින් විහාරපූජාව නිමවා මෙසේ සූපණස් කෙළක් හිරණ්‍යපරිත්‍යාගයෙන් බුදුපාමොක් සඟනට පාවාදුන්නේද; එහෙයින් **අනෙපිඬු සිටුහුගේ ආරාම** යයි කියනුලැබේ, ඒ **අනේපිඬු සිටුහුගේ ආරාමයෙහිය.**

මෙහිදු **ජේතවනෙ** යන වචනය පූර්ණවර්ධනියා ප්‍රකාශ කිරීමයි; **අනාථපිණ්ඩිකස්ස ආරාමෙ** යනු පශ්චිම සාමීයා ප්‍රකාශකිරීමයි; මොවුන්ගේ ප්‍රකාශකිරීමෙහි ප්‍රයොජනය කිමෙක් ද? යී පුණ්‍යකාමීන්ගේ දෘෂ්ටානුගතියට පැමිණීමයි. එහි වනාහි දෙරකොටු ප්‍රාසාද නිර්මාපණයෙහි බිම විකිණීමෙන් ලත් අටලොස් කෙළක් හිරණ්‍යය ද නො එක් කෙළගණන් අඹනා වෘක්ෂයෝ ද ජේතකුමාරයාගේ පරිත්‍යාග යයි; සූපණස් කෙළක් අනේපිඬු සිටුහුගේ පරිත්‍යාග යයි; මෙසේ ඔවුන් දැක්වීමෙන් මෙසේ පුණ්‍යකාමීහු පින් කෙරෙත් යයි දක්වන්නා වූ ආයුෂ්මත් ආනන්දයෝ අන්‍ය පුණ්‍යකාමීන් ද ඔවුන්ගේ දෘෂ්ටානුගතියට පැමිණීමෙහි යොදවත්.

සබ්බාසවසංවරපරියායං වො භික්ඛවෙ! යී කුමක් හෙයින් මේ සූත්‍රය වදාළසේක්ද යත්? ඒ භික්ෂූන්ගේ උපක්ලෙශ විශොධනය ආදිකොට ආශ්‍රවක්ෂය පර්‍යන්ත පිළිවෙත දැක්වීම පිණිසය; ඒ දෙශනාවෙහි

සඛ්ඛාසවසංවරපරියායං යනු සියලු ආශ්‍රවයන්ගේ සංවරයට කාරණය සංවරවූ කාරණය; යම් කරුණකින් ඔවුහු සංවරකරන ලදුව වසන ලදුව අනුතපාද නිරොධ සඛ්‍යාත වූ ක්‍ෂයවීමට යෙත් ද ප්‍රහීණ වෙත් ද නො පවතිත් ද ඒ කාරණය යන අර්ථයි.

ආශ්‍රව. එහි පහළවෙත් නුසි ආශ්‍රව නම් වෙති; ඇසින් ද -පෙ- සිතින් ද පහළවෙත් පවතිත් යයි කියනලද වෙයි; ධර්ම වශයෙන් ගොත්‍රභූසිත තෙක් ද අවකාශවශයෙන් භවාග්‍රය තෙක් ද පහළ වෙත් නුසි හෝ ආශ්‍රව නම් වෙත්; මේ ධර්මයන් ද මේ අවකාශය ද ඇතුලත් කොට පවතිත් යන අර්ථයි; මේ "ආ" කාරය තෙමේ ඇතුලත්කිරීම් අර්ථමැයි; බොහෝ කලක් පිරිවිසීම් අටින් සුරුදි ආසව වැනි නුසි ද ආශ්‍රව නම් වෙති; ඒ එසේමැයි- ලොකයෙහි චිරපාරිවාසිකාර්ථයෙන් සුරුදිහු ආසව යයි කියනු ලැබෙත්; ඉදින් චිරපාරිවාසිකාර්ථයෙන් ආසවයෝ නම්? මොවුහු ම වන්ට සුදුසු වෙති; මේ වදාරන ලද මැයි— **"පුබ්බා භික්ඛවෙ! කොටි න පඤ්ඤායති අවිජ්ජාය ඉතෝ පුබ්බෙ අවිජ්ජා නාහොසි"** යනාදියයි, නොහොත් දීර්ඝ වූ සංසාර දුඃඛය උපදවත් ප්‍රසව කෙරෙත් නුසි ද ආශ්‍රව නම් වෙත්; මෙහි පළමු දැක්වූ නිර්වචනයෝ යම් තැනක කෙලශයෝ ආශ්‍රවයෝ යි එත්ද එහි යෙදෙත්, පසුව කි නිර්වචනය කර්මයෙහි ද යෙදෙයි; හුදු කර්මක්ලෙශයෝ ම ආශ්‍රවයෝ නො වෙත්; වැලිදු වනාහි නානාප්‍රකාර වූ උපද්‍රවයෝ ද (ආශ්‍රව නම් වෙති;) ඒ එසේ මැයි- සූත්‍රයන්හි **"නාහං භික්ඛවෙ! දිට්ඨධම්මිකානං යෙව ආසවානං සංවරාය ධම්මං දෙසෙමි"** යන මෙහි විවාදයන්ට මුල්වූ ක්ලෙශයෝ ආශ්‍රවයෝ යයි ආවාහුය.

57. "යෙන දෙවූපපත්‍යස්‍ය ගන්ධබ්බා වා විහඞ්ගමෝ
යක්ඛත්තං යෙන ගච්ඡය්‍යං මනුස්සත්තඤ්ච අබ්බජේ
තෙ මයහං ආසවා ඛීණා විධූතා විනළීකතා" ති.

මෙහි ත්‍රෛභූමක කර්මය ද අවශෙෂ අකුශල ධර්මයෝ ද (ආශ්‍රවනම් වෙති;) **"දිට්ඨධම්මිකානං ආසවානං සංවරාය සම්පරායිකානං ආසවානංපටිඝාතාය"** යන මෙහි පරොපවාද විප්‍රතිසාර වධබන්ධනාදීහුද අපාය දුඃඛවූ ද නානාප්‍රකාර උපද්‍රවයෝ (ආශ්‍රවනම් වෙති;) ඒ මේ ආශ්‍රවයෝ වනාහි යම් තැනක යම්සේ ආවාහුද එහි එපරිදෙන් දතයුත්තාහුය.

---

57. **යෙන**= යම් ආශ්‍රවයක් හෙතුකොට ගෙන, **දෙවූපපත්‍ති**+ **අස්ස**= දිව්‍යලොකයෙහි ප්‍රතිසන්ධිය (මට) වන්නේද; **විහඞ්ගමෝ**= ආකාසචාරී වූ; **ගන්ධබ්බා වා**= ගාන්ධර්වයෙක් හෝ වන්නේද; **යෙන**= යම් ආශ්‍රවයක් හෙතුකොට ගෙන; **යක්ඛත්තං**= යක්ෂබවට; **ගච්ඡය්‍යං**= (මම) යන්නෙම් ද; **මනුස්සත්තඤ්ච**= මිනිස්බවට ද; **අබ්බජේ**= (ගියහු) පෙරලා එන්නේ ද; **මයහං**= මා විසින්; **තෙ ආසවා**= (ත්‍රෛභූමකකර්ම සඛ්‍යාත) ඒ ආශ්‍රවයෝ; **ඛීණා**= ක්ෂයකරන ලද්දාහුය; **විධූතා**= වෙසෙසින් පහකරන ලද්දාහුය; **විනළීකතා**= සිඳින ලද්දාහුය.

මේ ආශ්‍රවයෝ වනාහි පළමුකොට විනයෙහි **"දිට්ඨධම්මිකානං ආසවානං සංවරාය සම්පරායිකානං ආසවානං පටිඝාතාය"** යි දෙපරිද් දෙකින් ආවාහුය; සළායතන සූත්‍රයෙහි **"තයෝ මේ ආවුසෝ! ආසවා කාමාසවෝ භවාසවෝ අවිජ්ජාසවෝ"** යි තුන්පරිද්දෙකින් ආවාහුය; අන්‍ය සූත්‍රාන්තයන්හි ද අභිධර්මයෙහි ද ඔවුහු ම දිට්ඨාසවයත් සමග සතර පරිද්දෙකින් ආවාහුය; නිවේධික පර්‍යායයෙහි **"අත්ථි භික්ඛවේ! ආසවා නිරයගාමිනියා අත්ථි අසවා තිරච්ඡානයෝනිගාමිනියා අත්ථි ආසවා පෙතනිවිසයගාමිනියා අත්ථි ආසවා මනුස්සලෝක ගාමිනියා අත්ථි ආසවා දෙවලෝකගාමිනියා"** යි පස්පරිද්දෙකින් ආවාහුය; ඡක්කනිපාත යෙහි **"අත්ථි භික්ඛවේ! ආසවා සංවරා පහාතබ්බා"** යනාදි නයින් සපරිද්දෙකින් ආවාහුය; මේ සූත්‍රයෙහි වූ කලි ඔවුහු ම දර්‍ශනයෙන් ප්‍රහාතව්‍යයන් සමග සත්පරිද්දෙකින් ආවාහුය යි, මේ වනාහි "ආසව" යන පදයෙහි වචනාර්ථය හා ප්‍රභෙදය ද වෙයි.

සංවරය. "සංවර" යන පදයෙහි වනාහි සංවරණය කරනු ලැබේ නුයි සංවර නම් වසයි වළකයි පවත්නට නො දෙයි යන අර්ථයි; ඒ එසේමැයි– **"අනුජානාමි භික්ඛවේ! දිවා පතිසල්ලීය නෙනන මාරං සංවිත්වා පතිසල්ලිතුං"** යි ද **"සොතානං සංවරං බ්‍රූමි පඤ්ඤායෙනෙ පිථියරේ"** යි ආදි තැන්හි පිධාන (=වැසීම්) අර්ථයෙන් සංවර යයි වදුළහ. හේ මේ සංවරය තෙම පඤ්චවිධ වෙයි, සිල සංවරය සති– ඤාණ– ඛන්ති– විරිය සංවර යයි කියාසි. ඔවුන් අතුරෙහි **"ඉමිනා පාතිමොක්ඛ සංවරෙන උපෙතෝ"** යන මේ තෙමේ සිලසංවර නම්; ප්‍රාතිමෝක්ෂ ශීලය ම මෙහි සංවර යයි කියනලදී. **"චක්ඛුන්ද්‍රියෙ සංවරමාපජ්ජති"** යනාදින්හි සති සංවර යයි; සමාධිය ම මෙහි සංවර යයි කියනලද්දීය. **"සොතානං සංවරං බ්‍රූමි පඤ්ඤායෙනෙ පිථියරේ"** යන මේ තෙමේ ඤාණසංවර යයි; මෙහි ඥානය ම "පිථියරේ" යන මේ පිධානාර්ථයෙන් සංවර යයි කියනලදී. **'ඛමෝ හොති සිනස්ස' "උප්පන්නං කාමවිතක්කං නාධිවාසෙති"** යනාදි නයින් මේ සූත්‍ර යෙහි ම ඛන්ති– විරියසංවරයෝ ආවාහුය; **"සබ්බාසවසංවර පරියාය"** යන මේ උද්දෙසයෙන් සඞ්ග්‍රහකළ බැවින් ඔවුන්ගේ ද සංවරභාවය දත යුත්තේය.

තවද පස්වැදෑරුම් වූ ම මේ සංවරය තෙම මෙහි ආයේමය. ඔවුන් අතුරෙන් ඛන්ති– විරියසංවරයෝ පළමුකොට කියනලද්දාහු මය. **"සො නකතුව අනාසනං නකතුව අගොචරං"** යි මේ වනාහි මෙහි සිල සංවර යයි; **"පටිසඛ්ඛා යොනිසො චක්ඛුන්ද්‍රිය සංවර සංවුතෝ"** යි මේ තෙම සති සංවර යයි; සියලු තැන්හි "පටිසඛ්ඛා" යනු ඤාණ සංවර යයි; අග හිතහඟණයෙන් වනාහි දර්‍ශනය ද ප්‍රතිසෙවනය ද භාවනාව ද ඤාණ සංවර යයි; ධර්මයෝ මේ කරණකොට ගෙන වෙසෙසින් යෙත්නුයි පරි

යාය නම් වේ; උත්පත්තියට හෝ නිරුද්ධයට හෝ යෙත් යයි කියන ලද්දේ වෙයි; මෙතෙකින් **සබ්බාකාරෙන සංවර පරියායං** යන මෙහි යමක් කියයුතු ද එය කියනලද්දේ වෙයි.

මේ ප්‍රාප්තාවසරයෙහි **ජානතෝ අහං** යනාදියෙහි **ජානතෝ**= දන්නහුගේ; **පස්සතෝ**= දක්නහුගේ; දෙපදය ම එකාර්ථ වෙති, ව්‍යඤ්ජන ය ම විවිධ වෙයි; මෙසේ ඇතිකල්හි ද **ජානතෝ** යනු ඥානලක්ෂණය ගෙන පුද්ගලයා දක්වයි; සැබව- ඥානය දැනීම ලක්ෂණ කොට ඇත්තේය; **පස්සතෝ** යනු ඥානය ප්‍රභාවකොට ඇතිබව ගෙන (පුද්ගලයා දක්වයි;) එසේමැයි- ඥානය දැකීම උත්පත්තිකොට ඇත්තේය; ඥාන සම්බන්ධී පුද්ගල තෙමේ ඇස්ඇති තැනැත්තේ ඇසින් රූපයන් මෙන් නුවණින් විවෘත ධර්මයන් දකියි; වැලිදු උපායමනසිකාරය උපදවන්ට දන්නහුගේ අනුපායමනසිකාරය යම්සේ නූපදී ද එපරිද්දෙන් දක්නහුගේ යයි මේ මෙහි සාරයයි; කියි ආචාර්‍ය්‍ය කෙනෙක් වනාහි බොහෝ විස්තර බෙණෙති; ඒ විස්තරයන් මේ අර්ථයෙහි නො යෙදෙත්; **ආසවානං ඛයං** යනු ආශ්‍රවයන්ගේ ප්‍රහාණය ආශ්‍රවයන්ගේ **ආශ්‍රවක්ඛය.** අත්‍යන්තක්ෂය සමුත්පාදය ක්ෂයවූ ආකාරය නැතිබව යන අර්ථයි; මෙය ම මේ සූත්‍රයෙහි ද **ආසවානං ඛයා අනාසවං චෙතෝ විමුත්තිං** යනාදියෙහි ද ආශ්‍රවක්ෂයාර්ථයි; පිටත් තැන්හි වනාහි මාර්ගඵල නිර්වාණයෝ ද ආශ්‍රවක්ෂය යයි කියනු ලැබෙති; ඒ එසේමැයි—

58. "සෙඛස්ස සික්ඛමානස්ස උජුමග්ගානුසාරිනෝ
ඛයස්මිංපඨමං ඤාණං තතෝ අඤ්ඤා අනන්තරා" යන

ආදියෙහි මාර්ගය "ආසවක්ඛය" යයි කියනලදී. **"ආසවානං ඛයා සමණෝ හොති"** යනාදියෙහි ඵලය කියනලදී.

59. "පරවජ්ජානුපස්සිස්ස නිච්චං උජ්ඣානසඤ්ඤිනෝ
ආසවා තස්ස වඩ්ඪන්ති ආරා සෝ ආසවක්ඛයා" යන

ආදී තැන්හි නිර්වාණය ආශ්‍රවක්ෂය යයි කියනලදී. **නෝ අජානතෝ නෝ අපස්සතෝ** යනු යමෙක් වනාහි නො දනී ද නො දකී ද ඕහට

---

58. **සික්ඛමානස්ස**= ත්‍රිවිධ ශික්ෂාවෙහි හික්මෙන්නාවූ; **උජුමග්ගානුසාරිනෝ**= සෘජුමාර්ගී යයි කියනලද ආර්‍ය්‍යමාර්ගයට පිළිපන්නාවූ; **සෙඛස්ස**= ශෛක්ෂයාහට; **පඨමං**= පළමු කොට; **ඛයස්මිං ඤාණං**= මාර්ගඥානය උපදී; **තතෝ අනන්තරා**= ඒ (සතරවන) මාර්ගඥානයට අනන්තරුව; **අඤ්ඤා**= අර්හත්ඵලය උපදී.

59. **පරවජ්ජානුපස්සිස්ස**= අනුන්ගේ වරද දක්නාසුලුවූ; **නිච්චං**= සතතයෙන්; **උජ්ඣාන සඤ්ඤිනෝ**= (අනුන්ගේ රහස්‍යගවෙෂී බැවින්) උජ්ඣානසංඥීවූ; **තස්ස**= ඒ මහණහට; **ආසවා**= කාමාදි ආශ්‍රවයෝ; **වඩ්ඪන්ති**= වැඩෙත්; (එහෙයින්) **සෝ**= ඒ මහණතෙම; **ආසවක්ඛයා**= අර්හත්ඵල සඞ්ඛ්‍යාත ආශ්‍රවක්ෂයයෙන්; **ආරා**= දුරු වූයේ වෙයි.

(ආශ්‍රවක්ෂය) නො කියම් යන අර්ථයි; මෙයින් යමෙක්තුමූ නො දන්නා හුට නො දක්නහුට සංසාරාදියෙන් ම මුඩිය වේ යයි කියත් ද ඔවුහු ප්‍රතික්ෂේපකරන ලද්දාහු වෙති; නොහොත් පූර්වපදවයෙන් උපාය කියන ලද්දේය මෙයින් අනුපාය ප්‍රතිෂේධය කියනලද්දේ යයි; සංක්ෂේපයෙන් මෙහි දෙනය ආශ්‍රවසංවර ක්‍රියාය යයි දක්වනලද වෙයි.

මෙවිට යමක් දන්නහුට ආශ්‍රවයන්ගේ ක්ෂයවීම වේද එය දක්වනු කැමැත්තාහු **කිඤ්ච භික්ඛවේ! ජානතෝ** යන පෘච්ඡාව පටන් ගත්හ; එහි දැනීම් බහුවිධ වෙති; යම්හෙයකින් දම් (පණ්ඩිත) සවභාව ඇති යම් කිසි මහණෙක් ඡත්‍රයක් කරන්ට දනී ද කිසිවෙක් විවරාදීන් අතුරෙන් කිසිවක් කරන්ට දනීද; මෙබඳු කර්මයන් වත්තගිර්‍යාදියෙහි සිට කරන්නාවූ ඔහුගේ ඒ දැනීම මාර්ගඵලයන්ට පදස්ථාන නො වේයයි නො කියයුත්තීය යමෙක් වනාහි ශාසනයෙහි පැවිදිව ශ්‍රේදකම් ආදිය කරන්ට දනී ද දන්නාවූ ඔහුට ම ආශ්‍රවයෝ වැඩෙත් [illegible]යි.

එහෙයින් යමක් දන්නහුට දක්නහුට ද ආශ්‍රවයන්ගේ ක්ෂයවීම වේද එය ම දක්වනසේක් **යෝනිසෝ ච මනසිකාරං අයෝනිසෝ ච මනසිකාරං** යි වදාළහ. එහි යෝනිසොමනසිකාරය නම්? උපායමනසිකාරය පථමනසිකාර යයි; අනිත්‍යාදියෙහි අනිත්‍යය යනාදි නයින් ම හෝ සත්‍යානුලොමික ඥානයෙන් හෝ චිත්තයාගේ ආවර්ජනයක් අභිවර්ජනයක් ආභොගයක් සමන්නාහාරයක් මනසිකාරයක් වේද මේ තෙමේ යෝනිසොමනසකාර යයි කියනු ලැබේ.

අයෝනිසෝ මනසිකාරෝ යනු අනුපාය මනසිකාරය උපපථ මනසිකාරය යනාම්යි; අනිත්‍යයෙහි නිත්‍ය යයි දුඃඛයෙහි සුඛ යයි අනාත්ම යෙහි ආත්ම යයි අසුභයෙහි සුභ යයි අයොනිසෝ මනසිකාරයක් උපපථ මනසිකාරයක් සත්‍යයට ප්‍රතිකූලයෙන් හෝ චිත්තයාගේ ආවර්ජනයක් අභිවර්ජනයක් ආභොගයක් සමන්නාහාරයක් මනසිකාරයක් වේ ද මේ තෙම අයෝනිසෝ මනසිකාර යයි කියනු ලැබේ. මෙසේ යෝනිසෝ මනසකාරය උපදවන්ට දන්නහුට අයෝනිසෝ මනසකාරයත් යම්සේ නූපදී ද එපරිද්දෙන් දක්නහුට ආශ්‍රවයන්ගේ ක්ෂයවීම වෙයි; මෙවිට මේ අර්ථයාගේ ම යුක්තිය දක්වනසේක් **යොනිසෝ භික්ඛවේ!** —පෙ— **පහීයන්ති** යි වදාළහ. එසින් කුමක් කියනලද්දේ වේද යත්? යම්හෙයකින් නුනුවණින් මෙනෙහි කරන්නහුට ආශ්‍රවයෝ උපදිත් ද නුවණින් මෙනෙහිකරන්නහුට ප්‍රහීණ වෙත් ද එහෙයින් යොනිසෝ මනසකාරය උපදවන්ට දන්නහුට අයෝනිසෝ මනසකාරයත් යම්සේ නො උපදී ද එපරිද්දෙන් දක්නහුට ආශ්‍රවයන්ගේ ක්ෂයවීම වේ යයි දතයුතුයි. මෝ වනාහි මෙහි සංක්ෂේප වර්ණනායි. මේ වනාහි විස්තර යයි- එහි **"යෝනිසෝ අයෝනිසෝ"** යන මේ පදවයෙන් මත්තෙහි සියලු සූත්‍රය ආබද්ධ වෙයි; වට්ටවිවට්ට වශයෙන් ම මත්තෙහි සියලු සූත්‍රය වදාරනලදී.

වෘත්තය (=සංසාරය) අයොනිසො මනසකාරය මුල්කොට ඇත්තේද විවෘත්තය යොනිසො මනසකාරය මුල්කොට ඇත්තේද වෙයි; කෙසේද? අයොනිසො මනසිකාරය වනාහි වැඩෙන්නේ ධර්මදෙකක් පිරෙයි; අවිද්‍යාව ද භවතෘෂ්ණාවද කියායි; අවිද්‍යාව ඇතිකල්හි අවිද්‍යාව ප්‍රත්‍යය කොට සංසකාරයෝ වෙති —පෙ— දුඃඛස්කන්ධයාගේ සමුදය වෙයි; තෘෂ්ණාව ඇතිකල්හි තෘෂ්ණාව ප්‍රත්‍යය කොට උපාදානය වෙයි —පෙ— සමුදය වේ යයි; මෙසේ මේ අයොනිසොමනසකාරය බහුලකොට ඇති පුද්ගලතෙම වාතවෙගාහි ඝාතයෙන් වෙසෙසින් නට නැවක් මෙන් ද ගඩොළු වතීයෙහි හුනු ගෙරිකැලක් මෙන් ද සක්යත යෙදූ ගවයෙකු මෙන් ද නැවත නැවත භවයොනිගති විඤ්ඤාණස්ථිති සත්ත්වාවාසයන්හි ආවර්තනය පරිවර්තනය කෙරෙයි; මෙසේ පළමුකොට අයොනිසො මනසකාරමූලකවූ වෘත්තය වෙයි; යොනිසො මනසකාරය වනාහි වැඩෙන්නේ **"යොනිසො මනසිකාර සම්පන්නස්සෙතං භික්ඛවෙ! භික්ඛුනො පාටිඝඩ්ඩං අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙස්සති අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලී කරිස්සති"** යි වදළ හෙයින් සම්‍යග්දෘෂ්ටිය ප්‍රමුඛකොට ඇති අෂ්ටාඞ්ගික මාර්ගය සම්පූර්ණ කෙරෙයි; යම් සම්‍යග්දෘෂ්ටියකුත් වේද හෝ තොමෝ විද්‍යාව යයි විද්‍යාවගේ ඉපදීමෙන් අවිද්‍යාවගේ නිරොධයෙන් සංසකාර නිරොධය වෙයි -පෙ- මෙසේ මේ අසම්මිශ්‍ර වූ දුඃඛරාශියාගේ නිරොධය වේ යයි මෙසේ යොනිසො මනසිකාරමූලක වූ විවෘත්තය දතයුතුයි.

මෙසේ මේ පදවයෙන් මත්තෙහි සියලු සූත්‍රය ආබද්ධ වෙයි; මෙසේ බැඳුනුකල්හි ද මෙහි යම් හෙයකින් පළමුකොට ආශ්‍රවයන්ගේ ප්‍රහාණය දක්වා පසුව උත්පත්තිය කියනු ලබන්නී නො යෙදෙයිද; ඒ එසේමැයි- ප්‍රතිඥාවූවාහු යලි නො උපදින්; උපන්නවුන්ගේ වනාහි ප්‍රහාණය යෙදෙයයි; එහෙයින් උද්දෙශ ප්‍රතිලෝම වශයෙන් ම **අයොනිසො භික්ඛවෙ! මනසිකරොනො** යනාදිය වදළහ. එහි **අයොනිසො මනසිකරොනො** උක්තප්‍රකාරවූ අයොනිසො මනසකාරය උපදවන්නහුට; **අනුප්පන්නා වෙව ආසවා උප්පජ්ජන්ති** යන මෙහි පෙර නො ලත්විරූ විවරාදි ප්‍රත්‍යයක් හෝ උපස්ථායක සබ්‍රහ්මචාරික අන්තෙවාසිකයන් අතුරෙන් එක්තරා මනොඥ වසතුවක් හෝ ලැබ එය ශුභය සුඛ යයි නුනුවණින් මෙනෙහි කරන්නහුට ද අන්‍යතර වූ අනනුභූත පුළු (= පෙර නොලත්විරූ) අරමුණක් හෝ යම් ඒ ආකාරයකින් නුනුවණින් මෙනෙහි කරන්නහුට ද යම් ආශ්‍රව කෙනෙක් උපදිත්ද ඔවුහු නූපන්නාහු උපදිත් යයි දතයුත්තාහුය; අන්පරිද්දෙකින් වනාහි අනමතාග්‍රවූ සංසාරයෙහි නූපන් ආශ්‍රවයෝ නම් නැති; පෙර අනුභවකළවිරූ ද වසතුවෙහි හෝ අරමුණෙහි හෝ යමෙකුට ප්‍රකෘතිශුඩියෙන් හෝ උද්දෙශ පරිපෘච්ඡා පර්‍යාපන්න නවකර්ම යොනිසො මනසිකාරයන් අතුරෙන් එක්තරා එකක්හුගේ වශයෙන් ඉහෝ පෙර නො ඉපිද පසුව එබඳුවූ ප්‍රත්‍යයක් කරණකොට ගෙන (යම්

ආශ්‍රව කෙනෙක්) වහා උපදින්ද මොවුහු ද නූපන්නාහු උපදින් යයි දතයුත්තාහුය; ඒ වස්තුවාරම්මණයන්හි ම නැවත නැවත උපදින්නාහු උපන් ආශ්‍රවයෝ වැඩෙත් යයි කියනු ලැබේත්; මෙයින් අන්පරිද්දෙකින් පළමු උපන්නවුන්ගේ වැඩීමෙක් නම් නැති.

යොනිසෝ ච බෝ භික්ඛවෙ! යන මෙහි වනාහි යමෙකුට ආයුෂ්මත් මහාකාශ්‍යපයන්ගේ ද භද්‍රකාපිලානියගේ ද යම්සේ ද එමෙන් ප්‍රකෘතිශුද්ධියෙන් හෝ පරිපෘච්ඡාදි කාරණයන්ගෙන් හෝ ආශ්‍රවයෝ නූපදින් ද; හෙතෙම මාගේ ආශ්‍රවයෝ මාගීයෙන් නැසීමට නො ගියාහු යයි දැනගනී එකාන්තයෙන් ඔවුන්ගේ සමුදඝාතය පිණිස පිළිපදිමියි; අනතුරුව මාගී භාවනාවෙන් සියලු ආශ්‍රවයන් සමුදඝාතනය කෙරෙයි; ඔහුට ඒ ආශ්‍රවයෝ නූපන්නාහු නූපදින් යයි කියනු ලැබෙත්; කාරණ වූ ම යමෙකුට වනාහි සිහිමුළාවීමෙන් වහා ආශ්‍රව උපදින්ද ඉක්බිති සංවෙගයට පැමිණ නුවණින් වීර්‍යය කරන්නේ ඒ ආශ්‍රවයන් සමුච්ඡේද කෙරේද; ඔහට උපන්නාහු ප්‍රහීණවෙත් යයි කියනු ලැබෙත්.

"මහානිසභූති" නෙර වත.

මණ්ඩලාරාමවාසී **මහානිසභූති** ස්ථවිරයන්ට මෙනි හෙතෙම වනාහි ඒ වෙහෙරම උද්දෙශග්‍රහණය කෙරෙයි, ඉක්බිති ගම්හි පිඬු පිණිස හැසිරෙන ඕහට විසභාගාරම්මණයෙක්හි කෙලෙස් උපන; හෙතෙම එය විදර්‍ශනාවෙන් විඡකම්භණය කොට විහාරයට ගියේය. ඕහට සිහි නෙහි ද ඒ අරමුණ ළඟ සිටියේය; හෙතෙම මේ කෙලෙස් වැඩී අපා යෙහි ඉපදීම පිණිස පවත්නේ වේ යයි සංවෙග උපදවා ආචාර්‍යයන් විචාරා වෙහෙරින් නික්ම මහා සඞ්ඝරක්ෂිත ස්ථවිරයන්ගේ සමීපයෙහි රාගයට පිළිපක්වූ අසුභභාවනාවහන් ගෙන ගුම්බානන්තරයකට (=ලැහැබක් මැදව) ප්‍රවිෂ්ටව පවුල්සිවුර අතුරා හිඳ අනාගාමි මාර්ගයෙන් පඤ්චකාම ගුණීකරාගය සිඳ නැගිට ආචාර්‍යයන් වැඳ දෙවනදින උද්දෙශමාර්ගයට පැමිණියේය; යම් ආශ්‍රව කෙනෙක් වනාහි වර්තමානයෙහි නූපන්නාහුද ඔවුන්ගේ ප්‍රතිපත්තියෙන් ප්‍රහාණයෙක් නම් නැති; මේ අවසරයෙහි **උප්පන්නා ච ආසවා පහීයන්ති** යන මේ පදය ම ගෙන යම් ආශ්‍රව කෙනෙක් ප්‍රහීණ වෙත් ද ඔවුන්ගේ නානාප්‍රකාරය හෙයින් අනිකුදු ප්‍රහාණ කාරණයක් පහළකරන්ට දෙශනා ප්‍රභෙදයෙහි දක්ෂවූ ධර්මරාජ යෙක් යම්සේ ද එමෙන් දෙශනාව විස්තාරකරන සේක් **අපි භික්ඛවෙ! ආසවා දස්සනා පහාතබ්බා** යනාදිය වදාළහ.

එහි දස්සනා පහාතබ්බා= දර්‍ශනයෙන් පහකළ යුත්තාහු; සියලු තැන්හි මේ නයයි; මෙවිට ඒ පදයන් පිළිවෙළින් ප්‍රකාශකරනු කැමැත්තාහු **කතමෙ ච භික්ඛවෙ! ආසවා දස්සනා පහාතබ්බා?** යි ප්‍රශ්නකොට මූලපරියාය වණ්ණනාවෙහි කී ක්‍රමයෙන් ම **ඉධ භික්ඛවෙ! අස්සුතවා පුථුජ්ජනෝ** යි පුද්ගලාධිෂ්ඨාන දෙශනාව ආරම්භකළසේක.

එහි මනසිකරණීයෙ ධම්මෙ නප්පජානාති= ආවජ්ජනාකළ යුතුවූ; සිත්හි එලවිය යුතුවූ ධර්මයන් නො දනියි; **අමනසිකරණීයෙ**= ඊට විපරීතවූ; සෙසු පදයන්හි ද මේ නයයි; යම් හෙයකින් වනාහි මේ ධර්මයෝ මෙනෙහි කළයුත්තෝය මොවුහු නො මෙනෙහි කළයුත්තෝ යයි ධර්මහෙයින් නියමයක් නැත්ද; ආකාර වශයෙන් නියමය ඇත්ද; යම් ආකාරයකින් මෙනෙහි කරනු ලබන්නාහු අකුශලොත්පත්තියට පදස්ථාන වෙත් ද; ඒ අයුරින් නො මෙනෙහි කළයුත්තාහු ද; යම් ආකාරයකින් කුශලොත්පත්තියට පදස්ථාන වෙත් නම් එපරිද්දෙන් මෙනෙහි කළයුත්තාහුද; එහෙයින් **යස්ස හිකඛවෙ! ධම්මෙ මනසි කරොතො අනුප්පන්නා වා කාමාසවා** යනාදිය වදාළහ. එහි **යස්ස**= (යෙ + අස්ස යි විවෙජ්දයි) යම් (ධර්මකෙනෙක් මෙනෙහි කරන්නාවූ) ඒ අශ්‍රැතවත් පෘථජ්ජනයාහට; **මනසි කරොතො**= ආවජ්ජනා කරන්නහුට සිත්හි මොනොවට එලවන්නහුට; **අනුප්පන්නා වා කාමා** **"වා" ශබ්දය. සවෝ**= යන මෙහි "වා" ශබ්දය තෙම සමුච්චයාර්ථයි; විකල්පාර්ථ නො වෙයි; එහෙයින් යම්සේ **"යාවතා හිකඛවෙ! සත්තා අපදා වා දිපදා වා** —පෙ— **නත්ථාගතො නෙසං අග්ග මක්ඛායති"** යි කිකල්හි අපාදයෝ ද ද්විපාදයෝ ද යන අර්ථය වේද; යම්සේ **"භූතානං වා සත්තානං සිතියා සම්භවෙසිනං වා අනුග්ගහාය"** යි කිකල්හි භූතයන්ට ද සම්භවෙසින්ට ද (=උපන් සත්වයන්ට ද උපදිමින් සිටි සත්වයන්ට ද) යන අර්ථය වේද; යම්සේ **"අග්ගිනො වා උදකතො වා මිථුභෙදතො වා"** යි කිකල්හි ගින්නෙන් ද ජලයෙන් ද මිථුභෙදයෙන් ද යන අර්ථය වේද; එපරිද්දෙන් මෙහි ද නූපන් කාමාශ්‍රවය ද උපදියි. උපන් කාමාශ්‍රවය ද වැඩෙයි, යන අර්ථය දතයුතුයි; සෙස්සෙහිදු මෙසේයි. මෙහි ද **කාමාසවෝ** යනු පඤ්චකාමගුණික රාගයයි; **භවාසවෝ** යනු රූපාරූපභවයෙහි ඡන්දරාගය ද ධ්‍යානනිකාන්තිය ද ශාස්වත උච්ඡේද දෘෂ්ටි සහිත වූවාහු; මෙසේ දෘෂ්ට්‍යාශ්‍රවය ද භවාශ්‍රවයෙහි ම එක්වීමට යෙයි; **අවිජ්ජාසවෝ** සතු සිවිසස්හි නො දැන්මයි; එහි කාමගුණයන් ආස්වාද වශයෙන් මෙනෙහි කරන්නහුට නූපන් කාමාශ්‍රවය ද උපදී, උපන් කාමාශ්‍රවයත් වැඩෙයි; මහද්ගත ධර්මයන් ආස්වාද වශයෙන් මෙනෙහි කරන්නහුට නූපන් භවාශ්‍රවය ද උපදියි, උපන් භවාශ්‍රවයත් වැඩෙයි; භූමිත්‍රයෙහි ධර්මයන් සතර විපර්‍යාසයන්ට පදස්ථාන භාවයෙන් මෙනෙහි කරන්නහුට නූපන් අවිද්‍යාශ්‍රවය ද උපදියි උපන් අවිද්‍යාශ්‍රවයත් වැඩේ යයි දතයුතුයි. කී ක්‍රමයට ප්‍රත්‍යනීක වශයෙන් ශුකලපක්ෂය විස්තර කටයුතුයි.

කුමක් හෙයින් වනාහි ආශ්‍රව තුනක් ම මෙහි වදාරන ලද්දාහුද යත්? විමොක්ෂයන්ට ප්‍රතිපක්ෂ හෙයිනි; යම් හෙයකින් කාමාශ්‍රවය අප්‍රණිහිත විමොක්ෂයට ප්‍රතිපක්ෂවේද; අන්‍යයෝ අනිමිත්තසූන්‍යතා විමොක්ෂයන්ට ප්‍රතිපක්ෂ වෙත්ද; එහෙයින් මේ ආශ්‍රවත්‍රය උපදවන්නාහු ත්‍රිවිධවිමොක්ෂ

යන්ට අභාගීහු වෙති, නො උපදවන්නාහු භාගීහු වෙතැයි මේ අර්ථය දක්වන්නහු විසින් තිදෙනෙක් ම වදාරන ලද්දාහු යයි දතයුත්තාහුය; නොහොත් දෘෂ්‍යාශ්‍රවය ද මෙහි වදාරන ලද්දේ ම යයි මේ වර්ණනා කරනලද.

තස්ස අමනසිකරණීයානං ධම්මානං මනසිකාරා යනු මෙනෙහි කිරීම හෙතුකොටගෙන; යම් හෙයකින් ඒ ධර්මයන් මෙනෙහි කෙරේද එහෙයිනැයි කියනලද වෙයි; දෙවෙනි පදයෙහි ද මේ නයයි; **අනුප්පන්නා චෙව ආසවා උප්පජ්ජන්ති උප්පන්නා ච ආසවා පවඩ්ඪන්ති** යනු යට කියනලද ආශ්‍රවයන්ගේ ම මේ අභෙදවශයෙන් දැක්වීමයි.

මෙතෙකින් පුද්ගලාධිෂ්ඨාන දෙශනාවෙන් පහකළයුතු ආශ්‍රවයන් දක්වන්ට යම් මේ අශ්‍රැතවත් පෘථජ්ජනයෙක් කියනලද්දේ ද හෙතෙම යම් හෙයකින් **අයෝනිසෝ භික්ඛවෙ! මනසිකරොතෝ අනුප්පන්නා චෙව ආසවා උප්පජ්ජන්ති** යි මෙසේ සාමාන්‍යයෙන් කියනලද නුනුවණින් මෙනෙහි කිරීම ප්‍රත්‍යයකොට ඇති කාමාශ්‍රවාදීන්ගේ ද අධිෂ්ඨානය වේද; එහෙයින් ඒ ආශ්‍රවයන් ද ඒ පුද්ගලයා සමග ම දක්වා දැන් දැනීමයෙන් ප්‍රහීණකළයුතු ආශ්‍රවයන් දක්වනසේක් **සෝ එවං අයොනිසෝ මනසිකරොති අහොසිං නු ඛෝ අහං** යනාදිය වදාළහ. නොහොත් විචිකිච්ඡා ශීර්ෂයෙන් මෙහි දෘෂ්‍යාශ්‍රවය ද දක්වනු පිණිස මේ දෙශනාව පටන්ගත්සේක.

ඒ පදයාගේ අර්ථය නම්? යමෙකුට මේ කියනලද ක්‍රමයෙන් මේ ආශ්‍රවයෝ උපදිත්ද හෙතෙම පෘථජ්ජන නම් වේ; යම් මේ පෘථජ්ජනයෙක් තෙම "අස්සුතවා" යනාදිනයින් කියනලද්දේ ද ඒ පෘථජ්ජන තෙමේ මෙසේ නුනුවණින් අනුපායෙන් නො මඟින් මෙනෙහි කෙරෙයි; කෙසේ ද? **අහොසිං නු ඛෝ —පෙ— සෝ කුහිංගාමී භවිස්සතීති** යි; (මෙයින්) කුමක් කියනලද වේදයත්? ඔහට යම්සේ **අහොසිං නු ඛෝ** යනාදි ක්‍රමයෙන් කියනලද ඡොඩශ විභාගඇති මෝ විචිකිච්ඡා තොමෝ උපදීද හෙතෙම එපරිද්දෙන් නුනුවණින් මෙනෙහි කෙරෙයි; **එහිං අහොසිං නු ඛෝ නා නු ඛෝ** යනු ශාස්වතාකාරය ද අධිච්චසමුප්පත්ති ආකාරය ද නිසා අතීතයෙහි තමාගේ විද්‍යමානබව ද අවිද්‍යමානබව ද සැකකරයි; කරුණු කිමෙකැයි නො කියයුතුයි; පුහුදුන් තෙමේ උමතු වෙකු මෙන් යම් ඒ ආකාරයකින් පවතී; තවද අයොනිසෝ මනසිකාරය ම මෙහි කරුණුයි; මෙසේ අයොනිසෝ මනසිකාරයට කරුණු කිම යත්? ඒ පෘථජ්ජනභාවය ම හෝ ආර්‍යයන්ගේ නොදැක්මාදිය හෝයි; පෘථජ්ජන තෙමේ නුවණින් මෙනෙහි කරන්නේ නොවේ ද? යි නො මෙනෙහි කෙරේ යයි කවරෙක් හෝ මෙසේ කියා ද? එහි පෘථජ්ජන භාවය කරුණු නො වෙයි; සඩ්ඪී ශ්‍රවණය කල්‍යාණමිත්‍ර භාවාදිය එහි කරුණු වෙති; මස් මාළු ආදීහු තමාගේ පියවුන් නො ම සුවඳ වෙති සකස්කිරීම හෙතුකොට ගෙන සුවඳ ද වෙති.

කිනත්තු බො අහොසිං= ජාතිලිඞ්ගාපප්‍රාපතීන් නිසා ක්ෂත්‍රියයෙක් හෝ වීම්ද බ්‍රාහ්මණ වෛශ්‍ය ශූද්‍ර ගෘහස්ථ ප්‍රව්‍රජිත.දිව්‍ය මනුෂ්‍යයන් අතුරෙන් එක්තරා එකෙක් හෝ වීම්දැයි සැක කෙරෙයි; **කථන්නු බො=** සංස්ථානාකාරය නිසා දිඝ හෝ වීම්ද හ්‍රස්වාවදාත.කෘෂ්ණ ප්‍රමාණිකා ප්‍රමණිකාදීන් අතුරෙන් එක්තරා එකෙක් හෝ වීම්දැයි සැක කෙරෙයි; කිසි වෙක් වනාහි ඊශ්වර නිර්මාණාදිය නිසා කිනම් කාරණයකින් වූයෙම්ද? යි හෙතුවෙහි සැක කෙරේ යයි කියයි. **කිං හුත්වා කිං අහොසිං=** ජාති ආදිය නිසා ක්ෂත්‍රියයෙක් වී හෝ බ්‍රාහ්මණයෙක් වීම්ද —පෙ— දෙවියෙක් වී හෝ මිනිසෙක් වීම් දැ? යි තමාගේ පරම්පරාව සැක කෙරෙයි; සියලු තැන්හි ම **අඛානං** යන මෙය කාලයට නමකි. **භවිස්සාමි නු බො න නු බො** ශාශ්වතාකාරය ද උච්ඡේදාකාරය ද නිසා අනාගතයෙහි තමාගේ විද්‍යමානබව ද අවිද්‍යමානබව ද සැකකරයි; සෙස්ස මෙහි කී නයමැයි.

එතර්හි වා පච්චුප්පන්නං අඛානං යනු දැන් හෝ ප්‍රතිසන්ධිය ආදි කොට චුතිය අවසන්කොට ඇති සියලු ම වර්තමානකාලය ගෙන **අජ්ඣත්තං කථංකථී හොති=** යනු තමාගේ සකන්ධයන්හි විචිකිත්සා ඇත්තේ වෙයි; **අහං නු ඛොස්මි=** තමාගේ විද්‍යමානබව සැක කෙරෙයි; මේ (තමාගේ විද්‍යමානත්වය සැක කිරීම) යොග්‍යවේද යන්? යොග්‍ය වෙයි; අයුතු යයි මෙහි ලා සිතීමකිම? වැලිදු මෙහි මේ වසතුව ගෙනහැර දක්වති-

නමා ඇතිබව සැකකිරීම.

සුලුමවගේ පුත්‍රතෙම (හිස) මුඩුවූයේ ලු; මහමවගේ පුත්‍රතෙම මුඩු නොවූයේය; ඒ පුත්‍රයා (නිදනකල) මුඩු කළාහුය; හෙතෙම නැඟිට මම සුලුමවගේ පුත්‍රයා වෙම් දෝ හෝයි සිතී ලු; මෙසේ මම වෙම් දෝ හෝයි සැකය වෙයි.

නොහු බොස්මි= තමාගේ අවිද්‍යමාන (= නැති) බව සැක කෙරෙයි. එහි ද මේ වසතුව වෙයි; එකෙක් මසුන් අල්වන්නේ දියෙහි බොහෝ වේලාවක් සිටි මෙන් සිහිල්වූ තමාගේ කලවය මසෙකැයි සිතා පහළේ ලු; අනෙකෙක් සොහොන්පස කෙතක් රක්නේ බියපත් වූයේ හැකිලී හොත්තේය; හෙතෙම පිබිද තමාගේ දෙදන යකුන් දෙදෙනෙකැයි සිතා පහළේය. මෙසේ මම නොවෙම් දෝ හෝයි සැක කෙරෙයි. **කිනත්තු බො=** ක්ෂත්‍රියයෙක් වූයේ ම තමාගේ ක්ෂත්‍රියභාවය සැකකෙරෙයි; සෙස්සෙහිදු මේ නයයි. දෙවිවූයේ වනාහි දෙවිබව නොදන්නෙක් නම් නැති; එතකුදුවුවත් හෙතෙමේ ද මම රූපිදෙවියෙක් දෝ හෝ අරූපි දෙවියෙක් දෝ හෝ යනාදිනයින් සැක කෙරෙයි. ක්ෂත්‍රියාදීහු කුමක් හෙයින් නොදනිද යත්? ඔවුන්ගේ ඒ ඒ කුලයෙහි ඉපදීම ප්‍රත්‍යක්ෂ නොවන්නීය; ගෘහස්ථවූ ද පොතලිකාදිහු "ප්‍රව්‍රජිතයෙමි" යන සංඥ ඇති වෙත්; ප්‍රව්‍රජිතයෝ ද මාගේ කර්මය ඝොෂ්‍යවී දෝ හෝයි ආදි නයින් ගෘහස්ථ සංඥ ඇත්තාහු වෙත්; මනුෂ්‍යයෝ ද රජවරුන් මෙන් තමා කෙරෙහි දෙවිය යන සංඥව ඇත්තාහු වෙති.

කථඤ්හි බොසම් යනු කිම නය මැයි; හුදෙක් මෙහි ඇතුලත ජීවයක් නම් ඇතැයි ගෙන ඒ ජීවයාගේ පිහිටීම් ආකාරය ඇසුරුකොට දිඹී හෝ වෙම්ද හ්‍රස්ව සිව්රැස් සයැස් අටැස් සොළොසැස් ආදීන් අතුරෙන් එක්තරා ප්‍රකාරයක් වෙම් දෝ හෝයි සැකකරන්නේ කෙසේ වෙම් දෝ හෝයි සැකකෙරේ යයි දතයුතුයි. දැන් පවත්නාවූ සිරුරු සටහන වනාහි නො දන්නෙක් නම් නැති. **කුහෝ ආගතෝ සෝ කුහිංගාමී භවිස්සති** යනු ආත්මභාවයාගේ ආගමන ගමන ස්ථානය සැක කරයි; මෙසේ සොළොස් වැදෑරුම් විචිකිත්සාව දක්වා මෙවිට මේ විචිකිත්සාශීර්ෂ යෙන් යම් දෘෂ්‍යාශ්‍රවයක් දක්වන්ට මෝ දෙශනා තොමෝ පටන්ගත්තා ලද්දිද එය දක්වනසේක් **නස්ස එවං අයොනිසෝ මනසි කරොතෝ ජනනං දිට්ඨිනං** යනාදිය වදාළහ. ඒ පුද්ගලයාහට යම්සේ මෝ විචිකිත්සා උපදිද එපරිද්දෙන් නුනුවණින් මෙනෙහි කරන්නාහුට විචිකිත්සා සහිතවූ ඒ අයොනිසෝ මනසිකාරය ම දැඩිබවට ගියහෙයින් ස වැදෑරුම් දෘෂ්ටින් අතුරෙන් එක්තරා දෘෂ්ටියක් උපදියයි, කියනලද්දේ වෙයි; එහි සියලු පදයන්හි "වා" ශබ්දය තෙම විකල්පාර්ථයි; මෙසේ හෝ මෙසේ හෝ දෘෂ්ටිය උපදී යයි කියනලද්දේ වෙයි; **අත්ථි මේ අත්තා** යන මෙහි ද ශාස්වත දෘෂ්ටිය සියලු කාලයෙහි තමාගේ අස්තිභාවය ගනියි; **සච්චතෝ ථෙතතෝ**= භූත (=සත්‍ය) වශයෙන් ද සථිර වශයෙන් ද; මෙය සැබෑවැයි ඉතා දැඩභාවයෙනැයි කියනලද වෙයි.

නත්ථි මේ අත්තා යන මෝ වනාහි උච්ඡේද දෘෂ්ටි යයි; විද්‍යමානවූ සත්ත්වයාගේ ඒ ඒ තැන්හි විභවග්‍රහණය හෙයිනි. නොහොත් පළමු දක්වන ලද්දී ද කාලත්‍රයෙහි ඇතැයි ගන්නාහුට ශාස්වත දෘෂ්ටි යයි; වර්තමාන කාලය ම ඇතැයි ගන්නී උච්ඡේද දෘෂ්ටි යයි; පසුව දක්වන ලද්දී ද අතීතානාගත කාලයන්හි නැතැයි ගන්නාහුට "අපු කෙළවරකොට ගිහිවෙත්" යයි ගත්දෘෂ්ටි ඇත්තවුන්ට මෙන් උච්ඡේද දෘෂ්ටි යයි; **අතීතයෙහි ම නැතැයි ගන්නී අධිච්චසමුප්පන්නිකයාට මෙන් ශාස්වත දෘෂ්ටියයි.**

අත්තනාව අත්තානං සඤ්ඤානාමි= සංඥාසකාය ශීර්ෂයෙන් සකාය යන් ආත්ම යයි ගෙන සංඥාසකාය්‍යෙන් අවශෙෂ වූ **සකාය්‍යන් දැන** ගන්නාහුට මේ ආත්මයෙන් මේ ආත්මය දනිම්යි දෘෂ්ටිය වෙයි. **අත්තනාව අත්තානං**= සංඥාසකාය ම ආත්ම යයි ගෙන ඉතිරි සතර ම අනාත්ම යයි ගෙන සංඥාවෙන් ඔවුන් දැනගන්නාහුට මෙසේ (දෘෂ්ටිය) වෙයි; **අනත්තනාව අත්තානං**= සංඥාසකාය අනාත්ම යයි ද ඉතිරි සතර සකාය්‍යන් ආත්ම යයි ද ගෙන සංඥාවෙන් ඒ සකාය්‍යන් දැනගන්නාහුට මෙසේ (දෘෂ්ටිය) වෙයි; සියල්ලෝම ශාස්වතොච්ඡේද දෘෂ්ටිහු මැයි.

වදෙ වෙදෙය්‍යෝ= යනු ආදිය වනාහි ශාස්වත දෘෂ්ටිහුගේ ම බැස ගැනීම් ආකාරයෝයි; එහි කියාතුයි **"වදෙ"** යනු වේ; වාක් කර්මය කරන්නේ යයි කියනලද්දේ වෙයි; විදිනුයි **වෙදෙය්‍ය** නම් වේ; දනියයි ද අනුභව කෙරේ යයි ද කියනලද වෙයි; කුමක් විඳිද යත්? ඒ ඒ

තැන්හි කුශලා කුශල කර්මයන්ගේ විපාකය විඳියි; **තත්‍ර තත්‍ර**= ඒ ඒ යෝනි ගතිසම්පත්ති නිවාස නිකායයන්හි නොහොත් ආලම්බණයන්හි; **නිවෙවා**= ඉපදීම් විනාශවීම් රහිතවූයේ; **ධ්‍රුවෝ**= ස්ථිරවූයේ සාරවූයේ; **සශ්වතෝ**= සදාකාලිකවූයේ (= සියලු කල්හි පවත්නේ;) **අවිපරිණාම ධර්මෝ**= තමාගේ ප්‍රකෘතිභාවය නො හරින සුභාව ඇත්තේ; බොහෝ දෙකු මෙන් නානාප්‍රකාර බවට නො පැමිණෙයි; **සශ්වතිසමං**= වස්තු සූර්‍ය්‍ය සමුද්‍ර මහා පෘථිවී පර්වතයෝ ලෝක ව්‍යවහාරයෙන් සදාකාලිකයෝ යයි කියනු ලැබෙත්; ශාස්වතිකයන් හා සමානවූයේ "සස්සතිසම" නම් වේ; ශාස්වතීහු යම්තාක් සිටිද ඒතාක් එසේ ම සිටී යයි ගන්නාහුට මෙපරිද්දෙන් දෘෂ්ටිහු වෙති; **ඉදං වුච්චති භික්ඛවෙ! දිට්ඨිගතං** යනාදි තැන්හි **ඉදං** යනු දැන් කියයුත්තාහුගේ ප්‍රත්‍යක්ෂයෙන් දැක්වීමයි; දෘෂ්ටිගත සම්බන්ධයෙන් ද මේ කියනු ලදී; දෘෂ්ටි සම්බන්ධයෙන් නො කියනලදී. මෙහි වූ කලි දෘෂ්ටියම දෘෂ්ටිගත නම් "ගූථගතං" යනු මෙනි. නොහොත් දෘෂ්ටීන්හි ගියාවූ මේ දර්ශනය දෙසැට දෘෂ්ටියෙහි ඇතුලත්වූ බැවිනැයි ද "දිට්ඨිගත" නම් වෙයි; දෘෂ්ටියට ගියේ නුයි හෝ "දිට්ඨිගත" නම් වෙයි; මේ වාක්‍යාහි **අත්ථි මෙ අත්තා** යනාදිවූ දෘෂ්ටියට ගමනමාත්‍රයෙක් මැයි; **මෙහි** ආත්මවූ හෝ නිත්‍යවූ හෝ කිසිවෙක් නැතැයි කියනලද වෙයි.

ඕ මෝ දෘෂ්ටිතොමෝ ද දුකසේ නික්ම යායුතු අර්ථයෙන් **ගහණ** නම් වේ; දුකසේ ඉක්මවිය යුතු අර්ථයෙන් ද ප්‍රතිභය සහිතා ර්ථයෙන් ද **කානනාර** නම් වේ; දුර්භික්ෂකාන්තාර ව්‍යාලකාන්තාරාදිය මෙනි; **සම්‍යග් දෘෂ්ටිය විනිවිදින අර්ථයෙන් ද** (ඊට) විලෝමාර්ථයෙන් ද **විසූක** නම් වේ; **කලෙක ශාස්වතය ද කලෙක උච්ඡේදය ද ග්‍රහණය කරන හෙයින් විරූපවූ කල්පනය නුයි විප්ඵන්දිත** නම් වේ; බන්ධනාර්ථයෙන් **සංයොජන** නම් වේ; එයින් වදාළහ- **දිට්ඨිගහණං -පෙ- දිට්ඨිසංයොජනං** යි.

මෙවිට මේ දෘෂ්ටිහුගේ ඒ බන්ධනාර්ථය ම දක්වනසේක් දිට්ඨිසංයොජන සංයුත්තෙනා යනාදිය වදාළහ. ඒ දෙශනාවගේ මේ සංක්ෂේපාර්ථ යයි. මේ දෘෂ්ටිසංයෝජනයෙන් බැඳුනාවූ පුහුදුන් තෙමේ මේ ජාතිආදින්ගෙන් නො මිදෙයි; බොහෝ කිමෙන් කිම හෝ? සියලු සසර දුකින් ම නො මිදේ යයි.

මෙසේ ත්‍රිප්‍රභෙද වූ දෘෂ්ට්‍යාශ්‍රවය දක්වා යම්හෙයකින් ශීලව්‍රත පරාමර්ශය කාමාසවාදි වචනයෙන් ම දක්වනලද්දේ වේද කාමාසැපය පිණිස භවසැපය ද භවවිශුද්ධිය පිණිස අවිද්‍යාවෙන් මඩනාලද මේ ශාසනයෙන් බාහිර වූ මහණ බමුණෝ ශීලව්‍රතයනුත් පරාමර්ශය කෙරෙත්ද; එහෙයින් එය නො දක්වා දෘෂ්ටිග්‍රහණයෙන් හෝ ඒ ශීලව්‍රත පරාමර්ශය ගත්බැවින් එය නො දක්වා ම මෙවිට යම් පුද්ගලයෙක් දර්ශනයෙන් පහකළයුතු ආශ්‍රවයන් පහකෙරේද ඒ පුද්ගලයා දක්වා ඒ ආශ්‍රවයන්ගේ ප්‍රහාණය දක්වන්ට හෝ පළමුකොට නුනුවණින් මෙනෙහි කරන්නාවූ පුහුදුන්න

හුට ඔවුන්ගේ උත්පත්තිය දක්වා දැන් එයින් විපරීතවූවහුට ප්‍රහාණය දක්වන්ට හෝ **සුතවා ච බෝ හික්ඛවෙ!** යනාදිය වදාළහ. ඒ දෙශනා වගේ අර්ථය නම්? යම්තාක් හෙතෙම මේ දුක යයි පැමිණේද ඒතාක් යට කී නයින් ද කියනලද්දට විරුඬනයින් ද දතයුතුයි.

විරුඬ ක්‍රමයෙන් ද සියලු ආකාරයෙන් ආර්‍ය්‍ය ධර්‍මයෙහි අකොවිද අවිනීත ප්‍රත්‍යනීක භාවයෙන් මේ ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම ආර්‍ය්‍ය ධර්‍මයෙහි දක්ෂවූයේ ද ආර්‍ය්‍ය ධර්‍මයෙහි සුවිනීතවූයේ ද වේ යයි දතයුතුයි.

චතුස්සත්‍ය කර්‍මස්ථානිකයාගේ යොනිසොමන සකාරය.

වැලිදු වනාහි ශික්ෂාප්‍රාප්ත වූ විදර්‍ශීනාවෙහි පවත් ගොත්‍රභූවිත්තය යම්තාක් ද ඒතාක් ඊට අනුරූප වූ අර්‍ථයෙන් මේ ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම දතයුතු. **සො ඉදං දුක්ඛන්ති යොනිසො මනසිකරොති** යනාදියෙහි වනාහි මෝ අර්‍ථවිභාවනායි– ඒ චතුස්සත්‍ය කර්‍මස්ථානික වූ ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම තෘෂ්ණාව තොරකොට ඇති ත්‍රෛභූමක සකෘත්‍යයෝ දුක යැ තෘෂ්ණාව දුඃඛ සමුදය යැ දෙදෙනාගේ නො පැවැත්ම නිරොධය යැ නිරොධයට පමුණුවන්නේ මාර්‍ගය යැයි මෙසේ පළමුකොට ම ඇදුරන් සමීපයෙහි උගන්නාලද චතුස්සත්‍ය කර්‍මස්ථාන ඇත්තේ පසු කලෙක විදර්‍ශීනා මාර්‍ගයට බැසගන්නා ලද්දේ ඒ ත්‍රෛභූමක සකෘත්‍යන් මේ දුක යයි නුවණින් මෙනෙහි කරයි, උපායයෙන් මාර්‍ගයෙන් සිත්හි එලවීම ද කෙරෙයි, විදර්‍ශීනාත් කෙරෙයි; ඒ එසේමැය මෙහි සෝවාන් මහ යම්තාක් ද එතාක් මනසිකාර ශීර්‍ෂයෙන් ම විදර්‍ශීනා කියනලදු; ඒ දුක ම උපදවන්නී වූ පහළකරන්නී වූ යම් මෝ තෘෂ්ණාවක් වන්නී ද සමුදය මෙය යයි නුවණින් මෙනෙහි කෙරෙයි.

යම් හෙයකින් වනාහි මේ දුක ද සමුදය ද මේ ස්ථානයට පැමිණ නිරුඬවෙත් ද නො පවතින් ද එහෙයින් යම් මේ නිර්‍ව්‍යාණයක් නම් වේද මේ තෙමේ දුඃඛනිරොධ යයි නුවණින් මෙනෙහි කෙරෙයි; නිරොධයට පමුණුවන්නාවූ අටඟමඟ මෝ තොමෝ දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදාව යයි නුවණින් මෙනෙහි කෙරෙයි, උපායයෙන් මාර්‍ගයෙන් සිත්හි එලවීම ද කෙරෙයි, විදර්‍ශීනාත් කෙරෙයි; එහි මේ උපාය යයි– අභිනිවෙශය නම් වෘත්තයෙහි වෙයි, විවෘත්තයෙහි නැත්ද; එහෙයින් මේ තෙමේ මේ ශරීරයෙහි පෘථිවී ධාතුව ඇත, ආපෝ ධාතුව ඇත, යනාදි නයින් සවකීය සන්තතියෙහි සතර භූතයන් ද ඒ අනුසාරයෙන් උපාදරූපයන් ද පරිග්‍රහණය කොට "මේ රූපස්කන්ධ" යයි නිශ්චය කෙරෙයි; එය නිශ්චයකරන්නහුට උපන් තදුලම්බණ චිත්තචෛතසික ධර්‍මයන් "මොවුහු සතර අරූපස්කන්ධයෝ" යයි නිශ්චය කෙරෙයි; අනතුරුව මේ පඤ්චස්කන්ධයෝ දුක යයි නිශ්චය කෙරෙයි; ඔවුහු වනාහි සැකෙවින් නාමය ද රූපය දැයි දෙකොටසක් ම වෙති. මේ නාමරූපය ද කරුණු සහිතව ප්‍රත්‍යය සහිතව

උපදියි; ඒ නාම රූපයට මේ කරුණු යෑ මේ ප්‍රත්‍යය යැයි අවිද්‍යා භව තෘෂ්ණා කර්මාහාරාදි වූ හෙතු ප්‍රත්‍යයයන් ව්‍යවස්ථා කෙරෙයි; ඉක්බිති ඒ ප්‍රත්‍යයන්ගේ ද ප්‍රත්‍යයොත්පන්න ධර්මයන්ගේ ද අවිපරීතවූ තමාගේ සභාව ලක්ෂණය පිරිසිඳ දැන මේ ධර්මයෝ (පෙර) නොවී (වර්තමානයෙහි) වෙත් යයි අනිත්‍ය ලක්ෂණයට ආරොපණය කෙරෙයි. ඉපදීම් නැසීම් දෙකින් පීඩිතවූ හෙයින් දුඃඛ යයි දුඃඛලක්ෂණයට ආරොපණය කෙරෙයි තමාගේ වශයෙහි නොපවත්නා හෙයින් අනාත්ම යයි අනාත්ම ලක්ෂණයට ආරොපණය කෙරෙයි; මෙසේ ත්‍රිලක්ෂණයන්ට ආරොපණය කොට පිළිවෙළින් විදර්ශනාව පවත්වන්නේ සෝවාන්මගට පැමිණෙයි; එකෙණෙහි චතුරාර්යසත්‍යයන් එකප්‍රතිවෙධයෙන් ම ප්‍රතිවෙධ කෙරෙයි එකාභිසමයෙන් ම අභිසමය කෙරෙයි; දුඃඛසත්‍යය පරිඥත ප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කෙරෙයි; සමුදයසත්‍යය ප්‍රහාණ ප්‍රතිවෙධයෙන් ද නිරොධ සත්‍යය සාක්ෂාත්ක්‍රියා ප්‍රතිවෙධයෙන් ද මාර්ගසත්‍යය භාවනා ප්‍රතිවෙධ යෙන් ද (ප්‍රතිවෙධ කෙරෙයි;) යලි දුඃඛසත්‍යය පරිඥාභිසමයෙන් අභිසමය කෙරෙයි --පෙ— මාර්ගසත්‍යය භාවනාභි සමයෙන් අභිසමය කෙරෙයි; එතකුදුවුවත් අන්‍යොන්‍ය ඥානයෙන් නොද (අභිසමය කෙරෙයි;) සැබවමේ තෙම එකඥානයෙන් ම නිරොධය ආරම්මණ වශයෙන් ද සෙසු සත්‍යයන් කෘත්‍යය වශයෙන් ද ප්‍රතිවෙධය ද කෙරෙයි, අභිසමයත් කෙරෙයි; ඔහට එසමයෙහි මෙබඳු සිතක් නොවේ මැයි මම දුඃඛසත්‍යය දනිමියි කියා හෝ —පෙ— මාර්ගසත්‍යය වඩමියි හෝ සි; වැලි. එකෙක් ඇති-අරමුණු කොට ප්‍රතිවෙධ වශයෙන් නිරොධය පසක් කරන්නාවූ ම ඔහට ඒ (ප්‍රතිවෙධ) ඥානය දුඃඛයාගේ පරිඥත කෘත්‍යය ද සමුදයයාගේ ප්‍රහාණ කෘත්‍යය ද මාර්ගයාගේ භාවනා කෘත්‍යය ද කෙරේමැයි; මෙසේ උපාය යෙන් නුවණින් මෙනෙහි කරන්නාවූ ඔහුගේ විංශති වස්තුක සත්කාය දෘෂ්ටිය ද අෂ්ටවස්තුක විචිකිත්සාව ද ශීලයෙන් ශුද්ධිය යෑ ව්‍රතයෙන් ශුද්ධිය යැයි ශීලව්‍රතයන් පරාමර්ශනය කරන්නාවූ ශීලව්‍රත පරාමර්ශය ද යන සංයොජනත්‍රය ප්‍රහීණවෙත් යයි.

එහි සතර ආශ්‍රවයන් අතුරෙන් සත්කායදෘෂ්ටි ශීලව්‍රත පරාමර්ශයෝ දෘෂ්ට්‍යාශ්‍රවයෙන් සඞ්ග්‍රහකළ බැවින් ආශ්‍රවයෝ ද සංයොජනයෝ ද වෙත් මැයි; විචිකිත්සා නොමෝ සංයොජන ම වෙයි; ආශ්‍රව නොවෙයි; නැවත **දස්සනා පහාතබ්බා ආසවා** යන මෙහි ඇතුලත් බැවින් වනාහි ආශ්‍රව වෙත් යයි.

තුමෙ ද්‍රුවචනති දස්සනා පහාතබ්බා යනු මේ සත්කාය දෘෂ්ට්‍යාදීහු දර්ශනයෙන් ප්‍රහීණකළ යුතු ආශ්‍රවයෝ නම් වෙතැයි දක්වමින් වදාළහ. නොහොත් **ජනතං දිඞ්නං අඤ්ඤතර දිඞ් උපපජ්ජති** යි මෙසේ සවරූපයෙන් ම යම් මෝ සත්කායදෘෂ්ටියක් විභාගකරනලදු ද ඒ සඳහා වදාළහ-**තුමෙ වුවචනති භික්ඛවෙ!** සි; හෝ ද යම් හෙයකින් සහජාත ප්‍රහාණෙ කාර්යන් සමග ප්‍රහීණවන්නීද දෘෂ්ට්‍යාශ්‍රවය ප්‍රහීණවන කල්හි ඊට සහ

ජාත වූ හෝ සතර දෘෂ්ටි සම්ප්‍රයුක්ත චිත්තයන්හි කාමාශ්‍රවය ද අවිද්‍යාශ්‍රවය ද ප්‍රහීණ වේද; පහානෙකඨ වූයේ වනාහි සතර දෘෂ්ටි විප්‍රයුක්ත චිත්තයන්හි නාඝසුපණ්ණාදි සමඤ්ඤා ප්‍රාප්තීනා කිරීම් වශයෙන් උපදනාවූ භවාශ්‍රවය ද එය හාම සම්ප්‍රයුක්ත වූ අවිද්‍යාශ්‍රවය ද දෙම්නස් දෙසිත්හි ප්‍රාණාතිපාතාදිය නිපදවන්නාවූ අවිද්‍යාශ්‍රවය ද එසේම විචිකිච්ඡා චිත්ත සම්ප්‍රයුක්ත අවිද්‍යාශ්‍රවය දැයි මෙසේ සප්ප්‍රකාරයෙන් ම අවශෙෂ ආශ්‍රවත්‍රය ම ප්‍රහීණ වෙත්ද එහෙයින් බහුවචන නිර්දේශය කරනලදැයි මෙසේ ද මෙහි අර්ථය දතයුතු; මේ පෞරාණිකයන්ගේ අදහසි.

දස්සනා පහාතබ්බා යනු දර්ශන නම්? ශ්‍රෝතාපත්තිමාර්ග යයි, එයින් පහකළ යුත්තාහු යන අර්ථයි; කුමක් හෙයින් සෝවාන්මග දර්ශන නම් වීදයත්? පළමුකොට නිවන්දක්නා හෙයිනි; ගොත්‍රභූචිත්තය ඉතා පළමු කොට (නිවන්) දකී නො යත්? නො දක්නේ නො වෙයි; දැක කළයුතු කිස වූ කලි නො කෙරෙයි, සංයොජනයන් නො පහන හෙයිනි. එහෙයින් දකී යයි නො කිය යුතුයි; යම් කිසි තැනකදී රජු දැක ද පඹුරු දී කිස නිපදවීම නො දුටු හෙයින් "අදත් රජු නොදක්මි" යි කියන ගම් වැසි පුරුෂ ද මෙහි නිදස්සුන් වෙයි. මෙසේ දර්ශනයෙන් (= සෝවාන් මගින්) පහකළයුතු ආශ්‍රවයන් දක්වා දැන් එයින් අනතුරුව උද්දෙශකාල සංවරයෙන් ප්‍රහීණ කළයුතු ආශ්‍රවයන් දක්වන්ට **කතමෙ ච භික්ඛවෙ! ආසවා සංවරා පහාතබ්බා** යි වදළහ. මෙසේ සියලු තැන්හි සම්බන්ධය දතයුතුයි.

මෙයින් මත්තෙහි යම් හෙයකින් (පෙර කී සෙයින් සම්බන්ධය දතයුතු ද එහෙයින්) අර්ථය පමණක් ම වර්ණනා කරන්නෙමු. දර්ශනයෙන් ය භාවනාවෙන් ය යන මේ දෙකින් ප්‍රහීණ නො කළයුතු ආශ්‍රවයෙක් නම් නැත් නො ද? වැලි කුමක් හෙයින් වෙන් කොට සංවරාදීන් විසින් ප්‍රහීණකළ යුත්තන් දක්වත්ද යත්? සංවරාදීන් විසින් පූර්භාගයෙහි විෂ්කම්භණය කරනලද ආශ්‍රවයෝ සිව්මගින් (යම් හෙයකින්) මුල්සිදී මට යෙත් ද, එහෙයින් ඒ මාර්ගයන්ට පූර්භාගයෙහි මේ පස්අයුරින් විෂ්කම්භණ ප්‍රහාණය දක්වනසේක් මෙසේ වදළහ. එහෙයින් යම් මේ කියනලද ප්‍රථම මාර්ගයකුත් වේද (එය) දර්ශනමාර්ගය මැයි; මෙවිට භාවනා නාමයෙන් (සෙසු) මාර්ගත්‍රය කියනු ලබන්නාහුය; ඒ සියලු මාර්ගයන්ට ම මෝ පූර්භාග ප්‍රතිපදා යයි දතයුත්තිය. එහි **ඉධ** යනු මේ ශාසනයෙහි; **පටිසඞ්ඛා** යනු; නුවණින් දැන; එහි මේ **"සඞ්ඛා"** ශබ්දය තෙම ඤාන කොට්ඨාස ප්‍රඥප්ති ගණන යන අර්ථයන්හි දක්නා ලැබේ. ඒ එසේ මැයි– **සඞ්ඛායෙකං පටිසෙවති** යනාදීන්හි ඤානයෙහි දක්නා ලැබේ; **"පපඤ්ච සඤ්ඤා සඞ්ඛා සමුදාචරන්ති"** යනාදීන්හි කොට්ඨාසයෙහි ය; **"නෙසං නෙසං ධම්මානං සඞ්ඛා සමඤ්ඤා"** යනාදීන්හි ප්‍රඥප්තියෙහි ය; **"න සුකරං සඞ්ඛාතුං"** යනාදීන්හි ගණනෙහි ය; මෙහි වනාහි ඤානයෙහි දතයුතුයි.

"සඞ්ඛා" ශබ්දය.

පටිසඞ්ඛායොනිසෝ= යන මෙහි වනාහි උපායයෙන් මාර්ගයෙන් නුවණින් දැන ප්‍රත්‍යවෙක්ෂා කොට යන අර්ථයි; මෙහි ද අසංවරයෙහි ආදීනව දැනීම "යොනිසෝ පටිසඞ්ඛා" යි දතයුත්තීය; හෝ මෝ (පටිසඞ්ඛා තොමෝ) ද **"වරං භික්ඛවෙ! තත්තාය අයොසලාකාය ආදිත්තාය සම්පජ්ජලිතාය සජෝතිභූතාය චක්ඛුන්ද්‍රියං සම්පලිමඨං න ත්වෙව චක්ඛු විඤ්ඤෙය්‍යෙසු රූපෙසු අනුබ්‍යඤ්ජනසෝ නිමිත්තග්ගාහෝ"** යනාදීන් "ආදිත්තපරියාය" නයින් දතයුත්තීය.

චක්ඛුන්ද්‍රිය සංවර සංවුතෝ විහරති= යන මෙහි ඇස ම ඉන්ද්‍රිය නුයි **චක්ඛුන්ද්‍රිය** නම්, සංවරණය කරන හෙයින් **සංවර** නම්; වසන හෙයින අසුරන හෙයිනැයි කියනලද වෙයි; සමෘතියට මෝ නමකි; චක්ෂුරින්ද්‍රිය යෙහි සංවරවූයේ **චක්ඛුන්ද්‍රිය සංවර** නම් වේ; **"නිසජ්ජකාය, ආවාට කච්ඡප, වනමගිස"** යනාදීන් මෙනි. වැලිඑකෙක් ඇති- ඒ චක්ෂුරින්ද්‍රිය යෙහි සංවරයක් හෝ අසංවරයක් හෝ නැති; චක්ෂුඃ ප්‍රසාදය නිසා සිහිය හෝ මුළාසිහිය හෝ නො මැ උපදියි; තවද යම්විටක රූපාලම්බණයක් ඇසට හමුබවට පැමිණේද එවිට භවාඞ්ගය දෙවරක් ඉපිද නිරුඬවූකල්හි ක්‍රියා මනොධාතුව ආවජ්ජනා කෘත්‍යය සිඬ කරමින් ඉපිද නිරුඬ වෙයි; ඉක්බිති චක්ෂුර්විඥානය දර්ශන කෘත්‍යයද; නැවත විපාක මනොධාතුව සම්ප්‍රත්‍යෙෂණ කෘත්‍යය ද; ඉක්බිති විපාකහෙතුක මනොවිඥාන ධාතුව සන්තීරණ කෘත්‍යය ද; ඉක්බිති ක්‍රියාහෙතුක මනොවිඥාන ධාතුව ව්‍යවස්ථාපන කෘත්‍යය ද සිඬකරමින් ඉපිද නිරුඬවෙයි; ඊට අනතුරුව ජවන් දිවේයි; ඔවුන් අතුරෙහිදු සංවරයෙක් හෝ අසංවරයෙක් හෝ භවාඞ්ග සමයෙහි නොම ඇති, ආවජ්ජනාදීන් අතුරෙන් එක්තරා එකක්හු වන කල්හි ද නැති; ජවන ක්ෂණයෙහි වනාහි ඉදින් දුශ්ශීලබව හෝ මුළා සිහිය හෝ අඥානය හෝ අක්ෂාන්තිය හෝ කුසීතබව හෝ උපදිද (එවිට) අසංවරය වෙයි; මෙසේ ජවනක්ෂණයෙහි වන අසංවරය වනාහි චක්ෂුරින්ද්‍රියයෙහි අසංවරය යයි කියනුලැබේ; කුමක් හෙයිනයත්? යම් හෙයකින් ඒ අසංවරය ඇතිකල්හි චාරයත් අගුප්තාවේද භවාඞ්ගයත් ආවජ්ජනාදි ත්‍රිවිත්තයෝත් අගුප්තවෙත්ද; එහෙයිනි, කුමක් මෙන්ද යත්? යම්සේ නගරයෙහි සතර දොර නො වැසූකල්හි කිසිසේත් ඇතුලත ගෙදොර කොටුගබ් ආදිය මොනොවට වසන ලද්දාහුද එතකුදු වුවත් ඇතුලු නුවර සියලු බඬු අරක්ෂිත අගොපිත ම වේද, නුවර දොරවලින් සොරු පිවිස යමක් කැමැත්තාහු නම් ඒ කරින්නාහුද? එපරිද්දෙන් ම ජවන්හි දුශ්ශීලභාවාදිය උපන් කල්හි ඒ ජවන්හි අසංවරය ඇති කල්හි චාරය ද අගුප්ත වෙයි, භවාඞ්ගය ද ආවජ්ජනාදි ත්‍රිවිත්තයෝ ද අගුප්තවෙති.

ඒ ජවන්හි ශීලාදිය උපන්කල්හි චාරය ද ගුප්ත වෙයි, භවාඞ්ගය ද ආවජ්ජනාදි ත්‍රිවිත්තයෝ ද වසනලද වෙති; කුමක්මෙන යත්? යම්සේ නගරවාරයන් වසනලද කල්හි කිසිසේත් ඇතුලත ගෘහාදීහු නො වසන ලද්දාහුද එතකුදුවුවත් ඇතුලු නුවර සියලු බඬු සුරක්ෂිත සුගොපිත ම

වේද; නගරචාරයන් වැසූ කල්හි සොරුන්ගේ ප්‍රවේශය නැත්ද; එපරිද්දෙන් ම ජවන්හි ශීලාදිය උපන්කල්හි වාරය ද වසනලද වෙයි, භවාඞ්ගය ද ආවජ්ජනාදි වීථි චිත්තයෝ ද වසනලද වෙති; එහෙයින් ජවනක්ෂණයෙහි උපදනේ චක්ෂුරින්ද්‍රිය සංවර යයි කිඹනලදී. මෙහි ද මේ සතිසංවරය අදහස්කරන ලදැයි දතයුතු. චක්ෂුරින්ද්‍රිය සංවරයෙන් සංවෘතවූයේ **චක්ඛුන්ද්‍රිය සංවර සංවුත** නම් වේ, (චක්ෂුරින්ද්‍රියයාගේ සංවරයට) පැමිණියේ යයි කියනලද වෙයි; ඒ එසේමැය- **"පාතිමොක්ඛ සංවර සංවුතො"** යන මේ පදයට විභඞ්ගයෙහි **"ඉමිනා පාතිමොක්ඛ සංවරෙන උපෙතො හොති** —පෙ— **සමන්නාගතො"** යි වදාරනලද; එය එක් තැන් කොට චක්ෂුරින්ද්‍රියයාගේ සංවරයෙන් සංවරවූයේ **"චක්ඛුන්ද්‍රිය සංවර සංවුත"** නමැයි මෙසේ අර්ථය දතයුතුයි. නොහොත් සංවර කෙළේ නුයි **සංවුත** නම්, වැසී ඇවිරී යයි කියනලද වෙයි; චක්ෂුරින්ද්‍රියයෙහි සංවරයෙන් සංවෘතවූයේ **චක්ඛුන්ද්‍රිය සංවර සංවුත** නම්; චක්ෂුර්වාරයෙහි චක්ෂුරින්ද්‍රිය සංවර නම්ලද සිහි නමැති කවුළුව ගෙහි දොරකවුළුවක් මෙන් සංවර කෙළේය වැසීය ඇවිරී යයි කියනාලද්දේ වෙයි; මෙහිදු මේ අර්ථය ම අතිශයින් සුන්දර වෙයි;. ඒ සැබව **චක්ඛුන්ද්‍රිය සංවරං අසංවුතස්ස විහරතො සංවුතස්ස විහරතො** යන මේ පදයන්හි මේ අර්ථය ම දක්නා ලැබේ යයි.

විහරති= යනු මෙසේ චක්ෂුරින්ද්‍රිය සංවරයෙන් සංවරවූයේ යම් කිසි ඊර්‍යාපථ විහරණයකින් වාසය කෙරෙයි; **යංකිඤ්ච**= යන ආදියෙහි යම් චක්ෂුරින්ද්‍රිය සංවරයක් අසංවෘතිවූ නො වසා නො පියා වාසය කරන්නාවූ ඒ මහණහට යයි මෙසේ අර්ථය දතයුතුයි; නොහොත් "යෙ" කාරයට "යං" යි ආදෙශයි; "හි" කාරය ද පදපූරණයි; "යෙ අස්ස" (යම් ආශ්‍රවයෙක් තුමූ ඕහට) යන අර්ථයි; **උප්පජ්ජෙය්‍යුං**= උපදින්නාහු නම්; **ආසවා විඝාතපරිළාහා**= යනු චතුර්විධ ආශ්‍රවයෝ ද අන්‍යවූත් විවිධපීඩා කරවූ කෙලෙසපරිදාහයෝ නොහොත් විපාකපරිදාහයෝ; ඒ එසේමැයි- චක්ෂුර්වාරයෙහි ආපාථයට පැමිණියාවූ ඉෂ්ටාලම්බණය **කාමාස්වාද වශ**යෙන් ආස්වාද කරන්නහුට සතුටුවන්නහුට කාමාශ්‍රවය උපදියි; මේබදුවූ ඉෂ්ටාලම්බණය අන්‍ය සුගතිභවයෙහි ද ලබන්නෙමියි භවප්‍රාර්‍ථනාවෙන් ආස්වාද කරන්නහුට භවාශ්‍රවය උපදියි; සත්‍යයය කියා හෝ සත්‍යයා ගේය කියා හෝ ගන්නහුට දෘෂ්ට්‍යාශ්‍රවය උපදියි; සියල්ලන් සමග ම සහජාතවූ නො දැන්ම අවිද්‍යාශ්‍රව යයි මේසේ චතුර්විධ ආශ්‍රවයෝ උපදිත්; ඔවුන් හා සම්ප්‍රයුක්ත වූ අන්‍ය කෙලෙසයෝ විඝාතපරිළාහ නම් වෙති, නොහොත් මත්තෙහි ඔවුන්ගේ විපාකයෝ (විඝාතපරිළාහ නම් වෙති;) ඔව්හු ද අසංවරව වාසයකරන්නහුට ම උපදින්නාහු යයි කියනුලැබෙති; **එවං සන්තෙ**= යනු එවං + අස්ස තෙ (මෙසේ ඕහට ඒ ආශ්‍රවයෝ) මෙසේ මේ උපායයෙන් නො වෙති, අන් පරිද්දෙකින් නො වේ යයි කියන ලද්දේ වෙයි; **පටිසඞ්ඛා යොනිසෝ සොතින්ද්‍රිය සංවර සංවුතො** යනාදීන්හි ද මේ නයයි.

ඉමෙ වුච්චන්ති ආසවා සංවරා පහාතබ්බා= යනු සඳෙර සතර සතර කොට මේ සූවිසි ආශ්‍රවයෝ සංවරයෙන් පහකට යුත්තාහු යයි කියනු ලැබෙත්; මේ සියලු තැන්හි ම සතිසංවරය ම සංවරය යයි දත යුතුයි. **පටිසඞ්ඛා යොනිසෝ චීවරං** යනාදි තැන්හි යමක් කියයුතු නම් ඒ සියල්ල විශුද්ධිමාර්ගයෙහි ශීලකථාවෙහි කියන ලද්දේ මය. **යං කිඤ්චි=** යනු යම් චීවරයක් හෝ පිණ්ඩපාතාදීන් අතුරෙහි එක්තරා ප්‍රත්‍යයක් හෝ (සෙවනය කරන්නාවූ) ඔහට; **අපටිසෙවතෝ=** යනු මෙසේ නුවණින් නො සෙවිනාහට; සෙස්ස කී නයමැයි; හුදෙක් මෙහි වනාහි නො ලත් චීවරාදිය ප්‍රාර්ථනා කරන්නහුට ද ලත් චීවරාදිය ආසඞ්දය කරන්නහුටද කාමාශ්‍රවයාගේ උතපත්තිය දතයුත්තිය; "මෙබඳු ප්‍රත්‍යය අන්‍යවූත් සකතිභවයෙහි සුගතිභවයෙහි ලබන්නෙමි" යි භවප්‍රාර්ථනාවෙන් ආසඞ්දය කරන්නහුට භවාශ්‍රවයාගේ ද "මම ලබමි" යි කියා හෝ "නො ලබමි" යි කියා හෝ මේ මාගේ යයි හෝ ආත්ම සංඥාව නො හරනාහට දෘෂ්ට්‍යාශ්‍රවයාගේ උතපත්තිය දතයුත්තිය; සියල්ලන් හා සමග ම සහජාතවූයේ අවිද්‍යාශ්‍රව යයි; මෙසේ සතර ආශ්‍රවයන්ගේ උතපත්තිවිපාක පරිණාහයෝ ද නවවෙදනොත්පාදනයෙන් ම දතයුත්තාහුය. **ඉමෙ වුච්චන්ති භික්ඛවෙ! ආසවා පටිසෙවනා පහාතබ්බා=** යනු එකෙකී ප්‍රත්‍යයෙහි සතරක් සතරක් කොට මේ සොළොස් ආශ්‍රවයෝ මේ ඤාණසංවර සඞ්ඛ්‍යාතවූ ප්‍රත්‍යවෙක්ෂා ප්‍රතිසෙවනයෙන් පහකට යුත්තාහු යයි කියනු ලැබෙත් සී.

පටිසඞ්ඛා යොනිසෝ ඛමෝ හොති සීතස්ස= යනු උපායයෙන් මාර්ගයෙන් ප්‍රත්‍යවෙක්ෂාකොට ශීත ඉවසන්නේ වෙයි, ශීතය ඉවසයි; අවීරපුරුෂයෙකු මෙන් මදපමණවූ ද ශීතයෙන් නො සැලෙයි නො කැපෙයි කමටහන නො හරියි; වැලිදු වනාහි **ලොමසනාග** සඨවිරයන් මෙන් අනල්පවූ ද සිහිලෙන් පහසලද්දේ නො සැලෙයි නො කැපෙයි කමටහන ම මෙනෙහි කරයි.

ලොමසනාග තෙර වත.

තෙරුන් වහන්සේ සැගිරියෙහි පුවහු ගුහාවෙහිවූ ප්‍රධන් ගෙහි වාසය කරන්නෝ අන්තරඵකයෙහි හිම වැටෙන කල්හි ලොකාන්තරික නරකයෙහි (සිහිල) ප්‍රත්‍යවෙක්ෂා කොට කමටහන නො හරිමින් ම අභ්‍යවකාශයෙහි කල් යැවූ සේක් ල. මෙසේ උෂ්ණාදියෙහිදු අර්ථයොජනා දතයුතු. ඒ එසේ මැය- හුදෙක් යම් මහණෙක් වැඩිතරම්වූත් උණුසුම ඉවසාද ඒ **ලොමසනාග** තෙරුන් මෙන් ම මේ මහණද උණුසුම ඉවසන්නේ වේ යයි දතයුතුයි. තෙරුන් වහන්සේ වනාහි ග්‍රීෂ්මකාලයෙහි පසුබත භික්ෂූන් වහන්සේ මෙනෙහි කරමින් හුන්හ; උන්වහන්සේගේ දෙකැසින් ඔහ ද මිදෙන්; ඉක්බිති උන්වහන්සේට අතවැසිතෙම මෙසේ කීය; වහන්ස! මෙහි හුනමැනව (මේ) අවකාශය සිහිලැයි; තෙරුන් වහන්සේ

ඇවත! උණුසුම් බියෙන් ම මෙහි හුන්නෙම් වීමි සි අවීචිමහා නරකය ප්‍රත්‍යවෙක්ෂා කොට හුන්නාහු මය; උණ්හං= යන මෙහි ද වන්නිසන්තා පය ම දතයුතුසි; සූයිසන්තාපයාගේ වශයෙන් වනාහි මේ වස්තුව කියනලදී.

යමෙකුත් දෙතුන්වරක් බත් හෝ පැන් හෝ නොලබන්නේ ද අන මතාග්‍රවූ සංසාරයෙහි තමාගේ ප්‍රෙතවිෂයෙහි උපප්‍රාපතිය ප්‍රත්‍යවෙක්ෂා කොට නො වෙවුලමින් කම්සථානය නො හරී මය වැඩිතරම් වූ මැසි මදුරුවා අව්පහසින් පහස්ලද්දේ හෝ නමුදු තිරිසන් යොනියෙහි උප ප්‍රාපතිය මෙනෙහි කොට නො වෙවුලමින් කම්සථානය නො හරනේ ම වේ ද; දීඝීජාතීන්ගේ පහසින් පහස්ලද්දේ හෝ නමුදු අනමතාග්‍රවූ සංසා රයෙහි සිංහ ව්‍යාඝ්‍රාදීන්ගේ මුඛයන්හි නොයෙක්වර පෙර වැටුනුවිරූබව ප්‍රත්‍යවෙක්ෂා කොට නො වෙවුලමින් කම්සථානය නො හරනේ ම වේද; **පඛානිය** සථවිරයන් මෙන් මේ මහණතෙම බඛසාදුඝ –පෙ– දීඝීජාතීන් ගේ සපඝීය යන මොවුන් ඉවසන්නේ වේ යසි දතයුත්තේය.

"පඛානිය" තෙර වත.

ඛණ්ඩසෙල විහාරයෙහි කිණිහිරිප්‍රධන්ගෙහි ආයවීවංශ සූත්‍රානතය ශ්‍රවණය කරන්නාවූ තෙරුන් සොර විෂඇති සපීයෙක් දෂටකෙළේ ලු. තෙරුන් වහන්සේ දැනගෙන ද පහන්සිත් ඇතිව හුන්නාහු ධමීය ම අසති; විෂවෙගය තදවිය; තෙරුන් වහන්සේ උපසම්පද මණඩලය ආදි කොට ශීලය ප්‍රත්‍ය වෙක්ෂා කොට පිරිසුදු සිල් ඇත්තෙම් වෙමැයි ප්‍රීතිය ඉපදවූහ; ප්‍රීතිය ඉපදීම සමඟ ම විෂ නැවතී පෘථිවියට පිවිසියේය; තෙරුන් වහන්සේ එහිදී ම විතෙතෙකාග්‍රතාවලැබ විවසුන් වඩා රහත්බවට පැමිණියේක.

යමෙක් වනාහි ආක්‍රොෂ වශයෙන් නපුරුකොට කියනලද නපුරු කොට කියනලද බැවින් ම නපුරුසේ පැමිණියාවූ ද අන්තිම වසතු සහි තවූ වචනයන් අසා ඛාන්තිගුණය ම ප්‍රත්‍යවෙක්ෂා කොට නො සැලේද දීඝභාණක අභය තෙරුන් මෙන් මේ තෙමේ නපුරුකොට කියන ලද්දුවූ (එහෙයින් ම) නපුරුසේ පැමිණියාවූ වචනයන් ඉවසන්නේ වේ යසි දතයුතුසි.

දීඝභාණක අභය තෙර වත.

තෙරුන් වහන්සේ වනාහි ප්‍රත්‍යය සන්තොෂයෙහි හා භාවනාවෙහි ඇලුනු බැවින් මහා ආයවීවංශ ප්‍රතිපදාව වදුළහ; මාගම සියලු ජනතෙමේ පැමිණියේය. තෙරුන් වහන්සේට මහා සතකාරය උපන; එක්තරා මහතෙර කෙනෙක් එය ඉවසන්ට නො හැකිවන්නේ දීඝභාණක තෙම් ආයවීවංශය කියන්නෙමැයි සියලු රාත්‍රියෙහි කොලාහල කෙරෙයි යනාදීන් ආක්‍රොෂ කෙළේය; නැවත දෙදෙනම තම තමන්ගේ විහාර යට යන්නාහු ගව්වක් පමණතැන් එකමගින් ම ගියාහුය; සියලු ගව්වම හෙතෙම ඒ (දීඝභාණක අභය) තෙරුන්ට ආක්‍රොෂකෙළේ මය; ඉක්බිති යම් කැනක විහාරවයාගේ මාගීයෘ බෙදේ ද එහි සිට දීඝභාණක සථවිර යන් වහන්සේ ඒ මහලු තෙරුන් වැඳ වහන්ස! මේ ඔබගේ මාගී යසි

කිහ; හෙතෙම නො ඇසුනෙකු මෙන් ගියේය; තෙරුන් වහන්සේ ද විහාරයට ගොස් පා සොධා වැඩහුන්හ; එසේ වැඩහුන් තෙරුන්ට අතැ වැසි තෙම කිම? සාමිනි! සියලු ගව්වක් (තැන්) පරිහව කරන්නහුට කිසිවක් නො කිවහු ද? යි කිය; තෙරුන් වහන්සේ ඇවත! ඉවසීම ම මට බරෙක, නො ඉවසීම බරෙක් නොවේ; එක් පියවරෙක්හිදු කමට හනින් වෙන්වීමක් නො දකිමියි කිහ මෙහි ද වචනය ම වචනපථ යයි දතයුතුයි.

යමෙක් වනාහි ඉවසීමට දුෂ්කර අර්‍යයෙන් දුක් වූ බහලාර්‍යයෙන් තීව්‍රවූ පරුෂාර්‍යයෙන් ක්‍රූරවූ තියුණු අර්‍යයෙන් කටුකවූ ආසවාදි විරහිත හෙයින් අමධුරවූ මන නො වඩන හෙයින් අමනාපවූ ප්‍රාණය පැහැරීමට සමර්‍ථ හෙයින් ප්‍රාණහර වූ උපන්නා වූ ශාරීරික වෙදනාවන් ඉවසන්නේ ම වේ ද; කමපා නො වේ ද, මෙබඳු සභාව ඇත්තෝ වේ ද, මේ තෙම සිතුල්පව්වෙහි **පඛානිය** සථවිරයන් මෙන් උපන්නා වූ -පෙ- ඉවසන සභාව ඇත්තේ වේ යයි දතයුත්තේය.

සිතුල්පව්වැසි පඛානිය තෙර වත.

රාත්‍රිය ප්‍රධන්වීර්‍යයෙන් කල්යවා සිටියා වූ තෙරුන් වහන්සේට උදරවාතයක් උපන්නේ ලු; උන්වහන්සේ ඒ ඉවසන්ට නො හැකිවන්නෝ ආවතීනය වෙති, පරිවතීනය වෙති; එසේ පෙරළෙන්නාවූ උන්වහන්සේට සක්මන්පස සිටියාවූ පිණ්ඩපාතිය සථවිරයන් වහන්සේ මෙසේ කිහ; ඇවැත්නි! ප්‍රව්‍රජිත නම් ඉවසනසුලු වේ යයි; උන්වහන්සේ මැනව වහන්සැ! යි ඉවසා නිශ්චලව ම ශයනය කළහ; වාතය තෙම නැබ පවන් ළය තෙක් පැලිය; වෙදනාව විෂකාමභණය කොට විවසුන් වඩන්නාහු මොහොතකින් අනාගාම්ව පිරිනිවිසේකැයි.

ශං භික්ඛ= යනු ශීතාදීන් අතුරෙන් යම් කිසි එකධර්‍මයකුදු ඕහට; **අනධිවාසයතෝ=** යනු අධිවාසනය නො කරන්නහුට නො ඉවසන්නහුව; **සෙස්ස කි නය මැයි.** මෙහි ආශ්‍රවයන්ගේ උත්පත්තිය වනාහි මෙසේ දතයුත්තීය- ශීතයෙන් සංපීඩිකරනලද උණුසුම ප්‍රාර්‍ථනා කරන්නහුට කාමාශ්‍රවය උපදියි; සියලු තැන්හි මෙසේ (දතයුතුයි.) අපට සම්පත්තිභවයෙහි **සුඛානුභවයෙහි** සිහිලක් හෝ උණුසුමක් හෝ නැතැයි භවය ප්‍රාර්‍ථනා කරන්නාහුට භවාශ්‍රවය ද; මට ශීතය උණුසුම යයි ගන්නේ දෘෂ්ට්‍යාශ්‍රවය ද; සියල්ලන් හා සම්ප්‍රයුක්තවූ අවිද්‍යාශ්‍රවය ද උපදී යයි; **ඉමෙ වුච්චන්ති**—පෙ—**අධිවාසනා පහාතබ්බා=** යනු මේ සීතාදීන් අතුරෙන් එකෙකක්හුගේ වශයෙන් සතරක් සතරක් කොට නො එක් ආශ්‍රවයෝ මේ ඛන්තිසංවර සඞ්ඛ්‍යාතවූ ඉවසීමෙන් පහකට යුත්තාහු යයි කියනු ලැබෙත් යන අර්‍ථයි; මේහිදු යම්හෙයකින් මෝ ඛන්තිතොමෝ ශීතාදි ධර්‍මයන් ඉවසාද නම් මතුයෙහි ආරොපණය කොට වාසය කරන්නී ම වේද නො ඉවසන්නීව ආසවාද නො කරන්නී නො වේද එහෙයින් අධිවාසනා යයි කියනු ලැබේ යයි දතයුත්තීය.

පටිසඞ්ඛා යොනිසො චණ්ඩං හත්ථිං පරිවජ්ජෙති= යනු මම ශ්‍රමණ යෙක්මි සි සැඹවූ ඇතුගේ සමීපයෙහි නො සිටිය යුතුසි; යම්හෙයකින් ඒ හෙතුකොට මරණයත් මරණය සමාන දුකකුත් වන්නේ ද එහෙයිනි; මෙසේ උපායයෙන් මාගීයෙන් ප්‍රත්‍යවෙක්ෂාකොට චණ්ඩවූ ඇතා පරිවජී නය කෙරෙයි, ඉක්මවා යයි; සියලු තැන්හි මේ ක්‍රම යයි. **චණ්ඩං**= යනු ද දුෂ්ටවූ ව්‍යාලවූ යයි කියනලද වෙයි; **ඛාණුං**= යනු කිහිරිකණු ආදිය; **කණ්ටකාඨානං**= යනු කටු පිහිටිතැන්; යම් තැනක කටු විද්‍ය මානවෙත් ද ඒ අවකාශය යයි කියනලද වෙයි; **සොබ්භං**= යනු සියලු පසින් සුන් ඉවුරු ඇත්තේ; **පපාතං**= යනු එක්පසකින් සුන් ඉවුරු ඇත්තේ; **චන්දනිකං**= යනු ඉදුල්දිය ගැබ්මල ආදිය දමන තැන; **ඔලිගල්ලං**= යනු ඒ මඩආදීන් ම ගලාබස්නා සථානය; එය දණක් පමණ ද අසුචියෙන් පිරුනේ වෙයි; මේ (චන්දනික ඔලිගල්ල යන) දෙතැන ම අම නුෂ්‍යයන් විසින් දූෂිතවූවාහු වෙති; එහෙයින් ඒ සථානයෝ හළයුත්තා හුය; **අනාසනෙ**= යන මෙහි වනාහි අයුතු ආසනය අනාසන නම්; එය අපිහෙයින් අනියතාපත්තියට වසතු වූ රහසෙහි ප්‍රතිච්ඡන්නාසන යයි දතයුතුසි.

අගොචරෙ= යන මෙහි ද අයුතුවූ ගොචරය අගොචර යයි; හේ වෙ සිය ගොචරාදි හෙද හෙයින් පඤ්චවිධ වෙයි; **පාපකෙ මිත්තෙ**= යනු ලාමකවූ දුශ්ශීලවූ මිත්‍රප්‍රතිරූපකවූ අමිත්‍රයන්; **භජන්තං**= යනු සෙවනය කරන්නහු; **විඤ්ඤූ සබ්‍රහ්මචාරී**= යනු පණ්ඩිතවූ බුද්ධිසම්පන්නවූ සමාන බඹසර ඇත්තාහු; භික්ෂූන්ට මේ විශිෂ්ට නමකි; යම් හෙයකින් ඔවුහු එකකර්මය එකොදෙසය සමාන ශික්ෂා ඇතිබවය යන මේ බ්‍රහ්මයෙහි සමානව හැසිරෙත්ද, එහෙයින් සබ්‍රහ්මචාරී යයි කියනු ලැබෙත්. **පාප ඤෙසු ඨානෙසු**= යනු ලාමකවූ සථානයන්හි; **ඔඤ්ඤපෙය්‍යුං**= යනු එකා නතයෙන් මේ ආයුෂ්මත් තෙමේ කෙළේ යයි හෝ කරන්නේ යයි හෝ අදහන්නාහු ද නිෂ්ඨාවට පැමිණෙන්නාහු ද; **යං හිස්ස**= යනු හස්තිආදීන් අතුරෙන් යම් කිසි එකකුදු ඕහට; සෙස්ස කි නය මැයි. මෙහි ආශ්‍රව යන්ගේ උත්පත්තිය වනාහි මෙසේ දතයුත්තීය. ඇත් ආදීන් හෙතු කොට ගෙන උපන්නාවූ දුකින් සුපශීකරන ලද්දාවූ සුව ප්‍රාප්තිකරන්න හුට කාමාශ්‍රවය උපදියි; අපට සම්පත්ති භවයෙහි සුගති භවයෙහි මෙබඳු දුකක් නැතැයි භවය ප්‍රාප්තිකරන්නහුට භවාශ්‍රවය ද; මා ඇතෙක් මඬියි මා අසෙක් මඬියයි ගැනීම දෘෂ්ට්‍යාශ්‍රව යයි; සියල්ලන් සමග ම සම්ප්‍ර යුක්ත වූයේ අවිද්‍යාශ්‍රවිය ද වේ යයි; **ඉමෙ වුච්චන්ති** -පෙ- **පරිවජ්ජනා පහාතබ්බා**= යනු මේ ඇත් ආදීන් අතුරෙහි එකෙකක්හුගේ වශයෙන් සතරක් සතරක් කොට නො එක් ආශ්‍රවයෝ මේ ශීලසංවර සඞ්ඛ්‍යාතවූ පරිවර්ජනයෙන් පහකටයුත්තාහු යයි කියනු ලැබෙත් සී දතයුත්තාහුය.

පටිසඞ්ඛා යොනිසො උප්පන්නං කාමවිතක්කං නාධිවාසෙති= යනු මෙකරුණෙන් ද මේ විතර්කිය අකුශලය මෙකරුණෙන් ද සාවද්‍යය මෙකරුණෙන් ද දුඃඛවිපාකය හෙද වනාහි තමහට දුක් පිණිස ද පවතී

යයි ආදි නයින් නුවණින් කාමවිතර්කයෙහි ආදීනව ප්‍රත්‍යවෙක්ෂා කොට ඒ ඒ අරමුණෙහි උපන්නාවූ හටගත්තාවූ පහළවූ කාමවිතර්කය නො ඉව සයි සිතට ආරෝපණය කොට වාසය නො කරවයි අභ්‍යන්තරයෙහි හෝ වාසය නො කරවයි යන අර්ථයි; නො ඉවසන්නේ කුමක් කරන්නේද යත්? දුරුකරයි හැරදමයි; කිම කුඩයකින් කසළ මෙන් ද යත්? නො වේ; වැලිදු වනාහි සන්සිඳුවයි පෙළයි විදියි බැහැර කරයි; කිම කෙවිටකින් ගවයෙකු මෙන් ද යත්? නො වේ; වැලි ඒ විතර්කය විනාශ කෙරෙයි පහවූ අන්තය ඇති කෙරෙයි; යම්සේ ඇතුලත ද ඔහුගේ යවත් පිරිසෙයින් භවාඞ්ග මාත්‍රයකුදු අවශෙෂ නොවේ ද එය එපරිද්දෙන් කෙරෙයි; කෙසේ නම් එය එසේ කෙරේ ද යත්? **අනභාවං ගමෙති**= යනු මතුමත්තෙහි අභාවයට පමුණුවයි විෂ්කම්භන ප්‍රහාණයෙන් යම්සේ මොනොවට විෂ්කම්භණය කරනලද්දේ වේද එපරිද්දෙන් කෙරේ යයි කියනලද්දේ වෙයි; ව්‍යාපාද විහිංසා විතර්කයන්හි ද මේ ක්‍රම යයි. මේහිදු කාමවිතර්කී යනු **"යො කාමපටිසංයුත්තෙනා නක්ඛෙනා විතක්ඛෙනා මිච්ඡා සංකප්පෙයා"** යි විභඞ්ගයෙහි වදරන ලද්දේය. සෙස්සෙහිදු මේ ක්‍රමයයි.

උප්පන්නුප්පන්නෙනා= යනු උපනුපන්; උපන්ඇසිල්ලක් ඇත්තවුන් ම යයි කියනලද්දේ වෙයි; නොහොත් වරක් උපන් (විතර්කයන්) දුරුකොට දෙවනවට මධ්‍යස්ථවන්නේ නො වෙයි, සියවරක් ද උපනුපන් (විතර්කයන්) දුරුකෙරේ මය; **පාපකෙ අකුසලෙ**= යනු ලාමකාර්‍යයෙන් පාපක වූ අකෞශල්‍යතායෙන් අකුශල වූ; **ධම්මෙ**= යනු ඒ කාම විතර්කාදීන් ම; නොහොත් සියලුම නවමහා. විතර්කයන්; ඔවුන් අතුරෙන් තිදෙනෙක් කියනලද්දාහු මය; සෙස්සෝ ඥාති විතර්කය ජනපද විතර්කය අමර විතර්කය පරානුද්දයතා ප්‍රතිසංයුක්ත විතර්කය ලාභසත්කාර කීර්ති ප්‍රතිසංයුක්ත විතර්කය අනවඤ්ඤත්ති ප්‍රතිසංයුක්ත විතර්කය යන මොහු සදෙන වෙති.

නවමහා විතක්කා.

යං හිස්ස= යනු මේ විතර්කයන් අතුරෙන් යම් කිසි විතර්කයක් ඔහට; සෙස්ස කි නය මැයි. මෙහි කාමවිතර්කය වනාහි කාමාශ්‍රවය මැයි; එසින් වෙසෙස්වූයේ භවාශ්‍රව යයි; ඒ හා සම්ප්‍රයුක්තවූයේ දෘෂ්ට්‍යාශ්‍රව යයි; සියලු විතර්කයන්හි අවිද්‍යාව අවිද්‍යාශ්‍රව යයි; මෙසේ ආශ්‍රවයන්ගේ උත්පත්තිය දතයුත්තීය. **ඉමෙ වුච්චන්ති** -පෙ- **විනොදනා පහාතබ්බා**= යනු මේ කාමවිතර්කාදීන්ගේ වශයෙන් උක්තප්‍රකාරවූ ආශ්‍රවයෝ ඒ ඒ විතර්කයෙහි ආදීනව ප්‍රත්‍යවෙක්ෂාකිරීම් සහිතවූ මේ ඊස්සීසංවර සඞ්ඛ්‍යාතවූ විනොදනයෙන් පහකටයුත්තාහු යයි කියනු ලැබෙත් යි දතයුත්තාහුය.

පටිසඞ්ඛා යොනිසො සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති= යනු භාවනා නො කිරීමෙහි ආදීනවය ද භාවනාවෙහි අනුසස් ද උපායයෙන් මාගී යෙන් ප්‍රත්‍යවෙක්ෂා කොට සතිසම්බොධ්‍යඞ්ගය වඩයි; සියලු තැන්හි මේ ක්‍රම යයි. මෙහි ද කිසිසේත් මතු මාගීත්‍රය සමයෙහි උපන්නාවූ මේ ලොකොත්තර බොධ්‍යඞ්ගයෝ ම අදහස්කරන ලද්දාහු ද එතකුදු

වුවත් ආදි කර්මිකයන්ගේ බොධ්‍යඞ්ග විෂයෙහි අසම්මොහය පිණිස ලෞකික ලොකොත්තර මිශ්‍රකවූ නයින් ඔවුන්ගේ අර්ථවණ්ණනාව කරන්නේම්. මෙහි වනාහි ලෞකිකනය හැර ලොකොත්තරනය ම ගතයුත්තේය. එහි **සතිසම්බොජ්ඣඞ්ගං** යනාදි නයින් වදාරනලද්දාවූ මුල් පද යන් සත්දෙනාගේ ම පළමුකොට—

බොධ්‍යඞ්ග වණ්ණනා.

60. අට්ඨකථා ලක්ඛණාදිහි කමතෝ ච විනිච්ඡයෝ
අනුනාධිකතෝ චෙව විඤ්ඤාතබ්බෝ විභාවිනා.

(අර්ථ වශයෙන් ද ලක්ෂණාදීන්ගේ වශයෙන් ද ක්‍රම වශයෙන් ද අනුනාධික වශයෙන් ද නුවණැත්තහු විසින් විනිශ්චය දතයුත්තේය; යනු භාවයි.)

එහි පළමුකොට සමෘති සම්බොධ්‍යඞ්ගයෙහි සිහිකිරීම් අර්ථයෙන් **සති** නම්; ඕ මෝ සති වනාහි එලඹ සිටීම ලක්ෂණකොට ඇත්තීය අපිලාපනය (සිහිකරවීම) ලක්ෂණකොට ඇත්ති හෝ වන්නීය. මේ කියන ලද්දේ මය– **"යථා මහාරාජ! රඤ්ඤෝ භණ්ඩාගාරිකෝ රඤ්ඤෝ සාපතෙය්‍යං අපිලාපෙති එත්තකං මහාරාජ! හිරඤ්ඤං එත්තකං සුවණ්ණං එත්තකං සාපතෙය්‍යන්ති; එවමේව ඛෝ මහාරාජ! සති උප්පජ්ජමානා කුසලාකුසල සාවජ්ජානවජ්ජහීනප්පණීතකණ්හසුක්ක සප්පටිභාගෙ ධම්මෙ අපිලාපෙති ඉමෙ චත්තාරෝ සතිපට්ඨානා"** ති= ("මහරජ! රජුගේ භාණ්ඩාගාරික තෙමේ රජුගේ සම්පත්තිය යම්සේ සිහිකරවාද මහරජ! අමුරන් මෙපමණය රත්රන් මෙපමණය (සෙසු) ධනය මෙ පමණ යයි; එපරිද්දෙන් ම මහරජ! සමෘති තොමෝ උපදින්නී කුශලා කුශල සාවද්‍යානවද්‍ය හීන ප්‍රණීත කෘෂ්ණ ශුක්ලසප්‍රතිභාග ධර්මයන් සිහිකරවයි, මොවුහු සතර සතිපට්ඨානයෝය" යි විස්තරයි. සිහිකරවන කෘත්‍යය වන්නීය; ඒ එසේමැයි– කෘත්‍යවශයෙන් ම මේ සමෘතියගේ මේ (අපිලාපන) ලක්ෂණය (නාගසෙන) සථවිරයන් විසින් කියනලද්දේය; නො නැසෙන කෘත්‍යය හෝ වන්නීය; ගොචරයෙහි අභිමුඛබව වැටහීම කොට ඇත්තීය; සමෘතිය ම සම්බොධ්‍යඞ්ගවූයේ **සතිසම්බොජ්ඣඞ්ග** නම් වේ; එහි බොධිය පිණිස පවත්නාවූ ධර්මසමූහයාගේ හෝ බොධි සඞ්ඛ්‍යාත ආර්‍ය්‍ය ශ්‍රාවකයාගේ හෝ අඞ්ගය නුයි **බොජ්ඣඞ්ග** නම්; (මෙයින්) කුමක් කියන ලද්දේ වේද යත්? යම් මෝ ධර්ම සාමග්‍රියක් වනාහි (ධර්ම සාමග්‍රිය යනු ධර්ම සමූහ යයි) ලෞකික ලොකොත්තර මාර්ග ක්ෂණයෙහි උපදනාවූ ලීනය ඖද්ධත්‍යය පතිඨානය ආයූහනය කාම සුඛල්ලිකානු යොගය ආත්මකිලමථානු යොගය උච්ඡෙදදෘෂ්ටිය ශාස්වත දෘෂ්ටිය යන මොවුන්ට ඇතුලත්වීම්දිවූ නොයෙක් උපද්‍රවයන්ට ප්‍රති

---

60. **විභාවිනා**= නුවණැත්තහු විසින්; **අට්ඨකථා**= අර්ථ වශයෙන් ද; **ලක්ඛණාදිහි**= ලක්ෂණාදීන්ගේ වශයෙන් ද; **කමතෝ ච**= ක්‍රම වශයෙන් ද; **අනුනාධිකතෝ චෙව**= අනුනාධික වශයෙන් ද; **විනිච්ඡයෝ**= විනිශ්චය; **විඤ්ඤාතබ්බෝ**= දතයුත්තේය;

පඤ්චවූ සමෘති ධර්මවිචය වීර්‍යප්‍රීති ප්‍රශ්‍රබ්ධි සමාධි උපෙක්ෂා සඞ්ඛ්‍යාතවූ යම් ධර්ම සාමග්‍රියකින් (ධර්ම සමූහයකිනැයි යුයේ.) ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම අව බොධ කෙරේ යයි, කොට **බොධි** යයි කියනු ලැබේද; **බුජ්ඣති** යි සේ කෙලශසන්තාන නිද්‍රාවෙන් නැගිසිටි, චතුරාර්‍ය්‍යසත්‍යයන් හෝ ප්‍රතිවෙධ කෙරෙයි, නිර්‍වාණය ම හෝ ශාක්ෂාත් කෙරේ යයි කියනලද්දේ වෙයි; වදාළේමැනු- **"සත්තබොජ්ඣඞ්ගා භාවෙත්වා අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධෝ"** ති ("සප්තබොධ්‍යඞ්ගයන් වඩා නිරුත්තර වූ සම්‍යක් සම්බොධිය අවබොධ කෙළේ" යි.) ඒ ධර්මසාමග්‍රි සඞ්ඛ්‍යාතවූ බොධියගේ අඞ්ගය නුයි ද **බොජ්ඣඞ්ග** නම්; ඣානඞ්ග මඟඞ්ග යනාදීන් මෙනි; තවද ඝටොකත ප්‍රකාරවූ මේ ධර්ම සාමග්‍රියයෙන් අවබොධ කෙරේ යයි කොට යම් මේ ආර්‍ය්‍ය ශ්‍රාවකයෙක් තෙම **බොධි** යයි කියනු ලැබේ ද ඒ බොධිහුගේ අඞ්ගයනුයි ද **බොජ්ඣඞ්ග** නම්; සෙනඞ්ග රථඞ්ග යනාදීන් මෙනි; එයින් කිහු අර්‍ථකථාචාර්‍ය්‍යයෝ- **"බුජ්ඣනකස්ස පුග්ගලස්ස අඞ්ගාති වා බොජ්ඣඞ්ගාති"** ("අවබොධකරන පුද්ගලයාගේ අඞ්ගයෝ නුයි හෝ බොජ්ඣඞ්ගනම් වෙති"යි.) තවද **"බොජ්ඣඞ්ගාති කෙනට්ඨෙන බොජ්ඣඞ්ගා? බොධාය සංවත්තන්තීති බොජ්ඣඞ්ගා බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා අනුබුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා පටිබුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා සම්බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා"**= (බොජ්ඣඞ්ගා යනු කවර අර්‍ථය කින් බොජ්ඣඞ්ග නම් වෙත්ද? බොධය පිණිස පවතින් නුයි බොජ්ඣඞ්ග නම් වෙති, අවබොධ කෙරෙත් නුයි බොජ්ඣඞ්ග නම් වෙති, අනුබොධ කෙරෙත් නුයි බොජ්ඣඞ්ග නම් වෙති, ප්‍රතිබොධ කෙරෙත් නුයි බොජ්ඣඞ්ග නම් වෙති, මනාකොට අවබොධ කෙරෙත් නුයි බොජ්ඣඞ්ග නම් වෙති") යනාදිවූ ප්‍රතිසම්භිදා නයින් ද බොජ්ඣඞ්ගාර්‍ථය දතයුත්තේය.

ප්‍රශස්ත වූ ද සුන්දර වූ ද බොධ්‍යඞ්ගය **සම්බොජ්ඣඞ්ග** නම් වේ; මෙසේ සමෘතිය ම සම්බොධ්‍යඞ්ග වූයේ **සතිසම්බොජ්ඣඞ්ග** නම් වේ; ඒ සතිසම්බොජ්ඣඞ්ගය යි මෙසේ පළමුකොට එක් ආදි පදයක්හුගේ අර්‍ථ වශයෙන් ද ලක්ෂණාදින්ගේ වශයෙන් ද විනිශ්චය දතයුත්තේය.

චිත්තයාදියෙහි වනාහි චතුස්සත්‍ය ධර්මයන් පරීක්ෂාකෙරේ නුයි **ධම්ම විචය** නම් වේ; හේ පවිචය ලක්ෂණයි; (විෂයයන්) බබුලුවන කෘත්‍යය ඇත්තේය; අසම්මොහය ප්‍රත්‍යුපස්ථාන කොට ඇත්තේය; වීරයාගේ භාවය හෙයින් ද විධිවූ පරිද්දෙන් පැවැත්විය යුතු හෙයින් ද **විරිය** නම් වේ; එය (සම්ප්‍රයුක්ත ධර්මයන්) **දූහිකොට** ගැනීම් ලක්ෂණයි; උපස්ථම්භන කෘත්‍යය ඇත්තේයි; නොපසුබැසීම ප්‍රත්‍යුපස්ථානයි; පිනවා නුයි **පීති** නම් වා; ඕ ඵරණ ලක්ෂණ වන්නීය තූපිලක්ෂණ හෝ වන්නීය; කාය චිත්තයන් පිනවන කෘත්‍යය ඇත්තීය. ඔවුන්ගේ ම ඔදවැඩිබව ප්‍රත්‍යුප ස්ථාන වන්නීය; කායචිත්තදරථයන් සංසිඳුවන හෙයින් **පස්සද්ධි** නමු; ඕ තොමෝ උපසම ලක්ෂණ වන්නීය; කා ය චි ත්ත ද ර ථ ය න් මඬනා කෘත්‍යය ඇත්තීය; කායචිත්තයන්ගේ නොසෙල්වීම වූ සිහිල් භාවය ප්‍රත්‍යුපස්ථාන වන්නීය; මනාකොට (සිත) පිහිටන හෙයින් **සමාධි** නම්

වේ; හේ අවික්ඛේප ලක්ඛණයි නොවිසිරෙන ලක්ෂණ හෝයි; චිත්ත චෛතසිකයන් මොනොවට පිඬුකරන කෘත්‍යය ඇත්තේයි; චිත්තයාගේ සිතිහාව ප්‍රත්‍යුපස්ථානයි; (සම්ප්‍රයුක්ත ධර්මයන්) මධ්‍යස්ථව බලන හෙයින් **උපෙක්ඛා** නමුදු; හෝ තොමෝ (මැදහත් බැව්හි සිට විමසිම් සඞ්ඛ්‍යාත) පටිසඞ්ඛාන ලක්ෂණ වන්නීය සමවාහිත ලක්ෂණ හෝයි; ඌනාධික ධර්මයන්ගේ නිවාරණ කෘත්‍යය ඇත්තීය; පක්ෂපාත බැව් සිදීම් කෘත්‍යය හෝ වන්නීය; මැදහත්බව ප්‍රත්‍යුපස්ථාන වන්නීය; සෙස්ස කී නයමැයි. මෙසේ සෙසු පදයන්ගේ ද අර්ථවශයෙන් ද ලක්ෂණාදීන්ගේ වශයෙන් ද විනිශ්චය දතයුත්තේය.

ක්‍රම වශයෙන් යන මෙහි ද **"සතිඤ්ච ඛ්වාහං භික්ඛවෙ! සබ්බත්ථිකං වදාමි"** යි වදාළ හෙයින් සෙසු සියලු බොධ්‍යඞ්ගයන්ට උපකාරබැවින් සමෘති සම්බොධ්‍යඞ්ගය පළමුකොට වදාරන ලද්දේය; එයින් මතු **"සෝ තථා සතෝ විහරන්තෝ තං ධම්මං පඤ්ඤාය පවිචිනති"** යනාදිනයින් සෙසු බොධ්‍යඞ්ගයන්ගේ පෙරපසුකොට කීමෙහි ප්‍රයෝජනය සූත්‍රයෙහි ම වදාරනලදී; මෙසේ මෙහි(දෙශනා)ක්‍රමවශයෙන්ද විනිශ්චය දතයුත්තේය.

අනූනාධික වශයෙන් යනු කුමක් හෙයින් වනාහි භාග්‍යවත්හු විසින් නොඅඩු නොවැඩිවූ බොජ්ඣ සතක් ම වදාරන ලද්දාහුද යත්? ලීනෞද්ධත්‍යයන්ට ප්‍රතිපක්ෂ හෙයින් ද (සතක් ම වදාරනලදී;) ඒ එසේමැයි— මෙහි බොධ්‍යඞ්ගයෝ තිදෙනෙක් ලීනයට ප්‍රතිපක්ෂ වෙති; වදාළේ මැනු- **යස්මිඤ්ච ඛෝ භික්ඛවෙ! සමයෙ ලීනං චිත්තං හොති කාලෝ තස්මිං සමයෙ ධම්මවිචය සම්බොජ්ඣඞ්ගස්ස භාවනාය කාලෝ විරියසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය කාලෝ පීතිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය කාලෝ ති=**

(මහණෙනි! යම් කලෙක්හි වනාහි (කුසිතභාවයෙන්) හැකුලුනු සිත වේද එසමයෙහි ධම්මවිචිනිස සම්බොජ්ඣ බැවීමට කල් වෙයි වීරිය සම්බොජ්ඣ බැවීමට කල් වෙයි පීතිසම්බොජ්ඣ බැවීමට කල් වේ යයි.)

තිදෙනෙක් ඖද්ධත්‍යයට ප්‍රතිපක්ෂ වෙති; වදාළේ මැනු- **යස්මිඤ්ච ඛෝ භික්ඛවෙ! සමයෙ උද්ධතං චිත්තං හොති කාලෝ තස්මිං සමයෙ පස්සද්ධි සම්බොජ්ඣඞ්ගස්ස භාවනාය කාලෝ සමාධි සම්බොජ්ඣඞ්ගස්ස භාවනාය කාලෝ උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගස්ස භාවනාය ති=**

(මහණෙනි! යම් කලෙක්හි වනාහි උද්ධතවූ සිත වේද එසමයෙහි ප්‍රශ්‍රබ්ධි සම්බොධ්‍යඞ්ගය වැඩීමට කල්වෙයි, සමාධි සම්බොධ්‍යඞ්ගය වැඩීමට කල් වෙයි. උපෙක්ෂා සම්බොධ්‍යඞ්ගය වැඩීමට කල් වේ යයි.)

මෙහි එකෙක් වනාහි සබ්බත්ථිකා වෙයි; වදාළේ මැයි— **සතිඤ්ච ඛ්වාහං භික්ඛවෙ! සබ්බත්ථිකං වදාමි** යි. "සබ්බත්ථකං" යි ද පාඨයි; වචනවයාගේ ම සියලු තැන්හි කැමතිවිය යුතුය යනු අර්ථයි; මෙසේ ලීනෞද්ධත්‍ය දෙකට ප්‍රතිපක්ෂ හෙයින් ද සියලු තැන්හි කැමති වියයුතු හෙයින් ද අනූනාධික වූ බොධ්‍යඞ්ග සතක් ම වදාරනලද්දාහු යයි; මෙසේ මෙහි අනූනාධික වශයෙන් ද විනිශ්චය දතයුත්තේය.

මෙසේ පළමුකොට **සතිසම්බොජ්ඣඞ්ගං** යනාදි නයින් කියනලද සප්ත ආදි පදයන්ගේ ම අර්ථවණ්ණනාව දැන මෙවිට **භාවෙති විවෙක නිස්සිතං** යනාදීන්හි (අර්ථවණ්ණනා) මෙසේ දතයුත්තිය. **භාවෙති**= වඩයි, තමාගේ චිත්තසන්තානයෙහි නැවත නැවත උපදවයි, පහළකරවයි යන අර්ථයි; විවෙකය ඇසුරුකෙළේනුයි; **විවෙකනිස්සිත** නම් වේ; **විවෙක** යනු වෙන්වූ බවයි; හේ මේ විවෙකය ද තදඞ්ග විවේකය විෂ්කම්භණ-සමුච්ඡේද- ප්‍රතිප්‍රශ්‍රබ්ධි- නිඃසරණ විවේක යයි පඤ්චවිධ වෙයි; ඔහුගේ **නානත්තිය අරියධම්මෙ අවිනිතෝ** යන මෙහි කී නියෙන් ම දතයුතුයි; ඒ එසේමැයි- මේ විවේකය ම එහි "විනය" යි වදාරන ලද්දේය; මෙසේ මේ පඤ්චවිධ විවේකයෙහි **විවෙකනිස්සිතං** යනු තදඞ්ග විවේක නිශ්‍රිත වූ ද සමුච්ඡේද විවේක නිශ්‍රිතවූ ද නිඃසරණ විවේක නිශ්‍රිත වූ ද සමෘති සම්බොධ්‍යඞ්ගය වඩයි, යන මේ අර්ථය දතයුතුයි; ඒ එසේමැයි- මේ බොධ්‍යඞ්ග භාවනාවෙහි යෙදුන යොගීතෙම විදර්ශනා ක්ෂණයෙහි කෘත්‍ය වශයෙන් තදඞ්ග විවේක නිශ්‍රිත වූ ද අධ්‍යාශය වශයෙන් නිඃසරණ විවේක නිශ්‍රිත වූ ද මාර්ග කාලයෙහි වනාහි කෘත්‍ය වශයෙන් සමුච්ඡේද විවේක නිශ්‍රිත වූ ද ආලම්බණ වශයෙන් නිඃසරණ විවේක නිශ්‍රිත වූ ද සිතිසම්බොජ්ඣඞ්ග වඩයි.

පඤ්චවිධ විවේක නිඃශ්‍රිතවූ ම යයි කිසි ආචාර්‍ය්‍ය කෙනෙක් කියති. ඒ එසේමැයි- ඔවුහු හුදු බලව විදර්ශනා මාර්ගඵල ක්ෂණයෙහි ම බොධ්‍යඞ්ග යන් උඩරණය නො කෙරෙත් විදර්ශනා පාදක කෘත්සනඛ්‍යාන ආනාපානා ශුභ බ්‍රහ්මවිහාර ඛ්‍යානයන්හි ම උඩරණය කෙරෙත්; අර්ථකථාචාර්‍ය්‍යයන් විසින් නො ද වළකන ලදහ; එහෙයින් ඔවුන්ගේ මතයෙහි මේ ධ්‍යානයන්ගේ ප්‍රවෘත්ති ක්ෂණයෙහි කෘත්‍යවශයෙන් ම විෂ්කම්භණ විවේක නිශ්‍රිත වෙයි; යම්සේ විදර්ශනා ක්ෂණයෙහි අධ්‍යාශය වශයෙන් නිඃසරණ විවේක නිශ්‍රිතවූ යයි කියනලද ද එසේ ප්‍රතිප්‍රශ්‍රබ්ධි විවේක නිශ්‍රිතවූ ද (සතිසම්බොධ්‍යඞ්ගය) වඩා යයි කියන්ට වටී; විරාග නිශ්‍රිතාදියෙහි ද මේ ක්‍රම යයි; ඒ එසේමැයි- විරාගාදිහු ත්‍රිවිධ කා ථි ම වෙති. හුදෙක මෙහි වොස්සග්ගය ත්‍රිවිධ වෙයි, පරිච්චාග වොස්සග්ගය ද පක්ඛන්දන වොස්සග්ගය ද කියාසි; ඔවුන් අතුරෙහි **පරිච්චාග වොස්සග්ග** යනු තදඞ්ග වශයෙන් විදර්ශනා ක්ෂණයෙහි ද සමුච්ඡේද වශයෙන් මාර්ග ක්ෂණයෙහි ද කෙලෙසයන්ගේ ප්‍රහාණ යයි; **පක්ඛන්දන වොස්සග්ග** යනු විදර්ශනා ක්ෂණයෙහි තන්නින්න භාවයෙන් ද මාර්ගක්ෂණයෙහි අරමුණු කිරීමෙන් ද නිර්‍වාණ ප්‍රසක්ඛන්දන යයි; ඒ දෙක ම මේ ලෞකික ලෝකොත්තර මිශ්‍ර අර්ථවණ්ණනා ක්‍රමයෙහි වටියි; ඒ එසේමැය- මේ සමෘති සම්බොධ්‍යඞ්ගය තෙම යථොක්ත ප්‍රකාරයෙන් කෙලෙසයන් පරිත්‍යාග කෙරෙයි (දුරලයි;) නිර්‍වාණය ද ප්‍රසක්ඛන්දනය කෙරෙයි; (නිවනට පැන යයි,) **වොස්සග්ගපරිණාමිං** යන මේ සියලු වචනයෙන් ම නිර්‍වාණය පිණිස

පිරිනමන්නාවූ ද පිරිනමනලද්දාවූ ද (යන අර්ථය කියනලදී;) පිරිපැසෙන් නාවූ ද පිරිපැසුනාවූ ද යන මේ කියනලද්දේ වෙයි; ඒ එසේ මැයි— මේ බොධ්‍යඞ්ග භාවනාවෙහි යෙදුනාවූ මහණතෙම යම්සේ සමෘතිසම්බොධ්‍යඞ්ගය කෙලෙසපරිත්‍යාග වොස්සග්ගය පිණිසත් නිර්‍වාණ ප්‍රසක්‍තන්‍ය වොස්සග්ගය පිණිසත් මුහුකුරුවාද යම්සේ මුහුකුරුවන ලද්දේත් වේද එසේ එය වඩා යයි; සෙසු බොධ්‍යඞ්ගයන්හි ද මේ ක්‍රම යයි. මෙහි වූ කලි නිර්‍වාණය ම සර්‍වසංස්කෘතයන්ගෙන් වෙන්වූ බැවින් **විවේක** නම්; සියල්ලන්ගේ විරාග භාවයෙන් **විරාග** නම්; නිරෝධ භාවයෙන් **නිරෝධ** නමැයි කියනලදී; මාගීය ම **වොස්සග්ගපරිණාමී** නම් වේ; එහෙයින් විවේකය අරමුණුකොට ප්‍රවෘත්තියෙහි විවේකනිශ්‍රිතවූ ද එසේම විරාග නිශ්‍රිතවූ ද නිරෝධ නිශ්‍රිතවූ ද සමෘති සම්බොධ්‍යඞ්ගය වඩයි; හෙද වනාහි ආර්‍ය්‍ය මාගීක්ෂණයෙහි පැවැත්තාවූ කෙලෙසුන්ගේ සමුච්ඡේද වශයෙන් පරිත්‍යාග භාවයෙන් ද නිර්‍වාණ ප්‍රසක්‍තන්‍ය භාවයෙන් ද පිරිනමනලද මුහුකුරුවනලද යන මේ අර්ථය ම දතයුතුයි. සෙසු බොධ්‍යඞ්ගයන්හිදු **මේ ක්‍රම** යයි.

යං නිස්සා= මේ බොධ්‍යඞ්ගයන් අතුරෙන් යම් කිසිවක් ඕහට (යන අර්ථයි.) සෙස්ස කී නයමැයි. ආශ්‍රවයන්ගේ උත්පත්තියෙහි වනාහි මෙහි මේ මතු තුන්මඟ හා සම්ප්‍රයුක්ත වූ බොධ්‍යඞ්ගයන් නො වැඩූ බැවින් කාමාශ්‍රවය භවාශ්‍රවය අවිද්‍යාශ්‍රවය යන යම් ආශ්‍රවයෝ තිදෙනෙක් උපදින්නාහු ද වඩන්නාවූ ඕහට මෙසේ ඒ ආශ්‍රවයෝ නො වෙත් යන මේ ක්‍රමය දතයුත්තේය. **ඉමේ වුච්චන්ති** —පෙ— **භාවනා පහාතබ්බා** යනු මේ ආශ්‍රවයෝ තිදෙන මාර්ගත්‍රය සම්ප්‍රයුක්තවූ මේ බොධ්‍යඞ්ග භාවනාවෙන් පහකටයුත්තාහු යයි කියනු ලැබෙන් සී දතයුත්තාහුය.

මෙවිට මේ සත්ආකාරයෙන් ප්‍රහීණවූ ආශ්‍රව ඇති භික්‍ෂුවට **සතුති කාරණසේක් ආශ්‍රවයන්ගේ ප්‍රහීණකිරීමෙහි ද ඔහුගේ අනුසස් දක්වන සේක් නැවත මේ කාරණයන්ගෙන් ම ආශ්‍රව ප්‍රහාණයෙහි සත්‍යයන්ගේ උත්සාහය උපදවනසේක් යතො ඛො භික්ඛවෙ! —පෙ— අනනුස්සාසි දුක්ඛස්ස** සී වදාළහ. **එහි යතො ඛො** යනු සාමී වචනයෙහි (= සම්බන්ධයෙහි) "තො" කාර යයි; "**යස්ස ඛො**" (= යමෙකුගේ වනාහි) සී කියන ලද්දේ වෙයි; පොරණෘජරෝ වනාහි "යමහි කාලෙ" (= යම් කලෙක) සී වර්ණනා කෙරෙත්; **යෙ ආසවා දස්සනා** යනු යම් ආශ්‍රව කෙනෙක් දර්‍ශනයෙන් පහකටයුත්තාහුද ඔව්හු දර්‍ශනයෙන් ම ප්‍රහීණවූවාහු වෙත්ද ප්‍රහීණ නොවූ කල්හි ම ප්‍රහීණ වූවාහුය යන සංඥා ඇත්තේ නො වේද (යන අර්ථයි;) සියලු තැන්හි විස්තරය මෙසේයි.

සබ්බාසව සංවර සංවුතො= සියලු ආශ්‍රව පිධානයන්ගෙන් වසන ලද්දේ; නොහොත් සියලු ආශ්‍රවයන්ගේ පිධානයන්ගෙන් වසනලද්දේ; **අවෙජ්ඣි නාණභං**= සියලු ම තෘෂ්ණාව සින්දේය මොනොවට සින්දේය සමූලයෙන් සින්දේය; **වාවත්තයි සංයොජනං**= දසවිධ සංයොජනය

පරිවතීනය කෙළේය මුල් රහිත කෙළේය; **සමමා**= හෙතුවෙන් කාරණ යෙන්; **මානාභිසමයා**= මානයාගේ දර්‍ශනාභිසමයෙන් ද ප්‍රහාණාභිසම යෙන් ද; ඒ එසේමයැ- රහත්මහ කෘත්‍ය වශයෙන් මානය දකී, මේ ඔහු ගේ දර්‍ශනාභි සමයයි; එයින් දක්නාලද්දාවූ හේ වනාහි එකෙණෙහි ම දෘෂ්ටිවිෂයෙන් දෘෂ්ටසත්‍යයන්ගේ ජීවිතය මෙන් ප්‍රහීණවෙයි; මේ තෙම ඔහුගේ ප්‍රහාණාභිසමයයි.

අන්තමකාසි දුක්ඛස්ස යනු මෙසේ රහත්මගින් මානය දුටුහෙයින්ද ප්‍රහීණ වූ හෙයින් ද **කායබන්ධනස්ස අන්තෝ ජීරති හරිතත්තං වා** යි මෙසේ කියනලද අන්තිම මධ්‍යාදූන්තය ද **අන්තමිදං භික්ඛවෙ! ජීවිතා නං** යි මෙසේ කියනලද ලාමකාන්තය ද **සක්කායෝ එකෝ අන්තෝ** යි මෙසේ කියනලද කොඨාසාන්තය ද **එසෙවන්තෝ දුක්ඛස්ස සබ්බපච්චය සඞ්ඛයා** යි මෙසේ කියනලද කොඨාසාන්තය ද යන යම් මේ සතරඅන්ත කෙනෙක් වෙත්ද ඔවුන් අතුරෙන් සියලු ම වෘත්තදුඃඛයාගේ මේ සතර වන කෙළවර සඞ්ඛ්‍යාත වූ අන්තය කෙළේය, පරිවේඡදය හාත්පසින් පරිවේඡදය කෙළේය; දුඃඛය අන්තිම ශරීරය පමණක් අවශෙෂකොට ඇතිවූවක් කෙළේ යයි කියනලද්දේ වෙයි.

අත්තමනා තෙ භික්ඛූ= සවමනස් ඇත්තාහු සතුටුසිත් ඇත්තාහු නොඑහොත් ප්‍රීතිසෞමනස්‍යයෙන් සම්ප්‍රයුක්ත සිත්ඇත්තාහු වී; **භගව තො භාසිතං අභිනන්දුං**= මේ දුක් කෙළවර කිරීම අන්තකොට ඇති භාග්‍යවතුන් වහන්සේගේ භාසිතය සුකථිතය සුලපිතය "භාග්‍යවතුන් වහන්ස! මේ මෙසේ මය සුගතයන් වහන්ස! මේ මෙසේ මය" යි මුදු නෙන් පිළිගනිමින් අනුමොදන්වූහ යි.

මෙහි අවශෙෂ වූ යමක් නො කියනලද ද එය පෙර කී බැවින් ද සුවසේ දතහැකි බැවින් ද නො කියනලදී; එහෙයින් සියල්ල කී අනු සාරයෙන් පදයක් පාසා කල්පනා කටයුතුයි.

සබ්බාසව සූත්‍ර වර්ණනා නිමි.

ධම්මදායාද සූත්‍ර වණ්ණනා.

එවමේම සුතං යි "ධම්මදායාද" සූත්‍ර යයි. යම් හෙයකින් වනාහි මේ සූත්‍රයාගේ අපොතපත්තනික වූ නික්ඛේපය වේද, එහෙයින් ඒ අපොත්පත්තිය දක්වා ම මේ සූත්‍රයාගේ අපුඵපද වණ්ණනාව කරන්නෙමු. කවර අපොතපත්තියෙක්හි මේ සූත්‍රය වදරන ලද්දේ ද යත්? ලාභසත්කාර යෙහි ය; භාග්‍යවතුන් වහන්සේට මහත්වූ ලාභසත්කාරය උපන, සාරිසඛ්‍ය කලපලක්ෂයෙක්හි පිරූ දානපාරමී සමූහයාගේ (ආනිශංසය) යම්සේ ද එමෙනි; ඒ එසේමැයි- සියලු දිශාවන්හි යමාමහ වැස්සක් නැඟී මහ ගංවතුරක් මෙන් සියලු පැරැම්හු එක් අත්බැවෙක්හි විපාකය දෙන්නෙමුයි, එක්වූවන් මෙන් ලාභසත්කාර මහොඝය ඉපදවූහ; ඒ ඒ දිගින් බත්පැන් යහන්වත් මල්ගඳ විලවුන් ඇඟත් අත් ඇති රජ බමුණු ආදීහු අවුත් බුදුහු කොහි යැ භාග්‍යවත්හු කොහි යැ දෙව්යන්ට දෙව්වූවෝ නරශ්‍රෙෂ්ඨයෝ පුරුෂශ්‍රෙෂ්ඨයෝ කොහි යැ යි භාග්‍යවතුන් වහන්සේ සොයති; ගැල් සියයෙනුදු සිව්පසය ගෙනවුත් ඔවස් නො ලබමින් හාත්පස ගව්වක් පමණ ද ගැල්වියෙන් ගැල්විය හැපී සිටිති; අඞ්ඛ විඳූ බ්‍රාහ්මණාදීන් මෙන් නුහුබැඳීම ද කෙරෙත්; සියල්ල ඛඞ්ගකයෙහි ද ඒ ඒ සූත්‍රයන්හි ද ආ නයින් දතයුතු. භාග්‍යවතුන් වහන්සේට යම් සේ ද එපරිද්දෙන් භික්ඛනට ද (ලාභසත්කාරය උපන.) මේ වදරන ලදුයේ මැයි—

ධම්මදායාද සූත්‍ර අපොතපත්තිය.

තෙන බො පන සමයෙන භගවා සක්කතො හොති ගරුකතො මානිතො පූජිතො අපචිතො ලාභී චීවරපිණ්ඩපාත සෙනාසනගිලාන පච්චය භෙසජ්ජ පරික්ඛාරානං; භික්ඛුසඞ්ඝොපි බො සක්කතො හොති —පෙ— පරික්ඛාරානනති

(=එසමයෙහි වනාහි භාග්‍යවන්තෙම සත්කාර කරනලදුයේ ගරුකාර කරනලදුයේ සිතින් බුහුමන් කරන ලදුයේ නිපවවාකාරය දක්වන ලදුයේ පුදන ලදුයේ වෙයි, චීවර පිණ්ඩපාත ශයනාසන ග්ලානප්‍රත්‍යය භෛෂජ්‍ය පරිෂ්කාරයන් ලාභී වූයේ වෙයි; භික්ෂු සඞ්ඝතෙමේ ද සත්කාරකරන ලද්දේ වෙයි -පෙ- පරිෂ්කාරයන් ලාභීවූයේ වේ යයි.)

එසේම යාවතා බො චුන්ද! එතරහි සඞ්ඝා වා ගණා වා ලොකෙ උපපන්නා නාහං චුන්ද! අඤ්ඤං එකසඞ්ඝම්පි සමනුපස්සාමි එවං ලාභග්ගයසග්ගපත්තං යථරිව චුන්ද! භික්ඛුසඞ්ඝොති

(=චුන්දය! මෙකල්හි යම්පමණ සංඝයා හෝ ගණයා හෝ ලෙව්හි පහළවූවාහුද චුන්දය! භික්ෂු සංඝතෙමේ යම්සේ ද එපරිද්දෙන් ලාභයෙන් අග්‍රපත් යසසින් අග්‍රපත් අන්‍ය එක සංඝ කොතෙකුදු චුන්දය! මම නො දක්මියි.)

භාග්‍යවතුන් වහන්සේට ද භික්ෂු සඞ්ඝයාට ද උපන්නාවූ හේ මේ ලාභසත්කාරය තෙම එක්ව ගෙන මහා ගඞ්ගා දෙකුක්හුගේ ජලය මෙන් පමණ නො කළහැක්කේ විය.

භික්ෂූහු ක්‍රමයෙන් ප්‍රත්‍යය ගරුකවූවාහු ප්‍රත්‍යයෙහි හිඳුවූවාහු ප්‍රත්‍යයෙහි බහුල පැවතුම් ඇත්තාහු වූහ; පසුබත්හිදු තෙල්මී උක්සකුරු ආදිය ඵලවූකල්හි ගෙඩිය ගසා අපගේ ආචාර්‍යාහට දෙවු උපාධ්‍යායහට දෙවු යයි උස්කොට ශබ්ද කෙරෙති; ඒ ඔවුන්ගේ පැවැත්ම ද භාග්‍යවතුන්ටත් ප්‍රකටවූව; ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ නො සුදුසු යයි ධර්මසංවේගය උපදවා මෙසේ සිතූහ, ප්‍රත්‍යය නො කැප යයි ශික්ෂාපද පනවනුවට් නො හැක; යම් හෙයකින් කුලපුත්‍රයන්ගේ මහණ ධර්මයි පැවැත්ම ප්‍රත්‍යය පිළිබඳ වූවා ද එහෙයිනි; යම් ප්‍රතිපදාවක් ශික්ෂාකාමී කුලපුත්‍රයන්ට ශික්ෂාපද ප්‍රඥප්තියක් මෙනුත් නුවරදෙරතැබූ සප්‍රතිභාගිකා දර්ශියක් මෙනුත් වන්නේද එබැවින් මම ඒ ධර්මදර්ශනය ප්‍රතිපදාව දෙසම්; ඒ එසේමැයි- නුවරදෙර සියලු කය ගන්නා කැඩපතක් තැබූ කල්හි චතුර්ණ්‍යෝ ම සවකීය ඡායාව දැක යම්සේ වරද හැර නිදොස් වෙත් ද එපරිද්දෙන් ම ශික්ෂාකාමී කුලපුත්‍රයෝ ශික්ෂායොගමණ්ඩනයෙන් තමන් මණ්ඩනය කරනු කැමැත්තාහු මේ සප්‍රතිභාගිකාදර්ශියක් බඳුවූ දෙශනාව ආවර්ජනය කොට ආමිෂදර්ශනය ප්‍රතිපදාව දුරලා ධර්මදර්ශනය ප්‍රතිපදාව පුරන්නාහු වහාම ජාති ජරා මරණය කෙළවර කරන්නාහු යයි. මේ අර්ථාත් පත්තියෙහි මේ සූත්‍රය වදාළසේක.

ඒ දෙශනාවෙහි **ධම්මදායාදා මේ භික්ඛවෙ! භවථ මා ආමිසදායාදා** යනු මහණෙනි! මාගේ ධර්මය දායාදකොට ඇත්තෝ වවු, ආමිසය දායාද කොට ඇත්තෝ නො වවු; මාගේ යම් ධර්මයක් වේද එය පිළිගන්නාහු වවු, මාගේ යම් ආමිෂයකුත් වේද එය පිළිගන්නාහු නො වවු. යයි කියනලද වෙයි; එහි ධර්මය ද ත්‍රිවිධ වෙයි, **නිෂ්පර්‍යායධර්මය** පර්‍යායධර්මය යි; ආමිෂය ද ත්‍රිවිධ වෙයි, නිෂ්පර්‍යායාමිෂය පර්‍යායාමිෂය යි; කෙසේද? මෙසේ දතයුතු- මාගීඵලනිර්වාණ හෙද වූ නවවිධ වූ ම ලොකොත්තර ධර්මය නිෂ්පර්‍යායධර්මය නිර්වර්තිත ධර්මය ම වෙයි, කිසියම් පර්‍යායකින් කාරණයකින් හෝ ලෙශයකින් හෝ ධර්ම වූයේ නො වෙයි; යම් මේ විවෘතතයට උපනිශ්‍රය වූ කුශලයක් වේද ඒ කවරය යත්? මෙලොව කිසිවෙක් නිවන ප්‍රාර්ථනාකරමින් දන්දෙයි, සිල් සමාදන් වෙයි, පෙහෙවස්කම් කෙරෙයි, සුවදමල් ආදියෙන් වසතු පූජා කෙරෙයි, බණ අසයි, දෙසයි, දැහැන් සමවත් නිපදවයි, මෙසේ කරන්නේ පිළිවෙළින් නිෂ්පර්‍යාය ධර්මවූ අමෘතවූ නිර්වාණය ප්‍රතිලාභයකෙරෙයි, මේ (දක්වනලදුයේ) පර්‍යාය ධර්මයයි; එසේම සිවුරු ආදී සිව්පසය නිෂ්පර්‍යායාමිෂය මැයි, අන්‍ය පර්‍යායකින් හෝ ලෙශයකින් හෝ ආමිෂවූයේ නො වෙයි; යම් මේ වෘත්තගාමී කුශලයක් වේද, ඒ කවරයත්? මෙලෙව්හි කිසිවෙක් භවය ප්‍රාර්ථනා කරමින් සම්පත්ති භවය කැමතිවෙමින් දන්දෙයි -පෙ- සමවත් නිපදවයි, මෙසේ කරමින් පිළිවෙළින් දිව්‍යමනුෂ්‍ය සම්පත්තිය ප්‍රතිලාභය කෙරෙයි, මේ පර්‍යායාමිෂය නම්වේ.

ත්‍රිවිධ ධර්මය හා ආමිෂය.

එහි නිෂ්පර්‍යායය ධර්‍මය ද භාග්‍යවත්හු ම සත්‍යක වෙයි; සැබව භාග්‍ය වතුන් විසින් වදුළබැවින් භික්‍ෂූහු මාගීඵල නිර්‍වාණයන් අධිගම කෙරෙති; මේ වදුරනුලද මැයි- **සෝ හි බ්‍රාහ්මණ! භගවා අනුපාදාපරිනිබ්බානත්ථං ඉමස්ස මහතෝ ඛන්ධකායස්ස උප්පාදෙතා අසඤ්ඤාපත්තියා මහතෝ සඤ්ඤාවේදයිතස්ස සඤ්ඤාවේදනා —පෙ— මහතෝ නුගා ච පන එතරහි සාවකා විහරන්ති පච්ඡා සමන්නාගතා හි ච**

(=ඒ එසේමය,- බමුණ! ඒ භාග්‍යවතුන් වහන්සේ සවසත්තානායෙහි පෙර නූපන් ඛඩ අසාධාරණ ඥානයට හෙතු වූ ආයර්‍ෂ්මාගීය සවසත්තානායෙහි උපදවන්නාහුය, වෙනෙය්‍ය සත්තානායෙහි පෙර නූපන්වීරූ ශ්‍රාවක පාරමී ඥානයට හෙතුවූ ආයර්‍ෂ්මාගීය වෙනෙය්‍යයන්ගේ සත්තානායෙහි උපදවන්නානුය —පෙ— එහෙයින් භාග්‍යවතුන් වහන්සේ ගියමඟ අනුව යන්නාවූ භාග්‍යවතුන් වහන්සේට පසුව පැමිණි සීලාදි ගුණ යෙන් සමන්විතවූ ශ්‍රාවකයෝ මෙකල්හි වෙසෙනි යයි ද.)

සෝ හාවුසෝ! භගවා ඤාණං ඤාණතෝ පස්සං පස්සති චක්ඛුභූතෝ ඤාණභූතෝ ධම්මභූතෝ බ්‍රහ්මභූතෝ වත්තා පවත්තා අත්ථස්ස නිද්දෙසතා අමතස්ස දාතා ධම්මස්සාමී තථාගතෝ හි ච.

(=ඇවැත්නි! ඒ භාග්‍යවතුන් වහන්සේ වනාහි දතයුතුදෙය හෙවත් සියලු පඤ්චවිධ ඥෙය්‍ය පථය නුවණින් දනිති, දුක්කයුතුදෙය හෙවත් ඒ නෙය පථය ම ඇසින් දක් කාලද්දක් මෙන් නුවණැසින් දකිති, දර්‍ශනපරිනායකාර්‍ථයෙන් චක්‍ෂුභූතයහ, ඥෙය්‍ය ස්වභාවාර්‍ථයෙන් ඤාණභූතයහ, අවිපරීත ස්වභාවාර්‍ථයෙන් හෝ පර්‍යාප්තිධර්‍මය පවත්වා හෙයින් හෝ සිනින් සිතා වචනයෙන් වදරන් නුයි ධර්‍මභූත යහ, ශ්‍රෙෂ්ඨාර්‍ථයෙන් බ්‍රහ්මභූතයහ, දහම්දෙසන හෙයින් හෝ පවත්වන හෙයින් වක්තෘයහ, නානාප්‍රකාරයෙන් වදරන හෙයින් හෝ පවත්වන හෙයින් ප්‍රවක්තෘයහ අර්‍ථය දක්වමින් පමුණුවනසේක, අමෘතයට පැමිණීම පිණිස ප්‍රතිපත්තිය දේශනා කරන හෙයින් අමෘතදායකයහ වූසේක, ලොවුතුරුදහම් ඉපදවීමාදි හෙතුවෙන් ධර්‍මස්වාමි වූහ, තථාආගතත්වාදි කාරණයෙන් තථාගතවූහ යි ද; මෙසේ සාධකයි.)

පර්‍යායය ධර්‍මය ද භාග්‍යවතුන් වහන්සේ ම සත්‍යක වෙයි; යම් හෙයකින් භාග්‍යවත්හු විසින් වදුළ බැවින් ම වූයේ ද එහෙයිනි; නිවන ප්‍රාර්‍ථනාකොට දන්දෙන්නේ —පෙ— සමවත් උපදවන්නේ පිළිවෙළින් අමා නිවන් ලබා යයි.

නිෂ්පර්‍යායාභිඥය ද භාග්‍යවත්හු ම අයත්වෙයි; ඒ එසේ මැයි- භාග්‍ය වතුන් විසින් අනුදත් බැවින් ම භික්‍ෂූන් විසින් ජීවක වස්තුව ආදිකොට පිණිසිවුරු ලද්දේය; වදුලේ මැනු- **අනුජානාමි භික්ඛවෙ! ගහපති චීවරං යො ඉච්ඡති පංසුකූලිකො හොතු යො ඉච්ඡති ගහපති චීවරං සාදියතු ඉතරීතරෙන පාහං භික්ඛවෙ! සන්තුට්ඨිංයෙව වණ්ණෙමීති.**

(=මහණෙනි! ගෘහපති චීවරය අනුදනිමි; යමෙක් කැමතිවී නම් හෙතෙම පාංශු කූලික වේවා යමෙක් කැමතිවී නම් හෙතෙම ගෘහපති චීවරය පිළිගනීවා, එතකුදුවුවත් මහණෙනි! මම ඉතරීතර ප්‍රත්‍යයෙන් සන්තුෂ්ටිය ම වර්‍ණනා කරමි යි.)

පෙර භික්‍ෂූහු ප්‍රණීත පිණ්ඩපාතය නො ලත්හ, සපදානයෙන් ලත් පිණ්ඩියාලොප භොජනය ඇත්තාහු ම වූහ; රජගහනුවර වාසයකරන භාග්‍යවතුන් විසින් **අනුජානාමි භික්ඛවෙ! සඛීරඛත්තං උදෙදඝඛත්තං නිමන්තණඛත්තං සලාකඛත්තං පක්ඛිකං උපොසථිකං පාටිපදිකං යි**

මෙසේ වදුළ බැවින් ම ඔවුන් විසින් පිණ්ඩිබොදුන් ලද්දේය; සෙනසුන ද එපරිද්දෙනි; ඒ එසේමැයි- පෙර භික්ෂූහු අකෘතප්‍රාඛහාර වෘක්ෂමූලාදි සෙනාසන ඇත්තාහු ම හුහ; ඔවුහු **අනුජානාමි භික්ඛවෙ! පඤ්චලෙණානි** යි මෙසේ භාග්‍යවතුන් විසින් අනුදුන වදුළ බැවින් ම විහාරය අඩ්ඩයොගය ප්‍රාසාදය හම්‍යය ගුහාය යන මේ සෙනසුන් ලැබූහ; පෙර මුත්තහරීවකයෙන් ම බෙහෙත් කළාහුය; ඔවුහු භාග්‍යවතුන් විසින් ම **අනුජානාමි භික්ඛවෙ! පඤ්චහෙසජ්ජානි සෙය්‍යථීදං? සප්පි නවනීතං තෙලං මධු ඵාණිතං** යි මේ ආදි නයින් අනුදත් බැවින් නානා හෙෂජ්‍යයන් ලැබූහ. පය්‍යායාමිෂය ද භාග්‍යවත්හු ම අයත් වෙයි; යම්හෙයකින් භාග්‍යවතුන් විසින් වදුළ බැවින් උපන්නේ ද එහෙයිනි; සම්පත්ති භවය ප්‍රාර්ථනා කරන්නේ දන් දී සිල් -පෙ- සමවත් නිපදවා පිළිවෙළින් පය්‍යායාමිෂය වූ දිව්‍ය සම්පත්තිය මනුෂ්‍ය සම්පත්තිය ලබන්නේ යයි.

ආමිෂ දායාදය හා ධම්ම දායාදය.

යම් හෙයකින් ඒ නිෂ්පය්‍යාය ධර්මය ද පය්‍යාය ධර්මය ද නිෂ්පය්‍යායාමිෂය ද පය්‍යායාමිෂය ද භාග්‍යවත්හු ම අයත් වේ ද එහෙයින් එතුන්මන් වහන්සේගේ සවාමිභාවය දක්වනසේක් **ධම්මදායාදා මෙ භික්ඛවෙ! භවථ මා ආමිසදායාදා** යි වදුළහ මා සතුවූ යම් විවිධවූ ම ධර්මයක් වේද ඒ ධර්මයට දායාදවූවෝ වවු; තවද මා සතුවූ ම යම් මේ ආමිසයක් වේද ඒ ආමිෂයට දායාද වූවෝ නො වවු; ධර්මකොඨාසයට ම හිමිවූවෝ වවු; ආමිෂකොඨාසයට හිමි නො වවු;- යමෙක් වනාහි බුදුසසුන්හි පැවිදිව ප්‍රත්‍යය පරම්කොට ඇතිව වෙසේ ද චතුර්ධ තෘෂ්ණාතප්‍රාදයන්හි පැනෙමින් ධර්මානු ධර්ම ප්‍රතිපත්තියෙහි බහාතැබූ ව්‍යක්තිය වෙසේද මේ ආමිෂ දායාද කොට ඇත්තේ නම් වේ; එබදුවූවාහු නො වවු- යමෙක් වනාහි අනුදුන වදුළ ප්‍රත්‍යයන්හි අල්පෙච්ඡතාවාදිය ම නිසා නුවණින් සලකා සෙවනය කරමින් ප්‍රතිපත්තිය උතුම්කොට ඇතිව චතුර්ධ ආර්ය්‍යවංශයෙහි පැනෙමින් වෙසේද, මේ තෙම ධර්මදායාදකොට ඇත්තේ නම් වෙයි; එබදුවූවෝ වවු **ඝ** යි කියනලද්දේ වෙයි.

මෙවිට යම් කෙනෙකුන්ට ඒ දෙශනා විෂයෙහි මෙබදු සිතක් වූයේ ද අනාගතයෙහි හෝ වන්නේ ද **කිම** හෝ භාග්‍යවතුන් වහන්සේ ශ්‍රාවකයන්ට අලාභය කැමැත්තාහු මෙසේ වදුලෝ දැ? යි. මම ඔවුන්ට අනුශාසින් ප්‍රණීතලාභය කැමැත්තෙම් මෙසේ කියම්'යි දක්වනුවට වදුළහ- **අත්‍ථි මෙ තුම්හෙසු** —පෙ— **නො ආමිස දායාදා** යි. ඒ දෙශනාවගේ මේ අර්ථයයි- තොපකෙරෙහි මාගේ අනුකම්පාවක් අනුදයාවක් හිතෙෂී බවක් ඇත; කිනම් කාරණයකින් කවර උපායකින් මාගේ ශ්‍රාවකයෝ ධර්ම දායාදකොට ඇත්තාහු ධර්මකොඨාසයට හිමිවූවාහු වන්නාහුද ආමිෂය දායාදකොට ඇත්තාහු නො වන්නාහුදැයි; මේ වනාහි අදහසයි භාග්‍යවතුන් වහන්සේ ආමිෂගරුක වූ ආමිෂයෙහි ගැටුනාවූ (භික්ෂූන්

අතුරෙන්) අතීත කාලයෙහි වනාහි කපිල භික්ෂුවගේ ද **"සඞ්ඝාටිපි ආදීනනා හොති** යනාදි නසින් ආවාවූ ලාමක භික්ෂු භික්ෂුණී ශික්ෂමාණා දිවූ අනෙක ශතයන්ගේ ද තමන් වහන්සේගේ ශාසනයෙහි පැවිදි වූ දෙවදත්තාදීන්ගේ ද අපාය පරිපූරක භාවය ද; ධර්මගරුක වූ ශාරිපුත්‍ර මෞද්ගල්‍යායන මහාකාශ්‍යපාදීන්ගේ අභිඥ ප්‍රතිසම්භිදාදි ගුණ ප්‍රතිලාභ ය ද දක්නාසේක; එහෙයින් ඔවුන්ගේ අපායෙන් මිදීම ද සියලු ගුණ පැමිණීම ද කැමතිවනසේක් **අපි මෙ තුමෙහසු අනුකම්පා කිනති මෙ සාවකා ධම්මදායාදා භවෙයයුං නො ආමිසදායාදා** යි වදාළහ. යලි ප්‍රත්‍යයගරුක වූයේ සිව්පිරිස් අතරැ හොර කහවණුවක් මෙන් ද නිවුන අඟුරක් මෙන් ද තෙදරහිතවූයේ ප්‍රභාරහිතවූයේ වෙයි; එසින් නැවතුන් සිත් ඇති ධර්මගරුකවූයේ තෙද ඇත්තේ සිංහයෙකු මෙන් අභිභවනය කොට හැසිරෙනසුලු වූයේ වෙයි; ඒ කරුණෙනුදු මෙසේ වදාළහ; **අපි මෙ** -පෙ- **නො ආමිසදායාදා** යි.

ආමිෂ දායාදයෙහි ආදීනව.

මෙසේ **ධම්මදායාදා මෙ භික්ඛවෙ! භවථ මා ආමිසදායාදා** යන මෙය අනුකම්පාවෙන් අතිශයින් ප්‍රණීතවූ ලාභය කැමැත්තහු විසින් වදාරන ලද්දේය්, අලාභාර්‍ථීවූවහු විසින් නො වේ යයි සාධක කොට මෙවිට මේ අවවාදය නො කිරීමෙහි ආදීනව දක්වනසේක් **තුමෙහ ච මෙ භික්ඛවෙ!** -පෙ- **නො ධම්මදායාදා** යි වදාළහ. එහි **තුමෙහපි නෙන ආදිස්සා භවෙයයාථ** යනු තෙපිදු ඒ ආමිෂ දායාද භාවයෙන් ධර්මදායාද කොට නැති බැවින් ගැරහිය යුත්තෝ වන්නහුය වෙන්කොට දුක්විය යුත්තාහු වෙන් කටයුත්තාහු ව්‍යවසථා කටයුත්තාහු නුවණැත්තන් විසින් ගැරහිය යුත්තාහු වන්නාහු යයි කියන ලද්දේ වෙයි; **කිනති ආමිසදායාදා සඤ්ඤාවකා විහරනති නො ධම්මදායාදා** යි, **අහමපි තෙන ආදිස්සා භවෙයයං= මම ද තොපගේ ඒ ආමිෂ දායාද භාවයෙන් ධර්මය දායාදකොට නැති බැවින් ගැරහිය යුත්තෙමි වන්නෙමි.**

කිනති ආමිස -පෙ- **දායාදා** යන මෙය භාග්‍යවතුන් වහන්සේ ඔවුන් ඉතා ම මෘදුකිරීම පිණිස වදාළහ. මේ වනාහි මෙහි අදහසයි— මහණෙනි! ඉදින් තෙපි ආමිෂයෙහි ලොල්ව වසන්නහු නම් ඒ කරුණෙහි ලා පණ්ඩිතයෝ මා ගරහන්නාහුය, කෙසේ නම් සම්බුදු වූයේ තමාගේ ශ්‍රාවකයන් ධර්මදායාද වූවන් ආමිෂ දායාද නොවූවන් කරන්ට නො හැකි වේ දැයි කියා යි; අනාකල්ප සම්පන්න වූ භික්ෂූන් දැක මොවුහු කාගේ සද්ධිවිහාරිකයෝ ද? කාගේ අන්තෙවාසියෝ දැ? යි ආචාර්‍ය්‍ය උපාධ්‍යයන්ට යම්සේ නම් ගරහත් ද; තවද දුශ්ශීල වූ ලාමක ස්වභාව ඇති කුල කුමාරුන් හෝ කුල කුමරියන් දැක මොවුහු කවරෙකුගේ පුත්‍රයෝ ද? කවරෙකුගේ දියණියහු දැ? යි මවුපියන්ට යම්සේ ගරහත් ද; එපරිද්දෙන් ම මා පණ්ඩිතයෝ ගරහන්නාහුය, කෙසේ නම් සම්බුදු වූයේ තමාගේ ශ්‍රාවකයන් ධර්මදායාද වූවන් ආමිෂ දායාද නොවූවන් කරන්ට නො හැකි වේ

දැ? සි කියයි. මෙසේ මේ අවවාදය (පිළිගෙන) නො කිරීමෙහි ආදීනව දක්වා කිරීමෙහි අනුසස් දක්වනසේක් **තුමෙහ ච මෙ** යනාදිය වදළහ. **එහි අහම්පි නෙන න ආදිසෙසා භවෙය්‍යං** යනු වත් පුරන්නාවූ තරුණ භික්ෂූන් උද්දෙශපරිපෘච්ඡා සම්පූර්ණී වූවන් වස් සියයක් ගිය තෙරවරුන් මෙන් ආකල්ප සම්පන්නවූන් දැක කාගේ සඬ්විහාරිකයෝ ද? කාගේ අතවැසියෝ දැ? සි (විචාරා) අසවලාගේ යයි (දුන) තෙරුන් වහන්සේට සුදුසුය එකාන්තයෙන් අවවාද කරන්ට අනුශාසනා කරන්ට ප්‍රතිබල යයි යම්සේ නම් ආචාර්‍ය්‍ය උපාධ්‍යයෝ වෙන්කොට නො දැක්විය යුත්තාහු නො ගැරහිය යුත්තාහු වෙත්ද; එපරිද්දෙන් ම මම ද තොපගේ ඒ ධර්‍ම දායාද භාවයෙන් ආමිස දායාද නොවූ බැවින් කවරෙකුගේ ශ්‍රාවකයෝ නාලක ප්‍රතිපදාවට තුවටක ප්‍රතිපදාවට චන්ද්‍රොපම ප්‍රතිපදාවට රථවිනීත ප්‍රතිපදාවට මහාගොශෘඞ්ගසාල ප්‍රතිපදාවට මහාශූන්‍යත ප්‍රතිපදාවට පිළිපන්නාහු චතුර්ඞ්ග ප්‍රත්‍යය සන්තොෂ භාවනාරාම ආර්‍ය්‍ය වංශයන්හි ශික්ෂා වූවාහු ප්‍රත්‍යය තෘෂ්ණාවෙන් පෙරලුනු සිත් ඇත්තාහු වලාහකයෙන් මිදුනු චන්ද්‍රයා වැනි වූවාහු දැ? සි (විචාරා) ශ්‍රමණ ගෞතමයන්ගේ ශ්‍රාවකයෝ යයි කී කල්හි එකාන්තයෙන් භාග්‍යවතුන් වහන්සේ සර්‍වඥයහ, එකාන්තයෙන් ශ්‍රාවකයන් ආමිෂදායාද ප්‍රතිපදාව හරවා ධර්‍මදායාද ප්‍රතිපත්තිය පුරන්නවුන් කරන්ට හැකිවූහ සි නුවණැත්තන් විසින් වෙන්කොට නො දැක්විය යුත්තෙම් නො ගැරහිය යුත්තෙම් වන්නෙම් සි.

මෙසේ මේ පදයෙහි අදහස **දුන සෙස්ස කෘෂ්ණපක්ෂයෙහි කී ක්‍රම** යට ප්‍රත්‍යනීකයෙන් දතයුතුයි. මෙසේ මේ අවවාදය (පිළිගෙන) කිරීමෙහි අනුසස් දක්වා මෙවිට ඒ අවවාදය පාවාදෙන සේක් **නාසමාහිහ මෙ භික්ඛවෙ!** -පෙ- **නො ආමිසදායාදා** සි වදළහ. මෙසේ මේ අවවාදය පාවාදී දුන් ඒ ධර්‍මදායාද **ප්‍රතිපත්තිය සම්පූර්ණ කරන්නහුට සතුති කරනු පිණිස ඉඛාහං භික්ඛවෙ!** යනාදිය වදළහ. ඒ එසේමැයි- භාග්‍ය වත්හුගේ සැසසීම අසාත් ඒ පිණිස පිළිපදින්නාහු වෙත් මැය. **එහි ඉඛ** යනු මේ නිපාතපදයකි; **භූතනාවි** යනු වැළඳුයේ කළඛත්කිස ඇත්තේ යයි කියනලද වෙයි; **පවාරිණා** යනු යාවදත්පවාරණයෙන් පැවරුයේ යැපෙන පමණ වළඳ ප්‍රතික්ෂේපකළ බොදුන් ඇත්තේ තෘප්තියට පැමිණියේ ද සි කියනලද වෙයි. ඒ එසේ මැයි-

චතුර්ව්ඛ පවාරණය.

පවාරණය චතුර්ඞ්ග වන්නීය, වස්වැස නිමවනලද පවාරණය ප්‍රත්‍යය පවාරණය අනතිරික්ත පවාරණය යාවදත්පවාරණ යයි කියයි. ඔවුන් අතුරෙහි **අනුජානාමි භික්ඛවෙ! වස්සං වුත්ථානං භික්ඛූනං තිහි ඨානෙහි පවාරෙතුං** යන මෝ තොමෝ වස්වැස නිමවනලද පවාරණ යයි. **ඉච්ඡා මහං භන්තෙ සඞ්ඝං චාතුමාසං හෙඨජෙත්ති පවාරෙතුං** යි ද **අඤ්ඤතර පුනපවාරණාය අඤ්ඤතර නිච්චපවාරණාය** යි ද මෝ තොමෝ පච්චය පවාරණ යයි.

පවාරිතෝ නාම ආසනං පඤ්ඤායති භොජනං පඤ්ඤායති හත්ථපාසෝ සිනෝ අභිහරති පටික්ඛිපෝ පඤ්ඤායති එසෝ **පවාරිතෝ නාම** යන මෝ තොමෝ අනතිරිත්ත පවාරණ යයි **පණීතේන ඛාදනීයේන භොජනීයේන සහත්ථා සන්තප්පේසි සම්පවාරේසි** යන මෝ තොමෝ යාවදත් පවාරණ යයි. මෙහි මෝ තොමෝ අදහස්කරන ලද්දීය; එයින් කියනලදී. **පවාරිතෝ** යනු යාවදත් පවාරණයෙන් පැවරුයේ යි.

පරිපුණ්ණෝ= භොජනයෙන් සම්පූර්ණවූයේ; **පරියොසිතෝ**= අවසන්කළ භොජනය ඇත්තේ; (මෙහි) උත්තරපද ලොපය දත යුතුයි. යම්තාක් වැළදියයුතු වේ ද ඒ තාක් වළඳන ලද්දේ වෙයි, මා විසින් භොජන ක්‍රියාව අවසන්කරන ලද්දීය යන අර්ථයි; **සුහිතෝ**= පිණාගියේ සාදුක් නැති බැවින් හෝ සුඛිතවූයේ යයි කියනලද වෙයි; **යාවදත්ථෝ**= යම් පමණ මට භොජනයෙන් ප්‍රයොජන ද ඒ සියල්ල පැමිණියේ යයි; මෙහි ද පළමු (පද) ත්‍රයට පසුව කීවාහු සාධක වෙති; ඒ එසේමැයි— යමෙක් පරියොසිතද හෙතෙම භුත්තාවී වෙයි; යමෙකුත් සුහිතවූයේ ද හෙතෙම යාවදත් පවාරණයෙන් පවරනලද්දේ වෙයි; යමෙක් යාවදත්ද හෙතෙම පරිපුණ්ණ යයි; නොහොත් පූර්වයෙහි දුක්වූවෝ පශ්චිම යන්ට සාධක වෙති; ඒ එසේමැයි- යම් හෙයකින් භුත්තාවී වූයේ ද එහෙයින් පරියොසිතය; යම් හෙයකින් පවාරිතද එහෙයින් සුහිතය; යම් හෙයකින් පරිපුණ්ණද එහෙයින් යාවදත් යයි; මේ සියල්ල ද කල්පනා කොට කියනලදැයි දතයුතුයි.

"සිඤ්ඤා" ශබ්දය.

සිඤ්ඤා යනු එකාන්තයෙහි ද විකල්පයෙහි ද වෙයි; **පඨවිධාතු සිඤ්ඤා අප්පඨිට්ඨිතත්තා සිඤ්ඤා බාහිරා** යනු එකාන්තයෙහි ය; **සිඤ්ඤා අඤ්ඤතරස්ස භික්ඛුනෝ ආපත්තිවිත්තික්කමෝ** යනු විකල්පයෙහිය; මෙහි උභයාර්ථය ම වටී. **අතිරෙකවූයේ ම අතිරෙක ධම්ම නම්; ඡඩ්ඩිත ධම්මා** යනු ද එසේමැයි; අධිකවූයේ ද හළයුත්තේ ද වෙයි, අන් කිසිවක් නො කට යුත්තේය යන අර්ථයි. **අථ**= එකල්හි; **ජීඝච්ඡාදුබ්බල්‍යපරේතා** යනු බඩසයින් ද දුබලබැවින් ද පිඩිත වූවාහු සපශීකළාහු යුක්තවූවාහු ද යන අර්ථයි; අටදිනක් ද දසදිනක් ද එහි කිසිවෙක් බඩසය ඇත්තාහු ද දුර්බල නෝ වෙති, බඩසය ඉවසන්ට හැකිවෙත්, මොවුහු වනාහි එබදු නො වෙතියි දක්වන්ට (පද) දෙකක් වදාළහ; **නත්‍ථාහං**= තෙ + අහං= (ඔවුන්ට මම;) **සචේ ආකඞ්ඛථ**= ඉදින් කැමැත්තහු නම්; **අප්පහරිතේ**= හටනොගත් තණ ඇති බිමෙහි; යම් තැනෙක්හි පිණ්ඩපාතය දුම්මෙන් විනාශවන සුලුවූ තණ නැත්ද එහි යන අර්ථයි; එයින් තණ නැති තැන ද මහාතණ ලැහැබ ද යම් තැනක ගැලිනුදු පිණ්ඩපාතය දුමූකල තණ නො නැසෙත් ද එතැන ද ගන්නා ලද්දේ වෙයි; සැබව මෙය භූතගාම ශික්ෂාපදය අවිකොපනය පිණිස කියනලදී.

අපපාණකෙ= ප්‍රාණීන් රහිතවූ, පිණ්ඩපාතය බැහිමෙන් මළයුතු ප්‍රාණීන් රහිතවූ හෝ මහා ජලසකඨයෙහි; යම් හෙයකින් සවලජලය ඇති තැන්හි ම බත් දැමීමෙන් කැලඹුනු කල්හි සියුම් ප්‍රාණීහු මැරෙත්ද මහාතඩාගාදියෙහි නො මැරෙත් ද එහෙයින් ප්‍රාණීන් රැකීම පිණිස ම මෙසේ වදාරනලදී. **ඔපිලාපෙස්සාමි**= උල්පවා හරින්නෙමි; **තන්තෙකස්ස** ඔවුන් දෙදෙනා අතුරෙන් එකෙකුට; යමෙක් මේ ධර්මදේශනාව මනා කොට ඇසුයේ වේද නැවත නැවත ආවර්ජනාත් කෙරේද ඔහු සඳහා වදාළහ. **වුත්තං හෙතං පනෙතං** යි.

"වුත්ත" ශබ්දය.

මේ "වුත්ත" ශබ්දය තෙම කෙස් බැහිමෙහි ද දක්නා ලැබේ; **කාපවිකෙ මාණවෙ දහරෙ වුත්තසිරෙ** යනාදි තැන්හිය; රොපිතයෙහි ද (දක්නා ලැබේ,) **යථා සාරදිතං බීජං බෙ තෙත වුත්තං විරුහති** යනාදි තැන්හිය; කර්ෂිතයෙහි ද (දක්නා ලැබේ,) **වුත්තමිදං භගවතා වුත්තමරහතා** යනාදි තැන්හිය; මෙහි වූ කලී කර්ෂිතයෙහි දතයුතුයි; මේ වනාහි වදාරන ලද්දේය යන මේ තෙම මේ "වුත්ත" ශබ්දයාගේ අර්ථයි. **ආමිසකඤ්ඤතරං** යනු සිව්පස ආමිෂයන් අතුරෙන් අන්‍යතරයෙක, එකෙක යන අර්ථයි; **යදිදං** යනු නිපාතයි, සියලු ලිඞ්ගවිභක්ති වචනයන්හි එබඳුමැයි, ඒ ඒ තැන්හි අර්ථ වශයෙන් පෙරලාගත යුතුයි; මෙහි වනාහි මේ පදයාගේ "යො එසො" (= යම් මේ) යන අර්ථයි; යම් මේ පිණ්ඩපාතයක් නම් වේද මෙය එක්තරා ආමිෂයෙකැයි කියනලද වෙයි; **යතනූනාහං**= ඉතා යෙ හෙ ක මම (යන අර්ථයි;) **එවං**= දැන් මේ ක්‍ෂණය යම්සේ ඉක්මවම්ද එපරිද්දෙන් රැඳවල ද; **විනිනාමෙය්‍යං**= ගෙවන්නෙමි, ඉක්මවන්නෙමි; **සො තං පිණ්ඩපාතං**= හෙතෙම ඒ දෙවියන් සහිත ලොකයා විසින් මුදුනෙන් පිළිගතයුතු වූ සුගතයන් වහන්සේ විසින් ඉතිරිකරනලද පිණ්ඩපාතය නො වළඳ, ධර්මයාද භාවය කැමති වෙමින් ආදිපත ශික්ෂාපමාව ප්‍රත්‍යවෙක්‍ෂා කොට ඒ බඩසා දුබල බැවින් ම යුක්තව මෙසේ ඒ රැඳවල ඉක්මවන්නේය; **අථ දුනිමස්ස** යන මේ වාරයෙහි මේ සංක්‍ෂෙප යයි; ඉදින් **ඒ මහණ යතනූනාහං** —පෙ— **විනිනාමෙය්‍යං** යි ඔතන්නේ මෙසේක් ඔතන්නේය; පැවිද්දහු විසින් වනාහි ව්‍යාලමෘගයන් විසින් ආකුලවූ වනයෙහි බෙහෙතක් මෙන් පස්කම්ගුණ නමැති සැඩසිවිපාවුන් විසින් ගැවසීගත් ගම්හි පිණ්ඩපාතය ද සොයන්ට දුෂ්කර වෙයි; මේ පිණ්ඩපාතය වනාහි මෙසේ සෙවීම් ආදීනවයෙන් මිදුනේ ද සුගතයන් විසින් ඉතිරිකරන ලදුයේ දැයි උහතොසුජාත ක්ෂත්‍රිය කුමාරයෙකු මෙන් වෙයි.

පිණ්ඩපාතය නො වැළඳියයුතු කරුණු පස.

යම් කරුණු පසකින් පිණ්ඩපාතය නො වැළඳිය යුතු වේද; ඔහු කවරහ? අලජ්ජී පුද්ගලයා සන්තක යයි පුද්ගලයා ගරහා නො වැළඳිය යුත්තේ වෙයි; භික්ෂුණිය විසින් නිපදවන ලද්දෙහි අසන්ත සම්භාවනයෙන් උපන්නේ යයි අපරිශුද්ධ උත්පත්ති ඇති බැවින් නො වැළඳිය යුත්තේ වෙයි; පිණ්ඩපාතය හිමි මහණ බඩසයින්

යුක්තවූයේ යයි, සඛාමියා කෙරෙහි අනුකම්පාවෙන් නො වැළඳිය යුත්තේ වෙයි; අතවැසියන් හෝ ඔවුන් පිළිබඳ වූ අන්‍යයන් හෝ බඳසයින් යුක්තයහ'යි (පිණ්ඩපාත සඛාම්වූ) හෙතෙම පිණාගියේ වේ ද ඔහුගේ ම අතවැසි ආදීන් කෙරෙහි අනුකම්පාවෙන් නො වැළඳිය යුත්තේ වෙයි; පිණ්ඩපාතය හිමිවූ භික්‍ෂු තෙම නො ඇදහිය යුත්තේ යයි ඒ අතවැසි ආදීහු ද යැපුනාහු සුඛිතවූවාහු වෙත් ද එතකුදු වුවත් නො ඇදහිය යුතු බැවින් නො වැළඳිය යුත්තේ වෙයි; ඒ කරුණු පසින් ද මේ පිණ්ඩ පාතය තෙම මිදුනේ වෙයි; ඒ එසේමැයි- භාග්‍යවතුන් වහන්සේ ලජ්ජීන් අතුරෙන් අග්‍රවූසේක; පිණ්ඩපාතය තෙමේ පරිශුද්ධොතපත්ති ඇත්තේ වෙයි; භාග්‍යවතුන් වහන්සේ යැපුනාහු සුඛිත වූවාහු වෙති; කැමතිවන්නාවූ අන්‍ය පුද්ගලයෙකුදු නැති; යමෙක් ලොකයෙහි ඇද හිය යුත්තාහු වෙත්ද භාග්‍යවත්හු ඔවුන් අතුරෙන් අග්‍රවෙති'යි; මෙසේ සිතා ද හෙතෙම ඒ පිණ්ඩපාතය වළඳ, -පෙ- ඉක්මවන්නේය; මෙතෙකින් යමෙකුත් නො වළඳ, මහණදම් කෙරේද හෙතෙමේ ද වැළඳිය යුතු වූ ම පිණ්ඩපාතය නො වැළඳුයේ වෙයි; යමෙක් වළඳ, මහණදම් කෙරේ ද හෙතෙමේ ද වැළඳිය යුතුවූ ම පිණ්ඩපාතය වැළඳුයේ වෙයි; පිණ්ඩපාතයෙහි වෙසෙසෙක් නැති; පුද්ගලයා කෙරෙහි වනාහි විශෙෂය ඇති; එහෙයින් ඒ දක්වනසේක් **කිඤ්චාපි සෝ** යනාදිය වදළහ.

එහි **කිඤ්චාපි** යනු අනුදැනීම් පැසසීම් අරුත්හි නිපාතයි; කුමක් අනුදනී ද යත්? ඒ භික්‍ෂුහුගේ ඒ නිවැරදි පරිභොග යයි; කුමක් පසසා ද යත්? වළඳ, මහණදම්කිරීමයි; මේ කියනලද්දේ වෙයි; ඉදින් ඒ මහණ මෙසේ වැළඳිය යුතු පිණ්ඩපාතය ම වළඳ, කළයුතු මහණදම් ම කරන්නේ නම්, **අථ බෝ අසුයෙව මෙ පුරිමෝ භික්ඛු=**

පිණ්ඩපාත ප්‍රතික්ෂෙප කළ මහණ පැසසිය යුතු බැව්.

යම් පළමු කි මහණෙක් ඒ පිණ්ඩපාතය ප්‍රතික්ෂෙප කොට මහණදම් කෙරේ ද **අසුයෙව මෙ=** හෙතෙ මේ ම මා විසින්; ශූරයන් දෙදෙනෙකු අතුරෙන් අතිශයින් ශූරයා මෙන් ද පණ්ඩිතයන් දෙදෙනෙකු අතුරෙන් අතිශයින් පණ්ඩිතයා මෙන් ද අතිශයින් පිදිය යුත්තේ ද අතිශයින් පැසසිය යුත්තේ ද වෙයි; දෙවෙනි භික්‍ෂුවට වඩා අතිරෙකයෙන් පිදියයුතු ද පැසසිය යුතු ද වේ යයි කියනලද වෙයි; දැන් ඒ අර්ථය කාරණයෙන් සාධනය කරනසේක් **නං කිස්ස හෙතු** යනාදිය වදළහ.

එහි අර්ථය කවරේ ද? එහිලා තොපට මෙබඳු සිතක් වන්නේය, කුමකින් ඒ මහණ තෙම භාග්‍යවතුන් විසින් අතිශයින් පිදිය යුතු ද? අතිශයින් පැසසිය යුතු දැ? සි. ඒ එසේමැයි- යම් හෙයකින් ඔහුගේ ඒ පිණ්ඩපාත ප්‍රතික්ෂෙප කිරීමක් වේ ද එය ඒ මහණහට බොහෝ කලක් අලෙචඡබව පිණිස -පෙ- විඝාතාවහය පිණිස පවත්නේද

එහෙයිනි, කෙසේ ද? සැබවැ, ඔහට පසුකලෙක ප්‍රත්‍යයන් විෂයෙහි අත්‍රිච්ඡතාව හෝ පාපිච්ඡතාව හෝ මහිච්ඡතාව හෝ උපදින්නේ නම් නැවත ඒ තෘෂ්ණාව මේ පිණ්ඩපාතය පිළිකෙව් කිරීම් නමැති අකුස්ස කරණ කොට ගෙන "කොල! තෝ සුගතයන් විසින් ඉතිරිකළ පිණ්ඩපාතය පිළිකෙව් කොට මෙබදු තෘෂ්ණාවක් ඉපද වූයෙහි" යි මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කරමින් වළකන්නේය; උපන්නාවූ අසන්තුෂ්ටියගේ ද අසල්ලෙඛයා ගේ ද වැළකීමෙහි මේ ක්‍රම යයි; මෙසේ වනාහි ඔහුගේ අල්පෙච්ඡබව පිණිස ද සන්තුෂ්ටිය පිණිස ද සල්ලෙඛය පිණිස ද පවත්නේය.

සුභරතාය යන මෙහි මෝ සංවණ්ණනායි. මේ ශාසනයෙහි එකෙක් තමා විසින් ද උපස්ථායකයන් විසින් ද දුභර වෙයි, පොෂණයට දුෂ්කර වෙයි; එකෙක් තමා විසින් ද උපස්ථායකයන් විසින් ද සුභර වෙයි, සුවසේ පොෂණය කළහැකි වෙයි; කෙසේ ද? යමෙක් වනාහි ඇඹුල් ආදිය ලැබ නො ඇඹුල් ආදිය සොයා ද අනිකෙකුගේ ගෙහි ලද දෙය අනිකෙකුගේ ගෙහි දම්මින් සියලු ගමැ හැසිර හිස්පය ඇත්තේ ම විහාරයට පිවිස නිදුද, මේ තෙම තමා විසින් පොෂණය නො කළහැකි වෙයි; යමෙක් වනාහි හැල් මස් බත් ආදියෙන් පස පුරා දුන්කල ද දුර්මුඛව නො සතුටුබව දක්වා ද, නොහොත් ඔවුන් හමුයෙහි ම තොප විසින් දෙනලද්ද කුමක් දැ? යි ඒ පිණ්ඩපාතයට නිගා දෙමින් සාමණේර ගෘහ සථාදීන්ට දේද, මේ තෙම උපස්ථායකයන් විසින් දුභර වෙයි; මේ මහණ දෑක මනුෂ්‍යයෝ දුරදී ම ඉවත් වෙති, දුභරවූ මහණ පොෂණය කළ නො හැකි යයි කියාසී; යමෙක් වනාහි යම් කිසි රළුවූවක් හෝ පිණීවූවක් හෝ ලැබ තුටුසිත් ඇත්තේ ම වළඳ, විහාරයට ගොස් තමාගේ කට යුතු කෙරේ ද, මේ තෙම තමා විසින් සුභර වෙයි; යමෙකුත් අන්‍යයන්ගේ සවලපවූ හෝ බොහෝවූ හෝ රූක්ෂවූ හෝ ප්‍රණීතවූ හෝ දානය පිළිකුල් නො කොට සතුටුසිත් ඇත්තේ වෙසෙසින් පහන් මුහුණ ඇතිව ඔවුන්ගේ හමුයෙහි ම වළඳ, යේද මේ තෙම උපස්ථායකයන් විසින් සුභර වෙයි; මේ මහණ දෑක මනුෂ්‍යයෝ අතිශයින් ම විශ්වාසවූවාහු වෙති, "අපගේ පින්වතුන් වහන්සේ සුභරයහ, මදකිනුදු සතුටුවෙති, ඇපි ම උන්වහන්සේ පොෂණය කරන්නෙමු" යි පිළින කොට පොෂණය කෙරෙති. එහි පසුකලෙක ඒ (පළමු කී) මහණහට තමා විසින් හෝ උපස්ථායකයන් විසින් හෝ පොෂණය නො කළහැකි ක්‍රමයෙන් සිතක් ඉදින් උපදින්නේ ද ඉක්බිති "කොල! තෝ සුගතයන් විසින් ඉතිරිකළ පිණ්ඩපාතය ද ප්‍රතික්ෂේප කොට මෙබදු සිතක් ඉපදවූ යෙහි" යි මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කරමින් ඒ සිත මේ පිණ්ඩපාතය ප්‍රතික්ෂේප කිරීම් නමැති අකුස්සෙන් වළකන්නේය; මෙසේ ඔහුගේ සුභරබවට වැටෙන්නේය. ඉදින් ඔහට කුසීතබව උපදින්නේ ද එය ද "කොල! තෝ නම් එකල්හි සුගතයන් විසින් ඉතිරිකළ පිණ්ඩපාතය ප්‍රතික්ෂේප කොට එසේ බඩසා දුබල බැවින් පීඩිතව ම මහණදම් කොට අද කුසීතබැවිහි යෙදෙහි යයි

මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කරමින් මේ අකුස්සෙන් ම වළකන්නේය; මෙසේ ඔහුගේ ව්‍යායාමය පිණිස පවත්නේය; මෙසේ මේ පිණ්ඩපාත ප්‍රතිසේවය කිරීම ඔහට බොහෝ කලක් අලෙප්‍රවිහරණයට —පෙ— ව්‍යායාමයට පවත්නේය.

දශකථා වස්තු. මෙසේ ඔහට මේ පඤ්චගුණයෝ පිරුනාහු දශකථා වස්තූහු සම්පූර්ණවන්නාහුය; කෙසේ ද? මේහි වනාහි අපපිච්ඡතා සන්තුට්ඨිතා විරියාරම්භ යන මොවුන්ගේ වශයෙන් තුනක් පෙළෙහිම් ආවාහුය. සෙස්සෝ සල්ලේඛ නාමයෙන් සඞ්ග්‍රහකරන ලද්දාහුය, යම් මේ සල්ලේඛ යන නමක් වේද මේ වනාහි සියලු කථාවස්තූන්ට නමක් මැයි; වදාළේ මැනු- **සා ච බෝ අයං ආනන්ද! කථා අභිසල්ලේඛිකා යෙනාවිවරණ සප්පායා එකන්ත නිබ්බිදාය විරාගාය නිරෝධාය උපසමාය අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති සෙය්‍යථීදං? අප්පිච්ඡකථා ති.**

(=ආනන්දය! ඕ මෝ කථා තොමෝ ද අනිශයින් කෙලශ සංලිඛනය කරන්නී චිත්ත විවරණ සඞ්ඛ්‍යාතවූ සමථ විදර්ශනාවන්ට උපකාරවූවා එකාන්තයෙන් සසර කලකිරීම පිණිස විරාගය පිණිස නිරෝධය පිණිස කෙලශව්‍යුපශමය පිණිස විශිෂ්ට ඥානය පිණිස සම්බෝධය පිණිස නිර්‍වාණය පිණිස පවත්නීය ඕ කවරී ද? අලෙප්‍රවිහරණකථා යැ යි) වදාළ රයි; මෙසේ මේ පඤ්චගුණයෝ පිරුනාහු දශකථා වස්තූහු සම්පූර්ණ වන්නාහුය.

ත්‍රිවිධශික්ෂාව. දශකථා වස්තූහු පිරුනාහු ශික්ෂාත්‍රය පිරෙන්නාහුය; කෙසේ ද? මොවුන් අතුරෙන් වනාහි අලෙප්‍රවිහරණ කථා ය සන්තෝෂ කථා ය අසංසර්ග කථා ය ශීල කථා ය යන මේ සතර කථාවෝ අධිශීල ශික්ෂාවෙහි සංගෘහීත වූවාහු මැය; පවිවේක කථා ය ව්‍යායාමය කථා ය සමාධි කථා ය යන මේ තුන අධිචිත්ත ශික්ෂාවෙහි සඞ්ගෘහීතයහ; ප්‍රඥා කථා ය විමුක්ති කථා ය විමුක්ති ඥානදර්ශන කථා ය යන මේ තුන අධිප්‍රඥා ශික්ෂාවෙහි සඞ්ගෘහීතයහ යි; මෙසේ දශකථා වස්තු පරිපූර්ණවූවාහු ශික්ෂාත්‍රය සම්පූර්ණ වන්නාහුය; ශික්ෂාත්‍රය පිරුනාහු පඤ්චඅශෛක්ෂ ධර්මස්කන්ධයන් පරිපූරණය කරන්නාහුය; කෙසේ ද? පරිපූර්ණවූ අධිශීල ශික්ෂාව වනාහි අශෛක්ෂ ශීලස්කන්ධය ම වෙයි; අධිචිත්ත ශික්ෂාව අශෛක්ෂ සමාධිස්කන්ධය වෙයි; අධිප්‍රඥා ශික්ෂාව අශෛක්ෂවූ ප්‍රඥාවිමුක්ති විමුක්තිඥානදර්ශන ස්කන්ධයෝ ම වෙතැයි. මෙසේ ශික්ෂාත්‍රය පිරුනාහු පඤ්චඅශෛක්ෂ ධර්මස්කන්ධයන් පරිපූරණය කරන්නාහුය; පඤ්චධර්මස්කන්ධයෝ පිරුනාහු අමෘතවූ නිර්‍වාණය පරිපූරණය කරන්නාහුය; යම්සේ පර්වත මුදුනෙක්හි ප්‍රාවෘට් ඍතුවෙහි වූ මහා මෙඝයක් මොහොවට වර්ෂාකෙළේ පර්වත කන්දර ප්‍රදර ශාඛාවන් පුරවාද; පිරුනාවූ ඔවුහු කුඩාවිල් ද කුඩාවිල් මහවිල් ද මහවිල් කුඩානදීන් ද කුඩානදීහු මහානදීන් ද මහානදීහු සමුද්‍රසඞ්ඛ්‍යාත වූ සාගරය පුරවත්ද; එපරිදි දෙන් ම ඒ මහණහට මේ ගුණපස පිරුනාහු දශකථා වස්තූන් ආදිකොට අමෘත නිර්‍වාණය තෙක් පරිපූරණය වන්නාහුය; මෙසේ මේ මහණ ධර්ම

දායාද ප්‍රතිපදාවට පිළිපන්නේ පරම ධර්මදායාදය ලබන්නේ යයි මේ අර්ථය දක්නාවූ භාග්‍යවත්හු **නං කිස්සහෙතු? නං හි නස්ස හිතඤ්ඤෙ! හිතඤ්ඤ නො** යනාදිය වදාළහ. මෙසේ ඒ භික්ෂූහුගේ අතිශයින් පිදියයුතු අතිශයින් පැසසිය යුතුබව කාරණයෙන් සාධනය කොට මෙවිට ඒ භික්ෂූන් ඒ ධර්මදායාදය සඳහා යොදවනසේක් **නස්සානිහ මෙ හිතඤ්ඤෙ!** යනාදිය වදාළහ.

කවර අර්ථයක් වදාරන ලද්දේ වේද යත්? යම් හෙයකින් යමෙක් ඒ පිණ්ඩපාතය වළඳා මහණදම් කරන්නේ ද හෙතෙම මේ මුල්ගුණපසින් පරිබාහිර වේ ද; යමෙක් වනාහි නො වළඳා මහණදම් කරන්නේ ද හෙතෙම මේ පඤ්චගුණයන්ට හිමිවේ ද එහෙයින් මහණෙනි! මෙහිලා –පෙ– මාගේ ආමිෂය දායාදකොට ඇත්තෝ නො වෙමුයි. **ඉදමවොච භගවා** යන නිදාන පද්‍යාවශානයෙහි පටන් **නො ආමිසදායාදා** යනු අවසන්කොට ඇති මේ සූත්‍රප්‍රදේශය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. **ඉදං වත්වා සුගතො**= මේ සූත්‍රප්‍රදේශය වදාරා ම ශොභනවූ ප්‍රතිපදාවෙන් ගියහෙයින් සුගත යයි ප්‍රසිද්ධ වූ ඒ භාග්‍යවත්හු; **උට්ඨායාසනා විහාරං පාවිසි**= පනවනලද උතුම් බුද්ධාසනයෙන් නැඟිට පිරිස අසමහිත්‍ය වූ කල්හි ම විහාරයට තමන් වහන්සේගේ මහාගන්ධකුටියට ප්‍රවිෂ්ටවූසේක කුමක් හෙයිනයත්? ධර්මයට ප්‍රශංසාකරනු පිණිසය.

බුදුහු දෙසුම් නො නිමවා විහාරයට පිවිසිම.

බුදුවරයෝ වනාහි දෙශනාව නො නිම් කල්හි විහාරයට පිවිසෙන්නාහු කරුණු දෙකකින් පිවිසෙත් පුද්ගල ප්‍රශංසාව පිණිස හෝ ධර්ම ප්‍රශංසාව පිණිස හෝයි; පුද්ගල ප්‍රශංසාව පිණිස පිවිසෙනසේක් මෙසේ සිතනසේක; "මා විසින් සංක්ෂෙපයෙන් උද්දිෂ්ට වූ විස්තරයෙන් විභාග නො කරනලද්දාවූ මේ උද්දෙශය ධර්මප්‍රතිග්‍රාහකවූ භික්ෂූහු ඉගෙන ආනන්දයන් හෝ කාත්‍යායනයන් හෝ සමීපයට එලඹ විචාරන්නාහුය; ඔවුහු මාගේ ඥානය හා සංසන්දනය කොට විසඳන්නාහුය; ඉක්බිති ධර්මප්‍රතිග්‍රාහකයෝ යලිත් මා විචාරන්නාහුය; මම ඔවුන්ට මහණෙනි! ආනන්දයන් විසින් මනාකොට කියනලද්දේය, කාත්‍යායනයන් විසින් මනාකොට කියනලද්දේය; ඉදින් තෙපි මා මේ කාරණය විචාරන්නහු වීනම් මම ද එය මෙ පරිද්දෙන් ම ප්‍රකාශ කරන්නෙමි" යි මෙසේ ඒ පුද්ගලයන් පසසන්නෙමි; **ඉක්ඛිති** ඔවුන් කෙරෙහි ගෞරව උපදවා භික්ෂූහු සම්පයට එලඹෙන්නාහුය; ඔවුහු ද භික්ෂූන් අර්ථයෙහි ද ධර්මයෙහි ද යොදවන්නාහුය; ඒ භික්ෂූහු ඔවුන් විසින් යොදවනලද්දාහු ත්‍රිවිධ ශික්ෂාව පුරන්නාහු දුඃඛය කෙළවර කරන්නාහු යයි. ධර්මයට පැසසිම පණිස (විහාරයට) ප්‍රවෙශවන සේක් මෙහිදී ම යම්සේ සිතූසේක් ද එපරිද්දෙන් සිතනසේක; (කෙසේ ද?) "මා විහාරයට ප්‍රවිෂ්ටවූ කල්හි මේ පිරිස්හි ම හුන් ශාරිපුත්‍රයෝ එම ආමිෂදායාදයට ගරහමින් ද ධර්මදායාදයට පසසමින් ද දහම් දෙසන්නාහුය; මෙසේ අප දෙදෙනාගේ ම

එක් අදහස් ඇති මතයෙන් දෙසනලද මෝ දෙශනා පාෂාණචිත්‍රයක් සදෘශවූවා අග්‍ර ද ගරු ද වන්නීය; චතුරෙඝය එතරකිරීම් අවියෙන් තොටැ තැබූ නැවක් මෙන් ද සුඛීයට ගමනාවියෙන් ආජානීයයන් සතරදෙනෙක් යෙදූ රථයක් මෙන් ද වන්නේය; මේසේ කරන්නහුට මේ දඬ යයි පිරිස්හි ආඥාව තබා හුනස්නෙන් නැඟිට රජු ප්‍රාසාදයට් නැඟිකල්හි එහි ම හුන් සෙනෙවි තෙම ඒ රජු විසින් තැබූ ආඥාව යම් සේත් පවත්වා ද; මෙසේත් මා විසින් තැබූ දෙශනාව මේ පිරිස්හි ම හුන් ශාරිපුත්‍ර තෙම ප්‍රශංසා කොට දෙශනා කරන්නේය; මෙසේ අප දෙදෙනාගේ ම කල්පනාවෙන් දෙශිත වූ මෝ දෙශනා අතිශයින් බල වත් වූවා මධ්‍යාහ්නික සූර්‍යයා මෙන් දිලියෙන්නේ" යයි. මෙසේ මෙහි ධර්‍මයට පැසසීම් පිණිස හුනස්නෙන් නැඟිට විහාරයට ප්‍රවිෂ්ටවූ සේක. මෙබඳු තැන්හි ද භාග්‍යවත්හු හුනස්නෙහි ම අතුරුදහන් වූවෝ චිත්ත ගමනින් විහාරයට ප්‍රවෙශවෙත් යයි දතයුත්තේය; ඒ එසේමැයි- ඉදින් කායගතියෙන් යන්නේ නම් සියලු පිරිස භාග්‍යවතුන් පිරිවරා යන්නීය; හෝ පිරිස් තොමෝ එක්වරක් බිඳුනී යලි රැස්කිරීම දුෂ්කරවන්නී යයි භාග්‍යවතුන් වහන්සේ චිත්තගතියෙන් ම ප්‍රවිෂ්ටවූ සේක, මෙසේ භාග්‍ය වතුන් වහන්සේ ප්‍රවිෂ්ටවූ කල්හි භාග්‍යවතුන් වහන්සේගේ අදහසට අනුරූපව ඒ ධර්‍මයට පසසනු කැමැත්තේ; **නනු බො ආයස්මා සාරිපුත්තෙනා** —පෙ— **එතදවොච.**

එහි **ආයස්මා** යන මෙය ප්‍රිය වචනයකි; **සාරිපුත්තෙනා** යනු ඒ තෙරුන්ගේ නාම යයි; හෙද වනාහි මවුකෙරෙන් ආයේය; පියාකෙරෙන් නො ආයේයි; ඒ එසේමැය- උන්වහන්සේ "රූපසාරී" බැමිණියගේ පුත්‍රයෝය එහෙයින් "සාරිපුත්ත" යි කියනු ලැබෙත්; **අච්රපක්කන්තස්ස නික්මගිය නො බෝවේලාවකින්; ආවුසො භික්ඛවෙ!** යන මෙහි වනාහි භාග්‍යවත් බුදුවරයෝ ශ්‍රාවකයන් ආලපනය කරන්නාහු "භික්ඛවෙ" යි ආලපනය කෙරෙත්; ශ්‍රාවකයෝ වූ කලි සම්‍යක්ඥයන් සමාන වූවෝ නොවෙමු' යි "ආවුසො" යි පළමුකොට කියා පසුව "භික්ඛවෙ" යි කියකි; තවද සම්‍යක්ඥයන් විසින් ආමන්ත්‍රණය කරනලද්දාවූ භික්ෂු සඞ්ඝ තෙමේ "භදන්තෙ" යි ප්‍රතිවදන් දෙයි; ශ්‍රාවකයන් විසින් (ආමන්ත්‍රණය කරනලද්දේ) "ආවුසො" යි (ප්‍රතිවදන් දෙයි;) **කිත්තාවතා නු බො ආවුසො** යන මෙහි **කිත්තාවතා** යනු පරිච්ඡේද වචනයි; කෙපමණකින් යයි කියනලද වෙයි; **"නු"** කාරය ප්‍රශ්නයෙහියි; **"බො"** කාරය නිපාත මාත්‍රයෙකි; **සඤ්ඤ පවිචිත්තස්ස විහරතො**= සාය චිත්ත උපධි විවේකය යන ත්‍රිවිධ විවේකයන්ගෙන් යුක්තව වාසයකරන්නාවූ ශාස්තෘන් වහන්සේගේ; **විවෙකං නානු භික්ඛන්ති** යනු ත්‍රිවිධ විවේකයන් අතුරෙන් එකකුදු අනුව නො භික්මෙත් ද? ආමිෂය දැයාදකොට ඇත්තාහු ම වෙත් ද? යි මේ අර්‍ථය ආයුෂ්මත් ශාරිපුත්‍රයෝ භික්ෂූන් විවාළහ; ශුක්ලපක්ෂයෙහි ද මේ ක්‍රම යයි; මෙසේ වදාළකල්හි ඒ අර්‍ථය අසනු කැමතිවූ භික්ෂූහු **දූරතොපි බො** යනාදිය කීවාහුය.

එහි **දූරතොපි** යනු පිටරටින් ද පිට ජනපදයෙන් ද නොයෙක් යොදුන් ගණනක සිට දැ'සි කියනලද වෙයි; **සන්තිකෙ**= සමීපයෙහි; **අඤ්ඤාතුං**= දැනගන්ට අවබොධ කරන්ට; **ආයස්මතො යෙව සාරිපුත්තස්ස පටිභාතු** යනු ආයුෂ්මත් ශාරිපුත්‍රයන්ගේ ම භාගය වේවා, ආයුෂ්මත් ශාරිපුත්‍රයෝ වනාහි තමාගේ භාගය කොට විභාග කෙරෙත්වායි කියනලද්දේ වෙයි; ඒ එසේමැය- යම් මේ අර්ථ ප්‍රකාශ කිරීමක් වේද එය ආයුෂ්මත්හුගේ භාග යයි, ශ්‍රවණය වූ කලි අපගේ භාග යයි, මේ මෙහි අදහසි; මෙසේ ශබ්දලක්ෂණය හා සමවෙයි; කිසිවෙක් වනාහි **පටිභාතු** යනු දක්නා ලැබේවා' යි කියති; අනිකෙක් වැටහේවා' යි කියති. **ධාරෙස්සන්ති**= උද්ග්‍රහණය කරන්නාහුය ප්‍රගුණකරන්නාහුය; ඉක්බිති ඔවුන්ට වදුරනු කැමැත්තාවූ තෙරුන් වහන්සේ **නෙන හි** යනාදිය කිහ. එහි **නෙන** යනු කාරණ වචනයි; **"හි"** කාරය නිපාතයි; යම් හෙයකින් අසනු කැමතිවහු ද? යම් හෙයකින් මාහට භාරය ආරොපණය කළහු ද එහෙයින් ශ්‍රවණය කරවු යයි කියනලද්දේ වෙයි; ඒ භික්ෂූනු ද තෙරුන්ගේ වචනය පිළිගත්තාහුය; එයින් කිහ, **එවමාවුසො** —පෙ— **පච්චස්සොසුං** යී.

ඉක්බිති ඔවුන්ගේ ආමිෂ දයාදය ගරහන්නාවූ භාග්‍යවතුන් විසින් **තුමෙහපි නෙන ආදිස්සා භවෙය්‍යාථ** යී එක ම ආකාරයකින් වදුළඅර්ථය තුන්ආකාරයකින් දක්වන්නා වූ ආයුෂ්මත් ශාරිපුත්‍රයෝ මේ වදුළහ. **ඉධාවුසො සත්ථු පච්චිත්තස්ස විහරතො** —පෙ— **එත්තාවතා ඛො ආවුසො! සත්ථු පච්චිත්තස්ස විහරතො සාවකා විවෙකං නානුසික්ඛන්ති** මෙතෙකින් භාග්‍යවතුන් වහන්සේ ආමිෂ දයාද ප්‍රතිපදාවට ගරහමින් "තුමෙහපි තෙන ආදිස්සා භවෙය්‍යාථ" යී යමකුත් වදුළසේක්ද, තමන් වහන්සේ "කිත්තාවතා නු ඛො -පෙ- නානුසික්ඛන්ති" යී යම් ප්‍රශ්නය කුත් විචාළාහු ද, ඒ දෙශනාවගේ විස්තර හෙයින් අර්ථය මොනොවට විභාගකරන ලද්දේ වෙයි; හෙද භාග්‍යවතුන් වහන්සේගේ ආදිස්ස භාවය අනාමෙඩිණය කොට වෙයි; ඒ එසේමැයි- සව්වන් අනුගන්වන භාග්‍යවතුන් වහන්සේ විසින් ම "අහම්පි තෙන ආදිස්සො භවිස්සාමි" යී කියන්ට යොග්‍ය වෙයි; ශ්‍රාවකයන් විසින් (කියන්ට) යොග්‍ය නො වෙයි; ශුකුලපක්ෂයෙහි ද මේ ක්‍රම යයි; මෝ පළමුකොට (කියනලද්දී) මෙහි අනුසන්ධික්‍රම යොජනායි; මෝ මතු (කියනු ලබන්නී) අර්ථ වණ්ණනායි; **ඉධ**= මේ ශාසනයෙහි; **සත්ථු පච්චිත්තස්ස**= ත්‍රිවිධ විවෙකයෙන් අත්‍යන්තයෙන් විවික්ත වූ ශාස්තෘහුගේ; **විවෙකං නානුසික්ඛන්ති** යනු කාය විවෙකයට අනුව නො හික්මෙති පරිපූරණය නො කෙරෙත් යයි කියනලද්දේ වෙයි; ඉදින් වනාහි ත්‍රිවිධ විවෙකය ම සඳහා කියන්නේ නම්? ප්‍රශ්නයාගේ විශෙෂයක් නො වන්නේය; මේ කියනලදුයේ ව්‍යාකරණ පක්ෂය මැයි; එහෙයින් මේ පදයෙන් කායවිවෙකය ද **යෙසඤ්ච ධම්මානං** යනාදියෙන් චිත්තවිවෙකය ද **ඛානුලිඛා** යනාදියෙන් උපධි විවෙකය ද දැක්වී ය'යි මෙසේ මෙහි සංක්ෂෙපයෙන් අර්ථය දතයුත්තේය.

යෙසඤ්ච ධම්මානං යනු ලොභාදීන් සඳහා කිහ. යමෙක් මත්තෙහි **නත්‍රාවුසෝ! ලොභෝ ච පාපකෝ** යනාදි නසින් කියන්නේ ද (ඔවුන් සඳහායැ;) **නප්පජහනති**= දුරු නො කෙරෙත්; චිත්තවිවෙකය පරිපූර ණය නො කෙරෙත් යයි කියනලද්දේ වෙයි; **බාහුලිකා**= චීවරාදීන්ගේ බහුලභාවයට පිළිපන්නාහු; ශාසනය ලිහිල් කොට ගනිත් නුයි; **සාථ ලිකා** නම් වෙති; **ඔක්කමනෝ පුබ්බඞ්ගමා** යන මෙහි අවගමනාර්ථයෙන් පඤ්චනීවරණයෝ ඔක්කමන යයි කියනු ලැබේ; එහෙයින් පඤ්චනීවරණ යන් පිරිමෙහි පෙරදැරිවූවාහු යයි කියනලද්දේ වෙයි; **පවිවෙක්‍ඛේ**= උපධි විවෙකය වූ නිවනෙහි **නික්කිඤ්චනධුරා**= බහා තබනලද වීර්‍ය ඇත්තාහු ඊට පැමිණීම පිණිස ප්‍රථම වීර්‍යය ද නො කරත්නාහු යයි, මෙතෙකින් උපධි විවෙකය නො පුරත් යයි කියන ලද වෙයි; මෙතෙකින් අනියම යෙන් ම වදාරා මෙවිට දෙශනාව නියමයෙන් වදාරනසේක් **නත්‍රාවුසෝ!** යනාදිය කිහ. කුමක් හෙයින ගත්? ශ්‍රාවකයෝ තුමූ කරුණු තුනකින් යයි මෙසේ යම් හෙයකින් අනියමයෙන් ම කියනුලබන කල්හි කවරෙකුට නමුත් කියාගයි හඟිමු, අපට නො වේ ය'යි උදාසීන ද වෙති; සථවිරයෝ ය මධ්‍යමයෝ ය නවකයෝ යයි මෙසේ නියම කොට කියනුලබන කල්හි අපට කියා යයි ආදරය කෙරෙත්; යම් සේ ඇමතියන් විසින් නුවර වීථිහු ශුඛකාටයුත්තාහු යයි රජු විසින් කී කල්හි ද කවරෙකු විසින් ශුඛකාටයුත්තාහු ද?යි සිතමින් ශුඛ නො කෙරෙත් ද තම තමන්ගේ ගෙදොර ශුඛකාටයුතු යයි බෙර නිකුත්කළ කල්හි සියල්ලෝ මොහොතකින් ශුඛ කෙරෙත් ද අලඞ්කාර කෙරෙත් ද; මෙසේ මේ කාරණය දතයුතුයි.

එහි නත්‍ර= ඒ ශ්‍රාවකයන් අතුරෙහි; **ථෙරා** යනු දසවස් ඇත්තවුන් පටන් නියනුලැබෙත්; **තීහි ඨානෙහි**= කරුණු තුනකින්; ඒ එසේමැයි-

"ඨාන" ශබ්දය.

මේ "ඨාන" ශබ්දය තෙම ඓශ්වර්‍යීය සථිතිය ක්ෂණය කාරණය යන අර්ථයන්හි දක්නා ලැබේ; **කිං පනා යස්මා දෙවානමින්දෝ ඛත්තිමං ඛත්තා ඉමං ඨානං පත්තෝ ?** යනාදි තැන්හි වනාහි ඓශ්වර්‍යයෙහි දක්නා ලැබේ; **ඨානකුසලෝ හොති අත්ථඨානෙඩි** යනාදි තැන්හි සථිතියෙහි ය; **ඨාන සෝ චෙතං තථාගතං පටිභාති** යනාදි තැන්හි ක්ෂණයෙහි ය; **ඨානඤ්ච ඨානතෝ අඨානඤ්ච අඨානතෝ** යනාදි තැන්හි කාරණයෙහි ය; මෙහි වනාහි කාරණයෙහි ම දක්නා ලැබේ; ඒ එසේමැයි- කාරණය තෙම යම් හෙයකින් එය අයත් පැවතුම් ඇතිබැවින් එහි ඵලය සිදිද එහෙයින් "ඨාන" යයි කියනු ලැබේ.

ඉමිනා පඨමෙන ඨානෙන ථෙරා භික්ඛූ ආරඤ්ඤිකා යන මෙහි **ආරඤ්ඤිකා**= ගැරහිය යුත්තාහුය; සථවිර නම් වූවාහු අරණ්‍ය සෙනාසන යන් ද වනයෙහි දුරසෙනසුන් ද වනයෙහි ඉතා දුරසෙනසුන් ද කරා නො එලඹෙති, ග්‍රාමාසන්න සෙනාසනය නො හරිති, සඞ්ඝණිකාරාම බව වඩමින් වෙසෙති, කාය විවෙකය ද නො පුරති, නවකමධ්‍යම කාල යෙහි කෙබඳු වූවාහු ද? යි මෙසේ නිකුකළ යුත්තාහු වෙති, ඇවැත්නි!

මේ නිසුව ලබත් යයි දක්වත්; **දුතියෙන ඨානෙන** යන මෙහි ද මොවුහු නම් සථවිර ද වූවාහු ශාසතෘන් වහන්සේ යම් ධර්ම කෙනෙකුන්ගේ ප්‍රහාණය වදාළසේක් ද, ඒ ලොභාදි ධර්මයන් නො හරිති, අසුර ගසනකල් පමණකුදු එකපසෙක හිඳ සිත්හි එකඟබව නො ලබති, නවකමධ්‍යම කාලයෙහි කෙබඳු වූවාහු ද? සි මෙසේ නිසුකට යුත්තාහු වෙති, ඇවැත්නි! මේ නිසුව ලබත් යයි දක්වනසේකැයි මෙසේ යෙදීම කට යුත්තිය; **තතියෙන** යන මෙහි ද ඇවැත්නි! මොවුහු නම් සථවිර ද වූවාහු ඉතිරිතර ප්‍රත්‍යයෙන් නො යැපෙති, සිවුරු පාත්‍රසෙනසුන් කුණු කය සැරසීමෙහි යෙදුනාහු වෙසෙති, උපධි විවෙකය නො පුරමින් නව මධ්‍යම කාලයෙහි කෙබඳු වූවාහු ද? සි මෙසේ නිසුකළ යුත්තාහු වෙති, ඇවැත්නි! මේ නිසුව ලබත් යයි දක්වතියි මෙසේ යොජනා දතයුත්තිය. මධ්‍යම නවකවාරයන්හි ද මේ ක්‍රම යයි. මේ කියනු ලබන්නේ විශෙෂ යයි; **මජ්ඣිමා** යනු පස්වසක් ඇත්තවුන් පටන් නවවස් ඇතියන්තෙක් කියනු ලැබෙත්; **නවා** සි උනුපස්වස් ඇත්තාහු කියනුලැබෙත්; යම්සේ එහි " නවමධ්‍යම කාලයෙහි කෙබන්දේ වූවාහු ද " සි කියන ලද්දේ ද එපරිද්දෙන් මෙහි "නවක කාලයෙහි කෙබඳු වූවාහු ද, සථවිරකාලයෙහි කෙබඳු වන්නාහු ද, මධ්‍යම සථවිර කාලයෙහි කෙබඳු වන්නාහු ද" සි කියා යෙදිය යුතුයි. මේ කෘෂ්ණපක්ෂයෙහි කියනලද්දට ප්‍රත්‍යනීක ක්‍රම යෙන් ශුක්ලපක්ෂයෙහි ද අර්ථය දතයුත්තේය. මේ වනාහි මෙහි සංක්ෂෙප යයි; මොවුහු සථවිර වූවාහු ද යොදුන් පිළිවෙළින් අරණ්‍ය සෙනාසන ද වනමැද සෙනසුන් ද වනයෙහි ඉතා දුර සෙනසුන් ද සෙවනය කෙරෙති, ග්‍රාමාසන්න සෙනාසනයට පැමිණෙන්ට යුතු කල්හි ද නො පැමිණෙති, මෙසේ දිරු සිරුරු ඇත්තාහු ද ආරබ්ධ වීර්‍ය්‍ය ඇත්තාහු ප්‍රත්‍යය දායකයන්ගේ ප්‍රසාදය උපදවති, නවමධ්‍යම කාලයෙහි කෙබඳු වූවාහු ද? සි මේ පළමුවන කාරණයෙන් සථවිර භික්ෂූහු පැසසිය යුත්තාහු වෙති, පැසසුම් ලබති; ලොභාදිය දුරුකොට චිත්ත විවෙකය පුරති; මේ මහාසථවිර ද සඞ්ඝවිහාරික අන්තෙවාසිකයන් විසින් ශිරිවරන ලදුව හිඳින්ට සුදුසු කාලයවූ මෙබඳු වයස පවත්නා කාලයෙහි ද බත්කිස කොට ප්‍රවිෂටවූයේ සවස නික්මෙයි, සවස ප්‍රවිෂටවූයේ උදෑසන නික්මෙයි කිසුණු පිරියම් කෙරෙයි, සමවත් උපදවයි, ඕඝී ඵලයන්ට පැමිණෙයි, සම්ප්‍රකාරයෙන් ම චිත්තවිවෙකය පුරයි; මේ දෙවෙනි කාරණයෙන් සථවිර භික්ෂූහු පැසසිය යුතු වෙති, පැසසුම් ලබති; යම් කාලයෙක්හි තෙරුන්ට පටදුහුල් කොඹෙය්‍යාදි වූ සුවපහස් ඇති ලුහුසිවුරු යොග්‍ය වෙත් ද ඒ කාලයෙහිත් මේ මහා සථවිර පාංශුකූලයන් ධරයි, ශාසනය නො ලිහිල්කොට ගෙන පහකරනලද නීවරණ ඇත්තේ ඵල සමවත් වඩා උපධිවිවෙකය සමපූර්ණකරමින් වාසය කෙරෙයි, නවමධ්‍යම කාලයෙහි කෙබඳුවූයේ ද? සි මේ තුන්වන කාරණයෙන් සථවිර භික්ෂූහු පැසසිය යුත්තාහු වෙති, පැසසුම් ලබත් යයි. මධ්‍යම නවකවාරයන්හි ද මේ ක්‍රම යයි.

තත්‍රාවුසෝ යි අනුසන්ධි කවරේ ද? මෙසේ නවආකාරයකින් ආමිෂදායාද ප්‍රතිපදාව. ගරහමින් නවආකාරයකින් ධම්දායාද ප්‍රතිපදාව පසසමින් අටලොස් ආකාරයකින් දෙශනාව නිමවා යම් ඒ ධර්මකොටසක් **යෙසඤ්ච ධම්මානං සඤ්ඤා පහානමාහ, නෙව ධම්මෙ නාපජ්ජතෙති** යි මෙසේ ප්‍රතිඥාකළ යුතු ධර්මයෝ කියනලද්දාහු ද මේ ඔවුහු යයි ඔවුන් සවරූපයෙන් දක්වන්ට මේ **තත්‍රාවුසෝ ලොභෝ ච** යනාදිය කීහ. මේ අනුසන්ධි යයි. තවද යට පර්‍යායයෙන් ම ධර්මය කියන ලද්දේය. ආමිෂය වූ කලි පර්‍යායයෙන් ද නිෂ්පර්‍යායයෙන් ද කියනලදී; මෙවිට නිෂ්පර්‍යායය ධර්මය වූ ලොකොත්තර මාර්ගය ප්‍රකාශකරන්ට මේ කීහ. මෙද මෙහි අනුසන්ධියි.

එහි **තත්‍ර** යනු අතීත දෙශනාව දක්වීමයි; **සක්කු පච්චිත්තසස විභරතෝ සාවකා විවෙකං නානුසික්ඛන්ති** යනාදි නයින් වදාළ දෙශනා වෙහි යයි කියන ලද්දේ වෙයි; **ලොභෝ ච පාපකෝ දොසෝ ච පාපකෝ** යි මේ ධර්මයෝ දෙදෙන පාපකයෝ ය ලාමකයෝ ය මොවුහු පහ කටයුත්තාහු යයි දක්වති; එහි ලොභවීම ලක්ෂණකොට ඇත්තේ ලොභ යයි; දූෂ්‍යවීම ලක්ෂණකොට ඇත්තේ වෙෂ යයි; ඔවුන් අතුරෙන් ලොභය ආමිෂය දායාදකොට ඇත්තහුට ප්‍රත්‍යයන්ගේ ලැබීමෙහිදී වෙයි; වෙෂය ප්‍රත්‍යයන්ගේ නො ලැබීමෙහිදී වෙයි; ලොභය **කරණ** කොට ගෙන නො ලත් ප්‍රත්‍යය ප්‍රාර්‍ථනා කෙරෙයි; වෙෂය කරණකොට ගෙන නො ලබන්නේ වෛරඇත්තේ වෙයි; ලොභය දෙය්‍යධර්මයෙහි වෙයි; වෙෂය නො දෙන්නහු කෙරෙහි හෝ නො මනා දෙය දෙන්නහු කෙරෙහි හෝ වෙයි; ලොභයෙන් නවවැදෑරුම් තෘෂ්ණාමූලක ධර්මයන් පරිපූරණය කෙරෙයි; වෙෂයෙන් පඤ්චවිධ මාත්සර්‍යයන් පරිපූරණය කෙරෙයි; මෙවිට ඔවුන්ගේ ප්‍රහාණොපාය දක්වනසේක් **ලොභස්ස ච පහානාය** යනාදිය කීහ. එහි අර්‍ථය නම්? ඒ ලාමක වූ ලොභයාගේ ද වෙෂයාගේ ද ප්‍රහාණය පිණිස මධ්‍යම ප්‍රතිපදා තොමෝ ඇතැයි මාර්ගය සඳහා මේ කියනලදී. යම් හෙයකින් මාර්ගය තෙම ලොභය එක් අනන්‍ය යෙක, වෙෂය එක් අනන්‍යයෙකැයි, මේ අර්‍ථවයට නො එලඹේ ද, නො පැමිණේ ද, මේ අනන්‍ය දෙකින් විශෙෂයෙන් මිදුනේ ද, එහෙයින් "මජ්ඣිමා පටිපදා" යි කියනු ලැබේ; මොවුන්ගේ මධ්‍යයෙහි වූ හෙයින් "මජ්ඣිමා" නම් ද පිළිපැදියයුතු හෙයින් 'පටිපදා" නම් ද වීයයි; එසේම කාමසුඛල්ලිකානුයොගය එක් අනන්‍යයෙක, ආත්මක්ලමථානුයොගය එක් අනන්‍යයෙක, ශාස්වත දෘෂ්ටිය එක් අනන්‍යයෙක, උච්ඡෙද දෘෂ්ටිය එක් අනන්‍යයෙකැයි, පළමු නයින් ම විස්තරකළ යුතුයි; **චක්ඛුකරණී** යනාදීන් වනාහි ඒ ප්‍රතිපදාව ම පසසයි; ඒ එසේමැය– ඕ ප්‍රතිපදා තොමෝ දර්‍ශනයෙහි පරිනායකාර්‍යයෙන් සත්‍යයන්ගේ දර්‍ශනය පිණිස පවතීනුයි **චක්ඛුකරණී** නමුදු; විදිත කරණාර්‍යයෙන් සත්‍යඥනය පිණිස පවතීනු'යි

ඤාණකරණී නමු; රාගාදීන්ගේ ද සන්සිඳීම පිණිස පවත්නා හෙයින් **උපසමාය සංවත්තති** (= රාගව්‍යුපසමය පිණිස පවත්නීය;) චතුස්සත්‍ය යන්ගේ ම විශිෂ්ට ඥානයෙන් දතයුතුබව දක්වන හෙයින් **අභිඤ්ඤාය සංවත්තති** (= සත්‍යඥානය පිණිස පවත්නීය;) **සම්බොධ** නම්? මාගීයයි; ඒ (මාගීය) පිණිස පවත්නා හෙයින් **සම්බොධාය සංවත්තති** (= සංබොධිය පිණිස පවත්නීය;) ඒ එසේමැයි- මාගීය ම මාගීය පිණිස පවත්නේය මාගීයෙන් කළයුතු කිස කරන හෙයිනි; නිර්‍වාණාමෘතයාගේ සාක්ෂාත් කිරීම පිණිස ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවත්නා හෙයින් **නිබ්බානාය සංවත්තති** (= නිවන් පිණිස පවත්නීය) යී කියනු ලැබේ; මේ මෙහි සාර යයි; මෙයින් අන්‍යාකාර වූ වණීනා තොමෝ ප්‍රපඤ්ච (= විස්තර) වන්නීය. මෙවිට ඒ මධ්‍යම ප්‍රතිපදාව සවරූපයෙන් දක්වනු කැමැත්තේ **ඤානමා ච සා** යී විචාරා **අයමෙව** යනාදි නයින් විසඳයි;

මධ්‍යම ප්‍රතිපදාව. එහි **අයමෙව** යනු අවධාරණ වචනයි; අන්‍යමාගී ප්‍රතිෂේධය පිණිස ද බුඩ ප්‍රත්‍යෙකබුඩ බුඩශ්‍රාවකයන්ට සාධාරණ භාවය දැක්වීම පිණිස ද වෙයි; මේ කියනලද්දේ ද වෙයි- **එසෙව මගෙහා නත්ථඤ්ඤූ, දස්සනස්ස විසුඩියා** යි, හේ මේ මාගීය තෙම කෙලෙසුන් දුරුකළ හෙයින් ද "අරිය" නම් වේ; (කෙලෙස්) සතුරන් දුරුකිරීම පිණිස පවතිනුයි ද ආය්‍ය් වූ සත්ත්‍වයන් විසින් දෙසනලද නුයි ද ආය්‍යභාව ප්‍රතිලාභය පිණිස පවතී නුයි ද "අරිය" නම් වේ; අට අඟකින් උපෙත බැවින් "අට්ඨඞ්ගික" නම් වේ; පඤ්චාඩගික තූය්‍යාදීන් මෙන් අඩග විනිර්මුක්ත වූයේ නො ද වෙයි; කෙලෙසුන් නසමින් යේ නුයි හෝ නිර්‍වාණය මාගීනය (සෙවීම) කරනු ලැබේ නුයි හෝ නිර්‍වාණාර්ථීන් විසින් යනු ලැබේ නුයි හෝ ඔවුන් විසින් පිළිපදිනු ලැබේ නුයි හෝ "මග" නම් වේ; **සෙය්‍යථීදං** යනු නිපාතයි; හේ කවරේ ද යත්? යනු ඒ නිපාතයාගේ අර්ථයි; නොහොත් ඒ අෂ්ටාඩගයෝ කවරහු ද? යන අර්ථයි; ඒ එසේමැයි- එකෙකී අඩගය මාගීය ම වෙයි; වදාළේමැනු- **සම්මාදිට්ඨි මගෙහා වෙව හෙතු ච** යි; පොරණාචාර්‍යෝ ද කියත්- **දස්සන මගෙහා සම්මාදිට්ඨි, අභිනිරොපන මගෙහා සම්මාසඞ්කප්පෝ** -පෙ- **අව්කෙඛප මගෙහා සමාධි** යි; මේ සම්‍යග්දෘෂ්ට්‍යාදීන්හි ද මනාකොට දැකීම ලක්ෂණවූවා **සම්මාදිට්ඨි** නමු; මනාකොට අරමුණට නැඟීම ලක්ෂණ කොට ඇත්තේ **සම්මාසඞ්කප්ප** නම්; මනාකොට ගැනීම ලක්ෂණවූවා **සම්මාවාචා** නමු; සම්‍යක් සමුත්ථාපනය ලක්ෂණකොට ඇත්තේ **සම්මා කම්මන්ත** නම්; සම්‍යග් ව්‍යවදානය ලක්ෂණකොට ඇත්තේ **සම්මාආජීව** නම්; සම්‍යක් ප්‍රග්‍රහය ලක්ෂණකොට ඇත්තේ **සම්මාවායාම** නම්; සම්‍යග් උපස්ථානය ලක්ෂණකොට ඇත්තී **සම්මාසති** නමු; සම්‍යක් සමාධානය ලක්ෂණකොට ඇත්තේ **සම්මාසමාධි** නම්; ඔවුන්ගේ නිර්‍වචනය ද මනාකොට දැකී නුයි **සම්මාදිට්ඨි** නම් වේ යයි මේ නයින් ම දතයුතුයි.

ඔවුන් අතුරෙහි සම්‍යග්දෘෂ්ටි තොමෝ උපදින්නී මිථ්‍යා දෘෂ්ටිය ද ඒ සම්‍යග්දෘෂ්ටියට විරුද්ධ වූ කෙලෙශයන් ද අවිද්‍යාව ද දුරුකෙරෙයි, නිර්‍වාණය ද අරමුණු කෙරෙයි, සම්ප්‍රයුක්ත ධර්මයන් ද දකී, ඔවුහු ද නො මුළා හෙයිනි, ආලම්බන හෙයින් නො වෙයි, එහෙයින් "සම්මාදිට්ඨි" යි කියනු ලැබේ; සම්‍යක් සඞ්කල්පය තෙම මිථ්‍යා සඞ්කල්පය ද ඊට විරුද්ධවූ කෙලෙසුන් ද දුරුකෙරෙයි, නිර්‍වාණය ද අරමුණු කෙරෙයි, සම්ප්‍රයුක්ත ධර්මයන් ද මනාකොට අරමුණට නඟයි, එහෙයින් "සම්මාසඞ්කප්ප" යයි කියනු ලැබේ; සම්‍යග්වචනය මිථ්‍යාවචනය ද ඊට විරුද්ධ කෙලෙශයන් ද දුරු කෙරෙයි, නිර්‍වාණය ද අරමුණු කෙරෙයි සම්ප්‍රයුක්ත ධර්මයන් ද මනා කොට පරිග්‍රහණය කෙරෙයි, එහෙයින් "සම්මාවාචා" යයි කියනු ලැබේ සම්‍යක් කර්‍මාන්තය තෙම මිථ්‍යා කර්‍මාන්තය ද ඊට විරුද්ධ කෙලෙශයන් ද දුරුකෙරෙයි, නිර්‍වාණය ද අරමුණු කෙරෙයි, සම්ප්‍රයුක්ත ධර්මයන් ද මනා කොට නිපදවයි, එහෙයින් "සම්මාකම්මන්ත" යයි කියනු ලැබේ; සම්‍ය ගාජීවය තෙම මිථ්‍යා ආජීවය ද ඊට විරුද්ධ කෙලෙශයන් ද දුරුකෙරෙයි, නිර්‍වාණය ද අරමුණු කෙරෙයි, සම්ප්‍රයුක්ත ධර්මයන් ද මනාකොට පිරිසුදු කෙරෙයි, එහෙයින් "සම්මා ආජීව" යයි කියනු ලැබේ; සම්‍යග් ව්‍යායා මය තෙම මිථ්‍යා ව්‍යායාමය ද ඊට විරුද්ධ කෙලෙශයන් ද කුසීතබව ද දුරු කෙරෙයි, නිර්‍වාණය ද අරමුණු කෙරෙයි, සම්ප්‍රයුක්ත ධර්මයන් ද මනා කොට අනුබල දෙයි, එහෙයින් "සම්මාවායාම" යයි කියනු ලැබේ; සම්‍යක් සතිය තොමෝ මිථ්‍යා සතිය ද ඊට විරුද්ධ කෙලෙශයන් ද දුරුකෙරෙයි, නිර්‍වාණය ද අරමුණු කෙරෙයි, සම්ප්‍රයුක්ත ධර්මයන් ද මනාකොට එලවයි, එහෙයින් "සම්මාසති" යයි කියනු ලැබේ; සම්‍යක් සමාධිය මිථ්‍යා සමා ධිය ද ඊට විරුද්ධ කෙලෙශයන් ද ඔද්ධත්‍යය ද දුරුකෙරෙයි, නිර්‍වාණය ද අරමුණු කෙරෙයි, සම්ප්‍රයුක්ත ධර්මයන් ද මොනොවට පිහිටුවයි, එහෙ යින් "සම්මාසමාධි" යයි කියනු ලැබේ.

මෙවිට **අයං බො සා ආවුසො!** යි ඒ ප්‍රතිපදාවම නිගමනය කරමින් කීහ. ඒ දෙශනාවගේ අර්‍ථය නම්? සතර ලොකොත්තර මාර්‍ගයන් ම එක්කොට කියනලද යම් මේ අෂ්ටාඞ්ගික මාර්‍ගයක් වේද ඇවත්නී! ඕ මෝ –පෙ– නිර්‍වාණය පිණිස පවත්නී යයි. මෙසේ පහකටයුතු ධර්‍ම යන් අතුරෙහි ලොභ වෙෂයන් ද ඔවුන් ප්‍රහාණය කිරීමෙහි උපාය ද දක්වා මෙවිට අන්‍යවූත් ප්‍රහාතව්‍ය ධර්‍මයන් ද ඔවුන්ගේ ප්‍රහාණෝපාය ද දක්වන්නෝ **තත්‍රාවුසො! කොධො ච** යනාදිය කීහ.

ක්‍රෝධාදීහු ලක්ෂණාදි වශයෙන්. ඔවුන් අතුරෙහි ක්‍රෝධය තෙමේ කිපීම ලක්ෂණකොට ඇත්තේය, සැඩබව ලක්ෂණකොට ඇත්තේ හෝ වෙයි; වෛර කිරීම කෘත්‍යය කොට ඇත්තේය, දූෂණය වැටහීම් කොට ඇත්තේය; උපනාහය තෙමේ බැඳගෙන පැවැත්ම ලක්ෂණ කොට ඇත්තේය, වෛරය නො හැරීම කෘත්‍යය කොට ඇත්තේය; ක්‍රෝධය නුහුබඳනාබව වැටහීම් කොට ඇත්තේය; මේ කියන ලද දෙයි– **පුබ්බකාලෙ කොධො අපරකාලෙ උපනාහො** යි ඇ.

මකුබව මෙරමා ගුණමැකීම ලක්ෂණ කොට ඇත්තේය, ඒ ගුණයන් නැසීම කෘත්‍යය කොට ඇත්තේය; එය වැසීම වැටහීම් කොට ඇත්තේය; පළාසය තෙමේ යුගග්‍රාහය (තමා ගුණ නැතිව ගුණවතුන් හා සමාන කොට සිතීම) ලක්ෂණ කොට ඇත්තේය, පරා ගුණයන් හා තමා ගේ ගුණයන් සමානකිරීම කෘත්‍යය කොට ඇත්තේය; මෙරමා ගුණ පමණින් වැටහීම වැටහීම් කොට ඇත්තේය; ඊෂ්‍යා තොමෝ මෙරමා සැපතට නුගුණකීම ලක්ෂණ කොට ඇත්තීය, මෙරමා සැපත් නො ඉව සීම ලක්ෂණ කොට ඇත්තී හෝ වෙයි, එහි නො ඇලීම කෘත්‍යය කොට ඇත්තීය, එයින් විමුඛබව වැටහීම් කොට ඇත්තීය; මසුරුබව තමා සැපත් සැඟවීම ලක්ෂණ කොට ඇත්තේය, තමා සැපත් හා මෙරමා හා සාධාරණබව නො සැපකිරීම කෘත්‍යය කොට ඇත්තේය, හැකිලීම වැටහීම් කොට ඇත්තේය; මායාතොමෝ කළපව් වැසීම ලක්ෂණ කොට ඇත්තීය, ඒ පාපය සැඟවීම කෘත්‍යය කොට ඇත්තීය, එය ආවරණය කිරීම වැටහීම් කොට ඇත්තීය; ශඨබව තමාගේ අවිද්‍යමාන ගුණ පහළ කිරීම ලක්ෂණ කොට ඇත්තේය, ඒ ගුණයන් ව්‍යවහාර කිරීම කෘත්‍යය කොට ඇත්තේය, ශරීර ඉඟිතයන්ගෙන් ද ඔවුන් ප්‍රකාශකිරීම වැට හීම් කොට ඇත්තේය; සාතෙය තෙමේ චිත්තයාගේ ඉදිමුනුබව ලක්ෂණ කොට ඇත්තේය, ප්‍රතිශ්‍රයවෘත්ති (= යටත් පැවැත්ම) නැතිබව කෘත්‍යය කොට ඇත්තේය, නො මුදුබව වැටහීම් කොට ඇත්තේය; සාරම්භය තෙමේ කරණුත්තරිය (= කළාට වැඩියක් කිරීම) ලක්ෂණ කොට ඇත් තේය; විරුඩ බව කෘත්‍යය කොට ඇත්තේය, අගෞරවය වැටහීම් කොට ඇත්තේය; මානය තෙමේ උණ්ණතිය ලක්ෂණ කොට ඇත් තේය, අහඞ්කාරය කෘත්‍යය කොට ඇත්තේය, උඛුමාතභාවය වැටහීම් කොට ඇත්තේය; අධිමානය තෙමේ අතිශයින් උණ්ණතිය ලක්ෂණ කොට ඇත්තේය, අතිශයින් අහඞ්කාරය කෘත්‍යය කොට ඇත්තේය, අධික වූ උඛුමාත භාවය වැටහීම් කොට ඇත්තේය; මදය තෙමේ මත්වූබව ලක්ෂණ කොට ඇත්තේය, මදගන්වන කෘත්‍යය ඇත්තේය, උනමාදය වැටහීම් කොට ඇත්තේය; ප්‍රමාදය තෙම පඤ්චකාම ගුණ යන්හි සිත බැසගැනීම ලක්ෂණ කොට ඇත්තේය, වොස්සග්ගානුප්පදානය කෘත්‍යය කොට ඇත්තේය, සමානිවිප්‍රවාසය වැටහීම් කොට ඇත්තේ ය'යි මෙසේ මේ ධර්මයන්ගේ ලක්ෂණාදිය දතයුත්තාහුය. මේ මෙහි සංක්ෂේප යයි. විස්තරය වනාහි **නනු කතමො කොධො** යනාදීන් විභඞ්ගයෙහි කී නියෙන් ම දතයුත්තේය.

තවද විශෙෂ වශයෙන් මෙහි ආමිෂදෘශාදය තමා විසින් නො ලබන්නේ ලාභීවූ අනිකෙකුට කිපෙයි; ඕහට වරක් උපන්නාවූ ක්‍රොධය ක්‍රොධය මැයි, එයින් මත්තෙහි උපනාහය නම; හේ මෙසේ කිපියේ ක්‍රොධය බැඳගෙන පවත්වන්නේ ලාභී වූ අනිකෙකුගේ විද්‍යමානවූත් ගුණයන් මකයි, මමත් එබදු යයි ද යුගග්‍රාහය ගනියි, මේ ඔහුගේ මකුබව ද පළා සය ද වෙයි, හේ මෙසේ මකුවූයේ පළාසිවූයේ ඔහුගේ ලාභසත්කාරාදිය

විෂයෙහි මොහුට මෙයින් කිමැයි ඊර්ෂ්‍යා කෙරෙයි, ප්‍රදූෂ්‍ය වෙයි, මෝ ඔහුගේ ඊර්ෂ්‍යාවයි; ඉදින් ඕහට කිසියම් සම්පත්තියක් වන්නී ද ඒ සම්පත්තියගේ ඔහු හා සාධාරණබව නො ඉවසයි, මේ මොහුගේ මසුරුබවයි; ලාභ හෙතුවෙන් වනාහි තමාගේ විද්‍යමානවූත් දෝෂයන් වසයි, මෝ ඔහුගේ මායාවයි; අවිද්‍යමානවූත් ගුණයන් ප්‍රකාශ කෙරෙයි, මේ ඔහුගේ ශඨබවයි; හේ මෙසේ පිළිපන්නේ ඉදින් අදහස් වූ පරිදි ලාභය ලබා ද එයින් තදවූයේ වෙයි, නො මුදුසිත් ඇත්තේ වෙයි, මෙය මෙසේ නො කටයුතු යයි අවවාද කරන්ට නො හැකිවූයේ වෙයි, මේ ඔහුගේ සතමභ යයි; ඉදින් වනාහි ඕහට කිසිවෙක් කිසිවක් කියාද "මේ මෙසේ නො කටයුතු යයි කියාසි, එයින් සාරඛවූ සිත්ඇත්තේ හකුළුවනලද මුහුන ඇත්තේ වෙයි, නුඹ මාගේ කවරෙක් දූ? සි පැහැර කියන්නේ වෙයි, මේ ඔහුගේ සාරම්භ යයි; නැවත ඔත දැඩි බැවින් මම ම උතුමැයි තමා සිතන්නේ මාන ඇත්තේ වෙයි, සාරම්භයෙන් මොවුහු කවරහු දූ? සි මෙරමා ඉක්මවා සිතන්නේ අතිමානී වෙයි, මේ ඔහුගේ මානය ද අතිමානය ද වෙයි; හේ ඒ මානාතිමානයන් හේතුකොට ජාතිමදාදි වූ නන් රූමද දනවයි, මත්වූයේ කාමගුණාදි හෙදවූ වස්තූන් විෂයෙහි ප්‍රමාද වෙයි, මේ ඔහුගේ මදය ද ප්‍රමාදය දූයි මෙසේ ආමිෂදායාදය නො මුදන ලද්දේ වෙයි; මේ ලාමක ධර්මයන් ගෙන් ද අන්‍යවූත් මෙබඳු ධර්මයන් ගෙන් ද නො මිදුනේ වෙයි; මෙසේ පළමු කොට මෙහි ප්‍රහාතව්‍ය ධර්මයෝ දතයුත්තාහුය. ප්‍රහාණෝපාය වූ කලි පාඨ වශයෙන් ද අර්ථ වශයෙන් ද සියලු තැන්හි විශෙෂයක් නැත්තේ මය. ඥනපරිචයාගේ පාඨ වය පිණිස මෙහි මේ භෙදය ද ක්‍රමය ද භාවනානය ද දතයුත්තේය.

මධ්‍යම ප්‍රතිපදාව භෙදාදි වශයෙන්.

එහි පළමුකොට "භෙදය" කියනු ලැබේ- මෝ මධ්‍යම ප්‍රතිපදා තොමෝ වනාහි කිසිකලෙක ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය වෙයි, කිසිකලෙක සප්තාඞ්ගික වෙයි; ඒ එසේමැයි- මේ මාර්ගය තෙම ලොකොත්තර ප්‍රථමධ්‍යාන වශයෙන් උපදින්නේ අෂ්ටාඞ්ගික වෙයි. සෙසු ධ්‍යාන යන්ගේ වශයෙන් සප්තාඞ්ගික වෙයි; උභකෘෂ්ණ නිර්දේශයෙන් වනාහි මෙහි අෂ්ටාඞ්ගික යයි කියනලද්දේය; මෙයින් මත්තෙහි මාර්ගාඞ්ගයෙක් නැති; මෙසේ පළමුකොට මෙහි භෙදය දතයුත්තේය. යම් හෙයකින් වනාහි ඔයලු කුශලයන්ට සම්‍යග්දෘෂ්ටි තොමෝ ශ්‍රෙෂ්ඨවන්නී ද; වදාළේමැනු- **පඨමං භික්ඛවෙ සෙඨා කුසලා වදනති සි.** කුශලවාරයෙහිත් පූර්ව ඔහම වන්නී ද; වදාළේමැනෝ- **තඤ්ච භික්ඛවෙ! සම්මාදිට්ඨි පුබ්බඞ්ගමා හොති සම්මාදිට්ඨිං සම්මාදිට්ඨීති පජානාති මිච්ඡාදිට්ඨිං මිච්ඡාදිට්ඨීති පජානාති සි** විස්තරයි; වදාළේමැනු- **විජ්ජා ච බො භික්ඛවෙ! පුබ්බඞ්ගමා කුසලානං ධම්මානං සමාපත්තියා සි.** සෙසු අඞ්ගයෝ තත් ප්‍රභව යෙන් පහළ වූවාහු ද; වදාළේ මැනෝ- **සම්මාදිට්ඨිස්ස සම්මාසඞ්කප්පෝ**

පහොති -පෙ- **සම්මාඝතිස්ස සම්මාසමාධි පහොති** යි. එහෙයින් මේ ක්‍රමයෙන් මේ අඞ්ගයෝ කියනලද්දාහු යයි මෙසේ මෙහි "ක්‍රමය" දත යුත්තේය. "භාවනානය" යනු කිසිවෙක් සමථ පූර්ඞ්ගම වූ විදර්ශනාව වඩයි, කිසිවෙක් විදර්ශනා පූර්ඞ්ගම වූ සමථය වඩයි; කෙසේ ද? මේ ශාසනයෙහි කිසිවෙක් පළමුකොට උපචාර සමාධිය හෝ අර්පණා සමාධිය හෝ උපදවයි, මේ සමථ යයි; හෙතෙම ඒ සමථය ද තත් සම්ප්‍රයුක්ත ධර්මයන් ද අනිත්‍යාදි වශයෙන් විදර්ශනා කෙරෙයි, මෝ විදර්ශනායි; මෙසේ පළමුකොට සමථය ද පසුව විදර්ශනාව ද වෙයි; එසින් කියනු ලැබේ- "සමථපුබ්බඞ්ගමං විපස්සනං භාවෙති" යි; ඒ සමථ පූර්ඞ්ගම වූ විදර්ශනාව වඩන්නහුට මාර්ගය උපදියි, හෙතෙම ඒ මාර්ගය ආසෙවනය කෙරෙයි, භාවනා කෙරෙයි, බහුල වශයෙන් කෙරෙයි, ඒ මාර්ගය සෙවූ නාවූ වඩන්නාවූ බහුල වශයෙන් කරන්නාවූ ඔහුගේ සංයොජනයෝ ප්‍රහීණවෙති' අනුසයයෝ කෙළවර වෙති, මෙසේ සමථපූර්ඞ්ගම වූ විදර්ශනාව වඩයි. මේ ශාසනයෙහි ඇතැම් කෙනෙක් උක්තප්‍රකාර වූ සමථය නො උපදවා ම පඤ්චොපාදානස්කන්ධයන් අනිත්‍යාදි වශයෙන් විදර්ශනා කෙරෙයි, මෝ නොමෝ විදර්ශනායි; ඔහට විදර්ශනාවගේ සම්පූර්ණ වීමෙන් එහි උපන් ධර්මයන්ගේ වවස්සඟාරම්මණයෙන් චිත්තයාගේ එකඟබව උපදී, මේ සමථ යයි; මෙසේ පළමුකොට විදර්ශනාව ද පසුව සමථය ද වෙයි. එසින් කියනු ලැබේ- "විපස්සනා පුබ්බඞ්ගමං සමථං භාවෙති" යි විදර්ශනා පූර්ඞ්ගම වූ සමථය වඩන්නාවූ ඔහට මාර්ගය උපදියි, හෙතෙම ඒ මාර්ගය ආසෙවනය කෙරෙයි -පෙ- බහුලවශයෙන් කෙරෙයි, ඒ මාර්ගය සෙවූනාහට -පෙ- අනුසයයෝ විනාශයට පැමිණෙති; මෙසේ විදර්ශනා පූර්ඞ්ගමවූ සමථය වඩයි. සමථ පූර්ඞ්ගම විදර්ශනාව වඩන්නහුට ද විදර්ශනා පූර්ඞ්ගම සමථය වඩන්නහුට ද ලොකොත්තර මාර්ගක්ෂණයෙහි සමථ විදර්ශනාදෙක යුගලවූවාහු ම වෙත් යයි මෙසේ මෙහි භාවනානය දතයුත්තේ ය'යි.

ඛම්දුසාද සූත්‍ර වර්ණනා නිමි.

හයහෙරව සූත්‍ර වණ්ණනා.

එවමෙම සුතං යි හයහෙරව සූත්‍ර යයි. එහි මෝ තොමෝ අපූර්‍වපද වණ්ණනායි. **අථ** යනු අවිච්ඡේදාදීයෙහි නිපාතයි; **බෝ** යනු අවධාරණාදී යෙහියි; භාග්‍යවතුන් වහන්සේගේ සැවැත් නුවර විහරණය නො සුන් කල්හි ම යයි කියනලද වෙයි; **ජාණුස්සොණී** යනු මේ ඔහුගේ මවුපියන් විසින් කළ නමක් නො වෙයි, වැලි කෙසේ වීද යත්? තනතුරු ලැබීමෙන් ලද නමකි; මේ "ජාණුස්සොණී" සථානය නම්? පෙරෙවි තනතුරේක් ල එය ඔහට රජු විසින් දෙනලදී, එහෙයින් ජාණුස්සොණී යයි කියනු ලැබේ; "බ්‍රහමං අණතීති බ්‍රාහමණො" (= වෙදය හදාරනුයි බ්‍රාහමණ නම්;) මන්ත්‍රයන් සජ්ඣායනා කෙරෙයි යන අර්‍ථයි; මෙය ම ජාතියෙන් බමුණුවූවන්ට නිරුකති වචනයි; ආර්‍යයෝ වූ කලි ඛාහිත පාපි බැවින් බ්‍රාහමණ යයි කියනු ලැබෙති; **යෙන භගවා තෙනුප සඞ්කමි** යි **යෙන** යනු සපතම්‍යර්‍ථයෙහි කරණ වචනයි; එහෙයින් භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හි ද එතැන්හි එලඹියේ ය, යි මෙසේ

භාග්‍යවත්හු දෙවමිනිසුන් විසින් එලඹිය යුතුබව.

මෙහි අර්‍ථය දත යුතුයි; නොහොත් යම් කරුණකින් භාග්‍යවත් තෙම දෙවිමිනිසුන් විසින් එලඹිය යුත්තේ ද ඒ කාරණයෙන් එලඹියේ යයි මෙසේත් මෙහි අර්‍ථය දත යුතුයි; කිනම් කරුණකින් භාග්‍යවත් තෙමේ එලඹිය යුත්තේ ද යත්? නානාප්‍රකාර ගුණ විශෙෂයන්ට පැමිණීමෙහි අදහසින් මිහිරි ඵල වැලඳීමෙහි අදහසින් පක්ෂි සමූහයන් විසින් නිත්‍ය ඵල ඇති මහා වෘක්ෂයක් මෙන් (එලඹිය යුත්තේය.)

උපසඞ්කමි යි ද ගියේ යයි කියන ලද වෙයි; **උපසඞ්කමිත්වා** යනු **එලඹීමෙහි අවසානය දක්වීමයි; නොහොත් මෙසේ ගියේ නැවත භාග්‍යවත්හුගේ සම්පසාදාදීන වූ අතිශයින් ආසන්න සථානයට හොස් යි ද** කියනලද වෙයි; **භගවතා සද්ධිං සම්මොදි** යනු ඛමනීයාදිය විමර්‍ශන් නාවූ භාග්‍යවතුන් වහන්සේ ඔහු සමඟ යම්සේ ද එසේ හෙතෙමේත් භාග්‍යවතුන් සමඟ සමානව පැවති සතුටුවීම් ඇත්තේවිය, උණ්හුදිය සමඟ සිහිල්දිය මෙන් සම්මුදිතභාවයට එකීභාවයට ගියේය; භවත් ගෞතම යන් වහන්ස! කිම ඔබට ඉවසිය හැකිද? කිම යැපිය හැකි ද? භවත් ගෞතමයන් වහන්සේට ද ගෞතම ශ්‍රාවකයන්ට ද කිම විෂමභාග වෙදනා නැත්තේ ද? (නො ගිලන් බැවින්) නො බරවූ උඩාන ඇත්තේ ද? කායබල ඇත්තේ ද? ඵාසුවිහරණ ඇත්තේ ද? යනාදි වූ යම් කථාවකින් සතුටුවූයේ ද ඒ කථාව ප්‍රීතිප්‍රමොදයෙ සඞ්ඛ්‍යාත වූ සම්මොදය උපදවන බැවින් ද සතුටුවන්ට සුදුසු බැවින් ද **සම්මොදනීය** නම් වේ; අර්‍ථව්‍යඤ්ජන මධුර භාවයෙන් ද ඉතා දීර්‍ඝකලක් ද සිහිකරන්ට නිරතුරු පවත්වන්ට සුදුසු බැවින් ද සිහිකළයුතු බැවින් ද **සාරණීය** නම් වේ;

ශ්‍රැයමාන සුඛය ඇති බැවින් ද **සමෙමාදනීය** නම්, අනුස්සරියමාන සුඛය ඇති බැවින් **සාරණීය** නම්; එසේම ව්‍යඤ්ජනපරිශුඛ භාවයෙන් **සමෙමා දනීය** නම්; අර්ථපරිශුඛ භාවයෙන් **සාරණීය** නමැයි; මෙසේ නො එක් ආකාරයෙන් සතුටුවිය යුතු වූ සිහිකළ යුතු වූ කථාව කොට නිමවා අව සන්කොට නිමාකොට යම් කරුණකින් ආයේ ද එය විචාරනු කැමැත්තේ එක්පසෙක හුන්නේය. **එකමනතං** යනු භාවනාපුංසක නිදේශයි; **විසමං චඤ්මසුරියා පරිවතතනතති** යනාදියෙහි මෙනි;

නිඝණ්ඩු ලක්ඛණ.

එහෙයින් යම්සේ හුන්නේ එක්පසෙක හුන්නේ වේ ද එප රිද්දෙන් හුන්නේ යයි මෙසේ මෙහි අර්ථය දතයුත්තේය. නොහොත් මේ සපතම්‍යර්ථයෙහි ත්‍රිතීයා වචනයි, **නිසිදි** යනු හිඳගත්තේය; ඒ එසේමැයි- පණ්ඩිත පුරුෂයෝ ගරු කළ යුත්තෙකු සමීපයට එලඹ හිඳීමෙහි දක්ෂ බැවින් එක්පසෙක හිඳ ගනිත්, මේ තෙමේත් ඔවුන් අතුරෙන් එකෙක, එහෙයින් එක්පසෙක හිඳගත්තේය; කෙපරිද්දෙකින් හිඳගත්තේ එක්පසෙක හුන්නේ වේද යත්? **නිඝණ්ඩුදෙඝ සඝ ගැර** (හිඳගත්තේ එක්පසෙක හුන්නේ වෙයි;) ඔහු කවරහ? ඉතා දුරය ඉතා ලඟය උඩුසුළඟය උස්පෙදෙසය ඉතා හමු වය ඉතා පිටිපසය යන මොහුයි; ඒ එසේමැයි- ඉතා දුර හුන්නේ ඉදින් කථාකරනු කැමති වී නම් උස්හඬින් කථාකළ යුතු වෙයි; ඉතා ලඟ හුන්නේ එකට ගැටීම කෙරෙයි; උඩුසුළුහෙහි හුන්නේ සිරුරු ගදින් පෙළයි; උස්පෙදෙස්හි හුන්නේ අගෞරවය ප්‍රකාශ කෙරෙයි; ඉතා හමුයෙහි හුන්නේ ඉදින් දකිනු කැමැත්තේ වී නම් ඇසින් ඇස හපා දැක්ක යුතු වෙයි; ඉතා පසුපස හුන්නේ ඉදින් දකිනු කැමැත්තේ වී නම් ග්‍රීවය දිගු කොට දැක්ක යුතු වෙයි, එහෙයින් මේ තෙමේත් **මේ නීඝණ්ඩුදෙඝ සඝ දුරුකොට හුන්නේය; එයින් කියනලදී එකමනතං නිසිදි සි.**

මී විධ කුලපුත්‍රයෝ.

යෙ හම යනු යෙ ඉමෙ (= යම් මේ;) **කුලපුතතා** යනු ජාති කුලපුත්‍රයෝ ද ආචාර කුලපුත්‍රයෝ දැ' යි කුලපුත්‍ර යෝ විවිධ වෙති; ඔවුන් අතුරෙහි **තෙන බො පන සම යෙන රඤ්ඤා පසෙනදිනා කොසලෙන සාවත්ථියං යෙවඤ්ඤ කොසිනෙ අගඝකුලිකසස පුතතෙනා** යි මෙසේ ආවාවූ උසස් කුලයෙහි උපන්නාහු ජාති කුලපුත්‍රයෝ නම් වෙති; **යෙ තෙ කුලපුතතා සඛා අගාරසමා අනගාරියං පබබජිතා** යි මෙසේ ආවාහු වනාහි යම් කිසි කුලයෙක්හි උපන්නාහු ද ආචාර සමන්විත වූවාහු ආචාර කුලපුත්‍රයෝ නම් වෙති; මෙහි වූකලී දෙකරුණින් ම කුලපුත්‍ර වූවාහු ම වෙත්.

සඛා= ශ්‍රද්ධාවෙන්; **අගාරසමා**= ගිහිගෙයින්; **අනගාරියං**= ප්‍රව්‍රජ්‍යා වට ද භික්ෂුභාවයට ද; ඒ එසේමැයි- ප්‍රව්‍රජ්‍යා තොමෝ ද "නතෙථ අගාරියනති අනගාරියා" (=මෙහි අගාරිය කර්මය නැත්නුයි අනගාරියා නමු;) ගිහිගෙට හිතවූ කෘෂිගොරක්ෂාදි කර්මය මෙහි නැත්තේය යන

අවීසි; මහණ තෙමේ ද "නත්ථෙතස්ස අගාරන්ති අනගාරෝ" (=මෝහට අගාරය නැත් නුසි අනගාර නම්;) "අනගාරස්ස භාවෝ අනගාරියං" (=අනගාරයාගේ බව අනගාරිය නම්;) **පබ්බජිතා**= එලඹියාහු; මෙසේ සවීප්‍රකාරයෙන් ම අනගාරිය සඞ්ඛ්‍යාත වූ ප්‍රව්‍රජ්‍යාවට ද භික්ෂුභාවයට ද පැමිණියාහු යයි කියනලද්දේ වෙයි; **පුබ්බඞ්ගමෝ**= පෙරටුව යන සුලු වූයේ නායකවූයේ; **බහුකාරෝ**= හිතක්‍රියාවෙන් බොහෝ උපකාර ඇත්තේ; **භවං තෙසං ගොතමෝ සමාදපෙතා**= භවත් ගෞතම තෙමේ ඒ කුලපුත්‍රයන් අධිශීලාදිය ගන්වන්නේ භික්මවන්නේ; **සා ජනතා**= ඒ ජනසමූහ තෙම; **දිට්ඨානුගතිං ආපජ්ජති**= දෘෂ්ටියෙන් අනුගමනයට පිළිපදී; පින්වත් ගෞතම තෙමේ යම් දෘෂ්ටියක් ඇත්තේ ද යමක් කැමති වේද යමක් රුචි කෙරේ ද ඔවුහු ද ඒ දෘෂ්ටිය ඇත්තාහු එය කැමති වන්නාහු එය රුචිකරන්නාහු වෙති යන අවීසි. කුමක් හෙයින් මේ තෙමේ මෙසේ කියේද යත්? මේ තෙම වනාහි පෙර නො එක් කුල පුත්‍රයන් ගිහිගෙයි වසන්නවුන් දිව්‍යපුත්‍රයන් මෙන් පස්කම් ගුණයෙන් සතුටුවන්නවුන් ඇතුලත ද පිටත ද මොනොවට කරනලද ආරක්ෂා ඇත්තවුන් දැක ඔවුහු පසු කලෙක භාග්‍යවතුන් වහන්සේගේ මධුරස්වර ඇති ධර්මදේශනාව අසා සැදැහැයෙන් ගිහිගෙන් නික්ම පැවිදිව කෑම් හැඳීම් උතුම් කොට ඇති බැවින් සතුටුවූවන් ආරණ්‍යක සෙනාසනයන්හි කිසිවෙකු විසින් නොරක්නා ලබන කල්හි ද ආසඞ්කා පරිසඞ්කා රහිතවූ වන් අභිශයින් සතුටුවූ අභිශයින් ඔදවැඩියවුන් දුටුයේය; දැක ද මේ කුල පුත්‍රයන්ගේ මේ ඵාසුවිහරණය කවරෙකු නිසා උපන්නේ දැ? සි සිතන්නේ ශ්‍රමණ ගෞතමයන් නිසා යයි භාග්‍යවතුන් කෙරෙහි ප්‍රසාදය ලැබූ යේය; හෙතෙම ඒ ප්‍රසාදය දන්වන්ට භාග්‍යවතුන් වහන්සේගේ සමීප යට ආයේය. එහෙයින් මෙසේ කීහ.

ඉක්බිති භාග්‍යවත්හු ඔහුගේ ඒ වචනය පිළිගනිමින් ද අනුමොදන් වෙමින් ද **එවමෙතං බ්‍රාහ්මණ!** යනාදිය වදාළහ. මෙහි මේ එවං යන නිපාතය තෙම වචන සම්ප්‍රතිච්ඡනානු මොදනාවී මැයි; **මමං උද්දිස්ස**= මා උදෙසා; **සද්ධා** යනු ශ්‍රද්ධාවෙන් ම; "න ඉණට්ඨා න භයට්ඨා" යනාදිය සඳහා කීය. මෙබඳු වූවන්ට ම භාග්‍යවන්හු පූජාර්හයෝ වෙති, අන්‍යයන්ට නො වෙති; **දුරභිසම්භවානි හි**= යනු ලබන්ට දුෂ්කර වෙති; ඉවසිය නො හැකි වෙති, අලෙපශාක්‍යයන් විසින් බැසගන්ට නො හැකි යයි කියනලද්දේ වෙයි; **අරඤ්ඤානි වනපත්ථානි** යනු අරණ්‍ය සෙනාසන ද වෙනෙහි දුරසෙනසුන් ද; ඒ ආරණ්‍යක සෙනාසනයන් අතුරෙහි කිසි සේත් අභිධර්මයෙහි නිෂ්පර්‍යායයෙන් **නික්ඛමිත්වා බහි ඉඤ්ඣිලා සබ්බ මෙතං අරඤ්ඤං** යි කියනලද ද, එතකුදුවුවත් **පඤ්චධනුසතිකං පච්ඡි මං** යි යම් ඒ ආරණ්‍යකාඞ්ගනිෂ්පාදකවූ සෙනස්නක් කියනලද ද එය ම අදහස්කරන ලදැ යි දතයුතු. **වනපත්ථං** යනු ග්‍රාමාන්තය ඉක්මවා යම් තැනෙක්හි නො සානු ලැබේ ද, නො වපුරනු ලැබේ ද, එබඳු වූ මිනිසුන්

නො හැසිරෙන තැනය; මේ කියනලද ද වෙයි- **වනපත්‍ථනති දූරානමෙතං සෙනාසනානං අධිවචනං, වනපත්‍ථනති වනසණ්ඩානමෙතං සෙනාසනානං** -පෙ- **වනපත්‍ථනති හිංසනකානමෙතං- වනපත්‍ථනති සලොමහංසානමෙතං- වනපත්‍ථනති පරියන්තානමෙතං- වනපත්‍ථනති න මනුස්සූපචාරානමෙතං සෙනාසනානං අධිවචනං** යි. මෙහි දු "පරියන්තානං" යි මේ එක් පය්‍යායක් තබා සෙසු පය්‍යායයන් ගෙන් වාන්තප්‍රසථයෝ දතයුත්තාහුය. **පන්තානි**= පය්‍යන්ත වූ ඉතා දුරවූ; **දුක්කරං පවිවෙකං**= කායවිවෙකය දුෂ්කර වෙයි; **දුරභිරමං**= සිත් අලවන්ට පහසු නො වෙයි; **එකත්තෙන**= එකඟබැවිනි; (මෙයින්) කුමක් දක්වාද යත්? කායවිවෙකය කළකල්හිදු එහි සිත අභිරමණය කරවන්ට දුෂ්කර වෙයි, යම් හෙයකින් මේ ලෝවැසි තෙමේ වයංවයා රම් වේද එහෙයිනි. **හරන්නි මඤ්ඤේ**= හැරගන්නාක් මෙනි, කන්නාක් මෙනි; **මනො**= සිත; **සමාධිං අලභමානස්ස**= උපචාර සමාධිය හෝ අර්පණ සමාධිය හෝ නො ලබන්නහුගේ; කුමක් දක්වාද යත්? "තෘණ පත්‍රමෘගාදීන්ගේ ශබ්දයන්ගෙන් ද විවිධවූ භය අරමුණුවලින් ද වනයෝ මෙබඳු භික්ෂුවගේ සිත වික්ෂෙප කරන්නාක් මෙනැ" යි සියල්ල බමුණු තෙම සැදෑයෙන් පැවිදිවූ කුලපුත්‍රයන්ගේ අරණ්‍ය වාසයෙන් විමතිවැකිය. ඉක්බිති භාග්‍යවත්හු පළමු නයින් ම **එවමෙතං බ්‍රාහ්මණ!** යනාදීන් ඔහුගේ ඒ වචනය පිළිගෙන 'අනුමොදනාත් වී යම් හෙයකින් සොළොස් තැනෙක්හි ආලම්බන පරිග්‍රහ රහිතයන්ට ම එබඳු සෙනසුන් ලබන්ට දුෂ්කර වෙත් ද ඒ සොළොස් තැන්හි ආලම්බන පරිග්‍රහ යුක්ත යන්ට නො වෙත් ද, තමන් වහන්සේත් බොධිසත්වවූවාහු එබඳු වූහු ද, එහෙයින් තමන් වහන්සේට එබඳු සෙනාසනයන්ගේ දුරභිසම්භවත්වය දක්වන්ට **මයහම්පි ඛො** යනාදිය වදළහ. එහි **පුබ්බෙව සම්බොධා**= බුඩබැයෙන් පෙර ම; ආර්‍ය්‍ය මාර්ගයට පැමිණීමෙන් පෙර භාගයෙහි ම යයි **කියන්න** ලද වෙයි; **අනභිසම්බුද්ධස්ස**= ප්‍රතිවෙධ නො කළ චතුස්සත්‍යය අවබෝධ නොකළ තැත්තහුට; **බොධිසත්තස්සෙව සතො** යනු (සම්‍යක් සම්බොධිය) අවබොධකරන සත්වවූ ම සම්‍යක් සම්බොධියට පැමිණෙන්ට සුදුසුවූ ම; නොහොත් බොධියෙහි ශක්තවූ ම ලග්නවූ ම; **බොධිසත්ත.** යම් හෙයකින් දීපඞ්කර භාග්‍යවතුන් වහන්සේගේ පාදමූලයෙහි අෂ්ටධර්ම සමොධානයෙන් යුක්තව අභිනීහාර සමෘද්ධිය පවත් තථාගත තෙමේ බොධියෙහි ඇලුනේ ලැගුනේ මා විසින් මේ පැමිණිය යුත්තී යයි ඊට පැමිණීම පිණිස පරාක්‍රමය නො හරිමින් ම ආයේ ද එහෙයින් "බොධිසත්ව" යයි කියනු ලැබේ; **තස්ස මඤ්ඤං**= ඒ මෙසේ බොධිසත්වවූ ම මට; **යෙ ඛො කෙචි සමණා වා බ්‍රාහ්මණා වා**= යම්කිසි පැවිද්දට පැමිණියන් හෝ හොවාදීන් හෝ; **අපරිසුද්ධ කායකම්මන්තා** අපිරිසුදු වූ ප්‍රාණාතිපාතාදි කායකර්‍මාන්තයෙන් යුක්තවූවාහු; **අපරිසුද්ධ කායකම්මන්ත සඞ්ඛ්‍යෙසහෙතු** යනු අපරිශුඬ කායකර්‍මාන්ත සඞ්ඛ්‍යාත තමාගේ දෙෂය හෙතුකොට ගෙන; අපරිශුඬවූ කායකර්‍මාන්ත කාරණ

යෙනැසි කියනලද්දේ වෙයි; **භවෙ** යනු එකාන්න වචනයෙහි නිපාතයි; **අකුසලං**= සාවද්‍යවූ ද අක්ෂේමවූ ද; **භයභෙරවං** යනු "භයඤ්ච භෙරවඤ්ච" (= භය ද භෙරව ද;) සිත තැතිගැනීමට ද භය උපදවන අරමුණට ද මේ නමකි; ඔවුනතුරෙහි භය සාවද්‍යභීයෙන් අකුශලය භෙරවය අක්ෂේමාභීයෙන් අකුශල යැයි දතයුතු. **අච්භයනති**= කැඳවත්; කෙසේ ද? ඔවුහු වනාහි ප්‍රාණාතිපාතාදිය කොට "අපි අයුත්තක් කළම්හ යම් කෙනෙකුන්ට අපරාධකළමෝ ද ඉදින් ඔවුහු අප දන්නාහු නම් මෙවිට ලුහුබැඳ අනයව්‍යසනයට පමුණුවන්නාහුය"යි වනයට පිවිස ගස් අතර හෝ පඳුරු අතර හෝ හිඳිත්, ඔවුහු මදපමණවූ ද තෘණ ශබ්දයක් හෝ පත්‍ර ශබ්දයක් හෝ අසා මෙවිට නටුම්හ'යි ත්‍රස්ත වෙති, විශෙෂයෙන් ත්‍රස්ත වෙති, අවුත් අන්‍යයන් විසින් වධකරන ලද්දවුන් මෙන් බඳින ලද්දවුන් මෙන් නසන ලද්දවුන් මෙන් ද වෙති; මෙසේ ඒ භයභෙරවය තමා කෙරෙහි මොනොවට ආරොපණය නරන අටින් ආඟ්වානය කෙරෙත් කැඳවත්.

න බො පනාහං –පෙ– **පටිසෙවාමි**= මම වනාහි අපරිශුද්ධ කාය කර්මාන්ත ඇතිව වනසෙනසුන් ද වෙනෙහි දුරසෙනසුන් ද වනකෙළවර සෙනසුන් ද සෙවනය නො කරමි; **යෙ හි වො** යන මෙහි **වො** යනු නිපාත මාත්‍රයෙකැ; **අරියා** යි සප්පුරුෂයෝ ද සප්පුරුෂ ශ්‍රාවකයෝ ද. කියනු ලැබෙත්; **පරිසුද්ධකායකම්මන්තා**= මෙබන්දෝ වී; **අහං තෙසං අඤ්ඤතරොමෙ**= ඔවුන් අතුරෙන් මම ද එකෙක්මි, අන්‍යතරයෙක්මි; **ඒළුසේ** මැයි– බෝසත් තෙම හිහිවූයේ ද පැවිදිවූයේ ද පිරිසුදු වූ කායකර්මාන්ත ඇත්තේ ම වෙයි. **භියොා** යනු අතිරෙකාර්ථයෙහි නිපාතයි; **පලෙලොමං** යනු පතිතලොම ඇතිබවට ක්ෂේමයට සවඤ්ඤිභාවයට යන අර්ථයි; **ආපාදිං**= පැමිණියෙමි; අතිරෙකවූ සවඤ්ඤිභාවයට නොහොත් අතිරෙකයෙන් සවඤ්ඤිභාවයට පැමිණියෙමි'යි කියනලද්දේ වෙයි; **අරඤ්ඤෙ විහාරාය**= වෙනෙහි විසීම පිණිස.

කායකම්මාභාවාර කථා නිමි.

සියලු තැන්හි මේ ක්‍රම යයි. මේ කියනු ලබන්නේ විශෙෂ යයි. පළමුකොට වාක්කර්මාන්ත වාරයෙහි **අපරිසුද්ධවචීකම්මන්තා**= අපිරිසුදුවූ මෘෂාවාදාදි වාක්කර්මාන්තයෙන් යුක්තවූවාහු; ඔවුහු කෙසේ භය හා භයානක අරමුණු කැඳවත් ද යත්? ඔවුහු මෘෂාවාදයෙන් පරගේ අර්ථ නසා පිසුනු වචනයෙන් මිත්‍රභෙදය කොට පරුෂවචනයෙන් පිරිස්මැද අන්‍යයන්ගේ මර්මයන් බිඳ පෙළා නිරර්ථක වචනයෙන් පරසන්තයන්ගේ කර්මාන්තයන් නසා අපි අයුත්තක් කළම්හ, යම් කෙනෙකුන්ට අපරාධ කළමෝද ඉදින් ඔවුහු අප දන්නාහු නම් මෙවිට ලුහුබැඳ අනයව්‍යසනයට පමුණුවන්නාහුය" යයි අරණ්‍යයට පිවිස ගස් අතර හෝ පඳුරු අතර හෝ හිඳිති; ඔවුහු මද පමණවූ ද තෘණශබ්දයක් හෝ පත්‍රශබ්දයක් හෝ

අසා මෙවිට නවුම්හ, සි ත්‍රසතෙති, විශෙෂයෙන් ත්‍රසතෙති, අවුත් අන්‍යයන් විසින් වධකරන ලද්දවුන් මෙන් ද බඳින ලද්දවුන් මෙන් ද නසන ලද්දවුන් මෙන් ද වෙත්, මෙසේ ඒ භයහෙරවය තමා කෙරෙහි සමාරොපණය කිරීම් අවින් ආහ්වානය කෙරෙති, කැඳවත්.

මනඃ කම්මනත වාරයෙහි අපරිසුද්ධ මනොකම්මනතා= අපිරිසුදු වූ අභිධ්‍යාදි මනඃ කර්මාන්තයෙන් යුක්තවූවාහු; ඔවුහු කෙසේ භය හා භයානක අරමුණු කැඳවත් ද යත්? ඔවුහු අන්‍යයන් විසින් රක්ෂිත ගොපිත භාණ්ඩයන් කෙරෙහි අභිධ්‍යාසඞ්ඛ්‍යාත විෂම ලොභයඋපදවා පරාහවකිපි පරසන්තයන් මිසදිටු ගන්වා අපි අයුත්තක් කළම්හ -පෙ- තමා කෙරෙහි සමාරොපණය කරණාඊයෙන් ආහ්වානය කෙරෙති, කැඳවත්.

ආජීව වාරයෙහි **අපරිසුද්ධා ජීවා**= අපිරිසුදු වූ වෛද්‍යකර්ම දූතකර්ම වෘඩිප්‍රයොගාදි වූ (= පොලිය දීම්ආ) එක්විසි අනෙසනාභෙද ඇති ආජීව යෙන් යුක්තවූවාහු; ඔවුහු කෙසේ භය හා භයානක අරමුණු කැඳවත් ද යත්? ඔවුහු මෙසේ ජීවිකාව කොට ශාසනශොධක වූ ත්‍රිපිටකධර භික්ෂූහු ශාසනය ශුද්ධකරනු පිණිස නික්මුනාහුය, අද හෝ හෙට හෝ මෙහි පැමිණෙන්නාහු ල සි අසති, වනයට පිවිස ගස් අතර හෝ —පෙ— ත්‍රසතෙති, විශෙෂයෙන් ත්‍රසත වෙති, ඔවුන් විසින් අවුත් පිරිවරා ගන්නා ලද්දවුන් මෙන් ද සුදුවත් හඳවන ලද්දවුන් මෙන් ද වෙත් යසි. සෙස්ස එබදු මැයි. මෙයින් මතු **අභිජ්ඣාලූ** යනාදි තැන්හි කිසිසේත් අභිධ්‍යා ව්‍යාපාදයෝ මනඃ කර්මාන්තයෙහි සඞ්ග්‍රහ වූවාහු ද එතකුදුවුවත් නිවරණ යන්ගේ වශයෙන් යලි කියනලද්දහු ය'සි දතයුත්තාහුය. එහි **අභිජ්ඣාලූ**= පරගේ භාණ්ඩයන් දැඩි ලොභයෙන් සිතනසුලු වූවාහු; **කාමෙසු මිච්ඡාචාරා**= වසතුකාමයන්හි බොල්වූ කෙලෙස් රා ඇත්තාහු; ඔවුහු කෙසේ භය හා භයානක අරමුණු කැඳවත් ද යත්? ඔවුහු අව්‍යවසිතාරම්මණ ඇත්තාහු වෙති, අව්‍යවසිතාරම්මණ ඇතිව වෙනෙහි වසන්නාවූ ඔවුනට දහවල් දක්නාලද්ද රාත්‍රියෙහි භයහෙරවයක්වැ වැටහෙයි, ඔවුහු අකුශල සිත් ඇත්තාහු මද පමණකිනුදු ත්‍රසනසුලු වෙති, රැහැනක් හෝ වැලක් හෝ දැක සර්පයෙක යන සංඥ ඇත්තාහු වෙති, කණුවක් දැක යක්ෂයෙක යන සංඥ ඇත්තාහු වෙති, සටලයක් හෝ පඹුතයක් හෝ දැක ඇතෙක යන සංඥ ඇත්තාහු සර්පාදීන් විසින් අනයව්‍යසනයට පමුණුවන ලද්දවුන් මෙන් වෙත් යසි. සෙස්ස එබදුමැයි. **ඛ්‍යාපන්න චිත්තා**= ප්‍රකෘතිභාවය හැරීමෙන් විපන්න සිත්ඇත්තාහු; ඒ එසේමය- කෙලශානුගත වූ සිත ප්‍රකෘතිභාවය හරී, පුරාණ භක්තව්‍යඥානයක් මෙන් පිලුනු වෙයි; **පදුඨමනසඞ්කප්පා** යනු ප්‍රදූෂ්‍යවූ චිත්තසඞ්කල්ප ඇත්තාහු, සොඳුරු නො වූ අන්‍යයාහට අනර්ථ උපදවන්නාවූ චිත්ත සඞ්කල්පයෙන් යුක්තවූවාහු යසි කියනලද වෙයි; ඔවුහු කෙසේ භය හා භයානක අරමුණු කැඳවත් ද යත්? භයහෙරවාහ්වානය මෙතැන් පටන් අභිධ්‍යාලූ වාරයෙහි කිනියෙන් ම දතයුතුසි. යම් තැනක විශෙෂයක් වන්නේ|ද එහිදී කියන්නෙමු.

න බො පනාහං බ්‍යාපන්න චිත්තෙනා යන මෙහි වනාහි මම මෙත් සිත් ඇත්තෙම් හිතසිත් ඇත්තෙම්, යි දක්වයි; ඒ එසේමැයි– බොධි සත්වයෝ මෙබඳු වූවාහු වෙත් යයි, මෙසේ සියලු තැන්හි කියනලද දෙය යට ප්‍රතිපක්ෂ වශයෙන් බොධිසත්ව ගුණයෝ වර්ණනාකළ යුත්තාහුය. **ථීනමිඛපරියුට්ඨිතා** යනු චිත්තයාගේ ගිලන්බව වූ ථිනයෙන් ද අවශෙෂ නාමකායයාගේ ගිලන්බව වූ මිඛයෙන් ද වළඳනාලද්දාහු මඛනලද්දාහු ගන්නාලද්දාහු යයි කියනලද වෙයි; ඔවුහු නිද්‍රා බහුලකොට ඇත්තාහු වෙති. **උඛනා**= ඖඛත්‍යප්‍රකෘති වූවාහු සැලෙන සිත්ඇත්තාහු; ඒ එසේ මැයි– ඖඛත්‍යයෙන් එක් අරමුණෙක් හි වූ සිත වාතයෙන් ධජයට යෙහි පතාකාවක් මෙන් සැලෙයි. **අවූපසන්න චිත්තා**= නො නිවුනු සිත් ඇත්තාහු; මෙහිලා කුකුකුච්චය ගන්ට වටී.

කඞ්ඛී වෙව් කිච්ඡී යන මෙහි එකම වූ මේ පස්වන **නීවරණ** යයි; මේ කිමෙක් දැ? යි අරමුණ සැකකරන හෙයින් "කඞ්ඛා" නම් වෙයි; මෙය ම මේ යයි නිශ්චය කරන්ට අසමර්ථ බැවින් "විචිකිච්ඡා" යයි කියනු ලැබේ; එයින් සමන්විතවූ මහණ බමුණෝ "කඞ්ඛී වෙව් කිච්ඡී" යි කියන ලද්දාහුය; **අතතුක්කංසකා පරවම්භි** යනු යමෙක් තුමූ තමා උසස් කෙරෙත් ද ඔසවත් ද උසස්තැන්හි තබත් ද මෙරමා පහත් කෙරෙත් ද ගරහත් ද නිගාකෙරෙත් ද පහත්තැන්හි තබත් ද ඔවුනට මේ නමෙකි; ඔවුහු කෙසේ භය හා භයානක අරමුණු කැඳවත් ද යත්? "ඔවුහු අන්‍ය යන් විසින් අසවලා ද අසවලා ද ආතෙමාතක්කමණය කෙරෙති, අප ගර හති දුසයන් මෙන් කෙරෙත්ල, ඔවුන් ගනිවු යයි ලුහුබඳනා ලද්දාහු පලාගොස් වනයට පිවිස ගස් අතුරෙහි හෝ" යි කායකම්මාන්තය මෙන් විස්තරකළ යුතුයි. **ඡම්භි**= කය තදකරන ලොමු දැහැගැනීම් කරන තැතිගැනීමෙන් යුක්තවූවාහු; **භිරුකජාතිකා**= භය ප්‍රකෘතිකොට ඇත්තාහු; ගම්දරුවන් මෙන් භය බහුලවූවාහු ශූරනොවූවාහු දීනවූවාහු යයි කියනලද වෙයි. **ලාභසක්කාර සිලොකං** යන මෙහි **ලභතීති ලාභො** (= ලබානුයි ලාභ නම්,) සිව්පසයට මේ නමකි; **සක්කාර නම් සුන්දර** කාර යයි ප්‍රත්‍යයෝ ම අතිශයින් ප්‍රණීතවූවාහු අතිශයින් සුන්දර වූවාහු සකස්කොට කරනලද්දාහු **සක්කාර** යයි කියනු ලැබෙත්, පරුවිසින් තම ගට යම් හෙරව කිරීමකුත් වේ ද මල් ආදියෙන් හෝ පිදීමක් වේද (හෙද සක්කාර නම්;) **සිලොක** නම් ගුණ කීමයි; මේ ලාභය ද සක්කාරය ද සිලොකය ද "ලාභසක්කාර සිලොක" නම්; **නිකාමය මානා**= ප්‍රාර්ථනා කරන්නාහු; භයභෙරව කැඳවීම අභිඤ්ඤාලුවාරය සමාන මැයි. මෙහි ඒ අර්ථය දක්වනු පිණිස ප්‍රියගාමික වසතුව කියත්.

පියගාමික වසතුව.

පියගාමික නම් මහණෙක් සමාදන් වූ ධුතාඞ්ග ඇති භික්ෂූන්ගේ ලාභය දැක මම ද ධුතාඞ්ග සමාදන්ව ලාභය උපදවම්'යි සිතා සොසානිකාඞ්ගය සමාදන්ව සොහොනෙහි වෙසෙයි; ඉක්බිති එක්දිනක් කර්මාන්තයෙන් මුදනලද එක් මහලු ගවයෙක් දහවල් ගොවරයෙහි හැසිර රාත්‍රියෙහි ඒ සොහොන්හි

මල්පඳුරෙක හිස තබා රොම්මඵනය කරමින් (=වමාරා සපමින්) සිටියේය. ප්‍රිය ග්‍රාමික තෙම රාත්‍රියෙහි චඞ්ක්‍රමණයෙන් නික්මුනේ ඔහුගේ හනු ශබ්දය අසා මෙසේ සිතී; "මේ තෙම ලාභයෙහි නිදුවූයේ සොහොනෙහි වෙසේ යයි දැන දෙව්රජ එකැහින් මා වෙහෙසනු පිණිස ආයේවනැ"යි; හෙතෙම මහලු ගවයාගේ අභිමුඛයෙහි ඇඳිලි ගෙන "සත්පුරුෂවූ දිව්‍ය රාජය! මට අද එකරුයක් ඉවසනු මැන, සෙට පටන් මෙසේ නො කරන්නෙම්"යි නමසකාර කරමින් සියලු රුය අයදමින් සිටියේය; ඉක්බිති හිරු නැගිකල්හි ඒ ගවයා දැක සැරයටියෙන් පහරදී "සියලු රුය මා හය කෙළෙහි" යයි පලවා හැරියේය.

කුසිතා= කුසිතභාවයෙන් යුක්තවූවාහු; **හීනවිරියා** යනු හීනවූවාහු වීර්‍යය රහිතවූවාහු වෙන්වූවාහු නිවීර්‍යවූවාහු යයි කියනලදැ වෙයි; එහි කුසිතයෝ කායික වීර්‍යාරම්භ විරහිතයෝ වෙති හීනවීර්‍යයෝ චෛතසික වීර්‍යාරම්භ විරහිතයෝ වෙති; ඔවුහු ආරම්මණ ව්‍යවසථා මාත්‍රයකුදු කරන්ට නො හැකි වෙති, ඒ ආරම්මණ ව්‍යවසථා රහිතයන්ට, යයි සියල්ල පූර්‍වසදෘශ මැයි. **මුඤ්චන්ති**= නට සිහිඇත්තාහු; **අසම්පජානා**= ප්‍රඥරහිත වූවාහු; මීට ද විරුඬ පක්‍ෂයෙහි **උපඛිනාසතිහමස්මි** යි වදුළ හෙයින් මේ (අසම්පජානත්වය) සම්‍මෝහාජනීය මැයි; මෙහි ප්‍රඥව වනාහි සම්‍මෝහයගේ දුර්ලඝ්‍යය දැක්වීම පිණිස වදුරන ලද්දීය.

දෙවැදෑරුම් සිහි ය. ඒ එසේ මැයි- සම්‍මෝහ තොමෝ විවිධවන්නීය ප්‍රඥසම්ප්‍රයුක්ත ද විප්‍රයුක්ත ද කියාසි; ඔවුනතුරෙහි ප්‍රඥසම්ප්‍රයුක්ත වූවා බලවත් වන්නීය; එහෙයින් යම් කලෙකත් ඔවුන්ගේ සම්‍මෝහය වේද එකල්හිදු ඔවුහු **සම්‍යක්ප්‍රඥරහිත** හෙයින් මුළාසිහි ඇත්තාහු ම වෙති, දුර්ලඝ්‍යවූ සිහියෙන් සම්‍මෝහකෘත්‍යයක් නැති හෙයිනැයි මේ අර්ථය දක්වන්ට **අසම්පජානා** යි වදුරනලදී. ඔවුහු මෙසේ නවසිහි ඇත්තාහු **ප්‍රඥරහිත** වූවාහු අරමුණු ව්‍යවසථා මාත්‍රයකුදු කරන්ට නො හැකි වෙත් යි සියල්ල පෙර මෙනි. **අසමාහිතා**= **උපචාරඅර්පණා සමාධිරහිත** වූවාහු **විඛණන චිත්තා**= විශෙෂයෙන් භ්‍රාන්තසිත් ඇත්තාහු; **සමාධි රහිතවූ** කල්හි ලද අවකාශ ඇති ඖඩත්‍යයෙන් ඔවුන්ගේ සිත සමාධි විරහිත බැවින් වනශාඛාවන්හි වනචදුරෙක් මෙන් නානාරම්මණයන්හි හැසිරෙයි; උඩඟු බැවින් එක් අරමුණෙහි ද සිත වෙසෙසින් සැලෙයි; පෙර කිනියෙන් ඔවුහු මෙසේ එකඟ නො වූ සිත් ඇත්තාහු නානාඅරමුණෙහි හැසිරෙන සිත් ඇත්තාහු ආරම්මණ ව්‍යවසථා මාත්‍රයකුදු කරන්ට නො හැකි වෙත් යයි සියල්ල පූර්‍වසදෘශ මැයි. **දුප්පඤ්ඤා** යනු ප්‍රඥරහිතයන්ට මේ නමකි; ප්‍රඥ වූ කලි දුෂ්ටවූවා නම් නැති. **එලමූගා**= කෙලතොළු වූවාහු; "ඛ" කාරයට "ග" කාරය කරනලදැ; "ලාලමූඛා" යි කියනලද වෙයි; ඒ එසේමැයි- දුෂ්ප්‍රාඥයන් කථාකරන කල්හි මුඛයෙන් කෙළ ගලයි; කෙළ ද "එලා" යි කියනු ලැබේ; කියේමැනු- **පසෙසලමූඝං උරගං දුජ්ජිවහං** යි. එහෙයින් ඔවුහු "එලමූගා" යි කියනු ලැබෙත්; "එලමූගා" යි ද පාඨයි; කිසිවෙක් "එලමූකා" යි ද; අනෙකෙක් "එල

මුඛා" යී ද කියති; සියලු තැන්හි "එලමුඛා" (= කෙළතොළු වූවාහු) යන අර්ථයි. ඔවුහු කෙසේ භය හා භයානක අරමුණු කැඳවත්ද යත්? ඔවුහු ප්‍රඥරහිත වූවාහු කෙළතොළු වූවාහු **ආරම්මණ** ව්‍ය ව සථා මා ත්‍රා ය කූ ටු කරන්ට නො හැකි වෙති. **අව්‍යවසථාරම්මණ** වූ වෙනෙහි වසන්නා වූ ඔවුනට දහවල් දක්නාලද්ද රාත්‍රියෙහි භයභෙරවයක් වී වැටහෙයි; ඔවුහු අකුශල සිත් ඇත්තාහු මද පමණකිනුදු ත්‍රාසයට වෙති, රුහැනක් හෝ වැලක් හෝ දැක සර්පයෙකැ යන සංඥ ඇත්තාහු වෙති; කණුවක් දැක යකෙක යන සංඥ ඇත්තාහු සථලයක් හෝ පර්වතයක් හෝ දැක ඇතෙක යන සංඥ ඇත්තාහු සර්වාදීන් විසින් අනයව්‍යසනයට පමුණුවන ලද්ද වුන් මෙන් වෙති; මෙසේ ඒ භයභෙරවය තමා කෙරෙහි සමාරොපණය කිරීම් අර්ථයෙන් ආහ්වානය කෙරෙති, කැඳවත්; **පඤ්ඤා සම්පයුත්තා හමස්මි** යන මෙහි **පඤ්ඤාසම්පයුත්තා**= ප්‍රඥාවෙන් සම්පූර්ණවූයෙම් සමන් විතවූයෙම් විදර්ශනා ප්‍රඥාවෙන් නො ද වෙයි, මාර්ග ප්‍රඥාවෙන් ද නො වෙයි වැලිදු වනාහි මේ සොළොස් තැන්හි ආරම්මණ ව්‍යවස්ථාන ප්‍රඥාවෙන් යන අර්ථයි; සෙස්ස සියලු තැන්හි කී නයමැ'යි.

ඡොඩශසථානාරම්මණ පරිග්‍රහය නිමි.

නාසං මයහං යී අනුසන්ධි කවරේද? බෝසත් තෙම වනාහි මේ සොළොස් අරමුණු පරීක්ෂා කරන්නේ භයභෙරවයක් නො දැක භයභෙරවය නම් මෙබඳු රාත්‍රීන්හි මෙබඳු සෙනසුන්වලැ පැනෙයි, එහිදු එය නිශ්චයෙන් සොයම්, යි භයභෙරව ගවේෂණය කළේය; භාග්‍යවත්හු මේ කාරණය මෙකල්හි බ්‍රාහ්මණයාහට දක්වන්නාහු **නාසං මයහං** යනාදිය වදාළහ. එහි **යා නා** යන මේ පදවය රාත්‍රීන්ගේ ම උද්දෙශනිර්දේශ වචනයි; **අභිඤ්ඤාතා** යන මෙහි **අභි** යනු ලක්ෂණාර්ථයෙහි උපසර්ගයෙකි; එහෙයින් **අභිඤ්ඤාතා** යනු සඳ පිරීමෙන් ද සඳ හෙළීමෙන් ද යන මේ ආදී ලක්ෂණයන් හෙන් ප්‍රසිද්ධවූ යයි දතයුත්තාහුය; **අභිලකිතා** යන මෙහි උපසර්ගී මාත්‍රය මැයි; එහෙයින් **අභිලකිතා**= ලකුණු කටයුතු වූ යන අර්ථයි; උපොෂිතසමාදාන ධර්මශ්‍රවණ චෛත්‍යසත්කාරාදිය කිරීම පිණිස ලකුණු කටයුතු වූ සැලකියයුතු වූ උපලක්ෂණ කටයුතු වූ යයි කියනලද්දේ වෙයි **චාතුද්දසි** යනු පක්ෂය පිළිබඳ පළමුවන දිනය පවත් තුදුස් දිනක් පුරන් නිවූ එක් රැයකි; **පඤ්චදසි අෂ්ටමී** යනු ද මෙසේයි; **පකඛස්ස**= ශුක්ල පක්ෂයාගේ ද කෘෂ්ණපක්ෂයාගේ ද; මොවුහු තුනක් තුනක් කොට රැසයක් වෙති; එහෙයින් සියලු තැන්හි "පකඛ" වචනය යෙදිය යුතුයි, පක්ෂය පිළිබඳ තුදුස්වක පක්ෂය පිළිබඳ පසළොස්වක පක්ෂය පිළිබඳ අවවක යයි කියයි. වැලි විසේනිය කුමකින් නො ගන්නා ලදද යත්? සාර්කාලික නොවන හෙයිනි; භාග්‍යවත් සර්ව්‍වඥයන් නුපන් කල්හි ද ඉපිද නො පිරිනිවි කල්හි ද පඤ්චමී (විසේනිය) ලකුණු නො කරන ලද්දීමැයි;

පිරිනිවි කල්හි වනාහි ධර්මසඞ්ග්‍රාහක සථවිරයන් වහන්සේ ධර්මශ්‍රවණය කලකින් වේ යයි සිතූහ; ඉක්බිති "පඤ්චමී" යයි සම්මතකොට ධර්මශ්‍රවණ දිනයක් තැබූහ; එතැන් පටන් හෝ (විශේෂිය) ලකුණු කරන ලද්දී වූවා යයි මෙසේ අසාළිකාලික හෙයින් මෙහි නො ගන්නා ලද්දී යයි දත යුතු. **තථාරූපාසු**= එබදු වූ; **ආරාමවෙතියානි**= පුෂ්පාරාම ඵලාරාමාදීහු; ආරාමයෝ ම "ආරාමවෙතිය" නම් වෙති; ඒ එසේමැයි- චිත්තීකාරාඛ්‍යයෙන් ඔවුහු "වෙතිය" යි කියනු ලැබෙත්, පූජනීයාඛ්‍යයෙනැයි කියනලද වෙයි; **වනවෙතියානි**= බලිහරණය කරන වනලැහැබ් සුභග වන දෙවඟාල වනාදිවූ වනයෝ ම "වනවෙතිය" නම් වෙති; **රුක්ඛවෙතියානි**= ගම් නියම්ගම් ආදීන්ගේ වාරයන්හි පිදියයුතු වෘක්ෂයෝ ම "රුක්ඛවෙතිය" නම් වෙති; සැබව- ලෝවැසියෝ දෙවියන් විසින් අරක් ගන්නා ලද්දාහු යයි සිතමින් හෝ ඒ ආරාමාදීන් කෙරෙහි ම දෙවියනැයි යන සංඥ ඇතිව හෝ ආරාම වනවෘක්ෂයන් සිත්හිලා සලකති පුදති එහෙයින් ඒ සියල්ලෝම "වෙතිය"ය යි කියනු ලැබෙත්; **භිංසනකානි**= භය උපදවන්නාවූ; දක්නහුට ද අසන්නහුට ද භය උපදවත් (යයි සේසි) **සලෝම හංසානි**= පිවිසෙන කල්හි ම රොමොද්ගමය උපදවන හෙයින් රොමොද්ගමය සමග ම පවතිත්; **අපෙපවනාම පයෙසෙය්‍යං**= ඒ භය භාභයානක අරමුණ දක්නෙම් නම් ඉතා මැනවැයි; **අපරෙන සමයෙන**= "එතදහොසි යනනූනාහං" යි මෙසේ සිතූකාලයෙන් අන්‍යකාලයෙක්හි; **තඤ්ච මෙ බ්‍රාහ්මණ විහරතො**= එබදු වූ සෙනසුන්හි; (කොබදු වූ ද යත්?) යම් යම් තැනක් ඕනිසුන්ගේ අයැදීමට පුදකිරීමට යොග්‍යවූ යක්ෂ සථානයක් වේද මල් දුම් මස් ලේ වුරුණු මෙදස් බඩ දිවි පපු ආදියෙන් විසුරුවීමෙන් තෙත්වූ පොළෝතලය ඇත්තේ ද යක්ෂ රාක්ෂස පිශාචාදීන්ගේ අසහාය පැන්හලක් මෙන් වූයේ ද යම් තැනක් දුවල්හිදු දක්නවුන්ගේ ළය පලන්නාක් මෙන් වේ ද ඒ සථානය සඳහා කිහ- **තඤ්ච මෙ බ්‍රාහ්මණ විහරතො** යි; **මඟො වා ආගවජ්ජති**= අං හෝ කුර හෝ කොටමින් ගෝණ කඟවේණ දිවි හූරු ආදි හෙද ඇති මෘගයෙක් හෝ එයි; සියලු සිව්පාවුන්ට ම මෙහි "මඟ" යි නමකි; කිසිතැනක වනාහි කාණඟාගාල ද ('මඟ' යයි කියනු ලැබේ. කියේ මැනු-

"මඟ" ශබ්දය.

61. "උසභසෙව තෙ බන්ධො සිහසෙව විජම්භිතං
මිගරාජ! නමො තෘත්ථු අපි කිඤ්චිලභාමසෙ" යි.

---

61. **තෙ**= ඔබගේ; **බන්ධො**= සකන්ධය; **උසභස්ස ඉව**= වෘෂභයෙකුගේ මෙනි; **විජම්භිතං**= විජෘම්භණය; **සිහස්ස ඉව**= සිංහයෙකුගේ මෙනි; **මිගරාජ!**= මෘගරාජය; **තෙ**= ඔබට; **නමො**= (මාගේ) නමස්කාරය; **අත්ථු**= වේවා; **කිඤ්චි**= කිසිවක්; **ලභාම සෙ**= ලබන්නෙමු නම්; **අපි**= මැනවි.

මොරෙ වා කඤ්චං පාතෙති= මයූරයෙක් හෝ වියලිදරකඩක් රැකින් මෙසේලවා හෙලයි; "මොර" ග්‍රහණයෙන් ද මෙහි සියලු පක්ෂීන්ගේ ගැනීම අදහස්කරනලදී; එහෙයින් යම්කිසි පක්ෂියෙකැයි කියනලද්දේ වෙයි; නොහොත් "මොරෙ වා" යි වා ශබ්දයෙන් අන් කිසි පක්ෂියෙක් හෝ යයි (කියනලදී;) පූර්‍වයෙහි "මග" ශබ්දයාගේ ගැනීමෙහි ද මේ ක්‍රම යයි; **වාතෙ වා පණ්ණසටං එරෙති**= වාතය හෝ කොළ කසළ සටයි; **එතං ත්‍වුන තං භයභෙරවං ආගච්ඡති**= මේ යමක් පැමිණේ ද නිශ්චයෙන් එය භයානක අරමුණකි; මෙතැන් පටන් ද ආරම්මණය ම "භයභෙරව" යයි දතයුතුයි, සවලප වූ ද අධිමාත්‍ර වූ ද භයට ආරම්මණ වන හෙයිනි; සැප අරමුණු කොට ඇති රූපය සැපය මෙනි. **කිනාහු බොහං අඤ්ඤදත්ථු භයපාටිකඞ්ඛී විහරාමි**= මම වනාහි කුමනකරුණකින් එකාන්තයෙන්ම භය ප්‍රාර්‍ථනාකරන්නෙක් කැමති වන්නෙක්ව වාසය කෙරෙමි ද; **යථා භූත යථාභූතස්ස**= යම් යම් ඉරියව්වකින් සිටියා වූ පවත්නාවූ සමන්විතවූ හෝ; **මෙ**= මාගේ සම්පයෙහි; **තථාභූත තථාභූතොව** යනු ඒ ඒ ඉරියව්වෙන් ම සිටියෙම් පවත්නෙම් සමන්විත වූයෙම් හෝ යන අර්‍ථයි; **සො බොහං** -පෙ- **පවිවිනෙමි** යනු සක්මන් කරන්නාවූ බෝසත්හට වනාහි එහි මූවන්ගේ අංකුර ශබ්දාදි හෙද ඇති භයභෙරවාරම්මණයක් පැමිණි කල්හි මහසත් තෙම නො ම සිටියි, නො හිඳියි, නොනිදයි වැලි සක්මන් කරමින් ම හාත්පසින් විමසන්නේ හාත්පසින් සොයන්නේ භයභෙරවයක් නො දකි; එය මූවන්ගේ අංකුර ශබ්දාදි මාත්‍රයක් ම වෙයි; හෙතෙම ඒ දැන තෙල මේ නම්? භයභෙරවයක් නො වේ යයි අනතුරුව සිටියි, හෝ හිඳී හෝ ශයනය හෝ කෙරෙයි; මේ අර්‍ථය දක්වන්නාහු **සො බොහං** යනාදිය වදාළහ. සියලු පෙය්‍යාලයන්හි මේ ක්‍රම යයි.

මෙයින් මත්තෙහි ද ඉරියව් පිළිවෙළින් නො කියා ආසන්නපරිපාටියෙන් ඊර්‍ෂ්‍යාපථයෝ කියන ලද්දාහු යයි දතයුත්තාහුය. ඒ එසේමැයි– සක්මන් කරන්නහුට ඒ භයභෙරවය පැමිණිකල්හි නො සිටියේ නොහුන්නේ නො නිපන්නේ සිටියහුට ද පැමිණිකල්හි සක්මන් නො කෙළේ යයි මෙසේ ඒ ඒ ඉරියව්වට ආසන්න පරිපාටියෙන් කියන ලද්දාහු යයි. මේසේ භයජනකවූ ද සථානයන්හි තමහට භය හා භයානක අරමුණු නැතිබව දක්වා මෙවිට ධ්‍යානයින්ගේ සම්මූඪසථානයන්හි තමන් වහන්සේගේ අසම්මූඪ (= නොමුළා) විහරණ දක්වන්ට **සන්ති බො පන බ්‍රාහ්මණ!** යනාදිය වදාළහ. එහි **සන්ති**= ඇත්තාහුය විද්‍යමාන වෙත් ලැබෙත්; **රත්තිං යෙව සමානං**= රාත්‍රිකාලය ම ඇත්තේ; **දිවාති සඤ්ඤා නන්ති**= මේ දවාල යයි හඳුනත්; **දිවායෙව සමානං**=දවල්කාලය ම ඇත්තේ; **රත්තිති සඤ්ඤානන්ති**= මෝ රාත්‍රිය යයි හඳුනත්; කුමක් හෙයින් වනාහි මොවුහු මෙබඳු සංඥ ඇත්තාහු වෙත්ද යත්? උත්‍පාත කෞශල්‍යය නැති බැවින් හෝ පක්ෂීන්ගේ නාදයෙන් හෝ යි; කෙසේ ද? මෙලොව එකෙක් අවදාත කෘත්සනලාභීවූයේ දවල් පිරියම් කොට දවල්

සම්වන්නේ දහවල් ම නැගිසිටිමිසි මෙනෙහි කිරීම උපදවයි, එතකුදු වුවත් කල් පිරිසිඳීමෙහි නො ද දක්ෂවෙයි; හෙතෙම දවල් කාලය ඉක්මවා රාත්‍රිභාගයෙහි නැගිසිටියි. එතකුදු වුවත් අවදාන කෘත්සනසඤ්ඤා වශයෙන් ඕහට නිමිල වෙයි, ප්‍රකට වෙයි, අතිශයින් ප්‍රකට වෙයි; හෙතෙම "දහවල් නැගිටිමිසි" උපදවනලද මනසිකාර ඇති බැවින් ද අවදාන කෘත්සනසඤ්ඤා යෙන් නිමිල ප්‍රකට වූ බැවින් ද රාත්‍රිය ම දහවල් යයි දනගනී; මෙලොව එකෙක් වනාහි නීලකෘත්සනා ලාභීවූයේ රාත්‍රියෙහි පිරියම් කොට රාත්‍රියෙහි (සමවතට) සමවන්නේ රාත්‍රියෙහි ම නැගිසිටිමිසි සිතිවිලි උපදවයි, එතකුදුවුවත් නො ද කාලපරිච්ඡේදයෙහි දක්ෂවූයේ වෙයි; හෙතෙම රාත්‍රිය ඉක්මවා දිවාභාගයෙහි නැගී සිටියි; එතකුදු වුවත් නීලකෘත්සනසඤ්ඤා වශයෙන් ඕහට අවිසදවෙයි, අප්‍රකට වෙයි; හෙතෙම රාත්‍රියෙහි නැගිටිමිසි උපදවනලද සිතිවිලි ඇතිබැවින් ද නීලකෘත්සනසඤ්ඤා යෙන් අවිසද අප්‍රකටවූ බැවින් ද දහවල් ම රාත්‍රිය යයි දනගනී; මෙසේ වනාහි උත්ථාන කෞශල්‍යය නැති බැවින් මෙබදු සංඥ ඇත්තාහු වෙති. පක්ෂිනාදයෙන් වනාහි මෙලොව එකෙක් ඇතුලු සෙනසුන්හි හුන්නේ වෙයි; ඉක්බිත්තෙන් දිවාකාලයෙහි හඬන කවුඩු ආදි පක්ෂීහු චඤ්චාලෝකයෙන් දහවල් යයි සිතමින් හෝ අන්‍ය කාරණ යන්ගෙන් හෝ රාත්‍රියෙහි නාදකරත්; හෙතෙම ඔවුන්ගේ ශබ්දය අසා රාත්‍රිය ම දහවල් යයි දනගනී; යලි මෙලොව එකෙක් ගල්අතරෙහි ගැඹුරුවූ ඝනවූ වනයෙන් වැසුනු හල්ගුහාවෙක්හි සප්තාහවද්දලිකා පවත්නා කල්හි අතුරුදහන්වූ ඉරළුලිය ඇතිකල්හි හුන්නේ වෙයි; එකල්හි රාත්‍රියෙහි හඬන මහමුහුණු ආදි පක්ෂීහු මධ්‍යාහ්නකාලයෙහි ද ඒ ඒ තැන්හි සම්වූ අන්ධකාරයෙහි සැඟවුනාහු රාත්‍රි සංඥයෙන් හෝ අන් කරුණු වලින් හෝ හඬත්; හෙතෙම ඔවුන්ගේ ශබ්දය අසා දහවල් ම වූයේ රාත්‍රිය යයි දනගනී; මෙසේ පක්ෂීන්ගේ නාදයෙන් මෙබදු සංඥ ඇත්තාහු වෙත් යයි.

ඉදමහං යනු ඉදං + අහං (= මම මේ) මෙසේ දනගැනීම; **සමෙමාහ විහාරඤ්ඤං වදෑමි** යනු සම්මුඛ විහාර පරිණාමයට පත්වූවක් ඇතුලත් වූවක් එක්තරා මූලාවිහරණයක් යයි කියමිසි කියනලද්දේ වෙයි; **අහං බො පන බ්‍රාහ්මණ!** —පෙ— **සඤ්ඤානාමි** යනු බෝසත්හට රෑ දවල් පිරිසිඳීම ප්‍රකටය, සත්තාහවද්දලිකා ඇතිකල්හි ද සඳහිරු නො දක්නා කල්හි ද මෙතෙක් පෙරබත්කාලය ගියේය, මෙතෙක් පසුබත්කාලය ගියේය, මෙතෙක් පෙරයම ගියේය, මෙතෙක් මැදියම ගියේ යයි දනගනීමැයි! එහෙයින් මෙසේ වදළහ. පිරූ පැරැම්ඇති බෝසත් තෙම මෙසේ දනගනී යන යමක් ඇද්ද මෙය ආශ්චර්‍යයක් නො වෙයි; යම් හෙයකින් ප්‍රාදේශඥානයෙහි සිට ශ්‍රාවකයන්ට ද රාත්‍රිඳිව පරිච්ඡේදය ප්‍රකටවේද එහෙයිනි;

ගොදත්ත තෙරවත්ථ.

කැලණි මහ වෙහෙර වනාහි "ගොදත්ත" තෙරණුවෝ දෑහුල් කල්හි බත් ගෙන අහුල්කාලයෙහි වළඳති; හිරු නො පෙනෙන කල්හිදු උදෑසන ම සෙනස්නට පිවිස ඒ වෙලායෙහි නික්මෙති; දිනක් ආරම්භකයෝ සෙට තෙරුන් නික්මෙන කාලය දක්නොමූ යසි බත් සමපාදනය කොට කල් වැඹුණුල්හි හුන්හ; තෙරුන් වහන්සේ දෑහුල් කාලයෙහි ම නික්මුනු සේක; එතැන් පටන් හිරු නො පෙනෙන කල්හි ද තෙරුන් නික්මෙන ලකුණෙන් ම බෙරය පහරති.

කාළදෙව තෙරවත්ථ.

වජගරගිරි විහාරයෙහි ද කාළදෙව තෙරුන් වහන්සේ අතැවස ආමගණ්ඩිකය ගසනසේක. මෙය තෙරුන් විසින් පුරුදුකරන ලද්දේය; නො ද යාමයන්ත්‍රනාඞිකා (=පැතැටිය) යොදති; අන්‍ය භික්ෂූහු යොදති; එකල පෙරයම නික්මුනු කල්හි තෙරුන් මුහුර ගෙන සිටිකල්හි ම හෝ එක් දෙවරක් ගසනකල්හි ම හෝ යාමයන්ත්‍රය වැටෙයි; මෙසේ තුන්යම්හි මහණදම් කොට තෙරණුවෝ උදෑසන ම ගමට පිවිස පිණ්ඩපාතය ගෙන වෙහෙරට අවුත් බොදුන්හල්හි පය තබා දිවාවිහාරස්ථානයට ගොස් මහණදම් තෙරෙති; භික්ෂූහු කාලස්ථමභය දැක තෙරුන් ඊම පිණිස යවත්; ඒ ගිය මහණ තෙරුන් දිවාවිහාරස්ථානයෙන් නික්මෙන්නහු ම හෝ අතරමහ හෝ දකී, මෙසේ ප්‍රාදෙශඥානයෙහි සිටියාවූ ශ්‍රාවකයන්ට ද රෑ දුවල් පිරිසිදීම ප්‍රකටවූයේ වෙයි, බෝසතුන්ට කියනු කිමැයි.

යං බොතං –පෙ– **වදෙය්‍ය** යන මෙහි වනාහි බමුණ! ඒ යමෙක් උදෙසා "අසමෙමාහධම්මෙමා සත්තෙතා ලොකෙ උපපන්නෙතා –පෙ– සුඛාය දෙවමනුස්සානං" යන වචනය කියන්නාවූ කිසිවෙක් මනාකොට කියන්නේ නම් මනාකොට කියන්නේ වන්නේ ද මෘෂා නො කියන සුලුවූයේ වන්නේ ද මා උදෙසා ම ඒ වචනය කියන්නේ මනාකොට කියන්නේය මනාකොට කියන්නෙක් වන්නේය මෘෂා නො කියන සුලුවූයේ වන්නේ යයි මෙසේ පදසම්බන්ධය දතයුත්තේය. එහි **අසමෙමාහ ධම්මෙමා**= නො මුළාවන සුභාව ඇත්තේ; **ලොකෙ**= මනුෂ්‍ය ලොකයෙහි; **බහුජන හිතාය**= ප්‍රඥාසම්පත්තියෙන් දෘෂ්ටධාර්මික සාම්පරායික හිතොපදේශක වූයේ නුයි බොහෝ දෙනාට හිත පිණිස; **බහුජනසුඛාය**= ත්‍යාගසම්පත්තියෙන් උපකරණසුඛ දානය කරන්නේ නුයි බොහෝ දෙනාට සැප පිණිස; **ලොකානුකම්පාය**= මෛත්‍රීකරුණා සම්පත්තියෙන් මවු පියන් මෙන් ලොකයා රක්නේ ගොපනය කරන්නේනුයි ලොකයාහට අනුකම්පා පිණිස; **අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං** යන මෙහි දිව්‍ය මනුෂ්‍ය ග්‍රහණයෙන් භව්‍ය පුද්ගලයන් වූ වෛනෙය සත්ත්වයන් ම ගෙන ඔවුන්ගේ නිර්වාණමාර්ග ඵලාධිගමය පිණිස, තමන් වහන්සේගේ උත්පත්තිය දක්වන සේකැයි දතයුත්තේය. ඒ එසේමැයි– **අත්ථාය** යි කිකල්හි පරමාර්ථය පිණිස නිර්වාණය පිණිස යයි කියනලද වෙයි; **හිතාය**

යි කිකල්හි ඊට පමුණුවන මාගීය පිණිස යයි කියනලද වෙයි; සම්හෙය කින් නිවනට පමුණුවන මාගීයෙන් මත්තෙහි කිතයක් නම් නැත්ද එහෙයිනි; **සුඛාය** යි කිකල්හි පලසමවත් සුවය පිණිස යයි කියනලද වෙයි; එයින් මත්තෙහි සැපයක් නැති හෙයිනි; මේ වදුරන ලද්දේ ද වෙයි- **අයං සමාධි පච්චුප්පන්නසුඛෝ චෙව ආයතිඤ්ච සුඛවිපාකෝ** යි මෙසේ භාග්‍යවත්හු බුඩගුණ ප්‍රතිලාභය අවසන් කොට තමන් වහන්සේගේ නො මුළා විහරණය බමුණාහට දක්වා මෙවිට යම් ප්‍රතිපදාවකින් ඒ කොටිප්‍රාප්ත වූ අසමෙමාහ විහරණයට පැමිණියේ ද ඒ ප්‍රතිපදාව පූර්ව භාගයෙහි පටන් දක්වන්ට **ආරඛං ඛෝ පන මෙ බ්‍රාහ්මණ!** යනාදිය වදුළහ. කිසිවෙක් වනාහි මෙසේ කියති; "මේ අසමෙමාහ විහාරය අසා බමුණාට මෙබදු සිතක් උපන්නේය, කිනම් ප්‍රතිපදාවකින් මිට පැමිණියේ ද? යි ඔහුගේ සිත දැන මම මේ පිළිවෙතින් මේ උතුම්වූ අසමෙමාහ විහරණයට පැමිණියෙමි" යි දක්වනසේක් මෙසේ වදුළසේකැයි;

එහි ආරඛං ඛෝ පන මෙ බ්‍රාහ්මණ! විරියං අහොසි යනු බමුණ! මේ උතුම්වූ අසමෙමාහ විහාරය තෙම කුසීතවූ මුළාසිහිඇති දරථසහිත වූ කය ඇති විසුරුනු සිත් ඇත්තාවූ හෝ මා විසින් නො ලබන ලද්දේය; වැලිදු ඊට පැමිණීම පිණිස මා විසින් වීර්‍යය පටන්ගන්නා ලද්දේ විය; බෝමැඩ සමීපයෙහි හුන් මා විසින් චතුරඞ්ගවීර්‍යය පටන්ගන්නා ලද්දේ දැඩිකොට ගන්නාලද්දේ නො ලිහිල්ව පවත්වනලද්දේ වූයේ යයි කියන ලද වෙයි; මා විසින් ඒ වීර්‍යය ආරබධ බැවින් ම නො සැඟවුනේ විය; **උපට්ඨිතා සති අසම්මුට්ඨා**= හුදෙක් වීර්‍යයම නො ද වෙයි, මාගේ සිහිය ද අරමුණට අභිමුඛ භාවයෙන් එලඹසිටියා වෙයි; එලඹසිටි බැවින් ම නො මුළාවූවා වෙයි; **පස්සඩ්ඩෝ කායෝ අසාරඩ්ඩෝ**= කායචිත්ත ප්‍රශ්‍රබ්ධි සමඟ වයෙන් මාගේ කය ද බරඇරුනේ විය; එහි යම්හෙයකින් නාමකාය ප්‍රශ්‍රබධ (=බරඇරුන) කල්හි රූපකාය ද ප්‍රශ්‍රබධවූයේ ම වේ ද එහෙයින් නාමකායය රූපකාය යයි නො වෙසෙසා ම "පස්සඩ්ඩෝ කායෝ"යි කියන ලදී. **අසාරඩ්ඩෝ** යනු හෙද වනාහි ප්‍රශ්‍රබ්ද බැවින් ම අසාරඩය පහවූ දරථ ඇත්තේ යයි කියනලද්දේ වෙයි; **සමාහිතං චිත්තං එකග්ගං**= මාගේ සිත ද මනාකොට පිහිටියේය මොනොවට තබනලද්දේය අජීර්ණවව පමුණුවන ලද්දක් මෙන් විය; මනාකොට පිහිටුවනලද බැවින් ම එකඟවූයේය, අවලවූයේය, සැලීම්රහිත වූයේ යයි; මෙතෙකින් ධ්‍යාන යාගේ පූර්වභාග ප්‍රතිපදා තොමෝ කියනලද්දී වෙයි. මෙවිට මේ ප්‍රතිපදා වෙන් අධිගත වූ ප්‍රථමධ්‍යානය ආදි කොට විදර්‍ශනය අවසන් කොට ඇති විශේෂය දක්වනසේක්- **සෝ ඛෝ අහං** යනාදිය වදුළහ.

සතර ධ්‍යානය.

එහි **විවිච්චෙව කාමෙහි** -පෙ- **චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහාසිං** යන මෙහි වනාහි යමක් කියයුතු වන්නේ ද ඒ සියල්ල විශුඩිමාගීයෙහි පෘථිවී කෘත්ස්න කථාවෙහි කියන ලද්දේය; හුදෙක් එහි **උපසම්පජ්ජ විහරති** යි ආයේය, මෙහි **විහාසිං** යි ආයේය මෙය ම විශෙෂය වෙයි; භාග්‍යවත්හු කුමක්

කොට මේ ධ්‍යානයන්ට පැමිණ විසුසේක් ද යත්? කර්මස්ථාන භාවනා කොට ය. කවර කර්මස්ථානයක් ද යත්? ආනාපානසතිකර්මස්ථානය ය; යලි මේ සතරධ්‍යානයෝ කිසිවෙකුට චිත්තෛකාග්‍රතාවය පිණිස වෙති; කිසිවෙකුට විදර්ශනාපාදක වෙති; කිසිවෙකුට අභිඥාපාදක වෙති; කිසිවෙකුට නිරෝධපාදක වෙති; කිසිවෙකුට භවාවක්‍රමණය පිණිස වෙති; ඔවුනතුරෙහි ක්ෂීණාශ්‍රවයන්ට චිත්තෛකාග්‍රතාවය පිණිස වෙති; ඒ එසේමැයි– ඔවුහු සමවැද එකහසින් ඇත්තාහු සුවසේ දවස වාසය කරන්නෙමුයි මෙසේ කිසුණු පිරියම් කොට අටසමවත් නිපදවති; ශෛක්ෂ පෘථග්ජනයන්ට සමවතින් නැගිසිට එකහවූ සිතින් විදර්ශනා කරන්නෙමුයි නිපදවන්නවුන්ට විදර්ශනාපාදක වෙති; යමෙක් වනාහි අටසමවත් නිපදවා අභිඥාපාදක ධ්‍යානයට සම්වැද සමවතින් නැගිසිට **එකොපි හුත්වා බහුධා හොති** යි කියනලද නයඇති අභිඥාවන් ප්‍රාප්තිය කරන්නාහු නිපදවති; ඔවුනට අභිඥාපාදක වෙති; යම් කෙනෙක් අට සමත් උපදවා නිරෝධ සමාපත්තියට සම්වැද සතියක් අවිත්තකව දිටු ධැම්හි ම නිරෝධ සඞ්ඛ්‍යාත නිවනට පැමිණ සුවසේ වාසය කරන්නෙමුයි නිපදවත් ද ඔවුනට නිරෝධ පාදකවූවාහු වෙති; යම් කෙනෙක් වනාහි අටසමවත් නිපදවා නො පිරිහුනු දැහැන් ඇත්තමෝ බඹලොව උපදින් නෙමුයි නිපදවත් ද ඔවුනට භවාවක්‍රමණය පිණිස වෙති; භාග්‍යවතුන් විසින් වනාහි මේ චතුර්ථධ්‍යානය බෝරුක්මූලදී නිපදවන ලද්දේය; එය උන්වහන්සේට විදර්ශනාපාදකද විය, අභිඥාපාදක ද, සම්කෘත්‍යසාධක ද විය; සියලු ලොව් ලොවුතුරා ගුණදායක වූයේ යයි ද දතයුතුයි. යම් ගුණ කෙනෙකුත් ගෙනදුන්නේ වීද ඔවුනතුරෙන් එකදෙසයක් දක්වනසේක් **සො එවං සමාහිතෙ චිත්තෙ** යනාදිය වදාළහ.

එහි (පූර්වේනිවාස දිව්‍ය චක්ෂු යන) විද්‍යාවන්ගේ පදනුවණි භාවිද්‍යාව. නාව ද භාවනාඥාන ද විශුද්ධිමාර්ගයෙහි විස්තරකරන ලද්දේය හුදෙක් එහි **සො එවං සමාහිතෙ චිත්තෙ** –පෙ– **අභිනිනන්නාමෙති** යි කියනලදී; මෙහි **අභිනිනන්නාමෙසිං** යි කියනලද; **අයං බො මේ ධම්මාභිසමයෝ** යන මේ ධ්‍යානාභිසමය ද එහි නො ආයේ යයි මෙය ම විශෙෂ යයි. එහි **සො** යනු ඒ මම; **අභිනිනන්නාමෙසිං**= එලවීමි; **අභිනිනන්නාමෙසිං** යන වචනයෙන් ද; **සො** යන මෙහි "ඒ මම" යයි මෙසේ අර්ථය දතයුත්තේය. තවද යම් හෙයකින් භාග්‍යවතුන් වහන්සේගේ වශයෙන් මේ පූර්වේනිවාසානුස්මෘතිඥානය ආයේද එහෙයින් **සො තතො චුතො ඉධූපපන්නො** යි මෙහි මෙසේ යොජනා දතයුත්තීය. යම්හෙයකින් මෙහි **සො තතො චුතො** යනු පෙරලා නවත්න හුගේ ප්‍රත්‍යවෙක්ෂාව වේද, එහෙයින් **ඉධූපපන්නො** යනු මේ මෙහි උත්පත්තියට අනතුරුව; (යනු අර්ථයි;) **අමුත්‍ර උපපාදිං** යනු තුෂිත භවනය සඳහා

වදුලහ සි දතයුත්තේය. **තත්‍රාපාහිං එවනනාමෝ**= ඒ තුෂිත භවන යෙහි ද "සෙතකෙතු" නම් දිව්‍යපුත්‍රයා වීම්; **එවං ගොතෙනා**= ඒ දෙව කාවුන් සමග **සමාන** ගොත්‍ර ඇත්තෙම්; **එවං වණ්ණා**= සවණ්ණවණ්වූ යෙම්; **එවමාහාරෝ**= දිව්‍යසුධාහාර ඇත්තෙම්; **එවං සුඛදුක්ඛ පටිසංවෙදී**= මෙසේ දිවසුව විඳිනසුලු වූයෙම්; දුක වනාහි සංසකාරයන්ගේ දුඃඛ මාත්‍රයෙක් මැයි. **එවමායු පරියනෙනා**= මෙසේ සත්පණස් කෙළ සැටලක්ෂයක් අවුරුදු ආයුඇත්තෙම් වීම්; **සෝ තනෝ චුනෝ**= ඒ මම ඒ තුෂිත භවනයෙන් චුතවූයෙම්; **ඉධූපපනෙනා**= මේලෙවිහි මහාමායා දෙවියගේ කුසෙහි උපන්නෙම් වීම්; **අහං බෝ මෙ බ්‍රාහමණ!** ඝනාදි යෙහි; **මෙ**= මා විසින්; **විජ්ජා**= විදිත කරණාර්ථයෙන් විද්‍ය නමු; කුමක් විදිත කෙරේ ද යත්? පූර්වේනිවාස යයි; **අවිජ්ජා**= ඒ පූර්වේනිවාසය (= පෙර විසූ කඳපිළිවෙළ) සම්බන්ධවූ ම අවිදිත කරණාර්ථයෙන් එය ප්‍රතිච්ඡාදනය කරන්නාවූ මොහය කෙම (අවිද්‍යා සි) කියනු ලැබේ; **තමෝ**= ඒ මොහය ම ප්‍රතිවච්ඡාදකාර්ථයෙන් තමස් යයි කියනුලැබේ; **ආලොකෝ**= ඕ විද්‍යාතොමෝ ම අවභාස කරණාර්ථයෙන් ආලොක යයි කියනු ලැබේ; මෙහිදු විජ්ජාඅධිගතා (= විද්‍යා තොමෝ ලබන ලද්දීය) යන මේ අර්ථයි; සෙස්ස ප්‍රශංසා වචනයි; මෙහි යොජනා වනාහි "මා විසින් මෝ විද්‍යා තොමෝ ලබන ලද්දීය, ලබනලද විද්‍යා ඇත්තා වූ ඒ මා විසින් අවිද්‍යා තොමෝ නසන ලද්දීය, විශෙෂයෙන් නසන ලද්දීය යන අර්ථයි; කුමක් හෙයින් ද? යම් හෙයකින් විද්‍යා තොමෝ උපන්නී ද එහෙයිනි. සෙසු දෙපදයෙහි ද මේ ක්‍රම යයි. **යථා නං** යන මෙහි **යථා** යනු උපමායෙහි වේ; **නං** යනු නිපාතයෙක; සමාහියගේ අවිප්‍රවාසයෙන් **අපපමත්තස්ස** (=අප්‍රමාද වූවහුට;) වීර්‍ය්‍ය නමැති අච්චෙන්; **ආතාපිනෝ** (= තැවෙන සුලු වූවහුට; කෙලෙසුන් තවන වීර්‍ය්‍ය ඇත්තහුට යයි යූසේ.) කයෙහි ද ජීවිතයෙහි ද අපෙක්ෂාරහිත බැවින් **පහිතත්තස්ස** (=නිවනට මෙහෙයන ලද සිත් ඇත්තහුට,) ඔරිනලද සිත් ඇත්තහුටය යන අර්ථයි; මේ කියන ලද්දේ වෙයි- අප්‍රමත්තව කෙලෙසුන් තවන වීර්‍ය්‍ය ඇතිව ඔරිනලද සිත් ඇතිව වාසයකරන්නෙකු විසින් අවිද්‍යා තොමෝ යම්සේ නසනු ලබන්නේ ද විද්‍යා තොමෝ යම්සේ උපදවනු ලබන්නේ ද මොහඝඩ්ඛ්‍යාතතමස නසනු ලබන්නේ ද ආලොකය උපදවනු ලබන්නේ ද එපරිද්දෙන් මා විසින් අවිද්‍යා තොමෝ නසනලද්දීය, විද්‍යාව උපන්නීය, තමස නසන ලද්දේය ආලොකය උපන්නේය ප්‍රධාන්වීර්‍ය්‍යයෙහි යෙදුනාවූ මේ මා විසින් (වීර්‍ය්‍යයව) අනුරූපවූ ම ඵලය ලබනලද්දේ යයි.

පූර්වේනිවාස කථා නිමි.

චුතිඋපපත්ති කථාවෙහි යම් හෙයකින් මෙහි භාග්‍යවතුන් වහන්සේගේ වශයෙන් පෙල ආවාද එහෙයින් **පස්සාමි ජානාමි** යි වදාරන ලදී; මේ වෙනසි. සෙස්ස විශුද්ධිමාර්ගයෙහි කියනලද්දට සමාන මැයි. මෙහි වනාහි **විජ්ජා** යනු දිව්‍යචක්ෂුර්ඥාන විද්‍යාවයි; **අවිජ්ජා** යනු සත්ත්වයන්ගේ චුතිප්‍රතිසන්ධි ප්‍රතිවිජ්ධාදනය කරන්නීවූ අවිද්‍යාවයි; සෙස්ස සියි ක්‍රමය මැයි. යම් හෙයකින් පිරූ පැරැම් ඇති මහසත්වයන්ගේ පරිකර්ම කෘත්‍යයක් නම් නැත්තේ ද යම් හෙයකින් ඔවුහු සිත නැමූ ඇසිල්ලෙහිම අනේකප්‍රකාර වූ පෙරවිසූ කඳපිළිවෙළ සිහිකෙරෙත් ද දිවඇසින් සත්ත්වයන් දකිත් ද; එහෙයින් එහි පරිකර්මය ආදිකොට යම් භාවනාක්‍රමයක් කියනලද්දේ ද එයින් මෙහි ප්‍රයොජනයක් නැත් යයි.

තුන්වැනි විද්‍යාවෙහි **සො එවං සමාහිතෙ චිත්තෙ** යි විදර්ශනාපාදකවූ චතුර්ධ්‍යාන චිත්තය දතයුතු; **ආසවානං ඛයඤාණාය**= අර්හත්මාර්ගඥානය පිණිස; ඒ එසේමැයි– අර්හත්මාර්ගය තෙම ආශ්‍රවයන් විනාශකරන හෙයින් "ආසවානං ඛයො" (=ආශ්‍රවයන්ගේ ක්ෂය) යයි කියනු ලැබේ. ඒ ආශ්‍රවක්ෂයෙහි ද මේ ඥානය වෙයි, එහි ඇතුලත්වූ හෙයිනැයි; **චිත්තං අභිනීහාරක්ඛමති**= විදර්ශනා චිත්තය එලවිමි; **සො ඉදං දුක්ඛං** යන මේ ආදි තැන්හි මෙතෙක් දුකය මෙයින් වැඩියක් නැතැයි සියලු ම දුඃඛසත්‍යය රසලක්ෂණ සහිත ප්‍රතිවෙධයෙන් තත්වූ පරිද්දෙන් විශෙෂයෙන් අවබොධ කෙළෙමි, දැනගනිමි, ප්‍රතිවෙධ කෙළෙමි; ඒ දුඃඛයාගේ ද නිමිත්තක වූ තෘෂ්ණාව මේ දුඃඛසමුදය යයි ද ඒ (දුඃඛ දුඃඛ සමුදය යන) දෙක ම යම් තැනකට පැමිණ නිරුඛවේද ඒ ඔවුන්ගේ නො පැවැත්මවූ නිවන මේ දුඃඛනිරොධය යයි ද ඒ නිවනට ද පමුණුවන්නාවූ ආර්‍යාෂ්ටාංගික මෝ දුඃඛ නිරොධගාමිනී ප්‍රතිපදාව යයි ද සරසලක්ෂණ ප්‍රතිවෙධයෙන් තත්වූ පරිද්දෙන් විශෙෂයෙන් අවබොධ කෙළෙමි, දැනගනිමි, ප්‍රතිවෙධ කෙළෙමි' යි මෙසේ අර්ථය දතයුත්තේය. මෙසේ සවරූප වශයෙන් සත්‍යයන් දක්වා මෙවිට කෙලෙසයන්ගේ වශයෙන් පර්‍යායයෙන් දක්වනසේක් **ඉමෙ ආසවා** යනාදිය වදාළහ.

තස්ස මෙ එවං ජානතො එවං පස්සතො= මෙසේ දන්නාවූ මෙසේ දක්නාවූ ඒ මාගේ; විදර්ශනාව සමග කොටිප්‍රාප්ත වූ මාර්ගය වදාරති; **කාමාසවා**= කාමාශ්‍රවයෙන්; **විමුච්චිත්ථ** යන මෙයින් ඵලක්ෂය දක්වති; ඒ එසේමැයි– මාර්ගක්ෂණයෙහි සිත මිදෙයි; ඵලක්ෂණයෙහි මිදුනේ වෙයි;

ප්‍රත්‍යවෙක්ෂා ඥානය.

විමුත්තස්මිං විමුත්තමිති ඤාණං යන මෙයින් ප්‍රත්‍යවෙක්ෂා ඥානය දක්වති; **ඛීණා ජාති** යනාදියෙන් ඒ ප්‍රත්‍යවෙක්ෂා ඥානයාගේ භූමිය වදාරති; ඒ ඥානයෙන් ප්‍රත්‍යවෙක්ෂා කරන්නාවූ භාග්‍යවතුන් වහන්සේ "ඛීණා ජාති" යනාදිය දැනගත් සේක; භාග්‍යවතුන් වහන්සේගේ කිනම් ජාතියක් ක්ෂයවූවාද? එය කෙසේ දැනගත් සේක් ද යත්? උන්වහන්සේගේ ඉක්මුනු ජාති තොමෝ ක්ෂය නො වූවා වෙයි, පෙර ම ක්ෂයවූ හෙයිනි; අනාගත ජාතිය ද නො වෙයි, අනාගතයෙහි උත්සාහයක් නැති හෙයිනි;

පවත්නා ජාතිය ද නො වෙයි, විද්‍යමාන හෙයිනි; මාගීය නො වැඩූ බැවින් එකවතුපඤ්චවොකාර භවයන්හි එකවතුෘ පඤ්චස්කන්ධ සඞ්ඛ්‍යාත වූ යම් ජාතියක් උපදින්නී ද ඕ තොමෝ මාගීය වැඩූ බැවින් නූපදනා සුභාව ඇතිබවට පැමිණීමෙන් ක්‍ෂයවූ; ඒ භාග්‍යවත්හු මාගී භාවනා වෙන් ප්‍රහීණවූ කෙලෙශයන් ප්‍රත්‍යවෙක්ෂා කොට කෙලෙසුන් නැති කල්හි විද්‍යමානවූ ද ඒ කර්මය මත්තෙහි පිළිසඳ නො දෙන්නේ වේ යයි දන්නාහු දැනගත්සේක. **වුසිතං** යනු වැස නිමවන ලද්දේය, හාත්පසින් වැස නිමවන ලද්දේය, කරන ලද්දේය, හැසිරෙන ලද්දේය, නිමවන ලද්දේය යන අර්ථයි; **බ්‍රහ්මචරියං**= මාර්ග බ්‍රහ්මචරියාව; යම් හෙයකින් පෘථජ්ජන කල්‍යාණයා සමග සප්තඛෙක්ෂයෝ බඹසරවුස් වෙසෙත් නම් වෙත් ද; ක්ෂීණාශ්‍රවතෙම වැසනිමවනලද බඹසරවස් ඇත්තේද; එහෙයින් භාග්‍යවත්හු තමන් වහන්සේගේ බ්‍රහ්මචර්‍යා වාසය ප්‍රත්‍යවෙක්ෂා කරන්නාහු "වුසිතං බ්‍රහ්මචරියං" යි දැනගත්සේක. **කතං කරණීයං** යනු චතුස්සත්‍යයන්හි චතුර්මාගීයන්ගෙන් පරිඥ ප්‍රහාණ සාක්ෂාත්ක්‍රියා භාවනා වශයෙන් ෂොඩශවිධවූ කෘත්‍යය ම නිමවන ලද්දේය යන අර්ථයි. යම් හෙයකින් පෘථජ්ජන කල්‍යාණාදීහු ඒ සොළොස්කිස කෙරෙත් ද, ක්ෂීණාශ්‍රවතෙම කළ කටයුතු ඇත්තේද, එහෙයින් භාග්‍යවත්හු තමන් වහන්සේ විසින් කටයුතු ප්‍රත්‍යවෙක්ෂා කරන්නාහු "කතං කරණීයං" යි දැනගත්සේක. **නාපරං ඉත්ථත්තායා**= යනු මෙවිට යලි මෙබදුබව පිණිස හෝ මෙසේ ෂොඩශවිධ කෘත්‍යභාවය පිණිස හෝ කෙලෙස් ක්ෂයකිරීම පිණිස හෝ මාගී භාවනා කෘත්‍යයක් මට නැතැයි දැනගත් සේක; නොහොත් **ඉත්ථත්තායා**= මෙබදු භාවයෙන් මේ මෙබදු ප්‍රකාරයෙන් දැන් පවත්නාවූ **සකණ්ඩ පරම්පරාවෙන්** අන්‍යවූ සකණ්ඩ පරම්පරාවක් මට නැත, මේ පඤ්ච **සකණ්ඩයෝ වනාහි පරිඥතවූවාහු සුන්මුල්ඇති රුක් මෙන් සිටිති, ඔවුහු චරිම විඥානයාගේ නිරෝධයෙන් දරරහිත වූ ගින්නක් මෙන් නිවෙන්නාහු යැයි දැනගත් සේක; දැන් මෙසේ ප්‍රත්‍යවෙක්ෂා ඥානපරිගෘහිත වූ ඒ ආශ්‍රවක්ෂයඥානය බමුණාහට දක්වනසේක්- අයං බ්‍රෝ මේ බ්‍රාහ්මණ!** යනාදිය වදාළහ. **එහි විජ්ජා** යනු අර්හත්මාගීඥන විද්‍යාවයි; **අවිජ්ජා** යනු චතුස්සත්‍යය ප්‍රතිවේධාදනය කරන්නී වූ අවිද්‍යාවයි; සෙස්ස කි නයමැයි. මෙතෙකින් ද පූර්වේනිවාස ඥානයෙන් අතීතඥානය ද දිව්‍යචක්ෂුර් ඥානයෙන් ප්‍රත්‍යුත්පන්නානාගත ඥානය ද ආශ්‍රවක්ෂයකර ඥානයෙන් සියලු ලොකොත්තර ගුණය දැ'යි මෙසේ ත්‍රිවිද්‍යාවන්ගෙන් සියලු සර්ඥගුණයන් සඞ්ග්‍රහ කොට ප්‍රකාශකරන සේක් තමන් වහන්සේගේ නො මුළා විහරණය බ්‍රාහ්මණයාහට දැක්වූ සේක. මෙසේ වදාළ කල්හි බමුණු තෙම මෙසේ සිතී, "ශ්‍රමණ ගෞතම තෙමේ සර්ඥබව ප්‍රතිඥා කෙරෙයි, අද දක්වාත් අරණ්‍ය වාසය නොහරී, ඔහු විසින් කළයුතු අන් කිසිවකුත් ඇත්දැ" යි ඉක්බිති භාග්‍යවත්හු ඔහුගේ අදහස දැන මේ අධ්‍යාශයානුසන්ධියෙන් **ඔයා බ්‍රෝ පුන නෙ** යනාදිය වදාළහ.

එහි **සියා බෝ පන තෙ බ්‍රාහ්මණ! එවමස්ස**= බමුණ! කිසිවිටෙක නුඹට මෙසේ සිතක් වන්නේය; **න බෝ පනෙතං බ්‍රාහ්මණ! එවං දට්ඨබ්බං**= බමුණ! තා විසින් මාගේ මේ පන්තසෙනාසන සෙවනය කිරීම වනාහි ප්‍රහනොකළ රාගාදිය ඇති බැවිනැයි මෙසේ නො දත යුතුයි; මෙසේ වනකෙළවර සෙනසුන් සෙවනය කිරීමෙහි අකාරණය (= හෙතු රහිතබව) ප්‍රතික්ෂේපකොට කරුණු දක්වන සේක්– **මෙ බෝ අහං** යනා දිය වදාළහ. එහි අර්ථය ම "අත්‍රවස" නම් වේ; එහෙයින් **මෙ බෝ අහං බ්‍රාහ්මණ! අත්‍රවසෙ** යනු බමුණ! මම අර්ථ දෙකක් කරුණු දෙකක් දක්නෙමි යි කියන ලද වෙයි. **අත්තනෝ ච දිට්ඨධම්මසුඛ විහාරං** යන මෙහි "දිට්ඨධම්ම" නම් මේ ප්‍රත්‍යක්ෂවූ ආත්මභාව යයි; "සුඛවිහාර" නම්? සතර ඉරියව් විහරණයන්ගේ ඵාසුබවයි. යම් හෙයකින් වෙනෙහි හුද කලාවූවහුට යථාපිරිසෙසින් උච්චාරප්‍රශ්‍රාවකෘත්‍යය පවන් සියලු ඊර්ෂ්‍යා පථයෝ පහසු වූවාහු වෙත් ද එහෙයින් "දිට්ඨධම්මස්ස සුඛවිහාරං" (= ඉහාතමයාගේ සැප විහරණය) "දිට්ඨධම්ම සුඛවිහාර" යයි මේ අර්ථය දතයුත්තේය; **පච්ඡිමඤ්ච ජනතං අනුකම්පමානෝ**= යනු වෙනෙහි විසිමෙන් පශ්චිමජනතා තොමෝ කෙසේ අනුකම්පා කරන ලද්දී වේද යත්? සැදුහැයෙන් පැවිදිවූ කුලදරුවෝ වනාහි භාග්‍යවතුන් වහන්සේ ගේ අරණ්‍යවාසය දැක "යම් භාග්‍යවතුන් වහන්සේ කෙනෙකුට පරිඥා නයකළ යුත්තක් නැත්තේ ද ප්‍රහාණයකළ යුත්තක් නැත්තේ ද භාවනාකළ යුත්තක් නැත්තේ ද සාක්ෂාත්කළ යුත්තක් නැත්තේ ද ඒ භාග්‍යවත්හු ද වනසෙනසුන් නො හරිනසේක, අපි කියනු කිමැ" යි සිතා එහි වාසය කටයුත්තේ මය' යි සිතන්නාහුය, මෙසේ වහා ම දුක් කෙළවර කරන්නෝ වන්නාහු යයි මෙසේ පශ්චිමජනතා තොමෝ අනුකම්පා කරන ලද්දී වෙයි; මේ අර්ථය දක්වමින් වදාළහ– **පච්ඡිමඤ්ච ජනතං අනුකම්පමානෝ** යි; ඒ අසා සතුටුසිත්ඇති බ්‍රාහ්මණ තෙම **අනුකම්පිත රූපා** යනාදිය කීය. එහි **අනුකම්පිතරූපා** යනු අනුකම්පිත ජාතිකා= අනුකම්පාකළ සවභාව ඇත්තාහු; **ජනතා**= ජනසමූහ තෙම; **යථා නං අරහතා සම්මාසම්බුද්ධෙන**= නිකෙලෙසී වූ සම්‍යක් සම්බුද්ධ තෙමේ යම්සේ අනුකම්පා කරන්නේ ද එසේ ම අනුකම්පාකළ සවභාව ඇත්තාහු යයි; මෙසේත් කියා යලිත් භාග්‍යවතුන් වහන්සේගේ ඒ ධර්මදේශනාව අනුමොදනා වන්නේ භාග්‍යවතුන් වහන්සේට මේ කීය. **අභික්කන්තං භොතොගොතම! අභික්කන්තං භොතොගොතම!** යි. එහි මේ "අභික්කන්ත" "අභික්කන්ත" ශබ්දය තෙම ක්ෂයසුන්දර අභිරූප අබිභාවු මොදන යන අර්ථයන්හි දක්නා ලැබේ. ඒ එසේමැයි–

ශබ්දය.

අභික්කන්තා භවෙන! රත්තී නික්ඛන්තා පඨමෝ යාමෝ චිරනිසින්නෙනා භික්ඛුසඞ්ඝා යනාදි තැන්හි ක්ෂයෙහි දක්නා ලැබේ. **අයං ඉමෙසං චතුන්නං පුග්ගලානං අභික්කන්තතරෝ ච පණීතතරෝ ච** යනාදි තැන්හි සුන්දරයෙහි දක්නා ලැබේ.

62. කො මේ වඳති? පාදූනි ඉඞ්ඝා යසසා ජලං
අභික්කනෙනන වණ්ණෙන සබ්බා ඔභාසයං දිසා

යන ආදි තැන්හි අභිරූපයෙහි දක්නා ලැබේ. **අභික්කනෙනං භනෙන!** යනාදි තැන්හි අබහනුමොදනයෙහි දක්නා ලැබේ. මෙහි ද අබහනු මොදනයෙහි ම වේ; යම් හෙයකින් අ බහ නු මොදනයෙහි වේද එහෙ යින් "මෙනව මැනව පින්වත් ගෞතමයෙනි!" යි !කියනලද්දේ වේ යයි දතයුතු.

ආමෙඩිතය.

63. "භයෙ කොධෙ පසංසායං තුතිනෙ කොතුහලෙඣරෙ
භාසෙ සොකෙ පසාදෙ ච කරෙ ආමෙණ්ඩිතං බුධො" ති.

("භයෙහි ද ක්‍රොධයෙහි ද ප්‍රශංසාවෙහි ද ශීඝ්‍රයෙහි ද කුහුල්බැව්හි ද ආශ්චයර්‍යයෙහි ද සිනාවෙහි ද ශොකයෙහි ද ප්‍රසාදයෙහි ද යන මෙතෙක් තැන්හි පණ්ඩිත තෙම ආමෙඩිතය හෙවත් එකශබ්දයාගේ දෙතුන්වරක් යෙදීම කරන්නේය. යන-)

මේ ආමෙඩිත ලක්‍ෂණයෙන් ද මෙහි ප්‍රසාද වශයෙන් ද ප්‍රශංසා වශ යෙන් ද මේ ("අභික්කන්ත" ශබ්දය) දෙවරක් කියනලද්දේ යයි දතයුතු නොහොත් **අභික්කනෙනං**= යනු ඉතා කාන්ත (=කැමති) ය ඉතා ඉෂ්ටය ඉතා මනාපය ඉතා සුන්දර යයි කියනලද්දේ වෙයි; එහි එක් 'අභික්කන්ත' ශබ්දයකින් දෙශනාවට සතුතිකරයි; එකකින් තමාගේ පැහැදීම දක්වයි මේ වනාහි මෙහි අදහසයි. පින්වත් ගෞතමයෙනි! භවත් ගෞතමයන් වහන්සේගේ යම් මෝ දෙශනාවක් වන්නීද ඕ තොමෝ ඉතා මැනව; භවත් ගෞතමයන් වහන්සේගේ දෙශනාවට පැමිණ (හෙවත් දෙශනාව අසා) මාගේ යම් මේ පැහැදීමක් ඇද්ද එය ඉතා මැනව; භාග්‍යවතුන් වහන්සේගේ ම වචනය හෝ අර්‍ථ දෙකක් දෙකක් සඳහා පසසයි; භවත් ගෞතමයන් වහන්සේගේ වචනය දෙස් නසන හෙයින් ඉතා මැනව; ගුණාධිගමනයෙන් (=උතුම් ගුණයට පමුණුවන හෙයින්) ඉතා මැනව; එසේම ශ්‍රද්ධාව උපදවන හෙයින් ද ප්‍රඥව උපදවන හෙයින් ද මැනව; අර්‍ථ සහිත බැවින් ද ව්‍යඤ්ජන සහිත බැවින් ද මැනව; නො ගැඹුරු පද ඇති හෙයින් ද ගැඹුරු අර්‍ථ ඇති හෙයින් ද මැනව; කණ්සුඛ හෙයින් ද

---

62. **ඉඞ්ඝා**= ඉර්ඛියෙන් ද; **යසසා**= යසසින් ද; **ජලං**= දිලියෙ මින්; **අභික්කනෙනන**= අභිරූපවූ; **වණ්ණෙන**= වර්‍ණයෙන්; **සබ්බා දිසා**= සියලු දිගුන්; **ඔභාසයං**= බබුලුවමින්; **කො**= කවරෙක් තෙම; **මෙ**= මාගේ; **පාදූනි**= පාදයන්; **වන්දති**= වඳීද?

63. **භයෙ**= භයෙහි ද; **කොධෙ**= ක්‍රොධයෙහි ද; **පසංසායං**= ප්‍රශං සාවෙහි ද; **තුතිනෙ**= ශීඝ්‍රයෙහි ද; **කොතුහලෙ**= කුහුල්බැව්හි ද; **අච්ඡ රෙ**= ආශ්චර්‍යයෙහි ද; **භාසෙ**= සිනාවෙහි ද; **සොකෙ**= ශොකයෙහි ද; **පසාදෙ ච**= ප්‍රසාදයෙහි ද; **බුධො**= පණ්ඩිත තෙම; **ආමෙණ්ඩිතං**= ආමෙ ඩිතය (=එකශබ්දය දෙතුන්වරක් ප්‍රයොගකිරීම;) **කරෙ**= කරන්නේය.

හෘදයඞ්ගම හෙයින් ද මැනව, ආතෙමාතක්‍ෂීණය නො කරන හෙයින් ද පරවම්භනය නො කරන හෙයින් ද මැනව; කරුණාවෙන් සිහිල් හෙයින් ද ප්‍රඥාවෙන් නිම්ල හෙයින් ද මැනව; අභිමුඛයෙහි රමණීය බැවින් ද විමදීක්‍ෂම හෙයින් ද මැනව; ඇසීමෙන් සුවඵලවන හෙයින් ද විමසීමෙන් හිත ඵලවන හෙයින් ද යන මේ ආදීන්ගෙන් යෙදිය යුතු; එයින් මත්තෙහි ද උපමා සතරකින් දෙශනාවට ම පසසයි.

දෙශනා ප්‍රශංසා,

එහි නික්කුජ්ජිතං= අධොමුඛ කොට තබනලද මුවයටිහුරුවූ හෝයි; **උක්කුජ්ජෙය්‍ය**= මුව උඩුහුරු කරන්නේය; **පටිච්ඡන්නං**= තණපත් ආදියෙන් වසනලද්දක්; **විවරෙය්‍ය**= උදහාවනය (=වැසුම් හැරීම) කරන්නේය; **මූළ්හස්‍ස**= දිඞ්මූළාවූ වෙකුට; **මග්ගං ආචික්ඛෙය්‍ය**= අත් ගෙන මේ මග යයි කියන්නේ; **අන්ධකාරෙ**= කෘෂ්ණ පක්‍ෂයෙහි තුදුස්වකය අඞ්ධරාත්‍රිය ය ඝන වනලැහැබය මෙසපටලය ය යන මෙයින් චතුරඞ්ග වූ අන්ධකාරයෙහි; මේ පළමුකොට දක්වන ලද්දේ නො ගැඹුරු පදවීසි. මේ (මතු කියනු ලබන්නේ) වනාහි අභිප්‍රායාවී යොජනාසි. කිසිවෙක් මුව යටිහුරු කොට තබන ලද්දක් යම්සේ මුව උඩුහුරු කරන්නේ ද එසේ සඞ්ඛ්‍යාවිමුඛ වූ අසඞ්ඛ්‍යයෙහි පතිත වූ මා අසඞ්ඛ්‍යයෙන් නහා සිටුවන්නාවූ- (කිසිවෙක්) ප්‍රතිවජ්‍ඣාවූවක් යම්සේ විවෘත කරන්නේ ද එසේ කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේගේ ශාසනාඤ්ඤාණයෙහි පටන් මිසදිටු ගහනින් වැසුනාවූ සත්ත්ව විවෘතකරන්නාවූ- (කිසිවෙක්) මුළාවූවෙකුට යම්සේ මඟ කියන්නේ ද එසේ නො මහට මිත්‍යාමාගීයට පිළිපන්නාවූ මට සඟමොක්මඟ ප්‍රකාශ කරන්නාවූ- (කිසිවෙක්) අන්ධකාරයෙහි තෙල් පහනක් යම්සේ ධරන්නේ ද එසේ මොහඳුරෙහි ගැලුනාවූ බුඞ්ධාදි රතනාරුපයන් නොදක්නාවූ මට ඒ (බුඞ්ධාදි රතන) ප්‍රතිවේධාදකවූ මොහාන්ධකාරය විධවංශනය කරන දෙසුම් නමැති පහන් ධැරීමෙන් භවත් ගෞතමයන් විසින් මට මේ ක්‍රම වලින් ප්‍රකාශ කළ හෙයින් නොයෙක් අයුරින් ධර්මය ප්‍රකාශ කරන ලද්දේය.

මෙසේ දෙශනාවට **සතුති** කොට මේ දෙශනාවෙන් රුවන්තියාහි පහන් සිත් ඇත්තේ පහන් අයුරු කරන්නේ **එසාහං** යනාදිය කීය. **එහි එසාහං** එසො + අහං (= මේ මම;) **භවන්තං ගොතමං සරණං ගච්ඡාමි**= මට පින්වත් ගෞතමයන් වහන්සේ සරණය පිහිටය දුක් නසන්නෝය හිත විධායකයෝ ද වෙති යන මේ අදහසින් භවත් ගෞතමයන් වහන්සේ (**සරණ** කොට) යම්, භජනය කරමි, සෙවනය කරමි, පයිරුපාසනය කරමි, නොහොත් මෙසේ දනිමි, අවබොධ කරමි'සි යන අර්ථයි. යම් හෙයකින් යම් ධාතුකෙනෙකුන්ගේ ගමනාර්ථය ඇත්තේද බුඞ්ධත්වයට ඔවුන්ගේ අර්ථය වේද, එහෙයින් **ගච්ඡාමි** යනු මේ පදයාගේ දනිමි, අවබොධ කරමි, යන මේ අර්ථය කියන ලද්දේය. **ධම්මඤ්ච භික්ඛු සඞ්ඝඤ්ච** යන මෙහි වනාහි අධිගතමාගී ඇතියන් පසක්කළ නිවන් ඇතියන් අනුශාසනාපරිදි පිළිපදින්නවුන් අපායයන්හි නො වැටෙන්න

වුන් කොට ධරානුයි "ධම්ම" නම් වෙයි; හේ අර්ථ හෙයින් ආර්‍යමාගීය ද නිර්‍වාණය ද වෙයි. මේ වදාරනලද මැයි- **යාවතා භික්ඛවෙ! ධම්මා සඞ්ඛතා අරියො අට්ඨඞ්ගිකො මග්ගො තෙසං අග්ගමක්ඛායතීති** (=මහණෙනි! යම්තාක් "සඞ්ඛත" ධර්මයෝ වෙත් ද ඔවුනතුරෙන් ආර්‍ය අෂ්ටාඞ්ගික මාගීය අග්‍ර යයි කියනුලැබේ යි) විස්තරයි. හුදෙක් ආර්‍යමාගීය ද නිර්‍වාණය ද නො වෙයි, වැලිදු වනාහි ආර්‍ය ඵලයන් සමග පර්‍යාපන්න ධර්මය ද (ධර්ම නම්.) මේ කියනලද මැයි. ඡත්තමාණවක් විමානයෙහි-

64. රාගවිරාගමනෙජ්ජමසොකං ධම්මමසඞ්ඛතමප්පටිකූලං
මධුරම්මං පගුණං සුවිභත්තං ධම්මම්මං සරණත්ථමුපෙහි ති.

(රාග වශයෙන් ඇල්මක් නැත්තාවූ තෘෂ්ණා රහිතවූ ශොක රහිතවූ අසංස්කෘතවූ මේ නවලොකොත්තර ධර්මය ද පිළිකුල් නොවූ මිහිරිවූ ප්‍රගුණකළ යුතුවූ ස්කන්ධාදි වශයෙන් මොනොවට බෙදනලද මේ පාලිධර්මය ද ශරණ පිණිස පැමිණෙවයි.)

මෙහි **රාගවිරාගො** යි මාගීය කියනලද්දේය; **අනෙජ්මසොකං** යි ඵලය කියන ලද්දේය; **ධම්මමසඞ්ඛතං** යි නිර්‍වාණය කියනලද; **අප්පටිකූලං මධුරම්මං පගුණං සුවිභත්තං** යි පිටකත්‍රයෙන් විභාග කරන ලද සියලු ධර්මස්කන්ධයෝ කියනලද්දාහු යයි. දෘෂ්ටිශීල සමූහයෙන් සංහත නුයි "සඞ්ඝ" නම්; හේ අර්ථ හෙයින් අෂ්ටාර්‍යපුද්ගල සමූහ නෙමේයි. මේ කියනලද මැයි ඒ විමානයෙහි ම-

65. යඤ්ච දින්නං මහප්ඵලමාහු චතූසු සුවිසු පුරිසයුගෙසු
අට්ඨ ච පුග්ගල ධම්මදසා තෙ සඞ්ඝරතනම්මං සරණත්ථමුපෙහි ති

(පවිත්‍ර වූ පුරුෂයුගල වශයෙන් සතරක් වූ යම් සඞ්ඝරත්නයක් කෙරෙහි දෙන ලද්ද මහත්ඵල යයි කියත් ද? ඔවුහු අෂ්ටාර්‍යපුද්ගල ද වෙති; (ආර්‍යසත්‍ය) ධර්මයන් දක්නාහු ද වෙති. මේ සඞ්ඝරත්නය ශරණ පිණිස පැමිණෙව යි.)

---

64. **රාගවිරාගං**= රාග වශයෙන් ඇල්ම ක් නැත්තාවූ; හෙවත් රාගය දුරු වූ; **අනෙජං**= එජාසඞ්ඛ්‍යාත තෘෂ්ණා රහිත වූ; **අසොකං**= ශොකරහිත වූ; ශොකනිමිත්ත කෙලෙසයන් නැසුවාවූ යයි සේ; **අසඞ්ඛතං**= ප්‍රත්‍යයන් විසින් සකස් නො කරන ලද්දාවූ; **ඉමං ධම්මං**= මේ නව ලොකොත්තර ධර්මය ද; **අප්පටිකූලං**= ප්‍රතිකූල නො වූ; **මධුරං**= මිහිරිවූ; **පගුණං**= ප්‍රගුණ කටයුතු වූ; **සුවිභත්තං**= විභාග කට යුතු අර්ථ සකස්කිරීම් ආදි කුශලාදි උද්දෙශාදි වශයෙන් මොනොවට බෙදනලද්දාවූ; **ඉමං ධම්මං**= මේ පර්‍යාපන්න ධර්මය ද; **සරණත්ථං**= ශරණ පිණිස; **උපෙහි**= පැමිණෙව.

65. **සුවිසු**= පවිත්‍ර වූ; **චතූසු පුරිසයුගෙසු**= පුරුෂයුගල සතරක්වූ; **යඤ්ච**= යම් ආර්‍ය සඞ්ඝරත්නයක් කෙරෙහි; **දින්නං**= පරිත්‍යාගකළ දානවස්තුව; **මහප්ඵලං**= මහත් ඵල යයි; **ආහු**= කියත් ද; **නෙ**= ඔවුහු; **අට්ඨපුග්ගලා ච**= අෂ්ටාර්‍ය පුද්ගලයෝ ද වෙති; **ධම්මදසා**= (ප්‍රත්‍යක්ෂ හෙයින්) චතුරාර්‍යසත්‍ය ධර්මයන් දක්නාහුද වෙති; **ඉමං සඞ්ඝං**= මේ සඞ්ඝ රත්නය; **සරණත්ථං**= ශරණ පිණිස; **උපෙහි**= පැමිණෙව.

"භික්ඛූනං සඞ්ඝෝ භික්ඛු සඞ්ඝෝ" (= භික්ෂූන්ගේ සමූහය තෙම "භික්ඛු සඞ්ඝ" නම් වේ;) මෙතෙකින් බමුණු තෙම තුන් සරණ ගමන යන් අවබොධ කෙළේය.

මෙවිට ඒ සරණගමනයන්හි නිපුණ භාවය පිණිස සරණය සරණ ගමනය යමෙකුත් සරණයේ ද (හෙතෙමේ ය) සරණගමන ප්‍රභෙදය සරණගමන ඵලය සඞ්කිලෙසය හෙදය යන මේ විධිය දතයුත්තේය.

සරණය සරණගමනය හා සරණ ගතයා.

ඒ කෙසේ ද? පළමුකොට පදනිරුක්ති වශයෙන් "හිංසතීති සරණං" (= හිංසා කෙරේනුයි ශරණ නම්.) ශරණගිය වුන්ගේ ඒ සරණ ගමනය හෙතුකොට ගෙන ම භය සන්ත්‍රාසය දුඃඛය දුගීති පරිකෙලෙශය නසයි, විනාශ කෙරෙයි, යන අර්ථයි; මේ (ශරණ යනු) රතනත්‍රයට ම නමෙකි; නොහොත් හිතයෙහි පැවැත්වීමෙන් ද අහිතයෙන් වැළැක් වීමෙන් ද සත්වයන්ගේ භය හිංසා කෙරේනුයි සත්‍යඥ තෙමේ ද භවකාන්තාරයෙන් එතරකිරීමෙන් හා අස් වැසිලි දීමෙන් ධර්මය ද; සවලපවූත් සත්කාරයන්ගේ මහත්වූ ඵලප්‍රතිලාභ කරණයෙන් සඞ්ඝතෙමේ ද (සරණ නම් වෙයි;) එහෙයින් මේ ක්‍රමයෙන් ද රතනත්‍රය "සරණ" නම් වෙයි; තත්ප්‍රසාද තද්ගරුභාව යන මෙයින් වෙසෙසින් නසනලද කෙලෙස් ඇති තත්පරායණතාකාරයෙන් පැවත්තාවූ චිත්තෝත්පාදය තෙම "සරණ ගමන" නම් වෙයි. ඒ චිත්තෝත්පාදයෙන් යුක්තවූ සත්ව තෙම "සරණ" යයි උක්තප්‍රකාරවූ චිත්තෝත්පාදයෙන් යුක්තව (මට) මේ රතනත්‍රය සරණය මේ රතනත්‍රය පිහිට යයි මෙසේ පැමිණෙයි යන අර්ථයි. මෙසේ පළමුකොට සරණය සරණගමනය යමෙකුත් සරණයේ ද (හෙතෙමේය) යන මේ තුන දතයුතු.

සරණගමන ප්‍රභෙද.

සරණගමන ප්‍රභෙදයෙහි වනාහි සරණ ගමනය දෙවැදෑරුම් වේ; ලෞකොත්තර සරණ ගමනය ද ලෞකික සරණ ගමනය ද කියායි. ඔවුනතුරෙන් ලෞකොත්තර සරණ ගමනය (මාර්ග ඥානයෙන්) දක්නා ලද චතුරාර්ය සත්‍යය ඇත්තවුන්ට මාර්ගක්ෂණයෙහි සරණ ගමනොප කෙලෙශයන්ගේ සමුච්ඡේදයෙන් ආලම්බන හෙයින් නිවන් අරමුණුව කෘත්‍යය හෙයින් ඖයලු රතනත්‍රයෙහි ම සම්බන්ධවෙයි. ලෞකික සරණගමනය පෘථග්ජන යන්ට සරණගමනොපකෙලෙශයන්ගේ විෂ්කම්භණයෙන් අරමුණු හෙයින් බුද්ධාදි ගුණයන් අරමුණුව සම්බන්ධ වෙයි; එය අර්ථ වශයෙන් බුද්ධාදි වස්තූන්හි ශ්‍රද්ධා ප්‍රතිලාභ යයි; ශ්‍රද්ධාව මුල්කොට ඇත්තාවූ ද සම්‍යග්දෘෂ්ටිය දශපුණ්‍යක්‍රියා වස්තූන් විෂයෙහි "දිට්ඨුජ්ජු" කම් යයි කියනු ලැබේ. ඒ මේ (ලෞකික සරණගමනය) ඕවිපරිද්දෙකින් පවතී; ආත්මසන්නියාතනයෙන් ය තත්පරායණතායෙන් ය ශිෂ්‍යභාවොපගමනයෙන් ය ප්‍රණිපාතයෙන් යයි (කියායි.) ඔවුනතුරෙහි ආත්මසන්නියාතන නම්? අද ආදිකොට මම ආත්මය බුදුන්ට පවා දෙමි, ධර්මයට ද සඞ්ඝයාට ද (පවා දෙමි)යි

මෙසේ බුඩාදීන්ට ආත්ම පරිත්‍යාග යයි. තත්පරායණතා නම්? අද ආදි කොට මම බුදුන් පිහිට කොට ඇත්තෙමි වෙමි, ධර්මය පිහිට කොට ඇත්තෙමි වෙමි, සඞ්ඝයා පිහිට කොට ඇත්තෙමි වෙමි' යි මා ධැරුව මැනවැයි මෙසේ තත්පරායණ භාව යයි. ශිෂ්‍යභාවොපගමනය නම්? අද ආදි කොට මම බුදුන්ට අතවැසි වෙමි, ධර්මයට ද සඞ්ඝයාව ද අත වැසි වෙමි' යි මා ධැරුව මැනවැයි; මෙසේ ශිෂ්‍යභාවයට පැමිණීමයි. ප්‍රණිපාතය නම්? අද ආදි කොට මම අභිවාදන ප්‍රත්‍යුත්ථාන අඤ්ජලි කර්ම සාමීචිකර්ම බුඩාදි වස්තුත්‍රයට ම කෙරෙමි'යි මා ධැරුව මැනවැයි මෙසේ බුඩාදීන් විෂයෙහි අතිශයින් පහත් පැවතුම් ඇති ආකාර යයි; මේ සතර ආකාරයන් අතුරෙන් එක්තරා ආකාරයකුත් කරන්නහු විසින් සරණගමනය ගන්නාලද්දේ ම වෙයි.

තවද භාග්‍යවතුන් වහන්සේට ආත්මය පරිත්‍යාග කරමි, ධර්මයට ද සඞ්ඝයාට ද ආත්මය පරිත්‍යාග කරමි, ජීවිතය පරිත්‍යාග කරමි, මා විසින් ආත්මය පරිත්‍යාගකරන ලද්දේ මය, මා විසින් ජීවිතය පරිත්‍යාගකරන ලද්දේමය, ජීවිතය අන්තකොට බුදුන් සරණ කොට යෙමි, මට සරීඤ්ඤ තෙම සරණය නිලීනසථානය රක්ෂාසථාන යයි මෙසේත් ආත්මසන්නියාතනය දත යුතුයි. **සත්ථාරඤ්ච වනාහං පසෙසෙය්‍යං භගවන්තමෙව පසෙසෙය්‍යං සුගතඤ්ච වනාහං පසෙසෙය්‍යං භගවන්තමෙව පසෙසෙය්‍යං සම්මා සම්බුධඤ්ච වනාහං පසෙසෙය්‍යං භගවන්තමෙව පසෙසෙය්‍යං** යි මෙසේත් මහාකාශ්‍යපයන්ගේ සරණගමනයෙහි මෙන් ශිෂ්‍ය භාවොප ගමනය දතයුතුයි.

66. "සො අහං විචරිස්සාමි ගාමා ගාමං පුරා පුරං
නමස්සමානො සම්බුධං ධම්මස්ස ච සුධම්මතං" නති-

(ඒ ආලවික නම්වූ මම සම්බුඩයන් වහන්සේ නමස්කාරකරමින් ධර්මයාගේද සුධර්මබව (ප්‍රකාශ කරමින්) ගමින් ගම නුවරින් නුවර හැසිරෙන්නෙමි යි.)

මේසේත් ආලවිකාදීන්ගේ සරණ ගමනය මෙන් තත්පරායණ භාවය දතයුත්තේය. **අථ ඛො බ්‍රහ්මායු බ්‍රාහ්මණො උඨායාසනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා භගවතො පාදෙසු සිරසා නිපතිත්වා භගවතො පාදානි මුඛෙන ච පරිචුම්බති පාණීහි ච පරිසම්බාහති නාමඤ්ච සාවෙති බ්‍රහ්මායු අහං භො ගොතම! බ්‍රාහ්මණො බ්‍රහ්මායු අහං භො ගොතම! බ්‍රාහ්මණො** ති.

---

66. **සො අහං**= (ආලවක නම්වූ) ඒ මම; **සම්බුධං**= සම්බුඩයන් වහන්සේ; **නමස්සමානො**= නමස්කාර කරමින්; **ධම්මස්ස ච**= ධර්මයා ගේ ද; **සුධම්මතං**= සුධර්ම බව (ප්‍රකාශ කරමින්;) **ගාමා ගාමං**= ගමින් ගම; **පුරා පුරං**= නුවරින් නුවර; **විචරිස්සාමි**= හැසිරෙන්නෙමි.

(ඉක්බිති බ්‍රහ්මායු බ්‍රාහ්මණතෙම ඝුනස්නෙන් නැගිසිට උතුරු සළුව එකස් කොට භාග්‍යවතුන් වහන්සේගේ පාසම්පයෙහි මසහකයෙන් වැටී භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් මුඛයෙනින් ද සිඹී අතුල්වලින් ද පිරිමදී නම ද අස්වසි භවත් ගෞතමයන් වහන්ස! මම බ්‍රහ්මායුබ්‍රාහ්මණයා වෙමි භවත් ගෞතමයන් වහන්ස! මම බ්‍රහ්මායුබ්‍රාහ්මණයා වෙමි යි.) මෙසේත් ප්‍රණිපාත සරණ ගමනය දත යුතුයි. ඒ මේ පිණිපා වනාහි ඥතිභය ආචාර්‍ය්‍ය දක්ෂිණෙය්‍ය වශයෙන් සිව් වැදෑරුම් වෙයි; ඔවුනතුරෙන් දක්ෂිණෙය්‍ය ප්‍රණිපාතයෙන් සරණ ගමනය වෙයි, අන්‍යයන්ගෙන් නො වෙයි; යම් හෙයකින් ශ්‍රෙෂ්ඨවශ යෙන් ම සරණය ගනු ලැබේ ද ශ්‍රෙෂ්ඨවශයෙන් බිඳේ ද; එහෙයින් යම් ශාක්‍යවංශිකයෙක් හෝ කොළිය වංශිකයෙක් හෝ සම්බුදුතෙම අපගේ නැයෙකැයි වදිනම් සරණ නො ගන්නාලද්දේ ම වෙයි; යමෙක් හෝ ශ්‍රමණ ගෞතම තෙම රජුන් විසින් පුදනලද්දෙහ, මහානුභාව ඇත්තෙක, නො වදිනු ලබන්නේ අනර්‍ථ හෝ කරන්නේ යයි හයින් වදිනම් සරණ නො ගන්නාලද්දේම වෙයි; යමෙකුත් බොධිසත්ත්වකාල යෙහි භාග්‍යවතුන් වහන්සේගේ සම්පයෙහි කිසි උගන්නාලද්දක් සිහි කරමින් හෝ බුඩකාලයෙහි–

67. **"එකෙන භොගෙ භුඤ්ජය්‍ය චිහි කම්මං පයොජයෙ**
චතුපඤ්ච නිධාපෙය්‍ය ආපදසු භවිස්ස නී" ති–

(භොගයන් සතර කොටසක් කොට එක් කොටසකින් අනුභව කරන්නේය, දෙකොටසකින් කෘෂිවණිගාදි කර්‍මාන්ත යොදන්නේය, සතරවෙනි කොටස විපත් පැමිණි කල්හි ප්‍රයෝජන පිණිස වන්නේ යයි නිධානගත කරන්නේය යන–)

මෙබඳුවූ අනුශාසනයක් ඉගෙන හෝ මාගේ ආචාර්‍ය්‍යයයි වදිනම් සරණ නො ගන්නාලද්දේම වෙයි; යමෙක් වූ කලි මේතෙමේ ලොක යෙහි අග්‍රදක්ෂිණෙය්‍යයයි වදිනම් ඔහු විසින් ම ගන්නාලද්දේ වෙයි. මෙසේ ගන්නාලද සරණඇති උපාසකයාගේ හෝ උපාසිකාවගේ හෝ අන්‍ය තීර්‍ථකයන් කෙරෙහි පැවිදිවූ ද නැයෙකු මේතෙම මාගේ නැයෙකැයි වදින්නහුගේ සරණ ගමනය නො බිඳෙයි, පැවිදි නොවූවෙකු (වදින්නහුගේ නො බිඳේයයි) කියනු කිම? භයවශයෙන් රජෙකු වදින්නහුගේ ද එසේමැයි;

යම්හෙයකින් හෙතෙම රටවැසියා විසින් පුදනලද බැවින් නො වදිනු ලබන්නේ අනර්‍ථ නමුත් කරන්නේද එහෙයිනි; එසේම යම්කිසි

---

67. **භොගෙ**= භොගයන්; **එකෙන**= එක්කොටසකින්; **භුඤ්ජය්‍ය**= පරිභොගකරන්නේය; **චිහි**= කොටස් දෙකකින්; **කම්මං පයොජයෙ**= කෘෂිවණිගාදිකර්‍මාන්ත යොදන්නේය; **චතුපඤ්ච**= සතරවෙනි කොට ස ද; **ආපදසු**= රාජ චොරාදි විපත්තියක් පැමිණි කල්හි; **භවිස්සති**= (ප්‍රයොජනපිණිස) වන්නේයයි; **නිධාපයෙ**= නිධානකොට තබන්නේය.

ශිල්පයක් නික්මවන්නාවූ නිර්මිකයෙකු පවා මේතෙම මාගේ ආචාර්‍ය්‍ය යයි විඳින්නහුගේ ද (සරණය) නො බිඳේ යයි, මෙසේ **සරණගමන** ප්‍රභෙදය දතයුත්තේය.

ලොකොත්තර සරණගමනා මෙහි දු ලොකොත්තර සරණ ගමනයාගේ සතරශ්‍රා මණ්‍යඵලයෝ විපාක ඵලයයි; සියලු දුක් ක්ෂයකිරීම **නිශංස.** ආනිශංස ඵලයයි, මේ වදරණලද මැයි-

68. "යො ච බුද්ධඤ්ච ධම්මඤ්ච සඞ්ඝඤ්ච සරණං ගතො
චත්තාරි අරිය සච්චානි සම්මප්පඤ්ඤාය පස්සති.

69. දුක්ඛං දුක්ඛසමුප්පාදං දුක්ඛස්ස ච අතික්කමං
අරියඤ්චට්ඨඞ්ගිකං මග්ගං දුක්ඛූපසමගාමිනං.

70. එතං ඛො සරණං ඛෙමං එතං සරණ මුත්තමං
එතං සරණමාගම්ම සබ්බදුක්ඛා පමුච්චති" ති.

යම් ගෘහස්ථයෙක් හෝ ප්‍රව්‍රජිතයෙක් බුදුන් ද ධර්‍මය ද සඞ්ඝයා ද සරණකොට ගියේද චතුරාර්‍ය්‍යසත්‍යයන් විදර්‍ශනා සහිත මාර්ගඥානයෙන් දකී ද, (කිනම් චතුරාර්‍ය්‍ය සත්‍ය කෙනෙක්ද යත්?) දුඃඛසත්‍යය ද දුඃඛසමුදය සත්‍යය ද දුක් ඉක්මවීමවූ නිරෝධ සත්‍යය ද දුක් සංසිඳුවීමට පමුණුවන්නාවූ ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගික මාර්ගය ද යන මොහුයි.

මේ ලොකොත්තරසරණය වනාහි ක්ෂෙමය මේ සරණය උත්තමය මේ ලොකොත්තර සරණයට පැමිණ සියලු වෘත්තදුඃඛයෙන් මිදේ; යයි.

තවද නිත්‍ය හෙයින් අනුපගමනාදිවශයෙන් ද මේ ලොකොත්තර **සරණ** ගමනයාගේ ආනිශංසඵලය දතයුතුයි. මේ වදරනලද මැයි-

අඤ්ඤතිත්ථියා භික්ඛවෙ! අනවකාසො යං දිට්ඨසම්පන්නො පුග්ගලො සකදාපි සඞ්ඝාරං නිව්වත්තෙ උපගච්ඡෙය්‍ය; සුබතො උපගච්ඡෙය්‍ය; සකදාපි ධම්මං අත්තනො උපගච්ඡෙය්‍ය; මාතරං ජීවිතා වොරොපෙ

68-69. **යො ච**= යමෙකුත්; **බුද්ධඤ්ච**= බුදුන් ද; **ධම්මඤ්ච**= ධර්‍මය ද; **සඞ්ඝඤ්ච**= සඞ්ඝයා ද; **සරණං ගතො**= සරණකොට ගියේ ද; **දුක්ඛං**= දුඃඛසත්‍යය ද; **දුක්ඛසමුප්පාදං**= දුඃඛ සමුදයසත්‍යය ද; **දුක්ඛස්ස ච අතික්කමං**= දුඃඛනිරෝධසත්‍යය ද; **දුක්ඛූපසමගාමිනං**= දුක් සංසිඳුවීමට පමුණුවන්නාවූ; **අරියඤ්චට්ඨඞ්ගිකං මග්ගං**= ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය ද යන; **චත්තාරි අරියසච්චානි**= චතුරාර්‍ය්‍ය සත්‍යයන්; **සම්මා**= මනාකොට; **පඤ්ඤාය**= මාර්ගප්‍රඥාවෙන්; **පස්සති**= දකී ද;

70. **එතං ඛො සරණං**= මේ ලොකොත්තර ශරණය වනාහි; **ඛෙමං**= චතුරොඝයෙන් නිර්භය හෙයින් ක්ෂෙම වේ; **එතං සරණං**= මේ ලොකොත්තර ශරණය; **උත්තමං**= උතුම්; **එතං සරණං**= මේ ලොකොත්තර ශරණයට; **ආගම්ම**= පැමිණ; **සබ්බ දුක්ඛා**= සියලු සසර දුකින්; **පමුච්චතීති**= මිදේයයි.

පෙය්‍ය; පිතරං ජීවිතා වොරොපෙය්‍ය; අරහන්තං ජීවිතා වොරොපෙය්‍ය; දුට්ඨචිත්තෙන තථාගතස්ස ලොහිතං උප්පාදෙය්‍ය; සඞ්ඝං භින්දෙය්‍ය; අඤ්ඤං සත්ථාරං උද්දිසෙය්‍ය; නේතං ඨානං විජ්ජතී'ති. (මහණෙනි! යම්හෙයකින් මාගේදෘෂ්ටියෙන් යුක්තවූ ශ්‍රොතාපන්න ආර්‍ය ශ්‍රාවකතෙම චාතුර්මහා සංඝකාරයන් අතුරෙන් කිසි එකද සංඝකාරයක් නිත්‍ය වශයෙන් ගන්නේද යන මේ කාරණය හෙතුරහිතය ප්‍රත්‍යය රහිතය; සැපවශයෙන් ගන්නේද; කිසි ධර්මයක් ආත්ම වශයෙන් ගන්නේද; මව ජීවිතයෙන් තොරකරන්නේද; පියා ජීවිතයෙන් තොරකරන්නේද; ක්ෂීණාශ්‍රවයන්වහන්සේ ජීවිතයෙන් තොරකරන්නේද; (වධකසිතින්) දූෂ්‍යවූ සිත්ඇත්තේ තථාගතයන් වහන්සේගේ ජීවමාන ශරීරයෙහි කුඩා මැස්සකු බොනපමණකුදු ලේ උපදවන්නේද; සඞ්ඝභෙදය කරන්නේද; අන්‍යශාස්තෘවරයෙක් (මේ මාගේ ශාස්තෘ යයි මෙසේ ගන්නේද යන මේ කාරණය නොවන්නේයයි.)

ලෞකික සරණ ගමනානිසංස. ලෞකික සරණගමනයාගේ වශයෙහි භවසම්පත් ද ඵල සම්පත් ද ඵලයමැයි. මේ වදාරනලද මැයි–

71. **"යෙ කෙචි බුද්ධං සරණං ගතාසෙ න තෙ ගමිස්සන්ති අපායං පහාය මානුසං දෙහං දෙවකායං පරිපූරෙස්සන්ති" ති.**

(යම් කිසිවෙක් බුදුන් සරණගියාහුද ඔවුහු සතර අපායට නො යන්නාහුය; මනුෂ්‍ය ශරීරය හැර දිව්‍යනිකාය පූරණය කරන්නාහුය යි.)

අනිඤ්ජකුදු කියනලදී– **අථ ඛො සක්කො දෙවානමින්දො අසීතියා දෙවතාසහස්සෙහි සද්ධිං යෙනායස්මා මහාමොග්ගල්ලානො තෙනුපසඞ්කමි–පෙ–එකමන්තං ඨිතං ඛො සක්කං දෙවානමින්දං ආයස්මා මහා මොග්ගල්ලානො එතදවොච. සාධු ඛො දෙවානමින්ද! බුද්ධං සරණගමනං හොති; බුද්ධං සරණගමනහෙතු ඛො දෙවානමින්ද! එවම්ධම්මතාවෙව සත්තා කායස්ස භෙදා පරම්මරණාසුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති තෙ අඤ්ඤෙ දෙවෙ දසහි ඨානෙහි අභිභවන්ති; දිබ්බෙන ආයුනා, දිබ්බෙන වණ්ණෙන, සුඛෙන, යසෙන, ආධිපත්තෙය්‍යෙන, දිබ්බෙහි රූපෙහි, සද්දෙහි, ගන්ධෙහි, රසෙහි, ඵොට්ඨබ්බෙහි ති.**

(ඉක්බිති ශක්‍රදෙවෙන්‍ද්‍රතෙම අසූදහසක් දෙවතාවන් සමග ආයුෂ්මත් මහා මෞද්ගල්‍යායනයෝ යම් තැනෙක්හි ද එතැන්හි එළඹියේය. -පෙ- එක් පසෙක සිටි

---

71. **යෙ කෙචි**= යම් කිසිවෙක්තුමූ; **බුද්ධං**= බුදුන්; **සරණංගතා සෙ**= සරණ ගියාහුද; **තෙ**= ඒ සරණගතයෝ; **අපායං**= සතර අපායට; **න ගමිස්සන්ති**= නොයන්නාහුය ; **මානුසං දෙහං**= මනුෂ්‍ය ශරීරය; **පහාය**= හැර; **දෙවකායං**= දිව්‍යනිකාය; **පරිපූරෙස්සන්ති ඉති**= පූරණයකරන්නාහු යයි.

යාවූ ශක්‍රදෙවෙන්ද්‍රයාහට ආයුෂ්මත් මහාමෞද්ගල්‍යායනයෝ මේ වදාළහ. දෙවෙන්ද්‍රය! බුදුන් සරණයාම යහපත් වෙයි; දෙවෙන්ද්‍රය! බුදුන් සරණයාම හෙතුකොටගෙන වනාහි මෙසේ මෙලොව ඇතැම් සත්ව කෙනෙක් කය බිඳීමෙන් මරණින් මත්තෙහි සොඳුරු ගතිඇති සැපයෙන් අහුවූ ලොකයට (=දිව්‍යලොකයට) උත්පත්ති වශයෙන් පැමිණෙත්; ඔවුහු අන්‍ය දෙවියන් කරුණු දසයකින් යටපත් කෙරෙත්; දිව්‍යවූ ආයු ෂයෙන්; දිව්‍යවූ වණීයෙන්; සැපයෙන්; යසසින්; අධිපති භාවයෙන්; දිව්‍යවූ රූප යෙන් ශබ්දයෙන් ගඳයෙන් රසයෙන් ස්පර්ශයෙන් යයි.)

ධර්ම්ය සරණයාමෙහි ද සඞ්ඝයා සරණයාමෙහි ද මෙම නයයි. තවද වෙලාමසූත්‍රාදීන්ගේ වශයෙන්ද සරණගමනයාගේ ඵලවිශෙෂය දතයුත්තේය. මෙසේ සරණගමණ ඵලය දතයුතුයි.

සරණගමනයාගේ කෙලෙසිම හා බිඳීම. ඒ දෙවැදෑරුම් සරණගමනයන් අතුරෙහි ලෞකික සරණගමනය වසතුත්‍රයෙහි අඥාන ශංසය මිථ්‍යාඥානාදීන් කරණකොට ගෙන කිලිටු වන්නේය; (විපාකවශයෙන්) මහත් බැබලීම නො වෙයි; (විපාකවශයෙන්) මහත් පැහිරීම නොවෙයි; ලොකොත්තර සරණගමනයාගේ කෙලෙසීමක් නැති; ලෞකික සරණගමණයාගේ දෙවැදෑරුම් භෙදයකි, සාවද්‍ය භෙදය ද අනවද්‍යභෙදය ද කියාසි; ඔවුනතුරෙහි සාවද්‍යභෙදය අන්‍ය ශාසනෘ ආදීන් විෂයෙහි ආත්මසන්නියාතනාදිය කරණකොටගෙන වෙයි; හේ අනිටු ඵලඇත්තේ වෙයි; අනවද්‍යභෙදය කලුරියකිරීමෙන් වෙයි; හේ විපාකරහිතබැවින් නිෂ්ඵලවෙයි; ලොකොත්තරසරණගමන යාගේ වනාහි භෙදයක් නොමැතියි; යම් හෙයකින් ආර්‍යශ්‍රාවකතෙමේ භවාන්තරයෙහි ද අන්‍යශාස්තෘකෙනෙක් නො උදෙසාද එහෙයිනි. මෙසේ සරණගමනයාගේ කෙලෙසීම ද බිඳීම ද දතයුතුයි.

උපාසකං මං භවං ගොතමො ධාරෙතු යනු මේතෙම උපාසක යෙකැයි පින්වත් ගෞතමයන්වහන්සේ මා මෙසේ ධරණසේක්වා දැනගන්නාසේක්වා යන අර්ථයි;

උපාසකවිධිකෞශල්‍යය පිණිස ප්‍රකීර්ණක කථා. උපාසකවිධිකෞශල්‍යය පිණිස වනාහි මෙහිලා උපාසකතෙම කවරෙක්ද? කුමක් හෙයින් උපාසකයා යයි කියනු ලැබේද? ඔහුගේ ශීලය කුමක්ද? ආජීවය කවරේද? විපත්ති කවරිද? සම්පත්ති කවරිදැ? සි මේ ප්‍රකීර්ණකය දතයුතුයි. එහි උපාසකතෙම කවරෙක්ද? යනු යම් කිසි තිසරණගතශ්‍රාවකයෙකි; මේ වදාරණලදමැයි- **"යතෝ බෝ මහානාම! බුද්ධං සරණං ගතෝ හොති ධම්මං සරණං ගතෝ හොති සඞ්ඝං සරණං ගතෝ හොති එත්තාවතා බෝ මහානාම! උපාසකෝ හොති"** ති.

(=මහානාමය! යම් කාලක පටන් බුදුන් සරණගියේ වේද දහම් සරණගියේ වේද සඟුන් සරණගියේ වේද මහා නාමය! මෙපමණකින් ම උපාසකතම් වේ යයි.) "කුමක් හෙයින් උපසකතම් වේද?" යනු රත්නත්‍රය කරා ඵලඹෙන හෙයිනි; හෙතෙම වනාහි බුදුන් සම්පයට ඵලඹෙනුයි උපාසකතම් වේ.

ධර්මය -පෙ- සඞ්ඝයා සම්පයට ඵලඛෙනු,සි උපාසකනම් වේ. "ඔහුගේ ශීලය කුමක්ද?" යනු පසඳුවිරමණයෝයි; වදුලේමැනු- **යතෝ බෝ මහානාම! උපාසකෝ පාණාතිපානා පටිවිරතෝ හොති අදිනනාදනා- කාමෙසු මිච්ඡාචාරා- මුසාවාදා- සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතෝ හොති එත්තාවතා බෝ මහානාම! උපාසකෝ සීලවා හොති ති.**

(මහානාමය! යම් කලෙකපටන් උපාසකතෙම ප්‍රාණඝාතයෙන් වැලකුනේ වේ ද අදත්තාදනයෙන්- කාමයෙහි වරදවා හැසිරීමෙන්- මෘෂාවාදයෙන්- මදප්‍රමාදයට කරුණුවූ රහමෙර පිමෙන් වැලකුනේ වේද මහානාමය! මේපමණෙකින් උපාසක තෙම සිල්වත් වේ යයි.)

"ආජීවය කවරේද?" යනු මිථ්‍යාවෙළඳුම්පස දුරුකොට දැහැමෙන් සෙමෙන් ජීවිකාව කිරීමයි; මේ වදුරුනලදමැයි. **පඤ්චිමා භික්ඛවෙ! වණිජ්ජා උපාසකෙන අකරණීයා කතමා පඤ්ච? සත්ථවණිජ්ජා සත්තවණිජ්ජා මංසවණිජ්ජා මජ්ජවණිජ්ජා විසවණිජ්ජා ඉමා බෝ භික්ඛවෙ! පඤ්ච වණිජ්ජා උපාසකෙන අකරණීයා ති.**

(=මහණෙනි! උපාසකයා විසින් නො කටයුතුවූ මේ වෙළඳුම් පසකි; ඒ පස කවරහු ද? සත්‍රාකිංසක ආවුධවෙළඳුමය වහල්පිණිස මිනිසුන් වෙළඳුමය මරනුපිණිස සතුන් වෙළඳුමය මස් වෙළඳුමය විෂ වෙළඳුමය යන මොහුයි; මහණෙනි! මෙකී වෙළඳුම් පස උපාසකයා විසින් නො කටයුත්තාහුයයි.)

"විපත්ති කවරීද?" යනු ඒ ශීලයට ද ඒ ආජීවයට ද යම් විපත්ති යක් ඇත්තිද මෝතොමෝ ඒ උපාසකයාහට විපතතිනම් වන්නීය; තවද යමක් කරණකොටගෙන මේ උපාසකතෙම සැඩොලාත් වේද කිලිටු ඇත්තෙකුත් වේද අන්තිම නීචයෙකුත් වේද ඔතොමෝත් මේ උපාසකයාහට විපත්ති යයි දතයුත්තිය. ඒ විපත්තිහු ද අවීවශයෙන් අශ්‍රද්ධාදි පඤ්චධර්මයෝ වෙති. වදුලේමැනු- **පඤ්චහි භික්ඛවෙ! ධම්මෙහි සමන්නාගතෝ උපාසකෝ උපාසක චණ්ඩාලෝ ච හොති උපාසක මලඤ්ච උපාසකපතිකිට්ඨෝ ච කතමෙහි පඤ්චහි? අස්සද්ධෝ හොති දුස්සීලෝ හොති කොතූහලමඞ්ගලිකෝ හොති මඞ්ගලං පච්චෙති නො කම්මං ඉතොච බහිද්ධා දක්ඛිණෙය්‍යං ගවෙසති තත්ථච පුබ්බ කාරං කරොති ති**

මහණෙනි! අඟුණාඞ්ග පසකින් සමන්විතවූ උපාසකතෙම උපාසක චණ්ඩාල යෙක් ද වෙයි උපාසකමලිනයෙක් ද වෙයි උපාසක නීචයෙක් ද වෙයි කවරපස කින්ද යත්? සැදුහැ නැත්තේ වේද සිල් නැත්තේ වේද කුතුල් මඟුල් ඇත්තේ වේද මඞ්ගලය බලාද කර්මය නො බලාද (විශ්වාස නොකෙරේද) මේ ශාසනයෙන් පිට දක්ෂි ණෙය්‍යයෙක් සොයාද හෙවත් පරලොව අදහා දෙන දනයට සුදුස්සෙක් සොයාද ඒ බාහිර ක්‍ෂීණාසවයන් කෙරෙහි අග්‍ර දනය දේද යන මේ පසයි.

"සම්පත්ති කවරීද"? යනු ඔහට යම් ශීල සම්පත්තියකුත් අජීව සම්පත්තියකුත් වන්නීද රතනත්‍රයවාදිය සිඛකරන්නාවූ යම් ශ්‍රද්ධාදි පඤ්ච ධර්මකෙනෙක් වෙත්ද මොවුහු සම්පත්ති නම් වෙති. වදුලේමය- **පඤ්චහි භික්ඛවෙ! ධම්මෙහි සමන්නාගතෝ උපාසකෝ උපාසකරතනඤ්ච**

උපාසක පදුමක්ඛ උපාසක පුණ්ඩරීකොව කතමෙහි පඤ්චහි? සඩ්ඪා හොති සීලවා හොති න කොතූහලමඞ්ගලිකෝ හොති කම්මං පවෙචති නෝ මඞ්ගලං න ඉතෝ බහිධා දක්ඛිණෙය්‍යං ගවෙසති ඉධ ච පුබ්බකාරං කරොති ති.

(=මහණෙනි! ගුණාඩ්‍ය (=සම්පත්) පසකින් සමන්විතවූ උපාසකතෙම උපාසක රුවන ද උපාසක පියුම ද උපාසක පුණ්ඩරිකය ද වෙයි, කවර සම්පත්හි පසකින් ද යත්? සැදුහැති වේද සිල්වත් වේද කුතුහල්මඟුල් ඇත්තේ නො වේ ද කර්‍මය විශ්වාස කෙරේද දෘෂ්ටාදි මඞ්ගලය විශ්වාස නොකෙරේද මේ ශාසනයෙන් පිටත දක්ෂිණෙය්‍ය යෙක් නො සොයාද මේ ශාසනයෙහි ම අග්‍රදානාදිය කෙරේද යන මේ පස වෙහි.)

අගහ ශබ්දය. අජ්ජතග්ගෙ යන මෙහි මේ "අගහ" ශබ්දය තෙම ආදිය කොටිය කොඨාසය ශ්‍රෙෂ්ඨය යන මේ අර්‍ථයන්හි දක්නා ලැබේ. ඒ එසේමැයි- **අජ්ජතග්ගෙ සම්ම දෙවාදික! ආවජ්ජාමි වාරං නිගණ්ඨානං නිගණ්ඨිනං** යනාදිතැන්හි ආදියෙහි දක්නා ලැබේ. **නෙ නෙව අඩ්ඪුලග්ගෙහන නං අඩ්ඪුලහං පරාමසෙය්‍ය උච්ඡහං වෙළහං** යනාදිතැන්හි කෙළවරෙහි දක්නා ලැබේ, **අනුජානාමි භික්ඛවෙ! අම්බිලහං වා මධුරහං වා තිත්තකහහංවා විහාරග්ගෙනවා පරිවෙණග්ගෙන වා භාජෙතුං** යනාදිතැන්හි කොඨාසයෙහි දක්නා ලැබේ. **යාවතා භික්ඛවෙ! සත්තා අපදා වා -පෙ- තථාගතෝ තෙසං අග්ගමක්ඛායති** යනාදි තැන්හි ශ්‍රෙෂ්ඨයෙහි දක්නා ලැබේ. මෙහි වනාහි මේ "අගහ" ශබ්දයතෙම "ආදිය යන අර්‍ථයෙහි දතයුතුයි. එහෙයින් **අජ්ජතග්ගෙ** යනු අද ආදිකොට යයි මෙසේ මෙහි අර්‍ථය දතයුත්තේය. **අජ්ජතං** යනු අදවූයේ (යනාර්‍ථයි;) "අජ්ජදග්ගෙ" යි හෝ පාඨයි දකාරය පද සන්ධිකරයි; අද ආදිකොට යන අර්‍ථයි; **පාණුපෙතං** යනු පාණෙහි උපෙතං (ප්‍රාණයන් සීමාකොට;) මාගේ ජීවිතය යම්තාක් පවතීද එතාක් සීමාකොට අන්‍යන්‍ය ශාස්තෘකවූ තුන්සරණ ගමනයෙන් සරණ ගියාවූ උපාසකවූ කැපකරුවූ මා හට්ද් ගෞතමයන්වහන්සේ ධරනසේක්වා දැනගන්නාසේක්වා; තවද "මම වනාහි ඉදින් මාගේ හිස නියුණු කඩුවකින් සිඳින්නාහු නම් බුදුන් නො බුදුනැයි කියා හෝ දහම් නො දහමැයි කියා හෝ සඟුන් නො සඟුනැයි කියා හෝ නො ම කියන්නෙමි"යි මෙසේ ආනම්‍සනනිය්‍යාතනයෙන් සරණගොස් සිව්පසයෙන් ද පවරා උනස්නෙන් නැඟී භාග්‍යවතුන් වහන්සේ අභිවාදනය කොට තුන්වරක් පැදකුණුකොට ගියේයයි.

සඤහෙරව සූත්‍ර වර්‍ණනා නිමි.

අනඞ්ගණ සූත්‍ර වණ්ණනා.

——o:o——

එවමේම සුතං- ආයස්මා සාරිපුත්තෙතා යි අනඞ්ගණ සූත්‍රයයි. එහි මෝතොමෝ අප්‍රකට පද වණ්ණනායි. මේ සූත්‍රයෙහි (අනුත්තාන පද වණ්ණනා) යම්සේද සියලු සූත්‍රයන්හි එසේමැයි. එසේ හෙයින් මෙයින් මත්තෙහි මෙපමණකුත් නො කියා අප්‍රකට පදවණ්ණනාව ම කරන්නෙමු. **චතුනාරෝ** යනු ගණන පරිච්ඡේදයයි; **පුග්ගලා**= සත්ත්වයෝ මනුෂ්‍යයෝ පුරුෂයෝ; මෙතෙකින් ම ශාරිපුත්‍ර මහාස්ථවිරයෝ පුද්ගලවාදිහයි නො ගතයුතුයි; ඒ එසේමැයි- මේ (ශාරිපුත්‍ර) ආයුෂ්මත්තෙම බුඩපුත්‍රයන් අතුරෙන් ශ්‍රෙෂ්ඨවෙයි, හේ සප්‍රඥ භාග්‍යවත්හුගේ දෙශනාවට අවිරුඩ වෙමින් මැ දෙශනා කෙරෙයි; භාග්‍යවත් බුදුරජාණන්වහන්

විවිධ දෙශනාව.

සේගේ දෙශනා තොමෝ විවිධවන්නිය සම්මුති දෙශනාව ද පරමාර්ථ දෙශනාව දැයි කියායි; ඒ විවිධ දෙශනාවන් අතුරෙහි පුද්ගල යැ සත්ව යැ සත්‍රී යැ පුරුෂ යැ ක්ෂත්‍රිය යැ බ්‍රාහ්මණ යැ දෙව යැ මාර යැ යන මෙබඳු වූවා සම්මුති දෙශනා නමු; අනිත්‍ය යැ දුඃඛ යැ අනාත්ම යැ සකඞ්ඛයෝ යැ ධාතුහු යැ ආයතනයෝ යැ සමෘතිප්‍රස්ථානයෝ යැ යන මෙබඳුවූවා පරමාර්ථ දෙශනා නමු. ඔවුනතුරෙහි භාග්‍යවත්හු යමෙක්තුමූ සම්මුතිවශයෙන් දෙශනාව අසා අරුත් පිළිවිද මොහය දුරුකොට (අගපලනිවන් සඞ්ඛ්‍යාත) විශෙෂයට පැමිණෙන්ට සමර්ථ වෙත්ද ඔවුනට සම්මුති දෙශනාව දෙශනා කරති; යමෙක් වනාහි පරමාර්ථවශයෙන් දෙශනාව අසා අරුත් පිළිවිද මොහය දුරුකොට විශෙෂයට පැමිණෙන්ට සමර්ථවෙත්ද ඔවුනට පරමාර්ථ දෙශනාව දෙශනා කරති. එහි මෝතොමෝ උපමායි- යම්සේ වනාහි දෙශභාෂාවන්හි දක්ෂවූ වෙදතුමයට අර්ථ වණ්ණනාකරන්නාවූ ආචාර්‍යතෙම යමෙක් දෙමළ බසින් කිකල අරුත් දැනගනිත්ද ඔවුන්ට දෙමළබසින් කියාද, යමෙක් ආන්ධ්‍රභාෂාදීන් අතුරෙහි අන්‍යතරභාෂාවකින් (කිකල්හි අරුත් දැනගනිත්ද) ඔවුන්ට ඒ ඒ භාෂාවෙන් ප්‍රකාශ කෙරේද, මෙසේ ඒ මානවකයෝ දක්ෂවූ ව්‍යක්තවූ ඇදුරකු කරා පැමිණ වහාම ශිල්ප උගනිති. ඒ උපමාවෙහි ඇදුරා මෙන් භාග්‍යවත් බුදුහුද; ත්‍රිවෙදයන් මෙන් කියයුතුබැවිහි පිහිටි තුන්පිටකයද; දෙශභාෂාවන්හි කෞශල්‍යය මෙන් සම්මුති පරමාර්ථදෙශනාවන්හි කෞශල්‍යයද; නානා දෙශභාෂාවන් දත් මාණවකයන් මෙන් සම්මුති පරමාර්ථ වශයෙන් ප්‍රතිවෙදයෙහි සමර්ථ වූ වෙනෙය සත්වයෝද; ආචාර්‍යයා විසින් ද්‍රවිඩ භාෂාදියෙන් ප්‍රකාශ කිරීම මෙන් භාග්‍යවත්හුගේ සම්මුති පරමාර්ථවශයෙන් දෙශනාවද දතයුත්තිය. මෙහිලා කිහු-

72. "දුවෙ සච්චානි අක්ඛාසි සම්බුඩො වදතං වරෝ
සම්මුතිං පරමත්ථඤ්ච තතියං නූපලබ්භති.

73. සඞ්ඛෙතවචනං සච්චං ලොකසම්මුති කාරණා
පරමත්ථ වචනං සච්චං ධම්මානං භූතකාරණා.

74. තස්මා වොහාර කුසලස්ස ලොකනාථස්ස සත්ථුනෝ
සම්මුතිං වොහරන්තස්ස මුසාවාදෙ න ජායති" ති.

(=වාදීශ්වරවූ සම්බුඛයන් වහන්සේ සම්මුති සත්‍යය ද පරමාර්ථ සත්‍යය ද යන සත්‍යය දෙකක් වදළහ; (එයින් පිටත්) තුන්වෙනි සත්‍යයක් නො ලැබේ. (පුද්ගලයෑ සත්වයෑ යනාදි) ලොකසඞ්කේත වචනය ලොකයාගේ සංඥාව නිසා පවත්නා හෙයින් සත්‍යය වේ; (අනිත්‍ය දුඃඛාදි) පරමාර්ථකථාව සවභාව ධර්මයන්ගේ තත්වාකාරය නිසා පවත්නා හෙයින් සත්‍යය වේ. එසේහෙයින් ලොකව්‍යවහාරයෙහි දක්ෂවූ (පුද්ගලය සත්වය යනාදීන්) ලොක සංඥාව වදරන්නාවූ ලොකස්වාමිවූ ශාස්තෘන්වහන්සේහට මෘෂාවාදයෙක් නො වේ යයි.)

පුදගලකථා. තවද භාග්‍යවතුන් වහන්සේ අට කරුණකින් පුද්ගල කථාව වදරණසේක; (කවර කරුණු අවකින්ද යත්?) භික්ෂුභාවප්‍රතිපත්තිය සම්පූර්ණ කිරීම පිණිස කර්මය සවකියකොට ඇතිබව දක්වනු පිණිසද ඒ සත්වයන් විසින් කළයුතු පින්කම් දක්වීම පිණිස ද ආනන්තරියකර්ම දක්වීම පිණිස ද (සතර) බ්‍රහ්මවිහාර දක්වීම පිණිස ද පුබේනිවාස දක්වනු පිණිස ද දක්ෂිණාවිශුද්ධිය දක්වනු පිණිස ද ලොකසම්මුතිය නො පිරිහෙලනු පිණිස ද යන (මේ කරුණු අටෙනි) සඤ්ඤා ධාතු ආයතනයෝ ලජ්ජාවෙති, භයවෙති, සි කී කල්හි මහාජනතෙමේ නො දනී සමෙමාහයට පැමිණෙයි, "සඤ්ඤාධාත්වායතනයෝ ලජ්ජාවෙති භයවෙති" නම් මේ කිමෙක්ද? සි විරුද්ධ වෙයි. සත්‍රීතොමෝ ලජ්ජා වෙයි, භය වෙයි, පුරුෂතෙම- ක්ෂත්‍රියතෙම- බ්‍රාහ්මණතෙම- දෙවතෙම- මාරතෙම (ලජ්ජාවෙයි භයවේ) යයි කිකල්හි

---

72. **වදතං වරෝ**= වාදීන් අතුරෙහි ශ්‍රෙෂ්ඨවූ; **සම්බුඛෝ**= සම්‍යක් සම්බුඛතෙම්; **සම්මුතිං**= සම්මුතිසත්‍යය ද; **පරමත්ථඤ්ච**= පරමාර්ථ සත්‍යය ද යන; **දුවෙ සච්චානි**= සත්‍යය දෙකක්; **අක්ඛාසි**= වදළේය; **තතියං**= (එයින් පිටත්) තුන්වෙනි සත්‍යයක්; **නූපලබ්භති**= නො ලැබේ.

73. **සඞ්ඛෙත වචනං**= (පුද්ගලය සත්වය යනාදි) ලොකව්‍යවහාර කථාව; **ලොක සම්මුතිකාරණා**= ලොකයාගේ සඤ්ඤා නිසා පවත්නා හෙයින්; **සච්චං**= සත්‍යය වේ; **පරමත්ථවචනං**= (අනිත්‍ය දුඃඛාදි) පරමාර්ථ කථාව; **ධම්මානං**= සවභාව ධර්මයන්ගේ; **භූතකාරණා**= තත්වාකාරය නිසා පවත්නා හෙයින්; **සච්චං**= සත්‍යය වේ.

74. **තස්මා**= එසේ හෙයින්; **වොහාරකුසලස්ස**= ලොකව්‍යවහාරයෙහි දක්ෂ වූ; **සම්මුතිංවොහරන්තස්ස**= (පුද්ගලය සත්වය යනාදීන්) ලොක සංඥාව වදරන්නාවූ; **ලොකනාථස්ස**= ලොකස්වාමිවූ; **සත්ථුනෝ**= ශාස්තෘන් වහන්සේ හට; **මුසාවාදෙ**= මෘෂාවාදයෙක්; **න ජායතීති**= නො වේ යයි.

වනාහි දැනගනී, සමෙමාහයට නො පැමිණෙයි, විරුඬ නො වෙයි; එහෙයින් භාග්‍යවත්හු හිරිඔතප් දක්වනු පිණිස පුද්ගලකථාව වදරති; සකඬියෝ කමීය සවකීය කොට ඇත්තාහුය, ධාතූහු- ආයතනයෝ (කමීය සවකීයකොට ඇත්තාහු) යයි කිකල්හිද මේ නය මැයි; එහෙයින් කමීය සවකීයකොට ඇතිබව දක්වනු පිණිස පුද්ගල කථාව වදරති. වෙළුවනාදිමහාවිහාරයෝ සකඬයන් විසින් කරවන ලද්දාහුය, ධාතූන් විසින්- ආයතනයන්විසින් (කරවනලද්දාහු) යයි කිකල්හිද මේ ක්‍රමය මැයි. එසේහෙයින් භාග්‍යවත්හු ප්‍රත්‍යානමපුරුෂකාර දක්වනු පිණිස පුද්ගලකථාව වදරති. සකඬියෝ මව ජීවිතයෙන් තොරකරති, පියා-රහත්හු (ජීවිතයෙන් තොරකරති;) රුධිරොත්පාදකකර්මය කෙරෙති, සඞ්ඝභෙදකර්මය කෙරෙත්,යයි කිකල්හිද ධාතූහු ආයතනයෝ(කෙරෙත්) යයි කිකල්හිද මේ නයමැයි. එහෙයින් භාග්‍යවත්හු ආනන්තරිය දක්වීම පිණිස පුද්ගල කථාව වදරත්. සකඬියෝ මෛත්‍රී කෙරෙති ධාතූහු- ආයතනයෝ (මෛත්‍රී කෙරෙති) යයි කිකල්හිද මෙම නයයි; එහෙයින් භාග්‍යවත්හු බ්‍රහ්මවිහාර දක්වීම පිණිස පුද්ගලකථාව වදරති. සකඬියෝ පෙර විසූ කඳපිළිවෙළ සිහිකෙරෙති, ධාතූහු- ආයතනයෝ (පෙර විසූ කඳපිළිවෙළ සිහිකෙරෙති,) යයි කිකල්හිද මෙම නයයි; එහෙයින් භාග්‍යවත්හු පෙර විසූ කඳපිළිවෙළ දක්වනු පිණිස පුද්ගල කථාව වදරත්. සකඬියෝ දැනය පිළිගනිති, ධාතූහු- ආයතනයෝ (දැනය පිළිගනිති) යයි කිකල්හි ද මහදෙනෙක් නො දනී සමෙමාහයට පැමිණෙයි, විරුඬවෙයි, සකඬධාතුආයතනයෝ පිළිගනිත්, මේ කිනම්ද? යි කියාගි. පුද්ගලයෝ පිළිගනිත්, සිල්වත්වූවාහු කලණදහම්ඇත්තාහු (පිළිගනිති) යයි කිකල්හි වනාහි දැනගනී, සමෙමාහයට නො පැමිණෙයි, විරුඬ නො වෙයි, එහෙයින් භාග්‍යවත්හු දක්ෂිණාවිශුඬිය දක්වීම පිණිස පුද්ගල කථාව වදරති. භාග්‍යවත් බුදුවරයෝ ලෝකසම්මුතිය ද නො හරිත්, ලෝකව්‍යවහාරයෙහි ලෝකනිරුක්තියෙහි ලෝකයාගේ කථාවෙහි පිහිටියාහු ම දහම් දෙසති; එහෙයින් භාග්‍යවත්හු ලෝකසම්මුතිය නො හරිනු පිණිස ද පුද්ගල කථාව වදරත්; එසේහෙයින් මේ (ශාරිපුත්‍ර) ආයුෂ්මත් තෙමේ ද ලෝකව්‍යවහාරයෙහි දක්ෂ බැවින් භාග්‍යවත් බුදු රජාණන් වහන්සේගේ දෙශනාවට විලොම් නොවමින් ලෝකසම්මුතියෙහි සිට ම චත්තාරෙමෙ ආවුසො! පුග්ගලා යි කීය. එහෙයින් මෙහි පරමාර්ථ වශයෙන් නො ගෙන සම්මුතිවශයෙන් ම පුද්ගල තෙමේ දතයුත්තේය.

සඤ්ඤා සංවිජ්ජමානා= ලොකසඞ්කේත වශයෙන් ඇත්තාහුය, ලැබෙන්නාහුය; **ලොකසමිං**= සත්වලොකයෙහි; **සාඛ අඛණ ශබ්දය.** **ණොව සමාණෝ** යනාදි තැන්හි වනාහි අඛණං යි කිසිතැනෙක්හි කෙලශයෝ කියනු ලැබෙත්. වදුලේ මැනු- **තජ්ජ කතමානි තීනි අඛණානි? රාගෝ අඛණං දෝසෝ අඛණං මොහෝ අඛණං** යි. කිසිතැනෙක යම්කිසි මලයක් හෝ

කලලක් හෝ (අඛඟණ යයි කියනු ලැබේ.) වදාළේමැනු- **නත්‍ථෙව රජ්ජස්ස වා අඛඟණස්ස වා පහානාය වායමති** යි. කිසිතැනෙක තාදෘශවූ භූමිභාගය (අඛඟණ යයි කියනු ලැබේ.) හේ **බොධිඝඛඟණං වෙති යඛඟණං** යනාදිවශයෙන් දතයුත්තේය. මෙහි වූ කලි නන්වැදෑරුම් තියුණු කෙලෙස් **අඛඟණා** යි අදහස්කරන ලද්දාහුය. ඒ සැබව- **පාපකානං ඛො එතං ආවුසො! අකුසලානං ඉච්ඡාවචරානං අධිවචනං යදිදං අඛඟණං** යි මතු කියන්නේය. අඛඟණ සහිත වූයේ "සාඛඟණ" නම් වේ; **සාඛඟණොව සමානො**= තියුණු කෙලෙස් සහිතවූයේ ම; **අත්ථි මෙ අජ්ඣත්තං අඛඟණන්ති යථාභූතං නප්පජානාති**= මාගේ ආත්මයෙහි සිත් සතන්හි කෙලෙස් ඇත්තයි නො දනී; මේ කෙලශයෝ නම් කකීශයෝ යැ ව්‍යාලයෝ යැ පහකටයුත්තෝ යැ නො ගතයුත්තෝ යැ විෂපෙවූ හිවැන්නෝ යැයි මෙසේ යථාසවභාවයෙන් ද නො දනී; යමෙක් ඇතැයි කියාත් දූනගනීද හෙතෙම මෙසේත් දූනගනී- "මාගේ අධ්‍යාත්මයෙහි තියුණු කෙලෙස් ඇතැයි තත්වූපරිද්දෙන් දූනගනී" යයි කියනු ලැබේ; යමෙකු විසින් වනාහි කෙලශයෝ මාගීයෙන් නො ද නසනලද්දාහුද, යම් ඒ ක්‍රමයකින් වැළකූ බැවින් නො ද උපදින්ද, මෙතෙම මෙහි "අනඛඟණ" යයි අදහස් කරන ලද්දේය; **නත්ථි මෙ අජ්ඣත්තං අඛඟණන්ති යථාභූතං නප්පජානාති**= මාවිසින් කෙලශයෝ යම් ඒ ප්‍රකාරයකින් වැළකූ බැවින් නැත, නො ද මාගීයෙන් නැසූබැවිනැයි නො දනී; ඔවුහු උපදනාහු මහත් අනර්ථ කරන්නාහුය, කකීශයෝ යැ ව්‍යාලයෝ යැ දුරුකටයුත්තෝ යැ විෂපෙවූ හිසදෘශයෝ යැයි මෙසේ යථාසවභාවයෙන් ද නො දනී; යමෙක් වනාහි මේ කාරණෙන් නැතැයි කියාත් දූනගනීද හෙතෙම මෙසේත් දූනගනී- "මාගේ අධ්‍යාත්මයෙහි තියුණු කෙලෙස් නැතැයි තත්වූ පරිද්දෙන් දූනගනී" යයි කියනු ලැබේ.

නත්‍ථ= ඒ සතරපුද්ගලයන් අතුරෙහි නොහොත් ඒ කෙලෙස් සහිත පුද්ගලයන් දෙදෙනා අතුරෙහි; **යවායං**= යො + අයං (= යම් මේ;) **යායං** යි ද පාඨයි.

කො නු ඛො ආවුසො සාරිපුත්ත! හෙතු? කො පච්චයො? යන දෙපදයෙන් ම කාරණය ම විචාරයි; **යෙනිමෙසං** යනු යම් හෙතුවකින් යම් ප්‍රත්‍යයකින් මොවුන් දෙදෙනා අතුරෙන් එකෙක් ශ්‍රෙෂ්ඨ පුරුෂය, එකෙක් හීනපුරුෂයයි කියනු ලැබේද ඒ හෙතුව කවරේද? ඒ ප්‍රත්‍යය කවරේදැ? යි මෙසේ මෙහි සම්බන්ධය දතයුත්තේය; එහි ලා කිසිසේත් "නප්පජානාති පජානාති" යි මෙසේ කියනලද දැනීමය නො දැනීමය යන මේ දෙක ම හෙතුව ද ප්‍රත්‍යය ද වෙයි; තෙරුන්වහන්සේ වනාහි තමන් වහන්සේගේ විසිතුරු වැටහීම ඇති බැවින් අතිශයින් ප්‍රකට කොට දක්වන්ට නැවත **නත්‍ථාවුසො!** යනාදිය වදාළහ. එහි **නෙසෙතං පාටිඛඛං**= ඒ පුද්ගලයා විසින් මෙය කැමැතිවිය යුතුයි, මේ තෙම

මීට ම පැමිණෙන්නේය, අනෙකෙකට නොපැමිණෙන්නේයයි කැමැති වියයුතුයි,අවශ්‍යයෙන් වනාසුලුයයි කියනලද වෙයි; **න ඡන්දං ජනෙස්සති** යනාදි නයින් කියනලද ඡන්දය නො ඉපදවීම් ආදිය සඳහා කීහ. **එහි දු න ඡන්දං ජනෙස්සති**= නො දන්නේ ඒ අඞ්ගණයාගේ ප්‍රහාණය පිණිස කත්තුකම්‍යතාඡන්දය නො උපදවන්නේය; **න වායමිස්සති**= ඊට වඩා අතිශයින් බලවත් වූ ව්‍යායාමය ද නො කරන්නේය; **න විඝාතං ආරභිස්සති**= ඵාමගතචිත්තය වනාහි නො ම ආරම්භ කරන්නේය, නො පවත්වන්නේයයි කියනලදවෙයි; **සාඞ්ගණෝ**= මේ රාගාදි වූ තියුණු කෙලෙසුන් හෙතුකොට ගෙන අඞ්ගණසහිතවූයේ; **සඞ්කිලිට්ඨචිත්තෝ**= ඔවුන් විසින් ම අතිශයින් කිලිටුසිත්ඇත්තේ මලින සිත්ඇත්තේ වෙසෙසින් පෙළනලද සිත්ඇත්තේ හාන්පසින් තවනලදසිත්ඇත්තේ ම වී; **කාලං කරිස්සති**= මැරෙන්නේය; **සෙය්‍යථාපි**= යම්සේ නම්; **කංසපාති**= කස්ලෝබදුනක්; **ආහඤ්ඤා**= ගෙනඑනලද්දී; **ආපණා වා කම්මාරකුලා වා**= අවණින් හෝ කස්තලිකරන කම්මරුන්ගේ ගෙයින් හෝ **රජෙන**= ආගනතුක රජස්වූ පස් ආදියෙන්; **මලෙන**= එහි ම නැංගාවූ ලොහමලයෙන්; **පරියොනද්ධා**= ගැවසීගන්නාලද්දී; **න ච පරියොදපෙය්‍යුං**= සේදීම් ඉලීම් ආදියෙන් පිරිසුදු නො කරවන්නාහු නම්; **රජපථෙ**= යනු "රජපථෙ" මෙය ම හෝ පාඨයි. ඇඳයට හෝ දුසවියාකොටුවෙහි හෝ බදුන් අතරෙහි හෝ යම්තැනෙක රජසින් තව රනු ලැබේද (එබදු වූ) ධූළි එන තැන්හි හෝ නුඹින තැන්හි හෝ යන අර්ථයි; **සඞ්කිලිට්ඨකරා අස්ස මලගහණිනා** යනු මෙහි ධූලිනඹින තැන්හි බහා තැබීමෙන් අතිශයින් කිලිටු වූවා පරිභොග නො කිරීම් පිරිසුදු නො කිරීමෙන් මලගන්නාලද්දී අතිශයින් මලගන්නාලද්දී යයි කියන ලද වෙයි; මේ ප්‍රතිපාඨාවචනයක් ද වෙයි; එහෙයින් මේ පදයාගේ මෙසේ අර්ථය දතයුත්තේය. ඇවැත්නි! ඕ කස්තලිතොමෝ මෙසේ කරනුලබන්නී පසුකලෙක අතිශයින් කිලිටුවූවා ද අතිශයින් මලගන්නා ලද්දී ද මැටිතලියක් හෝ කස්තලියක් හෝ දැයි දැනගැන්මට දුෂ්කර වන්නේද? නො වේදැ? සි; තෙරුන්වහන්සේ එය ප්‍රතිඥාකරන්නාහු **එවමාවුසෝ!** සී වදාළහ. යලි දම්සෙනවියෝ උපමාවක් මොනවට **ප්‍රති** පාදනය කරන්නාහු **එවමෙවඛෝ** යනාදිය වදාළහ. එහි මෙසේ උපමා සසඳීම දතයුත්තිය. සාඞ්ගණ පුද්ගල තෙම කිලිටු කස්තලිය වැන්නේය; කිලිටු කස්තලිය පරිභොගනොකිරීම ආදිකොට රජස් නඹින නැන්හි බහා තැබීම මෙන් පැවිදි ලබන්නාවූ ඒ පුද්ගලයා වෙදකම් ආදියෙහි නියුක්ත පුද්ගලයෙකු සමීපයෙහි පැවිදි ලැබීම වෙයි; කිලිටුවූ කස්තලියෙහි නැවත අතිශයින් කිලිටුබව මෙන් අනුක්‍රමයෙන් ආචාර්‍යෝ පාධ්‍යයන්ට අනුව හික්මෙන්නාවූ ඒ පුද්ගලයාගේ වෙදකම් ආදිය කිරීම වෙයි; මෙහි සිටියහුගේ සාඞ්ගණ (= තියුණු කෙලෙස් සහිත) කලුරිය කිරීම වෙයි; නොහොත් පිළිවෙළින් දුෂ්කෘතදුර්භාෂිතව්‍යතික්‍රමය වෙයි; මෙහි සිටියහුගේ සාඞ්ගණකාලක්‍රියාව වෙයි; නොහොත්

අනුක්‍රමයෙන් පවිතිථුලසිව්‍යතික්‍රමය ද සඞ්ඝාදිශෙෂව්‍යතික්‍රමය ද පාරාජිකව්‍යතික්‍රමය ද මාතෘඝාතාදිආනන්තරියකරණය ද වෙයි; මෙහි සිටිය හුගේ සාඞඝණකාලක්‍රියාව වන්නියයි.

සඞකිලිඨචිත්තෙනා කාලං කරිස්සති යන මෙහි ද අකුසලසිතින් යුක්තව කලුරිය කරන්නේය යන මෙසේ අර්ථය නො දත යුතුයි; යම් හෙයකින් සියලු සත්වයෝ ම ප්‍රකෘතිචිත්තයවූ භවාඞඝසිතින් ම කලුරිය කෙරෙත්ද එහෙයිනි. මේතෙම වනාහි චිත්තසන්තානය ශුඛ්‍රනොකොට කලුරියකරන්නේය යන මේ අර්ථය සඳහා මෙසේ වදරන ලද්දේ යයි දතයුත්තේය. දෙවෙනි වාරයෙහි **පරියොදපෙය්‍යුං**= සේදීම් ඉලීම් සියුම් අලුයෙන් පිරිමැදීම් ආදියෙන් පිරිසුදුවූ ආදර්සමණ්ඩලයක් සමාන කරන්නාහු නම්; **න ච නං රජ්ජාපයේ**= පළමු කියනලද ප්‍රකාරස්ථාන යෙක්හි බහා නො තබා කරඬුමදෙස් ආදියෙක්හි හෝ තබන්නාහු නම් අවවින් වෙළා නාගදන්තයෙහි හෝ ලගන්නාහු නම්; සෙස්ස කියනලද ක්‍රමානුසාරයෙන් ම ගතයුතුයි. මෙහි උපමාසංසන්දනය වනාහි මෙසේ දතයුත්තීය. සාඞඝණපුද්ගලතෙම කිලිටු කස්තලියක් සමාන වන්නේය; පැවිදිලබන්නාවූ ඒ පුද්ගලයාට යම් භික්ෂූහුතුමූ අවවාද කෙරෙත් ද අනුශාසනා කෙරෙත් ද මදපමණවූත් ප්‍රමාදයක් දැක දඬුවම් කොට නැවත නැවත භික්මවත්ද (එබඳුවූ) ප්‍රියසීලී භික්ෂූන්ගේ සමීපයෙහි පැවිදිලැබීම කිලිටු කස්තලිය පරිභොගකිරීම ආදිකොට ශුඛස්ථානයෙක්හි තැබීම මෙන් වන්නේය; ආචාර්‍යඋපාධ්‍යයන්ට අනුව හික්මෙන්නාවූ ඒ පුද්ගලයාගේ අනුක්‍රමයෙන් යහපත් වත්පිළිවෙත කිලිටු කස්තලිය පිළිබඳ පසුකලෙක පිරිසුදු බව හාත්පසින් පිරිසුදු බව මෙනි; මෙහි සිටියහුගේ අනඞඝණ (=තියුණු කෙලෙස්රහිතවූ) කාලක්‍රියාව වන්නිය; නොහොත් අනුක්‍රමයෙන් පරිශුඛ වූ ශීලයෙහි පිහිටා තමහට අනුරූපවූ බුඩවචනය ඉගෙන ධුතාඞඝයන් සමාදන්ව තමහට අනුකූල වූ කර්මස්ථානයක් ගෙන ග්‍රාම්‍යාන්තසෙනාසනයෙහි විසීම හැර වනපර්‍යන්තසෙනාසනයෙහි විසීම වෙයි; මෙහි සිටියහුගේ අනඞඝණකාලක්‍රියාව වන්නිය; නොහොත් අනුක්‍රමයෙන් කිසුණුපිරියම් කොට අවසමවත් ඉපදවීමෙන් කෙලෙශවිෂකම්හණය ද; විදර්‍ශනාපාදකධ්‍යානයෙන් නැඟිසිට විදර්‍ශනාවෙන් කෙලෙසුන්ගේ තදඞඝනිවාරණය ද ස්‍රොතාපත්තිඵලාධිගම්යද -පෙ- රහත් බැව් පසක් කිරීම ද වේ යයි; මෙහි සිටියහුගේ අත්‍යන්තයෙන් අනඞඝණකාලක්‍රියාව ම වන්නියයි.

තුන්වෙනි වාරයෙහි **සුභනිමිත්තං**= රාගයට කරුණුවූ ඉෂ්ටාලම්බනය; **මනසිකරිස්සති**= ඒ ඉෂ්ටාලම්බනයෙහි විරුඬවූ (=වරදවා පැමිණි) සිහිය ඒ ශුභනිමිත්ත ආවර්ජනාකරන්නේය; **තස්ස සුභනිමිත්තස්ස මනසිකාරා**= ඒ පුද්ගලයාගේ ශුභනිමිත්ත මෙනෙහි කිරීම් කරුණෙන්; **අනුඛංසෙස්සති**= හිංසාකරන්නේය මැඩපවත්වන්නේය; ඒ එසේමැයි-

"රාගයතෙම උපදිනුයේ කුසලවාරය පසිඳ තෙමේ ම අකුශලජවන්වැ සිටිනුයේ කුසල්සිත මැඬපවත්වාය"යි දතයුතුයි. සෙස්ස කීක්‍රමානුසාර යෙන් ම ගතයුතුයි.

මෙහි උපමා සංසන්දනය වනාහි මෙසේ දතයුත්තීය. පියවින් මද කෙලෙස් ඇති අනඛණ පුද්ගලතෙම් පිරිසුදු කස්තලිය වැන්න; පිරි සුදු කස්තලිය පරිභොග නො කිරීම ආදිකොට රජස්පථයෙහි නික්ෂේ පය මෙන් පැවිදිලබන්නාවූ ඒ පුද්ගලයාගේ" යි මෙයින් මත්තෙහි සියල්ල පළමුවාරය සමාන මැයි.

සතරවැනි වාරයෙහි **සුභනිමිත්තං න මනසි කරිස්සති**= යන මෙහි සමාහිවිරහය නැතිහෙයින් ඒ ශුභනිමිත්ත ආවර්ජනා නො කරන්නේය; සෙස්ස දෙවෙනිවාරයාගේ අනුසාරයෙන් දතයුතුයි. **අයං බො ආවුසො!** යනාදිය වනාහි "කො නු ඛො ආවුසො!" යනාදියෙහි කීනයමැයි. මෙවිට ඒ අඛණය නන්අයුරින් ප්‍රකටකරවනු කැමැතිවූ ආයුෂ්මත් මහා මෞද්ගල්‍යායනයන් විසින් **අඛණං අඛණං** යනාදි නුයින් විවරන ලද්දහු එය ප්‍රකාශකරනයේක් **පාපකානං බො එතං ආවුසො!** යනා දිය වදුළහ. එහි **ඉත්ථාවවරණං**= කැමැත්තෙන් හැසිරෙන්නාවූ ඉත්ථා වශයෙන් අවකීර්ණවූ පවත්නාවූ නානාප්‍රකාරවූ කොපඅප්‍රත්‍යයන්ට යන අර්ථයි; **යං ඉධෙකච්චස්ස**= යම් හෙයකින් මේ ලොකයෙහි කිසි වෙකුට කැමැත්තක් උපදනේ ද ඒ සථානය ඒ කාරණය වන්නේය, ඇත, ලැබේයයි කියනලද්දේ වෙයි; **ආපත්තෙනා අස්සං**= පැමිණියෙමි වන්නෙමි; **න ච මං භික්ඛූ ජානෙය්‍යුං**= භික්ෂූහු ද මා නො දන්නාහු නම්; මෙහි කාරණය කිමයත්? ලාභය කැමති බවයි; ඒ එසේමැයි– ලාභාර්ථි වූ මහණතෙම පියවින් මැ කළපින් ඇත්තේ මිනිසුන් විසින් සත්කාර ගරුකාර කරනලද්දේ මෙසේ සිතයි, ඇවතට පැමිණි මහණ සථවිරභික්ෂූහු දැන මධ්‍යමභික්ෂූන්ට දන්වති, ඔවුහු නවකභික්ෂූන්ට ද නවකභික්ෂූහු විහාරයෙහි විඝාසාදීන්ට ද ඔවුහු අවවාදයට පැමිණි භික්ෂුණීන්ටද (දන්වති;) මෙසේ ක්‍රමයෙන් සිව්පිරිස ද දැනගනිත්; මෙසේ ඔහුගේ ලාභාන්තරාය වෙයි; එකාන්තයෙන් මම ඇවතට ද පැමිණියෙමි වෙමි, භික්ෂූහු මා නො ද දැනගන්නාහු නම් ඉතා යෙහෙකැයි; **යං තං භික්ඛුං භික්ඛූ ජානෙය්‍යුං**= යම් කරුණකින් ඒ භික්ෂුව අන්‍ය භික්ෂූහු දැනගන්නාහුද ඒ කාරණය විද්‍යමානවේ මඟ, ඇත්මය, නැත්තේ නො වේ; ඒ එසේ මැයි– සථවිරභික්ෂූහු දැන මධ්‍යභික්ෂූන්ට දන්වති, මෙසේ හෙතෙම පෙර කීනයින් සිව්පිරිස්හි ප්‍රකට වෙයි, යලි මෙසේ ප්‍රකටවූයේ අයයින් මඩනාලද්දේ ගම් සියයකට ද පැමිණ එලිපත් සිය යක පා පිස යථා දෙවි පයින් (=සිස් පයිනැයිසේයි.) නික්මේයි; ඉක්බිති භික්ෂූහු මා ඇවතට පැමිණියේයයි දනිති, ඔවුන් විසින් මෙසේ නසන ලද්දේත් වෙමියි සිතා; **ඉති සො කුපිතො හොති අප්පතීතො**= හෙතෙම මේ කාරණයෙන් ක්‍රොධයෙන් මඩනාලද්දේ කිපියේත් වෙයි,

දෙමිනසින් මඩනාලද්දේ නො සතුටුවූයේත් වෙයි; **යො චෙව ඛො ආවුසො! කොසො යො ච අපපච්චයො උභයමෙතං අඛණං=** ඇවැත්නි! සංඝකාරසඤ්ඤයට ඇතුලත්වූ යම් මේ කොපයකුත් වේද, වෙදනාසඤ්ඤයට ඇතුලත්වූ යම් මේ නො සතුටකුත් වේද, මේ දෙක අඛණයයි මෙසේ මෙහි අර්ථය දතයුතුයි; මෙද එබඳු පුද්ගලයන්ගේ වශයෙන් කියනලදී; ලොභය වනාහි මේ අඛණයට පූර්භාගවශයෙන් ද මොහය සම්ප්‍රයොගවශයෙන් ද ගන්නාලද්දේම වෙයි. **අනුරහො මං** යනු පළමුමෙන් ම භික්ෂූහු තමා ගෙන විහාරකෙළවර සෙනස්නකට පමුණුවා දෙර වසා වොජනාකරනකල්හි කැමති වෙයි; **ඣානං ඛො පනෙතං=** යම්හෙයකින් ඒ භික්ෂුව සිව්පිරිස් මැදට පමුණුවා ව්‍යක්තවූ විනීතවූ (භික්ෂූහු) තාවිසින් අසවල් නම් නැත වෙදකම් කරනලද්දේය, යනාදිනයින් වොදනාකරන්නාහුද මේ කාරණය ද වන්නේය; හෙතෙම සිව්පිරිස්හි ප්‍රකටවූයේ වෙයි; මෙසේ ප්‍රකටවූයේ ද අයසින් මඩනාලද්දේ ද වේයයි සියල්ල පූර්වයට සමානමැයි; **සපපටිපුග්ගලො=** සමානවූ පුද්ගලයෙක්; "සමාන" නම් ඇවැත් සහිතවූයේයි; "පටිපුග්ගල" නම් වොදකතෙමේයි; මේතෙම ඇවැත් සහිතවූවෙකු විසින් මැ වොදනා කිරීම කැමතිවෙයි; (කුමක්හෙයින යත්?) තෙපි ද මෙනම් මෙනම් ඇවතට පැමිණියෙහි පළමුකොට එය පිළියම් කරව, පසුව මා වොදනා කරන්නෙහි ය,යි කියන්ට හැකි වේ යයි සිතමිනි; තවද ජාතිආදියෙන් ද සමාන වූ පුද්ගලතෙමේ "සපපටිපුග්ගල" නම් වේ; ඒ එසේමැයි- මේ තෙම තමහට ජාතියෙන් ද කුලයෙන් ද බහුශ්‍රැතභාවයෙන් ද ව්‍යක්ත භාවයෙන් ද ධුතාඞ්ගයෙන් ද යන මේ ආදියෙන් ද සමානවූවෙකු විසින් ම වොදනාකිරීම කැමති වෙයි, එබඳු පුද්ගලයෙකු විසින් කියන ලද්ද ඉතා දුක් නො වේ යයි, (යම්හෙයකින්) සිතන්නේද (එහෙයිනි;) **අපපටිපුග්ගලො** යන මෙහි අයුක්ත වූ ප්‍රතිපුද්ගලතෙම "අපපටිපුග්ගල" නම් වේ; මේ ඇවැත්ආදියෙන් අසමානබැවින් ප්‍රතිශත්‍රු වූ ප්‍රතිමල්ල වූ වොදකයෙක් වන්ව අයුතුයයි කියනලද්දේ වෙයි; **ඉති සො කුපිතො=** මෙසේ හෙතෙම මේ අප්‍රතිපුද්ගලයාගේ වොදනාවෙන් කිපියේ වෙයි;

"අහෝ වත" ශබ්ද. සතරවෙනි වාරයෙහි **අහො වත** යනු **අහො වත රෙ අමහාකං පණ්ඩිතකා අහො වත රෙ අමහාකං බහුස්සුතකා තෙවිජ්ජකා** යි ගැරහීමෙහි ද දක්නා ලැබේ; **"අහො වත මං දහරංයෙව සමානං රජ්ජෙ අභිසිඤ්චෙය්‍යුං** යි ප්‍රාර්ථනාවෙහි ද දක්නාලැබේ; මෙහි ප්‍රාර්ථනාවෙහි ම වේ; **පමිපුච්ඡිතා පමිපුච්ඡිතා=** නැවත නැවත විචාරා; මේ මහණ ද ලාභකැමැත්තේ භාග්‍යවතුන් විසින් තමා විචාළයුත්තෙකු කොට කැමති වෙයි; හෙද වූ කලි අනුමතිපෘච්ඡාවෙනි, මාගීයක් හෝ ඵලයක් හෝ විදර්ශනාවක් හෝ ඇතුලත් කොට නො වේ; මේතෙම වනාහි ශාරිපුත්‍රාදී මහතෙරුන් **නං කිම්මඤ්ඤසි සාරිපුත්ත! මොග්ගල්ලාන! කස්සප! රාහුල!**

චක්ඛුං නිච්චං වා අනිච්චං වා යි මෙසේ පිරිස්මැද නැවත නැවත විචාරා දහම් දෙසන්නාවූ භාග්‍යවතුන්වහන්සේ දකී; පණ්ඩිතවූ සථවිරයෝ තුමූ ශාස්තෘන්වහන්සේගේ සිත සතුටුකෙරෙත් යයි; ඒ භික්ෂූන්ගේ ගුණය කියන්නාවූ ද ලාභසත්කාරය එලවන්නාවූ ද මිනිසුන් දකී; එහෙයින් ඒ ලාභසත්කාරය කැමතිවන්නේ මෙසේ සිතා සාරා සිටුවනලද කණුවක් මෙන් භාග්‍යවතුන්වහන්සේගේ අභිමුඛයෙහි ම වෙයි; **ඉති සො කුපිතො**= යනු ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ ඔහු නො මෙතෙහි කොට ම අනිත් තෙරකෙනෙකු විචාරා දහම් දෙසනසේක; ඒ කරුණෙන් හෙතෙම භාග්‍යවතුන්වහන්සේට ද තෙරුන්වහන්සේට ද කිපියේ වෙයි; භාග්‍යවතුන්වහන්සේට කෙසේ කිපේද යත්? මම පැවිදිවූ තැන්පටන් ගඳකිළි පිරිවෙනින් පිටත යාමක් නො දනිමි, සියලු කාලයෙහි සෙවනැල්ලක් මෙන් නොහරිමි, මා විචාරා දහම් දෙසුම් පමණකුදු නැති, එකෙණෙහි දුටුපමණ ඇති තෙරුන් විචාරා දහම් දෙසති"යි මෙසේ භාග්‍යවතුන්වහන්සේට කිපෙයි; තෙරුන්ට කෙසේ කිපේද යත්? මේ මහලුතෙර භාග්‍යවතුන්වහන්සේගේ අභිමුඛයෙහි කණුවක් මෙන් හිඳී කවරකලෙක මොහු ධම්කාර්මිකයෝ අභව්‍යස්ථානයට පමුණුවා බැහැර කරන්නාහුද, යමහෙයකින් මේ තෙම මේ විහාරයෙහි ඉදින් නොවූයේ නම් අවශ්‍යයෙන් භාග්‍යවතුන්වහන්සේ මා සමග කථාකරන්නේ ද එහෙයිනි; මෙසේ තෙරුන්වහන්සේට කිපෙයි. **පුරක්ඛතා පුරක්ඛතා**= අභිමුඛයෙන් අභිමුඛයෙන් කොට පිරිවරා යයි කියනලද්දේ වෙයි; මේ තෙමේ ද ලාභකාමති වූයේ ම වෙයි; ඒ එසේ මැයි- මේතෙම මහපිරිවරින් ගම් වදනාවූ සෑ වදනාවූ බහුශ්‍රැත භික්ෂූන් දකී; ඔවුන්ගේ ඒ සම්පත්තිය දැක පැහැදුනාවූ පැහැදුනුඅයුරු කරන්නාවූ උපාසකයන් ද දකී එසේහෙයින් මෙසේ කැමති වෙයි; **කුපිතො** යනු මේතෙමේ ද භික්ෂූන්ට ද තෙරුන්ට ද යන දෙතැනෙක්හි කිපෙයි; භික්ෂූන්ට කෙසේ කිපේද යත්? මේ භික්ෂූහු සිවුරු හෝ පිණ්ඩපාතය හෝ යමක් ම මට උපදීද එය ගෙන පරිභොගකෙරෙති, එතකුදු වුවත් මාගේ පා සිවුරු ගෙන පිටිපසින් එන්නෙකු පවා නැතැයි මෙසේ භික්ෂූන්ට කිපෙයි; තෙරුන්ට කෙසේ කිපේ ද යත්? මේ මහලුතෙර ඒ ඒ තැන්හි තෙමේ ම පැනෙයි, කවදානම් ඔහු ධම් කාර්මිකයෝ බැහැරකරන්නාහුද, මොහු නැතිකල්හි අවශ්‍යයෙන් මා ම පිරිවරන්නාහුය, යි කියායි; **භත්තග්ගෙ**= භොජනසථානයෙහි; **අග්ගාසනං**= සඞ්ඝසථවිරාසනය; **අග්ගොදකං**= දක්ෂිණොදකය; **අග්ගපිණ්ඩං**= සඞ්ඝසථවිරයන් පිණිස වූ පිණ්ඩය; නොහොත් සියලු තැන්හි **අග්ගං**= යන මෙය ප්‍රණීතයට නමකි; එහි "මම ම ලබන්නෙමි නම්" යන කැමැත්ත ඉතා මහාසාවද්‍ය වූවා නො වේ; "අන්‍යයෝ නො ලබන්නාහු නම්" යන මෝ වනාහි ඉතා මහාසාවද්‍ය වන්නීය; මේතෙමේ ද ලාභකැමැත්තේ සිවුරුඛැරීම් ආදියෙන් ප්‍රසාදඵලවන්නේ වෙයි; කිසි කලෙක පැවිදි වෙයි, කිසිකලෙක සිවුරු හරී; එහෙයින් හෙතෙම පෙර ලත්විරූ

ආසනාදිය පසුව නො ලබන්නේ මෙසේ සිතයි; **න සො භික්ඛු ලභෙය්‍ය**= යනු ඒ මහණ සථවිර භික්ෂූන්ට අග්‍රාසනාදිය පැමිණී කල්හි ඒ අනුසාරයෙන් මධ්‍යම භික්ෂූන්ට ද සෙසු නවකභික්ෂූන්ට ද (ආසනාදිය පැමිණීකල්හි) කිසිකලෙක යම් ඒ සියල්ලට නිගිනවූ ආසනාදිය ලබයි, නො ම හෝ ලබයි; **කුපිනො** යනු මේතෙමේ ද මිනිසුන්ට ද තෙරුන්ට දැයි දෙතැනෙක්හි කිපෙයි; මිනිසුන්ට කෙසේ කිපේද යත්? මොවුහු මඞ්ගලාමඞ්ගලාදියෙහි මා නිසා භික්ෂූන් ලබති; "වහන්ස! මෙතෙක් භික්ෂූන් ගෙන අපට අනුකම්පාකළමැනවැ" යි කියති; දැන් ඒ මොහොත දුටුපමණඇති මහලු තෙරුන්ට කියා ගියා හුය; වේවා මෙවිට ඔවුන්ගේ යම් කටයුත්තක් උපන්කල්හි දැනගන් නෙමැයි මෙසේ මිනිසුන්ට කිපෙයි; තෙරුන්ට කෙසේ කිපේද යත්? ඉදින් මොවුහු නො වූවාහු නම් මනුෂ්‍යයෝ මා ම පවරන්නාහු යයි මෙසේ තෙරුන්ට කිපෙයි; **අනුමොදෙය්‍යං**= අනුමොදනාව කරන්නෙම් නම්; මේ තෙමේ ද ලාභකැමැත්තේ යම් ඒ ඛණ්ඩානුමොදනාවක් දනී; හෙතෙම අනුමොදනස්ථානයෙහි බොහෝ මාගම්හු පැමිණෙති, ඔවුහු මා හැඳින එතැන් පටන් සැලිබත් දෙන්නාහුයයි ප්‍රාර්‍ථනාකරන්නේ මෙසේ සිතයි; **ඨානං** යනු බහුශ්‍රැතයන්ට අනුමොදනාව භාරවෙයි; **එහෙයින් බහුස්සුතො අනුමොදෙය්‍ය** යි කියන ලද්දේ වෙයි; **කුපිතො** යනු මේ තෙම මිනිසුන්ට ද තෙරුන්ට ද ධර්මකථිකයන්ට ද යන තුන් තැනෙක්හි කිපෙයි; මිනිසුන්ට කෙසේද? මොවුහු පෙර මා කරා ම ඵලඹ අපට නාගසථවිරයෝ අපට සුමනසථවිරයෝ අනුමොදනා කෙරෙත්වායි යාඥාකෙරෙති; අද වූ කලී නො කීවාහු යයි මෙසේ මිනිසුන්ට කිපෙයි; තෙරුන්ට කෙසේද? " **මේ සඞ්ඝසථවිර තෙම තොපගේ කුළුපගවූ නාගතෙරුන් කරා සුමනතෙරුන් කරා ඵලඹෙවූ, මේතෙම අනුමෙවෙනිකරන්නේය**" යි නො කියායයි මෙසේ තෙරුන්ට කිපෙයි; ධර්මකථිකයාහට කෙසේ කිපේද? "**තෙරුන් විසින් කි ඇසිල්ලෙහි ම පහර ලත් කුකුළෙකු මෙන් වහවහා ශබ්දකෙරෙයි,** මොහු බැහැර කරන්නාහු නම් කැත, යම්හෙයකින් මොහු කැති කල්හි මම ම අනුමෙවෙනි කරන්නෙම්ද එහෙයිනි" මෙසේ ධර්මකථිකයාහට කිපෙයි; **ආරාමගතානං**= විහාරයෙහි රැස්වූවන්ට; මේතෙමේ ද ලාභාර්ථී වූයේ යම් ඒ ඛණ්ඩධර්මකථාවක් දනී; හෙතෙම එබඳු තැන්හී දෙයොදුන් තුන්යොදුන් දුරින් රැස්ව සාරීරත්‍රිකනිත්‍යධර්මශ්‍රවණයන් ශ්‍රවණය කරන්නාවූ සතුටුසිත්ඇති භික්ෂූන් ද "සාධු සාධු" යි මහා ශබ්දයෙන් සාධුකාරදෙන්නාවූ තරුණභික්ෂූන් ද සාමණේරයන් ද දකී; එයින් දෙවෙනි දිනයෙහි උපාසකයෝ ඇතුලුගමට ගියාවූ භික්ෂූන් විචාරති, "වහන්ස! කවරහු ධර්මකථාව කීවාහුද" යි; ඒ භික්ෂූහු අසවලා ද අසවලාදැ යි කියති; ඒ අසා ප්‍රසන්න වූ මනුෂ්‍යයෝ ධර්මකථිකයන්ට මහත් සත්කාර කරති; හෙතෙම ඒ සත්කාරය කැමති වන්නේ මෙසේ සිතයි; **ඨානං** යනු බහුශ්‍රැතවූ විනිශ්චයෙහි දක්ෂවූවන්ට

දහම් දෙසිම් භාරවෙයි; එහෙයින් බහුශ්‍රැත තෙමේ දෙසන්නේයයි කියන ලද්දේ වෙයි; **කුපිනෝ** යනු සතරපද ගාථාවක් පමණකුත් කියන්ට අවකාස නො ලබන්නේ තමාගේ මන්දභාවයට කිපියේ වෙයි, මම වනාහි මන්ද වූයෙම් නැණමද වූයෙම් (දහම්) දෙසන්ට කොයින් ලබන්නෙම් දැයි කියායි; **භික්ඛුනීනං=** අවවාද පිණිස හෝ උදෙසිම් පිණිස හෝ විචාරීම පිණිස හෝ පූජාකිරීම පිණිස හෝ ආරාමයට අවුත් රැස්වූ භික්ෂුණීන්ට; මෙතෙමේ ද ලාභකාමති වූයේ වෙයි; ඔහට මෙබඳු සිතක් වෙයි; මේ භික්ෂුණීහු මහා කුලවලින් නික්ම පැවිදිවූවාහුය; මනුෂ්‍යයෝ කුලයන්හි පිවිස හුන්නාවූ ඔවුන් කවරෙ කුගෙන් අවවාද හෝ පරිපුච්ඡාව හෝ ගන්නහුදැ?යි විචාරන්නාහුය; අනතුරුව අසවල් නම් ආයෂ්මන්වහන්සේ බහුශ්‍රැතයහ, උන්වහන්සේට (ප්‍රත්‍යය) දෙවු, (සත්කාර) කරවු යයි කියන්නාහුය; එහෙයින් ඔහට මෙසේ ඉවජ්ජාව උපදී; **ඣානං** යනු අවවාදදිය නම් බහුශ්‍රැත යන්ට භාරවෙයි; එහෙයින් "බහුස්සුතො දෙසෙය්‍ය" යි කියනලද්දේ වෙයි; **කුපිනෝ** යනු මේතෙම දෙතැනෙක්හි කිපෙයි, මොවුහු පෙර මා නිසා පොහෝ පවුරුණු ආදිය ලබති, දැන් ඔවුහු එකෙණෙහි දුටුපමණඇති මහලුතෙරුන් සම්පයට ගියාහුයයි ඒ භික්ෂුණීන්ට ද; මේ තෙම ඔවුන්ට වහා අවවාද දුන්නේ ම යයි ධම්මකථිකයාහට ද (කිපෙයි;) **උපාසඣානං** යනු ආරාමයට ගියාවූ උපාසකයෝ නම් බැහැරකළ කම්නැතඇති මහා උපාසකයෝ වෙති; ඔවුහු පුත්‍ර සහෝදරයන්ට කම්නැත පාවාදී බණ අසමින් හැසිරෙති; මේතෙමේ ඔවුන්ට දෙශනාකරන්ට කැමතිවෙයි; කරුණු කිම යත්? මොවුහු පැහැද උපාසිකාවන්ට ද සැලකරන්නාහුය ඉක්බිති උපාසිකාවන් සමග මට ම ලාභ සත්කාරය ලවන්නාහුයයි කියායි; **ඣානං** (යන මෙය) බහුශ්‍රැතයා සමග ම යෙදිය යුතුයි; **කුපිනෝ** යනු මේතෙමේ ද දෙතැනෙක්හි කිපෙයි; මොවුහු අතිකෙකු සම්පයෙහි (බණ) අසත්, අපගේ කුලූපග (තෙරුන්) සම්පයෙහි අසමු යයි නො පැමිණෙත්, එසේ වේවා දැන් ඔවුන්ට කටයුත්තක් උපන්කල්හි දැනගන්නෙ මැ"යි කියා උපාසකයන්ට ද; මේතෙමේ මොවුන්ට දෙශනාකෙරේයයි ධම්මකථිකයාට ද (කිපෙයි;) **උපාසිකානං** යනු ආරාමයට පැමිණි උපාසිකාවෝ නම් ආසන පූජාදිය කිරීම පිණිස හෝ පොහෝදිනයෙහි රැස්වූවාහු වෙති; සෙස්ස උපාසකවාරයෙහි කීනයමැයි. **සක්කරෙය්‍යුං=** සකස්කොට ද කරන්නාහු නම්, සුඳරකොට ද කරන්නාහු නම්; මෙයින් තමා කෙරෙහි කරනුලබන්නාවූ සත්කාරය සකස්කොට කරනලද්දක් ද සුඳර වූවක් ද ප්‍රාර්ථනා කරයි; **ගරු කරෙය්‍යුං=** ගරුකරන්නාහු නම්; මෙයින් භික්ෂූන් විසින් තමා ගරුසථානයෙහි තබනුලබන්නෙකු කොට ප්‍රාර්ථනා කරයි. **මානෙය්‍යුං=** ප්‍රිය කරන්නාහු නම්; **පූජෙය්‍යුං=** මෙසේ සත්කාර කරන්නාහු ගරු කරන්නාහු ප්‍රියකරන්නාහු ප්‍රත්‍යයන්ගෙන් පුදන්නාහු නම් මැනවැයි ප්‍රත්‍යයපුජාව ප්‍රාර්ථනාකරයි; **ඣානං** යනු "පියො ගරු භාවනී-

යෝ"යි උකතප්‍රකාරවූ බහුශ්‍රැතවූ ද සිල්වත් වූ ද (භික්ෂුව) මේ විධියට සුදුසු වෙයි; එහෙයින් භික්ෂූහු මෙබදු වූවහුට මෙසේ කරන්නාහු යයි කියන ලද්දේ වෙයි; **කුපිනෝ** යනු මේතෙමේ ද ඔවුහු තෙල භික්ෂුවට සත්කාරකෙරෙත් යයි කියා භික්ෂූන්ට ද මොහු නැතිකල්හි මට ම සත්කාර කරන්නාහු යයි කියා තෙරුන්ට දූයි දෙතැනෙක්හි කිපෙයි; මෙයින් මතු වාරත්‍රයෙහි ද මේ ක්‍රමයයි. **පණීනානං චීවරානං**= පට දුහුල්පත්තුණණකොසෙය්‍යාදි මාඇඟිසියුම් සුවපහස්ඇති සිවුරු; මෙහි දුම්ම ම ලාභී වන්නෙමි, යන ඉච්ඡාව අතිශයින් මහාසාවද්‍ය නො වන්නීය; අනෙකක් නො ලබන්නේ වන්නේය, යන ඉච්ඡාව වූ කලී මහාසාවද්‍ය වන්නීය; **පණීනානං පිණඩපානානං**= සර්පිස්තෙලමධු සකීරාදිපූරිතශ්‍රෙෂ්ඨ පිණ්ඩපාතය; **පණීනානං සෙනාසනානං**= නො එක්සියගණන් නො එක්දහස්ගණන් අඟනා ඇඳපුටු ආදිය; **පණීනානං ගිලානපච්චයභෙසජ්ජ පරිකඛාරානං**= ගිතෙල් තලතෙල් මී උක්සකුරු ආදිවූ උතුම් බෙහෙත්; සියලු තැන්හි ම **ඨානං**= (යන මෙය බහුශ්‍රැතයන් ද පුණ්‍යවන්තයන් ද සමග යෙදිය යුතුයි. **කුපිනෝ**= යනු සියලු තැන්හි ම මොවුන්ගේ නම් පරිචිතභාවයකු දු නැත, බොහෝ කලක් එක්ව වසන්නාවූ ද පාංශුකූල පිණ්ඩපාත පිණ්ඩ හෝ පිණ්ඩපාත පිණ්ඩ හෝ ගිතෙල් තලතෙල් ආදිය පිණ්ඩ හෝ ගෙපිළිවෙළින් හැසිරෙන්නාවූ ද ම ට එක්දවසකුත් කිසි පිණ්ඩපසක් නො දෙති, ආගන්තුකමහලුතෙර වූ කලී දැකම යමක් කැමති නම් එය දෙති' යි කියා මිනිසුන්ට ද මේ මහලුතෙමේත් මොවුන්ට තමා දක්වමින් ම හැසිරෙයි, කවදා නම් ඔහු ධම්මී කාර්මිකයෝ බැහැරකරන්නාහු ද, මෙසේ මොහු නැතිකල්හි මම ම ලාභී වන්නෙමි යි කියා තෙරුන්ට දූයි දෙතැනෙක්හි කිපෙයි; **ඉමෙසං භො ආවුසො!**= මේ යට එකුන් විසිවාරයකින් කියනලද ඉච්ඡාවචරයන්ගේ; **දිස්සන්ති චෙව සූයන්ති ච** යනු ඉච්ඡාවචරයෝ ඇසින් නො දකිනු ලැබෙති, කනින් නො අසනු ලැබෙති, මනොවිඤ්ඤාණයට විෂයවෙසිනි; ප්‍රහීණ නො වූ ඉච්ඡාවචර ඇති පුද්ගලයාගේ ඉච්ඡාවචරවශයෙන් පැවති කාය කර්මය දැක දක්නා ලද්දවුන් මෙන් ද වාක්කර්මය අසා අසනලද්දවුන් මෙන් ද වෙත්; එසින් වදාරතලදී- **දිස්සන්ති චෙව සූයන්ති ච** යි. අසවල් භික්ෂුව විසින් මෙබදු යයි ප්‍රත්‍යක්ෂ කාලයෙහි දක්නා ලැබෙති, අප්‍රත්‍යක්ෂ කාලයෙහි අසනු ලැබෙත්; **කිඤ්චාපි** යනු අනුග්‍රහගර්භීත වචනයකි; එහෙයින් ආරණ්‍යකබවට අනුග්‍රහකෙරෙයි; ඉච්ඡාවචරයන් ප්‍රහීණ නො කිරීමට ගර්භීකෙරෙයි; එහි මෝ යෝජනායි- කිසිසේත් ඒ මහණ ග්‍රාමාන්ත සෙනාසනය ප්‍රතික්ෂේපකොට ආරණ්‍යක වේද අන්තයෙහි වනයෙහි ඉතාදුරසෙනසුන්හි වාසය්කෙරේද; එතකුදු වුවත් ඔහුගේ මේ මෙතෙක් ඉච්ඡාවචරයෝ අප්‍රහීණ වූවාහු වෙති; කිසිසේත් හෙතෙම අතිරෙක ලාභය ප්‍රතික්ෂේප කොට පිණ්ඩපාතික වේද, කිසිසේත් හෙතෙම ලොලුපචාරය දුරුකොට ගෙපිළිවෙළින් හැසිරෙන සුලු වේද,

තුච්ඡ ලූඛතා.

කිසිසේත් හෙතෙම ගැහැවියන් විසින් දුන් සිවුරු පිළිකෙව් කොට පාංශුකූලික වේද; **ලූඛ චීවරධරෝ** යන මෙහි වනාහී **ලූඛං** යනු සත්ථලූඛ යැ සුත්තලූඛ යැ රජනලූඛ යැයි කරුණු තුනකින් රූඤබව දතයුතුයි; ඔවුනතුරෙහි ආයුධයෙන් කඩ කඩ කොට සිඳිනාලද්දේ සත්ථලූඛනම; එය අගයෙන් පිරිහෙයි; දලදික්හුයින් මසනලද්දේ සුත්තලූඛ නම් වේ; එය පහසින් පිරිහෙයි; රළුපහස් ඇත්තේ වෙයි; රජකින් රඳනාලද්දේ රජනලූඛ නම් වේ; එය වණ්ණයෙන් පිරිහෙයි, දුබ්බණ්ණ වෙයි; කිසිසේත් ඒ මහණ මෙසේ සත්ථලූඛ සුත්තලූඛ රජනලූඛ වූ සිවුරු ධරන්නේ වේද, එතකුදු වුවත් ඔහුගේ මේ මෙතෙක් ඉවජ්ජාවචරයෝ අප්‍රහීණ වූවාහු දක්නාහු ද ලැබෙති, අසනුද ලැබෙති; ඉක්ඛිති ඔහට නුවණැති සබ්‍රහ්මචාරීහු නො ම සත්කාරකෙරෙති, නො පුදත් යයි; **නං කිස්ස හෙතු** යන මෙහි **නං** යනු නිපාතමාත්‍රයෙකි; **කිස්ස හෙතු**= කරුණු කිම්? ඔවුන් විසින් ඔහුගේ (ඉවජ්ජාවචරයෝ) අසනු ද ලැබෙත් යම් හෙයකින් ඔහුගේ ඒ ලාමකධර්මයෝ අසනුලැබෙත් ද යී කියනලද්දේ වෙයි; මේ ඉවජ්ජාවචරයන් ප්‍රහීණ නො වූ බැවින, යනු මේ මෙහි අදහසයි; මෙවිට ඒ කාරණය උපමාවකින් ප්‍රකට කරන්නාහු **සෙය්‍යථාපි** යනාදිය වදාළහ.

ඒ උපමාවෙහි **කුණපං**= මළසිරුරක්; "**අහිස්ස කුණපං**" (= සර්පයාගේ කුණපය) අහිකුණප නම්; සෙස්ස ද මෙසේයි; ඉතා පිළිකුල් ගැරහියයුතුබැවින්ද මෙහි මේ තුන ම කියනලද්දෑහුයයි දතයුත්තාහුය; ඒ එසේමැයි- අන්‍ය වූ සාහුරු ආදීන්ගේ කුණපය මනුෂ්‍යයෝ කුළඹඩු ආදියෙන් සකස්කොට පරිභොග ද කෙරෙත්, මොවුන්ගේ කුණපය වනාහි අලුත් වූයේ ද ගරහත් මය; කල්‍යාමෙන් කුණුවූ කල්හි කියනුම කිම්? **රවසිඤ්ඤා** යනු වඩා පුරවා යන අර්ථයි; **කුණපය** ගෙන කස්තලියෙහි බහා, යී කියනලද්දේ වෙයි; **අඤ්ඤිස්සා**= අන්‍යවූ; **පටිකුජ්ජිතා**= වසා; **අනනරූපණං**= සල්පිල් අතරෙහි බහා ජනයා විසින් ගැවසීගත් විටිමුඛයට; **පටිපජ්ජෙය්‍යුං**= යන්නාහු නම්; **ජඤ්ඤඤ්ඤං විය**= මනොඥමනොඥ වූවක් (= අතිශයින් මනොඥ වූවක්) මෙන් අතිශයින් මනවඩන්නක් මෙන්; තවද තරුණ ස්ත්‍රියක් පිණිස වූ පඹුරක් මෙන් යී ද කියන ලද්දේ වෙයි; ඒ එසේමැයි- වධූකා තොමෝ "ජනී" යයි කියනුලැබේ ඇට ගෙනයනු ලබන්නාවූ පඹුර "ජඤ්ඤ" නම්; දෙපරිද්දෙන් ම ආදරවශයෙන් හෝ ප්‍රශංසා වශයෙන් හෝ පුනරුක්තයි; "ජඤ්ඤං ජඤ්ඤං විය" යී හෝ පාඨයි. **අවාපුරිතා**= විවෘත කොට; **තස්ස සහ දස්සනෙන අමනාපතා ච සණ්ඨහෙය්‍යා**= ඒ කුණපය දැකීම සමග ඒ ජනයාගේ අමනාපබව සිටින්නේය; "අමනාපතා" (= අමනාපබව) යනු ද මෙය අමනාපයයි

උපන්නාවූ චිත්තචෛතසිකයන්ට ම මේ නමකි; පිළිකුල්බව ගැරහිය යුතුබව යන දෙක්හි ද මේ ක්‍රමයයි. **ජිඝච්ඡිතානම්පි**= බඩසා ඇත්ත වුන්ට; **ද න හොතුඤ්ඤතා අස්ස**= වළඳනු කැමතිබව නො වන්නේය; **පඤ්ච සුහිතානං**= තෘප්තයන්ට වනාහි ඉතාපළමුකොට ම වන්නේය; වළඳනු කැමතිබව නොවන්නේය, යි කියනලද්දේ වෙයි; එහි මෝ තොමෝ උපමා සංසන්දනායි- මොහුගේ පැවිදිවෙශය පිරිසුදු කස්තලිය මෙනි; ඉච්ඡාවචරයන් ප්‍රහීන නො කිරීම කුණප වැඹීම මෙනි; ආරණ්‍යකාඞ්ගාදියෙන් ඉච්ඡාවචරප්‍රතිච්ඡාදනය අනිත් කස්තලියකින් වැසීම මෙනි; ආරණ්‍යකාඞ්ගාදිය විශ්වාස නො කොට ඉච්ඡාවචරදර්ශනයෙන් සබ්‍රහ්මචාරීන්ගේ සත්කාරනොකිරීමාදිභාවය කස් තලිය විවෘත කොට කුණපදර්ශනයෙන් ජනයාගේ අමනොඥභාවය මෙනැයි. ශුකලප්‍රේක්ෂයෙහි වනාහි **කිඤ්චාපි** යනු අනුග්‍රහප්‍රශංසාවචනයි; එයින් ආරණ්‍යකත්වය අනුග්‍රහ කෙරෙයි, ඉච්ඡාවචරයන්ගේ ප්‍රහාණ යට ප්‍රශංසාකරයි; **නෙමන්තණ්ඩිකෝ**= නිමන්ත්‍රණබත් පිළිගන්නේ; **විචිතකාළකං**= තෝරා ඉවත්කළ කළුසහල්ඇති; **අනෙකසූපං අනෙක බ්‍යඤ්ජනං** යන මෙහි අතින් ගතයුතු වූයේ "සූප" නමැයි කියනු ලැබේ; "බ්‍යඤ්ජන" නම් අවුළු යැ; එහෙයින් මත්‍ස්‍යමාංශමුද්ගසූපාදීන් කරණකොටගෙන නො එක් සූපඇති නානාප්‍රකාර මාංශාදිව්‍යඤ්ජන යන් කරණකොටගෙන නො එක් ව්‍යඤ්ජනඇති යයි කියනලද්දේ වෙයි; සෙස්ස කී නියෙන් ම දතයුතුයි. උපමාසංසන්දනයෙහි ද ඉච්ඡාව චරයන්ගේ ප්‍රහාණය හැල්බත්වැඩීම මෙනි; අලොභිච්ඡතාවෙන් උපන් නාවූ ග්‍රාමානුග්‍රහවිහාරාදිය හෙතුකොටගෙන ඉච්ඡාවචරප්‍රහාණය වැසීම අන්කස්තලියකින් වැසීම මෙනි; ග්‍රාමානුග්‍රහවිහාරාදිය නො ගෙන ඉච්ඡාවචරප්‍රහාණය දැකීමෙන් සබ්‍රහ්මචාරීන්ගේ සත්කාරකිරීමාදි බව කස්තලිය විවරකොට හැල්බත් දැකීමෙන් ජනයාගේ මනාපබව මෙන් දතයුත්තීය. **උපමා මං ආවුසො සාරිපුත්ත! පටිභාති**= ඇවැත්නි ශාරිපුත්‍රය! මට උපමාවක් වැටහෙයි; මම එක් උපමාවක් කියනු කැමැත්තෙමි, යනු අදහසයි. **පටිභාතු තං**= ඔබට වැටහේවා; තෙපි කියව, යනු අදහසයි. **එකමිදාහං** යන මෙහි "ඉද" යනු නිපාතමාත්‍රයැ; එක්සමයෙක්හි මම යි කියනලද්දේ වෙයි; ආඛ්‍යාතියෙහි විභක්තියාවව නයි; **රාජගහෙ විහරාමි ගිරිබ්බජෙ**= "රාජගහ" යනු ඒ නගරයාගේ නාමයැ; හාත්පසැ පවත පරික්ෂේපයෙන් ගොවුදක් මෙන් පිහිටි බැවින් "ගිරිබ්බජ" යයි කියනු ලැබේ; ඒ නගරයෙහි වෙසෙමි, එය ඇසුරුකොට වෙසෙමි, යි කියන ලද්දේ වෙයි; **අථ ඛ්වාහං**= "අථ ඛො අහං" (= ඉක්බිති මම;) මෙහිදු අථ යනු අන්‍යාධිකාරවචනාරම්භයෙහි නිපාතයැ; **ඛො** යනු පදපූරණමාත්‍රයෙහි යැ; **පුබ්බණ්හසමයං**= දින යාගේ පූර්වභාගකාලයෙහි; පෙරවරු කාලයෙහි යන අර්ථයි; නොහොත්

"පුබ්බන්හ සමයං= පුබ්බණ්හසමයං" පෙරවරුයෙහි එක් ඇසිල්ලෙක යයි කියනලද්දේ වෙයි; මෙසේ අසත්යෝහි කම්විඛත් ලැබෙයි; **නිවාසෙත්වා**= හැඳ පෙරව; විහාරයෙහි හඳනා පොරෝනා පරිවර්තනය කිරීම් වශයෙන් මෙය දතයුතුයි; නොහොත් ගම්වැදීම පිණිස සකස් කොට හැඳීම් පෙරවීම් වශයෙන් (දතයුතුයි;) හෙතෙම එයින් පෙර නො හඳනාලද්දේ නො ම වී; **පත්තචීවරමාදාය**= පාත්‍රය දෙඅතින් ද විවරය කයින් ද ගෙන; **පිණ්ඩාය**= පිණ්ඩපාතය පිණිස; **සමිති** යනු ඔහුගේ නාමයැ; **ඝාණාකාරපුත්තෙන**= රියකරුපුත්තෙම; **පණ්ඩුපුත්තෙන**= පණ්ඩුනම් තැනැත්තහුගේ පුත්‍ර වූ; **ආජීවිකෙන**= නග්නශ්‍රමණතෙම; **පුරාණයාණාකාරපුත්තෙන**= පැරණි රියකරුකුලයාගේ පුත්‍රවූ; **පච්චුපසිත්තෙන**= එලඹ සිටියේ; **වඛ්ක** නම්? එක්පසකින් වක්වූයේ; **ජීමහ** නම්? සපීයෙකු ගියමඟ සමාන වූයේ; **දෙසං**= එලය විෂමඟැට ආදිය; **යථා යථා** කාලාවියෙහි නිපාත යැ; "යදා යදා" (යම් යම් කලෙක) යයි කියනලද්දේ වෙයි; **තථා තථා** යන මෙද කාලාවීමැයි; ඒ ඒ කාල යෙහි යයි කියනලද්දේ වෙයි; හෙතෙම තමාගේ සූත්‍රානුලෝමයෙන් සිතයි; අනිත් තැනැත්තේ ඔහුවිසින් සිතූ කෙණෙහි සිතූතැන ම සසි; **අත්තමනෝ**= සියමන් ඇත්තේ සතුටුසිත් ඇත්තේ; නොහොත් ප්‍රීතිසෞමනස්‍ය දෙකින් ගන්නාලද සිත්ඇත්තේ; **අත්තමනවාචං නිච්ඡාරෙසි**= සතුටුසිත් ඇතිබැවින් තෙපුලක් නොහොත් සතුටුසිත්ඇති බවට යොග්‍යවූ තෙපුලක් පහළකෙළේය; උසස්කොට කිය, ප්‍රකාශ යෙන් ගෙනහැරදැක්වීය,යි කියනලද්දේ වෙයි; **හදයා හදයං මඤ්ඤේ අඤ්ඤෝ**= සිතින් සිත දැන මෙන්; **අඤ්ඤඩා**= බුදුන් දහම් සඟුන් කෙරෙහි හැදහිලිරහිත වූවාහු; **ජීවිකත්ථා**= ණයබියආදියෙන් පෙළුනාහු, පිටත ජීවත්වන්ට නො හැකිවූවාහු, මේ සස්නෙහි ජීවිකාව කරනුකැමැත්තාහු වී; **න සඩා**= අශ්‍රද්ධාවෙන්; **සඨා මායාවිනෝ**= මායා ශාඨෙය්‍ය දෙකින් යුක්ත වූවාහු; **කෙවලිනෝ**= භික්ෂූන් කෙරෙහිවිත වූවාහු; නිශ්පන්නවූ ඵාමගතශඨභාවයෙන් යුක්ත වූවාහු යයි කියන ලද්දේ වෙයි; ඒ එසේමැයි- ශඨබව අභූතගුණ දැක්වීමෙන් අභූතභාෂණ යන්ගේ ගුණදැක්වීමක් මෙනැයි කොට "කෙරාටිය" යි කියනු ලැබේ; **උන්නළා**= උද්ගත වූ නළඇත්තාහු; උස්වූ හිස්මාන ඇත්තාහු යයි කියනලද්දේ වෙයි; **චපලා**= පාසිවුරුසැරසීම් ආදිවූ චපලබැවින් යුක්ත වූවාහු; **මුඛරා**= මුඛයෙන් ර්ළුවූවාහු; රළුවචන ඇත්තාහු යයි කියන ලද්දේ වෙයි; **විකිණ්ණවාචා**= අසංවරවචනඇත්තාහු; දවස මැ නිරර්ථක තෙපුල් තෙපලන්නාහු; **ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරා**= ඉන්ද්‍රියයන්හි නො පියනලද කම්දොර ඇත්තාහු; **භොජනෙ අමත්තඤ්ඤුනෝ**= පරියේෂණ ග්‍රහණ පරිභෝග විෂයෙහි යොග්‍යතාසඞ්ඛ්‍යාත වූ භොජනයෙහි යම් මාත්‍රාවක් දතයුත්තිද එය නො දන්නාහු; **ජාගරියං අනනුයුත්තා**=

නිදිදුරුකිරීමෙහි නොයෙදුනාහු; **සාමඤ්ඤේ අනපෙක්ඛවසෙනා**= මහණදම්හි අපෙක්ෂාරහිත වූවාහු; ධම්මානුධම්මප්‍රතිපත්තිරහිත වූවාහු යන අර්ථයි; **සික්ඛාය න තිබ්බගාරවා**= ශික්ෂාපදයන්හි බහල වූ ගෞරව ඇත්තානු නො වෙති; ආපත්තිව්‍යතික්‍රම බහුලකොටඇත්තානු (වෙත්;) **බාහුලිකා** යනාදිය "ධම්මදායාද" සූත්‍රයෙහි කියනලදී. **කුසිතා** යනාදිය "භයභෙරව" සූත්‍රයෙහි කියනලදී. **ධම්මපරියායෙන**= ධර්ම දෙශනාවෙන්; **සඛාඅභාරසම්භා**= පියවින් ම සැදුහැ ඇත්තානු පැවිදි වන්නාහු ද සැදුහැයෙන් ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වූවාහු; **පිවනති මඤ්ඤේ සසනති මඤ්ඤේ**= බොන්නාක් මෙනි, කන්නාක් මෙනැයි; සතුටුතෙපුල් නික්මවන්නානු වචනයෙන් බොන්නාක් මෙනි; මොනවට අනුමොදන්වන්නානු සිතින් කන්නාක් මෙනි; **සාධු වත**= එකාන්තයෙන් සුන්දරයැ; **සබ්‍රහ්මචාරී** යනු ("සබ්‍රහ්මචාරි" යි) හ්‍රස්ව වූයේ ද ("සබ්‍රහ්මචාරී"යි) දීර්ඝවූයේ ද වටී; හ්‍රස්වව ඇතිකල්හි සැරියුත් තෙරුන් මතුවෙයි දීර්ඝව ඇතිකල්හි සබ්‍රහ්මසරුන් මතු වෙයි; යම්විටෙක සැරියුත් තෙරුන් කෙරෙහි වේද එවිට සමානබඹසර ඇති සැරියුත් තෙම අප අකුසලින් නහාසිටුවා යන අර්ථයි; යම්විටක සබ්‍රහ්මසරුන් කෙරෙහි වේද එවට සමාන බඹසරඇති භික්ෂූන් අකුසලින් නහා සිටුවා යන අර්ථයි; **දහරෝ**= තරුණයෙක්; **සුවා**= යොවුන් බැව්හි සිටියේ; **මණ්ඩනාජාතිකෝ**= අලඞ්කාරකරන සභාවඇත්තේ; ඔවුන් අතුරෙහි කිසිවෙක් තරුණවූයේ ද යොවුන්වූයේ නො වෙයි, ඉතා තරුණ (= දහර) වූවෙක් යම්සේද එමෙන; කිසිවෙක් යෞවනවූයේ ද අලඞ්කාරකරනසභාව ඇත්තේ නො වෙයි, උපශාන්තසභාවඇත්තේ ආලස්‍යඅව්‍යසනාදීන් මඬනාලද්දේ යම්සේද එමෙනි; මෙහි වූ කලි තරුණ වූයේ ද, යෞවන වූයේ ද, අලඞ්කාරකරන සභාවඇත්තෙක් ම අදහස් කරනලදී, එහෙයින් මෙසේ කිහ. උපුල්ආදිය ලොකසම්මත හෙයින් කියනලද්දාහුය. **ඉතිහ නෙ**= මෙසේ ඔවුහු; **උභො මහානාගා**= මහානාගයෝ දෙදෙන ම; ඒ එසේ මැන- මේ අග්‍රශ්‍රාවකයෝ දෙදෙන ම "මහානාග" යයි කියනු ලැබෙත්; එහි ශබ්දය. මේ වචනාර්ථයි; "ඡහදීහි නගච්ඡන්තීති නාගා" (= ඡහදියෙන් අගතියට නො යෙත්නුයි "නාග" නම් වෙති;) "තෙන තෙන මග්ගෙන පහීනෙ කිලෙසෙ න ආගච්ඡන්තීති නාගා" (= ඒ ඒ මඟින් ප්‍රහීණවූ කෙලෙසුන්ට නො පැමිණෙත්නුයි "නාග" නම් වෙති;) නානපපකාරං ආගුං න කරොන්තීති නාගා (= නන්වැදෑරුම්වූ සොරකම් නොකෙරෙත්නුයි "නාග" නම් වෙති;) මේ මෙහි සංක්ෂෙපයයි; විස්තරය වනාහි මහානිදේශයෙහි කියනයින් ම දත යුත්තේය. තවද-

75. "ආගුං න කරොති කිඤ්චි ලොකෙ
සබ්බ සංයොගෙ විසජ්ජ බන්ධනානි
සබ්බත්ථ න සජ්ජති විමුත්තෙතා
නාගො තාදි පවුච්චතෙ තථත්තෙනා" ති.

(= යමෙක් ලොකයෙහි මද පමණවුත් පාප සඞ්ඛ්‍යාතවූ අපරාධයක් (=අකුශල යක්) නො කෙරේද (හෙතෙම) තථාරූපවූයේ හෙවත් එබඳු ස්වභාවඇත්තේ "නාග" යයි කියනු ලැබේ (කාමයොගාදිවූ) සියලු සංයොගයන් ද (දසසංයොජනභෙදවූ) සියලු බන්ධනයන් ද හැර (සිද යයි සේසි) (ඡඞ්ගාදිවූ) සියලු තැන්හි (කිසි සඞ්ගයකින්) නො ඇලුනේ වෙයි (විවිධ විමුක්තීන් ගෙන්) කෙලෙසුන් කෙරෙන් මිදුනේ ද (ලාභාලාභාදියෙහි) තාදිවූයේ ද වේ යයි.)

මෙසේ ද මෙහි අර්ථය දතයුත්තේය, **මහන්තා නාගා මහානාගා** (පිදියයුතුවූ නාගයෝ මහානාග නම් වෙති,) අන්‍යවූ ක්ෂීණාශ්‍රවනාග යන් විසින් අතිශයින් පිදියයුතු ද අතිශයින් පැසසියයුතු ද වෙයි යන අර්ථයි. **අඤ්ඤමඤ්ඤස්ස**= අනිකොක් අනිකෙකුගේ ; **සමනුමොදිංසු**= සමව අනුමොදන් වූවාහුය; ඔවුනතුරෙහි මේ උපමාවෙන් මහාමොග්ගල්ලායන සථවිරයන්වහන්සේ අනුමොදන්වූසේක, "පටිභාතු තං ආවුසො" යි ධම්මසෙනාපතීන්වහන්සේ අනුමොදන්වූසේක; එ සි න් කියනලදී "අඤ්ඤමඤ්ඤස්ස සුභාසිතං සමනුමොදිංසු" යි.

අනඞ්ගණ සූත්‍ර වර්ණනා නිමි.

——×——

75. (**යො**= යමෙක්තෙම්;) **ලොකෙ**= ලොකයෙහි; **කිඤ්චි ආගුං**= සවලපමාත්‍රවූ ද පාපසඞ්ඛ්‍යාතවූ අපරාධයෙක්; **න කරොති**= නො කෙරේද; (**සො**= හෙතෙම්;) **තථත්තෙනා**= තථාරූපවූයේ; **නාගො පවුච්චති**= "නාග" යයි කියනු ලැබේ; **සබ්බසංයොගෙ**= (කාමයොගාදි) සියලු සංයොගයන් ද; **බන්ධනානි**= (දසසංයොජනභෙදවූ) සියලු බන්ධනයන් ද; **විසජ්ජ**= හැර; **සබ්බත්ථ**= (සඞ්ගාදි) සියලුතැන්හි; **න සජ්ජති**= (කිසි සඞ්ගයකින්) නො ඇලෙයි; **විමුත්තෙතා**= (විවිධවිමුක්තියෙන්) මිදුනේ ද; **තාදි**= (ලාභාලාභාදියෙහි) තාදිවූයේ ද වෙයි;

ආකඞ්ඛෙය්‍ය සූත්‍ර වණ්ණනා.

එවමේමසූත්‍රං සි ආකඞ්ඛෙය්‍යසූත්‍රයසි- එහි **සම්පන්නසීලා** යනු සම්පන්නාය ත්‍රිවිධවෙසි, පරිපුණ්ණසමඞ්ගීමධුර වශයෙනි; එහි-

"සම්පන්න" ශබ්දය.

76. **"සම්පන්නං සාලිඛෙදරං සුවාභුඤ්ජන්ති ඛොභිය! පටිවෙදෙමිතෙ බ්‍රහ්මෙ න නං වාරෙතුමුස්සහෙ"සි**

මෙය පරිපුණ්ණසම්පන්න නම් වේ. **ඉමිනා පාතිමොක්ඛසංවරෙන උපෙතො හොති සමුපෙතො උපාගතො සමුපාගතො සම්පන්නෙනා සමන්නාගතො** යන මේ සමඞ්ගීසම්පන්න නම් වෙසි. **ඉමිස්සා භන්තෙ! මහාපඨව්‍යා හෙට්ඨිමං තලං සම්පන්නං සෙය්‍යථාපි බුද්ධඛමධුං අනෙලකං එවමස්සාදං** යන මේ මධුරසම්පන්න නම් වෙසි. මෙහි වූ කලි "පරිපුණ්ණසම්පන්නාය ද සමඞ්ගීසම්පන්නාය ද වටී එහෙයින් **සම්පන්නසීලා** යනු පරිපූණීසිල්ඇත්තාහු වී යසි ද සීලයෙන් සමන්විතවූවාහු වී යසි ද මෙසේ මෙහි අර්ථය දතයුත්තේය; සීලං යනු කුමන අර්ථයකින් ශීල නම්වීද? ශීලනාර්ථයෙන් ශීලනම් වෙසි, ඒ ශීල යාගේ විසතරකථා තොමෝ විශුද්ධි මාගීයෙහි කියනලද්දීය. එහි "පරිපූණීසිල්ඇත්තාහු" යන මේ අර්ථයෙන් ක්ෂෙත්‍රදෙෂවිගමයෙන් ක්ෂෙත්‍රයාගේ පිරීම මෙන් ශීලදෙෂවිගමයෙන් ශීලයාගේ පිරීම කියනලද්දී වෙසි. ඒ එසේමැසි යම්සේ බීජඛණ්ඩය, වපඛණ්ඩය, උදකඛණ්ඩය, උෂඛණ්ඩය යන චතුර්විධ දෙෂයෙන් සමන්විතවූ කෙත අපරිපූණී වේද, ඔවුනතුරෙහි බීජඛණ්ඩ නම්? යම්තැනෙක අතරින් අතර බිජුවට කැඩුනාහු හෝ කුණුවූවාහු හෝ වෙත්ද ඒ බිජුවට යම් තැනෙක වැටෙත්ද එහි සස්‍යය නො නගී ක්ෂෙත්‍රය ඛණ්ඩ වූයේ වෙසි. වපඛණ්ඩ නම්? යම් තැනෙක අදක්ෂයෙක් තෙම බිජුවට ඉසින්නේ අතරින් අතර නො හෙලාද මෙසේ වනාහි සියලු තැන්හි සස්‍යය නො නගී, ක්ෂෙත්‍රය ඛණ්ඩ වූයේ වෙසි. උදකඛණ්ඩ නම්? යම්කිසිතැනෙක ජලය ඉතා බොහෝ වූයේ හෝ වේද නොවූයේ හෝ වේද එහි ද සස්‍යයෝ නො නගිති ක්ෂෙත්‍රය ඛණ්ඩවූයේ වෙසි. උෂඛණ්ඩ නම්? යම් කෙතක ගොවිතෙම කිසි පෙදෙසෙක්හි නඟුලෙන් බිම සතරපස්වරක් සාන්නේ

---

76. **ඛොභිය**= කොසියගොත්‍රඇත්තව! **සම්පන්නං**= පරිපූණීවූ; **සාලිඛෙදරං**= හැල්කෙත; **සුවා**= ගිරවු; **භුඤ්ජන්ති**= කති; **බ්‍රහ්මෙ**= බ්‍රාහ්මණය! **තෙ**= තට; **පටිවෙදෙමි**= දන්වම්; **නං**= එය; **වාරෙතුං**= වළකන්ට; **න උස්සහෙ**= උත්සාහ නොකරමි.

ඉතා ගැඹුරුකෙරේද එහෙයින් කරමැටි උපදීද එහි ද සස්‍යය නො නහී ක්ෂේත්‍රය ඛණ්ඩවූයේ වෙයි. එබදුවූ කෙත ද මහත්ඵලවූයේ නොවෙයි, මහත් අනුසස් ඇත්තේ නොවෙයි. යම්හෙයකින් එහි බොහෝ වපුරා මදක් ලබත්ද එහෙයිනි, මේ සතර දෙඟයන්ගේ විගමයෙන්කෙත පරිපූණී වෙයි, එබදුවූ කෙතද මහත්ඵල වූයේ මහත් අනුසස්ඇත්තේවෙයි.

ශීලදෙඟ සතර. එපරිද්දෙන් ම ඛණ්ඩය, ජිඳුය, සබලය, කම්මාසය යන සතරදෙසින් යුත් ශීලය අපරිපූණී වෙයි, එබදු ශීලයද මහත්ඵල වූයේ නො වෙයි, මහත් අනුසස් ඇත්තේ නො වෙයි, මේ සතරදෙඟයන්ගේ විගමයෙන් ශීලය පරිපූණී වූයේ වෙයි, එබදුවූ ශීලයද මහත්ඵල වෙයි, මහානිශංසවෙයි, **සීලසම්ඵස්සෙනා** යන මේ අර්ථයෙන් වනාහි ශීලයෙන් සමන්විත වූවාහු රැස්වීමට හියාහු සම්ඵාගත වූවාහු වී වාසයකරවු යන මෙය ම කියනලද්දේ වෙයි. එහි දෙකරුණකින් ශීලයෙන් සම්පූණීබව වෙයි, ශීලවිපත්තිය පිළිබඳ ආදීනවදැකීමෙන් ද ශීලසම්පත්තිය පිළිබඳ ආනිශංස දැකීමෙන් ද යන දෙකරුණෙනි; ඒ දෙක ම විශුද්ධිමාර්ගයෙහි විස්තරකරන ලද්දේය. එහි **සම්පන්නසීලා** යන මෙතෙකින් වනාහි භාග්‍යවතුන්වහන්සේ චතුපාරිශුද්ධිශීලය උදෙසා **පාතිමොක්ඛසංවරසංවුතා** යන මෙයින් එහි ජ්‍යෙෂ්ඨ ශීලය විස්තර කොට දක්වූසේකැයි දීපවිහාරවාසී "සුමම"සථවිරතෙම කීය. උන්වහන්සේගේ අතවැසිවූ ත්‍රිපිටක "චූලනාග" සථවිරතෙම වනාහි මෙසේ කීය, දෙතැන්හි ම භාග්‍යවතුන් විසින් ප්‍රාතිමොක්ෂසංවරය වදාරනලද්දේය, ඒ එසේමය– ප්‍රාතිමොක්ෂසංවරය ම ශීලයයි, අන්‍යවූ (ඉන්ද්‍රියසංවරාදි) තුන ශීලය, යි කී තැනක් නම් ඇතැ, යි නො පිළිගනිමින් කියා (මේසේත් කීය); ඉන්ද්‍රිය සංවරය නම් සදෙර රැකීම පමණක්මැ යි; ආජීවපාරිශුද්ධිය දැහැමෙන් සෙමෙන් ප්‍රත්‍යය ඉපදීම පමණය; ප්‍රත්‍යය නිඃශ්‍රිතය ලැබූ ප්‍රත්‍යයන් මේ පිණිස යයි පස්විතා පරිභොගකිරීම පමණය; නිසපය්‍යාඃයයෙන් ප්‍රාතිමොක්ෂසංවරය ම ශීලයයි; යමෙකුගේ ඒ ප්‍රාතිමොක්ෂසංවරය බිඳුනේද මේතෙම සුන් සිස්ඇති පුරුෂයෙකු මෙන් සෙසු හස්තපාදයන් රකින්නේය, යි නො කියයුත්තේය. යමෙකුගේ වනාහි ඒ ප්‍රාතිමොක්ෂසංවරය අරොගද මේතෙම නො සුන්සිස්ඇතිපුරුෂයෙකුමෙන් දිවි ද සෙසු අවයව ද පියවි කොට රක්නට සමර්ථවෙයි; එහෙයින් **සම්පන්නසීලා** යන මෙයින් ප්‍රාතිමොක්ෂසංවරය උදෙසා **සම්පන්නපාතිමොක්ඛා** යි ඊටම පය්‍යාය වචනය වදාරා එය විස්තරකොට දක්වන්නාහු **පාතිමොක්ඛසංවරසංවුතා** යනාදිය වදාළසේකැ, යි.

එහි **පාතිමොක්ඛසංවරසංවුතා**= ප්‍රාතිමොක්ෂසංවරයෙන් යුක්තවූවාහු; **ආචාරගොචරසම්පන්නා**= ආචාරයෙන් ද ගොචරයෙන් ද සම්පූණීවූවාහු; **අණුම්පෙතෙසු**= අල්පමාත්‍ර වූ; **වජ්ජෙසු**= අකුශලධර්මයන්හි; **භයදස්සාවී**= භය දක්නාසුලුවූවාහු; **සමාදය**= මනාකොට ගෙන; **සික්ඛථ**

සික්ඛාපදෙසු= ශික්ෂාපදයන් අතුරෙහි ඒ ඒ ශික්ෂාපදය මනාකොට ගෙන හික්මෙවූ; තවද- **සමාදය සික්ඛති සික්ඛාපදෙසු** යනු ශික්ෂාපදයන් අතුරෙහි ශික්ෂා කොළොසයන් අතුරෙහි හික්මියයුතුවූ කායිකවූ හෝ වාචසිකවූ හෝ යම් කිසිවක් වේද ඒ සියල්ල මනාකොට ගෙන හික්මෙවූ යන මේතෙම මෙහි සංක්ෂෙපයයි; විසතරහෙයින් **වුතාහි** මේ සියලු "පාතිමොක්ඛසංවර"දිපදයෝ විභූඩිමාගීයෙහි කියන ලද්දාහුය. **ආකඞ්ඛෙය්‍ය** වෙ යන මේ කුමක්හෙයින් ආරබ්ධ ද යත්? **සීලානිසංස** දක්වන පිණිස යැ; ඉදින් නො සරස්පැවිද්දන්ව හෝ **නැණහීනයන්ට** හෝ මෙබඳු සිතක් වන්නේ නම්; භාග්‍යවතුන්වහන්සේ "සිල් පුරවු සිල් පුරවු" යි කියති, සිල් පිරීමෙහි අනුසස් කිමෙක්ද් හෝ විශෙෂය කවරේද වෘඩිකවරි දැ යි; ඔවුන්ට සතලොස් අනුසස් දක්වන්ට මෙසේ වදළහ. මෙපරිද්දෙන් සබ්‍රම්සරුන්ට ප්‍රියමනාපතාදී ආශ්‍රවක්ෂයකෙළවරකොට ඇති අනුසස් අසා ද සිල් පුරන්නාහු නම් ඉතා යෙහෙකැ'යි කියායි; විෂකණ්ටකවාණිජ්‍යා මෙනි- විෂකණ්ටක වාණිජ නම්? උක්සකුරු වෙළෙන්දැ'යයි කියනු ලැබේ;

විෂකණ්ටක වාණිජ්‍යා. හේ වනාහි උක්සකුරු පැණි ඛණ්ඩශර්කරා (= තදපාක යෙන් කැඹිය හැකිවූ උක්පැණි වැලිහකුරු යයි සේ) ආදිය ගැළින් ගෙන පසල්ගමකට ගොස් විසකටු ගනිවු විසකටු ගනිවු යි, උදෙසාඅණය කෙළේය, ඒ අසා ගම්වැස්සෝ විස නම් කැකුළය, යමෙක් එය කාද හෙතෙම මැරෙයි, කටු ද විද මරයි, මේ දෙක ම කකීෂයහ, මෙහි අනුසස් කවරේදැ? යි ගෘහවාරයන් වැසූහ; දරුවන් ද පලවාහැරියාහුය. ඒ දැක වෙළඳතෙම මේ ගම්වැසියෝ අව්‍යවහාරකුශලයෝ යැ වන්නාටය ඔවුන් උපායෙන් ගන්වන්නෙමි, යි ඉතාමධුරය ගනිවු, ඉතාප්‍රණීතය ගනිවු, උක්සකුරු පැණි සකුරු සමඅගය ලැබෙයි, කුටමාෂක කුටකර්‍මාපණාදියෙනුදු ලැබේ, යයි උදෙසාඅණය කෙළේය; ඒ අසා ගම්වැසියෝ තුටුපහටුවූවාහු නික්ම ගොස් බොහෝත් මිල දී ගත්තාහුය. ඒ උපමායෙහි භාග්‍යවත්හුගේ "මහණෙනි! ශීලයෙන් සම්පූර්ණ වූවාහු වාසයකරවු, ශික්ෂාපදයන් අතුරෙහි ඒ ඒ ශික්ෂාපදය මොනොවට ගෙන හික්මෙවු" යන වචනය වෙළෙන්දාගේ "විෂකණ්ටක ගනිවු" යයි උදෙසාඅණය මෙනි; භාග්‍යවත්හු "ශීලයෙන් සම්පූර්ණ වූවාහු වාසයකරවු" යයි වදළහ, එතකුදු වුවත් මේ ශීලය නම් කකීෂය, හාස්‍යක්‍රීඩාදියට විරුඬය, ශීලයෙන් සම්පූර්ණ වූවන්ට අනුසස් කිමෙක්ද් හෝ, යි භික්ෂූන්ගේ සිතීම (විසය කටුය යන) මේ දෙක ම කකීෂයහ, මෙහි අනුසස් කවරේදැ? යි ගම් වැසියන්ගේ සිතීම මෙනි; භාග්‍යවත්හුගේ ප්‍රියමනාපතාදි වූ ආශ්‍රවක්ෂය අවසන්කොටඇති සතලොස් අනුසස් ප්‍රකාශකරනු පිණිස **ආකඞ්ඛෙය්‍ය** යනාදි වචනය අනතුරුව ඒ වෙළෙන්දාගේ ඉතාමධුරය ගනිවු, යනාදි වචනය මෙනැ, යි දතයුතුයි.

එහි ආකඞ්ඛෙය්‍ය වෙ= ඉදින් ආකාඞ්ක්ෂා කරන්නේ නම් ඉදින් කැමතිවන්නේ නම්; **පියොවක්‍ඛං**= ප්‍රිය ඇස්වලින් බැලියයුත්තෙක්

සෙනහ ඉපදීමට කරුණු වූයෙක් වන්නෙමි, යි කියනලද්දේ වෙයි; **මනාපෝ**= ඔවුන්ට මනවඩන්නෙක් නොහොත් ඔවුන්ගේ සිතින් පැමිණිය යුත්තෙක් මෙත්සිතින් පැතිරිය යුත්තෙක් යයි කියන ලද්දේ වෙයි; **ගරූ**= ඔවුන්ගේ ගරුතැන්හි වූයෙක් පහනසතක් සමානවූ යෙක්; **භාවනීයෝ**= එකාන්තයෙන් මේ ආයුෂ්මත්තෙමේ දතයුත්ත දනී, දැක්කයුත්ත දකියි, යි මෙසේ සම්භාවනාකටයුතු වූයෙක්; **සීලෙ සෙවස්‍ස පරිපූරකාරී**= සිව්පිරිසුදුසිල්හි මේ සම්පූර්ණකරනසුලුවූයේ වන්නේය; අනූනවූ පිරිපුන් ආකාරයෙන් යුක්තවූයේ වන්නේ යයි කියනලද්දේ වෙයි; **අජ්ඣත්තං චෙතොසමථමනුයුත්තෙනා**= තමාගේ චිත්තසමථයෙහි යෙදුනේ; මෙහි වනාහි "අජ්ඣත්තං" යි හෝ "අත්ත නො" යි හෝ මේ එකාර්ථ යැ ව්‍යඤ්ජනය ම විවිධ යැ; මේ "සමථං" යන පදය ආධාරාර්ථයෙහි කර්මවචනයි; "අනු" යන මේ උපසර්ගය භා යොගයෙහි සිඳියි; **අනිරාකතජ්ඣානෙ**= යනු බැහැර නො කරනලද ධ්‍යානඇත්තේ නො නසනලද දුහැන්ඇත්තේ හෝ; මේ නිරාකරණය නම්? බැහැරකිරීම් විනාසකිරීම්අර්ථ මැ, යි; "ථමහං නිරං කත්වා" "නිවාතවුත්තී" යනාදිතැන්හි ද මේ පදයාගේ ප්‍රයෝගය දතයුතුයි.

සපනානු පස්සනා.

විපස්සනාය සමන්නාගතෙනා= සප්තවිධවූ අනුපස්සනාවෙන් යුක්තවූයේ; සප්තවිධවූ අනුපස්සනා නම්? අනිච්චානුපස්සනා දුක්ඛානුපස්සනා අනත්තානුපස්සනා නිබ්බිදානුපස්සනා විරාගානුපස්සනා නිරෝධානුපස්සනා පටිනිස්සග්ගානුපස්සනා යන මොහුයි. ඔවුහු විශුද්ධිමාර්ගයෙහි විස්තර කරන ලද්දාහුය. **ඉඤ්ඤතා සුඤ්ඤාගාරානං**= ශූන්‍යාගාරයන් (ශූන්‍යාගාරයෙහි කරනභාවනා යි සේ) වඩන්නේ; මෙහි ද සමථවිදර්ශනාවශයෙන් කම්වහන් ගෙන රැයුවල් ශූන්‍යාගාරයට පිවිස හිඳින්නාවූ **මහණ ඉඤ්ඤතා සුඤ්ඤාගාරානං** යි දතයුත්තේය; **එකභූමකාදිප්‍රාසාදයෙහි (භාවනා) කරන්නේ ද වනාහි ශූන්‍යාගාරභාවනාවන් වඩන්නේ නො වේ,** යයි දතයුතුයි; මෙතෙකිනුත් යම්සේ තෘෂ්ණාවිචරිතදේශනා තොමෝ පළමුකොට තෘෂ්ණාවශයෙන් පටන්ගන්නාලද්දී නමුත් මාහදෘෂ්ටිකු තෘෂ්ණාවට පදස්ථානබැවින් මාහදෘෂ්ටීන්ට බැස ක්‍රමයෙන් පඤ්චස්කන්ධය දෙසනාව වූවාද එසේ මෝ දේශනා තොමෝ පළමුකොම අධිශීල ශික්ෂාවශයෙන් ආරම්භකරනලද්දී නමුත් සමථවිදර්ශනාවන් ශීලයම පදස්ථාන බැවින් සමථවිදර්ශනාවන්ට බැස ක්‍රමයෙන් ශික්ෂාත්‍රයදේශනාව වී, යයි දතයුත්තීය.

මෙහි වනාහි **සීලෙසෙවස්‍ස පරිපූරකාරී** යන මේකෙකින් අධිශීලශික්ෂාව වදාරන ලද්දීය; **අජ්ඣත්තං චෙතොසමථමනුයුත්තෙනා අනිරාකතජ්ඣානෙ** යි මෙතෙකින් අධිචිත්තශික්ෂාව ද; **විපස්සනාය සමන්නාගතෙනා** යි මෙතෙකින් අධිප්‍රඥාශික්ෂාව ද; **ඉඤ්ඤතා සුඤ්ඤාගාරානං** යන මෙයින් වනාහි සමථවශයෙන් ශූන්‍යාගාරවර්ණනයෙහි අධිචිත්තශික්ෂාව ද විදර්ශනාවශයෙන් අධිප්‍රඥාශික්ෂාවද, යි මෙසේ

ශික්ෂාවය ම සඞ්ග්‍රහ කොට වදරණ ලද්දීය. මෙහි ද අජ්ඣත්තං වෙ තොසමථමනුයුත්තෙතා අනිරාකතඣානෙ යන මේ පදයන්ගෙන් ශීලයෙන් රක්නාලද්දීවූ ම චිත්තෙකාග්‍රතාවය වදරනලද්දීය; විපස්සනාය යන මේ පදයෙන් ශීලයෙන් රක්නාලද සංඝකාරපරිග්‍රහය වදරනලද්දේය. කෙසේ චිත්තෙකාග්‍රතා තොමෝ ශීලය රකී ද යත්? යම්හෙයකින් යමෙකුට චිත්තෙකාග්‍රතාව නැත්ද (එහෙයින්) හෙතෙම ව්‍යාධියක් උපන් කල්හි දුකට පැමිණෙයි, හෙතෙම ව්‍යාධියෙන් දුකට පමුණුවනලද්දේ විසුරුනු සිත්ඇත්තේ ශීලය විනාශ කොට ද රොගසංසිදීම කරන්නේ වෙයි; යමෙකුට වනාහි චිත්තෙකාග්‍රතාව ඇද්ද හෙතෙම ඒ ව්‍යාධි දුඃඛය දුරුකොට සමවතට සමවදී සමවන්කෙණෙහි දුක දුරින් වෙන්ව ගියේ වෙයි, ඉතාබලවත් සුවය උපදියි; මෙහේ චිත්තෙකාග්‍රතාතොමෝ ශීලය රක්ෂාකෙරෙයි; සංඝකාරපරිග්‍රහයතොම කෙසේ ශීලය ආරක්ෂාකෙරේද යත්? යමෙකුට වනාහි සංඝකාරපරිග්‍රහයක් නැද්ද ඔහට මාගේ රූපය මාගේ විඥානය, යි ආත්මභාවයෙහි බලවත් මමත්වය වෙයි; හෙතෙම් එබදුවූ දුර්භික්ෂව්‍යාධිභයාදීන් පැමිණි කල්හි ශීලය විනාශකොටද ආත්මභාවය පොෂණය කරන්නේ වෙයි; යමෙකුට වනාහි සංඝකාරපරිග්‍රහය ඇද්ද ඔහට ආත්මභාවයෙහි බලවත්මමත්වයක් හෝ සෙනහයක් හෝ නො වෙයි; හෙතෙම එබදුවූ දුර්භික්ෂ ව්‍යාධිභයාදීන් පැමිණිකල්හි ඉදින් ඔහුගේ අතුණු පිවත නික්මේද උතකණීයෙන් වියලේද විශෙෂයෙන් වියලේද සියක්ප්‍රකාරයෙන් ද දහස්ප්‍රකාරයෙන් ද කඩ කඩ හෝ වේද ශීලය විනාශකොට ආත්මභාවය පොෂණයකරන්නේ නො ම වෙයි; මේසේ සංඝකාරපරිග්‍රහයතෙම ශීලය ආරක්ෂාකරයි. බ්‍රූහෙතා සුඤ්ඤාගාරානං යන මෙයින් වනාහී ඒ (චිත්තෙකාග්‍රතා සංඝකාරපරිග්‍රහ යන) දෙදෙනාගේ ම බ්‍රූහනය වැඩීම සතතක්‍රියාව දක්වනලද්දීය. භාග්‍යවතුන්වහන්සේ යම්හෙයකින් සබ්‍රහ්මසරුන්ට ප්‍රිය වූවෙක් ද වන්නෙමි-ළෙප-සැලකියයුත්තෙක් ද වන්නෙමි, යි මේ සතර ධර්මයන් කැමතිවන්නාහුවිසින් කළයුතු අන්කිසිවක් නැද්ද එකාන්තයෙන් ශීලාදි ගුණයෙන් යුක්ත වූවෙක් ම වියයුතු ද මෙබදුතැනැත්තේ වනාහි සබ්‍රහ්මසරුන්ට ප්‍රිය වූයේ මනවඩන්නේ ගරුතැන්හි වූයේ සම්භාවනීය වූයේ වේද මේ වදරනලද්දේ මැ, යි-

77. "සීලදස්සනසම්පන්නං ධම්මට්ඨං සච්චවාදිනං
අත්තනෝ කම්මකුබ්බානං නං ජනෝ කුරුතෙ පියං" යි.

---

77. සීලදස්සනසම්පන්නං= චතුපාරිශුද්ධිශීලයෙන් හා සම්‍යග්දර්ශනයෙන් ද යුක්තවූ; ධම්මට්ඨං= නවලොකොත්තරධර්මයෙහි සිටියාවූ; සච්චවාදිනං= සත්‍යවාදීවූ; අත්තනෝ= තමාගේ; කම්මකුබ්බානං= කර්මය පුරන්නාවූ; නං= ඒ පුද්ගලයා; ජනෝ= ලෞකිකමහාජන තෙමේ; පියං කුරුතෙ= ප්‍රියවූවෙක් කෙරෙයි;

(= චතුපාරිශුඞ්ධිශීලයෙන් හා මාර්ගඵලසම්ප්‍රයුක්ත වූ සම්‍යග්දර්ශනයෙන් ද යුක්තවූ තවලොවුතුරු දහම්හි සිටියාවූ (පසක්කළ ලොවුතුරුදහම්ඇති යුහු සේ) සිව්සසුන් සොළොස්අයුරින් පසක්කළබැමින් සත්‍යඥානයෙන් සත්‍යවාදී වූ ත්‍රිවිධශික්ෂාසඞ්ඛ්‍යාත සවකීයකර්මය කරන්නාවූ ඒ පුද්ගලයා ලෞකිකකර්මභාජනතෙමේ ප්‍රියකරයි.)

එහෙයින් ආකඞ්ඛෙය්‍ය වෙ භික්ඛවෙ! භික්ඛු සබ්‍රහ්මචාරීනං පියො වස්සං -පෙ- භාවනියො වා නි සීලෙස්වවස්ස පරිපූරකාරී -පෙ- සුඤ්ඤාගාරානං යි වදාරා මේවිට යම්හෙයකින් ප්‍රත්‍යයලාභාදි භාවය ප්‍රාර්ථනාකරන්නහු විසින් ද මෙය ම කළයුතුද අන්කිසිවක් නො කළයුතු ද, එහෙයින් **ආකඞ්ඛෙය්‍ය වෙ භික්ඛවෙ! භික්ඛු ලාභී අස්සං** යනාදිය වදාළහ. මෙහි ලා භාග්‍යවතුන්වහන්සේ ලාභයනිමිති කොට ශීලාදිය පිරීම නො ද වදාරති, යි දතයුත්තේය; ඒ එසේමැයි- භාග්‍යවතුන්වහන්සේ **ඝාසෙසනං ජිගුච්ඡනකථො න වාචං පයුතං භණෙ** (= ජීවිකාකථාඇත්තෙක් මෙන් වි අවභාසපරිකථානිමිත්ත විඥප්තිප්‍රයුක්ත වූ ආහර සෙවීම පිණිස වූ වචනය නො කියන්නේය,) යි මෙසේ ශ්‍රාවකයන්ට අවවාද කරති, ඒ භාග්‍යවත්හු කෙසේ ලාභනිමිතිකොට ශීලාදිය පිරීම වදාරන්නාහු ද? පුද්ගලාධ්‍යාශය වශයෙන් ඒනාහි මේ වදාරනලදී; ඒ එසේමැයි- යම් කෙනෙකුන්ට මෙබදු අදහසක් වන්නේ නම්? ඉදින් ඇපි සිව්පසයෙන් විඩා නො වන්නෙමු නම් සිල්පුරන්ට හැකිවන්නෙමු, යි කියාසි; ඔවුන්ගේ අදහස්වශයෙන් භාග්‍යවත්හු මෙසේ වදාළහ. තවද යම් මේ සිව්පසයක් නම් වෙත්ද මේ තෙමේ ශීලයාගේ කෘත්‍යයසහිත ආනිසංසයයි; ඒ එසේමැයි- **පණ්ඩිතමනුෂ්‍යයෝ** කොටු ආදියෙහි තබනලද්ද ද බැහැර කොට පුත්‍රාදීන්ට ද නොදී තමාත් නො වළඳ ශීලවන්තයන්ට දෙත්, නුයි ශීලයාගේ සරසානිශංසය දැක්වීම පිණිස ද මෙය වදාරනලද්දේය.

තුන්වැනිවාරයෙහි යෙසාහං යනු "**යෙසං + අහං**"; **නෙසං නෙකාරං**= ඒ දෙවියන්ගේ හෝ මිනිසුන්ගේ හෝ මාකෙරෙහි කරණලද ඒ ප්‍රත්‍යයදායකභාවකාරයෝ; ඒ එසේමැයි- දෙවියෝදශීලාදිගුණයුක්ත යන්ට ප්‍රත්‍යය දෙති, හුදු මනුෂ්‍යයෝ ම නො වෙති, ආයුෂ්මත් මහාකාශ්‍යපයන්ට ශක්‍රයා මෙනි; **මහප්ඵලා මහානිසංසා** යන මේ දෙක අර්ථවශයෙන් එකෙකි, ව්‍යඤ්ජනයම විවිධයි; නොහොත් මහත්වූ ලෞකිකසැපය නිෂ්පාදනය කෙරෙත්, නුයි **මහප්ඵලා** යනුවේ; ඔහත්වූ ලොකොත්තරසැපයට ප්‍රත්‍යය වෙත්, නුයි **මහානිසංසා** යනු වේ; සැබව ශීලාදිගුණයුක්තයාහට සැන්දක් පමණ භික්ෂාව ද පස්රියන් පමණ බිම පන්සලක් ද කොට දෙනලද්දේ නො එක් කල්පදහස්ගණන් දුගතිවිනිපාතයෙන් රකී, කෙළවර අමෘතධාතුවෙන් පරිනිර්වාණයට ප්‍රත්‍යය ද වෙයි; මෙහිලා **ඛීරොදනං අභම්දසිං** යනාදි වස්තූහු ද නොහොත් සියලුම ප්‍රෙතවස්තු විමාන වස්තු ද සාධකයි; එහෙයින් ප්‍රත්‍යයදායකයන්විසින් තමාකෙරෙහි කරනලද සත්කාරයන්ගේ මහත්ඵලභාවය කැමැත්තහුවිසින් ද ශීලාදිගුණයුක්තයෙක් ම වියයුතු, යයි දක්වනසේක.

සතරවෙනි වාරයෙහි **ඤාති**= නැදිමසිල්පක්‍ෂයෙහි වූවාහු; **සාලොහිතා**= එක්ලෙසින් බැඳුනාවූ පියා පියාගේ පියා ආදීහු; **පෙතා**= පෙරවභාවයට (= පරලොවට) ගියාහු; **කාලඞතා**= මළාහු; **තෙසං තං**= ඔවුන්ගේ ඒ මාකෙරෙහි පහන්සිත්ඇතිබව හෝ පහන්සිතින් සිහිකිරීම හෝ; සැබව යම් මහණෙකුගේ කලුරියභාළ පියා හෝ මව හෝ අපගේ ඥතිසථවිරතෙම සිල්වත, කලණදහම්ඇත්තෙකැ,යි පහන් සිත්ඇතිව ඒ භික්‍ෂුව සිහිකෙරේද ඔහුගේ ඒ චිත්තප්‍රසාදය ද ඒ සිහි කිරීම්මාත්‍රය ද මහත්ඵල මහානිශංසවූයේ ම වෙයි; නො එක් දහස් ගණන්කල්ප දුගතියෙන් වළකන්ට ද අන්තයෙහි අමෘතයට පමුණුවන්ට ද සමර්ථ වූයේම වෙයි; මේ වදරනලද මැ,යි භාග්‍යවත්හු විසින්- **යෙ කෙචි භික්ඛවෙ! භික්ඛූ සීලසම්පන්නා සමාධිසම්පන්නා පඤ්ඤා-විමුත්ති- විමුත්තිඤාණදස්සනසම්පන්නා දස්සනම්පහං භික්ඛවෙ! තෙසං භික්ඛූනං බහුකාරං වදාමි, සවනං- අනුස්සතිං- අනුපබ්බජ්ජං- උපසඞ්කමනං- පයිරුපාසනම්පහං භික්ඛවෙ ! තෙසං භික්ඛූනං බහුකාරං වදාමි** යි. එහෙයින් නැසහලේනැයන්ට තමාකෙරෙහි චිත්ත ප්‍රසාදයාගේ ද අනුසමෘතියගේ ද මහත්ඵලභාවය කැමැත්තහුවිසින් ද ශීලාදිගුණයුක්තයෙක් ම වියයුතුය,යි දක්වනසේක.

පස්වැනි වාරයෙහි **අරතිරතිසහො අස්සං**= අරතිය ද රතිය ද ඉවසන්නේ මැඩපවත්වන්නේ යටපත්කරන්නේ වන්නෙමි; මෙහි ද **අරති** යනු අධිකුශලධර්මයන්හි ද පන්තසෙනාසනයෙහි ද උකටලිබවයි; **රති** යනු පඤ්චකාමගුණයෙහි ඇල්මයි; **න ච මං අරති සහෙය්‍ය**= මා ද අරතිතොමෝ නො මැඩපවත්නේය, නො මඬින්නේය යටපත් නොකරන්නේය; **උප්පන්නං**= හටගත් උපන්; යම්හෙයකින් ශීලාදිගුණයුක්තවූයේ අරතිය ද රතිය ද ඉවසාද යටපත්කෙරේද මැඩ සිටිද එහේයින් මෙබදුවූ ආත්මය කැමැත්තහුවිසින් ද ශීලාදිගුණයුක්තවූවෙක් ම වියයුතුය,යි දක්වනසේක.

සවෙනි වාරයෙහි **භය නම්?** සිත තැතිගැන්ම ද අරමුණ ද වේ; **භෙරව නම්?** අරමුණ මැ,යි; සෙස්ස පස්වෙනි වාරයෙහි කීනයමැ,යි. ශීලාදිගුණයුක්ත වූයේ වනාහි චිත්තුත්‍රාසභය හා භය අරමුණ ඉවසයි, යටපත්කොට මැඩ සිටී; අරියකොටිය වාසී මහා දත්තසථවිරයන් මෙනි, තෙරුන්වහන්සේ වනාහි මහට පිළිපන්නේ එක්තරා ප්‍රසාද ඵලවත අරණ්‍යයක් දැක මෙහි ම අද මහණදම් කොට යන්නෙමි,යි මඟින් ඉවත්ව එක්තරා රුකක් මූල සඟල සිවුර පනවා පලඟක් බැඳ හුන්නාහුය; වෘක්‍ෂදෙවතාවාගේ දරුවෝ තෙරුන්ගේ සිල්තෙදින් සියපියවින් සිටින්ට නො හැකිවන්නාහු මහත්නාදකළාහුය; දෙවතා තොමෝ ද සියලු රුක සෙලවුව; සථවිරතෙම නිශ්චල

අරියකොටියවාසි මහාදත්ත තෙරවත.

වම් හුන්නේය; ඕතොමෝ දුමන්ට විය, දිලියෙන්ට විය, තෙරුන් සොලවන්ට නො ම හැකිවුව; ඉක්බිති උපාසකවෙසයෙන් අවුත් වැද සිටියා මේ කවරෙක්දැ? සි විචාරනලද්දී වහන්ස! මම තෙල රැකෙහි අධිගෘහිතවූ දෙවතාවා වෙමි,සි කිව; නී තෙල විකාර කෙළෙහිදැ?සි එසේය වහන්සැ, සි; කුමක්හෙයින්ද? සි විචාරනලද්දී මෙසේ කීවා, වහන්ස! ඔබගේ සිල්තෙදින් දරුවෝ සියපියවුන් සිටින්ට නො හැක්කාහු මහත්කොට හැඬූහ ඕ මම ඔබ පලවාපියන්ට මෙසේ කෙළෙම්,සි; සථවිරතෙම මෙසේ කීය, වැලි කුමක් හෙයින් වහන්ස! මෙහි නො විසුව මැනව, මට අපහසුය,සි පළමුකොට ම නො කීයෙහිදැ?සි; දැන් වූ කලි කිසිවක් නො කියව, අරියකොටිය වැසි මහාදත්ත තෙමේ අම නුෂ්‍යයන්ට බියෙන් ගියේය යන වචනයෙන් ලජ්ජා වෙමි; එහෙයින් මම මෙහි ම වසන්නෙමි; තී වනාහි අද එක දවසක් යම් කිසි තැනෙක වාසයකරව,සි. මෙසේ ශීලාදිගුණයෙන් යුකත වූයේ භය භයඅරමුණු ඉවසන්නේ වෙයි; එහෙයින් තමා මෙබඳුවූවෙක් කොට කැමැත්තහු විසින් ද ශීලාදිගුණ යුකතවූවෙක් ම විය යුතුය,සි දක්වනසේක.

සත්වෙනි වාරයෙහි **ආභිචෙතසිකානං**= "අභිචෙත" යයි ඉතා කෘෂ්ණවූ විශුඬ චිත්තය අධිචිත්තය හෝ කියනුලැබේ; විශුඬචිත්ත යෙහි උපන්නාහු " ආභිචෙතසික " නම් වෙති ; විශුඬ චිත්තයෙහි රැස්වූවාහු, නුයි හෝ "ආභිචෙතසික" නම් වෙති; **දිඨධම්මසුඛවිහාරානං**= ඉහාත්මයෙහි සැපවිහරනඇති; "දිඨධම්ම"යි ප්‍රත්‍යක්ෂ වූ ආත්ම භාවය කියනුලැබේ; එහි සැප විහරණවූ යන අර්ථයි; මේ රූපාවචර ධ්‍යානයන්ට නමකි; සම්හෙයකින් ඒ රූපාවචරධ්‍යානයන්ට පැමිණ හුන්නාවූ ධ්‍යායිහු මේ අත්බැව්හි ම නො කිලිටිවූ නෛෂ්කාම්‍යසුඛය විඳින්ද එහෙයින් ඉහාත්මසැපවිහරනය ඇත්තාහුය,යි කියනුලැබෙත්; **නිකාමලාභී**= කැමති පරිද්දෙන් ලබන සුලුවූයේ, තමාගේ කැමැත්ත වශයෙන් ලබනසුලුවූයේ; කැමතිකැමතිඇසිල්ලෙහි සමවදින්ට සමර්ථ වූයේය,යි කියනලද්දේ වෙයි; **අකිච්චලාභී**= සුවසේ ම විරුඬධර්මයන් විෂ්කම්භණය කොට සමවදින්ට සමර්ථවූයේය, යි කියනලද්දේ වෙයි; **අකසිරලාභී**= අකසිරවූවන් විපුලවූවන් කොට ලබන සුලුවූයේ පිරිසිදුම වූ පරිද්දෙන් ම නැඟිසිටින්ට සමර්ථවූයේ යයි කියනලද්දේ වෙයි; ඒ එසේ මැයි- ඇතැම්කෙනෙක් ලාභිවූයේ ම වෙයි , එතකුදුවුවත් කැමති කැමති කෙණෙහි සමවදින්ට නොහැකිවෙයි; කිසිවෙක් එසේ සමවදින්ට හැකිවෙයි, උපද්‍රවයන් වනාහි දුකසේ දුරුකෙරෙයි; කිසි වෙක් එසේත් සමවදියි, උපද්‍රවයන් ද නිදුකින් ම විෂ්කම්භණය කෙරෙයි, නැළියතක් මෙන් යථාපිරිසුන් කල්හි ම නැඟිසිටින්ට නො හැකි වෙයි; යමෙක් වනාහි මේ ත්‍රිවිධසමපත්තිය ම කැමති වේ නම් හෙතෙමේ ද ශීලයන් ම සම්පූර්ණීකරන සුලුවූයේ වන්නේය,යි.

මෙසේ අභිඥාපාදක ධ්‍යානය කී කල්හි කිසිසේත් අභිඥාවන්ගේ වාරය ආයේද එතකුදු වුවත් භාග්‍යවතුන්වහන්සේ එය නො ගෙන ම යම්හෙයකින් හුදු අභිඥාපාදකධ්‍යානයෝ ද අභිඥාවෝ ද ශීලයන්ගේ ආනිශංසය නො වේද, වැලිදු වනාහි සතරඅරූපධ්‍යානයෝ ද හෙතිම් වූ තුන් ආර්‍යීමාර්ගයෝ ද ආනිශංසය වේද, එහෙයින් ඒසියල්ල හාත් පසින් ගෙන දක්වන්ට **ආකඞ්ඛේය්‍ය** වෙ -පෙ- **යෙ තෙ සන්තා** යන මේ ආදිය වදාළහ. එහි **සන්තා**= අඞ්ගයන්ගේ ශාන්තභාවයෙන් ද අරමුණෙහි ශාන්තභාවයෙන් ද ශාන්තවූ ; **විමොක්ඛා**= විරූඩඛීයන් ගෙන් මිදුනාවූ අරමුණෙහි ද ඇලුනාවූ **අතික්කමම රූපෙ**= රූපාවචරධ්‍යානයන් ඉක්මවා; "යෙ තෙ විමොක්ඛා අතික්කමම රූපෙ සන්තා"යි පද සම්බන්ධයි. සැබව අන්පරිද්දෙකින් චිනම් රූපාවචරධ්‍යානයන් ඉක්මවා කුමක් කෙරෙත්ද?යි නො පැතෙන්නාහුය. **ආරුප්පා**= අරමුණු වශයෙන් ද විපාකවශයෙන්ද රූපවිරහිත වූ ; **කායෙන ඵස්සිත්වා**= නාමකයින් සපඉරියොට පැමිණ අධිගමනය කොට යයි කියනලද වෙයි; සෙස්ස ප්‍රකටමැ,යි. මේ කියනලද වෙයි; යම් කිසි මහණෙකුත් මේ විමොක්ෂයන් සපඉරියොට වසනුකැමැත්තේ වේද හෙතෙමේ ද ශීලයන් ම සම්පූර්ණීකරනසුලුවූයේ වන්නේය,යි.

නවවෙනි වාරයෙහි **තිණ්ණං සංයොජනානං**= සත්කායදෘෂ්ටිවිචිකිත්සාශීලව්‍රතපරාමර්ශසඞ්ඛ්‍යාතවූ ත්‍රිවිධබන්ධනයන්ගේ ; යම්හෙයකින් ඕවු හු සකෘදාගාමීහවාදීන් සමග සකෘදාගාමීහවාදීහු ද කාමය හෝ ඵලය සමග යොදවත්ද, එහෙයින් සංයොජනයෝය,යි කියනු ලැබෙත්, බන්ධනයෝය යන අර්ථයි, **පරික්ඛයා**= ක්ෂයකිරීමෙන්; **සොතාපත්තා**= ස්‍රෝතයට පැමිණියේ; "ස්‍රෝත" යනු ද මාර්ගයට මේ නමකි; "ස්‍රෝතාපන්න" යනු ඒ මාර්ගක්ෂණයෙහි පුද්ගලයාට නමකි; වදාළේමැනු- **සොතො සොතොති හිදං සාරිපුත්ත! වුච්චති කත්තමො නු ඛො සාරිපුත්ත! සොතොති? අය්‍යමෙව හි භගවෙ! අරියො අට්ඨඞ්ගිකො මග්ගො සෙය්‍යථිදං? සම්මාදිට්ඨි-පෙ- සම්මාසමාධි ; සොතාපත්තා සොතාපත්තීති හිදං සාරිපුත්ත! වුච්චති කත්තමො නු ඛො සාරිපුත්ත! සොතාපත්තීති? යො හි භගවෙ! ඉමිනා අට්ඨඞ්ගිකෙන මග්ගෙන සමන්නාගතො අය්‍යං වුච්චති සොතාපත්තා සොය්‍යමා යස්මා එවං නාමෝ එවං ගොත්තෙතා** යි.

(භසාරිපුත්‍රය! ස්‍රෝත ස්‍රෝත යි මේ වචනය වනාහි කියනු ලැබේ, සාරිපුත්‍රය! ස්‍රෝත නම් කවරේදැ? යි; ස්වාමිනි! මේ ආර්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය මැ,යි ඒ කවරේද? සම්‍යග්දෘෂ්ටිය-පෙ-මැනැවි සමාධිය යන මොහුයි ; සාරිපුත්‍රය! ස්‍රෝතාපන්න ස්‍රෝතාපන්න,යි මේ වචනය වනාහි කියනු ලැබේ, සාරිපුත්‍රය! කවරෙක් වනාහි ස්‍රෝතාපන්නවූයේද?යි; ස්වාමිනි! යමෙක් වනාහි මේ අෂ්ටාඞ්ගිකමාර්ගයෙන් යුක්තවූයේද මේතෙමේ ස්‍රෝතාපන්නය,යි කියනුලැබේ, ඒ මේ ආයුෂ්මත් මෙනම් ඇත්තේ මෙනම් ගොත්‍ර ඇත්තේ වේ,යයි;)-

මෙහි වනාහි මාගීයෙන් ඵලයට නාමය දෙනලද, එහෙයින් ඵලසථවූයේ "ස්‍රොතාපත්ති" යයි දතයුතු. **අවිනිපාතධම්මෝ=** විනිපතනය කෙරේ නුයි (=හෙලානුයි) විනිපාත නම් වේ, මෝහට විනිපාතය සවභාව නො වූයේ නුයි "අවිනිපාතධම්ම" නම් වේ; තමා අපාය යන්හි හෙලන සවභාවය නැත්තේය,යි කියනලද්දේ වෙයි; කුමක් හෙයින් ද? අපායට යායුතුවූ යම් ධර්මකෙනෙක් වෙත්ද ඔවුන් ප්‍රහීණ කළබැවිනි; සම්බොධිය උතුම්වූ මාගීයවූයේ උතුම්වූ ගතියවූවා මෝහට නුයි **සම්බොධිපරායණෝ** යනු වේ; මතු මාගීත්‍රයට අවශ්‍යයෙන් පමුණුවන්නේය යන අර්ථයි; කුමක්හෙයින් ද? ලබනලද ප්‍රථමමාගී ඇති බැවිනි; **සිලෙසෙවව** යනු මෙබන්දෙක් වන්ට කැමැත්තේ ද? ශීල යන් සම්පූර්ණීකරනසුලුවූයේ ම වන්නේය,යි.

දසවෙනි වාරයෙහි ප්‍රථමමාගීයෙන් ක්ෂයවූ ත්‍රිවිධසංයොජනයෝ ද **සකෘදගාම්මාගීයාගේ** ගුණකථනය පිණිස වදරනලද්දාහුය; **රාගදොස මොහානං තනුත්තා=** මොවුන්ගේ තුනීභාවයෙන් තුනීබව කිරීමෙන්, යයි කියනලද වෙයි; **එහි** කරුණු දෙකකින් තුනීබව දතයුතුයි, හෙතු රහිතව ඉපදීමෙන් ද සමුදාචාරය මදබැවින්ද,යි කියායි; සැබව සකෘදගාම්පුද්ගලයාහට වෘත්තානුසාරී මහාජනයාට මෙන් කෙලෙසෝ නිතර නො උපදිති, කිසිවිටෙක කිසිවිටෙක උපදිත්, ඉතාවිරලාකාරව තුනීව වපුරනලද කෙතක අඹකුර මෙනි; යලි උපදනාහු ද වෘත්තානුසාරී මහාජනයාට මෙන් මඬිමින් පැහැරෙමින් වසමින් අඹකාර කරමින් නො උපදිති; මදමදව උපදිත්, තුනීආකාරව වලාපටලයක් මෙන් මැසිපියාපතක් මෙන් ද උපදින්; එහිලා කිසි තෙරකෙනෙක් මෙසේ කියති **සකෘදගාම්පුද්ගලයාගේ** කෙලෙසෝ කිසිසේත් බොහෝකල කින් උපදිත්ද බහලවූවාහුම උපදිති, ඒ එසේමැයි- ඕහට පුත්‍රයෝ ද දුහිතෘහු ද දක්නාලැබෙත්,යයි; මේ වනාහි **අප්‍රමාණයි, යම්හෙයකින්** පුත්‍රදුහිතෘහු අහපසහ පරාමර්ශමාත්‍රයකිනුත් වෙත්ද එහෙයිනි, හෙතු රහිතව ඉපදීමෙන් ද සමුදාචාරයාගේ මදබැවින්ද,යි දෙකරුණෙන් ම ඔහුගේ කෙලෙසුන් පිළිබඳ තුනීබව දතයුතුයි. **සකදගාමි=** වරක් පැමිණෙන සවභාව ඇත්තේ; **සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා=** එක් වරක් ම මේ මිනිස්ලොව පිළිසඳවිසින් අවුත්; යමෙක් වනාහි මෙලෙව්හි සකෘදගාම්මාගීය වඩා මෙහි ම පිරිනිවේද හෙතෙමේත් මෙහි නො ගන්නාලදී; යමෙකුත් මේ ලොකයෙහි මාගීය වඩා දෙව්ලොව ඉපිද එහි ම පිරිනිවේද; යමෙකුත් දෙව්ලොව මාගීය වඩා එහිම පිරිනිවේද; යමෙකුත් දෙව්ලොව මාගීය වඩා මේ මිනිස්ලොව ඉපිද පිරිනිවේද; හෙතෙමේත් (නො ගන්නාලදී;) යමෙක් වනාහි මේ ලොකයෙහි මාගීය වඩා දෙව්ලොව උපන්නේ එහි ආයුඇතිතෙක් සිට නැවත මේ ලොකයෙහි ම ඉපිද පිරිනිවේද මේතෙමේ මෙහි ගන්නාලදැ,යි

දතයුතු. **දුක්ඛස්සන්තං කරෙය්‍යං**= වෘත්තදුඃඛයාගේ අන්තය පිරිසිදීම කරන්නෙමි; **සිලෙසෙවව**= මෙබන්දෙක් වනුකැමැත්තේ ද ශීලයන් ම සම්පූර්ණකරනසුලුවූයේ වන්නේය,සි.

එකොළොස්වෙනි වාරයෙහි **පඤ්චන්නං** යනු ගණනපිරිසිදීමයි; **ඔරම්භාගියානං**= "ඔරං" යි යට කියනුලැබේ, යට හජනයකරන්නාවූ යන අර්ථයි; කාමාවචරදිව්‍යලොකයෙහි ඉපදීමට ප්‍රත්‍යයවූ යන අදහසයි; **සංයොජනානං**= බන්ධනයන්ගේ ; ඔහු කාමරාගව්‍යාපාද සංයොජන යන් සමග පළමු කියනලද සංයොජනයෝම යයි දතයුත්තාහුය; ඒ එසේමැයි- යමෙකුවිසින් ඔවුහු ප්‍රහීණ නො කරනලද්දාහුද හෙතෙම කිසිසේත් භවාග්‍රයෙහි උපන්නේ වේද එතකුදුවුවත් ආයුක්ෂයවීමෙන් කාමාවචරයෙහි උපදී මැයි; ඒ සැබව මේ පුද්ගලතෙම ගිලිනලදබිළිය ඇති මසුට උපමාඇත්තේ ද දික් හුයකින් පා බඳනාලද පක්ෂියෙකුට උපමාඇත්තේ ද වේ යයි දතයුතු. මෙහි පෙර කියනලද්දවුන්ගේ ද කථනය ගුණ කීමපිණිස ම යයි දතයුතු. **ඔපපාතිකො**= මෙය සෙසු යොනිප්‍රතික්ෂේපකිරීම්වචනයකි; **තත්ථ පරිනිබ්බායී**= ඒ බඹලොව්හිම පිරිනිවෙනසුලුවූයේ; **අනාවත්තිධම්මො තස්මා ලොකා**= ඒ බඹලොවින් පිළිසඳ විසින් නැවත පෙරළා නො එන ස්වභාවඇත්තේ; **සිලෙසෙවව**= මෙබන්දෙක් වන්ට කැමැත්තේ ද ශීලයන් ම සම්පූර්ණකරන සුලුවූයේ වන්නේය,සි.

මෙසේ අනාගාම්මාර්ගය වදුළකල්හි කිසිසේත් සතරවෙනි මාර්ගයට වාරය ආයේද එතකුදුවුවත් භාග්‍යවතුන්වහන්සේ එය නො ගෙන ම යම්හෙයකින් හුදු ආශ්‍රවක්ෂයාභිඥ තොමෝ ම ශීලයන්ගේ ආනිශංසය නො වේද වැලිදු වනාහි ලෞකිකාභිඥාවෝත් (ආනිශංසය වේද,) එහෙයින් ඔවුන් ද දක්වන්ට ද, තවද යම්හෙයකින් ආශ්‍රවක්ෂය වදුළුකල්හි දෙශනාතොමෝ නිමිත්ත වන්නීද එසේත් ඇති කල්හි මේ ගුණයන් නො වදුළබැවින් මෝ කථාතොමෝ මුණ්ඩාභිඥාභාර්‍යා නම් වන්නීද එහෙයින් අභිඥාවන් සම්පූර්ණකොට දෙශනා කරනු පිණිස ද, තවද යම්හෙයකින් අනාගාම්මාර්ගයෙහි සිටියහුට සමාධිඋපද්‍රවවූ කාමරාගව්‍යාපාදයන් සමූලයෙන් නැසුබැවින් සුවසේ සෘද්ධිවිකුර්ණා සමඟ වේද, යම්හෙයකින් අනාගාමි තෙම ශීලයන් ද සමාධිය ද සම්පූර්ණකරනසුලුවේද, එහෙයින් යුක්තසථානයෙහි ම ලෞකිකාභිඥාවන් දක්වනු පිණිස ද **ආකඞ්ඛෙය්‍ය වෙ-පෙ-අනොකවිහිනං** යන මේ ආදිය වදුළසේකැ,සි, මෝතොමෝ අනුසන්ධියයි. එහි **අනොකවිහිනං ඉද්ධිවිධං** යනාදිනයින් ආවාවූ පඤ්චවිධලෞකිකාභිඥාවන්ගේ ම භාවනාක්‍රමය සමඟ පාලිවර්ණනාතොමෝ විශුද්ධිමාර්ගයෙහි කියනලද්දීය.

සවෙනි අභිඥාවෙහි **ආසවානං ඛයා**= රහත්මඟින් සියලු කෙලෙසුන් ක්ෂයකිරීමෙන් ; **අනාසවං**= ආශ්‍රවවිරහිතවූ; **චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං** යන මෙහි "චෙතො" යන වචනයෙන් අර්හත්ඵල

සම්ප්‍රයුක්තවූ සමාධිය ද "පඤ්ඤූ" යන වචනයෙන් ඒ අහිත්ථලසම්ප්‍ර යුක්තවූ ප්‍රඥව ද කියනලද්දීය; එහි ද සමාධිය රාගයෙන් වෙසෙසින් මිදුනබැවින් "චෙතොවිමුත්ති" යයි ද, ප්‍රඥව අවිද්‍යාවෙන් වෙසෙසින් මිදුනබැවින් "පඤ්ඤාවිමුත්ති" යයි ද දතයුත්තීය. මේය භාග්‍යවතුන් විසින් වදාරනලද මෑයි- **යො හිස්ස භික්ඛවෙ! සමාධි නදස්ස සමාධින්ද්‍රියං යා හිස්ස භික්ඛවෙ! පඤ්ඤූ නදස්ස පඤ්ඤින්ද්‍රියං ඉති ඛො භික්ඛවෙ! රාගවිරාගා චෙතො විමුත්ති අවිජ්ජා විරාගා පඤ්ඤූ විමුත්ති** යි. තවද මෙහි සමථයාගේ ඵලය චෙතොවිමුත්තිය, විදර්ශී නාවගේ ඵලය ප්‍රඥාවිමුක්තිය,යි දතයුත්තීය. **දිට්ඨෙව ධම්මෙ**= මේ අත් බැවිහි ම; **සයං අභිඤ්ඤාසච්ඡිකත්වා**= තමාවිසින් ම ප්‍රඥාවෙන් ප්‍රත්‍යක්ෂ කොට; පරප්‍රත්‍යය රහිතව දැන යන අර්ථයි; **උපසම්පජ්ජ විහරෙය්‍යං**= පැමිණ සම්පාදනය කොට වාසයකරන්නෙම්; **සිලෙසෙව**; මෙසේ සියලු ආශ්‍රවය කෙළවා කොට හැර චිත්තවිමුක්තියට ද ප්‍රඥාවිමුක්ති යට ද පැමිණෙන්වකැමැත්තේ ද ශීලයන් ම සම්පූර්ණකරන සුලුවූයේ වන්නේය, යි.

මෙසේ භාග්‍යවතුන්වහන්සේ ශීලානිශංසකථාව අහිමිය තෙක් වදාරා මෙවිට ඒ සියලු ම ශීලානිශංසය සම්පිණ්ඩනය කොට දක්වන සේක් නිගමනය වදාළහ, **සම්පන්නසීලා භික්ඛවෙ!** -පෙ- **ඉදමෙනං පටිවච වුත්තං** යි. එහි මේ සංක්ෂෙපඅර්ථයයි- "මහණෙනි! ශීලයෙන් සම්පූර්ණ වූවාහු වාසයකරවු -පෙ- ශික්ෂාපදයන් අතුරෙන් ඒ ඒ ශික්ෂා පදය මොනොවට ගෙන හික්මෙවු" යයි **ඉති යනං වුත්තං**= ඒ යම්ක් මාවිසින් පෙර මෙසේ කියන ලද ද මේ සියල්ලම ශීලයෙන් සම්පූර්ණ වූ මහණ සබ්‍රහ්මචාරීන්ට ප්‍රිය වූයේ වෙයි, මනාප වූයේ ගරුසථානීය වූයේ සම්භාවනාකටයුතු වූයේ ප්‍රත්‍යයලාභී වූයේ ප්‍රත්‍යයදායකයන්ට මහත් ඵල කරන්නේ පූජිතනින්ගේ අනුස්මරණ චෙතනාව ඵලමහත්වය කරන්නේ අරතිරති ඉවසන්නේ භයභයානකඅරමුණු ඉවසන්නේ රූපාවචරධ්‍යානයන් ද අරූපාවචරධ්‍යානයන් ද ලබනසුලුවූයේ හෙයි ම වූ තුන් ශ්‍රාමණ්‍ය ඵලයන් ද පඤ්චවිධ ලෞකිකාභිඥාවන් ද ආශ්‍ර වක්ෂයඥානය ද යන මේ ගුණයන් ද තෙමේ විශිෂ්ඨඥානයෙන් දැන සාක්ෂාත්කරන්නේ වෙයි, මේ නිසා මේ සඳහා කියනලද්දේය,යි.

ආඝඩ්ඩය්‍ය සූත්‍ර වණ්ණනා නිමි.

—— × ——

වත්ථ සූත්‍ර වණ්ණනා.

එවමෙම සුතං,යි වත්ථසූත්‍රයයි; එහි **සෙය්‍යථාපි භික්ඛවෙ! වත්ථං=** මහණෙනි! වස්ත්‍රයක් යම්සේද; මේ උපමා වචනයයි; උපමාව ප්‍රභාශකරන්නාවූ ද භාග්‍යවතුන්වහන්සේ කිසිතැනෙක **උපමා දෙශනා.** උපමාව පළමුකොට ම දක්වා පසුව අර්ථය දක්වනසේක; කිසිතැනෙක පළමුකොට අර්ථය දක්වා පසුව උපමාව දක්වති; කිසිතැනෙක උපමාවෙන් අර්ථය පිරිවරකොට දක්වති; කිසිතැනෙක අර්ථයෙන් උපමාව පිරිවරකොට දක්වත්; ඒ එසේමැයි- මේ භාග්‍යවතුන්වහන්සේ **සෙය්‍යථාපඤ්ඤු භික්ඛවෙ! මෙ අගාරා සමාරා තත්ථවකඛුමා පුරිසො මජෙඣසිනො පඤ්ඤය්‍ය,** යි සියලු ම දෙවදූත සූත්‍රය උපමාව පළමුකොට දක්වා පසුව අර්ථය දක්වමින් වදාළහ. **තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානොගච්ඡති, සෙය්‍යථාපි ආකාසෙ,** යි මේ ආදික්‍රමයෙන් වනාහි සියලු ම ඍද්ධිවිධිය අර්ථය පළමුකොට දක්වා පසුව උපමාව දක්වමින් වදාළහ. **සෙය්‍යථාපි බ්‍රාහ්මණ! පුරිසො සාරත්ථිකො සාරගවෙසි** ඝනාදිනයින් ම සියලු ම චුල්ලසාරොපමසූත්‍රය උපමාවෙන් අර්ථය පිරිවරකොට දක්වමින් වදාළහ. **ඉධ පන භික්ඛවෙ! එකච්චෙ කුල පුත්තා ධම්මං පරියාපුණන්ති සුත්තං- පෙ- සෙය්‍යථාපි භික්ඛවෙ! පුරිසො අලඟද්දඤ්ඤිකො** ඝනාදික්‍රමයෙන් වනාහි සියලු ම අලගද්ද සූත්‍රය මහාසාරොපමසූත්‍රය යන මේ ආදීවූ සූත්‍රයන් අර්ථයෙන් උපමාව පිරිවරකොට දක්වමින් වදාළහ. ඒ මේ භාග්‍යවත්හු මෙහි පළමු කොට උපමාව දක්වා පසුව අර්ථය දක්වනසේක; කුමක්හෙයින් වනාහි භාග්‍යවත්හු මෙසේ දක්වනසේක්ද යත්? පුද්ගලාධ්‍යාශය වශයෙන් හෝ දෙශනාවිලාසයෙන් හෝ,යි. ඒ එසේමැයි- යම් පුද්ගලකෙනෙක් පළමුකොට උපමාව දක්වා කියනුලබන්නාවූ අර්ථය සුවසේ ප්‍රතිවෙධ කෙරෙත්ද ඔවුනට පළමුකොට උපමාව දක්වති; සියලු තැන්හි මේ ක්‍රමයයි. යම් ධර්මධාතුවකුත් මනාකොට ප්‍රතිවෙධකළබැවින් දෙශනා විලාසයට පැමිණියේ වේද, ඕ ධර්මධාතු තොමෝ ඒ භාග්‍යවතුන්විසින් මනාකොට ප්‍රතිවෙධකරනලද්දීද එහෙයින් මේ භාග්‍යවත්හු දෙශනා විලාසයට පැමිණි සේක් ධර්මේශ්වර වූ සේක් ධර්මරාජන් වූ සේක, හෙතෙම යම් යම්පරිද්දෙකින් කැමතිවේද, ඒ ඒ පරිද්දෙන් ධර්මය දෙශනාකෙරේ,නුසි මෙසේ මේ පුද්ගලාධ්‍යාශයෙන් හෝ දෙශනා විලාසයෙන් හෝ මෙසේ දක්වන්නේය,යි දතයුතු.

එහි වත්ථං= පියවිපිරිසුදුවතෙක්; **සඞ්කිලිට්ඨං මලගහිතං=** ආග නතුකවූ පස්ඵුලිආදිවූ කිලුටින් කිලිටුවූ, සෝදියදූලිආදිවූ ද මල යෙන් ගන්නාලදබැවින් මලගන්නාලද; **රඞ්ගජාතෙ=** යනු මෙහි

රඹයය (සායම) ම රඹයජාත නම්; **උපසංහරෙය්‍ය**= එලවන්නේ නම්; **යදිනීලකාය**= නීලවණ්ණය පිණිස හෝ යයි කියනලද වෙයි; සියලු තැන්හි මෙසේයි. ඒ එසේමැයි- රදුතෙම නීලවණ්ණය පිණිස එල වන්නේ ලොහොනිලපලාවන්නිල ආදිවූ නිල් පැහැයෙහි එලවයි; පීතවණ්ණය පිණිස පමුණුවන්නේ කිණිහිරිමල්සමානවූ කසාවන්පැහැ යෙහි ද; ලොහිතවණ්ණය පිණිස එලවන්නේ බඳුවදමල්සමානවූ රකත වණ්ණ වූ පැහැයෙහි ද; මඳටපැහැය පිණිස පමුණුවන්නේ කණේරු මල්සමානවූ මදරත්පැහැයෙහි ද (එලවයි;) එයින් කියනලදී- "යදි නීලකාය යදි පීතකාය යදි ලොහිතකාය යදි මඤ්ජෝඨකාය,, යි **දුරත්ත වණ්ණමෙවස්ස**= නපුරු කොට (=නො මනා කොට) රඳනා ලද්දක් ම වන්නේය; **අපරිසුඛවණ්ණමෙවස්ස**= ඒ වස්ත්‍රයාගේ නිල් පැහැය ද සෙසු පැහැය ද පිරිසුදු නො වන්නේය; සැබව එබඳු වස්ත්‍රය නිල්සැළියෙක්හි බහාලනලද්දේ නමුත් මනානිල්පැහැයක් නො වෙයි; සෙසු (පීතකාදි) කුමහින්හි බහාලනලද්දේද මනාවූ පීතාදිවණ්ණයක් නො වෙයි; මලානික (=පර) වූ නිල්කටුකරඹු- කිණි හිරි- බඳුවද · කණේරුමල්වන් වූයේ ම වෙයි; **නං කිස්ස හෙතු**= ඒ වස්ත්‍රය කුමක් හෙතුකොට කුමනකරුණකින් මෙබඳු වේ ද? නො හොත් ඒ වස්ත්‍රයෙහි ඒ රඹයජාතය කුමක් හෙතුකොට මෙබඳුවූ දුරත්තවණ්ණයක් අපරිශුඛවණ්ණයක් වේ ද යත්? යම්හෙයකින් වනාහි වස්ත්‍රයාගේ කිලිටුබව ම මෙහි කාරණය වේද අන්කිසිවක් නො වේද, **එහෙයින් අපරිසුඛත්තා හිකඛවෙ! වත්ථස්ස** යි වදළහ. **එවමෙව** යනු උපමාසම්පුතිපාදනයයි; **චිත්තෙ සංකිලිට්ඨෙ**= සිත කිලිටුවූකල්හි; කුමක් හෙයකින් වනාහි භාග්‍යවතුන් වහන්සේ කිලිටුවස්ත්‍රය හා ඔපමය කළසේක් ද යත්? ව්‍යායාමයාගේ සඵලබව දැක්වීම පිණිසයි; ආගන්තුකවූ මලවලින් කිලිටුවූ වස්ත්‍රය පියවින් පඬෙර බැවින් නැවත සොඬතු ලබන්නේ යම්සේ පඬෙර වේද; එහි උත්පත්තියෙන් කළුවූ එළලොමෙහි මෙන් ව්‍යායාමය නිෂ්ඵල වූයේ නො වේද එසේ සිතද ආගන්තුකවූ කෙලෙසුන්ගෙන් කිලිටුවූයේ පියවින් වනාහි එය සියලු ම ප්‍රතිසන්ධි භවාඞ්ගභවාරයෙහි පඬෙර වූයේ ම වෙයි; වදළේ මැනු · **පභස්සරමිදං හිකඛවෙ! චිත්තං තඤ්ච ඛො ආගන්තුකෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨං** යි. (=මහණෙනි! මේ භවාඞ්ගචිත්තය පිරිසුදුයැ, ඒ භවාඞ්ගචිත්තය සහජාත නො වූ හෙවත් පසුව ජවන ක්ෂණයෙහි උපදනාවූ රාගාදිඋපක්ලෙශයන් විසින් කෙලෙසන ලද් දේය.) එය පිරිසුදුකරනුලබන්නේ ප්‍රභාස්වර (=පඬෙර) වූවක් කරන්ට හැක්කේය එහි උත්සාහය නිෂ්ඵල වූයේ නො වේය, යි මෙසේ උත්සාහයාගේ සඵලබව දැක්වීම පිණිස කිලිටුවූ වස්ත්‍රය හා ඔපමය කෙළේය, යි දතයුතු. **දුග්ගති පාටිකඞ්ඛා**= මෙබඳු සිත ඇතිකල්හි දුගතිය කැමතිවියයුත්තීය; දුගතියට ම මේතෙමේ පැමිණෙන්නේය, **අන්තැනකට නො වේ,යයි** මෙසේ දුගතිය කැමතිවියයුත්තීය, අවශ්‍ය

යෙන් වියයුත්තීය,සි කියනලද්දේ වෙයි; ඕ මෝ දුගතිය නම්; ප්‍රතිපත්තිදුගීතිය ගතිදුගීතිය,සි විවිධවන්නීය. ප්‍රතිපත්තිදුගීතිය ද අගාරිය ප්‍රතිපත්තිදුගීතිය අනගාරිය ප්‍රතිපත්තිදුගීතිය,සි විවිධ වෙයි; ඒ එසේ මැ සි අගාරිකතෙම කිලිටුසිත්ඇත්තේ ප්‍රාණඝාත ද කෙරෙයි, නො දුන්දෙය ද හැරගනී, සියලු ම දශඅකුශලකර්මපථයන් පුරයි, මෝ තො මෝ ඔහුගේ අගාරියප්‍රතිපත්තිදුගීතිය,සි, හෙතෙම ඒ ප්‍රතිපත්තිදුගීතියෙහි සිටියේ කය බිඳීමෙන් නිරයට ද තිරශ්චීනයොනියට ද ප්‍රෙතවිෂයට ද යයි; මෝතොමෝ ඔහුගේ ගතිදුගීතිය, සි. අනගාරිය තෙමේ ද මේ ශාසනයෙහි පැවිදිවූයේ කිලිටුසිත්ඇත්තේ දූතභාවයෙන් යවන ගමනට යයි ද, වෙදකම් කෙරේද, සඞ්ඝභෙදය පිණිස චෙත්‍ය භෙදය පිණිස උත්සාහකෙරේද, වෙළඳුනාදියෙන් ජීවිකාව කෙරේද, සියලු ම අනාචාරයත් අගොචරයත් පූරණයකෙරේද; මෝතොමෝ ඔහුගේ අනගාරියප්‍රතිපත්තිදුගීතියයි. හෙතෙම ඒ ප්‍රතිපත්තිදුගීතියෙහි සිටියේ කය බිඳීමෙන් නිරයට ද යයි, තිරශ්චීනයොනියට ද ප්‍රෙත විෂයට ද යයි, ශ්‍රමණයක්ෂ නම්වූ ශ්‍රමණප්‍රෙතයෙක් වෙයි, ඇවිලගත් සඟලඇදියෙන් (යුක්තවූ) සම්ප්‍රජ්වලිතශරීරඇත්තේ මහත්වූ (හෙවත් පීඩිතවූ) ශබ්දය කරමින් හැසිරෙයි; මෝතොමෝ ඔහුගේ ගතිදුගීතියයි.

විවිධ දුගතිය

"සෙය්‍යථාපි,, සි ශොභනපක්ෂය දක්වන්ට ආරබ්ධයි; එහි අර්ථය අකුශලපක්ෂයෙහි කියනලද්දට විරුද්ධක්‍රමයෙන් දතයුත්තේය. මෙහි ද සුගතිය නම්; ප්‍රතිපත්තිසුගතිය ගතිසුගතිය,සි විවිධ වෙයි; ප්‍රතිපත්තිසුගතිය ද අගාරියප්‍රතිපත්තිසුගතිය අනගාරිය ප්‍රතිපත්තිසුගතිය,සි විවිධ වෙයි; ඒ එසේමැයි අගාරිය තෙමේ පිරිසුදුසිත්ඇත්තේ ප්‍රාණඝාතයෙන් ද වළකී අදත්තාදානයෙන් ද වළකී; සියලු ම දශකුශලකර්මපථයන් පූරණය කෙරෙයි මෝතොමෝ ඔහුගේ අගාරියප්‍රතිපත්තිසුගතියයි; හෙතෙම ඒ සුගතියෙහි සිටියේ කය බිඳීමෙන් මිනිසුන් අතුරෙහි මහත්බවට (හෙවත් පිදියයුතුබවට) ද දෙවියන් අතුරෙහි මහත් (=පිදියයුතු) බවට ද (ප්‍රතිසන්ධිවශයෙන්) පැමිණෙයි; මෝතොමෝ මොහුගේ ගතිසුගතියයි; අනගාරියතෙමේ හෝ මේ ශාසනයෙහි පැවිදිව පිරිසුදු සිත්ඇත්තේ සිව්පිරිසුදුසිල් සොධනය කෙරේද, තෙළෙස්දුවඟ සමාදන් වේද, අටතිස්අරමුණු අතුරෙන් තමහට අනුකූලවූ කමටහනක් ගෙන වනයෙහි ඉතාදුරසෙනසුනක් සෙවනය කරමින් කිසුණුපිරිවරිම් කොට ධ්‍යානසමාපත්තීන් උපදවා ද, සෝවාන් මඟ වඩා ද – අනගැමිමඟ වඩා ද; මෝතොමෝ ඔහුගේ අනගාරිය ප්‍රතිපත්තිසුගතියයි; හෙතෙම ඒ සුගතියෙහි සිටියේ කය බිඳීමෙන් මනුෂ්‍යලොකයෙහි ත්‍රිවිධමහාකුලයන්හි හෝ ෂට්කාමාවචර දිව්‍යලොකයන්හි හෝ දශවිධබ්‍රහ්මවිමානයන්හි හෝ පඤ්චශුද්ධාවාසයෙහි හෝ සතරඅරූතලයෙහි හෝ උපදී; මෝතොමෝ ඔහුගේ ගතිසුගතිය

විවිධ සුගතිය

වේය, යි. මෙසේ කිලිටුඝිතඇතිකල්හි දූගතිය කැමතිවියයුත්තිය. නො කිලිටි වූ කල්හි සුගතිය කැමතිවියයුත්තිය, යි වදුරා මෙවිට යම් උපකෙලෙශයන් කරණකොටගෙන ඝිත කිලිටු වූයේ වේද ඔවුන් දක්වන්නාහු **කතමෙ ච භික්ඛවෙ! චිත්තස්ස උපක්කිලෙසා අභිජ්ඣාවිසමලොභො** යනාදිය වදළහ.

එහි සවකියභාණ්ඩයෙහි ඡන්දරාගය **අභිජ්ඣා** නම්; පරභාණ්ඩයෙහි (ඡන්දරාගය) **විසමලොභ** නම්; නොහොත් සවභාණ්ඩයෙහි හෝ පරභාණ්ඩයෙහි හෝ වේවා, යුක්තප්‍රාප්තස්ථානයෙහි ඡන්දරාගය **අභිජ්ඣා** නම්; අයුක්තඅප්‍රාප්තස්ථානයෙහි (ඡන්දරාගය) **විසමලොභ** නම්; තෙරණුවෝ වනාහි මෙසේ කිහු, කුමකට විභාගයක් කරහු ද? යුක්තස්ථානයෙහි හෝ අයුක්තස්ථානයෙහි හෝ වේවා, **රාගො විසමං දොසො විසමං මොහො විසමං** යි වදළහෙයින් කිසි ලොභයෙක් අවිෂම වූයේ නම් නැති, එහෙයින් මේ ලොභය ම අභිමුඛකොට සිතීම්අර්ථයෙන් අභිජ්ඣා ය, විෂමාර්ථයෙන් විසම ය, මෙය එකාර්ථ ය ව්‍යඤ්ජනය ම විවිධයැ යි. ඒ මේ අභිධ්‍යාවිෂමලොභය ඉපිද (යම් හෙයකින්) සිත දූෂණය කෙරේද බබලන්ට නො දේද එහෙයින් චිත්තයාගේ උපකෙලෙශයෙකැ, යි කියනු ලැබේ; මේ අභිධ්‍යා **විෂම** ලොභය යම්සේද එසේ නවවිධ ආඝාතවස්තුවෙන් හටගත්තේ **ව්‍යාපාදය**, යි; දශවිධආඝාතවස්තුවෙන් හටගත්තේ **ක්‍රොධයයි**; නැවත නැවත සිත හාත්පසින් බඳනේ **උපනාහ** (=බඳවෙර) යයි; අගාරිකයාගේ හෝ අනගාරිකයාගේ හෝ සුකෘතකරණය නසන්නේ **මක්ඛ** නම්; ඒ එසේමැයි- අගාරියතෙමේ ද අනුකම්පක වූ කිසිවෙකු **ඝරගුණ නාසන්නා** විසින් දිළිඳුවූයේ උසස්තැන්හි තබනලද්දේ මෑත කාලයෙහි තා විසින් මට කුමක් කරනලද දූ? යි ඔහුගේ සුකෘතකරණය නසයි; අනගාරිය තෙමේ ද **සාමණෙර** කාලයෙහි පවන් ආචාර්‍යයන් විසින් හෝ උපාධ්‍යයන්විසින් හෝ ඔවිවසයෙන් ද උද්දෙසපරිපුච්ඡාවෙන් ද අනුග්‍රහකොට ධර්මකථානය ශ්‍රවණකෞශල්‍යාදියෙහි හික්මවනලද්දේ මෑත කාලයෙහි රාජරාජ මහාමාත්‍යාදීන්විසින් සත්කාර කරනලද්දේ ගරුකාර කරනලද්දේ ආචාර්‍යඋපාධ්‍යයන් කෙරෙහි (අනාදරව) හැසිරෙන්නේ මේතෙම අප විසින් තරුණකාලයෙහි මෙසේ අනුග්‍රහකරනලද්දේ ද වර්ධනයකරනලද්දේ ද (වෙයි,) එතකුදු වුවත් දූන් සෙනහරහිත වූයේය, යි කියනු ලබන්නේ මට නොපවසින් කුමක් කරනලදදූ? යි ඔවුන්ගේ සුකෘතකරණය විනාශ කරයි, ඔහට මේ සුකෘතකරණය නසන්නාවූ මකුබව ඉපිද සිත දූෂ්‍ය කෙරෙයි, බබලන්ට නො දෙයි, එහෙයින් චිත්තයාගේ උපකෙලෙශයෙකැ, යි කියනුලැබේ; මේ මකුබව යම්සේ ද එසේ බහුශ්‍රැතපුද්ගලයාකෙරෙහි ද යවපත්කොටගෙන ඉදින් මෙබදු වූ බහුශ්‍රැතයාහට අනියතවූ ගතිය වීනම් නට හෝ මට හෝ කවර විශෙෂයෙක්ද යනාදිනයින් උපදනාවූ යුගග්‍රාහය **පලාස** නම්; අන්‍යයන්ගේ සත්කා

රූපීන්ට බුඹුන්න (=රූපිනොකරන්නබව) **ඉස්සා** නමුදු; තමාගේ සම්පත්තිය හා අන්‍යයන් හා සාධාරණබව නොඉවසන්නේ **මච්ඡරිය** නම්; වඤ්චාවෙන් හැසිරීම **මායා** නමුදු; කෛරාවිකභාවයෙන් උපදනේ **සාඨෙය්‍ය** නම්; ඒ එසේමැයි- කෛරාවිකතෙමේ ආනන්ද මත්සයා මෙන් වෙයි; ආනන්ද මත්සයා නම් මත්සය විකයා. යන්ට නහුට ද සඳියන්ට හිස ද දක්වයි, මම තොප හා සමානවෙමි,යි දන්වනු පිණිසය; එපරිද්දෙන් ම කෛරාවික පුද්ගලතෙමේ යම් සූත්‍රාන්තිකයෙකු කරා හෝ ආභිධර්මිකයෙකු කරා හෝ එලඹේද ඕ හට මෙසේ කියයි, මම තොපට සබඳව හැසිරෙමි, තෙපි මට අනුකම්පාකරන්නහුය. මම තොප නොහරිමි,යි; මෙසේ මොවුහු මේ තෙම අපකෙරෙහි ගෞරව සහිතය, ප්‍රතිශ්‍රය සහිතය, හි සිතන්නාහුය,යි කියාහි; ඕහට කෛරාවිකභාවයෙන් උපදනාවූ මේ ශඨබව ඉපිද සිතදූෂ්‍යකෙරෙයි, බබලන්ට නොදෙයි; එහෙයින් චිත්තයාගේ උපක්ලේශයෙකැයි කියනුලැබේ; මේ ශඨබව යම්සේද එසේ වාතයෙන් පිරුනු භස්ත්‍රාවක් ස මා න වූ තදබැවින් දැඩිකොට ගන්නාලද හිස නොපහත්කොට පැවැත්ම කරන්නේ **ථම්භ** නම්; ඒ කරනලද්දට වැඩියක් කිරීම **සාරම්භ සාරම්භය** නම්; ඒ සාරම්භයතෙම අකුශලවශයෙන් ද කුශලවශයෙන්ද,යි දෙපරිද්දෙකින් ලැබෙයි; ඒ දෙකඅතුරෙහි අගාරිකයාහට මෙරමාවිසින් කරනලද අලඞ්කාරාදිය දූක ඊට දෙගුණයක් ඊට දෙගුණයක් කිරීමෙන් උපදනේ ද, අනගාරිකයාහට **යම්පමණ යම්පමණ** මෙරමාප්‍රගුණකෙරේද, කියා හෝ වේද, මාන වශයෙන් ඊට දෙගුණයක් ඊට දෙගුණයක් කිරීමෙන් උපදනේ ද, අකුශල වෙයි; අගාරිකයාහට වඩාහි එක් සලාකබතක් දෙන්නාවූ මෙරමා දූක තමාවිසින් දෙකක් හෝ කුනක් හෝ **දෙකුකැමිකි** බැවින් උපදනේ ද, අනගාරිකයාහට ද අන්‍යයා එක්නිකායක් ඉගෙන ගත්කල්හි මානය නොනිසා හුදෙක් දූක තමාගේ ආලස්‍යය මැඩ දෙනිකායක් හනුකැමිකිබැවින් උපදනේ ද කුසල් වෙයි; මෙහි වඩාහි අකුශලය අදහස්කරනලදී; ඒ එසේමැයි මේ සාරම්භය ඉපිද සිත දූෂ්‍යකෙරෙයි, බබලන්ට නොදෙයි, එහෙයින් චිත්තයාගේ උපක්ලේශයෙකැ,යි කියනුලැබේ; මෙය යම්සේ ද එසේ ජාතිආදිය නිසා චිත්තයාගේ උන්නතිවශයෙන් පැවැත්තේ **මාන** නම්; අතුල්‍ය උන්නතිවශයෙන්වූයේ **අතිමාන** නම්; මදග්‍රහණාකාරවූයේ **මද** නම්; කාමගුණයන්හි සිත බැසගැනීම්වශයෙන් උපදනේ **ප්‍රමාද** නම්; එය ඉපිද සිත දූෂ්‍යකෙරෙයි, බබලන්ට නොදෙයි, එහෙයින් චිත්තයාගේ උපක්ලේශයයි කියනුලැබේ.

කුමක් හෙයින් වඩාහි භාග්‍යවතුන්වහන්සේ උපක්ලේශ දක් වන්නාහු ලොභය ආදි කොට දක්වන සේක් ද යත්? ඒ ලොභයාගේ ප්‍රථමොත්පත්තිය හෙයිනි; සැබව යම් කිසි තැනක උපන්නාවූ සියලු

සත්ත්වයන්ට යටත් පිරිසෙයින් ශුද්ධාවාසභූමියෙහි උපන්නවුන්ට ද සියල්ලට පළමුව භවනිකාන්තති වශයෙන් ලොභය උපදී; අනතුරුව තමතමහට අනුරූපවූ ප්‍රත්‍යය සඳහා ලැබෙන පරිදි අන්‍යයෝ උපදිති; මොහු සොළොස්දෙන ම චිත්තයාගේ උපක්ලෙශයෝ නො ද වෙති, මේ ක්‍රමයෙන් වනාහි සියලූ ම ක්ලෙශයෝ ගත්තාහු ම වෙත්, යයි දතයුත්තාහුය. මෙතෙකින් සංක්ලෙශය දක්වා මෙවිට පිරිසුදුබව දක්වන්නාහු **සබ්බොසො හික්ඛවෙ!** යනාදිය වදාළහ. **එහි ඉති විදිත්වා**= මෙසේ දැන; **පජහති**= සමුච්ඡේදප්‍රහාණවශයෙන් ආර්‍යමාර්ගයෙන් දුරුකරයි; එහි කෙලෙස්පිළිවෙළින, මහපිළිවෙළින්ද,යි දෙපරිද්දෙකින් ප්‍රහාණය දතයුතුයි; පළමුකොට කෙලෙස් පිළිවෙළින් අභිධ්‍යාවිෂමලොභය සත්කායය සාරම්භය මානය අතිමානය මදය යන මේ ෂට්කෙලෙශයෝ අර්හත්මාර්ගයෙන් ප්‍රහීණ වෙති; ව්‍යාපාදය ක්‍රොධය උපනාහය ප්‍රමාදය යන මේ සතර කෙලෙශයෝ අනාගාම්මාර්ගයෙන් ප්‍රහීණවෙති; මකුබව පළාසය ඊර්ෂ්‍යාව මාත්සර්‍යය මායාව ශාඨ්‍යය යන මේ සය ස්‍රොතාපත්තිමාර්ගයෙන් ප්‍රහීණවෙත් යයි. මහපිළිවෙළින් වනාහි ස්‍රොතාපත්තිමාර්ගයෙන් මකුබව පළාසය ඊර්ෂ්‍යාව මාත්සර්‍යය මායාව ශාඨ්‍යය යන මේ සය ප්‍රහීණ වෙති; අනාගාම්මාර්ගයෙන් ව්‍යාපාදය ක්‍රොධය උපනාහය ප්‍රමාදය යන මේ සතර ද; අර්හත්මාර්ගයෙන් අභිධ්‍යාවිෂමලොභය සත්කායය සාරම්භය මානය අතිමානය මදය යන මේ සයද ප්‍රහීණ වෙත් යයි. මෙතැන්හි වනාහි මේ කෙලෙශයෝ සෝවාන්මගින් නැසියයුත්තාහුහෝ සෙසු මහකින් නැසියයුත්තාහු හෝ වෙත්වා, එතකුදුවුවත් **අනාගාම්මාර්ගයෙන් ම ප්‍රහාණය සඳහා අභිජ්ඣාවිසමලොභං චිත්තස්ස උපක්කිලෙසං පජහති** යනාදිය වදාළහ,යි දතයුතු; **මේ මෙහි ප්‍රවේණී මාර්ගතාවූ සඳහාවයයි;** හෙ ද ඝලිත් මත්තෙහි සතරමාර්ගය සිළිබඳවම දක්වූහෙයින් යෙදෙයි; ඒ **එසේමැයේ- තුන්වෙනි මාර්ගයෙන් ප්‍රහීණ වීමෙන් අවශෙෂවූ විෂමලොභාදීන්ගේ ප්‍රහාණය එයින් වෙයි, සෙස්සන්ගේ ප්‍රහාණය** මේ මාර්ගයෙන් ම වෙයි; යමෙකුත් ස්‍රොතාපත්ති මාර්ගයෙන් ප්‍රහීණවෙත්ද ඔවුහු ද ඔවුන් උපදවනයිත් ප්‍රහීණ නො වූබැවින් අනාගාම්මාර්ගයෙන් ම ඔහුකොට ප්‍රහීණ වූවාහු වෙත්,යයි. කියයි ආචාර්‍යකෙනෙක් වනාහි ප්‍රථම්මාර්ගයෙන් ම මෙහි ප්‍රහාණය වර්ණනා කෙරෙති; එය පූර්‍වාපරය හා නො ගැලපෙයි. කියවෙක් විෂකම්භණප්‍රහාණය,යි (කියති;) එය ඔවුන්ගේ ඊර්ෂ්‍යාමාත්‍රයෙක් මැය. **යතො ඛො හික්ඛවෙ!** යන මෙහි **යතො**= යම් කාලයෙක්හි; **පහීනො හොති**= අනාගාම්මාර්ගක්ෂණයෙහි ප්‍රහාණය සඳහා ම වදාළහ. **සො බුඩෙ අවෙච්චපසාදෙන** යන මෙය "මහණෙනි! යම් කලෙක්හි විෂමලොභය ප්‍රහීණ වූයේ වේද හෙතෙම බුදුන්කෙරෙහි අචලප්‍රසාදයෙන් යුක්තවූයේ වේය,යි මෙසේ එකෙණිපදය හා යෙදිය යුතුයි. මේ මහණහට අනාගාම්මාර්ගය සමග ලොකොත්තරප්‍රසාදය ආයේයැ. ඊට පසු මෑතකාලයෙහි

බුඩගුණ ද ධම්ගුණ ද සඩඝගුණ ද සිහිකරන්නාවූ ඕහට ලෞකික ප්‍රසාදය උපදී; ඔහුගේ ඒ සියලුම ලෞකිකලොකොත්තර මිශ්‍රවූ ප්‍රසාදය දක්වන්නාවූ භාග්‍යවත්හු බුඩෙ අවෙච්චප්පසාදෙන යනාදිය වදුලහ. එහි **අවෙච්චප්පසාදෙන**= බුඩධම්සඩඝ ගුණයන් සවභාවවූ (විද්‍යමානවූ) පරිද්දෙන් දත් හෙයින් නිශ්චලවූ ව්‍යුතනොවූ ප්‍රසාදයෙන්; මේවිට යම් ආකාරයකින් සිහිකරන්නාවූ ඒ මහණහට ඒ අවලප්‍රසාදය උපන්නේද ඒ ආකාරය දක්වනසේක් **ඉතිපි සො භගවා** යනාදිනයින් ත්‍රිවිධ අනුසමෘතිසථානයන් විසතරකළසේක; ඔවුන්ගේ අථවණ්ණා සම්භාරයෙන් විශුඩිමාගීයෙහි අනුසමෘතිකථාවෙහි කියනලද්දීය.

මෙසේ ඔහුගේ ලෞකිකලොකොත්තරමිශ්‍රවූ ප්‍රසාදය දක්වා මේවිට කෙලශප්‍රහාණය ද අවල ප්‍රසාදයෙන් යුකතබව ද ප්‍රත්‍ය වෙක්ෂාකරන්නහුට උපදනාවූ සෞමනස්‍යාදි අනුසස් දක්වන්නාහු **යතොපි ඛො පනස්ස** යනාදිය වදුලහ. ඒ එසේමැයි. අනාගාම් පුද්ගලයාකව ප්‍රත්‍යනනයෙහි උපන්නාවූ සොර උවදුරු සංසිදුවා එය මෙනෙහි කරමින් මහානගරයෙහි වාසයකරන්නාවූ රජුට මෙන් මාගේ මේ කෙලශයෝ ද ප්‍රහීණවූහ,යි තමාගේකෙලශප්‍රහාණය මෙනෙහි කරන්නහුට බලවත්සොම්නසඋපදී එය දක්වන භාග්‍යවත්හු **යතොපි ඛො පනස්ස** යනාදිය වදුලහ. එහි අථය නම්? යම් මේ අනාගාම් මහණෙක් මෙසේ බුදුන්කෙරෙහි අවලප්‍රසාදයෙන් යුකත වූයේ වේද, ධම්යකෙරෙහි සඩඝයාකෙරෙහි ලොකශටඅනුත්තරවූ සින්කෙතයයි; ඔහුවිසින් ඒ (කෙලෙස්) යම්කලෙක්හි චජනයකරන ලද්දේවේද දුරලනලද්දේ වේද, සවකියසවකිය අවධිවශයෙන් හරින ලද්දේ ම වෙයි, ඒ ඒ කෙලෙස්සමූහය වමනයකරනලද්දේ මුදන ලද්දේ ප්‍රහීණකරනලද්දේ දුරලනලද්දේ වෙයි, 'සවකියසවකියඅවධි වශයෙන්" යනු කෙලශාවධියද මාගීාවධිය දැ,යි අවධි දෙකක්වෙති; ඒ අවධිදෙක අතුරෙහි කෙලශාවධිවශයෙන් ද යම් කෙලෙස්කෙනෙක් යම් මඟකින් නැසියයුත්තාහු ද ඔවුහු අත්මඟකින් නැසියයුතු කෙලෙසුන් හා අමිශ්‍රව සවකිය අවධි (සීමා) යෙන් ම ප්‍රහීණවූවාහුවෙති; මාගීාවධිවශයෙන්ද යම් කෙලෙස්කෙනෙක් යම්මඟකින් ප්‍රහීණකළ යුත්තාහුද ඒ මඟින්ඔවුහුමප්‍රහීණවූවාහුවෙති මෙසේ සියසිය අවධි (=සීමා) වශයෙන් ඒ ඒ කෙලෙස්සමූහය හරිනලද්දේ ම දුරලන ලද්දේ ම වෙයි; එය මෙනෙහි කොට ම ලද සොම්නස් ඇත්තේ එයින් මත්තෙහි ද හෙතෙම බුදුන්කෙරෙහි අවලප්‍රසාදයෙන් යුකතවූයෙම් වෙම්,යි අථවෙදය (=අවලප්‍රසාදය අරමුණුකොට උපන් සොම්නස) ලබයි, කියා සමබනධය වෙයි.

යතොධි ඛො,යි ද පාඨයි. ඒ පාඨයාගේ වශයෙන් මේ අථයවේ. ඒ මහණවිසින් යම්හෙයකින් අවධිය චජනයකරනලද්දේ දුරලනලද්දේ වේද (කියයි.) එහි **යතො** යනු කාරණවචනය, යම්

හෙයකින් යයි කියනලද්දේ වෙයි; ඔබ යි යට තුන්මහ කියනු ලැබෙත්; කුමක්හෙයින් ද යත්? යම්හෙයකින් ඒ තුන්මහ සීමා කොට කොටස් කොට මතු මතු මඟින් ප්‍රහීණකළයුතුකෙලෙසුන් තබා ප්‍රහීණකෙරෙත්ද, එහෙයින් "ඔධි"යයි කියනුලැබෙත්; අතීතමානීය වූකලි කිසි කෙලෙසයක් අවශෙෂ නො කොට දුරුකෙරේද, එහෙයින් "අනොධි" යයි කියනුලැබේ; මේ භික්‍ෂුවවිසින් යට තුන්මඟින් හරින ලද්දේ "යතොධි ඛො පන වන්තං හොති" (යි කියනුලැබේ;) එහි **ඛො පන** යනු නිපාතමාත්‍රය; මේ කියනු ලබන්නේ පිණ්ඩාර්ථයයි යම් හෙයකින් ඔහු විසින් අවධිය හරිනලද්දේ දුරලනලද්දේ වේද එහෙයින් එය ප්‍රත්‍යවෙක්‍ෂාකොට ලත්සොම්නස්ඇත්තේ එයින් මත් තෙහි ද හෙතෙම "බුදුන්" කෙරෙහි අවලප්‍රසාදයෙන් යුක්තවූයෙම් වෙමි,යි අර්ථවෙදය ලබයි,, කියා පෙලවූ පරිද්දෙන් සම්බන්ධ කටයුතුයි. එහි **වන්තං** යන මෙය සඛකිය සඛභාව පරිත්‍යාගකිරීම්වශයෙන් කියනලදී; **වන්තං** යන මෙය නැවත නො ගැනීම්භාවය **දුක්ඛීම්** වශයෙන් ද; **මුත්තං** යන මෙය සන්තතිය විනිමොචනය(=වෙසෙසින් මිදීම්)වශයෙන් ද, **පහීනං** යන මෙය මුදනලද්දහුගේ ද කිසි තැනෙක්හි නො සිටීම **දුක්ඛීම්** වශයෙන් ද; **පටිනිස්සට්ඨං** යන මෙය පෙර ගන්නාලද වීරූ (කෙලෙසයාගේ) දුරලීම **දුක්ඛීම්**වශයෙන්හෝ ප්‍රතිඵල ව දුරලනලදබව **දුක්ඛීම්**වශයෙන් ද; (කියනලදී,) භාව නාබලයෙන් මැඩපවත්වා දුරුකලබව **දුක්ඛීම්**වශයෙන් යයි කියන ලද්දේ වෙයි; **ලභති අත්ථවෙදං ලභති ධම්මවෙදං** යන මෙහි බුදා දීන්කෙරෙහි අවලප්‍රසාදය ම අරණීයභාවයෙන් **අත්ථ** නම්, ඵලඹිය යුතුබැවිනැ,යි කියනලද වෙයි; ධාරණය කරනහෙයින් **ධම්ම** නම්, විවසව වැටෙන්ට නො දෙනබැවිනැ, යි කියනලද වෙයි; **වෙද වෙද** යයි ග්‍රන්ථයද ඥානය ද සොම්නසද (කියනුලැබේ;) **ඉමඤ්ච** ඒ එසේමැය- **නිග්ගණ්ඨං වෙදනං පාරගූ** යනාදිතැන්හි ග්‍රන්ථය"වෙද" යයි කියනුලැබේ; **ඉමං බ්‍රාහ්මණං වෙදඤ්ච ආභිජානාසි අකිඤ්චනං කාමභවෙ අසන්තං** යනාදිතැන්හි ඥානයද; **යෙ වෙදජාතා විචරන්ති ලොකෙ** යනාදිතැන්හි සොම්නස ද වෙදයයි කියනුලැබේ. මෙහි වන්‍යහි සොම්නසද සොම්නස්සහගිය නුවණ ද අදහස්කරනලදී: එහෙයින් **ලභති අත්ථවෙදං ලභති ධම්මවෙදං** යි අවලප්‍රසාදය අරමුණුකොටඇති සොම්නස ද සොම්නස්මයනුවණ ද ලබාය,යි මෙසේ මෙහි අර්ථයදතයුතු. නොහොත් **අත්ථවෙදං**= අවලප්‍රසාදය මෙනෙහි කරන්නහුට උපන්උකතප්‍රකාරවූම වෙදය; **ධම්මවෙදං**- අවල ප්‍රසාදයට හේතු වූ අවධිවශයෙන් කෙලෙසප්‍රහාණය මෙනෙහි කරන්නහුට උපන් උකතප්‍රකාරවූ ම වෙද ය,යි මෙසේත් මෙහි අර්ථය දතයුතු. මේ වදරනලද මැයි- **හෙතුමහි ඤාණං ධම්මපටිසම්භිදා හෙතුඵලෙ ඤාණං අත්ථපටිසම්භිදා** යි.

ධම්මූපසංහිතං පාමුජ්ජං= එම අර්ථය ද ධර්මය ද ඒ අර්ථධර්මයන්ගේ ආනිශංසයවූ සොම්නස ද මෙනෙහි කරන්නහුට උපන් ප්‍රමෝදය; ඒ ප්‍රමෝදය වනාහි අනවශේෂලක්ෂණවූ මෙනෙහි කිරීම්ආකාරයෙන් පැවති ධර්මයෙන් යුක්ත වූ යේ ය, සී කියනුලැබේ; **පමුදිතස්ස පීතිජායති**= මේ ප්‍රමෝදයෙන් ප්‍රමුදිතවූවහුට නිරාමිෂවූ ප්‍රීතිය උපදී; **පීතිමනස්ස**= ඒ ප්‍රීතියෙන් පිනවනලද සිත්ඇත්තහුගේ; **කායෝ පස්සම්භති**= කය නිවියේ සංසිඳුනුදරථඇත්තේ වෙයි; **පස්සද්ධකායෝ සුඛං**= මෙසේ සංසිඳුනු කායදරථඇත්තේ චෛතසිකසුවය විඳී; **චිත්තං සමාධියති**= සිත මනාකොට පිහිටුවයි, පුරවනලද්දක් මෙන් නිශ්චලව සිටී; මෙසේ ඔහුගේ කෙලෙශප්‍රහාණය ද අවලප්‍රසාදයෙන් යුක්තවීම ද මෙනෙහි කරන්නහුට උපදනාවූ සොම්නසආදිකොට ඇති අනුසස් ද දක්වා මේවිට **යතොපි ඛො මේ** යන වාරයෙන් ඒ ප්‍රත්‍යවෙක්ෂාවගේ ප්‍රවෘත්තාකාරය දක්වා එම අනාගාම්මාර්ගානුභාවයාගේ ද බලය දක්වනසේක් **සඩ්ඪා සෝ හික්ඛවෙ!** යනාදිය වදාළහ. එහි **එවං සීලෝ** යී ඔහුගේ අනාගාම්මාර්ගසම්ප්‍රයුක්ත වූ ශීලස්කන්ධය දක්වනසේක; **එවංධම්මෝ එවංපඤ්ඤෝ**,යී ඒ අනාගාම්මාර්ගසම්ප්‍රයුක්තවූ ම සමාධිස්කන්ධය ද ප්‍රඥාස්කන්ධයද දක්වනසේක; **සාලීනං**= රත්හැල්සුවදහැල් ආදිවූ අනෙකාකාර හැල්සම්බන්ධවූ; **පිණ්ඩපාතං**= ඔදනය (=බත;) **විචිත කාලකං**= ඉවත්කළ කළුසහල්ඇති; **නෙවස්සනං හොති අන්තරායාය**= ඒ එබදුවූ භික්ෂුහුගේ ඒ උක්තප්‍රකාරවූ පිණ්ඩපාතභෝජනය මාර්ගඵලයට හෝ ඵලයට හෝ අන්තරාය පිණිස නො ම වෙයි; ඒ සැබව- ලබනලදගුණඇත්තහුට ඒ පිණ්ඩපාතභෝජනය කවර අන්තරායක්කරන්නේද; යමෙකුත් නො ලත්සතරවෙනිමාර්ගයත් ඵලයත් ඇත්තේද එය ලැබීම පිණිස විදර්ශනාරම්භකරන්නාවූද ඔහුට ඒ භෝජනය අන්තරාය පිණිස නො ම වෙයි අන්තරාය කරන්ට අස මර්ථවූයේ ම වෙයි; කුමක්හෙයින්ද්දයත් ? උක්තප්‍රකාරවූ ශීලසමාධි ප්‍රඥාවන්ගේ සඞ්ග්‍රහය ඇති මාර්ගයෙන් විශුද්ධවූසිත්ඇතිබැවිනි; තවද යම්හෙයකින් මෙහි මෙයම කාරණය වේදඑහෙයින් ඊට අනුරූපවූ උප මා ව ක් දක්වනසේක් **සෙය්‍යථාපි** යනාදිය වදාළහ.

එහි **අච්ඡං**= වෙසෙසින් පැහැදුනාවූ; මලවිගමයෙන් **පරිසුද්ධං** යනු වේ; ප්‍රභාස්වරබැවින් **පරියොදාතං** යනු වේ; **උක්කාමුඛං**= රන්කරුවන්ගේ කෝවමුඛය; රන්කරුවන්ගේ කෝව ම **උක්කා** මෙහි උක්කා නම්; අන්තැන්හි වනාහි පන්දම් ආදිය ද **ශබ්දය.** කියනුලැබෙත්; **උක්කාසු ඩය්හමානාසු** යී ආතැන්හි පන් දම "උක්කා„ යී කියනුලැබේ; **උක්කං බන්ධෙය්‍ය උක්කං බන්ධිත්වා උක්කාමුඛං ආලිම්පෙය්‍ය** යී ආතැන්හි අඟුරුකබලය; **තම්මාරානං ඝථා උක්කා අන්තෝ ඣායති නො බහි** යී ආතැන්හි කඹුරුඋදුනයැ; **එවං විපාකෝ උක්කාපාතෝ භවිස්සති** යී ආතැන්හි

වාතවෙගය "උක්කා,, යි කියනුලැබේ; මෙතැන්හි ද මෙබඳුවූ අන් තැන්හි ද **සණ්ඩා සෙන ජාතරූපං ගහෙත්වා උක්කාමුඛෙ පක්ඛිපති** යි ආතැන්හි ද රන්කරුවන්ගේ කෝව "උක්කා,, යි දතයුත්තීය.

එහි මෝතොමෝ උපමා සංසන්දනායි; කිලිටුවූ වස්ත්‍රය මෙන් ද කිලිටුවූ ජාතරූපය මෙන් ද මේ මහණහුගේ පෘථග්ජනකාලයෙහි කාමරාගාදිමලානුගතවූ සිත දතයුතු; පහන්ජලය මෙන් ද කෝව මුඛය මෙන් ද අනාගාම්මාගීය දතයුතු; ඒ ජලයට ද කෝවමුඛයට ද පැමිණ වස්ත්‍රසඛණීයන්ගේ පිරිසුදුබව මෙන් ඒ මහණහුගේ උක්ත ප්‍රකාරවූ ශීලසමාධිප්‍රඥාසඞ්ග්‍රහවූ අනාගාම්මාගීයට පැමිණ විශුඛවූ සිත් ඇතිබව දතයුතු යයි. **සෝ මෙත්තාසහගතෙන චෙතසා**,යි යථානුසන්ධිවශයෙන් දෙශනාතොමෝ පැමිණියා වෙයි; ඒ එසේ

ත්‍රිවිධ අනුසන්ධි. මැයෙ- "පුබ්බානුසන්ධි, අජ්ඣාසයානුසන්ධි, යථානුසන්ධි,, යයි අනුසන්ධි තුනක් වෙති. ඔ වු න තු රෙහි **එවං වුත්තෙ අඤ්ඤතරෝ භික්ඛු භගවන්තං එතදවොච, සියා නුඛො භන්තෙ! ඛණ්ඩා අසතිපරිත්තාසනාති සියා හි භික්ඛු නි භගවා අවොච** යි මෙසේ විචාරන්නවුන්ගේ විසඳනලද සූත්‍රයන්ගේ වශයෙන් "පුබ්බානුසන්ධිය,, දතයුත්තේය; **සියා ඛො පන තෙ බ්‍රාහ්මණ! එවමස්ස අජ්ජාපි නූන සම්මොහා ගොතමො අවිතරාගො** යි මෙසේ අන්‍යයන්ගේ අදහස් දැන වදාළසූත්‍රයාගේ වශයෙන් "අජ්ඣාසයානුසන්ධිය,, දතයුතු; යම් ධර්මයකින් වත්‍යාහි ආදියෙහි දෙශනාතොමෝ පිහිටුවනලද්දී ද ඒ ධර්මයට අනුරූපධර්මියාගේ වශයෙන් හෝ ප්‍රතිපක්ෂවශයෙන් හෝ යම් සූත්‍රයන්හි මත්තෙහි දෙශනාතොමෝ එන්නීද ඒ සූත්‍රයන්ගේවශයෙන් "යථානුසන්ධිය,, දතයුතු; ඒ කවරහුද? ආකඞ්ඛෙය්‍ය සූත්‍රයෙහි යට ශීලයෙන් දෙශනාව පවත්ගන්නාලද්දී මතුයෙහි ඡඩභිඤ්ඤ පැමිණියාහුය; ක්‍රකචොපමසූත්‍රයෙහි යට අක්ෂාන්තියෙන් පටන්ගන්නාලද්දී මතුයෙහි ක්‍රකචොපමාවවාදය ආයේය; අලගද්දසූත්‍රයෙහි යට දෘෂ්ටි දැක්වීමෙන් ආරම්භකරනලද්දී, මත්තෙහි ත්‍රිපරිවෘත්තශූන්‍යතාප්‍රකාශකිරීම පැමිණියාය; චුල්ලඅස්සපුරසූත්‍රයෙහි යට කෙලශපරිදීපනයෙන් පටන්ගන්නාලද්දී මත්තෙහි බ්‍රහ්මවිහාරයෝ ආවාහුය; කොසම්බසූත්‍රයෙහි යට භණ්ඩනයෙන් පටන්ගන්නාලද්දී මතුයෙහි සාරාණීය ධර්මයෝ ආවාහුය; මේ වත්‍රසූත්‍රයෙහි ද යට කෙලශවශයෙන් දෙශනාතොමෝ ආරම්භකරනලද්දී මත්තෙහි බ්‍රහ්මවිහාරයෝ ආවාහුය; එයින් කියනලදී. "යථානුසන්ධිවශයෙන් දෙශනා ආවාය,, යි. බ්‍රහ්මවිහාරයන්හි වත්‍යාහි අනුපදවණ්ණාව ද භාවනාක්‍රමය ද යන සියල්ල සංක්ෂාරයෙන් විශුද්ධිමාගීයෙහි කියනලද්දේය.

මෙසේ භාග්‍යවත්හු! අභිධ්‍යාදි උපක්ලෙශයන්ට ප්‍රතිපක්ෂවූ සත් ප්‍රකාරයෙන් ම කාමරාගව්‍යාපාදයන්ගේ ප්‍රහාණයෙන් පහවූ විරුද්ධ ධර්මඇතිබැවින් ලබනලද පදස්ථානඇති ඒ අනාගාම්හුගේ බ්‍රහ්මවිහාර

භාවනාව දක්වා මෙවිට ඔහුගේ අතීතය පිණිස විදර්ශනාව දක්වා රහත්බවට පැමිණීම දක්වන්ට **සෝ අපරේ ඉදං** යනාදිය වදාළහ. එහි අර්ථය නම්? ඒ අනාගාමීතෙම මෙසේ වඩනලද බ්‍රහ්මවිහාර ඇත්තේ මේ බ්‍රහ්මවිහාරයන් අතුරෙන් යම්කිසිවකින් නැඟී සිට ඒ බ්‍රහ්මවිහාරධර්මයන් ම නාමවශයෙන් ද, ඔවුන්ට නිශ්‍රය්වූයේ හෘදය වස්තුව ය වස්තුනිශ්‍රයවූ වාහු භූතයෝයයි මේ ක්‍රමයෙන් භූතොපාදායධර්මයන් රූපවශයෙන් ද ව්‍යවස්ථාකොට "මේ දුඃඛ සත්‍ය ය ඇතැ,, යි දැනගනී; මෙතෙකින් මොහුවිසින් දුඃඛසත්‍යයෙහි ව්‍යවස්ථානය කරනලද්දේ වෙයි; අනතුරුව ඒ දුඃඛයාගේ සමුදය ප්‍රතිවෙධ කරන්නේ "හිනවූ සමුදයසත්‍යය ඇතැ,, යි දැනගනී; මෙතෙකින් මොහුවිසින් සමුදයසත්‍යයෙහි ව්‍යවස්ථානය කරනලද්දේ වෙයි; අනතුරුව ඒ සමුදයාගේ ප්‍රහාණයෙහි උපාය සොයන්නේ "ප්‍රණීතවූ මාර්ගසත්‍යය ඇතැ,,යි දැනගනී; මෙතෙකින් මොහුවිසින් මාර්ගසත්‍යයෙහි ව්‍යවස්ථානය කරනලද්දේ වෙයි; අනතුරුව ඒ මාර්ගයෙන් පැමිණියයුතුවූ සථානය සොයන්නේ "මේ බ්‍රහ්මවිහාරසංඥවට මත්තෙහි නිස්සරණය ඇතැ,,යි දැනගනී; මාවිසින් අධිගතවූ මේ බ්‍රහ්මවිහාරසංඥවට මත්තෙහි නිස්සරණයවූ නිර්‍වාණය ඇතැ,යි මෙසේ දැනගනී යන අදහසයි; මෙතෙකින් මොහුවිසින් නිරොධසත්‍ය ව්‍යවස්ථානය කරනලද්දේ වෙයි; **නස්ස එවං ජානතෝ එවං පස්සතෝ** යනු විදර්ශනාප්‍රඥවෙන් මෙසේ සිව්අයුරින් සිව්සසුන් දන්නාවූ මාර්ග ප්‍රඥවෙන් මෙසේ දක්නාවූ ඔහුගේ භයභෙරවසූත්‍රයෙහි කීනයින් ම කාමාශ්‍රවයෙන්ද සිත මිදෙයි ..... මේ ආත්මභාවය පිණිස අනිත් කළයුත්තක් නැතැ,යි දැනගනී,යයි.

මෙසේ අතීතය තෙක් දෙශනාව පවසණුවා මෙවිට යම්හෙයකින් ඒ පිරිස්හි සනානයෙන් ශුඩිය වේය, යි ලබ්ධිඇති බමුණෙක් සිටියේද හෙතෙම මෙසේ සනාන ශුඩියෙහි කියනුලබන්නාවූ ගුණය අසා පැවිදිව රහත්බවට පැමිණෙන්නේය,යි භාග්‍යවතුන්විසින් දන්නාලද්දේද, එහෙයින් ඔහුගේ විශුඩබව සඳහා **අඥං වුච්චති භික්ඛවෙ! භික්ඛු ඝිනාතෝ අනන්තරෙන ඝිනාතෙන,** යි මේ වෙනම අනුසඤ්ඤියක් වදාළහ. එහි **අනන්තරෙන ඝිනාතෙන**= අභ්‍යන්තරයෙහිවූ කෙලශයන්ගේ උදහමය (=පිරිසුදුබව) කරන්නාවූ සනානයෙන්; **සුන්දරිකභාරද්වාජෝ**= ඒ බමුණු භාරද්වාජනම, තමාගේ ගොත්‍රවශයෙනි; යම්හෙයකින් සුන්දරිකා නදියෙහි සනානයකරනලද්දහුගේ පාපප්‍රවාහය වේ, යයි මෝතොමෝ ඔහුගේ දෘෂ්ටිය වේද; එහෙයින් සුන්දරිකභාරද්වාජ යයි කියනු ලැබේ; හෙතෙම ඒ වචනය අසා මෙසේ සිතීය "ඇපි දු සනානශුඩිය වණ්ණා කරමු , ශ්‍රමණගෞතමතෙමේ ද එය ම වණ්ණා කෙරෙයි, මෙවිට මේ තෙමේ අප හා සමානවශන්ද ඇත්තේ වනැ"යි; නැවත භාග්‍යවත්හු බාහුකා නදියට ගොස් එහි පාපප්‍රවාහය කොට ආවක්හු මෙන් සිතමින් කිය; **ගච්ඡති පන භවං ගොතමෝ බාහුකං නදිං**

සිනාසිතුං යි; භාග්‍යවත්හු ඔහට යෙම්,යි හෝ නො යෙම්,යි හෝ නො වදරා ම බමුණාගේ දෘෂ්ටිය නැසීම කරනු කැමැත්තාහු **කිං බ්‍රාහ්මණ! බාහුකාය නදියා? කිං බාහුකා නදී කරිස්සති?,** යි වදළහ. ඒ වචනයාගේ අර්ථය කම්? බාහුකානදියෙන් කවර ප්‍රයොජනද? කුමක් කරන්නේද? ඔතොමෝ කිසිවෙකුට අර්පිණිස අසම්පවත්නීය කුමට එහි යන්නෙම්දැ?යි; ඉක්බිති බමුණු ඒ නදියට පසසන්නේ **ලොභ්‍යසම්මතා=** යනාදිය කිය.

එහි **ලොභ්‍යසම්මතා=** රූක්ෂභාවයෙන් සම්මතයැ; වෝක්ෂ(මනොඥ) භාවය විශුද්ධභාවය දෙයි කියා මෙසේ සම්මතයැ,යි කියනලද්දේ වෙයි. **ලොකස්‍යසම්මතා** යි ද පාඨයි; ඒ පාඨයාගේ අර්ථය? ශ්‍රේෂ්ඨ වූ ලොකයට පමුණුවයි කියා මෙසේ සම්මතයැ, යි; **පුඤ්ඤසම්මතා=** පිනැ, යි සම්මතයැ; **පවාහෙති=** හරි විශොධනයකෙරෙයි; **ගාථාහි අජ්ඣභාසි=** ගාථාවලින් වදළහ. ඒ එසේමැයි- ගාථා වදරනුලබන්නාහු ගාථා රුචිකයන්ට තදර්ථදීපනය පිණිස මැ හෝ විශෙෂාර්ථදීපනය පිණිස හෝ වදරනුලැබෙත්; මෙහි වනාහි මේ ගාථා උභයාර්ථදීපනය පිණිස වදරතලද්දාහුය,යි දතයුත්තාහුය.

ඒ එසේමැය බාහුකං යන මේ වචනය මැ මෙහි තදර්ථදීපකයි; සෙසුවචනයෝ විශෙෂාර්ථදීපකයෝයි; මේ විස්තරය වේ, බාහුකානදියව යම්සේද එසේ අධිකකකාදිනදීන් කරා ද ලෝවැසිතෙමේ සනාන සෙන් පාපප්‍රවාහය පිණිස යෙයි. ඒ එහි යන්නවුන්අතුරෙන් යමෙක් තුමූ ඒ ස්ථානයන්ට ආසන්නවූවාහු වෙත්ද ඔවුහු දවසට තුන්වරක් සනානය කෙරෙති; යමෙක් දුරවූවාහුද ඔවුහු පිළිවෙළින් දෙවරක් ද වරක් ද එක් දිනක් අතර ද යෙති; මෙසේ වසක් අතර දක්වා සනානය කෙරෙති; තවද යමෙක් සම්ප්‍රකාරයෙන් ම යන්ට නො හැකි වෙත්ද ඔවුහු කළවලින් ද එයින් දිය ගෙන්වා සනානය කෙරෙති; මේ සියල්ල අර්ථතයැ; එහෙයින් මේ විශෙෂාර්ථය දක්වන්ට "අධිකකකාදිය" ද වදළහ. එහි **අධිකකකං,** යි ස්නානද්‍රව්‍යයන්ගේ වශයෙන් ලදව්‍යවහාරඇති එක් තොටක් කියනුලැබේ; **ගයා,** යි ද මණ්ඩල වැවෙහි සටහන් ඇති තොටක් මැ කියනුලැබේ; **පයාගො** යන මෙය ද ගඞ්ගානදියෙහි එක් තොටක් මැයි ; මහාපනාදරජුගේ ගඞ්ගාවෙහි ගැලුනු ප්‍රාසාදයාගේ ඛින්න භාවූවු තැනය; **බාහුකා සුන්දරිකා සරස්සති බාහුමතී** යන මේ සතර වනාහි නදීහු වෙති; **බාලෝ=** දුෂ්ප්‍රාඥතෙම; **පක්ඛන්දෙනා=** ප්‍රවෙශවන්නේ; **න සුජ්ඣති=** කෙලෙශශුද්ධියට නො පැමිණෙයි; හුදෙක් රජස්දූලි ම ප්‍රවාහය කෙරෙයි. ශුද්ධකෙරෙයි සේයි.

කිං සුන්දරිකා කරිස්සති?= සුන්දරිකානදිතොමෝ කෙලෙශවිශොධනයෙහිලා කුමක් කරන්නේද? කිසිවකුත් කරන්ට සමර්ථ නො වන්නීය යන අදහසයි; ප්‍රයාගබාහුකාවන්හිදු මේ ක්‍රමයයි. යම්හෙයකින් කියනලද මේ පදතුනෙන් අනිත් සතරද ලක්ෂණහාරන්‍යායයෙන්

කියනලද්දහු ම වෙත්ද, එහෙයින් යම්සේ සුන්දරිකාප්‍රයාග බාහුකා යන මොවුහු කිසිවක් නො කෙරෙත්ද එසේ අධිකකකාදීහු ද නො කෙරෙත්,යයි දතයුත්තාහුය.

වෙරිං= ප්‍රාණඝාතාදිපඤ්චවෛරයෙන් යුක්තවූ ; **කතකිබ්බිසං**= කරනලද රෞද්‍රකම්ඇත්තාහු; **නහිනං සොධයෙ**= සුන්දරිකානදියහෝ ප්‍රයාගතීර්ථය හෝ බාහුකානදිය හෝ ශොධනය නො කරන්නේය; වෙසෙසින් පිරිසුදු නො කෙරේ,යයි කියනලද වෙයි; **පාපකම්මිනං**= ලාමකවූ වෛරරෞද්‍රකර්මයන්ගෙන් යුක්තවූ නොහොත් ලාමකකර්මයෙහි යෙදුනාවූ; වෛරරෞද්‍රබවට නො පැමිණි කුඩාවූ ද පාපයන්ගෙන් යුක්තවූ යයි කියනලද වෙයි; **සුඛඤ්ඤ**= කෙලෙස්රහිත වූවහුට; **සබ්බ එගහූ**= නිරතුරු ම එාල්ගුණනක්ෂත්‍රය මැ වෙයි; මැදින් මස උතුරුපල්ගුණනකත්දිනයෙහි යමෙක් ස්නානයකෙරේද හෙතෙම අවුරුද්දක් කළ පව් පිරිසුදුකෙරේ යයි ඒ බමුණු මෙසේ දෘෂ්ටිඇත්තෙක් ලු; එහෙයින් භාග්‍යවත්හු ඔහුගේ ඒ දෘෂ්ටිය ඝවමින් වදාළහ, **සුඛඤ්ඤ වෙ සබ්බ එගහූ** යී, නිකෙලෙසිවූවහුට නිරතුරු උතුරුපල්ගුණනකත වෙයි, එයින් අන්‍යතැනැන්තේ කිම පිරිසුදු වන්නේද? යි; **උපොසථො සබ්බ** යනු තවද කෙලෙස් රහිතවූ තුදුස්වක්පසළොස්වක් ආදි දිනයන්හි පොහොයඟ සමාදන් නොවන්නහුට ද නිත්‍යයෙන් මැ පොහොය වෙයි; **සුඛඤ්ඤ සුච්ඤමඤ්ඤ**= කෙලෙස්රහිතබැවින් පිරිසුදුවූ පවිත්‍රවූ කායකර්මාදියෙන් ද යුක්තවූවහුට ; **සබ්බ සමුපජ්ජතෙ වතං**= මෙබදුවූවහුට වැලි කුසලින් යුක්තවූ ව්‍රතසමාදනයද නිතර සමෘඩ වූයේ ම වේ, යයි.

ඉඛෙව සිනාහි= මේ මාගේ ශාසනයෙහි ම ස්නානයකරව; මේසින් කුමක් කියනලද වේදයත්? ඉදින් අධ්‍යාත්මයෙහි කෙලෙස්මල පිරිසුදු කිරීම කැමැත්තෙහි නම්? මේ මාගේ සස්නෙහි ම අෂ්ටාඞ්ගසමාහිතමැති ජ්ලඝෙන් නහව, යම්හෙයකින් අන්තැනෙක්හි මේ (අටඟසමඟජලඝ) නැත්ද එහෙයිනි; මෙවිට ඕහට සත්ප්‍රාය දෙසනාවශඝෙන් තුන්දෙර ම ශුඛිය දක්වනසේක් **සබ්බභූතෙසු කතරොහි බ්‍රහ්මතං** යනාදිය වදාළහ. **බ්‍රහ්මතං** යනු අභය හිතබව මෛත්‍රිය යයි කියනලද වෙයි; මේ පදඝයෙන් ඔහුට මනොවාරයෙහි ශුඛිය දක්වනලද්දේ වෙයි; **සබෙ මුසා න භණසි,** යන මෙයින් වාග්වාරශුඛිය ද; **සබෙ පාණං න හිංසසි සබෙ අදින්නං නාදියසි** යන මේ පදවලින් කායවාරශුඛිය ද දක්වන ලදී; **සබ්බදහානො අමච්ඡරී** යන මේ පදවලින් වනාහි මෙසේ පිරිසුදු තුන්දෙරඇති ඔහු ශ්‍රද්ධාසම්පත්තියෙහි ද ත්‍යාගසම්පත්තියෙහි ද යෙදුවූහ. **කිං කාහසි? ගඞ්ගං ගන්ත්වා උදපානොපි නෙගමා** යන මෝ අඞ්ගඝ වනාහි ඉදින් සියලු සත්ත්වයන් කෙරෙහි මෙත් කරන්නෙහි නම්, මෘෂා නොකියන්නෙහි නම්, ප්‍රාණඝාත නො කරන්නෙහි නම්, නො දුන්දෙය නො ගන්නෙහි නම්, ඇදහිම් ඇත්තේ නො මසුරු වූයේ වන්නෙහි නම්, ගඞ්ගාවට ගොස් කුමක් කරන්නෙහිද? ලිඳකුත්

තව ගයාව වෙයි; ගයා වෙහි ද ලිඳෙහි ද ස්නානයකරන්නාවූ තාගේ මෙසේ මේ පිළිවෙතින් කෙලශශුඛිය වෙයි; ශරීරමලශුඛිය වනාහි දෙතැන්හි ම සමානය,යි මෙසේ යෙදියයුත්තේය. තවද යම්හෙයකින් ලෙව්හි ගයාව අතිශයින් සම්මතද එහෙයින් ඔහුවිසින් භාග්‍යවත්හු **"ගච්ඡති පන භවං ගොතමෝ බාහුකං"** යි විචාරන ලද්දාහු නමුත් "කිං කාහසි බාහුකංගනත්වා?" යි නො වදාරා **"කිං කාහසි ගයං ගනත්වා?"** යි වදාළහ,යි දතයුතු.

එවං වුත්තෙ යන මේ ආදිය හයහෙරව සූත්‍රයෙහි කී බැවින් ප්‍රකට මැයි; **එකෝ වූපකට්ඨෝ** යනාදියෙහි වනාහි **එකෝ**= කාය විවෙකයෙන් එකලාවූයේ; **වූපකට්ඨෝ**= චිත්තවිවෙකයෙන් වෙන්වූයේ; **අප්පමත්තෝ**= කම්වහන්හි සිහිය නො හැරීමෙන් නො පමාවූයේ **ආතාපී**=කායිකචෛතසිකවීර්‍යයීසඞ්ඛ්‍යාතවූ ආතාපයෙන් තැවීම්ඇත්තේ **පහිතත්තෝ**= කයෙහි ද ජීවිතයෙහි ද අපෙක්ෂාරහිතබැවින් එක්තරා ඉරියව්විහරණයකින් වාසය කරන්නේ; **න චිරස්සෙව** යනු පැවිද්ද ගෙන කියයි; **කුලපුත්තා**= යනු ජාති කුලපුත්‍රයෝ ද ආචාරකුලපුත්‍රයෝ ද,යි කුලපුත්‍රයෝ විවිධ වෙති; මේ තෙම වනාහි දෙපරිද්දෙන් ම කුලපුත්‍රවූයේය; **අගාරස්මා**= ගෘහයෙන්; **අනගාරියං**= අගාරයට (ගෘහයට) හිතවූයේ "අගාරිය" නම්, කෘෂිගවරක්ෂාදිකුටුම්බපොෂණකර්මය කියනු ලැබේ; මෙහි කුටුම්බපොෂණකර්මය නැත්තා,යි අනගාරිය නම්, ප්‍රව්‍රජ්‍යාව මේ නමකි; **පබ්බජන්ති**= පැමිණෙත් ඵලඹෙත්; **තදනුත්තරං**= "තං + අනුත්තරං"; **බ්‍රහ්මචරියපරියොසානං**= මාර්ගබ්‍රහ්මචර්‍යාවගේ පර්‍යවසානයවූ; අර්හත්ඵලය,යි කියනලද වෙයි; ඒ එසේමැයි- එය ප්‍රයොජනකොට කුලපුත්‍රයෝ පැවිදිවෙති; **දිට්ඨෙව ධම්මෙ**= ඒ අත්බැව්හිම **සයං අභිඤ්ඤාසච්ඡිකත්වා**= තමාවිසින් ම කුවණින් සඳක් කොට; **පරප්පත්තිය රහිත කොට යන අර්ථයි. උපසම්පජ්ජ විහාසි**= පැමිණ සම්පාදනය කොට වාසයකෙළේය; මෙසේ වාසයකරන්නේ ද **ඛීණා ජාති-පෙ-අබ්භඤ්ඤාසි.** මෙයින් ඔහුගේ ප්‍රත්‍යවෙක්ෂාභූමිය දක්වන ලේකා.

ඔහුගේ කවර ජාතියක් ක්ෂයවූවාද? කෙසේක් එය දැනගත් තේද? යන චොදනායෙහි ලා පරිහාර කියනුලැබේ- යම්හෙයකින් මෙය හයහෙරවසූත්‍රයෙහිත් කියනලදද එතකුදුවුවත් එය මෙහි ප්‍රථමපුරුෂයාගේ වශයෙන් යොජනාක්‍රමය දක්වනපිණිස නැවත සැකෙවින් කියමු. පළමුකොට ඔහුගේ අතීතජාතිය ක්ෂයවූවා නොවෙයි, පෙර ම ක්ෂයවූ බැවිනි; අනාගතජාතිය ද නො වේ, එහි උත්සාහයක් නැතිහෙයිනි; ප්‍රත්‍යුත්පන්නජාතිය ද නො වේ, විද්‍යමාන බැවිනි; විශෙෂයක් ඇත- මාගීය නො වැඩූ බැවින් එකවතුපඤ්චොකාරභවයන්හි එකවතුපඤ්චස්කන්ධප්‍රභෙදවූ යම් ජාතියක් උපදිනීනම් ඕතොමෝ මාගීය

වැඩුබැවින් අනුතප්පාදසඞ්ඛාතයට පැමිණීමෙන් ක්ෂයවූවාය; හෙතෙම මාර්ගභාවනාවෙන් ප්‍රහීණවූ කෙලෙසුන් ප්‍රත්‍යවෙක්ෂාකොට කෙලෙස් නැතිකල්හි විද්‍යමානවූත් කර්මය මත්තෙහි පිළිසඳ නො දෙන්නේ වේ, යයි දන්නේ එය දූනගනී. **වුසිතං**= වසනලද පිරිවසනලද කරනලද හැසිරෙනලද නිමවනලද යන අර්ථයි; **බ්‍රහ්මචරියං**= මාර්ගබ්‍රහ්මචර්‍යාව; **කතං කරණීයං**= සිව්සස්හි සිව්මගින් පරිඥාප්‍රහාණසාක්ෂාත්ක්‍රියා භාවනාවශයෙන් සොළොස්වැදෑරුම් වූ ම කෘත්‍යය නිමවනලද යන අර්ථයි; **නාපරං ඉත්ථත්තායා**= දැන් නැවත ඉත්ථම්භාවය පිණිස මෙසේ සොළොස්කිස කළයුතුබව පිණිස හෝ කෙලෙස් ක්ෂයකිරීම පිණිස මාර්ගභාවනාවක් නැතැ,යි; නොහොත් **ඉත්ථත්තායා**= මෙබඳු භාවයෙන් මේ මෙබඳු ප්‍රකාරවූ දැන් පවත්නා සකඞ්ඛපරම්පරාවෙන් අන්‍යවූ සකඞ්ඛ පරම්පරාවක් නැත මේ පඤ්චසකඞ්ඛයෝ වනාහි සුන්මුල්ඇති රුකක් මෙන් සිටිත්, යයි දූනගත්තේය **අඤ්ඤතරෝ**= එකෙක්; **අරහතං**= රහතුන් අතුරෙන්; භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකවූ රහතුන්ගේ අභ්‍යන්තරයෙහි වූයේ ඒ, යයි.

වජ්ජසූත්‍ර වණ්ණනා නිමි.

—— × ——

සලෙලඛ සූත්‍ර වණ්ණනා.

එවමෙම සුතං, යි සලෙලඛසූත්‍රයයි; එහි **මහාවුත්තෙ,** යනු ඒ තෙරුන්ගේ නාමයයි; **සායන්හසමයං=** සවස්කාලයෙහි; **පටිසල්ලාණා වුට්ඨිතො** යන මෙහි පටිසල්ලාණං යි ඒ ඒ සත්වසංඝාරයන්කෙරෙන් ප්‍රතිනිවෘත්තව සංලීනය නිලීයනය එකඟබව ප්‍රකෘෂ්ටවිවේකය යයි කියනලද වෙයි; යමෙක් ඒ (සල්ලාණසංඛ්‍යාත) සමවතින් නැඟිසිටි යේද හෙතෙම "පටිසල්ලාණා වුට්ඨිත" නම් වෙයි; මේතෙම වනාහි යම්හෙයකින් සමවත්අතුරෙන් උතුම්වූ ඵලසමවතින් නැඟිසිටියේද එහෙයින් **පටිසල්ලාණා වුට්ඨිතො,** යි කියනලද්දේය; **භගවන්තං අභිවාදෙත්වා=** සමවූ දසනියෙන් දිලිඹෙන දෙහොතින් **අභිවාදනය** සරසනලද හිසින් භාග්‍යවතුන්වහන්සේ සකස්කොට වැඳ අභිවාදනය (=කථනය) කරවා හෙවත් "වුන්දය! සුවපත් වෙව,,යි මෙසේ වාග්භෙදය කරවා! භාග්‍යවතුන්වහන්සේ වනාහි වඳනාලද්දාහු රන්මිහිඟුවක් වැනිවූ ග්‍රීවය ගෙන කණ්සුඛවූ ප්‍රේමනීයවූ අමෘතාභිෂේකයක් වැනිවූ බ්‍රහ්මස්වරය විහිදුවමින් "සුඛී හොහි" යි ඒ ඒ වැඳියහුගේ නම ගෙන කියනසේක; මෙසේ ඒ කාරණය තථාගතයන් විසින් ආවිණීයැ; එහි මේ සාධකසූත්‍රයෙකි.

සක්කෝ භන්තෙ! දෙවානමින්දෝ සාමවෙවා සපරිජනෝ භගවතෝ පාදෙ සිරසා වන්දතීති, සුඛී හොතු පඤ්චසිඛ! දෙවානමින්දෝ සාමවෙවා සපරිජනෝ සුඛකාමා හි දෙවා මනුස්සා අසුරා නාගා ගන්ධබ්බා යෙපි චඤ්ඤෙ සන්ති පුථුකායා ති. (=ස්වාමීනි! ශක්‍ර දෙවෙන්ද්‍රතෙම සුහෘදයන් සහිතවූයේ පිරිවර ජනයා සහිතවූයේ භාග්‍යවතුන්වහන්සේගේ පාදයන් මස්තකයෙන් වඳියයි; පඤ්චශිඛය! සුහෘදයන් (=ඇමතියන්) සහිතවූ පරිජනයා සහිතවූ දෙවෙන්ද්‍රතෙම සුවපත්වේවා, යම්හෙයකින් දෙවියෝ ද මනුෂ්‍යයෝ ද අසුරයෝ ද නාගයෝ ද ගන්ධර්වයෝද අන්‍යවූත් යම් මහජනකෙනෙක් වෙත්නම් ඔවුහු ද සැපයට කැමැත්තාහුද එහෙයිනැයි,,) මෙසේ ද වනාහි තථාගතයෝ මෙබඳුවූ මහෙශාඛ්‍යදෙවතාවන්ට ප්‍රකාශකෙරෙත් යයි.

යා ඉමා යනු දැන් කියයුතු දෘෂ්ටීන් අභිමුඛකරමින් මෙන් වදාළහ. **අනෙකවිහිතා=** නානාප්‍රකාරවූ; **දිට්ඨියෝ=** මිථ්‍යාදෘෂ්ටීහු; **ලොකෙ උප්පජ්ජන්ති=** සත්වයන්කෙරෙහි පහළවෙත්ද; **අන්තවා ද පටිසංයුත්තා** යනු **රූපං අත්තතෝ සමනුපස්සති** යනාදික්‍රමයෙන් පැවති ආත්ම වාදයෙන් ප්‍රතිසංයුක්තවූ ඔවුහු විස්සක්වෙති **ලොකවාදපටිසංයුත්තා** යනු **සස්සතොඅත්තාච ලොකොච** යනාදි ක්‍රමයෙන් පැවති ලෝක වාදයෙන් ප්‍රතිසංයුක්තවූ; ඔවුහු අටදෙනෙක් වෙති; "සස්සතො,, අසස්සතො සස්සතො ච අසස්සතො ච නෙව සස්සතො නාසස්සතො අන්තවා

අනත්තවා, අත්තවා ච, අනත්තවා ච, නෙවත්තනවා නාත්තනවා අත්තාව ලොකො ච,,යි මෙසේ පැවතිබැවිනි. **ආදිමෙව** යනාදියෙහි මේ අර්‍ථයයි- කිමෙක් ද සවාමිනි! පළමුකොට ම මෙනෙහි කරන්නහුට (යයි සේ) සෝවාන්මඟට නොපැමිණ ම විදර්‍ශනාම්ශ්‍රකවූ ප්‍රථමමනසකාරය ම මෙනෙහි කරන්නාවූ භික්‍ෂුවට, මෙසේ මොවුන්ගේ (යයි සේ මෙතෙක් උපායෙන් ම මේ දෘෂ්ටින්ගේ ප්‍රහාණය ත් දුරලීමත් වේද? යි; මේ ප්‍රශ්නය ද තෙරණුවෝ තමන් අධිමාන රහිතවූවාහු ම අධිගතයෙමි යන මාන ඇත්තවුන්ගේ අධිමානප්‍රහාණය පිණිස අධිමානඇත්තෙකු මෙන් වී විචාරති,යි දතයුතු. අන්‍යආචාර්‍යකෙනෙක් වනාහි මෙසේ කිහු තෙරුන්ගේ අතවැසියෝ ප්‍රථමමනසකාරයෙන් ම දෘෂ්ටින්ගේ සමුච්ඡේදප්‍රහාණය වේ,යයි මෙසේ සංඥ ඇත්තාහු ද සමාපත්තිවිහරණයෝ සලෙඛවිහරණයෝය,යි මෙසේ සංඥඇත්තාහු ද ඇති, ඒ තෙරණුවෝ ඔවුන්ට වැඩ පිණිස භාග්‍යවතුන් විචාළහ,යි.

ඉක්බිති ඒ තෙරුන්ට භාග්‍යවතුන් වහන්සේ ඒ දෘෂ්ටින්ගේ ප්‍රහාණය දක්වනසේක් **සා ඉමා** යනාදිය වදාළහ. එහි **යඤ්ච වෙනා දිට්ඨියො උප්පජ්ජන්ති** යනාදිය පස්කඳ සඳහා වදාරනලදී. ඒ සැබව- මේ පඤ්චසඤ්ඤායන්හි මේ දෘෂ්ටිහු උපදිත්; වදාළේ මෑ නු- **රූපෙ ඛො භික්ඛවෙ! සති රූපං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති, සො අත්තා සො ලොකො සො පෙච්ච භවිස්සාමි නිච්චො ධුවො සස්සතො අවිපරිණාම ධම්මො ති** (=මහණෙනි! රූපය ඇතිකල්හි ම රූපයෙහි පිහිටා මෙසේ දෘෂ්ටිය උපදියි, ඒ මම ආත්මය වෙමි, ඒ මම ලොකය වෙමි, ඒ මම පරලොව වන්නෙමි, සදාකාලිකය ස්ථිරය ව්‍යුතවිම් ර හි ත ය ප්‍ර කෘ ති ය නො හරිනසුභාවඇත්තේ,යයි;) විසඳරයි. අරමුණුවශයෙන් වනාහි එකාවවන නොට **යඤ්ච**,යි වදාළහ; යම් අරමුණෙක්හි උපදිත්ද, සි කියනලද වෙයි; මෙහි ද **උප්පජ්ජන්ති අනුසෙන්ති සමුදාචරන්ති** යන මේ පදයන්ගේ මෙසේ නානාත්වය දතයුතු- ජාතිවශයෙන් වනාහි නූපන්නාහු උපදිමින් සිටියාහු **උප්පජ්ජන්ති**= උපදිත් යයි කියනුලැබෙත්; නැවත නැවත සෙවුනාලද්දාහු ස්ථිරවූවාහු නො හික්මවනලද්දාහු **අනුසෙන්ති**= අනුව හොවිත් යයි කියනුලැබෙත්; කායවාග්චාරයට පැ මි ණී යා හු **සමුදාචරන්ති**= හැසිරෙත් යයි කියනුලැබෙත්; මේ මොවුන්ගේ විවිධා කාරයයි; **තං නෙතං මම** යනාදි තැන්හි ඒ පඤ්චසඤ්ඤාප්‍රභෙදවූ අරමුණ "මෙය මාගේ නො වෙයි, මමත් මේතෙම නොවෙමි, මේ මාගේ ආත්මයත් නො වේ,,යයි; **එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො** යනු මෙසේ පළමුකොට පදවී දතයුතු. යම්හෙයකින් වනාහි මෙහි **එතං මම** යනු තෘෂ්ණාවශයෙන් ගැනීම වේද, එය ද ග්‍රහණය කරන්නේ එක්සියඅවක් තෘෂ්ණාවිචරිතප්‍රභෙදඇති තෘෂ්ණා ප්‍රපඤ්චය ගනීද; **එසොහමස්මි** යනු මානවශයෙන් ගැනීමවේද; එයද

ග්‍රහණය කරන්නේ තවයක් ප්‍ර හෙ ද ඇ ති මානප්‍රපඤ්චය ගනීද; **එසෝ මෙ අත්තා** යනු දෘෂ්ටිවශයෙන් ගැනීමවේද? එය ද ග්‍රහණය කරන්නේ මානදෘෂ්ටිප්‍රභෙදවූ දෘෂ්ටිප්‍රපඤ්චය ගනීද; එහෙයින් **නෙතං මම,සි** වදරන්නාවූ භාග්‍යවත්හු යථොක්තප්‍රභෙදවූ තෘෂ්ණා ප්‍රපඤ්චය ප්‍රතික්ෂෙප්කරනසේක; **නෙසොහමස්මි,සි** මානප්‍රපඤ්චය ද; **න මෙසෝ අත්තා,සි** දෘෂ්ටිප්‍රපඤ්චය ද (ප්‍රතික්ෂෙපකරනසේක;) මෙහි තෘෂ්ණාමානයෝ දෘෂ්ටිය හා එක්වූවාහු ම දතයුත්තාහුය; **එවමෙතං**= මෙසේ "නෙතං මම" යනාදි ආකාරයෙන් මේ සකාය පඤ්චකය; **යථාභූතං**= සවභාවවූ පරිදි යම්සේ ඇත්තේද; (එසේ) යයි කියනලද වෙයි; ඒ එසේමැය- සකායපඤ්චකය මේ ආකාර යෙන් ම "අහ්‍ම මම,, !යනාදිවශයෙන් ග්‍රහණයකරන්නේ නො ම ඇත, යන අදහයි; **සම්මප්පඤ්ඤාය පස්සතො**= ස්‍රොතාපත්තිමාගී ප්‍රඥව අවසන්කොටඇති විදර්ශනාප්‍රඥවෙන් මනාකොට දක්නහුට; **එවමෙතාසං**= මේ උපායෙන් මොවුන්ගේ; **පහානං පටිනිස්සග්ගෙහා** යන මේ දෙකා ම සමුච්ඡෙදප්‍රහාණයට ම නමකි.

මෙසේ භාග්‍යවත්හු ආදිමනසකාරයෙන් ම දෘෂ්ටින්ගේ ප්‍රහාණය වේ ද්‍රෝ හෝ නො වේ ද්‍රෝ හෝ,සි ආයුෂ්මත් මහාචුන්දයන්විසින් අධිගතයෙමි, යන මානඇත්තවුන්ගේ වශයෙන් ප්‍රශ්නය විචාරන ලද්දහු සෝවාන්මගින් දෘෂ්ටිප්‍රහාණය දක්වා මෙවිට තමන්වහන්සේම අධිමානිකයන්ගේ ධ්‍යානය විභාගකරනසේක් **ඣානං බො අධිමා පනෙතං** යනාදිය වදළහ. එහි අධිමානිකයෝ නම්? **යම් නිකායා.** කෙනෙකුන්ට නො පැමිණි (මාර්ගඵල) යෙහි පැමිණිසංඥ වෙන් අධිමානය උපදීද (ඔව්හුයි;) ඒ මේ අධිමානය උප දනේ ලෙව්හි වෘත්තානුසාරීවූ බාලපෘථජ්ජනයන්ට නො ම උපදී; ආර්‍යශ්‍රාවකයන්ට නූපදී; ස්‍රොතාපන්නයාහට මම සකෘදාගාමී වෙමි,සි අධිමානය නො ම උපදී; සකෘදාගාම්පුද්ගලයාහට මම අනාගාම්වෙමි,සි නූපදී; අනාගාම්පුද්ගලයාහට මම රහත් වෙමි,සි අධිමානය නූපදී; ශමථවශයෙන් හෝ විදර්ශනාවශයෙන් හෝ විෂ්කම්භණයකළ කෙලෙස් ඇති නිත්‍යයෙන් යුක්තප්‍රයුක්තවූ පටන්ගන්නාලද විදර්ශනා ඇති කාර කයාහට මැ උපදී; ඒ එසේමැයි; ශමථයෙන් විෂ්කම්භිතවූ හෝ විදර්ශනාවෙන් විෂ්කම්භිතවූ හෝ කෙලෙසුන්ගේ සමුදාචාරය නො දක් නාවූ ඔහට මම ස්‍රොතාපන්න වෙමි, සි හෝ සකෘදාගාමී- අනාගාමී- මම රහත් වෙමි, සි හෝ අධිමානය උපදී; තළඟුරු තිස්පව්වැයි ධම්ම දින්නතෙරුන්විසින් අවවාදකරනුලැබූ තෙරවරුන්ට මෙනි.

කළඟුරු වැසි ධම්මදින්න තෙරණුවෝ

උපසපන්වූ නො බෝකල්ඇති ධම්මදින්න තෙරුන්ගේ අවවාදයෙහි පිහිටා බොහෝ භික්ෂූහු විශෙෂ ගුණයට පැමිණියාහුය එපුවත් අසා නිසසමහාවිහාරවාසිභික්ෂුසඞ්ඝ තෙමේ "සථවිරයෝ අසථානයෙහි යොදවන්නෙක් නොවෙති තෙරුන් කැඳවාගෙන එවු යයි බොහෝ භික්ෂූන් යැවිය; ඒ භික්ෂූහු ගොස් "ඇවැත්නි ධම්ම දින්නය! භික්ෂුසඞ්ඝතෙමේ තා කැඳවා,, යයි කිවාහුය; හෙතෙම මේසේ කීය; "කිමෙක්ද වහන්ස! තෙපි ආතමය (=තමා) මාගීණය (=සෙවීම) කෙරෙත්ද? මෙරමා මාගීණය කෙරෙත්ද?යි; සත්පුරුෂය! ආතමය මාගීණය කරමු,යි; හෙතෙම ඔවුන්ට කමටහන් දින; සියල්ලෝ ම රහත්බවට පැමිණියාහුය; භික්ෂුසඞ්ඝතෙමේ නැවත අන්‍යභික්ෂූන් යැවිය; මෙසේ තෙවනවර දක්වා යවනලද්දාහු සියල්ලෝ ම එහිදීම රහත්බවට පැමිණ වාසයකළාහුය; ඉක්බිති සඞ්ඝතෙමේ ගියගියාහු නො එති,යි එක්තරා වෘඩප්‍රව්‍රජිතයෙක් යැවිය; හෙතෙම ගොස් සවාමීනි ධම්මදින්නය! තුන්වරක් නිසසමහාවිහාරවාසි භික්ෂුසඞ්ඝතෙම ඔබ වෙත දූතයන් එවුයේය, තෙපි සඞ්ඝයාගේ ආඥාව ගරු නොකළ හු ද? නො ආවහු දැ?,, යි කීය; සථවිරතෙම මේ කිමෙක් දැ?යි පන්සලට නො පිවිසමැ පාසිවුරු ගෙන්වාගෙන එකෙණෙහි ම නික්මින. හෙතෙම අතරමඟ හඞ්කනවිහාරයට පිවිසිය; එහි දු එක් සැට වස් ඉක්මවනලද මහතෙරකෙනෙක් අධිමානයෙන් අහිඞ්ගය ප්‍රතිඥා කෙරෙයි; තෙරණුවෝ ඒ මහතෙරුන් කරා එලඹ වැඳ පිළිසඳර කොට අධිගමය විචාළහ; මහතෙර මෙසේ කීය, "එසේය ධම්මදින්නය! පැවිද්දුවිසින් යමක් කළයුතුද එය මාවිසින් කළබොහෝකල්ඇත, දැන් ඉක්මවූ සැටවස්ඇත්තෙම් වෙමි,, යි; කිම වහන්ස! සෘඩිය ද වළඤ්ඡනයකරහු දැ? යි; එසේය ධම්මදින්නය!, යි; එ කා නත යෙන් යහපත සවාමීනි! ඇතෙකු ඔබ හමුවට එන්නක්හු කොට මැවුව මැනවැ,යි; මැනව ඇවැත්නි!,යි සථවිරතෙමේ සඞ්ඛෙවතවූ සත්තැන කින් පිහිටි තුන්පරිද්දෙකින් ප්‍රභෙදවූ නඟුට වලනයකරන්නාවූ සොඬ මූඛයෙහි ඛහා දෙදළින් විදිනු කැමතිවූවෙකු මෙන්වූ ප්‍රතිමුඛව එන්නාවූ මහාහසතියෙකු මැවිය; හෙතෙම ඒ තමාවිසින් ම මවනලද ඇතා දැක බියවූයේ පලායන්ට පටන්ගත; එවිට ම තමා මම නො රහත්මි,යි දැන ධම්මදින්නතෙරුන් පාමුල උකඋටිකව හිඳ "ඇවැත්නි! මට පිහිට වෙව,, යි කිය; ධම්මදින්නතෙමේ "වහන්ස! නහමක් ශොකකර, නහමක් අනත්මන වෙව කාරකයන්ට ම අධිමානය උපදීය,,යි තෙරුන්අස්වසා කමටහන් දින; මහතෙරණුවෝ ඒ ධම්මදින්නයන් අවවාදයෙහි සිට රහත්බැව් ලැබී.

සිතුල්පව්වෙහි ද එබදුවූ ම තෙරකෙනෙක් වෙසෙයි; ධම්මදින්න තෙමේ ඔහුකරා ද එලඹ එසේම විචාළේය; ඒ සථවිර ද එසේම

ප්‍රකාශකෙළේය. ඉක්බිති ඒ තෙරුන්ට ධම්මදින්නතෙමේ **කිම් වහන්ස** සෘඩියත් වළඤ්ඤනයකරහු දැ?යි කිය; එසේය ඇවැත්නි!, යි ඉතා යෙහෙක සවාමීනි! එක්පොකුරණියක් මවවු,යයි සඵවිරතෙමේ මැවිය; සවාමිනි! මෙහි පියුම්ගොමුවක් මවව,යි; එය ද මැවිය; පියුම්ගොමුවෙහි මහත් පියුමක් මවවු,යයි; එය ද මැවී; තෙල පියුම් ගැබෙහි සිට මිහිරිනදින් ගයන්නාවූ ද නටන්නාවූ ද එක් සත්‍රිශරීරයක් මවවුයයි එයදමැවීහෙතෙම වහන්ස තෙලසත්‍රිශරීරය නැවත නැවත හාත්පසින් සිතනුමැනවැ,යි කියා පහයට ප්‍රවිෂටවිය; ඒ රූපය හාත්පසින් සිතන්නාවූ තෙරුන්ගේ සැටවසක් විෂකාමභිතවූ කෙලඟයෝ වලිතවූහ; එකල්හි හෙතෙම තමා (නො රහත්මි,යි) පළමු තෙරුන්මෙන් ධම්මදින්නතෙරුන් සමීපයෙහි කමටහන්ගෙනරහත්බවට පැමිණියේය.

ධම්මදින්නයෝ ද පිළිවෙළින් තිඟ්‍යමහාවිහාරයට ගියහ; එකල්හි ද (එහි) තෙරහු සැයහණ හැමද බුඩාරම්මණප්‍රීතිය උපදවා හුන්නාහු වෙති; මේ වූ කලි ඔවුන්ගේ වතයැ; එහෙයින් ඔවුන තුරෙන් එකෙකුත් ධම්මදින්නයන්ට මෙහි පාසිවුරු තබව,යි කියන් නෙකු හෝ (පිළිසඳරවිසින් කිසිවක්) විචාරන්නෙකු හෝ නො වීය; වැළි (කුමක් කලාහුද යත්?) ධම්මදින්න මේ තෙමේ වන්නේය, යි දැන ප්‍රශ්න විවාළාහුය; හෙතෙම විවාළතාක් ප්‍රශ්නයන් තියුණු අසිපතකින් කුමුදුනළකලඹක් සෙයින් සිද පාදඬහුඡයෙන් මහපොළොව පහළේය; වහන්ස! මෝ සිත්නැති මහපොළොව ද ධම්මදින්නයාගේ **ගුණය** දනී, නෙපි වනාහි නො දන්නහුය,,යි කියා මේඝාඨාව කිය-

78 "අවෙඤ්ඤානෂං පඨවී විජානාති ගුණාගුණං
සඤ්ඤාණවා චඛෝ භගවතෙන! න ජානාථ ගුණාගුණං,,යි-

(මේසේ කියා) එකෙණෙහි මැ අහස්හි පැතෑනැති තළඟුරු කිස් ඝව්වව ම ශියේය.

මේසේ කාරකයාහට ම අධිමානය උපදී; එහෙයින් භාග්‍යවත්හු ඒබඳු භික්ෂූන්ගේ වශයෙන් ධ්‍යානය විභාගකරන්නේ **ඣානං චඛෝ පන** යනාදිය වදළහ. ඒ දෙශනාවගේ අර්ථය? මේ කාරණය ඇති නැත්තේ නො වේ; (කුමක්ද?) යම් කරුණකින් මේ සස්තෙහි ඇතැම් මහණෙක් බාහිරපරිව්‍රාජකයන් හා සාධාරණවූ කාමච්ඡන්‍දනීවරණයෙන් වෙන්ව-පෙ- පළමුදුහැන් උපදවා වාසයකරන්නේද

---

78 **අවෙඤ්ඤානෂං**= චෙතනාරහිතවූ; **අඤං පඨවි**= මෝ පෘථිවී තොමෝ; **ගුණාගුණං**= ගුණාගුණ දෙක; **විජානාති**= විශෙෂයෙන් දනී; **භගවතෙන**= වහන්ස!; (නෙපි) **සඤ්ඤාණවා චඛෝ**= චෙතනාසහිත වූවාහු ම; **ගුණාගුණං**= ගුණාගුණ දෙක; **න ජානාථ**= නො දන්නහුය.

යම්හෙයකින් ඔහට කෙලෙසසංලිඛනයෙන් (=කෙලෙසුන් ලියාදැම්මෙන්) යුක්තව වාසයකෙරෙමි,යි ද යම් ප්‍රතිපත්තිවිධානයක් කෙලෙසුන් මොනොවට ලියාදමාද මම ඒ පිළිවෙතින් යුක්තව වෙසෙමි,යි ද මෙබදු සිතක් වේද, එය නො ගෙදෙයි; ඒ එසේමැය- අධිමාන ඇති භික්ෂුවගේ ධ්‍යානය සලෙලඛවූයේ හෝ සලෙලඛප්‍රතිපන්නිවූයේහෝ නො වෙයි; කුමක්හෙයින් ද? විදර්‍ශනාපාදක නො වන හෙයිනි; යම්හෙයකින් හෙතෙම දැහැන් සමවැද එයින් නැගීසිට සංස්කාරයන් සම්මර්‍ශනය නො කෙරේද; තවද ඔහුගේ ධ්‍යානය සිත එකඟවීම පමණක් කරන්නාවූ ඉහාත්මසැපවිහරණය වූයේද; එහෙයින් ඒ කාරණය දක්වන්නාවූ භාග්‍යවත්හු **න ඛො පනෙතෙ චුන්‍ද! අරියස්ස විනයෙ සලෙලඛා වුච්චන්ති දිට්ඨධම්මසුඛවිහාරා එතෙ අරියස්ස විනයෙ වුච්චන්ති** යි වදාළහ. එහි එතෙ, යි ධ්‍යානධර්‍මවශයෙන් බහු වචනය දතයුතු; මේ ප්‍රථමධ්‍යාන ධර්‍මයෝය, යි කියනලද වෙයි; සම වත්විසින් හෝ එක ම ප්‍රථම ධ්‍යානය නැවත නැවත සමාපත්ති වශයෙන් පැවැත්තේ බොහෝබවට යෙයි; **අරමුණුවිසින්** හෝ එකම ප්‍රථමධ්‍යානය පෘථිවීකෘත්ස්නාදියෙහි පැවැත්ම වශයෙන් බොහෝ බවට යේ, යයි; දෙවෙනි තෙවෙනි සිව්වෙනිදැහැන්හි ද මෙම නයයි; අරූපධ්‍යානයන්හි වනාහි ආරම්මණභෙදයක් නැතිහෙයින් පළමු දෙකාරණයාගේ වශයෙන් ම බහුවචනය දතයුතු. තවද යම්හෙයකින් ඒ ධ්‍යානයන්ගේ අඩගයෝත් ශාන්තවූවාහුද ආරම්මණයෝත් ශාන්ත වූවාහුද නිවියාහු ද සිසුම්වූවාහු ද වෙත්යයි කියනලද වේද, **එහෙයින් ඔවුහු සන්තා එතෙ විහාරී** යි; මෙසේ වදාරනලද්දාහුය,යි දතයුතු; මෝ දක්වනලදු වනාහි ඔවුන් සතරදෙනාගේ ම සාධාරණවර්ණනායි. **විශෙෂවර්ණනාව වනාහි සබ්බසො රූපසඤ්ඤානං යනාදිපදත්‍රයෙන් කියයුතුවන්නීද ඕ වර්ණනාතොමෝ විශුද්ධිමාර්ගයෙහි සියලු අයුරින් කියනලද්දී මැය.**

මෙසේ යම්හෙයකින් අධිමානීකභික්ෂුවගේ ධ්‍යානවිහරණයතෙම විදර්‍ශනාපාදක නො වන හෙයින් සලෙලඛවිහාරය නො වේද; යම් හෙයකින් හෙතෙම ධ්‍යානයට සමවැද එයින් නැගීසිට සංස්කාරයන් සම්මර්‍ශනය නො කෙරේද; ඕහට විත්තෙකග්ගතාකාරවූ ඉහාත්මසැප විහරණය ම වේද; එහෙයින් ඒ අර්‍ථය දක්වමින් රූපධ්‍යානයන් හා අරූපධ්‍යානයන් ද විභාගකොට දුන් යම්තැනෙක්හි සංලිඛනය කළයුතුද සුසාලිස් ආකාරයකින් ඒ වසතුව ද ඒ සලෙලඛය ද දක්වන්නාහු ඉධ ඛො පන වො යනාදිය වදාළහ.

සලෙලඛය. කුමක්හෙයින් වනාහි අටසමවත් සමග අවිහිංසාදීහු ම සලෙලඛයෝය,යි වදාරනලද්දාහුද යත්? ලොකොත්තර (ධර්‍මයන්ට) පාදකබැවිනි; ඒ එසේමැය- බාහිරකයන්ගේ අෂ්ටසමාපත්තීහු වෘත්තපාදකවූවාහුම් වෙති; ශාසනයෙහි සරණගමණය

පවා ලොකොත්තරපාදකයෑ; අවිහිංසාදිහු කියනු කිම? යම්සේ බාහිරක අෂ්ටසමාපත්තිලාභීහට ද පඤ්චාභිඥඇත්තහුට ද දුන් දනට වඩා ශාසනයෙහි තිසරණගතයාහට දුන් දන අනිශයින් මහත්ඵල වේද මේ කාරණය මේ සූත්‍රයෙන් මැ දතයුතු; මේ සඳහා ම දක්ෂිණා විභඞ්ගසූත්‍රයෙහි **බාහිරකෙ කාමෙසු විතරාගෙ දානං දත්වා කොටි සතසහස්සගුණා දක්ඛිණා පාටිහාරියා වෙදිතබ්බා සොතාපත්තිඵල සච්ඡි කිරියාය පටිපන්නෙන දානං දත්වා අසඞ්ඛ්‍යෙය්‍යා අප්පමෙය්‍යා දක්ඛිණා පාටිහාරියා වෙදිතබ්බා කො පන වාදෙ සොතාපන්නෙන** යි වදාරනලද; සරණගමනයෙහි පටන් ම එහි සෝවාන්ඵලප්‍රසාදකිරීම පිණිස පිළිපන්නේ අදහස්කරනලද්දේය,යි. මෝ මෙහි පළමුකොට දක්වනලදු පාලියොජනායි.

අනුපදවණ්ණනාවෙහි වනාහි **ඉධ** යන මේ පදය විහිංසාදිවසතු දැක්වීමයි; **ඛො පන** යනු නිපාත මාත්‍රයෑ; **වො** යනු කරණාර්ථයෙහි සාමිවචනයෑ; මේ (මතු දක්වන්නේ) වනාහි මෙහි සංක්ෂෙපාර්ථයයි; **පරෙ විහිංසකා භවිස්සන්ති** යනාදිනයින් යම් මේ විහිංසාදිවසතුවක් කියමුද චුන්දය! මේ (විහිංසාදි) වසතුවෙහි තොපවිසින් සලෙලඛය කටයුතුය,යි; මෙසේ සැකෙවින් වදාරා දැන් විස්තරකරනසේක් **පරෙ විහිංසකා භවිස්සන්ති මයමෙත්ථ අවිහිංසකා භවිස්සාමාති සලෙල ඛො කරණීයො** යනාදිය වදළහ. එහි **පරෙ**= මේ කෙලෙසුන් ලියා දැමීමෙහි යෙදුනාවූ යම් කිසිවෙක් තුමූ; **විහිංසකා භවිස්සන්ති**= අත්ලෙන් හෝ කැටයෙන් හෝ යනාදියකින් සත්වයන් වෙහෙසන්නෝ වන්නාහුය; **මයමෙත්ථ අවිහිංසකා භවිස්සාම** ඇපි වනාහි යම් වසතුවෙක්හි ම අන්‍යයෝ මෙසේ විහිංසක වන්නාහුද තෙල වසතුවෙහි ම අවිහිංසකවූවෝම වන්නෙමු, අවිහිංසාව උපදවා වාසය කරන්නෙමු; **ඉති සලෙලඛො කරණීයො**= මෙසේ තොපවිසින් **සලෙලඛ කළයුතුය; මෙහි සලෙලඛ** යි ද අවිහිංසාව ම දතයුතු; යම්හෙයකින් **අවිහිංසාතොමෝ විහිංසාව මොහොවට ලියාදමා** ද ඕදිද එහෙයින් "සලෙලඛයයි කියනුලැබේ; සියලු තැන්හි මේ ක්‍රමයයි.

මේ වනාහි විශෙෂයයි- **පරෙ මච්ඡාදිඨී** යන මෙහි කම්පථයන්ගේ අන්තයෙහි වූ මිථ්‍යාදෘෂ්ටිය ද මිච්ඡත්තනයන්ගේ ආදියෙහිවූ මිථ්‍යාදෘෂ්ටියද මිශ්‍රකොට දෘෂ්ටිය වදාරනලද්දේය,යි දතයුතු; මෙහි මෝ මිථ්‍යාදෘෂ්ටිය යම්සේද "සම්මාදිඨි" යි කිතැන්හි සම්‍යක්දෘෂ්ටිය ද එසේයි. තවද මෙහි කම්පථයෝ විස්තරවශයෙන් සම්මාදිඨිසූත්‍රයෙහි මතුප්‍රකාශවන්නාහුය; මිච්ඡත්තනයන් අතුරේහි මිථ්‍යාදෘෂ්ටි ආදීහු වෙධාවිතකකාසූත්‍රයෙහි ප්‍රකාශවන්නාහුය; මේ කියනුලබන්නේ මෙහි සංක්ෂෙපයයි- ප්‍රාණය අතිපතනය කෙරෙත් නුයි **පාණාතිපාති** නම් වෙත්, ප්‍රාණඝාත කරන්නාහු යන අර්ථයි; නො දුන්වසතුව හැරගනිත් නුයි **අදින්නා දායි** නම්, සොරකම් කරන්නාහු යන අර්ථයි; අශ්‍රෙෂ්ඨවූ හීනවූ ලාමකවූ

ධර්මයෙහි හැසිරෙත් නුයි **අබ්‍රහ්මචාරී** නම, මෙවුන්දම් සෙවුනාහු යනඅර්ථයි; බ්‍රහ්මං, (යී සේ) ශ්‍රෙෂ්ඨවූ පිළිවෙතැ හැසිරෙත් නුයි **බ්‍රහ්ම චාරී** නම, මෙවුන්දමින් වැළකුනාහු යන අර්ථයි; මෙහි ද බඹසර සලෙළඛ යයි දතයුතු; සැබව- බඹසරතෙමේ අබ්‍රහ්මචර්‍යාව මොනොවට ලියා (සිඳ) දමයි; මෘෂා බෙණෙත් නුයි **මුසාවාදී** නම, මෙරමා වැඩසිදින්නාවූ සිස්වූ බොරුවූ තෙපුල් කියන්නාහු යන අර්ථයි; පිය සුන් තෙපුල් ඇත්තේ මොවුන්ට නුයි **පිසුණාවාචා** නම් වෙති; මෙරමා මම්සිදින්නාවූ පරොස් තෙපුල් මොවුන්ට නුයි **ඵරුසාවාචා** නම් වෙති; සම්ඵං, (යී සේ) නිරර්ථකවූ වචනය කියත් නුයි **සම්ඵප්පලාපී** නම් වෙති; දැඩිලොභය කෙරෙත් නුයි **අභිජ්ඣාලු** නම්වෙති; පර භාණ්ඩයෙහි ලොභකරනසුලුවූවාහු යන අර්ථයි; ව්‍යාපන්නවූ කුණුවූ සිත මොවුන්ට නුයි **ව්‍යාපන්නචිත්තා** නම් වෙති; මිථ්‍යාවූ ලාමකවූ නුවණැත්තන් ගරහනලද දෘෂ්ටිය මොවුන්ට නුයි **මිච්ඡාදිට්ඨී** නම් වෙති; කම්පථයෙහි ඇතුලත්වූ **"නත්ථිදිනනං"** යනාදිය වසකොටඇති (දෘෂ්ටියෙන්ද) **මිච්ඡත්තනියාමපතිත**වූ අනෙයර්‍යාණිකදෘෂ්ටියෙන් ද යුක්තවූවාහු යන අර්ථයි; යහපත්වූ ශොභනවූ නුවණැත්තන්පසස්නා ලද දෘෂ්ටිය මොවුන්ට නුයි **සම්මාදිට්ඨී** නම් වෙති, කම්පථපර්‍යාපන්නවූ **"අත්ථිදිනනං"** යනාදිවූ කම්සවකෘතදෘෂ්ටියෙන් ද සම්මත්තනියාමපර්‍යාපන්නවූ මාර්ගදෘෂ්ටියෙන් ද යුක්තවූවාහු යන අර්ථයි.

මිච්ඡාසඞ්කප්පා= අසවහාවවූ අනෙයර්‍යාණිකවූ **අකුශලසංකල්ප** ඇත්තාහු; **මිච්ඡාවාචා** යනාදියෙහි ද මේ ක්‍රමය,යි; මේ වනාහි විශෙෂය,යි- මිථ්‍යාසඞ්කල්පාදීන් වැනිවූ මිථ්‍යාසමෘති නම් වෙනම කිසි ධර්මයෙක් නැති; අතීතය සිතන්නහුට වනාහි පැවති සතර අකුශල සකඞ්ගියන්ට ම මේ නමකි, භාග්‍යවතුන්විසින් යම්කුත් වදරනලදද **අපෙථා ගිකඛවෙ! අනුසෙති නෙසා නාපතී වදුම් සුත්ත පති ලාභා වා ගිකඛවෙ! අනුසසරතො..... ඔනපතිලාභා වා ගිකඛවෙ! යස පතිලාභංවාගිකඛවෙ අනුසසරතො** යි. ඒය ද ඒ ඒ (කරුණ) සිතන්නහුට සමෘතිප්‍රතිරූපකයෙන් ඉපදීම් සඳහා වදරනලදු,යි දතයුතු. **මිච්ඡාඤාණී** යන මෙහි ද **මිච්ඡාඤාණ** නම්; පාපක්‍රියාවන්හි උපායවිනතාවිශෙෂයෙන්ද පව් නොට මාවිසින් යහපතක් කරනලදු,යි ප්‍රත්‍යවෙක්ෂාකාරයෙන් ද උපන්නාවූ මොහය,යි දතයුතු; එසින් යුක්තවූ පුද්ගලයෝ **මිච්ඡාඤාණී** නම් වෙති; **සම්මාඤාණී** යන මෙහි වනාහි එකුන්විසි හෙදවූ ප්‍රත්‍යවෙක්ෂාඥානය "සම්මාඤාණ,, යයි කියනුලැබේ, එසින් යුක්තවූ පුද්ගලයෝ **සම්මාඤාණී** නම් වෙති; **මිච්ඡාවිමුත්තී**= අවිමුක්තවූවාහු (=කෙලෙසුන් කෙරෙන් නොමිදුනාහු) ම ඇපි විමුක්ත යම්හ,යි මෙසේ සංඥඇත්තාහු; නොහොත් අවිමුක්තියෙහි විමුක්ති සංඥඇත්තාහු; එහි මේ වචනාර්ථය,යි- මිථ්‍යාවූ ලාමකවූ විපරිතවූ විමුක්තිය මොවුන්ට ඇත්,නුයි **මිච්ඡාවිමුත්තී** නම් වෙති; "මිච්ඡා

විමුත්තී,, යනු ද යථොක්තාකාරයෙන් පැවති අකුශලසඤ්ඤියන්ට මේ නමකි; ඵලසම්ප්‍රයුක්තවූ සම්‍යග්දෘෂ්ටිආදි අෂ්ටාඞ්ගයන් තබා සෙසු ධර්මයෝ සම්‍යග්විමුක්තී යයි දතයුත්තීය. ඕතොමෝ ද මිථ්‍යා විමුක්තිය සිඳදමා සිටිබැවින් සල්ලෙඛ යයි දතයුත්තීය; එහි යොද වනසේක් වදාළහ. **මයමෙපඵ සම්මාවිමුත්තිං භවිස්සාමාති සල්ලෙඛා කරණීයොං,,**යි. මෙයින් මත්තෙහිවූ තුන නීවරණවශයෙන් කියන ලද්දාහුය. **අභිජ්ඣාලූ ඛ්‍යාපන්නචිත්තා,,**යි මෙසේ කර්මපථයන්හි කී බැවින් ම මෙහි ප්‍රථමනීවරණවය නො කියනලද්දාහුය,යි දතයුතු. ඔවුනතුරෙහි පීනම්ඛයෙන් වළඳනාලද්දාහු මඛනාලද්දාහු නුයි **පීන මඛ පරියුට්ඨිතා** නම් වෙති; ඖඛත්‍යයෙන් යුක්තවූවාහු නුයි **උඛනා** නම් වෙති; විමසම්න් දුකට පැමිණෙත් සතිවූහන් කරන්ට නො හැකි වෙත් නුයි **වෙචිකිච්ඡී** නම් වෙති.

කොඛනා යනාදි දශය චිත්තයාගේ උපක්ලෙශවශයෙන් වදාරනලද්දාහුය; ඒ ක්‍රොධාදීන් අතුරෙහි යමක් කියයුතු වේද ඒ සියල්ල ධම්මදායාද- වත්ථුසූත්‍රයන්හි කියනලදී; මේ වනාහි (කියනුලබන්නේ) මෙහි වචනාර්ථය,යි- **කොඛනා**= කිපෙනසුලුවූවාහු **උපනාහී** නැවත නැවත සිත බඳිනසුලුවූවාහු නොහොත් උපනාහය (= නැවත නැවත සිත බැඳීම) මොවුන්ට ඇත්,නුයි (උපනාහී නම් වෙති;) **මක්ඛී** යනු ද **පළාසී** යනු ද එසේමැයි; ඊර්ෂ්‍යාකෙරෙත් නුයි **ඉස්සුකී** නම් වෙති; මසුරුකෙරෙත් නුයි හෝ මාත්සර්‍යය (=මසුරුබව) මොවුන්ට ඇත්,නුයි **මච්ඡරී** නම් වෙති; වඤ්චාකෙරෙත් නුයි **සඨා** යනු වේ; මනාකොට කථානොකෙරෙත් යයි කියනලද වෙයි; කෙරෙ ටිකබැවින් යුක්තවූවන්ට මේ නමකි; මායාව මොවුන්ට ඇත්,නුයි **මායාවී** නම් වෙති; තදබැව් යුක්තබැවින් **ථම්භා** නම් වෙති; අභිමාන යොගයෙන් **අතිමානී** නම් වෙති; කියනලද්දට විරුඛනයින් ශොභන පක්ෂය දතයුතුයි; දුබ්බචා= කියන්ට දුෂ්කරවූවාහු කිසිවක් කියනු ලබන්නාහු නො ඉවසති; ඊට විපරීතවූවාහු **සුබ්බචා** නම් වෙති; දෙවදූතාදීන් වැනිවූ ලාමකමිත්‍රයෝ මොවුන්ට නුයි **පාපමිත්තා** නම් වෙති; බුදුවරයෝ හෝ සැරියුත්තෙරුන් වැනිවූ හෝ කල්‍යාණ මිත්‍රයෝ මොවුන්ට නුයි **කල්‍යාණමිත්තා** නම් වෙති; කායදුශ්චරිතාදියෙහි සිතඵලවිමිවශයෙන් **පමත්තා** නම් වෙති; විපරීතවූවාහු **අප්පමත්තා** නම් වෙති,යි දතයුත්තාහුය; මේ තුන ප්‍රකිණ්ණකවශයෙන් කියන ලද්දාහුය.

අස්සඛා යනාදි පද සත අසඛම්වශයෙන් කියනලද්දාහුය; ඔවුන් අතුරෙහි වසතුත්‍රයෙහි ශ්‍රඛාව මොවුන්ට නැත්,නුයි **අස්සඛා** නම් වෙති; ශොභනපක්ෂයෙහි අදහත්,නුයි **සඛා** නම් වෙති; නොහොත් ශ්‍රඛාව (=ඇදගීම) මොවුන්ට ඇත්,නුයි ද **සඛා** නම් වෙති; ලජ්ජාව මොවුන්ට නැත් නුයි **අහිරිකා** නම් වෙති; අකුසල් පැමිණීමෙහි

ජුගුප්සා නො කරන්නවුන්ට මේ නමකි; ලජ්ජාව මොවුන්ගේ සිත්හි (වේ,නුයි) හෝ ලජ්ජාවෙන් යුකතසිත්ඇත්තාහු නුයි **හිරිමනා** නම් වෙති; භය නො වෙත් නුයි අනොත්තාපීනම්වෙති අකුසල්පැමිණීමෙහි භය නොවෙත් යයි කියනලද වෙයි; ඊට විපරීතවූවාහු **ඔත්තාපී** නම් වෙති; ශ්‍රැතය අවිද්‍යමානවූයේ මොවුන්ට නුයි **අප්පස්සුතා** නම් වෙති; "අපපං,, යි ද ථොක= මඳවූ **ස්‍රන** (අර්ථය) නො ගතයුතුයි; නැත ස්‍රන අර්ථය ගතයුතුයි; සැබව **අප්පස්සුතා** යි නිඃශ්‍රැතවූවාහු ශ්‍රැත විරහිතවූවාහු කියනුලැබෙති; ශ්‍රැතය බොහෝවූයේ මොවුන්ට නුයි **බහුස්සුතා** නම් වෙති; තථාගතභාෂිතවූ එක ගාථාවකුදු තත්වූ පරිද්දෙන් දැන අනුරූපප්‍රතිපදාවට පිළිපන්නවුන්ට මේ නමකි; කුත්සිතව (=අලසබවට) බැසගනිත් නුයි **කුසීතා** නම් වෙති; හීන වීර්‍ය්‍ය ඇත්තවුන්ට මේ නමකි; ආරබ්ධවූ වීර්‍ය්‍යය මොවුන්ට නුයි **ආරබ්භිසා** නම් වෙති; සම්‍යක්ප්‍රධානයෙන් යුකතවූවන්ට මේ නමකි; මුළාවූ සිහිය මොවුන්ට නුයි **මුළ්හස්සති** නම් වෙති; නට සිහිඇත්තා හුය,යි කියනලද වෙයි; එලබසිටි සිහිය මොවුන්ට නුයි **උපට්ඨිතස්සති** නම් වෙති; නිතර අරමුණට අභිමුඛව පැවතිසිහිඇත්තවුන්ට මේ නමකි; දුෂවූ ප්‍රඥව මොවුන්ට නුයි **දුප්පඤ්ඤා** නම් වෙති; නට ප්‍රඥඇත්තාහුය, යි කියනලද වෙයි; ප්‍රඥවෙන් සම්පූර්ණවූවාහු නුයි **පඤ්ඤාසම්පන්නා** නම් වෙති; පඤ්ඤා, යි ද මෙහි විදර්‍ශනාප්‍රඥව දත යුතු; ය්‍මිහෙයකින් විදර්‍ශනාසම්භාරය සම්පූර්ණවූයේ මෙතැන්හි ආයේද එහෙයින් මෝතොමෝ විදර්‍ශනාප්‍රඥව ම යයි පුරාණාචාර්‍ය්‍යයන්ගේ නියමයයි.

මෙවිට එක ම වූ ලොකොත්තරගුණයන්ට අනන්තරායකරවූ අනෙ ය්‍යාණිකදෘෂ්ටිය තුන්අයුරකින් දක්වනසේක් **සඤ්ඤිපරාමාසි** යනාදිය වදාළහ. එහි සං (=සඛකිය) දෘෂ්ටිය පරාමර්‍ශනයකෙරෙත් නුයි **සඤ්ඤි පරාමාසි** නම් වෙති; **දෘෂ්ටිකොට** ගනිත් නුයි **ආධානග්ගාහී** නම් වෙති; "ආධානං,, යි දෘෂ්ය කියනුලැබේ, දෘඪව ගන්නාසුලු ස්‍රන අර්ථයි; යොග්‍යවූ කාරණය දැක ලබ්ධිය දුරලත්,නුයි **පටිනිස්සග්ගී** නම් වෙති; දුකසේ කෘච්ඡ්‍රයෙන් කසිරයෙන් බොහෝත් කරුණු දක්වා දුරලන්නවුන් කරන්ට නො හැකිවෙත්,නුයි **දුප්පටිනිස්සග්ගී** නම් වෙති; යමෙක්තුමු තමහට උපන් දෘෂ්ටිය මෙය ම සැබවැ,යි දෘඪකොට ගෙන බුබාදින්විසිනුදු කරුණු දක්වා කියනු ලබන්නාහු නො හරිත්ද ඔවුන්ට මේ නමකි. ඒ එසේ මැ,යි– එබදු පුද්ගලයෝ යම්ක් යම්ක්මැ ධර්‍මය හෝ අධර්‍මය හෝ අසත්ද ඒ සියල්ල මෙසේ අප ඇදුරන් විසින් කියනලද මෙසේ අපවිසින් අසනලදැ,යි ඉදිබුතෙම අවයවයන් සිය කබලෙහි මෙන් ඇතුලත ම අභිනිවෙශය කෙරෙති, කුමහිලග්‍රා හයෙන් ගනිති, නො හරිත්. කියනලද්දට විපර්‍ය්‍යාසයෙන් ශොභන පක්‍ෂය දතයුතුයි.

මෙසේ සුසාලීස් ආකාරයකින් සලෙලඛය දක්වා මෙවිට ඒ සලෙලඛයෙහි චිත්තෝත්පාදයාගේ ද බොහෝ උපකාර ඇතිබව දක්වන්ට **චිත්තුප්පාදම්පි බෝ අහං** යනාදියවදාළහ ඒ දෙශනාවගේ අර්ථය නම්; චුන්දය! මම කුශලධර්මයන්හි සිත ඉපදවීම පවා බොහෝ උපකාර ඇත්තේය,යි කියමි; තවද යම් මේ කයින් වචසින් අනුෂ්ඨානයෝ වෙත්ද යම්සේ පළමු සිත උපන්නේද එසේ ම ඒ ධර්මයන් පිළිබඳව කයින් කිරීම ද වචනයෙන් "කරවු,, යයි ඇණවීම හෝ උද්ග්‍රහපරිපෘච්ඡාදියක් හෝ වෙත්ද එහි කියනු මැ කවරේද ඒ අනුෂ්ඨානයෝ එකාන්තයෙන් බොහෝ උපකාරඇත්තාහු ම යයි දක්වනසේක; කුමක්හෙයින් වනාහි මෙහි සිත් ඉපදවීමත් බොහෝ උපකාර ඇත්තේ වේද යත්? එකාන්තයෙන් හිතසුව ඵලවනහෙයින්ද අනුෂ්ඨානයන්ට හෙතුවනබැවින්ද (බොහෝ) උපකාරඇත්තේය;) දැනයක් දෙන්නෙම්,යි සිත් පහළවීම තෙමේත් එකාන්තයෙන් හිතසුව ඵලවන්නේ අනුෂ්ඨානයන්ට ද හෙතු වෙයි; ඒ එසේමැයි- මෙසේ උපන් සිත්ඇතිබැවින් ම දෙවන්දවස් මහවේ වසා මහමඬු කොට භික්ෂූන් සියයකට හෝ භික්ෂූන් දහසකට හෝ දන් දෙයි; භික්ෂුසඞ්ඝයා පවරවු පුදවු වළඳවවු,යයි පිරිවරජනයන් ඇණවයි; එසේ සඞ්ඝයාට සිව්රුසෙනසුන්බෙහෙත් දෙන්නෙම්,යි සිත් පහළවීම තෙමේත් එකැතින් හිතසුව ඵලවයි, අනුවිධානයන්ට ද හෙතු වෙයි; එසේ උපන්සිත්ඇතිබැවින් ම සිවුරුආදිය සකස්කෙරෙයි දෙයි, දෙවන්නේ ද වෙයි; සරණගමනාදියෙහි ද මේ නයයි; ඒ සැබව- සරණ යෙමි,යි සිත් උපදවා ම පසුව කයින් හෝ වචනයෙන් හෝ සරණ ගනී; එසේ පසඟ අටඟ දසඟ හෝ ශීලයක් සමාදන්වන්නෙම්,යි සිත් උපදවා ම කයින් හෝ වචනයෙන් හෝ සමාදන් වෙයි; පැවිදිව සිව්පිරිසුදුසිල්හි පිහිටන්නෙම්,යි ද සිත් උපදවා ම කයින් ද වචනයෙන් ද පිරියයුතු සිල් පුරයි; බුදුවදන් උගන්නෙම්,යි සිත් උපදවා ම එක් නිකායක් හෝ දෙනිකායක් හෝ තුන් නිකායක් හෝ සතරනිකායක් හෝ පස්නිකායම් හෝ වචසින් උගනී; මෙසේ දුඃඛසමාදාන කම්වහන් ඉගෙනීම් කිසුණුපිරියම් දැහැන් සමවත් විදසුන් මඟ පල ප්‍රත්‍යෙකබෝධි සම්‍යක්සම්බෝධි යන මොවුන්ගේ වශයෙන් දැක්විය යුතුයි. ඒ එසේමැය- බුදුවන්නෙම්,යි සිත් ඉපදවීම තෙමේත් එකැතින් හිතසුව ඵලවයි අනුෂ්ඨානයන්ට ද කරුණු වෙයි; සැබව- මෙසේ උපන් සිත්ඇතිබැවින් ම පසුකලෙක කල්ප ලක්ෂයක් අධිකකොටඇති සාරාසඞ්ඛ්‍යයක් කයින් ද වචනයෙන් ද පැරැම් පුරා දෙවියන් සහිත ලොකයා (සසරකතරින්) තරණයකරවමින් හැසිරෙයි; මෙසේ සියලු තැන්හි චිත්තෝත්පාදය ද බොහෝ උපකාරඇත්තේය, කායවාක් දෙකින් අනුවිධානයෝ වනාහි ඉතා බොහෝ උපකාරඇත්තාහු ම, යයි දතයුතු.

චිත්තෝත්පාදය.

විහිංසාදින්ගේ දුරලීම මෙසේ කුශල ධර්මයන්හි චිත්තෝත්පාදයා ගේ ද බොහෝ උපකාරඇතිබව දක්වා මෙවිට එහි යොදවන සේක් **නෙඝමානිහ චුන්ද!** යනාදිය වදාළහ. එය අර්ථයෙහින් ප්‍රකට මැය. මෙසේ සුසාලිස්අයුරින් දක්වනලද සලෙළඛයෙහි චිත්තෝ තපාදයාගේ ද බොහෝ උපකාරඇතිබව දක්වා දැන් ඒ සලෙළඛය ම භිතාධිගමය පිණිස මාගීයබැව් දක්වන්නාහු **සෙය්‍යථාපි** යනාදිය වදාළහ. එහි අර්ථය? චුන්දය! යම්සේ නම් කණුකටුගල්ආදියෙන් විෂ මවූ මාගීයක් වන්නේද, ඒ මාගීය දුරලීම පිණිස පරිවර්ජනය පිණිස, අනිත් මොනොවට පිරියම්කළ බිම්පෙදෙසක් මෙන් සම්මාගීයක් වන්නේද; යම්සේ හෝ රුක්මුල් ගල්ප්‍රපාතකිඹුල්මුවරාදීන් ගැවසී ගත් විෂමවූ තොටක් වන්නේද ඒ තොට දුරලීම පිණිස පරිවර්ජ නය පිණිස අන්‍යවූ අවිෂමවූ පිළිවෙළින් ගැඹුරුවූ තොටක් වන්නේ ද යම් තොටකට පිළිපන්නේ සුවසේ ම ඒ නදියට හෝ තඩාගයට හෝ බැස නාන්නේ හෝ එතර වන්නේ හෝ වේද, (එබදුවූ තොටයි;) එපරිද්දෙන් ම චුන්දය! විෂම මඟ විෂමතොට වැනිවූ විහිංසාවෙන් යුක්තවූ විහිංසකවූ පුද්ගලයාගේ (ඒ විහිංසාව) දුරලීම පිණිස සම මඟ සමතොට වැනිවූ අවිහිංසාව වෙයි; ඒ එසේමැය. විෂමවූ මඟ හා තොට දුරලීම පිණිස සමවූ මාගීය ද තීර්‍ථය ද යම්සේ පිළියෙළ කරනලදද එසේ විහිංසාව දුරලීම පිණිස අවිහිංසාව පිළියෙළකරන ලද්දීය හෙතෙම යම් අවිහිංසාවකට පිළිපන්නේ සුවසේ ම මනුෂ්‍ය ගතියට හෝ දිව්‍යගතියට පැමිණ සැපත් අනුභවකරන්නේ හෝ ලොකයෙන් එතරවන්නේ හෝ වේද; (එබදුවූ අවිහිංසාවයි;) මේ ක්‍රමයෙන් ම සියලු පදඝයෝ යෙදියයුත්තාහුය. මෙසේ ඔහුගේ ම භිතාධිගමය පිණිස මාගීයබැව් දක්වා මෙවිට උපරිභාවයට යායුතු බැව් දක්වනසේක් **සෙය්‍යථාපි** යනාදිය වදාළහ. එහි අර්ථය? චුන්දය! යම්සේ නම් පිළිසඳ දනවන්නාවූ හෝ නො දනවන්නාවූ හෝ දුන් නාවූ ද පිළිසඳ විවාදනවන්නාවූ හෝ නො දනවන්නාවූ හෝ යම් කිසි අකුශලධර්මකෙනෙක් වෙත්ද, ඔහු සියල්ලෝ ජාති විසින් අධොභාවයට යායුත්තාහු නුසි එබදු නම් ඇත්තාහු ම වෙත්ද, විපාක කාලයෙහි අනිෂ්ටවූ අකාන්තවූ විපාකදෙනබැවිනි; තවද යම්සේ පිළිසඳ දනවන්නාවූ හෝ නොදනවන්නාවූ හෝ දුන්නාවූ ද පිළි සඳ විවාදනවන්නාවූ හෝ නො දනවන්නාවූ හෝ යම් කිසි කුශල ධර්මකෙනෙක් වෙත්ද ඔහු සියල්ලෝ ජාතිවිසින් උපරිභාවයට යායුත් තාහු,නුසි එබදු නම් ඇත්තාහු ම වෙත්ද, විපාකකාලයෙහි ඉෂ්ටවූ කාන්තවූ විපාක ඇතිබැවිනි; එපරිද්දෙන් ම චුන්දය! විහිංසකවූ-පෙ- උපරිභාවයපිණිස වේ,යයි.

එහි මෝතොමෝ උපමාසංසන්දනායි - යම්සේ සියලු අකුශලයෝ අධොභාවයට පැමිණියයුත්තාහුද එසේ විහිංසක වූ පුද්ගලයාහට හුදු

විහිංසාතොමෝ ම (අධොභාවගමනීය වෙයි;) යම්සේ සියලු කුශලයෝ උපරිභාවයට පැමිණියයුත්තාහු වෙත්ද එසේ අවිහිංසකවූ පුද්ගලයා හට හුදු අවිහිංසාව ම (උපරිභාවගමනීය වෙයි;) මේ ක්‍රමයෙන් ම අකුශලය අකුශලය සමග ද කුශලය කුශලය සමග ද උපමාකට යුතුයි; මේ වනාහි මෙහි අදහසයයි. මෙසේ ඒ සල්ලෙඛයවිසින් ම උපරි භාවයට යායුතුබැව් දක්වා මෙවිට පරිනිර්‍වාපණයෙහි සමර්‍පිබැව් දක් වන්ට **සො වත චුන්ද!** යනාදිය වදාළහ.

එහි **සො** යනු කියයුතු ආකාරවූ පුද්ගලයා දක්වීමයි; ඒ දෙශ නාවෙහි "සො,, යන මේ උද්දෙසවචනය ගෙන "යො අත්තනා පලි පපලිපත්තෙනා සො වත චුන්ද! පරං පලිපපලිපත්තං උබරිස්සති,, යි මෙසේ සියලු පදයන්හි සම්බන්ධය දතයුතු. **පලිපපලිපත්තෙනා** යි ගැඹුරු මඩෙහි ගැලුනේ කියනුලැබේ; ආයත්‍තිවිනයෙහි (හේ) නො ද කියනු ලැබේ; ආයත්‍තිවිනයෙහි වනාහි **පලිපං** යි පස්කම්ගුණයෝ කියනුලැබෙත් **පලිපත්තෙනා,** යි එහි ගැලුනාවූ බාලපෘථජ්ජනතෙමේ කියනු ලැබේ; එහෙයින් මෙසේ මෙහි අර්‍ථයොජනා දතයුත්තීය- චුන්දය! යම්සේ කිසි පුරුෂයෙක් නැහැයග දක්වා ගැඹුරුමඩෙහි ගැලුනේ අන්‍යවූත් එහිම ගැලුනෙකු අත හෝ හිස හෝ ගෙන ගොඩනඟන්නේය යන මේ කාරණය නො වන්නේය; යම් කරුණෙකින් හෙතෙම ඔහු නඟා ගොඩ තබන්නේද ඒ කරුණ නො ම ඇති; එපරිද්දෙන් ම යමෙක් තමා පස්කම්ගුණ නමැති ගැඹුරුමඩෙහි ගැලුනේ වේද හෙතෙම එකාන්තයෙන් ඒ මඩෙහි ම ගැලුනාවූ මෙරමා නඟන්නේය යන මේ කාරණය නො වන්නේය; එහි (මේ චොදනාව) වන්නේය- **මේ නො යෙදෙයි, පෘථජ්ජනවූ භික්ෂුභික්ෂුණී උපාසකඋපාසිකාවන්ගේ ද ධම් දෙශනාව අසා දහම් අවබොධකරන්නාහු වෙත් මැය; පස්කම්ගුණ යෙහි ගැලුනේ මෙරමා නඟාසිටුවා, යයි; එයඑසේ නො**

ධම්කථිකයෝ පැස සුම් පමණක් ලබත්.

දතයුතුයි; ඒ එසේමැය **භාග්‍යවත්හු** ම එහි නඟාසිටු වීම කෙරෙති, ධම්කථිකයෝ **ප්‍රඥාමාත්‍රයක්** ම ලබති රජුවිසින් යැවුලියුම්කියවන්නෙකු මෙනි; ඒ එසේමැයි - රජුවිසින් පසල්දනව්වට යවනලද ලියමනක් එහි මනු ෂ්‍යයෝ ලියමන කියවන්ට නො දන්නාහු යමෙක් කිය වන්ව දන්නේද ඔහු ලවා කියවාගෙන ඒ අර්‍ථය අසා යම්සේ රජු ගේ ආඥාව යයි ආදරයෙන් සම්පාදනයකෙරෙත්ද; මේ ආඥාව ලිය මන කියවන්නාගේ යයි ඔවුන්ට සිතක් නො ද වේද; ලියමන කිය වන්නා වනාහි කෙළතොල්නොවූ නො පැකිලෙන වචනයෙන් කියවා ය,යි පැසසුම් පමණක් ම ලබාද; එපරිද්දෙන් ම කිසිසේත් ශාරි පුත්‍රාදිධම්කථිකයෝ ධම්දෙශනා කෙරෙත්ද එතකුදුවුවත් ඔවුහු ලියූ පතක් කියවන්නවුන් මෙන් වෙති; ඕ දම්දෙසුම් භාග්‍යවත්හුගේ ම වෙයි, රජුගේ ආඥාව මෙනි; යමෙක්තුවූ ඒ දහම් අසා අවබොධ

කෙරෙත්ද භාග්‍යවතුන්වහන්සේ ම ඔවුන් නහාසිටුවනසේකැ,යි දත යුතු; ධම්කපිකයෝ වනාහි කෙළතොල්නොවූ ඒ ඒ තැන නො පැකිලෙන වචනයෙන් දහම් දෙසත් යයි පැසසුම් පමණක් ම ලබත් යයි; එහෙයින් තෙල වචනය යෙදේ ම යයි. කියනලද්දටවිපය්‍යාසයෙන් ශොභනපක්‍ෂය දතයුතු.

අදමෙනා අවිනිතා අපරිනිබ්බුතා යන මෙහි වනාහි නිර්විශෙවණරහිතබැවින් **අදමන** නම්; නො භික්මුනු විනයඇතිබැවින් **අවිනිත** නම්; නො නිවූ කෙලෙස්ඇතිබැවින් **අපරිනිබ්බුත** නමැ, යි දතයුතු; ඒ එබඳුවූ පුද්ගලතෙමේ මෙරමා **දමෙස්සති**= නිර්විශෙවණ (=පොපියුම් රහිතයෙක්) කරන්නේය, **විනෙස්සති**= ත්‍රිවිධශික්‍ෂාවන් භික්මවන්නේය හෝ, **පරිනිබ්බාපෙස්සති**= ඔහුගේ කෙලෙසුන් පරිනිර්‍වාණයකරවන්නේය හෝ යන මේ කාරණය නො වන්නේය. උකතවිපය්‍යාසයෙන් ශොභනපක්‍ෂය දතයුතු.

එවමෙව ඛො චුන්‍ද! විහිංසකස්ස-පෙ-පරිනිබ්බානාය යන මෙහි වනාහි මෙසේ අර්‍ථය දතයුතු- තමා පලිපඤ්ඤාතවූ පඤ්චකාම ගුණයෙහි නො ගැලුනේ පඤ්චකාමගුණයෙහි ගැලුනාවූ මෙරමා නහන්නේය (තමා) දැමුනේ (මෙරමා) දමනයකරන්නේය (තමා) භික්මුනේ (මෙරමා) භික්මවන්නේය (තමා) පිරිනිවිසේ (මෙරමා) පරිනිර්‍වාණය කරවන්නේය යන මේ කාරණය යම්සේ විද්‍යමානවන්නේද; ඒ කාරණය කුමක්ද යත්? පස්කම්ගුණයෙහි නො ගැලුනුබව ද දැමුනුබව ද භික්මුනුබව ද පිරිනිවිබව ද වේ; එපරිද්දෙන් ම චුන්‍දය! විහිංසකවූ පුරුෂපුද්ගලයාගේ පරිනිර්‍වාණය පිණිස අවිහිංසාතොමෝ වෙයි; මෙයින් කුමක් කියනලද වේද? යමෙක් තමා අවිහිංසකවූයේ ඔහුගේ යම් අවිහිංසාවක් වේද මෝ අවිහිංසාතොමෝ විහිංසකවූ අන්‍යයාගේ යම් මෝ විහිංසාවක් වේද ඒ විහිංසාවගේ පිරිනිවීම පිණිස වෙයි; තමා අවිහිංසකවූයේ අන්‍යයාගේ විහිංසාවෙතනාව නිවන්නේය යන මේ කාරණය වන්නේය; ඒ කාරණය කුමක්ද යත්? අවිහිංසක බව මැයි; ඒ එසේමැය- යම්හෙයකින් තමා යමක් අධිගමය කරනලද්දේ වේද හෙතෙම් මෙරමා ඒ බැව්හි සමාදන් කරවන්ට හැකිවෙයි; නොහොත් තමා පස්කම්ගුණයෙහි නො ගැලුනේ දැමුනේ භික්මුනේ පිරිනිවියේ පස්කම්ගුණයෙහි ගැලුනාවූ නො දැමුනාවූ නො භික්මුනාවූ නො පිරිනිවියාවූ ද අන්‍යයා (පස්කම්ගුණයෙන්) නහන්නේය (ත්‍රිවිධ ශික්‍ෂාවෙහි) භික්මවන්නේයද මනයකරන්නේය පරිනිර්‍වාණය කරවන්නේය යන මේ කාරණය යම්සේ විද්‍යමානවේද; එපරිද්දෙන් විහිංසකවූ විහිංසාප්‍රහාණය පිණිස මාගීය වඩන්නාවූ පුරුෂයාහට උපන් අවිහිංසාතොමෝ පරිනිර්‍වාණය පිණිස වෙයි; ඒ එසේමැයි- (කෙලෙශ) පරිනිර්‍වාණය නො කළඑකක්හු පරිනිර්‍වාණය කළ එකෙකුමෙන් අවිහිංසාවෙතනාතොමෝ ම විහිංසාවෙතනාව පරිනිර්‍වාණයකර

වන්ට සමර්ථවන්නීය; මේ අර්ථය දක්වන්නාහු **එව මෙව බො චුන්ද!** යනාදිය වදාළහ,යි මෙසේ මෙහි අර්ථය දතයුතු. මෙහි යම්සේ ද එසේ සියලු පදයන්හි අරුත් දතයුතු. ඉතාවිස්තරභීතියෙන් ම අනු පදයොජනා (=පදයක් පාසා යෙදීම) නො කරනලද්දීය,යි. මෙසේ ඔහුගේ පරිනිර්වාණයෙහි සමර්ථබැව් දක්වා මෙවිට ඒ දෙශනාව නිගම නය කොට දහම් පිළිවෙතෙහි යොදවන්ට **ඉති බො චුන්ද** යනාදිය වදාළහ. එහි **සල්ලෙඛපරියායො**= සල්ලෙඛකාරණය සියලුතැන්හි මේ ක්‍රමයයි. මෙහි අවිහිංසාදීහු ම විහිංසාදීන්ගේ සංලිඛනය කරනහෙයින් සල්ලෙඛකාරණයවේ ඔවුන්ගේ වශයෙන් සිත් ඉපදවියයුතු බැවින් චිත්තුපපාදකාරණය වෙ; විහිංසාදීන්ගේ දුරලීමට හෙතුහෙයින් පරිකර්ම නකාරණය වේ; (සඛාදි) උපරිභාවය නිෂ්පාදනයකරනහෙයින් උපරි භාවකාරණය වේ; විහිංසාදීන්ගේ පරිනිර්වාණය කරවන හෙයින් පරි නිර්වාණකාරණය වේයයි දතයුත්තාහුය.

භිනෙසිනා= භික්ෂූහු සොයන්නාවූ; **අනුකම්පකෙන**= අනුකම්පා කරන්නාවූ; **අනුකම්පං උපාදාය**= අනුකම්පාව සිතින් ගෙන; සඳහා යයි ද කියනලද්දේ වෙයි; **කතං වෝ නං මයා**= මේ කරුණුපස දෙශ නාකරන්නාවූ මා විසින් එය කෙපට කරනලද; ඒ **ඒසේමැයි**- යම්මෝ අවිපරීතධර්මදෙශනාවක් වන්නීද මෙතෙක් ම අනුකම්පාකරන ශාස්තෘහුගේ කෘත්‍යය වෙයි; මින්මතුයෙහි ප්‍රතිපත්තිය නම් ශ්‍රාවක යන්ගේ කෘත්‍යය වෙයි; එසින් වදාළහ- **එතානි චුන්ද! රුක්ඛමූලානි -පෙ අම්හාකං අනුසාසනී** යි. එහි ද **රුක්ඛමූලානි** යන මෙයින් රුක්මුල්සෙනස්න දක්වනසේක; **සුඤ්ඤාගාරාන**= යන මෙයින් ජන යාගෙන් වෙන්වූ ස්ථානය දක්වනසේක; තවද පදදෙකින්ම යොගීන්ට යොග්‍යවූ සෙනාසනය ප්‍රකාශකරනසේක; දායාදය පාවාදෙනසේක. **ඣායථ**= අවතිස් අරමුණු ආරම්මණෝපනිධ්‍යානයෙන් ද අනිත්‍යාදි වශයෙන් සකඣායතනාදීන් ලක්ඛණෝපනිධ්‍යානයෙන් ද ධ්‍යාන්කරවූ ශමථය ද විදර්ශනාවද වඩවූ,යසි කියනලද වෙයි; **මා පමාදත්ථ**= පමා නො වවු; **මා පච්ඡා, විප්පටිසාරිනෝ අහුවත්ථ**= යමෙක් වනාහි පෙර කරුණකාලයෙහි ද නිරොගකාලයෙහි ද සප්තසප්ත්‍රායාදිසම්පත් ඇති කාලයෙහි ද ශාස්තෘන්වහන්සේගේ සම්මුඛභාවය ඇති කාල යෙහි ද යොනිසොමනසකාරයෙන් චෙන්වූවාහු රූපවල් ඔකුණුබක්ම ශයනසුඛය නිද්‍රාසුඛය අනුභවකරමින් ප්‍රමාදවෙත්ද, ඔවුහු පසුව ජරාවට පැමිණිකල්හි ද රොගඇති කාලයෙහි ද මරණකාලයෙහි ද විපත්ඇතිකාලයෙහි ද ශාස්තෘන් පිරිනිවිකාලයෙහි ද ඒ පෙර ප්‍රමාද විහරණය සිහිකරමින් පිළිසඳසහිත කාලක්‍රියාව් ද බරක් කොට දක් නාහු විපිළිසරඇත්තාහු වෙති; කෙවු වනාහි එබදුවූවෝ නො වවුයයි මේ අර්ථය දක්වමින් වදාළහ-**මා පච්ඡාවිප්පටිසාරිනෝ අහුවත්ථ** යි. **අයං වෝ අම්හාකං අනුසාසනී** කියඵ මා පමාදත්ථ,යි මෝතොමෝ අප හමුයෙන් තෙපට අනුශාසනා ඇ අවවාද ඇ,යි කියනලද්දේ වේ යයි.

සල්ලෙඛ සූත්‍ර වර්ණනා නිමි.

සම්මාදිඨි සූත්‍ර වණ්ණනා.

එවමේම සුතං, යි සම්මාදිඨිසූත්‍රයයි. එහි "සම්මාදිඨි සම්මාදිඨිති ආවුසො වුච්චති කිත්තාවතා නු ඛො ආවුසො!,, යි හෝ "කතමං පනාවුසො! අකුසලං?,,යි හෝ මෙසේ තෙරුන්විසින් යම් පමණ ප්‍රශ්න වදුරනලද්දාහුද ඒ සියල්ල කථෙතුකම්‍යතා පෘච්ඡා මැ වෙති. ඔවුන තුරෙහි යම්හෙයකින් දන්නාහු ද නො දන්නාහු ද බාහිරකයෝ ද ශාසනිකයෝ ද අනුශ්‍රවාදිවශයෙන් ද තමා ප්‍රත්‍යක්ෂකිරීම් වශයෙන් ද 'සම්මාදිඨි,,යි කියත්ද; එහෙයින් ඒ බොහෝදෙනාගේ වචනය ගෙන ආයුෂ්මත්ශාරිපුත්‍රයෝ දෙවරක් ආමඡීනය කරමින් **සම්මාදිඨි සම්මාදිඨිති අවුසො! වුච්චති** යි වදාළහ. මේ වනාහි මෙහි අදහස්සි- අන්‍යයන් විසින් ද "සම්මාදිඨි,, යි කියනුලැබේ, එයින් අන්‍යයන්විසින්ද සම්මාදිඨි, යි කියනු ලැබේ. ඒ මේ (සම්‍යග්දෘෂ්ටි ඇත්තේ) මෙසේ කියනුලබන්නේ අර්ථය ද ලක්ෂණය ද ගෙන "ඇවැත්නි,, ආර්‍යශ්‍රාවකතෙමේ කොපමණකින් සම්‍යග්දෘෂ්ටිඇත්තේ වේද,,යි; එහි **සම්මාදිඨිං**= ශොභනවූ ද ප්‍රශස්තවූ ද දෘෂ්ටියෙන් යුක්තවූයේ; යම් විටෙක ධර්මයෙහි ම මේ "සම්මාදිඨි,, ශබ්දය වැටේද එවිට ඒ ශබ්දයාගේ ශොභනවූ ද ප්‍රශස්තවූ ද දෘෂ්ටිය සම්‍යග්දෘෂ්ටිය,යි මෙසේ අර්ථය දතයුතු. හෝ මෝ සම්‍යග්දෘෂ්ටිතොමෝ ද විවිධ වෙයි,

සම්‍යග් දෘෂ්ටිය. ලෞකිකය ලොකොත්තරය,යි කියායි, ඔවුනතුරෙහි කර්ම්ස්වකෘතඥානය ද සත්‍යානුලොම්කඥානය ද ලෞකික සම්‍යග්දෘෂ්ටි නමු; නොහොත් සැකෙවින් සියලු ම ආශ්‍රව යන්ට ප්‍රත්‍යයවූ ප්‍රඥාතොමෝ යි; ආර්‍යමාර්ගඵලයන් හා සම්ප්‍රයුක්තවූ ප්‍රඥාතොමෝ ලොකොත්තර සම්‍යග්දෘෂ්ටි නමු සම්‍යග්දෘෂ්ටිපුද්ගලතෙමේ වනාහී ත්‍රිවිධවෙයි, පෘථග්ජනය ශෛක්ෂය අශෛක්ෂය,යි

සම්‍යග් දෘෂ්ටිකයෝ. කියායි; ඔවුනතුරෙහි පෘථග්ජනතෙමේ විවිධ වෙයි, බාහිරකයයි ද ශාසනීක යයි ද කියායි; ඔවුන් දෙදෙනා අතුරෙහි බාහිරකතෙමේ කර්මවාදී වූයේ කර්ම්ස්වකෘතදෘෂ්ටියෙන් සම්‍යග්දෘෂ්ටිවූයේ වේ, සත්‍යානුලොම්කදෘෂ්ටියෙන් නො වේ, ආත්මදෘෂ්ටිය පරාමර්ශනයකරනබැවිනි; ශාසනිකතෙමේ දෙකින් ම සම්‍යග්දෘෂ්ටිවූයේ වෙයි; ශෛක්ෂතෙමේ නියතවූ සම්‍යග්දෘෂ්ටියෙන් සම්‍යග්දෘෂ්ටිවූයේ වෙයි; අශෛක්ෂතෙමේ අශෛක්ෂසම්‍යග්දෘෂ්ටියෙන් සම්‍යග් දෘෂ්ටිවූයේ වෙයි. මෙහි වනාහි නියතවූ නෛර්‍යාණිකවූ ලොකොත්තරකුශලසම්‍යග්දෘෂ්ටියෙන් යුක්තවූයේ **සම්මාදිඨි**,යි අදහස් කරනලදී; එහෙයින් මැ වදාළහ· **උජුගතාසස දිඨි ධම්ම අවෙච්ච පසාදෙන සමන්නාගතො ආගතො ඉමං සද්ධම්මං** යි. ඒ එසේමැයි- ලොකොත්තරකුශලසම්‍යග්දෘෂ්ටිතොමෝ ම අන්තවයට නො පැමිණ

සෘජුභාවයෙන් ගියහෙයින් කායවඞ්කාදිවූ සියලු වඞ්කයන් සමූවෙජ්ද කොට ගියබැවින් හෝ සෘජුව ගියා වෙයි; ඒ දෘෂ්ටියෙන් ම යුක්ත වූයේ නවප්‍රකාරවූ ම ලොකොත්තරධර්මයෙහි ගුණ දැන පැහැදීමෙන් අවලපැහැදීමෙන් යුක්තවූයේ වෙයි, සියලු දෘෂ්ටිගහනයන් ද අවුල්හරිමින් සියලු කෙලෙසුන් දුරුකෙරෙමින් ජාතිසංසාරයෙන් නික්මෙන්නේ ප්‍රතිපත්තිය නිමවමින් ආයතිමාගියෙන් මේ සම්බන්ධයන් විසින් ප්‍රකාශ කොට වදාළ (අමෘතයෙහි නැමුසිත්ඇතිබැවින්) අමතොගධවූ නිර්‍වාණ සඞ්ඛ්‍යාතවූ සඞ්ගීයට ආයේ වනැ,යි කියනුලැබේ.

කුම්පථ යතෝ චෝ යනු මේ කල්පිරිසිදීම් වචනයෙකි; යම් කලෙක් **වණ්ණා.** හි යයි කියනලද වෙයි; **අකුසලඤ්ච පජානාති**= දශ අකුශලකර්මපථසඞ්ඛ්‍යාත වූ අකුශලය ද නිරොධය අරමුණු කොට ඇති ප්‍රඥාවෙන් කෘත්‍යවශයෙන් මේ දුකය,යි ප්‍රතිවෙධකරන්නේ දැනගනී; **අකුසලමූලඤ්ච පජානාති**= ඒ දුකට මූලප්‍රත්‍යයවූ අකුශලය ද ඒ ප්‍රකාරයෙන් ම මේ දුඃඛසමුදය,යි ප්‍රතිවෙධකරන්නේ දැනගනී; **කුසලඤ්ච කුසලමූලඤ්ච** යන මෙහි ද මේ ක්‍රමයයි. මෙහි යම්සේද එසේ මෙයින් මත්තෙහි සියලු වාරයන්හි කෘත්‍යවශයෙන්ම වසතු දැනඟනී ම දතයුතු. **එත්තාවතාපි** මෙතෙකින් මේ අකුශලාදීන්ගේ දැනගැනීමෙන් ම; **සම්මාදිට්ඨිහොති**= උක්තප්‍රකාරවූ ලොකොත්තරසම්‍යග්දෘෂ්ටියෙන් යුක්තවූයේ වෙයි ඔහුගේ දෘෂ්ටිය සෘජු වූවා -පෙ- මේ නිර්‍වාණසඞ්ඛ්‍යාත සඞ්ගීයට ආයේ වේය,යි; මෙතෙකින් සංක්ෂේපදේශනාව නිමියා වෙයි, මෝ දෙශනාව ම සංක්ෂිප්තවූව, ඒ භික්ෂූන්ගේ සම්‍යග්මනසිකාරප්‍රතිවෙධය විස්තරවශයෙන් ම දතයුතුයි.

දෙවෙනි වාරයෙහි වන්හි දෙශනාතොමෝ ද විස්තරයෙන් පැවතින, මනසිකාරප්‍රතිවෙධය ද විස්තරයෙන්ම පැවැත්තේයයි, දතයුතු. එහි සංක්ෂේපදේශනාවෙහි යට දෙමහ ද විස්තරදේශනාවෙහි මතුදෙම හද වදාරනලද්දාහුය, යි විස්තරදේශනාවශාතයෙහි **සබ්බසෝ රාගානුසයං පහාය** යන්නාදිවචනදක්නාවූ භික්ෂූහුකිවාහුය; එතකුදුවුවත් තෙරණුවෝ සංක්ෂිප්ත දෙශනාවෙහි ද විස්තරදේශනාවෙහි ද සතරමාගීයෝ රාශිවශයෙන් වදාරනලද්දාහුය,යි කීහ. මෙහි සංක්ෂිප්තවිස්තාර දෙශනාවන්හි යම්මෝ විචාරීමක් පහළකරනලද්දේද ඕතොමෝ සියලු වාරයන්හි මෙහි කී නයින් ම දතයුත්තීය; මෙයින් මතු අපූර්‍වඅප්‍රකටපදවණ්ණනා පමණක්ම කරන්නෙමු. එහි ප්‍රථම්වාරයාගේ ම විස්තරදේශනාවෙහි **පාණාතිපාතෝ චෝ ආවුසෝ! අකුසලං** යනාදි තැන්හි අකෞශල්‍යප්‍රවෘත්තියෙන් හෝ මත්තෙහි කියයුතු කුශලයට් ප්‍රතිපක්ෂවශයෙන් හෝ අකුශලය දතයුතු; එය ලක්ෂණවිසින් සාවද්‍යලක්ෂණ දුඃඛවිපාකලක්ෂණ සංකෙලෙශලක්ෂණ හෝ වෙයි; මෝතොමෝ වන්හි මෙහි සාධාරණවූ පදවණ්ණනායි.

අසංඛාරණිපදයන්හි වනාහි ප්‍රාණයාගේ සරසහෙළිම **ප්‍රාණඝාතය පාණාතිපාත** නම; ප්‍රාණවධය ප්‍රාණඝාතය,යි කියන ලද්දේ වෙයි; **පාණෝ** යනු ද මෙහි ව්‍යවහාරවශයෙන් සත්වයෙක පරමාර්ථවශයෙන් ජීවිතෙන්ද්‍රිය,යි; ඒ ප්‍රාණී(=සත්ව) යාකෙරෙහි ප්‍රාණීයෙක යන සංඥාඇත්තහුගේ ජීවිතෙන්ද්‍රියය සිඳින්නාවූ උපක්‍රම යෙන් උපදවනලද කායවාග්වාරයන් අතුරෙන් එක්තරා වාරයෙක්හි පැවති වධක චෙතනාතොමෝ **පාණාතිපාත** නම; ඒ ප්‍රාණඝාතයතෙම ගුණවිරහිතවූ තිරශ්චීනගතාදිප්‍රාණීන්අතුරෙන් කුඩාප්‍රාණයෙහි **අල්ප** සාවද්‍යයැ; මහත්වූ ශරීරයෙහි මහාසාවද්‍යයැ; කුමක්හෙයින, ප්‍රයොගය මහත්බැවිනි; ප්‍රයොගය සමව ඇතිකල්හි ද වසතුහුගේ මහත්බැවිනි; ගුණවත්වූ මනුෂ්‍යාදීන් අතුරෙන් මඳගුණඇති ප්‍රාණයෙහි අල්පසා වද්‍යයැ; මහත්වූ ගුණඇති ප්‍රාණයෙහි මහාසාවද්‍යයැ; ශරීරගුණයන්ගේ සමබව ඇතිකල්හි කෙලෙශයන්ගේ ද උපක්‍රමයන්ගේ ද මෘදුබැවින් අල්පසාවද්‍ය වෙයි; තීව්‍රබැවින් මහාසාවද්‍ය වේ යයි දතයුතු. ඒ ප්‍රාණ ඝාතයාගේ **අඞ්ග** පසක් වෙති, (රූපා රූප ජීවිතෙන්ද්‍රියයෙන් යුත්) ප්‍රාණීයෙක, ප්‍රාණීයෙක යන සංඥාඇතිබවය, වධකචිත්තය, උපක්‍රමය ඒ උපක්‍රමයෙන් මරණය,යි කියායි; සාහත්ථිකය, ආණත්තිකය, නිස්ස ග්ගියය, ඨාවරය, විජ්ජාමයය, ඉද්ධිමයය,යි ප්‍රයොග සයක් වෙති; යම් හෙයකින් මේ අර්ථය විස්තාරකථනලබනකල්හි ඉතා ප්‍රපඤ්ච වේද එහෙයින් එය ද මෙබදුවූ අන්‍යය ද විස්තර නො කරමු; විස්තාරාර්ථීන් විසින් සමන්තපාසාදිකා විනයාර්ථකථාව බලා ගතයුතුයි.

අදින්නා දානය.

නො දුන් වසතුහුගේ ගැනීම **අදින්නාදාන** නම; මෙරමා වසතුව පැහැරගැනීමය ථෙය්‍යය සොරකම්ය,යි කියනලද වෙයි; එහි **අදින්නං**යනු මෙරමා අයත්වූ; යම්වසතුවෙක්හි අතිකෙක් රුවි පරිද්දෙන් කරන බවට පැමිණෙන්නේ දඬුවමට නොසුදුසුවූයේත් උපවාදයෙන් මිදුනේත් වේද ඒ පරා අයත් වසතුවෙහි පරා අයත්ය යන සඥාඇත්තහුගේ ඒ වසතුව ගැනීමපිණිස වූ උපක්‍රමයෙන් උපදවනලද ථෙය්‍යචෙතනාතොමෝ **අදින්නාදාන** නම්වේ; ඒ අදින්නාදානය හීනවූ පරසතු භාණ්ඩයෙහි අල්පසාවද්‍යයැ; ප්‍රණීතවූ භාණ්ඩයෙහි මහාසාවද්‍යයැ; කුමක්හෙයින? වසතුහුගේ ප්‍රණීත බව හෙයිනි; වසතූන්ගේ සමබව ඇතිකල්හි ගුණයෙන් වැඩිසිටියන් සතු වසතුවෙහි මහාසාවද්‍යවෙයි ඒ ඒ ගුණයෙන්වැඩිසිටියහුසඳහා එයින් හීන ගුණ ඇත්තහු සතු වසතුවෙහි අල්පසාවද්‍යවෙයි; ඒ අදත්තාදානයට අඞ්ග පසක්වෙති, මෙරමා අයත් වසතුවෙහා, මෙරමා අයත්ය යන සංඥා ඇතිබවය, සොරසිතය, උපක්‍රමය, ඒ උපක්‍රමයෙන් හැරගැනීමය,යි කියායි; ප්‍රයොගසයක් වෙති, සාහත්ථිකාදීහු මැ,යි; ඔවුහු ද යෙදෙන පරිද්දෙන් ථෙය්‍යාවහාරය, පසය්හාවහාරය, පටිච්ඡන්නාවහාරය, පරිකප්පාවහාරය, කුසාවහාරය යන මේ අවහාරයන්ගේ වශයෙන්

පැවැත්තාහුය,කි; මේ මෙකි සංක්ෂෙපයයි; විස්තරය වනාහි සමන්ත පාසාදිකාවෙහි කියනලදී.

කාමමිථ්‍යා කාමෙසු මිච්ඡාචාරෙ යන මෙහි වනාහි **කාමෙසු** යනු **චාරය.** මෛථුන සමාචාරයන්හි; **මිච්ඡාචාරෙ** යනු එකාන්තයෙන් නින්දිතවූ ලාමකවූ හැසිරීම; ලක්ෂණවිසින් වනාහි අසඩ්ඝීය සෙවුනා අදහසින් කායචාරයෙහි පැවති මාතුරක්ඛිතාදි අගමනීය ස්ථානයන් ව්‍යතික්‍රමණයකරන චෙතනාතොමෝ **කාමෙසුමිච්ඡාචාර** නම; එහි අගමනීයස්ථාන නම්? පළමුකොට පුරුෂයන්ට මව විසින් රක්නාලද්දීයැ. පියාවිසින් රක්නාලද්දීයැ මව්පිය දෙදෙනා විසින් රක්නාලද්දීයැ බැයා විසින් රක්නාලද්දීයැ බ්‍රහ්මණිය විසින් රක්නා ලද්දීයැ නැයන්විසින් රක්නාලද්දීයැ ගොත්‍රයෙහි වූවන්විසින් රක්නා ලද්දීයැ සහදූමියන්විසින් රක්නාලද්දීයැ ආරක්ෂාසහිතවූවායැ දණ්ඩ නිග්‍රහසහිතවූවායැ යන මාතුරක්ඛිතාදි දසදෙන ද; (පුරුෂයාවිසින්) ධනයෙන් විකොට ගන්නාලද සත්‍රීය; ඡන්ධයෙන් එක්ව වාසයකරන්නීයැ; භොගවාසිනී (භොගයෙන් පුරුෂයාකෙරෙහි වාසයකරන්නීයැ; පට වාසිනී (=නිවාසනාදිමාත්‍රයක් ලැබ භාර්‍යාභාවයට පැමිණිනැනැත්තීයැ) ඔදපත්තකිනී (=පැන්තලියෙක දෙදෙනාගේ අත බස්වා මේ දියමෙන් සසඟවවු යයි පාවාදෙනලද නැනැත්තීයැ) බහාතැබූ සුඹුඑඇතිනැනැත් තීයැ දූසි ද භාර්‍යා ද වූවායැ; කම්කිළි ද භාර්‍යා ද වූවායැ; ධජයෙන් හෙවත් පරවිෂය මැඩ පැහැරගන්නාලද භාර්‍යාවයැ; එකොළණහි සෙව ණයකළ යුතුනැනැත්තීයැ; යන මේ ධනක්කිතාදි දසදෙනදූ,සි සත්‍රිහු විසිදෙන ද; සත්‍රීන් අතුරෙහි වනාහි සාරක්ඛසපරිදණ්ඩදෙදෙනාට ද ධනක්කිතාදි දසදෙනාට ද යන දෙළොස්සත්‍රීන්ට සෙසු පුරුෂයෝ ද; මේ අගමනීයස්ථාන නම; හේ මේ **මිථ්‍යාචාරය** ශීලාදිගුණරහිතවූ අගමනීයස්ථානයෙහි (=නො එලඹියයුතු තැන්හි) අල්පසාවද්‍යයැ; ශීලාදි ගුණසම්පන්නවූඅගමනීයස්ථායෙහි මහාසාවද්‍යයැ; ඒ කාමමිථ්‍යාචාරයට අඩිය සතරක් වෙති, නො එලඹියයුතු වස්තුවෙක, එහි සෙවුනාසිතයැ, සෙවනය පිණිස ප්‍රයොගයැ, මාඝීයෙන් මාඝීය ප්‍රතිපාදනයැ, ඉවසීම යැයි කියාසි; එක් ප්‍රයොගයෙක. සාහත්‍යික මැයි.

මුසා වාදය. මුසා යනු වළහාකීම (අසත්‍යයක් සත්‍යයසෙයින් ප්‍රකාශකිරීම) පෙරටුකොට ඇත්තහුගේ අර්ථ නසන්නාවූ වාක් ප්‍රයොගය හෝ කායප්‍රයෝගය හෝයි; ඔහුවිසින් වළහාකියනඅදහසින් පරවිසංවාදකවූ (=මෙරමා රවටන) කායවාක්ප්‍රයොගයෙන් උපදවනලද චෙතනාතොමෝ **මුසාවාද** නම; අනිත්ක්‍රමයක් කියනුලැබේ- **මුසා** යනු අභූතවූ අතථ්‍යවූ වස්තුවය; වාදෙ යනු ඒ වස්තුව භූතවශයෙන් තථ්‍යවශයෙන් දැන්වීමයැ; ලක්ෂණයෙයින් වනාහි අතථ්‍යවූ වස්තුව තථ්‍යවශයෙන් අන්‍යයාහටදක්වනුකැමැත්තහුගේ එබදුවූ විඥප්තියෙන්

උපදවන ලද චේතනා (=සිතිවිලි) තොමෝ **මුසාවාද** නම්; හේ මෘෂාවාදයතෙම යම් අර්ථයක් නසාද ඒ අර්ථයාගේ අල්පභාවයෙන් අල්ප සාවද්‍යයැ; මහද්භාවයෙන් මහාසාවද්‍යයැ; තවද ගෘහස්ථයාට තමා සතුවසතුවක් නො දෙනුකැමතිබැවින් "නැත,, යනාදික්‍රමයෙන් පැවති (මෘෂාවාදයතෙම) අල්පසාවද්‍යවෙයි; සාක්ෂිවැ සිට (මෙරමා) අර්ථනසන පිණිස කියනලද්දේ මහාසාවද්‍ය වෙයි; පැවිද්දන්ට මඳවූත් තෙලක් හෝ ගිතෙලක් හෝ ලැබ සිනාසෙන අදහසින් "අද ගම්හි තෙල් ගහක් මෙන් ගලාය,,යි පූරණ කථානයින් පැවැත්තේ අල්පසාවද්‍ය වෙයි; නො දක්නාලද්දක් ම දක්නාලද්දේය යනාදිනයින් කියන්න වුන්ට මහාසාවද්‍ය වෙයි; ඒ මෘෂාවාදයාගේ අඩහ සතරක් වෙති, අතථ්‍ය (=අභූතවූ) වසතුවෙහ, වළහාකියනසිතයැ, ඒ පිණිසවූ ව්‍යායාමයයැ, අන්‍යයාට ඒ වචනාර්ථය අවබොධවීමයැ,යි කියාසි; එක් ප්‍රයෝගයෙක, සාහත්‍ථික මැයි; ඒ ප්‍රයෝගය නසින් හෝ කයපිළිබඳවූව කින් හෝ වචනයෙන් හෝ පරහට සත්‍යය වළහන ක්‍රියා කිරීමෙහි දතයුතු. ඉදින් ඒ ක්‍රියාවෙන් මෙරමා තදර්ථය දැනගනිද මේ පුද්ගලතෙම ක්‍රියා උපදවනචෙතනාක්ෂණයෙහිම මෘෂාවාදකර්මයෙන් බැඳෙයි.

පෙසුඤ්ඤ පිසුණාවාචා යනාදි නැන්හි යම් වචනයකින් යමෙකුට
පරුෂවචන ඒ වචනය කියාද ඔහුගේ ළෙහි තමාගේ ද මෙරමා
සම්පප්‍රලාප ගේ ද ප්‍රියභාවය සුන්බැව් කෙරේද හෝ වාක්තොමෝ **පිසුණාවාචා** නමු; යම් වචනයකින් වනාහි නෙමේත් මෙරමාත් පරුෂ කෙරේද, යම් වචනයක් තොමෝත් පරුෂවූවා කනට සුව හෝ නො ම වූවා සිතට සුව හෝ නො වූවාද, මෝතොමෝ **ඵරුසාවාචා** නමු; යම් වචනයකින් "සමථං,,යි සේයි නිරර්ථක තෙපුල් බෙණේද, හේ **සම්ඵප්පලාප** නම; ඔවුනට මුල්වූ චෙතනාතොමෝ ද "පිසුණාවාචා,, දී නම් මැ ලබයි; ඕ චෙතනාතොමෝ මැ මෙහි අදහස්කරනලද,යි. ඔවුනතුරෙහි කිලිටුසිත් ඇත්තහුගේ අනුන් බිඳීම පිණිස හෝ තමහට ප්‍රියකැමති බැවින් හෝ කායවාක්ප්‍රයෝගයෙන් උපදවනලද චෙතනාතොමෝ **පිසුණාවාචා** නමු; ඕ වාක්තොමෝ යමෙකුගේ හෙදය කෙරේද ඔහුගේ අල්පගුණභාවයෙන් අල්පසාවද්‍යවේ; මහාගුණභාවයෙන් මහාසාවද්‍යවේ; ඒ පිසුණාවාචයට අඩහසතරක්වෙති, හෙදකටයුතුවූ අන්‍යයායැ, මෙසේ මොවුහු විවිධ වන්නාහුය වෙන් වන්නාහුය,යි හෙදය පෙරටුකොට ඇතිබව හෝ මෙසේ මම ප්‍රියවූවෙක් වන්නෙමි විශ්වාසවූවෙක් වන්නෙමි,යි ප්‍රියකැමතිබව හෝයැ ඒ පිණිසවූ ව්‍යායාමයැ, ඔහුවිසින් තදර්ථවිජානනයැ යන මොහුයි. අන්‍යයාගේ මම්සිඳින්නාවූ කායවාක්ප්‍රයෝගයෙන් උපදවනලද එකානනයෙන් පරුෂවූ චෙතනාතොමෝ **ඵරුසාවාචා** නමු. ඒ පරුෂවචනය දුක්වීම පිණිස මේ වසතුව වේ.

ගම් දරුවෙකුගේ වසනුව. එක් ගම්දරුවෙක් මවගේ වචනය නො ගෙන වනයට ගේල; මවුතොමෝ ඔහු නවත්වාලන්ට නොහැකිවන්නී සැඩම්හිදෙනක් තා නුහුබඳවා,යි ආක්‍රොශකලා; ඉක්බිති ඕහට එසේම වනයෙහි මහිෂියක් එලඹ සිටියා; දරුතෙම (ඒ දැක) මාගේ මවුතොමෝ මුවින් යමක් කීවාද, එය නො වේවා යමක් සිතින් සිතී නම් එය වේවා,යි සත්‍යක්‍රියා කෙළේය; මහිෂීතොමෝ එහි ම බැඳනාලද්දක මෙන් සිටියාය. මෙසේ මම්වෙහෙස කවූ ප්‍රයොගය පවා චිත්තයාගේ සිලුටුබැවින් පරුෂවාක් නො වන්නීය; සැබව- මවුපියදෙදෙන කිසිවිටෙක දරුවන්ට "සොරු තොප කඩකඩ සොරෙත්වා,,යි මෙසේ කියති; එතකුදුවුවත් උපුල්පතකුදු ඔවුන් මතුයෙහි වැටෙන්නේ නොකැමතිවෙත්; ආචාර්‍යඋපාධ්‍යයෝද කිසිවිටෙක ඇසුරුකළවුන්ට මෙසේ කියති "මේ අහිරිකවූ ඔතප් නැත්තාහු කුමටදැ,යි ඔවුන් බැහැරකරවුයයි ද කියති; එතකුදුවුවත් ඔවුන්ගේ ආගමාධිගම සම්පත්තිය කැමතිවෙති. තවද චිත්තයාගේ සිලුටුබැවින් පරුෂවචනය යම්සේ නො වේද, එසේ වචනයාගේ සිලුටු බැවින් අපරුෂවචනය ද නොවෙයි; ඒ සැබව- මරවනුකැමැත්තහුගේ "මොහු සුවසේ ශයනයකරවවු,, යන වචනය අපරුෂවචනයක් නොවේ (පරුෂවචනයක් මැ වෙයි යුතැනි,) චිත්තයාගේ පරුෂභාවයෙන් ම මෝතොමෝ පරුෂවචනයෙක් මැයි; ඕ පරුෂවාක්තොමෝ යමෙකු සඳහා පැවැත්තීද ඔහුගේ අල්පගුණබවයෙන් අල්පසාවද්‍යයැ, මහා ගුණබවයෙන් මහාසාවද්‍යයැ; ඒ පරුෂවචනයට අඞග තුනක් වෙති, **ආක්‍රොශකලයුතු අන්‍යයායැ, කිපිසිතයැ, ආක්‍රොශකිරිමයැ, යනමොහුයි අනවිඤ්ඤපනයකාරන්නාවූ කායවාක්ප්‍රයොගයෙන් උපදවනලද අකුශලචෙතනාතොමෝ ඵරුසවාචා නම්;** හේ ආසෙවනමන්දබවයෙන් අල්පසාවද්‍යයැ, ආසෙවනමහන්තබවයෙන් මහාසාවද්‍යයැ; ඊට අඞග දෙකක් වෙති, භාරතයුද්ධසීතාහරණාදි නිරර්ථකකථාවක් පෙරටුකොට ඇතිබවද එබදු කථාකරනබව ද යනමොහුයි.

අභිධ්‍යා අභිමුඛකොට සිතානු,යි **අභිජ්ඣා නම්;** පරභාණ්ඩයන්ට **ව්‍යාපාද** අභිමුඛව එහි නැමුනු සිත් ඇතිබැවින් පවතී යන අර්ථයි; **මිථ්‍යාදෘෂ්ටි** ඕ අභිධ්‍යාතොමෝ මෙය මට වන්නේනම් ඉතා යෙහෙකැ, යි මෙසේ පරභාණ්ඩයන් අභිමුඛකොට සිතීම ලක්ෂණ කොට ඇත්තීය; අදිත්‍තාදානය මෙන් අල්පසාවද්‍යද මහාසාවද්‍ය ද වෙයි; ඒ අභිධ්‍යාවට අඞගදෙකක් වෙති, පරභාණ්ඩයෙක්බව ද, තම හට පිරිණැමීම ද යන මොහුයි; පරභාණ්ඩවසතුකවූ ලොභය උපන් කල්හිදු මේ භාණ්ඩය මට වන්නේ නම් ඉතා යෙහෙකැ,යි යම්තාක් තමහට නො පිරිණමාද ඒතාක් කම්පථභෙදයෙක් නො වෙයි. හිත සුවය නසානු,යි **ව්‍යාපාද** නම් වේ; හේ ව්‍යාපාදයතෙම මෙරමා නැසීම පිණිස සිත දූෂ්‍යවීමලක්ෂණකොට ඇත්තේයැ; පරුෂවචනය

මෙන් අල්පසාවද්‍ය ද මහාසාවද්‍යද වෙයි; ඒ ව්‍යාපාදයට අඩය දෙකකි, පරසත්වයෙක් බවද, ඔහුගේ විනාශයසිතීමද කියායි; පරසත්වයෙකු වසතු කොට ඇති ක්‍රොධය උපන්කල්හිදු මේතෙම සිදෙන්නේ නම් නැසෙන්නේ නම් ඉතා යෙහෙකැ,යි යම්තාක් ඔහුගේ විනාශය නො සිතාද ඒතාක් කම්පථභෙදය නො වෙයි; තත්වූ පරිද්දෙන් ගැනීමක් නැති බැවින් වරදවා දකිනු සි **මිච්ඡාදිට්ඨි** නමු; ඔතොමෝ "නත්ථි දින්නං,, යනාදිනයින් විපරීතදර්ශනය ලක්ෂණකොට ඇත්තිය; සම්ඵප්‍රලාපය මෙන් අල්පසාවද්‍ය ද මහාසාවද්‍ය ද වෙයි; තවද අනියතවූ (මිත්‍යා දෘෂ්ටිතොමෝ) අල්පසාවද්‍යයැ, නියතවූවා මහා සාවද්‍යයැ; ඒ මිථ්‍යා දෘෂ්ටියට අඩය දෙකකි, වසතුව පිළිබඳ ගත්ආකාරයාගේ විපරීත බව ද යම්පරිද්දෙකින් එය ග්‍රහණයකෙරේ නම් එපරිද්දෙන් ඒ වසතුහුගේ වැටහීම ද යන මොහුයි.

දශඅකුශලකම්පථ විභාගය. තවද මේ දශඅකුශලකම්පථයන්ගේ ධම්මවශයෙන්ද කොඨාසවශයෙන් ද ආරම්මණවශයෙන් ද වෙදනා වශයෙන් ද මූලවශයෙන් ද, යි පස්ආකාරයකින් විනිශ්චය දතයුතු. ඒ විනිශ්චයෙහි "ධම්මවශයෙන්,, යනු මේ විසතරයයි- මේ දශඅකුශලයන් අතුරෙහි පිළිවෙළින් සතක් චෙතනා ධම්මයෝ ම වෙති, අභිධ්‍යාදි තුන චෙතනාසම්ප්‍රයුක්තයෝයි. "කොඨාස වශයෙන් යනු පිළිවෙළින් සතක් ද මිථ්‍යාදෘෂ්ටිය ද, යි මේ අටකම්පථයෝ ම වෙති, මූලයෝ නො වෙති; අභිධ්‍යාව්‍යාපාදයෝ කම්පථයෝ ද මූලයෝ ද වෙති; ඒ එසේමැයි- අභිධ්‍යාතොමෝ (අකුශලයන්ගේ) මුල්බවට පැමිණ ලොභසම්ප්‍රයුක්තවූ අකුශලමූලය වෙයි; ව්‍යාපාදයතෙම දෝස සම්ප්‍රයුක්තවූ අකුශලමූලය වෙයි. "ආරම්මණවශයෙන්,,යනු ප්‍රාණඝාතය ජීවිතෙන්ද්‍රියාරම්මණ වශයෙන් සංඝකාරාරම්මණ වෙයි; අදත්තාදානය සත්තාරම්මණතෝ සංඝකාරාරම්මණවෙයි. මිත්‍යාචාරයස්ප්‍රෂ්ටව්‍යවශයෙන් සංඝකාරාරම්මණ වෙයි. සත්තාරම්මණය,යි ද ඇතැම් ආචාර්‍යයෙක් කියති; මෘෂාවාදය සත්තාරම්මණ හෝ සංඝකාරාරම්මණ හෝ වෙයි; පෙ ශූන්‍යවඛනය දණ්ඩේයි; පරුෂවචනය සත්තාරම්මණ මැයි; සම්ඵප්‍රලාපය දෘෂ්ටශ්‍රුතමුතවිඥාතවශයෙන් සත්තාරම්මණ හෝ සංඝකාරාරම්මණ හෝ වෙයි; අභිධ්‍යාව ද එසේයි; ව්‍යාපාදය සත්තාරම්මණ මැයි; මිත්‍යාදෘෂ්ටිය තුන්හේතුකකම්ම වශයෙන් සංඝකාරාරම්මණ වෙයි "වෙදනාවශයෙන්,, යනු ප්‍රාණඝාතයතෙමේ දුඃඛවෙදනා වෙයි; ඒ එසේමැය- කිසිසේත් රජවරු සොරෙකු දැක සිනහසෙමින්දු "යවු ඔහු නසවු,, යයි කියත්ද එතකුදුවුවත් ඔවුන්ගේ සන්නිෂ්ඨාපකචෙතනාතොමෝ දුඃඛසම්ප්‍රයුක්ත වූවා ම වෙයි; අදත්තාදානය ත්‍රිවෙදනායැ; මිත්‍යාචාරය සුඛොපෙක්ෂාවශ යෙන් ත්‍රිවෙදනා යැ; සන්නිෂ්ඨාපකචිත්තයෙහි ම උපෙක්ෂාවෙදනාවෙයි;

මෘෂාවාදය ත්‍රිවේදනා යැ; පිසුණුවාක්තෝ මෝ ද එසේයි; පරුෂ වාක්තොමෝ දුඃඛවේදනායැ; සම්ඵප්‍රලාපයත්‍රිවේදනායැ; අභිධ්‍යාව සුඛ මධ්‍යස්ථ විසින් ත්‍රිවේදනායැ; මිථ්‍යාදෘෂ්ටිය ද එසේයි; ව්‍යාපාදය දුඃඛවේදනායැ; "මූලවශයෙන්,, යනු ප්‍රාණඝාතයතෙම වෙෂමොහවිසින් දෙමූලක්ඇත්තේ වේයි; අදත්තාදානය වෙෂමොහ විසින් හෝ ලොභමොහ විසින්හෝ ත්‍රිමූලකවෙයි; මිථ්‍යාචාරයලොභමොහ විසින් ත්‍රිමූලකයැ; මෘෂාවාදය වෙෂමොහවිසින් හෝ ලොභමොහවිසින් හෝ ත්‍රිමූලකයැ; පෛශුන්‍යවචනයත් සම්ඵප්‍රලාපයත් එසේයි; පරුෂවචනය වෙෂමොහ විසින් ත්‍රිමූලකයැ; අභිධ්‍යාතොමෝ මොහවශයෙන් එක්මූලක් ඇත්තී වෙයි; ව්‍යාපාදයත් එසේයි; මිථ්‍යාදෘෂ්ටිය ලොභමොහවිසින් දෙමූලක් ඇත්තියැ,යි.

ලොභෝ අකුසලමූලං යනාදියෙහි ලොභකෙරේ නු,යි (=ගිජුවේ නු,යි) **ලොභ** නම; නො සතුටුවේනු,යි **දෙෂ** නම, මුළාවේ නු, යි **මොහ** නම; ඔවුනතුරෙහි ලොභය **සාවද්‍යදුඃඛවිපාකාදියෙන්** තෙමේත් අකුශලවෙයි, මේ ප්‍රාණාතිපාතාදි අකුශලයන් අතුරෙන් කිසිවෙකුට සම්ප්‍රයුක්තප්‍රභාවාදියෙන් ද කිසිවෙකුට උපනිශ්‍රය ප්‍රත්‍යයාදියෙන් ද මුල්වේ නු,යි **අකුසලමූල** නම; මේ කියනලදී- **රත්තෝ ඛෝ ආවුසෝ රාගෙන අභිභූතෝ පරියාදිණ්ණචිත්තෝ පාණම්පි හනති** යනාදියයි, දෙසමොහයන්ගේ අකුශලමූලභාවයෙහි ද මෙම නයයි.

පාණාතිපාතා වෙරමණී කුසලං යනාදියෙහි පාණාතිපාතාදිහු කිඅපිඇත්තාහු මය. (අකුශල) වෛරය හරී නු,යි **වෙරමණී** යනුවේ; වෛරය දුරුකෙරෙයි යන අර්ථයි; නොඅොත් කාරණවූ මෙයකාරණ කොටගෙන පුද්ගලතෙමේ වෛරයකෙරෙන් වෙන්වේ නු,යි (**විරමණී** යයි කියයුත්තෙහි) "වි,, කාරයට "වෙ,,කාරය කොට ද **වෙරමණී** යනු වේ; මෝ පළමුකොට දක්වනලදු මෙහි **ව්‍යඤ්ජනවිසින්** වණ්ණ නායැ. අනතුරුව අර්ථවිසින් (වණ්ණනා කරනුලැබේ.) **වෙරමණී** යනු කුශලචිත්තසම්ප්‍රයුක්තවූ විරතියයි; ඕතොමෝ ප්‍රාණඝාතයෙන් වෙන් වන්නහුගේ **යාතසමිං සමයෙ පාණාතිපාතා ආරති විරති** යි මෙසේ වදාරනලද කුසල්ඉත හා යෙදුනු විරතියයි; ඕතොමෝ භෙදවශයෙන් ත්‍රිවිධවන්නීය, "සමපත්තවිරති, සමාදාන විරති, සමුච්ඡේදවිරති,, යයි කියායි; ඔවුනතුරෙහි සමාදන්නොවූ ශික්ෂාපදඇති තමාගේ ජාතිය වයස බහුශ්‍රැතබව ආදිය ප්‍රත්‍යවෙක්ෂාකොට අපට මෙබන්දක් කරන්ට අයුතුය,යි පැමිණී වසතුව ව්‍යතික්‍රමය නො කරන්නවුන්ට උපදනාවූ විරති තොමෝ සමපත්තවිරතිය,යි දතයුතු; හෙළදිව වකකන උපාසකයාට මෙනි.

ත්‍රිවිධ විරතිය.

චක්කන උපාසකයා. ඒ චක්කනඋපාසකයාගේ මවට (ඔහු) තරුණකාලයෙහි ම රොගයක් උපන්නේ ලු; වෙදුවිසින් ද අමු සාමස් ලබන්ට වටිය,යි කියනලදී; එහෙයින් චක්කනයාගේ සහොදරතෙමේ යා දරුව කෙතෙහි ඇවිදුව,යි චක්කනයා යැවී; හෙතෙම එහි ගියේය; එකල්හි ම එක් සාවෙක් ළාගොයම් කනු පිණිස ආයේ වෙයි; සාවා චක්කනයා දැක වෙගයෙන් දුවන්නේ වැලකින් බැඳුනේ "කිරි කිරි,, යි ශබ්දකෙළේය; චක්කණ ඒ ශබ්දයෙන් හොස් ඔහු අල්වා ගෙන මව්ට බෙහෙත් කෙරෙමි,යි සිතිය; නැවත මෙසේ සිතී, යම්බඳුවූ මම මවගේ ජීවිතය කරුණුකොට අනෙකෙකු දිවියෙන් තොරකරන්නෙම්ද මේ ද්විතොරකිරීම මට සුදුසු නො වේය, යි; ඉක්බිති ඒ සාවා "යව, වෙනෙහි සාවුන් සමග තණ දිය වළඳ,,යි මුදහැරියේය; සහොදරයාවිසින් ද කිම දරුව සාවෙකු ලද්දේදැයි? විචාරනලද්දේ එපුවත් කීය; ඉක්බිති ඔහට සහොදරතෙමේ පරිභවකෙළේය; හෙතෙම මව සමීපයට ගොස් "මම යම් කලෙකපටන් (මේ මිනිස්බැවැ) උපන්නෙම්ද (එතැන් සිට) දැන දැන සතෙකු (රැවාරැ) දිවියෙන් තොරකරවූයෙමි නො දනිමි,,යි සස් බැණ අධිෂ්ඨානකෙළේය; එදොනෙහි ම ඔහුගේ මවුතොමෝ අරොග වූවා විය.

සමාදන්වූ ශික්ෂාපදඇති ශික්ෂාපදසමාදාන කාලයෙහි ද එයින් මින්තෙහි ද තමාගේ ජීවිතය පවා පූජාකොට වසතුව්‍යතික්‍රමය නො කරන්නවුන්ට උපදනීවූ විරතිතොමෝ සමාදානවිරති නමැ, යි දතයුතු;

උතුරුවඩමන්වැසි උපාසකයා. උපාසකයාට මෙනි- හෙතෙම වනාහි **අම්බගිය විහාරවැසි පිඩඟලබුධරක්ඛිත** තෙරුන්ගේ සමීපයෙහි ශික්ෂාපදයන් ගෙන කෙතක් සාසි; එකල ඔහුගේ ගවයෙක් නටුයේය; හෙතෙම ඒ ගවයා සොයමින් උතුරුවඩමන් පව්වට නැඟේය; එහිදී ඕනු පිඹුරෙක් අල්වාගත්තේය; හෙතෙම මේ මුවහත්වූ කැත්තෙන් මොහුගේ හිස සිදිමි,යි සිතී; නැවත මෙසේ සිතුවේය "යම්බඳුවූ මම භාවනීයවූ ගුරුවූ තෙරුන් සමීපයෙහි ශික්ෂාපද ගෙන බිඳින්නෙම් නම් මේ ශික්ෂාබිඳීම නො සුදුසුය,, යි; මෙසේ තෙවන වට දක්වා සිතා "දිවි හරිමි ශික්ෂාපදය නො හරිමි,,යි අසෙක තුබූ තියුණුවූ කැත්ත වනයෙහි දැම්මේය; එකෙණෙහි ම පිඹුරුතෙමේ ඔහු මුදහැර ගියේය,යි.

ආර්‍යීමාගීසම්ප්‍රයුක්තවූ විරතිතොමෝ වනාහි සමුච්ඡේදවිරතිය,යි දතයුතු; යම්විරතියක්හුගේ උතපත්තියෙහි පටන් ප්‍රාණවධකරන්නෙමු,යි ආර්‍යීපුද්ගලයන්ට සිතකුත් නො උපදීද, ඕ මෝ විරතිතොමෝ වනාහි කෞශල්‍යයෙන් පැවතිබැවින් "කුශල,, යයි කියනලදුහ, කුත් සිතකුම්ය සලනයකරනහෙයින් හෝ (කුසලය,යි කියනලදුහ;) "කුස,,

යයි ලත් ව්‍යවහාර ඇති දුශ්ශීලබව සිදී නු,යි ද කුසල නම්; **කත්ත මඤ්ඤ ආවුසෝ! කුසලං?** යන මේ ප්‍රශ්නයට අනුරූප නො වනහෙයින් "කුසලා,, යි නො කියනලදු; අකුශලයන්ගේ යම් සේද එසේ මේ කුශල කර්මපථයන්ගේ ද ධර්මභෙදයින් කොට්ඨාසභෙදයින් ආරම්මණභෙදයින් වෙදනාභෙදයින් මූල භෙදයින් දැ,යි පස්ආකාරයකින් විනිශ්චය දතයුතු.

කුශල විභාගය.

ඒ විනිශ්චයෙහි "ධර්මවශයෙන්,, යනු මේ කුශලයන් අතුරෙහි ද පිළිවෙළින් සතක් චෙතනාවූවාහු ද විරතිවූවාහු ද වෙත්; අනභාවෙහිවූ තුන චෙතනාසම්ප්‍රයුක්තවූවාහු මැ වෙති. "කොට්ඨාසවශයෙන්,, යනු පිළිවෙළින් සතක් කර්මපථයෝ මැයි; මූලයෝ නො වෙති. අනභාවෙහිවූ තුන කර්මපථයෝ ද මූලයෝ ද වෙති; අනභිධ්‍යාතොමෝ (කුශලයන්ගේ) මූල්බවට පැමිණ අලෝභසඞ්ඛ්‍යාත කුශලමූලය වෙයි; අව්‍යාපාදය අදෙසසඞ්ඛ්‍යාත කුශලමූලය වෙයි; සම්‍යග්දෘෂ්ටිය අමෝහ සඞ්ඛ්‍යාත කුශලමූලය වෙයි. "ආරම්මණවශයෙන්,, යනු ප්‍රාණඝාතාදීන්ගේ ආරම්මණයෝ ම මොවුන්ට ආරම්මණ වෙති, ව්‍යතික්‍රමණය කළයුතුබැවින් ම "වෙරමණී,, නම් වේ; නිවන් අරමුණුකොට ඇති ආර්‍යමාර්ගය යම්සේ කෙලෙසුන් දුරුකෙරේද එසේ ජීවිතෙන්ද්‍රියාදිය අරමුණුකොටඇත්තාවූ ද මේ කර්මපථයෝ ප්‍රාණවධාදීවූ දුශ්ශීල්‍යයන් දුරුකෙරෙත් යයි දතයුත්තාහුය. "වෙදනාවශයෙන්,, යනු සියල්ලෝම සුඛවෙදනා හෝ මධ්‍යස්ථවෙදනා හෝ වෙති; ඒ එසේමැය- කුශලයට පැමිණ දුඃඛවෙදනා නම් නැති.

"මූලවශයෙන්,, යනු පිළිවෙළින් සතක් ඥානසම්ප්‍රයුක්තවූ චිත්තයෙන් වෙන්වන්නහුට අලෝභ අද්වේෂ අමෝහවශයෙන් ත්‍රිමූල වෙති; ඥානවිප්‍රයුක්තවූ චිත්තයෙන් වෙන්වන්නහුට විමූල වෙති; අනභිධ්‍යාතොමෝ ඥානසම්ප්‍රයුක්තවූ චිත්තයෙන් වෙන්වන්නහුට විමූල ද ඥානවිප්‍රයුක්තවූ චිත්තයෙන් ඒකමූල ද වෙයි; අලෝභය වන්‍යාහි තෙමේම තමහට මූල නො වෙයි; අව්‍යාපාදයෙහි ද මේ ම නයයි; සම්‍යග්දෘෂ්ටිතොමෝ අලෝභඅද්වේෂවිසින් විමූල මැ වේය,යි. **අලෝභෝ කුසල මූලං** යනාදියෙහි ලෝභය නො වේ නු,යි **අලෝභ** නම්, ලෝභප්‍රතිපක්ෂවූ ධර්මයට මේ නමකි; අදෙසඅමෝහයන්හි ද මෙ ම නයයි ඔවුන් අතුරෙහි අලෝභය තෙමේත් කුශලයැ, මේ ප්‍රාණඝාතයෙන් වෙන්වීම් ආදිවූ කුශලයන් අතුරෙන් කිසිවෙකුට සම්ප්‍රයුක්තප්‍රභාවකාර්‍ය්‍යයෙන් ද කිසිවෙකුම උපනිශ්‍රයප්‍රත්‍යයාර්‍ථයෙන් ද මූල නු, යි **කුසල මූල** නම් වෙයි; අදෙසඅමෝහයන්ගේ ද කුශලයන්ට මූල්බැව්හි මේ නය මැ,යි. මෙවිට ඒ සියලු ම සංක්ෂෙපවිසින් ද විස්තරවිසින් ද දෙසූ අර්‍ථය නිගමනයක්‍ කරන්නාහු **යතෝ ඛෝ ආවුසෝ!** යනාදිවූ අර්‍ථාවරය වදළහ. ඒ වාරයෙහි **එවං අකුසලං පජානාති** යනු මෙසේ දැක්වූ පරිදි දශඅකුශලකර්මපථයන්ගේ වශයෙන් අකුශලය දනගනී; **එවං අකුසල මූලං** යනාදියෙහි ද මේ ක්‍රමය මැ,යි.

මෙතෙකින් එක් ක්‍රමයකින් චතුස්සත්‍යකම්මට්ඨානිකයාගේ අගී භූය තෙක් නියාමිතය වදාරනලද්දේ වෙයි; කෙසේද? මෙහි වනාහි අභිධ්‍යාව තබා දශඅකුශලකර්මපථයෝ ද කුශල කර්මපථයෝ ද දුඃඛ සත්‍යය වෙයි; අභිධ්‍යාව ද ලොභසඞ්ඛ්‍යාත අකුශලමූලය ද, යි මේ ධර්‍ම යෝ දෙදෙන නිෂ්පර්‍යායවශයෙන් සමුදයසත්‍යයයැයි; පර්‍යායවශයෙන් වනාහි සියලු ම කර්මපථයෝ දුඃඛසත්‍යය වෙයි; සියලු කුශලාකුශල මූලයෝ සමුදයසත්‍යයවෙයි; දෙදෙනාගේ නො පැවැත්ම නිරෝධ සත්‍යයවෙයි; දුක භාත්පසින් දැනගන්නාවූ සමුදය දුරුකරන්නාවූ නිරෝධය දැනගන්නාවූ ආර්‍යමාර්ගය තෙමේ මාර්ගසත්‍යය,යි මෙසේ සත්‍යයෝ දෙදෙනෙක් සඞ්ඛේපයෙන් කියනලද්දාහුය; දෙදෙනෙක් ආවෘත්තභාරවශයෙන් දතයුත්තාහුය. **සෝ සබ්බසෝ රාගානුසයං පහාය**= හෙතෙම මෙසේ අකුශලාදිය දැනගන්නේ සම්මාකාරයෙන් රාගානුසය දුරුකොට; **පටිඝානුසයං පටිවිනෝදෙත්වා**= ප්‍රතිඝානුසයද සම්මාකාරයෙන් ම බැහැරකොට යයි කියනලද්දේ වෙයි; මෙතෙකින් අනාගාම්මාර්ගය වදාරනලද. **අස්මීති දිට්ඨිමානානුසයං සමූහනිත්වා** පස්කඳ අතුරෙන් කිසි ධර්‍මයක් ඉතිරි නොකොට "මම වෙමි,, යන මේ සමූහග්‍රහණාකාරයෙන් ප්‍රවෘත්තවූ දෘෂ්ටිමානානුසය සමූලඝාතනයකොට **එහි දිට්ඨිමානානුසයං** යනු දෘෂ්ටිය වැනිවූ මානානුසය යයි කියනලද වෙයි; ඝම්හෙයකින් මේ මානානුසයතෙම "මම වෙමි,, යි පැවති බැවින් දෘෂ්ටිය සමාන වේද එහෙයින් මෙසේ කියනලද; මේ අස්මිමානය විස්තර වශයෙන් දැනගනු කැමැත්තහු විසින් "ඛන්ධිය,, වගී යෙහි "ඛෙමක,, සූත්‍රය බැලියයුතුයි. **අවිජ්ජං පහාය**= වෘත්තමූලවූ අවිද්‍යාව දුරුකොට **විජ්ජං උප්පාදෙත්වා**= ඒ අවිද්‍යාව සමූලඝාතනය කරන්නීවූ අර්හත්මාර්ගවිද්‍යාව උපදවා; මෙතෙකින් අර්හත්මාර්ගය වදාරනලද. **දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරෝ හොති**= මේ අත්බැවිහිම වෘත්තදුඃඛයාගේ පිරිසිදීම කරන්නේ වෙයි; **එත්තාවතාපි ඛො ආවුසො!** යි දෙශනාව නියාමිතය කෙරෙති; මේ කර්මපථදෙශනා වෙහි කියනලද මනසිකාර ප්‍රතිවෙධ වශයෙන්මයි; කියනලද වෙයි; සෙස්ස කීතය මැ,යි. මෙසේ අනාගාම් අර්හත්මාර්ගවයෙන් දෙශනාව නිමවූසේකැ,යි.

කර්මපථවාර වණ්ණනා නිමි.

—— × ——

ආහාර වණ්ණනා

සාධාවුසො ති ඛො-පෙ-ආයස්මතො ඉමං සබ්බම්ම යනු මෙසේ ආයුෂ්මත්ශාරිපුත්‍රයන්ගේ කුශලාකුශල මූඛයෙන් සිව්සස්දෙසුම් අසා ආයුෂ්මත් ශාරිපුත්‍ර යන්ගේ ඒ භාෂිතය "සාධාවුසො,, යන මේ වචනයෙන් ඒ භික්ෂූහු අභිමුඛව පිළිගෙන මේ වචනයාගේ ම සමූඛාපකචිත්තයෙන් අනුමෝ දන්ව වචනයෙන් පිළිගෙන සිතින් ද ප්‍රියකොට යයි කියනලද

වෙයි; දැන් යම්හෙයකින් තෙරණුවෝ නන් අයුරින් සිව්සස්දෙසුම් දෙසන්ට ප්‍රතිබල වේද; වදුලේ මැ.නු- **සාරිපුත්තෙනා හිකඛවේ! පහොති චතුන්නං අරියසච්චානි විත්ථාරෙන ආචික්ඛිතුං දෙසෙතුං** යී. නොහොත් යම්හෙයකින් මත්තෙහි ද දෙශනාකරනු කැමතිව **එත්තාවතාපි බොධි** කිහුද, එහෙයින් අනිකුදු ක්‍රමයකින් සත්‍යදෙශනාව අසනු කැමතිවූ ඒ භික්ෂූහු ආයුෂ්මත් ශාරිපුත්‍රයන් මත්තෙහි ප්‍රශ්නවිචාළාහුය; එහෙ යින් තමන්වහන්සේ ම විචාරා විසදු ප්‍රශ්නයෙන් මත්තෙහි **සියා බොපනාවුසො අඤ්ඤම්පි පරියායෝ**= අනිකුදු කරුණක් වන්නේ දැ?යි මේ ක්‍රමයෙන් අන්‍යවූ අනිරෙකවූ ප්‍රශ්නයක් විචාළාහුය; නොහොත් පළමු ප්‍රශ්නයට මතුහාගයෙහි විචාළාහුය,යි කියනලද වෙයි; ඉක්බිති ඔවුන්ට ප්‍රකාශකරන්නාවූ තෙරණුවෝ **සියා ආවුසො** යනාදිය වදුළහ. **එහි** මෝ අනුත්තානපදවණ්ණනායි- **ආහාරං**= ප්‍රත්‍යය; යම්හෙය කින් ප්‍රත්‍යයතෙමේ තමාගේ ඵලය ඵලවාද එහෙයින් ආහාර යයි කියනු ලැබේ; **භූතානං වා සත්තානං** යනාදියෙහි **භූතා**= හටගත්තාහු උපන්නාහු; **සම්භවෙසිනං**= යමෙක්තුමූ සම්භවය ජාතිය නිෂ්පත්තිය සොයන්ද ගවෙෂණය කෙරෙත්ද (ඔවුන්ගේ;) එහි සිව්යොනීන් අතු රෙන් අණ්ඩජජරායුජසඤ්ඤයෝ අණ්ඩකොෂය ද වත්ථිකොෂය ද යම් තාක් නො බිඳිත්ද එතාක් සම්භවෙසී නම් වෙති; අණ්ඩකොෂය ද වත්ථිකොෂය ද බිඳ පිටතට නික්මුනාහු භූතයෝ නම් වෙති; සෙදජ ඔෂද්භිජසඤ්ඤයෝ ද ප්‍රථමචිත්තක්ෂණයෙහි සම්භවෙසී නම් වෙති දෙවෙනි චිත්තක්ෂණයෙහි පටන් භූතයෝ නම් වෙති; යමෙක් හෝ යම් ඉරියව්වකින් උපදිත්ද යම්තාක් ඒ ඉරියව්වෙන් අන් ඉරියව් වකට නො පැමිණෙත්ද ඒතාක් සම්භවෙසී නම් වෙති; එයින් මත් තෙහි භූතයෝ නම් වෙති; නොහොත් **භූතා** යනු හටගත්තාවූ උපන් නාවූ යමෙක්තුමූ හටගත්තාහු ම වෙත්ද නැවත නොහටගන්නාහු ය,යි සඤ්ඤාවට යෙත්ද ඒ ක්ෂීණාශ්‍රවයන්ට මේ නමෙකි; සම්භවය ඵණයකෙරෙත් නු,යි සම්භවෙසී නම් වෙති; ප්‍රහීණ නො කළ භව සංයොජනඇතිබැවින් මත්තෙහිත් සම්භවය සොයන්නාවූ සෙෂපෘ ථග්ජනයන්ට මේ නමෙකි; මෙසේ සාමාන්‍යප්‍රකාරයෙන් ම මේ දෙපද යෙන් සියලු සඤ්ඤයන් ඇතුලත්කොට ගනී; මෙහි "වා,, ශබ්දය ද සම්පිණ්ඩනාර්ථයි; එහෙයින් භූතයන්ගේ ද සම්භවෙසීන්ගේ ද,යි මේ අර්ථය දතයුතු. **සිනේහා** සස්නේහ පිණිස; **අනුග්ගහාය** අනුග්‍රහය පිණිස උපකාරය පිණිස; මෙ ද වචනභෙදය මැ වෙයි, අර්ථය වූ කලි දෙපද යන්ගේ ම එකෙක් මැය; නොහොත් **සිනේහා** ඒ ඒ සඤ්ඤාහට උපන් ධර්මයන්ගේ අනුව බැඳීම්වශයෙන් නො සිඳීම පිණිස; **අනුග්ගහාය** නූපන් ධර්මයන්ගේ ඉපදීම පිණිස; මේ දෙක ම භූතයන්ගේ ද පැ වැත්ම හා අනුග්‍රහය පිණිස ද, සම්භවෙසීන්ගේ ද පැවැත්ම හා අනු ග්‍රහය පිණිසද,යි මෙසේ දෙතැන්හි දතයුත්තාහුය.

කබළිඞ්කාරාහාරය.

කබළිඞ්කාරෝ ආහාරෝ යනු කවල කොට ගිලියයුතු ආහාරය; ඔදනකුලමාෂාදිය වසතුකොට ඇති ඔජාවට මේ නමකි; **ඔළාරිකෝ වා සුඛුමෝ වා** වසතූන්ගේ ඖදාරිකභාවයෙන් ඔළාරිකවූ වසතූන්ගේ සූක්ෂමභාවයෙන් සුඛුමවූ; එතකුදුවුවත් සභාවයෙන් සියුම්රූපයටඇතුලත්බැවින් කවලකාරආහාරයතෙමේ සියුම් මැ වෙයි; එබැවින් ඕජාතොමෝද (ඕදනකුලමාෂාදිවූ) ඒ වසතුහුගේ ඖදාරිකඛව ද සූක්ෂමඛව ද පිළිවෙළින් ගෙන දතයුත්තීය. ඒ එසේමයැ- කිඹුලුන්ගේ ආහාරය සඳහා මොතරුන්ගේ ආහාරය සියුම් වෙයි; කිඹුල්ලු කැටගල් ගිලිත් ල; ඒ ගල් ද ඔවුන්ගේ කුසට පැමිණියාහු දියවී යෙත් ල; මොතරු සජීවෝනුසුආදිවූ ප්‍රාණීන් කත් ල; තවද මොතරුන්ගේ ආහාරය සඳහා තරසුන්ගේ ආහාරය සියුම් වෙයි; ඔවුහු තුන්හවුරුදුවූ හැරදමනලද අං හා ඇට ද කත් ල; ඒ අං හා ඇට ද ඔවුන්ගේ කෙළවලින් තෙමුනු ඇසිල්ලෙහි ම කඳල මෙන් මොලොක් වෙත් ල; තරසුන්ගේ ද ආහාරය සඳහා ඇතුන්ගේ ආහාරය සියුම් වෙයි; ඔවුහු වනාහි නොයෙක් රුක්අතු කති, ඇතුන්ගේ ආහාරයට වඩා ගවයගෝණමුව ආදීන්ගේ ආහාරය සියුම් වෙයි; ඔවුහු නිසරුවූ නොයෙක් රුක්වල කොලආදිය කති; ඔවුන්ගේ ආහාරයට ද වඩා ගවයන්ගේ ආහාරය සියුම් වෙයි; ඒ ගවයෝ අමුවූද වියලුනාවූද තණ කති; ඔවුන්ගේ ආහාරයට වඩා සාවුන්ගේ ආහාරය සියුම් වෙයි; සාවුන්ගේ ආහාරයට වඩා පක්ෂීන්ගේ ආහාරය සියුම්වෙයි; පක්ෂීන්ගේ ආහාරයට වඩා පසල්වැසියන්ගේ ආහාරය සියුම් වෙයි; පසල් වැසියන්ගේ ආහාරයට වඩා ගම්මුදලින්ගේආහාරය සියුම් වෙයි; ගම් මුදලින්ගේ ආහාරයට වඩා රජරජමහඇමතියන්ගේ ආහාරය සියුම් වෙයි; ඔවුන්ගේ ද ආහාරයට වඩා සක්විතිරජුගේ ආහාරය සියුම් වෙයි; සක්විතිරජුගේ ආහාරයට වඩා බ්‍රහ්මාටුදෙවියන්ගේ ආහාරය සියුම් වෙයි; ඔවුන්ගේත් ආහාරයට වඩා චාතුම්මහාරාජිකයන්ගේ ආහාරය සියුම් වෙයි; මෙසේ පරනිම්මිතවසවත්තීන්ගේ ආහාරය දක්වා විසතර කටයුතුයි; ඔවුන්ගේ ආහාරයවනාහි සියුම් යයි කියාම නිෂ්ඵාවට පැමිණියේය. මෙහි ද ඖදාරිකවසතුවෙහි ඕජා මදවෙයි; දුර්ලවෙයි සියුම් වසතුවෙහි බලවත් වෙයි; ඒ සැබව- එක් පසක් පුරාලන්නාවූ ද කැඳ පානයකලේ මොහොතකින් ම බඩසාඇත්තේ වෙයි, යම් කිසිවක් ම කනුකැමැත්තේ වෙයි; ගිතෙල් වනාහි පතක් පමණ ද බී දවසක් නොවළඳනුකැමැත්තේවෙයි; ඔවුනතුරෙහි වසතුව පරිශ්‍රමය දුරුකෙරෙයි, පාලනයකරන්ටනො හැකි වෙයි; ඕජාතොමෝ පාලනය කෙරෙයි, විඩා දුරුකරන්ටනො හැකි වෙයි; දෙදෙන ම එක්වගෙන විඩාවත් දුරුකෙරෙති; පාලනයත් කෙරෙත් යයි,

එසෙසා දුතියෝ= "චක්ඛුසම්ඵස්සා" දීවූ සවැදෑරුම්වූ ම
එස්සාදි ආහාර සපශීය තෙමේ මේ සතර ආහාරයන් අතුරෙත් දෙවැනිවූ ආහාර ය්සි දතයුතු; යම්හෙයකින් මේ (දුතියෝ යන සඛ්‍යා නියමය) දෙශනාක්‍රමය ම වේද එහෙයින් මෙනම් කරුණකින් දෙවැනිත් තෙවැනිත්වීය,සි මේ (නියමය) මෙහි නො සෙවියයුතුසි. **මනොසඤ්චෙතනා** යි චෙතනාතොමෝ ම කියනුලැබේ; **විඤ්ඤාණං** යි යම් කිසි සිතක් කියනුලැබේ; මෙහිලා (චොදක) කියසි- ඉදින් ප්‍රත්‍ය යාපීයතෙමේ ආහාරාපී වි,නම් වැලි කුමක්හෙයින් සත්‍වයන්ට අන්‍යවූත් ප්‍රත්‍යයන් විද්‍යමානකල්හි මේ සතර ම කියනලද්දාහුද?සි. (පරිහාර) කියනුලැබේ- අධ්‍යාත්මිකසන්තතියට විශෙෂ ප්‍රත්‍යයවන බැවිනි ඒ එසේමැය කබලිඞ්කාරාහාරය බුදින්නාවූ සත්‍වයන්ගේ රූපකයට කබලිඞ්කාරාහාරය ද නාමකයෙහි වෙදනාවට සපශීය ද විඤ්ඤනයට වෙතනා ව ද නාමරූප දෙකට විඤ්ඤය ද විශෙෂප්‍රත්‍යය වෙයි; වදාළේ මැනු- **සෙය්‍යථාපි භිකඛවෙ ! අයං කායෝ ආහාරට්ඨිතිකෝ ආහාරං පටිච්ච තිඨති අනාහාරෝ නෝ තිඨති තථා එස්සපච්චයා වෙදනා සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං විඤ්ඤාණපච්චයා නාමරූපං,** යි.

මෙහි කවර ආහාරයක් කුමක් ඵලවාද යත් ? කබලිඞ්කාරාහාරය තෙමේ ඔජාෂ්ටමකරූපයන් ඵලවයි; එස්සාහාරයතෙමේ ත්‍රිවිධවෙදනාව ඵලවයි; මනොසඤ්චෙතනාහාරයතෙමේ තුන්භවය ඵලවයි; විඤ්ඤාණාහාරයතෙමේ ප්‍රතිසන්ධිනාමරූපය ද ඵලවා යයි; කෙසේද ? පළමු කොට කවලීකාරාහාරයතෙම මුඛයෙහි තැබූකෙණෙහි ම රූප අවක් උපදවයි දනින් සුණුකරනලදුව ආහාරකොට ගනුලබන්නාවූ එකෙකි බත්හුල අට අට රූපයන් උපදවා මැ, යි; මෙසේ ඔජාෂ්ටමකරූපයන් ඵලවයි. සපශීාහාරය වනා,හි සුවවිඳියයුතුවූ පහස උපදනේ සුව වෙදනාව ඵලවයි, දුඃඛවෙදනීයවූ (පහස) දුඃඛවෙදනාව ද උපෙක්ෂා වෙදනීයවූ (පහස) උපෙක්ෂාවෙදනාව ද,සි සේ සවිප්‍රකාරයෙන් මේ සපශීාහාරයතෙමේ ත්‍රිවිධවෙදනාවන් ඵලවයි; මනසඤ්චෙතනාහාරයෙහි කාමභවයට පැමිණෙන්නාවූ කර්මය කාමභවය ඵලවයි; රූපා රූපභවයන්ට පැමිණෙන්නාවූ කර්මයෝ ඒ ඒ භවය ඵලවයි, මෙසේ සවිප්‍රකාරයෙන් ඔ මනසඤ්චෙතනාහාරය භවත්‍රය ඵලවයි. විඤ්ඤාහාරය වනාහි පිළිසඳකෙණෙහි එය හා සම්ප්‍රයුක්තවූ යම් සකඛන්ධයක් වෙත්ද ත්‍රිසන්තතිවශයෙන් යම් තිස් රූකෙනෙකුත් උපදින්ද සහජාතාදිප්‍රත්‍යයෙන්. ඔවුන් ඵලවා යයි කියනුලැබේ; මෙසේ විඤ්ඤාහරය ප්‍රතිසන්ධිනාමරූපය ඵලවා' යයි. මෙහි ද මනසඤ්චෙතනා තොමෝ තුන් භවය ඵලවා,, යයි අශ්‍රවසහිතවූ කුශලාකුශලචෙතනා තොමෝ ම කියනලදුු; 'විඤ්ඤාය ප්‍රතිසන්ධිනාමරූපය ඵලවා" යයි ප්‍රතිසන්ධිවිඤ්ඤාය ම කියනලද; අවිශෙෂයෙන් තත්සම්ප්‍රයුක්තවූ තත් සමුත්ථානවූ ධර්මයන් ඵලවනහෙයින් ද මොවුහු ආහාරයෝ යයි දත

යුත්තානුයි. මේ සතර ආහාරයන් අතුරෙන් කවලීකාරාහාරය උප සථම්භනයකෙරෙමින් ආහාරකෘත්‍යය සිඛකරයි; සපශීයතෙමේ සපශී කෙරෙමින් ම (ආහාරකෘත්‍යය සිඛ්කරයි;) මනසඤ්චෙතනාතොමෝ ආයූහනයකරන්නී ම (අහරකිස කෙරෙයි;) විඤ්ඤාණයතෙම විජාතනය කරමින් ම (අහරකිස කෙරෙයි;) කෙසේද? යම්හෙයකින් කවලීකා රාහාරයතෙමේ උපසථම්භනය කරමින් ම කය පිහිටුවීමෙන් සත්වයන්ගේ පැවැත්ම පිණිස වේද; ඒ එසේමැය- කර්මයෙන් උපදවනලද්දා වූ ද මේ කය කවලකරඅහරින් උපසථම්භිතවූයේ දසවසක් හෝ විසි වසක් හෝ ආයුප්‍රමාණය තෙක් සිටීද; කුමක් මෙන්ද යත්? මව විසින් උපදවනලද්දාවූ ද දරුතෙමේ ධාත්‍රියවිසින් කිරිආදිය පොවා පොෂණය කරනුලබන්නේ යම්සේ බොහෝ කලක් සිටීද; තවද- ආධාරයකින් උපසථම්භිතවූ ගෙයක් යම්සේ (බොහෝ කලක් පව තීද;) මේ වදාරනලද්දේත් වෙයි- **යථා මහාරාජ! ගෙහෙ පතනෙන අඤ්ඤතර දාරුනා උපත්ථම්භෙනති අඤ්ඤතර දාරුනා උපත්ථම්භි තං පතනං එවං තං ගෙහං න පතති එව මෙව බො මහාරාජ! අයං කායො ආහාරඞ්ගිනිකො ආහාරං පටිච්චතිට්ඨති** යී (මහ රජ ගෙයක් වැටෙන කල්හි අනිත් දැවයකින් යම්සේ උපසථම්භකෙරෙත්ද අනිත් දැවයකින් උපසථම්භිතවූයේ මෙසේ ඒ ගෙය නොවැටේද එසේම මහරජ! මේ කය ආහාරයෙන් පවත්නේ ආහාරය නිසා සිටී) මෙසේ කවලකරඅහර උපසථම්භනය කෙරෙමින් අහරකිස සිඛකෙ රෙයි; මෙසේ (අහරකිස) සිඛකරන්නාවූ ම **කවලීකාරාහාරයතෙමේ ආහාරසමුට්ඨානරූපයට ද උපාදිණ්ණරූපයටද යන රූපසන්තති දෙදෙ නාහට ප්‍රත්‍යය වෙයි; කර්මජරූපයන්ට අනුපාලකව ද ආහාරසමුට්ඨාන රූපයන්ට ජනක වී ද ප්‍රත්‍යයවේයයි. සපශීආහාරය වනාහි සුඛාදියට කරුණුවූ අරමුණ සපශීකරමින් ම සුඛාදිවෙදනා පැවැත්වීමෙන් සත්ව යන්ගේ පැවැත්ම පිණිස වෙයි. මනසඤ්චෙතනාහාරය කුශලාකුශල කර්මයන්ගේ වශයෙන් ආයූහනය කරමින් ම භවමූලය නිපදවන හෙයින් සත්වයන්ගේ පැවැත්ම පිණිස වෙයි. විඤ්ඤාණාහාරය විඤ්ඤාණය කරමින් ම නාමරූපයන්ගේ පැවැත්වීමෙන් සත්වයන්ගේ පැවැත්ම පිණිස වෙයි.**

මේසේ උපසථම්භනාදිවසින් ආහාරකෘත්‍යය සිඛකරන්නාවූ ඒ සතරආහාරයන්හි භයසතරක් දැක්කයුත්තානුයි. ඔහුකවරහුද? කව ලීකාරාහාරයෙහි තෘෂ්ණාව භය වෙයි; සපශීආහා රයෙහි එලඹීම ම (=අරමුණු හා එක්වීමය,යි සේයි;) භය වෙයි; මනසඤ්චෙතනාහාරයෙහි ආයූහනය ම් (හෙවත් කුශලාකුසලකර්මයන්ගේ රැස්කිරීම) භය වෙයි; විඤ්ඤාණාහාරයෙහි අභිනිපාතය ම (හෙවත් ඒ ඒ භවයෙහි ප්‍රතිසන්ධි වශයෙන් පහළවීම) භය වේය,යි. කරුණු කිම යත්? යම් හෙයකින් කවලීකාරාහාරයෙහි තෘෂ්ණාව කොට ශීතාදීන්ට පෙරටුවූ සත්ත්වයෝ ආහාරපිණිස මුද්‍රාගණනාදිවූ කර්මයන් කරන්නාහු

අනලපවූ දුකට පැමිණෙත්ද? තවද ඇතැම් කෙනෙක් මේ සස්නෙහි පැවිදිවී ද වෙදකම් ආදිකොටඇති අනෙසනයෙන් ආහාර සොයන් නාහු ඉහාතමයෙහි ම ගැරහියයුත්තාහු වෙත් ද? පරලෙව්හි ද **නාසා සඛාවිපි ආදිතතා සමපජජලිනා** යනාදිවූ ලක්ෂණසංයුක්තයෙහි කිනියෙන් ශ්‍රමණ ප්‍රෙතයෝ වෙත්ද? එහෙයින් මේ කාරණයෙන් කවලීකාරාහාරයෙහි නිකාන්තිය ම භයයයි දතයුතු. පහසට පැමිණෙන් නාවූ ද සුපශීය ආස්වාදනයකරන්නාහු අන්‍යයන් විසින් රක්ෂිතගොපි තවූ භාර්‍යාදිවූ භාණ්ඩයන්හි අපරාධකෙරෙති. බඩුහිමියෝ ඔවුන් බඩුසහිතව ගෙන කඩකඩකොට හෝ සිඳ කසළගොඩ දමති, රජුට හෝ පාවාදෙති; ඉක්බිති ඔවුන්ට රජතෙම විවිධ කම්කටවුලු කරවයි; ඔවුන්විසින් ශරීරයාගේ භෙදයෙන් දුගතිය කැමතිවිය යුත්තීය; මෙසේ සුපශීය ආස්වාදනයකිරීම මුල්කොට ඇති දෘෂ්ටධම්මිකවූ ද සාම්පරායිකවූ ද සියලු භය ආයේම වෙයි; මේ කරුණෙන් පහස් අඟරෙහි උපගමනය ම භය යයි දතයුතු. **කුශලාකුශලකර්මයන්ගේ** රැස් කිරීමෙන්ම ඒ කර්මාවූහනය මුල්කොට ඇති භවත්‍රයෙහි සියලු භය ආයේ ම වෙයි; මේ කරුණෙන් මනසඤ්චෙතනාහාරයෙහි ආවූහනයම භය යයි දතයුතු. ප්‍රතිසන්ධිවිඥානයත් යම් යම් තැනෙක්හි පැමිණේද ඒ ඒ තැන්හි ප්‍රතිසන්ධිනාමරූපය ගෙන ම උපදී; ඒ නාමරූපය උපන් කල්හි ද සියලු භය උපන්නාහු ම වෙති, (යම්හෙයකින් භය) ඒ නාම රූපය මුල්කොටඇතිබවක් වේද එහෙයිනි; මේ කරුණෙන් විඥානාහාර යෙහි අභිනිපාතය ම භය යයි දතයුතු. මෙසේ භයසහිතවූ මේ ආහාර යන් අතුරෙන් කවලීකාරාහාරයෙහි තෘෂ්ණාක්ෂයකිරීම පිණිස **සම්‍යක් සම්බුද්ධයන්වහන්සේ සෙය්‍යථාපි භික්ඛවෙ මෙ ජයම්පතිකා** යනාදි නයින් පුත්‍රමාංශොපමාවදෙශනාකළසේක **සුපශීාහාරයෙහි තෘෂ්ණාක්ෂය කිරීම පිණිස සෙය්‍යථාපි භික්ඛවෙ ගාවි නිව්වම්මා** යනාදිනයින් නීශවම් ධෙ නූ ප මා ව දෙශනාකළසේක. **මනසඤ්චෙතනාහාරයෙහි තෘෂ්ණාක්ෂයකිරීම පිණිස සෙය්‍යථාපි භික්ඛවෙ අඞ්ගාරකාසු** යනාදි නයින් අඞ්ගාරකාසූපමාව දෙශනාකළසේක. **විඥානාහාරයෙහි තෘෂ්ණා ක්ෂයකිරීම පිණිස සෙය්‍යථාපි භික්ඛවෙ චොරං ආගුවාරිං** යනාදි නයින් ෂත්තිසතාහතොපමාව දෙශනාකළසේක. එහි මෝකොමෝ භූතාර්‍ථ කොට ෂංක්ෂපයෙන් අර්‍ථයොජනායි.

පුත්තමංසූපමා අඹුසැමි දෙදෙනෙක් පුතෙකු ගෙන මඳවූ පාථෙය්‍ය යෙන් යුක්තව සියක්යොදුන් කතරමහට පිළිපන්නා හුල; පනස් යොදුනක් ගොස් ඔවුන්ගේ පාථෙය්‍යය නිමාවී ගියේය; ඔවුහු සා පවසින් පෙළුනාහු තනුසෙවෙනෙක්හි හුන්හ; ඉක්බිති පුරුෂ තෙම භාර්‍යාවට මෙසේ කිය- සොදුර! මෙසින් හාත්පස පනස්යොදු නක් ගමක් හෝ නියංගමක් හෝ නැත එහෙයින් පුරුෂයෙකු විසින් කළයුතු කෘෂිගොරක්ෂාදීවූ බොහෝවූත් යම් ඒ කර්මයක් වේද මෙවිට

එය මා විසින් කරනු නො හැක. එව මා මරා අඩමසක් කා අඩක් පාථෙය්‍යකොට පුතු සමග කතර එතරකරව,සි; ඕතොමෝත් මෙසේ කිව- හිමියනි සත්‍රියකවිසින් කළයුතු බොහෝවූත් යම් ඒ හූ කැවීම් ඇ කමියක් ඇතත් මෙවිට මාවිසින් එය කරනු නො හැක එනු මැන මා මරා අඩමසක් කා අඩක් පාථෙය්‍ය කොට පුතු සමග කතර එතරකරව, සි; ඉක්බිති හෙතෙම ඇට කියයි; සොදුර! මාගමකගේ මරණයෙන් දෙදෙනෙකුගේ මරණය පැනෙයි, යම්හෙයකින් ළදරු කුමර මවගෙන් වෙන්ව ජීවත්වන්ට නොහැක්කේද එහෙයිනි; ඉදින් වනාහි ඇපි ජීවත්වමෝනම් යලි දරුවෙකු ලබන්නෙමු. එකැතින් මෙවිට පුතුමරා මස්ගෙණ කතර එතරකරමු, සි; ඉක්බිති මවුතොමෝ පුත්‍රයාට දරුව; පියා වෙත යව,සි කිව; හෙතෙම ගියේය; ඉක්බිති ඕහට පියතෙමේ මාවිසින් පුතු පොෂණයකරන්නෙමැ,සි සිසැම් ගෙරි රුකිම් ඇවිසින් මද නොවූ දුක් විඳිනලද පුතු මරන්ට නො හැකි වෙමි, නී මැ නී පුතු මරව,සි කියා දරුව! මව් වෙත යව, සි කීය; හෙතෙම ගියේය; ඉක්බිති ඕහට මවුතොමෝත් පුතෙකු පතන්නාවූ මාවිසින් ගොවෘතකුකුරවෘතදෙවතායාචනාදිවිසින් ද පළමුකොට පමණකළ නො හැකි දුක් විඳිනලද; කුසින් උසුලන්නියවිසින් කියනු කිම? මම පුතු මරන්ට අසමර්ථවෙමි,සි කියා දරුව! පියා වෙතම යව,සි කිව; මෙසේ හෙතෙම දෙදෙනා අතර යන්නේ ම මෙලේය; ඔවුහු මළ ඔහු දැක වැළප සූත්‍රයෙහි කීනියෙන් මස් ගෙන කමින් සියාහුය. ඔවුන්ට ඒ පුත්‍රමාංශාහාරය නවකරුණකින් පිළිකුල්බැවින් **ක්‍රීඩාපිණිස** නො ම වෙයි, මද වැඩීම **පිණිස** නො වෙයි, මණ්ඩනය **පිණිස** නො වෙයි. **විභූෂණය පිණිස** නො වෙයි; හුදෙක් කතර **එතර කිරීම පිණිස** මැ වෙයි; කවර නවකරුණකින් පිළිකුල් වේද යත්? **සවජාතියමාංශයක් බැවින්, ඤාතිමාංශය බැවින්, පුත්‍රමාංශය බැවින්, ප්‍රියපුත්‍රමාංශය බැවින්, තරුණමාංශය බැවින්, අමුමස බැවින්, ගවරස රහිතබැවින්, ලුණුරහිතබැවින්, දුම් නොගන්වනලදබැවිනැ,සි කියාසි** එහෙයින් යම් මහණෙක් කවලීකාරාහාරය මෙසේ පුත්‍රමාංශය සමාන කොට දකිද හෙතෙම එහි නිකාන්තිය දුරුකෙරෙයි; මේ වනාහි පුත්‍රමාංශොපමාවෙනි අර්ථයොජනායි.

නිවවම්මහාවූපමා. නිශවම්ඛෙනූපමාවෙහි වනාහි ඕ දෙන්තොමෝ ග්‍රීවයෙහි පටන් කුර දක්වා පළමුකොට සම් උපුටා හරිනලද්දී යම් යම් තැනැක් ඇසුරුකොට සිටිද, පණුවන්විසින් කනු ලබන්නී යම්සේ දුකට ම භාජනවේද, එසේ සපඤ්ඤය ද යම් යම් වස්තුවක් හෝ අරමුණක් හෝ ඇසුරුකොට සිටිද, ඒ ඒ වස්තු රම්මණයෙන් හටගත්තාවූ වෙදනාදුඃඛයට ආධාරවූයේ ම වෙයි; එසේහෙයින් යම් මහණෙක් පහස්අහර මෙසේ සම්උපුල දෙනක හා සමානකොට දකිද, ඒ මහණ එහි නිකාන්තිය දුරුකෙරෙයි; මෝතොමෝ නිවවම්මහාවූපමාවෙහි අර්ථයොජනායි.

අඞ්ගාරකාසූපමා. අඞ්ගාරකාසූපමාවෙහි වනාහි ඕ අහුරු වළ යම් සේද මහත්වූ පරිදාහාඞ්ගයෙන් තුන් භ.ව යෝ එසේසි; නොයෙක් අත්වලින් ගෙන එහි ඇදහෙලන්නාවූ පුරුෂයෝ දෙදෙන යම්සේද භවයන්හි ආකර්ෂණයකරන අඞ්ගයෙන් මනස්සඤ්චේතනා එසේසි; එසේහෙයින් යම් මහණෙක් මනස්සඤ්චේතනාහාරය මෙසේ අහුරුවළකට ඇදහෙලන්නාවූ පුරුෂයන් සමානකොට දකිද හෙතෙම එහි නිකානතිය දුරුකෙරෙයි; අඞ්ගාරකාසූපමාවෙහි අඞ්ගයොජනා මෙසේසි.

සතතිසහාහතූපමා. සතතිසහාහතූපමාවෙහි වනාහි ඒ පුරුෂතෙමේ පෙරවරුකාලයෙහි යම් සැත්සියයකින් පෙළනු ලැබේද, ඒ සැත්සියය ඔහුගේ සිරුරෙහි වණමුව සියයක් කොට අතරු නො සිට විනිවිද පරහාගයෙහි ම හෙයි; අනිත් සැත්දෙසියය ද එසේ මැයි; මෙසේ හුනු අවකාශයෙහි නොහී ගියාවූ සැත්වලින් ඔහුගේ සියලු සිරුර කුදුමහත් සිදුරුවූවක්ම වෙයි; ඔහුගේ එක් ව්‍රණමුඛයෙක් හි දු උපන් දුඃඛයාගේ පමණෙක් නැති; තුන්වණමුවසියයෙහි කවර කථායැ? ඒ උපමාවෙහි සැත් හෙනකාලය මෙන් පිළිසඳ ද; වණමුව ඉපදීම මෙන් පස්කඳ ඉපදීමද; ව්‍රණමුඛයන්හි දුඃඛවේදනා ඉපදීම මෙන් උපන් සකඤ්ඤයන්හි වෘත්තමූලකනානාවිධදුඃඛයන්ගේ ඉපදීම ද දතයුතු. අනිත් ක්‍රමයක් කියනුලැබේ- සොරකම්කළපුරුෂයා මෙන් ප්‍රතිසන්ධිවිඤ්ඤාණය ද; ඔහුගේ සැත්වලින් හැනීමෙන් උපන් ව්‍රණමුඛයන් මෙන් විඤ්ඤාණප්‍රත්‍යයෙන් නාමරූපය ද; ව්‍රණමුඛයන් නිසා ඒ පුරුෂයාට කැකුළුදුක් ඉපදීම මෙන් නාමරූපප්‍රත්‍යයෙන් විඤ්ඤාණයාගේ දෙතිස්කම්කටුලු අවාන්තුරොගාදිවිසින් නන්වැදුරුම්වූ දුක් ඉපදීම ද දතයුතු. එහෙයින් යම් මහණෙක් විඤ්ඤාණාහාරය සැත්සියය හැනීමක් සමානකොට දකිද හෙතෙම එහි නිකානතිය දුරුකෙරෙයි; මෝ තොමෝ සතතිසහාහතූපමාවෙහි අඞ්ගයොජනායි.

හෙතෙම මෙසේ මේ ආහාරයන්හි නිකානතිය ක්ෂයකරන්නේ සතරආහාරයන්මපිරිසිඳැනගනී;ඒ සතරආහාරයන් පිරිසිඳැදන්කල්හි සියලු දතයුතු වසතුව පිරිසිඳා දන්නාලද්දේ ම වෙයි; මේ වදරනලද මැයි; භාග්‍යවතුන්වහන්සේ මහණෙනි! කවලීකාරාහාරය (ත්‍රිවිධපරිඤ්ඤාවෙන්) පිරිසිඳ දත්කල්හි පස්කම්ගුණයෙන් උපන් රාගය පිරිසිඳ දන්නාලද්දේ වෙයි, පඤ්චකාමගුණිකරාගය පිරිසිඳ දත්කල්හි යම් සංයොජනයකින් සංයුක්තවූ ආර්‍යශ්‍රාවකතෙම නැවත මේ ලොකයට ප්‍රතිසන්ධිවශයෙන් පැමිණෙන්නේද ඒ සංයොජනය නැති; මහණෙනි! සපර්‍යාහාරය පිරිසිඳ දත් කල්හි ත්‍රිවිධවේදනා පිරිසිඳ දත්තාහු වෙති, ත්‍රිවිධවේදනාවන් පරිඤ්ඤාතකල්හි ආර්‍යශ්‍රාවකයාවිසින් මත්තෙහි කටයුතු කිසිවක් නැතැ,යි කියම්; මහණෙනි! මනස්සඤ්චේතනාහාරය පරිඤ්ඤාත කල්හි ත්‍රිවිධතෘෂ්ණා පරිඤ්ඤාතවූවාහු වෙති, ත්‍රිවිධතෘෂ්ණා පරිඤ්ඤාතකල්හි

ආර්‍යශ්‍රාවකයාවිසින් මත්තෙහි කටයුතු කිසිවක් නැතැ, සි කියමි; මහණෙනි! විඤ්ඤාහාරය පරිඥතකල්හි නාමරූපය පරිඥතවූයේ වෙයි; නාමරූපය පරිඥතකල්හි ආර්‍යශ්‍රාවකයා විසින් මත්තෙහි කටයුතු කිසි වක් නැතැ, සි කියමි,සී.

තණ්හා සමුදයා ආහාර සමුදයෝ යනු පූර්‍වභවයෙහි තෘෂ්ණා වන්ගේ සමුදය හෙතුකොටගෙන පිළිසඳ දනවන්නාවූ ආහාරයන්ගේ සමුදය (වෙයි.) ඉපදීම වෙයි, යන අර්‍ථයි; කෙසේද යත්? පිළිසඳ කෙනෙහි ම ත්‍රිසන්තති විසින් උපන් සමනිස්රූපයන් ඇතුලත හට ගත්තාවූ ඔජාවක් ඇති, මෝතොමෝ තෘෂ්ණා ප්‍රත්‍යයෙන් උපන්නාවූ උපාදිණ්ණක කබළිඞ්කාරාහාරයයි; ප්‍රතිසන්ධි චිත්තය හා සම්ප්‍රයුක්තවූ සපර්‍ශ චෙතනා තොමෝ වනාහි තොමෝ ද චිත්තය ද විඤ්ඤය ද යන මොවුහු තෘෂ්ණා ප්‍රත්‍යයෙන් උපන්නාවූ උපාදිණ්ණක එස්ස මනෝ සඤ්චේතනා විඤ්ඤාණාහාරයෝ වෙත් යයි; මෙසේ පළමුකොට පූර්‍ව තෘෂ්ණා සමුදය හෙතුකොටගෙන ප්‍රතිසන්ධියට හිතවූ ආහාරයන්ගේ සමුදය දතයුතු. යම්හෙයකින් වනාහි මෙහි උපාදිණ්ණකවූ ද අනුපාදිණ්ණකවූ ද ආහාරයෝ මිශ්‍රකොට වදාරන ලද්දාහුද එහෙයින් අනුපාදිණ්ණකයන්ගේ ද මෙසේ තෘෂ්ණා සමුදයෙන් ආහාර සමුදය දතයුතු. අඞ්ගලොභ සහගත චිත්තයන් විසින් උපදවනලද රූපයන්හි ඔජාව ඇති මෝ ඔජාතොමෝ සහජාත තෘෂ්ණා ප්‍රත්‍යයෙන් උපන්නාවූ අනුපාදිණ්ණක කබළිඞ්කාරාහාරයයි; ලොභසහගත චිත්තයන් හා සම්ප්‍රයුක්තවූ ඵස්ස චෙතනාතොමෝ වනාහි තොමෝද චිත්තයද විඤ්ඤය ද යන මොවුහු තෘෂ්ණා ප්‍රත්‍යයෙන් උපන්නාවූ අනුපාදිණ්ණක ඵස්සමනෝ සඤ්චේතනා විඤ්ඤාණාහාරයෝ වෙත් යයි. **තණ්හා නිරෝධා ආහාර නිරෝධෝ** යනු උපාදිණ්ණකවූ ද අනුපාදිණ්ණකවූ ද ආහාරයන්ට ප්‍රත්‍යයවූ මේ තෘෂ්ණාවගේ නිරොධයෙන් ආහාරයන්ගේ නිරොධය පැනෙයි; සෙස්ස ඛීනය මැයි. මේ වනාහි (මතු කියනු ලබන්නේ) විශෙෂයයි- මෙහි චතුස්සත්‍යයෝ ම ස්වරූපයෙන් ම කියන ලද්දාහුය, මෙහි යම්සේද එසේ මෙයින් මත්තෙහි ද සියලු වාරයන්හි (කියනලද්දාහු) යයි, එහෙයින් සියලු තැන්හි නො මුළාවන්නහු විසින් සත්‍යයෝ උඩරණය කළයුත්තාහුය; තවද සියලු වාරයන්හි **එත්තාවතා පිඩෝ ආවුසෝ!** යන මේ දෙශනා නිර්‍යාතනය ඒ ඒ වාරයන්හි දෙසූ ධර්‍මයන්ගේ වශයෙන් යෙදිය යුතුයි, ඒ නිර්‍යාතනයාගේ පළමු කොට මෙහි මෝ යොජනායි- **එත්තාවතාපි** යනු මේ ආහාර දෙශනාවෙහි වදාළ මනසිකාර ප්‍රතිවෙධ වශයෙන් ද, යයි කියනලද වෙයි; සියලු තැන්හි මැ මේ ක්‍රමය වේ යයි.

ආහාර වණ්ණනා නිමි.

දැන් **සාධාවුසෝ**,යි පළමු නයින් ම තෙරුන්ගේ භාෂි
සත්‍යවණ්ණනා. තය පිළිගෙන අනුමෝදන්ව ඒ භික්ෂූහු මත්තෙහි
ප්‍රශ්න විචාළාහුය; තෙරණුවෝ ද ඔවුන්ට අන් ක්‍රම
යකිනුදු ප්‍රකාශකළහ; මෙයින් මතු සියලු වාරයන්හිම මේ ක්‍රමයයි.
එහෙයින් මෙයින් මතුයෙහි මෙබඳු වචනයන් ආමඹිණය නො කොට
යම් යම් ක්‍රමයකින් ප්‍රකාශකෙරේද ඒ ඒ ක්‍රමයාගේ ම අරුත් වණ්නා
කරන්නෙමු; මේ වාරයාගේ වනාහි සංක්ෂෙප දෙශනාවෙහි **දුක්ඛසච්ච
පඤ්ඤාතානි,** යන මෙහි **දුක්ඛං**= දුඃඛ සත්‍යය; විසතර දෙශනාවෙහි
වනාහි යමක් කියයුතු වන්නේද ඒ සියල්ල විශුඬි මාර්ගයෙහි සත්‍ය
නිර්දේශ යෙහි කියනලද්දේ ම වේයයි.

සත්‍යවාර වණ්ණනා නිමි.

මෙයින් මත්තෙහි ප්‍රතීත්‍ය සමුත්පාද වශයෙන්
ජරා මරණ වණ්ණනා. දෙශනා තොමෝ වෙයි; එහි පළමුකොට ජරා
මරණ වාරයෙහි **නෙසං නෙසං** යන මෙය
සංක්ෂෙපයෙන් නොයෙක් සත්වයන්ගේ සාධාරණ නිර්දේශය, යි දත
යුතු; දෙවදත්තයාගේ යම් දිරීමක් වේද සොමදත්තයාගේ යම් දිරී
මක් වේද,යි මෙසේ වනාහි දවසකුත් කියන්නහුට **සත්වයෝ** කෙළ
වරීමට නො ම යෙත්, මේ දෙපදයෙන් වනාහි කිසි සත්වයෙක් ඇතු
ලත්කොට නො ගන්නා ලද්දේ නො වෙයි; එහෙයින් මේ සංක්ෂෙප
යෙන් නොයෙක් සත්වයන්ගේ සාධාරණ නිර්දේශය,යි කියනලදී; **නාමඤ්
නාමඤ්** යන මෙය ගති ජාති වශයෙන් නොයෙක් සත්ව නිකායයන්ගේ
සාධාරණ නිර්දේශය,යි,. **සත්තනිකායෙ** යනු සාධාරණ නිර්දේශයෙන්
දක්වන ලද්දහුගේ සවරූපයෙන් දැක්වීමයි; **ජරාජීරණතා** යනාදියෙහි
වනාහි **ජරා** යනු සවභාව නිර්දේශය,යි; **ජීරණතා** යනු ආකාර නිර්දේශ
ය,යි; **ඛණ්ඩිච්චං** යනාදීහු කල්‍යාමෙහිදී කෘත්‍යනිර්දේශයෝයි; පසුවකී
පදදෙක ප්‍රකෘති නිර්දේශයෝයි; ඒ එසේමැය- මෝ ජරාතොමෝ **ජරා**
යන මේ පදයෙන් සවභාව වශයෙන් දක්වන ලදුය, එහෙයින් මේ
"**ජරා**" යන පදය ඒ ජරාවගේ සවභාව නිර්දේශය,යි; **ජීරණතා**, යන
මේ පදයෙන් ආකාරවශයෙන් (ජරා තොමෝ) දක්වන ලදුයෑ, එහෙ
යින් මේ පදය ඒ ජරාවගේ ආකාර නිර්දේශය, යි; **ඛණ්ඩිච්චං** යන මේ
පදයෙන් කල්ඇවෑමෙහි දත් නියපොත්තන්ගේ කැඩුනුබව කරන
කිසවිසින් (ජරාතොමෝ දක්වන ලදුයෑ;) **පාලිච්චං**, යන මේ පදයෙන්
කෙශ රොමයන්ගේ පැ සුනුබව කරන කිස විසින් (ජරා දක්වනලදුදු;)
වලිතත්තචතා, යන මේ පදයෙන් මස් වියලවා සිවියෙහිද රැළිනැඟීම්
කරනකිසවිසින් (ජරාතොමෝ) දක්වන ලදුයෑ; එහෙයින් මේ **ඛණ්ඩිච්චං**
යනාදි පදතුන කල්ඉක්මීමෙහි ඒ ජරාවගේ කෘත්‍යනිර්දේශයෝයි; ඒ
පද තුනෙන් මේ විකාරයන් දැක්වීම් වශයෙන් ප්‍රකටවූ ප්‍රකට ජරා

තොමෝ දක්වනලදු; තවද ජලයාගේ හෝ වාතයාගේ හෝ වහ්නි යගේ හෝ තණරුක් ආදීන්ගේ භාත්පසින් සිදබිඳගිය බැවින් හෝ දුහියබැවින් හෝ ගිය මඟ යම්සේ ම ප්‍රකටවූයේ වේද; ඒ ගිය මඟ ඒ උදකාදීහු ම නො ද වෙත්ද; එසේ ම ජරාව විසින් දත් ආදීන්හි කැඩුනුබැව් ඇවිසින් ගියමඟ ප්‍රකටවූයේ ඇසදල්වාත් අරමුණු වශයෙන් ගන්නා ලැබෙයි; කැඩුනුබැව් ආදීහු ජරානොමෝ නො ද වෙති; ඒ එසේ මැය-ජරානොමෝ චක්ඛුර්විඤ්ඤනයෙන්දතයුතුවූවක්නොවෙයි; **ආයුනෝ සංහානි ඉන්ද්‍රියානං පරිපාකෝ,** යන මේ පදයන්ගෙන් වනාහි කල් ඉකුත් වීමෙහි ම අභිව්‍යක්තවූ (= අතිශයින් ප්‍රකටවූ) ආයුස පිරිහීම් චක්ඛුරාදි ඉන්ද්‍රියයන්ගේ පිරිපැසීම් සඞ්ඛ්‍යාතවූ ප්‍රකෘති වශයෙන් ජරා නොමෝ දක්වන ලදුයෑ; එහෙයින් මේ පසුව කී දෙපදය ඒ ජරාවගේ ප්‍රකෘති නිර්දේශයෝය,යි දතයුත්තාහුය; ඒ ජරානිර්දේශයෙහි යම් හෙයකින් ජරාවට පැමිණියහුගේ ආයුසය (=ජීවිතෙන්ද්‍රියය) පිරිහේද එහෙයින් ජරානොමෝ **ආයුනෝ සංහානි** (=ආයුහුගේ පිරිහීම) යයි එලොපවාරවශයෙන් වදරණ ලද්දීය; තවද යම්හෙයකින් තරුණ කාලයෙහි වෙසෙසින් පහන්වූ (එහෙයින්ම) සියුම්වූ ද තමහට විෂයවූ අරමුණ සුවසේම ගැනීමට සමර්ථවූ චක්ඛුරාදි ඉන්ද්‍රියයෝ ජරාවට පැමිණියහුගේ මිහිකිරීමටහියාහු කැළඹුනාහු නො පැහැදුනාහු (එහෙයින්ම) ඕඳරිකවූත් තමහට විෂයවූ අරමුණ ගන්ට අසමර්ථවූවාහු වෙත්ද එහෙයින් **ඉන්ද්‍රියානං පරිපාකෝ** (=ඉඳුරන්ගේමිහිකිරීම) යයි ද එලොපචාර වශයෙන් ම වදරන ලද්දීය. මෙසේ දක්වන ලද සියලු ම ඕ ජරා නොමෝ වනාහි ප්‍රකටජරාය ප්‍රතිවඡ්ඡන්න ජරාය,යි විවිධ වෙයි; ඔවුනතුරෙහි දන්නාදීන්හි ඛණ්ඩ භාවාදිය දක්නාලබන හෙයින් රූපධර්මයන්හි මෝනොමෝ ප්‍රකටජරානමු; එතකුදුවුවත් අරූපධර්මයන්හි **විවිධ ජරා.** ජරානොමෝ එබදුවූ විකාරයක්හුගේ නොදැක්ම හෙයින් ප්‍රතිවඡ්ඡන්නජරා නමු; නැවත අච්චිජරාය සච්චිජරාය,යි මෙසේත් විවිධ වෙයි; ඒ වෛවිධ්‍යයෙහි මිණිකනා රිදී පබළු සඳ හිරු ආදීන්ගේ මෙන්ද මඳ දඟකාදි අවස්ථාවන්හි ප්‍රාණීන්ගේ මෙන් ද මල් පල පලු ආදි අවස්ථාවන්හි අප්‍රාණීන්ගේ මෙන් ද අතරතුරු වණ්ණ විශෙෂාදීන්ගේ නොදතහැකි බව හෙයින් ඕ ජරා නොමෝ අච්චි ජරා නමු, නිරන්තරජරායැ යන අර්ථයි; ඒ මිණිකනා ඇ වස්තූන්කෙරෙන් අන්‍යවූ යථොක්ත දන්නාදීන්හි අතරතුරු වණ්ණවිශෙෂාදීන්ගේ සුවසේ දතහැකිබව හෙයින් ඕ ජරානොමෝ සච්චිජරා නමැ, යි දතයුතු

මෙයින් මතුයෙහි **නෙසං නෙසං,** යනාදිය කී නියයෙන් ම දතයුතු. **චුති වචනතා,** යනාදියෙහි වනාහි **චුති** යනු ව්‍යුතවීම් වශයෙන් කියනු ලැබේ;එකසඤ්ඤ චතුසඤ්ඤ පඤ්චසඤ්ඤ යන්ට මේ (ව්‍යුති යනු) සාමාන්‍ය වචනයෙකි. **වචනතා** යන භාවප්‍රත්‍යය යුක්ත වචන්යෙන්

ලක්ෂණ දුක්ඛිමයි; **භෙදෙ** යන වචනයෙන් ව්‍යුතිසඤ්ඤියන්ගේ භඞ්ගය පිළිබඳ පැවැත්ම දුක්ඛිමයි; **අන්තරධානං** යනු බුන් සටයාගේ මෙන් භින්නවූ ව්‍යුති සඞ්ඛ්‍යාත සඤ්ඤියන්ගේ යම් කිසි පරිද්දෙකින් නො පැවැත්ම දුක්ඛිමයි; **මච්චුමරණං** යනු මෘත්‍යු සඞ්ඛ්‍යාතවූ මරණය; ඒ වචනයෙන් සමුච්ඡේද මරණාදියවළඤ්ඤයි, **කාල** නම්; අන්තඤයැ; ඔහුගේ ක්‍රියාව **කාල කිරියා** නම; මේ වචනයෙන් ලොක සම්මුති වශයෙන් මරණය දක්වයි; මෙවිට පරමාර්ථය දක්වන්ට **ඛන්ධානං භෙදෙ,** යනාදිය වදාළහ. ඒ එසේ මැයි- පරමාර්ථ වශයෙන් සඤ්ඤිත්‍වා තුමූ ම බිඳෙති, කිසි සත්වයෙක් නම් නො මැරෙයි; සඤ්ඤියන් බිඳෙන කල්හි සත්වයා මැරෙයි කියාද බිදුනුකල්හි මළේය,යි කියාද ව්‍යවහාරය වෙයි; මේ දෙපදයන් අතුරෙහි චතුවොකාර පඤ්චවොකාරභවයන්ගේ වශයෙන් සඤ්ඤියන්ගේ බිඳීම දතයුතු; එකවොකාරභවයාගේ වශයෙන් කලෙවරයාගේ නික්ඛෙපය (=ශරීරය බහාතැබීම) දතයුතු; නොහොත් චතුවොකාරභවයාගේ වශයෙන් සඤ්ඤියන්ගේ බිඳීම ද; ශෙෂවයාගේ වශයෙන් කලෙවරයාගේ නික්ඛෙපය ද දතයුතුයි; කුමක්හෙයිනැ යත්? එකපඤ්චවොකාර භවවයෙහි ම රූපකාය සඞ්ඛ්‍යාතවූ කලෙවරයාගේ සම්භවය හෙයිනි; නොහොත් යම්හෙයකින් චාතුම්හාරාජිකාදින්හි සඤ්ඤියෝ බිඳෙත්ම වෙත්ද කිසිවක් බහා නොලත්ද එහෙයින් ඔවුන්ගේ වශයෙන් සඤ්ඤියන්ගේ භෙදය දතයුතු; මනුෂ්‍යාදින් කෙරෙහි කලෙවරයාගේ නික්ඛෙපය දතයුතු; මෙහි දු කලෙවරයාගේ බහා තැබීම් කරුණෙන් ම මරණයතෙමේ "කලෙබරස්ස නික්ඛෙපො, යි කියනලදුයි මෙසේ අර්ථය දතයුතු; **ඉති අයඤ්ච ජරා ඉදඤ්ච මරණං ඉදං වුච්චනාවුසො** යන මේ දෙක ම එක් තැන් කොට "ජරා මරණ,, යයි කියනු ලැබේ; සෙස්ස කි ක්‍රමය ම වේ යයි.

ජරා මරණ වණ්ණනා නිමි.

ජාතිවණ්ණනා. ජාතිවාරයෙහි **ජාතිසඤ්ඤාති,** ඇත්තාදී තැන්හි ඉපදීම් අර්ථයෙන් **ජාති,** නමුදු; ඕ **ජාතිතොමෝ** නො පිරිපුන් ආයතන ඇත්තවුන්ගේ වශයෙන් කියනලදුදු; මොනවට ඉපදීම් අර්ථයෙන් **සඤ්ඤාති,** නමුදු; ඕ තොමෝ පිරිපුන් අවයව ඇත්තවුන්ගේ වශයෙන් කියනලදුදු; ඔවුකුසට පිවිසීම් අර්ථයෙන් **ඔක්කන්තිති,** නමුදු; ඕ තොමෝ අණ්ඩජ ජරායුජ යෝනීන්ගේ වශයෙන් කියනලද; ඔවුහු වනාහි අණ්ඩකොෂයෙහි ද වස්තිකොෂයෙහි ද පිළිසඳගන්නාහු පිවිසෙන්නවුන් මෙන් පිළිසඳ ගනිත්; ප්‍රකටවූ ඉපදීමය යන අර්ථයෙන් **අභිනිබ්බත්තිති,** නමුදු; ඕ තොමෝ සංසෙවදජ ඔපපාතික වශයෙන් වදාරනලදුදු; ඔවුහු වනාහි ප්‍රකටවූවාහුම වී උපදිති; මෝ පළමුකොට දක් වනලද්දී ව්‍යවහාර දෙශනායි. මෙවිට පරමාර්ථදෙශනා තොමෝ ම වෙයි

පරමාර්ථවශයෙන් සකඛයෝ ම පහළ වෙති, සත්ත්ව යෙක් පහළ නො වෙති, ඒ පරමාර්ථ දෙශනාවෙහි **ඛන්ධානං** යනු එකවොකාර භවයෙහි එක් රූපසඛන්ධියාගේ ගැනීම ද චතුවොකාර භවයෙහි (වේදනා දිවූ) චතුසඛන්ධියන්ගේ ගැනීම ද පඤ්චවොකාර භවයෙහි පඤ්චසඛන්ධියන්ගේ ම ගැනීම ද දතයුතුයි; **පාතුභාවෝ**= ඉපදීම; **ආයතනානං** යන මේ පදයෙහි ඒ ඒ භවයෙහි උපදනාවූ ආයතනයන්ගේ වශයෙන් සඞ්ග්‍රහය දතයුතු, **පවත්තියා** සන්තතියෙහි (–පැවැත්වෙළ නොසිඳ පැවැත්මෙහි) පහළවීම; ඒ එසේමැයි– පහළවන්නාවූ ම ඒ ආයතනයෝ ප්‍රතිලබ්ධවූවාහු නම් වෙති, **අයං වුච්චතාවුසෝ ජාති** යන මේ පදයෙන් ව්‍යවහාර විසින්ද පරමාර්ථ විසින්ද දෙසූ ජාතියගේ නිගමනය කෙරෙති, **භවසමුදයා** යන මෙහි වනාහි ජාතියට ප්‍රත්‍යයවූ කර්මභවය දතයුතු, සෙස්සකි නය මැයි.

ජාති වර්ණනා නිමි.

භවවර්ණනා. භවවාරයෙහි **කාමභවෝ** යනු කර්මභවය ද උපප්‍රාප්ති භවය ද; ඒ විවිධ භවයන් අතුරෙහි "කාමභව,, නම්? කාමභවයට පැමිණෙන්නාවූ කර්මය මැයි; ඒ එසේමැයි– ඒ කර්මභවය උපප්‍රාප්තිභවයට කරුණුබැවින් **සුඛා ඛුඛානං උප්පාදෙ දුක්ඛා පාපස්ස උච්චයෝ** යනාදිහු මෙන් ඵලව්‍යවහාරයෙන් භවය, යයි කියනලද "උපපත්තිභව,, නම්? ඒ කර්මයවිසින් උපදවනලද උපාදිණ්ණඛන්ධපඤ්චකයයි; සැබව– ඒ උපාදිණ්ණඛන්ධපඤ්චකය ඒ (එකවොකාරාදි) භවයෙහි වේ යයි කොට භවය,යි කියනලද. මෙසේ සම්ප්‍රකාරයෙන් ම මේ (කාමභවූපගවූ) කර්මය ද (උපාදිණ්ණඛන්ධපඤ්චකය,යි කියනලද) **උපප්‍රාප්තිය** ද මේ දෙකම් මේ භවනිර්දේශයෙහි කාමභවය,යි කියනලදැ; රූපාරූපභවයන්හි ද මේ ක්‍රමයයි. **උපාදානසමුදයා** යන මෙහි වනාහි උපාදානය කුශලකර්මභවයට උපනිශ්‍රයවශයෙන් ම ප්‍රත්‍යය වෙයි; අකුශලකර්මභවයට උපනිශ්‍රයවශයෙන් ද සහජාතාදීන්ගේ වශයෙන් ද ප්‍රත්‍යය වෙයි; සියලු ම උපප්‍රාප්තිභවයට වනාහි උපනිශ්‍රයවශයෙන් ම ප්‍රත්‍යය වෙයි; සෙස්ස කී ක්‍රමයමැ,යි.

උපාදානවර්ණනා. උපාදානවාරයෙහි **කාමූපාදානං** යනාදි කැන්හි මේ කාරණකොටගෙන වස්තුසඞ්ඛ්‍යාතකාමය දැඩිකොට ගනිත්, තෙමේ හෝ ඒ වස්තුකාමයදැඩිකොට ගනිත්,යි "කාමූපාදාන,, නම; කාමවූයේත් හේ,යැ උපාදානවූයේත් හේ නු,යි හෝ කාමූපාදාන නම් වේ; **උපාදානං** යි, දැඩිකොට ගැනීම කියනුලැබේ; ඒ එසේමැ,ය මෙහි "උප,, ශබ්දයතෙමේ දෘඪතාදීයැ "උපායාස,, "උපක්කුඨ,, යනාදියෙහි මෙනි; (කාමූපාදාන යන) මේ වචනය පඤ්චකාමගුණිකරාගයට නමකි. මේ කියනලද්දේ මෙහි සංක්ෂෙපයයි– මෙය විස්තරවශයෙන් වනාහි **තත්ථ කතමං කාමූපාදානං? යෝ කාමෙසු කාමච්ඡන්දෝ,** යි

වදුලනියෙන් ම දතයුතු, එසේ ම **දෘෂ්ටිවූවාත් ඕතොමෝයැ**; උපාදාන වූවාත් ඕතොමෝ නුයි **දිෂ්ඨුපාදාන නම**; නොහොත් **දෘෂ්ටිය දැඩිකොට** ගනී, හෝ මේ **කරණකොටගෙන දෘෂ්ටිය දැඩිකොට** ගනිත් නුයි "දිෂ්ඨුපාදාන,, නම; සැබව- පළමු ගත් **මිථ්‍යාදෘෂ්ටිය පසුවගත් දෘෂ්ටි** තොමෝ දැඩිකොට ගනී; තවද (**සත්‍යයෝ**) පසුවගත් දෘෂ්ටිය පළමු දෘෂ්ටිය කරණකොටගෙන දැඩිව ගනිත්; වදුලේ මැ, නු- **සස්සතෝ අත්තා ච ලෝකෝ ච ඉදමේව සච්චං මොඝමඤ්ඤං** යනාදිය මේ (දිෂ්ඨුපාදාන යන වචනය) ශීලව්‍රතොපාදානආත්මවාදොපාදානයන් තොර කොටඇති සියලු දෘෂ්ටිගතයහට නමකි; මේ මෙහි සංක්ෂෙපය,යි. විස්තර වශයෙන් වනාහි මේ පදය **තත්‍ථ කතමං දිෂ්ඨුපාදානං? නත්ථි දින්නං**, යි වදුලනියෙන්ම දතයුතු. එසේ ම මේ **කරණකොටගෙන** (**සත්‍යයෝ**) ශීලව්‍රතය දැඩිකොටගනිත්, තෙමේ හෝ ඒ මිථ්‍යාදර්‍ශනය දැඩිකොට ගනී නුයි නොහොත් ශීලව්‍රතවූයේත් හේ යැ, උපාදානවූයේත් හේ නු,යි **සීලබ්බතූපාදාන නම**; ගොසීලගොව්‍රතාදීහු ම මෙසේ ගුඩිය වේය, යි අභිනිවෙශය කරන්නහුට තුබූ ම උපාදානයෝ නම් වෙති; මේ මෙහි සංක්ෂෙපය,යි. විස්තරවශයෙන් වනාහි මෙය **තත්‍ථකතමං සීලබ්බතූපාදානං? ඉධෙකච්චෙ බාහිරා සමණබ්‍රාහ්මණානං සීලෙන සුද්ධි** යි වදුලක්‍රමයෙන් ම දතයුතු. එපරිද්දෙන් මේ කරණකොටගෙන **සත්‍යයෝ** කියත්නු,යි **වාද නම**; මේ කරණකොටගෙන **දැඩිකොට** ගනිත්නුයි **උපාදාන නම**; කුමක් කියත්ද? **දැඩිකොට** හෝ ගනිත්ද යත්? ආත්ම යයි; ආත්මයාගේ **වාදය** (=ප්‍රකාශයව කරුණුවූවක්) **දැඩිකොටගැනීම අත්තවාදුපාදාන නම**; ආත්මය යන වචනමාත්‍රය ම හෝ **මේ කරණ කොටගෙන ආත්මයයි දැඩිකොට** ගනී නු,යි **ආත්මවාදොපාදාන නම**; මේ ("අත්තවාදුපාදාන,, යනු) විංශතීවස්තුකවූ **සත්කායදෘෂ්ටියට නමකි**; මේ මෙහි (දක්ඛිණලද්දුයේ) **සංක්ෂෙපය,යි. විස්තරවශයෙන් වනාහි මේ ආත්මවාදොපාදානය තත්‍ථ කතමං අත්තවාදුපාදානං? ඉධ අස්සුතවා පුථුජ්ජනෝ අරියානං අදස්සාවී** යි වදුල **ක්‍රමයෙන් ම දත යුතුයි. තණ්හා සමුදයා** යන මෙහි තෘෂ්ණාතොමෝ **කාමොපාදාන** යට උපනිශ්‍රයවශයෙන් හෝ අනන්තර- සමනන්තර-නත්ථි-විගත-ආසෙවනවශයෙන් හෝ ප්‍රත්‍යය වෙයි; සෙසු උපාදානයන්ට **වනාහි** සහජාතාදිවශයෙන් ද ප්‍රත්‍යය වෙයි. සෙස්ස කීනය මැ,යි.

තණ්හාවණ්ණනා. තණ්හාවාරයෙහි **රූපතණ්හා** -පෙ- **ධම්මතණ්හා** යන මෙය චක්ෂුර්වාරාදීන්හි ජවන්වීථියෙහි පැවති තෘෂ්ණාවට සිටුපිත්යැ බමුණුපිත්යැ යන මේ ආදියෙහි පියාකෙරෙන් **ආ නාමය** මෙන් පියා වැනිවූ අරමුණකෙරෙන් **ආ නමෙකි**; මෙහිදු රූපය අරමුණුකොට ඇති තෘෂ්ණා තොමෝ රූපයෙහි තෘෂ්ණා වනු,යි **රූපතණ්හා** නමුදු; ඕ රූපතෘෂ්ණාතොමෝ කාමරාගභාවයෙන් රූපාරම්මණය ආස්වාදනයකරමින් පවත්නී **කාමතණ්හා** නමුදු; **ශාශ්වත**

දෘෂ්ටිසහගතවූ රාගභාවයෙන් රූපය නිත්‍යයැයි වශ ශාශ්වතය,යි මෙසේ ආස්වාදනයකරමින් පවත්නී **භවතණ්හා** නමු; උච්ඡේදදෘෂ්ටිසහගතවූ රාගභාවයෙන් රූපාරම්මණය සිදෙයි නැසෙයි පරලොව නොවන්නේය,යි මෙසේ ආස්වාදනයකරමින් පවත්නී **විභවතණ්හා** නමැ යි මෙසේ ත්‍රිවිධ වෙයි; රූපතෘෂ්ණාතොමෝ යම්සේද ශබ්දතෘෂ්ණාදීහු ද එසේ වෙති; මෙසෙයින් මොවුහු අටලොස් තෘෂ්ණාවන්ගේ විවරිතයෝ වෙති; ඔහු අටලොස්දෙන අධ්‍යාත්මරූපාදියෙහි අටලොසෙක, බාහ්‍ය රූපාදියෙහි අටලොසක්,යි **සතිසක්** වෙති; මෙසේ (මේ ක්‍රමයෙන්) අතීතවූවාහු (=ඤාණත්‍රයට පැමිණියාහු) සතිසෙක අනාගතවූවාහු (=ඤාණත්‍රයට නො පැමිණියාහු) සතිසෙක, ප්‍රත්‍යුත්පන්නවූවාහු (=ඤාණත්‍රයෙහි පවත්නාහු) සතිසෙක,යි එක්සියඅටක් වෙති; නොහොත්- **අජ්ඣත්තික්ඛන්ධෙසුපාදාය අස්මීති සති ඉත්ථස්මිං හොති**- යන මේ ආදිවූ ආධ්‍යාත්මිකරූපාදිය ඇසුරුකළාහු අටලොසෙක; **බාහිරක්ඛන්ධෙසුපාදාය ඉමිනා අස්මීති සති ඉමිනාඉත්ථස්මිං හොති** යි බාහ්‍යරූපාදිය ඇසුරු කළාහු අටලොසක්,යි සතිසක් වෙති; මේ නයින් අතීතයෝ සතිසෙක අනාගතයෝ සතිසෙක ප්‍රත්‍යුත්පන්නයෝ සතිසෙක,යි මෙසේත් එක් සියඅටක් තෘෂ්ණාවිචරිතයෝ වෙති; යලි සඞ්ග්‍රහ කරනලබනකල්හි රූපාදි ආරම්මණයන්හි සයක් ම තෘෂ්ණාකායයෝ ද තුනක්ම කාම තෘෂ්ණාදීහු ද වෙත් යයි; මෙසේ-

79. නිද්දෙසපදේන නිද්දෙස විත්ථාර විත්ථරස්ස ච
පුන සඞ්ගහතෝ තණ්හා විඤ්ඤාතබ්බා විභාවිනා යි.

වේදනා සමුදයා යන මෙහි වේදනාහි **වෙදනා**,යි විපාකවේදනා තොමෝ අදහස්කරනලද්දීය; ඕතොමෝ සදෙර තෘෂ්ණාවට ප්‍රත්‍යය කෙසේ වේද යත්? ආස්වාදකළයුතුබැවිනි; සැබව සුඛවේදනාවෙහි ආස්වාදනය හෙතුකොටගෙන සත්වයෝ ඒ වේදනාවට මමත්වය කරන්නාහු වේදනාවෙහි තෘෂ්ණාව උපදවාසුඛවේදනාරාගයෙන් රක්තයෝවැ චක්ෂුර්වාරයෙහි ඉෂ්ටවූ ම රූපයක් ප්‍රාප්තනා කෙරෙති; නැවත ලද්දහු එය අස්වාදනය කෙරෙති; සුවඅරමුණු දෙන්නාවූ සිත්කරු ආදීන්ට ද සත්කාර කෙරෙති; එපරිද්දෙන් ශ්‍රොත්‍රද්වාරාදියෙහි ඉෂ්ටවූ ම ශබ්දාදින් ප්‍රාප්තනා කෙරෙති; ලද්දහු ද ඒ ශබ්දාදින් ආස්වාදනය කෙරෙති; ආලම්බනදර්ශකවූ චිණ්ණවාදකය සුවඳකරුය අරක්ඇමිය පෙහෙරුය විවිධශිල්පසන්දර්ශකය යනාදීන්ට ද සත්කාර කෙරෙති; කුමක්මෙන්ද යත්? පුත්‍රස්නේහයෙන් පුතුට මමත්වය කරන්නාහු කිරිමවටද යම්සේ

---

79. **නිද්දෙසපදේන**= නිර්දේශාර්ථයෙහි වූ තණ්හාශබ්දයෙන්; **නිද්දෙස විත්ථාර**= නිර්දේශවිස්තාරවශයෙන් ද; **විත්ථරස්ස ච**= විස්තාරවූවහුගේත් **පුන**= නැවත; **සඞ්ගහතෝ**= සඞ්ග්‍රහවශයෙන් ද; **විභාවිනා**= නුවණැත්තහු විසින් **තණ්හා**= තෘෂ්ණාතොමෝ; **විඤ්ඤාතබ්බා**= දතයුත්තීය.

සතකාරකෙරෙත්ද සැපවූ ගිතෙල්කිරිආදිය ම ඇට පොවත්ද වළඳවත්ද එමෙන් සෙස්ස කීනයමැ, සි.

වෙදනාවණ්ණනා. වෙදනාවරයෙහි **වෙදනාකායා**= වෙදනා සමූහයෝ; **චක්ඛුසම්ඵස්සජා වෙදනා** -පෙ- **මනොසම්ඵස්සජා වෙදනා** යන මේ නාමය **චක්ඛුසම්ඵස්සජාවෙදනා අත්ථි කුසලා අත්ථි අකුසලා අත්ථි අව්‍යාකතා** යි මෙසේ විභඞ්ගයෙහි ආබැවින් චක්ෂුර්වාරාදියෙහි පැවති කුශලාකුශලාව්‍යාකෘත වෙදනාවන්ට ශාරිපුත්‍රය මහතා ණිපුත්‍රය යන මේ ආදිනාමයන්හි මවුකෙරෙන් ආ නාමය මෙන් මාතෘසමානවූ වසතුවකෙරෙන් ආ නාමයකි, මෙහි වචනීය වනාහි චක්ෂුඃසංසර්ශහෙතුවෙන් උපන් වෙදනාතොමෝ **චක්ඛුසම්ඵස්සජා වෙදනා** නමු; සියලු තැන්හි මේ ක්‍රමයයි; මෝ පළමුකොට දක්වන ලද්දී සමීසංග්‍රාහිකා කථායැ. විපාකවශයෙන් චක්ෂුර්වාරයෙහි චක්ෂුර්ඥානයෝ දෙදෙනය මනොධාතුහු දෙදෙනය මනොවිඤ්ඤාණධාතුහු තිදෙන යන මොවුන් හා සම්ප්‍රයුක්තවශයෙන් (චක්ඛුසම්ඵස්සහෙතුවෙන් උපන්) වෙදනාතොමෝ දතයුතු; ශ්‍රොත්‍රවාරාදියෙහි ද මේ ක්‍රමයයි; මනොවාරයෙහි මනොවිඤ්ඤාණධාතුසම්ප්‍රයුක්තවූ වේදනාව මැ,යි. **එස්ස සමුදයා** යන මෙහි වනාහි පඤ්චවාරයෙහි සහජාතචක්ඛුසම්ඵස්සාදීන්ගේ සමුදයහෙතුකොටගෙන පඤ්චවසතුකවෙදනාවන්ගේ සමුදය වෙයි; අවශෙෂයන්ට චක්ඛුසම්ඵස්සාදීහු උපනිශ්‍රයාදිවශයෙන් ප්‍රත්‍යය වෙති; මනොවාරයෙහි තදාලම්බනවෙදනාවන්ගේ ද අවාරිකවූ ප්‍රතිසන්ධිභවාඞ්ගව්‍යුතිවෙදනාවන්ගේ ද සහජාතවූ මනොසම්ඵස්සසමුදය හෙතුකොටගෙන පහළවීම වේය,යි දතයුතු. සෙස්ස කීනයමැ,යි.

සඵස්සවණ්ණනා. එස්සවාරයෙහි **චක්ඛුසම්ඵස්සෝ** ඇසෙහි සඵස්ස; සියලු තැන්හි මේ ක්‍රමයයි; **චක්ඛුසම්ඵස්සෝ- කායසම්ඵස්සෝ**,යි මෙතෙක් වචනයෙන් ද කුශලවිපාක අකුශලවිපාකවූ පඤ්ච වසතුකවූ සඵස්සයෝ දස්දෙන වදාරනලද්දාහු වෙති; **මනොසම්ඵස්සෝ** යන මේ වචනයෙන් සෙසු දෙවිසි ලෞකික විපාකයන් හා **එකොතපාදිභාවයෙන්** සම්ප්‍රයුක්තවූ සඵස්සයෝ වදාරනලදහුය. **සළායතන සමුදයා** යනු චක්ෂුරායතනාදිවූ ෂඩායතනයන්ගේ හටගැනීම හේතු කොටගෙන මේ සැවැදෑරුම්වූ ම සඵස්සයාගේ හටගැනීම වේය,යි දතයුතු. සෙස්ස කීනයඇත්තේ ම වේය,යි.

ෂඩායතනවණ්ණනා සළායතනවාරයෙහි **චක්ඛායතනං** යනාදි පදයන්හි යම්ක් කියයුතුද ඒ සියල්ල විභඞ්ගාගීයෙහි සකඛන්ධනිද්දේශයෙහි හා ආයතනනිද්දේශයෙහි ද කීනය මැ,යි. **නාමරූප සමුදයා** යන මෙහි වනාහි යම් නාමයකුත් යම් රූපයකුත් යම් නාම රූපයකුත් ඒ ආයතනයට ප්‍රත්‍යය වේද ඒ නාමරූපයාගේ වශයෙන් විභඞ්ගාගීයෙහි ප්‍රතීත්‍යසමුත්පාදනිද්දේශයෙහි කීක්‍රමයෙන් නාමරූප

යන්ගේ හටගැනීමෙන් ෂඩායතනයන්ගේ හටගැනීම දතයුතු. සෙස්ස උක්තප්‍රකාර ම වේය,යි.

නාමරූපවණ්ණනා. නාමරූපවාරයෙහි නැමීම ලක්ෂණකොට ඇත්තේ **නාම** නම; බිඳීම ලක්ෂණකොට ඇත්තේ **රූප** නම; ඒ නාමරූපයාගේ විත්ථාරවාරයෙහි වනාහි **වේදනා** යනු වෙද නාසඤ්ඤියයි; **සඤ්ඤා** යනු සඤ්ඤාඤ්ඤියයි; චේතනාය සපයීය මනසඤා රය යන මොහු **සඞ්ඛාරක්ඛන්ධ**, යයි දතයුතු. තවද එකාන්තයෙන් **සංඛාරසඤ්ඤාසඞ්ගහිතවූ** ධර්මයෝ වෙති, එතකුදුවුවත් මොහු තිදෙන **සීලදුශීලවූවිත්තයන්හි** පවා (යම්හෙයකින්) වෙත්ද එහෙයින් මොවුන් ගේ ම වශයෙන් මෙහි සංඛාරසඤ්ඤය දක්වනලදැ: **චත්තාරි මහා භූතානි,** යන මෙහි '**චත්තාරි** යනු ගණනපරිච්ඡේදයයි; **මහාභූතානි** යනු පෘථිව්‍යප්තේජෝවායූහී යන මොහුයි; යම් කරුණෙකින් වනාහි ඔවුහු මහාභූතයෝය,යි කියනු ලැබෙත්ද මෙහි අන්‍යවූ යම් විනිශ්චය නයකුත් වේද ඒ සියල්ල විශුද්ධිමාර්ගයෙහි රූපසඤ්ඤානිද්දේශයෙහි කියන ලද්දේය. **චතුන්නං ච මහා භූතානං උපාදාය,** යන මෙහි වනාහි **චතුන්නං** යනු උපයෝගා (කර්මා)ර්ථයෙහි සඞ්ඛ්‍යාවචනයයි; සතරමහාභූත යන්,යි කියනලද වෙයි; **උපාදාය** යනු උපාදානයකොට ගෙන යන අර්ථයි; ඇතැම් ආචාර්යයෙකුනෙක් නිශ්‍රයකොට,යි ද (අරුත් බෙණෙති;) "චත්තමානං,, යන මෙද මෙහි පාඨශෙෂයි; නොහොත් මේ සමූහාර්ථයෙහි සඞ්ඛ්‍යාවචනයයි; එහෙයින් සතරමහාභූතයන්ගේ සමූහය ගෙන හෙවත් ඇසුරුකොට පවත්නාවූ රූපය,යි මේ අර්ථය දතයුතුයි. මෙසේ සියලු තැන්හි ම පෘථිව්‍යාදිවූ යම් සතර මහා භූත කෙනෙකුත් වෙත්ද සතරමහාභූතයන්නිසා පවත්නාවූ යම්චක්ෂුරායතනාදිභෙදයෙන් අභිධර්මයෙහි පෙළෙහිම වදාළ තෙවිසිවැදෑරුම් රූපයකුත්වේද ඒ සියල්ලම රූපය,යි දතයුතු. **විඤ්ඤාණ සම්භවා** යන මෙහි වනාහි යම් විඤ්ඤාණයක් යම් නාමයකට ද යම් රූපයකට ද යම් නාමරූපයකට ද ප්‍රත්‍යය වේ නම් ඒ ප්‍රතිසන්ධිවිඤ්ඤාණයාගේ වශයෙන් විශුද්ධිමාර්ගයෙහි ප්‍රතීත්‍යසමුත්පාද නිද්දේශයෙහි කීනියෙන් ම විඤ්ඤාණයාගේ හටගැනීමෙන් නාමරූපයාගේ හටගැනීම දතයුතු. සෙස්ස කීනය මැ,යි.

විඤ්ඤාණවණ්ණනා. විඤ්ඤාණවාරයෙහි **චක්ඛුවිඤ්ඤාණං**යනු ඇසෙහිවිඤ්ඤාණයහෙවත් ඇසහේතුකොටගෙන හටගත් විඤ්ඤාණය නු,යි **චක්ඛුවිඤ්ඤාණ** නම්; සොතඝානජිව්හාකායවිඤ්ඤාණයෝද මෙසේයි අන්‍යවූ (මනොවිඤ්ඤාණය) වනාහි සිත ම විඤ්ඤාණය වූයේ නු,යි "මනොවිඤ්ඤාණ" නම්, දෙපස්විඤ්ඤාණයන් තොරකොටඇති ත්‍රෛභූමකාවිපාක චිත්තයට මේ මනොවිඤ්ඤාණ යනු නමකි; **සඞ්ඛාරසම්භවා** යන මෙහි වනාහි යම් සංඛාරයෙක්තෙම යම් විඤ්ඤාණයකට ප්‍රත්‍යය වේ ද ඒ සංඛාරයාගේ වශයෙන් විශුද්ධිමාර්ගයෙහි කීනියෙන් ම සංඛාරයන්ගේ හටගැනීමෙන් විඤ්ඤාණයාගේ හටගැනීම දතයුතුයි. සෙස්ස කීනය මැ,යි.

සංඛාරවණ්ණනා. සඞ්ඛාරවාරයෙහි සඞ්ගස්කිරීම ලක්ෂණකොටඇත්තේ "සඞ්ඛාර" නම; මේ සංඝකාරයාගේ විභාරවාරයෙහි වනාහි **කායසඞ්ඛාරෝ** යනු කයින් පවත්වනලද **සංඝකාරය**, හි, කායවාරයෙහි මදවශයෙන් පැවති කාමාවචරකුශලයන් වශයෙන් අටදෙනෙකුට ද අකුශලයන් වශයෙන් දෙළොසකට දැයි, විසිවැදැරුම්වූ කායසඤ්චේතනාවන්ට මේනමකි; වචීසඞ්ඛාරෝ යනු වාග්වාරයෙහි වාග්භෙදවශයෙන් පැවති විසිවැදැරුම්වූ ම වාක්සඤ්චේතනාවන්ට මේ නමකි; **චිත්තසඞ්ඛාරෝ** යනු සිතින් පැවති සංඝකාරය,යි; කායවාග් වාරයන්හි මදපැවැත්ම නො කොට රහසෙහි හිඳ සිතන්නහුට පැවති ලෞකිකකුශලාකුශලවශයෙන් එකුන්තිස් මනොසඤ්චේතනා වන්ට මේ නමකි; **අවිජ්ජාසමුදයා** යන මෙහි වනාහි කුශලයන්ට උපනිශ්‍රයවශයෙන් ද අකුශලයන්ට සහජාතාදීවශයෙන් ද අවිද්‍යා තොමෝ ප්‍රත්‍යය වන්නීය,යි දතයුත්තීය. සෙස්ස කීතය මැ,යි.

අවිජ්ජාවණ්ණනා අවිජ්ජාවාරයෙහි **දුක්ඛෙඅඤ්ඤාණං**=දුඃඛසත්‍යවිෂයෙහි නො දැනීම මෙය මොහයට නමකි; **සමුදයෙ අඤ්ඤාණං** යනාදි තැන්හිද මේ ක්‍රමය,යි; ඔවුනතුරෙහි කරුණු සතරකින් දුඃඛසත්‍යයෙහි නො දැනීම දතයුතුයි; ඇතුලත්වීම් වශයෙන් ද වසතුවශයෙන් ද අරමුණුවශයෙන් ද පිළිසෙවීම් වශයෙන් දැ,යි කියායි; ඒ එසේමැය- ඒ දුඃඛයෙහි නොදැනීම දුඃඛසත්‍යපර්‍යාපන්න බැවින් දුඃඛසත්‍යයෙහි ඇතුලත්වේ; දුඃඛසත්‍යය ද ඊට නිශ්‍රය ප්‍රත්‍යයභාවයෙන් වසතුවෙයි, **ආරම්මණ** ප්‍රත්‍යය භාවයෙන් අරමුණු වෙයි; දුඃඛසත්‍යයම එය ප්‍රතිවේධනය කෙරෙයි ඒ දුඃඛයාගේ අවිපරීතවූ ලක්ෂණ ප්‍රතිවේධය වැළකීම්වශයෙන් ද ඒ දුඃඛයෙහි ඥනයාගේ පැවැත්ම නො දීම් වශයෙන් ද වේ; සමුදයසත්‍යයෙහි නොදැන්ම කරුණු තුනකින් දතයුතුයි, වසතුවශයෙන් ද අරමුණුවශයෙන්ද පිළිසෙවීම්වශයෙන්ද,යි කියායි; නිරොධ සත්‍යයෙහි ද ප්‍රතිපදාවෙහි (= මාගීසත්‍යයෙහි) ද නොදැනීම ප්‍රතිවේධනවශයෙන් එක් කරුණකින් ම දතයුතුයි; ඒ එසේමැයි- නිරොධප්‍රතිපදාවන්ගේ ප්‍රතිවේධනය ම නො දැන්ම වෙයි; ඒ නිරොධප්‍රතිපදාවන්ගේ අවිපරීතවූ ලක්ෂණප්‍රතිවේධය වැළකීම් වශයෙන් ද ඒ නිරොධප්‍රතිපදාවන්හි ඥන ප්‍රවෘත්තිය නො දීම්වශයෙන් ද වෙයි; ඒ අඤ්ඤාණය (=නො දැන්ම) එහි ඇතුලත්වූයේ නො වෙයි, ඒ සත්‍යවයෙහි අපර්‍යාපන්නබැවිනි; ඒ නො දැන්මට ඒ සත්‍යවය වසතුවූයේ නොවෙයි, සහජාතනොවූ බැවිනි; අරමුණුවූයේ නො වෙයි, ඒ සත්‍යවය අරභ්‍යා නො පවත්නා හෙයිනි; සැබව- පශ්චිමවූ නිරොධප්‍රතිපදාසත්‍යවය ගම්භීරබැවින් දක්නට දුෂ්කරවෙයි; එහි (සත්‍යප්‍රතිවේධනයකරනහෙයින්) අතිවූ නො දැන්ම නො පවතී; පූර්වවූ (දුඃඛසමුදය) සත්‍යවය වනාහි ප්‍රත්‍යනීකාදියෙන් සභාවලක්ෂණය තමා දැකීමට දුෂ්කරබැවින් ගම්භීරවේ; එහි

විපල්ලාසග්‍රාහවශයෙන් (නො දැන්ම) පවතී; තවද **දුක්ඛෙ** යී මෙතෙකින් සඞ්ග්‍රහවශයෙන් ද වස්තුවශයෙන් ද ආරම්මණවශයෙන් ද කෘත්‍ය වශයෙන් ද අවිද්‍යාතොමෝ දක්වනලදුදු; **දුක්ඛසමුදයෙ**,යී මෙතෙකින් වස්තුවශයෙන් ද ආරම්මණවශයෙන් ද කෘත්‍යවශයෙන් ද (අවිද්‍යා තොමෝ දක්වනලදු;) **දුක්ඛනිරොධෙ දුක්ඛනිරොධගාමිනියා පටිපදායයි** මෙතෙකින් කෘත්‍යවශයෙන් (අවිද්‍යාතොමෝ දක්වනලදු;) අවි ශෙෂයෙන් වනාහි **අඤ්ඤාණං** යන මේ වචනයෙන් සභාවවශයෙන් (අවිද්‍යාතොමෝ) දක්වනලද්දීය,යි දතයුත්තීය. **ආසවසමුදයා** යන මෙහි වනාහි කාමාශ්‍රව භවාශ්‍රවයෝ සහජාතාදීන්ගේ වශයෙන් අවි ද්‍යාවට ප්‍රත්‍යය වෙති; අවිද්‍යාශ්‍රවය උපනිශ්‍රයවශයෙන් ම (ප්‍රත්‍යය වෙයි;) තවද මෙහි පළමු උපන් අවිද්‍යාතොමෝ අවිද්‍යාශ්‍රවය,යි දත යුත්තීය; ඕතොමෝ පසුව පසුව උපන් අවිද්‍යාවට උපනිශ්‍රයප්‍රත්‍යය වෙයි; සෙස්ස කියනලද ක්‍රමයමැ,යි.

ආශ්‍රව වණ්ණනා. ආසවවාරයෙහි **අවිජ්ජාසමුදයා** යන මෙහි අවිද්‍ය තොමෝ කාමාශ්‍රව භවාශ්‍රවයන්ට සහජාතාදීන්ගේ වශයෙන් ප්‍රත්‍යය වෙයි; අවිද්‍යාශ්‍රවයට උපනිශ්‍රයවශයෙන් ම (ප්‍රත්‍යය වෙයි;) තවද මෙහි පසුව පසුව උපන් අවිද්‍යාතොමෝ අවිද්‍යාශ්‍රවයයි දතයුත්තීය; පළමු උපන්නී අවිද්‍යා මැ,යි ඕතොමෝ පසුව පසුව උපන් අවිද්‍යාශ්‍රවයට උපනිශ්‍රයප්‍රත්‍යය වෙයි; සෙස්ස කීනය මැ,යි. මේ ආශ්‍රව වාරයතෙම ප්‍රතීත්‍යසමුත්පාදයෙහි ප්‍රධානවූ යම් මෝ අවිද්‍යාවක් වන් නීද ඒ අවිද්‍යාවගේ ද ප්‍රත්‍යය **දුක්ඛ**ම්වශයෙන් වදාරනලද්දේය; මෙසේ වදාරනලද මේ වාරය හෙතුකොටගෙන සංසාරයාගේ නො දතහැකි අග්‍රය ඇතිබැව් සාධිතවූවා වෙයි; කෙසේද යත්? ආශ්‍රව සමුදයෙන්ම අවිද්‍යාසමුදය වෙයි; අවිද්‍යාසමුදය හේතුකොටගෙන ම ආශ්‍රවසමුදය වෙයි; මෙසේ ආශ්‍රවයෝ අවිද්‍යාවට ද අවිද්‍යාතොමෝත් ආශ්‍රවයන්ට ද ප්‍රත්‍යය වේය,යි කොට අවිද්‍යාවගේ පූර්වකොටිය නො පැනෙයි ඒ පූර්වකොටිය (=කෙළවර) නො පැනෙනබව හෙයින් සංසාරයාගේ අවිදිතවූ අග්‍රය ඇතිබව සිඳුවූවා වේය,යි.

මෙසේ මේ සූත්‍රයෙහි මේ සියල්ල ම කර්මපථවාරය ආහාරවාරය දුඃඛවාරය ජරාමරණ- ජාති- භව- උපදාන- තෘෂ්ණා- වේදනා- ස්පර්ශ- ෂඩායතන- නාමරූප- විඥාන- සංස්කාර- අවිද්‍යා- ආශ්‍රවවාරය,යි සොළොස්වාරයක් වදාරනලද්දහුය; ඔවුනතුරෙහි එකෙකිවාරයාගේ සංක්ෂේපවිස්තාරවශයෙන් දෙපරිද්දෙකින් සිටිබැවින් දෙතිස්තැනක් වෙති; මෙසේ මේ සූත්‍රයෙහි මේ දෙතිස්තැන්හි සිව්සස් වදාරනලද්දහුය; මොවුන්ගේ ම විස්තාරවශයෙන් වදාළසොළොස්තැන්හි අශීතිය වදාරනලද; තෙරුන්වහන්සේගේ බුද්ධියෙන් දෙතිස්තැන්හි ම සිව්සස් ද සිව්මගද වදාරනලදහ. මෙසේ හෙයින් සියලු ම පඤ්චමහානිකායෙහි

ඇතුළත්වූ බුදුවදන්හි යම් සූත්‍රයෙක්හි දෙතිස්වරක් චතුස්සත්‍යයත් දෙතිස්වරක් අනිත්‍යයත් වදාරනලදද මේ සම්මාදිට්ඨිසූත්‍රය හැර එබදු සූත්‍රයක් නැතැ,යි.

ඉදමවොචායස්මා සාරිපුත්තෙනා යනු දෙතිසක්වතුස්සත්‍යපඨ්‍යායයන් හෙන් ද දෙතිසක් අනිත්‍යපඨ්‍යායයන්ගෙන්ද,යි සූසැටකරුණකින්සරසා ආයුෂ්මත් ශාරිපුත්‍රයෝ මේ සම්මාදිට්ඨිසූත්‍රය වදාළහ; සියමන්ඇති හෙවත් සතුටුසිත්ඇති ඒ භික්ෂූන් ආයුෂ්මත් ශාරිපුත්‍රයන්ගේ භාෂිතය අනුමෝ දන්වූවාහුය= මොනොවට පිළිගත්තාහුය,යි.

සම්මාදිට්ඨිසූත්‍රවණ්ණා නිමි.

සතිපට්ඨාන සූත්‍ර වණ්ණා.

එවංමෙ සුතං, යි සතිපට්ඨානසූත්‍රයයි. **එහි කුරූසු විහරති** යනු "කුරු,, නම්? දනව්වැසි රාජකුමාරයෝයි; ඔවුන්ට නිවාසවූ එක් ජන පදයකුදු රැඳීශබ්දවශයෙන් "කුරු,,යයි කියනුලැබේ; ඒ කුරුදනව් වෙහි යන අර්ථයි. අර්ථකථාචාරිහු වනාහි මෙසේ කිහු- මඤ්ඤාතුරජ්ජුගේ කාලයෙහි (පූර්විදෙහාදි) තුන් දිවයින්හි මනුෂ්‍යයෝ **කුරූජනපදය.** දඹදිව නම් බුදු පසේබුදුමහසව්සක්විති ආදිවූ උතුම් පුරුෂයනට උත්පත්තිභූම්වූ උතුම් දිවයිනෙක, ඉතා සිත්කලුය,යි අසා සක්රුවන පෙරටුකොට සිව්දිව්හි පිළිවෙළින් හැසිරෙන්නාවූ මඤ්ඤාතුසක්විතිරජ්ජු සමගපැමිණියාහුය. ඉක්බිති රජතෙමේ පරිණායකරතනය විවාළේය "මිනිස්ලොවට වඩා ඉතා රමණී තැනක් ඇත්දෝ හෝ,,යි; දෙවයිනි! කුමක්හෙයින් මෙසේ කියහුද? කිම ඔබ හිරුදෙදෙනාගේ ආනුභාවය නොදක්නහුද? මොවුන්ගේ වාසස්ථානය මීට වඩා ඉතාරමණීවූයේ නොවේදැ?යි; රජ්ජුරුවෝ සක්රුවන පෙරටු කොට එහි ගියහ; සතරවරම් මහරජදරුවෝ මඤ්ඤාතු මහරජතෙමේ ආයේය,යි අසාම (හෙතෙම) මහත්ඍිඇති මහත් ආනුභාව ඇති රජෙක යුඬයෙන් පිටුදක්නට නොහැක්කම්හ,යි සියරජය පාවාදුන්හ; හෙතෙම ඒ රජය ගෙන නැවතත් විවාළේය; "මේ ස්ථානයට වඩා අතිශයින් රමණීතැනක් ඇත්දෝහෝ,,යි; ඉක්බිති ඔහට තව්තිසාභවන රමණීබැව් කිවාහුය; දෙවයිනි! තව්තිසා භවන අතිශයින් සිත්කලුවෙයි, එහි සක්දෙවිරජහට මේ සතරවරම් රජදරුවෝ පිරිවරවූවාහු දෙරටුපල් තැන්හි සිටිති; සක්දෙවිරජතෙමේ මහත්ඍිඇත්තේ මහානුභාව ඇත්තේ වෙයි; මේ ඔහුගේ උපභොගසථානයෝවෙති; යොදුන් දහසක් උස්වූ වෛජයන්ත නම් පහයෙක්වෙයි. පන්සියයක් යොදුන් උස්වූ සුධම්ම

නම් දිව්‍යසභාවක්වෙයි, එසිය පනස්යොදුන්වූ වෛජයන්තනම් රථයෙක් වෙයි; එබදුවූම එරාවණ නම් ඇතෙක් වෙයි කප්රුක් දහස්ගණනින් සැදුම්ලද නන්දන වනය ද චිත්‍රලතාවනයද එාරුසකවනයද මිශ්‍රක වනයද වෙයි සියක්යොදුන් උස්වූ පාරිචජත්තක නම් කොවිදාරවෘක්ෂය වෙයි ඒ පරසතුයටයම් පාණ්ඩුකම්බල ශෛලයක්හුගේ මෘදුබව හෙතුකොට ගෙන හිඳගන්නාවූ ශක්‍රයාගේ අඩකාය ඇතුලත පිවිසේ ද එබදුවූ සැට යොදුන් දික්වූ පනස් යොදුන් පුලුල්වූ පසළොස් යොදුන් උස්වූ බදුවද මල් පැහැනි පඬු ඇඹුල්සලය වේය, සි ඒ අසා රජතෙමේ එහි යනු කැමැත්තේ සක්රුවනටපැන්වැඩිය; ඒ සක්රුවන සිව්රහසෙනහ සමග අහසට පැනනැංග; ඉක්බිති දෙදෙව්ලොව මැදින් සක්රුවන බැස පරිණායකරතනය ප්‍රමුඛකොටඇති සිව්රහසෙනහසමග පොළොවෙහි පිහිටියේය; රජ්ජුරුවෝ එකාකිවම තව්තිසා භවනට ගියහ; ශක්‍ර තෙමේ මඤ්ඣාතුරජ ආයේයයි අසාම ඔහුට පෙරගමන් කොට මහරජ! ඔබට සවාගතයැ, මහරජ! ඔබගේ සන්තකයැ, මහරජ! අනුශාසනාකළමැනවැ,යි කියා නළුවන් සමග රජය දෙභාගයක් කොට එක් භාගයක් දුන්නේය; තව්තිසාභවනයෙහි පිහිටි ඇසිල්ලක්ඇත්තාවූ ම රජුගේ මිනිස්බව පහවගියේය; දිව්‍යභාවයපහළවිය; ශක්‍රයා සමග පඬු ඇඹුල් සලයෙහි හුන්නාවූ ඔහුගේ ඇසිපිය හෙළීම පමණකින් නානාත්වය පැනේ ලා; ඒ නානාත්වය නො සලකන්නාවූ දෙවියෝ ශක්‍රයාගේ ද ඔහුගේ ද නානාත්වයෙහි මුළුවෙති හෙතෙම ඒ තව්තිසාභවනයෙහි දිවසැපත් වළඳමින් යම්තාක් සතිස් ශක්‍රකෙනෙක් ඉපිද චුතවූවාහු ද එතෙක්කල් රජය කරවා පඤ්චකාමයෙන් නො නිත්වූයේ ම එසින් ගිලිහි සිය උයන්හි වැටුනේ අව්සුලඟින් පහළකයඇත්තේ කලුරිය කෙළේය; තවද සක්රුවනපොළොවෙහි පිහිටිකල්හි පරිණායකරත්නය රන්පටෙක මඤ්ඣාතුරජුගේ වහන්සඟල අන්දවා මේ මඤ්ඣාතු රජුගේ රජය,, යයි රාජ්‍යඅනුශාසනාකෙළේය; ඒ තුන්දිවසිනෙන් පැමිණි මනුෂ්‍යයෝද නැවත යන්ට නො හැක්කාහු පුත්රුවන කරා එලඹ "දෙවයිනි! ඇපි රජුගේ ආනුභාවයෙන් ආම්හ; දැන්යන්ට නොහැක්කම්හ, අපට වාසයට තැනක් දුනමැනවැ,, සි යාඥාකළහ; හෙතෙම ඔවුනට එකෙකි ජනපදයක් දුන්නේය; ඒ ජනපදයන් අතුරෙහි පූර්විදෙහ්යෙන් පැමිණි මිනිසුන් විසූපෙදෙස ඒ පළමු නමින් මැ "විදෙහරට,, යයි නම් ලද; අපරගොයානයෙන් පැමිණි මිනිසුන් විසූපෙදෙස අපරන්තජනපදය,,යි නම් ලද; උතුරුකුරු දිවයිනෙන් පැමිණි මිනිසුන් විසූපෙදෙස "කුරුරට,, යයි නම් ලැබී බොහෝවූ ගම් නියංගම් ආදිය ගෙන බහුවචනයෙන් ව්‍යවහාර කරනු ලැබේ; එසින් කියනලදී- "**කුරූසු විහරති**,, සී.

තම්මාසඛම්මං. තම්මාසඛම්මං නාම කුරූනං නිගමෝ= තම්මාසඛම්මං යන මෙහි කිසිවෙක් "ඛ,, කාරයට "ද,, කාරවශයෙන් අරුත් වනති; කල්මාෂතෙමේ මෙහි දමනයකරනලද නු,යි

කම්මාසධම්ම නම්; "කම්මාසෝ,,යි කල්මාෂවූ පයඇති පොරිසාද තෙමේ කියනුලැබේ; ඔහුගේපය කණුවකින් විදිතැන ව්‍රණය රුහණය වන්නේ චිත්‍රදුරුසදෘශව යම්හෙයකින් රුහණය වීද; එහෙයින් කල්මාෂපාද යයි ප්‍රසිඛවිය, ඒ කල්මාෂපාද ද ඒ අවකාසයෙහි දමනය කරනලද පොරිසාද භාවයෙන් වළකනලද; කවරෙකුවිසින් ද යත්? මහසත්තු විසින් දමනයකරනලද; කවර ජාතකයෙක්හිදී ද යත්? "සුතසොම,, ජාතකයෙහි යයි ඇතැම් ආචාර්‍යයෙකුනෙක් කියති; මේ (මහවෙහෙරැවැසි) තෙරහුවනාහි 'ජයද්දිස, ජාතකයෙහිය,යි කියති; (ජයද්දිස ජාතකයෙහියැ යනු) සැබව ඒ ජයද්දිස කාලයෙහි මහසත්තු විසින් කලමාෂපාදතෙමේ දමනයකරනලද්දේය; වදලේ මැනු-

80 **පුත්තෝ යදූ හොමි ජයද්දිසස්ස පඤ්චාලරඤ්ඤෝ අත්‍රජෝ**
චජාන පාණං පිතරං අමොචයිං කම්මාසපාදම්පි චහං පසාදයිං

(සියම්කලෙක මම පඤ්චාලදෙශාධිපතිවූ ජයද්දිසරජහුගේ අත්‍රජවූ පුත්‍රයා වීමිද එකල්හි මම ජීවිතය පුදා පියා (මරණයෙන්) මිදීමි කල්මාෂපාදයා ද පැහැදවීමි)

කිසිවෙක් වනාහි "ඛ,, කාරයෙන් මැ අපි වණීනාකෙරෙති; කුරුරටවැසිසන්ගේ කුරුව්‍රතධර්මය එතැන්හි යම්හෙයකින් කලමාෂවීද, එහෙයින් ඒ සථානය "මෙහි ධර්මය කලමාෂවූයේ නු, යි **කම්මාසධම්මං** යි කියනු ලැබේ; එහි නිවිෂටවූ නියම්ගමට ද මේ නාමය මැවෙයි; ("කම්මාසධම්මෙ කුරූනං නිගමෙ,, යි) භූම්මවචනයෙන් කුමක් හෙයින් නො කියනලදද යත්? විසීමට අවකාස නො වනහෙයිනි; භාග්‍යවතුන්වහන්සේට ඒ නියම්ගමැ විසීමට අවකාසවූ කිසිවිහාරයෙක් නො වීය; එතකුදුවුවත් නියම්ගමින් ඉවත්ව උදකසමපන්නවූ එක්තරා රමණීය භූමිපෙදෙසක මහත්වූ වනලැහැබක් විය; ඒවනලැහැබෙහි භාග්‍යවතුන්වහන්සේ ඒ නියම්ගම ගොදුරුගම් කොට වීසූසේක එහෙයින් මෙසේ මෙහි අරුත් දතයුතු; කුරුදනවිවෙහි කලමාෂධර්ම නම් කුරුවාසින්ගේ නියම්ගම් (යම් තැනෙක්හිද) එය ගොදුරුගම් කොට වාසයකරනසේකැයි.

ඇතා බලය.

එකායනෝ අයං භික්ඛවෙ! මග්ගෝ, යි කුමක් හෙයින් භාග්‍යවත්හු මේ සූත්‍රය වදාළසේක්දයත්? කුරුවාසින්ගේ ගැඹුරුදෙසුම් පිළිගැනීමෙහි සමර්ථ බවහෙයිනි; කුරුරටවැසි භික්ෂුභික්ෂුණීහු ද උපාසක

---

80 **යදූ** යම්කලෙක; **පඤ්චාලරඤ්ඤෝ**= පඤ්චාලදෙශාධිපතිවූ; **ජයද්දිසස්ස**= ජයද්දිසමහරජහුගේ; **අහං**= මම: **අත්‍රජෝ**= අත්‍රජවූ; **පුත්තෝ හොමි**= (අලීනසත්තුනම්වූ) පුත්‍රයා වීමිද; (තදූ= එකල්හි;) **පාණං**= මාගේ ප්‍රාණය; **චජාන**= පරිත්‍යාගකොට; **පිතරං**= පියාණන් **අමොචයිං**= (මරණයෙන්) මිදවීමි; **ච**= නැවත; **කම්මාසපාදම්පි**= කලමාෂපාදනම්වූ පොරිසාදයා ද; **පසාදයිං**= (දමනයකොට) පැහැදවීමි.

උපාසිකාවෝ ද ඍතුප්‍රත්‍යයාදියෙන් සමපූර්ණබැවින් ඒ රටපිළිබඳ වූ සැපවූ ඍතුප්‍රත්‍යය සෙවනය කිරීමෙන් නිතොර නිරොගවූ සිරුරු ඇත්තාහු ද නිරොගවූ සිත්ඇත්තාහු ද වෙති; ඔවුහු චිත්තශරීරයන්ගේ කල්‍යභාවයෙන් අනුගන්නාලද නැණබලඇත්තාහු ගැඹුරු කථා පිළිගැනීමට සමර්ථ වෙති; ඒ කරුණෙන් භාග්‍යවත්හු ඔවුන්ගේ මේ ගැඹුරු දෙසුම් පිළිගැනීමෙහි සමර්ථබව දක්නාසේක් එක්විසිතැනෙක්හි කමටහන් රහත්බැවිනි පිහිටුවා මේ ගැඹුරුඅරුත්ඇති සතිපට්ඨාන සූත්‍රය වදාළසේක. ඒ එසේමැයෙ- යම්සේ පුරුෂයෙක්තෙම රන් පැහැක් ලැබ එහි විවිධපුෂ්පයන් බහාලන්නේද රන්කරඬුවක් හෝ ලැබ සත්රුවන් බහාලන්නේද එපරිද්දෙන් භාග්‍යවත්හු කුරු රට වැසිපිරිස ලැබ ගැඹුරුවූ දෙශනාව දෙසූසේක්ය,සි; එහෙයින්ම මෙහිදී අන්‍යවූ ද ගම්භීරාර්ථඇති දීඝනිකායෙහි මහානිදානසූත්‍රය මහාසතිපට්ඨාන සූත්‍රය මේ මධ්‍යමනිකායෙහි සාරෙපමසූත්‍රය රුක්ඛූපමසූත්‍රය රට්ඨපාල සූත්‍රය මාගන්දියසූත්‍රය ආනඤ්ජසප්පායසූත්‍රය යන අන්‍යවූ ද සූත්‍රයන් දෙසූසේක.

තවද ඒ ජනපදයෙහි සිවිපිරිස ම පියවින්ම සතිපට්ඨානභාවනානුයොගයෙහි යෙදුනාහු වෙසෙති; යටත්පිරිසෙයින් දස්කම්කරුපිරිවර ජනයෝ ද සිවටන් ප්‍රතිසංයුක්තවූ ම කථාවක් කියති; පැන්තොට නූල්කටිනතැන ආදියෙහි ද නිරර්ථකකථා නම් නො පවති; ඉදින් කිසි සත්‍රියක් මැණියනි! තෙපි කවර සිවටන්භාවනාවක් මෙනෙහි කෙරෙහි ද,සි විචාරනලද්දී කිසිවක් නැතැ,සි කියානම් ඇට ගරහති "තිගේ ජීවිතය නිකුවේවා ජීවත්වන්නීවූ ද තී මළුළුකක් සමානය,,සි; ඉක්බිති ඇට දුන් යලිත් මෙසේ නො කරව,සි අවවාදකොට එක්තරා සතිපට්ඨානයක් උගන්වති; යම් සත්‍රියක් වනාහි මම අසවල් නම් සතිපට්ඨානය මෙනෙහි කෙරෙමි,සි කියා නම් ඇට "සාධු සාධු,,සි සාධුකාර දී තිගේ ජීවිතය සොඳුරුජීවිතයෙක, තී නම් මිනිස්බවට පැමිණියා වෙයි තිපිණිස සම්‍යක්සම්බුද්ධයෝ උපන්නාහුය,සි ද මේ ආදිවචනයන්ගෙන් පසසති; තවද මේ ජනපදයෙහිහුදු මිනිස් ජාතිඇත්තාහු ම සමාධිප්‍රසථානමනසිකාරයෙහි යෙදුනාහු නො වෙති, ඔවුන් ඇසුරුකොට වාසයකරන්නාවූ තිරිසන්ගතයෝ පවා (සිවටන්මෙනෙහි කෙරෙති;) ඒ තිරිසන්ගතයන්ගේ සිවටන් මෙනෙහි කිරීමෙහි මේ වස්තුවකි-

සිවටන් මෙනෙහි කළ සුවපොතකයා එක් නළුසමූහයක් සුවපොතකයෙකු ගෙන හික්මවමින්හැසිරේ ලු; ඒ නළුසමූහයතෙම මෙහෙණි අසපුවක් ඇසුරුකොට වැස යනකාලයෙහි සුවපොතකයා සිහිනොකොට හිඳේය; සාමණේරිහු ඒ සුවපොතකයා ගෙන පොෂණයකළාහුය; ඔහට බුබරකඛිතය,සි නමක් ද කළාහුය; එක්

දිනක් අභිමුඛයෙහි හුන්නාවූ ඒ සුවපොතකයාදැකමහාසථවිරිතොමෝ බුඩරකඛිතය! සි කිව; ආයුෂ්මාවෙනි! කිමැ,යි; තාගේ කිසියම් භාවනා මෙනෙහිකිරීමක් ඇත්දැ?යි; ආයුෂ්මාවෙනි! නැතැ,යි; ඇවත! පැවිද්දන් සමීපයෙහි වසන්නහුවිසින් නම් විසුළ අත්බැව්ඇත්තෙක් වන්ට නොවටී, කිසියම් මෙනෙහි කිරීමක් කැමතිවියයුත්තේය, තෙපි වනාහි අනිකක් නොහැකිවන්නෙහි "අසි අසි,, යි හැදෑරීම කරව,යි; හෙතෙම සථවිරින්ගේ අවවාදයෙහි සිට "අසී අසී,, යි හදෑරමින් වෙසෙයි; එක් දිනක් උදෑසන ම තොරන්අග හිඳ ළහිරුරැස් තප්නාවූ ඒ සුවපොතකයා එක් ලිහිණියෙක් නියමැදුරෙන් අල්වාගත්තේය; හෙතෙම "කී කී,, යි ශබ්දකළේය; සාමණේරිහු (ඔහුගේ ශබ්දය) අසා ආයුෂ්මාවෙනි! බුඩරකඛිතතෙමේ ලිහිණියෙකුවිසින් ගන්නාලද්දේය; ඔහු මුදන්නොමැ,යි ගල්ආදිස ගෙන ලුහුබැඳ මිදවූවාහුය; ගෙනවුත් අභිමුඛයෙහි තබන ලද ඔහුට සථවිරිතොමෝ මෙසේ කිව; "බුඩරකඛිතය! ලිහිණියාවිසින් ගත්කාලයෙහි කුමක් සිතුයෙහිදැයි; ආයුෂ්මාවෙනි! අනිකක් නොසිතීමි ඇවරැසක් මැ ඇවරැසක් ගෙනයයි කවර තැනෙක්හි නමුත් වීසි රෙන්නේය,යි; ආයුෂ්මාවෙනි! මෙසේ අසිපුඤ්ඤසංඥව ම සිතුයෙමි,යි; සාධු සාධු බුඩරකඛිතය! අනාගතයෙහි භවක්ෂයකිරීම පිණිස තට ප්‍රත්‍යය වන්නේය,යි. මෙසේ ඒ කුරුජනපදයෙහි තිරිසන්ගතයෝ පවා සීවථන් මෙනෙහි කිරීමෙහි යෙදුනාහුය; එහෙයින් භාග්‍යවත්හු ඔවුන්ගේ සතිපඨානවෘඩිය ම දන්නාසේක් මේ සූත්‍රය වදාළහ. එහි **එකායනෝ** යනු එකමාගීයැ යන අර්ථයි; මාගීයට වන්නේ-

81 **මග්ගෝ පන්ථෝ පථෝ පජ්ජෝ අඤ්ජසං වට්ටමායනං**
නාවා උත්තරසෙතූ ච කුල්ලෝ ච භිසි සඞ්කමෝ යි.

බොහෝ නාමයෝ වෙති; හේ මේ මාගීය මෙහි "අයන,, නාමයෙන් වදාරනලද; එහෙයින් **එකායනෝ අයං භික්ඛවෙ! මග්ගෝ** යන මෙහි මහණෙනි! මේ මාගීයතෙම එකමාගීය වෙයි, විධාපථවූයේ නොවේය,යි මෙසේ අර්ථ දතයුතු; නොහොත් **"එකෙන අයිනබ්බා,,** (එකක්හු විසින් පිළිපැදියයුත්තේය) එහෙයින්"එකායන,,නම; **එකෙන**= ගණයා හා සහය හැර (වසතුකාමකෙලෙශකාමයන් කෙරෙන් කයින් හා සිතින්) වෙන්වූවහුවිසින් ප්‍රකෂීවිවෙකඇත්තහුවිසින්; **අයිනබ්බා**= මේතෙමේ පිළිපැදියයුත්තේනුයි හෝ මේකරණකොටගෙන පිළිපැදියයුත්තේනුයි "අයන,, නම; සසරින් නික්ම නිවනට පැමිණෙයි යන අර්ථයි; **"එකසසඅයනෝ,,**(=ශ්‍රෙෂඨවූ භාග්‍යවත්හුගේ මාගීය)"එකායන,, නම; **එකසස** ශ්‍රෙෂඨවූවහුගේ; භාග්‍යවත්හුසියලුසත්වයන්අතුරෙන්ශ්‍රෙෂඨවූවාහුදවෙති; එහෙයින් භාග්‍යවත්හුගේ යයි කියනලද වෙයි; වැලි එකෙක් ඇති-(එකායනසඞ්ඛ්‍යාතවූ) ඒ මඟින් අන්‍යයෝ ද නිවනට යෙති, එසේ ඇතිකල්හි ද ඒ අයනය භාග්‍යවත්හුගේ ම,යැ ඒ භාග්‍යවතුන්විසින් උපදවනලදබැවිනි; වදාළේමැ,නු-**යො කි බ්‍රාහ්මණ! භගවා අනුප්පන්නස්ස**

මගගස්ස උප්පාදෙනා යන ආදිය. නොහොත් "අයතීති අයනො,, (=යේනු,සි අයන නම) යයි පවතී යන අර්ථයි; "එකස්මිං අයනො,, (=එකෙක්හිවූ අයනය) "එකායන,, නම; මේ ශාසනයෙහි ම පවතී අන්‍යශාසනයෙක්හි නැතැ,සි කියනලද වෙයි; වදාළේ මැයි- **ඉමස්මිං බො සුභද්ද! ධම්මවිනයෙ අරියොඅට්ඨඞ්ගිකො මග්ගො උපලබ්භති** යී. යම්හෙයකින් මේතෙමේ දෙශනාභෙදය ම වේද එහෙයින් අර්ථය එකෙක් වෙයි; අනෙකොකුදු ඇති- "එකං අයතීති,, (හුදු නිවනට පැමිණෙයි මේ කරුණෙන්) "එකායන,, නම; පූර්භාගයෙහි නානා මුඛයෙන් භාවනානය පැවැත්තේ නමුත් අපරභාගයෙහි හුදු නිවනවම පැමිණේය,සි කියනලද්දේ වෙයි; කියේ මැ,නු සහම්පතිබ්‍රහ්මතෙම-

එකායනං ජාතිඛයනනදස්සි මග්ගං පජානාති භිනානුකම්පි
එතෙන මග්ගෙන අනංසු පුබ්බෙ තරිංසුනති යෙ ච තරනතිඔඝං යී.

(-ජාතික්ෂයානන්ත නිර්‍වාණය දක්නා සුලුවූ හිතයෙන් අනුකම්පා කරන්නාවූ තථාගත යන් වහන්සේ එකායන සඞ්ඛ්‍යාත මාර්ගය දැනගත්සේක, පෙර යමෙක් තුම්බූ චතු රොඝය තරණය කළාහුද මතු තරණය කරන්නාහුද දැනුදු තරණය කෙරෙන් ද ඔවුහු මේ මාර්ගය කරණකොටගෙන තරණයකළාහුය තරණය කරන්නාහු තරණය කෙරෙති,)

එකායන මාර්ගය කිසි ආචාර්‍ය කෙනෙක් වනාහි **"න පාරං දිගුණං පිළිබද්ධ ච්‍රුඩ්ඪමන යනති"** යන ගාථානයින් යම්හෙයකින් එක්වරක් **නිර්‍වාණය** නිවනට පැමිණේද එහෙයින් එකායන යයි කියති, ඒ කිමනොයෙදෙයි; (ඒ) සැබව- මේ අර්ථයට "සකිං අයනො,, යන මේ ව්‍යඤ්ජනයෙන් විය යුතුයි; එක් අයනයක් ඇත්තේ ඒක්ගතිය පැවැත්ම ඇත්තී මෝහට ය,සි මෙසේ අරුත් යොදු ඉදින් කියනු ලබන්නේ නම්("එකායනො යන,,) ව්‍යඤ්ජනය යෙදෙන්නේය; එතකුදු වුවත් අර්ථය දෙපරිද්දෙන් ම නො යෙදෙයි; කුමක් හෙයින්ද යත්? මේ සතිපට්ඨාන සූත්‍රයෙහි පූර්භාග මාර්ගය තමා අදහස්කළ බැවිනි; ඒ එසේමැය-කායාදිවූ සිව්අරමුණෙහි පැවති පූර්භාග සතිපට්ඨාන මාර්ගය මෙහි අදහස් කරන ලද්දේය; ලොකොත්තර (සතිපට්ඨානමාර්ගය)

---

82 **භිනානු කම්පි**= (සත්වයන් කෙරෙහි) හිතයෙන් අනුකම්පා කරන සුලුවූ; **ජාතිඛයඤාන දස්සි**= ජාතික්ෂයාඥානදර්ශිවූ; (තථාගත යන් වහන්සේ) **එකායනං**= එකා යන සඞ්ඛ්‍යාතවූ; මග්ගං යම් මාර්ගයක්; **පජානාති**= දැනගත්සේක්ද; **එතෙන මග්ගෙන**= මේ මාර්ගය කරණකොටගෙන; **පුබ්බෙ**= පූර්‍වයෙහිවූ; (යම් ආර්‍යකෙනෙක් වූවාහුද ඔවුහු;) **ඔඝං**= (කාමාදි) චතුරොඝය; **අතංසු**= තරණය කළාහුය; **යෙව**= (අනාගතයෙහි)යම් ආර්‍ය කෙනෙකුත්(වන්නාහුද ඔවුහුද;)**තරිංසුනති**= (මේ මාර්ගයෙන් චතුරොඝය) තරණය කරන්නාහුය; **තරනති**= (වර්‍තමාන යෙහි ආර්‍යයෝ ද චතුරොඝය) තරණය කෙරෙත්.

අදහස් නො කරන ලදී; හෙද නො එක්වර ම පැමිණෙයි, .ඒ (පූජිභාග මාගීයාගේ) නො එක් අයනය ද වෙයි.

එකායන මාගීය පිළිබඳ ධම් සාකච්ඡා පූජියෙහි ද මේ පදයෙහි (අර්ථය පිළිබඳව) මහතෙර වරුන්ගේ ධම්සාකච්ඡා පහළවූයේ ම ය. **තිපිටක චුල්ලනාග** සථවිරයෝ පූජිභාග සතිපඨාන මාගීය,යි කීහ; උන්වහන්සේගේ ආචාය්‍යවූ **තිපිටක චුල්ල සුමම** සථවිරයෝ වනාහි මිශ්‍රක මාගීයයි කීහ; "සවාමිනි! පූජිභාගය,,යි "ඇවැත්නි! මිශ්‍රක මාගීය,,යි; ආචාය්‍යයන් නැවත නැවත කියනකල්හි ප්‍රතිබාහණය නොකොට ශිෂ්‍යවූ චුල්ලනාග සථවිරයෝ නිශ්ශබ්ද වූහ; ප්‍රශනය විනිශ්චය නො කොට ම නැගී ගියහ; ආචාය්‍ය සථවිරයන් වහන්සේ නහන කොටුවට යන්නාහු මාවිසින් මිශ්‍රක මාගීය,යි කියන ලද චුල්ලනාගයෝ පූජිභාග මාගීය,යි ගෙන ව්‍යවහාර කෙරෙති, මෙහි විනිශ්චය කවරේදෝ හෝ,යි සූත්‍රාන්තය මූලපටන් (අර්ථ) පරිවතීනය **කරමින් යො හි කොචි භික්ඛවෙ! ඉමෙ චත්තාරො සතිපඨානෙ එවං භාවෙය්‍ය සත්ත වස්සානි** යන මේ සථානයෙහි අර්ථ සැලකූහ. ලොකොත්තර මාගීය ඉපිද සත් වසක් සිටින්නෙක් නම් නැති මා විසින් කියන ලද මිශ්‍රක මාගීය නො ලැබෙයි, චුල්ලනාගයන් දක්නා ලද පූජිභාග මාගීය ම ලැබේයයි දැන (එද වස්) අවවක් පොහොයෙහි ධම්ශ්‍රවණය සොඹාකළ කල්හි ගියහ; පෙරාණිකා සථවිරවරයෝ ධම්ශ්‍රවණය ප්‍රියකරන්නාහු වෙත් ල, (කාලඝොඹා) ශබ්දය අසා ම මම පළමුකොට යෙම්, මම පළමුකොට යෙම්,යි එක්වරින් ම රැස්වෙත් ල; එදවස් ද චුල්ලනාග තෙරුන්ට දෙශනාවාරය විය, එහෙයින් ධම්සභායෙහි හිඳ විජිතිපත ගෙන පූජිගාථාව වදාළකල්හි අසුන් පිටපස සිටියාවූ තෙරුන්ට "රහසිගතව හිඳ කියන්නෙම්,,යි මෙමබඳු සිතක් නොවිය, යම් හෙයකින් පුරාණ තෙරුන් වහන්සේ දෙස් පහළ නොකරන්නහු වෙත්ද, තමාගේ රුවියම ඉෂ්ඨාභාරයක් මෙන් ඔසවාගෙන නො හැසිරෙත්ද, කාරණය ම ගනිත් ද, අකාරණය හරිත්ද එහෙයින් චුල්ලසුමම සථවිරයන් වහන්සේ ඇවැත්නි චුල්ලනාගය,යි කීහ; හෙතෙම ආචාය්‍යයන්ගේ ශබ්දය මෙනැයි ධම්දෙශනාව තබා කිම? වහන්සැ යි කිය; ඇවැත්නි චුල්ලනාගය! මා කියනලද මිශ්‍රක මාගීය තෙමේ නො ලැබෙයි, තොප කී පූජිභාග සතිපඨාන මාගීය ම ලැබේ යයි; චුල්ලනාග සථවිරයෝ සිතූහ – අපගේ ආචාය්‍යයෝ සම්පය්‍යාපන්නවූහ, ත්‍රෛපිටකයහ, බහුශ්‍රැතයහ, මෙබඳුවූ නම් භික්ෂුවක් හටද මේ ප්‍රශනය ඇලළීයෙයි, අනාගතයෙහි (ඇතිවන) මාගේ භ්‍රාතෘහු මේ ප්‍රශනයෙහි ව්‍යාකූලවන්නාහුය, සූත්‍රයක් ගෙන මේ ප්‍රශනය නිශ්චල කරන්නෙම්,යි ප්‍රතිසමභිදා මාගීයෙන් (නිදර්ශනයක් ගෙනදක්වා) පූජිභාග සතිපඨාන මාගීය එකායනමාගීය,යි කියනුලැබේ.

83 මඟහා නඤ්ඤිකෝ සෙට්ඨෝ සච්චානං චතුරෝ පද
විරාගෝ සෙට්ඨෝ ධ ම්මා නං දිපදානඤ්ච චක්ඛුමා

84 එසෙව මඟෙහා නත්ථඤ්ඤෝ දස්සනස්ස විසුද්ධියා
එතං හි තුමෙහ පටිපජ්ජථමාරසෙසනං පමොහනං
එතං හි තුමෙහ පටිපන්නා දුක්ඛස්සන්තං කරිස්සථ,,සී.

(=සියලු මාර්ගයන් අතුරෙන් සම්‍යග්දෘෂ්ට්‍යාදි අටකින්යුත් ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය උතුම්වෙයි; සියලු සත්‍යයන් අතුරෙන් "දුක්ඛං අරියසච්චං,, යනාදීන් දැක්වූ සතරපදයෝ උතුම් වෙති; සඞ්ඛතාදි සියලු ධර්මයන් අතුරෙන් නිර්වාණසඞ්ඛ්‍යාතවූ විරාගධර්මය උතුම් වෙයි. දෙපාමිනිවත්තවුන් අතුරෙන් පසෙක්මිනි තථාගත තෙම උතුම්වෙයි.

දර්ශනවිශුද්ධිය පිණිස මේ උතුම්ය,යි දැනුවූ අවමඟහි ම වෙයි අන් මඟක් නොමැති; තෙපි මේ මඟ ම පිළිපදිවු, මේ අවමඟ මාරයා මුලාකරන්නේය තෙපි මේ මඟට පිළිපන්නාහු සියලු සසරදුක කෙළවර කරන්නාහුය.)

මෙසේ පාලිධර්මසඞ්ඛ්‍යාතසූත්‍රයක් ගෙනහැර තැබූහ.

මඟෙහා යනු කුමන අර්ථයකින් "මඟහ,, නම් ඒද? නිවනට පැමිණෙන අටින් ද නිවන් කැමතියන්විසින් මැඟියයුතු අටින් ද "මඟහ,

---

83. **මඟහානං**= (ජඞ්ඝ මාර්ගදීවූ හෝ වාෂපවිදූෂපිගත වූ හෝ යම් මාර්ගකෙනෙක් වෙත්ද ඒ සියලු) මාර්ගයන් අතුරෙන්; **අඤ්ඤිකෝ**= (සම්‍යග් දෘෂ්ට්‍යාදි අෂ්ටාඞ්ගයන් විසින්) මිථ්‍යාදෘෂ්ටි ආදි අටදෙනාගේ ප්‍රහාණය කරමින් නිවන් අරමුණු කොට සිව්සස්හි දුඃඛපරිජ්ඤානාදි කෘත්‍යය (සිඞ්ක කරන්නාවූ) අෂ්ටාඞ්ගික ආර්ය්‍යමාර්ගයතෙම; **සෙට්ඨෝ**= උතුම්වෙයි; **සච්චානං**= (වාක්සත්‍යය හෝ සම්මුතිසත්‍යය හෝ දෘෂ්ටිසත්‍යය හෝ පරමාර්ථ හෝ වේවා මේ සියලු) සත්‍යයන් අතුරෙන්; **චතුරෝපදං**= (පරිඥාසත්‍යය තව්‍යාදි අර්ථයෙන් "දුක්ඛං අරියසච්චං,, යනාදිවූ) සතරපදයෝ ශ්‍රේෂ්ඨ වෙති; **ධම්මානං**= ("යවතා භික්ඛවෙ! ධම්මා සඞ්ඛතා වා අසඞ්ඛතා වා විරාගෝ තෙසං අග්ගමක්ඛායති,,යි වදාළබැවින් ප්‍රත්‍යය සම්භූතපන්නාදිවූ) සියලු ධර්මයන් අතුරෙන්; **විරාගෝ**= (නිර්වාන සඞ්ඛ්‍යාතවූ) විරාගය **සෙට්ඨෝ**= උතුම්වෙයි; **දිපදානංච**= (සියලු ම දිව්‍යමනුෂ්‍යාදි භෙද ඇති) දෙපා ඇත්තවුන් අතුරෙන් **චක්ඛුමා**= (පඤ්චචක්ෂුසින්) චක්ෂුර්මත්වූ තථාගතතෙම; **සෙට්ඨෝ**= ශ්‍රේෂ්ඨවෙයි.

84 **දස්සනස්ස**= (මාර්ගඵලසඞ්ඛ්‍යාතවූ) දර්ශනයාගේ; **විසුද්ධියා**=විශුද්ධිය පිණිස; **එසෝ + එව මඟෙහා**= (යම් මාර්ගයක් මාවිසින් ශ්‍රේෂ්ඨය,යි කියන ලද්දේද) මේ තෙමේ ම මාර්ගය වෙයි; **අඤ්ඤෝ**= අනිත් මාර්ගයෙක්; **නත්ථි**= නැති; **තුමෙහ**= තෙපි; **එතං හි**= මේ මාර්ගය ම; **පටිපජ්ජථ**= පිළිපදිවු; **එතං**= මේ අෂ්ටාඞ්ගිකමාර්ගය; **මාරස්සපමොහනං**= මාරයා මුලාකරන්නේය; **තුමෙහ**= තෙපි; **එතං හි**= මේ අෂ්ටාඞ්ගිකමාර්ගයට ම; **පටිපන්නා**= පිළිපන්නාහු; **දුක්ඛස්ස**= සියලු ම වෘත්තදුඃඛයාගේ; **අන්තං**= අන්තය හෙවත් කෙළවර; **කරිස්සථ**= කරන්නාහුය.

නම්; **සත්තානං විසුද්ධියා** යනු රාගාදි මලයන්ගෙන් ද අභිඛ්‍යාවිෂම ලෝභාදිවූ උපක්ලේශයන්ගෙන් ද උපක්ලිෂ්ටවූ සිත්ඇති සත්වයන්ගේ විශුද්ධිය පිණිස; ඒ එසේමැයි- මේ අෂ්ටාඩ්ගිකමාර්ගයෙන් ම මෙයින් කල්පලක්ෂයක් අධිකකොටඇති සාරාසඞ්ඛ්‍යයක්හුගේ මතුයෙහි එකම කල්පයක පහළවූ තණ්හඞ්කරමේධඞ්කරසරණඞ්කරදීපඞ්කරනම්වූ බුදු වරුන් ආදිකොට ශාක්‍යමුනීන්ද්‍රයන් අවසන්කොටඇති නො එක් සම්‍යක් සම්බුද්ධයෝ ද නො එක් සියගණන් ප්‍රත්‍යේකසම්බුද්ධයෝ ද ගණන්මඟ ඉක්මැ සිටි ආර්‍යශ්‍රාවකයෝ ද යන මේ සත්වයෝ සියලු චිත්තමලයන් ප්‍රවාහය කොට පරමවිශුද්ධියට පැමිණියාහුය; රූපමලයාගේ වශයෙන් වනාහි අපිරිසුදුබව පිරිසුදුබව යන දෙදෙනාගේ පැනවීමෙක් මැ නැති; ඒ එසේමැයි-

85. "රූපෙන සඞ්කිලිට්ඨෙන සඞ්කිලිස්සන්ති මානවා
රූපෙ සුද්ධෙ විසුජ්ඣන්ති අනක්ඛාතං මහෙසිනා,,

86. "චිත්තෙන සඞ්කිලිට්ඨෙන සඞ්කිලිස්සන්ති මානවා
චිත්තෙ සුද්ධෙ විසුජ්ඣන්ති ඉති වුත්තං මහෙසිනා,,

(කිලිටුවූ රූපයෙන් සත්වයෝ කිලුටු වෙති, රූපය පිරිසුදුවූකල්හි විශුද්ධියට පැමිණෙති සි, මහර්ෂිවූ තථාගතයන්විසින් නො වදරනලද.

කිලුටුවූ සිත හේතුකොටගෙන සත්වයෝ කිලුටු වෙති සිත විසුද්ධවූකල්හි විශුද්ධියට පැමිණෙත් යයි මහර්ෂිවූ තථාගතයන්විසින් වදරනලද්දේය.)

වදාළේමැයි- **චිත්තසඞ්කිලෙසා භික්ඛවෙ! සත්තා සඞ්කිලිස්සන්ති චිත්තවොදානා විසුජ්ඣන්තීයි.** ඒ චිත්තයාගේවිශුද්ධභාවයද මේ සතිපට්ඨාර්ගයෙන් වෙයි; එහෙයින් වදාළහ- "**සත්තානං විසුද්ධියා,,යි. සොකපරිදේවානං සමතික්කමාය** යනු ශොකයාගේ ද පරිදෙවයාගේ ද **ඉක්මවීම පිණිස ප්‍රහාණය පිණිස** යන අර්ථයි; ඒ එසේමැය- මේ සතරසතිපට්ඨානසඞ්ඛ්‍යාතවූ මාර්ගයතෙම වඩනලදදේ සත්ත්වනිමහාමාත්‍යාදීන්ට

---

85. **සඞ්කිලිට්ඨෙන**= රජස්ආදීන්විසින් කිලිටුවූ; **රූපෙන**= රූපය හේතුකොටගෙන; **මානවා**= සත්වයෝ; **සඞ්කිලිස්සන්ති**= කිලිටු වෙති; **රූපෙ**= රූපය; **සුද්ධෙ**= රජාදීන්ගේ අපගමයෙන් ශුද්ධවූ කල්හි; **විසුජ්ඣන්ති**= විශුද්ධියට පැමිණෙත් යයි; **මහෙසිනා**= මහර්ෂිවූ තථාගතයන්විසින්; **න අක්ඛාතං**= ප්‍රකාශනොකරනලද.

86. **සඞ්කිලිට්ඨෙන**= රාගාදිකෙලෙශමලයන් විසින් කිලුටුවූ; **චිත්තෙන**= සිතහෙතුකොටගෙන; **මානවා**= සත්වයෝ; **සඞ්කිලිස්සන්ති**= කිලුටු වෙති; **චිත්තෙ**= සිත; **සුද්ධෙ**= රාගාදීන්ගේ ප්‍රහාණයෙන් පිරිසුදුවූ කල්හි; **විසුජ්ඣන්ති ඉති**= විශුද්ධියට පැමිණෙත් යයි; **මහෙසිනා**= මහර්ෂිවූ තථාගතයන්විසින්; **වුත්තං**= වදරනලදී.

මෙන් ශොකයාගේ ඉක්මවීම පිණිස ද, පටාචාරාදීන්ට මෙන් පරිදෙව යාගේ ඉක්මවීම පිණිස ද පවතී; එහෙයින් වදාළහ- "සොකපරිදේවානං සමතික්කමාය,,යී. තවද මෙහි කියයුතු විශෙෂයෙක් ඇති, සත්‍යතති මහාමාත්‍යතෙමේ-

87. "යං පුබ්බෙ තං විසොධෙහි පච්ඡා තෙ මාහු කිඤ්චනං
මජ්ඣෙ වෙ නො ගහෙස්සසි උපසන්තො චරිස්සසි,, යන.

(-තට පූර්ව්‍යජන්මයෙහි යම් කර්මයක්හෙවත් අතීත සංස්කාරයන්නිසාඋපන්න ක්ලෙශ ධර්ම සමූහයක් වේද එය විශොධනය කරව, පසුව අනාගතසංස්කාරයන් නිසා උපදින රාගාදි කිසි ධර්මයකුදු නානමක් වේවා; ඉදින් මධ්‍යයෙහි [පවත්නා භවයෙහි රූපාදි ධර්මයන්] නොගන්නෙහි නම් එකල ක්ලෙශොපසම්යෙන් සන්සිදුනේ හැසිරෙන් නෙහිය.)

මේ ගාථාව අසා සිව්පිළිඹියා සමග රහත් බවට පැමිණියේය. පටාචාරතොමෝ-

88. "නසන්ති පුත්තා තාණාය න පිතා නපි බන්ධවා
අන්තකෙනාධිපන්නස්ස නත්ථි ඤාතිසු තාණතා,, යන

(සමරහුවිසින් මඩනාලද සත්වයාහට පිහිට පිණිස පුත්‍රයෝ නො පවත්නාහුය, පිය තෙමේ ද නො පවතී, සෙසු ඥාතිසුහෘදයෝ ද ප්‍රතිෂ්ඨාපිණිස නොවෙත්, කිසිඋපායකිනුදු මරණයෙන් නො වැළකියහැකිහෙයින් නැයන්කෙරෙහි පිහිටවියයුතුබවක් නැති.)

මේ ගාථාව අසා සෝවාන් පෙලෙහි පිහිටියා. යම්හෙයකින් වන්‍දාහි කාය වෙදනා චිත්තධර්මසඞ්ඛ්‍යාතවූ අනුපස්සනාධර්මයන් අතුරෙන් කිසි ධර්මයක් ආමිෂිණය නො කොට භාවනාවක් නම් නැද්ද, එහෙයින් ඔවුහු ද මේ මාගීයෙන් ම ශොකපරිදෙවයන් ඉක්මවූවාහුය,යි දතයුත්තාහුය.

---

87. **නෙ=** තව; **පුබ්බෙ=** පූර්ව්‍යජන්මයෙහි අතීතසංස්කාරයන් නිසා **යං කෙලෙශධම්මසමූහයක් වීද; තං=** එය; **විශොධෙහි=** නො පැවැත්ම කිරීමෙන් විශොධනය කරව; **පච්ඡා=** අනාගතභවයෙහි; **කිඤ්චනං=** අනාගතසංස්කාරයන් නිසා උපදනා රාගාදි කිසි ධර්මයක්; **මා + අහු=** නානමක් වේවා; **මජ්ඣෙ=** වර්තමාන භවයෙහි (මධ්‍යයෙහි;) **වෙ=** ඉදින්; **නො ගහෙස්සසි=** ප්‍රත්‍යුත්පන්නරූපාදිධර්මයන් නොගන්නෙහි නම්; (එකල්හී) **උපසන්තො=** ක්ලෙශොපශම්යෙන් සන්සිදුනේ; **චරිස්සසි=** හැසිරෙන්නෙහි.

88 **අන්තකෙන=** මරහුවිසින්; **අධිපන්නස්ස=** මර්දනාලද සත්වයා හට; **තාණාය=** ප්‍රතිෂ්ඨා පිණිස; **පුත්තා=** පුත්‍රයෝ; **න සන්ති=** නො පවත්නාහුය; **පිතා=** පියතෙමේ ද; **න=** ප්‍රතිෂ්ඨාපිණිස නො පවති; **බන්ධවා අපි=** සෙසු ඥාති සුහෘදයෝද **න=** ප්‍රතිෂ්ඨාපිණිස නොවෙත්; **ඤාතිසු=** නැයන්කෙරෙහි; **තාණතා=** (කිසි උපායකිනුදු මරණයෙන් නොවළකා ලියහැකිහෙයින්) පිහිටවියයුතුබක්; **නත්ථි=** නැති.

දුක්ඛදෞමනස්සානං අත්ථඞ්ගමාය යනු කායික දුඃඛයාගේ ද චෛතසික දෞර්මනස්‍යයාගේ ද යන මොවුන් දෙදෙනාගේ අස්තඞ්ගමය පිණිස නිරුඛකිරීම පිණිස යන අර්ථයි; ඒ එසේමැය- මේ මාගීයතෙමේ භාවනා වශයෙන් වඩනාලද්දේ තිස්සසථවිරාදින්ට මෙන් කයෙහි උපදනා දුක ද ශක්‍රාදීන්ට මෙන් සිත්හි උපදනා දෞර්මනස ද අතුරුදහන්කිරීම පිණිස පවතී; එහි මෝතොමෝ අර්ථදක්වීම වෙයි-

තිස්සතෙර. සැවැත්නුවර තිස්සනම් කෙළෙඹිපුත්‍රයෙක් සතළිස්කෙළක් හිරණ්‍යය හැරදමා පැවිදිව මිනිසුන්ගේ හැසිරීම් රහිත වනයෙහි වෙසෙයි; ඔහුගේ ඤාතිවුබෑයා බිරිඳ ඇවු ඔහු ජීවිතයෙන් තොර කරවූ ය,යි පන්සියයක් සොරුන්ගැවී; ඒ සොරුගොස් තෙරුන් පිරිවරා හුන්නාහුය; සථවිරතෙමේ උපාසකවරුනි! කුමක්හෙයින් ආවහුදැ?යි කියය; තොප ජීවිතයෙන් තොරකරන්නෙමු,යි කියා ආමිහ,යි; උපාසක වරුනි! ඇපයක් ගෙන අද එක රැයක් මට දිවි දෙවුය,යි; මහණ මේ තැන්හි තට කවරෙක් ඇප වන්නේදැ?යි; තෙරුන්වහන්සේ මහත්වූ ගලක් ගෙන දෙකලවේ ඇට බිඳ උපාසකවරුනි! ඇපය වරිදැ?යි කීහ; ඔවුහු එතැනින් නික්ම සක්මන් හිස ගිනිදල්වා වැදහොත්තාහුය; වෙදනාව විෂකම්භණය කොට ශීලය ප්‍රත්‍යවෙක්ෂාකරන්නාවූ තෙරුන් වහන්සේට පරිශුඛවූ ශීලය නිසා ප්‍රීතිප්‍රමෝද්‍යය උපන; ඉක්බිති අනුක්‍රමයෙන් විදර්ශනා වඩන්නේ තුන්යම්රෑ මහණදම් කොට අරුණනගින කල්හි රහත්බවට පැමිණියේ මේ උදන් ඇනී-

89. "උභො පාදානි භින්දිත්වා සඤ්ඤඤ්ඤමිස්සාමි වෝ අහං
අට්ඨිකාමි හරායාමි සරාගමරණං අහං,,

90. "එවාහං චිනතයිත්වාන යථාභූතං විපස්සිසං
සම්පත්තෙන අරුණුග්ගමනේ අරහත්තං අපාපුණිං,,යි.

(මෙම දෙපය බිඳ විහසක් මාහරනව හිමිස්සෙමි; තවද මම රාගසහිතවූ මරණය පිළිකූල්කෙරෙමි ලජ්ජාකෙරෙමි. මම මෙසේ සිතා අවිපරීතව අනිත්‍යාදිවශයෙන් විදර්ශනා කෙළෙමි, අරුණෝදීම පැමිණිකල්හි රහත්බවට පැමිණියෙමි.)

---

89. අහං= මම; උභො පාදානි= දෙපය; භින්දිත්වා= බිඳ; සඤ්ඤඤ්ඤමිස්සාමි= (එක් රැයක් මා හරනතව) හිමිස්සෙමි; වෝ,යනු පදපූරණයෙහි නිපාතයි.) අහං= මම; සරාගමරණං= රාගසහිතවූ මරණය; අට්ඨිකාමි= පිළිකූල්කෙරෙමි; හරායාමි= ජුගුප්සා කෙරෙමි.

90. අහං= මම; එවං= මෙසේ; චිනතයිත්වාන= සිතා; යථාභූතං= යථාසවභාවවශයෙන් හෙවත් අවිපරීතව; විපස්සිසං= අනිත්‍යාදිවශයෙන්; විද්ශීනාකෙළෙමි; අරුණුග්ගමනේ= අරුණොත්ගමයෙ; සම්පත්තෙන= පැමිණිකල්හි; අරහත්තං= රහත්බවට; අපාපුණිං= පැමිණියෙමි.

තිසඤ් හික්ඛූහු. අන්‍යවූ ද භික්ෂූහු තිස්නමක් භාග්‍යවතුන්වහන්සේ සමීපයෙහිකමටහන් ගෙන අරණ්‍යවිහාරයෙක්හි වස් එලඹ ඇවැත්නි! තුන්යම්රෑ මහණදම ම කළයුතුයි, එකිනෙකා සමීප යට නො පැමිණියයුතුය,යි කියා වාසයකළාහුය; එක් ව්‍යාඝ්‍රයෙක් අවුත් මහණදම් කොට අලුයම්කාලයෙහි නිදාට බැසගන්නාවූ ඔවුන් අතුරෙන් එකෙකි භික්ෂුව ගෙන යයි; කිසිවෙක් මා ව්‍යාඝ්‍රයෙක් ගත්තේය,යි ශබ්දයකුදු නො නික්මවිය; මෙසේ භික්ෂූන් පසළොස්දෙනෙක් කැකල්හි පොහෝදිනයෙහි ඇවැත්නි! සෙස්සෝ කොහිදැ?යි විචාරා පසුව (ව්‍යාඝ්‍ර යාගත්බව) දැන දැන් ගන්නාලද්දාහුවිසින් ගන්නාලද්දෙම්සිකියයුතුය,යි කියා වාසයකළාහුය; ඉක්බිති එක්තරා තරුණ භික්ෂුවක් ව්‍යාඝ්‍රතෙම පළමුපරිද්දෙන්ම ගත්තේය; ඒ භික්ෂුතෙම සවාමීනි! ව්‍යාඝ්‍රතෙමේය,යි කිය; භික්ෂූහු සැරයටි ද ගිනිහුල් ද ගෙන මුදන්නෙමු,යි ලුහුබැන්දාහුය. ව්‍යාඝ්‍රතෙම භික්ෂූන් නො යාඟැකි මහඇති බුන්ඉවුරුඇති තැන කට තැබී ඒ භික්ෂුව පාදඛණ්ඩය පටන් කන්ට පටන්ගත්තේය; සෙසු භික්ෂූහු ද සත්පුරුෂය! මෙවිට අපවිසින් කළයුත්තක් නැත භික්ෂූන්ගේ විශෙෂයනම් මෙබඳු තැන්හි දක්නාලැබේය,යි කීවාහුය; ඒ මහණ ව්‍යාඝ්‍රමුඛයෙහි හොත්තේ ම ඒ වෙදනාව යටපත්කොට විදර්‍ශනාවඩන්නේ ගොප්මස දක්වා කැකල්හි සෝවාන්වැ දණ දක්වා කැකල්හි සකෘදාගාම්වැ නැබ දක්වා කැකල්හි අනාගාම්වැ හෘදය රූපය නො කැකල්හි ම සිව්පිළිසිඹියා සමඟ රහත්බවට පැමිණ මේ ප්‍රීතිවාක්‍යය පහළකෙළේය-

91. සීලවා වතසම්පන්නෝ පඤ්ඤවා සුසමාහිතෝ
මුහුත්තං පමාදමඤ්ඤාය ව්‍යග්ඝෝ නොරුධ මානසෝ
පඤ්ඣරසම්හි ගම්භීරා සිලාය උපනීතකෝ,,

92. "කාමං බාදතු මං ව්‍යග්ඝෝ හඤ්ඤතා කායෝ අචෙතනෝ
පටිලද්ධෙ කම්මඤානම්හි මරණං හෙහිති භද්දකං,,යි.

---

91. **සීලවා**= සිල්වත්වූයෙම්; **වතසම්පන්නෝ**= ව්‍රතයෙන් සම්පූර්ණ වූයෙම්; **පඤ්ඤවා**= කර්‍මස්ථානප්‍රඥාවෙන් නුවණැත්තෙම්; **සුසමාහිතෝ**= මනාකොට සමාධියෙහි පිහිටුවනලද සිත්ඇත්තෙම්; **මුහුත්තං**= මොහොතක් පමණකල්; **පමාදං අඤ්ඤාය**= ප්‍රමාදයට පැමිණ (සිටියාවූ මම) **ව්‍යග්ඝෙන**= ව්‍යාඝ්‍රයෙකුවිසින්; **ඔරුධමානසෝ**= මඩනාලද සිත්ඇත්තෙම්; **පඤ්ඣරසම්හි**= නියපදුරෙහි ලා; **ගම්භීරා**= ගෙන; **සිලාය**= පර්‍වතයෙහි; **උපනීතකෝ**= පමුණුවනලද්දෙම් වෙම්.

92. **ව්‍යග්ඝෝ**= ව්‍යාඝ්‍රතෙම; **කාමං**= කැමතිපරිද්දෙන්; **මං**= මා; **බාදතු**= හක්ෂණය කෙරේවා (කාමා;) **අචෙතනෝ**= චෙතනාරහිතවූ; **කායෝ**= මේ කය; **හඤ්ඤතා**= (මෙරමාවිසින්) කැයුත්තේ වෙයි; **පටිලද්ධෙ**= ප්‍රතිලබ්ධවූ; **කම්මඤානම්හි**= කර්‍මස්ථානය ඇතිකල්හි; **මරණං**= මරණය; **භද්දකං හෙහිති**= සොඳුරු වන්නේය.

(=සිල්වත්වූ වුතයෙන් සම්පූර්ණවූ කම්ස්වකාතප්‍රඥාවෙන් පැනවත්වූ සමාධියෙහි පිහිටුවනලදසිත්ඇතිමොහොතක් පමණ කල්ප්‍රමාදයට පැමිණ සිටියාවූ මම ව්‍යාඝ්‍රයෙකු විසින් මඩනාලදසිත්ඇත්තෙම් නියපඳුරෙහිලා හෙන පර්වතයට පමුණුවන ලද්දෙමි වෙමි.

ව්‍යාඝ්‍රතෙමේ මා කැමති පරිද්දෙන් කාවා, සිත්නැති මේ කය අනුන් විසින් කෑ යුත්තේයැ. ලැබූ කම්වහන්ඇතිකල්හි මරණය සොඳුරු වන්නේය.)

පිනමල්ල තෙර. අන්‍යවූ ද පිනමල්ලනම්වූ ස්ථවිරකෙනෙක් ගිහිකලැ තුන් රජයෙක්හි කෙහෙලි ගෙන තාම්‍රපර්ණීදිවයිනට පැමිණ රජු දැක රජුවිසින් කළ අනුග්‍රහඇත්තේ එක්දිනක් කිලෙසුජ කාසනශාලාවාරයෙන් යන්නේ **රූපං භික්ඛවෙ! න තුම්හාකං නං පජහථ නං වෝ පහීනං දීඝරත්තං හිතාය සුඛාය භවිස්සති** යි නතුම්හාකවගීය අසා මෙසේ සිතී; ''රූපය තමාගේ නො ම වේලි, වෙදනාව තමාගේ නො වේලි,,යි; හෙතෙම් එය ම අඩකුසය කොට නික්ම මහවෙහෙරට ගොස් පැවිදි ඉල්වා පැවිදිවූ යේ උපසපන්වූයේ උභයමාතිකා පුහුණු කොට භික්ෂූන් නිස්නමක් ගෙන ''ගවරවාලිය අඹගණ,, නම් ස්ථානයට ගොස් මහණදම් කෙළේය; පා නො වහන කල්හි දෙදණින් සක්මන්කෙරෙයි; එක් මුවවැද්දෙක් රාත්‍රියෙහි එසේ සක්මන්කරන ඒ තෙරුන් මුවෙකැයි හඟිමින් පහළේය; අඹයටිය (තෙරුන් සිරුර) විනිවිද ගියා; හෙතෙම් ඒ සැත බැහැරකරවා පහර මුඛයන් තණවැටින් පුරවා ගලතලමතුයෙක්හි තමා හිඳුවා ඔවස් කරවාගෙන විවසුන් වඩා සිව්පිළිසිඹියා සමග රහත්බවට පැමිණ කැරීම් ශබ්දයෙන් පැමිණි භික්ෂූන්ට (අතීතය) ප්‍රකාශකොට මේ ප්‍රීතිවාක්‍යය පහළකෙළේය.

93. ''භාසිතං බුද්ධසෙට්ඨස්ස සබ්බලෝකගහවාදිනෝ
න තුම්හාකං ඉදං රූපං නං ජහෙය්‍යාථ භික්ඛවෝ!,,

94. ''අනිච්චා වත සඞ්ඛාරා උප්පාදවයධම්මිනෝ
උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති තෙසං වූපසමෝ සුඛෝ,, යි,,

---

93. **භික්ඛවෝ**= මහණෙනි!; **ඉදං රූපං**= මේ (භූතොපාදායහෙදයෙන් අටවිසිවැදෑරුම්වූ) රූපස්කන්ධය; **තුම්හාකං නං**= තොපගේ නොවේ; **නං**= ඒ රූපය; **ජහෙය්‍යාථ**= හැරපියවු,යි; **සබ්බලෝකගහවාදිනෝ**= සියලු ලොකයෙහි අග්‍රවාදීවූ; **බුද්ධසෙට්ඨස්ස**= සර්ව්‍ඥ ශ්‍රේෂ්ඨයන්විසින්; **භාසිතං**= වදරනලද.

94. **සඞ්ඛාරා**= සියලු සංස්කාරයෝ; **වත**= එකාන්තයෙන්; **අනිච්චා**= අනිත්‍යයහ; **උප්පාදවයධම්මිනෝ**= ඉපදීම හා විනාශය සවභාව කොට ඇත්තාහුය; **උප්පජ්ජිත්වා**= ඉපිද; **නිරුජ්ඣන්ති**= නිරුඬවෙති; **තෙසං**= ඒ සංස්කාරධර්මයන්ගේ; **වූපසමෝ**= සංසිදීමවූ (අසංස්කෘත නිර්‍වාණධර්මය ම;) **සුඛෝ**= සැපවූයේය.

(-මහණෙනි! මේ රූපය තොපගේ නොවෙයි, එය හැරපියවු යයි සියලු ලොක යෙහි අග්‍රවාදීවූ සම්මැදුග්‍රෙෂ්ඨයන්වහිසින් වදරතලද්දේය.

සියලු සංස්කාරධර්මයෝ එකාන්තයෙන් අනිත්‍යයහ, උත්පාදව්‍යය සවභාවකොට ඇත්තාහුය, ඔවුහු ඉපිද නිරුඩවෙති, ඒ සංස්කාරයන්ගේ සංසිදීමවූ අසංස්කෘත ලක්ෂණවූ නිර්වාණය ම සැපවෙයි.)

ඉක්බිති උන්වහන්සේට භික්ෂූහු මෙසේ කීවාහුය; "සවාමිනි! ඉදින් සම්‍යක් සම්බුඩයන් වහන්සේ අරොග වූ සේක් නම් ඒ කාන්තයෙන් මුහුදු මතුයෙන් අතදිඟුකොට ඔබගේ හිස පිරිමදින්නාහුය,යි මෙසේ වනාහි මේ එකායන මාර්ගය තෙම තිෂ්‍යසථවිරාදීන්ට මෙන් දුක් නැසීම පිණිස පවත්නේය.

ශක්‍රදෙවෙන්ද්‍ර සක්දෙව්රජ

තෙමේ වනාහි තමහට පහළවූ පස්වැදෑරුම් පෙරනිමිති දැක මරණභයින් තැතිගන්නා ලද්දේ හටගත් දෙම්නස් ඇත්තේ භාග්‍යවතුන්වහන්සේ සමීපයට එළඹ ප්‍රශ්නයක් විමාළේය. හෙතෙම උපෙක්ෂා ප්‍රඥා විසර්ජිතාවඝානයෙහි අසූදහසක් දෙවතාවන් සමඟ සෝවාන් පෙලහි පිහිටියේය; ඔහුගේ ඕ උත්පත්තිතොමෝද නැවත ප්‍රකෘති වූවා ම විය.

සුබ්‍රහ්ම දෙව්පුත්

සුබ්‍රහ්ම නම් දිව්‍යපුත්‍රතෙමේ ද අප්සරාවන් දහසක් පිරිවරතලද්දේ සඟසැපත් අනුභව කෙරෙයි; එහි (=නදුනුයන්හි) පන්සියයක් අප්සරාවෝ (පරසතු) රුකින් මල් නෙලන්නාහු ම ඉන් සැව නිරයෙහි උපන්නාහුය; ඒ දෙව් පුත්තෙම කුමක්හෙයින් මොවුහු කල්‍යවත්දැ,යි විමසන්නේ ඔවුන් නිරයෙහි උපන් බැව් දැක මාගේ ආයු කෙතෙක් දෝ හෝ,යි පරීක්ෂාකරන්නේ තමාගේ ද 'ආයු ගෙවීම දැන ඒ නිරයෙහි ම උපදින බැව් දැක භියපත්වූයේ අතිශයින් මැ හටගත් දෙම්නස් ඇතිවැ මාගේ මේ දෙම්නස ශාස්තෘන් වහන්සේ දුරුකරනසේක, අනිකෙක් නොකෙරේය,යි සෙසු පන්සියයක් අප්සරාවන් ගෙන භාග්‍යවතුන් වහන්සේ සමීපයට එළඹ ප්‍රශ්නයක් විමාළේය.-

95 "නිච්චං උත්‍රාසනමිදං චිත්තං නිච්චං උබ්බිගමිදං මනෝ
අනුප්පන්නෙනසු කිලෙසසු අථෝ උප්පත්ති නෙසු ච
සචෙ අත්ථි අනුත්‍රාසං තමේව අක්ඛාහි පුච්ඡිනෝ,,යි.

---

95 **අනුප්පන්නෙනසු කිලෙසසු**= (සත්දිනකින් උපදනා අපායදුක් සඛ්‍යාතවූ) නූපන් දුක් නිමිත්තකොටද; **අථෝ**= නැවත **උප්පත්තිනෙසුච**= (අපායේහිඋපන් දෙවභනන් දැක) හටගත් දුක් නිමිත්තකොට ද; **ඉදං චිත්තං**=(මාගේ) මේ සිත; **නිච්චං**= (ශොකොත්පත්ති කාලයෙහි පටන්) නිරතුරු **උත්‍රාසනං**= භයට පැමිණියේය; **ඉදං මනෝ**= මේ සිත; **නිච්චං**= නිරතුරු **උබ්බිගං**= උවෙගයට පැමිණියේය; **සචෙ**= ඉදින් **අනුත්‍රාසං**= තැතිනොගැනීමක්; **අත්ථි**= ඇත්නම්; **තං**= එය; **මෙ**= මාවිසින්; **පුච්ඡිනෝ**= විමාරන ලද්දවූ (ඔබ) **අක්ඛාහි**= වදාළමැනව;

(- මෙයින් සත් දිනක් ඇවැමෙන්යම් දුකක් උපදනාහුද ඒ නූපන් දුක් නිමිති කොට ද යලින් නිරයෙහි උපන් පන්සියයක් දෙවඟනෝ දුටුවාහුද ඔවුන් නිමිති කොට උපන්නාවූ දැයි මේ උන්පනහා නුත්පන්න දුක් නිමිතිකොට ශොකා උපන් තැන් පවත් මාගේ සිත නිරතුරු ඇතුලත දවන ලඛන්නාක් මෙන් තැතිගැනුන්සේය නිරතුරු උද්වේගයට පැමිණියේය, යම් හෙයකින් තැතිතොගැනීමක් ඇත්නම් මා විසින් විචාරනලද්දාවූ ඔබ එය මට ප්‍රකාශකොට වදාළ මැනව.)

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔහට මේ වදාළහ.

96 "නාඤ්ඤත්‍රබොජ්ඣඞ්ගා නපසා නාඤ්ඤත්‍ර ඉන්ද්‍රියසංවරා
නාඤ්ඤත්‍ර සබ්බනිස්සග්ගා සොත්ථිං පස්සාමි පාණිනං,,ඉති.

(-බොධ්‍යඞ්ග භාවනාව ද ධුත ධර්ම සඞ්ඛ්‍යාත තපොගුණය ද හැර සත්වයන්ට සුවයක් නොදකිමි, ඉන්ද්‍රිය සංවරය හැර සුවයක් නැති, නිර්වාණය හැර සත්වයන්ට සුවයක් නොදකිමි.)

ඒ දෙව්පුත්තෙමේ දෙසුන් කෙළවර පන්සියයක් අප්සරාවන් සමග සෝවාන් පෙලෙහි පිහිටා ඒ දිව්‍යසම්පත්තිය ස්ථිරකොට දෙව්ලොවට ම ගියේය,යි මෙසේ මේ එකායන මාර්ගය තෙම වඩන ලද්දේ ශක්‍රාදීන්ට මෙන් දෙමිනස අතුරුදහන් වීම පිණිස පවතීය,යි දතයුතු.

ඤ්ඤයස්සඅධිගමාය යනු "ඤ්ඤය,,යි ආශ්‍රවාඛයඥාන්මාර්ගය කියනු ලැබේ; ඒ අශ්‍රවාඛයඥාන මාර්ගයාගේ අධිගමය (=අවබොධය) පිණිස පැමිණීම පිණිසය,යි කියනලද වෙයි; ඒ එසේමැයි- පූර්වභාගයෙහි මේ ලෞකික සතිපට්ඨාන මාර්ගය වඩනලද්දේ ලොකොත්තර මාර්ගයාගේ අධිගමය පිණිස පවතී; එසින් වදාළහ- "ඤ්ඤයස්ස අධිගමාය,,යි, **නිබ්බානස්ස සච්ඡිකිරියාය** යනු තෘෂ්ණා සඞ්ඛ්‍යාත වානයෙන් වෙන්වූ බැවින් "නිර්වාණ,,යැයි ලද නම් ඇති අමෘතයාගේ සාක්ෂාත් කිරීම පිණිස තමා විසින් පසක් කිරීම පිණිසය,යි කියනලද වේ; ඒ සැබවි-මේ මාර්ගය තෙමේ වඩනලද්දේ නිවන්පසක් කිරීම සිඩකරයි; එසින් වදාළහ- නිබ්බානස්ස සච්ඡිකිරියා ය,,යි.

එහි කිසියේත් **සත්තානං විසුද්ධියා,යි** වදාළකල්හි ශොකය ඉක් මවීමාදිය අර්ථවශයෙන් සිඩවූවාහු ම වෙත්ද; එතකුදු වුවත් ශාසන යුකතියෙහි දක්ෂවූවන් තබා අන්‍යයන්ට ප්‍රකට නොවෙති; යම් හෙයකින් භාග්‍යවතුන් වහන්සේ පළමුකොට ජනයා ශාසන යුකතියෙහි දක්ෂකොට පසුව දහම් නො දෙසනසේක්ද ඒ ඒ සූත්‍රයන් ඒ ඒ අර්ථය හඟවනසේක්ද; එහෙයින් මේ සතිපට්ඨාන සූත්‍රයෙහි යම් යම්

---

96 **බොජ්ඣඞ්ගා**= බොධ්‍යඞ්ගභාවනාව ද; **නපසා**= තපොගුණය ද; **අඤ්ඤත්‍ර**=හැර; **නා**= සුවයක් නැති; **ඉන්ද්‍රිය සංවරා අඤ්ඤත්‍ර**= ඉන්ද්‍රිය සංවරය හැර; **නා**= සුවයක් නැති; **සබ්බනිස්සග්ගා අඤ්ඤත්‍ර**= නිර්වාණය හැර; **පාණිනං**= සත්වයන්ට **සොත්ථිං**= සුවයක්; **නපස්සාමි**= නොදකිමි.

අර්ථයක් එකායන මාර්ගය සිඳකෙරේද ඒ ඒ අර්ථය ප්‍රකටකොට දක්වනසේක් **සොකා පරිදේවානං සමතික්කමාය** යනාදිය වදාළහ. නොහොත් එකායන මාර්ගයෙන් සත්වයන්ගේ යම් විශුද්ධියක් යම් හෙයකින් පවතීද ඕ විශුද්ධිතොමෝ ශොකපරිදෙවයන්ගේ ඉක්මවීමෙන් (යම් හෙයකින්) වේද; ශොකපරිදෙවයන්ගේ ඉක්මවීම දුක් දෙම්නසුන්ගේ නිරුඬකිරීමෙන්වේද? දුක්දෙම්නසුන්ගේ නිරුඬ කිරීම ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයාගේ අධිගමයෙන් වේද; අෂ්ටාඞ්ගික මාර්ගයාගේ අධිගමය නිර්‍වාණයාගේ ප්‍රත්‍යක්ෂ කිරීමෙන් වේද; එහෙයින් මේ ක්‍රම යද දක්වනසේක් "සත්තානං, විසුද්ධියාදී වදුරා මේ එකායනමාර්ගයාගේ "සොකපරිදවානං සමතික්කමාය,, යනාදිය වදාළහ. තවදමේ එකයන මාර්ගයාගේ ගුණ කීමකි ඒ එසේ මැයි- යම්සේ භාග්‍ය

එකායන මාර්ග වතුන් වහන්සේ **ධම්මං වෝ භික්ඛවෙ දෙසිස්සාමි ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසාන කල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙස්සාමි** යදිදං **ජ ජකකානි** යි "ජ ජකක, දෙශනාවෙහි අවපද්යකින් ගුණය වදාළසේක්ද;තවද යම්සේ "අරියවංස, දෙශනාවෙහි **චත්තාරෝ මෙ භික්ඛවෙ අරියවංසා අග්ගඤ්ඤ, රත්තඤ්ඤ, වංසඤ්ඤ, පොරාණා අසඞ්කිණ්ණා අසඞ්කිණ්ණපුබ්බා න සඞ්කීයන්ති න සඞ්කීයිස්සන්ති අප්පතිකුට්ඨා සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි** යි නව පදයකින් ගුණය වදාළසේක්ද; (එමෙනි මෙසේ වර්ණ කථනය) කුමක්හෙයින්ද යත්? ඒ භික්ෂූන්ගේ උත්සාහය ඉපදීම පිණිසයැ; සැබව ගුණකථනය අසා ඒ භික්ෂූහු මේ මාර්ගය තෙම ලය තැවීමවූ ශොකයද, වචනයෙන් වැලපීමවූ පරිදෙව්යද,කය ඇසුරුකළ අම්බුරවූ දුකද, සිත ඇසුරුකළ අම්බුරවූ දෙම්නසද, යන් සතර උවදුරු දුරු කෙරේ ල, විශුද්ධියද ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගික මාර්ගයද නිර්‍වාණය ද යන තුන් විශෙෂයන් එලවා ල යි හටගත් උත්සාහ ඇත්තාහු මේ ධර්මදෙශනාව ඉගෙනගතයුතුය, පුහුණුකළයුතුය, ධාරිය යුතුය, වනපොත් කළයුතුය මේ මාර්ගයත් වැඩියයුතුය,යි සිතන්නාහුද; එහෙයින් ඒ භික්ෂූන්ට උත්සාහය උපදවන පිණිස ගුණ වදාළසේක. **කම්බලවාණිජාදිහු** කම්බලාදීන්ගේ ගුණ කථනය මෙනි; ඒ එසේමැයි- යම් සේ ලක්ෂයක් අගනා පඬුපලස් වෙළඳෙකු විසින් පලස් ගනිවුය,යි උද්ඝොෂණය කළකල්හිද මනුෂ්‍යයෝ අසවල් පලසැ,යි පළමුකොට නොදැනගනිත්ද; යම් හෙයකින් දුගඳවූ රළුපහස් ඇති කෙශකම්බල ව්‍යාලකම්බලාදිහු ද කම්බලය,යි ම කියනු ලැබෙත් ද එහෙයිනි; එතකුදු වුවත් යම්විටෙක ඒ වෙළඳ විසින් ගන්ධාරදේශයෙහි උපදවනලද රත්පලසයැ සියුම්යැ උජුවලයැ සුවපහස් ඇත්තේ යැ,යි උද්ඝොෂණය කරනලද්දේ වේද; එවිට යමෙක් පොහොසත් වෙත්ද ඔවුහු ගනිත්, යමෙක් නො පොහොසත්ද ඔවුහුත් දකිනු කැමැත්තාහු වෙත්ද; එපරිද්දෙන් මෑ **එකායනෝ අයං භික්ඛවෙ මග්ගෝ** යි වදාළකල්හි ද අසවල්මගැ,යි පළමුකොට

ප්‍රකට නොවෙයි; යම් හෙයකින් නන්වැදෑරුම් වූ අනෙකප්‍රාණීන්ට මාගී යෝ ද මාගීයයි කියාම කියනු ලැබෙත්ද එහෙයිනි; **සත්තානං විසුද්ධියා** යනාදිය් වදාළකල්හි වනාහි මේ එකායන මාගීය තෙමේ සිව් උවදුරු දුරුකෙරේ ලු, තුන්විශෙෂයන් ඵලවාලූයි හටගත් උත්සාහ ඇත්තාහු මේ දෙශනාව ඉගෙනගතයුතු පුහුණුකළයුතු ධාරියයුතු වන පොත් කළයුතු කොට මේ මාගීයත් වැඩියයුතු කොට සිතන්නාහුය,යි ගුණවදාරන සේක් "සත්තානං විසුද්ධියා,, යනාදිය වදාළහ. ලක්ෂයක් අගනා පාණ්ඩුකම්බල වෙළඳුගේ උපමාව යම්සේද එසේ රත්නපාමොක්ඛ නද සවණී- උදකප්‍රසාදක මාණික්‍යරතන- විශුද්ධ මුක්තා මාණික්‍ය රතන- රෙෂමකප්‍රවාලාදිවූ වෙළඳුන්ගේ උපමා ද මෙහිලා දැක්විය යුත්තාහුය.

යදිදං යනු නිපාතයෑ; "යෙ ඉමෙ,, (=යම් මේ) යන මෙය ඒ නිපාතයාගේ අර්ථයි; **චත්තාරෝ** යනු ගණන් පිරිසිඳීමයෑ; ඒ පදයෙන් එයින් යව(ඌනවෑ,යි සේ) නැති එයින්මතුයෙහි නැතෑ,යි **සතිපට්ඨාන** යන්ගේ පිරිසිඳීම දක්වති; **සතිපට්ඨානා** යනු සතිපට්ඨාන තුනකි- **සතිපට්ඨාන** සමෘතිගොචරය ද තුන්පරිද්දෙකින් පිළිපන් ශ්‍රාවකයන් කෙරෙහි ශාස්තෘහුගේ ප්‍රතිඝානුනය ඉක්මුනු බව ද සමෘතිය ද,යි කියාසි; ඒ එසේමැයි- **චතුන්නං භික්ඛවෙ සතිපට්ඨානානං සමුදයඤ්ච අත්ථඛමඤ්ච දෙසිස්සාමි තං සුනාථ-පෙ-තස්ස ච භික්ඛවෙ! කායස්ස සමුදයෝ ආහාරසමුදයා කායසමුදයෝ** යනාදි තැන්හි **සමෘතිගොචරය සතිපට්ඨානය,යි** කියනුලැබේ; **කායෝ උපට්ඨානං නෝ සති සති උපට්ඨානඤ්ඤව සති ච** යනාදි තැන්හි ද එසේමැයි; එහි අර්ථය නම්? මේ ගොචරයෙහි පිහිටානු,යි "පට්ඨාන" නම්; කවරක් පිහිටාද යත්? සිහිය,යි; සිහියගේ පිහිටීම "**සතිපට්ඨාන**" නම්; නොහොත් ප්‍රධානවූ සිටීම නු,යි පට්ඨාන නම්; සමෘතියගේ ප්‍රස්ථානය "**සතිපට්ඨාන**' නම් "**සතිපට්ඨානඅස්සපට්ඨාන**" ආදිය මෙනි. **තයෝ සතිපට්ඨානා යදරියෝ සෙවති යදරියෝ සෙවමානෝ සත්ථා ගණමනුසාසිතුමරහති** යන මෙහි තුන්පරිද්දෙකින් පිළිපන් ශ්‍රාවකයන්කෙරෙහි ශාස්තෘහුගේ ප්‍රතිඝානුනය ඉක්මුනුබව "සතිපට්ඨාන" යයි කියනලදී; ඒ වචනයාගේ අර්ථ නම්? පිහිටුවියයුතුබැවින් "පට්ඨාන" නම්; "පැවැත්වියයුතුබැවින" යන අර්ථයි; කුමකින් පැවැත්වියයුතුබැවින්ද යත්? සමෘතියෙනි; සමෘති යෙන් යුක්තව පැවැත්ම "සතිපට්ඨාන" නමැ,යි. **චත්තාරෝ සතිපට්ඨානා භාවිතා බහුලීකතා සත්ත බොජ්ඣඞ්ගෙ පරිපූරෙන්ති** යනාදි තැන්හි වනාහි සමෘතිය මැ "සතිපට්ඨාන" යයි කියනුලැබේ; ඒ වචනයාගේ අර්ථය නම්? පිහිටා නු,යි "පට්ඨාන" නම්; එලඹ සිටී අවසක්ඛන්ධය කොට ප්‍රසක්ඛන්ධය කොට පවතී යන අර්ථයි; සමෘතිය ම "සතිපට්ඨාන" නම්; නොහොත් සිහිකිරීම අර්ථයෙන් "සති" නමු, එලඹසිටීම අර්ථයෙන් "පට්ඨාන" නම්; එහෙයින් සතිවූවාත් හෝයෑ පට්ඨානවූවාත් හෝ මෑ නු,යි "සතිපට්ඨාන" නම්; මේ (පසුව කී සමෘතිසඞ්ඛ්‍යාත සතිපට්ඨානය) ම

මෙහි අදහස්කරනලද ඉදින් මෙසේ (සමෘතිය ම සතිපට්ඨාන) ඒනම් කුමක්හෙයින් "සතිපට්ඨානා"යි බහුවචන වීද යත්? සමෘති බොහෝ බැවිනි; (සමෘතිබහුත්වය)සැබව- ඒ සමෘතීහු ආලම්බනභෙදයෙන් බොහෝ වෙති; එකල්හි "මග්ගෝ" යි කුමක්හෙයින් එකවචන වීද යත්? මාර්ගීය යෙන් එකක්බැවිනි; සැබව- මේ සතරසමෘතීහුම මාර්ගීයයෙන් එකත්වයට යෙති! මේ වදරනලද මැයි- **මග්ගොති කෙනට්ඨෙන මග්ගෝ නිබ්බාන ගමනට්ඨෙන නිබ්බානඤ්ඤෙව මග්ගනියට්ඨෙන** ච යයි. තවද මේ සති පට්ඨානයෝ සතරදෙන ම අපරභාගයෙහි කායාදිආලම්බනයන්හි කෘත්‍යය සිද්ධකරමින් නිර්වාණය කරා පැමිණෙත්ද මුලපටන් ම නිර්වාණාර්ථවසින් මාර්ගණය(සෙවීම)ත් කරනුලැබෙත්ද එහෙයින් සත රම එක් මාර්ගයකැ,යි කියනුලැබෙත්, මෙසේත් ඇතිකල්හි වචනානු සන්ධියෙන් අනුසන්ධිසහිතවූ ම දෙශනාතොමෝ වෙයි; **මාරසෙනප්ප මද්දනං වෝ හිකඛවෙ! මග්ගං දෙසිස්සාමි තං සුණාථ** -පෙ- **කතමෝ ච හිකඛවෙ! මාරසෙනප්පමද්දනෝ මග්ගෝ යදිදං සත්ත බොජ්ඣඞ්ගා** යනාදියෙහි මෙනි "මාරසෙනප්පමද්දනෝ,, යි ද "සත්ත බොජ්ඣඞ්ගා,,යි ද යම්සේ අර්ථවශයෙන් එකක්වූයේ ව්‍යඤ්ජනය ම විවිධ වේද; එසේ "එකායනමග්ගෝ"යි ද චත්තාරෝ සතිපට්ඨානා" යි ද අර්ථවශයෙන් එකෙක ව්‍යඤ්ජනය ම විවිධවෙයි;එහෙයින් මාර්ගීය යෙන් එකක්බැවින් එකවචනයැ ආලම්බනභෙදයෙන් සමෘතිබහුත්ව යෙන් බහුවචනයැ දතයුතු.

සතිපට්ඨාන අනුනාධිකථා කුමක්හෙයින් වනාහි භාග්‍යවතුන්වහන්සේවිසින් නො අඩු නො වැඩිවූ සතිපට්ඨානයෝ සතරක් ම වදරන ලද්දාහුද යත්? වෙනෙයයන්ට හිතබැවිනි; සැබව- **කාමණාවරිතදෘෂ්ටිවරිතසමථයානිකවිදර්‍ශනායානිකවූ මන්දතීක්ෂණවිසින් දෙපරිද්දෙකින් දෙපරිද්දෙකින් පවත්නාවූ** වෙනෙයයන් **අතුරෙන් මන්දවූ කාමණාවරිතයාහට ඔත්තරිකවූ කායානුපස්සනා සතිපට්ඨානය විශුද්ධිමාර්ගීය වෙයි; තීක්ෂණවූකාමණාවරිතයාහට සියුම්වූ වෙදනානුපස්සනා සතිපට්ඨානය** (විශුද්ධිමාර්ගීය වෙයි;) දෘෂ්ටිචරිතයා පිළිබඳවූ ද මඳනුව ණැත්තහුට ඉතා ප්‍රභෙදයට නො පැමිණි **චිත්තානුපස්සනාසතිපට්ඨානය** විශුද්ධිමාර්ගීය වෙයි; **තියුණු නුවණැත්තහුට** ඉතා ප්‍රභෙදයට පැමිණි **ධම්මානුපස්සනාසතිපට්ඨානය** (විශුද්ධිමාර්ගීය වෙයි;) **සමථයානිකයා** පිළිබඳවූ ද මන්දප්‍රාඥයාහට නිදුකින් අවබොධකළයුතු නිමිතිඇති පළමුවන **සතිපට්ඨානය** විශුද්ධිමාර්ගීය වෙයි; **තීක්ෂණප්‍රාඥයාහට** මහත්වූ අර මුණෙහි නො පිහිටනභෙයින් දෙවෙනි **සතිපට්ඨානය** (විශුද්ධිමාර්ගීය වෙයි;) විපස්සනායානිකවූ ද මන්දප්‍රාඥයාහට ඉතා ප්‍රභෙදයට නො පැමිණි අරමුණුඇති තුන්වෙනි **සතිපට්ඨානය** (විශුද්ධිමාර්ගීයවෙයි;) **තීක්ෂණ ප්‍රාඥයාහට** ඉතාප්‍රභෙදයට පැමිණි අරමුණුඇති සතරවෙනි **සතිපට්ඨා නය** (විශුද්ධිමාර්ගීය වෙයි;) එහෙයින් නො අඩුවූ නො වැඩිවූ (සති පට්ඨානයෝ) සතරක්ම වදරනලද්දාහුය,යි.

ශුභසුඛනිත්‍යාත්මභාවවිපල්ලාසයන්ගේ ප්‍රහාණයපිණිස හෝ (සති පට්ඨානසතරක් ම වදාරනලදහු;) ඒ එසේමැයි-කාය අශුභය; ඒ කයෙහි දු සඹයෝ ශුභය,යි පෙරලා ගැනීමෙන් විපල්ලාසයට පැමිණියාහුය; ඔවුන්ට එහි අශුභභාවය දැක්වීමෙන් ඒ (ශුභයයි ගත්) විපල්ලාසයාගේ ප්‍රහාණය පිණිස පළමුවන සතිපට්ඨානය වදාරනලද; සුඛය නිත්‍යය ආත්මය,යි ගත්තාවූද වෙදනාදීන් අතුරෙහි වෙදනාතොමෝ දුක්ඛ චිත්තය අනිත්‍යය ධම්මෝ අනාත්මයෝය; ඒ වෙදනාදියෙහි ද සඹ යෝ සුඛනිත්‍යාත්මවශයෙන් පෙරලා ගැනීමෙන් විපල්ලාසයට පැමි ණියාහුය; ඔවුන්ට එහි දුඃඛාදිභාවය දැක්වීමෙන් ඒ විපල්ලාසයන්ගේ ප්‍රහාණය පිණිස සෙසු තුන වදාරනලද්දාහුය,යි මෙසේ ශුභසුඛනිත්‍යා ත්මභාව විපල්ලාසයන්ගේ ප්‍රහාණය පිණිස හෝ නො අඩු නො වැඩිවූ සතිපට්ඨාන සතරක් ම වදාරනලද්දාහුය,යි දතයුතු. තවද හුදෙක් විප ල්ලාසයන්ගේ ප්‍රහාණය පිණිස ම නො වෙයි, චතුර්විධවූ ඔඝයෝග ආශ්‍රවග්‍රන්ථඋපාදානඅගතී ඇත මොවුන්ගේ ප්‍රහාණය පිණිස ද සතර වැදෑරුම් ආහාරයන්ගේ පිරිසිඳ දැනීම පිණිස ද සතරක් ම වදාරන ලද්දාහුය,යි දතයුතු. මේ විභාගී ප්‍රකරණ ක්‍රමයයි.

අට්ඨකථාවෙහි විභාගී හැසිරීම්වශයෙන් ද එක්තැනෙක රැස්වීම් වශයෙන් ද එකක් මැවූ සතිපට්ඨානය අරමුණුවශයෙන් සතරක්වී ය,යි මෙතෙක් ම කියනලදි; ඒ එසේමැයි- දෙරටු සතරක් ඇති නගර යෙහි පැදුම්දිගින් පැමිණෙනමනුෂ්‍යයෝ පැදුම්දෙස උපදිනබඳු ගෙන පැදුම්දෙරින් යම්සේ නුවරටම පිවිසෙත්ද; දකුණුදිගින්- පැළදිගින්- උතුරුදිගින් පැමිණෙන මනුෂ්‍යයෝ උතුරුදෙස උපදින බඳුගෙන උතුරුදෙරටුවෙන් නුවරට ම පිවිසෙත්ද; මේ කාරණය මෙබඳු උපමා සම්පත්ඇත්තේයයි දතයුතු. ඒ එසේමැයි- නිර්වාණය නගරයක්මෙනි; අෂ්ටාඞ්ගිකවූ ලොකොත්තරමාර්ගය මහත්වූ නුවරදෙර මෙනි; කායාදිහු ප්‍රාර්ථනදිශාදින් මෙනි; පැදුම්දිගින් පැමිණෙන මනුෂ්‍යයෝ පැදුම්දෙස උපදනාබඳු ගෙන පැදුම්දෙරටුවෙන් යම්සේ නුවරට ම පිවිසෙත්ද එසේ කායානුපස්සනාවාරයෙන් පැමිණෙන්නාහු තුදුස්ප්‍රකාරයකින් කායානුපස්සනාසතිපට්ඨානය භාවනාකොට කායානුපස්සනාභාවනානුභාවයෙන් උපන්නාවූ ආර්‍යමාර්ගයෙන් එක මැ නිර්වාණයට වදනාහුය; දකුණුදිගින් පැමිණෙන්නාහු දකුණුදෙස උපදනාභාග්‍ය ගෙන දකුණුදෙරින් නුවරට ම වදිත්ද, එපරිද්දෙන් වෙදනානුපස්සනා වාරයෙන් පැමිණෙන්නාහු නවප්‍රකාරයකින් වෙදනානුපස්සනාසති පට්ඨානය භාවනාකොට වෙදනානුපස්සනාභාවනානුභාවයෙන් උපන් නාවූ ආර්‍යමාර්ගයෙන් හුදු නිවනට මැ වදනාහුය; පැළදිගින් එන් නාහු පැළදෙස උපදනාබඳු ගෙන පැළදෙරින් යම්සේ නුවරට ම පිවිසෙත්ද, එපරිද්දෙන් චිත්තානුපස්සනාවාරයෙන් පැමිණෙන්නාහු සොළොස්ප්‍රකාරයකින් චිත්තානුපස්සනාසතිපට්ඨානය භාවනාකොට

චිත්තානුපස්සනාභාවනානුභාවයෙන් උපන්නාවූ ආයතිමාගියෙන් හුදු නිබ්බාණපුරයට මැ වදනාහුය; උතුරුදිගින් පැමිණෙන්නාවූ මනුෂ්‍යයෝ උතුරුදෙස උපදනා බඩු ගෙන උතුරුදෙරින් යම්සේ නුවරට මැ පිවිසෙත්ද, එපරිද්දෙන් ධම්මානුපස්සනාචාරයෙන් පැමිණෙන වෙනෙයජනයෝ පඤ්චප්‍රකාරයකින් ධම්මානුපස්සනාසතිපට්ඨානය භාවනා කොට ධම්මානුපස්සනාභාවනානුභාවයෙන් උපන්නාවූ ආයතිමාගියෙන් හුදු නිබ්බාණයට මැ වදනාහුය,යි මෙසේ හැසිරීම්වශයෙන් ද එක් තැනෙක රැස්වීම්වශයෙන් ද එකෙක් මැ වූ සතිපට්ඨානය අරමුණු වශයෙන් සතරක් මැ කොට වදුරනලද්දාහුය,යි දතයුතු.

ඉමෙ චත්තාරෝ යනු කථෙතුකම්‍යතා පෘච්ඡාසි; **ඉධ**= මේ ශාසනයෙහි; **භික්ඛවෙ** යන මේ දහම් පිළිගන්නා පුද්ගලයන් ආමන්ත්‍රණයකිරීමයි; **භික්ඛු** යන මේ පදය ප්‍රතිපත්තිසම්පාදනයකරන්නාවූ පුද්ගලයා දැක්වීමයි; අන්‍යවූ ද දිව්‍යමනුෂ්‍යයෝ ප්‍රතිපත්තිසම්පාදනය කෙරෙ මැය; එතකුදුවුවත් ශ්‍රෙෂ්ඨබැවින් ද. ප්‍රතිපත්තිය හෙතුකොට ගෙන භික්ෂුභාවය දක්නාහෙයින් ද **භික්ඛු**,යි වදළහ; ඒ දෙකරුණ) සැබෑව- භාග්‍යවතුන්වහන්සේගේ අනුශාසනය පිළිගන්නවුන් අතුරෙන් භික්ෂූහු ශ්‍රෙෂ්ඨ වෙති, සම්ප්‍රකාරවූ අනුශාසනාවට භාජනවූ බැවිනි; එහෙයින් ශ්‍රෙෂ්ඨබැවින් **භික්ඛු** යයි වදළහ; තවද ඒ ශ්‍රෙෂ්ඨවූ භික්ෂුව ගත්කල්හි සෙසු (දිව්‍යමනුෂ්‍යයෝ) ගන්නාලද්දාහු ම වෙති, රජුගේ ගමනාදියෙහි රජුගැනීමෙන් සෙසුපිරිස ගත් මෙනි; යමෙක් මේ (සතිපට්ඨාන) පිළිවෙතෙහි පිළිපදිද හෙතෙම භික්ෂුනම් වේය,යි ප්‍රතිපත්තිය හෙතුකොටගෙන භික්ෂුභාවය දක්නාහෙයින් ද **භික්ඛු**,යි වදළහ; ඒ එසේමැය- (පිළිවෙතෙහි) පිළිපන්නැනැත්තේ දෙව්යෙක් හෝ මිනිසෙක් හෝ වේවා භික්ෂු,යි ගිණීමට යේ මැය. වදාළේ මෙබඳු.

97. "අලඞ්කතෝ චෙපි සමං චරෙය්‍ය
සන්තෝ දන්තෝ නියතෝ බ්‍රහ්මචාරී
සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩං
සෝ බ්‍රාහ්මණෝ සෝ සමණෝ සභික්ඛු,,යි.

---

97. අලඞ්කතෝ අපි= වස්ත්‍රාභරණයෙන් ප්‍රතිමණ්ඩිතවූ පුද්ගල ද; **චෙ**= ඉදින්; **සමං චරෙය්‍ය**= කායාදියෙන් සමීපෙහි යෙදී පවතීද; **සන්තෝ**= රාගාදීන්ගේ සංසිදීමෙන් ශාන්තද; **දන්තෝ**= ඉන්ද්‍රියදම නයෙන් දැමුනේද; **නියතෝ**= සතරමහනියමයෙන් නියතවූයේද; **බ්‍රහ්මචාරී**= ශ්‍රෙෂ්ඨචර්‍යාවෙන් බ්‍රහ්මචාරිවූයේද; **සබ්බෙසු භූතෙසු**= සියලු සත්වයන්කෙරෙහි; **දණ්ඩං**= කායදණ්ඩාදි දඬුවම; **නිධාය**= බහා තබා වෙසේද; **සෝ**= ඒ මෙබඳුවූ පුද්ගලතෙම; **බ්‍රාහ්මණෝ**= බාහිතවූ පව්ඇතිබැවින් බ්‍රාහ්මණය,යි ද; **සෝ**= හෙතෙම; **සමණෝ**= සංසිඳුවන ලද පව්ඇතිබැවින් ශ්‍රමණය,යි ද; **සෝ**= හෙතෙම; **භික්ඛු**= භින්නවූ කෙලෙසයන්ඇතිබැවින් භික්ෂුය,යි ද කියයුතු වේ.

(=වස්ත්‍රාභරණාදියෙන් සැරසුනාවූද යම් පුද්ගලයෙක් කායවිඤ්ඤාදිය හැර සමාධියෙහි පවතීද සංසිඳුනු කෙලෙස් ඇති බැවින් ශාන්තද ඉන්ද්‍රියදමනයඇත්තේද මාර්ගඵලයෙන් නියතවූයේද බඹසරඇත්තේද සියලු සත්වයන්කෙරෙහි බහාතැබූ කායදණ්ඩාදිය ඇත්තේද මෙබඳු ඒ පුද්ගලතෙම බ්‍රාහ්මණයයි ද ශ්‍රමණයයි ද භික්ෂුයයි ද කියයුතුවේ.)

කායශබ්දය. කායෙ= රූපකයෙහි; (=රූපසමූහයෙහියයි සේයි;) ඒ එසේමැය- මෙහි රූපකය අඩහප්‍රත්‍යඩහයන්ගේ ද කෙශාදිවූ ධර්මයන්ගේ ද සමූහාර්ථයෙන් "හත්ථිකාය රථකාය,, ආදියමෙන් "කාය" යයි අදහස්කරනලදී; තවද සමූහාර්ථයෙන් යම්සේ (කායනම්) ඒ ද එපරිද්දෙන් කුත්සිතවූ (කෙශාදීන්ගේ) උත්පත්තිප්‍රදෙශය යන අර්ථයෙන් "කාය" නම් වේ; ඒ එසේමැයි- කුත්සිතවූ අතිශයින් පිළිකුල්වූ කෙශාදීන්ව හේ ආශ්‍රයස්ථානත්වයි ද" කාය"නම් වේ; **ආය** නම්? උත්පත්තිදෙශය,යි; එහි මේ වචනාර්ථයි; එයින් උපදිත් නුයි ආය නම්; කවුරුහු උපදිත්ද යත්? කුත්සිතවූ කෙශාදීහුයැ; එහෙයින් කුත්සිතවූ කෙශාදීන්ගේ උත්පත්තිදෙශය නුයි "කාය"නම් වේ; **කායානුපස්සී**= කාය අනුව බලනසුලුවූයේ නොහොත් කාය අනුව බලමින්; "කායෙ" යී ද වදාරා යලිත් "කායානුපස්සී" යයි දෙවෙනි කායග්‍රහණය අසම්මිශ්‍ර වශයෙන් ධාතුව්‍යවස්ථාන(ඝනතාදි චතුර්විධ)ඝනවිනිර්භෝගාදිදර්ශනය පිණිස කරනලද්දැයි දතයුතු. ඒ දෙවෙනි කාය,, ශබ්දග්‍රහණයෙන් වේදනාඅනුව බලනසුලුවූයේ හෝ චිත්තධර්මයන් අනුව බලනසුලුවූයේ හෝ නොවෙයි, වැලි කාය අනුව බලනසුලුවූයේ ම යයි කායසඞ්ඛ්‍යාතවූ වස්තුවෙහි කාය අනුව බලනආකාරය ම දැක්වීමෙන් අසම්මිශ්‍රවශයෙන් ව්‍යවස්ථානය දක්වනලද්දේ වෙයි; එසේ ම කායෙහි අඩහප්‍රත්‍යඩහයන් ගෙන් තොරවූ එක් ධර්මයක් අනුව බලනසුලුවූයේ නො වෙයි; කෙශ ලෝමාදියෙන් තොරවූ ස්ත්‍රීපුරුෂයන් අනුව බලනසුලුවූයේ නො ද වෙයි; තවද මෙහි කෙශලෝමාදිවූ භූතොපාදායසමූහසඞ්ඛ්‍යාතවූ යම් ශරීරයක් වේද ඒ ශරීරයෙහි ද භූතොපාදායරූපයන්ගෙන් තොරවූ එක් ධර්මයක් අනුව බලනසුලුවූයේ නො වෙයි; වැලිකෙසේ බලනසුලුවූයේ ද යත්? රථාවයව පිළිවෙළින් බලන්නෙකු මෙන් අභ්‍යන්තරසමූහය පිළිවෙළින් බලනසුලුවූයේ, නගරයකඅවයව පිළිවෙළින් බලන්නෙකු මෙන් කෙශලෝමාදිසමූහයන් පිළිවෙළින් බලනසුලුවූයේ, කෙසෙල්කඳක පත්වැට වෙන්කරන්නෙකු මෙන් ද හිස්වූ මිට විදහන්නෙකු මෙන් ද භූතොපාදායරූපසමූහය පිළිවෙළින් බලනසුලුවූයේ ම වේය,යි නානා ප්‍රකාරයෙන් සමූහවශයෙන් ම කායසඞ්ඛ්‍යාතවූ වස්තුහුගේ දර්ශනයෙන් ඝනවිනිර්භෝගය (=ඝනතාදීන්ගේ වෙන්කිරීම) දක්වනලද්දේ වෙයි; මේ ශරීරයෙහි යථොක්තසමූහයෙන් වෙන්වූ කයක් හෝ ස්ත්‍රියෙක් හෝ පුරුෂයෙක් හෝ අන් කිසි ධර්මයක් හෝ නො ම දක්නා ලැබේ; යථොක්තධර්මසමූහය පමණෙක්හි මැ වනාහි ඒ ඒ පරිද්දෙන් සත්වයෝ වරදවා ගැනීම කෙරෙති. එයින් කිහු පුරාණාචාර්යයෝ-

98 **යං පස්සති න තං දිට්ඨං යං දිට්ඨං තං න පස්සති අපස්සං බජ්ඣතෙ මූළ්හො බජ්ඣමානො නමුච්චති යි.**

(=බාලතෙමේ ස්ත්‍රී පුරුෂාදිවශයෙන් යමක් දකීද එය කෙශලොමාදි හෝ අශුභාදි වශයෙන් නො දක්නාලද වෙයි. ස්ත්‍රීපුරුෂාදිවශයෙන් යමක් දක්නාලදද එය නුවණින් නොදකී, බාලතෙම නුවණින් නො දක්නේ සංයොජනයන්ගෙන් බඳනා ලැබෙයි. බඳිනුලබන්නාවූ හෙතෙම සසරදුකින් නො මිදෙයි.)

අනිකකුදු ඇති–"ඝනවිනිබ්භොගාදිදස්සනත්ථං,,යි කියනලද "ආදි,, ශබ්දයෙන් මෙහි මේ මතුදක්වන අර්ථයද දතයුතු; මේතෙමවන්හි තෙල ශරීරයෙහි කය අනුව බලමින්ම (වෙසෙයි) අන්‍යධර්මයන් අනුව බලන සුලුවූයේ නොවේය,යි කියායි; (මේ අර්ථයෙන්) කුමක්කියනලද්දේ වේද යත්? ජලය නො වූ ම මිරිඟුයෙහි (මෘගයෝ) යම්සේ ජලය යන සංඥ ඇතිව බලන්නාහුවෙත්ද එපරිද්දෙන් අනිත්‍යදුඃඛානාත්මඅශුභවූ ම මේ කයෙහි නිත්‍යසුඛආත්මශුභභාවය අනුව බලනසුලුවූයේ නො වෙයි, වැලි කුමක් අනුවබලනසුලුවූයේදයත්? කය අනුව බලනසුලුවූයේ අනිත්‍යදුඃඛ අනාත්ම අශුභාකාරවූ (කෙශාදි) සමූහයන් අනුව බලනසුලුවූයේ ම යයි කියනලද්දේවෙයි; නොහොත් මත්තෙහි **ඉධ භික්ඛවෙ! භික්ඛු අරඤ්ඤ ගතො වා-පෙ-සො සතොව අස්සසති** යනාදි නයින් ආශ්වාසප්‍රශ්වාස ආදිකොටඇති සුඤ්ඤවූ අසංකාය අවසන්කොටඇති යම් මේ කායක් වදරනලද්දේද; **ඉධෙකච්චෙවා පඨවිකායං අනිච්චතො අනුපස්සති ආපොකායං තෙජොකායං වායොකායං කෙසකායං ලොමකායං ජව්හකායං චම්මකායං මංසකායං රුහිරකායං නහාරුකායං අට්ඨිකායං අට්ඨිඤ්ජකායං ති** (=මේ ශාසනයෙහි ඇතැම් යොගාවචරයෙක් (මේ කයෙහි) පෘථිවීධාතු සමූහය අනිත්‍යවශයෙන් නැවත නැවත බලයි අබ්ධාතුසමූහය තෙජොධාතුසමූහය වායොධාතුසමූහය කෙශ සමූහය රොමසමූහය සිවිසමූහය චර්මසමූහය මාංශසමූහය රුධිරසමූහය නහර සමූහය ඇටසමූහය ඇටමිදුලුසමූහය අනිත්‍යවශයෙන් නැවත නැවත බලයි;) යි **ප්‍රතිසම්භිදාමාගීයෙහි** යම් කයකුත් වදරන ලද්දේද; ඒ (ආශ්වාසාදිවූ **ද පෘථිවීධාත්වාදිවූ** ද) සමූහය මේ කයෙහි ම ලා නැවත නැවත බලනහෙයින් "කයෙහි පෘථිවීධාත්වාදිසමූහය නැවත නැවත

---

98. **යං**= (ස්ත්‍රීපුරුෂාදි වශයෙන්) යමක්; **පස්සති**= (බාලතෙම) දකීද; **තං**= එය; **න දිට්ඨං**= (කෙශලොමාදිවශයෙන් හෝ අශුභාදි වශයෙන්) නො දක්නාලද වෙයි; **යං**= යමක්; **දිට්ඨං**= (ස්ත්‍රීපුරුෂාදි වශයෙන්) දක්නාලදද; **තං**= එය; **න පස්සති**= (අශුභාදිවශයෙන්) නො දකී; **මූළ්හො**= (කෙශලොමාදිධර්මසමූහයෙහි මුසුවූ) බාලතෙම; **අපස්සං**= (අශුභාදිවශයෙන්) නො දක්නේ; **බජ්ඣතෙ**= සංයොජනයන් විසින් බඳනාලැබේ; **බජ්ඣමානො**= (වෘත්තයෙහි) බඳිනුලබන්නේ; **නමුච්චති**= වෘත්තදුඃඛයෙන් නො මිදෙයි.

බලනසුලුවූයේය,, සි මෙසේත් අර්ථය දතයුතු. නොහොත් කයෙහි මමය කියා හෝ මාගේය කියා හෝ මෙසේ ගතයුතුවූ කිසි ධර්මයක්හුගේ නො දක්නාබවහෙයින් යලි කෙශලෝමාදිවූ ඒ ඒ නානාවිධ ධර්මසමූහ ය ම නැවත නැවත බලනහෙයින් කයෙහි කෙශාදි ධර්මසමූහසඞ්ඛ්‍යා තවූ කය අනුව බලනසුලුවූයේය,,සි මෙසේ අර්ථය දතයුතු.

තවද **ඉමස්මිං කායෙ අනිච්චතො අනුපස්සති නො නිච්චතො** යනාදීන් අනුක්‍රමයෙන් ප්‍රතිසම්භිදාමාගීයෙහි ආ ක්‍රමඇති සියලු ම අනිත්‍යලක්ෂණාදිවූ ආකාරසමූහසඞ්ඛ්‍යාතවූ කායයාගේ නැවත නැවත බලනහෙයින් ද කයෙහි අනිත්‍යලක්ෂණා දි ආකාර සමූහසඞ්ඛ්‍යාතවූ කය නැවත නැවත බලනසුලුවූය,,සි මෙසේත් අර්ථ දතයුතු. ඒ එසේමැයි- කයෙහි කායානුපස්සනාප්‍රතිපදාවට පිළිපන් මේ මහණ (අනිත්‍යලක්ෂණාදි ආකාරසමූහයයි කියනලද) මේ කය අනිත්‍යානුදර්ශනාදිවූ සත් වැදෑරුම් අනුපස්සනාවන්ගේ වශයෙන් අනිත්‍යවශයෙන් නැවත නැවත බලයි, නිත්‍යවශයෙන් නො බලයි, දුක්වශයෙන් නැවත නැවත බලයි, සුවවශයෙන් නොබලයි,අනාත්මවශයෙන් නැවත නැවත බලයි, ආත්මවශයෙන් නො බලයි, (සංඝකාරයන්කෙරෙහි) කළකිරෙයි, සතුටු වූයේ නො වෙයි, නො ඇලුනේ වෙයි, නො රඳයි, (අනුපපාදනිරොධයෙන්) නිරුඬකරයි, නො උපදවයි, (නැවත නොගන්නාපරිද්දෙන්) දුරුකෙරෙයි, ග්‍රහණය නො කෙරෙයි; ඒ මහණතෙම ඒ කය අනිත්‍යවශයෙන් නැවත නැවත බලන්නේ නිත්‍යය යන සංඥාව දුරුකෙරෙයි, දුක්වශයෙන් බලන්නේ සුඛසංඥාව දුරුකෙරෙයි, අනාත්මවශයෙන් බලන්නේ ආත්මසංඥාව දුරුකෙරෙයි, කළකිරීමට පැමිණෙන්නේ තෘෂ්ණාව දුරුකෙරෙයි, නො ඇලීමට පැමිණෙන්නේ රාගය දුරුකෙරෙයි, නිරුඬකරන්නේ සමුදය දුරුකෙරෙයි, පටිනිස්සජනය (=දුරුකිරීම) කරන්නේ ආදානය දුරුකෙරේය,සි දතයුතු.

විහරති= (ඊර්‍යාපථවිහරණයෙන්) වාසයකෙරෙයි; **ආතාපී**= භවත්‍රයෙහි කෙලෙසුන් තවා නුසි "ආතාප,, නම් මේ (ආතාප යනු) වීර්‍යයට නමකි; (වීර්‍යසඞ්ඛ්‍යාතවූ) ආතාපය ඕහට ඇත් නුසි "ආතාපී,, නම් වේ; **සම්පජානො**= සම්ප්‍රජන්‍යසඞ්ඛ්‍යාතවූ ඥානයෙන් යුක්තවූයේ **සතිමා**= කායපරිග්‍රාහිකවූ සිහියෙන් යුක්තවූයේ; මේ යොගාවචර වනාහි යම් හෙයකින් සිහියෙන් අරමුණු පිළිගෙන නුවණින් නැවත නැවත බලාද; (ඒ නුවණින් අරමුණු බැලීම) සැබව- සමෘති විරහිතයහට අනුපස්සනාවක් නම් නැති; එහෙයින් ම වදාළහ- **සතිඤ්ච ඛොහං භික්ඛවෙ! සබ්බත්‍ථිකං වදාමි** එහෙයින් මෙහි **කායෙ කායානුපස්සී විහරති** යි මෙතෙක් වචනයන්ගෙන් "කායානුපස්සනාසතිපට්ඨාන කර්මස්ථානය,, වදාරනලද්දේ වෙයි; ඉක්බිති යම් හෙයකින් වීර්‍යරහිතවූවහුගේ ඇතුලත හැකීම (ඒ යොගාවචරභව) අනන්තරායකර

වේද; **සම්ප්‍රජන්‍යසඞ්ඛ්‍යාත** නුවණරහිතවූයේ උපාය ගැනීමෙහි හා අනුපාය දුරුකිරීමෙහිත් මුළාවේද; මුළාසිහි ඇත්තේ උපාය නොහැරීමෙහි හා අනුපාය නො ගැන්මෙහිත් අසම්මූ වේද; එයින් ඕහට ඒ කම්සථානය සම්පාදනය නො වේද; එහෙයින් යම් ධර්ම කෙනෙකුන්ගේ ආනුභාවයෙන් ඒ කම්සථානය සම්පාදනය වේද, ඒ ධර්මයන් දැක්වීම පිණිස **ආතාපී සම්පජානෝ සතිමා** යන මෙය වදාරන ලදැයි දතයුතු.

මෙසේ කායානුපස්සනාසතිපට්ඨානය ද ඒ සතිපට්ඨානයාගේ සම්ප්‍රයොගාඞ්ග ද දක්වා මෙවිට ප්‍රහාණාඞ්ග දක්වන්ට **විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදෙමනස්සං,** යි වදාරනලදී. එහි **විනෙය්‍ය**= තදඞ්ගවිනයෙන් හෝ විෂ්කම්භනවිනයෙන් හෝ දුරුකොට; **ලොකෙ**= ඒ කයෙහි ම; ඒ එසේමැය- මෙහි රූපකය ලුජ්ජනපලුජ්ජන (=නැසෙන වෙසෙසින් නැසෙන) අර්ථයෙන් "ලොක„යයි අදහස්කරනලද; තවද යම්හෙයකින් ඒ යොගාවචරයාගේ කය පමණෙක්හි ම අභිධ්‍යාදෞර්මනස්‍යය ප්‍රහීණ නො වේද, වෙදනාදියෙහිත් ප්‍රහීණවන්නේ ම වේද; එහෙයින් **පඤ්චපි උපාදානක්ඛන්ධා ලොකෝ,** (=උපාදානස්කන්ධයෝ පස්දෙන ම ලොක නම් වේ) යයි විභඞ්ගයෙහි වදාරනලදි; නොකොත් ඒ (රූපාදි) ධර්මයන් ලෝකසඞ්ඛ්‍යානබැඳීන් අපොඛාරණක්‍රමයෙන් මේ වදාරනලදි; **නනු භනතෙ ලොකෝ? කෙව කායෝ ලොකෝ** (=එහි ලොකයැ කවරේද? හේ කය මැ ලොක නම් වේ) යයි යමකුත් වදලෝද, මේ මෙහි අර්ථයයි; "තසම්ං ලොකෙ අභිජ්ඣාදෙමනස්සං විනෙය්‍ය„යි මෙසේ සම්බන්ධය දතයුතු; යම්හෙයකින් වනාහි මෙහි "අභිධ්‍යාව ගැනීමෙන් කාමච්ඡන්දයත් දෞර්මනස ගැනීමෙන් ව්‍යාපාදයත් සඞ්ග්‍රහයට යේද, එහෙයින් නීවරණයන්ට ඇතුලත්වූ බලවත් ධර්මයන් දෙදෙනාගේ දුක්වීමෙන් නීවරණප්‍රහාණය වදාරණලද්දේවේය, යි දතයුතුයි; විශෙෂයෙන් මෙහි අභිධ්‍යාව සංසිදුවීමෙන් කායසම්පත්තිමූලකවූ අනුරොධ (සඞ්ඛ්‍යාත කාම) යාගේ ද, ව්‍යාපාදසඞ්ඛ්‍යාත නොසතුටුබව සංසිදුවීමෙන් කායවිපත්තිමූලකවූ ප්‍රතිඝයාගේ ද නැවත අභිධ්‍යාව (=කාමච්ඡන්දසඞ්ඛ්‍යාත ලොභය) සංසිදුවීමෙන් ශරීරයෙහි ඇල්ම ද, දෞර්මනස (=ව්‍යාපාදසඞ්ඛ්‍යාත නො සතුටුබව) සංසිදුවීමෙන් කායභාවනා වෙහි නො ඇල්ම ද, අභිධ්‍යාව සංසිදුවීමෙන් කයෙහි අවිද්‍යමානවූ ශුභ සුඛභාවාදින්ගේ ප්‍රක්ෂෙපයාගේ ද, දෞර්මනස සංසිදුවීමෙන් කයෙහි විද්‍යමානවූ අශුභඅසුඛභාවාදින්ගේ අපනයනයාගේ ද ප්‍රහාණය වදාරනලද; එයින් යොගාවචරයාගේ යොගානුභාවය ද යොගයෙහි සම්භවය ද දක්වනලද්දී වෙයි; යම්හෙයකින් මේ යොගාවචර අනුරොධවිරොධ =කාමප්‍රතිඝ) යන්කෙරෙන් විශෙෂයෙන් මිදුනේ අරතිරති (=කායභාව) නාවෙහි නො ඇල්ම හා කයෙහි ඇල්ම) ඉවසන්නේ අභූතවූ (ශුභාදින්ගේ) ප්‍රක්ෂෙපය භූතවූ (අශුභාදින්ගේ) අපනයනය යන මෙයින් විරහිතවූයේත් වේද මේතෙමේ යොගානුභාවනාව මැයි; තවද මේ යොගා

වචර අනුරොධ විරොධයන්ගෙන් වෙසෙසින් මිදුනේ අරතිරති ඉව සන්නේ අහුතවූ ශුභාදිය නො බහාලන්නේ භූතවූ අශුභාදියත් බැහැර නො කරන්නේයොගයෙහි සමවූවුයේ වේය,යි.

අනිත් ක්‍රමයක් කියනුලැබේ- **කායෙ කායානුපස්සී** යන මෙහි අනුපස්සනාවෙන් කම්ඨානය වදාරනලද; **විහරති** යන මෙහි වදාළ විහරණයෙන් කම්ඨානිකයාගේ කායපරිහරණය වදාරනලද; **ආතාපී** යනාදියෙහි ආතාප (=වීය්‍ය) යෙන් සම්‍යක්ප්‍රධානය ද; සතිසම්පජඤ්ඤ යෙන් සචිත්‍රකම්ඨානය හෝ කම්ඨානපරිහරණයෙහි උපාය ද; නො හොත් සතියෙන් කායානුපස්සනාවශයෙන් ලබනලද සමථ (=සමාධි) ය ද; සම්පජඤ්ඤයෙන් විදර්‍ශනාව ද; අභිධ්‍යාදෞර්මනස්‍යයන්ගේ සංසිදුවීමෙන් භාවනාඵලය ද වදාරනලදැයි දතයුතු. විභඞ්ගයෙහි වනාහි- **අනුපස්සී** යනු එහි අනුපස්සනාතොමෝ කවරිද? යම් අනිත්‍යාදිප්‍රකාරයෙන් ධර්‍මයන් දැනගන්නාවූ ප්‍රඥවක් ප්‍රකර්‍ෂයෙන් දන්නාබවක් -පෙ- සම්‍යග්දර්‍ශනයක් වේද මෝතොමෝ අනුපස්සනා යැයි කියනුලැබේ, මේ අනුපස්සනාවෙන් (යම්හෙයකින්) යුක්තවූයේ මොනොවට යුක්තවූයේ පැමිණියේ මොනොවට පැමිණියේ උත්පන්නවූයේ සමෘද්ධවූයේ **සමන්විත** වූයේ වේද එහෙයින් "අනුපස්සී,, යැයි කියනුලැබේ; **විහරති** යනු වැටෙයි පවතී පාලනයකෙරෙයි යැපෙයි යාපනයකෙරෙයි හැසිරෙයි විහරණයකෙරෙයි එහෙයින් "විහරති,, යැයි කියනුලැබේ; **ආතාපී** යනු එහි ආතපපය කවරේද යත්? යම් චෛතසිකවූ වීය්‍යාරම්භයක් -පෙ- සම්‍යග්ව්‍යායාමයක් වේද මෙය "ආතපප,,යැයි කියනුලැබේ, මේ ආතපපයෙන් (යම්හෙයකින්) යුක්තවූයේ -පෙ- සමන්විතවූයේ වේද එහෙයින් "ආතාපි,, යැයි කියනුලැබේ; **සම්පජානො** යනු එහි "සම්පජඤ්ඤ,, නම් කවරේද? යම් (අනිත්‍යාදිප්‍රකාරයෙන් දන්නාවූ) ප්‍රඥවක් දන්නාබවක් -පෙ- සම්‍යග්දර්‍ශනයක් වේද මෙය "සම්පජඤ්ඤ,, යැයි කියනුලැබේ; මේ සම්ප්‍රජන්‍යයෙන් (යම්හෙයකින්) යුක්තවූයේ -පෙ- සමන්විතවූයේ වේද එහෙයින් "සම්පජානො,, යැයි කියනුලැබේ; **සතිමා** යනු එහි සති කවරිද? යම් සිහිකිරීමක් නැවත නැවත සිහිකිරීමක් -පෙ- සම්‍යක්සතියක් වේද, මෝතොමෝ "සති,, යැයි කියනුලැබේ; (යම්හෙයකින්) මේ සතියෙන් යුක්තවූයේ -පෙ- සමන්විතවූයේ වේද, එහෙයින් "සතිමා,, යි කියනුලැබේ; **විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං** යනු එහි ලොකය කවරේද? හේ කය ම ලොක නම, පස් කඳ ම ලොක නම, මේතෙමේ "ලොක,, යැයි කියනුලැබේ; එහි අභිජ්ඣා කවරිද? යම් රාගයක් බලවත් රාගයක් අනුනයක් අනුරොධ (=කාම) යක් තෘෂ්ණාවක් නන්දිරාගයක් චිත්තයාගේ බලවත් ඇලීමක් වේද, මෝතෝමෝ "අභිජ්ඣා,, නම්; එහි "දොමනස්ස,, නම් කවරේද? යම් චෛතසිකවූ නොසැපයක් චෛතසිකවූ දුකක් චිත්තසංස්පර්‍ශයෙන් හටගත් නොසැපයක් දුකක් වෙදනාවක් වේද මේ "දොමනස්ස,, යැයි කියනු ලැබේ; මෙසේ මෝ අභිධ්‍යාතොමෝද

මේ දෙමිනස ද මේ (කායසඞ්ඛ්‍යාතවූ හෝ පඤ්චසඤ්ඤාසඞ්ඛ්‍යාතවූ) ලොකයෙහි (යම්හෙයකින්) විනීතවූවාහු ප්‍රතිවිනීතවූවාහු ශාන්තවූවාහු සංසිදුවනලද්දාහු වෙසෙසින් සංසිදුවනලද්දාහු නසනලද්දාහු වෙසෙසින් නසනලද්දාහු බැහැරකළාහු වෙසෙසින් බැහැරකළාහු විශලනද්දාහු වෙසෙසින් විශලනද්දාහු විගතාන්තකළාහු වෙත්ද, එහෙයින් "විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදෙමනස්සං,,යි කියනුලැබේ. මෙසේ මේ පදයන්ගේ අර්ථය වදාරනලද්දේය; ඒ විභඞ්ගයෙහි දැක්වූ අර්ථය සමඟ මේ අර්ථකථා ක්‍රමය යම්සේ සැසඳේද එපද්ධතියෙන් දතයුතුයි.

පළමුකොට කායානුපස්සනාසතිපට්ඨානොද්දෙශයාගේ මෝ අර්ථවණ්ණනානොමෝ දක්වනලද්දීය.

දූන් වෙදනාසු- විත්තෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති-පෙ- විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදෙමනස්සං යන මෙහි "වෙදනාසු වෙදනානුපස්සී,, යනාදියෙහි වෙදනාදිශබ්දයන්ගේ නැවත කීමෙහි ප්‍රයොජනය කායානුපස්සනාවෙහි කීතියෙන් ම දතයුතු. **වෙදනාසු වෙදනානුපස්සී විත්තෙ විත්තානුපස්සී ධම්මෙසු ධම්මානුපස්සී** යන මෙහි වනාහි **වෙදනා** යනු ත්‍රිවිධවෙදනාගැ; ඔවුහු ද ලෞකිකාවූවාහු මැ වෙති; චිත්තය ද ලෞකිකයැ; ධර්මයෝත් එසේමැය; ඒ වෙදනාදීන්ගේ විභාගය නිදෙස් වාරයෙහි පලටවන්නේය; හුදෙක් මෙහි වෙදනා යම්සේ නැවත නැවත නුවණින් බැලියයුත්තාහුද එපරිද්දෙන් නැවත නැවත බලන්නේ **වෙදනාසු වෙදනානුපස්සී** යයි දතයුතු. චිත්තධර්මයන්හි දූ මේ ක්‍රමයයි. යලි කෙසේ වෙදනා අනුදර්ශනය කටයුත්තාහුද යත්? පළමුකොට සැප වෙදනාව (දුකටවසතුබැවින්) **දුක්වශයෙන්** ද; දුක්වෙදනාව (පිඬාජනනාදිහෙතුයෙන්) **ශල්‍යවශයෙන්** ද; උපෙක්ෂාවෙදනාව (අසාම්භාවාදිහෙතුයෙන්) **අනාකම්වශයෙන්** ද නැවත නැවත බැලියයුතුයි. වදාළේ මැනැ-

99. "යො සුඛං දුක්ඛතො අද්ද දුක්ඛමදද්දක්ඛි සල්ලතො
අදුක්ඛමසුඛං සන්තං අද්දක්ඛි නං අනිච්චතො
සබ්බෙ සම්මදද්දසො භික්ඛු උපසන්තෙතා චරිස්සති,, ඒ.

---

99. **යො**= යමෙක්තෙම; **සුඛං**= සැපදෙනාව; **දුක්ඛතො**= දුක්වශයෙන්; **අද්ද**= නුවණැසින් දුටුයේද; **දුක්ඛං**= දුඃඛවෙදනාව; **සල්ලතො**= පිඬාඋපදවනහෙයින් ද අවිරපුරුෂයන්විසින් බැහැරකිරීමදුෂ්කරහෙයින් ද ශරීරයට පිවිසි හුලක් සෙයින්; **අද්දක්ඛි**= දුටුයේද; **සන්තං**= සැපදුක්දෙකින් සංසිදුනුපියවිඇතිබැවින් අතිශයින් ශාන්තවූ; **අදුක්ඛමසුඛං**= නො දුක් නො සැපවූ; **නං**= ඒ මධ්‍යස්ථවෙදනාව; **අනිච්චතො**= ඉපිදනැසීමාදිහෙතුවෙන් අනිත්‍යවශයෙන්; **අද්දක්ඛි**= දුටුවේද; **වෙ**= එකාන්තයෙන්; **සම්මදද්දසො**= හෙතුවශයෙන් සම්‍යග්දර්ශනඇති; **සො භික්ඛු**= ඒ ක්ෂීණාශ්‍රවමහණතෙම; **උපසන්තෙතා**= කෙලශව්‍යුපසමයෙන් සන්සිදුනේ; **චරිස්සති**= හැසිරෙන්නේය;

(යම් මහණෙක් සැප වෙදනාව දුක්වශයෙන් දුටුයේද දුක්වෙදනාව ශරීරයට පිවිසි ශූලක් මෙන් දුටුයේද ඝාතනවූ උපෙක්ෂාවෙදනාව අනිත්‍යවශයෙන් දුටුයේද එකාන්තයෙන් සම්‍යග්දර්ශන ඇති ඒ ක්ෂීණාශ්‍රවමහණ සන්සිඳුනු කෙලෙස් ඇතිව හැසිරෙන්නේය.)

තවද මේ සියලු ම වෙදනාවෝදුක්ඛ,යි ද නැවත නැවත නුවණින් බැලියයුත්තාහුය; මේ වදුරනලද මැයි- **යං කිඤ්චි වෙදයිතං සබ්බං තං දුක්ඛස්මන්ති වදාමි** (=යම් කිසි අරමුණුරසවිඳීම් ලක්ෂණවූ වෙදනාසමූහයක් වේ ද ඒ සියලු ධර්මජාතය දුක,යයි කියමි;) යි. නැවතත් සැපවෙදනාව දුක් වශයෙන් නුවණින් නැවත නැවත බැලියයුත්තීය. වදාළේ මැනු- **සුඛා වෙදනා ඨිතිසුඛා විපරිණාමදුක්ඛා** (=සැපවෙදනාතොමෝ ප්‍රවෘත්තියෙහි සුව ඵලවන්නීය විපරිනාමයෙහි=පෙරලීමෙහි දුක්වන්නිය) යි සියල්ල විස්තරකළ යුතුයි. නැවතත් අනිත්‍යාදිවූ සප්තඅනුපස්සනාවන්ගේ වශයෙන් ද නැවත නැවත බැලියයුතුයි. සෙස්ස නිර්දේශවාරයෙහිම ප්‍රකට වන්නේය. චිත්තධර්මයන් අතුරෙහි දු පළමුකොට චිත්තය ආරම්මණාධිපතිසහජාත භූමිකර්මවිපාකක්‍රියාදිවූ නානාත්වභෙදයන්ගේ ද අනිත්‍යාදිවූ අනුපස්ස නාවන්ගේ ද නිර්දේශවාරයෙහි ආ සරාගාදිභෙදයන්ගේ ද වශයෙන් නැවත නැවත බැලියයුතුයි. ධර්මයෝ **සවලක්ඛණසාමාන්‍යලක්ඛණයන්** ගේ ද ශූන්‍යතධර්මයාගේ ද අනිත්‍යාදිෂට්පන්නවිධ අනුපස්සනාවන්ගේ ද නිර්දේශවාරයෙහි ආ ඥානතාඥානතාදිභෙදයන්ගේ ද වශයෙන් නුවණින් නැවත නැවත බැලියයුත්තාහුය. සෙස්ස කීනය මැයි. තවද මෙහි යම් යොගාවචරයක්හුගේ කායසඞ්ඛ්‍යාත ලොකයෙහි අභිධ්‍යාදෞර්මනස්‍යය ඉදින් ප්‍රහීණවූයේ නම් ඔහුගේ වෙදනාදිසඞ්ඛ්‍යාතලොකයන් හිද ඒ අභිධ්‍යාදෞර්මනස්‍යය ප්‍රහීණවූයේ ම වෙයි; එතකුදුවුවත් නානාපුද්ග ලයන්ගේ වශයෙන් ද නානාචිත්තක්ෂණිකසතිපට්ඨානභාවනාවශයෙන් ද සියලු කැන්හි වදුරනලද නොහොත් යම්කෙයකින් (කායාදි) එක් තැනෙක්හි ප්‍රහීණවූයේ (වෙදනාදි) සෙසුතැන්හි දු ප්‍රහීණවූයේ වේද එහෙයින්ම ඔහුගේ ඒ එක්තැනෙක්හි ප්‍රහාණය දුක්ඛ්ම පිණිස ද මෙසේ වදුරනලදැයි දතයුතු.

උද්දේශවාරකථා නිමි!

නිද්දේසවාර කථා.

දැන් දක්ෂවූ කුලුපොතුතෙම් මහත්වූ භුණ්ඩයක් ලැබ ඝනකලාල් සියුම්කලාල් කරඬුපෙට්ටිඇ උපකරණයන් කරනු කැමැත්තේ සත රට පලා එයින් එකෙකි භුණ්ඩඛඩක් ගෙන පලා ඒ ඒ උපකරණය යම්සේ නම් කරන්නේද; එපරිද්දෙන්ම භාග්‍යවතුන්වහන්සේ සති පට්ඨානදේශනාවෙන් සත්වයන්ගේ අනෙකප්‍රකාරවිශේෂාධිගමය (=ලොං

එක් ගුණ විශෙෂයන්ට පැමිණීම) කරනු කැමැත්තාහු එකම සම්‍යක් සම්බුදිය වත්තාරෝ සතිපට්ඨානා භාවනාමෙ වත්තාරෝ? ඉධ භික්ඛවෙ! භික්ඛු කායෙ කායානුපස්සී යනාදි නයින් අරමුණු වශයෙන් සතර පරිදිදෙකින් වෙන්කොට එයින් එකෙකි සතිපට්ඨානය ගෙන විභාග කරනසේක් භාවෙත්වා භික්ඛවෙ! යනාදි නයින් නිදේශවාරය වදාරන්ට පටන්ගත්සේක.

ඒ නිදේශවාරයෙහි භාවෙත්වා යනාදිය විස්තරකරනුකැමතිබැවින් (විවාළ) පෘච්ඡායැ; මේ වනාහි මෙහි සංක්ෂෙපාර්ථයයි. "මහණෙනි කවර ප්‍රකාරයකින් මහණතෙම කයෙහි කය අනුව බලමින් වාසය කෙරේද?,,යි. සියලු පෘච්ඡාවාරයන්හි මේ ක්‍රමයයි. ඉධ භික්ඛවෙ! භික්ඛු=මහණෙනි! මේ ශාසනයෙහි මහණතෙම; යම්හෙයකින් මෙහි මේ "ඉධ,, ශබ්දයතෙම සර්ව්ප්‍රකාරයෙන් කායානුපස්සනා නිපදවන්නාවූ පුද්ගලයාගට සන්නිශ්‍රයවූ (බුද්ධ) ශාසනය දක්වන්නේ ද අන්‍ය ශාසනයක්හුගේ එබදුබව වළක්වනානේ ද වෙයි; මේ වදාළේ මෑනු- ඉධෙවභික්ඛවෙ! සමණෙ-පෙ-සුඤ්ඤෝපරප්පවාදෝ සමණෙහි අඤ්ඤෝයි එහෙයින් කියනලදී- "මේ ශාසනයෙහි මහණතෙමෙය,,යි.

ඕසනාසන පරිග්‍රහය. අරඤ්ඤගතෙනවා-පෙ- සුඤ්ඤාගාරගතෙනා වා යන මේ ඒ යොගීහට සීවථන් භාවනාවට අනුරූපවූ සෙනාසන පරිග්‍රහය දක්වීමයි; යම්හෙයකින් මේ භික්ෂුහුගේ බොහෝකලක් රූපාදිඅරමුණෙහි විසුරුණු සිත කමටහන් වීථියට බැසගනුවට නො කැමති වේද; කුළුගොනෙකු යෙදූ රියක්මෙන් නො මහටමැ දිවේද; එහෙයින් ගොපලුතෙම කුළුදෙනගේ සියලු ක්‍රීඩා වැඩිනු කුළුවස්සා දමනුකැමැත්තේ දෙනුකෙරෙන් පහකොට එක් පසෙක මහත්වූ වැඹක් හිදුවා එහියම්සේ යොතකින් බඳින්නේද, එකල ඒ වසු තෙම ඔබිනොබ සැලී පලායන්ට අපොහොසක් වන්නේ ඒ වැඹ කරා ම එලඹ යම්සේ හිදිනේ හෝ හෝනේ හෝ වේද; එපරිදිදෙන් ම මේ මහණවිසිනු දු බොහෝකලක් රූපාරම්මණාදීන් නිසා උපදනාවූ ආස්වාදසඤ්ඤාත රසඤානයෙන් වැඩිනු කො දුම්මුහුකික දමනු කැමැත්තහු රූපාදිආරම්මණයෙන් පහකොට අරණ්‍යයකට හෝ වෘක්ෂමූලයකට හෝ ශූන්‍යාගාරයකට හෝ ප්‍රවෙශකොට එහි සීවථන්අරමුණු නමැති වැඹෙහි සිහි නැමති යොතින් බැන්දයුතු; මෙසේ ඒ යොගීහුගේ ඒ සිත ඔබිනොබ සැලී ද (පැවිද්දෙන්) පෙර (හෝ අනාදිමත් සංසාරයෙහි) පුරුදුකළ අරමුණ නො ලබන්නේ සිහියොත බිඳ පලායන්නට නො පොහොසත්වූයේ ඒ සීවථන්අරමුණෙහි මැ එලඹ හිදිනේ ද හෝ නේද වෙයි. එයින් කීහු පූරණාචාර්‍යයෝ-

100. "යථා එමෙහ නිබන්ධෙය්‍ය වස්සං දම්මං නරෝ ඉධ
බන්ධිත්‍වාන එවං සකං චිත්තං සතියාරම්මණෙ දළහං,, යි.

(=ගොපලුතෙමේ දමනයකටැවිවූ වස්සා වැඟෙහි යම්සේ බඳනේද එපරිද්දෙන් යොගාවචරතෙමේත් දමනයකටැවිවූ තමාගේ සිත කමටහන් සලකනසිහියෙන් කමටහන්අරමුණෙහි දැඩිකොට බැඳ තබන්නේය.)

මෙසේ ඒ යොගීහට තෙල සෙනාස්න භාවනාවට අනුරූපවූයේ වෙයි; එහින් කියනලදි- "මේ (අරඤ්ඤගතො යනාදිය) ඒ යොගීහට සතිපට්ඨානභාවනාවට අනුරූපවූ සෙනාසන පරිග්‍රහය දැක්වීම, යයි.

තවද යම්හෙයකින් කායානුපස්සනාවෙහි මනසිකාර වැනිවූ සියලු බුදුවරයන්ගේ ද (සමිහර) පසේබුදුබුදුසව්වන්ගේ ද විශෙෂාධිගමයට හා (අන්‍යකම්මට්ඨානයෙන් ලද විශෙෂඇත්තවුන්ගේ) ඉහාතම්සැපවිහරණයට කරුණුවූ මේ අනාපන්සීකමටහන සත්පුරුෂහස්‍යඝොෂාදීන්ගේ ශබ්දයෙන් ආකුලවූ ග්‍රාමාන්තය නො හැර සම්පාදනය කරනුවට පහසු නො වේ. (කුමක්හෙයින?) ධ්‍යානය තමා ශබ්දකණ්ටකයෙහිනි; යම්හෙයකින් නො ගම්වූ වෙනෙහි යොගාවචරවිසින් මේ කම්මට්ඨානය පරිග්‍රහ කොට ආනාපානචතුර්ථධ්‍යානය උපදවා ඒ ධ්‍යානය ම පාදක කොට සංඝකාරයන් සම්මර්ශනය කොට අග්‍රඵලයවූ අර්හත්වයට පැමිණෙනුවට පහසු වේද; එහෙයින් ඒ යොගීහට යොග්‍යවූ සෙනස්න දක්වන්නාවූ භාග්‍යවතුන්වහන්සේ **අරඤ්ඤගතොවා** යනාදිය වදළහ. ඒ එසේ මැයි- භාග්‍යවත්හු (යොගීනට නිසි නිවාසස්ථානොපදෙශකවෙයින්) වාසතුවිද්‍යාචාර්‍යයෙකුනෙකුත් වැන්නහ; හේ වාසතුවිද්‍යාචාර්‍ය නුවරට නිසිබිමක් දැකමොනොවට පරීක්ෂාකොට මේහි නුවරක්ඉදිකළමැනවැයි යම්සේ උපදෙශකෙරේද, සූවසේ මැ නුවර නහා නිමිකල්හි රාජකුලයෙන් මහත්වූ සත්කාරත් ලබාද; එපරිද්දෙන් ම යොගාවචරයාට අනුරූපවූ සෙනස්න පරීක්ෂාකොට මෙතැන්හි කමටහන්හි යෙදියයුතු යයි උපදෙශකෙරෙති; අනතුරුව එහි කමටහන්හි යෙදෙන යොගීහුවිසින් අනුක්‍රමයෙන් අර්හත්ව ලැබූකල්හි "එකාන්තයෙන් භාග්‍යවත්හු සම්‍යක් සම්බුද්ධයහ,,යි මහත්වූ සත්කාරලබනසේක. අනිකකුදුඇත- මේ මහණ (වෙනෙහි එසලාව හැසිර ප්‍රතිපක්ෂයන් මැඩ ඊර්ෂ්‍යාපථසිද්ධිකරනයෙයින්)

---

100. **ඉධ**= මේ ලොකයෙහි; **නරෝ**= මනුෂ්‍ය (ගොපලු) තෙම; **දම්මං**= දමනයකටැවිවූ; **වස්සං**= වස්සා; **එමෙහ**= වැඟෙහි; **යථා නිබන්ධෙය්‍ය**= යම්සේ බඳනේද; **එවං**= එපරිද්දෙන්; (යොගාවචර මහණතෙම;) **සකං චිත්තං**= (දම්‍යවූ) තමාගේ සිත; **සතියා**= (මනා කොටකමටහන් සැලකිම් වශයෙන් පැවති) සිහියෙන්; **ආරම්මණෙ**= කමටහන් අරමුණෙහි; **දළහං**= සථිරකොට; (සමාධිකාරීහට උපචාරාර්පණාභෙදවූ සමාධිය යම්සේ සම්භවේද එසේ සථිරකොට යයි සේසි;) **බන්ධෙය්‍ය**= බඳනේය.

දිවියෙකු වැන්නැ,යි කියකුලැබේ; සැබව මහත්වූ දිවිරදෙක්හෙම වනයෙහි තෘණගහනයක් හෝ වනගහනයක් හෝ පර්වතගහනයක් හෝ ඇසුරුකොට සැඟවීහිද වනමීගොණහූරුආදිවූ මෘගයන් යම්සේ ගනීද එසේ මැ මේ යොගාවචර අරණ්‍යාදියෙහි කමටහන්හි යෙදෙන්නේ පිළිවෙළින් සතර මාර්ගයන් ද සතර ඵලයන් ද ගනී. එසින් කිහු පැරණියෝ-

101. "යථා හි දිපිඤ්ඤා නාම නිලීයිත්වා ගණ්හති මිගෙ
තථේවායං බුඩපුත්තෝ යුත්තයොගෝ විපස්සකෝ
අරඤ්ඤං පවිසිත්වාන ගණ්හාති ඵලමුත්තමං,, යි.

(=දිවිතෙම සැඟවී සිට යම්සේ මුවන් අල්වාගනීද, එසේ ම මේ බුඩපුත්‍රතෙම සමාධිවශයෙන් යෙදුනුයොගඇත්තේ වනයට පිවිස උතුම්වූ ශ්‍රාමාණ්‍යඵලය ගනී.)

ඒ කාරණයෙන් ඒ යොගාවචරමහණහට භාවනොත්සාහජවයට යොග්‍යභූම්වූ වනසෙනස්න දක්වන භාග්‍යවතුන්වහන්සේ **අරඤ්ඤ ගතෝ වා** යනාදිය වදාළසේක. මෙයින් මත්තෙහි මේ ආනාපාන පවීයෙහි පළමුකොට කියයුතුවූ යමක්වන්නේද එය විශුඩිමාර්ගයෙහි කියනලද්දේ මය.

දීඝං වා අස්සසන්තෝ දීඝං අස්සසාමීති පජානාති -පෙ- **පස්සම්භයං කායසඞ්ඛාරං පස්සසිස්සාමීති සික්ඛති** යි මෙසේ වදාරනලද මේ ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් භික්මෙන්නාවූ ඔහුට වනාහි ආශ්වාස ප්‍රශ්වාසනිමිත්තෙහි සතරධ්‍යානයෝ උපදිත්; හෙතෙම ධ්‍යානයෙන් නැගීසිට ආශ්වාසප්‍රශ්වාසයන් හෝ ධ්‍යානාඞ්ගයන් හෝ පරිග්‍රහණය කෙරෙයි; ඔවුන් දෙදෙනා අතුරෙහි ආශ්වාසප්‍රශ්වාසකාම්මිකතෙම ආශ්වාසප්‍රශ්වාසයෝ කුමක් ඇසුරුකලාහුද? හදවත ඇසුරුකලාහුයැ; හදවත නම්? කරජකායයැ; කරජකය නම්? සතර මහාභූතයන් හා උපාදායරූපය දැ,යි මෙසේ රූපය පරිග්‍රහණය කෙරෙයි; අනතුරුව ඒ ආශ්වාසප්‍රාශ්වාසාරම්මණයෙහි එසසපඤ්චමකධර්මයන් නාමය,යි (නාමය පරිග්‍රහණය කෙරෙයි;) මෙසේ නාමරූපපරිග්‍රහය කොට ඒ නාමරූපය ගේ ප්‍රත්‍යය සොයන්නේ අවිද්‍යාදිවූ ප්‍රතීත්‍යසමුත්පාදය දැක ඒ නාම රූපය ප්‍රත්‍යයප්‍රත්‍යයොත්පන්නධර්මමාත්‍රයෙක් මැය අන්‍යවූ සත්වයෙක්

---

101. **දිපිඤ්ඤා**= දිවිතෙම; **නිලීයිත්වා**= (වනගහනාදියෙහි) සැඟවී සිට; **මිගෙ**= මෘගයන්; **යථා හි නාම**= යම්සේ නම්; **ගණ්හාති**= ග්‍රහණයකෙරේද; **තථේව**= එපරිදිදෙන් ම; **අයං බුඩපුත්තෝ**= මේ සර්වඥපුත්‍රතෙම; **යුත්තයොගෝ**= (සමාධිවශයෙන්) යුක්ත යොගඇතියේ; **විපස්සකෝ**= විදර්ශීකවූයේ; **අරඤ්ඤං**= ආරණ්‍යසෙනාසනයට; **පවිසිත්වාන**= ප්‍රවිශටව; **උත්තමං ඵලං**= උත්තමවූ ශ්‍රාමාණ්‍යඵලය; **ගණ්හාති**= ග්‍රහණයකෙරෙයි.

හෝ පුද්ගලයෙක් හෝ නැතැ,යි තරණයකළ සැකඇත්තේ ප්‍රත්‍යය සහිත නාමරූපයෙහි (අනිත්‍යාදි) ත්‍රිලක්ෂණයට නහා විදර්ශීනා වඩන්නේ (මාර්ගඵල) පිළිවෙළින් රහත්බවට පැමිණෙයි; මේ එක් භික්ෂුකෙනෙකුගේ රහත්බව තෙක් නිර්‍වාණමාර්ගයයි; (ධ්‍යානාඞ්ගයන් මෙනෙහි කරන) ධ්‍යානකාර්‍මිකතෙමේ ද මේ ධ්‍යානාඞ්ගයෝ කුමක් ඇසුරු කළාහුද? හදවත ඇසුරුකළාහුයැ; හදවත නම්? කරජකායයැ; ධ්‍යානාඞ්ගයෝ නාමයයැ, කරජකය රූපයයැ,යි නාමරූපය නිශ්චය කොට ඒ නාමරූපයාගේ ප්‍රත්‍යය සොයන්නේ අවිද්‍යාදිවූ ප්‍රත්‍යයාකරය දැක මේ නාමය හා රූපය ප්‍රත්‍යයප්‍රත්‍යයොත්පන්නධර්‍මමාත්‍රයෙක් මැය, අන්‍යවූ සත්වයෙක් හෝ පුද්ගලයෙක් හෝ නැතැ,යි වෙසෙසින් දුරුකළ (සොළොස්වැදෑරුම්) සැකඇත්තේ ප්‍රත්‍යය සහිතවූ නාමරූපයෙහි ත්‍රිලක්ෂණයට නහා විදර්ශීනා වඩන්නේ අනුක්‍රමයෙන් අර්හත්වයට පැමිණෙයි; මේ එක් භික්ෂුකෙනෙකුගේ අර්හත්වය තෙක් නිර්‍වාණමාර්ගයයි.

ඉතිඅජ්ඣත්තං වා= මෙසේ තමාගේ හෝ ආශ්වාසප්‍රශ්වාසකයෙහි කායානුපස්සනාභාවනාව සිත්හි කරමින් (=කය අනුවබලමින්) වාසය කරන්නේය; **බහිද්ධා වා**= අන්‍යයාගේ හෝ ආශ්වාසප්‍රශ්වාසකයෙහි; **අජ්ඣත්තබහිද්ධා වා**= කලෙක තමාගේ ද කලෙක මෙරමාගේ ද අශ්වාසප්‍රශ්වාසකයෙහි; මේ පදයෙන් ඒ යොගාවචරයාගේ ප්‍රගුණකර්‍මස්ථානය නො තබා ඔබිනොබ හැසිරෙනකාලය වදාරනලද; එතකුදුවුවත් එක් කලෙක මේ දෙක ම නො ලබති; **සමුදයධම්මානුපස්සී වා**= කඹුරාගේ හස්ත්‍රාව ද කඹුරුසමෙහි නළය ද ඒ පිණිසවූ වැයම ද නිසා යම්සේ වාතය ඔබිනොබ හැසිරේද, එසේ භික්ෂුහුගේ කරජකය ද නාසාපුටයද සිත ද නිසා ආශ්වාප්‍රශ්වාසකාය ඔබිනොබ හැසිරෙයි; කායාදිධර්‍මයෝ "සමුදය,, නම්; ඒ ධර්‍මයන් බලන්නේ **සමුදයධම්මානුපස්සී වා කායස්මිං විහරති,** යි කියනුලැබේ. **වයධම්මානුපස්සී වා**= කඹුරුසම ඉවත ලූකල කඹුරුසමෙහි නළය බිඳුනුකල ඒ පිණිසවූ ව්‍යායාමය ද නැතිකල්හි ඒ වාතය යම්සේ නො පවතීද; එසේ ම කය බුන්කල නැහැසිදුර නැසුනුකල සිත නිරුඩවූකල ආශ්වාසප්‍රශ්වාසකාය නම් (යම්හෙයකින්) නො පවතීද එහෙයින් කායාදීන්ගේ නිරොධයෙන් ආශ්වාසප්‍රශ්වාසයන්ගේ නිරොධය වෙයි; මෙසේ බලන්නේ **වයධම්මානුපස්සී වා කායස්මිං විහරති,** යි කියනුලැබේ; **සමුදයවයධම්මානුපස්සී**= කලෙක උත්පත්තිය ද කලෙක විනාශය ද නැවත නැවත බලන්නේ; **අත්ථි කායොති වා පනස්ස**= (ආශ්වාසප්‍රශ්වාස) කය නම් ඇතැ,යි ද සත්වයෙක් නැති, පුද්ගලයෙක් නැති, ස්ත්‍රියක් නැති, පුරුෂයෙක් නැති, ආත්මයෙක් නැති, ආත්මනීය නොවේ, මම් නො වෙමි, මාගේ නොවේ, කිසිවෙක් නො වේ, කිසිවෙකුගේත් නො වේ,යයි මෙසේ ඒ මහණහට සිහිය ඵලඛසිටියා වෙයි; **යාවදේව** යන මේ පදය ප්‍රයෝජනපරිවේෂ්දයාගේ ව්‍යවස්ථාපනය වෙයි; මේ කියනලද වෙයි; ඕ යම් සිහියක් ඵලඛසිටියා වේද ඕ

තොමෝ අනිකක් පිණිස නො වේ; වැලි කුමක් පිණිසද යත්? **සාව දෙව ඤාණමත්තායං**= ඔහිනොබ මතුමත්තෙහි ඥානප්‍රමාණය පිණිස ද සමෘතිප්‍රමාණය පිණිස ද වෙයි; සමෘතිසම්ප්‍රජන්‍යයන්ගේ වැඩීම පිණිසය" යන අර්ථයි. **අනිස්සිතෝ ච විහරති**= තෘෂ්ණානිශ්‍රය දෘෂ්ටිනිශ්‍රයන්ගේ වශයෙන් අනිශ්‍රිතවූයේ ද වාසයකෙරෙයි;

න ච කිඤ්චි ලෝකෙ උපාදියති= ලොකයෙහි කිසි රූපයක් හෝ -පෙ- විඥානයක් හෝ මේතෙම මාගේ ආත්මය හෝ ආත්මය පිළිබඳ හෝ යයි නො ගනී; **එවම්පි**= මතු අර්ථය සඳහා සම්පිණ්ඩනාර්ථයෙහි "පි" කාරයයි; තවද මේ පදයෙන් භාග්‍යවතුන්වහන්සේ ආනාපාන පරීදෙශනාව නිමවා දක්වූසේක. ඒ ආනාපානපරීයෙහි ආශ්වාසප්‍රශ්වාස පරිග්‍රාහකසමෘතිතොමෝ දුඃඛසත්‍යයැ; ඒ සමෘතිය උපදවන්නීවූ පූර්ව තෘෂ්ණාතොමෝ සමුදයසත්‍යයැ; ඒ (සමෘතිතෘෂ්ණා) දෙදෙනාගේ නො පැවැත්ම නිරොධසත්‍යයැ; දුකදැනගන්නාවූ සමුදය දුරුකරන්නාවූ නිරොධය අරමුණුකරන්නාවූ ආර්‍යමාර්ගයතෙම මාර්ගසත්‍යයැ; මෙසේ චතුස්සත්‍යවශයෙන් උත්සාහකොට නිවනට පැමිණේ,ගයි. මේ ආශ්වාස ප්‍රශ්වාසවශයෙන් (භාවනාවෙහි) යෙදුනු එක් මහණක්හට රහත්බව තෙක්නිර්‍වාණවාරය වේය,යි.

ආනාපානපර්‍වය නිමි.

මෙසේ ආශ්වාසප්‍රශ්වාසවශයෙන් කායානුපස්සනාව විභාගකොට මෙවිට ඊර්‍යාපථවශයෙන් විභාගකරන්ට **පුන ච පරං** යනාදිය වදළහ. එහි ශ්‍රාවකශ්‍රැගාලාදීහුද යන්නාහු එකාන්තයෙන් (ඇපි) යමුය,යි දනිති; එතකුදුවුවත් මේ (ඊර්‍යාපථදෙශනාව) මෙබඳුවූ දැනීමක් සඳහා නො වදරනලද; ඒ එසේමැය- මෙබඳුවූ දැනීම සත්වදෘෂ්ටිය නොපියයි, ආත්මසංඥාව නොනස යි, කර්‍මස්ථානය හෝ ස්මෘතිපට්ඨානභාවනාව හෝ නො වෙයි; මේ භික්ෂුවගේ දැනීම වනාහි සත්වදෘෂ්ටිය පියයි, ආත්මසංඥාව නසයි, කර්‍මස්ථානය හා සතිපට්ඨානභාවනාව ද වෙයි; මේ (ගමන) වනාහි කවරෙක්යේද? කවරෙකුගේ ගමනක්ද? කුමනකරුණකින්යේද, යි මෙබඳු දැනීම සඳහා වදරනලදී; සිව්ම් ආදියෙහිදු මේ නයයි. **එහි කවරෙක් යේද?** යන මෙහි කිසි සත්වයෙක් හෝ පුද්ගලයෙක් හෝ නො යෙයි; කවරෙකුගේ ගමනක්ද? යන මෙහි කිසි සත්වයෙකුගේ හෝ පුද්ගලයෙකුගේ හෝ ගමනක් නොවෙයි; කුමනකරුණකින් යේද? යනමෙහි චිත්තක්‍රියා වායොධාතුහුගේ පැතිරීමෙන් යෙයි; එහෙයින් මේමහණ මෙසේ දැන ගනී- "යන්නෙමි,යි සිතක් උපදිද ඒ සිත වායොධාතුව උපදවයි; වායොධාතුව ගමනාකාරය ගතවන කාය)විඥප්තිය උපදවයි; චිත්තක්‍රියා වායොධාතුහුගේ පැතිරීමෙන් සකලශරීරයාගේ ඉදිරියට එලවීම "ගමන"යයි කියනුලැබේ; සිව්ම් ආදියෙහි දු මෙම නයයි. එහි දු විස්තරය

කියනුලැබේ- සිවිමි,යි සිතක් උපදී, ඒ සිත වායොධාතුව උපදවයි වායොධාතුව කායවිඤ්ඤත්තිය උපදවයි; චිත්තක්‍රියා වායොධාතුහුගේ පැතිරීම හේතුකොටගෙන සියලු ශරීරයාගේ කෙළවරපටන් ඔසවනලද බව සිවිම,යයි කියනුලැබේ; හිඳිමි,යි සිතක් උපදී ද ඒ සිත වායොධාතුව උපදවයි, වායොධාතුව කායවිඤ්ඤත්තිය උපදවයි; චිත්තක්‍රියාවායොධාතුහුගේ පැතිරීමෙන් හෙයිම (=යට) ශරීරයාගේ ගැකිලීම හා උපරිමශරීරයාගේ ඔසවනලදබව හිඳිම,යයි කියනුලැබේ; හෝමි,යි සිතක් උපදී ද, ඒ සිත ක්‍රියාවායොධාතුව උපදවයි, ඒ වායොධාතුව (සයනාකාරය ගහවන කාය) විඤ්ඤත්තිය උපදවයි, චිත්තක්‍රියාවායොධාතුහුගේ පැතිරීමෙන් සකලශරීරයාගේ සරසට දිගුකිරීම සයනය,යි කියනුලැබේ යයි කියායි. මෙසේ දැනගන්නාවූ ඔහට මෙබඳු සිතක් වෙයි- "සත්‍යතෙම යෙයි, සත්‍යතෙම සිටී,යයි කියනුලැබේ, කිසි සත්ව යෙක් යන්නේ හෝ සිටියේ හෝ නැති; අතිකෙක්ඇති- ගැල යයි, ගැල සිටිය,යි යම්සේ කියනුලැබේද යන්නාවූ හෝ සිටින්නාවූ හෝ, කිසි ගැලක් නම් නැත්තේද; එතකුදුවූවත් ගොනුන් සතරදෙනෙකු යොදා දක්ෂවූ සාරථියෙකු පදවනකල්හි ගැල යෙයි, ගැල සිටී,යයි ව්‍යවහාරමාත්‍රයක් වේද; එපරිද්දෙන් ම අජ්ඣත්තිකයෙන් කය ගැලක් මෙනි; චිත්තජවාතයෝ ගොනුන්මෙනි; සිත රියැදුරාමෙනි යෙම්යි; සිවිමි,යි සිත උපන්කල්හි වායොධාතුව කායවිඤ්ඤත්තිය උපදවමින් උපදී, චිත්තක්‍රියාවායොධාතුහුගේපැතිරීම හේතුකොටගෙන ගමනාදිය පවතියි; එහෙයින් සත්‍යතෙම යෙයි, සත්‍යතෙම සිටී; මම යමි, මම සිවිමි,යි ව්‍යවහාරමාත්‍රයෙක් වේ,, යයි

එහින් කිහ-

102. "නාවා මාලුතවෙගෙන ජීවාවෙගෙන නෙජනං
යථා යාති තථා කායෝ යාති වාතාහතෝ අයං.

103. යන්තසුත්තවසෙනේව චිත්තසුත්තවසෙනිදං
පයුත්තං කායයන්තම්පි යාති ඨාති නිසීදති.

---

102. **මාලුතවෙගෙන**=පවනවෙගයෙන්; **නාවා**=නොකාතොමොද; **ජීවාවෙගෙන**= දුනුදියවෙගයෙන්; **නෙජනං**= හීය ද; **යථා යාති**= යම්සේ යේද; **තථා**= එපරිද්දෙන්; **වාතාහතෝ**= වාතයෙන් පහළාවූ; **අයං කායෝ**= මේ කය; **යාති**= යයි.

103. **පයුත්තං**= යොදනලද; **ඉදං කායයන්තම්පි**= මේ ශරීර නමැති යන්ත්‍රයද; **යන්තසුත්තවසෙන** + **ඉව**= යන්ත්‍රසූත්‍රයාගේ වශයෙන් (යන්ත්‍රය) මෙන්; **චිත්තසුත්තවසෙන**= චිත්තසූත්‍රයාගේ වශයෙන්; **යාති**= යෙයි; **ඨාති**= සිටී; **නිසීදති**= හිඳී.

104. කො නාම එත්ථ සො සත්තො යො විනා හෙතුපච්චයෙ අත්තනො ආනුභාවෙන තිට්ඨෙ වා යදි වා වජ්ජෙ,, ති.

(=පවනවෙගයෙන් මුහුදෙහි නැවත් දුනුදියවෙගයෙන් අහසෙහි ඊයත් යම්සේ යේද වාතයෙන් පහළ මේ කයද එසේ ගමන් කෙරෙයි.

යන්ත්‍ර සූත්‍ර වශයෙන් යෙදූ යන්ත්‍රය මෙන් චිත්ත සූත්‍රවශයෙන් යෙදූ මේ ශරීර නාමැති යන්ත්‍රය ද යෙයි සිවී හිඳී.

මේ ලොකයෙහි යම් සත්වයෙක් හෙතු ප්‍රත්‍යයන් හැර තමාගේ ආනුභාවයෙන් සිටින්නේ හෝ යන්නේ හෝ වේද ඒ සත්ව තෙමේ කවරෙක්ද? එබඳු සත්වයෙක් නැත,යි සේයි.)

එහෙයින් මෙසේ හෙතු ප්‍රත්‍යයන්ගේ වශයෙන් ම පැවති ගම්නාදිය සලකන්නාවූ මේ යොගාවචර තෙම "යන්නේ හෝ යන්නෙමි,යි (සත්ත්‍වපුද්ගලාදියෙන්) තොරකොට දැනගනී, සිටියේ හෝ-පෙ-හුන්නේ හෝ-පෙ- හෝනේ හෝ හෝනේ වෙමි,යි දැනගනියැ,යි දත යුතු. **යථා යථා වා පනස්ස කායො පණිහිතො හොති තථා තථා නං පජානාති** යන මේ වචනය සම්මසඞ්ගාහික වචනයකි; මේ (අර්ථය) කියනලද වෙයි- යම් යම් ආකල්පයකින් හෝ ඔහුගේ කය සිටියේ වේද (ගමනාදි) ඒ ඒ ආකාරයෙන් ඒ (ඉරියව්ව) දැනගනී; ගමනාකාරයෙන් සිටියේ යන්නේ ය.යි දැනගනී; සථාන- නිසජ්ජා- ශයනාකාරයෙන් සිටියේ ශයනයකරන්නෙමි වෙමි,යි දැනගනී යයි **ඉති අජ්ඣත්තං වා=** මෙසේ තමාගේ හෝ සතර ඉරියව් පරිග්‍රහණයෙන් ඊර්ෂ්‍යාපථකායයෙහි කායානු පස්සනා භාවනාවෙහි යෙදුනේ (=කය අනුව බලනසුලුවූයේ) වාසයකෙරෙයි; **බහිද්ධා වා=** අන්‍යයාගේ හෝ සතර ඉරියව් පරිග්‍රහණයෙන්; **අජ්ඣත්තබහිද්ධා වා=** කලෙක තමාගේද කලෙක අන්‍යයාගේ ද සතරඉරියව් පරිග්‍රහණයෙන් කයෙහි කය අනුවබලමින් වාසයකෙරෙයි; **සමුදය ධම්මානුපස්සී** යනාදියෙහි වනාහි අවිද්‍යාවගේ හටගැනීමෙන් රූපයන්ගේ හටගැනීම වෙයි, යනාදිනයින් පස්ආකාරයෙන් රූපස්කන්ධයාගේ ඉපදීම ද නැසීම ද ඵලවා දැක්විය යුත්තේය; ඒ සඳහා මෑ මෙහි **සමුදය ධම්මානුපස්සී** යනාදිය වදාරන ලද **අත්ථිකායොති වා පනස්ස** යනාදිය කී අයුරු මැයි. මෙහි දු සිව්ඉරියව් පිළිගන්නීවූ සිහිතොමෝ දුඃඛසත්‍යයැ; ඒ සිහිය උපදවන්නීවූ සූහී කෘෂ්ණතොමෝ සමුදය සත්‍යයැ ඒ දෙවැදෑරුම් සමාහින්ගේ නොපැවැත්ම නිරොධසත්‍යයැ; දුක දැනගන්නාවූ සමුදය දුරුකරන්නාවූ නිරොධය අරමුණු කරන්නාවූ ආර්‍යමාර්ගය මාගී

---

104. **එත්ථ=** මේ ලොකයෙහි; **යො=** යම් සත්වයෙක්තෙම; **හෙතුපච්චයෙ විනා=** හෙතුප්‍රත්‍යයන් හැර; **අත්තනො ආනුභාවෙන=** තමාගේ ආනුභාවයෙන්; **තිට්ඨෙ වා=** සිටින්නේ හෝ; **යදි=** නොහොත්; **වජ්ජෙ වා=** යන්නේ හෝ වේද; **සො සත්තො=** ඒ සත්වතෙම; **කො නාම=** කිනම් වේද. (එබඳු කිසි සත්වයෙක් නැත යන අර්ථයි.)

සත්‍යයෙ; මෙසේ චතුස්සත්‍ය වශයෙන් උත්සාහකොට නිවනට පැමිණේ ය,යි මේ සතර ඊර්‍යාපථ පරිග්‍රාහකවූ එක් භික්‍ෂුවක්හුගේ අර්‍ථවය තෙක් නියාමාණවාරය වේ යයි.

ඊර්‍යා පථ පර්‍වය නිමි.

මෙසේ ඊර්‍යාපථ වශයෙන් කායානුපස්සනාව විභාගකොට දැන් චතුඃසම්ප්‍රජන්‍ය වශයෙන් විභාගකරන්ට පුන **ච පරං** යනාදිය වදළහ. **අභික්කන්තෙන පටික්කන්තෙන** යන මෙහි වනාහි ගමන "අභික්කන්ත,, යයි කියනු ලැබේ; නැවැත්ම "පටික්කන්ත,, යයි කියනු ලැබේ; ඒ දෙකම සතර ඊර්‍යාපථයන්හි ලැබෙයි; පළමුකොට ගමනෙහි ඉදිරියට කය අභිමුඛකොට ඵලවන්නේ "අභික්කමති,, (=ඉදිරියට යෙයි) නම් වේ; පෙරලා නවත්නේ "පටික්කමති,, (=ආපසු එයි) නම් වේ; සිටීමෙහිද සිටියේ ම කය අභිමුඛයට නමන්නේ අභික්කමනය කෙරෙයි නම් වේ; පිටිපසට නමන්නේ පටික්කමනය කෙරෙයි නම්වේ හිඳීමෙහි හුන්නේ ම ආසනයාගේ පූර්‍ව අවයවයට අභිමුඛව නික්මෙන්නේ අභික්කමනය කෙරෙයි නම් වේ; පසුඅවයව පෙදෙසට ප්‍රතිමුඛව හැසිරෙන්නේ පටික්කමනය කෙරෙයි නම් වේ; නිෂද්‍යාවෙහිද මේ නයයි. **සම්පජානකාරිහොති** =සම්‍යක් ප්‍රඥාවෙන් යුක්තව සියලු කෘත්‍යය කරනසුලුවූයේ නොහොත් සම්‍යක් ප්‍රඥාවෙන් යුක්තවූ විහු විසින් ම කරන සුලුවූයේ වෙයි; ඒ එසේවැයි- ඉදිරියට යාම් ආදියෙහි හෙතෙම නුවණින් දැන කෙරේ මය, කිසිතැනෙක්හි දු සම්ප්‍රජන්‍ය විරහිතවූයේ නො වෙයි; එහිසාර්‍ථක සම්ප්‍රජන්‍ය ය ඝත්ප්‍රායසම්ප්‍රජන්‍යය හොවර සම්ප්‍රජන්‍යය අසම්මොහ සම්ප්‍රජන්‍යය, යි සම්ප්‍රජන්‍යය චතුර්විධ වේ. ඒ චතුර්විධ සම්ප්‍රජන්‍යයන් අතුරෙහි අභිමුඛයව ගමනෙහි සිත උපන් කල්හි චිත්තයාගේ වශයෙන් මේ නො ගොස් කිමෙක හෝ මෙහි ගමන හෙතුවෙන් මව වැඩක් ඇද්ද? නැත්ද?යි අර්‍ථානර්‍ථ විමසා අර්‍ථ පරිග්‍රහණය ඤාර්‍ථක් සම්ප්‍රජන්‍යය නම්; එහි දු අර්‍ථ නම්? වෛත්‍ය දර්‍ශන බෝධි දර්‍ශන සඞ්ඝදර්‍ශන සථවිර දර්‍ශන අශුභ දර්‍ශනාදි වශයෙන් ධර්‍ම හෙයින් වැඩී මයි; ශම්හෙයකින් වෛත්‍යයක් දැක ම බුදුන් අරමුණුකොට උපදනා බුද-පෙ-සඞ්ඝ දර්‍ශනයෙන් සඞ්ඝයා අරමුණු කොට උපදනාවූ ද ප්‍රීතිය උපදවා ඒ ප්‍රීතිය ම ක්‍ෂයවශයෙන් මෙනෙහි කරන්නේ රහත්බවට පැමිණේද; තෙරුන්දැක ඔවුන්ගේ අවවාදයෙහි පිහිටා ද අශුභයක් දැක ඒ අශුභාරම්මණයෙහි ප්‍රථමධ්‍යානය උපදවාද ඒ ධ්‍යානය ම ක්‍ෂය වශයෙන් මෙනෙහි කරන්නේ රහත්බවට පැමිණේද; එහෙයින් මේ වෛත්‍යා දින්ගේ දර්‍ශනය ඤාර්‍ථ (=වැඩසහිත) වෙයි. තවද ආමිෂයාගේ වශයෙන් වැඩීම ද අර්‍ථ මැය, ඒ ආමිෂය ඇසුරුකොට බ්‍රහ්මචර්‍යාවට

අනුග්‍රහ පිණිස පිළිපන් බැවීනැ,යි කිසිවෙක් කියති. ඒ ගම්නෙහි වනාහි පහසු නොපහසු සලකා පහසුව සියලු ආකාරයෙන් ගැනීම සත්ප්‍රාය සම්ප්‍රජන්‍ය නම්; ඒ කෙසේද යත්? චෛත්‍ය දර්ශනය නිරවශෙෂයෙන් සාර්‍යැ; එතකුදුවුවත් චෛත්‍යයට මහත් පූජාකරන කල්හි දසදෙලොස් යොදුනක් අතුරු පිරිස ඉදින් රැස්වන්නී නම් සවකිය සම්පත්තියට සුදුසු පරිදි සත්‍රිහු ද පුරුෂයෝද අබරණ ලා සැරසුනාහු සිත්තම්රු මෙන් හැසිරෙති, ඒ පිරිස් අතුරෙහි ද ඒ මහණහට ඉෂ්ටවූ අරමුණෙහි ලොභයත් අනිෂ්ටවූ අරමුණෙහි කොපයත් නො සමව බැලීමෙන් මොහයත් උපදීනම්, කායසංසර්ගාපත්තියට පැමිණේ නම් ජීවිතබ්‍රහ්ම චය්‍යාවන්ට හෝ අනතුරු වේ නම් මෙබඳුවූ ඒ චෛත්‍යසථානය නො සැප වෙයි; උකතප්‍රකාරවූ අනතුරු නැති කල්හි; සැපවෙයි; සඞ්ඝදර්ශනය ද සාර්‍යැ, එසේද වුවත් .ඇතුලුගම් මිනිසුන් මහ මඬු තනවා තුන්යම්රු ධර්ම්ශ්‍රවණය කරවනකල (පළමු) කී ආකාරයෙන් ම ජනසන්නිපාතය හා අනතුරු ද වේ නම්, මෙබඳුවූ ඒ සථානය නො සැප වෙයි; අනතුරු නැතිකල්හි සැපවෙයි. මහ පිරිස් පිරිවැරූ තෙරුන්ගේ දර්ශනයෙහි ද මෙම නයයි. අශුභදර්ශනය ද සාර්‍යැ තදර්ථදීපනය පිණිස මේ කථාවසතුවකුදු වේ.

අශුභ දර්ශන වසතුව. එක් තරුණ භික්‍ෂුකෙනෙක් ගෙරණපැවිද්දෙකු ගෙන දැහැටිදඬු පිණිස ගියේ ලු; සාමණෙරතෙම මඟින් ඉවත්ව ඉදිරියට යන්නේ අශුභනිමිත්තක් දැක පළමු වනදැහැන් උපදවා ඒ ධ්‍යානය ම පාදක කොට සංසකාරයන් මෙනෙහි කරන්නේ තුන්ඵලයන් පසක්කොට මතුමහ පිණිස කුමටහන් ගෙන සිටියේය; තරුණභික්‍ෂුතෙම ඔහු නො දක්නේ සාමණෙරයා,යි හඬ හැර; ගෙතෙම මා පැවිදිවූ දින පටන් භික්‍ෂුවක් සමඟ දෙවරෙක කථාවෙක් නම් නො කළවිරියැ, එහෙයින් අන් දවසෙක ඔහු විශෙෂය (අරහත්ඵල) උපදවන්නෙම්,යි සිතා කිම? වහන්සෑ!යි පිළිවදන් දිනැ; නැවත එව,යි කියනලද්දේ එක් බසින් ම අවුත් සවාමීනී! පළමුකොට මේ මඟින් ගොස් මා සිටි පෙදෙසෙහි මොහොතක් පෙර දිගට අභිමුඛව සිට බැලුව මැනවැ,යි කිය; ඒ තරුණභික්‍ෂූන්වහන්සේ එසේ කොට ඒ හෙරණුන්ද පැමිණිවිශෙෂයට ම (තුන්වනඵලයට යයි සේයි) පැමිණියහ,යි. මේසේ එක් අශුභය දෙදෙනාහට ම වැඩ පිණිසවිය. අනිකෙක් ඇති- මෙසේ සාදිවූ ද මේ අශුභය පුරුෂයාහට මාගම්අශුභය නො සැප වෙයි; මාගමට ද පුරුෂඅශුභය නො සැප වෙයි; සහාගවූයේ ම සැප වේය,යි මෙසේ සත්ප්‍රායපරිග්‍රහණය සත්ප්‍රායසම්ප්‍රජන්‍ය නම්. නැවත මෙසේ නො අඩුකොට ගත් සාර්‍ය සත්ප්‍රායඇත්තහුගේ අවතිස් කම්ටහන් අතුරෙන් තමාගේ සිතට රුචිවූ කර්මස්ථානසඞ්ඛ්‍යාත ගොචරයක් ඉගෙන භික්‍ෂාචාරගොචරයෙහි ඒ (කර්මස්ථානගොචරය) ගෙන ම යාම ගොචරසම්ප්‍රජන්‍ය නම්. ඒ ගොචරසම්ප්‍රජන්‍යයප්‍රකටකිරීම පිණිස මේ වතුයකය දතයුතු-

හරණ පච්චාහරණ චතුක්කය. මේ ශාසනයෙහි එක් මහණෙක් (කර්මස්ථානය) ගෙනයයි පෙරලා නො ගෙනෙයි; එකෙක් නො ගෙනයයි නැවත ගෙනඑයි; එකෙක් වනාහි නො ම ගෙනයයි පෙරලාත් නො ගෙනෙයි; එකෙක් ගෙන යන්නේත් පෙරලා ගෙන එන්නේත් වෙයි. ඒ මහණුන් සතරදෙනා අතුරෙහි යම් මහණෙක් දහවල් සක්මනින් හා හිඳීමෙන් නීවරණ ධර්මයන් කෙරෙන් සිත පිරිසුදුකොට එපරිද්දෙන් රෑ පෙරයම (සිත) පිරිසුදුකොට මැදියමෑ ශයනය කොට පසුයම්හිද හිඳීම්සක්මනින් කල් යවා උදැසන ම සැමලුබෝමලුවත් කොට බෝරුකැ දිය ඉස පියයුතු පරිභොගකළයුතු (පැන්) එලවාතබා ආචාර්‍ය්‍ය උපාධ්‍යායවත් ආදිවූ සියලු කදුවත් සමාදන්ව හැසිරේද; හෙතෙම සිරුරු පිරියම් කොට සෙනස්නට පිවිස දෙතුන් පලහක් තෙද ගන්වමින් කමටහන්හි යෙදී පිඬුසිඟන වෙලායෙහි නැගිට කර්මස්ථානශීර්ෂයෙන් ම පාසිවුරු ගෙන සෙනසුනෙන් නික්ම කර්මස්ථානය මෙනෙහි කරමින් සැමලුවට හොස් ඉදින් (මෙනෙහි කරනලද්දේ) බුඬානුස්මෘතිකර්මස්ථානය වීනම් එය නො හැර ම සැමලුවට පිවිසෙයි; ඉදින් අන්‍යකර්මස්ථානයක් වී නම් හින (=සැමලුවට නගින පඩිය සේ) මුල සිට අතින් ගත් භාණ්ඩයක් මෙන් ඒ කර්මස්ථානය තබා බුඬාරම්මණප්‍රීතිය උපදවා ගෙන සැමලුවට නැඟී ඉදින් මහත්වූ සෑයක් වී නම් තුන්වරක් පැදකුණු කොට සතරතැනෙක්හි සිට වැන්දයුතු; කුඩාසෑයක් වී නම් එසේ ම (තුන්වරක්) පැදකුණුකොට අවතැනෙක්හි සිට වැන්දයුතු; සෑය වැඳ බෝමලුවට පැමිණියහුවිසින් ද, භාග්‍යවත් බුදුන් හමුයෙහි මෙන් පහත් පැවතුම්ඇතිආකාරය දක්වා බෝ වැන්ද යුත්තේය; හෙතෙම මෙසේ වෛත්‍යය ද බොධිය ද වැඳ පිළිසම් (=තැන්පත්) කළ තැනකට ගොස් පිළිසම්කළ භාණ්ඩයක් අතින් ගන්නෙකු මෙන් බහාතැබූ කර්මස්ථානය ගෙන ඉර්යාපථයෙහි කර්මස්ථාන ශීර්ෂයෙන් ම සිවුරු පෙරව ගමට පිඬුපිණිස පිවිසෙයි; ඉක්බිති මනුෂ්‍යයෝ ඒ භික්ෂුව දැක අපගේ ආර්‍ය්‍යයන් වහන්සේ වැඩියාහ,යි පෙර ගමන් කොට පාත්‍රය ගෙන ආසනශාලාවෙහි හෝ ගෙයි හෝ වඩා හිඳුවා කෑද පිළිගන්වා යම්තාක් බත් නිමාවේද ඒතාක් පා සොඩා තෙල් ගල්වා අභිමුඛයෙහි හිඳ ප්‍රශ්න හෝ විචාරති, බණ අසනු කැමැත්තාහු හෝ වෙති; ඉදින් (මනුෂ්‍යයෝ) කථානොකරවත් නම් ජනයාට සංග්‍රහ පිණිස ධර්මකථාව නම් කළයුත්තී මය, යි අර්ථකථාවාර්‍යයීහු බෙණෙති; යම්හෙයකින් කර්මස්ථානයෙන් තොරවූ ධර්මකථාවක් නම් නැත්ද, එහෙයින් කර්මස්ථානශීර්ෂයෙන් ම බණ කියා කර්මස්ථානශීර්ෂයෙන් ම ආහාර වලඳ අනුමොදනාව කොට නවතනු ලබන්නාවූ ද මිනිසුන් විසින් අනුගතවූයේ ම ගමින්. නික්ම එහි ඒ මිනිසුන් නවතා මහට පිළිපදී; ඉක්බිති පෙරාතුව නික්ම බිහිගම්හි කළබත්කිසඇති හෙරණුන් හා තරුණභික්ෂූහු ඔහු දැක පෙරගමන්

කොට ඔහුගේ පාසිවුරු ගනිත්; පෞරාණිකභික්ෂූහු වනාහි අපගේ උපාධ්‍යයෝය ආචාර්‍යයෝය,යි මුහුන තො බලා වත් කෙරෙති; පැමිණි පිරිසෙයින් මැ කෙරෙති; ඒ සාමණේරතරුණභික්ෂූහු ඔහු මෙසේ චිරාරත්- "සබාමීනි! මේ මිනිස්සු නුඹ වහන්සේට කිම මව් පක්ෂයෙන් සම්බන්ධවූවාහු වෙත්ද? පියපක්ෂයෙන් සම්බන්ධවූවාහුදැයි; කුමක් දැක විචාරවූදැ,,?යි; නුඹවහන්සේ කෙරෙහි මේ මිනිසුන්ගේ පෙම්බුහුමන් දැක විචාරමෝය, යි; ඇවැත්නි! යමක් මව්පියන්විසිනුදු දුෂ්කරද එය මේ මිනිස්සු අපට කෙරෙති; අපගේ පාසිවුරු ද මොවුන් සතුමය; මොවුන්ගේ ආනුභාවයෙන් භයඅවස්ථාවෙහි භයක් නො ම දනිමු ක්ෂුධාඅවස්ථාවෙහි ක්ෂුධාවක් නො දනිමු; අපට උපකාරීවූ මෙබඳු මිනිස්සු නම් නැතැ,යි ඔවුන්ගේ ගුණ කියමින් යයි; මේ මහණ (කර්‍මස්ථානය) ගෙනයන්නේ පෙරලා නො ගෙනේය,යි කියනුලැබේ.

උදෑසනම උක්තප්‍රකාර වත්පිළිවෙත් කරන්නාවූ යමෙකුගේ වනාහි කර්‍මජතෙජස (=ජඨරාග්නිය) දුල්වේද, අනුපාදින්නකකය හැරදමා උපාදින්නකකය ගනීද, ශරීරයෙන් ඖදිය ගලත්ද, කර්‍මස්ථානය පීපියට නො නගීද; හෙතෙම උදෑසනම පාසිවුරු ගෙන වෙගයෙන්ම වෛත්‍ය වැඳ ගවසමූහයා නික්මෙනවෙලායෙහි ම ගමට කැඳ සිඟීම පිණිස පිවිස කැඳක් ලැබ ආසනශාලාවට ගොස් පානයකරයි; ඉක්බිති දෙතුන්වරක් ගිලිපමණින් ම ඔහුගේ කර්‍මජතෙජෝධාතුව උපාදින්නකකය හැරදමා අනුපාදින්නකකය ගනී; දියකළසියයකින් නැළුකෙක් මෙන් තෙජෝධාතුපරිදෘහය නිවීමට පැමිණ කර්‍මස්ථානශීලීයෙන් කැඳ වළඳා පය ද මුව ද සෝධා ඇතුලුබත කමටහන් මෙනෙහි කොට සෙසු තැනෙක්හි පිඬුපිණිස හැසිර කර්‍මස්ථාන ශීලීයෙන්ම ආහාර වළඳා එතැන් පටන් පිළිවෙළින් වැටහෙන්නාවූ කර්‍මස්ථානය ගෙන ම එයි; මේ මහණ (කර්‍මස්ථානය) නො ගෙනයයි පෙරලා ගෙනඒය,යි කියනුලැබේ. මෙබඳු භික්ෂූහු කැඳ වළඳා විදර්‍ශනා වඩා බුදුසස්නෙහි රහත් බවට පැමිණියාහු නම් සඛ්‍යාපථය ඉක්ම සිටියාහුය. සිංහලද්වීපයෙහි ම ඒ ඒ ගම්වල ආසනශාලාවෙහි යම් තැනෙක්හි කැඳ වළඳා රහත් බවට පැමිණිභික්ෂූහු නැද්ද එබදුවූ ආසනයක් නැත්තේය;යි.

යම් මහණෙක් වනාහි ප්‍රමාදව හැසිරෙනසුලුවූයේ වේද බහා තබන ලදවියදීඇත්තේ සියලු වත් බිඳ පඤ්චවිධචේතඛිලබන්ධනයන්විසින් බඳනාලද සිත්ඇතිව වාසයකරන්නේ කර්‍මස්ථානයක් නම් ඇතැයි කියාත් හැඟීමක් නො කොට ගමට පිඬුපිණිස පිවිස අනනුලෝම්වූ ගිහිසංසර්‍ගයෙන් සංසර්‍ගවූයේ (පිඬුපිණිස) හැසිර ද වළඳා ද හිස්වූයේ නික්මේද; මේ මහණ (කර්‍මස්ථානය) නො ම ගෙනයන්නේ පෙරලා නො ගෙනෙන්නේත් වේය,යි කියනුලැබේ.

යම් මේ මහණෙක් වනාහි (කම්සථානය) ගෙනයන්නේත් පෙරලා ගෙනඑන්නේත් වේය,සි කියනලද්දේද හෙතෙම ගතපච්චාගතිකවූත වශයෙන් දතයුතු. ඒ එසේමැයි- තමහට වැඩකැමති කුලපුත්‍රයෝ ශාසනයෙහි පැවිදිව දසදෙන ද විසිදෙන ද පනස්දෙ න ද සියක් දෙන ද එක්ව වසන්නාහු කතිකවතක් කොට

ගතපච්චාගතික වත.

වෙසෙති; "ඇවැත්නි! තෙපි (යම්හෙයකින් ණයෙන් පීඩිතව නො පැවිදිවූවහුද (රාජභයාදී) භයින් පීඩිතව නො පැවිදිවූවහුද (දුර්භික්ෂාදිහෙතුවෙන්) ජීවත් වියනොහැකිව නොපැවිදිවූවහුද; වැලි දුකින් මිදෙනුකැමතිව පැවිදිවූවහුද; එහෙයින් ගමනෙහි උපන් කෙලෙශය ගමනෙහි ම නිග්‍රහකරවු; සිටීමෙහි- හිඳීමෙහි- ශයනයෙහි උපන් කෙලෙශය ශයනයෙහිදී ම "නිග්‍රහකරවු,,යයි; ඔවුහු මෙසේ කතිකවත් කොට පිඬුසිඟීමට යන්නාහු අඬුස්බක් ඉස්බක් අඬගව්වක් ගව්වක් අතරත පාෂාණයෝ වෙත් නම් ඒ පාෂාණසංඥාවෙන් කම්සථාන මෙනෙහි කරමින් ම යෙති; ඉදින් කිසිවෙකුට ගමනෙහිදී කෙලෙශයෙක් උපදී නම් එහිදී ම ඒ කෙලෙශයට නිග්‍රහකෙරෙයි; එසේ නො හැකිවන්නේ සිටී; එකල්හි ඔහුගේ පිටිපසින් එනතැනැත්තේ ද සිටී; ඒ (උපන්කෙලෙස් ඇති) භික්ෂුතෙම මේ (පිටිපසින් සිටි) භික්ෂුතෙම තට උපන් විතර්කය දනී තට මෙබදු විතර්කයෙක් ඉපදවීම සුදුසු නො වේය,යි තමහට වොදනාකොට විදසුන් වඩා එහිදී ම ආර්‍යභූමියට බසී; එසේ නොහැකිවන්නේ හිඳගනී; එකල්හි ඔහුගේ පිටිපසින් එනතැනැත්තේ ද හිඳගනී,යයි ඒ (පළමුකී) ක්‍රමය ම වේ. ආර්‍යභූමියට බැසගන්ට අසමර්ථවූයේ ද ඒ කෙලෙශය යටපත්කොට කම්සථානය මෙනෙහි කරමින් ම යයි; කම්සථානයෙන් වෙන්වූ සිතින් යුක්තව පිය නො නඟයි; ඉදින් එසවිනම් පෙරලා නැවතී පළමුසිටි පෙදෙසට ම. එයි.

ආළිඳකවැසි මහාසුස්සදෙව තෙර.

ආලිඳකවැසි **මහාසුස්සදෙව** තෙරුන්වහන්සේ මෙනි; උන්වහන්සේ වනාහි එකුන්විසිවසක් ගතපච්චාගතික වත පුරමින් ම විසූහ; මනුෂ්‍යයෝ ද අතරමඟ සාන්නාහු ද වපුරන්නාහු ද (සස්‍ය) මඩනාහු ද (අන්‍යත්) කම්මාන්ත කරන්නාහු ද එසේ යන්නාවූ තෙරුන් දැක මේ තෙරුන්වහන්සේ නැවත නැවත නැවතී යෙති, කිමෙක්ද්‍ෙ හෝ මංමුළා වූ වාහුද නොහොත් කිසිවක් නැතිවූවාහු ද,සි කථා කෙරෙති; උන්වහන්සේ ඒ කථාව නො ගෙන කම්සථානයෙහි යෙදුන සිතින් ම මහණදම් කරමින් විසිවසක් ඇතුලත රහත්බවට පැමිණි සහ. රහත්බවට පැමිණිදවස්හි ම උන්වහන්සේට සක්මන්කෙළවර අරක්ගත් දෙවතාතොමෝ ඇඟිලිවලින් පහන් දල්වා සිටියා; සතර වරම්මහරජහු ද ශක්‍රදෙවෙන්දුතෙමේ ද සහම්පතිබ්‍රහ්මතෙමේ ද උපසථානයට පැමිණියාහුය; ඒ ආලෝකය ද **වනවාසිමහාතිස්ස** නම්

තෙරුන්වහන්සේ දූක දෙවනදවස් ඒ තෙරුන් විචාළහ- "රාත්‍රිභාග යෙහි ආයුෂ්මතුන් සමීපයෙහි ආලොකයක් විය, ඒ ආලොකය කිමෙක් දූ?„සි! තෙරුන්වහන්සේ (කථාව) වික්ෂෙප කරම්න් ආලොකයක් නම් පහන්ආලොකය ද මැණික්ආලොකය ද වේ,යසි මේ ආදිය කිහ; ඉක්බති තුඹවහන්සේ ප්‍රතිවේධනය කරහුය,සි නිබඳ වවාරනලද්දාහු එසේය,සි ප්‍රතිඥකොට දූන්වූහ. අනිකුදු කථාවස්තුවක් වේ- කළුවැල් මඩුවැසි **මහානාග** තෙරුන්වහන්සේ මෙනි; ඒ තෙරුන්වහන්සේ ද ගතපච්චාගතිකවත පුරන්නාහු පළමුකොට ම භාග්‍යවතුන්වහන්සේගේ මහාප්‍ර ධානය පුදන්නෙම්,සි සත්වසක් සිටීම හා සක් මන ම අධිෂ්ඨානකළාහු ලු; නැවත සොළොස්වසක් ගතපච්චාගතිකවත පුරා රහත්බවට පැමිණියහ; උන්වහන්සේ කමටහන්හි යෙදුන සිතින්ම පය නහන්නාහු කම්ස්ථානයෙන් වෙන්වූ සිතින් නැඟුකල්හි පෙරලා නවත්නාහු ගම් සමීපයට ගොස් ගවයෙක්. දේ පැවිද්දෙක් දේ,සි සැකකළයුතු පෙදෙස්හි සිට සිවුරු පොරවා කස්කරකයෙන් (ගත්) දියෙන් පාත්‍රය සොධා ජලයෙන් ගණ්ඩූෂ •(=මුඛයපිරීම) කෙරෙසි; කරුණු කිම යත්? මට භික්ෂාව දෙන්ට හෝ වඳින්ට හෝ ආ මිනිසුන්ට "දිගා වවූ"යසි වදන්පමණකිනිදු කම්ස්ථානවික්ෂෙපයක් නො වේවැසි කියාසි; සවාමීනි! අද කිනම් තිථිය දූසි? දවස හෝ භික්ෂූන්ගේ සඞ්ඛ්‍යාව හෝ ප්‍රශ්නයක් හෝ විචාරනලද්දේ වනාහි ජලය ගිල කියසි; ඉදින් දවස්ආදිය විචාරන්නාහු නො වෙත් නම් (ගමින්) නික්මෙන වෙලායෙහි ගම්දෙර කාරාදමා යෙසි.

ගලඹනොට පනසක්භික්ෂූන් ගලඹතොට විහාරයෙහි වස්එලඹියාවූ **පනසක්භික්ෂූහු** මෙනි- ඒ භික්ෂූහු වනාහි ඇසළ පුණු පොහෝ දවස් කතිකවතක් කළාහුය- අහිඞ්ඝයට නොපැමිණ අනන් මනන් නො බෙණෙන්නෙමු,,සි; දවස් ආදිය විචාළ කල්හි පළමුකි නියෙන්ම පිළිපැද්දාහුය; එගම්හි මිනිස්සු කාරුණිම දූක අද එකෙක් අය අද දෙදෙනෙකු,සි දූනගත්තාහුය; නැවත මෙසේ සිතූහ- "කිමේක්දෝ හෝ මේ භික්ෂූහු අප සමග ම කථා නොකෙරෙත්ද නො හොත් ඔවුනොවුනුත් නො බෙණෙත් දූ,සි; ඉදින් අනන් මනන් නො බෙණෙත් නම් එකාන්තයෙන් හටගන්නා විවාද ඇත්තෝ වන්නා හුය; එවු ඒ භික්ෂූන් ඔවුනොවුන් කමවන්නෙමු,සි සියල්ලෝ විහාර යට ගොස් පනසක් භික්ෂූන් අතුරෙන් භික්ෂූන් දෙදෙනෙක් එක් නැනෙක්හි නොදුටූහ; නැවත ඒ මිනිසුන් අතුරෙහි යම් නුවණැස් ඇති පුරුෂයෙක් විද හෙතෙම මෙසේ කිය- "පින්වත්නි! කලහ කරුවන් (වසන) ස්ථානයක් මෙබඳු නොවෙසි; සැමලු බෝමලු මොන වට හමදනාලද; මුසුන් මොනවට තබනලදහ; පැන් පරිභොග ජලය එලවා තබන ලදූ,සි ඔවුහු එසින් ම නැවැත්තාහුය. ඒ භික්ෂූ

හු ද ඇතුලු තුන්මස්හි ම රහත්බවට පැමිණ මහාපවාරණයෙන් විශුද්ධි පවාරණය පැවරුහ.

මෙසේ (යම් මහණෙක්) කළුවැල්මඩු වැසි මහානාග තෙරුන් මෙන් ද ගලඹතොට විහාරයෙහි වස්එලඹි භික්ෂූන් මෙන් ද කමට හන් හි යෙදුනු සිතින් ම පිය නහමින් ගම සම්පයට පැමිණ උදක ගණ්ඩූ ශය කොට වීපි සලකා යම් වීපියෙක්හි රා සොඬුන් හා ධූර්ත දීහු හෝ කලහකරුවෝ හෝ සැඩ ඇත් අස් ආදී හු හෝ නැත්නම් ඒ වීපියට පිළිපදී ද; එහි ද පිඬුපිණිස හැසිරෙන්නේ ඉතා ශීඝ්‍රවූ වෙක් මෙන් වෙගයෙන් නො යේද; යම් හෙයකින් ජවන පිණ්ඩපාතික ධූතාඞග නම් වූ කිසිවක් නැත්ද එහෙයිනි; වැලිදු විෂමභූමි භාගයකට පැමිණි දියපිරු ගැලක් මෙන් නියඵලව යේද; හෙපිළි වෙළින් පිම්බියේ ද දෙනුකැමති බව හෝ නො දෙනුකැමති බව හෝ සලකාගන්ට ඊට සුදුසු කාලයක් ඉක්මවමින් භික්ෂාව ගෙන ඇතුල් ගම හෝ බිහිගම හෝ විහාරයට ම හෝ අවුත් යම් යම් පහසුවූ සුදු සුවූ අවකාසයෙක්හි හිද කම්මට්ඨානය මෙනෙහි කරමින් ආහාරයෙහි ප්‍රතිකූල සංඥාව ඵලවා අකඛබහඤ්ඣාන වණාලෙපන පුත්තමංස යන මේ උපමාවන්ගේ වශයෙන් ප්‍රත්‍යවෙක්ෂා කරමින් අටහකින් යුත් ආහාරය වළඳයි, (එය) නොම ක්‍රීඩාපිණිස වේ, මදවැඩීම පිණිස නොවේ, සැරසීම පිණිස නොවේ, අඩුතැන් පිරීම පිණිස නොවේ; වළඳ අවසන්වූයේ ද දියකිස කොට මොහොතක් බත් විඩාව සන්සිඳුවා පෙරඛත යම්සේ නම් එසේ පසුඛත ද පෙරයම යම්සේ නම් එපරිද්දෙන් පසුයම ද කම්මට්ඨානයම මෙනෙහි කෙරේද; මේ මහණතෙම (කම්මට්ඨානය) ගෙනයන්නේත් පෙරලා ගෙන එන්නේත්වේ යයි කියනු ලැබේ.

මේ හරණ පච්චාහරණ සඞ්ඛ්‍යාතවූ ගතපච්චා ගතික වත පුරන හැනැත්තේ වනාහි ඉදින් උපනිශ්‍රය සම්පන්නවූයේ වී නම් පළමු වියසෙහි ම රහත්බවට පැමිණෙයි; ඉදින් පළමුවයසෙහි (අහීඞ්කයට) නො පැමිණේ නම් පසුව මධ්‍යම වයසෙහි පැමිණෙයි; ඉදින් මධ්‍යම වයසෙහි නො පැමිණියේ නම් පසුව මරණ සමයෙහි පැමිණෙයි; ඉදින් මරණ සමයෙහි (රහත්බවට) නො පැමිණේ නම් ඊට පසුව දිව්‍ය පුත්‍රයෙක්ව රහත්බවට පැමිණෙයි; ඉදින් දිව්‍ය පුත්‍රයෙක් වී නො පැමිණේ නම් බුදුකෙනෙක් නූපන් කල්හි (මිනිස් ලොව) උපන්නේ ප්‍රත්‍යේකබොධිය පසක් කෙරෙයි; ඉදින් ප්‍රත්‍යේකබොධිය නො පසක් කෙරේ නම් අනතුරුව බුදු කෙනෙකුගේ සම්මුඛීභාවයෙහි දූරුවිරිය නම් බාහිය තෙරුන් වහන්සේ යම්සේද එමෙන් "ඛිපපා භිඤ්ඤ,, හෝ වෙයි; සැරියුත් තෙරුන් මෙන් "මහාප්‍රාඥ,, හෝ වෙයි; මහාමුගලන් තෙරුන් මෙන් "මහත්සෘඞ්ධි ඇත්තේ,, හෝ වෙයි; මහ කස්සප් තෙරුන් මෙන් "ධූතවාදී,, හෝ වෙයි; අනුරුඬ තෙරුන්

මෙන් "දිවැස් ඇත්තේ,, හෝ වෙයි; උපාලි තෙරුන් මෙන් "විනය ධර,, හෝ වෙයි; මන්තාණී පුත්‍ර පුණ්ණ තෙරුන් මෙන් "ධර්මකථික,, හෝ වෙයි; රෙවත තෙරුන් මෙන් "ආරණ්‍යක,, හෝ වෙයි; අනඳ තෙරුන් මෙන් "බහුශ්‍රැත,, හෝ වෙයි;; බුඩපුත්‍ර රහල් තෙරුන් මෙන් "ශික්ෂාකාමි,, හෝ වේ යයි. මෙසේ මේ චතුෂ්කය අතුරෙන් යම් මේ මහණෙක් (කර්මස්ථානය) ගෙනයන්නේත් පෙරලා ගෙන එන්නේත් වේද ඔහට ගොචර සම්ප්‍රජන්‍යය ශිඛාප්‍රාප්තවූයේ වෙයි;

නැවත ඉදිරියට යාම්ආදියෙහි නො මුළාවීම අසම්මොහසම්ප්‍රජන්‍යය නම; ඒ අසම්මොහසම්ප්‍රජන්‍යය මෙසේ දතයුතු- "මේ ශාසනයෙහි මහණතෙම ඉදිරියට යන්නේ හෝ පෙරලා එන්නේ හෝ යම්සේ බාලපුහුදුන්තෙමේ ඉදිරියට යාම්ආදියෙහි ආත්මයක් ඉදිරියට යෙයි, ආත්මයවිසින් ඉදිරියට යාම නිපදවනලදැයි කියා හෝ මම ඉදිරියට යම් මාවිසින් ඉදිරියට යාම නිපදවනලදැයි කියා හෝ වෙසෙසින් මුළාවේද, එපරිද්දෙන් නො මුළාවන්නේ ඉදිරියට යම්,සි සිතක් උපන්කල්හි ඒ සිත සමග ම (ගමනාකාරය දක්වන) චිත්ත සමුට්ඨාන වායොධාතුව කායවිඥප්තිය උපදවමින් පහළවෙයි; මෙසේ චිත්තක්‍රියාවායොධාතුහුගේ පැතිරීම්වශයෙන් මේ කායසඞ්ඛ්‍යාතවූ ඇට සැකිල්ල අභිමුඛයට යයි, මෙසේ අභිමුඛයට යන්නාවූ ඒ අසම්මෝහකතයාගේ එකෙකි පියවරක් නැඟීමෙහිදී පෘථිවීධාතුඅබ්ධාතුයන ධාතු දෙදෙන මඳවූවාහු දුබල වෙති; ඉතිරි ධාතුදෙදෙන අධිකවූවාහු බලවත් වෙති; (පය පෙරට්ටවට ගෙනයාමවූ) අභිහරණය (කණ්ඩුකටු සඳිඳින් අතුරෙන් කිසිවක් දැක ඔබිනොබ පය හැසිරවීමවූ) චිත්තිහරණය යන දෙක්හි ද එසේමැයි; (පය පහත්කිරීමවූ) වොඝ්ඨබ්බනයෙහි තෙජොධාතුවායොධාතූහු මඳවූවාහු දුබල වෙති; ඉතිරි ධාතූහු දෙදෙන අධිකවූවාහු බලවත් වෙති; (පය පොළෝතෙලෙහි තැබීමවූ) සන්නික්ඛේපණය (නැවත පය තබනකල්හි පොළොව හා ශරීරයාගේ ගැටීමවූ) සන්නිරුම්භණය යන දෙක්හි ද එසේමැයි; එහිදී පාදෙඛ්‍රණයෙහි පැවති රූපාරූපධර්මයෝ අභිහරණයට නො පැමිණෙත්; එසේම අභිහරණයෙහි පැවති (රූපාරූපධර්මයෝ) චිත්තිහරණයට ද; චිත්තිහරණයෙහි පැවැත්තාහු වොඝ්ඨබ්බනයට ද; වොඝ්ඨබ්බනයෙහි පැවැත්තාහු සන්නික්ඛේපණයට ද; සන්නික්ඛේපණයෙහි පැවැත්තාහු සන්නිරුම්භණයට ද නො පැමිණෙති; ඒ ඒ (පය නැඟීම්ආදි) කාලයෙහි ම පුරුක් පුරුක් සන්ධිසන්ධි කොටස්කොටස් වී රත් වූ කබලෙක දැමූ තල මෙන් "තටතට,, යි; ශබ්දකෙරෙමින් බිඳියෙත්; එහි කිනම් එකෙක් අභිමුඛයට යේද; නොහොත් කිනම් එකෙකුගේ අභිමුඛයට යාමක්ද; පරමාර්ථවශයෙන් වනාහි ඒ ඒ කොටසෙහි ම රූපය සමග ධාතූන්ගේ ම ගමන ධාතූන්ගේ සිටීම ධාතූන්ගේ හිඳීම ධාතූන්ගේ නිදීම වෙයි.

105 අඤ්ඤං උපපජ්ජනෙ චිත්තං අඤ්ඤං චිත්තං නිරුජ්ඣති අවිච්චිමනුසම්බන්ධො නදිසොතොව වත්තති, සි.

(=අන් සිතක් උපදී, අන්සිතක් නිරුඬවෙයි, නිරතුරුව ගඩාශ්‍රොතසක් මෙන් රූපාරූපධර්මසමූහය එක්ව සම්බන්ධවූයේ පවතී.)

මේ දුක්වූපරිදි ඉදිරියට යාම්ආදියෙහි නො මුළාවීම අසම්මොහ සම්ප්‍රජන්‍යය නම් වේය,සි.

අභික්කන්තෙන පටික්කන්තෙන සම්පජානකාරී හොති යන පදයාගේ අර්ථය නිමි.

ආලොකිතෙ විලොකිතෙ යන මෙහි වනාහි **ආලොකිත** නම්; අභිමුඛයෙහි බැලීමය; **විලොකිත**= නම්; අනුදික් බැලීමය; අන්‍ය වූද යට උඩ පිටපස බැලීම්වශයෙන් "ඔලොකිතඋල්ලොකිතපලොකිත., නම්වූවාහු ද වෙති; ඒ ශබ්දයෝ මෙහි නොගන්නාලදහ; එහෙත් සාරූප්‍යවශයෙන් (ආලොකිතවිලොකිත යන) මේ දෙකම ගන්නා ලදහ; නොහොත් මේ (ආලොකිතවිලොකිතයන්ගේ) වාරයෙන් ඒ (ඔලොකිතාදි) සියල්ල ද ගන්නාලද්දහු ම වෙති,සි. මෙහි අභිමුඛය බලන්නෙම්,සි සිතක් උපන්කල්හි චිත්තයාගේ වශයෙන් ම නොබලා අර්ථ විමසා ගැනීම සාර්ථසම්ප්‍රජන්‍යය නම් වේ; ඒ සාර්ථසම්ප්‍රජන්‍යය ආයුෂ්මත් නන්දයන් කායසාක්ෂිකොට දතයුතු. මේ විදර්ශනාලද මැති භාග්‍යවතුන්වහන්සින්- **සචෙ භික්ඛවෙ! නන්දස්ස පුරත්ථිමාදිසා ආලොකෙ නබ්බා හොති සබ්බවෙනසො සමන්නාහරිතබ්බා නන්දෙ පුරත්ථිමං දිසං ආලොකෙති එවං මෙ පුරත්ථිමං දිසං ආලොකයතො න අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලාධම්මා අන්වාස්සවෙය්‍යුන්ති ඉති වා තත්ථ සම්පජානො හොති සචෙ භික්ඛවෙ! නන්දස්ස පච්ඡිමා දිසා-පෙ-උත්තරා දිසා -පෙ-දක්ඛිණා දිසා- උඩ්ඪං- අධො-අනුදිසා ආලොකෙතබ්බා හොති සබ්බවෙනසො සමන්නාහරිතබ්බා නන්දෙ අනු දිසං ආලොකෙති එවං මෙ අනුදිසං ආලොකයතො-පෙ-සම්පජානො හොති** (=මහණෙනි! ඉදින් නන්දයාවිසින් පෙරදිග බැලිය යුතු නම් සියලු සිතින් ආවර්ජනාකොට නන්දතෙම පෙරදිග බලයි. මෙපරිද්දෙන් පෙරදිග බලන්නාවූ මාගේ (සිත) අභිධ්‍යාදොම්නස්‍ය සඞ්ඛ්‍යාත ලාමක අකුශලධර්මයෝ අනුව නො එන්නාහුය,සි කියයි,

---

105. **අඤ්ඤං චිත්තං**= අන්‍යවූ සිතක්; **උපපජ්ජනෙ**= උපදී; **අඤ්ඤං චිත්තං**= අන්‍යවූ සිතක්; **නිරුජ්ඣති**= නැසෙයි; **අවිචිං**= නිරන්තරව; **නදිසොතොව** + **ඉව**= ගඟදියපහරක් මෙන්; **අනුසම්බන්ධො**= (රූපාරූපධර්මසමූහය) එක්ව බැඳුනේ; **වත්තති**= පවතී.

මෙසේ හෝ ඒ පෙරදිග බැලීමෙහි නුවණින් දැන කරන්නේ වෙයි මහණෙනි! නඳුයාවිසින් පැදුම්දිග-පෙ-උතුරුදිග-දකුණුදිග-උඩ-යට අනුදින බැලියයුතු නම් සියලු සිතින් ආවර්ජනාකොට නඳුතෙමේ අනුදිග බලයි, මෙපරිද්දෙන් අනුදිග බලන්නාවූ මාගේ සිත-පෙ-නුවණින් දැන කරන්නේ වේ) යයි.

තවද මේ ආලොකිතවිලොකිතයෙහි ද පෙර කියනලද චෛත්‍ය දර්‍ශනාදීන්ගේ වශයෙන් ම සාර්‍ථකව ද සාත්‍මායකව ද දතයුත්තීය, යම් හෙයකින් කර්‍මස්ථානයාගේ අත්නොහැරීම ම ගොචරසම්ප්‍රජන්‍යයවේද එහෙයින් සකඛධාතුආයතනකර්‍මස්ථානිකයන් විසින් තම තමන්ගේ කර්‍මස්ථානවශයෙන් ම හෝ කෘත්ස්නාදි කර්‍මස්ථානිකයන්විසින් කර්‍මස්ථාන ශීර්‍ෂයෙන් ම හෝ ආලොකනවිලොකනය කළ යුතුයි. අභ්‍යන්තරයෙහි අභිමුඛය බලන්නාවූ හෝ අනුදිග බලන්නාවූ ආත්මයක් නම් නැති, එහෙත් අභිමුඛය බලන්නෙමි,සි සිතක් උපදනාකල්හි ඒ සිත සමඟ ම චිත්තසමුත්ථානවායොධාතුව (අභිමුඛය බලනඅයුරු දක්වන) කාය විඥප්තිය දනවමින් පහළවෙයි; මෙසේ චිත්තක්‍රියා වායොධාතුහුගේ පැතිරීම් වශයෙන් ම යටි ඇස්පිය පහතට බසී, උඩු ඇස්පිය උඩට නැඟෙයි, යන්ත්‍රයකින් විවෘත කරන්නාවූ කිසිවෙක් නම්නැති; ඉක්බිති චක්ෂුර්විඥානය දර්‍ශනකෘත්‍යය සිඛකරමින් උපදී,යයි මෙපරිද්දෙන් මනාකොට දැනගැනීම වනාහි මෙහි අසම්මූළ සම්ප්‍රජන්‍යය නම් වේ; තවද "මූලපරිඤ්ඤ ආගතනුක තාවකාලික,, භාවයන්ගේ වශයෙන් ද මෙහි අසම්මූළ සම්ප්‍රජන්‍යය දතයුතුයි. පළමුකොට මූල පරිඤ්ඤ වශයෙන් -

106 "භවඞඟා විජ්ජ නඤ්චව දස්සනං සම්පටිච්ඡ නං
ඝනතීරණං වොත්ථපනං ජවනං භවති සත්තකං,යි

(මේසේදැක්වූ) ඒ චිත්තවීථියෙහි භවාඞඟචිත්තය උපප්‍රාප්තිභාවයවඳ අඞඟකෘත්‍යය සිඛකරමින් පවතී; ඒ භවාඞඟචිත්තය ආවර්‍ජනයකොට (භවාඞඟය සිඳ යයි සේයි) ක්‍රියා මනොධාතුව ආවර්‍ජනකෘත්‍යය සිඛකරමින් පවතී; ඒ ක්‍රියා මනොධාතුහුගේ නිරුඬීමෙන් චක්ෂුර්විඥානය දර්‍ශන කෘත්‍යය සිඛකරමින් පවතී; ඒ චක්ෂුර්විඥානයාගේ නිරුඬීමෙන් විපාක මනොධාතු තොමෝ සම්ප්‍රත්‍යෙෂණ (=පිළිගැනීම්)

---

106 භවඞඟ + ආවජ්ජනංච + එව=භවාඞඟ චිත්තය හා (පඤ්චවාරයෙහි උපදනා) ආවර්‍ජන චිත්තය ද; දස්සනං=(රූපාලම්බනය ප්‍රත්‍යක්ෂ හෙයින් දක්නාවූ) දර්‍ශන (=චක්ෂුර්විඥාන) ය ද; සම්පටිච්ඡනං= (රූපාලම්බනය පිළිගන්නාවූ) සම්ප්‍රත්‍යෙෂණ චිත්තය ද; ඝනතීරණං= (මනාකොට සලකන්නාවූ) සන්තීරණ චිත්තය ද; වොත්ථපනං= (එම අරමුණ නියම කරන්නාවූ) ව්‍යවස්ථාපන චිත්තය ද; සත්තකං= සත් වැනිවූ ජවනං= ජවනය ද; භවති= (පිළිවෙළින්) වෙයි.

කෘත්‍යය සාධමින් පවති; ඒ විපාක මනොධාතුහුගේ නිරුඩ්ඨීමෙන් විපාක මනෝ විඤ්ඤාණ ධාතු තොමෝ සන්තීරණ (මනාකොට සැලකීම්) කෘත්‍යය සාධමින් පවති; ඒ විපාක මනොවිඤ්ඤාණ ධාතුහුගේ නිරුඩ්ඨීමෙන් ක්‍රියා මනොවිඤ්ඤාණ ධාතුව ව්‍යවස්ථාපන (නියමකිරීම්) කෘත්‍යය සිඩ්කරමින් පවතී; ඒ ක්‍රියා මනොවිඤ්ඤාණ ධාතුහුගේ නිරුඩ්ඨීමෙන් සත්වරක් (එකුන්තිස් කාමාවචර ජවනයන් අතුරෙන් යම්කිසි) ජවනයක් දිවෙයි; ඒ භවාඞ්ග ජවනාදීන් අතුරෙන් එක් චිත්තයෙක්හි ද ප්‍රථමජවනයෙහි ද මෝ සත්‍රීය මේ පුරුෂය,සි ඇලීම් දූෂ්‍යවීම් මුළාවීම් වශයෙන් ආලොකන විලොකනයක් නො වෙයි; දෙවෙනි ජවනයෙහිද -පෙ- සත්වෙනි ජවනයෙහි ද (රාගාදි විසින් ආලෝකන විලොකනය නොවෙයි.) මේ චිතියාදී ජවනයන්හි වනාහි යුඩ මණ්ඩලයෙහි යොධයන් උඩයට වශයෙන් බිඳී වැටුනු කල්හි (හැඳින කරන යුඩාදි ක්‍රියා) මෙන් මෝ සත්‍රීය මේ පුරුෂය, සි රාගාදිවශයෙන් ආලොකන විලොකනය වෙයි; මෙසේ මෙහි පළමුකොට මූලපරිඤ්ඤ වශයෙන් අසමෙමොහ සම්ප්‍රජන්‍යය දතයුතු.

නැවත චක්ඛුර්වාරයෙහි රූපයක් හමුබවට පැමිණිකල්හි භාවාඞ්ග චලනයෙන් මත්තෙහි සවකීය කෘත්‍යය නිපදවීම් වශයෙන් ආවර්ජනා දිය ඉපිද නිරුඩ්ධවූ කල්හි අවසානයෙහි ජවන් උපදී; ඒ ජවන් සිත පළමු උපන් ආවජ්ජනාදීන්ට ගෘහයක් වැනිවූ චක්ඛුර්වාරයෙහි ආගන්තුක පුරුෂයෙක් වැනි වෙයි; අනෙකෙකුගේ ගෙයි කිසිවක් ඉල්වාගන්ට පිවිසියාවූ ඒ ආගන්තුක පුරුෂයා විසින් ගෙහිමියන් ද නො බැණ හුන්කල්හි අණකිරීම සමිසේ අයුතු වේද; එපරිද්දෙන් ආවර්ජනාදීන්ට ගෙයක් වැනිවූ චක්ඛුර්වාරයෙහි ආවර්ජනාදි චිත්තයනුදු (රාගයෙන්) නො ඇලෙන කල්හි ද (වෙෂයෙන්) දූෂ්‍යනොවන කල්හි ද (මොහයෙන්) මුළානොවන කල්හිද ඇලීම දූෂ්‍යවීම මුළාවීම අයුතු ය,සි මෙසේ ආගන්තුකභාව වශයෙන් අසමෙමොහ සම්ප්‍රජන්‍යය දතයුතු.

නැවත චක්ඛුර්වාරයෙහි ව්‍යවස්ථාපනය අවසන්කොට ඇති යම් ඒ සිත්කෙනෙක් උපදින්ද ඒ චිත්තයෝ සම්ප්‍රයුක්ත ධර්මයන් සමග ඒ ඒ තැන්හි ම බිඳෙන් බවුනොවුන් නො දකිත්, එහෙයින් ඉන්ද්‍රියෝ තාවකාලික වෙත්; එහි එක් ගෙයක සිඟලු මිනිසුන් මළකල්හි අවශෙෂවූ එකෙනෙහි මැරෙනසුලු වූ එකෙකුට නෘත්‍යගීතාදියෙහි ඇලීම නම් යම්සේ නො යෙදෙන්නීද; එපරිද්දෙන් ම එක් චාරයෙක්හි සම්ප්‍රයුක්ත ධර්මයන් සහිතවූ ආවර්ජනාදිය ඒ ඒ තැන්හිම නැසුනකල්හි අවශෙෂවූ එකෙනෙහි ම නැසෙන සුලුවූ ජවනයට ද ඇලීම් දූෂ්‍යවීම් මුළාවීම් වශයෙන් අභිරතියක් නම් නො යෙදෙන්නීය,සි මෙසේ තාවකාලික භාව වශයෙන් අසමෙමොහ සම්ප්‍රජන්‍යය දතයුතු.

තවද සඤ්ඤායතන ධාතු ප්‍රත්‍යය යන මොවුන් ප්‍රත්‍යවෙක්ෂා ඤ්ඨීම් වශයෙන් ද මේ අසමෙමොහ සම්ප්‍රජන්‍යය දතයුතුයි. මෙහි

වනාහි ඇස හා රූපය ද රූපස්කන්ධයයි; දර්‍ශනය විඥානස්කන්ධ යයි ඒ විඥානය හා සම්ප්‍රයුක්තවූ වෙදනා වෙදනාස්කන්ධයයි; සංඥා සංඥාස්කන්ධ යයි; සපර්‍යාදී හු සංස්කාරස්කන්ධයයි; මෙසේ මේ පඤ්චස්කන්ධ යන්ගේ සමවායයෙහි ආලෝකන විලෝකනය පැනෙයි; එහි හුදු කවරෙක් ආලෝකනය කෙරේද කවරෙක් විලෝකනය කෙරේ ද; එසේම ඇස චක්ෂුරායතනයැ; රූපය රූපායතනයැ; දර්‍ශනය මනා යතනයැ; වෙදනාදීහු ද සම්ප්‍රයුක්තධර්‍මයෝ ද ධර්‍මායතනයැ; මෙසේ මේ සතර ආයතනයන්ගේ එක්වීම ඇතිකල්හි ආලෝකන විලෝක නය පැනෙයි; එහි හුදු කවරෙක් ආලෝකනය කෙරේද, කවරෙක් විලෝකනය කෙරේද; එපරිද්දෙන් ඇස චක්ෂුර්ධාතුවයැ; රූපය රූප ධාතුවයැ; දර්‍ශනය චක්ෂුර්විඥාන ධාතුවයැ; ඒ චක්ෂුර්විඥානය හා එක්ව යෙදුනාවූ වෙදනාදි ධර්‍මයෝ ධර්‍මධාතුවයැ; මෙසේ මේ සතරධාතූන්ගේ සමවාය ඇතිකල්හි ආලෝකන විලෝකනය පැනෙයි; එහි හුදු කව රෙක් ආලෝකනය කෙරේද, කවරෙක් විලෝකනය කෙරේද; එප රිද්දෙන් ඇස නිශ්‍රයප්‍රත්‍යය වෙයි; රූපය ආරම්මණ ප්‍රත්‍යයයි; ආවර්ජ නය අනන්තර සමනන්තර උපනිශ්‍රය නාස්තිවිගත ප්‍රත්‍යයයි; ආලෝ කය උපනිශ්‍රය ප්‍රත්‍යයයි; වෙදනාදීහු සහජාත ප්‍රත්‍යය වෙති; මෙසේ මේ ප්‍රත්‍යයන්ගේ සමවායයෙහි ආලෝකන විලෝකනය පැනෙයි; එහි හුදු කවරෙක් ආලෝකනය කෙරේද කවරෙක් විලෝකනය කෙරේද,යි මෙසේ මෙහි සකල ආයතන ධාතු ප්‍රත්‍යයන් ප්‍රත්‍යවේක්ෂා කිරීම් වශයෙන් ද අසම්මෝහ සම්ප්‍රජන්‍යය දතයුතුයි.

සම්මිඤ්ජිතෙ පසාරිතෙ= පසිඟන්ගේ හැකිලීමෙහි හා දිගුකිරී මෙහි එහි චිත්තවශයෙන් ම හැකිලීම හා දිගුකිරීම නො කොට හස්තපාදයන්ගේ හැකිලීම්දිගුකිරීම්ප්‍රත්‍යයෙන් අවිනාභූ සලකා අභි පරිග්‍රහණය සාර්‍ථකසම්ප්‍රජන්‍යය නම්; එහි හස්තපාදයන් ඉතා බොහෝ වෙලාවක් හකුලුවා ම හෝ දිගුකොටම හෝ සිටියහුට කෙණෙහි කෙණෙහි වෙදනා උපදින්; සිත එකඟබවක් නො ලබයි; කර්‍මස්ථා නය හාත්පසින් පහවෙයි; (ධ්‍යානාදි) විශෙෂයක් නො ලබයි; කලෙක (හස්තපාදයන්) හකුලුවන්නහුට කලෙක දිගුකරන්නහුට වනාහි ඒ වෙදනා නූපදින්; සිත (අරමුණෙහි) එකඟවෙයි; කර්‍මස්ථා නය වැඩීමට යෙයි; විශෙෂයට පැමිණෙයි,යි මෙසේ අවිනාභූ පරි ග්‍රහණය දතයුතු. අවියක් ඇතිකල්හි දු සැප නො සැපබව සලකා සත්ප්‍රායපරිග්‍රහණය සත්ප්‍රායසම්ප්‍රජන්‍යය නම්; එහි මේ ක්‍රමයයි- මහසැමලුවෙහි වනාහි තරුණභික්ෂූහු (ධර්‍මය) හදාරති, ඔවුන්ගේ පිටි පස (හුන්) තරුණභික්ෂුණීහු ධර්‍මය අසති, ඔවුන් අතුරෙහි එක් තරුණ භික්ෂුවක් අත දිගුකරන්නේ (මෙහෙණක් හා) කායසංසර්‍ගයට පැමිණ එකරුණෙන් ම (හෙතෙම) ගිහිවිය. අනිත් භික්ෂුවක් පය දිගුකරන් නේ ගින්නට දිගුකෙළේය, ඇවය දක්වා (ඔහුගේ) පය දැස. අනි කෙක් තුඹසකට (පය) දිගුකෙළේය, හෙතෙම සර්පයෙකුවිසින් ඩහන

ලද්දේ විය. අනිකෙක් සිවුරුකිළියෙහි දඹුයෙක පහළේය, ඔහු මිණී නයෙක් ඩැසී. එහෙයින් මෙබඳුවූ අසත්ප්‍රායසථානයෙහි දිගුනොකොට සත්ප්‍රායසථානයෙහි දිගුකළයුතුයි. මේ මෙහි සත්ප්‍රායසම්ප්‍රජන්‍යයයි.

මහනෙරවන. ගොචරසම්ප්‍රජන්‍යය වනාහි මහතෙරුන්ගේ වසතුවෙන් දැක්විය යුතුය, මහතෙරණුවෝ දිවාසථානයෙහි හුන් නාහු අතවැසියන් සමග කථාකරමින් වහා අත හකුලුවා නැවත තුබූතැන්හි තබා සෙමින් හැකිලූහු ලු; අතවැසියෝ උන්වහන්සේ විචාළෝ- සවාමීනි! කුමක්හෙයින් වහා අත හකුලුවා නැවත තුබූ තැන්හි තබා සෙමින් හැකිලූහුදැ?යි; ඇවැත්නි! මම යම්දිනක පටන් කර්මසථානය මෙනෙහි කරන්ට ආරම්භකෙළෙම් ද (එතැන්පටන්) මා විසින් කර්මසථානය මුදා අන නො හැකිලුවිරැයැ; දැන් වූකලී තොප සමග කථාකරන මා විසින් කර්මසථානය මුදා හකුලුවනලද; එහෙයින් නැවත තුබූතැන්හි තබා හැකිලීම්,යි; සාධු සවාමීනි! භික්ෂුවක්විසින් නම් මෙබන්දෙකු වියයුතුය,යි (පෙසසූහ.) මෙසේ මෙහි දු කර්මසථානය නො හැරීම ම ගොචරසම්ප්‍රජන්‍යය,යි දතයුතු.

අභ්‍යන්තරයෙහි හකුලුවන්නාහු හෝ දිගුකරන්නාහු හෝ කිසි ආතමයක් නම් නැති; එනකුදුවුවත් (පෙර) කිවිරු චිත්තක්‍රියාවායෝ ධාතුහුගේ පැතිරීමෙන් නූල ඇදීම්වශයෙන් දුරුයන්ත්‍ර (රූප) යාගේ අත්පා ලාළනයක් මෙන් හැකිලීම හා දිගුකිරීම වේය,යි දැනගැනීම වනාහි මෙහි අසම්මූළසම්ප්‍රජන්‍යය,යි දතයුතු.

සඞ්ඝාටිපත්තචීවරධාරණෙ යන මෙහි සහලසිවුරු හැඳීම් පෙර වීම් විසින් ද පාත්‍රය ආහාර පිළිගැනීමාදිවිසින් ද පරිභොගය **ධාරණ** නම්; පිළිවෙළින් ඒ සහලසිවුරු ධැරීමෙහි හැඳගෙන ද පොරවාගෙන ද හැසිරෙන්නහුගේ ආමිෂලාභය ද **සිනාසස පටිඝානාය** යනාදි නයින් භාග්‍යවතුන්විසින් වදාළවිරු ම අර්ථය ද අර්ථ නම්; ඒ අර්ථයාගේ වශයෙන් සාර්ථසම්ප්‍රජන්‍යය දතයුතු. නැවත උණුසුම්පියව්වූවහුට ද දුබලයාට ද සියුම් සිවුර සැපවෙයි; සිහිල්බිහිලියහට ඝනදුපටය සැපවෙයි; විපරීතවූයේ නො සැපවෙයි; යම් කිසිවෙකුට දිරු සිවුර නො සැපවූයේ ම වේද, අඟහළ (=අණ්ඩ) ආදිය දැමීමෙහි ම ඔහුට ඒ සිවුර පලිබොධකර වෙයි; පටදුහුල්ආදිහෙදඇති ලොභකටයුතු චීවරය එසේම පලිබොධකර වෙයි; ඒ එසේමැයි- එබඳු සිවුර වන යෙහි එසලාව වසන්නහුට නිවාසානන්තරායකර ද ජීවිතානන්තරාය කරද වෙයි; නිෂ්පර්‍යායවශයෙන් වනාහි යම් සිවුරක් නිමිත්තකර්මාදි මිථ්‍යාජීවවශයෙන් උපන්නේද යම් සිවුරකුත් සෙවුනාවු ඕහට අකුශලධර්මයෝ වැඩෙත්ද කුශලධර්මයෝ පිරිහෙත්ද ඒ සිවුර නො සැපවෙයි; විපරීතවූයේ සැපවෙයි; ඒ චීවරයාගේ වශයෙන් මෙහි සත්ප්‍රායසම්ප්‍රජන්‍යය ද කර්මසථානය නො හැරීම්වශයෙන් ගොචරසම්ප්‍රජන්‍යය ද දතයුතුයි. අභ්‍යන්තරයෙහි සිවුරු පොරවන්නාවූ කිසි ආතම

යෙක් නම් නැති; (පළමු) කී අයුරු චිත්තක්‍රියාවායොධාතුහුගේ පැතිරීම්වශයෙන් ම වනාහි සිවුරු පෙරවීම වෙයි; එහි චීවරයත් අවෙතනයැ කයත් අවෙතනයැ; මාවිසින් කය පොරවනලදැයි සිවුර නොදනී; කයත් මම සිවුර විසින් පොරෝනාලද වෙමි,යි නො දනී; ධාතුහු මැ ධාතුසමූහයක් පිළිසොයති. පටකඩකින් පොතලු රුවක් වැසීමෙහි මෙනි; එහෙයින් සොඳුරු සිවුරක් ලැබ සොම්නසක් නො ම කටයුතුයි; සොඳුරු නොවූ සිවුරක් ලබා දෙම්නස් නො කටයුතුයි- යම්සේ නාගවල්මිකචෛත්‍යවෘක්ෂාදියෙහි කිසිවෙක් මල්ගඳ දුම්වත් ආදියෙන් සත්කාර කෙරෙත්ද, කිසිවෙක් මලමූමඩදඬුඅවිපහර ආදියෙන් අසත්කාර කෙරෙත්ද, එයිත් වාල්මිකවෘක්ෂාදිහු සොම්නසක් හෝ දෙම්නසක් හෝ නො කෙරෙත්ද; එපරිද්දෙන්ම සොඳුරු සිවුරක් ලැබ සොම්නස් නො කළයුතුයි; සොඳුරු නොවූ සිවුරක් ලැබ දෙම්නස් නොකළයුතුයයි; මෙසේ පැවති පස්විකිම් වශයෙන් මෙහි අසම්මූඪසම්ප්‍රජන්‍යය දතයුතු.

පාත්‍රපරිභොගයෙහි ද පාත්‍රය වහා ම නො ගෙන මේ පාත්‍රය ගෙන පිඬුපිණිස හැසිරෙමින් භික්ෂාව ලබන්නෙමි,යි මෙසේ පාත්‍රය ගැනීම් ප්‍රත්‍යයෙන් ලැබියයුතු ප්‍රයෝජනයාගේ වශයෙන් සාර්‍ථසම්ප්‍රජන්‍යය දතයුතු. කෘශදුර්ලභශරීරඇත්තහුට වනාහි බර පාත්‍රය නො සැපවෙයි; යම් කිසිවෙකුට සතරපස්ගැටයකින් පහළපාත්‍රයක් වේද (එය) සේදිය නො හැක්කේද නො සැපවූයේද වෙයි; සැබව- (මනා කොට) නො සේදූපාත්‍රය නො වටී; ඒ පාත්‍රය සොධන්නාවූ ම ඕහට පලිබොධ වෙයි; මණිවණ්ණපාත්‍රය වනාහි ලොහකටයුතුවූයේ චීවර යෙහි කිනියෙන් ම නො සැපවෙයි; නැවත නිමිත්තකර්මාදිවශයෙන් ලත් (යම් පාත්‍රයක් වේද) යමක් සෙවුනාහට අකුශලධර්මයෝ හාත් පසින් වැඩෙත්ද කුශලධර්මයෝ පිරිහෙත්ද, මේ පාත්‍රය එකාන්තයෙන් නො සැපවූයේ ම වෙයි; විපරීතවූයේ සැපවෙයි; ඒ පාත්‍රයාගේ වශයෙන් මෙහි සත්ප්‍රායසම්ප්‍රජන්‍ය ද කර්මස්ථානය නො හැරීම්වශයෙන් ගොචරසම්ප්‍රජන්‍ය ද දතයුතු. අභ්‍යන්තරයෙහි පාත්‍රය ගන්නාවූ කිසි ආත්මයක් නම් නැති; එතකුදුවුවත් උක්තප්‍රකාරවූ චිත්තක්‍රියාවායොධාතුහුගේ පැතිරීම්වශයෙන් ම පාත්‍රය ගැනීම නම් වෙයි; එහි පාත්‍රය ද සිත්නැතියෙක, අත් ද සිත්නැතියෝයැ; පාත්‍රයතෙමේ මම හස්තයන් විසින් ගන්නාලද වෙමි,යි නො දනී; අත් ද පාත්‍රය අප විසින් ගන්නාලදැ යි නොදනිත්; අඬුවකින් ගිනිවන් පයක් ගැනීම මෙන් ධාතුහු මැ ධාතුසමූහයක් ගනිත් යයි; මෙසේ පැවති පස්විකිම්වශයෙන් මෙහි අසම්මූඪසම්ප්‍රජන්‍යය දතයුතුයි. තවද යම්සේ සුන්අත්පාඇති වණමුව වලින් වැගිරෙන ලේසැරවපණුකාලඇති නිලමැස්සන්විසින් අවට ගැව සිගත් අනාථශාලාවෙක සිටි අනාථමිනියන් දැක දයාබිහිලි මිනිස්සු ඔවුනට වණවස්ත්‍රකඩ හා සබල්ආදියෙන් බෙහෙතුත් ඵලවත්ද; ඒ දීමෙහිදී රෙදිකඩ ද කිසිවෙකුට සියුම්වූවාහු කිසිවෙකුට ඝනවූවාහු

පැමිණෙත්; බෙහෙත්කබල් ද කිසිවෙකුට මනාසටහන් ඇත්තාහු කිසි වෙකුට නො මනාසටහන්ඇත්තාහු පැමිණෙත්; ඔවුහු එහි සොම්නස් ඇත්තාහු හෝ දෙම්නස්ඇත්තාහු හෝ නො වෙත්ද; යම්හෙයකින් වණවැසීමට පමණවූ මැ රෙදිකඩින් ද බෙහෙත් පිළිගැනීමට පමණ වූ මැ කබලින් ද ඔවුන්ට ප්‍රයෝජනවේද එහෙයිනි; එපරිද්දෙන් ම යම් මහණෙක් වණවසනකඩක් මෙන් සිවුර ද බෙහෙත්කබලක් මෙන් පාත්‍රය ද කබලෙහි බෙහෙත් මෙන් පාත්‍රයෙහි ලත් භික්ෂාව ද සල කන්නේ වේද මේ මහණ සඟළපාසිවුරුපරිභොගයෙහි අසම්මුඝසමප්‍ර ජන්‍යයෙන් උත්තමසම්පජානකාරිවූයේ වනැයි දතයුතු.

"අසිතං"දිපදයන්හි **අසිතං**= පිණ්ඩපාතභොජනයෙහි; **පීතං**= කෑද ආදිය පීමෙහි; **ඛායිතං**= පිටිකැවුම්ආදිය කෑමෙහි; **සායිතං**= මිපැණි ආදිය රසවිඳගැනීමෙහි; එහි **තෙව දවාය** යනාදිනයින් වදුළ අට වැදෑරුම්වූ ම අර්ථය අවී නම්; ඒ අර්ථයාගේ වශයෙන් සාර්ථසම්ප්‍රජන්‍යය දතයුතු. නැවත රූපප්‍රණීතතිකතම්ඛුරාදීන් අතුරෙහි යම් භොජන යකින් යමෙකුට නො සුව වේ ද ඒ භොජනය ඔහට අසත්ප්‍රාය වෙයි; නැවත නිමිත්තකම්මාදිවශයෙන් ලැබූ යම් භොජනයක් වේද, යම් භොජ නයකුත් වලඳන්නාවූ ඒ මහණහට අකුශලධර්මයෝ වැඩෙත්ද කුශල ධර්මයෝ පිරිහෙත්ද ඒ භොජනය එකාන්තයෙන් අසත්ප්‍රාය ම වෙයි; විපරිතවූයේ සත්ප්‍රාය වෙයි; ඒ සත්ප්‍රායභොජනයාගේ වශයෙන් මෙහි .සත්ප්‍රායසම්ප්‍රජන්‍යය ද,කර්මස්ථානය දුරු නො කිරීම්වශයෙන් ම ගොචරසම්ප්‍රජන්‍ය ද දතයුතු. අභ්‍යන්තරයෙහි වලඳන්නාවූ කිසි ආත්ම යෙක් නම් නැති; එහෙත් උක්තපකාර චිත්තක්‍රියාවායොධාතුහුගේ පැතිරීමේම පාත්‍රය පිළිගැනීම නම්වෙයි; චිත්තක්‍රියාවායොධාතුහුගේ පැතිරීමෙන් ම අත පාත්‍රයෙහි බහාලීම නම් වෙයි; චිත්තක්‍රියාවායෝ ධාතුහුගේ පැතිරීමෙන් ම පිඬුකිරීම දපිඬුනැඟීම ද මුවවිවරණය ද වෙයි; කිසිවෙක් හකුඇට කෙසිමුදුවකින් විවර නො කෙරෙයි යන්ත්‍රයකින් විවර නො කෙරෙයි; චිත්තක්‍රියාවායොධාතුහුගේ පැතිරීමෙන්ම ආලෝපය මුඛයෙහි තැබීමද උඩදන්මොහොල්කිස සිඳකිරීම ද යටදන් උදුබල (=වනපිළිබඳවූ) කිස සිඳකිරීම ද දිව අත්කිස සිඳකිරීම ද වෙයි; මෙසේ ඒ ආලෝපය එහිදිවගෙහි තුනීකෙළ ද දිවමුල බොල්කෙළ ද වැකෙයි; යටදන්නමැති වනෙහි ලාදිවනමැති අතින් පෙරලනලද කෙළ නමැති දිමයන් තෙමනලද උඩදන්නමැති මොහොලින් සුණුකරනලද ඒ ආලෝපය කෙණෙස්සකින් හෝ හැන්දකින් හෝ ඇතුලත ප්‍රවේශ කරන්නාවූ කිසිවෙක් නම් නැති; වායොධාතුවහෙතුකොටගෙන ම පිවි සෙයි; පිවිසි පිවිසි ආලෝපය පිදුරු ඇතිරියක්කොට ධරන්නාවූ කිසිවෙක් නම්නැති; වායොධාතුවශයෙන් ම සිටී; සිටි සිටි අලෝපය උදුනක්කොට ගිනි දල්වා පිසන්නාවූ කිසිවෙක් නම් නැති; තෙජොධාතුවිසින් ම පිසනුලැබෙයි; පැසුනු පැසුනු ආලෝපය දණ්ඩකින් හෝ ඇටකින්

හෝ බැහැරකරන්නාවූ කිසිවෙක් නම් නැති; වායොධාතුතොමෝ ම බැහැරකරයි; මේසේ වායොධාතුතොමෝ පෙරටුවට ගෙනයන්නී ද සරසට ගෙනයන්නී ද ධරන්නී ද පෙරලන්නී ද සුණුකරන්නී ද වියලන්නී ද බැහැරකරන්නී ද වෙයි; පෘථිවීධාතුතොමෝ ධරන්නී ද පෙරලන්නී ද සුණුකරන්නී ද වියලන්නී ද වෙයි; අබ්ධාතුතොමෝ තෙත්කරන්නී ද තෙත්බව රක්නී ද වෙයි; තෙජොධාතුතොමෝ ඇතුලත පිවිසි පිවිසි ආහාරය පැසවන්නීය; ආකාශධාතුව මාඝීය වෙයි; විඤ්ඤාණධාතුව ඒ ඒ තැන්හි මනාකොට යෙදීමට පැමිණ පාලනය කරන්නීය,යි; මෙසේ පැවති පස්විකිම්වශයෙන් මෙහි අසම්මුසසම්ප්‍රජඤ්ඤය දතයුතුයි.

තවදගමනහෙයිනා,පිරියෙසුම්හෙයිනා,පරිභොගහෙයිනා,(පිත්තාදි) ආසයහෙයිනා, නිධාන (=පිහිටිතැන්) හෙයිනා, නො පැසුනුහෙයිනා පැසුනු හෙයිනා, ඵලහෙයිනා, වැගිරීම්හෙයිනා, වැකීම්හෙයිනා යි, මෙසේ දසවැදෑරුම්පිළිකුල්බැව් ප්‍රත්‍යවෙක්ෂාකිරීම්වශයෙන් ද මෙහි අසම්මොහසම්ප්‍රජඤ්ඤය දතයුතුයි. මෙහි විස්තරකථා වනාහි විශුද්ධිමාර්ගයෙහි ආහාරප්‍රතිකූලසංඥානිද්දේශයෙන් ගතයුත්තීය.

උච්චාරපස්සාවකම්මෙ= මල ද මූත්‍ර ද පහකිරීමෙහී; එහි පැමිණි කල්හි මලමූ නොකරන්නහුගේ සියලු සිරුරින් ඔහදය ගලත්, ඇස් බමත්, සිත එකඟ නො වෙයි, අන්‍යවූ ද රොගයෝ උපදිති; (පැමිණි කල්හි මලමූ) කරන්නහුට වනාහි ඒ සියල්ල නො වේය,යි මේ මෙහි අර්ථයි; ඒ අර්ථයාගේ වශයෙන් ම සාර්ථසම්ප්‍රජඤ්ඤය දතයුතු. නැවත අසප්පායගෙහි මලමූ කරන්නහුට අවැත්වෙයි අයසස්වැඩෙයි දිවිඅනතුරුවෙයි සුදුසුතැන්හි කරන්නහුට ඒ සියල්ල නො වේය,යි මේ මෙහි සප්පායයි; ඒ සැපයාගේ වශයෙන් සප්පායසම්ප්‍රජඤ්ඤය ද ගෝචරසම්ප්‍රජඤ්ඤය නො හැරීම්වශයෙන් ම ගොචරසම්ප්‍රජඤ්ඤයද දතයුතු. අභ්‍යන්තරයෙහි මලමූකිස කරන්නාවූ කිසි ආත්මයක් නම් නැති; එනුකුදුවුවත් එකල ක්‍රියාවායොධාතුහුගේ පැහිරීමෙන් ම මලමූ කිරීම වෙයි; ගබොල පැසුනුකල ගබඳිදීමෙන් ලේසැරව නො කැමතිපරිද්දෙන් යම්සේ නික්මේද; තවද ඉතාබර්වූ දියබදුනෙන් ජලය නොකැමතිපරිද්දෙන් යම්සේ නික්මේද; එපරිද්දෙන් පක්වාසය මූත්‍රවස්තීන්හි රැස්වූ උච්චාර ප්‍රස්‍රාවයෝ වාතවෙගයෙන් මොහොවට පෙළනලද්දාහු නො කැමති පරිද්දේ ද නික්මෙති; මෙසේ නික්මෙන්නාවූ ඒ මේ මලමූ වනාහි භික්ෂුහුගේ ආත්මීය වූයේ නොම වෙයි; අනිකෙකුගේ ද නො වෙයි; ඒ හුදෙක් සිරුරින් වැගිරුනේ ම වෙයි; කුමක් මෙන්ද යත්? දිය කොතලයකින් පැරණිදිය බැහැරකරන්නහුගේ ඒ දිය යම්සේ ආත්මීය; නොමවේද ;අනිකෙකුගේත් නොවේද; හුදෙක් පිළිදැගීම්පමණක් මවේද මෙසේ පැවති පස්විකිම් වශයෙන් මෙහි අසම්මුසසම්ප්‍රජඤ්ඤය දතයුතු.

ගතාදි ශබ්දයන් අතුරෙහි **ගතෙ**= ගමනෙහි **ඨිතෙ**= සිටීමෙහි; **නිසිතෙන**= හිඳීමෙහි; **සුතෙන**= ශයනයෙහි **ජාගරිතෙ**= නිදි දුරු කිරීමෙහි; **භාසිතෙ**= කථාකිරීමෙහි· **තුණ්හීභාවෙ**= නො බිණීමෙහි; **ගච්ඡතෙතා වා ගච්ඡාමීති පජානාති ඨිතෙ වා ඨිතොමහීති පජානාති නිසිතෙතා වා නිසිතෙනොමහීති පජානාති සයානෙ වා සයානොමහීති පජානාති,** යි මෙතැන්හි දීඝ ඊර්‍යාපථයෝ වදුරන ලදහු; **අභික්කමතෙන් පටික්කමතෙන ආලොකිතෙ විලොකිතෙ සම්මිඤ්ජිතෙ පසාරිතෙ,** යි මෙහි මධ්‍යම ඊර්‍යාපථයෝ වදුරනලදහු; **ගතෙ ඨිතෙ නිසිතෙන සුතෙන,** යි මෙහි වනාහි. කුඛාවූ සුණුවූ ඊර්‍යාපථයෝ වදුරනලදහු; එහෙයින් මේ (තුන්) තැන්හි දු කිනියෙන් ම නුවණින් දැන කරන බව දතයුතු.

ත්‍රිපිටක **මහාසිව** සථවිරයෝ වනාහි මෙසේ කිහු "යමෙක් බොහෝ වෙලාවක් ගමන්කොට හෝ සක්මන්කොට හෝ පසුකාලයෙහි සිටියේ මෙසේ ප්‍රත්‍යවෙක්ෂාකෙරේද **සක්මන්කරන** කාලයෙහි පැවති රූපාරූප ධර්මයෝ මෙහිම නිරුඬවූහ,යි මේ තෙම ගමනෙහි නුවණින් දැන ඉරියව් පවත්වන සුලුවූයේ නම් වෙයි; යමෙක් තෙම හැදූරීම හෝ කරන්නේ ප්‍රශ්න හෝ විසඳන්නේ කර්මස්ථානයක් හෝ මෙනෙහි කරන්නේ බොහෝ වෙලාවක් සිට පසුව හිඳගත්තේ මෙසේ ප්‍රත්‍යවෙක්ෂාකෙරේද, සිටිකාලයෙහි පැවති රූපාරූපධර්මයෝ මෙහිම නිරුඬවූහ,යි මේ තෙම සිටීමෙහි සම්පජාන කාරීනම් වෙයි; යමෙක් හැදූරීම් ආදිය කිරීම් වශයෙන් ම බොහෝ වෙලාවක් හිඳ පසුව හොත්තේ මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කෙරේද, හුන්කාලයෙහි පැවති රූපාරූපධර්මයෝ මෙහි ම නිරුඬවූවාහුය,යි මේ තෙම හිඳීමෙහි සම්පජානකාරි නම් වෙයි; යමෙක් වනාහි වැදහොත්තේ පාඩම් කරමින් හෝ කම්ටහනක් මෙනෙහි කරමින් හෝ නින්දට බැස පසුව නැඟිට මෙසේ ප්‍රත්‍යවෙක්ෂාකෙරේද හෝනා කල්හි පැවති රූපාරූපධර්මයෝ මේ ශයනයෙහි ම නිරුඬවූවාහුය,යි මේ තෙම නින්දෙහි ද නිදිදුරු කිරීමෙහි ද සම්පජානකාරි නම් වෙයි; ඒ එසේමැයෙ- ක්‍රියාමය චිත්තයන්ගේ නො හැවැත් ම නින්ද නම්, පැවැත්ම නිදි දුරුකිරීම් නම්,යි; තවද යමෙක් කථාකරමින් මේ ශබ්ද ය නම් තොල් ද දත් ද නීසා දිව ද තල්ල ද නීසා -චිත්තයාගේ ඊව අනුරූප ප්‍රයෝගය නීසා හටගනීය,යි සිහි ඇත්තේ නුවණැත්තේ බෙණේද; යලිදු විරකලක් හැදූරීම හෝ කොට බණ හෝ කියා කර්මස්ථානය හෝ පිරිවහා ප්‍රශ්න හෝ විසඳා පසුකාලයෙහි තූෂ්ණීම්භූතවූයේ මෙසේ ප්‍රත්‍යවෙක්ෂාකෙරේ ද "බෙණෙනකල උපන් රූපාරූප ධර්මයෝ මෙහි ම නිරුඬවූහ.,යි මේ තෙම බිණීමෙහි සම්පජානකාරි නම; යමෙක් නොබැණ බොහෝ වෙලාවක් ධර්මය හෝ කර්මස්ථානයක් හෝ මෙනෙහි කොට පසුව මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කෙරේද- "නොබැණ සිටි කාලයෙහි පැවති රූපාරූප ධර්මයෝ මෙහි ම නිරුඬවූහ, උපාදරූපයන්ගේ පැවැත්ම

ඇතිකල්හි බෙණෙයි නම් වේ; නැතිකල්හි නොබෙණෙයි නම් වේය,,යි; මේ තෙම තුෂ්ණීම්භාවයෙහි ''සම්පජානකාරී නමැ,,යි. ඒ මේ මහාසිව තෙරුන් විසින් කියනලද අසම්මොහධුරය මේ සතිපට්ඨාන සූත්‍රයෙහි අදහස්කරනලදී. සාමඤ්ඤඵල සූත්‍රයෙහි වනාහි සියලු ම සිව්වැදෑරුම් සම්ප්‍රජන්‍යය ලැබෙයි; එහෙයින් වෙසෙසින් මෙහි අසම්මූළ සම්ප්‍රජන්‍යයාගේ වශයෙන් ම සම්පජානකාරීබව දතයුතු.

තවද **සම්පජානකාරි සම්පජානකාරී** යන සියලු පදයන්හි සමෘති සම්ප්‍රයුක්ත වූ ම සම්ප්‍රජන්‍යයාගේ වශයෙන් අර්ථය දතයුතුයි; විභඞ්ග ප්‍රකරණයෙහි වනාහි- **සන්තෝ සම්පජඤ්ඤෝ අභික්කමතීති සන්තෝ සම්පජඤ්ඤෝ පටික්කමතීති** යි මෙසේ මේ පදයෝ විභාගකළාහු මය. **දුන් අජ්ඣත්තං වා=** මෙසේ සතර සම්ප්‍රජන්‍ය පරිග්‍රහණයෙන් තමාගේ කයෙහි හෝ අන්‍යයාගේ කයෙහි හෝ කලෙක තමාගේ හෝ කලෙක අන්‍යයාගේ හෝ කයෙහි කය අනුව බලමින් වෙසෙයි; **මෙහි ද සමුදය ධම්මානුපස්සී** යනාදියෙහි රූපස්කන්ධයාගේම සමුදයද ව්‍යය ද ඵලවා දැක්වියයුතුයි; සෙස්ස කී පරිදි මැයි. මෙහි සතර සම්ප්‍රජන්‍ය පරිග්‍රාහිකවූ සමෘතිතොමෝ දුඃඛසත්‍යයැ; ඒ සිහිය උපදවන්නීවූ පුරිම තෘෂ්ණාතොමෝ සමුදය සත්‍යයැ; ඒ (සමෘතිතෘෂ්ණා) දෙදෙනාගේ නො පැවැත්ම නිරෝධ සත්‍යයැ; උක්තප්‍රකාරවූ ආර්‍ය්‍ය මාර්ගය මාර්ගසත්‍යයැ; මෙසේ සිව්සස් විඹින් උතුසාගකොට නිවනට පැමිණේය,යි මේ එක් චතුඃසම්ප්‍රජන්‍ය පරිග්‍රාහකයෙකුගේ වශයෙන් අර්ථය තෙක් නියාම්ණචාරය,යි.

චතුස්සම්ප්‍රජන්‍ය පර්‍ය්‍ය නිමි.

මේසේ චතුස්සම්ප්‍රජන්‍යවශයෙන් කායානුපස්සනාව විභාගකොට දැන් ප්‍රතිකූල මනසිකාරවශයෙන් විභාගකරන්ට පුනර්ව පරං යනාදි වශයෙන් වදාළහ. **එහි ඉමමේවකායං** යනාදියෙහි යම්ක් කියයුතු වන්නේද ඒ සියල්ල සියලුආකාරයෙන් විස්තරවෙයින් විශුද්ධිමාර්ගයෙහි කාය ගතා සති කම්මට්ඨානයෙහි කියනලදී. **උභතෝ මුඛා=** යට ද උඩද,යි (දෙපස) මුඛ දෙකකින් යුක්තවූ; **නානාවිහිතස්ස=** නානාවිධවූ; මේ වනාහි මෙහි ඕපම්‍යසංසන්දනයයි- උඩයට මුවඇති මල්ලක් මෙන් චාතුම්මහාභෞතිකවූ කය ද; එහි මිශ්‍රකොට බහාලනලද විවිධ ධාන්‍ය මෙන් කෙශාදිවූ දෙතිස් ආකාරයෝ ද; ඇස් ඇති පුරුෂයෙකුමෙන් යොගාවචරතෙමේ ද; ඒ මල්ල මුදා විමසන්නාවූ ඒ පුරුෂයා හට විවිධධාන්‍ය ප්‍රකටවූ කාලය මෙන්. යෝගීහට චත්තිංසාකාරය විවිධත්වයෙන් ප්‍රකටවූ ආකාරය දතයුතුයි. **ඉතිඅජ්ඣත්තං වා=** මෙසේ කෙශාදීන්ගේ පරිග්‍රහණයෙන් තමාගේ කයෙහි හෝ අනිකෙකුගේ කයෙහි හෝ කලෙක තමාගේ හෝ කලෙක අනිකෙකුගේ හෝ කයෙහි කය අනුව බලමින් වෙසෙයි; මෙයින් මතු කීනය මැ,යි. හුදෙක් මෙහි

වත්‍රිංශදාකාර පරිග්‍රාහික සමෘති තොමෝ දුඃඛසත්‍යය,යි මෙසේ යෝජනා කොට නියම්‍යාණ මුඛය දතයුතු. සෙස්ස පූර්‍වයට සමාන මැයි.

ප්‍රතිකූල මනස්කාර පර්‍වය නිමි.

මෙසේ පිළිකුල්බැව් මෙනෙහි කිරීම්වශයෙන් කායානුපස්සනාව විභාගකොට මෙවිට ධාතුමනස්කාරවශයෙන් මෙනෙහිකරන්ට **පුනාච පරං** යනාදිය වදළහ. එහි මෝතොමෝ ඔපම්‍යසංසන්දනය සමඟ අර්‍ථවර්‍ණනාවයි- කිසියම් ගවයන් නසන්නෙක් හෝ ඔහුගේ ම බත් වැටුපින් පුස්නාලද අතවැසියෙක් හෝ ගවයෙකු නසා විනිවිද සතරදිගට ගියාවූ මහාමාංසීයන්ගේ මධ්‍යස්ථානසඞ්ඛ්‍යාතවූ සතරමං සන්ධියෙක කොටස් කොටස් කොට යම්සේ හුන්නේ වේද; එපරිද්දෙන් මහණතෙම සතර ඊර්‍යාපථයන් අතුරෙන් යම් කිසි ආකාර යකින් සිටිහෙයින් සිටිවනීන් සිටියාවූ නැවත සිටිපරිදි සිටිහෙයින් පිහිටිවනින් පිහිටියාවූ කය "මේ ශරීරයෙහි පෘථිවීධාතු ඇත අබධාතු ඇත තෙජෝධාතු ඇත වායොධාතු ඇතැ,යි මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කෙරෙයි; (මෙසින්) කුමක් කිනියා වේද යත්? ගවයෙකු පොෂණය කරන්නාවූ ද වධස්ථානයට ගෙනයන්නාවූ ද ගෙනගොස් එහි බැඳ තබන්නාවූද නැසූ මළසිරුර දක්නාවූ ද ගොඝාතකයාහට යම්තාක් ඒ ගවයා පලාකොටස් කොටස්වශයෙන් නො බෙදුද ඒතාක් ගවයෙක යන සංඥව යම්සේ අතුරුදහන් නො වේද; එතකුදුවුවත් බෙදූ හුන්න හුව ගවසංඥව අතුරුදහන්වේද මාංශසංඥව පවතීද; මම ගවයෙකු විකුණම්, මොවුහු ගවයා ගෙනයත්ය, යි ඕහට් මෙබඳු සිතක් නො වේද; වැලි කිමෙක්ද? මම මස් විකුණම්, මොවුහු මස් ගෙන යෙති යයි කියා ම ඕහට සිත වේද; එපරිද්දෙන් ම පෙර බාල පෘථජ්ජනකාලයෙහි ගිහිවූත් පැවිදිවූත් මේ මහණහට ද මේ කය ම සිටිවනින් පිහිටිවනින් ඝනවිනිභෝගය කොට ධාතුවශයෙන් යම්තාක් ප්‍රත්‍යවෙක්ෂා නො කෙරේද ඒතාක් සත්වයෙකැ, යි හෝ පුද්ගලයෙක්ැ, යි හෝ සංඥව නො අතුරුදහන් වෙයි; ධාතුවශයෙන් ප්‍රත්‍යවෙක්ෂාකරන්නාවූ ඕහට වනාහි සත්වසංඥව අතුරුදහන් වෙයි; ධාතුවශයෙන් ම සිත පිහිටයි. එසින් වදළහ භාග්‍යවත්හු- **ඉමමෙව කායං යථාඨිතං යථාපණිහිතං ධාතුසෝ පච්චවෙක්ඛති අත්ථි ඉමස්මිං කායෙ පඨවිධාතු ආපොධාතු තෙජෝධාතු වායොධාතු සෙය්‍යථාපි? භික්ඛවෙ! දක්ඛො ගොඝාතකො වා - පෙ - වායොධාතු,,** යි. ඒ එසේමැයි- යොගීතෙමේ ගොඝාතකයා මෙනි; සත්වසංඥව ගවසංඥව මෙනි; සතරඊර්‍යාපථය සතරමංසඛ්‍ය මෙනි; ධාතුවශයෙන් ප්‍රත්‍යවෙක්ෂාකිරීම කොවස්වශයෙන් බෙදූ හුන්බව මෙනැ, යි; මේ මෙහි පාලිවර්‍ණනායි. කර්‍මස්ථානකථාව වනාහි විශුද්ධිමාර්‍ගයෙහි විස්තරකරන ලද්දීය. **ඉති අජ්ඣත්තං වා=** මෙසේ චතුර්‍ධාතුපරිග්‍රහණයෙන් තමාගේ

කයෙහි හෝ අනිකෙකුගේ කයෙහි හෝ කලෙක තමාගේ හෝ කලෙක මෙරමාගේ හෝ කයෙහි කය අනුව බලමින් වෙසෙයි; මෙයින් මතුයෙහි කීනයමැ,යි හුදෙක් මෙහි චතුධාතුපරිග්‍රාහිකසමාතිතොමෝ දුඃඛසත්‍ය යැ,යි මෙසේ යොජනාකොට නිවන්පැමිණෙන චාරය දතයුතු. සේස්ස පළමුමෙනැ,යි.

ධාතුමනසිකාරපබ්බය නිමි.

මෙසේ ධාතුමනසිකාරවශයෙන් කායානුපස්සනාව විභාගකොට දැන් නවසීවථිකාපබ්බයන්ගෙන විභාගකරන්ට **පුන ච පරං** යනාදිය වදාළහ. එහි **සෙය්‍යථාපි පස්සෙය්‍ය**= යම්සේ දක්නේද? **සරීරං**= මළසිරුර; **සීවථිකාය ඡඩ්ඩිතං**= සොහොනෙහි දමනලද; **එකාහමතං** යනු වේ; දෙදිනක් (ඉක්මුනේ) මළාවූ ඕහට නු,යි **ඒහමතං**,යි වේ; තෙදිනක් (ඉක්මුනේ) මළාවූ ඕහට නු,යි **තීහමතං**,යි වේ; වාතයෙන් පිරුනු කඹුරුසමක් මෙන් ජීවිතක්ෂයෙන් මතුයෙහි **ක්‍රමක්‍රමයෙන්** නැංගාවූ සූනත්වයෙන් ඉදිමගියබැවින් **උද්ධුමාත** නම් වේ; උද්ධුමාතය මැ **උද්ධුමාතක** නම් වේ; නොහොත් පිළිකුල් බැවින් කුතසිතවූ උද්ධුමාතය නු,යි **උද්ධුමාතක** නම්; (සුදුරත්ආදියෙන්) මිශ්‍රවූ වණ්ණඇත්තේ විනීලය,යි කියනුලැබේ; විනීලය මැ **විනීලක** නම්; පිළිකුල්බැවින් හෝ කුතසිතවූ විනීලය නු,යි **විනීලක** නම්; මස් උස්ව ගියතැන්හි **රක්තවණ්ණ**වූ පූයාපිරුනුතැන්හි **ශ්වේතවණ්ණ**වූ බොහෝ සෙයින් ම **නීලවණ්ණ**වූ නිල්තැන්හි නිල්සළුවක් පෙරවියක්හු වැනි මළ සිරුරට මේ නමකි; බිඳුනුතැනින් හෝ නවද්වාරමුඛයන්ගෙන් හෝ වැහෙන්නාවූ පූයාඇත්තේ **විපුබ්බ** නම; විපුබ්බය මැ **විපුබ්බක** නම්; නොහොත් පිළිකුල්බැවින් කුතසිතවූ විපුබ්බය නු,යි **විපුබ්බක** නම්; හටගත් පූයාඇත්තේ එබදු (විපුබ්බක) භාවයට ගියේ නු,යි **විපුබ්බක ජාත** නම් වේ; **සෝ ඉමමේව කායං**= ඒ මහණ මේ තමාගේ කය ඒ මළසිරුර සමඟ නුවණින් සමාන කෙරෙයි, එලවයි; කෙසේද යත්? මේ කය ද මෙබදු (උද්ධුමාතාදි) සභාවඇත්තේය, මෙබදු සභාවයට පැමිණෙනසුලුය, මෙබදු සභාවය නො ඉක්ම සිටියේය,යි කියයි; මේ කියනලද වෙයි- ආයුෂය තෙජෝධාතුවය විඤ්ඤාණය යන මේ ධර්මයන් තිදෙනාගේ අඅභිබවයෙන් මේ කය සිරිමගමන්කිරීම් ආදිය ඉවසන්නේ වෙයි; යලි මොවුන්ගේ වෙන්වීමෙන් මේ (මාගේ) කය ද **එවං ධම්මෝ**= මෙසේ **කුණපවනසභාවඇත්තේ** මය; **එවං භාවී**= මෙපරිද්දෙන් ම උද්ධුමාතාදිභෙදඇත්තේ වන්නේය; **එවං අනතීතෝ**= මෙපරිද්දෙන් උද්ධුමාතාදිභාවය නො ඉක්මවනලද්දේය; **ඉති අජ්ඣත්තං වා**= මෙසේ උද්ධුමාතකාදිපරිග්‍රහණයෙන් තමාගේ කයෙහි හෝ අනිකෙකුගේ කයෙහි හෝ කලෙක තමාගේ හෝ කලෙක අනිකෙකුගේ හෝ කයෙහි කය අනුව බලමින් වෙසෙයි; **බහිද්ධා වා**= උදරාදි තැන්හි හිඳ උදර

මාංශය ඔඝස්මාංශය ඇස්ගුළඇදිය ගලවගලවා කනුලබන්නාවූ; **සමංස ලොහිතං**= සෙසු ඉතිරි මස්ලේසහිතවූ; **නිම්මංසලොහිතමක්ඛිත්තං**= මස් කෑයව ගියකල්හි ද ලේ නොවියලෙයි, ඒ සඳහා වදුරනලදි- ලොහිතමක්ඛිත්තං,යි. **අනුපුබ්බන**= අනාදිශාභාගයෙක; **හතවික්ඛිත්තං**= යනු සූසැටක් භෙදඇති වෙනවෙන ම විසුරුනාවූ අත් ඇට දී; පාඇට ආදියෙහි දු මෙම නයයි. **තෙරොවස්සිකානි**= වසක් ඉක්මුනාවූ; **පූතීනි**= අබවස්හි සිටි අව්වැසිසුළං වැදීමෙන් වසක් ඉක්මුනාහු ම කුණුවූවාහු වෙති; පොළෝතුලට පැමිණියාහු වනාහි බොහෝකලක් පවතිත්; **චුණ්ණකජාතානි**= සුණු සුණුව විසුරුනාහු; සියලු තැන්හි **සෝ ඉම මෙව** යනු කිපරිද්දෙන් **ඛජ්ජමානං** යනාදි පදයන්ගේ වශයෙන් යොජනා කළ යුත්තීය.

ඉතිඅජ්ඣත්තං වා= මෙසේ (කාකාදීන්විසින්) කනුලබන්නාවූශරීරාදිය පරිග්‍රහණය කිරීමෙන්; සුණුවූ ශරීරය තෙක් තමාගේ කයෙහි හෝ අනිකෙකුගේ කයෙහි හෝ කලෙක තමාගේ හෝ කලෙක අනිකෙකුගේ හෝ ශරීරයෙහි කායානුදර්ශීවැ වෙසෙයි; නැවත මෙතැන්හි සිව නව සීවථිකා එක්කොට දැක්වියයුත්තාහුය- මේ එහි සමොධානක්‍රමයයි, එකාහමතං වා යනාදිනයින් වදුළ සියල්ලම එක් ශීවථිකායෙක; "කාකෙහි වා ඛජ්ජමානං,, යනාදිය එකෙක; "අසිසඞ්ඛලිකං සමංසලොහිතං නහාරුසම්බන්ධං,, යනු එකෙක; "නිම්මං සලොහිතමක්ඛිත්තං නහාරුසම්බන්ධං,, යනු එකෙක; "අපගතමංසලොහිතං නහාරුසම්බන්ධං,, යනු එකෙක; "අට්ඨිකානි අපගතසම්බන්ධානි,, යනාදිය එකෙක; "අට්ඨිකානි සෙතානි සඞ්ඛවණ්ණූපනිභානි,, යනු එකෙක; අට්ඨිකානි පුඤ්ජකිතානි තෙරොවස්සිකානි,, යනු එකෙක; අට්ඨිකානි පූතීනි චුණ්ණකජාතානි,, යනු එකෙක. **එවං බෝ භික්ඛවෙ!** යන මෙය නවසීවථිකය දක්වා කායානුපස්සනාදෙශනාව නිම්වමින් වදුළ සේක. එහි නවශීවථිකපරිග්‍රාහිකාවූ සමෘතිතොමෝ දුඃඛසත්‍යයෑ; ඒ සමෘතිය උපදවන්නීවූ පූර්වතෘෂ්ණාතොමෝ සමුදයසත්‍යයෑ; ඒ (සමෘති තෘෂ්ණා) දෙදෙනාගේ නොපැවැත්ම නිරොධසත්‍යයෑ; දුක දුනගන්නාවූ සමුදය දුරුකරන්නාවූ නිවන් අරමුණුකරන්නාවූ ආර්‍යමාර්ගය තෙම මාර්ගසත්‍යයෑ;මෙසේ චතුස්සත්‍යවශයෙන් උත්සාහකොට නිවනට පැමිණේය,සි. මේ නවශීවථිකපරිග්‍රාහකවූ භික්ෂූන්ගේ රහත්බව තෙක් නිර්ණවාරය වේය,සි.

සීවථිකා පර්‍යය නිමි.

මෙතෙකින් අනාපාන පර්‍යය ඊර්‍යාපථ පර්‍යය චතුස්සම්ප්‍රජන්‍ය පර්‍යය ප්‍රතිකූල මනසිකාර පර්‍යය ධාතුමනසිකාර පර්‍යය, නවශීවථිකා පර්‍යය සි තුදුස් පුරුෂක් ඇති කායානුපස්සනාව නිම්වනලද්දී වෙයි. ඒ තුදුස් පර්‍යයන්අතුරෙහි ආනාපාන පර්‍යය ප්‍රතිකූල මනසිකාර පර්‍යය

යන මේ දෙක ම අජ්ඣත්ත කම්මට්ඨානයෝයි. ශීවපිකයන් වනාහි ආදී නවානු පස්සනා වශයෙන් වදුළ බැවින් සෙසු දෙළසම උපචාර කම්මට්ඨානයෝ මැයි.

කායානුපස්සනා සතිපට්ඨානය නිමි.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ **තුදුස්** ආකාරයකින් කායානුපස්සනා සතිපට්ඨානය වදාරා මෙවිට නවආකාරයකින් වෙදනානුපස්සනාව වදාරනු පිණිස **සත්තසු භික්ඛවෙ**=; යනාදිය වදාළහ. එහි **සුඛංවෙදනං** යනු කායිකවූ හෝ චෛතසිකවූ හෝ සැප වෙදනාව විඳින්නේ "මම සැපවෙදනාවක් විඳිමි,,යි දැනගනී යන අර්ථයි; ඒ දැනීමෙහි ඒකාන්තයෙන් උඩුකුරුව හෝනාවූ ළදරුවෝ පවා කිරිපිම්ආදි කාලයෙහි සැපවිඳින්නාහු "අපි සැපයක් ද විඳිමු,,යි දැනගනිත්, එතකුදුවුවත් මේ (යොගාවචරයාගේ) දැනීම **එබදුවූ** දැනීමක් සඳහා නොවදරන ලදී; ඒ එසේමැය- ඒ (ළදරුවන්ගේ දැනීම) බදුවූ දැනීම සම්‍යග්දෘෂ්ටිය නොහරී, සම්‍යග්ඥෙය යන සඤ්ඤව නූගුලුවයි, කම්මට්ඨානයක් හෝ සතිපට්ඨානභාවනාව හෝ නොවෙයි; මේ භික්ෂුහුගේ දැනගැනීම වනාහි සම්‍යග්දෘෂ්ටිය දුරුකරයි, සම්‍යග්ඥව ගලවා පියයි කම්මට්ඨානය හා සතිපට්ඨාන භාවනාව ද වෙයි; මෙය විනාහි කවරෙක් විඳිද; කවරෙකුගේ විඳීමෙක් ද? කුමන කරුණකින් වූ වෙදනාවෙක්ද?යි මෙසේ නුවණින් දැන විඳි ම සඳහා වදාරන ලදී. ඒ ප්‍රශ්න කම්යෙහි කවරෙක් විඳිද? යනු කිසි සත්වයෙක් හෝ පුද්ගලයෙක් හෝ නො විඳියි කවරෙකුගේ විඳිමෙක්ද? යනු කිසි සම්‍යග්ඥයෙකුගේ හෝ පුද්ගලයෙකුගේ හෝ විඳීමක් නො වේ; කවර කරුණකින් වූ වෙදනාවෙක්ද? යනු වසම්භාරමම්මණයෙන් වෙදනා තොමෝ වන්නීය; මේ යොගාවචරතෙම කුමක් හෙයින් මෙසේ දැනගනීද යත්? ඒ ඒ සුඛාදි වස්තුව අරමුණුකොට වේදනාතොමෝ ම විඳී; ඒ වෙදනා ප්‍රවෘත්තීය ගෙන මම විඳිමි,යි ව්‍යවහාරමාත්‍රයක් වේය,යි; මෙසේ වස්තුව අරමුණු කොට වෙදනා තොමෝ විඳීය,යි සලකන්නාවූ මේ තෙම සැපවේදනාව විඳිමි,යි දැනගනීය,යි දතයුතු. සිතුල්පව්වෙහි එක්තරා තෙරකෙනෙක් මෙනි.

සිතුල්පව්වෑසි තෙරුන් වහන්සේ වනාහි නො සුව (=රොගී) කාලයෙහි බලවත් වෙදනාවෙන් තතනමින් ඔබිනොබ පෙරලෙති; උන්වහන්සේ ට එක් තරුණ භික්ෂුවක් මෙසේ කීය- "ස්වාමීනි! ඔබගේ කවර තැනක් රිජා කෙරේද,,යි; ඇවැත්නි! වෙනම රිජාකරන තැනක් නම් නැති, (කායසඞ්ඛ්‍යාත) වස්තුව අරමුණු කොට වෙදනා තොමෝ විඳී ය,යි ස්වාමීනි! මෙසේ දන්නාකල පටන් ඉවසන්ට වටී නුදැ,යි? ඇවැත්නි! ඉවසම්,යි කීය; ස්වාමීනි! ඉවසිම උතුමැ,යි; තෙරුන් වහන්සේ ඉවසූහ; වාතය ළය

දක්වා පැලීය; ඇඳෙහි අතුනු රැස්වූහ;. තෙරුන්වහන්සේ ඇවැත්නි! මෙතෙක් ඉවසීම වටිද,යි තරුණ භික්ෂුවට දැක්වූහ; තරුණතෙමේ තූෂ්ණීම්භූතව්‍ය; තෙරුන්වහන්සේ වියත්සමත්ඛය යොදා පිව්පිළිසිඹියා සමග රහත්බවට පැමිණ සමසිසිවැ පිරි නිවිසේක.

සුඛවෙදනාව යම්සේද එපරිද්දෙන් දුඃඛ වෙදනාව -පෙ- නෛෂ්කාම්‍ය නිඃශ්‍රිතවූ උපෙක්ෂා වෙදනාවක් විඳින්නේ නෛෂ්කාම්‍ය නිඃශ්‍රිත උපෙක්ෂා වෙදනාවක් විඳිමි,යි දැනගනී; මෙසේ භාග්‍යවතුන් වහන්සේ රූපකම්ඝ්‍යානය වදාරා අරූපකම්ඝ්‍යානය වදාරනසේක්; වෙදනාවශයෙන් වදාළසේක, ඒ එසේමැයි- කම්ඝ්‍යානය දෙවදාරුම් වෙයි, රූපකම්ඝ්‍යානය අරූපකම්ඝ්‍යානය,යි කියායි; මේ ත්‍රිවිධ කම්ඝ්‍යානයම රූපපරිග්‍රහය අරූප පරිග්‍රහය,යි ද කියනු ලැබේ. ඒ ත්‍රිවිධ කම්ඝ්‍යානයන් අතුරෙන් භාග්‍යවතුන් වහන්සේ රූපකම්ඝ්‍යානය වදාරනසේක් සංක්ෂෙප මනසිකාර වශයෙන් හෝ විස්තාර මනසිකාර වශයෙන් හෝ චතුර්ධාතු ව්‍යවස්ථානය වදාරනසේක; ඒ දෙක ම විශුද්ධිමාර්ගයෙහි සම්මාකාරයෙන් දක්වනලද්දේ මය. අනතුරුව අරූප කම්ඝ්‍යානය වදාරනසේක් බොහෝ සෙයින් වෙදනා වශයෙන් වදාරති; ඒ විස්තර කරනු ලැබේ-

විවිධ කම්ඝ්‍යානය

අරූපකම්ඝ්‍යානයෙහි අභිනිවෙශය (=පිහිටීම) ත්‍රිවිධවේ; සඥාවශයෙන, වෙදනා වශයෙන, චිත්ත වශයෙනැයි කියායි; කෙසේද යත්? ඇතැම් යොගාවචරයෙකුට වනාහි සංක්ෂෙපයෙන් හෝ විස්තරයෙන් හෝ රූපකම්ඝ්‍යානය පරිග්‍රහණය කළකල්හි රූපාරම්මණයෙහි චිත්ත චෛතසිකයන්ගේ ප්‍රථමාභිනිපාතය ඇතිකල්හි ඒ අරමුණ සඥා කරමින් උපදනාවූ සඥාය ප්‍රකට වෙයි; කිසිවෙකුට ඒ අරමුණ විඳිමින් උපදනාවූ වේදනාතොමෝ ප්‍රකටවෙයි ඇතැම් කෙනෙකුට ඒ අරමුණ පරිග්‍රහණය කොට දැනගනිමින් උපදනාවූ විඥානය ප්‍රකට වෙයි; ඔවුන් තිදෙනා අතුරෙහි යමෙකුට සඥායප්‍රකටවේද හෙතෙමේ ද "හුදෙක් සඥාය ම නො උපදී,, ඒසඥාය සමග ඒ අරමුණ ම විඳිමින් වේදනාව ද උපදී. හැඳිනගනිමින් සංඥාව ද, සිතමින් චෙතනාවද දැනගනිමින් විඥානය ද උපදී,, යයි සඥා පඤ්චමක ධර්මයන් ම පරිග්‍රහණය කෙරෙයි; යමෙකුට වෙදනාව ප්‍රකටවේද හෙතෙමේත් "හුදෙක් වෙදනාව ම නුපදී ඒ වෙදනාව සමග (අරමුණ) සඥාකරමින් සඥාය ද උපදී, හැඳින ගනිමින් සඥාව ද, සිතමින් චෙතනාව ද, දැනගනිමින් විඥානය ද උපදී,,යයි සඥා පඤ්චමකධර්මයන් ම පරිග්‍රහණය කෙරෙයි; යමෙකුට විඥානය ප්‍රකටවේද හෙතෙමේත් "හුදෙක් විඥානය ම නුපදී, ඒ විඥානය සමග ඒ අරමුණ ම සඥා කරමින් සඥාය ද උපදී, (අරමුණුරසය) අනුභවකරමින් වේදනාව ද, හැඳිනගනිමින් සඥාව, සිතමින් චෙතනාව ද උපදී,, යයි සඥා පඤ්චමක ධර්මයන් ම පරිග්‍රහණය කෙරෙයි. හෙතෙම මේ සඥා පඤ්චමක ධර්මයෝ

අරූප කම්ඝ්‍යානය

කුමක් ඇසුරුකළාහුදැ? යි විමසන්නේ හදවත ඇසුරුකළාහුය,යි දැන ගනී; වස්තුව නම්? කරජකය යැ; යමක් සඳහා මේ **ඉදඤ්ච පන මේ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධං** යි වදාරන ලදද එහෙයිනි, ඒ කරජකය අවීහෙයින් සතරමහා භූතයන් හා උපාදායරූපයෝ ද වෙති; මෙපරිද්දෙන් මෙහි වස්තුව රූපයයැ එසස පඤ්චමක ධම්මෝ නාම ය,යි නාමරූප මාත්‍රයක් මැ දකී; තවද මෙහි රූපය රූපස්කන්ධයයැ නාමය සතර අරූපීස්කන්ධයෝ ය,යි පස්කඳ මතු වෙයි; ඒ එසේමැය-නාමරූපයෙන් තොරවූ පඤ්චස්කන්ධයෝ හෝ පඤ්චස්කන්ධයෙන් තොරවූ නාමරූයෙක් හෝ නැති හෙතම මේ පඤ්චස්කන්ධයෝ කුමක් හෙතුකොට හටගත්තාහුදැ?යි පරීක්ෂාකරන්නේ අවිද්‍යාදිය හෙතු කොට හටගත්තාහුය,යි දකී; ඉක්බිති මේ (නාමරූපකාය) ප්‍රත්‍යය හා ප්‍රත්‍යයොත්පන්න ධම්ය ද වෙයි; අනිත් සත්ත්වයෙක් හෝ පුද්ගලයෙක් හෝ නැති ශුද්ධවූ සංස්කාර රාශිමාත්‍රයෙක් මය,යි සප්‍රත්‍යය නාමරූප යාගේ වශයෙන් තිලකුණු නහා විවසුන් පිළිවෙළින් අනිත්‍යයැ දුඃඛයැ අනාත්මයැයි සම්මර්ශනය කරමින් හැසිරෙයි; හෙතෙම අද අදය,යි ප්‍රතිවෙධය කැමතිවෙමින් එබදුවූ දිනයෙක සෘතු පහසුව හෝ පුද්ගල පහසුව හෝ භොජන පහසුව හෝ ධම්ශ්‍රවණ පහසුව හෝ ලැබ එක් පලහෙක හුන්නේ විදර්ශනාව මත්තකප්‍රාප්තකොට රහත්ඵලයෙහි පිහිටයි; මෙසේ මේ තිදෙනාගේ ම රහත්ඵලය තෙක් කම්මස්ථානය කියන ලද්දේ වෙයි.

මෙහි වනාහි භාග්‍යවතුන් වහන්සේ අරූපකම්මස්ථානය වදාරන සේක් වෙදනා වශයෙන් වදාළහ; යම් හෙයකින් සපර්‍ශ වශයෙන් හෝ විඤ්ඤාන වශයෙන් හෝ වදාරනු ලබන්නේ ප්‍රකට නො වේද අඞ්කාරයක් මෙන් වැටහේද; වෙදනා වශයෙන් ම ප්‍රකට වේද; කුමක් හෙයින ය්ත්? වෙදනාවන්ගේ උත්පත්තිය ප්‍රකට බැවිනි; සැබව සැපදුක් වෙදනා වන්ගේ උත්පත්තිය ප්‍රකටය; යම් විටක සැපවෙදනාවක් උපදීද (එකල්හි) සියලු ශරීරය අලලමින් මඬිමින් සැකිරෙමින් වගුරුවමින් සියක් වර සේදූ ගිතෙලක් කවණකලක් මෙන් සියක්වරපැසූ තෙලක් ගල්වන කලක් මෙන් දීය කළ දහසකින් පරිදහය නිවන කලක් මෙන් අහෝ සැපයැ අහෝ සැපයැ,යි වචන නික්මවමින්මැ උපදී; යම් කලෙක දුක් වෙදනාවක් උපදීද (එකල්හි) සියලු ශරීරය අලලමින් මඬිමින් සැකිරෙමින් වගුරුවමින් රක්කළසිවැලක් ප්‍රවේශකරන කලක් මෙන් ඳුවවූ තඹ ලොහය ඉසිකලක් මෙන් වියලිතණ වනදෙටුරුක් ඇති වන යෙක්හි දරගිනි හුල් මිටියක් දමන කලක් මෙන් අහෝ දුකයැ අහෝ දුකයැ,යි විලාප කියවමින් මැ උපදී. මෙපරිද්දෙන් සැපදුක් වෙදනා වන්ගේ ඉපදීම ප්‍රකාශ වෙයි; එතකුදුවුවත් උපෙක්ෂා වෙදනාව දුකසේ දැක්විය යුත්තීයැ අඞ්කාරයැ අප්‍රකාශයැ; ඕ තොමෝ සැපදුක් දෙදෙ නාගේ පහව්මෙහි සැපදුක් දෙනට ප්‍රතිපක්ෂ වශයෙන් මධ්‍යස්ථා කාරවූවා නො දුක් කො සැපවූ (=උපෙක්ෂා) වෙදනාවය,යි නයවශයෙන් ගන්

නහුට ප්‍රකට වෙයි; කුමක් මෙන්ද යත්? පිටිගලක් අතරට නැඟි පලාඟිය මුවාගේ පිය අනුව යන්නාවූ මුව වැදී තෙම පිටිගලට මෙපිට ද එපිට ද පියවර්දෙක මැද නො දක්නේ නමුදු මෙතැනින් (ගලට) නැංගේය, මෙතැනින් බැස්සේය, මැද ගල්පිට මේ පෙදෙසින් ගියේ වන්නේය,යි; යම්සේ නයවශයෙන් දැනගනීද; එපරිද්දෙන් නැඟි තැන්හි පිය මෙන් සැපවෙදනාවගේ උතපත්තිය ප්‍රකට වෙයි; බට තැන්හි පිය මෙන් දුක් වෙදනාවගේ උත්පත්තිය ප්‍රකට වෙයි; මෙතැනින් නැඟී මෙතැනින් බැස මැද මෙසේ ගියේ වනැ,යි නයවශයෙන් ගැනීම මෙන් සැපදුක් දෙදෙනාගේ පහව යාමෙහි සැපදුක් දෙකට ප්‍රතිපක්ෂ වශයෙන් මධ්‍යස්ථාකාරවූවා උපෙක්ෂා වෙදනාවය,යි නයවශයෙන් ගන්නහුට ප්‍රකට වෙයි; මෙසේ භාග්‍යවතුන් වහන්සේ පළමු කොට රූපකම්ඨානය වදාරා පසුව අරූපකම්ඨානය වෙදනා වශයෙන් විනිවතීනය කොට දක්වූසේක. තවද හුදෙක් මේ සතිපට්ඨාන සූත්‍රයෙහි ම මෙසේ නොදක්වූහ; චූල තණ්හා සඞ්ඛය සූත්‍රයෙහියැ මහා තණ්හා සඞ්ඛය සූත්‍රයෙහි යැ චූලවේදල්ල සූත්‍රයෙහි යැ මහා වේදල්ල සූත්‍රයෙහි යැ රට්ඨපාල සූත්‍රයෙහි යැ මාඝන්දිසූත්‍රයෙහි යැ ධාතු විභඞ්ග සූත්‍රයෙහි යැ ආනඤ්ජ සප්පාය සූත්‍රයෙහි යැ දීඝනිකායෙහි මහා නීදාන සූත්‍රයෙහි යැ සඞ්ඛාරුප්පත්ති සූත්‍රයෙහි යැ මහාසතිපට්ඨාන සූත්‍රයෙහියැ සංයුක්තනිකායෙහි චූලනිදාන සූත්‍රයෙහි යැ රුක්ඛූපම සූත්‍රයෙහි යැ පරිවීමංසන සූත්‍රයෙහි යැ සියලුවෙදනා සංයුක්තයෙහි යැ,යි මෙසේ නොයෙක් සූත්‍රයන්හි පළමුකොට රූපකම්ඨානය වදාරා පසුව අරූප කම්ඨානය වෙදනා වශයෙන් විනිවතීනය කොට දක්වූසේක; ඒ සූත්‍රයන් හි යම්සේද එපරිද්දෙන් මේ සතිපට්ඨාන සූත්‍රයෙහි ද පළමුකොට් රූපකම්ඨානය වදාරා පසුව අරූප කම්ඨානය වෙදනා වශයෙන් විනිවතීනය කොට දක්වූහ.

එහි සුඛංවෙදනං යනාදී කැන්හි මේ අනිකුදු පඤ්ඤාපන්ප්‍රකාරයකි- සුඛං වෙදනං වෙදියාමීති පජානාති- සැපවෙදනාව (උපන්) කෙණෙහි දුක් වෙදනාවක් නැති හෙයින් සැපවෙදනාව විඳින්නේ "සැපවේදනාව විඳිමි,,යි දැනගනී; එහෙයින් පළමු පෙර උපන්විරූ යම් දුක් වෙදනාවක් වූද ඒ දුක් වෙදනාව දැන් නැතිහෙයින් ද මේ සැපය ද මේයින් පළමු නො වූ හෙයින් වෙදනාව නම් අනිත්‍ය යැ අස්ථිර යැ නැසෙන පියවි ඇත්තිය,යි මෙසේ එහි නුවණින් දැනගන්නේ වෙයි; භාග්‍යවතුන් වහන්සේ විසින් මේ වදාරන ලද්දේද වෙයි-

අහිවෙසඝනඅ! යම්කලෙක සැපවෙදනාව විඳීද එකල්හි දුක් වෙදනාව නො ම විඳී උපෙක්ෂාවෙදනාව නො විඳී එකල්හි සැපවෙදනාව ම විඳී; ගිනිවෙස්න! යම්කලෙක දුක්වෙදනාව-පෙ-උපෙක්ෂාවෙදනාව විඳීද එකල්හි සැපවෙදනාව නො ම විඳී; දුක්වෙදනාව නොවිඳී; එකල්හි උපෙක්ෂාවෙදනාව ම විඳී; ගිනිවෙස්න! සැපවෙදනාව ද අනිත්‍යයැ

ප්‍රත්‍යයන්වීසින් කරනලද යැ, වස්ත්වාලම්බනය නිසා උපන, කෙමෙන් කියවනසුලු යැ පිරිහෙනසුලු යැ නො නැවතී වෙන්වනසුලු යැ නිරුඬ වනසුලු යැ; දුක්වෙදනාව ද-පෙ-ගිනිවෙස්න! උපෙක්ෂාවෙදනාව ද අනිත්‍ය යැ-පෙ-නිරුඬවනසුලුයැ; ගිනිවෙස්න! මෙසේ දක්නාවූ ශ්‍රැත වත් ආර්‍යශ්‍රාවකතෙමේ සැපවෙදනාවෙහි ද කලකිරෙයි, දුක්වෙදනා වෙහි ද-පෙ-උපෙක්ෂාවෙදනාවෙහි ද කලකිරෙයි, කලකිරුනේ නො ඇලෙයි, නො ඇලීමෙන් කෙලෙසුන්කෙරෙන් සිත මිදෙයි, සිත මිදුනු කල්හි මිදුනේය,යි ප්‍රත්‍යවෙක්ෂාඥානය වෙයි; ජාතිය ක්ෂයවූවා යැ මාගී බ්‍රහ්මචර්‍යාව වැසනිමවනලද, සිව්සස්හි සිව්මගින් කළයුතුවූ සොළොස් වැදෑරුම්කිසනිමවනලද, ඉොඛඡවිධකෘත්‍යය පිණිසහෝ කෙලෙසුන් ක්ෂයකිරීමපිණිස නැවත මාගීභාවනාකෘත්‍යයක් මට නැතැ, යි දැන ගනී යයි.

සාමිසං වා සුඛං= යනාදි තැන්හි **සාමිසසුඛ නම්? පඤ්චකාම ගුණාමිෂනිශ්‍රිතවූ** සවැදෑරුම් ගෘහශ්‍රිත සොමනස්වෙදනාවෝයි; **නිරා මිසසුඛ නම්?** සවැදෑරුම් නෛෂ්කර්‍ම්‍යනිශ්‍රිතවූ සොමනස්වෙදනාවෝයි **සාමිසදුක්ඛ** වෙදනා නම්; සවැදෑරුම් ගෘහශ්‍රිතවූ දෞර්මනස් වෙදනා වෝයි; **නිරාමිසදුක්ඛ** වෙදනා නම්? සවැදෑරුම් නෛෂ්කර්‍ම්‍යනිශ්‍රිතවූ දෞර්මනස්වෙදනාවෝයි; **සාමිසඅදුක්ඛමසුඛ** වෙදනා නම් සවැදෑරුම් ගෘහශ්‍රිතවූ උපෙක්ෂාවෙදනාවෝයි; **නිරාමිසඅදුක්ඛමසුඛ** වෙදනා නම්; සවැදෑරුම් නෛෂ්කර්‍ම්‍යනිශ්‍රිතවූ උපෙක්ෂාවෙදනාවෝයි; ඒ වෙදනා වන්ගේ විභාගය උපරිපණ්ණාසකයෙහි පාලියෙහි ආයේ මැය. **ඉති අජ්ඣත්තං වා=** මෙසේ සැපවෙදනාදිය පිරිසිඳගැනීමෙන් තමාගේ වෙදනාවන්හි හෝ අනිකෙකුගේ වෙදනාවන්හි හෝ කලෙක තමාගේ හෝ කලෙක අනිකෙකුගේ හෝ වෙදනාවන්හි වෙදනාඅනුව බල මින් වෙසෙයි; **සමුදයධම්මානුපස්සී වා යන මෙහි වනාහි අවිජ්ජා සමුදයා වෙදනාසමුදයෝ** යනාදිවූ පස්ආකාරයෙන් වෙදනාවන්ගේ ඉපදීම ද විනාශය ද දක්නේ වෙදනාවන්හි උත්පත්තිසවභාවවශයෙන් දක්නේ හෝ වෙසෙයි, වෙදනාවන්හි විනාශසවභාවවශයෙන් දක්නේ හෝ වෙසෙයි, වෙදනාවන්හි කලෙක උත්පත්තිසවභාව අනුව බලමින් කලෙක විනාශසවභාව අනුව බලමින් හෝ වාසයකෙරේ,යයි දත යුතු. මෙයින් මත්තෙහි කායානුපස්සනාවෙහි කීනය මැ,යි හුදෙක් මෙහි වෙදනාවන් පිරිසිඳදැනගන්නාවූ සිහිය දුඃඛසත්‍යය,යි මෙසේ යෙදීම කොට වෙදනාපරිග්‍රාහකභික්ෂුහුගේ (නිවන් අරමුණු කොට වෘත්තයෙන්) නික්මයන චාරය දතයුතු. සෙස්ස ඒ පළමු කියන ලද්දට සමාන මැ,යි.

වෙදනානුපස්සනා නිමි.

මෙසේ නවප්‍රකාරයකින් වෙදනානුපස්සනාසතිපට්ඨානය වදාරා දැන් ෂඩාඛ්‍යප්‍රකාරයකින් චිත්තානුපස්සනාව වදාරනු පිණිස කථාසඳ භික්ඛවෙ! යනාදිය වදාළහ. **එහි සරාගං=** අටවැදෑරුම් ලොභසහගතවූ; **විත රාගං=** ලෞකිකකුශලාව්‍යාකෘතවූ; මේ චිත්තානුපස්සනාසතිපට්ඨානය වනාහි යම්හෙයකින් ධම්සම්මර්ශනය වේද, ධම්සමොධානය නොවේද එහෙයින් මෙහි එක් පදයෙක්හි දු ලොකොත්තරචිත්තය නො ලැබෙයි; සෙසු අකුශලචිත්තයෝ සතරදෙන පූර්‍ණපදය නො ම භජනය කෙරෙති, පශ්චිමපදය ද භජනය නො කෙරෙත්. **සදොසං=** දෙවැදෑරුම් දෙම්නස්සහගතවූ; **විතදොසං=** ලෞකිකකුශලාව්‍යාකෘතවූ; සෙසු අකුශලචිත්තයෝ දසදෙන පූර්‍ණපදය නොම භජනය කෙරෙති, පශ්චිමපදය ද භජනය නො කෙරෙත්; **සමොහං=** විචිකිච්ඡාසහගතවූ ද උඩවවසහගතවූ ද, යි දෙවැදෑරුම්වූ; මොහය වනාහි යම්හෙයකින් සියලු අකුශලයන්හි උපදීද එහෙයින් සෙසු අකුශලයෝ ද මෙහි වත්තිමැය; ඒ එසේමැයි. මේ දුකයෙහි මැ වාදශඅකුශලචිත්තයෝ ඇතුලත් කොට ගත්නාලද්දාහුය,යි. **විතමොහං=** ලෞකිකකුශලාව්‍යාකෘතවූ; **සඛිත්තං=** පීතම්බයට බැසගත්තාවූ; මේ සිත වනාහි හැකුළුනාවූ සිත නම්; **විකිත්තං=** උඩවවසහගතවූ; මේ සිත වනාහි විසුරුනු සිත නම්; **මහගගතං=** රූපාරූපාවචරවූ; **අමහගගතං=** කාමාවචරවූ; **සඋත්තරං=** කාමාවචරවූ; **අනුත්තරං=** රූපාරූපාවචරවූ; එහි දු "සඋත්තර,, චිත්තය රූපාවචරයැ; "අනුත්තර,, චිත්තය අරූපාවචර මැ,යි; **සමාහිතං=** යමෙකුට අප්‍රිණසමාධිය හෝ උපචාරසමාධිය හෝ ඇත්තේද (ඔහුගේ සමාධිසහිතවූ සිත;) **අසමාහිතං=** උභයසමාධිවිරහිතවූ; **විමුත්තං=** තදඞ්ගවිෂ්කම්භණවිමුක්තීන්ගෙන් මිදුනාවූ; **අවිමුත්තං=** උභයවිමුක්තියෙන් විරහිතවූ; සමුච්ඡේදපටිපස්සද්ධිනිස්සරණ මිමුක්තීන්ට වනාහි මේ චිත්තානුපස්සනාවෙහි අවකාසයෙක් මැ නැති.

ඉති අජ්ඣත්තං වා= මෙසේ සරාගාදි චිත්තයන් පිරිසිඳ ගැනීමෙන් යම් යම් ඇසිල්ලෙක යම් යම් සිතක් පවතිද ඒ ඒ සිත සල කම්න් තමාගේ සිතෙහි හෝ අනිකෙකුගේ සිතෙහි හෝ කලෙක තමාගේ හෝ කලෙක අනිකෙකුගේ හෝ සිතෙහි චිත්තානුදර්ශිව වෙසෙයි. **සමුදයධම්මානුපස්සී** යන මෙහි වනාහි **අවිජ්ජා සමුදයා චිත්තසමුදයා** **සමුදයෝ** යි මෙසේ පස් පස් ආකාරයෙන් චිත්තයාගේසමුදය ද ව්‍යය ද එලවා **දුක්ඛිය** යුතුයි; මෙයින් මත්තෙහි කිතයමැ,යි. හුදෙක් මෙහි චිත්තපරිග්‍රාහිකා සමාධිතොමෝ දුඃඛසත්‍යයැ,යි මෙසේ යෙදීම කොට චිත්තපරිග්‍රාහක භික්ෂුහුගේ රහත්ඵලය තෙක් නිර්‍වාණවාරය දතයුතු. සේස්ස ඒ පළමු කියනලද්දට සමාන මැයි.

චිත්තානු පස්සනාව නිමි.

මෙසේ සොළොස් ආකාරයකින් චිත්තානුපස්සනා සතිපට්ඨානය වදාරා මෙවිට පස්ආකාරයකින් ධම්මානුපස්සනාව දෙශනාකරනු පිණිස **කථඤ්ච භික්ඛවෙ;** යනාදිය වදාළහ. වැලිදු භාග්‍යවතුන් වහන්සේ විසින් කායානුපස්සනාවෙහි ශුඩරූපපරිග්‍රහය වදාරන ලද්දේය; වෙදනානුපස්සනා චිත්තානුපස්සනාවන්හි ශුඩ අරූප පරිග්‍රහය වදාරනලද; දැන් රූපාරූප මිශ්‍රක පරිග්‍රහය වදාරනු පිණිස **කථඤ්ච භික්ඛවෙ!** යනාදිය වදාළහ. නොහොත් කායානුපස්සනාවෙහි රූපසඤ්ඤ පරිග්‍රහය වදාරනලද; වෙදනානුපස්සනාවෙහි වෙදනාසඤ්ඤ පරිග්‍රහය ම වදාරනලද; චිත්තානුපස්සනාවෙහි විඤ්ඤාසඤ්ඤ පරිග්‍රහය ම වදාරන ලද; දැන් සංඛෙසඤ්ඤ සංඛාරසඤ්ඤයන්ගේ පරිග්‍රහය ද වදාරනු පිණිස **කථඤ්ච භික්ඛවෙ** යනාදිය වදාළහ. **එහි සන්තං**= සතතයෙන් සිත්හි හැසිරීම් වශයෙන් විද්‍යමානවූ; **අසන්තං**= සිත්හි නො හැසිරීම් වශයෙන් හෝ ප්‍රහීනවූ බැවින් හෝ අවිද්‍යමානවූ; **යථා** ච= යම් කරුණකින් කාමච්ඡන්දයාගේ ඉපදීම වේද; **තඤ්ච පජානාති**= ඒ කරුණද දනගනී; මේ ක්‍රමයෙන් සියලු පදයන්හි අර්ථ දතයුතු. ඒ නීවරණයන් අතුරෙහි ශුභනිමිත්තෙහි අයොනිසො මනසිකාරය හෙතුකොට ගෙන කාමච්ඡන්දයාගේ ඉපදීම වෙයි; ශුභනිමිත්තය නම්? ශුභය ද ශුභ නිමිත්තය ශුභාරම්මණය ද ශුභනිමිත්තය; අයොනිසොමනසිකාරය නම්? අනුපාය මසකාරය උපපථමනසකාරය (=කුසල්දහම් පැවැත්මට මහ නොවූ මෙනෙහි කිරීම) අනිත්‍යයෙහි නිත්‍යය,යිද දුකෙහි සැපය,යිද අනාත්මයෙහි ආත්මය,යි ද අශුභයෙහි ශුභය,යි ද මෙනෙහි කිරීමයි; ඒ නුනුවණින් මෙනෙහි කිරීම ඒ ශුභාරම්මණයෙහි බහුලව පවත්වන්නහුට කාමච්ඡන්දය උපදී; එසින් වදාළහ. භාග්‍යවත්හු- **අත්ථි භික්ඛවෙ; සුභනිමිත්තං තත්‍ර අයොනිසො මනසිකාර බහුලීකාරෝ අයමාහාරෝ අනුප්පන්නස්ස වා කාමච්ඡන්දස්ස උප්පාදාය උප්පන්නස්ස වා කාමච්ඡන්දස්ස භියොභාවාය වෙපුල්ලාය යි** (= මහණෙනි! ඉෂ්ට රම්මණය ඇති, එසි අයොනිසො මනස්කාරයාගේ යම් බහුල කිරීමක් වේද මේ ආහාරය නොම නූපන් කාමච්ඡන්දයාගේ ඉපදීම පිණිස ද උපන් කාමච්ඡන්දයාගේ බහුලබව පිණිසද විපුලබව පිණිස ද පවතී. *A*)

නැවත අශුභ නිමිත්තෙහි නුවණින් මෙනෙහි කිරීම හෙතුකොට ගෙන (කාමච්ඡන්දයාගේ) ප්‍රහාණය වෙයි; අසුභනිමිත්ත නම්? අශුභයද අශුභාරම්මණය ද වේ; යොනිසොමනසිකාර නම්? උපාය මනසකාරය පථමනසකාරය අනිත්‍යයෙහි අනිත්‍යය,යි ද දුකෙහි දුකය යි ද අනාත්ම යෙහි අනාත්මය,යි ද අශුභයෙහි අශුභය,යි ද මෙනෙහි කිරීමයි; ඒයොනි සොමනසකාරය ඒ අශුභාරම්මණයෙහි බහුලකොට පවත්වන්නහුට කාමච්ඡන්දය ප්‍රහීණවෙයි; එසින් වදාළහ භාග්‍යවත්හු- **අත්ථි භික්ඛවෙ! අසුභ නිමිත්තං තත්‍ර යොනිසො මනසිකාර බහුලීකාරෝ අයමා**

A මත්තෙහි මෙබඳු තැන්හි මේ ලෙසම අර්ථ සැලකිය යුතුයි.

භාරෝ අනුප්පන්නස්ස වා කාමච්ඡන්දස්ස අනුප්පාදාය උප්පන්නස්ස වා කාමච්ඡන්දස්ස පහානාය යි. තවද ධර්මයෝ සදෙනෙක් කාමච්ඡන්දයාගේ ප්‍රහාණය පිණිස පවතිත්, අශුභාරම්මණය ඉගෙනීමය අශුභ භාවනාවෙහි යෙදීමය ඉන්ද්‍රිය යන්හි වැසුදොර ඇතිබවය භෝජන යෙහි පමණ දන්නාබවය කල්‍යාණ මිත්‍රයන් ඇතිබවය සත්ප්‍රාය කථා වය යන මොහුයි. ඒ එසේමැයි- දසවැදෑරුම් අශුභ නිමිත්ත ඉගෙන ගන්නහුට ද කාමච්ඡන්දය ප්‍රහීණවෙයි; භාවනා කරන්නහුට ද; ඉන්ද්‍රිය යන්හි වැසූ චක්ෂුරාදි වූ සදොර ඇත්තහුට ද සතරපස් පිඬකට අවකාස ඇතිකල්හි පැන් බී යැපෙන සුලු බැවින් භෝජනයෙහි පමණ දන්නහුට ද (කාමච්ඡන්දය ප්‍රහීණවෙයි;) එයින් මේ වදාරන ලදී-

107 "චත්තාරෝ පඤ්ච ආලෝපෙ අභුඤ්ඡා උදකං පිවෙ
අලං ඵාසුවිහාරාය පහිතත්තස්ස භික්ඛුනෝ,,යි

අසුභ කම්මික තිස්ස තෙරුන් වැනිවූ අශුභභාවනාවෙහි ඇලුනු කල්‍යාණ මිත්‍රයන් සෙවූනාහට ද කාමච්ඡන්දය; ප්‍රහීණ වෙයි; භික්ඛු සිවුම් ආදියෙහි දශ අශුභ නිශ්‍රිතවූ සැපකථාවෙන් ද ප්‍රහීන වෙයි. එයින් කියනලදී- "ධර්මයෝ සදෙනෙක් කාමච්ඡන්දයාගේ ප්‍රහාණය පිණිස පවතිත්,, යයි. මේ ධර්මයන් සදෙන හෙතුකොටගෙන රහත් මගින් ප්‍රහීණවූ කාමච්ඡන්දයාගේ මත්තෙහි නො ඉපදීම වේ ය,යි දැනගනී.

නැවත ප්‍රතිඝ නිමිත්තෙහි නුනුවණින් මෙනෙහි කිරීම හෙතු කොටගෙන ව්‍යාපාදයාගේ ඉපදීම වෙයි; එහි ප්‍රතිඝය ද ප්‍රතිඝ නිමිත්ත යැ ප්‍රතිඝාරම්මණය ප්‍රතිඝනිමිත්ත යැ; අයොනිසෝ මනසිකාරය සියලු තැන්හි සමානලක්ෂණ ඇත්තේමැ ය; ඒ අයොනිසෝ මනසිකාරය ඒ ප්‍රතිඝනිමිත්තෙහි බහුල වශයෙන් පවත්නහුට ව්‍යාපාදය උපදී, එයින් වදාළහ- **අපි භික්ඛවෙ; පටිඝ නිමිත්තං තත්ථ අයොනිසෝ මනසිකාර බහුලී කාරෝ අයම්හාරෝ අනුප්පන්නස්ස වා ව්‍යාපාදස්ස උප්පාදාය උප්පන්නස්ස වා ව්‍යාපාදස්ස භිය්‍යොභාවාය වෙපුල්ලාය** යි.

මෛත්‍රී චිත්ත විමුක්තිය නුවණින් මෙනෙහි කිරීමෙන් ඒ ව්‍යාපාදයාගේ ප්‍රහීණවීම වෙයි; එහි "මෙත්තා,. යි කීකල්හි අර්ණාසමාධිය ද උපචාර සමාධිය ද වටී "චෙතෝ විමුත්ති,,යි අර්පණ සමාධිය මැයි; යොනිසෝ

---

107 **චත්තාරෝ පඤ්ච ආලෝපෙ**= සතරපස් ආලෝපයක්; **අභුඤ්ඡා**= නොවළඳා; **උදකංපිවෙ**= පැන් පානය කරන්නේ නම්; **පහිතත්තස්ස**= නිවනටමෙහෙයනලද සිත්ඇති; **භික්ඛුනෝ**=(භාවනානුයෝගී) භික්ෂුහුගේ; **ඵාසුවිහාරාය**= සැපවිහරණය පිණිස; **අලං**= ප්‍රමාණවෙයි.

මනසිකාරය කි ලක්‍ෂණ ඇත්තේ මැය; ඒයොනිසො මනසකාරය ඒ මෛත්‍රී චිත්ත සමාධියෙහි බහුල වශයෙන්පවත්නහුට ව්‍යාපාදය ප්‍රහීණවෙයි; එයින් වදළහ.- **අපි භික්ඛවෙමෙත්තා චෙතොවිමුත්ති තප්පඨොනිසොමනසිකාර බහුලීකාරෝ අයමාහාරෝ අනුප්පන්නස්ස වා ව්‍යාපාදස්ස අනුප්පාදය උප්පන්නස්ස වා ව්‍යාපාදස්ස පහානා ය** යි තවද ධර්මයෝ සදනෙක් ව්‍යාපාදයාගේ ප්‍රහාණය පිණිස පවතිත්, මෛත්‍රීනිමිත්ත ඉගෙනීමය මෛත්‍රීභාවනාවෙහි නැවත නැවත යෙදීමය කර්මයසඵකිය කොට ඇතිබව මෙනෙහි කිරීමය නුවණින් විමසීම බහුලකොට ඇතිබවය කල්‍යාණ මිත්‍රයන් ඇතිබවය සත්ප්‍රාය කථාවය යන මොහුයි. ඒ එසේ මැය- (ආත්ම ආත්මප්‍රිය මධ්‍යස්ථ වෛරීන්ගේ වශයෙන්) ඔදිස්සකථරණය (සීමාසමෝහදය කිරීමෙන්) අනොදිස්සකථරණය (එක් දිශාවෙක යනාදිවශයෙන්) දිසාථරණය යන මොවුන් අතුරෙන් එකක්හුගේ වශයෙන් මෛත්‍රිය උපදවන්නහුටද ව්‍යාපාදය ප්‍රහීණවෙයි; ඔධිසොථරණ අනොධිසොථරණ දිසාථරණ යන්ගේ වශයෙන් මෛත්‍රී ධ්‍යානය වඩන්නහුට ද; තෙපි මොහුට කිපියේ කුමක් කරන්නෙහි ද? කිම ඔහුගේ ශීලාදිගුණයන් නසන්ට පොහොසත් වන්නෙහි ද? තෙපි තමාගේ කර්මයෙන් අවුත් තමාගේ කර්මයන් ම පරලොව යන්නෙහි නො ද? මෙරමාහට කිපිම නම් සිලු රහිත අහුරු රත්අයසලාක අසුචි ආදිය ගෙන අනිකෙකුට ගසනු කැමතිබව වැනි වෙයි; මේ තෙමේත් කට කිපියේ කුමක් කරන්නේද? කිම තාගේ ශීලාදිගුණයන් නසන්ට පොහොසත් වන්නේද? මේ තෙම තමාගේ කර්මයෙන් අවුත් තමාගේ කර්මයෙන් ම පරලොව යන්නේය; නොපිළිගත් පඬුරක් මේන් ද උඩුසුළඟට දැමූ ධූලිමිටක් මෙන්ද මේ ක්‍රොධය මොහුගේම මුදුනෙහි වැටෙන්නේය,යි මෙසේ තමාගේ ද මෙරමාගේ ද කර්මය සඵකිය කොට ඇතිබව නුවණින් සලකන්නහුට ද දෙදෙනාගේ කර්මසඵකිය බව ප්‍රත්‍යවෙක්‍ෂාකොට නුවණින් විමසීමෙහි පිහිටියහුට ද; **අස්ස භගවතා** තෙරුන් වැනි මෛත්‍රී භාවනාවෙහි ඇලුනු කල්‍යාණ මිත්‍රයන් සේවනය කරන්නහුට ද ව්‍යාපාදය ප්‍රහීණවෙයි; සිවිමි හිදීම් ආදියෙහි මෛත්‍රී නිශ්‍රිත සත්ප්‍රාය කථාවෙන් ද ප්‍රහීණවෙයි; "ධර්මයෝ සදෙනෙක් ව්‍යාපාදයාගේ ප්‍රහාණය පිණිස පවතිත්,, යයි එහෙයින් කියනලදී. මේ ධර්මයන් සදෙනා හෙතුකොටගෙන ප්‍රහීණවූ ව්‍යාපාදය අනාගාමි මාර්ගයෙන් මත්තෙහි නො ඉපදිම වේය,යි දැනගනී.

අරතිආදියෙහි අයොනිසොමනසකාරයෙන් පිනම්ඩයාගේ ඉපදීම වෙයි; "අරති"නම්උකටලී බවයි; "තන්ද්‍රි"නම්නාමකායයාගේ අලසබවයි; "විජම්භිකා"නම් ශරීරයාගේ නැවත නැවත කම්පාවනබවයි; "භත්ත සම්මද"නම් භක්තමුර්ජාව භක්තපරිදාහයයි; "චෙතසොලීනත්ත න්ම,, චිත්තයාගේ හැකුළුනුආකාරයයි; මේ අරතිආදියෙහි

අයොනිසොමනසිකාරයබහුල වශයෙන් පවත්නහුට පීනම්ඛය උපදී. එසින් වදුලහ- **අත්ථි භික්ඛවෙ! අරති නන්දි විජ්ජාභිභා භත්තසම්මදෙ වෙනසො ච ලීනත්තං තත්ථ අයොනිසො මනසිකාරබහුලීකාරෝ අයමාහාරෝ අනුප්පන්නස්ස වා පීනම්ඛස්ස උප්පාදාය උප්පන්නස්ස වා පීනම්ඛස්ස භියොභාවාය වෙපුල්ලාය** සී. ආරම්භධාතු ආදියෙහි යොනිසොමනසිකාරයෙන් ඒ පීනම්ඛයාගේ ප්‍රහාණය වෙයි; ආරම්භ ධාතු,,නම් ප්‍රථමාරම්භවීර්‍යයයි; "නික්කමධාතු,,නම් කුසීතභාවයෙන් නික්මුනුබැවින් ඊට වඩා ඉතාබලවත් වීර්‍යයයි; "පරක්කමධාතු,,නම් මතු මතු විශෙෂයට පැමිණෙනහෙයින් (හෙවත් අධිකවූ ඉතාඅධිකවූ විරුඩධර්මයන් නැසීමට සමර්ථවූ පටුපටුතරාදිභාවයට පැමිනෙණහෙයින්) ඒනික්කමධාතුවට ද වඩා ඉතාබලවත්වීර්‍යයයි; මේ ත්‍රිභෙදවූ වීර්‍යයෙහි යොනිසොමසිකාරය බහුලවශයෙන් පවත්නහුට පීනම්ඛය ප්‍රහීණවෙයි; එසින් වදුලහ- **අත්ථි භික්ඛවෙ! ආරම්භධාතු නික්කමධාතු පරක්කම ධාතු තත්ථ යොනිසොමනසිකාරබලීහුකාරෝ අයමාහාරෝ අනුප්පන්නස්සවා පීනම්ඛස්ස අනුප්පාදාය උප්පන්නස්ස වා පීනම්ඛස්ස පහානාය** සී. තවද ධර්මයෝ සදෙනෙක් පීනම්ඛයාගේ ප්‍රහාණය පිණිස පවතිත්, අධිකභොජනයෙහි නිමිති ගැනීමය (=මෙතෙක් වැලඳුකල්හි එය පීනම්ඛයට කරුණු නොවේය,සිභොජනයෙහි පමණ දන්නාබවයයි සූතැනි,) ඉරියව් පෙරළීමය, ආලොකසංඥව මෙනෙහිකිරීමය, අභ්‍යවකාසයෙහි වසීමය, කල්‍යාණමිත්‍රයන් සෙවනයකරනබවය, සත්ප්‍රාය කථාවය, යන මොහුයි; ඒ එසේමැයි- (බොහෝකොට කා නැඟිසිටිය නොහී අත දෙව,සි කියන) ආහරහත්ථකය (වළඳ නැඟිසිටිය නොහී එහි ම පෙරලෙන) තත්‍රවට්ටකය (වළඳ ඉතාමහත්වූ කුසඇතිබැවින් නැඟිසිටිය ද පිළි හැඳගතනොහෙන) අලංසාටකය (කවුඩන්වියසින් සපයිකාලහැකිසේ මුවදෙරුදක්වා බුදින) කාකමාසකය (වළඳ මුඛයෙහි නො දුරියහැකිව එහිම වමනයකරන)භුත්තවමිතකය යන(මොවුන්ගේ වශයෙන්) බොජුන් වළඳ රාත්‍රිසථානදිවාසථානයෙහි හිඳිමින් මහණ දම් කරන්නහුට පීනම්ඛය මහඇතෙකු මෙන් ම බිමින් පැමිණෙයි; එතකුදුවුවත් සතරපස්පිඬකට ඔවස් කබා පැන් බී යැපෙනසුලුවූ මහණහට ඒ පීනම්ඛය නො වේය,සි මෙසේ අධිකභොජනයෙහි නිමිති ගන්නහුට ද පීනම්ඛය ප්‍රහීණවෙයි; යම් ඉරියව්වෙකින් (සිටියහුට) පීනම්ඛයබැසගනීනම් එසින් අන්‍යවූ ඉරියව්වකට පෙර ලෙන්නහුට ද; රාත්‍රියෙහි සඳළුලිය පහන්ළුලිය පන්දම්ළුලිය හා දවල් ඉරළුලිය මෙනෙහිකරන්නහුට ද; අබවස්හි වසන්නහුට ද මහකසුප් තෙරුන් වැනි ප්‍රහීණකළ පීනම්ඛයඇති කල්‍යාණමිත්‍රයන් සෙවූනා හට ද පීනම්ඛය ප්‍රහීණවෙයි; සිවිමිහිදිම්ආදියෙහි ධුතාඞ්ගනිඃශ්‍රිතවූ සැපකථාවෙන් ද ප්‍රහීණවෙයි; එසින් කියනලදී- "ධර්මයෝ සදෙනෙක් පීනම්ඛයාගේ ප්‍රහාණයපිණිස පවතිත්,,යයි. මේ ධර්මයන් සදෙන හෙතු කොටගෙන ප්‍රහීණවූ පීනම්ඛයාගේ රහත්මගින් මත්තෙහි නො ඉපදීම් වේය,සි දැනගනී.

චිත්තයාගේ අවූපසමයෙහි අයොනිසො මනසිකාරය හෙතුකොට ගෙන උඩච්චකුක්කුච්චයාගේ ඉපදීම වෙයි; අවූපසමනම්? නො සන්සුන් ආකාරයයි; මේ අවූපසමය අවිහෙයින් උඩච්චකුක්කුච්චය මැයි; ඒ අවූපසමයෙහි අයොනිසො මනසිකාරය බහුලවශයෙන් පවත්නහුට උඩච්චකුක්කුච්චය උපදී. එහෙයින් වදාළහ- **අපි හික්ඛවෙ! චෙතසො අවූපසමො නත්ථි අයොනිසො මනසිකාරබහුලිකාරෙ අයමාහාරෙ අනුප්පන්නස්ස වා උඩච්චකුක්කුච්චස්ස උප්පාදාය උප්පන්නස්ස වා උඩච්චකුක්කුච්චස්ස භියෝභාවාය වෙපුල්ලාය** යි. නැවත සමාධි සඞ්ඛ්‍යාතවූ චිත්තයාගේ සන්සිඳීමෙහි යොනිසොමනස්කාරය හෙතු කොටගෙන ඒ උඩච්චකුක්කුච්චයාගේ ප්‍රහාණය වෙයි එයින් වදාළහ- **අපි හික්ඛවෙ! චෙතසො වූපසමො නත්ථි යොනිසොමනසිකාර බහුලිකාරෙ අයමාහාරෙ අනුප්පන්නස්ස වා උඩච්චකුක්කුච්චස්ස අනුප්පාදාය උප්පන්නස්ස වා උඩච්චකුක්කුච්චස්ස පහානාය** යි. වැලිදු ධම්මෝ සදෙනෙක්, උඩච්චකුක්කුච්චයාගේ ප්‍රහාණයපිණිස පවතින්- බහුශ්‍රැතබවය, පිළිවිස්නාබවය, චිතයෙහි ප්‍රගුණබවය, වැඩිසිටියන් සෙවූනාබවය, කල්‍යාණමිත්‍රයන් ඇතිබවය, සත්ප්‍රාශකථාවය යන මොහුයි. ඒ එසේමැයි- බහුශ්‍රැතභාවයෙන් ද එක් නිකායක් හෝ දෙනිකායක් හෝ තුන්නිකායක් හෝ සතරනිකායක් හෝ නිකාය පස ම හෝ පෙලවශයෙන් අටුවාවශයෙන් ද ඉගෙනගන්නහුට ද උඩච්චකුක්කුච්චය ප්‍රහීණවෙයි; කැප නො කැපදෙය පිළිවිසීම බහුලකොට ඇත්තහුට ද; චිනයප්‍රකෘතියෙහි පුරුදුකළවශීභාවයෙන් ප්‍රගුණවූවහුට ද; වෘඩවූ මහලුතෙරුන් කරා එලඹෙන්නහුට ද; **උපාලිතෙරුන්** වැනි චිනයධරවූ කල්‍යාණමිත්‍රයන් සෙවූනාහට ද උඩච්චකුක්කුච්චය ප්‍රහීණවෙයි; හිඳිමිසිටීම් ආදියෙහි කැප නො කැපදෙය ඇසුරුකොට පවත්නා සත්ප්‍රාශකථාවෙනුදු ප්‍රහීණවෙයි. එහෙයින් කියනලදී- ධම්මෝ සදෙනෙක් උඩච්චකුක්කුච්චයාගේ ප්‍රහාණයපිණිස පවතියි යයි. මේ ධම්මයන් සදෙනාහෙතුකොටගෙන ප්‍රහීණවූ උඩච්චකුක්කුච්චයෙහි උඩච්චයාගේ රහත්මඟින් ද කුක්කුච්චයාගේ අනාගාම්මාඟියෙන් ද මත්තෙහි නො ඉපදීම වේය,යි දැනගනී.

විචිකිත්සාවට කරුණුවූ ධම්මයන්හි නුනුවණින් මෙනෙහිකිරීමෙන් විචිකිච්ඡාවගේ ඉපදීම වෙයි; "විචිකිත්සාවට කරුණුවූ ධම්මෝ නම්? නැවත නැවත සැකකිරීමට කරුණුබැවින් විචිකිත්සාව මැයි; ඒ විචිකිත්සාවෙහි අයොනිසොමනස්කාරය බහුලවශයෙන් පවත්නහුට විචිකිච්ඡාව උපදී. එයින් වදාළහ- **අපි හික්ඛවෙ! විචිකිච්ඡා ඨානියා ධම්මා නත්ථි අයොනිසොමනසිකාරබහුලිකාරෙ අයමාහාරෙ අනුප්පන්නාය වා විචිකිච්ඡාය උප්පාදාය උප්පන්නාය වා විචිකිච්ඡායා භියෝභාවාය වෙපුල්ලාය** යි. කුශලාදිධම්මයන්හි නුවණින් මෙනෙහි කිරීමෙන් වනාහි ඒ විචිකිච්ඡාවගේ ප්‍රහාණය වෙයි. එයින්,

වදළහ- **අත්ථි භික්ඛවෙ! කුසලාකුසලාධම්මා සාවජ්ජානවජ්ජා ධම්මා සෙවිතබ්බාසෙවිතබ්බා ධම්මා හීනපණීතා ධම්මා කණ්හසුක්කසප්පටිභාගා ධම්මා තඤ්ච යොනිසොමනසිකාරබහුලීකාරෝ අයමාහාරෝ අනුප්පන්නාය වා විචිකිච්ඡාය අනුප්පාදාය උප්පන්නාය වා විචිකිච්ඡාය පහානාය** යි. යලිදු ධර්මයෝ සදෙනෙක් විචිකිච්ඡාවගේ ප්‍රහාණය පිණිස පවතිත්- බහුශ්‍රැතබවය පිළිවිස්නාබවය චිනයෙහි ප්‍රගුණබවය අධිමොක්ෂබහුලබවය කල්‍යාණමිත්‍රයන් ඇතිබවය සත්ප්‍රායකථාවය යන මොහුයි; ඒ එසේමැයි- බහුශ්‍රැතභාවයෙන් ද එක් නිකායක් හෝ -පෙ- නිකාය පස ම හෝ පෙලවහයෙන් ද අටුවාවහයෙන් ද ඉගෙන ගන්නහුට ද විචිකිත්සාව ප්‍රහීණවෙයි; රත්නත්‍රය අරබයා පිළිවිසීම් බහුලකොට ඇත්තහුට ද; චිනයෙහි පුරුදුකළවයිබැව් ඇත්තහුට ද; රත්නත්‍රයෙහි ඔකප්පනීයශ්‍රද්ධාසඞ්ඛ්‍යාත අධිමොක්ෂබහුලකොට ඇත්තහුව ද; ශ්‍රද්ධාධිමුක්තවූ **චක්කලි නෙරුන්** වැනි කල්‍යාණමිත්‍රයන් සෙවූ තාහට ද විචිකිත්සාව ප්‍රහීණවෙයි; භිදිම්සිරිම්ආදියෙහි රත්නත්‍රයාගේ ගුණනිශ්‍රිතසත්ප්‍රායකථාවෙන් ද ප්‍රහීණවෙයි; එහෙයින් කියනලදී "ධර්මයෝ සදෙනෙක් විචිකිත්සාවගේ ප්‍රහාණයපිණිස පවතිත්,, යයි. මේ ධර්මයන් සදෙන හෙතුකොටගෙන ප්‍රහීණවූ විචිකිත්සාවගේ සෝවාන්මඟින් මත්තෙහි නො ඉපදීම වේය,යි දැනගනී.

ඉති අජ්ඣත්තං වා= මෙසේ පඤ්චනීවරණපරිග්‍රහණයෙන් තමාගේ පඤ්චනීවරණධර්මයන්හි හෝ අනිකෙකුගේ නීවරණ ධර්මයන්හි හෝ කලෙක තමාගේ හෝ කලෙක අනිකෙකුගේ හෝ නීවරණ ධර්මයන්හි ධර්මානුදර්ශීව වෙසෙයි; මෙහි උත්පත්තිවිනාශදෙක වනාහි ශුභනිමිත්තත අශුභනිමිත්තාදියෙහි අයොනිසොමනසිකාර යොනිසොමනස්කාරයන්ගේ වශයෙන් පඤ්චනීවරණයන්හි කියනලද්දාහු ම දැක්විය යුත්තාහුය. මෙයින් මත්තෙහි කිහිය මැයි. හුදෙක් මෙහි නීවරණයන් හිරිසිදදැනගන්නාවූ සිහිය දුඃඛසත්‍යය,යි මෙසේ යෙදීම කොට නීවරණපරිග්‍රාහකඥානයහුගේ නිර්ණාරය දතයුතුයි. සෙස්ස ඵබදුමැයි.

නීවරණ පඵිඝ නිමි.

මේසේ පඤ්චනීවරණයන්ගේ වශයෙන් ධර්මානුපස්සනාව විභාග කොට වදාරා දැන් පඤ්චඋපාදානස්කන්ධයන්ගේ වශයෙන් විභාග කරනු පිණිස **පුන ච පරං** යනාදිය වදළහ. **පඤ්චසුපාදානක්ඛන්ධෙසු=** උපාදානයාගේ සකඤ්ඤෝ උපාදානස්කන්ධ නම් වෙති; උපාදානයට ප්‍රත්‍යවූ ධර්මපුඤ්ජයෝයැ ධර්මරාශීහුයැ යන අර්ථයි. මේ මෙහි සංක්ෂේපය,යි සකඤ්ඤකථාතොමෝ විස්තරවශයෙන් විශුද්ධිමාර්ගයෙහි කියනලද්දීය. **ඉති රූපං=** මේ රූපයැ. මෙතෙක් රූපයැ, මෙයින් මත්තෙහි රූප

යක් නැත්ද, සවභාවවශයෙන් රූපය දැනගනී; වෙදනාදියෙහි ද මෙම නයයි. මේ මෙහි සංක්ෂෙපය, යි; විස්තරවශයෙන් වනාහි රූපාදීහු විශුද්ධිමාගීයෙහි සකඛකථාවෙහි ම කියනලද්දාහුය. **ඉති රූපස්ස සමුදයෝ=** මෙසේ අවිද්‍යාසමුදයාදීන්ගේ වශයෙන් පස්ආකාරයකින් රූපයාගේ සමුදය වෙයි; **ඉති රූපස්ස අත්ථඞගමෝ=** මෙසේ අවිද්‍යා නිරොධාදීන්ගේ වශයෙන් පස්ආකාරයකින් රූපයාගේ අස්තඞගමය වෙයි; වෙදනාදියෙහි ද මෙම නයයි. මේ මෙහි සංක්ෂෙපයයි; විස්තරය වනාහි විශුද්ධිමාගීයෙහි උදයව්‍යයඤ්ඤනකථාවෙහි කියනලද්දේය. **ඉති අජ්ඣත්තං වා=** මෙසේ පඤ්චසකඛන්ධපරිග්‍රහණයෙන් තමාගේ සකඛ ධර්මයන්හි හෝ අනිකෙකුගේ සකඛ ධර්මයන්හි හෝ කාලෙක තමාගේ හෝ කාලෙක මෙරමාගේ හෝ සකඛධර්මයන්හි ධර්මානුදර්ශිව වාසයකරයි; මේ **පඤ්චුපාදානක්ඛන්ධයෙහි සමුදව්‍යය** වනාහි **අවිජ්ජාසමුදයා රූපසමුදයෝ** යනාදීවූ පඤ්චුපාදානක්ඛන්ධයන්හි කියනලද පනස් ලක්ෂණයන්ගේ වශයෙන් දැක්විය යුත්තාහුය. මෙයින් මත්තෙහි කීනය මැයි. හුදෙක් මෙහිස්කඛන්ධයන් පිරිසිඳ දැනගන්නාවූ සමෘතිතොමෝ දුඃඛ සත්‍යය, යි මෙසේ යොජනා කොට සකඛපරිග්‍රාහකභික්ෂුහුගේ නිර්වාණ චාරය දතයුතු. සෙස්ස එබදු මැයි.

සකඛපඨිය නිමි.

මෙසේ පඤ්චුපාදානක්ඛන්ධයන්ගේ වශයෙන් ධම්මානුපස්සනාව විභාග කොට වදාරා දැන්ආයතනයන්ගේ වශයෙන් විභාගකරනුපිණිස **පුන ච පරං** යනාදිය වදාළහ. එහි **ඡසු අජ්ඣත්තිකබාහිරෙසු ආයතනෙසු= චක්ඛුඤ් ශ්‍රොත්‍රඤ්ඤාණජිව්හාකායමනස් යන ආධ්‍යාත්මිකෂඩායතනයන්හි ද, රූපය ශබ්දය ගන්ධය රසය ඵස්පීය ධර්ම යන මේ බාහිර ෂඩායතනයන්හි ද; චක්ඛුඤ්ච පජානාති= චක්ෂුඃප්‍රසාදය අවිපරීතවූ සවකීය** සවභාවලක්ෂණවශයෙන් දැනගනී; **රූපෙ ච පජානාති=** බාහිරවූ චතුසමුට්ඨානරූපයන් ද අවිපරීතවූ තමාගේ සවභාවලක්ෂණ වශයෙන් දැනගනී; **යඤ්ච තදුභයං පටිච්ච උප්පජ්ජති සංයොජනං=** ඇසු හා රූපයන් ද යන මේ දෙක නිසා කාමරාගසංයොජනය ප්‍රතිඝ- මාන- දෘෂ්ටි- විචිකිත්සා- ශීලව්‍රතපරාමර්ශී- භවරාග- ඊර්ෂ්‍යා- මාත්සර්‍ය්‍ය- අවිද්‍යා සංයොජනය යන දශවිධවූ යම් සංයොජනයකුත් උපදීද ඒ දශවිධ සංයොජනය ද අවිපරීතවූ සවකීය සවභාවලක්ෂණවශයෙන් දැනගනී. මේ දසසංයොජනය නොසේ උපදීදයත්? පිළිවෙළින්කියනුලැබේ- චක්ෂුර්වාරයෙහි හමුබවට පැමිණියාවූ ඉෂ්ටාරම්මණය කාමාස්වාදවශයෙන් ආස්වාදනයකරන්නහුට සතුටුවන්නහුට කාමරාගසංයොජනය උපදී; අනිෂ්ටාරම්මණයෙහි කිපෙන්නහුට ප්‍රතිඝසංයොජනය උපදී; මා තබා අන් කවරෙක් තෙල අරමුණ නුවණින් සලකන්ට සමර්ථවූයේ ඇත්දැයි?

සිතන්නහුට මානසංයොජනය උපදී; මෙපරිද්දෙන් රූපාරම්මණය නිත්‍යය සථිරය,යි ගන්නහුට දෘෂ්ටිසංයොජනය උපදී; මෙපරිද්දෙන් රූපාරම්මණය සත්‍වයෙක් දෝ හෝ සත්‍වයාගේ දෝ හෝ,යි සැකඋපද වන්නහුට විචිකිත්සාසංයොජනය උපදී; සම්පත්තිභවයෙහි අපට එකාන්තයෙන් මේ රූපාරම්මණය සුලභවූයේ වනැ,යි භවය ප්‍රාර්ථනා කරන්නහුට භවරාගසංයොජනය උපදී; මත්තෙහිදු මෙබඳුවූ රූපාරම්මණයක් ශීලවූතසමාදන්වැ ලබන්ට හැක්කැයි ශීලවූතසමාදන්වන්නහුට ශීලව්‍රතපරාමර්ශී සංයොජනය උපදී; තෙල රූපාරම්මණය අන්‍යයෝ නො ලබන්නාහුනම් ඉතා යෙහෙකැ,යි ඊර්ෂ්‍යාකරන්නහුට ඊර්ෂ්‍යාසංයොජනය උපදී; තමාලත් රූපාරම්මණය අනිකෙකුට (ලැබීම) මසුරුකරන්නහුට මාත්සර්‍ය්‍ය සංයොජනය උපදී; (කාමරාගාදි) සියල්ලන් සමඟ සහජාතවූ අඥානයාගේ වශයෙන් අවිද්‍යාසංයොජනය උපදී; **යථාච අනුපපත්තිය=** යම් කරුණකින් අසමුදාචාරවශයෙන් නූපන් ඒ දසවැදෑරුම්වූ ම සංයොජනයාගේ ඉපදීම වේද ඒ කරුණත් දනගනී; **යථා ච උප්පන්නානං=** ප්‍රහීණ නොවූ කරුණෙන් සමුදාචාරවශයෙන් හෝ උපන්නාවූ ඒ දශවිධවූ ම සංයොජනයාගේ යම් කරුණකින් ප්‍රහාණය වේද ඒ කාරණයත් දනගනී; **යථා ච පහීනානං=** තදඞ්ගවික්ඛම්භණප්‍රහාණයන්ගේ වශයෙන් ප්‍රහීණවූ ද ඒ දසවිධසංයොජනයාගේ යම් කරුණකින් මත්තෙහි නො ඉපදීම වේද ඒ කරුණත් දනගනී; කවර කරුණකින් වනාහි ඒ දසසංයොජනයාගේ මත්තෙහි නො ඉපදීම වේ ද යත්; පළමුකොට දෘෂ්ටිවිචිකිත්සාශීලව්‍රතපරාමර්ශීර්ෂ්‍යාමාත්සර්‍ය්‍යහෙදවූ පඤ්චවිධසංයොජනයාගේ සෝවාන්මඟින් මත්තෙහි නො ඉපදීම වෙයි; ඕදාරිකවූ කාමරාගප්‍රතිඝසංයොජනාවියාගේ සෙදගැම්මඟින් (මත්තෙහි නො ඉපදීම වෙයි;) අණුසහගතවූ (ඒ සංයොජනවයාගේ)අනගැම්මඟින් (මත්තෙහිනොඉපදීමවෙයි;) මානභවරාගඅවිද්‍යාසංයොජනත්‍රයාගේ රහත්මඟින් මත්තෙහි නො ඉපදීම වෙයි; **සොතඤ්ච පජානාති** සද්දෙ ච, යනාදියෙහි ද මෙම නයයි. තවද මෙහි ආයතනකථාතොමෝ විසතර වශයෙන් විභාවිතාගීයෙහි ආයතනනිද්දේශයෙහි කීතියෙන් ම දතයුත්තීය. **ඉති අජ්ඣත්තං වා=** මෙපරිද්දෙන් ආධ්‍යාත්මිකායතනපරිග්‍රහණයෙන් තමාගේ ආයතන ධර්මයන්හි හෝ බාහිරායතන පරිග්‍රහණයෙන් අනිකෙකුගේ ආයතනධර්මයන්හි හෝ කලෙක තමාගේ හෝ කලෙක මෙරමාගේ හෝ ආයතනධර්මයන්හි ධර්මානුදර්ශීව වාසය කෙරෙයි; මෙහි සමුදයව්‍යය දෙක වනාහි **අවිජ්ජාසමුදයා චක්ඛුසමුදයෝ**,යි රූපායතනයන්ගේ රූපසඤ්ඤයෙහි ද අරූපායතනයන් අතුරෙන් මනායතනයාගේ විඤ්ඤාණසඤ්ඤයෙහි ද ධර්මායතනයාගේ සෙසු සඤ්ඤයන්හි ද (සමුදයව්‍යය) කීනයින්දුක්ඛයත්තාහුය ලොකොත්තර ධර්මයෝ නො ගතයුත්තාහුය. මෙයින් මත්තෙහිකීනය මැයි. හුදෙක් මෙහි ආයතනයන් පිරිසිඳ දනගන්නීවූ සම්මුතිතොමෝ දුඃඛසත්‍යය, යි

මෙසේ යොජනා කොට ආයතනපරිග්‍රාහක භික්ෂුහුගේ නිවන් මගට පැමිණෙන චාරය දතයුතු. සෙස්ස එබඳුමැයි.

ආයතනපච්චය නිමි.

සම්මාසම්බොධ්‍යඞ්ගය. මෙසේ ෂඩ්විධ ආධ්‍යාත්මික බාහිරායතනයන්ගේ වශයෙන් ධම්මානුපස්සනාව විභාගකොට වදාරා දැන් බොධ්‍යඞ්ගයන්ගේ වශයෙන් විභාගකරනු පිණිස **පුන ච පරං** යනාදිය වදාළහ. **එහි බොජ්ඣඞ්ගෙසු**= සත්‍යාවබෝධය කරන සත්වයාගේ අඞ්ගවූ (ධම්මයන්හි); **සන්තං**= ප්‍රතිලාභවශයෙන් විද්‍යමානවූ; **සම්මාසම්බොජ්ඣඞ්ගං**=සම්මා සඞ්ඛ්‍යාතවූ සම්බොධ්‍යඞ්ගය; යම් හෙයකින් (මේ සම්බොජ්ඣඞ්ග යන) මෙහි ආරබ්ධ විදර්ශීකයා පටන් යොගාවචරතෙම මොනවට අවබෝධ කෙරේද එහෙයින් (ඒ යොගාවචර) "සම්බෝධි නම්වේ; නොහොත් ඒ යොගාවචර තෙම සම්මාසතිආදි කොට ඇති යම් සප්තධර්ම සාමග්‍රියක් හෙතුකොට ගෙන අවබෝධ කෙරේද කෙලෙසනිද්‍රාවෙන් නැගී සිටීද නොහොත් සත්‍යයන් ප්‍රතිවෙධ කෙරේද ඕ ධර්ම සාමග්‍රිතොමෝ "සම්බෝධි,, නම් වා; (යොගාවචර සඞ්ඛ්‍යාතවූ) ඒ සම්බෝධිහුගේ හෝ (ධර්මසාමග්‍රි සඞ්ඛ්‍යාතවූ) ඒ සම්බෝධියගේ අඞ්ග නුයි "සම්බොජ්ඣඞ්ග,, නම් වේ; එයින් කී- "සත්තිසඞ්ඛාතං සම්බොජ්ඣඞ්ගං,,යි සෙසු සම්බොධ්‍යඞ්ගයන්හිදු මේ ක්‍රම යෙන් ම වචනාර්ථය දතයුතු. **අසන්තං**= අප්‍රතිලාභ වශයෙන් අවිද්‍යමානවූ; **යථා ච අනුප්පන්නස්ස** යනාදියෙහි වනාහි පළමුකොට සත්ත සම්බෝධ්‍යඞ්ගයාගේ අප්‍රාප්තිකාලයෙහි **සතිසම්බොජ්ඣඞ්ගාදීනං ධම්මානඤ්ච යොනිසෝ මනසිකාර බහුලීකාරෝ අයමාහාරෝ අනුප්පන්නස්ස වා සතිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය උප්පන්නස්සවා සතිසම්බොජ්ඣඞ්ගස්ස භියෝභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තති යි** (=මහණෙනි! සම්මා සම්බෝධ්‍යඞ්ගයට කරුණුවූ ධර්මයෝ ඇති, ඒ ධර්මයන් කෙරෙහි යොනිසොමනස්කාරයාගේ යම් බහුල කිරීමක් වේද මේ ආහාරයතෙමේ නූපන් සම්මාසම්බෝධ්‍යඞ්ගයාගේ ඉපදීම පිණිස ද උපන් සම්මා සම්බෝධ්‍යඞ්ගයාගේ බහුලබව පිණිස විපුලබව පිණිස වැඩීමපිණිස සම්පූර්ණවීම පිණිස ද පවතී*A*) මෙපරිද්දෙන් ඉපදීම වෙයි. එහි සම්මතිය ම සතිසම්බොධ්‍යඞ්ගයට කරුණුවූ ධර්ම වෙති; යොනිසොමනස්කාරය කී ලක්ෂණ "ඇත්තේ මැය.- ඒ යොනිසෝ මනසිකාරය ඒ සම්මතියෙහි බහුලව පවත්නහුට සම්මාසම්බෝධ්‍යඞ්ගය උපදී. තවද ධර්මයෝ සතරදෙනෙක් සම්මති සම්බෝධ්‍යඞ්ගයාගේ ඉපදීම පිණිස පවතිත්. සම්මතිසම්ප්‍රජන්‍යය, මුළා සිහි ඇති පුද්ගලයන් දුරුකරන බවය, එලඹසිටි සිහි ඇති පුද්ගලයන් සෙවුනා බවය, ඒ එළඹ සිටි සිහිඇති පුද්ගලයන් කෙරෙහි නැමුනු

A මින්පෙහි දු මෙබඳු තැන්හි අපි මේ නයින් සැලකිය යුතු.

බවය යන මොහුයි. ඒ එසේමැය- "අභික්කන්තා,,දිවූ සත්තැන්හි සාථිකාදි සම්ප්‍රජන්‍යයන්ගේ වශයෙන් ද බත් සඟවාතැබූ කවුඩෙකු වැනි මූලාසිහිඇති පුද්ගලයන් දුරුකිරීමෙන්ද **තිස්සදත්ත** සථවිර **අභය** සථවිරාදීන් වැනිවූ එලඹසිටි සිහිඇති ,පුද්ගලයන් සෙවනය කිරීමෙන් ද හිඳීම් සිටීම් ආදියෙහි සිහි ඉපදවීම් පිණිස නැමුනු අවනතවූ අභිමුඛවූ සිත් ඇතිබැවින් ද සමෘතිසම්බොධ්‍යඞ්ගය උපදී; මෙසේ සතරකරුණින් උපන් සමෘතිසම්බොධ්‍යඞ්ගයාගේ වනාහි රඟත්මගින් වැඩීමෙන් සම්පුණීම වේය,යි දැනගනී.

ධම්මවිචය නැවත ධම්මවිචය සම්බොධ්‍යඞ්ගයාගේ **අත්ථි භික්ඛවෙ සම්බොධ්‍යඞ්ගය. කුසලාකුසල ධම්මා-පෙ- තණ්හාසුක්ඛ සප්පටිභාගා ධම්මා නත්ථි යොනිසොමනසිකාර බහුලීකාරෝ අය මාහාරෝ අනුපපන්නස්ස වා ධම්මවිචය සම්බොජ්ඣඞ්ගස්ස උපපාදාය උපපන්නස්ස වා ධම්මවිචය සම්බොජ්ඣඞ්ගස්ස භියෝ භාවාය වෙපුල්ලාය භවනාය පාරිපූරියා සංවත්තනති** යි මෙපරිද්දෙන් ඉපදීම වෙයි; තවද ධම්මෝ සත්දෙනෙක් ධම්මවිචය සම්බොධ්‍යඞ්ගයාගේ ඉපදීම පිණිස පවතින්, පරිපුච්ඡකතා (= හාත්පසින් බැස පිළිවිස්තා බවය) වත්‍ථුවිසදකිරියා (= වාහ්‍යාභ්‍යන්තර වසතුන්ගේ නිම්ලකරන බවය) ඉන්ද්‍රියසමත්තපටිපාදනා (= ඉඳුරන්ගේ සමබව පිළියෙළකිරීමය) දුෂ්ප්‍රාඥ පුද්ගලයන් දුරුකිරීමය, ප්‍රඥවත් පුද්ගලයන් සෙවුනාබවය, ගම්භීරඤ්ඤාණචරිය පච්චවෙක්ඛනා (= ගැඹුරු නුවණැත්තන් විසින් අවබෝධ කටයුතු සඤ්ඤාදීවූ හෝ ශූන්‍යතාප්‍රතිසංයුක්තවූ හෝ සූත්‍රාන්තයන් ප්‍රත්‍යවෙක්ෂාකරන බවය) තදධිමුත්තතා (=ප්‍රඥවෙහි නිම්නප්‍රවණභිමුඛවූ බවය) යන මොහුයි. ඒ සප්තබෝධ්‍යඞ්ගයන් අතුරෙහි **පරිපුච්ඡකතා** යනු සඤ්ඤාධාතු ආයතන ඉන්ද්‍රිය බලබොධ්‍යඞ්ග මාර්ගාඞ්ග ධ්‍යානාඞ්ග ශමථ විදර්ශනාවන්ගේ අර්ථනිශ්‍රිත පිළිවිසීම් බහුලකොට ඇති බවයි; **වත්‍ථුවිසදකිරියා** යනු ආධ්‍යාත්මික බාහ්‍යවස්තූන්ගේ නිම්ලබව කිරීමයි; යම් හෙයකින් යම් විටෙක ඔහුගේ කෙස් නිය ලොම් ඉතාදික් වෙත්ද, ශරීරය හෝ උත්සන්නවූ දෙඉඇත්තේත් ඛහමලවැකුනේත් වේද, එකල්හි අධ්‍යාත්මික වසතුව අවිශදවූයේ අපිරිසුදුවූයේ වේ. යම් විටෙක වනාහි සිවුරු දිරුයේ කිලිටුවූයේ දුගඳවූයේ වේද, සෙනස්න හෝ කසළවූයේ වේද එකල්හි බාහිරවසතුව අවිශදවූයේ අපිරිසුදුවූයේ වේද; එහෙයින් කෙශාදිය සිදීමෙන් ද උඳුඩ විරෙවන අඩොවිරෙවනාදියෙන් ශරීරයාගේ සැහැල්ලුබව කිරීමෙන් ද ඇඟ ඉලීමෙන් හා නෑමෙන් ද ආධ්‍යාත්මිකවසතුව නිම්ලකළයුතුයි. මැසිමසෙදීම් රැඳීම් පිරිඛඩකිරීම් ආදියෙන් බාහ්‍යවසතුව නිම්ලකළයුතුයි; ඒ එසේමැයි- මේ අවිශදවූ ආධ්‍යාත්මික බාහිරවසතුවෙහි චිත්තචෛතසිකයන් උපන් කල්හි ඥනයත් අපිරිසුදු වෙයි, අපිරිසුදුවූ පහන්වැටිතෙල් නිසා උපන්

වසතු විශදක්‍රියා.

පහන් සිලුවෙහි ආලෝකය මෙනි; නැවත විශදවූ ආධ්‍යාත්මික බාහිර වස්තුවෙහි චිත්තචෛතසිකයන් උපන්කල්හි ඥානයත් විශද වෙයි; පිරිසුදුවූ පහන්වැටි තෙල් නිසා උපන් පහන්සිලුවෙහි ආලෝකය මෙනි; එහෙයින් කියනලදී- "වස්තුවිශදක්‍රියාව ධර්මවිචය සම්බොධ්‍යඞ්ග යාගේ ඉපදීම පිණිස පවතීය,යි.

ඉන්ද්‍රිය සමත්ත පටිපාදනා නම් ශ්‍රද්ධාදිවූ ඉඳුරන්ගේ සම සමත්වය. බව කිරීමයි; ඒ මෙසේයි- මේ යොගාවචරහට යම් හෙයකින් ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත් වේද ඉතරෙන්ද්‍රියයෝ හීනවෙත්ද එහෙයින් වීර්‍යේන්ද්‍රියය ප්‍රග්‍රහකෘත්‍යය ද සමෘතීන්ද්‍රියය උපස්ථාන කෘත්‍යය ද සමාධීන්ද්‍රියය අවික්ෂේපකෘත්‍යය ද ප්‍රඥේන්ද්‍රියය දර්ශනකෘත්‍යය ද කරන්ට නො හැකි වෙයි; එහෙයින් ඒ ශ්‍රද්ධෙන්ද්‍රියය ධර්මසභාවය ප්‍රත්‍යවෙක්ෂා කිරීමෙන් හෝ යම් පරිද්දෙකින් මෙනෙහි කරන්නහුට බලවත්වූයේ නම් එපරිද්දෙන් නො මෙනෙහි කිරීමෙන් හෝ ගෙවා දැමියයුතුයි. මේ කරුණෙහිලා **වක්කලි** තෙරුන්ගේ වස්තුව ද නිදර්ශන වෙයි. නැවත යම්හෙයකින් වීර්‍යේන්ද්‍රියය බලවත් වීනම් එකල්හි ශ්‍රද්ධෙන්ද්‍රියය අධිමොක්ෂකෘත්‍යය කරන්ට නො ම් පොහොසත් වෙයි; ඉතරෙන්ද්‍රි යයෝ ඉතර කෘත්‍යභෙද ය කරන්ට නො පොහොසත් වෙති; එහෙ යින් ඒ වීර්‍යේන්ද්‍රියය ද ඔහුවසින් ශ්‍රද්ධාදිය වැඩීමෙන් ගෙවිය යුතුයි. එහි දු **සොණ** තෙරුන්ගේ වස්තුව දැක්විය යුතුයි. මෙපරිද්දෙන් සෙස්සෙහි දු එක් ඉන්ද්‍රියයක් හුගේ බලවත්බව ඇතිකල්හි සෙසු ඉන්ද්‍රි යයන්ගේ සවකීය කෘත්‍යයන්හි අසම්ථබව දතයුත්තීය. තවද විශෙෂ වශයෙන් මෙහි ශ්‍රද්ධාප්‍රඥවන්ගේ ද සමත්වය පසසින්; යම් කරුණකින් බලවත් ශ්‍රද්ධාඇති මඳ නුවණැත්තේ නො දැන පැහැදුනේ වේද, අවස්තුවෙහි පහදීද; බලවත් ප්‍රඥඇති මඳවූ ශ්‍රද්ධා ඇත්තේ කෙරා ටික පක්ෂය සෙවුනේ වේද බෙහෙදින් උපන් රොගයක් මෙන් පිළි ය්ම් නො කළහැක්කේ වෙයි; චිත්තෝත්පාද මාත්‍රයකින් ම කුසල් වේ ය,යි අතිධාවනය කොට දුනාදිකුසල් නො කරන්නේ නිරයෙහි උපදී; (ශ්‍රද්ධාප්‍රඥ යන) දෙදෙනාගේ සමත්වයෙන් වස්තුවෙහි ම පහදීද; නැවත බලවත් සමාධි ඇති මඳවූ වීර්‍යීය සමාධිය තමා කෞසීද්‍ය පක්ෂබැවින් කෞසීද්‍යය මැඩපවත්වා ද; බලවත් වීර්‍යීඇති මඳවූ සමාධිය වීර්‍යීය තමා ඖඩත්‍යපක්ෂ බැවින් ඖඩත්‍යය මැඩපවත්වාද; (එහෙයින් අර්ණා වට නො පැමිණෙයි යන අදහසයි.) එතකුදුවුවත් සමාධිය වීර්‍යීය සමග යොදනලද්දේ කුසීත බැවිනි වැටෙන්ට නො ලබයි; වීර්‍යීය සමාධිය සමග යොදනලද්දේ උඩතබැවිනි වැටෙන්ට නොලබයි; එහෙ යින් ඒ (ශ්‍රද්ධා-ප්‍රඥවය ද සමාධි- වීර්‍යීවය ද යන) දෙක සමානවූ කෘත්‍යය ඇතිකළයුතුයි; යම්හෙයකින් දෙදෙනාගේ සමබැවින් අර්ණාව වේද එහෙයිනි. තවද ශමථකර්මස්ථානිකයාහට බලවත්වූ ද ශ්‍රද්ධාව

වටී; මෙසේ (=ශ්‍රද්ධාව මදක් බලවත්ව ඇතිකල්හි) (සම්‍යක්සම්බුද්ධයන් වදාළවිධි සමාධවේය,යි) අදහන්නේ ඇතුලත්ව අදහන්නේ අජිණාවට පැමිණෙන්නේය; සමාධි-ප්‍රඥදෙක අතුරෙන් වනාහි ශමථකර්මසථානිකයාහට එකාග්‍රතාතොමෝ බලවත්වූවා වටී; යම් හෙයකින් මෙසේ ඇතිකල්හි හෙතෙම අජිණාවට පැමිණේද එහෙයිනි; විදර්ශනාකර්මසථානිකයාහට ප්‍රඥතොමෝ බලවත්වූවා වටී; යම් හෙයකින් මෙසේ ඇතිකල්හි හෙතෙම ලක්ෂණ ප්‍රතිවෙධයට පැමිණේද එහෙයිනි; අනිකෙක් ඇති-සමාධිප්‍රඥ දෙදෙනාගේ සමබැවින් ද අජිණාතොමෝ වන්නීමැ යි; එතකුදුවුවත් සියලු තැන්හි සමෘතිය බලවත්වූවා වටී; සමෘතිතොමෝ සිත ඖඛත්‍යපක්ෂයෙහිවූ ශ්‍රද්ධාවීර්‍ය ප්‍රඥවන්ගේ වශයෙන් ඖඛත්‍යයෙහි හිමෙන්ද කෞසිද්‍යපක්ෂයෙහිවූ සමාධිය හැකොටගෙන කෞසිද්‍යයෙහි හිමෙන් ද යම් හෙයකින් රකීද; එහෙයින් ඕ සමෘතිතොමෝ සියලු ව්‍යඤ්ජනයන්හි ලුණු හා තෙල් සෙයින් ද සියලු රාජකෘත්‍යයන්හි සාමීක්‍යාමාත්‍ය අමාත්‍යයා සෙයින් ද හැමතැන්හි කැමතිවිය යුත්තීය; එයින් කිහ- (අටුවාහි) "සමෘතිතොමෝ වනාහි භාග්‍යවතුන් විසින් හැමතැන ම කැමතිවිය යුත්තීය,යි වදාරනලදු, කරුණු කිම යත්? යම් හෙයකින් සිත සිහිය පිළිසරණ කොට ඇත්තේ ද සිහිතොමෝ ආරක්ෂාව වැටහීම්කොට ම ඇත්තීද, සිහියෙන් වෙන්ව චිත්තයාගේ ප්‍රග්‍රහ නිග්‍රහ දෙක නො වේද එහෙයිනැයි. "දුෂ්ප්‍රාඥ පුදුගල පරිවර්ජනය,, නම් සකක්‍රාදි ධර්මභෙදයෙහි නො බැසගත් නුවණ ඇති දුර්මේධ පුදුගලයන් දුරින් දුරුකිරීමයි; "ප්‍රඥවත් පුදුගල සෙවනය,, නම් සම්පනස්ලක්ෂණයකින් පිරිසිදිනලද උදයව්‍යය ප්‍රඥවෙන් සමන්විත පුදුගලයන් සෙවනය කිරීමයි. ගම්භීරඤාණචරියපච්චවෙක්ඛණතා නම් ගම්භීරවූ සකක්‍රාදි ධර්මයන්හි ප්‍රවෘත්තවූ ගම්භීරප්‍රඥාවගේ ප්‍රභේදයන් ප්‍රත්‍යවෙක්ෂා කිරීමයි. නානාධිමුත්තතා නම් භිදීම් සිටීම්ආදියෙහි ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය ඉපදවීම පිණිස නැමුනු අවනතවූ නැඹුරුවූ සිත් ඇතිබවයි; මෙසේ උපන්නාවූ ධර්මවිචය සම්බොධ්‍යඞ්ගයාගේ වනාහි රහත්මගින් වැඩීමෙන් සම්පූර්ණවීම මේය,යි දැනගනී.

විරියං වීර්‍යසම්බොධ්‍යඞ්ගයාගේ අභිගීතකම්මවෙ! **ආරම්භධාතු සම්බොධ්‍යඞ්ගං. නික්කමධාතු පරක්කමධාතු තථාගතයොනිසොමනසිකාරබහුලීකාරෝ අයමාහාරෝ අනුප්පන්නස්ස වා විරියසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය උප්පන්නස්ස වා විරියසම්බොජ්ඣඞ්ගස්ස භීයෝභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තති** යි. මෙසේ ඉපදීම වෙයි; තවද එකොළොස්ධර්මකෙනෙක් වීර්‍යසම්බොධ්‍යඞ්ගයාගේ ඉපදීම පිණිස පවතින්- අපායභයප්‍රත්‍යවෙක්ෂා කරණබවය, අනුසස් දක්නාසුලුබවය, ගමනමාර්ගය ප්‍රත්‍යවෙක්ෂාකරනබවය, පිණ්ඩපාතයට ප්‍රතිපූජාකරනබවය, දායාදමහත්බය ප්‍රත්‍යවෙක්ෂාකරනබවය, ශාස්තෘහුගේ මහත්බය ප්‍රත්‍යවෙක්ෂාකරනබවය, ජාතිමහත්බය

ප්‍රත්‍යවෙක්ෂාකරනබවය, සබ්‍රහ්මචාරීන්ගේ මහත්බය ප්‍රත්‍යවෙක්ෂාකරන බවය, කුසීතපුද්ගලයන් දුරුකරනබවය, ආරබ්ධවීර්‍යඇති පුද්ගලයන් සේවනයකරනබවය, තදධිමුක්තබවය, යන මොහුයි. ඒ එකොළොස් ධර්මයන් අතුරෙහි පඤ්චවිනිබන්ධනකම්කටුලු පවන් නිරයෙහි මහදුක් විඳිනකාලයෙහි ද තිරිසන්යොනියෙහි දුල්කුරක්කෙමින්ආදියෙන් නහා ගත්කාලයෙහි ද නැවත කෙවිටිකටුආදිපහරින් පෙළනලද්දහුගේ ගැල් ඉසිලීම්ආදිකාලයෙහිද ප්‍රෙතවිෂයෙහි නොයෙක් හවුරුදුදහස්ගණන් ද එක් බුඩානතරයක් ද ක්ෂාපිපාසායෙන් පීඩිතවූ කාලයෙහි ද කාල කඤ්ඤිකඅසුරයොනියෙහි සැටරියන්අසූරියන්පමණවූ ඇටසම්පමණක් ම ඇති අත්බැවින් අව්සුළංආදියෙන් දුක්අනුභවකරනකල්හි දු වීර්‍ය සම්බොධ්‍යඞ්ගය උපදවන්ට නො හැක, මහණ තට මෙය ම (ඊට) කල් වේය,යි මෙසේ අපායභය ප්‍රත්‍යවෙක්ෂාකරන්නහුට ද වීර්‍ය සම්බොධ්‍යඞ්ගය උපදී. කුසීතයක්හුවිසින් නවලොවුතුරුදහම් ලබන්ට නොහැක්කානුය. ආරබ්ධවීර්‍යක්හුවිසින් ම (ලබන්ට) හැක්කානුය. මේතෙම වීර්‍යයාගේ අනුසස්ය,යි මෙසේ අනුසස්දක්නාසුල්ලහුට ද උපදී. තාවිසින් සියලු බුදුපසේබුදුමහසව්වන්විසින් ගියමඟ යායුතුය, හෙ ද කුසීතවූවහුවිසින් යන්නට නො හැක්කැ,යි මෙසේ යායුතුමඟ ප්‍රත්‍යවෙක්ෂාකරන්නහුට ද උපදී. යමෙක්තුමූ තා පිණ්ඩපාතාදියෙන් උවටන්කෙරෙත්ද, මේ මනුෂ්‍යශෝ තාගේ නො ම නැයෝ වෙති; දස්කම්කරුවෝ නො වෙති; තා නිසා ජීවත්වන්නම්හ,යි තට ප්‍රණීතවූ පිණ්ඩපාතාදිය නො ද දෙති; වැලි(කුමක්හෙයින් දෙත්දයත්?)තමන්ගේ සත්කාරයන්ගේ මහත්ඵලබව ප්‍රාප්තිනාකරම්න් දෙති; ශාතෘන්වහන්සේවිසිනුදු මේතෙම මේ ප්‍රත්‍යයන් වලඳ ශරීරය දැඩිකිරීමෙහි යෙදුනේ සුවසේ වාසයකරන්නේය,යි මෙසේ දක්නහුවිසින් තට ප්‍රත්‍යය නො අනුදන්නාලද්දහුය; වැලි කුමක්පිණිසද යත්? මේතෙම මේ ප්‍රත්‍යය වලඳමින් මහණදම් කොට සසරදුකින් මිදෙන්නේය,යි කව ප්‍රත්‍යය අනුදන්නාලද්දහුය. දැන් ඒ තෙපි කුසීතව වාසයකරම්න් ඒ පිණ්ඩපාතයට අපවායනය නො කරන්නෙහිය; පවන්ගත් වීර්‍යඇත්තහුගේ ම පිණ්ඩපාතයට අපවායන්ය (=පිදීම) නම් වේය,යි මෙසේ පිණ්ඩපාතාපවායනය ප්‍රත්‍යවෙක්ෂාකරන්නහුට ද (වීර්‍යසම්බොධ්‍යඞ්ගය) උපදී. "මහාමිත්‍ර,,තෙරුන්ට මෙනි-

මහා මිත්‍ර තෙරුන්. මහාමිත්‍ර තෙරුන්වහන්සේ වනාහි "කස්සක,, නම් ලෙනෙහි වාසයකෙරෙති; උන්වහන්සේගේ ගොදුරුගමහි ද එක් මහාඋපාසිකාවක් තෙරුන් පුතෙකු මෙන් කොට පොෂණයකරයි; ඔතොමෝ එක්දිනක් වලව යන්නී දුවණියට මෙසේ කිව- "දරුව! අසවල් නම් තැන පරණඝල්යැ අසවල්තැන කිරියැ අසවල් තැන ගිතෙල්යැ අසවල්තැන පැණියැ තොපගේ සොහොයුරුවූ ආර්‍ය මිත්‍රතෙරුන්වහන්සේ (ගෙට) වැඩකල්හි බත් පිස කිරිගිතෙල්මිසකුරු

සමඟ දෙව; නුඹත් අනුභවකරන්නෙහි; මම ඊයේ පැසූ සිහිල්බත් කැඳ සමඟ වැලඳීම්,සි. මැණියනි! දවල් කුමක් වලඳන්නෙහිදැ?සි; දරුව! පලාකොළ බහා සුන්සහලින් ඇඹුල්කැඳක් පිස තබව,සි තෙරුන්වහන්සේ සිවුරු පොරවා පාත්‍රය (ථවිකාවෙන්) බැහැරකරන්නාහු ම ඒ ශබ්දය (දිවකනින්) අසා තමන්වහන්සේට අවවාදකළහ- "මහාඋපාසිකාතොමෝ කැඳ සමඟ සිහිල්බත් වැලඳූ ලැ; දවල් ද සුන් සහලින් පැසූ කොළඇඹුල්කැඳ වළඳන්නීය; එතකුදුවුවත් තා පිණිස පරණසහල්ආදිය කියන්නීය; එහෙත් තා නිසා ඕතොමෝ කෙතක් හෝ වත්තක් හෝ බතක් හෝ වතක් හෝ නො ම කැමතිවන්නීය; වැලි ත්‍රිවිධසම්පත් ප්‍රාප්තිනාකරමින් දෙන්නීය; තෙපි තෙලඋපාසිකාවට ඒ සම්පත් දෙන්ට හැකිවන්නෙහි? නො හැකිවන්නෙහිදැ?,සි. එකෙක් ඇති- මේ පිණ්ඩපාතය රාගසහිතවූ වෙෂසහිතවූ මොහ සහිතවූ තාවිසින් ගන්නට නො පිළිවනැ,සි පාත්‍රය ථවිකාවෙහි ලා (සිවුරෙහි) ගණ්ඨිය මුදා නැවතී "කස්සක,, නම් ලෙනට ම ගොස් පාත්‍රය ඇඳයට ද චීවරය චීවරවංශයෙහි ද තබා රහත්ඵලයට නො පැමිණ නො නික්මෙන්නෙමි,සි වීර්‍යය අධිෂ්ඨානකොට හුන්හ; දික් කලක් නො. පමාවැ වාසයකළ මහණ විදසුන් වඩා පෙරබත්හි මැ රහත්ඵලයට පැමිණ පිපෙන පියුමක් මෙන් මහාක්ෂීණාශ්‍රවවූයේ (නිදුකින් ම මාවිසින් වෘත්තදුඃඛය ඉක්මවනලදැ,සි ප්‍රත්‍යවෙක්ෂාවෂයෙන් උපන් ප්‍රමොදයෙන්) සිනා පහළකරමින් මැ නික්මුනහ. ලෙන් දෙර රැකෙහි අධිපතිවැ වෙසෙන දෙවතාතොමෝ-

108 **නමෝ තෙ පුරිසාජඤ්ඤ! නමෝ තෙ පුරිසුත්තම!**
යස්ස තෙ ආසවා ඛීණා දක්ඛිණෙය්‍යොසි මාදිස! සි.

(=නිදුකාණෙනි! යම්බදුවූ නුඹවහන්සේගේ ආශ්‍රවයෝ ක්ෂයවූවාහුද එහෙයින් නුඹවහන්සේ දක්ෂිණාවට සුදුස්සහුය, පුරුෂ ශ්‍රෙෂ්ඨය ඔබට නමස්කාර වේවා, පුරුෂොත්තමය! ඔබට නමස්කාර වේවා.)

ප්‍රිතිවාක්‍යය පහළකොට සවාමිනි! පිඬුපිණිස පිවිසියාවූ නුඹවහන්සේ වැනිවූ රහතුන්ට භික්ෂාවදී මැහැලිසත්හු දුකින් මිදෙන්නාහුය,සි කිව. තෙරුන්වහන්සේ නැගිසිට දෙර හැර කාලය බලන්නාහු උදැසන ම යයි දැන පාසිවුරුගෙන ගමට පිවිසියහ; ඒ දැරිතොමෝ ද

---

108. **මාදිස**= නිදුකාණෙනි!; **යස්ස තෙ**= යම්බදුවූ නුඹවහන්සේගේ; **ආසවා**= (කාමාදි සියලු) ආශ්‍රවයෝ; **ඛීණා**= (යම්හෙයකින්) ක්ෂයවූවාහුද; (එහෙයින්) **දක්ඛිණෙය්‍යො + අසි**= දක්ෂිණාවට සුදුසුවූ වහු; **පුරිසාජඤ්ඤ**= පුරුෂශ්‍රේෂ්ඨය; **තෙ**= නුඹවහන්සේට; **නමෝ**= (මාගේ) නමස්කාරය වේවා; **පුරිසුත්තම**= පුරුෂොත්තමය!; **තෙ**= නුඹවහන්සේට; **නමෝ**= (මාගේ) නමස්කාරය වේවා.

බත් සපයා දුන් මාගේබැයාණෝ එන්නාහුය; දුන් මාගේ බැයාණෝ එන්නාහුය, යි දෙර බලමින් හුන්නා; ඕතොමෝ තෙරුන් ගෙදෙරට පැමිණිකල්හි පාත්‍රය ගෙන ගිතෙල් සකුරු යෙදූ ක්ෂීරපිණ්ඩපාතය පුරවා අත තැබුවා; තෙරුන් වහන්සේ "සුව වේවා„ යි අනුමෙවෙනි කොට නික්මගියහ. ඕතොමෝත් උන්වහන්සේ බලමින් සිටියා; එකල් හි තෙරුන්වහන්සේගේ අතිශයින් පිරිසුදුවූ ජවිවණීය විය; ඉදුරෝ වෙසෙසින් පහදුහ, මුඛය බබ්බනයෙන් මිදුනු පැසුනු තල්ගෙඩියක් සෙයින් අතිශයින් බැබලිණි; මහා උපාසිකාතොමෝ වලින් අවුත් "කිම දරුව! තොප බැයාණෝ ආවාහුදැ?„යි විවාළාය; ඕතොමෝ ඒ සියලු පුවත් දන්වී; උපාසිකාතොමෝ අද මාගේ පුත්‍රයාගේ පැවිදිකිස මුදුන් පැමිණියේ වනැ,යි දැන දරුව! තී බැයාණෝ බුදුසසුන්හි සිත්අලවා වෙසෙති උකටලී නො වෙති,යි කිව.

යම් මේ සප්පායධ්‍යනයෝ නම් වෙත්ද මේ ශාස්තෘන් වහන්සේගේ දායාද බව මහත්වේමැයි; එය කුසීතවූවහුවිසින් ගන්නට නො පිළිවන; ඒ එසේමැයි- විප්‍රතිපන්නවූ පුත්‍රයෙකු මවුපියදෙදෙන "මේතෙම අපගේ අපුත්‍රයෙකැ,,යි යම්සේ පරිබාහිර කෙරෙත්ද; හෙතෙම ඔවුන්ගේ ඇවැමෙන් දායාදබව නො ලබාද; එපරිද්දෙන් කුසීත තෙමේ ද මේ ආර්‍යධනදායාදය නො ලබයි; පටන්ගත්වීර්‍යඇත්තේම ලබාය,යි; මෙසේ දායාදභාවයාගේ මහඵල ප්‍රත්‍යවෙක්ෂාකරන්නහුට ද වීර්‍යසම්බොධ්‍යඞ්ගය උපදී. තාගේ ශාස්තෘන්වහන්සේ (ශීලාදිගුණයෙන්) මහත්වූවාහු මැයි; යම්හෙයකින් තොප ශාස්තෘන්වහන්සේගේ මව්කුස පිළිසිඳගන්නාකාලයෙහි ද අභිනිෂ්ක්‍රමණයෙහි ද සම්‍යක්සම්බොධියෙහි ද ධර්මචක්‍රප්‍රවර්තනය යමකප්‍රාතිහාර්‍යය දෙවොරොහණය ආයුසංඝකාරවොස්සජ්ජනය යන කාලයන්හි ද පරිනිර්වාණකාලයෙහි දී දසසහස්‍රලොකධාතුව කම්පාවිය; මෙබදුවූ ශාස්තෘහුගේ ශාසනයෙහි පැවිද්ද කාවිසින් කුසීතයක්හු වන්නට සුදුසු දැ?යි මෙසේ ශාස්තෘන් වහන්සේගේ මහඵල ප්‍රත්‍යවෙක්ෂාකරන්නහුට ද උපදී. ජාතියෙන්ද තෙපි දුන් ලාමකජාතිඇත්තේ නො වෙති, අසමධාන්‍යවූ මහාසම්මත ප්‍රවේණියෙන් පැමිණි ඉක්ෂ්වාකරාජවංශයෙහි උපන්නේ වෙහි; ශුද්ධොදනමහරජුට ද මහාමායාදෙවියට ද නප්තෘයෙහි; රාහුල භද්‍රයන්ගේ කණිටුවූ යෙහි; තාවිසින් නම් මෙබදුවූ ජිනපුත්‍රයෙක්වැ සිට කුසීතයක්වැ වාසයකරන්නට නො සුදුසුය,යි මෙපරිද්දෙන් ජාතිමහත්ත්වය ප්‍රත්‍යවෙක්ෂාකරන්නහුට ද උපදී. සැරියුත් මුගලන් දෙදෙනාවහන්සේ හා අසූමහාශ්‍රාවකයෝ ද වීර්‍යය හෙතුකොටගෙන ම ලොකොත්තර ධර්මය ප්‍රතිවෙධකළාහුය, තෙපි තෙල සබ්‍රහ්මචාරීන්ගේ මහ පිළිපද නෙහි? නො පිළිපදනෙහි දැ?යි මෙසේ සබ්‍රහ්මචාරීමහත්ත්වය ප්‍රත්‍යවෙක්ෂාකරන්නහුට ද උපදී. කුස පුරවා සිටිපිඹුරෙකු වැනිවූ දුරුකළ කායික චෙතසිකවීර්‍යඇති කුසීතපුද්ගලයන් දුරුකරන්නහුට ද පටන්

ගන්නාලදව්යීඇති නිවනට මෙහෙයූසිත්ඇති පුද්ගලයන් සෙවූනා හට ද; භිදිම්සිවිම්ආදියෙහි වීයීය ඉපදවීමපිණිස නිමිත්තප්‍රවණාභි මුඛකළසිත්ඇත්තහුට ද (වියීසම්බොධ්‍යඞ්ගය) උපදී. මෙසේ උපන්නාවූ ඒ වීයීසම්බොධ්‍යඞ්ගයාගේ වනාහි අර්හත්මාගීයෙන් වැඩීමෙන් සම්පූණීවීම වේය,යි දැනගනී.

ප්‍රීති සම්බොධ්‍යඞ්ගය. ප්‍රීතිසම්බොධ්‍යඞ්ගයාගේ- **අපජී හිකඛවෙ! පිති සම්බොධ්‍යඞ්ගය. සම්බොජ්ඣඞ්ගඨානියා ධම්මා තපථ යොනිසෝ මනසිකාරබහුලීකාරෝ අයමාහාරෝ අනුපපඤවා පිතිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය උපපන්නඤවා පිතිසම්බොජ්ඣඞ්ගස්ස භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තන්ති** යි මෙසේ ඉපදීම වෙයි; එහි ප්‍රීතිය ම ප්‍රීතිසම්බොධ්‍යඞ්ගස්ථානීයධම් නම්; ඒ ප්‍රීතිය උපදවන්නාවූ මනසකාරයතෙම යොනිසොමනසකාර නම්; වැලිදු එකොළොස්ධම්කෙනෙක් ප්‍රීතිසම්බොධ්‍යඞ්ගයාගේ ඉපදීමපිණිස පවත්නාහුය, බුඛානුස්මෘතිය; ධම්-සඞ්ඝ-ශීල-ත්‍යාග- දෙවතානුස්මෘතිය රූඤපුදගලයන් දුරුකරනබවය, ඤීඝපුදගලයන් සෙවනයකරන බවය, ප්‍රසාදනීයසූත්‍රාන්තයන් ප්‍රත්‍යවෙක්ෂාකරනබවය, තදධිමුක්තබවය ඤන මොහුයි; ඒ එසේමැයි- බුඛගුණයන් මෙනෙහි කරන්නහුට ද උපචාරසමාධිය තෙක් (ප්‍රීතිසමුත්ථානරූපයන්විසින්) සියලු ශරීරය පැතිරෙමින් ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය උපදී. ධම්සඞ්ඝගුණයන් සිහිකරන්නහුට ද- දීඝීකාලයක් නො කඩ කොට රක්නාලදවතුඃපාරිශුඞ්ශීලය ප්‍රත්‍යවෙක්ෂාකරන්නහුට ද- දඟශීලය පඤචශීලය ප්‍රත්‍යවෙක්ෂාකරන්නාවූ ගෘහසථයාට ද- දුර්භික්ෂභයාදියෙහි සඞ්ඝභෝජනාරීන්ට ප්‍රණීත භොජනය දී මෙබඳුවූ දැනයක් නම් දුනිම්ඟ,යි ත්‍යාගය ප්‍රත්‍යවෙක්ෂා කරන්නහුට ද- එබඳුවූ දුර්භික්ෂාදි කාලයෙහි සිල්වත්තට දුන් දැනය ප්‍රත්‍යවෙක්ෂාකරන්නාවූ ගෘහසථයාහට ද- යම්බඳුවූ (ශ්‍රඞ්ධාදි) ගුණයන්ගෙන් යුක්තවූවාහු දිව්‍යභාවයට ගියාහුද එබඳුවූ ගුණයන් තමාකෙරෙහි ඇතිබව ප්‍රත්‍යවෙක්ෂාකරන්නහුට ද- සම්වතින් යටපත් කළ කෙලෙසුන් සැට වසකුදු සැත්තැවසකුදු සමුදාචාරයට නො පැමිණෙත්ය,යි ප්‍රත්‍යවෙක්ෂාකරන්නහුට ද- වෛත්‍යදර්ශීනබොධිදර්ශීන සථවිරදර්ශීනයෙහි නො සකස්ක්‍රියාවෙන් හැඟවූ රළුබැව් ඇති බුඛාදි වසතුත්‍රයෙහි ප්‍රසාදනමැතිසෙනහයෙන් නැතිබැවින් කොටලූවාගේ පිටෙහි රජස් වැනිවූ රළුපුද්ගලයන් දුරුකරන්නහුට ද- බුඛාදීන්කෙරෙහි පැහැදීම්බහුලකොටඇති මොලොක්සිත්ඇති සිනිදුපුද්ගලයන් සෙවනය කරන්නහුට ද- රතනත්‍රයගුණ්‍ඤකාශකවූ ප්‍රසාදඵලවන සූත්‍රාන්තයන් ප්‍රත්‍යවෙක්ෂාකරන්නහුට ද- භිදිම්සිවිම්ආදියෙහි ප්‍රීතිඋපදවනපිණිස නිමිතප්‍රවණාභිමුඛවූ සිත්ඇත්තහුට ද උපදී. මෙසේ උපන්නාවූ ද ඒ ප්‍රීතිසම්බොධ්‍යඞ්ගයාගේ රහත්මගින් වැඩීමෙන් පිරීම් වේය,යි දැනගනී.

ප්‍රශ්‍රබ්ධි සම්බොධ්‍යඞ්ගයා. ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගයාගේ අපි හිකඛවෙ! කාය පස්සද්ධි චිත්තපස්සද්ධි නපථ යොනිසොමනසිකාර බහුලීකාරෝ අයමාහාරෝ අනුප්පන්නස්ස වා පස්සද්ධිසම්බොජ්ඣඞ්ගස්ස උපපාදාය උප්පන්නස්ස වා පස්සද්ධි සම්බොජ්ඣඞ්ගස්ස භියෝභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තති යි මෙසේ ඉපදීම වෙයි. තවද ධර්මයෝ සත්දෙනෙක් ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගයාගේ ඉපදීමපිණිස පවත්නාහුය; ප්‍රණීතභොජන සෙවනයකරනබවය, ඍතුසුඛසෙවනයකරනබවය, ඊර්ය්‍යාපථසුඛය සෙවනයකරනබවය, මධ්‍යස්ථවූප්‍රයොගඇතිබවය, (ප්‍රයොගසම්භාදිය නැතිබැවින්) දරථසහිත ශරීරයඇතිපුද්ගලයන් දුරුකරනබවය, සන් සිදුනුකයඇති පුද්ගලයන් සෙවනයකරනබවය, ඒ ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍ය ඞ්ගයෙහි නිමිත්තප්‍රවණබවය යන මොහුයි. ඒ එසේමැයි- පිණ්ඩිසිනිදුසැප බොජුන් බුදින්නහුට ද ශීතොෂ්ණඍතූන්හි ද සිරිම්ආදීවූ ඉරියව්වල ද සැපවූඍතුවත් ඉරියව්වත් සෙවූනාහට ද ප්‍රශ්‍රබ්ධිය උපදී. යමෙක් වනාහි මහාපුරුෂසභාවඇත්තේ සියලු ඍතුර්ය්‍යාපථයන් ඉවසන් නේ ම වේද ඔහු සඳහා මෙය නොකියනලදී; යමෙකුට සභාගවිෂ භාගබව ඇත්තේද විෂභාගඍතුර්ය්‍යාපථයන් දුරුකොට සභාගඍතු ර්ය්‍යාපථයන් සෙවූනාවූ ඕහට ම උපදී. තමාගේ ද කර්මය සවකිය කොටඇතිබව මෙනෙහි කිරීම මධ්‍යස්ථප්‍රයොගය,යි කියනුලැබේ; මේ මධ්‍යස්ථප්‍රයොගයෙන් (ප්‍රශ්‍රබ්ධිය) උපදී. යමෙක් ගල්දඹුආදියෙන් මෙරමා වෙහෙසමින්ම හැසිරේද මෙබඳුවූ දරථසහිතවූ කයඇති පුද්ගලයා දුරුකරන්නහුට ද; සංඝතවූ අත්පාඇති (එහෙයින්ම) සන්සිදුනු කය ඇතිපුද්ගලයා සෙවූනාහට ද; හිදීම්සිරීම්ආදියෙහි ප්‍රශ්‍රබ්ධිය ඉපදවීම පිණිස නැමූනාවූ අවනතවූ අභිමුඛවූ සිත්ඇත්තහුට ද උපදී. මෙප රිද්දෙන් උපන්නාවූ ද ඒ ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගයාගේ අභීනමාණීයෙන් වැඩීමෙන් සම්පූර්ණවීම වේය,යි දැනගනී.

සමාධි සම්බොධ්‍යඞ්ගය. සමාධිසම්බොධ්‍යඞ්ගයාගේ- අපි හිකඛවෙ! සමථ නිමිත්තං අබ්‍යග්ගනිමිත්තං නපථ යොනිසොමනසිකාරබහුලීකාරෝ අයමාහාරෝ අනුප්පන්නස්ස වා සමාධිසම්බොජ්ඣඞ්ගස්ස උපපාදාය උප්පන්නස්ස වා සමාධිසම්බොජ්ඣඞ්ගස්ස භියෝභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තති යි මෙසේ ඉපදීම වෙයි. එහි සමථය ම "සමථනිමිත්ත,, නම; නැවත අවික්ඛේපාර්ථයෙන් "අබ්‍යග්ගනිමිත්ත,, නමැ,යි. වැලිදු එකොළොස්ධර්ම කෙනෙක් සමාධිසම්බොධ්‍යඞ්ගයාගේ ඉපදීම පිණිස පවත්නාහුය- වස්තු විශදක්‍රියාව ඇතිබවය, ඉන්ද්‍රියයන්ගේ සමත්වය ප්‍රතිපාදනය කරනබවය ධ්‍යානොතපත්තිනිමිත්ත ඉගෙනීමෙහි දක්ෂබවය, සුදුසුකාලයෙහි සිත දැඩිකොට ගන්නාබවය, සුදුසුකාලයෙහී සිත නිගන්නාබවය, සුදුසුකාල යෙහි සතුටුකරනබවය, සුදුසුකාලයෙහි මධ්‍යස්ථවනබවය, සමාධිරහි

තවූ පුද්ගලයන් දුරුකරනබවය, සමාධිගතසිත්ඇතිපුද්ගලයන් සෙවනයකරනබවය, ධ්‍යානවිමොක්ෂයන්ප්‍රත්‍යවෙක්ෂාකරනබවය, තදධිමුක්ත බවය යන මොහු වෙති. ඒ එකාදශධර්මයන් අතුරෙහි වසතුවිශදක්‍රියාභාවය ද ඉන්ද්‍රියසම්භාවප්‍රතිපාදනභාවය ද කිනියෙන් ම දතයුතු. නිමිත්ත කුශලභාවය නම්? කෘත්ස්නනිමිත්ත ඉගෙනීමෙහි දක්ෂබවයි; සුදුසුකාල යෙහි සිතදැඩිකොට ගන්නාබව නම්? යම් කලෙක ඉතාලිහිල්වූ වීර්‍ය්‍ය ඇතිබැව් ආදියෙන් හැකුලුනාවූ සිත වේද එසමයෙහි ධර්මවිචයවීර්‍ය්‍යප්‍රීති සම්බොධ්‍යඞ්ගයන්ගේ ඉපදවීමෙන් ඒ සිත දැඩිකොට ගැනීමයි; සුදුසු කාලයෙහි සිත නිගන්නාබව නම්? යම් කලෙක අතිශයින් ආරබ්ධවීර්‍ය්‍ය ඇතිබැව්ආදියෙන් විසුරුනාවූ සිත වේද එසමයෙහි ප්‍රශ්‍රබ්ධිසමාධි උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගයන්ගේ ඉපදවීමෙන් ඒ සිත නිග්‍රහකිරීමයි; සුදුසු කාලයෙහි සතුටුකරනබව නම්? යම් කලෙක සිත ප්‍රඥප්‍රයෝගය මද බැවින් හෝ උපසමසුඛය අධිගමය නො කිරීමෙන් හෝ ආසවාදරහිත වේද එසමයෙහි අෂ්ටවිධවූ සංවෙගවස්තුප්‍රත්‍යවෙක්ෂාකිරීමෙන් සංවෙගයට පමුණුවයි; අෂ්ටසංවෙගවස්තු නම්? ජාතිජරා

සංවෙගවස්තු. ව්‍යාධිමරණ යන සතරය, පස්වැනිවූ අපායදුකය, අතීතයෙහි වෘත්තමූලකවූදුකය, අනාගතයෙහි වෘත්තමූලකවූ දුකය, වර්තමානයෙහි ආහාරසෙවීම මුල්කොට ඇති දුකය, යන මොහු වෙති; රත්නත්‍රයගුණ මෙනෙහි කිරීමෙන්ද ප්‍රසාදය උපදවයි; මෝතොමෝ සුදුසුකාලයෙහි පහදවන බවය,යි කියනුලැබේ. සුදුසුකාල යෙහි මධ්‍යස්ථවනබව නම්? යම් කලෙක මනාපිළිවෙතට පැමිණ නො හැකුලුනු නො විසුරුනු නිරාසාද නොවූ අරමුණෙහි සමව පැවති සමථවීථියට පිළිපන් සිත වේද, එකල්හි ඔහුට ප්‍රග්‍රහනිග්‍රහසමප්‍රහර්ෂණ යන්හි උත්සාහයකට නො පැමිණෙයි, අසුන් සමව පැවතිකල්හි රියැදුරා මෙනි; මෝතොමෝ සුදුසුකාලයෙහි මධ්‍යස්ථවනබවයයි කියනුලැබේ. සමාධිරහිතපුද්ගලයන් දුරුකරනබවනම්? උපචාරසමාධියට හෝ අර්පණ සමාධියට හෝ නොපැමිණි විසුරුනුසිත්ඇති පුද්ගලයන් දුරින් දුරුකිරීමයි; සමාහිතපුද්ගලයන් සෙවනයකරනබව නම්? උපචාරසමාධියෙන් හෝ අර්පණ සමාධියෙන් හෝ එකඟවූ සිත්ඇති පුද්ගලයන්ගේ සෙවනය භජනය පර්‍යුපාසනයයි. තදධිමුක්තතා නම්? හිඳීම් සිටීම්ආදියෙහි සමාධිය ඉපදවීමපිණිස ම නිමිත්තප්‍රවණභාවූවූ සිත්ඇතිබවයි. මෙසේ පිළිපදනහුට වනාහි මේ ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගය උපදී. මෙපරිද්දෙන් උපන් මේ සම්බොධ්‍යඞ්ගයාගේ රහත්මගින් වැඩීමෙන් පිරීම වේය යි දතයුතුයි.

උපෙක්ඛා සම්බොධ්‍යඞ්ගය. උපෙක්ඛාසම්බොධ්‍යඞ්ගයාගේ- අත්ථි භික්ඛවෙ! උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගනිස්සිතා ධම්මා තත්‍රයොනිසෝ මනසිකාරබහුලීකාරෙ අයමාහාරෙ අනුප්පන්නා සෙවා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය උප්පන්නාසෙවා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්සඉඤ්ජනාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා

සංවත්තති යි මෙසේ ඉපදීම වෙයි. එහි උපෙක්ඛානෙමෝ මෑ උපෙක්ඛාසම්බොධ්‍යඞ්ගසඨානියධම්මී නම් වෙති; තවද ධම්මෙහි පස්දෙනෙක් උපෙක්ඛාසම්බොධ්‍යඞ්ගයාගේ ඉපදීමපිණිස පවත්නාහුය- සත්තමධ්‍යසථතාවය, සංසකාරමධ්‍යසථතාවය, සත්තසංසකාරයන් මමත්තියකරනපුද්ගලයන් දුරුකරනබවය, තදධිමුත්තභාවය යන මොහුයි. ඒ පඤ්චධම්මයන් අතුරෙහි දෙපරිද්දෙකින් සත්තයන්කෙරෙහි මධ්‍යසථබව උපදවයි; තෙපි තමාගේ කම්මයෙන් අවුත් තමාගේ ම කම්මයෙන් යන්නෙහි; මේ තෙමේත් තමාගේ කම්මයෙන් අවුත් තමාගේ ම කම්මයෙන් යන්නේය; තෙපි කවරෙකුට මමත්තියකෙරෙහිදැ?යි මෙසේ කම්මය සවකීයකොටඇති බව ප්‍රත්‍යවෙක්ෂාකිරීමෙන් ද පරමාර්ථවශයෙන් සත්තයෙක් ම නැති, ඒ තෙපි කවරෙකුට මමත්තියකෙරෙහිදැ?යි මෙසේ නිසසත්තබව ප්‍රත්‍යවෙක්ෂා කිරීමෙන් ද දෙපරිද්දෙකින් සංසකාරයන්ගේ මධ්‍යසථබව උපදවයි. මේ චිවරය පිළිවෙළින් වණ්ණවිකාරයට හා ජීණ්ණභාවයට ද පැමිණ පාපිස් නාකඩක් වැ සැරයටිකොණ්ණින් ඉවතට දැමියයුතු වන්නේය.; ඉදින් ඒ සිවුරට හිමියෙක් වන්නේ නම් මෙපරිද්දෙන් එය විනාශවන්ට නො දෙන්නේය,යි මෙසේ අසත්තාමිකභාවය ප්‍රත්‍යවෙක්ෂාකිරීමෙන් ද; මෙය කල්නොපවත්නේය, තාවකාලිකය,යි මෙසේ තාවකාලිකබව ප්‍රත්‍ය වෙක්ෂාකිරීමෙන් ද? (මධ්‍යසථබව ප්‍රත්‍යවෙක්ෂාකරයි;) නැවත චිවර යෙහි යම්සේද එපරිද්දෙන් පාත්‍රාදියෙහි ද යෙදියයුත්තාහුය. සත්ත සංසකාරයන්කෙරෙහි මමත්තියකරන පුද්ගලයන් දුරුකරනබවය යන මෙහි යම් පුද්ගලයෙක් හිහිවූයේ තමාගේ පුත්‍රධීත්‍රාදීන් හෝ පැවිදිවූයේ තමාගේ අන්තෙවාසික සමානඋපාධ්‍යායාදීන් හෝ මමත්තියකෙරේ ද; සියතින් ම ඔවුන්ගේ හිසකේ කැපීම් සිවුරු මැසීම් සිවුරු සේදීම් රදන්කිරීම් පාත්‍රාපිසීම් ආදිය කෙරේද; මොහොතකුත් නො දක්නේ අසවල් සාමණේරයා කොහියැ? අසවල් තරුණභික්ෂුව කොහියැ?යි භ්‍රාන්තවූ මූවෙකු මෙන් ඔබිනොබත් බලාද; අනිකෙකුවිසින් හිසකේ කැපීම්ආදියක් සඳහා මොහොතක් අසවලා එවනු මැනවැ,යි යාඥා කරන්නේත් අපිදු ඔහුලවා තම කටයුත්තක් නො කරවමු, තෙපි ඔහු ගෙන විඛාකරන්නහුය,යි නො දේද; මේතෙම සත්තකෙලායන (=මමත්ත යකරන) පුද්ගලයා නම් වෙයි. යමෙක් වනාහි සිවුරුපාත්‍රාතලුතැටි සැරයටිආදිය මමත්තිය කෙරේද; අනිකෙකුගේ අතින් පරාමර්ශනය කරන්වත් නො දේද; තාවකාලිකවැ ඉල්වනලද්දේ ඇපිත් මෙය මමත්තිය කරමින් පරිභොග නො කරමු, කිම තොපට දෙන්නෙමුදැ?යි කියාද; මේතෙම සංසකාරකෙලායන නම් වේ. යමෙක් වනාහි ඒ දෙවත්හි ම මධ්‍යසථවූයේ උදාසීනවූයේ වේද මේතෙම සත්තසංසකාර මධ්‍යසථපුද්ගලයා නම් වේ. මෙසේ මේ උපෙක්ඛාසම්බොධ්‍යඞ්ගයතෙම මෙබඳුවූ සත්තසංසකාරකෙලායන පුද්ගලයන් දුරින් දුරුකරන්නහුට ද සත්තසංසකාරමධ්‍යසථපුද්ගලයන් සෙවනයකරන්නහුට ද භිදිම්සිටීම් ආදියෙහි එය ඉපදවීම පිණිස නිමිනප්‍රවණාභිමුඛවූ සිත්ඇත්තහුට ද

උපදී. මේසේ උපන්නාවූ ඒ උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගයාගේ අභිනවභාවයෙන් වැඩීමෙන් සම්පූර්ණවීම වේය,යි දතයුතු.

ඉතිඅජ්ඣත්තං වා= මේසේ තමාගේ සම්බොධ්‍යඞ්ගයන් හෝ මෙරමාගේ (සම්බොධ්‍යඞ්ගයන්) හෝ පිරිසිඳ ගෙන කලෙක තමාගේ හෝ කලෙක අනිකෙකුගේ හෝ සම්බොධ්‍යඞ්ගයන් පිරිසිඳ ගෙන බොධ්‍යඞ්ගධර්මයන්හි ධර්මානුදර්ශීව වාසයකෙරෙයි. මෙහි සමුදයව්‍යයයෝ වනාහී බොධ්‍යඞ්ගයන්ගේ ඉපදීම් නිරුඬවීම් වශයෙන් දතයුත්තානුය. මෙයින් මත්තෙහි කීනය මැ,යි. හුදෙක් මෙහි බොධ්‍යඞ්ග පරිග්‍රාහකසමෘති තොමෝ දුඃඛසත්‍යය,යි මෙසේ යෙදීමකොට බොධ්‍යඞ්ග පරිග්‍රාහක භික්ෂුහුගේ නිර්‍වාණවාරය දතයුතු. සෙස්ස එබදුම වේ යයි-

බොධ්‍යඞ්ග පර්‍ය්‍ය නිමි.

මෙසේ සම්බොධ්‍යඞ්ගයන්ගේ වශයෙන් ධර්මානුපස්සනා සතිපට්ඨානය විභාගකොට මෙවිට චතුස්සත්‍යයන්ගේ වශයෙන් විභාගකරනු පිණිස පුන ච පරං යන්නාදිය වදාළසේක. එහි **ඉදං දුක්ඛන්ති යථාභූතංපජානාති=** යනු තාත්ත්විකව තබා ත්‍රෛභූමක ධර්මයන් මේ දුක්ඛය,යි යථාසභාව වශයෙන් දතගනී. නැවත ඒ දුඃඛයාගේ මවුවූ උපදවන්නීවූ පුර්‍වතෘෂ්ණාව මේ දුඃඛසමුදය,යි ද, ඒ දුඃඛ දුඃඛ සමුදය යන දෙදෙනාගේ නො පැවැත්මවූ නිර්‍වාණය මේ දුඃඛ නිරොධය,යි ද දුක්ඛ පිරිසිඳ දතගන්නාවූ සමුදය දුරුකරන්නාවූ නිරොධය පසක් කරන්නාවූ ආර්‍යාෂ්ටාංගීය මෝ දුඃඛනිරොධ ගාමිනී ප්‍රතිපදාවය,යි ද යථාසභාව වශයෙන් දතගනී යන අර්ථයි. අවශෙෂවූ ආර්‍යසත්‍ය කථාතොමෝ විශුද්ධිමාර්ගයෙහි විස්තරකරන ලද්දීමය.

ඉති අජ්ඣත්තං වා= යනු මෙසේ තමාගේ චතුස්සත්‍යයන් හෝ පරිග්‍රහණය කොට අනිකෙකුගේ හෝ කලෙක තමාගේ හෝ කලෙක අනිකෙකුගේ හෝ චතුරාර්‍ය්‍ය සත්‍යයන් පරිග්‍රහණය කොට ආර්‍යසත්‍ය ධර්මයන්හි ධර්මානුදර්ශීව වාසයකරයි; මේ සත්‍ය වර්ණනාවෙහි සමුදය ව්‍යයයෝ වනාහි චතුස්සත්‍යයන්ගේ අවිපරීතසභාවයෙන් උත්පත්තිනිවෘත්ති වශයෙන් දතයුත්තානුය. මෙයින් මත්තෙහි (පළමු) කී ක්‍රමය මැයි. හුදෙක් මෙහි චතුස්සත්‍යය පිරිසිඳ දතගන්නාවූ සමෘති තොමෝ දුඃඛසත්‍යය,යි මෙසේ යොජනාව කොට සත්‍යපරිග්‍රාහක භික්ෂුහුගේ නිර්‍වාණය අරමුණුකොට සංසාර වෘත්තයෙන් නික්මයන චාරය,යි දතයුතු සෙස්ස එබදු මැයි.

චතුස්සත්‍ය පර්‍ය්‍ය නිමි.

මේතෙකින් ආනාපානසමෘතිය සතරර්‍ය්‍යාපථය චතුස්සම්ප්‍රජන්‍යය චත්‍රිංශදාකාරය චතුර්ධාතුව්‍යවස්ථානය නවශීවථිකයෝය වේදනානුදර්ශී

නාය චිත්තානුදර්ශීනාය නීවරණ පරිග්‍රහය සඛන්ධපරිග්‍රහය බොධ්‍යඞ්ග පරිග්‍රහය සත්‍යපරිග්‍රහය යයි එක්විසි කම්ඨාන කෙනෙක් වදාරන ලද්දාහුමය. ඒ කම්ඨානයන් අතුරෙහි ආනාපානසතියය චත්‍රිංශද් කාරය නවශීවථිකයෝය යන එකොළොස අර්ණ කම්ඨානයෝ වෙති, දීඝභාණක මහාසිව සථවිරයන් වහන්සේ වනාහි නවශීවථිකයෝ ආදීනවානුපස්සනා වශයෙන් වදාරනලද්දාහුය,යි කීහ; එහෙයින් උන් වහන්සේගේ මතයෙහි අර්ණ කම්ඨානයෝ දෙදෙනෙක් ම වෙති. සෙස්සෝ උපචාර කම්ඨානයෝයි. තවද මේ සියලු කම්ඨානයන්හි කිම අභිනිවෙශය උපදීද? නො උපදීද යත්? නූපදනේ නො වෙයි. රූයාපථ සම්ප්‍රජන්‍ය නීවරණ බොධ්‍යඞ්ග කම්ඨානයන්හි යම් හෙයකින් අභිනිවෙශය නො උපදීද සෙසු කම්ඨානයන්හි උපදීද එහෙයිනි මහාසීවස්ථවිරයෝ වනාහි මෙසේ කීහු- මේ රූයාපථාදියෙහි දු අභිනිවෙශය වෙයි, යම් හෙයකින් මේ යොගාවචර තෙම සතර රූයාපථයෝ මට ඇත් දෝ හෝ නොහොත් නැද්ද මට චතුස්සම්ප්‍රජන්‍ය ඇත් දෝ හෝ නොහොත් නැද්ද මට පඤ්චනීවරණයෝ ඇත් දෝ හෝ නොහොත් නැද්ද මට සප්ත බොධ්‍යඞ්ගයෝ ඇත් දෝ හෝ නොහොත් නැද්දැ,යි මෙපරිද්දෙන් පරිග්‍රහණය කෙරේද එහෙයින් සියලු තැන්හි අභිනිවෙශය වේය,යි.

යොහි කොචි හික්ඛවෙ!= යම් කිසි මහණෙක් හෝ මෙහෙණක් හෝ උවසුවෙක් හෝ උවැසියක් හෝ; **එවං භාවෙය්‍ය**= ආදියෙහි පටන් කියනලද භාවනානුක්‍රමයෙන් වඩනේද; **සාමඤ්ඤං**= කැමතිවියයුතුයි; අවශ්‍යයෙන් වනසුලුය යන අර්ථයි; **අඤ්ඤං**= රහත්ඵලය; **සති වා උපාදිසෙසෙ**= උපාදානශෙෂය හෝ ඇතිකල්හි (උපාදානයන්) ක්ෂය නොවූ කල්හි; **අනාගාමිතා**= අනාගාමීභාවය; මෙපරිද්දෙන් සප්ත බෝධ්‍යඞ්ගයන්ගේ වශයෙන් ශාසනයාගේ නෛර්‍යාණිකබව දක්වා නැවත එයිනුදු ඉතාමදවූ කලෙක නෛර්‍යාණිකබව වේය,යි දක්වන්නාහු **තිණ්ණන්නු හික්ඛවෙ!** යනාදිය වදළසේක. මේ සියලු ම (කාලවිශෙෂය) මධ්‍යම වෛනෙයපුද්ගලයාගේ වශයෙන් ම වදාරනලදී. තියුණුප්‍රඥඇති පුද්ගලයා සඳහා "උදෘඝන අනුශාසනාකරනලද්දේ සවස්කාලයෙහි විශෙෂය අවබොධ කරන්නේය, සවස්කාලයෙහි අනුශාසනා කරනලද්දේ උදෘඝන විශෙෂය අධිගම්යකරන්නේය,,යි කියනලදී. මෙපරිද්දෙන් භාග්‍යවතුන්වහන්සේ "මහණෙනි! මාගේශාසනය මෙසේ නෛර්‍යාණික යයි දක්වාඵක්විසි තැන්හි ම රහත්ඵලය කුළඟැන්වීමෙන් දෙශනාකළ (මේ සතිපට්ඨාන) දෙශනාව නිමවා වදාරනසේක් **"එකායනෝ අයං හික්ඛවෙ! මග්ගෝ-පෙ-ඉති යනං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං,,** යි වදළසේක. සෙස්ස ප්‍රකටවූ අර්ථයන්තේ මය,යි.

සතිපට්ඨානසූත්‍රවර්ණනා නිමි.

ප්‍ර ප ඤ්ච දී පි කා

නම්වූ

මැදුම්සඟි සිංහල අටුවාවෙහි මූලපරියාය නම්වූ

ප්‍රථම වර්ගය මෙතෙකින් සමාප්තයි.

චූලසීහනාද සූත්‍ර වණ්ණනා.



එවමේම සුතං, යි චූලසීහනාද සූත්‍රයයි. යම්හෙයකින් මේසූත්‍රයාගේ අපෝතපත්තික නික්ඛේපය වේද, එහෙයින් ඒ අපෝතපත්තිය දක්වා ම මේ සූත්‍රයාගේ අපුබ්බපදවණ්ණනාව කරන්නෙමු. මේ සූත්‍රය කවර අපෝතපත්තියක වදාරනලද ද යත්? ලාභසක්කාර ප්‍රත්‍යයෙන් තිත්ථිකයන්ගේ විලාපකිමෙහි වදාරනලද; භාග්‍යවතුන් වහන්සේට වනාහි "ධම්මදායාද" සූත්‍රයෙහි කී ක්‍රමයෙන් මහත්වූ ලාභසක්කාරය උපන. ඒ එසේමැයි—

චතුස්ස ප්‍රමාණයෝ.

මේ ලොකසන්නිවාසයතෙම චතුඃප්‍රමාණික වේ; රූපප්‍රමාණවූ රූපයෙහි ප්‍රසන්නයෝ. ඝොෂප්‍රමාණවූ ඝොෂයෙහි ප්‍රසන්න යෝ, රූක්ෂප්‍රමාණ වූ රූක්ෂප්‍රසන්නයෝ, ධම්ප්‍රමාණ වූ ධම්යෙහි ප්‍රසන්නයෝ යි, මේ පුද්ගලයන්ගේ වශයෙන් සතර පරිද්දෙකින් සිටියේයි; මේ ඔවුන්ගේ නානාත්වයයි- රූපප්‍රමාණ වූ රූපප්‍රසන්න පුද්ගලතෙම කවරේ ද? මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් උච්චභාවය හෝ දූක පෘථුලභාවය හෝ දූක සංඝාතය හෝ දූක සම්පූර්ණබව හෝ දූක එහි ප්‍රමාණය ගෙන ප්‍රසාදය උපදවයි. මේ පුද්ගලතෙම රූපප්‍රමාණවූ රූපප්‍රසන්න පුද්ගලයාය, යි කියනු ලැබේ; ඝොෂප්‍රමාණවූ ඝොෂ ප්‍රසන්න පුද්ගලතෙමේ කවරේ ද? මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් අන්‍යයාගේ වණ්ණභාවෙන් අන්‍යයාගේ සතුතියෙන් අන්‍යයාගේ ප්‍රශංසා වෙන් අන්‍යයාගේ වණ්ණභාරිත්වයෙන් එහි ප්‍රමාණය ගෙන ප්‍රසාදය උපදවයි, මේතෙම ඝොෂප්‍රමාණවූ ඝොෂප්‍රසන්න පුද්ගලයාය, යි කියනුලැබේ; රූක්ෂප්‍රමාණවූ රූක්ෂප්‍රසන්න පුද්ගලයා කවරේ ද? මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් චීවරයෙහි රූක්ෂබව හෝ දූක පාත්‍රයෙහි රූක්ෂබව හෝ දූක සෙනාසනයෙහි රූක්ෂබව හෝ දූක විවිධවූ දුශ්චරක්‍රියාව හෝ දූක එහි ප්‍රමාණය ගෙන ප්‍රසාදය උපදවයි, මේ තෙම රූක්ෂප්‍රමාණවූ රූක්ෂප්‍රසන්න පුද්ගලයාය, යි කියනු ලැබේ; ධම්ප්‍රමාණවූ ධම්ප්‍රසන්න පුද්ගලතෙම කවරේ ද? මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් තෙම ශීලය හෝ දූක සමාධිය හෝ දූක ප්‍රඥාව හෝ දූක එහි ප්‍රමාණය ගෙන ප්‍රසාදය උපදවයි, මේ තෙම ධම්ප්‍රමාණ වූ ධම්ප්‍රසන්න පුද්ගලයාය, යි කියනුලැබේ යයි; මේ පුද්ගලයන් සතරදෙනා අතුරෙහි රූපය පමණ කොටගෙන ප්‍රසන්නවූයේ ද භාග්‍යවතුන් වහන්සේගේ ආරොහපරිණාහ යුක්තවූ සංඝාතයෙන් යුක්තවූ පරිපූර්ණවූ වණ්ණසම්පත්තිය ඇති අසීත්‍යනුව්‍යඤ්ජන ප්‍රතිමණ්ඩිත බැවින් නානාරතන විචිත්‍රවූ සබ්බාකාරපරිපූර්ණ වැනි දෙකිස් මහාපුරුෂ ලක්ඛණයෙන් ගැවසීගත් බැවින් තාරකාසමූහයෙන් බබලන අහස්තලය වැනි සියලු තැන්හි හාත්පස හවගත් මල්ඇති

සියක්යොදුන් පරසතුරුක වැනිවූ අවලොස්රියන් උස්වූ ව්‍යාමප්‍රභාපරි ක්ෂේපයෙන් සශ්‍රීකවූ අනොපම වූ ශරීරය දැක සම්‍යක්සම්බුඩයන් වහන්සේ කෙරෙහිම ප්‍රසන්නාණවයි; ඝොෂය පමණ කොටගෙන ප්‍රසන්න වූයේ ද භාග්‍යවතුන් වහන්සේ විසින් කල්පලක්ෂයක් අධිකකොට ඇති චතුරසඞ්ඛ්‍ය කල්පයක් දශපාරමීහු දශඋපපාරමීහු දශපරමාර්ථපාරමීහු පුරනලද්දාහුය; අඞ්ගපරිත්‍යාගය පුත්‍රදාරපරිත්‍යාගය රාජ්‍යපරිත්‍යාගය ආත්මපරිත්‍යාගය නයනපරිත්‍යාගය ද කරනලද්දේය යනාදී නයින් පැවති ගුණඝොෂය අසා සම්‍යක්සම්බුඩයන් කෙරෙහි ම පහදියි; රූපසම්පත්ති පමණ කොටගෙන ප්‍රසන්න වූයේ ද භාග්‍යවතුන් වහන්සේගේ චීවරයෙහි රූපඝබව දැක ඉදින් භාග්‍යවතුන් වහන්සේ ගිහිගෙයි වාසය කළාහු නම් කසීවත් ම ධරන්නාහුය; එතකුදුවුවත් සාණ පාංශුකූල චීවරයෙන් සතුටුවන්නාවූ ඒ භාග්‍යවතුන් විසින් ධරවූවක් කරනලද්ද, යි සම්‍යක්සම්බුඩයන් කෙරෙහි ම පහදියි; පාත්‍රයෙහි රූපඝබව ද දැක ගිහිගෙයි වාසයකරන්නා වූ මොවුන් වහන්සේ විසින් උතුම් වූ රත්රන් බදුන්හි සක්වත්තෙකුගේ භොජනයට සුදුසු වූ සුවඳහැල් භොජනය වලඳනලද්ද; එතකුදුවුවත් පැවිදිව සෙල්ලූවා පඝක් ගෙන උසස් පහත් කුලදෙර සපදානයෙන් පිඬු පිණිස හැසිර ලත් පිණ්ඩියාලොපයෙන් සතුටු වෙමින් ධරවූවක් කෙරෙති, යි සම්‍යක්සම්බුඩයන් කෙරෙහි ම පහදියි; සෙනස්නෙහි රූපඝබව දැක ද මුන්වහන්සේ ගිහිගෙයි වාසය කරන්නාහු තුන් සෘතුන්ට යොග්‍ය වූ තුන් පහයෙක්හි ත්‍රිවිධ නළුවන් පරිවරකොට ඇත්තාහු දිවසැපත් මෙන් රජසිරි විඳ දැන් පැවිදිවූවාහු රුක්මුල්සෙනසුන් ආදියෙහි දූවපුවරු ගල්තල විදල්මැසි ආදියෙහි හෝ මින් ධරකමක් කෙරෙති, යි සම්‍යක්සම්බුඩයන් කෙරෙහි ම පහදියි; උන්වහන්සේගේ දුෂ්කරක්‍රියාව දැක ද සාවුරුද්දක් මුංයුස කොල්ලුයුස කලන්යුස ආදීන්ගේ අඩපතක් අඩපතක් පමණකින් යැපුනේය, අප්‍රාණකධ්‍යානයෙන් ධ්‍යාන කෙළේය, ශරීරයෙහි ද ජීවිතයෙහි ද අපෙක්ෂා රහිත වැ වාසය කෙළේය, ආශ්චර්‍යයිය, භාග්‍යවතුන් වහන්සේ දුෂ්කර ක්‍රියා ඇතිසේකැයි සම්‍යක්සම්බුඩයන් කෙරෙහි මැ පහදියි; ධර්මය ප්‍රමාණ කොට ඇත්තේ ද භාග්‍යවතුන් වහන්සේගේ ශීලගුණය ද සමාධිගුණය ද ප්‍රඥාගුණය ද ධ්‍යානවිමොක්ෂ සමාපත්ති සම්පත්තිය ද අභිඥාවන්ගේ පාරිපූරිභාවය ද යමකප්‍රාතිහාර්‍යය ද දෙවාවරොහණය ද පාටියපුත්‍රදමනාදිය ද යන නොයෙක් ආශ්චර්‍යයන් දැක සම්‍යක්සම්බුඩයන් කෙරෙහි මැ පහදියි; ඔවුහු මෙසේ ප්‍රසන්න වූවාහු භාග්‍යවතුන් වහන්සේට මහත්වූ සත්කාරය එලවති, නීරොගයන්ට වනාහි බාවෙරුජාතකයෙහි කවුඩාට මෙන් ලාභසත්කාරය පිරිහුනේයි. වදාළේ මැයි—

109. "අදස්සනෙන මොරස්ස – සිඛිනෝ මඤ්ජුභාණිනෝ
කාකං නජ්ජ අපූජේසුං – මංසෙන ච ඵලෙන ච.

110. යදා ච සරසම්පන්නා – මොරෝ බාවෙරූ මාගමා
අථ ලාභෝ ච සක්කාරෝ – වායසස්ස අභාසථ.

111. යාව නුප්පජ්ජති බුද්ධෝ – ධම්මරාජා පභඞ්කරෝ
අථ අඤ්ඤේ අපූජේසුං – පුථුසමණබ්‍රාහ්මණෙ.

112. යදා ච සරසම්පන්නා – බුද්ධෝ ධම්මං අදෙසයි
අථ ලාභෝ ච සක්කාරෝ – තිත්ථියානං අභාසථ" යි.

මෙසේ ඔවුහු ප්‍රතිඥා වූ ලාභසත්කාර ඇත්තාහු රාත්‍රියෙහි එක්දහස් පමණ ආලෝක කොට ද හිරු නැගෙනකල්හි කඳෝපැනියන් සෙයින් නටුවාවූ ප්‍රභාඇත්තාහු වූහු.

113. යථා හි ඛජ්ජූපනිකා – කාළපක්ඛම්හි රත්තියා
නිදස්සයන්ති ඔභාසං – එවෙසං විසයෝ හි සෝ.

---

109. සිඛිනෝ= ශිඛායෙන් සම්පන්න වූ; මඤ්ජුභාණිනෝ= මධුර සඬ ඇති; මොරස්ස= මයුරයාගේ; අදස්සනෙන= නො දැක්ම හේතු කොට ගෙන; තස්ස– ඒ බාවෙරුරට (ජනයෝ;) මංසෙන ච= මාංස යෙන් ද; ඵලෙන ච= (නන්වැදෑරුම්) ඵලයෙන් ද; අපූජේසුං= පිදූහ.

110. ච= නැවත; යදා= යම් කලෙක්හි; සරසම්පන්නා= මධුර සඬරයෙන් සම්පන්න වූ; මොරෝ= මයුරතෙම; බාවෙරූ= බාවෙරුරටට; ආගමා= ආයේ ද; අථ= එකල්හි; වායසස්ස= කවුඩාගේ; ලාභෝ ච= ලාභය ද; සක්කාරෝ ච= සත්කාරය ද; අභාසථ= පිරිහුනේයි.

111. ධම්මරාජා= (නවලොවුතුරු දහමින් පිරිස රඤ්ජනය කරන හෙයින්) ධර්මරාජන් වූ; පභඞ්කරෝ= (සත්ත්වලෝක – අවකාසලෝක – සංඛාර ලෝකයන්හි ආලෝකය කළ හෙයින්) පභඞ්කර නම් වූ; බුද්ධෝ= සම්බුදුයන් වහන්සේ; යාව= යම් තාක්; නුප්පජ්ජති= පහළ නො වන සේක් ද; තාව= ඒ තාක්; අඤ්ඤේ= අන්‍ය වූ; පුථු සමණබ්‍රාහ්මණෙ= බොහෝ මහණබමුණන්; අපූජේසුං= පිදූහ.

112. ච= නැවත; යදා= යම් කලෙක්හි; සරසම්පන්නා= බ්‍රහ්ම සඬරයෙන් සම්පන්න වූ; බුද්ධෝ= සම්බුදුයන් වහන්සේ; ධම්මං අදෙසයි= සිව්සස්දහම් වදාළසේක් ද; අථ= එකල්හි; තිත්ථියානං= තීර්ථකයන්ගේ; ලාභෝ ච= ලාභය ද; සක්කාරෝ ච= සත්කාරය ද; අභාසථ= පිරිහුනේයි.

113. යථා හි= යම් සේ වනාහි; ඛජ්ජූපනිකා= කඳෝපැනියෝ; කාළපක්ඛම්හි රත්තියා= කෘෂ්ණපක්ෂ රාත්‍රියෙහි; ඔභාසං= ආලෝකය; නිදස්සයන්ති= දක්වත් ද; හි= යම් හෙයකින්; සෝ= ඒ කෘෂ්ණපක්ෂය; එවෙසං= මේ කඳෝපැනියන්ට; විසයෝ= විෂය වේද එහෙයිනි.

114. යදා ච රශ්මිසම්පනෙනා - අබහූදති පභඞ්කරෙ
අථ බජ්ඣූපසඞ්ඛාතං - පභා අනතරධායති.

115. එවං බජ්ඣූපසදිසා - තිත්ථියා'පි පුථූ ඉධ
කාලපක්ඛූපමෙ ලොකෙ - දීපයන්ති සකං ගුණං.

116. යදා ච බුඩ්ඪො ලොකස්මිං - උදෙති අමිතපභො
නිප්පභා තිත්ථියා හොන්ති - සුදිවසෙ බජ්ඣූපකා යථා.

ඔවුහු මෙසේ නිෂ්ප්‍රභා වැ කැසිපොළ ආදියෙන් ගැවසුනු සිරුරු ඇත්තාහු අතිශයින් පිරිහීමට පැමිණියාහු බුදුහු යම් තැනෙක ද, ධර්මය යම් තැනෙක ද, සඞ්ඝයා යම් තැනෙක ද, මහජනයාගේ රැස්වීම යම් තැනෙකත් වේද, ඒ ඒ තැන්හි ගොස් අතුරු වේහි ද මංසන්ධියෙහි ද සතරමං සන්ධියෙහි ද සභායෙහි ද සිට විලාප කියති; "කිම පින්වත්නි! ශ්‍රමණ ගෞතම තෙමේ ම ශ්‍රමණ වූයේ ද? ඇපි ශ්‍රමණයෝ නො වමු ද? කිම ශ්‍රමණ ගෞතමයන්ගේ ම ශ්‍රාවකයෝ ශ්‍රමණයෝ වෙත් ද? අපගේ ශ්‍රාවකයෝ අශ්‍රමණයෝ වෙත් ද? ශ්‍රමණ ගෞතමයන්ට ද ඔහුගේ ශ්‍රාවකයන්ට ද දෙනලද්ද ම මහත්ඵල ද? අපට දෙනලද්ද මහත්ඵල නො වේ ද? ශ්‍රමණ ගෞතම තෙමේ ත් ශ්‍රමණ වූයේ නො ද? ඇපි ද ශ්‍රමණයෝ නොවමෝ ද? ශ්‍රමණ ගෞතමයන්ගේ ශ්‍රාවකයෝ ද ශ්‍රමණයෝ යැ; අපගේ ශ්‍රාවකයෝ ද ශ්‍රමණයෝ යැ; ශ්‍රමණ ගෞතමයන් ට ත් ඔහුගේ ශ්‍රාවකයන්ට ත් දෙනලද්ද ද මහත්ඵල යැ; අපටත් අපගේ ශ්‍රාවකයන්ට ත් දෙනලද්ද ද මහත්ඵල මැයි. ශ්‍රමණ ගෞතම යන්ට ද ඔහුගේ ශ්‍රාවකයන්ට ද (දන්) දෙවු, (පූජා) කරවු; අපට ද අපගේ ශ්‍රාවකයන්ට ද (දන්) දෙවු, (පූජා) කරවු; මහණ ගොයුම් තෙමේ පළමු දිනයන්හි උපන්නේ නො ද? ඇපි වූ කලි ලොව උප දනාකලමැ උපන්නමෝ" යයි මෙසේ නන්අයුරින් කැගසත්.

විලාපය.

---

114. ච= යලිදු; යදා= යම් කලෙක්හි; රශ්මිසම්පනෙනා= සහස්‍ර රශ්මීන් සම්පූර්ණ වූ; පභඞ්කරෙ= සූර්‍ය්‍ය තෙම; අබහූදති= උදයට පැමිණේද; අථ= එකල්හි; බජ්ඣූපසඞ්ඛාතං= බද්ධෙන සම්මතයාගේ; පභා= ආලොකය; අනතරධායති= අතුරුදහන් වේ.

115. එවං= එපරිද්දෙන්; ඉධ= මේ ලොකයෙහි; බජ්ඣූපසදිසා= බද්ධෙතයන් සදෘශ වූ; පුථූ= බොහෝ වූ; තිත්ථියා අපි= තීර්ථිකයෝ ද; කාලපක්ඛූපමෙ= කෘෂ්ණපක්ෂය හා තුල්‍ය වූ; ලොකෙ= ලොකයෙහි; සකං ගුණං= සවකීය ගුණය; දීපයන්ති= ප්‍රකාශ කෙරෙත්.

116. ච= නැවත; යදා= යම් කලෙක්හි; අමිතපභො= අප්‍රමාණවූ ප්‍රභා ඇති; බුඩ්ඪො= සම්බුද්ධ තෙම; ලොකස්මිං= ලොකයෙහි; උදෙති= පහළවේද; (එකල්හි) තිත්ථියා= තීර්ථිකයෝ; සුදිවසෙ= හිරු උදාවූකල්හි; බජ්ඣූපකා යථා= කදෝපැනියන් මෙන්; නිප්පභා හොන්ති= නිෂ්ප්‍රභා වූවාහු වෙත්.

එකල්හි භික්ෂූහුයැ භික්ෂුණීහුයැ උපාසකයෝයැ උපාසිකාවෝයැ යන සිව් පිරිස ඔවුන්ගේ ශබ්දය අසා භාග්‍යවතුන් වහන්සේට දැන්වූහ. "සවාමීනි! තීර්ථකයෝ මේ මේ (වචන) ද කියති" යි. ඒ අසා භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි! තෙපි තීර්ථකයන්ගේ වචනයෙන් (ශාසනයෙන්) අන්තැනෙක මහණෙක් ඇතැයි සංඥ ඇත්තාහු නො වවු" යයි වදාරා අන්‍ය තීර්ථකයන් කෙරෙහි ශ්‍රමණභාවය ප්‍රතිෂේධ කරනසේක් යළි මේ සසුන්හි මැ (ශ්‍රමණභාවය) අනුදන්නාසේක් මේ අපොතපතිඅයහි **ඉධෙව භික්ඛවෙ සමණෝ** යි මේ සූත්‍රය වදාළසේක.

එහි **ඉධෙව** යනු= මේ ශාසනයෙහි ම; (යනාථයි.) මේ නියමය වනාහි සෙසු පදයන්හි ද දතයුත්තේයි. ඒ එසේ මැඟ. දෙවැනි ශ්‍රමණාදීහු ද මේ ශාසනයෙහි මැ වෙති; අන් තැනෙක නැත්. **සමණෝ**= සෝවාන් පුද්ගල තෙම; එහෙයින් ම වදාළහ- **ඉතෝ ච භික්ඛවෙ! සමණෝ? ඉධ භික්ඛවෙ! භික්ඛු තිණ්ණං සංයොජනානං පරික්ඛයා සොතාපන්නෝ හොති අවිනිපාතධම්මෝ නියතෝ සම්බොධිපරායණෝ අයං භික්ඛවෙ! සමණෝ** යි (=මහණෙනි! ශ්‍රමණ තෙමේ කවරෙක් ද? මහණෙනි! මේ ශාසනයෙහි භික්ෂු තෙම සක්කායදිට්ඨි ආදි තුන් බන්ධනයන්ගේ ක්ෂය කිරීමෙන් මාර්ගස්‍රොතයට පැමිණියේ වේද, සතර අපායයෙහි නො වැටෙන පියවි ඇත්තේ ධර්මනියාමයෙන් නියත වූයේ මතු තුන්මහ පිහිට කොට ඇත්තේ වේද, මහණෙනි! මේ ශ්‍රමණ තෙමේයි.) **දුතියෝ**= සකෘදාගාමී පුද්ගල තෙමේයි; එහෙයින් මැ වදාළහ- **ඉතෝ ච භික්ඛවෙ! දුතියෝ සමණෝ? ඉධ භික්ඛවෙ! භික්ඛු තිණ්ණං සංයොජනානං පරික්ඛයා රාගදොසමොහානං තනුත්තා සකදාගාමී හොති, සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරොති, අයං භික්ඛවෙ! දුතියෝ සමණෝ** යි (=මහණෙනි! දෙවැනි ශ්‍රමණ තෙමේ කවරෙක් ද? මහණෙනි! මේ ශාසනයෙහි **මහණ** තෙම තුන් සංයොජනයන්ගේ ක්ෂය කිරීමෙන් රාග ද්වේෂ මොහයන්ගේ තුනී බැවින් සකෘදාගාමී වේද, වරක් මැ මේ ලොවට අවුත් සසරදුක කෙළවර කෙරේද, මහණෙනි! මේ තෙම දෙවැනි ශ්‍රමණයා වෙයි.) **තතියෝ**= අනාගාමී පුද්ගල තෙමේයි; එහෙයින් මැ වදාළහ- **ඉතෝ ච භික්ඛවෙ! තතියෝ සමණෝ? ඉධ භික්ඛවෙ! භික්ඛු පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකෝ හොති, තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මෝ තස්මා ලොකා, අයං භික්ඛවෙ! තතියෝ සමණෝ** යි (=මහණෙනි! තුන්වැනි ශ්‍රමණ තෙම කවරෙක් ද? මහණෙනි! මේ ශාසනයෙහි මහණ තෙම පස් ඔරම්භාගිය සංයොජනයන්ගේ ක්ෂය කිරීමෙන් ඕපපාතික වේද, ඒ භවයෙහි ම පිරිනිවෙන සුලු වූයේ ඒ බඹලොවින් නැවත පිළිසඳ විසින් නො වැටෙන පියවි ඇත්තේ වේද, මහණෙනි! මේ තෙම තුන්වැනි ශ්‍රමණයා වෙයි.) **චතුත්ථෝ**= රහතුන් වහන්සේයි; එහෙයින් මැ වදාළහ- **ඉතෝ ච**

භික්ඛවෙ! චතුත්ථො සමණො? ඉධ භික්ඛවෙ! භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති, අයං භික්ඛවෙ! චතුත්ථො සමණො යි (=මහණෙනි! සතරවැනි ශ්‍රමණ තෙමේ කවරෙක් ද? මහණෙනි! මේ ශාසනයෙහි මහණ තෙම ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීමෙන් කාමාදි ආශ්‍රව රහිත වූ සියලු කෙලෙස් බැඳුමෙන් මිදුනු රහත්ඵල චිත්තය ද රහත්ඵල ප්‍රඥාව ද මේ අත්බැවිහි මැ තෙමේ මැ මනාකොට දැන පසක් කොට ඊට පැමිණ වාසය කෙරේ ද, මහණෙනි! මේ තෙම සතරවැනි ශ්‍රමණයා වෙයි.) මෙසේ මෙතැන්හි සතර ඵලයෙහි සිටී ශ්‍රමණයෝ මැ අදහස් කරනලද්දාහුය. සුඤ්ඤා= සිස්වූවාහුය, තුච්ඡා වූවාහුය; පරපපවාදා= සතර ශාශ්වතවාදයෝ යැ, සතර එකත්‍යශාශ්වතිකයෝ යැ, සතර අන්තානන්තිකයෝ යැ, සතර අමරාවික්ඛෙපිකයෝ යැ, අධිච්චසමුප්පන්නිකයෝ දෙදෙන යැ, ඡොඩශ සංඥිවාදයෝ යැ, අසඤ්ඤිවාදයෝ යැ, සත උච්ඡෙදවාදයෝ යැ, පඤ්ච දෘෂ්ටධර්ම නිර්වාණවාදයෝ යැ, යන මේ සියලු මැ බ්‍රහ්මජාලයෙහි ආවා වූ දෙසැට දෘෂ්ටිහු මේ ශාසනයෙන් බැහැර වූ අන්‍යයන්ගේ වාදයෝ "පරපපවාද" නම් වෙති; ඔහු සියල්ලෝ මැ මේ සතර ඵලයෙහි ශ්‍රමණයන් කෙරෙන් ශූන්‍යයෝ යැ; ඒ දෘෂ්ටිහු මේ ශාසනයෙහි නො මැ ඇත්තාහුය; හුදෙක් මේ ඵලසප්තයන් කෙරෙන් ම ශූන්‍ය වූවාහු නො වෙති, වැලි සතරමාගීසප්ත ශ්‍රමණයන් කෙරෙන් ද සතර මාගීයන් පිණිස පටන්ගත් විදර්ශනා ඇත්තවුන් කෙරෙන් දැයි වාදශ ශ්‍රමණයන් කෙරෙන් ම ශූන්‍ය වූවාහු මැයි. මේ කාරණය සඳහා මැ භාග්‍යවතුන් වහන්සේ විසින් "මහාපරිනිර්වාණ" සූත්‍රයෙහි වදාරනලදී.

117. එකූනතිංසො වයසා සුභද්ද - යං පබ්බජිං කිං කුසලානුඑසි
වස්සානි පඤ්ඤාය සමාධිකානි - යතො අහං පබ්බජිතො සුභද්ද!
ඤායස්ස ධම්මස්ස පදෙසවත්තී - ඉතො බහිධා සමණොඋපි නත්ථි

---

117. සුභද්ද= එම්බා සුභද්‍රය! වයසා= වයසින්; එකූනතිංසො= එකුන්තිස් හවුරුදු ඇතිව; කිං කුසලානුඑසි= සම්භාවනාර්ථයෙන සඞ්ඛ්‍යාත කුශලය කුමැයි සොයමින්; පබ්බජිං= පැවිදිවූයෙමි. සුභද්ද= සුභද්‍රය! යතො= යම් තැනක පටන්; අහං= මම; පබ්බජිතො= පැවිදි වූයෙමි ද; (එතැන් සිට මේ අතර) සමාධිකානි= වසක් අධික කොට ඇති; පඤ්ඤාය වස්සානි= පනස් වසක් වෙති; ඉතො බහිධා= මේ මාගේ ශාසනයෙන් බැහැර; ඤායස්ස ධම්මස්ස= ආර්‍යමාගී ධර්මයාගේ; පදෙස වත්තී= ප්‍රදෙශඝඞ්ඛ්‍යාත විදර්ශනාමාත්‍රයෙහි පිහිටියෙක් ද; සමණොපි= ප්‍රථම ශ්‍රමණ වූ ස්‍රොතාපන්නයෙක් ද; නත්ථි= නැත්තේය.

"දුතියෝ'පි සමණෝ නත්ථි, තතියෝ'පි සමණෝ නත්ථි, චතුත්ථෝ'පි සමණෝ නත්ථි, සුඤ්ඤා පරප්පවාදා සමණේහි අඤ්ඤේහී" ති. යම් හෙයකින් මෙහි **පදෙසවනති** යි ආරබ්ධවිදර්ශීක තෙමේ අදහස් කරනලද ද, එහෙයින් සෝවාන්මහට පටන්ගත් විදසුන් ඇත්තහුය මාගීසප්තයාය ඵලසප්තයාය යන තිදෙන මැ එක්රැස් කොට **"සමණෝ'පි නත්ථි"** යනු වදළහ; සකෘදාගාමී මාගීයට ආරබ්ධ විදර්ශීකය මාගීසප්තය ඵලසප්තය යන තිදෙන ම එක්රැස් කොට **"දුතියෝ'පි සමණෝ නත්ථි"** යි වදළහ; අනිත් දෙ තැන්හි දු මේ නය මැයි. වැලි කුමක් හෙයින් මොවුහු අන් තැනෙක නැත් දැ?යි; ක්ෂෙත්‍ර නො වන හෙයිනි; ඒ එසේ මැයි– යම්සේ හිදිඅඟැ සමීපයෙක් (=අඹ) නො සිටීද, ජලපිට හිනි නො දැල්වේද, පිටිගලකැ බිජුවට නො වැඩෙත්ද, එසේ ම බාහිර තීර්ථායතන යන්හි මේ ශ්‍රමණයෝ නූපදින්; මේ ශාසනයෙහි මැ උපදින්. කුමක් හෙයින යත්? ක්ෂෙත්‍ර වූ බැවිනි. තවද– ඕ මෝ අක්ෂෙත්‍රතාවය ද ක්ෂෙත්‍රතාවය ද ආර්‍යීමාගීයාගේ අවිද්‍යමානභාවයෙන් ද විද්‍යමානභාවයෙන් ද දතයුත්තීය.

එසින් වදළහ. භාග්‍යවතුන් වහන්සේ– **"යම් ශාසනයෙක්හි ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාගීය නො ලැබේ ද, (පළමුවන) සෝවාන්මහණ ද, එහි නො ලැබෙයි, දෙවැනි මහණ ද එහි නො ලැබෙයි, තුන්වැනි මහණ ද එහි නො ලැබෙයි, සිව්වැනි මහණ ද එහි නො ලැබේ. තවද– සුභද්‍රය! යම් ශාසනයෙක්හි ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගික මාගීය ලැබේ ද, (පළමුවැනි) සෝවාන් මහණ ද එහි ලැබෙයි, දෙවැනි මහණ ද එහි ලැබෙයි, තුන්වැනි මහණ ද එහි ලැබෙයි, සිව්වැනි මහණ ද එහි ලැබේ. සුභද්‍රය! මේ මාගේ ශාසනයෙහි වූ කලී ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාගීය ලැබෙයි, සුභද්‍රය! (එහෙයින්) පළමුවැනි මහණ මේ ශාසනයෙහි මැය, දෙවැනි මහණ මේහි යැ, —පෙ— අන්‍ය වූ පරවාදයෝ (මේ සතර) ශ්‍රමණයන් කෙරෙන් සිස් වූවාහුය"** ති.

මේසේ යම්හෙයකින් තීර්ථායතනය ක්ෂෙත්‍ර නො වූයේ ද, ශාසනය ක්ෂෙත්‍ර වූයේ ද, එහෙයින්– යම් සේ සුරත් අත්පා ඇති ඔහසුරු කෙසරුසළා ඇති සිහම්ගරජෙක් සොහොනෙහි හෝ කසළගොඩෙහි හෝ නො වෙසේ ද, වැලි තුන්දහස් යොදුන් විතරැති හිමවතට පිවිස මැණික්ගුහාවකැ වෙසේ ද; යම් සේ ත් ෂඩ්දන්තහස්තිරාජයෙක් ගොව රියඇත්කුලාදි වූ නවකුලයන්හි නූපදී ද, සදත්කුලයෙහි මැ උපදී ද; තවද– යම් සේ වලාහක අශ්වරාජයෙක් කොවුලුකුලයෙහි හෝ අස්කුඹ කුලයෙහි හෝ නූපදීද, සිඹුනදීතීරයෙහි සෛන්ධවකුලයෙහි මැ උපදී ද; යම් සේ ත් සියලු කැමති සැපත් දෙන මනහර මිණිරුවන කසළ ණොඩෙක්හි හෝ පාංශුපර්‍වතාදියෙහි හෝ නූපදී ද, වෙපුල්ල පර්‍වතය ඇතුලත මැ උපදී ද; යම් සේ ත් තිමිරපිඹගල මත්ස්‍යරාජ වල – කුඹා පොකුණුවලැ නූපදී ද, සුවාසූදහසක් යොදුන් ගැඹුරු වූ මහඉඹුදුර මැ

උපදී ද; යම් සේ ත් දෙයළඟසියක් ගොදුන් ගුරු එරජෙක් ගම්දෙරු එරඬුවනාදියෙහි නො වෙසේ ද, මහසමුදුරට පිවිස හිඹුල්දහවනයෙහි මෑ වෙසේ ද; යම් සේ ත් ධ්‍රතරාෂ්ට්‍ර සවණීහංස තෙම ගම්දෙරු කුඹාවළ ආදියෙහි නො වෙසේ ද; අනූදහසක් හංසයන් පිරිවර ඇති වැ සිත්කුළු පව්වෙහි මෑ වෙසේ ද; යම් සේ ත් චතුර්මහාරාජිකයන් වූ සක්විතිරජෙක් නීචකුලයෙහි නූපදී ද, අසමහිත්‍ත වූ ජාතික්ෂත්‍රිය කුලයෙහි මෑ උපදී ද; එසේ මෑ මේ සතර මහණුන් අතුරෙහි එක් මහණෙකු වූ අන්‍ය තීර්ථකායතනයෙහි නූපදී. එයින් වදාළහ. භාග්‍යවතුන් වහන්සේ— **ඉඛෙව භික්ඛවෙ!** —පෙ— **සුඤ්ඤා පරප්පවාදා සමණෙභි අඤ්ඤෙහි** යී.

සම්මා සීහනාදං නදථ යන මෙහි- **සම්මා**= හෙතුවෙන්, නයෙන්, කාරණයෙන්; **සීහනාදං**= ශ්‍රෙෂ්ඨනාදය, අභීතනාදය, අප්‍රතිනාදය; (= අනිකෙකුට අසමාන වූ නාදය.) මේ සතර වැදෑරුම් ශ්‍රමණයන් මේ ශාසනයෙහි ම ඇති බැවින් මේ නාදය තෙම ශ්‍රෙෂ්ඨනාදය උත්තම නාදය නම් වෙයි; මේ ශ්‍රමණයෝ මෙහි ම ඇත්තාහු යයි කියන්නහුට අනිකෙකු කෙරෙන් භයක් හෝ සැකයක් හෝ නැත් නුයි. "අභීතනාද" නම් වෙයි; අපගේ ශාසනයෙහි වූ මේ ශ්‍රමණයෝ ඇත්තාහු යයි; පූරණාදීන් අතුරෙහි එකෙකුගේ ද නැඟිට කියන්ට අසමර්ථ භාවයෙන් මේ නාදය "අප්‍රතිනාද" නම් වෙයි; එයින් කියනලදී- **සීහනාදං**= ශ්‍රෙෂ්ඨනාදය, අභීතනාදය, අප්‍රතිනාදය යනු. **ඨානං ඛෝ පනෙතං විජ්ජති**= මේ කාරණය නොහි විද්‍යමාන වෙයි; **යං අඤ්ඤතිත්ථියා**= යම් කරුණකින් අන්‍ය තීර්ථකයෝ; මෙහි දු- **තීර්ථය** දනයුතුයි, **තීර්ථකර** තෙමේ දනයුතුයි, **තීර්ථකයෝ** දනයුත්තාහුය, **තීර්ථක ශ්‍රාවකයෝ** දනයුත්තාහුයි; "**තීර්ථ**" **නම්** දෙසැව් දෘෂ්ටිහුයැ; යම් හෙයකින් මේ දෙසැව දෘෂ්ටියෙහි සත්වයෝ තරණය කෙරෙත් ද, ඉල්පෙත් ද, ගැලීම් නැඟීම් කෙරෙත් ද, එහෙයින් "**තීර්ථ**" යයි කියනු ලැබෙයි; ඒ දෘෂ්ටින් උපදවන්නේ "**තීර්ථකර**" **නම්** වෙයි; ඔහුගේ ලබ්ධිය ගෙන පැවිදි වූවාහු "**තීර්ථකයෝ**" **නම්** වෙයි; ඔවුන්ගේ ප්‍රත්‍යයදායකයෝ "**තීර්ථක ශ්‍රාවකයෝ**" යයි දනයුත්තාහුයි. **පබ්බාජෙසුං**= නික්ම්බාදුම් හැර පැවිද්දට පැමිණියාහු; **අස්සාසෙහා**= අස්වැසීම, ප්‍රතිඥාව, උපසථමහය; **බලං**= ශක්තිය; **කෙන තුම්හෙ**= යම් අස්වැසීමෙකින් හෝ බලයකින් හෝ (තෙපි) මෙසේ කියවුද ? **අත්ථි ඛෝ නො ආවුසො! තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන** යන මෙහි මේ සංක්ෂෙපාර්ථය (කියනු ලැබේ-) යම් ඒ භාග්‍යවතුන් වහන්සේ කෙනෙක් සම තිස් පැරැම් පුරා සියලු කෙලෙසුන් බිඳ අනුත්තර වූ සම්‍යක්සම්බොධිය අවබොධ කළ සේක් ද, **තෙන භගවතා**= ඒ භාග්‍යවතුන් වහන්සේ විසින්; ඒ ඒ සත්ත්වයන්ගේ ආසයානුස **ජානතා**= දන්නහු විසින්; අත් තෙලෙහි තැබූ ආමලකයක් මෙන් සියලු ලෞකධර්ම **පස්සතා**= දක්නහු විසින්; තවද- පූර්වේනිවාසාදියෙන් දන්නහු විසින්; දිවැසින් දක්නහු විසින්; ත්‍රිවිද්‍යාවන්ගෙන් හෝ ෂඩභිඥාවන්ගෙන් හෝ දන්නහු විසින්;

සියලු තැන්හි අප්‍රතිහත වූ සමතැසින් දක්නහු විසින්; සියලු ධර්මයන් දැනීමෙහි සමර්ථ වූ ප්‍රඥාවෙන් දන්නහු විසින්; සියලු සත්ත්වයන්ගේ ඇස් විසය ඉක්මවනලද්දාවූ තිරෙකුඩ්ඩාදියට පැමිණියාවූ හෝ රූපයන් පවා ඉතා නිර්මල වූ මසැසින් දක්නාවූ; අත්වැඩ සිදුකරන සමාධියට පදස්ථාන වූ ප්‍රතිවෙධ ප්‍රඥාවෙන් දන්නාවූ; පරවැඩ සිදුකරන කරුණාවට පදස්ථානවූ දෙශනා ප්‍රඥාවෙන් දක්නාවූ; (කෙලෙස්) සතුරන් නැසූ හෙයින්, ප්‍රත්‍යයාදියට සුදුසු හෙයින් අර්හත් වූ; මනාකොට තෙමේ ම සියලු ධර්මයන් අවබෝධ කළ හෙයින් සම්‍යක් සම්බුද්ධ වූවහු විසිනැයි මෙසේ චතුර්වෛශාරද්‍ය වශයෙන් සතර ආකාරයකින් සතුති කරනලද (සර්ව්ඥයන් විසින්) සතර ධර්මකොටසක් ප්‍රකාශ කරනලද්දාහුය, යම් ධර්ම කොටසක් ඇති තමාකෙරෙහි මොනොවට දක්නමෝ මෙසේ කියමු ද, රජ-රජමහ ඇමති ආදීන්ගේ උපස්ථානාදිය දක්නමෝ නො කියමු ද, කායබලය දක්නමෝ නො කියමු ද, (ඒ සතර ධර්මයෝසි.)

සත්ථරි පසාදෙ= "ඉතිපිසෝ භගවා" යනාදි නයින් බුදුගුණ සිහි කරන්නවුන්ට උපන් පැහැදීම යැ; **ධම්මෙ පසාදෙ**= "සවාකඛාතෝ භගවතා ධම්මෝ" යනාදි නයින් සිහිකරන්නවුන්ට උපන් පැහැදීම යැ; **සීලෙසු පරිපූරකාරිතා**= ආර්‍යකාන්ත වූ ශීලයන් සම්පූර්ණ කරනසුලු බව යැ; ආර්‍යකාන්ත (=ආර්‍යයන්ට රුචි වූ) ශීලයෝ නම්? පන්සිල් යැ;

ආර්‍යකාන්තශීලය.

ඒ එසේ මැනි- ඒ ශීලයන් අන්‍යභවයකට ගියාවූ ද ආර්‍ය ශ්‍රාවක තෙම තමාගේ ආර්‍ය ශ්‍රාවක භාවය නො දන්නේ නමුදු නො ඉක්මවසි; ඉදින් යම් හෙයකින් ඔහට කිසිවෙක් මේ සියලු සක්විතිරජය පිළිගෙන කුඩා මැස්සකු ජීවිතයෙන් තොර කරවසි කියන්නේ නම් හෙතෙම ඔහුගේ වචනය කරන්නේය යන මේ කාරණය හෙතුරහිත යැ; මෙසේ ආර්‍යයන්ට ශීලයෝ කාන්ත වූවාහු ප්‍රිය වූවාහු මනාප වූවාහු වෙති; ඒ ශීලයන් සඳහා කියනලදී "සීලෙසු පරිපූරකාරිතා" සි. **සහධම්මිකා බො පන**=

සහධාර්මිකයෝ.

භික්ෂුයැ භික්ෂුණියැ ශික්ෂමාණයැ ශ්‍රාමණේරයැ ශ්‍රාමණේරියැ උපාසකයැ උපාසිකායැ යන මොවුහු සත් දෙන සමාන ධර්මයෙහි හැසිරෙන්නාහු වෙති; ඒ එසේ මැනි- මොවුන් අතුරෙහි භික්ෂු තෙම භික්ෂූන් සමග සමාන ධර්මයෙහි හැසිරෙයි, සමානශික්ෂා ඇතිබැවිනි; එසේ ම භික්ෂුණී තොමෝ භික්ෂුණීන් සමග —පෙ— උපාසිකා තොමෝ උපාසිකාවන් සමග සමාන ධර්මයෙහි හැසිරෙයි; ස්‍රොතාපන්න තෙම ස්‍රොතාපන්නයන් සමග, සකෘදාගාමී තෙම සකෘදාගාමීන් සමග අනාගාමී තෙම අනාගාමීන් සමග සමාන ධර්මයෙහි හැසිරෙයි; එහෙයින් මේ සියල්ලෝ මැ සහධාර්මිකයෝ යයි කියනු ලැබෙත්. තවද- මෙහි ආර්‍ය ශ්‍රාවකයෝ මැ අදහස් කරන ලද්දාහුයැ; යම් හෙයකින් භවාන්තරයෙහි පවා ඔවුන්ගේ මාර්ගඵලයෙහි විවාදයෙක් නැත් ද, එහෙයින් ඔවුහු අතිශයින් සමාන ධර්මයෙහි හැසිරෙන සුලු බැවින් සහධාර්මිකයෝ යැ; මෙයින් "සුපටිපන්නෝ

භගවතො සාවක සඞ්ඝා'' යනාදි නයින් සඞ්ඝයා සිහි කරන්නවුන්ට උපන් පැහැදීම කියනලද්දේයි. මෙතෙකින් සෝවාන්වූවහුගේ සතර අඞ්ගයෝ කියනලද්දාහු වෙත්.

ඉමෙ ඛො නො ආවුසො= ඇවැත්නි! ඇපි යම් ධම්මෙනෙක් තමා කෙරෙහි දක්නමෝ මෙසේ කියමුද, මේ සතර ධම්මෝ ඒ භාග්‍යවතුන් විසින් අපගේ අස්වැසිම ද බලය ද වෙනිසි වදුරන ලද්දාහුය; **සො අම්හාකං සත්ථා** යන මෙයින් පූණ්ණකාශ්‍යපාදි ශාස්තෘන් සදෙන දක් වත්; යම් සේ වනාහි මෙකල ශාසනයෙහි ආචාර්‍ය්‍ය උපාධ්‍යායාදීන් කෙරෙහි අපගේ ආචාර්‍ය්‍ය ය, අපගේ උපාධ්‍යායය ය යි ගෘහනිශ්‍රිත ප්‍රේමය වේද, මෙබඳු වූ ප්‍රේමය සඳහා "සත්ථරි පසාදෙ" යි කියති; (අටුවා පුස්තකාරූඪ කළ මහා සඞ්ඝරක්ෂිත) තෙරුන් වහන්සේ වනාහි මෙසේ කීහු- යම් හෙයකින් ශාස්තෘහු නම් එකෙකුට නො වේ ද, දෙදෙනෙකුට නො වේ ද; දෙවියන් සහිත ලොවට එකෙක් ම ශාස්තෘහු වේ ද; එහෙයින් තීර්ථකයෝ "අම්හාකං සත්ථා" යන එක පදයකින් ම ශාස්තෘහු වෙන් කොට මේ පදයෙන් ම වරදනාලද්දාහු පරදවනලද්දාහු යයි.

ඛමෙම පසාදෙ යන මේ වනාහි යම් සේ මෙකල ශාසනයෙහි අපගේ දීඝනිකාය ය, අපගේ මජ්ඣිමනිකාය ය යි මමත්වය කෙරෙත් ද, එපරිද්දෙන් තම තමන්ගේ පඤ්ඤාපනිධම්මයෙහි ගෘහශ්‍රිත ප්‍රේමය සඳහා කියත්; **සීලෙසු**= අජ්ඣාචාර - ගොසීල - මෙණ්ඩකසීල - කුක්කුර සීලාදි යෙහි; **ඉධ නො ආවුසො** යන මෙහි ඉධ යනු ප්‍රසාදය සඳහා කියත්. **කො අධිප්පායො**= අධිප්‍රයෝජනය කවරේ ද? **යදිදං**= නොපගේ හා අපගේ ද විවිධ කාරණයක් කියන්නහු ද, ඒ කිනම් ද? **යම්හෙයකින් නොපගේ ද සතර තැනෙක්හි ප්‍රසාදය වෙයි; අපගේ ද (සතර තැනෙක්හි ප්‍රසාදය වෙයි,)** මේ ප්‍රසාදයෙහි නොපි ද ඇපි ද දෙකට බිඳුනු සඞ්ඝයක් හෙයින් එකසදෘශ වූවාහු නො වමෝ දැ? යි වචනයෙන් සම්බුරව සිටියා හු ද; එහෙයින් ඔවුන්ගේ ඒ සම්බුරත්වය බිඳින්නාවූ භාග්‍යවතුන් වහන්සේ **එවං වාදිනො** යනාදිය වදුළසේක.

එහි එකා නිඤ්ඤා= ඒ ප්‍රසාදයාගේ පර්‍යවසානය වූ යම් නිෂ්ඨාවක් වන්නී ද, කිම ඕ නිෂ්ඨාව එකක් ද? නොහොත් වෙන් වූවා දැ? යි මෙසේ විචාරවූ ය යි කියයි; තව ද- යම් හෙයකින් ඒ ඒ ලබ්ධියෙහි නිෂ්ඨාවක් නො පනවන්නෙක් නම් නැත් ද, ඒ එසේමැයි- බ්‍රාහ්මණයන්ගේ (ලබ්ධියෙහි) බඹලොව නිෂ්ඨාව ය; තාපසයන්ගේ ආභස්සරය ය; පරිව්‍රාජකයන්ගේ සුභකිණ්හය ය; ආජීවිකයන්ගේ "අනන්තමානස" යයි මෙසේ පරිකල්පිත (= සලකනලද) අසංඛ්‍යාතභවය ය; මේ ශාසනයෙහි අග්‍රඵල නිෂ්ඨාය යි. තව ද- මොවුහු සියල්ලෝ මැ රහත් බව ම නිෂ්ඨාව යයි කියත් ද; එතකුදු වුවත් දෘෂ්ටි වශයෙන් බ්‍රහ්ම ලොකාදිය පනවත් ද, එහෙයින් තම තමන්ගේ ලබ්ධි වශයෙන් එක ම නිෂ්ඨාවක් පනවත්. එය දක්වන්ට භාග්‍යවතුන් වහන්සේ **සම්මා වාකරමානො** යනාදිය වදුළහ.

දැන් හිඤ්ඡූන්ගේ ද එක නිඝණ්ඨව යැ; තීර්ථකයන්ගේ ද එක නිඝණ්ඨව යැයි යුකති ප්‍රකාශ කරන්නවුන් දෙදෙනෙකු මෙන් සිටිකල්හි භාග්‍ය වතුන් වහන්සේ අනුයොග (= කරුණු ගැන්වීම්) වත දක්වන සේක් **සා පනාවුසො නිඝා සරාගස්ස උදහු වීතරාගස්ස** යනාදිය වදාළහ. එහි යම්හෙයකින් රාගරක්තාදීන්ට නිඝණ්ඨ වක් නම් නැත් ද, ඉදින් වන්නී නම් බලු-සිවල් ආදීන්ට ද වන්නී යයි මේ දෝෂය දක්නා වූ තීර්ථකයන්ගේ "වීතරාගස්ස ආවුසො! සා නිඝා" යනාදි නයින් විසඳීම දක්වන ලද්දේය. එහි **විදූසූනො**= පණ්ඩිතයාගේ; **අනුරුඛපටිවිරුඛස්ස**= රාගයෙන් අනුරුඬ වූවහුගේ (=ශුභවශයෙන් ඇලුනහුගේ) ක්‍රොධයෙන් ප්‍රතිවිරුඬ වූවහුගේ; **පපඤ්චාරාමස්ස පපඤ්චරතිනො** යන මෙහි "ආරමන්ති එත්ථාති" (= මෙහි සිත් අලවා වෙසෙත් නුයි) "ආරාම" නම් වෙයි, "පපඤ්චා ආරාමො අස්සාති" (= ප්‍රපඤ්චය ආරාම වූයේ මෝහට නුයි) "පපඤ්චාරාම" නම් වේ; "පපඤ්චෙ රති අස්සාති" (=ප්‍රපඤ්චයෙහි රතිය මෝහට නුයි) "පපඤ්චරති" නම් වේ. **පපඤ්ච** යනු ද මත්ත ප්‍රමත්තාකාර භාවයෙන් පැවැත්තාවූ තෘෂ්ණාමාන දෘෂ්ටින්ට මේ නමෙකි; මෙහි වූ කලි **තණ්හාදෘෂ්ටිහු** ම අදහස් කරන ලද්දාහුය. **සරාගස්ස** යනාදි පස්තැන්හි එක **ම** කෙලෙශයෙක් ආයේය; ඔහුගේ ආකාර වශයෙන් නානාත්වය දතයුතුයි. ඒ එසේ මැයි- **සරාගස්ස** යි වදාළතැන්හි පඤ්චකාමගුණික රාගයාගේ වශයෙන් ගන්නා ලද්දේය; **සනිණ්හස්ස** යි භවතෘෂ්ණා වශයෙන් ද; **සඋපාදානස්ස** යි ග්‍රහණ වශයෙන් ද; **අනුරුඛ පටිවිරුඛස්ස** යි යුගම වශයෙන් ද; **පපඤ්චාරාමස්ස** යි ප්‍රපඤ්චයාගේ උපතත්තිය දක්වීම් වශයෙන් ද දක්වනලද්දේයි, නොහොත් **සරාගස්ස** යන මෙහි අකුශලමූල වශයෙන් ගන්නා ලද්දේය; **සනිණ්හස්ස** යන මෙහි තෘෂ්ණාප්‍රත්‍යයෙන් උපාදානයාගේ දුක්වීම් වශයෙන් ගන්නාලද්දේය; සෙස්ස පළමු සමාන මැයි. (මහාසඞ්ඝරක්ඛිත) තෙරුන්වහන්සේ වනාහි කිහු- කුමක් හෙයින් මෙසේ විශෙෂ දර්ශනය කරවු ද? ඒ එසේ මැයි- මේ එක මැ ලොභය රැඳීම් වශයෙන් "රාග" යයි වදාරනලද, යලි තෘෂ්ණා කිරීම් වශයෙන් "තණ්හා" යයි ද, ගැනීම් අර්ථයෙන් "උපාදාන" යයි ද, යුගම වශයෙන් "අනුරොධ පටිවිරොධ" යයි ද, ප්‍රපඤ්චයන්ගේ ඉපදීම් අර්ථයෙන් "පපඤ්ච" යයි ද වදාරනලද්දේයි.

මෙවිට මේ කෙලෙසුන්ට මුල් වූ දෘෂ්ටිවාදය දක්වන සේක් **මෙ'මා සික්ඛවෙ! දිට්ඨියො** යනාදිය වදාළහ. එහි **භවදිට්ඨි** යනු ශාශ්වතදෘෂ්ටි යයි; **විභවදිට්ඨි** යනු උච්ඡෙදදෘෂ්ටි යයි; **භවදිට්ඨි අලිනා**= තෘෂ්ණා-දෘෂ්ටි වශයෙන් ශාශ්වතදෘෂ්ටිය වැලඳගත්තාහු; **උපගතා**= තෘෂ්ණා-දෘෂ්ටි වශයෙන් ම පැමිණියාහු; **අජ්ඣොසිතා**= තෘෂ්ණා-දෘෂ්ටි වශයෙන් ම ඇතුලත් වූවාහු; **විභවදිට්ඨියා තෙ පටිවිරුඛා**= ඔවුහු සියල්ලෝ උච්ඡෙදවාදීන් සමග තෙපි අඥබාලයෝ යැ, නො දන්නහු යැ, මේ ලොව ශාශ්වත යැ, මේ ලොව නො නැසේ යැයි ප්‍රතිවිරුඬ වූවාහු **නිතොර කලහ-**

විවාදයෙහි ඇලුනාහු වෙසෙත්. දෙවෙනි වාරයෙහි ද මෙම නයයි. සමුදයසූත්‍ර යනාදියෙහි- දෘෂ්ටීන්ගේ සමුදයයෝ (= ඉපදීම්) දෙකෙකි, ක්ෂණික සමුදය ද ප්‍රත්‍යය සමුදය දැයි කියායි. ක්ෂණික සමුදය (නම්) දෘෂ්ටීන්ගේ ඉපදීම ය; ප්‍රත්‍යය සමුදය අට තැනෙක් වෙති; ඒ කවරහු ද? "සහජාතයෝ ද දෘෂ්ටිසම්ප්‍රයුක්ත යෙකි; අවිද්‍යාව ද- ඵස්පර්ශය ද- සංඥාව ද- චේතනාව ද- අයෝනිසෝමනසිකාරය ද- පාපමිත්‍ර තෙමේ ද- පරතෝඝෝෂය ද දෘෂ්ටිසම්ප්‍රයුක්ත යෙකි. සමුච්ඡේදාදියෙන් දෘෂ්ටීන්ගේ ඉපදීමට සහජාතයෝ හෙතු වෙයි, සහජාතයෝ ප්‍රත්‍යය වේ; මෙසේ සහජාතයෝ ද දෘෂ්ටිසම්ප්‍රයුක්ත යෙක් වේ. අවිද්‍යාව- ස්පර්ශය- සංඥාව- චේතනාව- අයෝනිසෝමනසිකාරය- පාපමිත්‍ර තෙමේ- පරතෝඝෝෂය සමුච්ඡේදාදියෙන් දෘෂ්ටීන්ගේ ඉපදීමට හෙතු වෙයි, පරතෝඝෝෂය ප්‍රත්‍යය වේ."

(දෘෂ්ටීන්ගේ) අස්තාඛගමයෝ ද දෙදෙනෙක් ම වෙති, ක්ෂණිකාස්තාඛගමය ද ප්‍රත්‍යයාස්තාඛගමය ද කියායි; ක්ෂණිකාස්තාඛගමය නම්? (කෙණෙහි) ක්ෂය වීම ය, (පිළිවෙළින්) නැසීම ය, බිඳී දෘෂ්ටිභාගය. ම ය, හාත්පසින් බිඳීම ය, අනිත්‍යබව ය, අතුරුදහන් වීම ය; ප්‍රත්‍යයාස්තාඛගමය නම්? ස්‍රෝතාපත්තිමාර්ගය ය; ඒ එසේ මැයැ- සෝවාන් මහ දෘෂ්ටීන්ගේ සමුදස්තාත (=සහමුලින් නැසීම) යයි කියනලදී. **අස්සාදං**= දෘෂ්ටිමූලික වූ ආනිශංසය; යමක් සඳහා (මේ) වදාරන ලද ද- **යඤ්හි භික්ඛවෙ සත්ථා හොති, තඤ්හි භික්ඛූ සාවකා හොන්ති, තඤ්හි භික්ඛවෙ සත්ථාරං සාවකා සක්කරොන්ති, ගරුං කරොන්ති මානෙන්ති පූජෙන්ති, ලභති ච තතො නිදානං චීවරපිණ්ඩපාතසේනාසනගිලානප්පච්චය භෙසජ්ජපරික්ඛාරං අයං හික්ඛවෙ දිට්ඨියා දිට්ඨධම්මිකො ආනිසංසො** (= ශාස්තෘ තෙම යම් දෘෂ්ටියක් ඇත්තේ වේද, ශ්‍රාවකයෝ ඒ දෘෂ්ටිය ඇත්තාහු වෙති, ශ්‍රාවකයෝ යම්බඳු දෘෂ්ටියක් ඇති ශාස්තෘහු සත්කාර කෙරෙත් ද ගරු කෙරෙත් ද බුහුමන් කෙරෙත් ද පූජා කෙරෙත් ද, ඒ හෙතුවෙන් (ශ්‍රාවක තෙම) සිවුරු - පිණ්ඩපාත - සෙනසුන් - ගිලන්පස බෙහෙත් පිරිකර ලබන්නේ ද වෙයි, මහණෙනි! මේ දෘෂ්ටිය පිළිබඳ ඉහාතම්යෙහි වූ (ආනිශංසයෙකි) යි. **ආදීනවං**= දෘෂ්ටිග්‍රහණය මුල්කොට ඇති උපද්‍රවය; හේ වගාලිව්‍රතය, උඤ්ඤාචරිකවත්තය, කණ්ටකාධාරයෙහි හිඳීම් සිටීම් ආදිය ඇතිබවය, පඤ්චතාපයෙන් තැවීමය, ගල්පෘෂ්ඨයට පැනීමය, කෙස්රැවුලු ඉදිරීමය, අප්‍රාණකධ්‍යානය, යනාදීන් ගේ වශයෙන් දතයුත්තේයි. **නිස්සරණං**= දෘෂ්ටීන්ගේ නිස්සරණය නම් නිර්වාණ යයි; **යථාභූතං නප්පජානන්ති**= යමෙක් තුමූ මේ සියල්ල තතු සේ නො දනිත් ද; **ඉමා පරිමුච්චන්ති දුක්ඛස්මා**= සියලු වෘත්තදුඃඛයෙන් නො මිදෙත්; මෙයින් මොවුන්ගේ නිෂ්ඵාවක් නම් නැතැයි දක්වයි. **පරිමුච්චන්ති දුක්ඛස්මා**= සියලු සසර දුකින් මිදෙත්; මෙයින් මොවුන් ගේ නිෂ්ඵාව ඇතැයි යුක්ති බණන්නවුන් දෙදෙනාගේ යුක්තිය සිදිමින් මෙහි ශාසනයෙහි මේ නිෂ්ඵාව ඇතිබැව් පිහිටුවන සේකි.

මෙවිට දෘෂ්ටින්ගේ සිදීම දක්වන සේක්- **වත්තානිමානි භික්ඛවෙ!** **උපාදානානි** යනාදිය වදාළහ. ඔවුන්ගේ විස්තර කථාව විශුද්ධිමාර්ගයෙහි කියනලද්දීමය, **සබ්බූපාදානපරිඤ්ඤත්ථාය ධම්මං දෙසෙති**= ඇපි සියලු උපාදානයන්ගේ ප්‍රහාණය ඉක්මවීම කියාමැයි මෙසේ ප්‍රතිඥා කරන්නාහු; **න සම්මා සබ්බූපාදානපරිඤ්ඤං පඤ්ඤපෙන්ති**= සියලු උපාදානයන්ගේ ඉක්මවීම මනාකොට නො පනවත්; කිසිවෙක් කාමෝපාදානමාත්‍රයාගේ (ප්‍රහාණය) පනවති; කිසිවෙක් දෘෂ්ට්‍යුපාදානයාගේ ද; කිසිවෙක් ශීල ව්‍රතොපාදානයාගේ ද (ප්‍රහාණය පනවති;) එතකුදු වුවත් ආත්මවාදෙ පාදානයාගේ ප්‍රහාණය පනවන්නෙක් නම් නැති; නැවත ඔවුන්ගේ වෙනස දක්වන සේක්- **කාමූපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති** යනාදිය වදාළහ; එහි සියල්ලෝ මැ කාමෝපාදානයාගේ ප්‍රහාණය පනවත් මැයි. ඒ එසේ මැයි- **ඡණ්ණවතිපාසණ්ඩියෝ** මැ "කාමයෝ වනාහි පැවිද්ද විසින් සෙවනය නො කළ යුත්තාහුය" යි වස්තුප්‍රතිසෙවනකාමය කැප යයි නො පනවති, අකැප වූවක් ම කොට පනවති; යමෙක් වනාහි සෙවුනාහු ද ඔවුහු සොරකම්න් සෙවනය කෙරෙත්. එයින් කියනලදී- **කාමූපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති** යනු. යම් හෙයකින් "නත්ථි දින්නං" යනාදිය ගෙන හැසිරෙත් ද, ශීලයෙන් ශුද්ධිය ව්‍රතයෙන් ශුද්ධිය භාවනාවෙන් ශුද්ධිය වේ යයි ගනිත් ද, ආත්ම යයි දැඩි කොට ගැනීම නො හරිත් ද, එහෙයින් දෘෂ්ට්‍යුපාදානයාගේ (ඉක්මවීම) නො පනවති, ශීලව්‍රතොපාදානයාගේ (ඉක්මවීම) නො පනවති, ආත්මවාදෙපාදානයාගේ ඉක්මවීම නො පනවත්; **කිං කිස්ස හෙතූ**= මොවුන්ගේ ඒ නො පැනවීම කුමක් හෙතු කොට ගෙන, කුමන කරුණකින් ද යත්? **ඉමානි හි තෙ හොතෙනා** යනු යම් හෙයකින් ඒ පින්වත්හු මේ කරුණු තුන යථා සභාවයෙන් නො දනිත් ද යන අර්ථයි. මෙහි යමෙක් වනාහි ප්‍රහාණය ත් දෙදෙනාගේ පැනවීමට කරුණු වූ දෘෂ්ටිය හා ශීලව්‍රතය ද "මේ ප්‍රහාණය කටයුතු" යයි යථා සභාව වශයෙන් දනිත් ද, ඔවුන් සඳහා මත්තෙහි දෙවාරය වදාරන ලද්දාහුය; එහි යමෙක් "දුන් දෙයෙහි විපාකය ඇත" යනාදිය ගනිත් ද, ඔවුහු දෘෂ්ට්‍යුපාදානයාගේ ඉක්මවීම පනවති; යමෙක් ශීලයෙන් ශුද්ධිය නැත, ව්‍රතයෙන් ශුද්ධිය නැත, භාවනාවෙන් ශුද්ධිය නැතැයි ගනිත් ද, ඔවුහු ශීලව්‍රතොපාදානයාගේ ද ඉක්මවීම පනවති; එතකුදු වුවත් ආත්මවාදෙපාදානයාගේ ඉක්මවීම පනවන්ට එකෙකු දු නො හැකි වෙයි; යම් හෙයකින් අෂ්ටසමාපත්තිලාභී වූවාහු ද සඳ හිරු අතින් පිරිමැද හැසිරෙන්නාහු නමුදු තීර්ථකයෝ ප්‍රහාණයන් තිදෙනෙක් පනවත් ද, ආත්මවාදෙපාදානය හරින්ට නො හැකි වෙත් ද, එහෙයින් නැවත නැවත වෘත්තයෙහි මැ වැටෙත්. ඒ එසේ මැයි- මොවුහු පෘථිවියට ජුගුප්සා කරන සුවෙකු මෙනි; ඒ මෝ අර්ථ ප්‍රකාශ කරන උපමාවකි-

පෘථිවිය සාවෙකුට (මෙසේ) කීවාල- එම්බා ශශකය! ඔයි; සාවා කිය, මේ කවරෙක් දැ? ඔයි; මාගේ මැ මතුයෙහි සියලු ඉරියව් පවත්වමින් මල - මූ කරමින් කුමක් හෙයින් මා නො හඳුනහි දැ? ඔයි; තී විසින් මම මොනොවට දක්නාලදුයෙමි, මා විසින් ඇක්මුණු තැන ද ඇඟිලිඅගින් සපශී කළ තැනක් මෙන් වෙයි, හළ (මූත්‍ර) ජලය මද පමණයැ, මලය ඉඟිනිඵල යක් පමණයැ; එතකුදු වුවත් ඇත් අස් ආදීන් විසින් ඇක්මුණු තැනද මහත්යැ, ඔවුන්ගේ මූත්‍රය ද කළයක් පමණයැ, මලය ද පැසක් පමණ වෙයි; තී විසින් මට කම් නැහැයි උඩ පැන අන් තැනෙක වැටුනේය; නැවත පෘථිවි තොමෝ ඔහුට කිය, පුදුමයැ දුරට ගියෙහි, මාගේ මතුයෙහි මැ වැටුනේ නො වෙහි දැ? ඔයි; යලි හෙතෙම ඒ පෘථිවියට ජුගුප්සා කරන්නේ උඩ පැන අන් තැනෙක වැටුනේය; මෙසේ භවුරුදු දහස කුදු උඩ පැන පැන වැටෙන්නාවූ ශශක තෙම පෘථිවිය හරින්ට නො හැකි වේ. එපරිද්දෙන් තීර්ථකයෝ සියලු උපාදානයන්ගේ ඉක්මවීම පනවන්නාහු ද කාමොපාදානාදි වූ තිදෙනාගේ මැ ඉක්මවීම පනවති, එතකුදු වුවත් ආත්මවාදෙපාදානය හරින්ට නො හැකි වන්නාහු නැවත නැවත වෘත්තයෙහි මැ වැටෙත් යයි. මෙසේ තීර්ථකයෝ යම් ආත්මවාදෙපාදානයක් ඉක්මවන්ට නො හැකි වෙත් ද, ඔහුගේ වශයෙන් දෘෂ්ටිවෙශ්දවාරය වදාරා මේවිට ප්‍රඥාදවෙශ්දවාරය දක්වනසේක් **එවරූපෙ බො හික්ඛවෙ! ධම්මවිනයෙ** යනාදිය වදළහ.

එහි- ධම්මවිනයෙ= ධර්මයෙහි හා විනයයෙහි ද දෙපදයෙන් ම අනෙයන්‍යාණික ශාසනය දක්වයි. **යො සත්ථරි පසාදෙ සො හි සම්ම ගහනෙ**= අනෙයන්‍යාණික ශාසනයෙහි වනාහි ශාස්තෘ තෙම කලුරිය කොට සිංහයෙක් හෝ වෙයි, ව්‍යාඝ්‍රයෙක් හෝ දිවියෙක් හෝ, වලසෙක් හෝ, තරසෙක් හෝ වෙයි; යලි ඔහුගේ ශ්‍රාවකයෝ මෘගයෝ හෝ, ශූකරයෝ හෝ, පසදමෘගයෝ හෝ වෙති; හෙතෙම මොවුහු පෙර මාගේ උපස්ථායකයෝ යැ, ප්‍රත්‍යයකදායකයෝ යැයි ඤාතිගයක් හෝ මෛත්‍රියක් හෝ කරුණාවක් හෝ නො කොට ඔවුන් මතුයෙහි පැන ලේ ද බොයි, ඝන ඝන වූ මස් ද කයි; නැවත ශාස්තෘ තෙමේ හෝ බළලෙක් වෙයි, ශ්‍රාවකයෝ කුකුළන් හෝ මීයෝ හෝ වෙති; එකල්හි ඔවුන් කී තියෙන් ම අනුකම්පා නො කොට කයි; නොහොත් ශාස්තෘ තෙම නිරයපාලයෙක් වෙයි; ශ්‍රාවකයෝ නිරිසත්තු වෙති, හෙතෙම මොවුහු පෙර මාගේ ප්‍රත්‍යයදායකයෝ යයි අනුකම්පාවක් නො කොට තන්වැදුරුම් කම්කටුලු කොරයි, ගිනි ඇවිලගත් රියෙහිත් යොදයි, අගුරුපව්වටත් නගවයි, ලොහොකුඹුයෙහිත් දමයි, නොයෙක් දුඃඛ සහභාවයන් සමගත් මොනොවට යොදවයි; යලි ශ්‍රාවකයෝ හෝ කලුරිය කොට සිංහාදීහු වෙති; ශාස්තෘ තෙම මෘගාදීන් අතුරෙන් එකෙක්

වෙයි; ඔවුහු ඇපි පෙර මොහු සිව්පසයෙන් උවටැන් කෙළෙමු, මේ තෙම අපගේ ශාසනය යයි ඔහු කෙරෙහි ක්ෂාන්තියක් හෝ මෛත්‍රියක් හෝ කරුණාවක් හෝ නො කොට කි නියෙන් ම අනය ව්‍යසනයට පමුණුවත්. මෙසේ අනෙයය්‍යාණික ශාසනයෙහි ශාස්තෘන් කෙරෙහි යම් ප්‍රසාදයෙක් වේද, ඒ ප්‍රසාදය මනාකොට පැමිණියේ නො වෙයි; මද කාලක් ගොස් ද පසුව නැසෙන්නේ මැයි.

යො ධම්මෙ පසාදෙ= යම් හෙයකින් අනෙයය්‍යාණික ශාසනයෙහි ධර්මයෙහි ප්‍රසාදය නම්? ඉගෙනගත් පුහුණු කාල කියනලද ධරණලද පමණ ඇති පෙලදහමෙහි ප්‍රසාදය වේද; එතකුදු වුවත් මෙහි සසරින් මිදීමෙක් නැත් ද; එහෙයින් මෙහි යම් පැහැදීමෙක් වේ ද, ඒ පැහැදීම නැවත නැවත සසර ම ගැබුරු කෙරේ නුයි මනාකොට නො පැමිණියේ අසවහාවයට පැමිණියේ යයි කියනුලැබේ. **යා සීලෙසු පරිපූරකාරිතා=** අනෙයය්‍යාණික ශාසනයෙහි අජ්ඣාලාදින්ගේ වශයෙන් යම් සම්පූර්ණ කරනසුලුබවකුත් වේ ද, ඕ තොමෝ ද යම් හෙයකින් සසරින් මිදීමට භවයෙන් නික්මයෑමට නො පමුණුවා ද, යලි සම්පාදනය කරනලද්දී නිරිසන් යොනියට පමුණුවා ද, වරදනාලද්දී නිරයට පමුණුවා ද; එහෙයින් මනාකොට නො පැමිණියා යයි කියනුලැබේ. **යා සහධම්මිකෙසු=** අනෙයය්‍යාණික ශාසනයෙහි වනාහි යම් සහදැමියෝ වෙත් ද, ඔවුන් කෙරෙහි; යම් හෙයකින් ඇතැම් කෙනෙක් කලුරිය කොට සිංහාදිහු හෝ වෙත් ද; ඇතැම් කෙනෙක් මෘගාදිහු වෙත් ද, එහි සිංහාදි වූවාහු මොවුහු අපගේ සහදැමියෝ වූවාහු යයි මෘගාදි වූවන් කෙරෙහි ක්ෂාන්ති ආදිය නො කොට පළමු කි නියෙන් ම ඔවුන්ට මහත් වූ දුක් උපදවත් ද; එහෙයින් මෙහි සහදැමියන් කෙරෙහි ප්‍රියමනාපබව ද මනාකොට නො පැමිණියා යයි කියනු ලැබේ. නැවත මේ සියලු මැ කාරණයන්ගේ භෙදය එක්තැන් කොට දක්වන භාග්‍යවතුන් වහන්සේ **තං කිස්ස හෙතු? එවං භන්තං ගිකඛවෙ! හොති** යනාදිය වදාළහ. **එහි** මේ සංක්ෂෙපපාඨී යයි- **එවං භන්තං ගිකඛවෙ! හොති=** මා විසින් "**යො සත්ථරි පසාදෙ සො න සම්මග්ගතො හොති**" යනාදි වූ යමක් කියනලද ද, මේ කාරණය මෙසේ වෙයි; කුමක් හෙයින ද? යම් හෙයකින් ඒ ප්‍රසාදාදිහු වරදවා කියනලද සම්‍යක්සම්බුද්ධ නො වූවෙකු විසින් අවබොධ කරනලද ශාසනයෙහි වූවාහු වෙත් ද; එහෙයිනි, මෙහි වනාහි **යථානං** යනු කාරණාර්ථයෙහි නිපාත යැ; **එහි දුරක්ඛාතෙ=** වරදවා කියනලද; වරදවා කියනලද හෙයින් ම දුරවබොධ වූ; ඒ මේ ධර්මය වනාහි යම් හෙයකින් මහපල පිණිස නො පමුණුවාද, එහෙයින් **අනිය්‍යානිකා** යැ; රාගාදින්ගේ සංසිදීම පිණිස නො පවත්නා හෙයින් **අනුපසම සංවත්තනිකා** යැ; සම්‍යක් සම්බුද්ධ වූ සර්ඥයන් විසින් නො අවබොධ කරනලද නුයි **අසම්මා සම්බුද්ධප්පවෙදිතා** යැ; ඒ අනෙයය්‍යාණික වූ (රාගාදින්ගේ) සංසිදීම පිණිස නො පවත්නා වූ සම්‍යක්සම්බුද්ධ නො වූ වෙකු විසින් අවබොධ කරනලද (ශාසනයෙහි-)

මෙතෙකින් භාග්‍යවතුන් වහන්සේ තීර්තකයන් කෙරෙහි ප්‍රසාදය සුරාපානඝණ්ඨ සිවලා කෙරෙහි ප්‍රසාදය මෙන් නිරර්ථක යයි දක්වූ සේක-

එක්තරා කණඝිවලෙක් රාත්‍රියෙහි නුවරට පිවිසියේ සුරාමණ්ඩිකා තෝර වනයෙක්හි හෙව නිදන්නේ හිරු උදාවන කල්හි පිබිද

සුරාපානයඝණ්ඨ සිවලා. මෙසේ සිතී ය. "මේ කල්හි යා නොහැක, අපගේ සතුරෝ බොහෝ යැ, එකෙකු දැසිදාකරන්ට වටනේ ය" යි හෙතෙම යන්නා වූ එක් බමුණකු දැක මොහු රවටන්නෙමියි හිමි! බමුණාණෙනි! යි කියය; තෙල කවරෙක් බමුණා අමතා දැ? යි; හිමි! මම යැ. පළමුකොට මෙහි එනු මැනවැයි; කිම පින්වත! යි; මා ගමින් පිටත පමුණුව, මම නුඹට කහවුණු දෙසියයක් දෙන්නෙමියි; හෙතෙම ගෙන යන්නෙමියි පාදයන් ගත්තේය; කොල! බාලබමුණ! මාගේ කහවුණු බැහැර දමනලද්දහු නැති, කහවුණු දුලීහ යැ, මතා කොට මා ගනුව යි; පින්වත! කෙසේ ගනිම් දැ? යි; උතුරුසළුයෙහි පොදියක් කොට අංශයෙහි එල්වා ගනුව යි; බමුණු තෙම ඔහු එසේ ගෙන දකුණුදෙරටුව සමීපතැනට ගොස් මෙහි තබම් ද? යි විචාළේය; මේ කවර නම් තැනක් දැ? යි; මේ මහා දෙරටුව යයි; කොල! බාල බමුණ! කිම තාගේ නැයෝ ඇතුලු දෙරටුවෙහි කහවුණු තබත් ද? මා ඉදිරියට ගෙන යව යි; හෙතෙම නැවත නැවත මද මද තැන් ගොස් මෙහි බස්වම් ද? මෙහි බස්වම් දැ? යි විචාරා ඒ සිවලා විසින් තර්ජනය කරනලදුව රවටනලද්දේ නිර්භීය ස්ථානයකට ගොස් මෙහි බස්සව යි කියනලද්දේ බස්වා සළුව ගත්තේය; කණඝිවල් තෙම මෙසේ කිය, "මම නුඹට කහවුණු දෙසියයක් දෙන්නෙමි" යි කියෙමි, එතකුදු වූවත් මාගේ කහවුණු බොහෝ වෙති, කහවුණු දෙසියයක් මැ නොවෙති, යම්තාක් මම කහවුණු ගෙන එමි ද ඒතාක් නුඹ සූඝ්‍යියා බලමින් සිටුව යි කියා මදක් ගොස් නැවති නැවත බමුණාට කියා; "හිමි! බමුණ! මෙහි නො බලව, සූඝ්‍යියා ම බලමින් සිටුව" යි මෙසේක් කියා වැවකේ වනඝණට පිවිස රුවි වූ පරිද්දෙන් නික්ම ගියේය. හිරු බලමින් සිටියා වූ ම බමුණාගේ නළලින් ද කිසිලිවලින් ද සෝදිය වැගුරුනාහුය. ඉක්බිති ඕහට රැක්දෙවියෙක් (මෙසේ) කිය.

118. "සදදහාසි සිගාලස්ස - සුරාපිතස්ස බ්‍රාහ්මණ!
සිප්පියානං සතං නත්ථි - කුතෝ තාහං සතා දුවේ" යි-

මෙසේ කණඝිවලා කෙරෙහි ප්‍රසාදය යම් සේ නිරර්ථක වූයේ ද, එපරිද්දෙන් තීර්තකයන් කෙරෙහි (පැහැදීම ද නිරර්ථක) යැයි; අනේයාණික ශාසනයෙහි ප්‍රසාදයාගේ නිරර්ථකභාවය දක්වා නෛයාණික

---

118. බ්‍රාහ්මණ= බමුණ! සුරාපිතස්ස= සුරාපාණඝ කළ; සිගාලස්ස= සිවලාගේ (වචනය;) සදදහාසි= හැදුහුයෙහි; (ඕහට) සිප්පියානං= ශුකතින් (=සිප්පිබෙල්ලන්) සම්බන්ධ වූ; සතං= සියයකුදු; නත්ථි= නැති; දුවෙකංසසතා= කහවුණු දෙසියයෙක්; කුතෝ= කොයින් ලැබේ ද?

ශාසනයෙහි ඒ ප්‍රසාදයාගේ සාධිකභාවය දක්වනු පිණිස- **තථාගතෙ ච භික්ඛවෙ!** යනාදිය වදාළසේක. එහි- **කාමූපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙති**= රහත්මඟින් කාමොපාදානයාගේ ප්‍රහාණය පරිඥව ඉක්ම වීම පනවයි; ඉතිරි තුන් උපාදානයන්ගේ ප්‍රහාණය සෝවාන් මඟින් පනවයි; **එවරූපෙ බො භික්ඛවෙ! ධම්මවිනයෙ**= මහණෙනි! මෙබඳු වූ ධර්මයෙහි ද විනයයෙහි ද; දෙපදයෙන් ම නෛර්‍යාණික ශාසනය දක්වනසේක. **සන්ථරි පසාදෙ**= මෙබඳු වූ ශාසනයෙහි ශාස්තෘන් කෙරෙහි යම් ප්‍රසාදයෙක් වේ ද, ඒ ප්‍රසාදය මනාකොට පැමිණියේ යයි කියනු ලැබේ, සසරදුක් එතර කිරීම පිණිස පවත්නේයි. මෙහි මේ වස්තුව වෙත්-

භාග්‍යවතුන් වහන්සේ වනාහී වෙදිසක පර්වතයෙහි වූ ඉන්ද්‍රසාලගුහාවෙහි වාසය කරනසේක. එකල්හි එක් මහමුහුණු ලිහිණියෙක් භාග්‍ය වතුන් වහන්සේ ගමට පිඬු පිණිස පිවිසෙන කල්හි අඹ මහක් පසුගමන් කෙරෙයි; (ගමින්) නික්මෙන කල්හි අඩමහක් පෙරගමන් කෙරෙයි; හෙතෙම එක් දිනක් පර්වතයෙන් බැස සවස් කාලයෙහි භික්ෂුසඞ්ඝයා විසින් පිරිවරනලදුව වැඩහුන් සම්‍යක් සම්බුදුයන් වැඳ පියාපත් නමා ඇදිලි ගෙන හිස යට කොට දසබලයන් වහන්සේට නමස්කාර කෙරෙමින් සිටියේය. භාග්‍ය වතුන් වහන්සේ ඔහු බලා සිනහ කළසේක. ආනන්ද ස්ථවිරයන් වහන්සේ "සඞ්ගාමීනි! සිනහ පහළ කිරීමට හෙතු කවරේ ද? ප්‍රත්‍යය කවරේ ද? සි විවාළහ. ආනන්දය! මේ මහමුහුණුලිහිණියා බලව, මේ තෙම මා කෙරෙහි ද භික්ෂු සඞ්ඝයා කෙරෙහි ද සිත පහදවා කල්පලක්ෂයක් දෙව්ලොව ද මිනිස්ලොව ද සැරිසරා **සොමනස්ස** නම් පසේබුදු වන්නේ යයි වදාළසේක.

කොසිය වශතුව.

119 **"උලූකඤ්ඤ! මණ්ඩලකඤ්ඤ! - වෙදිසඤ්ඤ විරදිසවාසිඤ්ඤ!**
සුඛිනොඝි ත්වං අය්‍යෙ! කොසිය! - කාලුඞ්ගිනං පස්සසි බුඛවරං"

තවද- මේණී අන්‍යවූ ද රජගහ නුවර **සුමනමාලාකාර** වසතුව යැ, **මහාහෙරිවාදක** වසතුව යැ, මොරජීක වසතුව යැ, සඞ්ඝභමනක වසතුව යැ, යන මේ ආදි වූ වස්තූහු විසතර කථයුත්තාහුය. මෙසේ නෛර්‍යාණික ශාසනයෙහි ප්‍රසාදය මනාකොට පැමිණියේ වේ. **ධම්මෙ පසාදෙ**= නෛර්‍යාණික ශාසනයෙහි ධර්මයෙහි ප්‍රසාදය මනාකොට පැමිණියේ වෙයි; ශබ්දමාත්‍රයෙක්හි නිමිත්ත ගෙන අසන්නාවූ තිරිසන්ගතයනට පවා සැපත් දෙන්නේ වෙයි; මේ කාරණය මණ්ඩූක දිව්‍යපුත්‍රාදීන්ගේ වස්තු වශයෙන් දතයුත්තේයි.

---

119. **උලූකඤ්ඤ**= උලූක සඞ්ඛ්‍යාත වූ; **මණ්ඩලකඤ්ඤ**= මණ්ඩල වූ ඇස් ඇති; **වෙදිසඤ්ඤෙ**= වෙදිසක පර්වතයෙහි; **විරදිසවාසිඤ්ඤ**= ඉතා දීර්ඝ කාලයක පටන් වාසයකරන්නා වූ; **අය්‍යෙ**= ආර්‍ය්‍ය වූ; **කොසිය**=

120. "ඔසි චිත්තං පසාදෙත්වා - භික්ඛුසඞ්ඝෙ අනුත්තරෙ
කප්පානි සතසහස්සානි - දුග්ගතිං සො න ගච්ඡති.

121. දෙවලොකා චවිත්වාන - කුසලමූලෙන චොදිතො
භවිස්සති අනන්තඤ්ඤො - සොමනස්සොති විස්සුතො" ති-

122. "ගිරොදනං අහම්දාසිං - භික්ඛුනො පිණ්ඩාය චරන්තස්ස -පෙ-
ඵාණිතං -පෙ- උච්ඡුඛණ්ඩකං - නිම්බරුක්ඛං - කක්කාරුකං-
එලාලුකං - වල්ලිපක්කං- එරුක්ඛං-භද්දපීඨකං-සාකමුට්ඨිං-
පුථුකමුට්ඨිං- මූලකං- නිම්බමුට්ඨිං- අම්බිලකඤ්ජිං-
අදාසිං නිම්මජ්ජනිං-කාසඛණ්ඩිකං-අංසවට්ටකං-ආසොගපට්ටං-

සීලෙසු පරිපූරකාරිනා= නෛයර්‍යාණික ශාසනයෙහි ශීලයන් සම්පූර්ණ කරන්නවුලුබව ද මොහොවට පැමිණියා වෙයි; සඟමොක්ෂඵල් ලබවයි; එහි ලා ජාතමාත්‍රවකවත්තු - සාමණේරවත්තු ආදිය දැක්විය යුත්තාහුයි. **සඛම්මිකෙසු=** නෛයර්‍යාණික ශාසනයෙහි සඛර්‍මිකයන් කෙරෙහි ප්‍රියමනාපබව ද මොහොවට පැමිණියා වෙයි; මහත්වූ සැපත් ලබවයි; මේ අර්ථය විමාන - ප්‍රෙතවස්තූන්ගෙන් දැක්විය යුත්තේයි. මේ වදුරන ලද්දේ මැයි—

(කොසියගොත්‍රයෙහි වූ හෙවත් කොටරසඞ්ඛ්‍යාත රුක්බිලයෙහිවෙසෙන හෙයින්) කොසිය නම් වූ පක්ෂිය; **සත්ථා=** ශාස්තෘ; **කාලුණිතං=** සවස්කාල යෙහි දිවාවිහරණයෙන් නැගී සිටියාවූ; **බුද්ධවරං=** උතුම් වූ සම්බුදුයන්; **පස්සසි=** දක්නෙහි; **සුබ්භනා අසි=** සුඛිත වූයේ වෙහි. (මේ ගය රුක් දෙවතාවක විසින් කියනලද යනු ටීකාහි.)

120 **ඔසි=** මා කෙරෙහි ද; **අනුත්තරෙ=** නිරුත්තර වූ; **භික්ඛු සඞ්ඝෙ=** භික්ෂු සඞ්ඝයා කෙරෙහි ද; **චිත්තං පසාදෙත්වා=** සිත පහදවා; **සො=** හෙතෙම; **කප්පානි සතසහස්සානි=** කල්පලක්ෂයක් මුලුල්ලෙහි; **දුග්ගතිං න ගච්ඡති=** දුගතියට නො යන්නේය. ("දුග්ගතෙසො" යන ටීකාගත පාඨාන්තරයෙහි "දුග්ගතිං + එසො" යි පදවෙර්දසි.)

121. **දෙවලොකා=** දෙව්ලොවින්; **ච වි ත්වා න=** චුතවැ; **කුසල මූලෙන=** (සොම්නස් සහගත) කුශලමූලයෙන්; **චොදිතො=** මෙහෙයන ලදුයේ; **සොමනස්සොති විස්සුතො=** "සොමනස්ස" යයි ප්‍රසිද්ධවූ; **අනන්ත ඤ්ඤො=** අපරිමිත ප්‍රඥඇති(පසේබුදුකෙනෙක්;) **භවිස්සති=** වන්නේයි.

122. **පිණ්ඩාය චරන්තස්ස=** පිඬු පිණිස හැසිරෙන්නා වූ; **භික්ඛු නො=** භික්ෂුවක්හට; **අහං=** මම; **ගිරොදනං=** කිරිමිසු බතක් හෝ කිරි සමග බතක්; **අදාසිං=** දුනිමි.

විධූපනං- තාලවණ්ටං- මොරහත්ථං- ජතුනං- උපාහනං- පූවං- මොදකං
සඩ්ඩකුලිකං අහමදාසිං- භික්ඛුනෝ - පිණ්ඩාය චරනතාසස
නාසසා මේ පසසවිමානං- අච්ඡරා කාමවණ්ණිනී'හමස්මි'' ති.

නං කිසස හෙතු යනාදිය කී ක්‍රමානුසාරයෙන් ම යොදා දතයුතුයි. මෙවිට තීර්තකයෝ යම් උපාදාන කෙනෙකුන්ගේ ප්‍රභාණය මනාකොට නො පනවත් ද, තථාගත තෙම පනවාද, ඔවුන්ගේ ප්‍රත්‍යය දක්වන්ට- **ඉමෙ** ච **භික්ඛවෙ!** යනාදිය වදාළහ. එහි- **කිනනිදානා** යනාදි තැන්හි නිදානාදී වූ සියල්ලෝ මැ කාරණ වෙ වචනයෝයි; ඒ එසේමැයි- යම් හෙයකින් කාරණය තෙම එය ගනිවු යයි පාවාදෙන කලක් මෙන් ඵලය ගෙනදේ ද, එහෙයින් නිදාන යයි කියනුලැබේ; යම්හෙයකින් ඒ ඵලය එයින් උපදී ද, උදාවේ ද, පහළවේ ද, එහෙයින් **සමුදය - ජාති - පභව** යයි කියනුලැබේ; මේ වනාහි මෙහි පදවී ය; "කිං නිදානං එතෙසනන්ති" (=කුමක් නිදාන වූයේ මොවුන්ට නුයි) **කිනනිදාන** නම් වෙති; "කො සමුදයො එතෙසනන්ති" (=කවරෙක් සමුදය වූයේ මොවුන්ට නුයි **කිංසමුදය** නම් වෙති; "කා ජාති එතෙසනන්ති" (=කවරක් ජාති වූවා මොවුන්ට නුයි) **කිංජාතිකා** නම් වෙති; "කො පභවො එතෙසනන්ති" (=කවරෙක් ප්‍රභව වූයේ මොවුන්ට නුයි) **කිංපභව** නම් වෙත්. තවද- යම්හෙයකින් ඔවුන්ට තෘෂ්ණා තොමෝ යථොක්ත අර්ථයෙන් නිදාන ද සමුදය ද ජාති ද ප්‍රභවත් වේ ද, එහෙයින් **තණහානිදානා** යනාදිය වදාළහ.

එණෙයනං= උක්සකුරු හෝ පැණි; **උච්ඡුඛණ්ඩකං**= උක්කඩක්; **නිම්බරුසකං**= නිම්බරිඵලයක්; **කකකාරුකං**= කැකිරි; (තියඹරා යයි ද කියත්.) **එලාලුකං**= එල්වලු; **වලලිපකකං**= වැල්ඵලයක්; **එාරුසකං**= බොරලුදම්බු; **හත්ථපතාකං**= ගිනිකබලක්; **සාකබුඬිං**= පලාම්වක්; **සුඵුකබුඬිං**= ළාකොලම්වක්; **මූලකං**= මූලාලයක්; **නිම්බබුඬිං**= කොසඹ මිටක්; **අම්බිලකඤ්ජිං**= ඇඹුල්කැඳක්; **දුණ්ණිමමජජනිං**= තෙල්සහිත තලමුරුවට; **කාසඛණ්ඩිකං**= කාඛහනක්; **අංසවට්ටකං**= අස්පවක් (=අංසකඛයක්;) **ආයොගපට්ටං**= ආයොගපටයක්; (=යොගීන්ගේ ආසන විශෙෂයක්) **විධූපනං**= සිවුරුස් විජිනියක්; **තාලවණ්ටං**= තල් වැටක් (=තල්පතින් කළ මණ්ඩලවීජිනියක්;) **මොරහත්ථං**= මොනර පිළිරින් කළ විජිනියක්; **ජතුනං**= සතක්; **උපාහනං**= වහන්සඳලක්; **පූවං**= පූපයක්; **මොදකං**= හත්වට (=අග්ගලා;) **සඩ්ඩකුලිකං**= ශස්කුල නම් පූපවිශෙෂය; **අහං**= මම; **පිණ්ඩාය චරනතාසස**= පිඬු පිණිස හැසිරෙන්නාවූ; **භික්ඛුනෝ**= භික්ෂුවක්හට; **අදාසිං**= දුනිමි; **නාසසා මෙ**= ඒ මාගේ; **විමානං**= විමානය; **පසස**= බලව; **අහං**= මම; **කාමවණ්ණිනී**= ඉච්ඡානුරූපවර්ණී ඇති; **අච්ඡරා අස්මි**= අප්සරාවක් වෙමි.

මෙසේ සියලු පදයන්හි අර්ථ දතයුත්තේසි. තවද- යම්හෙයකින් භාග්‍යවතුන් වහන්සේ හුදු උපාදානයාගේ මෑ ප්‍රත්‍යය දන්නාසේක් නොවෙත් ද, උපාදානයට ප්‍රත්‍යය වූ තෘෂ්ණාවගේ ද තෘෂ්ණාදීන්ට ප්‍රත්‍යය වූ වෙදනාදීන්ගේ ද ප්‍රත්‍යය දන්නාසේක් මැ වෙත් ද, එහෙයින් **නණහා වා'යං භික්ඛවෙ!** යනාදිය වදාළහ. **යතො** ච **ඛො**= යම් කලෙක්හි; **අවිජ්ජා පහීනා හොති**= සසරට මුල් වූ අවිද්‍යාව අනුත්පාද නිරෝධයෙන් ප්‍රහීණ වූවා වේද; **විජ්ජා උප්පන්නා**= අර්හත්මාර්ගඥානය උපන්නී ද; **සො අවිජ්ජාවිරාගා විජ්ජුප්පාදා**= ඒ මහණ අවිද්‍යාව ප්‍රහීණ වූ බැවින් ද විද්‍යාව උපන්බැවින් ද; **නෙවකාමූපාදානං උපාදියති**= කාමෝපාදානය නොම ගනී, සෙසු උපාදානයන් නො ගනී; **අනුපාදියං න පරිතස්සති**= මෙසේ කිසි උපාදානයක් නො ගන්නේ තණ්හාපරිතස්සනා වෙන් නො තැතිගනී; **අපරිතස්සං**= ත්‍රාසය නො වන්නේ තෘෂ්ණාව නූපදවන්නේ; **පච්චත්තං යෙව පරිනිබ්බායති**= තෙමේ ම කෙලෙසපරිනිර්වාණයෙන් පිරිනිවෙයි; මෙසේ ඔහුගේ ආශ්‍රවක්ෂය දක්වා මෙවිට ක්ෂීණාශ්‍රව භික්ෂුහුගේ ප්‍රත්‍යවෙක්ෂා දක්වනසේක් **ඛීණා ජාති** යනාදිය වදාළහ. එය කියනලද අර්ථ ඇත්තේ ම වේ යයි.

චූලසීහනාද සූත්‍ර වර්ණනා නිමි.

———:o:———

මහාසීහනාද සූත්‍ර වර්ණනා.

එවමෙම සුතං යි මහාසීහනාද සූත්‍ර යයි. එහි- **වෙසාලියං** යනු එනම් ඇති නගරයෙහි; ඒ නගරය ඔබිනොබ විසාලවූ බැවින් "වෙසාලී" යයි ප්‍රසිද්ධියට ගියේ ය. එහි මෝ පිළිවෙළ කථා යැ-

බරණැස් රජුගේ අගමෙහෙසියගේ කුසැ දරුගැබක් පිහිටියේ ය; ඕ තොමෝ (එය) දැන රජුට දැන්වූ; රජතෙම ගැබ්පෙරහර දුන්නේය; ඕ තොමෝ මනාකොට පරිහරණය කරනුලබන්නී ගැබ පිරිපැසුනු කල්හි තිබිරිගෙට පිවිසියා; පිනැත්තියන් ගේ අලුයම් කාලයෙහි ගැබ්බිහිවීම වෙයි; ඕ තොමෝ ඔවුනතුරෙන් එක්තරා තැනැත්තියක; එහෙයින් අලුයම් කාලයෙහි ලතුයෙන් ගැල්වූ බදුවද මලක් වැනි වූ මස්වැදුල්ලක් වැදූ; එහෙයින් "අන්‍ය දෙවිහු රන්බිඹු වැනි පුතුන් වදති; අගමෙහෙසිය මස්වැදුල්ල කැයි රජු ඉදිරියෙහි මාගේ අගුණ පහළ වන්නේය" යි සිතා ඒ නුගුණ බියෙන් ඒ මස්වැදුල්ල එක් බදුනෙක බහා වසා රාජමුද්‍රිකාවෙන් ලස්තබා ගඞ්ගාස්‍රොතයෙහි දැම්මවිය; මිනිසුන් විසින් හළ ඇසිල්ලෙහි දෙවතාවෝ අරක් ගක්තාහුය; තෙල බදුනෙහි "බරණැස් රජුගේ අගමෙහෙසියගේ දරුවෝ" යයි දැහිගුලෙන් ලියා රන්පටක් ද බැන්දාහුය; එතැන් සිට ඒ බදුන උණ්හීම් (=රළ) හයාදියෙන් අනුපද්‍රැත වැ ගඞ්ගා වෙගයෙන් ගියේය.

තවද- එසමයෙහි එක්තරා තවුසෙක් ගොපලුකුලයක් නිසා ගංඉවුරෙහි වෙසෙයි; හෙතෙම උදැසන ම ගඟට බැස්සේ එන්නාවූ ඒ බදුන දැක පාංශුකූල සංඥාවෙන් ගත්තේය, නැවත එහි ඒ අකුරු පට ද රාජමුද්‍රිකා ලාඤ්ඡනය ද දැක මුදා මස්වැදුල්ල දුටුයේය, දැන ඕහට මේ සිත විය; "දරුගැබෙක් විය හැක, එතකුදුවුවත් මෙහි දුගඳ කුණුබවෙක් නැතැ" යි අසපුවට ගෙනවුත් පිරිසුදු තැනෙක තුබුයේය; ඊට පසු අඩමසක් ඇවැමෙන් මස්වැදැලි දෙකක් වූවාහුය, තාපස තෙම දැක ඉතා මැනවින් තැබිය, ඉන්පසු නැවත අඩමසක් ඇවැමෙන් එකි එකි පෙශියෙහි අත් පා හිස් පිණිස පස් පස් පොළ නැංගාහුය, නැවත ඉන් අඩමසක් ඇවැමෙන් එක් මස්වැදුල්ලක් ශෝණිබිම්බයක් වැනි දරුවෙක් විය, එකක් දැරියක් වී. ඔවුන් කෙරෙහි තවුසාහට පුත්‍රස්නෙහය උපන; යලි ඔහුගේ මාපටැගිල්ලෙන් කිරි උපන, එතැන්පටන් කිරි හා බත් ද ලැබී, තවුස් තෙම බත් වලඳ කිරි දරුවන්ගේ මුඛයෙහි වගුරුවයි; ඔවුන්ගේ උදරයට යමක් යමක් පිවිසේ ද ඒ ඒ සියල්ල මිණිබදුන්ගත වූවක් මෙන් පෙනෙයි; මෙසේ නිවඥිහු වූවාහුය; අන්‍ය ආචාර්‍ය කෙනෙක් (මෙසේ) කිහු— වියා තබනලද්දක් මෙන් ඔවුන්ගේ එකිනෙහ වැලඳගත් සිවිය වූවා යයි. මෙසේ ඔවුහු අපගත වූ ඡවි ඇතිබැවින් හෝ වැලඳගත් ඡවි ඇතිබැවින් හෝ **ලිච්ඡවි** යයි ප්‍රසිද්ධ වූවාහුය.

තාපස තෙම දරුවන් පොෂණය කරන්නේ හිරු නැගිකල්හි ගමට පිඬු පිණිස පිවිසෙයි, ඉතා දහවල් වැ (ගමින්) නික්මෙයි; ඔහුගේ ඒ ව්‍යාපාරය දුන ගොපල්ලෝ කීවාහුය- වහන්ස! පැවිද්දන්ට දරුවන් පොෂණය පලිබොධ යැ, අපට දරුවන් දුන මැනව, ඇපි පොෂණය කරන්නෙමු, නුඹ වහන්සේ සඝකිය කර්මය කළ මැනවැ" යි, තවුස් තෙම මැනවැයි පිළිගත්තේය. ගොපල්ලෝ දෙවනදවස් මහ සමකොට මිල් ඉස ධවජපතාකයන් ඔසවා තූර්‍යවාදනයෙන් යුක්තව අසපුවට පැමිණියාහුය; තාපස තෙම "මහපිනැති දරුවෝ යැ, අප්‍රමාදයෙන් වර්ධනය කරවු, වර්ධනය කොට ද ඔවුනොවුන් ආවාහ කරවු, පස්ගෝරසයෙන් රජු සතුටු කොට නුවරක් කරවු, එහි කුමරු අභිෂෙක කරවු" යයි කියා දරුවන් දුන්නේය. ඔවුහු මැනවැයි පිළිවදන් දී දරුවන් ගෙනගොස් පොෂණය කළාහුය; දරුවෝ වැඩීමට පැමිණ කෙළනාහු විවාදසථාන යෙහි අන් ගොපලු දරුවන්ට අතින් ද පයින් ද පහරති; ඔවුහු හඬන්නාහු- යලි කුමට හඬවු දැ? යි මවුපියන් විසින් කියනලද්දාහු මේ මවුපියන් නැති තවුසා විසින් පොෂණය කළාහු අපට ඉතා ම පහර දෙතියි කියත්. ඉක්බිති ඔවුන්ගේ මවුපියෝ "මේ දරුවෝ අන් දරුවන් වන සතා, දුක් උපදවති, මොවුහු සඞ්ග්‍රහ නො කටයුත්තාහුය, මොවුහු වජිනය කටයුත්තාහුය" යි කීවාහුය; එතැන් පටන් ඒ පෙදෙස යොදුන් සියයක් මානයෙන් "වජ්ජි" යයි කියනුලැබේ ල. ඉක්බිති ගොපල්ලෝ රජු සතුටු කරවා ඒ පෙදෙස ගත්තාහුය. යලිදු එහි නුවරක් මවා සොළොස් අවුරුදු පමණ වූ කුමරු අභිෂෙක කොට රජ කළාහුය- යලි ඒ දූරිය සමග විවාහ කොට කනිකාවක් කළාහුය- "බැහැරින් දූරියක් නො කැඳවිය යුත්තීය, මෙයින් දූරියක් කිසිවෙකුට නො දිය යුත්තීය" යි. ඔවුන්ගේ පළමු සංවාසයෙන් දුවක් ද පුතෙක් දූයි දරුවෝ දෙදෙනෙක් උපන්නාහුය, මෙසේ සොළොස්වරක් දෙදෙන දෙදෙන උපන්නාහුය; ඉක්බිති අනුක්‍රමයෙන් වැඩෙන්නාවූ ඒ දරුවන්ට ආරාම උද්‍යාන නිවාසසථාන පරිවාරසම්පත්තිය (යන මේ) ගන්නට නො පොහොනාවූ නගරය තුන්වරක් ගවුවක් අතරින් ගවුවක් අතරින් තුන්වරක් පිරිකෙවී කළාහුය. ඒ නගරය නැවත නැවත විශාල කළ බැවින් "වෙසාලි" යයි ම නම් විය. එයින් කියනලදී- වෙසාලියං යනු එනම් නගරයෙහි යයි.

බහිනගරෙ= නගරයාගේ පිටත; අම්බපාලිවනය මෙන් ඇතුලු නගරයෙහි නො වෙයි; මේ වනාහි ජීවකම්බවනය මෙන් නගරයාගේ පිටත වූ වනලැහැබෙකි; එයින් කියනලදී- බහිනගරෙ යනු. අවර පුරෙ= පුරයාගේ අවරයෙහි, පශ්චිමදිශාවෙහි යන අර්ථයි; වනසණ්ඩ= ඒ වනලැහැබ වනාහි නගරයාගේ පශ්චිමදිශාවෙහි ඔවුවක් පමණ නැන්හි යැ, එහි මනුෂ්‍යයෝ භාග්‍යවතුන් වහන්සේට ගදකිළියක් කොට එය පිරිවරා භික්ෂූන්ට රාත්‍රිසථාන - දිවාසථාන - චඞ්ක්‍රම - ලෙණ - කූටි-

මණ්ඩපාදිය පිහිටුවූවාහුය; භාග්‍යවතුන් වහන්සේ එහි වාසය කරන සේක; එහෙයින් කියනලදී- අවරපුරෙ වනසණ්ඩ යි. **සුනක්ඛත්තෙනා** යනු ඔහුගේ නම යැ; තවද- ලිච්ඡවිරජුගේ පුත්‍ර වූ බැවින් **ලිච්ඡවිපුත්තෙනා** යයි කියනලදී; **අවිරපක්කමනෙනා**= සිවුරු හැර ගිහිබවට පැමිණීමෙන් අලුත නික්ම ගියේ; **පරිසති**= පිරිස්මැද; **උත්තරිමනුස්සධම්මා** යන මෙහි මනුෂ්‍ය ධර්මය නම්? දශකුශල කර්මපථයෝ යැ, ඔවුන් ප්‍රතිෂේධ කරන්ට නො හැකි වෙයි; කුමක් හෙයිනයත්? දෙෂාරොපණහේතුයෙනි. ඒ එසේමැයි- වෙසාලි නගරයෙහි බොහෝ මනුෂ්‍යයෝ රත්නත්‍රයෙහි ප්‍රසන්න වූවාහුය, බුදුන් කෙරෙහි මමත්වය ඇත්තාහුය, ධර්මයෙහි මමත්වය ඇත්තාහුය, සඞ්ඝයා කෙරෙහි මමත්වය ඇත්තාහුය; ඔවුහු දශකුශල කර්මපථමාත්‍රයකුදු ශ්‍රමණ ගෞතමයන්ට නැතැයි කී කල්හි— තෝ කොතැන්හි භාග්‍යවත්හු ප්‍රාණඝාත කරන්නහු දුටුයෙහි ද? කොතැන්හි නො දුන්දෙය ගන්නහු දුටුයෙහි ද? යනාදිය කියා තමාගේ පමණ නො දන්නෙහි, කිම මට දත් ඇතැයි ගල්බොරලු කන්නෙහි ද? සර්ගයකු නගුටැ කඩන්ට වැයම් කෙරෙහි ද? කියත්දත්වලැ, මල්මාලාවක් මෙන් කොට කෙළනට කැමැත්තෙහි ද? මුඛයෙන් තාගේ දත් හෙලන්නෙමුයි කියන්නාහුය; හෙතෙම ඒ දෙෂාරොපණ හේතුයෙන් මෙසේ කියන්ට නො හැකි වෙයි; එනකුදු වුවත් එයින් මත්තෙහි (ශාස්ත්‍රවිදර්ශනාදි) **විසෙසාධිගමය වලකන්නේ උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසො** යි කිය. එහි ආර්‍යත්වයෙකු කරන්ට ප්‍රමාණ නුයි "අලමරිය" නම්, ආර්‍යභාවයට සම්පූර්ණ යයි කියනලද වෙයි; ඥානදර්ශනය මැ "ඤාණදස්සනවිසෙස" නම්, අලමරිය වූයේ ත් හේ යැ, ඤාණදස්සන විසෙස වූයේ ත් (හේ මැ නුයි) **අලමරියඤාණදස්සනවිසෙස** නම් වේ. **ඤාණදස්සනං** යි දිව්‍යචක්ෂුස ද, විදර්ශනාව ද, මාර්ගය ද, ඵලය ද, ප්‍රත්‍යවෙක්ෂණ ඥානය ද, සර්ව්‍වඥතාඥානය ද කියනුලැබේ. ඒ එසේ මැයි-

ඥානදර්ශනය. **අපපමත්තෙනා සමාහිතෙනා ඤාණදස්සනං ආරාධෙති** යන මෙහි දිව්‍යචක්ෂුස "ඤාණදස්සන" නම්; **ඤාණදස්සනාය චිත්තං අභිනීහරති අභිනිනන්නාමෙති** යන මෙහි විදර්ශනාඥානය යැ; **අභබ්බා තෙ ඤාණදස්සනාය අනුත්තරාය සම්බොධාය** යන මෙහි මාර්ගය යැ; **අයං මග්ගඤ්ඤූ උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසෙ අධිගතො එසුවිහාරෙ** යන මෙහි ඵලය යැ; ඤාණං ච පන මෙ දස්සනං උදපාදි අකුප්පා මෙ චෙතොවිමුත්ති අයමන්තිමා ජාති නත්ථිදානි පුනබ්භවෙ යන මෙහි පච්චවෙක්ෂණ නුවණ යැ; ඤාණං ච පන මෙ දස්සනං උදපාදි සන්නාහකාලකතො ආළාරො කාලාමෙ යන මෙහි සර්ව්‍වඥතාඥානය යැ; මෙහි වූ කලි ලොකොත්තරමාර්ගය අදහස්කරනලද; හෙතෙම භාග්‍යවතුන් වහන්සේගේ ඒ (මාර්ගය) මැ ප්‍රතිෂේධ කෙරෙයි. **තක්කපරියාහතං** යන මෙයින් ආවාර්‍යයකු ප්‍රතිබාහනය කෙරෙයි; ඔහුට මෙබඳු සිතක් වී ය- "ශ්‍රමණ ගෞතමයන් විසින් ඇදුරන් කරා

එලඹ ගන්නාලද සියුම් ධම්මන්තරයක් නම් නැති, එතකුදු වුවත් ඒ ඒ ප්‍රකාරයෙන් තර්ක කොට ගන්නාලද- තර්ක කොට විතර්ක කොට මෙසේ වන්නේය මෙසේ වන්නේ යයි ඒ ඒ ප්‍රකාරයෙන් විතර්කයෙන් ගන්නා ලද්දක් කොට දහම් දෙසයි; **වීමංසානුචරිතං** යන මෙයින් උන්වහන්සේගේ ලෞකිකප්‍රඥව අනුඥ කෙරෙයි; ශ්‍රමණ ගෞතම තෙමේ ප්‍රඥ ඇත්තෙහ, හෙතෙම ඒ ප්‍රඥයඛ්‍යාත වූ ඉන්ද්‍රියාගේ වර්ධන බදුවූ වීමංශාව මෙසේ වනන්නේය මෙසේ වටනේ යයි ඔබිනොබ හසුරුවා වීමංශාවෙන් හසුරුවනලද ධර්මය දෙශනාකරයි; **සයම්පටිභානං** යන මෙයින් උන්වහන්සේගේ ධර්මයන්හි ප්‍රත්‍යක්ෂභාවය ප්‍රතිබාහනය කෙරෙයි, ඒ එසේ මැයි- ඔහට මෙසේ සිතක් විය- ශ්‍රමණ ගෞතමයන්හට සියුම් ධම්මන්තරයෙක් (එනම්) විදර්ශනාවක් හෝ මාර්ගයෙක් හෝ ඵලයෙක් හෝ ප්‍රත්‍යක්ෂ වූවෙක් නම් නැති; එතකුදු වුවත් මේ තෙම ලද පිරිස් ඇත්තෙහ, සක්විතිරජක්හු සෙයින් චතුර්ණී යෝ ඔහු පිරිවරති, තවද ඔහුගේ ඥනාවරණය (=දෙතොල) මොනොවට ලද පහස් ඇත්තේ යැ, දිව මොළොක් යැ, හඬ මිහිරි යැ, තෙපුල කෙලවැගිරීම් (දෝෂ) රහිත යැ; හෙතෙම ඔහට යමක් යමක් ම වැටහේ ද, ඒ ඒ කරුණ ගෙන තමහට වැටහුණු කථාව කියන්නේ මහාජනයා සතුටු කරයි: **යඤ්ච ඛෝ සෝ අඤ්ඤාය ධම්මං දෙසිතෝ=** යම් කරුණකුත් සඳහා ඔහු විසින් ධර්මය දෙශනා කරනලද ද ඒ කවරේ ද? **රාගස්ස නැසීම පිණිස** අශුභකර්මස්ථානය යැ, **ද්වේෂස්ස නැසීම පිණිස** මෛත්‍රීභාවනාව යැ, **මෝහස්ස නැසීම පිණිස** (ගුරූපවාසාදි) පඤ්චධර්මයෝ යැ, **විතක්කෝපච්ඡේදාය පිණිස** ආනාපානසතිය යැ (යන මේයි.) **සෝ නියාති නක්කරස්ස සම්මා දුක්ඛක්ඛයාය=** ඒ ධර්මය තෙම- යමෙක් එය කෙරේ ද, ඒ තක්කරයාහට (=ඒ ධර්මය පිළිපදිනහුව) මනාකොට හෙතුවශයෙන් නයවශයෙන් කරුණුවශයෙන් වෘත්තදුඃඛයාගේ ක්ෂය කිරීම පිණිස පැමිණෙයි යෙයි; ඒ අර්ථය සිඳ කෙරේ යයි දක්වයි. මේ වනාහි හෙතෙම තමාගේ අදහස් වශයෙන් නොකියයි; යම් හෙයකින් සම්බුදයන්ගේ ධර්මය අනෙයාර්ථික යයි මෙසේ හෙතෙම කියන්නේ ද එතකුදු වුවත් කියන්ට අසමර්ථ මේ ද, කුමක් හෙයින ද යත්? දෙශාරොපණහේතුයෙනි; ඒ එසේ මැයි- වෙසාලී නගරයෙහි බොහෝ ස්‍රෝතාපන්න වූ සකෘදාගාමී වූ අනාගාමී වූ උපාසකයෝ ද උපාසිකාවෝ ද වෙති, ඔවුහු මෙසේ කියන්නාහුය, සුනක්ඛත්තය! නුඹ භාග්‍යවතුන් විසින් දෙශනාකළ ධර්මය අනෙයාර්ථික යයි කියෙහි ඉදින් මේ ධර්මය අනෙයාර්ථික වූයේ නම් මේ නගරයෙහි මේ මෙතෙක් ජනයෝ කුමක්හෙයින් සෝවාන් වූවාහු ද? මෙතෙක් සෑදගැමි වූවාහු ද? මෙතෙක් අනගැමි වූවාහු දූ? යි පළමු කී ක්‍රමයෙන් දෙශාරොපණය කරන්නාහු යයි; හෙතෙම මේ උපාරම්භහේතුයෙන් අනෙයාර්ථික යයි කියන්ට නොහැකි වන්නේ අර්ජුන විසින් විදිනලද කාණ්ඩ (=ඊතල) යක් සෙයින් ඔහුගේ ධර්මය නොසිස් වූයේ (දුඃඛක්ෂය පිණිස) පැමිණෙයි, එතකුදු වුවත් ඔහුගේ අභ්‍යන්තරයෙහි කිසිවක් නැතැයි කියයි.

අසෙසාසි බොෘ= වෙසාලියෙහි බමුණුකුල - සිටුකුලාදියෙහි ඒ ඒ තැන පිරිස්මැද මෙසේ කියන්නහුගේ ඒ වචනය ඇසි; එතකුදු වුවත් නො වැළකි; කුමක් හෙයින යත්? කාරුණ්‍යය හෙයිනි; උන්වහන්සේට මේ සිත විය- "මේ තෙම කිපියේ දූවෙන හුණවතයක් මෙන් ද බහාලූ ලුණුඇති උදුනක් මෙන් ද ක්‍රොධ වශයෙන් තව තවා යෙයි, මා විසින් වළකන ලදුයේ වනාහි මා කෙරෙහි ද වෛරය බිඳනේය, මෙසේ ඔහුගේ තථාගතයන් කෙරෙහි ද මා කෙරෙහි ද යන දෙදෙනා කෙරෙහි වෛරය ඉතා බර වන්නේ ය" යි කාරුණ්‍යයෙන් නො වැළකිය. තවද- උන්වහන්සේට මෙසේත් සිතක් විය- "සම්බුදුරජාණන්ගේ අගුණ කිම නම් පුන්සඳෙහි දෙස් නැඟීමක් සමයැ; කවරෙක් මොහුගේ කථාව ගන්නේ ද, තෙමේ මැ තෙල සිදුන කල්හි මුව වියලුන කල්හි නවත් නේය"යි මේ කරුණෙන් ද නො වැළකිය. **පිණ්ඩපාතපටික්කමනෙනා=** පිඬු සෙමීමෙන් වෙන් වූයේ; **ඛොඛනෝ=** වණ්ඩ වූයේ පරුෂ වූයේ; **මොඝපුරිසෝ=** සිස් පුරුෂතෙම; ඒ එසේ මැයි- යමෙකුට ඒ අත්බැව්හි මාගීඵලයන්ට උපනිශ්‍රය නැත්තේ ද, ඔහට සම්බුදුරජාණෝ "මොඝපුරිස" යි කියති, උපනිශ්‍රය ඇතිකල්හි දු එකෙණෙහි මාගීඵයක් හෝ ඵලයක් හෝ නැතිකල්හි "මොඝපුරිස" යි කියත් මැයි; මොහුට වනාහි ඒ අත්බැව්හි මාගීඵලයන්ගේ උපනිශ්‍රය සමුච්ඡින්න මැයි, එහෙයින් ඔහට "මොඝපුරිසෝ" යි කිහ. **ඛොඛා ච පනස්ස එසා වාචා භාසිතා= තවද- ඔහු විසින් මේ තෙපුල ක්‍රොධයෙන් කියනලද්දීය; වැලි කුමක් හෙයින් මේ තෙම භාග්‍යවතුන් වහන්සේට කිපියේ ද යත්?**

මේ තෙම වනාහි පෙර භාග්‍යවතුන් වහන්සේ කරා එලඹ දිවැස් පිරියම් විවාළේය, එකල්හි ඔහට භාග්‍යවතුන් වහන්සේ වදාළසේක:

සුනක්ඛත්තයාදීන් දෙස් කළ අයුරු පෙන්වීම.

හෙතෙම දිවැස උපදවා ආලෝකය වඩා බලන්නේ දෙව්ලොව හා නඳනවන - චිත්‍රලතාවන - පාරුෂකවන - මිශ්‍රකවනයන්හි දිවසැපත් විඳිනාවූ දෙව්සුතුන් ද දෙව් දූන් ද දැක "මෙබඳු වූ ආණ්මහාව සම්පත්තියෙහි සිටියාවූ මොවුන්ගේ ශබ්දය කොපමණ මිහිරි වන්නේ දෝ හෝ" යි ශබ්දය අසනු කැමති වැ දසබලයන් වහන්සේ කරා එලඹ දිවසෝධාපිරියම් විවාළේය. භාග්‍යවතුන් වහන්සේ වනාහි ඔහට දිව්‍යශ්‍රොත්‍රධාතුවට උපනිශ්‍රය නැතැයි දැන පිරියම් නො වදාළසේක; ඒ එසේ මැයි- බුදුවරයෝ යමෙකුට නො වන්නේ නම් ඔහට පිරියම් නො වදාරති. හෙතෙම භාග්‍යවතුන් කෙරෙහි ආඝාතය බැඳ (මෙසේ) සිතිය- මම ශ්‍රමණ ගෞතමයන් පළමු කොට දිවැස් පිරියම් විවාළෙමි, හෙතෙම මට එය සමෘඩ වේවා හෝ සමෘඩ නොවේවා හෝ යි කියේය, මම වනාහි තමාගේ පුරුෂවීර්‍යයෙන් එය නිපදවා දිවසෝධා පිරියම් විවාළෙමි, එය මට නො කියේය; එකාන්තයෙන් ඔහට මෙසේ (සිතක්) වෙයි, රජකුලයෙන් පැවිදි වූ මේ තෙම දිව්‍යචක්ෂුර් ඥානය උපදවා දිව්‍යශ්‍රොත්‍රධාතු ඥානය උපදවා

වෙතොපරිය ඤානය උපදවා ආශ්‍රවයන්ගේ ක්ෂය ඤානය උපදවා මා හා සම්සම්යෙක් වන්නේ යයි ඊර්ෂ්‍යාමාත්සර්‍යය වශයෙන් මට නොකියා යයි. හෙතෙම බොහෝසෙයින් වෛරයබැඳ කඹවත්හැර "ගිහිබවට පැමිණ ද තුෂ්ණීම්භූතවූයේ නොහැසිරෙයි, වැලි භාග්‍යවතුන් වහන්සේට අසත්‍යවූ හිස්වචනයෙන් අභ්‍යාඛ්‍යාන (=බොරු දොෂාරොපණ) කරමින් හැසිරෙයි. එයින් වදුළහ, භාග්‍යවතුන් වහන්සේ- **කොඛා ච පනස්ස එසා වාචා භාසිනා සි වණෙණා හෙසො සාරිපුත්තන**= ශාරිපුත්‍රය! කල්පලක්ෂයක් අධික කොට ඇති චතුරසඞ්ඛ්‍යයක් පැරැම් පුරන්නා වූ තථාගතයන් වහන්සේ "මාගේ දෙශනා ධර්මය නෛයර්‍යාණික වන්නේ ය"යි මේ සදහා මැ වැයම් කරනලද්දේය; එහෙයින් යමෙක් මෙසේ කියන්නේනම් හෙතෙම තථාගතයන්ගේ ගුණයක් මැ කියන්නේය; ශාරිපුත්‍රය! මේ තෙම තථාගතයන්ගේ වර්ණයෙක් මැය, මේ ගුණයෙක් මැයි, අගුණයෙක් නොවේ යයි දක්වනසේක. **අයම්පි හි නාම සාරිපුත්තන**! යනාදීන් කුමක් දක්වත් ද යත්? සුනක්ඛත්තයා විසින් ප්‍රතිෂෙධකළ උතුරුමිනිස්දහම් තමන් වහන්සේ කෙරෙහි ඇතිබව දක්වනසේක. භාග්‍යවතුන් වහන්සේ වනාහි- බලව ශාරිපුත්‍රය! සුනක්ඛත්තමොඝ පුරුෂ තෙම තථාගතයාහට උත්තරිමනුෂ්‍ය ධර්මයෙක් නැතැයි කියයි; එහෙත් මට සවිඤ්ඤාණක නම් ඇති, සෘඞ්ඛිඥානය නම් ඇති, දිව්‍ය ශ්‍රොත්‍රධාතු ඤානය නම් ඇති, වෙතොපරිය ඤානය නම් ඇති, දශබල ඤානය නම් ඇති, චතුවෛශාරද්‍යඤානය නම් ඇති, අෂ්ටපරිෂද්හි අසම්පන ඤානය නම් ඇති, චතුර්‍යෝනිපරිවෙඡ්දකඤානය නම් ඇති පඤ්චගති පරිවෙඡ්දකඤානය නම් ඇති මොවුහු සියල්ලෝ මැ උත්තරිමනුෂ්‍යධර්මයෝ මැයි; මෙබඳු වූ උතුරු මිනිස්දහම් අතුරෙන් එකක්හුගේ ද දැනීමෙහි සම්ප්‍රාප්ත වූ ධර්මාඛ්‍යමාත්‍රයකුත් මෙ සිස් පුරුෂයාට නම් නොවන්නේ යයි මේ කාරණය දක්වනු පිණිස- **අයම්පි හි නාම සාරිපුත්තන**! යනාදි නයින් මේ දෙශනාව ආරම්භ කළහ. එහි "අඤ්ඤාතීනි=අඤ්ඤො" දැනගනී, අවබෝධ කෙරෙයි යන අර්ථයි; " ධම්මස්ස අඤ්ඤො " (=ධර්මයාගේ අඤ්ඤ) "ධම්මඤ්ඤ" නම්; ඒ ඒ සවිඤ්ඤාණකඤානාදි ධර්මයන් දැනගන්නා ප්‍රඥාවට මේ නමෙකි; **ඉතිපි සො භගවා** යනාදියෙන් මෙබඳු වූ ත් මාගේ සවිඤ්ඤාණක සඞ්ඛ්‍යාත විද්‍යමාන වූ මැ උත්තරි මනුෂ්‍ය ධර්මයක් නම් ඇතැයි දැනගන්ට ඒ සිස් පුරුෂයාට ධර්මාවබෝධයකුදු නොවන්නේ යයි දක්වනසේක. සෘඞ්ඛිඥානාදියෙහි දු මෙසේ යෙදීම් දතයුතු. තවද මෙහි කියයුත්තෙක් ඇති, වෙතොපරිය ඤානයට අනතුරු කොට ත්‍රිවිද්‍යාවෝ කියයුතු වන්නාහුය, එත කුදු වුවත් යම් හෙයකින් ඒ ත්‍රිවිද්‍යාවන් කිකල්හි මත්තෙහි දශබලඤානය නොපිරේ ද, එහෙයින් ඔවුන් නොකියා තථාගතබලඤානය පරිපූර්ණකොට දක්වනසේක් **දස ඛො පනිමානි සාරිපුත්තන**! යනාදිය වදුළහ. එහි **තථාගතබලානි**= අන්‍යයන් හා

තථාගතයන් කෙරෙහි උතුරුමිනිස්දහම් ඇතිබව.

අසාධාරණ වූ තථාගතයන් වහන්සේගේ ම බලයෝ; නොහොත් යම් සේ පූර්වබුදුවරයන්ගේ බලයෝ අධික වූ පුණ්‍යසම්පත්තියෙන් පැමිණියාහු ද, එපරිද්දෙන් පැමිණියාවූ බලයෝයි ද අර්ථයි; එහි තථාගතයන්ගේ බලය විවිධ වෙයි, කායබලය ද ඥානබලය ද (කියයි.) ඔවුනතුරෙහි කායබලය හස්තිකුලානුසාරයෙන් දතයුතුයි. මේ කියනලද මැයි, පෞරාණිකයන් විසින්—

123. **"කාළාවකඤ්ච ගඩෙගඤ්ච - පණ්ඩරං නම්බපිඞ්ගලං**
ගන්ධම්බගලහෙමඤ්ච - උපෝසථඡද්දන්තිමෙ දස" යි.

මොවුහු වනාහි දස ඇත්කුලයෝයි; **එහි කාළාවකං** යි ප්‍රකෘති හස්තිකුලය දතයුතුයි; පුරුෂයන් දසදෙනෙකුගේ යම් කායබලයක් වේද, එය එක් කාළාවක ඇතෙකුගේ (බලයයි;) කාළාවක ඇතුන් දස දෙනෙකුගේ යම් බලයක් වේද, එය එක් ගඩෙගය ඇතෙකුගේ යැ; ගඩෙගය හස්තීන් දසදෙනෙකුගේ යම් බලයක් වේද, එය එක් පණ්ඩර ඇතෙකුගේ යැ; පණ්ඩරහස්තීන් දසදෙනෙකුගේ යම් බලයක් වේද, එය එක් තම්බහස්තියෙකුගේ යැ; තම්බහස්තීන් දසදෙනෙකුගේ යම් බලයක් වේද, එය එක් පිඞ්ගලහස්තියෙකුගේ යැ; පිඞ්ගලහස්තීන් දස දෙනෙකුගේ යම් බලයක් වේද, එය එක් ගන්ධහස්තියෙකුගේ යැ; ගන්ධ හස්තීන් දසදෙනෙකුගේ යම් බලයක් වේද, එය එක් මඞ්ගලහස්තියෙකුගේ යැ; මඞ්ගලහස්තීන් දසදෙනෙකුගේ යම් බලයක් වේද, එය එක් හෙමහස්තියෙකුගේ යැ; හෙමහස්තීන් දසදෙනෙකුගේ යම් බලයක් වේද එය එක් උපෝසථහස්තියෙකුගේ යැ, උපෝසථහස්තීන් දසදෙනෙකුගේ යම් බලයක් වේද, එය එක් ඡද්දන්ත හස්තියෙකුගේ බල යයි; ඡද්දන්ත හස්තීන් දසදෙනෙකුගේ යම් කායබලයක් වේද, එය එක් තථාගත යෙකුගේ (කායබල යයි;) මෙය ම "නාරායනසඞ්ඝාතබලය" යි ද කියනු ලැබේ. ඒ මේ බලය ප්‍රකෘති හස්තිසඞ්ඛ්‍යාවෙන් කෙළදහසක් ඇතුන්ගේ ද, පුරුෂසඞ්ඛ්‍යාවෙන් දසකෙළදහසක් මිනිසුන්ගේ ද බලය වෙයි; මේ වනාහි තථාගතයන් වහන්සේගේ කායබල යයි. යළි ඥානබලය වූ කලි පෙළෙහි ආයේ මැයි. දශබල ඥානය, චතුවෛශාරද්‍ය ඥානය, අෂ්ටපරිෂත්හි අනාමන්ත ඥානය, චතුයෝනිපරිච්ඡේදක ඥානය, පඤ්චගති පරිච්ඡේදකඥානය, සංයුක්තකයෙහිආ තෙසැත්තැනුවණය, සත්සැත්තැනුවණය, යන මෙසේ අන්‍ය වූ ද නොයෙක් දහස්ගණන් ඥානයෝය යන මේ ඥානබලය නම් වේ; මෙහි ද ඥානබලය ම අදහස් කරනලදී. ඒ එසේ

---

123. **කාළාවකඤ්ච**= කාළාවක කුලය ද; **ගඩෙගඤ්ච**= ගඩෙගය කුලය ද; **පණ්ඩරං**= පණ්ඩර කුලය ද; **නම්බපිඞ්ගලං**= තම්බ කුලය හා පිඞ්ගල කුලය ද; **ගන්ධම්බගලහෙමඤ්ච**= ගන්ධකුලය මඞ්ගලකුලය හෙම කුලය යන මොහු ද; **උපෝසථඡද්දන්තං**= උපෝසථ කුලය ඡද්දන්ත කුලය ද යන; **දස**= දසඇත්කුලයෝ වෙත්.

මැයි-ඥානය අකම්පාභාවයෙන් ද උපස්ථම්භාවයෙන් ද "බලය" යි කියන ලදී. **යෙහි බලෙහි සමන්නාගතෝ**= යම් ඥානබල දසයකින් උපෙත වූයේ සමූපෙත වූයේ; **ආසභං ඨානං**= ශ්‍රේෂ්ඨස්ථානය, උත්තමස්ථානය; නොහොත් ආසභයෝ පූජ්‍ය බුදුවරයෝ යැ, ඔවුන්ගේ ස්ථානය යන අර්ථයි; තවද- ගවයන් සියයකට දෙවූ වූයේ "උසභ" නම් වෙයි, ගවයන් දහසකට දෙවූ වූයේ "වසභ" නම් වෙයි; නොහොත් සියක් ගොවුදට දෙවූ වූයේ "උසභ" යැ, දහසක් ගොවුදට දෙවූ වූයේ "වසභ" යැ, සියලු ගවයන්ට ශ්‍රේෂ්ඨ වූ සියලු උවදුරු ඉවසන ශෝභන වූ ප්‍රසාද උපදවන මහත්බර උසුලන දහසක් සෙණහඬිනුදු අකම්පාය වූයේ "නිසභ" නම් වේ; හෙතෙම මෙහි "උසභ" යි අදහස් කරනලදී; යම්හෙයකින් මෙද ඕහට පර්‍යායවචනයෙක් වේද එහෙයිනි. "උසභස්ස ඉදං" (= උසභයාගේ මෙය) නුයි "ආසභ" නම් වේ. **ඨානං** යනු සතරපයින් පෘථිවිය පෙළා සිටීම යැ; මේ සිටීම වනාහි "ආසභාවට්ඨානය" වැනි නුයි "ආසභ" නම් වේ. ඒ එසේ මැයි- යම්සේ නිසභ සඞ්ඛ්‍යාත ඍෂභ තෙම ඍෂභබලයෙන් යුක්ත වූයේ සතරපාදයන්ගෙන් පෘථිවිය පෙළා නිශ්චල වූ අවස්ථානයෙන් සිටී ද, එපරිද්දෙන් තථාගතයන් වහන්සේ ද දසතථාගත බලයන්ගෙන් සමන්විත වූයේ චතුර්වෛශාරද්‍ය නමැති පාදයන්ගෙන් අෂ්ට පර්ෂද් නමැති පෘථිවිය පෙළා දෙවියන් සහිත ලොකයෙහි කිසිසේ සතුරෙකු විසින් පසම්තුරෙකු විසින් අකම්පාය වූයේ අවලාවස්ථානයෙන් සිටිනසේක; යලි මෙසේ සිටිනසේක් ඒ ආසභට්ඨානය ප්‍රතිඥා කෙරෙති, ඵලඹෙති, ප්‍රතිඤ්ඤා නො කෙරෙති, තමන් වහන්සේ කෙරෙහි ආරොපණය කෙරෙත්. එහෙයින් වදරන ලදී— **ආසභං ඨානං පටිජානාති** යනු. **පරිසාසු**= අවපිරිස්හි; **සීහනාදං නදති**= ශ්‍රේෂ්ඨනාදය අභීත නාදය නාද කෙරෙයි; නොහොත් සිංහනාදය සදෘශ වූ නාදය නදයි; මේ අර්ථය "සීහනාද" සූත්‍රයෙන් දැක්විය යුත්තේයි. නොහොත් යම්සේ සිංහතෙම (ඍෂභාලාදි ලාමක සත්වයන්ගේ) සහනයෙන් ද (හස්ත්‍යාදීන්ගේ) හනනයෙන් ද "සිංහ" යයි කියනු ලැබේ ද, එපරිද්දෙන් තථාගතයන් වහන්සේ ලොක ධර්මයන්ගේ ඉවසීමෙන් ද, පරප්‍රවාදයන්ගේ නැසීමෙන් ද "සිංහ" යයි කියනු ලැබේ; මෙසේ කියනලද සිංහයාගේ නාදය "සීහනාද" නම් වේ. එහි යම්සේ සිංහ තෙම සිංහබලයෙන් සමන්විත වූයේ සියලු තැන්හි විශාරද වූයේ පහ වූ රොමහර්ෂ ඇත්තේ සිංහනාදය කෙරේ ද, එපරිද්දෙන් තථාගත සිංහ තෙමේ ද තථාගතබලයන්ගෙන් සමන්විත වූයේ අවපිරිස්හි විශාරද වූයේ පහවූ රොමහර්ෂ ඇත්තේ **ඉති රූපං** යනාදි නයින් නානාවිධ දෙශකා විලාස සම්පන්න වූ සිංහනාදය නදයි; එයින් වදරනලදී= **පරිසාසු සීහනාදං නදති** යනු. **බ්‍රහ්මචක්කං පවත්තෙති** යන මෙහි බ්‍රහ්මං යනු ශ්‍රේෂ්ඨ යැ, උත්තම යැ, විශිෂ්ට යැ, යන අර්ථයි; මේ **චක්ක** ශබ්දය වනාහි—

124. සම්පත්තියං ලක්ඛණෙ|ච – රථඩෙඝ ඉරියාපථෙ
"චක්ක" දුනෙ රතනධම්මුර – චක්කාදිසු ච දිස්සති
ශබ්දය. ධම්මචක්කෙ ඉධ මතො – නානං වෙඩා විභාවයෙ.

ඒ එසේ මැයි- මේ ("චක්ක" ශබ්දය) චත්තාරිමානි භික්ඛවෙ! චක්කානි යෙහි සමන්නාගතානං දෙවමනුස්සානං යනාදි තැන්හි සම්පත්තියෙහි දක්නා ලැබෙයි; පාදතලෙසු චක්කානි ජාතානි යන මෙහි ලක්ෂණයෙහි යැ; චක්කංව වහතො පදං යන මෙහි රථාවයව යෙහි යැ; චතුචක්කං නවද්වාරං යන මෙහි ඊර්‍යාපථයෙහි යැ; දද හුඤ්ජ ව මා ච පමාදෙ චක්කං වත්තය සබ්බපාණීනං යන මෙහි දාන යෙහි යැ; දිබ්බං චක්කරතනං පාතුරහොසි යන මෙහි රතනචක්‍රයෙ හියැ; මහා පවත්තිනං චක්කං යන මෙහි ධර්මචක්‍රයෙහි යැ; ඉත්ථා හතස්ස පොසස්ස චක්කං භවති මත්ථකෙ යන මෙහි උරචක්‍රයෙහි යැ; බුරපරියනෙනන වෙපි චක්කෙනන යන මෙහි ප්‍රහරණ චක්‍රයෙහි යැ; අසනි විය චක්කං යන මෙහි අසනිමණ්ඩලයෙහි යැ; මෙහි වනාහි මේ "චක්ක" ශබ්දය ධර්මචක්‍රයෙහි දන්නාලද්දේය.

ඒ ධර්මචක්‍රය වනාහි ත්‍රිවිධ වෙයි; ප්‍රතිවෙධ ඥානය ද දෙශනාඥානය දැයි කියාසි; එහි තමන් වහන්සේගේ ආශ්‍රීඵලය ඵලවන්නා වූ ප්‍රඥා වෙත් උපදවන ලද්දේ ප්‍රතිවෙධ ඥාන යයි; ශ්‍රාවකයන්ගේ
ධර්මචක්‍රය. ආශ්‍රීඵලය ඵලවන්නා වූ කරුණාවෙන් උපදවන ලද්දේ දෙශනා ඥාන යයි; එහි ප්‍රතිවෙධ ඥානය උපදිමින් පවත් නේය, උපන්නේ යයි ත්‍රිවිධ වෙයි; ඒ එසේ මැයි- ඒ (ප්‍රතිවෙධඥානය) අභිනිෂ්ක්‍රමණයෙහි පටන් රහත්මහ තෙක් උපදිමින් පවත්නේ වෙයි; ඵලක්ෂණයෙහි උපන්නේ නම් වෙයි; නොහොත් තුෂිතභවනයෙහි පටන් මහාබොධි පර්‍යඞ්කයෙහි රහත්මහ තෙක් උපදිමින් පවත්නේ වෙයි; ඵලක්ෂණයෙහි උපන්නේ නම් වෙයි; නොහොත් දීපඞ්කර පාද මූලය පටන් රහත්මහ තෙක් උපදිමින් පවත්නේ වෙයි; ඵලක්ෂණයෙහි උපන්නේ නම් වේ. දෙශනාඥානය ද පැවැත්වෙමින් සිටියේය, පැවැත් තේ යයි ත්‍රිවිධ වෙයි; ඒ එසේ මැයි- ඒ (දෙශනා ඥානය) අඤ්ඤා කොණ්ඩඤ්ඤ තෙරුන්ගේ සෝවාන්මහ තෙක් පැවැත්වෙමින් සිටියේ

---

124. සම්පත්තියං= සම්පත්තියෙහි ද; ලක්ඛණෙ ච= ලක්ෂණයෙහි ද; රථඩෙඝ= රථාවයවයෙහි ද; ඉරියාපථෙ= ඉරියව්වෙහි ද; දුනෙ= දානයෙහි ද; රතනධම්මුරචක්කාදිසු ච= රතනචක්‍ර – ධර්මචක්‍ර – උරචක්‍රාදි යෙහි ද; දිස්සති= දක්නාලැබේ. ඉධ= මෙහි; ධම්මචක්කෙ= ධර්මචක්‍ර යෙහි; මතො= දන්නාලදී; නානං ච= භෙද; වෙඩා= දෙපරිද්දෙකින්; විභාවයෙ= දක්වන්නේයි.

වෙයි; ඵලක්ෂණයෙහි පැවැත්තේ නම් වේ. ඔවුනතුරෙහි ප්‍රතිවෙධ ඥානය ලොකොත්තර යැ; දෙශනා ඥානය ලෞකිකයි. යලි මේ ඥාන ත්‍රය ම අන්‍යයන් හා අසාධාරණ වූ බුදුවරයන්ගේ ම ළඟ උපන්නාවූ ඥානයෙකි.

මෙවිට යම් දසබලයකින් සමන්විත වූ තථාගතයන් වහන්සේ ශ්‍රේෂ්ඨාවස්ථානය ප්‍රතිඥා කරන්නාසේක්ද, යම් දසබලකෙනෙක් ආදියෙහි ම **දස ඛො පනිමානි සාරිපුත්ත! තථාගතස්ස තථාගතබලානි** යි නික්ෂිප්ත වූවාහු ද, ඔවුන් විස්තර වශයෙන් දක්වන්ට- **කතමානි දස? ඉධ සාරිපුත්ත! තථාගතො ඨානං ච ඨානතො** යනාදිය වදළහ. **එහි ඨානඤ්ච ඨානතො**= කාරණය ද කාරණ වශයෙන්; කාරණය වනාහි යම්හෙයකින් එහි ඵලය සිටීද, එය අයත් පැවතුම් ඇති බැවින් උපදින්නේ ත් පවත්නේ ත් වේ ද, එහෙයින් **ඨාන** යයි කියනු ලැබේ. එය භාග්‍යවතුන් වහන්සේ- යම් යම් ධර්ම කෙනෙක් යම් යම් ධර්ම කෙනෙකුන්ට ඉපදීම පිණිස හෙතු ප්‍රත්‍යය වෙත් ද, ඒ ඒ ධර්මය ස්ථාන යැ; යම් යම් ධර්ම කෙනෙක් යම් යම් ධර්ම කෙනෙකුන්ට ඉපදීම පිණිස හෙතුප්‍රත්‍යය නො වෙත් ද, ඒ ඒ ධර්මය අස්ථාන යයි දන්නාහු ස්ථානය ස්ථාන වශයෙන් ද අස්ථානය අස්ථාන වශයෙන් ද තත්වූ පරිද්දෙන් ඥානගන්නාසේක. තවද- මෙය අභිධර්මයෙහි- **තත්‍ර කතමං තථාගතස්ස ඨානඤ්ච ඨානතො අට්ඨානඤ්ච අට්ඨානතො යථාභූතං ඤාණං** යනාදි නයින් විස්තර කරනලද්දේ මය. **යම්පි**= යම් ඥානයකින්; **ඉදම්පි සාරිපුත්ත! තථාගතස්ස** යනු මේ ස්ථාන ස්ථාන ඥානය ද තථාගතයාගේ තථාගත බලයෙක් නම් වෙයි යනා වීයි; මෙසේ සියලු පදයන්හි යෙදීම දතයුතු. **කම්මසමාදානානං**= සමාදන් වැ (= මොනොවට ගෙන) කරනලද කුශලා කුශල කර්මයන්ගේ; හොහොත් කර්මය ම කර්මසමාදානය යැ; **ඨානසො හෙතුසො**= ප්‍රත්‍යය වශයෙන් හා හෙතු වශයෙන් ද; **එහි** ගති-උපධි-කාල-ප්‍රයොගයෝ විපාකයට ස්ථාන යැ, කර්මය හෙතුයි; තවද- මේ ඥානයාගේ විස්තර කථා තොමෝ- **අනෙකවිධානි පාපකානි කම්මසමාදානානි ගති සම්පතිපතිබාළහානි න විපච්චන්ති** යනාදි නයින් අභිධර්මයෙහි ආවා මැයි. **සබ්බත්ථ ගාමිනිං**= සියලු ගතිගාමිනී වූ ද අගතිගාමිනී වූ ද; **පටිපදං**= මාර්ගය; **යථාභූතං පජානාති**= බොහෝ මිනිසුන් පවා එක මැ සතෙකු නසන කල්හි මොහුගේ චෙතනාව නිරයගාමිනී වන්නීයැ, මොහුගේ (චෙතනාව) තිරශ්චීන්ගාමිනී වන්නී යයි මේ ක්‍රමයෙන් එක් වස්තුවෙහි දු කුශලා කුශල චෙතනා සඞ්ඛ්‍යාත වූ ප්‍රතිපත්තීන්ගේ සඵභාවය අවිපරීත හෙයින් ඥානගනී; මේ ඥානයාගේ විස්තර කථාව ද- **තත්‍ර කතමං තථාගතස්ස සබ්බත්ථ ගාමිනිපටිපදං යථාභූතං ඤාණං? ඉධ තථාගතො අයං මග්ගො අයං පටිපදා නිරයගාමිනීති පජානාති** යනාදි නයින් අභිධර්මයෙහි ආවා මැයි. **අනෙකධාතුං**= චක්ෂුර්ධාතු

දසබලඥානය.

ආදි වූ හෝ කාමධාතු ආදි වූ හෝ ධාතූන්ගෙන් බොහෝ ධාතු ඇති; **නානාධාතුං**= ඒ ධාතූන්ගේ ම විවිධ ලක්ෂණවලයෙන් නානාප්‍රකාර ධාතු ඇති; **ලෝකං**= සකර්‍මායතන ධාතුලෝකය; **යථාභූතං පජානාති**= ඒ ඒ ධාතූන්ගේ අවිපරීත හෙයින් සවභාවය ප්‍රතිවෙධ කෙරෙයි; මේ ඤාණය ද- **තඤ්ච ඛෝ පනේතං තථාගතස්ස අනෙකධාතුනානාධාතුලෝකං යථාභූතං ඤාණාය ඉධ තථාගතෝ බාහිනානාත්තං පජානාති** යනාදි නයින් අභිධර්‍මයෙහි විස්තරකරන ලද්දේ මය. **පරසත්තානං**= ප්‍රධාන සත්වයන්ගේ; **පරපුග්ගලානං**= එයින් අන්‍ය වූ හීන සත්වයන්ගේ; නොහොත් මේ පදවය එකාර්‍ථ මැයි, වෛනෙයයන්ගේ වශයෙන් දෙප රිද්දෙකින් වදාරනලද. **ඉන්ද්‍රියපරෝපරියත්තං**= ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන්ගේ පරභාවය ද අපරභාවය ද, වෘද්ධිය ද හානිය ද යන අර්ථයි; මේ ඤාණයා ගේ ද විස්තරකථා තොමෝ- **තඤ්ච ඛෝ පනේතං තථාගතස්ස පරසත්තානං පරපුග්ගලානං ඉන්ද්‍රියපරෝපරියත්තං යථාභූතං ඤාණං? ඉධ තථාගතෝ සත්තානං ආසයං පජානාති අනුසයං පජානාති** යනාදි නයින් අභිධර්‍මයෙහි ආවා මැයි. **ඣානවිමොක්ඛසමාධිසමාපත්තීනං**= ප්‍රථමාදි සතර ධ්‍යානයන්ගේ ද, "රූපී රූපානි පස්සති" යනාදි වූ අෂ්ටවිමොක්ෂ යන්ගේ ද, සවිතර්කක-සවිචාරාදි වූ තුන් සමාධීන්ගේ ද, ප්‍රථමධ්‍යාන සමාපත්ති ආදි වූ නව අනුපූර්‍වසමාපත්තීන්ගේ ද; **සඞ්කිලෙසං**= හාන භාගිය ධර්‍මය; **වොදානං**= විශෙෂභාගිය ධර්‍මය; **වුට්ඨානං**= "වොදානය ද වුට්ඨාන යැ, ඒ ඒ සමාධියෙන් නැඟී සිටීම ද වුට්ඨානය" යි මෙසේ කියන ලද ප්‍රගුණධ්‍යානය හා භවාඞ්ගය ද ඵලසමාපත්තීහු ද (වුට්ඨාන නම්;) යම්හෙයකින් හෙයිම හෙයිම වූ ප්‍රගුණධ්‍යානය මතු මතු ධ්‍යානයට පද ස්ථාන වේ ද, එහෙයින් "වොදානය ද වුට්ඨාන" යයි කියනලදි; නැවත සියලු ධ්‍යානයන්ගෙන් නැඟී සිටීම භවාඞ්ගයෙන් වේ ද, නිරොධ සමා පත්තියෙන් නැඟී සිටීම ඵලසමවතින් වේ ද, එය සඳහා "ඒ ඒ සමාධි යෙන් නැඟී සිටීම ද වුට්ඨානය" යි කියනලදී. මේ ඤාණය ද- **තඤ්ච ඛෝ පනේතං තථාගතස්ස ඣානවිමොක්ඛසමාධිසමාපත්තීනං සඞ්කිලෙසං වොදානං වුට්ඨානං යථාභූතං ඤාණං? ඣායී චතුන්නං රූපාවචරානං ඣායී අපෙ තඤ්චෙවා ඣායී සමාපත්තිං යෙව සමානං වීපත්තීති පවෙචනී** යනාදි නයින් අභිධර්‍මයෙහි විස්තර කරනලදී. තවද- සියලු ඤාණයන්ගේ විස්තර කථාව පිළිබඳ විනිශ්චය "**සමෙමාහ විනොදනී**" විභඞ්ගාර්‍ථ කථා වෙහි කියනලද්දේය; පූර්‍වේනිවාසානුස්සතිඥාන-දිව්‍යචක්ෂුර්ඥානයන් පිළිබඳ කථාව විශුද්ධිමාර්ගයෙහි විස්තරකරන ලද්දීය; ආශ්‍රවක්ෂය කථාව භය හෙරව (අටුවාවෙහි විස්තර කරනලදී.) **ඉමානි ඛෝ සාරිපුත්ත!** යනු යම් (දසබල කෙනෙක්) පූර්‍වයෙහි- **දස ඛෝ පනිමානි සාරිපුත්ත! තථාගතස්ස තථාගතබලානි** යි කියෙම් ද, මොවුහු; **නානි** යි. අර්‍ථය (= නිගමනය) කරනසේක.

එහි පරවාදී කථාවක් වෙයි- "දශබලඥානය නම් වෙන ම නැති, සර්වඥතාඥානයාගේ මෑ මේ ප්‍රභෙදයෙකැ" යි. එය එසේ නො දතයුතු; කුමක් හෙයින යත්? දශබලඥානය අනෙකෙක් මැය, සර්වඥතාඥානය අනෙකෙකි; ඒ එසේ මැයි- දශබලඥානය සවකීය සවකීය කෘත්‍යය ම දනගනී, සර්වඥතාඥානය එය ද එයින් අවශෙෂය ද දනගනී; විස්තර මෙසේයි- දශබලඥානයන් අතුරෙහි 1. පළමුවැන්න කාරණා කාරණය ම දනගනී; 2. දෙවැන්න කර්මාන්තර-විපාකාන්තරය ම දනියි; 3. තෙවැන්න සර්වපරිවෙර්දය ම දනියි; 4. සතරවැන්න ධාතූන්ගේ නානාත්ව කාරණය ම දනියි; 5. පස්වැන්න සත්වයන්ගේ අධ්‍යාශය අධිමුක්තිය ම දනියි; 6 සවැන්න ඉන්ද්‍රියයන්ගේ තියුණුබව මෘදුබව ම දනගනියි; 7. සත්වැන්න ධ්‍යානාදීන් සමග ඔවුන්ගේ කෙලෙසීම් ආදිය ම දනියි; 8. අටවැන්න පෙර විසූ සකනිවාසානුස්මෘතිය ම දනියි; 9. නවවැන්න සත්වයන්ගේ චුතිප්‍රතිසන්ධිය ම දනියි; 10. දසවැන්න (පරිඥාභිසමයාදි වශයෙන්) සත්‍යපරිවෙර්දය ම දනගන්නේයි.

සර්වඥතාඥානය වූ කලි මොවුන් විසින් දතයුත්ත ද එයින් මත්තෙහි ද දනගනී. තවද- මේ (දසබල) ඥානයන්ගේ කෘත්‍යය සියල්ල නො කෙරෙයි; ඒ එසේ මැයි- එය ධ්‍යානය වැ අර්ණය කරන්ට නො හැකි වෙයි, සෘර්ධිය වැ විකුර්ණය කරන්ට නො හැකි වෙයි, මාර්ගය වැ කෙලෙසුන් ක්ෂය කරන්ට නො හැකි වේ. තවද- පරවාදී තෙම මෙසේ විචාළ යුත්තේ යැ- මේ දශබලඥානය නම් සවිතර්කසවිචාර ද? අවිතර්කවිචාරමාත්‍ර ද? අවිතර්කඅවිචාර ද? කාමාවචර ද? රූපාවචර ද? ලෞකික ද? ලොකොත්තර ද? යි කියයි. (හෙතෙම) දන්නේ (නම්) පිළිවෙළින් ඥානයෝ සවිතර්කසවිචාරයෝ යයි කියන්නේය, එයින් මත්තෙහි දෙදෙන අවිතර්කඅවිචාරයෝ යයි කියන්නේය, ආශ්‍රවක්ෂයඥානය සවිතර්කසවිචාර වන්නේය, අවිතර්කවිචාරමාත්‍ර වන්නේය, අවිතර්කඅවිචාර වන්නේය, යි කියන්නේය; එසේ ඕ පිළිවෙළින් සත්දෙනෙක් කාමාවචරයෝ යැ, එයින් මත්තෙහි දෙදෙනෙක් රූපාවචරයෝ යැ, අවසාන යෙහි එසෙක් ලොකොත්තර යයි කියන්නේය; සර්වඥතාඥානය වනාහි සවිතර්කසවිචාර මය, කාමාවචර මය, ලෞකික ම යයි කියන්නේය.

මෙසේ මෙහි අනුපදවර්ණනාව කොට මෙවිට යම්හෙයකින් තථාගත යන් වහන්සේ පළමුකොට මෑ සථානා සථාන ඥානයෙන් ලෞකික සම්‍යග්දෘෂ්ටි සථානය දක්නා හෙයින් ද නියත මිථ්‍යාදෘෂ්ටි සථානයාගේ අභාවය දක්නා හෙයින් ද වෙනෙයසත්වයන්ගේ ආශ්‍රවක්ෂයාධිගමයට හා අනධිගමයට ද සථානා සථාන වූ කෙලෙශාවරණයාගේ අභාවය දක්නා සේක් ද, නැවත කර්මවිපාක ඥානයෙන් ඔවුන්ගේ ත්‍රිහෙතුක ප්‍රතිසන්ධිය දක්නා හෙයින් විපාකාවරණයාගේ අභාවය දක්නාසේක් ද, සර්වත්‍රගාමිනී ප්‍රතිපද ඥානයෙන් ආනන්තරිය කර්මයක්හුගේ අභාවය දක්නා හෙයින්

කම්මාවරණයාගේ අභාවය දක්නා සේක් ද, මෙසේ අනාවරණ වූ සත්ත්වයන්ට අනුකූල ධර්මදේශනය පිණිස අනේකධාතු නානාධාතු ඥානයෙන් (ධර්ම) ධාතූන්ගේ වෛමාත්‍ර දර්ශනය හේතුකොට ගෙන චරිත විශේෂය දක්නාසේක් ද, නැවත ප්‍රයෝගය නො ගෙන ම ඔවුන්ගේ අධ්‍යාශය වශයෙන් ධර්මදේශනය පිණිස නානාධිමුත්තික ඥානයෙන් අධිමුක්තිය (=අදහස) දක්නාසේක් ද, නැවත මෙසේ දක්නාලද අධිමුක්ති ඇත්ත වුන්ගේ ශක්තිය නො ඉක්මැ බලය නො ඉක්මැ දහම් දෙසනු පිණිස ඉන්ද්‍රියපරාවරතා ඥානයෙන් ශ්‍රද්ධාදීන්ගේ තියුණුබව හා මෘදුබව දක්නා හෙයින් ඉන්ද්‍රියයන්ගේ පරාවරත්වය (=වෘද්ධි-හානිභාවය) දක්නාසේක් ද, යලි මෙසේ දැනගන්නාලද ඉන්ද්‍රියපරාවරත්වය ඇති ඒ (වෙනෙය ජනයෝ) ඉදින් දුරු වෙත් නම් ප්‍රථමධ්‍යානාදියෙහි වසිභූත බැවින් සෘද්ධිවිශේෂයෙන් වහා ඔවුන් වෙත පැමිණෙන සේක, පැමිණ ද පූර්වේනිවාසානුස්මෘතිඥානයෙන් ඔවුන්ගේ පූර්වජාතිභාවනාව ද දිව්‍යචක්ෂුර්ඥානානුභාවය හේතුකොට ගෙන පැමිණියයුතු චෙතෝපරිය ඥානයෙන් එකෙණෙහි චිත්ත විශේෂය ද දක්නාසේක් ආශ්‍රවක්ෂය ඥානානුභාවයෙන් ආශ්‍රවක්ෂය ගාමිනී ප්‍රතිපදාවෙහි පහවූ සම්මෝහ ඇති බැවින් ආශ්‍රවක්ෂය පිණිස ධර්ම දෙශනා කරන සේක් ද, එහෙයින් මේ පිළිවෙළින් මේ දශ බලයෝ කියනලද්දාහු යයි දතයුත්තාහුයි.

නං වාචං අප්පහාය යනාදි තැන්හි නැවත මේබදු වචනයක් නො කියන්නෙමියි කියන්නේ වචනය දුරු කෙරෙයි නම් වේ; නැවත මෙබදු සිතක් නූපදවන්නෙමියි සිතන්නේ සිත දුරු කෙරෙයි නම් වේ; නැවත මෙබදු දෘෂ්ටියක් නො ගන්නෙමියි දුරු කරන්නේ දෘෂ්ටිය බැහැරලයි නම් වේ; එසේ නො කරන්නේ නො ම දුරු කෙරෙයි, නො බැහැරලයි; **හෙතෙම- ඝට්ටනං නික්කිපෙත්වා එවං නිරයේ=** යම්සේ නිරය සාලයන් විසින් ගෙනවුත් නිරයෙහි තබනලද්දේ වේද, එපරිද්දෙන් නිරයෙහි තබනලද්දේ ම වේ යයි දතයුතු.

මෙවිට ඒ (නිරයෙහි පැමිණීමට) අතිශාධික උපමාවක් දක්වනසේක් **සෙය්‍යථාපියනාදිගවදුළහ.** එහි **සීලසම්පදානෙන්** යනාදි තැන්හි ලෞකික ලොකොත්තර වූ ශීලසමාධි ප්‍රඥාවෝ දතයුත්තාහුය. ලොකොත්තර වශයෙන් ම විනිවර්තනය කරන්ට ද වටී; ඒ එසේ මැයි- මේ තෙම සම්‍යග්වචනකර්මාන්තාජීවයන්ගෙන් ශීලසම්පන්න වෙයි, සම්‍යග්ව්‍යායාම සම්‍යක් සමාධින්ගෙන් සමාධිසම්පන්න වෙයි, සම්‍යග්දෘෂ්ටි සඞ්කල්පයන් ගෙන් ප්‍රඥාසම්පන්න වේ. මෙසේ ශීලාදියෙන් සම්පූර්ණ වූ ඒ මහණ යම් සේ **දිට්ඨෙව ධම්මෙ=** මේ අත්බැව්හි ම; **අසඤ්ඤං ආරාධෙති=** රහත්බවට පැමිණේ ද; **එවං සම්පදමිදං භාදිපුත්ත! වදාමි=** මේ කාරණය ද මෙබදු

මැයි, ඒ එසේ මැයි- යම්සේ මාඝීයට අනතුරුව නො වරදවා මැ ඵලය උපදී ද, එපරිද්දෙන් ම මේ පුද්ගලයාගේ ද චුතියට අනතුරුව නො වරදවා මැ නිරයෙහි ප්‍රතිසන්ධිය වේ යයි දක්වනසේක. සියලු මැ බුඩවවන යෙහි මේ උපමාවට වඩා දැඩිතර කොට වදාළ උපමාවක් නම් නැති.

වෙසාරජ්ජානි යන මෙහි ශාරද්‍යය (= නො බුහුටිබව) ට ප්‍රතිපක්ෂ වූයේ "වෙසාරජ්ජ" නම් වෙයි; සතරතැනෙක්හි ශාරද්‍යයාගේ අභාවය ප්‍රත්‍යවෙක්ෂා කරන්නහුට උපන් සොම්නස්මය නුව

චතුවෛශාරද්‍යය. **ණ**ට මේ නමෙකි. **සම්මාසම්බුඩස්ස නෙ පවිජානතො**= මම සම්‍යක්සම්බුඩයෙමි, සියලු ධර්මයෝ මා විසින් අභි සම්බුඩයහයි මෙසේ ප්‍රතිඥ කරන්නා වූ ඔබ විසින්; **අනභිසම්බුඩා**= මේ නම් ධර්මයෝ ඔබ විසින් අවබොධ නො කරනලද්දාහුය; **තත්‍ර වත**= ඒ අනභිසම්බුඩයහ,යි මෙසේ දක්වනලද ධර්මයන්හි **සඛඩමෙමන**= හෙතු **සහිත** වූ කරුණු සහිත වූ වචනයෙන් සුනකඛත්තයා මෙන් විප්‍රලාප කියන්නාහු අප්‍රමාණ යැ; **නිමිත්තඝමනං** යන මෙහි පුද්ගලයා ද ධර්මයද "නිමිත්ත" යයි අදහස් කරනලද; යමෙක් මට වීරුඩ චොදනා කරන්නේ ද, ඒ පුද්ගලයා නො දක්මි; යම් (ධර්මයක්) දක්වා මේ නම් ධර්මය ඔබ විසින් අනභිසම්බුඩ යයි මට ප්‍රතිචොදනා කරන්නේ ද, ඒ ධර්මය ද නො දක්මි යි මේ මෙහි අර්ථයි. **ඔඔමප්පතෙනා**= ක්ෂෙමයට පැමිණියේ; සෙසු දෙපදය මේ පදයාගේ ම වේ වචනයි; මේ සියල්ල මැ වෛශාරද්‍ය ඥානය ම සඳහා වදාරනලද. ඒ එසේ මැයි- "මේ නම් ධර්මය ඔබ විසින් අනභිසම්බුඩ" යයි චොදනා කරන පුද්ගලයකු හෝ චොදනාකාරණයක් හෝ අනභිසම්බුඩ ධර්මයක් හෝ නො දක්නාවූ දසබලයන් වහන්සේට ඒකාන්තයෙන් සඩහාව බුඩ වූයේ ම "මම බුඩ වෙමි, යි කියමි" යි ප්‍රත්‍ය වෙක්ෂා කරන්නහුට ඉතා බලවත් සොම්නසක් උපදී, ඒ සොම්නස ඇති යෙදුනා වූ ඥානය වෛශාරද්‍ය නම් වෙයි; එය සඳහා **ඔඔමප්පතෙනා** යනාදිය වදාළහ. මෙසේ සියලු තැන්හි අර්ථය දතයුතු. **අනන්තරායිකා ධම්මා** යන මෙහි චාහි අන්තරාය කෙරෙත් නුයි "අන්තරායිකා" නම් වෙති; ඔවුහු අර්හෙයින් දැන දැන ඉක්මවනලද සප්පායපථනිසඤ්ඤි යෝයි; සැබව- දැන දැන ඉක්මවනලද යථාත්මිරිසෙයින් දුෂ්කාට – දුර්ගතියකු දු මාඝීඵලයන්ට අන්තරාය කෙරෙයි; එහෙත් මෙහි මෛථුන ධර්මය අදහස් කරනලද. ඒ එසේ මැයි- මෙවුන් සෙවුනාවූ යම් කිසි වෙකුට නිසැක ව මැ මාඝීඵලයන්ට අන්තරාය වේ. **යස්ස ඛො පන නත්‍ථි අප්පාය**= රාගක්ෂයාදීන් අතුරෙහි යමක් යමක් පිණිස; **ධම්මා දෙසිතෙනා**= අශුභ භාවනාදී ධර්මය වදාරනලද ද; **තත්‍ර වත මං**= ඒ අනෛයර්‍යාණික ධර්මය නිමිත්ත කොට ඔබ; **සෙස්ස කි නියෙන් ම** දතයුතු.

අඵ බෝ ඉමා සාරිපුත්ත! යන මෙය කුමක් හෙයින් ආරබ්ධ ද යත්? වෛශාරද්‍ය ඥානයාගේ බලය දැක්වීම පිණිස යැ. සැබව යම්සේ ව්‍යක්ත වූ පිරිසක් මැදට පැමිණ පණ්ඩිතයන්ගේ චිත්තාරාධනයෙහි සමර්ථ වූ කථාවෙන් ධර්මකථිකයාගේ දක්ෂබව පැනේද, එපරිද්දෙන් මේ අවපිරිස් කරා පැමිණ වෛශාරද්‍ය ඥානයාගේ වෛශාරද්‍යභාවය දැනගන්ට හැකි නුයි, වෛශාරද්‍ය ඥානයාගේ බලය දක්වනසේක්- **අඵ බෝ ඉමා සාරිපුත්ත!** යනාදිය වදාළහ. **එහි ඛත්තියපරිසා**= ක්ෂත්‍රියයන් රැස්ව හුන් සථානය; සියලු තැන්හි මේ නයයි. වැලි මාරකායික දෙවියන් රැස්ව හුන් තැන **මාරපරිසා** යි දතයුත්තිය. මාරයන් (හුන් තැන) නො වේ. තවද- මේ සියලු පිරිස් ම උග්‍රවූ සථානයන් දැක්වීම් වශයෙන් ගන්නා ලද්දාහුය; සැබව- මනුෂ්‍යයෝ මෙහි රජතෙම හුන්නේ යයි ප්‍රකෘති වචනය පවා කියන්ට නො හැකි වෙති; දෙකැසින් සෝදිය වැගිරෙත්, මෙසේ ක්ෂත්‍රිය පිරිස උග්‍රයැ; බමුණෝ ත්‍රිවේදයෙහි දක්ෂ වෙති; ගෘහපතියෝ විවිධ ව්‍යවහාරයන්හි ද අක්ෂරවින්‍යාසයෙහි ද (දක්ෂ වෙති;) ශ්‍රමණයෝ සවවාද- පරවාදයන්හි දක්ෂ වෙත්; ඔවුන් මැද ධර්මකථා කථනය නම් ඉතා ම භාරයැ; අමනුෂ්‍යයෝ ද උග්‍ර වෙති; සැබව- අමනුෂ්‍යයෙකැයි කී ඇසිල්ලෙහි ම සියලු සිරුර කම්පා වෙයි; ඔහුගේ රූපය හෝ දුක ශබ්දය හෝ අසා සත්වයෝ විසංඥ වූවාහු වෙති; මෙසේ අමනුෂ්‍ය පිරිස උග්‍ර වූවාය; ඒ පිරිස්හි ද ධර්මකථාකථනය නම් ඉතා ම භාරයැ; මෙසේ උග්‍ර වූ සථාන දැක්වීම් වශයෙන් ඒ (පිරිස්) ගන්නාලද්දාහු යයි දතයුතු. **අපේක්ඛාගාහති**= ඇතුලත පිවිසෙයි; අනෙක සතං ඛත්තිය පරිසං= බිම්බිසාර සමාගම- ඥති සමාගම- ලිච්ඡවී සමාගම සදෘශ වූ (සමාගම්) අන්සක්වළවල ද ලැබේ මැයි; කිමෙක් ද භාග්‍යවතුන් වහන්සේ අන්සක්වළවලටත් යන සේක්ද යත්? එසේය, යෙති; කෙබඳු වැ ද යත්? ඔවුහු යම්බදු වූවාහු ද, එබදු වැ ම යෙත්. එහෙයින් ම වදාළහ- "ආනන්ද! මම නොයෙක් සියගණන් ක්ෂත්‍රිය පිරිස් කරා එලඹුනෙම් දනිමි, එහි ඔවුන්ගේ යම්බදු වූ වණ්ණයෙක් වේද, මාගේ එබදු වූ වණ්ණය වෙයි; ඔවුන්ගේ යම්බදු වූ සවරය වේද, මාගේ එබදු වූ සවරය වෙයි; යලි (අනුරූප වූ) දැහැමි කථාවෙන් (දෘෂ්ටධාම්මික සාම්පරායික අර්ථය) දක්වම්, —පෙ— සතුටු කරවම්, කථාකරන්නාවූ ද මා මේ කවරෙක් කථා කෙරේ ද? දෙවියෙක් හෝ මිනිසෙක් හෝ දැ? යි නො දනිති; යලි දැහැමි කථාවෙන් (කරුණු) දක්වා —පෙ— සතුටු කරවා අතුරුදහන් වෙමි, අතුරුදහන්වූ ද මා මේ කවරෙක් අතුරුදහන් වූයේ ද? දෙවියෙක් හෝ මිනිසෙක් හෝ දැ? යි නො දනිත්" යයි.

ක්ෂත්‍රියයෝ වළලු- අඟුපලඳනා- මල්- ගඳ ආදියෙන් සැරසුනාහු විවිධවණ්ණ වස්ත්‍ර ඇත්තාහු (කන්හි) පළන් මිණිකොඩොල් ඇත්තාහු මුහුළු දරන්නාහු වෙති; කිම භාග්‍යවතුන් වහන්සේ ද එපරිද්දෙන්

ආතමය සරසත් ද? තවද- ඔවුහු සුදු වූවාහු ද කළු වූවාහු ද මහුරුවන් සිවි ඇත්තාහු ද වෙති; කිම ශාස්තෘන් වහන්සේ ද **එබදු** වෙත් ද යත්? ශාස්තෘන් වහන්සේ තමන් වහන්සේගේ පැවිදිවෙසින් ම යෙති, එත කුදු වුවත් ඔවුන්ට එබදු වැ වැටහෙත්; හොස් **රාජාසනයෙහි** හුන්නා වූ තමන් දක්වති; **ඔවුන්ට** අද අපගේ **රජ්ජුරුවෝ** අතිශයින් බබලතියි (සිතක්) වෙයි; තවද- ඔවුහු සිදුණු සවර ඇත්තාහු ද බැදුණු සවර ඇත්තාහු ද කාකසවර ඇත්තාහු ද වෙති; ශාස්තෘන් වහන්සේ බ්‍රහම සවරයෙන් ම දහම් වදුරති; **නාදිසඛෝ මයහං සතෘ හොති** යන මේ වනාහි භාසාන්තරය සඳහා වදුරනලදී; මිනිසුන්ට වූ කලි ඒ අසා අද රජ්ජුරුවෝ මිහිරි හඬින් කථා කෙරෙතියි (සිතක්) වෙයි; තවද- භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසා නික්ම ගිය කල්හි යලි ආවාවූ රජු දූක මේ තෙම කවරෙක් දෝ හෝයි විමසීම උපදියි; මේ **කියනලද** වෙයි- "මේ සථානයෙහි මෙවිට ම මගදබසින් සිහලබසින් මිහිරි හඬින් කථා කරමින් අතුරුදහන් වූ මේ තෙම කවරෙක් ද? කිම දෙවියෙක් ද? නොහොත් මිනිසෙක් ද?" යි කුමක් පිණිස වනාහි මෙසේ නො දන්න වුන්ට දහම් දෙසත් ද යත්? වාසනා පිණිස ය; සැබව- මෙසේ අසන ලද්දාවූ ද ධර්මය අනාගතයෙහි ප්‍රත්‍යය වේ ම යයි අනාගතය සඳහා දෙශනා කරන සේක. **සතතිඛිනනපුබබං**= එක්වැ හුන්විරුය; **සලල පිනපුබබං**= අල්ලාපසල්ලාපය කළ විරුය; **සාකචඡා**= ධර්මසාකච්ඡාව ද පැමිණෙනලද විරුය; **අනෙකසතං බ්‍රාහමණපරිසං** යනාදීන්ගේ ද **සොණදණ්ඩ සමාගමාදීන්ගේ** වශයෙන් ද අන්‍ය වක්‍රවාටයන්ගේ වශ යෙන් ද සම්භවය දතයුතු.

චතසසො ඛො ඉමා භාරිපුතත! යොනියො යන මෙහි **යොනි** යනු සකඛඞකොථාසයට ද කාරණයට ද ප්‍රස්‍රාවමාගීයට ද නමෙකි. ඒ එසේ මැයි- **චතසසො නාගයොනියො චතසසො සුපණණ යොනියො** යන මෙහි සකඛඞකොථාසය "යොනි" නම්; "යොනි ශබ්දය" **යොනි හෙසා භූමිජ ඵලසස අධිගමාය** යන මෙහි කාරණ යයි; **න චාහං බ්‍රාහමණං බ්‍රූමි ඔනිජං මතති සම්භවං** යන මෙහි ප්‍රස්‍රාවමාගීය (යොනි නම්;) මෙහි වූ කලි සකඛඞකොථාසය "යොනි" යයි අදහස් කරනලදී. එහි **ඕජුවෙහි** උපන්නාහු= **අණ්ඩජ** නම් වෙති; දලබුයෙහි උපන්නාහු= **ජලාබුජ** නම් වෙති; චතුර්යොනි. **සංසෙවදයෙහි** (= සෝදියෙහි) උපන්නාහු= **සංසෙදජ** නම් වෙති; මේ කාරණයන් හැර (ඉපදීම් වශයෙන්) පැන මෙන් උපන්නාහු **තුයි; ඔපපාතික** නම් වෙත්. **අභිනිබබතති ජායනති**= බිඳ නික්මීම් වශයෙන් උපදිත්; **පුතිකුණපෙ වා** යනාදිහු වනාහි අනීඝට වූවාහු ම දක්වනලද්දාහුය. එතකුදු වුවත් ඉඝට වූද ගිතෙල්-තලතෙල්-මී-පැණි ආදීන්හි සත්වයෝ උපදිත් මැයි. **දෙවා** යනාදියෙහි චාතුමහා රාජිකයෙහි පටන් මත්තෙහි දෙවියෝ ඔපපාතික වෙති; භූමාට්ඨදෙවියෝ

වනාහි සිව්යෝනි ඇත්තානුය. **එකචෙව ච මනුස්සා** යන මෙහි මිනිසුන් අතුරෙහි කිසිවෙක් ම ඔපපාතික වෙති, මොවුහු වනාහි බොහෝ සෙයින් ජලාබුජයෝ මැයි; කුන්තපුත්‍ර වූ දෙබැතෙරුන් මෙන් අණ්ඩජයෝ ද වෙති; පියුම්ගැබැ උපන් පොක්ඛරසාති බ්‍රාහ්මණ පදමාවතී දෙවී ආදීන් මෙන් සංසෙවදජයෝ ද වෙත්. විනිපාතිකයන් අතුරෙහි නිජ්ඣාමතණ්හිකප්‍රෙතයෝ නිරැසතුන් මෙන් ඔපපාදුකයෝ මැයි; සෙස්සෝ සිව්යෝනි ඇත්තානුම ද වෙත්. ඔවුන් යම්සේ ද එපරිද්දෙන් යක්ෂයෝ ද සියලු චතුෂ්පාද – පක්ඛිජාති – දීඝීජාති ආදිවූ ද සියල්ලෝ සතරයෝනි ඇත්තානුම මැයි.

පඤ්ච ඛෝ ඉමා සාරිපුත්ත! ගතියෝ යන මෙහි සුකෘත – දුෂ්කෘත කර්මයන්ගේ වශයෙන් යායුත්තානුම නුයි **ගති** නම් වෙති; තවද– ගති ගති – නිප්ඵත්තිගති – අධ්‍යාශයගති – විභවගති – නිෂ්පත්ති ගති යයි ගතිය නම් බහුවිධ වන්නීය; එහි **තං ගතිං පෙච්චභවිස්සාමි** යි ද, **යස්ස ගතිං න ජානන්ති දෙවා ගන්ධබ්බමානුසා** යි ද, මෝ තොමෝ "ගතිගති" නමු; **ඉමෙසං ඛෝ අහං භික්ඛූනං සීලවතානං නෙව ජානාමි ගතිං වා ආගතිං වා** යන මෝ තොමෝ "නිබ්බත්තිගති" නමු; **එවම්පි ඛෝ නෙ අහං බ්‍රහ්මෙ ගතියාච පජානාමි චුතියාච පජානාමි** යන මෝ තොමෝ "අජ්ඣාසය ගති" නමු; **විභවොගති ධම්මානං නිබ්බානං අරහතෙ ගති** යන මෝ තොමෝ "විභවගති" නමු; **මෙ එව ගතියෝ භවන්ති අනාසවා** යන මෝ තොමෝ "නිප්ඵත්තිගති" නමු; ඔවුනතුරෙන් මෙහි "ගති ගතිය" අදහස් කරනලදු. **නිරයෝ** යනාදියෙහි රතිරහිතාර්ථයෙන් ආස්වාදරහිතාර්ථයෙන් "නිරය" නම්; සරසට ගියාහුනුයි පඤ්චගති. "තිරච්ඡාන" නම් වෙති, ඔවුන්ගේ යොනිය "තිරච්ඡාන යොනි" නමු; ප්‍රෙත්‍යභාවයට පැමිණියවුන්ගේ විෂය නුයි, "පෙත්තිවිසය" නම්; මනසින් උත්සන්න බැවින් "මනුස්ස" නම් වෙති; පඤ්චකාමගුණයන් කරණකොට ගෙන ද තම තමන්ගේ ආනුභාවයන් ගෙන් ද ක්‍රීඩා කෙරෙත් නුයි "දෙව" නම් වෙත්. **නිරයඤ්චාහං සාරිපුත්ත!** යනාදියෙහි **නිරයෝ** යනු අවකාසය සමග සකනියෝයි; **නිරච්ඡානයොනිඤ්ච** යනාදියෙහි දු මෙම නයයි. **ඔගහං, පවිපදං** යන දෙකින් ම ඒ ඒ ගතිය පිණිස පවත්නාවූ කර්මය ම දක්වයි; **යථා පවිපන්නා**= යම් මාගීයකින් යම් ප්‍රතිපදාවකින් පිළිපන්නේ යයි (මාගී–ප්‍රතිපදා) දෙක ම එක් කොට දක්වයි; **අපායං** යනාදියෙහි අනිවෘඩිසඞ්ඛ්‍යාත වූ හෝ සුඛසඞ්ඛ්‍යාත වූ හෝ අයයෙන් පහ වූ බැවින් "අපාය" නම් වෙයි; දුකට ගතිය පිළිසරණ නුයි **දුග්ගති** නමු; දුෂ්කෘතකාරීහු මෙහි විවසව වැටෙත් නුයි **විනිපාත** නම්; **නිබ්බානඤ්චාහං** යන මෙය වනාහි හුදෙක් ගතිය ම නො වෙයි, ගතිනිස්සරණය වූ නිවන ද දැනිමියි දක්වනු පිණිස වදළහ. මෙහි **ඔගහං, පවිපදං** යන දෙකින් ම ආසන්නමාගීය ම

කිඤ්ඤලද්දේය; මෙවිට යථොක්ත සථානයන්හි තමන්වහන්සේගේ ඥන ප්‍රවෘත්ති ආකාරය දක්වනසේක් **භූධාහං සාරිපුත්ත!** යනාදිය වදළහ. **එහි එකන්තදුක්ඛා**= නිත්‍යයෙන් දුක්වූ, නිරන්තරයෙන් දුක්වූ; **තිප්පා**= බහල වූ; **කටුකා**= රළු වූ; **සෙය්‍යථාපි** යනාදිය ඔපම්‍යය දැක්වීම පිණිස වදාරන ලද්දාහුය; **එහි කාසූ** යි වළ ද, රැස ද කියනුලැබේ.

125. **"කිංනුඛණ්ඩරමාතොව – කාසූංඛණසි? සාරජි!**
"කාසූ" ශබ්දය **පුඤ්ඤො මෙ සම්ම! අක්ඛා හි–කිං කාසූයා කරිස්සසි"**
යන මෙහි වන්නහි ආවාටය (=වළ) "කාසූ" නම්;

a. **"අඩ්ඪාරකාසූං අපරෙ පූණන්ති – නරා රූදන්තා පරිදඩ්ඪගත්තා"** යන මෙහි රාශිය (කාසු නම්;) මෙහි වූකලි ආවාටය අදහස් කරනලද. එහෙයින් ම වදළහ. **සාධිකපොරිසං පූරඅඩ්ඪාරාතං** යනු. එහි අධිකයක් සහිත වූ පුරුෂප්‍රමාණය (= බඹය) ප්‍රමාණ වූයේ මෝහට නුයි **සාධිකපොරිසං** යනු වේ; අතිරෙකපස්රියතෙක යන අර්ථයි. **විඤ්ඤාණං විඤ්ඤමානං** යන මෙය පරිදෘහයාගේ බලවත්බව දැක්වීම පිණිස වදාරනලද; සැබව- ගිනිසිළ හෝ දුම හෝ ඇතිකල්හි වාතය උපදියි, එහෙයින් පරිදාහය බලවත් නො වේ. **සම්මපරෙතෝ**= සම්‍යක් අනුව ගියේ; **නසිතෝ**= හවගත් තෘෂ්ණා ඇත්තේ; **පිපාසිතෝ**= දිය බොනු කැමැත්තේ; **එකායනෙනෙව මඟෙහන**= එක මගින් ම, පිළිවෙළින් යායුතුවූ දෙපස නිරතුරුවැ කටුරුක්වලින් ගහන වූ මගින්; **පණ්ඩිතාය**= අහුරුවළැ ප්‍රාප්තිකාවක් නම් නැත් මය, එතකුදු වුවත් අහුරුවළ අර භයා ඉරියව් පිහිටුවනලද බැවින් මෙසේ කියනලදී. **එවමෙව ඛෝ**= යන මෙහි මේ ඔපම්‍යසංසන්දන යයි- ඒ එසේ මැයි- අහුරුවළ මෙන් නිරය දතයුතු, අහුරුවළට යන මහ මෙන් නිරයට පැමිණෙන කර්මය ද, මහට බැසගත්තහු මෙන් කර්මයෙන් යුක්ත පුද්ගල තෙමේ ද, ඇස් ඇති පුරුෂයා මෙන් දිවැස් ඇති භාග්‍යවතුන් වහන්සේ ද, යම් සේ ඒ පුරුෂ තෙම මහට පිළිපන්නහු දැක ම "මේ තෙම මේ මගින් ගොස් අහුරුවළෙහි වැටෙන්නේ ය" යි දැනගනී ද, එපරිද්දෙන් භාග්‍යවතුන් වහන්සේ ප්‍රාණඝාතාදීන් අතුරෙහි යම් කිසි කර්මයක් ආයූහනය (=රැස්කිරීම) කරන්නහු ම "මේ තෙම මේ කර්මය කොට නිරයෙහි උපදින්නේ ය" යි දැනගන්නාසේක, යම් සේ ඒ පුරුෂ තෙම මැතකාලයෙහි අහුරුවළෙහි

---

125. **සාරජි**= එම්බා සාරපිය! **ඛණ්ඩරමාතොව**= වෙලෙවිවූවෙකු මෙන්; **කාසූං**= වළ; **කිංනුඛණසි**= කුමක් හෙයින් සාරහි ද? **සම්ම**= යහලුව! **මෙ**= මා විසින්; **පුඤ්ඤො**= විචාරනලදුයෙහි; **අක්ඛාහි**= කියව. **කාසූයා**= වළ කරණකොටගෙන; **කිං කරිස්සසි**= කුමක් කරන්නෙහි ද?

a. **අපරෙ නරා**= අන්‍ය මනුෂ්‍යයෝ; **රූදන්තා**= හඬන්නාහු; **පරිදඩ්ඪගත්තා**= හාත්පසින් දැවුණු සිරුරු ඇත්තාහු; **අඩ්ඪාරකාසූං**= අහුරුරැස; **පූණන්ති**= විසුරුවත්.

වැටුනාවූ ඔහු දකී ද, එපරිද්දෙන් භාග්‍යවතුන් වහන්සේ මෑතකාලයෙහි ඒ පුරුෂ තෙම ඒ කර්මය කොට කොහි උපන්නේ ද? යි ආලෝකය වඩා දිවැසින් බලනසේක් නිරයෙහි උපන්නාවූ පඤ්චවිධබන්ධනාදි වූ මහදුක් විඳින්නහු දක්නාසේක; අනිකෙකු දු ඇති- එහි (මිනිස්ලොවැ) කර්මයූ හනකාලයෙහි ඔහුගේ වර්ණය අනිකෙක, නිරයෙහි උපන්නහුගේ (වර්ණය) අනිකෙකි; එකල්හි දු ඒ සත්ව තෙම ඒ කර්මය කොට ඒ (නිරයෙහි) උපන්නේ යයි බලන්නාවූ උන්වහන්සේට නොයෙක් දහස්ගණන් සත්ව යන් මධ්‍යයෙහි සිටියේ නමුදු "මේ හෙතෙමේ" යයි ඒ සත්ව තෙමේ ම ආපාථයට පැමිණෙයි දිවැස්හුගේ ඵලය නම් මේ යයි කියත්.

දෙවෙනි උපමාවෙහි යම් හෙයකින් අඟුරුවළෙහි මෙන් ගුථකූප යෙහි පරිදාහයෙක් නැත්ද, එහෙයින් "එකන්තදුක්ඛා" යි නො වදාරා **දුක්ඛා** යනාදිය වදාළහ. මෙහි දු පළමු නයින් ම ඕපම්‍ය සංසන්දනය දතයුතු. භාග්‍යවතුන් වහන්සේ මේ පුද්ගලයා ද හස්තියොනි ආදි වූ යම් කිසි තැනෙක උපන්නහු වධබන්ධන ආකර්ණ විකර්ණාදියෙන් මහත්වූ දුක් විඳින්නහු දක්නාසේක් මය.

තුන්වෙනි උපමාවෙහි **තනුපත්තපලාසෝ** යනු වලාපවලයක් මෙන් නො වැ, තුනී වූ පත්‍ර ඇතියේ; ඒ වෘක්ෂයාගේ විරල වූ පත්‍රඇති බව සඳහා මෙය වදාරනලද්දේය. **ඛබරච්ඡාසෝ**= විරල වූ සෙවන ඇතියේ; **දුක්ඛබහුලෝ**= යම්හෙයකින් ප්‍රෙතවිෂයෙහි දුක ම බහුල වේද, සැපය මද වැ කිසිවිටෙක වින්ද යුතු වේද, එහෙයින් මෙසේ වදාළහ. **මෙහි දු පළමු නයින් ම ඕපම්‍යසංසන්දනය දතයුතු.**

සතරවැනි උපමාවෙහි **බහලපත්තපලාසෝ**= නිරතුරු වූ පත්‍ර ඇත්තේ, පත්‍රයෙන් ගැවසීගත්තේ; **සන්දච්ඡායෝ**= පහණසතක් මෙන් සතවූ සෙවන ඇතියේ; **සුඛබහුලා වේදනා**= මිනිස්ලොවැ කැත්කුල ආදියෙහි සැපබහුල වූ වේදනාවෝ වින්දයුත්තාහු වෙති, ඒ වේදනාවන් විඳිමින් හුන්නහු හෝ හොත්තහු හෝ දක්නෙමියි දක්වන සේක; **මෙහි දු ඕපම්‍ය සංසන්දනය පළමු නයින් ම දතයුතුයි.**

පස්වැනි උපමාවෙහි **පාසාදෙ**= දිසිප්‍රාසාදයෙක්; **ඵලිකතලා වලිත්තලං**= ඇතුලත හා පිටත ද (සුණු) ආලෙපකළ; **ඡුසසිනඛගළං**= දෙරබා සමග මොනොවට වසනලද කවුළුඇති; **ගොනකත්ථතෝ**= සතරඟුලින් අධික වූ ලොම් ඇති කළුකොදුපලසින් අතුරනලද; **පටිකත්ථතෝ**= එළු ලොම්මුවා සුදුඇතිරියෙන් අතුරනලද; **පටලිකත්ථතෝ**= සතවූ පුප්ඇති එළුලොම්මුවා ඇතිරියෙන් අතුරනලද; **කාදලිමිගපවරපවරත්ථරණෝ**= කෙසෙල්මුවසම්මුවා උතුම් පසතුරුනෙන් අතුරනලද; ඒ පසතුරන සුදු වතක් මතුයෙහි කෙසෙල්මුවසම අතුරා මසා කෙරෙත් ල. **සඋත්තරච්ඡදෙ**= උඩුවියන් සහිත වූ, මතුයෙහි බඳනාලද රතුවියන සමග යැ යන **අට්ඨි. උභතෝ ලොහිතකූපධානෝ**= ශීර්ෂොපධානය ද පාදෙපධානය

දැයි පශ්‍යීඞ්කයාගේ දෙපස තබනලද රතුකන්වයින් (= කොච්ච) ඇති; මෙහි දු ඕපම්‍යසංසඳනය පළමු නයින් ම විභාගකටයුතුයි. මේ කියනු ලබන්නේ මෙහි පසුභාගයෙහි (ඕපම්‍ය) යොජනා ය- යම්සේ ඒ පුරුෂ තෙම මහට අවතීර්ණ වූවහු ම "මේ තෙම මේ මඟින් ගොස් පහයට නැඟී කුළුගෙට පිවිස පශ්‍යීඞ්කයෙහි හිඳින්නේ හෝ නිදන්නේ හෝ" යි දැන ගනී ද, එපරිද්දෙන් භාග්‍යවතුන් වහන්සේ දෑනාදි පුණ්‍යක්‍රියා වස්තූන් අතුරෙන් යම්කිසි කුසලකර්මයක් ආයූහනය කරන්නාවූ ම පුද්ගලයා දැක "මේ තෙම මේ කර්මය කොට දෙව්ලොවැ උපදින්නේ ය" යි දැනගන්නා සේක; යම්සේ ඒ පුරුෂතෙම මැතකාලයෙහි ඔහු පහයට නැඟී කුළුගෙට පිවිස පලහෙහි හුන්නා වූ හෝ නිදන්නා වූ හෝ එකාන්තයෙන් සැප වූ නිරන්තරයෙන් සැප වූ වෙදනාවන් විඳින්නාහු දකිද, එපරිද්දෙන් භාග්‍යවතුන් වහන්සේ මැතකාලයෙහි ඒ පුරුෂ තෙම ඒ කුශලකර්මය කොට කොහි උපන්නේ දැ? යි ආලොකය වඩා දිවැසින් බලන්නේ දෙව් ලොවැ උපන්නාවූ නදුනුයන් ආදියෙහි අපසරස්සමූහයා විසින් පිරිවරන ලදුව දිවසැපත් විඳින්නහු දක්නාසේක.

ආශ්‍රවක්ෂයවාරයෙහි දිබ්බෙන චක්ඛුනා යි නො වදාරා **තමෙනං පස්සාමි** යි වදාරනලද; ඒ කුමක් හෙයින් ද යත්? නියමයක් නැති හෙයිනි; ඒ සැබව මේ පුද්ගලයා දිවැසින් ද දකිති, චෙතොපරිය ඥන යෙන් ද දැනගනිති, සර්ඥතාඥනයෙන් ද දැනගනිත් මැයි. **එකන්ත සුඛා වේදනා** යන මෙය කියිසේ ත් දෙව්ලෝසැපය සමග ව්‍යඤ්ජන හෙයින් එක යැ, එහෙත් අර්ථහෙයින් විවිධ වෙයි; සැබව දෙව්ලෝසුවය රාගපරිදාහාදීන් ඇති බැවින් එකාන්තයෙන් ම එකාන්තසුඛ නො වෙයි; උපමාවෙහි දු ප්‍රාසාදයෙහි ලා "එකන්තසුඛා" යි යම්ක් කියනලද ද, එය මාගීපරිදාහය නො සන්හුන් බැවිනුදු බඩඇසින් පෙළන බැවිනුදු පවසින් මඩනාලද බැවිනුදු එකාන්තයෙන් එකාන්තසුව නො වේ. එත කුදු වුවත් වනලැහැබෙහි පොකුණට බැස රජස්දූලි සෝදා හළ බැවින් මංවිඩාව සන්සිඳුණු බැවින් ද, නෙලුඹුදූලි කැමෙන් හා මිහිරිදිය පිමෙන් ද සා පවත් පහවූ බැවින් ද, දියඇළුව පෙරලා පවදුහුල් හැඳ සන්ල්ථවිකාව ඉස්දෙරැ කොට දියඇළුව මිරිකා ලෙහි තබා මඳමඳපවනින් සලනු ලබන්නහු නිපැන් බැවින් සීතාකාරයෙන් එකාන්තසුඛ වේ. **එව මෙව වඩා** යන මෙහි මේ ඕපම්‍යසංසඳන යැ- පොකුණ මෙන් ආර්‍යීමාගීය දතයුතු; පොකුණට යන මහ මෙන් සුවීහාගප්‍රතිපදාව ද; මහට බැසගත්තහු මෙන් ප්‍රතිපදාවෙන් යුත් පුද්ගල තෙමේ ද; ඇස්ඇති පුරුෂයා මෙන් විවෘත වූ චක්ෂුසින් යුත් (= අනාවරණ වූ පසැස් ඇති) භාග්‍යවතුන් වහන්සේ ද; වනලැහැබ මෙන් නිවන ද (දතයුතු;) යම්සේ ඒ පුරුෂ තෙම මහට බටහු දැක ම "මේ තෙම මේ මඟින් ගොස් පොකු ණෙහි නා සිත්සතු වනලැහැබෙහි රුක්මුල හිඳින්නේ හෝ නිදන්නේ හෝ" යි දැනගනී ද, එපරිද්දෙන් ම භාග්‍යවතුන් වහන්සේ පිළිවෙත්

පුරන්නහු ම නාමරූපයන් පිරිසිඳින්නහු ම ප්‍රත්‍යය පරිග්‍රහය කරන්නහු ම ලක්ෂණාරම්මණ විදර්ශනාවෙහි කම් කරන්නහු ම "මේ තෙම මේ ප්‍රතිපදාව පුරා සියලු ආශ්‍රවයන් ක්ෂය කොට **අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං** යි මෙසේ කියනලද ඵලසමාපත්තියට පැමිණ වාසය කරන්නේ ය" යි දැනගන්නාසේක; යම් සේ ඒ පුරුෂ තෙම මෑතකාලයෙහි පොකුණෙහි නා වනලැහැබට පිවිස හුන්නා වූ හෝ නිදන්නා වූ හෝ එකාන්තයෙන් සැප වූ වේදනාවන් විඳින්නා වූ ඔහු දකිද, එපරිදෙන් ම භාග්‍යවතුන් වහන්සේ පසුකාලයෙහි ඒ පුද්ගලයා පිළිවෙත් පුරා මාගීය වඩා ඵලය පසක් කොට නිරෝධ නමැති උතුම්වූ යහන්ගත වූවහු නිවන් අරමුණු කොට ඇති ඵලසමාපත්තියට පැමිණ එකාන්තයෙන් සැපවූ වේදනාව විඳින්නහු දක්නාසේක.

අභිජානාමි බො පනා'හං සාරිපුත්ත! චතුරඞ්ගසමන්නාගතං යන මෙය කුමක් හෙයින් ආරබ්ධ ද යත්? වෙන ම අනුසන්ධි වශයෙන් ආරබ්ධ ය; මේ සුනක්ඛත්ත තෙම දුෂ්කර ක්‍රියාවෙන් ශුද්ධිය වේ යයි මෙසේ ලබ්ධිඇත්තෙක් ල, එහෙයින් ඕහට භාග්‍යවතුන් වහන්සේ මා විසිනුදු එක් අත්බැවෙක්හි සිව චතුරඞ්ගයෙන් යුක්ත වූ දුෂ්කරක්‍රියාව කරනලද, දුෂ්කරක්‍රියා ඇත්තෙක් නම් මා හා සදෘශයෙක් නැති දුෂ්කරක්‍රියාවෙන් ශුද්ධිය ඇතිකල්හි මම මැ ශුද්ධ වූවෙක් වන්නෙමි, යි දක්වනු පිණිස මේ දෙශනාව ආරම්භ කළහ. තවද- මේ සුනක්ඛත්ත තෙම දුෂ්කර ක්‍රියාවෙහි ප්‍රසන්න වූවෙක, ඔහුගේ ඒ ප්‍රසන්නභාවය ද- a **අදද්දසා බො භගවා! සුනක්ඛත්තෙනා ලිච්ඡවිපුත්තෙනා අවෙලං කොරක්ඛත්තියං චතුකුණ්ඩිකං ජමානිකිණ්ණං භක්ඛාසං මුඛතොව ඛාදනතං මුඛතා හුඤ්ජනතං, දිස්වානස්ස එතදහොසි, සාධුරූපො වත හො අරහං සම්මණා චතුකුණ්ඩිකො ජමානිකිණ්ණං භක්ඛාසං මුඛතොව ඛාදති, මුඛතා හුඤ්ජති"** යි මේ ආදි වූ "පාටික" සූත්‍රයෙහි ආ නයින් දතයුතු. එකල්හි භාග්‍යවතුන්වහන්සේ මේ තෙම දුෂ්කරක්‍රියාවෙහි ප්‍රසන්නවූවෙක මා විසිනුදු එක් අත්බැවෙක සිව ඉවිරහින් යුත් දුෂ්කරක්‍රියාව කරනලද දුෂ්කරක්‍රියාවෙහි පහදනාවූ ද මොහු විසින් මා කෙරෙහි පැහැදිය යුතු වන්නේය, ඔහුගේ ඒ ප්‍රසාදය ද මා කෙරෙහි නැතැයි දක්වන්නාහු ද මේ දෙශනාව ආරම්භ කළහ. එහි- බ්‍රහ්මචරියං යි

"බ්‍රහ්මචරිය,, ශබ්දය. දානය ද වතාවත ද ශික්ෂාපදය ද බ්‍රහ්ම විහාරය ද ධර්මදෙශනාව ද මෛථුන විරතිය ද සවදාරසනෙතා ඤාය ද උපෙෂ්ඨථය ද ආර්‍යාමාගීය ද සත්ථුශාසනය ද අධ්‍යාශය ද ව්‍යාප්තිය ද කියනුලැබේ. ඒ එසේ මැයි—

---

a. භගවාය! සුනක්ඛත්ත නම් ලිච්ඡවි පුත්‍ර තෙම කොරක්ඛත්තියි නම් නුවණැති චතුකුණ්ඩික වූවහු (භාදෙදන දෙවැලමිටු බිම තබා හැසිරෙන්නාහු) බිම දමනලද ආහාරය මුඛයෙන් ම කන්නාහු මුඛයෙන් බුදින්නාහු දුටුසේය, දැක ඔහට මේ සිත විය, එකාන්තයෙන් සොඳුරු පියවිඇති රහත් මහණෙක්හු, චතුකුණ්ඩික වැ බිම දමනලද ආහාරය මුඛයෙන් ම කයි, මුඛයෙන් බුදී, යයි.

126. "කිං තෙ වතං? කිං පන බ්‍රහ්මචරියං?
කිස්ස සුවිණ්ණස්ස අයං විපාකො?
ඉධි ජුති බලවිරියූපපත්ති
අක්ඛාහි මෙ නාග! මහාවිමානං.

127. අහං ච භරියා ච මනුස්සලොකෙ
සඛා උභො දුනපති අහුම්හ
ඔපානභූතං මෙ ඝරං තදාසි
සන්තප්පිතා සමණබ්‍රාහ්මණා ච.

128. තං මෙ වතං තං පන බ්‍රහ්මචරියං
තස්ස සුවිණ්ණස්ස අයං විපාකො
ඉධි ජුති බලවිරියූපපත්ති
ඉදං ච මෙ ධීර! මහාවිමානං" යන

මේ ප්‍රණාමකථාතක්‍රයෙහි දෘතය "බ්‍රහ්මචරිය" යි කියනලදි.

---

126. **නාග**= නාගරාජයා! **තෙ**= තොප විසින් (සමාදන්වනලදැ;) **වතං**= ව්‍රතය; **කිං**= කිම? **බ්‍රහ්මචරියං**= දෘතසඞ්ඛ්‍යාත ශ්‍රෙෂ්ඨචර්‍යාව; **කිං පන**= කිමෙක්ද? **සුවිණ්ණස්ස**= මොනොවට රැස්කරනලදැ; **කිස්ස**= කවර කර්මයක්හුගේ; **අයං විපාකො**= මේ විපාකය වේ ද? **ඉධි**= (දිව්‍ය මය) ආනුභාවය ද; **ජුති**= (වස්ත්‍රාභරණයන්ගේ හා ශරීරයාගේ) කාන්තිය ද වෙයි; **බලවිරියූපපත්ති**= කායබලයෙන් හා උත්සාහයෙන් ද සම්පන්න වූයෙහි; **මහාවිමානං**= මහත් වූ විමානයෙක් ද වෙයි; **මෙ**= මා විසින් විචාරනලද්දේ; **අක්ඛාහි**= කියව.

127. **අහං ච**= මම ද; **භරියා ච**= භාර්‍යාව ද (යන;) **උභො**= දෙදෙන; **මනුස්සලොකෙ**= මිනිස්ලොව; **සඛා**= සැදැහැ ඇතියමෝ; **දුනපති අහුම්හ**= දුනපති වූයෙමු; **තදා**= එකල්හි; **මෙ**= මාගේ; **ඝරං**= ගෘහය; **ඔපානභූතං ආසි**= (සතරමංසන්ඩියක කතිනලද) පොකුණක් මෙන් විය; **සමණබ්‍රාහ්මණා ච**= මහණ බමුණෝ ද; **සන්තප්පිතා**= (ආහාරපානාදියෙන්) සන්තර්පණය කරනලද්දාහුය.

128. **ධීර**= ධීරයන් වහන්ස! **මෙ**= මා විසින් (සමාදන්වනලදැ;) **තං වතං**= ඒ ව්‍රතය වෙයි; **තං පන බ්‍රහ්මචරියං**= ඒ දෘතසඞ්ඛ්‍යාත ශ්‍රෙෂ්ඨ චර්‍යාව වෙයි; **සුවිණ්ණස්ස**= මොනොවට රැස්කරනලදැ; **තස්ස**= ඒ කර්මයාගේ; **අයං විපාකො**= මේ විපාකය යි; **ඉධි**= ආනුභාවය ද; **ජුති**= කාන්තිය ද වෙයි; **බලවිරියූපපත්ති**= කායබලයෙන් හා උත්සාහයෙන් ද යුක්ත වෙමි; **මෙ**= මාගේ; **ඉදං ච මහාවිමානං**= මේ මහත් වූ විමානය ද වේ.

129. "කෙන පාණි කාමදදෙ - කෙන පාණි මධුස්සවො
කෙන නෙ බ්‍රහ්මචරියෙන - පුඤ්ඤං පාණිම්හි ඉඤ්ඣති,

130. නෙන පාණි කාමදදෙ - නෙන පාණි මධුස්සවො
නෙන මෙ බ්‍රහ්මචරියෙන - පුඤ්ඤං පාණිම්හි ඉඤ්ඣති"

යන- මේ අඩකුරප්‍රෙතවස්තුවෙහි වතාවත "බ්‍රහ්මචරිය" යි කියනලදී.

ඉදං ඛො නං භික්ඛවෙ! නිත්‍යතිදිගං **නාම බ්‍රහ්මචරියං අහොසි** යයි මේ "නිත්‍යනිරජාතක" යෙහි පඤ්චශික්ෂාපදය "බ්‍රහ්මචරිය" යි කියනලද. **නං ඛො පන පඤ්චසිඛ!** බ්‍රහ්මචරියං **නෙව නිබ්බිදාය න විරාගාය යාව දෙව බ්‍රහ්මලොකූපපත්තියා** යයි මේ "මහාගොවින්ද" සූත්‍රයෙහි බ්‍රහ්ම විහාරයෝ "බ්‍රහ්මචරිය" යි කියනලද්දාහුය. **එකන්තං බ්‍රහ්මචරියන්තං සහස්සං මච්චුහායිනො** යන මෙහි ධර්මදේශනාව "බ්‍රහ්මචරිය" යි කියනලදු. **පරෙ අබ්‍රහ්මචාරි භවිස්සන්ති මයමෙත්ථ බ්‍රහ්මචාරි භවිස්සාම** යි "සලෙලඛ" සූත්‍රයෙහි මෛථුනවිරතිය "බ්‍රහ්මචරිය" යි කියනලද්දීය

131. "මයඤ්චව භරියා නාතික්කමාම
අමෙහ ව භරියා නාතික්කමන්ති
අඤ්ඤත්‍ර නාහි බ්‍රහ්මචරියං චරාම
තස්මාහි අම්හං දහරා න මියරෙ" යි-

මහාධම්මපාල ජාතකයෙහි සවදාරසනෙත්තාඡය "බ්‍රහ්මචරිය" යි කියනලදී.

---

129. **කෙන**= කවර කර්මයක් හෙතුකොටගෙන; **පාණි**= (ඔබගේ දකුණු) අත; **කාමදදෙ**= (කප්රුකක් මෙන්) කැමති කැමති සම්පත් දෙන්නේ වේද? **කෙන**= කුමක් හෙතුකොටගෙන; **පාණි**= (දකුණු) අත; **මධුස්සවො**= මධුරරස වහුරුවන්නේ වේ ද? **නෙ**= තොපගේ; **කෙන බ්‍රහ්මචරියෙන**= කෙබඳු වූ වතාවත් සඞ්ඛ්‍යාත ශ්‍රෙෂ්ඨචර්‍යාවක් හෙතු කොට ගෙන; **පාණිම්හි**= අතෙහි; **පුඤ්ඤං**= පුණ්‍ය ඵලය; **ඉඤ්ඣති**= සම්‍යඞ් වේ ද?

130. **නෙන**= (පැමිණෙන යාචකයන්ට අසයහසිටුහුගේ දැනසථානය අත ඔසවා දුක්විම්මය වූ) ඒ කර්මය හෙතුකොට ගෙන; **පාණි**= (මාගේ) හස්තය; **කාමදදෙ**= කැමති සම්පත් දෙන්නේ වෙයි; **පාණි**= හස්තය; **මධුස්සවො**= මධුරරස හෝ ඉෂ්ටවස්තු දෙන්නේ වෙයි; **මෙ**= මාගේ; **නෙන බ්‍රහ්මචරියෙන**= ඒ වතාවත යයි කියනලද බඹසර හෙතු කොට ගෙන; **පාණිම්හි**= අතෙහි; **පුඤ්ඤං**= පුණ්‍ය ඵලය; **ඉඤ්ඣති**= සම්‍යඞ් වෙයි හෙවත් නිපදී.

131 **මයං** ච= ඇපි දු; **භරියා**= (අපගේ) භාර්‍යාවන්; **නාතික්කමාම**= ඉක්ම නො පවතුම්හ; **භරියා** ච= භාර්‍යාවෝ ද; **අම්හෙ**= අප; **නාතික්කමන්ති**= ඉක්ම නො පවතින්; **නාහි**= ඔවුන් කෙරෙන්; **අඤ්ඤත්‍ර**= අන්‍ය ස්ත්‍රීන් කෙරෙහි; **බ්‍රහ්මචරියං**= සවදාරසනෙත්තාඡ සඞ්ඛ්‍යාත බ්‍රහ්මචර්‍යාවෙහි; **චරාම**= හැසිරෙමු; **තස්මා හි**= එහෙයින්; **අම්හං**= අප ගේ; **දහරා**= බාලයෝ; **න මියරෙ**= නො මැරෙත්.

132. "හිනෙන බ්‍රහ්මචරියෙන - ඛත්තියෙ උපපජ්ජති
මජ්ඣිමෙන ච දෙවත්තං - උත්තමෙන විසුජ්ඣති" යි-

මෙසේ නිම්ජාතකයෙහි ආත්මදමන වශයෙන් කරනලද අෂ්ටාඞ්ගික උපෝෂථය "බ්‍රහ්මචරිය" යනි කියනලදී.

ඉදං බො පන පඤ්ඣිඛ! බ්‍රහ්මචරියං එකන්ත නිබ්බිදාය විරාගාය -පෙ- අයමෙව අරියෝ අට්ඨඞ්ගිකෝ මග්ගෝ යි "මහාගෝවින්ද" සූත්‍රයෙහි ම ආර්‍යමාර්ගය "බ්‍රහ්මචරිය" යනි කියනලද. **නයිදං බ්‍රහ්මචරියං ඉඛං චෙව ඵීතං ච විත්ථාරිකං බාහුජඤ්ඤං පුථුභූතං යාව දෙව මනුස්සෙහි සුපකාසිතං** යි "ප්‍රාසාදික" සූත්‍රයෙහි ශික්ෂාත්‍රය සඞ්ග්‍රහ වූ සියලු ශාසනය "බ්‍රහ්මචරිය" යනි කියනලදී.

133. "අපි අතරමානානං - ඵලාසාව සම්ජ්ඣති
විපක්කබ්‍රහ්මචරියොඝම් - එවං ජානාහි ගාමණි!" යන

මෙහි අධ්‍යාශය "බ්‍රහ්මචරිය" යනි කියනලදී. මෙහි වූ කලි ත්‍රියර්‍ය "බ්‍රහ්මචරිය" යනි අදහස් කරනලදී. ඒ එසේ මැයි- ත්‍රියර්‍ය බ්‍රහ්මචර්‍යාවට මෙය ම සූත්‍රය වෙයි; ඒ මේ ත්‍රියර්‍ය එක් අත්බැවෙක්හි සිව්වැදෑරුම් දුෂ්කරක්‍රියාව කළබැවින් **චතුරඞ්ගසමන්නාගතං** යි වදරනලද. **තපස්සි සුදං හොමි** යන (මෙහි) **සුදං** යනු නිපාතමාත්‍ර යැ; තපස් ඇත්තෙක් වෙමි යන අර්ථයි. **පරමතපස්සි**= උතුම් වූ තපස් ඇත්තෙක්, තපස් ඇත්තවුන් අතුරෙන් උතුම් වූවෙක්; **ලූඛස්සුදං හොමි**= රූක්ෂවූයෙමි වෙමි;

---

132. **හිනෙන බ්‍රහ්මචරියෙන**= (තීර්‍ථායතනයෙහි රක්නාලද මේථුනවිරති සඞ්ඛ්‍යාත නොහොත් ශාසනයෙහි) **අට්ඨාඞ්ගිකඋපෝෂථ** සඞ්ඛ්‍යාත හීන වූ බඹසරින්; **ඛත්තියෙ**= ක්ෂත්‍රියකුලයෙහි; **උපපජ්ජති**= උපදියි; **ච**= නැවත; **මජ්ඣිමෙන**= ධ්‍යානොපචාර මාත්‍රයක් වූ මධ්‍යම බ්‍රහ්මචර්‍යාවෙන් නොහොත් අනුලෝමඥානය තෙක් පැවති ආරබ්ධවිද ශීඛායාගේ ශාසනමාර්ගී බ්‍රහ්මචර්‍යාවෙන්; **දෙවත්තං**= දෙව්ඵවට පැමිණෙයි; **උත්තමෙන**= (අෂ්ටසමාපත්ති සඞ්ඛ්‍යාත වූ නොහොත් ශාසනයෙහි විදසුන් වඩා රහත්බවට පැමිණීම් සඞ්ඛ්‍යාත උත්තම බ්‍රහ්මචර්‍යාවෙන්; **විසුජ්ඣති**= බඹලොව ඉපදීමෙන් හෝ සියලු කෙලෙස්මල නැසීම් වශයෙන් විශුඞ්ඵ වේ.

133. **අපි අතරමානානං**= (පණ්ඩිතයන්ගේ අවවාදයෙහි සිට) අතුරිත වැ ක්‍රියා කරන්නවුන්ට; **ඵලාසා**= ප්‍රාප්තිය කළ ඵලයෙහි ආශාව නොහොත් ආශාඵලය; **සම්ජ්ඣති එව**= (ඒ ඵලයාගේ නිපදීමෙන් යම් සේ ද එමෙන්) සම්ඃඩවන්නේ ම වෙයි, නොහොත් (ප්‍රාප්තිය කළ ඵලය සේ) සම්ඃඩ වන්නේ ම වේ; **විපක්කබ්‍රහ්මචරියොඝම්**= (චතුස්සඞ්ග්‍රහ වස්තුසඞ්ඛ්‍යාත ශ්‍රෙෂ්ඨචර්‍යාව මුල් කොට ඇති යශස්සමාපත්තියෙන් ලත් හෙයින්) මුහුකුරා ගිය අධ්‍යාශය සඞ්ඛ්‍යාත බ්‍රහ්මචර්‍යාව ඇත්තෙම් වෙමි; **ගාමණි**= එම්බා ග්‍රාමණීය; **එවං ජානාහි**= (නුඹ) මෙසේ දනුව.

ජේගුච්ඡී= පාපයට ජුගුප්සා කරන්නෙමි; **පඨිවිත්තසඤ්ඤුදං හොමි**= මම ප්‍රකෂීවිවෙක ඇතියෙක් වෙමි; **නත්‍ථඤ්ඤු මේ ඉදං සාමිපුත්තන!**= ඒ (ඊයම් සඞ්ඛ්‍යාත) වතුරඞ්ග බ්‍රහ්මචර්‍යාවෙහි මේ මාගේ තපස් ඇතිබව වෙයි; තපසින් යුක්තභාවයෙහි මාගේ මේ අවෙලකාදි තපසින් යුත්බව වේයයි දක්වති. **එහි අවෙලකෝ**= සෙල්රහිත වූයේ, නග්න වූයේ; **මුත්තාචාරෝ**= හරිනලද ආචාර ඇත්තේ; උච්චාරකර්මාදියෙහි ලෞකික කුලපුත්‍රයන්ගේ ආචාරයෙන් වෙන් වූයේ මල-මූ කෙරෙමි කම් බුදිමි; **හත්ථාපලෙඛනෝ**= අතෙහි පිණ්ඩය නිමිකල්හි දිවින් අත ලෝතෙමි, මල හෝ කොට අතෙහි ම දඬුකඬෙක යන සන් ඇතිව අතින් පිසදමමි; ඔවුනු දඬුකඩ සහිතයෙකැයි පනවත් ල, එහෙයින් ඔවුන්ගේ පිළිවෙත පුරමින් මෙසේ කෙළේ යැ. භික්ෂාව ගැනීම පිණිස එනුමැන වහන්ස! යි කියනලදුයේ නො ඒ නුයි **න එහි භදන්තිකන්ත** නම් වෙයි; **එසේ වී නම්** සිටිනුමැන වහන්ස! යි කියනලද්දේ ද නො සිටී නුයි **න තිට්ඨභදන්තිකන්ත** නම් වෙයි; ඒ දෙක ම තීර්ථකයෝ මොහුගේ වචනය කරනලද්දේ වන්නේ යයි නො කෙරෙති, මම ද එසේ කෙළෙමි, යි දක්වති. **අභිහටං**= පළමුකොට ගෙන එලවනලද භික්ෂාව; **උද්දිස්ස කතං**= මෙය ඔබ උදෙසා කරනලදුයි මෙසේ ආරොචනය කළ භික්ෂාව; **න නිමන්තනං**= අසවල් නම් කුලයට හෝ පිරිසට හෝ ගමට හෝ පිවිසෙනු මැනවැයි මෙසේ නිමන්ත්‍රණය කළ භික්ෂාව ද; **න සාදියාමි**= නො ගනිමි; **න කුමහිමුඛා**= කළයෙන් නහා දෙනු ලබන්නා වූ භික්ෂාව නො ගනිමි; **න කළොපිමුඛා**= "කළොපි" යනු සැළිය හෝ පැස හෝ යි, එයිනුදු (නහා දෙනු ලබන භික්ෂාව) නො ගනිමි; කුමක් හෙයින ගත්? කුමහි - කළොපිහු මා නිසා සැන්දෙන් පහර ලබනියි කියායි. **න එළකමන්තරං**= එලිපත අතර කොට දෙනුලබන (භික්ෂාව) නො ගනිමි; කුමක් හෙයින් ද? මේ තෙම මා නිසා අතුරු කිරීම ලබා යයි කියායි. දණ්ඩ-මුසලයන්හි දුමෙ ම නයයි. **න ච්ඡන්නං**= වලඳන දෙදෙනෙකු අතුරෙන් එකෙක් නැඟිට දෙනකල්හි නො ගනිමි; කුමක් හෙයින? ආලෝපයට අනන්තරය වේ යයි කියායි. **ගබ්භිනියා** යනාදියෙහි වතාහි ගැබිනියගේ කුසෙහි දරු තෙම වෙහෙසි, කිරි පොවන තැනැත්තියගේ ළදරුවාට ක්ෂීරාන්තරාය වෙයි, පුරුෂයන් අතරට ගිය තැනැත්තියගේ රතිඅන්තරාය වේ යයි නො ගනිමි; **න සඞ්කිත්තිතෙසු**= සඞ්කිත්තනය කොට කරනලද බත් ඇති කල්හි; දුර්භික්ෂකාලයෙහි අවෙලකයන්ගේ ශ්‍රාවකයෝ අවෙලකයන් පිණිස ඒ ඒ තැනින් සහල් ආදිය සමාදන් කරවා බත් පිසත් ල, උතකාලට වූ අවෙලක තෙම එයින් නො පිළිගනී. **න යත්ථ සා**= යම් තැනෙක ශුනකයෙක් පිඹු ලබන්නෙමියි එලඹ සිටියේ වේද, එහි ඔහුට නො දී ගෙන එනලද්ද නො ගනිමි; කුමක් හෙයින? තෙල ශුනකයාගේ පිණ්ඩාන්තරාය වේ යයි කියායි. **සණ්ඩ සණ්ඩ චාරිනී**= සමූහ සමූහ ව හැසිරෙන්නාහු; ඒ එසේ මැයි- ඉදින් අවෙලකයකු දුක මොහුට භික්ෂාව දෙන්නෙමුයි මනුෂ්‍යයෝ ආහාරගෘහයට පිවිසෙත් ද, යලි ඔවුන්

පිවිසි කල්හි සැළමුව ආදියෙහි නිලීනව (=වසා) සිටි මැස්සෝ නැගිට උඩට නැගී සමූහ සමූහ වැ හැසිරෙත් ද, එයින් ගෙන එනලද භික්ෂාව නො ගනිමි; කුමක් හෙයින ? මා නිසා මැස්සන්ගේ ගොචරාන්තරාය වූයේ යයි කියායි. මම ද එසේ කෙළෙමි. **ථූසොදකං**= සියලු සස්‍ය සම්භාරයෙන් කරනලද සෙෂවීරකය; මෙහි දු සුරාපානය ම සාවද්‍ය යැ; මේ තෙම වනාහි සියල්ලෙහි සාවද්‍යසංඥ ඇත්තේයි. **එකාගාරිකො**= යමෙක් එක ම ගෘහයෙක්හි භික්ෂාව ලැබ නවතීද (හෙතෙමේයි;) **එකාලොපිකො**= යමෙක් එක ම ආලොපය (=බත්පිඬ)කින් යැපේද (හෙතෙමේයි;) **වාගාරිකො** යනාදියෙහි දු මෙ ම නයයි. **එකිස්සාපි දතියා**= එක් (බත්) තැටියකින්; "දති" නම් යම් බදුනක අග්‍රහික්ෂාව බහා තබත් ද, එබදු වූ එක් කුඩා තැටියක් වෙයි. **එකාහිකං**= එක් දිනක් අතරැ වූ (=දිනකට වරක් යයි සේයි;) **අඩමාසිකං**= අඩමසක් අතරැ වූ; **පරියායභත්තභොජනං**= වාරභක්ත භොජනයෙහි; එක් දිනකට වරක් දෙදිනකට වරක් සත්දිනකට වරක් අඩමසකට වරක් යයි මෙසේ දින වාරයෙන් ආ භක්තභොජනයෙහි; **සාකභක්ඛා**= අමුපලා බුදින්නේ; **සාමාකභක්ඛා**= බොඩහමුසහල් බුදින්නේ; "නීවාරා" දියෙහි පළමු කොට **නීවාර** නම් වනයෙහි සවයඤ්ඤාත විජාතියෙකි; **දඳුල** යනු සම් මරුන් විසින් සම් ලියා දමනලද කසට යැ; **භව** යයි මැලියම් ද, සෙවෙල් ද කිණිහිරි ආදි රුක්ලාටු ද කියනුලැබේ; **කණ** යනු කුඩු යැ; **ආචාම** යනු බත්සැලියෙහි ලගින වූ දම්බත් (= දමුකුඩ,) හැර දමනලද තැන්හි එය ගෙන කයි. බත්කැඳ යයි ද කියත්. **පියඤ්ඤූකාදීහු** ප්‍රකට මැයි. **පවත්තඵලභොජී**= වැටුණු ගෙඩි බුදිනසුලු වූයේ; **සාණානි**= සණ වැහැරි; **මසාණානි**= මිශ්‍රකවස්ත්‍ර; **ඡවදුස්සානි**= මළසිරුරින් හැර දමනලද වස්ත්‍ර; එරූපත්තණ ආදිය හෝ ගොනා කළ වස්ත්‍ර; **පංසුකූලානි**= පොළොවෙහි දමනලද කඩරෙදි; **තිරීටානි**= රුක්සුඹුලුයෙන් කළ වස්ත්‍ර; **අජිනං**= අදුන්මුව සම්; **අජිනක්ඛිපං**= එය ම මැද පලනලද්දේ; කුර සහිත (අදුන්දිවිසම) යයි ද කියති; **කුසචීරං**= කුසතණ ගොනා කළ වැහැරි; **වාකචීර** - **ඵලකචීරයන්හි** දු මෙ ම නයයි. **කෙසකම්බලං**= මිනිස්කෙසින් කළ කම්බලය; යම්ක් සඳහා ඇ. **යානි හානිවි හිකඛවෙ! තනනාවුතානි වත්ථානි කෙසකම්බලං තෙසං පඨිකිට්ඨං, සීතකාලෙ සීතං, උණ්හකාලෙ උණ්හං, අප්පතෙජා ච දුක්ඛසමඵස්සො ච දුග්ගන්ධො ච වායති** යි වදරනලද ද (එයයි.) **වාලකම්බලං**= අස්වල් ආදියෙන් කළ කම්බලය; **උලූකපක්ඛිකං**= බකමුහුණු පියාපත් ගොනා කරනලද වස්ත්‍රය; **උබ්භඣ්ඩිකා**= උඩුකුරුව සිටියේ; **උභකුවිකප්පධාන මනුයුත්තො**= උක්කුටික ව්‍යායාමයෙහි යෙදුනේ; යන්නේ ද උක්කුටික ව

ඇ, මහණෙනි! ඝුයෙන් විසා කරනලද යම් කිසි වස්ත්‍ර කොතෙක් වෙත් ද, ඔවුන තුරෙන් කෙශකම්බලය ලාමක යැ, ශීතකාලයෙහි ශීතලයැ, උෂ්ණකාලයෙහි උණුසුම් ශැ, මිදුක් අගනේ ද දුස්පශස් ඇත්තේ ද (වෙයි,) දුර්ගන්ධය ද හමන්නේයි,

මෑ පැන පැන යෙයි; **කණ්ටකාපස්සයිකෝ**= ලොහොකටු හෝ පියවි කටු හෝ බිම සිටුවා එහි සමක් අතුරා සිටීම් සක්මන් ආදිය කෙරෙමි,යි දක්වයි; **සෙය්‍යං**= හෝනේ ද එහි ම සයනය කෙරෙමි; **සවස තුන්වැනි වූයේ** මෝහට නුයි **සායනතියඤ්ච** නම් වෙයි; උදෑසන යැ- මධ්‍යාහ්න යැ සවස යැයි දවසට තුන්වරක් පව් සොදා හරින්නෙමියි ජලයට බැසීම් යොගයෙහි යෙදුනේ වාසය කෙරෙමියි දක්වයි; **නෙකවස්සගණ්ඨිඝං**= නොයෙක් වසී සමූහයෙන් හටගත්; **රජෝජල්ලං**= රජස්මල; මෙය තමන්ගේ "රජෝජල්ලක" ව්‍රතසමාදානකාලය සඳහා කියයි. **පේගුවජි සම්ං**= පාපයට පිළිකුල් කරනබැවිනි; **ඝාව උදඤ්චබ්භූමහිපි**= දියබින්දු වෙහි දු පවා මාගේ කරුණාව එලඹ සිටියා වෙයි, අන්‍ය වූ සකුරු-කැබිලිති-දඬු-වැලි ආදියෙහි කියනු මැ කිම? ඔවුහු වනාහි දියබින්දූන් මෙන් මේ කැටකැබිලිති ආදීහු ද ක්ෂුද්‍රප්‍රාණීහු යයි පනවති; එයින් කිහ- "දියබින්දුවෙහි දු පවා මාගේ දයාව එලඹ සිටියා වෙයි, දියබින්දුවකු දු නො නසම්, විනාශ නො කරම්; **කුමන කරුණකින් ද යත්? මා'හං බුදඤ්ච පාණේ විසමගතෙ සඤ්ඤානං ආපාදෙසිං**= වළගොඩ-තණගරුක්අතු ආදි වූ විෂම ස්ථානයන්හි පැමිණි ජලබිඳු සඤ්ඤාත වූ කුඩා සතුන් නැසීමට වධයට නො පමුණුවම්යි කියායි. මේ සඳහා "සිහි ඇති වැ ම ඉදිරියට යෙම්" යි දක්වයි. අවෙලකයන් අතුරෙහි බිම ඇක්මුණු කල් පවන් සිල්වත් වූයෙක් නම් නැත් ල, පිඬු සිඟීමට යන්නා ද දුශ්ශීලයෝ වැ ම යෙත් ල, උපාසකයන්ගේ ගෙයි වලඳන්නාහු ද දුශ්ශීලයෝ වැ ම වලඳත් ල, එන්නාහු ද දුශ්ශීලයෝ වැ ම එත් ල, යම් කලෙක වනාහි මොනරපිළින් පුවරුව හැමද සිල් ඉටා හිඳින්ද, එකල්හි සිල්වත් වූවාහු නම් වෙත් ල. **වනකම්මිකං**= අල මුල් ආදිය සඳහා වනයෙහි හැසිරෙන්නකු; **වනෙන වනං**= වනයෙන් වනයට සියලු තැන්හි මේ ම නයයි. **පපතාමි**= යෙමි; **ආරඤ්ඤකෝ**= වනයෙහි ඉපිද වැඩුණු; මෙය තමන්ගේ ආජීවිකකාලය සඳහා කියයි; බෝසත් වනාහි පාඟාණ්ඩියන් විමසීම් පිණිස ඒ පැවිද්දව පැමිණියේය; **යලි නිරවිකභාවය දැන** ද හිහි නො වූයේය. ඒ එසේ මැයි- බොධිසත්ත්වයෝ යම් යම් කැනකම් පැමිණෙත් ද, එයින් නො නවතින පියවි ඇත්තාහු වෙති; යලි පැවිදිව "කිසිවෙක් මා නො දකිවා" යි එයින් ම වනයට පිවිසියේය **එහෙයින් මේ** කිහ- **මා මං නෙ අද්දසංසු අහංව මා නෙ අද්දසං** යනු.

ගොඨා= ගෙරිගාල්; **පඤ්ඤාගාවෝ**= නීක්මුණු ගවයන් ඇත්තාහු; **තත්ථ චතුකුණ්ඩිකෝ**= වනාත්හි මැ සිටියේ ගොපල්ලන් දෙනුන් සමග පහව ගියබැවි දූක දෙඅත් ද දෙදන ද බිම තබා මෙසේ චතුකුණ්ඩික වැ එලඹැ යන අවසි. **තානි සුදං ආහාරෙමි**= මහත් වූ වස්සන්ගේ ගොම (යම් හෙයකින්) කසට වූවාහු ඔජස් රහිත වූවාහු වෙත් ද, එහෙයින් ඒ ගොම හැර තරුණ වූ කිරි බීමෙන් ම වැඩෙන්නවුන්ගේ ඔජස් සහිත වූ යම්

(ගොම වෙත් ද ඒ) ගොම කුස පුරා කා යලි වනලැහැබට ම පිවිසෙයි; ඒ සඳහා කිහ- **නානි සුදං ආහාරෙමි** යනු **යාවකිවඤ්ච** මෙ= යම්පමණ කල් මාගේ සිය මලමූ ක්‍ෂය නො වූයේ වේද, යම්තාක් මාගේ වාරවළලු ඤ්‍ජය පැවැත්තේ ද, ඒ තාක් එය ම ආහාර කෙරෙමි යන අර්ථයි. අන තුරුව කල් යත් යත් ක්‍ෂය වූ මස් ලේ ඇත්තේ සිදීගිය වාරවළලුඤ්ජය ඇත්තේ වස්සන් පිළිබඳ වූ ගොම ආහාර කෙළේයි. **මහාවිකටභොජනසම්මිං**= මහත් වූ විකෘත භොජනයෙහි අප්‍රකෘති භොජනයෙහි යන අර්ථයි.

නත්‍ර සුදං සාරිපුත්ත! හිංසනස්ස වනසණ්ඩස්ස හිංසනකස්මිං හොති යන මෙහි **නත්‍ර** යනු පළමු වචනය අපෙක්‍ෂා කිරීම යැ; **සුදං** යනු පදපූරණමාත්‍රයෙහි නිපාත යැ; **සාරිපුත්ත!** යනු ආලපන යැ; මෝ මතු කියනුලබන්නී මෙහි අර්ථයොජනායි- **නත්‍ර**= "අඤ්ඤතරස්මිං හිංසනකෙ වනසණ්ඩෙ" යි යමක් කියකලද ද එහි, (= ඒ වනලැහැබෙහි;) **යම්** ඒ බිහිසුනු වනලැහැබෙක් කියනලද ද ඒ බිහිසුනු වනසණ්ඩයාගේ; **හිංසනකනස්මිං හොති**= හිංසනක්‍රියාව (- බිහිසුනුකම) වෙයි යන අර්ථයි; කුමක් වේ ද යත්? මෙය වෙයි; යම් කිසි අවිතරාගයෙක් වේද, ඔහුගේ ලොමුදහ ගනියි. නොහොත් **නත්‍ර** යනු සවාම්‍යර්ථයෙහි ආධාර යැ; **සු** යනු නිපාත යැ; **කිංසු නාම න හොතෙනා සමණබ්‍රාහ්මණා** යනාදියෙහි මෙනි. **ඉදං**= අදහස් කළ අර්ථය ප්‍රත්‍යක්‍ෂ වූවක් මෙන් කොට දක්වන වචන යැ; "සු + ඉදං" යි සුදං; සන්ධි වශයෙන් ඉකාරලෝපය දතයුතු; "චක්ඛින්ද්‍රියං, ඉත්ථින්ද්‍රියං, අනඤ්ඤතඤ්ඤස්සාමීතින්ද්‍රියං, කිංසුධ විත්තං" යනාදියෙහි මෙනි. මෝ කියනුලබන්නී මෙහි අර්ථයොජනායි- ශාරිපුත්‍රය! ඒ බිහිසුනු වනසණ්ඩයාගේ බිහිසුනු බැව්හි මේ වෙයි. **හිංසනකනස්මිං** යනු බිහිසුනු බැව්හි යන අර්ථයි; එක් තකාරයක්හුගේ ලෝපය දතයුතු. "හිංසනකතස්මිං" (කියා) මැ හෝ පාඨයි; "හිංසන කතාය" යි කියයුත්තෙහි ලිඞ්ගව්පයය්‍යාසය කරනලදැ; තවද මෙහි නිමිත්තාර්ථයෙහි ආධාර වචන යැ; එහෙයින් මෙසේ සම්බන්ධය දතයුතු- බිහිසුනුබැව්හි මේ වෙයි, බිහිසුනුබව නිමිති කොට බිහිසුනුබව හෙතු කොට බිහිසුනුබව ප්‍රත්‍යය කොට මේ වෙයි; **සො කොචි අවිතරාගො නං වනසණ්ඩං පවිසති, යෙහුයෙන ලොමානි හංසෙති**= ඉතා බොහෝ ලොමුදහ ගනිති, උඩුහුරු වූවාහු හිදිවැනි ද කටුවැනි ද වී සිටිති මිද වූවාහු නො උදහති, නොහොත් ඉතා බොහෝ සත්‍වයන්ගේ උදහති (= රොමහර්‍ෂවෙති ලොම් උඩට නැඟුනු මුව ඇතිව සිටිති, යි සේයි) සවලප වූ ඉතා ශූරපුරුෂයන්ගේ රොමහර්‍ෂ නො වෙත්.

අනතරඛ්‍යා= නවම්මස අවසානයෙහි සතරෙන මැදින් මස ආදියෙහි සතරෙකැයි මෙසේ දෙමසඅතරැ රාත්‍රිහු අටදෙන; **අඛ්‍යොකාසෙ**= මහසත් තෙම හිම වැටෙන කල්හි රාත්‍රියෙහි අභ්‍යවකාසයෙහි වෙසෙයි, එකල්හි ඔහුගේ රොම්කූපයන්හි අවුනනලද මුතු මෙන් හිමබිඳුහු සිටිති ඕරැර සුදු දුහුලකින් පොරවනලද්දක් මෙන් වෙයි; **දිවා වනසණ්ඩ**=

දවල් හිමබිඳුන් හිරුරැස් පහසින් පහව ගිය කල්හි අස්වැසිමකු දු වන් නේය, එහෙත් මේ තෙම හිරු නගින කල්හි ම වනලැහැබට පිවිසෙයි, එහි දු හිරුරැසින් වැගිරෙන හිම බිඳුගේ සිරුරෙහි ම වැටෙයි; **දිවා අබ්භොකාසෙ විහරාමි රතනිං වනසණ්ඩෙ**= ත්‍රිමකාලයෙහි මේ තෙම දවල් අභ්‍යවකාසයෙහි විසි ලැ. එහෙයින් ඔහුගේ දෙකැසින් සෝදිය දහර වැගිරෙනාහුය, රාත්‍රියෙහි අස්වැසිමෙක් වන්නේය, එතකුදු වුවත් මේ තෙම හිරු අස්තයට යන කල්හි ම වනලැහැබට පිවිසෙයි, එකල්හි දහවල් ගත් උණුසුම ඇති වනලැහැබෙහි- අතුරුවලෙක්හි බහාලනලද් දෙකු මෙන් ඔහුගේ ආත්මභාවය හාත්පසින් දැවිණි. **අනවජ්ජියා**= "අනු + අවජ්ජියා" (=ආශ්‍රවයෙන් වූ;) **පටිභාසි**= වැටහිනි.

සොභතෙතා= දවල් අව්වෙන් රැ වනඋණුසුමින් අතිශයින් තැවුණේ; **සොසිතො**= රැ හිමයෙන් දවල් හිමජලයෙන් අතිශයින් තෙමුණේ; **භිංසනකෙ**= භයඋපදවන; **නිග්ගෙහා**= සෙල්රහිත වූයේ; ඒ එසේ මැයි- හඳන - පොරෝන ඇති කල්හි සිහිල හෝ උණුසුම හෝ අතිශයින් නො පෙළන්නේය, හෙ ද මට නැතැයි දක්වයි; **න ච'ඝහිමාසි නො**= ගින්න කරා ද නො එලඹියෙමි; **එසනාපසුතො**= (සංසාර) ඉඩිය සෙවීම පිණිස යෙදුනේ අතිශයින් යෙදුනේ; **මුනි** යි එකල්හි තමන් වහන්සේ "මුනි" යයි කොට වදාරනසේක.

ඡවඩ්ඩනානි= අඩක් දැ ඇට; **උපඛාණ**= යම්සේ හිසැ කොට්ටය ත් පයැ කොට්ටය ත් පැනේද, එපරිද්දෙන් අතුරා එහි ශයනය කෙරෙමි,යි දක්වති; **ගොමණ්ඩලා**= ගොපලුදරුවෝ; ඔවුහු බෝසතුන් සම්පඝටගොස් "සුමේධය! නුඹ මෙතැන්හි කුමක් හෙයින් හුන්නෙහි ද? කියව" යි කියත් ලැ.

උපෙක්ඛාවිහරණය.

බෝසත් තෙම යට බැලූ මුහුණු ඇතිව හිඳිසි,= කථා නො කෙරෙයි; එකල්හි ඔවුහු කථා නො කරන්ට නො දෙන්නෙමුයි ඒ බෝසතුන් සිරි වරු කාරු දමති, ශරීරයෙහි කෙළ ගසති; බෝසත් තෙම මෙසේ ත් කථා නො කෙරෙති; එකල්හි ඔහුව නුඹ කථා නො කෙරෙහි යයි මූත්‍ර කෙරෙති, ඔහු මතුයෙහි මූත්‍රජලය විහිදුවති; බෝසත් තෙම මෙසේ ත් කථා නො කෙරේ මය; නැවත ඔහුට කථාකරව කථාකරවයි පස් විසු රුවති; බෝසත් තෙම මෙසේ ත් කථා නො කෙරේ මය; එකල්හි ඔහුට කථා නො කෙරෙහි යයි දඹකුරු ගෙන කන්සිදුරුවල ගසති; බෝසත් තෙම දුක් වූ තියුණු වූ කටුක වූ වෙදනාව ඉවසමින් කිසිවෙකුට කිසිවක් නො කියන්නෙමියි මළුඑකකු මෙන් හිඳී. එයින් වදාළහ— **න බො පනා'හං සාරිපුත්ත! අභිජානාමි තෙසු පාපකං චිත්තං උප්පාදෙතා** යනු, මා විසින් ඔවුන් කෙරෙහි පවිටු සිතක් නො උපදවනලද යන අර්ථයි. **උපෙක්ඛාවිහාරස්මිං හොති**= උපෙක්ෂාවිහාරය වෙයි; යම් හෙයකින් විහාරය (= වාසය කිරීම) ම "විහාරසම්" යි කියන ලද ද,

එහෙයින් මෙහි ඉදං සු මේ යන මෙ තැන්හි දු "අයං සු මේ" යි මෙසේ අර්ථ දතයුතු; මේ ක්‍රමයෙන් අන්‍ය වූ ද මෙබඳු පදයෝ දතයුත්තාහුයි. මේ දෙශනාවෙන් මින් (පෙර) එක් අනුවන කල්පයෙහි පිරූ උපෙක්ෂා විහරණය දක්වනසේක. යමක් සඳහා—

134. **"සුඛෙ පතෙත න රජ්ජාමි - දුක්ඛෙ හොමි න දුම්මනො**
සබ්බත්ථ තුලිතො හොමි - එසා මෙ උපෙක්ඛාපාරමී" යනු

වදළාහුද, එයයි.

ආහාරෙන සුඛි= ඩෙබර ආදි එක්තරා මද වූ ආහාරයකින් ශුඛිය ලබන්ට හැක්කේ ය,යි මෙබඳු දෘෂ්ටි ඇත්තාහු වෙති; **එවමාහංසු**= මෙසේ කියති; **ඛොලෙහි**= ඩෙබර වලින්; **ඛොලොදකං**= ඩෙබර මිරිකා කළ පානය; **ඛොලවිඝාතිං**= ඩෙබරසාළුව - ඩෙබරපූ - ඩෙබරගුළ ආදි වූ ඩෙබරවිඝාතිය (= ඩෙබරයෙන් කළ විවිධාකාර ආහාර;) **එතපරමා**= තෙල ප්‍රමාණය පරම වූයේ මෝහටනුයි "එතපරම" නම් වේ; එකල එක් අනුකපින් මත්තෙහි දු බෙලිගෙඩි තල්ගෙඩි පමණ වූ ඩෙබර (ගෙඩි) යෙක් නො වෙයි, මෙකල ඩෙබරයාගේ යම් ප්‍රමාණයෙක් වේ ද, එපමණ ම වෙයි යන අර්ථයි. **අභිමත්තඤ්ඤසිමානං**= ඉතා ම කෘෂබවට; **ආසිතිකපබ්බානි වා කාළපබ්බානි වා**= යම් සේ ආසිතිකවැලේ හෝ කළුවැලේ සන්ධිස්ථානයන්හි මැලවී මැද උස් උස් වූවාහු වෙත් ද, මාගේ අඟපසඟ එසේ වෙනියි දක්වති; **ඔඤ්ඤදං**= යම්සේ ඔටුවාගේ පිය මැද ගැඹුරු වේද, එපරිද්දෙන් බෝසතුන්ගේ මස්ලේ මැලවුණු කල්හි වස් ඇර ඇතුලත පිවිසි බැඳින් නිසිදනමාංසය මැද ගැඹුරු වෙයි, එකල ඔහු බිම හුන් තැන ඊ පගලියකින් ඇක්මුණු කලක් මෙන් මැද උස් වෙයි; **වට්ටනාවළි**= යම් සේ රැහැණින් අවුණා (කුරුවින්දපාසාණයෙන්) කරනලද බෝලවැල බෝලයන්ගේ අතරින් අතර පහත් වේද, බෝල පිහිටි තැන්හි උස් වේද, එපරිද්දෙන් පිටකටුව උස්පහත් වෙයි; **ජරසාලාය ගොපානසිගණා**= දිරූ ශාලාවෙක ගොතැස්හු; ඔවුහු වසින් ගිලිහී මැඩිල්ලෙහි (= හිත්තිපදයන් මතුයෙහි) පිහිටති, මැඩිල්ලෙන් ගිලිහි බිම සිටිති, මෙසේ එකක් මතු වෙයි, එකක් යට වේ නුයි උඩුයටි වූවාහු වෙති; බෝසතුන්ගේ ඉලඇට එසේ නො වෙති, සැබව ඔහුගේ

---

134. **සුඛෙ පතෙත**= සැපයක් පැමිණි කල්හි; **න රජ්ජාමි**= (රාග වශයෙන්) නො ඇලෙමි; **දුක්ඛෙ**= දුකක් පැමිණි කල්හි; **න දුම්මනො හොමි**= නො සතුටුසිත් ඇත්තෙමි නො වෙමි; **සබ්බත්ථ**= සැප - දුක් ආදි සියලු තැන්හි; **තුලිතො හොමි**= (අවනති - උන්නතිභාවය හැර සමව ගත්) තරාදියක් මෙන් වෙමි; **එසා**= මෝ තොමෝ; **මෙ**= මාගේ; **උපෙක්ඛාපාරමී**= උපෙක්ෂා (පරමාර්ථ) පාරමිතාවයි.

ලේ සිදුණු කල්හි මස් මැලවුණු කල්හි ඉලඇට අතරින් සම් යටට බැස් සාහු වෙති, ඒ සඳහා මෙය කියනලදී. **ඔකඩාසිකා**= යටට පිවිසියාහු; ඔහුගේ වනාහි ලේ සිදුණු කල මස් මැලවුණු කල අක්ෂිකූපයෝ හිස් මුලට හැපී සිටියාහුය; එහෙයින් ඔහුගේ මෙබඳු වූ ඇස්තරු වූවාහුය; **ආමකවජිනෙනා**= ඉතා තරුණකාලයෙහි සිදිනලදුයේ; සැබව හේ අව් සුළඟින් පැලෙන්නේ ද මැලවෙන්නේ ද වෙයි. **යාවඤ්ඤ මේ සාරිපුත්ත!** ශාරිපුත්‍රය! මාගේ උදරසිවිය පිටකටුව දක්වා ඇලුනී වෙයි; **නොහොත් ශාරිපුත්‍රය!** මාගේ දුෂ්කර ක්‍රියාව යම්තාක් බැරෑරුම් වූවා ද, මාගේ උදර සිවිය පිටකටුවට ඇලුනී වූවා යයි මෙසේ මෙහි සම්බන්ධය දතයුතු. **පිට්ඨිකණ්ටකං යෙව පරිගණ්හාමි**= උදරසිවිය සමග ගනිමි; **උදරච්ඡවිං යෙව පරිගණ්හාමි**= පිටකටුව සමග ගනිමි; **අවකුජෙජා පපතාමි**= යම් හෙයකින් මලමූකිරීම පිණිස හුන්නා වූ ඔහුගේ මූත්‍රය නො මැ නික්මේ ද, මලය වූ කලි ඉගිනිඇට එකක් දෙනක් පමණ නික්මේ ද, බලවත් වූ දුන උපදවා ද, සිරුරින් සෝදිය වැගිරෙත් ද, **එහි** මැ යටිකුරු වැ බිම වැටේ ද;. එයින් කීහ- "අවකුජෙජා පපතාමි" යනු. **නමෙව කායං**= ඒ එක්අනුවන කපින් මත්තෙහි වූ කය; "මහාසච්චක" සූත්‍රයෙහි වූ කලි පශ්චිමභවික ශරීරය සඳහා "ඉමමෙව කායං" සී වදාළහ. **පූතිමූලානි**= මස් **හෝ** ලේ හෝ ඇතිකල්හි (ලොමයෝ) සිටිති, ඒ මස්ලේ නැතිකල්හි සම්බඳක ලෝමයන් මෙන් අතෙහි ම ලැගෙති; ඒ සඳහා වදාළහ— "පූතිමූලානි ලොමානි කායසමා පපතන්ති" යනු. **අලමරියඤාණදස්සන විසෙසං**= ආර්‍යභාවය කරණ්ට සමර්ථ වූ ලොකොත්තරමාර්ගීය **ඉමිස්සා යෙව අරියාය පඤ්ඤාය**= විදර්ශනා ප්‍රඥවගේ නො ලැබීමෙන්; **යා'ඤං අරියා**= යම් මෝ මාර්ගීප්‍රඥවක් අධිගමය කරනලද්දී ද; මේ කියනලද වෙයි- "යම් සේ මෙකල්හි විදර්ශනා ප්‍රඥව ලැබූ බැවින් මාර්ගීප්‍රඥව ලබන ලද්දී ද, එපරිද්දෙන් එක්අනුකපින් මත්තෙහි විදර්ශනා ප්‍රඥව නො ලැබූ බැවින් ලෝකොත්තර මාර්ගීප්‍රඥවට නො පැමිණියෙමි" සී (සඞ්ඝරක්ෂිත) තෙරුන් වහන්සේ වනාහි මෙසේ කීහු. "ඉමිස්සා යෙව" සී වදාළ ප්‍රඥව ද "යා'ඤං අරියා" සී වදාළ ප්‍රඥව ද මාර්ගීප්‍රඥව මැයි. එකල්හි උන්වහන්සේට භික්ෂූහු (මෙසේ) කීවාහුය; "වහන්ස! එසේ ඇතිකල්හි මාර්ගීය නො පැමිණි බැවින් මාර්ගීයට නො පැමිණියෙමි සි මේ කියනලද වේ" යයි. ඇවැත්නි! **එකෙක්** ඇති දක්වන්ට නො හැකි වෙමි, එතකුදු වුවත් දෙක ම මාර්ගීප්‍රඥව ම යයි. මෙය ම මෙහි යොග්‍යයැ; සැබව අන් පරිද්දෙකින් වී නම් "යා අයං" යන නිර්දේශය නො සුදුසු වන්නේයි.

සංසාරෙන සුඛි= බොහෝ කල්ක් සැරිසරා ශුඛ වෙතියි කියති; **උපපත්තියා සුඛි**= බොහෝවර ඉපිද ශුඛ වෙතියි කියති; **ආවාසෙන සුඛි**= බොහෝ තැන්හි වැස ශුඛ වෙතියි කියති; තුන්තැන්හි ම සැරි සැරිම් වශයෙන් "සංසාර" යැ, ඉපදීම් වශයෙන් "උපපත්ති" යැ, විසීම්

වශයෙන් "ආවාස" යැයි, සකාධිපයෝ ම කියනලද්දාහුය. **යඤ්ඤේන**= බොහෝ යාගයන් යාග කොට ශුද්ධ වෙතියි කියති; **මුඛාවසිත්තෙන**= සක් තුනකින් ක්ෂත්‍රියාභිෂේකයෙන් මස්තකයෙහි අභිෂෙක කරනලද් දාහු විසින්; **අග්ගිපරිචරියාය**= බොහෝ ගිනිපිදීමෙන් ශුද්ධවෙතියි කියත්.

තථාගතයන්ගේ ප්‍රඥා ව්‍යාකතභාවය.

දහරෝ= තරුණ වූයේ; **යුවා**= යොවුන් බැවින් සමන් විත වූයේ; **සුසුකා ලකෙසෝ**= අතිශයින් කළුකෙස් ඇත්තේ; **භද්‍රේන යොබ්බනේන සමන්නාගතෝ**= ඉන මෙයින් යම් යොවුනකින් යුක්ත වූයේ තරුණ වේද, ඔහුගේ ඒ යෞවනය සොඳුරු යැ, සිත්කලු යැයි දක්වයි. **පඨමේන වයසා**= පළමුවන වයස නම් තෙතිස්වසකි, එයින් සමන්විත වූයේ ඉන අදියි; **පඤ්ඤාවෙය්‍යත්තියේන**= ප්‍රඥාවගේ ව්‍යක්තභාවයෙන්; **ජිණ්ණෝ**= ජරාවෙන් දිරුයෙම්; **වුඩ්ඪෝ**= වැඩී සිටි අහපසඟ ඇතියෙම්; **මහල්ලකෝ**= ජාතියෙන් මහලු වූයෙම්; බොහෝ කල් ගියේ, බොහෝ කල් ඉක්මවූයෙම්; **වයොඅනුප්පත්තෝ**= වර්ෂශතයාගේ තුන්වැනි කොට ස වූ පශ්චිමවයසට පැමිණියෙම්; **අසීතිකෝ මේ වයෝ වත්තති**= මේ සූත්‍රය වදාහි භාග්‍යවතුන් වහන්සේ පරිනිර්වාණ වර්ෂයෙහි වදාළසේක, එහෙයින් මෙසේ වදාළහ. **පරමාය**= උතුම් වූ; **සඤ්ඤා** ඉන්‍රියාදියෙහි පද සියයකු දු පදදහසකු දු කියත් කියත් මැ ඉගෙනීමෙහි සම්පිඬව "**සති**" නමු; එය ම ධාරණයෙහි (සිත්හි ලා විමසා) ගැනීමෙහි සම්පිඬව "**ගති**" නමු; මෙසේ ගන්නාලද්ද ධරනලද්ද හැදෑරීම කරන්ට සම්පිඬ වූ ප්‍රඥාව "**ධිති**" නමු; ඔහුගේ අර්ථය ද කාරණය ද දැනීමෙහි සම්පිඬව "**පඤ්ඤා වෙය්‍යත්තිය**" නම්. **දළහධම්මෝ ධනුග්ගහෝ**= දැඩිවූ දුන්නක් ගෙන සිටි දුනුවාවෙක්; "දළහධනු" නම් විසහස්සත්ථාම (= දෙදහසක් පුරුෂ යන්ගේ ශක්තිය ඇතියේ) කියනුලැබේ; "විසහස්සත්ථාම" නම් (දුනුදිය) නහනලද (දුනු) දඹුයෙහි ගෙන ගෙලපමණින් ඔසවනලද යම් දුන්නක් හුගේ දුනුදීයෙහි බඳනාලද ලෝහ - ර්යම් ආදීන්ගේ බර පොළොවෙන් මිදේද, (එයයි.) **සික්ඛිතෝ**= දසදෙලොස්වසක් ඇදුරුකුලයෙහි උගන් නාලද ශිල්ප ඇත්තේ; **කතහත්ථෝ**= කිසිවෙක් ශිල්පය ම උගනී, කෘතහස්ත නො වෙයි, මේ වූ කලි කෘතහස්ත වූයේ පුරුදුකළ වශීභාවය ඇත්තේ වෙයි; **කතූපාසනෝ**= රාජකුලාදියෙහි දක්වනලද ශිල්ප ඇතියේ; **ලහුඤ්ඤේන අසනේන**= ඇතුලත සිදුරු කොට පුලුන් ආදිය පුරවා කරනලද ලාපිරියම් ඇති සැහැල්ලු ර්යෙන්; ඒ එසේ මැයි— මෙසේ කරනලද්දේ එකඉස්බක් යනසුලු වූයේ දෙඉස්බක් යෙයි, අටඉස් බක් යනසුලු වූයේ සොළොස්ඉස්බක් යෙයි; **අප්පඤ්ඤිරෙන**= නිදුකින්; **අනිපාතෙය්‍ය**= ඉක්මවන්නේය; **එවං අධිමත්තඤ්ඤතිම්මෙනා**= යම්සේ ඒ දුනුවා තෙම ඒ ඉයක්සතරහුල් සෙවනැල්ල වහා ම ඉක්මවා ද, එසේ පද සියයකු දු පද දහසකු දු ඉගෙනගන්ට විමසන්ට හදුරන්ට අර්ථයන්

හා කාරණයනුදු පරීක්ෂා කරන්ට සමර්ථ වූවාහු යන අර්ථයි; **අසිතපිතාදීනං අසිතපිතාදිකායාසිතාදීනං**= යම් හෙයකින් අසිතපීතාදීහු භාග්‍යවතුන් වහන්සේ විසිනුත් භික්ෂූන් විසිනුත් කළයුත්තාහු වෙත් ද, එහෙයින් ඒ (අසිතපීතාදීන්) කරනපමණ කල්හිබා යයි දක්වති; **අපරියාදිණ්ණා යෙව**= ක්ෂය නො වූවා මය; සැබව ඉදින් එක් භික්ෂුවක් කායානුපස්සනාව විහරා ද, අනිකෙක් වෙදනානුපස්සනාව -පෙ- ධම්මානුපස්සනාව විහරා ද, මොහු විසින් විහාරකල්හි මම විහරන්නෙමි,යි එකෙක් එකකු නො බලා ද, එසේ ඇතිකල්හි දු ඔවුන්ගේ වාරය පැනෙයි, වැලි එපරිදි දෙන් සර්ඥයන්ගේ වාරය නො පැනෙයි; ව්‍යත්සතරහුල් සෙවනැල්ල ඉක්මවීමෙන් පළමු මැ භාග්‍යවතුන් වහන්සේ තුදුස්ප්‍රකාරයකින් කායානුපස්සනාව ද, නවප්‍රකාරයකින් වෙදනානුපස්සනාව ද, සොළොස්ප්‍රකාරයකින් චිත්තානුපස්සනාව ද, පඤ්චප්‍රකාරයකින් ධම්මානුපස්සනාව ද වදාරන සේක. පළමු කොට මොහු සතරදෙන සිටිත්වා, අන්‍යයෝ පඤ්චේන්ද්‍රියයන් විෂයෙහි ද, අන්‍යයෝ පඤ්චබල විෂයෙහි ද, අන්‍යයෝ සප්තබොධ්‍යඞ්ගයන් විෂයෙහි ද, අන්‍යයෝ අෂ්ටමාර්ගාඞ්ගයන් විෂයෙහි ද ප්‍රශ්නවිචාරන්නාහු නම්, හෙ ද භාග්‍යවතුන් වහන්සේ විසඳන සේක. නොහොත් මොහු අටදෙන සිටිත්වා, ඉදින් අන් සකිස්දෙනෙක් බෞද්ධ පාර්ෂිය ධර්මවිෂයෙහි ප්‍රශ්න විචාරන්නාහු නම් හෙ ද භාග්‍යවතුන් වහන්සේ එකෙණෙහි ම වදාරන සේක. කුමක් හෙයින යත්? යම්හෙයකින් යම්තාක්කලකින් ලෞකික මහාජනයෝ එක් පදයක් කියත් ද, එකල්හි ආනන්දස්ථවිරයන් වහන්සේ අට පදයක් කියති; වැලි ආනන්ද තෙරුන් එක්පදයක් කියන කල්හි ම භාග්‍යවතුන් වහන්සේ සොළොස් පදයක් වදාරන සේක. කුමක් හෙයින යත්? යම් හෙයකින් භාග්‍යවතුන් වහන්සේගේ දිව මොළොක් වේ ද, දන්තාවරණය (= තොල) සුසපරිශීත ද, වචනය අගලිත (= නො ගිලිනලද) ද, භවාඞ්ගපරිවාසය (= පෙරලීම) සැහැල්ලු ද, (එහෙයිනි;) එසින් වදාළහ— **අපරියාදිණ්ණා යෙවස්ස භාරිපුත්ත! තථාගතස්ස ධම්මදෙසනා** යනු. එහි **ධම්මදෙසනා**= පෙල තැබීම; **ධම්මපදබ්‍යඤ්ජනං**= පෙලසම්බන්ධ වූ පදව්‍යඤ්ජනය; ඒ ඒ අර්ථයාගේ ව්‍යඤ්ජන සඞ්ඛ්‍යාත අක්ෂරය; **පඤ්හපවිභාගං**= ප්‍රශ්නවිසඳීම;

තථාගතයන්ගේ ප්‍රශ්න ව්‍යාකරණය.

මෙයින් කුමක් දක්වත් ද? තථාගතයන් වහන්සේ පෙර තරුණකාලයෙහි අකුරු පිඬු කොට පදයක් කියන්ට හැකි වෙති, පදයන් පිඬු කොට ගාථාවක් කියන්ට හැකි වෙති, සතරකුරකින් හෝ අටකුරකින් හෝ සොළොසකුරකින් හෝ පදයන්ගෙන් යුත් ගාථාවක අරුත් කියන්ට හැකි වෙති; දැන් වූ කලී මහලුකලැ අකුරු පිඬු කොට පදයක් හෝ පදයන් පිඬු කොට ගාථාවක් හෝ ගාථාවක අරුත් හෝ කියන්ට නො හැකි වෙති, යි මෙසේ නැති; තරුණකාලයෙහි ද මහලුකාලයෙහි ද තථාගතයන්ගේ මේ සියල්ල ක්ෂය නො වූයේ මැය යන මේ දක් වනසේක.

මඤ්ඤතෙන වෙ'පි මං යන මෙය බුඩබලය දැක්වීම පිණිස ම පරිකල්පනය කොට වදුළහ. එහෙත් දසබලයන් ඇදකට නංවා ගම් නියම් ගම් රාජධානීන්ට උසුලාගෙන යන කලෙක් නම් නැති; සැබව තථාගතයෝ පස්වන ආයුකොටසෙහි දත්වැටීම් ආදියෙන් තෝ මඩතා ලද්දාහු රන්වන් සිරුර විවණීබව තෝ පැමිණි කල්හි දෙවම්නිසුන්ට ප්‍රියමනාප කාලයෙහි ම පිරිනිවෙත්. **නාගසමාලෝ** යනු ඒ තෙරුන්ගේ නාමය ය; ඒ එසේ මැයි— ප්‍රථමබොධියෙහි විසිවසක් ඇතුලත උපවාණ - නාගිත - මෙසිය යන තෙරවරුන් මෙන් මේ තෙමේ ත් භාග්‍යවතුන් වහන්සේගේ උපස්ථායකයෙක් විය. **විජමානෝ**= මඳ මඳ වූ තල්වැටපවනින් භාග්‍යවතුන් වහන්සේට සෘතුසුඛය උපදවමින්; **එනද වොච**= සියලු සූත්‍රාන්තය අසා භාග්‍යවතුන් වහන්සේගේ පූජාවරිතය වූ දුෂ්කරක්‍රියාවට පැමිණ පැහැදුනේ; **"එතං අච්ඡරියං භන්තෙ!"** යනාදි වචනය කීය. එහි අසුර ගසන්ට සුදුසු නුයි අච්ඡරිය නම්; අභූතපූර්ව වූ (= පෙර නොවූ) වක් වූයේ නුයි අබ්භූත නම්; දෙකින් ම තමන්ගේ විෂය ම දක්වයි. **තෙනා නාමෝ අයං භන්තෙන** යන මෙය එකාන්තයෙන් මේ ධර්මපරියාය සොඳුරු ය, මෙයට භාග්‍යවතුන් අයැද නාමය ගන්වන්නෙම් නම් මැනවැ යන අදහසින් කීය. එකල භාග්‍යවතුන් වහන්සේ එයට නාමය ගන්නාසේක් **තස්මාතිහ තවං** යනාදිය වදුළහ. එහි අර්ථය නම්? යම් හෙයකින් මේ සූත්‍රය අසා තොපගේ ලොමුදහ ගත්තාහු ද, එහෙයින් නාගසමාල! තෙපි මෙහි ලා මේ ධර්මපර්‍යාය ය "ලොමහංසනපරියාය" යි ම එය ධරව යයි.

මහාසිහනාද සූත්‍ර වර්ණනා නිමි.

———:o:———

මහාදුක්ඛක්ඛන්ධ සූත්‍ර වණ්ණනා.

එවමේමසුතං යි මහාදුක්ඛක්ඛන්ධ සූත්‍ර යයි. **එහි- සම්බහුලා**= විතය පරියායයෙන් තුන් දෙනෙක් "සම්බහුලා" යයි කියනු ලැබෙති, එයින් මත්තෙහි "සඞ්ඝ" යැ; සූත්‍රානන්තපරියායයෙන් තුන්දෙන තුන්දෙන මැයි, එයින් මත්තෙහි "සම්බහුලා" යැ; මෙහි සූත්‍රානන්තාපරියායයෙන් සම්බහුල වූවාහු දතයුතු. **පිණ්ඩාය පවිසිංසු**= (පිඬු පිණිස) පිවිසියාහුය; එහෙත් ඔවුහු ඒතාක් නො පිවිසියාහුය, පිවිසෙන්නෙමුයි නික්මුණු බැවින් වනාහි "පවිසිංසු" යි කියන ලද්දාහුය. කුමක් මෙන් ද යත්? යම්සේ ගමට යන්නෙමි යි නික්මුණු පුරුෂ තෙම ඒ ගමට නො පැමිණියේ නමුදු මේ නම් තැනැත්තේ කොහි දැ?යි කී කල්හි ගමට ගියේ යයි කියනු ලැබේ ද, එපරිද්දෙනි. **පරිබ්බාජකාරාමං ආරාමෝ**= ජේතවනයෙන් නො දුරෙහි අන්‍යතීර්ථක පරිව්‍රාජකයන්ගේ ආරාමයෙක් ඇති, ඒ සඳහා මෙසේ කීවාහුය; **සමණෝ ආවුසෝ** != ඇවැත්නි! තොපගේ ශාස්තෘ වූ ශ්‍රමණ ගෞතම තෙම; **කාමානං පරිඤ්ඤං**= කාමයන්ගේ ප්‍රහාණය ඉක්මවීම පනවයි; "රූපවේදනා" දියෙහි ද මෙ ම නයයි.

කාමාදින්ගේ ප්‍රහාණය.

එහි තීර්ථකයෝ සවසමය දන්නාහු ප්‍රථමධ්‍යානය කියමින් කාමයන්ගේ ප්‍රහාණය පනවන්නාහුය, **අරූපභවය කියමින්** රූපයන්ගේ ප්‍රහාණය පනවන්නාහුය, **අසංඥභවය කියමින්** වේදනාවන්ගේ ප්‍රහාණය පනවන්නාහුය; එතකුදු වුවත් ඔවුහු මේ නම් ප්‍රථමධ්‍යානය, මේ අරූපභවය, මේ අසංඥභවය යි ද නො දනිති; ඔවුහු පනවන්ට නො හැකි වන්නාහු ම හුදෙක් පනවමු පනවමු යි කියත්. තථාගතයන් වහන්සේ වනාහී කාමයන්ගේ ප්‍රහාණය අනාගාම්මාර්ගයෙන් පනවනසේක, රූපවේදනාවන්ගේ ප්‍රහාණය රහත්මඟින් පනවන සේක. ඔවුහු මෙසේ මහත් වූ විශෙෂය (= වෙනස) විද්‍යමානකල්හී දු- **"ඉධ නො ආවුසෝ! ඝො විසෙසෝ"** යනාදිය කිහු. එහි- **ඉධ**= මේ පැනවීමෙහි; **ධම්මදෙසනාය වා ධම්මදෙසනං**= ශ්‍රමණ ගෞතමයන්ගේ ධර්මදෙශනාව සමග අපගේ ධර්මදෙශනාව හෝ අපගේ ධර්මදෙශනාව සමග ශ්‍රමණ ගෞතමයන්ගේ ධර්මදෙශනාව හෝ අරහයා යම් මේ වෙනස් කරුණක් කියවු ද, ඒ කිනම් දැ? යි කියති; දෙවෙනි පදයෙහි දු මෙ ම නයයි. මෙසේ ඔවුහු මධ්‍යයෙහි හින්නා වූ සවණීයක් මෙන් ශාසනය සමග තමන්ගේ ලබ්ධිය වචනමාත්‍රයෙන් සමධුරයෙහි තැබූහ. **නෙව අභිනන්දිංසු**- මෙය එසේ යයි නො පිළිගත්තාහුය; **න පටික්කොසිංසු**= මෙය එසේ නො වේ යයි ප්‍රතිශෙධ නො කළාහුය; කුමක් හෙයින යත්? ඔවුහු වනාහි තීර්ථකයෝ නම් අඛවූවාහු දැන හෝ නො දැන හෝ කියන්නාහු යයි නො පිළිගත්තාහුය, "පරිඤ්ඤං" යන වචනයෙන් මදක් ශාසනගඛිය ඇතැයි ප්‍රතිශෙධ නො කළාහුය; කොහොත් තෙල භික්ෂූහු ජනපදවාසීහු යැ,

සවසමය පරසමයයන්හි අතිශයින් සමර්ථ නො වූවාහු නුයි ද (සම්පටිච්ඡනය ප්‍රතිශේධය යන) දෙක නො කළාහුය. **න වෙව සම්පායිංසූනති=** සම්පාදනය කොට කියන්ට නො හැකිවන්නාහුය; **උත්තසිං ච විඝාතං=** සම්පාදනය කොට නො කිය හැකි හෙයින් මත්තෙහි දු දුකට පැමිණෙන්නාහුය; ඒ සැබව සම්පාදනය කොට කියන්ට නො හැකි වන්නවුන්ට දුක් උපදනේයි. **යථා නං භික්ඛවෙ!** අවිඝයඝම්ං යන මෙහි **යථා** යනු කාරණවචන යැ; **නං** යනු නිපාතමාත්‍ර යැ; යම් හෙයකින් අවිඝය වූ ප්‍රශ්නයෙහි විචාරනලද්දේ වේ ද යන අර්ථයි. **සදෙවකෙන=** දෙවියන් සහිත වූයේ "සදෙවකෙ" යනු වේ; "සමාරකෙ" යනාදියෙහි දු මෙ ම නයයි. මෙසේ තුන් තැනක් "ලොකෙ" යි ද දෙ තැනක් "පජාය" යි ද බහා (පද) පසින් ම සත්ත්වලොකය ම ඇතුලත් කොට ගෙන "මේ සදෙවකාදි භෙද ඇති ලොකයෙහි ඒ දෙවියා හෝ මිනිසා හෝ නො දක්නෙමි" යි දක්වනසේක. **ඉමෙනා වා පන සුත්තා=** මේ මාගේ ශාසනයෙන් හෝ අසා; ඒ එසේ මැයි- මේ ශාසනයෙන් අසා තථාගත නො වූයේ ද තථාගත ශ්‍රාවක නො වූයේ ද ආරාධනය කරන්නේය, සතුටු කරන්නේය; අන් පරිද්දෙකින් සතුටු කිරීමෙක් නම් නැතැයි දක්වනසේක; මෙව්ට තමන් විසින් ඒ ප්‍රශ්නයන් විසදීමෙන් චිත්තාරාධනය දක්වනසේක් කොට ය භික්ඛවෙ! යනාදිය වදාළහ.

කාමගුණා= කැමතිකරවියයුතු අර්ථයෙන් කාමයෝ මැ බන්ධනාර්ථයෙන් "ගුණ" නම් වෙති; "**අනුජානාමි භික්ඛවෙ! අහතානං වත්ථානං විගුණං සඞ්ඝාටිං**" යන මෙහි වනාහි පවල "ගුණ" ශබ්දවාච්‍ය. (= සමූහ) වීය ගුණාර්ථය යැ; "**අවෙවනහි කාලා තර ගහති රතනියෝ- විඤ්ඤාගුණා අනුපුබ්බං ජහන්ති**" මෙහි රාශ්‍යර්ථය ගුණාර්ථය යැ; "**සත්තගුණා දක්ඛිණා පාටිකඞ්ඛිතබ්බා**" මෙහි ආනිශංසාර්ථය ගුණාර්ථය යැ; "**අත්තනං අත්තගුණං**" "**කසිරම්මාලා ගුණෙ බහූ**" මෙහි බන්ධනාර්ථය ගුණාර්ථය යැ; මෙහි දු මෙය ම අදහස් කරනලද. එයින් කියනලදී. "බන්ධනාර්ථයෙන් ගුණ නම් වෙති" යි. **චක්ඛුවිඤ්ඤෙය්‍යා=** චක්ෂුර්විඥානයෙන් දැක්කයුත්තාහු; මේ උපායයෙන් "**සොතවිඤ්ඤෙය්‍යා**" ආදියෙහි දු අර්ථය දතයුතු. **ඉච්ඡා=** සොයනලද්දාහු වේවා හෝ නො වේවා හෝ ඉෂ්ටාරම්මණ වූවාහු යන අර්ථයි. **කන්තා=** කමනීය වූවාහු; **මනාපා=** මනවඩන්නාහු; **පියරූපා=** ප්‍රියස්වභාව ඇත්තාහු; **කාමූපසංහිතා=** අරමුණු කොට උපදනා වූ කාමයෙන් යුක්ත වූවාහු; **රජනියා=** ඇලුම් කවයුතු වූ, රාගොත්පත්තියට කරුණු වූවාහු යන අර්ථයි.

ඉදිමුද්ධං යනාදියෙහි **මුද්ධං** යනු ඇඟිලිපුරුක්වලැ සලකුණු තබා (කරන) හස්තමුද්‍රාව යැ; **ගණනා** යනු (එක-දෙක යනාදිනයින් නිරතුරු වූ) අවච්ඡිද්ගණනාව යැ; **සඞ්ඛාන** යනු (සිහල්ල පිඹු කොට කරන) පිණ්ඩගණනාව යැ; යම් විද්‍යාවකින් කෙනක් බලා මෙහි මෙතෙක් වී

වන්නාහුය, රූකක් බලා මෙහි මෙතෙක් ඵල වන්නාහුය, අහස බලා අහසෙහි මේ මෙතෙක් තම් පක්ෂීහු වන්නාහුය, යි දනිත් ද එයයි. **කසි** යනු කෘෂිකර්මය යැ; **වණිජ්ජා** යනු දිය වෙළඳුමය ගොඩ වෙළඳුමය ආදිවූ වෙළඳමාශීය යැ; **ගොරක්ඛ** යනු තමාගේ හෝ අනුන්ගේ හෝ ගවයන් රැක පස්ගෝරස විකිණීමෙන් ජීවත්වන කර්මය යැ; **ඉස්සත්ථ** යයි අවි ගෙන උවටැන් කරන කර්මය කියනු ලැබේ; **රාජපෝරිස** යනු අවියෙන් වෙන් වැ රාජකර්ම කොට උපස්ථානය යැ; **සිප්පඤ්ඤතර** යනු ගන්නාලද්දෙන් ඉතිරි වූ හස්ති අශ්ව ශිල්පාදි යයි. **සිනස්ස පුරක්ඛතෝ**= ඊතලයට ඉලක්කය මෙන් සිතයට පෙරටු වැ සිවියේ; සිතයෙන් පෙළනුලබන්නේ යන අර්ථයි. උපමාවෙහි දූ මෙ ම නයයි. "**ඛංස**" යනාදියෙහි **ඛංස** යනු පිඹුලමස්කිකා (= ඇටලේමැස්සෝ) යි; **මකස** යනු සියලු මැස්සෝයි; **සිරිංසප** යනු යම් කිසිවෙක් සිහි කොට (=සංසර්ජණය=කසින් භූමිය සපරීකොට)යෙත්ද(ඔවුහුයි;) **පියඤ්ඤමානෝ**= පෙළෙන්නේ, ගැවෙන්නේ; **මියමානෝ**= මැරෙන්නේ (= මිරිකෙන්නේ;) **අඤ්ඤං ජීවිතවෝ!**= මහණෙනි! හස්තාමුද්‍රාදියෙන් ජීවිකාව කිරීමට පැමිණ ශීතාදි ප්‍රත්‍යයෙන් වූ මේ ආබාධය (=පෙළීම;) **කාමානං ආදීනවෝ**= කාම යන්හි උපද්‍රවය, උවදුරු යැ යන අර්ථයි. **සන්දිට්ඨිකෝ**= ප්‍රත්‍යක්ෂ වූ තමා විසින් දැක්කයුතු වූ; **දුක්ඛක්ඛන්ධෝ**= දුක්රැස; **කාමහේතු** යනාදියෙහි ප්‍රත්‍යයාර්ථයෙන් කාමයෝ මෝහට හේතු නුයි "**කාමහේතු**" යනු වේ; මූලාර්ථයෙන් කාමයෝ මෝහට නිදන නුයි "**කාමනිදානෝ**" යනු වේ; එහෙත් ලිඞ්ගව්පර්‍යාසයෙන් **කාමනිදානං** යි කියනලදී. **කාරණාර්ථයෙන් කාමයෝ මෝහට කාරණා නුයි "කාමාධිකරණෝ"** යි වේ; එහෙත් ලිඞ්ගව්පර්‍යාසයෙන් ම **කාමාධිකරණං** යි කියනලදී. **කාමානමේව හේතූ**= මේ නියම වචන යැ; කාම්ප්‍රත්‍යයෙන් උපදී මැය යන අර්ථයි.

උඤ්ඡෙනෝ= ආජීවඝණ්ඨාපථ (= උඤ්ඡන) ව්‍යායාමයෙන් නැඟී සිටින්න හුගේ; **ඝටෙනෝ**=ඒ ව්‍යායාම පූර්වයෙන් අපරය (=ආරම්භයෙහි පටන් නිරතුරු වැ යයි සේයි,) ගළපන්නහුගේ; **වායමෙනෝ**= ව්‍යායාමය පරාක්‍රමය ප්‍රයෝගය කරන්නහුගේ; **නාභිනිප්පජ්ජන්ති**= නො නිපදිති, අතට නො නැඟෙති; **සොචන්ති**= සිතැ උපන් බලවත් ශොකයෙන් ශොක කෙරෙයි; **කිලමන්ති**= කයැ උපන් දුකින් කලාන්ත වෙයි; **පරිදෙවන්ති**= වචනයෙන් වැලපෙයි; **උරත්තාළිං**= ළය තළා; **කන්දන්ති**= හඬයි; **සම්මොහං ආපජ්ජන්ති**= පහ වූ සත්ඇතියකු මෙන් අතිශයින් මුලාවූයේ වෙයි; **මොඝං**= සිස් යැ; **අඵලෝ**= නිෂ්ඵල යැ; **ආරක්ඛාධිකරණං**= ආරක්ෂාව කරුණු කොට; **කින්නු**= කවර උපායකින්? **යම්පි මෙ**= මා විසින් කෘෂි කර්මාදිය කොට උපදවනලද යම් ධනයකුත් වී ද; **තම්පි නො නත්ථි**= හෙ ද අපට දැන් නැති.

පුන ච පරං භික්ඛවෙ! කාමහෙතු යනාදියෙනුදු යලි කාරණය දක්වා ආදීනවය දක්වනසේක. එහි කාමහෙතු= කාමප්‍රත්‍යයෙන් රජ වරු ද රජුන් සමග විවාද කෙරෙති; කාමනිදානං යනු භාවනපුංසකයෑ; කාමයන් නිදාන කොට විවාද කෙරෙති යන අර්ථයි; කාමාධිකරණං යනු ද භාවනපුංසක මැයි; කාමයන් අධිකරණ (= කාරණා) කොට විවාද කෙරෙති යන අර්ථයි; කාමානමෙව හෙතු= ගම් - නියම්ගම් - සෙනෙවි - පෙරවි ආදී වූ කාමයන් ම හෙතු කොට විවාද කෙරෙත් යන අර්ථයි. උපක්කමන්ති= පහර දෙති; අසිචම්මං= කඩුව හා ඛෙටකඵල කාදින් (= පලිහ) ද; ධනුකලාපං සන්නය්හිත්වා= දුන්න ගෙන හිඟවුර බැඳ; උභතො බ්‍යුළ්හං= දෙපසින් රැස් වූ; පක්ඛන්දන්ති= පිවිසෙති; උසූසු= ඊතලයන්; විජ්ජානලනෙනසු= කරකවන කල්හි; නෙ තස්ස= ඔවුහු ඒ සඬග්‍රාමයෙහි; අද්දසුවලෙපනා උපකාරියො යන මෙහි මනුෂ්‍ය යෝ ප්‍රාකාරපාදය අස්කුරසටහනින් ගඩොල්වලින් බැඳ මතුයෙහි සුණු යෙන් ආලෙප කෙරෙති, මෙසේ කරනලද ප්‍රාකාරපාදයෝ "උපකාරීහු" යයි කියනු ලැබෙති, ඔවුහු තෙත් වූ කලලින් ඉසිනලද්දාහු "අද්දුවලෙපන" නම් වෙත්. පක්ඛන්දනති= ඒ (උපකාරීන්) ගව සාරු සිටුවනලද යහුල්-රුක්හුල් ආදියෙන් විදිනුලබන්නාහු ද ප්‍රාකාරය බෙලසුල්බැමින් නගින්ට නො හැකි වන්නාහු ද සමීපයට දිවෙත් මය; පක්කඞ්ගා= කකාරවනලද ගොමයෙන්; අභිවග්ගෙන= සතදනතයෙන්; එය අඟට දනතාකාරයෙන් කොට නුවරදොර බිඳ පිවිසෙන්නෙමුයි ආ කල්හි දොර ටුව මතුයෙහි සිටියාහු ඒ සතදනතයාගේ බැදුම්යොත් සිඳ ඒ සතදනත යෙන් මඩින්.

සකිම්පි ජීවන්ති= ගෘහසඤ්ඤි සිදිනි; නිලෙලාපං= ගම් පැහැර මහා විලොපය කෙරෙති; එකාගාරිකං= පනසක් පමණ වූවාහු ද සැටක් පමණ වූවාහු ද පිරිවරා ජීවග්‍රාහයෙන් ගෙන ධනය ගෙන්වා ගනිති; පරිපන්ථෙපි තිට්ඨන්ති= මංපැහැරීම් කර්මය කෙරෙති; අඩදණ්ඩකෙහි= මුගුරුවලින්; පහරවලින් ද පහරදීම පිණිස හෝ සතරරියන් දණ්ඩක් දෙකට සිඳ ගන්නාලද දඬුවලින්; බිලඞ්ගථාලිකං= කඤ්ජියඋකඛලි (= කැඳහැලි) නම් කම්කටුල්ල; එය කරන්නාහු හිස්කබල ගළවා රත්වූ ලෝගුළියක් අඬුවෙන් ගෙන එහි බහාලති; එයින් හිස්මුල් කකියා මතු යෙහි උතුරයි. සඞ්ඛමුණ්ඩිකං= සඞ්ඛමුණ්ඩක නම් කම්කටුල්ල; එය කරන්නාහු උත්තරොෂ්ඨය දෙකන්සිඳුව ගලවාටය යන පරිච්ඡේදයෙන් සම සිඳ සියලු කෙස් එකට ගැටයක් කොට දණ්ඩකින් සොලවා උපුටති, කෙස් සමග සම නැහෙයි, නැවත හිස්කබල බොරලුවලින් ඝටා සෝදමින් සක්වන් කෙරෙති; රාහුමුඛං= රාහුමුඛ නම් කම්කටුල්ල; එය කරන්නාහු අඬුවකින් මුඛය විවෘත කොට මුවතුල පහනක් දල්වති; නොහොත් කන්සිඳ පවන් මුඛය යවුලකින් සාරති, ලේ වැගිරී මුඛය පුරවයි. ජෝතිමාලිකං= සියලු සිරුර තෙල්කඩරෙද්දෙන් වෙළා ගිනි

දල්වති; **හත්ථපජ්ජෝතිකං**= දෙඅත් තෙල්කඩරෙද්දෙන් වෙලා පහනක් (පන්දමක්) මෙන් දල්වති; **එරකවතනිකං**= එරකවත්ත නම් කම්කටුල්ල; එයකරන්නාහු යට ශ්‍රීවයපටන් සම්වැටියගළවා ගොප් ඇටයෙහි හෙලති, නැවත ඔහු යොත්වලින් බැඳ අදිති, හෙතෙම තමාගේම සම්වැටියෙහි ඇක්මෑ ඇක්මෑ වැටෙයි. **විරකවාසිකං**= විරකවාසික නම් කම්කටුල්ල; එය කරන්නාහු එසේ ම සම්වැටිය ගළවා කටියෙහි තබති, කටියෙහි පවන් ගළවා ගොප්ඇටවල තබති, මතුයෙහි වූ සම්වැටිවලින් යට සිරුර වැහැරිවතක් හැඳි එකකු මෙන් වෙයි. **එණෙය්‍යකං**= එණෙය්‍යක කම් කටුල්ල; එය කරන්නාහු දෙවැලම්වෙහි ද දෙදණෙහි ද යකඩකූරු ගසා යහුල් සිටුවති, හෙතෙම යහුල් සතරකින් බිම පිහිටයි, නැවත ඔහු වට කොට ගිනි කෙරෙති; **"එණෙය්‍යකෝ ජෝති පරිගතෝ යථා"** යි ආ තැන්හිදු මෙය ම කියනලදී; ඔහු සඤ්ඡවලින් හුල් ඉවත් කොට සතර ඇවකොන්වලින් ම තබති; මෙබදු වූ කම්කටුල්ලක් නම් නැති. **බලිසමංසිකං**= දෙපසමුව ඇති බිළියෙන් පැහැර සම් මස් නහර උපුරති; **නහාපණිකං**= සියලු සිරුර තියුණු වැවලින් කෙළවර පවන් කහවුණු පමණට කහවුණු පමණට පමුණුවමින් කොටති; **ඛාරාපතච්ඡිකං**=සිරුර ඒ ඒ තැන ආයුධවලින් පැහැර කොසුවලින් කාරම් දමති, සම් මස් නහර වැගිර ඇට සැකිලි ම සිටින්. **පලිඝපරිවත්තිකං**= එක්පසකින් හොවා කන්සිදුරෙහි යහුලක් සිටුවා පොළොව හා එකාබද්ධ කෙරෙති, නැවත ඔහු දෙපස ගෙන කරකවත්. **පලාලපිඨිකං**= දැඟ වූ කම්කටුලු කරන්නෙක් සිවිමස් නො සිඳ ඇඹරුම්ගල්වලින් ඇට බිඳ කෙස්වැටිය ගෙන ඔසවයි, මස් රැසක් ම වෙයි, නැවත ඔහු කෙස්වලින් ම හාත්පස වෙළා ගනිති, පිදුරුවැටියක් මෙන් කොට වෙළත්. **සුනඛෙහිපි**= කිප දිනක් ආහාර නො දී හවගත් බඩසා ඇති ශුනකයන් ලවා කවති, ඔවුහු මොහොතකින් ම ඇටසැකිල්ලක් ම කෙරෙත්. **සම්පරායිකෝ**= සම්පරායයෙහි දෙවෙනි අත්බැව්හි විපාකයෙක යන අපියි.

ඡන්දරාගවිනයෝ ඡන්දරාගපහානං යනු නිර්‍වාණය ය; යම් හෙයකින් නිවනට පැමිණ පස්කම්හි ඡන්දරාගය දුරුවන්නේ ත් ප්‍රහීණ වන්නේ ත් වේද, එහෙයින් නිවන "ඡන්දරාගවිනය, ඡන්දරාගපහාන" යයි කියනලද. **සාමං වා ඤාමෙ පරිඤ්ඤෙය්‍යන්ති**= තුමූ හෝ කාමයන් ත්‍රිවිධ පරිඥාවෙන් දැනගනිත්; **තථත්තාය**= එබදුබවට; **යථාපවිත්තෙනා**= යම් පිළිවෙතකින් පිළිපන්නේ; **ඔතතියඤාණඤ්ඤං වා** යනාදිය නො මද වූ මහත් වූ කුශලයකින් ගත් පිළිඹඳ ඇති වස්ත්‍රාභරණාදිය ලබන තැනැත්ත උපන්නහු දක්වන්ට වදරනලද. **පඤ්චවස්සවයුද්දෙසිකා**= පසළොස් හවුරුදු වයස් ඇති; දෙවෙනි පදයෙහි දු මෙ ම නයයි. වයස් ප්‍රමාණය කුමක් හෙයින් ගනී ද යත්? වණ්ණසම්පත්තිය දැක්වීම පිණිසයි. සැබව දුගීකුලයෙහි උපන්නා වූ ද මාගමගේ මෙ කලැ පැහැසටහන මඳ මඳ වැ

පහදී; පුරුෂයන්ගේ වූ කලී විසිවස් - පස්විසිවස්කලැ (පැහැසවහන) ප්‍රසන්න වේ. **නාතිදීඝා** යනාදියෙන් සදෙසින් තොර වූ ශරීරසම්පත්තිය දක්වයි; **වණ්ණනිභා** යනු වණ්ණයෝ මැයි; **ජීරණං**= ජරාවෙන් දිරූ; **ගොපානසිවඞ්කං**= ගොතැස්සක් මෙන් වක් වූ; **භොගභං**= බිදුණු; මෙයිනුදු ඔහුගේ වක්බව මැ දක්වයි. **දණ්ඩපරායනං**= සැරයටිය පිහිට කොට ඇති, සැරයටිය දෙවෙනි කොට ඇති; **පවේධමානං**= කම්පා වන්නාවූ; **ආතුරං**= ජරාවෙන් ආතුර වූ; **ඛණ්ඩදන්තං**= ජරානුභාව යෙන් කඩනලද දත්ඇති; **පලිතකෙසං**= පඬෙර (= සුදු) කෙස් ඇති; **විලූනං**= සිඳ ගත් කෙස් ඇත්තකු මෙන් මුණ්ඩගීම් වූ (= කෙස් නැති හිසැති;) **ඔලිනසිරං**= මහාඛල්ලාවගීම් ඇති; **වලිනං**= හටගත් රැළිඇති; **තිලකාහතගත්තං**= සුදුතිලක - කළුතිලකවලින් ගැවසුණු සිරුරු ඇති; **ආබාධිතං**= හටගත් ව්‍යාධි ඇති; **දුක්ඛිතං**= දුප්පත් වූ; **බාළහගිලානං**= වැඩිතරම් ගිලන් වූ; **සිවථිකාය ඡඩ්ඩිතං**= අමුඅොගොතෙහි දමනලද; මෙහි ශෙෂය සතිපට්ඨානයෙහි කියනලද මැයි. මෙහි දු නිබ්බිණය ම **ජරූරාගවිනය** නම් නෙව තාසං සමයෙ අත්තව්‍යාබාධාය= එ සම යෙහි තමහට ද දුක් පිණිස නො සිතයි; **අබ්‍යාපජ්ඣං යෙව**= නිදුක් වූ ම; **යං හිකඛවෙ! වෙදනා අනිච්චා**= මහණෙනි! යම් හෙයකින් වෙදනා තොමෝ අනිත්‍ය වූවා ද එහෙයින්; මේ අනිත්‍යාදි ආකාරය වෙදනාවගේ ආදීනවයෙක ගත අවයි. "නිස්සරණය" උකතප්‍රකාර ම වේ යයි.

මහාදුකඛක්ඛන්ධ සූත්‍රවණ්ණා නිමි.

චූලදුක්ඛක්ඛන්ධ සූත්‍ර වණ්ණනා.

එවමේමසුතං යි චූලදුක්ඛක්ඛන්ධ සූත්‍ර යයි. **එකේ සක්කේසු=** එනම් ජනපදයෙහි; ඒ ජනපදය වනාහි ශාක්‍යරාජ කුමාරයන්ගේ වාසස්ථාන වූ බැවින් "සක්ක" යි ම ප්‍රසිද්ධියට ගියේය. ශාක්‍යයන්ගේ උත්පත්තිය වූ කලි අම්බට්ඨ සූත්‍රයෙහි ආවා මැයි. **කපිලවත්ථුස්මිං=** එනම් නගර යෙහි; එය වනාහි කපිලඍෂිහුගේ නිවාසස්ථානයෙහි කළබැවින් "කපිලවත්ථු" යයි කියනලදී; එය ගොදුරුගම් කොට; **නිග්‍රෝධාරාමේ=** "නිග්‍රෝධ" නම් ශාක්‍යයෙකි, හෙතෙම ඉතිසමාගම කාලයෙහි භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වතට පැමිණි කල්හි තමන්ගේ අරමුහි විහාරයක් කරවා භාග්‍යවතුන් වහන්සේට පිදී; "එහි වාසය කරනසේක" යන අර්ථයි. **මහානාමෝ=** "අනුරුද්ධ" තෙරුන්ගේ සොහොවුරු යැ, භාග්‍යවතුන් වහන්සේගේ සුලුපියාගේ පුත්‍ර තෙමේ යි. "සුඩොදන" යැ "සුකෙකාදන" යැ "සක්කොදන" යැ "ඩොතොදන" යැ "අමිතොදන" යැ යන මොහු පස්දෙන සහෝදරයෝයි; "අමිතා" නම් දෙවිය ඔවුන්ගේ නැඟනි යයි. "නිස්ස" තෙර ඇගේ පුත්‍ර යැ; තථාගතයන් වහන්සේ ද නන්දසථවිරයන් වහන්සේ ද සුඩොදන රජුගේ පුත්‍රයෝ යැ; මහානාම රජු ද අනුරුද්ධසථවිරයන් වහන්සේ ද සුකෙකාදන රජුගේ පුත්‍රයෝ යැ; ආනන්දසථවිරයන් වහන්සේ අමිතොදන රජුගේ පුත්‍ර යැ; උන්වහන්සේ භාග්‍යවතුන් වහන්සේට කනිටු යැ; මහානාම තෙම වැඩිමහලු යැ, සකෘදාගාමී ආර්‍යශ්‍රාවකයෙකි; **දීඝරත්තං=** මාගේ සකෘදාගාමී ඵලයට පැමිණීම පටන් බොහෝකල් දනිමි,යි දක්වයි. **ලොභධම්මා=** ලොභසඞ්ඛ්‍යාත ධර්මයෝ; නන්වැදෑරුම් වූ ලොභය ම සඳහා කියයි. ඉතිරි දෙතැන්හි ද මෙ ම නයයි. **පරියාදාය තිට්ඨන්ති=** ක්ෂයකොට සිටිත්; ඒ එසේ මැයි- මේ "පරියාදානය" නම් "සබ්බං හත්ථිභාණ්ඩං පරියාදිණ්ඩවා, සබ්බං අස්සභාණ්ඩං සබ්බං රථභාණ්ඩං සබ්බං පත්තිභාණ්ඩං පරියාදිණ්ඩවා ජීවන්තං යෙව නං අග්ගහෙසි" යන මෙහි ගැනීමෙහි ආයේ යැ; "අනිච්චසඤ්ඤා හිභික්ඛවෙ! භාවිතා බහුලීකතා සබ්බං කාමරාගං පරියාදියති" යන මෙහි ක්ෂය කිරීමෙහි යැ; මෙහි දු ක්ෂය කිරීමෙහි අදහස් කරනලදි. එයින් කියන ලදී- "පරියාදිණ්ඩානි ඛෙපෙවා"යනු. **යෙන මෙ එකදා ලොභධම්මාපි=** යම් කරුණකින් එක් කලෙක ලොභසඞ්ඛ්‍යාත ධර්මයෝ ද මාගේ සිත ක්ෂය කොට සිටිත් ද? යි විචාරයි.

"පරියාදාන" ශබ්දය.

මේ රජතෙම වනාහි සකෘදාගාමී මාර්ගයෙන් ලොභ වෙෂ මොහයෝ නිරවශෙෂ වූවාහු ප්‍රහීණ වෙතියි සංඥ ඇත්තේ විය; හෙතෙම මාගේ (සන්තානයෙහි කෙලෙස්) ප්‍රහීණවූයේ ඇතැයි ද දනී, අප්‍රහීණ වූ (කෙලෙසය) නිසා ප්‍රහීණ වූයේ ද පසුව පෙරලා එන්නේය,යි සංඥ (=අදහස්) ඇත්තේ වෙයි; ආර්‍ය්‍ය ශ්‍රාවකයාට මෙසේ සැකයෙක් උපදී ද යත්? එසේ යැ, උපදී; කුමක් හෙයින? ප්‍රඥප්තියෙහි අදක්ෂහෙයිනි. ඒ සැබවෙ-

ආර්‍ය්‍ය ශ්‍රාවකයාගේ සන්‍දෙහය.

තථාගතයන්හෙ ඥතීත්‍වූ.

මේ කෙලෙසය අසවල්මගින් නැසිය යුතුය,යි මේ ප්‍රඥප්තියෙහි අදක්ෂ වූ ආර්‍ය්‍ය ශ්‍රාවකයාට ද මෙසේ (සැකය) වෙයි; කිම ඔහුට ප්‍රත්‍යවෙක්ෂාව නැද්ද යත්? ඇත්; එතකුදු වුවත් ඕ (ප්‍රත්‍යවෙක්ෂාව) සියල්ලන්ට සම්පූර්ණ වූවා නො වෙයි; සැබව- එකෙක් ප්‍රහීණ වූ කෙලෙසය ම ප්‍රත්‍යවෙක්ෂා කෙරෙයි, එකෙක් අවශෙෂ වූ කෙලෙසය ම යැ, එකෙක් මාර්‍ගය ම යැ, එකෙක් ඵලය ම යැ, එකෙක් නිර්‍වාණය ම (ප්‍රත්‍යවෙක්ෂා කෙරෙයි.) එතකුදු වුවත් මේ පඤ්චප්‍රත්‍යවෙක්ෂාවන් අතුරෙන් එකක් හෝ දෙකක් හෝ නො ලබන්ට නො වටී. මෙසේ යමෙකුට ප්‍රත්‍යවෙක්ෂාව අපරිපූර්ණ වූවා ද, ඔහුගේ මාර්‍ගවධ්‍ය වූ කෙලෙසප්‍රඥප්තියෙහි අදක්ෂභාවයෙන් මෙසේ (සැකය) වේ.

සො එව බො තෙ= එම ලොභය ද වෙෂය ද මොහය ද තොපගේ **සන්තානයෙහි** අප්‍රහීණ යැ, තෙපි වූ කලී ප්‍රහීණ යැ යන සංඥ ඇත්තේ වී යයි දක්වනසේක. **සො ච හි තෙ**= ඒ තොපගේ ලොභ වෙෂ මොහ **සඞ්ඛ්‍යාත** ධර්‍මය; **කාමෙ**= විවිධ වූ ම කාමයන්, පරිභොග නො කරන්නෙහි නම් අප මෙන් පැවිදිවන්නෙහි යයි දක්වති; **අප්පස්සාදෑ**= මද වූ සුව ඇත්තාහු; **බහුදුක්ඛා**= දෘෂ්ටධර්‍මිකසාම්පරායික දුඃඛය ම මෙහි බොහෝ යැ; **බහූපායාසා**= දෘෂ්ටධර්‍මිකසාම්පරායික වූ දැඩි ආයාසපිඩා ව ම මෙහි බොහෝ යැ; **ආදීනවො**= දෘෂ්ටධර්‍මිකසාම්පරායික වූ උපද්‍රවය; **එත්ථහියෙය්‍යා**= මේ කාමයන්හි මේ ආදීනවය ම බොහෝ යැ, ආශ්වාදය වැලින් හිමවත නිසා අඹඇටයක් මෙන් අල්ප යැ, මද වේ. **ඉති චෙපි මහානාම!**= මහානාමය! මෙසේ ත් ආර්‍ය්‍ය ශ්‍රාවකයා විසින් තත්වූ පරිදි සභාව වූ පරිදි මනාකොට න්‍යායයෙන් කාරණයෙන් ප්‍රඥවෙන් මොනොවට දක්නාලද වේ යයි දක්වනසේක. එහි- **පඤ්ඤාය**= විදර්‍ශනා ප්‍රඥවෙන්; ඝට දෙමඟනුවණින් යන අර්‍ත්‍ථයි. **සො ච**= ඒ මේ දෙමගින් දුටු කාමාදීනවඇති ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම; **පිතිසුඛං**= මෙයින් සප්‍රීතිකවූ ධ්‍යාන යෝ දෙදෙන දක්වති. **අඤ්ඤං වා තතො සන්තතරං**= ඒ ධ්‍යානවයට හෝ වඩා අතිශයින් ශාන්ත වූ අන්‍ය වූ මත්තෙහි ධ්‍යානවය හා මාර්‍ගඵලය ද; **නෙව තාව අනාවටටි කාමෙසු හොති**= වැලි ඒ දෙමඟ පිළිවිද සිටියාවූද ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම මතු ධ්‍යානයන් හෝ මාර්‍ගයන් හෝ අනධිගත බැවින් එතාක් කාමයන්හි නො වැටෙනසුලු වූයේ නො ම වෙයි, අනාවතීන වූයේ අනාහොග වූයේ නො වෙයි, ආවතීන සහිත වූයේ ආහොග සහිත වූයේ ම වෙයි; කුමක් හෙයින? සතර දැහැනින් විෂ්කම්භණ ප්‍රහාණයාගේ ද දෙමගින් සමුච්ඡෙද ප්‍රහාණයාගේ ද අභාවය හෙයිනි.

මයහම්පි බො= හුදෙක් තොප විසින් ම නො වෙයි, වැලි මා විසින් ද; **පුබ්බෙව සම්බොධා**= මාර්‍ගසම්බොධියෙන් පළමු කොට ම; **පඤ්ඤාය සුදිඨං අහොසි**= මෙහි අන්තඃපුරනාටකයන් දුරුකිරීමෙහි ප්‍රඥව අදහස් කරනලදුදු; **පිතිසුඛං නාජ්ඣගමං**= සප්‍රීතික වූ ධ්‍යානමය නො ලැබිමි; **අඤ්ඤං වා තතො සන්තතරං**= මෙහි මත්තෙහි ධ්‍යානවය හා සතර මාර්‍ගයෝ ද අදහස් කරනලද්දාහුය; **පච්චඤ්ඤාසිං**= ප්‍රතිඥ කෙළෙමි.

එකමිදාහං මහානාම! සමයං යනු කුමක් හෙයින් ආරබ්ධ ද යත්? මේ වෙන ම අනුසන්ධියෙකි; යට කාමයන්ගේ ආස්වාදය ද ආදීනවය ද කියනලද, නිස්සරණය නො කියනලදී; එය කියනු පිණිස මෝ දෙශනාව ආරබ්ධ යැ. නොහොත් කාමසුඛල්ලීකානුයෝගය එක් අන්තයෙක ආත්මකිලමථානුයොගය එක් අන්තයෙක; මේ දෙ අන්තයන්ගෙන් මාගේ ශාසනය මුක්ත යයි මත්තෙහි ඵලසමාපත්ති ශිෂ්‍යයෙන් සියලු ශාසනය දක්වනු පිණිස ද මෝ දෙශනාව ආරබ්ධයි. **ගිජ්ඣකූටෙ පබ්බතෙ**= ඒ පර්වතයාගේ ගිජුලිහිණියෙකු වැනි වූ කූටයෙක් ඇති, එහෙයින් "ගිජ්ඣකූට" යයි කියනුලැබේ; නොහොත් ගිජුලිහිණියෝ ඒ පර්වතයාගේ කූටයන්හි වෙසෙත් නුයි ද "ගිජ්ඣකූට" යයි කියනු ලැබේ. **ඉසිගිලි පස්සෙ**= ඉසිගිලි පර්වතයාගේ පසෙක; **කාළසිලායං**= කාලවර්ණ වූ ගලතලයෙක්හි; **උබ්භක්ඛකා හොන්ති**= උඩුකුරුව ම සිටියාහු නො හුන්නාහු වෙත්; **ඔපක්කමිකා**= උඩුකුරුව සිටීම් ආදි වූ තමාගේ උපක්‍රමයෙන් උපදවනලද; **නිගණ්ඨා ආවුසො!** යි අතිත් කරුණක් කියන්ට නො හැකි වන්නාහු නිගණ්ඨයාගේ මතුයෙහි දැවැහ. **සබ්බඤ්ඤූ සබ්බදස්සාවී**= ඒ අපගේ ශාස්තෘ තෙම අතීතානාගත ප්‍රත්‍යුත්පන්න වූ සියල්ල දනී, දකියයි දක්වයි; **අපරිසෙසං ඤාණදස්සනං පටිජානාති**= ඒ අපගේ ශාස්තෘ තෙම අනවශෙෂ වූ ධර්මය දන්නේ අපරිශෙෂ සඞ්ඛ්‍යාත වූ ඥානදර්ශනය ප්‍රතිඥා කෙරෙයි; ප්‍රතිඥා කරන්නේ ත් මෙසේ ප්‍රතිඥා කෙරෙයි- **චරතො ච මෙ තිට්ඨතො ච** —පෙ— **පච්චුපට්ඨිතං** යි. එහි **සතතං**= නිතොර; **සමිතං** යනු ඒ පදයාගේ ම වෙවචන යැ; **කිං පන තුම්හෙ ආවුසො! නිගණ්ඨා! ඤාතථ එතතකං වා දුක්ඛං නිජ්ජිණ්ණං** යන මෙය භාග්‍යවතුන් වහන්සේ- පුරුෂයෙක් නම් යමක් කෙරේ ද එය දැනගනී; කඟවුණු විස්සක් ණය ගෙන දසයක් දී මා විසින් දසයක් දෙනලද්දාහුය, යි දැනගනී; දසයක් (ඉතිරිව) සිටියාහුය, යි දැනගනී; එය ද දී සියල්ල දෙනලද්දැ, යි දැනගනී; ක්ෂෙත්‍රයාගේ තුන්වෙනි කොටස කපා එක් කොටසක් කපනලද, දෙකොටසක් ඉතිරි වූවාහුය, යි දැනගනී, යලි එක් කොටසක් කැපූ දෙකොටසක් කපනලද්දාහුය, එක් කොටසක් ඉතිරි වූයේ යයි දැනගනී, එය ද කැපූ කල්හි සියල්ල නිමියේ යයි දැනගනී; මෙසේ සියලු කටයුතු වල කරනලද්ද ද නො කරනලද්ද ද දැනගනී. තොප විසින් ද එසේ දතයුතු වන්නේ යයි දක්වනසේක. **අකුසලානං ධම්මානං පහානං**= මෙයින් අකුශලය හැර කුශලය වඩා ශුද්ධවට පැමිණි නිගණ්ඨයෙක් නම් තොපගේ ශාසනයෙහි ඇද්දැ? යි විචාරනසේක; **එවං සන්තෙ**= තොපගේ මෙසේ නො දැනෙනබව ඇතිකල්හි; **ලුද්දං**= රෞද්‍ර වූ හැසිරීම් ඇති; **ලොහිතපාණිනො**= ප්‍රාණීන් ජීවිතයෙන් තොරකරන්නාහු ලෙසින් වැකුණු අත්ඇත්තාහු; ප්‍රාණවධ කරන්නහුගේ ද ලෙසින් අත තවරනු ලැබෙයි, හෙතෙමේ ද "ලොහිතපාණී" යයි ම කියනු ලැබේ. **කුරූර කම්මන්තා**= දරුණු ක්‍රියා ඇත්තාහු; මව කෙරෙහි ද පියා කෙරෙහි ද

දූහැමි මහණ බමුණන් කෙරෙහි ද කළ අපරාධ ඇත්තාහු; නොහොත් මුවවැදි ආදි වූ සකීඝත්‍රියා ඇත්තාහු; **න ඛො ආවුසො! ගොතම!**= මෙය නිගණ්ඨයෝ "මේ තෙම අපගේ වාදයෙහි දෝෂ දෙයි, ඇපි දූ මොහුගේ (වාදයෙහි) දෝෂාරොපණය කරමු" යි සිතමින් ආරම්භ කළාහුය. එහි අථ තම්- ඇවැත්නි ගෞතමයෙනි! යම්සේ ඔබ පිණිසිවුරු ධරමින් හැල්මස් අහර බුදිමින් දෙව්විමනක් වැනි ගදකිළියෙහි වෙසෙමින් සැපයෙන් සැපයට පැමිණෙන්නහු ද; මෙසේ සැපයෙන් සැපයක් නො ලැබිය හැකියි; තවද- යම්සේ ඇපි උක්කුටිකපධානාදියෙන් නන්වැදෑරුම් වූ දුක විඳිමුද, එපරිද්දෙන් දුකින් සැපය ලැබියයුතු යයි.

සුඛෙන ච හා'වුසො!= යන මෙය ඉදින් සැපයෙන් සැපයක් ලැබිය හැකි වන්නේනම් රජතෙමේ ත් (සැපය) ලබන්නේ යයි දක්වනු පිණිස කියනලදී. **එහි මාගණ්ඩො**= මඟඩරවට අධිපති වූයේ; **සෙනියො** යනු ඔහුගේ නම යැ; **බිම්බි** යනු ආතමභාවයට නමෙකි; ඔහුගේ ඒ (ආතම භාවය) සාරවූයේ යැ දශනීය යැ ප්‍රසාද ඵලවන්නේ යැයි ආතමභාවයාගේ **සමඞ්ගිය** හෙතුකොටගෙන "බිම්බිසාර" යයි කියනුලැබේ. **සුඛවිහාරී නරෙ**= මෙය ඔවුහු තුන්පහයෙහි තුන්වයස්ඇති නළුවන් සමග රජුගේ සැපත් විදීම සඳහා කියති. **අඤ්ඤා**= එකාන්තයෙන්; **සහසා අප්පටිසඤ්ඤා**= සැහැසිකමක් කොට නො විමසා රාගවශයෙන් රත් වූයේ වෙෂවශයෙන් දූෂ්ට වූයේ මොහවශයෙන් මුළා වූයේ යම් සේ කියාද, එපරිද්දෙන් වචන කියනලදුයි දක්වයි. **එහි පටිපුච්ඡිස්සාමි**= ඒ අර්ථයෙහි විචාරන්නෙමි; **යථා වො ඛමෙය්‍ය**= යම් සේ තොපට රුචි වන්නේ ද; **පහොති**= හැකි වෙයි; **අනිඤ්ජමානෙ**= නො සැලෙනුයේ; **එකන්තසුඛ පටිසංවෙදි**= එකාන්ත වූ සැපය විඳිනසුලු වූයේ; **අහං ඛො ආවුසො! නිගණ්ඨා පහොමි එකන්තසුඛපටිසංවෙදි** යන මෙය තමන් වහන්සේගේ ඵලසමවත්සුවය දක්වමින් වදළහ. මෙහි දූ කථාව පිහිටන පිණිස රාජවාර යෙහි සත ආදි කොට පෘච්ඡාව කරනලදුය; **සත්තරත්තින්දිවානි නප්පහොති** යි කී කල්හි සය-පස-සතර යයි සුවය විචාරන්ව වෙයි; බුඬවාර යෙහි වූ කලි සතෙකැයි කී කල්හි යලි සය-පස-සතර යයි කියනුලබන්නේ ආශ්චර්‍ය්‍ය නොවේද, එහෙයින් එකආදි කොට දෙශනාකරනලද්දීය, සෙස්ස සියලු තැන්හි තොඟඹුරු අර්ථ ඇත්තේ මැයි.

වූලදුක්ඛක්ඛන්ධ සූත්‍ර වර්ණනා නිමි.

අනුමාන සූත්‍ර වණ්ණනාව.

එවමෙමසුතං යි අනුමාන සූත්‍ර යයි. **එහි භගෙහසු**= එ නම් ඇති ජනපදයෙහි; මෙහි වචනාර්ථය වනාහි කි අනුසාරයෙන් ම දතයුතු. **සුංසුමාරගිරෙ**= එ නම් ඇති නගරයෙහි; ඒ නගර වසතුව ගන්නා දින යෙහි නො දුරු තැන්හි දියවිලෙක කිඹුලෙක් ශබ්ද කෙළේ ල, වචන කියේ ල; එකල නුවර නිර්මිත කළ කල්හි "සුංසුමාරගිර" යි ම එයට නම් කළාහුය. **හෙසකලාවනෙ**= "හෙසකලා" නම්වූ වනයෙහි; "හෙස කලවනෙ" යි ද පාඨයි. **මිගදායෙ**= ඒ වනය මෘගපක්ෂීන්ට අභය දුන් තැන සිටියේ යැ, එහෙයින් "මිගදාය" යි කියනු ලැබේ. **පවාරෙති**= කැමති කරවයි; **වදනතු**= අවවාදානුශාසනාවශයෙන් කියත්වා; අවවාද කෙරෙත්වා, අනුශාසනා කෙරෙත්වා යන අර්ථයි. **වචනීයොමහි**= මම තොප විසින් කියයුතු අවවාදකටයුතු අනුශාසනාකටයුතු වෙමි යන අර්ථයි. **සො ච හොති දුබ්බචො**= හෙතෙමේ ද දුකසේ කියයුතු වූයේ වෙයි; කියනලද්දේ නො ඉවසයි. **දුව්වස්සකරණෙහි**= දුර්වචව කරන්නාවූ මත්තෙහි ආ සොළොස් ධර්මයන්ගෙන්; **අපපදක්ඛිණගහාහි අනුසාසනිං**= යම්හෙයකින් යමෙක් කියනු ලබන්නේ "තෙපි මට කුමක් හෙයින් කියවු ද? මම තමාගට කැප නො කැප වරද නිවරද වැඩ අවැඩ දනිමි"යි කියාද, මේ තෙම අනුශාසනාව දකුණතින් නො ගනීද, වමතින් ම ගනීද, එහෙයින් "අපපදක්ඛිණගහාහි" යයි කියනු ලැබේ. **පාපිකානං ඉච්ඡානං**= ලාමක වූ අසත්සම්භාවන ප්‍රාර්ථනාවන්ගේ; **පච්චුපට්ඨිතා**= ප්‍රතිවිරුඬ වැ ප්‍රත්‍යනීක වැ සිටී; **අපඤ්ඤාදෙති**= බාල වූ අව්‍යකත වූ තා විසින් කියන ලද්දෙන් කිම? තෙපි ද කියයුතු යයි සිතුගෙහි යයි මෙසේ ගටයි; **පච්චාරොපෙති**= තෙපිත් මේ නම් ඇවතට පැමිණියේ වෙහි, පළමු කොට එය පිළිගම් කරවයි මෙසේ පෙරළා ආරොපණය කෙරෙයි; **අඤ්ඤෙනඤ්ඤං පටිචරති**= අනිත් කරුණකින් හෝ වචනයකින් අනිත් කරුණක් හෝ වචනයක් වසයි; "ඇවතට පැමිණියෙහි"යි කිකල්හි කවරෙක් පැමිණියේ ද? කුමකට පැමිණියේ ද? කොහි පැමිණියේ ද? කවරෙකුට කියවු ද? කුමක් කියවු දැ? යි කියයි; මෙබඳු වූ කිසිවක් තා විසින් දක්නාලද දැ? යි කී කල්හි නො අසම්,යි කන හෝ ළිලවයි; **ඛණ්ඩා කථං අපනාමෙති**= මේ නම් ඇවතට පැමිණියේ වෙහි දැ? යි විචාරනලද්දේ පැළලුප්නුවරට ගියෙමි; යි කියා යලි තාගේ පැළලුප් ගමන නො විචාරමු ඇවත විචාරමු,යි කියනලද්දේ එයින් රජගෙදරට ගියෙමි,යි (කියයි;) රජගෙදරට හෝ බමුණුගෙදරට හෝ යව, ඇවතට පැමිණියේ වෙහි යි, එහි හුරුමස් ලද්දේය, යනාදිය කියමින් කථාව බැහැර විසුරුවයි; **අපදානෙ**= තමාගේ චරිතයෙහි; **න සම්පායති**= ඇවැත්නි! තෙපි කොහි වෙසෙහි ද? කවරෙක් නිසා වෙසෙහි දැ?යි හෝ

"මා විසින් ඇවතට පැමිණෙන්නා වූ මේ තෙම දක්නා ලදැ" යි තෙපි යමෙකුට කියෙහි ද, එකල්හි තෙපි කුමක් හෙරෙහි ද? මේ තෙම කුමක් කෙරේ ද? යලි තෙපි කොහි වූයෙහි ද? මේ තෙම කොහි වූයේ දැ? යි හෝ (මෙ) ආදිනයින් චරිතය විචාරනලද්දේ සම්පාදනයකොට කියන්ට නො හැකි වෙයි; **නන්‍ද්‍රාවුසෝ**= ඇවැත්නි! ඒ සොළොස් ධර්‍මයන්හි; **අත්තනාව අත්තානං එවං අනුමිනිතබ්බං**= මෙසේ තමා විසින් ම තෙමේ ප්‍රමාණ කටයුතු තුලනය කටයුතු, තීරණය කටයුතුයි; **පච්චවෙක්ඛිතබ්බං**= ප්‍රත්‍යවෙක්ෂා කටයුතුයි; **අහොරත්තානුසික්ඛිනා**= දවල ද රෑ ද හික්මෙන්නහු විසින්; රෑ ද දවල ද කුසල්දහම්හි හික්මෙන්නහු විසින් ප්‍රීතිප්‍රමොද්‍යය ම ඉපදවිය යුතුය යන අර්‍ථයි. **අවෙජ්ජ වා උදපනෙය්‍යා**= පැහැදුන දියබදුනක හෝ; **මුඛනිම්මිතානං**= මුවපිළිබිඹුව; **රජං**= ආගන්තුකරජස්; **අඞ්ගණං**= එහි හටගත් තලකැලලක් හෝ පිඬකයක් හෝ; **සබ්බේපි මේ පාපකේ අකුසලේ ධම්මේ පහීනේ**= මෙයින් සියලු ප්‍රහාණය වදාළහ; කෙසේ ද? මෙතෙක් අකුසල ධර්‍මයෝ පැවිද්දහට නො සුදුසු වෙති, යි ප්‍රත්‍යවෙක්ෂාව උපදවන්නහුට එනාහි ප්‍රත්‍යවෙක්ෂා ප්‍රහාණය වදාරනලද වෙයි; ශීලය පදස්ථාන කොට කිසුණුපිරියම් පවන් ගෙන අවසමවත් උපදවන්නහුට විෂකම්භණ ප්‍රහාණය වදාරනලද; සමථ පදස්ථාන කොට විදසුන් වඩන්නහුට තදඞ්ගප්‍රහාණය වදාරනලද; විදසුන්වඩා මාගීය වඩන්නහුට සමුච්ඡේද ප්‍රහාණය වදාරනලද; ඵලය පැමිණිකල්හි ප්‍රතිප්‍රශ්‍රබ්ධි ප්‍රහාණය ද, නිර්‍වාණය පැමිණිකල්හි නිස්සරණ ප්‍රහාණය දැයි, මෙසේ මේ සූත්‍රයෙහි සියලු ප්‍රහාණය වදාරනලද්දේ වේ.

මේ සූත්‍රය එනාහි භික්ෂුප්‍රාතිමොක්ෂ නමැයි පොරණැදුරෝ කියති. මෙය දවසට තුන්වරක් ප්‍රත්‍යවෙක්ෂා කටයුතු, උදැසන වාසස්ථානයට පිවිස හුන්නහු විසින් මේ මෙතෙක් කෙලෙස් මට ඇද්දේ හෝ නැද්දැ? යි පස්විකියයුතු, ඉදින් ඇතැයි දකී නම් ඔවුන්ගේ දුරලීම පිණිස වැයම් කටයුතු, ඉදින් නො දකී නම් මනාපැවිද්දෙක්මි යි සතුටු වූවෙක් විය යුතු, බත් කිස කොට රාත්‍රිස්ථානයෙහි හෝ දිවාස්ථානයෙහි හිඳ ද පස්විකියයුතු, සවස වඳනතැනැහි හිඳ ද පස්විකියයුතු, තුන්වරක් නො හැක්කහු විසින් දෙවරක් පස්විසිකියයුතු, දෙවරක් නො හැක්කහු විසින් වූ කලි අවශ්‍යයෙන් එක්වරක් පස්විකිය යුතුයි; ප්‍රත්‍යවෙක්ෂා නො කරන්ම නො වටී යයි කියත්. සෙස්ස සියලු තැන්හි නො ගැඹුරු අර්‍ථ ඇත්තේ ම යයි.

අනුමාන සූත්‍ර වර්ණනා නිමි.

වෙතොඛිල සූත්‍ර වණ්ණනා.

එවමෙම සුතං යි වෙතොඛිල සූත්‍ර යයි. **එහි වෙතොඛිලා** යනු චිත්තයාගේ තදබැව් කසළබැව් කණුබැව් හුයි; **වෙතසෝ විනිබන්ධා=** සිත බැඳ මිටෙහි කොට මෙන් ගනිත් නුයි "වෙතසෝ විනිබන්ධ" නම් වෙති; වුඩ්ං යනාදීන්හි ශීලයෙන් වැඩීමට, මාර්ගයෙන් නැගීමට, නිර්ණයෙන් විපුලබවට, නොහොත් ශීලසමාධින්ගෙන් වැඩීමට, විදර්ශනා මාර්ගයෙන් නැගීමට, ඵලනිර්ණයන්ගෙන් විපුලබවට; **සප්පති භඞ්ගති=** ශාස්තෘන්ගේ ශරීරයෙහි හෝ ගුණයෙහි හෝ සැක කෙරෙයි; ශරීරයෙහි සැක කරන්නේ උතුම් වූ දෙතිස් ලකුණෙන් හෙබි යාවූ සිරුරක් නම් ඇද්දේ හෝ නැද්දැයි සැක කෙරෙයි; ගුණයෙහි සැක කරන්නේ අතීතානාගත වර්තමානය දැනී මෙහි සමර්ථ වූ සර්ව්ඥතාඥානය ඇද්දේ හෝ නැද්දැයි සැක කරයි. **විචිකිච්ඡති=** විමසමින් වෙහෙසෙයි, දුකට පැමිණෙයි, විනිශ්චය කරන්ට නොහැකි වෙයි; **නාධිමුච්චති=** මෙය මෙසේ යයි අධිමොක්ෂය (=නිශ්චය) නොලබයි; **න සම්පසීදති=** ගුණයන් කරණකොට ගෙන නුවණින් පිවිස නිසැක බැවින් පහදින්ට නොකැලඹුනෙක් වන්ට නොහැකි වෙයි; **ආතප්පාය=** කෙලෙස්තවන වීර්‍යය කරනු පිණිස; **අනුප්පධානාය=** නැවත නැවත යෙදීම පිණිස; **සාතච්චාය=** සතතක්‍රියාව පිණිස; **පධානාය=** ප්‍රධාන්වීර්‍යය පිණිස; **අයං පඨමෝ වෙතොඛිලෝ=** මේ ශාස්තෘන් කෙරෙහි සැක යයි කියනලද පළමුවන චිත්තයාගේ තදබව මෙසේ මේ භික්ෂූහුගේ ප්‍රහීණ වූයේ වේ.

ධම්මෙ= පර්‍යාප්ති ධර්මයෙහි ද ප්‍රතිවෙධ ධර්මයෙහි ද; පර්‍යාප්ති ධර්මයෙහි සැක කරන්නේ ත්‍රිපිටක බුද්ධවචනය සුවාසූදහසක් ධර්මස්කන්ධයෝ යයි කියති, මේ ඇද්දේ හෝ නැද්දැයි සැක කරයි; ප්‍රතිවෙධ ධර්මයෙහි සැක කරන්නේ විදර්ශනානිශංසය මාර්ගය නම, මාර්ගානිශංසය ඵලය නම, සියලු සංස්කාරයන්ගේ දුරලීම නිර්ණය නමැයි කියති, එය ඇද්දේ හෝ නැද්දැයි සැක කරයි.

සඞ්ඝෙ කඞ්ඛති= "සුපටිපන්නෝ" යනාදි පදයන්ගේ වශයෙන් මෙබඳු වූ පිළිවෙතට පිළිපන් සතර මාර්ගස්ථයෝය සතර ඵලස්ථයෝය අෂ්ටපුද්ගලයන්ගේ සමූහය වූ සඞ්ඝ තෙමේ නම් ඇද්දේ හෝ නැද්දැයි සැක කෙරෙයි; ශික්ෂාවෙහි සැක කරන්නේ අධිශීලශික්ෂා නම අධිචිත්ත —පෙ— අධිප්‍රඥාශික්ෂා නමැයි කියති, ඕ ශික්ෂා තොමෝ ඇද්දේ හෝ නැද්දැයි සැක කරයි; **අයං පඤ්චමෝ=** මේ සබ්‍රහ්මචාරීන් කෙරෙහි කොප සඞ්ඛ්‍යාත වූ පස්වැනි චිත්තයාගේ තදබව කසළබව කණු (=හුල්) බව වේ.

විනිබඳයන්හි **කාමෙ**= වසතුකාමයෙහි ද කෙලෙසකාමයෙහි ද; **කායෙ**= තමාගේ කයෙහි; **රූපෙ**= බාහිරරූපයෙහි; **යාවදත්ථං**= යම් තාක් කැමති වේද ඒතාක්; **උදරාවදෙහකං**= බඩ පුරා; වෙතොවිනිබඳ. **එය** වනාහි උදරය අවදෙහනය (= පිරීම) කරනහෙයින් "උදරාවදෙහක" යයි කියනු ලැබේ. **සෙය්‍යසුඛං**= ඇඳ පුටුසුවය ද සෘතුසුවය ද; **පස්සසුඛං**= යම්සේ දකුණුපසට හා වම්පසට පෙරළෙමින් නිදන්නහුට සුව වේද, එසේ උපන් සුවය; **මිඛසුඛං**= නිදි සුවය; **අනුයුත්තතා**= යුක්තප්‍රයුක්ත වූයේ වෙසේද; **පණිධාය**= ප්‍රාර්ථනා කොට; **සිලෙන** යනාදියෙහි- **සීලං**= චතුපාරිශුද්ධි ශීලය; **වතං**= ව්‍රත සමාදානය; **තපෝ**= තපශ්චරණය; **බ්‍රහ්මචරියං**= මෛථුනවිරතිය; **දෙවෝ වා භවිස්සාමි**= මහෝඝ්‍ය දෙවියෙක් හෝ වන්නෙමි; **දෙවඤ්ඤතරෝ වා**- අල්පෝඝ්‍ය දෙවියන් කෙරෙහි හෝ එක්තරා එකෙක්; සාඛ්‍යාදයන්හි ඡන්දය නිසා පැවති සමාධිය **ඡන්දසමාධි** නම්; ප්‍රධාන වූ සංස්කාරයෝ **පධානසඞ්ඛාර** නම් වෙති; **සමන්නාගතං**= ඒ ධර්මයන් ගෙන් යුක්ත වූ ඍද්ධියගේ පාදය නොහොත් ඍද්ධි වූ පාදය නුඹ **ඉද්ධිපාද** නම්; සෙස්සෙහි ද මෙ ම නයයි. මේ මෙහි සංක්ෂේප යයි; යලි විස්තරය ඍද්ධිපාදවිභඞ්ගයෙහි ආයේ මැයි. විශුද්ධිමාර්ගයෙහි වූ කලි මේ පදයාගේ අර්ථය දක්වනලදී. මෙසේ මේ සතර ඍද්ධිපාදයන්ගෙන් විමුක්තමහණ ප්‍රභාණය කියනලද්දේයි. **උස්සොළ්හි යෙව පඤ්ඤාති** යි එහි **උස්සොළ්හි** යයි සියලු තැන්හි කවයුතු වීර්‍යය දක්වයි; **උස්සොළ්හිපනතාරසඞ්ඝ සමන්නාගතෝ**= පඤ්ච චේතොඛිල ප්‍රභාණයෝ යැ පඤ්ච විනිබඳ ප්‍රභාණයෝ යැ සතර ඍද්ධිපාදයෝ යැ උස්සොළ්හි (= වීර්‍යය) යැයි මෙසේ වීර්‍යය සමඟ පසළොස් අඟින් සම්පන්න වූයේ; **භබ්බෝ**= අනුරූප වූයේ, සුදුසු වූයේ; **අභිනිබ්භිදාය**= නුවණින් කෙලෙස් බිඳීම පිණිස; **සම්බොධාය**= සතර මාර්ගයාගේ අවබෝධය පිණිස; **අනුත්තරාය**= ශ්‍රේෂ්ඨ වූ; **යොගක්ඛෙමාය**= සතර යොගයන්ගෙන් උපද්‍රවරහිත වූ අර්හත්ත්වයාගේ; **අධිගමාය**= ප්‍රතිලාභය පිණිස.

සෙය්‍යථා යනු ඔපම්‍යාර්ථයෙහි නිපාත යැ; **පි** යනු සම්භාවනාර්ථයෙහි යි; දෙකින් ම "මහණෙනි! යම්සේ නම්" යනු දක්වයි. **කුක්කුටියා අණ්ඩානි අට්ඨ වා දස වා බාදස වා**= මෙහි කිසිසේත් කුක්කුටපොත කොපමාව. කිකිළියගේ උකුසප්‍රකාරයෙන් උෂ්ණාධික වූ ද බිජුවට වෙති, එත කුදු වුවත් වචනයාගේ සිලුටුබව පිණිස මේ කියනලදී; සැබව මෙසේ ලොකයෙහි සිලුටු වචන ය වේ. **නානාස්සු**= තානි + අස්සු, වන්නාහුය යන අර්ථයි. **කුක්කුටියා සම්මා අධිසයිතානි**= ඒ මවු වූ කිකිළිය පියාපත් පිහිටුවා ඒ (බිජුවට) මතුයෙහි ශයනය කරන්නිය විසින් මනාකොට මතුයෙහි හෝනාලද්දාහු **සම්මා පරිසෙදිතානි**= කලින් කල සෘතු ගන්වන්නිය විසින් මනාකොට හාත්පස සෙවිත වූවාහු උණුසුම් කරනලද්දාහු; **සම්මා පරිභාවිතානි**=

කලින් කල මනාකොට භාත්පස භාවිත වූවාහු, කුකුළුගද ගන්වන ලද්දාහු යන අර්ථයි. **කිඤ්චාපි නස්සා කුක්කුටියා=** ත්‍රිවිධ ක්‍රියාකරණයෙන් අප්‍රමාදය කොට කිසිසේත් ඒ කිකිළියට මෙබඳු කැමැත්තක් නූපදනේය; **අථ ඛෝ භබ්බාව නෙ=** වැලිත් ඒ කුකුළුපැටවු කී ක්‍රම යෙන් සුවසේ පිටත නික්මෙන්ට සුදුසු වූවාහු මය; සැබව යම්හෙයකින් ඔවුහු ඒ කිකිළිය විසින් මෙසේ තුන් ආකාරයකින් ඒ බිජුවට පාලනය කරනු ලබන්නාහු කුණු නො වෙත් ද, ඔවුන්ගේ යම් තෙත් වූ දියඟති යකුත් වූයේ ද එය ක්ෂය වීමට යේ ද, කබල (= කටුව) තුනී වේද, පානියසිළු ද මුවතුඩ ද රළු වේද, තුමූත් මේරීමට යෙත් ද, කටුව තුනී බැවින් පිටත ආලෝකය ඇතුලතැ පැනේ ද, එහෙයින් ඒකාන්තයෙන් ඇපි බොහෝ කලක් කුකුළුවනලද අන්පා ඇත්තමෝ සම්බාධයෙහි ශය නය කෙළෙමු. මේ පිටත ආලෝකය පෙනේ, එහි දැන් අපව සැපවිහරණය වන්නේ ය,යි නික්මෙනු කැමති වැ කටුව පසින් පහරති, කර දිගු කෙරෙති, එවිට ඒ කටුව දෙකක් වැ බිඳෙයි; එකල්හි ඔවුහු පියාපත් සලමින් ඒ ඇසිල්ලට සුදුසු සේ නාද කරමින් නික්මෙත් මය; නික්මැ ද ගම්කෙත් හොබවමින් හැසිරෙත්.

එවමෙවං ඛෝ යන මෙය ඔපම්‍ය ප්‍රතිපාදන යැ; ඒ මෙසේ අර්ථය හා සසඳ දතයුතු. මේ විස්තර යැ— ඒ කිකිළියගේ බිජුවට විෂයෙහි ත්‍රිවිධක්‍රියා කිරීම මෙන් මේ භික්ෂුහුගේ වීර්‍යය පසළොස්වෙනි කොට ඇති අඛයන්ගෙන් සමන්විතබව වෙයි; කිකිළියගේ ත්‍රිවිධක්‍රියා සම්පාදනයෙන් බිජුවට කුණු නො වනබව මෙන් පසළොස් අඟින් යුත් මහණහුගේ ත්‍රිවිධ වූ අනුපස්සනා සම්පාදනයෙන් විදර්‍ශනාඥානයාගේ නො පිරිහීම වෙයි; ඇගේ ත්‍රිවිධක්‍රියාකරණයෙන් අණ්ඩයන්ගේ තෙත්දිය ක්ෂය වීම මෙන් ඒ මහණහුගේ ත්‍රිවිධානුපස්සනා සම්පාදනයෙන් භවත්‍රයානුගත වූ නිකාන්තිසෙනහයාගේ ක්ෂය වීම වෙයි; අණ්ඩකපාලයන්ගේ (= බිජුවටකටු) තුනීබව මෙන් භික්ෂුහුගේ අවිද්‍යා නමැති අණ්ඩකොෂයාගේ තුනීබව වෙයි; කුකුළුපැටවුන්ගේ පානියතුඩවල තදබව මෙන් ඒ භික්ෂුහුගේ විදර්‍ශනාඥානය පිළිබඳ තියුණු රළුපැහැදුනු බව වෙයි; කුකුළුපැටවුන්ගේ මිහිකිරීම් කාලය මෙන් භික්ෂුහුගේ විදර්‍ශනා ඥානය පිළිබඳ පිරිනැමුණු කාලය වැඩුණු කාලය ගැබ්ගන්නා කාලය වෙයි; කුකුළුපැටවුන්ගේ පානියසිළින් හෝ මුවතුඩින් හෝ අණ්ඩකොෂය පලාපියා ගසා සුවසේ නික්මෙන කාලය මෙන් ඒ භික්ෂුහුගේ විදර්‍ශනාඥානය ගැබ්ගන්වා හැසිරෙන්නහු තද්ජාතික වූ සෘතුපහසුව හෝ හොජනපහසුව හෝ පුද්ගලපහසුව හෝ ඛමීශ්‍රවණපහසුව හෝ ලැබ එක් අසුනෙකහුන්නාවූ ම විදර්‍ශනා වඩන්නහුගේ පිළිවෙළින් පැමිණෙනලද රහත්මගින් අවිද්‍යාණ්ඩකොෂය පලා (ලෞකික) අභිඥා නමැති පියා විහිදුවා ගසා සුවසේ රහත්බවට පැමිණි කාලය දතයුතු. තවද- යම්සේ කුකුළුපැටවුන් මුහුකලබව දැන මවුතොමෝත් අණ්ඩකොෂය බිඳී ද, එපරිද්දෙන් එබදු භික්ෂුහුගේ ත්‍රුවණ මිහිකිරීම් දැන ශාස්තෘන් වහන්සේ ද-

135. "උච්ඡින්ද සිනෙහමත්තනෝ - කුමුදං සාරදිකංව පාණිනා
සන්තිමග්ගමේව බ්‍රූහය - නිබ්බානං සුගතේන දෙසිතං" යන-

ආදිනයින් ඔහාසඵරණ ගාථාවකින් අවිද්‍යාණ්ඩකොෂය පහරන සේක; හෙතෙම ගාථාවසානයෙහි අවිද්‍යාණ්ඩකොෂය බිඳ රහත්බවට පැමිණෙයි. එතැන් පටන් යම්සේ ඒ කුකුළුපැටවු ගම්කෙත් හොබවමින් ඒ ඒ තැන හැසිරෙත් ද, එපරිද්දෙන් මේ මහාඍෂිණාශ්‍රව තෙමේ ද නිවන් අරමුණු කොට ඇති පලසම්වතට සමවැද සහරම හොබවමින් හැසිරෙයි.

මෙසේ මේ සූත්‍රයෙහි සතර ප්‍රහාණයෝ වදාරනලද්දාහුය, කෙසේ ද? වෙතොඛිලයන්ගේ ද චේතොවිනිබ්ඛයන්ගේ ද ප්‍රහාණයෙන් පටිසඞ්ඛා ප්‍රහාණය වදාරනලද, සෘද්ධිපාදයන්ගෙන් විෂකම්භණ ප්‍රහාණය ද මාගීය පැමිණි කල්හි සමුච්ඡේද ප්‍රහාණය ද, ඵලය පැමිණි කල්හි ප්‍රතිප්‍රශ්‍රබ්ධි ප්‍රහාණය ද වදාරනලදී. සෙස්ස සියලු තැන්හි ප්‍රකට වූ අර්ථ ඇත්තේ ම යයි.

වෙතොඛිල සූත්‍ර වර්ණනා නිමි.

---

135. සාරදිකං= සරාකලෑ උපන්; කුමුදං= කුමුදුකුසුමයක්; පාණිනා ඉව= අතින් (සිදින්නාක්) මෙන්; අත්තනෝ= තමාගේ (සන්තානයෙහි වූ;) සිනෙහං= තෘෂ්ණාසඞ්ඛ්‍යාත සෙනහය; උච්ඡින්ද= (රහත්මග ඤාණින්) සිදුව; සන්තිමග්ගමේව= නිර්‍වාණගාමී වූ අෂ්ටාඞ්ගික මාගීය ම; බ්‍රූහය= වඩව; (යම්හෙයකින්) නිබ්බානං= නිර්‍වාණය (ශාන්ත යයි;) සුගතේන= සුගතයන් විසින්; දෙසිතං= දෙශනාකරනලද ද (එහෙයිනි.)

වනපත්ථ සූත්‍ර වණ්ණනා.

එවමේමසුතං යි වනපත්ථ සූත්‍ර යයි. එහි **වනපත්ථපරියායං** යනු වානප්‍රස්ථකාරණය, වානප්‍රස්ථදෙශනාව හෝ යැ; **වනපත්ථං උපනිස්සාය විහරති**= මිනිසුන්ගේ හැසිරීම ඉක්මවන ලද වනලැහැබ් සෙනසුනක් ඇසුරු කොට මහණදම් කෙරෙමින් වෙසෙයි; **අනුපඛීනා** යනාදියෙහි පෙර නො එලඹ සිටි සිහිය එය ඇසුරුකොට වසන්නහුට ද නො එලඹ සිටිද; පෙර සමාධියට නො පැමිණි සිත සමාධියට නො පැමිණේ ද (=එකහ නො වේ ද;) පෙර ක්ෂය නො කළ ආශ්‍රවයෝ ක්ෂය වීමට නො යෙත් ද; පෙර නො පැමිණෙනලද නිරුත්තර වූ යොගක්ෂෙම සඞ්ඛ්‍යාතවූ අමෘතයට ද නො පැමිණේ ද යන අර්ථයි. **ජීවිතපරික්ඛාරං**= ජීවිත සම්භාරයෝ (=ජීවිතය රැකීම පිණිස වූ උපකරණයෝ;) **සමුදානෙතබ්බා**= රැස් කළ යුත්තාහු; **කතිහරත්ත සමුදානමේතබ්බන්ති**= දුකසේ උපදින් ද; **රත්තිභාගං වා දිවසභාගං වා**= රැකොටසෙහි හෝ දවල්කොට සෙහි හෝ; මෙහි දූ රාත්‍රිභාගයෙහි ප්‍රත්‍යවෙක්ෂා කරන්නහු විසින් දැන රාත්‍රියෙහිම නික්ම යායුතුයි, **රත්තියෙහි වණ්ඩව්‍යාලාදීන්ගේ** උවදුරු ඇති කල්හි අරුණ නැගීම බලාපොරොත්තු විය යුතුයි; දවල්භාගයෙහි දැන දවල් නික්ම යායුතුයි, දවල් උවදුරු ඇතිකල්හි හිරු අස්ගල් පැමිණීම බලාපොරොත්තු විය යුතුයි; **සඞ්ඛාපි**= මෙසේ මහණදම් නො නිපදින බැව් දැන; වැලි අනතුරු වාරයෙහි **සඞ්ඛාපි**= මෙසේ මහණදම් නිපදින බැව් දැන; **ඝාවජීවං**= යම්තාක් දිවි පවතී ද, ඒතාක් විසියයුතු මැයි; **සෝ පුග්ගලෝ** යන පදයාගේ **නා'නුබන්ධිතබ්බා** යන මෙය සම්බන්ධය වේ. **අනාපුච්ඡා**= මෙහි වනාහි ඒ පුද්ගලයා නො විචාරා නික්ම යායුතුය යන අර්ථයි. **සඞ්ඛාපි**= මෙසේ මහණදම් නො නිපදින බැව් දැන ඒ පුද්ගල තෙම අනුබන්ධනය නො කටයුතු; ඔහු නො විචාරා නික්ම යායුතු. **අපි පනුජ්ජමානෙනා'පි**= බැහැර කරනුලබන්නහු විසින් නමුදු; ඒ එසේ මැයි- මෙබඳු පුද්ගල තෙම ඉදින් දරම්පි සියයක් දිය කළ සියයක් වැලිඅමුණු සියයක් හෝ දඩ ගෙන්වා ද, මෙහි නො වසවයි බැහැර හෝ කරවා ද, ඔහු ක්ෂමා කරවා දිවි පවත්නා තෙක් වාසය කළ යුත්තේ ම යයි.

වනපත්ථ සූත්‍ර වණ්ණනා නිමි.

මධුපිණ්ඩික සූත්‍ර වණ්ණනා.

එවමෙමසුතං යි මධුපිණ්ඩික සූත්‍ර යයි. **එකං සමයං** යනු හිමවත සමඟ එකට බැඳුණු අරුමපිම වූ සවයංජාත (= තෙමේ ම හටගත්) වනය; වෙසාලියෙහි රොපිතාරොපිතවනය යමසේ ද එමෙන් නො වේ. **දිවා විහාරාය=** දහවල් සමවතින් විසීම පිණිස; **බෙලුවලඝිකාය=** තරුණ බෙලිවෘක්ෂයාගේ; **දණ්ඩපාණී=** ජරාවෙන් දුබලබැවින් දඬු ගත් අත් ඇත්තේ නො වෙයි; ඒ එසේ මැයි— මේ තෙම තරුණ වූයේ පළමු වයස්හි සිටියේ යැ; එහෙත් සැරයටියෙහි ලොල් වූ සිත් ඇතිබැවින් රන්සැරයටියක් ගෙන හැසිරෙයි, එහෙයින් "දණ්ඩපාණී" යයි කියනලදී.

දණ්ඩපාණී ශාක්‍යයා.

ජඞ්ඝාවිහාරං= කෙණ්ඩා විඩාව දුරලනු පිණිස ජඞ්ඝාචාරයෙන්; **අනුවඩ්ඪමානෝ අනුවිචරමානෝ=** ආරම්භදර්ශන වනදර්ශන පර්වතදර්ශනාදිය පිණිස ඔබිනොබ හැසිරෙනුයේ; **නිත්තෝර නික්ඛිම ඇති** මේ තෙම කිසිදිනෙක නික්ම මෙසේ හැසිරේල; **දණ්ඩමොලුබ්භ=** සැරයටිය එල්ලා ගෙන ගොපලුදරුවෙකු මෙන් සැරයටිය පෙරටු කොට කබා සැරයටි මතුයෙහි දෙ අත් පිහිටුවා, පිටිඅල්ල හනුයෙන් පෙළා එක් පසෙක සිටියේය; **කිංවාදී=** කුමන දෘෂ්ටි ඇත්තේ ද; **කිමකඛාසී=** කිනම් දෘෂ්ටියක් කියන්නේ ද; මේ රජතෙම භාග්‍යවතුන් වහන්සේට නො වැඳ පිළිසඳර මතු මැ කොට ප්‍රශ්න විචාරයි; කුමක් හෙයින ? මේ තෙම දෙව්දත්හුගේ පක්ෂයෙහි වූයෙක් ල, දෙව්දත් තමන් සමීපයට පැමිණෙන්නවුන් තථාගතයන් කෙරෙහි බිඳුවයි; හෙතෙම මේසේ කියන්නේ ල- ශ්‍රමණ ගෞතම තෙම අපගේ කුලය සමඟ වෛරියෙක, අපගේ කුලයාගේ වැඩීම නො කැමැති වෙයි, මාගේ නැගනියද සක්විත්තෙකු විසින් පරිභොග කටයුත්ති යැ, ඇ සැරදමා වෙ නසී වා,යි නික්මැ ගොස් පැවිදි විය, මාගේ බැන තෙමේ ද සක්විති බිජයෙ කැයි දැන අපගේ කුලයාගේ වැඩීම නො තුස්නේ මොහු නසීවා,යි ඔහු ද ළදරුකලැ ම පැවිදිකරවිය, මම වූ කලී මොහුගෙන් වෙන් ව පවත්නට නො හැකි වන්නෙම් පසුව පැවිදි වීම්, එසේ පැවිදිවූ ද මා පැවිදිවූ දින පටන් සෘජු වූ ඇස්වලින් නො බලයි, පිරිස් මැද කථාකරන්නේ ද මහා පොරොවකින් පහර දෙන්නෙකු මෙන් දෙව්දත් අපායෙහි උපදින් නෙක ගනාදිය කියන්නේ ය,යි, මෙසේ මේ රජතෙමේ ත් දෙව්දත්හු විසින් බිඳිනලද්දේය, එහෙයින් එසේ කෙළේයි. එකල්හි භාග්‍යවතුන් වහන්සේ- යම්සේ මේ රජතෙම "මා විසින් ප්‍රශ්න විචාළකල්හි (පිළිතුරු) නො කියා ය" යි කියන්ට නො ලබා ද, යම්සේත් කියනලද්දහුගේ අර්ථය නො දනී ද, මොහුට එපරිද්දෙන් කියන්නෙම්, යි ඔහට සුදුසු කොට වදාරනසේක්- **ඝථාවාදී** බොා ගනාදිය වදාළහ.

එහි න කෙනචි ලොකෙ විගහයහ තිඨති= ලෙව්හි කිසිවකු සමග විග්‍රාහික කථාවක් නො කෙරේ ද, විවාද නො කෙරේ ද; සැබව කථාගතයන් වහන්සේ ලොකයා සමග විවාද නො කෙරෙති, වැලි ලෝවැසි තෙම තථාගතයන් සමග අනිත්‍ය යැයි කිකල නිත්‍ය යැයි කියමින් දුඃඛ යැ- අනාත්ම යැ- අශුභ යැයි කිකල ශුභ යැයි කියමින් විවාද කෙරෙයි. එහෙයින් ම වදාළහ— a. **"නාහං භික්ඛවෙ! ලොකෙන විවදාමි, ලොකොා ච බොා භික්ඛවෙ! මයා විවදති"** යි. එසේ ම b. **"න භික්ඛවෙ! ධම්මවාදි කෙනචි විවදති, අධම්මවාදි ච බොා භික්ඛවෙ! විවදති"** යි. **තථාා**= යම් කරුණකින්; **තථාගතොා**= වසතුකාම යන්ගෙන් ද කෙලසකාමයන්ගෙන් ද; **තං බ්‍රාහ්මණං**= ඒ ක්ෂීණාශ්‍රව බ්‍රාහ්මණයා; **අකථංකථිං**= විචිකිච්ඡා රහිත වූවහු; **ඤාණකුසකුසවවං**= විපිළිසරකුකුස හා අත්පාකුකුස ද සිඳිනලද බැවින් සුන්කුකුස් ඇතියහු; **භවාභවෙ**= නැවත නැවත භවයෙහි නොහොත් හීන ප්‍රණීතභවයෙහි; සැබව- ප්‍රණීත වූ භවය වෘඩියව පැමිණීයේ "අභව" යයි කියනු ලැබේ. **සඤ්ඤකෙ**=කෙලසසංඥවෝ; කෙලසයෝ මැ හෝ මෙහි "සඤ්ඤ" නාම යෙන් කියනලද්දාහුය; එහෙයින් යම් කරුණකින් (විවිධ) කාමයන් ගෙන් වෙන්ව වාසයකරන්නා වූ ලොකයෙහි විවාදරහිත වූ ඒ ක්ෂීණාශ්‍රව බ්‍රාහ්මණයා කෙරෙහි කෙලසසංඥවෝ අනුශයනය නො කෙරෙත් ද (= පිවිසෙත් ද;) ඒ කාරණය ද මම දනිමි,යි මේ මෙහි අර්ථ යයි. මෙසේ භාග්‍යවතුන් වහන්සේ තමන් වහන්සේගේ ක්ෂීණාශ්‍රවභාවය දක්වන සේක. **නිලලාළෙඩා**= බැහැර කොට කෙලවා; **තිවිසාබං**= රෙඛා තුනක් ඇති; **නළාමිඛං**= රැලිබිඳීම; නළලෙහි හිරි තුනක් දක්වමින් රැලිබිඳුම නංවා යන අර්ථයි; **දණ්ඩමොලුබහ**= සැරයටිය පෙළා; "දණ්ඩ මාලුබහ" යි ද පාඨයි; ගෙන ගියේය, යන අර්ථයි.

අඤ්ඤතරෙ= නමින් අප්‍රකට වූ එක් මහණෙක්; හෙතෙම වත්තාහි අනුසතියෙහි දක්ෂයෙකි; භාග්‍යවතුන් විසින් "යම්සේ දණ්ඩපාණි තෙම නො දනී ද, එපරිද්දෙන් මා විසින් කියනලදැ" යි වදාළ කල්හි කවර කරුණකින් වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් නො දතහැකි කොට ප්‍රශ්නය වදාරනලද දැ? යි අනුසතියෙන දසබලයන් අයැද මේ ප්‍රශ්නය භික්ෂු සඞ්ඝයාහට ප්‍රකට කරන්නෙමි, යි හුනස්නෙන් නැගිට උතුරුසළුව එකස් කොට දශනඛසමුජ්ජල කොට ඇදිලි බැඳ **කිංවාදී පන හගොන! භගවා** යනාදිය කී.

---

a. මහණෙනි! මම ලොකයා සමග විවාද නො කෙරෙමි. ලොකයා වැලිත් මහණෙනි! මා සමග විවාද කෙරේ.

b. මහණෙනි! ධර්මවාදී තෙම කිසිවකු සමග විවාද නො කෙරෙයි, අධර්මවාදී වැලිත් මහණෙනි! විවාද කෙරේ.

යතොනිදානං යන මෙය භාවනපුංසකයෑ; **යම්** කරුණකින්, **යම්** කරුණක් ඇතිකල්හි යන අර්ථයි. **පපඤ්චසඤ්ඤාසඞ්ඛා** යන මෙහි **සඞ්ඛා**= කොඨාසයෝ; **පපඤ්චසඤ්ඤා**= තෘෂ්ණාදෘෂ්ටි ප්‍රපඤ්චයන් හා යෙදුනාවූ **සංඥාවෝ**; නොහොත් **සංඥානාමයෙන්** ප්‍රපඤ්චයෝ මෑ කියන ලද්දාහුය; එහෙයින් "ප්‍රපඤ්චකොඨාසයෝ" යි මේ මෙහි අර්ථයි. **සමුදාචරන්ති**= පවතිත්; **එත්ථ** වෙ **නත්ථි අභිනන්දිතබ්බං**= මා දශායතන සඞ්ඛ්‍යාත වූ යම් කරුණක් ඇති කල්හි ප්‍රපඤ්චසම්ප්‍රයුක්ත වූ සංඥා කොඨාසයෝ පවතිත් ද, මෙහි එක් ආයතනයකු දු (මමය මාගේ යයි) සතුටුවිය යුත්තෙක් (මමය මාගේ යයි) කියයුත්තෙක් ඇතුලත් ව ගත යුත්තෙක් නැත යන අර්ථයි. **එහි අභිනන්දිතබ්බං**= මම යෑ මාගේ යෑයි සතුටු විය යුත්තෙක්; **අභිවදිතබ්බං**= මම යෑ මාගේ යෑයි කියයුත්තෙක්; **අජ්ඣොසානබ්බං**= ඇතුලත්ව ගිල අවසන් කොට ගතයුත්තෙක්; මෙයින් මේ ආයතන විෂයෙහි තෘෂ්ණාදීන්ගේ මූල පැවැත්ම කියති; **එසෙවනත්ථෙනා**= මේ අභිනන්දනාදීන්ගේ නැතිබව ම රාගානුසයයන්ගේ අන්තය යෑ; සියලු තැන්හි මෙ ම නයයි. "**දණ්ඩාදාන**" යනාදියෙහි වනාහි යම් චෙතනාවකින් දඬු ගනී ද ඕ තොමෝ **දණ්ඩාදාන** නම්; යම් චෙතනාවකින් ශස්ත්‍රය ගනී ද පරාමර්ශී කෙරේ ද ඕ (චෙතනා තොමෝ) **සත්ථාදාන** නම්; මුදුන් පැමිණීයේ **කලහ** නම්; විවිධග්‍රාහයට පැමිණීයේ **භණ්ඩන** නම්; විවිධවාදයට පැමිණීයේ **විවාද** නම්; "තෝ තෝ" යයි මෙසේ (වචන) පැවැත්තේ **තුවං තුවං** නම්; ප්‍රියබව ශූන්‍ය කිරීම **පෙසුණඤ්ඤ** නම්; (යම් චෙතනාවකින්) අයථාසභාවය වූ මෘෂාවාදය කෙරේ ද (= බොරු කියා ද) ඕ තොමෝ **මුසාවාද** නමැයි දතයුතු. **එත්ථෙතෙ**= මේ වාදශායතනයන්හි මොවුහු; ඒ එසේ මැයි- කොලෙස් උපදනාහු ද දෙලොස් ආයතනයන් ඇසුරු කොට උපදිති, නිරුඬ වන්නාහු ද දෙලොස් ආයතනයන්හි ම නිරුඬ වෙති; මෙසේ යම් තැනෙක උපන්නාහු ද එහි'ම නිරුඬ වූවාහු වෙත්. ඒ මේ කාරණය **සමුදයසත්‍ය** ප්‍රකාශයෙන් දැක්විය යුත්තේය. a. **"සා බො පනෙසා තණ්හා කත්ථ උප්පජ්ජමානා උප්පජ්ජති? කත්ථ නිවිසමානා නිවිසති?"** යනු වදුරා b. **"යං ලොකෙ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති, කිඤ්ච ලොකෙ පියරූපං සාතරූපං? චක්ඛුං ලොකෙ පියරූපං සාතරූපං"** යනාදි නයින් දෙලොස් ආයතනයන්හි ම ඒ තෘෂ්ණාවගේ උත්පත්තිය ද නැසීම ද

---

a. උපදනා වූ ඕ මෝ ත්‍රිවිධතෘෂ්ණාව වනාහි කොතැන්හි උපදී ද? නැවත නැවත පැවතීම් වශයෙන් පිහිටා සිටින්නී කොතැන්හි පිහිටා සිටී ද?

b. ලොකයෙහි යම් කිසිවක් ප්‍රිය වූ සුභාව ඇත්තේ ද, මධුර වූ සුභාව ඇත්තේ ද, උපදනා වූ මෝ ත්‍රිවිධ තෘෂ්ණාව මේ ප්‍රිය වූ මධුර වූ සුභාවයෙහි උපදී, පැවතීම් වශයෙන් පිහිටා සිටින්නී මෙහි පිහිටා සිටී; ලෙව්හි එබඳු වූ ප්‍රිය සුභාවය මධුරසුභාවය කුමක් ද? ඇස ලෙව්හි ප්‍රියසුභාව ඇත්තේ මධුරසුභාව ඇත්තේ වේ.

කියනලද්දේය; තවද- යම් පරිද්දෙකින් තෘෂ්ණා තොමෝ වාදශායතනයන්හි ඉපිද නිවීණයට පැමිණ නිරුඬ වූවාහු ද ඵලි ආයතනයන්හි පැවැත්මක් නැති හෙයින් ආයතනයන්හි ම නිරුඬ වූවා යයි කියනලද්දීය; එපරිද්දෙන් මේ ලාමක අකුශල ධර්මයෝ ද ආයතනයන්හි නිරුඬ වෙත් යයි දතයුත්තාහුය. නොහොත් යම් මේ අභිනන්දනාදීන් ගේ අභාවය ම රාගානුසයාදීන්ගේ අනන්ත යැයි ලබනලද ව්‍යවහාර ඇති නිවීණයෙහි ලාමක අකුශල ධර්මයෝ අනවශෙෂ වූවාහු නිරුඬ වෙත්. සැබව- යමක් යම් තැනක නැද්ද, එය එතැන්හි නිරුඬ වූයේ නම් වේ. ඒ මේ කාරණය නිරොධ ප්‍රශනයෙන් දක්විය යුතු. මේ කියනලද මැයි- **"දුතියජ්ඣානං සමාපන්නස්ස විතක්කවිචාරා වචීසඞ්ඛාරා පටිප්පස්සඛා හොන්ති"** යනාදිය.

සඤ්ඤා චෙව සංවණ්ණිතා= ශාස්තෘන් වහන්සේ විසින් ද පසස්නා ලද්දේය; **විඤ්ඤූනං**= මෙ ද කරණාර්ථයෙහි සාමීවචනයැ, පණ්ඩිත වූ සබ්‍රහ්මචාරීන් විසින් ද සම්භාවනා කරනලද්දේය යන අර්ථයි. **පහොති**= හැකි වෙයි; **අතික්කමෙමෙව මූලං අතික්කමම්ම බන්ධං**= හරය නම් මූලෙහි හෝ කඳෙහි හෝ වන්නේ ද හෙ ද ඉක්මවා යන අර්ථයි. **එවං සම්පදමිදං**= (මේ වචනය) මෙසේ සම්පත් ඇති, මෙබඳු යැ යන අර්ථයි. **අනිසිට්ඨා**= ඉක්මවා; **ජානංජානාති**= දතයුත්ත ම දනී; **පස්සං පස්සති**= දක්කයුත්ත ම දකී; නොහොත් යම්සේ ඇතැම් කෙනෙක් විපරීත වැ ගන්නේ දන්නේ ත් නො දනී ද, දක්නේ ත් නො දකී ද; භාග්‍යවතුන් වහන්සේ එසේ නො වෙති; භාග්‍යවතුන් වහන්සේ වනාහි (අවිපරීත ව) දන්නාසේක් දනිති, දක්නාසේක් දකිත් මැයි. ඒ මේ (භාග්‍යවත්හු) දර්ශන (කෘත්‍යයෙහි) පරිනාශකාර්ථයෙන් චක්ඛුභූත යැ; විදිත කරණාර්ථයෙන් ඤාණභූත යැ; අවිපරීත සවභාවාර්ථයෙන් පඨමාපත්තිධර්මය පවත් වන හෙයින් හෝ සිතින් සිතා වචනයෙන් දෙශනාකළ ධර්මමය වූයේ නුයි ධම්මභූත යැ; ශ්‍රෙෂ්ඨාර්ථයෙන් බ්‍රහ්මභූත යැ; නොහොත් ඇසක් මෙන් වූයේ නුයි චක්ඛුභූත යැ; මේසේ ත් මේ පදයන්හි අරුත් දතයුතු. ඒ මේ (තථාගත සිව්සස්දහම්) දෙසන හෙයින් වත්තා යැ; පවත් වන හෙයින් පවත්තා යැ; අර්ථ ඵලව ඵලවා දුක්වීමෙහි සමර්ථ බැවින් අත්ථස්ස නිජ්ඣාපනා යැ; අමෘතාධිගමය පිණිස පිළිවෙත දෙන්නේ නුයි අමතස්සදාතා නම්. **අගරුංකත්වා**= නැවත නැවත යාඥ කරවන්නේ ම "ගරු කරන්නේ" නම් වෙයි; තමන් වහන්සේගේ ශ්‍රාවකපාරමී ඥානයෙහි සිට මහමෙර පතුලෙන් වැලි නඟන්නෙකු මෙන් නො දත හැකි කොට කියන්නේ ද ගරුකරන්නේ ම නම් වේ එසේ නො කොට අප නැවත නැවත යාඥ නො කරවා අපට සුවසේ දතහැකි ද කොට වදාළ මැනවැයි කියනලද්දේ වේ.

යං බ්‍රූ නෝ ආවුසෝ! යන මෙහි එතෙක් ඇති- "යං බ්‍රූ වෝ" කියයුතු වන්නේ නමුදු ඒ භික්ෂූන් ද තමන් සමග සඛ්‍රහ කරන්නාහු "යං බ්‍රූ නෝ" යි කිහ. නොහොත් යම්හෙයකින් ("යතෝ නිදානං" යනාදි) උදෙශය ද ඔවුනට උදෙසනලදද, භාග්‍යවත්හු වැලිත් තෙරුන් ව ද ඒ භික්ෂූන්ට ද භාග්‍යවත්හු ම වෙත් ද, එහෙයින් "භගවා" යන පදය සඳහා ද මෙසේ කිහ. අපගේ භාග්‍යවතුන් වහන්සේ තොපට සැකෙවින් යම් උදෙශයක් උදෙසා යන අර්ථයි. **චක්ඛුඤ්චාවුසෝ!** යනාදියෙහි මේ අර්ථ යැ- ඇවැත්නි! නිශ්‍රයභාවයෙන් චක්ෂුඃප්‍රසාදය ද ආරම්මණභාවයෙන් චතුසමුට්ඨානික රූපයන් ද නිසා චක්ෂුර්විඥානය නම් උපදී. **නිදානං සඛත්ති එකච්චෝ**= ඔවුන් තිදෙනාගේ එක්වීමෙන් සපර්‍ශය නම් උපදී, ඒ සපර්‍ශය නිසා සහජාතාදි වශයෙන් සපර්‍ශය ප්‍රත්‍යය කොට වෙදනාව උපදී, ඒ වෙදනාව පිළිබඳ වූ යම් අරමුණක් විඳී ද සංඥා තොමෝ ඒ අරමුණ ම හැඳිනගනී; සංඥාව යම් අරමුණක් හැඳින ගනී ද, චිතර්‍කය ඒ අරමුණ ම විතර්‍ක කෙරෙයි; විතර්‍කය යමක් විතර්‍ක කෙරේ ද, ප්‍රපඤ්චය තෙම් ඒ අරමුණම ප්‍රපඤ්ච කෙරෙයි; **තතෝ නිදානං**= මේ "චක්ඛුරූපා" දි කාරණයන්ගෙන්; **සුදිඝං පපඤ්චසඤ්ඤාසඤ්ඤාඛා සමුදාචරන්ති**= ඒ පරිඥානය නො කළ කාරණය ඇති පුරුෂයා ප්‍රපඤ්ච කොට්ඨාසයෝ මැඩපවත්වති, ඔහු පිළිබඳව පවතින් යන අර්ථයි. එහි සපර්‍ශ – වෙදනා - සංඥාවෝ චක්ෂුර්විඥානය හා සහජාත වූවාහු වෙති; චිතර්‍කය චක්ඛුවිඤ්ඤාණානන්තරාදි වූ සවිතර්‍කවිචාරයන්හි දනයුතු; ප්‍රපඤ්චකොට්ඨාසයෝ ජවනය හා සහජාත වූවාහු වෙති; ඉදින් එසේ නම් කුමක් හෙයින් අතීතානාගත ග්‍රහණය කරනලද ද යත්? එසේ උපදින හෙයිනි. සැබව— දැන් යම්සේ ම චක්ෂුර්වාරික වූ ප්‍රපඤ්චය ඇස ද රූපය ද සපර්‍ශ – වෙදනා – සංඥ – විතර්‍කයන් ද නිසා උපන්නේ ද, එපරිද්දෙන් අතීතානාගත වූ ද චක්ෂුර්විඥෙය වූ රූපයන්හි ඒ ප්‍රපඤ්චයා ගේ උතපත්තිය දක්වන්නේ මෙසේ කිහ. **සොතඤ්චාවුසෝ!** යනාදියෙහි දු මේ ම නයයි. සවනවාරයෙහි වනාහි **මනං**= භවාඞ්ග චිත්තය; **ධම්මෙ**= ත්‍රෛභූමක ධර්‍මාරම්මණය; **මනොවිඤ්ඤාණං**= ආවර්ජනය හෝ ජවනය හෝ; ආවර්ජනය ගත්කල්හි සපර්‍ශ – වෙදනා – සංඥ – විතර්‍කයෝ ආවර්ජනය හා සහජාත වූවාහු වෙති; ප්‍රපඤ්චය ජවනසහජාත වෙයි; ජවනය ගත්කල්හි ආවර්ජන සහිත වූ භවාඞ්ගය "මන" නම් වෙයි; නැවත සපර්‍ශාදි වූ සියල්ලෝ ම සහජාත වූවාහු ම වෙති; මනොවාරයෙහි වනාහි යම් හෙයකින් අතීතාදි භෙද වූ සියල්ල ම අරමුණු වේද, එහෙයින්- **අතීතානාගතපච්චුප්පන්නෙහි** යන මෙය සුදුසු මැයි.

මෙවිට වෘත්තය දක්වන්නාහු **සොවනා'වුසෝ** යි දෙශනාව ආරම්භ කළහ. **එසාපඤ්ඤත්තිං පඤ්ඤපෙස්සති**= සපර්‍ශ නම් එක් ධර්‍මයෙක් උපදනේය,යි මෙසේ සපර්‍ශ ප්‍රඥප්තිය පනවන්නේය දක්වන්නේය, යන අර්ථයි; සියලු තැන්හි මේ නයයි, මෙසේ මේය ඇතිකල්හි මෙය වේ යයි

දෙලොස් ආයතනයන්ගේ වශයෙන් සිය ලු වෘත්තය දක්වා මෙවිට දෙලොස් ආයතනයන්ගේ ප්‍රතික්ෂේප වශයෙන් විවෘත්තය දක්වන්නාහු **සෝ වතා'වුසෝ චක්ඛුස්මිං අසති** යි දෙශනාව ආරම්භ කළහ. එහි කී නියෙන් මේ අරුත් දතයුතු. මේසේ ප්‍රශ්නය විසඳ මෙවිට ශ්‍රාවකයකු විසින් ප්‍රශ්නය කියනලදුයි නිසැක වූවාහු නොවූ, මේ භාග්‍යවතුන් වහන්සේ සර්ව්ඥතාඥාන නමැති තුලාව ගෙන හුන්සේක; කැමති වන්නාහු ඒ භාග්‍යවතුන් කරා මැ එලඹ නිසැක වූවාහු වූ යයි යොදා වනුවෝ **ආසන්නඛ්ඛමානා ච පන** යනාදිය කීහ.

ඉමෙහි ආකාරෙහි= මේ කාරණයන්ගෙන් ප්‍රපඤ්චයන්ගේ ඉපදීමට වෙන මේ කාරණයන්ගෙන් හා වටවිවටට කාරණයන්ගෙන් ද; **ඉමෙහි පදෙහි**= මේ අක්ෂරසමූහයන්ගෙන්; **බ්‍යඤ්ජනෙහි**= වෙන මේ අක්ෂරයන්ගෙන්; **පණ්ඩිතෝ**= පණ්ඩිතභාවයෙන් සම්පන්නවූයේ; නොහොත් ධාතුකුසල යැ ආයතනකුසල යැ පච්චයාකාරකුසල යැ කාරණා කාරණකුසල යැ යන සතර කාරණයන්ගෙන් පණ්ඩිත වූයේ; **මහාපඤ්ඤෝ**= මහත් වූ අර්ථයන් මහත් වූ ධර්මයන් මහත් වූ නිරුක්තීන් මහත් වූ ප්‍රතිභානයන් අවබෝධ කිරීමෙහි සමර්ථ වූ මහා ප්‍රඥාවෙන් සම්පන්න වූයේ; **යථා නං මහාකච්චායනෝ**= යම්සේ මහාකාත්‍යායනයන් විසින් ප්‍රකාශ කරනලද ද; ඒ සඳහා පාලිය කියනලද ද; යම්සේ මහාකාත්‍යායනයන් විසින් එය ප්‍රකාශ කරනලද ද, මම ද එය එපරිද්දෙන් ම ප්‍රකාශ කරන්නෙමි යන අර්ථයි. **මධුපිණ්ඩිකං**= මහත්වූ ගුඩපූපයක්; බදනාලද අත් සුනුගුළියක් හෝ; **ආසෙවනකං**= සමව වැගිරියයුතු රසඇති, ගිතෙල් – පැණි – මී – සකුරු ආදීන් අතුරෙහි මේ නම් මේහි මද යැ, මේ බොහෝ යැයි නොකියයුතු වූ සමව යෙදූ රසඇති; **චේතසෝ**= (ධර්මචින්තාවෙන්) සිතනපියවි ඇති; **දබ්බජාතිකෝ**= පණ්ඩිතස්වභාව ඇති; **තෝ නාමෝ අයං**= මෙය (ආනන්ද) ස්ථවිරයන් වහන්සේ මේ ධර්මපරියාය ඉතා සොඳුරු යැ, දසබලයන්ගේ සර්ව්ඥතාඥානයෙන් ම මෙයට නාමය ගන්වන්නෙමි,යි සිතා කීහ **නාමා**= යම්හෙයකින් මධුපිණ්ඩිකයක් මෙන් මිහිරි ද, එහෙයින් "මධුපිණ්ඩිකපරියාය" යි ම එය ධරව,යි වදාරන්සේක. සෙස්ස සියලු තැන්හි ප්‍රකට වූ අර්ථ ඇත්තේ මැයි.

මධුපිණ්ඩික සූත්‍ර වර්ණනා නිමි.

වෙධාවිතක්ක සූත්‍ර වණ්ණනා.

එවමෙමසුතං යි වෙධාවිතක්ක සූත්‍ර යයි. එහි වෙධා කත්වා වෙධා කත්වා= කොටස් දෙකක් දෙකක් කොට; **කාමවිතක්කෙකා=** කාමප්‍රතිසංයුක්ත වූ විතර්කය; **බ්‍යාපාදවිතක්කෙකා=** ව්‍යාපාදප්‍රතිසංයුක්ත වූ විතර්කය; **විහිංසාවිතක්කෙකා=** විහිංසා ප්‍රතිසංයුක්ත වූ විතර්කය; **එකං භාගං=** අධ්‍යාත්ම වූ හෝ බාහිර වූ හෝ මහත් වූ හෝ සියුම් වූ හෝ මේ සියලු විතර්කය ම අකුශලපක්ෂයෙහි වූයේ ම යයි කාම - ව්‍යාපාද - විහිංසා විතර්කයන් නිදෙන ම එක් කොටසක් කෙළෙම්, කාමයන්ගෙන් නික්මුනා වූ නෛෂ්කාම්‍ය ප්‍රතිසංයුක්ත වූ විතර්කය **නෛෂ්කාම්‍යවිතර්ක** නම් වෙයි; ඒ විතර්කය ප්‍රථමධ්‍යානය තෙක් වටී, අව්‍යාපාද ප්‍රතිසංයුක්ත වූ විතර්කය **අව්‍යාපාදවිතර්ක** නම්; හේ මෛත්‍රී පූර්ව භාගය පටන් ප්‍රථමධ්‍යානය තෙක් වටී; අවිහිංසා ප්‍රතිසංයුක්ත වූ විතර්කය **අවිහිංසාවිතර්ක** නම්; හේ කරුණාපූර්වභාගය පටන් ප්‍රථමධ්‍යානය තෙක් වටනේය. **දුතියං භාගං=** මේ සියලු විතර්කය ම කුශලපක්ෂයෙහි වූයේ ම යයි දෙවෙනි කොටස කෙළෙම්; මෙයින් බෝසතුන්ගේ විතර්කනිග්‍රහය කරන කාලය වදාරනලදැ සැබව- සවසක් ප්‍රධන් වීර්‍යය කරන්නාවූ බෝසතුන්ට නෛෂ්කාම්‍ය විතර්කාදීහු පුබ්බ පුබ්බව මහානදියෙක්හි සැඩ පහර මෙන් පැවැත්තාහුය; එහෙත් සිහිමුළාවීමකින් වහා කාමවිතර්කාදිය ඉපිද කුසලවාරය සිඳ තුමූ අකුසලජවනවාරයෝ වී සිටිති, එකල බෝසත් (මෙසේ) සිතී- "මාගේ මේ කාමවිතර්කාදීහු කුසලවාරය පසිඳ සිටිති, මම මේ විතර්කයන් දෙකොටසක් කොට වාසය කෙරෙම්, කාමවිතර්කාදීහු අකුශලපක්ෂයෙහි වූවාහු නුයි එක් කොටසක් කෙරෙම්, නෛෂ්කාම්‍ය විතර්කාදීහු කුශලපක්ෂයෙහි වූවාහු නුයි, එක් (කොටසක් කෙරෙම්,) නැවත අකුශලපක්ෂයෙන් ආවා වූ විතර්කය මනාලයෙන් කෘෂ්ණසර්පයකු දැඩිව පෙළා ගන්නෙකු මෙන් ද සතුරකු ග්‍රීවයෙන් ආක්‍රමණය කරන්නෙකු මෙන් ද නිග්‍රහ කරන්නෙමි, ඔහට වැඩෙන්ට නො දෙන්නෙමි; කුශලපක්ෂයෙන් ආ විතර්කය වැසිකලැ මේඝයක් මෙන් ද, මනා කෙතක සල්කලණ පැලයක් මෙන් ද, වහ වහා වඩන් නෙමි" යි; හෙතෙම් එසේ කොට අකුශල විතර්කයන් නිග්‍රහ කෙළේය; කුශල විතර්කයන් වර්ධනය කෙළේය; මේසේ මෙයින් බෝසතුන්ගේ විතර්කනිග්‍රහය කරන කාලය වදාරනලදැයි දතයුතු.

විතර්කනිග්‍රහය.

මෙවිට යම්සේ ඔහට ඒ විතර්කයෝ උපන්නාහු ද යම්සේ ත් ඔවුන් නිග්‍රහ කෙළේ ද, **එය දක්වනසේක්- නාගස්ස මයහං භික්ඛවෙ!** යනාදිය වදාළහ. එහි **අජ්ඣත්තසන්තස්ස=** සමෘති අවිප්‍රවාසයෙහි සිටියා වූ; **ආතාපිනෝ=** භාවනාපසින් (කෙලෙස්) තවන වීර්‍ය්‍ය ඇත්තා වූ; **පහීනත්තස්ස=**

(නිවනට) යවනලද සිත් ඇත්තාවූ; **උපපජ්ජන්ති කාමවිතක්කෙකා=** සාවු රුද්දක් ප්‍රධන්වියත්‍රීය කරන්නාවූ බෝසත්හට රජසුවය හෝ ප්‍රාසාදයන් හෝ නළුවන් හෝ අන්තඃපුරවාසීන් හෝ කිසියම් සැප

මහසත්හුගේ විතක්කොත්පාදය.

තක් හෝ අරහයා කාමවිතර්කයෙක් නම් නූපන් විරුදැ; එතකුදු වුවත් දුෂ්කර ක්‍රියාවෙහි ආහාර සිදීමෙන් අධිමාත්‍ර වූ කෘෂභාවයට පැමිණි ඕහට මේ සිත විය, "ආහාර සිදීමෙන් විශෙෂයක් උපදවන්ට නො හැක, මම ඖදරික වූ ආහාරය ගන්නෙම් නම් ඉතා යෙහෙකැ"යි හෙතෙම උරුවෙල් දනව්වට පිඬු පිණිස පිවිසියේය; මනුෂ්‍යයෝ "පෙර මහපුරිස් තෙම සමීපයට ගෙනවුත් දෙනලද්ද නො ගත්තේය, දැන් ඒකාන්තයෙන් ඔහුගේ මන දෙළ මුදුන් පැමිණියේ වන, එහෙයින් තෙමේ මැ ආයේ වනැ" යි පිණි පිණි ආහාර ඵලවූහු; බෝසත්හුගේ අත්බැව නො බෝකලකින් ම ප්‍රකෘති විය; යම්හෙයකින් ජරාවෙන් දිරූ ආත්මභාවය සැප වූ හොජනය ලැබ ද ප්‍රකෘති නො වේ ද, බෝසත් වැලිත් තරුණ වූයේ ද, එහෙයින් සැප වූ බොදුන් බුදින්නා වූ ඔහුගේ ආත්මභාවය නො බෝකලකින් ම ප්‍රකෘති වූයේය; ඉන්ද්‍රියයෝ වෙසෙසින් පැහැදුන්හුය, සිවි පැහැය පිරිසුදු විය, පහළ වූ තරුණාල ඇති අහස මෙන් පිරිපුන් දෙතිස් මහ පුරිස්ලකුණෙන් හෙබියා වූ සිරුර වී. හෙතෙම ඒ සිරුර බලා "ඒතාක් කලාණත්ත වූ ආත්ම භාවය ද මෙසේ පෙරලා ප්‍රකෘති වූයේ වනැ" යි සිතා තමන්ගේ ප්‍රඥාමහත්ත්වය හෙතුකොට ගෙන මෙසේ මද වූ ද විතර්කය ගෙන කාමවිතර්කය යි (මෙනෙහි) කෙළේය; පන්සල අහිඛුඛයෙහි හුන්නා වූ හෝ රුරු - පසද - ගවය - රොහිතමෘගාදි වූ මෘගසමූහයන් ද සිත්කලු වූ පියාපත් හා නාද ඇති මොනර - වලිකුළු ආදි වූ පක්ෂිසමූහයන් ද නීලුපුල් - කුමුදු - පියුම් ආදියෙන් ගැවසීගත් කුඩාවිල් ද නන්වැදුරුම් මලින් ගැවසීගත් පදුරුඇති වනලැහැබ් ද මිණිකඳමෙන් පිරිසුදු ජලවහනයවන නෙරඤ්ජරානදිය ද (යම් විටක) දකී ද, (එකල්හි) ඔහුට මෙසේ සිතක් වෙයි- "මේ මෘගසමූහයෝ ද පක්ෂිසමූහයෝ කුඩාවිල් වනලැහැබ් නෙරඤ්ජරානදිය එකාන්තයෙන් හොඳතාහුය" යි. හෙතෙම මෙසේ මද වූ ද ඒ විතර්කය ගෙන කාමවිතර්කයක් කෙළේය. එහීන් වදාළහ- **උපපජ්ජන්ති කාමවිතක්කෙකා** යි. **අත්තබ්‍යාබාධාපි=** තමහට දුක් පිණිස ද; සියලු තැන්හි මේ නයයි. නිම වැලිත් මහසත්හට උභයදුඃඛය පිණිස පවත්නා වූ විතර්කයෙක් නම් ඇත් ද සත්? නැති. එතකුදු වුවත් ප්‍රහාණය නො කොට සිටියහුගේ විතර්කය යම් තාක් උභයදුඃඛය පිණිස පවතී නුයි මේ නම් තුන ලබයි; එහෙයින් මෙසේ වදාළහ. **පඤ්ඤානිරොධිකෙකා=** නූපන් ලෞකික ලොකොත්තර ප්‍රඥාවට උපදින්ට නො දෙයි; ලෞකික ප්‍රඥාව වූ කලි අෂ්ටසමාපත්ති පඤ්චාභිඥා වශයෙන් උපන්නාහු ද ඕද දමා නුයි "පඤ්ඤා නිරොධික" නම් වෙයි; **විඝාතපක්ඛිකෙකා=** දුක්කොටසෙහි වූයේ; අසංඝටිත වූ නිර්වාණාමෘතය ප්‍රත්‍යක්ෂකරන්ට නො දේ නුයි **අනිබ්බානසංවත්තනිකා**

නම් වෙයි; **අඛයං ගච්ඡති**= ක්ෂය වීමට නැතිබවට යෙයි; දියබුබුලක් මෙන් නිරුඩ වෙයි; **පජහාමෙව**= දුරු කෙළෙමි මය; **විනොදෙමෙව**= බැහැර කෙළෙමි මය; **ව්‍යන්තෙනව නං අකාසිං**= එය විගතානත්ත වූවක් නිරවශෙෂ වූවක් හාත්පසින් පරිවර්ජන වූවක් පිරිසිදු නලදුක් ම කෙළෙමි; **බ්‍යාපාදවිතක්කෙකා**= පරුපඝාත ප්‍රතිසංයුක්ත (= අනුන් පෙළීම පිළිබඳ) වූ විතර්කයෙක් නම් බෝසත්හුගේ සිත්හි නූපදී; එහෙත් එකල අධික වර්ෂාව අධික උෂ්ණය අධික ශීතය ආදිය නිසා ඔහුගේ සිත්හි විපරිණාමභාවය වෙයි, ඒ සඳහා "බ්‍යාපාදවිතක්කෙකා" යි **කිඤ්චි විහිංසා විතක්කෙකා**= මහසත්ත්වයාට මෙරමා දුක් ඉපදවීම පිළිබඳ වූ විතර්කයෙක් නම් නූපදී; එහෙත් සිත්හි උඩහු ආකාරය එකඟ නොවූ ආකාරය වෙයි, එය ගෙන 'විහිංසාවිතර්කය" කෙළේය; පන්සල්දෙර හුන්නේ ම සිංහව්‍යාඝ්‍රාදි වූ ව්‍යාලමෘගයන් ශූකරාදි වූ ක්ෂුද්‍රමෘගයන් **නසන්නවුන් දකී, එකල්හි බෝසත් කොසිහුන් නො බිය වූ මේ වනයෙහි ද මේ තිරිසන්ගතයන්ට පසම්බුරෝ උපදිති, බලවත්හු දුර්ලයන් කති, දුර්ලයන් කන්නාහු වෙකියි කාරුණ්‍යය උපදවයි, අන්‍ය වූ බළල් ආදීන් ද කුකුළු ම් ආදීන් කන්නවුන් දකී, ගමට පිඬු පිණිස පිවිසියේ රාජකාර්‍යකයන් විසින් උපද්‍රුත වූ මිනිසුන් වධබන්ධනාදිය අනුභව කරන්නවුන් (දකී, එකල) තමාගේ ගොවිතැන් වෙළඳුම් ආදි වූ කර්මාන්තයන් කොට ජීවත් වන්ට නො ලබති,යි කාරුණ්‍යය උපදවයි; ඒ සඳහා උපසජ්ජතිවිහිංසා විතක්කෙකා** යි වදළහ. **තථා තථා**= ඒ ඒ ආකාරයෙන්; මේ කියනලද වෙයි, කාමවිතර්කාදීන් අතුරෙන් යමක් යමක් විතර්ක කෙරේ ද, යම් යම් විතර්කයක් පවත්වා ද, ඒ ආකාර වූ ම කාමවිතර්කාදිභාවයෙන් ඔහුගේ චිත්තයාගේ නැම්ම වෙයි; **පහාසි නෙක්ඛම්මවිතක්කං**= නෛෂ්කාම්‍ය විතර්කය දුරුකෙරෙයි; **බහුලමකාසි**= බහුල කෙරෙයි; **තස්ස තං කාම විතක්කාභාව චිත්තං**= ඔහුගේ ඒ සිත කාමවිතර්කය පිණිස; **යම්සේ කාම විතර්කසම්ප්‍රයුක්ත වූයේ ද, එපරිද්දෙන් නැමෙයි යන අර්ථයි. සෙසු පද** යන්හිදු මෙ ම නයයි.

මෙවිට අප්‍රකාශ වූ උපමාවක් දක්වනසේක්- **සෙය්‍යථාපි** යනාදිය් වදළහ. එහි **කිඤ්ඤික්ඛෙ**= සස්‍යයෙන් සම්බාධ ඇතිකල්හි; **ආකොටෙය්‍ය**= සෘජු කොට පිටෙහි පහර දෙන්නේය; **පති** ඝාතපාලකෝපමාව. **කොටෙය්‍ය**= සරස ඉලඇටයන්හි පහර දෙන්නේය; **සන්නිරුම්භෙය්‍ය**= ආවරණය කොට සිටින්නේය; **සන්නිවාරෙය්‍ය**= ඔහොබ දී යන්ට නො දෙන්නේය; **තතොනිදානං**= ඒ කරුණෙන්; මෙසේ නො රක්නාලද ගවයන් විසින් අනුන්ගේ සස්‍ය ඛාදනකරුණෙන යන අර්ථයි. ඒ එසේ මැයි- බාල වූ ගොපලුතෙම මෙසේ ගෙරින් නො රක්නේ "මේ තෙම අපගේ බත් වැටුප් කයි, සෘජුව ගෙරින් රක්නට ද නො හැකි වෙයි, කුලයන් සමඟ වෛරය ගන්වා" යයි ගවහිමියන් සමීපයෙන් ද සස්‍යහිමියන් සමීපයෙන් ද වධයන්ට

පැමිණෙයි; වැලි පණ්ඩිත වූ හොපලුතෙම මේ සතර භය දක්නේ ගෙරින් මතා කොට රකී; ඒ සඳහා මේ කියනලද්දේයි. **ආදීනවං**= උපද්‍රවය; **ඔකාරං**= ලාමකබව, නොහොත් සකඤ්ඤයන්හි පිවිසීම; **සඞ්කිලෙසං**= කිලිටුබව; **නෙක්ඛම්මෙ**= නෛෂ්කාම්‍යයෙහි; **ආනිසංසං**= විශුද්ධිපක්ෂය; "**වොදානපක්ඛං**" යනු මෙයට ම වෙ වචනයි; කුශලධර්මයන් සම්බන්ධව නෛෂ්කාම්‍යයෙහි විශුද්ධිපක්ෂය දුටුයෙම් යන අර්ථයි. තවද- **නෙක්ඛම්මං** යනු කාමයන්ගෙන් වෙන් වූ සියලු කුශලයෑ; එක් ධර්මයක් ගනුලබන කල්හි නිර්‍වාණය මැයි.

එහි මේ ඖපම්‍යසංසන්දනය (දතයුතු.) මේ විස්තර යෑ- **සස්‍යසම්බාධය** මෙන් රූපාදි අරමුණ ද, කුළුහවයා මෙන් කුළුසිත ද, පණ්ඩිත හොපල්ලා මෙන් බෝසත් ද, චතුර්විධහය මෙන් සව - පර - උභයදුඃඛය පිණිස පවත්නා වූ විතර්කයෝ ද, පණ්ඩිත ගවපාලයාගේ චතුර්විධභය දූක **සස්‍යසම්බාධයෙහි අප්‍රමාදයෙන් ගෙරින් රැකීම මෙන්** සාවුරුද්දක් ප්‍රධන් වීර්‍යය කරන්නා වූ බෝසත්හුගේ ආත්මපීඩාදි භය දූක රූපාදි අරමුණු වල යම්සේ කාමවිතර්කාදිහු නූපදින් ද, එපරිද්දෙන් සිත රැකීම ද (දතයුතු.) **පඤ්ඤාවුඩ්ඪතා** යනාදියෙහි නූපන් ලෞකික ලෝකොත්තර ප්‍රඥාවගේ ඉපදීම පිණිස ද උපන් (ප්‍රඥාවගේ) වැඩීම පිණිස ද පවතී නුයි **පඤ්ඤාවුඩ්ඪතා** යි වෙයි; දුක්කොටස පිණිස නො පවතී නුයි **අවිඝාත පක්ඛිතතා** යි වෙයි; නිර්‍වාණධාතුව ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතී නුයි **නිබ්බාන සංවත්තනිකතා** යි වේ. **රත්තිං වෝපි නං භික්ඛවෙ! අනුවිතක්කෙය්‍යං**= ඉදින් සියලු රාත්‍රිය ම ඒ විතර්කය පවත්වන්නෙම් ද; **තතෝ නිදානං**= එය මුල් (= නිමිති) කොට; **ඌභයං අඤ්ඤාය**= ගැටෙන්නේය, ඖඛත්‍යය පිණිස පවත්නේය යන අර්ථයි. **ආරා**= දුරෙහි; **සමාධිම්හා**= උපචාරසමාධියෙන් ද අර්පණසමාධියෙන් ද; **සෙ බො අහං භික්ඛවෙ! අජ්ඣත්තමෙව චිත්තං**= මහණෙනි! ඒ මම මාගේ සිත සමාධියෙන් දුරු නො වේවා, යි අධ්‍යාත්මයෙහි ම සිත පිහිටුවමි, ගොචරාධ්‍යාත්මයෙහි තබමි යන අර්ථයි. **සන්නිසාදෙමි**= එහි ම ඒ (සිත) හිඳුවමි; **ඒකොදිං කරොමි**= එකඟ කරමි; **සමාදහාමි**= මනාකොට පිහිටුවමි, මොනොවට (අරමුණෙහි) ආරොපණය කරමි යන අර්ථයි. **මා මෙ චිත්තං ඌභයං අඤ්ඤාසි**= මාගේ සිත නො ගැටේවා, ඖඛත්‍යය පිණිස නො පවතීවා යන අර්ථයි.

උප්පජ්ජති අබ්‍යාපාදවිතක්කො අවිහිංසාවිතක්කො යන මෙහි මේ යට කියනලද තරුණ විදර්‍ශනාව සමග උපන් යම් ඒ විතර්කයෙක් කාමයන්ට ප්‍රත්‍යනීක (= විරුද්ධ) අර්ථයෙන් "නෙක්ඛම්ම විතක්ක" යයි කියනලද ද, ඒ විතර්කය ම ව්‍යාපාදයට ප්‍රත්‍යනීකාර්ථයෙන් අබ්‍යාපාදවිතර්ක" යි ද, විහිංසාවට ප්‍රත්‍යනීකාර්ථයෙන් "අවිහිංසාවිතර්ක" යි ද කියනලදී;

බෝසත්හුගේ විදර්‍ශනාරම්භය.

මෙතෙකින් බෝසතුන්ගේ සමාපත්තිය නිසා විදර්‍ශනා පිහිටුවන කාලය කියනලදි. ඒ එසේ මැයි— ඒ බෝසත්හුගේ සමාධිය ද විදර්‍ශනාව ද තරුණයෑ, විදසුන් පිහිටුවා ඉතා බොහෝකලක් හුන්නා වූ ඔහුගේ කය

කලාතත වෙයි, ඇතුලත ගින්නක් මෙන් වැටහෙයි, දෙකැසින් සෝදිය වැහෙයි, මුදුනෙන් ගිනිවැටියක් මෙන් වැවහෙයි; සිත ගැටෙයි, වෙසෙසින් ගැවෙයි, සැලෙයි, උඩත වේ. යලි හෙතෙම සමවතට සමවැද ඒ සිත දමනය කොට මෘදු වූවක් කොට අස්වසා නැවත විදශීනාව පිහිටුවයි; නැවත ඉතා බොහෝ වේලාවක් හුන්නාවූ ද ඕහට එසේ ම වෙයි; හෙතෙම නැවත සමවතට සමවැද එසේ ම කරයි; ඒ එසේ මැයි- විදශීනාවට සමාපත්‍ති තොමෝ බොහෝ උපකාර ඇත්තිය; යම්සේ යොධයාට පුවරුකොටුව නම් බොහෝ උපකාර වේද, හෙතෙම එය ඇසුරු කොට සඞ්ග්‍රාමයට පිවිසේ ද, එහි ඇතුන් ද අසුන් ද යොධයන් ද සමග කමී කොට ආයුධයන් හෝ ක්‍ෂය වූ කල්හි වලඳනු කැමතිබැව් ආදියක් හෝ ඇතිකල්හි නැවති පුවරුකොටුවට පිවිස ආයුධ ත් ගනී ද, විඳා හරින්නේ ත් වලඳන්නේ ත් පැන් බොන්නේ ත් වේද, සන්නාහය ත් පෙරළා බඳී ද, ඒ ඒ (දෙය) කොට නැවත සඞ්ග්‍රාමයට පිවිසේ ද, එහි කමී කොට යලිත් උවටාරුදියෙන් පිඬිත වූයේ හෝ කිසි යම් කටයුත්තකින් හෝ පුවරුකොටුවට පිවිසේද; උපසථමහ කොට නැවත සඞ්ග්‍රාමයට පිවිසේ ද; මෙසේ යොධයාහට පුවරුකොටුව මෙන් විදශීනාවට සමාපත්‍තිය බොහෝ උපකාර ඇත්තිය. සමාපත්‍තියට වනාහි සඞ්ග්‍රාමයට බසින්නාවූ යොධයාට පුවරුකොටුවට ද වඩා විදශීනාව අතිශයින් බොහෝ උපකාර ඇත්තිය; සැබව අනිකකුදු ඇති- සමාපත්‍තිය නිසා විදශීනාව පවතී; එහෙත් විදශීනා තොමෝ සථිර වූවා සමාපත්‍තිය ද රකී, සථිර වූවක් කරයි; ඒ සැබව- යම්සේ ගොඛ්බිමෑ නැව ද නැවෙහි බඳු ද ගැල්බර කෙරෙත් ද, ජලයට පැමිණ වූ කලි ගැල ද ගැලෙහි බඳු ද යෙදූ ගොණුන් ද නැව්බර කෙරෙත් ද, නැව සරස සැඬපහර සිඳ සුවසේ සොඳුරු පටුනට යේ ද; එපරිද්දෙන් සමාපත්‍තිය නිසා විදශීනාව පවතී නමුදු විදශීනා තොමෝ වැලිත් සථිර වූවා සමාපත්‍තිය ද රකී, සථිර වූවක් කෙරෙයි; ඒ එසේ මැයි- සමාපත්‍තිය ගොඛ්බිමට පැමිණ ගැල මෙනි; විදශීනා තොමෝ ජලයට පැමිණ නැව මෙති. මෙසේ මෙතෙකින් බෝසතුන්ගේ සමාපත්‍තිය නිසා විදශීනා පිහිටුවන කාලය වදාරනලදුයි දතයුතු.

ඔසැඳැදෙව යනාදිය කෘෂ්ණපක්‍ෂයෙහි කී අනුසාරයෙන් ම දත යුතුයි, මෙහි දු අවිප්‍රකාශක වූ උපමාවක් දක්වනු පිණිස සෙය්‍යථාපි යනාදිය වදාළහ. එහි ගාමනන්තසමහනෙසු= ග්‍රාමාන්තයට ගෙන ආකල්හි; සන්තිකරණීයමෙව හොති= තෙල හෙරිහු යයි සිහි ඉපිදවීම පමණක් ම කටයුතු වෙයි, ඔබ්නොබ ගොස් සෘජු කොට පහරදීම් ආදි කටයුත්තෙක් නැති. එතෙ ධම්මා= මොවුහු ශමථවිදශීනා ධර්‍මයෝ යයි සිහි ඉපදවීම් මාත්‍රයක් ම කටයුතු වෙයි; මෙසින් බෝසතුන්ගේ ශමථ විදශීනාවන් සථිර වූ කාලය වදාරනලදී, එකල්හි සමාපත්‍තිය පිහිටුවීම පිණිස හුන්නා වූ ඒ බෝසතුන්ට අෂ්ටසමාපත්‍තීහු එක් ආවජ්ජනයකින් ආපාථයට පැමිණෙත් ල, විදසුන් පිහිටුවා හුන්නේ සපත අනුපස්ස

වන්ට එක් පහරින් ආරුළ වූයේ වේ ල. **සෙය්‍යථා'පි** යි මෙහි කුමට දක්වත් ද යත්? මෝ වෙන ම අනුසන්ධියකි. ඒ එසේ මැයි- සත්‍යයන්ට හිතයෙහි හැසිරීම ද තමන් වහන්සේගේ ශාසනාභාව සම්පත්තිය ද දක් වන්නා වූ භාග්‍යවතුන් වහන්සේ මේ දෙශනාව ආරම්භ කළහ. එහි **අරඤ්ඤං**= වනයෙහි; **පවනෙ**= වනලැහැබෙක්හි; ඒ එසේ මැයි- අර්ථ වශයෙන් මේ පදවය එකෙක් මැයි; පළමුවැන්නට දෙවැන්න වෙවචනයි. **අයොගයුත්තෙ මමත්තා මෝ**= සතර යොගයන්ගෙන් යෙදුම් වූ නිර්භයස්ථානය නො කැමති වන්නේ හය ම කැමති වන්නේ; **සොවජ්ජිකෙ**= සවැසිහාවය ඵලවන්නා වූ; **පිතිගමනීයෙ**= සතුටුසේ යාහැකි වූ; "පිතගමනීයෙ" යි ද හෝ පාඨයි. **පිදහෙය්‍ය**= අතු ආදියෙන් වසන්නේය; **විවරෙය්‍ය**= ප්‍රකට වූ මුඛය ඇති කොට විවෘත කරන්නේය; **කුම්මග්ගං**= උදක - වන - පර්වතාදියෙන් අවුරනලද නො මඟ; **ඔදහෙය්‍ය ඔකවරං**= ඔවුන් ගේ ගෘහයෙහි හැසිරෙන්නෙකු මෙන් එක් දීපකමෘගයෙක් (=දඩමුවෙක්) එක් තැනෙක තබන්නේය; **ඔකවාසිකං**= දිගරුහනකින් බඳනාලද ඔහුගේ ම මුවදෙන; ඒ එසේ මැයි- වැදිතෙම වනයෙහි මුවන් වසන තැනට ගොස් මෙහි වෙසෙති, මේ මඟින් නික්මෙති, මෙහි හැසිරෙති, මෙහි පානය කෙරෙති, මේ මඟින් පිවිසෙති,යි සලකා මහ වසා නො මහ විවෘත කොට දඩමුවා ද දඩමුවදෙන ද තබා තෙමේ වැසුණු තැනක සැත ගෙන සිටී; ඊට පසු සවස්කාලයෙහි මෘගයෝ කොයිනුත් නො බියවූ වනයෙහි හැසිර පැන් බී මුවපැටවුන් සමඟ කෙළිමින් වාසස්ථානය සම්පයට අවුත් දඩමුවා ද දඩමුවදෙන ද දැක අපගේ යහලුවෝ ආවෝ වන්නාහු ය,යි නිසැක ව පිවිසෙති; ඔවුහු වසනලද මහ දැක මේ මඟ නො වෙයි, මේ මඟ වන්නේ ය,යි කුමාර්ගයට පිළිපදිත්. වැදිතෙම ඒ තාක් කිසිවක් නො කෙරෙයි, යළි පිවිසිකල්හි සියල්ලන්ට පසුව වූවහුට සෙමින් ගසයි; හෙතෙම තැනිගනී, නැවත සියල්ලෝ තැනිගෙන භයෙක් උපනැයි අනිවූඛයෙහි බලන්නාහු ජලයෙන් හෝ වනයෙන් හෝ පර්වතයෙන් හෝ අවුරනලද මහ දැක දෙපසින් ඇඟිලිහැකිල්ලක් මෙන් ගහන වූ වනයට පිවිසෙන්ට නො හැකි වන්නාහු පිවිසි මඟින් ම නික්මෙන්ට පවන්ගනිත්. වැදිතෙම ඔවුන් නැවතිබැව් දැන ආදියෙහි පවන් මුවන් නිසක් හෝ සතලිසක් හෝ නසයි. මේ සඳහා **එවං හි සො භික්ඛවෙ!** **මහාමිගසඞ්ඝා අපරෙන සමයෙන අනයව්‍යසනං පාපුණන්ති ආපජ්ජන්ති** යනු වදාරනලදී.

නන්දිරාගසොතං අධිවචනං **අවිජ්ජාසොතං** අධිවචනං යන මෙහි යම්හෙයකින් මේ **සත්ත්වයෝ** අවිද්‍යාවෙන් අඥානයෝ වෑ නන්දිරාගයෙන් හාත්පසින් බැඳි රූපාලම්බනාදියට ඵලවනලද්දාහු සසරදුක් නමැති සැත් පහර ලබත් ද, එහෙයින් භාග්‍යවතුන් වහන්සේ දඩමුවා නන්දිරාගයයි ද දඩමුවදෙන අවිද්‍යාවයයි ද කොට දැක්වූහ. ඒ එසේ මැයි- මුවවැදිතෙම එක් දිනෙක ඒ දඩමුවන්ගේ සිරුර අතුඇඹකින් පිසදමා මිනිස්ගඳ ඉවත්

කොට දඩමුවා එක් තැනක තබා දඩමුවදෙන රැහැනත් සමග හැර තමා සැහවී සැතක් ගෙන දඩමුවා සමීපයෙහි සිටී, දඩමුවදෙන මුවසමූහයා හැසිරෙන තැනට අභිමුඛ ව යයි; ඇ දැක මුවෝ හිස් ඔසවා සිටිති, ඕ ද හිස ඔසවා සිටී, ඔවුහු මෝ අපට සම්භාවනීය ඇත්තියකැයි ගොදුරු ගනිති, ඕ ද තණ කන්නියක මෙන් සෙමින් සමීපයට යයි, වනයෙහි වූ සමූහයට ප්‍රධාන මුවතෙම ඇගේ වාතය ලැබ සිය පිරිස හැර ඇට අභිමුඛ වෙයි; ඒ එසේ මැයි- සත්ත්වයන්ට අලුත් අලුත් වූවහු ම ප්‍රිය වේ. දඩමුවදෙන වනමුවාට ඉතා ආසන්නබව නො දී ඔහුට අභිමුඛ වූවා ම පිටිපසින් පෙරලා අවුත් දඩමුවා සමීපයට යයි, යම් යම් තැනක ඇගේ රැහැන ලැගේද, ඒ ඒ තැන කුරයෙන් ගසා මුදයි, වනමුව තෙම දඩමුවා දැක දඩමුවදෙන කෙරෙහි අතිශයින් මත් වැ දඩමුවා කෙරෙහි ඊර්ෂ්‍යා කොට පිට නමා හිස සලමින් සිටී, එ තෙණෙහි සැතක් දිවින් ලෝනේ නමුදු මේ කිමෙක් දෑ? යි නො දනී; දඩමුව තෙමේ ද ඉදින් ඔහුගේ මතුභාගයෙන් ඒ මුවාට පහරදෙන්ට පහසු වේ නම් පිට නමයි, ඉදින් ඔහුගේ යටභාගයෙන් පහරදෙන්ට පහසු වේ නම් ළය උඩට නමයි; එකල්හි වැදිතෙම වනමුවා මුවසැතින් පැහැර එහි ම හෙලා මස් ගෙන යෙයි.

එපරිද්දෙන් ම යම්සේ ඒ මුවතෙම දඩමුවදෙන කෙරෙහි අතිශයින් මත් වූයේ දඩමුවා කෙරෙහි ඊර්ෂ්‍යා කොට සැතක් දිවින් ලෝනේ නමුදු කිසිවක් නො දනිද, එපරිද්දෙන් මේ සත්වයෝ අවිද්‍යාවෙන් අතිශයින් මත් වූවාහු අන්ධ වූවාහු කිසිවක් නො දන්නාහු රූපාදීන්හි නන්දිරාගයට පැමිණ සසරදුක් නමැති සැතින් භය ලබත් යයි භාග්‍යවතුන් වහන්සේ දඩමුවා නන්දිරාගය,යි දඩමුවදෙන අවිද්‍යාව යයි ද කොට දැක්වූසේක.

ඉති බො භික්ඛවෙ! චිරතො මයා ඛෙමො මග්ගො= මහණෙනි! මෙසේ වනාහී මේ සත්වයන්ගේ හිතයෙහි හැසිරෙන මා විසින් සම්‍යක් සම්බොධියට පැමිණ "මම බුදු වූයෙමි" යි තූෂ්ණීම්භූත ව නො හිඳ දම්සක් පැවැත්වී මෙහි පටන් දහම් දෙසන්නහු විසින් අඤ්ඤකොණ්ඩඤ්ඤාදි වූ භව්‍යපුද්ගලයන්ට නිර්‍වාණ වූ ආර්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය විවෘත කරනලද්දේය. කුමාර්ගය වසනලද්දේය; **ඵුෂනතො ඔඝවරෝ=** නන්දිරාගය දෙපලුකොට සිඳ හෙලනලද්දේය; **නාසිනා ඔඝවාරිකා=** අවිද්‍යාව සියල්ලෙන් සියල්ල සමූලයෙන් නසනලද්දීය,යි තමන් වහන්සේගේ හිතයෙහි හැසිරීම් දැක් වූසේක. සෙස්ස සියලු තැන්හි ප්‍රකට වූ අර්ථ ඇත්තේ මැයි.

මෙඛාචිතකඤ සුත්‍ර වර්ණනා නිමි.

———:o:———

විතක්කසණ්ඨාන සූත්‍ර වර්ණනා.

එවමෙමසුතං යි විතක්කසණ්ඨාන සූත්‍ර යයි. **එහි අධිචිත්තමනුයුත්තෙනා**= දශකුශල කර්මපථ වශයෙන් උපන් සිත චිත්තය මැයි; විදර්ශනාපාදක වූ අෂ්ටසමාපත්ති චිත්තය ඒ සිතට වඩා අධික වූ චිත්තය නුයි "අධිචිත්ත" නම්; **අනුයුත්තෙනා**= ඒ අධිචිත්තයෙහි යෙදුනහු විසින්, **එහි** යුක්තප්‍රයුක්ත වූවහු විසින් යන අර්ථයි; **එහි** මේ මහණ පෙරබත පිඬු පිණිස හැසිර පසුබත පිණ්ඩපාතයෙන් වැළකුනේ නිසීදනය ගෙන අසවල් රුක්මූලැ හෝ වනලැහැබෙහි හෝ පව්ත්පාදයෙහි හෝ ප්‍රාබ්භාරයෙහි හෝ මහණදම් කරන්නෙමි,යි නික්මෙන්නේ ද **එහි** ගොස් අතින් හෝ පයින් හෝ හිඳිනා තැනින් තණපරණලා ඉවත් කරන්නේ ද අධිචිත්ත යෙහි යෙදුනේ ම වෙයි, වැලිත් හිඳ අත්පා සෝදා පලඟ බැඳ මූලකර්මස්ථානය ගෙන වාසය කරන්නේ අධිචිත්තයෙහි යෙදුනේ ම වේ. අධිචිත්තයෙහි යෙදීම.

නිමිත්තානි= කාරණයෝ; **කාලේන කාලං**= කලින් කල; එකෙක් ඇතිකර්මස්ථානය නම් මොහොතකුදු නොහැර නිරතුරු මෙනෙහි කළයුතු නොවේ ද? කුමක් හෙයින් භාග්‍යවතුන් වහන්සේ "කාලේන කාලං" යි වදාළ සේක් ද යත්? සැබව පාලියෙහි අවතිස් කර්මස්ථානයෝ බෙදන ලද්දාහුය, ඔවුනතුරෙන් තමාගේ සිතට රුචි වූ කමටහනක් ගෙන හුන් නාවූ මහණ විසින් යම්තාක් කිසි යම් උපක්ලේශයෙක් නූපදී ද, ඒතාක් මේ නිමිත්තයන්ගේ මනසිකාර කෘත්‍යයක් නැති; වැලිත් යම් විටෙක උපදී ද, එකල මේ නිමිති ගෙන සිතැ උපන් අර්බුදය බැහැර කවයුතු යයි දක්වන සේක් මෙසේ වදාළහ.

ඡන්දූපසංහිතා= ඡන්දසහගත වූ රාගය හා සම්ප්‍රයුක්ත වූ; තවද— මේ තුන් විතර්කයන්ගේ කෙත (උත්පත්තිස්ථානය) ද අරමුණ ද දත යුතුයි. එහි ඡන්දසහගත වූ විතර්කයන්ට ලොභසහගත චිත්තයෝ අටදෙන ක්ෂේත්‍ර යැ; වෛෂසහගත විතර්කයන්ට දෞර්මනස්සහගත චිත්තයෝ දෙදෙන (ක්ෂේත්‍රයැ,) මොහසහගත විතර්කයන්ට දෙලොස් අකුශල චිත්තයෝ ම (ක්ෂේත්‍ර යි) විචිකිත්සාසම්ප්‍රයුක්ත චිත්තයෝ දෙදෙන වනාහි මොවුන්ට ප්‍රතිපූදග්ලික වූ ක්ෂේත්‍රයි. සියල්ලන්ට මැ සත්වයෝ ද සංස්කාරයෝ ද අරමුණු වේ. ඒ එසේ මැයි— ඉෂ්ටානිෂ්ට අසමපෙක්ෂිත වූ (= නොසමව බලනලද) සත්වයන් කෙරෙහි ද සංස්කාරයන්හි ද ඒ (විතර්කයෝ) උපදිත්. විතර්කෝත්පාදය.

අඤ්ඤං නිමිත්තං මනසිකාතබ්බං කුසලූපසංහිතං= ඒ නිමිත්තයෙන් අන්‍ය වූ කුශලනිමිත්තක් මෙනෙහි කවයුතුයි; **එහි** අන්‍යනිමිත්ත නම්? ඡන්දසහගත වූ විතර්කයක් සත්වයන් කෙරෙහි උපන් කල්හි අශුභ භාවනාව අන්‍යනිමිත්ත නම් වෙයි; සංස්කාරයන් කෙරෙහි උපන් කල්හි අනිත්‍යය මෙනෙහි කිරීම අන්‍යනිමිත්ත නම් වෙයි; වෛෂසහගත විතර්කයක් සත්වයන් කෙරෙහි උපන්කල්හි මෛත්‍රීභාවනාව අන්‍යනිමිත්ත නම් වෙයි අන්‍යනිමිත්ත පමිය.

සංසකාරයන් කෙරෙහි උපන්කල්හි ධාතුමනසිකාරය අන්‍යනිමිත්ත නම් වෙයි; මොහසහගත චිතක්‍රියක් යම් කිසි තැනක උපන්කල්හි පඤ්ච ධර්මයන් ඇසුරුකිරීම අන්‍යනිමිත්ත නම් වේ. විස්තාරය මෙසේ යැ- මොහුගේ අත් හෝ පා හෝ හොබනාහුය යනාදි නයින් සත්වයන්කෙරෙහි ලොභය උපන්කල්හි අශුභ වශයෙන් ඵලවිය යුතුයි; කුමක් කෙරෙහි ඇලුනේ වෙහි ද? කෙශයන්හි ඇලුනේ වෙහි? ලොමයන්හි —පෙ— මූත්‍රයෙහි ඇලුනේ වෙහි ද? මේ අත්බැව නම් තුන්සියයක් ඇටවලින් බැඳුනලද්දේ යැ, නවසියයක් නහරවලින් බඳනලද්දේ යැ, නවසියයක් මස් වැදලිවලින් අනුලිප්ත යැ, තෙත්සමින් භාත්පස ඔතනලද්දේ යැ, සිවි පැහැයෙන් වසනලද්දේ යැ, නවවණ දොරින් ද නවානුදහසක් රොම කූපයන්ගෙන් ද අසුචි වැගිරෙයි; (ඇව) සැකිලිවලින් පූරිත යැ, දුගඳ යැ, ජුගුප්සිත යැ, ප්‍රතිකූල යැ, දෙතිස් කුණපයන්ගේ සමූහය යැ මෙහි සාරයක් හෝ උතුම් වූවක් හෝ නැතැයි මෙසේ අශුභ වශයෙන් ඵලවන්නහුට සත්වයන් කෙරෙහි උපන් ලොභය ප්‍රහීණ වෙයි; එහෙයින් අශුභ වශයෙන් ඵලවීම ඒ නිමිත්තයාගේ අන්‍ය නිමිත්ත නම් වේ. පා-සිවුරු ආදි සංස්කාරයන්හි ලොභය උපන්කල්හි දෙආකාරයකින් සංස්කාර මධ්‍යස්ථතාව උපදවා යයි සතිපට්ඨාන වණ්ණනාවෙහි කී නයින් අස්වාමික - තාවකාලික භාව වශයෙන් මෙනෙහි කරන්නහුට එය ප්‍රහීණ වෙයි; එහෙයින් අනිත්‍ය වශයෙන් මෙනෙහි කිරීම ඔහුගේ අන්‍යනිමිත්ත නම් වේ. සත්වයන් කෙරෙහි වෙෂය උපන්කල්හි ආඝාතවිනය - කකචොප මොවාදීන්ගේ වශයෙන් මෙත් වැඩිය යුත්තීය, එය වඩන්නහුගේ ඒ වෙෂය ප්‍රහීණවෙයි; එහෙයින් මෛත්‍රීභාවනාව ඔහුගේ අන්‍යනිමිත්ත නම් වේ. යලි කණුකට්ඨතණපරණලාදියෙහි වෙෂය උපන්කල්හි තෙපි කාට කිපෙහි ද? කිම පෘථිවිධාතුවට ද? නොහොත් අබ්ධාතුවට ද? මේ කවරෙක් හෝ කිපෙයි නම් වේ ද? කිම පෘථිවිධාතුව ද? නොහොත් අබ්ධාතුව ද? යනාදි නයින් ධාතුමනසිකාරය කරන්නහුට ඒ වෙෂය ප්‍රහීණ වෙයි; එහෙයින් ධාතුමනසිකාරය ඔහුගේ අන්‍යනිමිත්ත නම් වේ. මොහය වනාහි යම් කිසි තැනක උපන්කල්හි—

136. "ගරූපවාසෝ උදෙදසෝ - උද්දිඨපරිපුච්ඡනං
කාලේන ධම්මසවනං - ඨානාඨානවිනිච්ඡයෝ
පඤ්ඤත්තූපනිසාය - මොහධාතු පහීයති" යන—

---

136. ගරූපවාසෝ= ගුරූපාශ්‍රය; උදෙදසෝ= පරියාපනිධර්මයාගේ උද්ග්‍රහණය; උද්දිඨපරිපුච්ඡනං= උද්ග්‍රහණය කළ ධර්මයාගේ අර්ථ විචාරීමය; කාලේන ධම්මසවනං= සුදුසු කාලයෙහි ධර්මශ්‍රවණය; ඨානාඨාන විනිච්ඡයෝ= ස්ථානාස්ථාන විනිශ්චය යන; පඤ්ඤත්තූපනිසාය= ධර්මයන් පස්දෙන නිසා; මොහධාතු= මොහය තෙම; පහීයති= ප්‍රහීණ වන්නේයි.

මේ පඤ්චවිධයෝ ඇසුරු කළයුත්තාහුය; ඒ එසේ මැයි– ගුරුහු ඇසුරු කොට වාසය කරන මහණ – ගම්වැදීම නො විචාරන්නහුට පාඥෙතා තැනට නො පැමිණෙන්නහුට වත්කලැ වත් නො කරන්නහුට ඇදුරු තෙම දියකළ සියයක් ඇදීම් ආදි වූ දඬුවම් කෙරේ යයි උත්සාහයට පැමිණියේ වේද, එකල්හි ඔහුගේ මොහය ප්‍රහීණ වෙයි; උදෙශ ග්‍රහණය කරන්නේ ද, උදෙශකාලයෙහි උදෙස් නො ගන්නහුට ද නො මනා කොට හදාරන්නහුට ද නො හදාරන්නහුට ද ඇදුරුතෙම දඬුවම් කෙරේ යයි උත්සාහවත් වූයේ වේද, මෙසේ ත් ඔහුගේ මොහය ප්‍රහීණ වෙයි; ගරු කටයුතු බුහුමන් කටයුතු භික්ෂූන් කරු එලඹ වහන්ස! මේ කෙසේ ද? මේ පදයාගේ අර්ථය කවරේ දැ? යි විචාරමින් සැක දුරු කෙරේ ද, මෙසේ ත් ඔහුගේ මොහය ප්‍රහීණ වෙයි; සුදුසු කාලයෙහි ධර්මශ්‍රවණය කරන ස්ථානයට ගොස් සකස් කොට බණ අසන්නහුට ද ඒ ඒ තැන්හි අර්ථය ප්‍රකට වෙයි; මෙසේ ඔහුගේ මොහය ප්‍රහීණ වෙයි; මේ මෙයට කාරණය මේ අකාරණය යි ස්ථානාස්ථාන විනිශ්චයෙහි දක්ෂ වූයේ වේද; මෙසේ ත් ඔහුගේ මොහය ප්‍රහීණ වෙයි; එහෙයින් පඤ්චවිධයින් ඇසුරු කිරීම ඒ (නිමිත්තයාගේ) අන්‍යනිමිත්ත නම් වේ. තවද– අටනිස් අර මුණු අතුරෙන් යම් කිසි අරමුණක් වඩන්නහුට ද මේ විතර්කයෝ ප්‍රහීණ වෙත් මැයි. මේ නිමිත්තයෝ වනාහි (රාගාදීන්ට) ඍජුව විරුද්ධ වූවාහුය, ප්‍රතිපක්ෂ වූවාහුය; මොවුන් කරණකොට ගෙන ප්‍රහීණ වූ රාගාදීහු මොහොවට ප්‍රහීණ වූවාහු වෙත්. ඒ එසේ මැයි– යම්සේ ගින්න දර වලින් ද පස්වලින් ද අතුවලින් ද ගසා නිවත් මැ වේද; එහෙත් ජලය ගින්නට ඍජුව විරුද්ධ යැ; එසින් නිවන්නලද්දේ මහාකොට නිවන්නලද්දේ වෙයි; මෙසේ මේ නිමිත්තයන්ගෙන් ප්‍රහීණ වූ රාගාදීහු මොහොවට ප්‍රහීණ වූවාහු වෙත්. එහෙයින් මොවුහු කියන ලද්දාහුය, යි දතයුතු.

කුසලූපසංහිතං= කුශලනිශ්‍රිත වූ කුශලයට ප්‍රත්‍යය වූ; **අජ්ඣත්තමේව**= ගොවරාධ්‍යාත්මයෙහි ම; **පලගණ්ඩකොං**= වඩුතෙම; **සුබුමාණි ආණිං**= යම් ඇණයක් බැහර කරනු කැමති වේද, ඊට

ආදීනව පදීප්‍ය. වඩා ඉතා සියුම් වූ හරදූවයෙන් කළ ඇණයකින්; **ඔළාරිකං ආණිං**= සදුන්පුවරුවක හෝ හරපුවරුවක හෝ හසන්නලද විෂම ඇණයක්; **අභිනිහනෙය්‍ය**= මුගුරකින් ගසමින් පෙළන්නේය; **අභිනීහරෙය්‍ය**= මේසේ පෙළමින් පුවරුවෙන් බැහැර කරන්නේය; **අභිනිවජ්ජෙය්‍ය**= දැන් බොහෝ නික්මුනී යයි දැන අතින් සොලවා ඇද දමන්නේය; ඒ උපමාවෙහි පුවරුව මෙන් සිත යැ, පුවරුවෙහි විෂමඇණය මෙන් අකුශල විතර්කයෝ යැ, සියුම් ඇණය මෙන් අන්‍ය අශුභභාවනාදි වූ කුශලනිමිත්ත යැ, සියුම් ඇණයෙන් මහත් ඇණය බැහැර කිරීම මෙන් අශුභභාවනාදි වූ කුශලනිමිත්තයන්ගෙන් ඒ විතර්කයන්ගේ බැහැර කිරීම් වේ.

අතිකුණපෙන යනාදිය ඉතා ජුගුප්සිත ප්‍රතිකූල වූ කුණපය දැක්වීම පිණිස වදාරනලද. **කණෙඤ්ඤ ආසතෙනන**= කිසි යම් පසම්තුරකු විසින් ගෙනවුත් ගෙලෑ බඳනලද එල්වනලද; **අටටියෙයය**= ආති වූයේ, දුකට පැමිණියේ වන්නේය; **හරායෙයය**= ලජ්ජාවන්නේය; **ජිගුච්ඡෙයය**= හවගත් ජුගුප්සා ඇත්තේ වන්නේය; **පඤ්ඤනති**= මෙසේ මේ මේ කාරණයෙන් ද මේ අකුශලයෝ සාවද්‍යයෝ යැ, දුක්ඛ්පාක ඇත්තාහු ය,යි තමාගේ පැනබලයෙන් විමසන්නහුට අසිකුණපාදීන් මෙන් ජුගුපසා කරන්නහුට ප්‍රතිණ වෙති, යමෙක් වනාහි තමාගේ පැනබල යෙන් විමසන්ට නො හැකි වේද, ඔහු විසින් ආචාර්යයන් හෝ උපාධ්‍යාය යන් හෝ එක්තරා ගරුතැන්හි සිටි සබ්‍රහ්මචාරී කෙනෙකුන් හෝ සඞ්ඝ සථවිරයන් හෝ සමීපයට පැමිණ හෙඞිය ගසා භික්ෂුසඞ්ඝයා ම හෝ රැස් කරවා ආරොචනය කළයුතුයි. යම්හෙයකින් බොහෝදෙනාගේ රැස් වීම් ඇතිකල්හි යමෙක් ඔහට මෙසේ මේ විතර්කවිෂයෙහි ආදීනවය දත යුතු යයි කියන්නේ ද, යලි කායවිඤ්ඤත්තිය කථාදියෙන් හෝ ඒ විතර්ක යන් නිග්‍රහ කරන්නේ ද, (එබදු වූ) එක් පණ්ඩිත මනුෂ්‍යයෙක් වන්නේ ම යයි කියාසි.

අසති අමනසිකාරෙ ආපජ්ජනතඛ්බා= ඒ විතර්කයෝ නො මැ සිහි කළයුත්තාහුය, නො මෙනෙහි කළ යුත්තාහුය, අන්‍යවිහිත වූවහු විසින් විය යුතු; ඒ එසේ මැයි- යම්සේ රූපයක් නො දකිනු කැමති පුරුෂයෙක් ඇස් පියන්නේ ද, එපරිද්දෙන් මූලකම්මට්ඨානය ගෙන හුන්නා වූ මහණ විසින් සිතෙහි විතර්කයක් උපන් කල්හි අන්‍යවිහිත වූවහු විසින් විය යුතුයි; මෙසේ ඔහුගේ ඒ විතර්කය ප්‍රහීණ වේ. එය ප්‍රහීණ වූ කල්හි නැවත කම්මට්ඨානය ගෙන භිදගත යුතුයි, ඉදින් ප්‍රහීණ නො වේ නම් උගන්නාලද ධර්මකථා ප්‍රබන්ධයෙක් වේ නම් ඒ ප්‍රබන්ධය මහත් වූ හඬින් සජ්ඣායනා කළ යුතුයි; ඉදින් මෙසේ ත් අන්‍යවිහිත වූවහුගේ ඒ විතර්කය ප්‍රහීණ නො වේ නම් එවිකා වෙහි (ලූ) යම් පොතක බුදුගුණ ද දහම්ගුණ ද ලියනලද්දහු වෙත් ද (එබදු වූ) අක්පොතක් වේ නම් එය බැහැර කොට කියවන්නහු විසින් අන්‍යවිහිත වූවකු විය යුතුයි; ඉදින් මෙසේ ත් ප්‍රහීණ නො වේ නම් එවිකාවෙන් අරණී (= ගිනිගානාදඬු) යුගලය ආදි භාණ්ඩයන් බැහැර කොට මේ උත්තරාරණිය මේ අධරාරණිය යි ආවර්ජනා කරන්නාහු විසින් අන්‍යවිහිත වූවකු විය යුතුයි; ඉදින් මෙසේ ත් ප්‍රහීණ නො වේ නම් කොපුව බැහැර කොට මේ භිදිවිදිනාකටුව නම්, මේ කඩකතුර නම්. මේ නියසැත නම්, මේ භිදිකටුව නමැයි පිරිකර එලවා බලන්නහු විසින් අන්‍යවිහිත වූවකු විය යුතුයි; ඉදින් එසේ ත් ප්‍රහීණ නො වේ නම් භිදි කටුව ගෙන සිවුරෙහි දිරුතැන් මහන්නහු විසින් අන්‍යවිහිත වූවකු විය යුතුයි; මෙසේ යම් තාක් ප්‍රහීණ නො වේද ඒ තාක් ඒ ඒ කුශලකර්ම කරන්නහු විසින් අන්‍යවිහිත වූවකු විය යුතුයි; ප්‍රහීණ වූ කල්හි යලි

අසනිපමය.

මූලකර්මස්ථානය ගෙන හිඳගත යුතුයි. නවකම් වූ කලි පවන් නො ගත යුතු; කුමක් හෙයින? විතර්කය පසිඳුනකල්හි කමටහන් මෙනෙහි කිරීමට අවකාශ නො වේ; (එහෙයිනි.) එතකුදු වුවත් පෞරාණික පණ්ඩිතයෝ නවකම් කොට ද විතර්කය පසිඳ ලූහු.

"තිස්සසාමණේර"වත.

එහි මේ වස්තුවෙකි. ඒ මෙසේ අසනු ලැබේ- තිස්ස සාමණේරයන් ගේ උපාධ්‍යාය තෙම තිස්සමහා විහාරයෙහි වාසය කෙරෙයි, උන් වහන්සේට සාමණේර තෙම වහන්ස! උකටලී වූයෙම් සි කියා, එකල්හි ඔහට තෙරුන් වහන්සේ මේ විහාරයෙහි නහනජලය දුලීහ යෑ, මා ගෙන සිතුල්පව්වට යවයි කිහ; හෙතෙම එසේ කෙළේය; එහිදී ඔහට තෙරුන් වහන්සේ මෙසේ කිහ- "මේ විහාරය අතිශයින් සඟසතු යෑ, එක් පුද්ගලික ස්ථානයක් කරව" යි. හෙතෙම ඔබ්නව වහන්ස! යි මූලපටන් සංයුක්ත නිකාය ද ප්‍රාඛහාරය ශුඛ කිරීම ද තෙජෝකසිණපරිකර්මය ද යන තුන ම එකවිට පටන් ගෙන කර්මස්ථානය අර්පණාවට පැමිණ විය, සංයුක්ත නිකාය අවසන් කෙළේය, ලෙන් කර්මාන්තය නිමවූයේය; සියල්ල කොට උපාධ්‍යායන්ට දුන්වී; උපාධ්‍යාය තෙම සාමණේරය! තොප විසින් දුකසේ කරනලද, අද පළමු කොට තෙපි ම වාසය කරව, යි කිය. හෙතෙම ඒ රෑය ලෙණෙහි වෙසෙමින් සෘතුපහසුව ලැබ විදසුන් වඩා රහත්බවට පැමිණ එහි ම පිරිනිවී. උන් වහන්සේගේ ධාතූන් ගෙන සැයක් කළාහුය. (එය) අද පවා තිෂ්‍යසථවිර චෛත්‍යය යි ප්‍රකට වේ.

විතක්කමූල භෙදපදීය.

මේ (දුක්වූ) පදීය "අසකිපදී" නම් වේ. මෙහි සිව විතර්කයන් නිගන්නට නො හැකි වන්නේ මෙහි සිව නිග්‍රහ කරන්නේ ය, යි "විතර්කමූල භෙදපදීය" දක්වනයේක් නැවත- නාසය වේ හික්ඛවෙ! යනාදිය වදළහ. එහි **විතක්කසඞ්ඛාර සඤ්ඤානං මනසි කාතබ්බං**= රැස් කෙරේ තුයි "සඞ්ඛාර" නම්, ප්‍රත්‍යය යැ කාරණ යැ මූල යැ යන අර්ථයි; මෙහි පිහිටා සිටී තුයි "සඤ්ඤාන" නම්, විතර්කී සංඝකාරයාගේ සංස්ථානය "විතක්කසඞ්ඛාර සඤ්ඤාන" නම් වේ. එය මෙනෙහි කටයුතු. මේ කියනලද වෙයි- මේ විතර්කීය තෙම කුමක් හෙතු කොට කුමන ප්‍රත්‍යයකින් කවර කරුණකින් උපන්නේ දැ? යි විතර්කීයන්ගේ මූලය ද මූලයෙන් මූලය ද මෙනෙහි කටයුතුයි. **කින්නු බො අහං සිඝං ගච්ඡාමි**= කුමන කරුණකින් මම වහා යෙම් දෝ හෝ? **යන්නූනා'හං සණිකං ගච්ඡෙය්‍යං**= මට මේ වහා ගමනින් කිම? සෙමින් යන්නෙම් නම මැනවැයි සිතයි; **සො සණිකං ගච්ඡෙය්‍ය**= හෙතෙම මෙසේ සිතා සෙමින් යන්නේය; සියලු තැන්හි මේ නයයි. එහි ඒ පුරුෂයාගේ ශීඝ්‍රව ගමන් කරන කාලය මෙන් මේ භික්ෂුවගේ විතර්කීයට නැගි කාලය යෑ, ඔහුගේ සෙමින් ගමන්කරන කාලය මෙන් මොහුගේ විතර්කීයන්ගේ හැසිරීම සිදින්නකාලය යෑ, ඔහුගේ

සිවිකාලය මෙන් මොහුගේ විතර්කවිචාරය සිදුණු කල්හි මූලකම්මට්ඨානය සිතට බසින කාලය යැ, ඔහුගේ හුන් කාලය මෙන් මොහුගේ විදසුන් වඩා රහත් බවට පැමිණි කාලය යැ, ඔහුගේ වැදහොත් කාලය මෙන් මොහුගේ නිවන් අරමුණු කොට ඇති පලසමවතින් දවස ඉක්මවන කාලය වේ. එහි මේ විතර්කයෝ කුමක් හෙතු කොට ඇත්තාහු ද? කුමක් ප්‍රත්‍යය කොට ඇත්තාහු දැ? යි විතර්කයන්ගේ මූලින් මූලට යන් නහුගේ විතර්කවිචාරය ලිහිල් වෙයි; එය ලිහිල්වූ කල්හි (පිළිවෙළින් ඒයාී භාවයට පැමිණීමෙන්) මස්තකයට පැමිණෙන කල්හි විතර්කයෝ සප්‍රකාරයෙන් නිරුඬ වෙත්. මේ අර්ථය "දද්දහ" ජාතකයෙන් ද දැක්විය යුතු.

ඒ මෙසේ අසනු ලැබේ- බෙලිරුකක්මූල නිදන්නාවූ සාවෙකුගේ කන්මුලැ බෙලිගෙඩියක් තුවටුයෙන් සිදී වැටුනේය, හෙතෙම ඒ බෙලි ගෙඩියේ ශබ්දයෙන් පොළොව බිඳේය,යි සලකා නැඟිට වෙගයෙන් පලාගියේය, ඔහු දැක ඉදිරියෙහි (සිටි) අන් සිව්පාවෝ ද පලාගියාහුය; එකල බෝසත් තෙම සිංහයෙක් වූයේ වෙයි; හෙතෙම මෙසේ සිතී- "මෝ පෘථිවිය නම් කප නැසෙනකලැ බිඳෙයි, අතරැ පොළොව බිඳිමෙක් නම් නැති, මම මූලින් මූලට ගොස් දැනගන්නෙමි නම් යෙහෙකැ" යි; හෙතෙම හස්ති නාගයා පවන් සාවා තෙක් විවාළේය, දරුව! තා විසින් පොළොව බිඳෙන්නී දුටු දැ?යි; සාවා එසේය දේවයිනි! යි කීය. සිංහ තෙම- එව පින්වත! දක්වව,යි සාවා- නො හැක්කෙමි හිමියෙනි! යි; එව කොල! භය නො වෙව,යි තද මොළොක් වචනයෙන් ගෙන ගියේය; සාවා රුකසමීපයෙහි සිට-

137. "දද්දහායති හදදං තෙ – යස්සිං දෙසෙ වසාමිහං
අහමෙපනං න ජානාමි – කිමෙතං දද්දහායති." යන—

ගාථාව කීය. බෝසත් තෙම තෝ මෙහි ම සිටුව, යි රුක්මූලට ගොස් සාවා වැදහොත් තැන දුටුයේය, බෙලිගෙඩිය දුටුයේය, උඩ බලා තුවටුව දුටුයේය; දැක මේ සාවා මෙහි වැදහෙව නිදන්නේ කන්මුලැ වැටුණු මේ (ගෙඩියේ) ශබ්දයෙන් පොළොව බිඳේ යයි මෙසේ සන්ඇතියේ වැ පලාගියේය,යි දැන ඒ කරුණ සාවා විවාළේය; සාවා එසේය දේවයිනි! යි කීය. බොධිසත්වයෝ මේ ගාථාව කිහ...

---

137. තෙ= ඔබට; හදදං= කල්‍යාණයෙක් වේවා. යස්සිං දෙසෙ= යම් පෙදෙසක; අහං= මම; වසාමි= වෙසෙමි ද (එහි;) දද්දහායති= "දද්දහ" යි ශබ්ද කෙරෙයි; එතං කිං= මේ කුමක්; දද්දහායති= "දද්දහ" යි ශබ්ද කෙරේ දැ? යි; අහමපි= මම ද; එතං= මේ කාරණය; න ජානාමි= නො දනිමි.

138. "බෙල්ලං නිපතිතං සුත්වා - දදදහනති සසෝ ජවි
සඝස්ස වචනං සුත්වා - සන්නත්තා මිගවාහිනී" යි.

ඉක්බිති බොධිසත්වයෝ භය නො වවු යයි මෘගසමූහයන් අස්වැසූහ. මෙසේ විතර්කීයන්ගේ මූලින් මූලට යන්නහුගේ විතර්කියෝ ප්‍රහීණ වෙත්. මේ "විතර්කීමූලභෙදපඒයෙහි" සිට විතර්කියන් නිගන්නට නො හැකි වන් නහු විසින් වනාහී මෙසේ නිග්‍රහ කටයුත්තාහු ය,යි අනිකුදු කාරණයක් දක්වනසේක් නැවත- තසෙව හිකඛවෙ! යනාදිය වදාළහ.

දනෙනහි දනනමාඛාඝ= යටිදතැ උඩුදත තබා; **චෙතසා චිත්තං**= කුශල චිත්තයෙන් අකුශල චිත්තය නිග්‍රහ කටයුතුයි; **බලවා පුරිසෝ**= යම්සේ ශක්තිසම්පන්න වූ මහාබල ඇති පුරුෂයෙක් දුර්බල පුරුෂයකු හිසැ හෝ කදැ හෝ ගෙන දැඩිව නිගන්නේ ද දැඩිව පෙළන්නේ ද දැඩිව තවන්නේ ද තැවුනකු කලාන්ත වූවකු මුසින් පිඩාවූවකු මෙන් කරන්නේ ද, එපරිද්දෙන් ම භික්‍ෂුව විසින් විතර්කියන් සමග ප්‍රතිමල්ලයක්හු වී "තෙපි කව රහු යැ? මම කවරෙක් යැ" යි මැඩපවත්වා- "එකාන්තයෙන් සම ද නහර ද ඇට ද ඉතිරි වේවා, සිරුරෙහි මස් ලේ වියලේවා" යි මෙසේ මහාවීර්‍යය දැඩි කොට ගෙන විතර්කියෝ නිග්‍රහ කටයුත්තාහු ය,යි දක් වන සේක් මේ අර්ථප්‍රකාශක වූ උපමාව වදාළහ.

අනිනිග්‍රහණපඒය.

යතො බො හිකඛවෙ! යන මෙය මයිසාදෘෂාජනීය නම් වෙයි; එය ප්‍රකට වූ අර්ථ ඇත්තේ මැයි. තවද- යම්සේ ශාස්ත්‍රාචාර්‍ය්‍ය තෙම පිට රටින් පැමිණි රාජපුත්‍රයකු පඤ්චායුධ ශිල්පය උගන්වා යව සිය රටෙහි රජය ගනුව, ඉදින් තා වෙත අතරමඟ සොරු එලඹ සිටිත් නම් දුන් නෙන් කටයුතු කොට යව, ඉදින් තොපගේ දුන්න නැසේ හෝ බිඳේ හෝ නම් සැතින් ද කඩුවෙන් දැ,යි මෙසේ ආයුධ පසින් ම කටයුතු දක්වා මෙහෙයා ද; හෙතෙම එසේ කොට සියරටට ගොස් රජය ගෙන රජසිරි වලද ද; එපරිද්දෙන් භාග්‍යවතුන් වහන්සේ අධිචිත්තයෙහි යෙදුනා වූ මහණ රහත්බැව් ගැනීම පිණිස මෙහෙයන්නාහු ඉදින් ඔහට අතර අකුශලවිතර්කියෝ උපදින් ද, (එකල) අන්‍යනිමිත්තපඒයෙහි සිට ඒ විතර්කියන් නිග්‍රහ කොට විදසුන් වඩා රහත්බවට පැමිණෙන්නේය; එහි නො හැකි වන්නේ ආදීනවපඒයෙහි සිට, එහි ද නො හැකිවන්නේ

---

138. **දදදහනති**= "දදදහ"යි ශබ්ද කරමින්; **බෙල්ලං**= බෙලිගෙඩිය; **නිපතිතං සුත්වා**= වැටුනහු අසා; **සසෝ ජවි**= ශශ තෙම දිවී. **සඝස්ස වචනං සුත්වා**= සාවාගේ වචනය අසා; **මිගවාහිනී**= (කොයෙක් දහස් ගණන්) මෘගසෙනාව; **සන්නත්තා**= උත්‍රස්ත වූවා,

අසතිපඨියෙහි සිට, එහි ද නො හැකි වන්නේ විතකීමූලහෙදපඨියෙහි සිට එහි ද නො හැකි වන්නේ අභිනිග්‍රහණපඨියෙහි සිට විතකීයන් නිග්‍රහ කොට විදසුන් වඩා රහත්බවට පැමිණෙන්නේ ය,යි මේ පඤ්ච පඨියන් දෙශනා කළසේක. **වසි විතක්කපරියායෙ පථෙසු**= විතකීවාර මාගීයන්හි පුරුදුකළ වසභබව ඇතිවැ, ප්‍රගුණවූ වසභබව ඇති වැ යයි කියනු ලැබේ; **යං විතක්කං ආකඞ්ඛිස්සති**= මෙය ඔහුගේ වසභභාවා කාරය දක්වනු පිණිස වදරනලද; ඒ එසේ මැයි- මේ තෙම පෙර යම් විතකීයක් විතකී කරනු කැමති වේද, එය විතකී නො කෙරෙයි; යමක් විතකී නො කරනු කැමති වේද, එය විතකී කෙරෙයි; දැන් වූ කලි වශී භූත හෙයින් යම් විතකීයක් විතකී කරනු කැමති වේ ද, එය ම විතකී කෙරෙයි; යමක් විතකී නො කරනු කැමති වේ ද, එය විතකී නො කෙරෙයි; එසින් වදරනලදී- **යං විතක්කං ආකඞ්ඛිස්සති තං විතක්කං විතක්කෙස්සති, යං විතක්කං නා'කඞ්ඛිස්සති න තං විතක්කං විතක්කෙස්සති** යනු අවෙජවජී කරණාදිය සබඳාසව සූත්‍රයෙහි කියන ලද්දේ මැයි.

විතක්කසණ්ඨාන සූත්‍ර වණ්ණනා නිමි.

"ප්‍රපඤ්චදීපිකා" නම් වූ මැදුම්සඟි සිංහල අටුවාවෙහි දෙවැනි වූ

සී හ නා ද ව ගී ය

මෙතෙකින් සමාප්තයි.

—:o:—

කකචූපම සූත්‍ර වණ්ණනා.

එවමෙමසුතං යි කකචූපම සූත්‍ර යයි. එහි **මොලියඵගුනෝ**= "මොලි" යි සිළුව කියනු ලැබේ. මේ කිහු—

139. "**ජෙට්ඨාන මොලිං වරගන්ධවාසිනං**
වෙහාසයං උක්කිපි සක්‍යපුඞ්ගවෝ
රතනස්ස වඩ්ඪාටවරෙන වාසවෝ
සහස්සනෙත්තෝ සිරසා පටිග්ගහි" යි-

ඔහුගේ ඕ මෙඟලිය ගිහිකලැ මහත් වී, එහෙයින් ඕහට "මෙඟලිය ඵගුන" යන නාමප්‍රඥප්තිය උපත; පැවිදිවූ ද ඔහු ඒ නමින් ම හඳුනති. **අතිවෙලං**= (ත්‍රිවිධ) වෙලා ඉක්මවා; එහි කාලවෙලා - සීමවෙලා - සීල වෙලා යයි වෙලා තොමෝ ත්‍රිවිධ වන්නී යැ; ඒ එසේ මැයි- "**නායං වෙලායං ඉමං උදුනං උදුනෙසි**" යන මෝ කාලවෙලා නමු; "**සිනඛමෙමා වෙලං නා'තික්කමති**" යන මෝ සීමවෙලා නමු; "**වෙලා අනතික්කමෝ සෙතුඝාතෝ**" යි ද, "**වෙලා වෙසා අනතික්කමනඤෙන**" යි ද මෝ සිලවෙලා නමු; ඒ ත්‍රිවිධ වූ ම වෙලාව හෙතෙම ඉක්මවූයේ මැයි. ඒ සැබව- භික්ෂුණීන්ට අවවාද කරන්ට කාලයෙක් නම් ඇති. හෙතෙම හිරු අසතඔහත වූ කල්හි ද අවවාද කරන්නේ ඒ කාලවෙලාව ද ඉක්මවිය; භික්ෂුණීන්ට අවවාද කිරීමෙහි ප්‍රමාණයෙක් සීමාවක් මයෑදුවක් නම් ඇති, හෙතෙම වචන පසක් සයකින් මත්තෙහි අවවාද කරන්නේ ඒ සීමවෙලාව ද ඉක්මවිය; යලි කථාකරන්නේ ක්‍රීඩා සහගත කොට දුළුල් ඇවතට පොහොනක් කොට කථාකරයි, මෙසේ සිලවෙලාව ද ඉක්මවී. **සංසඳෝ**= මිශ්‍ර වූයේ සමාන සුවඳක් ඇතියෙක් වැ; **සම්මුඛා**= අනිවුඛයෙහි; **අවණ්ණං භාසති**= ඔවුන් පිසීම් කෙටීම් ආදිය කරන්නවුන් දූක මොවුන්ට නො ඇවැත් නම් නැති, මේ භික්ෂුණීහු අනාචාර ඇත්තාහුය, දුවුතවූවාහුය, ප්‍රගල්භවූවාහුය,යි අගුණ කියයි; **අධිකරණම්පි කාරෙති**= මේ භික්ෂුණීන් දුටුකල පටන් මේ භික්ෂූන්ගේ ඇසේ දූවෙති, මේ විහාර යෙහි මල්පිදීම හෝ අසුන්සෙදීම් පිරිබඩකිරීම් ආදිය හෝ මොවුන්ගේ

---

139. **සක්‍යපුඞ්ගවෝ**= ශාක්‍යශ්‍රෙෂ්ඨ වූ බෝසත් තෙම; **වරගන්ධවාසිනං**= උතුම් වූ සුවඳ ගන්වනලද; **මොලිං**= මෙඟලිය (= සිළුව;) **ජෙට්ඨාන**= සිඳ; **වෙහාසයං**= අහසට; **උක්කිපි**= දැම්. **සහස්සනෙත්තෝ**= දහසක් නුවණැස් ඇති; **වාසවෝ**= ශක්‍රදෙවෙන්ද්‍ර තෙම; **රතනස්ස වඩ්ඪාටවරෙන**= උතුම්වූ රුවන් කරඬුවකින්; **සිරසා**= මස්තකයෙන්; **පටිග්ගහි**= (ඒ මෙඟලිය) පිළිගත්තේයි.

වශයෙන් පවතින්; මොවුහු ලජ්ජා ඇති කුලධීතෘහු යැ; තෙපි මොවුන්ට මේ මේ වචන ද කියහු; තොපට මෙ නම් ඇවැත් වෙයි; විනයධරයන් වෙත පැමිණ මට විනිශ්චය දුන මැනවැයි අධිකරණය ආකඞ්ඛනය කෙරෙයි; **මොලියඵගුනඤ්ඤ අවණ්ණං භාසති**= මේ මහණහට නො ඇවතක් නම් නැති, නිරතුරු මොහුගේ පිරිවෙන්දෙර භික්ෂුණීන්ගෙන් නො සිස් යයි අගුණ කියයි; **අධිකරණම්පි කරොනති**= මොලියඵගුන තෙරුන් දුටුකල පවන් මේ භික්ෂූන්ගේ ඇස් දූවෙති, මේ විහාරයෙහි අන්‍යයන්ගේ වාසස්ථානයක් බලන්ට ද නො හැක, විහාරයට පැමිණි භික්ෂුණීහු අවවාදය හෝ පිළිසඳර හෝ උද්දෙසපදය හෝ තෙරුන් නිසා ම ලබති; (මේ තෙම) කුලපුත්‍රයෙක, ලජ්ජා ඇත්තෙක, කුකුස් ඇත් තෙක, මෙබදු භික්ෂුවට ද තෙපි මේ මේ වචන ද කියහු; එවු විනයධර යන් සමීපයෙහි විනිශ්චය දෙවු යයි අධිකරණය ආකඞ්ඛනය කෙරෙත්.

සො භික්ඛු භගවතනං එතදවොච= ප්‍රියබව කැමැත්තෙන් නො ම වෙයි, භෙදාධ්‍යාශයෙන් නො වෙයි, වැඩකැමති බැවින් කීය; ඕහට මේ සිත විය; "මෙසේ **සංඝඤ්ච** වාසයකරන්නා වූ මේ භික්ෂුවට අයස උපදින්නේය, හේ ශාසනයාගේ ද අගුණයෙක් මය, එතකුදු වුවත් අනි කෙකු විසින් කියනලද්දේ මේ තෙම නො නවත්නේය, භාග්‍යවතුන් වහන්සේ විසින් දහම් දෙසා අවවාද කරනලද්දේ ම නවත්නේ ය" සි ඕහට වැඩකැමති බැවින් භාග්‍යවතුන් වහන්සේට මේ **ආයස්මා භගෙන! ඉතාදිය** කීය. **ආමඤ්ඤනති**= දන්වව; **ආමනෙනති**= කැඳවයි; **සඛා**= සැදුහැ යෙන්; **නඤ්ඤා**= යම්හෙයකින් තෙපි කුලපුත්‍ර වූයේ ද සැදුහැ යෙන් පැවිදිවූයේ ද, යම්හෙයකින් හෝ මොවුන් සමග සංඝඤ්ච වාසය කරන්නා වූ තොපට යමෙක් තුමූ ඒ භික්ෂුණීන්ට ආක්‍රොෂ කරන්නාහු හෝ පහර දෙන්නාහු හෝ වෙත් ද, ඔවුන් කෙරෙහි දෙම්නස උපදින් නේද, සංඝඤ්ච ප්‍රතිෂේධ කල්හි නූපදින්නේද එහෙයින්; **තඤ්ඤ**= ඒ නුගුණ කීමෙහි; **ගෙහසිතා**= පඤ්චකාම ගුණනිශ්‍රිත වූ; **ඡන්දා**= තෘෂ්ණාවශ්‍රද යෝ ද, ප්‍රතිඝවශ්‍රදයෝ ද; **විපරිණතං**= (රාගයෙන්) රත්වූ සිත ද විපර්‍යාස වෙයි; දූෂ්ට වූ සිත ද, මුළා වූ සිත ද විපර්‍යාස වේ. මෙහි වූ කලි තෘෂ්ණාවශ්‍රද වශයෙන් රත් වූ; ප්‍රතිඝවශ්‍රද වශයෙන් දූෂ්ට වූ ද (සිත) වටී. **හිතානුකම්පී**= හිතයෙන් අනුකම්පා කරන්නේ හිතයෙන් පතුරුවන්නේ; **න දොසනතරෙ**= වෙෂයින් ඇත්තෙම් නො වන්නෙම්; **අථබො භගවා** යනු කුමක් හෙයින් ආරම්භ කෙළේ ද? ඵගුනඟට වූ කලි මෙතෙක් අවවාද අසා ද භික්ෂුණීසංඝඤ්ච යෙන් නවත්නෙම් වළක් නෙම්,යි සිතකුදු නූපන. වැලි භාග්‍යවතුන් වහන්සේ සමග **විලොම්ව** සිටි ඇණයක් (=පවහැණි වූවෙක්) මෙන් ප්‍රතිවිරුඬ ව සිටියේයි.

එකල්හි භාග්‍යවතුන් වහන්සේට යම්සේ බඩසා ඇත්තහුට භොජන යෙහි පිපාසා ඇත්තහුට පැතෙහි සීතයෙන් පහස්නාලද්දහුට උණුසු මෙහි දුකින් පීඩිතයහට සුවයෙහි ප්‍රාර්ථනා උපදිද, එපරිද්දෙන් මේ දුර්වල වූ භික්ෂුව දැක ප්‍රථමබෝධියෙහි සුවව වූ ද භික්ෂූහු ආපාථ යට පැමිණියාහුය. එකල්හි ඒ භික්ෂූන්ගේ ගුණය කියනු කැමති ව මේ දෙශනාව ආරම්භ කළහ. **ආරාධයිංසු**= ගත්තාහුය, පිරුහ; **එකං සමයං**= එක් කාලයෙක්හි, **එකාසනභොජනං**= එක් පෙරබතැ වැලඳීම, ඒ එසේ මැයි- හිරු නැගීම පටන් මධ්‍යාහ්නය දක්වා සියක්වර වැලඳු භොජනය ද මෙහි "එකාසන භොජනය" යි ම අදහස් කරනලදී. **අප්පාබාධතං**= නිරොගබව; **අප්පාතඞ්කතං**= නිදුක්බව; **ලහුට්ඨානං**= ශරීරයාගේ සැහැල්ලු පැවතුම; **බලං**= කායබලය; **ඵාසුවිහාරං**= ශරීරයාගේ සැපවිහරණය; මෙයින් කුමක් කියනලද ද? දහවල් විකාලභොජනය දුරුකරවූ කාලය කියනලද; "භද්දාලි" සූත්‍රයෙහි වනාහි රාත්‍රියෙහි විකාලභොජනය දුරුකරවූ කාලය කියනලදී. ඒ එසේ මැයි— මේ (විකාල) භොජනවය භාග්‍යවතුන් වහන්සේ එක් වරින් නො දුරුකරවූහ. කුමක් හෙයින? යම්හෙයකින් මෙ ම භොජන දෙක සඟරැ වසන්නවුන් විසින් පුරුදුකරනලද්දාහු ද, සියුම්ලී කුලදරුවෝ ඇත්තාහු යැ, ඔවුහු එක්වීට භොජනවය ම දුරුකරන්නාහු කලාතන්තා වෙත් ද, එහෙයින් එක්වීට නො දුරුකරවා එක් කලක දිවාවිකාල භොජන යැ එක් කලක රාත්‍රි විකාලභොජන යැයි වෙන ම දුරුකරවූ සේක. ඔවුනතුරෙන් මෙහි දිවා විකාලභොජනය දුරුකරවූ කාලය වදාරනලදී. එහි යම්හෙයකින් බුදුවරයෝ භය දක්වා තැතිගන්වා නො දුරුකරවත් ද, වැලි අනුසස් දක්වා දුරුකරවත් ද, මෙපරිද්දෙන් ම සත්‍වයෝ සුවසේ දුරුකෙරෙත් ද, එහෙයින් අනුසස් දක්වනසේක් මේ පස් ගුණයන් දැක්වූහ.

න අනුසාසනී කාරණීයා= නැවත නැවත අනුශාසන්‍යෙන් කිව යුතු නො වීය; මෙය කරවු, මෙය නො කරවු ශබ්ද සිහි ඉපදවීම කළයුතු පමණක් ම වී. එපමණකින් ම ඔවුහු කටයුතු කළාහුය, පහකටයුතු පහකළාහුය; "මහණෙනි! ප්‍රථම බෝධියෙහි භික්ෂූහු සුවව වූහ, නිකරු වූහ. අවවාදය පිළිගෙන කරන්නෝ වූහ, සි. මෙවිට ඔවුන්ගේ සුවව බව ප්‍රකාශක වූ උපමාවක් එලවන සේක්- **සෙය්‍යථාපි** යනාදිය වදළහ. එහි **සුභූමියං**= සමබිමෙහි; **"සුභූමේ සුබෙත්තෙ විහතඛාණුකෙ බ්‍රහති පතිඛාපෙය්‍ය"** යන මෙහි වූ කලි සඟස්කළ භූමිය "සුභූම" යි ආවා යැ; **චාතුම්මහාපථේ**= මහාමාර්ග දෙකක් විනිවිද ගිය තැන්හි; **ආජඤ්ඤරථෝ**= හික්මවනලද අසුන් යෙදූ රථයෙක්; **ඔදඤ්ඨපනෝදෙ**= යම්සේ රථයට නැඟී සිටියහු විසින් ගන්ට හැකි වේද, එපරිද්දෙන් ආලම්බනය

නිසා සරසට තබනලද කැවිටි ඇතියේ; **ඔවාදකාචරියෝ**= අශ්වාචාර්‍ය්‍ය යෙක්; හෙතෙමේ ම දමනය කටයුතු අසුන් දමා නුසි. **අස්සදම්මසාරථි** නම් වෙයි; **යෙනිච්ඡකං**= යම් යම් මහකින් කැමති වේද; **යදිච්ඡකං**= යම යම් ගතිය (=ගමන) ක් කැමති වේ ද; **සාරෙය්‍ය**= සෘජුව ඉදිරියට යවන්නේය; **පච්චාසාරෙය්‍ය**= පෙරලා නවත්නේය; **එවමෙව බෝ**= යම් සේ ඒ අශ්වාචාර්‍ය්‍ය තෙම යම් යම් මහකින් ගමන කැමති වේද, ඒ ඒ මහට අශ්වයෝ ආරූඪ වූවාහු ම වෙති; තවද- යම් යම් ගතියකින් කැමති වේද, ඕ ඕ ගතිය ගන්නාලද්දී ම වෙයි; රථය යවා අශ්වයෝ නො ම වැළකියයුත්තාහු වෙති, (කැවිටෙන්) නො විද්දයුත්තාහු වෙති; හුදෙක් සම වූ භූමිභාගයෙහි ඔවුන්ගේ කුරයන්හි නිමිති තබා ගමන ම බැලියයුතු වේ; එපරිද්දෙන් මට ද ඒ භික්ෂූන් කෙරෙහි නැවත නැවත කියයුත්තෙක් නො වීය; මේ කරවු, මේ නො කරවු යයි සිහි ඉපදවීම් මාත්‍රයෙක් ම කටයුතු වේ. ඔවුන් විසින් ද එකෙණෙහි කටයුතු කරන ලද්දේ ම වෙයි; නො කටයුතු හරිනලද්දේ ම වේ. **සාසම්භා**= යම්හෙයකින් සුවඳ වූවාහු (අසුන්) යෙදූ යානයක් සමාන වූවෝ වැ සිහි ඉපදවීම් පමණෙකින් ම හැරියාහු ද, එහෙයින් තෙපි ද හරිවු යන අර්ථයි. **එල කණ්ඩකි**= එලණ්ඩයෝ ශාලදූෂණයෝ (=පිලිළ?) වෙත් ල, එහෙයින් මෙසේ වදාළහ. **විසෝධෙය්‍ය**= ශාලදූෂණයන් ද අන් වැල් ද සිදු බැහැර දැමීමෙන් ශුද්ධ කරන්නේය; **සුජානා**= මොනොවට පිහිටියාහු; **සම්මා පරිහරෙය්‍ය**= මධ්‍යාදුව බැඳ ජලය ඉසීමෙන් ද කලින් කල මූල අවට කෙවීමෙන්ද වැල් පදුරු ආදිය සිදීමෙන් ද දිම්ගොටු මකුළුදැල් ව්‍යලිදඬු හැරීමෙන් ද මනාකොට වඩන්නේය. පොෂණය කරන්නේය; වුඩි ආදි (පදයෝ) කියනලද අර්ථ ඇත්තාහු මැයි.

. මේවිව අඤ්ඤානියෙහි දෙස් දක්වනසේක් **භූනසුඛං** යනාදිය වදාළහ. එහි **වෙදෙහිකා**= විදෙහරට වැසි කුලයකගේ දියනි වූ; නොහොත් "වෙද" යි ප්‍රඥව කියනු ලැබේ. ප්‍රඥ නො ඉවසීමෙයි දෙස. වෙන් උතුසාහ කෙරෙයි, ඉරියව් පවත්වා නුසි "වෙදෙහිකා" නමු; පණ්ඩිත වූ යන අර්ථයි. **ගහ පනානි**= ගෘහස්වාමිනීය; **කිතනිසඥ්ඤ**= කිත්තිං සොෂය; **සොරතා**= සුරතබැවින් යුකතවූවා; **නිබ්බානා**= පහත් පැවතුම් ඇත්තී; **උපසන්නා**= නිවුනී; **දකඛා**= බත් පිසීම් යහන් ඇතිරීම් පහන් දැල්වීම් ආදි කටයුතු වල දක්ෂ වූවා; **අනලසා**= උත්සාහවන්තියී ඇත්තී; **සුසංවිහිතකම්මන්තා**= මොනොවට පිහිටුවනලද කම්මන්ත ඇත්තී; එකක් අනලස වූවා වෙයි; එතකු දු වුවත් යම් යම් බදුනක් ගනීද ඒ ඒ බදුන බිඳී හෝ සිරුර හෝ සිදුරු කරයි; මෝ වනාහි එබදු වූ වා නො වේ යයි දක්වයි. **දිවා උඤ්ඤසි**= උදැසන කටයුතු වූ දෙනුන් දෙවීම් ආදි කටයුතු නො කොට ගිර නැගිකල්හි නැගිසිටියා; **හෙ ජෙ කාලි!**= කොල! කාලිය! **කිං ජෙ! දිවා උඤ්ඤසි**= කිම නිට කිසි අපහසුවක් ඇද්දැ?යි; **නො වත රෙ කිඤ්චි**=

කොල! ඉදින් තිට කිසි අපහසුවක් නැත් නම් නො මැ හිස රැජ කෙරේ නම් පිට රැජ නො කෙරේ නම් එකල්හි කුමක් හෙයින් ලාමක දැසිය! දහවල් වැ නැගිසිටියෙහි යයි කිපියා නො සතුටු වූවා බැම බිඳිම කළා; **දිවාතරං උඤ්ඣසි**= දෙවනදවස් ඉතා හිර නැගිකල්හි නැගිසිටියා; **අනත්ත මනවාවං**= කොල! ලාමක දැසිය! තමාගේ පමණ දනුව, කිම ගින්න සිහිල් යයි සිතහි ද? මෙවිට ති භික්ම්වන්නෙමි,යි ආදිය කියමින් කිපි වවන නික්ම්වීය; **පඤ්ඤායතූනං**= අසල් ගෙවැසියන්ව; **උජ්ඣාපෙසි**= අවමන් කොට කීය; **චණ්ඩි**= සුරත නො වූවා අපරාධ ඇත්තී යැ; මෙසේ යම් පමණ ගුණ වූවාහු ද එයින් විහුණ වූ දෙෂයෝ උපන්නාහුය; ගුණ යෝ නම් සෙමින් සෙමින් පැමිණෙති, දෙෂයෝ එක්දිනකින් ම පත ලාහු වෙත්

සොරත සොරතෝ= ඉතා ම සුරත වූයේ; සෝවාන් වූවෙක් දෝ හෝ **සකදාගාමී - අනාගාමී - රහත්** වූවෙක් දෝ හෝයි කියයුතුබවට පැමිණෙයි; **පූසනති**= සපතී කෙරෙමින් හැටෙමින් හමුවට පැමිණෙති; **අථ භික්ඛු සොරතොති වෙදිතබ්බා**= එකල්හි අධිවාසනඤාණයෙහි සිටියාවූ මහණ සුරත වූයේ යයි දතයුතු; **යො චිවර —පෙ— පරික්ඛාර මත්තූ**= යමෙක් මේ සිවුරු ආදිය ඉතා ප්‍රණීත වූවන් පාපිරියම් පිවපිරි යම් ආදිය ලබන්නේ එක් වවනයෙන් ම කෙරේ ද; **අලභමානෝ**= පෙර යම්සේ ලබාද, එපරිද්දෙන් නො ලබන්නේ; **ධම්මකෙළඤ්ඤව සකකරොතෙනෝ**= ධර්‍මයට ම සතකාරය සුකෘත ක්‍රියාව කරන්නේ; **ගරුකරොතෙනෝ**= ගරු වූ බර වූ (ක්‍රියාව) කරන්නේ; **අපචායමානෝ**= ධර්‍මයට ම පූජාව පහත් පැවැත්ම දක්වන්නේ;

මේසේ නො ඉවසිමෙහි දෙස් දක්වා මේවිට යමෙක් ඉවසත්ද ඔවුහු මේසේ **ඉවසති**,යි පඤ්චවවනපථයන් දක්වනසේක් **පඤ්චිමෙ භික්ඛවෙ!** යනාදිය වදාළහ. **එහි කාලෙන**= යුකතප්‍රාප්ත (=සුදුසු පැමිණි) කාල යෙන්; **භූතෙන**= ඇත්තාවූ විද්‍යමානවූ (කරුණකින්;)

පඤ්චවවනපථය. **සභණ්හෙන**= මිහවූ (වවනයෙන්;) **අසඤ්හිතෙන**= අපී නිශ්‍රිත වූ කාරණ නිශ්‍රිත වූ (වවනයෙන්;) **අකාලෙන** යනාදිය ඔවුන්ගේ ම ප්‍රතිපක්‍ෂ වශයෙන් දතයුත්තා හුය. **මෙත්ත චිත්තා**= උපන් මෙත්සිත් ඇත්තෝ වැ; **දොසන්තරා**= දුරට වූ සිත් ඇත් තානු ඇතුලත උපන් වෙශ ඇත්තෝ වැ; **නත්‍ථ**= ඒ වවනපථයන්හි; **එරිතා**= ඇලී (=පැකිර;) **තදුරමමණකඤ්ච**= සියලු සත්‍වයන් ඇති ලොකය කෙසේ තදුරමමණ කෙරේ ද යත්? පඤ්චවවනපථයන් ගෙන ආ ප්‍රදග ලයා මෙත්සිතට අරමුණු කොට යලි ඒ මෙත්සිතට ම සෙසු සත්‍වයන් අරමුණු කරන්නේ සියලු සත්‍වයන් ඇති ලොකය තදුරමමණ කෙරෙයි නම් වේ. එහි මේ වවනාර්‍ථ යැ- **තදුරමමණකඤ්ච**= ඒ මෙත්සිතට ම අර මුණු කොට; **සබ්බාවනත**ං= සියලු සත්‍වයන්ඇති; **ලොකං**= සත්‍වලොකය; **විපුලෙන**= නොයෙක් සත්‍වයන් අරමුණු කොට ඇති; **මහග්ගතෙන**= මහදගත භූමියෙහි වූ; **අප්පමාණෙන**= මොනොවට වඩනලද්දාවූ; **අවෙ**

රෙන= නිදේශ වූ; **අබ්‍යාපජ්ඣෙන**= නිදුක් වූ; **එවඤ්ච විහරිස්සාම**= මෙබඳු මෛත්‍රීසහගත වූ සිතින් ඒ පුද්ගලයා ද සියලු ලොකය ද ඒ සිතට අරමුණු කොට පතුරුවා වාසය කරන්නෙමු. මෙවිට ඒ අර්ථය ප්‍රකාශ කරන්නාවූ උපමාවක් එලවනසේක් **සෙය්‍යථාපි** යනාදිය වදාළහ.

එහි **අපඤ්ච**ං= නො පොළොවක් කරන්නෙමි, අභාවයට පමුණුවන් නෙමි, යන අර්ථයි. **තත්‍ර තත්‍ර**= ඒ ඒ තැන්හි; **විකිරෙය්‍ය**= පැසකින් පස්නහා බිජුවට මෙන් විසුරුවන්නේය; **ඔක්ඛෙය්‍ය**= හෙළගසන්නේය; **අපඤ්චං කරෙය්‍ය**= මෙසේ කසින් ද වචනයෙන් ද උපක්‍රම කොට ත් නො පොළොව කරන්ට හැකි වන්නේ ද? යි; **ගම්භීරා**= බොල් (=ඝන) බැවින් යොදුන් දෙසියදහසක් හා සිව්නහුතයක් ද (= දෙලක්ෂ සතලිස් දහසක්) ගැඹුරු යැ; **අප්පමේය්‍යා**= සරස වූ කලි නො පිරිසුන් වූවා; **එවමෙව ඛො** යන මෙහි මේ උපමාසංසන්දන යැ- ඒ මෙසේයි; පෘථිවිය මෙන් මෙත්සිත දතයුතු; උදුල්ල හා පැස ගෙන ආ පුරුෂයා මෙන් පඤ්චවචනපථයන් ගෙන ආ පුද්ගල තෙමේ දතයුතු; යම්සේ හෙතෙම උදුල්ලෙන් හා පැසින් මහපොළොව නො පොළොවක් කරන්ට නො හැකි වේද, එපරිද්දෙන් පඤ්චවචනපථයන් ගෙන ආ පුද්ගල තෙම තොපගේ මෙත්සිත අන්‍යථාත්වයක් කරන්ට නො හැකි වන්නේය,යි.

දෙවෙනි උපමාවෙහි- **හලිද්දිං**= යම් කිසි කහපැහැයක්; **නීල**ං= කස් නිල හෝ පලාවන්නිල හෝ; **අරූපී**= රූපරහිත වූ ෂය්; තවද- "කාෂ්ට දෙකක්හුගේ හෝ රුක් දෙකක්හුගේ හෝ යහන් දෙකක්හුගේ හෝ ගල් දෙකක්හුගේ හෝ අතර පරිච්ඡින්නාකාශරූපය,යි ආයේ නො වේද? කුමක් හෙයින් මෙහි "අරූපී" යයි කියනලද ද යත්? **ඝනිදර්ශනභාවයට ප්‍රතික්ෂේප** වශයෙනි; **එහෙයින් ම වදාළහ- අනිදස්සනෝ** යි. යම්හෙයකින් එහි රූපයක් අදින්ට රූපයාගේ පහළවීම් දක්වන්ට නො හැකි ද, එහෙයින් **අරූපි** යි වදාරනලදි. **අනිදස්සනෝ**- දර්ශනයට චක්ෂුර්ඥානයට ආපාථ (=හමු) නො වූයේ; **මෙහි උපමාසංසන්දනයෙහි වනාහි- අහස මෙන් මෙත්සිත** යැ; තෙලිකූර පස්වැනි කොව් ඇති සතර **රඞ්ගජාත** යන් මෙන් පඤ්චවචනපථයෝ යැ; තෙලිකූර පස්වැනි කොට ඇති සෘයම් ගෙන ආ පුරුෂයා මෙන් පඤ්චවචනපථයන් ගෙන ආ පුද්ගල තෙමේ යැ; යම් සේ හෙතෙම තෙලිකූර පස්වැනිකොට ඇති සෘයම්වලින් අහසෙහි රූපප්‍රාදුර්භාවය කරන්ට නො හැකි වේ ද, එපරිද්දෙන් පඤ්ච වචිනපථයන් ගෙන ආ පුද්ගල තෙම තොපගේ මෙත්සිත අන්‍යථාත්වයක් කොට වෙෂයාගේ ඉපදීම් දක්වන්ට නො හැකි වන්නේය,යි.

තුන්වෙනි උපමාවෙහි- **ආදිත්තං**= ප්‍රජ්වලිත වූ; **ගම්භීරා අප්පමෙය්‍යා**= මේ ගඞ්ගාවගේ ගැඹුරු තැන ගවුවක් ද අඩයොදුනක් ද ඇති, ඇගේ පුලුල්බව වූ කලි එබඳු මැයි; දිගින් වනාහි යොදුන් පන්සියයක් වෙති; ඕ තොමෝ සෙසේ ගැඹුරු වූවා අප්‍රමේය්‍ය වූවා ද යත්? මේ ප්‍රයෝගයෙන් පරිවර්තනය කොට උදුනෙහි දියක් මෙන් තවන්ට නො හැකිවන

හෙයිනි. සිටි ජලය වතාහි කිසි උපායයෙකින් අඟුලක් පමණ හෝ අඩ අඟුලක් පමණ හෝ මෙසේ තවන්ට හැකි වන්නේය, එතකුදු වුවත් මෝ (නදිය තවන්ව) නො හැකි වන්නීය; එහෙයින් මෙසේ වදාරනලදී. මෙහි උපමාසංසන්දනයෙහි වතාහි ගඟ මෙන් මෙත් සිත යැ; තණහුල ගෙන ආ පුරුෂයා මෙන් පඤ්චවචනපථයන් ගෙන ආ පුද්ගල තෙමේ යැ; යම්සේ හෙතෙම තණහුලින් ගඩගාව තවන්ට නො හැකි වේද, එපරිදි දෙන් පඤ්චවචනපථයන් ගෙන ආ පුද්ගල තෙම තොපගේ මෙත් සිත අන්පරිද්දෙකින් කරන්ට නො හැකි වන්නේය,සි.

සතරවෙනි උපමාවෙහි- බිලාරහසකා= බළල්සමින් කළ හස්ත්‍රාව (= පසුම්බිය;) සුමද්දිතා= මොනොවට මදිනලද්දී; සුපරිමද්දිතා= ඇතුලත ද පිටත ද හාත්පසින් මනාකොට මදිනලද්දී; තූලිනී= හිඹුල්පුලුන් ලියපුලුන් සමාන වූවා; ජිනනසඤ්ඤරා= සිදිනලද "සඤ්ඤර" යන ශබ්ද ඇත්තී; ජිනනභඛභරා= සිදිනලද "භඛභර" යන ශබ්ද ඇත්තී; මෙහි උපමාසංසන්දනයෙහි වතාහි බළල්සම්පහිය මෙන් මෙත්සිත යැ; දඹු කැබිලිති ගෙන ආ පුරුෂයා මෙන් පඤ්චවචනපථයන් ගෙන ආ පුද්ගල තෙමේ යැ; යම්සේ හෙතෙම කාෂ්ඨයකින් හෝ කඨලයකින් හෝ විඛා ලහස්ත්‍රාව "සරසර" යන ශබ්ද "හරහර" යන ශබ්ද කරන්ට නො හැකි වේ ද, එපරිද්දෙන් පඤ්චවචනපථයන් ගෙන ආ පුද්ගලතෙම තොපගේ මෙත්සිත වෙනස් කොට වෙඟස අනුව හියඹව කරන්ට නො හැකිවන් නේය,සි.

ඔවරකා= ලාමක හැසිරීම් ඇත්තාහු පහත් හැසිරීම් ඇත්තාහු; නීචක්‍රියා කරන්නාහු යන අර්ථයි. යො මනො පදොසෙය්‍ය= යම් මහ ණෙක් හෝ මෙහෙණක් හෝ සිතාප්‍රදූෂ්‍ය කරන්නේ ද, ඒ කියතින් පහතට කැපීම නො ඉවසන්නේ ද; න මේ සො තෙන සාසනකරො= හෙතෙම ඒ නො ඉවසීමෙන් මාගේ අවවාදය කරන්නේ නො වෙයි; එහෙත් මෙහි ඇවතක් නැති. අණුං වා ථූලං වා= අල්පසාවද්‍ය වූ හෝ මහාසාවද්‍ය වූ හෝ; යං තුමෙහ නාධිවාසෙය්‍යාථ= යමෙක් තොප විසින් නො ඉවසිය යුත්තේ නො වන්නේය යන අර්ථයි. නො හෙතං භණෙන!= වහන්ස! නො ඉවසියයුතු වචනපථයක් නම් නො දක්නෙමු යන අදහස යැ; දීඝරත්තං හිතාය සුඛාය යි මෙසේ භාග්‍යවතුන් වහන්සේ රහත් බැවින් කුළු ගන්වමින් අනුසඤ්ඩි වශයෙන් දෙශනාව නිමවූ සේකැයි.

කකචූපම සූත්‍ර වර්ණනා නිමි.

අලගද්ද සූත්‍ර වණ්ණනා.

එවමෙමසුතං යි අලගද්ද සූත්‍ර යයි. එහි ගිජ්ඣලිහිණියන් නැසුවාහු නුයි "ගඩබාධිං" නම් වෙති; ගිජ්ඣලිහිණියන් නැසූ පෙර පුරුෂයෝ මොහුට නුයි "ගඩබාධිපුබ්බ" නම් වෙයි; ඒ **ගඩබාධිපුබ්බස්ස**= ගිජ්ඣලිහිණියන් නසනකුලයෙහි උපන්නහුගේ යන අර්ථයි. සවගීමොක්ෂයන්ට අනන්තරය කෙරෙත් නුයි **අනන්තරාධිකා** නම් වෙති; ඔවුහු කම්ම-කිලෙස-විපාක-උපවාද-ආණාවීතික්කකම වශයෙන් පඤ්චවිධ වෙති;

අනන්තරාධිකා ධම්මෝ. ඔවුනතුරෙහි 1. පඤ්චානන්තරිය ධම්මයෝ **කම්මානන්තරාධිකා** නම් වෙති, භික්ෂුණීදූෂක කම්ය ද එසේයි; එහෙත් එය මොක්ෂයට ම අනන්තරය කෙරෙයි, සවගීයට අනන්තරය නැති. 2. **නියතමිච්ඡාදිට්ඨි** ධම්මයෝ කෙලශානන්තරාධිකා නම් වෙති; 3. පණ්ඩක නිරග්ගිනගතික - උභතොබ්‍යඤ්ජනකයන්ගේ ප්‍රතිසන්ධි ධම්මයෝ විපාකානන්තරාධිකා නම් වෙති; 4. **ආයෙහිපවාද** ධම්මයෝ උපවාදානන්තරාධිකා නම් වෙති; ඔවුහු වූකලි යම්තාක් ආර්‍යයන් ක්ෂමා නො කරවත් ද ඒ තාක්ම වෙති, එයින් මත්තෙහි නො වෙත්. 5 දූන දූන ඉක්මවනලද සපත ආපත්තිසකාධියෝ ආඥව්‍යතික්‍රමානන්තරාධිකා නම් වෙති; ඔවුහු ද යම් තාක් භික්ෂුභාවය හෝ ප්‍රතිඥ කෙරේ ද, (ඇවතින්) නො නැගිටි හෝ වේද, නො දෙසා හෝ වේද, ඒ තාක් ම වෙති; එයින් මත්තෙහි නො වෙත්.

එහි මේ මහණ බහුශ්‍රැත යැ ධම්කථික යැ සෙසු අනන්තරාධිකා ධම්මයන් දනී, එහෙත් විනයෙහි අදක්ෂ බැවින් ප්‍රඥප්තිව්‍යතික්‍රමානන්තරාධිකා ධම්මයන් නො දනී; එබැවින් රහඹිගත වූයේ මෙසේ සිතී- "මේ ගිහි ගෙවැසියෝ පස් කම්ගුණ වලඳනාහු ශ්‍රොතාපන්නයෝ ද සකෘදාගාමීහු ද අනාගාමීහු ද වෙති, භික්ෂූනු ද මනවබන්නාවූ චක්ෂුර්විඥානයෙන් ගත යුතු වූ රූපයෝ දකිති, කායවිඥෙය වූ සප්‍රතීයන් සප්‍රති කෙරෙති, මෘදුවූ අතුරුණු පියවිලි ආදිය පරිභොග කෙරෙති, මේ සියල්ල වටනේය, කුමක් හෙයින් සත්‍රීන්ගේ ම රූප ශබ්ද ගන්ධ රස ස්පෂ්ටීව්‍යයෝ නො වටිත් ද? මොවුහු ද වටිත්, යයි මෙසේ (අනවද්‍ය වූ ප්‍රත්‍යය පරිභොග) රසය හා (සාවද්‍ය වූ කාමපරිභොග) රසය සසඳ, සවිඥඤරාගපරිභොගය ද නිවිඥඤරාගපරිභොගය ද එකක් කොට ඝනවැහැරිහු සමග ඉතා සියුම් හුයක් ගවන්නෙකු මෙන් අඹුවක් සමග මහමෙර සමාන කරන්නෙකු මෙන් ලාමක වූ දෘෂ්ටියක් උපදවා "කිම භාග්‍යවතුන් විසින් මහසමුද්දර බඳින් නකු මෙන් මහත් වූ වැයමින් ප්‍රථමපාරාජිකාව පනවනලද ද? මෙහි දෙසෙක් නැතැ" යි **සම්ඝතාඥනය** හා ප්‍රතිවිරුඬ වෙමින් වෛශාරද්‍ය ඥනය ප්‍රතිබාහනය කෙරෙමින් ආර්‍යමාගීයෙහි කණු සටු ආදිය හෙලමින් මෙවුන්ධම්හි දෙසෙක් නැතැයි **සම්ඝයන් වහන්සේගේ** ආඥාචක්‍ර

යෙහි පහර දුන්නේයි. එයින් කියා- **නථා'හං භගවතා ධම්මං දෙසිතං ආජානාමි** යනාදිය. **එවං වා බො**= "එවං + වා ඛො"= එසේ ම; **සම්මුයුඤ්ජතී** යනාදියෙහි තෙපි කුමන ලඛ්ධි ඇත්තෙහි ද? ලඛ්ධිය කියව,යි විචාරන්නාහු "සම්මුයුඤ්ජතී"= **සම්මුයුඤ්ජනය** කෙරෙත් නම් වෙයි; ලඛ්ධිය පිහිටුවන්නාහු **සම්මුගාහනති**= සම්මුගාහනය කෙරෙත් නම් වෙයි; කුමන කරුණකින් මෙසේ කියහි ද? යි කාරණය විචාරන්නාහු **සම්මුභාසනති**= සම්මුභාෂණය කෙරෙත් නම් වේ. **අසී සූඛබලූපමා කාමා** යනාදියෙහි **අසීසූඛබලූපමා**= මඳ වූ රසවිදීම් අර්ථයෙන් (ඇට සැකිල්ලකට බඳු උපමා ඇත්තාහුය;) **මංසපෙසූපමා**= බොහෝදෙනාට සාධාරණභාවයෙන් (මස්වැදැල්ලකට බඳු උපමා ඇත්තාහුය;) **තිණුකූපමා**= අනුදහනභාවයෙන් (තණහුලකට බඳු උපමා ඇත්තාහුය;) **අඞ්ගාරකාසූපමා**= මහත් වූ අභිතාපභාවයෙන් (අඟුරුවළකට බඳු උපමා ඇත්තාහුය;) **සුපිනකූපමා**= මඳකලක් ඵලඹ සිටීම් අර්ථයෙන් (සිහිනයකට බඳු උපමා ඇත්තාහුය;) **යාචිතකූපමා**= තාවකාලිකභාවයෙන් (පිරුලෙන් ගත්තාලද්දකට බඳු උපමා ඇත්තාහුය;) **රුක්ඛඵලූපමා**= සියලු අහපසඟ බිඳීම් අර්ථයෙන් (රුක්ඵල හා උපමා ඇත්තාහුය;) **අසිසූනූපමා**= අධිකුට්ටනාර්ථයෙන් (කඩුව හා මස්ලොඹුවකට බඳු උපමා ඇත්තාහුය;) **සත්තිසූලූපමා**= විනිවිද යන අර්ථයෙන් (සැත්හුලකට බඳු උපමා ඇත්තාහුය;) **සපඵඬරූපමා**= සාශඞ්කසප්‍රතිභයභාවයෙන් (සර්පයකට බඳු උපමා ඇත්තාහුය;) **ඵාමසා**= දෘෂ්ටිඵාමශයෙන්; **පරාමාසා**= දෘෂ්ටි පරාමර්ශයෙන්; **අභිනිවිසන්ති**= ඇතුලත්ව ව්‍යවහාර කෙරෙයි හෝ දක්වයි; **යතෝ බො තෙ භික්ඛූ**= යම් කලක ඒ භික්ෂූහු; **එවං වා බො අහං භන්තෙ! භගවතා** යන මෙය මේ තෙම තමාගේ අදහසින් නැතැයි කියනු කැමැත්තේ ද භාග්‍යවතුන් වහන්සේගේ ආනුභාවයෙන් පිළිගනී; බුදුවරයන්ගේ හමුවෙහි කථා දෙකක් කියන්ට සමර්ථයෙක් නම් නැත්ල. **තඤ්ච බො නාම ත්වං මොඝ පුරිස!**= තුච්ඡපුරුෂය! තෙපි කවර ක්ෂත්‍රිය යෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ වෛශ්‍යයෙකුට හෝ ශූද්‍රයෙකුට හෝ ගෘහස්ථයෙකුට හෝ ප්‍රව්‍රජිතයෙකුට හෝ දෙවියෙකුට හෝ මනුෂ්‍යයෙකුට හෝ මා විසින් මෙසේ දෙසනලද ධර්මය දන්නෙහි ද?

අථ බො භගවා භික්ඛූ ආමන්තෙසි යනු වෙන ම අනුසන්ධියෙකි. අරිමට තෙම මෙසේ සිතී ල- "භාග්‍යවතුන් වහන්සේ මට මොඝපුරිෂ යයි කියති එහෙත් මොඝපුරුෂ යයි කී පමණකින් මාගේඵලයන්ට උපනිශ්‍රය නො වන්නේ නො වෙයි; ඒ එසේ මැයි- වඩ්ඪමානපුත්‍ර උපසේන තෙරුන්ට ද "**අභිලහුං බො ත්වං මොඝපුරිස! බාහුල්ලාය ආවත්තෝ**" යි භාග්‍යවතුන් වහන්සේ මොඝපුරුෂ යන වචනයෙන් අවවාද කළසේක; තෙරුන් වහන්සේ මැතකාලයෙහි ගැටෙමින් වැඩම කරමින් ඔවහිඟ පසක් කළහ. ඔම් ස් එබඳු ව්‍යර්ථය දැඩිව ගෙන මහපල

උපදවන්නෙමි" යි. එකල්හි භාග්‍යවතුන් වහන්සේ කටුයෙන් ගිලිහුණු පඬුවන් කොලයක මෙන් ඔහුගේ (සසුන්හි) නො වැඩෙනබැව් දක්වමින් මේ දෙසනාව ආරම්භ කළහ. **උසම්භනෙ'පි**= මහණෙනි! තෙපි කුමැයි සිතවු ද? මේ අරිඨ තෙම මෙබඳු ලබ්ධි ඇත්තේ සච්ඡතාඥනය හා ප්‍රතිවිරුඬ වූ වෛශාරද්‍යඥනය ප්‍රතිබාහනය කොට තථාගතයන්ගේ ආඥාචක්‍රයෙහි පහරදෙමින් මේ ශාසනයෙහි ඥානොඝමයෙන් උණුසුම් කරනලද්දේත් වේ ද? යම්සේ මහත් වූ ගිනිකඳක් නිවිගිය කල්හි දු යම් (ගිනිපුපුරක්) නිසා ඇති මහා ගිනිකඳෙක් වන්නේ ද, (එබඳු) කඳෙපැනි යකු පමණ වූ ද ගිනිපුපුරක් වේ මැයි; කිම එපරිද්දෙන් මොහුට යම් (නුවණක්) නිසා වැයම් කරන්නේ මහපල උපදවන්නේ ද (එබඳු) මද පමණ වූත් ඥානොඝමයෙක් ඇද්දැ?යි. **භො හෙතං හණෙන!**= වහන්ස! මෙබඳු ලබ්ධි ඇත්තහුට මෙබඳු වූ ඥානොඝමයෙක් කොයින් ද? මාගීඵල යන්ට ප්‍රත්‍යයවීමට සමර්ථවූ ඥානොඝමයෙන් උණුසුම් කළබැව් ප්‍රතික්ෂෙප කරමින් කියත්. **මඬඛුභූතො**= තෙදරහිත වූයේ; **පත්තක්ඛන්ධො**= (පහතට) හෙලූ කඳඇත්තේ; **අප්පටිභානො**= කිසි වැටහීමක් නො දක්නේ, සුන් වැටහීම් ඇත්තේ; මෙබඳු වූ ද නෛයර්‍යාණික ශාසනයක් ලැබ නො වැඩෙනපියවි ඇත්තෙම් වූ යෙම් ල, නසනලද ප්‍රත්‍යය ඇත්තෙම් වීම් ල,යි තමාගේ අභව්‍යභාවය ප්‍රත්‍යවෙක්ෂා කරමින් පාදඬහුඡයෙන් බිම සාරමින් හුන්නේයි.

පඤ්ඤුසිඤ්ඤි බො යන මේ ද වෙන ම අනුසන්ධියෙකි. අරිඨ තෙම මෙසේ සිතී ල- "භාග්‍යවතුන් වහන්සේ **මාගේ** මාගීඵලයන්ට උපනිශ්‍රය පසිදුනාලදැයි වදරති; එහෙත් බුදුවරයෝ උපනිශ්‍රය සහිත වූවන්ට ම දහම් නො දෙසති, උපනිශ්‍රය රහිතයන්ට ද දෙසනා කෙරෙති මම ශාස්තෘන් වහන්සේගේ සමීපයෙන් සුගතොවාදය ලැබ තමාගේ සම්පත්තියට පැමිණෙන කුශලයක් කරන්නෙමි" යි. **ඉක්ඛිති** ශාස්තෘන් වහන්සේ ඔහට අවවාදය පිළිබහනසේක් **පඤ්ඤුසිඤ්ඤි** යනාදිය වදළහ ඒ පදයාගේ මේ අර්ථ යැ- මොඝපුරුෂය! තෙපි මෑ මේ ලාමක වූ දෘෂ්ටිය හෙතුකොට ගෙන නිරයාදියෙහි පැනෙන්නෙහි, මා සමීපයෙන් තට සුගතොවාදයෙක් නම් නැති, මට තා විසින් වැඩෙක් නැති, **මෙහි** ලා මම භික්ෂූන් විචාරන්නෙමි,යි.

අථ බො භගවා යන මේ ද වෙන ම අනුසන්ධියෙකි. **මෙ** තැන්හි භාග්‍යවතුන් වහන්සේ පිරිස ශුද්ධ කරනසේක; අරිඨමහණ ගණයෙන් බැහැර කරනසේක. ඒ එසේ මැයි- ඉදින් පිරිසෙහි වූවන් අතුරෙන් කිසිවෙකුට මෙබඳු සිතක් වන්නේ ද; මේ අරිඨ තෙම භාග්‍යවතුන් විසින් නො කියනලද්දක් කියන්ට කිම හැකි වන්නේ ද, කිමෙක් ද පිරිස්මැද භාග්‍යවතුන් විසින් කථාව පවත්ගත් කල්හි වහා කියනලද දැ? යි කියායි; මෙසේ කියනලද්ද වනාහි අරිඨ තෙමේ ම නො අසයි,

අන්‍යයා විසින් ද අසන්නලද්දේ වන්නේය; තවද- ඕහට මේ සිත වන්නේය- යම්සේ ශාස්තෘන් වහන්සේ අරිඨමහණ නිග්‍රහ කෙරෙත් ද, මට ද මෙපරිද්දෙන් නිග්‍රහ කරන්නේකැයි අසාත් තූෂ්ණීම්භාවයට පැමිණෙන්නේය,යි; ඒ සියල්ල නො කරන්නාහුය, මා විසින් ද නො කියන ලද්දක් අනිකෙකු විසින් ද අසන්නලද්දේ නැතැයි තුමෙහ'පි මෙ භික්ඛවෙ! යනාදීන් පිරිස්හි ලබ්ධිය ශුද්ධ කරන්නේක; යලි පිරිස්හි ලබ්ධිය ශුද්ධ කිරීමෙන් ම අරිඨ තෙම ගණයෙන් බැහැර කරන්නලද්දේ නම් වේ.

අරිෂ්ටභික්ෂුවගේ ලබ්ධිය.

මෙවිට අරිෂ්ටභික්ෂුවගේ **ලබ්ධිය** ප්‍රකාශ කරන්නේක් **සො වත භික්ඛවෙ!** යනාදිය වදාළහ. එහි **අඤ්ඤත්‍රෙව කාමෙහි** යනාදියෙහි මහණෙනි! යම් ඒ මහණෙක් (අන්තරායකරවස්තු කියන ලද) "ඒ ධර්මයෝ සෙවනාහට සවගී මොක්ෂාන්තරාය පිණිස සමර්ථ නො වෙති" යි මෙසේ ලබ්ධි ඇත්තේ ද, හෙතෙම **එකාන්නතයෙන්** කෙලශකාම යන්ගෙන් ද කෙලශකාම සම්ප්‍රයුක්ත වූ සංඥාවිතර්කයන්ගෙන් ද වෙන් ව මේ ධර්මයන් හැර මේ ධර්මයන්ගෙන් වෙන් ව වසන්නට කාමයන් සෙවනය කරන්නේය, මේ ඵල සමාචාරයෙහි හැසිරෙන්නේ ය,යි **නෙතං ඨානං විජ්ජති=** මේ මේ කාරණය නම් නැත්තේ. මෙය කරුණු රහිත යැ අනවකාශ ය,යි. මෙසේ භාග්‍යවතුන් වහන්සේ මේ අරිඨ තෙම යම්සේ රදවෙක් සුවඳ වූ ද දුගඳ වූ ද දිරූ ද අලුත් වූ ද ශුද්ධ වූ ද අශුද්ධ වූ ද වස්ත්‍රයන් එක් කොට පොදියක් කෙරේ ද, එපරිද්දෙන් ම භික්ෂූන්ගේ නිවර්ණදූරාග වූ ප්‍රණීත චීවරාදීන්ගේ පරිභොගය ද නිබඳ සිල් නැත්තවුන්ට අනන්තරාය කර වූ සවර්ණදූරාග පරිභොගය ද නිබඳ සිල් ඇති භික්ෂූන්ට ආවරණ කර වූ සවර්ණදූරාග පරිභොගය ද සියල්ල එක් වැනි කෙරේ යයි අරිෂ්ටගේ **ලබ්ධිය** ප්‍රකාශ කොට මෙවිට වරදවා ගන්නාලද පඤ්චාපත්තියගේ දොෂය දක්වනසේක් **ඉඛ භික්ඛවෙ! එකච්චෙව** යනාදිය වදාළහ.

නවාඞ්ගශාසනය.

එහි පරියාපුණන්තීති= උගනිත්; **සුත්තං** යනාදියෙහි උභතොවිභඞ්ග - **නිද්දෙස - ඛන්ධක - පරිවාරයෝ** ද **සූත්‍රනිපාතයෙහි මඞ්ගලසූත්‍ර - රතන සූත්‍ර - නාළකසූත්‍ර - තුවටකසූත්‍රයෝ** ද අන්‍යවූ ත් **සූත්‍ර නාමය** ඇති තථාගත වචනය ද **සුත්තන** යයි දතයුතු; සියලු මැ **සගාථක සූත්‍රය ගෙය්‍ය** යි දතයුතු; විශෙෂයෙන් සංයුක්තනිකායෙහි සියලු මැ **සගාථක** වගී යයි. සියලු අභිධර්මපිටකය ද ගාථාරහිත **සූත්‍ර** ද අෂ්ටාඞ්ගයෙන් සඞ්ග්‍රහ නො කරනලද අන්‍ය වූත් යම් බුඩවචනයක් වේ නම් එය ද **වෙය්‍යාකරණ** යි දතයුතු; ධම්මපද - ථෙරගාථා - ථෙරීගාථා ද සූත්‍රනිපාතයෙහි සූත්‍රනාමය නො ලත් **සුද්ධිකගාථා** ද **ගාථා** යයි දතයුත්තිය; **සොමනස්සඤාණ** නුවණින් වදාළ ගාථාප්‍රතිසංයුක්ත වූ දෙඅසූවක් සූත්‍රාන්තයෝ **උදාන** යයි දතයුත්තාහුය; **"වුත්තඤ්හිදං භගවතා"** යනාදි නයින් දසාධික සූත්‍රාන්ත සියය **ඉතිවුත්තක** යයි දතයුත්තාහුය; අපණ්ණකජාතකය ආදි කොට ඇති

පනසක් අධික කොට ඇති ජාතක පන්සියය **ජාතක** යයි දතයුත්තා හුය; **"චතුනාරෝ'මෙ භික්ඛවෙ! අච්ඡරියා අබ්භුතා ධම්මා ආනන්දෙ"** යනාදි නයින් පැවති ආශ්චර්‍යී අද්භූතධර්‍ම ප්‍රතිසංයුක්ත වූ සූත්‍රාන්තයෝ **අබ්භූතධම්ම** යයි දතයුත්තාහුය; චුල්ලවෙදල්ල – මහාවෙදල්ල – සම්මා දිට්ඨි – සක්කපඤ්හ – සඞ්ඛාරභාජනීය – මහාපුණ්ණම් සූත්‍රාදි වූ ඥානය ද තුෂ්ටිය ද ලැබ ලැබ සියලු ම විචාරනලද සූත්‍රාන්තයෝ **වෙදල්ල** යයි දතයුත්තාහුයි.

අත්ථං න උපපරික්ඛන්ති= ප්‍රයොජන සඞ්ඛ්‍යාත අර්ථය කාරණාර්ථය තුලනය නො කෙරෙති, නො විමසති; **අනුපපරික්ඛතං**= නො විමසන්න වුන්ව; **න නිජ්ඣානං ඛමන්ති**= නො වැටහෙති, ආපාථයට නො පැමිණෙත්; මේ තැන්හි ශීලය සමාධිය විදර්‍ශනාය මාර්ගඵලය වෘත්තය විවෘත්තය හෝ කියනලදැයි මෙසේ දැනගන්ට නො හැකි වෙත් යන අර්ථයි. **නෙ උපාරම්භානිසංසා වෙව**= ඔවුහු අන්‍යයන්ගේ වාදයෙහි දෝෂාරොපණය අනුසස් කොට ඇත්තාහු වැ ප්‍රගුණ කෙරෙත් යන අර්ථයි. **ඉති වාදප්පමොක්ඛානිසංසා ච**= මෙසේ සවවාදයෙහි දෝෂාරොපණයෙන් මිදීම අනුසස් කොට ඇත්තාහු; අන්‍යයන් විසින් සවවාදයෙහි දෙස් නැගුකල්හි ඒ දෝෂය මෙසේ ත් මෙසේ ත් මුදන්නෙමුයි මේ කාරණයෙන් ද ප්‍රගුණ කෙරෙත් යන අර්ථයි. **තඤ්ච'ස්ස අත්ථං නානුභොන්ති**= තව ද- යම් මාර්ගයක් හෝ ඵලයක් හෝ සඳහා කුල පුත්‍රයෝ දහම් පුහුණු කෙරෙත් ද, ඒ ධර්‍මයාගේ ඒ අර්ථය ද වරදවා ගන්නා සුලු වූවාහු නො ලබති; ඇලිදු පරවාදයෙහි දෙස් නඟන්ට සවවාදයෙන් ඒ (දෝෂය) මුදන්ට නො හැකි වන්නාහු ද ඒ අර්ථය ද නො ලබත් මැයි. **අලගද්දූපමිකෙහි**= ආශීර්ෂයෙකු කැමති වූයේ; ඒ එසේ මැයි— "ගදූ" යි විෂයව නමෙකි. එය ඔහුට පමණ වූයේ පරිපූර්‍ණ වූයේ ඇත්තුයි "අලගද්ද" නම්. **සොගෙ**= ශරීරයෙහි; **ඉධ පන භික්ඛවෙ! එකච්චෙ කුලපුත්තා ධම්මං පරියාපුණන්ති**= නිස්සාරණපර්‍යාපත්ති වශයෙන් උගනිත්.

ඒ එසේ මැයි— පර්‍යාපත්ති තුනක් වෙති, "අලගද්දපරියත්ති – නිත්ථරණ පරියත්ති – භණ්ඩාගාරික පරියත්ති" යි කියාසි. එහි- 1. යමෙක් මෙසේ සිවුරු ආදිය හෝ ලබන්නෙමි සිව්පිරිස් මැද
නිස්සරණපර්‍යාපත්තිය. හෝ මා හැඳින ගන්නාහු ය, යි ලාභසත්කාරය හෙතු කොට බුදුවදන් පුහුණුකෙරේ ද, ඔහුගේ ඕ පර්‍යාපත්තිය "අලගද්දපරියත්ති" නමු; එකෙක් ඇති- මෙසේ බුදුවදන් පුහුණුකිරීමට වඩා පුහුණු නො කොට නින්දට බැසගැනීම ඉතා උතුම් වේ. 2. යමෙක් වනාහි බුදුවදන් ඉගෙන සිලය පැමිණි තැන්හි සිල් පුරා සමාධිය පැමිණි තැන්හි සමවත් ගැබ් ගන්වා විදර්‍ශනාව පැමිණි තැන්හි විදසුන් පිහිටුවා මාර්ගඵලයන් පැමිණි තැන්හි මාර්ගය වඩන්නෙමි ඵලය

පසක් කරන්නෙමි,සි උගනී ද, ඔහුගේ ම ඕ පර්‍යාපතිය "නිප්පරණපරියතති" නම් වේ. 3. ක්ෂීණාශ්‍රවයාගේ පර්‍යාපතිය වනාහි "භණ්ඩාගාරිකපරියතති" නමු; තවද- ඔහු විසින් පරිඥතය නො කළ (සකඛ්ඩියෙක්) ප්‍රහීණ නො කළ (කෙලෂයෙක්) අභාවිත වූ (මාඝියෙක්) ප්‍රත්‍යක්ෂ නො කළ (ඵලයෙක්) හෝ නැති; යම්හෙයකින් හෙතෙම පරිඥතය කළ සකඛ්ඩි ඇත්තේ ද ප්‍රහීණ කළ කෙලෙස් ඇත්තේ ද වැඩූ මාඝිය ඇත්තේ ද ප්‍රත්‍යක්ෂ කළ ඵලය ඇත්තේ ද එහෙයින් බුදුවදන් පුහුණු කරන්නේ පාලිය ධරන්නෙක් ප්‍රවෙණිය පාලනය කරන්නෙක් වංශය රකින්නෙක් ම වී. උගනී; මෙසේ ඔහුගේ ඕ පර්‍යාපතිය "භාණ්ඩාගාරිකපරියතති" නම් වේ. තවද- යම් පෘථජ්ජනයෙක් සාඛිය ආදිය ඇතිකල්හි ග්‍රන්ථධාරීන් එක්තැන වසන්ට නො හැකි වූ කල්හි තෙමේ නිඃශීලාචාර යෙන් අතිශයින් කලාන්තවෙමින් ඉතා මිහිරි බුදුවදන් නො නසිවා, තන්තිය ධරන්නෙමි, වංශය තබන්නෙමි, ප්‍රවෙණිය රකින්නෙමි, සි පුහුණු කෙරේ ද, ඔහුගේ පර්‍යාපතිය භාණ්ඩාගාරික පර්‍යාපතිය වේ ද; නො වේ ද යත් ? නො වෙයි; කුමක් හෙයින ? සඛකිය ස්ථානයෙහි නොසිට පුහුණු කළහෙයිනි. සැබව- පෘථජ්ජනයාගේ පර්‍යාපතිය නම් "අලඟද්දූ" හෝ "නිප්පරණ" හෝ වෙයි, සප්තශෛක්ෂයන්ගේ පර්‍යාපතිය "නිප්පරණ" මැයි, ක්ෂීණාශ්‍රවයාගේ "භාණ්ඩාගාරිකපරියතති" මැයි, මෙ තැන්හි වූ කලි නිඃසරණ පර්‍යාපතිය අදහස් කරනලදුදු.

නිජ්ඣානං ඛමනති= ශීලාදිය ආ තැන්හි මෙහි ශීලය කියනලද, මෙහි සමාධිය, මෙහි විදර්‍ශනාවය, මෙහි මාඝිය, මෙහි ඵලය, මෙහි විෘත්තය, මෙහි විවෘත්තය සි, ආපාථයට පැමිණෙත්. **තඤ්ඤේව අත්ථං අනුභොතති**= යම් මාඝිඵලයන් සඳහා ප්‍රගුණ කෙරෙත් ද, මොනොවට ගන්නාලද පර්‍යාපතිය නිසා මාඝිය වඩා ඵලය ප්‍රත්‍යක්ෂ කරන්නාහු ඒ ධර්‍මයාගේ ඒ ප්‍රයොජනය ද ලබත්; පරවාදයෙහි දෙස් නඟන්ට හැකිවන්නාහු ද සවවාදයෙහි ආරොපණය කළ දෙෂය කැමති කැමති නැනක් ගෙන මුදන්ට හැකිවන්නාහු ද (ඒ අර්‍ථය) ලබත් මැයි; **දිඝරත්තං හිතාය සුඛාය සංවත්තන්තීති**= සීලාදිය ආ තැන්හි සීලාදිය පුරන්නවුන්ට ද අන්‍යයන්ගේ වාදයෙහි කරුණු සහිතව දෙස් නඟන්නවුන්ට ද සඛකිය වාදයෙන් දෙෂය බැහැර කරන්නවුන්ට ද රහත්බවට පැමිණ පිරිස්මැද දහම් දෙසා දම්දෙසුම්හි පහන් වූවන් විසින් ඵලවූ සිවිපසය වලඳන්නවුන්ට ද දික්කලක් හිත පිණිස සුව පිණිස පවතින්; මෙසේ මනාකොට උගන්නාලද බුදුවදන්හි අනුසස් දක්වා මෙවිට එහි ම ගොදවන සේක් **තඤ්ඤාතිහ භික්ඛවෙ!** යනාදිය වදළහ.

එහි තඤ්ඤා= යම්හෙයකින් වරදවා ගන්නාලද පර්‍යාපතිය වරදවා ගත් සඳියෙකු මෙන් දික්කලක් අහිත පිණිස දුක් පිණිස පවතී ද, මොනොවට ගන්නාලද පර්‍යාපතිය මොනොවට ගත් සඳියෙකු මෙන්

හිත පිණිස සුව පිණිස පවති ද, එහෙයින් යන අර්ථයි. **නථා නං ධාරෙ ය්‍යාථ**= එසේ ම එය ධරන්නහුය, ඒ අර්ථයෙන් ම ගන්නහුය; **යෙ වා පන'ඤ්ඤෙ භික්ඛූ**= යලි අන්‍ය වූ සාරිපුත්ත – මොග්ගල්ලාන – මහා කස්සප – මහාකච්චානාදි ව්‍යක්ත වූ පණ්ඩිත වූ යම් භික්ෂූහු හෝ වන්නාහුද, ඔවුහු විචාළයුත්තාහුය; අරිෂ්ට භික්ෂුව විසින් මෙන් මාගේ ශාසනයෙහි මඬ හෝ කසළ හෝ නො බහාලියයුතු.

කුලූපමං= පසුරක් සමාන කොට; **නිත්ථරණත්ථාය**= වතුරොඝනිස්තරණය පිණිස; **උදකණ්ණවං**= යම් ජලයක් වනාහි ගැඹුර ද පුලුල් නො වේද, නොහොත් පුලුල ද එහෙත් ගැඹුරු නො වෙද, එය අණ්ව යයි නො කියනු ලැබේ; යම් ජලයක් වනාහි ගැඹුරුත් වේද පුලුලත් වේද, එය අණ්ව යයි කියනුලැබේ; එහෙයින් **මහන්තං උදකණ්ණවං** යනු මහත් වූ පුලුල් වූ ගැඹුරු වූ ජලයෙකැයි මෙසේ මෙහි අර්ථයි. **සාසඞ්ක නම්** යම් පෙදෙසක සොරුන් වුසූ තැන පෙනේ ද සිටිතැන හුන්තැන හොත්තැන පෙනේ ද (එයයි;) **සප්පටිභය නම්** යම් පෙදෙසක සොරුන් විසින් මනුෂ්‍යයෝ **නසන්තලද්දුහු** දක්නාලැබෙත් ද, පැහැරගන්නා ලද්දුහු දක්නාලැබෙත් ද, **තළන්තලද්දුහු** දක්නාලැබෙත් ද, (එයයි;) **උත්තරසෙතු**= ජලාණ්ණවයාගේ මතුයෙහි බඳනාලද හෙය; **කුලලං බන්ධිත්වා**= "කුලල" නම් එතරවිම පිණිස මිටි කොට බඳනා ලද්දේයැ; පතුරුවා බඳනාලද්දේ වනාහි "පතරවාටි" ආදි යයි, යමෙක් උළුම්ප (=පාරුව) යයි කියනු ලැබේ ද (එයයි;) **උස්සාදෙත්වා**= ඔසවා තබා; **කිච්චකාරී**= කටයුතු කරනසුලු වූයෙක්, යොග්‍ය සේ කරනසුලු වූයෙක්, සුදුසු සේ කරනසුලු වූයෙක් යන අර්ථයි; **ධම්මා'පි වො පහාතබ්බා**= මෙහි ධම්මා යනු ශමථවිදර්ශනායි; සැබව භාග්‍යවතුන් වහන්සේ ශමථයෙහි ද විදර්ශනාවෙහි ද ඡන්දරාගය දුරුකරවන සේක; ශමථයෙහි ඡන්දරාගය කොතැන්හි දුරුකරවූ සේක් ද යත්? a. **"ඉති ඛො උදායි! නෙවසඤ්ඤානාසඤ්ඤායතනසස'පි පහානං වදාමි, පසන්නෙ නො ත්වං උදායි! තං සංයොජනං අණුං වා ථූලං වා යස්සා'හං නො පහානං වදාමි"** යන් මෙහි ශමථයෙහි ඡන්දරාගය දුරුකරවූහ. b. **"භූතඤ්ච තුමෙහ භික්ඛවෙ! දිට්ඨිං එවං පරිසුද්ධං පරියොදාතං න අල්ලියෙථ න සාලියෙථ න ඛනියෙථ"** යන මෙහි විදර්ශනාවෙහි ඡන්දරාගය දුරුකරවූහ. මෙහි

---

a. උදායි! මෙසේ වනාහි නෙවසඤ්ඤානාසඤ්ඤායතනයාගේ ද ප්‍රහාණය කියමි උදායි! මම යම් සංයොජනයක්හුගේ ප්‍රහාණය නො කියමිද, සියුම් වූ හෝ මහත් වූ හෝ ඒ සංයොජනය තෙපි දක්නාහු ද?

b. මහණෙනි! තෙපි මෙසේ පිරිසුදු වූ හාත්පසින් අවදාත වූ මේ දෘෂ්ටිය (= යථාභූත ඥානදර්ශන යයි කියනලද විදර්ශනාව) ද නො ඇලෙන්නහුය, මම්බව නොකරන්නහුය, බහයක් මෙන් නො ගන්නහුය.

එතෑහි දෙතැන්හි (ම ඡන්දරාගය) දුරුකරවනසේක් **ධම්මා'පි වෝ පහාතබ්බා පගෙව අධම්මා** යී වදාළහ. එහි මේ අදහස යැ– මහණෙනි! මම මෙබඳු වූ ද ශාන්තප්‍රණීත ධර්මයන්හි ඡන්දරාගප්‍රහාණය කියම්, කිම වැලිත් යම් අසද්ධර්මයෙක්හි මේ අරිඨමොඝ පුරුෂ තෙම නිදේ්ශය යන හැඟීම් ඇතිව පස්කම් ගුණයන්හි ඡන්දරාගය අන්තරාය පිණිස අසමර්ථ යයි කියාද, මේ ගම්වැසියන්ගේ ධර්මයක් වූ වසල (=හීන) යන්ගේ ධර්මයක් වූ දුෂ්ටුලල (=කෙලෙසුන් විසින් දූෂිත නො සියුම්) වූ ඕදකාන්තික වූ (=දිය කිස අවසන් කොටඇති) අසද්ධර්මයෙහි(ඡන්දරාගප්‍රහාණය නො කියම්ද?) අරිඨ විසින් මෙන් තොප විසින් මාගේ ශාසනයෙහි මඩ හෝ කසළ හෝ නො දැමියයුතු ය,සි මෙසේ භාග්‍යවතුන් වහන්සේ මේ අවවාදයෙන් අරිඨමහණ ම නිගන්නාසේක.

මෙවිට යමෙක් පඤ්චසකන්ධයෙහි ත්‍රිවිධග්‍රාහ වශයෙන් මම යැ මාගේ යැයි ගනී ද, හෙතෙම මාගේ සසුන්හි මේ අරිඨ මෙන් කලල කසළ දමා යයි දක්වනසේක් **ඡ ඉමානි භික්ඛවෙ!** යනාදිය වදාළහ. **එහි දිට්ඨානානි**= දෘෂ්ටිය ද දෘෂ්ටිස්ථාන යැ, දෘෂ්ටිහුගේ අරම්මණ ද දෘෂ්ටිහුගේ ප්‍රත්‍යය ද දෘෂ්ටිස්ථාන යැ; **රූපං එතං** මම යනාදියෙහි **එතං** මම යනු තෘෂ්ණා වශයෙන් ගැනීමයැ; **එසෝ'හමස්මි** යනු මාන වශයෙන් ගැනීමයැ; **එසෝ මෙ අත්තා** යනු දෘෂ්ටි වශයෙන් ගැනීමයැ; මෙසේ රූපය අරම්මණු කොට ඇති තෘෂ්ණාමාන දෘෂ්ටිහු කියනලද්දාහු වෙති; රූපය වනාහි ආත්ම යයි නො කියයුතුයි; වෙදනාදියෙහි ද මෙ ම නයයි. **දිට්ඨං**= රූපායතනය; **සුතං**= ශබ්දායතනය; **මුතං**= ගන්ධායතනය **රසා** යතනය සප්ශායතනය; ඒ එසේ මැයි— එය පැමිණ ගතයුතු බැවින් "මුත" යයි කියනලදී; සෙසු සප්තායතනයෝ **විඤ්ඤාතා** නම් වෙති; **පත්තං**= සොයා හෝ නො සොයා හෝ පැමිණෙනලද්ද; **පරියෙසිතං**= පැමිණෙනලද හෝ නො පැමිණෙනලද හෝ සොයනලද්ද; **අනුවිචරිතං මනසා**= සිතින් හැසිරෙනලද්ද; ඒ එසේ මැයි— ලෙව්හි සොයා පැමිණෙනලද්දේ ද ඇති, සොයා නො පැමිණෙනලද්දේ ද ඇති; එහි සොයා පැමිණෙනලද්දේ "පත්ත" නම් වෙයි; සොයා නො පැමිණෙන ලද්දේ "පරියෙසිත" නම් වෙයි; නො සොයා පැමිණෙනලද්දේ ද නො සොයා නො පැමිණෙන ලද්දේ ද "මනසානුවිචරිත" නම් වේ. නොහොත් සොයා පැමිණෙනලද්දේ ද නො සොයා පැමිණෙනලද්දේ ද පැමිණීම් අර්ථයෙන් "පත්ත" නම; සොයා නො පැමිණෙනලද්දේ "පරියෙසිත" නම; මනා සොයා නො පැමිණෙනලද්දේ "මනසානුවිචරිත" නම; මේ සියල්ල හෝ සිතින් අනුවිචරිත හෙයින් "මනසානුවිචරිත" මැ වෙයි; මෙයින් විඥානය අරම්මණු කොට ඇති තෘෂ්ණාමාන දෘෂ්ටිහු කියන ලද්දාහුය; මෙහි දෙශනා විලාසයෙන් ම දෘෂ්ටාදි අරම්මණු වශයෙන් විඥානය දක්වනලද. **යම්පිදං දිබ්බානං**= හේ ලොක යැ යනාදි නයින් පැවති යම් මේ දෘෂ්ටිස්ථානයක්; **සෝ ලොකෝ සෝ අත්තා**= යම් මෝ

"රූපං අත්තතෝ සමනුපස්සති" යනාදිනයින් පැවති දෘෂ්ටියක් ලොකය ත් ආත්මය ත් වේ යයි ගනිද ඒ දෘෂ්ටිය සඳහා මෙය කියනලදී. **සෝ පෙවව භවිස්සාමි**= ඒ මම පරලොව ගොස් නිත්‍ය වූයෙක් වන්නෙමි ධ්‍රැවයෙක් ශාශ්වතයෙක් නො වෙනස්වන සුභාව ඇත්තෙක් වන්නෙමි; සිතෙරු – මහාපෘථිවි – මහාසමුද්‍රාදි වූ ශාශ්වතීන් සමව එසේ ම සිටින්නෙමි; **තම්පි එතං මම**= ඒ දෘෂ්ටිය ද මෙය මාගේ යැ, මේ තෙම මම වෙමි, මේ මාගේ ආත්ම යයි දකි; මෙයින් රූපායතනය අරමුණු කොට ඇති තෘෂ්ණාමාන දෘෂ්ටිහු කියනලද්දාහුය; **ඒ එසේ මැයි**– විදර්ශනාවෙන් ප්‍රතිවිදර්ශනා කාලයෙහි මෙන් දෘෂ්ටියෙන් පූර්වදෘෂ්ටිය ගන්නා කාලයෙහි මෙසේ වෙයි. ශුක්ලපක්ෂයෙහි **රූපං නෙතං** මම යි රූපයෙහි තෘෂ්ණාමානදෘෂ්ටි ග්‍රහණයෝ ප්‍රතික්ෂේපකරනලද්දාහුය; වේදනාදියෙහි ද මේ ම නයයි. **සමනුපස්සති** යන මේ පදයාගේ වනාහි "තණ්හාසමනුපස්සනා මානසමනුපස්සනා දිට්ඨිසමනුපස්සනා සුඤ්ඤසමනුපස්සනා" යන සතර සමනුපස්සනා වෝ යනු අමැයි; ඔවුහු අකුශලපක්ෂයෙහි තුන් සමනුපස්සනාවන්ගේ ද කුශලපක්ෂයෙහි සුඤ්ඤසමනුපස්සනාවගේ ද වශයෙන් දතයුත්තාහුය. **අසති න පරිතස්සති**= අවිද්‍යමාන කල්හි භයපරිතස්සනාවෙන් හෝ තණ්හාපරිතස්සනාවෙන් නො තැතිගන්නේය; මෙයින් භාග්‍යවතුන් වහන්සේ අධ්‍යාත්මසකක්ඛයන්ගේ විනාශය ඇති කල්හි නො තැතිගන්නාවූ ක්ෂීණාශ්‍රවයා දක්වමින් දෙශනාව මුදුන් පැමිණවූහ.

එවං වුත්තෙන අඤ්ඤතරෝ භික්ඛු= භාග්‍යවතුන් විසින් මෙසේ වදාළ කල්හි එක්තරා අනුසඤ්ඤිකුසල වූ මහණෙක් භාග්‍යවතුන් විසින් අධ්‍යාත්මසකක්ඛයන්ගේ විනාශය ඇතිකල්හි නො තැතිගන්නා වූ ක්ෂීණාශ්‍රවයා දක්වා දෙශනාව නිමවන ලදු; එතකුදු වුවත් අධ්‍යාත්මයෙහි (සකක්ඛයන්ගේ විනාශයෙහි) නො තැතිගන්නහු ඇතිකල්හි අධ්‍යාත්ම (සකක්ඛනාශ) යෙහි තැතිගන්නෙක් ද, බාහිරපරිෂ්කාර විනාශයෙහි තැතිගන්නෙක් ද, නො තැතිගන්නෙක් ද විය යුතුයි; මෙසේ මේ සතර කාරණයන්ගෙන් මේ ප්‍රශ්නය විවාළයුතු යයි සිතා සිවුර එකස් කොට ඇදිලි බැඳ භාග්‍යවතුන් වහන්සේට මේ කීය. **බාහිරා අසති**= බාහිර පරිෂ්කාරයන්ගේ විනාශයෙහි; **අහු වත මෙ**= එකාන්තයෙන් මට සොදුරු වූ යාන – වාහන – හිරණ්‍ය – සුවර්ණ වූයේය යන අමැයි. **නං වත මෙ නත්ථි**= එය එකාන්තයෙන් දැන් මට නැති, රජුන් විසින් හෝ සොරුන් විසින් හෝ පැහැරගන්නාලද, ගින්නෙන් හෝ දනලද, ජලයෙන් හෝ උල්පවා හරිනලද, පරිභොගයෙන් හෝ දිරනලද; **සියා වත මෙ**= එකාන්තයෙන් මට යානය වාහනය හිරණ්‍යය සුවර්ණය සාලිය වීහිය යවය ගොධූමය යන මේ වන්නේද; **නං වතාහං න ලභාමි**= එය මම අලසයෙක් මෙන් වූයෙමි ඊට සුදුසු කටයුතු නො කොට හුන්බැවින් මෙවිට නො ලබමි,යි ශොක කෙරෙයි; මේ ගිහිගෙවැසියන්ගේ ශොකානිරීම යි. ශාස්නිකයාගේ (ශොකය) පාසිවුරු ආදින්ගේ වශයෙන් දතයුතු.

අපරිතස්සනාචාරයෙහි **න එවං හොති**= යම් කෙලෙස් කෙනෙක් හෙතුකොටගෙන මෙසේ වන්නේ ද, ඔවුන් ප්‍රහීණ කළබැවින් මෙසේ නො වෙයි; **දිට්ඨානාධිට්ඨානපරියුට්ඨානාභිනිවෙසානුසයානං**= දෘෂ්ටීන් ගේ ද දෘෂ්ටිස්ථානයන්ගේ ද දෘෂ්ට්‍යධිෂ්ඨානයන්ගේ ද දෘෂ්ටිපරියුත්ථානයන් ගේ ද අභිනිවෙසානුසයයන්ගේ ද; **සබ්බසඞ්ඛාරසමථාය**= නිර්වාණය පිණිස; යම්හෙයකින් නිවනට පැමිණ සියලු සංස්කාරයන්ගේ ඉසැඳී තයෝ සියලු සංස්කාරචලනයෝ සියලු සංස්කාර විෂ්ඵන්දිතයෝ සංසිඳෙත් ද වෙසෙසින් සංසිඳෙත් ද, එහෙයින් ඒ නිවන **සබ්බසඞ්ඛාරසමථ** යයි කියනුලැබේ; තවද- එයටම පැමිණ සකලොපධි කෙලසොපධි අභිසංස්කාරොපධි පඤ්චකාමගුණොපධි යන මේ උපධීහු දුරලනු ලැබෙත්ද තෘෂ්ණාව ක්ෂය වේද, නො ඇලේද, නිරුඩ වේද; එහෙයින් **සබ්බූපධිපටිනිස්සග්ගෝ** යැ, **තණ්හක්ඛයෝ** යැ, **විරාගෝ** යැ, **නිරෝධෝ** යැයි කියනුලැබේ. **නිබ්බානාය**= මේ වනාහි ඒ නිර්වාණයාගේ සවරූපය දැක්වීම යැ; මෙසේ මේ සියලු පදයන්ගෙන් ම නිවන් පසක් කිරීම පිණිස දහම් දෙසන්න හුගේ යයි මේ අර්ථය දක්වනලද්දේයි. **තස්සෙවං හොති**= ඒ දෘෂ්ටිගතිකයාහට "උතුපත්‍ති වශයෙන් සිදෙන්නෙමි, වැනසෙන්නෙමි, මතු පහළ නො වන්නෙමි" යි මෙසේ සිතත් වේ. සැබව- තිලකුණු නම් ශූන්‍යතා ප්‍රතිසංයුක්ත කොට දෙසනු ලබන්නා වූ ධර්මය අසන දෘෂ්ටිගතිකයාහට තැතිගැනීම උපදී; මේ වදරතලද මැයි— **"නාසෝ හෙසෝ භික්ඛවෙ අස්සුනවතො පුථුජ්ජනස්ස යදිදං, නො චස්සං නො ච මෙ සියා"** යි. මෙතෙකින් බාහිර පරිස්කාරයන්ගේ විනාශයෙහි තැතිගන්නහුගේ ද නො තැතිගන්නහුගේ ද අධ්‍යාත්මස්කන්ධවිනාශයෙහි තැතිගන්නහුගේ ද නො තැතිගන්නහුගේ දැ?යි මොවුන්ගේ වශයෙන් චතුකොටික ශූන්‍යතාව කියනලදුදු. මෙවිට බාහිරපරිෂ්කාරය "පරිග්‍රහ" නම් කොට විංශති වස්තුක සත්කාය දෘෂ්ටිය "අත්තවාදුපාදාන" නම් කොට සත්කායදෘෂ්ටිය ප්‍රමුඛ කොට ඇති දෙසැට දෘෂ්ටීහු "දිට්ඨිසස්ස" නම් කොට ත්‍රිකොටික ශූන්‍යතාව දක්වන්ට **නං භික්ඛවෙ පරිග්ගහං** යනාදිය වදළහ. එහි **පරිග්ගහං**= බාහිරපරිෂ්කාරය; **පරිගණ්හෙය්‍යාථ**= යම්සේ විඥමනුෂ්‍යයෙක් පරිග්‍රහණය කරන්නේ ද (එසේ විමසන්නහුය;) **අහම්පි වො නං භික්ඛවෙ**= මහණෙනි! තෙපි ද නො දක්නහු, මම ද නො දක්නෙමි; මෙසේ මේබදු පරිෂ්කාරයෙක් නැතැයි දක්වති; මෙසේ සියලු තැන්හි අර්ථය දතයුතුයි

මෙසේ ත්‍රිකොටික ශූන්‍යතාව දක්වා මෙවිට අධ්‍යාත්මස්කන්ධයන් ආත්ම යයි බාහිරපරිෂ්කාරයන් ආත්මනීය යයි කොට චතුකොටික (ශූන්‍යතාව) දක්වනසේක් **අත්තනි වා භික්ඛවෙ! සති**= යනාදිය වදළහ. එහි මේ සංක්ෂේපාර්ථ යයි— මහණෙනි! ආත්මය හෝ ඇතිකල්හි මේ මාගේ පරිෂ්කාර සමූහය තමා සතුයයි (දෘෂ්ටිය) වන්නේය; තමා සතුවූ පරිෂ්කාරය හෝ ඇතිකල්හි මම් මාගේ ආත්මය තෙම මේ පරිෂ්කාරයාගේ සවාමි

යයි (දෘෂ්ටිය වන්නේය;) මෙසේ මම යයි (දෘෂ්ටිය) ඇතිකල්හි මාගේ යයි ද මාගේ යයි (දෘෂ්ටිය) ඇතිකල්හි මම යයි ද යොගය වන්නේයි; **සච්චතෝ**= භූත (= සත්‍ය) වශයෙන්; **තථතෝ**= තථවශයෙන් සිර හෙයින් හෝ; මෙව්ට මේ පඤ්චස්කන්ධයන් අනිත්‍ය යැ දුඃඛ යැ අනාත්ම යැයි මෙසේ ත්‍රිපරිවෘත්ත වශයෙන් නො ගන්නේ මේ අරිෂ්ට මෙන් මාගේ ශාසනයෙහි කලල කසළ දමන්නේ යයි දක්වනසේක් **නං කිං මඤ්ඤථ භික්ඛවෙ! රූපං නිච්චං වා** යනාදිය වදාළහ. **අනිච්චං භන්තෙ!** වහන්ස! යම්හෙයකින් ඇතිව නො වේද (= නැතිවේද) **එහෙයින්** අනිත්‍යයැ; උත්පාදය ව්‍යයභාවය තාවකාලිකය නිත්‍යප්‍රතිත්‍ය යැ; **දුක්ඛං භන්තෙ!** වහන්ස! පනිපීළනාකාරයෙන් දුක් යැ; තැවීමය ඉවසිය නො හැකිබවය දුෂ්ට වසනුබවය සුඛප්‍රතිපක්ෂය යන අර්ථයෙන් දැයි සතර කාරණයන්ගෙන් **දුක්** යැ; **විපරිණාම ධම්මං**= භවසඞ්ක්‍රාන්තියට නො පැමිණෙන සුභාව යැ, පියවිබව හරින සුභාව යැ; **කල්ලන්නු නං සමනුපස්සිතුං එතං** මම **එසෝ'හමස්මි එසෝ මෙ අත්තා**= එය තෘෂ්ණාමාන දෘෂ්ටිග්‍රාහයන්ගේ වශයෙන් මම යැ මාගේ යැයි මෙසේ ගන්ට සුදුසු ද? **නෝ හෙතං භන්තෙ!** යන මෙයින් ඒ භික්ෂූහු වහන්ස! වස්තුයෙහි නො පවත්නා ආකාරයෙන් රූපය අනාත්ම යයි ප්‍රතිඥා කෙරෙති; ශූන්‍යත – අසාමික – අනීශ්වර – ආත්ම ප්‍රතිපක්ෂාර්ථයෙන් දැයි සතර කාරණයන්ගෙන් අනාත්ම යැ; ඒ එසේ මැයි– භාග්‍යවතුන් වහන්සේ කිසි තැනෙක අනිත්‍ය වශයෙන් අනාත්ම බව දක්වති; කිසි තැනෙක දුක් වශයෙන් ද, කිසි තැනෙක දෙදෙනාගේ වශයෙන් ද, (අනාත්මබව දක්වති;) සැබව— "චක්ෂුස ආත්ම ය,යි යමෙක් නියන්නේ ද එය නො යෙදෙයි, චක්ෂුහුගේ උත්පාදය ද විනාශය ද පැනෙයි, යම්ක්හුගේ වනාහි උත්පාදය ත් විනාශය ත් පැනේ ද, මාගේ ආත්මය උපදින්නේ හෝ වේ ද නො වේ හෝ දැයි මෙසේ ඔහුට මෙපරිද්දෙන් ආයේ වේද, එහෙයින් චක්ෂුස ආත්ම යයි යමෙක් කියන්නේද එය නො යෙදෙයි, මෙසේ චක්ෂුස අනාත්ම යැ" යන මේ ඡඡක සූත්‍රයෙහි අනිත්‍ය වශයෙන් අනාත්මබව දැක්වූසේක. "මහණෙනි! යම් හෙයකින් මේ රූපයත් ආත්මය වන්නේ නම් මේ රූපය ආබාධ පිණිස නො පවත්නේය, රූපයෙහි මාගේ රූපය මෙසේ වේවා, මාගේ රූපය මෙසේ නො වේවායි ලැබෙන්නේ ද වෙයි; මහණෙනි! යම්හෙයකින් රූපය අනාත්ම වේද, එහෙයින් මේ රූපය ආබාධ පිණිස පවතී, රූපයෙහි මාගේ රූපය මෙසේ වේවා, මාගේ රූපය මෙසේ නො වේවායි නො ද ලැබෙයි" යන මේ අනාත්මලක්ෂණ සූත්‍රයෙහි දුක්වශයෙන් අනාත්මබව දැක්වූසේක; "මහණෙනි! රූපය අනිත්‍ය යැ යම්ක් අනිත්‍ය නම් එය දුක යැ යම්ක් දුක නම් එය අනාත්ම යැ යම්ක් අනාත්ම නම් එය මේ මාගේ නො වෙයි මේ තෙම මම නො වෙමි ඒ ආත්මය මාගේ

නො වේ යයි මෙසේ මේ රූපය තතු වූ පරිදි සම්‍යක්ප්‍රඥාවෙන් (= විද සුන්නැණින්) දැක්කයුතු" යන මේ අරහන්ත සූත්‍රයෙහි දෙදෙනාගේ වශයෙන් අනාත්මබව දැක්වූයේය. කුමක් හෙයින? අනිත්‍යය ද දුඃඛ ය ද ප්‍රකට ය, "අනත්තා" යනු අප්‍රකට ය; සැබවැ- පරිභොග භාජනාදිය බිඳුනුකල්හි දු "අහො අනිච්චං" යි කියති; "අනත්තා" යි කියන්නෙක් නම් නැති; හිරුරෙහි හඬපොළ ආදිය හෝ නැහිකල්හි කටුව කින් හෝ විදුනාලද්දාහු "අහො දුක්ඛං" යි කියති; "අහො අනත්තා" යි කියන්නෙක් නම් නැති; කුමක් හෙයින? යම් හෙයකින් මේ අනාත්ම ලක්ෂණය නම් අවිභූත ද දුකසේ දැක්ක යුතු ද දුකසේ හැඟවිය යුතු ද; එහෙයින් භාග්‍යවතුන් වහන්සේ එය අනිත්‍ය වශයෙන් හෝ දුඃඛ වශයෙන් හෝ උභය වශයෙන් හෝ දක්වනසේක. ඒ මේ අනාත්ම ලක්ෂණය මේ ත්‍රිපරිවෘත්තයෙහි ද අනිත්‍ය දුඃඛ වශයෙන් ම දක්වනලද වෙදනාදියෙහි දු මෙ ම නයයි. **නෙසෝතිහ භික්ඛවෙ!** යම්හෙයකින් දැනුදු අන්කල්හි දු රූපය අනිත්‍ය ද දුක් ද අනාත්ම ද එහෙයින් යන අර්ථයි.

යං කිඤ්චි රූපං යනාදිය විශුද්ධිමාර්ගයෙහි සකඛනිද්දේශයෙහි විසතර කරනලද්දාහු මැයි. **නිබ්බින්දති**= උකටලි වෙයි; මෙහි දු නිබ්බිදා යි උත්තානගාමිනී විදර්ශනාව අදහස් කරනලදී; ඒ එසේ මැයි— උත්තානගාමිනි විදර්ශනාවට බොහෝ නාමයෝ වෙති; මෝ වූ කලි කිසිතැනක "සඞ්ඛාරුදයඤාණං" යි ද කිසි තැනක "ධම්මට්ඨිතිඤාණං" යි ද කිසි තැනෙක "පාරිසුද්ධිපධානියඞ්ගං" යි ද කිසි තැනක "පටිපදාඤාණදස්සනවිසුද්ධි" යි ද කිසි තැනක "තම්මයපරියාදානං" යි ද කියන ලද්දිය; කිසි තැනක නම් තුනකින් ද කිසි තැනක නම් දෙකකින් ද (කියනලද්දී) යයි. එහි පළමු කොට පොඨපාද සූත්‍රයෙහි **"සඞ්ඛාරුදයෙ ඛො පොඨපාද! පඨමං උප්පජ්ජති පච්චයාඤාණං"** යි මෙසේ "සඞ්ඛාරුදයඤාණ" යයි කියනලදුදු; සුසීමසූත්‍රයෙහි **"පුබ්බෙ ඛො සුසීම! ධම්මට්ඨිතිඤාණං පච්චයා නිබ්බානෙ ඤාණං"** යි මෙසේ "ධම්මට්ඨිතිඤාණ" යයි කියනලදුදු; දසුත්තර සූත්‍රයෙහි **"පටිපදාඤාණදස්සනවිසුද්ධි පාරිසුද්ධිපධානියඞ්ගං"** යි මෙසේ "පාරිසුද්ධිපධානියඞ්ග" යයි කියනලදුදු; රථවිනීතයෙහි **කිනාහු ඛො ආවුසො! පටිපදාඤාණදස්සනවිසුද්ධත්ථං භගවති බ්‍රහ්මචරියං වුස්සති"** යි මෙසේ "පටිපදාඤාණදස්සනවිසුද්ධි" යයි කියනලදුදු; සළායතනවිභඞ්ගයෙහි **"අනමතග්ගෙ භික්ඛවෙ! නිස්සාය අනමතග්ගෙ ආගම්ම යා'යං උපෙක්ඛා නානත්තා නානත්තසිතා නං අභිනිවජ්ජෙත්වා යා'යං උපෙක්ඛා එකත්තා එකත්තසිතානං නිස්සාය නං ආගම්ම එවමෙතිස්සා පහානං හොති සමතික්කමො හොති"** යි මෙසේ "තම්මයපරියාදාන" යයි කියනලදුදු; පටිසම්භිදා මාර්ගයෙහි **"යා ච මුඤ්චිතුකම්‍යතා යා ච පටිසඞ්ඛානුපස්සනා යා ච සඞ්ඛාරුපෙක්ඛා ඉමෙ ධම්මා එකට්ඨා ව්‍යඤ්ජනමෙව නානං"** යි මෙසේ නම්

තුනකින් කියනලදු; පඨානයෙහි **"අනුලොමං ඉොත්‍රභුස්ස අනන්තර පච්චයෙන පච්චයො අනුලොමං වොදානස්ස අනන්තරපච්චයෙන පච්චයො"** නම් දෙකකින් කියනලද්දීය. මේ අලඟද්දූපමසූත්‍රයෙහි වූ කලි **නිබ්බිඳති** යි "නිබ්බිදා" නාමයෙන් ආවායැ; **නිබ්බිඳං විරජ්ජති** යන මෙහි "විරාග" යනු මාගී ඵයි; **විරාගා විමුච්චති** යන මෙහි විරාගසඞ්ඛ්‍යාත මාගී යෙන් මිදේ යයි ඵලය කියනලද; **විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති** යන මෙහි ප්‍රත්‍යවෙක්ෂාව කියනලද්දීය. මෙසේ මිදුනසිත් ඇති මහාක්ෂීණාශ්‍රවයා දක්වා මෙවිට ඔහට යථාභූත වූ කරුණුපසකින් නාමය ගන්නාසේක් **අයං වුච්චති භික්ඛවෙ!** යනාදිය වදළහ.

අවිජ්ජා= සසරට මුල්වූ අවිද්‍යාව; මෝ වනාහි ඔසවා දැම්ම දුෂ්කරය යනාඵයෙන් **පලිඝ** යයි කියනු ලැබේ. එහෙයින් මේ තෙම් ඒ අවිද්‍යාව ඔසවා දමනලද බැවින් **උක්ඛිත්තපලිඝ** යයි කියනලද්දේය; **තාලාවත්ථු කතා**= මුදුන සිඳිනලද තල්රුකක් මෙන් කරනලද්දීය; නොහොත් මුල්සහිත තල්රුක උදුරා තාලයාගේ භූමිය මෙන් කරනලද්දීය; යම්සේ ඒ බිමැ යලි ඒ තල්රුක නො පැනේ ද එපරිදෙන් නැවත නො පැනෙනබවට පමුණුවනලද යන අර්ථයි. **පොනොභවිකො**= පුනර්භවය දෙන්නාවූ; **ජාතිසංසාරො**= ඉපදීම් වශයෙන් හා හැසිරීම් වශයෙන් ද මෙසේ ලද නම් ඇති පුනර්භවයෙහි සකඞ්ගියන්ට ප්‍රත්‍යය වූ කම්ම්නිසංඝකාරය; හේ වනාහි නැවත නැවත උත්පත්තිය කිරීම් වශයෙන් පරිඝෙප කොට සිවිබැවින් **පරිඛා** යයි කියනු ලැබේ; එහෙයින් මේ තෙම ඒ පරිඛාව සඞ්කිණී කළබැවින් විකිණී කළබැවින් **සඞ්කිණ්ණපරිඛ** යයි කියනලද. **තණ්හා**= සසරට මුල්වූ තෘෂ්ණාව; මෝ වනාහි ගමගිරුනුගතාඵයෙන් **එසිකා** යයි කියනු ලැබේ; එහෙයින් මේ තෙම ඒ තෘෂ්ණාව උපුටා හළ බැවින් ගලවා ඉඳිනලද බැවින් අබ්බූළ්හෙසිකා යයි කියනලද. **ඔරම්භාගියානි**= ඔර (=කාමභවය) භජනය කරන්නාවූ, කාමභවයෙහි උත්පත්තියට ප්‍රත්‍යය වූ; මොවුහු වනාහි තුවරදෙර කවුළුව මෙන් සිත වසා ගිවිබැවින් **අගහල** යයි කියනු ලැබෙත්; එහෙයින් මේ තෙම් ඒ සංයොජනයන් නො තැබූ බැවින් බිඳිනලද බැවින් **නිරග්ගළ** යයි කියනලද. **අසිතා**= නිකෙලෙස් වූයේ, පිරිසුදු වූයේ; **පනීතඛජෙ**= හෙළනලද මානඛජය ඇත්තේ; **පනීතාහාරො**= සඤ්ඤාහාර - චෙතනාහාර - අභිසංඛාරහාර - පඤ්චකාමගුණහාරයෝ පතිත වූවාහු බහා තබනලද්දාහු මෝහට නුසි "පණීතාහාර" නම්; තවද- මෙහි මානහාරය බහාතබනලද බැවින් "පණීතාහාර" යයි අදහස් කරනලදී. **විසංයුත්තො**= සතර යොගයන්ගෙන් ද සියලු කෙලෙසුන්ගෙන් ද වෙන්වූයේ; මෙහි වූ කලි මානයොගයෙන් ම වෙන්වූ බැවින් "විසංයුක්ත" යයි අදහස් කරනලදී. **අස්මිමානො**= රූපයෙහි (මම) වෙමි යන මානය, වෙදනාවෙහි සංඥාවෙහි සංස්කාරයන්හි විඥානයෙහි මම වෙමි යන මානය.

මෙතෙකින් භාග්‍යවතුන් විසින් මාගධියෙන් කෙලෙසුන් ක්ෂය කොට උතුම් වූ නිරෝධශය්‍යාසනයට පැමිණ නිවන් අරමුණු කොට ඇති පලසමාපත්තියට සමවැද වාසය කරන්නාවූ ක්ෂීණාශ්‍රවයාගේ කාලය දක්වනලද්දේසි. උපමා දක්වනු ලැබේ- යම්සේ නගරයෝ දෙදෙනෙක් වෙත් ද එකෙක් වොරනගරය යැ එකෙක් ක්ෂේමනගර යසි; එකල්හි එක් මහා යොධ යෙකුට මේ සිත වන්නේ ද, යම්තාක් මේ වොරනගරය පවතී ද, ඒතාක් ක්ෂේමනගරය හසින් නො ඉදෙසි, වොරනගරය අනගරය කරන් නෙමියි; සන්‍යාහය කොට කඩුව ගත වොරනගරය වෙත පැමිණ නුවරදොරැ ඔසවනලද එසිකාස්තාමභයන් කඩුවෙන් සිඳ දොරබා සමග කවුළුව බිඳ කණුයම ඔසවා පවුර බිඳිමින් දියඅගල විසුරුවා නගර ශොභාව පිණිස ඔසවනලද ධවජයන් හෙලා නුවර ගින්නෙන් දවා ක්ෂේමනගරයට පිවිස පහසට නැඟී ඥතිසමූහයා විසින් පිරිවරනලද්දේ මනා රසබොදුන් වලඳන්නේ ද; එපරිද්දෙන් වොරනගරය මෙන් සතකාය යැ, ක්ෂේමනගරය මෙන් නිර්‍වාණය යැ, මහායොධයා මෙන් යොගාවචර තෙමේ යැ, ඔහට මේ සිත වෙසි- යම්තාක් සතකායවෘත්තය පවතී ද ඒතාක් දෙතිස් කම්කටුලු - අවානුරෝධ - පස්විසිමහාභය යන මෙයින් මිදීමෙක් නැතැසි; ඒ මහායොධ තෙම සන්‍යාහය මෙන් ශීල නමැති සන්‍යාහය කොට ප්‍රඥා නමැති කඩුව ගෙන කඩුවෙන් එසිකාසතා ඔහයන් මෙන් රහත්මගින් තෘෂ්ණා නමැති එසිකාව ගලවා ඒ යොධ තෙම දොරබාසහිත නුවරකවුළුව මෙන් පඤ්චාරම්භාගියසංයොජන නමැති අගුළුකණුව උගුළුවා ඒ යොධතෙම කණුයම මෙන් අවිද්‍යා නමැති කණුයම ඔසවා ඒ යොධ තෙම පවුර බිඳිමින් දියඅගල මෙන් කම්හි සංඝකාරය බිඳිමින් ජාතිසංසාර නමැති දියඅගල විසුරුවා, ඒ යොධ තෙම නුවර ගහබිම පිණිස ඔසවනලද ධවජයන් මෙන් මාන නමැති ධවජයන් හෙලා සතකාය නමැති නගරය දවා, ඒ යොධ තෙම ක්ෂේම නගරයෙහි මධුපහයෙහි හිඳ මිහිරි රසබොදුන් මෙන් කෙලෙස් රහිතවූ නිවන්නුවරට පිවිස අමානිවන් අරමුණුකොට ඇති පලසමාපත්තියෙහි වැඩි මින් කල් ඉක්මවසි.

මෙවිට මෙසේ මිදුණු සිත් ඇති ක්ෂීණාශ්‍රවයාගේ අන්‍යයන් විසින් නො ලැබියහැකි විඥානය දක්වනසේක් එවං විමුත්තචිත්තං ඛො යනා දිය වදාළහ. එහි අන්වේසං= අන්වේෂණය කරන්නාහු, ගවේෂණය කරන්නාහු (=සොයන්නාහු;) ඉදං නිස්සිතං= මේ නම් (අරමුණ) ඇසුරු කෙළේ; තථාගතස්ස යන මෙහි සත්‍වතෙමේ ද උත්තමපුද්ගල වූ ක්ෂීණාශ්‍රව තෙමේ ද අදහස් කරනලද; අනනුවෙජ්ජා= අවිද්‍යමාන වූයේ හෝ නො ලැබියහැකි වූයේ හෝ; ඒ එසේ මැසි- "තථාගතො" යි සත්වයා ගත්කල්හි "අවිද්‍යමාන වූයේ" යන අර්ථය වටී, ක්ෂීණාශ්‍රවයා ගත්කල්හි "නො ලැබියහැක්කේ" යන අර්ථය වටී; එහි පළමු නයෙහි මේ අදහසයැ- මහණෙනි! මම මේ අත්බැව් හි ම ජීවමානවූ ම ක්ෂීණාශ්‍රවයා තථාගතයැ සත්ව යැ පුද්ගල යැයි නො පනවම්, යලි පිළිසඳ රහිත වූ පිරිනිවියා වූ

ක්ෂීණාශ්‍රවයා සත්ව යයි හෝ පුද්ගල යයි හෝ කිම පනවන්නෙම් ද? ක්ෂීණාශ්‍රව තෙම නො ලැබිය හැක්කේය; යම්හෙයකින් පරමාර්ථ වශයෙන් කිසි සත්වයෙක් නම් නැත් ද, ඒ අවිද්‍යමාන වූවහුගේ විඥානය මෙය ඇසුරු කෙළේ යයි සොයන්නාහු ද කිම අධිගමය කරන්නාහු ද? කෙසේ ලබන්නාහු ද? යන අර්ථයි. දෙවෙනි නයෙහි මේ අදහස යැ— මහණෙනි! මම මේ අත්බැව්හි ම ජීවමානවූ ම ක්ෂීණාශ්‍රවයා ඉන්‍ද්‍රාදීන් විසින් විඥාන වශයෙන් නො ලැබියහැකි යයි කියමි; ඉන්‍ද්‍රයා සහිත වූ බ්‍රහ්මයා සහිත වූ මාරයා සහිත වූ දෙවියෝ සොයන්නාහු නමුදු ක්ෂීණාශ්‍රවයාගේ විදර්ශනා චිත්තය හෝ මාර්ග චිත්තය හෝ ඵල චිත්තය හෝ මේ නම් අරමුණ නිසා පවතී යයි දැනගන්ට නො ම හැකිවෙති; ඔවුහු අප්‍රතිසන්ධික වූ පිරිනිවියහුගේ (සිත) කිම දැනඟනිත් ද? සි. **අසනා**= අවිද්‍යමාන වූයෙන්; **තුච්ඡා**= සිස්වචනයෙන්; **මුසා**= මෘෂාවාදයෙන්; **අභූතෙන**= යමක් නැත්තේ ද එයින්; **අබ්භාචික්ඛන්ති**= "අභි + ආචික්ඛන්ති" අභිභවා බෙණෙත්; **වෙනයිකොහං**= "විනයති" යි සේයි වනසා කුයි "විනය" නම්, හේ මැ "වෙනයික" නම්; සත්වයන් වනසන්නෙක යන අදහසයි. **යථා වාහං භික්ඛවෙ! න**= මහණෙනි! යම් ආකාරයකින් හෝ මම සතුන් වනසන්නෙක් නො වෙම් ද; **යථා වාහං න වදාමි**= යම්ආකාරයකින් හෝ මම සත්වවිනාශය නො පනවම් ද; මේ කියනලද වෙයි- යම්සේ මම සත්වයන් වනසන්නෙක් නොවෙම්ද යම්සේ ත් සත්වවිනාශය නො පනවම් ද එපරිද්දෙන් මට ඒ පින්වත් මහණ බමුණෙ! **"වෙනයිකොසමණොගොතමො"** යි කියමින් මහණ ගොයුම් සතුන් වනසන්නෙකැයි ද **"සතොසත්තස්ස උච්ඡෙදං විනාසං විභවං පඤ්ඤපෙති"** යි කියමින් සත්වයන්ගේ විනාශය පනවා යයි ද අසත්‍ය වූ ඔස් වූ මෘෂා වූ අභූත වචනයෙන් අභිභවා බෙණෙත් යයි.

පුබ්බ ච= පෙර ද මහබෝමැඩදී ම; **එතරහි ච**= දැන් දම්දෙසුම්හි ද; **දුක්ඛඤ්චව පඤ්ඤපෙමි දුක්ඛස්ස ච නිරොධං**= දම්සක් නො පවත්වා බෝමැඩ වසන්නෙම් ද දම්සක් පැවැත්වීමෙහි පවත් දහම් දෙසන්නෙම් ද සිව්සස් ම පනවම් යන අර්ථයි. ඒ එසේ මැයි මෙහි දුඃඛයාගේ හැනීමෙන් ඒ දුකට මුල් වූ සමුදය ද නිරොධයාගේ හැනීමෙන් ඒයම පමුණුවන මාර්ගය ද ගන්නා ලද්දේ ම වේ යයි දතයුතු. **තත්‍ර වෙ**= ඒ සිව්සස් ප්‍රකාශකිරීමෙහි; **පරෙ**= සත්‍යයන් දැනගන්ට ප්‍රතිවෙධ කරන්ට අසමර්ථ පුද්ගලයෝ; **අක්කොසන්ති**= දශආක්‍රොශ වසතුවෙන් ආක්‍රොශ කෙරෙති; **පරිභාසන්ති**= වචනයෙන් පරිභව කෙරෙති; **රොසෙන්ති විහෙසෙන්ති**= කොප කරන්නෙමු වෙහෙසන්නෙමු යන අදහසින් ගටති දුක් උපදවති; **තත්‍ර**= ඒ ආක්‍රොශාදියෙහි ඒ පරපුද්ගලයන් කෙරෙහි; **ඛන්තියා**= කොපයෙක්; **අප්පච්චයෝ**= දෙම්නසෙක්; **අනභිරති**= නො සතුටක්; **තත්‍ර වෙ**= සිව්සස් ප්‍රකාශ කිරීමෙහි ම; **පරෙ**= සිව්සස් ප්‍රකාශ කිරීම දැනගන්ට ප්‍රතිවෙධකරන්ට සමර්ථ පුද්ගලයෝ; **ආනන්දෙ**= ආනන්දසඞ්ඛ්‍යාත ප්‍රීතියක්; **උබ්බිල්ලාවිතත්තං**= ඉල්පෙන ප්‍රීතියක්; **තත්‍ර**

වෙ= සිව්සස් ප්‍රකාශ කිරීමෙහි ම; **තත්‍ර**= සත්කාරාදියෙහි; **යං බො භූදං පුබ්බෙ පරිඤ්ඤාතං**= යම් මේ පස්කඳක් පෙර බෝමැඩදී ත්‍රිවිධ පරිඥාවන්ගෙන් දැනගන්නාලද; **තදජ්ඣගමා**= ඒ සකඤ්ඣපඤ්චකයෙහි මොවුහු; කුමක් කියනලද වේද යත්? **එහි දූ තථාගතයාහව්** මේ සත්කාරයෝ මා කෙරෙහි කරනුලැබෙති යි හෝ මම මේ සත්කාරයන් අනුභව කෙරෙමි යි හෝ නො වෙයි, පෙර පරිඥානය කළ සකඤ්ඣපඤ්චකයට ම ඒ සත්කාරයෝ වෙති, **සකඤ්ඣපඤ්චකය** ම ඒ සත්කාරයන් අනුභව කෙරේ යි, මෙතෙක් ම වේ" යයි. **තඤ්ඤා**= යම්හෙයකින් සත්‍යයන් පිළිවිදුනට අස මථ වූවාහු තථාගතයන්ව ද ආක්‍රොශ කෙරෙත් ද; (එහෙයින්;) සෙස්ස කි නියෙන් ම දතයුතු.

තඤ්ඤාතිහ භික්ඛවෙ! යං න තුම්හාකං= යම්හෙයකින් තමා කෙරෙහි ම ඡන්දරාගප්‍රහාණය දික්කලක් හිත පිණිස සුව පිණිස පවතී ද, එහෙයින් යමක් තොපගේ නො වේද එය දුරු කරවු යන අර්ථයි. **යථාපච්චං වා කරෙය්‍යං**= යම් යම් සේ කැමතිවන්නේ ද ඒ ඒ පරිද්දෙන් කරන්නේය; **න කි නො එතං භගවෙත**! **අත්තා**= වහන්ස! මේ තණ-දර-අතු-කොල අපගේ ආත්මය නො ම වෙයි, අපගේ රූපය නො වෙයි, විඥානය නො වේ යයි කියති; **අත්තනියං වා**= අපගේ සිවුරුඇ පිරිකර කුදු නො වෙයි යන අර්ථයි; **එව මෙව බො භික්ඛවෙ! යං න තුම්හාකං නං පජහථ**= භාග්‍යවතුන් වහන්සේ සකඤ්ඣපඤ්චකය ම තොපගේ නො වේ යයි දක්වා දුරුකරවති; හෙද වනාහි උපුවා හෝ ගලවා නො වෙයි; වැලි ඡන්දරාගවිනයයෙන් මෙය දුරුකරවන සේක. **එවං සොකඛානො** යන මෙහි ත්‍රිපරිවෘත්තය පවත් මෙ තැන දක්වා ගන්ට ද වටී, ප්‍රතිලොම යෙන් ප්‍රෙමමාත්‍රයකින් සඛගීපරායණවීම පවත් මෙ තැන දක්වා ගන්ටද වටී. **සොකඛානො**= මොනොවට කියනලද්දේය; මනාකොට කියනලද බැවින් ම නොගැඹුරුයැ, විවෘත්තයැ, ප්‍රකාශිත යැ; **පිලොතිකා** යනු සුන්බුන් වූ ඒ ඒ තැන මසනලද ගැටගසනලද දිරූ වස්ත්‍රයයි; එය යමෙකුට නැත් ද අවරියන් හෝ නවරියන් හෝ අලුත්සළුවක් හදිනලද්දේ වේද හෙතෙම **ජිණ්ණපිලොතිඛ** නම් වෙයි; මේ ධර්මය ද එබඳුයැ. මෙහි කොහොන්බැව් ආදින්ගේ වශයෙන් සුන්බුන් මසනලද ගැටගසනලද බවක් නො ම ඇති; තවද- කසළ ද "පිලොතිකා" යි කියනු ලැබේ; මේ ශාසනයෙහි දූ මහණකසළක් නම් පිඹිටා සිටින්ව නො ලබා. එහෙයින් ම වදාළහ—

140. "**සාරණ්ඩවං නිඛමථ - කසඹුං වා'වකඩ්ඪථ**
තතො පලාපෙ වාහෙථ - අස්සමණෙ සමණමානිනො,

---

140. **සාරණ්ඩවං**= ශ්‍රමණකාසළය; **නිඛමථ**= පිඹහරිවු; **කසඹුං**= ශ්‍රමණකසඨය ද; **අවකඩ්ඪථ**= බැහැර දමවු; **තතො**= නැවත; **අස්සමණෙ**= අශ්‍රමණ වූ; **සමණමානිනො**= ඇපි ශ්‍රමණයෝය යන මන් ඇති; **පලාපෙ**= (විඅතුරෙහි බොල්වී මෙන් නිසරු බැවින් ශ්‍රමණයන් අතුරෙහි) බොල් ශ්‍රමණයන්; **වාහෙථ**= උල්පවා හරිවු.

141. **නිබ්බිඤ්ඤ පාපිච්ඡෝ - පාපආචාරගොචරෝ**
සුඛා සුඛේහි සංවාසං - කප්පයවේහා පතිස්සතා
නනෝ සමගතා නිපකා - දුක්ඛස්සන්තං කරිස්සථ" ඕ—

මේසේ මහණකසළය සුත්බැවින්ද මේ ධර්මය "ජිත්‍යාපිලොතිකා" නම් වේ. **වටටං නෙසං නත්ථි පක්ඛූපනායං**= ඔවුන්ගේ වෘත්තය නො පැනවිය හැක්බවට ගියේය, නිෂ්ප්‍රඥප්තික විය; මෙබඳු වූ මහාක්ෂීණාශ්‍රව තෙම මෙසේ සවාක්ඛාත වූ ශාසනයෙහි ම උපදී; තවද- ක්ෂීණාශ්‍රව තෙම යම් සේද අනාගාමී ආදීහු ද එසේයි. එහි **ධම්මානුසාරිනෝ සද්ධානුසාරිනෝ** යන මේ දෙදෙන සෝවාන්මඟ සිටියෝ වෙති; වදාළේ මැනු— **(ඛන්ධමෝ ච පුග්ගලෝ -පෙ- එලෙ ඨිතෝ සද්ධාවිමුත්තෝ)**

"ධම්මානුසාරී පුද්ගල තෙම කවරේ ද? සෝවාන්ඵල පසක් කිරීම පිණිස පිළිපන්නා වූ යම් පුද්ගලයෙකුගේ ප්‍රඥෙන්ද්‍රියය අධිමාත්‍ර වේද, ප්‍රඥව ඵලවනසුලු වූයේ ප්‍රඥව පෙරදැරි කොට ඇති අරිමඟ වඩා ද මේ පුද්ගල තෙම ධම්මානුසාරී යයි කියනු ලැබේ; සෝවාන් ඵලපසක් කිරීම පිණිස පිළිපන් පුද්ගල තෙම ධම්මානුසාරී ය; ඵලයෙහි සිටියේ දෘෂ්ටිප්‍රාප්ත ය. සද්ධානුසාරී පුද්ගලතෙම කවරේ ද? සෝවාන් ඵලපසක් කිරීම පිණිස පිළිපන්නා වූ යම් පුද්ගලයෙකුගේ ශ්‍රද්ධෙන්ද්‍රියය අධිමාත්‍ර වේද, ශ්‍රද්ධාව ඵලවනසුලු වූයේ ශ්‍රද්ධාව පෙරදැරිකොට ඇති අරිමඟ වඩා ද, මේ පුද්ගල තෙම සද්ධානුසාරී යයි කියනුලැබේ. සෝවාන්ඵලපසක්කිරීම පිණිස පිළිපන් පුද්ගල තෙම සද්ධානුසාරී ය, ඵලයෙහි සිටියේ සද්ධා විමුක්ත නම් වේ" යයි.

යෙසං මයි සද්ධාමත්තං පෙමමත්තං යන මෙයින් යම් කෙනෙකුන්ට අන්‍ය ආර්‍යධර්මයෙක් නැත් ද, එතකුදු වුවත් තථාගතයන් කෙරෙහි ශ්‍රද්ධාමාත්‍රයක් ප්‍රේමමාත්‍රයක් ම වේද ඒ විදර්ශක පුද්ගලයෝ අදහස්කරන ලද්දාහුය. ඒ එසේ මැයි- විදසුන් පිහිටුවා හුන් විදර්ශක භික්ෂූන්ට දස බලයන් කෙරෙහි හුදු ශ්‍රද්ධාව හුදු ප්‍රේමය උපදී, ඒ ශ්‍රද්ධාවෙන් ඒ ප්‍රේම යෙන් අත් ගෙන සවර්ගයෙහි තබන ලද්දවුන් මෙන් වෙති; මොවුහු නියතගතිකයෝ ල; පෞරාණිකතෙරවරයෝ වනාහි මෙබඳු මහණ "වුල්ල සෝතාපන්න" යයි කියත් සෙස්ස සියලු තැන්හි ප්‍රකට වූ අර්ථ ඇත්තේ මැයි.

---

141. **පාපිච්ඡෝ**= ලාමක ආශාඇති; **පාපආචාරගොචරෝ**= ලාමක හැසිරීම් හා ගොචර ඇති (ශ්‍රමණයන්;) **නිබ්බිඤ්ඤා**= බැහැර කොට; **සුඛා**= නිමිල වූවාහු; **පතිස්සතා**= සමෘතියෙන් යුක්ත වූවාහු; **සුඛේහි**= නිමිලවූවන් සමඟ; **සංවාසං කප්පයවේහා**= සහවාසය කරවු; **නනෝ**= නැවත; **සමගතා**= සමගි වූවාහු; **නිපකා**= නිපක නම් ප්‍රඥවෙන් යුක්තා වූවාහු; **දුක්ඛස්සන්තං කරිස්සථ**= සසරදුක කෙළවර කරවු.

අලගද්ද සූත්‍ර වර්ණනා නිමි.

චම්මික සූත්‍ර වණ්ණනා.

එවමෙමසුතං යි චම්මිකසූත්‍ර යයි. **එහි ආයස්මා** යන මේ ප්‍රියවචන යෙකි; **කුමාරකස්සපෝ** යි ඔහුගේ නමයැ; කුමාරකාලයෙහි පැවිදි වූ බැවින් වූ කලි භාග්‍යවතුන් විසින් කාශ්‍යපයා කැඳවවු, මේ ඵලය හෝ ඛාද්‍යය හෝ කාශ්‍යපහට දෙවු යයි කී කල්හි කවර කාශ්‍යපහට ද? කුමාරකාශ්‍යපහට යයි මෙසේ ගන්නාලද නම් ඇති බැවින් එතැන් පටන් වෘඩ්කාලයෙහි පවා "කුමාරකස්සප" යි ම කියනු ලැබේ. තවද– රජු විසින් පොෂණය කළ පුත්‍රයා බැවින් ද ඔහු "කුමාරපස්සප" යි හැඳිනවූහු.

මේ වනාහී ඔහුගේ පූර්‍වාධිකාරය පටන් ප්‍රකාශ කොට දක්වන කථාව ය— තෙරුන් වහන්සේ වනාහී පියුමතුරා භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි සිටුපුත්‍රයෙක් වූහ. එකල එක්දිනක් විත්‍රකථි වූ තමන් වහන්සේගේ එක් ශ්‍රාවකයකු තන තුරෙහි තබන්නා වූ භාග්‍යවතුන් දැක භාග්‍යවතුන් වහන්සේට සත්දිනක් දන් දී "භාග්‍යවතුන් වහන්ස! මම ද අනාගතයෙහි මේ තෙරුන් මෙන් එක් බුදුකෙනෙකුගේ විත්‍රකථි වූ ශ්‍රාවකයෙක් වන්නෙමි" යි ප්‍රාර්‍ථනා කොට පින් කරන්නේ කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේගේ ශාසනයෙහි පැවිදි වී විශෙෂයක් උපදවන්ට නො හැකි විය. ඒ මෙසේ අසනු ලැබේ– එකල පිරිනිවියා වූ භාග්‍යවතුන් වහන්සේගේ ශාසනයෙහි භික්‍ෂූහු පස්දෙනෙක් භිණක්බැඳ පථිතයකට නැගී මහණදම් කළාහුය; සඞ්ඝසථවිර තෙම තුන්වන දිනයෙහි රහත්බවට පැමිණියේය. දෙවෙනි සථවිර තෙම සතරවන දිනයෙහි අනාගාමී විය. ඉතිරි තිදෙන විශෙෂයක් උපදවන්ට නො හැකි වන්නාහු දෙව්ලොව උපන්නාහුය; එක් බුඛානන්තරයක් දෙව්ලොව ද මිනිස්ලොව ද සැපත් වලදන්නා වූ ඔවුනතුරෙන් එකෙක් තක්‍ෂශිලාවෙහි රජකුලයෙහි ඉපිද "පුක්කුසාති" නම් රජ වැ භාග්‍යවතුන් උදෙසා පැවිදිව රජගහ නුවරට එන්නේ කුම්භකාර ශාලාවෙහි භාග්‍යවතුන්ගේ දම්දෙසුන් අසා අනාගාමී ඵලයට පැමිණියේය. එකෙක් එක්මුහුදුපටුනක කුලගෙයෙක්හි ඉපිද නැව්නැගී බිදුනනැව් ඇත්තේ දැවවැහැරි හැඳ ලාභසම්පත්තියට පැමිණියේ මම රහත්කෙනෙකැයි සිත් උපදවා "තෝ රහත් නො වෙහි යව ශාස්තෘන් වහන්සේ ප්‍රශන විචාරව" යි වැඩකැමති දෙවතාවක විසින් මෙහෙයනලද්දේ එසේ කොට රහත්ඵලයට පැමිණියේය. එකෙක් රජ ගහනුවර එක් කුලදූරියක කුසැ උපන; ඕ තොමෝ ද පළමුකොට මවු පියන් යාඥා කොට පැවිද්ද නො ලබන්නී කුලගෙට පැමිණියා පිහිටියාවූ ද ගැබ නො දන්නී සවාමියා සතුටු කරවා ඔහු විසින් අනුදන්නා ලද්දී භික්‍ෂුණීන් කෙරෙහි පැවිදි වූ ඇගේ ගැබ්නිමිති දැක භික්‍ෂුණීහු

දෙවදහතයන් විවාළාහුය; හෙතෙම අශ්‍රමණීයකැයි කියා; දඹබලයන් විවාළාහුය; ශාස්තෘන් වහන්සේ උපාලි තෙරුන් පිළිනකරවූහ; තෙරුන් වහන්සේ සැවැත්නුවර වැසි කුලයන් ද විසාඛා උපාසිකාව ද කැඳවා ශුඛ කරන්නාහු (පැවිද්දෙන්) පෙර ලත් ගහීයෙක, පැවිද්ද නිදෙස් වූවා යයි කීහ. ශාස්තෘන් වහන්සේ අධිකරණය මතාකොට විනිශ්චය කරන ලදුයි තෙරුන් වහන්සේට සාධුකාර දුන්සේක. ඕ මෙහෙණ සවණ්ණිබිම්බයක් වැනි පුත්‍රයකු වැදූ; ඔහු ගෙන පසෙනදි කොසොල් රජතෙම පොෂණය කෙළේය; ඕහට "කස්සප" යි ද නම් කොට පසුකලක අලඞ්කාර කොට ශාස්තෘන් වෙත ගෙන ගොස් පැවිදි කරවී. මෙසේ ඔහු රජු විසින් පොෂණය කළ පුත්‍රයා වූ බැවින් ද "කුමාරකස්සප" යයි හැඳිනගත්හු යයි.

අඞ්ඛවතෝ= එසේ නම් ඇති වනයෙහි; මේ අසනු ලැබේ- ඒ වනය දෙ බුදුවරයන්ගේ කාලයෙහි "අඞ්ඛවන" යයි කියා ම නො හරනාලද නාමය පැනෙයි. එහි මෝ ප්‍රඥප්ති විභාවනා යැ. ඝම්හෙය කින් අල්පායුෂ්ක වූ බුදුවරයන්ගේ ශරීරධාතු එකඝන නො වෙයි, අධිෂ්ඨානානු භාවයෙන් විසිරී යෙයි; එහෙයින් ම අපගේ භාග්‍යවතුන් වහන්සේ ද "මම බොහෝකල් සිටියෙමි නො වෙමි සඵල වූ සත්‍යයන් විසින් මම දක්නාලද්දෙමි, යම් කෙනෙකුන් විසින් නො දක්නාලද්දෙමි ද ඔවුහු ම ඉතා බොහෝවෙති, ඔවුහු මාගේ ධාතූන් ගෙන ඒ ඒ තැන පුදන්නාහු සවඥීපරායණ වන්නාහු ය" යි පරිනිර්වාණ කාලයෙහි තමන් වහන්සේගේ ශරීරය විසිරේවා, යි ඉටුසේක. එතකුදු වුවත් දීර්ඝායුෂ්ක වූ බුදුවරයන්ගේ රන්කඳක් මෙන් එකඝන වූ ධාතුශරීරය සිටී; කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේගේ ද (ධාතුශරීරය) එසේ ම සිටියේය. ඉක්බිති මහාජනයෝ රැස්ව ධාතු එකඝනවූවා යැ, වෙන් කරන්ට නො හැක, කුමක් කරන්නෙමු දැ? යි එක්ව කථා කොට එක ඝන වූ ම සෑයක් කරන්නෙමු, එහෙත් කොපමණ වන්නේ දැ? යි. කිසිවෙක් සත්යොදුනකැයි කීහු; මෙය ඉතාමහත, අනාගතයෙහි පිළිදග්නට නො හැක, යොදුන් සයක් වේවා; පස්යොදුනක් සිව්යොදුනක් තුන්යොදුනක්, දෙයොදුනක්, යොදුනක් වේවා,යි සනිටුහන් කොට උළු කෙබඳු වන්නාහු දැ? යි; පිටපස උළු රකතසවණ්ණිමය වූ එකඝන වූ ලක්ෂ යක් අගනාහු වෙත්වා; ඇතුලුපස (උළු) පනස්දහසක් අගනාහු වෙත්වා; සිරියල් - මනොසිලායෙන් මැටිකිස කෙරේවා, තලතෙලින් දියකිස කෙරේවා,යි නිෂ්කාවට ගොස් සතර මුහුන සතර කොටසක් කොට බෙදූහ. රජ තෙම එක් මුඛයක් ගත්තේය, රාජ පුත්‍ර වූ "පඨවිබර" කුමාර තෙම එක් මුඛයක් ද, ඇමතියන්ට ප්‍රධාන වැ සෙනවි තෙම එක් මුඛයක් ද, දනව්වැසියන්ට ප්‍රධාන වැ සිටුතෙම එක් මුඛයක් ද ගත් තේය; ඔවුනතුරෙන් රජතෙම ධනසම්පන්න බැවින් රන් බැහැර කරවා තමා විසින් ගන්නාලද මුඛයෙහි කර්මාන්ත ආරම්භ කෙළේය; යුවරජ

තෙමේ ද, සෙනෙවි තෙමේ ද, (කම්මාන්ත ආරම්භ කළාහුයි.) එහෙත් සිටුහු විසින් ගත් මුඛයෙහි කම්මාන්ත පසුබසියි; ඉක්බිති "සොරත" නම් ත්‍රෙපිටක වූ භාණක වූ අනාගාමී ආර්‍ය්‍ය ශ්‍රාවක වූ එක් උපාසකයෙක් විය; හෙතෙම කම්මාන්ත පසුබසියයි දැන ගැල් පන්සියයක් යොදවා දනව්වට ගොස් "කාශ්‍යප සම්‍යක්සම්බුඩයන් වහන්සේ විසිදහසක් අවු රුදු සිට පිරිනිවිසේක; උන්වහන්සේ පිණිස යොදුනක් වූ රුවන් සෑයක් කරයි, යමෙක් රන් හෝ අමුරන් හෝ සත්රුවන් හෝ සිරියල් හෝ මනොසිලා හෝ යමක් දෙන්ට උත්සාහ කෙරේද, හෙතෙම එය දෙව" යි සමාදන්කරවිය; මනුෂ්‍යයෝ තම තමන්ගේ ශක්තියෙන් භිරණ්‍යසුවණ්‍ණාදිය දුන්නාහුය; නො හැකි වන්නාහු තෙල් සහල් ආදිය දෙත් මය; උපාසක තෙම තෙල් සහල් ආදිය කම්කරුවන්ගේ ඔත් වැටුප් පිණිස යවයි; අවශෙෂයෙන් රන් රුස්කරවා යවයි; මෙසේ සියලු දඹදිව හැසුරුනේය. සෑයෙහි කම්මාන්ත නිමිණේය; චෛත්‍යස්ථානයෙන් පතක් ගැවූහ- "කම්මාන්ත නිමිණේය, ආචාර්‍ය්‍ය තෙම අවුත් චෛත්‍යය වඳිවා" යි හෙතෙමේ ද පතක් යැවී- "මා විසින් සියලු දඹදිව සමාදන් කරනලද් දේය, යමක් ඇද්ද එය ගෙන කම්මාන්තය නිමවත්වා" යි. හසුන්පත් දෙක ම අතරමඟ පැමිණියාහුය; එහෙත් ආචාර්‍ය්‍යයන්ගේ පතට වඩා පළමු කොට චෛත්‍යස්ථානයෙන් (එවූ) පත ආචාර්‍ය්‍යයන් අතට පැමිණියේය; හෙතෙම පත්‍රය කියවා සෑය වඳින්නෙමි, යි එකලාව ම නික්මුණේය; අතරමඟැ වනයෙහි පන්සියයක් සොරු එලඹ සිටියාහුය; ඔවුනතුරෙහි කිසිවෙක් ඔහු දැක "මොහු විසින් සියලු දඹදිවින් භිරණ්‍යසුවණ්‍ණ රුස්කරනලද, අපට නිධිකුම්භියක් පෙරලෙමින් ආවා" යයි සෙස්සන්ට දන්වා ඔහු ගත්තාහුය. දරුවෙනි! කුමක්හෙයින් මා ගණිවූදැ? යි තොප විසින් සියලු දඹදිවින් භිරණ්‍යසුවණ්‍ණ රුස්කරනලද, අපව ද මදක් දෙවයි; කිම තෙපි නො දනිවු ද? කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ පිරිනිවිසේක, උන්වහන්සේ පිණිස එක් යොදුන් වූ රුවන්සෑයක් කරයි, එය සඳහා මා විසින් සමාදන් කරනලද, තමා පිණිස නො වෙයි, එය ලද ලද තැනින් එහි ම යවනලද, මාගේ වචනයි හන්සළුව පමණක් තබා අන් ධනයක් කිසිවකුදු නැතැයි, කිසිවෙක් එසේය කෙල ආචාර්‍ය්‍යයන් හරිවු යයි කිහු; කිසිවෙක් මේ තෙම රාජපූජිත යැ, අමාත්‍යපූජිත යැ, අප අතුරෙන් කිසිවෙක් නගරශ්‍රීයෙහි දැක රජ් රජ් මහඇමති ආදීන්ට දන්වා අනයව්‍යසනයට පමුණුවන්නේය,යි කිහු; උපාසකතෙම දරුවෙනි! මම එසේ නො කරන්නෙමියි කියා; හෙ ද වනාහී ඔවුන් කෙරෙහි කාරුණ්‍යයෙන් වෙයි, තමාගේ ජීවිතනිරපේක්ෂයෙන් නොවේ; එකල්හි ගතයුතුය හළයුතු යයි විවාදකරන්නා වූ ඔවුන් අතුරෙහි ගතයුතුය යන ලබ්ධිඇත්තාහු ඉතා බොහෝ වැ ජීවිතයෙන් තොරකළාහුය; බලවත් ගුණ ඇති ආර්‍ය්‍ය ශ්‍රාවකයා කෙරෙහි අපරාධය හෙතුකොටගෙන නිවුණු පහන්සිළු මෙන් ඔවුන්ගේ ඇස් අතුරුදහන් වූහ; ඔවුහු "අහෝ ඇස අහෝ ඇස" යි විලාපකියන්නාහු කිසිවෙක් නැයන් විසින් ගෙට

ගෙනයන ලද්දාහුය; කිසිවෙක් නැගන් නැත්තාහු අනාථ වූවාහු හුයි, එහි ම වනයෙහි රුක්මූලැ පන්සලැ විසූහ. වනයට ගිය මනුෂ්‍යයෝ කරුණාවෙන් ඔවුන්ට සහල් හෝ බත්සුල් හෝ වැටුප් හෝ දෙති; දර පලා ආදිය පිණිස ගොස් ආ මනුෂ්‍යයෝ කොහි ගියහු දැයි කී කල්හි අඹිවනයට ගියෙමුයි කියති; මෙසේ දෙබුදුවරයන්ගේ ම කාලයෙහි ඒ වනය අඹිවනය,යි ම දන්නා ලැබේ. කාශ්‍යප බුඩකාලයෙහි වනාහි මේ වනය ඔරනාලද ජනපදයෙහි අවවියක් විය, අපගේ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි සැවැත් නුවරින් නුදුරෙහි දෙව්රමට පිටිපස විවෙක කැමති කුලපුත්‍රයන්ට වාසස්ථාන වූ ප්‍රධන්ගෘහයක් විය, එහි ආයුෂ්මත් කුමාරකාශ්‍යප තෙම එකල ශෛක්ෂප්‍රතිපදාව පුරමින් වාසය කරයි. එසින් කියනලදී- අඹිවනෙ විහරති යී.

අඤ්ඤතරා දෙවතා= නම් ගොත් විසින් අප්‍රකට වූ එක් දෙවතාවක් යන අර්ථයි. "අභිජානාති නො භන්තෙ! භගවා අහුනං යෙව අඤ්ඤං නඤ්ඤතරස්ස මහෙසක්ඛස්ස යක්ඛස්ස සඩ්ඪිතෙනන නාණභාසඛඩය විමුතතිං අභාසිත්ථ" යි මෙහි වනාහි ප්‍රසිඩ වූ ශක්‍රදිව්‍යරාජ තෙමේ ද "අන්‍යතර" යයි කියනලද; **දෙවතා** යන මේ ද දෙවියන්ට ද දෙව ධිතෘන්ට ද සාධාරණ වචනයකි; මේ අර්ථයෙහි වූ කලි දෙවියෙක් අදහස් කරනලදි, **අභික්කන්තාය රත්තියා** යන මෙහි "අභික්කන්තා" ශබ්දය. "අභික්කන්තා" ශබ්දය තෙම ක්ෂය - සුන්දර - අභිරූප - අබ්භානුමොදනාදියෙහි දක්නා ලැබේ. එහි **"අභික්කන්තාභන්තෙ! රත්තී නික්ඛන්තා පඨමා යාමා විරතිඤ්ඤා ගික්ඛුසඞ්ඝා උද්දිසතු භන්තෙ! භගවා භික්ඛූනං පාතිමොක්ඛං"** යනාදී තැන්හි ක්ෂයවීමෙහි දක්නා ලැබේ; **"අයං ඉමෙසං චතුන්නං පුග්ගලානං අභික්කන්තතරෝ ච පණීතතරෝ ච"** යනාදි තැන්හි සුන්දරයෙහි යැ;

142. **"කථා මෙ වඤ්ඣේ පාදුනි - ඉඩ්ධියා යසසා ජලං**
අභික්කන්තෙන වණ්ණෙන - සබ්බා ඔභාසයං දිසා" යන මේ ආදිතැන්හි අභිරූපයෙහි යැ; **"අභික්කන්තං භෝ ගොතම! අභික්කන්තං භෝ ගොතම!"** යනාදි තැන්හි අබ්භානුමොදනයෙහි යි; මෙහි වනාහි ක්ෂයෙහි වේ. එහෙයින් **අභික්කන්තාය රත්තියා**= රාත්‍රිය ක්ෂය වූකල්හි යයි කියනලද වෙයි; එහි මේ දෙවපුත් තෙම මැදුම්යමට

---

142. **ඉඩ්ධියා**= (මේ මෙබඳු වූ දිව්‍යමය) ඍඩියෙන් ද; **යසසා**= (මෙබඳු වූ) පිරිවරින් හා සම්පත්තියෙන් ද; **ජලං**= බබලමින්; **අභික්කන්තෙන වණ්ණෙන**= අභිරූප (අතිශයින් කාන්ත) වූ; **වණ්ණෙන**= ශ්‍රීවර්ණයෙන්; **සබ්බාදිසා**= සියලු දිගුන්; **ඔභාසයං**= මහාබවමින්; **ඛථා**= (දිව්‍ය-නාගාදීන් අතුරෙන්) කවරෙක්; **මෙ**= මාගේ; **පාදුනි**= පාදයන්; **වන්දති**= වඳී ද?

අනතුරුව ආයේ යයි දතයුතු. අභික්කන්තවණ්ණා යන මෙහි "අභික්කන්ත" ශබ්දය අභිරූපයෙහිය. "වණ්ණ" ශබ්දය වනාහි ජවි-සතුති-කුලවංශ - කාරණ - සංසථාන- ප්‍රමාණ - රූපායතනාදි යෙහි දක්නාලැබේ. එහි "සුවණ්ණවණ්ණා'සි භගවා" යන මේ ආදිතැන්හි ජවියෙහිය; "කදා සංයුළහා පන තෙ ගහපති සමණස්ස ගොතමස්ස වණ්ණා" මේ ආදිතැන්හි සතුතියෙහි ය; "චත්තාරෝ'මෙ භො ගොතම! වණ්ණා" මේ ආදිතැන්හි කුලවංශයෙහි ය; "අථ කෙන නු වණ්ණෙන ගන්ධපෙථනොති වුච්චති" මේ ආදිතැන්හි කාරණයෙහි ය; "මහන්තං භික්ඛුසඡ්ඝවණ්ණං අභිනිම්මිනිත්වා" මේ ආදිතැන්හි සංසථානයෙහි ය; "තයො පත්තස්ස වණ්ණා" මේ ආදිතැන්හි ප්‍රමාණයෙහි ය; "වණ්ණා ගන්ධා රසා ඔජා" මේ ආදිතැන්හි රූපායතනයෙහි ය; හේ මෙහි ජවියෙහි දක්නයුතු; එහෙයින් අභික්කන්තවණ්ණා= අභිරූප වූ ජවි ඇති ඉෂ්ට වූ ජවි ඇති මනවඩන්නා වූ ජවි ඇති යයි කියනලද වේ. ඒ එසේ මැයි - දෙවතාවෝ මිනිස් ලොවට එන්නාහු ප්‍රකෘති වර්ණීය ප්‍රකෘති සෘඩිය හැර ඕදරිකවූ ආතමභාවයක් කොට අතිරෙකවර්ණීය අතිරෙකසෘඩිය මවා නෘත්‍ය සමජ්‍යාදියට යන මිනිසුන් මෙන් සකස්කරනලද කයින් පැමිණෙත්. මේ දෙවපුත්‍ර ද එසේ ම ආයේය; එයින් කියනලදී— අභික්කන්ත වණ්ණා යනු.

කෙවලකප්පං යන මෙහි "කෙවල" ශබ්දය අනවශෙෂ - භූයෙය්‍ය - අව්‍යාමිශ්‍ර - අනතිරෙක - දෘඪී - විසංයොගාදි නොයෙක් අර්ථ ඇත්තේය. ඒ එසේ මැයි- මේ ශබ්දයාගේ "කෙවල පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං" මේ ආදිතැන්හි අනවශෙෂබව අර්ථ ය; "කෙවලකප්පා ච අඞ්ගමගධා පහූතං ඛාදනීයං භොජනීයං ආදාය උපසඞ්කමිස්සන්ති" මේ ආදියෙහි යෙහුය්‍යතාව ය; "කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති" මේ ආදියෙහි අව්‍යාමිශ්‍රත්වය ය; "කෙවලං සද්ධාමත්තකං නූන අඤ්ඤාඅසම්මා" මේ ආදියෙහි අනතිරෙකත්ව ය; "ආයස්මතො අනුරුද්ධස්ස ඛාණුකොණ්ඩඤ්ඤෙ නාම සබ්‍රහ්මචාරිනො කෙවලකප්පං සඞ්ඝභෙදාය ඨිතො" මේ ආදියෙහි දෘඪීබව ය; "කෙවලී වුසිතවා උත්තමපුරිසොති වුච්චති" මේ ආදියෙහි විසංයොග ය යි. මෙහි වනාහි මේ ශබ්දයාගේ අනවශෙෂභාවය අර්ථ යයි අදහස් කරනලදී.

මේ "කප්ප" ශබ්දය වනාහි අභිසද්දහන - ව්‍යවහාර - කාල - ප්‍රඥප්ති - ඡේදන - විකල්ප - ලෙශ - සමන්තභාවාදි නොයෙක් අර්ථ ඇත්තේය. ඒ එසේ මැයි- මේ ශබ්දයාගේ "ඔක්කප්පනියමෙතං භොතො ගොතමස්ස යථා නං අරහතො සම්මාසම්බුද්ධස්ස" යන මේ ආදියෙහි අභිසද්දහනය අර්ථ ය; "අනුජානාමි භික්ඛවෙ! පඤ්චහි සමණකප්පෙහි ථූලං පරිභුඤ්ජිතුං" මේ ආදියෙහි

ව්‍යවහාරය යැ; "යෙන සුදං නිච්චකප්පං විහරාමි" මේ ආදියෙහි කාල ය යැ; "ඉච්චායස්මා කප්පෝ" මේ ආදියෙහි ප්‍රශ්නපනීය යැ; "අලඞ්ක තෝ කප්පිතෝකාසමස්සු" මේ ආදියෙහි ඡේදනය යැ; "කප්පති මඩ්ඨු ලාබූපෝ" මේ ආදියෙහි විකල්පය යැ; "අපි කප්පෝ නිපජ්ජිතුං" මේ ආදියෙහි ලෙශය යැ; "කෙවලකප්පං වෙළුවනං ඔභාසෙත්වා" මේ ආදියෙහි සම්මන්නභාව යයි. මෙහි වනාහි මේ ශබ්දයාගේ සම්මන්න භාවය අපි යයි අදහස් කරනලදී. එහෙයින් කෙවලකප්පං අඞ්ගවනං යන මෙහි නිරවශෙෂ කොට භාත්පසින් අඞ්ගවනය යි මෙසේ අපි දනයුතු.

ඔභාසෙත්වා= වස්ත්‍රාභරණයෙන් භා ශරීරයෙන් උපන් ආලොක යෙන් පතුරුවා; සඳ මෙන් ද හිරු මෙන් ද එකොභාස එකප්පජ්‍යොත කොට යන අර්ථයි. එකමනතං අඞ්ගසි= එක් පසක එක් අවකාසයක සිටියේසි; එතදවොච= මේ "භික්ඛු! භික්ඛු!" යනාදි වචනය කිය; වැලි කුමක් හෙයින් මේ තෙම නො වැද ශ්‍රමණව්‍යවහාරයෙන් ම කථා කෙරේ ද යත්? ශ්‍රමණසංඥව පවත්නා හෙයිනි; ඕහට මේ සිත වී ල- "මේ තෙම අතරැ කාමාවචරයෙහි විසිය, මම වූ කලි එකල පටන් බඹ සර ඇත්තෙම් වෙමි" යි ඕහට ශ්‍රමණසංඥව ම පවතී; එහෙයින් නො වැද ශ්‍රමණව්‍යවහාරයෙන් ම කථාකරයි; මේ දෙව්පුත් තෙම තෙරුන්ගේ පූර්වසහායයෙක්ල; කවර තැනක පටන් ද යත්? කාශ්‍යපසම්‍යක්සම්බුඩයන්ගේ කාලයෙහි පටන් වේ. සැබව- පූර්වාධිකාර කථාවෙහි ආ සහායයන් පස්දෙන අතුරෙහි යම් ඒ අනුතෙර කෙනෙක් සතරවන දින අනාගාමී වී යයි කියනලද ද, මේ හෙතෙමේයි. ඒ මෙසේ අසනු ලැබේ- එකල ඔවුනතුරෙහි සඞ්ඝසථ විරයන්ව රහත්බව සමග මැ අභිඥාවෝ පැමිණියාහුය; හෙතෙම මාගේ කිස මුදුන් පැමිණියේ යයි අහසට පැනනැඟී අනුතත් විලැ මුව ඝෝදු උතුරුකුරු දිවයිනෙන් පිණ්ඩපාතය ගෙන අවුත් "ඇවැත්නි! මේ පිණ්ඩ පාතය වලඳු නො පමාවැ මහණදම් කරව්" යයි කිය; අන්‍යයෝ මෙසේ කිහු- "ඇවැත්නි! අපගේ මෙසේ කතිකාවක් නැති, යමෙක් පළමු කොට විශෙෂය උපදවා පිණ්ඩපාතය ගෙන ඒ ද ඔහු විසින් ගෙන එන ලද්ද වලඳු සෙස්සන් විසින් මහණදම් කටයුතු" යයි. නුඹවහන්සේ තමන්ගේ උපනිශ්‍රය හෙතුකොට ගෙන කටයුතු මුදුන් පැමිණ වූවහු; ඇපි දු ඉදින් අපගේ උපනිශ්‍රයයෙක් වන්නේ නම් කටයුතු මුදුන් පමුණුවන්නෙමු, තෙල අපට ප්‍රපඤ්චයෙන; නුඹ වහන්සේ යනු මැනවැයි. උන් වහන්සේ යම් පහසු තැනකට ගොස් ආයුකෙළවර පිරිනිවියහ. දෙවන දවස් අනුතෙරුන් වහන්සේ අනාගාමිඵලය පසක් කළහ, උන් වහන්සේට ද අභිඥ පැමිණියාහුය; හෙතෙමේ ද එසේ ම පිණ්ඩපාතය ගෙනවුත් ඔවුන් විසින් පිළිකෙව් කරන ලද්දේ යම් පහසු තැනකට ගොස් ආයුකෙළවර ශුඛාවාසයෙහි උපන. හෙතෙම ශුඛාවාසයෙහි සිට

පෙර යහලුවෙක්.

ඒ යහලුවන් බලන්නේ එකෙක් එකල මැ පිරිනිවියේය; එකෙක් දැන් භාග්‍යවතුන් සමීපයෙහි ආර්‍යභූමියට පැමිණියේය; එකෙක් ලාභසත්කාරය නිසා "මම රහත්මි" යි සිත් උපදවා සුපාරකපටුන්හි වෙසේ යයි දැක ඔහු කරා පැමිණ තෙපි රහත් නො වෙහි, රහත්මඟට පිළිපන්නේ නො වෙහි, යව භාග්‍යවතුන් වහන්සේ වෙත එලඹ බණ අසව,යි යෙදවී. හෙතෙමේ ද ඇතුලුගමැ භාග්‍යවතුන් වහන්සේ අවවාද යාඤ්ඤ කොට "නාසමාතිහ නෙ බාහිය! දිට්ඨෙ දිට්ඨමත්තං භොතු" යි භාග්‍යවතුන් වහන්සේ විසින් සංක්ෂේපයෙන් අවවාද කරන ලද්දේ ආර්‍යභූමියට පැමිණියේය. නැවත අන් එකෙක් ඇති හෙතෙම කොහි දැ? යි බලන්නේ අඞ්ගවනයෙහි ශෛක්ෂප්‍රතිපදාව පුරමින් වාසය කෙරේ යයි දැක මෙසේ සිතී- "යහලුවාගේ සමීපයට යන්නෙමි, වැලි යන්නහු විසින් සිසතින් නො ගොස් කිසි පඬුරක් ගෙන යන්ට විටී, එහෙත් යහලුතෙම වනාහි නිරාමිෂ වූයෙක, ගල්මුදුනැ වෙසෙන්නේ මා විසින් අහසෙහි සිට දෙනලද පිණ්ඩපාතයපවා නො වලඳ, මහණදම් කෙළේය, දැන් ආමිෂ පඬුරක් කිම ගන්නේ ද? දහම්පඬුරක් ගෙන යන්නෙමි" යි බඹලොව සිටියේ ම රුවන්වැලක් ගොතන්නෙකු මෙන් ප්‍රශස්ත පසළොසක් විභාග කොට ඒ දහම් පඬුර ගෙන අවුත් යහලුවා සමීපයෙහි සිට තමාගේ ශ්‍රමණ සංඥාව පැවතීම් විසින් ඒ තෙරුන් නො වැඳ මහණ! මහණ! යි අමතා අයං වම්මිකො යනාදිය කී. එහි තුරිතයෙහි ආමන්ත්‍රණ වශයෙන් "භික්ඛු! භික්ඛු!" යි ආමෙඩිතය දතයුතු; නොහොත් යම්සේ එකම තිලකයකින් නළල නො හොබී ද, එය වට කොට අන්‍ය (තිලක) ගතුදු දුන්කල්හි පිපි සැරසුනාක් මෙන් හොබී ද, එපරිද්දෙන් එක ම පදයකින් වචනය නො හොබී, පරිවාරසපදයක් සමඟ පිපි සැරසුනාක් මෙන් හොබනේ නුසි, පිරිවරපදයාගේ වශයෙන් වචනය ඵුල්ලිතව සැරසුනාක්හු මෙන් කරන්නේ ද මෙසේ කියේයි.

අයං වම්මිකො= පෙරටවැ සිටි වාල්මීක (තුඹසෙක්) නම් නැති, එහෙත් දෙශනා වශයෙන් පෙරටවැ සිටියක්හු දක්වන්නෙකු මෙන් අයං යි කිය. ලඞ්ගිං= සෑතක් ගෙන කණින්නේ කණයමක් දුටුයේය; උකඛිප ලඞ්ගිං අභික්ඛණ සුමෙධ!= දරුව! පණ්ඩිතය! කණයමෙක් නම් රාත්‍රියෙහි නො දුමසි, දහවල් නො දැල්වෙසි, තෙල කණයම නඟව මත්තෙහි සාරව,යි මෙසේ සියලු පදයන්හි අරුත් දතයුතු. උඩුමායි සං= මැඩියකු; චඞ්ගවාරං= අළුපද්දක් (= කරපෙරහනක්;) කුම්මං= ඉදිබුවකු; අසිසූනං= මස්කපන කඩුවක් හා මස්ලොඹුවක් ද; මංසපෙසිං= අත්ගල් පමණ වූ අමුමස්පිඬක්; නාගං= සමන්මල් කලඹක් වැනි මහාපෙණයක් ඇති ත්‍රිවිධසෞවස්තිකයෙන් පරිකර්මිත වූ නාගයකු දුටු යේය; මා නාගං ඝට්ටයි= දඹු කෙළවරකින් හෝ වැල් කෙළවරකින් හෝ යලි පස්සුණු ඔසවමින් හෝ නාගයා නො ගටව; නමො කරොහි නාගස්ස= උඩුසුළඟින් ඉවත් වැ පිරිසුදු වතක් හැඳ නාගයාට නමස්කාර

කරව, නාගයා විසින් අධිෂ්ඨිත වූ ධනය නම් සත්වන කුලපරපුර දක්වා කන්නහුට ද ක්ෂය නො වෙයි, නාගතෙම් තට අධිෂ්ඨිත වූ ධනය දෙන් නේය, නාගයාට නමස්කාර කරව,යි. **ඉතො වා පන සුත්වා**= යම්සේ දූකඛකඛඩි සූත්‍රයෙහි "ඉතො" යනු ශාසනයෙහි අවධිවචන වී ද, මෙහි එසේ නො වෙයි; මෙහි වනාහි දිව්‍යපුත්‍ර තෙම අවධියැ; එහෙයින් **ඉතො වා පන**= යලි මාගේ සමීපයෙන් හෝ අසා,යි මේ මෙහි අර්ථයි.

චාතුම්මහාභූතිකස්ස= සතර මහාභූතමය වූ; **කායස්ස අධිවචනං**= ශරීරයට නමෙකි; ඒ එසේ මැයි- යම්සේ බාහිර වාල්මීකය තෙම "වම්නය කොරේ නුයි, වමනය කරනලද නුයි, වමනය කරනලද්දෙන් ඔස වනලද නුයි, වමනය කරනලද සෙනහ බඳනාලද නුයි" සතර කරුණකින් "වම්මික" යයි කියනුලැබේ ද; සැබව- ඒ තුඹස මත - මූගටි - මී - සිකනල් ආදී වූ නන්වැදෑරුම් ප්‍රාණීන් වමනය කෙරේ නුයි "වම්මික" නම්, වේයන් විසින් වමනය කරනලද නුයි, "වම්මික" නම, වේයන් විසින් වමනය කොට මුවතුඹින් නගනලද පාංශූචූණියෙන් කපිපම ණින් ද මිනිස්පමණින් ද ඔසවනලද නුයි, "වම්මික" නම, වේයන් විසින් වමනය කළ කෙළවල සෙනහයෙන් භාත්පසින් බඳනාලද බැවින් සතියක් වැයි වයින කල්හි දූ නො විසිරෙනු ලැබෙයි, නියංකල ද එසින් පස්මිටක් ගෙන එය මිටින් පෙළනකල්හි සෙනහය නික්මෙයි; මෙසේ වමනය කළ සෙනහයෙන් බඳනාලද්දේ නුයි, "වම්මික" නම් වේ. එප රිද්දෙන් මේ කයද **අකතිඤ්ඤා අකතිගුණඤ්ඤා** යනාදි නයින් නන්වැදෑරුම් වූ අසුචිකිලුටුමල වමනය කෙරේනුයි ද "වම්මික" නම, බුදු - පසේ බුදු - ක්ෂීණාශ්‍රවයෝ මේ අත්බැවිහි නිකාන්තිය ක්ෂයකිරීමෙන් ආත්ම භාවය හැර ගියාහු නුයි, ආර්‍යයන් විසින් වමනය කරනලද නුයි ද "වම්මික" නම, තවද- මේ කය යම් ඇට තුන්සියයකින් ඔසවනලද්දේ නහරවැලින්බඳනාලද්දේ මසින්ආලෙපකරනලද්දේ තෙත්සමින් ඔතන ලද්දේ සිව්යෙන් රඳනාලද්දේ සකයන් වඤ්චා කෙරේ ද, ඒ සියල්ල ආර්‍යයන් විසින් වමනය කරනලද්දේ ම නුයි වමනය කරනලද උවදුය ඇත්තේ නුයි ද "වම්මික" නම; **නාණඤා ජනෙති පුරිසං - චිත්තනමස්ස විඛාවති** යි මෙසේ තෘෂ්ණාව විසින් උපදවනලද බැවින් ආර්‍යයන් විසින් වමනය කරනලද්දූ වූ ම තෘෂ්ණා සෙනහයෙන් මේ කය බඳනා ල ද නුයි ද "වම්මික" නම් වේ. තවද- යම්සේ තුඹස ඇතුලත නන්වැදෑරුම් ප්‍රාණීහු එහි ම උපදින් ද, මලමූ කෙරෙත් ද, ගිලන් වැ හොවින් ද, මළාහු වැටෙත් ද, මෙසේ හෙතෙම ඔවුන්ට නිබ්බිරගෙය ත් වස්කිළිය ත් ගිලන් හල ත් සොඉහාන ත් වේද, එපරිද්දෙන් ක්ෂත්‍රියමහාසාරාදීන්ගේ පවා කය "මේ ගොපිතරක්ෂිත වූ මණ්ඩිතප්‍රසාධිත වූ මහානුභාව ඇත්තවුන් ගේ කයකැ" සි නො සිතා සිව්ඇසුරුකළ පණුවෝ යැ සම්ඇසුරුකළාහු යැ මස්ඇසුරුකළාහු ඇ නහරඇසුරුකළාහු ඇ ඇටඇසුරුකළාහු යැ ඇටමිදුලුඇසුරුකළ පණුවෝ යයි මෙසේ කුලගණනින් අසූදහසක් **ප්‍රමණ** කෘමිකුලයෝ ඇතුලු කයෙහි ම උපදිති, මලමූ කෙරෙති, ගිලන්

බැවින් ආතුර වූවාහු හොවිති, මළාහු වැටෙති, මෙසේ මේ කය ද ඒ පණු වන්ට තිබිරිගෙය ත් වස්කිළිය ත් ගිලන්හල ත් සොහොන ත් වේ නුසි "වම්මික" යි ම සඞ්ඛ්‍යාවට ගියේයි. එයින් වදුළහ. භාග්‍යවතුන් වහන්සේ- **වම්මිකොඃනි බ්‍රොහි භික්ඛවේ! ඉමස්සෙතං චාතුම්මහාභූතිකස්ස කායස්ස අධිවචනං යදුත.**

මාතාපෙත්තිකසම්භවස්ස= මව්කෙරෙන් ද පියා කෙරෙන් ද උපන් මාතාපෙතෘක වූ ශුක්‍රශොණිතයෙන් සම්භව වූ; **ඔදනකුම්මාසූපචයස්ස**= ඔදනයෙන් හා කුලමාෂ (=කොමු) යෙන් ද උපචිත වූ වඩනලද්දා වූ; **අනිච්චුච්ඡාදනපරිමද්දනභෙදනවිධංසනධම්මස්ස**=මෙහි මේ කාය අනිච්ච නැතිවන අවින් අනිත්‍ය සවභාව යැ; දුගඳ නැසීම පිණිස ශරීරවිලෙපන යෙන් ඉලිම සවභාව කොට ඇත්තේයැ; අඟපසඟපිඬා දුරලීම පිණිස කුඩා සම්බාහනයෙන් පිරිමැදියයුතු සවභාව ඇත්තේයැ; ළඳරුකලැ හෝ උණුමතුයෙහි හොවා ගැබවිසිමෙන් වරදවා පිහිටි ඒ ඒ අවයව යන්ගේ සවභන් සම්පාදනය පිණිස අඤ්ඡනය පිඬනය ආදීන්ගේ වශයෙන් පිරිමැදියයුතු සවභාව ඇත්තේයැ; මෙසේ පරිහරණය කරන්න හුගේ ද බිඳෙන විසිරෙන පියවි ඇත්තේයැ; බිඳෙන්නේත් විසිරෙන්නේත් වෙයි, මෙබඳු සවභාව යැ යන අර්ථයි. එහි "මාතාපෙත්තිකසම්භව - ඔදනකුම්මාසූපචය - උච්ඡාදන - පරිමද්දන" පදයන්ගෙන් සම්භව දස කියනලද; "අනිච්චු'ච්ඡාදන - භෙදන - විඛංසන" පදයන්ගෙන් අසාඩහමය කියනලද; මෙසේ පදසතින් ම සතරමහාභූතමය වූ ශරීරයාගේ උස්පහත්බව ද වැඩීම හා පිරිහීම ද භටගැනීම හා නැසීම ද කියනලදැයි දතයුතු **දිවා කම්මනෙන**= දවල් කටයුතු කම්හාතයන්; **ධූපායනා** යන මෙහි මේ "ධූම" ශබ්දය ක්‍රොධයෙහි ද තෘෂ්ණා වෙහි ද විතර්කයෙහි ද පඤ්චකාමගුණයන්හි ද ධර්මදේශනා වෙහි ද ප්‍රකෘති ධූමයෙහි ද යන මේ අර්ථයන්හි වැටේ. ඒ එසේ මැයි- **"සොඩෝ ධූමෝ භයමනි මොසවජ්ජං"** යන මෙහි ක්‍රොධයෙහි වැටෙයි; **"ඉච්ඡාධූමායිතෝ සඳ"** මෙහි තෘෂ්ණාවෙහිය; **"තෙන ඛෝ පන සමයෙන අඤ්ඤතරෝ භික්ඛු භගවතෝ අවිදූරෙ ධූපායතෙනා නිසිතෙනා හොති"** මෙහි විතර්කයෙහි ය;

"ධූම" ශබ්දය.

143. **"පඞ්කෝ ච කාමා පලිපෝ ච කාමා - භයඤ්ච මෙතං තිමූලං පවුත්තං**
රජෝ ච ධූමෝ ච මයා පකාසිතා - හිත්වා තුවං පබ්බජ බ්‍රහ්මදත්ත!"

---

143. **කාමා**= පඤ්චකාමගුණයෝ; **පඞ්කෝ ච**= (ජලයෙහි හටගත් තණසෙවෙල් ආදි) පඞ්කයක් ද වෙයි; **කාමා**= කාමයෝ; **පලිපෝ ච**= මහාකර්දමය (= මඩ) ක් ද වෙයි; **එතං භයං ච**= මේ කාමසඞ්ඛ්‍යාත මහත් වූ භය ද; **තිමූලං**= මූලත්‍රයකින් පිහිටියාක් මෙන් තිශ්චල යයි; **පවුත්තං**= බුඩාදීන් විසින් කියනලද; (නොහොත්) **තිමූලං පවුත්තං**= (මා විසින්) මූලත්‍රයක් ඇත්තේ යයි කියනලද; **රජෝ ච**= (ඒ කාමරජස් සිත්තුල

යන- මෙහි පස්කම්ගුණයෙහිය; **"ධූමං කතනා හොති"** මෙහි ධර්මදේශනාවෙහිය; "ධජෝ රථස්ස පඤ්ඤනං - ධූමෝ පඤ්ඤනමගනිනෝ" මෙහි ප්‍රකෘතිධූමයෙහි ය. මෙහි වූ කලි මේ (ධූමශබ්දය) විතර්කයෙහි අදහස් කරනලදී. එයින් වදුලහ- "අයං රත්තිං ධූපායනා" යනු. **තථාගත ශ්‍රෙෂ්ඨං අධිවචනං**= තථාගතයන් වහන්සේ වනාහි සප්තධර්මයන් බාහිත බැවින් "බ්‍රාහ්මණ" නම් වෙති; වදුලේ මැනු- **"සත්තන්නං ඛෝ භික්ඛු! ධම්මානං බාහිතත්තා බ්‍රාහ්මණෝ හොති, කතමේසං සත්තන්නං? රාගෝ බාහිතෝ හොති, දෝසෝ - මෝහෝ - මානෝ - සක්කායදිට්ඨි - විචිකිච්ඡා - සීලබ්බතපරාමාසෝ බාහිතෝ හොති. ඉමේසං ඛෝ භික්ඛු සත්තන්නං ධම්මානං බාහිතත්තා බ්‍රාහ්මණෝ හොති"** යි. **සුමේධෝ**= සුන්දරප්‍රඥ ඇත්තේ; **සෙඛස්ස** යන මෙහි හික්මේ නුසි "සෙඛ" නම්; වදුලේ මැනු— **"සික්ඛතීති සික්ඛතීති ඛෝ භික්ඛු! තස්මා සෙඛෝති වුච්චති, කිඤ්ච සික්ඛති? අධිසීලම්පි සික්ඛති, අධිචිත්තම්පි සික්ඛති, අධිපඤ්ඤම්පි සික්ඛති"** යනු. **පඤ්ඤායෙතං**= ලෞකික ලොකොත්තර ප්‍රඥාවට මේ නමෙකි; ආයුධසඞ්ඛ්‍යාත ශස්ත්‍රයට නොවේ. **විජ්ඣාරමහඤ්ඤ**= කාමික වෛතසික වීර්‍යයට; එය ප්‍රඥාගතික ම වෙයි; ලෞකික ප්‍රඥාව හා ලෞකික වීර්‍යය ද, ලොකොත්තර ප්‍රඥාව හා ලොකොත්තර වීර්‍යය ද යෙදේ.

එහි වනාහි මෝ අවදිපනා යැ- එක් දනව්වැසි බමුණෙක් උදැසනම මානවකයන් සමග ගමින් නික්ම දහවල් වනයෙහි මන්ත්‍ර කියවා **සවස** ගමට පැමිණෙ ල, අතරමඟ ද එක් තුඹසෙක් ඇති, හේ රාත්‍රියෙහි දුමසි දහවල් දැල්වෙයි, බමුණු තෙම අතවැසි වූ සුමේධ මානවකයාට කීය— "දරුව! මේ තුඹස රෑ දුමසි, දවල් දැල්වෙයි, මොහුගේ විකාරය බලන් නෙමු, එය බිඳ සතර කොටසක් කොට විසුරුව ව" යි. හෙතෙම මැන වැසි උදැල්ලක් ගෙන සමවූ පසින් පොළොවෙහි පිහිටා එසේ කෙළේය. එහි ඇදුරුබමුණා මෙන් භාග්‍යවතුන් වහන්සේ ද, සුමේධ මානවකයා මෙන් ශෛක්ෂභික්ෂු තෙමේ ද, තුඹස මෙන් කය ද, "දරුව! මේ තුඹස රෑ දුමසි, දවල් දැල්වෙයි, මොහුගේ විකාරය බලන්නෙමු, එය බිඳ සතර කොටසක් කොට විසුරුව" යි බමුණා විසින් කියනලද කාලය මෙන් "මහණ! සතරමහා භූතමය වූ කය සතර කොටසක් කොට විමසව" යි භාග්‍යවතුන් විසින් කියනලද කාලය ද; ඔහුගේ "මැනවැ" යි උදැල්ලක්

වැටුණු කලපවන් ගුණවණ්ණාදිය නසන හෙයින්) රජස් යයි ද; **ධූමෝ** ච= (කාමධූමයෙන් පහළ කල් පවන් ගුණ විනාශයට පැමිණීමෙන් මහා ජනයා මැද තෘෂ්ණාව පැතෙන හෙයින්) දුම් යයි ද; **මයා පකාසිතා**= මා විසින් (තොපට ඒ කාමයෝ) ප්‍රකාශ කරන ලද්දාහු ද; (එහෙයින් ඒ කාමයන්) **භික්ඛා**= හැර; **බ්‍රහ්මදත්තා**= බ්‍රහ්මදත්තය; **තුවං**= ඔබ; **පබ්බජ**= පැවිදිවව.

ගෙන එසේ කිරීම මෙන් ශෛක්ෂභික්ෂූහුගේ (කෙශාදි) විසිකොටසෙහි යම් තදබවක් වේද මේ පෘථිවිධාතු යැ, (පිත්තාදි) දෙළොස් කොටසෙහි යම් හාත්පසින් බඳනාබවක් වේද මේ අබ්ධාතු යැ, (සන්තාපාදියට කරුණුවූ) සතර කොටසෙහි යම් පැසවනබවක් වේ ද මේ තෙජොධාතු යැ, (උඩඬගම්වාතාදි) සයකොටසෙහි යම් පුරවනබවක් වේ ද මේ වායොධාතු යැයි මෙසේ චතුධාතුවවත්‍ථාන වශයෙන් කායපරිග්‍රහය දතයුතු.

උඛහිනි ඛො භික්ඛු! යි කුමක් හෙයින් භාග්‍යවතුන් වහන්සේ අවිද්‍යා කණයම යයි කොට දැක්වූයේක් ද යත්? යම්සේ වනාහි නුවර දොර වසා කණයම (=අඟුලුකණුව) යෙදුකල්හි මහාජනයාගේ ගමන පසිදේද යමෙක් නුවර ඇතුලත වෙත් ද ඔවුහු ඇතුලත ම වෙති, යමෙක් පිටත වෙත් ද ඔවුහු පිවත ම වෙති, එපරිද්දෙන් ම යමෙකුගේ ඥානචාරයෙහි අවිද්‍යා නමැති කණයම වැටේ ද ඔහුගේ නිවනට පමුණුවන ඥානගමන පසිදෙයි; එහෙයින් අවිද්‍යා කණයමැයි කොට දැක්වූ සේක. **පජහ අවිජ්ජං=** මෙහි කම්සථානය ඉගෙනීම් පිළිවිසීම් වශයෙන් අවිද්‍යාප්‍රහාණය වදරණලද; **උඛුමාසිඛානි ඛො භික්ඛු!=** මෙහි උඛුමාසික මැඩියා නම් මහත් නො වෙයි, නියපිටක් පමණ වෙයි, පරණලා අතරෙහි හෝ ගස් අතරෙහි හෝ වැල් අතරෙහි හෝ වෙසෙයි, හෙතෙම දඹුකෙළවරකින් හෝ වැල් කෙළවරකින් හෝ පස්සුන්නෙන් හෝ ගවනලද්දේ වැයම් කොට මහත් වැ වට වැ බෙලිගෙඩියක් පමණ වී සතරපය අහස්ගත කොට සිදුණු ගමන් ඇතිව සතුරන්ගේ වසඟයට පැමිණෙයි, කවුඩු උකුසු ආදීන්ට බත්වූයේ ම වේ එපරිද්දෙන් මේ ක්‍රොධය ද පළමුව උපදනේ සිත කැලඹීම් මාත්‍රයෙක් ම වෙයි, එකෙණෙහි නිග්‍රහ නො කරනලද්දේ වැඩී මුහුණ හැකිලීමට පමුණුවයි, එකල නො නිගන්නා ලද්දේ හඟු සැලීමට පමුණුවයි, එකල නො නිගන්නා ලද්දේ පරුෂවචන කීමට පමුණුවයි, එකල නො නිගන්නා ලද්දේ දිගුන් බැලීමට පමුණුවයි, එකල නො නිගන්නාලද්දේ ආකඞ්ණ-පරිකඞ්ණයට පමුණුවයි, එකල නො නිගන්නාලද්දේ අත්-ගල්-දඬු-අවි සැපයීකිරීමට පමුණුවයි, එකල නො නිගන්නා ලද්දේ දඬු-අවිවලින් පහරදීමට පමුණුවයි, එකල නො නිගන්නා ලද්දේ මෙරමා නැසීමට ද තමා නැසීමට ද පමුණුවයි; මේ වදරන ලද්දේ මැයි— **"යතො අයං ඛොඩා පරං ඝාතෙඩා අත්තානං ඝාතෙති එත්තාව තා'යං ඛොඩා පරමුස්සදගතො හොති පරමවෙපුල්ලප්පත්තො"** යි. එහි යම්සේ මැඩියාගේ සතරපාදයන් අහස්ගතකල්හි ගමන පසිදේ ද, මැඩියා සතුරන්ගේ වසඟයට හොස් කවුඩු ආදීන්ට බත් වේ ද, එපරිද්දෙන් ක්‍රොධයෙන් යුත් පුදගල තෙම කමටඅන්ගෙන වඩන්ට නො හැකි වෙයි, සතුරන්ගේ වසඟයට යෙයි, (කෙලඹාදි) සියලු මාරයන් විසින් කැමති සේ කටයුතු වූයේ වෙයි; එයින් වදළහ. භාග්‍යවතුන් වහන්සේ-

ක්‍රොධය

උඹුමාසිකා'නි ඛෝ භික්ඛු! කොධූපායාසස්සේතං අධිවචනං යනු. එහි බලප්‍රාප්ත වූ ක්‍රෝධය ම **කොධූපායාස** නම්; **පජහ කොධූපායාසං** යන මෙහි ප්‍රත්‍යවෙක්ෂා ප්‍රහාණය වදරනලදී.

මෙඛාපථෝ= මෙහි යම්සේ පුරුෂයෙක් ධනය සහිත වූයේ භොග සහිත වූයේ කතරමහට පිළිපන්නේ දෙමංසන්ධියකට පැමිණ මේ මඟින් යායුතු ද? මේ මඟින් යායුතු දැ? යි නිශ්චය කරන්ට නො හැකි වන්නේ එහි ම සිටීද, එකල්හි ඔහු වෙත සොරු එලඹ අනයව්‍යසනයට පමුණුවති; එපරිද්දෙන් මූලකර්මස්ථානය ගෙන හුන්නාවූ මහණ බුඩාදීන් කෙරෙහි සැකය උපන් කල්හි කර්මවහන් වඩන්ට නො හැකි වෙයි, එකල්හි ඔහු කෙලෙසමාරාදිවූ සියලු මාරයෝ අනයව්‍යසනයට පමුණුවත්. එහෙයින් විචිකිත්සාව දෙමංසන්ධියක් සම වෙයි එහෙයින් වදළහ. භාග්‍යවත්හු- **මෙඛාපථෝ'නි ඛෝ භික්ඛු! විචිකිච්ඡායෙතං අධිවචනං** යනු. **පජහ විචිකිච්ඡං**= මෙහි කර්මස්ථානය ඉගෙනීම් පිළිවිසීම් වශයෙන් විචිකිත්සාප්‍රහාණය වදරනලදී. **චඞ්ගවාරං**= මෙහි යම්සේ රදවුන් විසින් කරපෙරහනෙහි දිය වත්කළ කල්හි එක් දියකළයක් ද දෙකක් ද දසයක් ද විස්සක් ද කළසියයක් ද වැගිරෙන්නේ ම වේද, පතක් පමණ කුදු ජලය නො සිටීද, එපරිද්දෙන් නීවරණ සමඟගි පුද්ගලයාගේ අබ්භන්තරයෙහි කුසල්දහම් නො සිටී. එසින් වදළහ. භාග්‍යවත්හු- **චඞ්ගවාරනති ඛෝ භික්ඛු! පඤ්චන්නෙතනං නීවරණානං අධිවචනං** යනු. **පජහ පඤ්චනීවරණෙ**= මෙහි විෂ්කම්භණ - තදඞ්ගවශයෙන් නීවරණ ප්‍රහාණය වදරනලදී. **කුම්මෙමා**= යන මෙහි යම්සේ ඉදිබුවාගේ සතර පාදයෝ සෑ නිසයෑ සි අවයව පසක් ම වෙත් ද, එපරිද්දෙන් සියලු ම සඞ්ඛත ධර්මයෝ සඞ්ග්‍රහ කරනු ලබන්නාහු පඤ්චස්කන්ධයෝ ම වෙත්. එසින් වදළහ, භාග්‍යවත්හු- **කුම්මෙමා'නි ඛෝ භික්ඛු! පඤ්චන්නෙතනං උපාදානක්ඛන්ධානං අධිවචනං** යනු. **පජහ පඤ්චුපාදානක්ඛන්ධෙ**= මෙහි **පඤ්චස්කන්ධයන්හි ඡන්දරාගප්‍රහාණය** වදරනලදී. **අසිසූනා**= මෙහි යම්සේ මිස්ලොඹුව මිතුගෙහි මිස් තබා කඩුමෙන් කොවත් ද, එපරිද්දෙන් සත්ත්වයෝ වසතුකාමය පිණිස කෙලෙසකාමයන් විසින් නසනුලබන්නාහු වසතුකාමයන් මත්තෙහි කොට කෙලෙසකාමයන් විසින් කපනලද්දාහු කොටනලද්දාහු ම වෙත්. එසින් වදළහ, භාග්‍යවත්හු- **අසිසූනාති ඛෝ භික්ඛු! පඤ්චන්නෙතනං කාමගුණානං අධිවචනං** යනු **පජහ පඤ්ච කාමගුණෙ**= මෙහි පස්කම් ගුණයෙහි ඡන්දරාග ප්‍රහාණය වදරනලදී. **මංසපෙසිති ඛෝ භික්ඛු!** යන මෙහි මෝ මස්වැදලි නම් බොහෝදෙනා විසින් පතනලදු; ක්ෂත්‍රියාදි මනුෂ්‍යයෝ ද එය ප්‍රාර්ථනා කෙරෙති, කවුඩු ආදි තිරිසන්හු ද (ප්‍රාර්ථනා කෙරෙති;) යම්හෙයකින් මේ සත්ත්වයෝ අවිද්‍යාවෙන් මොහොවට මුළාවූවාහු නන්දිරාගයට පැමිණ වෘත්තය ප්‍රාර්ථනා කෙරෙත් ද, යම්සේ හෝ මස්වැදුල්ල තැබූතැබූ තැන ලැබේද; එපරිදි

දෙන් මේ සත්වයෝ නන්දිරාගයෙන් (=තෘෂ්ණාවෙන්) බඳනාලද්දාහු සසරැ ලැගෙති; දුකට පැමිණ ද නො උකටලි වෙත්. මෙසේ නන්දිරාගය මස් වැදුල්ලක් සමානවූයේ වේ. එසින් වදළහ. භාග්‍යවත්හු- **මංසපෙසිති ඛො භික්ඛු! නන්දිරාගස්සෙතං අධිවචනං**, යනු. **පජහ නන්දිරාගං**= මෙහි සතරවනමඟින් නන්දිරාගප්‍රහාණය වදාරනලද. **නාගොති ඛො භික්ඛු! ඛීණාසවස්සෙතං භික්ඛුනො අධිවචනං** යන මෙහි යම් අර්ථය කින් ක්ෂීණාශ්‍රව තෙම "නාග" යයි කියනු ලැබේද, හේ අනඞ්ගණ සූත්‍ර යෙහි ප්‍රකාශ කරනලද මැයි. **නමො තෙ හරොති නාගස්ස**= ක්ෂීණාශ්‍රව වූ බුඩනාගයාහට "ඒ භාග්‍යවත්හු සත්‍යාවබොධය කළාහු සත්‍යාවබොධය පිණිස දහම් දෙසති, ඒ භාග්‍යවත්හු ඉන්ද්‍රියදමනය පිණිස දහම් දෙසති, ඒ භාග්‍යවත්හු සන්සිදුනාහු, ශමථය පිණිස දහම් දෙසති, ඒ භාග්‍යවත්හු තරණය කළාහු තරණය පිණිස දහම් දෙසති, ඒ භාග්‍ය වත්වූ පිරිනිවියාහු පරිනිර්වාණය පිණිස දහම් දෙසති" යි මෙසේ නමස්කාර කරව,යි. මේ මෙහි අර්ථයි.

මෙසේ මේ සූත්‍රය තෙරුන් වහන්සේට කර්මස්ථානය විය; තෙරුන් වහන්සේ ද මේ සූත්‍රය ම කර්මස්ථානය කොට විදසුන් වඩා රහත්බවට පැමිණියේක. **අඤ්ඤතරස්ස අපෙක්ඛා**= මේ තෙම තෙල ප්‍රශ්නයාගේ අර්ථයි. මෙසේ භාග්‍යවතුන් වහන්සේ රුවන්රැසක කුළු ගන්නාහු මෙන් අනු සඞ්ගි වූ පරිද්දෙන් ම දෙශනාව නිමවූ සේකැයි.

චම්මික සූත්‍ර වණ්ණනා නිමි.

——:=:——

රථවිනීත සූත්‍ර වර්ණනා.

එවමෙමසුතං යි රථවිනීත සූත්‍ර යයි. **එහි රාජගහෙ**= එනම් නගර යෙහි; ඒ නගරය වනාහි මඬාතු - මහාගොවිතුදින් විසින් පරිගෘහීත බැවින් "රාජගෘහ" යයි කියනු ලැබේ. මෙහි අන්‍ය වූ ත් ප්‍රකා
රාජගහ. රයන් වර්ණනා කෙරෙති; ඔවුන්ගෙන් කිම? මේ ඒ නගරයා ගේ නාම යයි. තවද- ඒ මේ නගරය බුඩකාලයෙහි ද චක්‍ර වර්ත්තිකාලයෙහි ද නගරය වෙයි; සෙසුකලැ ශූන්‍ය වූයේ යක්‍ෂපරිගෘහීත වූයේ වෙයි; ඔවුන්ට වසනතවනයක් වැ සිටී. **වෙළුවනෙ කලන්දක නිවාපෙ**= "වෙළුවන" යනු ඒ උද්‍යානයාගේ නාම යයි; එය වනාහි හුණ ගසින් ද අටලොස්රියන් පවුරකින් ද පරික්ෂිප්ත වූයේ විය, දෙරටු - අටුලුවලින් යුක්ත වූයේ නීලවර්ණ වූයේ මනහරවූයේ වෙයි. එහෙයින් "වෙළුවන"යි කියනුලැබේ. තවද- මෙහි ලෙහෙනුන්ට වැටුප්දුන්නාහුය,
"කලන්දකනිවාප" යයි කියනු ලැබේ. ඒ මෙසේ අසනු
කලන්දකනිවාප. ලැබේ- පෙර එක්තරා රජෙක් එහි උයන්කෙළි පිණිස පැමිණියේ රහමෙදෙන් මත්වූයේ දහවල් නින්දට පැමිණියේ ශයනය කෙළේය; ඔහුගේ පිරිවර ජන තෙමේ ද රජතෙම ශයනය කෙළේ යයි මල්පල ආදියෙන් පොලඹවනු ලබන්නේ ඔබතොබ නික්මුනේය; එකල රාගද හෙතුකොට එක්තරා සිදුරු ගසකින් කෘෂ්ණ සර්පයෙක් නික්ම රජුට අභිමුඛව එයි, ඒ දැක රුක්දෙවතා තොමෝ රජුට දිවි දෙන්නෙමි,යි ලෙහෙනවෙසින් අවුත් කන්මුලැ ශබ්ද කළා. රජ තෙම පිබිදියේය. කෘෂ්ණ සර්පයා නැවතුනේය. හෙතෙම ඒ දැක මේ ලෙහෙනා විසින් මාගේ ජීවිතය දෙනලදැයි එහි ලෙහෙනුන්ට වැටුප් පිහිටුවී; අභයඝොෂාවක් ද ඝොෂා කරවිය. එහෙයින් ඒ උයන එතැන් පටන් **කලන්දකනිවාප** යයි ප්‍රසිද්ධියට ගියේය. ඒ එසේ මැයි. "කල න්දක" යනු ලෙහෙනුන්ට නමෙකි.

ජාතිභූමකා= ජාතිභූමියෙහි වැසිවූ; **එහි ජාතිභූමි** යනු උපන් ස්ථාන යයි; ඒ මේ ජාතස්ථානය වනාහි කොසොල් මහරජු ආදීන්ගේ නො මැ
වෙයි, චඩ්කිබ්‍රාහ්මණාදීන්ගේ නො වෙයි, ශක්‍රසුයාම සනානුෂි
ජාතිභූමි. තාදීන්ගේ නො වෙයි, අසුමහා ශ්‍රාවකාදී වූ අන්‍ය සඞ්ඝයන්ගේ ජාතස්ථානය "ජාතිභූමි" යයි නො කියනු ලැබේ. වැලි යමෙ කුගේ ජාතදිනයෙහි දශසහස්‍රී ලොකධාතුව එක ම දදපෙලඇත්තී විදු රුණු සුවඳ සුණුගදින් සුවඳ වූවා සර්පාලිඳුලල වූ නදුනුයන මෙන් බබලන්නී පියුම්පතක දියබිඳක් සෙයින් කම්පාවූ ද, ජාත්‍යන්ධාදීන්ගේ රූපදර්ශනාදි වූ නො එක් පෙළහර පැවැත්තාහු ද, ඒ සර්ව්ඥ බෝධිසත්ව යන්ගේ ජාතස්ථානය වූ ශාක්‍යජනපදයෙහි කපිලවස්තුනගරය "ජාත භූමි" යයි කියනුලැබේ. **වස්සං වුත්ථා**= තෙමසක් වස් වසනලද්දාහු පව

රණය කළ (මහා) පවාරණ ඇත්තාහු වෑ; **භගවා එතදවොච**= මහණෙනි! කිම ඉවසිය හැකි ද? යනාදි වචනයන්ගෙන් ආගනතුක පිළිසඳර කොට **එතං නො නු ඛො භික්ඛවෙ!** යනාදි වචනය වදාළහ. ඒ භික්ෂූහු වනාහි- "මහණෙනි! කිම ඉවසිය හැකිද? කිම යැපිය හැකිද? කිම නො වෙහෙසින් මහ ආවාහු ද? නො ද පිණ්ඩපාතයෙන් කලාන්ත වූවහු ද? යලි මහණෙනි! තෙපි කොහි සිට ආවාහු දෑ? සි පිළිසඳර විසින් විචාරනාලද්දාහු- භාග්‍යවතුන් වහන්ස! ශාක්‍යජනපදයෙහි කපිලවස්තු ගාරයෙහි සිට ජාතිභූමියෙන් ආම්හ, සි කිවාහුය; එකල්හි භාග්‍යවතුන් වහන්සේ ශුඛොදන මහරජුගේ නිරොගබව නො මැ විචාළහ, නො ද සුකොදනරජුගේ - නො ද සක්කොදනරජුගේ - නො ද ඛොතොදන රජුගේ - නො ද අමිතොදනරජුගේ - නො ද අමිතාදෙවියගේ - නො ද පමිතාදෙවියගේ - නො ද මහාපජාපතියගේ - නො ද සියලු ශාක්‍යමණ්ඩලයාගේ නිරොගබැව් විචාළසේක. වැලි තමාත් දශකථාවසතුලාභී වූ මෙරමාත් එහි සමාදන් කරවන්නා වූ ප්‍රතිපත්තිසම්පන්න වූ භික්ෂුවක් විචාරනසේක් මේ- **නො නු ඛො භික්ඛවෙ!** යනාදි වචනය වදාළසේක.

සම්මෑයන්ගේ ධම්මගරුභාවය.

වැලි කුමක් හෙයින් භාග්‍යවතුන් වහන්සේ ශුඛොදනා දීන්ගේ නිරොගබැව් නො විචාරා මෙබදු වූ භික්ෂුවක් ම විචාරනසේක; ප්‍රියබැවිනි. සැබව- බුදුවරයින්ට (පිළිවෙත්හි) ප්‍රතිපන්නා වූ භික්ෂූහු ද භික්ෂුණීහු ද උපාසකයෝ ද උපාසිකාවෝ ද ප්‍රියවූවාහු මනාපවූවාහු වෙති; කරුණු කිම යත්? ධම්මගරුභාවය හෙයිනි. සැබව- තථාගතයෝ ධම්මගරුක වූවාහු වෙති; ඔවුන්ගේ ඒ ධම්මගරුභාවය ද- **"දුක්ඛං ඛො අගාරවො විහරති අපතිස්සො"** යන මේ අජපල් නුගමුලැ උපන් අදහසින් දතයුතු. ඒ එසේ මැයි- ධම්මගරුභාවයෙන් ම භාග්‍යවත්හු මහකසුප් **තෙරුන්ගේ** අභිනිෂ්ක්‍රමණ දිනයෙහි පෙරගමන් කරන්නාහු තුන්ගවුමහ වැඩියහ; අතිරෙක යොදුන් සියයක් ගොස් ගඞ්ගානදියෙහි දහම් දෙසා පිරිස්සහිත මහාකපිත තෙරුන් රහත්බැවිහි පිහිටුවූහ; **එක්** පසුබතැ පන්සාලිස් යොදුන් මහ ගොස් කුඹල් නිවෙස්නෙහි තුන්යම් රැ දහම්කථා කොට "පුක්කුසාති" කුලපුත්‍රයා අනාගාමි ඵලයෙහි පිහිටුවූහ; **එක්සිය** විසි යොදුන් ගොස් වනවැසි හෙරණුන්දෑට අනුග්‍රහ කළහ; සැටයොදුන් මහ ගොස් ඛදිරවනිය තෙරුන්ට දහම් දෙසූහ; අනුරුද්ධතෙර පාචීනවංස මිගදායයෙහි හුන්නේ මහාපුරුෂවිතර්කය විතර්කකෙරේ යයි දැන එහි අහසින් ගොස් තෙරුන් හමුවෙහි බැස සාධුකාර දුන්හ; කුටිකණ්ණ සොණ තෙරුන්ට එක් ගදකිළියෙහි සෙනසුන් පනවා අලුයම්කලැ දම්දෙසුම්ට ආරාධනා කොට සරභඤ්ඤයාගේ අවසානයෙහි සාධුකාර දුන්හ; තුන් ගවු මහ ගොස් තුන් කුලපුතුන් වසනතැන ගොසිඔගඝල් වෙනෙහි සම ගිරසයෙහි අනුසස් වදාළහ; **කාශ්‍යප** භාග්‍යවතුන් වහන්සේ ද මේ තෙම අනාගාමි ඵලයෙහි පිහිටි ආර්‍ය්‍ය ශ්‍රාවකයෙකැයි විස්වස් උපදවා ඝටිකාර කුම්භකාරයාගේ නිවෙස්නට ගොස් සියතින් අහර ගෙන වැලඳුහ.

අපගේ භාග්‍යවතුන් වහන්සේ ම වස්ඵලඔන දිනය පැමිණි කල්හි දෙවිරමින් භික්ෂුසඞ්ඝයා විසින් පිරිවරනලද්දාහු වාරිකාවෙහි නික්මුනහ;

පුණ්ණ මෙතෙණ.

කොසොල් මහරජ - අනේපිඬුසිටු ආදීහු නවත්වන්ට නොහැකිවූහ, අනේපිඬු සිටුතෙම ගෙට අවුත් දෙමිනසට පැමිණ හුනි, එකල ඔහට "පුණ්ණා" නම් දැසී තොමෝ හිමියනි! දෙමිනසට පැමිණියහුදැ?සි කිව; එසේයැ-කොල! ශාස්තෘන් නවත්වන්නට නොහැකිවිම්, එකල මට මේ තුන්මස දහම් අසන්ට හෝ අදහස් සේ දන් දෙන්ට හෝ නොලබන්නෙමි,යි සිතිවිලි උපනැයි; හිමියනි! මම ශාස්තෘන් නවත්වන්නෙමි,සි; ඉදින් නවත්වන්නට හැකි වෙහි නම් නී නොදුස්වූවා ම යයි; ඕ හොස් දශබලයන් පාවුලෑ හෙව "භාග්‍යවතුන් වහන්ස! නැවතුන මැනවැ" සි කිව; පුණ්ණාවෙනි! නී අනුන් අයත් දිවිපෙවෙත ඇත්තී වෙහි, මට කුමක් කරන්නෙහි දැ? සි භාග්‍යවතුන් වහන්ස! මට දෙය්‍යධම්මයක් නම් නැතැයි නුඹවහන්සේත් දන්නහුය, එහෙත් නුඹ වහන්සේගේ නැවතීම් කරුණෙන් මම තෙස රණයෙහි ද පන්සිල්හි ද පිහිටන්නෙමි,සි; භාග්‍යවත්හු " සාධු සාධු " පුණ්ණාවෙනි! සි සාධුකාර දී නැවතී දෙවුරමට ම පිවිසි සේක. මෝ කථාව ප්‍රකටවූවාය, සිටුතෙම ඒ අසා පුණ්ණාව විසින් භාග්‍යවත්හු නවත්වනලදහු ල-යයි ඇ නොදුස් කොට දුවනී නැන්හි තැබී; ඕ පැවිද්ද අයැද පැවිදි වුව; පැවිදි වී විදසුන් පටන්ගත; ඉක්බිති ඇට ශාස්තෘන් වහන්සේ පටන්ගන්නාලද විදර්ශනා ඇතිඵැවිදැන මේ ඔහාස ගාථාව වදුලහ—

144. "පුණ්ණ පූරෙහි සඞ්ඝම්මං - වණ්ඨෙ පනතරසෝ යථා
පරිපුණ්ණාය පඤ්ඤාය - දුක්ඛස්සන්තං කරිස්සසි" යි.

ඕ තොමෝ ගාථාකෙළවර රහත්බවට පැමිණ ප්‍රසිඩි වූ ශ්‍රාවිකාවක්වූ. මෙසේ තථාගතයෝ දහම් ගරුකොට ඇක්තාහු වෙති; නන්දකතෙරුන් උපස්ථාන ශාලාවෙහි දහම් දෙසකල්හි ද භාග්‍යවතුන් වහන්සේ සතානය නොකළාහු ම ගොස් තුන්ඇම් රැ සිටියාහු ම බණ අසා දෙසුම් කෙළවර සාධුකාර දුන්හ; තෙරුන් වහන්සේ අවුත් වැඳ වහන්ස! කවර වේලාවක වැඩියහු දැ? සි විචාළහ, තොප විසින් සූත්‍රාන්තය පටන්ගත් ඇසිල්ලෙහි යයි; වහන්ස! දුෂ්කර වූවක් කළහුය, නුඹ වහන්සේ බුදු හෙයින් සිවුමැලි වූවහු යයි; භාග්‍යවතුන් වහන්සේ නන්දකය! ඉදින් තෙපි කල්පයක් දෙසන්ට හැකි වන්නෙහි ද, කල්පයක් පමණ ම මම

---

144. පුණ්ණා= පුණ්ණාවෙනි! වණ්ඨෙ පනතරසෝ යථා= පනු රැස සඳමෙන්; සඞ්ඝම්මං= ශාසනසඞ්ඛ්‍යය; පූරෙහි= පුරහි; පඤ්ඤාය= විදර්ශනාසහිත මාර්ගප්‍රඥාව; පරිපුණ්ණාය= සම්පූර්ණවූ කල්හි; දුක්ඛස්සන්තං= වෘත්තදුඃඛයාගේ කෙළවර; කරිස්සසි= කරන්නෙහි.

සිටියේ ම අසන්නෙමි,සි වදළහ; මෙසේ තථාගතයෝ ධර්මගරුක වෙත්. ධර්මගරුවයෙන් ඔවුන්ට පිළිවෙතට පැමිණියාහු ප්‍රිය වෙති; එහෙයින් ප්‍රතිපන්නකයන් විචාරත්.

තවද- ප්‍රතිපන්නයා නම්- 1. තමහට හිත පිණිස පිළිපන්නේ පර හිතයට නො පිළිපන්නේ යෑ, 2. පරහිතයට පිළිපන්නේ තමහට හිත පිණිස නො පිළිපන්නේ යෑ, 3. සවහිතට ද පරහිත යට ද පිළිපන්නේ යෑ, 4. සවහිතයට නො මැ පිළිපන් නේ පරහිතයට ද නො පිළිපන්නේ යයි චතුර්විධ වේ. එහි 1. යමෙක් තෙමේ දශකථාවස්තුලාභී වේ ද, මේරමා එහි අවවාද නො කෙරේ ද, අනුශාසනා නො කෙරේ ද, ආයුෂ්මත් වක්‍කුලයන් මෙනි, මේ තෙම සවහිතයට පිළිපන්නේ පරහිතයට නො පිළිපන්නේ නම් වෙයි; මෙබඳු භික්‍ෂුව භාග්‍යවතුන් වහන්සේ නො විචාරනසේක. කුමක්හෙයින? මාගේ ශාසනයාගේ වෘද්ධිපක්‍ෂයෙහි නො සිටියේ යයි කියාසි. 2. යමෙක් වනාහි දශකථාවස්තූන් නො ලබනසුලු වූයේ මේර මා ඒ දශකථාවස්තූන්හෙන් අවවාද කෙරේ ද, ඔහු විසින් කළ වත් ඉවසනු පිණිසයෑ, උපතිස්ස ශාක්‍යපුත්‍රයන් මෙනි, මේ තෙම පරහිතයට පිළිපන්නේ සවහිතයට නො පිළිපන්නේ නම් වෙයි; මෙබඳු වූවහු ද? නො විචාරති; කුමක් හෙයින ? ඔහුගේ තෘෂ්ණාව මහාපෘසක් මෙන් ප්‍රහීණ නො වූවා යයි කියාසි. 3. යමෙක් තමාත් දශකථාවස්තූන් නො ලබනසුලු වූයේ මේරමාත් එයින් අවවාද නො කෙරේ ද, ලාළුදායී තෙරුන් මෙනි; මේ තෙම නො මැ තමහට වැඩ පිණිස පිළිපන්නේ පරහට වැඩ පිණිස ද නො පිළිපන්නේ වෙයි; මෙබඳු වූවහු ද නො විචා රති; කුමක්හෙයින? ඔහුගේ ඇතුලත කෙලෙශයෝ පොරොවකින් කැපිය යුතු වූවන් මෙන් මහත් වූවාහු යයි කියාසි. 4. යමෙක් වනාහි තෙමේ දශකථාවස්තුලාභී වූයේ මේරමාත් එයින් අවවාද කෙරේ ද, මේ තෙමේ සවහිතයට හා පරහිතයට ද පිළිපන්නේ නම් වෙයි; සැරියුත් මුගලන් මහසඟුන් ඇ අසුමහා තෙරුන් මෙනි. මෙබඳු වූ භික්‍ෂුව විචාරනසේක. කුමක්හෙයින? මාගේ ශාසනයාගේ වෘද්ධිපක්‍ෂයෙහි සිටියේ යයි කියාසි. මෙහි දු මෙබඳු වූ මහණක්හු ම විචාරනසේක් **නො නු බො හික්‍ඛවෙ!** යනාදිය වදළහ.

ප්‍රතිපන්නකයෝ.

නැවත මෙසේ භාග්‍යවතුන් විසින් විචාරන ලද්දා වූ ඒ භික්‍ෂූන්ට වනාහි- "භාග්‍යවතුන් වහන්සේ සවකීය ජාතිභූමියෙහි උභයහිත පිණිස පිළිපන් දශකථාවසතු ලාභී වූ භික්‍ෂුවක් විචාරති, එහි කව රෙක් වනාහි මෙබඳු වූයේ දැ?" සි ඔවුනොවුන් සිතීමක් හෝ එක්ව කථාකිරීමක් හෝ නො විය; කුමක් හෙයින? යම්හෙයකින් ආයුෂ්මත් මන්නානිපුත්‍ර තෙම ඒ ජනපද යෙහි අහස්මැද සිටි සඳ මෙන් ද හිරු මෙන් ද ප්‍රකට වූයේ ප්‍රසිඛ වූයේ වේද, එහෙයින් ඒ භික්‍ෂූහු මෙෂනාදය අසා එකමිට රැස්වූ මයූරසමූහ

මන්නානිපුත්‍ර පුණ්ණතෙර.

යක් මෙන් ද ගණසඤ්ඤායකාව කරන්ට පවන්ගත් භික්ෂූන් මෙන් ද තමන්ගේ ඇදුරුවූ පුණ්ණතෙරුන් භාග්‍යවතුන් වහන්සේට දන්වන්නාහු තෙරුන්ගේ ගුණකියන්ට නො පොහොනා මුවින් **එක්වරින් ම පුණ්ණෝ නාම භගවතා! ආයස්මා** යනාදිය කීවාහුය.

එහි **පුණ්ණෝ** යනු ඒ තෙරුන්ගේ නාමය යැ; එහෙත් හෙතෙම මන්තාණියගේ පුත්‍රයැ, එහෙයින් **මන්තාණිපුත්තෝ** යි කියනු ලැබේ. **සම්භාවිතෝ**= ගුණසම්භාවනාවෙන් සම්භාවිත යැ; **අපපිච්ඡෝ**= ඉච්ඡා විරහිත වූයේ, ආශාරහිත වූයේ, පහවූ තෘෂ්ණාඇත්තේ; මෙහි **වත්තාහි** ඛ්‍යඤ්ජනය සාවශේෂ මෙන් වෙයි, එහෙත් අර්ථය නිරවශේෂ යැ; යම් හෙයකින් ඔහුගේ සිතතුල ලෙශමාත්‍ර වූ ද අල්ප වූ ඉච්ඡාවක් නම් නැත්තේ ද එහෙයිනි; මේ තෙම සර්ව්‍රප්‍රකාරයෙන් ප්‍රහීණ වූ තෘෂ්ණා ඇති සර්ව්‍රඥාශ්‍රවයෙක් මැයි. තවද- මෙහි "අත්‍රිච්ඡිතා, පාපිච්ඡිතා, මහිච්ඡිතා අපපිච්ඡිතා" යන මේ භෙදය දතයුතු. එහි 1. සවකීය ලාභ යෙහි තෘප්තිරහිත වූවහුගේ පරලාභයෙහි ප්‍රාර්ථනාව "අත්‍රිච්ඡිතා" නමුදු; එයින් යුක්තවූවහුට එකබදුනෙහි පැසුණු පූප යන් අතුරෙන් තමාගේ පාත්‍රයෙහි වැටුනේ මනාකොට නො පැසුනාක් මෙන් කුඩාවූවක් මෙන් වැටහෙයි; එය ම මෙරමාගේ පාත්‍රයෙහි බහා ලනලද්දේ මනාකොට පැසුනාක් මෙන් ද මහත්වූවක් මෙන් ද වැටහේ. ඉච්ඡාභෙද.

ඉලි- 2. අවිද්‍යමානගුණ පහළකරනබව ද පිළිගැනීමෙහි පමණ නො දන්නාබව ද "පාපිච්ඡිතා" නමුදු; ඕතොමෝ "**ඉධෙකච්චෙවා අස්සඛෝ සම්භාවෙතා සඛෝති මං ජනෝ ජානාතු**" යනාදී නයින් අභිධර්මයෙහි ආවා මැයි; එයින් සමන්විත වූ පුද්ගල තෙම කොහොන්බැව්හි පිහිටයි.

නැවත- 3. විද්‍යමානගුණ පහළකරනබව ද පිළිගැනීමෙහි පමණ නො දන්නාබව ද "මහිච්ඡිතා" නමුදු; ඕ ද "**ඉධෙකච්චෙවා සඛෝ සම්භාවෙතා සඛෝති මං ජනෝ ජානාතූති ඉච්ඡති, සීලවා සම්භාවෙතා සීලවාති මං ජනෝ ජානාතු**" යි මේ නයින් ආවා මැයි; එයින් සමන්විත වූ පුද්ගල තෙම සන්තාපිණියට දුෂ්කර වූයේ වෙයි; වැදුම්වු ද ඔහුගේ සිත්ගන්ට නො හැකි වෙයි; එයින් මේ කියනුලැබේ-

අතෘප්ති කර වසතු, 145. **අගධිකඛණ්ඩෝ සමුද්දෙ ච - මහිච්ඡෝ වා'පිපුග්ගලෝ**
සකතෙන පවවයං දෙනතු - නයෝ'පෙතෙ අනපපියා යි

ඉලි- 4. විද්‍යමානගුණ සඟවනබව ද පිළිගැනීමෙහි **පමණ** දන්නා බව ද "අපපිච්ඡිතා" නමුදු; එයින් සමන්විතවූ පුද්ගල තෙම තමා කෙරෙහි විද්‍යමානවූ ද ගුණය ප්‍රතිච්ඡාදනය කරනු කැමති බැවින් සැදුහැ ඇතියේ

---

145. **අගධිකඛණ්ඩෝ**= ගිනිකඳ ද; **සමුද්දෙ ච**= සමුද්‍රය ද; **අපි**= නැවත; **මහිච්ඡෝ ච පුග්ගලෝ**= මහෙච්ඡ පුද්ගල තෙමේ ද යන; **එතෙ නයෝ අපි**= මොවුහු තිදෙන ම; **සකතෙන**= ගැලින්; **පවවයං**= ප්‍රත්‍යය; **දෙනතු**= දෙන්නාහු නමුදු; **අනපපියා**= තෘප්තිය නො කටහැක්කාහු වෙත්.

"සැදුහැතියෙකැයි මා ජනතෙමේ දැන ගනීවා" යි නො කැමති වෙයි; සිල්ඇතියේ - විවෙක ඇතියේ - බහුශ්‍රැත වූයේ - පටන්ගන්නාලද වියයී ඇත්තේ - සමාධිසම්පන්න වූයේ - ප්‍රඥවත් වූයේ - ක්ෂීණාශ්‍රව වූයේ "ක්ෂීණාශ්‍රවයෙකැයි මා ජනතෙමේ දැනගනීවා" යි නො කැමති වේ. "මජ්ඣිමනිකා" තෙරුන් වහන්සේ යම්සේ ද එමෙනි.

මේ අසනු ලැබේ- මජ්ඣිමනිකා තෙරුන් වහන්සේ වනාහි මහා ක්ෂීණාශ්‍රව වූහ. එහෙත් උන්වහන්සේගේ පාසිවුරු පාදයක් පමණ මැ අගී. උන්වහන්සේ ධර්මාශොක මහරජුගේ විහාරපූජා දිනයෙහි සඩ්ඝසථවිර වූහ. එකල උන්වහන්සේගේ ඉතා රූසම්පන්නභාවය දැක මනුෂ්‍යයෝ වහන්ස! මදක් බැහැර වුව මැනවැ,යි කිහු. තෙරුන් වහන්සේ මා වැනි ක්ෂීණාශ්‍රව යක්හු රජුට සඩ්ග්‍රහ නො කරන කල්හි අන් කවරෙක් කරන්නේ ද? යි පොළොවෙහි කිමිද සඩ්ඝසථවිරයන්ට ඔසවනලද පිණ්ඩය ගනිමින් ම නැඟුනුසේක. මෙසේ ක්ෂීණාශ්‍රවවූයේ ක්ෂීණාශ්‍රවයෙකැයි මා ජනතෙමේ දැනගනීවා,යි නො කැමති වේ. මෙසේ අලොභී වූ භික්ෂු තෙම වනාහි නූපන් ලාභය උපදවයි, උපන් (ලාභය) තහවුරු කෙරෙයි, දායකයන්ගේ සිත ආරාධනය කෙරෙයි, හෙතෙම යම් යම් පරිද්දෙකින් ම තමාගේ අලොභී භාවයෙන් මදක් ගනී ද, ඒ ඒ පරිද්දෙන් ඔහුගේ වතෙහි ප්‍රසන්න වූ මනුෂ්‍යයෝ බොහෝකොට දෙන්නාහුයි.

චතුර්විධ අලොභීයෝ.

අන්‍ය වූ ද චතුර්විධ වූ අලොභීයෙක් වෙයි- ප්‍රත්‍යයාලොභී යැ, ධුතාඞ්ගාලොභී යැ, පර්‍යාප්තාලොභී යැ, අධිගමාලොභී යැයි කියනු ලැබේ. ඔවුනතුරෙහි 1. සිව්පසයෙහි අලොභී වූයේ ප්‍රත්‍යයාලොභී නම්; හෙතෙම දායකයාගේ කැමැත්ත දනී, දෙය්‍යධර්මයාගේ ප්‍රමාණය දනී, තමාගේ ශක්තිය දනී; ඒ එසේ මැයි- ඉදින් දෙය්‍යධර්මය බොහෝ වේද, දායකතෙම මදක් දෙනුකැමති වේද, (එකල) දායකයාගේ වශයෙන් සවල්පයක් ගනී; දෙය්‍යධර්මය සවල්ප වූයේ දායකතෙමේ බොහෝ දෙනු කැමැත්තේ වේද, (එකල) දෙය්‍යධර්මයාගේ වශයෙන් සවල්පයක් ගනී; දෙය්‍යධර්මය ත් බොහෝ වේද, දායකතෙමේ ත් බොහෝ දෙනු කැමති වෙද, (එකල) තමාගේ ශක්තිය දැන ප්‍රමාණයෙන් ම ගන්නේයි. 2. ධුතාඞ්ගසමාදානය තමා කෙරෙහි ඇතිබැව් නො දන්වනු කැමැත්තේ "ධුතාඞ්ගාලොභී" නම් වෙයි; ඔහු ප්‍රකට කිරීම පිණිස මේ වස්තුහු වෙති. ඒ මෙසේ අසනු ලැබේ- සොණනන්ද මහාකුමාර තෙරුන් වහන්සේ සැටවසක් සොහොනෙහි විසූහ; අන් එක භික්ෂුනෙනෙකුදු නො දත්තේයි. එහෙයින් ම කිහු—

146. සුඤ්ඤෝ සඞ්ඝ වස්සානි - අබ්බොකිණ්ණං වසාමහං
දුතියෝ මං න ජානෙය්‍ය - අහෝ සොඤ්ඤානි කුත්තමෝ, යි.

සැගිරියෙහි දෙබෑතෙරකෙනෙක් විසූහ. කනිටුතෙම උපස්ථායකයා විසින් එවනලද උක්කැබිලි ගෙන දෙවුතෙරුන් වෙත ට ගියේය, වහන්ස! පරිභොග කළ මැනවැ, යි (කියැ;) තෙරුන්ගේ ද බත්කිස කොට මුවදෙනා කල විය; උන්වහන්සේ ඇවැත්නි! කම්නැතැයි කිහ; කිම වහන්ස! එකාසනික වූවහු දැ? යි; ඇවැත්නි! උක්කැබලි ගෙන එව, යි පනස්වසක් එකාසනික වූවාහු නමුදු ධුතාඞ්ගය සඟවමින් පරිභොග කොට මුව සෝදා යලි ධුතාඞ්ගය ඉටා ගියහ. 3. යමෙක් වනාහි සාකෙතකතිස්ස තෙරුන් මෙන් බහුශ්‍රැතභාවය දන්වන්ට නො කැමති වේද, මේ තෙම "පය්‍යාපත්‍යලෙපච්ඡ" නම් වෙයි; තෙරුන් වහන්සේ වනාහි ඇසිල්ලෙක් නැතැයි උදෙසීම් පිළිවිසීම්හි අවකාසයක් නො කරන්නාහු වහන්ස! මරණඇසිල්ල ලබන්නහු දැ? යි බොදනා කරන ලද්දාහු ගණයා හැර "කිහිරිවැලිමුහුදු විහාරයට" ගියහ. එහි දී ඇතුලු වස සප්වරනවකමධ්‍යම භික්ෂූන්ට උපකාර වැ මහාපවාරණය පිළිබඳ පෙහෙවස්දින ධර්මකථාවෙන් ජනපදය අලලා ගියහ. 4. යමෙක් වනාහි ස්‍රොතාපන්නාදීන් අතුරෙන් එක්තරා එකෙක් වැ ස්‍රොතාපන්නාදි භාවය දන්වන්ට නො කැමති වේද, මේ තෙම "අධිගමාලෙපච්ඡ" නම් වෙයි; (අනුරුඬාදි) කුලපුත්‍රයන් තිදෙන මෙන් ද, ඝටිකාර කුම්භකාරයා මෙන් ද වේ.

ආයුෂ්මත් පුණ්ණ තෙම වනාහි අත්‍රිච්ඡතාව ද පාපිච්ඡතාව ද මිහිච්ඡතාව ද හැර සම්ප්‍රකාරයෙන් ඉච්ඡාවන්ට ප්‍රතිපක්ෂ වූ අලොභසඞ්ඛ්‍යාත වූ පරිශුද්ධ වූ අලෙපච්ඡතායෙන් සමන්විත බැවින් අලෙපච්ඡ වූයේ නම් විය. භික්ෂූන්ව ද ඇවැත්නි! අත්‍රිච්ඡතා-පාපිච්ඡතා-මිහිච්ඡතා යන මේ ධර්මයෝ පඤ්චවස්තුත්තාහු ය, යි ඒ ධර්මයන්හි ආදීනව දක්වා මෙබඳු වූ අලෙපච්ඡභාවය දැඩිව ගෙන පැවතිය යුතු යයි අලෙපච්ඡකථාව කීය. එයින් කියනලදි- අත්තනා ව අපිච්ඡෝ අපිච්ඡකථඤ්ච යික්ඛූනං භත්තා යත්‍ර.

මෙවිට අත්තනා ච සන්තුට්ඨෝ යනාදියෙහි විශෙෂාර්ථය මි දක්වන්නෙමු; අර්ථයොජනාව වනාහි කි නියෙන් ම දත්යුත්තිය. සන්තුට්ඨෝ= ඉතරෙතර ප්‍රත්‍යය සන්තොෂයෙන් සමන්විත වූයේ; ඒ මේ සන්තොෂය

---

146. සුඤ්ඤෝ= සොහොනෙහි; අහං= මම; සඞ්ඝ වස්සානි= සැට වසක් මුලුල්ලෙහි; අබ්බොකිණ්ණං= අනිකෙකු හා අසම්මිශ්‍රවැ; වසාමි= වෙසෙමි; දුතියෝ= දෙවැන්නෙක්; මං= මා; න ජානෙය්‍ය= නො දන්නේය; සොඤ්ඤානිකුත්තමෝ= සොඤ්ඤානිකාඞ්ගයාගේ උතුම්බව; අහෝ= ආශ්චර්‍යයි.

වනාහි දෙළොස් වැදෑරුම් වෙයි; ඒ මෙසේයි— චීවරයෙහි යථාලාභ සන්තෝෂය, යථාබල සන්තෝෂය, යථාසාරුප්‍ය සන්තෝෂ ය,යි ත්‍රිවිධ වෙයි; පිණ්ඩපාතාදියෙහි ද මෙසේයි. ඒ සන්තෝ ෂයාගේ මෝ ප්‍රභෙද සංවණ්ණනායි- මේ ශාසනයෙහි මහණ තෙම සුන්දරවූ හෝ අසුන්දරවූ හෝ චීවරයක් ලබා‍ද, හෙතෙම එයින් ම යැපේ ද, අනිකක් ප්‍රාර්‍ථනා නො කෙරේ ද, ලබන්නේ නමුදු නො ගනී ද, මේ තෙම ඔහුගේ චීවරයෙහි යථාලාභ සන්තෝෂ යයි; නැවත යමෙක් ප්‍රකෘතියෙන් දුර්‍ශීල හෝ වේද, රොගයෙන් හා ජරාවෙන් මඩනාලද්දේ හෝ වේ ද, බරසිවුරක් පොරවන්නේ කලාන්ත වේ ද, හෙතෙම සභාගභික්‍ෂුවක් සමඟ එය පරිවර්‍තනය කොට සැහැල්ලු සිවුර කින් යැපෙන්නේ ද සතුටු වූයේ ම වේද, මේ ඔහුගේ චීවරයෙහි යථා බල සන්තෝෂ යයි; අනිකෙක් ප්‍රණීත වූ ප්‍රත්‍යය ලබනසුලු වූයේ වේද, පටසිවුරු ආදීන් අතුරෙන් එක්තරා මාහැඟි සිවුරක් හෝ බොහෝ සිවුරු හෝ ලැබ මෙය පැවිදිව බොහෝ කල් ඉක්මූණු තෙරුන්ට ද මෙය බහු ශ්‍රැතයන්ට ද සුදුසු යැ, මෙය ගිලනුන්ට ද මෙය අල්පලාභීන්ට ද වේවා,යි දී ඔවුන්ගේ පැරණි සිවුරක් හෝ යලි කසළගොඩ ආදියෙන් හෝ කඩ රෙදි අවුලා එයින් සඟල කොට ධරන්නේ ද සතුටුවූයේ ම වෙයි; මේ ඔහුගේ චීවරයෙහි "යථාසාරුප්‍ය" සන්තෝෂ යයි.

නැවත මේ ශාසනයෙහි මහණ තෙම රූක්ෂ වූ හෝ ප්‍රණීත වූ හෝ පිණ්ඩපාතය ලබා ද, හෙතෙම එයින් ම යැපේ ද, අනිකක් නො පතා ද, ලබන්නේ නමුදු නො ගනී ද, මේ ඔහුගේ පිණ්ඩපාතයෙහි "යථාලාභ" සන්තෝෂ යයි. යමෙක් වනාහි තමාගේ ප්‍රකෘතියට විරුද්ධ වූ හෝ රොග යට විරුද්ධ වූ හෝ පිණ්ඩපාතය ලබා ද, වැලඳු යම් පිණ්ඩපාතයකින් ඕගව නො සුව වේද, හෙතෙම එය සභාගමභික්‍ෂූන්ගව දී ඔහු අතින් (ගෙන) සැපවූ බොදුන් වලඳ මහණදම් කරන්නේ ද, සතුටුවූයේ ම වේද; මේ ඔහුගේ පිණ්ඩපාතයෙහි "යථාබල" සන්තෝෂ යයි. අනිකෙක් බොහෝ ප්‍රණීත පිණ්ඩපාතය ලබා ද, හෙතෙම එය චීවරය මෙන් විර ප්‍රව්‍රජිතයන්ට බහුශ්‍රැතයන්ට අල්පලාභීන්ට ගිලනුන්ට දී ඔවුන්ගේ අව ශෙෂය හෝ පිඬුපිණිස හැසිර හෝ මිශ්‍රඝාහාරය වලඳමින් ද සතුටුවූයේ ම වෙයි; මේ ඔහුගේ පිණ්ඩපාතයෙහි "යථාසාරුප්‍ය" සන්තෝෂ යයි.

තවද මේ ශාසනයෙහි මහණතෙම මනාපවූ හෝ අමනාපවූ හෝ සෙනස්නක් ලබා ද, හෙතෙම එයින් සොම්නසක් හෝ කොපයක් හෝ නො මැ උපදවා‍ද, යටත්පිරිසෙයින් තණඇනිරියකිනුදු ලැබූ පරිද්දෙ කින් ම සතුටු වේද, මේ ඔහුගේ සෙනස්නෙහි "යථාලාභ" සන්තෝෂ යයි. අනිකෙක් මහාපිනැතියේ ලෙන්-මඩු-කුළුගෙවල් ආදි වූ බොහෝ පිණිසෙනසුන් ලබා ද, හෙතෙම ඒ සෙනසුන් සිවුරු ආදිය මෙන් විර ප්‍රව්‍රජිත-බහුශ්‍රැත-අල්පලාභී-ගිලානයන්ට දී යම් කිසි තැනක වෙසෙ මින් ද සතුටු වූයේ ම වේද? මේ ඔහුගේ සෙනස්නෙහි "යථාසාරුප්‍ය"

සඤ්ඤාණ යයි. යමෙකුත් "උත්තම සෙනාසනය නම් ප්‍රමාදයට කරුණැයැ, එහි හුන්නහුට පීතම්බය බැසගනී, නින්දෙන් මඛනාලදුව නැවත පුබුදින්නහුට පාපවිතකීයෝ පහළ වන්නාහුය" යි ප්‍රත්‍යවෙක්ෂා කොට එබදුවූ සෙනස්න පැමිණියේ නමුදු නො පිළිගනී ද, හෙතෙම එය පිළි කෙව් කොට අභ්‍යවකාස වෘක්ෂමූලාදියෙහි වෙසෙමින් ද සතුටු වූයේ ම වෙයි, මෙද සෙනස්නෙහි "යථාසාරුප්‍ය" සඤ්ඤාණ යයි.

නැවත මේ ශාසනයෙහි මහණතෙම රැක්ෂ වූ හෝ ප්‍රණීත වූ හෝ බෙහෙදක් ලබා ද, හෙතෙම යමක් ලබා ද එයින් ම සතුටුවන්නේ ද, අනිකක් ප්‍රාර්ථනා නො කෙරේ ද, ලබන්නේ නමුදු නො ගනී ද; මේ ඔහුගේ ගිලන්පසෙහි "යථාලාභ" සඤ්ඤාණ යයි. යමෙක් වනාහි තෙලින් ප්‍රයොජන ඇත්තේ උක්සකුරු ලබා ද, හෙතෙම එය සහාග මහණක් හට දී ඔහු අතින් තෙල් ගෙන අනික් තෙලක් ම හෝ සොයා බෙහෙත් කරන්නේත් සතුටුවන්නේ ම වේද; මේ ඔහුගේ ගිලන්පසෙහි "යථාබල" සඤ්ඤාණ යයි. අනිකෙක් මහපිනැතියේ බොහෝ තෙල් මී සකුරු ආදි පිණිබෙහෙත් ලබා ද, හෙතෙම එය චීවරය මෙන් විරජබබජිත - බහුසුත - අප්පලාභ - ගිලානයන්ට දී ඔවුන්ට ගෙන එනලද යම් කිසිවකින් යැපෙන්නේ ද සතුටුවූයේ ම වේද; යමෙක් වැලි එක්බදුනක මූත්‍රහරීතකය ද එක් බදුනක වතුමධුරය ද තබා වහන්ස! යමක් කැමැත්තහු නම් එය ගතමැනවැයි කියනුලබන්නේ ඉදින් ඔහුගේ රොගය ඒ දෙක අතුරෙන් එක්තරා එකකින් නමුදු සන්සිදෙන්නේ ද එකල්හි මූත්‍රහරීතකය නම් බුබාදීන් විසින් වණ්ණිතා කරනලදුයි සියුම්යුරු පිළිකෙව් කොට මූත්‍රහරීතකයෙන් බෙහෙත් කරමින් අතිශයින් සතුටට පැමිණියේ ම වේද; මේ ඔහුගේ ගිලන්පසෙහි "යථාසාරුප්‍ය" සඤ්ඤාණ යයි. තවද- වෙන වෙන ම ප්‍රත්‍යයන්හි මේ ත්‍රිවිධ සඤ්ඤාණයන් අතුරෙන් "යථාසාරුප්‍ය සඤ්ඤාණය" ම අග්‍ර වේ. ආයුෂ්මත් පුණ්ණ තෙම එතෙකි ප්‍රත්‍යයෙහි මේ ත්‍රිවිධ සඤ්ඤාණයන්ගෙන් ම සතුටු වූයේ ම වී. **සන්තුට්ඨිකථාවණ්ණනා** යලි භික්ෂූන්ට ද මේ සන්තුෂ්ටිකථාව කරන්නේ ම වී.

පවිවිත්තතා යනු "කායපවිවෙකය, චිත්තපවිවෙකය, උපධිපවිවේකය" යන මේ තුන් පවිවෙකයන්ගෙන් සමන්විත වූයේ; එහි- 1. එකලාව යෙයි, එකලාව සිටී, එකලාව හිඳියි, එකලාව ශයනය කෙරෙයි, එකලාව ගමට පිඬුසිණිස පිවිසෙයි, එකලාව පෙරලා එයි, එකලාව සක්මනට බසියි, එකලාව හැසිරෙයි, එකලාව වාසය කෙරෙයි, යන මේ තෙම "කායපවිවෙක" නම්. 2. අෂ්ටසමාපත්තීහු වනාහි "චිත්ත පවිවෙක" නම්. 3. නිර්වාණය "උපධි පවිවෙක" නම්. මේ වදාරනලද මැයි- **"කායපවිවෙකෝ ච වවකඨකායානං නෙකඛම්මාභිරතානං, චිත්තපවිවෙකෝ ච පරිසුද්ධචිත්තතානං පරමවොදානප්පත්තානං, උපධිපවිවෙකෝ ච නිරූපධීනං පුග්ගලානං විසඞ්ඛාරගතානං"** යි. **පවිවෙකකථං=** යලි භික්ෂූන්ට ද මේ පවි

ත්‍රිවිධ පවිවෙකය.

වෙකකථාව කරන්නේ; අසංසට්ඨෝ= පඤ්චවිධසංසර්ගයෙන් විරහිතවූයේ; ඒ එසේ මැයි- "ශ්‍රවණ සංසර්ගය, දර්ශන සංසර්ගය, සමුල්ලාප සංසර්ගය, සමෝහාග සංසර්ගය, කායසංසර්ගය" යි සංසර්ගය පඤ්චවිධ යැ; ඔවුනතුරෙන් 1. "මේ ශාසනයෙහි මහණ තෙම අසවල් ගමැ හෝ නියංගමැ හෝ සත්‍රියක් හෝ කුමාරිකාවක් හෝ උතුම්රූඇත්ති දැකුම්කවයුතු වූවා විත්තප්‍රසාදය එලවන්නී උතුම්වූ ශරීරවර්ණයෙන් හා අවයව සටහනින් යුක්ත වූවා යයි අසාද, හෙතෙම ඒ අසා (මිථ්‍යාවිතර්කයෙහි) ගැලෙයි, වෙසෙසින් ගැලෙයි, බඹසරවස් රක්නට නො හැකිවෙයි, ශික්ෂාවෙහි දුබලබැව් ප්‍රකාශ නො කොට ලාමකවූ ගිහිබවට පැමිණේය" යි මෙසේ මෙරමා විසින් කියනු ලබන්නා වූ රූප සම්පත්තිය හෝ තමා විසින් සිනහවෙන කථා කරන ගීකියන ශබ්දය හෝ අසන්නහුගේ ශ්‍රෝත්‍රවිඥාන වීථි වශයෙන් උපන් රාගය "ශ්‍රවණ සංසර්ගී" නම්. හේ අනිෂ්ටඝණ්ඩි පසේබෝසතුන්ගේ ද පඤ්චගහළලෙණ වාසි නිස්සර දහරයාගේ ද වශයෙන් දතයුතු. දහර තෙම වනාහි අහසින් යන්නේ කුමරියන් පස්දෙනෙකු සමඟ පියුම්විලට ගොස් නා පියුම් පැළඳ මිහිරි හඬින් ගායනා කරන්නා වූ ගිරිගම්වැසි කඹුරුදියනියකගේ ශබ්දය අසා කාමරාගයෙන් විදුනාලද්දේ විශෙෂයෙන් පිරිහී අනය ව්‍යසනයට පැමිණියේය.

පසඟුල්ලෙන්වැසි නිස්සදහරයා.

2. "මේ ශාසනයෙහි මහණෙක් නො මැ අසයි, වැලිදු වනාහි විශිෂ්ට රූපඇති දර්ශනයට යොග්‍ය වූ ප්‍රසාද එලවන්නා වූ උතුම් වූ ශරීරවර්ණයෙන් හා අවයව සටහනින් යුක්ත වූ සත්‍රියක් හෝ කුමරියක් හෝ තෙමේ දකී, හෙතෙම ඇ දැක (මිථ්‍යාවිතර්කයෙහි) ගැලෙයි, වෙසෙසින් ගැලෙයි, බඹසරවස් රක්නට නො හැකි වෙයි, ශික්ෂාවෙහි දුබලබැව් පහළ නො කොට ගිහිබවට පැමිණේ ය" යි මෙසේ විෂභාග රූපය බලන්නහුට වනාහි චක්ෂුර්විඥාන වීථිවශයෙන් උපන් රාගය "දර්ශනසංසර්ගී" නම්. හේ මෙසේ දතයුතු- එක් තරුණ භික්ෂුවක් කාළදීඝවාපිමාර විහාරයට උදෙසිම පිණිස ගියේය; ආචාර්‍යතෙම ඔහුට (වන) අන්තරාය දැක අව කාශ නො කෙරෙයි; හෙතෙම නැවත නැවත පැරැත්ත කරයි; ආචාර්‍යතෙම ඉදින් ඇතුලුගම්ට නො හැසිරෙන් නෙහි නම් නොපට උද්දෙශය දෙන්නෙමියි කියැ; හෙතෙම මැනවැයි පිළිගෙන උද්දෙශය නිමිකල්හී ආචාර්‍යයන් වැඳ යන්නේ මාගේ ආචාර්‍ය තෙම මේ ගමැ හැසිරෙන්ට නො දෙයි, කරුණු කිම් දෝ හෝ,යි සිවුරු පොරවා ගමට පිවිසියේය; එක් කුලදියනියක් කහවතක් හැඳ ගෙයි සිටියා තරුණ භික්ෂුව දැක උපන් රාගඇත්ති කෙණෙස්සෙන් කැඳ ගෙනවුත් ඔහුගේ පාත්‍රයෙහි බහා නැවතී ඇදෙහි වැදහොත්තිය; එකල්හි ඇ මවුපිය දෙදෙන කිම? දරුව! යි විමාළාහුය; "දෙරින් ගියාවූ තරුණ (භික්ෂුව) ලබන්නී ජීවත්

අන්‍යතර තරුණ භික්ෂුවක්.

වන්නෙමි, නො ලබන්නී මැරෙන්නෙමි" යි; මවුපිය දෙදෙන වෙහ යෙන් ගොස් ගම් දොර දී තරුණ භික්ෂුව වෙත පැමිණ වැඳ වහන්ස! නවතිනු මැනව, භික්ෂාව ගතමැනවැ,යි කීවාහුය; දහරතෙම කම්නැත, යන්නෙමියි; ඔවුහු වහන්ස! මේ නම් කාරණයයි යාඥ කොට වහන්ස! අපගේ ගෙයි මෙතෙක් නම් ධනය ඇති, එක ම දියනියක් වෙයි, ඔබ අපගේ දෙටුපුත්තැන්හි සිටින්නහුය, සුවසේ ජීවත්වන්ට හැකි යයි කීවාහුය. දහරතෙම මව මේ පළිබොධයෙන් ප්‍රයොජන නැතැයි නො පිළිගෙන ම නික්ම ගියේය. ඔවුපිය දෙදෙන ගොස් දරුව! තරුණ භික්ෂුව නවත්වන්ට නො හැකිවීමු, අන්‍යවූ යම් හිමියෙක් කැමැත්තෙහි නම් ඔහු ලබන්නෙහි නැගීසිටුව, කව, පොව,යි කීවාහුය; ඕ නො කැමති වන්නී සතියක් නිරාහාර ව සිට කලුරිය කළා. මවුපිය දෙදෙන ඇගේ සිරුරුකිස කොට ඒ කඹවත සම්පතිහාරයෙහි භික්ෂු සඞ්ඝයාට දුන්නා හුය. භික්ෂූහු වසන්‍රය කඩ කඩ කොට බෙදූහ. එක් මහලු භික්ෂුවක් තමාගේ කොටස ගෙන කැලණිවිහාරයට පැමිණියේය; ඒ දහරතෙමේ ද සැය වදින්නෙමියි එහි ම ගොස් දිවාසථානයෙහි හුන්නේය. මහලු තෙම ඒ වත්කඩ ගෙන වහන්ස! මෙයින් මට පෙරහනක් කළමැනවැයි තරුණ භික්ෂුවට කිය; දහරතෙම මහතෙර! කොහි දී ලද දැ? යි කිය; හෙතෙම සියලු පුවත කිය. හෙතෙම ඒ අසා ම මෙබඳු තැනැත්තිය සමග සංවාසය නො ලැබීම්,යි රාගයින්නෙන් දවනලද්දේ එහි ම කලුරිය කෙළේයි.

3. ඔවුනොවුන් අල්ලාප සල්ලාප වශයෙන් උපන් රාගය වනාහි "සමුල්ලාප සංඝයී" නම. 4. භික්ෂුවක් භික්ෂුණියක සන්තක වූ හෝ භික්ෂුණියක් භික්ෂුවක සන්තක වූ හෝ (හාණ්ඩ) ගෙන පරිභොග කිරීම් වශයෙන් උපන් රාගය "සම්භොග සංඝයී" නම. හේ මෙසේ දතයුතු. මිරිසවැටිවිහාර පූජාවෙහි වනාහි භික්ෂූන් ලක්ෂයක් ද භික්ෂුණීන් අනූදහසක් ද වූවාහුය; එක් සාමණේරයෙක් උණුකැඳ ගෙනයන්නේ වරක් සිවුරු කොණෙහි ද වරක් බිම ද තැබීය; එක් සාම

පරතෙරගිය මහණ මෙහෙණ දෙදෙනෙක්.

ණේරියක් දැක මෙහි පාත්‍රය තබා යවයි තැටියක් දුන්නීය; ඔවුහු පසුකලක එක් හයක් ඉපන්කල්හි පරසමුද්‍රයට ගියාහුය; ඔවුනතුරෙන් භික්ෂුණිය පළමු කොට ගියා, ඕ තොමෝ එක් සිංහල භික්ෂුකෙනෙක් ආයේ ලැයි අසා තෙරුන් සමීපයට ගොස් පිළිසඳර කොට හුන්නී වහන්ස! මිරිසවැටිවිහාර පූජාකාලයෙහි නුඹවහන්සේ කෙතෙක් වස් ඇත්තහු දැ?යි විවාළා; එකල මම සත්වැසි හෙරණෙක් වෙමි, තෙපි වනාහි කෙතෙක් වස්ඇත්තී දැ?යි; මම ද සත්වැසි හෙරණක් ම විමි, උණුකැඳ ගෙන යන්නාවූ එක් හෙරණෙකුට පාත්‍රය තැබීම පිණිස තැටියක් දුනිමි,යි; සථවිර තෙම ඒ මම යයි කියා තැටිය බැහැර කොට දැක්වී. ඔවුහු මේ පමණ වූ මෑ සංඝයීයෙන් බඹසරවස් රක්නට නො හැකි වන්නාහු දෙදෙන ම සැටවස් කාලයෙහි සිවුරු හැරියාහුය.

5. අත් ගැනීම් ආදි වශයෙන් උපන් රාගය වනාහි "කායසංසග්ගී" නම්. එහි මේ වස්තුවෙකි. මෙසේ අසනුලැබේ- මහසැමලුවෙහි තරුණ භික්ෂූහු පාඩම් කරති; ඔවුන් පිටිපස තරුණ භික්ෂුණීහු බණ අසති; එහි එක් තරුණ භික්ෂුවක් අත දිගුකරන්නේ එක් තරුණ භික්ෂුණියක ගේ කය සපශී කෙළේය; ඕ ඒ අත ගෙන තමාගේ ළෙහි තැබුය; මෙතෙක් සංසග්ගීයෙන් දෙදෙන ම සිවුරු හැර ගිහිබවට පැමිණියාහුය. තවද- මේ පඤ්ච සංසග්ගීයන් අතුරෙහි භික්ෂූන් සමග භික්ෂුවගේ ශ්‍රවණ-දශීන-සම්මුලලාප-සම්භොග-කායපරාමශීයෝ නිරතුරු ද වෙත් මැයි; භික්ෂුණීන් සමග කායසංසග්ගීය තබා සෙසු (සංසග්ගීයෝ) කලින් කල වෙති; උපාසිකාවන් සමග ද එසේයි; උපාසකයන් සමග සියල්ලෝම කලින් කල වෙති; ඔවුන් කෙරෙහි කෙලශොතපත්තියෙන් සිත රැකිය යුතුයි.

මේ විස්තර යැ- එක් මහණෙක් ග්‍රාහග්‍රාහක වෙයි, එකෙක් ග්‍රාහ මුක්තක වෙයි, එකෙක් මුක්තග්‍රාහක වෙයි, එකෙක් මුක්තාමුක්තක වේ.

ගාහගාහකාදි පුද්ගලයෝ සතරදෙන.

ඔවුනතුරෙහි 1. යම් භික්ෂූවක් කරා මනුෂ්‍යයෝ ද ආමිෂයෙන් සඞග්‍රහ කොට ගැනීම් වශයෙන් එල ඔත් ද, මහණ ද වල්පල ආදියෙන් සඞග්‍රහ කොට ගැනීම් වශයෙන් එලබේද, මේතෙම "ගාහගාහක" නම්; 2. වැලි මනුෂ්‍යයෝ යම් මහණක්හුකරා කි පරිද්දෙන් එලඔත්ද මහණතෙම දක්ෂිණෙය්‍ය වශයෙන් එලබේද, මේ තෙම "ගාහමුත්තක" නම්; 3. යම් මහණෙකුට මනුෂ්‍යයෝ දක්ෂිණෙය්‍ය වශයෙන් සිවිපසය දෙත්ද, මහණතෙම මල්පල ආදියෙන් සඞග්‍රහ කොට ගැනීම් වශයෙන් එලබේද, මේතෙම "මුත්තගාහක" නම්; 4. යම් මහණෙකුට මනුෂ්‍යයෝ ද දක්ෂිණෙය්‍ය වශයෙන් සිවිපසය දෙත් ද, මහණ ද චුලපිණ්ඩපාතියතිස්ස තෙරුන් මෙන් දක්ෂිණෙය්‍ය වශයෙන් වලඳ ද, මේ තෙම "මුත්තමුත්තක" නම් වේ. මේ අසනු ලැබේ- (චුලලපිණ්ඩපාතියතිස්ස) තෙරුන්ට එක් උවැසියක් දෙලොස්වසක් උවටැන් කළා, එක් දිනක් ඒ ගමැ ගිනි නැගී ගෙවල් දැවී; අන්‍ය යන්ගේ කුලූපග භික්ෂූහු අවුත් "කිම උපාසිකාවෙනි! කිසි භාණ්ඩයක් අරොග කරන්ට හැකිවී දැ?" සි පිළිසඳර කළාහුය; මනුෂ්‍යයෝ "අපගේ මවගේ කුලූපග තෙරුන් වහන්සේ වළඳන වේලාවෙහි ම එන්නාහු ය" සි කිහු; තෙරුන් වහන්සේ ද දෙවන දවස් පිඬුපිණිස හැසිරෙන වේලාව සලකා ම පැමිණියහ; උපාසිකා තොමෝ බත්ති සෙවනෙහි හිඳුවා භික්ෂාව සම්පාදනය කොට දුන්නිය; තෙරුන් බත්කිස කොට නික්ම ගියකල්හි මනුෂ්‍යයෝ (මෙසේ) කිහු- "අපගේ මවගේ කුලූපගතෙරුන් වහන්සේ වලඳන වේලාවෙහිම පැමිණියාහු ය" සි. උපාසිකා තොමෝ "තොපගේ කුලූපගයෝ තොපට ම සුදුස්සෝය, මාගේ තෙරුන් වහන්සේ මට ම සුදුසු වූහ" සි කීය.

චුල්ලපිණ්ඩපාතිය තිස්ස තෙර.

ආයුෂ්මත් මන්තාණිපුත්‍ර තෙම වනාහි මේ පඤ්ච සංඝගීයන්ගෙන් සිව්පිරිස සමග ම අසංඝගී වූයේ ග්‍රාහමූකතාක ද මූකතාමූකතාක ද විය; යලි යම්සේ තෙමේ අසංඝඨ වූයේ ද එපරිද්දෙන් භික්ෂූන්ට ද අසංඝගී කථාව කරන්නේ විය. **ආරබ්භිස්සා**= දැඩිව ගන්නාලද වීර්‍යඇත්තේ; **සම්පූණී** වූ කායිකචෛතසිකවීර්‍ය ඇත්තේ යන අර්ථයි. ඒ එසේ මැසියම් මහණෙක් ගමනෙහි උපන් කෙලඹය සිටීමට පැමිණෙන්ට නොදේද, සිටීමෙහි උපන් කෙලඹය හිඳීමට හෝ හිඳීමෙහි උපන් කෙලඹය නිදීමට හෝ පැමිණෙන්ව නොදේද, මන්ත්‍රයකින් කෘෂ්ණසර්පයක්හු පෙළා ගන්නෙකු මෙන් ද සතුරකු ග්‍රීවයෙන් ඇක්මෙන්නෙකු මෙන් ද හැසිරේද; මේ තෙම "ආරබ්භවීරිය" නම් වේ. තෙරුන් වහන්සේ ද එබදු වූහ; භික්ෂූන්ට ද එසේ ම වීර්‍යාරම්භ කථාව කරන්නාහු වූහ.

සීලසම්පන්නෙහා යනාදියෙහි **සීලං** යනු සිව්පිරිසුදු ශීලයයි; **සමාධි**= විදර්ශනාපාදකවූ අවසමවත්; **පඤ්ඤා**= ලොව්ලොවුතුරුනුවණ; **විමුත්තී**= ආර්‍යඵලය; **විමුත්තිඤාණදස්සනං**= එකුන් විසිවැදෑරුම් වූ පස්විකුම් නුවණ; තෙරුන් වහන්සේ තුමූත් ශීලාදියෙන් සම්පූණී වූහ; භික්ෂූන්ට ද ශීලාදි කථාව කරන්නාහු වූහ.

ඒ මේ සප්තවිර දශකථා වස්තූන්ගෙන් අවවාද කෙරේ නුයි **ඔවාදක** නම් වෙයි; තවද- යම්සේ එකෙක් අවවාද කරන්නේ ම වේද, සියුම් වූ අර්ථය පරිවර්තනය කොට හඟවන්ට නොහැකි වේද, තෙරුන් වහන්සේ එසේ නොවෙති; තෙරුන් වහන්සේ වනාහි ඒ දශකථාවස්තූන් හඟවත් නුයි **විඤ්ඤාපක** නම් වෙති; එකෙක් හඟවන්ට හැකි වෙයි, කරුණ දක්වන්ට නොහැකි වේ; තෙරුන් වහන්සේ කාරණය ද දක්වත් නුයි **සන්දස්සක** නම් වෙති; එකෙක් විද්‍යමාන වූ කාරණය දක්වයි; එහෙත් ගන්වන්ට නොහැකි වේ; තෙරුන් වහන්සේ ගන්වන්ට ද හැකි වෙත් නුයි **සමාදපක** නම් වෙති; නැවත එසේ සමාදානය කරවා (= ගන්වා) ඒ කථාවස්තූන්හි උත්සාහය ඉපදවීම් වශයෙන් භික්ෂූන් තෙදගන්වත් නුයි **සමුත්තේජක** නම් වෙති; උත්සාහය උපන්කල්හි ගුණ කියා සතුටු කරවත් නුයි සම්පහංසක නම් වෙති; **ලාභලාභා**= අන්‍යයන්ගේ ද මිනිසත්බව පැවිද්ද ආදි ගුණයෝ ලාභයෝ නම් වෙති; ආයුෂ්මත් පුණණ තෙරුන්ට වනාහි මේ ගුණයෝ මොනොවට ලැබූ ලාභයෝ වූහ; ශාස්තෘන් වහන්සේගේ සම්බුධයෙහි මෙසේ යමෙකුගේ ගුණය පැතනැංගේ ද, එහෙයින; යන අර්ථයි. අපණ්ඩිතවූවන් විසින් ගුණකීම නම් එසේ ලාභයෙක් නොවෙයි; වැලි පණ්ඩිතයන් විසින් ගුණකීම ලාභයෙක; ගිහියන් විසින් හෝ ගුණකීම එසේ ලාභයෙක් නොවේ. **සැබව**- ගිහි තෙම ගුණකියන්නෙම්,යි අපගේ ආර්‍යයන් වහන්සේ මෘදු වූහ, සිලුටුවූහ, සුවඑලවන කථා ඇත්තාහ, විහාරයට පැමිණියවුන්ට කැඳබත් සකුරු ආදියෙන් සඞ්ග්‍රහ කෙරෙත් යයි කියන්නේ අගුණයක් ම කියයි; අගුණය කියන්නෙම්,යි මේ තෙරුන් වහන්සේ අතිශයින්

බාලයෙකු මෙන් අතිශයින් දුශීලයෙකු මෙන් අතිශයින් බැමතඟන් තෙකු මෙන් වෙති, මොහු සමඟ විශ්වාසයෙක් නැතැයි කියන්නේ ගුණ යක් ම කියයි; සබ්‍රහ්මචාරීන් විසින් ද ශාස්තෘන්ගේ අනභිමුඛයෙහි ගුණ කීම එසේ ලාභයෙක් නො වෙයි; ශාස්තෘන්ගේ අභිමුඛයෙහි (ගුණකීම) වනාහි ඉතා ලාභයෙකැයි මේ කාරණය ද සඳහා සුලබලාභො යනුකිහ. **අනුමාසඤ අනුමාසඤ**= දශකථා වස්තූන්ට පිවිස පිවිස; **නඤ්ඤං සත්ථා අබ්භනුමොදති**= ඔහුගේ ඒ ගුණය ද ශාස්තෘන් වහන්සේ "මෙය එසේ මය, ඒ මහණ අලෝභ මය, ඒ මහණ සන්තුෂ්ට වූයේ මය" යි අනුමෝදන් වෙති; මෙසේ විඥයන් විසින් ගුණකීම එක්ලාභයෙක, සබ්‍රහ්මචාරීන් විසින් (ගුණකීම) එකෙක, ශාස්තෘන් හමුයෙහි (ගුණකීම) එකෙක, දශකථා වස්තූන්ට පිවිස පිවිස (ගුණකීම) එකෙක, ශාස්තෘන් විසින් අනුමොදන් වීම එකෙක,යි මේ පඤ්චලාභයන් සඳහා සුලබලාභො යි කීහ. **කදාචි**= කිසියම් කලෙක; **කරහචි** යනු ඔහුගේ වෙවචන යැ; **අපෙප වනාම ඔඨා ඛොවිදෙව කථාසල්ලාපො**= කිසියම් කථා පැවැත්මෙකු දු වන්නේ නම් ඉතා යෙහෙක; තෙරුන් විසින් ආයුෂ්මත් පුණ්ණතෙම නො මැ දුටුවිරැ ලු; ඔහුගේ ධර්මකථාව නො ඇසුවිරැ ලු; මේසේ හෙතෙම් ඔහුගේ දර්‍ශනය ද ධර්මකථාව ද ප්‍රාර්‍ථනා කරමින් මෙසේ කීහ.

යථාභිරන්තං= අදහස් වූ පරිදි වැස; ඒ එසේ මැයි- එක් තැනක වසන්නාවූ බුදුවරයන්ට ජාර්‍යුදකාදි විපත්තියකට හෝ නො සුවවූ සෙන සුනකට හෝ මිනිසුන්ගේ අශ්‍රද්ධාදිභාවයකට හෝ පැමිණ

බුදුවරයන්ගේ චිරවාසය.

අනභිරතියක් නම් නැති; ඒ (ජාර්‍යුදකාදීන්ගේ) සම්පත්ති යෙන් මෙහි සුවසේ වෙසෙමුයි සිත් අලවා කලක් විසීම කුදු නැති; එහෙත් යම්තැනක තථාගතයන් වාසයකරන කල්හි සඞ්ඝයෝ සරණයෙහි හෝ පිහිටත් ද, සිල් හෝ සමාදන් වෙත් ද, පැවිදි හෝ වෙත් ද, වැලි ඔවුන්ගේ ස්‍රොතාපත්ති මාර්ගාදීන්ට උපනිශ්‍රය හෝ වේ ද, එහි බුදුවරයෝ සඞ්ඝයන් ඒ සම්පත්තීන්හි පිහිටුවන අද හසින් වෙසෙති; ඔවුන් නැති කල්හි නික්ම යෙත්. එහින් කියනලදී "අදහස් වූ පරිදි වැස" යනු.

චාරිකං චරමානො= අදන්ගම්තෙහි යන්නාහු; තවද- භාග්‍යවතුන් වහන්සේගේ මෝ චාරිකා නම්? විවිධ වෙයි, තුරිතචාරිකාව ද අතුරිත චාරිකාව දැයි; එහි දුර ද අවබොධ කටයුතු පුද්ගලයන් දැක වහා යැම "තුරිතචාරිකා" නමු; ඕ මහකසුප් (තෙරුන් හට කළ) පෙරගමන් ආදියෙහි දතයුතු. ඒ එසේ මැයි-

බුදුවරයන්ගේ චාරිකාව.

භාග්‍යවතුන් වහන්සේ මහකසුප් තෙරුන්ට පෙරගමන් යන්නාහු මොහොතකින් තුන්ගවුවක් ගියහ, ආළවකයන් සඳහා තිස් යොදුනක් (ගියහ;) අඞ්ගුලිමාලයන්ට ද එසේයි; පුක්කුසාතිය (රජු) ට වනාහි පන්සාලිස් යොදුනකි; මහාකප්පින (රජු) ට එක්සිය විසියොදු නකි; ඛදිරවනිය (රෙවත) තෙරුන් සඳහා යොදුන් සත්සියයක් ගියහ;

දම්සෙනෙවියන්ගේ සහිවිහාරික වූ වනවැසි "තිස්ස" සාමණේරයන්ට තුන්ගවුවක් අධික කොටඇති එක්සිය විසියොදුනක් ගියහ. ඒ මෙසේ අසනුලැබේ- එක් දිනක් (සැරියුත්) තෙරුන් වහන්සේ "වහන්ස! තිස්ස සාමණේරයන්ගේ සමීපයට යන්නෙමි" සි කීහ. භාග්‍ය වතුන් වහන්සේ මම ද යන්නෙමි,සි වදාරා ආයුෂ්මත් ආනන්දයන් ඇමතූහ; "ආනන්ද! භාග්‍යවත්හු වනවාසී තිස්ස සාමණේරයන් සමීපයට යන්නාහු යයි විසිදහසක් ෂඩභිඥ භික්ෂූන්ට දන්වව" සි. ඉක්බිති දෙවනදවස් විසිදහසක් සප්ත ශ්‍රවයන් පිරිවරකොට ඇත්තාහු අහස පැනනැඟි එක්සිය විසියොදුන් මත්තෙහි ඔහුගේ ගොදුරුගම්දෙරැ බැස සිවුරු පෙරවූහ, කම්මාන්තයට යන මනුෂ්‍යයෝ දැක "පින්වත්නි! ශාස්තෘන් වහන්සේ වැඩියහ, කම්මාන්තයට නො යවු" යයි කියා අසුන් පනවා කැඳ පිළිගන්වා පාමෙහෙවර කරන්නාහු "වහන්ස! භාග්‍යවතුන් වහන්සේ කොහි වඩිත් දැ?සි තරුණ භික්ෂූන් විවාළාහුය. උපාසකවරුනි! භාග්‍යවතුන් වහන්සේ අන්තැනක නොයති, මෙහි ම තිස්ස සාමණේරයන් දැකීම පිණිස වැඩියෝ යසි; ඔවුහු "අපගේ කුලූපගතෙරුන් දැකීම පිණිස ශාස්තෘන් වහන්සේ වැඩියෝ ල, එකාන්තයෙන් අපගේ තෙරුන් වහන්සේ මදපමණ වූවාහු නො වෙති" සි හවගත් සොම්නස් ඇත්තෝ වූහ. ඉක්බිති භාග්‍යවතුන් ගේ බත්කිස කෙළවර සාමණේරතෙම ගම්ඇ පිඬු පිණිස හැසිර "උපාසක වරුනි! මහා භික්ෂුසඞ්ඝයා දැ?" සි විවාළේය; එකල ඕහට ඔවුහු "වහන්ස! ශාස්තෘන් වහන්සේ පැමිණියෝ ය" සි දැන්වූහ. හෙතෙම භාග්‍යවතුන් කරා එලඹ පිණ්ඩපාතයෙන් විවාළේය; ශාස්තෘන් වහන්සේ ඔහුගේ පාත්‍රය අතින් ගෙන "තිස්සය! කම් නැත, බත්කිස නිමියේය" සි වදාළහ. නැවත උපාධ්‍යායයන් විවාරා තමනට පැමිණි අසුනැ හිඳ බත්කිස කෙළේය; ඉක්බිති ඔහුගේ බත්කිස කෙළවර ශාස්තෘන් වහන්සේ මඟුල් වදාරා නික්ම ගම්දෙර සිට "තිස්ස! තොප වසන තැනට යන මඟ කවරේ දැ?" සි වදාළහ. භාග්‍යවතුන් වහන්ස! මේ යසි; තිස්ස! මඟ දක් වමින් පෙරටුව යවසි; භාග්‍යවතුන් වහන්සේ දෙවියන් සහිත ලොවට මාර්ගදෙසක වූවාහු නමුදු සියලු තුන්ගවු මඟ සාමණේරයන් දක්නට ලබන්නෙමියි ඔහු මහදක්වන්නා කළාහු ල. හෙතෙම තමන් වසන තැනට ගොස් භාග්‍යවතුන්ට වත් කෙළේය; ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ "තිස්ස! තොපගේ සක්මන කවරේ දැ?" සි ඔහු විවාරා එහි ගොස් සාමණේරයන් හිඳිනා පහණෙහි හිඳ "තිස්ස! මේ තැන්හි සුවසේ වෙසෙහි දැ?" සි විවාළහ; හෙතෙම කිය- "එසේය, වහන්ස! මේ තැන්හි වසන්නාවූ සිංහ ව්‍යාඝ්‍ර භයානි මයූරාදීන්ගේ ශබ්දය අසන්නාවූ මට අරණ සංඥව උපදී, එසින් සුවසේ වෙසෙමි"සි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔහුට "තිස්ස! භික්ෂු සඞ්ඝයා රැස්කරව, තොපට බුඩදායාදය දෙන්නෙමි" සි වදාරා භික්ෂු සඞ්ඝයා රැස්වූ කල්හි උපසම්පදා කරවා තමන් වහන්සේ වසනතැනට ම වැඩිසේකැසි. මෝ "අතුරිත වාරිකා" නමු.

නැවත ගම්නියම්ගම් පිළිවෙළින් දිනපතා යොදුන් අඩයොදුන් වශයෙන් පිඬුපිණිස හැසිරීම් ආදියෙන් ලොවට අනුකම්පා කරන්නහුගේ යම් ගමනක් වේද, මෝ "අතුරිතවාරිකා" නමු. තවද- මේ වාරිකාවෙහි හැසිරෙන භාග්‍යවතුන් වහන්සේ මහාමණ්ඩලය මධ්‍යමණ්ඩලය අන්තර් මණ්ඩලයයි මේ තුන්මණ්ඩලයන් අතුරෙන් එක්තරා මණ්ඩලයෙක්හි හැසිරෙන සේක. ඔවුනතුරෙහි මහාමණ්ඩලය යොදුන් නව සියයෙකි, මධ්‍යමණ්ඩලය යොදුන් සසියයෙකි, අන්තර් මණ්ඩලය යොදුන්තුන්සියයෙකි; යම්කලෙක මහාමණ්ඩලයෙහි වාරිකාවෙහි හැසිරෙනු කැමති වෙත් ද, (එකල) මහාපවාරණා යෙන් පවරා පැළවිය දිනයෙහි මහා භික්ෂු සඞ්ඝයා පිරිවර කොට ඇති ව නික්මෙන සේක; හත්පස යොදුන් සියයක් එකකොලාහල වෙයි; පළමු පළමු ආවාහු පවරන්ට ලැබෙති, ඉතිරි දෙමණ්ඩලයෙහි සතකාරය මහාමණ්ඩලයෙහි බැසගනී, එහි භාග්‍යවතුන් වහන්සේ ඒ ඒ ගම්නියම්ගම් වල එක්දිනක් දෙදිනක් වෙසෙමින් ආමිෂය පිළිගැනීමෙන් මහාජනයාට අනුග්‍රහ කෙරෙමින් ධර්මදානයෙන් වටවිවට ඇසුරුකළ කුශලය වඩමින් නවමසකින් වාරිකාව අවසන් කරනසේක. යලි ඉදින් ඇතුලුවසැ භික්ෂූන්ගේ ශ්‍රමඵවිදර්ශීතා තරුණ වේද, (එකල) මහාපවාරණායෙන් නො පවරා පවාරණා සඞ්ග්‍රහය දී කැතිපුණුමස (= ඉල්මස) පවරා උදුවපැ පැළවිය දිනයෙහි මහා භික්ෂු සඞ්ඝයා පිරිවර කොට ඇත්තාහු නික්ම මධ්‍යමණ්ඩලයට බැසගනිති, අන් කරුණකින් නමුදු මධ්‍යමණ්ඩලයෙහි වාරිකාවෙහි හැසිරෙනු කැමැත්තාහු සිව්මසක් වැස ම නික්මෙනසේක; කී නියෙන් ම ඉතිරි දෙමණ්ඩලයන්හි සතකාරය මධ්‍යමණ්ඩලයෙහි බැසගනී, භාග්‍යවතුන් වහන්සේ පළමු නයින් ම ලොවට අනුග්‍රහ කෙරෙමින් අටමසකින් වරිකාව අවසන් කරනසේක. යලි ඉදින් සිව්මසක් වාසය කළාවූ ද භාග්‍යවතුන් වහන්සේගේ වෛනෙය සත්ත්වයෝ නො පිරිපැහුණු ඉඳුරන් ඇත්තාහු වෙත් ද, එකල ඔවුන්ගේ ඉන්ද්‍රියපරිපාකය බලා පොරොත්තු වෙමින් අන්‍යූන ද එක් මසක් හෝ දෙ-තුන්-සාරමසක් හෝ එහි ම වැස මහා භික්ෂු සඞ්ඝයා පිරිවර කොට ඇත්තාහු නික්මෙනසේක; කී නියෙන් ම ඉතිරි දෙමණ්ඩලයන්හි සතකාරය අන්තරමණ්ඩලයෙහි බැසගනී, භාග්‍යවතුන් වහන්සේ පළමු නයින් ම ලොවට අනුග්‍රහ කරමින් සත්මසකින් හෝ සමසකින් හෝ පස්මසකින් හෝ සාරමසකින් හෝ වාරිකාව කෙළවර කරනසේක. මෙසේ මේ තුන් මණ්ඩලයන් අතුරෙන් යම් කිසි තැනක වාරිකාවෙහි හැසිරෙනසේක් වීවරාදිය හෙතු කොට නො හැසිරෙති, වැලිදු වනාහි යමෙක් දුගී වූවාහු බාල වූවාහු ජරා වූවාහු භවගත් ව්‍යාධි ඇත්තාහු වෙත් ද, ඔවුහු කවරකලෙක අවුත් තථාගතයන් දක්නාහු ද එහෙත් මා වාරිකාවෙහි හැසිරෙනකල්හි මහාජන තෙම තථාගත දර්ශනය ලබන්නේය, ඔවුනතුරෙහි කිසිවෙක් සිත් පහදවන්

නාහුය, කිසිවෙක් මල් ආදියෙන් පුදන්නාහුය; කිසිවෙක් කවටජුහිඤ්ඤාව දෙන්නාහුය, කිසිවෙක් මිථ්‍යාදර්ශනය හැර සම්‍යග්දෘෂ්ටිකයෝ වන්නාහුය, එය ඔවුන්ට දික්කාලක් හිතයට සුවයට වන්නේය,යි මෙසේ ලොවට අනුකම්පා පිණිස වාරිකාවෙහි හැසිරෙත්.

තවද- භාග්‍යවත් බුදුවරයෝ සතර කරුණකින් වාරිකාවෙහි හැසිරෙති, ජඩඝාවිහරණ වශයෙන් සිරුරු පහසුව පිණිස යැ, අපොතපත්ති කාලය කැමතිවනු පිණිස යැ, භික්ෂූන්ට ශික්ෂාපද පැනවීම පිණිස යැ, ඒ ඒ තැන පිරිපැසීමට ගිය ඉඳුරන් ඇති අවබොධ කටයුතු සත්ත්වයන් අවබොධ කරවනු පිණිස යැයි කියාසි. අනිත් කරුණු සතරකින් ද භාග්‍යවත් බුදුවරයෝ වාරිකාවෙහි හැසිරෙති; බුදුන් සරණ කොට යන්නාහු යයි කියා හෝ දහම් සරණ කොට යන්නාහු යයි කියා හෝ සඟ සරණ කොට යන්නාහු යයි කියා හෝ මහත් වූ දහම් වැස්සෙන් සිව් පිරිස සතප්වන්නෙමියි කියා හෝ යයි, අනිත් කරුණු පසකින් භාග්‍යවත් බුදුවරයෝ වාරිකාවෙහි හැසිරෙති. ප්‍රාණඝාතයෙන් වෙන්වන්නාහුය,යි කියා හෝ, අදත්තාදානයෙන් - කාමයෙහි වරදවා හැසිරීමෙන් - මෘෂාවාදයෙන් - මදයට ප්‍රමාදයට කරුණු වූ රහමෙර පානයෙන් වෙන් වන්නාහු ය,යි කියා හෝයි. අනිත් අටකරුණකින් භාග්‍යවත් බුදුවරයෝ වාරිකාවෙහි හැසිරෙති. ප්‍රථමධ්‍යානය ලබන්නාහු ය,යි කියා හෝ, ද්විතීයධ්‍යානය —පෙ— නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තිය ලබන්නේය,යි හෝ යි. අනිකුදු අටකරුණකින් භාග්‍යවත් බුදුවරයෝ වාරිකාවෙහි හැසිරෙති; සෝවාන්මඟ ලබන්නාහුයයි කියා හෝ, සෝවාන්ඵලය —පෙ— රහත්ඵලය ප්‍රත්‍යක්ෂ කරන්නාහු ය,යි කියා හෝ යි. මෝ අතුරිතවාරිකාව මෙහි අදහස් කරනලද්දීය. ඕ මෝ අතුරිතවාරිකාව වනාහි නිබ්බවාරිකාව ද අනිබ්බවාරිකාව දැයි විවිධ වෙයි; එහි යම් වාරිකාවක් එක ම බොධනෙය්‍ය සත්ත්වයකු සඳහා යෙත් ද මෝ "නිබ්බවාරිකා" නමුදු; යමක් වනාහි ගම්නියම්ගම් තුවර පිළිවෙළ විසින් හැසිරේ ද මෝ "අනිබ්බ" වාරිකා නමුදු. මෝ අනිබ්බවාරිකාව මෙහි අදහස් කරනලද්දීය.

සෙනාසනං සංසාමේකා= සෙනස්න සකස්කොට; එය වනාහි සකස් කරන්නා වූ තෙරුන් වහන්සේ සුලුපා - මහපා - සුලුතැටි - මහතැටි - පවසිවුරු - දුහුල්සිවුරු ආදීන් පොදියක් කොට යලි ගිතෙල් තල තෙල් ආදිය හෝ කළයෙහි පුරවා ගබඩාවෙහි තබා දෙර වසා කෙහිමුදු ආදිය නො යෙදවූහ. "ඉදින් මහණෙක් හෝ මෙරණෙක් හෝ ආරාමිකයෙක් හෝ විහාරස්වාමියෙක් හෝ නො වේද, (එකල්හි) සතරපහණෙක්හි ඇඳපිට ඇඳ නංවා පුටුවපිට පුටුව නංවා චීවරවංසයෙහි හෝ චීවරරජ්ජුයෙහි හෝ මතුයෙහි පුඩු කොට දෙර-වා කවුළුවසා නික්ම යායුතු" යයි කී හෙයින් නෙවාසික භික්ෂුව විචාරීම් පමණකින් ම සකස් කළහ. **යෙන සාවත්ථි තේන චාරිකං පක්කාමි**= ශාස්තෘන් වහන්සේ දකිනු කැමති වැ යම් දිශාභාගයෙක්හි සැවැත් නුවර ඒද එහි නික්

මූනේය, නික්මෙන්නේ ද සුදෙවුන් මහරජුට දන්වා ගිතෙල්-තලතෙල් - මී - උක්සකුරු ආදිය ගෙන්වාගෙන නො නික්මුනේය; යලි සමූහය හැර නික්ම ගියා වූ මතෑතෙකු මෙන් අසහායකෘත්‍ය ඇති සිංහයෙකු මෙන් පාසිවුරු පමණක් ගෙන එකලාව ම නික්මුනේය; වැලි කුමක් හෙයින් මේ තෙම පන්සියයක් තමන් අතැවැසියන් සමග රජගහනුවරට අවත් දුන් (මෙසේ) නික්මුනේ ද යත්? රජගහ නුවර කිඹුල්වතින් දුර සැටයොදුනෙකි, සැවැත්නුවර වනාහි දෙලොස් යොදුනෙකි; ශාස්තෘන් වහන්සේ රජගහ නුවරින් පන්සාලිස් යොදුනක් අවුත් සැවැත් නුවර වාසය කෙරෙති, දැන් ළංවූහයි අසා නික්මුනේ ය, යි; මෙය කරුණු රහිත යැ, යම්හෙයකින් බුදුන් සමීපයට යන්නා වූ මේ තෙම යොදුන් දහසකුදු යන්නේ ද; එහෙත් එකල කායවිවේකය ලබන්ට නො හැකි වේද එහෙයිනි. **සැබව**- බොහෝදෙන සමග යනකල්හි එකක්හු යමු,යි කියනකල්හි එකෙක් මෙහි ම වෙසෙමුයි කියයි; එසක්හු වෙසෙමු,යි කියනකල්හි එකෙක් යමු,යි කියයි; එහෙයින් කැමති කැමති ඇසිල්ලෙහි සමවත් සමවැද හිඳින්ට හෝ පහසු සෙනස්නක කායවිවේකය ලබන්ට හෝ නො හැකි වෙයි; එහෙත් එකලාවූවහුට ඒ සියල්ල සුලභ වේ නුසි එකල (එසේ) අවුත් මෙවිට (මෙසේ) නික්මගියේයි. **චාරිත්තං චරමානෝ**= යන මෙහි කිසිසේත් මෝ චාරිකාව නම් මහාජනයාට සඬ්ග්‍රහ පිණිස බුදුවරයන්ගේ ම ලැබේ ද, එහෙත් සම්බුදුන් ගෙන රැසිශබ්ද වහගෙන් ශ්‍රාවකයන්ට ද කියනුලැබේ; කළාල් ආදියෙන් කළ විජිතිය ද නල්වැට වන්නාක් මෙනි. **යෙන භගවා**= සැවැත්නුවර සම්පයෙහි එක් ගමක පිඩු පිණිස හැසිර කළබත්කිස ඇත්තේ දෙවුරම්ට පිවිස සැරියුත් තෙරුන්ගේ හෝ මහමුගලන් තෙරුන්ගේ හෝ වාසසථානයට ගොස් පා **සෝදා** තෙල්ගල්වා පැනක් හෝ පැන් හෝ බී මදක් විඩාහැර ශාස්තෘන් දක්නෙමි,යි සිතකුදු නූපදවා සෘජුව ගඳකිළිපිරිවෙනට ම ගියේය; යම්හෙයකින් ශාස්තෘන් දකිනු කැමති වූ තෙරුන්ට අන් භික්ෂුවක් විසින් කටයුත්තෙක් නැද්ද, එහෙයින් රහල්තෙරුන් හෝ අනඳ තෙරුන් හෝ ගෙන අවකාස කරවා ශාස්තෘන් වහන්සේ දක්නෙමියි මෙසේ සිතකුත් නො ඉපදවී; යම්හෙයකින් සථවිර තෙම තෙමේ ම බුදු සසුන්හි වලලහවූයේ රජුගේ සඬ්ග්‍රාමවිජය කළ මහායොධයකු මෙන් විද; සැබව- යම්සේ රජු දකිනුකැමතිවූ එබදු යොධයකුට අනිකෙකු ඇසුරු කොට දශින ක්‍රියාවක් නම් නැද්ද, වලලහ බැවින් තෙමේ ම දකිද, එපරිදිදෙන් තෙරුන් වහන්සේ ද බුදුසසුන්හි වලලහයහ; උන්වහන්සේට අනිකෙකු ඇසුරු කොට ශාස්තෘන් දැකිම් කෘත්‍යයෙක් නැතැයි පා සෝදා පා පිස්නෙහි පා පිස භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හි ද එහි එලඹියහ භාග්‍යවතුන් වහන්සේ ද අලුයම්කල ම මන්නානිපුත්‍රතෙම එන්නේයැයි දුටුසේක. එහෙයින් ගඳකිළියට පිවිස සුවිසටිකාව නොදීම වෙහෙස සන්සිඳුවා නැගිට වැඩහුන්සේක. තෙරුන් වහන්සේ කවුළුව හැර ගඳකිළියට පිවිස භාග්‍යවතුන් වැඳ එක්පසෙක හුන්හ.

ධම්මියා කථාය= භාග්‍යවතුන් වහන්සේ දැහැමි කථාව වදාරන සේක් චුල්ලගොසිඟ සූත්‍රයෙහි තුන් කුලපුත්‍රයන්ට සම්බන්ධයෙහි අනුසස් වදාළහ; සෙඛ සූත්‍රයෙහි ආර්‍යාෂ්ටාංගික මාර්ගය ද, ඝටිකාර සූත්‍රයෙහි සම්‍යක් ප්‍රතිලාභය වූ පූජෝපනිශ්‍රය ප්‍රතිසංයුක්ත වූ කථාව ද, රට්ඨපාල සූත්‍රයෙහි සතර ධර්මෝද්දේශයන් ද, සෙල සූත්‍රයෙහි පාංශුකූලාංග කථාව ද කිලෙසිය සූත්‍රයෙහි මහාසථවිරයන් දහම්කථා වදාරන සේක් එකහබැවිනි අනුසස් ද වදාළහ; මේ රථවිනීත යෙහි වනාහි ආයුෂ්මත් පුණ්ණ තෙරුන්ට වදාරන සේක් දශකථාවස්තූනිශ්‍රය කොට ඇති අනන්තනය දක්ත් වූහ. පුණ්ණ! මෝ ද අලෙජ්ජකථා මයැ, සන්තෝෂකථා ම යැයි ප්‍රතිසම්විදාප්‍රාප්ත වූ ශ්‍රාවකයහට වෙරළ කෙළවර සිට මහාසමුද්‍රයෙහි අත දිගු කිරීමක් මෙන් විය. **සෙනාසනං**= එකල වනාහි පසුබතැ දෙව්රම ජනාකීර්ණ වෙයි, බොහෝ ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදීහු දෙව්රමට රැස්වෙති; සක්විති රජකුගේ කඳවුරු පිහිටිතැන් මෙන් වෙයි, උතුම් විවේකය ලබන්ට මනා හැකි වෙයි, අඞ්ගවනය වූ කලි ප්‍රධන්ගෙයක් මෙන් විවේක ඇත්තේය; එහෙයින් අඞ්ගවනය යම් තැනෙක්හි ද එහි එලඹියේය. යලි කුමක් හෙයින් මහතෙරවරුන් නො දුටුයේ ද? ඔහට මේ සිත විය. "සවස්කාලයෙහි අවුත් මහතෙරවරුන් දැක යලි දසබලයන් දක්තෙමි, මෙසේ මහතෙරවරුන්ට එක් උපස්ථානයක් වන්නේය, ශාස්තෘන් වහන්සේට දෙකක් වන්නාහුය; නැවත ශාස්තෘන් වැඳ මාගේ වාස ස්ථානයට ම යන්නෙමි" යි. **අභිණ්හං කිත්තයමානෝ අහොසි**= නැවැත නැවත ගුණකීර්තනය කරමින් වාසය කෙළේය; තෙරුන් වහන්සේ වනාහි එතැන් පටන් දවසක් පාසා සඞ්ඝයා මැද "මන්තාණීපුත්‍ර වූ පුණ්ණතෙරුන් වහන්සේ නම් සිව්පිරිස සමඟ සංසර්ගරහිතයහ, හෙතෙම දසබලයන් දක්නා පිණිස එන්නේ ල, කිම හෝ මා නො දැක ම යන්නේ ද? යි සප්තවිරතවකමධ්‍යමයන්ට සිහි කිරීම පිණිස ආයුෂ්මත් පුණ්ණ තෙරුන්ගේ ගුණ කියති; උන්වහන්සේට මේ සිත විය- "මහලු භික්ෂූහු නම් සියලු කලැ ඇතුලු විහාරයෙහි නො වෙති; එහෙත් ඔහුගේ ගුණ කථාව කී කල්හි යම් භික්ෂුකෙනෙක් ම ඔහු දක්නේ ද හෙතෙමේ ම අවුත් මට දන්වන්නේ ය" යි. එකල්හි මේ තෙරුන්ගේ ම අතැවැසි තෙම ඒ ආයුෂ්මතුන් පාසිවුරු ගෙන ගඳකිළියට පිවිසෙන්නහු දුටුයේය; එහෙත් මේ තෙම ඔහු කේසේ දැනගත්තේ ද යත්? "පුණ්ණ! පුණ්ණ!"යි කියා වදාරන්නා වූ භාග්‍යවතුන් වහන්සේගේ ධර්මකථාවෙන් දැනගත්තේය; "මාගේ උපාධ්‍යාය තෙම නිතර යමෙකුගේ ගුණ කීර්තනය කරන්නේ වේ ද, මේ තෙම ඒ සප්තවිර තෙමේයි; මෙසේ හෙතෙම අවුත් තෙරුන්ට දන්වීය. **නිසීදනං ආදාය**= නිසීදනය නම්? දැවලුසහිත වූ අවාසිම (විවරය) කියනු ලැබේ; තෙරුන් වහන්සේ වනාහි සම්කඩ ගෙන ගියහ **පිණ්ඩෙනා පිණ්ඩෙනා**= පිටිපසින් පිටිපසින්; **සීහානුලොකී**= යමෙක් උස්තැන්හි පිට දකිමින් මිටිතැන්හි හිස දකිමින් යේද, මේතෙම "සීහානුලොකී" යයි කියනු ලැබේ; එබඳු වැ ලුහුබැන්දේය; වැලිදු

තෙරුන් වහන්සේ නොහි සංවරවූ පාදශබ්ද ඇතිබැවින් ඉතා ආසන්න වැ ඝන්නාහු නමුදු පියහඬින් නො පෙළති, එහෙත් මේ කථා කරනකාලය නො වේ යයි දැන ඉතා ආසන්න නො වූහ, අඤ්ඤතය නම් මහත්ය, එක් තැනක නො පෙනිහුන්නහුව නො දක්නා (මා) විසින් "ඇවැත්නි! පුණ්ණ! අණ්ණ!" යි නො පහසු ශබ්දය කළයුතු වේ යයි හුන් තැන දැන ගනු පිණිස ඉතා නො දුරෙහි වැ සීඝානුලොකී වැ ගියහ. **දිවාවිහාරං නිසිදි**= දිවාවිහරණය පිණිස හුන්හ; එහි ආයුෂ්මත් පුණ්ණ තෙමේ ද ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ද ප්‍රසිද්ධ වූ බ්‍රාහ්මණජාති ඇත්තාහුය; පුණ්ණ ස්ථවිරයන් වහන්සේ ද ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ද **සඛිණී** වණී වූහ; පුණ්ණ ස්ථවිරයන් වහන්සේ ද ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ද රහත්ඵලසම්වතට සම්වත්හ; පුණ්ණ ස්ථවිරයන් වහන්සේ කල්ප ලක්ෂයක් සම්පුණීකළ අභිනීහාර ඇත්තාහ, ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ සැලපලක්ෂයක් අධික කොට ඇති එකාසඞ්ඛ්‍යයෙකි; පුණ්ණ ස්ථවිරයන් වහන්සේ ද ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ද ප්‍රතිසම්භිදා ප්‍රාප්ත වූ මහාක්ෂීණාශ්‍රව වූහ; මෙසේ එක් රන්ගුහාවකට පිවිසි සිංහයන් දෙදෙනෙකු මෙන් ද, එක් විජෘම්භණ භූමියකට බැසගත් ව්‍යාඝ්‍රයන් දෙදෙනෙකු මෙන් ද, එක් සුපිපි සල්වනයකට පිවිසි සඳත් ඇත්රජුන් දෙදෙනෙකු මෙන් ද, එක් හිඹුල් වනයකට පිවිසි ගුරුළුරජුන් දෙදෙනෙකු මෙන් ද, එක් නරවාහන යානයකට ආරූඪ වූ වෛශ්‍රවණයන් දෙදෙනෙකු මෙන් ද, එක් පාණ්ඩුකම්බලශෛලයක හුන්නාවූ ශක්‍රයන් දෙදෙනෙකු මෙන් ද, එක් විමනක් ඇතුලට ගියා වූ හාරිත මහා බ්‍රහ්මයන් දෙදෙනෙකු මෙන් ද, ඔවුහු දෙදෙන ම බ්‍රාහ්මණජාති ඇත්තාහු දෙදෙන ම සඛිණීවණී වූවාහු දෙදෙන ම සමාපත්තිලාභී වූවාහු දෙදෙන ම අභිනීහාරසම්පන්න වූවාහු දෙදෙන ම ප්‍රතිසම්භිදාප්‍රාප්ත මහා ක්ෂීණාශ්‍රව වූවාහු එක් වනලැහැබකට පිවිසියාහු ඒ වනලැහැබ හෙබවූහ.

භගවති නො ආවුසො! බ්‍රහ්මචරියං වුස්සති= ඇවැත්නි! කිම අප ගේ භාග්‍යවතුන් සම්පයෙහි ආයුෂ්මතුන් විසින් බඹසර විසීම වේ දැ? යි; මෙය ආයුෂ්මත් ශාරිපුත්‍රයන් වහන්සේ භාග්‍යවතුන් කෙරෙහි ඔහුගේ බඹසරවස් දන්නාහු නමුදු කථා ඉපදවීම පිණිස විචාළහ; යම්හෙයකින් පුථුකථාව නො පිහිටකල්හි පශ්චිම කථාව නූපදී ද, එහෙයින් මේසේ විචාළහ. තෙරුන් වහන්සේ පිළිනකරන්නාහු **එවමාවුසො!** යි කිහ. ඉක්බිති උන්වහන්සේගේ පැනවිසදුම් අසනු කැමති වූ ආයුෂ්මත් ශාරිපුත්‍රයන් වහන්සේ **කින්නු බො ආවුසො! සීලවිසුද්ධත්ථං භගවති බ්‍රහ්මචරියං වුස්සති** යි පිළිවෙළින් සපනවිශුද්ධීන් විචාළහ. ඔවුන්ගේ විස්තර කථාව විශුද්ධිමාර්ගයෙහි කියන ලදු. ආයුෂ්මත් පුණ්ණයන් වහන්සේ වනාහි යම්හෙයකින් සිව්පිරිසුදුසිල් ආදියෙහි සිටියහුගේ ද බඹසරවස් මුදුන් නො පැමිණේ ද එහෙයින් **නො හි'දං ආවුසො!** යි සියල්ල ප්‍රතික්ෂේප කළහ, **කිඤ්චාපි වරහා'වුසො!**= ඉදින් ශීලවිශුද්ධ්‍යාදීන් සඳහා

බඹසරවස් නො වෙසේ ද එකල්හි කුමක් පිණිස වෙසේ දැ? යි විචාරති; **අනුපාදාපරිනිබ්බානඤ්ච වො ආවුසො!**= මෙහි අනුපාදා පරිනිබ්බාණය නම්? අප්‍රත්‍යයපරිනිබ්බාණ යයි. උපාදානයෝ දෙදෙ
මේ ඛඋපාදානයෝ. නෙක් ම වෙති, ග්‍රහණෝපාදානය ද ප්‍රත්‍යයොපාදානය දැයි කියාහි. "ගහණූපාදාන" නම්? කාමොපාදානාදි වශයෙන් චතුර්විධ වූයේ ය; "පච්චයූපාදාන" නම්? **අවිජ්ජාපච්චයා සඞ්ඛාරා** යි මෙසේ වදාරනලද ප්‍රත්‍යයෝයි. ඔවුනතුරෙහි ග්‍රහණෝපාදානය ප්‍රකාශ කරන්නාවූ ආචාර්‍යයෝ "අනුපාදාපරිනිබ්බානං" යි සතර උපාදානයන් අතුරෙන් එක්තරා එකකිනුදු කිසි ධර්මයක් නො ගෙන පැවැත්තා වූ රහත්ඵලය අනුපාදාපරිනිබ්බාණ යයි කියති; එය වනාහි උපාදානයන් හා සම්ප්‍රයුක්ත වැ කිසි ධර්මයක් නො ද දැඩිකොට ගනී, යලි කෙලෙසුන්ගේ පිරිනිවීම් අවසානැ උපන් බැවින් "පරිනිබ්බාන" යි කියනු ලැබේ; ප්‍රත්‍යයොපාදානය ප්‍රකාශ කරන්නාහු වනාහි "අනුපාදා පරිනිබ්බානං" යි ප්‍රත්‍යය රහිත පරිනිබ්බාණය වූ ප්‍රත්‍යය වශයෙන් නූපන් අසංඛතධාතු ම අනුපාදාපරිනිබ්බාණ යයි කියති; මේ අන්තය ය, මේ කෙළවර ය, මේ නිෂ්ඨාව ය; යම්හෙයකින් අප්‍රත්‍යය පරිනිබ්බාණයට පැමිණියහුගේ බඹසරවස් මුදුන් පැමිණියේ නම් වේද, එහෙයින් සථවිරයන් වහන්සේ **අනුපාදාපරිනිබ්බානඤ්ච** යි කිහ. ඉක්බිති ඔහු අනුයොගවතට නඟන්නාවූ ආයුෂ්මත් ශාරිපුත්‍රයන් වහන්සේ **කින්නු වො ආවුසො! සීලවිසුද්ධි අනුපාදාපරිනිබ්බානං?** යි නැවත පෘච්ඡාව ආරම්භ කළහ. තෙරුන් වහන්සේ ද සියලු පරිවර්තනයන්හි එසේ ම ප්‍රතික්ෂේප කොට අවසානයෙහි දෙස් දක්වන්නාහු **සීලවිසුද්ධිං වේ ආවුසො!** යනාදිය කිහ. එහි **පඤ්ඤපෙස්සා**= ඉදින් පනවන්නේ නම්; **සඵපාදානං යෙව සමානං අනුපාදාපරිනිබ්බානං පඤ්ඤපෙස්සා**= ග්‍රහණ සහිත වූ ධර්මයක් ම ග්‍රහණරහිත ධර්මයෙහ, ප්‍රත්‍යය සහිත වූ ධර්මයක් ම අප්‍රත්‍යය ධර්මයෙහ, සඞ්ඛත ධර්මයක් ම අසඞ්ඛත ධර්මයෙහැයි පනවන් නේය යන අර්ථයි. ඥානදර්ශන විශුද්ධියෙහි වනාහි සප්‍රත්‍යය ධර්මයක් ම අප්‍රත්‍යය ධර්මයෙහ, සඞ්ඛත ධර්මයක් ම අසඞ්ඛත ධර්මයෙහැයි පනවන් නේය යන මේ අර්ථය ම ගතයුතු. **සුවිඤ්ඤෙයෝ හාවුසො!** යන මෙහි වෘත්තානුගතවූ ලෞකිකබාලපෘථග්ජන තෙමේ දතයුතු. සැබව හෙතෙම සිව්පිරිසුදුසිල් පමණකු දූ නැති බැවින් සම්ප්‍රකාරයෙන් ම මේ ධර්මයන් ගෙන් වෙන්වූයේයි.

නෙත හි= යම් කරුණකින් ඇතැම් පණ්ඩිතයෝ උපමාවෙන් අර්ථය දැනගනිත් ද, එ කරුණෙන් ඔබට උපමාවක් කරන්නෙමි යන අර්ථයි. **සත්තරථවිනීතානි**= හික්මවනලද අශ්වාජානීයයන් යෙදූ රථ සතක්; **යාවදෙවචිත්තවිසුද්ධත්ථා**= ඇවැත්නි! මෝ ශීලවිශුද්ධිය නම් යම්තාක් චිත්තවිශුද්ධි ප්‍රයොජනය දක්වා වෙයි; **චිත්තවිසුද්ධත්ථා** යනු මේ අවධි වචනයෙහි, මේ වනාහි මෙහි අර්ථය- යම් තාක් චිත්තවිශුද්ධිසඞ්ඛ්‍යාත

අර්ථය වේද, ඒතාක් මෝ ශීලවිශුද්ධිය නම් කැමතිවිය යුත්තීය; යලි යම් මෝ චිත්තවිශුද්ධියක් වන්නී ද, ශීලවිශුද්ධියගේ මේ අර්ථයැ, මෝ කෙළවර යැ, මේ පර්‍යවසාන යයි. යම්හෙයකින් චිත්ත විශුද්ධියෙහි සිටියහු විසින් සීලවිශුද්ධි කෘත්‍යය කරනලද්දේ වේද එහෙයිනි. සියලු පදයන්හි මේ නයයි.

මේ දක්වනු ලබන්නේ මෙහි ඔපම්‍යසංසන්දන යයි- ඒ මෙසේ යැ, පසෙනදි කොසොල්රජු මෙන් ජරා මරණ හිරුහා වූ යොගාවචර තෙම දතයුතු; සැවැත්නුවර මෙන් සත්කාය නමැති නගරය යැ; සාකෙත නුවර මෙන් නිර්‍වාණ නමැති නගරය යැ; රජුගේ සාකෙතයෙහි වෘඩි ඵලවන්නාවූ වහා ගොස් පැමිණියයුතු අත්‍යාසික වූ කෘත්‍යයාගේ උපන් කාලය මෙන් යොගීහුගේ අභිසමය නො කළාවූ චතුරාර්‍යසත්‍යයන්ගේ අභිසමය කෘත්‍යය උපන් කාලය යැ; විනීත වූ අසුන් යෙදූ රියසත මෙන් සුපාවිශුද්ධිහු යැ; පළමුවන රථවිනීත (=විනීතඅසුන් යෙදූරථ)යට නැංග කාලය මෙන් ශීලවිශුද්ධියෙහි සිටි කාලය යැ; ප්‍රථම රථවිනීතාදියෙන් විතීයාදි රථවිනීතයන්ට නැංගකාලය මෙන් ශීලවිශුද්ධි ආදියෙන් චිත්ත විශුද්ධි ආදියෙහි සිටි කාලය යැ; සත්වන රථවිනීතයෙන් සාකෙතයෙහි අන්තඃපුරවාරයෙහි බැස මතුපහයෙහි ඥතිමිත්‍ර සමූහයා විසින් පිරිවරන ලද්දහුගේ ඕහිරි රසබොදුන් වලඳනකාලය මෙන් ඥානදර්‍ශනවිශුද්ධියෙන් සියලු කෙලෙසුන් ගෙවා උතුම් වූ දහම්පහයට නැගී පස්පස්කුසල්දහම් පිරිවර කොට ඇතිව නිවන් අරමුණුකොට ඇති ඵලසමාපත්තියට සම වැදී නිරෝධ නමැති ශයනයෙහි හුන්නාවූ යොගීහුගේ ලොවුතුරුසුව විඳින කාලය දතයුතු.

මේසේ දම්සෙනෙවි සැරියුත් තෙරුන් වහන්සේ දශකථාවස්තු ලාභී වූ ආයුෂ්මත් පුණ්ණතෙරුන් සපාවිශුද්ධින් විවාළහ; ආයුෂ්මත් පුණ්ණයන් වහන්සේ දශකථාවස්තූන් විසඳූහ; එකෙක් ඇති මෙසේ ඔවුන් විවාරන්නාවූ දම්සෙනෙවියෝ කිම දැන විවාළෝ ද? නොහොත් නො දැන විවාළෝ ද? යලි තීර්‍ථකුශල වැ හෝ විෂයයෙහි විවාළෝ ද? නොහොත් තීර්‍ථකුශල නො වැ අවිෂයයෙහි විවාළෝ ද? පුණ්ණතෙරුන් වහන්සේ ත් කිම දැන විසඳූහු ද? නොහොත් නො දැන විසඳූහු ද? යලි තීර්‍ථකුශල වැ විෂයයෙහි විසඳුහු ද? නොහොත් තීර්‍ථකුශල නො වැ අවිෂයයෙහි විසඳුහු ද යත්? යම්හෙයකින් දැන තීර්‍ථකුශල වැ විෂයයෙහි විවාරකි,සි කියන්නේ දම්සෙනෙවියන් ම කියන්නේ ද, දැන තීර්‍ථකුශල වැ විෂයයෙහි විසඳකි,සි කියන්නේ පුණ්ණතෙරුන් ම කියන්නේ ද; යමක් වනාහි විශුද්ධින්හි සංක්ෂෙප කරනලද ද, එය කථාවස්තූන්හි විස්තර කරනලද්දේ වේ ද; යමක් කථාවස්තූන්හි සංක්ෂිප්ත ද, එය විශුද්ධින්හි විස්තීර්‍ණ වේ ද; එය මේ නයින් දතයුතු මේ විස්තරයැ- විශුද්ධින් අතුරෙහි එක් ශීලවිශුද්ධි තොමෝ සතර කථාවස්තුවක් වැ ආවා, අලෙජ්ජ කථාය‍ැ සහතුෂ්ති කථා යැ අසංසර්‍ග කථා යැ ශීල කථා යැයි කියාසි;

එක් විතතවිශුඩිය තුන් කථාවසතුවක් වැ ආවා, පව්වෙසා කථා යැ වීයතීා රමහ කථා යැ සමාධි කථා යැයි කියායි; මෙසේ පළමුකොට යමක් විශු ඩින්හි සංක්ෂිපතා ද, එය කථාවස්තූන්හි විසතිණී යැ; යලි කථාවස්තූන්හි එක් ප්‍රඥකථාව පස් විශුඩි කෙනෙක් වැ ආවා, දෘෂ්ටිවිශුඩි යැ කාඩක්ෂා විතරණ විශුඩි යැ මාගීාමාගී ඥනදශීන විශුඩි යැ ප්‍රතිපද්ඥනදශීන විශු ඩි යැ ඥනදශීන විශුඩි යැයි කියායි; මෙසේ යුමක් කථා ව ස් තූන් හි සංක්ෂිපතා ද එය විශුඩින්හි විසතිණී යැ; එහෙයින් සැරියුත් තෙරුන් වහන්සේ සපතාවිශුඩි විවාරන්නාහු අනිකක් නො විවාළහ, දශකථා වස්තූන් ම විවාළහ; පුණණතෙරුන් වහන්සේ ද සපතවිශුඩි විසඳන් නාහු අනිකක් නො විසදූහ, දශකථා වස්තූන් ම විසදූහ; මෙසේ මොවුහු දෙදෙන ම දූන තිථිකුශලයෝ වැ විෂයයෙහි මෑ ප්‍රශන විවාළාහු ද, විසදු වාහු ද යයි දතයුතු.

ඤා නාමෝ ආයසමා= සථවිර තෙම ඔහුගේ නම් නො දන්නේ නො වෙයි; යලි දන්නේ ම සතුටුවන්ට ලබන්නෙමි,යි විවාලේය; **කථං ච පන ආයසමතතං** යන මෙය වනාහි තෙරුන් වහන්සේ සතුටුවෙමින් කිහ; **මනතාණීපුතතෙනා**= මනතාණී නම් බැමිණියගේ පුත්‍ර තෙම; **ඝථා නං** යන මෙහි **නං** යනු නිපාතමාත්‍ර යැ; ශ්‍රැතවත් ශ්‍රාවකයකු විසින් යම්සේ ප්‍රකාශ කළයුතු ද, එපරිද්දෙන් ප්‍රකාශ කරනලද යන මේ මෙහි සංක්ෂෙපාථී යයි; **අනුමාසස අනුමාසස**= දශකථාවස්තූන්ට බැස පිවිස; **වෙලණඩුකෙන**= මෙහි "වෙල" යයි වසත්‍රය කියනුලැබේ; "අණඩුක" නම්? සුඹුළයැ; වත්සුඹුළක් හිසැ කොට ආයුෂ්මතුන් එහි හිදුවා පරි හරණය කරන්නාවූ ද සබ්‍රහමචාරිහු ඉදින් දක්නට ලබන්නාහු නම්, මෙසේ ලද දශීනය ද ඔවුන්ට ලාභය පිණිස ම වේ යයි අසථානපරිකලප නයෙන් නිරතුරු දූකීමට උපාය දූක්වූහ. යම්හෙයකින් මෙසේ පරිහර ණය නො කරන්නාවූ පැන හෝ පුළුවුස්නා කැමැත්තහු විසින් බණ හෝ අසනු කැමැත්තහු විසින් තෙරුන් වහන්සේ කොහි සිටියාහු ද? කොහි හුන්නාහු ද? සි සොයන්නහු විසින් හැසිරිය යුතු වේ ද, වැලි මෙසේ පරිහරණය කරන්නහු විසින් කැමති කැමති ඇසිල්ලෙහි ම හිසින් බස්වා මාහැගි අසුනෙක්හි හිදුවා පැන හෝ පුළුවුස්නට බණ හෝ අසන්ට හැකි වේද, එහෙයින් අසථානපරිකලපනයෙන් නිරතුරු දූකී මට උපාය දූක්වූහ.

සාරිපුතතෙනාති ච පන මං= ශාරි බැමිණියගේ පුත්‍ර තෙමේ යි ද මෙසේ මා සබ්‍රහමචාරිහු දකිති; **සතථුසාසනෙපෙන**= ශාසනයන් සදෘශ වූ; මෙසේ එක් පදයෙන් ම ආයුෂ්මත් පුණණතෙම සැරියුත් තෙරුන් සද මඩලට නහා තබන්නෙකු මෙන් එසවීය; යම්හෙයකින් මේ තැන්හි තෙරුන්ගේ එකානත ධර්මකථිකභාවය ප්‍රකට වූයේ ද එහෙයිනි. සැබව- අමාතයයකු මහත් යයි කියන්නේ "රජු හා සදෘශ" යයි කියන්නේය,

ගොණෙකු "ඇතෙක් පමණ" යයි ද, වැවක් "මුහුදු පමණ" යයි ද, ආලොකය "චන්ද්‍රසූර්‍යාලොකය ප්‍රමාණ" යයි ද කියන්නේය; මෙයින් මත් තෙහි මොවුන්ගේ මහත්බැව් පිළිබඳ කථාවක් නම් නැති; ශ්‍රාවකයකු දු මහත් යයි කියන්නේ "ශාසනාප්‍රතිභාග" යයි කියන්නේය, මෙයින් මත් තෙහි ඔහුගේ මහත්බවක් නම් නැති. මෙසේ ආයුෂ්මත් පුණ්ණතෙම එකපදයෙන් ම තෙරුන් සඳමඬලට නඟා තබන්නෙකු මෙන් එසවීය. **එතඤ්ඤපි නො නප්පටිභාසෙය්‍ය**= ප්‍රතිසම්භිදාප්‍රාප්තයක්හට නො වැට හිමෙක් නම් නැති; යම් මෝ උපමාවක් එලවනලදු ද, එය නො එල වන්නෙමු, අර්‍ථය ම කියන්නෙමු; යම්හෙයකින් නො දන්නවුන්ට උප මාව එලවනුලබා ද එහෙයිනි; මේ මෙහි අදහසයි. එහෙත් අට්ඨකථා වෙහි මෙ ද පිළිකෙව් කොට උපමා නම් බුදුරදුන් සම්පයෙහි එලවනු ලබා යයි, වැලි මේතෙම තෙරුන් බුහුමන් කරනුයේ මෙසේ කියේ ය,යි. **අනුමාසඤ්ඤ අනුමාසඤ්ඤ පුච්ඡිතා**= දශකථාවස්තූන්ට බැස බැස විමාරනලද්දී දුහු; තවද- කිම ප්‍රශ්නය පිළිවිසීම බරෙක් ද? නොහොත් විසඳීම ද? යි ඉගෙන පිළිවිසීම නො බැරිය; එහෙත් විසඳීම බරෙක් වෙයි; සහෙතු කොට සකාරණ කොට පිළිවිසීම ද විසඳීම ද බරෙක් මැයි. **සමනුමොදිංසු**= සමානයින් ඇත්තාහු වී අනුමෝදන් වූහ. මෙසේ අනුසන්‍ධි වූ පරිද්දෙන් ම දෙශනාව නිමවනලද්දීයයි.

රථවිනීත සූත්‍ර වණ්ණනා නිමි.

නිවාප සූත්‍ර වණ්ණනා.

එවමෙමසුතං යි නිවාප සූත්‍ර යයි. එහි **නෙවාපිකො** යනු යමෙක් මුවන් ගැනීම පිණිස "මේ තණ කන්ව පැමිණී මුවන් සුවසේ ගන්නෙමි" යි වනයෙහි තණබිජුවට වපුරා ද (හෙතෙමේයි;) **නිවාපං**= නිවාප තෘණය; **නිවුතතං**= වපුරනලද; **මිගජාතා**= මෘගසමූහයෝ; **අනුපඛජ්ජ**= ඇතුලත පිවිස; **මුඛයිතා**= තෘෂ්ණාමූර්ඡිතාවෙන් මූසපත්වූවාහු; තෘෂ්ණාවෙන් ළයට පිවිස මූර්ඡාවූ ආකාරයට පමුණුවනලද්දාහු යන අර්ථයි. **මදං ආපජ්ජිස්සන්ති**= මානමදයට පැමිණෙන්නාහුය; **පමාදං**= විසුළු සිහි ඇතිබවට; **යථාකාමකරණීයා භවිස්සන්ති**= යම්සේ කැමති වන් නෙම්ද, එසේ කටයුතු වන්නාහුය; **ඉමස්මිං නිවාපෙ**= මේ නිවාපස්ථානයෙහි; නියංකලැ සොඳුරුවූ එක් "නිවාපතෘණ" යෙක් කම් ඇත් ලු; එය යම් යම් සේ නියහ වේද, ඒ ඒ පරිද්දෙන් හූරුහැල් වනයක් මෙන් ද මෙසමාලාවක් මෙන් ද එකඝන වෙයි, වැද්දේ එය එක් දියපහසුතැනක කැස වපුරා වැටක් කොට දොර **යොදා රකිති**; නැවත යම් කලෙක මහානියඟය වේද සියලු තණ වියලු නාහු වෙත් ද, දිවතෙමෙක පමණකු දු ජලය දුලීහ වේද, එකල්හි මෘග සමූහයෝ වියලි තණ ද පරණලා ද කමින් වෙවුලමින් මෙන් හැසිරෙන් නාහු නිවාපතෘණයාගේ ගඳ ආඝ්‍රාණයකොට වඩබඩිනාදිය නොසලකා වැට මඩිමින් පිවිසෙති; යම්හෙයකින් ඔවුන්ට නිවාපතෘණය අතිශයින් ප්‍රිය මනාප වේද එහෙයිනි; නෙවාපිකතෙම ඕවුන් දැක දෙතුන්දිනක් ප්‍රමත්තයෙකු මෙන් වෙයි, දොර විවර කොට සිටී; ඇතුලුනිවාපස්ථානයෙහි තැන්හි තැන්හි දියවළුවල් ද වෙති, මෘගයෝ හළුදෙරින් පිවිස කැපමණක් පිපමණක් ම කොට පැන යෙති; දෙවන දවස් කිසිවක් නො කෙරෙති, සි කන් සලමින් කා බී නො වෙලෙවී වූවාහු යෙති; දෙවන දවස් කිසිවක් කරන්නාවූ කිසිවෙක් නැතැයි යැපෙන තැක් කා බී මඩුලු ලැහැබකට පිවිස නිදත්. වැදිතෙම ඔවුන්ගේ ප්‍රමත්තභාවය දැක දොර වසා හාත්පසින් වට කොට කෙළවර පටන් කොටමින් යෙයි. මෙසේ ඔවුහු ඒ නිවාපස්ථානයෙහි නෙවාපිකයා විසින් කැමති සේ කටයුත්තාහු වෙත්.

තත්‍ර හික්ඛවෙ!= මහණෙනි! ඒ මෘගසමූහයන් කෙරෙහි; **පඨමා මිගජාතා**= මෘගසමූහයෝ ප්‍රථම-ත්‍රිතීය වූවාහු නම් **තැති**, එහෙත් භාග්‍ය වතුන් වහන්සේ ජැම්බී පිළිවෙළ විසින් සලකා ප්‍රථම-ත්‍රිතීය-තෘතීය-චතුර්ථ යයි නම ආරොපණය කොට දක්වූහ. **ඉඛානුභාවා**= කැමති සේ කටයුතු බැවින්; වසඟබව ම මෙහි "ඉඛි" යි ද "ආනුභාව" යි ද අදහස්

කරනලද; **භයභොගා**= බියෙන් කවයුතු පරිභොගයෙන්; **බලවිරියං**= ඔබිනොබ හැසිරෙන වායොධාතුව, ඕ පිරිහී යෑ යන අර්ථයි. **උපනිස්සාය ආසයං ඛණ්පෙස්සාම**= ඇතුලත හෙව කන්නවුන්ට භය ම වෙයි, බැහැරින් අවුත් කන්නවුන්ට ද භය ම වෙයි; ඇපි වනාහී මේ නිවාපසථානය ඇසුරු කොට එක් පසෙක වාසසථානය කරන්නෙමු නම් ඉතා යෙහෙ කැයි සිතූහු; **උපනිස්සාය ආසයං ඛාපෙසිංසු**= වැද්දේ නම් සියලු කල අප්‍රමාද වූවාහු නො වෙති, ඇපි තැන්හි තැන්හි මඩුලුලැහැබිවල ද වැට පාදයන්හි ද වැදහෙව මොවුන් මුවඳේනා පිණිස හෝ බත්කිස කරනු පිණිස හෝ නික්මගිය කල්හි නිවාපවත්තට පිවිස කැපමණක් පිපමණක් කොට අප වසන තැනට පිවිසෙන්නෙමු,යි නිවාපවත්ත ඇසුරු කොට වනයෙහි වූ පදුරුවැටපාආදියෙහි වාසසථානය කළාහුය. **භූඤ්ජිංසු**= කීනියෙන් වැද්දන්ගේ ප්‍රමාදකාලය දැන වහ වහා පිවිස කෑවාහුය; **භෙටුගිනෝ**= භික්ෂූණු කෙරෙහි කෘපාවෝ; **ඉද්ධිමන්නා**= සෘද්ධි ඇත්තවුන් මෙනි; **පරජනා**= යක්‍ෂයෝ යෑ, මොවුහු මෘගසමූහයෝ නො වෙති; **අඝනිං වා**= මේ නම් තැනින් එති, අසවල් තැන යෙහි,යි මොවුන්ගේ මේ (කාරණය) නො දනිමු; **දණ්ඩවාඝාතඤ්ඤි**= දඬුවරදුල්වලින්; **සමන්නා සප්පදෙසං අනුපරිවාරෙසුං**= මොවුහු ඉතා මායා ඇත්තාහුය, දුර නො යන්නාහුය, සමීපයෙහි ම හොත්තාහු වන්නාහුය,යි නිවාපකෙත භාත්පස පෙදෙස සමග මහත්වූ අවකාසය වටකළාහුය; **අදදසාසුං**= මෙසේ වටකොට වරදුල් භාත්පස එලා බලන්නාහු දුටුවාහුය; **යඤ්ච ඛෝ**= යම් තැනක ඔවුහු (ලැගුම්) ගැනීමට ගියාහුද, එ තැන දුටුවාහුය යන අර්ථයි **සනන්‍නූන මයං යඤ්ච අඝනිං**= ඔවුහු මෙසේ සිතුවාහු ල- ඇතුලත හෙව ඇතුලත කන්නවුන්ට ද බිය ඇ, බැහැරින් අවුත් කන්නවුන්ට ද, සමීප යෙහි වැස කන්නවුන්ට ද බිය ම වෙයි; යම්හෙයකින් ඔවුහු ද වරදුලින් වටකොට ගන්නාලද්දාහු ම වෙත් ද, එහෙයින් ඔවුන්ට මේ සිත විය- "ඇපි යම් තැනක නෙවාසිකයාට ද නෙවාසික පිරිසට ද ගති නො වේද, විෂය නො වේද, එහි වාසසථානය කරන්නෙමු නම් ඉතා යෙහෙකැ"යි. **අඤ්ඤෙඤ්ඤ සමෙවසඤ්ඤනති**= එයින් ඉතාදුර වසන්නාවූ අන්‍යයන් ගවන්නා හුය; **තෙ සමෙතා අඤ්ඤෙඤ්ඤ**= ඔවුහු ද ගවනලද්දාහු එයින් දුර වසන්නාවූ අන්‍යයන් ගවන්නාහුය; **එවං ඉමං නිවාපං නිවුත්තං සබ්බසෝ මිග ජාතා පිඤ්ඤිස්සන්තීති**= මෙසේ මේ අප විසින් වපුරනලද නිවාපසථානය සියලු මුවගළ මෘගසමූහයෝ හරින්නාහුය දුරලන්නාහුය; **අජ්ඣුපෙක්ඛිස්සාම**= ඔවුන් ගැනීමෙහි අව්‍යාවෘත වන්නෙමු; ඒ එසේ මැයි- යම් ඒ පරිද්දෙකින් එතකල්හි තරුණපැටවෙකු හෝ මහලු වූවෙකු හෝ දුබල වූවෙකු හෝ රැලින් පිරිහුනෙකු හෝ ලබන්ට හැකි වෙයි, නො එතකල්හි කිසිවක් නැති; **අජ්ඣුපෙක්ඛිංසු වෝ හිත්ථවෙ!**= මෙසේ සිතා අව්‍යාවෘත වූහ; **අමුං නිවාපං නිවුත්තං මාරස්ස අමූනි ච ලොකා**

මිසානි යන මෙහි **නිවාප** යි හෝ **ලොකාමිස** යි හෝ වෘත්තාමිෂ වූ පඤ්ච කාම ගුණයන්ට ම මේ නමෙකි; මාරතෙම බිජයන් මෙන් පස්කම්ගුණ වපුරමින් නො ද ඇවිදියි, එහෙත් කාමගුණයෙහි ගිජුවූවන්ගේ මතු යෙහි ප්‍රභවය පවත්වයි; එහෙයින් කාමගුණයෝ මාරයාගේ නිවාපයෝ නම් වෙති; එයින් කියන ලදී- "අම්භං නිවාපං නිවුත්තතං මාරස්ස" යනු. **න පරිමුච්චන්ති මාරස්ස ඉඛානුභාවා**= මාරයාගේ වසඟයට ගියාහු කැමති සේ කටයුතු වූහ. මෝ සපුත්‍රභාර්‍යා ප්‍රව්‍රජ්‍යාවට ආ උපමායි.

වෙනොවිමුත්තති පරිභාසි= මෙහි **වෙනොවිමුත්තති** නම්? වනයෙහි වෙසෙමුයි උපන් අදහස ය; එය පිරිහි ගියේය යන අර්ථයි. **තථූපමේ අහං භික්ඛවෙ! ඉමේ දුනිමෙ**= මෝ බ්‍රාහ්මණ ධාර්මික ප්‍රව්‍රජ්‍යාවට උපමායි. මේ විස්තර ය- බ්‍රාහ්මණයෝ අවසාලිස් වසක් කුමරබඹසර හැසිර සසරසිදිම්බියෙන් පරපුර ගළපන් නොමැ,සි ධනය සොයා භාර්‍යාවක් ගෙන ගිහිගේ මෑද වෙසෙමින් එක් පුතකු උපන්කල්හි අප කරා පැමිණ වෘත්තය නො සිදුනාලද, ප්‍රවේණිය ගලපනලදැයි නැවත නික්ම පැවිදි හෝ වෙති, එම සකලත්‍රවාසයෙහි හෝ වෙසෙත්. **එවං ඛි තෙ භික්ඛවෙ! නතියා සමණබ්‍රාහ්මණා න පරිමුච්චිංසු**= පළමුවැන්නන් මෙන් ඔවුහු ද මාරයාගේ සෘද්‍ධ්‍යානුභාවයෙන් නො මිදුනාහුය, කැමතිසේ කට යුත්තාහු ම වූහ. වැලි ඔවුහු කුමක් කළාහු ද යත්? ගම්නියම්ගම් රජ දහම්වලට බැස ඒ ඒ ආරම්ම උද්‍යාන ස්ථානයන්හි අසපු මවා වෙසෙමින් කුලදරුවන්ව ඇත් අස් රථ ශිල්පාදි වූ නන්වැදුරුම් ශිල්පයන් ඉගැන් වූහ. මෙසේ ඔවුහු වරදුලින් තුන්වන මෘගසමූහයන් මෙන් පාපිමත් වූ මාරයාගේ දිටුදුලින් වටකරනලද්දාහු කැමතිසේ කටයුතු වූහ.

තථූපමේ අහං භික්ඛවෙ! ඉමෙ චතුරෝ යන මෝ මේ ශාසනයට ඵලවූ උපමායි. **අඛ්ඛිමඛාසි මාරං**= මාරයාගේ ඇස් නො බින්ද; එහෙත් විදර්‍ශනාපාදකධ්‍යානයට සමවන් මහණහුගේ සිත මේ නම් අරමුණ නිසා පවතී යයි මාරතෙම දක්නට නො හැකි වෙයි; එයින් වදාරනලදී, "අඛ්ඛිමඛාසි මාරං" යනු. **අපදං වධිත්වා මාරචක්ඛුං**= ඒ පර්‍යායයෙන් ම යම් සේ මාරයාගේ ඇස අස්ථාන වේ ද, **නිප්පද - අප්‍රතිෂ්ඨා - නිරාලම්බණ** වේද, එපරිද්දෙන් නසා යන අර්ථයි. **අදස්සනං ගතො පාපිමතො**= ඒ පර්‍යායයෙන් ම පාපිමත් මාරයාගේ නො දක්මට ගියේය, හෙතෙම තමාගේ මසැසින් විදර්‍ශනාපාදක ධ්‍යානයට සමවන් භික්ෂුවගේ නුවණ සිරුර දක්නට නො මැ හැකි වෙයි; **පඤ්ඤාය චස්ස දිස්වා**= මාර්ගප්‍රඥාවෙන් චතුරාර්‍යසත්‍යයන් දැක චතුරාශ්‍රවයෝ ක්ෂය කරනලද්දාහු වෙති; **තිණ්ණො ලොකෙ විසත්තිකං**= ලොකයෙහි ඇලුනු වෙසෙසින් ඇලුනු

බැවින් "විසත්තිකා" යි මෙසේ සඞ්ඛ්‍යාවට ගිය නොහොත් "විසත්තිකා යනු කවර අර්ථයකින් විසත්තිකා නම් වූ ද? පතළා නුයි විසත්තිකා යැ, (තුන්බිමැ පතුරුවන විසින්) පතළා නුයි විසත්තිකා යැ, (රූපාදියෙහි) විශාල වූවා නුයි විසත්තිකා යැ, ඉවසා නුයි විසත්තිකා යැ, සිත හකුලුවා නුයි හෝ විෂ (=දුක්) ඵලවා නුයි විසත්තිකා යැ, (අනිත්‍යාදිය නිත්‍යාදි වශයෙන් ගනිමින්) විසංවාදනය කෙරේ නුයි විසත්තිකා යැ, (දුක් උපද වන කර්මයට හෙතු බැවින්) විෂමූල නුයි විසත්තිකා යැ, (දුඃඛසමුදය බැවින්) විෂඵලඇත්තී නුයි විසත්තිකා යැ, දුඃඛපරිභොගය ඇත්තී නුයි විසත්තිකා යැ, යලි ඕ තෘෂ්ණාව රූපයෙහි ශබ්දයෙහි ගන්ධයෙහි රසයෙහි ස්පර්ශයෙහි පතළා නුයි මෙසේ හෝ විසත්තිකා නමැ" යි සඞ්ඛ්‍යාවට ගිය තෘෂ්ණාව තරණය කෙළේය, නිස්සරණී යැ, උත්තරණී යැ; එහෙයින් කියනුලැබේ- **තිණ්ණා ලොකෙ විසත්තිකං** යනු.

නිවාප සූත්‍ර වණ්ණනා නිමි.

පාසරාසි සූත්‍ර වණ්ණනා.

එවමෙමසුතං යි පාසරාසි සූත්‍ර යයි. **එකං සාධු මයං ආවුසො!** යනු ආයාචනා කරමින් කියති; මේ දනව්වැසි පන්සියයක් භික්ෂූහු වනාහි දසබලයන් වහන්සේ දක්නෙමුයි සැවැත්නුවරට පැමිණියාහුය; ශාස්තෘන් දැකීම වූ කලි මොවුන් විසින් ලදි; එතැක් ධර්මකථාව නො අසති; ඔවුහු ශාස්තෘගෞරවයෙන් වහන්ස! අපට ධර්මකථා සම්භූයන් වක් වදුළ මැනවැයි කියන්ට නො හැකි වෙති; ඒ එසේමැයි- දුරාසදබෑව්, බුදුවරයෝ ගරු වූවාහු වෙති, එකලා වැ හැසිරෙන සිංහ මෘගරාජයෙකු මෙන් ද, ප්‍රහීන්න වූ (මදය ඇති) ඇතෙකු මෙන් ද, පෙණය කළ සර්පයෙකු මෙන් ද, ගිනිකඳක් මෙන් ද ළංවිය නො හැක්කාහුයි. මේ කියනලද මැයි—

147. **"ආසීවිසෝ යථා ඝොරෝ - මිගරාජා ච කේසරී**
නාගෝ ච කුඤ්ජරෝ දන්තී - එවං බුද්ධා දුරාසදා" යි.

මෙසේ දුරාසද වූ ශාස්තෘන් වහන්සේ ඒ භික්ෂූහු තුළ ශාස්ත්‍රකරන්ට නො හැකි වන්නාහු ආයුෂ්මත් ආනන්දයන් යාඥා කරන්නාහු **සාධු මයං ආවුසො!** යි කිහු. **අභිසමෙතාමි**= ලබන්නහු නම් ඉතා යෙහෙක; වැලි කුමක් හෙයින් තෙරුන් වහන්සේ ඒ භික්ෂූන්ට රම්මක බ්‍රාහ්මණයාගේ අසපුවට එලඹෙන්නහු යයි කිහු ද යත්? ප්‍රකට වූ ක්‍රියා ඇති බැවිනි. ඒ එසේ මැයි- දශබලයන්ගේ ක්‍රියාව තෙරුන්ට ප්‍රකට වෙයි, තෙරුන් වහන්සේ ම "අද ශාස්තෘන් වහන්සේ දෙවිරම වැස පූර්වාරාමයෙහි දිවා විහාරය කරන්නාහ, අද පූර්වාරාමයෙහි වැස ජේතවනයෙහි දිවාවිහාරය කරන්නාහ, අද එකලාව ම පිඬු පිණිස හැසිරෙන්නාහ, අද භික්ෂුසඝයා විසින් පිරිවරනලදුව (පිඬු පිණිස හැසිරෙන්නාහ,) මේ කල ජනපදවාරිකාවට නික්මෙන්නාහ" යි දැනගනිති. වැලි කිමෙක් ද ඕහට මේසේ දැනගැනීම පිණිස චෙතොපරියඥානය ඇත් ද යත්? නැති; එහෙත් අනුමාන බුද්ධියෙන් කළ ක්‍රියාව පිළිබඳ නයග්‍රාහයෙන් දැනගනිති; ඒ එසේ මැයි- යම් දිනක භාග්‍යවතුන් වහන්සේ ජේතවනයෙහි වැස පූර්වාරාමයෙහි දිවාවිහරණය කරනු කැමති වෙත් ද, එකල සෙනාසනපරිෂ්කාර භාණ්ඩයන්ගේ සකස්කරන අයුරු දක්වති, තෙරුන් වහන්සේ මුසුන් කසළදමන පැස් ආදිය සකස් කෙරෙති; පූර්වාරාමයෙහි වැස ජේතවන

---

147. **ඝොරෝ**= දරුණු වූ; **ආසීවිසෝ**= ආශීවිෂයෙක්; **යථා**= යම් සේ ද; **කේසරී**= කෙසරිසඞ්ඛ්‍යාත වූ; **මිගරාජා ච**= මෘගරාජ තෙමේ ද; **කුඤ්ජරෝ**= කුඤ්ජරසඞ්ඛ්‍යාත වූ; **දන්තී**= දන්තීන් නම් වූ; **නාගෝ ච**= හස්ති තෙමේ ද; (යම්සේ දුරාසද වෙත් ද,) **එවං**= එපරිද්දෙන්; **බුද්ධා**= සර්ව්ඥ බුදුවරයෝ; **දුරාසදා**= ළංවිය නො හැක්කාහු වෙත්.

යට දිවාවිහරණය පිණිස එනකල්හි දු මෙම නයයි. යම් දිනක වනාහි එකලාව පිඬු පිණිස පිවිසෙනු කැමති වෙත් ද, එකල උදැසන ම සිරුරු පිළිදගුම් කොට ගඳකිළියට පිවිස දෙර විසා පලසම්වතට සම්වැද වැඩ හිඳිති, තෙරුන් වහන්සේ අද භාග්‍යවත්හු බොධනෙය්‍යබන්ධවයකු දැක වැඩහුන්හ,යි ඒ සලකුණෙන් දැන ඇවැත්නි! අද භාග්‍යවත්හු එකලාව ම පිවිසෙනු කැමැත්තාහ, තෙපි භික්ෂාචාරයට සැරසෙවු යයි භික්ෂූන්ට සංඥාව දෙති, යම් දිනක වනාහි භික්ෂු සඞ්ඝයා පිරිවරන ලදුව පිවිසෙනු කැමති වෙත් ද, එකල ගඳකිළිය අඩක් වසනලද කොට පලසම්වතට සම්වැද වැඩහිඳිති; තෙරුන් වහන්සේ ඒ සලකුණෙන් දැන පාසිවුරු ගැනීම පිණිස භික්ෂූන්ට සන් දෙති; යම් දිනක වනාහි ජනපදවාරිකා වෙහි නික්මෙනු කැමති වෙත් ද, එකල බත්පිඬු එකක් දෙකක් අතිරෙකව වලඳති, සියලු කල සක්මනට නැගි ඔබිනොබ සක්මන් කෙරෙති, තෙරුන් වහන්සේ ඒ සලකුණෙන් දැන ඇවැත්නි! භාග්‍යවතුන් වහන්සේ ජනපදවාරිකාවෙහි හැසිරෙනු කැමතිසේක, තොප විසින් කටයුතු කරවු යයි භික්ෂූන්ට සන් දෙති; භාග්‍යවතුන් වහන්සේ ප්‍රථමබොධියෙහි විසි වසක් අනිබඳවාසය ඇතිවූහ, පසුව පස්විසි වසක් අනිකෙකු හා අසම්මිශ්‍රව සැවැත් නුවර ම ඇසුරු කොට වසනසේක් එක් දවස දෙතැනක් පරිභොග කෙරෙති, දෙවුරම රැ වැස දෙවන දවස් භික්ෂු සඞ්ඝයා විසින් පිරිවරතලදුව දකුණු දෙරින් සැවැත් නුවරට පිඬු පිණිස පිවිස පැදුන් දෙරින් නික්ම පූර්වාරාමයෙහි දිවාවිහරණය කෙරෙති, පූර්වාරාමයෙහි රැ වැස දෙවන දවස් පැදුන් දෙරින් සැවැත් නුවරට පිඬු පිණිස පිවිස දකුණු දෙරින් නික්ම දෙවුරම දිවාවිහාරය කෙරෙති; කුමක් හෙයින ? දෙකුලයන්ට අනුකම්පා පිණිසයැ; ඒ එසේ මැයි- මිනිසත් බැව්හි සිටියා අන් කිසිවකු විසින් අනේපිඬු සිටුණන් මෙන් ද, මාගම් අත්බැව්හි සිටියාවූ අන් සත්‍රියක විසින් විශාඛාව මෙන් ද තථාගතයන් උදෙසා ඛනපරිත්‍යාගය කළ එකෙක් නම් නැති; එහෙයින් භාග්‍යවත්හු ඔවුන්ට අනුකම්පා පිණිස එක්දවස මේ දෙතැන පරිභොග කරනසේක. එදවස වනාහි ජේතවනයෙහි විසූහ; එහෙයින් තෙරුන් වහන්සේ අද භාග්‍යවත්හු සැවැත් නුවර පිඬු පිණිස හැසිර සවස්කාලයෙහි සිරුරු සේදීම පිණිස පැදුන් කොටුවට යනසේක; එකල්හි මම සිරුරු සෝදා සිටියාවූ භාග්‍යවතුන් අයැද "රම්මක" බ්‍රාහ්මණයාගේ අසපුවට ගෙන යන්නෙමි, මෙසේ මේ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙන් දැහැමි කථා ශ්‍රවණයට ලබන්නාහු යයි සිතා ඒ භික්ෂූන්ට මෙසේ කිහ.

මිගාරමාතු පාසාදෙ= විශාඛාවගේ ප්‍රාසාදයෙහි; ඒ එසේ මැයි— ඕ මිගාරසිටුහු විසින් මවුතැන්හි තැබූ බැව්න් "මිගාරමාතා" යයි කියනු ලැබේ. **පච්ඡලලාණා චුඩිකෝ**= ඒ ප්‍රාසාදයෙහි මහා ශ්‍රාවකයන් දෙදෙනාගේ ශ්‍රීගර්භයන් මැද භාග්‍යවතුන්ගේ ශ්‍රීගර්භය විය; තෙරුන් වහන්සේ දෙර විවර කොට ඇතුලුගබ හැමද මල්කසළ බැහැර කොට ඇද සුටු

පතවා ශාසනඤාණ් වහන්සේට සත් දුන්හ; ශාසනඤාණ් වහන්සේ සිරි හැඹව පිළිස දකුණුපසින් සිහිඇතිව නුවණඇතිව සිහසෙය්‍යාවට පැමිණ වෙහෙස සන්සිඳුවා නැඟිට පලසමවතට සම්වැද හිඳ සවස්කලැ එයින් නැඟිසිටියේක. ඒ සඳහා කියන ලදී- "පටිසල්ලාණා වුට්ඨිතෝ" යනු. **පරිසිඤ්චිතුං**= යමෙක් වතාහි සුණු මැටි ආදියෙන් අවයව උලමින් මැලුක (=ඉද්ද?) මූලාදියෙන් හෝ ගටමින් නහාද, හෙතෙම සනානය කෙරේ යයි කියනු ලැබේ. යමෙක් එසේ නො කොට ප්‍රකෘතියෙන් ම නහාද, හෙතෙම පරිඝෙක කෙරේ යයි කියනු ලැබේ. භාග්‍යවතුන් වහන්සේගේ සිරුරෙහි ද එසේ හළයුතු, රජස්දූලි නම් නො තැවරෙයි; එහෙත් සෘතුගැනීම් පිණිස භාග්‍යවතුන් වහන්සේ හුදෙක් ජලයට බසිනී එයින් කිහ- "ගත්තානි පරිසිඤ්චිතුං" යනු.

පුබ්බකොළඤ්ඤා= පැදුන්කොටුව; මේ අසනු ලැබේ- සැවැත්නුවර විහාරය කලෙක මහත් වෙයි, කලෙක කුඩා වෙයි; ඒ එසේ මැයි—

සැවැත්නුවර විහාරය.

ඒ විහාරය විදර්ශි භාග්‍යවතුන්ගේ කාලයෙහි යොදුනක් විය, සිඛි භාග්‍යවතුන්ගේ කාලයෙහි තුන්ගවුවෙක, වෙස්සභූ භාග්‍යවතුන්ගේ කාලයෙහි අඩයොදුනෙක, කකුසඤ්ඡ භාග්‍යවතුන්ගේ කාලයෙහි ගවු පමණයැ, කොනාගමන භාග්‍යවතුන්ගේ කාලයෙහි අඩගවුවක් පමණයැ, කාශ්‍යප භාග්‍යවතුන්ගේ කාලයෙහි විසිඉස්බක් පමණයැ, අපගේ භාග්‍යවතුන්ගේ කාලයෙහි අවකිරියක් පමණ වූයේයි. ඒ නගරය ද කිසිකලෙක ඒ විහාරය පැදුන්දෙයින් වෙයි, කිසි කලෙක දකුණු දෙසින් ද, කිසි කලෙක පැලදෙසින් ද, කිසි කලෙක උතුරු දෙසින් ද වෙයි; එහෙත් දෙවුරම් භදකිළියෙහි සිව් ඇදපා පිහිටිතැන් අවල මැයි. සැබව- අවල වෛත්‍ය ස්ථානයෝ නම් සතර දෙනෙක් වෙති; මහබෝපලඟ පිහිටිතැන, ඉසිපතන්හි දම්සක් පවත්වන තැන, සකස්නුවර දෙරැ දෙවාවරොහණ කාලයෙහි හිඳ පිහිටන තැන, ඇදපා පිහිටන තැන යයි. මේ පුබ්බකොළඤ්ඤය (=පැදුන් කොටුව) වතාහි කසුප් දසබලයන්ගේ විසිඉස්බක් පමණ විහාරය ඇතිකල්හි පැදුන්දෙරැ විය; හේ දැනුදු "පුබ්බකොළඤ්ඤ" යි ම පැනෙයි; කසුප් දසබලයන්ගේ කාලයෙහි අවිරවතිය නුවර වටකොට ගලාබසින්නී පැදුන් කොටුවට පැමිණ ජලයෙන් බිඳී සම තොට ඇති පිළිවෙළින් ගැඹුරු වූ මහත් දිය විලක් මැවී; එහි එකෙක් රජුගේ නහනතොට යැ, එකෙක් නුවරැන්ගේ යැ, එකෙක් භික්ෂු සඞ්ඝයාගේ යැ, එකෙක් සමීඳුගන්ගේ යැ,යි මෙසේ වෙන වෙන ම සිත්කලු වූ විසුරැණු රිදීපට වැනි වැලි ඇති නහන තොට වෙත්.

පුබ්බකොළඤ්ඤය.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්දයන් සමඟ මේ මෙබඳු වූ පැදුන්කොටුව යම් තැනෙක්හි ද එතැන්හි සිරුරු සෝදනු පිණිස එලඹියේසා. එකල්හි ආයුෂ්මත් ආනන්දයන් වහන්සේ උදක සාටිකාව එලවූහ. භාග්‍යවතුන් වහන්සේ රත්දෙපට හඳනය ඉවත් කොට ජලසාටිකාව හැන්දහ, තෙරුන් වහන්සේ දෙපටහඳනය සමඟ මහාචීවරය තමන් හසුන ගත කළහ, භාග්‍යවත්හු ජලයට බැස්සහ. උන්වහන්සේගේ බැසීම සමඟ ම ජලයෙහි මස්කැසුප් සියල්ලෝ රන්වන් වූහ, යතුරුනළවලින් රන්රහදහර විහිදුවනකලක් මෙන් ද රත්පට අතුරන කලක් මෙන් ද විය; ඉක්බිති නහකවත් දක්වා නහා (ජලයෙන්) ගොඩ බැස්සාවූ භාග්‍යවතුන් වහන්සේට තෙරහු රත්දෙපට හඳනය එලවූහ. භාග්‍යවතුන් වහන්සේ එය හැඳ විදුලියක් වැනි වූ කාබඹන බැඳ කොනින් කොන හකුලා පියුම් ගැබක් සේ කොට එලවූ මහාචීවරය දෙකොන්හි ගෙන සිටියහ; එසින් කියනලදී- **සුබඛෙනාඛඛෙ ගතතානි පරිසිඤචිතවා එකචීවරෙ අඛාසි** යනු. වැලි මෙසේ සිටියා වූ භාග්‍යවතුන් වහන්සේගේ සිරුර විකසිත කමලපුල්මල සියලුතැන සුපිපි පර සතුරුසා තරුකිරණින් විසිතුරු අහස්තලය සිරින් අපහාස කරන්නෙකු මෙන් බැබලි; තවද- උන්වහන්සේගේ ව්‍යාමප්‍රභා පරික්ෂේපයෙන් බබලන්නාවූ දෙතිස්වර ලකුණු පෙල ගොතා තැබූ දෙතිස්සඳපෙලක් මෙන් ද දෙතිස් රිවිපෙලක් මෙන් ද පිළිවෙළින් තැබූ දෙතිස් සක්විත් තන් දෙතිස් දෙව්රජුන් දෙතිස් මඟබඹුන් මෙන් ද අතිශයින් බැබලූ; වැණුම්බිම් නම් මෝ ඇ; මෙබඳු තැන්හි බුදුවරයන්ගේ ශරීරවර්ණය හෝ ගුණය හෝ චූර්ණිය පදයන්ගෙන් හෝ ගාථාවන්ගෙන් හෝ අර්ථය ද උපමා ද කරුණු ද ඵලවා ප්‍රතිබල වූ ධර්මකථිකයා විසින් සම්පූර්ණ කොට කියන්ට වටී; සැබව- මෙබඳු තැන්හි ධර්මකථිකයාගේ ශක්තිය දතයුතු.

ගතතානි සුබඛාපගමාතෙනාති ප්‍රකෘතිභාවයට පැමිණුවමින් තිරුදක කෙරෙමින්, විමලවමින්, යන අර්ථයි. ඒ එසේ මැයි- දියඝඟින කඹෙහි සිවුරු පොරවන්නහුගේ සිවුරෙහි කැණි නගිති, පරිම්පැවිදිවනක්. කාර භාණ්ඩය කෙලෙසෙයි; එසොක් ඇති- සර්ෂපයන්ගේ සිරුරෙහි රජස්දූලි නො තැවරෙයි, පියුම්පපොසා දුමු දියබිඳක් සෙයින් ජලය පෙරලී යෙයි; මෙසේ ඇතිකල්හි දු ශික්ෂාවෙහි ගරුබවයෙන් භාග්‍යවතුන් වහන්සේ මේ නම් පැවිදිවතෙකැයි මහාචීවරය දෙකොන් ගෙන ඉදිරිපසින් කය වසා සිටියේසා; එකෙණෙහි තෙරුන් වහන්සේ (මෙසේ) සිතූහ- "භාග්‍යවතුන් වහන්සේ මහාචීවරය පොරවා ම්හාරමාතෘප්‍රාසාදය අරහයා ගමනට අදහස්කළතැන් පටන් නො තැවැත්විය හැකි වන්නාහුය, ඒ එසේ මැයි- බුදුවරයන්ගේ අභිප්‍රායකොපනය නම් එකවාරික සිංහයකු ගැනීම පිණිස අත දිගුකිරීමක් මෙන් ද ප්‍රභින්න වූ (මදඇති) උත්තම හස්තියකු සොඬින් සපශීකිරීමක්

මෙන් ද උග්‍ර තෙජස් ඇති ආශීවිෂයකු ග්‍රීවයෙන් ඇනීමක් මෙන් ද බරෙක් වෙයි; මෙහි දී මැ රමමඝ බ්‍රාහ්මණයාගේ අසපුව පිළිබඳ ගුණ කියා එහි යෑම පිණිස භාග්‍යවතුන් යාඥ කරන්නෙමි" යි; හෙතෙම් එසේ කෙළේයි. එයින් කියනලදී- **අථ ඛෝ ආයස්මා ආනන්දෝ, -පෙ- අනුකම්පං උපාදාය** යනු. එහි **අනුකම්පං උපාදාය**= භාග්‍යවතුන් වහන්සේ හමුයෙන් දැහැමි කථාව අසන්නෙමුයි ඒ අසපුවට ගියාවූ පන්සියයක් භික්ෂූන්ට අනුකම්පා පිණිස, ඔවුන් කෙරෙහි කරුණා කොට යන අර්ථයි. **ධම්මියා කථාය**= දසපෙරුම් අතුරෙන් එක්තරා පාරමිතාවක් පිළිබඳ වූද මහාභිනිෂ්ක්‍රමණය පිළිබඳ වූ ද ගුණ කියමින් හුන්නාහු වෙති; **ආයස්මා** මානෝ= බලමින්; **මම** බුදුයෙමි,යි වහා නො පිවිස යම්තාක් ඕ කථාව නිමායේ ද ඒතාක් සිටියහ යන අර්ථයි. **අඟණළං ආකොටෙසි**= නියගින් කවුළුවෙහි සන් දුන්හ; **විවරිංසු**= කන යොමා ම හුන් බැවින් එසෙණෙහි ම අවුත් විවෘත කළාහුය.

පඤ්ඤත්තෙ ආසනෙ= බුඩකාලයෙහි යම් යම් තැනක එක් භික්ෂුවක් නමුදු වාසය කෙරේ ද, (ඒ) සියලු තැන්හි බුඩාසනය පනවනලද්දේ ම වේ ලු; කුමක් හෙයින ? භාග්‍යවතුන් වහන්සේ වනාහි තමන් වහන්සේ සමීපයෙහි කම්වහන් ගෙන පහසුතැනෙක්හි වාසය කරන්නවුන් "අසවල් මහණ මා සමීපයෙහි කම්වහන් ගෙන ගියේ, විශෙෂයක් නිපදවන්ට හැකිවී හෝ නො වී දැ?" යි මෙනෙහි කරනසේක; එකල්හි ඔහු කම්වහන් හැරදමා අකුශල විතකීයක් විතකී කරන්නහු දකිති, නැවත කෙසේ නම් මා වැනි ශාස්තෘකෙනෙකුන් සමීපයෙහි කම්වහන් ගෙන වාසය කරන්නා වූ මේ කුලපුත්‍රයා අකුශල විතකීයෝ මැඩපවත්වා අවිද්‍යා ග්‍රහ වූ සංසාර දුඃඛයෙහි ගිල්වන්නාහු දැ?යි ඔහුට අනුග්‍රහ පිණිස එහි ම තමන් දක්වා ඒ කුලපුත්‍රයාට අවවාද කොට අභසට පැනනැඟී නැවත තමන් වහන්සේගේ වාසස්ථානයට ම යෙති; එකල්හි මෙසේ අවවාද කරනු ලබන්නා වූ ඒ භික්ෂූහු (මෙසේ) සිතූහු; "ශාස්තෘන් වහන්සේ අපගේ සින දැන අවුත් අප සමීපයෙහි සිටියාවූ ම තමන් දක්වනසේක; එසෙණෙහි වහන්ස! මෙහි හිදගත මැනව මෙහි හිදගත මැනවැයි අසුන් සෙවීම නම් බරෙකැ" යි ඔවුහු අසුනක් පනවා ම වාසය කෙරෙති; යමෙකුට පුටුවක් ඇත්තේ ද හෙතෙම් එය පනවයි, යමෙකුට නැත්තේ ද හෙතෙම් ඇඳක් හෝ සුවරුවක් හෝ කාෂ්ඨයක් හෝ ගලක් හෝ වැලිරැසක් හෝ පනවයි; එය නො ලබන්නාහු පරණලා නමුදු රැස් කොට එහි පාංශුකූලය අතුරා තබත්. මෙහි වූ කලි ප්‍රකෘතියෙන් පනවකලද්දාවූ ම අසුනක් විය. ඒ සඳහා කියනලදී- "**පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි**" යනු. **කාය නු ඛෝ**= කවර කථාවකින් යුක්තව රැස්ව හුන්නාහු වූවහු ද? යන අර්ථයි. "**කාය බෝ**" යි ද පාලි ය, ඇතැම් "මෙහි කවර කථාවකින් (යුක්තව හුන්නාහු) ද?" යනු අර්ථයි. "**කාය නෝ**" යි ද

බුදුනට පැනබූ අස්න.

පාලි ය, ඇගේ පළමු අර්ථය මැයි. **අනනරා කථා=** කම්වහන් මෙනෙහි කිරීම උදෙසීම පිළිබිසිඹි ආදීන්ගේ අතරැ වූ අන් එක් කථාව; **විපස්සනා=** මාගේ පැමිණීම් ප්‍රත්‍යයෙන් නො නිමියාවූ, මුදුන් නො පැමිණියාවූ; **අථ භගවා අනුප්පත්තෝ=** අනතුරුව මේ කාලයෙහි භාග්‍යවතුන් වහන්සේ පැමිණියහ; **ධම්මී වා කථා=** දශකථාවසතු නිශ්‍රිත වූ හෝ ධර්ම කථාව; **අරියෝ වා තූණ්හීභාවෝ=** මෙහි වහාහි විතීයධ්‍යානය ද මූල කර්මස්ථානය ද ආර්‍ය්‍ය (=උත්තම) වූ තූෂ්ණීම්භාවය වෙයි; එහෙයින් ඒ ධ්‍යානය වඩා හුන්නාවූ ද මූලකර්මස්ථානය ගෙන හුන්නාවූ ද මහණ ආර්‍ය්‍යතූෂ්ණීම්භාවයෙන් හුන්නේ යයි දතයුතු.

මෙමා භික්ඛවෙ! පරියෙසනා යි අනුසන්ධි කවරේ ද? ඒ භික්ෂූහු (තථාගතයන්ගේ) සම්මුඛයෙන් ධර්මකථාවක් අසන්නෙමුයි තෙරුන්ව භාරකළාහුය; ඔවුහු එහි හිඳ තිරශ්චීනකථා නො කරන්නෝ වැ දහම් කථාවකින් යුක්තව හුන්හ; එකල්හි භාග්‍යවතුන් වහන්සේ මෝ තොප ගේ පර්‍යේෂණා තොමෝ ආර්‍ය්‍යපර්‍යේෂණා නමැයි දක්වනු පිණිස මේ දෙශනාව ආරම්භ කළහ. එහි **කතමා ච භික්ඛවෙ! අනරියා පරියෙසනා=** මෙහි යම්සේ මාගීයෙහි දක්ෂ වූ පුරුෂයෙක් පළමුකොට හළයුතු අපාය මාගීය දක්වන්නේ වම් හැර දකුණ ගනුව,යි කියා ද, එපරිද්දෙන් භාග්‍යවතුන් වහන්සේ දෙශනා කුශල බැවින් පළමුකොට හළයුතු අනාර්‍ය්‍යපර්‍යේෂණය කියා පසුව අන්‍යය කියන්නෙමි,යි උදෙශයාගේ අනුක්‍රමය බිඳ මෙසේ වදාළහ. **ජාතිධම්මෝ=** උපදින සුභාව ඇත්තේ; **ජරාධම්මෝ=** දිරනසුභාව ඇත්තේ; **ව්‍යාධිධම්මෝ=** ව්‍යාධිසුභාව ඇත්තේ; **මරණධම්මෝ=** මරණසුභාව ඇත්තේ; **සොකධම්මෝ=** ශොකකරන සුභාව ඇත්තේ; **සංකිලෙසධම්මෝ=** කෙලෙසන සුභාව ඇත්තේ; **පුත්තභරියං=** පුත්‍රයෝ ද භාර්‍ය්‍යාව ද; සියලුතැන්හි මේ නයයි. **ජාතරූපරජතං** යන මෙහි වනාහි **ජාතරූප** යනු සුවණ්ණ ය; **රජත** යනු යම් කිසි ව්‍යවහාරයට පැමිණි ලොහොමසු ආදියයි; **ජාතිධම්මා හෙ'තෙ භික්ඛවෙ! උපධයෝ=** මේ පස්කම්ගුණයෝ උපධීහු නම් වෙති, ඔවුහු සියල්ලෝ මැ ඉපදීම සුභාව කොට ඇත්තාහුයයි දක්වනසේක. "ව්‍යාධිධම්ම" වාරාදියෙහි "ජාතරූපරජතය" නො ගන්නාලද; යම්හෙයකින් මේ (ජාතරූපරජතයාගේ) ශීතරොගාදි ව්‍යාධීහු නම් නො වෙත් ද, සබ්බයන්ට මෙන් චුතිසඞ්ඛ්‍යාත මරණය නො වේද, ශොකය නූපදී ද, (එහෙයිනි;) එහෙත් අග්‍රස් ආදි කෙලෙසිලිවලින් කෙලෙසේ නුයි "සංකිලෙස" ධර්මවාරයෙහි ගන්නාලද; එසේ ම සෑතුසමුට්ඨාන හෙයින් "ජාතිධම්" වාරයෙහි ද, මල් හටගෙන දිරන හෙයින් "ජරාධම්" වාරයෙහි ද ගන්නාලදි. **අයං භික්ඛවෙ! අරියා පරියෙසනා=** මහණෙනි! මෝ තොමෝ මැ නිදොස් බැවින් ද ආර්‍ය්‍යයන් විසින් සෙවියයුතු බැවින් ද, "අරියපරියෙසනා" යයි දතයුතු; **අහම්පි සුදං භික්ඛවෙ!** යනු කුමක් හෙයින් ආරම්භ කළසේක් ද? මූලපටන් මහාභිනීෂ්ක්‍රමණය දක්වනු

පිණිස යැ; උන්වහන්සේට මෙසේ (සිතක්) වී ල- "මහණෙනි! මම ද පෙර අනාගත්‍යපයේ‍යෂණය සෙවීම්, ඒ මම එය හැරදමා ආගත්‍යපයේ‍යෂණය (=ආගත්‍යයන් විසින් කටයුතු සෙවීම) සොයා සම්බුදුවට පැමිණියෙමි; පඤ්චවග්ගිය භික්ෂූහු ද අනාගත්‍යපයේ‍යෂණය සෙවූහ, ඔවුහු එය හැර ආගත්‍යපයේ‍යෂණය සොයා ක්ෂීණාශ්‍රව භූමියට පැමිණියාහුය. තෙපි ද මාගේ හා පස්වගුන්ගේ ද මඟට නැංගාහුය; ආගත්‍යපයේ‍යෂණාව තොපගේ පයේ‍යෂණාව යයි මූලපටන් තමන් වහන්සේගේ මහානිෂ්ක්‍රමණය දක්වනු පිණිස මේ දෙශනාව ආරම්භ කළහ.

එහි දහරොව සමානෝ= තරුණ වූයේ ම; **සුසුකාළකෙසෝ**= මොනොවට කළුවූ කෙස් ඇත්තේම් අදුන්වන් කෙස්ඇති වැ යන අර්ථයි, **භද්‍රෙන**= සිත්කලු වූ; **පඨමෙන වයසා**= පුන් වයස් අතුරෙන් පළමුවන වයසින්; **අකාමකානං**= නො කැමති වන්නවුන්ට; අනාදරාර්යෙහි සාමිවචනයි. මූහුණෙහි කඳුලු වූවාහු මොවුන්ගේ නුයි "අස්සුමුඛ" නම් වෙති, **තෙසං අස්සුමුඛානං**= ඒ කඳුලු වලින් තෙත්වූ මූහුණු ඇත්තවුන්ට; යන අර්ථයි. **රුදනානං**= හඬා කඳුලු වගුරුවන්නවුන්ට; **කිං කුසලගවෙසී**= කුසලය කිමැ? යි සොයන්නෙම්; **අනුත්තරං සන්තිවරපදං**= උත්තම වූ ශානතිසඞ්ඛ්‍යාත වරපදය, නිර්වාණය සොයමින් යන අර්ථයි. **ඉෙන ආළාරෝ** යන මෙහි **ආළාරෝ** යනු ඔහුගේ නමයැ; හෙතෙම දීඝනිකාය පෙළ ල, එහෙයින් ඔහට "ආළාර" යන නම වී ල; **කාලාමෝ** යනු ගොත්‍ර යයි; **විහරනා'යස්මා**= ආයුෂ්මත් තෙම වාසය කෙරේවා; **යංනූ විඤ්ඤූ පුරිසෝ**= යම් ධර්මයෙක්හි පණ්ඩිත පුරුෂයෙක් තෙම; **සකං ආචරියකං**= තමාගේ ආචාර්‍යසමය; **උපසම්පජ්ජ විහරෙය්‍ය**= පිළිලැබ වාසය කරන්නේය; මෙතෙකින් ඔහු විසින් අවකාශය කරනලද වෙයි. **තං ධම්මං**= ඒ ඔවුන්ගේ සමයපෙල; **පරියාපුණිං**= අසා ම ඉගෙන ගතිමි; **ඔඤ්ඤහනමත්තෙනන්**= ඔහු විසින් කියනලද්ද පිළිගැනීම පිණිස තොල්පැහැරීම් පමණින්, ඔඤ්ඤාබ කොට තොල්හැසිරවීම් පමණකින් යන අර්ථයි. **ලපිතලාපනමත්තෙනන්**= ඔහු විසින් කියනලද්දට ප්‍රතිලපන (=පෙරලා කියන) මාත්‍රයකින්; **ඤාණවාදං**= දනිමි යන වචනය; **ථෙරවාදං**= ස්ථිරභාවවාදය; මම මෙහි ස්ථිර වෙමි යන මේ වචනය; **අහං චෙව අඤ්ඤෙ ච**= හුදු මම නො වෙමි, බොහෝ අන්‍යයෝ ද මෙසේ කියති; **සෙවලං සද්ධාමත්තකෙන**= නුවණින් ප්‍රත්‍යක්ෂ නො කොට ශුද්ධවූ ශ්‍රද්ධාමාත්‍රයකින් ම; බෝසත් වහාහි වචනයෙන් ධර්මය උද්ග්‍රහණය කරන්නේ ම කාලාම විසින් වචනයෙන් ප්‍රගුණකළ පමණක් නො වෙයි, මේ ධර්මයෙහි මේ තෙම එකාන්තයෙන් සපතසමාපත්තිලාභී යයි දැනගත්තේය; එහෙයින් ඔහට මේ ඝිත වය. **ආකිඤ්චඤ්ඤායතනං පඤ්ඤපෙසි**= ආකිඤ්චඤ්ඤායතනය අවසන් කොට ඇති සත්සමවත් මුල

ආලාරකාලාම නවුසංකර ඵලඹීම.

දැන්වීය; සඛා= මේ සප්තසමාපත්තීන්ගේ ඉපදවීම පිණිස ශ්‍රද්ධාව; විදිතා දියෙහි දූ මෙම නයයි. පදහෙය්‍යං= ප්‍රයොගය (=වැයම) කරන්නෙමි; නවිරසෙසෙව නං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසිං= බෝසත්තෙම වියත්‍වය දැඩිකොට ගත නො බෝකලකින් ම සත්රන් හිනිපෙලක් ගළපන්නෙකු මෙන් සත්සමවත් ඉපදවී; එහෙයින් මෙසේ වදාළහ. ලාභා නො ආවුසො!= මේ කාලාම තෙම ඊර්ෂ්‍යා නො කරන්නෝ ල, එහෙයින් මේ අධුනාගත තෙම කුමැයි කොට මේ ධර්මය ඉපදවී දැ?යි ඊර්ෂ්‍යා නො කොට පැහැදුනේ ප්‍රසාදය ප්‍රකාශ කරමින් මෙසේ කී. උභොව සන්තා ඉමං ගණං පරිහරාම= මේ සමූහය තෙම මහත් ය, දෙදෙන ම පරිහරණය කරමුයි කියා ගණයාට සන් දුනි- "මම ද සත් සමවත් ලාභී වෙමි, මහාපුරුෂ තෙමේ ද සත්සමවත් ම ලාභී වෙයි, මෙතෙක් දෙන නම් මහාපුරුෂයා වෙත පිරියම් උගනිවු, මෙතෙක් මා වෙත උගනිවු" යයි මධ්‍යයෙහි බෙදා දුන්නේයි. උළාරා= උතුම්වූ; පූජා= කාලාමගේ උපස්ථායක වූ සත්‍රිහු ද පුරුෂයෝ ද ගදමල් ආදිය ගෙන එත් ල, කාලාම තෙම යවූ මහපුරිසා පුදවු යයි කියායි, ඔවුහු ඔහු පුදා යමක් ඉතිරි වේද, එයින් කාලාමයන් පුදති, මාහැඟිවූ ඇඳ පුටු ගෙන එති, ඒවා ද මහපුරිසාට දෙවා ඉදින් අවශෙෂයක් වේ නම් තෙමේ ගනී, ගිය ගිය තැන උතුම් සෙනස්න බෝසතුන්ට පමුණුවා සෙස්ස තෙමේ ගනී; මෙසේ උතුම්වූ පූජාවෙන් පිදී. නා'යං ධම්මෝ නිබ්බිදාය යනාදියෙහි මේ සප්තසමාපත්ති ධර්මය සසර කලකිරීම පිණිස නො මැ පවතී, නො ඇලීම පිණිස නො පවතී, රාගාදීන්ගේ නිරොධය පිණිස නො පවතී, කෙලෙස් සන්සිඳීම පිණිස නො පවතී, අභිඥෙය ධර්මය දැනගැනීම පිණිස නො පවතී, සතර මාගීාවබොධය පිණිස නො පවතී, නිවන් පසක්කිරීම පිණිස නො පවත්නේය යන අර්ථයි ඡාව දෙව ආකිඤ්චඤ්ඤායතනූපපත්තියා= කල්ප සැටදහසක් ආයු ප්‍රමාණය ඇති ආකිඤ්චඤ්ඤායතන භවයෙහි ඉපදීම යම්තාක් ද, ඒ තාක් පවතී, එයින් මත්තෙහි නො පවතී; මෙසේ මේ තෙම නැවත පෙරලා එන සුවහාවයෙක් ම වෙයි, තවද- යම් තැනකට පමුණුවා නම් එය ජාති ජරා මරණයන්ගෙන් නො මිදුනේ ම වෙයි, මාරපාසයෙන් වටකරන ලද්දේ ම යයි; නැවත එතැන් පටන් මහසත්තෙම යම්සේ බඹසහින් පෙළෙන පුරුෂයෙක් මනහර හොජනයක් ලැබ අතිශයින් ප්‍රියකරනු ලබන්නේ නමුදු වලඳ, පිත්වශයෙන් හෝ සෙම් වශයෙන් හෝ මැස්සන් වශයෙන් හැරදමා නැවත එක් පිඬකුදු වලඳන්නෙමි,යි සිත් නුපදවා ද, එපරිද්දෙන් ම මේ සත්සමවත් මහත්වූ වැයමින් උපදවා ද ඒ සමවත්හි මේ පුනරාවර්තනාදි හෙද ඇති ආදීනවය දැක නැවත මේ ධර්මය ආවර්ජනා කරන්නෙමි හෝ සමවදින්නෙමි හෝ ඉවත්නෙමි හෝ නැගිසිටින්නෙමි හෝ ප්‍රත්‍යවෙක්ෂා කරන්නෙමි හෝ,යි සිතක් මැ නො ඉපදවී. අනලං කම්මිකා= මෙයින් කම් නැත මෙයින් කම් නැතැයි නැවත නැවත පමණ කොට; නිබ්බිජ්ජ= කලකිරී; අපක්කමිං= ගියෙමි.

න ඛෝ රාමෝ ඉමං ධම්මං යන මෙහි ද බෝසත්තෙම ඒ ධර්මය උද්ග්‍රහණය කරන්නේ ම "මේ අවසමවත්දහම් උදුකතවුසා විසින් වචනයෙන් උගත් පමණ ම නො වෙයි, වැලි එකාන්තයෙන් මේ තෙම අෂ්ටසමාපත්තිලාභී" යයි දැනගත්තේය; එහෙයින් ඔහුට මේ සිත විශ- **න ඛෝ රාමෝ** -පෙ- **ජානං පස්සං විහාසි** යී. මෙහි සෙස්ස පළමු වාර යෙහි කී නියෙන් ම දතයුතු.

සෙය්‍යථා උරුවෙලා සෙනානිගමෝ යන මෙහි **උරුවෙලා**= මහත් වූ වෙලා (= සමූහය,) මහාවැලිරැස යන අර්ථයි; නොහොත් "උරු" යී වැලි කියනු ලැබේ. "වෙලා" යී මය්‍යාදුව (කියනු ලැබේ.) **මය්‍යාදුව** ඉක්ම වීම් හෙතුවෙන් ගෙනඑනලද වැලි "උරුවෙලා" යී මෙසේත් මෙහි අරුත් දතයුතු. මේ අසනු ලැබේ- අතීතයෙහි බුදුන් නුපන්කල

උරුවෙලා. දසදහසක් කුලපුත්‍රයෝ තවුස් පැවිද්දෙන් පැවිදිව ඒ පෙදෙස්හි වාසය කරන්නාහු එක් දිනක් රැස්ව කතිකවතක් කළාහුය- "කාමසකම් වාක්කාමියෝ නම් අන්‍යයන්ට ද ප්‍රකට වෙති, එහෙත් මනඃ කාමිය අප්‍රකට යැ, එහෙයින් යමෙක් කාමවිතර්කියක් හෝ ව්‍යාපාදවිතර්කියක් හෝ විහිංසාවිතර්කියක් හෝ විතර්කී කෙරේ ද, ඔහුට අනිත් චොදකයෙක් නම් නැති, හෙතෙම තමා මැ තමාහට චොදනා කොට කොලගොටුවකින් වැලි ගෙනවුත් මේ තැන්හි විසුරුවාවා මේ ඔහුට දඬුවම්මැ" යි. එතැන් පවන් යමෙක් එබඳු විතර්කියක් විතර්කී කෙරේ ද, හෙතෙම එහි කොලගොටුවකින් වැලි විසුරුවයි; මෙසේ එහි අනුක්‍රමයෙන් මහාවැලිරැසක් විය ඊට පසු පශ්චිමජනතාව එය පිරිකෙව් කොට චෛත්‍යසථානයක් කෙළේයි. ඒ සඳහා කියනලදී- **"උරු වෙලා**= මහත්වූ සමූහය, මහාවැලිරැස යන අර්ථයැ" යනු. ඒ සඳහා ම කියනලදී- "නොහොත් උරු යී වැලි කියනු ලැබේ, වේලා යී මය්‍යාදුව කියනු ලැබේ, මය්‍යාදුව ඉක්මවීම් හෙතුවෙන් ගෙනඑනලද වැලි උරු වෙලා යී මෙසේත් මෙහි අරුත් දතයුතුයැ" යනු.

සෙනානිගමෝ= සෙනාවගේ නියම්ගම; එ තැන්හි ප්‍රථම කල්පක යන්ගේ සෙනාවිවෙසය වී ල; එහෙයින් ඒ පෙදෙස "**සෙනානිගම**" යී

සෙනානිගම. කියනු ලැබේ. **සෙනානිභාමෝ** යී ද පාඨයි, "සෙනානි" නම් සුජාතාවගේ පියායි; ඔහුගේ ගම යැ යන අර්ථයි.

නදවඤ්ඣං= එහි ගියෙම්; **රමණීයං භූමිභාගං**= සුපිපි නන් වැදුරුම් ගොඩ භටගන්නා මලින් විසිතුරු වූ මනරම් වූ බිම් පෙදෙස; **පාසාදිකං ච වනසණ්ඩං**= මොනරපිල්කලඹක් වැනි ප්‍රසාද උපදවන වනලැහැබ ද දුටුවෙම්; **නදිං ච සන්දන්තිං**= ගලාබසින්නා වූ මිණිකදක් වැනි විමල්නිල්සිහිල්සිලිල්ඇති නෙරඤ්ජරා නදිය ද දුටුවෙම්; **සෙතකං**= පිරිසුදු වූ මඩරහිත වූ; **සුපතිත්ථං**= පිළිවෙළින් ගැඹුරු සොඳුරු තොට වලින් යුකත වූ; **රමණීයං**= රිදීපවක් මෙන් විසුරුණුවැලි ඇති බොහෝ

මස්කැසුබන් ඇති සිත්කලු දැකුම් ඇති; **සමණානා ච ගොචරගාමං**= ඒ පෙදෙස භාත්පස නො දුරෙහි ගමනා ගමන සම්පන්න වූ පැමිණි පැවිද්දන්ට සුලභපිණ්ඩය ඇති ගොචරග්‍රාමය ද දුටුයෙමි; **අලංවතා**= එකාන්තයෙන් සමර්ථ යැ; **තත්‍රේව නිසීදිං** යනු බෝපලඟැ හිඳීම සඳහා වදුලහ; ඒ එසේ මැයි- උපරිසූත්‍රයෙහි **තත්‍රේව** යි දුෂ්කාරක්‍රියා ස්ථානය අදහස් කරනලද; මෙහි වූ කලි බෝපලඟැ (හිඳීමයැ;) එයින් වදුලහ- "තත්‍රේව නිසීදිං" යනු. **අලමිදං පධානාය**= මේ ස්ථානය ප්‍රධන්වියයි පිණිස සමර්ථ යයි මෙසේ සිතා හුන්නෙමි යන අර්ථයි. **අජ්ඣගමං**= අධිගමය කෙළෙමි, ලැබිමි; **ඤාණං ච පන මෙ දස්සනං**= සියලු ධර්මයන් දැකීමෙහි සමර්ථ වූ මාගේ සර්ව්ඥතාඥානය ද ලාභය. පහළවිය; **අකුප්පා මෙ විමුත්ති**= මාගේ අර්හත්ඵල විමුක්තිය අකොප්‍ය බැවින් ද අකොප්‍ය වූ අරමුණු ඇති බැවින් ද අකොප්‍ය යැ; සැබව- ඕ විමුක්තිය රාගාදීන් විසින් නො කිපේ හුයි අකොප්‍ය බැවින් ද "අකුප්පා" නමු; අකොප්‍ය වූ **නිවන** ඇගේ අරමුණ හුයි අකොප්‍යාලම්බණ බැවින් ද "අකුප්පා" නමු. **අය මන්තිමා ජාති**= මෝ සියල්ලට පශ්චිම වූ ජාති යයි; **නත්ථිදානි පුනබ්භවෝ**= දැන් මාගේ නැවත ප්‍රතිසන්ධියක් නම් නැතැයි මෙසේ පස්විකුම් හුවණ ද මට උපන්නැයි දක්වන්නේක. **අධිගතෝ**= ප්‍රතිවෙධ කරනලද; **ධම්මෝ**= චතුස්සත්‍ය ධර්මය; **ගම්භීරෝ**= මේ ප්‍රකට බවට ධර්මාභිසමය. ප්‍රතිපක්ෂ වචනයෙකි; **දුද්දසෝ**= ගැඹුරුබැවින් ම දුදීශ යැ, දුකසේ දැක්කයුතු යැ; සුවසේ දක්නට නො හැක; දුකසේ දැක්කයුතු බැවින් ම **දුරනුබෝධෝ**= දුකසේ අවබොධ කළයුතු යැ, සුවසේ අවබොධ කරන්ට නො හැක; **සණ්හෝ**= නිවුනේ යැ; **පණීතෝ**= අතෘප්තිකර යැ; මේ (පද) මය ලොකොත්තර ධර්මය සඳහා ම වදුරනලද. **අනක්කාවචරෝ**= තර්කයෙන් පැමිණිය යුත්තේ, බැසගත යුත්තේ නො වෙයි; හුවණින් ම පැමිණිය යුත්තේ යැ; **නිපුණෝ**= සිලුටු යැ; **පණ්ඩිතවෙදනීයෝ**= සම්‍යක් ප්‍රතිපත්තියට පිළිපන් පණ්ඩිතයන් විසින් දතයුතු යැ; **ආලයරාමා**= සත්ත්වයෝ පඤ්චකාමගුණයෙහි ඇලෙති, එහෙයින් ඒ (පඤ්චකාමගුණයෝ) "ආලය" යි කියනු ලබත්; එක්සියඅටක් තෘෂ්ණා විචරිත යෝ (සත්ත්වයන්) අලවති, එහෙයින් "ආලය" යි කියනු ලබත්. ඒ (පඤ්චකාමගුණ සඞ්ඛ්‍යාත් වූ ද තෘෂ්ණා සඞ්ඛ්‍යාත වූ ද) ආලයයන් කරණකොටගෙන ක්‍රීඩා කෙරෙත් හුයි "ආලයාරාම" නම් වෙති; ආලයයන්හි ඇලුනාහු හුයි **ආලයරතා** යැ; ආලයයන්හි මොනොවට මුදිත වූවාහු හුයි **ආලයසම්මුදිතා** යැ; ඒ එසේ මැයි- යම්සේ මොනොවට සරසනලද මල්පලඹර වූ වෘක්ෂාදියෙන් සමන්විත වූ උයනකට පිවිසි රජතෙම ඒ ඒ සම්පත්තියෙන් සිත් අලවා වෙසේ ද, අතිශයින් සතුටු වූයේ ආමොදිත ප්‍රමොදිත වූයේ වේද, උකටලි නො වේද, සවස පවා නික්මෙන්ට නො කැමති වේද, එපරිද්දෙන් මේ කාමාලය තෘෂ්ණාලයයන් කරණකොට ගෙන ද සත්ත්වයෝ ඇලෙති, සංසාර

වෘත්තයෙහි අතිශයින් සතුටුවූවාහු උකටලි නොවැ වෙසෙති; එහෙයින් භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ට විවිධ වූ ම ආලය ය උදාහරණයක් මෙන් දක්වනසේක් "ආලයරාමා" යනාදිය වදාළහ. **ඉදඤ්** යනු නිපාත යැ; ඔහුගේ- සථානය සඳහා "ඉං + ඉදං" යි ද, ප්‍රතීත්‍යසමුත්පාදය සඳහා "යො + අයං" යි ද, මේ අර්ථය දතයුතු. **ඉදප්පච්චයතා පටිච්චසමුප්පාදෙ**= මොවුන්ගේ ප්‍රත්‍යයෝ "ඉදප්පච්චයා" නම් වෙති, "ඉදප්පච්චයා එව= ඉදප්පච්චයතා" (= ඉදප්‍රත්‍යයෝ ම ඉදප්පච්චයතා) නමු; ඉදප්පච්චයතා වූවා ද ඕ යැ පටිච්චසමුප්පාද වූයේ ද හේ නුයි "ඉදප්පච්චයතා පටිච්ච සමුප්පාද" නම් වේ. සංඝකාරාදීන්ට ප්‍රත්‍යය වූ අවිද්‍යාදීන්ට මේ නමෙකි. **සබ්බසඞ්ඛාරසමථෝ** යනාදි සියල්ල නිර්වාණය මැයි; සැබව- යම්හෙයකින් ඒ නිවනට පැමිණ සියලු සංඝකාර විප්‍රපන්දිතයෝ සන්සිඳෙත් ද, වෙසෙසින් සන්සිඳෙත් ද, එහෙයින් "සබ්බසඞ්ඛාරසමථ" යයි කියනු ලැබේ. තවද- යම්හෙයකින් එයට පැමිණ සියලු උපධීහු දුරලනලද්දාහු වෙත් ද, සියලු තෘෂ්ණාවෝ ක්ෂයවෙත් ද, සියලු කෙලෙසරාගයෝ නො ඇලෙත් ද, සියලු දුක නිරුඬ වේද එහෙයින් **සබ්බූපධිපටිනිස්සග්ගෝ තණ්හක්ඛයෝ විරාගෝ නිරොධෝ** යි කියනු ලැබේ. ඕ තෘෂ්ණාව මැලිත් භවයෙන් භවය ඵලය සමග හෝ කර්මය ගළපයි, වෙසෙසින් ගලපා නුයි කොට "වාන" යයි කියනු ලැබේ; ඒ වානයෙන් නික්මුනේ නුයි **නිබ්බාන** නම්; **සෝ වත'ස්ස කිලමථෝ**= නො දන්නවුන්ට යම් දෙශනාවක් නම් වූ ද, හේ මට කලමථයෙක් වන්නේය, ඕ මට වෙහෙස ක් වන්නේය යන අර්ථයි; සැබට කලානතයෙක් හා සැබට වෙහෙසක් ද වන්නේ යයි කියනලද වෙයි; එහෙත් සිතෙහි මේ දෙක ම බුදුවර යන්ට නැති. **අපිඤ්ඤ** යනු අනුබ්‍රූහනාර්ථයෙහි නිපාත යැ; ඒ (නිපාතය) නුදෙක් තෙල (දැක්වූ) සිත වූයේ නො වෙයි, මේ ගාථා ද වැටහුනාහු යයි දක්වයි. **මං**= මට; **අනජ්ඣභාසි**= "අනු + අජ්ඣභාසි" (= අතිශයින් ආශ්චර්‍ය්‍ය වූ;) **පටිභංසු**= ප්‍රතිභාන සඞ්ඛ්‍යාත වූ නුවණට ගොචර වූහ; **ඒවරූපිය** යුතුබවට පැමිණියාහුය.

කිලෙජන= දුකසේ; දුඃඛ ප්‍රතිපදාවෙන් නො වේ. ඒ එසේ මැයි— බුදුවරයන්ගේ සතර මාගීයෝ මැ සුඛප්‍රතිපදා ම වෙති; එහෙත් පැරැම් පුරන කාලයෙහි රාගසහිත - ද්වේෂසහිත - මොහසහිත වූ ම ආ ආ යාචක යන්ට අලඞ්කාරයෙන් සත්කාරනලද හිස ගළවා ගලලොහිතය බැහැර කොට මොනොවට අදනාලද ඇස් උපුටා කුලවංශය බබුලුවන පුත්‍ර යැ මනාපචාරිනී වූ භාර්‍යා යැ යන මේ ආදිය දෙන්නහුගේ අන්‍ය වූ ද ක්ෂානතිවාදී සදෘශ වූ ආත්මභාවයන්හි සිදුම් බිඳුම් ආදියට පැමිණෙන්න හුගේ පැමිණිය යුතු පිළිවෙත සඳහා මේ වදාරන ලදී. **හලං**= මෙහි "හ" කාරය නිපාතමාත්‍රයැ; "අලං" (= කම්නැත) යන අර්ථයි. **පකාසිතුං** දෙශනා කරන්ට; මේසේ දුකසේ අධිගමය කරනලද ධර්මය දෙශනා කරන්ට කම් නැත, දෙශනා කරනලද්දෙන් කවර ප්‍රයොජන ද? යි

කියනලද වෙයි; **රාගදෙසපරෙතෙහි**= රාගවෙෂයන්ගෙන් සපෂී කරන ලද්දවුන් විසින්; නොහොත් රාගවෙෂයන් අනුව ගියවුන් විසින්; **පඨි සොතගාමිං**= අනිත්‍ය යැ දුඃඛ යැ අනාත්ම යැ අශුභ යැයි මෙසේ නිත්‍යා දීන්ගේ ප්‍රතිස්‍රොතසට ගිය චතුස්සත්‍ය ධර්මය; **රාගරත්තා**= කාමරාග යෙන් ද භවරාගයෙන් ද දෘෂ්ටිරාගයෙන් ද, ඇලුනාහු; **න දක්ඛිනති**= අනිත්‍ය යැ දුඃඛ යැ අනාත්ම යැ අශුභ යැයි මේ සවභාවයෙන් නො දක්නා හුය; නො දක්නාවූ ඔවුන්ට මෙසේ ගන්වන්ට කවරෙක් හැකිවන්නේ ද? **තමොකඛන්ධෙන ආවටා**= අවිද්‍යාරාශියෙන් පැතිරෙන ලද්දාහු; **අපෙපාසසුක්කතනාය**= උත්සාහරහිත බැවින්; නො දෙසනු කැමති බැවින් යන අර්ථයි. වැලි කුමක් හෙයින් උන්වහන්සේගේ සිත මෙසේ නැමුනේ ද යත්? මේ (තථාගතයන් වහන්සේ මම කෙලෙසුන් කෙරෙන්) මිදුනෙම් (සත්වයන්) මුදන්නෙමි, තරණය කෙළෙම් (සත්වයන්) තරණය කරවන්නෙම්-

148. **"කිං මේ අඤ්ඤාතවෙසෙන - ධම්මං සච්ඡිකතෙනිධ?**
සබ්බඤ්ඤුතං පාපුණිත්වා - තාරයිසසං සදෙවකෙ" යි-

ප්‍රාර්ථනා කොට පැරැමි පුරා සම්බුදුබවට පැමිණියාහු නො ද යත්? මේ සැබව- එහෙත් ප්‍රත්‍යවෙක්ෂානු භාවයෙන් උන්වහන්සේගේ සිත මෙසේ නැමුනේය; ඒ එසේ මැයි- සම්බුදුබවට පැමිණ සත්වයන්ගේ කෙලෙශහරණය ද ධර්මයාගේ ගම්භීරත්වය ද ප්‍රත්‍යවෙක්ෂා කරන්නා වූ උන්වහන්සේට සත්වයන්ගේ කෙලෙස් ගහණබව ද ධර්මයාගේ ගැඹුරු බව ද සර්වාකාරයෙන් ප්‍රකට වූවාය; එකල්හි උන්වහන්සේට "මේ සත්වයෝ කාඩිපිරු ලබුකබල් මෙන් මෝරුපිරු සැළ මෙන් වුරුණුතෙල් උරා ගත් රෙදිකඩ මෙන් අඳුන්වැකුණු අතක් මෙන් කෙලෙශහරිතයහ, ඉතා සංකලිෂ්ටයහ, රාගයෙන් රක්තයහ, වෙෂයෙන් දුෂ්ටයහ, මෝහයෙන් මූඪයහ, ඔවුනු කුමක් නම් ප්‍රතිවෙධ කරන්නාහු ද?" යි සිතන්නහුට කෙලෙස් ගහණබව ප්‍රත්‍යවෙක්ෂා කිරීමෙහි අනුභසින් ද මෙසේ සිත නැමුනේය. තවද- මේ ධර්මය තෙම පෘථිවිසන්ධාරකජලසකන්ධය සෙයින් ගැඹුරු යැ, පර්වතයකින් වසා තුබූඅඹරෙක් සෙයින් නො දැක්කහැකියැ, සියපරිද්දෙකින් පළනලද අස්ලොමක්හුගේ කොනින් කොන ගැළපීම මෙන් අවබෝධ නො කළහැකියැ; ඒ එසේ මැයි- මේ ධර්මය ප්‍රතිවෙධ කරන්ට වැයම්කරන්නා වූ මා විසින් නො දුන් දනක් නම් නැත්තේ නො වේ ද, නො රැකි සීලයක් නම්- නො පිරූ කිසි පාරමිතාවක් නම්

---

148. **ඉධ**= මේ ශාසනයෙහි (භික්ෂුවක් මෙන්) **අඤ්ඤාතවෙසෙන**= අප්‍රකට වූ වෙසයෙන්; **ධම්මං**= සිව්සස් දහම්; **සච්ඡිකතෙන**= ප්‍රත්‍යක්ෂ කරනලද්දවූ; **මෙ**= මා විසින්; **කිං**= කවර ප්‍රයෝජන ද? **සබ්බඤ්ඤුතං**= සම්බුදුබවට; **පාපුණිත්වා**= පැමිණ; **සදෙවකෙ**= දෙවියන් සහිත වූ සත්වයන් හෝ ලෝවැසියන්; **තාරයිසසං**= තරණය කරවන්නෙමි.

නැත්තේ නො වේද; ඒ මා නිරුත්සාහයෙන් ම මරණසෙනග විධ්වංසනය කරන්නහුට ද, පොළොව කම්පා නොවූ, පෙරයමැ පෙරවිසූ කඳපිළිවෙළ සිහිකරන්නහුට ද කම්පා නො වූ, මැදුම්යමැ දිවැස පිරිසුදු කරන්නහුට ද කම්පා නොවූ, පසුයමැ ප්‍රතීත්‍යසමුත්පාදය ප්‍රතිවෙධ කරන්නාවූ ම මාහට දශසහස්‍රී ලොකධාතුව කම්පා වුව; මෙසේ මාබඳු වූ තියුණු නුවණැත්තෙකු විසිනුදු දුකසේ ම මේ ධර්මය ප්‍රතිවෙධ කරනලද්දේය; එය ලෞකික මහාජන යෝ කෙසේ ප්‍රතිවෙධ කරන්නාහු දැ? සි දහම්ගැඹුරු බැව් ප්‍රත්‍යවෙක්ෂා කිරීමෙහි ආනුභාවයෙන් ද මෙසේ සිත නැමේ යයි දතයුතු- තවද- බඹහු විසින් අයැදිසඳ උන්වහන්සේගේ දෙසනුකැමති බැවින් ද මෙසේ සිත නැමුනේය; සැබව- භාග්‍යවතුන් වහන්සේ "මාගේ සිත අලෙනාතසුඛභාවයට නැමෙන කල්හි මහාබ්‍රහ්මතෙම ධර්මදේශනාවට යාඥා කරන්නේය, මේ සත්වයෝ ත් බ්‍රහ්මගරුකයෝ ය, ඔවුහු ශාස්තෘන් වහන්සේ දහම් නො දෙසනුකැමති වූවාහු ලු, එකල මහබඹු උන්වහන්සේ අයැද දේශනා කරවී ලු, භවත්නි! එකාන්තයෙන් ධර්මය ශාන්ත යැ ප්‍රණීත යැයි සිතමින් අසනු කැමති වන්නාහු ය" සි දන්නා සේක; මේ කාරණය නිසා ද උන්වහන්සේගේ සිත අලෙනාතසුඛභාවයට නැමුනේය; ධර්මදේශනාවට නො නැමුනේ යයි දතයුතු. **සහම්පතිස්ස**= මේ අසනු ලැබේ- හෙතෙම කාශ්‍යප භාග්‍යවතුන්ගේ ශාසනයෙහි සහක නම් සඵවිර විය, පළමුවන දෑහැන් උපදවා ප්‍රථමධ්‍යාන භූමියෙහි කලපායුෂක මහාබ්‍රහ්ම වැ උපන, එහි දී ඔහු "සහම්පති මහාබ්‍රහ්ම" යයි හඳුනති; ඒ සඳහා කිහ. "බ්‍රහ්මුනෝ සහම්පතිස්ස" යනු. **නස්සති වත**= හෙතෙම මේ ශබ්දය බ්‍රහ්මාරාධනාව. යම්සේ දශසහස්‍රී ලොකධාතුවෙහි බ්‍රහ්මයෝ අසා සියල්ලෝ රැස්වූවාහු ද, එපරිද්දෙන් නික්මවී ලු; **යඤ්හි නාම**= යම් ලොකයෙක්හි නම්; **පුරතෝ පාතුරහොසි**= ඒ දසදහසක් බ්‍රහ්මයන් සමඟ පහළ විය; **අප්පරජක්ඛජාතිකා**= ප්‍රඥාමය ඇසෙහි අල්ප වූ මද වූ රාගවෙෂමොහ නමැති රජස් මොවුන්ගේ (කුසි අපරජක්ඛ නම් වෙති,) මෙබඳු සවභාව ඇත්තාහු කුසි "අපරජක්ඛජාතික" නම් වෙත්. **අස්සවනතා**= නො අසනබැවින්; **භවිස්සන්ති**= පූර්ව බුදුවරයන් කෙරෙහි දශපුණ්‍යක්‍රියා වශයෙන් කළ අධිකාරඇති මුහුකුරාගිය පියුම් හිරුරැස්පහස මෙන් දම්දෙසුන් මැ කැමති වෙමින් සතරපද ගාථාවසානයෙහි ආර්‍ය්‍ය භූමියට බැසගැනීමට සුදුසු වූවාහු එකෙක් දෙදෙනෙක් නො වෙති, නොයෙක් සියදහස් ගණන් දහම් අවබොධ කරන්නාහු වන්නාහු යයි දක්වයි.

පාතුරහොසි= පහළ විය; **සම්ලෙහි චිත්තනිනෝ**= (කෙලෙස්) මල සහිත වූ ෂට් ශාස්තෘන් විසින් සිතනලද; ඔවුහු වනාහි ඉතා පළමුව ඉපිද සියලු දඹදිවැ කටු පතුරුවන්නවුන් මෙන් ද විෂ ඉසින්නවුන් මෙන් ද කෙලෙස්මල සහිත වූ මිසදිටු දහම් දෙසූහ. **අවාසුරෙහං**= මේ

විවෘත කරනුමැන; **අමතස්ස ද්වාරං**= අමෘතනිර්වාණයාගේ ද්වාරය වූ ආර්ය්‍ය මාර්ගය; **සුණන්තු ධම්මං විමලේනානුබුද්ධං**= භාග්‍යවතුන් වහන්ස! පළමු කොට මේ සත්වයෝ රාගාදිමලයන්ගේ අභාවයෙන් නිර්මල වූ සම්‍යක්සම්බුද්ධයන් විසින් අවබෝධ කරනලද චතුස්සත්‍ය ධර්මය අසත්වා,සි යාදෙ කෙරෙයි; **සෙලේ යථා පබ්බතමුද්ධනිට්ඨිතෝ**= ශෛලමය වූ එකඝන වූ පර්වතමස්තකයෙක්හි සිටි එකෙකු මෙන්; එහි සිටියහුගේ දැකීම පිණිස ගෙල එසවීම් දිගුකිරීම් ආදි කවයුත්තෙක් නො ම ඇති; **තූපමං**= තත් ප්‍රතිභාග වූ ශෛලපර්වතයකට බඳු උපමාඇති; මේ වනාහි මෙහි සංක්ෂේපාර්ථ යයි- යම්සේ ශෛල පර්වත මස්තකයෙක්හි සිටියාවූ ම ඇස් ඇති පුරුෂයෙක් භාත්පසින් ජනසමූහයා දක්නේ ද, එපරිද්දෙන් ඔබ ද; **සුමේධ**= සුන්දර ප්‍රඥාඇති සම්පන්නචක්ෂුස් වූ භාග්‍යවතුන් වහන්ස! **ධම්ම මයං**= ප්‍රඥාමය වූ; පහයට නැඟී තෙමේ පහවූ ශොකඇත්තේ ශොකයට බැසගත්තාවූ ජාති ජරාවෙන් මඩනාලද ජනසමූහයා; **අවෙක්ඛස්සු**= බලනුමැන, පරීක්ෂා කරනුමැන; මේ වනාහි මෙහි අදහසයැ- යම්සේ වනාහි පර්වතපාදයෙක්හි භාත්පස මහත් වූ කෙතක් කොට එහි ලියදි පඬුකතීන්හි පැල් කොට රාත්‍රියෙහි ගිනි දල්වන්නාහු ද, චතුරඞ්ගයෙන් සම්පන්න වූ අන්ධකාරයත් වන්නේ ද, එකල්හි ඒ ගල්මතුයෙහි සිට බිම බලන්නාවූ ඇස් ඇති පුරුෂයෙකුට කෙත නො මැ පෙනේ ද, ලියදි පඬුකතීහු නො පෙනෙත් ද, පැල් නො පෙනෙත් ද, එහි ශයනය කළ මනුෂ්‍යයෝ නො පෙනෙන්නාහු ද; වැලි පැල්වල ගිනිදැල් පමණෙක් ම පෙනෙන්නේ ද, එපරිද්දෙන් දහම් නමැති පහයට නැඟී සත්ත්වසමූහයා බලන්නාවූ තථාගතයන් වහන්සේට යම් ඒ නො කළ කුසල් ඇති සත්වයෝ වෙත් ද, ඔවුහු එක් වෙහෙර දකුණුදණ්ඩලුපස හුන්නාහු නමුදු බුදුඇස හමුවට නො පැමිණෙති; රාත්‍රියෙහි විදිනලද ඊතල මෙන් වෙති; එහෙත් යම් කළකුසල්ඇති වෙනෙය පුද්ගලයෝ වෙත් ද, ඔවුහු ම දුර සිටියාහු පවා උන්වහන්සේගේ ආපාථයට පැමිණෙති; ඔවුහු ගින්න මෙන් ද හිමවත් පර්වතය මෙන් ද වෙත්. මේ කියනලදද වේ-

149. **"දූරෙ සතෙනා පකාසෙනති - හිමවතෙනාව පබ්බතෝ**
අසතෙනත්ථ න දිස්සනති - රත්තිඛිත්තා සරා යථා" යි.

---

149. **සතෙනා**= (පෙර බුදුවරයන් කෙරෙහි කළ අධිකාර ඇති උත්සන්න වූ කුසල්මුල් ඇති භාවිත භාවනා ඇති) සත්පුරුෂයෝ; **දූරෙ**= දුර සිටියාහු ද; **හිමවතෙනා පබ්බතෝ ඉව**= හිමවත් පර්වතය මෙන්; **පකාසෙනති**= (බුදුවරයන්ගේ ඥානපථයට පැමිණෙන්නාහු) ප්‍රකාවෙති; **එත්ථ**= මේ ලොකයෙහි; **අසතෙනා**= (මෙලොව ගරු කොට ඇති හරන ලද පරලොව ඇති ආමිෂයෙහි ඇස් ඇති ජීවිතය සඳහා පැවිදි වූ) බාල පුද්ගලයෝ; **රත්තිඛිත්තා සරා යථා**= රාත්‍රියෙහි (චතුරඞ්ගසම්පන්න අන්ධකාරයෙහි) විදිනලද ශරයන් මෙන්; **න දිස්සනති**= (උපනිශ්‍රය වූ පූර්ව හෙතුවක් නැතිහෙයින්) නො පැනෙන්නාහුයි.

උඤ්ඤි යි භාග්‍යවතුන් වහන්සේට දහම්දෙසීම පිණිස වාරිකාවෙහි හැසිරීම යාඥාකරමින් කියයි; **වීර** යනාදියෙහි භාග්‍යවතුන් වහන්සේ වීර්‍යවත් බැවින් "වීර" නම් වෙති; දිව්‍යපුත්‍ර - මෘත්‍යු - ක්ලේශමාරයන් දිනූබැවින් **විජිතසඞ්ගාම** නම් වෙති; ජාතිකාන්තාරාදිය නීසරණය පිණිස වෛනෙය නමැති සාර්ථයන් වහනයෙහි සම්පී බැවින් **සත්ථවාහ** නම් වෙති; සාම්වජ්ජ නමැති ණය නැතිබැවින් **අනණ** නම් වෙති,යි දතයුතු.

අජ්ඣාසයං= යාඥාව; **බුද්ධචක්ඛුනා**= ඉන්ද්‍රිය පරෝපරියත්ත ඥාන යෙන් ද ආසයානුසය ඥානයෙන් ද; සැබෑ- මේ විවිධ ඥානයන්ට "බුද්ධ චක්ඛු" යි නාමයැ, සර්‍වඥතාඥානයට "සමන්තචක්ඛු" යි නාමයැ, ත්‍රිවිධ මාර්ගඥානයන්ට "ධම්මචක්ඛු" යි නාමය වේ.

වෛනෙයයන් දැකීම.

අපපරජක්ඛෙ යනාදියෙහි කිනියෙන් ම යම් කෙනෙකුන් ගේ ප්‍රඥාචක්ෂුසෙහි රාගාදිරජස් මද වේද, ඔවුහු **අපපර ජක්ඛ** නම් වෙති, යම් කෙනෙකුන්ගේ එය මහත් වේද, ඔවුහු **මහා රජක්ඛ** නම් වෙති; යම් කෙනෙකුන්ගේ ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයෝ තියුණු වෙත් ද, ඔවුහු **තික්ඛින්ද්‍රිය** නම් වෙති; යම් කෙනෙකුන්ගේ ඒ ශ්‍රද්ධාදි ආකාරයෝ ම සොඳුරුවූවාහු ද, ඔවුහු **සඞ්ඛාර** නම් වෙති; යමෙක් තුමූ කි කරුණ සලකත් ද, සුවසේ භගවන්ට හැකිවෙත් ද, ඔවුහු **සුවිඤ්ඤාපය** නම් වෙති; යමෙක්තුමූ පරලොව ත් වරද ත් භයවශයෙන් දකිත් ද, ඔවුහු **පරලොකවජ්ජභයදස්සාවි** නම් වෙති; මේ වනාහි මෙහි පෙල යැ- "**සඬ්ඪා පුග්ගලෝ අපපරජක්ඛෝ, අස්සඬ්ඪා පුග්ගලෝ මහාරජක්ඛෝ, ආරබ්භධාතුයා- කුසීතෝ- උපට්ඨිතසති- මුට්ඨස්සති- සමාහිතෝ- අසමාහිතෝ- පඤ්ඤවා- දුප්පඤ්ඤ පුග්ගලෝ මහාරජ ක්ඛෝ**" එසේ ම- "**සඬ්ඪා පුග්ගලෝ තික්ඛින්ද්‍රියෝ, -පෙ- පඤ්ඤවා පුග්ගලෝ පරලොකවජ්ජභයදස්සාවි, දුප්පඤ්ඤ පුග්ගලෝ න පර ලොකවජ්ජ භයදස්සාවි; ලොකොති බහිලොකෝ ඛාතුලොකෝ ආයතනලොකෝ සම්පත්තිභවලොකෝ සම්පත්තිසම්භවලොකෝ විපත්තිභවලොකෝ විපත්තිසම්භවලොකෝ, එකෝ ලොකෝ සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා, මෙ ලොකා නාමඤ්ච රූපඤ්ච, තයෝ ලොකා තිස්සෝ වෙදනා, චත්තාරෝ ලොකා චත්තාරෝ ආහාරා, පඤ්ච ලොකා පඤ්චුපාදානක්ඛන්ධා, ඡ ලොකා ඡ අජ්ඣත්තිකානි ආයත නානි, සත්ත ලොකා සත්ත විඤ්ඤාණට්ඨිතියෝ, අට්ඨ ලොකා අට්ඨ ලෝකධම්මා, නව ලොකා නව සත්තාවාසා, දස ලොකා දසායත නානි, මාදස ලොකා මාදසායතනානි, අට්ඨාරස ලොකා අට්ඨාරස ධාතුයෝ; වජ්ජන්ති සබ්බ කිලෙසා වජ්ජා, සබ්බ දුච්චරිතා වජ්ජා,**

සබ්බෙ අගිසඞ්ඛාරා වජ්ජා, සබ්බෙ භවගාමිකම්මා වජ්ජා; a. ඉති ඉමස්මිඤ්ඤෙව ලොකෙ ඉමස්මිඤ්ඤෙව වජ්ජෙ නිබ්බා භයසඤ්ඤිනා පච්චුපට්ඨිතා හොති, සෙය්‍යථා'පි උකණ්ඨනා'සිකෙ වධකෙ, ඉමානි පඤ්චුපාදානක්ඛන්ධානි ආහාරෙති ඉමානි පඤ්චින්ද්‍රියානි ජානාති පස්සති අඤ්ඤාති පටිවිජ්ඣති ඉදං තථාගතස්ස ඉන්ද්‍රියපරොපරියත්තෙ ඤාණං'' යි.

උප්පලිනියං= උපුල්වත යෙක්හි; ඉතිරියෙහි දු මෙම නයයි. **අඤ්ඤතා නිමුග්ගපොසිනී**= යමෙක් තුමූ ඇතුලත ගැලුනාහු ම පොෂණය වෙත්ද (ඔවුහු ය.) **උදකංඅච්චුග්ගම්ම තිට්ඨන්ති**= ජලය ඉක්මවා සිටිති; ඔවුන තුරෙහි යමෙක් (ජලය) ඉක්මැ සිටියාහු ද, ඔවුහු **කිරුරුප්පහස කැමති** වෙමින් සිටි අද පිපෙන්නාහු ය.; යමෙක් ජලය හා සම්ව සිටියාහු ද ඔවුහු සෙට පිපෙන්නාහු ය.; යමෙක් ජලයෙන් නො නැංගාහු ඇතුලත ගැලුනාහු පොෂණය වෙත් ද, ඔවුහු තුන්වන දවස පිපෙන්නාහු ය.; තවද- ජලයෙන් නො නැංගාවූ අන්‍යවූ ද සරොග උත්පලයෝ නම් ඇති, යමෙක් නො මැ පිපෙන්නාහු ද මස්කැසුප්බත් වූවාහු ම වන්නාහු ද, ඔවුහු පෙලට නො පැමිණියාහුය, එහෙත් එලවා ප්‍රකාශ කළයුත්තාහු යයි දක්වන ලද්දාහුය; ඒ එසේ මැයි- ඒ චතුර්විධ පුඟලයෝ යම්සේ ද එපරිද්දෙන් "උග්ඝටිතඤ්ඤූ විපචිතඤ්ඤූ නෙය්‍ය පදපරම" යන සතර පුද්ගලයෝ වෙති; ඔවුනතුරෙහි යම් පුද්ගලයෙකුට උදාහාත (=කියනලද) කාලය සමඟ ධර්මාභිසමය වේද, මේ පුද්ගල තෙම "උග්ඝටිතඤ්ඤූ" යයි කියනු ලැබේ; යම් පුද්ගලයෙකුට සැකෙවින් වදාරනලද්දාහුගේ විස්තාරයෙන් අර්ථය විභාග කරන කල්හි ධර්මාභිසමය වේද, මේ පුද්ගල තෙම "විපචිතඤ්ඤූ" යයි කියනු ලැබේ; උද්දෙශ වශයෙන් පරිපෘච්ඡා වශයෙන් නුවණින් මෙනෙහි කරන්නාවූ කල්‍යාණමිත්‍රයන් සෙවනය භජනය පය්‍යුපාසනය කරන්නාවූ යම් පුද්ගලයෙකුට ධර්මාභිසමය වේද, මේ පුද්ගල තෙම "නෙය්‍ය" යයි කියනු ලැබේ; බොහෝ ත් අසන්නාවූ බොහෝ ත් කියන්නාවූ බොහෝ ත් ධරන්නාවූ බොහෝ ත් කියවන්නාවූ යම් පුද්ගලයෙකුට ඒ ජාතියෙහි ධර්මාභිසමය නො වේද, මේ පුද්ගල තෙම "පදපරම" යයි කියනු ලැබේ. එහි භාග්‍යවතුන් වහන්සේ උත්පලවනාදිය වැනිවූ දශසහස්‍රී ලොකධාතුව බලනසේක් අද පිපෙනමිල් මෙන් උග්ඝටිතඥයන් ද, සෙව පිපෙනමල් මෙන් විපචිතඥයන් ද තුන්වන දිනයෙහි

උද්ඝටිතඤ්ඤූ පුද්ගලයෝ.

---

a. උකනප්‍රකාර වූ සකාබාදි ලොකයෙහි ද ඛෙලඝාදි වෘෂයෙහි ද බලවත් වූ භය යෑ යන සංඥාව එලඹ සිටියා වෙයි. පහරදෙනු පිණිස ඔසවා ගත් ඛඩුව ඇති සතු රතු කෙරෙහි යම්සේ ද එමෙනි; මේ (අල්පරජස්කාදි පඤ්චක දශයෙහි) පහස් ආකාරයෙන් මේ ශ්‍රද්ධාදි පඤ්චෙන්ද්‍රියයන් (තථාගත තෙම) ප්‍රඥාවෙන් දැනගනී, දිවැසින් දකී සම්‍යක්කාරණයන් අවබොධ කෙරෙයි, නිරවශෙෂයන් ප්‍රතිවෙධ කෙරෙයි; මේ තථාගත යන් වහන්සේගේ ඉන්ද්‍රියපරාවරතායෙහි ඥානයයි. (මේ පාලිප්‍රදෙශයෙහි ශෙෂයසුඝ මයි; සවිසමඟිදමඟහ - ඉන්ද්‍රියපරොපරියත්තඤ්ඤාණනිද්දෙසය බලනු.)

පිපෙනමල් මෙන් නොයෑයන් ද, මස්කැසුප්බත්වූ මිල් මෙන් පදපරම යන් ද දුටුසේක, දක්නාහු ද මෙතෙක් අල්පරජස්කයෝ යැ, මෙතෙක් මහාරජස්ක යෝ යැ, ඔවුනතුරෙහි දු මෙතෙක් උදඝටිතඥයෝ යැයි මෙසේ සළකාරයෙන් ම දුටුසේක. එහි තුන් පුද්ගලයන්ට මේ අත්බැව්හි ම භාග්‍යවතුන්ගේ ධර්මදේශනාව වැඩ සිදුනොවෙයි; පදපරමයන්ට අනාගතය පිණිස වාසනා වෙයි; නැවත භාග්‍යවතුන් වහන්සේ මේ සතර පුද්ගලයන්ට අර්ථ ඵලවන්නා වූ ධර්මදේශනාව දැන දෙසනු කැමතිබව උපදවා යලි තුන්භවයෙහි සියලු සත්වයන් භව්‍යාභව්‍ය වශයෙන් දෙකොටසක් කළසේක. යමෙක් සඳහා- a. **"කම්මාවරණේන සමන්නාගතා විපාකාවරණේන සමන්නාගතා කිලේසාවරණේන සමන්නාගතා අස්සද්ධා අවජානිකා දුප්පඤ්ඤා අභබ්බා නියාමං ඔක්කමිතුං කුසලේසු ධම්මේසු සම්මත්තං, ඉමේ තෙ සත්තා අභබ්බා; කතමේ තෙ සත්තා භබ්බා? යෙ තෙ සත්තා න කම්මාවරණේන -පෙ- ඉමේ තෙ සත්තා භබ්බා"** යි වදරනලද ද, ඔවුනතුරෙහි සියලු මෑ අභව්‍ය පුද්ගලයන් හැර භව්‍යපුද්ගලයන් ම නුවණින් පරිග්‍රහණය කොට මෙතෙක් මෙහි රාගචරිතයෝ යැ, මෙතෙක් වෙෂ -පෙ- මොහ-විතර්කී-ශ්‍රද්ධා-බුද්ධි චරිතයෝ යැයි ස කොටසක් කළසේක; මෙසේ කොට දහම් දෙසන් නෙමි යි සිතූහ.

පවවහාමිං= පෙරලා කිම්; **අපාරුතා**= විවෘත වූවාහුය; **අමතස්ස ද්වාරා**= ආයතීමාගීය; ඒ එසේ මැයි- හේ අමෘතසඞ්ඛ්‍යාත නිර්වාණයට වාරය වෙයි, ඒ (වාරය තෙම) මා විසින් විවෘත කොට තබනලද්දේ යයි දක්වති. **පමුඤ්චන්තු සද්ධං**= සියල්ලෝ තමන්ගේ ශ්‍රද්ධාව ඵලවත්වා, විහිදුවත්වා, පසු දෙපාද යෙහි මේ අර්ථයැ- මම වනාහි තමහට ප්‍රගුණවූ මොනොවට පැවැත්තා වූ ද මේ ප්‍රණීත වූ උත්තමධර්මීය කායවචනයන්ට වෙහෙසයැ යන සංඥ ඇතිව නො කිම්; එහෙත් දැන් සියලු ජනතෙම සැදුහැ නමැති බදුන ඵලවාවා, ඔවුන්ගේ සඞ්කල්පය පුරන්නෙමි යනුයි. **නස්ස මයහං භික්ඛවෙ! එතදහොසි**= මේ සිත විය; **කස්ස නුඛො අහං පඨමං ධම්මං දෙසෙය්‍යං** යි මේ ධර්මදේශනා ප්‍රතිසංයුක්ත වූ විතර්කීය උපන යන අර්ථයි. යලි කවරකලෙක මේ විතර්කීය උපන්නේ ද යත්? බුදුවූවහුට අටවෙනි සතියෙහි යැ; එහි මෝ පිළිවෙළ කථායි.

---

a. යම් ඒ සත්වසන්තානක පඤ්චානන්තරීය සඞ්ඛ්‍යාත කර්මාවරණයෙන් යුක්තවූවාහු ද, අහෙතුක ප්‍රතිසන්ධි සඞ්ඛ්‍යාත විපාකාවරණයෙන් යුක්ත වූවාහු ද, නියතමිථ්‍යාදෘෂ්ටි සඞ්ඛ්‍යාත ක්ලේශාවරණයෙන් යුක්ත වූවාහු ද, බුද්ධාදීන් කෙරෙහි සැදුහැ රහිත වූවාහු ද, සන්තුෂ්ටාත්‍මතා කුසලවර්ධනරහිත වූවාහු ද, භවාඞ්ග ප්‍රභාවෙන් පිරිහුනාහු ද කුසල්දහම්හි සම්‍යක් සවභාව සඞ්ඛ්‍යාත ආර්‍යමාගීයට පිවිසෙන්ට අභව්‍ය වූවාහු ද, මේ ඒ සත්වයෝ අභව්‍යයෝ යැ; ඒ භව්‍යසත්වයෝ කවරහු ද? යම් ඒ සත්වසන්තානක කර්මාවරණයෙන් යුක්ත නො වූවාහු ද, -පෙ- මේ ඒ සත්වයෝ භව්‍යයෝයි.

ඒ මෙසේ අසනු ලැබේ- බෝසත් තෙම මහඛිනික්මන් දිනයෙහි විවෘතකළ ඇතොවුරදූන කලකිරුණු සිත් ඇත්තේ "කන්ථකයා ගෙනෙව" යි ඡන්නයා අමතා ඡන්නයා සහායකොට ඇත්තේ අස්රජපිටට පැමිණියේ නුවරින් නික්ම "කන්ථක නිවත්තන වෙතියඨාන" ය නම් දක්වා තුන්රජයක් ඉක්මැ අතොමා ගංඉවුරෙහි පැවිදිව පිළිවෙළින් චාරිකාවෙහි හැසිරෙමින් රජගහ නුවර පිඬු පිණිස හැසිර පාණ්ඩව පර්වත සමීපයෙහි වැඩහුන්නේ මගධෙශ්වරයන් විසින් නම්ගොත් විචාරා මේ රජය පිළිගනුවැසි කියනලද්දේ "කම්පැන මහරජ! මට රජයෙන් වැඩෙක් නැති, මම රජය හැර ලොව ඒ හිත පිණිස ප්‍රධන්වීර්‍යයෙහි යෙදී ලොකයෙහි හරතලද රහාදි සෙවෙනි ඇති බුදුකෙනෙක් වන්නෙමි, යි නික්ම ආයෙමි" යි කියා එසේ වී තම් බුදු වැ පළමුකොට මාගේ විජිතයට පැමිණෙන්නෙහි යයි පිළිගන ගන්නා ලද්දේ කාලාම තවුසා ද උද්දකතවුසා ද කරා එලඹ ඔවුන්ගේ දම්දෙසුමෙන් සාරයක් නො ලබන්නේ ඒයින් නික්ම ගොස් උරුවෙල්දනව්වෙහි සවසක් දුෂ්කාරක්‍රියා කරන්නේ ද නිවන් ප්‍රතිවෙධ කරන්ට නො හැකිවන්නේ ඕදරිකආහාර ප්‍රතිසෙවනයෙන් කය සන්තර්පණය කළේය. තවද- එකල උරුවෙල්ගමැ "සුජාතා" නම් කෙලෙඹිදුවනිය එක් නුගරුකක් සමීපයෙහි ප්‍රාර්ථනා කළා- "ඉදින් මම සමජාති ඇති කුලගෙයකට ගොස් පළමුගැබ පුතකු ලබන්නෙම් නම් බිලියම් කරන්නෙමි" යි; ඇගේ ඒ ප්‍රාර්ථනාව සමෘද්ධ වූ; වෙසක් පුණු පොහෝදවස් උදැසන ම බිලියම් කරන්නෙම්යි රැ අලුයම්කල මැ කිරිබත් පිළියෙළ කළා. ඒ කිරිබත පැසෙනකල මහත් මහත් බුබුලු නැඟී දකුණාවර්ත වැ හැසිරෙති, එක් බින්දුවකුදු බැහැර නො යෙයි, මහබඹ සත් දෙරි, සතර ලෝපල්ලෝ කඩුගත් අත්ඇති ව අරක් ගත්තා හුය, ශක්‍රතම පෙනෙහෙලි ලංකරමින් ගිනි දැල්වී, දෙවතාවෝ සිව්දිව සින්හි ඕජා රැස්කොට එහි බහාලූහු; බෝසත් භික්ෂාචාරකාලය බලමින් උදැසන ම ගොස් රුක්මුලැ හිදගත; රුක්මුල ශුද්ධකිරීම පිණිස ගිය කිරිමිටි අවුත් සුජාතාවට දැන්වූ- "දෙවතාවා රුක්මුල හුන්නා" යනි සුජාතා තොමෝ සියලු අබරණ පැලඳ ලක්ෂයක් අඟනා රන්තලියක කිරිබත් වඩා අන් රන්පියනකින් වසා ඔසවාගන ගියා මහපුරිසා දැක තැටියේ සමග ම අතැ තබා වැඳ "ඝම්සේ මාගේ මනදෙළ නිපන්නේ ද එසේ බුදුගේ (මනදෙළ) ද නිපදීවා" යි කියා නික්ම ගියා. බෝසත් තෙර සඳහා ගංඉවුරට ගොස් රන්තලිය ඉවුරෙහි තබා නා ගොඩනැඟි එකුන් පනස් පිඬක් කරමින් කිරිබත් වලඳ, "ඉදින් මම අද බුදු වෙම්නම් තලිය පිළිහොයට යේවා" යි දැමී. තලිය පිළිහොයට ගොස් මදක් සිට කාලනාගරාජයාගේ භවනයට පිවිස තුන්බුදුවරයන්ගේ තලි ඔසවා සිටි යේය; මහසත් වනලැහැබෙහි දිවාවිහරණය කොට සවස්කාලැ සොත්තිය බමුණු දුන් අවතණමිට ගෙන බෝමැඩට නැඟි දකුණ දිශාභාගයෙහි සිටියේය; ඒ පෙදෙස පියුම්පතක දියබිඳක් සෙයින් කම්පාවිය; මහසත්

මේ පෙදෙස මාගේගුණය ඔරන්ට නො හැක්කේ යයි පශ්චිමදිශාභාගයට ගියේය; එදෙස ද එසේ ම කම්පා විය; උත්තරදිශාභාගයට ගියේය; එදෙස ද එසේ ම කම්පා විය; පූර්වදිශාභාගයට ගියේය; එහි පලඟපමණ තැන් මොනොවට සිටුවනලද ඉඳුඛීලයක් සෙයින් නිශ්චල වූයේය; මහ සත් තෙම මෙතැන සියලු බුදුවරයන්ගේ කෙලෙස්පදුරු විධ්වංසනය කරන සථානය,සි ඒ තණ අග ගෙන සෙලවී; ඔවුහු සිත්තරෙකු විසින් තෙලිඅඟින් පිරිසිඳින ලද්දවුන් මෙන් වූහ; බෝසත්හු "බොධියට නො පැමිණ මේ පලඟ නො බිඳින්නෙමි" යි චතුරඞගවීර්‍යය අධිෂ්ඨාන කොට පලඟ බැඳ වැඩහුන්හ. එකෙණෙහි ම මාරතෙම අත් දහසක් මවා යෙල සියයක් යොදුන් ගිරිමෙවුල් නම් ඇතුපිට නැගි නවයොදුන් (පැතිර සිටි) මරසෙනඟ ගෙන අඩැසින් බලමින් පළිතයක් මෙන් යටපත් කෙරෙමින් එලඹියේය; මහසත්හු "දසපැරැමි පුරන්නාවූ මට අන් මහණෙක් හෝ බඹුණෙක් හෝ දෙවියෙක් හෝ මාරයෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ ශාක්‍ෂි නැති, එහෙත් වෙසතුරු අත්බැව්හි මට සත්තැනෙක්හි මහපොළොව ශාක්‍ෂි විය, දැනුදු මට මෝ සිත්නැති වියලිදඬුකඬක්බදු මහපොළොව ම ශාක්‍ෂි" යයි අත දිගුකළහ; මහපොළොව එකෙණෙහි ම යදණඩකින් පහළ කස්තලියක් මෙන් සියරැව් දහස්රැව් විහිදුවමින් හඬා පෙර ලෙන්නී මරසෙනඟ සක්වළ මුවවිටෙහි පුඩු කළා; මහසත්හු හිරු හත් ගල් නො ගියකල්හි ම මරසෙනඟ පලවාහැර පෙරයම් පෙරවිසූකදපිළි වෙළදන්කා නුවණ ලැබ මැදියම් දිවැස පිරිසුදු කොට පසුයම් ප්‍රතීත්‍ය සමුත්පාදයෙහි නුවණ බස්වා වෘත්තය හා විවෘත්තය සම්මර්ශණය කරමින් අරුණ උදාවනකල්හි බුදු වැ මා විසින් නොයෙක් කප්කෙළ සිඳදහස් කල් මේ පලඟ සඳහා වැයම් කරනලද්දේ ය,යි සත්දිනක් එක්පලඟින් වැඩහුන්හ; එකල්හි ඇතැම් දෙවතාවුන්ට "කිමෙක් දෝ හෝ අන්‍ය වූ ද බුදුබැව් සිදුකරන ධර්මයෝ ඇද්ද" යි සැක උපන; ඉක්බිති භාග්‍ය වතුන් වහන්සේ අටවැනිදවස් සමාධියින් නැගිසිට දෙවියන්ගේ සැකය දූන සැක දුරුකරනු පිණිස අහසැ පැනනැඟි යමාපෙළහර දක්වා ඔවුන්ගේ සැක දුරු කොට පලඟින් මඳක් පැදුන්දෙස ඇසුරුකළ උතුරු දෙස සිව එතුරසඞඛ්‍යයක් හා කල්පලක්‍ෂයක් ද පිරූ පාරමීන්ගේ ඵලයට පැමිණි සථානය වූ පලඟ ද බෝරුක ද නිමෙස්රහිත ඇසින් බලමින් සතියක් ඉක්මවූහ; ඒ සථානය "අනිමිසචෛත්‍ය" නම් වී. ඉක්බිති පල ඟට ද සිවිතැනට ද අතර පැදුන්-පැලදිගින් දික්වූ රුවන්සක්මනෙහි සක්මන් කරමින් සතියක් ඉක්මවූහ; එ තැන "රතනචඞකමචෛත්‍ය" නම් විය. ඉක්බිති පැලදෙස දෙවියෝ රුවන්ගෙයක් මැවූහු; එහි පල ඟින් හිඳ විජම්පිටකය ද වෙසෙසින් එහි අනන්තනය සමන්තපඨානය ද විමසමින් සතියක් ඉක්මවූහ; එ තැන "රතනඝරචෛත්‍ය" නම් විය. මෙසේ බොධිය සමීපයෙහි ම සතර සතියක් ඉක්මවා පස්වන සතියෙහි බෝරුක්මූලින් (නික්ම) අජපල් නුගරුක යම් තැනෙක්හි ද එහි එලඹි සහ; එහි ද දහම් විමසමින් ම විමුක්තිසුවය ද විඳිමින් වැඩහුන්හ;

තවද- මෙහි දහම් විමසන්නේ මෙසේ අභිධර්මයෙහි නයමාගීය මෙනෙහි කළහ- පළමුවැන්න ධර්මසඞ්ගණීප්‍රකරණ නම්, නැවත විභඞ්ගප්‍රකරණයෑ, ධාතුකථාප්‍රකරණයෑ, පුග්ගලපඤ්ඤත්තිප්‍රකරණයෑ, කථාවත්ථුප්‍රකරණ නම්, යමක නම්, නැවත මහාප්‍රකරණය වූ පට්ඨාන නමැති; එහි සිලුටු සියුම් වූ පට්ඨානය වනාහි උන්වහන්සේගේ සිත්හි බැසගත්කල්හි ප්‍රීතිය උපන, ප්‍රීතිය උපන්කල්හි ලොහිතය පැහැදුණි, ලේ පැහැදුන කල්හි සිව්ය පැහැදුණි, සිවිය පැහැදුනකල්හි පෙරකයින් කුළුගෙවල් ආදිය පමණ වූ රැස් නැගි අහසෑ පැන නැගුණු සදත්ඇත් සමූහයක් මෙන් පැදුන් දෙස අනත්සක්වළ පැනගියාහුය; පැසලුකයින් නැගී පැලදෙස ද, දකුණුදසරුවෙන් නැගී දකුණුදෙස ද, වම්දසරුවෙන් නැගී උතුරුදෙස ද අනත්සක්වළ පැනගියාහුය, පාතෙලෙන් පබළුකුරුපැහැති රැස් නැගී මහපොළොව විනිවිද ජලය දෙබෑකොට වාතය පලා අජටාකාශයට පැනගියාහුය, හිසින් මොනොවට පරිවර්තනය වෙමින් මිණි දමක් වැනි නිල්වන් රැස්වැට පැනනැගී සදෙව්ලොව විනිවිද නවබඹලොව ඉක්මෑ අජටාකාශයට පැනගියාහුයි. එදවස අප්‍රමාණ වූ සක්වළෑ අපමණ වූ සත්වයෝ සියල්ලෝ රන්වන් මෑ වූහු, තවද- එදවස භාග්‍යවතුන්ගේ සිරුරින් නික්මුණු ඒ රශ්මිහු අදදවස පවා ම අනන්තලොකධාතූන් කරා යෙත් මැයි. මෙසේ භාග්‍යවතුන් වහන්සේ අජපල්නුගරුක් වෙත සතියක්ඉක්මවා එයින්පසු සතියක්මුවලින්ද(මූල) යෙහි වැඩහුන්හ; යලි උන්වහන්සේ වැඩහුන් ඇසිල්ලෙහිම සියලු සක්වළඟෙ පුරමින් මහත් වූ නො කල්වැස්සෙක් උපන; මේබදු වූ මහාමේඝයෙක් දෙකාල යෙක්හි ම වසී ලු, සක්විත්තෙක් හෝ බුදුකෙනෙක් හෝ උපන්කල්හි යෑ, මෙහි බුදුන්කලෑ උපන; තවද- ඒ වැස්ස උපන්කල්හි "මුවලින්ද" නම් නාරජ මෙසේ සිතී- "මේ වැස්ස ශාසනඍන් මාගේ භවනයට පිවිසි කෙණෙහි උපන, උන්වහන්සේට විසිමට ගෙයක් ලබන්ට වටනේය" සි හෙතෙම සත්රුවන්මුවා පහයක් නිමවන්ට හැකිවන්නේ නමුදු එසේ කළකලෑ මට මහත් ඵල නොවන්නේය, දශබලයන්ට කයින් වතාවතක් කරන්නෙමි,සි මහත් වූ ආත්මභාවයක් කොට ශාස්තෘන් වහන්සේ සත් වරක් දරණවැලින් වටකොට මතුයෙහි පෙනය ඵැරී; පරිභෝජයාගේ ඇතුලු අවකාශයයට ලොහොපහය පමණ විය; යම් හෙයකින් ශාස්තෘන් වහන්සේ කැමති කැමති ඉරියව්වකින් වාසය කරන්නාහුය,සි නාගයාගේ අදහස වීද, එහෙයින් එපරිද්දෙන් මහත් අවකාශය වටකෙළේය, මැද රුවන්පලහක් පනවනලද්දේ වෙයි, මතුයෙහි රන්තරුයෙන් විසිතුරුකළ රැස්කළ කුසුම් ගඳදුම්ඇති සෙල්විහනක් විය, සතරකොන ගඳතෙලින් පහන් දල්වනලද්දාහුය, සිව්දෙස වීථිවරකොට සඳුන්කරඹු තබනලද්දාහුයි. මෙසේ භාග්‍යවතුන් වහන්සේ ඒ සතිය එහි ඉක්මවා එයින් පසු සතිය "රාජායතන" සමීපයෙහි වැඩහුන්හ. රාජායතනයෙන් නික්ම අටවෙනි සතියෙහි සක්දෙව්රජු විසින් ගෙනඑනලද දැහැටි දඬු ද බෙහෙත්අරලු ද වලඳ මුව සොඳ සිව්ලෝපල්ලන් විසින් එලවූ

නවසෙල්මුවාපයෙහි තපස්සුහල්ලිකයන්ගේ පිණ්ඩපාතය වලඳ නැවත පෙරලා අවුත් අජපල් නුගරුක්මුල වැඩහුන්නහුව සියලු බුදුවරයන්ට ආවිණි වූ මේ විතර්කය උපන.

එහි පණ්ඩිතෝ= පණ්ඩිත බැවින් සමන්විත වූයේ; **බ්‍යත්තෝ**= ව්‍යක්ත බැවින් සමන්විත වූයේ; **මේධාවී**= තැනට උපදනා නුවණින් සමන්විත වූයේ; **අපපරජක්ඛජාතිකෝ**= සමවතින් ඔටපත්කළ බැවින් නිකෙලෙස්පියවි ඇති ශුද්ධසත්ත්වයෙක; **ආජානිස්සති**= සලකන්නේය, ප්‍රතිවේධකරන්නේය; **ඤාණඤ්ච පන මේ**= මට ද සර්ව්ඥතාඥාණය උපන; භාග්‍යවතුන් වහන්සේ ද දෙවතාවා විසින් කියනලද්දෙන් ම නිශ්චාවට නො පැමිණ තමන් වහන්සේ ත් සර්ව්ඥතාඥානයෙන් බලනසේක් මෙසින් සත්දිනකින් මත්තෙහි කලුරියකොට ආකිඤ්චඤ්ඤායතනයෙහි උපනැයි දුටුසේක. ඒ සඳහා වදාළහ- "ඤාණඤ්ච පන මෙ දස්සනං උදපාදි" යනු. **මහාජානියෝ**= සත්දිනක් අතර පැමිණියයුතු මාගඵලයෙන් පිරිහුණු බැවින් "මහත් වූ හානිය මෝහව නුසි මහාජානිය" නම් වෙයි; අක්ෂණයෙහි උපන, ගොස් දෙසනුලබන්නා වූ ද (ධර්මය) අසන්ට ඔහුගේ ශ්‍රොත්‍රප්‍රසාදය නැති, මෙහි දම්දෙසන තැනට පැමිණනපාදය ද නැති; මෙසේ මහත් වූ හානියෙක් වූයේ යයි දක්වති; **අහිදෙසකාලඝනෝ**= අර්ධරාත්‍රියෙහි කලුරියකෙළේ; ඤාණඤ්ච පන මේ= මට ද සර්ව්ඥතාඥානය උපන; මෙහි දු භාග්‍යවතුන් වහන්සේ දෙවතාවාගේ වචනයෙන් සතිවූ හන් නො කොට සර්ව්ඥතාඥානයෙන් බලනසේක් ඊයේ අර්ධරාත්‍රියකොට "උද්දකරාමපුත්‍ර" තෙම නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි උපනැයි දුටුසේක; එහෙයින් මෙසේ වදාළහ. සෙස්ස පළමුවනය සමානමැයි. **බහුකාරෝ**= බොහෝ උපකාරඇත්තාහුය; **පධානපහිතත්තං උපඨහිංසු**= ප්‍රධන්වීර්‍යය පිණිස මෙහෙයකලද අන්බැව් ඇත්තහු වසනතැන පිරිවෙන් හැමදීමෙන් ද පාසිවුරු ගෙන පසුපස්සෙහි යෑමෙන් ද මුවදෝනා දිය දෑගැට්දඬු දීමාදියෙන් ද උපස්ථාන කළාහුය; මේ පඤ්චවර්ගීයයෝ නම් කවරහු ද යත්? ඒ යමෙක් තුබූ-

150. "රාමෝ ඔජෝ ලක්ඛණෝ වාපි මන්ති
යඤ්ඤෝ ච හොජෝ සුයාමෝ සුදත්තෝ
එතෙ තදා අට්ඨ අහෙසුං බ්‍රාහ්මණා
ජලඛවා මන්තං වියාකරිංසු" යන-

---

150. **රාමෝ**= රාමය; **ඔජෝ**= ඔවජය; **අපි**= නැවත; **ලක්ඛණෝ ච**= ලක්ෂණය; **මන්ති**= මන්ත්‍රීය; **යඤ්ඤෝ ච**= යඥය; **හොජෝ**= හොජය; **සුයාමෝ**= සුයාමය; **සුදත්තෝ**= සුදත්තය යන; **එතෙ අට්ඨ බ්‍රාහ්මණා**= මේ බ්‍රාහ්මණයෝ අවදෙන; **තදා**= එකල්හි; **ජලඛවා**= ශ්‍රීවෙ දුඹ ඇත්තාහු; **අහෙසුං**= වූහ; (ඔවුහු) **මන්තං**= ලක්ෂණ මන්ත්‍රය; **වියාකරිංසු**= ප්‍රකාශ කළාහුයි.

බෝසතුන් උපන්කලැ සිහින පිළිගත්තා වූ ද ලකුණු පිළිගත්තා වූ ද බ්‍රාහ්මණයෝ අවදෙනෙක් වූවාහු ද, ඔවුනතුරෙන් තිදෙනෙක් දෙපරිද්දෙකින් ප්‍රකාශ කළාහුය, මේ ලකුණුවලින් යුක්තා වූයේ ගිහිගෙයි වෙසෙන්නේ සක්විතිරජ වෙයි, පැවිදි වන්නේ බුදු වේ යයි. බුමුණෝ පස්දෙනෙක් "මේ ලකුණුවලින් සමන්විත වූයේ ගිහිගෙයි නො සිටී, බුදු වේ" යයි එකව්‍යාකරණ ඇත්තෝ වූවාහු ද; ඔවුනතුරෙන් පළමු තිදෙන මන්ත්‍රපදය අනුව ගියාහුය, එහෙත් මොවුහු පස්දෙන මන්ත්‍රපදය ඉක්ම ගියාහුය; ඔවුහු තමන් ලත් පූණ්‍යපාත්‍රය නැයන්ට පරිත්‍යාග කොට මේ මහාපුරුෂ තෙම ගිහිගෙයි නො වසන්නේය, එකාන්තයෙන් බුදුවන්නේ ය,යි විතර්කවිතර්ක කොට බෝසතුන් උදෙසා ශ්‍රමණපැවිද්දට පැමිණියාහුය, ඔවුන්ගේ පුත්‍රයෝ යයි ද කියති; එය අර්ථකථාවෙහි ප්‍රතික්ෂේප කරනලදී. මොවුහු තරුණකාලයෙහි ම බොහෝ මන්ත්‍ර දැනගත්තාහු ල, එහෙයින් බ්‍රාහ්මණයෝ ඔවුන් ඇදුරුතැන්හි තැබූහ; ඔවුහු පසුව අප විසින් අඹුදරු අවුල බිඳ පැවිදිවන්ට නො හැකි වන්නේ යයි තරුණකල ම පැවිදිව සිත්කලු සෙනසුන් පරිභෝග කරමින් හැසිරුනාහුය; එහෙත් කලින් කල කිම පින්වත්නි! මහපුරිස් තෙම මහාභිනික්මන් නික්මුනේ දැ? යි විචාරති; මනුෂ්‍යයෝ තෙපි කොතැන්හි මහා පුරුෂයකු දක්නහු ද? තුන්පහයෙහි තුන්වැදෑරුම් කළුවන් මැද දෙවියෙක් මෙන් සැපත් විඳි යයි කියති. ඔවුහු (ඒ) අසා ඒ තාක් මහපුරිසාගේ නුවණ මහිකිරීමට නො යේ යයි අලෝභසුඛ ව වාසය කළාහු මය.

යලි කුමක් හෙයින් භාග්‍යවතුන් වහන්සේ මෙහි "බහුකාරා බො මේ පඤ්චවග්ගියා" යි වදාළාහු ද? කිම උපකාර ඇත්තවුන්ට ම මේ භාග්‍යවන්හු දහම් දෙසත් ද? උපකාර රහිතයනට නො දෙසත් ද යත්? නො දෙසන්නාහු නො වෙති; උන්වහන්සේ පරිචය වශයෙන් ම ආළාරකාලාම තවුසා ද උද්දකරාමපුත්‍රය තවුසා ද බැලූහ; තවද- එක් බුඩක්ෂේත්‍රයෙක්හි අඤ්ඤාකොණ්ඩඤ්ඤ තෙරුන් තබා පළමුකොට දහම් පසක්කරන්ට සමර්ථයෙක් නම් නැති; කුමක් හෙයින; එබඳු උපනිශ්‍රය ඇති බැවිනි.

අඤ්ඤාකොණ්ඩඤ්ඤ තෙර.

මේ අසනු ලැබේ- පෙර පින්කරන කාලයෙහි දෙබෑ කෙනෙක් වූහ; ඔවුහු එක්ව ගොයම් කළාහුය, ඔවුනතුරෙහි දෙටු බෑයාට එක් සස්‍යයෙක්හි නවවරෙක මා විසින් අගහස්දන් දියයුතු යයි සිත් වීය; හෙතෙම වප්කලැ "බීජගහ" නම් දනක් දී ගැබ්කලැ කනිටු බෑයා සමඟ මන්ත්‍රණය කෙළේය, කනිටුතෙම ගැබ්කලැ ගැබ් පලා දෙන් නෙමිසි, තරුණසස්‍යය නසනු කැමැත්තේ වෙහි යයි කිය. දෙටුතෙම කනිටුබෑයාගේ අනුව නො පවත්නාබැව් දැන කෙත බෙදූ තමාගේ කොටසින් ගැබ් පලා කිරි බැහැර කොට ගිතෙල් සකුරු සමඟ යොදූ දුන්නේය; පැසෙනකාලයෙහි පුටුකා (= හබලපෙති) කරවා දුන්නේය;

කපනකාලයෙහි "දුයනගහ" යැ. වෙණිකිරීමෙහි "වෙණගහ" යැ, කලප් කිරීම් ආදියෙහි "කලාපගහ යැ, බළගහ යැ, බළහණ්ඩගහ යැ, කොඳගහ" යැයි මෙසේ එක්ගොයමෙහි නවවරක් අගදන් දුන්නේය; කතිවුතෙම වනාහි නගා දුන්නේය. ඔවුනතුරෙහි දෙවුතෙම "අසුසුකොණ්ඩසුසු" තෙර විය; කතිවූ තෙම "සුහදද" පිරිවැජියා විය. මෙසේ එක් ගොය මෙහි නවඅගදනක් දුන් බැවින් තෙරුන් තබා පළමු කොට දහම් පසක් කරන්ට සමර්ථ වූ අනිකෙක් නම් නැති. බහුකාරා බෝ පඤ්ච වග්ගියා යන මේ වනාහි උපකාර සිහිකිරීම පමණකින් ම වදුරනලදි; ඉසිපතනෙ මිගදායෙ= ඒ පෙදෙසෙහි නූපන් බුඩොතපාදය ඇති කල්හි පසේබුදුවරයෝ ගඤ්ඣමාදන පර්වතයෙහි සත්දිනක් නිරොධ සමාපත්ති යෙන් කල්යවා නිරොධයෙන් නැගී සිට නාලියදූහැටිදබ්බ වලඳ අනව තප්පාවිලෙහි මුව සෝදා පාසිවුරු ගෙන අහසින් අවුත් බසිත් ලා; එහි සිවුරු පොරවා නුවර පිඬුපිණිස හැසිර කළ බත්කිස ඇත්තාහු යන කල්හි දූ එතැනින් ම (අහසට) නැගී යෙත් ලා; මෙසේ ඍෂිහු මෙහි බසින්නාහු ද නහින්නාහු ද නුසි එතැන "ඉසිපතන" යි ප්‍රසිඩියට ගියේය; තවද- මුවන්ට අහස පිණිස දුන් හෙයින් "මිගදාය" යි කියනු ලැබේ. එහෙයින් කියනලදී- "ඉසිපතනෙ මිගදායෙ" යනු. අනනරා ච ගයං අනනරා ච බොධිං= ගයාවට ද බොධියට ද විවර වූ තුන්ගවු අතර තැන්හි; ඒ එසේ මැයි- බෝමැඩින් ගයාව තුන්ගවුවෙකි; බරණැස අටලොස් යොදුනෙකි; උපකතෙම බෝමැඩට ද ගයාවට ද අතර භාග්‍ය වතුන් දුටුයේය; එහෙත් "අනනරා" ශබ්දය හා යෙදූ බැවින් කර්මධාරය කරනලද; සැබව- මෙබඳු තැන්හි අක්ෂරචින්තකයෝ "අනනරා ගමං ච නදිං ච යාති" යි මෙසේ එක ම "අනනරා" ශබ්දයක් යොදති, හේ දෙවෙනි පදය හා ද යෙදිය යුතු වෙයි, නො යොදන කල්හි කර්මධාරය නො පැමිණේ. මෙහි වූ කලි යොදා ම කියන ලද්දේ ය, යි. අඩානමගගපටිපන්නානං= අඩ්ධානසඞ්ඛ්‍යාත මාර්ගයට පිළිපන්නහු; දිඝිමාගී යට යැ යන අර්ථයි. ඒ එසේ මැයි- අඩ්ධානගමන කාලයට විභක්තියෙහි "අඩ්ධයොජනං ගච්ඡිස්සාමීති භුඤ්ජිතබ්බං" යනාදිය වදුල හෙයින් අඩ්ධ යොදුන ද අඩ්ධානමාර්ගය වෙයි; ගයාව වනාහි බෝමැඩින් තුන්ගවුවෙකි.

සබ්බාකාරෙන= සියලු ත්‍රෛභූමක ධර්මය මැඩපවත්වා සිටියෙමි; සබ්බ විදූ= සියලු චාතුර්භූමක ධර්මය දනගතිමි, අවබොධ කෙළෙමි; සබ්බසු ධම්මෙසු අනූපලිත්තෙනා= සියලු ත්‍රෛභූමක ධර්මයන්හි කෙලෙසලෙපන යෙන් නො තැවරුනේ; සබ්බං ජහෝ= සියලු ත්‍රෛභූමක ධර්මය හැර සිටියෙමි; තණ්හක්ඛයෙ විමුත්තෙනා= තෘෂ්ණාක්ෂය වූ නිර්වාණයෙහි අර මුණු වශයෙන් විමුක්ත වූයෙමි; සයං අභිඤ්ඤාය= සියලු චාතුර්භූමක ධර්මය තමා විසින් ම දැන; කමුද්දිසෙය්‍යං= අන් කවරෙක් මාගේ ආචාර්‍ය යයි උදෙසම් ද? න මෙ ආචරියෝ අත්ථි= ලොකොත්තර ධර්මයෙහි මට ආචාර්‍යයෙක් නම් නැති; නත්ථි මෙ පතිපුග්ගලෝ= මට ප්‍රතිභාග පුද්ග

ලයෙක් නම් නැති; **සම්මාසම්බුද්ධෝ**= සම්‍යක්හේතුයෙන් නයින් චතුස්සත්‍යයන් තමා විසින් අවබෝධකරනලද්දේ; **සිතිභූතෝ**= සියලු කෙලෙස් ගිනී නිවීමෙන් සිඟිල් වූයේ; කෙලෙසුන්ගේ ම නිවුණුබැවින් **නිබ්බුතෝ** (= නිවියේ;) **කාසීනං පුරං**= කසීරට නුවරට; **ආහඤ්ඡං අමතදුන්දුභිං**= දම්සක් ලැබීම පිණිස අමාබෙරය ගසන්නෙමියි යමි; **අරහසි අනන්තජිනෝ**= අනන්තජින යයි වන්ව සුදුසු ඇ; **භූවෙය්‍ය පාවුසෝ!**= ඇවැත්නි! මෙසේත් නම් වන්නේය; **පක්කාමි**= වඩහාර නම් ජනපදයට ගියේය.

එහි එක් මුවවැදිගමක් ඇසුරු කොට වාසය කෙළේය, දෙවුවැදි තෙම ඔහුට උපස්ථාන කෙළේය; ඒ ජනපදයෙහි වණ්ඩවූ මැස්සෝ වෙති, එකල්හි ඔහු **එක්** සැළකින් වැසූහ; මුවවැදි තෙම දුර මුවදඩ යන්නේ "අපගේ රහතුන් වහන්සේ **කෙරෙහි** නො පමාව" යි "ජවා" නම් දුවණියට ඇණවා පුත්‍රයාණන් සමග ගියේය; ඕ ඔහුගේ දූ ද දැකුම්කටයුතු වූවා පිරුණු දසරුවැ ඇත්තී වෙයි; දෙවන දවස් උපකතෙම ගෙට පැමිණියේ ඒ දැරිය සියලු උපචාර කොට වලඳවන්ට එලඹියා දැක රාගයෙන් මඩනාලද්දේ වලඳන්ට ද නො හැකි වන්නේ බදුනෙන් බත් ගෙන වසන තැනට ගොස් බත් **එක්පසෙක** බහාතබා "ජවා" ලැබෙම් නම් ජීවත් වෙමි, ඉදින් නො ලැබෙම් නම් මැරෙමි" යි නිරාහාර වැ ශයනය කෙළේය; **සත්වනදවස්** මුවවැදි අවුත් දුව අතින් උපකයාගේ පවත් විචාළේය, **එක් දිනක්** ම අවුත් නැවත නො ආවිරැ යයි කීය; මුවවැදි ආ වෙසින් ම ඔහු කරා එලඹ විචාරන්නෙමි,යි **එකෙණෙහි** ම ගොස් වහන්ස! නො පහසුව කිමැයි පාදයන් පරාමර්ශනය කරමින් විචාළේය; උපකතෙම තතනමින් පෙරලේ මැය; හෙතෙම වහන්ස! කියනුමැන, යමක් මා විසින් කරන්ටහැකි නම් ඒ සියල්ල කරන්නෙමි,යි කීය; උපකතෙම "ඉදින් ජවා ලැබේම් නම් ජීවත් වෙමි, ඉදින් නො ලැබෙමි නම් මෙහි ම මරණය උතුමැ"යි කීය; වහන්ස! කීසි ශිල්පයක් දනිහි දැ? යි; නො දනිමි,යි; වහන්ස! කිසි ශිල්පයක් නො දන්නහු විසින් ගෘහාවාසයෙහි පිහිටන්ට නො හැකි යයි හෙතෙම කීය; මම කිසි ශිල්පයක් නො දනිමි, එතකුදු වුවත් තොපගේ මාංසහාරකයෙක් වන්නෙමි, මස් ද විකුණන්නෙමියි; මුවවැදිතෙම අපට ද මෙය ම රැවි වේ යයි උතුරැසළුවදී ගෙට කැඳවාගොස් දුවණිය දුන්නේය; ඔවුන්ගේ සංවාසයට පැමිණි මෙන් පුත්‍රයෙක් වැදූ; ඔහට "සුභද්‍ර" යයි නම් කළාහුය; ජවා තොමෝ ඔහු හඬනකල්හි "මස් අදින්කාගේ පුත! මුවවැද්දාගේ පුත! නො හඬව නො හඬව" යනාදිය කියමින් පුත්‍රයා සතුටුකරන ගීතයෙන් උපකයා නිග්‍රහ කෙළේය; සොඳුර! තී මා අනාථයෙකැයි සිතහි, මට "අනන්තජින" නම් යහලුවෙක් ඇති, මම ඔහු සමීපයට යන්නෙමියි කීය. ජවා මෙසේ මේතෙම ලජ්ජා වේ යයි දැන නැවත නැවත කියයි; හෙතෙම එක් දිනක් නො

දන්වා ම මෑදුම්දෙසට අභිමුඛව නික්මුනේය; භාග්‍යවතුන් වහන්සේ ද එසමයෙහි සැවැත්නුවර සම්පයෙහි දෙවුරම් මහවෙහෙර වෙසෙති, එකල භාග්‍යවතුන් වහන්සේ පළමු ම භික්ෂූන් ඇණවූසේක. "මහණෙනි! යමෙක් අනන්තජින යයි විචාරමින් පැමිණේ ද, ඔහට මා දක්වන්නහු ය" යි උපක තෙමේ ද අනන්තජින කොහි වෙසේ දැ? යි අසමින් පිළි වෙළින් සැවැත්නුවරට අවුත් වෙහෙරමැද සිට අනන්තජින කොහි යැ? යි ඇසී. භික්ෂූහු ඔහු භාග්‍යවතුන් වෙත පැමිණවූහ; හේ ද භාග්‍ය වතුන් දැක භාග්‍යවතුන් වහන්සේ මා හඳුනන්නහු දැ? යි කීය; එසේය උපක! හඳුනම්, තෙපි කොහි විසූයෙහි දැ? යි; වහන්ස! වඩහාර ජන පදයෙහි යයි; උපක! මහලුවූයෙහි පැවිදිවන්ට හැකිවන්නෙහි දැ? යි; වහන්ස! පැවිදිවන්නෙමියි; භාග්‍යවතුන් වහන්සේ පැවිදිකරවා ඔහුට කම්වහන් දුන්හ; හෙතෙම කම්වහනෑ කම් කරන්නේ අනාගාමී ඵල යෙහි පිහිටා කලුරිය කොට අවිහයෙහි උපන; තවද- උපන් ඇසිල්ලෙ හි ම රහත්බවට පැමිණියේය. ඒ එසේ මැයි- අවිහයෙහි උපන් ඇසිල් ලක් ඇතිව සත්දෙනෙක් රහත්බවට පැමිණියාහුය; හෙතෙම ඔවුන තුරෙන් අන්‍යතරයෙකි. මේ වදුරතලද මැයි-

151. "අවිහං උපපන්නාසෙ - විමුත්තා සත්ත භික්ඛවො
රාගදෝසපරික්ඛීණා - තිණ්ණා ලොකෙ විසත්තිකං.

152. උපකො ඵලගණ්ඩා ච - පුක්කුසාති ච තෙ තයො
හද්දියො බණ්ඩදෙවො ච - බාහුදන්ති ච පිඩ්ඩියො
තෙ හිත්වා මානුසං දෙහං - දිබ්බං යොගං උපච්චගුං" යි.

සණ්ඨපෙසුං= කතිකා කළාහුය; බාහුලිකෝ= චීවරබාහුල්‍යාදිය සඳහා පිළිපන්නේ; පධානවිබ්භන්තා= ප්‍රධන්වියෝගයෙන් පෙරළුනේ, බැස්සේ, පිරිහුනේ; ආවත්තෙතා බාහුල්ලාය= චීවරාදීන්ගේ බහුලබව පිණිස පෙරළුනේ; අපි ච බෝ ආසනං ඨපෙතබ්බං= එතකුදු වුවත්

---

151 සත්ත භික්ඛවෝ= භික්ෂූහු සත්දෙනෙක්; අවිහං= අවිහබඹු ලොව්ව; උපපන්නාසෙ= උතපත්ති වශයෙන් පැමිණියාහු; විමුත්තා= අහිත්ඵලවිමුක්තියෙන් මිදුනාහු; රාගදෝසපරික්ඛීණා= රාගදෙෂයන් ක්‍ෂයකළාහු; ලොකෙ= සත්ත ලොක යෙහි; විසත්තිකං= තෘෂ්ණාව; තිණ්ණා= තරණය කළාහුය.

152. උපකෝ= උපකය; ඵලගණ්ඩා ච= ඵලගණ්ඩය; පුක්කුසාති ච= පුක්කුසාතිය යන; තෙ තයෝ= ඔවුහු තිදෙන ද; හද්දියෝ= හද්දියය; බණ්ඩදෙවෝ ච= බණ්ඩදෙවය; බාහුදන්ති ච= බාහුදන්තියය; පිඩ්ඩියෝ= පිඩ්ඩියය යන; තෙ= ඔවුහු සිව්දෙන ද; මානුසං දෙහං= මනුෂ්‍යදෙහ සඞ්ඛ්‍යාත ඔරම්භාගියසංයොජන පස; හිත්වා= දුරුකොට; දිබ්බං යොගං= දිව්‍යයොග සඞ්ඛ්‍යාත උඩ්ඩභාගියසංයොජන පස; උපච්චගුං= ඉක්ම ගියාහුයි.

උසස්කුලයෙහි උපන් ඕහට අසුන් පමණක් තැබියයුතු යයි කීහු; **නාසා කඛිංසු**= බුඩානුභාව යෙන් බුඩතෙජයින් මඩනාලද්දාහු තමන්ගේ කතික වෙහි සිටින්ට නො හැකි වූහු; **නාමෙන ච ආවුසොවාදෙන ච සමුදාචරන්ති**= "ගොතම!" යි කියති "ආවුසො!" යි කියති; ඇවැත්නි! ගෞතමයෙනි! ඇපි උරුවෙලායෙහි ප්‍රධන්වියර්‍යය කරන කාලයෙහි තොපගේ පාසිවුරු ගෙන හැසිරුනෙමු, මූවදෙනාදිය දැහැටිදඬු දුනිමු, වුසු පිරි වෙන හැමදීමු, පසුව ඔබට කවරෙක් වත්පිළිවෙත් කෙළේ ද? කිම අප ඉවත්ව නියකල්හි නො සිතූහු දැ? යි මෙබඳු කථාව කියති යන අර්ථයි. **ඉන්ද්‍රියානි**= දුෂ්කර වූ ඉරියව්වෙන්; **පරිපඳානි**= දුෂ්කර වූ පිළිවෙතින්; **දුක්කරකාරිකාය**= පතක් පතක් මුංයුසාදිය ආහාරකොට ගැනීම්ආදි වූ දුෂ්කරයන් කිරීමෙන්; **අභිජානාථ මෙ නො**= දන්නහු ද? මාගේ; **එවරූපං වඩාචිතමෙතං**= තෙල මෙබඳු වූ වාක් බිඳීම යන අර්ථයි. කිමෙක් ද? මම උරුවෙල්හි ප්‍රධන් සමයෙහි තොප සඟන්නා පිණිස උකටලී නො වනු පිණිස රෑ හෝ දවල් හෝ අවුත් "ඇවැත්නි! විතකී නො කරවු, මට අවහාසයෙක් හෝ නිමිත්තයෙක් හෝ පැනේ" යයි මෙබඳු වූ කිසි වචනබිඳීමක් කෙළෙම් ද? යන අදහසයි. ඔවුහු එක් පෙදෙන් ම සිහි ලැබ උපන් ගෞරව ඇත්තාහු එකාන්තයෙන් මේ තෙම බුදුවූයේ වනැයි අදහා "නො හෙතං භන්තෙ!" යි කීහු. **අසක්කිං වො අහං භික්ඛවෙ! පඤ්චවග්ගියෙ භික්ඛූ සඤ්ඤාපෙතුං**= මහණෙනි! මම පස්වගමහණුන් "මම බුදුම්" යි හඟවන්ට හැකිවීම්; කවද- එකල භාග්‍යවතුන් වහන්සේ පොහෝදවස්හි මෑ පැමිණියහ, නැවත තමන්වහන්සේගේ බුඩභාවය දන්වා කෞණ්ඩින්‍ය සථවිරයන් කායසාක්ෂි කොට දම්සක්පැවතුම් සූත්‍ර වදාළහ, සූත්‍රාවසානයෙහි තෙරුන් වහන්සේ අට ලොස් කෙළක් බ්‍රහ්මයන් සමඟ සෝවාන්පෙලෙහි පිහිටියහ. භිරු බැර මාන කල්හි මෑ දෙසුම් නිමිසේයි. භාග්‍යවතුන් වහන්සේ එහි ම වස් එලඹියහ. **මෙපි සුදං භික්ඛවෙ! භික්ඛූ ඔවදමි** යනාදිය පැළවිය දින පවන් පිඬු පිණිස ද ගමට නො පිවිසිම දක්වන පිණිස වදාරනලද; ඒ භික්ෂූන්ගේ කම්වහන්හි උපන් මලවිශොධනය පිණිස භාග්‍යවතුන් වහන්සේ ඇතුලු වෙහෙර ම වූහ; ඒ භික්ෂූහු ද උපනුපන් කම්වහන් මලයන් භාග්‍යවතුන් සමීපයට ගොස් විචාරති, භාග්‍යවත්හු ද ඔවුන් හුන් තැනට ගොස් මල දුරුකෙරෙති; එකල්හි මෙසේ බැහැරකළ බත් ඇති භාග්‍යවතුන් විසින් අවවාද කරනුලබන්නාවූ ඔවුනතුරෙන් "වප්ප" තෙර පැළවිය දවස් සෝවාන් විය; "භද්දිය" තෙර දියවක ද, "මහානාම" තෙර තියවක ද, "අස්සජි" තෙර ජලවක ද (සෝවාන් විය;) යලි පඤ්චයාගේ විසේනියදවස් ඔවුන් සියල්ලන් මෑ රැස්කරවා "අනත්තලක්ඛණ" සූත්‍රාවසානය වදාළහ. සූත්‍රාවසානයෙහි සියල්ලෝ මෑ රහත් පෙලෙහි පිහිටියාහුය. එයින් වදාළහ— **"අථ වො භික්ඛවෙ! පඤ්චවග්ගියා භික්ඛූ මයා එවං ඔවදියමානා -පෙ- අනුත්තරං යොගක්ඛෙමං**

නිබ්බානං අජ්ඣගමංසු -පෙ- නත්ථිදානි පුනබ්භවෝ'' යි. මෙතෙක් කථා මාර්ගීය භාග්‍යවත්හු ''තෙපි ද මාගේ ගා පස්වහුන්ගේ ද මඟට බැස ගත්තාහුය, තොපගේ සෙවීම ආර්‍යයන්ගේ සෙවීම ය'' යි පළමු යමක් වදාළසේක් ද, මේ එකා ම අනුසන්ධිය දක්වමින් එලවූසේක.

මෙවිට යම්හෙයකින් ගිහිගෙ වැසියන්ගේ ම පස්කම් ගුණ සෙවීම නො වේද, සිව්පසය නො පස්වකා වලඳන්නාවූ පැවිද්දන්ගේ ද පස් කම්ගුණ වශයෙන් අනාර්‍යපර්‍යේෂණය වේද; එහෙයින් එය දක්වන්ට පඤ්චිමේ භික්ඛවෙ! කාමගුණා යනාදිය වදාළහ. එහි අලුත රැඳූ පවසිවුරු ආදියෙහි ''චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා'' යනාදි වූ සතර කාමගුණ යෝ ලැබෙති, රසය වැලිත් මෙහි පරිභොගරසය වෙයි; මනොඥ වූ පිණ්ඩපාතයෙහි ද භෛෂජ්‍යයෙහි ද පස ම ලැබෙති, සෙනස්නෙහි සිවු රෙහි මෙන් සතරකි, රසය වනාහි මෙහි ද පරිභොගරසය මැයි. කෙ හි කෙචි භික්ඛවෙ! යනු කුමක් හෙයින් ආරම්භ කළසේක් ද? මෙසේ පස් කම්ගුණ දක්වා මේවිට යමෙක් තුමූ ''පැවිදි වූ කල පටන් පැවිද්දන්ට අනාර්‍යපර්‍යේෂණා නම් කොයින් ද? ආර්‍යපර්‍යේෂණා ම වේ'' යයි මෙසේ කියන්නාහු ද? ඔවුන් ප්‍රතිෂේධ කරනු පිණිස පැවිද්දන්ගේ ද සිව්පසයෙහි නො පස්වකිමෙන් පරිභොගය අනාර්‍යපර්‍යේෂණා ම වේ යයි දක්වන්ට මේ දෙශනාව ආරම්භ කළහ එහි ගථිතා= තෘෂ්ණාග්‍රන්ථ නයෙන් ගෙතුනාහු; මුච්ඡිතා= තෘෂ්ණාමූර්ච්ඡායෙන් මුසපත් වූවාහු; අජ්ඣාපන්නා= තෘෂ්ණාවෙන් ඇතුලත ගැලුනාහු; අනාදීනවදස්සාවිනො= ආදීනවය නො දක්නාහු; අනිස්සරණපඤ්ඤා= ''නිස්සරණ'' යයි පස්වකුම්නුවණ කියනුලැබේ, එයින් තොර වූවාහු; මෙවිට ඒ අර්‍ථය ඔබ කරන්නාවූ උපමාවක් දක්වමින් සෙය්‍යථාපි භික්ඛවෙ! යනාදිය වදාළහ. එහි මෙසේ ඕපම්‍යසංසන්දනය දතයුතු. මේ විස්තර යෑ— වනමුවා මෙන් මහණ බමුණෝ ද, වැද්දු විසින් වනයෙහි තැබූ පාශය මෙන් සිව්පසය ද, ඒ වැද්දුගේ පාශරාශිය මැඩගෙන නිදන කාලය මෙන් ඔවුන්ගේ සිව්පසය නො පස්වකා පරිභොග කරන කාලය ද, වැද්දු එනකල්හි මුවාගේ යම් කැමකි තැනෙක්හි යන කාලය මෙන් මහණබමුණන්ගේ මාරයා විසින් කැමතිපරිද්දෙකින් කළයුතු කාලය ද මාරවශගතයව පැමිණීබව යන අර්‍ථයි; යලි නො බඳනාලද මුවාගේ පාශරාශිය ඔත්තෙහි ශයන කාලය මෙන් මහණ බමුණන්ගේ සිව්පසයෙහි පස් විකීමෙන් පරිභොගය ද, වැද්දු එනකල්හි මුවාගේ කැමති තැනෙක්හි යෑම මෙන් මහණබමුණන්ගේ මාරවශයට නො පැමිණීම ද දතයුතු. විඝාසෙට්ඨා= නිහීය වූයේ, නිසැක වූයේ; සෙස්ස සියලු තැන්හි ප්‍රකට වූ අර්‍ථ ඇත්තේ මැයි.

පාසරාසි හෙවත් අරියපරියෙසන සූත්‍ර වර්ණනා නිමි.

චූලහත්ථිපදෝපම සූත්‍ර වණ්ණනා.

එවමේමසුතං යි චූලහත්ථිපදෝපම සූත්‍ර යයි. එහි **සබ්බසෙතෙන වළභිරථෙන** යනු "සෙතා සුදං අස්සා යුත්තා හොන්ති සෙතාලඞ්කාරා, සෙතෝ රථෝ සෙතපරිවාරෝ සෙතාරස්මියෝ සෙතා පතෝදලට්ඨි සෙතං ඡත්තං සෙතං උණ්හීසං සෙතානි වත්ථානි සෙතා උපාහනා සෙතාඝ සුදං වාලවීජනියා වීජියති" යි මෙසේ කියනලද සම්පූර්ණ වූ වෙළඹුන් සතර දෙනෙක් යෙදූ රථයෙන්; තවද– මේ රථය නම් විවිධ වෙයි, යොධරථය අලඞ්කාරරථය යි කියායි; **එහි** යොධරථය සිව්රැස්සටහන් ඇත්තේ වෙයි, ඉතාමහත් නො වෙයි, ජනයන් දෙදෙනෙක් තිදෙනෙක් හෝ හැනීමට පොහොනේයි; අලඞ්කාරරථය මහත් වෙයි, දිගින් ද දිගයැ, පුළුල්ලින් ද පුළුල්යැ; එහි ඡත්‍රග්‍රාහක යැ වාලව්‍යජනග්‍රාහක යැ තාලවෘන්තග්‍රාහක යැයි මෙසේ අටදෙනෙක් හෝ දසදෙනෙක් හෝ සුවසේ ම සිටින්ට හෝ හිඳින්ට හෝ නිදන්ට හෝ හැකිවෙත්. මේ ද අලඞ්කාර රථයෙක් මැයි; චක්‍ර – පඤ්ජර – රියකඳ සහිත වූ ඒ සියලු රථය රිදීයෙන් කරනලද්දේ විය, වෙළඹ පියවින් ශ්වේතවර්ණවූවාහු ම වෙති, ඔවුන්ගේ අබරණ ද රිදීමුවා විය, රැහැන් ද රජතප්‍රණාලීන්හි බහාලන ලද්දාහුය; කෙවිට ද රිදීයෙන් කරනලද; බමුණුතෙමේ ද සුදුවතක්හැඳ සුදුවූ ම උතුරැසළුවක් කෙළේය, සුදු මිලවුන් තැවරිය, සුදුමල් පැළඳුන්දේය, දසඇඟිලිවල ඇඟිලිමුදු ද කනෙහි කුණ්ඩලාදිය ද යන මේ ආදි වූ ඔහුගේ අබරණ ද රිදීමුවා විය; ඔහුගේ පිරිවර බමුණෝ ද දසදහසක් පමණ වූවාහු එසේම ශ්වේත වස්ත්‍ර විලෙපන මාලාලඞ්කාර ඇත්තාහු වූහ. එසින් කියනලදී— "සබ්බසෙතෙන වළභිරථෙන" යනු.

සාවත්ථියා නිය්‍යාති= මහතෙම සය සය මසකට එක්වරක් නුවර පැදකුණු කෙරේ ලු; මෙසින් මෙතෙක් දිනකින් නුවර පැදකුණු කරන්නේය,යි සොඹණය කෙරෙයි; ඒ අසා යමෙක් නුවරින් නො නික්මුනාහු ද ඔවුහු නො නික්මෙති, යමෙක් නික්මගියාහු ද ඔවුහු ද පිනැත්තහුගේ සිරිසැපත් බලන්නෙමුයි පැමිණෙති, යම් දිනක බමුණු නුවර හැසිරේ ද එදින උදෑසන ම නුවරවිදි හැමද වැලි ඉස ලප්පස්මලින් හාස්පස විසුරුවා පුන්කුඹු තබා කෙසෙල්ගස් ද ධජ ද ඔසවා සියලු නුවර දුම්ගන්වනලද – සුවඳගන්වනලද්දක් කෙරෙති; බමුණු උදෑසන ම යීඝීඝනාකය කොට පෙරබත වලඳා කි පරිදි ම සුදුවත් ආදියෙන් තමා අලඞ්කාර කොට පහයෙන් බැස රථයට නගී; ඉක්බිති ඒ බමුණෝ සම්පූර්ණ ශ්වේතවස්ත්‍ර විලෙපන මාලාලඞ්කාර ඇත්තාහු සේසත් ගෙන ඔහු පිරිවරති. අනතුරුව මහාජනයාගේ රැස්වීම පිණිස පළමු කොට ම තරුණ

ජනුසෙසාණං බමුණු නුවරපැදකුණුකිරීම.

දරුවන්ට එලා එල විසුරුවති; ඊට අනතුරුව මසු ද ඊට අනතුරුව කවණු ද විසුරුවති; මහාජන තෙම රැස් වෙයි, බල්වර ද පිළිසිසැරීම් ද පවතියි. ඉක්බිති බමුණු තෙම මාඞ්ගලික – සෙෘවඤ්ඡිකාදි පුරුෂයන් මඞ්ගලයන් ද සවසතින් ද කරන කල්හි මහත් වූ සම්පත්තියෙන් යුකතව නුවර හැසිරෙයි; පිනැති මනුෂ්‍යයෝ එක්බුමුආදි පහයෙහි නැඟී සුවපියා වැනි වාකවුළු විවරකොට බලති; බමුණු ද තමාගේ යශස්ත්‍රීසම්පත්තියෙන් නුවර උතුරුවමින් මෙන් දකුණු දොරට අභිමුඛ වූයේ වෙයි. එයින් කියනලදී- "සාවත්ථියා නියාති" යනු.

දිවා දිවස්ස= දිනයාගේ ද දවල්; මධ්‍යාහ්නකාලයෙහි යන අර්ථයි. **පිංගලානිකං පරිබ්බාජකං**= "පිලොතිකා" යි මෙසේ ස්ත්‍රීලිඞ්ග ව්‍යවහාර වශයෙන් ලද නම් ඇති පිරිවැජියා; ඒ පරිව්‍රාජක තෙම තරුණවූයේ පළමුවයසෙහි සිටියේ රන්වන්වූයේ බුඩොපසථාඅකයෙක් ලු; උදෑසන ම තථාඅතයන්ට ද මහතෙරවරුන්ට ද උපසථාන කොට ත්‍රිදණ්ඩකුණ්ඩිකාදි පිරිකර ගෙන දෙවුරම්න් නික්ම නුවරට අභිමුඛව නික්මුනේය. මේ තෙම ඔහු දුරින් ම එන්නහු දුටුයේය.

එතදවොච= පිළිවෙළින් සම්පයට පැමිණියහු හැඳින **භදන්තෙ කුතෝ නු භවං වජ්ජායනෝ ආගච්ඡති** යි හොත්‍රය ප්‍රකාශකරමින් මේ වචනය කීය. **පණ්ඩිතෝ මඤ්ඤේ**= භවත් වාත්සාය්‍යායන තෙම ශ්‍රමණ ගෞතම යන් පණ්ඩිතයෙකැයි සිතා ද, නොහොත් නැත් ද? යි මේ මෙහි අර්ථයි. **නො වා'හං භෝ!**= පින්වත! ශ්‍රමණ ගෞතමයන්ගේ ප්‍රඥව්‍යකතභාවය දැනීමෙහි ලා මා කවරෙක් ද? **කෝ ච සමණස්ස ගොතමස්ස පඤ්ඤා වෙය්‍යත්තියං ජානිස්සාමි**= යලි කොයින් මම ශ්‍රමණ ගෞතමයන්ගේ ප්‍රඥව්‍යකතභාවය දැනගන්නෙම් ද? කවර කරුණකින් දැනගන්නෙම් ද? යි මෙසේ සර්ව්‍රකාරයෙන් ම තමාගේ නො දන්නබව දක්වයි; **සෝ'පි නූන'ස්ස නාදිසෝ'ව**= යමෙක් ශ්‍රමණ ගෞතමයන්ගේ ප්‍රඥ ව්‍යකතභාවය දන්නේ ද, හෙ ද ඒකාන්තයෙන් දසපැරැම් පුරා සම්බෝධ බවට පැමිණි එබදු වූ බුදුකෙනෙක් ම වන්නේය; ඕහමෙර හෝ හිමවත හෝ පොළොව හෝ අහස හෝ මනිනු කැමැත්තහු විසින් එපමණ වූ මැදණ්ඩක් හෝ රැහැනක් හෝ ලබන්ට වටනේය; ශ්‍රමණ ගෞතමයන්ගේ ප්‍රඥව දැනගන්නහු විසින් ද ඔහුගේ නුවණ හා සමානවූ ම සම්බෝධතාඥනය ලබන්ට වටනේ යයි දක්වයි; තවද- මෙහි ආදරවශයෙන් ආමෙඩිතය කරනලදී. **උළාරාය**= උතුම් වූ, ශ්‍රෙෂ්ඨ වූ; **කොචා'හං භෝ!**= පින්වත! මම ශ්‍රමණ ගෞතමයන්ට පැසසීමෙහි කවරෙක් ද? **කෝ ච සමණං ගොතමං පසංසිස්සාමි**= කවර කරුණකින් පසසන්නෙම් ද? **පසත්ථා පසත්ථෝ**= සියලු ගුණයන් මතුයෙහි හැසිරෙන්නා වූ සියලු ලොකයා විසින් පසස්නාලද තමන්ගේ ගුණයන් විසින් ම ප්‍රශස්ත යැ; උත්තමයන් සේට අන්‍යයන් විසින් පැසසුම් කටයුත්තෙක් නැති; ඒ එසේ මැයි— යම්සේ සපුමලක් හෝ නිලුපුලක් හෝ පියුමක් හෝ රත්සඳුන් හෝ

තමාගේ වණ්ණගන්ධශ්‍රියෙන් ම ප්‍රභාද එලවන්නේ ත් සුවඳ වූයේ ත් වේද, ඕහට ආගන්තුක වූ වණ්ණගන්ධයන්ගෙන් තුනිකටයුත්තෙක් නැත්තේ ද; තවද-සම්සේ මිණිරුවනක් හෝ සඳමඩල හෝ තමාගේ ආලෝකයෙන්ම බබලා ද, ඕහට අනිකෙකු විසින් එලියකටයුත්තෙක් නැත්තේ ද; එප රිදෙන් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ සියලු ලොකයා විසින් පසස්නා ලද තමන් වහන්සේගේ ගුණයන් විසින් ම පසස්නා ලද්දේය, සතුති කරන ලද්දේය, සියලු ලොකයාගේ ශ්‍රෙෂ්ඨභාවයට පමුණුවන ලද්දේය; උන්වහන්සේට අනිකෙකු විසින් පැසසුම් කටයුත්තෙක් නැත්තේසි. නොහොත් ප්‍රශස්තයන් විසින් පසස්නා ලද්දේ නුසි ද "පසත්‍ථ පසත්‍ථ" නම් වේ; කවරහු වැලිත් ප්‍රශස්තයෝ නම් වෙත් ද? පසේනදිකොසොල් රජ තෙම කාසිකොසලවාසීන් විසින් ප්‍රශස්ත යැ, බිම්සර රජ තෙම අඞ්ග මගධවාසීන් විසින් (ප්‍රශස්ත යැ,) විසාලාවැසි ලිච්ඡවීහු වැදූරටවාසීන් විසින් ප්‍රශස්ත යෝ යැ, පාවෙය්‍යකමල්ල රජදරුවෝ ද කුසිනාරාවැසි මල්ලරජදරුවෝ ද අන්‍යවූ ත්- ඒ ඒ ක්ෂත්‍රියයෝ ද ඒ ඒ දනව් වැසියන් විසින් පසස්නා ලද්දාහුය; වඩ්ඪිආදි බ්‍රාහ්මණයෝ බමුණු සමූහයා විසින් (ප්‍රශස්තයහ;) අනාථපිණ්ඩිකාදි උපාසකයෝ උපාසක සමූහයා විසින් ද, විසාඛාදි උපාසිකාවෝ නොයෙක් සියගණන් උපාසිකාවන් විසින් ද, සකුලුදායි ආදි පරිව්‍රාජකයෝ නොයෙක් පරිව්‍රාජකශතයන් විසින් ද, උත්පලවණ්ණා සථවිරී ආදි මහා ශ්‍රාවිකාවෝ නොයෙක් සියගණන් භික්ෂුණීන් විසින් ද, ශාරිපුත්‍රසථවිරාදි මහා සථවිරයෝ නොයෙක් සියගණන් භික්ෂූන් විසින් ද, ශක්‍රාදි දෙවියෝ නොයෙක් දහස්ගණන් දෙවියන් විසින් ද, මහා බ්‍රහ්මාදි බ්‍රහ්මයෝ නොයෙක් දහස් ගණන් බ්‍රහ්මයන් විසින් ද ප්‍රශස්තයෝසි. ඔවුහු සියල්ලෝ ම දශබලයන් සතුති කෙරෙති වණ්ණනා කෙරෙති, ප්‍රශංසා කෙරෙත් නුසි භාග්‍යවත්හු ප්‍රශස්ත ප්‍රශස්ත යසි කියනු ලැබෙත්.

අත්‍ථවසං= අර්‍ථානිශංසය; ඉක්බිති ඕහට පිරිවැජි තෙම තමාගේ පැහැදීමට කරුණ කියන්නේ **සෙය්‍යථාපි භෝ! කුසලෝ නාගවනිකෝ** යනාදිය කියා, එහි **නාගවනිකෝ**= ඇතුන් විසන වනයක වෙසෙන්නාවූ නුගත් ශිල්පඇති පුරුෂයෙක්; මත්තෙහි වනාහි උගත් ශිල්පඇති පුරුෂයෙක් "නාගවනිකෝ" සි ආයේය. **චතුනාළි පදානි**= සතර ඥානපදයන්; නැණවැළඳුම් නුවණින් ඇක්මුණුතැන් යන අර්‍ථයි. **ඛත්තියා පණ්ඩිතෝ** යනාදියෙහි **පණ්ඩිතෝ**= පණ්ඩිත බැවින් සමන්විත වූවන්; **නිප්පණෝ**= සිලුටුවූවන්, සියුම්බුඩි ඇතියන්, සියුම් වූ අර්‍ථානන්තර ප්‍රතිවෙධයෙහි සමර්‍ථ වූවන්; **ඤානපරප්පවාදෙ**= දැනගත් පරවාද ඇතියන් හා අන්‍යයන් සමඟ කළවාදපරිචය ඇතියන් ද; **වාලවෙධිරූපෙ**= වාලවෙධි ධනුර්‍ධර යන් සමානවූවන්; **වොහිඤඤා මඤ්ඤේ චරන්ති**= වාලවෙධි ධනුර්‍ධර යෙක් අස්ලොම මෙන් සියුම්වූ ද අන්‍යයන්ගේ දෘෂ්ටිගතයන් තමාගේ නුවණින් බිඳින්නවුන් මෙන් හැසිරෙත් යන අර්‍ථයි.

පඤ්හං අභිසඞ්ඛරොතීති= දෙපදවූ ද තිපදවූ ද සිව්පදවූ ද ප්‍රශ්න යන් කෙරෙති; **වාදං ආරොපෙස්සාම**= දෙස් නහන්නෙමු; **න වෙ'ව සමණං ගොතමං පඤ්හං පුච්ඡන්ති** යනු කුමක් හෙයින් නො විචාරත් ද? භාග්‍යවතුන් වහන්සේ වනාහි පිරිස්මැද දහම් දෙසනසේක් පිරිසෙහි අදහස බලති, ඉක්බිති මේ ක්ෂත්‍රිය පණ්ඩිතයෝ ගුරු වූ රහස් වූ ප්‍රශ්න යක් ඔවට්ටිකසාරය කොට ආවාහු යයි දක්නාසේක. හේ ඔවුන් විසින් නො විචාරනලද්දේ ම මෙබදු ප්‍රශ්නයෙහි විචාරීමෙහි ලා මෙතෙක් දෙෂ යෝ යැ, විසඳීමෙහි මෙතෙක් (දෙෂයෝ යැ,) අර්ථයෙහි, පදයෙහි, අක්ෂර යෙහි, මෙතෙක් (දෙෂයෝ) යයි මේ ප්‍රශ්නයන් විචාරන්නේ මෙසේ විචාරන්නේය, විසඳන්නේ මෙසේ විසඳන්නේ යයි මෙපරිද්දෙන් ඔවට්ටි කසාරය කොට ගෙන ආ ප්‍රශ්න ධර්මකථාව අතරැ බහා වෙසෙසින් දක් වන්නේය; ක්ෂත්‍රිය පණ්ඩිතයෝ ඇපි යම් මේ ප්‍රශ්නයන් නො විචාළ මෝ ද අපට එකාන්තයෙන් යහපතෙක, ඉදින් ඇපි පුළුවුස්නෙමු නම් ශ්‍රමණ ගෞතම තෙම අප ප්‍රතිඤ්ඤාරහිතයන් කොට දමන්නේ යයි සතුටු සිත් ඇත්තාහු වෙති. තවද- බුදුවරයෝ නම් දහම් දෙසන්නාහු පිරිස මෙත්‍රියෙන් පතුරුවති, මෙත් පැතිරවීමෙන් දශබලයන් කෙරෙහි මහා ජනයාගේ සිත පහදී. වැලිත් බුදුවරයෝ නම් රුවින් අගපත් වූවාහු දැකුම්කලු වූවාහු මධුරස්වර ඇත්තාහු මොළොක්දිව ඇත්තාහු මොනො වට පහස්ලද දන්තාවරණ ඇත්තාහු වෙති, අමායෙන් ළය තෙමන්න වුන් මෙන් දහම් දෙසති; එහි මෙත් පැතිරවීමෙන් පහන්සිත් ඇති ඔවුන්ට මේ සිත වෙයි- මෙබදු වූ දෙපරිද්දෙකින් නො පැවති කථාව නො සිස් කථාව නෛයර්‍යාණික කථාව කියන්නා වූ භාග්‍යවතුන් සමග විරුඬග්‍රහණය ගන්නට නො හැකිවන්නෙමුයි තමාගේ පහන් බැවින් ම නො පුළුවුස්ති. **අඤ්ඤදත්ථු**= එකාන්තයෙන්; **සාවකා සම්පජ්ජන්ති**= සරණගමන වශයෙන් ශ්‍රාවකයෝ වෙති; **නදනුත්තරං**= ඒ අනුත්තර වූ; **බ්‍රහ්මචරියපරියොසානං**= මාගීබ්‍රහ්මචර්‍යාවගේ පර්‍යවසානය වූ අගින් ඵලය; **සැබව**- එය ප්‍රයොජන කොට ඔවුහු පැවිදි වෙති; **මනං වත භො! අනස්සාම**= පින්වත්නි! ඉදින් ඇපි නො ඵලබුනෙමු නම් මේ මදවූ නො ඵලඹීම් පමණෙකින් පර්‍යුපාසනය නො කිරීම් පමණෙකින් ම නටුවෝ වන්නෙමු, වැලි ඵලඹීම් මාත්‍රයකින් නො නටුවෝ වෙමු යන අර්ථයි. දෙවෙනි පදය පළමු පදයාගේ ම වෙ වචනයි. **අසස්සමණාව සමානා** යනාදියෙහි පාපයන් නො සන්සිඳුවනලද බැවින් අශ්‍රමණ වූවාහු ම; යලි නො බහාතබනලද බැවින් අබ්‍රාහ්මණ වූවාහු ම; කෙලෙස් සතුරන් නො නසනලද බැවින් නො රහත් වූවාහු ම යන අර්ථයි.

උදානං උදානෙසි= ප්‍රීතිමයවචනයක් පහළ කෙළේය; ඒ එසේ මැයි- යම්සේ යම් තෙලක් මිනුම ගන්ට නො හැකි වේද, වැගිරී යේද, එය "අවසෙක" යයි කියනු ලැබේද; යම් ජලයකුත් තබාකය ගන්ට නො හැකි වේද, ඉතිර යේද, එය "ඔඝ" යයි කියනු ලැබේද, එපරිද්දෙන් ම යම් ප්‍රීතිමය වචනයක් හෘදය ගන්ට නො හැකි වේද, අධිකවැ ඇතුලත

නො පිහිටා පිටත නික්මේද, එය "උදුන" යයි කියනු ලැබේ; මෙබදු වූ ප්‍රතිමය වචනයක් පහළ කෙරුණ්ය යන අර්ථයි. **හත්ථිපදෝපමෝ**= ඇත් පිය උපමා වූවා මේ ධර්මයට නුසි "හත්ථිපදෝපම" නම් වේ. ඒ ධර්මය මේ පමණෙකින් විස්තරයෙන් පරිපූර්ණ වූයේ නො වේ" යයි දක්වන සේක. **නාගවනිකෝ**= උගත් හස්තිශිල්පය ඇති ඇතුන් වෙසෙන වනයක හැසිරෙන්නෙක්; වැලි කුමක්හෙයින් "කුසලෝ" යි නො වදරනලද ද යත්? මත්තෙහි "යෝ හොති කුසලෝ" යි විභාගය දැක්වීම පිණිසයැ; යම් හෙයකින් යම් කිසිවෙක් පිවිසේ ද, වැලි යමෙක් දක්ෂ වේද, හෙතෙම එතැන් නිෂ්ඨාවට නො ම යේ ද, එහෙයින් මෙහි "කුසලෝ" යි නො වදරා මත්තෙහි වදරනලද්දේය; **වාමනිකෝ**= හ්‍රස්වවූ ආයාමයෙන් ද නො දික් වූ මහත් කුසැති ඇතිනීහු.

උච්චා ච නීචෙච්චනං= සත්-අවරියන් උස් වූ නුගරුක් ආදීන්ගේ කඳපෙදෙසෙහි ගැටුණු තැන; **උච්චාකාළාදිකා**= යට වැනි පා ඇති ව උස්වූ ද, දන්තයන්ගේ නො සමබැවින් "කාළාරිකා" නම්වූ ද; ඔවුන්ගේ එක් දන්තයෙක් උන්නත වේල, එකෙක් අවනත වේල; (දත්) යුවළ ම විරල වූවාහු වෙති, ආසන්න නො වෙත් ල.

උච්චා ච දන්තෙහි ආරඤ්ජිනානි= සත්පුරියන් උස්වූ නුගරුක් ආදීන්ගේ කඳපෙදෙස පොරොවකින් පහළතැන් මෙන් දළවලින් සිදින ලද තැන; **උච්චාකණේරුකා නාම**= යට වැනි පා ඇති වැ උස්වූ ද, දන්තයන්ගේ මකුලභාවයෙන් "කණේරුකා" නම් වූ ද; ඔවුහු මුහුලුදළ ඇත්තාහු වෙත් ල, එහෙයින් "කණේරුකා" යි කියනු ලැබෙත්. **සෝ නිඤ්ඤං ගච්ඡති**= ඒ නාගවනික තෙම එකාන්තයෙන් මම යම් ඇතෙකුගේ පිය අනුව ආයෙම් ද, හේ මේ තෙමේ ම වෙයි, මේ ම හෙතෙමේ ය, අනිකෙක් නො වේ; ඒ එසේ මැයි- මම පළමු කොට යම් පියක් දැක වාමනිකාවන්ගේ පියක් වන්නේ යයි නිෂ්ඨාවට නො ගියෙම් ද, ඉන් මැතභාගයෙහි යම් (පියවර) කුත් දැක කාළාරිකාවන්ගේ වන්නේ යයි, කණේරුකාවන්ගේ වන්නේ යයි නිෂ්ඨාවට නො ගියයම් ද, ඒ සියල්ල මේ මහඇත්හුගේ ම පියවර යයි මහඇත් දැක ම නිෂ්ඨාවට යන්නේය;

එවමෙව ඛෝ යන මෙහි මේ ඕපම්‍ය සංසන්දන යයි.

හත්ථිපදෝපමාව. මේ විස්තර යැ- හස්තිවනය මෙන් ආදියෙහි පවත් නීව රණප්‍රහාණය තෙක් ධර්මදේශනාව දතයුත්තීය; දක්ෂවූ නාගවනිකයා මෙන් යොගාවචර තෙමේ ද, මහඇත්හු මෙන් සම්‍යක් සම්බුද්ධ ද, මහත්වූ ඇත්පිය මෙන් ධ්‍යානාභිඥ ද, නාගවනිකයාගේ ඒ ඒ තැන ඇත්පිය දැක ද වාමනිකාවන්ගේ පියක් වන්නේය, කාළාරිකාවන්ගේ- කණේරුකාවන්ගේ පියක් වන්නේ යයි නිෂ්ඨාවට නො ගියබව මෙන් යොගීහුගේ මේ ධ්‍යානාභිඥ නම් බාහිරක පරිව්‍රාජකයන්ට ද ඇත්තාහු යයි නිෂ්ඨාවට නො ගියබව ද, නාගවනිකයාගේ ඒ ඒ තැන

මා විසින් දක්නාලද පිය මේ මහඇත්හුගේ මැය අනිකෙකුගේ නොවේ යයි මහඇත් දූන නිෂ්ඨාවට යෑම මෙන් ආර්‍යශ්‍රාවකයාගේ රහත් බවට පැමිණ ම නිෂ්ඨාවට යෑම ද දතයුතු. තවද- මේ ඔඝපම්‍යසංසන්‍දනය මස්සාකයෙහි සිට ද කරන්ට වටනේය; මේ තැන්හි ද වටනේ මය; වැලි අනුක්‍රමයෙන් පැමිණියා වූ ඒ පාලිපදය ගෙන මෙහි ම කරනලදී.

එහි **ඉධ** යනු දෙශය දූක්වී මෙහි නිපාතයෑ; ඒ මේ "ඉධ" ශබ්දය, "ඉධ" ශබ්දය කිසි තැනෙක ලොකය ගෙන කියනු ලැබේ; වදාළේ මැනු- **ඉධ තථාගතෝ ලෝකෙ උප්පජ්ජති** යනු. කිසිතැනෙක ශාසනය කියනු ලැබේ; වදාළේ මැනු- **ඉධෙව භික්ඛවෙ! සමණෝ ඉධ දුතියෝ සමණෝ** යනු. කිසි තැනෙක අවකාශය යෑ; කියේ මැනු—

153. **"ඉධෙව තිට්ඨමානස්ස - දෙවභූතස්ස මේ සතෝ**
පුනරායු ච මේ ලද්ධෝ - එවං ජානාහි මාරිස!" යනු—

කිසි තැනෙක පදපූරණමාත්‍රයෙක් මයෑ; වදාළේ මැනු- **ඉධා'හං භික්ඛවෙ! භූතපුබ්බෙ අස්සං පවාරිතෝ** යනු. මෙහි වූ කලි ලොකය සඳහා කියනලදුයි දතයුතු. මේ කියනලද වෙයි- "බ්‍රාහ්මණය! මේ ලොකයෙහි අතීත් වූ -පෙ- චතුස්සත්‍යාවබෝධය කළාවූ භාග්‍යවත් වූ තථාගත තෙම උපදනේය" යි. එහි "තථාගත" ශබ්දය මූලපරියායයෙහි ද, "අරහං" යනාදීහු විශුද්ධිමාර්ගයෙහි ද විස්තාරකරන ලද්දාහුය; **ලෝකෙ උප්පජ්ජති** යන මෙහි වනාහි **ලෝක** යනු අවකාශ ලෝක යෑ සත්ත්වලෝක යෑ සංඝකාර ලෝක යැයි ත්‍රිවිධ වෙයි; මෙහි වනාහි සත්ත්වලෝකය අදහස් කරනලදී. තවද- සත්ත්වලෝකයෙහි උපදනාවූ ද තථාගතයන් වහන්සේ දෙවිලොවැ නූපදිති; බඹලොවැ නූපදිති; මිනිස්ලොව මැ උපදිත්. මිනිස්ලොව ද අන් සක්වළක නූපදිති; මේ සක්වළ මැ උපදිත්. එහි ද සියලු තැන නූපදිති; "පූර්‍ව මැදුම්පියස. දිශාවෙහි කජඞ්ගල නම් නියම්ගමෙක් වෙයි, එයට පසුභාගයෙන් මහාසාලයෝ යෑ, එයින් මත්තෙහි ප්‍රත්‍යන්තජනපදයෝ වෙති, මොබින් මධ්‍යයෙහි; පූර්‍වදක්ෂිණ (= ගිනිකොණ) දිශාවෙහි සලළවති නම් නදිය වෙයි, එයින් මත්තෙහි ප්‍රත්‍යන්තජනපදයෝ වෙති, මොබින් මධ්‍යයෙහි; දක්ෂිණදිශාවෙහි සෙවනඝණ්ටිකා නම් නියම්ගම යෑ එයින් මත්තෙහි ප්‍රත්‍යන්ත ජනපදයෝ වෙති, මොබින් මධ්‍යයෙහි; පශ්චිමදිශාවෙහි ථූණ නම් බමුණුගම යෑ, එයින් මත්තෙහි ප්‍රත්‍යන්ත ජනපදයෝ වෙති, මොබින් මධ්‍යයෙහි; උත්තරදිශාවෙහි උශීරධ්වජ නම්

---

153. **ඉධෙව**= මේ අවකාශයෙහි ම; **තිට්ඨමානස්ස**= සිටින්නා වූ; **දෙවභූතස්ස සතෝ**= දිව්‍ය වූ; **මෙ**= මාගේ; **පුනරායු ච**= නැවත (අන්‍ය කර්මවිපාකයකින්) ජීවිතය ද; **මෙ**= මා විසින්; **ලද්ධෝ**= ලද්දේය; **මාරිස**= නිදුකානන් වහන්ස! **එවං**= එපරිද්දෙන්; **ජානාහි**= දූනගනු මැනව.

පවීතය වෙයි, එයින් මත්තෙහි ප්‍රත්‍යන්ත ජනපදයෝ වෙති, මොබින් මධ්‍යයෙහි" යයි මෙසේ පිරිසිඳිනලද දිගින් තුන්සියයක් යොදුන් වූ පුළුලින් දෙසියපනස් යොදුන් වූ අවවින් නවසියයක් යොදුන් වූ මැදුම්පිය සෙහි උපදිති. හුදෙක් තථාගතයන් වහන්සේ නොවෙති; පසේබුදුවරු ද, අගසව්වෝ ද, අසුමහා තෙරවරු ද, බුඩමාතෘ තොමෝ ද, බුඩපිතෘ තෙමේ ද, සක්විතිරජ ද, අන්‍යවූත් සාරප්‍රාප්ත වූ බ්‍රාහමණ ගෘහපතිහු ද මෙහි ම උපදිත්.

එහි තථාගත තෙම සුඡාතාව විසින් දුන් මධුපායාස භොජනය පවන් රහත්මඟ යම්තාක් ද ඒතාක් උපදී නම, රහත්ඵලය (පැමිණි කල්හි) උපන්නේ නම; මහාභිනිෂ්ක්‍රමණයෙහි පවන් රහත්මඟ තෙක් හෝ- තුසිතභවනය පවන් රහත්මඟ තෙක් හෝ- දීපඞ්කරපාදමූලය පවන් රහත්මඟ යම්තාක් හෝ වේද ඒතාක් උපදී නම; රහත්ඵලය (පැමිණිකල්හි) උපන්නේ නම; මෙහි සියල්ලට පළමුව උපන්බව සඳහා **උප්පජ්ජති** යි කියනලදී; තථාගත තෙම ලොකයෙහි උපන්නේ වෙයි යන මේ වනාහි මෙහි අර්ථ යයි. **සෝ ඉමං ලෝකං**= ඒ භාග්‍යවත්හු මේ ලොකය; මෙවිට කියයුත්ත නිදර්ශනය කෙරෙති. **සදෙවකං**= දෙවියන් සහිත වූයේ "සදෙවක" නම්; එසේ ම මාරයා සහිත වූයේ **සමාරක** නම්; බ්‍රහමයා සහිත වූයේ **සබ්‍රහමක** නම්; මහණබමුණන් සහිත වූයේ **සස්සමණබ්‍රාහමණි** නම් වේ; ප්‍රකෘතියෙන් උපන් බැවින් **පජා** නමු; ඒ ප්‍රජාව ඇති; දෙවිමිනිසුන් සහිත වූයේ **සදෙවමනුස්ස** නම් වෙයි; එහි "සදෙවක" වචනයෙන් පඤ්චකාමාවචර දෙවියන්ගේ ගැනීම දතයුතු; "සමාරක" වචනයෙන් **සවෙනි** කාමාවචර දෙවියන්ගේ ගැනීම ද; "සබ්‍රහමක" වචනයෙන් බ්‍රහමකායිකාදි බ්‍රහමයන්ගේ ගැනීම ද; "**සස්සමණබ්‍රාහමණි**" වචනයෙන් ශාසනයට විරුඩ-පසමිතුරු වූ **මහණ බමුණන්ගේ** ගැනීම හා සම්මතපාපී බාහිතපාපී **මහණබමුණන්ගේ** ගැනීම ද; "පජා" වචනයෙන් සත්ත්වලොකය ගැනීම ද; "**සදෙවමනුස්ස**" වචනයෙන් සම්මුති දෙවියන් හා සෙසු මිනිසුන්ගේ ගැනීම ද දතයුතු; මෙසේ මෙහි තුන්පදයකින් අවකාශලොකය සමග සත්ත්වලොකය, දෙපදයකින් ප්‍රජා වශයෙන් සත්ත්වලොකය ම ගන්නාලදුයි දතයුත්තේයි. අනිත් ක්‍රමයක් කියනු ලැබේ. "සදෙවක" ග්‍රහණයෙන් අරූපාවචර ලොකය ගන්නාලද; සමාරක ග්‍රහණයෙන් ෂට්කාමාවචර දිව්‍යලොකය ද; "සබ්‍රහමක" ග්‍රහණයෙන් රූපිබ්‍රහමලොකය ද, "සස්සමණ බ්‍රාහමණාදි" ග්‍රහණයෙන් සිව්පිරිස් වශයෙන් හෝ සම්මුති දෙවියන් සමග හෝ මිනිස්ලොව හෝ සෙසු සියලු සත්ත්වලොකය හෝ ගන්නාලදී. තවද- මෙහි **සදෙවක** වචනයෙන් උඩත්පිරි සෙයින් සියලු ලොව පසක්කළබැව් කිහු; නැවත යම් කෙනෙකුන්ට "මාරතෙම මහානුභාව ඇතියෙක, ෂට්කාමාවචරයට අධිපති යැ, වසවත්තී යැ" යි සිතක් වීද; හෙතෙමේ ත් මොහු විසින් පසක් කරනලදුයි ඔවුන්ගේ විමතිය දුරුකරමින් **සමාරකං** යි වදළහ. ඉදී

යම් කෙනෙකුන්ට "බ්‍රහ්ම තෙම මහානුභාව ඇත්තෙක, එක් ඇඟිල්ලකින් එක්දහසක් සක්වළ ආලොකය පතුරුවයි, දෙකකින් -පෙ- දස ඇඟිල්ලකින් දසදහසක් සක්වළ ආලොකය පතුරුවයි, නිරුත්තර වූ දැහැන් සමවත්සුවය ද විඳියි, කිම හෙතෙමේ ත් පසක්කරනලද දැ?" යි සිතක් වීද, ඔවුන්ගේ විමතිය දුරුකරන්නේ **සබ්‍රහ්මකං** යි වදළහ. නැවත යමෙක් තුමූ මෙසේ සිතූහු ද- "බොහෝ මහණ බමුණෝ ශාසනයට විරුඬ වූවාහුය, කිම ඔවුහු ත් පසක්කරනලද්දාහු දැ?" යි ඔවුන්ගේ විමතිය දුරුකරමින් **සස්සමණ බ්‍රාහ්මණිං පජං** යි වදළහ. මෙසේ උත්කෘෂ්ට වූවන්ගේ පසක්කළබැව් ප්‍රකාශ කොට ඉක්බිති සම්මුතිදෙවි යන් ද සෙසු මිනිසුන් ද ගෙන උත්කෘෂ්ට පරිච්ඡේද වශයෙන් සෙසු සත්ත්වලොකයාගේ පසක්කළබැව් ප්‍රකාශ කරමින් **සදෙවමනුස්සං** යි වදළහ. මේ මෙහි භවයන්ගේ අනුක්‍රම යයි. පොරණදුතරෝ වනාහි මෙසේ කිහු- **සදෙවකං** යනු දෙවතාවුන් සමග අවශෙෂලොකය ය; **සමාරකං** යනු මාරයා සමග අවශෙෂලොකය ය; **සබ්‍රහ්මකං** යනු බ්‍රහ්මයන් සමග අවශෙෂලොකය ය; මෙසේ සියලු ම භවත්‍රයට පැමිණි සත්ත්වයන් තුන් ආකාරයකින් තුන් පදයෙක්හි බහා නැවත දෙපදයකින් ඇතුලත්කොට ගන්නාහු **සස්සමණ බ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං** යි වදළහ; මෙසේ පස්පදයෙන් ඒ ඒ ආකාරයෙන් ත්‍රෛධාතුක (ලොකය) ම ඇතුලත් කොට ගන්නාලදැයි.

සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති යන මෙහි **සයං**= තෙමේ අතිකෙකු විසින් නො දතයුතු වැ; **අභිඤ්ඤා**= අභිඤ්ඤාය අධික වූ නුවණින් දැන යන අර්ථයි; **සච්ඡිකත්වා**= ප්‍රත්‍යක්ෂ කොට; මෙයින් අනුමානාදීන්ගේ ප්‍රතික්ෂෙපය කරනලද වෙයි; **පවෙදෙති**= අවබොධ කරවයි, දන්වයි, ප්‍රකාශ කෙරෙයි; **සො ධම්මං දෙසෙති** ආදි -පෙ- **පරියොසානකල්‍යාණං**= ඒ භාග්‍යවත්හු සත්ත්වයන් කෙරෙහි කාරුණ්‍යය සඳහා නිරුත්තර වූ විවෙක සුවය හැරදමා ද දහම් දෙසති, හෙද වනාහි මදක් හෝ බොහෝ හෝ දෙශනා කරන්නාහු ආදිකල්‍යාණාදිප්‍රකාර වූවක් ම දෙශනා කරති, ආදියෙහි දු කල්‍යාණ වූවක් භද්‍ර වූවක් අනවද්‍ය වූවක් ම කොට දෙසති, මධ්‍යයෙහි දු -පෙ- පර්‍යවසානයෙහි දු කල්‍යාණ වූවක් භද්‍ර වූවක් අනවද්‍ය වූවක් ම කොට දෙශනා කෙරෙති,යි කියනලද වෙයි; එහි දෙශනාවෙහි ආදිය මධ්‍යය අවසානය

ආදිමධ්‍යාවසානය. ඇති, ශාසනයාගේ (ද ආදිමධ්‍යාවසානය) ඇති; පළමු කොට දෙශනාවෙහි සිව්පදුති ගාථාවක ද ප්‍රථම පාදය ආදි නම, නැවත දෙපාදයෙක් මධ්‍ය නම; අන්තයෙහි එක් පාදයෙක් පරියොසාන නම; එක් අනුසන්ධියක් ඇති සූත්‍රයාගේ නිදානය ආදි ය, "ඉදමවොච" යන පරියොසාන ය, දෙදෙනාගේ අතර මධ්‍ය ය, තොයෙක් අනුසන්ධි ඇති සූත්‍රයාගේ ප්‍රථමානුසන්ධිය ආදි ය, අන්තයෙහි අනුසන්ධිය අවසාන ය, මධ්‍යයෙහි එකෙක් හෝ දෙදෙනෙක් හෝ

බොහෝ (අනුසන්ධි) හෝ මධ්‍යය මැයි; නැවත ශාසනයාගේ ශීල-සමාධි-විදර්ශනා ආදි නම, මේ කියනලද මැයි- "සෝ චාදි කුසලානං ධම්මානං සීලං ච විසුද්ධා දිට්ඨි ච උජුකා" යි. "අත්ථි ඛිකඛවෝ! මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා" යි මෙසේ වදාරනලද ආර්‍යමාර්ගය වනාහි මධ්‍යය නම; ඵලය හා නිර්වාණය ද පර්‍යවසාන නම; "නෙසෝ තිහ භික්ඛු බ්‍රාහ්මණ! බ්‍රහ්මචරියං එතං සාරං එතං, පරියොසානං" යන මෙහි ඵලය පර්‍යවසාන යයි වදාරනලද; "නිබ්බානොගධං හි ආවුසෝ! විඤ්ඤාණ! බ්‍රහ්මචරියං වුස්සති නිබ්බාන පරායනං නිබ්බාන පරියොසානං" යන මෙහි නිර්වාණය පර්‍යවසාන යයි කියනලදී. මෙහි දෙශනා වෙහි ආදිමධ්‍යාවසානය අදහස් කරනලදී. ඒ එසේ මැයි- භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසනසේක් ආදියෙහි ශීලය දක්වා මධ්‍යයෙහි මාර්ගය අවසානයෙහි නිර්වාණය දක්වති; එයින් වදාරනලදී- සෝ ධම්මං දෙසෙති ආදි කල්‍යාණං මජ්ඣෙ කල්‍යාණං පරියොසාන කල්‍යාණං යනු. එහෙයින් අන්‍ය ධර්මකථිකයෙක් නම්වූ දහම් දෙසන්නේ-

කථික ලක්ෂණ. 154. "ආදිම්හි සීලං දෙසෙස්සය්‍ය - මජ්ඣෙ මග්ගං විභාවයෙ
පරියොසානම්හි නිබ්බානං - එසා කථික සණ්ඨිති" යි.

සාත්ථං සබ්‍යඤ්ජනං= යම්හෙයකින් යමෙකුගේ දෙශනාව කැදබත් සත්‍රිපුරුෂාදීන්ගේ වර්ණනා නිශ්‍රිත වූවා හෙතෙම අර්ථ සහිත වැ නො දෙසා ද; භාග්‍යවතුන් වහන්සේ වූ කලි එබදු වූ දෙශනාව හැර සතර සතිපට්ඨානාදිය ඇසුරු කළ දෙශනාව දෙසනසේක් ද, එහෙයින් අර්ථ සහිත වැ දෙශනා කෙරෙති,යි කියනුලැබේ. වැලි යමෙකුගේ දෙශනාව සමාන ව්‍යඤ්ජනාදියෙන් යුක්තවූවා හෝ සම්පිණ්ඩිතව්‍යඤ්ජන වූවා හෝ සම්විඝාෂිතව්‍යඤ්ජන වූවා හෝ වේද, ද්‍රව්‍ය-ක්‍රියා-යවනාදි මෙලවස් යන්ගේ භාෂාව මෙන් ව්‍යඤ්ජනපරිපූර්ණතිය නැතිහෙයින් ඔහුගේ දෙශනාව අව්‍යඤ්ජනා නම් වේද; භාග්‍යවතුන් වහන්සේ වනාහි-

දශවිධ ව්‍යඤ්ජනය 155. "සිථිලධනිතසඤ්ඤදිඝරස්සං-ගරුකලහුකසඤ්ඤනිගහගහිතං
සම්බන්ධිං ඨවජීනං විමුත්තං-දසධා ව්‍යඤ්ජනබුද්ධියා පභෙදෙ" යි-

---

154. ආදිම්හි= ආදියෙහි; සීලං දෙස්සය්‍ය= ශීලය දක්වන්නේය; මජ්ඣෙ= මධ්‍යයෙහි; මග්ගං= මාර්ගය; විභාවයෙ= ප්‍රකාශ කරන්නේය; පරියොසානම්හි= කෙළවර; නිබ්බානං= නිර්වාණය ප්‍රකාශ කරන්නේය; එසා= මෝ තොමෝ; කථිකසණ්ඨිති= කථිකයාගේ පැවැත්මයි.

155. සිථිලධනිතං ච= (වර්‍ග ප්‍රථම තෘතීය සඞ්ඛ්‍යාත) ශිථිලය හා (ද්විතීය චතුර්ථ සඞ්ඛ්‍යාත) ඝනිතය ද; දීඝරස්සං= ("ආකාර" ද) දීර්ඝය හා ("අකාර" ද) හ්‍රස්වය ද; ගරුකලහුකං ච= (දීර්ඝය සංයොගාදි පරහ්‍රස්වය,යි කියනලද) ගරුකය හා (කෙවල හ්‍රස්ව සඞ්ඛ්‍යාත) ලඝුකය ද; නිග්ගහිතං= (කරණයන් පෙළා අව්‍යවහිතවූ ඛයෙන් ඝානුනාසික කොට කියයුතු)

මෙසේ කියනලද දශවිධ ව්‍යඤ්ජනය නො ලොපා පරිපූර්ණව්‍යඤ්ජන යුක්ත කොට ම ධර්මය දෙශනා කෙරෙත් ද, එහෙයින් ව්‍යඤ්ජන සහිත වැ දෙශනා කරන සේකැයි කියනු ලැබේ. **කෙවල පරිපුණ්ණං** යන මෙහි **කෙවලං** යනු සකලාධි වචනයි; **පරිපුණ්ණං** යනු අනූනාධික වචනයි; මේ කියනලද වෙයි- **සකල පරිපූර්ණ** (=සියල්ල නො අඩු නො වැඩි) වූ ම (ධර්මය) දෙශනා කෙරෙති, එක් දෙශනාවකුදු අපරිපූර්ණ වූවා නැත්තේ යයි. **පරිසුද්ධං**= උපක්ලෙශ රහිත වූ; **යම්හෙයකින්** යමෙක් මේ ධර්මදෙශනාවනිසා ලාභය හෝ සත්කාරය හෝ **ලබන්නෙමියි** දෙසාද ඔහුගේ දෙශනාව අපරිශුද්ධ වූවා වේද; භාග්‍යවතුන් වහන්සේ වනාහි ලොකාමිෂ නිරපෙක්ෂ වූ සේක් හිත පැතිරවීමෙන් මෛත්‍රී භාවනාවෙන් මොළොක්වූ සිත් ඇතිසේක් නහාසිටුවන සුභාවයෙන් පිහිටි සිතින් දෙශනා කරන සේක් ද, එහෙයින් පිරිසුදු කොට දෙශනා කෙරෙතියි කියනු ලැබේ. **බ්‍රහ්මචරියං පකාසෙති** යන මෙහි **බ්‍රහ්මචරියං** යනු ශික්ෂාත්‍රය සඞ්ග්‍රහ වූ සියලු ශාසන යයි; එහෙයින් "**බ්‍රහ්මචරියං පකාසෙති**" යනු ඒ තථාගත තෙමේ **ආදියෙහි කල්‍යාණ වූ** -පෙ- පරිශුද්ධ වූ ධර්මය දෙශනා කෙරෙයි; මෙසේ දෙශනා කරන්නේ ද ශික්ෂාත්‍රය සඞ්ගෘහී තවූ සියලු ශාසනබ්‍රහ්මචර්‍යාව ප්‍රකාශ කෙරේ යයි මෙසේ මෙහි අර්ථය දත යුතු. **බ්‍රහ්මචරියං**= ශ්‍රෙෂ්ඨාර්ථයෙන් බ්‍රහ්ම වූ චර්‍යාව **නොහොත් බ්‍රහ්ම** වූ බුඩාදීන්ගේ චර්‍යාව යයි කියනලද වෙයි; **තං ධම්මං**= ඒ උක්තප්‍රකාර සම්පත් ඇති ධර්මය; **සුණාති ගහපති වා**= කුමක් හෙයින් පළමු කොට ගෘහපතියකු දක්වත් ද යත්? **නිහතමාන** බැවින් ද **උත්සන්න** බැවින් ද වේ; සැබව- බොහෝ හෙයින් **කැත්කුලයෙන්** පැවිදි වූවාහු **ජාතිය නිසා මානය කෙරෙති, බමුණුකුලයෙන්** පැවිදි වූවාහු **මන්ත්‍රයන් නිසා මානය කෙරෙති; ඒත ජාති ඇති කුලයෙන් පැවිදි වූවාහු තමාගේ විජාතිභාව** යෙන් පිහිටා සිටින්ට නො හැකි වෙති; **ගැහැවිදරුවෝ** වැලිත් සෝදිය ගලන දෙකැසින් යුක්ත ව ලුණුපිපෙන පිටින් යුක්ත ව බිම **කැණ නසන** ලද මානදණ්ඩ ඇත්තාහු වෙති; ඔවුහු පැවිදිව **මානයක්** හෝ දම්යක් හෝ නො කොට ශාක්‍යපරිදි බුදුවදන් ඉගෙන විදර්ශනාව පිණිස කම් කරන්නාහු රහත්බැවිහි පිහිටන්ට හැකි වෙත්. තවද- ඉතරකුලයන්ගෙන් නික්ම පැවිදිවූවාහු **නම්** බොහෝ නො වෙති; ගැහැවියෝ ම බොහෝ වෙත්. මෙසේ **නිහතමාන** බැවින් ද **උත්සන්න** බැවින් ද පළමු කොට ගැහැවියා දක්වනසේක් යයි. **අඤ්ඤතරස්මිං වා**= **ඉතරකුලයන් අතු**

නිගහිතය ද; **සම්බන්ධං**= (පරපදය හා සම්බන්ධ කොට උච්චාරණලක්ෂණ වූ) සම්බන්ධය ද; **ව්‍යවත්ථිතං**= (පරපදය හා සම්බන්ධ නො කොට උච්චාරණලක්ෂණ වූ) ව්‍යවස්ථිතය ද; **විමුත්තං**= (කරණයන් නො පෙළා විවෘත මුඛයෙන් අනුනාසික කියයුතු) විමුක්තය දැයි; **ඛ්‍යඤ්ජනබුද්ධියා**= ව්‍යඤ්ජනබුද්ධිය පිණිබඳ; **පභෙදෙ**= ප්‍රභෙදය; **දසධා**= දශප්‍රකාර වේ.

රෙන් හෝ එක්තරා කුලයෙක්හි; **පච්චාජාතෝ**= උපන්නේ; **තථාගතෙ සඛං පටිලභති**= පිරිසුදු දහම් අසා ධර්මස්වාමි වූ තථාගතයන් කෙරෙහි "එකාන්තයෙන් භාග්‍යවතුන් වහන්සේ සම්‍යක් සම්බුද්ධයහ" යි ශ්‍රද්ධාව ලබයි; **ඉති පටිසඤ්චික්ඛති**= මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කෙරෙයි; **සම්බාධෝ ඝරාවාසෝ**= ඉදිනුදු සැවරියන් ඝගයක ගොදුන් සියයක් අතර මැ හෝ අඹුසැමි දෙදෙනෙක් වෙසෙත් ද, එතකුදු වුවත් ඔවුන්ට සකිඤ්චන සපරිබෝධාර්ථයෙන් ගෘහාවාසය සම්බාධ මැයි. **රජපථෝ**= රාගරජස් ආදීන්ගේ උපදින ස්ථාන යයි මහාඅට්ඨාවෙහි කියනලදී; පැමිණෙනමහ යයි ද වටී; නො ලැගෙන අටින් අභ්‍යවකාශයක් මෙනැයි **අබ්භොකාසෝ** නම් වෙයි; යම්හෙයකින් පැවිදිතෙම කුළුගේ – රුවන්පහ – දෙව්විමන් ආදිවූ වසනලද දෙරවාකවුළු ඇති වැසුණුතැන්හි වෙසෙන්නේ නමුදු නො ම ලැගේ ද නො ඇලේ ද නො බැඳේ ද, එහෙයින් කියනලදී. **අබ්භොකාසෝ පබ්බජ්ජා** යනු. තවද- ගෘහාවාසය සම්බාධ යැ, කුශල ක්‍රියාවට අවකාශ නැතිබැවිනි; රාගාදිරජස් උපදින මගෙකි, රජස්වලට නො වැසූ කසළගොඩක් මෙන් කෙලෙස් රජස් රැස්වනතැන් බැවිනි; පැවිද්ද අභ්‍යවකාශයෙකි, කුශලක්‍රියා වට කැමති සේ අවකාශ ඇති බැවිනි; **නාසිදං සුකරං -පෙ- පබ්බජෙය්‍යං**= යන මෙහි මෝ සංක්ෂෙප කථා යැ- යම් මේ ශික්ෂාත්‍රය බ්‍රහ්මචර්‍යාවක් එක් දවසකුදු නො කඩ කොට අවසානසිතට පැමිණවියයුතු බැවින් **එකන්තපරිපුණ්ණං** නම්; එක් දවසකුදු සංකෙලෙසමලයෙන් මලරහිත කොට අවසානසිතට පැමිණවියයුතු බැවින් **එකන්තපරිසුද්ධ** නම; **සඞ්ඛලිඛිතං**= ලියවනලද සක් ගෙඩියක් වැනිකොට සෙදූ සක්ගෙඩියක් සමාන කොට හැසිරිය යුතු වූ මේ (බඹසර) **අගාරං අජ්ඣාවසතා**= අගාරමධ්‍යයෙහි වසන්නහු විසින් එකාන්තපරිපූර්ණ කොට —පෙ— හැසිරෙන්ට පහසු නො වෙයි; මම කෙස් ද රැවුලු ද බහා කසවරස පි බැවින් කසාවන්වූ බඹසර වසන්න වුන්ට සුදුසු වූ වස්ත්‍රයන් හැඳ පෙරව ගිහිගෙන් නික්ම පැවිද්දට පිළිපද නෙම් නම් ඉතා ශෙහෙක; මෙහි දු යම්හෙයකින් ගිහිගෙට **ඒත** වූ කෘෂි වණිජාදිකර්මය "අගාරිය" යි කියනු ලැබ්ද, හෙද පැවිද්දෙහි නැත් තේද, එහෙයින් පැවිද්ද "අනගාරියා" යි දතයුත්තී නුයි, ඒ පැවිද්දට **පබ්බජෙය්‍යං**= පිළිපදනෙම් නම්; **අප්පං වා**= දහසින් ඔබ හොඟසකඬය අල්ප නම් වෙයි, දහස පටන් මහත් නම් වේ; ආබන්ධන (=පසුපස්සෙහි අනුබඳන) අවියෙන් ඇති තෙමේ ම **ඤාතිපරිවට්ට** නම් වෙයි; හේ විස්ස කින් ඔබ අල්ප වෙයි, විස්ස පටන් මහත් වේ; **භික්ඛූනං සික්ඛාසාජීව සමාපන්නෙසු**= භික්ෂූන්ගේ යම් අධිශීලසඞ්ඛ්‍යාත ශික්ෂාවක් විද එය ද, වැලි යම් ශික්ෂාවෙක්හි මේ භික්ෂූහු සමඟ ජීවත් වෙත් ද, සමානජීවිකාව ඇත්තාහු සහාග පැවතුම් ඇත්තාහු වෙත් ද, ඒ භාග්‍යවතුන් විසින් පනවනලද ශික්ෂාපද සඞ්ඛ්‍යාත සාජීවය ද; එහි භික්මෙන බැවින් පිළි

පන්නේ **ගිකඛුනං සිකඛාසාජීව සමාපනෙනා** යි වේ. **සමාපනෙනා**= ශික්ෂාව පරිපූරණය කරන්නෙක් සාජීවය ද නො ඉක්ම වන්නෙක් වැ ඒ දෙකට පැමිණියේ යන අර්ථයි.

පාණාතිපාතං පහාය යනාදියෙහි පාණාතිපාතාදිය පිළිබඳ කථාව යට විස්තර කරනලද්දී මය; **පහාය**= මේ ප්‍රාණාතිපාත චෙතනාසඞ්ඛ්‍යාත දුශ්ශීලබව දුරුකොට; **පටිවිරතෝ හොති**= ප්‍රතිවිරත වූ කාලය පවත් ඒ දුශ්ශීලභාවයෙන් මෑත් වූයේ වෙන් වූයේ ම වෙයි; **නිහිතදණ්ඩා නිහිතසත්ථා**= මෙරමා නැසීම පිණිස දණ්ඩක් හෝ ශස්ත්‍රයක් හෝ ගෙන නො පවත්නා හෙයින් බහාතැබූ දඬු ඇත්තේ ද බහාතැබූ අවි ඇත්තේ ද යන අර්ථයි. තවද- මෙහි දඬු තබා සියලු ම සෙසු උපකරණය සත්වයන් වෙහෙසන බැවින් **ශස්ත්‍ර** යයි දතයුතු; යලි **මහණ** තෙම යම් සැරයටියක් හෝ දැහැවිදඬු (කපන) වැයක් හෝ කතුරක් හෝ ගෙන හැසිරේ ද, එය මෙරමා නැසීම පිණිස නො වෙයි; එහෙයින් නිහිත දණ්ඩ යැ නිහිතසත්ථ යැයි කියා ම සඞ්ඛ්‍යාවට යෙයි; **ලජ්ජී**= පාපයට පිළිකුල්කිරීම ලක්ෂණ වූ ලජ්ජාවෙන් යුක්ත වූයේ; **දයාපනෙනා**= දයාවට මෙත්සිත් ඇතිබවට පැමිණියේ; **සබ්බපාණභූතහිතානුකම්පී**= සියලු සත්වයන්ට හිතයෙන් අනුකම්පා කරන්නේ; ඒ මෙත්සිත් ඇතිබවට පැමිණි බැවින් සියලු සත්වයන්ට හිතසිත් ඇත්තේ යන අර්ථයි. **විහරති**= ඉරියව් පවත්වයි, පාලනය කෙරෙයි.

දෙනලද්දක් ම ගනීනුයි **දනනාදූයි** නම් වෙයි; සිතිනුදු දෙනලද්දක් ම කැමති වේ නුයි **දිනනපාටිකඛකී** නම්; සොරකම් කෙරේ නුයි "ථෙන" නම්, නො සොරවූයෙන් (නුයි) **අථෙනෙන** යනු වේ; නො සොර වූ බැවින් ම **සුචිභූතෙන** යනු වේ; **අත්තනා**= අත්බැවින් (යුක්තව;) නො සොර වූ පවිත්‍ර වූ අත්බැව ඇති කොට වාසය කෙරේ යයි කියනලද වේ. **අබ්‍රහ්මචරියං**= අශ්‍රේෂ්ඨවූ චර්‍යාව; බ්‍රහ්ම වූ ශ්‍රේෂ්ඨවූ ආචාරයෙහි හැසිරේ නුයි බ්‍රහ්මචාරී යනු වේ; **ආරාචාරී**= අබ්‍රහ්මචර්‍යා වෙන් දුරු වැ හැසිරෙනසුලු වූයේ; **මෙථුනා**= රාගය ඉපදීම් වශයෙන් සමානබැවින් "මෙථුනක" යයි ලද ව්‍යවහාර ඇත්තවුන් විසින් සෙවනය කටයුතු බැවින් "මෙථුන" යයි සඞ්ඛ්‍යාවට ගිය අසඞ්මීයෙන්; **ගාමධම්මා**= ගම්වැසියන්ගේ ධර්මයෙන්.

සත්‍යය කියා නුයි **සච්චවාදී** නම්; සැබවින් සැබව පිහිටුවයි, ගළපා නුයි **සච්චසන්ධ** නම්; අතරින් අතර මෘෂා නො කියයි යන අර්ථයි. යම්හෙයකින් යම් පුරුෂයෙක් කිසිවිටෙක බොරු කියා ද, කිසිවිටෙක සත්‍යය කියා ද, ඔහුගේ මෘෂාවාදයෙන් අතුරුකළ බැවින් සැබව සැබවින් නො ගැළපේ ද, එහෙයින් හේ "සච්චසන්ධ" නො වෙයි; මේ තෙම වනාහි එබඳු නො වූයේ ජීවිතය හෙතුකොට ද බොරු නො කියා සැබවින් සැබව පිහිටුවා ම නුයි "සච්චසන්ධ" නම්; **ථෙනෝ**= සථිර වූයේ,

සිටි කථා ඇත්තේ යන අර්ථයි; ඒ එසේ මැයි- එක් පුද්ගලයෙක් කසා පැහැය මෙන් ද දැසවිරැසෙක සිටවූ කණුවක් මෙන් ද අසුපිට තැබූ කොමඩුගෙඩියක් මෙන් ද නො පිහිටි කථා ඇත්තේ වෙයි, එකෙක් පහණැඇදි ඉරක් මෙන් ද ඉඳුඛිලයක් මෙන් ද සිටි කථා ඇත්තේ වෙයි, කඩුවෙන් හිස සිඳින කල්හි දු දෙකථාවක් නො කියයි, මේ තෙම "ථෙත" යයි කියනු ලැබේ. **පච්චයිකෝ**= විශ්වාස කටයුතු වූයේ, හැඳ කියයුත්තේ යන අර්ථයි. ඒ එසේ මැයි- ඇතැම් පුද්ගලයෙක් විශ්වාස නො කටයුත්තේ වෙයි, මෙය කවරෙකු විසින් කියනලද ද? අසවලා විසිනැයි කිකල්හි ඔහුගේ වචනය නො හඳහවු යයි කියයුතු බවට පැමිණෙයි; එකෙක් විශ්වාස කටයුත්තේ වෙයි, මෙය කවරෙකු විසින් කියනලද ද? අසවලා විසිනැයි කිකල්හි ඉදින් ඔහු විසින් කියනලද නම් මෙය ම පමණයැ, මෙවිට විමසිය යුත්තෙක් නැති, මෙය එසේ ම යයි කියයුතු බවට පැමිණෙයි; මේ තෙම "පච්චයිකෝ" යයි කියනු ලැබේ. **අවිසංවාදකෝ ලෝකස්ස**= ඒ සත්‍යවාදී බැවින් ලොකයා විසංවාදනය (=රැවටීම) නො කරයි, යන අර්ථයි.

ඉමේසං භෙදා= "ඉතෝ" යි කියනලද යම් කෙනෙකුන්ගේ **සමීපයෙහි අසනලද්ද** ඔවුන්ගේ බිඳීම පිණිස **භින්නානං වා සන්ධාතා**= කිසි යම් කරුණකින් භින්න වූ මිත්‍රයන් දෙදෙනෙකු අතුරෙන් හෝ සමානොපාධ්‍යායාදීන් අතුරෙන් හෝ **එකෙකා** වෙත **එලඹි** මෙබඳු කුලයෙහි උපන්නා වූ මෙසේ බහුශ්‍රැත වූ හෝ තොපට මෙය නො සුදුසු යැ යනාදිය කියා ගැළපීම කරන්නේ; **අනුප්පදාතා**= ගැළපීම දැඩිකරන්නේ; **සමගි** වූ දෙදෙනෙකු දැක මෙබඳු කුලයෙහි උපන්නා වූ මෙබඳු ගුණයන්ගෙන් යුක්ත වූ තොපට මේ සුදුසුයැ යනාදිය කියා දැඩි කරන්නේ යන අර්ථයි. සමගිය ඇලුම් කරන්නේ මෝහට නුයි **සමගහාරාමා** නම්; යම් තැනක සමගි වූවාහු නැත් ද, එහි වසන්ට ද නො කැමති වෙයි යන අර්ථයි; "සමග්ගාරාමෝ" යි ද පාලියැ, මේ අර්ථ මැයි. **සමගඅරතෝ**= සමගිවූවන් කෙරෙහි ඇලුනෝ; ඔවුන් හැර අන්තැනෙක යන්ට ද නො කැමති වෙයි යන අර්ථයි. සමගිවූවන් දැක ද අසා ද සතුටු වෙනුයි **සමගහනන්දී** නම්; **සමගඅකරණිං වාචං භාසිතා**= යම් තෙපුලක් සත්වයන් සමගි වූවන් ම කෙරේ ද, ඒ සමගිගුණ ප්‍රකාශක වූ ම තෙපුල කියයි, අන්‍යය නො කියයි යන අර්ථයි. **නෙලා**= "එල" යි දොෂය කියනු ලැබේ, මේ තෙපුල පිළිබඳ දොසක් නැත්නුයි "නෙලා" නම්; නිදොස්වූ යන අර්ථයි. **නෙලඬෙහා සෙනාපච්චාදෙ** යන මෙහි කී සීලය මෙනි; **කණ්ණසුඛා**= ව්‍යඤ්ජනමාධුර්‍යයෙන් කන්වලට සුව වූ; හිදිකටුවකින් විදීමක් මෙන් කන්රැජව නූපදවයි, අර්ථමධුර බැවින් සියලු සිරුරෙහි කොපය නූපදවා ප්‍රේමය උපදවා නුයි **පෙමනීයා** නම්; හෘදයට යෙයි, නො ගැවෙමින් සුවසේ සිතට පිවිසේ නුයි **හදයඞ්ගමා** නම්; ගුණයෙන් පිරිපුන් බැවින් පුරයෙහි වූවා නුයි **පොරී** නම්; පුරයෙහි වැඩුණු අහනක් සෙයින්

සියුමැලි වූවා නුයි ද **පොරී** නමු; "පුරසස එසා" යි ද **පොරී** නමු; "පුරසස එසා" යනු නගරවාසීන්ගේ කථාව යැ යන අර්ථයි; සැබව- නගරවාසීහු යොග්‍ය වූ කථා ඇත්තාහු වෙති, පියපමණ වූවහුට "පිතා" යි ද, සොහොයුරු පමණ වූවහුට "භාතා" යි ද කියති; මෙබඳු වූ කථාව බොහෝජන යාට කාන්න වේනුයි **බහුජනකන්තා** නමු; කාන්න බැවින් ම බොහෝ දෙනාට මනාප වූවා චිත්තවෘඩිය කරන්නී නුයි **බහුජනමනාපා** නමු.

(සුදුසු) **කලැ** කියා නුයි **කාලවාදි** නමු; කියයුතු කල සලකා කියයි යන අර්ථයි. විද්‍යමාන වූ සත්‍ය වූ සභාව වූවක් ම කියානුයි **භූතවාදි** නම; දෘෂ්ටධාර්මික සාම්පරායික අර්ථනිශ්‍රිත වූවක් ම කොට කියා නුයි **අත්ථවාදි** නම; තවලොවුතුරුදහම් ඇසුරු කොට කියා නුයි **ධම්මවාදි** නම; සංවරවිනය ප්‍රහාණවිනය ඇසුරු කොට කියානුයි **විනයවාදි** නම; තබන අවකාශය "නිධාන" යයි කියනු ලැබේ. නිධානය මේ (තෙපුලව) ඇත්නුයි **නිධානවති** නමු; ලෙහි නිධානකලයුතු තෙපුල කියන්නේය යන අර්ථයි; **කාලෙන**= මෙබඳු (තෙපුල) කියන්නේ නමුදු මම නිධන වත් තෙපුලක් කියන්නෙම්යි නො කල්හි නො කියයි, වැලි සුදුසුකල බලා කියයි යන අර්ථයි; **සාපදෙසං**= උපමා සහිත ව කරුණු සහිත ව යන අර්ථයි; **පරියනනවතිං**= පරිවෙජදය දක්වා යම්සේ මේ (තෙපුල) පිළිබඳ පරිවෙජදයක් පැනේ ද එපරිද්දෙන් කියයි යන අර්ථයි; **අත්ථසංහිතං**= නොයෙක් ක්‍රමවලිනුදු විභාග කරන්නහු විසින් ගන්නට නොහැකි බැවින් අර්ථසම්පන්න කොට; නොහොත් ඒ අර්ථවාදි තෙම යම් අර්ථයක් කියාද, ඒ අර්ථයෙන් යුක්ත බැවින් අර්ථ යුක්ත වූ තෙපුලක් කියයි; අනිකක් බහා අනිකක් නො කියා යයි කියනලද වේ.

බීජගාමභූතගාමසමාරම්භා= මූලබීජය ඛන්ධබීජය ඵලබීජය අග්‍රබීජය බීජබීජය යන පස්වැදෑරුම් බීජග්‍රාම (=සමූහ) යාගේ ද යම් කිසි නිල්තණ රුක් ආදි වූ භූතග්‍රාමයාගේ ද සමාරම්භයෙන් = සිදීම් පිසීම් ආදි සභාව වූ ඒකොපනයෙන් වෙන්වූයේ යන අර්ථයි. **එකභත්තිකො**= පාතරාසභත්තය සායමාසභත්ත යයි බත් දෙකක් වෙති, ඔවුනතුරෙන් පාතරාස (= උදැසන කෑයුතු) බත ඇතුලු. මධ්‍යාහ්නයෙන් පිරිසිඳින ලද් දේය, ඉතිරි (සායමාසබත) මධ්‍යාහ්නයෙන් උඩ ඇතුලු **අරුණෙන්** (පරිච්ඡින්නය;) එහෙයින් ඇතුලු මධ්‍යාහ්නයෙහි **දසවරක්** වලඳන්නේ ද, "එකභත්තික" වෙයි; ඒ සඳහා කියනලදී- **එකභත්තිකො** යනු. රාත්‍රි භොජනය "රත්ති" නමු, එයින් වැළකුනේ නුයි **රත්තූපරතො** යි වේ; මධ්‍යාහ්නය ඉක්මගිය කල්හි හිරු අස්තයට යැම තෙක් පැවති භොජනය "විකාලභොජන" නම; එයින් වෙන් වූ බැවින් **විරතො විකාල භොජනා** යි වේ. ශාසනයට අනුලොම් නො වන බැවින් ශාසනයට ප්‍රතිපක්ෂවූ පටහැණිවූ දර්ශනය නුයි **විසූකදස්සන** නම් වේ; තමා නැටීම නැටවීමාදි වශයෙන් නෘත්‍යයෝ ද ගීතයෝ ද වාදිතයෝ ද යටත්පිරිසෙයින් මයුර නෘත්‍යාදි වශයෙනුදු පැවති නෘත්‍යාදීන්ගේ ප්‍රතිපක්ෂ වූ දර්ශනයෝ දැයි

නච්චගීතවාදිතවිසූකදස්සනා යි වේ; ඒ එසේ මැයි- නෘත්‍යාදිය තමා විසින් යොදන්ට හෝ අනුන් ලවා යොදවන්ට හෝ යොදනලද්දහු බලන්ට හෝ භික්ෂූන්ට නො මැ වටිති, භික්ෂුණීන්ට නො වටිත්. **මාලා** දියෙහි මාලා යනු යම් කිසි පුෂ්පයෙකි; **ගන්ධං** යනු යම් කිසි ගඳදූයෙකි; **විලෙපනං** යනු සිව්පැහැකිරීම යැ; එහි පළඳින්නේ ධාරණය කෙරෙයි නම්; උනුතැන් පුරවන්නේ මණ්ඩනය කෙරෙයි නම; ගන්ධවශයෙන් ද ජ්වරාග වශයෙන් ද ඉවසන්නේ විභූසනය කෙරෙයි නම; **ඨාන** යි කාරණය කියනු ලැබේ; එහෙයින් යම් දෞශශීල්‍යචෙතනාවකින් ඒ මල් ධැරීම් ආදිය මහාජන තෙම කෙරේ ද, එයින් වෙන්වූයේ යන අර්ථයි. **උච්චාසයන** යි ප්‍රමාණය ඉක්ම වූ (අසුන) කියනු ලැබේ; නො කැප ඇතිරි අතුරනලද්දේ මහාසයන නම්; එයින් වෙන්වූයේ යන අර්ථයි. **ජාතරූපං** යනු සවණී යැ; **රජතං** යනු කහාපණ යැ ලොහමාසක යැ ජතුමාසක යැ දාරුමාසක යැයි යමෙක් තුමූ ව්‍යවහාරයට යෙත් ද ඔහුයි; ඒ දෙවැදෑරුම් වූවහුගේ ම පිළිගැනීමෙන් වෙන්වූයේ, එය තෙමේ නො මැ ගනී, නො ගන්වයි, තමා වෙත තබනලද්ද නො ඉවසයි යන අර්ථයි.

ආමකධඤ්ඤපටිග්ගහණා= හැල් - වී - යව - තිරිඟු - තණ (සහල්)- ගමු යයි කියනලද සත්වැදෑරුම්වූ ම අමුධාන්‍යය පිළිගැනීමෙන්; තවද- හුදෙක් මොවුන්ගේ පිළිගැනීම ම නො වෙයි, සපඝීය ද භික්ෂූන්ට නො වටී මැයි. **ආමකමංසපටිග්ගහණා** යන මෙහි කරුණු කොට අනුදන්නාලද්ද තබා අමු මස් - මාලු පිළිගැනිම ම භික්ෂූන්ට නො වටී; සපඝීය නො වේ. **ඉත්ථිකුමාරිකපටිග්ගහණා** යන මෙහි **ඉත්ථි** යනු පුරුෂයන් අතරට ගියා වෙයි; ඉතර වූවා **කුමාරිකා** නමු; ඔවුන්ගේ පිළිගැනීම ද සපඝීය ද නො කැප මැයි; **දාසිදාසපටිග්ගහණා** යන මෙහි දාසිදාසුන් වශයෙන් ම ඔවුන්ගේ පිළිගැනීම නො වටී, එහෙත් කැපකරු වකු දෙමි, ආරාමිකයකු දෙමි, යි කී කල වටී; එළු - බැටළු ආදි වූ ද කෙත් වත් අවසන් කොට ඇත්තවුන් කෙරෙහි කැප අකැප නය විනය වශයෙන් විමසිය යුතුයි; එහි **බෙත්ත** නම්? යම් තැනක (හැල් ආදි) පුබ්බණ්ණාය වැඩේ ද, (එයයි;) **වත්ථු** නම්? යම් තැනක (උදු මුං ආදි) අපරණ්ණාය වැඩේ ද, (එයයි;) නොහොත් යම් තැනක උභය (ධාන්‍යය)ම වැඩේ ද, එය **බෙත්ත** නම; ඒ සඳහා (සකස්) නො කළ බිම්පෙදෙස **වත්ථු** නම; තවද- මෙහි කෙත් - වත් හිසින් වැව් - විල් ආදිය සඞ්ග්‍රහ කරන ලද්දහුදු මැයි.

දූතෙය්‍යං යි දූතකර්මය කියනු ලැබේ; ගිහින්ගේ පතක් හෝ හසුනක් හෝ ගෙන ඒ ඒ තැන යැම යැ; **පහිණගමන** යි ගෙන් ගෙට යවන ලද්දහුගේ කුඩා ගමන කියනු ලැබේ; **අනුයොග** නම්? ඒ දෙක කිරීම යැ; එහෙයින් දූතකම් ප්‍රෙෂිතගමනයන්ගේ යෙදීම යැයි මෙසේ මෙහි අරුත් දතයුතු. **කයවික්කයා**= විකිණීම් ගැනීමෙන් හා විකිණීමෙන් ද;

"තූලාකූටා" දියෙහි කූටං= වඤ්චා කිරීම යැ; එහි පළමු කොට තූලා කූටය රූපකූට යැ අඞ්ගකූට යැ ගහණකූට යැ පටිච්ඡන්නකූට යැයි සිව් වැදෑරුම් වේ. ඔවුනතුරෙහි 1. "රූපකූට" නම්? එක්වැනි වූ තරුදි දෙකක් කොට ගන්නේ මහත් තරුදියෙන් ගනී, දෙන්නේ කුඩා තරුදි යෙන් දෙයි. 2. "අඞ්ගකූට" නම්? ගන්නේ පසුපසැ අතින් තරුදිය ඇක්මෙයි, දෙන්නේ පෙරපසැ ඇක්මෙයි; 3. "ගහණකූට" නම්? ගන්නේ මූලැ රැහැන ගනී, දෙන්නේ අගැ ගනී; 4. "පටිච්ඡන්නකූට" නම්? තරුදිය සිදුරු කොට ඇතුලත යසුණු බහා ගන්නේ එය පසුපසැ කෙරෙයි, දෙන්නේ අගපසැ කෙරෙයි; කංස යි රන්තැටිය කියනුලැබේ; එයින් වඤ්චා කිරීම කංසකූට නම; කෙසේ ද? එක් රන්තැටියක් කොට රන්වන් වූ අන් ලෝතැටි දෙකක් තුනක් කෙරෙති; ඊට පසු දනවූ ගොස් කිසි යම් ආඪ්‍ය කුලයකට පිවිස රන්බදුන් මිල දී ගනිවු ද?යි කියා අගය විචාළ කල අනිශයින් සමඅගය දෙනු කැමති වෙති; නැවත ඔවුන් විසින් කෙසේ මෝවුන්ගේ රන්බව දතයුතු ද?යි කී කල විමසා ගනිවු යයි රන්තැටිය පහණැ ගවා සියලු තැටි දී යෙත්. "මානකූට" ය හදය භෙද - සිඛාභෙද - රජ්ජුභෙද වශයෙන් ත්‍රිවිධ වෙයි; ඔවුනතුරෙහි 1. "හදයභෙදය" හිතෙල් තලතෙල් ආදිය මනිනකලැ ලැබෙයි; ඒ එසේ මැයි- එවා ගන්නේ යට සිදුරුති මිනුමෙන් සෙමින් වත්කරව,යි කියා ඇතුලු බදුනැ බොහෝ වතුරුවා ගනී, දෙන්නේ සිදුර වසා වහා පුරවා දෙයි; 2. "සිඛාභෙදය" තල - සහල් ආදිය මනින කලැ ලැබෙයි; ඒ එසේ මැයි- ඒවා ගන්නේ සෙමින් සිළුව ඔසවා ගනී දෙන්නේ වෙගයෙන් පුරවා සිළුව සිදිමින් දෙයි; 3. "රජ්ජුභෙදය" කෙත් - වත් මනින කලැ ලැබෙයි; ඒ එසේ මැයි- අත්ලස් නො ලබන්නාහු නො මහත් වූ ද කෙත මහත් කොට මනිත්.

"උකෙක්කාවනා" දියෙහි උකෙක්කාවනං= හිමියන් අහිමියන් කරනු වස් අත්ලස් ගැනීම යැ; වඤ්චනං= ඒ ඒ උපායයන්ගෙන් මෙරමා රැවටීම යැ; එහි මේ එක් වසතුවෙකි- මේ අසනු ලැබේ; එක් වැද්දෙක් මුවෙක් ද මුවපොව්වෙක් ද හෙන එයි; එක් ධූනීයෙක් වැද්දෙකු රැවටීම, ඔහුට "පින්වත! මුවා කෙතෙක් අගී ද? මුවපැටවා කෙතෙක් දැ?" යි කියා; මුවා කහවණු දෙකෙහා, මුව පැටවා එකෙකැයි ද කී කල්හි කහවණුවක් දී මුවපැටවා ගෙන මදක් ගොස් නැවතුනේ "පින්වත! මට මුවපැටවාගෙන් වැඩෙක් නැත, මට මුවා දෙව" යි කියා. "එසේ නම් කහවණු දෙකක් දෙව" යි; හෙතෙම කී- "පින්වත! මා විසින් පළමු එක් කහවණුවක් දෙනලද්දේ නො වේ දැ?" යි; එසේය, දෙනලද්දේ යයි; මේ මුවපැටවා ද ගනුව එසේ ඒ කහ වණුව ද මේ කහවණුවක් අගනා මුවපැටවා දැ, යි කහවණු දෙකක් වන් නාහු ය, යි; හෙතෙම යුකතියක් කියා යයි සලකා මුවපැටවා ගෙන මුවා දුන්නේ යයි.

නිකති= යොග වශයෙන් හෝ මායා වශයෙන් හෝ පාමඞ්ග නො වූයේ පාමඞ්ග යයි මාණික්‍ය නො වූයේ මාණික්‍ය යයි සුවණ්‍ණ නො වූයේ සුවණ්‍ණ යයි කොට සමාන වූවකින් රැවටීම යැ; **සාවියොගො**= කුටිල ප්‍රයොගය; මෙය මේ උකෙකාටනාදීන්ට ම නමෙකි; එහෙයින් උකෙකාවනසාවියොගය වඤ්චනසාවියොගය නිකතිසාවියොග යයි මෙසේ මෙහි අර්ථය දතයුතු. කිසිවෙක් අනිකක් දක්වා අනිකක් පරිවර්තනය කිරීම "සාවියොග" යයි කියති, එහෙත් එය වඤ්චනයෙන් සඞ්ග්‍රහ කරනලද. "ඡේදනා" දී යෙහි **ඡෙදන** නම් අත් සිඳීම් ආදිය යැ; **වධ** නම් මරණ යැ බන්ධ නම් රජ්ජු (=රැහැන්) බන්ධනාදියෙන් බැඳීම යැ; **විපරාමොස** නම් හිමවිපරාමොස යැ ගුම්බවිපරාමොස යැයි විවිධ වෙයි; යමක් හිමවැටෙන කලැ හිමයෙන් ප්‍රතිවර්ණන වැ මගට පිළිපන් ජනයා පැහැර ගනිත් ද, මේ "හිමවිපරාමොස" යැ; යමක් පඳුරු ආදියෙන් ප්‍රතිච්ඡන්න වැ පැහැර ගනිත් ද, මේ "ගුම්බවිපරාමොස" යයි. **ආලොප** යි ගම් නියම්ගම් ආදීන් ගේ පැහැරීම යැ; සැහැසි වැ කිරීම නුයි **සාහසකිරියා** නමු; ගෙට පිවිස මිනිසුන්ගේ ළෙහි සැත තබා කැමති බඩු ගැනීම යැ; මෙසේ මේ ඡේදන -පෙ- සාහසක්‍රියා යන මෙයින් වැලකුනේ වේ.

සො සනත්තූඤ්ඤො හොති= ඒ මේ මහණ යට කී සිව්පසයෙහි දෙළොස් වැදෑරුම් වූ ඉතරෙතරප්‍රත්‍යය සන්තොෂයෙන් සමන්විත වූ මහණහට තුන්සිවුරු යැ පාත්‍ර යැ දූහැටිදඬු කපනවැය (= පිහිය) යැ අවපිරිකර. එක් භිදිකටුවෙක කාබහන යැ පෙරහන යැ අවපිරිකර වටින් මේ කියනලද ද වෙයි—

156. **"තිචීවරං ච පත්තො ච – වාසි සූචි ච ඔණිනං**
පරිස්සාවනෙන අට්ඨ'තෙ – යුත්තයොගස්ස භික්ඛුනො" යි.

ඒ සිඟල්ල කය පරිහරණයට පමණ වූවාහු ද, කුස පරිහරණයට පමණ වූවාහු ද වෙති; කෙසේ ද? පළමු කොට තුන්සිවුර හැඳ ද පෙරව ද හැසිරෙන කලැ කය පරිහරණය කෙරෙයි, පොෂණය කෙරේ නුයි "කායපරිහාරිය" වෙයි; සිවුරු කණින් දිය පෙරා බොන කල ද කැයුතු ඵලවැල ගන්නා කල ද කුස පරිහරණය කෙරෙයි, පොෂණය කෙරේ නුයි "කුච්ඡිපරිහාරිය" වෙයි; පාත්‍රය ද එයින් දිය නගා නහන කල ද කුටිය පිරිබඳ කරන කල ද "කායපරිහාරිය" වෙයි; ආහාර ගෙන වළඳන කල "කුච්ඡිපරිහාරිය" වෙයි; වැය (= පිහිය) ද එයින් දූහැටිදඬු කපන කල ද ඇඳ පුටු වලට විශල්-පා-සිවුරුදඬු – කිළිදඬු සකස්කරන කල ද "කායපරිහාරිය" වෙයි; උක්දඬු කපන පොල් ආදිය සසින කල

---

156. **තිචීවරං** ච= තුන් සිවුර ද; **පත්තො** ච= පාත්‍රය ද; **වාසි**= (දූහැටිදඬු කපන) පිහිය ද; **සූචි** ච= භිදිකටුව ද; **ඔණිනං**= කායබන්ධනය ද; **පරිස්සාවනෙන**= පෙරහන සමඟ; **එතෙ අට්ඨ**= මේ (පිරිකර) අට; **යුත්තයොගස්ස**= යෙදුණු යොග ඇති; **භික්ඛුනො**= භික්ෂු හට (වටනාහුය.)

"කුචඡිපරිහාරිය" වෙයි; **කිඳිකටුව** සිවුරු මසන කල "කායපරිහාරිය" වෙයි; කැවුම් හෝ ගෙඩි හෝ විද කන කල "කුචඡිපරිහාරිය" වෙයි; කාබහන බැඳ හැසිරෙන කල "කායපරිහාරිය" වෙයි; උක් ආදිය බැඳ ගන්නා කල "කුචඡිපරිහාරිය" වෙයි; පෙරහන එසින් දිය පෙරා නාන කල ද සෙනසුන් පිරිබඩ කරන කල ද "කායපරිහාරිය" වෙයි; පානීය හා පැන් පෙරන කල ද එසින් තල-සහල්-හබලපෙති ආදිය ගෙන කන කල ද "කුචඡිපරිහාරිය" වේ. මේ වූ කලි **අෂ්ටපරිෂ්කාරික** (භික්ෂූ හුගේ) පරිෂ්කාරමාත්‍රයෝසි. යලි ශයනාසට පිවිසෙන නවපරිෂ්කාරිකයා හට **එහි** පිහිටි පසතුරණ හෝ කොණ්ඩිය හෝ වටී, දශපරිෂ්කාරිය හට හිඳිනා සම්කඩ වටී. **එකාදශපරිෂ්කාරිකය** හට සැරයටිය හෝ තෙල් නැළිය හෝ වටී. **වාදශපරිෂ්කාරිකය** හට ජිත්‍රය හෝ වහන් සඟළ හෝ වටී. තවද- මොවුනතුරෙහි **අෂ්ටපරිෂ්කාරික** තෙමේ ම **සනතුෂ්ට** යැ **අන්‍යයෝ අසනතුෂ්ටයෝ** යැ මහාආශා ඇත්තාහු යැ මහාතෘෂ්ණා ඇත්තාහු යැයි නො කියයුත්තාහුය; මොවුහු ද අල්පෙච්ඡයෝ ම **සනතුෂ්ට** වූවාහු ම සුභර වූවාහු ම සැහැල්ලූ පැවතුම් ඇත්තාහු ම වෙති. භාග්‍ය වතුන් වහන්සේ වදාහි මේ සූත්‍රය ඔවුන්ගේ වශයෙන් නො වදාළහ. **අෂ්ටපරිෂ්කාරිකයා**ගේ වශයෙන් වදාළහ. ඒ එසේ මැයි- හෙතෙම කුඩා පිඟිය ද හිඳිකටුව ද, පෙරහනැ බහා පාත්‍රය ඇතුලත තබා පාත්‍රය උර හිසැ **එල්වා** තුන්සිවුර කය පිළිබැඳි කොට කැමති වූ යම් තැනෙක්හි සුවසේ නික්ම යෙයි; පෙරලා අවුත් ගතයුත්තෙක් නම් ඔහුට නො වේ. මෙසේ මේ භික්ෂූහුගේ සැහැල්ලූ පැවතුම් ඇතිබැව් දක්වමින් භාග්‍ය වතුන් වහන්සේ **සනතුෂ්ඨො හොති කායපරිහාරිකෙන චීවරෙන** යනා දිය වදාළහ. **එහි කායපරිහාරිකෙන**= කය පරිහරණයට (= පොෂණ යට) පමණ වූ; **කුචඡිපරිහාරිකෙන**= කුස පරිහරණයට පමණ වූ; **සමා දෙයව පක්කමති**= ඒ අවපිරිකර පමණ වූ සියල්ල ගෙන කය පිළිබැඳි කොට ම යෙයි; මාගේ විහාර යැ පිරිවෙන යැ උපස්ථායකයෝ යැයි ඔහුගේ ඇලීමෙක් හෝ බැඳීමෙක් හෝ නො වෙයි; හෙතෙම දුනුදි යෙන් මුදුණු හියක් මෙන් රැළින් පහවූ මහ ඇතෙකු මෙන් කැමති කැමති **සෙනස්න** වනලැහැබ රුක්මුල අලුත් අලුත් ප්‍රාබ්භාරය පරිභොග කරමින් එකලාවැ සිටී, එකලා වැ හිඳී, සියලු ඉරියව් වලැ එකලා වූයේ දෙවෙනියෙක් රහිත වූයේ—

157. "**චාතුද්දිසෝ අප්පටිඝෝ ච හොති**
සනතුස්සමානෝ ඉතරීතරෙන
පරිස්සයානං සහිතා අජඣගා
එකෝ චරං ඛග්ගවිසාණකප්පෝ" යි-

---

157. **චාතුද්දිසෝ**= සිව්දිග කැමති පරිද්දෙන් හැසිරෙන්නේ, නොහොත් බ්‍රහ්මවිහාරභාවනා පැතිර වූ සිව්දිග ඇත්තේ; **අප්පටිඝෝ ච හොති**= (සත්ත්වසංස්කාරයන් කෙරෙහි) නො ගැටෙන්නේ ද වෙයි; **ඉතරීතරෙන**= කුදුමහත් ප්‍රත්‍යයෙන්; **සනතුස්සමානෝ**= (වාදශ විධ

මෙසේ වණ්ණනා කරනලද කඟවෙහෙණකු සදෘශ බවට පැමිණෙයි; මෙවිට ඒ කාරණය උපමාවකින් සාධනය කරන සේක් **සෙය්‍යථාපි** යනා දිය වදළහ. **එණි පක්ඛිසකුණෝ**= පියාපත් ඇති ලිහිණියෙක්; **ඩෙති**= පියාසර කරයි; මේ වූ කලි මෙහි සංක්ෂේපාර්ථ යැ; ලිහි ණීහු නම් අසවල් පෙදෙසැ රුකෙක් පැසුණු ඵල ඇතැයි දැන නන් දෙසින් අවුත් නිය-පියා-තුඩ ආදියෙන් ඒ ඟස ගෙඩි විදිමින් විසුරුවමින් කති; මේ අද පිණිස මේ සෙට පිණිස වන්නේ යයි ඔවුන්ට (අදහසෙක්) නො වෙයි; වැලි ගෙඩි ක්ෂය වූ කල ගසට නො මැ අරක් තබති, එහි පියා හෝ පත් හෝ නිය හෝ තුඩ හෝ නො තබති; වැලි ඒ ගසැ අපෙක්ෂා රහිතයෝ වැ යමෙක් යම් දිශාභාග යක් කැමති වේද, හේ එහි සිය පත්බර ඇතිව ම පියාඹා යෙයි. **එෂරිද්** දෙන් ම මේ මහණ ඇලුම් රහිත වූයේ අපෙක්ෂා රහිත වූයේ ම නික්ම යෙයි, අවපිරිකර පමණක් වූ සියල්ල ගෙන ම නික්ම යන්නේය,යි.

අභියෙන= නිදෙස් වූ; **අජ්ඣත්තං**= සිය අත්බැවිහි; **අනවජ්ජසුඛං**= නිදෙස් සුවය; **සෝ චක්ඛුනා රූපං දිස්වා**= ඒ මේ නිදෙස් වූ ශීලසඤ්ඤ යෙන් සමන්විත මහණ චක්ෂුර්ඥානයෙන් රූපයක් දැක යන අවිසි. සෙසු පදයන්හි යමක් කියයුතු වන්නේ නම් ඒ සියල්ල විශුද්ධිමාර්ගයෙහි කියන ලදී. **අබ්‍යාසෙකසුඛං**= කෙලෙසුන් විසින් නො ඉසිනලද සුවය; නො විසුරුණු සුවය යි ද කියන ලදී. ඒ එසේ මැයි- **ඉන්ද්‍රියසංවරයෙන්** උපන් සුවය රූපායතනාදියෙහි දෘෂ්ටමාත්‍රාදි වශයෙන් පැවති බැවින් **අවිකිණ්ණේ** වේ. **සෝ අභිඤ්ඤාතෙන පහීතබ්බෙන**= ඒ මනස සවෙනිකොට ඇති ඉදුරන්ගේ සංවරයෙන් සමන්විත වූ මහණ මේ ඉදිරියට යෑම පෙරලා ඊම ආදි සත් තැන්හි සමෘති සම්ප්‍රජන්‍ය වශයෙන් නුවණින් දැන කරන්නේ වේ. එහි යමක් කියයුතු වන්නේ නම් එය සතිපට්ඨානයෙහි කියනලද මැයි.

සෝ ඉමිනා ච ඝනාදීන් කුමක් දක්වත් ද යත්? වනවාසය පිළිබඳ ප්‍රත්‍යයසමපත්තිය දක්වන සේක. සැබව- යමෙකුට මේ සතර ප්‍රත්‍යයෝ නැත්තාහු ද ඔහුගේ ආරණ්‍යවාසය සමෘඩ නො වෙයි, තිරිසන්ගියවුන් හෝ වනචරයන් හෝ සමඟ ලා කියයුතුබවට පැමිණෙයි; වනයෙහි අධිෂ්ඨිත දෙවතාවෝ මෙබඳු ලාමක මහණහුගේ වනයෙහි විසීමෙන් කිම් දූ? යි භයානක ශබ්දය අස්වති, අත්වලින් හිස පැහැර පලායන

සන්තාෂයාගේ වශයෙන්) සතුටුවන්නේ; **පරිස්සයානං**= (සිංහව්‍යාඝ්‍රාදි බාහ්‍ය වූ ද කාමච්ඡන්දාදි ආභ්‍යන්තරික වූ ද කායචිත්ත) උපද්‍රවයන්; **සහිතා**= (අධිවාසනක්ෂාන්තියෙන් ද ව්‍යාඝ්‍රාදි ධර්මයන්ගෙන් ද) ඉවසන්නේ; **අජ්ඣත්තේ**= තැතිගැනීම් රහිත වූයේ; **ඛග්ගවිසාණකප්පෝ**= කඟ වෙහෙණකු සදෘශ වූයේ; **එකෝ**= එකලා වූයේ; **චරේ**= (ඊර්‍යාපථ චර්‍යාදි වූ හෝ ශ්‍රද්ධාදි වූ හෝ අෂ්ටවිධචර්‍යාවෙන්) හැසිරෙන්නේයි.

අයුරක් කෙරෙත්. අසුවල් මහණ වතයට වැද මේ මේ පව්කම් කෙළේ ය,සී අයස පැතිරේ. වැලි යමෙකුට මේ සතර ප්‍රත්‍යයෝ ඇත් ද ඔහුගේ අරණ්‍යවාසය සමෘඩ වෙයි; සැබව හෙතෙම තමාගේ ශීලය ප්‍රත්‍යවෙක්ෂා කරමින් කිසි කැළලක් හෝ තිලකයක් හෝ නො දක්නේ ප්‍රීතිය උපදවා එය ක්ෂයවශයෙන් ව්‍යයවශයෙන් සිහි කරමින් ආර්‍යභූමියට බැසගනී; වනයෙහි අධිපති වැ වෙසෙන දෙවතාවෝ සතුටු වූවාහු ගුණ කියති; මෙසේ ඔහුගේ කීර්තිය දියෙහි බහාලූ තෙල්බිඳක් සෙයින් පැතිරෙන්නී වේ.

එහි **විවිත්තං**= සිස් වූ; අල්පශබ්ද යැ අල්පනිර්‍ඝෝෂ යැ යන අර්‍ථයි. ඒ එසේ මැයි— මේ සඳහා ම විභඞ්ගයෙහි **"විවිත්තන්ති සත්තිහෙ චෙ'පි සෙනාසනං හොති, තඤ්ච අත්තකාමරූපං ගහට්ඨෙහි පබ්බජිතෙහි තෙන තං විවිත්තං"** යි වදාරනලදී. මෙහි හෝනේ ත් හිඳි නේ ත් වේ නුයි **සෙනාසන** නම්; මේ ඇඳ පුටු ආදීන්ට නමෙකි; එයින් වදාළහ— **"සෙනාසනන්ති මඤ්චො'පි සෙනාසනං පීඨම්පි භිසි'පි බිම්බොහනම්පි විහාරෙ'පි අඩ්ඪයොගෙ'පි පාසාදෙ'පි හම්මියම්පි ගුහා'පි අට්ටො'පි මාලෙ'පි ලෙණම්පි වෙළුගුම්බා'පි රුක්ඛමූලම්පි මණ්ඩපෙ'පි සෙනාසනං යත්ථ වා පන භික්ඛූ පවිත්තකමනන්ති සබ්බමෙතං සෙනාසනං"** යනු. තවද- විහාර යැ අඩ්ඪයොග (= ගුරුළුපියා වැනි සෙවෙනි ඇති ගේ) යැ, ප්‍රාසාද යැ හම්මිය (= සඳලු සහිත ගේ) යැ ගුහා යැ යන මේ විහාරසෙනාසන නම; ඇඳ යැ පුටු යැ හිසි යැ බිම්බොහන යැ යන මේ මඤ්චපීඨසෙනාසන නම; පටරෙදිකඩ යැ සම්කඩ යැ තණඇතිරිය යැ පත්ඇතිරිය යැ යන මේ සන්ථතසෙනාසන නම; "යම් තැනෙක්හි හෝ භික්‍ෂූහු පෙරලා එත් ද" යන මේ ඔකාසසෙනාසන නමැයි මෙසේ සිව්වැදෑරුම් සෙනසුනක් වේ. ඒ සියල්ල ම සෙනාසන ග්‍රහණයෙන් ගන්නාලද මැයි. යලි ලිඛිණියක වැනි වූ සිව්දෙස කැමති සේ හැසිරෙන මේ මහණ හට සුදුසු (සෙනස්න) දක්වනසේක් **අරඤ්ඤං රුක්ඛමූලං** යනාදිය වදාළහ.

එහි **අරඤ්ඤං**= "නික්ඛම්ත්වා බහි ඉන්දඛීලා සබ්බමෙතං අරඤ්ඤං" යන මේ භික්‍ෂුණීන්ගේ වශයෙන් ආ අරණ්‍ය යයි; "ආරඤ්ඤකං නාම සෙනාසනං පඤ්චධනුසතිකං පච්ඡිමං" යන මේ වනාහි මේ මහණ හට සුදුසු යැ; ඒ සෙනාසනයාගේ ලක්‍ෂණ විභඞ්ගාගමයෙහි ධුතාඞ්ගනිර්දේශයෙහි කියන ලදී. **රුක්ඛමූලං**= යම් කිසි ගනසෙවනලු ඇති සිස් වූ රුක් මූල යැ; **පබ්බතං**= ශෛල යැ; ඒ එසේ මැයි- එහි කුඩා දියවිල්වලැ දියකිස කොට සිහිල් රුක්සෙවනක හුන් නන්දිගුන් වැටහෙන කල්හි සිහිල් පවනින් පවන් සලනු ලබන්නහුගේ සිත එකඟ වේ. **කන්දරං**= "කං" යි ජලය කියනු ලැබෙයි; එයින් දූරීත වූ දියෙන් බිඳුණු පර්‍වත ප්‍රදේශය යැ; යමක් "නිනම්බ" යි ද "නදීකුඤ්ජ" යි ද කියත් ද (එයයි;) ඒ එසේ මැයි- එහි රිදීපට වැනි වැලි වෙති, මතුයෙහි මිණිවියනක් වැනි වනගහනය වෙයි, මිණිකඳ වැනි ජලය ගලා බසී; මේබඳු කඳුරට බැස

පැන් බී අවයව සිහිල් කොට වැලි නහා පවුල් සිවුර පහවා හුන් මහණ දම් කරන්නහුගේ සිත එකඟ වේ. **ගිරිගුහං**= පර්වත දෙකක් අතරහෝ එක් පර්වතයෙක්හි මැ හෝ උමඟක් වැනි මහා විවර ය; "සුසාන" ලක්ෂණය විශුද්ධිමාර්ගයෙහි කියනලදී. **වනපත්ථං**= මිනිසුන්ගේ උපචාර ස්ථානය ඉක්මැ යම් තැනක නො සාත් ද නො වපුරත් ද (ඒ ස්ථානයයි;) එහෙයින් ම කිහ— **දූරානමේතං සේනාසනානං අධිවචනං** යනාදිය. **අබ්භොකාසං**= නො වැසුණු තැන; එහෙත් කැමති වන්නෝ මෙහි සිවුරු කිළියක් කොට වෙසෙයි. **පලාලපුඤ්ජං**= පිදුරුරැස; ඒ එසේ මැයි— මහත් පිදුරුරැසකින් පිදුරු ඇද ප්‍රාබහාර-ලෙන් වැනි වූ වාස ස්ථානයන් කෙරෙති; ගස්-පඳුරු ආදීන්ගේ මතුයෙහි දූ පිදුරු බහා යට හුන්නාහු මහණදම් කෙරෙති, ඒ සඳහා මෙය කියනලදී.

පච්ඡාභත්තං= බතට පසු; **පිණ්ඩපාත පටික්කන්තෙනා**= පිඬු සෙවීමෙන් වැළකුනේ; **පල්ලඞ්කං**= හාත්පසින් ඌරුබඩාසනය; **ආභුජිත්වා**= බැඳ; **උජුං කායං පණිධාය**= මතු සිරුර සෘජුව තබා; අටලොස් පිටකවූ කොතින් කොත පිහිටුවා; ඒ එසේ මැයි- මෙසේ හුන්නහුගේ **සම්**-මස්-නහර නො නැමෙති, එකල්හි ඔහුට ඒ (**සම්** ආදීන්ගේ) නැමීම් හෙතුවින් කෙණෙහි කෙණෙහි යම් වෙදනා උපදනාහු ද, ඔවුහු නූපදිති; ඔවුන් නූපදනා කල්හි සිත එකඟ වෙයි, කමටහන නො පෙරලෙයි, වැඩිමට තරවීමට පැමිණෙයි; **පරිමුඛං සතිං උපට්ඨපෙත්වා**= කමටහනට අභිමුඛ කොට සිහිය පිහිටුවා, මුඛය සමීපයෙහි හෝ කොට යන අර්ථයි; එහෙයින් ම විභඞ්ගයෙහි කියනලදී- **"අථං සති උපට්ඨිතා හොති සුපට්ඨිතා නාසිකග්ගෙ වා මුඛනිමිත්තෙ වා, තෙන වුච්චති පරිමුඛං සතිං උපට්ඨපෙත්වා"** යනු. නොහොත් **"පරීති පරිග්ගහට්ඨෙ මුඛන්ති නිය්‍යානට්ඨෙ සතීති උපට්ඨානට්ඨෙ තෙන වුච්චති පරිමුඛං සතිං"** යි මෙසේ ප්‍රතිසම්භිදාවෙහි කී නියමයෙන් ද මෙහි අර්ථ දතයුතු. එහි මේ සංක්ෂේප ය යි- "ගන්නාලද නිස්කම යැම ඇති සිහිය කොට" යි. **අභිජ්ඣං ලොකෙ** යන මෙහි බිඳීම් අටින් පඤ්චොපාදානස්කන්ධයෝ ලොක ය; එහෙයින් "පඤ්චොපාදානස්කන්ධයන්හි රාගය දුරු කොට කාමච්ඡන්දය විෂ්කම්භණය කොට" යි මේ මෙහි අර්ථයි. **විගතාභිජ්ඣෙන**= විෂ්කම්භණ වශයෙන් ප්‍රහීණබැවින් පහවූ අභිධ්‍යා ඇති චක්ෂුර්ඥානය සදෘශවූයෙන් නො වෙයි යන අර්ථයි. **අභිජ්ඣාය චිත්තං පරිසොධෙති**= අභිධ්‍යාවෙන් සිත හාත්පසින් මුදයි, යම්සේ ඒ (සිත) ඕ (අභිධ්‍යාව තොමෝ) මුදන්නී ත් මුදා නැවත නො ගන්නී ත් වේද, එසේ කෙරෙයි යන අර්ථයි. **බ්‍යාපාදපදොසං පහාය** යනාදියෙහි දූ මෙ ම නයයි. මෙයින් සිත විකෘතියට පැමිණෙයි, කුණු කොමු ආදිය මෙන් පළමු ප්‍රකෘතිය හරි නුයි **බ්‍යාපාද** නම; විකාරයට පැමිණීමෙන් දූෂ්‍ය වෙයි, මෙරමා හෝ දූෂ්‍ය කෙරෙයි, විනාශ කෙරේ නුයි **පදොස** නම; මේ දෙක ක්‍රෝධ යට ම නම්.

චිත්තං= චිත්තයාගේ ගිලන්බව; **මිඛං**= චෛතසිකයන්ගේ ගිලන් බව; **චිත්තඤ ද මිඛඤ ද චිත්තමිඛ නම්**; **ආලොකසඤ්ඤී**= රැසිදු දහවල් දුටු එලිය හැඳිනීමෙහි සමර්ථ වූ පහ වූ නීවරණ ඇති පිරිසුදු වූ සංඥාවෙන් සමන්විත වූයේ; **සතෝ සම්පජානෝ**= සිහියෙන් ද නුවණින් ද සමන්විත වූයේ; මේ දෙක ආලොකසංඥාවට උපකාරක බැවින් කියන්නලද. ඖඛත්‍යඤ ද කෞකෘත්‍යඤ ද **උඛවඝුඤ්ඤුච්ච නම්**; **තිණණවිචිකිච්ඡෝ**= විචිකිත්සාව තරණය කොට ඉක්මවා සිටියේ; මේ කෙසේ ද? මේ කෙසේ ද? යි මෙසේ නො පවතී නුයි **අකථංකථී නම්**; **කුසලෙසු ධම්මෙසු**= අනවද්‍ය ධර්මයන්හි; මොවුහු කුශලයෝ ද? කෙසේ මොවුහු කුසල් වූවාහු ද? යි මෙසේ විචිකිත්සා නො කෙරෙයි, සැක නො කෙරෙයි යන අර්ථයි. මේ මෙහි සංක්ෂේප යයි. යලි මේ නීවරණයන්හි වචනාර්ථ ලක්ෂණාදි භෙදයෙන් යමක් කියයුතු වන්නේ නම් ඒ සියල්ල විශුද්ධිමාර්ගයෙහි කියනලද්දේය.

පඤ්ඤාය දුබ්බලී කරණෙ= මේ පඤ්චනීවරණයෝ උපදනාහු නුපන් ලෞකික ලොකොත්තර ප්‍රඥාව උපදින්ව නො දෙති; උපන් නාවූ ද අෂ්ට සමාපත්ති හෝ පඤ්චාභිඥාවන් මුලිනුපුටා හෙලති; එහෙයින් "ප්‍රඥාව දුර්බල කරන්නාහු ය" යි කියනු ලැබෙත්. **තථාගතපදං ඉතිපි**= මේ ද තථාගතයන්ගේ ඥානපදය ඥානවලඤ්ඡනය නුවණින් ඇක්මුණු තැන යයි කියනු ලැබේ. **තථාගතනිසෙවිතං**= තථාගතයන් වහන්සේගේ නුවණ නමැති ඉළයෙන් ඔටනා ලද තැනෙක; **තථාගතා රඤ්ජිතං**= තථාගතයන්ගේ නුවණ නමැති දළයෙන් ඉරි ඇඳි තැනෙක; **යථාභූතං පජානාති**= සවභාව වූ පරිදි දැනගනී; **නත්ථෙව නාම අරියසාවකෝ නිබ්බං ගතෝ හොති**= මේ ධ්‍යානාභිඥ බාහිරකයන් හා ද සාධාරණයෝ යයි ඒ තාක් නිර්ඝාණයට නො ගියේ වෙයි; මාර්ගක්ෂණයෙහි ද අවසන් නො කළ කටයුතු ඇති බැවින් ඒ තාක් නිර්ඝාණයට නො ගියේ වේ. **අපි ච ඛෝ නිබ්බං ගච්ඡති**= වැලි දූ විනාහි මාර්ගක්ෂණයෙහි මහඇතු දක්නාවූ නාගවනිකයා මෙන් "භාග්‍යවතුන් වහන්සේ සම්‍යක්සම්බුද්ධයහ" යි මේ ආකාරයෙන් තුන්රුවන්හි නිර්ඝාණයට යෙයි; **නිබ්බං ගතෝ හොති**= මෙසේ මාර්ගක්ෂණයෙහි නිර්ඝාණය යන්නේ අර්හත්ඵලක්ෂණයෙහි අවසන් කළ සියලු කිස ඇති බැවින් සියලු අයුරින් තුන්රුවන්හි නිර්ඝාණයට ගියේ වේ. සෙස්ස සියලු තැන්හි ප්‍රකට අර්ථ ඇත්තේ මැයි.

චූළහත්ථිපදෝපම සූත්‍ර වර්ණනා නිමි.

මහාහත්ථිපදෝපම සූත්‍ර වණ්ණනා.

එවමේතසුතං යි මහාහත්ථිපදෝපම සූත්‍ර යයි. එහි **ජඞ්ඝලානං**= පොළෝතෙලෙහි හැසිරෙන්නා වූ; **පාණීනං**= පා සහිත ප්‍රාණීන්ගේ; **පදජාතානි**= පදයෝ; **සමොධානං ගච්ඡන්ති**= රැස්වීමට බැසගැනීමට යෙති; **අග්ගමක්ඛායති**= ශ්‍රේෂ්ඨ යයි කියනුලැබේ; **යදිදං මහන්තත්තෙන**= මහත්බැවින් අග්‍ර යයි කියනු ලැබේ; ගුණවශයෙන් නො වෙයි යන අර්ථයි. **යෙ කෙචි කුසලා ධම්මා**= යම් කිසි ලෞකික හෝ ලොකොත්තර හෝ කුශල ධර්මයෝ; **සඞ්ගහං ගච්ඡන්ති** යන මෙහි සඞ්ග්‍රහය චතුර්විධ යැ- සජාතිසඞ්ග්‍රහ යැ සඤ්ජාතිසඞ්ග්‍රහ යැ ක්‍රියාසඞ්ග්‍රහ යැ ග්‍රහණසඞ්ග්‍රහ යැයි කියයි. ඔවුනතුරෙහි 1. "සබෙබ ඛත්තියා ආගච්ඡන්තු සබෙබ බ්‍රාහ්මණා" යි මෙසේ සමානජාතිවශයෙන් සඞ්ග්‍රහය සජාතිසඞ්ග්‍රහ නම්; 2. "සබෙබකොසලා සබෙබමාගධකා" යි මෙසේ උපන් දෙශයාගේ වශයෙන් සඞ්ග්‍රහය සඤ්ජාතිසඞ්ග්‍රහ නම්; 3. "සබෙබරථිකා සබෙබ ඛත්තුගහා" යි මෙසේ ක්‍රියාවශයෙන් සඞ්ග්‍රහය ක්‍රියාසඞ්ග්‍රහ නම්; 4. **"චක්ඛායතනං ඝානමං ඛණ්ඩගහණං ගච්ඡතීති? චක්ඛායතනං රූපක්ඛණ්ඩගහණං ගච්ඡති, නාසඤ්ච චක්ඛායතනං රූපක්ඛණ්ඩගහණං ගච්ඡති, නෙන වත රෙ! වත්තබ්බං චක්ඛායතනං රූපක්ඛණ්ඩන සඞ්ගහිතං"** යි මේ ග්‍රහණසඞ්ග්‍රහ නම්; මෙ තැන්හි දු මෙය ම අදහස් කරනලදී. තවද- **"චතුන්නං අරියසච්චානං කති කුසලා? කති අකුසලා? කති අබ්‍යාකතා?"** යන ප්‍රශ්නය විසඳීමෙහි **"සමුදයසච්චං අකුසලං, මග්ගසච්චං කුසලං, නිරොධසච්චං අබ්‍යාකතං, දුක්ඛසච්චං සියා කුසලං සියා අකුසලං සියා අබ්‍යාකතං"** යි ආ හෙයින් චාතුර්භූමක කුශලය ම දෙ අඩ සත්‍යයක් ම ගැනීම කරන්නේ නො වේ ද? වැලි කුමක් හෙයින් (සැරියුත්) මහතෙරුන් වහන්සේ චතුරාර්‍යසත්‍යයන්හි ග්‍රහණය වන්නේ ය, යි විදුලහ ද යත්? සත්‍යයන්ට ඇතුලත් බැවිනි. සැබෑ- යම්සේ **"සාධිකමිදං භික්ඛවෙ! දිගඩ්ඪං සික්ඛාපදසතං අට්ඨමාසං උද්දෙසං ආගච්ඡති යත්ථ අනූනකාමා කුල්ලූනා සික්ඛන්ති, තිස්සො ඉමා භික්ඛවෙ! සික්ඛා අධිසීලසික්ඛා අධිචිත්තසික්ඛා අධිපඤ්ඤාසික්ඛා"** යන මෙහි සාධික වූ දෙ අඩ ශික්ෂාපද සතය එක් අධිශීලශික්ෂාව ම වෙයි; එය භික්මෙන්නේ ද ත්‍රිවිධ ශික්ෂාව භික්මෙන්නේ ය, යි දක්වනලද්දේය; ශික්ෂාවන්ට ඇතුලත් බැවිනි. තවද- යම් කිසි එක් ඇත්පියකු සතර කොටසින් එක් කොටසක බැසගත්තා වූ ද දෙ තුන් සතර කොටසක බැසගත්තාවූ ද සිවල්-සා-මුව ආදීන්ගේ පිය ඇත්පියෙහි රැස්වීමට ගියාහු ම වෙත් ද, ඇත්පියෙන් නො මිදී එය ම ඇතුලත් වූ හෙයිනි; එපරිද්දෙන් ම එක් (සත්‍යයෙක්හි) ද දෙ තුන් සතර සත්‍යයන්හි ද ගැනීමට ගියාවූ ධර්මයෝ චතුස්සත්‍යයන්හි ගැබීමට ගියාහු ම වෙති; සත්‍යයන්ට ඇතුලත් වූ හෙයිනැ යි; දෙ අඩ

චතුර්විධ සඞ්ග්‍රහය.

සත්‍යයන්හි ග්‍රහණයට ගියාවූ ද කුශලධර්මයන් **සඞ්ඛෙ තෙ චතූසු අරියසච්චෙසු සඞ්ගහං ගච්ඡන්ති** යි වදාළහ. **දුක්ඛෙ අරියසච්චෙ** යනාදි උද්දෙශපදයන්හි ද **ජාතිපි දුක්ඛා** යනාදි නිද්දේශපදයන්හි ද යම්ක් කියයුතු ද ඒ සියල්ල විශුද්ධිමාර්ගයෙහි කියනලද මැයි. යලි හුදෙක් මෙහි දෙශනානුක්‍රමය දතයුත්තේය- යම්සේ දක්ෂවූ කුලුපොත්තෙක් මොනොවට වැඩුණු හුණගසක් ලැබ සතරට කපා එයින් තුන් කොටසක් තබා එකක් ගෙන පස් කොටසකට කපන්නේ ද, එයිනුදු සතරක් තබා එකක් ගෙන පලමින් පිඬු පසක් කරන්නේ ද, එයින් සතරක් තබා එකක්ගෙන ඇතුලු භාගය පිට භාග යයි දෙපරිද්දෙන් පලා පිට භාගය තබා ඇතුලු භාගය ගෙන එයින් සුමුග-විජිනිපත්-තල්වැට ආදි නන්වැදුරුම් වෙණු විකෘති කරන්නේ ද; හෙතෙම පිටභාගය ද ඉතිරි සතර පෙශිහු ද ඉතිරි සතර කොටස ද ඉතිරි තුන් කොටස ද වැඩට නො පමුණුවන්නේ ය,යි නො කියයුතුයි; එහෙත් එක් පාරින් පමුණුවන්ට නො හැක; පිළිවෙළින් පමුණුවන්නේයි. එ පරිද්දෙන් ම මේ මහතෙරුන් වහන්සේ ද කුලුපොත්තෙක් මනාකොට වැඩුණු හුණගසක් ලැබ සතරට කොටස් (කලාක්) මෙන් මේ මහත්වූ සූත්‍රය ආරම්භ කොට චතුරාර්‍යසත්‍යවශයෙන් මාතෘකා තැබුහ. කුලුපොත්තා තුන් කොටසක් තබා එකක් ගෙන පස් පරිද්දෙකින් කිරීම මෙන් තෙරුන් තුන් ආර්‍යසත්‍යයන් තබා එක් දුඃඛ සත්‍යයගෙන බෙදන්නහුගේ සකාඞ්ඛවශයෙන් පස් පරිද්දෙකින් කිරීම යැ; නැවත යම් සේ ඒ කුලුපොතු සතර කොටසක් තබා එක් භාගයක් ගෙන පසට පැලී ද, එපරිද්දෙන් තෙරුන් වහන්සේ සතර අරූපසඞ්ඛ්‍යන් තබා රූපසඞ්ඛ්‍ය විභාග කරන්නාහු. සතර මහාභූතයෝ ද සතර මහාභූතයන්ගේ උපාදාය රූපය දැයි පස්පරිද්දෙකින් කළහ; නැවත යම්සේ ඒ කුලුපොතු තෙම සතර පෙශීන් තබා එකක් ගෙන ඇතුලු භාගය පිට භාග යයි දෙකට පැලී ද, එපරිද්දෙන් තෙරුන් වහන්සේ උපාදාරූපයද තුන් ධාතූන් ද තබා එක් පෘථිවිධාතුව විභාග කරන්නාහු **ආධ්‍යාත්මික-බාහ්‍ය වශයෙන් දෙපරිද්දෙකින් දක්වූහ.**

යම්සේ ඒ කුලුපොතු පිට භාගය තබා ඇතුලු භාගය ගෙන නන් වැදුරුම් වෙණුවිකෘති කෙළේ ද, එපරිද්දෙන් තෙරුන් වහන්සේ බාහිර පඨවිධාතුව තබා ආධ්‍යාත්මික පෘථිවිධාතුව විසි ආකාරයකින් විභාග කොට දක්වන්ට **කතමා චාවුසො! අජ්ඣත්තිකා පඨවිධාතු** යනාදිය වදාළහ.

නැවත යම්සේ කුලුපොතු තෙම පිට කොටස ද ඉතිරි සතර කොටස ද ඉතිරි තුන් කොටස ද පිළිවෙළින් වැඩට පමුණුවන්නේ ද එක් පහරින් පමුණුවන්ට නො මැ හැක්කේ ද; එපරිද්දෙන් තෙරුන් වහන්සේ බාහිර පඨවිධාතුව ද ඉතිරි තුන් ධාතූන් ද උපාදාරූපය ද ඉතිරි සතර අරූපිසඞ්ඛ්‍යන් ද ඉතිරි තුන් ආර්‍යසත්‍යයන් ද පිළිවෙළින් විභාගකොට දක්වන සේක; එක් පහරින් දක්වන්ට නො මැ හැක්කේය.

තවද- රාජපුත්‍රෝපමාවෙනුදු මේ ක්‍රමය දැක්විය යුත්තේය- එක් මහරජෙකි, ඔහුගේ අතිරෙක දහසක් පුත්‍රයෝ යෑ, හෙතෙම ඔවුන්ගේ පළඳන පිරිකර පෙට්ටි සතරක තබා දෙවු පුත්‍රයාට පාවා දුන්නේය; දරුව! මේ තා බෑයන්ගේ පළඳන බඩු යෑ, එබඳු උත්සවයක් පැමිණි කල්හි අපව පළඳන දෙවයි ඉල්වන්නවුන්ට දෙන්නෙහි යයි. හෙතෙම මැනව දෙවයෙනි! යි, සාරගර්භයෙහි තැන්පත් කෙළේය; එබඳු සැණසෙළි දිනයක රාජ පුත්‍රයෝ රජු වෙත ගොස් "පියාණෙනි! අපව පළඳන දුනමැනව, නකත් කෙළින්නෙමු" යි කිවාහුය; "දරුවෙනි! තොප දෙවුබෑයා අත මා විසින් පළඳන තබනලද එය ගෙන්වා පළඳිවු" යයි. ඔවුහු මැනවැයි පිළි වදන් දී ඔහු වෙත ගොස් "අපගේ පළඳනබඩු ඔබ අතෙහි ලා, එය දුන මැනවැ" යි කිවාහුය; හෙතෙම එසේ කරන්නෙමි,යි ගබඩාව විවෘත කොට පෙට්ටි සතර බැහැර කොට තුනක් තබා එකක් විවෘත කොට එයින් සුමුඟ පසක් බැහැර කොට සතරක් තබා එකක් විවෘත කොට එයින් කරඹු පසක් බැහැර කොට ඔවුනතුරෙනුදු සතරක් තබා එකක් විවෘත කොට පියන පසෙක තබා එයින් අතෙහි පළඳින පයෙහි පළඳින නන්වැදෑරුම් පළඳනා බැහැර කොට දුන්නේය; එකෙක් ඇති— හෙතෙම ඉතිරි කරඹු සතරින් ද ඉතිරි සුමුඟ සතරින් ද ඉතිරි පෙට්ටි තුනින් ද ඒතාක් බෙදා නො දෙයි, එහෙත් පිළිවෙළින් දෙන්නේය; එක් පහරින් දෙන්ට නො හැකි වේ. ඒ උපමාවෙහි මහරජු මෙන් භාග්‍යවතුන් වහන්සේ දතයුතු; මේ වදාරනලද මැයි- **"රාජා'හමස්මි සෙලා'ති භගවා ධම්මරාජා අනුත්තරෝ"** යි. ජ්‍යෙෂ්ඨ පුත්‍රයා මෙන් ශාරිපුත්‍ර සැවිරුන් වහන්සේ (දතයුතු;) මේ වදාරන ලද මැයි— **"යං බො නං භික්ඛවෙ! සම්මා වදමානෝ වදෙය්‍ය භගවතෝ පුත්තෝ ඔරසෝ මුඛතෝ ජාතෝ ධම්මජෝ ධම්මනිම්මිතෝ ධම්මදායාදෝ නෝ ආමිසදායාදෝති, සාරිපුත්තමේ'ව නං සම්මා වදමානෝ වදෙය්‍ය භගවතෝ පුත්තෝ -පේ- නෝ ආමිසදායාදෝ"** යි. අසිරු දහස් රාජපුත්‍රයන් මෙන් භික්ෂු සඞ්ඝ තෙමේ දතයුතු මේ ද වදාරනලදී-

158 **"පරොසහස්සං භික්ඛූනං - සුගතං පයිරුපාසති**
දෙසෙනතං විරජං ධම්මං - නිබ්බානං අනුනොහයං" යි.

---

158. **භික්ඛූනං**= භික්ෂූන් සම්බන්ධ වූ; **පරොසහස්සං**= අතිරෙක දහසක්, (අඩතෙළස් දහසකැයි සේසි;) **අනුනොහයං**= කොයිනුත් නො බිය වූ; **නිබ්බානං ධම්මං**= නිර්‍වාණ ප්‍රතිසංයුක්ත වූ ධර්මය; **දෙසෙනතං**= දෙශනා කරන්නාවූ; **විරජං**= පහවූ කෙලෙස්රජස් ඇති; **සුගතං** සුගත යන් වහන්සේ; **පයිරුපාසති**= පයුදාසනය කෙරෙයි.

රජු විසින් ඒ පුත්‍රයන්ගේ පළඳන පෙට්ටි සතරක බහා දෙවු පුත්‍රයාගේ අතැ තැබූ කල මෙන් භාග්‍යවතුන් විසින් දම්සෙතෙවියන් අතැ සිවිසස් පවසනු පිණිස තැබූ කාලය යැ; එහෙයින් ම වදාළහ- **"සාරි පුත්තෙනා හික්ඛවෙ! පහොති වත්තාරි අරියසච්චානි විත්ථාරෙන ආවි කාතුං දෙසෙතුං පඤ්ඤපෙතුං පට්ඨපෙතුං විවරිතුං විභජිතුං උත්තානී කාතුං"** යනු. එබදු වූ සැණකෙළියෙහි ඒ රාජපුත්‍රයන්ගේ රජු කරා එලඹ පළඳන ඉල්වන කල මෙන් භික්ෂු සඞ්ඝයාගේ වස් එලඹෙන සමයෙහි අවුත් දම් දෙසුම් පිණිස අයැදි කාලය යැ; වස් එලඹෙන දිනය ළංව සිටි කල්හි මේ සූත්‍රය දෙශනා කරන ලද්දේ ලු; රජු විසින් "දරුවෙනි! තොප දෙවුබෑයා අතැ මා විසින් පළඳන තබන ලද, එය ගෙන්වා ගෙන පළඳිවු" යයි කී කාලය මෙන් සම්‍යක් සම්බුද්ධයන් වූ සිනු දු "මහණෙනි! සැරියුත්-මුගලන් දෙදෙන සෙවනය කරවු, මහණෙනි! සැරියුත්-මුගලන් දෙදෙන භජනය කරවු, පණ්ඩිත වූ භික්ෂූහු යැ, සබ්‍රහ්මචාරීන් අනුග්‍රහ කරන්නාහු ය" යි මෙසේ දම්සෙතෙවියන් වෙත භික්ෂූන් යැවූ කාලය යැ; රාජපුත්‍රයන් විසින් රජුගේ කථාව අසා දෙවුබෑයා කරා ගොස් පළඳන අයැදි කාලය මෙන් භික්ෂූන් විසින් ශාස්තෘන් වහන්සේගේ කථාව අසා දම්සෙතෙවියන් කරා එලඹ දම්දෙසුම් අයැදි කාලය යැ; දෙවුබෑයා ගැබ විවර කොට පෙට්ටි සතර බැහැර කොට තැබීම මෙන් දම්සෙතෙවියන් මේ සූත්‍රාන්තය ආරම්භ කොට චතුරාර්‍ය සත්‍යයන්ගේ වශයෙන් මාතෘකාව තැබීම යැ; පෙට්ටි තුනක් තබා එකක් විවෘත කොට එයින් සුමුඛ පසක් බැහැර කිරීම මෙන් තුන් ආර්‍යසත්‍ය යන් තබා දුඃඛාර්‍යසත්‍යය විභාග කරන්නහුගේ පස් කඳ දැක්වීම යැ; සුමුඛ සතරක් තබා එකක් විවර කොට එයින් කරඬු පසක් පිටතට ගැනීම මෙන් සතර අරූකඳ තබා එක් රූපස්කන්ධය විභාගකරන්නහුගේ සතර මහාභූත-උපාදාරූප වශයෙන් පස් කොටස දැක්වීම යැ; කරඬු සතරක් තබා එකක් විවර කොට පියන පසක තබා ඝන්ධපඤ්ච-ධාතුපඤ්චාදි පළඳන දීම මෙන් තුන් මහාභූතයන් ද උපාදාරූපය ද තබා එක් පෘථිවී ධාතුව විභාග කරන්නහුගේ පළමු කොට බාහිර (පඨවිධාතුව) පියන මෙන් තබා ආධ්‍යාත්මික පෘථිවිධාතුහුගේ නානාසභාව කෙසින් විසි ආකාරයකින් දැක්වීම පිණිස **කතමා චාවුසො අජ්ඣත්තිකා පඨවිධාතු** යනාදි වචනය යැ; නැවත ඒ රාජපුත්‍රයාගේ ඒ කරඬු සතරින් ද සුමුඛ සතරින් ද පෙට්ටි තුනින් ද පසුව පිළිවෙළින් බැහැරකොට පළඳන දීම මෙන් තෙරුන් වහන්සේගේ ද ඉතිරි තුන් මහාභූතයන්ගේ ත් උපාදාරූපයන්ගේ ත් සතර අරූපස්කන්ධයන්ගේ ත් තුන් ආර්‍යසත්‍යයන්ගේ ත් පසුව පිළිවෙළින් දැක්වීම දතයුතු.

නැවත යම් මේ **කතමා චාවුසො! අජ්ඣත්තිකා පඨවිධාතු?** යනාදිය වදාරනලද ද, එහි **අජ්ඣත්තං පච්චත්තං** යන මේ දෙක ම නියකාධිවචන (= සඞ්ඝත්තානයට නමක්) මැයි; **කක්ඛළං=** තද වූ; **ඛරිගතං=**

පරිඝ වූ; **උපාදින්නං**= කර්මසමුත්ථාන රූපය ම නො වෙයි, යලි අවිශෙෂ යෙන් මෙය **ශරීරසණ්ඨානයාගේ** ගැනීම යැ; ඒ එසේ මැයි- උපාදින්න හෝ අනුපාදින්න හෝ වේවා, ආදින්න - ගෘහීත - පරාමශී වශයෙන් සියල්ල උපාදින්න ම නම් වේ. **කතමඤ්ච පනිදං? කෙසා ලොමා** —පෙ— **එදමියං කායෝ** යන මෙය ධාතුකර්මස්ථානික කුලපුත්‍රයාගේ ආධ්‍යාත්මික පෘථිවි ධාතු වශයෙන් පළමු කොට කර්මස්ථානය විභාග කරන ලදී; නැවත මෙහි මෙනෙහි කිරීම පටන් ගෙන විදසුන් වඩා රහත්බව ගනු කැමැත්ත හු විසින් යමක් කටයුතු ද ඒ සියල්ල විශුද්ධිමාර්ගයෙහි විස්තර කරන ලද්දේ මැයි.

එකෙක් ඇති- මෙහි "මත්ථලුඞ්ග" ය පෙළ නො ආයේය; හෙ ද එලවා විශුද්ධිමාර්ගයෙහි කී නියෙන් ම පැහැ - සටහන් ආදි වශයෙන් විභාග කොට "මෝ ද අවෙතන වූ අව්‍යාකෘත වූ ශූන්‍ය වූ පෘථිවිධාතු මැ" යයි මෙනෙහි කටයුතු. **යං වා පනඤ්ඤම්පි**= මෙය ඉතිරි තුන් කොටසෙහි යෙදුනා වූ පෘථිවිධාතුව ගැනීම පිණිස කියනලදී. **යා චෙව බාහිරා පඨවිධාතු**= යම් මෝ උක්තප්‍රකාර ආධ්‍යාත්මික පෘථිවි ධාතුවකු ත්; **යා ච බාහිරා**= විහඞ්ගයෙහි "අයෝ ලොහං තිපු සීසං" යනාදි නයින් ආ බාහිර වූ යම් පෘථිවිධාතුවකු ත්; මෙතෙකින් තෙරුන් විසින් ආධ්‍යාත්මික පෘථිවිධාතුව නානා සභාවයෙන් විසි ආකාරයකින් විස්තරයෙන් දක්වනලද්දීය; බාහ්‍යපෘථිවිධාතුව සංක්ෂෙපයෙන් දක්වන ලදු; කුමක් හෙයින ද? යම් හෙයකින් යම් තැනෙක්හි සත්ත්වයන්ගේ ආලය නිකානතිය ප්‍රාර්ථනාව බැසගැනීම ග්‍රහණය පරාමශීය බලවත් වේද, (එහෙයින්) එහි ඒ ආලයාදීන්ගේ උඩරණය පිණිස බුදුවරයෝ හෝ බුඩශ්‍රාවකයෝ හෝ විස්තර කථාව වදාරති, වැලි යම් තැනෙක බලවත් නො වේ ද, එහි කළයුතු කිස නැති හෙයින් සැකෙවින් වදාරත්. ඒ එසේ මැයි- යම්සේ ගොවියෙක් කෙත සාන්නේ යම් තැනක මූලප්‍රබන්ධයන්ගේ (= මුල්බිස්ස) බලවත් බැවින් නහුල ලැඟේද, එහි ගොනුන් තබා පස් ඉවත් කොට මූලප්‍රබන්ධයන් සිඳ සිඳ නහමින් බොහෝ වැයම් කෙරේද, යම් තැනක ඒ (මුල්) නැත්ද, එහි බලවත් උත්සාහය නො කොට ගොනුන් පිට පහර දෙමින් සාන්නේ ම වේද; මේ කාරණය එපරිද්දෙන් දතයුතු.

දෙශනා ක්‍රමයක්.

පඨවිධාතුරෙවෙසා= ඇවැත්නි! මෝ විවිධ වූවා ම සාමඤ්ඤයෙන් සාමාන්‍යයෙන් පරාමර්ශයෙන් සමානලක්ෂණ ඇති පෘථිවිධාතු ම යයි ආධ්‍යාත්මිකය බාහ්‍යය සමග යොදා දක්වති; කුමක් හෙයින ද? යම් හෙය කින් බාහ්‍යපෘථිවිධාතුහුගේ සිත් නැති බව ප්‍රකට ද, ආධ්‍යාත්මික (පෘථිවි ධාතුහුගේ එසේ) නො වේ ද, එහෙයින් ඕ බාහිරපඨවිධාතුව සමග එක් වැනි වූවා අවෙතන වූවා ම යයි ගන්නහුට සුවසේ පරිග්‍රහය වේ. කුමක් මෙන් ද යත්? යම්සේ දැමුණු ගොනෙකු සමග යෙදූ නො දැමුණු ගවයා කිප දිනක් ම ප්‍රතිපක්ෂ වේ ද, කම්පා වේද, අනතුරුව කිප දිනකින් ම දමනයට පැමිණේ ද; එපරිද්දෙන් ආධ්‍යාත්මික පෘථිවිධාතුව ද බාහ්‍යය

සමඟ එක් වැනි යයි ගන්නහුට කිප දිනක් ම අවෙතනා භාවයෙන් නො වැටහෙයි; අනතුරුව නො බොහෝ දිනකින් ම ඒ (ආධ්‍යාත්මික පෘථිවිධාතුහුගේ) චෙතනා රහිතබව ප්‍රකට වේ. **නං නෙතං මම**= ඒ මේ උභය පෘථිවිධාතුව ම මාගේ නො වෙයි; මේ තෙම මම නො වෙමි, මේ තෙම මාගේ ආත්මය නො වේ යයි මෙසේ තතු පරිදි විදර්‍ශනාඥාන යෙන් දතයුතුයි; **යථාභූතං**= යථාසභාවයෙන්; **යම් හෙයකින් එය අනිත්‍යාදි සභාවය වේද, එහෙයින් අනිත්‍ය යැ දුඃඛ යැ අනාත්ම යැයි මෙසේ දතයුතු යැ යන අර්ථයි.**

හොති ඛෝ සෝ ආවුසෝ! යනු කුමක් හෙයින් ආරම්භ කළ සේක් ද? බාහිර ආපොධාතු වශයෙන් බාහිර පඨවිධාතුහුගේ විනාශය දක්වා එයට වඩා ඉතා විශෙෂයෙන් උපාදින්න වූ ශරීරසඨ පෘථිවිධාතු හුගේ විනාශය දැක්වීම පිණිස යැ; **පකුප්පති**= අප්සංවති විසින් වැඩෙන්නී කිපෙයි; **අනනරහිතා තස්මිං සමයෙ බාහිරා පඨවිධාතු හොති**= එකල්හි කෙළ සියදහසක් සක්වළ කරදියෙන් විලින වන්නී ජලය හා අනුගත වැ පවතාදි වශයෙන් පිහිටි සියලු පෘථිවිධාතුව අතුරුදහන් වෙයි, දියව ජලය ම වේ; **නාවමහලලිඛාය**= එ පමණ මහත් වූ;

පෘථිවිය මහත් බව හා අනිත්‍ය බව.

159. **"දුවෙ සතසහස්සානි - චත්තාරි නහුතානි ච**
එත්තකං බහලත්තෙන - සඞ්ඛානාගං වසුන්ධරා" යි -

මෙසේ බොල්බැවින් මහත් වූ පුලුලින් වනාහි කෙළ සියදහසක් සක්වළ පමණ වූ; **අනිච්චතා**= ඇති වැ නැති වනබව; **බයධම්මතා**= භෂයට යන සභාව ඇතිබව; **වයධම්මතා**= ව්‍යයට යන සභාව ඇතිබව; **විපරිණාම ධම්මතා**= ප්‍රකෘතිය හරින සභාව ඇතිබව; මෙසේ මේ සියලු පද යන්හෙන් ම අනිත්‍යලක්ෂණය මැ වදාරනලද. යම් යමෙක් අනිත්‍ය ද, එය දුඃඛ යැ, යමෙක් දුක් ද, එය අනාත්ම යැ,යි ලක්ෂණත්‍රයම ආවාහු ම වෙති. **මත්තඤ්ඤාසිං**= මදකලක් සිටිනා වූ; එහිදෙ ආකාර යකින් මේ කායයාගේ මදකලක් සිටිනබව දතයුතු; සිති පරිත්තතා වශයෙන් ද සරස පරිත්තතා වශයෙන් ද වේ.

කය මදකලක් පවත්නාබව.

ඒ එසේ මැයි- මේ කය අනිතවිත්තක්ෂණයෙහි ජීවත්විය, (දැන්) ජීවත් නො වෙයි, (මතු) ජීවත් නො වන්නේය; අනාගත විත්ත ක්ෂණයෙහි ජීවත් වන්නේය, (දැන්) ජීවත් නො වෙයි, (පෙර) ජීවත් නො වී; වර්‍තමාන විත්තක්ෂණයෙහි ජීවත් වෙයි, (පෙර) ජීවත්නොවී, (මතු) ජීවත් නො වන්නේ ය,යි කියනු ලැබේ.

---

159. **දුවෙ සතසහස්සානි**= (යොදුන්) දෙ සියදහසක් ද; **චත්තාරි නහුතානි ච**= සාර නහුතයක් ද; (දෙ ලක්ෂ සතලිස් දහසෙකැයි යූ සේ) **බහලත්තෙන**= බොල් බැවින්; **එත්තකං**= මේ පමණ; **අයං වසුන්ධරා**= මෝ පෘථිවි තොමෝ; **සඞ්ඛානා**= සඞ්ඛ්‍යා කරන ලද්දීය.

160. "**ජීවිතං අත්තභාවෝ ච – සුඛදුක්ඛා ච කේවලා**
එකචිත්තසමායුත්තා – ලහුසෝ වත්තතෙ ඛණෝ" යන-

මෙය ද මොහුගේ මෑ මදකල් පැවැත්ම දක්වනු වස් වදාරතලදී. මෙසේ ඝිතිපරිත්තතා වශයෙන් මදකල් සිටිනබැව් දතයුතු. නැවත ආශ්වාස ප්‍රතිබඬාදිභාවයෙන් ඔහුගේ සරසපරිත්තතා දතයුතු. "ඒ එසේ මැසි– සත්වයන්ගේ ජීවිතය ආශ්වාසප්‍රතිබඬ යැ, ජීවිතය ප්‍රශ්වාසප්‍රතිබඬ යැ, ජීවිතය ආශ්වාසප්‍රශ්වාසප්‍රතිබඬ යැ, ජීවිතය මහාභූතප්‍රතිබඬ යැ, ජීවිතය කවලීකාරාහාරප්‍රතිබඬ යැ, ජීවිතය විඤ්ඤාන ප්‍රතිබඬ යැ" සි මෙය විශුද්ධිමාර්ගයෙහි විස්තර කරන ලදී.

නාණහුපාදිනනාසස= තෘෂ්ණායෙන් ආදින්න - ගෘහීත - පරාමෂ්ට කරන ලද; **අහනති වා මමනති වා අසමීති වා අථ බවසස නො වේ වෙපා හොති**= එකල්හි මෙසේ ත්‍රිලක්ෂණයට නහා බලන්නාවූ ඒ මහණහට මේ ආධ්‍යාත්මික පෘථිවීධාතුවෙහි "මේ මම වෙමි" යි හෝ යනාදි ත්‍රිවිධ වූ තෘෂ්ණාමානදෘෂ්ටිග්‍රාහය නො ම වෙයි; නො වේ මයැ යන අර්ථයි. තවද– ආපොධාතු වශයෙන් ද්‍රවස්වභාවය ද එපරිද්දෙන් තෙජෝධාතු–වායෝධාතු වශයෙන් ද බාහිරපඨවීධාතූන්ගේ අතුරුදහන් වීම වෙයි; එහෙත් මෙහි එකක් මෑ ආයේයැ; ඉතිරි වූවාහු ද අර්ථයෙහින් දතයුත්තාහුයි.

කං වෙ ආවුසෝ!= මෙහි ඒ ධාතුකම්මට්ඨානික භික්ෂූ ගේ ශ්‍රෝත්‍රද්වාරයෙහි පරිග්‍රහය පිහිටුවමින් බලය දක්වන සේක. **අක්කොසනති**= දශ ආක්‍රෝශවස්තූන්ගෙන් ආක්‍රෝශ කෙරෙති; **පරිභාසනති**= තා විසින් මෙ ද මෙ ද කරන ලද, තව මෙසේ ත් කරන්නෙමු,යි වචනයෙන් පරිභව බෙණෙති; **රොසෙනති**= ගටති; **විහෙසෙනති**= දුක් උපදවති; සියල්ල වචනයෙන් ගැටීම ම කියනලදී. **සො එවං**= ඒ ධාතුකම්මට්ඨානික මෙසේ දැනගනී; **උප්පජ්ජනතා බො මෙ අයං**= දැන් වර්තමානයෙහි උපන් බැවින් ද සමුදයවාර වශයෙන් උපන් බැවින් ද උපන්නීය; **සොතසමඵස්සජා**= උපනිශ්‍රය විසින් ශ්‍රෝත්‍රස්පර්ශයෙන් උපන් ශ්‍රෝත්‍රද්වාරයෙහි ජවනවෙදනා නොමෝ; **එසෙසා අනිච්චෙවා**= ශ්‍රෝත්‍රස්පර්ශය තෙම ඇති වැ නැති වන අනිත්‍ය සි දකී; වෙදනාදීහු ද ශ්‍රෝත්‍රස්පර්ශය හා සම්ප්‍රයුක්ත වූවාහු ම දතයුත්තාහුයි. **ධාතාරම්මණමෙව**= ධාතු ඝඩ්‍යාත වූ මෑ අරමුණ;

---

160. **ජීවිතං**= ජීවිතෙන්ද්‍රියය ද; **අත්තභාවෝ ච**= (ජීවිත – වෙදනා – විඤ්ඤාණයන් තබා අවශෙෂ ධර්මඝඩ්‍යාත) ආත්මභාවය ද; **සුඛදුක්ඛා ච**= සුඛ දුඃඛ වෙදනා ද යන මොවුහු; **කේවලා**= (ආත්මය සමග හෝ නිත්‍ය භාවයෙන් හෝ) අසම්මිශ්‍ර වූවාහු; **එකචිත්ත සමායුත්තා**= එකෙකි චිත්තය හා යෙදුනාහුය; **ඛණෝ**= (ජීවිතාදීන්ගේ) ක්ෂණය; **ලහුසෝ**= (උක්තප්‍රකාරයෙන් එකචිත්තක්ෂණික බැවින්) ඉතා මදකල් වැ; **වත්තතෙ**= පවත්නේයි.

පක්ඛන්දති= බසී; **පසීදති**= ඒ අරමුණෙහි පහදී; නොහොත් මෙය ආධාරවචන මැයි, ව්‍යඤ්ජන සන්ධි විසින් "ධාතාරම්මණමෙව" යි කියන ලද; ධාතුසඞ්ඛ්‍යාත අරමුණෙහි ම යන මේ මෙහිඅර්ථයි. **විමුච්චති**= ධාතු වශයෙන් මෙසේ යයි අධිමොක්ෂය ලබයි; නො ඇලෙයි, දූෂ්‍ය නො වෙයි; ඒ එසේ මැයි- මේ තෙම ශ්‍රොත්‍රද්වාරයෙහි අරමුණ ආපාථයට පැමිණි කල්හි මූලපරිඥා-ආගන්තුක -තාවකාලික වශයෙන් පරිග්‍රහය කෙරෙයි; ඔහුගේ විස්තර කථාව සතිපට්ඨානයෙහි චතුස්සම්ප්‍රජන්‍යපර්‍වයෙහි කියන ලද්දීය. එහෙත් ඕ එහි චක්ෂුර්ද්වාර වශයෙන් කියන ලදු; මෙහි ශ්‍රොත්‍ර ද්වාර වශයෙන් දතයුතු. ඒ එසේ මැයි- මෙසේ කළ පරිග්‍රහය ඇති ධාතු කර්‍මස්ථානික වූ බලවත් විදර්‍ශකය හට ඉදින් චක්ෂුර්ද්වාරාදියෙහි අරමුණ ආපාථයට පැමිණි කල්හි භවාඞ්ගය උපදී ද, ව්‍යවස්ථාපන යට පැමිණේ ද, ව්‍යවස්ථාපනයට පැමිණ එක් දෙ වරක් ආසෙවනය ලැබ සිත භවාඞ්ගයට ම බසී ද, රාගාදි වශයෙන් නො උපදී ද, මේ තෙම කොටිප්‍රාප්ත වූ තියුණු විදර්‍ශක යැ; අනිකෙකුට රාගාදි වශයෙන් එක් වරක් ජවන් දිවෙයි, යලි ජවන් කෙළවර රාගාදි වශයෙන් මෑඟේ ජවන් දුවන ලදුයි මෙනෙහි කරන්නහු විසින් අරමුණ භුවණින් වෙන් කොට ගන්නා ලද්දේ ම වෙයි; නැවත වරක් එසේ නො දිවෙයි; අනිකෙකුට- එක් වරක් මෙනෙහි කරන්නහුට යලි දෙවෙනි වර රාගාදි විසින් දිවේ මය; එහෙත් දෙවෙනි වර අවසානැ මෙසේ මාඟේ ජවනය දුවන ලදුයි මෙනෙහි කරන්නහු විසින් අරමුණ වෙන් කොට ගන්නා ලද ම වෙයි; තුන්වෙනි වර එසේ නූපදී. මෙහි වනාහි ප්‍රථමයා ඉතා තියුණු වූයේ වෙයි; තුන්වැනි වූයේ ඉතා මඳ වූයේ වෙයි; යලි දෙවැන්නාඟේ වශ යෙන් මේ සූත්‍රයෙහි ද ලටුකිකොපමයෙහි ද ඉන්ද්‍රිය භාවනා යෙහි ද මේ අර්ථය දතයුතු.

මෙසේ ශ්‍රොත්‍රද්වාරයෙහි පරිග්‍රහ වශයෙන් ධාතුකර්‍මස්ථානිකයාඟේ බලය ප්‍රකාශ කොට මෙවිට කායද්වාරයෙහි (බලය) ප්‍රකාශ කරන්නාහු **තං වෙ ආවුසො!** යනාදිය වදළහ. යම් හෙයකින් අනිටු අරමුණට පැමිණ ශ්‍රොත්‍රද්වාරයෙහි ද කායද්වාරයෙහි ද යන දෙ දෙ
කොන් හිමියෙක්. රෙහි වෙහෙසේ ද, එහෙයින් යම්සේ කෙත්හිම් පුරුෂ යෙක් උදැල්ලක් ගෙන කෙතෙහි හැසිරෙන්නේ යම් යම් තැනෙක් හෝ මැටි පිඬක් නො දී දුබල තැන්හි ම උදැල්ලෙන් බිම් බිද තණ සහිත මැටිපිඬක් දෙන්නේ ද, එපරිද්දෙන් මහතෙරුන් වහන්සේ අනාගතයෙහි ශික්ෂාකාමී වූ ප්‍රධන්වීර්‍යය කරන්නාවූ කුලපුත්‍රයෝ මේ දෙ දෙර සංවරය පිහිටුවා වහා ම ජාති - ජරා මරණය කෙළවර කරන් නාහුය,යි මේ දෙ දෙර මැ දැඩි කොට සංවරය දෙසන සේක් මේ දෙශ නාව ආරම්භ කළහ. **එහි සමුදාචරන්ති**= උපක්‍රම කෙරෙති; **පාණ්ඩුමත්ථ සෙසනා**= අතුල්පහරින්; සෙස්සෙහි දු මෙ ම නයයි; **තථාභූතො**= එබඳු සවභාව ඇතියේ; **යථාභූතස්මිං**= යම් සවභාවයක් ඇති; **ඤාණන්ති**= පව තින්; **එවං බුද්ධං අනුස්සරතො** යනාදියෙහි "ඉතිපි සො භගවා" යනාදී

නයින් සිහි කරන්නේ ද බුදුන් සිහි කෙරෙයි, "වුත්තං බො පනෙතං භගවතා" යි සිහි කරන්නේ ද (බුදුන්) සිහි කෙරේ මැයි. "සවාකඛාතො භගවතා ධම්මො" යනාදි නයින් සිහි කරන්නේ ද දහම් සිහි කෙරෙයි, කකචූපමොවාදය සිහි කරන්නේත් (දහම්) සිහි කෙරේ මැයි. "සුපටිපන්නො" යනාදි නයින් සිහි කරන්නේ ද සඞ්ඝයා සිහි කෙරෙයි, කියතින් කැපීම ඉවසන භික්ෂුහුගේ ගුණය සිහි කරන්නේත් (සඞ්ඝයා) සිහි කෙරේ මැයි. **උපෙක්ඛා කුසලනිස්සිතා න සණ්ඨාති** යන මෙහි විදශී නොපෙක්ෂාව අදහස් කරන ලදු; **උපෙක්ඛා කුසලනිස්සිතා සණ්ඨාති** යන මෙහි ෂඩඞ්ගොපෙක්ෂාව ය; වැලි එකෙක් ඇති- ඕ මෝ (ජළඛු පෙක්ඛා) ක්ෂීණාශ්‍රව හට ඉටුනිටු අරමුණු වලැ නො ඇලීම් ආදි විසින් පවති, එහෙත් මේ මහණ වියැයිබලයෙන් භාවනාසිඛිය පිණිස තමාගේ විදශීනාව ක්ෂීණාශ්‍රවයාගේ ෂඩඞ්ගොපෙක්ෂාසථානයෙහි තබා නුසි විදශී නාව "ජළඛුපෙක්ඛා" නම් වූ.

අබ්ධාතු නිදේශයෙහි **ආපොගතං**= සියලු ආපයෙහි ඇතුලත් තෙත් වූ ගුසභාව ලක්ෂණය; යලි **පිත්තං සෙම්හං** යනාදියෙහි යමක් කියයුතු ද ඒ සියල්ල භාවනානය සමග විශුඞ්මාගීයෙහි කියන ලදී. **පකුප්පති**= ඔස වශයෙන් වැඩෙයි; සමුද්‍රයෙන් හෝ ජලය උතුරයි; මේ තෙම මේ (අබ්ධාතුහුගේ) පියවි කිපීම ය; **අප්සංවතී කාලයෙහි** වනාහි කෙළසියදහසක් සක්වළ ජලයෙන් පිරුනේ ම වේ. **ඔගච්ඡතති**= යටට යෙති; උදුනෙහි තැගූ ජලය මෙන් ක්ෂයට විනාශයට පැමිණෙයි; සෙස්ස පළමු නයින් ම දතයුතු.

තෙජොධාතු නිදේශයෙහි **තෙජොගතං**= සියලු තෙජස්හි ඇතුලත් උෂ්ණභාව ලක්ෂණය; තෙජස් මැ හෝයි; තෙජස් බවට ගියේ නුසි "තෙජොගත" නම්; පළමු "ආපොගත" යෙහි ද පසු "වායොගත" යෙහි ද මෙ ම නයයි. **යෙන** ච= කිපියාවූ යම් තෙජොගතියකින් මේ කය අකීගයින් තැවේ ද, එකාහික ජ්වරාදිභාවයෙන් උණුසුම් වූයේ වේද; **යෙන ච ජීරියති**= යමකින් මේ කය දිරා ද, ඉඳුරන්ගේ විකලබවට බල පිරිහීමට විලිපිලි ඇබවට ත් පැමිණේ ද; **යෙන ච පරිඩය්හති**- කිපුණු යම් (තෙජසකින්) මේ කය දූවේ ද, ඒ පුදගල ද දූවෙමි දූවෙමි,යි හඬමින් සියවර සෙදූ ගිතෙල් රත්සඳුන් ආදීන්ගේ ගැල්වීම් හා තල්වැටපවන ත් කැමති වේ ද; **යෙන ච අසිතපීතඛායිතසායිතං සම්මා පරිණාමං ගච්ඡති**= යමකින් ඒ ඔදනාදි වලඳන ලද්ද හෝ පැන් ඇ බොන ලද්ද හෝ සුවිකැවුම් ඇ කනලද්ද හෝ නො පැහූ මී-පැණි ඇ රසවිඳින ලද්ද හෝ මනාකොට පරිපාකයට යේද; රසාදිභාවයෙන් විභාගයට ගන්නේය යන අර්ථයි. මේ මෙහි සංක්ෂෙප යයි. යලි විසතරයෙන් ගමක් කියයුතු වන්නේ ද, ඒ සියල්ල භාවනානය සමග විශුඞ්මාගී යෙහි කියනලදී.

භණිතනනං යනු නිල්තණ මැසි; තෙත් වූ තණ වෙත පැමිණ නිවෙයි යන අර්ථයි. **පත්ථනනං**= මහමග; **සෙලනනං**= පර්වතය; **උදකනනං**= ජලය; **රමණීයං වා භූමිභාගං**= තණ ලැහැබි ආදිය රහිත වූ ජනශූන්‍ය වූ නො පිළිසන් බිම්පෙදෙස; **අනාහාරා**= ප්‍රත්‍යය රහිත වූවා දර රහිත වූවා; මේ ද පියවින් ම තෙජස්සිකාරය කියනලදැ; තෙජ සසංවර්ත කාලයෙහි වනාහි කෙළ සියදහසක් සක්වළ දවා අළුමතු ද නො සිටි; **නහාරූ දඩ්ඪලෙන**= සම්වැරලියෙන්; අග්ගිං **ගවෙසන්තෝ**= යමක් මදපමණ වූ ත් උණුසුම් ලැබ දැල්වේ ද, එබදු සියුම් දර ගෙන සොයති; මෙහි ද සෙස්ස පළමු නයින් ම දතයුතු.

වායොධාතු නිද්දේශයෙහි **උද්ධඞ්ගමා වාතා**= ඔකකාර-නිකකාදිය පවත්වන උඩට නගින වාතයෝ; **අධොගමා වාතා**= මල-මූ ආදිය බැහැර කරන යටට බසින වාතයෝ; **කුච්ඡිසයා වාතා**= අතුනු පිටත (හැසිරෙන) වාතයෝ; **කොට්ඨාසයා වාතා**= අතුනු ඇතුලත වාතයෝ; **අඞ්ගමඞ්ගානුසාරිනෝ**= ධමනිජාලානුසාරයෙන් සියලු සිරුරු අවයව යක් පාසා පතළාවූ හැකිලීම් දිගුකිරීම් ආදිය උපදවන වාතයෝ; **අස්සාසෝ**= ඇතුලත පිවිසෙන නාසික වාතය; **පස්සාසෝ**= පිටත නික්මෙන නාසිකවාතය; මේ මෙහි සංක්ෂේප යයි, යලි විස්තරයෙන් යමක් කිය යුතු වන්නේ නම් ඒ සියල්ල භාවනානය සමග විශුද්ධිමාර්ගයෙහි කියන ලදී. **ගාමම්පි වහති**= සියලු ගම් මැ සුණු විසුණු කරමින් ගෙන යයි; නිගමාදියෙහි ද මේ ම නයයි. මෙහි වායුසංවර්ත කාලයෙහි කෙළ සිය දහසක් සක්වළ වැනසීම් විසින් වායොධාතුවිකාරය දක්වනලදැ; **විජ්ඣාපනෙන**= අග්නිවිජ්ඣාපනයෙන්; **ඔස්සාවනෙ**= සියනහැ; යම් හෙයකින් එයින් ජලය වැගිරේ ද, එහෙයින් එය "ඔස්සාවන" යයි කියනු ලැබේ. මෙහි ද සෙස්ස පළමු නයින් ම දතයුතු.

සෙය්‍යථාපි ආවුසෝ! යන මෙහි කුමක් දක්වත් ද? යම් කියන ලද මහාභූතයන්ගේ නිස්සත්තභාවය යැ; **සම්භං**= ද්‍රව්‍ය සම්භාරය; **වලිං**= හාත්පසින් බඳින වැල්; **තිණං**= සෙවෙනි තණ; **මත්තිකං**= මතුයෙහි ආලෙප කරන මැටි; **ආකාසෝ පරිවාරිතෝ**= මේ කාෂ්ඨාදිය ඇතුලත ද පිටත ද පිරිවරා අහසැ සිටියේ යන අර්ථයි. **අගාරමෙවඤ්ඤං සඞ්ඛං ගච්ඡති**= අගාර (=ගේ) යි පැනවීම් මතු වෙයි; යලි කාෂ්ඨාදිය වෙන වෙන ම රැස් කළ කල්හි දැවරැස වැල්රැස යි මැ කියනු ලැබේ. **එවමෙව ඛෝ**= එපරිද්දෙන් ඇට ආදිය ඇතුලත ද පිටත ද වව කොට සිටි අහස ඒ ඇට ආදිය ම නිසා "රූප" යි මැ සඞ්ඛ්‍යාවට යේ; "ශරීර" යි ව්‍යවහාර යට යේ. යම් සේ කාෂ්ඨාදිය නිසා "ගෙහ" යි සඞ්ඛ්‍යාවට ගිය ගෙය රජුගේ බමුණුගේ යයි කියනු ලැබේ ද, එසේ මෙ ද රජසිරුර බමුණු සිරුර යයි කියනු ලැබේ. මෙහි කිසි සත්වයෙක් හෝ ජීවයෙක් හෝ නැතැයි.

අජ්ඣත්තඤ්ච වෝ ආවුසෝ! චක්ඛුං යන මේ කුමක් සඳහා ආරබ්ධ ද? යම උපාදාරූපය ද සතර අරූපීස්කන්ධයෝ ද තුන් ආර්‍යසත්‍යයෝ ද නො කියන ලද්දාහුය, මෙවිට ඔවුන් කියනු පිණිස මෝ දෙශනා ආරබ්ධ ය; එහි **චක්ඛුං අපරිඤ්ඤාතං=** චක්ෂුඃප්‍රසාදය තිරුඹ කල්හි දු නට කල්හි දු පිත් සෙම් ලෙයින් පෙළුණු කල්හි දු ඇස චක්ෂුර්විඥානයට ප්‍රත්‍යය වන්ට නො හැකි වේ නුයි බිඳුනේ ම වෙයි; යලි චක්ෂුර්විඥානයට ප්‍රත්‍යය වන්ට **සමර්ථ** වූයේ "අපරිඤ්ඤා" නම්; **බාහිරා ච රූපා=** බාහිරවූ චතුසමුට්ඨානික රූපයෝ; **තජ්ජා සමඤ්ඤාහාරෝ=** ඇස ද රූපයන් ද නිසා භවාඞ්ගය පෙරළා උපදන මෙතෙහි කිරීම; භවාඞ්ගාවර්ජනයට සමර්ථ වූ චක්ෂුර්ද්වාරයෙහි ක්‍රියාමනොධාතු චිත්තය යන අර්ථයි. එය රූප යන් ආපාථයට නො පැමිණි හෙයින් ද අනන්‍යවිහිත වූවහුට ද නො වේ. **තජ්ජස්ස=** තදනුරූප (= එයට සුදුසු) වූ; **විඤ්ඤාණභාගස්ස=** විඥාන කොට්ඨාසයට; **තථාභූතස්ස** යනාදියෙහි දු වාර විසින් සිවුසස් දක්වති; එහි **තථාභූතස්ස=** චක්ෂුර්විඥානය සමඟ වූවහුගේ චක්ෂුර්විඥානයෙන් යුක්ත වූවහුගේ යන අර්ථයි. **රූපං=** චක්ෂුර්විඥානය තමා රූපජනක නො වන බැවින් චක්ෂුර්විඥාන ක්ෂණයෙහි තිසමුට්ඨාන රූපය ද, එයට අනතුරු චිත්ත ක්ෂණයෙහි චතුසමුට්ඨාන රූපය ද ලැබේ. **සඞ්ඛහං ගච්ඡති=** ගණනට යෙයි; වෙදනාදීහු චක්ෂුර්විඥානය හා යෙදුනාහු මැයි; "විඤ්ඤාණ" ය චක්ෂුර්විඥානය මැයි.

මෙහි ද **සඞ්ඛාරා** යි වෙතනාව ම කියන ලදු; **සඞ්ඛතමභිසඤ්චේතයිකා=** එක් තැන සඞ්ග්‍රහය; **සඤ්චේතනිකා=** සමාගමය; **සමවායෝ=** රාශිය; **යෝ පච්චයසමුප්පාදං පස්සති=** යමෙක් ප්‍රත්‍යයන් දකී ද; **සෝ ධම්මං පස්සති=** හෙතෙම ප්‍රතීත්‍යසමුත්පන්න ධර්මයන් දකී; **ඡන්දෝ,** යනාදි සියල්ල තෘෂ්ණා වට වෙ වචන මැයි. සැබව- තෘෂ්ණා තොමෝ ඡන්දය කිරීම් වශයෙන් **ඡන්ද නම්;** ආලය කිරීම් (=ඇලීම්) වශයෙන් **ආලය නම්;** සෙනහ කිරීම් වශයෙන් **අනුනය නම්;** බැසගෙන ගිල ගැනීම් වශයෙන් **අජ්ඣොසාන** නමැයි කියනු ලැබේ. **ඡන්දරාගවිනයෝ ඡන්දරාගප්පහානං** යනු නිව නව ම නමෙකි. මෙසේ තුන් සත්‍යයෝ පෙළ ආවාහු මැයි; මාර්ගසත්‍යය එලවා ගනයුතුයි; මේ තුන් සත්‍යයන්හි යම් දෘෂ්ටියක් සංකල්පයෙක් වචනයෙක් කර්මාන්තයෙක් ආජීවයෙක් වැයමෙක් සතියක් සමාධියක් භාවනාවක් ප්‍රතිවේධයෙක් වේ ද, මේ මාර්ග යයි කියාසි. **බහුකතං හොති=** මෙතෙකිනු දු භාග්‍යවතුන් වහන්සේගේ ශාසනය බොහෝ කොට කරනලද වෙයි; **අජ්ඣත්තඤ්ච වෝ ආවුසෝ! සොතං=** යනාදි වාරයන්හි දු මෙ ම නයයි.

යලි මනොද්වාරයෙහි ආධ්‍යාත්මික **මනස** නම්? භවාඞ්ගචිත්ත යයි. එය නිරුඹ වූයේ ද ආවර්ජන චිත්තයට ප්‍රත්‍යය වන්ට **අසමර්ථ** වැ මඳ වැ තමගත වමැ පවත්නේ ද පරිඤ්ඤා නම් වෙයි; ආවර්ජනයට ප්‍රත්‍යය වන්ට

සමථ වූයේ අපරිහීන්න නම් වේ. **ඛාණිරා ච ධම්මා** යනු ධම්මාරම්මණය යැ; **නෙව තාව තජ්ජස්ස**= මෙය භවාඞ්ගකාලයෙන් ම කියනලද ත්‍රිතිය වාරය ප්‍රගුණ වූ ධ්‍යානය ප්‍රත්‍යවෙක්ෂා කිරීමෙන් හෝ ප්‍රගුණ වූ කම්සථානය මෙනෙහි කිරීමෙන් හෝ ප්‍රගුණ වූ බුදුවදන් හැදෑරීම් ආදියෙන් හෝ අන්‍යවිඝිත වූවහු සඳහා කියන ලදී. මේ වාරයෙහි **රූපං** යි චතුසමුට්ඨාන (රූපය) ද ලැබෙයි; සැබව- මනොවිඤ්ඤණය රූපය උපදවයි; වෙදනා දිහු මනොවිඤ්ඤණය හා සම්ප්‍රයුක්ත වූවාහුය; "විඤ්ඤාණ" ය මනොවිඤ්ඤණය මැයි. මෙහි වූ කලි සංඝකාරයෝ එස්ස - චෙතනා වශයෙන් ම ගන්නාලද්දාහුය; සෙස්ස කි නියෙන් ම දතයුතු. මෙසේ මහතෙරුන් වහන්සේ යට එකදෙශයක් ම සම්මර්ශනය කරමින් අවුත් මෙ තැන්හි සිට යට පිරිහුණු දෙශනාව සියල්ල ඒ ඒ වාරවශයෙන් බෙදා දක්වන සේක් අනුසන්ධි වූ පරිද්දෙන් ම සූත්‍රාන්තය නිමවූ සේකි.

මහාහත්ථිපදෝපම සූත්‍ර වණ්ණනා නිමි.

මහාසාරොපම සූත්‍ර වණ්ණනා.

එවමෙමසුතං යි මහාසාරොපම සූත්‍ර යයි. අචිරපක්කන්තෙන= සඩ්ඝයා බිඳ රුධිරොත්පාද කර්මය කොට නික්ම ගිය නො බෝකල් ඇති කල්හි සවලිඞ්ගයෙන් ම වෙන් වූ කල්හි; ඉධ භික්ඛවෙ! එකච්චෙවා කුල පුත්තෙනා= එකෙක් ඇති- අසවල් කුලපුත්‍ර යි නො නියම කරන ලද, එහෙත් දෙවදත්තයන් සඳහා මැ මේ කියන ලදැයි දතයුතු. සැබවහෙතෙම අසමහිත්‍ය වූ මහාසම්මත පරපුර ඉක්ෂ්වාකුවංශයෙහි උපන් හෙයින් ජාතිකුලපුත්‍ර යැ; ඔතිණ්ණොණා= යමෙකු ගේ ජාතිය ඇතුලත පිවිසියා ද, හේ ජාතියෙන් අවතීර්ණ නම; ජරාදියෙහි දු මෙ ම නයයි. "ලාභසක්කාරෘ" දියෙහි ලාභො= සිවුපසය; සක්කාරො= ඔවුන්ගේ ම මනා සේ කළබව; සිලොකො= ගුණ කීම; අභිනිබ්බත්තෙන්ති= උපද වයි; අප්පඤ්ඤාතා= දෙදෙනෙකු සිටි තැන නො පැනෙති, බත් - වත් පමණකු දු නො ලබති; අප්පෙසක්ඛා= මද පිරිවර ඇත්තාහු; පෙරටු වෙන් පිටිපසින් හෝ යන්නෙකු නො ලබති; සාරෙන සාරකරණීයං= රැක්ඛරයෙන් කටයුතු අක්ෂ - චක්‍රයුගම - නඹලාදි යම් කිසිවක්; සාඛා පලාසං අහඤ්ඤෙසි බ්‍රහ්මචරියස්ස= මග - පල හරය කොට ඇති ශාසන බ්‍රහ්මචර්‍යාවගේ සිවුපසය අතු - කොළ නම, එය ගත්තේය; ඤාණ ච වොසානං ආපාදි= එයින් ම "මෙතෙකින් පමණි, මා විසින් සාරය ලබන ලදු" යි අවසානයට පැමිණියේ වෙයි; සුණ්ණදස්සනං ආරාධෙති= දෙවිදත් පඤ්චාභිඥ යැ, දිවැස ද පඤ්චාභිඥවන්ගේ මතුයෙහි සිටියේ යැ; එය මේ සූත්‍රයෙහි "සුණ්ණදස්සන" යි කියන ලද. අජානං අපස්සං විහරන්ති= කිසි සියුම් රූපයක් නො දන්නාහු යටත් පිරිසෙයින් පාංශුපිසාචයකු දු නො දක්නාහු වෙසෙති; අසමයවිමොක්ඛං ආරාධෙති= "කතමො අසමයවිමොක්ඛො? චත්තාරො අරියමග්ගා චත්තාරි ච සාමඤ්ඤඵලානි නිබ්බානං ච අයං අසමයවිමොක්ඛො" යි මෙසේ කියන ලද නව ලොවුතුරුදහම් ආරාධනය කෙරෙයි, සම්පාදනය කෙරෙයි; ලබයි; යම් හෙයකින් ලෞකික සමාපත්තීහු සමවන් සමවන් තෙණෙහි ම විරුද්ධර්මයන්හෙන් මිදෙත් ද, එකෙයින් "කතමො සමයවිමොක්ඛො? චත්තාරිඤාණානි, චතස්සො ච අරූපසමාපත්තියො, අයං සමයවිමොක්ඛො" යි මෙසේ සමයවිමොක්ෂය කියනලද; ලොකොත්තර ධර්මයෝ වනාහි කලින් කල නො මිදෙති; සැබව- වරක් විමුක්ත වූ මාර්ඵලයෝ විමුක්තාවුවාහු ම වෙති; නිර්‍වාණය සියලු කෙලෙසුන්ගෙන් අත්‍යන්තයෙන් මිදුනේ ම යයි, මේ නව ධර්මයෝ අසමය විමොක්ෂ යයි කියන ලද්දාහුය. අකුප්පා චෙතොවිමුත්තනි= අර්හත්ඵල විමුක්තිය; අයමන්තා එතස්ස= මේ සඳහා, රහත්ඵලය සඳහා මේ ඛඹසර වෙයි; මේ වනාහි මේ (බ්‍රහ්මචර්‍යාවගේ) ප්‍රයොජන යයි කියන ලද වෙයි; එතං සාරං= මේ අර්හත්ඵලය බ්‍රහ්මචර්‍යාවගේ සාරය යැ; එතං පරියොසානං= මේ අර්හත්ඵලය බ්‍රහ්මචර්‍යාවගේ අවසානය යැ, මෝ කෙළවර යැ, මෙයින් මත්තෙහි පැමිණිය යුත්තෙක් නැතැයි යථානුසන්ධි වශයෙන් ම දෙශනාව නිමවූසේකි.

මහාසාරොපම සූත්‍ර වණ්ණනා නිමි.

චූලසාරොපම සූත්‍ර වණ්ණනා.

එවමෙමසුතං යි චූලසාරොපම සූත්‍ර යයි. **පිඞ්ගලකොවෙජ්ඣා** යනු ඒ බමුණු පිතුවන් පියවි ඇස්තේය, "කොවජ්ඣ" යනු ඔහුගේ නම යැ; එහෙයින් "පිඞ්ගලකොවජ්ඣ" යයි කියනු ලැබේ. **සඞ්ඝිනෝ** යනාදියෙහි ප්‍රව්‍රජිතසමූහ **සඞ්ඛ්‍යාත** වූ සඞ්ඝ තෙමේ මොවුනට ඇත් නුයි **සඞ්ඝිනෝ** යනු වේ; හෙ ම ගණය මොවුනට ඇත් නුයි **ගණිනෝ** යනු වේ; ආචාරයෙහි හික්මවීම් විසින් ඒ ගණය හට ඇදුරු වූවාහු නුයි **ගණාචරියා** නම් වෙති; **ඤාතා**= ප්‍රසිඛ වූවාහු, ප්‍රකට වූවාහු; අලෙපවජ්ඣෝ යැ සනතුෂ්ටයෝ යැ අලෙපවජ්ඣ භාවයෙන් වසත්‍රයකු දු නො හඳිසි,යි ආදි නයින් උස්ව නැංග යශස මොවුන්ට ඇත් නුයි **යසසසි** නම් වෙති; **තිත්ථකරා**= ලබ්ධි ඇතිකරන්නාහු; **සාධුසම්මතා**= මොවුහු සාධුහු යැ, සුඳරයෝ යැ, සත්පුරුෂයෝ යැ,යි මෙසේ සම්මත වූවාහු; **බහුජනස්ස**= අශ්‍රැතවත් වූ අඛ්බාල පෘථජ්ජනයා විසින්; මෙවිට ඔවුන් දක්වමින් **සෙය්‍යථිදං?** **පූරණෝ** යනාදිය කී.

ඔවුනතුරෙහි **පූරණෝ** යනු ශාස්තෘ යයි ප්‍රතිඥ ඇති ඔහුගේ නම යැ; **කස්සපෝ** යනු ගොත්‍රය යි. හේ එක්තරා කුලයක දැසයන් එකුන් සියය පුරම්න් උපන්නේ ල; එයින් ඔහුට "පූරණ" යයි නම් කළාහුය; තවද- මඞ්ගලදැස වූ බැවින් ඔහු විසින් කරන ලද්ද දුෂ්කෘත යයි හෝ නො කරන ලද්ද නො කරන ලදැයි හෝ කියන්නෙක් නැති, හේ කුමට මම මෙහි වෙසෙම් දැ?යි පලානියේය. එකල්හි සොරු ඔහුගේ වස්ත්‍ර පැහැර ගත්තාහුය; හේ පත්‍රයෙන් හෝ තෘණයෙන් හෝ (විලි) වසන්ට ද නො දන්නේ උපන් වනින් මැ එක් ගමකට පිවිසියේය; මිනිස්සු ඔහු දැක "මේ මහණ රහත් යැ අලෙපවජ්ඣ යැ මොහු හා සමයෙක් නැතැ" යි කැවුම් බත් ආදිය ගෙන එලඹෙති; හේ මා විසින් සළුවක් නො හැඳි බැවින් මේ උපනැයි එතැන් පටන් සළුවක් ලැබ ද නො හඳියි, එය ම පැවිද්ද කොට ගත් තේය; ඔහු සමීපයෙහි අන්‍යයෝ අන්‍යයෝ දැයි පන්සියයක් මනුෂ්‍යයෝ පැවිදි වූහ. ඔහු සඳහා කියා- **පූරණෝ කස්සපෝ** යනු.

පූරණකාශ්‍යප.

මක්ඛලී යනු ඔහුගේ නම යැ; ගවහලැ උපන් බැවින් **ගොසාලෝ** යනු දෙවෙනි නම යැ; මඩ සහිත බිම්බ තෙල්කළයක් ගෙන යන්නාවූ ඔහුට සවාමි තෙම "දරුව! නො පැකිල" යි කියේ ල; හේ ප්‍රමාදයෙන් පැකිල වැටී භූමියාට බියෙන් පලා යන්ට පටන් ගත; සවාමි තෙම එලවා දුවලු කොන ගත්තේය; හේ සළුව දමා අවෙලක වැ පලාගියේය, සෙස්ස **පූරණ** හා සමාන මැයි.

මක්ඛලිගොසාල.

අජින යනු නම යැ; කෙශකම්බලයක් ධරානුයි **කෙසකම්බලි** නම; මේසේ නම් දෙන සඳහ, **අජිනෝ කෙසකම්බලි** යයි කියනු ලැබේ. එහි "කෙසකම්බල" නම්? මිනිස්කෙසින් කළ කම්බල යැ; එයට වඩා අතිශයින් ලාමක වූ වස්ත්‍රයෙක් නම් නැති; වදාළේ මැනු- a. "**සෙය්‍යථාපි භික්ඛවෙ! යානි ඛානිව් තනනාවුනානං වත්ථානං කෙසකම්බලෝ තෙසං පතිකිට්ඨො අක්ඛායති, කෙසකම්බලෝ භික්ඛවෙ! සීතෙ සීතෝ උණ්හෙ උණ්හෝ දුබ්බණ්ණෝ දුග්ගන්ධෝ දුක්ඛසම්ඵස්සෝ**" යි.

අජිනකෙසකම්බලි.

පකුධෝ යනු ඔහුගේ නම යැ; **කච්චායනෝ** යනු ගොත්‍ර යැ; මේසේ නම් ගොත් සඳහ **පකුධෝ කච්චායනෝ** යි කියනු ලැබේ. මේ තෙම සිහිල්දිය ප්‍රතික්ෂෙප කළ එතෙක; වස් කොට ද දිය කිස නො කෙරෙයි; උණුදිය හෝ කැඳ හෝ ලැබ (දියකිස) කෙරෙයි; නදියක් හෝ මාඟීයෙහි ජලය හෝ ඉක්මවා මාගේ සිල් බිඳිනැයි වැලිසැයක් කොට සිල් ඉටාගෙන යෙයි; මේ තෙම මෙබදු නිසරු ලබ්ධි ඇත්තෙකි.

පකුධකාත්‍යායන.

සඤ්ජයබෙලට්ඨ පුත්‍ර. **සඤ්ජයෝ** යනු ඔහුගේ නම යැ; බෙලඨගේ පුත්‍ර නුයි **බෙලඨපුත්ත** නම.

අපගේ ඟැවගසන කෙලෙස් වෙහෙසන කෙලෙස් නැති, ඇපි කෙලෙස්ගැවරහිත යම්හයි මෙසේ ප්‍රකාශ කරන බැවින් ලද නම් වශයෙන් **නිගණ්ඨ** නම; නාථ යාගේ පුත්‍ර වූයේ නුයි **නාථපුත්ත** නම; **අඛඤ්ඤංසු**= ඔවුන්ගේ ප්‍රතිඥව යම්සේ ද, එසේ ම දැනගත්තාහු ද නො දැනගත්තාහු ද; මේ කියන ලද වෙයි- "ඉදින් ඔවුන්ගේ ඕ ප්‍රතිඥව නෛයර්‍යාණික වූවා නම් සියල්ලෝ දැනගත්තාහු ද, ඉදින් නෛයර්‍යාණික නො වූ නම් නො දැනගත්තාහු ද, එහෙයින් කිම ඔවුන්ගේ ප්‍රතිඥව නෛයර්‍යාණික වූවා ද? නෛයර්‍යාණික නො වූවා ද? යි; මේ තෙල ප්‍රශ්නයාගේ අර්ථයයි. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ගේ අනෛයර්‍යාණික බැව් කිමෙන් අර්ථයක් නැති හෙයින් අලං යි ප්‍රතික්ෂෙප කොට උපමාවෙන් අර්ථය පිරිවරමින් ධර්මය ම දෙසනු පිණිස **ධම්මං තෙ බ්‍රාහ්මණ! දෙසෙස්සාමි** යනාදිය වදළහ.

නිගණ්ඨනාථ පුත්‍ර.

---

a. මහණෙනි! යම් කිසි හුයින් වියන ලද වස්ත්‍රයෝ යම්සේ ද, ඔවුනතුරෙන් කෙශකම්බලය ලාමක යයි කියනු ලැබේ, මහණෙනි! කෙශකම්බලය ශීතකාලයෙහි සිහිල් යැ, උෂ්ණකාලයෙහි උණුසුම් යැ, දුර්ණ්‍ණ යැ, දුර්ගන්ධ යැ, දුක් පහස් ඇත්තේයි,

එහි සච්ඡිකිරියාය= ප්‍රත්‍යක්ෂ කරනු පිණිස; **න ඡන්දං ජනෙති=** කත්තුකම්‍යතා ඡන්දය නො උපදවයි; **න වායමති=** වෑයම පරාක්‍රමය නො කෙරෙයි; **ඔලීනවුත්තිකෝ ච හොති=** හීන වූ අදහස් ඇත්තේ වෙයි; **සාථලිකෝ=** ශිථිල කොට ගන්නේ; ශාසනය ලිහිල් කොට ගනී; දැඩි කොට නො ගනී; **ඉධ බ්‍රාහ්මණ! භික්ඛු විවිච්චේව කාමෙහි=** කෙසේ මේ ප්‍රථමධ්‍යානාදි ධර්මයෝ ඥානදර්ශනයෙන් උත්තරිතර වූවාහු ද යත්? නිරොධපාදක බැවිනි; යම් හෙයකින් යට ප්‍රථමධ්‍යානාදි ධර්මයෝ විදර්ශනාපාදක වූවාහු ද, මොවුහු නිරොධපාදක වූවාහු ද, එහෙයින් උත්තරිතර වූවාහු යයි දතයුතු. මේසේ භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍ර ය ද අනුසන්ධි වූ පරිද්දෙන් ම නිමවූ සේක. දෙශනා කෙළවර බමුණු සරණයෙහි පිහිටියේ යයි.

චූලසාරොපම සූත්‍ර වර්ණනා නිමි.

"ප්‍රපඤ්චදීපිකා" නම් වූ මැදුම්සහි සිංහල අටුවාහි තෙවැනි වූ

ඔපම්‍ය වර්ග වර්ණනා

මෙතෙකින් සමාප්තයි.

——:o:——

චූලගොසිඞ්ඝ සූත්‍ර වණ්ණනා.

එවමේමසුතං යි චූලගොසිඞ්ඝ සූත්‍ර යයි. එහි **නාදිකෙ විහරති**= "නාදිකා" නම් එක් විලක් ඇසුරු කොට සුලුපිය – මහපිය පුතුන් දෙදෙ නෙකුගේ ගම් දෙකක් වූහ; එයින් එක් ගමක; **ගිඤ්ජකාවසථෙ**= උළු මුවා ගෙයි; මේ අසනු ලැබේ- එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ මහාජනයාට සඞ්ග්‍රහ කරන සේක් වැදැරට චාරිකාවෙහි හැසිරෙමින් "නාදික" ගමට පැමිණිසේක; නාදිකවැසි මිනිස්සු භාග්‍යවතුන් වහන්සේට මහදන් දී දහම් අසා පහන් සිත් ඇත්තාහු ශාස්තෘන් වහන්සේට වසන තැනක් කරන්නෙමුයි කථා කොට උළුවලින් ම බිත්ති – හිණි – වැඹ – වළරු ආදිය දක්වමින් පහ යක් කොට සුණු පිරියම් කොට මල්කම් ලියකම් ආදිය නීමවා බුමුතුරණ – ඇද – පුටු ආදිය පනවා ශාස්තෘන් වහන්සේට පාවා දුන්හ; යලි පසු පසුව එහි මනුෂ්‍යයෝ භික්ෂු සඞ්ඝයාට රාත්‍රිස්ථාන – දිවාස්ථාන – මණ්ඩප – වඩ්ක්‍රමාදිය කරවූහ. මෙසේ ඒ විහාරය මහත් වී. ඒ සඳහා කියනලදී- "ගිඤ්ජකාවසථෙ" යනු. **ගොසිඞ්ඝසාලවනදායෙ**= එහි එක් දෙවුරුකක කදින් ගවඝඝක සටහන් වැ විවපයෙක් නැංගේ ලු; ඒ රුක සඳහා සියලු මැ ඒ වනය "ගොසිඞ්ඝසාලවන" යි සඞ්ඛ්‍යාවට ගියේය. **දාය** යනු අවිශෙෂයෙන් මේ වනයට නමෙකි; එහෙයින් **ගොසිඞ්ඝසාලවනදායෙ** යනු ගොඝඞ්ඝශාලවනාරණ්‍යයෙහි යන අර්ථයි.

විහරන්ති= සමගිරස විඳිමින් වෙසෙති; ඒ එසේ මැයි- උපරිපණ්ණාසකයෙහි මේ කුලපුත්‍රයන්ගේ පෘථජ්ජනකාලය කියන ලද මෙහි ක්ෂීණාශ්‍රව කාලය යැ; සැබව- එකල ඔවුහු ලද ආසවාදී ඇති ලද ප්‍රතිසම්භා ඇති අධිගමය කළ පිළිසිඹියා ඇති ක්ෂීණාශ්‍රවයෝ වැ **සමගිරස විඳිමින් එහි වාසය කළාහුය. ඒ සඳහා මේ කියන ලදී- යෙන ගොසිඞ්ඝසාලවන දායෙ තෙනුපසඞ්කමි යි. දම්සෙනෙවි – මහමුගලන් තෙරුන් අතුරෙන්** හෝ අසුම්භසවුවන් අතුරෙන් හෝ යවත් පිරිසෙයින් ධර්ම භාණ්ඩාගාරික වූ ආනන්දසථවිරයන් පවා කිසිවකු නො අමතා තමන් වහන්සේ ම පෘසිවුරු ගෙන බලසෙනගින් නික්මුණු අතෙකු මෙන් ද රැළින් නික්මුණු කාලසිංහයෙකු මෙන් ද වාතයෙන් සිදුණු වලාකුලක් මෙන් ද එකලාව ම එළඹි සේක. යලි කුමක් හෙයින් මෙහි භාග්‍යවතුන් වහන්සේ තුමූ ගිය සේක් ද යත්? කුලපුත්‍රයෝ තිදෙන සමගිරස විඳිමින් වාසය කෙරෙති, ඔවුන්ගේ උත්සාහය වඩන හෙයින් ද පශ්චිමජනතාවට අනුකම්පා කරන හෙයින් ද ධර්මය ගරු කොට ඇතිබැවින් ද වේ; උන්වහන්සේට මෙ සිත වී ලු- "මම මේ කුල පුත්‍රයන් උත්සාහවත් කොට උසස් කොට පිළිසඳර කොට දහම් දෙසන් නෙමි" යි මෙසේ පළමු කොට උත්සාහය වඩන හෙයින් වැඩි සේක;

සමගිරසය.

උන් වහන්සේට අනිත් සිතකු දු විය— "අනාගතයෙහි කුලපුත්‍රයෝ සම්‍යක් සම්බුඩයන් වහන්සේ සමගවාසයෙන් වසන්නවුන් සමීපයට තුමූ ගොස් පිළිසඳර කොට දහම් දෙසා තුන් කුලපුත්‍රයන්ගේ උත්සාහය දූන වූහ, කවරෙක් නම් සමගවාසයෙන් නො වසන්නේ දූ? සි සමගවාස යෙන් විසියයුතු යයි සිතමින් වහා ම දුක් කෙළවර කරන්නාහු ය" සි මෙසේ පශ්චිමජනතාවට අනුකම්පා කරන හෙයින් ද වැඩි සේක; තවද- බුදුවරයෝ නම් ධර්මගරුක වූවාහු වෙති, ඔවුන්ගේ ඒ ධර්මගරුකභාවය ද රථවිනීතයෙහි පහළ කරන ලද්දේ මය; මෙසේ මේ ධර්මගරු භාවය හෙයින් ද ධර්මය නගන්නෙමි" සි වැඩි සේක. **දූයපාලෝ**= අරණ්‍යපාල තෙම; හෙතෙම ඒ වනයට කැමති කැමති පෙදෙසින් මනුෂ්‍යයෝ පිවිස එහි මල් හෝ ගෙඩි හෝ ලාටු හෝ ද්‍රව්‍යසම්භාරය හෝ යම්සේ නො හැර ගනිත් ද, එපරිද්දෙන් වැටින් පිරිකෙවි කළ ඒ වනයාගේ යෙදූ දෙරටු වෙහි හිද ඒ වනය රකී පාලනය කෙරෙයි; එහෙයින් "දූයපාලෝ" සි කියනලදී.

අතනතාකාමරූපා= තමහට හිතය කැමති වන පියවි ඇති වැ වාසය කෙරෙති; ඒ එසේ මැයි- යමෙක් මේ ශාසනයෙහි පැවිදි ව ද වෙදකම් දූතකම් ගෙන් ගෙට යෑම් ආදීන්ගේ වශයෙන් එක්විසි අනෙසනයන්ගෙන් ජීවිකාව කෙරේ ද, මේ තෙම "ආතම කාමරූප" නම් නො වෙයි; යලි යමෙක් මේ ශාසනයෙහි පැවිදිව එක්විසි අනෙසනයන් හැර සිවුපිරිසුදු සිල්හි පිහිටා බුදුවදන් ඉගෙන සැපවූ ධූතාඩ්ගයක් ඉටා අටතිස් අරමුණු අතුරෙන් සිතට රුචි වූ කමටහනක් ගෙන ග්‍රාමාන්තය හැර වනයට පිවිස සමවත් නිපදවා විදර්ශනාවෙහි කම් කරමින් වෙසේ ද, මේ තෙම "ආතම කාම රූප" නම; ඒ තුන් කුලපුත්‍රයෝ ද මෙබඳු වූවාහුය. එහෙයින් කියනලදී- **අතනතාකාමරූපා විහරනතීයනු. මා තෙසං අඵාසුමකාසි**= "ඔවුන්ට නොසුව නො කරව" සි භාග්‍යවතුන් වැල කී. ඔහුට මේ සිත විය- "මේ කුල පුත්‍රයෝ සමග වූවාහු වෙසෙති, යම් ඇතැම් කෙනෙකුගේ ගිහි කැන භණ්ඩන - කලහ - විවාදයෝ පවතිත්, තියුණු අං ඇති සැඩ ගොනෙකු මෙන් ඔවිදුමින් හැසිරෙයි, එකල එක් මගින් දෙදෙනෙකුගේ ගමනක් නො වෙයි, කිසිවිටෙක මේ තෙමේ ත් එසේ කරමින් මේ කුලපුත්‍රයන් ගේ සමගවාසය බිඳින්නේය, අනිකකු දූ ඇති- මේ තෙම ප්‍රසාද උපද වන්නෙක, රන්වන් වෙයි, රසයෙහි ගිජු වූවෙකැයි හඟිමි, ගිහි කල පටන් ප්‍රණීතදූයකයන්ගේ ද තම උපස්ථායකයන්ගේ ද තුණකිම් ආදි යෙන් මේ තුලපුත්‍රයන්ගේ අප්‍රමාද විහරණය බිඳින්නේය, නැවත මේ කුලපුත්‍රයන්ගේ වසන තැන් ද නිබඳ වූවාහු පිරිසිඳින ලද්දාහුය, පන්සල් තුනක් ද සක්මන් තුනක් ද දිවාසථාන තුනක් ද ඇඳ පුටු තුනක් ද වෙති, මේ මහණ වැලිත් මහත් කය ඇත්තෙක, ඉතා වැඩ යෙක් වන්නේයයි හඟිමි, හෙතෙම නො කල්හි මේ කුලපුත්‍රයන් සෙනස් කෙන් නැඟිටුවන්නේය, මෙසේ සම්ප්‍රකාරයෙන් ම මොවුන්ට නො සුව

වන්නේ ය" යි ඒ (භාග්‍යවතුන්ගේ පැමිණීම) නො කැමති වන්නේ **මා නෙසං අඵාසුමකාසි** යි භාග්‍යවතුන් වැලකී. යලි කිමෙක් ද? මේ තෙම ඔදුනමින් වැලකී ද? නො ඔදුනමින් වැලකී ද යත්? නො දන්නේ යැ; ඒ එසේ මැයි- තවද- තථාගතයන්ගේ පිළිසඳ ගැනීම පටන් දසදහසක් සක්වළ කම්පා වීම් ආදී පෙළහර පැවැත්තාහුය, එහෙත් වනවාසී දුර්ලභ මනුෂ්‍යයෝ කමියන්හි යෙදුනාහු ඒ පෙළහර සලකන්ට නො හැකි වෙති; තවද- සම්‍යක් සම්බුඩයෝ නම් යම් කලක නොයෙක් දහස්ගණන් භික්ෂු පිරිවර ඇත්තාහු ව්‍යාමප්‍රභාවෙන් ද අශීත්‍යනුව්‍යඤ්ජනයන්ගෙන් ද වාත්‍රිංශද්මහාපුරුෂලක්ෂණශ්‍රියෙන් ද බුඩානුභාවය දක්වමින් හැසිරෙත් ද, එකල්හි මේ කවරෙක් දැ? යි නො පිළිවිස මැ දනයුත්තාහු වෙති; වැලි එකල භාග්‍යවතුන් වහන්සේ සියලු මැ ඒ බුඩානුභාවය සිවුරුගබින් වසා වලාගබකින් වැසුණු සඳු මෙන් තුමූමැ පාසිවුරු ගෙන අප්‍රසිඩ වෙශයෙන් ගිය සේක. එහෙයින් උන්වහන්සේ නො ඔදුනමින් මැ දැයපාල තෙම වැලකී.

එතදවොච= තෙරුන් වහන්සේ වදාහි "මා සමණ!" යි දැයපාල යාගේ කථාව අසා ම සිතුහ- "ඇපි තිදෙනෙක් මෙහි වෙසෙමු, අන් පැවිද්දෙක් නම් නැහි, මේ දැයපාල ද පැවිද්දෙකු සමග මෙන් කථා කරයි, කවරෙක් වන්නේ දෝ හෝ යි දිවාසථානයෙන් කැඟිට දෙරටු වෙහි සිට මහ බලමින් භාග්‍යවතුන් දුවහ; භාග්‍යවතුන් වහන්සේ ද තෙරුන්ගේ දැකීම සමග මැ ශරීරාලොකය විහිදවූහ; අශීත්‍යනුව්‍යඤ්ජන යෙන් විරාජිත වූ ව්‍යාමප්‍රභාව විදහළ රන්පටක් මෙන් බැබලූ; තෙරුන් වහන්සේ මේ දැයපාල පෙනය කළ ආශීවිෂයකු ශ්‍රීවයෙන් ගන්ව අත විදහන්නෙකු මෙන් ලොකයෙහි අග්‍රපුදගලයන් සමග කථාකරන්නේ ම නො ඔදුනයි. අප්‍රසිඩ මහණක්හු සමග මෙන් කථා කෙරේ යයි වලක මින් මේ- **මා ආවුසො! දැයපාල!** යනාදි වචනය කිහ. **නොනුපසඞ්කමි**= කුමක් හෙයින් භාග්‍යවතුන්ව පෙරගමන් නො කොට ම එලඹියේ ද? උන් වහන්සේට මේ සිත වී ල— "ඇපි තුන් දෙන සමග වාසයෙන් වෙසෙමු, ඉදින් මම එකලාව මැ පෙරගමන් කරන්නෙම් නම් සමග වාසයෙක් නම් නො වන්නේය, ප්‍රියමිත්‍රයන් ගෙනම පෙරගමන් කරන් නෙමි, තවද- යම්සේ භාග්‍යවත්හු මට ප්‍රිය සේක් ද එසේ මාගේ සහාය යන්ට ද ප්‍රිය සේකැ" යි ඔවුන් සමග පෙරගමන් කරනු කැමති ව හෙමේ (පෙරගමන්) නො කොට ම එලඹියේය; යලි කිහිවෙක්-"ඒ තෙරුන්ගේ පන්සල්දෙර සක්මන් කෙළවර භාග්‍යවතුන් වහන්සේගේ පැමිණෙන මහ වෙයි, එහෙයින් තෙරුන් වහන්සේ ඔවුන්ට සන් දෙමින් ම ගිය හ" යි කියත්.

අගිඤ්ඡකමථ= මෙහි එවූ; **පාදෙපකඩාලෙඝි**= සුපිපි පියුම් වැනි ජල භක්‍ෂයන්ගෙන් මිණිවන් දිය ගෙන රන්වන් පිටපතුල්හි දිය එව පාද යෙන් පාදය ගටමින් සේදූහ; බුදුවරයන්ගේ කයෙහි රජස්දූලි නම්

නො තැවරෙයි, කුමක් හෙයින් සෙදූහු ද යත්? ශරීරයට සෘතු ගන්වනු පිණිස ද ඔවුන්ගේ සිත් පිණවනු පිණිස ද වේ; යම් හෙයකින් අප විසින් එලවූ ජලයෙන් භාග්‍යවතුන් වහන්සේ පා සේදූහ, පරිභොග කළහ, සි ඒ භික්ෂූන්ගේ බලවත් සොම්නස් විසින් සිත ප්‍රණීත වේද, එහෙයින් සේදූහ. **ආයස්මතානං අනුරුඛං භගවා එතදවොච**= හෙතෙම වනාහි ඔවුනතුරෙන් වැඩතර යැ; ඕහට සඬ්ග්‍රහ කළ කල්හි සෙස්සන්ට කරන ලද්දේ ම වේ නුසි තෙරුන්ට ම මේ- **කච්චි වො අනුරුඛා !** යනාදි වචනය වදුළහ. එහි **කච්චි** යනු පෘච්ඡාර්ථයෙහි නිපාත යැ; **වො** යනු සාම්වචන යැ; මේ කියන ලද වෙයි- අනුරුඬයෙනි! කිමෙක තොපට **ඛමනීයං**= (ඉවසිය හැකි ද?) තොපගේ ඉරියව් ඉවසා ද? **කච්චි යාපනීයං**= කිම තොපගේ ජීවිතය යැපේ ද? ගැළපේ ද? **කච්චි පිණ්ඩකෙන කිලමථ**= කිම තොපට පිණ්ඩපාතය සුලභ ද? පැමිණී තොප දැක මනුෂ්‍යයෝ උලුඬුකයාගු හෝ කටවජ්‍රනිඝණ්ඨාව හෝ දියයුතු කොට සිතත් ද? සි පිඬු හැසිරීම් වත පුළුවුස්නි; කුමක් හෙයින? යම් හෙයකින් ප්‍රත්‍යයෙන් නො වෙහෙසන්නහු විසින් මහණදම් කරන්ට හැකි වේද, මේ පැවිද්දන්ගේ වත ම හෝ වේද, එහෙයිනි. **ඉක්ඛිති** ඔහු විසින් පිළිවදන් දුන් කල්හි අනුරුඬයෙනි! තෙපි රජපැවිද්දෝ යැ, මහ පිනැතියෝ යැ, මනුෂ්‍යයෝ වෙනෙහි වසන තොපට නො දී අන් කවරෙකුට දියයුතු යසි සිතන්නාහු ද? යලි තෙපි තෙල පිණ්ඩපාතය වලඳ, කිම හෝ මුවපොල්ලන් මෙන් ඔවුනොවුන් ගැටෙමින් වසවු ද? නොහොත් තොප ගේ සමනිය ඇත් දැ?සි සාමග්‍රීරසය විචාරමින් **කච්චි පන වො අනුරුඛා! සමඟඟා** යනාදිය වදුළහ. එහි **ඛිරෝදකිභූතා**= යම්සේ කිරි ත් දිය ත් ඔවුනොවුන් සැසඳේ ද, වෙන් නො වේද, එකසේයට මෙන් පැමිණේ ද, කිම එපරිද්දෙන් සාමග්‍රී වශයෙන් එකසේයට පැමිණි චිත්තෙකාත්මතාද ඇත්තවුන් මෙන් වසවු දැ?සි පුළුවුස්නි; **පියචක්ඛූහි**= මෙත්සිත් පිහිටුවා බලන ඇස් "පියචක්ඛූ" නම් වෙති, කිම එබදු ඇස්වලින් ඔවුනොවුන් බලමින් වසවු දැ? සි පුළුවුස්නි; **භගෂ** යනු එකාන්තාර්ථයෙහි නිපාත යැ; වදාන්ස! ඇපි එකාන්තයෙන් සි කියන ලද වෙසි. **යථා කථං පන** යන මෙහි **යථා** යනු නිපාතමාත්‍ර යැ; **කථං** යනු කාරණපෘච්ඡා යැ; කෙසේ වනාහි තෙපි මෙපරිද්දෙන් වසවු ද? කවර කරුණකින් වසවු ද? මම ඒ කාරණ කියවූ ඇසි කියන ලද වේ. **මෙත්තෙනං කායකම්මං**= මෙත් සිත් වශයෙන් පැවති කායකර්මය; **වාචි වෙව රහො ච**= සම්මුඛයෙහි හා පරාඞ්මුඛයෙහි ද; සෙස්සෙහි දු මේ ම නයයි. එහි සම්මුඛයෙහි කායවාක්කර්මයෝ එක් ව විසිමෙහි ලැබෙති, අන්‍යයෝ වෙන් ව විසි මෙහි යැ; මනඃකර්මය සියලු තැන්හි ලැබේ. ඒ එසේ මැති-

මෛත්‍රීසහගත කායකර්මාදිය.

සමග වසන්නවුන් අතුරෙන් එකෙකු විසින් යම් ඇඳ පුටු හෝ දුවබඬු හෝ මැටිබඬු හෝ පිටත නො මනා කොට තබනලද වේද, එය දැක කවරෙකු විසින් මේ පරිභොග කරන ලද දැ?සි අවඥ නො කොට තමා විසින් නො මනා කොට තබන ලද්දක් මෙන්

ගෙන තැන්පත් කොට තබන්නහුගේ- යලි පිළිජැගියයුතු තැන හෝ පිළිජග්නහුගේ සම්මුඛයෙහි මෛත්‍රීකායකර්මය නම් වෙයි; එකකු නික්මගිය කල්හි ඔහු විසින් නො මනා කොට තබන ලද සෙනසුන්පිරිකර එසේ ම බහා තබන්නහුගේ යලි පිළිජැගියයුතු තැන හෝ ජග්නහුගේ පරාඞ්මුඛයෙහි මෛත්‍රීකායකර්මය නම් වෙයි; නැවත සඝ වසන්නහුගේ තෙරුන් සමඟ මිහිරි වූ සතුටු වියයුතු කථාව පිළිසඳර කථාව සිහිකළයුතු කථාව දූහැම් කථාව සවරහණ්‍යය පැන පිළිවිසීම පැන විසඳීම යන මේ ආදිය කිරීමෙහි සම්මුඛයෙහි මෛත්‍රීවාක්කර්මය නම් වෙයි; යලි තෙරවරුන් නික්ම ගිය කල්හි මාගේ ප්‍රියසහායය වූ නන්දියසථවිර කිමිබිලසථවිර මෙසේ ශීලසම්පන්න යැ, මෙසේ ආචාරසම්පන්න යැ, යනාදි ගුණකථනය පරාඞ්මුඛයෙහි මෛත්‍රීවාක්කර්මය නම් වෙයි; මාගේ ප්‍රියමිත්‍ර වූ නන්දියසථවිර කිමිබිලසථවිර වෛරරහිත වේවා, නිදුක් වේවා, සුවපත් වේවා,යි මෙසේ ආවර්ජනය කරන්නහුගේ වනාහි සම්මුඛයෙහි ද පරාඞ්මුඛයෙහි ද මෛත්‍රීමනඃකර්මය වේ මැයි. **නානා කි බො නො භණෙන!** භාෂා= කථ වනාහි පිටි මෙන් ද මැටි මෙන් ද මැඬ එක් කරන්ට නො හැක; **එකං ච පන මඤ්ඤද්ද චිත්තං=** එහෙත් අපගේ සිත සහිතාර්‍යයෙන් නිරන්තරාර්‍යයෙන් විග්‍රහරහිතාර්‍යයෙන් සමග්‍රාර්‍යයෙන් එකෙක් ම යයි දක්වයි; යලි කෙසේ මොවුහු සවකීය චිත්තය බහා තබා අන්‍යයන්ගේ සිත් වශයෙන් පැවැත්තාහු ද යත්? එකක්හුගේ පාත්‍රයෙහි මල නැති, එකක්හුගේ චීවරය කිලිටි වෙයි, එකක්හුගේ පිරිබඬකම් වෙයි, ඔවුනතුරෙන් යමෙකුගේ පාත්‍රයෙහි මල නැහුනේ ද, ඔහු විසින් ඇවැත්නි! මාගේ පාත්‍රයෙහි මල නැංගා පිසන්ට වටී යයි කී කල්හි- අන්‍යයෝ මාගේ සිවුර කිලිටි වීය, එය සේදිය යුතු යැ, මාගේ (පන්සල) පිරිබඬ කළයුතු යයි නො කියා වනයට පිවිස දර ගෙනවුත් කපා ප්‍රත්‍රකවාහය පිරිබඬ කොට පාත්‍රය පිස එයින් පසු සිවුර හෝ සෝදති, පිරිබඬ හෝ කෙරෙත්. ඇවැත්නි! මාගේ සිවුර කිලිටි යැ, සෝදන්ට වටනේය, මාගේ පන්සල කසළසහිත වුව, පිරිබඬ කරන්ට වටී යයි පළමු කොට දැන්වූ කල්හි දු මේ ම නයයි. **සාධු සාධු අනුරුඬා!**= භාග්‍යවතුන් වහන්සේ යට "න ච මයං භණෙන' පිණ්ඩකේන කිලම්මහ" යි කී කල්හි සාධුකාර නො දුන්හ; කුමක් හෙයින ? මේ කබලිඞ්කාරාහාරය නම් මේ සත්වයන්ට අපායලොකයෙහි ද දිව්‍ය-මනුෂ්‍ය ලොකයෙහි ද ආවේණී සමාවේණී මැය; යලි මේ ලොකසන්නිවාසය බොහෝ සෙයින් විවාදයට බැස ගත්තේය; ඒ එසේ මැයි- අපාය ලොකයෙහි ද දිව්‍ය-මනුෂ්‍යලෝකයෙහි ද මේ සත්වයෝ ප්‍රතිවිරුඬයෝ මැයි; මොවුන්ගේ සමගිකාලය දුලීහ යැ, කිසි කලෙක්හි මැ වේ නුයි, සමගවාසය තමා දුලීහ බැවින් මෙහි භාග්‍යවතුන් වහන්සේ සාධුකාර දුන් සේක.

මෙවිට ඔවුන්ගේ අප්‍රමාදලක්ඛණය ප්‍රළුවුස්න සේක් **කච්චි පන වො අනුරුඬා!** යනාදිය වදාළහ. එහි **වො** යනු නිපාතමාත්‍ර යැ; ප්‍රථමාවචන හෝ යැ; කිම?, තෙපි යන අර්ථයි. **අමඤ්ඤං=** අප තුන් දෙන අතුරෙන්

පිණ්ඩාය පවිසනකමති= ගමෑ පිඬු පිණිස හැසිර පෙරලා පැමිණේ ද; **අවකඩ්ඪාරපාතිං**= අතිරෙක පිණ්ඩපාතය බැහැර කොට තැබීම පිණිස එක් සුමුඛපයක් සෝදා තබයි; **යෝ පචජා**= ඒ තෙරවරු එක්ව මෑ භික්ෂා වාරයෙහි නො පිවිසෙත් ලු, මොවුහු පලසම්පත්හි ඇලුනා හු මැයි; උදෑසන ම සිරුරු පිළිදුගුම් කොට වත්පිළිවත් පුරා සෙනස්නට පිවිස කාලපරිච්ඡේදය කොට පලසම්පතට සම්මෑද හිඳිති; ඔවුනතුරෙන් යමෙක් ඉතා පළමුව හුන්නේ තමාගේ කාලපරිච්ඡේද වශයෙන් ඉතා පළමුව නැගී සිටී ද, හෙතෙම පිඬු පිණිස හැසිර පෙරලා ආයේ බත්කිස කරන තැනට අවුත් "භික්ෂූහු දෙදෙනෙක් පසු වූහු යැ, මම ඉතා පළමු වැ ආයෙමි" යි දැනගනී; එකල්හි පාත්‍රය වසා අසුන් පැනවීම් ආදිය කොට ඉදින් පාත්‍රයෙහි (බත්) කොටසක් පමණ ම වේද, (එකල්හි) හිඳ වලදයි; ඉදින් අතිරෙක වේද, (එකල්හි) අවකඩ්ඪාරපාති (=වැඩි ආහාර බහාලන භාජන) යෙහි බහා පාත්‍රය වසා වලඳයි; කළ බත්කිස ඇත්තේ පාත්‍රය සෝදා ජලය රහිත කොට ථවිකායෙහි බහා අසුන් ඔසවා පාඹිවුරු ගෙන තමා වසන තැනට පිවිසෙයි. දෙවැනි තැනැත්තේ ද අවුත් මෑ දැනගනී- එකෙක් පළමු ආයේ වන, එකෙක් පසු වී යයි; හෙතෙම ඉදින් පාත්‍රයෙහි බත් පමණ වූයේ ම වේද, (එකල්හි) වලඳයි; ඉදින් මඳ වූයේ නම් අවකඩ්ඪාරපාතියෙන් ගෙන වලඳයි; ඉදින් අතිරෙක වී නම් අව කඩ්ඪාරපාතියෙහි බහා පමණ ව මෑ වලඳා පළමු තෙරුන් මෙන් වසන තැනට පිවිසෙයි. තුන්වැනි තැනැත්තේ ද, අවුත් මෑ දැනගනී- දෙදෙ නෙක් පළමු ආවාහුයැ, මම පසුව ආයෙමි" යි; හෙතෙමේ ද දෙවෙනි තෙරුන් මෙන් වලඳා කළ බත්කිස ඇත්තේ පාත්‍රය සෝදා ජලය රහිත කොට ථවිකාවෙහි බහා අසුන් ඔසවා තැන්පත් කොට තබයි; පැන්කළ යෙහි හෝ පරිභොග කළයුතු දියකළයෙහි හෝ ඉතිරි ජලය බැහැර දමා කළ යටිකුරු කොට අවකඩ්ඪාරපාතියෙහි ඉදින් ඉතිරි බතක් වේ නම් එය කි නියෙන් බැහැර කොව පාත්‍රය සෝදා තැන්පත් කෙරෙයි, භක්තා ග්‍රය හමදියි, නැවත කසළ දමා මූස්න නහා වේයන්ගෙන් මිදුනු තැනක තබා පාඹිවුරු ගෙන වසන තැනට පිවිසෙයි. මේ තෙරවරුන්ගේ කිහි වෙහෙර ද වනයෙහි ද බත්කිස කරන තැන ද බොදුන්හල ද වත යැ; මේ සඳහා **යෝ පචජා** යනාදිය කියන ලදී.

යෝ පසසති යනාදිය වනාහී ඔවුන්ගේ ඇතුලු වෙහෙර වත යයි දතයුතු. **එහි වචසඨං**= වැසිකිළියෙහි පරිභොගදිය තබන කළය; **තිනනං**= සිස් වූවහු; **තුචජං**= යනු එයට ම වෙවචනයි; **අවිසයහං**= ඔස වන්ට නො හැකි වන්නෙමි, ඉතා බර යැ; **හසඨවිකාරෙන**= හසනසංඥ වෙන්; ඔවුහු වනාහි පැන්කළ ආදීන් අතුරෙන් යම් කිසිවක් හිස් වූයේද, එය ගෙන පොකුණට ගොස් ඇතුලත ද පිටත ද සෝදා දිය පෙරා ඉවු රෙහි තබා අන් භික්ෂුවක් හසනවිකාරයෙන් කැඳවති; (එකෙකු) නියම කොට හෝ නො නියම් කොට හෝ ශබ්ද නො කෙරෙති; කුමක් හෙයින්

නියම කොට නො කෙරෙත් ද? ඒ මහණ ශබ්දය තෙමේ පෙළන්නේ ය, සි කියයි. කුමක් හෙයින් නො නියම කොට නො කෙරෙත් ද? අනියම යෙන් ශබ්දය දුන් කල්හි මම පෙරවූවෙමි, මම පෙරවූ වෙමි,යි දෙදෙන ම නික්මෙන්නාහුය; එහෙයින් දෙදෙනෙකු විසින් කළයුතු ක්‍රියාවෙහි තෙවැන්නාගේ කම්වෙජ්දය වන්නේය; යලි සංවර වූ පියඟව ඇති වැ අන්‍ය භික්‍ෂුහුගේ දිවාසථානය වෙත ගොස් ඔහු විසින් දුටුබැව් දැන අත්සන් කෙරෙයි; ඒ ලකුණෙන් අනිත් ම හණ පැමිණෙයි; ඉක්බිති දෙදෙන අනින් අත බදිමින් දෙ අත්හි තබා එලවා තබත්. ඒ සඳහා කිඟ– **හත්ථවිකාරෙන දුතියං ආමසනතඛා හත්ථවිලඞ්ඝ නෙන උපඞ්ඝෙම** යනු.

පඤ්චාභිඤ්ඤං ඛො පන= තුදුස්වක් පොහොය පසළොස්වක් පොහොය අවවක යැ යන මේ වූ කලි ප්‍රකෘති ධර්‍මශ්‍රවණය මැ වෙයි; එය නො කඩ කොට පස්වන පස්වන දිනයෙහි තෙරවරු දෙදෙන ඉතා නො විකල්හි නා අනුරුඬ තෙරුන් වසන තැනට යෙති; එහි තිදෙන ම හිඳ තුන්පිටකයෙන් එක්තරා පිටකයෙක්හි ඔවුනොවුන් පැන පුළුවුස්සති ඔවුනොවුන් විසඳති; ඔවුන් මෙසේ කරද්දී මැ අරුණ නගී. ඒ සඳහා මේ කියනලදී.

මෙතෙකින් භාග්‍යවතුන් විසින් අප්‍රමාදලක්‍ෂණය විවාළාවූ තෙරුන් විසින් ප්‍රමාදසථානයන්හි මැ අප්‍රමාදලක්‍ෂණය විසඳන ලද වෙයි; යම් හෙයකින් අන්‍ය භික්‍ෂූන්ට භික්‍ෂාචාරයෙහි පිවිසෙන කලය (ගමින්) නික්මෙන කලය හඳන පරිවර්‍තනය සිවුරු පෙරවීමය ඇතුලු ගමැ පිඬු පිණිස හැසිරීමය දහම් දෙසීමය අනුමොදනය ඇතුලු ගමින් නික්මැ බත්කිස කිරීමය පා සේදීමය පා වියලීමය පා සිවුරු තැන්පත් කිරීමය යන මොවුහු ප්‍රමාදකර සථානයෝ වෙත් ද; එහෙයින් තෙරුන් වහන්සේ අපට මෙතෙක් තැන් හැර ප්‍රමාදකාලයෙක් නම් නැතැයි දක්වමින් ප්‍රමාදසථානයන්හි මැ අප්‍රමාද ලක්‍ෂණය විසඳූහ. ඉක්බිති ඔනුට භාග්‍ය වතුන් වහන්සේ සාධුකාර දී ප්‍රථමධ්‍යානය පුළුවුස්නාහු යලි- **අත්ථි පන වො** යනාදිය වදාළහ. එහි **උත්තරිමනුස්සධම්මා**= මිනිස්දහමින් **මත්** තෙහි; **අලමරියඤාණදස්සෙසෝ**= ආර්‍යීභාවය කිරීමෙහි සමර්‍ථ වූ විශෙෂයෙක් **කිං හි නො සියා? භගවෙන!**= වහන්ස! කුමක් හෙයින් නො ලද්දේ වන්නේ ද? ලදුයේ මැයි.

සාවදෙව= යම්තාක් මැ; මෙසේ ප්‍රථමධ්‍යානලාභය ප්‍රකාශ කළ කල්හි ත්‍රිතීයධ්‍යානාදිය පුළුවුස්නාහු **එතඤ්ච පන වො** යනාදිය වදාළහ. එහි **සමනික්කමාය**= ඉක්මවීම පිණිස; **පටිපස්සද්ධියා**= මැඩලීම පිණිස; සෙස්ස සියලු තැන්හි කී නියෙන් ම දතයුතු. නැවත පශ්චිම ප්‍රශ්නයෙහි ලොකොත්තර ඥානදර්‍ශනයාගේ වශයෙන් ප්‍රතිලබ්ධ වූ නිරොධසමාපත්තිය පුළුවුස්න සේක් **අලමරියඤාණදස්සනවිසෙසෝ** සි වදාළහ. තෙරුන් වහන්සේ තුන් පෘච්ඡාක්‍රමයෙන් ම ප්‍රකාශ කළහ. එහි යම් හෙයකින්

වෙදයිත සුවයට වඩා අවෙදයිත සුවය් අතිශයින් ශාන්ත වේද, එහෙයින් **අඤ්ඤං එාසුවිහාරං උත්තරිතරං වා පණීතතරං වා න සමනුපස්සාමී** යී කිහ. **ධම්මියා කථාය**= සමගිරසයෙහි අනුසස් ප්‍රතිසංයුක්ත වූ දහැමි කථාවෙන්; ඔවුහු සියල්ලෝ මැ සිව්සස්හි නිමවූ කිස ඇත්තාහුය; එහෙයින් ඔවුන්ගේ ප්‍රතිවෙධය පිණිස කිසි කියයුත්තෙක් නැති, සමයි වාසෘයන් වැලි මෙ ද මෙ ද අනුසසැයි සාමග්‍රිරසානිශංසය මැ භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ට වදාළසේක.

භගවන්තං අනුසංසාවෙත්වා= අනුව ගොස්; ඔවුහු වනාහි භාග්‍යවතුන් වහන්සේගේ පාසිවුරු ගෙන මදක්(දුර) ගියාහුය; **ඉක්ඛිති** භාග්‍යවතුන් වහන්සේ විහාරොපවනයාගේ කෙළවරට ගිය කල්හි මාගේ පාසිවුරු ගෙනෙවු, තෙපි මෙහි මැ සිටිවු යයි නික්මුණු සේක. **තතෝ පටිනිවත්තිත්වා**= ඒ සිට තැනින් නැවතී; **කිත්තයතා මයං ආයස්මතෝ** යනු භාග්‍යවතුන් නිසා පැවිදි ආදියට පැමිණ ද තමන්ගේ ගුණ කථාවෙන් ලජ්ජා වන්නාහු අධිගමාලෙපවශ් භාවයෙන් කීවාහුය. **ඉමාසං ච ඉමාසං ච**= ප්‍රථමධ්‍යානාදි ලෞකික ලොකොත්තර වූ; **චෙතසා චෙතෝ පරිවච්චිත්වා**= අද මේ ආයුෂ්මත්හු ලෞකිකසමාපත්තියෙන් යුක්ත ව ඉක්ම වූහ, අද ලොකොත්තර සමාපත්තියෙනැයි මෙසේ සිතින් සිත පිරිසිඳ දන්නාලද; **දෙවතාපි මෙ**=වහන්ස! අනුරුඬ! අද ආයුෂ්මත් නන්දිය සථවිර අද ආයුෂ්මත් කිමිබිලසථවිර මේ නම් වූ ද මෙ නම් වූ ද සමවතින් ඉක්ම වී යයි මෙසේ දන්වූවාහුය යන අර්ථයි. **පඤ්හාභිපුඵෙන**= හෙ ද මා විසින් තමා දන්න ලදුයි හෝ දෙවියන් විසින් දන්වන ලදුයි හෝ මෙතෙකින් ම මාගේ මුඛය සැරසිනැයි කථාව උපදවා මා නො පුළුවුස්න ලදහු විසින් මැ නො කියනලද, යලි භාග්‍යවතුන් ප්‍රශ්න කොට විචාරන ලද්දහු විසින් පැන පුළුවුස්න ලදුව ම ප්‍රකාශ කරන ලද, එහි මාගේ (වචනය) කිම නො රුස්නහු දැ? යි කිහ.

දීඝෝ යනු **"මණි මාණිචරෝ දීඝෝ-අථෝ සෙරිස්සකෝ සහ"** යි මෙසේ ආ අටවිසි යක්සෙනෙවියන් ඇතුලත වූ එක් දිව්‍යරාජයෙක; **පරජනෝ** යනු ඒ යක්‍ෂයාගේ ම නම ඇ; **සෙන භග වා තෙනුපසඞ්කම්**= හේ වනාහි වෛශ්‍රවණ විසින් මෙහෙයන ලදුයේ එක් තැනකට යන්නේ භාග්‍යවතුන් වහන්සේ තමන් පාසිවුරු ගෙන ගිඤ්ජකාවසථයෙන් (නික්ම) ගොසිඹහසාල වනයාගේ අතර දක භාග්‍යවතුන් වහන්සේ තමන් පාසිවුරු ගෙන ගවහංසල්වෙනෙහි තුන් කුලපුතුන් වෙත යෙති, අද මහත් දම්දෙසුම් වන්නේය, මා ද ඒ දෙශනාවට කොටස් වූවහු විසින් විය යුතු යයි පෙනෙන කසින් යුක්ත වැ ශාස්තෘන්ගේ පදානුපදික වැ ගොස් නො දුරු සිට දහම් අසා ශාස්තෘන් යන කල්හි දු නො ගියේ ඇ; යලි මේ තෙරහු කුමක් කරන්නාහු දැයි දක්නා පිණිස එහි මැ සිටි සේ යි. එකල්හි ඒ දෙ තෙරුන් අනුරුඬ සථවිරයන් වෙහෙසන්නවුන්

දීඝපරජනයක්‍ෂයා.

දැන මේ සථවිර දෙදෙන භාග්‍යවතුන් නිසා ප්‍රව්‍රජ්‍යාදි සියලු ගුණයන් ලැබ ද භාග්‍යවතුන් වහන්සේට ම මසුරු කෙරෙති, නො ඉවසති, ඉතා ම සඟවති, වසති, මෙවිට ඔවුන්ට වසන්ට නො දෙන්නෙමි, පොළොව පවන් බඹලොව තෙක් මොවුන්ගේ ගුණ ප්‍රකාශ කරන්නෙමි,යි සිතා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හි ද එතැන්හි එළඹේය; **ලාභා හෙනෙත=** වහන්ස! යම් වැදූරට වාසිහු භාග්‍යවතුන් ද මේ තුන් කුල පුත්‍රයන් ද දක්නට ලබත් ද, වඳින්ට ලබත් ද, දෙය්‍යධම්ම දෙන්ට ලබත් ද, බණ අසන්ට ලබත් ද, වහන්ස! ඒ වජ්ජීන්ට ලාභ යැ යන අර්ථයි. **සඳදං සුත්වා=** හේ වනාහි තමාගේ යක්ෂානුභාවයෙන් මහත් ශබ්ද කොට සියලු වැදූරට වතුරුවමින් ඒ වචනය නික්ම වී. එහෙයින් ඒ ඒ වෘක්ෂපතීන්ගේ අධිපති ව වෙසෙන බූමාටු දෙවියෝ ඔහුගේ ශබ්දය ඇසූහ. ඒ සඳහා කියන ලදී- **සඳදංසුත්වා** යනු. **අනුස්සාවෙසුං=** මහත් ශබ්ද කොට ඇස්වූහ; සියලු තැන්හි මේ නයයි. **යාව බ්‍රහ්ම ලොකා= අකනිට්ඨ** බඹලොව තෙක්; **නං වෙ'පිකුලං= අපගේ** කුලයෙන් නික්ම මේ කුලපුත්‍රයෝ පැවිදිවූවාහු මෙසේ සිල්වත් වූවාහු ගුණවත් වූවාහු ආචාරසම්පන්න වූවාහු කලණදහම් ඇත්තාහු යයි මෙසේ ඉදින් ඒ කුලය ද මේ තුන් කුලපුත්‍රයන් පහන් සිත්ඇතිව සිහි කරන්නේ යයි මෙසේ සියලු තැන්හි අර්ථ දතයුතු. මෙසේ භාග්‍යවතුන් වහන්සේ අනුසඤ්ඤි වූ පරිද්දෙන් ම දෙශනාව නිම වූ සේ කැයි.

චූලගොසිඞ්ඝ සූත්‍ර වණ්ණනා නිමි. (1)

මහාගොසිඞ්ඝ සූත්‍ර වණ්ණනා.

එවමෙමසුතං යි මහාගොසිඞ්ඝ සූත්‍ර යයි. **එහි ගොසිඞ්ඝසාලවන දූසෙ** යන මේ වසන තැන දැක්වීම පිණිස කියනලදී; යම් හෙයකින් අන්‍ය සූත්‍රයන්හි **"සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ** යි මෙසේ පළමුව ගොදුරුගම දක්වා පසුව වසන තැන දක්වා ද, එහෙත් මේ මහාගොසිඞ්ඝ සූත්‍රයෙහි භාග්‍යවතුන්ගේ ගොදුරුගම අනිබඳ වේද; කිසිවක් ම ගොදුරුගම වන්නේ ද; එහෙයින් වසනතැන ම දක්වනලද. මේ සූත්‍රය අරණ්‍යනිදාන ඇත්තේ නමැයි.

සම්බහුලෙහි= බොහෝ වූ; **අභිඤ්ඤාතෙහි අභිඤ්ඤාතෙහි**= සියලු තැන්හි ප්‍රසිඞ්ධ වූ ප්‍රකට වූ; **ථෙරෙහි සාවකෙහි සද්ධිං**= ප්‍රාතිමෝක්ෂ සංවරාදිසපිරකාරක ධර්මයන්ගෙන් සමන්විත බැවින් සථවිරවූ ශ්‍රවණානන්තයෙහි ජාත බැවින් ශ්‍රාවකවූ භික්ෂූන් සමග එක්ව; මේවිට ඒ සථවිරයන් සවරූපයෙන් දක්වමින් **ආයස්මතා ච සාරිපුත්තෙන** යනාදිය කීහ.

එහි ආයුෂ්මත් ශාරිපුත්‍රයන් වහන්සේ තමන්ගේ ශීලාදි ගුණයන් ගෙන් බුදුසසුන්හි ප්‍රසිඞ්ධ ය, ඇස්ඇතියනට අහස් මැද සිටි හිරු මෙන් ද සඳ මෙන් ද මුහුදුතෙර සිටියනට සයුර මෙන් ද ප්‍රකට වූහ; ප්‍රසිඞ්ධ වූහ; නවද- හුදෙක් මේ සූත්‍රයෙහි ආ ගුණයන්ගේ වශයෙන් ම මහත් බැව් නො දතයුතු; මෙයින් අන්‍ය වූ ධම්මදායාදය අනඞ්ගණය සම්මාදිට්ඨිය සීහනාද සූත්‍රය මහාසීහනාදය රථවිනීතය මහාහත්ථිපදොපමය මහාවෙදල්ලය චූළුම සූත්‍රය දීඝනඛය අනුපදසූත්‍රය සෙඛතබ්බා සෙඛතබ්බය සඛවිහඞ්ග සූත්‍රය පිණ්ඩපාතපාරිසුද්ධි සම්පසාදනීයය සඞ්ගීතිය දසුත්තරය පවාරණාසූත්‍රය සුසීම සූත්‍රය ථෙරපඤ්හ සූත්‍රය මහානිදෙසය පටිසම්භිදාමගගය ථෙරසීහනාද සූත්‍රය (තෙරුන්ගේ) අභිනීහාරක්‍රමණය එතදග්ගය යන මේ සූත්‍රයන්ගේ වශයෙන් ද තෙරුන්ගේ මහත් බැව් දතයුතු. ඒ එසේ මැයි- එතදග්ගයෙහි **"එතදග්ගං භික්ඛවෙ! මම සාවකානං භික්ඛූනං මහාපඤ්ඤානං යදිදං සාරිපුත්තෙනා"** යි වදරන ලද.

සාරිපුත්ත තෙර.

මහමුගලන් තෙරුන් වහන්සේ ද ශීලාදිගුණයන් ගෙන් ද මේ සූත්‍රයෙහි ආ ගුණයන් ගෙන් ද (සැරියුත්) තෙරුන් මෙන් ප්‍රසිඞ්ධ වූහ. ප්‍රකට වූහ, මහත් වූහ; වැලි දු අනුමාන සූත්‍රය චූළුලතණ්හා සඞ්ඛය සූත්‍රය මාරතජ්ජනීයය පාසාදකම්පනය සියලු ඉඞ්ධිපාද සූත්‍රානන්තය නන්දොපනන්දදමනය ධම්මමහපෙළහර කලෑ දෙව්ලෝ යෑමය විමානවත්ථුය පෙතවත්ථුය තෙරුන්ගේ අභිනීහාරක්‍රමණය එතදග්ගය යන මොවුන්ගේ වශයෙන් ද උන්වහන්සේගේ මහත් බැව් දතයුතු. ඒ එසේ මැයි- එතදග්ගයෙහි- **"එතදග්ගං භික්ඛවෙ! මම සාවකානං භික්ඛූනං ඉද්ධිමන්තානං යදිදං මහාමොග්ගල්ලානෙ"** යි වදරනලද.

මහමුගලන් තෙර.

මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ද ශීලාදි ගුණයන් ගෙන් ද මේ සූත්‍රයෙහි ආ ගුණයන් ගෙන් ද (සැරියුත්) තෙරුන් මෙන් ප්‍රසිඩ වූහ, ප්‍රකට වූහ, මහත් වූහ; තවද- චීවරපරිවත්තන
මහාකාශ්‍යප්තෙර. සූත්‍රය ජීර්ණචීවර සූත්‍රය චේලූපමය සියලු කාසඋපසං යුත්තය මහාඅරියවංස සූත්‍රය තෙරුන්ගේ අභිනිෂ්ක්‍රමණය එතදග්‍රය යන මොවුන්ගේ වශයෙන් ද උන්වහන්සේගේ මහත්බව දතයුතු. ඒ එසේ මැයි- එතදග්‍රපාලියෙහි- **"එතදග්ගං භික්ඛවෙ! මම සාවකානං භික්ඛූනං ධුතවාදානං යදිදං මහාකස්සපෝ"** යි වදරනලදි.

අනුරුඩ ස්ථවිරයන් වහන්සේ ද ශීලාදි ගුණයන් ගෙන් හා මේ සූත්‍ර යෙහි ආ ගුණයන් ගෙන් ද (සැරියුත්) තෙරුන් මෙන් ප්‍රසිඩයහ, ප්‍රකට යහ, මහත්හ; තවද- චූලගොසිඟ සූත්‍රය නළකපාන
අනුරුත්තෙර. සූත්‍රය අනුත්තරිය සූත්‍රය උපක්කිලෙස සූත්‍රය අනුරුඩසං යුත්තය මහාපුරිසවිතක්ක සූත්‍රය තෙරුන්ගේ අභිනිෂ්ක්‍රමණය එතදග්‍රය යන මොවුන්ගේ වශයෙන් ද උන් වහන්සේගේ මහත් බැව් දතයුතු; ඒ එසේ මැයි- එතදග්‍රයෙහි- **"එතදග්ගං භික්ඛවෙ! මම සාවකානං භික්ඛූනං දිබ්බචක්ඛුකානං යදිදං අනුරුඩො"** යි වදරන ලදී.

ආයස්මතා ච රෙවතෙන යන මෙහි වනාහි ඛදිරවනිය රෙවත ද කඩ්ඛාරෙවත දැයි රෙවත තෙරහු දෙදෙනෙක් වූහ; ඔවුනතුරෙහි "ඛදිර වනිය රෙවත" තෙරුන් වහන්සේ දම්සෙනෙව් තෙරුන් රෙවතතෙර. ගේ කනිටුබෑ වූහ, හේ මෙහි අදහස් නො කරන ලද; යලි හුළ නො කැප යැ, මූං නො කැප යැ,යි මෙසේ සැක බිහිලි වූ තෙරුන් වහන්සේ මෙහි "රෙවත" යි අදහස් කළහ. උන් වහන්සේ ද ශීලාදිගුණයන් ගෙන් හා මේ සූත්‍රයෙහි ආ ගුණයන් ගෙන් ද (සැරියුත්) තෙරුන් මෙන් ප්‍රසිඩයහ, ප්‍රකටයහ, මහත් වූහ; තවද- උන් වහන්සේගේ අභිනිෂ්ක්‍රමණයෙන් ද එතදග්‍රයෙන් ද මහත් බැව් දතයුතු. ඒ එසේ මැයි- එතදග්‍රපාලියෙහි- **"එතදග්ගං භික්ඛවෙ! මම සාවකානං භික්ඛූනං ඣායීනං යදිදං ඛඩ්ඛාරෙවතො"** යි වදරන ලදී.

ආනන්ද ස්ථවිරයන් වහන්සේ ද ශීලාදිගුණයන් ගෙන් හා මේ සූත්‍ර යෙහි ආ ගුණයන් ගෙන් ද (සැරියුත්) තෙරුන් මෙන් ප්‍රසිඩයහ, ප්‍රකට යහ, මහත් වූහ; තවද- සෙඛ සූත්‍රය බාහිතිය සූත්‍රය
ආනන්දතෙර. ආනඤ්ඤ සප්පාය ය හොපක මොග්ගල්ලානය බහුධාතුකය චූලසුඤ්ඤතය මහාසුඤ්ඤතය අච්ඡරියඛභූත සූත්‍රය භද්දෙක රත්තය මහානිදානය මහාපරිනිබ්බානය සුභ සූත්‍රය චූලනියලොකධාතු සූත්‍රය අභිනිෂ්ක්‍රමණය එතදග්‍රය යන මොවුන්ගේ වශයෙන් ද උන් වහන්සේගේ මහත් බැව් දතයුතු. ඒ එසේ මැයි- එතදග්‍ර පාලියෙහි- **"එතදග්ගං භික්ඛවෙ! මම සාවකානං භික්ඛූනං බහුස්සුතානං යදිදං ආනන්දො"** යි වදරන ලදී.

අඤ්ඤතරේන ච අභිඤ්ඤාතේන අභිඤ්ඤාතේන= හුදෙක් මේ තෙරුන් මැ සමඟ නො ව අන්‍ය වූ ද මහා ගුණවත් බැවින් ප්‍රකට වූ ප්‍රසිද්ධ වූ බොහෝ සථවිර වූ ශ්‍රාවකයන් සමඟ භාග්‍යවතුන් වහන්සේ ගොශෘඞ්ග ශාලවනාරණ්‍යයෙහි වාසය කෙරෙති යන අර්ථයි. ඒ එසේ මැයි— ආයුෂ්මත් ශාරිපුත්‍රයන් වහන්සේ තුමූ මහාප්‍රඥ ඇත්තාහු අන්‍ය වූ ද බොහෝ මහාප්‍රඥ ඇති භික්ෂූන් ගෙන එකල්හි දශබලයන් පිරිවරා වාසය කළහ; ආයුෂ්මත් මහාමෞද්ගල්‍යායනයන් වහන්සේ තුමූ ඍද්ධිමත් වූවාහු- ආයුෂ්මත් මහාකාශ්‍යපයන් වහන්සේ තුමූ ධුතවාද ඇත්තාහු— ආයුෂ්මත් අනුරුද්ධයන් වහන්සේ තුමූ දිව්‍යචක්ෂු ඇත්තාහු— ආයුෂ්මත් රේවතයන් වහන්සේ තුමූ ධ්‍යානයෙහි ඇලුම් ඇත්තාහු— ආයුෂ්මත් ආනන්දයන් වහන්සේ තුමූ බහුශ්‍රැතවූවාහු අන්‍ය වූත් බොහෝ බහුශ්‍රැත භික්ෂූන් ගෙන එකල දශබලයන් පිරිවරා වාසය කළහ. මෙසේ එකල මේ දක්වන ලද්දාවූ ත් අන්‍ය වූ ත් ප්‍රසිද්ධ වූ මහාසථවිර වූ කිස්දහසක් පමණ භික්ෂූහු දශබලයන් පිරිවරා වාසය කළාහුය,යි දතයුතු.

පවිවේකා වුට්ඨිතෝ= ඵලසමාපත්ති විවේකයෙන් නැඟී සිටියේ; **යේනායස්මා මහාකස්සපෝ තේනුපසඞ්කමි**= තෙරුන් වහන්සේ වනාහි පලසමවතින් නැඟී සිටි සේක් පැල ලෝදැ බලමින් සඤ්ඤාවක්, වනාන්තයෙහි ක්‍රීඩා කරන මත්තඤ්ඤත්‍රියයක්හුගේ කනින් ගිලිහෙන කුණ්ඩලයක් සෙයින් ද භකුලා සුමුගක බකාලත රකතකමඛලයක් සෙයින් ද මිණිමුවා නාගදන්තයකින් වැටෙන සියදහසක් අඟනා රන්තැටියක් සෙයින් ද අසතයට යන පිරිපුන් පනස්යොදුන් රිවිමඬල දුටහ, එයට අනතුරුව පැදුන් ලෝදැ බලමින් නිම්වළල්ල ගෙන පරිවර්තනය කරන රිදීසකක් සෙයින් ද රිදීකුළකින් නික්මෙන කිරිදහර මඩලක් සෙයින් ද පියා පෙළා ගුවන්තෙලෙහි පැනනගින සේහසකු සෙයින් ද මේවන් මුහුදුකුසින් උඩට නැඟී පැදුන් සක්වළඟල් මතුයෙහි සසලකුණෙන් හෙබි එකුන් පනස් යොදුන් සඳමඬල දුටහ; **ඉක්ඛිති** සල්වනය බැලූහ, එ සමයෙහි වනාහි සල්රුක් මූල පවන් අග තෙක් සියල්ල භාත්පසින් සුපිපියාහු. දුහුල්සළු පොරෝනා ලද්දවුන් සෙයින් ද මුතුකලප් වලින් අවුනන ලද්දවුන් සෙයින් ද බැබලූහ; පොලෝතලය මල්ඇතිරි පුදයෙන් හෙබියාක් මෙන් ඒ ඒ තැන වැටෙන මල්රොනින් ලාරෙසෙන් තෙමන ලබන්නක් මෙන් විය; භ්‍රමරමධුකර සමූහයෝ මල් රොන් මෙදෙන් මත් වූවාහු ළංව ගයන්නවුන් මෙන් වනාන්තරයන්හි හැසිරෙති; තවද- එ දින පෙහෙවස් දවසෙක් ම වෙයි; **ඉක්ඛිති** තෙරුන් වහන්සේ අදහවර රතියකින් **ඉක්මවන්නෙමි** යි හෝ සිතූහ; එකෙක් ඇති- ආයුෂ්මත් ශ්‍රාවකයෝ නම් ප්‍රියධර්මශ්‍රවණ ඇත්තාහු වෙති, එහෙයින් උන්වහන්සේට මේ සිත විය- "අද මාගේ දෙවුබෑ දම්සෙනෙවි තෙරුන් වෙත හොස් ධර්මරතියෙන් **ඉක්මවන්නෙමි**" යි; යලි යන්නෙමි එකලා ව මැ නො හොස් මාගේ ප්‍රියසහාය වූ මහකසුප් තෙරුන් ගෙන යන්නෙමි,යි හුන් තැනින් නැඟිට සම්කඩ පොළා ආයුෂ්මත් මහාකාශ්‍යපයන්

යම් තැනෙක්හි ද එහි එලඹියහ. **එවමාවුසෝ'ති බො ආයස්මා මහා කස්සපෝ**= තෙරුන් වහන්සේ ද යම් හෙයකින් ප්‍රියධර්මශ්‍රවණ ඇති ආයුෂ්මත් ශ්‍රාවකයෙක් ම වූහු ද, එහෙයින් උන් වහන්සේගේ වචනය අසා- "ඇවැත්නි! තෙපි යවු, මාගේ හිස හෝ පිට හෝ රිදේ" යයි කිසි මද කරුණක් නො කොට තුටු සිත් ඇත්තාහු මැ **එවමාවුසෝ!** යනාදිය කිහ. පිළින කොට ද හුන් තැනින් නැගිට සම්කඩ පොළා **මහමුගලන්** තෙරුන් අනුබැන්දහ. එ සමයෙහි දෙ මහතෙරහු පිළිවෙළින් සිටි සඳ මඩල දෙකක් මෙන් ද රිවිමඩල දෙකක් මෙන් ද සදත්ඇත්රජුන් දෙදෙනෙකු මෙන් ද සිංහයන් දෙදෙනෙකු මෙන් ද ව්‍යාඝ්‍රයන් දෙදෙනෙකු මෙන් ද බැබලූහු.

අනුරුඬ ස්ථවිරයන් වහන්සේ ද එ සමයෙහි දිවාස්ථානයෙහි හුන්නාහු දෙ මහතෙරුන් සැරියුත් තෙරුන් වෙත යන්නවුන් දැක පැල ලෝදැ බලමින් හිරු වනාත් පිවිසෙන්නකු මෙන් ද පැදුන්ලෝදැ බලමින් සඳු වනාතින් උඩවනගින්නකු මෙන් ද සල්වනය බලමින් සියලු තැන්හි හාත්පසින් සුපිපි සල්වනය ද දැක- "අද පෙහෙවස් දිනය වෙයි, මේ මාගේ දෙටුබෑයෝ ද, දම්සෙනෙවියන් වෙත යෙති, මහත් ධර්මශ්‍රවණ යක් වියයුතු ය, මම ත් ධර්මශ්‍රවණය ට කොවස් වන්නෙමි" යි හුන් තැනින් නැගිට සම්කඩ පොළා මහතෙරුන්ගේ පදානුපදික වැ නික් මුනහ. එසින් කියන ලදී- **අථ බො ආයස්මා ච මහාමොග්ගල්ලානෝ ආයස්මා ච මහාකස්සපෝ ආයස්මා ච අනුරුඬෝ** යනු.

යෙනායස්මා සාරිපුත්තෝ තේනුපසඞ්කමිංසු= පිළිවෙළින් සිටි තුන් සඳක් මෙන් හිරක් මෙන් සිංහයන් මෙන් ද බබලමින් එලඹියහුය; යලි මෙසේ එලඹෙන්නා වූ ඒ මහතෙරුන් ආයුෂ්මත් ආනන්දයන් වහන්සේ තමන්ගේ දිවාස්ථානයෙහි හුන්නාහු මැ දැක- "අද මහත් ධර්මශ්‍රවණ යෙක් වන්නේය, මා ද එයට කොවස් වූවක්හු විසින් වියයුතු ය, යලි එකලා ව මැ නො යන්නෙමි, මා ප්‍රියසහාය වූ රෙවතස්ථවිරයන් ගෙන යන්නෙමි" සි; සියල්ල මහමුගලන් තෙරුන් මහකසුප් තෙරුන් වෙත එලඹීමෙහි කී නියෙන් ම විස්තරයෙන් දතයුතු. මේසේ ඒ දෙදෙන ද පිළිවෙළින් සිටි දෙ සඳක් මෙන් ද හිරක් මෙන් ද සිංහයන් මෙන් ද බබලමින් එලඹියාහුසි. එසින් කියන ලදී- **අද්දසා බො ආයස්මා ආනන්දෝ** යනාදිය. **දිස්වාන ආයස්මන්තං ආනන්දං එතදවොච**= දුරදී මැ දැක අනුක්‍රමයෙන් කථාඋපචාරයට (=කථාව ඇසෙන දුර) පැමිණියහුට මේ- **එතු බො ආයස්මා** යනාදි වචනය කිහ. **රමණීයං ආවුසෝ!** යන

මෙහි රමණී බව විවිධ යැ- වනරාමණෙය්‍යය යැ පුඤ්ඤ

රමණීයතාය. රාමණෙය්‍යය යැයි කියාසි; එහි වනය නම්? නා - හොර - සල් - සපු ආදියෙන් ගැවසී ගත්තේ වෙයි, ගනසෙවනලු ඇති මල්පල ගන්නා නන් රුක් ඇතියේ උදකසම්පන්න වූයේ ගම්න් බැහැර වූයේ වෙයි; මේ "වනරාමණෙය්‍යක" නම්; යමක් සඳහා "රමණීයානි" යනාදිය කියන ලද ද—

161. "**රමණීයානි අරඤ්ඤානි - යත්ථ න රමති ජනෝ**
විතරාගා රමිස්සන්ති - න තෙ කාමගවෙසිනෝ" යනු.

මෙසේ වැලිත් ඉදින් විෂම වූ දිය රහිත වූ තුනී සෙවනලු ඇති කටු යෙන් ගැවසීගත් (භූමිභාගයක්) වේද, එහි බුඩාදි ආර්‍යයෝ ත් වාසය කෙරෙත් ද, මෙය "පුග්ගලරාමණෙය්‍යක" නම්; යමක් සඳහා "ගාමෙ වා" යනාදිය වදරන ලද ද-

162. "**ගාමෙ වා යදි වා'රඤ්ඤෙ - නිනෙන වා යදි වා ථලෙ**
යත්ථ අරහන්තො විහරන්ති - තං භූමිං රාමණෙය්‍යකං" යනු.

මෙහි වූ කලී ඒ විවිධ වූ ම ඒ රමණී බව ලැබෙයි; සැබව- එකල ගවඛංසල්වනය සිඟලු තැන හාත්පසින් සුපිපියේ මල්ගදින් සුවඳ වූයේ වෙයි; තවද- මෙහි දෙව්යන් සහිත ලොකයෙහි අග්‍රප්‍රාප්ත වූ **සම්‍යක්** සම්බුඩයන් වහන්සේ තිස්දහසක් පමණ වූ ප්‍රසිඛ භික්ෂූන් සමග වාසය කෙරෙති; ඒ සඳහා කියනලදී- **රමණීයං ආවුසො! ආනන්ද! ගොසිඞ්ග සාලවනං** යනු. **දෙසිනා**= දෙසින් පහවූවා; අග්‍ර යැ මහිකා යැ ධූම යැ රජස් යැ රාහු යැ යන මේ උපක්ලෙශයන් ගෙන් විරහිත වූවා යයි කියන ලද වෙයි; **සබ්බපාලිඵුල්ලා**= සිඟලු තැන්හි පාලිඵුල්ලයෝ යැ, ඹුල පවන් අග තෙක් නො පිපි තැනක් නම් නැති; **දිබ්බා මඤ්ඤු ගන්ධා සම්පවන්ති**= දිව මදුරුමල් කොබෝලීල පරසතු සදුන්සුණු සුවඳ මෙන් හාත් පස හමති; ශක්‍ර-සුයාම-සන්තුෂිත-සුනිම්මිත-පරනිම්මිත-මහාබ්‍රහ්ම යන් බැසගත් තැනක් මෙන් (සුවඳ) හමති,යි කියන ලද වේ. **ඝථං රූපෙන ආවුසො! ආනන්ද!**= අනදතෙර ඒ පස් තෙරුන් අතුරෙන් සඞ්ඝනවක යැ; කුමක් හෙයින් තෙරුන් වහන්සේ ඔහු මෑ පළමු කොට විචාරත් ද යත්? මම්මඞ්ය කළ හෙයිනි; සැබව- ඒ සප්ථිරයෝ දෙදෙන ඔවුනොවුන් මම්මඞ්ය කළාහුය; සැරියුත් තෙරුන් වහන්සේ මා විසින්

---

161. **අරඤ්ඤානි**= (සුප්‍රඵුල්ලිත තරුවනසණ්ඩමණ්ඩිත විමල සලිල සම්පන්න වූ) ආරණ්‍යයෝ; **රමණීයානි**= සිත්කලු වෙති; **යත්ථ**= යම් අරණ්‍යයෙක්හි; **ජනෝ**= කාමගවෙසක වූ ජනතෙමේ; **න රමති**= (විකසිත පියුම්වනයන්හි ගම්වැස්සන් මෙන්) නො ඇලේ ද; **විතරාගා**= විතරාග වූ ක්ෂීණාශ්‍රවයෝ; **රමිස්සන්ති**= (පියුම්වනයන්හි බඹර-මිහිරුන් මෙන් එබදු වනයන්හි) සිත් ඇලවා වෙසෙති; (කරුණු කිම යත්?) **තෙ**= ඒ ක්ෂීණාශ්‍රවයෝ; **න කාමගවෙසිනෝ**= යම් හෙයකින් වසතුකාම කෙලශකාමයන් නො සොයන්නාහු වෙත් ද, එහෙයිනි

162. **ගාමෙ වා**= ගමක හෝ; **යදි**= නොහොත්; **අරඤ්ඤෙ වා**= වනයක හෝ; **නිනෙන වා**= වළතැනක හෝ; **යදි**= නොහොත්; **ථලෙ වා**= ගොඩතැනක හෝ; **යත්ථ**= යම් තැනෙක්හි; **අරහන්තො**= රහත්හු; **විහරන්ති**= වාසය කෙරෙත් ද; **තං භූමිං**= ඒ භූමිප්‍රදෙශය; **රාමණෙය්‍යකං**= සිත්කලු වන්නේයි.

කළයුතු ශාස්තෘන් වහන්සේගේ උපස්ථානය කෙරේ යයි අනඳතෙරුන් මම්බය කළහ; ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන්ගේ ශ්‍රාවකයන් අතුරෙන් අග්‍රයහ,යි සැරියුත් තෙරුන් මම්බය කළහ; කුලදරුවන් පැවිදි කරවා සැරියුත් තෙරුන් වෙත උපාධ්‍යාය කොට ගැන්වූහ; සැරියුත් තෙරුන් වහන්සේ ත් එසේ ම කළහ; මෙසේ ඔවුනොවුන් විසින් තමන්ගේ පාසිවුරු දී පැවිදි කරවා උපාධ්‍යාය කොට ගන්වන ලද්දාහු පන්සියයක් භික්ෂූහු වූහ. ආයුෂ්මත් ආනන්දයන් වහන්සේ ප්‍රණීත වූ චීවරාදිය ලැබ (සැරියුත්) තෙරුන්ට ම දෙන්නාහුය.

මේ අසනු ලැබේ- එක් බමුණෙක් මෙසේ සිතී- "බුදුරුවනට ද සඟරුවනට ද පූජා පැනෙයි, කෙපරිද්දෙකින් ධම්රුවනට පුදන ලද නම් වේ දෝ හෝ" යි; හේ භාග්‍යවතුන් වෙත එලඹ මේ කරුණ පිළිවිත. භාග්‍යවතුන් වහන්සේ වදාළහ- "ඉදින් බමුණ! ධම්රුවන පුදනු කැමැත්තේ වෙහි නම් එක් බහුශ්‍රැතයකු පුදව" යි. වහන්සේ! බහුශ්‍රැතයකු වදාළ මැනවැයි; භික්ෂු සඞ්ඝයා විචාරව,යි; හේ භික්ෂූන් වෙත එලඹ- "වහන්ස! බහුශ්‍රැතයකු ප්‍රකාශ කළ මැනවැ" යි කියය; බමුණ! ආනන්ද ස්ථවිරයෝ ය,යි; බමුණු දහසක් අගන සිවුරකින් තෙරුන් පිදී. තෙරුන් වහන්සේ එය ගෙන භාග්‍යවතුන් සමීපයට ගියහ; භාග්‍යවතුන් වහන්සේ ආනන්ද! කොයින් ලද දැ? යි වදාළහ; වහන්ස! එක් බමුණකු විසින් දෙන ලද, මේ වූ කලි මම ආයුෂ්මත් ශාරිපුත්‍රයන්ට දෙනු කැමැත්තම්හ,යි; ආනන්ද! දෙව,යි; වහන්ස! චාරිකාවෙහි නික්මුනේ ය,යි; ආ කලැ දෙව,යි; වහන්සේ! ශික්ෂාපද පනවන ලද,යි; වැලි ශාරිපුත්‍ර කවර කලක එන්නේ දැ? යි; වහන්ස! දසදිනක් පමණකිනැ,යි; "ආනන්ද! දසදිනක් පරම කොට අතිරෙක චීවරය බහා තබන්ට අනුදනිමි" යි ශික්ෂාපද පැනවූහ. ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ත් එසේ ම යම් කිසි මනවඩන්නක් ලබත් ද, එය ආනන්ද ස්ථවිරයන්ට දෙනි; මෙසේ ඒ තෙරහු ඔවුනොවුන් මම්බයනය කළහ; මේ පරිද්දෙන් මම්බය කළ හෙයින් පළමු පුළුවුත්හ.

ධම්රත්නයට පූජාවක්.

තවද- මෝ අනුමතිපෘච්ඡා නම් කුඩා වූවහු පටන් විචාළ යුත්තී වෙයි, එහෙයින් තෙරුන් වහන්සේ සිතූහ- "මම පළමු ආනන්දයන් පුළුවුස්නෙමි, ආනන්දයෝ තමාගේ වැටහීම ප්‍රකාශ කරන්නාහුය; අනතුරුව රෙවතයන් - අනුරුඬයන් - මහාකාශ්‍යපයන් - මහාමෞද්ගල්‍යායනයන් පුළුවුස්නෙමි, මහාමෞද්ගල්‍යායනයෝ තමාගේ වැටහීම ප්‍රකාශ කරන්නාහුය; නැවත පස් තෙරහු ම මා පුළුවුස්නාහුය, මම ද තමාගේ වැටහීම ප්‍රකාශ කරන්නෙමි; මෙතෙකිනු දු මෝ ධම්දෙශනා මුදුන් පැමිණියා මහත්බවට පැමිණියා නො වන්නීය, ඉක්බිති ඇපි සියල් ලෝ මැ දශබලයන් කරා එලඹ පුළුවුස්නෙමු; ශාස්තෘන් වහන්සේ සච්ඡිකාෂ්ඨතයෙන් ප්‍රකාශ කරන සේක; මෙතෙකින් මෝ ධම්දෙශනා මුදුන් පැමිණියා මහත්බවට පැමිණියා වන්නීය. ඒ එසේ මැයි— යම්සේ ජනපදයෙහි උපන් යුකතීය (=නඩුව) ගම්ලද්දෑ කරා පැමිණේ ද,

ඔහු නිශ්චය කරන්ට නො හැකි කල්හි ජනපදඅොජකයා කරා- ඔහු නො හැකි කල්හි මහාවිනිශ්චයාමාත්‍යයා කරා- ඔහු නො හැකි කාල්හි සෙනාපතියා කරා- ඔහු නො හැකි කල්හි යුවරජු කරා- ඔහු විනිශ්චය කරන්ට නො හැකි කල්හි රජු කරා පැමිණේ ද, රජු විසින් විනිශ්චය කළ තැන් පටන් යුකතිය ඔබිනොබ නො හැසිරේ ද, රජුගේ වචනයෙන් ම සිදේ ද; එපරිද්දෙන් ම මම පළමු කොට ආනන්දයන් පුළුවුස් නෙමි, —පෙ— ඉක්බිති ඇපි සියල්ලෝ මැ දශබලයන් කරා එලඹ පුළුවුස්නෙමු; ශාස්තෘන් වහන්සේ සර්ඥතාඥතයෙන් ප්‍රකාශ කරන සේක; මෙතෙකින් මෝ ධර්මදෙශනා මුදුන් පැමිණියා විපුලබවට පැමිණියා වන්නීය,යි මෙසේ අනුමතිපෘච්ඡාව පුළුවුස්තා වූ තෙරුන් වහන්සේ පළමු ආනන්ද සථවිරයන් පුළුවුත්හ.

බහුස්සුතො හොති= මොහු විසින් බොහෝ අසනලද වෙයි, නවාඞග ශාස්තෘශාසනය පාලනුසසි පූර්‍වාපර විසින් උගන්නා ලද වෙයි යන අර්ථයි. සුතධරො= ශ්‍රැතයට ආධාර වූයේ; ඒ එසේ මැයි- යමෙකුගේ මෙයින් ගන්නා ලද්ද මෙයින් පලායේ ද, සිදුරු කළයෙහි දිය මෙන් නො සිරි ද, පිරිස් මැද එක් සූත්‍රයක් හෝ ජාතකයක් හෝ කියන්ට කිය වන්ට හෝ නො හැකි වේද, මේ තෙම ශ්‍රැතධර නම් නො වෙයි; යම් යමෙකුගේ උගන්නා ලද බුඞවචනය උගත් කාලය හා සමාන මැ වේද, දසවසකු දු විසිවසකු දු හැදෑරීම නො කරන්නහුගේ (ශ්‍රැතය) නො නැසේද, මේ තෙම "සුතධර" නම් වේ. සුතසන්නිචයො= ශ්‍රැතය (සිත්හි) රැස් වූයේ; ඒ එසේ මැයි- යමෙකුගේ ශ්‍රැතය හෘදය නමැති මඤ්ජුසා වෙහි රැස් වූයේ ගලක රෙඛාවක් මෙන් ද රන්කළයක වත්කළ සිතෙල් මෙන් ද සිටී නම්, "සුතසන්නිචය" නම; ධතා= ධරන ලද්දාහු, ප්‍රගුණ වූවාහු; ඒ එසේ මැයි- එකෙකු විසින් උගත් බුදුවදන් ධරන ලද්දේ ප්‍රගුණ වූයේ නිශ්චල වූයේ නො වෙයි, අසවල් සූත්‍රය හෝ ජාතකය හෝ කියවයි කි කල හදුරා සසඳා කරුණු ගන්වා දැනගන්නෙමි යි කියයි; එකෙකු විසින් ධරන ලද්ද ප්‍රගුණ කරන ලද්ද භවාඞශ්‍රොතයක් මෙන් වෙයි, අසවල් සූත්‍රය හෝ ජාතකය හෝ කියව,යි කි කල නඟා එය ම කියයි; ඒ සඳහා කියන ලදී- ධතා යනු. වචසා පරිචිතා= සූත්‍රදසක වගීදසක පණ්ණාසදසක වශයෙන් වචනයෙන් හදුරන ලද්දාහු; මනසානුපෙක්ඛිතා= සිතින් විමසන ලද්දාහු යමෙකුගේ වචනයෙන් හදුණ බුදුවදන් සිතින් සිතන්නහුට ඒ ඒ තැන්හි ප්‍රකට වේද, මහත් ප්‍රදීපයක් දල්වා සිටියහුට රූපයක් මෙන් පැනේ ද; ඒ සඳහා මේ කියන ලදී. දිට්ඨියා සුප්පටිවිධා= අර්‍ථ හෙයින් ද කරුණු හෙයින් ද නුවණින් මොනොවට ප්‍රතිවෙධ කරන ලද්දාහු; පරිමණ්ඩලෙහි පදබ්‍යඤ්ජනෙහි= මෙහි පදය ම අර්‍ථය ප්‍රකාශ කරන හෙයින් පදබ්‍යඤ්ජන නම; එය අක්ෂර පරිපූර්ණකොට දශවිධව්‍යඤ්ජනබුඩින් නො පිරිහෙලා කියන ලද්දේ "පරිමණ්ඩල" නම් වෙයි; මෙබඳු වූ පදව්‍යඤ්ජනයන් ගෙන් යන අර්‍ථයි. තවද- යම් මහණෙක් පිරිස්හි දහම්

පරිමණ්ඩලකථා,

දෙසන්නේ සූත්‍රයක් හෝ ජාතකයක් හෝ බහා අන්‍ය වූ නිග්‍රහාරොපණය කරන සූත්‍රයක් එලවා ද, එයට උපමා කියා ද, වසතුවක් හෙලා දා මෙසේ මේ(සූත්‍රය)ගෙන තෙල (සූත්‍රයෙක්හි) බහාලමින් එක් පසකින් ම පරිහරණය කරන්නේ කල් දැන නැඟිසිටි ද, එහෙත් බහාලූ සූත්‍රය නික්ෂේපමාත්‍රයෙක් ම වේ ද, ඔහුගේ කථාව නො පිරිමඩුලු වූවා නම් වේ. යම් මහණෙක් වත්‍රාහි සූත්‍රයක් හෝ ජාතකයක් හෝ බහා එක් පදයකු දු පිටත නො ගොස් පාලිය පිළිබඳ අනුසන්ධිය ද පූර්වාපරය ද නො මකමින් ඇදුරන් දුන් නයෙහි සිට තෙලිකුරකින් පිරිසිඳින්නෙකු මෙන් ගැඹුරු ඇළකින් ජලය හරින්නෙකු මෙන් පිය සිඳිමින් සෙඤ්චවා ජනෙයයෙකු මෙන් යේද, ඔහුගේ කථාව පිරිමඩුලු වූවා නම් වේ. මෙබදු කථාව සඳහා **පරිමණ්ඩලෙති පදබ්‍යඤ්ජනෙහි** යනු කියන ලදී.

අප්පබ්බෙහි= මෙහි යම් මහණෙක් දහම් දෙසන්නේ සූත්‍රයක් හෝ ජාතකයක් හෝ ආරම්භ කොට ආරම්භ කළ තැන් පටන් ඉතා තුරිත වැ අරණි මන්ථනය (ගිනිගානා දඬු ඇලලීම) කරන්නෙකු මෙන් උණුසුම් කැමක් කන්නෙකු මෙන් පාලිය පිළිබඳ අනුසන්ධි-පූර්වාපරයන් අතුරෙන් ගන්න ලද්ද ගත්වන ම කොට ද නො ගන්න ලද්ද නො ගත්වන ම කොට ද පරණලා අතර හැසිරෙන ගොයකු නැඟිටුවන්නෙකු මෙන් ඒ ඒ තැන ගවමින් අවසන් කොට නැඟිට යේද; නැවත යමෙක් දහම් දෙසන්නේ කලෙක ශීඝ්‍ර ව කලෙක මන්ද ව කලෙක මහාශබ්දය කලෙක කුඩාශබ්දය කෙරේ ද; යම්සේ ප්‍රේත ගින්න කලෙක දැල්වේද, කලෙක නිවේ ද, එසේ "ප්‍රේතධර්මකථික" නම් වේ; පිරිස නැඟිසිටිනු කැමති කල්හි නැවත නැවත ආරම්භ කෙරේ ද; යමෙකු ත් කියමින් ඒ ඒ තැන තදබවට යේද, තතනන්නෙකු මෙන් හඬන්නෙකු මෙන් කියා ද, මොවුන් සියල්ලන්ගේ මැ කථාව ප්‍රබන්ධ වූවා නම් වෙයි; නැවත යමෙක් සූත්‍රයක් ආරම්භ කොට ඇදුරන් දුන් නයෙහි සිටියේ නො සුන් බාරු ඇති කොට ගඩාශ්‍රොතසක් මෙන් පවත්වා ද, අහස්ගඟින් බසින ජලය මෙන් නිරතුරු කථාව පවත්වා ද; ඔහුගේ කථාව අප්‍රබන්ධ වූවා වේ. ඒ සඳහා කියන ලදී- **අප්පබ්බෙහි** යනු **අනුසන්ධිපුබ්බාපරානං**= සපනානුසන්ධයන්ගේ නැසීම්පිණිස; **එවරූපෙන**= මෙබදු බහුශ්‍රැත වූ මහණ කරණකොට ගෙන එබදු වූ මැ සඟළ කණින් සඟලුකණ හෝ පලගින් පලඟ හෝ ගැටි හුන් භික්ෂූන් සියයකින් හෝ භික්ෂූන් දහසකින් හෝ ගවඛංසල්වනය හොබනේසි. මේ නයින් සියලු වාරයන්හි අරුත් දතයුතු.

පවිසල්ලාණ (=පලඟමවත) ඕහට ඇලුම් ඇත්තේ නුයි **පවිසල්ලාණාරාම** නම; පවිසල්ලාණයෙහි රති ඇත්තේ නුයි **පවිසල්ලාණරත** නම් **සහස්සං ලොකධාතූනං**= දහසක් ලොකධාතූන්; ඒ එසේ මැයි— මෙතක් තෙරුන්ගේ නීත්‍යානුසෙවනය වෙයි, ආවජ්ජනප්‍රතිබඬ වෙයි;

එහෙත් තෙරුන් වහන්සේ කැමති වන්නාහු නොයෙක් සක්වළ සියදහස් දී බලත් මැසි. **උපරිපාසාදවරගතෝ**= සත්බුමු හෝ නවබුමු හෝ උතුම් පහයක් මත්තට ගියේ; **සහස්සං නෙම්මණ්ඩලානං ඔලෝකෙය්‍ය**= පහපිරිවෙන්හි තැබින් පිහිටියා වූ නිම්වළල්ලෙන් නිම්වළල්ල හැපී සිටියාවූ නෙම්මණ්ඩල දහසක් වාකවුළුව විවර කොට බලන්නේ ද; ඔහුට නාගීහු (= සක්නැබ) ද අරයෝ (= ගරුඩි) ද අරඅතර ද නිම්වළලු ද ප්‍රකට වූවාහු වෙත් ද; **එවමෙව බෝ ආවුසෝ!**= එපරිද්දෙන් මේ දිවැස් ඇති **මහණ** ද මිනිසැස ඉක්ම සිටි දිවැසින් දහසක් ලොකධාතු බලයි; පහයෙහි සිටි පුරුෂයාහට සක්නැබ මෙන් ඒ මහණ හට සක්වළ දහසෙහි මහමෙරදහස් ප්‍රකට වෙයි, අරයන් මෙන් චිපයෝ ප්‍රකට වෙති, අරඅතර මෙන් දිවසින් වල සිටි මනුෂ්‍යයෝ ප්‍රකට වෙති, නිම්වළලු මෙන් සක්වළගල් ප්‍රකට වෙත්.

ආරඤ්ඤිකෝ= සමාදන්වූ ආරණ්‍යක ධුතාඞ්ග ඇත්තේ; සෙසු පද ඇත්හි දු මේ ම නයයි. **නෝ ච සංසාදෙති**= නො ගිල්වති; ඒ එසේ මැසි- හෙතු සහිත කරුණු සහිත කොට පැන පුළුවුස්නට ද විසඳන්නට ද නො හැකි වන්නේ සංසාදනය (=ගවපත්) කෙරෙයි නම්; එසේ නො කෙරෙති යන අර්ථයි. **පවත්තනී හොති**= ගඞ්ගාශ්‍රොතස් ජලයක් මෙන් පවතී; **යාය විහාරසමාපත්තියා**= යම් ලෞකික වූ හෝ ලොකොත්තර වූ හෝ විහාරසමාපත්තියකින්; **සාධු සාධු සාරිපුත්ත!** යි මේ සාධුකාරය ආනන්ද සථවිරයන්ට දෙන ලද, එහෙත් භාග්‍යවත්හු සැරියුත් තෙරුන් සමඟ ආලපනය කෙරෙති; සියලු තැන්හි මේ නයයි. **යථා නං ආනන්දෝ'ව**= යලි මතාකොට ප්‍රකාශ කරන්නෙක් යම්සේ ප්‍රකාශ කරන්නේ ද, ආනන්දයන් වීසින් එසේ ප්‍රකාශ කරනලද, තමහට සුදුසු වූවක් ම අදහසට ගැළපෙන්නක් ම ප්‍රකාශ කරන ලද යන අර්ථයි. **සැබෑ-** තෙරුන් වහන්සේ තමා ත් බහුශ්‍රැතයෙහි, උන් වහන්සේගේ අදහස ද එසේ සිටියේ වන- ශාසනයෙහි සබ්‍රහ්මචාරීහු බහුශ්‍රැතයෝ වන්නාහු නම් ඉතා යෙහෙකැයි කියායි. කුමක් හෙයින ? යම් හෙයකින් බහුශ්‍රැතය හට කප්‍යාකප්‍යය සාවද්‍යානවද්‍යය ගරුකලහුකය සතෙ කිවිඡ අතෙකිවිඡය ප්‍රකට වේද, නැවත බහුශ්‍රැත තෙමේ උගත් බුදු වදන් මෙනෙහි කොට මේ තැන ශීලය කියන ලද මෙහි සමාධිය- මෙහි විදර්‍ශනාව- මෙහි මාගඵල නිර්‍වාණයෝ යයි මෙනෙහි කොට ශීලය ආ තැන්හි සිල් පුරා සමාධිස්ථානයෙහි සමවත් පුරා විදර්‍ශනාස්ථානයෙහි විද සුන් ගබ්ගන්වා මාගඵය වඩා ඵලය පසක් කෙරේ ද; එහෙයින් තෙරුන්ට මෙසේ අදහස් වෙයි- "සබ්‍රහ්මචාරීහු එක් නිකායක් හෝ දෙකක් හෝ තුනක් හෝ සතරක් හෝ නිකාය පස ඉහෝ ඉගෙන ආවර්ජන කරමින් ශීලාදිය ආ තැන්හි ශීලාදිය පුරමින් පිළිවෙළින් මහපලනිවන් පසක් කරන්නාහු නම් ඉතා යෙහෙකැ" යි. සෙසු වාරයන්හි දු මේ ම නයයි.

යම් හෙයකින් ආයුෂ්මත් රෙවතයන් වහන්සේ ධ්‍යානාධ්‍යාශ ඇත්තාහු ධ්‍යානයෙහි අභිරති ඇත්තාහු ද, උන් වහන්සේට මේ සිත වෙයි- "සබ්‍රහ්මචාරීහු එකලා වැ හිද කිසුණු පිරියම් කොට අටසමවත් නිපදවා ධ්‍යානයන්ට පදසථාන වූ විදසුන් වඩා ලොවුතුරු දහම් පසක් කරන්නාහු නම් ඉතා යෙහෙකැ" යි කියාසි. එහෙයින් මෙසේ ප්‍රකාශ කළහ.

ආයුෂ්මත් අනුරුඬයන් වහන්සේ දිවැස් ඇති සේක; උන් වහන්සේට මෙසේ සිතක් වෙයි. "සබ්‍රහ්මචාරීහු ආලොකය වඩා දිවැසින් නොයෙක් සක්වළ දහස්හි මියන්නාවූ උපදින්නාවූ ද සත්ත්වයන් දැක සසරබියෙන් සිත සංවේග කොට විදසුන් වඩා ලොවුතුරු දහම් පසක් කරන්නාහු නම් ඉතා යෙහෙකැ" යි. එහෙයින් මෙසේ ප්‍රකාශ කළහ.

ආයුෂ්මත් මහාකාශ්‍යපයන් වහන්සේ ධුතවාදයහ; උන් වහන්සේට මේ සිත වෙයි- "සබ්‍රහ්මචාරීහු ධුතවාදයෝ වැ ධුතඞ්ගානුභාවයෙන් ප්‍රත්‍යය තෘෂ්ණාව හකුළුවා අන්‍ය වූ ත් නන්වැදුරුම් කෙලෙස් සලා විදසුන් වඩා ලොවුතුරු දහම් පසක් කරන්නාහු නම් ඉතා යෙහෙකැ" යි. එහෙයින් මෙසේ ප්‍රකාශ කළහ.

ආයුෂ්මත් මහාමෞද්ගල්‍යායනයන් වහන්සේ සමාධිපාරමිතාවගේ මස්තකයට පැමිණියහ. මේ විස්තර ඇ- සියුම් වූ චිත්තානන්තරය සඤ්ඤානන්තරය ධාත්වන්තරය ආයතනානන්තරය ධ්‍යානාවක්‍රාන්තිය ආරම්මණාවක්‍රාන්තිය අඞ්ගවවත්ථානය ආරම්මණවවත්ථානය අඞ්ගසඞ්කන්තිය ආරම්මණසඞ්කන්තිය එකතොවඩ්ඪනය උභතොවඩ්ඪනය යන මේ අභිධර්මය හදුළු ධර්මපිටකයාට මැ ප්‍රකට වෙයි; යම් හෙයකින් අභිධර්මය නො හදුළු තැනැත්තේ දහම් දෙසන්නේ මේ සවවාද ඇ මේ පරවාද ඇයි නොදනී ද, සවවාදය දක්වන්නෙමියි පරවාදය දක්වා ද, පරවාදය දක්වන්නෙමියි සවවාදය දක්වා ද, ධර්මාන්තරය විසංවාදනය කෙරේ ද, ආනි ධර්මික තෙම සකවාදය සකවාදනියමයෙන් ම පරවාදය පරවාදනියමයෙන් ම දක්වා ද, ධර්මාන්තරය විසංවාදනය නො කෙරේ ද, එහෙයින් තෙරුන්ට මේ සිත වෙයි— "සබ්‍රහ්මචාරීහු ආභිධර්මිකයෝ වැ සියුම් තැන්හි නුවණ බස්වා විදසුන් වඩා ලොවුතුරු දහම් පසක් කරන්නාහු නම් ඉතා යෙහෙකැ" යි එහෙයින් මෙසේ ප්‍රකාශ කළහ.

ආයුෂ්මත් ශාරිපුත්‍රයන් වහන්සේ ප්‍රඥාපාරමිතා වෙහි මස්තකයට පැමිණියහ; තවද- නුවණැත්තේ ම සිත තමා වශයෙහි පවත්වන්ට හැකි වෙයි, දුෂ්ප්‍රාඥ තෙම නො හැකි වෙයි; යම් හෙයකින් දුෂ්ප්‍රාඥ උපනුපන් චිත්තයාගේ වශයෙහි වැටී යලි ඔබිනොබ සැලී කිපදිනකින් ම ගිහිබවට පැමිණ අනයව්‍යසනයට පැමිණේ ද; එහෙයින් තෙරුන්ට මේ සිත වෙයි- "සබ්‍රහ්මචාරීහු චිත්තවශිකයෝ නො වැ සිත තමාගේ වශයෙහි පවත්වා ඔහුගේ සියලු විරුඬසෙවන- ප්‍රතිපක්ෂග්‍රාහ - විෂඵන්දන යන් බිඳ මදකුත් පිටත නික්මෙන්ට නො දෙමින් විදසුන් වඩා ලොවුතුරු දහම් පසක් කරන්නාහු නම් ඉතා යෙහෙකැ" යි එහෙයින් මෙසේ ප්‍රකාශ කළහ.

සඞ්ඛිත්තං වෝ සාරිපුත්තා! සුභාසිතං පරියායෙන= ශාරිපුත්‍රයෙනි! යම් හෙයකින් සඟමොක් පිළිබඳ නම් බහුශ්‍රැත භික්‍ෂූන් විසිනු දු හොබනට කරුණු ඇත් ද, ධ්‍යානයෙහි ඇලුනන් විසිනු දු- දිවැස් ඇතියන් විසිනු දු ධුතවාදීන් විසිනු දු ආභිධම්මිකයන් විසිනු දු අවිත්තවසිකයන් විසිනු දු හොබනට කරුණු ඇත් ද; එහෙයින් තොප සියල්ලන්ගේ (වචනය) සුභාෂිත යැ, පර්‍යායයෙන් ඒ ඒ කරුණෙන් සුභාෂිත මැයි; දුර්භාෂිත නො වේ **එකෙක් ඇති**- මාගේ වචනය ද අසවු; **න නාවාහං ඉමං පලලඞ්කං හිඤ්ඤිස්සාමි**= ඒ තාක් මම මේ සිව්රහවැර ඉවා බඳන ලද පලඟ නො බිඳින්නෙමි, නො මුදන්නෙමි, යන අර්‍ථයි. මේ වනාහි භාග්‍යවත්හු තුවණ මෝරුගියකල රජසිරි හැර කළ අභිනිෂ්ක්‍රමණ ඇත් තාහු පිළිවෙළින් බෝමැඩව නැඟී සිව්රහවැර ඉවා යම් අපරාජිතපර්‍යඞ්කයක් බැඳ දැසසමාදුන ඇති වැ වැඩහුන්නාහු තුන් මරුන්ගේ මස්තකය බිඳ අලුයම්කලැ දසදහසක් ලොකධාතුව උන්නාද කරවමින් සර්‍වඥතාඥානය ප්‍රතිවෙධ කළසේක් ද, ඒ තමන් වහන්සේගේ මහඃබෝපලඟ සඳහා මෙසේ වදළහ. තවද- පශ්චිමජනතාවට අනුකම්පා කරමින් ද ප්‍රතිපත්ති සාර වූ පෘථජ්ජන කල්‍යාණයා දක්වන සේක් මෙසේ වදළහ. සැබව- භාග්‍යවතුන් වහන්සේ අනාගතයෙහි මෙසේ අදහස් ඇති කුල පුත්‍රයෝ මෙසේ ප්‍රත්‍යවෙක්‍ෂා කරන්නාහු යයි දක්නා සේක; (එනම්?) භාග්‍යවත්හු මහාගොසිඟහ සූත්‍රය වදාරන සේක්- **"ඉධ සාරිපුත්ත! භික්ඛු පච්ඡාභත්තං —පෙ— එවරූපෙන ඛෝ සාරිපුත්ත! භික්ඛුනා ගොසිඞ්ගසාලවනං සොභෙය්‍ය"** යි වදළහ. ඇපි භාග්‍යවතුන්ගේ අදහස ගන්නෙමු,යි පසුබත පිණ්ඩපාතයෙන් වැලකුනාහු සිව්රහවැර ඉඳ දැසසමාදුන ඇති වැ රහත්බවට නො පැමිණ මේ පලඟ නො බිඳින්නෙමුයි මහණදම් කටයුතු යයි සිතන්නාහුය; ඔවුහු මෙසේ පිළිපන්නාහු කිපදිනකින් ම ජාති ජරා මරණය කෙළවර කරන්නාහු ය,යි මේ පශ්චිම ජනතාවට අනුකම්පා කරමින් පිළිවෙත් සරු වූ පෘථජ්ජන කල්‍යාණයා දක්වමින් මෙසේ වදළහ. **එවරූපෙන ඛෝ සාරිපුත්ත! භික්ඛුනා ගොසිඞ්ගසාලවනං සොභෙය්‍ය**= ශාරිපුත්‍ර! මෙබඳු මහණ කරණකොට ගෙන නිෂ්පර්‍යායයෙන් ම ගවඟංසල්වනය හොබනේ යයි අනුසන්ධි වූ ලෙසින් ම දෙසුම් නිමවූ සේකි.

මහාගොසිඞ්ඟ සූත්‍ර වර්‍ණනා නිමි. (2)

———o÷o———

මහාගොපාලක සූත්‍රවර්ණනා.

එවමෙමසුතං යි මහාගොපාලක සූත්‍රයයි. එහි කථා තුනක් වෙති, එකානාළිකා යැ චතුරස්සා යැ නිසිඤ්ඤාවත්තිකා යැයි. ඔවුන තුරෙහි පෙළ කියා එකෙකි පදයාගේ අරුත් බිණීම **එකනාළිකා** නිර්ඛ කථා. නමු; අපණ්ඩිත ගොපල්ලා දක්වා අපණ්ඩිතමහණ දක්වා පණ්ඩිතගොපල්ලා දක්වා පණ්ඩිතමහණ දක්වා යයි චතුෂ්කය බැඳ බිණීම **චතුරස්සා** නමු; අපණ්ඩිතගොපල්ලා දක්වා කෙළවරට යැමයැ, **අපණ්ඩිතමහණ** දක්වා කෙළවරට යැමයැ, පණ්ඩිතගොපල්ලා දක්වා කෙළවරට යැමයැ, පණ්ඩිතමහණ දක්වා කෙළවරට යැමයැ, යන මෝ **නිසිඤ්ඤාවත්තිකා** නමු; මෝ (නිසිඤ්ඤාවත්තිකා) මෙහි සියලු ආචාර්‍යයන් විසින් ආවිණි යැ; **එතදඝගි භික්ඛවෙ! අඤ්ඤතරෝ**= එකොළොස් අතුණකොටසින්; **ගොගණං**= ගවමඬුලු (=පව්චිය); **පරිහරිතුං**= ගෙන හැසිරෙන්ට; **ඨාතිකාතුං**= වැඩීමට පමුණුවන්ට; **ඉධ**= මේ ලොකයෙහි; **න රූපඤ්ඤූ හොති**= ගණන හෙයින් හෝ **වණ්ණී** හෙයින් හෝ සවරූපය නො දනී; ගණන හෙයින් නො දනී නම්? තම ගවයන්ගේ නො විසත් සියයෙක හෝ දහසෙක හෝ යි සඞ්ඛ්‍යාව නො දනී, හෙතෙම ගොපල්ලා, දෙනුන් පැහැරගත් කල්හි හෝ පලාගිය කල්හි හෝ ගව මඬුලු ගැණ අද මෙතෙක් නො දක්නා ලැබෙති,යි දෙ තුන් ග්‍රාමාන්තරයක හෝ **වනයෙහි** හෝ හැසිරෙමින් නො සොයයි, අනුන්ගේ දෙනුන් තමාගේ ගවසමූහයට පිවිසි කල ද ගවමඬුලු ගැන මේ මෙතෙක් දෙන්නු අපගේ නො වෙති, යි යටින් තලා බැහැර නො කරයි, ඔහුගේ නට දෙන්නු නටුවාහු ම වෙති, අනුන්ගේ දෙනුන් ගෙන හැසිරෙයි; ගව හිමියෝ දැක මේ තෙම මෙතෙක් කල් අපගේ දෙන දෙවී යයි තර්ජනය කොට තම දෙනුන් ගෙන යෙති; ඔහුගේ ගවමඬුලු ද පිරිහෙයි; පස්ගෝරස පරිභොගයෙන් ද පරිබාහිර වේ. **වණ්ණී** හෙයින් නො දනී නම්? මෙතෙක් දෙන්නු සුදු යැ මෙතෙක් රතු යැ මෙතෙක් කළු යැ මෙතෙක් පළොල්වන්නැයි නො දනී; හෙතෙම් දෙනුන් පැහැරගත් කල හෝ පලා ගිය කල හෝ —පෙ— පස්ගෝරස පරිභොගයෙන් ද පරිබාහිර වේ.

න ලක්ඛණඤ්ඤූ= දෙනුන්ගේ ශරීරයෙහි කරන ලද දුනු අඹ යටි ත්‍රිශූලාදිභෙද වූ ලක්ෂණය නො දනී, හෙතෙම් දෙනුන් පැහැර ගත් කල හෝ පලාගිය කල හෝ අද අසවල් ලක්ෂණ වූ ද අසවල් ලක්ෂණ වූ ද දෙන්නු නො දක්නා ලැබෙති,යි —පෙ— පස්ගෝරස පරිභොගයෙන් ද පරිබාහිර වේ.

න ආසාටිකං සාටෙතා= ගවයන්ගේ කණුකටු ආදියෙන් පහළ තැන්හි වණ වෙයි, එහි නිලමැස්සෝ බිජුවට (=ඉහඳ) තබති, ඔවුන්ට "ආසාටිකා" යි නම්‌යැ, ඒවා දණ්ඩකින් ඉවත් කොට බෙහෙත් දියයුතු වෙයි, බාලගොපලු එසේ නො කෙරෙයි; එයින් කියන ලදී- "**න ආසා**

ටිකං සාටෙතා හොති" යනු. ඔහුගේ ගවයන්ගේ ව්‍රණයෝ වැඩෙති, ගැඹුරු වෙති, පණුවෝ කුසට පිවිසෙති, දෙන්නු ගිලන් බැවින් මඛනා ලද්දාහු යැපෙන පමණ තණ කන්ට නො ම හැකි වෙති, පැන් බොන්ට නො හැකි වෙත්. එපරිද්දෙන් දෙනුන්ගේ කිරි සිදෙයි, ගවයන්ගේ ශක්තිය පිරිහෙයි; දෙනුන් හා ගොනුන්ගේ ජීවිතාන්තරාය ද වෙයි; මෙසේ ඔහුගේ ගවමඬුලු ද පිරිහෙයි; පස්ගෝරසයෙන් ද පරිබාහිර වේ.

න වණං පටිජානාදෙතා හොති= ගවයන්ගේ කි නියෙන් හටගත් වණය බෙහෙත් දී වැහැරියෙන් හෝ රැක්පටයෙන් හෝ වැසියයුතු වෙයි; බාලගොපලු එහි එසේ නො කෙරෙයි, අවශ්‍යයෙන් ගවයන්ගේ වණවලින් යුස වැගිරෙති, ඔවුහු ඔවුනොවුන් ගැටෙති, එයින් අන්‍ය යන්ගේ ද වණ හටගනිත්; මෙසේ ගවයෝ ගිලන්බැවින් මඛනා ලද්දාහු නො මැ යැපෙන පමණ තණ කන්ට —පෙ— පරිබාහිර වේ.

න ධූමං කත්තා හොති= ඇතුලු වසැ මැසිමදුරු ආදීන් උපන් කල ගවසමූහය ගොවුදට පිවිසි කල්හි ඒ ඒ තැන දුම් කළයුතු වෙයි; නො වියත් ගොපලු ඒ නො කෙරෙයි; ගවසමූහය සියලු රෑ මැසි ආදීන් විසින් මඛනා ලදුයේ නිදි නො ලැබ දෙවන දවස් වෙනෙහි ඒ ඒ තැන රුක්මුල් ආදියෙහි හෙව නිදයි; නො මැ යැපෙන පමණ තණ කන්ට —පෙ— පරිබාහිර වේ.

න තිත්ථං ජානාති= තොට සම යයි හෝ විෂම යයි හෝ (කිඹුල් ආදි) ග්‍රාහයන් සහිත යයි හෝ ග්‍රාහයන් රහිත යයි හෝ නො දනී; හේ නො තොටින් දෙනුන් බස්වයි, විෂම තොටැ ගල් ආදිය ඇක්මෙන් නාවූ ඔවුන්ගේ පා බිඳෙති, ග්‍රාහයන් සහිත ගැඹුරු තොටට බැස්සවුන් කිඹුල් ආදි ග්‍රාහයෝ ගනිති, අද මෙතෙක් දෙන්නු නවුවාහුය, අද මෙතෙක් යයි කියයුතු බවට පැමිණෙත්; මෙසේ ඔහුගේ ගවමඬුලු ද පිරිහෙයි; පස්ගෝරසයෙන් ද පරිබාහිර වේ.

න පීතං ජානාති= යම් හෙයකින් ගොපල්ලා විසින් "මේ දෙන විසින් පානය කරන ලද, මෑ විසින් පානය නො කරන ලද, මෑ විසින් පැන්තොටැ අවකාශ ලද මෑ විසින් නො ලදී" යි මෙසේ පානය කළ බැව් දතයුතු වේද; එහෙත් මේ තෙම දවල්කාලය වානයෙහි ගවසමූහයා රැක පැන් පොවන්නෙමියි ගඟකට හෝ විලකට හෝ ගෙන යෙයි; එහි මහාවෘෂභයෝ ද බලවත් දෙන්නු ද දුර්වල වූ හා මහලු වූ ද ගොරුපින් අං වලින් හෝ ඉල වලින් හෝ පැහැර තම හට ඔවස් නොට කලවේ පමණ දියට පිවිස කැමති සේ බොති; සෙස්සෝ ඔවස් නො ලබන්නාහු ඉවුරු සිට කලල්මුසු දිය බොන්නාහු හෝ නො බීවාහු ම හෝ වෙති; එකල ඒ ගොපලු තෙම පිට පැහැර නැවත වතයට ප්‍රවෙශ කෙරෙයි; ඔවුනතුරෙහි නො පි දෙන්නු පවසින් වියලෙන්නාහු යැපෙන තෙක් තණ කන්ට නො හැකි වෙති; ඔවුනතුරෙහි දෙනුන්ගේ කිරි සිදෙයි, ගොනුන්ගේ ශක්තිය පිරිහෙයි, —පෙ— පරිබාහිර වේ.

න විජිං ජානාති= මේ මග සම යැ මේ විෂම යැ සැකසඟිත යැ භය සඟිත යැයි නො දනී; හේ සම වූ නිර්භය වූ මග හැර ගවසමූහය ඉතිරි (විෂම) මගට පිළිපදවයි, එහි ගවයෝ සිංහව්‍යාඝ්‍රාදීන්ගේ ගදින් හෝ සොරුවදුරින් හෝ මඩනා ලද්දාහු තැනිගත් මුවන් වැනි වූවාහු ගෙල නහා සිටිති; නො මැ යැපෙන පමණ තණ කති, පැන් නො බොති; ඔවුනතුරෙහි දෙනුන්ගේ කිරි සිඳෙයි, —පෙ— පරිබාහිර වේ.

න කොවරකුසලෝ හොති= මේ විසතර යැ- ගොපල්ලා විසින් ගොවරයෙහි දක්ෂ වූවෙක් විය යුතුයි, පස්දිනක් අතර වූ වාරය හෝ සතියක් අතර වූ වාරය හෝ දත යුතුයි, එක් දෙසක ගවසමූහයා හසු රුවා දෙවන දවස් එහි නො හැසිර විය යුතුයි, යම් හෙයකින් මහත් ගවසමූහයා විසින් හැසුරුණු තැන බෙරඇසක් මෙන් ශුඛ වූයේ තණ රහිත වේද, ජලය ත් කැලඹේද; එහෙයින් පස්වෙනි හෝ සත්වෙනි හෝ දිනයෙහි නැවත එහි හසුරුවන්ට වටී; සැබව- මෙතෙක් දින කින් තණ ද නැවත වැඩෙයි, ජලය ද පහදී; එහෙත් මේ තෙම මේ පඤ්චාභිකවාරය හෝ සත්තාභිකවාරය නො දනී, දවසැ දවසැ රැකි තැන්හි ම රකී, එකල ඔහුගේ ගවසමූහය නිල් තණ නො ලබයි, වියලි තණ කමින් මඩමුසු දිය බොයි; ඔවුනතුරෙහි දෙනුන්ගේ කිරි සිඳෙයි, —පෙ— පරිබාහිර වේ.

අනවසෙසදෙහී ච හොති= පණ්ඩිත ගොපාලකයා විසින් යම් පමණකින් වස්සාගේ මස්ලේ පිහිටා ද එ පමණ එක් දෙ තනයක් තබා සාවශෙෂයෙන් දෙවන්නෙක් විය යුතුයි; මේ තෙම වස්සාට කිසිවක් ඉතිරි නො කොට දෙවයි; කිරි බොන වස්සා කිරිපවසින් වියලෙයි, සිටින්ට නො හැකි වූයේ කමපා වෙමින් මවු හඹවෙහි වැටී කලුරිය කෙරෙයි; මවු තොමෝ පුත්‍රයා දූක මාගේ පුත්‍රයා තම මවගේ පවා කිරි බොන්ට නො ලබා යයි පුත්‍රශොකයෙන් යැපෙන පමණ තණ කන්ට නො හැකි වෙයි, පැන් බොන්ට නො හැකි වෙයි; තතවල කිරි සිඳෙයි. මෙසේ ඔහුගේ ගවසමූහය ද පිරිහෙයි; පස්ගෝරසයෙන් ද පරිබාහිර වේ.

ගවයන්ගේ පිතෘස්ථානය කෙරෙත් හුයි **ගොපිතරෝ**.(= ගොපිතෘ නම් වෙති;) ගවයන් පමුණුවති, රැුචි සේ ගෙන යෙත් හුයි **ගොපරිණායකා** (= ගවපරිණායක නම් වෙති;) **න අතිරෙකපූජාය**= ඒ එසේ මැයි; පණ්ඩිත ගොපාල තෙම මෙබඳු වෘෂභයන් අතිරෙකපූජාවෙන් පුදයි, ප්‍රණීත වූ ගවාහාරය දෙයි, ගඳපසඟුලින් සරසයි, මාලා පළඳවයි, අංවල රන්රිදී කොපු පිහිටුවයි, රැ පහන් දල්වා සෙල්ඹියන යට හොවවයි; එහෙත් මේ තෙම එයින් එහා සත්කාරයකුදු නො කෙරෙයි; වෘෂභයෝ අතිරෙකසත්කාරය නො ලබන්නාහු ගවසමූහය නො රකිති, උවදුරු නො වලකත්. මෙසේ ඔහුගේ ගවසමූහය ද පිරිහෙයි, පස්ගෝරසයෙන් ද පරිබාහිර වේ.

ඉධ= මේ ශාසනයෙහි; **න රූපඤ්ඤූ හොති** යනු **"චතූනාඤ් මහාභූතානි චතුන්නඤ් ච මහාභූතානං උපාදාය රූපං"** යි මෙසේ වදාළ රූපය ගණනවශයෙන් හෝ සමුට්ඨානවශයෙන් හෝ දෙ ආකාරයෙන් නො දනී; ගණනවශයෙන් නො දනී නම්; **"චක්ඛායතනං සොතායතන- ඝාන- ජිව්හා- කාය- රූප- සද්ද- ගන්ධ- රස- ඵොට්ඨබ්බායතනං ඉත්ථින්ද්‍රියං පුරිසින්ද්‍රියං ජීවිතින්ද්‍රියං කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති ආකාස ධාතු ආපොධාතු රූපස්ස ලහුතා මුදුතා කම්මඤ්ඤතා උපචයො සන්තති ජරතා රූපස්ස අනිච්චතා කබළීඞ්කාරෝ ආහාරෝ"** යි මෙසේ පෙළ ආවාහු පස්විසි රූපඝොඨාසයෝ යයි නො දනී; යම් සේ ඒ ගොපලු ගණනවශයෙන් ගවයන්ගේ සවරූපය නො දනී ද, එබදු උපමා ඇති මේ මහණ සඞ්ඛ්‍යාහෙයින් රූපය නො දන්නේ රූපය පරිග්‍රහණය කොට අරූපය වවත්ථානය කොට රූපාරූපය පරිග්‍රහණය කොට ප්‍රත්‍යය සලකා ලක්ෂණයට නඟා කමවහන් මුදුන් පමුණුවන්ට නො හැකි වෙයි; හේ යම් සේ ඒ ගොපල්ලාගේ ගවසමූහය නො වැඩේ ද, එපරිද්දෙන් මේ ශාසනයෙහි ශීල-සමාධි-විදර්ශීනා-මාර්ග-ඵල-නිර්‍වාණයන්ගෙන් නො වැඩෙයි; යලි යම් සේ ඒ ගොපලු පස් ගෝරස යෙන් පරිබාහිර වේ ද, එපරිද්දෙන් අශෛක්ෂ වූ ශීලස්කන්ධයෙන් අශෛක්ෂ වූ සමාධි - ප්‍රඥා - විමුක්ති - විමුක්තිඥානදර්ශීනස්කන්ධයන් යන පඤ්චවිධශීක්ෂාස්කන්ධයන් ගෙන් පරිබාහිර වේ. සමුට්ඨාන හෙයින් නො දනී නම්: මෙතෙක් රූපය එකසමුට්ඨාන යැ, මෙතෙක් ද්විසමුට්ඨාන යැ, මෙතෙක් තිසමුට්ඨාන යැ, මෙතෙක් චතුසමුට්ඨාන යැ, මෙතෙක් කොයිතුත් නූපදී යයි නො දනී; යම් සේ ඒ ගොපලු වණ්හෙයින් ගවයන්ගේ සවරූපය නො දනී ද, එබදු උපමා ඇති මේ මහණ සමුට්ඨාන හෙයින් රූපය නො දන්නේ රූපය පරිග්‍රහණය කොට අරූපය වවත්ථානය කොට —පෙ— පරිබාහිර වූයේ වේ.

න ලක්ඛණකුසලෝ හොති යනු **"කම්මලක්ඛණෝ බාලෝ කම්ම ලක්ඛණෝ පණ්ඩිතෝ"** යි මෙසේ වදාළ කුශලාකුශල කර්මය පණ්ඩිත-බාලලක්ෂණය, යි නො දනී; හේ එසේ නො දන්නේ බාලයන් හැර පණ්ඩිතයන් නො සෙවුනේය; බාලයන් හැර පණ්ඩිතයන් නො සෙවුනේ කැප නො කැපය කුශලා කුශලය සාවද්‍යානවද්‍යය ගරුකලහුකය සතෙකිවජ්ජ - අතෙකිවජ්ජභාවය කාරණාකාරණය නො දනී; එය නො දන්නේ කමවහන් ගෙන වඩන්ට නො හැකි වෙයි; හේ යම් සේ ඒ ගොපල්ලාගේ ගවසමූහය නො වැඩේ ද, එපරිද්දෙන් මේ සසුන්හි යථොක්තශීලාදීන් ගෙන් නො වැඩෙයි; පස්ගෝරසයෙන් ගොපල්ලා මෙන් යථොක්ත පඤ්චවිධශීක්ෂාස්කන්ධයන් ගෙන් පරිබාහිර වූයේ වේ.

න ආසාවිතං සාධෙතා හොති යනු **"උප්පන්නං කාමවිතක්කං"** යි මෙසේ වදාළ කාමවිතර්කාදීන් දුරු නො කෙරෙයි, හේ මේ අකුශල විතර්කී සඞ්ඛ්‍යාත වූ ඉහදය බැහැර නො කොට විතර්කීයන්ට වසඟ වැ හැසිරෙන්නේ කමවහන් ගෙන වඩන්ට නො හැකි වෙයි; හේ යම් සේ ඒ ගොපල්ලාගේ —පෙ— පරිබාහිර වූයේ වේ.

න වණ්ණං පටිවිජානෙනා හොති යනු **"චක්ඛුනා රූපං දිස්වා නිමිත්තග්ගාහී හොති"** යනාදි නයින් සියලු අරමුණුවල **නිමිති** ගන්නේ යම් සේ ඒ ගොපලු ත්‍රණය නො වසා ද එපරිද්දෙන් සංවරය සම්පාදනය නො කෙරෙයි; හේ විවෘත වූ (චක්ෂුරාදි) දොර ඇති ව හැසිරෙන්නේ කම්ම හන් ගෙන වඩන්ට නො හැකි වෙයි; —පෙ— පරිබාහිර වූයේ වේ.

න ධම්මං කත්තා හොති= ඒ ගොපලු ධර්මය මෙන් ධර්මදේශනා තමැති ධර්මය නො කෙරෙයි; ධර්මකථාව හෝ **සරභඤ්ඤය** හෝ උපනිසිඥාන කථාව හෝ අනුමෝදනාව හෝ නො කෙරෙයි, **එහෙයින්** ඔහු මනුෂ්‍යයෝ බහුශ්‍රැත වූ ගුණවතෙකැයි නො දනිති; ඔවුහු ගුණාගුණ නො දන්නාහු සිවුපසයෙන් සඞ්ග්‍රහ නො කෙරෙති; හෙතෙම ප්‍රත්‍යයෙන් කලාතන වන්නේ බුදුවදන් ඉදුරන්ට වත්පිළිවෙත් පුරන්ට කම්ට හන් ගෙන වඩන්ට නො හැකි වෙයි; —පෙ— පරිබාහිර වූයේ වේ.

න තිට්ඨං ජානාති= තීර්ථ වූ බහුශ්‍රැත භික්ෂූන් කරා නො එළඹෙයි; නො එළඹෙන්නේ වහන්ස! මේ ව්‍යඤ්ජනය කෙසේ නැගිය යුතු ද? මේ භාෂිතයාගේ අර්ථය කවරේ ද? මේ තැන්හි පාලිය කුමක් ප්‍රකාශ කෙරේ ද? මේ තැන්හි අර්ථය කුමක් දක්වා ද? යි මෙසේ නො විචාරයි, නො ප්‍රශ්න කෙරෙයි; නො දන්වයි යන අර්ථයි. මෙසේ නො විචාරන්නාවූ ඔහුට ඒ (භික්ෂූහු) ප්‍රතිවිජ්ඣන වූ අර්ථය ද විවෘත නො කෙරෙති, බෙදා නො දක්වති; ගැඹුරු වූ අර්ථය ද නො ගැඹුරු නො කෙරෙති, අප්‍රකට වූ අර්ථය ද ප්‍රකට කෙරෙත්. **අනොකච්ඡිතෙසු ච කඞ්ඛාඨානියෙසු ධම්මෙසු**= නන්වැදුරුම් සැකයන් අතුරෙහි එක සැකයකු දූ දුරු නො කෙරෙති; සැබෑව- සැකයෝ ම "කඞ්ඛාඨානියධම්ම" නම් වෙති; ඔවුනතුරෙහි එක සැකයකු දූ බැහැර නො කෙරෙති යන අර්ථයි. හෙතෙම මෙසේ බහුශ්‍රැතසඞ්ඛ්‍යාත තීර්ථය කරා නො එළඹ සැක සහිත වූයේ කම්මහන් ගෙන වඩන්ට නො හැනි වෙයි; තවද- යම් සේ ඒ ගොපලු තොට නො දනී ද, එපරිද්දෙන් මේ මහණ ද දහම්තොට නො දනී; නො දන්නේ අවිෂයෙහි පැන පුළුවුස්සී, ආනිධම්මිකයකු කරා එළඹ සැප නො කැප විචාරයි, චිත්තඛරයකු කරා එළඹ රූපාරූප පරිච්ඡේදය විචාරයි, ඔවුහු අවිෂයෙහි විචාරන ලද්දහු කියන්ට නො හැකි වෙති; හේ තමා සැක සහිත වූයේ කම්මහන් ගෙන වඩන්ට නො හැකි වෙයි; —පෙ— පරිබාහිර වූයේ වේ.

න පිතං ජානාති= යම් සේ ඒ ගොපලු පානය කළ නො කළහු නො දනී ද, එ පරිද්දෙන් (පෙල අටුවා) දහම් නිසා උපන් ප්‍රමෝද්‍යය නො දනී, නො ලබයි, ශ්‍රවණමය පුණ්‍යක්‍රියාවස්තුව නිසා අනුසස් නො ලබයි; ධර්මශ්‍රවණ ස්ථානයට ගොස් සකස් වැ නො අසයි, හුන්නේ නිදයි, කථා කෙරෙයි, අන්‍යවිහිතක වෙයි; හේ සකස් කොට දහම් නො අසන්නේ කම්මහන් ගෙන වඩන්ට නො හැකි වෙයි; —පෙ— පරිබාහිර වූයේ වේ.

න චිත්තං ජානාති= හේ ගොපලු මහ නො මහ මෙන් මේ ලෞකිකයැ, මේ ලොකොත්තර යැයි අරිඅවබෝධ තතු සේ නො දනී; නො දන්නේ ලෞකික ධර්මයෙහි පිවිස ලොකොත්තර ධර්මය උපදවන්ට නො හැකි වෙයි; —පෙ— පරිබාහිර වූයේ වේ.

න ඉන්ද්‍රියසංවරකුසලෝ හොති= හේ ගොපලු පඤ්චාභ- සත්තාභවාර යන් මෙන් සතර සතිපට්ඨානයන් මොවුහු ලෞකිකයෝ යැ, මොවුහු ලොකොත්තරයෝ යැයි තතු සේ නො දනී; නො දන්නේ සියුම් තැන්හි තමාගේ නුවණ හසුරුවා ලෞකික සතිපට්ඨානයන්හි පිවිස ලොකොත්තර (මාර්ගය) උපදවන්ට නො හැකි වෙයි; —පෙ— පරිබාහිර වූයේ වේ.

අනවසෙසදෙසී ච හොති= පිළිගැනීමෙහි පමණ නො දන්නේ අනවශේෂ කොට දේශනේයි; යලි මොහුගේ නිදෙසවාරයෙහි **අභිහඤ්ඤ පවාරෙනති**= සම්පයට එලවා පවරත්; මෙහි අභිහාරයෝ (= පැවරීම්) දෙදෙනෙක් වෙති; වාචාභිහාරය ද පච්චයාභිහාරය දැයි කියායි

පැවරීම. "වාචාභිහාර" නම්: මනුෂ්‍යයෝ භික්ෂුව සම්පයට ගොස් වහන්ස! යමකින් ප්‍රයෝජන ඇත්තේ ද එය කියනු මැනවැයි පවරති; "පච්චයාභිහාර" නම්: වස්ත්‍රාදිය හෝ තෙල්-පැණි ආදිය හෝ ගෙන භික්ෂුව සම්පයට ගොස් වහන්ස! යම් පමණකින් ප්‍රයෝජන නම් එ පමණ ගනු මැනවැයි කියති; **තත්‍ර භික්ඛු මත්තඤ්ඤූ න හොති**= මහණ ඒ ප්‍රත්‍යයන්හි පමණ නො දනී; **"දුක්ඛස්ස වූපසමෝ වෙදිතබ්බෝ අයඤ්ච ධම්මස්ස වූපසමෝ වෙදිතබ්බෝ අත්තනෝ ඨාමෝ වෙදිතබ්බෝ,"** යි රථ විනීතයෙහි වදළ ක්‍රමයෙන් ප්‍රමාණයෙන් යුක්ත ව නො ගෙන යමක් ගෙන එත් ද, ඒ සියල්ල ගනී යන අර්ථයි. මනුෂ්‍යයෝ විපිළිසර වූවාහු යලි එලවා නො පවරත්. හේ ප්‍රත්‍යයෙන් කලාතනවන්නේ තමටහන් ගෙන වඩන්ට නො හැකි වෙයි; —පෙ— පරිබාහිර වූයේ වේ.

නෙ න අනිරෙකපූජාය පූජෙනා හොති= ඒ ගොපලු මහාවෘෂභ යන් මෙන් සථවිරභික්ෂූන් හමුවෙහි හා නො හමුවෙහි ද මෛත්‍රීකාර්ය කර්මාදි වූ මේ අතිරේක පූජාවෙන් නො පුදයි; එහෙයින් සථවිරභික්ෂූහු මොවුහු අප කෙරෙහි ගරුචිත්තීකාරය නො කෙරෙති, යි නවකභික්ෂූන්ට විවිධ සඞ්ග්‍රහයෙන් සඞ්ග්‍රහ නො කෙරෙති; ධර්මසඞ්ග්‍රහයෙන් නො මැ සඞ්ග්‍රහ කෙරෙති; චීවරයෙන් හෝ පාත්‍රයෙන් හෝ පාත්‍රයට ලද දෙය කින් හෝ වාසස්ථානයෙන් හෝ ආමිෂසඞ්ග්‍රහයෙන් සඞ්ග්‍රහ නො කෙරෙත්. විඩාවෙන කල්හි මැලවෙන කල්හි දූ නො පිළිජගිති; පෙළ හෝ අට්ඨවග්ග හෝ ධර්මකථිකඛන්ධයක් හෝ ගුණග්‍රන්ථයක් හෝ නො භික්ම වත්. නවකයෝ තෙරුන් සම්පයෙන් සත්කාරයෙන් මේ දෙ සඞ්ග්‍රහ යන් නො ලබන්නාහු මේ ශාසනයෙහි පිහිටා සිටින්ට නො හැකි වෙති; යම් සේ ඒ ගොපල්ලාගේ ගවසමූහය නො වැඩේ ද, එ පරිද්දෙන් ශීලා දියෙන් නො වැඩෙති; යලි යම් සේ ඒ ගොපලු පස් ගෝරසයෙන් (බැහැර වේ ද,) එ පරිද්දෙන් පඤ්චධර්මසකඛයෙන් පරිබාහිර වූවාහු වෙත්. ශුක්ලපක්ෂය කෘෂ්ණ (= අකුශල) පක්ෂයෙහි කියන ලද්දට විප ක්‍රීසවශයෙන් යොදූ දතයුත්තේයි.

මහාගොපාලක සූත්‍ර වර්ණනා නිමි. (3)

චූලගොපාලක සූත්‍රවර්ණනා.

———:o:———

එවමේමසුතං යි චූලගොපාලක සූත්‍ර යයි. එහි **උක්කාවේලායං**= එසේ නම් ඇති නගරයෙහි; මේ අසනු ලැබේ: ඒ නුවර නිර්මිත කරන කල්හි ගඞ්ගාස්‍රොතයින් මත්ස්‍යයෙක් ගොඩට පැමිණි යේ ය, මනුෂ්‍යයෝ රෙදි තෙල්සෑලෙහි ලා තෙමා ගිනි හුල් කොට මත්ස්‍යයා ගත්තාහුය, නුවර නිම් කල්හි එයට නම් කරන්නාහු "අප විසින් නුවරබිම් ගත් දිනයෙහි රෙදිගිනි හුල් වලින් මසෙකු ගන්නා ලද්දේය" යි **උක්කාවේලා** යි ම එ නුවරට නම් කළාහුයි.

උක්කාවේලානුවර.

භික්ඛූ ආමන්තෙසි= යම් තැනක හුන්නහුට සියලු ගඞ්ගාව ප්‍රකට ව පැනේ ද, එබඳු වූ වැලි උත්සන්න වූ ගංඉවුරෙහි සවස් කාලයෙහි මහා භික්ෂුසඞ්ඝයා විසින් පිරිවරන ලදුව වැඩහිඳ හාත්පසින් පිරුණු ගලා බසින මහාගඞ්ගාව බලමින් මේ ගඞ්ගාව නිසා පෙර වෘඩිය පිළිබඳ පර තෙරට පැමිණි කිසිවෙක් ඇත් දෝ හෝයි ආවර්ජිතා කොට පෙර එක් බාල ගොපල්ලකු නිසා නොයෙක් දහස් ගණන් වූ ගවසමූහයෙක් මේ ගඞ්ගාවෙහි ආවර්තයෙහි වැටී මුහුදට ම පිවිසියේ ය; යළි අනිත් පණ්ඩිත ගොපල්ලකු නිසා නොයෙක් දහස්ගණන් ඇති ගවසමූහයකට සුව වී ය, අහිංසිය වූ ය, නිරොගබැව් වී යැයි දුටු සේක. දැක මේ කරුණ නිසා භික්ෂූන්ට දහම් දෙසන්නෙමියි සිතා භික්ෂූන් ඇමතූ සේක.

මාගඩෙකා= මිගදරට වැසි; **දූපඝඤ්ඤජාතිකා**= නුවණ නැති පියවි ඇත්තේ, දඬි වූයේ මහද්ජඩ වූයේ; **අසමපෙක්ඛිකා**= නො සලකා, නො විමසා; **පතාරෙසි**= එතර කරවන්ට පවන් ගත; **උත්තරං තීරං සුවිදෙහානං**= ගඞ්ගාවෙන් මෙතෙර මිගදරට ය, එතෙර විදෙහ රට ය; ගවයන් මගදරවින් විදෙහරටට පමුණුවා රක්නෙමි,යි උතුරු තෙරට තරණය කරවන්ට පවන් ගත. ඒ සඳහා වදාරන ලදී: **උත්තරං තීරං සුවිදෙහානං** යනු. **ආමණ්ඩලිඝං කරිත්වා**= මඬුලු කොට; **අනය ව්‍යසනං ආපජ්ජිංසු**= නො වැඩිම් සඞ්ඛ්‍යාත වනසට පැමිණියාහුය; මහාසමුද්‍රයට ම පිවිසියාහුයි. ඒ එසේ මැයි: ගවයන් බස්වන්නාවූ ඒ ගොපල්ලා විසින් ගඞ්ගාවෙහි මෙතෙර සම තොට ද විෂම තොට ද බැලිය යුතු විය, ගහමැද ගවයන්ගේ විඩා හරින තැන් සඳහා දෙ තුන් වැලිතලයෙක් සැලකිය යුතු වූවාහුය; එ සේම පරතෙර මේ තොටින් බැස්සාහු මේ තොට ගන්නාහුය, මේ තොටින් බැස්සාහු මේ තොට ගන්නාහුය,යි තුන් සතර තොවක් (සැලකිය යුතු වූවාහුය.) එහෙත් මේ බාලගොපාල තෙම

බාලගොපල්ලෙක්.

මෙතෙර ගවයන් බසින තොට සම හෝ විෂම හෝ දූසි නො බලා ම, ගඟමැද ගවයන්ගේ විඩා හැරීම පිණිස දෙ තුන් වැලිතලයකු දු නො සලකා ම, පරතෙර සතර පස් ගොඩ බසින තොටකු දු නො බලා ම, නො තොවින් ම ගවයන් බැස්වී; එකල ඔහුගේ මහාවෘෂභ තෙම වෙග යෙන් යුත් බැවිනු ත් ශක්තියෙන් යුත් බැවිනු ත් සරසට ගඟෙහි සැඩ පහර සිඳ පරතෙරට පැමිණ සිදුණු ඉවුර ද කටුලැහැබ්ඝනය ද දූන, මේ නො පිවිසිය හැකි තැනෙකැයි දූන කුරග තැබීමට අවකාසයකු දු නො ලැබ පෙරලා නැවැත්ත; ගවයෝ "මහාවෘෂභ තෙම නැවැත්තේ යැ, ඇපි දු නවත්නෙමු" යි නැවැත්තාහු යැ; මහත් ගවසමූහය නැවති තැන්හි ජලය බිදී ගඟමැද ආවතී (= සුළි) ය නැංවී යැ; ගවසමූහය ආවතීයෙහි පිවිස සමුදුරට ම පැමිණියේ යැ; එක ද ගවලොමයෙක් අරොග වූයේ නම් නො වී. එයින් වදුළහ; **තෙසඤ්ච අනඝබ්‍යසනං ආපජ්ජිංසු** යනු.

අකුසලා ඉමිස්‍ස ලොකස්‍ස= මේ ලෙව්හි සකඬධාත්වායතන විෂයෙහි අපණ්ඩිත වූවාහු, අදක්ෂ වූවාහු; පරලෙව්හි දු මේ ම නයයි. **මාර ඛෙය්‍යං** යි ත්‍රෛභූමක ධර්මයෝ කියනු ලැබේ; **අමාරඛෙය්‍යං**= නව ලොකොත්තරධර්මයෝ; **අච්චුඛෙය්‍ය** නමුදු ත්‍රෛභූමකධර්මයෝ මැයි; **අමච්චුඛෙය්‍යං**= නව ලොකොත්තර ධර්මයෝ; **එහි** අපණ්ඩිත වූවාහු, අදක්ෂවූවාහු යළි වවනාර්ථ වශයෙන් මාරයාගේ ඛෙය්‍යය **මාරඛෙය්‍ය** නම්; **ඛෙය්‍යං** යනු ස්ථාන යැ, වස්තු යැ, නිවාස යැ, ගොචර යැ; "මච්චු ඛෙය්‍ය" යෙහි දු මේ ම නයයි **නෙසං**= ඒ මෙ බදු මහණබමුණන්ගේ; මෙයින් ශාස්තෘහු සදෙන දක්වන ලද්දාහුයයි දතයුතු.

මේසේ කෘෂ්ණපක්ෂය නිමවා ශුක්ලපක්ෂය දක්වනසේක් **භූතපුබ්බං භික්ඛවෙ** යනාදිය වදුළහ— එහි **බලවහාවෝ**- දැමුණු ගොනුන් හා දෙනුන් ද; **දම්මහාවෝ**- දැමිය යුතු ගොනුන් හා නො වැදූ දෙනුන් ද; **වච්ඡතරෙ**= වසු බැව් ඉක්මවා සිටි බලවත් වස්සන්; **වච්ඡෙ**= දෙනුන් කරා පැමිණෙන තරුණ (= බාල) වස්සන්; **කිසබලෙ**= මද මස් - ලේ ඇති මද ශක්ති ඇතියන්; **තාවදෙව ජාතෙ**= ඒ දවස උපන්නේ; **මාතු ගොරවෙන වුඤහමානෙ**= මවු තොමෝ පෙරටු පෙරටු වැ "හුං හුං" යි ගවරාවය (= ගවයන්ගේ හඬ) කොට සලකුණු දෙමින් හෘද යෙන් ජලය සිඳිමින් යෙහි, වසු තෙම ඒ ගොරවසංඥාවෙන් එම දෙනගේ ලෙන් සිඳි දියෙන් යන්නේ- "**මාතු ගොරවෙන වුඤහමානෙ**" යි කියනු ලැබේ.

මාරස්‍ස සොතං ඡෙත්වා= රහත්මගින් මාරයාගේ තෘෂ්ණාස්‍රොතස සිඳ; **පාරං ගතා**- මහාවෘෂභයන් නදීපාරයට මෙන් සසර පරතෙර වූ නිවනට ගියාහු; **පාරං අගම්සු**= මහාවෘෂභයන් පරතෙරව ගිය කෙණෙහි ගඬගාස්‍රොතස තුන් නොවසක් ඉක්මවා සිටියාහු මහාවෘෂභ

යන් පරතෙර පැමිණියවුන් දැක ඔවුන් ගිය මඟ ගෙන පරතෙරට ගියා හුය; **පාරං ගමිස්සන්ති**= සිවුමඟින් නැසිය යුතු කෙලෙසුන් අතුරෙන් තුන් කොටසක් ගෙවා සිටියාහු මේවිට රහත්මඟින් අවශෙෂ වූ තෘෂ්ණා ස්‍රොතස සිඳ දැමුණු ගවයන් නදීපාරයට මෙන් සංසාරපාරය වූ නිවනට යන්නාහුයි. මේ නයින් සියලු වාරයන්හි අරුත් දත යුතු.

ධම්මානුසාරිනෝ සඛානුසාරිනෝ යන මොහු දෙදෙන ප්‍රථම්මාගී යෙන් යුක්ත වූවාහු යැ; **ජානන්තා**= සියලු ධර්මයන් දන්නාවූ බුදුහු විසින් **සුපඤ්ඤාසිතෝ**= මොනොවට වදාරන ලද; **විවටං**= විවෘත කරන ලද; **අමතමාරං**= ආර්‍යමාගීය; **නිබ්බානපත්තියා**= නිවනට පැමිණීම පිණිස **විනළීකතං**= පහවූ මානනාල ඇති කරන ලද; **කෙමංපත්ථේථ**= කැතතු කම්‍යතාඡන්දයෙන් අගීතත්වය ප්‍රාර්ථනා කරවු; කරනු කැමැත්තාහු නිපද වනු කැමැත්තාහු වවු යන අර්ථයි. "පත්තත්ථේ" යි ද පාඨ යැ; මේ බදු ශාස්තෘවරයකු ලැබ තෙපි පැමිණියාහු ම නම් වෙති යන අර්ථයි. සෙස්ස සියලු තැන්හි ප්‍රකට මැයි. භාග්‍යවතුන් වහන්සේ එතැනි අනුසඤ්ඤි තුබූ සෙයින් ම දෙශනාව නිමවූ සේකි.

චූළගොපාලක සූත්‍ර වර්ණනා නිමි. (4)

චූලසච්චක සූත්‍ර වර්ණනා.

——:=:——

එවමේමසුතං යි චූලසච්චක සූත්‍ර යයි. **එහි මහාවනෙ කූටාගාර සාලායං=** මහාවන නම්: සවයඤ්ජාත වූ රෙපණය නො කරන ලද මහත් වනයෙකි; තවද- කිඹුල්වත අවට මහාවනය හිම වත සමග එකට බැඳුනේ පරිවෙජද රහිත වැ මහාසමුද්‍රය ඟැටී සිටියේ යැ; මෙය එබඳු නො වෙයි; පරිවෙජද සහිතවූ මහත් වනය නුයි "මහාවන" වී. කූටාගාරශාලාව වූ කලි මහාවනය ඇසුරු කොට කළ අරමෙහි කුළුගෙයක් ඇතුලු කොට හංසවට්ටක ඡද නයෙන් (= හංසමණ්ඩලාකාර වහලින්) කරන ලද සජ්ඣාකාරයෙන් සමෘඩ වූ භාග්‍යවත් බුදුන්ගේ "ගඳකිළිය" යි දතයුතු.

මහාවනය.

සච්චකො නිගණ්ඨපුත්තො= මේ අසනු ලැබේ: පෙර එක් නිගණ්ඨයෙක් හා නිගණ්ඨියක් ද පන්සිය පන්සිය වාද උගෙන වාදරෙපණය කරන්නෙමු යි දඹදිව හැසිරෙන්නාහු විසාලානුවරව පැමිණියාහුය; ලිච්ඡවිරජදරුවෝ (ඔවුන්) දැක තෝ කවරෙක් ද? තී කවරක් දෑ? යි විචාළාහුය; නුවට "මම වාද රෙපණය කරන්නෙමි යි දඹදිව හැසිරෙමි" යි කීය. නුවට්ට ද එසේ ම කිව ලිච්ඡවීහු මෙහි දී මැ ඔවුනොවුන් වාදරෙපණය කරවු යයි කිහ; නුවට්ට තමා උගත් වාද පන්සිය විචාළා; නිවට (පිළිතුර) කීය; නුවට විසින් පුළුවුන් කල්හි ද නුවට්ට (පිළිතුරු) කීවා ම යැ; එකක්හට ද ජයෙක් නො වීයැ; පරාජයෙක් නො වී; දෙදෙන සමසමයෝ ම වූවාහුය. ලිච්ඡවීහු "තෙපි දෙදෙන ම සමසමයෝ යැ, ඇවිද කුමක් කරන්නාහු ද? මෙහි ම වසවු" යයි ගෙයක් දී වැටුප් තැබූහු. ඔවුන්ගේ සංවාසයට පැමිණ දූහු සතර දෙනෙක් උපන්හ; එකක් සච්චා නමු, එකක් ලොලා නමු, එකක් පඩාවාරා නමු, එකක් සිවාවතිකා නමු; ඔවුහු ද පණ්ඩිත වූවාහුය; ඔවුපියන් විසින් උගන්නා ලද පන්සියක් පන්සියක් වාදයන් උගත්හ; විය පැමිණි ඔවුන්ව මවුපිය දෙදෙන කීහු; "දූරියෙනී! අපගේ කුලයෙහි දූරියෝ නම් හිරණ්‍ය සවණ්ණාදිය දී කුලගෙට යැවූ විරූ නම් නැති, යළි ගිහිගෙ වැසි යමෙක් ඔවුන්ගේ වාදය මඩනට හැකි වී නම්, ඔහුට පාදපරිවාරිකා වෙති; පැවිදි වූ යමෙක් මඩනට හැකි වී නම්, ඔහු වෙත පැවිදි වෙති; තෙපි කුමක් කරවු දෑ?" යි; "ඇපි දූ එපරිද්දෙන් ම කරන්නෙමු" යි සතර දෙන මැ පරිව්‍රාජකවෙස් ගෙන මේ දඹදිව නම් දඹයෙන් පැනේ යයි දඹඅත්තක් ගෙන වාරිකාවෙහි නික්මුනාහුය; යම් ගමකට පැමිණෙත් ද, එ ගම්දෙර පස්රැසක හෝ වැලිරැසක හෝ දඹඅත්ත තබා "යමෙක් වාදරෙපණය කරන්ට හැකි වේ නම්, හේ මෙය මඩිවා" යි කියා ගමට පිවිසෙති; මෙසේ ගම්න් ගම යන්නාහු සැවැත්නුවරට

සච්චක නිගණ්ඨපුත්ත.

පැමිණ එසේ ම ගම්දෙර ජම්බුධවජය තබා පැමිණි මිනිසුන්ට දන්වා ඇතුළු නුවරට පිවිසියාහුය; එ කල භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර ඇසුරු කොට ජේතවනයෙහි වාසය කරන සේක; ඉක්බිති ආයුෂ්මත් ශාරිපුත්‍රයන් වහන්සේ ගිලනුන් විචාරමින් නො හැමදි තැන් හමදමින් තමිහට කවයුතු මහත් බැවින් අන්‍ය භික්ෂූන්ට වඩා ඉතා දහවල් වැ ගමට පිඬු පිණිස පිවිසෙන සේක් ගම්දෙර දදය දැක මේ කිමෙක් දැ? යි දරුවන් විචාළහ; ඔවුහු එ කරුණ කිහු; එ සේ වී නම් මඬිවු යයි; නො හැක්කෙමු සවාමිනි! භය වෙමුයි; භය නො වවු, කවරකු විසින් අපගේ දදය මඬවා පියන ලද දැ? යි කී කල්හි "බුදුසවු සැරියුත්තෙරුන් විසින් මඬවා පියන ලදුයි ද, වාද කවැටි වූහු නම් ජේතවනයෙහි තෙරුන් සමීපයට යවු යයි ද, කියන්නාහු" යයි; ඔවුහු තෙරුන්ගේ වචනය අසා දදය මැඬ පිහ; තෙරුන් වහන්සේ පිඬු පිණිස හැසිර විහාරයට ගියහ. පරිව්‍රාජිකාවෝ ද ගමින් නික්මැ අපගේ දදය කවරකු විසින් මඬවා පියන ලද දැ? යි විචාළාහුය; දරුවෝ ඒ කාරණය දැන්වූහු. යළි පරිව්‍රාජිකාවෝ ගමට පිවිස එක් එක් විපිය ගෙන "ශාරිපුත්‍ර නම් බුදුසවු කෙනෙක් අප හා වාද කරන්නේ ල, අසනු කැමැත්තාහු නික් මෙවු" යයි දැන්වූහ; මහාජන තෙම නික්මුණ; ඒ මහාජනයා සමග පරි ව්‍රාජිකාවෝ දෙවුරමට ගියාහුය; තෙරුන් වහන්සේ අප වසන තැන්හි මාගමකගේ ඊම නම් අපහසුය යි වෙහෙර මැද වැඩ හුන්හ. පරිව්‍රාජිකාවෝ ගොස් තෙරුන් පුළුවුත්හ; "ඔබ විසින් අපගේ දදය මඬවා පියන ලද දැ?" යි; එසේය, මා විසින් මඬවාපියන ලදු යි; ඇපි ඔබ හා වාද කරන්නෙමු යි; මැනව කරවු, "කවරෙකුගේ ප්‍රශ්නය කවරෙකුගේ විසඳීම වන්නේ දැ" යි; ප්‍රශ්නය නම් අපට පැමිණියේය යි; තෙපි වූ කලි මාගම්හු ය, පළමු විචාරවු යයි; ඔහු සතර දෙන ම සතර දිග සිට මවුපිණින් කෙරෙහි උගත් වාද දහස විචාළාහුය; තෙරුන් වහන්සේ කඩුවකින් කුමුදු තලයක් සිඳින්නක්හු සෙයින් පුළුවුත් පුළුවුත් (පැනය) අවුල් නැති කොට ගැට නැති කොට වදාළහ; වදාරා යළි විචා රවු යයි කීහ. වහන්ස! ඇපි මෙතෙක් ම දනිමු යයි; තෙරුන් වහන්සේ කීහ; "තොප විසින් වාද දහසක් විචාරන ලද මා විසින් විසඳන ලද, මම වූ කලි එක ම ප්‍රශ්නයක් විචාරන්නෙමි, එය තෙපි කියවු, යයි; ඔවුහු තෙරුන්ගේ විෂය දැක "විචාළ මැනව වහන්ස! විසඳන්නෙමු" යි කියන්ට නො හැකි වූහ; එහෙත් "වහන්ස! දන්නමෝ නම් ප්‍රකාශ කරන්නෙමු" යි කිහු; තෙරුන් වහන්සේ "මේ කුලපුත්‍රයන් පැවිදි කරවා පළමු භික්මවියයුතු ප්‍රශ්නය" යි වදාරා "එක නාම කිං" යි විචාළහ ඔවුහු නො මැ අන්තය දුටුවහු, කෙළවර නො දුටුවහු; තෙරුන් වහන්සේ කියවු යයි කීහ; වහන්ස! නො දක්නෙමු යි; තොප විසින් වාද දහසක් විචාරන ලද, මා විසින් විසඳන ලද තෙපි එක ප්‍රශ්නයකු දු විසඳන්ට නො හැක්කහුය, එසේ කල්හි කවරෙකුට ජය ද? කවරෙකුට පරාජය දැ? යි; වහන්ස! ඔබට ජය ය, අපට පරාජය යැයි; දැන් කුමක් කරන්

නහු දැ? යි; ඔවුහු මවුපියන් විසින් කී වචනය දන්වා ඔබ වෙත පැවිදි වන්නෙමුයි කීහු; තෙපි මාගම්හු නම්, අප වෙත පැවිදි වන්ව නොව නේය; යළි අපගේ හසුන් ගෙන මෙහෙණවරට ගොස් පැවිදි වවු යයි; ඔවුහු මැනවැයි තෙරුන්ගේ හසුන් ගෙන භික්ෂුණීසඞ්ඝයා සමීපයට ගොස් පැවිදි වූහ; යලි දු- පැවිදි වූවාහු අප්‍රමත්ත වූවාහු කෙලෙසුන් තවන වීර්‍ය්‍ය ඇතිව නො බෝකලකින් ම රහත්බවට පැමිණියාහුයි. මේ සවවක තෙම ඔවුන් සතර දෙනාගේ ම කනිටුබෑයා ය; ඔවුන් සතර දෙනාට ම වඩා ඉතා අධික වූ නුවණැත්තේ ය; ඔවුපියන් කෙරෙන් වාද දහසක් ද එයින් බොහෝ වූ බාහිරසමය ද ඉගෙන කියා තැනක නො ගොස් රජදරුවන්ට ශිල්ප උගන්වමින් ඒ විශාලා නුවර ම වෙසෙයි; ප්‍රඥාවෙන් ඉතා පිරුණු බැවින් මාගේ කුස බිඳේ යයි බිය වූයේ යපටින් කුස වටකොට හැසිරේ. මොහු සඳහා කියන ලද— **සවවකො නිඝණ්ඨපුත්තො** යනු.

භස්සපපවාදිකො= "භස්ස" යි කථාමාර්ගය කියනු ලැබෙයි, එය ප්‍රකාශ කෙරෙයි, කියා නුයි "භස්සපපවාදිකා" නම්; **පණ්ඩිතවාදෙ**= මම "පණ්ඩිත වෙමි" යි මේසේ වාද ඇත්තේ; **සාධු සම්මතො බහුජනස්ස**= නක්ෂත්‍රවාරය හෙතුකොට ගෙන ගමක් ගමක් කියා ද, එය බොහෝ සෙයින් එසේ ම වෙයි, එහෙයින් මේ තෙම සුන්දර ය, සිත්කලු ය, හද්‍ර යැයි මෙසේ මහාජනයා විසින් සම්මත ය; **වාදෙන වාදං සමාරබො**= කථාමාර්ගයෙන් දෙසාරොපණය කරනලද්දේ; **ආයස්මා අස්සජී**= සැරියුත් තෙරුන් ඇදුරු අස්සජි තෙරුන් වහන්සේ; **ජඞ්ඝාවිහාරං අනුවඞ්කමමාණො**= ඒ ඒ ලිච්ඡවිරජගෙයින් ඒ ඒ රජගෙව යෑම සඳහා අනුක්‍රමයෙන් ඇවිදුනේ; **කෙනායස්මා අස්සජී තෙනු**

සවවක අස්සජිතෙරුන් කරා එළඹීම.

පයඞ්කම්= කුමක් හෙයින් එලඹි ද යත්? සමය දැන ගනු සඳහා ය; ඔහුට මේ අදහස වී ය: 'මම මහණ ගොයුම් හට වාදාරොපණය කරන්නෙමියි, ඇවිදිමි එතකුදු වත් ඔහුගේ සමය නො දනිමියි වාදාරොපණය නො කෙරෙම්, ඒ එසේ මැය— මෙරමා සමය දැන ආරොපණය කළ වාදය මොනොවට ආරොපණය කරන ලද නම් වෙයි; මේ වූ කලි මහණ ගොයුම්හුගේ සවු අස්සජි තෙර පැනෙයි; (හේ) තමාගේ ශාසනය සමයෙහි නිපුණ ය; මම මොහු පිළිවිස කථා පිහිටුවා මහණගොයුම්හට වාදාරොපණ කරන්නෙමි" යි එ කරුණෙන් එලඹි.

විනෙති= කී සෙයින් හික්මවයි? කී සෙයින් උගන්වා දැ? යි විචාරයි; තෙරුන් වහන්සේ වූ කලි යම් හෙයකින් "දුක" යැයි කී කල දෙස් දැක්වීම අවකාස වෙද; සැබව- මාගීඵලයෝ ද පරියායයෙන් දුකැයි ආවාහුය; මේ තෙමේත් දුකැයි කී කල- තෙරුන් පුළුවුස්නේය, භවත් අස්සජි! කුමක් සඳහා තෙපි පැවිදි වූහු දැ? යි; අනතුරුව මහපල සඳහා යැයි කී කල- භවත් අස්සජි! මේ තොපගේ ඍස්තෙක් නම් නො වෙයි,

මේ මහාදම්ගෙඩියෙක් නම් වෙයි, මේ ඔසුපත් තිරයෙක් නම් වෙයි, තොපට සුවයෙහි ආශා නම් නැති, වැර කොට කොට දුක් ම වඩමින් ඇවිදින්නහු යයි දෙමාරොපණය කරන්නේ ද; එහෙයින් පරවාදී හට පරියාය කථා කියන්ට නො වටී; යම් සේ මේ තෙම පිහිට නො ලබා ද, එ සෙයින් මොහුට නිප්පරියාය කොට කියන්නෙමි" යි සිතා රූප හිඤ්ඤවෙ! අනිච්චං යි අනිත්‍යානාත්ම වශයෙන් ම මේ කථාව කීහු. දුස්සුතං= අසන්ව අයුතු වූවක්; සන්ථාගාරෙ= රාජකුලයන්ගේ අවියෙන් අනුශාසනා කරන සන්ථාගාරශාලාවෙහි; යෙන හං ලිච්ඡවී තෙනුපසඞ්කමි= ඔහුට මේ බදු සිතක් වී ය;- "මම පෙර ලබන්‍ය නො දන්නා බැවින් ශ්‍රමණ ගෞතමයන හට වාදාරොපණය නො කෙළෙමි; එහෙත් මේවිට ඔහුගේ මහාශ්‍රාවකයා විසින් කියන ලද ලබන්‍ය දනිමි, වැළි දු මේ මා අතැවැසි පන්සියයක් ලිච්ඡවීහු රැස් වූවාහු ය; මොවුන් සමඟ ගොස් මහණගොයුම් හට වාදාරොපණය කරන්නෙමියි; එහෙයින් එළඹියේය; ඤාතඤ්ඤතරෙන= ප්‍රසිඛ වූ වෙසෙසින් ප්‍රසිඛ වූ පඤ්චවග තෙරුන් අතුරෙන් අන්‍යතර වූ, පතිඞ්කතං= යම් සේ ඔහු විසින් පිහිටන ලද ද, ඉදින් එපරිද්දෙන් පිහිටන්නේ නම්; වැළි අනිසක් ම කියන්නේ නම් එහි මා විසින් කුමක් කරන්ට හැක්කේ දැයි පිට පෙරළමින් කිය; ආකඩ්ඪෙය්‍ය= තමා හමුවට අදින්නේ ද; පරිකඩ්ඪෙය්‍ය= ඉදිරි යෙන් පිටිපසට නමන්නේ ද; සම්පරිකඩ්ඪෙය්‍ය= කාලෙක ආකර්ෂණ කරන්නේ ද; කලෙක පරිකර්ෂණ කරන්නේ ද; සොණ්ඩිකාකිලඤ්ජං= සුරාහලෙහි (රා පෙරන) මට්ටලු කොස්ස; සොණ්ඩිකාවුත්තෙතා= සුරාධූර්ත යෙක්; වාලං කණ්ණෙ ගහෙත්වා= සුරා පෙරන ථවිකාව (= පෙරහන) සෝදනු කැමැත්තේ කසට (= රොඩු) පිඹ හරිනු පිණිස දෙ කොන ගෙන; ඔධුනෙය්‍ය= ඔවිහුරු කොට පිඹින්නේ ද; නිධුනෙය්‍ය= උඩුහුරු කොට පිඹින්නේ ද; නිවෙජෙය්‍ය= නැවත නැවත පොළන්නේ ද; සණ්ඩොවිකං නාම යන මෙහි මනුෂ්‍යයෝ සණසළු කරනු පිණිස සණවැහැරි ගෙන මිටි මිටි බැඳ දියෙහි බහාලති; සණදෙවුන්කෙළි. ඒ සණ (මිටි) තුන්වන දවසැ මතා වැ කුණු වෙති; ඉක්බිති මනුෂ්‍යයෝ ඇඹුල් කැඳ රා ආදිය ගෙන එහි ගොස් සණමිටි ගෙන දකුණුපස වම්පස හමුයෙහි දැයි (මෙසේ තුබූ) තුන් පුවරු අතුරෙන් වරක් දකුණුපස පුවරුයෙහි වරක් වමත්පස පුවරුයෙහි වරක් හමුයෙහි වූ පුවරුයෙහි ගසමින් බුදිමින් බොමින් කමින් සෝදති, මහත් ක්‍රීඩා වෙයි; රජුගේ ඇත් ඒ ක්‍රීඩාව දැක ගැඹුරු දියට වැද සොඬින් දිය ගෙන වරක් කුඹුයෙහි වරක් පිට වරක් දෙ පස වරක් කලවේඅතරැ ඕමින් ක්‍රීඩා කෙළේ; ඒ ඇසුරු කොට ඒ කෙළිවෙසෙහ "සණ්ඩොවික" නමැයි කියනු ලැබේ. ඒ සඳහා කියන ලදි:- "සණ්ඩොවිකං නාම කීළාජාතං කීළති" යනු. කිංසොහමානො සවවකො නිඛණඩ සුතෙතා භගවතො වාදං ආරොපෙස්සති= කවරක්හු වන්නේ කිම? යස්ස වන්නේ නොහොත් ශාස්තෘවන්නේ හෝ බුහම වන්නේ භාග්‍යවත්

හට වාදරොපණය කරන්නේ ද, පියවි මිනිසක්හු විසින් භාග්‍යවත් හට වාදරොපණය කරන්ට නො මැ හැක්ක යන මේ මෙහි අදහස්; **නෙන බො පන සමයෙන**= යම් කලෙක සවන ආරාමයට පිවිසියේ ද, එකලැ; **යළි කවර කලෙක පිවිසි ද යත්?** මහාමධ්‍යාහ්න කාලයෙහි (= හිරි දිදුනෙහි) යැ; වැළි කුමක් හෙයින් එ කලැ සක්මන් කෙරෙත් ද යත්? පිණි බොදුන් හෙතුවින් වූ නිදිමත නසනු පිණිස යැ; නොහොත් ඔවුහු දහවල් කරන වැර ඇතියෝ යැ; සැබෑව- එබදු වූ පසුබතැ සක්මන් කොට නා ශරීරය සෘතු ගන්වා හිද මහණදම් කරන්නවුන්ගේ සිත එකඟ වේ. **යෙන තෙ භික්ඛූ**= හේ වනාහි "මහණගොයුම් කොහි යැ?" යි පිරිවෙනින් පිරිවෙනට ගොස් පිළිවිස පිවිසෙන්නෙමි යි බලන්නේ වෙනෙහි ඇතුන් මෙන් මහසක්මනැ සක්මන් කරන පාංශුකූලික භික්ෂූන් දැක ඔවුන් වෙත ගියේයි. ඒ සඳහා මේ "යෙන තෙ භික්ඛූ" යනාදිය කියන ලදී.

කහං නු බො භො!= කවර ආවාසයක හෝ ලෙණක හෝ මණ්ඩපයක හෝ යැ? යත අවියි. **එසගිවෙසසන! භගවා**= එකල භාග්‍යවත්හු අලුයම් කලැ මහකුළුණුසමවතට සමවැද දසදහසක් සක්වළැ සඟුගත නමැති දැල පතුරුවා බොධනෙය්‍යසත්වයකු බලන සේක් "සෙට සවන නුවරපිත් මහත් ලිච්ඡවිපිරිස් ගෙන මට වාදරොපණය කරනු කැමැති වැ එන්නේය" යි දුටු සේක; එහෙයින් උදැසන ම සිරුරැපිරියම් කොට මහණගණපිරිවර ඇති වැ විසාලානුවර පිඬු පිණිස හැසිර පිණ්ඩපාතයෙන් වැළකුනාහු මහපිරිසට හිදිනුවට සුව ඇති තැනක හිද ගන්නෙමි,යි ගදකිළියට නො පිවිස ම මඟවනයෙහි එක්තරා රුකක් මූල දිවාවිහරණයට වැඩහුන්හ; ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේව වත් දක්වා ආවාහු සවන විසින් පුළුවුස්නා ලද්දාහු දුරැ වැඩහුන් භාග්‍යවතුන් දක්වමින් "එසගිවෙසසන! භගවා" යි කිහු.

මහතියා ලිච්ඡවිපරිසාය සද්ධිං= යට පන්සියක් පමණ ලිච්ඡීන් විසින් පිරිවරන ලදුයි කියන ලද, ඔවුහු මොහුගේ අතැවැසියෝ මැ ය; තවද- විසාලානුවර ඇතුළත "සවන තෙම පන්සියක් පමණ ලිච්ඡවී රජුන් ගෙන වාද කටැවි වූයේ භාග්‍යවතුන් කරා එළඹෙන්නේ ය" යි අසා පණ්ඩිතයන් දෙදෙනාගේ කථාසංලාපය අසන්නෙමු" යි බොහෝ සෙයින් මනුෂ්‍යයෝ නික්මුණාහුය; මෙසේ ඕ පිරිස් තොමෝ නො පිරිසුන් ගණන් ඇත්තී වුව; ඒ සඳහා මේ කියන ලදී. **අඤ්ජලිං පණාමෙසුං**= මොවුහු දෙ පක්ෂයක වූවාහුය:- ඔවුහු මෙසේ සිතූහ; "ඉදින් අපට මිසදිටුවෝ කුමක් හෙයින් තෙපි මහණගොයුම්හු වැඳියහු දැ? යි වොදනා කරන්නාහු නම්, ඔවුනට කිම ඇඳිලි කිරීම් පමණකිනු දු වඳින ලද වේ දැ? යි කියන්නෙමු; ඉදින් අපට සම්දිටුවෝ කුමක් හෙයින් භාග්‍යවත්හු නො වැඳියහු දැ? යි වොදනා කරන්නාහු නම්, කිම හිසින්

සවන බුදුන්කරා පැමිණීම.

බිම පහරනහු විසින් ම වඳන ලද වේ ද? ඇඳිලි කිරීම් මතු වන්දනා නො මැ වේ ද? සි කියන්නෙමු" සි. **නාමගොතතං**= භවත් ගෞතම යෙනි! මම අසවලාගේ පුත් දත්ත නම, මිත්ත නම, මෙහි ආයෙම් වෙම්සි කියන්නාහු නම අස්වති නම්; භවත් ගෞතමයෙනි! මම වාසෙට්ඨ නම, කච්චාන නම, මෙහි ආයෙම් වෙම් සි කියන්නාහු ගොත්‍රය අස්වති නම්; මොහු වනාහි දිළිදු වූ ජීර්ණකුලපුත්‍රයෝ ය, පිරිස්මැද නම්-ගොත් දිශ යෙන් ප්‍රකට වන්නෙමු සි මෙසේ කළාහුය; යමෙක් වනාහි නො බැණ හුන්නාහු ද, ඔහු කෛරාටිකයෝ ද අඹබාලයෝ ද වෙති; ඔවුනතු රෙන් කෛරාටිකයෝ "එක් දෙ කථාසංලාපයක් කරන්නේ විස්වැසි වෙයි, අනතුරු විශ්වාසය ඇති කල්හි එක් දෙ භික්ෂාවක් නො දෙන්ට නො වටනේය" සි එයින් තමා මුදන්නාහු නො බැණ හිඳිති; අඹබාල යෝ අඥන බැවින් ම බහා තුබූ මැටිපිඬු සෙයින් යම් කිසි තැනක නො බැණ හිඳිත්. **කඤ්චිදේව දෙසං**= කිසි අවකාසයක් කිසි කරුණක්; ඉක්බිති ඕහට භාග්‍යවතුන් වහන්සේ ප්‍රශ්නවිචාරමෙහි උත්සාහ උපදවන සේක්- **පුච්ඡ'ගහිවෙසාන!** **යදඤ්ඤඬ්ඩසි** සි වදළහ. එහි මේ අර්ථ යැ:- ඉදින් කැමැත්තෙහි නම් පුළුවුස, මට පැන විසඳීමෙහි බරෙක් නැති; නොහොත් යමක් කැමැත්තෙහි නම් පුළුවුස, සියල්ල තට විසඳන්නෙම් සි පසේබුදු-අගසවු-මහසව්වන් හා අසාධාරණ වූ සර්ව්ඥප්‍රවාරණයෙන් පැවරූහ. සැබව- ඒ (පසේබුදු ආදීහු) "**යදඤ්ඤඬ්ඩසි**" සි නො කියති, අසා දූනගන්නෙමු සි කියත්. "**පුච්ඡාවුසො! යදඤ්ඤඬ්ඩසි**" සි හෝ "**පුච්ඡ මහාරාජ! යදඤ්ඤඬ්ඩසි**" සි හෝ-

163. "**පුච්ඡ වාසව! මං පඤ්හං - යං කිඤ්චි මනසිච්ඡසි,**
තස්ස තස්සෙව පඤ්හස්ස - අහං අන්තං කරොමි තෙ" සි හෝ-

a "**නෙත්ත හි ත්වං හික්ඛු! සඤ්ඤං ආසනෙ නිසිදිත්වා පුච්ඡ යදඤ්ඤඬ්ඩසි**" සි හෝ-

164. "**බාවාරිස්ස ච තුම්හං වා - සබ්බස්සං සබ්බසංසයං**
කතාවකාසා පුච්ඡවෙහා - යං කිඤ්චි මනසිච්ඡථ" සි හෝ-

---

163. **වාසව**= ශක්‍රය!; **යං කිඤ්චි පඤ්හං**= යම්කිසි පැනයක්; **මනසා**= සිතින්; **ඉච්ඡසි**= කැමති වෙහි නම්; **මං**= මා; **පුච්ඡ**= පුළුවුස; **අහං**= මම; **තෙ**= තාගේ; **තස්ස තස්සෙව පඤ්හස්ස**= ඒ ඒ පැනයාගේ ම; **අන්තං කරොමි**= කෙළවර කෙරෙමි.

a මහණ! එසේ වී නම් තෙපි සවකීය ආසනයෙහි හිඳ ඉඳින් රුස්නොසි නම් පුළුවුස; (මට පැන විසඳීමෙහි බරෙක් නැති. නොහොත්) යමක් රුස්නොසි නම් පුළුවුස; (සියල්ල තට විසඳ ලන්නෙමි.)

164. **කතාවකාසා**= (තෙපි මා විසින්) කළ අවකාශ ඇතියෝ වහු; (එහෙයින්) **බාවාරිස්ස ච**= බාවාරි තවුසාගේ හෝ; **තුම්හං වා**= තොපගේ හෝ; **මනසා**= සිතින්; **යං කිඤ්චි**= යම් කිසිවක්; **ඉච්ඡථ**= කැමති වූවහු ද; **සබ්බස්සං**= තොප සියල්ලන්ගේ; **සබ්බසංසයං**= ඒ සියලු සැකය; **පුච්ඡවෙහා**= විචාරවු.

165. "පුච්ඡ මං භගිය පඤ්හං - යං කිඤ්චි මනසිච්ඡසි
තස්ස තස්සේව පඤ්හස්ස - අහං අන්තං කරෝමි තෙ" යි හෝ-

ඒ ඒ යක්ෂ-නරේන්ද්‍ර-දෙව-ශ්‍රමණ-පරිව්‍රාජකයන්ට සම්ඥප්‍රවාරණ යෙන් පවරන සේක. යම් හෙයකින් භාග්‍යවතුන් වහන්සේ බුඩභූමියට පැමිණ මේ සම්ඥප්‍රවාරණයෙන් පවරන්නාහු නම් මෙය ආශ්චර්‍ය්‍ය නොවෙයි; යමෙක් බොධිසත්වභූමියෙහි ප්‍රදේශඥතයෙහි ම සිටියාහු-

166. "කොණ්ඩඤ්ඤ! පඤ්හානි ව්‍යාකරොහි
යාචන්ති නං ඉසයෝ සාධුරූපා
කොණ්ඩඤ්ඤ! එසෝ මනුජේසු ධම්මෝ
යං බුඩමාගච්ඡති එස භාරෝ" යි-

මේසේ ශක්‍රාදීන් සඳහා සෘෂීන් විසින් යාචනා කරන ලද්දේ-

167. "කතාවකාසා පුච්ඡන්තු හොතෙනා!
යං කිඤ්චි පඤ්හං මහාසාහිපත්ථිතං
අහං හි නං නං වෝ ව්‍යාකරිස්සං
ඤත්වා ඉමං ලොකම්මං පරඤ්ච" යි-

මේසේ සරභඩඟකාලයෙහි ද, සම්භවජාතකයෙහි ද සියලු දඹදිව් තෙවරක් ඇවිද පැන කෙළවර කරන්නකු නොදක සුවිරත බමුණ විසින් පැන පුළුවුස්නව ඕවස් කරවූ කල ජාතියෙන් සත්වැනි වූයේ මීපියෙහි පස් කෙළිමින් පළඟ බැඳ ඇතුළුවෙයැ හුන්නේ මේ-

---

165. (මේහි ද 163 වෙනි ගඟව අරුත් කී නියෙන් සලකනු.)

166. කොණ්ඩඤ්ඤ!= කෞණ්ඩින්‍යගොත්‍ර ඇති ශරභඩඟ තාපස යන් වහන්ස! සාධුරූපා= සුඳුරරූප ඇති; ඉසයෝ= සෘෂීහු; නං= ඔබ; යාචන්ති= (ප්‍රශ්න විසඳීම පිණිස) යාඥ කෙරෙති; පඤ්හානි= ඒ ප්‍රශ්න යන්; ව්‍යාකරොහි= විසඳුලනු මැනව; කොණ්ඩඤ්ඤ= කෞණ්ඩින්‍ය ගොත්‍ර ඇතියව! යං බුඩං= යම් ඥතවෘඩ වූ පුරුෂයෙක් වේ ද, ඔහු කරා; එස භාරෝ= මේ පැන විසඳීම සඩ්ඛ්‍යාත භාරය; ආගච්ඡති= පැමිණෙයි; එසෝ= මේ තෙමේ; මනුජේසු= මිනිසුන් කෙරෙහි; ධම්මෝ= සවභාව යෙක් වේ.

167. මහාමුනෙ!= මහින්වත්නි! කතාවකාසා= (තෙපි) කළු අවසර අතියහු; මනසා= සිතින්; අභිපත්ථිතං= කැමතිවන ලද; යං කිඤ්චි පඤ්හං= යම් කිසි පැනයක්; පුච්ඡන්තු= පිළිවිසිත්වා; අහං හි= මම වනාහි; වෝ= තොපගේ; නං නං= (මෙලොව හෝ පරලොව හෝ ඇසුරුකළ) ඒ ඒ සියලු පැනය; ඉමං ලොකං= මේ ලොව ද; පරං ච= පරලොව ද; ඉඝං= තෙමේ; ඤත්වා- (ඥානයින් සසක් කොට) දැන ව්‍යාකරිස්සං= විසඳුලන්නෙමි.

168. "**නගඝ තෙ අහමක්කිඤ්ඤං - යථාපි කුසලෝ තථා**
රාජා ච ඛෝ නං ජානාති - යදි කාහති වා න වා" ඉ-

සම්මෘදප්‍රවාරණයෙන් පැවරී. මෙසේ භාග්‍යවතුන් විසින් සම්මෘදප්‍රවාරණය කළ කල්හි සතුටුසිත් ඇත්තේ පැන පුළුවුස්නේ **කථං පන භෝ ගොතම!** යනාදිය කී.

ඉක්බිති ඕහට භාග්‍යවතුන් වහන්සේ- "බලව පින්වත්නි! ශ්‍රාවකයා විසින් කියන ලද්ද අනිකෙකි, ශාස්තෘහු අනිකක් කියති; මා විසින් පළමු ම කියන ලද නො වේ ද, යම්සේ ඔහුගේ ශ්‍රාවකයා විසින් පිහිටා සිටින ලද ද, ඉදින් එපරිද්දෙන් පිහිටා සිටින්නේ නම් එසේ කල්හි මම වාදාරොපණය කරන්නෙමි සි; එහෙත් මේ තෙම අනිකක් ම කියයි, එහි ලා මා විසින් කුමක් කරන්ට හැකි ද?" සි මෙසේ නිගණ්ඨයාගේ වචනයට අවකාශයෙක් නො වේව සි යට අසසජී තෙරුන් කී නියෙන් ම වදාරන සේක්- **එවං ඛෝ අහං අග්ගිවෙස්සන!** යනාදිය වදාළහ. **උපමා මං භෝ ගොතම! පටිභාති**= භවත් ගෞතමයෙනි! මට එක් උපමාවක් වටහයි, ඒ උපමාව එලවම් සි කියයි; **පටිභාතු තං අග්ගිවෙස්සන!**= ගිනිවෙස්න! තට වැටහේවා, නිසැක ව ඒ උපමාව එළව සි භාග්‍යවතුන් වහන්සේ වදාළහ. **බලකරණීයා**= අත්වැරින් කටයුතු කෘෂිවණිජාදි කම්හු; **රූපත්තා'ඤං පුරිසපුග්ගලෝ**= රූපය ආත්ම වූයේ මොහට හුයි "රූපත්තා:" රූපය ආත්මය සි හෙන සිටි පුද්ගලයා දක්වයි; **රූපං පතිඛාය**= ඒ ආත්මය සි ගත් රූපයෙහි පිහිටා; **පුඤ්ඤං වා අපුඤ්ඤං වා පසවති**= කුසල් හෝ අකුසල් හෝ උපදවයි; **වෙදනත්තා** යනාදියෙහි ද මෙ ම නයයි. මෙහින් කුමක් දක්වා ද? "මේ පඤ්ච ස්කන්ධයෝ මේ සත් කට පොළොව මෙන් පිහිට හෑ, ඔවුහු මේ පස්කඳ පිහිටා සිට කුශලා කුශලකම් නම් රැස් කෙරෙති; ඔබ මෙසේ විද්‍යමාන වූ මෑ ආත්මය ප්‍රතිෂෙධ කරන්නාහු පස්කඳ අනාත්මය සි දක්වහු" යයි අතිශයින් කරුණු සහිත කොව උපමා ඇර දැක්වී තවද- මේ නුවටහු විසින් **එළවූ ඕපම්‍යතීයාමයෙන්** ම සම්මෘඛුඛයන් හැර අනිකෙක් ඔහුගේ කථා සිද වාද යෙහි දෙස් දක්වන්ට **සමර්ථ** වූයේ නම් නැත්.

සැබව- පුද්ගලයෝ විවිධයහ:- බුදුන් විසින් විනය කවයුත්තාහු ද සව්වන් විසින් විනය කවයුත්තාහු දැයි; ශ්‍රාවකවෙනෙයයන් ශ්‍රාවකයෝ ද බුදුහු ද විනය කෙරෙති; එහෙත් බුඩවෙනෙයයන් සව්වෝ විනය කරන්ට නො හැකි වෙති, බුදුහු ම විනය කෙරෙත්. මේ නුවට ද බුඩවෙනෙයයෙකි; එහෙයින් මොහුගේ වාදය සිඳ අනිකෙක් දෙස් දක්වන්ට සමර්ථ වූයේ

බුඩපුද්ගලයෝ

---

168. **නගඝ**= එකාන්තයෙන්; **අහං**= මම්; **යථාපි කුසලෝ**= සමර්ථ වූයෙක් යම් සේ ද; **තථා**= එපරිද්දෙන්; **තෙ**= තට; **අක්කිඤ්ඤං**= කියන්නෙම්; **යදි**= ඉදින්; **කාහති වා**= කරන්නේ හෝ **න වා**= නො කරන්නේ හෝ වේද; **නං**= එය; **රාජා ච ඛෝ**= රජතෙමේ ත්; **ජානාති**= දනී.

නම් නැති; එහෙයින් භාග්‍යවතුන් වහන්සේ තමන් වහන්සේ ම ඔහුගේ වාදයෙහි දෙස් දක්වන්ට- **නනු ත්වං අග්ගිවෙස්සන!** යනාදිය වදාළහ. එකල්හි නිගණ්ඨ තෙම සිතී:- "මහණගොයුම් **ඉතා** ම මාගේ වාදය පිහිටුවයි, ඉදින් මතුයෙහි කිසි දෙසෙක් වන්නේ නම්, එකලා මා මැ නිග්‍රහ කරන්නේය, මම මේ වාදය මහාජනයා කෙරෙහි දු බහාලම් නම් මැනවැ" යි; එහෙයින් මෙසේ කී- **"අහං හි භො ගොතම! එවං වදාමි, රූපං මේ අත්තා** —පෙ— **විඤ්ඤාණං මේ අත්තාති, අයං ච මහති ජනතා"** යි

භාග්‍යවතුන් වහන්සේ යම් හෙයකින් නුවවාට වඩා සියගුණයෙනු දු දහස් ගුණයෙනු දු සියදහස් ගුණයෙනු දු වාදීන් අතුරෙන් අතිශයින් උතුම් වෙත් ද, එහෙයින් සිතූ සේක:- "මේ නුවට තමා මුදවාලා මහාජනයා මතුයෙහි වාදය බහාලයි, ඕහට තමා මුදුලන්ට නො දෙන්නෙම්, මහාජනයා කෙරෙන් නිවේඨනය කොට එකලා වූ ම ඔහු නිගන්නෙම්" යි. **ඉක්බිති** ඕහට **කිං හි නෙ අග්ගිවෙස්සන!** යනාදිය වදාළහ. එහි අර්ථ:- "මෝ ජනතා මට වාදූරොපණය කරන්ට නො පැමිණියා වෙයි, තෙපි ම සියලු ලිඡාලානුවර දන්වා මට වාදූරොපණය කරන්ට ආයේ වෙහි, එහෙයින් තෙපි සඛකිය වාදය ම නිවේඨනය කරව, කුමක් හෙයින් මහජනයාගේ මතුයෙහි බහාලහි ද?" යි. හේ ප්‍රතිඥ කරන්නේ- **අහං හි භො ගොතම!** යනාදිය කියා. මෙසේ භාග්‍යවතුන් වහන්සේ නිගණ්ඨයාගේ වාදය පිහිටුවා **තෙන හි අග්ගිවෙස්සන!** යි පෘච්ඡාවට පවත් ගත්හ. එහි- **තෙනහි** යනු කාරණාර්ථයෙහි නිපාත යැ; යම් හෙයකින් තෙපි පස්කඳ ආත්මවශයෙන් ප්‍රතිඥ කෙරෙහි ද, එහෙයින් යන අර්ථ යි. **සඤ්ඤමං විජිතෙ=** සිය රට; **ඝාතෙතාඝං වා ඝාතෙතුං=** නැසීමට සුදුසු වූවකු, නැසිය යුත්තකු **නසන්ට**; **ජාපෙතාඝං වා ජාපෙතුං=** ධනහානි සම සුදුසු වූවකු, ධනහානිය කළ යුත්තකු ධනහානිය කරන්ට, දිළිඳු කරන්ට; **පබ්බාජෙතාඝං වා පබ්බාජෙතුං=** සිඟරවින් නෙරපා හරින්ට සුදුස්සකු නෙරපා හරින්ට, බැහැර කරන්ට; **වතතිතුඤ්ච මරහති=** පවත්නේ ද වෙයි, පවත්නට ද සුදුසු යැ, පවත්නට යුතු යයි දක්වයි.

මෙසේ නුවට තමාගේ වාද බිඳිනු පිණිස අළු කාරණය ම තමාගේ මරණ සඳහා ආයුධයක් නියුණු කරන්නෙකු මෙන් වෙසෙස් කොට දක්වයි; නුවණ මද වූවෙක් යම් සේ ද **එමෙනි**; **එවං මෙ රූපං භොතු=** මාගේ රූපය මෙ බඳු වූ ප්‍රසාද උපදවන මනා රූ ඇති අලඞ්කාර කොට පිළියෙළ කළ රන්තොරණක් සෙයින් ද මොනොවට සැරසූ සිතුවම් පවක් සෙයින් ද මනවඬන දැකුම් ඇති වේව යි; **එවං මෙ රූපං මා අභොසි=** මාගේ රූපය මෙ බඳු දුර්ණ වූ දුසවහන් ඇති විලිපිලිතල කැලලින් ගැවසී ගන්නාලද්දක් නො වේව යි; **තුණ්හි අභොසි=** නුවට මෙ තැන්හි වරදන ලද බැව් දැන **මහණගොයුම්හු** මාගේ වාද බිඳිනට

කරුණක් එලිවී, මම නුවණ මදබැවින් එය ම වෙසෙස් කොට දක්වීමි, දැන් නවතියෙමි; ඉදින් "පවතී" යයි කියන්නෙම් නම්, මේ රජදරුවෝ නැගිසිට "ගිනිවෙස්න! තෙපි මාගේ රූපයෙහි වශය පවතී කියහි, ඉදින් තාගේ රූපයෙහි ඉසුරු පවතී නම්, කුමක් හෙයින් තෙපි- යම්සේ මේ ලිච්ඡවි රජදරුවෝ තව්තිසාවැසි දෙවියන් වැනි අත්බැවින් බබලත් ද, අභිරූප වූවාහු ප්‍රසාද එළවන්නාහු වෙත් ද; එ පරිදි දෙන් නො බබලහි දැ?" යි, ඉදින් නො පවතී යයි කියන්නෙම් නම්, (එකල) මහණගොයුම් නැගිසිට "ගිනිවෙස්න! නෝ පෙර මාගේ රූප යෙහි වශය පවතී යයි කියා මෙවිට ප්‍රතික්ඛේප කෙරෙහි" යයි වාදාරෝපණය කරන්නේය; මෙසේ පවතී යයි කී කල එක් දෙසෙක, නොපවතී යයි කී කල එක් දෙසෙකැයි නො බිණී. භාග්‍යවතුන් වහන්සේ දෙවෙනි වර ද විවාළහ; දෙවෙනි වර ද නො බිණී. යළි යම් හෙයකින් තුන්වන වර තෙක් භාග්‍යවතුන් විසින් විවාළ කල්හි නො කියන්නහුගේ මුදුන සත්කඩ වැ පැළේද; තවද- බුදුවරයෝ නම් සත්වයන් සඳහා මැ කලප ලක්ෂයක් අධික කොට ඇති චතුරසඞ්ඛ්‍යයක් පැරැම් පිරූ බැවින් සත්වයන් කෙරේ බලවත් කරුණා ඇත්තාහු වෙත් ද, එහෙයින් තුන්වන වර තෙක් නො පිළිවිස අනතුරු භාග්‍යවතුන් වහන්සේ සව්වකනිගණ්ඨ පුත්‍ර හට මේ වදාළහ; **එතං බ්‍යාකරොති'දානි** යනාදි වචනය වදාළහ එහි- **සහධම්මිකං**= හෙතු සහිත වැ, කරුණු සහිත වැ;

වජ්‍රය අතෙහි වූයේ මොහුගේ නුසි= **වජිරපාණී** නම්; **යකෙඛා**= යම් ඒ ලාමක යක්ෂයෙක් නො වෙසි, **සක්දෙවිරජ** යයි දතයුතු; **ආදිත්තං**= ගිනිවන් වූ; **සම්පජ්ජලිතං**= මොනොවට ඇවිලගත්; **සඤ්ඡාතිභූතං**= හාත්පස ගිනිදැල් ඇති; එක් වහනිජ්ඣාලාවක් වූ යන අර්ථයි. **යක්ඛෙස ගත් සක්දෙවිරජ**

සිනො හොති= මහත් වූ හිස යැ කඳලවුහුලු වැනි දළ යැ බිහිසුණු වූ ඇස්-නාසාදිය යයි මෙසේ විරූප වූ රූවක් මවා සිටියේ; යලි කුමක් හෙයින් මේ තෙම ආයේ ද යත්? දෘෂ්ටිය හරවනු පිණිස යි. තවද- "**අහං වෙව ඛො පන ඛම්මං දෙසෙස්සං පරෙ ච මෙ න ආජානෙය්‍යුං**" යි මෙසේ භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසිමට අලෙප්‍රාත්සුක බවට පැමිණි කල්හි සක්දෙවිරජ මහබඹහු සමග අවුත් "භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසනු මැනව, වැළි ඔබගේ අණ නො පවත්නවුන් ඇපි පවත්වාලන්නෙමු, ඔබගේ දහම්සක වේවා, අපගේ අණසක ය" යි (යම් හෙයකින්) පිළින කෙළේ ද; එහෙයින් අද සව්වකයා තැකිගන්වා පැන විසඳවා ලන්නෙමි යි ආයේ යි. **භගවා වෙව පඨමතරං සව්වකො ච නිගණ්ඨපුත්තෙකා**= ඒ එසේ මැයි- ඉදින් ඔහු අන්‍යයෝ ත් දක්නාහු නම් එ කරුණ නො ගරු වන්නේය, "මහණගොයුම් සව්වකයා තමාගේ වාදයෙහි නො බස් නහු දැන යක්ෂයකු කැඳවා දක්වීය, එහෙයින් සව්වක හයින් භීතියේය" යි

කියන්නාහු ද; එහෙයින් භාග්‍යවතුන් වහන්සේ හා සච්චක ද දකී; ඔහු දැක ම ඔහුගේ සියල්සිරුරින් සෝදිය වැහුණාහ, ඇතුළුකුස පෙරෙළෙමින් මහඟින් හැඬී. හේ අන්‍යයෝ ත් දකිති හෝ යි බලන්නේ කිසිවක්හුගේ කිසි ලොමහළීමාත්‍රයකු දු නො දිටි; ඉක්බිති "මේ හඬ මට ම උපන, ඉදින් මම යක්‍ෂයෙකැයි කියම් නම්, කිම තට ම ඇස් ඇත් ද? තෝ මැ යක්‍ෂයා දකිහි ද? පළමු යක්‍ෂයකු නො දැක මහණ ගොයුම්හු විසින් වාදකුලයෙහි හෙලන ලද්දේ ම යක්‍ෂයකු දක්නෙහි ද? යි කියන්නාහුය" යි සිතා "දැන් මට මහණගොයුම්හු විනා මෙහි අන් පිළිසරණක් නැතැ" යි සිතන්නේ- ඉක්බිති සච්චකනිගණ්ඨපුත්‍ර භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් කී; **තාණං ගවෙසි**= ත්‍රාණ (= රක්‍ෂා සථාන) යසි සොයන්නේ; **ලෙණං ගවෙසි**= නිලීයනසථාන යසි සොයන්නේ; **සරණං ගවෙසි**= ශරණ යසි සොයන්නේ; මෙහි දු "පාලනය කෙරෙයි, රක්‍ෂණය කෙරේ නුයි" **තාණ** නම; "මෙහි නිලීයනය කෙරෙත් නුයි" **ලෙණ** නම; "හිංසා කෙරේ නුයි" **සරණ** නම; භය නසයි, විධ්වංසනය කෙරෙයි, යන අර්ථයි. **මනසිකරිත්වා**= මෙනෙහි කොට, ප්‍රත්‍යවෙක්‍ෂා කොට, විමසා; **එවං මේ වෙදනා හොතු**= කුශල වෙදනාව ම වේවා, සුඛවෙදනාව ම වේවා; **එවං මේ සඤ්ඤා හොතු**= කුශල සංඥාව ම වේවා, සෞමනස්‍ය සම්ප්‍රයුක්ත සංඥාව ම වේවා යි; සංඝකාර-විඥානයන්හි දු මෙ ම නයයි.

මා අහොසි= මෙහි වතාහි කියන ලද්දට විපර්‍යාසයෙන් අරුත් දතයුතු. **කල්ලං නු**= යුතු ද? **සමනුපස්සිතුං**= මෙය මාගේ යැ, මේ තෙම මම වෙමි, මේ තෙම මාගේ ආත්මය යි මෙසේ තෘෂ්ණා-මාන-දෘෂ්ටි විසින් දක්නට; **නො හි'දං හො ගොතම!**= භවත් ගෞතමයෙනි! මෙය යුතු නො වෙයි; මෙසේ භාග්‍යවතුන් වහන්සේ යම් පරිද්දෙකින් දක්‍ෂ වූ අභිගුණඩිකයෙක් සජීයාගේ දළුවිෂය ඒ සජීයා ලවා ම නැවත දළුව කරවා නහාපියන්නේ ද, එපරිද්දෙන් ඒ පිරිස්හි මැ සච්චකනිගණ්ඨපුත්‍රයා ඒ මුවින් ම පස්කඳ අනිත්‍ය යැ, දුඃඛ යැ, අනාත්ම යයි කියවූහ. **දුක්ඛං අලලිතෝ**= මේ පඤ්චස්කන්ධදුඃඛය තෘෂ්ණාදෘෂ්ටීන් ඇලුනේ; **උපගතෝ අජ්ඣොසිතෝ** යනු ද තෘෂ්ණාදෘෂ්ටිවශයෙන් ම දතයුතු. **දුක්ඛං එතං මම** යනාදියෙහි පඤ්චස්කන්ධ දුඃඛය තෘෂ්ණාමානදෘෂ්ටි විසින් දකී යන අර්ථයි. **පරිඤ්ඤෙය්‍ය**= අනිත්‍ය යැ, දුඃඛ යැ, අනාත්ම යයි තීරණ පරිඥාවෙන් පිරිසිඳ දැනගන්නේය; **පරික්ඛයපත්තා**= ක්‍ෂයට ව්‍යයට අනුත්පාදයට පමුණුවා; **නවං**= තරුණ වූ; **අකුක්කුක්කජාතං**= මල් ගන්නා කලැ ඇතුළත අඞ්ගුෂ්ටප්‍රමාණ වූ එක් ඝන වූ දණ්ඩයක් හටගනී, එයින් විරහිත යැ යන අර්ථයි. **තිත්තෙනා**= ශූන්‍ය වූයෙහි හර රහිත වූයෙහි; ශූන්‍ය හෙයින් **තුච්ඡා** (= සිස් වූයෙහි;) **අපරද්ධා**= පරදන ලදුයෙහි.

භාසිතා බො පන තෙ යි මේය භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ මුඛරභාවය පවසා නිගන්ම්න් වදාළහ. හේ වනාහි පෙර පූරණාදී ෂට් ශාස්තෘන් කරා එළඹ ප්‍රශ්න විචාරයි, ඔවුහු විසඳන්ට නො හැකි වෙති, එකල්හි ඔවුන්ට පිරිස් මැද මහත් වියරු නහා නැඟිට ජය ප්‍රකාශ කර මින් යෙයි; හේ සම්‍යක්සම්බුද්ධයනු දු එසේ ම වෙහෙසන්නෙම් යන සිතින් එළඹ—

167. **"අමෙහා! කො නාම'යං රුක්ඛා - සිනපත්තෙහා සඛණ්ඩඵලෝ යත්ථ එකපපහාරෙන - උත්තමඞ්ගං විභාවිතං"** යි-

මේ තෙම- නිසරුරුක පුරුදු වූ මෙලෙක් තුඩැති (කාඳඟලක නම්) ලිහිණියා කිහිරිරුක පැහැර මෙන් සිඳුතාඳුන නමැති හර පැහැර තුවණ තුඩු බිඳීමට පැමිණියේ සිඳුතාඳුනයාගේ තදබැව් දුනගත; එකල ඔහුගේ (මුඛරබැව්) පිරිස්මැද ප්‍රකාශ කරන භාග්‍යවතුන් වහන්සේ **භාසිතා බො පන තෙ** යනාදිය වදාළහ. එහි **එතරහි**= උපාදිණ්ණක ශරීරයෙහි සෙවද නම් නැතැයි නො කිය යුතු යැ, එහෙත් දැන් නැතැයි කියති; **සුවණ්ණවණ්ණං කායං විවරි**= සියලු කය විවෘත නො කළහ, බුදුහු නම් ගැටවටු ගන්වා පිළිසන් සිරුරු ඇත්තාහු පිරිසැ දහම් දෙසති; එකල භාග්‍යවතුන් වහන්සේ ගලවළු හමු වූ තැන සිවුරු ගෙන සතර හුල් පමණ බහාලූහ; එය බහාලූ කෙණෙහි රන්වන් රැස් පුසඳ්පුසඳ් වැ රන්කළයකින් රත්රන්රසදහර සෙයින් ද රත්වලාහැබකින් විදුලිය මෙන් ද නික්ම රන්මිහිගුවක් බදු මහාකදැති උතුම් හිස පැදකුණු කර මින් අහසැ පැන හියාහුය; වැළි ගාග්‍යවතුන් වහන්සේ කුමක් හෙයින් මෙසේ කළ සේක් ද යත්? මහාජනයාගේ සැක දුරලනු පිණිස යැ; සැබව- මහාජන තෙමේ "මහණ ගොයුම්හු මාගේ සෙවද නැතැයි කියති, සවසානිගණ්ඨපුත්‍රයාගේ වැළිත් යහතුරුසඳක්හුගේ සෙයින් සෙවද වැහිරෙති, මහණගොයුම් වූ කලි ගත දෙපටසිවුරු පෙරවැ හුන්නේය; ඇතුළත සෙවදය ඇති බැව් හෝ නැති බැව් හෝ දුනගන්ට කෙසේ හැකි දැ?" යි සැක කරන්නේය; ඒ මහාජනයාගේ සැක දුරු කරනු පිණිස මෙසේ කළ සේක. **මඛඝුහදොසා**= තෙද රහිත වූයේ; **පතතකඛන්ධා**= හෙලූ කඳ ඇතියේ; **අපපටිභානො**= උත්තරයක් නො දක්නේ; **නිසීදි**= පය මහපවගිල්ලෙන් බිම හිරි අදිමින් හුන්නේයි.

දුම්මුඛා යනු විරූපමුඛ ඇත්තේ නො වෙයි; හේ අභිරූප වූයේ ප්‍රසාද එළවන්නේ මැයි; ඔහුගේ නාමය වනාහි මේ යි. **අහඞ්කා තං පොක්ඛරණිං පුන ඔතරිතුං**= සියලු අළයන් බුන් බැවින් පසුන් ගමන්

---

167. **අමෙහා**= එම්බා! (බදිරවනියෙ!) **යත්ථ**= යම් රුක්හි; **එකපපහාරෙන**= එක ම පහරින්; **උත්තමඞ්ගං**= උතුමහ; **විභාවිතං**= බිඳින ලද ද; **සිනපත්තෙහා**= සියුම් පත් ඇති; **සඛණ්ඩඵලො**= කටු සහිත වූ; **අයංරුක්ඛා**= මේ රුක; **කො නාම**= කිනම් ද?

ඇත්තේ බස්නට අභව්‍ය වූයේ එහි ම කවුඩු-ගිජුලිහිණි ආදීන්ට බත් වේ යයි දක්වයි. **විසූකායිකානි**= දෘෂ්ටිවිසූකයෝ (සම්‍යග්දෘෂ්ටිය විනිවිදින, එයට විලොම් වූ දෘෂ්ටිහු;) **විසෙවිතානි**= දෘෂ්ටිසඤ්ඤ රිතයෝ; **විප්ඵන්දිතානි**= (කලින් කල ශාශ්වත-උච්ඡේද ග්‍රහණය කරන හෙයින්) විරූප වූ දෘෂ්ටිකම්පනයෝ; **යදි දං වාදුපාදාය**= මෙහි යදිදං යනු නිපාතමාත්‍ර යැ; වාදයෙහි අදහස් ඇති වැ, වාදාරොපණය කරන්නෙමි යන අදහසින් එළඹෙන්ට අභව්‍ය වෙයි; එහෙත් ධර්මශ්‍රවණයට එළඹෙන්නේය යි දක්වයි. **දුම්මුඛං ලිච්ඡවිපුත්තං එතදවොච**= කුමක් හෙයින් කියේ ද? දුර්මුඛයා උපමා අරන කල සෙසු ලිච්ඡවිකුමාරයෝ ද සිතූහ:— "මේ නුවණ මිසින් අපට ශිල්ප උගන්නා තැන බොහෝ කලක් අවමන් කරන ලද, දැන් මේ පසමිතුරා පිටු දක්නට කල් යැ, ඇපි දු එක් එක් උපමාව ඇර දක්වා අතුල් පහරින් වැටුනක්හු මුගුරින් තලන්නවුන් මෙන් යළි යම්සේ පිරිස්මැද හිස ඔසවන්ට නො හැකි වන්නේ ද, ඔහුට එපරිද්දෙන් කරන්නෙමු" සි; ඔවුහු උපමා කොට දුර්මුඛයාගේ කථා වසානය බලමින් හුන්නාහුය. සචෙඝ ඔවුන්ගේ අදහස් දැන "මොහු සියල්ලෝ මැ ගෙල ඔසවා සැලෙන තොලින් යුකතව සිටියාහුය, ඉදින් වෙන වෙන උපමා අරනට ලබන්නාහු නම් යළි මා විසින් පිරිස්මැද හිස ඔසවන්ට නො හැකි වන්නේය; වන්නාව යැ. මම දුර්මුඛයා වළකා යම්සේ අනිකෙකුට අවකාශ නො වේ ද, එපරිද්දෙන් කථාවාරය පසිඳ මහණගොයුම්හු පැන පුළුවුස්නෙමි" සි; එහෙයින් මෙය කී. **එහි ආගමෙහි**= සිටුව, යළි නො බැණ යන අර්ථයි. **තිඵ නෙසා නො ගොතම!** භවත් ගෞතමයෙනි! මෝ අපගේ හා අන්‍ය වූ ත් බොහෝ මහණ බමුණන්ගේ තෙපුල් තිබේවා; **විලාපං විලපිතං මඤ්ඤේ**= මේ වචනය වනාහි විලපිතයක් මෙන් වෙයි, විප්‍රලාපමාත්‍රයක් වෙයි යන අර්ථයි; නොහොත් **තිඵනෙසා** යන මෙහි "කථා" යි ඇර කිය සුතුයි. **වාචාවිලාපං විලපිතං මඤ්ඤේ** යන මෙහි වනාහි මේ තෙපුල් කිම් විප්‍රලාප මාත්‍රයක් මෙන් වෙයි යන අර්ථයි. මේවිට පැන පුළුවුස්නේ **කිත්තාවතා** යනාදිය කියයි. එහි **වෙඤාරජ්ජායතනෙ**= ඥතයට පැමිණියේ; **අපරප්පච්චයො**= පරප්‍රත්‍යය රහිත වූයේ; **ඉක්ඛිති** භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ පැන විසඳන සේක්- **ඉධ අග්ගිවෙස්සන!** යනාදිය වදාළහ. එය ප්‍රකට අර්ථ ඇත්තේ මැයි. තවද- යම් හෙයකින් මෙහි "පස්සති" යි කී බැවින් ශෛක්ෂභූමිය දක්වන ලද ද, එහෙයින් මත්තෙහි අශෛක්ෂ භූමිය පුළුවුස්නේ දෙවෙනි ප්‍රශ්නය විවාලේය. එය ද ඔහුට භාග්‍ය වතුන් වහන්සේ ප්‍රකාශ කළහ:- **එහි දස්සනානුත්තරියෙන** යනාදියෙහි **දස්සනානුත්තරියං**= ලෞකිකලොකොත්තරප්‍රඥව; **පටිපදානුත්තරියං**= ලෞකික ලොකොත්තර ප්‍රතිපදාව; **විමුත්තානුත්තරියං**= ලෞකික ලොකොත්තර විමුක්තිය; නොහොත් ශුද්ධ ලොකොත්තරය ම ගෙන **දස්සනානුත්තරියං**= අර්හත්මාර්ග සම්‍යක්දෘෂ්ටිය; **පටිපදානුත්තරියං**=

සෙසු මාගීඵලයෝ; විමුත්තානුත්තරියං= මාගීඵලවිමුක්තිය; නොහොත් ක්ෂීණාශ්‍රවයාගේ නිර්වාණදර්ශනය දස්සනානුත්තරිය නම; අෂ්ටමාගීඵලයෝ පටිපදානුත්තරිය නම; අග්‍රඵලය විමුත්තානුත්තරිය නමැයි දතයුතු.

බුද්ධෝ සෝ භගවා= ඒ භාග්‍යවත්හු තුමූ ත් සිවුසස් අවබොධ කළහ; බෝධාය= අන්‍යයන්ගේ ත් චතුස්සත්‍යාවබොධයට දහම්දෙසති; දන්තෝ යනාදියෙහි- දන්තෝ= නිර්සෙවන (ඉන්ද්‍රිය දමනයෙන් යුක්ත) වූයේ; දමථාය= නිර්සෙවනය පිණිස; සන්තෝ= සියලු කෙලෙස් සන්සිඳීමෙන් ශාන්ත වූයේ; සමථාය= කෙලෙස් සන්සිඳීම පිණිස; තිණ්ණෝ= චතුරොඝතරණය කෙළේ; තරණාය= චතුරොඝතරණය පිණිස; පරිනිබ්බුතෝ= කෙලෙස් පිරිනිවනින් පිරිනිවියේ; පරිනිබ්බානාය= කෙලෙසපරිනිර්වාණය පිණිස දහම් දෙසියි; ඛංසි= ගුණ නසත්තාහු; පගබ්භා= වාක් ප්‍රාගල්භ්‍යයෙන් යුක්ත වූවාහු; ආසාදෙතබ්බං= ගැටිය යුතු; ආසජ්ජ= ගවා; න ඛෝ එවං භවතෝ ගොතමස්ස= භවත් ගෞතමයන් ගවා කිසි වෙකුට තමාගේ තෝ නට සියලු වාදය ගෙන නික්ම යන්ට ශක්තියෙක් නැතැයි දක්වයි; භාග්‍යවත්හු ඇත් ආදීන් මෙන් කිසිවෙකුට ජීවිතාන්තරාය නො මැ කෙරෙති; තවද- මේ නුවට මේ තුන් උපමා භාග්‍යවතුන්ට උතුකම් පිණිස නො එළුණි; තමහට උතුකම් පිණිස ම එළුණි. සැබව- යම්සේ රජෙක් කිසි පසමිතුරකු නසා මෙසේ ත් ශූර වූ මෙසේ බලසම්පන්න වූ පුරුෂයෙක් වන්නේ යයි පසමිතුරා පසසන්නේ නුමුදු තමහට ම පසසාද, එපරිද්දෙන් ම මේ තෙමේ ත්- ඕඝාති භෝ ගොතම! හත්ථිපප්පභිතීනං යනාදීන් භාග්‍යවතුන් උසස් කරන්නේ ම ඇපි ම ශූරයෝ වම්හ, ඇපි පණ්ඩිතයෝ වම්හ, ඇපි බහුශ්‍රැතයෝ වම්හ. යම් ඇපි මෙසේ ප්‍රතිඥා (= මද වැහෙන) හැන්නියකු කරා මෙන් ද, දිලියෙන ඛිනිකඳක් කරා මෙන් ද, පෙනෙන කළු සර්පයකු කරා මෙන් ද, වාදකවෘත්තියමෝ සම්මක්සම්බුද්ධයන් කරා එළඹියමෝ දැයි තමන් මැ උසස් කෙරෙයි; මෙසේ තමා උසස් කොට භාග්‍යවතුන් පවරන්නේ- අධිවාසෙතු මේ යනාදිය කි. එහි අධිවාසෙතු= පිළිගනීවා; සඞ්ඛතානඤ්ච= ඔබ කෙරෙහි සත්කාර කරන්නාවූ මට යම් පිනකුත් ප්‍රීතිප්‍රමෝද්‍යයකුත් සෙට වන්නේද, ඒ සඳහා; අධිවාසෙහි භගවා තුණ්හීභාවෙන= භාග්‍යවතුන් වහන්සේ කායාඩම්බර - වාග්විස්තරාඩම්බර ච්ඡාපය (= මෙහෙයීම) ක් නොකොට අභ්‍යන්තරයෙහි ම ක්ෂාන්තිය ධර්මයින් තූෂ්ණීම්භාවයෙන් ඉවසූ සේක; සවස හට අනුග්‍රහ කරනු පිණිස සිතින් ම පිළිගත් සේකැයි කියන ලද වෙයි. යඤ්ඤ පතිරූපං මඤ්ඤදඤ්ඤාථ= ඒ ලිච්ඡවීහු වනාහි ඔහට පන්සියයක් බත්සැළි නිතිබත් කොට එළුවති, එය ම සඳහා මේ තෙම "සෙට තෙපි ඒ මහණගොයුම් හට යමක් සුදුසු යැ කැප යයි සිතන්නහු නම් එය ගෙන එන්නහුය, යම් හෙයකින් තෙපි මහණගොයුම්හුගේ පිරිවර වූවාහු කැප අකැප යුතු අයුතු දන්නහු ද එහෙයි

නෑ" යි කියයි. **හත්තාගිහාරං අභිහරිංසු**= එළවිය යුතු බත් එළවූහු; **පණීතෙන**= උතුම් වූ; **සහත්ථා**= සියතින්; **සන්තප්පෙත්වා**= මොනොවට තර්පණය කොට, (භොජනයෙන්) සම්පූර්ණ වූවකු, පිණාගියකු, යැපුනකු කොට; **සම්පවාරෙත්වා**= මොනොවට හවරවා; පමණ පමණැයි අත්සනින් පිළිකෙව් කරවා; **භුත්තාවිං**= වැළඳුවහු; **ඔණීතපත්ත පාණිං**= පාත්‍රයෙන් ඉවත් කළ අත් ඇත්තහු, බැහර කළ අත් ඇත්තහු යයි කියන ලද වෙයි; **ඔහිනපත්තපාණිං** යි ද පාඨයැ; එහි අරුත්:- අතින් බැහර වූ, වෙන් වූ පාත්‍රය මෝහට නුයි= **ඔහිනපත්ත පාණි** නම්; ඒ අතින් බැහැර වූ පාත්‍රය ඇත්තහු; අත් ද පාත්‍රය ද සෝදා එක් පසෙක පාත්‍රය තබා හුන්නහු යන අර්ථයි. **එකමන්තං නිසිදි**= මෙසේ වූ භාග්‍යවතුන් දැන එක් අවකාශයක හුන්නේය යන අර්ථයි. **පුඤ්ඤඤ්ච පුඤ්ඤමහි ච**= මේ දැනැ යම් පිනක් මත්තෙහි විපාක සඤ්ඤියක් යන අර්ථයි. **පුඤ්ඤමහි** යනු විපාකසඤ්ඤියන්ගේ මැ පරිවාරය; **නං දාඝරත්තං සුඛාය භොතු**= එය මේ ලිච්ඡවීන්ට සුවයට වේවා; මේ වනාහී හෙතෙම "මම පැවිද්දෙම් නම, පැවිද්දෙකු විසින් තමාගේ දන පාවා දෙන්ට අයුතු ය" යි ඔවුනට පාවා දෙමින් මෙසේ කීය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ යම් හෙයකින් ලිච්ඡවීන් විසින් සවස හට දෙන ලදද, භාග්‍යවතුන්ට නො දෙන ලදද, යළි සවස විසින් භාග්‍යවතුන්ට දෙන ලදද; එහෙයින් එකරුන දක්වන සේක්-ලෙස **බහු අත්ථිවෙත්‍යාන!** යනාදිය වදාළහ. මෙසේ භාග්‍යවතුන් වහන්සේ නිගණ්ඨයාගේ සිතක් නැතිව මැ තමහට දුන් දක්ෂිණාව භුක්ති කොට පාවාදුන්හ. ඕ (දක්ෂිණා) ඔහට අනාගතයෙහි විපාක වන්නී යයි කීහ.

මහාසච්චක සූත්‍ර වර්ණනා නිමි. (6)

—:+:—

මහාසච්චක සූත්‍ර වණ්ණනා.

———:o:———

එවං මෙ සුතං යි මහාසච්චක සූත්‍ර යයි. එහි එකං සමයං යි ද- තෙන ඛො පන සමයෙන යි ද- පුබ්බණ්හසමයං යි ද තුන් පදයෙන් එක මැ සමය කියන ලද. ඒ එසේ මැයි- භික්ෂූන් වත්පිළිවත් කොට මුව සෝදා පාසිවුරු ගෙන සෑ වැඳ කවර හමකට පිවිසෙමෝ දැයි විතකී මාලකයෙහි සිටි කාලය නම් වෙයි; භාග්‍යවතුන් වහන්සේ එබඳු කලෙ රහතන්වණි දෙපටහඳනය ඇඳ කාබහන බැඳ පාංශුකූලචීවරය එකාංශ කොට පොරවා ගඳකිළියෙන් නික්ම භික්ෂුසඞ්ඝයා විසින් පිරිවරන ලදුව ගඳෙළු අහිවුඛයෙහි සිටි සේක. ඒ සඳහා- "එකංසමයං" යි ද- "තෙන ඛො පන සමයෙන" යි ද- "පුබ්බණ්හසමයං" යි ද කියනලදී. පවිසිතු කාමෝ= පිඬු පිණිස පිවිසෙන්නෙමි යි කළ සිතිවුහන් ඇත්තේ; කෙනුපසඞ්කමිං= කුමක් හෙයින් පැමිණියේ ද යත්? වාදාරොපණය කරන අදහසිනි. ඔහුව මේ සිත වී ලෑ:- "පෙර මම නොවියත් බැවින් සියලු විශාලානුවර පිරිස් ගෙන මහණ ගොයුම් සම්පයට ගොස් පිරිස්මැද මකු වූයෙමි, දැන් එසේ නො කොට එකලාව මැ ගොස් වාදාරොපණය කරන්නෙමි, ඉදින් මහණගොයුම්හු පරදවන්ට හැකි වන්නෙමි ද, එකල තමාගේ ලබ්ධිය ප්‍රකාශ කොට ජය කරන්නෙමි; ඉදින් මහණගොයුම් හට ජය වන්නේ ද එකල අදුරෙහි නැටුම් සෙයින් කිසිවෙක් නො දැන ගන්නේය" යි "නිද්‍රාප්‍රශ්න" නම් පැනයක් ගෙන මේ වාදාධ්‍යාශයෙන් පැමිණියේයි. අනුකම්පං උපාදාය= සච්චකනිගණ්ඨපුත්‍ර හට අනුකම්පා පිණිස; තෙරුන්ට මේ සිත වී ලෑ:- "භාග්‍යවතුන් වහන්සේ මොහොතක් වැඩහුන් කල බුදගුණය ද ධර්මශ්‍රවණය ද ලබන්නේය, එය ඔහට දික්කලක් හිතයට සුවයට පවත්නේය" යි; එහෙයින් භාග්‍යවතුන් වහන්සේ අයැද පාංශුකූලචීවරය චතුර්ගුණ කොට පනවා භාග්‍යවතුන් වහන්සේ වැඩහුන මැනවැයි කිය; ආනන්ද තෙමේ යුක්තියක් බෙණේ යයි සලකා භාග්‍යවතුන් වහන්සේ පැනවූ අස්නෙහි වැඩහුන් සේක.

සච්චක එකලා වැඩුන්වෙත පැමිණීම.

භගවන්තං එතදවොච= වැළි යම් පැනයක් සඟවා ගත් සාරය කොට ගෙන ආයේ ද, එය තබා පළමු කොට පසෙකින් ගෙන හැසිරෙමින් මේ- සන්ති හෙ ගොතම! යනාදි වචනය කිය. සුසන්ති ඛි හෙ ගොතම!= ඒ මහණබමුණෝ සිරුරු උපන් ශාරීරික දුඃඛවෙද නාව සපයී තෙරෙති, ලබති, විඳිති යන අර්ථයි. ඌරුක්ඛතමෙහා= තද බවට පැමිණි ඌරු ඇතිබව; ඌරුසඤ්ඤාවය යන අර්ථයි. තවද- මෙහි විසමයාථ වශයෙන් භවිස්සති යි අනාගත වචනය කරන ලද; කායඤ්චයං හොති= කය අනුව ගියේ වෙයි, කායවශයෙහි පවත්නා සුලු වෙයි; කායභාවනා යි යම් හෙයකින් විදර්ශනාව කියනු ලැබේද, එයින්

චිත්තවික්ඛේපයට පැමිණෙන්නෙක් නම් නැද්ද, එහෙයින් නිගණ්ඨ තෙම යමක් අවිද්‍යමාන ද, අභූත ද, නැත්තේ ද, එය ම කියයි; **චිත්ත භාවනා** යි ද සමථය කියනු ලැබෙයි; යළි දු- (යම් හෙයකින්) සමාධියෙන් යුත් පුද්ගලයා හට ඌරුඤාණාදීහු නම් නැත් ද, එහෙයින් නිගණ්ඨ තෙම මෙ ද අභූතයක් ම කියයි; **තවද-** (මහා) අට්ඨකථාවෙහි කියන ලදී:- "යම්සේ **කුණපුබ්බං** යි කියා **ඌරුකබ්බමෙහාපි නාම** හවිස්සති යනාදිය කියන්නහුට අනාඝතරූපය නො සම වෙයි, එසේ ම අට්ඨය ද නො සම වෙයි, යමක් අවිද්‍යමාන ද, අභූත ද, නැත් ද, එය කියා" යයි. **නො කායඛාධනං** යනු පඤ්චාතපයෙන් තැවීම් ආදි වූ ආතම්භලමථානුයොගය සඳහා කියයි; සැබවි- මෝ ඔවුන්ගේ කාය භාවනා නමුදු; වැළි- කිම හෙතෙම දූන මෙසේ කියේ ද? හේ වනාහි මැදිඳුවල් විහාරයට පැමිණෙයි, **එකල්හි** දු භික්ෂූහු පාසිවුරු සකස්කොට තබා තමන්ගේ **රාත්‍රිසථාන-දිවාසථානයන්හි** සමාධියට (= එකඟ බවට) පැමිණෙති, හෙතෙම ඒ සමාධියට පැමිණියවුන් දූන මොවුහු චිත්ත භාවනාමාත්‍රයක යෙදෙති, එහෙත් මොවුනට කායභාවනාවක් නැතැයි හඟිමින් මෙසේ කියයි; එකල භාග්‍යවතුන් වහන්සේ ඔහු මෙහෙයමින් **කිනහි පන තෙ අඟගිවෙසාන! කායභාවනාසුතා** යි වදාළහ. හේ එය විස්තර කරමින් **සෙය්‍යථිදං?** **නාළෙරු වච්ඡෝ** යනාදිය කී:- එහි **නාළෙරු** යනු ඔහුගේ නම යැ; **වච්ඡෝ** යනු ගොත්‍රය යි; **කිංසෝ** යනු නම යැ; **සඛලිගොසාලෙ** යනු ගොත්‍රය යි; **මකඛලිගොසාල** යට ආයේ මැයි; **එතෙ=** මේ තුන් දෙන; ඔවුහු කිලිට තපස් පිළිබඳ මුදුන් පැමිණියාහු ලු; **උළාරානි උළාරානි=** ප්‍රණීත ප්‍රණීත වූ; **ගාහෙනති නාම=** බලය ගන්වති නම්; **බ්‍රූහෙනති=** වඩති; **මෙදෙනති=** හටගත් මෙදස් ඇති කෙරෙති; **පුබ්බං පහාය=** පළමු දුෂ්කාරක්‍රියාව හැර; **පච්ඡා උපචිනනති=** පසුව ප්‍රණීත ඛාද්‍යාදියෙන් සන්තර්පණය කෙරෙති, වඩති; **ආචයාපචයෙ හොති=** වැඩීම ද නො වැඩීම ද වෙයි; **ඉති ඉමස්ස කායස්ස කාලෙන වඩ්ඪි කාලෙන පරිහානි=** වැඩීම් පිරිහීම් පමණක් මැ පැනෙයි, **කාය** භාවනා වූ කලි නො පැනේ යයි දක්වා චිත්තභාවනාව පුළුවුස්නා සේක් **කිනහි පන තෙ අඟගිවෙසාන! චිත්තභාවනා සුතා?** යි වදාළහ.

න සම්පායෂි= සම්පාදනය කොට කියන්ට නො හැකි විය, බාල පෘථග්ජනයෙන් යම්සේ ද එමෙනි; **කුතො පන තං=** යම් බදු තෙපි මෙසේ ඕදාරික වූ දුර්බල භාවනාව නො දනිහි ද, ඒ තෙපි සිලුටු වූ සියුම් වූ චිත්තභාවනාව දූන ගන්නෙහි දූ? යි; මේ තැන්හි වනාහි **ගොණරවිය** තෙරුන් වහන්සේ "මේ පදය නො බුදුවදනැ" යි විජිනි පත තබා නික්ම ගියහ. ඉක්බිති ඕහට **මහාසිව** තෙරුන් වහන්සේ කීහ:- *a* "**දිසසති ගිකඛවෙ! ඉමස්ස චාතුම්මහාභූතිකස්ස කායස්ස**

---

a මහණෙනි! සතර මහාභූතමය වූ මේ කායයාගේ වැඩීම ද නැසීම ද ඉපදීම ද චුතවීම ද දක්නාලැබේ.

ආවඥෝ'පි අපචඥෝ'පි ආදූනම්පි නික්ඛිපනම්පි'' යි. ඒ අසා- "ඖදාරිකකායපරිග්‍රහණය කරන්නහුට උපන් විදර්‍ශනාව ඖදාරික යයි කියන්ට වටනේය" යි සැලකූහ. **සුඛසාරාගී=** සැපයෙහි බහලරාග යෙන් සමන්විත වූයේ; **සුඛාය වේදනාය නිරෝධා උප්පජ්ජති දුක්ඛා වේදනා=** අනතුරුව ම නො උපදී; ඒ එසේ මැයි- සැපදුක් දෙදෙනාගේ අනන්තරප්‍රත්‍යයභාවය පඨානයෙහි ප්‍රතිෂිඛ යැ; තවද- යම් හෙයකින් සැපය නිරුඛ නො වූ කල්හි දුක නූපදී ද, එහෙයින් මෙහි මෙසේ කියන ලද. **පරියාදාය තිට්ඨති=** ගෙවා ග්‍රහණය නොව සිටී; **උභතෝ පක්ඛං=** සැපය එක් පක්ෂයෙහා, දුක එක් පක්ෂයෙහැ,යි මෙසේ දෙපසක් වැ- **උප්පන්නා'පි සුඛා වේදනා චිත්තං න පරියාදාය තිට්ඨති, භාවිතත්තා කායස්ස, උප්පන්නා'පි දුක්ඛා වේදනා චිත්තං න පරියාදාය තිට්ඨති, භාවිතත්තා චිත්තස්ස** යන මෙහි කායභාවනා නම්, විදර්‍ශනා යැ; **චිත්තභාවනා නම්,** සමාධිය යි; තවද- විදර්‍ශනාව සැපයට විරුඛ වූවා දුකට ආසන්න වූවා වෙයි; සමාධිය දුකට විරුඛ වූයේ සැපයට ආසන්න වෙයි; කෙසේ ද? මේ විස්තර යැ- විදසුන් පිහිටුවා හුන්නහුට කල් යත් යත් ඒ ඒ තැන ගිනි නැඟීමක් මෙන් වෙයි, දෙ කැසින් සෙවද ගලති, මුදුනින් ගිනිවැටි නැගීමක් මෙන් වෙයි, ඔත පෙළෙයි, වෙසෙසින් පෙළෙයි, සැලෙයි; මෙසේ විදර්‍ශනාව සැපයට විරුඛ වූවා දුකට ආසන්න යැ; නැවත කායික වූ හෝ චෛතසික වූ හෝ දුක උපන්කල ඒ දුක යටපත් කොට සමවතට සමවන්නහුට සමවත් ඇසිල්ලෙහි දුක දුරින් පහව ගියේ වෙයි, නො මද වූ සුවය පැමිණෙයි; මෙසේ සමාධිය දුකට විරුඛ වූයේ සැපයට ආසන්න වෙයි; යම්සේ විදර්‍ශනාව සුවයට විරුඛවූවා දුකට ආසන්න වූ ද, සමාධිය එසේ නො වෙයි; යම්සේ සමාධිය දුකට විරුඛ වූයේ සැපයට ආසන්න ද, විදර්‍ශනාව එසේ නො වන්නි ය යි. එයින් කියන ලදී:- **උප්පන්නාපි සුඛා වේදනා චිත්තං න පරියාදාය තිට්ඨති, භාවිතත්තා කායස්ස, උප්පන්නාපි දුක්ඛා වේදනා න චිත්තං පරියාදාය තිට්ඨති, භාවිතත්තා චිත්තස්ස** යි. **ආසජ්ජ උපනීය=** ගුණයන් ගටා ත් එළවා ත්; **නං වත මෙ=** එකාන්තයෙන් මාගේ ඒ සිත; **කිං හි නො සියා? අගහිවෙස්සත!=** ගිනිවෙස්න! කිම නො වන්නේ ද? වන්නේ මැය, මෙබදු අදහස් ඇත්තේ නො වෙව, මට සැප වූ ද දුක් වූ ද වෙදනා උපන්නී මැයි. එතකුදු වත් මම ඒ උපන් වේදනාවට සිත හාත්පසින් මැඬලන්ට නො දෙමි; මෙවිට ඔහුට ඒ කරුණ ප්‍රකාශ කරණු පිණිස මත්තෙහි ප්‍රසාදඵලවත දම්දෙසුම් දෙසනු කැමැත්තාහු මූල පටන් මහානිනිෂ්ක්‍රමණය ආරම්භ කළහ. එහි- **භූත මෙ අගහි වෙස්සන! පුබ්බේව සම්බොධා, —පෙ— තස්සේව නිස්සිදං අලම්දං පඨා නාය** යි මේ සියල්ල යට "පාසරාසි" සූත්‍රයෙහි කී නියෙන් දතයුතු; මේ වනාහි වෙතස යැ:- එහි (=පාසරාසි සූත්‍රයෙහි) බෝපලඟ වැඩහිඳ යැ; මෙහි දූෂ්කරක්‍රියාවෙහි යි. **අල්ලං කණ්ඨං=** අමු දිඹුල්දඹුකඩක්; **සඛෙත ගං=** කිරි සහිත; **කාමෙහි=** වස්තුකාමයන්ගෙන්; **අවූපසන්තෙහා=** පහ

නො වූයේ; **කාමච්ඡන්දෙ**, යනාදියෙහි කෙලෙශකාමය ම ඡන්දය කිරීම් වශයෙන් **ඡන්ද** නම්, සෙනහ කිරීම් වශයෙන් **සෙනහ** නම්, පවස් කිරීම් වශයෙන් **පිපාසා** නම්, දැවීම් වශයෙන් **පරිළාහ** නමැයි දතයුතු. **ඔපක්කමිකා**= උපක්‍රමයෙන් උපදවන ලද; **දස්සනාය අනුත්තරාය සම්බොධාය** යන සියල්ල ලොකොත්තරමාගීයට වේවවන මැ යි. යළි මේ මෙහි ඔපම්මසංසන්දන යැ:- ඒ මෙසේයි- අවු වූ කිරි සහිත දිඹුල් දඹුකඩ මෙන් කෙලෙශකාමය හෙතු කොටගෙන වසතුකාමයෙන් නො නික්මුණු පුදගලයා වෙයි, දියෙහි බහාලූ බව මෙන් කෙලෙශකාමයෙන් තෙත්බව වෙයි, ඇලළීමෙනු දු ගිනී නො ඉපදීම මෙන් කෙලෙශකාමය හෙතු කොටගෙන වසතුකාමයෙන් බැහැර නො වූවන්ගේ උපක්‍රමයෙන් උපදවන ලද වෙදනාවලින් ලොවුතුරුමඟ නො ලැබීම වෙයි, නො ඇලළීමෙනු දු ගිනි නො ඉපදීම මෙන් ඒ පුදගලයන්ගේ උපක්‍රමයෙන් උපදවන ලද වෙදනාවලින් වෙන් ව ද ලොවුතුරා මඟ නො ලැබීම වේ යයි. දෙවෙනි උපමාව ද මේ නයින් ම දතයුතු. මේ වූ කලි විශෙෂ යයි- පළමු කියන ලද්දී සපුත්‍රභාර්‍යාප්‍රව්‍රජ්‍යාව පිළිබඳ උපමා යැ; පසුව කියන ලද්දී බ්‍රාහ්මණධාර්මිකප්‍රව්‍රජ්‍යාව පිළිබඳ උපමා යි. තුන්වැනි උපමාවෙහි **ඔලාපං**= සිදුණු තෙත ඇති, දිය රහිත වූ; **ථලෙ නික්ඛිත්තං**= ගල්තෙලෙහි හෝ පොළෝතෙලෙහි බහාලන ලද; එහි දු මේ ඔපම්මසංසන්දන යැ:- ඒ මෙසේ යි- වියලුණු කොලපුතඬක් මෙන් කෙලෙශකාමය හෙතු කොටගෙන වසතුකාමයෙන් නික්මුණු පුදගලයා වෙයි, ජලයෙන් වෙන් කොට ගොඩ බහාලූ බව මෙන් කෙලෙශකාමයෙන් නො තෙත් බව වෙයි, ඇලළීමෙනු දු ගිනි ඉපදීම මෙන් කෙලෙශකාමය හෙතු කොටගෙන වසතු කාමයෙන් බැහැරවූවන්ගේ අබ්භොකාසික-නෙසජ්ජිකාදි වශයෙන් උපක්‍රමයෙන් උපදවන ලද්දා වූ ද වෙදනාවලින් ලොවුතුරු මඟ ලැබීම වෙයි, නො ඇලළීමෙනු දු අන් රුකක වියලි අත්තක් සමඟ ගැටීම් පමණකින් ම ගිනි ඉපදීම මෙන් උපක්‍රමයෙන් උපදවන ලද වෙදනාවලින් වෙන්ව ම සුව වූ පිළිවෙතින් ම ලොවුතුරු මඟ ලැබීම වේ යයි. මෝ උපමාව භාග්‍යවතුන් විසින් තමන් වහන්සේ සඳහා එළවන ලද්දීය.

මෙවිට තමන් වහන්සේගේ දුෂ්කරක්‍රියාව දක්වන සේක්- **කාසං භික්ඛං** යනාදිය වදාළහ කිම භාග්‍යවතුන් වහන්සේ දුෂ්කරක්‍රියා නො කොට බුදු වන්ට සමර්ථ සේක් ද? යත්:- (දුෂ්කරක්‍රියා) කොට ද නො කොට ද සමර්ථ සේක් මැයි. වැළි කුමක් හෙයින් කළ සේක් ද? යත්:- "**සදෙවකලොකයාට** තමන්ගේ පරාක්‍රමය දක්වන්නෙමි, යලි ඒ වීර්‍යයෙන් (කෙලෙස්) ඇලළීම් ගුණය මා සතුටු කරවන්නේය" යි කියායි. ඒ එසේ මැයි- බලසෙනහ ගෙන සඬ්ග්‍රාමයෙහි දෙ තුන් පහරක් දී සතුරන් මර්ථනය කොට පැමිණි රජය ඇත්තේ යම්සේ ද, එසේ ක්ෂත්‍රිය තෙම පහ

භාග්‍යවතුන්ගේ දුෂ්කරක්‍රියාව.

යෙහි හුන්නේ ම පරපුරෙන් ආ රජය ලැබ ද සතුටු වූයේ නො වෙයි; සැබව- මෙසේ පැමිණි රජය ඇති රජසිරි වලදන්නා වූ පිරිස බලා තමාගේ පරාක්‍රමය සිහි කොට "අසුවල් තැන අසුවල් කමීය කොට අසුවල් ද අසුවල් ද සතුරා මෙසේ විද මෙසේ පැහැර මේ රජසිරි පැමිණියෙමි" සිතන්නහුට බලවත් සොම්නස උපදී; එපරිද්දෙන් භාග්‍යවතුන් වහන්සේ ද "සදෙවකලොකයාට පරාක්‍රමය දක්වන්නෙමි, යළි ඒ පරාක්‍රමය මා අතිශයින් සතුටු කරවන්නේය, සොම්නස උපදවන්නේ ය" යි දූෂකරක්‍රියාව කළ සේක. තවද පශ්චිම ජනතාවට අනුකම්පා කරන්නාහු ද කළ සේක් මැයි. සැබව- පශ්චිමජනතා තොමෝ "සම්‍යක් සම්බුඩයන් වහන්සේ කල්පලක්‍ෂයක් අධික කොට ඇති චතුරසඞ්ඛ්‍යයක් පැරැම් පුරා ද ප්‍රධන්වීර්‍යයීය කොට ම සම්බෝධ බවට පැමිණියහ, ඇපි කියනු කිමෑ, යි ප්‍රධන්වීර්‍යයීය කටයුතු යයි සිතන්නේය. මෙසේ ඇති කල වහා ම ජාතිජරාමරණයාගේ කෙළවර කරන්නේය,යි පශ්චිමජනතාවට අනුකම්පා කරන්නාහු (දූෂකරක්‍රියාව) කළසේක් මැයි.

දනෙනභිදනනමාධාය= යට දතැ අභිදනනය= උඩුදත තබා; **වෙන සා චිනතං**= කුසල් සිතින් අකුසල්සිත; **අභිනිගහණණහයං**= නිග්‍රහ කෙරෙම් නම්; **අභිනිපපීළෙහයං**= පෙළම් නම්; **අභිසනනාපෙහයං**= තවා වීර්‍යයෙන් අලළන ලද්දක් කෙරෙම් නම්; **සාරඛෝ**= දරථ (= විඛා) සහිත වූයේ; **පඛානාභිඤඤානඤඤ**= වීර්‍යයෙන් මඬන ලද්ද හුගේ, විදින ලද්දහුගේ යන අර්ථ යි. **අපපාණඤං**= ආශ්වාස රහිත වූ; **කඛමාරඝඝරියා**= කඛුරුගේ කඛුරුසම; **සිඝවෙදනා හොනති**= කිසි නැනකින් නික්මෙන්ට නො ලබන වාතයෙන් උපදවන ලද බලවත් වූ ශීර්‍ෂවේදනා වෙති; **සීඝවෙඨං දදෙහය**= හිස්වෙළුම් දෙන්නේය; **දෙවතා**= බෝසතුන්ගේ සක්මන් කෙළවර පන්සල්පිරිවෙන හාත්පස අධිගෘහිත වූ දෙවතාවෝ; එදවස බෝසත්හට අධිමාත්‍ර වූ ශරීරදුඃඛය උපන් කල්හි මූර්ඡාව උපන, උන් වහන්සේ සක්මන ම හිඳගෙන වැටුනාහු ලු; ඒ දැක දෙවතාවෝ මෙසේ කීහු, **විහාරෙ තෙ සවෙසවසෝ අරහතෝ** යනු රහත්හු නම් මේබදු වූවාහු වෙති, මළවුන් සමාන වෙති ලබ්ධියෙන් කියති; එහි යම් දෙවතා කෙනෙක් "කලුරිය කෙළේය" යි කීවාහු ද, ඔවුහු ගොස් සුදොවුන් මහරජුට දැන්වූහ:- "තොපගේ පුත්‍ර තෙම කලුරිය කෙළේය" යි "මාගේ පුත්‍ර තෙම බුදු වැ කලුරිය කෙළේ ද? නො වී ද?" යි; "බුදුවන්ට නො හැකි විය, ප්‍රධන් භූමියෙහි ම වැටී කලුරිය කෙළේය" යි; "මම නො අදහමි, මපුත්හුගේ බොධියට නො පැමිණ කාලක්‍රියාවක් නම් නැතැ" යි.

පසුකාලයෙහි දම්සක් පවත්වා පිළිවෙළින් රජගහනුවරට ගොස් කිඹුල්වතට පැමිණි සම්‍යක් සම්බුඩයන්ට සුදොවුන් මහරජ පාත්‍රය ගෙන ප්‍රාසාදයට නංවා කැඳ - අවුලු පිළිගන්වා අතුරුඛත්කලැ මේ පවත්

දුන්වීය:- "භාග්‍යවතුන් වහන්ස! නුඹ වහන්සේ ප්‍රධන්වියෂී කරන කාලයෙහි දෙවතාවෝ අවුත් "මහරජ! තොපගේ පුත්‍ර තෙම කලුරිය කෙළේය" යි කීහු යයි; "මහරජ! ඇදහි දෑ?" යි; "භාග්‍යවතුන් වහන්ස! නො ඇදහිමි" "මහරජ! දැන් සිහින පිළිගැනීමෙහි පවත් ආශ්චර්‍යයන් දකිමින් කිම අදහන්නෙහි ද? මම ද බුදු වූයෙමි, නුඹ ද බුදුන්ට පිය වූයෙහි; පෙර වූ කලි මා නො පිරිපැසුණු නුවණ ඇති කල බොධිවෘක්‍ෂයා වෙහි හැසිරෙන්නහු ධර්මපාල කුමාරකාලයෙහි ශිල්ප උගන්නා පිණිස ගියහුට "තොපගේ පුත් ධර්මපාලකුමාර තෙම මළේය මේ ඔහුගේ ඇට ය" යි එළඹැව ගෙනවුත් දැක්වූහ; මහරජ! එකල්හි දු තෙපි "ම පුතුන් ගේ අන්‍යතර මරණයෙක් නම් නැති, මම නො අදහමි" කීවහු යයි මේ අපෝතපත්තියෙහි භාග්‍යවතුන් වහන්සේ මහාධර්මපාල ජාතකය වදාළ සේක.

මා බො තවං මාරිස! යනු අතිශයින් ප්‍රිය කරමින් කීවාහුය, යම් මේ "මාරිස" යන වචනයෙක් වේ ද, එය දෙවතාවුන්ගේ ප්‍රිය - මනාප ව්‍යවහාරයෙක් ල; **අජ්ඣුපෙක්ඛං=** අහොජනය (= නො වැළඳීම;) **හලනති වදාමි= "අලං"** යි කියමි, මෙයින් කම් නැත, එසේ නො කරව, මම යැපෙන්නෙමි, මෙසේ වළකම් යන අර්ථ යි. **මධුරවස්සව්=** මහුරු මසකු ගේ සිවිය; **එනාව පරමං=** ඒ වේදනාවන්ට ද මෙය ම පරම වූ උතුම් වූ ප්‍රමාණ යයි. **පිතුසක්කසස්ස තම්මණෙන —පෙ— පඨමජ්ඣානං උප සම්පජ්ජ විහරිතා** යනු රජුගේ වතාහි වප්මහුල් දිනයෙක් වප්මහුල නම් වෙයි; එ දවස අනෙකප්‍රකාර වූ ඛාද්‍ය භොජ්‍ය පිළියෙල කෙරෙති, නුවරවීථි ශුබ කරවා පුන්කලස් තබ්බවා ධ්වජ පතාකා ඔසොවවා සියලු නුවර දෙව්විමනක් මෙන් අලඞ්කාර කෙරෙත්. සියලු දස්-කම්කරු ආදීහු අලුත් පිළි ඔඳනා ලද්දාහු සුවඳ මලින් සැර සුණාහු රජගෙදර රැස් වෙති; රජුගේ කම්මාන්තයෙහි නහුල් දහසක් ගොදනු ලැබේ; වැළි එ දවස එකකින් අඩු අටසියයක් (නහුල්) ගොදති; ගවයන් රැහැන් හා යොත් සමග සියලු නහුල් ජාණුස්සොණි බ්‍රාහ්මණාගේ රථය මෙන් රිදීයෙන් සරසන ලද්දාහු වෙති; රජු අල්වාගන්නා නහුල වූ කලි රත්රනින් සරසන ලද වෙයි; ගවයන්ගේ අං ද රැහැන් හා කෙවිටි ද රනින් සරසන ලද්දාහු ම වෙති; රජ තෙම මහපිරිවරින් නික්මෙන්නේ පුත්‍රයා ගෙන ගියේය. කම්මාන්තස්ථානයෙහි හැසිසිටි කොළු ඇති සන වූ සෙවණලු ඇති එක් දඹරුකෙක් විය; ඒ රුක යට කුමාර යාගේ යහන පනවා රන්තරුවලින් සරසන ලද වියනක් බඳවා තිර පවුරින් මතුයෙහි වට කරවා අරක් තබා රජ්ජුරුවෝ සර්වාලඞ්කාරයෙන් අලඞ්කාර කොට ඇමතිගණයා විසින් පිරිවරන ලද්දාහු සීඝානා තැනට ගියහ. එහි රජ රන්නහුල ගනී, ඇමතියෝ එකකින් උතු අටසියක් රිදීනහුල් ගනිති, ගොවියෝ සෙසු නහුල් ගනිත්. ඔවුහු ඒ නහුල් ගෙන

ඔබ්නොබ සාති; රජ්ජුරුවෝ වනාහි මොබින් හෝ ඔබට යෙති, ඔබින් හෝ මොබට යෙති; මේ ස්ථානයෙහි මහාසම්පත්තිය වෙයි; බෝසතුන් පිරිවරා හුන් කිරිමවුවරු "රජ්ජුගේ සැපත් බලන්නෙමු" යි ඇතුළුකිර යෙන් පිටත නික්මුණාහුය, බෝසත්හු ඔබ්නොබ බලන්නාහු කිසිවකු නො දැක වහා නැගිට පලක් බැඳ ආශ්වාස-ප්‍රශ්වාසයන් ගෙන (= ආනාපානසතිය වඩා) පළමුවන ඤාණයෙන් නිපදවූහ. කිරිමවුවරු ඛාද්‍යභෝජ්‍ය නානාරයෙහි හැසිරෙමින් මදක් කල් යැවූහ. සෙසු වෘක්ෂයන්ගේ ඡායාව නැවතුනී යළි ඒ දඹරුකට පිරිමඬුලු ව සිටියා. කිරිමවුවරු හිමිපුත් එහලා වනැ,යි වහා තිරය ඔසොවා ඇතුළත පිවිසෙන්නාහු බෝසතුන් යහනැ පලඟින් හුන්නහු ද ඒ පෙළහර ද දැක ගොස් රජ්ජුට දැන්වූහ- "දෙවයන් වහන්ස! කුමාර තෙම මෙසේ හුන්නේය, අන්‍යවෘක්ෂයන්ගේ ඡායාව නැවතුනී දඹරුකට පිරිමඬුලු ව සිටියා" යයි රජ තෙම වෙග යෙන් ගොස් පෙළහර දැක "පුත! නුඹට මේ දෙවෙනි වැදුම ය" යි පුතු වැන්ද. මේ සඳහා කියන ලදී- මේ **"පිතුසක්කාසං ආගම්මනෙන -පෙ- පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරිතා"** යනු.

සියා නු ඛෝ එසෝ මග්ගෝ බොධාය= මේ අනාපන්සි පළමුවන ඤාන (සිවුසස්) අවබොධය පිණිස මාර්ගය වන්නේ දෝ හෝ යි; **සතානුසාරී විඤ්ඤාණං**= "මේ දුෂ්කර වූ (ප්‍රතිපදාව) සත්‍යාවබොධයට මාර්ගය නො වන්නේය, ආනාපානසතිය ප්‍රථමධ්‍යානය වනාහි (මාර්ගය) වන්නේය"යි මෙසේ එක් දෙවරක් උපන් සිහියට අනතුරු ව උපන් විඥානය "සතානුසාරිවිඤ්ඤාණ" නම්. **යං නූනං සුඛං**= යම් ඒ අනාපන්සිපළමුවන ඤාන්සුවයක්; **පච්චුපජ්ජිත්‍රා හොතූති**= පන්සල්මඑව ඇමදීම් ආදි වත් කිරීමෙන් ළඟ සිටියාහු වෙති; **බාහුලිකෝ**= ප්‍රත්‍යය බහුල කොට ඇත්තේ; **ආවත්තෙත්‍රා බාහුල්ලාය**= රසයෙහි ගිජු ව ප්‍රණීතපිණ්ඩපාතා දිය සඳහා පෙරළෙන්නේ; **නිබ්බිජ්ජපක්කමිංසු**= උකටලි ව ධම්නියාම යෙන් ම පලාගියාහුය; බෝසතුන් සම්බෝධියට පැමිණි කල්හි කාය විවේකයට අවකාස දීම පිණිස සඛාව හෙයින් ගියාහුය. ඔත්තාහු ද අන් තැනෙක නො ගොස් බරනැසට ම ගියාහුය. බොධිසත්වයෝ ඔවුන් ගිය කල්හි අඛමසක් කාශ්‍යවේසය ලැබ බෝමැඩ අපරාජිතපල්‍යාඬක යෙන් හිද සම්බුදුඤාණය ප්‍රතිවෙධ කළහ. **විවිච්චෙව කාමෙහි** යනා දිය භයහෙරව සූත්‍රයෙහි කී නියෙන් ම දතයුතු.

අහිඤ්ඤාමි බෝ පනාහං යන මේ වෙන ම අනුසන්ධියෙකි. නිගණ්ඨ මෙසේ සිති ලදී:- "මම මහණ ගොයුම් එක් පැනයක් විවාළෙමි, මහණ ගොයුම්හු "අපරා'පි මං අග්ගිවෙස්සන! අපරා'පි මං අග්ගිවෙස්සන!" යි අවසානයක් නො දක්වම්න් බෙණෙත් මය, කිපියාහු දෝ හෝ" හි. එකල භාග්‍යවතුන් වහන්සේ "ගිනිවෙස්න! තථාගතයන් නොයෙක් සියගණන් පිරිස්හි දහම් දෙසන කල්හි මහණගොයුම් කිපියේ යයි

කියන්නාවූ එකෙකු දු නැති, අන්‍යයන්ගේ අවබෝධය පිණිස ප්‍රති වෙධය පිණිස ම තථාගතයෝ දහම් දෙසති" දක්වන සේක් මේ දෙශ නාව ආරම්භ කළහ. එහි- **ආරබ්භ**= සඳහා; **යාවදෙව යනු** ප්‍රයෝ ජනාවධි පරිවෙච්ඡදයාගේ නියම කිරීම යැ; මේ **කියන ලද** වෙයි:- අන්‍ය යන්ට අවබෝධ කරවීම ම තථාගතයන්ගේ ධර්මදේශනාවෙහි (ධර්මයෙය කින්) ප්‍රයෝජනය වේ ද, එහෙයින් එකකුහට ම නො දෙසති, යම් තාක් අවබෝධ කරන්නාහු ඇත් නම්, ඔවුන්ට දෙශනා කෙරෙත් යයි. **තඤ්ච යෙව පුරිමඤ්ච** යන මෙයින් කුමක් දක්වත් ද? සවචක මෙසේ සිතී ල- "මහණහොයුම් අභිරූප යැ, ප්‍රසාද එළවන්නේ යැ, දන්තාවරණය (= දෙතොල) මනා පහස් ඇත්තේ යැ, දිව මොළොක් යැ, බස මිහිරි යැ, පිරිස රදමින් මෙන් හැසිරෙයි; එතකුදු වුවත් ඔහට තමාගේ සිතෙහි එකඟබවක් නැතැ" යි. ඉක්බිති ඔහට භාග්‍යවතුන් වහන්සේ- "ගිනිවෙස්න! තථාගතයෝ පිරිස රදමින් නො හැසිරෙති, සක්වළ කෙළවර කොට ඇති පිරිසට නමුදු තථාගතයෝ වෙසෙසින් නො ඇලුනාහු පැමිණ ද නො ඇලුනාහු එකාන්තයෙන් අසඝාය විහරණ ඇති ව ශූන්‍යතාඵලසමාපත්තියෙහි යෙදුණාහු දහම් දෙසති" දක්වන්ව මෙසේ වදාළහ. **අජ්ඣත්තඤ්ඤේව**= ගොචරාධ්‍යාත්මයෙහි ම; **සන්තීභාවදීපං**= නිදුවම්; ඒ එසේ මැයි- තථාගතයන් වහන්සේ යම් ඇසිල්ලෙක පිරිස සාධුකාර දෙසි ද, ඒ ඇසිල්ලෙහි පුඵාභොගයෙන් පිරිසිඳ පලසමවතට සමවදිති, සාධුකාර ශබ්දයාගේ නාදය නො සුන් කල්හි ම සමවතින් නැගිසිට සිවිතැන පටන් දහම් දෙසති; යම් හෙයකින් බුදුවරයන්ගේ භවාඞ්ගපරිවාසය (= භවාඞ්ගයෙහි විසීම) ශ්‍රුතුව වේ ද, (එහෙයින්) ආශ්වාසවාරයක් පාසා ඵලසමාපත්තියට සමවදින්. **ඤත්වා සුදං නිච්චකප්පං**= යම් ශූන්‍යතාඵල සමාධියකින් (යුක්තව) නිර තුරු වෙසෙම් ද, ඒ සමාධිනිමිත්තයෙහි සිත මොනොවට තබම්, පිහිටුවම්, දක්වන සේක. **ඔතාරයනිඤ්ඤමෙතං**= මේය ඇදහිය යුතු යැ; මේසේ භාග්‍යවතුන් වහන්සේගේ එකඟ සිත් ඇතිබව පිළිනෙත මේවිට තමා විසින් සඟවාගත් සාරය කොට ගෙන ආ ප්‍රශ්නය විසඳුවුස්නේ **අභිඤ්ඤා හි පන භාවං ඤාතුමෝ දිවා සුඛිනා** යනු කියා. සැබව- යම්සේ ශූන

ඛකවෘත්තිය

කයෙක් නම් නො මුසු කිරෙහි පැසූ කිරිබත ගිතෙලින් යොදු බඩ පුරා කවන ලද්දේ නමුදු අසුචි දූෂක නො කා යන්ට නො හැකි වේ ද, නො කන්නේ සිඹ හෝ යේ ද; තවද- නො සිඹ ගියහුගේ හිස රුජා කෙරේ ල; එපරිද්දෙන් මේ සවචක හට ද ශාස්තෘන් වහන්සේ නො මුසු කිරිබතක් වැනි අභිනිෂ්ක්‍රමණය පටන් ආශ්‍රවක්ෂය තෙක් පැහැදිය යුතු දහම්දෙසුම් දෙසූ සේක; එතකුදු වුවත් ඔහුට මෙබඳු දහම්දෙසුම් අසා ශාස්තෘන් කෙරෙහි පැහැදීම් පමණකු දු නූපන; එහෙයින් සඟවා ගත් සාරය කොට ගෙනා ප්‍රශ්නය

නො විචාරා යන්ව නො හැකි වන්නේ මෙසේ කියි. ඉක්බිති යම්හෙයකින් ඕනම්බය සියලු ක්ෂීණාශ්‍රවයන්ගේ රහත්මගින් ම ප්‍රහීණ වේ ද, කායදරථය වැළිත් උපාදිණ්ණකකායයෙහි ත් අනුපාදිණ්ණකකායයෙහි ත් වේ ද, ඒ එසේ මැයි- පියුම්පුල් ආදීහු එක් කලෙක පිපෙති, එක් කලෙක මුහුළු වෙති; සවස ඇතැම් වෘක්ෂයන්ගේ ද කොළ හැකිලෙති, උදැසන පැතිරුණාහු වෙත්; එපරිද්දෙන් උපාදිණ්ණකකායයාගේ දරථය ද දරථ (= විඩා) වශයෙන් භවාඩ්ගස්‍රොතය ද මෙහි නිද්‍රා යයි අදහස් කරන ලදුව; එය ක්ෂීණාශ්‍රවයන්ට ද වෙයි; ඒ සඳහා අභිඤ්ඤාමහං යනාදිය වදාළහ.

සමෙමාහ විහාරසම්මං වදනති= මුළා විහරණයකැයි කියති; **ආසජ්ජ ආසජ්ජ**= ගට ගවා; **උපනීතෙහි උපනීතෙහි**= එළව එළවා කියන ලද; **වචනපථෙහි**= වචනයන් ගෙන්; **අභිනන්දිත්වා අනුමොදිත්වා**= සිතින් පිළිගනිමින් සතුටු වැ, වචනයෙන් පසසමින් අනුමෝදන් වැ; භාග්‍යවතුන් විසින් මේ නුවණහව දෙසුතක් වදාරන ලදහු, පළමු සූත එක් බණවරෙහා, මෙය දෙඅඩ බණවරෙක; මෙසේ අඩුතුන් බණවරක් ආසා ත් මේ නුවණ නො මැ අධිගමයට පැමිණියේ, පැවිදි නො වී ය, සරණයෙහි නො පිහිටියෙ යි.

සවචකනුවවහුගේ අනාගතවාසනාව.

මොහුට භාග්‍යවතුන් වහන්සේ කුමක් හෙයින් දහම් දෙසූ සේක් ද? යත්:- අනාගතයෙහි වාසනා සඳහා ය; සැබව- භාග්‍යවතුන් වහන්සේ මේ දක්නා සේක- "මොහුට දැන් වැඩෙක් නැති, එහෙත් පිරිනිවනින් සමධික වූ අවුරුදු දෙසියයක් ඇවැමෙන් තඹපැන් (= ලක්) දිවැ සසුන් පිහිටන්නේ ය, එහි මේ තෙම කුලගෙයක ඉපද කල් පැමිණි සඳ පැවිදිවැ තෙවළා ඉගෙන විදසුන් වඩා සිවුපිළිසිඹියා සමිඟ රහත්බවට පැමිණ කාලඛුඩරක්ඛිත නම් මහාක්ෂීණාශ්‍රවයෙක් වන්නේය" සි. මේ දැක අනාගතයෙහි වාසනා සඳහා දහම් දෙසූ සේක.

හෙතෙමේ ද එසේ ම තඹපැන්දිවැ සසුන් පිහිටි කල දෙව්ලොවින් සැව දකුණුගිරිවෙහෙර ගොදුරුගම්හි එක් ඇමතිකුලයක උපන්නේ පැවිද්දව පොහොසත් වියෙහි පැවිදි ව තෙවළා බුදු වදන් ඉගෙන ගණයා පරිහරණය කෙරෙමින් මහා භික්ෂුසඞ්ඝයා විසින් පිරිවරන ලද්දේ උපාධ්‍යායන් දක්නට ගියේය. ඉක්බිති ඔහුගේ උපාධ්‍යායයන් වහන්සේ "අතැවැසියාට වොදනා කරන්නෙමි" තෙවළා බුදුවදන් ඉගෙන ආවහු සමඟ මුහුණ දී කථා පමණකු දු නො කළහ. හෙතෙම අලුයම් කල නැගිට තෙරුන් වෙතට ගොස් "වහන්ස! ඔබ මා ග්‍රන්ථකර්මය කොට ඔබ සමීපයට ආ කල්හි මුහුණ දී කථා පමණකු දු නො කළහු මාගේ කවර දෙසෙක් දැ"යි විවාළේය. තෙරුන් වහන්සේ (මෙසේ) කීහ- "ඇවැත්නි! බුඩරක්ඛිත! තෙපි මෙතෙකින් ම මා විසින් සැදිකිස මුදුන් පමුණුවන

කඵඵබුඩරක්ඛිතතෙර.

ලදැයි සිතවු දෑ?" යි; "වහන්ස! කුමක් කෙරෙම් දෑ?" යි; "ගණයා දුරු කොට ප්‍රපඤ්චය සිඳ වාගිරිගල්වෙහෙරට ගොස් මහණදම් කරව" යි උපාධ්‍යායයන්ගේ අවවාදයෙහි සිට එසේ කොට පිළිසිඹියා සමඟ රහත් බවට පැමිණ පිනැත්තේ රාජපූජිත වැ මහාභික්ෂුසඞ්ඝයා පිරිවර කොට ඇත්තේ සැගිරිවෙහෙර විසි.

තවද- එකල (සඩා) තිස්ස මහරජ තෙම පෙහෙවස්කම් කෙරෙමින් සැගිරියෙහි රජලෙන වෙසෙසි; හෙතෙම තෙරුන්ගේ උපස්ථායකභික්ෂුවට දැන්වී:- "යම් කලෙක මාගේ සඞ්ගමින් වහන්සේ පැන විසඳත් ද, දහම් දෙසත් ද, එකල මට දැන්වුව මැනවැ" යි තෙරුන් වහන්සේ එක් බණ අසන දවසෙක භික්ෂුසඞ්ඝයා පිරිවර කොට ඇත්තාහු කටුසැමළුවට නැඟී සැය වැද කළුතිඹිරිරුක් මූල වැඩසිටි සේක. එකල එක් පිණ්ඩපාතිකතෙරකෙනෙක් උන් වහන්සේ අතින් කාළකාරාම සූත්‍රාන්තයෙහි ප්‍රශ්නයක් විචාළහ. තෙරුන් වහන්සේ "ඇවැත්නි! අද ධර්මශ්‍රවණ දිනය නොවේ දෑ?" යි වදාළහ; "එසේය සඞ්ගමිනි! ධර්මශ්‍රවණ දිනය වනැ" යි; "එසේ වී නම් පුටුවක් ගෙනෙවු, මෙහි ම හුන්නමෝ ධර්මශ්‍රවණය කරනෙමු" යි; ඉක්බිති උන් වහන්සේට රුක්මූල අස්නක් පනවා දුන්හ; තෙරුන් වහන්සේ පූජිගාථා වදාරා කාළකාරාම සූත්‍රය ආරම්භ කළහ. තෙරුන් වහන්සේගේ ඒ තරුණ උපස්ථායක මහණ ද රජුට දැන්වීය; රජ තෙම පූජිගාථාවන් නොනිම් කල්හි ම පැමිණියේය; පැමිණ ද අප්‍රසිඩ වෙශයෙන් ම පිරිස්කෙළවර සිට තුන්යම්රැ සිටිවන ම බණ අසා තෙරුන් "ඉදම්වොච භගවා" යි කියන කල්හි සාධුකාර දිය. තෙරුන් වහන්සේ දැන "මහරජ! කවර වේලෙහි අවු දෑ?" යි විචාළහ; වහන්ස! පූජිගාථා පවන්ගන්නා කල්හි ම ය" යි; "මහරජ! තොප විසින් දුෂ්කරයක් කරන ලදැ" යි; "සඞ්ගමිනි! මේ දුෂ්කරයෙක් නොවෙයි, යළි ඉදින් සඞ්ගමින් ධර්මකථාවට පවන්හත් කල පවන් එක පදයෙක්හි දු මාගේ අන්‍යවිශික බවෙක් වී නම්, ලක්දිව කෙවිටක් බහාලන පමණ තැන්හි දු මාගේ සඞ්ගමියාවයෙක් නම් නොවේව" යි දිවුලේය. තවද- ඒ සූත්‍රයෙහි බුදුගුණ ප්‍රකාශ කොට දක්වන ලද්දාහුය; එහෙයින් රජ්ජුරුවෝ විචාළහ- "සඞ්ගමිනි! බුදුගුණ මෙතෙක් ම ද? නොහොත් සෙසු ත් ඇත් දෑ?" යි; "මහරජ! මා විසින් කියන ලද්දට වඩා නොකියන ලද්ද ම බොහෝ යැ, අප්‍රමාණ ය" යි. "සඞ්ගමිනි! උපමාවක් කළ මැනවැ" යි; "මහරජ! දහස් කිරියක් පමණ හැල්නෙතඟ එක් හැල්කරලකට වඩා අවශෙෂ හැල් ම යම්සේ බොහෝ වෙත් ද, එපරිද්දෙන් මා විසින් කී ගුණයෝ අල්ප වෙති, අවශෙෂ ගුණයෝ බොහෝ වෙති." "සඞ්ගමිනි! අනිත් උපමාවකු දු කළ මැනවැ" යි; "මහරජ! යම්සේ සැඞපහරින් පිරුණු මහාගඞ්ගා වෙහි හිදිසිදුරක් අහිමුඛ කරන්නේ නම්, හිදිසිදුරින් ගිය දිය මද වේ ද

කාළකාරාම සූත්‍ර දෙශනාව.

සෙස්ස බොහෝ වේ ද, එපරිද්දෙන් මා විසින් කී ගුණයෝ මද වෙති, සෙසු ගුණයෝ බොහෝ වෙති" "ස්වාමිනි! අනෙකු දු උපමාවක් කළ මැනවැ" යි; "මහරජ! මෙහි වාතසකුණ නම් වූවාහු අහසැ කෙළිමින් හැසිරෙති, (ඔහු) කුඩා ලිහිණිජාතියෙක; කිම ඒ ලිහිණියාගේ අහසැ පියාපහරන තැන බොහෝ වේ ද? සෙසු අහස බොහෝ වේ දැ?" යි; 'ස්වාමිනි! කුමක් වදාරන සේක් ද? ඔහු පියාපහරන පෙදෙස මද ය, සෙසු අහස ම බොහෝ ය" යි; "එපරිද්දෙන් ම මහරජ! මා විසින් මද වූ බුදුගුණකෙතෙක් කියන ලදහු, සෙසු ගුණයෝ ම බොහෝහ, අනන්ත යහ, අප්‍රමාණයහ" යි; "ස්වාමිනි! මතා කොට කියන ලදද, අනන්ත වූ බුදුගුණයෝ අනන්ත වූ ආකාශය සමග ම උපමා කරන ලදහ, ඇපි ස්වාමීන් වහන්සේට පැහැදුනම්හ, එතකුදු වුවත් සුදුසු වූවක් කරන්ට නො හැක්කම්හ; මේ මාගේ දුගී පඬුරෙක, මේ තඹපැන්දිවයිත මේ සියක් යොදුන් රජය ස්වාමීන් වහන්සේට දෙමු" යි; "මහරජ! තොප විසින් තමාගේ පැහැදුණු ආකාරය කරන ලද, ඇපි වූ කලි අපට දුන් රජය තොපට ම දෙමු, මහරජ! දැහැමෙන් සෙමෙන් රජය කරව" යි.

මහාසච්චක සූත්‍ර වර්ණනා නිමි. (6)

———:÷:———

චූලතණ්හාසඞ්ඛය සූත්‍ර වර්ණනා.

———:=:———

එවමේම සුතං යි චූලතණ්හාසඞ්ඛය සූත්‍ර යයි. **එහි සුඛාරාමේ මිගාරමාතු පාසාදෙ**= පූර්ණාරාම සඞ්ඛ්‍යාත විහාරයෙහි වූ මිගාරමවගේ පහයෙහි; එහි මෝ පිළිවෙළ කථා යැ:- යටගිය දවස කල්ප ලක්ෂයකින් මත්තෙහි එක් උපාසිකාවක් පියුමතුරා බුදුන් වහන්සේ පවරා

විසාඛාව හා පූර්ණාරාමය.

බුදුපාමොක් බික්සහනට දන් දී බුදුන් පාමුල හෙව් "අනාගතයෙහි නුඹ වහන්සේ වැනි බුදුකෙනෙකුට අග්‍රොපස්ථායිකා වෙම්ව" යි ප්‍රාර්ථනා කළා. ඕ කල්පලක්ෂයක් දෙව් ලොව ද මිනිස්ලොව ද සැරිසරා අප භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි හදදීයනුවර මෙණ්ඩකසිටුහු පුත් ධනඤ්ජයසිටුහුගේ ගෙයි සුමනාදෙවියගේ කුස පිළිසඳ ගත. යළි උපන් කල ඇට "විසාඛා" යි නම් කළාහුය. ඕ තොමෝ යම් කලෙක භාග්‍යවතුන් වහන්සේ හදදීය නුවරට වැඩි සේක් ද, එකල පන්සියයක් දූරියන් සමඟ භාග්‍යවතුන් වහන්සේට පෙරගමන් ගියා පළමු දැක්මෙහි ම සෝවාන් වූවාය. පසු කලෙක සැවැත්නුවර මිගාරසිටුපුත් වූ පුණ්වර්ධන කුමාරයාගේ ගෙට පැමිණියා; එහි දී ඇ මිගාරසිටුතෙම මවුතැන්හි තැබී; එහෙයින් "මිගාරමාතා" යයි කියනු ලැබේ. තවද- සඞ්ඝකුලයට යන්නා වූ ඇට පිය තෙම මහලිය නම් පළඳනාවක් කරවී; ඒ පළඳනාවෙහි යෙදීමට විදුරු නැළි සතරක් ගියහ, මුතු එකොළොස්නැළියෙක, පබළු දෙවිසි නැළියෙක, මැණික් තෙතිස්නැළියෙක, යන මෙයින් ද අත් සත්වනක් උතුම් රුවනින් ද නිමාවට ගියේය. එය හිස බහාලන ලද්දේ පාපිට දක්වා බසී; ඇතුන් පස්දෙනෙකුන්ගේ බලය ධරන්නාවූ ම සත්‍රියක් ඒ පළඳනාව ධරන්ට හැකි වෙයි. ඕ පසුකලෙක දසබලයන්ගේ අග්‍රොපස්ථායිකා වැ ඒ පළඳනාව විකොව නවකෙළකින් භාග්‍යවතුන් වහන්සේට විහාරයක් කරවන්නී කිරියක් පමණ බිම්පෙදෙසෙහි විහාරය කරවී. ඒ වෙහෙර උඩඹිමැ ගබඩා පන්සියයක් වෙති, යටඹිමැ පන්සියයක් ද, යි ගබඩා දහසකින් හෙබියේ වෙයි; ඕ තොමෝ "හුදු පහයම නො හොබනේය" යි එය පිරිවර සොට කුළුගෙවල් පන්සියයක් ද සුළු පහය පන්සියයක් ද දික්සාලා පන්සියයක් ද කරවිය; විහාරපූජාව සාරම්භකින් නිමාවට ගියේය මාගම්අත්බැවැ සිටි විසාඛාවගේ මෙන් අන්තෙනැත්තියකගේ බුදුසසුන්හි ධනපරිත්‍යාගයෙක් නම් නැති; පිරිමිඅත්බැවැ සිටියාවූ ද අනේපිඬුසිටුහුගේ මෙන් අනෙකෙකුගේ ධන පරිත්‍යාගයෙක් නැති. හේ වනාහි සුප්‍රතිෂ්ඨිත ක්ෂේත්‍රයක් වියදම් කොට සැවැත්නුවරින් දකුණුදෙස අනුරාධපුරයාගේ මහාවිහාරයට සමාන තැන්හි ජේතවන නම් මහාවිහාරය කරවිය; විසාඛා තොමෝ සැවැත් නුවරින් නැගෙනහිරදෙස උත්තමදෙවී විහාරයට සමාන තැන්හි පූර්ණාරාම නම් විහාරය කරවී. භාග්‍යවතුන් වහන්සේ මේ දෙකුලයන්ට අනුකම්පා පිණිස සැවැත්නුවර ඇසුරු කොට වාසයකරන සේක් මේ දෙවෙ

කෙර නිරතුරු වාසයෙන් විසූ සේක. එක් අතැවසක් ජේතවනයෙහි වෙසෙති, එක් අතැවසක් පූර්වාරාමයෙහි වෙසෙත්. මේ සමයෙහි වත්‍රාභාග්‍යවතුන් වහන්සේ පූර්වාරාමයෙහි වාසය කරන සේක. එහින් කියන ලදී- පුබ්බාරාමේ විහරමානු පාසාදේ යනු.

කිත්තාවතා නු ඛෝ භන්තෙ! සවාමිනි! කොපමණෙකින්; **සඞ්ඛිත්තෙන තණ්හාසඞ්ඛය විමුත්තෝ හොති=** තෘෂ්ණාසංක්ෂය (සඞ්ඛ්‍යාත) නිර්වාණයෙහි එය අරමුණු කොට මිදුණු සිත් ඇතිබැවින් තෘෂ්ණාසංක්ෂයෙහි විමුක්තවූවෙක් නම් සැකෙවින් කොපමණෙකින් වේ ද? යම් පිළිවෙතකින් තෘෂ්ණාසංක්ෂය විමුක්තයෙක් (= නිවන් අරමුණුකොට කෙලෙසුන් කෙරෙන් මිදුණේ) වේ ද, සම්බුද්ධශ්‍රාවක භික්ෂුහුගේ ඒ පූර්වභාග ප්‍රතිපදාව මට සැකෙවින් දෙශනා කළ මැනවැ, යි විචාරයි. **අවවත්තනිඤ්ඤෝ= ක්ෂය** ව්‍යය සඞ්ඛ්‍යාත අන්තය ඉක්මවන ලද නුයි "අවවත්තා" නම්, අත්‍යන්තවූ නිෂ්ඨාව මොහුට නුයි "අවවත්තනිඤ්ඤ" නම; **එකාන්තනිෂ්ඨා ඇත්තේ** නිරතුරු නිෂ්ඨා ඇත්තේ යන අර්ථයි. අත්‍යන්ත (= අන්තය ඉක්මවන ලද) යොගක්ෂේම ඇත්තේ නුයි **අවවත්තයොගක්ඛෙමී නම්; නිරතුරු** (සතර) යොගයෙන් ක්ෂේම වූයේ යන අර්ථයි. අත්‍යන්ත වූ බ්‍රහ්මචර්‍යා ඇත්තේ නුයි **අවවත්තබ්‍රහ්මචාරී නම්; නිත්‍යබ්‍රහ්මචර්‍යා ඇත්තේ** යන අර්ථයි. අත්‍යන්ත වූ පර්‍යවසානය මොහුට නුයි පළමු නයින් ම **අවවත්ත පරියොසාන නම්; සෙට්ඨෝ දෙවමනුස්සානං=** දෙවියන්ට ද මිනිසුන්ට ද ශ්‍රේෂ්ඨ වූයේ උතුම් වූයේ; මෙබදු මහණ කොපමණෙකින් වේ ද? "වහා සැකෙවින් ම මොහුගේ පිළිවෙත වදාළ මැනවැ" යි භාග්‍යවතුන් වහන්සේ යාඥා කෙරෙයි. වැළි කුමක් හෙයින්

ශක්‍රයා බුදුන් කරා එළඹීම

මේ තෙම මෙසේ ප්‍රභූසුලු වේ ද? යත්:- කෙළි (සුව) විඳිනු කැමති බැවිනි. මේ තෙම වනාහි උයන්කෙළි විධාන කොට සතර වරම් මහරජුන් ලවා සතර දිශා අරක් ගන්වා දෙදෙව්ලොව දිව්‍යසමූහයා විසින් පිරිවරන ලද්දේ අඩු තුන්කෙළක් නළුවන් සමඟ එරාවණ ඇතු පිට නැඟී උයන්දොර සිටියේ, මේ ප්‍රශ්නය සැලකි:- "කොපමණෙකින් නිවන් අරමුණු කොට කෙලෙසුන් කෙරෙන් මිදුණු රහත්හුගේ සැකෙවින් පැමිණිය යුතු පූර්වභාග ප්‍රතිපදාව වේ දෝ හෙ," යි, අනතුරු ව ඔහුට මේ සිත විය:- "මේ ප්‍රශ්නය ඉතා ම සප්‍රීක යැ, ඉදින් මම මේ ප්‍රශ්නය නො ඉගෙන ම උයනට පිවිසෙම් නම්, සදෙර අරමුණුවලින් අලඟන ලද්දෙම් යළි මේ පැනය නො සලකන්නෙම්; උයන්කෙළි තිබේවා, ශාස්තෘන් වහන්සේ සමීපයට ගොස් මේ පැනය පිළිවිස උගත් පැන ඇත්තෙම් උයනෙහි ක්‍රීඩා කරන්නෙම්" ඇත්තඳ හිඳ අතුරුදහන් වූයේ භාග්‍යවතුන් සමීපයෙහි පහළ විය. ඒ සතරවරම්මහරජහු අරක් ගෙන සිටි විධානයෙන් ම සිටියාහුය, පිරිවර දිව්‍යසමූහයා ද, නළුසමූහයා ද, එරාවණ ඇත් රජ ද එහි ම උයන්දොර සිටියේය. මෙසේ මේ තෙම කෙළි (සුව) විඳිනු කැමතිබැවින් ප්‍රභූසුලු වෙමින් මෙසේ කියා.

සංඛිත්ත ධම්මා නාලං අභිනිවෙසාය යන මෙහි සියලු ධර්මයෝ නම්? පඤ්චුපාදානක්ඛන්ධයෝ යැ, වාදශාස්තෘන්ගේ යෝ යැ, අන්‍යවාදශාස්තෘහු යැ යන මොහුයි; ඔහු සියල්ලෝ මැ තෘෂ්ණාදෘෂ්ටි වශයෙන් ඇතුළත් වැ ගැනීමට නො සුදුසු යැ, නො පිරියත්හු යැ, නො සමත්හු යැ, අයුතු වූවාහු යි. කුමක් හෙයින්ද? ගත් ආකාරයෙන් නො සිටින හෙයිනි. යම්හෙයකින් ඔවුහු නිත්‍යයෝ යයි ගන්නාලද්දාහු නමුදු අනිත්‍යයෝ ම වෙත් ද, සැප වූවාහු යයි ගන්නා ලද්දාහු නමුදු දුක්වූවාහු ම වෙත් ද, ආත්ම වූවාහු යයි ගන්නා ලද්දාහු නමුදු අනාත්ම වූවාහු ම වෙත් ද, එහෙයින් අභිනිවෙස යට (= තෘෂ්ණාදෘෂ්ටීන් ඇතුළත් ව ගැනීමට) නො සුදුසු යි. **අභිජානාති**= අනිත්‍ය යැ දුඃඛ යැ අනාත්ම යැයි ඥාතපරිඥාවෙන් මොනොවට දනගනී; **පරිජානාති**= එසේ ම තීරණපරිඥාවෙන් සම්ප්‍රකාරයෙන් දනගනී; **යං කිඤ්චි වේදනං**= යම්කිසි පිරිසෙයින් පඤ්චවිඥානය සමඟ යෙදුනාවූ ද යම් කිසි මද පමණ වූ ත් වේදනාවක් විඳී ද; මෙයින් භාග්‍යවත්හු වහන්සේ ශක්‍රදෙවෙන්ද්‍රයාට වේදනා වශයෙන් විවේචනය කොට අරූපපරිග්‍රහය දක්වන සේක. යලි ඉදින් වේදනා කම්ඨස්ථානය යට නො කියන ලද වන්නේ නම්, මෙතැන්හි කියයුතු වන්නේය, යම්හෙයකින් යට කියන ලද ද, එහෙයින් සතිපට්ඨානයෙහි කී නියාමයෙන් ම දතයුතු.

අනිච්චානුපස්සී යන මෙහි අනිත්‍යය දතයුතු යැ, අනිත්‍යානුදර්ශී දතයුත්තී යැ, අනිත්‍යානුදර්ශී දතයුත්තේ යි. **එහි අනිච්ච නම්?** පඤ්ච ස්කන්ධයෝ යැ; **අනිච්චානුපස්සනා නම්?** පස් කඳ ක්ෂයවශයෙන් ව්‍යයවශයෙන් දක්නා ඥාන යැ; **අනිච්චානුපස්සී නම්?** ඒ ඥානයින් සමන්විත වූ පුද්ගල තෙමේ යි. **එහෙයින් අනිච්චානුපස්සී විහරති**= අනිත්‍යවශයෙන් නැවත නැවත ඥානයින් බලමින් වෙසෙයි යන මේ මෙහි අර්ථ යි. **විරාගානුපස්සී** යන මෙහි ක්ෂයවිරාගය ද අත්‍යන්තවිරාගය දැ'යි විරාගයෝ දෙදෙනෙකි. එහි සංස්කාරයන්ගේ ක්ෂයවීම ක්ෂයහෙයින් දක්නා විදර්ශනාව ද අත්‍යන්තවිරාග වූ නිර්වාණය විරාග හෙයින් දක්නා මාර්ගඥානය ද "විරාගානුපස්සනා" නමුදු, ඒ දෙකින් යුක්ත වූ පුද්ගල තෙම "විරාගානුපස්සී" නම; ඔහු සඳහා කියන ලදී- **විරාගානුපස්සී** යනු; විරාග වශයෙන් නැවත නැවත ඥානයින් බලන්නේ යන අර්ථ යි. **නිරෝධානුපස්සී** යන්නෙහි ද මේ ම නයයි. ඒ එසේ මැයි- නිරෝධය ද ක්ෂයනිරෝධ යැ, අත්‍යන්තනිරෝධ යැ, යි විවිධ වූයේ මැයි. **පටිනිස්සග්ගානුපස්සී** යන මෙහි දුරලීම "පටිනිස්සග්ග" යයි කියනු ලැබේ. හෙ ද පරිච්චාගවොස්සග්ග යැ, පක්ඛන්දනවොස්සග්ග යැයි විවිධ වෙයි; **එහි පරිච්චාගවොස්සග්ග නම්?** විදර්ශනාව යැ; සැබව- ඕ විදර්ශනා තදඞ්ගවශයෙන් කෙලෙසුන් ද සංස්කාරයන් ද දුර ලයි. **පක්ඛන්දනවොස්සග්ග නම්?** මාර්ග යැ; සැබව- හේ මාර්ගය නිවනට අරමුණුවශයෙන් ප්‍රසක්ඛන්දනය(=පැනසිටීම) කෙරෙයි; නොහොත් දෙ කරුණෙන් ම හේ මාර්ග වොස්සග්ග මැයි,

සමූලෙඡද වශයෙන් සකඞ්ඛයන්ගේ ද කෙලශයන්ගේ ද දුරලීම කරණ හෙයින් ද, නිබ්බාණයෙහි ත් පැනසිටින හෙයින් දැයි; එහෙයින් කෙලේ සුන් ද සකඞ්ඛයන් ද පරිත්‍යාග කෙරේ නුයි පරිච්චාගවොස්සග්ග යැ, නිරොධ සඞ්ඛ්‍යාත නිබ්බාණධාතුවෙහි සිත ප්‍රසක්ඛදය (= පැනයැම) කෙරේ නුයි පක්ඛන්දනවොස්සග්ග යැ යන මේ දෙක ම මාගධියෙහි සම්වෙයි; ඒ දෙකින් යුක්ත වූ පුදගල මේ පටිනිස්සග්ගානු පස්සනාවෙන් යුක්ත බැවින් "පටිනිස්සග්ගානුපස්සී" නම් වෙයි; ඔහු සඳහා වදාරන ලදී- **පටිනිස්සග්ගානුපස්සී** යනු. **න ච කිඤ්චි ලොකෙ උපාදියති**= කිසි එක ද සංස්කාරයක් තෘෂ්ණාවශයෙන් උපාදානය නො කෙරෙයි, නො ගනී, පරාමර්ශය නො කෙරෙයි; **අනුපාදියං න පරිතස්සති**= නො ගන්නේ තණ්හාපරිතස්සනාවෙන් ත්‍රාස නො වෙයි; **පච්චත්තං යෙව පරිනිබ්බායති**= තෙමේ ම කෙලෙස් පිරිනිවනින් පිරිනිවෙයි; **ඛීණා ජාති** යනාදියෙන් ඔහුගේ ප්‍රත්‍යවෙක්ෂණා ව දක්වන ලදී. මෙසේ භාග්‍යවතුන් වහන්සේ සක්දෙව්රජු සැකෙවින් ඛීණාශ්‍රවයාගේ පූර්භාග ප්‍රතිපදාව විවාරන ලද්දහු සැහැල්ලු කොට සැකෙවින් ම වහා වදාළ සේක.

අවිදූරෙ නිසිනෙනා හොති= අනතුරු කුළුගෙයි හුන්නේ වෙයි; **අභිසමෙච්ච**= හුවණින් අභිසමය කොට දැන යන අර්ථයි. මේ කියන ලද වෙයි- කිමෙක් දෝ හෝ මේ තෙම දැන අනුමොදන් වී ද, නොහොත් නො දැන ම හිස සැලි දැයි. යළි කුමක් හෙයින් උන් වහන්සේට මේ සිත වී ද? යත්:- තෙරුන් වහන්සේ වනාහි භාග්‍යවතුන් වහන්සේගේ පැහ විසඳුම්හි ශබ්දය නො ඇසූහ, එහෙත් **සක්දෙව්රජුගේ එවමෙතං භගවා! එවමෙතං සුගත!** යි අනුමොදනශබ්දය ඇසූහ. සක්දෙව්රජ් මහඟඩින් අනුමෝදන් වී ල. යළි කුමක් හෙයින් භාග්‍යවතුන්ගේ ශබ්දය නො ඇසි ද? යත්:- පිරිස් වූ පමණින් විඤ්ඤත්තිය (= හැඟවීම) හෙයිනි. සැබවි දහම්දෙසන බුදුවරුන්ගේ ශබ්දය එකව බැඳුණු සක්වළ කෙළවර කොට ඇති පිරිස විසිනුදු අසනු ලැබෙයි, එහෙත් කෙළවර ඉක්මවා අඟුලක් පමණකු දු පිවත නො නික්මෙයි; කුමක් හෙයින්? "මෙබඳු මධුරකථාවී නිරවීක වැ නො යේව" යි කියායි. තවද- එකල භාග්‍යවතුන් වහන්සේ මිගාරමාතෘප්‍රාසාදයෙහි සත්රුවන් කුළුගෙයි සිරිගැබ හුන්නාහු වෙති; ඒ පහයට දකුණුපස සැරියුත්තෙරුන් වසන කුළුගෙය ද වම්පස මහ මුගලන් තෙරුන් වසන කුළුගෙය ද වෙයි; අතරැ සිදුරින් විවර වූ අවකාසයෙක් නැති. එහෙයින් තෙරුන් වහන්සේ භාග්‍යවතුන්ගේ ශබ්දය නො ඇසූහ, ශක්‍රයාගේ ශබ්දය ම ඇසූහ යි. **පඤ්චඞ්ගිකතූරියානි**= පඤ්චාඞ්ගිකතූර්‍යයන් පන්සියයකින්; පඤ්චාඞ්ගිකතූර්‍ය නම්? ආතත යැ විතත යැ ආතතවිතත යැ සුසිර යැ ඝන යැ යන මේ පසින් යුක්ත වෙයි. එහි **ආතත** නම්- සමින් වෙළන ලද බෙරආදීන් අතුරෙහි එක් මුහුණක් ඇති තූර්‍ය

පඤ්චාඞ්ගික තූර්‍ය

ගැ; විතත නම්- දෙ මුහුණක් ඇත්තේ ගැ; ආතත විතත නම්- තනින් බඳනා ලද ඇටබෙර ආදිය ගැ; සුසිර නම්- වස්කුලල් ආදිය ගැ; ඝන නම්- කුළුතාලම් ආදිය සි. **සමපපිතෝ**= උපගත (= යුකත) වූයේ; **සමඞගිභූතෝ** යනු ඊට ම වෙවවන සි. **පරිචාරෙති**= සැපත් අනුභව කෙරෙමින් ඒ ඒ තැන ඉදුරන් හසුරුවයි; මේ කියන ලද වෙසි- පිරිවරා වාදනය කරන පන්සියක් තූර්‍යයන් ගෙන් යුකත වැ දිවසැපත් වලදයි. **පවිපඤ්ඤාමෙථා**= ඉවත් කොට, නිශශබද කරවා යන අර්ථ සි. ඒ එසේ මැයි - යම් සේ මෙකල සැදැහැති රජවරු ගරුබුහුමන් කටයුතු මහණකු දැක "අසුවල් නම් සවාමීන් වහන්සේ වඩිති, දරුවෙනි! ගායනා නො කරවු, වාදනය නො කරවු, නො නටව" සි නළුවන් නවතත් ද; ශක්‍ර ද තෙරුන් දැක එසේ කෙළේය. **චිරසසං බො මාරිස! මොගගලලාන! ඉමං පරියායමකඛාසි**= ලෙව්හි පියවින් මෙබඳු වූ ප්‍රියප්‍රකාශක වචනය වෙයි; සැබව- ලෝවැස්සෝ කලකින් ආවාවූ ද නො ආව්රු ද මනවඩන පියවී ඇති ආවහු දැක "භවත් කොයි සිට ආයෙහි ද? භවත් කලකින් ආයෙහි, කෙසේ නුඹ විසින් මෙහි ධර්මට මඟ දතු ද? කිම මංමුළා වූයෙ හි ද?" යනාදිය කියති; මේ වූ කලි පෙර ආව්රු බැවින් ම මෙසේ කිය. සැබව- තෙරුන් වහන්සේ කලින් කල දෙව්ලොව චාරිකාවෙහි යන සේක් මය. එහි **පරියායමකඛාසි**= චාරය කෙළේය; **යදිදං ඉධා ගමනාය**= යම් මේ මෙහි ධර්මට චාරයෙක් වේ ද, එය කලකින් කෙළේය, සි කියන ලද වේ. **ඉදමාසනං පඤඤපෙතබං** යනු ගොදුන් උසඇති මිණි පලඟක් පනවා මෙසේ කියයි.

බහුකිචචා බහුකරණීයා යන මෙහි යම් තෙනෙක්නට බොහෝ කටයුතු වෙත් ද, ඔවුහු බහුකිච්ච නම් වෙති; බහුකරණීයා යනු ඊට ම වෙවවන සි. **අපපෙව නෙසං තථා කරණීයෙන**= සිය කටයුතු මොහුට ඔද ගැ, බොහෝ නො වෙයි, වැලි දෙවියන්ගේ කටයුතු බොහෝ සි; සැබව- පොළොවෙහි පවත් කප්රුක් මාගම් ආදීන් සඳහා **දෙවියන්ගේ කටයුතු** අට්ට (= යුකතවිහු) ශක්‍රයා සමීපයෙහි සිදෙති, එහෙයින් නියම කරමින් කිය- **අපිච දෙවානං යෙව නාම්නිංසානං කරණීයෙන** සි. ඒ එසේ මැයි- දෙවියන්ගේ සිතෑ ද පුත්‍ර ද ඇතෙහි උපදින්, පාදපරිචාරිකා ස්ත්‍රීහු යහනෙහි උපදින්, ඔවුන් සැරසීම් සැලදීම් කරන දෙවතාවෝ යහන පිරිවරා උපදින්, වතා වත්කරුවෝ ඇතුළුවීමතැ උපදින්, මොවුන් සඳහා යුකති කිණිමෙක් නැති; වැලි යම් තෙනෙක් සිමාඅතරැ උපදින් ද, ඔවුහු මා සතු ද? නා සතු ද? සි නිශවය කරන්ට නො හැක්කාහු යුකති බෙණෙති; සක් දෙව්රජු විචාරන්. හෙතෙම යමෙකුගේ විමන ඉතා ආඪය ද ඔහු සතු යයි කියයි, ඉදින් විමන් දෙක ම සම තැන වෙත් ද, (එකල) යමෙකුගේ විමන බලමින් සිටියේ නම් ඔහු සතු යයි කියයි; ඉදින් එකකු දු නො බලා නම්, ඔහු දෙදෙනාගේ කලහ සිඳීම පිණිස තමා සතු කෙරෙයි;

මේ සඳහා- **දෙවානං යෙව තාවතිංසානං කරණීයෙන** යි කියා. තවද- ඔහුට මෙබඳු වූ ක්‍රීඩාකෘත්‍ය ද කරණීය මැයි **යං නො බිම්බමෙව අනන රඛාඝනි**= යම් හෙයකින් අප විසින් (ගත්තා ලද්ද) වහා ම අඳුරෙහි රූපයක් මෙන් නො පෙනෙයි, "සවාමිනි! මේ කරුණෙන් මම ඒ පැන විසඳුම් නො සලකමි" දක්වයි.

තෙරුන් වහන්සේ කුමක් හෙයින් මේ යඤ්ඤ නො සලකනබැව් දක්වා ද? පසකින් ගෙන හැසිරේ ද? යි ආවර්ජනය කරන සේක්- "දෙව්යෝ නම් මහාමූඪයෝ වෙති, සදෙර අරමුණුවලින් අල ලනු ලබන්නාහු තමා කෑ නො කෑ බව ද පී නො පී බව ද නො දනිති, මෙහි කරන ලද්ද තෙලතැන්හි මුළාවෙයි" **දූනඟත්ථ**. වැළි කිසිවෙක් මෙසේ කීහු:- තෙරුන් වහන්සේ මොහු විසින් ගරුබුහුමින් කටයුත්තෝය, එහෙයින් දූන් ම ලොකයෙහි අග්‍ර පුද්ගලයන් සම්පයෙහි පැන උගෙන ආයේ දූන් ම නළුවන් අතරට පිවිසියේය,යි මෙසේ මට තෙරුන් වහන්සේ තර්ජනය කෙරෙති, බියෙන් මෙසේ කී" යයි. එසේ වූ කලි කොහොන්බව නම් වෙයි, ආර්‍යශ්‍රාවක යාට ද කොහොන්බවක් නම් නැති, එහෙයින් මුළාබැවින් ම නො සැලකි යයි දතයුතු. මත්තෙහි කුමක් හෙයින් සැල කි ද? යත්:— තෙරුන් වහන්සේ ඔහුට සොම්නස් - සංවෙග උපදවා මොහය බැහැර කළහ, එහෙයින් සැලකි. මේවිට ශක්‍ර පෙර තමා පිළිබඳ එක් කල කරණක් තෙරුන්ට දන්වන්ට **භූතපුබ්බං**= යනාදිය කීය. එහි **සම්පබ්බුළ්හා**= සන්නිපතිත වූයේ, රැස් වූයේ; **අසුරා පරාජිනිංසු**= අසුරයෝ පරාජයට පැමිණියාහුය; යලි කවරකලක ඔවුහු පරදවන ලද්දහු ද? යත්:- ශක්‍රයා උපන් කල්හි යැ.

ඒ මෙසේ යැ- **සක්දෙව්රජ අනතුරු අත්බැවැ මඟධරට මච්ලගම් පණ්ඩිත වූ ව්‍යක්ත වූ මඝ නම් මානවකයෙක් විය, බෝසතුන්ගේ වය්‍යාව (= ව්‍රතසමාදානය) මෙන් ඔහුගේ වය්‍යාව විය; හෙතෙම** මඝමානවක **තෙතිසක් පුරුෂයන් ගෙන කුසල් කෙළේය. එක් දිනක් තමාගේ ඔ කුවණින් විමසා ගම්මැද මහාජනයා රැස්වූ තැන්හි කසළ දෙපසින් බැහැරකොට එ තැන රමණීය කෙළේය; තැවත එහි ම මණ්ඩපයක් කරවිය; පසුව කල් යන කල්හි ශාලාවක් කරවී. තවද- ගමින් නික්ම ගව්වක් ද අඩයොදුනක් ද තුන්ගව්වක් ද යොදුනක් ද හැසිර ඒ යහලුවන් සමඟ විෂම තැන් සම කෙළේය, ඔහු සියල්ලෝ ම එකවර්‍ෂයෙ ව ඒ ඒ තැන හෙයක් කරන්ට සුදුසු තැන හෙය ද, මණ්ඩප ශාලා පොකුණු මල්ගස් සිටුවීම්දියට සුදුසු තැන්හි මණ්ඩපා දිය ද, කරමින් බොහෝ පින් කළාහුය. මඝමානවක සපත්නීක තපදයන් පුරා කය බිඳීමෙන් (පසු) යහලුවන් සමඟ තාවතිංසභවනයෙහි උපන. එකල අසුරගණයා තාවතිංසභවනයෙහි වෙසෙසි; ඔහු සියල්ලෝ දෙවි යන්ට සමාන ආයු ඇත්තාහු සමාන වණ් ඇත්තාහු ද වෙති; ඔවුහු**

පිරිස් සහිත ශක්‍රයා දැක- "අලුත උපන් නවකදිව්‍යපුත්‍රයෝ ආවාහුය" යි මහත් පැනක් සැරසූහ. ශක්‍ර තෙම දිව්‍යපුත්‍රයන්ට සන් දින- "අප කුසල් කරන්නවුන් විසින් අනුන් සමඟ සාධාරණ කොට නො කරන ලද, තෙපි ගණඩපානය නො බොවු, බී පමණක් ම කරව" යි; ඔහු එසේ කළාහුය. බාල වූ අසුරයෝ ගණඩපානය බී මත් වූවාහු නින්දට බැසගත්තාහුය. ශක්‍ර තෙම දෙවියන්ට සන් දී ඔවුන් පා හන්වා මහ මෙර පත්ලෙහි දැම්මේවි. මහමෙර යටභාගයෙහි වනාහි තව්තිසාදෙව් ලොව පමණ වූ ම අසුරභවන නම් ඇති, එහි අසුරයෝ වෙසෙති; ඔවුන් ගේ සිත්පළොල් නම් රුකෙක් ඇති, ඒ රුක පිපෙන කල ඔවුහු— 'මෝ තව්තිසා නො වෙයි, ඇපි ශක්‍රයා විසින් නුළුම්හ" යි දැනගනිත්. ඔවුහු "ඔහු ගනුව" යි කියා මහමෙර ඇඹුරුකරමින් වැසි වටකල්හි තුඹස පත්ලෙන් වේමැස්සන් මෙන් නැංගාහුය එහි කලෙක දෙවියෝ දිනති, කලෙක අසුරයෝ දිනත්. යම් කලෙක දෙවියන්ට ජය වේ ද, එකල අසුරයන් මුහුදුපිට තෙක් ලුහුබදිති; යම් කලෙක අසුරයන්ට ජය වේ ද, එකල දෙවියන් වෙදිකාතලය තෙක් ලුහුබදිත්. ඒ සඞ්ග්‍රාම යෙහි වනාහි දෙවියන්ට ජය විය; දෙවියෝ අසුරයන් මුහුදුපිට තෙක් ලුහුබැන්දාහුය. ශක්‍ර අසුරයන් පලවාහැර පස් තැනෙක අරක් දෙවිය. මෙසේ අරක් දී වෙදිකාතලයෙහි වප්‍රභස්ත වූ ඉඳුප්‍රතිමාවන් තැබිය. අසුරයෝ කළින් කල නැඟී ඒ පිළිම දැක "ශක්‍ර නො පමාව සිටී ය" යි එයින් ම නවතිත්.

නනෝ පටිනිවත්තන්ති= දිනූ තැනින් නැවතී; **පරිචාරිකායෝ**= මල් ගෙතීම් ආදි මෙහෙ කරන්නාහු; **වෙස්සවණෝ ච මහාරාජා**= හේ වනාහි ශක්‍ර භව වලලහ ඇ, ඉතා විස්වැසි ඇ; එහෙයින් ශක්‍රයා සමඟ ගියේය. **පුරක්ඛත්වා**= ඉදිරියෙහි කොට; **පවිසිංසු**= පිවිස ද යළි දෙර මල් අඩවලු කොට බලමින් සිටියාහුය; **ඉදම්පි මාරිස! මොග්ගල්ලාන! වෙජයන්තස්ස පාසාදස්ස රාමණෙය්‍යකං**= "නිදුකාණෙනි! මෙඉදාල්‍යා යනයන් වහන්ස! විජයොත්පාසාදයේ මේ රමණීය බව ද බලනු මැන රන්වැම් බලනු මැන, රිදීවැම්- මිණිවැම්- පබළුවැම්- පියුම්රුමිණිවැම්- මැසිරිගල් වැම්-සත්රුවන්වැම් (බලනු මැන) ඔවුන්ගේ ම සඞ්ඛ්‍යාදිමය වූ පේකඬෙහි ව්‍යාලරූපයන් බලනු මැනවැ" යි මෙසේ වැම්පෙළ ආදි කොට රමණීබැව් දක්වමින් මෙසේ කිහු. **යථා නං පුබ්බේ කතපුඤ්ඤස්ස**= යම්සේ පෙර කළ පින් ඇත්තෙකුගේ පරිභොගසථානයක් හෙඬියයුතු ද, එපරිදි දෙන් ම හොබී යන අපී යි. **අනිබාළ්හං බෝ අහං භගවතෝ පමත්තෙන විහරාමි**= තමාගේ පහයෙහි නළුවිරිවරින් සම්පත්තියගේ වශයෙන් අති ශයින් මත්වූයේ; **ඉඛාභිසඞ්ඛාරං අභිසඞ්ඛාසිං**= සෘඩියක් කෙළේය; ආපොකසිණයට සමවැද පහය පිහිටි අවකාසය ජලය වේව,යි ඉටා පහ කැණියෙහි පය මිපවැගිල්ලෙන් පහළේය; ඒ පහය දියවැටී තැබූ මුවවිට ඇගිල්ලෙන් පහළ පාත්‍රයක් යම්සේ නම් ඔබිනොබ කම්පා වේද, සැලේද, නො පිහිටා ද, එපරිද්දෙන් කම්පා විය, අතිශයින් කම්පා විය, අතිශ

සින් වෙවුලීය; වැම්-දෙරබා-කැණිමඩුලු-ගොනැස් ආදීහු "කර කර" යන ශබ්ද නගමින් වැටෙන්ට මෙන් පටන්ගත්හ. එහෙයින් කියනලදී- **සඞ්කම්පෙසි සම්පකම්පෙසි සම්පවෙධෙසි** යනු. **අච්ඡරියබ්භුතචිත්තා ජාතා**= අහෝ ආශ්චර්‍ය්‍ය යැ, අහෝ අද්භූත යැයි මෙසේ භවඟත් ආශ්චර්‍ය්‍ය - අද්භූත ඇත්තාහු ද භවඟත් තුෂ්ටි ඇත්තාහු ද වූහ; උපන් බලවත් සොම්නස් ඇත්තාහු- **සංවිග්ගා**= උවෙග වූවහු, සැලුනහු; **ලොම හඞ්ජනා**= භවඟත් ලොමුදහ ඇත්තහු; කසුන්බිතෙක තැබූ මණිනාග දන්නයන් මෙන් උඩුඅක් වූ ලොමින් ගැවසුණු සිරුරු ඇත්තහු යන අර්ථ සි. තවද- මේ ලොමුදහ නම් සොම්නසින් ද දෙම්නසින් ද වෙයි; මෙහි වූ කලි සොම්නසින් උපත. යම්හෙයකින් තෙරුන් වහන්සේ ශක්‍රයා සොම්නසින් වූ සංවෙගයෙන් චලිත කරවන්ට ඒ පෙළහර කළ සේක් ද, එහෙයින් සොම්නසින්වූ සංවෙගයෙන් සැලුණු ලොමුදහ ඇත්තහු දැන යන අර්ථ සි.

ඉධාහං භාරිස= මෙවිට යම් හෙයකින් තෙරුන් විසින් සොම්නස් සංවෙග උපදවා ඔහුගේ මොහදුරු දුරුකරන ලද ද, එහෙයින් සලකා මෙසේ කීය. **එසෝ නු තෙ භාරිස! සෝ භගවා සත්ථා**= නිදුකාණෙනි! "තෙපි කොයි ගියහු දැ?" යි කී කල "මාගේ ශාස්තෘන් වෙතට ය" යි කීයවු, මේ දෙව්ලොව එක්පියකින් මෙන් සිටිවු, යම්ක්‍හු තෙපි මෙසේ කීයවු නම්, නිදුකාණෙනි! මේ තෙම තොපගේ ඒ භගවත් ශාස්තෘ දැ? යි විචාළාහුය. **සබ්‍රහ්මචාරී මෙ එසෝ** යන මෙහි එකෙක් ඇති තෙරුන් වහන්සේ අනගාරියහ, අභිනීහාරසම්පන්න වූ අග්‍රශ්‍රාවක වූහ, ශක්‍ර අගාරික යැ, එහෙත් මොවුහු මාගීබ්‍රහ්මචර්‍ය්‍යාවශයෙන් සබ්‍රහ්මචාරීහු වෙත් ද, එහෙයින් මෙසේ කීය. **අහෝ නූන තෙ භගවා සත්ථා**= තොපගේ සබ්‍රහ්මචාරී තෙමේ ත් මෙසේ මහත් සෘඩි ඇත්තේ යැ, වැලි තොපගේ ඒ භගවත් ශාස්තෘන් වහන්සේ ආශ්චර්‍ය්‍ය යැ, එකාන්තයෙන් මහත් සෘඩි ඇත්තාහු වනැ,යි ශාස්තෘන් වහන්සේගේ සෘඩිප්‍රාතිහාර්‍ය්‍ය දශීනයෙහි උපන් අභිලාෂ ඇති ව මෙසේ කීහු. **අඤ්ඤතරස්ස**= ප්‍රසිඛ වූවන් අතුරෙන් එක්තරා එහෙක්හුගේ ඒ එසේ මැයි- ශක්‍ර තෙම ප්‍රසිඛ වූවන් අතුරෙන් අන්‍යතරයෙකි. **සෙස්ස** සියලු තැන්හි ප්‍රකට මැයි. යළි භාග්‍යවතුන් වහන්සේ දෙශනාව අනුසන්ධි වූ ලෙසින් ම නිමවූ සේකි.

චූලනණ්හාසඞ්ඛය සූත්‍ර වණ්ණනා නිමි. (7)

—————:=:—————

මහාතණ්හාසඞ්ඛය සූත්‍ර වර්ණනා.

—————:=:—————

එවමෙම සුතං යි මහාතණ්හාසඞ්ඛය සූත්‍රය යි. **එහි දිට්ඨගතං**= අල ගද්දූ සූත්‍රයෙහි ලබ්ධිමාත්‍රය "දිට්ඨගත" යි කියන ලද, මෙහි ශාශ්වතදෘෂ්ටි ය යි; ඒ මහණ ද බහුශ්‍රැත යැ, මේ තෙම අල්පශ්‍රැත යැ, ජාතකභාණක යෙකි. භාග්‍යවතුන් ජාතකයක් වදාරා "මහණෙනි! මම එ සමයෙහි වෙස තුරු වීමි, මහෞෂධ – විධුරපණ්ඩිත – සෙනකපණ්ඩිත – මහාජනකරජ වීමි" අවසන් කරන්නවුන් අසයි. එකල ඔහුට මේ සිත විය:- "මේ රූප – වේදනා – සංඥා – සංස්කාරයෝ ඒ ඒ තැන්හි ම නිරුඬ වෙති; විඥානය වැළි මෙලොවින් පරලොවට පරලොවින් මෙලොවට

සාතිභික්ෂුවගේ දෘෂ්ටිය. දිවෙයි, හැසිරේ ය" යි ශාශ්වතදෘෂ්ටිය උපන. එයින් කියා– **නාඤ්ඤත්‍රිදං විඤ්ඤාණං සන්ධාවති සංසරති අනඤ්ඤං** යනු. එහෙත් සම්මාසම්බුදුන් විසින් "විඥානය ප්‍රත්‍යයෙන් උපදනේය, ප්‍රත්‍යය ඇති කල්හි උපදී, ප්‍රත්‍යයෙන් වෙන් ව විඥානයාගේ ඉපදීමෙක් නැතැ" යි වදාරන ලද, එහෙයින් මේ මහණ බුදුන් විසින් නො වදාරන ලද්දක් කියයි, ජිනවක්‍රයෙහි පහර දෙයි, වෙසරද නුවණ පළිබඳයි, අසනු කැමති ජනයා වඤ්චා කෙරෙයි, ආර්‍ය්‍ය මාර්ගයෙහි සරසට වැටී මහාජනයාට අහිතයට දුකට පිළිපන්නේය; යම්සේ රජුගේ රාජ්‍යයෙහි මහසොරෙක් උපදනේ මහාජනයාට අහිත යට දුකට උපදී ද, එපරිද්දෙන් බුදුසසුන්හි සොරෙක් ව මහාජනයාට අහිතයට දුකට උපනැ,යි දතයුතු. **සම්බහුලා භික්ඛූ**= දනව්වැසි පිණ්ඩ පාතිකභික්ෂූහු; **නෙතුප්පඝඨකමිංසු**= මේ තෙම පිරිස් ලැබ සසුන ද අතුරැ දහන් කරවන්නේය, යම් තාක් පක්ෂය නො ලබා ද, ඒ තාක් ඔහු දෘෂ්ටි යෙන් වෙන් කරමු,යි ඇසු ඇසු තැනින් ම නො සිට නො හිඳ එළඹියා හුය. **කතමං නං සාති! විඤ්ඤාණං**= සාතිය! තෝ යම් විඥානයක් සඳහා කියෙහි ද, ඒ විඥානය කුමක් දැ? යි. **යවායං භන්තෙ! වදෙ වෙදෙය්‍යෝ තත්‍ර තත්‍ර කල්‍යාණපාපකානං කම්මානං විපාකං පටිසං වෙදෙති**= සවාමිනි! මේ යමෙක් කථාකෙරේද, (සුවදුක්) විඳී ද, මේ යමෙ කුත් ඒ ඒ තැන කුශලා කුශල කර්‍මයන්ගේ විපාකය විඳී ද, සවාමිනි! යමක් සඳහා මම කියම් ද මේ ඒ විඥානය,යි. **කස්ස නු ඛෝ නාම**= කවර ක්ෂත්‍රියයකුට හෝ බ්‍රාහ්මණයකුට හෝ වෛශ්‍ය-ශූද්‍ර-ගෘහස්ථ-ප්‍රව්‍රජිත-දිව්‍ය-මනුෂ්‍යයන් අතුරෙන් එකෙකුට;

අථ ඛෝ භගවා භික්ඛූ ආමන්තෙසි= කුමක් හෙයින් ඇමතූ සේක් ද? සාතිභික්ෂු හට යම්හෙයකින් මේබදු සිතක් වී ද– "ශාස්තෘන් වහන්සේ මට මොඝපුරිස යි වදාරති, මොඝපුරිස යයි කී පමණින් ම මාර්ගඵලයන්ට නො ද උපනිශ්‍රය වන්නේ නො වෙයි, **"අනිලඤ්ඡං ඛෝ මොඝපුරිස! බාහුල්ලාය ආවත්තෙතා"** යි වදාරන ලද උපසෙන තෙර ද යම්හෙයකින් මෑතකාලයෙහි ගැවෙමින් වැයම් කරමින් අභිඥවන් පසක් කෙළේ ද,

මම ත් විඤ්ඤාණය දැඩි ව ගෙන මගපලයන් පසක් කරන්නෙමි" එකල ඔහුට භාග්‍යවතුන් වහන්සේ සිදුණු ප්‍රත්‍යය ඇති මේ තෙම ශාසනයෙහි නො වැඩෙන සවභාව ඇත්තෙකැ,යි දක්වන සේක් භික්ෂූන් ඇමතූ සේක. **උසම්භතනෝ** යනාදිය යට කී අදහස් ඇත්තේ මය. **අථ බෝ භගවා** යන මේ ද වෙන ම අනුසන්ධියෙකි. සාතිභික්ෂු හට මේ සිත විල- "භාග්‍යවතුන් වහන්සේ මාගේ මාගීඵලයන්ට උපනිශ්‍රය නැතැ,යි වදරති, උපනිශ්‍රය නැති කල්හි කුමක් කරන්ට හැකි ද? තථාගතයෝ උපනිශ්‍රය සහිත වූවහුට ම දහම් නො මැ දෙසති, යම් කිසිවෙකුට දෙශනා කෙරෙත් මය, මම බුදුන් සමීපයෙන් සුගතාවවාදය ලැබ සැපතට පැමිණෙන කුශලයක් කරන්නෙමි" ඉක්බිති ඔහට භාග්‍යවතුන් වහන්සේ "ඔස් පුරුෂය! මම තට අවවාදයක් හෝ අනුශාසනාවක් හෝ නො දෙමි" සුගතාවවාදය පිළිබඳන සේක් මේ දෙශනාව ආරම්භ කළහ. එහි අරුත් යට කී නියෙන් ම දතයුතු. මෙවිට පිරිස්හි ලබ්ධිය ශුඩ්කරන සේක් **ඉධා'හං භික්ඛු පටිපුච්ඡිස්සාමි** යනාදිය වදළහ. හෙ ද යට කී නියෙන් ම දතයුතු.

සාතිභික්ෂු වර්ණනය නිමි.

මෙවිට විඤ්ඤාණය තමා සප්‍රත්‍යය බව දක්වන්ට **යඤ්ඤදෙව භික්ඛවේ!** යනාදිය වදළහ. එහි **මනඤ්ච පටිච්ච ධම්මෙ ච**= ආවර්ජිතය සමග භවාඞ්ගයිත ද තෙහුමකධර්මයන් ද නිසා; **ඝනඤ්ච පටිච්ච** යනාදිය ඔවපම්‍ය දැක්වීම පිණිස වදරන ලද; එයින් කුමක් දක්වන සේක් ද? යත්:- වාරසඞ්ක්‍රාන්තිය (= වාරයකින් වාරයකට පැමිණීම) නැතිබව යැ; ඒ එසේ මැයි- යම්සේ දරකඩක් නිසා දැල්වෙන ගින්න උපාදාන (= දර) ප්‍රත්‍යය ඇතිකල්හි ම දැල්වේ ද, එය නැති කල්හි ප්‍රත්‍යයාගේ විකලත්වයෙන් එහි ම සන්සිඳේ ද, සකලිකා (= රැක්පොතු) ආදියට සඞ්ක්‍රමණය වී ශකලාගනි ආදි සඞ්ඛ්‍යාවට නො යේ ද, එපරිද්දෙන් ම ඇස නිසා ත් රූපයන් නිසා ත් උපන් විඤ්ඤාණය ඒ වාරයෙහි චක්ඛු-රූප-ආලොක-මනසිකාර සඞ්ඛ්‍යාත ප්‍රත්‍යය ඇති කල්හි ම උපදී, එය නැති කල්හි ප්‍රත්‍යය විකලත්වයෙන් එහි ම නිරුඬ වෙයි, ශ්‍රොත්‍රාදියට සඞ්ක්‍රමණය වී ශ්‍රොත්‍රවිඤ්ඤාණ යනාදි සඞ්ඛ්‍යාවට නො යේ. සියලු වාරයන්හි මේ නයයි. මෙසේ භාග්‍යවතුන් වහන්සේ "මම විඤ්ඤාණයාගේ ප්‍රවෘත්තියෙහි වාරසඞ්ක්‍රාන්තිය පමණකු දු නො කියම්, එහෙත් මේ සාතිමොඝපුරුෂ තෙම භවසඞ්ක්‍රාන්තිය කියා" යයි සාතිමහණහට නිග්‍රහ කළ සේක. මෙසේ විඤ්ඤාණයාගේ සප්‍රත්‍යයබව දක්වා- දැන් යළි පඤ්ච සකන්ධයන්ගේ ම සප්‍රත්‍යයබව දක්වන සේක් **භූතමිදං** යනාදිය වදළහ. එහි **භූතමිදං** මේ සකන්ධපඤ්චකය ජාත යැ, භූත යැ, නිර්‍මිත යැ, මහණෙනි! තෙපි ත් ඒ (පස්කඳ) මෙය ප්‍රත්‍යයෙන් උපන්නැයි දනිවු දැ? යි. **තදාහාරසම්භවං**= ඒ මේ සකන්ධපඤ්චකය වනාහි ආහාර-

විඤ්ඤාණය සප්‍රත්‍යය බව

පඤ්චස්කන්ධ සප්‍රත්‍යයබව

යෙන් උපනැ, ප්‍රත්‍යයෙන් උපනැ, එය ප්‍රත්‍යය ඇති කල්හි උපදී යයි මෙසේ දකිවු දැ? සි විවාරන සේක. **තදාහාරනිරෝධා=** ඒ ප්‍රත්‍යයාගේ **නිරෝධයෙන්; භූතමිදං නෝ'ඤ්ඤු=** මෙය උපන්නේ දෝ හෝ නූපන්නේ දෝ හොයි; **තදාහාරසමුදයං නෝ'ඤ්ඤු=** යළි ඒ මේ උපන් සඤ්ඣපඤ්ඣ කය ප්‍රත්‍යයෙන් උපන්නේ දෝ හෝ නූපන්නේ දෝ හොයි; **තදාහාර නිරෝධා=** ඒ ප්‍රත්‍යයාගේ නිරෝධයෙන්; **නිරෝධධම්මං නෝ'ඤ්ඤු=** නිරුඬ වන සුභාව ඇත්තේ දෝ හෝ නො වේ දෝ හොයි; **පඤ්ඤාය ච පස්සතො=** මේ සඤ්ඣපඤ්ඣකය ජාත යැ භූත යැ නිපනැයි තතු සේ රස (= කෘත්‍ය) සහිත ලක්ෂණ වශයෙන් විදර්ශනා ප්‍රඥාවෙන් දක්නහුව; **පඤ්ඤාය සුදිට්ඨං=** කි නියෙන් ම විදසුන් නුවණින් මොනොවට දක්නා ලද; මෙසේ යම් යම් කෙනෙක් ඒ පෘථග්ජනාව සැලකූහු ද, ඔවුනොවුන්ගේ ප්‍රතිඥව ගනිමින් පඤ්ඣසඤ්ඣයන්ගේ ප්‍රත්‍යය සහිතබව දක්වූ සේක. මෙවිට යම් නුවණකින් ඔවුන් විසින් ඒ සප්‍රත්‍යය වූ සනිරෝධ වූ සඤ්ඣ පඤ්ඣකය මනා කොට දක්නා ලද ද, එහි තෘෂ්ණාරහිත බව විවාරමින්- **ඉමං වෙ තුමෙහ** යනාදිය වදළහ. එහි **දිට්ඨං=** විදර්ශනා සම්‍යග්දෘෂ්ටිය; සුභාව දර්ශනයෙන් **පරිසුද්ධ** යැ; ප්‍රත්‍යය දර්ශනයෙන් **පරියොදාත** යැ; **අලත්ථෙථ=** තෘෂ්ණාදෘෂ්ටින් ඇලීගෙන වාසය කරවු ද? **සෙලායෙථ=** තෘෂ්ණාදෘෂ්ටින් කෙළිමින් වාසය කරවු ද? **ධනායෙථ=** ධනයක් මෙන් කැමතිවෙමින් තෘෂ්ණාවට පැමිණෙන්නහු ද? **මමායෙථ=** තෘෂ්ණාදෘෂ්ටි මමත්වය උපදවන්නහු ද? **නිප්පරිණ්ණට්ඨාය නො ගහණට්ඨාය=** මා විසින් චතුරෞඝනිස්තරණය පිණිස යම් ඒ ධර්මයෙක් පසුරකට උපමාඇත්තේ දෙසන ලද ද, නිකානතිවශයෙන් ගැනීම පිණිස නො දෙසන ලද ද, තෙපි එය කිම දනිවු දැ? සි. විපශ්‍යනාසයෙන් සොභනපඤ්ඣය දතයුතු.

දැන් ඒ සඤ්ඣයන්ගේ ප්‍රත්‍යය දක්වන සේක් **චත්තාරෝ මේ භික්ඛවෙ! ආහාරා=** යනාදිය වදළහ. එය කි අරුත් ඇත්තේ මය. යළි යම්සේ **එකෙක්** "මොහු දනී දැ?" සි කියන ලද්දේ "හුදෙක් මොහු නො වෙයි, මොහුගේ මව ද දනිමි, මවගේ මව ද දනිමි" මෙසේ ප්‍රවේණිවශයෙන් දන්නේ මනා කොට දනී නම්; එපරිද්දෙන් ම භාග්‍යවතුන් වහන්සේ හුදෙක් සඤ්ඣමාත්‍රයක් ම නො දනිති, සඤ්ඣයන්ගේ ප්‍රත්‍යය ද ඒ ප්‍රත්‍යයන්ගේ ත් ප්‍රත්‍යය දැයි මෙසේ සියලු ප්‍රත්‍යය පරම්පරාව දක්වන්ට- **ඉමමෙව භික්ඛවෙ! චත්තාරෝ ආහාරා** යනාදිය වදළහ. හෙ ද උක්තවී මැයි. **ඉති බො භික්ඛවෙ! අවිජ්ජාපච්චයා සඞ්ඛාරා —පෙ— දුක්ඛක්ඛන්ධස්ස සමුදයෝ හොති** යන මෙහි වනාහි ප්‍රතීත්‍ය සමුත්පාදකථාව විස්තර කටයුතු වන්නීය. ඕ විශුද්ධිමාර්ගයෙහි විස්තර කරන ලද්දී මැයි **ඉමස්මිං සති ඉදං හොති=** මේ අවිද්‍යාදි ප්‍රත්‍යය ඇති කල්හි මේ සංස්කාරාදි ඵලය වෙයි; **ඉමස්සුප්පාදා ඉදං උප්පජ්ජති=** මේ අවිද්‍යාදි ප්‍රත්‍යයාගේ ඉපදීමෙන් මේ සංස්කාරාදි ඵලය උපදී; එහෙයින් ම වදළහ- **යදිදං අවිජ්ජාපච්චයා සඞ්ඛාරා —පෙ— සමුදයෝ හොති** යනු.

මෙසේ වෘත්තය දක්වා නැවත විවෘත්තය දක්වන සේක් අවිජ්ජාය ත්වෙව අසෙසවිරාගනිරොධා යනාදිය වදාළහ. එහි අවිජ්ජා යත්වෙව= නැවත අවිද්‍යාවගේ ම; අසෙසවිරාගනිරොධා= විරාගසඞ්ඛ්‍යාත මාර්ගයෙන් අශෙෂයෙන් නිරුද්ධ කිරීමෙන්; සඞ්ඛාරනිරොධෝ= සංස්කාරයන්ගේ අනුත්පාද නිරොධය වෙයි; යළි මෙසේ නිරුද්ධ වූ සංස්කාරයන්ගේ නිරොධයෙන් විඤ්ඤාය (නිරුද්ධ වෙයි;) විඤ්ඤාදීන්ගේ ද නිරොධයෙන් නාමරූපාදීහු නිරුද්ධ වූවාහු ම වෙති දක්වන්ට සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධෝ යනාදිය වදාරා එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධෝ හොති යි වදාරන ලද. එහි කෙවලස්ස= සියලු; නොහොත් ශුද්ධ වූ; සඞ්ගවිරහිත වූ යන අර්ථ යි. දුක්ඛක්ඛන්ධස්ස= දුඃඛ රාශිහුගේ; නිරොධෝ හොති= අනුත්පාදය වෙයි; ඉමස්මිං අසති යනාදිය කියන ලද්දට විරුද්ධ නසින් දතයුතු. මෙසේ වෘත්තය හා විවෘත්තය වදාරා මේවිට මේ වාදශාඛාප්‍රත්‍යයවෘත්තය විදර්ශනාඥානය සහිත මාර්ගයෙන් දන්නහුගේ යම් ප්‍රතිඛාවන (= පසුව දීමක්) ප්‍රහීණ වේ ද, ඒ ඛාවනයාගේ අභාවය විචාරන සේක්- අපි නු තුමෙහ ඉඤ්ඣවෙ! යනාදිය වදාළහ. එහි එවං ඤාණතා= මෙසේ විදර්ශනා සහිත මාර්ගයෙන් දන්නාහු; එවං පස්සතා යනු ඊට ම පර්‍යාය වචනයි. පුබ්බන්තං= පළමු කොටස; අතීත වූ සඤ්ඤා - ධාතු - ආයතනයන් යන අර්ථ යි. පච්ඣා වෙස්සාථ= තෘෂ්ණාදෘෂ්ටි වශයෙන් ප්‍රතිඛාවනය කරවු ද? සෙස්ස සබ්බා සව සූත්‍රයෙහි විස්තර කරන ලද මැයි. මෙවිට ඔවුන්ගේ එහි නිඃශඞ්කබව විචාරන සේක් අපි නු තුමෙහ ඉඤ්ඣවෙ! එවං ඤාතතා එවං පස්සතා එවං විදෙස්සාථ? සත්ථා නෝ ගරූ යනාදිය වදාළහ. එහි ගරූ= බරෙක් වූයේ, නො කැමැත්තෙන් අනුව පැවැත්ත යුත්තේ; සමණෝ= බුද්ධශ්‍රමණ; අඤ්ඤං සත්ථාරං උද්දිසෙය්‍යාථ= "මේ ශාසනා තෙම අපගේ කෘත්‍යය ඕඩ කරන්ව නො හැකි වෙයි" කිම මෙසේ හැඟීම් ඇති ව අන් බාහිර ශාස්තෘකෙනකු උදෙසා වසවු ද? පුථු සමණබ්‍රාහ්මණානං= බොහෝ වූ නීච ශ්‍රමණයන්ගේ ද බ්‍රාහ්මණයන්ගේ ද; වතකුතූහළ මඞ්ගලාදිනි= ව්‍රතසමාදානයෝ ද දෘෂ්ටිකුතූහලයෝ ද දිඨ - සුත - මුත මඞ්ගලයෝ ද; නානි සාරතෝ පච්චාගච්ඡෙය්‍යාථ= ඔවුන් සාර යයි මෙසේ හැඟීම් ඇති ව පෙරළා ගනිවු ද? මෙසේ හරන ලද්දාහු ත් නැවත ගනිවු ද? යන අර්ථ යි. සාමං ඤාතං= තමා විසින් ඤාණයෙන් දන්නා ලද; සාමං දිඨං= තමා විසින් පැහැසින් දක්නා ලද; සාමං විදිතං= තමා විසින් විභාවිත, ප්‍රකට කරනලද; උපනීතා ඛෝ මෙ තුමෙහ= මහණෙනි! මා විසින් තෙපි මේ සද්ධිසිකාදි ශ්‍රවණාව ඇති ධර්මයෙන් උපනීත වූවාහු, පමුණුවන ලද්දාහු යන අර්ථ යි. සන්දිඨිකෝ යනාදියෙහි අරුත් විශුද්ධිමාර්ගයෙහි විස්තර කරන ලද. ඉදමෙතං පටිච්ච වුත්තං= මේ වචනය තොප විසින් ශ්‍රවයංඥතාදි භාවය සඳහා වදාරන ලද.

තිණණං වො පන භිකඛවෙ! යනු කුමක් හෙයින් ආරම්භ කළ සේක් ද? ඔට වටවිටට විසින් දෙශනා මුදුන් පමුණුවන ලද්දී නො ද? **ඝත්:-** එසේ ය, පමුණුවන ලදු; මේ කලි වෙන ම අනුසඤ්ඤියෙකි. ඒ එසේ මැයි- "මේ ලෝවැසි සත්වසමූහ තෙම ප්‍රතිසඤ්ඤියෙන් වෙසෙසින් මුසා ය, එහෙයින් ඔහුගේ මුළා වන තැන නසා ප්‍රකට කරන්නෙමි" මේ දෙශනාව පටන් ගත්හ. තවද- වටට (= සසරට) මූල අවිද්‍යා ය, විවටට (= නිවනට) මූල බුඩොතපාද යයි; මෙසේ වෘත්තමූල අවිද්‍යාව ත් විවෘත්තමූල බුඩොතපාදය ත් දක්වා ද නැවත එක් වරක් වට - විවට විසින් දෙශනාව මුදුන් පමුණුවන්නෙමි ද මේ දෙශනාව ආරම්භ කළ සේක. එහි **ඝතඤ්ඤිපානා=** **සම්වඩ්ඪතයෙන්,** පිඩුබැඳින්; **ගබ්භස්ස=** ගබ උපදනා සත්වයාගේ; **අවක්කන්තනි ඉහොති=** ඉපදීම වෙයි; තවද කිසි තැනක "ගබ්භ" යි මවුකුස කියන ලදු- එදුලේ මැනු-

170. **"ඉමෙකරත්තිං පඨමං - ගබ්භෙ වසති මානවො**
අබ්භුඩ්ඩිතො'ව සො යති - ස ගච්ඡං න නිවත්තති" යි.

කිසි තැනෙක ගහීයෙහි උපදනා සත්ව ය ය; එදුලේ මැනු- *a* **"යථා වො පනා'නන්ද! අඤ්ඤතරා ඉත්ථිකා නව වා දස වා මාසෙ ගබ්භං කුච්ඡිනා පරිහරිත්වා, විජායනති"** යි. මෙහි සත්ව තෙම අදහස් කරන ලද, ඒ සඳහා කියන ලදී. **ගබ්භස්ස අවක්කන්තනි හොති** යනු. **ඉඛ=** මේ සත්වලොකයෙහි; **මානා ච උතුනි හොති** යන මේ සෘතුකාලය සඳහා කියන ලද- ඒ මෙසේ ය ය- මාගම්හුගේ යම් අවසාසයක දරුවා උපදී ද, **එහි** මහත් වූ ලේපිළාවක් පිහිටා බිඳී වැගිරෙයි; **වසතුව** ශුඛ වෙයි; වසතුව විශුඛ වූ කල්හි මවුපියන් **එක්වරක් එක්වූ කල්හි ඝත් දවස** තෙක් **ඝෙත්ත්‍රය ම** වෙයි; **එ සමයෙහි අත් ගැනීම් ඝිසකේ ගැනීම් ආදි** වූ **ඝරීරපරාමර්ශියෙහු** දු දරුවා උපදී මැයි. **ගබ්බෙබා=** එහි එළඹෙන සත්ව; **පච්චුපඨිතො හොති=** මවුපියන්ගේ එක් **ඕම ඛලම්හි ළඟ ඝිවියේ නම් නො වෙයි;** වැළි කම්යනත්‍රයෙන් යනත්‍රිත වූ **එක් සඤ්ඤියෙක්** ඒ අවකාඝයෙහි උපදනේ වෙයි යනු මෙහි මේ අදහස යි. **සංසෙනෙ=** මම නිරොධ වන්නෙමි දෝ හෝ නොහොත් මාගේ පුත්‍රයා (නිරොධ වන්නේ දෝ හො) යි මෙසේ මහත් වූ ජීවිතසෑකයෙන්; **ලොකිකා හෙ'තං භිකඛවෙ!=** එකල වනාහි එ තැනට පැමිණි පැමිණි

---

170. **මානවො=** සත්ව තෙම; **යං + එකරත්තිං=** යම් එක් රෑ යෙක්හි **නොහොත් රෑයක් මුළුල්ලෙහි; පඨමං=** පළමුකොට (= පිළිසඳකොණෙහි;) **ගබ්භෙ=** මවුකුස; **වසති=** වෙසේ ද; **අබ්භුඩ්ඩිතො ව=** නැගිසිටි අත්‍රයක් මෙන්, නොහොත් (මරණයට) අභිමුඛ ව නැගිසිටියේ ම; **සො=** ඒ මානව; **යාති=** යේ මය; **සො=** හෙතෙම; **ගච්ඡං=** (මෙසේ) යන්නේ; **න නිවත්තති=** (ඇසිල්ලකු දු) නො නවති.

a ආනන්ද! යම්සේ අන්‍ය ස්ත්‍රිහු මාස නවයක් හෝ දසයක් හෝ දරුගැබ නොහොත් ඔබ උපන් සඤ්ඣා කුසින් උසුලා වදත් ද.

මවගේ ලේ පුත්‍රසෙනාඝයෙන් (යම් හෙයකින්) පඬුර වේ ද, එහෙයින් මෙසේ වදළහ. **වඞ්කඞ්කං**= දරුවන්ගේ කෙළිබඩු වූ කුඩා නඟුල; **ඝසිඤ්ඤා** යයි දික් දඬුකින් කොට දඬුවට ගසන ක්‍රීඩාව කියනු ලැබේ. **මොක්ඛචිඤ්ඤං**= හාත්පස පෙරළෙන ක්‍රීඩාව; ආකාශයෙහි දණ්ඩක් ගෙන බිම හෝ හිස තබා යට උඩ වශයෙන් පෙරළෙන ක්‍රීඩාව යයි කියන ලද වෙයි. **විඛගුලඤ්ඤං**= තල්කොළ ආදියෙන් කළ සුළං වැදීමෙන් කරකැවෙන චක්‍රය කියනු ලැබේ; **පත්තාළ්හඤ්ඤං**= කොළනැළිය කියනු ලැබේ, එයින් වැලි ආදිය මතිමින් කෙළිති; **රථඤ්ඤං**= කුඩා රථය; **ධනුඤ්ඤං**= කුඩා දුන්න මැයි; **සාරජ්ජති**= රාගය උපදවයි; **ඛ්‍යාපජ්ජති**= ව්‍යාපාදය උපදවයි.

අනුපඛ්ඛන්ඤායසති= කයෙහි සිහිය "ඤායසති" නමුදු; එය නො එළවා යන අර්ථ යි. **පරිත්තඤ්චෙතසෝ**= අකුසල්හිත් ඇත්තේ; **ඡට්ඨස්ස නෙ පාපකා**= පලසම්වතෙහි මේ අකුසල් නිරුඬ වෙති; එය නො දනී, නො පැමිණෙයි යන අර්ථ යි. **අනුසරාඛ්විරොධං**= රාගය හා වෙශය ද; **අභිනන්දති**= තෘෂ්ණාවශයෙහි සතුටු වෙයි; තෘෂ්ණාවශයෙන් ම "අහෝ සැප යැ" යනාදිය කියන්නේ **අභිවදති** (= සතුටු වචන කියයි;) **අජ්ඣොසාය තිට්ඨති**= තෘෂ්ණාවෙන් බැසගැනීමෙන් ගිල නිමවා ගනී; සැපය හෝ උපෙක්ෂාව හෝ සතුටු වේවා, දුක කෙසේ සතුටු වේ ද? යත්:- "මම දුප්පත්මි, මාගේ දුක යැ" යි ගන්නේ සතුටු වේ නම. **උප්පජ්ජති නන්දි**= තෘෂ්ණාව උපදී; **තදුපාදානං**= ඕ තෘෂ්ණාව ම ගැනීම් අර්ථයෙන් උපාදාන නම; **තණ්හුපාදානපච්චයා භවෝ** —පෙ— **සමුදයෝ හොති** යි භාග්‍යවතුන් විසින් නැවත එක් වරක් විසඳා ත්‍රිසංඛේප වූ මේ ප්‍රත්‍යාකාරවෘත්තය ද දක්වන ලදි.

මෙවිට විවෘත්තය දක්වන්ට **ඉධ භික්ඛවෙ! තථාගතෝ ලොකෙ උප්පජ්ජති** යනාදිය වදළහ. එහි **අප්පමාණචෙතසෝ**= අප්‍රමාණ වූ ලොකොත්තර වූ සිත මෝහට නුසි "අප්පමාණචෙතස" නම්; මාගී චිත්තය හා යුක්ත වූ යන අර්ථ යි. **ඉමං බො මෙ තුමෙහ භික්ඛවෙ! සඞ්ඛිත්තෙන තණ්හාසඛ්ඛයවිමුත්තිං ධාරථ**= මහණෙනි! මේ සැකෙවින් දෙසන ලද මාගේ තෘෂ්ණාසංක්ෂයවිමුක්තිදෙශනාව තෙපි නිරතුරු ධරන්නහුය, නො නසන්නහුය; මෙහි දෙශනාව ම විමුක්තිප්‍රතිලාභයට හෙතු හෙයින් "විමුත්තිං" යයි කියන ලදු. **මහාතණ්හා ජාලතණ්හා සඞ්ඝාටපටිමුක්කං**= තෘෂ්ණාව මැසිම කළ අර්ථයෙන් "මහාතණ්හාජාල" යැ, ගැළපීම කළ අර්ථයෙන් "සඞ්ඝාට යැ" යි කියනු ලැබේ. මෙසේ මේ මහාතෘෂ්ණාජාලසඞ්ඛ්‍යාත තෘෂ්ණාසඞ්ඝාටයෙහි ද බැඳුණෙකු කොට මේ හෙවුල්පුත් සාකීමහණ සලකවූ; ඇතුළත පිවිසියෙක, ඇතුළත් වූයෙකැ,යි ඔහු ධරන්නහුය යන අර්ථ යි. සෙස්ස සියලු තැන්හි ප්‍රකට අර්ථ ඇත්තේ මැයි.

මහාතණ්හාසඞ්ඛය සූත්‍ර වණ්ණනා නිමි. (8)

මහාඅස්සපුර සූත්‍ර වර්ණනා.

———:o:———

එවමෙම සුතං යි මහාඅස්සපුර සූත්‍ර යයි. එහි **අඞ්ගෙසු**= "අඞ්ග" නම් දනව්වැසි රාජකුමාරයෝ ය, ඔවුන්ගේ නිවාස වූ එක් ජනපදයකු දු රුඪිශබ්දයෙන් "අඞ්ග" යයි කියනු ලැබේ, ඒ අඟුදනව්වෙහි

අඟුද්නව්ව. **අස්සපුරං නාම අඞ්ගානං නිගමෝ**= අස්සපුර යන නගර නාමයෙන් ලත් ව්‍යවහාර ඇති අඟුදනව්වේ එක් නියං ගමෙකි; එය ගොදුරුගම් කොට වාසය කෙරෙයි යන අර්ථ යි. **භගවා එතදවොච**= මේ "ශ්‍රමණයෝ ශ්‍රමණයෝ යයි මහණෙනි! තොප ජානයා හඳුනයි" යනාදි වචනය වදාළ සේක. යළි කුමක් හෙයින් මෙසේ වදාළ සේක් ද? යත්- මේ අසනු ලැබේ:- ඒ නියංගම මනුෂ්‍යයෝ

අඟුදනව් වැසියෝ. ශ්‍රද්ධාසම්පන්නයෝ ය, බුද්ධාමාකයෝ ය, ධම්මාමකයෝ ය, සඞ්ඝාමාකයෝ යි; එදවස පැවිදි වූ සාමණේරයකු දු යිය වස්තෙරකෙනෙක් සමාන කොට දකිති, පෙරවරුකල පිඬු පිණිස පිවිසෙන භික්ෂුසඞ්ඝයා දැක බිජුවට – නහුල් ආදිය ගෙන කෙතට යන්නාහු ද, පොරෝ ආදිය ගෙන වලට පිවිසෙන්නාහු ද ඒ උපකරණ ඛහා තබා භික්ෂුසඞ්ඝයා හිඳිනා තැන අසුන්හල හෝ මඩුව හෝ රුක්මූල හෝ ඇමද අසුන් පනවා ආධාරකයන් ද පැන් ද එළවා භික්ෂුසඞ්ඝයා වඩාහිඳුවා කැඳ-කැවිලි ආදිය දී කළ බත්කිස ඇති භික්ෂුසඞ්ඝයා ගමනට මෙහෙයවා අනතුරුව ඒ උපකරණ ගෙන කෙතට හෝ වලට හෝ ගොස් තමාගේ කටයුතු කෙරෙති; කම්මාන්තකරන තැන ද ඔවුන්ගේ අන් කථා වක් නම් නැති, "සතර මාගීසථයෝ ය සතර ඵලසථයෝ ය යන අෂට පුදගලයෝ ආර්‍යසඞ්ඝ නම්, ඔවුහු මේබදු ශීලයෙන් මේබදු ආචාරයෙන් මේබදු පිළිවෙතින් යුකතයෝ ය, ලජ්ජිහු ය, පෙසලයෝ ය, උදාරගුණ ඇත්තාහු ය" යි භික්ෂුසඞ්ඝයාගේ ම ගුණ කියති; කම්මාන්තසථානයෙන් අවුත් කෑ සවස්බත ඇත්තානු හෙදෙරවල හුන්නාහු ද නිදන ගෙව සිවිස හුන්නාහු ද භික්ෂුසඞ්ඝයාගේ ම ගුණ කියත්. භාග්‍යවතුන් වහන්සේ ඒ මිනිසුන්ගේ යටහත් පැවැත්ම දැන භික්ෂුසඞ්ඝයා පිණ්ඩපාතාපචය යනයෙහි යොදවන සේක් මෙසේ වදාළහ. **ඉධ ඛෙමා සමණකරණා ච බ්‍රාහමණකරණා ච**= යම් ධර්ම කෙනෙක් සමාදන් ව පුරන ලද්දාහු සමිත පාප ශ්‍රමණයකු ත් බාහිතපාප බ්‍රාහමණයකු ත් කෙරෙත් ද යන අර්ථ යි.

"*a* **තිණ්ණාමානි භික්ඛවෙ! සමණස්ස සමණකරණීයානි, කතමානි තීණි? අධිසීලසික්ඛාසමාදානං අධිචිත්තසික්ඛාසමාදානං අධිපඤ්ඤාසික්ඛාසමාදානං**" යන මෙහි වදාහි ශ්‍රමණයා විසින් කළ යුතු ධර්මයෝ කියන ලද්දාහුය. ඔවුහු ම ශ්‍රමණකරණයෝත් වෙත් මැයි.

---

a මහණෙනි! ශ්‍රමණයාගේ ශ්‍රමණයා විසින් කටයුතු තුනකි, කවර තුනක් ද? අධිශීලශික්ෂාසමාදානය අධිචිත්තශික්ෂාසමාදානය අධිප්‍රඥාශික්ෂාසමාදානය යන තුනකි.

මෙහි වූ කලි හිරි-ඔතප් ආදීන්ගේ වශයෙන් දෙශනාව විස්තර කරන ලද්දීය. එවං නො අයං අම්හාකං යන මෙහි නො යනු නිපාතමාත්‍ර යැ; මේසේ මේ අපගේ යන අර්ථ යි. මහප්ඵලා මහානිසංසා යන දෙකම අර්ථ හෙයින් එකෙක් මැයි; අවඤ්ඤා= නො සිස් වූවාහු; සඵලා= මේ ඒ පදයාගේ ම අර්ථ යි; ඒ එසේ මැයි- යමකුගේ ඵලයක් නැත් ද ඕ වඤ්ඣා (= වඳවූවා) නම් වෙයි; සඵලා= වැඩීම් සහිත වූවා; මේ සඵලභාවයාගේ වෙවචනයි. එවං හි භවා භික්ඛවෙ! සික්ඛිතබ්බං= මහණෙනි! මේසේ තොප විසින් හික්මිය යුතු. මෙසේ භාග්‍යවතුන් වහන්සේ මේ මෙතෙක් කරුණෙන් හිරි-ඔතප් ආදි ධර්මයන්ගේ ගුණ වදාළ සේක. කුමක් හෙයින? වචන මාගීය පසිඳිනා පිණිස යැ; ඒ එසේ මැයි- ඉදින් පැවිදි වූ නොබෝ කල් ඇති කිසි බාල මහණෙක් මෙසේ කියන්නේ නම්, "භාග්‍යවතුන් වහන්සේ හිරි-ඔතප් ආදි ධර්මයන් සමාදන් ව පවතිවයි වදාරති, ඒ ධර්මයන් සමාදන් ව පැවැත්මෙහි අනුසස් කවරේ දෝ හො" යි. ඔහුගේ වචනමඟ පසිඳිනා පිණිස "මේ ත් මේ ත් ආනිශංස යැ, මේ ධර්මයෝ සමාදන් ව පුරන ලද්දාහු ශ්‍රාමණ්‍යයකු නම් භාග්‍යවතාපාපබ්‍රාහ්මණයකු නම් කෙරෙති, සිවුපස ලාභය උපදවති, ප්‍රත්‍යයදායකයන්ට මහත් ඵලබව සම්පාදනය කෙරෙති, පැවිද්ද නො වඳ වූ සඵල වූ වැඩීම් සහිත වූවක් කෙරෙති" ගුණ වදාළහ. මේ මෙහි සංක්ෂේප යයි; යළි විස්තර යෙන් ගුණකථාව සතිපට්ඨානයෙහි කී නියෙන් ම දතයුතු.

හිරොත්තප්පෙන යනු "යං හිරියති හිරියිතබ්බෙන ඔත්තප්පති ඔත්තප්පිතබ්බෙන" යි මෙසේ විස්තර කරන ලද හිරියෙන් හා ඔත්තප්පයෙන් ද; තවද- මෙහි අධ්‍යාත්මයෙහි උපදනී "හිරි" නමු, බැහැර උපදනේ "ඔත්තප්ප" නම්; හිරි තොමෝ තමා අධිපති කොට ඇත්තීය, ඔත්තප්පය ලොකය අධිපති කොට ඇත්තේය; හිරි ලජ්ජාසභාවයෙන් සිටියාය, ඔතප් භයසභාවයෙන් සිටියේහි. යළි මෙහි විස්තරකථාව සියලු අයුරින් විශුද්ධිමාගීයෙහි කියන ලද්දීය. තවද- මේ ධර්මයෝ දෙදෙන ලොකය පාලනය කරන හෙයින් ලොකපාලක ධර්මයෝ නමැයි කියන ලද්දාහුය. වදාළේ මැනැ:- *a* "එවමේ භික්ඛවෙ! සුක්කා ධම්මා ලොකං පාලෙන්ති, කතමෙ ද්වෙ? හිරිං ච ඔත්තප්පං ච, ඉමෙ ඛො භික්ඛවෙ! ද්වෙ සුක්කා ධම්මා ලොකං පාලෙන්ති; ඉමෙ ච ඛො භික්ඛවෙ! ද්වෙ සුක්කා ධම්මා ලොකං න පාලෙයුං, නාඩිඛ පඤ්ඤායෙථ මාතා'ති වා මාතුච්ඡා'ති වා මාතුලානී'ති

---

a. මහණෙනි! මේ ශුක්ලධර්මයෝ දෙදෙනෙක් ලොකය පාලනය කෙරෙති, කවර දෙදෙනෙක් ද? යත්:- හිරි ද ඔතප් ද යන දෙදෙනා යැ, මහණෙනි! මේ ශුක්ලධර්මයෝ දෙදෙන ලොව රකිති; තවද- මහණෙනි! මේ ශුක්ලධර්මයෝ දෙදෙන ලොව නො රක්නාහු නම්, මෙ ලෙවසි මවු යැ හෝ කුඩාමවු යැ හෝ නැදි යැ හෝ ඇදුරු බිරිඳ ඇ හෝ ගුරුන්ගේ බිරිඳ යැයි හෝ නො පැහැනින්නේය; එබඳිරෙළුවෝ ගුරුකුකුළෝ බලු සිවල්ලු යම්සේ ද එමෙන් අල්වැසි පෙම සම්භෙදයට යන්නේය.

වා ආවජ්ජහරියා'ති වා ගරූනං දූරා'ති වා; සමෙහදං ලොකො අහම්ඝස්ස, යථා අජේළකා කුකකුවසූකරා සොණසිගාලා" යි. මොවුහු ම ජාතකයෙහි "දෙවධම්මී" යයි කියන ලද්දාහුය. වදාළේ මැයි:-

171. "හිරිඔත්තපසම්පන්නා - සුක්කධම්ම සමාහිතා
සණෙනා සප්පුරිසා ලොකෙ - දෙවධම්මා'ති වුච්චරෙ" යි.

යළි මහාවුන්දතෙරුන්ව තෙලෙස් ලියාදමන පිළිවෙතැ'යි කොට දක්වන ලද්දාහුය. වදාළේ මය- *a* "පරෙ අහිරිකා භවිස්සන්ති, මය මෙසු හිරිමනා භවිස්සාමා'ති සල්ලෙඛො කරණීයො; පරෙ අනොත්තාපී භවිස්සන්ති, මයමෙසු ඔත්තාපී භවිස්සාමා'ති සල්ලෙඛො කරණීයො" යි. යළි දූ මොවුහු මහඤසුප් තෙරුන්ව අව්වාදෙපසම්පදුව යයි කොට දක්වන ලද්දාහුය. මේ වදාරන ලද මැයි- *b* "තස්මාතිහ තෙ කස්සප! එවං සික්ඛිතබ්බං, තිබ්බං මෙ හිරොත්තප්පං පච්චුපට්ඨිතං භවිස්සති ථෙරෙසු නවෙසු මජ්ඣිමෙසූ'ති; එවං හි තෙ කස්සප! සික්ඛිතබ්බං" යි. මෙහි වූ කලි මොවුහු "ශ්‍රමණධර්මයෝ නමැ" යි දක්වන ලද්දාහුය. වැලි යම්හෙයකින් මෙතෙකින් ශ්‍රාමණ්‍යාර්ථය මුදුන් පැමිණියේ නම් නො වේ ද, එහෙයින් අනිකු දූ ශ්‍රමණකරණධර්මයන් දක්වන්ට හිඟා බො පන හික්ඛවෙ! තුම්හාකං යන්නාදිය වදාළහ. එහි සාමඤ්ඤ පෙළා යනු සංයුක්තකයෙහි වනාහි- *c* "කතමඤ්ච භික්ඛවෙ! සාමඤ්ඤං? අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො, සෙය්‍යථිදං:- සම්මා දිට්ඨි – පෙ— සම්මාසමාධි; ඉදං වුච්චති භික්ඛවෙ! සාමඤ්ඤං. කතඤ්ච භික්ඛවෙ! සාමඤ්ඤඵලං? යො භික්ඛවෙ! රාගක්ඛයො දොසක්ඛයො මොහක්ඛයො, අයං වුච්චති භික්ඛවෙ! සාමඤ්ඤඵලං" යි මාගීය ශ්‍රමණබව යයි ද, ඵල-නිර්වාණයෝ ශ්‍රමණඵලයාගේ අර්ථ යයි ද වදාරන ලද්දාහුය; එහෙත් මේ තැන මාගීය ත් ඵලය ත් එක් කොට ශ්‍රාමණ්‍යාර්ථය වදාරන ලදැයි දතයුතු.

---

171. හිරිඔත්තපසම්පන්නා= හිරිඔතප් දෙකින් යුක්ත වූ; සුක්කධම්මසමාහිතා= ශුක්ල (= කුශල) ධර්මයන්හෙන් යුක්ත වූ; සණෙනා= ඥානවත් වූ; සප්පුරිසා= සත්පුරුෂයෝ; ලොකෙ= ලෙව්හි; දෙවධම්මා'ති= දෙවධර්මයෝ යයි; වුච්චරෙ= කියනු ලැබෙත්.

a. අන්‍යයෝ අහිරික (= ලජ්ජාරහිත) යෝ වන්නාහුය. ඇපි මෙහි හිරිමත් (= ලජ්ජාසිත්) ඇතියේ වන්නෙමුයි සල්ලෙඛ කටයුතු යැ; අන්‍යයෝ ඔතප්පරහිතයෝ වන්නාහුය ඇපි මෙහි ඔතප් ඇතියෝ වන්නෙමුයි සල්ලෙඛ කටයුතු.

b කාශ්‍යප! එහෙයින් මෙහි ලා තොප විසින් මෙසේ හික්මිය යුතු යැ, සථවිරනවක - මධ්‍යමයන් කෙරෙහි මාගේ දැඩි වූ හිරි - ඔතප් ඵළඹ සිටියේ වනැයි; කාශ්‍යප! තොප විසින් මෙසේ ම හික්මිය යුතු;

c. මහණෙනි! ශ්‍රාමණ්‍යය (= ශ්‍රමණබව) කවරේ ද? මේ අරිඅටඟමඟ ම යැ; ඒ කවරේ ද? සම්‍යග්දෘෂ්ටිය —පෙ— සම්‍යක්සමාධිය යන මොහුයි; මහණෙනි! මේ ශ්‍රාමණ්‍ය යයි කියනු ලැබේ. මහණෙනි! ශ්‍රාමණ්‍යාර්ථය කවරේ ද? මහණෙනි! යම් රාගය ක්ෂය කිරීමක් මෙෂය ක්ෂය කිරීමක් මොහය ක්ෂය කිරීමක් වේ ද, මහණෙනි! මේ ශ්‍රාමණ්‍යාර්ථ යයි කියනු ලැබේ.

ආරොචයාමි= කියමි; **පවේදයාමි**= දන්වමි; **පරිසුද්ධා නෝ කායසමාචාරෝ** යන මෙහි කායසමාචාරය පරිශුද්ධ යැ, අපරිශුද්ධ යැයි විවිධ වෙයි:- ඒ මෙසේ යැ- යම් මහණෙක් පරපණ නසා ද අයිනාදන් ගනී ද මිසහසර හැසිරේ ද ඔහුගේ කායසමාචාරය අපරිශුද්ධ වූයේ නම; මේ වනාහී කම්පථයෙන් ම වළකන ලද. වැලි යමෙක් අතින් හෝ කැටින් හෝ දඬින් හෝ සැතින් හෝ මෙරමා පෙළා ද වෙසෙසින් පෙළා ද, ඔහුගේ කායසමාචාරය අපිරිසුදු වූයේ නම; මෙ ද ශික්ෂාපදසකඛියෙන් ම ප්‍රතික්ෂිප්ත යැ; මේ සූත්‍රයෙහි මේ දෙක ම නො වදුරා පරමසල්ලෙඛ නමැයි වදුරන ලදී; ඒ එසේ මැයි- යම් මහණෙක් පැන්කළයෙහි පැන්බොන්නාවූ හෝ පාත්‍රයෙහි බත් කන්නාවූ හෝ කවුඩන් වැළකීම් වශයෙන් අතක් හෝ කැටක් හෝ දඬක් හෝ නහා ද, ඔහුගේ කායසමාචාරය අපිරිසුදු යැ; (එසින්) විපරීත වූයේ පිරිසුදු වූයේ නම. **උත්තානෝ**= උදහන වූයේ, ප්‍රකට වූයේ; **විවටෝ**= අනාවෘත වූයේ, නො වැසුණේ; දෙකින් ම පිරිසුදුබව ම දක්වයි; **න ච ඡිද්දවා**= සියලු කල එක්වැනි වූයේ, අතරින් අතර සිදුරු රහිත වූයේ; **සංවුතෝ**= කෙලෙසුන්ට දොර වැසීමෙන් පිහිත වූයේ; වරද වැසීම සඳහා පිහිත නො වූයේ.

වාක්සමාචාරයෙහි දු යම් මහණෙක් මෘෂා කියා ද පෙශුන්‍ය කියා ද පරුෂ බෙණේ ද ප්‍රලාප කියා ද, ඔහුගේ වාක්සමාචාරය අපිරිසුදු වූයේ නම; මේ වනාහි කම්පථ වශයෙන් ම වළකන ලද.
වාක්සමාචාරය. වැළි යමෙක් ගැහැවියෝ යයි හෝ දූසයෝ යයි හෝ මෙහෙකරුවෝ යයි හෝ (මේ) ආදීන් ආක්‍රොශ කෙරෙමින් කියා ද, ඔහුගේ වාක්සමාචාරය අපිරිසුදු වූයේ නම; මෙ ද ශික්ෂාපදසකඛියෙන් ම ප්‍රතික්ෂිප්ත යැ; මේ සූත්‍රයෙහි මේ දෙක නො වදුරා පරමසල්ලෙඛ නමැයි වදුරන ලදී. ඒ එසේ මැයි - යම් මහණෙක් තරුණ මහණකු විසින් හෝ තෙරණකු විසින් හෝ "කිම් වහන්ස! අපගේ උපාධ්‍යායන් දක්නාහු දැ?" යි කියනලද්දේ "ඇවැත්නි! බොහෝ භික්ෂුණීහු එක් පෙදෙසෙක හැසුරුණාහුය, තොපගේ උපාධ්‍යාය චිකිණීය යුතු පලාපොදියක් ඔසොවා ගියේ වනැ" යි මේ ආදි නයින් සිතහසෙන අදහස් ඇත්තේ නවුදු මෙබදු කථා කියා ද, ඔහුගේ වාක්සමාචාරය අපරිශුද්ධ යැ; විපරීත වූයේ පරිශුද්ධ නම.

මනසමාචාරයෙහි යම් මහණෙක් අභිධ්‍යා බහුල වූයේ ව්‍යාපාදයට පැමිණි සිත් ඇත්තේ මිථ්‍යාදෘෂ්ටි ඇත්තේ වේ ද, ඔහුගේ චිත්තසමාචාරය අපිරිසුදු වූයේ නම; මේ වනාහි කම්පථ විසින් ම වළකන ලද; වැළි යමෙක් එළුවා තබන ලද රන් රිදී ඉවසා ද, ඔහුගේ චිත්තසමාචාරය අපිරිසුදු වූයේ නම; මේ ද ශික්ෂාපදසකඛියෙන් වළකන ලද; මේ සූත්‍රයෙහි මේ දෙක
මනසමාචාරය.

නො වදුරා පරම්සලෙලඛ නමැයි වදුරන ලදී. යම් මහණෙක් කාම විතර්කයක් හෝ ව්‍යාපාදවිතර්කයක් හෝ විහිංසාවිතර්කයක් හෝ විතර්ක සෙරේ ද, ඔහුගේ මනඃසමාචාරය අපරිශුද්ධ යැ; විපරීත වූයේ පරිශුද්ධ නම.

අනතුරුව ආජීවයෙහි *a* **"යෝ භික්ඛු ආජීවහෙතු වෙජ්ජකම්මං පහිණගමනං භණ්ඩපාලනං කරොති අරුමක්ඛණං දෙති තෙලං පවති"** යි එක්විසි අනෙසනා වශයෙන් ජීවිකාව කෙරේ ද;

ආජීවය. යළි යමෙක් පිතවා හෝ වළඳු ද; ඔහුගේ ආජීවය අපරිශුද්ධ වූයේ නම; මේ වනාහි ශික්ෂාපදසඤ්ඤායෙන් ම ප්‍රතික්ෂිප්ත යැ; මේ සූත්‍රයෙහි මෙය නො වදුරා පරම්සලෙලඛ නමැයි වදුරන ලදී. ඒ එසේ මැයි- යම් මහණෙක් ගිතෙල්-වෙඩරු-තෙල්-මී-සකුරු ආදිය ලැබ "සෙට හෝ අනිද්දා හෝ (ප්‍රයොජනයට) වන්නාහුය" යි රැස්කොට වළඳු ද, නොහොත් යමෙක් වනාහි නිම්බඩකුරුදිය දැක සාමණෙරයන්ට "ඇවැත්නි! අඹකුර කව" යි කියා ද, සාමණෙරයෝ "තෙරුන් වහන්සේ කනු කැමැත්තාහුය" යි කැප කොට දෙත් ද, යළි තරුණභික්ෂූන්ට හෝ සාමණෙරයන්ට හෝ "ඇවැත්නි! පැන් බොව" යි කියා ද, "තෙරුන් වහන්සේ පැන් බොනු කැමැත්තාහුය" යි පැන්සක සෝදා දෙත් ද, සෙ ද වළඳන්නහුගේ ආජීවය අපරිශුද්ධ නම් වෙයි; විපරීත වූයේ පරිශුද්ධ නම.

මත්තසඤ්ඤී= සෙවීම් - පිළිගැනීම් - පරිභොගයන්හි මාත්‍රඥ වූවාහු යුක්ත වූවාහු පමණ දන්නාහු; **ජාගරියමනුයුත්තා**= රැදුවල සය කොට සක් කොට එක් කොටසක නින්දට අවකාස දී පස්කොටසක් නිදිවැරී මෙහි යුක්තප්‍රයුක්ත වූවාහු; **සිහසෙය්‍යං** යන මෙහි කාම භොගිශය්‍යා - ප්‍රෙතශය්‍යා - සිංහශය්‍යා - තථාගතශය්‍යා යයි සතර ශය්‍යාවකි. ඔවුනතුරෙහි *b* **"සෙහුසෙය්‍යෙන භික්ඛවෙ! කාමභොගී සත්තා වාමෙන පස්සෙන සෙන්ති"** යන මෝ කාමභොගී ශය්‍යා නම්; ඒ එසේ මැයි- ඔවුනතුරෙන් බොහෝ සෙයින් දකුණැල යෙන් හෝනාහු නම් නැති. *c* **"සෙහුසෙය්‍යෙන භික්ඛවෙ! පෙතා උත්තනා සෙන්ති"** යන මෝ ප්‍රෙතශය්‍යා නම්; ඒ එසේ මැයි- මද වූ මස්-ලේ ඇතිබැවින් ඇටසැකිළිවලින් ගැටුණාහු එක් ඇලයකින් හෝනට නො හැකි වෙති, උඩුකුරුව ම හොවත්. *d* **"සෙහුසෙය්‍යෙන භික්ඛවෙ!**

---

a. යම් මහණෙක් ආජීවය හෙතු කොට වෙදකම් ගිහින්ගේ හඹුන් ගෙන යෑම භාණ්ඩයන් රැකීම කෙරේ ද, ව්‍රණ ලෙපය දේ ද, තෙල් පිසී ද.

b. මහණෙනි! බොහෝසෙයින් කාමසුව වළඳන සුලු සත්වයෝ වම්ඇලයෙන් හොවත්.

c. බොහෝසෙයින් මහණෙනි! ප්‍රෙතයෝ උඩුකුරුව හොවත්.

d. බොහෝසෙයින් මහණෙනි! සිංහ මෘගරාජ අතුරුකලවෙහි ඔහා දකුණැලයෙන් හෝනේහි.

සීහෝ මිගරාජා නඛඝුඤං අනන්තරහිතාහි පකතිපිට්ඨා දක්ඛිණේන පස්සේන සෙති'' යන මෝ සිංහශය්‍යා නමු; ඒ එසේ මැයි- තෙදින් උණුසුම් බැවින් සිංහ මෘගරාජ තෙම පෙර දෙපය එක් තැනෙක තබා නහුට කලවේ අතර බහා පෙරපා - පසුපා - නහුට යන මොවුන් සිටි අව කාසය සලකා පෙර දෙපය මත්තෙහි හිස තබා හොවී; දවසකු දු හෙව් පුබුදිනේ නො තැතිගනිමින් පුබුදී; යළි හිස නහා පෙරපා සිටි අවිකා සය සලකයි, ඉදින් මද තැනක් හැර සිටියේ වේ නම් "මේ තාගේ ජාති යට නො සුදුසු ය, ශූරභාවයට නො සුදුසු ය" යි නො සතුටු ව එහි ම හොව්, ගොදුරට නො යයි; නො හැර සිටිකල වනාහි "තාගේ ජාති යට ද ශූරභාවයට ද මේ සුදුසු ය"යි තුටුපහටු වූයේ නැගිට සිංහවිජෘම්භණය කොට කෙසරුබර සලා තුන්වරක් සිංහනාද කොට ගොදුරට නික් මෙයි. වතුර්ධ්‍යානශය්‍යාව වූ කලී තථාගතශය්‍යා නමැයි කියනු ලැබේ; ඔවුනතුරෙන් මෙහි සිංහශය්‍යාව ආ ඇ; සැබව- මෝ තෙදින් උණුසුම් ඉරියව් ඇතිබැවින් උත්තමශය්‍යා නමු. **පාදෙ පාදං=** දකුණුපයැ වම් පය; **අච්චාධාය=** අති + ආධාය, මදක් ඉක්මැ තබා; ඒ එසේ මැයි- ගොප්ඇටින් ගොප්ඇටයෙහි දණින් හෝ දණැ හැටෙන කල්හි තීව්‍රතුරු වෙදනා උපදී, සිත එකඟ නො වෙයි, ශයනය නො සුව වෙයි; වැළී ගම්සේ නො හැටේ ද, එසේ ඉක්මවා (= ඇද) තැබූ කල්හි වෙදනා නුපදී ද, සිත එකඟ වේ ද, ශයනය සුව වේ ද; එහෙයින් මෙසේ වදාළහ.

අභිජ්ඣාලුං ලෝකෙ යනාදිය චුල්ලහත්ථිපද සූත්‍රයෙහි විස්තර කරන ලදී. නැවත යම් මෝ **සෙය්‍යථාපි භික්ඛවෙ!** යි උපමාවක් වදාරන ලද්දී ද, එහි- **ඉණං ආදාය=** පොලියට ධනය ගෙන; **ව්‍යන්තිං කරෙය්‍ය=** විගතාන්ත (= කෙළවර) කරන්නේ; ගම්සේ ඔවුනතුරෙන් කඹවණුවක් පමණකු දු අන්තයක් ඉතිරි නො වන්නේ ද, එපරිද්දෙන් කරන්නේය, සම්ප්‍රකාරයෙන් පෙරළා දෙන්නේය යන අර්ථ යි. **තණ්හාමූලකානං= තණ්හා** නැතිබව කරණු කොට; ඒ එසේ මැයි- හෙතෙම "තණ්හා නැත්තෙමි" යිහි කරන්නේ බලවත් සතුට ලබයි, බලවත් සොම්නසට පැමිණෙයි; එයින් වදාරන ලදී- **ලභෙථ පාමොජ්ජං අධිගච්ඡෙය්‍ය සොමනස්සං** යනු. විසභාග වෙදනාවන්ගේ ඉපදීමෙන් කියතකින් මෙන් සිවුඉරියව් සිදිමින් පෙළා නුයි "ආබාධ" නම; හේ මොහුට ඇත් නුයි **ආබාධිකා** නම; එයින් උපදනා දුකින් දුක්ඛිත වූයේ නම; අධිමාත්‍ර (= දැඩිව) ගිලන් වූයේ නුයි **බාළ්හගිලානා** නම්. **න චිරස්සෙව=** අධිමාත්‍ර ව්‍යාධියෙන් පීඩිත බැවින් රෑ නො වන්නේය; බලමිතනා යනු බලය මැයි; බලය ද ඔහුගේ කයෙහි නො වන්නේය යන අර්ථ යි. **තණ්හා භිදුනං=** ආරොග්‍යය කරණු කොට; ගම්හෙයකින් ''අරුග වෙමි'' මෙනෙහි කරන ඔහුට ඒ දෙක වේ ද එහෙයින් වදාරන ලදී- **ලභෙථ පාමොජ්ජං අධිගච්ඡෙය්‍ය සොමනස්සං** යනු. **න ච'ස්ස කිඤ්චි භොගානං වයෝ=** කඹවණුවක් පමණකු දු භොගයන්ගේ විය දමෙක් නො වන්නේය;

තණ්හා නිදානං= බන්ධනයෙන් මිදීම කරුණු කොට; සෙස්ස කී නියෙන් ම සියලු පදයන්හි යෙදිය යුතු. **අනත්තාධිනෝ**= තමා කෙරෙහි ප්‍රභූ (= ප්‍රධාන) නො වූයේ, තමාගේ රුවියෙන් කිසිවක් කරන්ට නො ලබයි; **පරාධිනා**= මෙරමා කෙරෙහි ප්‍රභූ වූයේ, අන්‍යයාගේ ම රුවියෙන් පවතී; **න යෙන කාමඛතමෝ**= යම් දිශාවෙක්හි යැමට ඔහුට කැමැත්ත වේ ද, රුවිය උපදී ද, එහි යන්ට නො ලබයි; **දුඛවසා**= දුඛභාවයෙන්; **භුජිස්සෝ**= තමා සතු වූයේ; **තණ්හා නිදානං**= තමා සතුබව කරුණු කොට; **ඛණතාරඛාතමඝඛං**= කාන්තර (ඛඩ්ඛ්‍යාත) වූ අදන්මඝ, නිරුදක වූ දීඝීමාඝීය යන අටවැසි. **තණ්හා නිදානං**= ක්ෂෙමභූමිය කරුණු කොට.

ඉමේ පඤ්ච නිවරණෙ අප්පහීනෙ යන මෙහි භාග්‍යවතුන් වහන්සේ ප්‍රහීණ නො වූ කාමච්ඡන්දනීවරණය ණය සමාන කොට, සෙස්සන් රුහාදීන් සමාන වුවත් කොට දක්වන සේක. එහි මෝ සදෘශ බව යැ-

යමෙක් වතාහි අන්‍යයන්ගේ ණය ගෙන විනාශ කෙරේ ද,
කාමච්ඡඡය. හෙතෙම ඔවුන් විසින් "ණය දෙව" යි කියනු ලබන්නේ ද,
පරුෂ කියනු ලබන්නේ ද, බදිනු ලබන්නේ ද, කිසිවක් විරුඬ ව කියන්ට නො හැකි වෙයි, සියල්ල ඉවසයි; යම්හෙයකින් ඒ ණය ඔහුගේ ඉවසීමට කරුණු වේ ද එහෙයිනි. එපරිද්දෙන් ම යමෙක් යම්කු කෙරෙහි කාමච්ඡන්දයෙන් ඇලේ ද, තෘෂ්ණාග්‍රහණයෙන් ඒ වස්තුව ගනී ද, හෙතෙම ඔහු විසින් පරුෂ කියනු ලබන්නේ ද බදිනු ලබන්නේ ද ගසනු ලබන්නේ ද, සියල්ල ඉවසයි; යම්හෙයකින් ඒ කාම ච්ඡන්දය ඔහුගේ ඉවසීමට කරුණු වේ ද එහෙයිනි. ගෙහිමියන් විසින් වධ කරනු ලබන්නාවූ සත්‍රීන්ගේ මෙනැසි; මෙසේ ණයක් මෙන් කාම ච්ඡන්දය දතයුතු.

කැවිත යම්සේ පිත්තරොගයෙන් ආතුර වූයේ මී-සකුරු ආදිය තමුදුන් කල්හි පිත්තරොගයෙන් ආතුර බැවින් ඒ මී-සකුරු ආදීන්ගේ රස නො විඳී ද, "තිකත යැ තිකත යැ" යි වම්මාරන්නේ ම වේ ද,
ව්‍යාපාදඡ. එපරිද්දෙන් ව්‍යාපාදයට පැමිණී සිත් ඇත්තේ වැඩ කැමති ආචාර්‍ය්‍ය-උපාධ්‍යායයන් විසින් මදපමණකු දු අවවාද කරනු ලබන්නේ අවවාදය නො ගනී, "තෙපි මට ඉතා ම උපද්‍රව කරවු" යනාදීය කියා සිවුරු හරී; පිනින් ආතුර බැවින් ඒ පුරුෂ මී-සකුරු රස මෙන් ක්‍රෝධයෙන් ආතුර බැවින් ධ්‍යානසුඛාදි හෙද ඇති ශාසනරසය නො විඳී නුයි මෙසේ රොගයක් මෙන් ව්‍යාපාදය දතයුතු.

කැවිත යම්සේ නකත් දිනයෙහි සිරගෙයි බැඳි පුරුෂ නැකැත් කෙළිඹේ ආදිය නො දකී ද, මධ්‍යය නො දකී ද, අවසානය නො දකී ද,
හෙතෙම දෙවන දවස් මුදන ලද්දේ අහෝ! ඊයේ නැකැත් පිනම්ඛඡ. (කෙළි) මනාප වී යැ, අහෝ! නැටුම්, අහෝ! ගැයුම් (මනාප වී යැ,) යනාදිය අසා ත් පිළිවදන් නො දේ ද; කරුණු කිම? යන්: නැකැත් කෙළි නො වින්ද හෙයිනි. එපරිද්දෙන් පිනම්ඛයෙන්

මඛනා ලද මහණ විසිතුරු නය ඇති ධර්මශ්‍රවණය නමුදු පවත්නා කල්හි ඒ ධර්මයාගේ ආදිය- මධ්‍යය - අවසානය නො මැ දනී; හෙතෙම ධර්මශ්‍රවණයෙන් නැඟිසිටි කල "අහෝ! ධර්මශ්‍රවණය අහෝ! කාරණය අහෝ! උපමාව" යනි ධර්මශ්‍රවණයාගේ ගුණ කියන්නවුන්ගේ (වචන) අසා ත් පිළිවදන් නො දෙයි; කරුණු නිම? යත්:- පිනම්ඩයාගේ වශයෙන් ධර්ම කථාව නො වින්දහෙයිනැසි; බඹනාහාර (= සිරගෙ) යක් මෙන් පිණ්ඩය දතයුතු.

නැවත යම්සේ තැකැත් කෙළින්නා වූ ද දැස තෙම "මේ නම් ඉක් මන් කටයුත්තෙක් ඇති, වහා එහි යව, ඉදින් නො යෙයි නම් තාගේ අත්-පා හෝ කන්-නාසා හෝ සිඳිමි" කියන ලද්දේ වහා යේ මය, තැකැත්කෙළියේ මූල-මැද-අග විඳින්ට නො ලබයි; කුමක් හෙයින? පරාධීන බැවිනි. එපරිද්දෙන් විනයෙහි ප්‍රගුණ නො වූවහු විවෙක සඳහා වනයට පිවිසියහු විසිතුරු දු කිසිවෙක්හි ම යටත් පිරිසෙයින් කැපමසෙහි දු අකැප යැ යන හැඟීම උපන් කල්හි විවෙකය හැර සිල් පිරිසුදු කරනු පිණිස විනයධර යකු සමීපයට යායුතු වෙයි, විවෙකසුව විඳින්ට නො ලබයි; කුමක් හෙයින? උඛවකුක්කුච්චයෙන් මඛනා ලද බැවිනැසි, මෙසේ දැසබවක් මෙන් උඛවකුක්කුච්චය දතයුතු.

උඛවකුක්කුච්චයය.

නැවත යම්සේ කතර අදන්මහට පිළිපන් පුරුෂ සොරුන් විසින් මිනිසුන්ගේ (ධනය) පැහැරගත් තැන ගිය තැන දුක දඬුශබ්දයෙන් ද පක්ෂීන්ගේ ශබ්දයෙන් ද සොරු ආවාහු යයි යේ නමුදු සිටි නමුදු නවති නමුදු ගවගත් සැක ඇත්තේ හාත්පසින් සැක ඇත්තේ වේ ද; ගිය තැනට වඩා (පෙරළා) ආ තැන් ම ඉතා බොහෝ වේ ද, හෙතෙම දුකින් වෙහෙසින් ක්ෂෙමභූමියට පැමිණෙන්නේ හෝ නො පැමිණෙන්නේ හෝ වෙයි. එපරිද්දෙන් යමෙකුට (බුඩාදි) අවතැන්හි විචිකිත්සා උපන්නී වේ ද, හෙතෙම "බුදු වූයේ දෝ හෝ නො බුදු වූයේ දෝ හෝ" යනාදි නයින් සැක කරන්නේ ගුණ සලකා ශ්‍රඩාවෙන් ගන්ට නො හැකි වෙයි, නො හැකි වන්නේ මාර්ගයට හෝ ඵලයට හෝ නො පැමිණේ නුයි මෙ පරිද්දෙන් යම්සේ කතර අදන් මහ සොරු ඇද්ද නැද්ද,යි නැවත නැවත චිත්තයාගේ ඉදිරියට යැම හාත්පස යැම බැසගැනීම තැතිගැනීම උපදවමින් නිර්වාණභූමියට පැමිණීමට අන්තරාය කෙරේ ද, එපරිද්දෙන් විචිකිත්සාව ද "බුදුහු ද නො බුදුහු ද" යනාදී නයින් නැවත නැවත චිත්තයාගේ අභිමුඛයට යැම හාත්පස යැම බැසගැනීම තැතිගැනීම උපදවන්නාහු ආර්‍යභූමියට පැමිණීමට අන්තරාය කෙරේ නුයි කතරඅදන්මහ මෙන් දතයුතු.

මෙවිට **සෙය්‍යථාපි භික්ඛවෙ!** ආනණ්‍යං යන මෙහි භාග්‍යවතුන් වහන්සේ ප්‍රහීණ වූ කාමච්ඡන්දනීවරණය ණය නැතිබව සමාන කොට, සෙසු නීවරණයන් නිරොගබැව් ආදිය සමාන කොට දක්වන සේක; එහි මෝ සදෘශ බව යැ:- යම්සේ පුරුෂයෙක් ණය ගෙන කම්මන්තයෙහි යොදවා සමෘඩ වූ කම්මන්ත ඇත්තේ "ණය නම් පළිබොධයට මූල ය" යි සිතා පොලිය සහිත ණය පාවාදී පත්‍රය පලවාපියන්නේද, නැවත ඔහුට එතැන් පටන් කිසිවෙක් දූතයකු නො ම එවන්නේ ද, පතක් නො එවන්නේ ද, ඒ ණයහිමියන් දූත ත් ඉදින් කැමති නම් ආසනයෙන් නැඟිටින්නේ ද, ඉදින් නො කැමති නම් නො නැඟිටින්නේ ද වෙයි; කුමක් හෙයින ? ඔවුන් සමග නො ඇලුණු බැවිනි, නො ලැගුණු බැවිනි. එපරිද්දෙන් ම මහණ තෙම මේ කාමච්ඡන්දය නම් පළිබොධයට මූල යයි සතිපට්ඨානයෙහි කී නියෙන් ම (අශුභනිමිත්ත ආදි) ධර්‍ම සයක් වඩා කාමච්ඡන්දනීවරණය දුරු කෙරෙයි; මෙසේ ප්‍රහීණ වූ කාමච්ඡන්දය ඇති ඔහුට- යම්සේ ණයෙන් මිදුණු පුරුෂයාට ණයහිමියන් දැක නො මැ භයක් නො තැති ගැනීමක් වේද, එපරිද්දෙන් පරවසතුවෙහි නො මැ ඇලීමෙක් නො බැඳීමෙක් වෙයි; දිව්‍යරූපයන් නමුදු දක්නහුට කෙලෙස් නූපදී. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ ණය නැතිබව මෙන් කාමච්ඡන්දයාගේ ප්‍රහාණය වදාළහ.

නැවත යම්සේ ඒ පිත්තරොගයෙන් ආතුර වූ පුරුෂ තෙම බෙහෙත් කිරීමෙන් ඒ රොගය සන්සිඳුවා එ තැන් පටන් මී-සකුරු ආදීන්ගේ රස විඳී ද; එපරිද්දෙන් මහණ "මේ ව්‍යාපාදය නම් අනර්‍ථකරණයෙකැ" යි (මෙත්තානිමිත්ත ආදි) ධර්‍ම සය වඩා ව්‍යාපාදනීවරණය දුරු කෙරෙයි; හෙතෙම මෙසේ ප්‍රහීණ වූ ව්‍යාපාදය ඇත්තේ- යම්සේ පිත්ත රොගයෙන් මිදුණු පුරුෂ මී-සකුරු ආදි මධුරයන් ප්‍රිය කෙරෙමින් සෙවනය කෙරේද; එපරිද්දෙන් ආචාරප්‍රඥප්ති ආදිය භික්ම්වනු ලබන්නේ හිසින් පිළිගෙන ප්‍රිය කෙරෙමින් භික්මෙයි එහෙයින් භාග්‍යවතුන් වහන්සේ ආරොග්‍යය මෙන් ව්‍යාපාදයාගේ ප්‍රහාණය වදාළහ. යම්සේ නැකැත් දිනයෙහි සිරගෙට ප්‍රවේශ කළ ඒ පුරුෂ අනිත් නැකැත් දිනයෙක්හි "පෙර ත් මම ප්‍රමාද දොෂයෙන් බන්ධනා ලද්දේ ඒ නකත්කෙළි නො වින්දෙමි, මේවිට නො පමා වන්නෙමි" යම්සේ ඔහුගේ පස්මිතුරෝ අවකාස නො ලබත් ද, එපරිද්දෙන් අප්‍රමාද වැ නකත්කෙළි විඳ "අහෝ! නකත්කෙළි" යයි උදන් අනාදැ; එපරිද්දෙන් මහණ "මේ පීතිසම්බොධය නම් මහානර්‍ථකර" යයි (හොජ්ජනයෙහි මාත්‍රඥතාදි) ධර්‍ම සය වඩා පීතිසම්බොධ නීවරණය දුරු කෙරෙයි; හෙතෙම මෙසේ ප්‍රහීණ වූ පීතිසම්බොධය ඇත්තේ- යම්සේ බන්ධනයෙන් මිදුණු පුරුෂ සතියකුදු නකත්කෙළියේ ආදිමධ්‍ය පර්‍යවසානය විඳිද, එපරිද්දෙන් දහම් නමැති නකත්කෙළියේ ආදිමධ්‍ය පර්‍යවසානය විඳිමින් සිවුපිළිසිඹියා සමඟ රහත්බවට පැමිණෙයි.

එහෙයින් භාග්‍යවත්හු බඹතයෙන් මිදීම මෙන් පීතම්බරයාගේ ප්‍රහාණය වදාළහ. නැවත යම්සේ දාසයෙක් කිසි යම් මිතුරකු ඇසුරු කොට හිමි යන්ට ධනය දී තමා සියඇතු කොට (= දාසභාවයෙන් මුදා) ඒ තැන්පවන් යමක් කැමති නම් එය කරන්නේ ද; එපරිද්දෙන් මහණ "මේ උඩවව කුක්කුච්චය නම් මහාතස්කර" යයි (බහුශ්‍රැතභාවාදි) ධර්මය වඩා උඩවව කුක්කුච්චය දුරු කෙරෙයි, හෙතෙම මෙසේ පහවූ උඩවවකුක්කුච්චය ඇත්තේ- යම්සේ දාසභාවයෙන් මිදුණු පුරුෂ යමක් කැමති නම් එය කෙරේ ද, ඔහු කිසිවෙක් බලාත්කාරයෙන් එයින් නො වළකා ද; එ පරිද්දෙන් මහණ කැමති සේ නෛෂ්කාම්‍යප්‍රතිපදාවට පැමිණෙයි, ඔහු උඩවවකුක්කුච්චය බලාත්කාරයෙන් එයින් නො නවත්වයි; එහෙයින් භාග්‍යවත්හු දාසභාවයෙන් මිදීම මෙන් උඩවවකුක්කුච්චයාගේ ප්‍රහාණය වදාළහ. යම්සේ බලවත් පුරුෂයෙක් හස්තසාරය ගෙන සැදුණු ආයුධ ඇත්තේ පිරිවර සහිත වූයේ කතරට පිළිපදනේ ද, සොරු ඔහු දුරින් ම දැක පලායන්නාහු ද, හෙතෙම සුවසේ ඒ කතර තරණය කොට ක්ෂේම භූමියට පැමිණියේ තුටුපහටු වන්නේ ද; එපරිද්දෙන් මහණ "මේ විචිකිච්ඡාව නම් අනර්ථ කරන්නී ය" යි (බහුශ්‍රැතභාවාදි) ධර්මයන් සදෙන වඩා විචිකිච්ඡාව දුරු කෙරෙයි; හෙතෙම මෙසේ ප්‍රහීණ වූ විචිකිච්ඡා ඇත්තේ යම් සේ බලවත් වූ සැදුණු ආයුධ ඇති සපරිවාර වූ පුරුෂයෙක් සොරුන් දැක නිර්භය වූයේ සොරුන් තෘණයක් කොට ද නො ගෙන සුවසේ නිර්භ ක්ෂේමභූමියට පැමිණේ ද, එපරිද්දෙන් දුශ්චරිත නමැති කාන්තාරය තරණය කොට පරමක්ෂේමභූමි වූ අමා නිවනට පැමිණෙයි; එහෙයින් භාග්‍යවත්හු ක්ෂේමභූමියක් මෙන් විචිකිච්ඡාප්‍රහාණය වදාළහ.

ඉමමෙව කායං= මේ කළේවරය; **අභිසන්දෙති**= තෙමයි, සෙනහ කෙරෙයි, සියලු තැන්හි පැවති ප්‍රීතිසුවය කෙරෙයි; **පරිසන්දෙති**= හාත් පසින් තෙමයි; **පරිපූරෙති**= වාතයෙන් හස්ත්‍රාවක් මෙන් පුරයි; **පරිඵරති**= හාත්පසින් සපශී කෙරෙයි; **සබ්බාවතෝ කායස්ස**= ඒ භික්ෂුහුගේ සියලු කොටස් ඇති ශරීරය පිළිබඳ උපාදිණ්ණක සන්තතියෙහි පවත්නා තැන්හි සිව්-මස්-ලේ අනුව ගිය කිසි මද පමණකු දු තැනක් පළමුවන දැහැන්සුවයෙන් සපශී නො කරන ලද්දේ නම් නො වෙයි; **දකෙඩා**= නහානීය චූර්ණ (= නානුසුණු) කරන්ට ද යොදන්ට ද පිඬු කරන්ට ද දක්ෂ වූයේ, ප්‍රතිබල වූයේ; **කංසථාලෙ**= යම් කිසි ලොහයකින් කළ බදුනෙක්හි; යම්හෙයකින් මැටිබදුන සිදුර නො වේ ද, පිඬුකරන්නහු බිඳේ ද, එහෙයින් එය නො දක්වයි; **පරිපෙඵොසකං පරිපෙඵොසකං**= ඉස ඉස; **සනෙනහසුත්තෙන**= වමතින් කස්තලිය ගෙන දකුණතින් පමණින් යුත් දිය ඉස ඉස පිරිමදිමින් පිඬු කරන්නේය; **සෙනහානුගතා**= උදක සෙනහයෙන් යුකත වූවා; **සෙනහපරෙතා**= උදකසෙනහයෙන් හාත් පසින් යුකත වූවා; **සන්තරබාහිරා**= ඇතුළු පෙදෙස ද පිටත පෙදෙස ද

සමඟ සියලු තැන ම උදකසෙනහ (= දියතෙතින්) සපශී කරන ලද්දී යන අර්ථ යි; න ච පඝසරණී= බිඳ බිඳ දිය නො වැගිරෙයි, අතින් ද දැගිල්ලෙන් ද ගන්ට ත් වැට කරන්ට ත් හැකි වෙයි යන අර්ථ යි.

තිතියඣානසුවය පිළිබඳ උපමාවෙහි උබහිනොදකෝ= උඹට බිඳුණු ජලය ඇත්තේ, (පොළොව) බිඳී උඹට නහින දිය ඇත්තේ; යට බිඳී උඹට නහින දිය ඇත්තේ නො වෙයි, වැළි ඇතුළත ම උපදින දිය ඇති යන අර්ථ යි. ආයමුඛං= එන මහ; දෙවෝ= මෙඝය (= වැස්ස;) කාලෙන කාලං= අඛමඝක් පාසා හෝ දඝදිනක් පාසා හෝ යන අර්ථ යි; ඛාරං= වැසිපොද; නානුපපවෙච්ඡය්‍ය= නො පිවිසෙන්නේය; නො වස්නේය යන අර්ථ යි. සිනා වාරිධාරා උබහිජ්ජිතා= සිහිල් දිය ඒ විල පුරමින් ඉපද; ඒ එසේ මැයි- යටින් උඹට නහින දිය උඹට නැඟී බිඳෙන්නේ ජලය අලළයි, සිවුදිගින් පිවිසෙන දිය පරණලා - තණ - දර - දඬු ආදි යෙන් කලඹයි, වැසි දිය පොද වැටීමෙන් හටගත් බුබුළුවලින් ජලය කලඹයි; වැළි පිහිටියේ ම වී සෘඩියෙන් මවන ලද්දක් මෙන් උපදනා ජලය මේ පෙදෙස පැතිරෙයි, මේ පෙදෙස නො පැතිරෙයි යනු නැති; එහින් සපශී නො කළ අවකාසයෙක් නම් නො වෙයි. එහි රහදය මෙන් කරජකාය යැ, ජලය මෙන් දෙවනදූහැන්සුවය යැ; සෙස්ස පළමු නයින් ම දතයුතු.

තෘතියධ්‍යානසුවය පිළිබඳ උපමාවෙහි උපුල් මෙහි ඇත් නුයි උප්පලිනී නම්; සෙසු දෙපදයෙහි ද මෙ ම නය යි. තවද- මෙහි සුදු-රත්-නිල් වූවන් අතුරෙහි යම් කිසිවක් උපුල් මැයි; උනු සියපත් ඇතියේ පුණ්ඩරීක නම; සියපත් ඇතියේ පදුම නම; නොහොත් පත්‍රතියමයක් නැති ව ම සුදු වූයේ පදුම යැ; රත් වූයේ පුණ්ඩරීක යැයි මේ මෙහි විනිශ්චය යි. උදකානුනහනානි= ජලයෙන් නො නැංහුනු; අනෙනා නිමුග්ගපොසිනී= ජලතලයාගේ ඇතුළත ගැලුනාහු ම වී පොෂණය වෙති, වැඩෙති, යන අර්ථ යි. සෙස්ස පළමු නයින් ම දතයුතු.

චතුර්ථධ්‍යානසුවය පිළිබඳ උපමාවෙහි පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන යන මෙහි උපක්ලෙශ රහිතාර්ථයෙන් පරිසුද්ධ යැ, ප්‍රභාස්වරාර්ථයෙන් පරියොදාත යැ දතයුතු. ඔදාතෙන වත්ථෙන යන මෙය සෘතු පැතිරීම සඳහා කියන ලදි; ඒ එසේ මැයි- කිලිටි වතින් සෘතු පැතිරීමක් නො වෙයි, එ කෙණෙහි සේදූ පිරිසුදු වතින් සෘතු (ගුණ) පැතිරීම බල වත් වෙයි; යම් හෙයකින් මේ උපමාවෙහි වස්ත්‍රය මෙන් කරජකාය වේ ද, සෘතු පැතිරීම මෙන් සතරවන දූහැන්සුවය වේද; එහෙයින් යම්සේ මොනොවට සනානය කළ පිරිසුදු වතක් හිස සහිත ව පොරවා හුන් පුරුෂයාගේ ශරීරයෙන් සෘතුගුණය සියලු මැ වස්ත්‍රාවයවයෙහි හැඟිරේ ද වස්ත්‍රයාගේ කිසි සපශී නො කළ අවකාසයෙක් නො වේ ද, එපරිද්දෙන් සතරවන දූහැන්සුවයෙන් භික්ෂුහුගේ කරජකාය පිළිබඳ කිසි අවකාස

යෙක් සපාගී නො කරන ලද්දේ නො වේ යයි මෙසේ මෙහි අර්ථ දතයුතු. නොහොත් චතුර්ධ්‍යානවිත්තය ම පොරෝණා ලද වසනුය මෙනි, එයින් උපදනා රූපය සෘතු පැනිරීම මෙනි; ඒ එසේ මැයි- යම් සේ සූදු වසනුය කය සපාගී නො කරන කල්හි දූ එයින් උපදනා සෘතුවෙන් සියලු තැන්හි වූ මෑ කය සපාගී කරන ලද්දේ වේ ද, එපරිද්දෙන් චතුර්ධ්‍යානයෙන් උපන් සියුම් රූපයෙන් භික්ෂුහුගේ සියලු තැන්හි වූ මෑ කය සපාගී කරන ලද්දේ වේ යයි මෙසේ ත් මෙහි අර්ථ දතයුතු.

පූර්වේනිවාසඥාන උපමාවෙහි එ දවස කළ ක්‍රියාව ප්‍රකට වේ නුයි; එ දවස ගිය ගම් තුනක් ම හන්නා ලදි; එහි ගම් තුනට ගිය පුරුෂයා මෙන් පූර්වේනිවාසඥානලාභී තෙම දතයුතු; ගම් තුන මෙන් තුන් භවය දතයුතු; ඒ පුරුෂයාට ගම් තුනෙහි එදවස කළ ක්‍රියාව ප්‍රකට වීම මෙන් පූර්වේනිවාසය පිණිස සිත එළවා හුන් මහණහට තුන්භවයෙහි කළ ක්‍රියාව පහළ වීම දතයුතු.

දිවැස්උපමාවෙහි- **ගෙ අගාරා**= ගෘහ දෙකක්; **සඉත්ථාරා**= මුඛවාර සහිත වූවාහු; **අනුවඩකම්මෙනා**= ඔබිනොබ සක්මන් කරන්නවුන්; **අනුවිචරණෙනා**= එහා මෙහා හැසිරෙන්නවුන්; මෙ ගෙයින් නික්ම තෙල ගෙට තෙල ගෙයින් නික්ම හෝ මෙ ගෙට පිවිසීම් වශයෙන් දතයුත්තා හුය; ඒ උපමාවෙහි මුඛවාර සහිත ගෙවල් දෙක මෙන් ව්‍යුතිප්‍රතිසන්ධි හු යැ; ඇස් ඇති පුරුෂයා මෙන් දිවැස්නුවණ ලත් මහණ යැ; ගෙවල් දෙක අතරැ සිට බලන්නා වූ ඇස් ඇති පුරුෂයාට ගෙවල් දෙකට පිවිසෙන නික්මෙන පුරුෂයන් ප්‍රකට වූ කාලය මෙන් ආලෝකය වඩා බලන්නාවූ දිවැස් ලාභීහට චුතවන උපදින සත්ත්වයන් ප්‍රකට වූ කාලය යැ, යළි කිම ඔවුහු නුවණට ප්‍රකට වූවාහු ද? පුද්ගලයා හට ද? යත්:— නුවණට යැ, වැළි ඒ නුවණට ප්‍රකට බැවින් පුද්ගලයා හට ප්‍රකට වූවාහු ම යයි.

ආශ්‍රවක්ෂයඥානඋපමාවෙහි- **පබ්බතසණ්ඩපෙ**= පර්වතමස්තකයෙහි; **අනාවිලෝ**= කැළඹ (= මඩ) රහිත වූයේ; සිපපිබෙල්ලෝ ද රන්වන් බෙල්ලෝ ද= **සිප්පිසම්බුකා** නම; කැට ද කැබිලිති ද- **සක්ඛරකඨල** නම; මසුන්ගේ ගුම්බය, සමූහය නුයි **මච්ඡගුම්බ** නම; **තිට්ඨන්තම්පි චරන්තම්පි** යන මෙහි කැට-කැබිලිති සිටී ම යැ, සෙස්සෝ හැසිරෙන්නාහු ත් සිටින්නාහු ත් වෙති, වැලි යම්සේ අතරින් අතරැ සිටියා වූ ද හුන්නා වූ ද හෝනා වූ ද දෙනුන් ඇති කල්හි "මේ දෙන්නු හැසිරෙති" ඇවිදින දෙනුන් සඳහා අන්‍යයෝ ත් "ඇවිදිති" කියනු ලැබෙත් ද, එපරිද්දෙන් සිටිනා වූ ම කැට-කැබිලිති ගෙන ඉතිරි දෙක ද "තිට්ඨන්තං" යි කියන ලද; නැවත හැසිරෙන්නා වූ ඉතිරි දෙක ගෙන කැට-කැබිලිති ද "චරන්තං" යි කියනු ලදී. ඒ උපමා

වෙයි. අවුරෙහි සිට බලන්නාවූ ඇස් ඇති පුරුෂයාට සිපපි - සම්බුකාදීන් ප්‍රකට වූ කාලය මෙන් ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීම පිණිස සිත එළවා හුන් මහණ හට සිවුසස් ප්‍රකට වූ කාලය දතයුතු.

මෙවිට සත්ආකාරයකින් සමාන ලිඛග හෙයින් සමාන ගුණ හෙයින් සමණාශ්‍රවයාගේ නම් ගන්නාහු අයං වුච්චති භික්ඛවෙ! භික්ඛු සමණෝ ඉතිපි යනාදිය වදළහ. එහි- එවං බො භික්ඛවෙ! භික්ඛු සමණෝ හොති යනාදි තැන්හි මහණෙනි! මෙපරිද්දෙන් මහණ සන්ඝදුවන ලද පව් ඇති බැවින් සමණ වෙයි; බැහැර කළ පව් ඇති බැවින් බ්‍රාහමණ වෙයි; සනාතකෙලෙශ ඇති බැවින් නහාතක වෙයි; සෝදන ලද කෙලෙස් ඇති බැවින් යත අවී යි. සිවුමඟඵලාවණ සඞ්ඛ්‍යාත වූ වෙද යන් විසින් අකුශල ධර්මයන් නැසූ බැවින් වෙදගූ වෙයි; දන්නා ලද බැවින් යත අවී යි. එහෙයින් ම විදිතා'සස හොනති යනාදිය වදළහ. කෙලෙසුන් වගුළ බැවින් සොතනිය වෙයි; නිඃශ්‍රෙත බැවින් පහ වූ බැවින් යත අවී යි. කෙලෙසුන් දුරු කළ බැවින් අරිය වෙයි; දුරු වූ බැවින් යත අවී යි. සෙස්ස සියලු තැන්හි ප්‍රකට මැයි.

මහාඅසසපුර සූත්‍ර වර්ණනා නිමි. (9)

———:÷:———

චූලඅස්සපුර සූත්‍ර වණ්ණනා.

——o×o——

එවං මේ සුතං යි චූලඅස්සපුර සූත්‍රය යි. දෙශනාආරම්භය පළමු සූත්‍රයට සමාන මැයි. **සමණසාමීචිපටිපදා**= මහණුන්ට සුදුසු වූ මහණුන්ගේ අනුලොම් පිළිවෙත; **සමණමලානං** යනාදියෙහි මේ ධර්මයෝ උපදනාහු මහණුන් මලිනයන් මල ගත්තවුන් කෙරෙති, එහෙයින් **සමණමල** යයි කියනු ලැබෙත්; මොවුන් විසින් ශ්‍රමණයෝ දූෂ්‍ය කරනු ලැබෙත්, ප්‍රදූෂ්‍ය කරනු ලැබෙත්; එහෙයින් **සමණදූස** යයි කියනු ලැබෙත්; මොවුහු ඉපද මහණුන් කසටයන් ඔජස් රහිතයන් කෙරෙති; මලානික කෙරෙත්, එහෙයින් **සමණකසට** යයි කියනු ලැබෙත්; **අපායිකානං ඨානානං**= අපායයෙහි උපදවන කාරණයන්ට; **දුග්ගතිවෙදනීයානං**= දුගතියෙහි විපාක වෙදනාවන්ට ප්‍රත්‍යය වූවන්ට; **මනුස්සානං**= මනුෂ්‍යයෝ තියුණු යකඩ අරයෙන් (= පිරෙන්) ගවා ඒ යහුණු මස් සමඟ මැඩ කොස්වාලිහිණින්ට කවති, ඔවුහු උවා (= මල) කරන්වී නො හැක්කාහු මැරෙති, ඉදින් නො මැරෙත් නම් පැහැර මරති; අනතුරු ඔවුන්ගේ කුස පලා අතුනු ජලයෙහි සෝදා සුණු ගෙන මස් සමඟ මැඬ කැවත කවති, මෙසේ සත්වරක් කවා ගත් යහුණෙන් ආයුධ කෙරෙති; එය මොනොවට පුහුණු වූ ලොහොකරුවෝ ම බොහෝ අත්තම්මිල ලැබ කෙරෙත්, එය මල ලිහිණියා කෙරෙන් උපන් හෙයින් "මතජ" යයි කියනු ලැබේ; ඉතා තියුණු වේ. **පිතනිසිතං**= දිය බොන ලද්දා වූ ද ගලෙහි මොනොවට ගවන ලද්දා වූ ද; **සඞ්ඛාමිසා**= කොපුවෙන්; **සමපාරුතං**= හාත්පසින් වසන ලද්දේ; **සමපලිවෙඨිතං**= හාත්පසින් වෙළන ලද්දේ; **රඤ්ඤලලිකස්ස**= රජස් - දූලි ධරන්නහුගේ; **උදකොරොහකස්ස**= දවසට තුන්වරක් දියට බස්නහුගේ; **රුක්ඛමූලිකස්ස**= රුක්මුල වසන්නහුගේ; **අබ්භොකාසිකස්ස**= අභ්‍යවකාශයෙහි වසන්නහුගේ; **උබ්භඣ්ඩිකස්ස**= උඩුකුරුව සිටින්නහුගේ; **පටිසාණභක්ඛස්ස**= මසකට වරක් හෝ අඩමසකට වරක් හෝ වළඳන්නහුගේ; මේ සියල්ල බාහිරසමය (= ලබඩ) යෙන් ම කියන ලදා; ඒ එසේ මැයි= මේ ශාසනයෙහි සිවුරු දරන්නාවූ මහණ "සඞ්ඝාටික" යයි නො කියනු ලැබේ, රජස්-දූලි ධරීම් ආදි ව්‍රතයෝ ද මේ ශාසනයෙහි නැත් මැයි; බුඩවචනයට "බුඩවචන" යී ම නාමය යා; "මත්ත" යී නාමයෙක් නැතී. එහෙත් "රුක්ඛමූලික යා, අබ්භොකාසික යා" යන මෙතෙක් ම ලැබෙහී; හෙ ද (මෙහි) බාහිරසමයෙන් ම කියන ලදි. **ජානමෙව නං**= උපන් දිනයෙහි උපන් ඇසිල්ලක් ඇත්තාවූ ම ඔහු; **සඞ්ඝාමිසං කරෙය්‍යුං**= සහළවතක් හදවා ද පොරවා ද සඞ්ඝාටිකයකු කරන්නාහුය; **සියලු තැන්හි මේ ම නයයි.**

විසුඛමත්තානං සමනුපස්සති= තමා විශුඛයකැයි දකී; එහෙත් ඒ තෘෂ්ණාව විශුඛ යයි නොකියයුතු. **පාමුජ්ජං ජනයති**= සතුටු ආකාරය උපදී; **පමුදිතස්ස පීති**= සතුටු වූවහුගේ සියලු ශරීරය අලලමින් ප්‍රීතිය උපදී; **පීතිමනස්ස කායෝ**= ප්‍රීතියෙන් යුක්ත වූ පුද්ගලයාගේ නාම කාය; **පස්සම්භති**= පහවූ දරථ (= විඩා) ඇත්තේ වෙයි; **සුඛං වෙදෙති**= කායික වූ ද චෛතසික වූ ද සුවය විඳී; **චිත්තං සමාධියති**= මේ නොයෙක් කාම්‍ය සැපයෙන් සුවපත් වූවහුගේ සිත එකඟ වෙයි; **අපිණාවට පැමිණී යක් මෙන් වෙයි**; **යථා මෙත්තා සහගතෙන චෙතසා**= යම කෙලෙස් වශයෙන් පටන්ගන්නා ලද දෙශනාව පවිතයෙහි වට වැස්සක් නදියට මෙන් අනුසන්ධි නොඉක්මැ බ්‍රහ්මවිහාරභාවනාවට බැසගන්නා ලද්දීය. එහි සමක් කියයුතු වන්නේ නම් ඒ සියල්ල විශුඛිමාර්ගයෙහි කියන ලද මැයි. **සෙය්‍යථාපි භික්ඛවේ!** පොක්ඛරණී යනු මහාසීහනාද සූත්‍රයෙහි පොකුණට මාර්ගය උපමා කරන ලද, මෙහි ශාසනය උපමා කරන ලද්දේ යයි දතයුතු. **ආඝාවානං බහා සම්මණ්ණා හොති**= සියලු කෙලෙ සුන් සන්සිඳුවන ලද බැවින් පරමාර්ථශ්‍රවණ වූයේ වේ. සෙස්ස සියලු කැණ්කි ප්‍රකට වූයේ මැයි.

චූළඅස්සපුර සූත්‍ර වර්ණනා නිමි. (10)

———:÷:———

"ප්‍රපඤ්චදීපිකා" නම් මැදුම්සඟි සිංහල අටුවාවෙහි

සිවුවැනි වූ

ම හා ය ම ක ව ගී ව ර්ණ නා

මෙතෙකින් සමාප්තයි.

———

සාලෙය්‍යක සූත්‍ර වණ්ණනා.

එවං මෙ සුතං යි සාලෙය්‍යක සූත්‍ර යයි. **එහි කොසලෙසු=** "කොසල" නම් දනව්වැසි රාජකුමාරයෝ යැ, ඔවුන්ව නිවාස වූ එක් ජනපදයකුදු රුඪිශබ්දයෙන් "කොසල" යි කියනු ලැබේ.

කොසලජනපදය.

ඒ කොසොල්දනව්වෙහි; පොරණදුරෝ වනාහි මෙසේ කිහුඃ- යම්හෙයකින් පෙර මහාපණාද රාජකුමාරයා නා නා නළුවන් දැක සිනහ පමණකු දු නො කරන්නහු අසා රජ්ජුරු වෝ (මෙසේ) කිහඃ- "යමේක් මපුතු සිනහ කරවා නම් ඔහු සඳිලඬකාරයෙන් අලඬකාර කෙරෙමි" ඉක්බිති ත්හුල් පවා හැරදමා මහාජනසමූහයා රැස්වූ කල්හි මනුෂ්‍යයෝ අතිරෙක වූ සත්වසක් මුලුල්ලෙහි තන් වැදුරුම් කෙළි දක්වා ඔහු සිනහ කරන්ට නො හැකිවූහ. ඉක්බිති සක්දෙව්රජ දෙව්තළුවකු යැවීය; හෙතෙම දිව්‍ය නාවකයක් දක්වා සිනහ කරවී. එකල්හි ඒ මනුෂ්‍යයෝ තම තමන් වසන තැනට අභිමුඛ ව ගියාහුඃ. ඔවුහු අභිමුඛයෙහි මිත්‍රසුහෘදුන් දැක පිළිසඳර කරන්නාහු "කිම සුව දැ?" යි කිහුඃ එහෙයින් ඒ "කුසල යැ, කුසල යැ" යන වචනය ගෙන ඒ පෙදෙස "කොසල" යි කියනු ලැබේ යයි. **චාරිකං චරමානො=** අතුරිත චාරිකාවෙහි හැසිරෙන සේක්; **මහතා භික්ඛු සඞ්ඝෙන සද්ධිං=** සියයක් හෝ දහසක් හෝ සියදහසක් හෝ,යි මෙසේ පිරිසිදිම් රහිත වූ මහාභික්ෂුසඞ්ඝයා සමඟ; **බ්‍රාහ්මණගාමො=** බමුණන් රැස්වන ගම් ද "බ්‍රාහ්මණගාම" යි කියනු ලැබේ; බමුණන්ගේ හොඟ ග්‍රාම්‍ය ද කියනු ලැබේ; මෙහි රැස්වන ගම අදහස් කරන ලදි. **තදවසරි=** එ ගමට ඇතුල්වූහ, පැමිණියහ යන අර්ථ යි. යම්හෙයකින් මෙහි විහාරය නියම නො කරන ලද ද, එහෙයින් එ ගමට නුදුරු තැන්හි බුදුනට සුදුසු වූ එක් වනලැහැබෙක් වන්නේය, ශාස්තෘන් වහන්සේ ඒ වනලැහැබට වැඩි සේකැයි දතයුතු **අස්සොසුං=** ඇසූහ, ලැබූහ, ශ්‍රොතවාරයට පැමිණි වචනයාගේ ශබ්දානුසාරයෙන් දැනගත්හ; **ඛො** යනු අවධාරණාර්ථයෙහි පදපූරණමාත්‍රයෙහි හෝ නිපාත යැ; එහි අවධාරණාර්ථයෙන් "ඇසුවාහු ම ය, ඔවුන්ට කිසි ශ්‍රවණානන්තරාවෙක් නො වී යැ" යන මේ අර්ථය දතයුතු; පදපූරණයෙන් ව්‍යඤ්ජනයාගේ සිලුටු බව පමණක් මැයි.

මේවිට යම් කාරණක් ඇසුවාහුද එය ප්‍රකාශ කරන්ට **සමණො බලු හො ගොතමො** යනාදිය කියන ලද. එහි සන්සිඳුවන ලද පව් ඇති බැවින් **සමණ** යි දතයුතු; **බලු** යනු අනුශ්‍රවනාර්ථයෙහි නිපාත යැ; **හො** යනු ඔවුන්ගේ අනන්මනන් ඇමතීම් මාත්‍රයෙහි; **ගොතමො** යනු භාග්‍යවතුන්ගේ ගොත්‍ර වශයෙන් දැක්වීම යැ; එහෙයින් **සමණො බලු හො! ගොතමො** යන මේහි පින්වත! ශ්‍රමණයෝ ගෞතමගොත්‍ර ඇත්

තාහු ල" යි මෙසේ අර්ථ දතයුතු. **සක්‍යපුත්තෝ** යන මේ වනාහි භාග්‍ය වතුන්ගේ උසස් කුලය දැක්වීම යැ; **සක්‍ය කුලා පබ්බජිතෝ** යනු සැදැහැයෙන් පැවිදිවූ බව් දැක්වීම යැ; කිසි පිරිහීමකින් නො මඩනා ලද්දේ ක්ෂය නො වූ මැ ඒ කුලය හැර සැදැහැයෙන් පැවිදි වූයේය,යි කියන ලදවෙයි; එයින් මත්තෙහි කී අරුත් ඇත්තේ මය. **තං ඛෝ පන** යනු ඉතිපිඅාදි නාමාඛ්‍යානාර්ථයෙහි කම්වවන යැ, ඒ භවත් ගෞතමයන්ගේ යන අර්ථ යි. **කල්‍යාණෝ**= කල්‍යාණ ගුණයෙන් සමන්විත වූ ශ්‍රෙෂ්ඨ වූ යයි කියන ලද වෙයි; **කිත්තිසද්දෝ**= කීර්තිය මැයි, **සුතිඝොෂෝ** හෝ යි. **අබ්භුග්ගතෝ**= දෙවියන් සහිත ලොව යට කොවගෙන උඩට නැංගේ; කුමක් ද? යත්:- **ඉතිපි සෝ භගවා** —පෙ— **බුද්ධෝ භගවා** යි. එහි මේ පදසම්බන්ධය යැ- "සෝ භගවා ඉතිපි අරහං, ඉතිපි සම්මාසම්බුද්ධෝ —පෙ— ඉතිපි භගවා" යි. මේ කරුණෙන් ද මේ කරුණෙන් දැයි කියන ලද වේ. එහි පළමු කොට (කෙලෙසුන් කෙරෙන්) දුරුවූ හෙයින් යැ, (කෙලෙස්) සතුරන් ද (සංසාරචක්‍රයාගේ) දැව් ද නැසූහෙයින් යැ, ප්‍රත්‍යයාදීන්ට සුදුසු හෙයින් යැ, පව්කිරීමෙහි රහස් නැති හෙයින් යැ,යි මේ කාරණයන්ගෙන් ඒ භාග්‍යවත්හු "අර්හත්" යයි දතයුතු යැ යනාදි නයින් මාතෘකාව බහා මේ සියලු ම පදයෝ විභුඩිමාගීයෙහි බුද්ධානුස්මෘති නිර්දේශයෙහි විසතරකරන ලද්දාහු නුයි එයින් ඒ පදයන්ගේ විස්තරය නතයුතු. **සාධු ඛෝ පන**= සුන්දර යැ, අර්ථ එළවන්නේ යැ, සුව එළවන්නේ යැයි කියනලද වෙයි. **තථාරූපානං අරහතං**= ඒ භවත් ගෞතම සම්බුදු ද, එබදු වූ නොයෙක් කප්කෙළ සියදහසකිහු දු දුලීහ වූ දශීන ඇති ව්‍යාමප්‍රභාවෙන් පරික්ෂේප කරන ලද අසූ අනුව්‍යඤ්ජන නමැති රතනයෙන් ප්‍රතිමණ්ඩිත වූ උතුම් වූ දෙසිස් මහාපුරුෂලක්ෂණයෙන් ගැව සිගත් මනහර ශරීර ඇති අතෘප්තිකර දශීන ඇති ඉතා මිහිරි වූ ධර්මදෙශනා ශබ්ද ඇති විද්‍යමාන වූ ගුණයන්ව පැමිණීමෙන් ලොකයෙහි "අරහතත" යයි ලද වචන ඇති රහතුන්ගේ; **දස්සනං හොති= ප්‍රසාදයෙන්** සෞම්‍ය වූ ඇස් උන්මීලනය කොට දැකීම් මාත්‍රයකු දු සුන්දර වෙයි; ඉදින් වැළි අශ්වාඛ්‍යසම්පන්න වූ බ්‍රහ්මස්වරයෙන් දහම් දෙසන්නහුගේ එක් පදය කුදු අසන්ට ලබන්නෙමු නම් අතිශයින් සුන්දර වූයේ ම වන්නේය යි මෙසේ අදහස් කොට; **යෙන භගවා තෙනුපසඞ්කමිංසු**= යියලු කවයුතු හැරදමා සතුටු සිත් ඇත්තාහු පැමිණියාහුය.

එතදවොචුං= පෘච්ඡාව (= ප්‍රශ්නය) විවිධ මැයි; අගාරියපෘච්ඡාව ද අනගාරියපෘච්ඡාව දැයි; එහි **"කිං භොතෝ! කුසලං? කිං අකුසලං?"** යි අගාරියපෘච්ඡාව ආ යැ, **"ඉමෙ නු ඛෝ භොතෝ! පඤ්චු** විවිධපෘච්ඡා **පාදෙසු කඞ්ඛා?"** යි මේ නයින් අනගාරියපෘච්ඡාව ආ යැ; මොවුහු වූ කලි තමහට අනුරූප වූ අගාරියපෘච්ඡාව විවාරන්නාහු මේ- **ඛො නු ඛෝ භෝ ගොතම! හෙතු? ඛෝ පච්චයෝ?** යනාදි වචනය කිවාහුය. භාග්‍යවතුන් වහන්සේ ඔවුනට යම්සේ සල

කන්ට නො හැකි වෙත් ද, එසේ සැකෙවින් ම පළමුකොට ප්‍රශ්නය විසඳන සේක්- **අධම්මචරියවිසමචරියා හෙතු බො ගහපතයො!** යනාදිය වදාළහ. වැළි කුමක් හෙයින් භාග්‍යවතුන් වහන්සේ යම්සේ නො සැලකිය හැකි වෙත් නම් එසේ විසඳු සේක් ද? යත්:- ඔවුහු යම් හෙයකින් පණ්ඩිතයම්හ,යි මාන ඇත්තාහු වෙත් ද, පළමු ම මාතෘකාව තබා යම්සේ සැලකිය හැකි වෙත් ද, එසේ අර්ථය විස්තර කළ කල්හි දෙශනාව නො ගැඹුරු යයි සිතමින් අවමන් කෙරෙත් ද, ඇපි දු කියන් නමෝ මෙපරිද්දෙන් ම කියන්නෙමු,යි කියන්නාහු වෙත් ද; එහෙයින් ඔවුන්ට භාග්‍යවතුන් වහන්සේ යම්සේ සලකන්ට නො හැකි වෙත් ද, එසේ සැකෙවින් ම පළමු කොට ප්‍රශ්නය විසඳු සේක. **ඉක්ඛිති** සලකන්ට නො හැකි වූවන්ට විස්තර දෙශනාවට යාඥ කරන ලද්දාහු විස්තරයෙන් දෙසනු පිණිස **තෙන හි ගහපතයො!** යනාදිය වදාළහ. **එහි තෙන හි** යනු කාරණාර්ථයෙහි නිපාත යැ; යම්හෙයකින් තෙපි මා යාඥ කරවු ද? එහෙයින් යන අර්ථ යි. **තිවිධං=** කොවස් තුනකින්; **කායෙන=** කාය වාරයෙන්; **අධම්මචරියවිසමචරියා=** අධම්මචරියා සඞ්ඛ්‍යාත වූ විසමචරියාව; මේ යළි මෙහි පදාර්ථ යැ- අධම්මියාගේ චරියාව (= හැසිරීම) "අධම්ම චරියා" නමු, අධම්කරණය යන අර්ථ යි; විෂම ව හැසිරීම නොහොත් විෂමකම්යාගේ කිරීම "විසමචරියා" නමු; අධම්මචරියා වූවා ත් විසම චරියා වූවා ත් ඕ නුයි "අධම්මචරියවිසමචරියා" නමු; මේ උපායයෙන් සියලු කෘෂ්ණශුක්ල (= කුශලා කුශල) පදයන්හි අරුත් දතයුතු.

ලුද්දෙ= කැකුළු වූ දරුණු වූ, සැහැසි වූයේ; **ලොහිතපාණි=** මෙරමා ජීවිතයෙන් තොර කරන්නහුගේ දෙඅත්ල ලෙහෙයෙන් තැවරෙති, ඉදින් නො තැවරෙත් නමුත් එබදු වූයේ "ලොහිතපාණි" යි ම කියනු ලැබේ. **හනනපහනනෙ නිච්චෙ=** නැසීමෙහි මෙරමාහට පහර දීමෙහි ද ප්‍රකෘතියෙන් නැසීමෙහි= මෙරමා මැරීමෙහි ද තත්පර වූයේ; **අදයාපන්නා=** කරුණා රහිතබවට පැමිණියේ; **යං නං පරස්ස=** යම් ඒ මෙරමා සතුවූවක්; **පරිච්චතූපකරණං=** ඒ මෙරමාගේ ම තුෂ්ටි ජනක උපකරණය, සතුටු උපදවන පරිෂ්කාර භාණ්ඩයක්; **ගාමඝාතං වා=** ඇතුළුගම හෝ තබන ලද; **අරඤ්ඤඝාතං වා=** වනයෙහි ගස්අඟ - ගල්මුදුන් ආදී තැන්හි තබන ලද; **අදින්නං=** ඒ අන්‍යයන් විසින් කයින් හෝ වචනයෙන් හෝ නො දෙන ලද; **චෙය්‍යසඞ්ඛාතං=** යන මෙහි "චෙත" නම් සොර යැ, චෙතයාගේ භාවය චෙය්‍ය යැ, අවහරණචිත්ත යට මේ නමෙකි; "සඞ්ඛාතං" යනු අර්ථ හෙයින් එක් කොටසකට මේ නමෙකි; **"සඤ්ඤුනිදානා හි පපඤ්චසඞ්ඛා"** යනාදී තැන්හි මෙනි; චෙය්‍ය වූයේ ත් සඞ්ඛාත වූයේ ත් ඒ ම නුයි "චෙය්‍යසඞ්ඛාත" නම; චෙය්‍යචිත්තසඞ්ඛ්‍යාත වූ එක් චිත්තාකොඨාසයෙහ යන අර්ථ යැ; තවද- මේ කරණාර්ථයෙහි කම්වවන යැ, එහෙයින් චෙය්‍ය සඞ්ඛ්‍යාත වූ (සිතින්) යයි අර්ථ හෙයින් දතයුතු. **මාතුරක්කිනා=** පියා නට කල්හි හෝ මල

කල්හි හෝ ආහාර-වස්ත්‍රාදියෙන් පිළිජගිමින් විය පැමිණි යමක් කුල ගෙයි පාවාදෙන්නෙමි, මවු තොමෝ රකී ද, මෝ මාතුරක්ඛිතා නමු. මේ උපායයෙන් "මාතුරක්ඛිතා" දිහු ද දතයුත්තාහුය. සභාගකුලයෝ වූ කලි දරුගැබ් කුස සිටි කල්හි ම කතිකා කෙරෙති- "ඉදින් මට පුතෙකු ත් නුඹට දුවකු ත් වේ නම්, අන් තැන යන්ට නො ලබන්නේය, මාගේ පුතුට ම වේව" යි; මෙසේ ගැබ්හි දී ම අයත් කරන ලද්දී සඤ්ඤා මිඤ්ඤා නමු. "යමෙක් මේ නම් සත්‍රිය කරා යේ නම් ඔහුට මෙතෙක් දඩ ය" යි මෙසේ ගමක් හෝ ගෙයක් හෝ පිටියක් හෝ උදෙසා තැබූ දඩුවම් ඇත්තී වනාහි සපරිදණ්ඩා නමු; අනනමඤ්ඤා මාලාඟුණපරික්ඛිත්තා‘පි= යම් සත්‍රියක් හැමට යටත්පිරිසෙයින් "මෝ මට භාර්‍යා වන්නේය" යි හඟ ඇ මතුවෙහි මල්දම් දමන්නාවූ කිසිවකු විසින් මල්දම් පමණකිනු දු පරිභෝජනා වූවා වේ ද; නඤ්ඤාරූපාසු චාභිත්තතං ආපජ්ජිනා හොති= මෙබඳු සත්‍රීන් කෙරෙහි සම්මාදිසි සූත්‍රයෙහි කි මිථ්‍යාචාරයාගේ ලක්ෂණ වශයෙන් ව්‍යතික්‍රමය කරන්නේ වේ.

සභාගතෙනා= සභාවෙහි සිටියේ; පරිසාගතෙනා= ගමැ පිරිස්හි සිටියේ; ඤාතිමජ්ඣගතෙනා= දැයාදයන් මැද සිටියේ; පූගමජ්ඣගතෙනා= සමූහයා මැද සිටියේ; රාජකුලමජ්ඣගතෙනා= රාජකුලය මැද මහාවිනිශ්චයෙහි සිටියේ; අභිනීතෙනා= පුළුවුස්නා පිණිස පමුණුවන ලද්දේ; සක්ඛිපුට්ඨෙනා= ශාක්ෂි කොට විචාරන ලද්දේ; එහ‘මෙහා පුරිස!= මේ ආලපන ය; අත්තහෙතු වා පරහෙතු වා= තමාගේ හෝ මෙරමාගේ හෝ හස්තා පාදාදිය හෙතු කොට හෝ ධනය හෙතු කොට හෝ; ආමිසකිඤ්චික්ඛහෙතු වා යන මෙහි "ආමිස" යි අත්ලස් අදහස් කරන ලද, "කිඤ්චික්ඛ" යනු යම් ඒ මදපමණ වූවක්; යටත්පිරිසෙයින් තිත්වටුවෙක් ගිතෙල් පිඩක් වෙඩරුපිඩක් ආදිය පමණ වූ ද අත්ලසක් හෙතු කොට යන අර්ථයි. සම්පජානමුසා භාසිනා හොති= දන්නේ ම මුසාවාද කියන්නේ වෙයි; ඉමෙස්සං හෙදුය= "ඉතො" (= මෙයින්) යි කියන ලද, යම් කෙනෙකුන් සම්පයෙහි අසන ලද වේ ද, ඔවුන්ගේ හෙදය පිණිස; අමුස්සං හෙදුය= "අමුත්‍ර" (= අසුවල් තැන) යි කියන ලද යම් කෙනෙකුන් සම්පයෙහි අසන ලද වේ ද, ඔවුන්ගේ හෙදය පිණිස; ඉති සමග්ගානං වා හෙතනා= මෙසේ සමගි වූ යහලුවන් දෙදෙනෙකුගේ හෝ හෙදය කරන්නේ; භින්නානං වා අනුප්පදානා= "ඔහු හරතා වූ තා විසින් කරන ලද්දේ මැනව, කිපදිනකින් ම තට මහත් අවැඩක් කරන්නේ ය"යි මෙසේ භින්න වූවන්ගේ නැවත නො ගැළපීමට (කරුණු) දෙන්නේ උපසහාය කරන්නේ, කරුණු දක්වන්නේ යන අර්ථයි; වග්ගය (= වෙන් වීම) ආරාම වූයේ ඔත් ඇලීමට කරුණු වූයේ මෝහට නුයි වග්ගාරාම නම; වග්ගයෙහි (= වෙන් වීමෙහි) ඇලුනේ නුයි වග්ගරත නම; වග්ග වූවන් දැක අසා හෝ සතුටු වේ නුයි වග්ගනන්දී නම; වග්ගකරණිං වාචං= යම් වචනයක් සමග වූ සත්‍යයනු දු වග්ග වූවන් කෙරේ ද, බිඳී ද,

ඒ කලහකාරී වචනය කියන්නේ වෙයි; **අණ්ඩකා**= යම්සේ සදෙස් රැකෙහි බිත්තරය භටගනිත් ද, එසේ සදෙස් බැවින් ආක්‍රෝශය පහත් කිරීමය ආදී වචනයන් ගෙන් හටගත් අණ්ඩක (= බිත්තර) ඇති; **කක්කකසා**= කුණු වූ ඕ යම්සේ නම් පූතික (= කුණු වූ) වෘක්ෂය කලක වූයේ, වැඟිරෙන සුණු ඇත්තේ වේ ද; එසේ කුණු වූවා වෙයි, කනට හසම්න් මෙන් පිවිසෙයි; එයින් කියන ලදී- "කක්කකසා" යනු. **පර කටුකා**= අන්‍යයන්ට කටුක වූ, සිතට අප්‍රියබව උපදවන; **පරාභිසජ්ජනී**= වක්වූ කටුඅත්තක් මෙන් මම්යන් ඒද අන්‍යයන් ඇලවන්නී වූ, යනු කැමැත්තවුන්ට ද යන්ට නො දී ඇලිම කරන්නී වූ; **කොධසාමන්තා**= ක්‍රෝධයට ආසන්න වූ; **අසමාධිසංවත්තනිකා**= අපිණාසමාධියට හෝ උපචාරසමාධියට හෝ නො පවත්නී වූ; මෙසේ මේ සියල්ලෝ ම සදෙස වචනයට වේවචනයෝ යි. **අකාලවාදී**= නො කල්හි කියන්නේ; **අභූතවාදී**= බොරු නැද්ද, එය කියන්නේ; **අනත්ථවාදී**= නො කරුණු අසුරු කොට කියන්නේ; **අධම්මවාදී**= අසභාවය කියන්නේ; **අවිනයවාදී**= සංවරවිනය ප්‍රතිසංයුක්ත නො වූවක් කියන්නේ; **අනිධානවතිං වාචං**= හදවත් නමැති මදෙසෙහි (= පෙට්ටියෙහි) බහාතබන්ට අයුතු වචනයක් කියන්නේ වෙයි; **අකාලේන**= කියයුතු කාලයට පෙර හෝ පසු හෝ අයුතුකලැ කියන්නේ වෙයි; **අනත්ථසංහිතං**= සූත්‍රොපදෙසවිරහිත වූ, **අපරියන්තවතිං**= පරිවෙජ්ද රහිත වූ; සූත්‍රයක් හෝ ජාතකයක් හෝ නික්ෂේප කොට ඒ ඒ (සූත්‍රයට හෝ ජාතකයට) යෙදිය යුත්තක් හෝ උපමාවක් හෝ වස්තුවක් හෝ නො එළවා බාහිර කථාවක් ම කියයි, (පළමු)කියන ලද්ද කි පමණක් ම වෙයි; සූත්‍රයක් කියන්නේ දෝ හෝ ජාතකයක් කියන්නේ දෝ හෝ ඔහුගේ අන්තයක් හෝ කෙළවරක් හෝ නො දක් නොමැයි කියයුතු බවට පැමිණෙයි; යම්සේ නුගරුක අතු ගිය ගිය තැන අරලු බසින් ද, බට බට තැන්හි (පොළොවෑ) පිහිටාගෙන නැවත වැඩෙන්නාහු ම වෙත් ද, මෙසේ අඩයොදුනකු දු යොදුනකු දු යේ මැයි; නැවත (කල්) යත් යත් මුල්රුක නැසෙයි, ප්‍රවේණියෙන් හටගත්තාහු ම සිටිති; එපරිද්දෙන් මේ තෙමේ ත් "නිග්‍රොධ ධම්මිකපිඛ" නම් වෙයි; කියන ලද්ද කියන ලද ම කොට පසකින් මෙන් ගනිමින් යෙයි; යමෙක් වූ කලි බොහෝ නමුදු කියන්නේ මේ සඳහා මෙය කියන ලදැයි එළව එළවා දන්වන්ට හැකි වේ ද; ඔහුගේ කථාව වටනේය. **අනත්ථසංහිතං**= අර්ථනිශ්‍රිත නො වූ;

නිග්‍රොධ ධම්මිකසූ.

අභිජ්ඣාලූ හොති= අභිධ්‍යාවෙන් බලන්නේ වෙයි; **අභොවත**= යනු ප්‍රාර්ථනාර්ථයෙහි නිපාත යැ; තවද- මෙහි අභිධ්‍යා (= දැඩි ලොභ) යෙන් බැලූ පමණකින් කර්මපථභෙදය නො වෙයි, වැළී යම් කලෙක 'මෙය මා සතු වන්නේ නම්, මම මෙහි ඉසුරු බව පවත්වන්නෙම් නම් ඉතා යෙහෙකැ" යි තමහට පිරිනමා ද, එකල්හි කර්මපථභෙදය වෙයි;

මේ මෙහි අදහස් කරන ලදී. **බ්‍යාපන්නචිත්තෙනා**= විරුද්ධවව පැමිණි සිත් ඇත්තේ, කුණු වූ සිත් ඇත්තේ **පදුට්ඨමනසඞ්කප්පෙනා**= වෙෂයෙන් දූෂට වූ චිත්තසඞ්කල්ප ඇත්තේ; **හඤ්ඤන්තු**= නසනු ලැබෙත්වා; **වජ්ඣන්තු**= වධයට පැමිණෙත්වා; **මා වා අහෙසුං**= කිසිවකු දු නො වේ වා; මෙහි දු කොපමාත්‍රයකින් කම්පථභෙදය නො වෙයි, **නසනු** ලැබෙත්වා යනාදිය සිතිමෙන් ම වෙයි; **එතෙයින්** මෙසේ කියන ලදී. **මිච්ඡාදිට්ඨිකා**= අකුශලදශීන ඇත්තේ; **විපරීතදස්සනෝ**= විපර්‍යාශවූ දශීන ඇත්තේ; **නත්ථිදින්නං** යනු දෙන ලද්දහුගේ ඵලය නැතිබව සඳහා කියයි; **සිඞ්ගං සී** මහායාගය කියනු ලැබේ. **හුනං සී** පඬුරු කොට යවන සත්කාරය අදහස් කරන ලදි; ඒ දෙක ම ඵලාභාවය ම සඳහා ප්‍රතිෂෙප කෙරෙයි; **සුකතදුක්කතානං**= සුකෘත – දුෂ්කෘතයන්ගේ, කුශලාකුශලයන්ගේ යන අර්ථයි; **ඵලං විපාකෝ**= යම්ක් ඵලය යි හෝ විපාකය යි හෝ කියනු ලැබේ ද, එය නැතැයි කියා; **නත්ථි අයං ලෝකෝ**= පරලොව සිටියහුට මේ ලොව නැති; **නත්ථි පරෝ ලෝකෝ**= මේ ලොව සිටියහුට ද පරලොව නැති; සියල්ලෝ ඒ ඒ තැන්හි ම උවෙඡ දයට (= වැනසීමට) පැමිණෙති දක්වයි; **නත්ථි මාතා නත්ථි පිතා** යනු ඔවුන් කෙරෙහි **සම්මාප්පටිපත්ති** – **මිච්ඡාප්පටිපත්තීන්ගේ** ඵලය නැති බැව් විසින් කියා; **නත්ථි සත්තා ඔපපාතිකා** යි චුත වැ උපදනා සත්වයෝ නම් නැතැයි කියා; **සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්ති**= යමෙක් මෙලොව ත් පරලොව ත් අභි=විශිෂට ඥානයෙන් තුමූ පසක් කොට ප්‍රකාශ කෙරෙත් ද ඔවුහු නැතැයි සර්ව්ඥබුද්ධයන්ගේ අභාවය දක් වයි; මෙතෙකින් දශවස්තුකමිථ්‍යාදෘෂ්ටිය කියන ලද වේ.

පාණාතිපාතං පහාය යනාදි සප්තකම්මපථයෝ චූළහත්ථිපදයෙහි විස්තර කරන ලද්දාහුය අනභිධ්‍යාදිහු ප්‍රකට වී ඇත්තාහු මය. **සහ ව්‍යතං උපපජ්ජිස්සාමි**= සහභාවයට පැමිණෙන්නෙමි; **බ්‍රහ්මකායිකානං දෙවානං**= පළමුවන දැහැන්බිම දෙවියන්ගේ; **ආභානං දෙවානං**= ආභා නමැති වෙන ම නැති, පරිත්තාභ – අප්පමාණාභ – ආභස්සර දෙවියන්ට මේ නම යැ; යළි **පරිත්තාභානං** යනාදිය එක් කොට නො ගෙන ඔවුන්ගේ ම භෙද භෙයින් ගැනීම යැ; **සුභානං පරිත්තසුභානං** යනාදියෙහි දු මෙ ම නයයි. මේ පරිද්දෙන් භාග්‍යවතුන් වහන්සේ ආශ්‍රව ක්ෂය දක්වා රහත්බව කුළුගැන්වීමෙන් දෙශනාව නිමවූ සේකි.

යළි මෙහි සිව දිව්‍යලොකයෝ එළවා කියයුත්තාහුය පළමුකොට තුන් ධ්‍යානභූමීන්ගේ වශයෙන් නව බ්‍රහ්මලොකයෝ යැ, පඤ්ච ශුද්ධාවාසයෝ යැ, සතර **ආරුප්‍ය**යන් සමග නවයක් ම යයි

දිව්‍යලෝක අටලොස යැ, වෘහත්ඵලයන් සමග එකුන්විස්සෙක් යැ, ඔවුහු අසංඥතලය බහා විංශති බ්‍රහ්මලොකයෝ වෙති; මෙසේ ෂට්කාමාවචරයන් සමග සවිසි දෙව්ලෝ නම් වෙති. භාග්‍යවතුන්

විසින් ඒ සියල්ලන්ගේ ම දශකුශලකර්මපථයන්ගේ ඉපදීම දක්වන ලද. එහි ෂට්කාමාවචරයෙහි තුන් සුචරිතයන්ගේ විපාකයෙන් ම ඉපදීම වෙයි; එහෙත් මතු දිව්‍යලොකයන්ට මේ කර්මපථයෝ උපනිශ්‍රය වශයෙන් කියන ලද්දාහුය. ඒ එසේ මැයි- දශකුශල කර්මපථයෝ ශීලය ඇසිල්වත්හුගේ ම කිසුණුපිරියම් සමෘඩ වේ නුයි ශීලයෙහි පිහිටා කිසුණු පිරියම් කොට පළමුවන දූහැන් උපදවා පළමුවන දූහැනබිම උපදී; දෙවෙනි දූහැන් ආදිය වඩා දෙවෙනි දූහැන්බිම් ආදියෙහි උපදී; රූපාවචරධ්‍යානය පාදක කොට විදසුන් වඩා අනාගාම්ඵලයෙහි පිහිටියේ පඤ්චශුද්ධාවාසයන්හි උපදී; රූපාවචරධ්‍යානය පාදක කොට අරූපාවචරසමාපත්තිය උපදවා සතර ආරූප්‍යයන්හි උපදී; රූපාරූපධ්‍යානය පාදක කොට විදසුන් වඩා රහත්බවට පැමිණෙයි; අසංඥභවය වූ කලි බාහිර වූ තවුස්පිරිවැජියන් විසින් පුරුදු කරන ලද නුයි මෙහි නො දක්වන ලද්දේය. සෙස්ස සියලු තැන්හි ප්‍රකට අර්ථ ඇත්තේ මැයි.

සාලෙය්‍යක සූත්‍ර වණ්ණනා නිමි. (1)

වෙරඤ්ජක සූත්‍ර වණ්ණනා.

එවං මෙ සුතං යි වෙරඤ්ජක සූත්‍රයයි. එහි වෙරඤ්ජකා= වෙරඤ්ජවාසිහු; කඤ්චිදෙව කරණීයෙන= කිසි යම් නියම නො සළ කටයුත්තකින්; සෙසු සියල්ල පළමු සූත්‍රයෙහි කී නියෙන් ම දතයුතු. එසෙස් ඇති- හුදෙක් මෙහි අධම්මවාදි විසමවාදි යි මෙසේ පුද්ගලාධිෂ්ඨාන දෙශනාව කරන ලද්දේය. පූර්වසූත්‍රයෙහි ධර්මාධිෂ්ඨාන දෙශනාව යි. මේ විශෙෂය වේ. සෙස්ස එබඳු මැයි.

වෙරඤ්ජක සූත්‍ර වණ්ණනා නිමි. (2)

මහාවෙදල්ල සූත්‍ර වර්ණනා.

—:÷:—

එවං මේ සුතං යි මහාවෙදල්ල සූත්‍ර යයි. **එහි ආයස්මා** යන මේ ගුරුවූ-නිශ්‍රය සහිත වචනයෙකි; **මහාකොට්ඨිතෝ** යනු ඒ තෙරුන්ගේ නම යැ; **පඤ්ඤාලාභග්ගා වුට්ඨිතෝ**= ප්‍රඥාලාභීන් අතින් නැඟිසිටියේ; **දුප්පඤ්ඤෙසු, දුප්පඤ්ඤෙසු** යන මෙහි ප්‍රඥාවගේ දුෂ්ටභාවයෙක් නම් නැති, **අප්‍රාඥ** යැ නිෂ්ප්‍රාඥ (= නුවණැත්තේ) අර්ථ යි. **කිත්තාවතා නුඛෝ** යනු **කාරණ** පරිච්ඡේදය විචාරීම යැ; කොපමණෙකින් මෙසේ කියනු ලැබේ ද? යන අර්ථ යි. **තවද-** මෝ පදාර්ථ නම්:- "අදිට්ඨජොතනා පුච්ඡා, දිට්ඨසංසන්දනා පුච්ඡා, විමතිච්ඡේදනා පුච්ඡා, අනුමති පුච්ඡා, කථෙතුකම්‍යතා පුච්ඡා" යයි පඤ්චවිධ වේ.

පඤ්චවිධ පදාර්ථ.

ඔවුන්ගේ මේ නානාත්වය යැ:- 1. අදිට්ඨජොතනා පුච්ඡාව කවරේ ද? පියවින් (ධර්මයන්ගේ) **ලක්ඛණය** නො දන්නා ලද්දේ නො දක්නා ලද්දේ තුලනය (= ප්‍රමාණ) නො කරන ලද්දේ තීරණය නො කරන ලද්දේ ප්‍රකට නො වූයේ නුවණින් නො විඳිනා ලද්දේ වේ ද, ඒ ධර්මයාගේ ලක්ෂණඥනය පිණිස දැකීම පිණිස තුලනය පිණිස තීරණය පිණිස ප්‍රකටබව පිණිස විභාග කිරීම පිණිස පැන විචාරා ද, මෝ අදිට්ඨජොතනා පුච්ඡා නමු. 2. දිට්ඨසංසන්දනා පුච්ඡා කවරේ ද? පියවින් (ධර්මී) ලක්ෂණය දන්නා ලද්දේ දක්නා ලද්දේ තුලනය කරන ලද්දේ තීරණය කරන ලද්දේ විභූත (= ප්‍රකට) වූයේ විභාවිත (= නුවණින් විඳිනා ලද්දේ) වෙයි, අන්‍ය පණ්ඩිතයන් සමග සැසඳීම පිණිස ප්‍රශ්නය විචාරයි; මෝ දිට්ඨසංසන්දනා පුච්ඡා නමු. 3. විමතිච්ඡේදනා පුච්ඡා කවරේ ද? පියවින් සැකයට පැමිණියේ විමතියට පැමිණියේ මෙසේ අෙ හෝ නො වේ අෙ හෝ කිමෙක් අෙ හෝ නොසේ අෙ හොැයි දෙපරිද්දෙකින් සැක ඇත්තේ වෙයි, හෙතෙම විමති ඡිදීම පිණිස ප්‍රශ්නය විචාරයි; මෝ විමතිච්ඡේදනා පුච්ඡා නමු. 4. "මහණෙනි! ඒ කුමැයි සිතවු ද? රූපය නිත්‍ය හෝ අනිත්‍ය හෝ දැ? යි, වහන්ස! අනිත්‍යය" යි මෙබඳු වූ දහම් දෙසන කල අනුමතිය ගෙන විචාරීම වනාහි අනුමති පුච්ඡා නමු. 5. "මහණෙනි! මේ සිව්වතන් සතරකි, කවර සතරක් ද?" යි භික්ෂුසඞ්ඝයා තුළ මැ විචාරා තුළ මැ විසඳනු කැමති සර්ව්ඥයන්ගේ මෙබඳු ප්‍රශ්නය කථෙතුකම්‍යතා පුච්ඡා නමු. ඔවුනතුරෙන් මෙහි දිට්ඨසංසන්දනා පුච්ඡාව අදහස් කරන ලදු. ඒ එසේ මැයි- තෙරුන් වහන්සේ තමන්ගේ දිවාසථානයෙහි හිඳ තුළ මැ ප්‍රශ්නය උපදවා තුළ මැ විනිශ්චය කරමින් මේ සූත්‍රය මූල පටන් මුදුන් පැමිණවූහ.

මහාප්‍රාඥයෝ.

ඒ එසේ මැයි- එකෙක් ප්‍රශ්නය උපදවන්ට ම හැකි වෙයි, නිශ්චය කරන්ට නො හැකි වෙයි; එකෙක් නිශ්චය කරන්ට ම හැකි වෙයි, උපදවන්ට නො හැකි වෙයි; එකෙක් දෙක ම නො හැකි වෙයි; එකෙක්

දෙක ම හැකි වේ, ඔවුනතුරෙන් (මහාකොට්ඨිත) තෙරුන් වහන්සේ දෙක ම හැකි වෙත් ම ය. කුමක් හෙයින ? මහාප්‍රාඥ හෙයිනි. සැබව- මහාප්‍රඥව නිසා මේ ශාසනයෙහි ශාරිපුත්‍රස්ථවිර යැ, මහාකාත්‍යායන යැ, පුණ්ණස්ථවිර යැ, කුමාරකාශ්‍යපස්ථවිර යැ, ආනන්දස්ථවිර යැ, මේ ම ආයුෂ්මත්හු යැ,යි බොහෝ ස්ථවිරයෝ විශෙෂස්ථානයට පැමිණියාහුය. යම් ඒ මදපමණ වූ නුවණින් යුත් මහණ විසින් ශ්‍රාවකපාරමීඥානයාගේ ම්‍යතාකයට පැමිණෙන්ට නො ම හැක්ක, වැළි මහපැනැත්තකු විසින් හැකි නුයි මහාප්‍රාඥ බැවින් ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ ඒ තනතුරට පැමිණියහ; සැබව- ප්‍රඥවෙන් තෙරුන් හා සදෘශයෙක් නැති; එහෙයින් භාග්‍යවතුන් වහන්සේ ඒ තෙරුන් එතදග්‍රයෙහි තැබූසේක- **"එතදග්ගං භික්ඛවෙ! මම සාවකානං භික්ඛූනං මහාපඤ්ඤානං යදිදං සාරිපුත්තො"** යි. එපරිද්දෙන් යම් ඒ මදපමණ වූ නුවණින් යුත් මහණ විසින් භාග්‍යවතුන් සැකෙවින් වදාළ ධර්මයාගේ සවිස්තරාර්ථය සමග සංසන්දනය කොට සමාන කොට විස්තරයෙන් අර්ථය විසඳන්ට නො හැක්ක; වැළි මහාප්‍රාඥයකු විසින් හැකි නුයි මහාප්‍රාඥ බැවින් මහා කාත්‍යායන ස්ථවිරයන් වහන්සේ එහි ප්‍රතිබල වූහ. එහෙයින් ම භාග්‍ය වතුන් වහන්සේ ඒ තෙරුන් එතදග්‍රයෙහි තැබූ සේක- **"එතදග්ගං භික්ඛවෙ! මම සාවකානං භික්ඛූනං සඞ්ඛිත්තෙනපි භාසිතස්ස විත්ථාරෙන අත්ථං විභජන්තානං යදිදං මහාකච්චානො"** යි. එපරිද්දෙන් යම් ඒ මදපමණ වූ ප්‍රඥවකින් යුත් මහණ ධර්මකථාව කියන්නහු දශ කථාවස්තූන් එළවා සපත විශුද්ධි විභාග කරන්නහු විසින් ධර්මකථාව කියන්ට නො හැක්ක; වැළි මහපැනැත්තහු විසින් හැකි නුයි මහාප්‍රාඥ බැවින් පුණ්ණතෙරුන් වහන්සේ සිවුපිරිස් මැද අලඞ්කෘත ධර්මාසනයෙහි විත්‍රච්ඡත්‍රය ගෙනහුන්නේ පුන්සඳ මෙන් පැලඹෙමින් ධර්මකථාව වදාරති; එහෙයින් ම භාග්‍යවතුන් වහන්සේ ඒ තෙරුන් එතදග්‍රයෙහි තැබූසේක- **"එතදග්ගං භික්ඛවෙ! මම සාවකානං භික්ඛූනං ධම්මකථිකානං යදිදං පුණ්ණො මන්තානිපුත්තො"** යි. යළි යම් ඒ අල්පමාත්‍රවූ ප්‍රඥවෙන් සමන්විත මහණ ධර්මකථාව කියන්නේ මෙයින් හෝ තෙලින් හෝ (මඟට) බැස යවකෙළ ගෙන අන්‍යයකු මෙන් ද, එකපදීක වූ දඹුමහය කට නැගියෙකු මෙන් ද ඇයි; එතකුදු වත් මහාප්‍රාඥ තෙම සිවුපැදි ගයක් නමුදු (මානෘකා කොට) කියා උපමා ද කරුණු ද එළවා තෙවළා බුදුවදන් උඩු-යටි කෙරෙමින් කියයි. වැළි මහනුවණැති බැවින් කුමර කසුප් තෙරුන් වහන්සේ සිවුපැදි ගයකුදු කියා උපමා ද කරුණු ද එළවා ඒ උපමා - කාරණයන් සමග යොදමින් විලක පස්වනක් කුසුම් විකසිත කරන්නවුන් මෙන් මහමෙර මුදුනෙහි වැටිදහසක් දල්වන්න වුන් මෙන් තෙවළා බුදුවදන් උඩු - යටි කෙරෙමින් දෙසන සේක. එහෙයින් ම භාග්‍යවතුන් වහන්සේ ඒ තෙරුන් එතදග්‍රයෙහි තැබූ සේක- **"එතදග්ගං භික්ඛවෙ! මම සාවකානං භික්ඛූනං විත්තකථිකානං**

යදිදං කුමාරකස්සපෝ'' යි. එපරිද්දෙන් යම් ඒ මදපමණ තුවණින් යුත් මහණ සාරමසකින් සිවුපැදි ගයක් උගන්නට නො හැකි වෙයි; එහෙත් මහතුවණැත්තේ එක්පියෙහි සිව පද සියයකු දු පද දහසකු දු ගනී; වැළි ආනන්දසථවිරයන් වහන්සේ මහාප්‍රාඥ බැවින් එක් පියවරි සිට වරක් ම අසා නැවත නො විචාරත්තාහු පද සැවදහසක් ඇති ගාථා පසළොස් දහසක් වැලින් මල් හයා ගන්නවුන් මෙන් එක්පහරින් ම ගන්නා සේක; ගත් ගත් (පදය) පහණැ කෙටූ ඉරක් මෙන් ද; රන් කලයෙහි බහාලූ සිතෙල් මෙන් ද ගත් ලෙසින් ම සිටී. එහෙයින් ම භාග්‍යවතුන් වහන්සේ ඒ තෙරුන් එතදග්‍රයෙහි තැබූ සේක- ''එතදග්ගං භික්ඛවෙ! මම සාවකානං භික්ඛූනං ගතිමන්තානං යදිදං ආනන්දො, සතිමන්තානං, ධිතිමන්තානං, බහුස්සුතානං, උපට්ඨාකානං යදිදං ආනන්දො'' යි. යම් ඒ අල්පමාත්‍ර වූ ප්‍රඥාවෙන් යුත් මහණ විසින් සිවුපිළිසිඹියා ප්‍රභෙදයාගේ මස්තකයට පැමිණෙන්ට නො මැහැක්ක; වැළි මහාප්‍රාඥයකු විසින් හැකි තුසි මහාප්‍රඥ ඇති බැවින් මහාකොඹිත සථවිරයන් වහන්සේ අධිගම - පරිපෘච්ඡා - ශ්‍රවණ - පූජා යොගයන්ගේ වශයෙන් අනන්තනයෙන් උත්සන්න වූ ප්‍රතිසම්භිදා ප්‍රභෙදයට පැමිණියහ. එහෙයින් ම භාග්‍යවතුන් වහන්සේ ඒ තෙරුන් එතදග්‍රයෙහි තැබූසේක- ''එතදග්ගං භික්ඛවෙ! මම සාවකානං භික්ඛූනං පටිසම්භිදාප්පත්තානං යදිදං මහාකොඹිනො'' යි. මේසේ තෙරුන් වහන්සේ මහාප්‍රාඥ බැවින් ප්‍රශ්නය උපදවන්ට ද නිශ්චය කරන්ට ද, යි දෙක ම හැකි වෙති; උන් වහන්සේ දිවාසථානයෙහි හිඳ තුමූ ම සියලු ප්‍රශ්නයන් උපදවා තුමූ විනිශ්චය කරමින් මේ සූත්‍රය මුල පටන් මුදුන් පමුණුවා ''එකාන්තයෙන් මෝ ධම්දෙශනා ශොභන යැ, එය දෙවු බැණන් ධම්සෙනෙවියන් සමග සංසන්දනය කරන්නෙමි, නැවත මෝ අප දෙදෙනාගේ ම එකමතියෙන් එකාධ්‍යාශයෙන් තබන ලද්දී ඉතා ගරුවූවා පහණසතක් සමාන වන්නීය, චතුරොසතරණය කරනු කැමති යන්ට තොවැ තුබූ නැවක් මෙන් සඛීයට යනු කැමතියන්ට දහසක් යෙදූ ආජඤ්ඤරථයක් මෙන් බොහෝ උපකාර වන්නීය'' යි දක්නා ලද්ද සංසන්දනය පිණිස ප්‍රශ්නය විචාළහ. එහෙයින් කියන ලදී- ''ඔවුන තුරෙන් මෙහි දිඨසංසන්දනා ප්‍රුවජ්‍රා අදහස් කරන ලදු ය'' යි.

නප්පජානාති නප්පජානාති යන මෙහි යම් හෙයකින් නො දනී ද, එහෙයින් ''දුප්පඤ්ඤ'' යයි කියනු ලැබේ යන මේ අර්ථ යි; සියලු තැන්හි මේ නයයි. ඉදං දුක්ඛන්ති නප්පජානාති= මේ (උපාදානස්කන්ධ පස) දුක යැ, මෙතෙක් දුක යැ, මෙයින් උඩ දුකෙක් නැතැ,යි දුඃඛසත්‍යය තතුසේ සරසලක්ෂණ වශයෙන් නො දනී; අයං දුක්ඛසමුදයෝ= මේ දුක උපදවයි, පවත්වා යයි දුක උපදවන්නී වූ තෘෂ්ණාව සමුදයසත්‍ය යයි තතුසේ සරසලක්ෂණ වශයෙන් නො දනී; අයං දුක්ඛනිරොධෝ= මේ දුක ද දුඃඛසමුදය ද මෙ තම් තැනට පැමිණ නිරුඬ වේ යයි (දුඃඛ

සමුදය) දෙදෙනාගේ නො පැවැත්ම සඞ්ඛ්‍යාත නිර්‍වාණය නිරොධසත්‍ය යයි තතුසේ සරසලක්‍ෂණ හෙයින් නො දනී; අයං දුක්‍ඛනිරොධගාමිනී පටිපදා= මෝ ප්‍රතිපදාව දුඃඛනිරොධයට පැමිණේ යයි මාර්‍ගසත්‍යය තතුසේ සරසලක්‍ෂණ හෙයින් නො දනී; අනන්තරුවාරයෙහි ද මේ ම නයින් අර්‍ථ දතයුතු. යළි මෙහි සංක්‍ෂේපයෙන් චතුස්‍සත්‍ය කර්‍මස්ථානික පුද්ගලයා කියන ලදුයි දතයුතු. ඒ එසේ මැයි- මේ තෙම ඇදුරන් සමීපයෙහි සිවුසස් ඇසීමෙන් උගනී; තෘෂ්ණාව තබා ත්‍රෛභූමක කර්‍මයෝ දුඃඛසත්‍ය යැ තෘෂ්ණාව සමුදයසත්‍ය යැ, දෙදෙනාගේ අප්‍රවෘත්තිසඞ්ඛ්‍යාත නිර්‍වාණය නිරොධසත්‍ය යැ, නිරොධය දැනගන්නාවූ මාර්‍ගය මාර්‍ගසත්‍ය යැ යි මෙසේ ඉගෙන (කර්‍මස්ථානයෙහි) පිහිටයි; ඒ සත්‍යයන් අතුරෙහි පූර්‍වසත්‍ය දෙක වෘත්තය යැ, පශ්චිම දෙක විවෘත්තය යැ; (පූර්‍වසත්‍යවයසඞ්ඛ්‍යාත) වෘත්තය යෙහි අභිනිවෙසය වෙයි, විවෘත්ත (= පශ්චිමවය) යෙහි නො වෙයි; මේ තෙම අභිනිවෙසය කරන්නේ දුඃඛසත්‍යයෙහි අභිනිවෙසය කෙරෙයි; දුඃඛසත්‍යය නම්, රූපාදී පඤ්චුපාදානස්කන්ධයෝ යැ; ඒ පස්කඳ නිශ්චය කරන්ට චාතුර්ධාතු කර්‍මස්ථාන වශයෙන් බැස සතර මහාභූතයෝ ද සතර මහාභූතයන්ගේ උපාදායරූපය ද "රූප" යයි නිශ්චය කෙරෙයි; ඒ රූපයට අරමුණු වූ වේදනා යැ සංඥා යැ සංස්කාරයෝ යැ විඥානය යැ (යන මේ) "නාම" යයි මෙසේ යමාතල්ලකුත් බිඳින්නකු මෙන් මේ ධර්‍මයෝ දෙදෙන "නාමරූප" යයි නිශ්චය කරයි; යළි ඒ මේ (නාමරූපය) අහෙතුක නො වෙයි, සහෙතුක යැ සප්‍රත්‍ය යැ; ඔහුගේ ප්‍රත්‍යය කවරේ ද? අවිද්‍යාදි ධර්‍මයෝ යැයි මෙසේ ප්‍රත්‍යය ද ප්‍රත්‍යයෙන් උපන් ධර්‍මයන් ද නිශ්චය කොට- මේ සියලු මැ ධර්‍මයෝ ඇති වැ නැසෙන අර්‍ථයෙන් අනිත්‍යයෝ යයි අනිත්‍යලක්‍ෂණයට ආරොපණය කෙරෙයි; නැවත උදයව්‍යය දෙකින් පෙළෙන අයුරින් දුඃඛයෝ යැ; (තමාගේ) වශයෙහි නො පවත්නා අයුරින් අනාත්මයෝ යයි ත්‍රිලක්‍ෂණයට නඟා විදසුන් පිළිවෙළින් නැවත නැවත මෙනෙහි කරන්නේ ලොවුතුරා මඟට පැමිණෙයි; මාර්‍ගක්‍ෂණයෙහි චතුස්‍සත්‍යයෝ එකප්‍රතිවේධයෙන් ම ප්‍රතිවේධ කෙරෙයි; එකාව බොධයෙන් අවබෝධ කෙරෙයි; දුඃඛසත්‍යය පරිඥාප්‍රතිවේධයෙන් ප්‍රතිවේධ කෙරෙයි, සමුදය ප්‍රහාණප්‍රතිවේධයෙන් ද, නිරොධය ශාන්ත්‍යක්‍රියා ප්‍රතිවේධයෙන් ද මාර්‍ගය භාවනා ප්‍රතිවේධයෙන් ද ප්‍රතිවේධ කෙරෙයි; දුක පරිඥාභිසමයෙන් අභිසමය කෙරෙයි, (= තුවණින් දැනගනී,) සමුදය ප්‍රහාණාභිසමයයෙන්, නිරොධය ශාන්ත්‍යක්‍රියාභිසමයයෙන්, මාර්‍ගය භාවනාභිසමයයෙන් අභිසමය කෙරෙයි. හෙතෙම (දුක්ඛ-සමුදය-මාර්‍ග යන) තුන් සත්‍යය කෘත්‍ය හෙයින්, නිරොධය අරමුණු හෙයින් ප්‍රතිවේධ කෙරෙයි. තාවද- ඕහට එ හෙණහි "මම් දුක භාත්පසින් දැනගනිමි, සමුදය දුරු කෙරෙමි, නිරොධය පසක් කෙරෙමි මාර්‍ගය වඩමි" ආභොගයක් සිත්හි එළවීමක් මෙනෙහි කිරීමක් ප්‍රත්‍යවෙක්‍ෂාවක් නැති; යම්

හෙයකින් මේ චතුසත්‍යකම්ඨානික මහණ පරිග්‍රහණය කරත් කරත් ම මාගීය තෙම තුන් සත්‍යයන්හි පරිඥදිකෘත්‍යය සිදුකෙරෙමින් ම නිරොධය අරමුණු හෙයින් ප්‍රතිවෙධ කෙරේ ද, එහෙයින් "පඤ්ඤවා" (= ප්‍රඥවත්) යයි කියනු ලැබේ යයි. මෙහි යවත් පිරිසෙයින් ස්‍රොතාපන්න ද උඩත් පිරිසෙයින් ක්ෂීණාශ්‍රව ද ප්‍රඥවත් යයි දක්වන ලද. යමෙක් වතාහි තෙවළා බුදුවදන් පාලි හෙයින් ද අටුවා හෙයින් ද අනුසන්ධි හෙයින් ද පූර්‍වාපර හෙයින් ද ඉගෙන උඩුයටි කෙරෙමින් හැසිරේ ද, අනිත්‍ය-දුඃඛ -අනාත්ම වසින් පරිග්‍රහමාත්‍රයකු ත් නැත් ද, මේ නුවණැත්තේ නම්, දුෂ්ප්‍රාඥ නම් වේ ද? යත්- විඥානචරිත නම් වූ මේ තෙම ප්‍රඥවත් යයි නො කියයුතු; වැළි යමෙක් තිලකුණු නහා විදසුන් පිළිවෙළින් සම්මර්ශන කරමින් අද අද ම රහත්බව වේ යයි හැසිරේ ද, මේ තෙම ප්‍රඥවත් නම්, දුෂ්ප්‍රාඥ නම් නො වේ යයි සෙවනය කරවන්නා වූ ප්‍රඥවත් තෙම පඤ්ඤය ඇසුරු කෙරෙයි. සූත්‍රයෙහි වූ කලි ප්‍රතිවෙධය ම කියන ලදී.

විඤ්ඤාණං විඤ්ඤාණං යන මෙහි කුමක් විචාරත් ද? යම් විඥානය කින් සංස්කාරයන් සම්මර්ශනය කොට මේ තෙම ප්‍රඥවත් නම් වූයේ ද ඔහුගේ ඒ ආගමනීයවිදර්ශනා විඥානකර්මය කළ සිත විචාරමි, පුළුවුස්නි; **සුඛන්තිපි විජානාති**= සැපවෙදනාව ත් දනගනී; මතු දෙකෙහි ද මේ ම නයයි. මෙසින් තෙරුන් වහන්සේ **"සුඛං වේදනං වේදියමානෝ සුඛං වේදනං වේදියාමීති පජානාති"** යනාදි නයින් ආ වෙදනා වශයෙන් අරූප කර්මස්ථානය වදළහ. ඒ පදයාගේ අර්ථය සතිපට්ඨානයෙහි කී නයින් ම දතයුතු. **සංඤ්ඤා**= එකොතපාදාදි ලක්ෂණ වූ සංඥාවෙන් සංසෘෂ්ට (= මිශ්‍ර) වූවාහු ද? නොහොත් අමිශ්‍ර වූවාහු දැ? යි විචාරති; තවද- මෙහි තෙරුන් වහන්සේ මාගී ප්‍රඥව ද විදර්ශනාඥානය ද යන මේ ලෞකික - ලොකොතතර ධර්මයන් දෙදෙන මිශ්‍ර කොට භූම්‍යන්තර බිඳ සමය නො දන්නකු මෙන් විචාරති නො දතයුතු; වැළි මාගීප්‍රඥවගේ මාගීවිඥානය සමග ද විදර්ශනාප්‍රඥවගේ විදර්ශනාවිඥානය ම සමග ද මිශ්‍රබව විචාරති දතයුතු. (සැරියුත්) තෙරුන් වහන්සේ ද ඒ (මහා කොඨිත) තෙරුන්ගේ ඒ අර්ථය ම විසඳන සේක් **ඉමේ මේ ධම්මා සංඛා** යනාදිය වදළහ. එහි **න ච ලබ්භා ඉමේසං ධම්මානං** යනු ලෞකික මාගීක්ෂණයෙහි ද ලොකොතතර මාගීක්ෂණයෙහි ද එක්විට උපන් මේ ධර්මයන් දෙදෙනාගේ විනිර්භෝග කරමින් වෙන් කොට විනිවර්තනය (= ඔවුනොවුන් විශෙෂ) කොට අරමුණු හෙයින් හෝ වසතු හෙයින් හෝ උත්පාද හෙයින් හෝ නිරොධ හෙයින් හෝ වෙනස් කරුණක් දක්වන්ට නො හැක්ක යන අර්ථ යි; එහෙත් ඒ ඒ ධර්මයන්ගේ විෂය නම් ඇති; ඒ එසේ මැයි- ලෞකික ධර්මයට පැමිණ සිත දෙවු වෙයි, පෙරදුරි වෙයි; ලොකොතතර ධර්මයට පැමිණ ප්‍රඥව (දෙවු වෙයි පෙරදුරි වෙයි;) සැබව- සම්මාසම්බුදුන් වහන්සේ ද ලොව්දහම් පුළුවුස්නා සේක් - "මහණ! තෙපි කවර ප්‍රඥවකට පැමිණියේ වෙහි ද? ප්‍රථම්මාගීප්‍රඥවට ද? නොහොත්

විතීය-තෘතීය-චතුර්මාගී ප්‍රඥාව ද?" යි මෙසේ නො පුළුවුස්නා සේක; "මහණ! තෙපි කවර සඳශී ඇත්තේ කවර වෙදනා ඇත්තේ කවර සංඥ ඇත්තේ කවර චෙතනා ඇත්තේ වෙහි ද?" යි කියාත් නො පුළුවුස්නා සේක; යළි චිත්තයාගේ වශයෙන් "මහණ! තෙපි කවර සිත් ඇත්තේ වෙහි ද?"යි විචාරන සේක. කුශලා කුශලය පතවන්නාහු ද **"මනෝ පුබ්බඞ්ගමා ධම්මා මනොසෙට්ඨා මනොමයා"** යි ද- **"කතමෙ ධම්මා කුසලා? යස්මිං සමයෙ කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හොති"** යි ද මේසේ චිත්තයාගේ වශයෙන් ම පතවන සේක. නැවත ලොවුතුරු දහම් පුළුවුස්නාහු "මහණ! තෙපි කවර සඳශී ඇත්තේ කවර වෙදනා ඇත්තේ කවර සංඥ ඇත්තේ කවර චෙතනා ඇත්තේ වෙහි ද?" යි නො විචාරති; "මහණ! තොප විසින් කවර ප්‍රඥාවක් ලබන ලදු ද? කිම ප්‍රථම්මාගී ප්‍රඥාව ද? තොහොත් විතීය-තෘතීය-චතුර්ථ මාගීප්‍රඥාව ද?" යි මෙසේ ප්‍රඥාවශයෙන් ම පුළුවුස්නා සේක; ඉන්ද්‍රිය සංයුක්තයෙහි ද, [a] **"පඤ්චිමානි භික්ඛවෙ! ඉන්ද්‍රියානි, කතමානි පඤ්ච? සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං; . කතඤ්ච භික්ඛවෙ! සද්ධින්ද්‍රියං දට්ඨබ්බං? චතූසු සොතාපත්තියඞ්ගෙසු, එත්ථ සද්ධින්ද්‍රියං දට්ඨබ්බං; කතඤ්ච භික්ඛවෙ! විරියින්ද්‍රියං දට්ඨබ්බං? චතූසු සම්මප්පධානෙසු, එත්ථ විරියින්ද්‍රියං දට්ඨබ්බං; කතඤ්ච භික්ඛවෙ! සතින්ද්‍රියං දට්ඨබ්බං? චතූසු සතිපට්ඨානෙසු, එත්ථ සතින්ද්‍රියං දට්ඨබ්බං; කතඤ්ච භික්ඛවෙ! සමාධින්ද්‍රියං දට්ඨබ්බං? චතූසු ඣානෙසු, එත්ථ සමාධින්ද්‍රියං දට්ඨබ්බං; කතඤ්ච භික්ඛවෙ! පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං? චතූසු අරියසච්චෙසු එත්ථ පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං"** යි මෙසේ සවිශයෙහි ම ලොව්-ලොවුතුරු දහම් වදාරන ලද්දාහුග. උපමා කෙසේ ද? යත්:- සිටු පුත්‍රයෝ සතරදෙනෙක රජු යැයි රජු පස්වැනිකොට ඇති යහළුවන් නැකැත් කෙළින්නෙමු යි විටියට බට කල්හි එක් සිටුපුතකුගේ ගෙට ගියකල ඉතිරි සතරදෙන නො බැණ හිඳිති, ගෙහිමියා ම "මොවුනට කෑයුතු බුදියයුතු දෙවු, ගදමල් අබරණ ආදිය දෙව" යි විධාන කෙරෙයි; දෙවෙනියාගේ-තුන්වෙනියාගේ-සතරවැනියාගේ ගෙට ගියකල ඉතිරි සතරදෙන නො බැණ හිඳිති, ගෙහිමියා ම "මොවුනට කෑයුතු බුදියයුතු දෙවු, ගදමල් අබරණ ආදිය දෙව" යි ගෙයි විධාන කෙරෙයි; නැවත සියල්ලට පසුව රජුගේ ගෙට ගියකල රජ සියලු තැන්හි අධිපති වූයේ ම තමුදු මේ කල්හි වතාහි තමාගේ ගෙයි දී ම මොවුන්ට කෑයුතු බුදියයුතු දෙවු සුවඳමල් අලඞ්කාරාදිය දෙව,යි විධාන කෙරෙයි; එපරිද්දෙන් ශ්‍රද්ධාපඤ්චමක ඉන්ද්‍රියයන්-

ඉන්ද්‍රියයන්ගේ විෂය.

---

a මහණෙනි! මේ ඉන්ද්‍රියයෝ පස්දෙනෙක් වෙති. කවර පස්දෙනෙක් ද? යත්:— ශ්‍රද්ධෙන්ද්‍රිය විර්‍යේන්ද්‍රිය සම්‍රෘතීන්ද්‍රිය සමාධීන්ද්‍රිය ප්‍රඥෙන්ද්‍රිය යන මොහුයි; මහණෙනි! කොතැනයි ශ්‍රද්ධෙන්ද්‍රිය දැක්ක යුතු ද? සතර ශ්‍රොතාපත්ත්‍යඞ්ගයන්හි යැ, මෙහි ශ්‍රද්ධෙන්ද්‍රිය දතයුතුයි; (සෙස්සෙහි ද මෙසෙයින් ම අර්ථවිමසිය යුතු)

ඒ යහළුවන් එකතුව විපියට බස්නවුන් මෙන් එහ අරමුණෙහි උපදනා කල්හිදු ඔබේ පලමුවැන්නාගේ ගෙයි ඉතිරි සතරදෙන නො බැණ හිඳිත් ද, ගෙහිමියා ම විධාන කෙරේ ද, එපරිද්දෙන් ස්‍රොතාපත්ත්‍යඞ්ග යන්ට පැමිණ අධිමොක්ෂලක්ෂණ වූ ශ්‍රද්ධෙන්ද්‍රියය ම දෙවු වෙයි, පෙරදුරි වෙයි; සෙස්සෝ එය අනුව ගියාහු වෙති; යම්සේ දෙවැන්නාගේ ගෙයි ඉතිරි සතරදෙන නො බැණ හිඳිත් ද, ගෙහිමියා ම විධාන කෙරේ ද, එපරිද්දෙන් සම්‍යක්ප්‍රධානයන්ට පැමිණ ප්‍රග්‍රහලක්ෂණ වූ වීර්‍යෙන්ද්‍රියය ම දෙවු වෙයි, පෙරදුරි වෙයි, සෙස්සෝ එය අනුව ගියාහු වෙති; යම්සේ තෙවැන්නාගේ ගෙයි ඉතිරි සතරදෙන නො බැණ හිඳිත් ද, ගෙහිමියා ම විධාන කෙරේ ද; එපරිද්දෙන් සතිපට්ඨානයන්ට පැමිණ උපස්ථාන ලක්ෂණ වූ සමෘතීන්ද්‍රියය ම දෙවු වෙයි, පෙරදුරි වෙයි; සෙස්සෝ එය අනුව ගියාහු වෙති; යම්සේ සතරවැන්නාගේ ගෙයි ඉතිරි සතරදෙන නො බැණ හිඳිත් ද, ගෙහිමියා ම විධාන කෙරේ ද, එසේ ධ්‍යාන විමොක්ෂයන්ට පැමිණ අවික්ෂෙපලක්ෂණ වූ සමාධීන්ද්‍රියය ම දෙවු වෙයි, පෙරදුරි වෙයි; සෙස්සෝ එය අනුව ගියාහු වෙති; යළි සිඟල්ලට පසුව රජුගේ ගෙට ගියකල යම්සේ ඉතිරි සතරදෙන නො බැණ හිඳිත් ද රජ තෙමේ ම ගෙයි විධාන කෙරේ ද; එපරිද්දෙන් ආර්‍යසත්‍යයන්ට පැමිණ පජානන ලක්ෂණ වූ ප්‍රඥෙන්ද්‍රියය ම දෙවු වෙයි, පෙරදුරි වෙයි; සෙස්සෝ එය අනුව ගියාහු වෙත්. මෙසේ පිළිසිඹියාපත්වූවන් අතුරෙන් අගතැන්හි තැබූ මහාකොණ්ඩඤ්ඤ තෙරුන් වහන්සේ ලොව්දහම් පුළුවුස්නාහු සිත දෙවු කොට සිත පෙරදුරි කොට විචාළහ; ලොවුතුරු දහම් පුළුවුස්නාහු ප්‍රඥව දෙවු කොට ප්‍රඥව පෙරදුරි කොට විචාළහ. ධම්සෙනෙවි සැරියුත් තෙරුන් වහන්සේ ද එසේ ම විසඳූ සේකි.

යං භාවුසො! පජානාති= යම් චතුස්සත්‍ය ධර්මයක් "මේ දුකයැ" යනාදි නයින් මාගීප්‍රඥ තොමෝ දනගනී ද; **තං විජානාති**= මාගීචිත්තය ද එසේ ම එය දනගනී; **යං විජානාති**= යම් සංස්කාරයක් "අනිත්‍යයැ" යනාදි නයින් විදර්‍ශනා චිත්තය දනගනී ද; **තං පජානාති**= විදර්‍ශනා ප්‍රඥව ද එසේ ම එය දනගනී; **තස්මා ඉමෙ ධම්මා**= ඒ කරුණෙන් මේ ධර්මයෝ එකොතපාද-එකනිරොධ-එකවඨාන-එකාලම්බනභාවයෙන් සංසෘෂ්ට වූවාහුය. **පඤ්ඤා භාවෙතබ්බා** යන මෙය මාගීප්‍රඥව සඳහා කියන ලද; යළි ඒ මාගීප්‍රඥව හා සම්ප්‍රයුක්ත වූ විඥානය ඒ ප්‍රඥව සමග වැඩිය යුතු ම වෙයි. **විඤ්ඤාණං පරිඤ්ඤෙය්‍යං** යන මෙය විදර්‍ශනා චිත්තය සඳහා කියන ලද; යළි ඒ විඥානය හා සම්ප්‍රයුක්ත වූ ප්‍රඥව ඒ විඥානය සමඟ හාත්පසින් දනගතයුත්තේම වේ.

වෙදනා වෙදනා යන මෙය කුමක් හෙයින් විචාරත් ද? යත්:— වෙදනාලක්ෂණය පුළුවුස්නෙමි විචාරති; මෙසේ ඇති කල්හි දු ත්‍රෙහු මෙ සම්මර්‍ශනවාරයෙහි වෙදනාව ම අදහස් කරන ලද්දී යයි සැලකිය යුතු; **සුඛම්පි වෙදෙති**= සුවඅරමුණ විඳි අනුභව කරයි; මත්තෙහි දෙපද

යෙහි දු මේ ම නයයි. *a* "රූපං ච හි'දං මහාලි! එකන්තදුක්ඛං අභවිස්ස දුක්ඛං දුක්ඛානුපතිතං දුක්ඛාවක්කන්තනං අනවක්කන්තනං සුඛේන නයිදං සත්තා රූපස්මිං සාරජ්ජේය්‍යුං; යස්මා ච ඛෝ මහාලි! රූපං සුඛං සුඛානුපතිතං සුඛාවක්කන්තනං අනවක්කන්තනං දුක්ඛේන, තස්මා සත්තා රූපස්මිං සාරජ්ජන්ති, සාරාගා සංයුජ්ජන්ති, සංයොගා සංකිලිස්සන්ති; වේදනා ච හි'දං -පෙ- සඤ්ඤා- සඛාරා- විඤ්ඤාණං ච හි'දං මහාලි! එකන්තදුක්ඛං අභවිස්ස —පෙ— සඛකිලිස්සන්ති" යි මේ මහාලිසූත්‍රපරියායයෙන් ද මෙහි ආලම්බනය සුඛය දුඃඛය උපෙක්ෂා යයි කියන ලදි; තවද- පුළු වූ සුඛවේදනාව අරමුණු කොට අපර සුඛ වේදනාවන් විඳී, පුළු වූ දුඃඛවේදනාව අරමුණු කොට අපර දුඃඛවේදනා වන් විඳී, පුළු වූ උපෙක්ෂාවේදනාව අරමුණු කොට අපර උපෙක්ෂාවේද නාවන් විඳී යයි මෙසේ මෙහි අර්ථ දතයුතු. ඒ එසේ මැයි- වේදනා තොමෝ ම විඳී, විඳින්නා වූ අන් කිසිවෙක් නම් නැතැයි මේ කියන ලදී. **සඤ්ඤා සඤ්ඤා** යි මෙහි කුමක් විචාරත් ද? යත්:- (සියලු චාතුර්භූමක) සංඥාවගේ ලක්ෂණය විචාරති; කිම සම්ප්‍රයුක්ත (සියලු චිත්තෝත්පාදයෙහි පවත්නා) සංඥාවගේ ද? යත්- සංඥාවගේ ලක්ෂණය යි ද සම්ප්‍රයුක්ත සංඥා වගේ ලක්ෂණය යි ද මේ එකෙකි; මෙසේ ඇති කල්හි දු ත්‍රෛභූමක සම්මර්ශනචාර සංඥාව ම අදහස් කරන ලදුයි සැලකිය යුතු. **නීලම්පි සඤ්ජානාති**= නීලපුෂ්පයන හෝ වස්ත්‍රයක හෝ පරිකර්ම කොට උපචාර යට හෝ අර්පණාවට පමුණුවමින් හැඳිනගනී; ඒ එසේ මැයි- මේ අර්ථ යෙහි පරිකර්මසංඥාව ද උපචාරසංඥාව ද අර්පණාසංඥාව ද වටී, නීලයෙහි නීලයැයි උපදනා සංඥාව ද වටනේ ම ය; **පීතකාදි**යෙහි ද මේ ම නය යි.

ඉමා වාහං භන්තේ! වේදනා යන මෙහි වේදනා යැ සංඥා යැ විඤ්ඤාණය යන මේ තුන ගෙන ප්‍රශ්නය කුමක් හෙයින් නො ගත්තා ලද්දේ ද? යත්:- අසම්මුඛාභ්‍රාහික (= සියල්ලෙහි ඇතුළත් නො වන) හෙයිනි; සැබෑ ප්‍රශ්නය ගත් කල්හි ප්‍රශ්නය හා යෙදුනා වූ වේදනාදිහු ලැබෙති, වෙන් වූවාහු නො ලැබෙති; යළි ඒ ප්‍රශ්නය නො ගෙන මොවුන් ගත් කල්හි ප්‍රශ්නසම්ප්‍රයුක්ත වූ ද විප්‍රයුක්ත වූ ද යථාපිරිසෙයින් දෙපස් විඤ්ඤණඛ්ම යෝ ද ලැබෙත්. යම්සේ වනාහි පුරුෂයෝ තිදෙනෙක් සූත්‍ර (= නූල්)යැ සූත්‍ර යැයි කියන්නාහු ද, ඝතරවැන්නා රන්න ඇවිණූ සූත්‍ර යැයි කියන්නේ ද ඔවුනතුරෙහි පළමු තිදෙන නූල්කරින "තක්කක" යෙහි වූ ද නූල් වෙළන "පරිවට්ටා" දියෙහි වූ ද යම් කිසි බොහෝ නූල් ලබත් ද, යථාපිරි

---

a මහාලි! යම්නෙයකින් මේ රූපය ද එකාන්තයෙන් අහිතට වූයේ (එහෙයින් ම) දුක් වූයේ දුක්වේදනාවෙන් බැසගන්නා ලද්දේ දුකින් අවක්‍රාන්ත වූයේ සැපයෙන් අනවක්‍රාන්ත වූයේ වන්නේ නම්, සත්ත්වයෝ රූපයෙහි නො ඇලෙන්නාහුය; තවද- මහාලි! යම්නෙයකින් රූපය සැප වූයේ ද සැපයෙන් බැසගන්නා ලද ද සැපයෙන් අවක්‍රාන්ත ද දුකින් අනවක්‍රාන්ත ද එහෙයින් රූපයෙහි ඇලෙති, ඇලීම හේතුකොටගෙන සංයෝග වෙති, සංයෝගය හේතු කොටගෙන කෙලෙසෙත්.

සෙයින් මකුළුහුයකු දු ලබත් ද; රුවන් ඇවුණු හුය සොයන තෙනැත්තේ මද ව ලබා ද; මෙ කරුණ එපරිද්දෙන් දතයුතු. නොහොත් යටින් ප්‍රඥව විඥනය සමඟ සම්ප්‍රයොගය ලබවා හරන ලද්දී නුයි බල බැලින් ද මෙහි නො හන්නා ලද්දී යයි කියත්. යං භා'වුසො! වෙදෙති= යම් අරමුණක් වෙදනා තොමෝ විඳී ද, සංඥව ද එය ම හැඳිනගනී; යං සඤ්ජානාති= යම් අරමුණක් සංඥ තොමෝ හැඳිනගනී ද, විඥනය ත් එය ම දැනගනී යන අර්ථ යි.

මෙවිට සඤ්ජානාති විජානාති යන මෙහි විශෙෂය ද අවිශෙෂය ද දතයුතු: එහි උපසර්ගමාත්‍රය ම විශෙෂ යැ, "ජානාති" යන පදය වැළි ත් අවිශෙෂයි; ඒ පදයාගේ ද ජානනාර්ථයෙහි විශෙෂය දතයුතු- මේ විසඳුම යැ- සංඥ තොමෝ නීලාදි වශයෙන් අරමුණු හැඳිනීම පමණක් ම කෙරෙයි, අනිත්‍ය යැ දුඃඛ යැ අනාත්ම යැයි ලක්ෂණ ප්‍රතිවෙධයට පමුණුවන්ව නො හැකි වෙයි; විඥනය නීලාදි අරමුණත් දැනගනී, අනිත්‍යාදි ලක්ෂණ ප්‍රතිවෙධයට ත් පමුණුව යි; එහෙත් උතුසාහ කොට මාගීයාගේ පහළවීමට පමුණුවන්ව නොහැකි වෙයි; ප්‍රඥතොමෝ නීලාදි වශයෙන් අරමුණ ත් හැඳිනගනී, අනිත්‍යාදි වශයෙන් ලක්ෂණ ප්‍රතිවෙධයට ත් පමුණුවයි, උතුසාහ කොට මාගීයාගේ පහළවීමට ත් පමුණුවයි. උපමා මෙසේ යැ:- රන්කරුවාගේ පුවරුවෙහි කහවණු රැසක් කළ කල්හි නුපන්බුඩි ඇති ළදරු යැ ගම්වැසි පුරුෂ යැ මහා රන්කරු යැ යන බලා සිටි තුන්දෙනා අතුරෙන් නුපන් බුඩි ඇති ළදරු කහවණු පිළිබඳ චිත්‍ර-විචිත්‍ර-චතුරස්‍ර-මණ්ඩලභාවය ම දැනගනී, මේ මිනිසුන්ගේ උපභොග පරිභොග වූ රතනසම්මතකයකැයි නො දනී; ග්‍රාමික පුරුෂ චිත්‍රාදිභාවය ත් දැනගනී, මිනිසුන්ගේ උපභොග පරිභොග රතන සම්මත භාවය ත් දැනගනී, එහෙත් මේ කූව (= කහවණු ප්‍රතිරූප) යැ මේ ජේක (= සාර) යැ මේ අකූව (= අල්පසාර) යැ මේ සිටුවූ යැයි නො දනී; එසේ රන්කරු චිත්‍රාදිභාවය ද රතනසම්මතභාවය ද කූවාදිභාවය ද දැනගනී; යම් දැනගන්නේ ත් එය රූපය දැක ද ශබ්දය අසා ද ගන්ධය ආඝ්‍රාණය කොට ද රසය විඳ ද අතින් බර-සැහැල්ලුබව විමසා ද අසවල් හමා කරන ලදැයි කියා ත් දැනගනී, අසවල් නියම්ගම් අසවල් නුවර අසවල් ගල්සෙවණෙහි අසවල් ගංඉවුරෙහි කරන ලදැයි ද අසවල් ඇදුරු විසින් කරන ලදැයි ද දැනගනී; එපරිද්දෙන් සංඥ තොමෝ නුපන් නුවණැති දරුවාගේ කහවණු දැකීම මෙන් නීලාදි වශයෙන් අරමුණු පමණක් ම දැනගනී; විඥනය ගම්වැසි පුරුෂයාගේ කහවණු දැක්ම මෙන් නීලාදි වශයෙන් අරමුණ ත් දැනගනී, අනිත්‍යාදි වශයෙන් ලක්ෂණ ප්‍රතිවෙධයට ත් පමුණුවයි; ප්‍රඥ තොමෝ මහාරන්කරුවාගේ කහවණු දැකීම මෙන් නීලාදි වශයෙන් අරමුණ ත් හැඳිනගනී. අනිත්‍යාදි වශයෙන් ලක්ෂණ ප්‍රතිවෙධයට ත් පමුණුවයි, උතුසාහ කොට මාගීයාගේ පහළවීමටත් පමුණුවයි.

සඤ්ඤා - විඤ්ඤාණ - ප්‍රඥවන්ගේ විශෙෂය.

තවද- ඔවුන්ගේ ඒ විශෙෂය දුකසේ ප්‍රතිවෙධ කටයුත්තේය, එසින් කිහ- ආයුෂ්මත් "නාගසෙන" තෙරුන් වහන්සේ- "මහරජ! භාග්‍යවතුන් විසින් දුෂ්කර වූවක් කරන ලදැ" යි "වහන්ස! නාගසෙන! භාග්‍යවතුන් විසින් කවර දුෂ්කරයක් කරන ලද දැ?"යි; "මහරජ! භාග්‍යවතුන් විසින් දුෂ්කරයක් කරන ලද, එක් අරමුණෙහි පවත්නා වූ අරූපී චිත්තචෛතසික ධර්මයන්ගේ- මේ සඳහා යැ මෝ වෙදනා යැ මෝ සංඥා යැ මෝ චෙතනා යැ මේ චිත්ත යැයි යම් විභාගයෙක් වදාරන ලද ද, යම්සේ තලතෙල් යැ අබතෙල් යැ මීතෙල් යැ එරඬු තෙල් යැ වුරුණු තෙල් යැ යන මේ පස්තෙල් එක් සැලෙක බහා දව සක් යමාමතින් අලළා නැවත මේ තලතෙල් යැ මේ අබතෙල් යැයි එකක් එකක්හු වෙන වෙන තැහීම නම් දුෂ්කර වේ ද, මෙය ඊට වඩා අතිශයින් දුෂ්කර වෙයි; භාග්‍යවතුන් වහන්සේ සර්ව ඥතා ඥාන ය මොනොවට ප්‍රතිවෙධ කළ බැවින් ධර්මස්වාමී වූවාහු ධර්මරාජන් වූවාහු එක් අරමුණෙහි පවත්නා වූ මේ අරූපී ධර්මයන්ගේ විභාගය කළ සේකැ" යි. පඤ්චමහානදීන් මුහුදට පිවිසි තැන්හි මේ ගඞ්ගා නදිය ගේ ජලය මේ යමුනා නදිය ගේ යයි මෙසේ වෙන වෙන ජලය නැගීමෙනු දු මේ අර්ථය දතයුතු.

නිස්සඤ්ඤා= නික්මුණාවූ තොහොත් හරන ලද්දාවූ; එහි "නික්මුණු" යන අර්ථය ඇතිකල්හි පසිඳුරන් කෙරෙනැසි අවධිවචන යැ, "හරන ලද" යන අර්ථය ඇතිකල්හි කරණ වචනය දතයුතු; මේ කියන ලද වෙයි- පසිඳුරන් කෙරෙන් නික්ම මනොවාරයෙහි පැවැත්තා වූ නොහොත් පසිඳුරන් කරණ කොටගෙන ඔහුගේ වසතුබවට නො පැමිණෙන බැවින් පරිත්‍යාග කරන ලද; **පරිසුද්ධෙන**= උපක්ලෙශ රහිත වූ; **මනොවිඤ්ඤාණෙන**= රූපාවචරචතුර්ධ්‍යානචිත්තයෙන්; **කිං නෙය්‍යං**= කුමක් දතයුතු ද? ඒ එසේ මැයි- "යං කිඤ්චි නෙය්‍යං නාම අත්ථි ධම්මං" යනාදියෙහි මෙන් දතයුත්ත "නෙය්‍ය" යි කියන ලදී; **ආකාසානඤ්චායතනං නෙය්‍යං**= රූපාවචරචතුර්ධ්‍යාන චිත්තයෙන් අරූපාවචර සමාපත්තිය කෙසේ දතයුතු ද? යි, රූපාවචර චතුර්ධ්‍යානයෙහි සිටියහු විසින් අරූපාවචර සමාපත්තිය උපදවන්ට හැකි වෙයි; යම් හෙයකින් මෙහි සිටියහුට ඕ සමාපත්ති සම්බන්ධ වේ ද, එහෙයින් "ආකාසානඤ්චායතනං නෙය්‍යං" යනාදිය කිහ. යළි "නෙවසඤ්ඤූ නාසඤ්ඤූ යතනය" කුමක් හෙයින් නො කියන ලද ද? යත්- වෙන වෙන ම (විදර්ශනා) අභිනිවෙශයක් නැති හෙයිනි; යම් හෙයකින් එහි කලාප හෙයින් නයහෙයින් සම්මර්ශනය ලැබේ ද, ධම්සෙනෙවියන් වැනි වූ මහණක්හට ද, වෙන වෙන ම අභිනිවෙශයක් නො වේ ද, එහෙයින් තෙරුන් වහන්සේ ත් "මෙසේ වනාහි මේ ධර්මයෝ (අභිනිවෙශය) නොවී පහළ වෙති, (පහළ) වී නැසෙති" කලාපහෙයින් නයහෙයින් සම්මර්ශනය

කොට කොට විසඳූහ. භාග්‍යවතුන් වහන්සේ වූ කලි සර්වඥතාඥානය අත්පත්බැවින් ඒ නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තියෙහි වූ පරෝපනස් ධර්මයන් වෙන වෙන ම අඛෙදාඩාරයෙන් ම නහා **"ඝාවනා සඤ්ඤාසමාපත්ති නාවනා සඤ්ඤාපවිවෙඛා"** යි වදළහ. **පඤ්ඤාචක්ඛුනා පස්සනාති**= දර්ශනපරිණායකාර්‍යයෙන් ඇසක් වැනි වූ ප්‍රඥාවෙන් දූනගනී; එහි සමාධිප්‍රඥ විදර්ශනාප්‍රඥ දූයි ප්‍රඥ දෙකෙකි, සමාධිප්‍රඥාවෙන් කෘත්‍ය හෙයින් ද අසම්මුඛ හෙයින් ද දූනගනී, විදර්ශනාප්‍රඥාවෙන් ලක්ෂණ ප්‍රතිවෙධයෙන් අරමුණු හෙයින් දූනීම කියන ලදි; **කිමත්ථියා**= මෑ ප්‍රඥාවගේ ප්‍රයෝජන කවරේ ද? **අභිඤ්ඤත්ථා** යනාදියෙහි **අභිඤ්ඤය** (= දතයුතු) ධර්මයන් වෙසෙසින් දූනගනී නුයි **අභිඤ්ඤත්ථා** නම්; පරිඥෙය ධර්මයන් හාත්පසින් දූනගනී නුයි **පරිඤ්ඤත්ථා** නම්; ප්‍රහාතව්‍යධර්මයන් දුරුකෙරේ නුයි **පහානත්ථා** නම්; යළි ඕ මෝ ප්‍රඥාව ලෞකික වූවා ද අභිඥාව ප්‍රයෝජන කොට ඇත්තී ත් පරිඥාව ප්‍රයෝජන කොට ඇත්තී ත් විෂයාමෝහණ වශයෙන් ප්‍රහාණය ප්‍රයෝජන කොට ඇත්තී ත් වෙයි; ලොකොත්තර වූවා ද අභිඥාව ප්‍රයෝජන කොට ඇත්තී ත් පරිඥාව ප්‍රයෝජන කොට ඇත්තී ත් සමූවෙඡ්ද වශයෙන් ප්‍රහාණය ප්‍රයෝජන කොට ඇත්තී ත් වෙයි; එහි ලෞකිකප්‍රඥාව කෘත්‍යවශයෙන් ද තො මුළාවශයෙන් ද දූනගනී; ලොකොත්තර ප්‍රඥාව අසම්මොහ (= තො මුළා) වශයෙන් දූනගනී. **සම්මාදිට්ඨා උප්පාදාය**= විදර්ශනා සම්‍යග්දෘෂ්ටියගේ ද මාර්ග සම්‍යග්දෘෂ්ටියගේ ද; **පරතොඝොසෝ**= සැප වූ ධර්මශ්‍රවණය; **ඉමා නිස්සා මනසිකාරෝ**= තමාගේ උපායමනසිකාරය; එහි ශ්‍රාවකයන් අතුරෙහි ධර්මසෙනෙවියන්ට ද ප්‍රත්‍යය දෙක ලබන්ට වටිත් මැයි, ඒ එසේ මැයි- තෙරුන් වහන්සේ කල්පලක්ෂයක් අධික කොට ඇති එකාසඞ්ඛ්‍යයක් පැරැම් පුරා ත් තමන්ගේ පියවින් අනුමාත්‍ර වූ ත් කෙලෂයක් දුරු කරන්ට නො හැකි වූහ; **"යෙ ධම්මා හෙතුප්පභවා"** යි අස්සජී තෙරුන් කෙරෙන් මේ ගාථාව අසා ම ඒ තෙරුන්ගේ ප්‍රතිවෙධය විය. එහෙත් පසේබුදුවරුන්ට ද බුදුවරුන්ට ද පරතොඝොසයෙන් කවයුත් තෙක් නැති යොනිසොමනසිකාරයෙහි ම සිට ප්‍රත්‍යෙකබොධිය ද සර්ඥතාඥාණයන් ද උපදවත්. **අනුග්ගහිතා**= ලද උපකාර ඇත්තී; **සම්මාදිට්ඨි**= අනිත්‍යමාර්ග සම්‍යග්දෘෂ්ටිය; ඵලක්ෂණයෙහි උපන් චෙතොවිමුත්තිඵලය මැට නුයි **චෙතොවිමුත්තිඵලා** නම්; එම චෙතොවිමුත්තිය සඛ්‍යාත වූ ඵලය අනුසස් වූයේ මැට නුයි **චෙතොවිමුත්තිඵලානිසංසා** නම්; දෙවෙනි පදයෙහි දූ මෙ ම නයයි. මෙහි දූ සතරවෙනි ඵලප්‍රඥාව **පඤ්ඤාවිමුත්තිනි** නම්; අවශෙෂ ධර්මයෝ **චෙතොවිමුත්තිනි** යයි දතයුතු. **සීලානුග්ගහිතා** යනාදියෙහි සීල නම් සිවුපිරිසුදු සීලයයි; **සුත** නම් සැප වූ ධර්මශ්‍රවණ යයි; **සාකච්ඡා** නම් කර්මස්ථානයෙහි සැලීම් පැකිලීම් සිදින කථාව; **සමථ** නම් විදර්ශනාපාදක වූ අෂ්ටසමාපත්තීහු; **විපස්සනා** නම්

සත්වැදෑරුම් අනුපස්සනාවෝ; ඒ එසේ මැයි- සිවුපිරිසුදුසිල් පුරන්න හුව සැපවූ ධර්මකථාව අසන්නහුට කර්මස්ථානයෙහි සැලීම් පැකිලීම් සිඳින්නහුට විදර්ශනාවට පාදක වූ අවසමවත්හි කර්ම කරන්නහුට සත්වැදෑරුම් අනුපස්සනාව වඩන්නහුට රහත්ඵල ඉපද ඵලය ගෙනදෙයි. උපමා මෙසේයැ:- මිහිරි අඹපක් වළඳනු කැමැත්තේ අඹ පැලය හාත්පස දියකොටුවක් සපිර කොට බඳී, කළයක් ගෙන කලින් කල දිය වත්කරයි, දිය බැහැර නො යෑම පිණිස ඉවුර සපිර කෙරෙයි, සම්පයෙහි යම් වැලක් හෝ වියලි දණ්ඩක් හෝ කුහුඹුගොටුවක් හෝ මකුළුදැලක් හෝ වේ නම් එය බැහැර කරයි, ඛණ්ඩිත්‍රි (= සාරත ආයුධ) යක් ගෙන කලින් කල මුල් අවට සාරයි; මෙසේ මේ පස් කරුණු කරන්නාවූ අප්‍රමාද වූ ඔහුට ඒ අඹහස වැඩි ඵල දෙයි; මෙසේ මේ කරුණ දතයුතු. ඒ එසේ මැයි:- රුක හාත්පස කොටු බැඳීම මෙන් සිවුපිරිසුදු සිලය දතයුතු; කලින් කල දිය ඉසීම මෙන් ධර්මශ්‍රවණය; ඉවුර සපිරබව කිරීම මෙන් ශමථය; සම්පයෙහි වැල්ආදිය බැහැර කිරීම මෙන් කමට හන්හි සැලීම් පැකිලීම් සිඳීම; කලින් කල ඛණ්ඩිත්‍රිය ගෙන මුල් සෑරීම මෙන් සත්වැදෑරුම් අනුපස්සනාවන්ගේ භාවනාව; ඒ කරුණු පසින් අනුගන්නා ලද අඹරුක මිහිරිපල දෙන කලක් මෙන් මේ මහණහට මේ පඤ්චධර්මීයන් ගෙන් අනුගන්නා ලද සම්‍යග්දෘෂ්ටියගේ රහත්ඵලය දීම දතයුතු.

කති පනා'වුසෝ! භවා යි මෙහි කුමක් විචාරත් ද? මුලට ම ගියාවූ අනුසන්ධියයි; දුෂ්ප්‍රාඥ තෙම යම් භවයන්ගෙන් නො නැගිසිටී ද, ඒ භවයන් පුළුවුස්මී විචාරති; එහි **කාමභවෝ**= කාමභවයට යන කර්මය ද කර්මයෙන් උපදවන ලද උපාදිණ්ණ සඞ්ඛ්‍යෝ දැයි දෙන එක්තැන් කොට "කාමභවෝ" යි කීහ; රූපාරූපභවයන්හි දු මෙම නයයි. **ආයතිං**= අනාගතයෙහි; නැවත භවයාගේ ඉපදීම= **පුනබ්භවා'හි නිබ්බත්තිනමු**; මෙහි වර්තාය පුළුවුස්තෙමී විචාරති; **නනු නන්‍රා'හි නඤ්ඤා**= රූපයෙහි සතුටු වීම යැ ශබ්දයෙහි සතුටු වීම යැයි මෙසේ ඒ ඒ තැන සතුටු වීම; තවද- මේ කරණයෙහි ප්‍රථමා යැ, (රූපාදි) ඒ ඒ තැන්හි අභිනන්දනය කරණ කොටගෙන පුනර්භවයාගේ පහළවීම වෙයි යන අර්ථ යි. මෙතෙකින් වනාහි ගමන වෙයි, ආගමන වෙයි, ගමනාගමන වෙයි, වර්තාය පවර්තී යයි වර්තාය මුදුන් පමුණුවා දැක්වූ සේක. මෙවිට විවර්තාය පුළුවුස්නාහු **කථං පනා'වුසෝ!** යනාදිය කීහ. ඒ ප්‍රශ්නයාගේ විසඳීමෙහි **අවිජ්ජාවිරාගා**= අවිද්‍යාවගේ ක්ෂයවිරාගයෙන්; **විඤ්ඤාණපච්චයා**= අතීතමාගීවිද්‍යාවගේ ඉපදීමෙන්; කිම අවිද්‍යාව පෙර නිරුද්ධ වූවා ද; විද්‍යාව උපන්නී ද? යි; මේ දෙන නො කියයුතු යැ; පහන දැල්වීමෙන් අදුර මෙන් විද්‍යාව ඉපදීමෙන් අවිද්‍යාව නිරුද්ධ වූවා ම වෙයි;

තණ්හානිරොධා= තෘෂ්ණාවගේ ක්‍ෂයසඞ්ඛ්‍යාත නිරොධයෙන්; **පුනබ්භවාභිනිබ්බත්ති න හොති**= මෙසේ මත්තෙහි පුනර්භවයාගේ පහළවීම නො වෙයි; ගමනය ආගමනය ගම්‍ය ගමනය සිදෙයි, චුතිය නො පවතී යයි විවර්තනය මුදුන් පමුණුවා දැක්වූ සේක.

කතමං පනා'වුසෝ! යි මෙහි කුමක් විචාරත් ද? යත්:- උභතෝ භාගවිමුක්ත වූ මහණ කලින් කල නිරොධයට සමවදී, ඔහුගේ නිරොධ පාදක වූ ප්‍රථමධ්‍යානය පුළුවුස්මී විචාරති. **පඨමං පනා'වුසෝ! ඣානං** යි මෙහි කුමක් විචාරත් ද? නිරොධයට සමවදනා මහණ විසින් අඞ්ග ව්‍යවස්ථාවය කොට්ඨාස පරිවෙඡ්දය නම් දතයුත්තේය, මේ ධ්‍යානය පඤ්චාඞ්ගික යැ මෙය චතුරඞ්ගික යැ මෙය ත්‍රයඞ්ගික යැ මෙය ද්‍වයඞ්ගික යයි ඒ අඞ්ගව්‍යවස්ථාව ද කොට්ඨාසපරිවෙඡ්දය ද පුළුවුස්මී විචාරති; **විතක්කෝ** යනාදියෙහි **අභිනිරොපණ** (= නැඟීම) **ලක්ඛණ** වූයේ **විතක්ක** නම්; පිරිමැදීම **ලක්ඛණ** වූයේ **විචාර** නම්; පැතිරීම **ලක්ඛණ** වූවා **පීති** නමු; සාත (= සැපය) **ලක්ඛණ** වූයේ **සුඛ** නම්; අවික්ඛේපය **ලක්ඛණ** වූවා **විතක්කාදයෝ** නමැයි මේ පඤ්ච ධර්මයෝ පවතිත්. **කතං'ඔතාවප්පහීනං** යි මෙහි කුමක් විචාරත් ද? යත්:- නිරොධයට **සමවදනා** මහණ විසින් උපකාර වූ ද අනුපකාර වූ ද අඞ්ගයෝ දතයුත්තාහුය, ඔවුන් පුළුවුස්නෙමි විචාරති; මෙහි විසඳීම වනාහි ප්‍රකට මැයි. මෙසේ යට නිරොධපාදක වූ ප්‍රථමධ්‍යානය ගන්නා ලද, මත්තෙහි ඒ නිරොධයට අනන්තරප්‍රත්‍යය වූ නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිය විචාරන්නාහුය; යළි අතර සමාපත්තීහු සංක්ෂෙප කරන ලද්දාහුය; නොඉක්මනය දක්වා විසඳන ලද්දාහු යයි දතයුතු;

දැන් විඤ්ඤාණය නිශ්‍රය වූ පඤ්චප්‍රසාදයන් විචාරන්නාහු **පඤ්චිමානි ආවුසෝ!** යනාදිය කිහ. එහි **ගොචරවිසයං**= ගොචර වූ විෂය; **අඤ්ඤමඤ්ඤස්ස**= චක්ෂුරින්ද්‍රිය ශ්‍රොත්‍රෙන්ද්‍රියයාගේ ද ශ්‍රොත්‍රෙන්ද්‍රිය හෝ චක්ෂුරින්ද්‍රියයාගේ දැයි මෙසේ එකක් එකාක්හුගේ ගොචරවිෂය නොවිඳී; ඒ එසේ මැයි- ඉදින් නීලාදිභෙදවූ රූපාරම්මණය රැස් කොට ශ්‍රොත්‍රෙන්ද්‍රියයට "මේ කිනම් අරමුණක් දැයි එය විනිශ්චය කරව, සලකව" යි එළවන්නේ නම් චක්ෂුර්විඤ්ඤාණය මුඛයක් නැති නමුදු තමාගේ පියවින් මෙසේ කියන්නේය- "කොල! අඹබාලය! අවුරුදු සියයකු දු අවුරුදු දහසකු දු ඖත්පස දුවන්නේ මා හැර මොහුගේ දැනීමක් කොහි ලබන්නෙහි ද? ගෙනෙව එය චක්ෂුඃප්‍රසාදයෙහි එළවව, නිල්වූයේ හෝ කහාවන් වූයේ හෝ මම මේ අරමුණ දැන ගන්නෙමි, මේ තෙම අනෙකෙකුට විෂය වූයේ නො මැ වෙයි, මේ තෙම මට ම විෂය වෙයි; සෙසු වාරයන්හි දු මේ ම නයයි. මෙසේ මොවුහු එකිනෙකාගේ ගොචරවිෂය නො විඳිත් නම් වේ. **කිං පටිසරණං**= මොවුන්ගේ ප්‍රතිෂ්ඨාව (= පිළිසරණ) කිම? මොවුහු කුමක් පිළිසරණ කොරෙත් ද? යි විචාරති; **මනොපටිසරණං**= ජවන්ඝිත පිළිසරණ යැ;

මනෝ ච නෙසං= මනොවාරික ජවන්සිත හෝ පඤ්චවාරික ජවන්සිත හෝ මොවුන්ගේ ගොචරවිෂය ඇලීම් ආදිවශයෙන් විදී; සැබව- චක්ඛුර් විඤ්ඤය රූ දැකීම් මාත්‍රයක් ම වෙයි, මෙහි ඇලීමක් හෝ තො සතුවක් හෝ මුළාවක් හෝ නැති; වැළි මේ චක්ඛුර්වාරයෙහි ජවනය ඇලෙන්නේ හෝ කිපෙන්නේ හෝ මුළාවන්නේ හෝ වෙයි; ශ්‍රොත්‍රවිඤ්ඤාදි යෙහි දු මෙ ම නයයි. එහි මෝ උපමා යැ:- දුර්‍ලභ වූ හොජකයෝ පස් දෙනෙක් රජු ඇසුරු කොට දුකසේ ඉතා දුකසේ කුලපසක් ඇති එක් ගමක සවලප වූ අය ලැබූහ, ඔවුන්ට එහි මත්‍සයමාගය හෝ මාංශමාගය හෝ යුකත කහවණුවක් හෝ අනුකහවණුවක් හෝ මාසකහවණුවක් හෝ අටකහවණුවක් හෝ සොළොස්කහවණුවක් හෝ දෙතිස්කහවණුවක් හෝ සූසැටකහවණුවක් හෝ දඩ යයි මෙ පමණෙක් ම පැමිණෙයි, ශතවසතුක වූ සහස්‍රවසතුක වූ මහාබලි (= කරවුවර) රජ තෙමේ ම ගනී; ඒ උපමාවෙහි පඤ්චකුලිකග්‍රාමය මෙන් පඤ්ච ප්‍රසාදයෝ දතයුත්තාහුය; දුර්‍ලභොජකයන් පස්දෙන මෙන් පඤ්ච විඤ්ඤාණයෝ ද, රජු මෙන් ජවනය ද, දුර්‍ලභොජකයන්ට සවලප වූ අය පැමිණීම මෙන් චක්ඛුර්විඤ්ඤාදීන්ගේ රූපදර්‍ශනාදිමාත්‍රය ද දතයුතු; ඇලීම් ආදිය වනාහි මේ චක්ඛුර් විඤ්ඤාදීන් කෙරෙහි නැති, රජුගේ මහාබලි ගැනීම මෙන් ඒ වාරයන් ජවනයාගේ ඇලීම් ආදිය දතයුත්තාහුය.

පඤ්චිමානි ආවුසො! සි මෙහි කුමක් විවාරත් ද? යත්:- **ඇතුළු නිරොධයෙහි පඤ්චප්‍රසාදයන්** ක්‍රියාමය ප්‍රවෘත්තියෙහි පවත්නා කල්හි අරූප ධර්මයෝ ප්‍රසාදයන්ගේ බලවත් ප්‍රත්‍යයෙන් වෙති; යම් යමෙක් ඒ ප්‍රවෘත්තිය නිරුද්ධ කොට නිරොධසමාපත්තියට සමවන්නේ ද, ඔහුගේ ඇතුළු නිරොධයෙහි පඤ්චප්‍රසාදයෝ කුමක් නිසා (= ඇසුරු කොට) සිටිත් දැ? සි මෙය පුළුවුස්නෙමී විවාරති. **ආයුං පටිච්ච**= ජීවිතෙන්ද්‍රියය නිසා සිටී; **උසමං පටිච්ච**= කර්මජතෙජස නිසා සිටී; තවද- යම්හෙයකින් කර්මජතෙජස ත් ජීවිතෙන්ද්‍රියය හැර නො සිටී ද, එහෙයින් කර්මජතෙජස ආයු (= ජීවිතෙන්ද්‍රියය) නිසා සිටී යයි කිහ. ජීවිතෙන්ද්‍රිය හා කර්මජතෙජස **කිලායනෝ**= දැල්වෙන්නා වූ; **අච්චිං පටිච්ච**= ගිනිසිළුව නිසා; **ආභා පභාසති**= ආලොකය නම් පැනෙයි; **ආභං පටිච්ච අච්චි**= ඒ ආලොකය නිසා ගිනිසිළුව පැනෙයි; **එවමෙව ඛො ආවුසො! ආයු උසමං පටිච්ච තිට්ඨති** යන මෙහි ගිනිසිළුව මෙන් කර්මජතෙජොධාතුව යැ, ආලොකය මෙන් ජීවිතෙන්ද්‍රිය යැ; ඒ එසේ මැයි- ගිනිසිළුව උපදනී ආලොකය ගෙන ම උපදී, ඕ ගිනිසිළුව ඒ තමා ඉපද වූ ආලොකයෙන් ම තොමෝත් සියුම් යැ මහත් යැ දිගී යැ ප්‍රභව යැයි ප්‍රකට වෙයි; එහි ගිනිසිළුව පැවැත්මෙන් ඉපදවූ ආලොකයෙන් ඒ ගිනිසිළුව පැවැත්ම පිළිබඳ වූ ම ප්‍රකටබව මෙන් කර්මජතෙජස නිසා උපන් කර්මජමහාභූතයන්ගෙන් හටගත් ජීවිතෙන්ද්‍රිය විසින් කර්මජතෙජස්හුගේ පාලනය වෙයි; ඒ එසේ මැයි- ජීවිතෙන්ද්‍රිය

දසවසකු වූ විසිවසකු වූ —පෙ— සියක් වසකු වූ කර්මජතෙජස්හුගේ පැවැත්ම පාලනය කෙරෙයි; මෙසේ මහාභූතයෝ උපාදාරූපයන්ට නිශ්‍රයප්‍රත්‍යයාදීන්ගේ වශයෙන් ප්‍රත්‍යය වෙත් හුයි ජීවිතෙන්ද්‍රියය කර්මජ තෙජස නිසා සිටී; ජීවිතෙන්ද්‍රියය මහාභූතයන් පාලනය කෙරේ හුයි කර්මජතෙජස ජීවිතෙන්ද්‍රියය නිසා සිටි යයි දතයුත්තීය.

ආයුසඞ්ඛාරා යනු **ආයුස** (= ජීවිතෙන්ද්‍රිය) ය මැයි; **වෙදනියා ධම්මා** යනු වේදනා ධර්මයෝ මැයි; **විඤ්ඤාණං පඤ්ඤපනති**= සමවතින් නැගිසිටීම පැනෙයි; ඒ එසේ මැයි- යම් මහණෙක් අරූපධර්මයන්ගේ පැවැත්මෙහි උකටලි වැ සංඥාව ද වේදනාව ද නිරුඛ කොට නිරෝධයට සමවන් නේ ද, ඔහට පරිවෙර්ද කළ කාලයාගේ වසයෙන් රූපජීවිතෙන්ද්‍රිය යාගේ ප්‍රත්‍යයෙන් අරූප ධර්මයෝ උපදිත්; යළි මෙපරිද්දෙන් රූපා රූප ප්‍රවෘත්තිය පවතී. කුමක් මෙන් ද? යත්:- යම්සේ එක් පුරුෂයෙක් හිනිදැල් පැවැත්මෙහි උකටලි වූයේ ජලයෙන් පැහැර හිනිදැල් නො පැවැත්ම කොට අළුවලින් අඟුරු වසා නො බැණ හිඳී ද, යළි යම්විටෙක ඔහුට හිනිදැලින් ප්‍රයෝජන වේ නම් අළු ඉවත් කොට අඟුරු පෙරළා දර දමා මුඛවාතය හෝ තල්වැට වාතය හෝ දේ ද, එකල්හි හිනිදැල් නැගීම නැවත පවතී ද; එපරිද්දෙන් හිනිදැල් නැගීම මෙන්- අරූප ධර්මයෝ ය, හිනිදැල් පැවැත්මෙහි උකටලි වැ දියපහරින් හිනිදැල් නො පැවැත්ම කොට අළුවලින් අඟුරු වසා තූෂ්ණීම්භූත වූ පුරුෂයාගේ හිඳීම මෙන්- අරූප ධර්මයන්ගේ පැවැත්මෙහි උකටලි වැ සංඥාව ත් වේදනා ත් නිරුඛ කොට භික්ෂුහුගේ නිරෝධයට සමවැදීම ය; අළුවලින් වැසූ අඟුරු මෙන්- රූපජීවිතෙන්ද්‍රිය ය; යළි හිනිදැලින් ප්‍රයෝජන ඇති කල්හි පුරුෂයාගේ අළු ඉවත්කිරීම් ආදිය මෙන්- භික්ෂුහුගේ පිරිසුන් කාලය ඉක්මීම ය; හිනිදැල් පැවැත්ම මෙන් යළි අරූපධර්මයන් උපන් කල්හි රූපාරූපයන්ගේ පැවැත්ම දතයුතු. **ආයු උසමා ච විඤ්ඤාණං** යනු රූපජීවිතෙන්ද්‍රිය ය, කර්මජ තෙජෝධාතු ය, චිත්ත ය, මෙ යන මේ ධර්මයෝ **තිදෙන** යම් කලෙක මේ රූපකාය හරිත් ද මෘතශරීරය එකල්හි මේ කාය සිත් නැති දඬුකඩක් මෙන් පොළොවෙහි හැරදමන ලද්දේ හොවී යන අර්ථ යි. මේ වදරන ලද මැයි-

172 "**ආයු උසමා ච විඤ්ඤාණං - යදා කායං ජහන්ති'මං**
අපවිඩෝ තදා සෙති - පරභත්තං අචෙතනං" යි-

---

172. **යදා**= යම් කලෙක; **ආයු**= ජීවිතෙන්ද්‍රියය ද; **උසමා ච**= කර්මජ තෙජස ද; **විඤ්ඤාණං**= චිත්තය ද යන මොහු; **ඉමං කායං**= මේ කය; **ජහන්ති**= හරිත් ද; **තදා**= එකල්හි; **අපවිඩෝ**= අපෙක්ෂා රහිත ව හැර දමන ලද්දේ. **පරභත්තං**= (ශුනකාදි) අන්‍යසත්ත්වයන් විසින් කෑයුතු ව; **අචෙතනං**= චේතනා රහිත ව; **සෙති**= හෝනේ යි.

කායසඞ්ඛාරා= ආශ්වාස-ප්‍රශ්වාසයෝ; **වචීසඞ්ඛාරා**- විතර්කවිචාරයෝ; **චිත්තසඞ්ඛාරා**= සංඥා-වෙදනාවෝ; **ආයු**= රූපජීවිතෙන්ද්‍රිය; **විපරිගිනන්නානි**= නටුවාහු වෙසෙසින් නටුවාහු; එහි කිසිවෙක්- **"නිරොධං සමාපන්නස්ස චිත්තසඞ්ඛාරා'ව නිරුඣා"** යි කී හෙයින් සිත අනිරුඬ වෙයි, එහෙයින් මෝ සමාපන්නි යවිතර්කී වූවා යයි කියත් ද, ඔවුහු මෙසේ කියයුත්තාහුය:- **"වචීසඞ්ඛාරා-පි'ස්ස නිරුඣා"** යි කී හෙයින් වාග් අනිරුඬ වෙයි, එහෙයින් නිරොධයට සමවන්නහු විසින් බණ කියමින් හැදෑරීම ද කරමින් හිඳිදයුතු වන්නේය; **"යො වා-ඝං මරණා කාලඞ්ඝනා නස්සා'පි චිත්තසඞ්ඛාරා නිරුඣා"** යි කී හෙයින් සිත අනිරුඬ වන්නේය, එහෙයින් කලුරිය කළ මවුපියන් හෝ රහතුන් හෝ දවන්නහු විසින් ආනන්තරිය කර්ම්ය කරන ලද්දේ වන්නේය. මෙසේ හෙයින් ව්‍යඤ්ජනයෙහි අනිනිවෙශය නො කොට ආචාර්‍යයන්ගේ නයෙහි සිට අර්ථය පරීක්ෂා කළ යුත්තේය. ඒ එසේ මැයි- **අර්ථය පිළිසරණ යැ, ව්‍යඤ්ජනය පිළිසරණ නැති.**

ඉන්ද්‍රියානි විප්පසන්නානි= යම්කෙයකින් ක්‍රියාමය ප්‍රවෘත්තිය පවත්නා කල්හි බාහිර අරමුණු ප්‍රසාදයෙහි ගැටෙන කල්හි ඉන්ද්‍රියයෝ කලාතත වෙත් ද, වාතාදියෙන් නැඟූ රජසින් සතර මංසඛණ්ඩයෙහි තැබූ කැඩපතක් මෙන් (අරමුණුවලින්) මැඩුනාහු තැවරුනාහු වෙත් ද; තවද- යම්සේ එම කාවෙහි බහා පෙට්ටි ආදියෙහි තැබූ කැඩපත ඇතුළත ම බබළා ද, එපරිදිදෙන් නිරොධයට සමවන් භික්ෂුහුගේ ඇතුළු නිරොධයෙහි පඤ්ච ප්‍රසාදයෝ ඉතා ම බබළන්. එහෙයින් කියන ලදි- **ඉන්ද්‍රියානි විප්පසන්නානි** යනු.

නිරොධසමාපත්තියා.

කති පනා'වුසෝ! පච්චයා? යි මෙහි කුමක් විචාරන් ද? යත්:- **නිරොධයාගේ අනන්තරප්‍රත්‍යය වූ නෙවසඤ්ඤානාසඤ්ඤායතනය පුළුවුස් නෙමී විචාරති;** යම් ඒ ප්‍රශ්නයාගේ විසඳීමෙහි **සුඛස්ස ච පහානා** යි සතර අපගමන (=පහව යන) ප්‍රත්‍යයෝ කියන ලද්දාහුය. **අනිමිත්තානං** යි මෙහි කුමක් විචාරන් ද? යත්:- නිරොධයෙන් නැගීසිටිනා ඵලසමාපත්තිය පුළුවුස්නෙමී විචාරති. ඒ එසේ මැයි- අවශෙෂ සමාපන්නීන්ගේ නැගීසිටීම භවාඞ්ගයෙන් වෙයි; එහෙත් නිරොධසමාපත්තියෙන් නැගීසිටීම විදර්‍ශනානිශංස වූ ඵලසමාපත්තියෙන් වෙයි; මේ තෙරුන් වහන්සේ ඒ ඵලසමාපත්තිය විචාරති. **සබ්බනිමිත්තානං**= රූපාදි සියලු ආරම්මණයන්ගේ **අනිමිත්තානඤ්ච ධාතුයා මනසිකාරෙ**= සියලු නිමිත්තයන්ගෙන් පහවූ නිර්‍වාණධාතුහුගේ මෙනෙහි කිරීම ඵලසමාපත්තිය හා සහජාත වූ මෙනෙහි කිරීම සඳහා කිහ. මෙසේ යට නිරොධපාදක වූ ප්‍රථමධ්‍යානය ගන්නා ලද, නිරොධයාගේ අනන්තරප්‍රත්‍යය වූ නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ගන්නා ලද; මෙහි නිරොධයෙන් නැගිසිටිනා ඵලසමාපත්තිය

ගන්නා ලද්දී යයි. මෙ තැන්හි නිරොධකථාව කියයුත්තී වෙයි; ඕ තොමෝ - "(ශමථ - විදර්‍ශනාය) විවිධ බලයන්ගෙන් යුක්ත බැවින් ත්‍රිවිධ සංස්කාරයන්ගේ දුරලීමෙන් (අනිච්චානුපස්සනාදි) සොළොස් ඥානචර්‍යාවන් ගෙන් ද (රූපාරූපධ්‍යාන සඞ්ඛ්‍යාත) නව සමාධිචර්‍යාවන්ගෙන් ද වශීභාවය ඇති ප්‍රඥ තොමෝ නිරොධසමාපත්තිය පිළිබඳ ඥානය" යි මෙසේ ප්‍රතිසම්භිදා මාර්‍ගයෙහි ආ ය; යළි විශුද්ධිමාර්‍ගයෙහි ඒ නිරොධ කථාවගේ සම්මාකාරයෙන් විතිශ්චයකථාව කියන ලද්දීය.

මෙවිට (ආයුෂ්විහාරවශයෙන්) වළඳනා සමාපත්තිය විචාරන සේක් **කතිපනා'වුසො! පච්චයා** යනාදිය කිහ. ශ්‍රමණයකුන් නිරොධයෙන් නැගිසිටිනා පලසමවත්හුගේ සිටීමක් නම් නො වේ ද, චිත්තවාර එකක් දෙකක් ම පැවත භවාඞ්ගයට බසි ද; සැබව- මේ මහණ සත්දිනක් අරූපධර්‍මයන්ගේ පැවැත්ම නිරුද්ධ කොට හුන්නේ නිරොධයෙන් නැගී සිටිනා පලසමවතෙහි කාලක් නො සිටී, යළි වළඳන්න සමාපත්තියෙහි කාලපරිච්ඡේදය ම ප්‍රමාණ වෙයි; එහෙයින් ඕ (වළඳන්න සමාපත්ති) ඕති නම් වෙයි; එයින් කිහ- **අනිමිත්තාය චෙතොවිමුත්තියා කිත්තියා** යනු; ඒ සමාපත්තියගේ විරසන්තිය පිණිස කෙතෙක් ප්‍රත්‍යයෝ වෙත් ද? යන අර්‍ථ යි. යළි ඒ පෘච්ඡාවගේ විසඳීමෙහි- **පුබ්බව අභිසඞ්ඛාරෝ**= කාලපරිච්ඡේදය; **වුට්ඨානාය** යි මෙහි භවාඞ්ගයාගේ උත්ථානය විචාරති; ඒ ප්‍රශ්නය විසඳීමෙහි ද- **සබ්බනිමිත්තානං ච මනසිකාරෝ** යි රූපාදි නිමිත්තයන්ගේ වශයෙන් භවාඞ්ගය හා සහජාත වූ මනසිකාරය කියන ලදි; **ආවා'සං ආයුසො!** යි මෙහි කුමක් විචාරත් ද? මෙහි අන්‍ය අනි භවතා ච්‍යෙක් නැති, යව කී ධර්‍මයන් ම එක්තැන රැස් කොට පුළුවුස්මි විචාරති; වැළි මේ ධර්‍මයෝ කවර තැනෙක්හි කියන ලද්දාහු ද? (කියන ලද්දේ) සැබව- **නිලම්පි සඤ්ඤානානි පීතකම්පි ලොහිතකම්පි ඔදාතම්පි සඤ්ඤානානි** යි මෙ තැන්හි අප්පමාණා චෙතොවිමුත්තිය කියන ලද්දීය; **නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං නෙය්‍යං** යි මෙහි ආකිඤ්චඤ්ඤායතනය කියන ලද; **පඤ්ඤාචක්ඛුනා පස්සනාති** යි මෙහි ශූන්‍යතා චෙතොවිමුත්තිය කියන ලදු; **කති පනා'වුසො! පච්චයා අනිමිත්තාය චෙතොවුට්ඨානාය** යන මෙහි අනිමිත්තා චෙතොවිමුත්තිය කියන ලදු; මේසේ යට කියන ලද්දාහු ම මේ තැන්හි එක්රැස් කොට විචාරති. වැළි එය ප්‍රතික්ෂේප කොට මොවුහු ඒ ඒ තැන දක්වන ලද්දාහු යයි කියා අනිත් සතර ධර්‍මකෙනෙක් එක් නම් ඇත්තාහු ඇති, එක් ධර්‍මයෙක් නම් සතරක් ඇත්තේ ඇතැයි මෙසේ ප්‍රකට කොට කිය වන්ට මෙහි විචාරති අටුවාවෙහි සනිටුහන් කරන ලදි. එය විසඳීමෙහි **අයං වුච්චතා දුසො! අප්පමාණාචෙතොවිමුත්ති** යි මෝ තොමෝ පැතිරීම් අප්‍රමාණ බැවින් "අප්පමාණා" නමු; සැබව- මෝ තොමෝ අප්‍රමාණ වූ, සත්වයන් කෙරෙහි හෝ පතුරුවයි, එක් සත්වයකු කෙරෙහි හෝ අශෙෂ කොට පතුරුවයි; **අයං වුච්චතා'වුසො! ආකිඤ්චඤ්ඤා**= **ආරම්මණ කිඤ්චන** (= පළිබොධ) යාගේ අභාවයෙන් "ආකිඤ්චඤ්ඤ" නමු;

අත්තෙන වා= ආත්මභාව - පුරුෂ - පුද්ගල සඞ්ඛ්‍යාත වූ ආත්මයෙන් ශූන්‍ය යැ; **අත්තනියෙන වා**= ඒවාරුදි පරිෂ්කාර සඞ්ඛ්‍යාත වූ ආත්මනීය (= තමා පිළිබඳ) යෙන් ශූන්‍ය යැ; **අනිමිත්තතා**= රාගනිමිත්තතාදීන්ගේ අභාවයෙන් "අනිමිත්තතා" නැමැ; අහිත්ඵල සමාපත්තිය සඳහා කියය. **නානත්තා චේව නානාබ්‍යඤ්ජනතා**= ඔවුන්ගේ ව්‍යඤ්ජනය ද අර්ථය ද විවිධ යැ; එහි ව්‍යඤ්ජනයාගේ නානාත්වය ප්‍රකට මැයි; අර්ථය වනාහි අපපමාණා චෙතොවිමුත්තිය භූම්‍යන්තර හෙයින් මහද්ගත වෙයි, රූපාවචර යැ, අරමුණු හෙයින් සත්ත්වප්‍රඥප්තිය අරමුණු කොට ඇත්තීය; ආකිඤ්චඤ්ඤායතන චෙතොවිමුත්තිය භූම්‍යන්තර හෙයින් මහද්ගත යැ, අරූපාවචර යැ ආරම්මණ හෙයින් නවකත්තව්‍යාරම්මණ යැ; ශූන්‍යතා චෙතොවිමුත්තිය භූම්‍යන්තර හෙයින් කාමාවචර යැ, අරමුණු හෙයින් සංඝකාරාරම්මණ යැ; ඒ එසේ මැයි- විදර්ශනා තොමෝ මෙහි "සුඤ්ඤතා" යි අදහස් කරන ලදුව; අනිමිත්තතා චෙතොවිමුත්තිය භූම්‍යන්තර හෙයින් ලොකොත්තර යැ, අරමුණු හෙයින් නිර්වාණාරම්මණ යි.

රාගො ඛො ආවුසො! පමාණකරණෝ යනාදියෙහි යම්සේ පළිත පාදයෙහි කළුපැහැති කුණුවූ කොළරසදිය නම් වේ ද, බලන්නවුන්ට බිය සියයක් ගැඹුරඇත්තාක් මෙන් වැටහේ ද, යවක් හෝ රූහැනක් හෝ ගෙන මනින්නහුට පිටිපය ගැලෙන පමණකුත් නො වේ ද; එපරිද්දෙන් යම්තාක් රාගාදීහු නුපදින් ද, ඒතාක් පුද්ගලයා හැඳින ගන්ට නො හැකි වෙයි, ස්‍රොතාපන්නයෙක් මෙන් ද සකෘදාගාම්යෙක් මෙන් ද අනාගාම්යෙක් මෙන් ද වැටහෙයි; එහෙත් යම් කලෙක ඔහුට රාගාදීහු උපදින් ද, එකල්හි රකුතයෙක දූෂ්‍යයෙක මූසයෙකැයි පැනෙයි; මෙසේ ඒ රාගාදීහු මේ තෙම මෙපමණ යයි පුද්ගලයාගේ ප්‍රමාණය දක්වන්නවුන් මෙන් උපදින් නුයි "පමාණකරණ" නමැයි කියන ලද්දාහුය. **යාවතා ඛො ආවුසො! අප්පමාණාචෙතොවිමුත්තිනිස්සෝ**= අපපමාණ චෙතොවිමුත්තීහු යම්තාක් වෙත් ද; වැළි ඔවුහු කෙතෙක් වෙත් ද? යත්:- සතර බ්‍රහ්මවිහාරයෝ යැ සතර ආරූපීයෝ යැ සතර ඵලයෝ යැයි දේශනාසෙකි; එහි බ්‍රහ්මවිහාරයෝ එරණයාගේ අප්‍රමාණ්‍යයෙන් අප්‍රමාණ යහ, සෙස්සෝ ප්‍රමාණ්‍යයෝයි; ප්‍රමාණය කරන්නාවූ කෙලෙසුන්ගේ අභාවයෙන් නිර්වාණය ත් අප්‍රමාණ මැයි; එහෙත් චෙතොවිමුත්තිය නො වෙයි; එහෙයින් නො ගත්තාලදි. **අකුප්පා**= අහිත්ඵල චෙතොවිමුත්තිය; යම් හෙයකින් ඕ ඔවුනතුරෙන් සියල්ලන්ට දෙවුවූවා ද, එහෙයින් අග්ගමක්ඛායති යි කියන ලද්දීය. **රාගො ඛො ආවුසො! කිඤ්චනෝ**= රාගය ඉපද පුද්ගලයා පෙළයි මඩි පලිබොධ කෙරෙයි, එහෙයින් "කිඤ්චන" යයි කියන ලද්දේය. මිනිස්සු ගොනුන් ලවා කමත මඩවන්නාහු කපිලය! මඩව කළුව! මඩව'යි කියත් ල. මෙසේ මැඩීම අර්ථය කිඤ්චනාථ යයි දතයුතු. දෙස - මොහයන්හි දු මෙ ම නයයි. ආකිඤ්චඤ්ඤායතනචෙතොවිමුත්තීහු නම් ආකිඤ්චඤ්ඤායතනය ද මාගී ඵලයෝ දූයි ධර්මයෝ නවදෙනෙකි; එහි ආකිඤ්චඤ්ඤායතනය කියි

අරමුණක් ඔහට නැත් නුසි "ආකිඤ්චඤ්ඤ" නම්; මාගීඵලයෝ කිඤ්චන වූ මඛත පළිබොධ කරන කෙලෙසුන් නැති බැවින් "ආකිඤ්චඤ්ඤ" නම් වෙති; නිට්ඨාණය ද "ආකිඤ්චඤ්ඤ" යැ, එහෙත් චෙතොවිමුත්ති නොවෙයි; එහෙයින් නොගන්නා ලදී. **රාහෝ බෝ ආවුසෝ! නිමිත්ත කරණෝ** යනාදියෙහි යම්සේ නම් කුල දෙකක්හුගේ සමාන වූ වස්සෝ දෙන්නෙක් වෙත් ද; යම්තාක් ඔවුන්ගේ (සතහි-ශූලාදි) ලක්ෂණයක් නොකරන ලද වේ ද, ඒ තාක් මේ අසවල් කුලයාගේ වසු යැ, මේ අසවල් කුලයාගේ යැයි දැනගන්ට නොහැකි වෙත් ද; යළි යම් කලෙක ඔවුන්ගේ සතහි-ශූලාදීන් අතුරෙන් එක්තරා ලක්ෂණයක් කරන ලද වේ ද, එ කල්හි දැනගන්ට හැකි වෙත් ද; එපරිද්දෙන් යම්තාක් පුදුගලයාට රාගය නුපදී ද, ඒ තාක් ආර්‍යයෙක් හෝ පෘථග්ජනයෙක් දෝ හොයි දැනගන්ට නොහැකි වෙයි; යම් හෙයකින් ඕහට රාගය උපදනේ ම මේ පුදුගල සරාගයෙක් නමැයි හැඳිනගන්නා නිමිත්ත කරමින් මෙන් උපදී ද; එහෙයින් "නිමිත්තකරණ" යයි කියන ලද්දේය. දෙස-මොහයන්හි ද මේ ම නයයි.

අනිමිත්තාචෙතොවිමුත්තියහු නම්- විදර්‍ශනාව යැ සතර ආරුප්‍යයෝ යැ සතර මාගීයෝ යැ සතර ඵලයෝ යැයි තෙළෙස් ධර්ම කෙනෙකි, එහි විදර්‍ශනා තොමෝ නිත්‍යනිමිත්ත යැ සුඛනිමිත්ත යැ ආත්මනිමිත්ත යැ (යන මොවුන්) උගුළුවා නුසි "අනිමිත්තා" නමු; සතර ආරුප්‍යයෝ රූපනිමිත්ත නැති හෙයින් අනිමිත්ත නම් වෙති; මාගීඵලයෝ නිමිති කරවූ කෙලෙස් නැති හෙයින් අනිමිත්ත නම් වෙති; නිට්ඨාණය ද අනිමිත්ත මැයි; එහෙත් එය චෙතොවිමුත්තිය නොවෙයි, එහෙයින් නොගන්නා ලදි. වැළි කුමක් හෙයින් ශූන්‍යතා චෙතොවිමුත්තිය නොගන්නා ලද්දේ ද? යත්- ඕ තොමෝ **සුඤ්ඤෝ රාගෙන** යනාදි වචන හෙයින් ඕයලු තැන්හි නොපිවිසියා මැයි. එහෙයින් චෙන ම නොගන්නා ලද්දීය, **එකඤා** යනු අරමුණු වශයෙන් එකාර්‍ථයෝ යැ; සැබව- "**අපපමාණ** යැ ආකිඤ්චඤ්ඤ යැ සුඤ්ඤත යැ අනිමිත්ත යැ" යන මේ ඕයල්ලෝ නිට්ඨාණයට ම නාමයෝ යැ; මෙසේ මේ ක්‍රමයෙන් එකාර්‍ථයෝ ගි. යළි අන් තැනක අප්‍රාමාණ්‍යයෝ වෙති, අන් තැනක ආකිඤ්චඤ්ඤ වෙති, අන් තැනක ශූන්‍යතා වෙති, අන් තැනක අනිමිත්තා වෙති මේ ක්‍රමයෙන් නානාව්‍යඤ්ජන ඇත්තාහුගි. මෙසේ තෙරුන් වහන්සේ අනුසන්ධි වූ පරිද්දෙන් ම දෙශනාව නිමවූ සේකි.

මහාවෙදල්ල සූත්‍ර වර්ණනා නිමි. (3)

———:+:———

චූලවෙදල්ල සූත්‍ර වණ්ණනා.

—:÷:—

එවං මෙ සුතං යි චූලවෙදල්ල සූත්‍රයයි. එහි **විසාඛො උපාසකො**= "විසාඛ" යයි මෙසේ නම් ඇති උපාසක තෙම; **යෙන ධම්ම දින්නා**= ධම්මදින්නා නම් මෙහෙණ යම් තැනෙක්හි ද එහි එළඹියේය. යළි මේ විසාඛ කවරෙක් ද? ධම්මදින්නා කවරක් ද? කුමක් හෙයින් පැමිණියේ ද? යත්:- විසාඛ නම් ධම්මදින්නාවගේ ගිහිකාල ගෘහස්වාමි තෙමේ යි. හෙතෙම යම් කලෙක භාග්‍ය වතුන් වහන්සේ සම්‍යක්සම්බොධිය අවබොධ කොට පවත්වන ලද උතුම් දම්සක් ඇති සේක් යසාදි කුල පුත්‍රයන් භික්මවමින් උරුවෙල්දනව්වට පැමිණ එහි දහසක් ජටිලයන් භික්මවා පුරුණ ජටිල වූ කශ්‍යපාශ්‍රව භික්ෂූන් සමග රජගහනුවරට ගොස් බුදුන් දක්නා පිණිස දෙලොස් නහුතයක් පිරිස සමග පැමිණි බිම්සර මහරජුට දහම් දෙසූසේක් ද; එකල රජු සමග පැමිණියා වූ දෙලොස් නහුතය අතුරෙන් එක් නහුතයක් උපාසකබව දන්විය; එසකාලොස් නහුතයක් බිම්සර රජු සමග සෝවාන්පෙලෙහි පිහිටියාහුය; මේ උපාසක ඔවුනතුරෙන් එකෙක. ඔවුන් සමග ප්‍රථමදර්ශනයෙහි ම සෝවාන් පෙලෙහි පිහිටා නැවත එක් දිනක් බණ අසා සකෘදාගාම්ඵලයට පැමිණ එයින් පසු කලෙක ද එක් දිනක් බණ අසා අනාගාම්ඵලයෙහි පිහිටියේය. හෙතෙම අනාගාමී ව හෙව් එන්නේ යම්සේ අන් දිනයන්හි ඔබ නොබ බලමින් සතුටු පහළ කරමින් සිනාසෙමින් එන්නේ ද, එසේ නො අවුත් සන්සිදුණු ඉඳුරන් ඇති ව සන්සිදුණු සිත් ඇති ව ආයේය; ධම්මදින්නා තොමෝ සිවැදුර හැර විපිය බලමින් ඔහු එන ආකාරය දැක "මේ කිමෙක් දෝ හෝ" යි සිතා ඔහුට පෙරගමන් කරන්නී හිතිමත සිට එල්බගන්නා පිණිස අත දිගු කෙළේය; උපාසක තුමාගේ අත හැකිළීය. ඕ තොමෝ "උදෑසන ආහාර වළඳන කල දැනගන්නෙමි" සිතී; උපාසක පෙර ඇ සමග එකතු ව වළඳයි; එ දවස වනාහි ඇ නො බලා යොගාව චර මහණකු මෙන් එකලාව ම වැළඳීය; ඕ "නිදන කල දැනගන්නෙමි" සිතී; උපාසක එදවස් සිරිගබට නො පිවිසියේය; අනිත් ගබක් පිළි දැගුම් කරවා කැප ඇඳක් පනවවා හොත්තේය. උපාසිකා "කිමෙක් දෝ හෝ මොහුගේ පිටත ප්‍රාර්ථනාවක් ඇත් ද, නොහොත් කිසියම් පිසුනු කියන්නකු විසින් බිඳුවන ලද්දේ ද, නොහොත් මාගේ ම කිසි දෙසෙක් ඇත් දැ" යි බලවත් දෙමනස් ඇති ව "එක් දෙ දවසක් විසූ කල දැනගන්ට හැක්කැ" යි ඔහුට උපසථාගයට ගොස් වැඳ සිටියා උපාසක "කිම ධම්මදින්නාවෙනි! නො කල්හි ආවනැ?" යි විචාළේය, "එසේය සඩාමිපුත්‍රය! ආවෙමි, නුඹ පෙර මෙන් වූයේ නො වෙහි, කිම නුඹගේ පිටත ප්‍රාර්ථනා ඇත් දැ?" යි; "නැති ධම්මදින්නාවෙනි! "අන් කිසි පිසුන

කියන්නෙක් ඇත් ද?" යි; "මේ ද නැතැ" යි; "මේසේ ඇති කල මාගේ ම කිසි දෙසෙක් වන්නේ ද" යි; තොපගේ ත් දෙසෙක් නැතැ" යි; "එකල්හි කුමක් හෙයින් මා සමග පියවිලෙසින් අල්ලාප සල්ලාප මාත්‍රය කු දු නො කරන්නහු ද?" යි. තෙතෙම මෙසේ සිතී:- "මේ ලොවුතුරු දහම් නම් ගරු යැ බැරි යැ නො පැවසියයුතු යැ, එහෙත් ඉදින් මම නො කියම්නෙම් නම් මෝ තොමෝ ළය පලා මෙහි ම කලුරිය කරන්නේය" යි ඇව අනුග්‍රහ පිණිස කියේය- "ධම්ම දින්නා වෙනි! මම ශාස්තෘන්ගේ ධර්මදේශනාව අසා ලොවුතුරු දහමට පැමිණියෙම් නම් වෙමි, ඊට පැමිණියහුට මෙබඳු ලෞකික ක්‍රියා නො වටී; ඉදින් තී කැමැත්තෙහි නම් තීගේ සතලිස් කොටියෙක, මාගේ සතලිස් කොටි යෙහෙයි අසූකෙළක් ධනය ඇති, මේ ධනයෙහි ඉසුරු ව මාගේ මවු තැන්හි හෝ නැහණිතැන්හි හෝ සිට වාසය කරව, තී දුන් බත් පිඬු පමණකින් මම යැපෙන්නෙම්; වැළි එසේ නොකෙරෙහිනම්, මේ හොග ගන් ගෙන කුලගෙට යව; වැළි ත් තීගේ පිටත ප්‍රාර්ථනා ඇත් නම්, මම තී නැහණිතැන්හි හෝ දුවණිතැන්හි හෝ තබා පොෂණය කරන්නෙමි" ඔ තොමෝ මෙසේ සිතූ:- "පියවි පිරිමියෙක් මෙසේ කියන්නෙක් නම් නැති, නියතින් මොහු විසින් ලොවුතුරුදහම් ලබන ලද, වැළි ඒ දහම් කිම පුරුෂයන් විසින් ම ප්‍රතිවෙධ කළ යුතු ද? නොහොත් මාගමක් නමුත් ප්‍රතිවෙධ කරන්ට හැකි වේ ද?" යි; විසාඛට මේ කිව- "කිමෙක් දෝ හෝ මේ දහම් පුරුෂයන් විසින් ම ලැබිය යුතු ද? මාගමක් විසිනු දු ලබන්ට හැකි ද" යි. "ධම්මදින්නා! කුමක් කියයි ද? යම් තෙනෙක් පිළිපන්නාහු ද, ඔවුහු මේ දහමට දායාදයෝය, යම් යම් තෙනෙකුට උපනිශ්‍රය ඇත් ද, ඒ ඒ (පුරුෂ) මෙය ලබා" යයි. "එසේ ඇති කල්හි මව පැවිද්දට අවසර දෙව" යි. "මැනව සොදුර! මම ත් මේ මහ මැ යොදනු කැමැත්තෙම්, එහෙත් තීගේ සිත නො දන්නෙම් නො කියමි" එකෙණෙහි ම බිම්සර රජු සමීපයට ගොස් වැඳ සිටියේය. රජ තෙම "කිම ගෘහපතිය! නො කල්හි ආවනැ?" යි විචාළේය. "මහ රජ! ධම්මදින්නා පැවිදි වන්නෙමි කියා ය" යි; වැළි ඇව කුමක් ලබන්ට වටී ද?" යි; "අන් කිසිවක් නැත, දෙවඟනි! සවණ්ඩිසිවිකාවක් ලබන්ට වටී, නුවර ත් පිළිජගින්නට වටී" යයි. රජ තෙම ශවණ්ඩිසිවිකාවක් දී නුවර පිළිදුගුම් කරවී; විසාඛ තෙම ධම්මදින්නා හඳදියෙන් නාවා සියලු අබරණින් සරසවා සවණ්ඩිසිවිකාවෙහි හිඳුවා ඥාතිසමූහයන් පිරිවර කරවා හඳමල් ආදියෙන් පූජා කරවමින් නුවර ඍාසනය (= බැබළීම් හෝ වැසීම) කරන්නෙකු මෙන් මෙහෙණඅසපුවට ගොස් "ආර්‍යාවෙනි! ධම්මදින්නා වන් පැවිදි කළ මැනවැ" යි කීය. භික්ෂුණීහු- "ගෘහපතිය! එකක් හෝ දෙකක් හෝ දෙස් ඉවසන්ට වටී" යයි කීවාහුය. "ආර්‍යාවෙනි! කිසි දෙසෙක් නැති, සැදුහැයෙන් පැවිදි වේ" යයි. එකල ව්‍යක්ත වූ එක් තෙරණියක් "තවපඤ්චක" කම්මට්ඨානය කියවා කෙස් බහා පැවිදි කර

වූය. විසාඛ තෙම "ආයුෂ්මාවෙනි! සිත් අලවා වාසය කරවු, ධර්මය සවාකඛාත යැ" යි වැද නික්මගියේය. ඈ පැවිදි වූ දින පටන් ලාභ සත්කාරය උපන, එයින් පීඩිත වූවා මහණදම් කරන්ට අවකාශ නො ලබයි; එකල ආචාර්‍ය්‍ය-උපාධ්‍යාය සථවිරින් ගෙන දනව්වට ගොස් අට හිස් අරමුණු අතුරෙන් සිතට රුචි වූ කමටහනක් කියවාගෙන මහණ දම් කරන්ට පටන් ගත්තා. තවද- අභිනීහාරසම්පන්න බැවින් ඉතා බොහෝ කලක් කලාන්ත නො වීය; ඒ එසේ මැයි- මෙහි පටන් කල්ප ලක්‍ෂයකින් මත්තෙහි පියුමතුරා නම් ශාස්තෘන් වහන්සේ ලොව පහළවූ සේක, එකල මෝ තොමෝ එක් කුලයක දැසි ව තමාගේ කෙස් විකොට අග්‍රශ්‍රාවක වූ සුජාත නම් තෙරුන්ට දන් දී ප්‍රාර්ථනා කළා; ඕ තොමෝ ඒ ප්‍රාර්ථනාභිනීහාරසම්පත්තියෙන් ඉතා බොහෝ කලක් කලාන්ත නො වීය. කිපදිනකින් ම රහත්බවට පැමිණ (මෙසේ) සිහිවිය:- "මම යම් ප්‍රයෝජනයක් කරණකොට ශාසනයෙහි පැවිදි වූමි ද, ඒ අර්ථය මුදුන් පැමිණියේ වන, මට ජනපදවාසයෙන් කිම? මාගේ නෑයෝ ත් පින් කරන්න! හුය, භික්‍ෂූණීසඞ්ඝයා ත් ප්‍රත්‍යයන්ගෙන් නො වෙහෙසෙන්නේය, රජගහනුවරට යෙමි" භික්‍ෂූණී සඞ්ඝයා ගෙන රජගහ නුවරට ම ගියේය. විසාඛ තෙම "ධම්මදින්නා ආවා ය" යි අසා "පැවිදිව නොබෝකලකින් ම දනව්වට ගියා, ගොස් ද නො බෝකලකින් ම පෙරළා ආය, කුමක් වන්නේ දෝ හෝ ගොස් දැනගන්නෙමි" දෙවෙනි ගමනින් මෙහෙණ අසපුවට ගියේය. එයින් කියන ලදි- **"අථ ඛෝ විසාඛෝ උපාසිකා ඉමා ධම්මදින්නා භික්ඛුනී නෙතුපසඞ්කමි"** යනු.

එතදවොච= මේ "සකකායෝ" යනාදි වචනය කීය. කුමක් හෙයින් කීයේ ද? යත්- ඔහුට මේ සිත වී ය:- "ආයුෂ්මාවෙනි! සිත් ඇලවා වෙසෙයි ද? නො වෙසෙයි ද? යි මෙසේ විචාරීම නම් පණ්ඩිතයන්ගේ කටයුත්තක් නො වෙයි; පසෙඳෑපාදුනසඤ්ඤයෙහි එළවා පැන පුළුවුස්නෙමි, පැන විසදීමෙන් ම ඇගේ අභිරතිය හෝ අනභිරතිය හෝ දැනගන්නෙමි" එහෙයින් කීය. ඒ අසා ධම්මදින්නා තොමෝ "ඇවැත්නි! විසාඛා මම පැවිදි වූ නො බෝකල් ඇතියා වෙමි, සවකාය හෝ පරකාය හෝ කොයින් දැනගන්නෙම් ද?" යි හෝ "අන්‍යසථවිරින් කරා එළඹ විචාරව" යි හෝ නො කියා ප්‍රවෙශම් කොට තබන ලද්දක් පාවාදෙන්නක මෙන් එක් පාශයක් ඇති ගැටයක් මුදන්නක මෙන් කැලයෙන් වැසුණු කැනක ඇත්මග බැහැර කරන්නක මෙන් කඩුතුඩින් පෙට්ටියක් විවෘත කරන්නක මෙන් ප්‍රතිසංවිද්විශයෙහි සිට පැන විසඳන්නී- **පඤ්ච ඛෝ ඉමෙ විසාඛ! උපාදානක්ඛන්ධා** යනාදිය කීය. එහි **පඤ්ච** යනු ගණන පිරිසිදීම යැ; **උපාදානක්ඛන්ධා**= උපාදානයන්ට ප්‍රත්‍යය වූ සඤ්ඤායෝ යයි මේ ආදිනයින් මෙහි උපාදානසඤ්ඤ කථාව විස්තර කොට කියයුතු වන්නීය, යම්හෙයකින් ඕ මෝ සඤ්ඤකථා විශුද්ධිමාර්ගයෙහි විස්තර කරන ලද්දී ම වේ ද. එහෙයින් එහි විස්තර කළ නයින් ම දනයුත්තීය.

සක්කායසමුදය ආදියෙහි දු යමක් කියයුතු නම් එය ඒ ඒ තැන කියන ලද මැයි. යළි මේ චතුස්සත්‍ය ප්‍රකාශ කිරීම අසා විසාඛ තෙම සථවිරින්ගේ (ශාසනයෙහි) ඇලුණුබව දැනගත්තේය. යම් හෙයකින් යමෙක් බුදුසසුන්හි උකටලි වූයේ වේ ද, අනභිරත වූ මහතෙම මෙසේ ඇසු ඇසු පැන අඹුවකින් එක් නරකෙසක් ගන්නකු මෙන් මෙරපත් ලෙන් වැලි නහන්නකු මෙන් විසඳන්ට නො හැකි වේ ද, යළි යම්හෙයකින් මේ සිවුසස් ලෙව්හි සඳහිරු මෙන් බුදුසසුන්හි ප්‍රකට වෙත් ද; යම් හෙයකින් සිවුපිරිස් මැදට වන් භාග්‍යවතුන් වහන්සේ ත් මහතෙරහු ත් සිවුසස් ම පවසත් ද, භික්ෂුසඞ්ඝයා ත් පැවිදි වූ දින පටන් කුලදරුවන්ට "චත්තාරි නාම කිං? චත්තාරි අරියසච්චානි" යි ප්‍රශ්නය උගන්වා ද; මේ ධම්මදින්නා තොමෝ ත් උපාසකකුලයාගේ දුවණි වූවා පණ්ඩිත වූවා ව්‍යක්ත වූවා නය ගෙන ශ්‍රැතයෙහු දු කියන්ට සමර්ථ වූවා ද; එහෙයින් මේතෙකින් මැගේ සත්‍යයන් ප්‍රතිවෙධ කළබව දැනගන්ට නො හැක්ක, වැළි සත්‍යවිභාගප්‍රශ්නය විසඳීමෙන් දැනගන්ට හැක්කැ" යි සිතා "යට කී සත්‍ය දෙක නවතා ගුඪ කොට ග්‍රන්ථිප්‍රශ්නයක් පුළුවුස්නෙමි" විචාරන්නේ- **තං කෙව නු ඛො අයෙ!** යනාදිය කිය. එය විසඳීමෙහි **න ඛ්‍ව ආවුසො! විසාඛ! තංයෙව උපාදානං=** උපාදානය තමා සංසකාරස්කන්ධයාගේ එකදෙශයක් බැවින් ඒ උපාදානය ම ඒ පඤ්චස්කන්ධයෝ නො වෙති; පඤ්චොපාදානස්කන්ධයන් විනා උපාදානයෙක් නො ද ඇති; ඉදින් යම්හෙයකින් එය ම වන්නේ නම් (එකල්හි) රූපාදිස්වභාවය ත් උපාදාන වන්නේ ද; ඉදින් (උපාදානස්කන්ධයන්) විනා (උපාදානය) වන්නේ නම් (එකල්හි) පරසමයෙහි සිතින් වෙන්වූ අනුසය මෙන් ද ප්‍රඥප්තිය මෙන් ද නිර්‍වාණය මෙන් ද සන්තතියෙන් තොර වූයේ හෝ වන්නේ ද; සවෙනි සන්තතියක් හෝ පැනවිය යුත්තේ වන්නේ ද; එහෙයින් මෙසේ ප්‍රකාශ කෙළේය. ඇගේ විසඳීම අසා "මෝ තොමෝ පැමිණි ප්‍රතිවෙධ ඇත්තී ය" යි විසාඛ තෙම නිඝණ්ඨාවට ගියේය:- "**ඝණිණාග්‍රව** නො වූවකු නො ගැටෙන්නහු ව්‍යාකුල නො වන්නහු විසින් පහන් දහසක් දල්වන්නකු විසින් මෙන් මෙබදු වූ සැහවුණු වැසුණු තිලකුණෙන් මඬනා ලද ගැඹුරු වූ ප්‍රශ්නයෙක් විසඳන්ට නො ම හැක්කැ" යි. නිඝණ්ඨාවට හොස් නැවත "මෝ ධම්මදින්නා ශාසනයෙහි ලද ප්‍රතිඥා ඇත්තීය, අධිගත වූ පටිසිඹියා ඇත්තීය, විශාරදබවට පැමිණියාය, භවය නසන ලද්දීය, මහාඝණිණාග්‍රව වූවාය; මා පුළුවුත් පුළුවුත් ප්‍රශ්නය කියන්ට සමර්ථ වන්නීය" යි (සිතීය.)

මෙවිට යළි ඔවට්ටිකසාරය කොට ප්‍රශ්නය සිතා එය පුළුවුස්නේ- **කථං පන'යෙ!** යනාදිය කිය. එය වීසඳීමෙහි **අසඝුනවා** යනාදිය මූලපරියාය සූත්‍රයෙහි විස්තර කරන ලද මැයි. **රූපං අත්තා නො සමනුපස්සති** යනු "මෙලොව්හි කිසිවෙක් රූපය ආත්ම වශයෙන් දකී, යමක් රූපය ද හේ මම යැ, යමෙක් මම වෙම් ද එය රූප යැ,යි රූපය ත් ආත්මය ත් දෙකක් නො කොට

දකී; දුල්වෙන තෙල්පහනක්හුගේ යම් ගිනිසිළුවක් වේ ද, හේ වණ්ණය ය, යම් වණ්ණයෙක් වේ ද, ඕ ගිනිසිළැ,යි ගිනිසිළුව ත් පැහැය ත් යම්සේ නම් අවය කොට දකී ද; එපරිද්දෙන් මෙලෙව්හි කිසිවෙක් රූපය ආත්මවශයෙන් —පෙ— අවය කොට දකී" යයි මෙසේ රූපය ආත්මය,යි දෘෂ්ටි දර්ශනයෙන් දකී; ආත්මය රූපවත් යයි හෝ අරූපය ආත්මය,යි ගෙන ඡායාවත් වෘක්ෂය මෙන් රූපවත් ආත්මය දකී. **අත්තනිවා රූපං**= අරූපය ම ආත්මය,යි ගෙන මලෙහි සුවඳ මෙන් ආත්මයෙහි රූපය දකී; **රූපස්මිං වා අත්තානං**= අරූපය ම ආත්මය,යි ගෙන භරඬුවෙහි මැණික මෙන් ආත්මය රූපවිශයෙහි (ඇතැයි) දකී. **වෙදනං අත්තතෝ** යනාදියෙහි ද මෙ ම නයයි. එහි "**රූපං අත්තතෝ සමනුපස්සති**" යි ශුඛ රූපය ම ආත්මය,යි කියන ලදී. "**රූපවන්තං වා අත්තානං, අත්තනි වා රූපං, රූපස්මිං වා අත්තානං, වෙදනං අත්තතෝ- සඤ්ඤං- සඞ්ඛාරෙ- විඤ්ඤාණං අත්තතෝ සමනුපස්සති**" යන මේ සත් තැන්හි අරූපය ආත්මය,යි කියන ලදී. "**වෙදනාවන්තං වා අත්තානං, අත්තනි වා වෙදනං, වෙදනාය වා අත්තානං**" යි මෙසේ සතර සක්කායන්හි තුනක් තුනක්හුගේ වශයෙන් දෙළොස් තැනෙක්හි රූපා රූපමිශ්‍ර වූ ආත්මය කියනලද්දේය. එහි "**රූපං අත්තතෝ සමනුපස්සති, වෙදනං- සඤ්ඤං- සඞ්ඛාරෙ- විඤ්ඤාණං අත්තතෝ සමනුපස්සති**" යි පස් තැනෙක්හි උවෙදදෘෂ්ටිය කියන ලද්දීය; සෙසු තැන්හි ශාශ්වතදෘෂ්ටිය කියන ලද්දීය,යි මෙසේ මෙහි භවදෘෂ්ටි පසළොසක් ද විභවදෘෂ්ටි පසක් ද වෙත්. **න රූපං අත්තා** යන මෙහි රූපය ආත්මය,යි (තෘෂ්ණාදි වශයෙන්) නො දකී, අනිත්‍ය ය, දුඃඛ ය, අනාත්ම යැයි (විදසුන්ඤණින්) දකී. **න රූපවන්තං අත්තානං —පෙ— න විඤ්ඤාණස්මිං අත්තානං**= මේ පඤ්චස්කන්ධයන් කිසි ප්‍රකාරයකින් ආත්ම වශයෙන් නො දකී නුයි; යම් සියලු ආකාරයෙන් අනිත්‍යයෝ ය, දුඃඛයෝ ය, අනාත්මයෝ යැයි දකී. **මේතෙකින් සථවිරින් විසින් එවං ඛෝ ආවුසෝ! විසාඛ! සක්කායදිට්ඨි හොති** යි මෙසේ පළමු ප්‍රශ්නය විසඳන්නීය **මේතෙකින්** ගමනය වෙයි, ආගමනය වෙයි, ගමනා ගමනය වෙයි, (සංසාර) වතීය පවතී යයි වතීය මුදුන් පමුණුවා දක්වන ලදි; **එවං ඛෝ ආවුසෝ! විසාඛ! සක්කායදිට්ඨි න හොති** යි සප්වැනි ප්‍රශ්නය විසඳන්නීය, මේතේකින් ගමනය නො වෙයි, ආගමනය නො වෙයි, ගමනා ගමනය නො වෙයි, වතීය නො පවතී යයි වතීය මුදුන් පමුණුවා දක්වන ලදී.

කතමෝ පන'ආයස්ම! අරියෝ අට්ඨඞ්ගිකෝ මග්ගෝ? යන මේ ප්‍රශ්නය සථවිරින් විසින් නැවත විවාරා විසඳිය යුතු වන්නේය— "උපාසකය! තොප විසින් යම් මාගීය විවාරන ලද, මෙහි කුමක්හෙයින් මාගීය ම විවාරසි ද?" යි එහෙත් ඕ තොමෝ තමා ව්‍යකත බැවින් පණ්ඩිත බැවින් ඔහුගේ අදහස සැලකිය- "මේ උපාසකයා විසින් යම් පිළිවෙන් වශයෙන් මාගීය විවාරනලද්දේ වන්නේය, මෙහි යම් ඒ මාගීය සංඛෘතය

සංසකෘත- ලෞකික- ලොකොත්තර- සංගෘහීතා සංගෘහීත වශයෙන් විචාරනු කැමැත්තේ වන්නේ ය" යි; එහෙයින් නො පිළිවිස ම යමක් යමක් විචාළේ නම් ඒ ඒ ප්‍රශ්නය විසඳීය. **එහි සඞ්ඛතෝ**= සිතන ලද සලකන ලද භාත්පසින් සලකන ලද රැස්කරන ලද උපදවන ලද පැමිණෙන්නහු වීසින් පැමිණියයුතු යයි.

තීහි ච බො ආවුසො! විසාඛ! ඛන්ධෙහි අරියෝ අට්ඨඞ්ගිකෝ මග්ගෝ සඞ්ගහිතෝ යන මෙහි යම්හෙයකින් මාගීය සප්‍රදෙශ ද තුන් සකඤ්ඤෝ නිෂ්ප්‍රදෙශයෝ ද, එහෙයින් මේ මාගීය සප්‍රදෙශ (ශීලසකඤ්ඤාදීන්ගේ අතුරෙන් එක්දෙසක් සහිත) බැවින් නගරය (නිෂ්ප්‍රදෙශ වූ) **රාජ්‍යයෙන් මෙන් නිෂ්ප්‍රදෙශ වූ තුන් සකඤ්ඤයන් කරණකොට සඞ්ග්‍රහ** කරන ලද්දේය. එහි සම්‍යග්වචනාදි තිදෙන ශීලය මැයි; **ශීලසකඤ්ඤය.** එහෙයින් ඔවුහු සමාන ජාති වශයෙන් ශීලසකඤ්ඤයෙන් සඞ්ග්‍රහ කරන ලද්දාහුය; වැළිදු එකෙක් ඇති- පාලියෙහි "සීලකඤ්ඤෙ" යි ආඛ්‍යාරයෙන් මෙන් නිර්දේශ කරන ලද්දේය, **එහෙත් අර්ථය කරණවශයෙන් දතයුතු.** නැවත සම්‍යග්ව්‍යායාමාදි තුනෙහි සමාධිය තමාගේ ප්‍රකෘතියෙන් අරමුණෙහි එකඟ බැවින් **සමාධිසකඤ්ඤය.** පිහිටා සිටින්ට නො හැකි වෙයි, යළි ඒ්‍යීයය ප්‍රග්‍රහකෘත්‍යය සිදුකරන කල්හි සමෘතිය ත් අපිලාපනකෘත්‍යය සිදුකරන කල්හි ලද උපකාර ඇති ව හැකි වෙයි. එහි මෝ උපමා යැ:— ඒ මෙසේයි- නකත් කෙළින්නෙමු,සි උයනට පිවිසි යහළුවන් තිදෙනකු අතුරෙන් එකෙක් සුපිපි සපුරුකක් දැක අත ඔසොවා ත් ගන්ට නො හැකි වන්නේය, එකල්හි දෙවැන්නා පහතවනැමී ඔට දෙන්නේය, හෙතෙම ඔහුගේ ඔට සිට ත් වෙවුලමින් ගන්ට නො හැකි වන්නේය, එකල ඕහට අනිකා උරහිස එළවන්නේය, හෙතෙම එකෙකුගේ පිදෙහි සිට එකෙකුගේ උරහිස එල්බගෙන කැමතිසේ මල් නෙලාගෙන පැළඳ නකත් කෙළින්නේය; මෙ කරුණ එපරිද්දෙන් දතයුතු. ඒ එසේමැයි- එක්ව උයනට පිවිසි යහළුවන් තිදෙනා මෙන් එක්ව උපන් සම්‍යග්ව්‍යායාමාදි තුන් ධර්‍මයෝ යැ, සුපිපි සපුගස මෙන් අරමුණ යැ, අත ඔසොවා ත් ගන්ට නො හැකි වූවහු මෙන් තමාගේ ප්‍රියත්වයින් අරමුණෙහි එකඟ බැවින් පිහිටා සිටින්ට නො හැකි වූ සමාධිය යැ; පිට දී පහතට නැමුණු යහළුවා මෙන් ව්‍යායාමය යැ, උරහිස දී සිටි යහළුවා මෙන් සමෘතිය යැ; යම්සේ ඔවුනතුරෙන් එකෙකුගේ පිටෙහි සිට එකෙකුගේ උරහිස එල්බගෙන අනිකා රුවිසේ මල් නෙලාගන්ට හැකි වේද, එපරිදෙන් ඒ්‍යීය ප්‍රග්‍රහකෘත්‍යය ද සමෘතිය අපිලාපනකෘත්‍යය ද සිදුකරන කල්හි ලද උපකාර ඇති සමාධිය අරමුණෙහි එකඟ බැවින් පිහිටා සිටින්ට හැකි වෙයි; එහෙයින් සමාධිය ම මෙහි සමාන ජාති වශයෙන් සමාධිසකඤ්ඤයෙන් සඞ්ග්‍රහ කරන ලද්දේය; ව්‍යායාම-සමෘතීහු වනාහි ක්‍රියාවශයෙන් සඞ්ග්‍රහ කරන ලද්දාහු වෙත්.

සම්‍යග්දෘෂ්ටි-සංකල්පයන් අතුරෙහි දු ප්‍රඥා තොමෝ තමාගේ ධර්මතාවෙන් අනිත්‍ය යැ දුඃඛ යැ අනාත්ම යැ,යි අරමුණ නිශ්චය කරන්ට නො හැකි වෙයි; යළි චිතක්‍රීය (අරමුණ) හාත්පසින් එළවා එළවා දෙන කල්හි හැකි වෙයි. කෙසේ ද? උපමා මෙසේයි:- රන්කරු තෙම කහවණුව අතෙහි තබා සියලු කොවස් බලනු කැමති වූයේ නමුදු ඇසේ බලයෙන් ම පෙරළන්ට නො හැකි වෙයි, වැළි ඇඟිලිපුරුක්වලින් පෙරළා ඔබිනොබ ද බලන්ට හැකි වෙයි; එපරිද්දෙන් ප්‍රඥා තමාගේ පියවින් අනිත්‍යාදි වශයෙන් අරමුණු නිශ්චය කරන්ට නො හැකි වෙයි; යම්හෙයකින් අභිනිරොපණය (= අරමුණට අභිමුඛ කොට නැංවීම) ලක්ෂණ කොට ඇති ආහනන-පරියාහනනය (= තැළීම හාත්පසින් තැළීම) කෘත්‍ය කොට ඇති චිතක්‍රීය විසින් එළවන්නකු මෙන් ද පෙරළන්නකු මෙන් ද (ළඟට) ගෙන ගෙන දෙන ලද්දම නිශ්චය කරන්ට හැකි වේද; එහෙයින් මෙහි ද සම්‍යග්දෘෂ්ටිය ම සමානජාති වශයෙන් ප්‍රඥාසකඞ්ගයෙන් සඞ්ග්‍රහ කරන ලද්දීය; සම්‍යක් සංකල්පය වූ කලි ක්‍රියා හෙයින් සඞ්ග්‍රහ කරන ලද්දේ වේ. මෙසේ මේ තුන් සකඞ්ගයන් කරණකොට මාර්ගය තෙමේ සඞ්ග්‍රහයට පැමිණෙයි. එයින් කියන ලදී- **හිඟි ච භික්ඛවෝ ආවුසෝ! විසාඛ! ඛක්ඛිති අරියෝ අට්ඨඞ්ගිකෝ මග්ගෝ සඞ්ගහිතෝ** යනු.

දැන් එකචිත්තක්ෂණික වූ නිමිති රහිත වූ පිරිවර සහිත වූ මාර්ගසමාධිය පුළුවුස්නේ- **කතමෝ පන'ආයස්මා!** යනාදිය කියා. එය විසඳීමෙහි සතර සතිපට්ඨානයෝ මාර්ගක්ෂණයෙහි (කායානුපස්සනාදි) සතරකිස සිදු කිරීම් වශයෙන් උපන් සමෘතිය සමාධියට ප්‍රත්‍යයාදියෙන් නිමිති වෙති; සතර සම්‍යක්ප්‍රධානයෝ සතර කෘත්‍යයන් සිදුකිරීම් වශයෙන් ම උපන් වීර්‍යය යි, එය පරිවාරාදියෙන් පරිෂ්කාර නම් වේ. **තෙසං යෙව ධම්මානං** ඒ මාර්ගසම්ප්‍රයුක්ත ධර්මයන්ගේ; **ආසෙවනා** යනාදියෙහි **එකචිත්තක්ඛණිකා වූ** ම ආසෙවනාදීහු කියන ලද්දාහුය. එකෙක් ඇති- විරුද්ධවාදී තෙම- "**එකචිත්තක්ඛණිකා** වූ මාර්ගයෙක් නම් නැති, ඒ එසේ මැයි- **එවං භාවෙත්‍ය ඝතත වස්සානි** යි වදාළ හෙයින් සත් වසකු දු මාර්ගභාවනාව වෙයි; වැළි කෙලඹයෝ වහා සිඳෙන්නාහු සේ (අනුපස්සනා) ඥානයෙන් සිඳෙති" කියා නම්, හෙතෙම "සූත්‍රයක් එළවා කියව" යි කියයුත්තේය; එකානන්තයෙන් අනික් සූත්‍රයක් නො දක්නේ "**යා තෙසංයෙව ධම්මානං ආසෙවනා භාවනා බහුලීකම්මං**" යි ගෙනැර අන් සිතකින් ආසෙවනය කෙරෙයි, අන් සිතකින් වඩයි, අන් සිතකින් බහුල කෙරේ ය,යි කියයි; එවිට (මෙසේ) කියයුතුයි- "කිම මේ සූත්‍රය නෙයාර්‍ථ ද? නීතාර්ථ ද?" යි; එවිට- "නීතාර්ථ යැ, සූත්‍රය යම්සේ ද, එසේ ම අර්ථය වේ ය" යි කියන්නේය, ඔහුගේ මේ උත්තර යයි; මෙසේ කල සෙවනය කරමින් උපන් එක් සිතෙක, සෙවනය කරමින් අනිකු දු සිතෙක. සෙවනය කරමින් අනිකු දු සිතෙකැ,යි මෙසේ දවසකු ත් ආසෙවනය ම වන්නේය,

වැඩීමක් කොයින් ද? බහුල කිරීමක් කොයින් ද? නොහොත් වඩමින් උපන් එක් සිතෙක, වඩමින් අනිකු දු සිතෙක, වඩමින් අනිකු දු සිතෙකැ, යි මෙසේ දවසක් භාවනාව ම වන්නේය, ආසෙවනයක් කොයින් ද? බහුලකිරීමක් කොයින් ද? නොහොත් බහුලකරමින් උපන් එක් සිතෙක, බහුලකරමින් අනිකු දු සිතෙක, බහුලකරමින් අනිකු දු සිතෙකැ, යි මෙසේ දවසකු ත් බහුලිකරණය ම වන්නේය, ආසෙවනයක් කොයින්ද? භාවනාවක් කොයින් දැ? යි; නොහොත් මෙසේ කියන්නේ නම්:- එක් සිතකින් සෙවනය කෙරෙයි, දෙ සිතකින් වඩයි, තුන් සිතකින් බහුල කෙරෙයි; දෙසිතකින් හෝ සෙවනය කෙරෙයි, තුන් සිතකින් වඩයි, එක් සිතකින් බහුල කෙරෙයි; තුන් සිතකින් හෝ ආසෙවනය කෙරෙයි, එකකින් වඩයි, දෙ සිතකින් බහුල කෙරේ යයි; හෙතෙම (මෙසේ) කියයුත්තේය:- "මා විසින් සූත්‍රයක් ලදුයි යම් ඒ මුඛාරූඪයක් නොකියව, ප්‍රගුණ විසඳන්නහු විසින් නම් ඇදුරන් සමීපයෙහි වැස බුදුවදන් ඉගෙන අරුත්රස විඳ කියයුතු වෙයි; මෝ ආසෙවනා එකචිත්තක්ඛණික මැය, භාවනා එකචිත්තක්ඛණික යැ, බහුලිකමීය එකචිත්තක්ඛණික යි; ක්ෂයගාමී වූ ලොකොත්තරමාගීය බහුචිත්තක්ඛණික වූයේ නම් නැති, එකචිත්තක්ඛණික වූයේ මයැ" යි හැඟවිය යුත්තේය; ඉදින් හඟනේ නම් හඟීවා; ඉදින් නොහඟනේ නම් "යව උදුසන ම විහාරයට පිවිස කැඳ පොව" යි යැවිය යුත්තේය.

කති පන'ඤ්ඤ! සඞ්ඛාරා? යි මෙහි කුමක් විචාරා ද? යම් සංස්කාර කෙනෙක් නිරුඬ කොට නිරෝධයට සමවදින් ද ඒ සංස්කාරයන් පුළුවුස් නෙමි, විචාරයි; එයින් ම ඔහුගේ අදහස දැන සථවි

නිරෝධසමාපත්තිය

රීන් වහන්සේ පුණ්‍යාභිසංස්කාරාදි නොයෙක් සංස්කාරයන් ඇති කල්හි දු කායසංස්කාරාදිය ම ප්‍රකාශ කරන්නාහු **නනු'මේ ආවුසො!** යනාදිය කීහ. එහි කය පිළිබඳබැවින් කයින් රැස් කරනු ලැබෙයි උපදවනු ලැබේනුයි **කායසඞ්ඛාර** නම්; වචන පිළිබඳ බැවින් වචනයෙන් රැස් කරනු ලැබෙයි උපදවනු ලැබේනුයි **වචීසඞ්ඛාර** නම්; සිත පිළිබඳ බැවින් සිතින් රැස් කරනු ලැබෙයි උපදවනු ලැබේනුයි **චිත්තසඞ්ඛාර** නම්. **කතමෙ පන'ඤ්ඤ!** යි මෙහි කුමක් විචාරා ද? යත්- මේ සංස්කාරයෝ ඔවුනොවුන් මිශ්‍රවූවාහු කැලඹුනාහු අප්‍රකට වූවාහු දැක්වීමට දුෂ්කර වූවාහුද; ඒ එසේ මැයි- කාය වාරයෙහි ආදානසඞ්ඛ්‍යාත ගැනීමය හැරීමය සැලීමය යන මොවුන්ට පමුණුවා උපන් අට කාමාවචර කුසල්සිත් ද දෙලොස් අකුසල්සිත් දැයි මෙසේ කුශලාකුශල චේතනා ද ආශ්වාස-ප්‍රශ්වාසයෝ ද කාය සංස්කාර යයි ම කියනු ලැබෙත්. වාග්වාරයෙහි හනු සැලීමට වාග් භෙදයට පමුණුවා උපන් උකතප්‍රකාර වූ ම චේතනා ද විතර්ක-විචාරයෝ ද වාක්සංස්කාරයයි ම කියනු ලැබෙත්. මෙසේ මේ සංස්කාරයෝ ඔවුනොවුන් කායවාග්චාරයන්හි චලනයට නො පැමිණ රහසි ව

හුන් සිතන්නහුට උපන් කුශලා කුශල එකුන්තිස් චෙතනාවෝ ද සංඥාව ද වෙදනාව ද යන මේ ධර්මයෝ දෙදෙන ද චිත්තසංඛාර යයි ම කියනු ලැබෙත්. මෙසේ මේ සංඛාරයෝ ඔවුනොවුන් මිශ්‍රයෝ ය, ඇලුණාහුය, අප්‍රකටයෝය, නො දැක්විය හැක්කාහුය; ඔවුන් ප්‍රකට වූවන් විභූත වූවක් කොට කියවන්නෙමි, විචාරසි. **කඞ්ඛා පන'ය්‍යෙ!** සි මෙහි "කායසඞ්ඛාර" දි නාමයාගේ පදභූමිය විචාරසි; එය විසඳීමෙහි- **කායපටිබද්ධා**= කය ඇසුරු කළාහු; කය ඇති කල්හි වෙති, නැති කල්හි නො වෙත්. **චිත්තපටිබද්ධා**= සිත ඇසුරු කළාහු; සිත ඇති කල්හි වෙති නැති කල්හි නො වෙත්.

දැන් කිමෙක් දෝ හෝ මෝ තොමෝ සඤ්ඤාවෙදයිත නිරොධය වළඳා ද නො වළඳා ද, එහි විණඟවසි හෝ වේ ද, විණඟවසි නො වේ දැයි දැනගැනීම පිණිස පුළුවුස්නේ- **කථං පන'ය්‍යෙ! සඤ්ඤාවෙදයිත නිරොධසමාපත්ති හොති** සි කිය. එය විසඳීමෙහි **සමාපජ්ජිස්සතීති වා සමාපජ්ජාමීති වා** යන දෙපදයෙන් නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තිකාලය කියන ලද්දේය; **සමාපන්නො** යන පදයෙන් ඇතුළු නිරොධය කියන ලද්දේය; එසේ ම පළමු දෙපදයෙන් සචිත්තකකාලය කියන ලද්දේය, පසුපදයෙන් අචිත්තකකාලය කියන ලදී. **පුබ්බෙව නථා චිත්තං භාවිතං හොති**= නිරොධසමාපත්තියෙන් පෙර කාලය පිරිසිඳිනා කල්හි ම මෙතෙක් කල් අචිත්තක වන්නෙමි කාලපරිච්ඡේද චිත්තය වඩන ලද වෙයි; **යං නං තථත්තාය උපනෙති**= මෙසේ වඩන ලද යම් සිතක් ඒ පුද්ගලයා තථාත්වයට අචිත්තකභාවයට පමුණුවා ද; **පඨමං නිරුජ්ඣති වචීසඞ්ඛාරෝ**= සෙසු සංඛාරයන්ගෙන් පළමු දෙවෙනි දූහැන්හි ම නිරුද්ධ වෙයි; **තතො කායසඞ්ඛාරෝ**= ඉන් පසු කායසංඛාරය සතරවන දූහැන්හි නිරුද්ධ වෙයි; **තතො චිත්තසඞ්ඛාරෝ**= ඉන් පසු චිත්තසංඛාරය ඇතුළුනිරොධයෙහි නිරුද්ධ වෙයි; **වුළ්හිස්සං'ති වා වුළ්හාමීති වා** යන දෙපදයෙන් ඇතුළු නිරොධකාලය කියන ලද; **වුට්ඨහො** යන පදයෙන් ඵලසමාපත්තිකාලය කියන ලද; එසේ ම පළමු දෙපදයෙන් අචිත්තකාලය කියන ලද; පසු පදයෙන් සචිත්තකාලය කියන ලදී. **පුබ්බෙව නථා චිත්තං භාවිතං හොති**= නිරොධ සමාපත්තියෙන් පෙර කල් පිරිසිඳින කල්හි ම මෙතෙක් කල් අචිත්තක ව ඉන් පසු සචිත්තක වන්නෙමි, කාලපරිච්ඡේද චිත්තය වඩන ලද වෙයි; **යං නං තථත්තාය උපනෙති**= මෙසේ වඩන ලද යම් සිතක් ඒ පුද්ගලයා තථාත්වයට සචිත්තකබවට පමුණුවා ද; මෙසේ යව නිරොධයට සම්වදින කාලය ගන්නා ලද; මෙහි නිරොධයෙන් නැඟී සිටින කාලය ගන්නා ලදී. දැන් නිරොධකථාව කියන්ට වාරය නුසි නිරොධකථාව කියයුතු වන්නීය. යම් හෙයකින් ඕ මෝ නිරොධකථා- **"චිත්ත ඛලෙහි සමනුභාගනන්තා නතයො ච සඞ්ඛාරානං පටිප්පස්සද්ධියා**

සොළසහි ඤාණචරියාහි නවහි සමාධිචරියාහි වසිභාවනා පඤ්ඤා නිරොධසමාපත්තියා ඤාණං" යි මාතෘකාව කඩා සියලු ලෙසින් විශුද්ධි මාර්ගයෙහි කියන ලද්දේ ද, එහෙයින් එහි කී නයින් ම ගතයුතු.

යළි මේ නිරෝධය නම් කවරේ ද? යත්:- (වේදනාදි) සතර සඤ්ඤා යන්ගේ ප්‍රත්‍යවේක්ෂාවෙන් තොර පැවැත්මය; එකල්හි කුමක් හෙයින් මෙහි සම්භවදින් ද? යත්:- සංඝකාරයන්ගේ පැවැත්මෙහි උකටලි වූවාහු සතියක් අවිත්තඤ වැ සුවසේ වසන්නෙමු, යම් ඒ නිරෝධයෙක් වේ ද මෙය "දිට්ඨධම්මනිබ්බාන" නමැති මේ සඳහා සම්භවදින්. **පඨමං උප්පජ්ජති චිත්තඤඤ්ඣාරෝ**= යම්හෙයකින් නිරෝධයෙන් නැගිසිවින්නහුගේ ඵලසමාපත්ති චිත්තය පළමු උපදී ද, (එහෙයින්) එය හා සම්ප්‍රයුක්ත වූ සංඥාව ත් වේදනාව ත් සඳහා **පඨමං උප්පජ්ජති චිත්තඤඤ්ඣාරෝ** යි කිය. **තතෝ කායඤඤ්ඣාරෝ**= ඉන් පසු භවාඞ්ගසමයෙහි කායසංඝකාරය උපදී; වැළි කිම ඵලසමාපත්තිය ආශ්වාස-ප්‍රශ්වාසයන් නුපදවා ද? යත්:- යම්හෙයකින් මොහුගේ චතුර්ථධ්‍යානිකඵලසමාපත්තිය වේ ද, (එහෙයින්) ඕ කායසංඝකාරය නුපදිවයි; කිම හෝ ඵලසමාපත්තිය ප්‍රථමධ්‍යානික හෝ විතිය - තෘතිය - චතුර්ථධ්‍යානික හෝ වේවා, ඥානත වූ සමාපත්තියෙන් නැගිසිටි භික්ෂුහුගේ ආශ්වාස - ප්‍රශ්වාසයෝ අව්‍යවහාරික වෙති; ඔවුන්ගේ අව්‍යවහාරික භාවය සඤ්ජීව තෙරුන්ගේ වසතුවෙන් දත යුත්තේය-

ඒ එසේ මැයි- සම්භවතින් නැගිට කැලමල් වැනි වූ ගිනිදැල් රහිත අඟුරු මඬිමින් යන්නාවූ සඤ්ජීව තෙරුන්ගේ සිවුරෙහි නූලක් පමණකු දු නො දැවිණි, උණුසුම් ආකාර පමණකු දු නො වීය;

සඤ්ජීව තෙර

මේ සමාපත්තිබලය නමැයි කියත්. එපරිද්දෙන් ඥානතවූ සමාපත්තියෙන් නැගිසිටි භික්ෂුහුගේ ආශ්වාස-ප්‍රශ්වාසයෝ අව්‍යවහාරික වෙති. මෙය භවාඞ්ගකාලයෙහි ම කියන ලදුයි දතයුතු. **තතෝ වචීසඞ්ඛාරෝ**= ඉන් පසු ක්‍රියාමය ප්‍රවෘත්තිය වළඳනා කල්හි වාක් සංඝකාරයෝ උපදිත්; කිම භවාඞ්ගය විතර්ක - විචාරයන් නුපදවා ද? යත්:- උපදවයි; එහෙත් එයින් උපන් විතර්ක - විචාරයෝ වචනය උපද වන්ට නො හැකි වෙත් නුයි මෙය ක්‍රියාමය ප්‍රවෘත්තිය වළඳනා කල්හි ම කියන ලදී.

සුඤ්ඤතෝ එසෝ යනාදීහු සමානගුණයෙන් ද ආරම්මණයෙන් ද කියයුත්තාහුය. පළමු කොට සමාන ගුණයෙන් (කියනු ලැබේ-) "සුඤ්ඤතා" නම් ඵලසමාපත්තිය යැ; ඒ සම්භවත හා සමඟ උපන් සපර්‍යය සඳහා **සුඤ්ඤතෝ එසෝ** යි කියන ලදී;

ශූන්‍යතාදිසපරි

"අනිමිත්ත - අප්පණිහිත" යන්හි දු මෙම නයයි. නැවත ආරම්මණයෙන් (කියනු ලැබේ-) නිමිත්තය රාගාදියෙන් ශූන්‍ය බැවින්

"සුඤ්ඤත" නම; රාගනිමිත්තාදීන්ගේ අභාවයෙන් "අනිමිත්ත" නම; රාග - ද්වේෂ - මෝහ ප්‍රාර්ථනාවන්ගේ අභාවයෙන් "අප්පණිහිත" නම; ශූන්‍යත වූ නිර්වාණය අරමුණු කොට උපන් පලසමවතෙහි සපශීය "සුඤ්ඤත" නම; "අනිමිත්ත - අප්පණිහිත" යන්හි දු මේ ම නයයි.

අන්‍ය වූ ආගමනීයකථා නම් වෙයි:- මේ විස්තර ය:- "සුඤ්ඤතං, අනිමිත්තං අප්පණිහිතං" යි විදර්ශනාව ද කියනු ලැබේ; එහි යම් මහණෙක් සංස්කාරයන් අනිත්‍ය වශයෙන් (සංස්කාරයන්) පරිග්‍රහණය කොට අනිත්‍ය වශයෙන් දුක (සංස්කාරයන් ගේ) අනිත්‍යභාවයෙන් නැගිසිටී ද, ඔහුගේ උත්තාන ගාමිනී විදර්ශනාව "අනිමිත්තං" නම් වෙයි; යම් මහණෙක් දුක්වශයෙන් පරිග්‍රහණය කොට දුක්වශයෙන් දුක (සංස්කාර) දුඃඛයෙන් නැගිසිටී ද, ඔහුගේ (විදර්ශනාව) "අප්පණිහිතං" නමු; යම් මහණෙක් අනාත්ම වශ යෙන් පරිග්‍රහණය කොට අනාත්ම වශයෙන් දුක (සංස්කාරයන්ගේ) අනාත්මභාවයෙන් නැගිසිටී ද, ඔහුගේ (විදර්ශනාව) "සුඤ්ඤතං" නමු. එහි අනිමිත්ත විදර්ශනාවගේ මාර්ගය "අනිමිත්ත" නම; අනිමිත්තමාර්ගය ගේ ඵලය අනිමිත්ත (ඵල) නම; අනිමිත්තඵලසමාපත්තිය හා සහජාත වූ සපශීය සපශී කරන කල්හි අනිමිත්තසපශීය සපශී කෙරේ යයි කියනු ලැබේ. අප්‍රණිහිත - ශූන්‍යතයන්හි දු මේ ම නයයි. යම් හෙයකින් ආගමනීය කථාව කී කල්හි ශූන්‍යතසපශීය හෝ අනිමිත්තසපශීය හෝ අප්‍රණිහිතසපශීය හෝ යි විකල්පය පැමිණෙන්නේ ද, එහෙයින් සමාණ ගුණයෙන් හා ආරම්මණයෙන් ද කියයුතුයි. එපරිද්දෙන් ම **තණ්හා එසා ථූණනති** යනු සම වේ. **විවෙකනින්නං** යනාදියෙහි නිර්වාණය "විවෙක" නම; ඒ (නිර්වාණ සඞ්ඛ්‍යාත) විවෙකයෙහි නැමුණේ අවනත වූයේ නුයි **විවෙකනින්නං** නම; විවේකයෙහි ප්‍රමාණ වූයේ අන් තැනෙක නො හොස් විවේකය යම් තැනෙක්හි ද එතැන්හි වක්වූවකු මෙන් ව සිටියේ නුයි **විවෙකපොණං** නම; විවේකය යම් තැනෙක්හි ද එතැන්හි වැටෙන්නාකු මෙන් සිටියේ නුයි **විවෙකපබ්භාරං** නම්.

මෙවිට යම් වේදනා කෙනෙක් නිරුඬ කොට නිරෝධසමාපත්තියට සමවදී ද, ඒ වේදනාවන් පුළුවුස්තෙමි, විචාරන්නේ- **කතිපන'ත්‍ථෝ! වේදනා?** යි කීය. **කායිකං වා** යනාදියෙහි පස්දෙර උපන් සැපය **කායිකං** නම; මනොවාරයෙහි උපන්නේ **චෙතසිකං** නමැයි දතයුතු. එහි **සුඛං** යනු සවභාවනිර්දේශ ය; **ඨානං** යනු ඔහුගේ ම මධුරබව දක්වන වෙවචන ය; **වේදයිතං** යනු වේදනාභාවය දක්වන සියලු වේදනාවන්ට සාධාරණ වචන ය; සෙසු පදයන්හි ද මේ ම නයයි. **සුඛා වේදනා ඛිණසුඛා විපරිණාමදුක්ඛා** යනාදියෙහි සැපවේදනාව ඇතිබව සුව ය, නැතිබව දුක ය, දුක්වේදනාව ඇතිබව දුක ය, නැතිබව සුව ය, උපේක්ෂා වේදනාව දන්නාබව සුව ය නො දන්නාබව දුක ය යන අර්ථ යි. **කිං අනුසයෝ අනුසෙති?**= කවර අනුසයයෙක් අනුව සයනය

කෙරේ ද? අප්‍රහීණාදීයෙන් ශයනය කළ එකෙක් මෙන් වේ දැ? යි අනුසයප්‍රහාණය විචාරයි. **න ඛෝ ආවුසෝ! විසාඛ! අනුසෙති**= සියලු සැප වේදනාවෙහි රාගානුසය අනුසයනය නො කෙරෙයි, සියලු සැපවේදනාවෙහි හේ අප්‍රහීණ වූයේ නො වෙයි, සියලු සැපවේදනාව අරභයා නූපදී යන අර්ථ යි. සියලු තැන්හි මේ නයයි.

කිං පහානඛ්බං? යන මෝ ප්‍රහාණපෘච්ඡා නම්; **රාගං නෙත පජහති** යි මෙහි එක විසඳීමෙන් ප්‍රශ්න දෙකක් විසඳයි; මේ ශාසනයෙහි මහණ රාගානුසය යටපත් කොට පළමුවන ධ්‍යානයට පැමිණෙයි, ධ්‍යානයෙන් යටපත් කළ රාගානුසය එසේ යටපත් කරන ලද්දක් ම කොට විදසුන් වඩා අනාගාම්මාර්ගයෙන් සමූලඝාතනය කෙරෙයි; ඒ රාගානුසය අනාගාම්මාර්ගයෙන් ප්‍රහීණ වූයේ නමුදු එසේ යටපත් කළ බැවින් ම ප්‍රථමධ්‍යානයෙහි අනුසයනය නො කෙරේ නම; එයින් කියා. **න තත්ථ රාගානුසෝ අනුසෙති** යනු. **තදඝනනඤ්**= තං + ඝනනඤං, පරමා ශ්වාසභාවයෙන් පිණිට වූ රහත්බව යන අර්ථ යි. **ඉති අනුත්තරෙසු**= මෙසේ "අනුත්තර යැ, විමොක්ඛ යැ" යි ලද නම් ඇති රහත්බැවිහි ප්‍රාප්තිනාව තබන්නහුට; **උප්පජ්ජති පිහප්පච්චයා දෙමනස්සං**= ප්‍රාප්තිනාව තැබීම මුල්කොට ඇති දෙම්නස උපදී; ඒ මේ දෙම්නස වූ කලි ප්‍රාප්තිනාව තැබීම මුල් කොට නූපදී, වැළි ප්‍රාප්තිනා කොට නො ලබන්නහුට නො ලැබීම මුල්ව උපදනේ **උප්පජ්ජති පිහප්පච්චයා** යි කියන ලදී. තවද- එහි දෙම්නස නම් එකාන්තයෙන් අකුසල් යැ, එහෙත් මේ සෝතාපන්න කටයුතු දෙම්නස වටනේ යයි කියති; සැබවි- යෝගීහු තෙමාසික වූ හෝ ෂාණ්මාසික වූ හෝ නවමාසික වූ හෝ ප්‍රතිපදාව ගනිති, ඔවුනතුරෙන් යමෙක් ඒ ඒ ප්‍රතිපදාව ගෙන කාලපරිච්ඡේදය ඇතුළත ම රහත්බවට පැමිණෙන්නෙමී, ගැටෙමින් වැයම් කරමින් පිරිසුන් කාලයෙන් පැමිණෙන්ට නො හැකි වේ ද, ඔහට බලවත් දෙම්නස උපදී. ආළින්දකවැසි මහාථූණතෙරුන්ට මෙන් කඳුලුධාරා වැටෙත්. තෙරුන් වහන්සේ එකුන්විසිවසක් ගතපවාගතවත පිරුළු; "මේ වර රහත්බව ලබන්නෙමි, මේ වර විශුද්ධිපවාරණයෙන් පවරන්නෙමි" සිත බැඳ මහණදම් කරන්නාවූ ම උන්වහන්සේට එකුන්විසිවසක් ඉක්මුණාහුය. පවාරණදිනයෙහි පැමිණි තෙරුන්ගේ කඳුලු වැගිරීමෙන් මිදුණු දිනයෙක් නම් නො වී; යළි විසිවෙනි වස රහත්බවට පැමිණියේක.

ආළින්දකවැසි මහාථූණතෙර.

පටිඝං නෙත පජහති යන මෙහි දෙම්නසින් ම ප්‍රතිඝය දුරු කෙරෙයි; ප්‍රතිඝයෙන් ම ප්‍රතිඝය දුරලීමක් හෝ දෙම්නසින් දෙම්නස දුරලීමක් නම් නො ම ඇති; වැළි මේ මහණ තෙමාසිකාදි පිළිවෙත් අතුරෙන් එක්තරා පිළිවෙතක් ගෙන මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කෙරෙයි:— "බල මහණ! තාගේ ශීලයෙන් පිරිහුණු තැනක් ඇද්ද, නොහොත් චිත්ත්‍යෙන්- ප්‍රඥාවෙන් හෝ (පිරිහුණු තැනක් ඇද්ද,) තාගේ ශීලය පිරිසුදු

නො ද? වියදීය දැඩි කොට ගත්තා ලද්දේ නො ද? ප්‍රඥව ශූර වැ පැමිණේ නො ද?" යි. හෙතෙම මෙසේ ප්‍රත්‍යවේක්ෂා කොට යළි "දැන් මේ දෙම්නසට උපදින්ට නො දෙන්නෙමි" වියදීය දැඩි කොට ඇතුළු තුන්මසින් හෝ ඇතුළු සමසින් හෝ ඇතුළු නවමසින් හෝ අනාගාමි මාගීයෙන් ඒ දෙම්නස සමූද්ඝාතනය කෙරෙයි; මේ ක්‍රමයෙන් ප්‍රතිඝයෙන් ම ප්‍රතිඝය දෙම්නසින් ම දෙම්නස දුරු කෙරෙයි නම්. **න තත්‍රේ පටිඝානුසයෝ අනුසෙති** යන මෙහි මෙබඳු දෙම්නසෙහි ප්‍රතිඝානුසය අනුසයනය නො කෙරෙයි, එය අරහයා නූපදී; එහි ප්‍රතිඝානුසය ප්‍රහීණ යැ යන අර්ථ යි. **අවිජ්ජං නෝන පජහති**= මේ ශාසනයෙහි මහණ අවිද්‍යානුසය යටපත් කොට සතරවන දැහැනට සමවදී; ධ්‍යානයෙන් යටපත් කළ අවිද්‍යානුසය එසේ යටපත් කරන ලද්දක් ම කොට විදසුන් වඩා රහත්මඟින් සහමූලින් නසයි; හේ රහත්මඟින් ප්‍රහීණ වූයේ නමුදු එසේ යටපත් කරන ලද බැවින් ම චතුර්ථධ්‍යානයෙහි අනුසය නො කෙරෙයි නම්; එයින් කියා- **න තත්‍රේ අවිජ්ජානුසයෝ අනුසෙති** යනු.

මෙවිට ප්‍රතිභාග ප්‍රශ්නය පුළුවුස්නේ **සුඛාය පන'ත්‍රෝ!** යනාදිය කියා. එය විසඳීමෙහි යම්හෙයකින් සැපයට දුක ත් දුකට සැපය ත් විරුද්ධ ද, එහෙයින් වේදනා දෙකෙහි විෂමභාග-ප්‍රතිභාගය කියන ලදී, උපෙක්ෂාව වනාහි අඤ්ඤාණ යැ අප්‍රකට යැ දුක්ඛීමට දුෂ්කර යැ; අවිද්‍යා ව ත් එබඳු මැයි; එහෙයින් මෙහි සභාග - ප්‍රතිභාගය කියන ලදී. **"සත්තසෙසු පන ඨානෙසු අවිජ්ජා නමං කරොති, නත්තසෙසු විජ්ජා නමං විනොදෙති"** යන මෙහි විෂමභාග ප්‍රතිභාගය කියන ලදී; **විජ්ජාය ඛො ආවුසො** යි මෙහි මේ ධර්මයෝ දෙදෙන ම අනාශ්‍රවයෝ යැ ලෝකොත්තරයෝ යැයි සභාග ප්‍රතිභාගය ම කියන ලදී. **විමුත්තිභා ඛො ආවුසො!** යි මෙහි අනාශ්‍රවාර්ථයෙන් ද ලෝකොත්තරාර්ථයෙන් ද අව්‍යාකෘතාර්ථයෙන් ද සභාගප්‍රතිභාගය කියන ලදී. **අවඝසරා**= මෙහි ප්‍රශ්නය ඉක්මවා යියේ වෙහි යන අර්ථ යි. **නාසක්ඛි පඤ්හානං පරිසන්තං ගතෙතුං**= ප්‍රශ්නයන්ගේ පරිවේජදයක් ප්‍රමාණයක් ගන්ට නො හැකි විය; අප්‍රතිභාග ධර්මයාගේ ප්‍රතිභාගය විචාළේය; මේ නිර්වාණය නම් අප්‍රතිභාග යැ, නිල් හෝ කහාවන් හෝ ඝයි කිසි ධර්මයක් සමඟ ප්‍රතිභාග කොට දක්වන්ට නො හැක්කා; හෙ ද තෙපි මේ අදහසින් විචාරව යන අර්ථ යි. **තවද**- මෙතෙකින් මේ උපාසක තෙම- යම්සේ සත්වෙනි ගෙයි සලාක පිණ්ඩය ලැබ ගියාවූ මහණ ගෙවල් සතක් ඉක්මවා අටවෙනි ගෙදොර සිටියේ ඕයලු ම ගෙවල් සත වැරදුණේ ම නො දනගත්තේ ද, එපරිද්දෙන් අප්‍රතිභාග ධර්මයාගේ ප්‍රතිභාගය පුළුවුස්නේ සියලු ම ප්‍රතිභාග ප්‍රශ්න සතෙහි වැරදුණේ ම වී යයි දතයුතු. **නිබ්බානොගධං**= නිවනට ඇතුළත් වූයේ, නිවනට පිවිසියේ; **නිබ්බාන පරායණං**= නිර්වාණය මොහට උතුම් අයනය, උතුම් ගතිය වූයේ; එයින් මත්තෙහි නො යෙයි යන අර්ථ යි. නිර්වාණය පර්‍යවසානය වූයේ අවසානය වූයේ මොහට කුයි

නිබ්බානපරියොසානා නම්; **පණ්ඩිතා**= පණ්ඩිත බැවින් යුක්ත වූවා, අවලෝස් ධාතුවෙහි දක්ෂ වූවා, දෙලෝස් ආයතනයෙහි දක්ෂ වූවා, ප්‍රතීත්‍යසමුත්පාදයෙහි දක්ෂ වූවා, සථානාසථානයෙහි දක්ෂ වූවා; **මහා පඤ්ඤා**= මහත් අර්ථයන් මහත් ධර්මයන් මහත් නිරුක්තීන් මහත් වූ ප්‍රතිභානයන් පරිග්‍රහණයෙහි සම්ප්‍රවූ ප්‍රඥාවෙන් යුක්ත වූවා; **ඝථානං ධම්ම දිනනායං**= ධම්මදිත්‍යනා මෙහෙණ විසින් යම් සේ ප්‍රකාශ කරන ලද දා මම් ත් එසේ ම ප්‍රකාශ කරන්නෙමි. තවද- මෙතෙකින් මේ සූත්‍රාන් තය ජිනභාෂිතයෙක් නම් විය; ශ්‍රාවකභාෂිතයෙක් නො වී. ඒ එසේ මැයි- යම්සේ රාජකාර්‍යයෙහි යුක්තවූවන් විසින් ලියන ලද පත යම් තාක් රාජමුද්‍රිකාවෙන් ලස් නො කරන ලද්දේ වේ ද, ඒ තාක් රජුගේ පතකැයි ගණනට නො යේ ද, එහෙත් ලස් කළ මාත්‍රයක් ඇත්තේ රජුගේ පතක් නම් වේ ද; එපරිද්දෙන්- **අහම්පි නං එවමෙවං ව්‍යාකරෙය්‍යං** යි මේ ජිනවචන නමැති මුද්‍රාවෙන් ලස් කළ බැවින් මේ සූත්‍රාන් තය ආහච්ච වචනයෙන් (= එළවා කියන ලද වචනයෙන්) ජිනභාෂිත යෙක් නම් වී. සෙස්ස සියලු තැන්හි ප්‍රකට අර්ථ ඇත්තේ මැයි.

මූලවෙදල්ල සූත්‍ර වර්ණනා නිමි. (4)

———:÷:———

චූලධම්මසමාදාන සූත්‍ර වර්ණනා.

———:o:———

එවං මේ සුතං යි චූලධම්මසමාදාන සූත්‍රයයි. එහි **ධම්මසමාදානානි**= ධර්මය සි ගන්නා ලද ග්‍රහණයෝ; **පච්චුප්පන්නසුඛං**= ප්‍රත්‍යුත්පන්න (වර්තමාන) යෙහි සුව වූ, රැස්කරන කෙණෙහි සුව වූ, සුකර වූ, සුවයේ පුරන්ට හැකි; **ආයතිං දුක්ඛවිපාකං**= අනාගතයෙහි විපාක දෙන කාලයෙහි දුක්විපාක වූ; මේ උපායයෙන් සියලු පදයන්හි අරුත් දත යුතු; **නත්ථි කාමේසු දොසෝ**= වස්තුකාමයන්හි ද ක්ලේශකාමයන්හි ද දෙසෙක් නැති; **පාතව්‍යතං ආපජ්ජන්ති**= ඔවුහු වස්තුකාමයන්හි ක්ලේශකාමයෙන් පාතව්‍යතියට පියයුතුබවට කැමතිසේ වැළඳියයුතු බවට පැමිණෙත් යන අර්ථ සි. **මොළිබද්ධාහි**= මෙහෙලි මෙන් කොට බඳනා ලද කෙශ ඇති තාපසපරිව්‍රාජිකාවන් සමඟ; **එවමාහංසු**= මෙසේ කියති; **පඤ්ඤාදීපං පඤ්ඤූපෙනහි**= ප්‍රඥාණය ඉක්මව්ම පතළුනි; **මාලුවාසිපාවිඛා**= දික්සටහන් ඇති මාලුවාගෙඩියක් (= කරලක්;) **එකලෙය්‍ය**= අව්වෙන් වියලී බිඳෙන්නේය; **සාලමූලෙ**= සල්රුකක් සමීපයෙහි; **සත්තාසං ආපජ්ජෙය්‍ය** යනු කුමක් හෙයින් පැමිණේ ද? යත්:- භවනය නැසෙන බියෙනි; සැබව රුක්මූල වැටුණු මාලුවාඇටයෙන් වැලක් පැලවී රුකට නගී, ඕ මහත් පත්‍ර ඇත්ති ද බොහෝ පත්‍ර ඇත්ති ද කොබෝලිඳුපත් වැනි පත්‍රවලින් යුක්ත වූවා ද වෙයි; අනතුරු ඒ රුක මූල පටන් බිඳිමින් සියලු වෙළෙප් වසා මහත් වූ බරක් උපදවා සිටී; ඕ සුළං හමන කල්හි වැසි හෝ වසින කල්හි ගවට (එල්ඛිමට හෙතු වූ) සත්‍රව උපදවා ඒ වෘක්ෂයාගේ කුදු මහත් අතු බිඳී, බිම හෙලයි, ඉකබිති ඒ රුකෙහි ඉතිරි විමන් බිඳෙයි, වැනසෙයි; මෙසේ ඕ දෙවතා භවන වැනසෙන බියෙන් තැතිගැනීම්ව පැමිණෙයි. **ආරාමදෙවතා**= ඒ ඒ තැන පුෂ්පාරාම-ඵලාරාමයන්හි අධිෂ්ඨිත දෙවතාවෝ; **වනදෙවතා**= අඹවන-සුභගවනාදි වනයන්හි අධිෂ්ඨිත දෙවතාවෝ; **රුක්ඛදෙවතා**= ප්‍රත්‍යක්ෂයෙන් සලකන ලද නළෙරු පුවිමඳ (=එනම් යක්ෂයා වසඳා සොසඹගස) ආදි වූ වෘක්ෂයන්හි අධිපති ව වසන දෙවතාවෝ; **ඔසධිනිණ්ණාසද්දේසු**= අරළු-හෙල්ලි ආදි ඖෂධීන්හි ද තල්-පොල් ආදි තෘණයන්හි ද වනදෙටු වූ වනස්පතිවෘක්ෂයන්හි ද අධිපති ව වසන දෙවතාවෝ; **වනකම්මිකා**= වනයෙහි සිසැමෙ-ගොයම් කැපීම්-දර ගෙනෙවීම්-ගෙරින් රුකීම්ආදි කිසියම් කටයුත්තකින් හැසිරෙන මනුෂ්‍යයෝ; **උද්ධනෙයුං**= කන්නාහුය; **විලම්බිනි**= සුළඟින් පහළ පහළ තැන්හි ක්‍රීඩා කරන්නා මෙන් එල්බෙන්නී; **සුඛා ඉමස්සා**= මේ මෙබඳු වූ මාලුවාවැලේ සපගීය ද සුවය, දැකීම ද සුවය; මෝ මාගේ දරුවන්ට අවන්මඬලක් වන්නේය, කෙළිබිමක් වන්නේය,

මා විසින් දෙවෙනි විමානක් උදුසි වැල දැකීමෙහි ද සපතීයෙහි ද භවගත් සොම්නස් ඇත්තී මෙසේ කිව; විමපිං සරෙයා= අතු මත්තෙහි ඡත්‍ර යක ආකාරයෙන් සිටින්නේය; ඔසනං ජනෙයා= යටට සතබව උපද වන්නේය; මත්තට නැඟී සියලු රුක හාත්පසින් වෙළා යළි යටට බස්නී පොළොව ගන්නේය යන අර්ථ යි. පදලෙයා= මෙසේ යටට සත බව උපදවා යළි එතැන් පටන් මූල දක්වා බැසගත් අතුවලින් උඩට නඟිමින් සියලු අතු වෙළමින් මුදුනට පැමිණ ඒ ක්‍රමයෙන් ම නැවත බැස ද නැඟී ද සියලු රුක මසා සියලු අතු යට කොට නොමෝ මතුයෙහි සිට සුළං හමන කල්හි වැසි හෝ වසින කල්හි පලන්නේය, බිඳින්නේය යන අර්ථ යි; කණු පමණක් ම සිටින්නේය. එහි යම් ශාඛාසඨවිමාන යෙක් වේ ද, එය අතු බිඳෙන කල්හි ඒ ඒ තැන ම බිඳී සියලු අතු බිඳුණු කල්හි සියල්ල බිඳෙයි, රුකෙහි සිටි විමානය වනාහි යම්තාක් වෘක්ෂයාගේ මූල පමණකුදු සිටී ද ඒ තාක් නො නැසෙයි; යම් හෙයකින් මේ විමන ශාඛාවෙහි සිටියේ ද එහෙයින් සියලු අතු බිඳුණු කල්හි බිඳුණේය; දෙවතා තොමෝ දරුවන් ගෙන කණුවෙහි සිටියා හඬන්ට පවන්ගත.

නිබ්බරාගජාතිකෝ= බහල වූ රාගසවභාව ඇත්තේ; රාගජං දුක්ඛං දෙමනස්සං පටිසංවෙදෙති= බහල (=තීව්‍රයුණු) රාගසවභාව ඇති බැවින් දුටු දුටු අරමුණෙහි නිමිති ගනී; එකල ඔහුට ආචාර්‍ය-උපාධ්‍යායයෝ දඬුවම් නියම කෙරෙති; හෙතෙම නිරතුරු දඬුවම් කරන්නේ දුක් දෙමනස් විඳී; නො මැ ව්‍යතික්‍රමය කෙරෙයි. තියුණු වෙෂසවභාව ඇත්තේ ද මදපමණකින් ම කිපෙයි; තරුණ සාමණේරයන් සමග හසහ පරාමර්ශාදිය කරන්නේ ත් කථා කෙරෙයි; හෙතෙමේ ත් දඬුවම් හෙතු වෙන් දුක් දෙමනස් විඳී. න නිබ්බරාගජාතිකෝ යනාදිය කියන ලද්දට ප්‍රතිපක්ෂනයින් දතයුත්තාහුය. යළි කුමක්හෙයින් මෙහි කියසිවෙක් තියුණු රාගසවභාව ඇත්තේ වේ ද? කියසිවෙක් තියුණු රාගසවභාව ඇත්තේ නො වේ ද? යත්- කම්නියමයෙනි. සැබව- යමෙකුට කම්‍ය රැස් කරන කෙණෙහි ලොභය බලවත් වේ ද, අලොභය මද වේ ද; අවෙෂ-අමොහයෝ බලවත් වෙත් ද, වෙෂ-මෝහ යෝ මද වෙත් ද, ඔහුගේ මද වූ අලොභය ලොභය යට පත් කරන්වනෝ හැකි වෙයි; යම්හෙයකින් අවෙෂ-අමොහයෝ බල වත් වූවාහු වෙෂ-මොහයන් යටපත් කරන්ට හැකි වෙත් ද, එහෙයින් හෙතෙම ඒ කම්‍යයෙන් දුන් ප්‍රතිසන්ධි වසයෙන් උපන්නේ ලොභී වූයේ සැපවිඳිනසුලු වූයේ ක්‍රොධ නො කරන්නේ ප්‍රඥ ඇත්තේ වප්‍රෝපම ඥනය ඇත්තේ වෙයි; තවද- යමෙකුට කම්‍යූහණක්ෂණයෙහි ලොභ වෙෂයෝ බලවත් වෙත් ද, අලොභ - අවෙෂයෝ මද වෙත් ද, අමෝ හය බලවත් වේ ද, මොහය මද වේ ද, හෙතෙම පළමු නයින් ම ලොභී වූයේ ත් දුෂට වූයේ ත් වෙයි; යළි ප්‍රඥවත් වූයේ විදුරට බදු නුවණැත්තේ වේ. දතනාහය තෙරුන් මෙහි: යමෙකුට කම්‍යූහණක්ෂණයෙහි

ලොභ - අදෝස - මොහයෝ බලවත් වෙත් ද, සෙස්සෝ මද වෙත් ද, හෙතෙම පළමු නයින් ම ලොභී වූයේ ත් මද නුවණැත්තේ ත් වෙයි; යළි සැප විඳිනසුලු වූයේ ක්‍රොධ නො කරන්නේ වෙයි; එපරිද්දෙන් යමෙකුට කම්‍යූහණක්ෂණයෙහි ලොභ - දෝස - මොහයෝ තිදෙන ම බලවත් වෙත් ද, අලොභාදීහු මද වෙත් ද, හෙතෙම පළමු නයින් ම ලොභී වූයේ ත් දුෂට වූයේ ත් මූසා වූයේ ත් වෙයි; යළි යමෙකුට කම්‍යූහණක්ෂණයෙහි අලොභ - දෝස - මොහයෝ බලවත් වෙත් ද, සෙස්සෝ මද වෙත් ද, හෙතෙම පළමු නයින් ම මදකෙලෙස් ඇත්තේ දිව්‍යාරම්මණයකු දු දැක නිශ්චල වූයේ වෙයි; යළි කිපෙනසුලු වූයේ ත් මද නුවණැත්තේ ත් වෙයි; යමෙකුට කම්‍යූහණක්ෂණයෙහි අලොභ-අදෝස-මොහයෝ බලවත් වෙත් ද, සෙස්සෝ මද වෙත් ද, හෙතෙම පළමු නයින් ම අලොභී වූයේ ත් සැප විඳිනසුලු වූයේ ත් වෙයි; යළි මදනුවණැත්තේ ත් වෙයි; එපරිද්දෙන් යමෙකුට කම්‍යූහණක්ෂණයෙහි අලොභ - දෝස - අමොහයෝ බලවත් වෙත් සෙස්සෝ මද වෙත් ද, හෙතෙම පළමු නයින් ම අලොභී වූයේ ත් නුවණැත්තේ ත් වෙයි; යළි දුෂට වූයේ කිපෙනසුලු වූයේ වෙයි. තවද- යමෙකුට කම්‍යූහණක්ෂණයෙහි අලොභාදීහු තිදෙන ම බලවත් වෙත් ද, ලොභාදීහු මද වෙත් ද; හෙතෙම මහාසඞ්ඝරක්ෂිත තෙරුන් මෙන් අලුබධ වූයේ ත් අදුෂට වූයේ ත් ප්‍රඥාවත් වූයේ ත් වේ. සෙස්ස සියලු තැන්හි ප්‍රකට වූ අර්ථ ඇත්තේ මැයි.

චූළධම්මසමාදාන සූත්‍ර වණ්ණනා නිමි. (5)

———:×:———

මහාධම්මසමාදාන සූත්‍ර වර්ණනා.

———:=:———

එවං මේ සුතං යි මහාධම්මසමාදාන සූත්‍ර ගයි. එහි **එවං කාමා=** මෙබඳු ඉච්ඡා (= ආශා) ඇත්තාහු; **එවං ඡන්දා=** මෙබඳු අදහස් ඇත්තාහු; **එවං අධිප්පායා=** මෙබඳු ලබඩි ඇත්තාහු; **තත්‍ර=** ඒ අනිෂ්ටයන් වැඩි මෙහි ද ඉෂ්ටයන් පිරීමෙහි ද; **භගවංමූලකා=** භාග්‍යවත්හු මුල් වූයේ මොවුන්ටනුයි "භගවංමූලකා" මේ කියන ලද වෙයි:- "සවාමීනි! අපට මේ ධර්මයෝ පෙර කසුප් සම්මාසම්බුදුන් විසින් උපදවන ලද්දාහුය, ඒ සම්බුදුන් පිරිනිවි කල්හි එක් බුඩානන්තරයක් අත් මහණෙක් හෝ බමුණෙක් හෝ මේ ධර්මයන් උපදවන්ට සමර්ථ වූයේ නම් නො වී, යළි භාග්‍යවතුන් විසින් අපට මේ ධර්මයෝ උපදවන ලද්දාහුය; භාග්‍යවතුන් ම නිසා ඇපි මේ ධර්මයන් දනගන්නෙමු පිළිවිදින්නෙමු" යි මෙසේ **සවාමීනි! අපගේ** ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මූල් කොට ඇත්තාහු ය යි. **භගවං නෙතත්තිකා=** භාග්‍යවත්හු ම ධර්මයන්ට නෙතෘ (= නායක) විනෙතෘ අනුනෙතෘ වූවාහු යථාසඛභාවයෙන් වෙන වෙන ම නම් ගෙන දක්වන්නාහු නුයි ධර්මයෝ භාග්‍යවතුන් නෙතෘ කොට ඇත්තාහු නම් වෙති; **භගවං පටිසරණා=** චාතුර්භූමක ධර්මයෝ සර්ඥතාඥතයාගේ ආපාථයට පැමිණෙන්නාහු භාග්‍යවතුන් කෙරෙහි රැස්වෙත් නමැයි භාග්‍යවතුන් පිළිසරණ කොට ඇත්තාහු වෙති; **පටිසරණානි** යනු බැසගනිත් රැස්වෙත්; තවද- මහබෝමැඩ වැඩහුන් භාග්‍යවතුන්ගේ (සමීපයට) ප්‍රතිවෙධවශයෙන් සපර්ශ පැමිණෙයි- "භාග්‍යවතුන් වහන්ස! මම කිනම් දෑ?" යි; නෙපි සපර්ශ කිරීම් අවීයෙන් "ඵස්ස" නම; වෙදනාව- සංඥාව- සංස්කාරයෝ- විඥානය පැමිණෙයි- "භාග්‍යවතුන් වහන්ස! මම කිනම් දෑ?" යි; නෙපි විජානනාවීයෙන් "විඤ්ඤාණ" නමැයි; මෙසේ චාතුර්භූමක ධර්මයන්ට යථා සවභාව වශයෙන් වෙන වෙන ම නම් ගන්නාවූ භාග්‍යවතුන් වහන්සේ ධර්මයන් රැස් කෙරෙත් නුයි ද භාග්‍යවතුන් පිළිසරණ කොට ඇත්තාහු නම් වෙත්. **භගවන්තංයෙව පටිභාතු=** භාග්‍යවතුන් වහන්සේට ම මේ භාෂිතයාගේ අර්ථය වැටහේවා නුඹ වහන්සේ ම අපට කියා දුනමැනව යන අර්ථ යි.

සෙච්චාභඞ්ගා= ඇසුරු කෙරෙයුතු (ධර්මයන්;) **භජිතබ්බා=** ඵළඹියයුතු (ධර්මයන්;) **ඝථානං අවිදදසූනෝ=** අපණ්ඩිත වූ බාල වූ අඤ්ඤථත්ථජනයකුට යම්සේ ද එමෙන්; **ඝථානං විදූනෝ=** නුවණැති ප්‍රඥාව ඇති පණ්ඩිතයකුට යම්සේ ද එමෙන්; **අපි ඛෝ භික්ඛවෙ! ධම්මසමාදානං** යි සූත්‍රයෙහි උපිළිවෙළින් මාතෘකාව තබන ලදුව; මෙහි වනාහි ශාස්තෘන් වහන්සේ ධර්මරසඥ වූ ලෙසින් ම මාතෘකාව තැබූ සේක. **එහි ධම්මසමාදානං=** ප්‍රාණාතිපාතාදි ධර්මයන්ගේ ගැනීම; **අවිජ්ජාගතෝ=** අවිද්‍යාවෙන්

සමන්විත වූයේ; විජ්ජාගතෝ= විද්‍යාවෙන් සමන්විත වූයේ, ප්‍රඥාවත් වූයේ; සහාපි දුක්ඛේන යන මෙහි මිථ්‍යාවාරය අභිධ්‍යාය මිථ්‍යාදෘෂ්ටිය යන මේ තිදෙන වනාහි පූර්වචේතනාවගේ ද අපරචේතනාවගේ ද යන චේතනාවන් දෙදෙනාගේ වශයෙන් දුක්වේදනා ඇත්තාහු වෙති; යම් සන්නිධාපකචේතනාව සුඛසම්ප්‍රයුක්ත වූවා හෝ උපෙක්ෂාසම්ප්‍රයුක්ත වූවා හෝ වෙයි; සෙසු ප්‍රාණාතිපාතාදි සත තුන් චේතනාවන්ගේ ම වශයෙන් දුක්වේදනා ම වෙත්. මේ සඳහා කියන ලදී- සහාපි දුක්ඛේන සහාපි දෞමනස්සේන යනු. තවද මෙහි දෞමනස ම දුක යයි දතයුතු; සෙසු මට හෝ පැමිණෙන්නහුගේ පූර්භාග - අපරභාගයන්හි කායික දුක ද වටී මැයි. සහාපි සුඛේන යන මෙහි ප්‍රාණඝාතය පරැඹවචනය ව්‍යාපාදය යන මේ තිදෙන වනාහි පූර්චේතනාවගේ ද අපරචේතනාවගේ ද යන චේතනාවන් දෙදෙනාගේ වශයෙන් සැපවේදනා ඇත්තාහු වෙති, සන්නිධාපකචේතනාව වූ කලි දුඃඛසම්ප්‍රයුක්ත වූවා ම වෙයි; සෙසු සත් දෙන තුන් චේතනාවන්ගේ ම වශයෙන් සැපවේදනා ඇත්තාහු වෙත් මැයි. සහාපි සෝමනස්සේන= තවද- මෙහි සෞමනස ම සැප යයි දතයුතු; ඉෂ්ට වූ සපශීයෙන් යුක්තවූවහුගේ හෝ පූර්භාග-අපරභාගයන්හි කායිකසැපය ද වටී මැයි.

තුන්වෙනි ධර්මසමාදානයෙහි- මෙලොව්හි කිසිවෙක් කෙවුලෙක් හෝ මුවාවැද්දෙක් හෝ වෙයි, ප්‍රාණඝාතය ම නිසා ජීවිකාව කෙරෙයි, ගරු තැන්හි සිටි මහණෙක් නො කැමති වූ ම ඕහට ප්‍රාණඝාතයෙහි ආදීනවද ප්‍රාණඝාතයෙන් වැළකීමෙහි අනුසස් ද කියා ශික්ෂාපද දෙයි; හෙතෙම ගන්නේ ද, දුක් ඇත්තේ දෞමනස් ඇති ව ම ගනී; අපරභාගයෙහි කිපදිනක් ඉක්මවා රක්නට නො හැකිවන්නේ ද වෙයි; ඔහුගේ පූර්ව පරචේතනා දුක්සහගත වූවාහු ම වෙති; සන්නිධාපකචේතනාව වනාහි සුඛසහගත හෝ උපෙක්ෂාසහගත හෝ වෙයි; මෙසේ සියලු තැන්හි අරුත් දතයුතු. මෙපරිද්දෙන් පූර්භාග - අපරභාග චේතනාව ම සඳහා මේ කියන ලදී- සහාපි දුක්ඛේන සහාපි දෞමනස්සේන යි; තවද මෙහි දෞමනස ම දුක යයි දතයුතු.

සතරවෙනි ධර්මසමාදානයෙහි- දශපදයන්හි ම පූර්භාග-අපරභාග-සන්නිධාපක චේතනාවෝ තිදෙන ම සුඛසම්ප්‍රයුක්ත වූවාහු වෙත් මැයි. ඒ සඳහා මෙය කියන ලදී- සහාපි සුඛේන සහාපි සෝමනස්සේන යි; තවද- මෙහි සෞමනස ම සැප යයි දතයුතු. නිත්තණ්ඩුලාපු= තිකන රස ඇති ලබු; විසෙන සංසට්ඨෝ= හලාහල විෂයෙන් සංයුක්ත වූයේ, මිශ්‍ර කරන ලද්දේ, අළුත්න ලද්දේ; නවජ්ඣාදෙස්සති= රුචි නො කරන්නේය, තුටු නො කරන්නේය; නිගච්ඡති= පැමිණෙන්නෙහි; අපපටිසඩ්ඛා පිවෙය්‍ය= ප්‍රත්‍යවෙක්ෂා නො කොට බොන්නේ නම්; ආපාණිඝ

කංසෝ= පානය කවයුතු වූ මිහිරිපානය පුරන ලද බඳුන; **වණ්ණසම්පන්නා**= පානකවණ්ණාදියෙන් යුක්ත වූ කංසය (= ලොහොබඳුන;) වැළි බහාලූද්‍රව්‍යෝපචාරයෙන් කංසය මෙසේ කියන ලදි; **ඡාදෙස්සන්ති**= යම් හෙයකින් ඒ හලාහලවිෂය යම් යම් බඳුනක බහාලන ලද වේ ද, ඒ ඒ බහාලන ලද්දහුගේ ම රසය දෙන්නේ ද, එහෙයින් කියන ලදි- ඡාදෙස්සන්ති යනු. **පූතිමුත්තං** යනු මූත්‍රය මැයි; ඒ එසේ මැයි යම්සේ මිනිසත්බව රන්වන් වූයේ නමුදු "පූතිකායෝ" යි ම කියනු ලැබේ ද, එදවස හටගත්තා වූ ද කිදිවැල ත් "පූතිලතා" යි ම කියනු ලැබේ ද, එපරිදි දෙන් එකෙණෙහි ගත්තාවූ තරුණවූ ද මූත්‍රය "පූතිමුත්ත"මැයි. **නානා භෙසජ්ජෙහි**= අරළු-තෙල්ලි ආදි වූ නානා ඖෂධයන්හෙන්; **සුඛී අස්ස**= සුව ඇත්තේ අරෝග වූයේ රන්වන් වූයේ සුවපත් වූයේ වන්නේය; **දධි ච මධු ච**= සුපිරිසුදු දී ද මිහිරි වූ මී ද; **එකජ්ඣං සංසඳ්ඵං**= එක්තැන් කොට මිශ්‍ර කරන ලද්දේ අලලන ලද්දේ; **නස්ස නං**= ඒ සියුම්යුරු බෙහෙත බොන්නාවූ ද ඔහුට රුචි වන්නේය; මෙ ද හඟදැරයෙන් වූ යම් ලොහිතයෙක් නික්මේ ද ඊට බෙහෙත් නො වෙයි; ආහාරය දැඩි කොට මාගීය නො වළඳනා කෙරෙයි. යළි පිතින් මිශ්‍ර වූ යම් ලොහිතයක් වේ ද, ඊට මේ බෙහෙත ශීතලක්‍රියාව අවසන් කොට ඇත්තේ වේ. **විගඩ**= පහවගියය; වළාකුළු පහවීමෙන් දුරු වූ යන අර්ථ යි. **විගතවලාහකෙ**= පහවගිය මෙඝය ඇති; **දෙවෙ**= ආකාශයෙහි; **ආකාසගතං තාරගණං**= අහසැ වූ අදුර; **පුථුසමණබ්‍රාහ්මණපරප්පවාදෙ**= බොහෝවූ මහණ-බමුණු සඞ්ඛ්‍යාත පරයන්ගේ වාදයෙහි; **අභිවිහවව**= වෙසෙසින් නසා; **භාසතෙ ච තපතෙ ච විරොචති ච**= සරාකල මධ්‍යාහ්නසමයෙහි හිරු මෙන් ආලෝකය පතුරුවයි, දිලිසෙයි, බබලායයි.

මේ සූත්‍රය වනාහි දෙවියන්ට ඉතා ම ප්‍රිය යැ මනාප යැ; එහි මේ වස්තුවෙකි- මෙසේ අසනු ලැබේ:- දක්ෂිණදිශාවෙහි භග්ගිභොග ජනපදයෙහි පඞ්ගුර නම් විහාරයෙක් ඇති; එවෙහෙර හොජනශාලා වාරයෙහි පඞ්ගුර (= පඟුරු) රුකෙහි අධ්‍යුෂිත වූ දෙවතාවා රාත්‍රිකාලයෙහි එක් තරුණ භික්ෂුවක් පද-ප්‍රශ්න වශයෙන් මේ සූත්‍රය පිරිවහන්නහු අසා සාධුකාර දුන; තරුණ මහණ "මේ කවුදැ" යි කිය; "වහන්ස! මම මේ රුක වසන දෙවතා වෙමි" "දෙවතාවෙනි! කුමක් කෙරෙහි පැහැදුනා වෙහිද? කිම ශබ්දයෙහි ද? නොහොත් සූත්‍රයෙහි දැ" යි; "ස්වාමීනි! ශබ්දය නම් යම් කිසිවෙකුව වේ මය, සූත්‍රයෙහි පැහැදුනිමි වෙමි, ශාස්තෘන් විසින් දෙව්රම්හි වැඩහිඳ වදාළ දිනයෙහි ද අද ද එක් ව්‍යඤ්ජනයෙක්හි දු වෙනසෙක් නැති" "දෙවතාවෙනි! තෙපි ශාස්තෘන් වදාළ දිනයෙහි ඇසුවෙහි දැ?" යි; එසේය ස්වාමීනි! "කොහි සිටියා ඇසුවෙහි දැ?" යි; "ස්වාමීනි!

පඞ්ගුරවෙහෙර තරුණ භික්ෂුව.

දෙව්රමට ගියෙමි, එහෙත් මහෙශාක්‍ය දෙවතාවන් පැමිණෙන කල්හි එහි අවකාශ නො ලැබ මෙහි ම සිට ඇසුවෙමි" "මෙහි සිටියහු විසින් ශාස්තෘන්ගේ ශබ්දය අසන්ට හැකි දැ?" යි; "එහන්ස! ඔබ වැළිත් මාගේ ශබ්දය අසවු දැ?" යි; "එසේය දෙවතාවෙනී" සවාමිනි! දකුණුකන පසෙහි හිඳ "කියන කාලක් මෙන් වේ" යයි; "යළි කිමෙක දෙවතාවෙනි! ශාස්තෘන්ගේ රූපය දක්නොහි දැ?" යි; "ශාස්තෘන් වහන්සේ මා ම බලන සේකැයි හඟිමින් සිටින්ට නො හැකි වෙමි සවාමිනී" "දෙවැනි වෙනි! වැළි විශෙෂයක් උපදවන්ට හැකිවූවෙහි දැ? යි; දෙවතා තොමෝ එහි ම අතුරුදහන් වූය. එදවස මේ දෙව්පුත් සෝවාන්පලෙහි පිහිටියේ ලා. මෙසේ මේ සූත්‍රය දෙවියන්ට ප්‍රිය යැ, මනාප යි. ශෙස්ස සියලු තැන්හි ප්‍රකට අර්ථ ඇත්තේ මැයි.

මහාධම්මසමාදාන සූත්‍ර වණ්ණනා නිමි. (6)

වීමංසක සූත්‍ර වණ්ණනා.

——:÷:——

එවං මේ සුතං යි වීමංසක සූත්‍ර ය‍යි. එහි **වීමංසකෙන** යනු වීමංසක කයෝ තිදෙනෙක් වෙති, අත්‍ථවීමංසක ය‍ෑ සංසකාරවීමංසක ය‍ෑ ශාසනා වීමංසක ය‍ෑයි; ඔවුනතුරෙන් **"පණ්ඩිතා හා'වුසො! මනුස්සා වීමංසකා"** ය‍න මෙහි අත්‍ථවීමංසක ආයේ ය‍ෑ; **"යතො බො ආනන්ද! භික්ඛු ධාතුකුසලො ච හොති ආයතන කුසලො ච හොති පටිච්චසමුප්පාද කුසලො ච හොති ඨානාඨාන කුසලො ච හොති, එත්තාවතා බො ආනන්ද! පණ්ඩිතො භික්ඛු වීමංසකොති අලං වචනාය"** ය‍න මෙහි සංසකාරවීමංසක ආයේ ය‍ෑ; මේ සූත්‍රයෙහි වූ කලි ශාසනාවීමංසක අදහස් කරන ලදි. **චෙතොපරියායං**= චිත්තපරිවෙජ්ජය; **සමන්නෙසනතා**= සෙවීම හා‍ත්පසින් සෙවීම පරීක්ෂා කිරීම; **ඉති විඤ්ඤූනාය**= මෙසේ දැනගැනීම පිණිස; **ඉමස්ස ධම්මස්ස නථාගතො සමන්නෙසඉතබ්බො** යි මෙහි කල්‍යාණමිත්‍රයාගේ උපනිශ්‍රය දක්වන ලේඛ- මේ කල්‍යාණමිත්‍රෝ පනිශ්‍රය නම් මහත් මැයි. ඔහුගේ මහත්බව මේසේ දත යුතු:- එක් සමයෙක්හි ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් වහන් සේ (බුහ්මවය්‍යාවගේ) අඩියක් තමාගේ අනුභාවයෙන් වෙයි, අඩියක් කල්‍යාණමිත්‍රානුභාවයෙන්ය‍ි සිතා තමන් ගේ සවභාව (=ඥත) යෙන් නිශ්චයකරන්ට නො හැකි වන්නාහු භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ විචාළහ- "ස්වාමීනි! යම් මේ කල්‍යාණමිත්‍රයන් ඇතිබවක් වේ ද කල්‍යාණසහායයන් ඇතිබවක් වේ ද කල්‍යාණමිත්‍රයන් කෙරෙහි නැමුණුබවක් වේ ද, මෙය මාගීබ්‍රහ්මචය්‍යාවෙහි අඩියකැ" යි. භාග්‍යවතුන් වහන්සේ වදාළහ- ෆ **"ඒවං හෙව ආනන්ද! අවව, මා හෙවං ආනන්ද! අවව, සකලමෙව හිදං ආනන්ද! බ්‍රහ්මචරියං යදිදං කල්‍යාණ**

කල්‍යාණ මිත්‍රොපනිශ්‍රය.

ෆ ආනන්ද! එසේ නො කියව. ආනන්ද! එසේ නො කියව, ආනන්ද! යම් මේ කල්‍යාණමිත්‍රයන් ඇතිබවක් කල්‍යාණසහායයන් ඇතිබවක් කල්‍යාණමිත්‍රයන් කෙරෙහි නැමුණුබවක් වේ ද, මෙය සියලු ම මාගීබ්‍රහ්මචය්‍යාව වෙයි; ආනන්ද! කල්‍යාණමිත්‍රයන් ඇති කල්‍යාණසහායයන් ඇති කල්‍යාණමිත්‍රයන් කෙරෙහි නැමුණු මහණහට ආර්‍යඅෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේය ආර්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය බහුල කරන්නේය යන යම්ක් අද්ද මෙය කැමති විය යුතුයි; ආනන්ද! මහණතෙම කල්‍යාණමිත්‍රයන් ඇත්තේ —පෙ— ආර්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය කෙසේ වඩන්නේ ද? ආර්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය කෙසේ බහුල කරන්නේ ද? ආනන්ද! මේ ශාසනයෙහි මහණ සම්‍යග්දෘෂ්ටිය වඩයි —පෙ— විවෙකය ඇසුරු කළ සම්‍යක්සම්බෝධිය වඩයි; —පෙ— ආනන්ද! මේසේ මහණ කල්‍යාණමිත්‍රයන් ඇත්තේ —පෙ— ආනන්ද! යම් මේ කල්‍යාණමිත්‍රයන් ඇතිබවක් කල්‍යාණසහචරයන් ඇතිබවක් කල්‍යාණමිත්‍රයන් කෙරෙහි නැමුණුබවක් වේ ද මෙය යම්සේ සියලු ම බඹසර වේ ද, ඒ මේ කාරණ (මතු දක්වන) මේ ක්‍රමයෙන් ද දතයුතුයි. ඒ මේසේ ය‍ෑ- ආනන්ද! කල්‍යාණමිත්‍රයා වූ මා කරා පැමිණ ජාතිය සවභාව කොට ඇති සත්වයෝ ජාතියෙන් මිදෙති, ජරාව සවභාව කොට ඇති සත්වයෝ —පෙ— ශොක-පරිදෙව-දුක්ඛ-දෞර්මනස්ස-උපායාස සවභාව කොට ඇති සත්වයෝ ශොක-පරිදෙව-දුක්ඛ-දෞර්මනස්ස-උපායාසයන්ගෙන් මිදෙත්.

මිත්තතා කල්‍යාණසහායතා කල්‍යාණසම්පවඞ්කතා, කල්‍යාණමිත්ත යෝනං ආනන්ද! භික්ඛුනෝ පාටිභබ්බං කල්‍යාණසහායස්ස කල්‍යාණ සම්පවඞ්කස්ස අභිඤ්ඤෙය්‍යං අඤ්ඤාතං මහත්තං භාවෙස්සති අභිඤ්ඤෙය්‍යං අඤ්ඤාතං මහත්තං බහුලීකරිස්සතීති; සඤ්ඤානන්ද! භික්ඛු කල්‍යාණමිත්තෙතා- —පෙ— අභිඤ්ඤෙය්‍යං අඤ්ඤාතං මහත්තං භාවෙති? අභිඤ්ඤෙය්‍යං අඤ්ඤාතං මහත්තං බහුලීකරොති? ඉධානන්ද! භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති —පෙ— සම්මා සමාධිං භාවෙති විවෙකනිස්සිතං —පෙ— එවං බෝ ආනන්ද! භික්ඛු කල්‍යාණමිත්තෙතා —පෙ— බහුලීකතරොති. තදමිනා'පෙතං ආනන්ද! පරියායෙන වෙදිතබ්බං යථා සකලමෙව හිදං බ්‍රහ්මචරියං යදිදං කල්‍යාණ මිත්තතා කල්‍යාණ සහායතා කල්‍යාණ සම්පවඞ්කතා; මමං හි ආනන්ද! කල්‍යාණමිත්තං ආගම්ම ජාතිධම්මා සත්තා ජාතියා පරිමුච්චන්ති, ජරාධම්මා —පෙ— සොක පරිදෙව දුක්ඛදෝමනස්සු පායාස ධම්මා සත්තා සොකපරිදෙවදුක්ඛදෝමනස්සු පායාසෙහි පරි මුච්චන්ති" යි.

භික්ෂූන්ට වතිරඞ්ගසම්පත්තිය වදාරන්නාහු ද මෙසේ වදාළහ— a "බාහිරං භික්ඛවෙ! අඞ්ගන්ති කරිත්වා න අඤ්ඤං එතඞ්ගමං සමනු පස්සාමි යං එවං මහතෝ අත්ථාය සංවත්තති, යථයිදං භික්ඛවෙ! කල්‍යාණමිත්තතා; කල්‍යාණමිත්තතා භික්ඛවෙ! මහතෝ අත්ථාය සංවත්තති" යි. මහාචුන්ද තෙරුන්ට කෙලෙස් ලියාදමන පිළිවෙත වදාරන්නාහු ද- b "පරෙ පාපමිත්තා භවිස්සන්ති මය්හමෙව කල්‍යාණ මිත්තා භවිස්සාමාති සල්ලෙඛො කරණීයො" යි වදාළහ. මෙසේ තෙරුන්ට විමුක්තිය මුහුකුරුවන ධර්මයන් වදාරන්නාහු ද- c "අපරි පක්කාය භන්තෙ! වෙනෙය්‍යතාය පක්කා ධම්මා පරිපාකාය සංවත්ත නති, කතමෙ පක්කා? ඉධ භන්තෙ! භික්ඛු කල්‍යාණමිත්තෙතා හොති" යි කල්‍යාණමිත්‍රයන්ගේ උපනිශ්‍රය ම විශෙෂ කළ සේක. ප්‍රියපුත්‍ර වූ රාහුල තෙරුන්ට නිරතුරු අවවාද දෙන සේක් ද-

---

a මහණෙනි! යම් කාරණෙක් මෙසේ මහත් වූ අර්ථය පිණිස පවතී ද, මහණෙනි! මේ කල්‍යාණමිතුරන් ඇතිබව යම්සේ ද එබඳු වූ බාහිරඅඞ්ගයකි කොට අන් එක ද කාර ණෙක් මම නො දක්නෙමි; මහණෙනි! කල්‍යාණමිතුරන් ඇතිබව මහදරිය පිණිස පවත් නේකි.

b අන්‍යයෝ පාපමිත්‍රයන් ඇත්තෝ වන්නාහුය, ඇපි මෙහි ලා කල්‍යාණමිත්‍රයන් ඇත්තෝ වන්නොමුකි සල්ලෙඛ කටයුතුකි.

c මෙහිය! නො මුහුකුරුයහිය චිත්තවිමුක්තිහුගේ පරිපාකය පිණිස ධර්මයෝ පස් දෙනෙක් පවත්නාහුය, කවර පස්දෙනෙක් ද? මෙහිය! මේ ශාසනයෙහි මහණ කල්‍යණ මිතුරන් ඇත්තේ වෙයි

173. "මිත්තෙන භජිස්සු කල්‍යාණේ - පන්තඤ්ච සයනාසනං
විවිත්තං අප්පනිඝෝසං - මත්තඤ්ඤූ හොහි භෝජනෙ,

174 චීවරෙ පිණ්ඩපාතෙ ච - පච්චයෙ සයනාසනෙ
එතෙසු තණ්හං මා'කාසි - මා ලොකං පුනරාගමී" යි.

කල්‍යාණමිත්‍රයන්ගේ උපනිශ්‍රය ම සියල්ලට පළමු ව වදාළ සේක. මෙසේ මේ කල්‍යාණමිත්‍රොපනිශ්‍රය තම් මහත් වේ. මෙහි දු එය දක් වන භාග්‍යවතුන් වහන්සේ භික්ඛු ධම්මෙසු තථාගතො සම්මන්තයි භික්ඛවෝ යි දෙශනාව ආරම්භ කළ සේක. පණ්ඩිත වූ මහණ ධර්‍ම දෙකක් විෂයෙහි තථාගතයන් සොයාවා, පරීක්ෂා කෙරේවා යන අර්‍ථ යි. මෙයින් භාග්‍යවතුන් වහන්සේ- "මේ තෙම මහාජාති ඇත්තෙකැයි හෝ ලක්ෂණ යෙන් සම්පූර්‍ණ වූවෙකැයි හෝ මහාරු ඇති දැකුම් කටයුත්තෙකැයි හෝ ප්‍රසිඩ වූවෙක අභිලක්ෂිතයෙකැයි හෝ මොහු නිසා මම චීවරාදි ප්‍රත්‍යයන් ලබන්නෙමි හෝ මෙසේ සිතා මා ඇසුරු කොට විසිමෙන් කටයුත් තෙක් නැති, වැළි යමෙක් මෙසේ සලකා ද- මේ තෙම මට ශාස්තෘ වැ ශාස්තෘකෘත්‍යය සිදුකරන්ට පොහොනේය,යි; හෙතෙම මා සෙවනය කෙරේව" යි සිංහනාද කළ සේක. මේ සූත්‍රාන්තානන්තය බුඩසිංහනාද නම් වී ලු.

මෙවිට ඒ ධර්‍මයන් දෙදෙන දක්වන සේක්- චක්ඛු-සොතවිඤ්ඤේය්‍යෙසු යි වදාළහ. එහි ශාස්තෘන්ගේ කායිකසමාචාරය විමසන්නහුගේ චක්ෂුර්විඥානයෙන් දතයුතු ධර්‍මය නම; වාචසිකසමාචාරය ශ්‍රොත්‍රවිඥාන යෙන් දතයුතු ධර්‍මය නම්. දැන් ඒ ධර්‍මයන්හි විමසියයුතු ආකාරය දක් වන සේක්- යෙ සංකිලිට්ඨා යනාදිය වදාළහ. එහි සංකිලිට්ඨා= කෙලෙසුන්ගෙන් සම්ප්‍රයුක්ත වූවාහු; ඔවුහු චක්ෂුර්-ශ්‍රොත්‍ර විඥානයන්ගෙන් දතයුත්තාහු නො ද වෙති; වැළි යම්සේ දිය සැලෙන කල්හි හෝ බුබුළු භරින කල්හි හෝ ඇතුළත මත්ස්‍යයෝ ඇතැයි හැඟේ ද, එපරිද්දෙන්

---

173. කල්‍යාණෙ මිත්තෙන= (ශීලාදියෙන් අධික වූ) කල්‍යාණ මිත්‍ර යන්; භජිස්සු= සෙවනය කරව; විවිත්තං= ජනාකීර්‍ණ නො වූ; අප්පනිඝෝසං= ජනයාගේ කොෝරහිත වූ; පන්තං= වනයෙහි ඉතා දුර වූ; සයනාසනං ච= (මෘග-ශූකරාදීන්ගේ ශබ්දයෙන් ආරණ්‍යසංඥ උපදින) සෙනසුන ද; භජිස්සු= සෙවනය කරව; භොජනෙ= භොජනයෙහි; මත්තඤ්ඤූ හොහි= (පිළිගැනීමෙහි හා වැළඳීමෙහි) පමණ දන්නේ වෙව.

174. චීවරෙ= චීවරයෙහි ද; පිණ්ඩපාතෙ ච= පිණ්ඩපාතයෙහි ද; පච්චයෙ= ග්ලානප්‍රත්‍යයෙහි ද; සයනාසනෙ= සෙනාසනයෙහි ද යන; එතෙසු= මේ සිවුපසයෙහි; තණ්හං= තෘෂ්ණාව; මා අකාසි= නො කරව; ලොකං= මේ ලොකයට; මා පුනරාගමී= (ප්‍රතිසන්ධි වශයෙන්) නැවත නො පැමිණේව.

ප්‍රාණඝාතාදිය හෝ කරන්නහුගේ මෘෂාවාදාදිය හෝ බණින්නහුගේ කාය – වාක්සමාචාරයන් දැක ද අසා ද එය උපදවන සිත කිලුටු යයි නැගේ; එහෙයින් මෙසේ වදාළහ. ඒ එසේ මැයි– කිලුටුසිත් ඇත්තහුගේ කාය – වාක්සමාචාරයෝ ත් කිලුටු වූවාහු ම නම්; **න තෙ තථාගතස්ස සංවිජ්ජන්ති**= ඒ (සමාචාරයෝ) තථාගතයන්ගේ නැති, නො ලැබෙති, මෙසේ **දූනඝනි** යන අර්ථයි. සැබව– නැති බැවින් ම ඔවුහු නො ලැබෙති, ප්‍රතිවජ්ජන්න වූ බැවින් නො වේ. ඒ එසේ මැයි– භාග්‍යවතුන් වහන්සේ එක් දිනක් මේ ධර්මයන් විෂයෙහි භික්ෂුසඞ්ඝයා පවරන සේක් (මෙසේ) වදාළහ– **"හඤ්ඤි භික්ඛවෙ! ආජානනායම් වො න ච මෙ කිඤ්චි ගරහථ කායිකං වා වාචසිකං වා"** යි. මෙසේ වදාළ කල්හි ආයුෂ්මත් ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ හුනස්නෙන් නැගිට උතුරුසළුව එකස් කොට භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හි ද එහි ඇදිලි බැඳ භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් කීහ:– "සවාමිනි! ඇපි භාග්‍යවතුන් ගේ කායික හෝ වාචසික හෝ කිසි (සමාචාරයක්) නො ගරහමු, සවාමිනි! යම්හෙයකින් භාග්‍යවතුන් වහන්සේ නුපන් මාගීය උපදවන්නෝය, අසඤ්ජාත මාගීය ජනනය කරවන්නෝය, ප්‍රකාශ නො කළ මාගීය ප්‍රකාශ කරන්නෝය, මාර්ගඥයෝය, මාගීය වෙසෙසින් දන්නෝය, මාගීයෙහි දක්ෂයෝය; තවද– සවාමිනි! මෙකල්හි මාගීය අනුව යන්නා වූ ද පසුව යෙදුනාවූ ද ශ්‍රාවකයෝ වාසය කෙරෙති" මෙසේ තථාගතයන්ගේ කාය – වාක්සමාචාරයෝ පිරිසුදු වූවාහුය. **උත්තරිමණුසකතෙමේ** ත් "තථාගතයන්ගේ කාය – වාග්චාරයෙහි සිත් නො ගන්නා කිසිවක් දක්නෙමි" සත්මසක් මුළුල්ලෙහි ලුහුබැඳ ශික්ෂාමාත්‍රයකු ත් නො දැක්ක. මනුෂ්‍ය වූ හෝ මේ තෙම බුදුබවට පැමිණියහුගේ කාය – වාග්චාරයෙහි සිත් නො ගන්නා කුමක් දක්නේ ද? මාරදිව්‍යපුත්‍ර ද බෝසත් වූවහුගේ මහාභිනික්මන පවත් සවසක් විමසමින් සිත් නො ගන්නා කිසිවක් යටත්පිරිසෙසින් චිත්තයාගේ විතර්කීමාත්‍රයකු දු නො දැක්ක. මාර තෙම මෙසේ සිති ලදී:– "ඉදින් මොහුගේ විතර්කී කළ පමණකු දු අකුශලයක් දක්නෙම් නම්, එහි දී ම ඔහුව මුදුනෑ පැහැර යන්නෙමි" හෙතෙම සාවුරුද්දක් නො දැක බුදුවූවහු ද එක් වසක් ලුහුබැඳ කිසි වරදක් නො දක්නේ යන කාලයෙහි වැද–

175. **"මහාවීර! මහාපඤ්ඤ! – ඉඞ්ඝා යඤ්ඤා ජලං!**
සබ්බවෙරභයාතීත! – පාදෙ වන්දාම ගොතම!" යි–

---

175. **මහාවීර**= මහාවීර වූ; **මහාපඤ්ඤ**= මහාප්‍රාඥ වූ; **ඉඞ්ඝා**= ඍඞ්ධියෙන් ද; **යඤ්ඤා**= යශසින් ද; **ජලං**= දිලියෙන්නාවූ; **සබ්බවෙර භයාතීත**= සියලු අකුශල වෛරයන් හා පුදාල වෛරයන් ද දුගීති ආදි භය ද ඉක්මවා සිටි; **ගොතම**= ගෞතමයන් වහන්ස! **පාදෙ**= ඔබගේ පාදයන්; **වන්දාම**= වඳිමි.

ගාථාවක් කියා ගියේය. **විතිමිස්සා**= කලෙක කෘෂ්ණ වූවාහුය කලෙක ශුක්ල වූවාහු යනි මෙසේ ව්‍යතිමිශ්‍ර වූ; **වෝදාතා**= පිරිසුදු වූ, නිකෙලෙස් වූ; **සංසිද්ධන්ති**= පිරිසුදු වූ ධර්මයෝ ඇත්තාහුය, ලැබෙත්; ඒ එසේ මැයි- තථාගතයන්ගේ කායසමාචාරාදීහු පිරිසුදු වූවාහුය, එයින් කිහ- *a* **"චත්තාරිමානි භික්ඛවෙ! තථාගතස්ස අරක්ඛෙය්‍යානි, කතමානි චත්තාරි? පරිසුද්ධකායෙ සමාචාරෙ භික්ඛවෙ! තථාගතෙ, නත්ථි තථාගතස්ස කායදුච්චරිතං යං තථාගතෙ රක්ඛෙය්‍ය මා මෙ ඉදං පරෙ අඤ්ඤාසිනි; පරිසුද්ධවචීසමාචාරෙ- පරිසුද්ධමනොසමාචාරෙ- පරිසුද්ධාජීවෙ භික්ඛවෙ! තථාගතෙ, නත්ථි තථාගතස්ස මිච්ඡාජීවෙ යං තථාගතෙ රක්ඛෙය්‍ය මා මෙ පරෙ අඤ්ඤාසි"** යි.

ඉමං කුසලං ධම්මං= මේ අජීවඨමකසීලයට; මේ ආයුෂ්මත් ශාසනය තෙම කිමෙක් දෝ හෝ බොහෝ කලක් පැමිණියේ ද, බොහෝ කලක පටන් මෙයින් යුක්ත වූයේ ද, නොහොත් පැමිණි මදකල් ඇත්තේ ද, ඊයේ හෝ පෙරදා හෝ පෙරතර (= පළමු) දා හෝ පැමිණියේ දැයි මෙසේ විමසයි යන අර්ථ යි ඒ එසේ මැයි- එකකු විසින් එක් තැනක වසන්නා බොහෝ මිථ්‍යාජීවකර්මය කරන ලද වෙයි; එය කල් ඉක්මයාමෙහි දී පැනෙයි, ප්‍රකට වෙයි; හෙතෙම් එක්තරා පසල්ගමකට හෝ මුහුදුතෙර කට හෝ ගොස් පන්සලක් කරවා ආරණ්‍යකයකු මෙන් ව වෙසෙයි; මනුෂ්‍යයෝ බුහුමන් උපදවා ඔහට ප්‍රණීත වූ ප්‍රත්‍යයන් දෙති; දනව්වැසි භික්ෂූහු ඔහුගේ පෙරහර දැක "එකාන්තයෙන් මේ ආයුෂ්මත් ඉතා දුප්පුණෙක, මේ කවරෙක් දෝ හෝ" යි විමසන්නාහු අසවල් තැන අසවල් නම් මිථ්‍යාජීවය කොට පැනගිය මහණ යයි දැන "මොහු සමඟ පොහොය හෝ පවුරුණු හෝ කරන්ට නො හැක්කැ" යි රැස් ව දැහැමෙන් සෙමෙන් උක්ෂෙපණීයාදීන් අතුරෙන් එක්තරා කර්මයක් කෙරෙත්. මෙබඳු වූ ප්‍රතිවර්ජනා වූ ප්‍රතිපත්තිය ඇතිබව හෝ නැතිබව හෝ විමසන්ට මෙසේ වදාළහ. **එවං ජානාති**= බොහෝ කලක පටන් පැමිණියේය, පැමිණි මදකල් ඇත්තේ නො වේ යයි දැනගනී තවද- යම්හෙයකින් මෙකල්හි සුදුහඬවට පැමිණි තථාගතයන්ගේ බොහෝ කලක් ආජීවඨමකසීලය පිරිසුදු වන්නේ ද, බෝසත් ව හැසිරෙන කල්හි දු යමෙකුගේ (සිලය) මෙසේ පිරිසුදු වී ද, මෙය ආශ්චර්‍යයෙක් නො වන්නේය.

---

a මහණෙනි! තථාගතයන්ගේ නො රැක්කයුතු ධර්ම සතරක් වෙති; කවර සතරක් ද? යත්:- මහණෙනි! තථාගත පිරිසුදු කායසමාචාර ඇත්තේ යැ, මහණෙනි! මාගේ මේ කර්මය අනිසෙක් නො දනිව.යි තථාගත යම් දුශ්චරිතයක් රක්නේ ද, එබඳු වූ කාය දුශ්චරිතය තථාගතයාට නැත; -වචීසමාචාර- මනොසමාචාර- මහණෙනි! තථාගත පරිශුද්ධාජීව ඇත්තේ යැ, මාගේ මේ කර්මය අනිසෙක් නො දනිව,යි තථාගත යම් මිථ්‍යා ජීවයක් රක්නේ ද, එබඳු වූ මිථ්‍යාජීවය තථාගතයාට නැති.

අතීතයෙහි ගන්ධාරරජ්ජුරුවෝ ද විදෙහරජ්ජුරුවෝ ද යන දෙදෙන ම යහළුවෝ වැ පස්කම්හි ආදීනව දැන රාජ්‍යයන් පුතුන්ට පාවා දී ඍෂිප්‍රව්‍රජ්‍යාවව පැමිණ එක් ආරණ්‍යග්‍රාමයක පිඹු

ගන්ධාරජාතකය. පිණිස හැසිරෙති; තවද- පිටිසර නම් දැකසේ ලැබිය යුතු ලුණු ඇත්තේ වෙයි; ඔවුහු ලුණු නැති කැඳ ලැබී එක් ශාලාවක හිඳ පානය කරති; අතරින් අතර මනුෂ්‍යයෝ ලුණුසුණු ගෙනවුත් දෙන්නාහුය; එක් දවසක් එනෙක් (වෙදෙහ) ඍෂිහට කොළ යක බහා ලුණුසුණු දුන්නේය; වෙදෙහඍෂි (එය) ගෙන අඬක් ගන්ධාර ඍෂින් සමීපයෙහි තබා අඬක් තමන් සමීපයෙහි තැබීය; එයින් මදක් වළඳන ලදින් ඉතිරි වූයේ දැක මෙය නො හසිව,යි කොළයෙන් ඔතා තණලැහැබක තැබීය; නැවත එක් දිනක් කැඳ බොන වේලෙහි සිහි කොට බලන්නේ ඒ දැක ගන්ධාරඍෂින් වෙත පැමිණ "ආචාරිනි! මෙයින් මදක් ගනුමැනවැ" යි කීය; "වෙදෙහඍෂිය! තොප විසින් කොයින් ලද දැ?" යි; එදවස වළඳන ලදින් ඉතිරි (ලුණු) නො නසීවයි මා විසින් තබන ලදැයි; ගන්ධාරඍෂිහු ගන්ට නො කැමති වූහ; ඒ ලුණු නැත් නාවූ ම කැඳ බී වෙදෙහ ඍෂිහට මෙසේ කිහ.

176. **"හිත්වා ගාමසහස්සානි - පරිපුණ්ණානි සොළස**
භොඤ්ඤාගාරානි චීනානි - සන්නිධිංදූනි කුබ්බසි" යි.

වෙදෙහඍෂි මෙසේ කීය- නුඹ වහන්සේ රාජ්‍යය හැරදමා පැවිදි වූවාහු දැන් ලුණුසුණු පමණක් රැස්කිරීම් කරුණෙන් පැවිද්දට සුදුසු වූවක් නො කරන්නහු දැ? යි; වෙදෙහඍෂිය! මා විසින් කුමක් කරන ලද දැ? යි; එකල්හි ඒ ගන්ධාරඍෂින්ට මෙසේ කීය-

177. **"හිත්වා ගන්ධාරවිසයං - පහූනධනධඤ්ඤිං**
පඤ්ඤානෙනා නික්ඛමනෙනා - ඉධ'දූනි පඤ්ඤසි" යි.

ගන්ධාරඍෂිහු (මෙසේ) කීහ-

---

176. **පරිපුණ්ණානි**= සම්පූර්ණ වූ; **සොළස ගාමසහස්සානි**= සොළොස් දහසක් ගම් ද; **චීනානි**= පිරුණාවූ; **භොඤ්ඤාගාරානි**= (රන්රුවන් ආදියෙන් යුත්) කොටුගුල් ද; **හිත්වා**= හැරදමා; **ඉදූනි**= දැන්; **සන්නිධිං**= (ලුණුමාත්‍රයක්) රැස් කොට තැබීම; **කුබ්බසි**= කරන්නෙහි.

177. **පහූනධනධඤ්ඤිං**= පිරුණා වූ ධනධාන්‍ය ඇති; **ගන්ධාරවිසයං**= ගන්ධාරදෙශය; **හිත්වා**= හැරදමා; **පඤ්ඤානෙනා**= අවවාද-අනුශාසනාදීනයෙන්; **නික්ඛමනෙනා**= නික්මුණේ; **ඉදූනි**= දැන්; **ඉධ**= මේ වත්යෙහි; **පඤ්ඤසි**= (කුමක් හෙයින් මට) අවවාද කෙරෙහි ද?

178. "ධම්මං භණාමි හදදනෙත - අධම්මෝ මෙ න රුච්චති
ධම්මං මෙ භණමානස්ස - න පාපමුපලිප්පති" යි.

වෙදෙහ තෙම කියා-

179. "යෙන කෙනචි වණ්ණෙන - පරෙ ලබ්භති රූපනං
මහත්තියමපි චෙ වාචං - න නං භාසෙය්‍ය පණ්ඩිතෝ" යි

ගඤ්ඣාර තෙම් කියා-

180. "කාමං රූපතු වා මා වා - භුසංව විකිරියතු
ධම්මං මෙ භණමානස්ස - න පාපමුපලිප්පති" යි.

මෙසේ ද කියා නැවත - "යමෙකුට සවකිය බුඩියත් නැද්ද, ඇදුරන් සමීපයෙහි විනයත් නො හික්මේ ද, හෙතෙම වනයෙහි අදම්මෙකුමෙන් හැසිරේ ය" යි සිතා කියා-

181. "නො චෙ අස්ස සකා බුඩි - විනයෝ වා සුසික්කිතෝ
වනෙ අඩ්ඣමගිසෝව - වරෙය්‍ය බහුකා ජනෝ,

---

178. නෙ= නුඹට; හදදං= කල්‍යාණයක් වේවා; ධම්මිං= සවභාවය හෙවත් බුඩාදීන් වණ්නා කළ ප්‍රශස්ත කාරණය; භණාමි= මම කියමි. මෙ= මට; අධම්මෝ= අධම් නම් වූ අසවභාවය; න රුච්චති= රුචි නො වේ. ධම්මං= ධර්ම හෙවත් කාරණය ම; භණමානස්ස මෙ= කියන්නා වූ මාගේ (සිතෙහි;) පාපං= පාපයෙක්; න උපලිප්පති= නො ඇලෙයි, (පවිතම් නැති.)

179. යෙන කෙනචි වණ්ණෙන= දැහැමි වූ ද යම් කිසි කාරණය කින්; පරෝ= මෙරමා; රූපනං= හැටීම හෙවත් කිපීම; ලබ්භති= ලබා ඉැසි. චෙ= ඉදින් (යම් වචනයකින් මෙරමා කිපේ ද;) මහත්තියමපි= මහත් අවිනිශ්‍රිත වූ ද; නං වාචං= ඒ වචනය; පණ්ඩිතෝ= පණ්ඩිත පුරුෂ තෙම; න භාසෙය්‍ය= නො කියන්නේයි.

180. කාමං= එකාන්තයෙන් (අයුකතකාරී පුඟල අවවාද කරනු ලබන්නේ;) රූපතු වා= කිපේවා හෝ; මා වා= නො කිපේවා හෝ; භුසං + ඉව= බොල්මවක් මෙන්; විකිරියතු= විසිරේ වා හෝ; ධම්මං= ධර්ම ය; භණමානස්ස මෙ= කියන්නා වූ මාගේ සිතෙහි; පාපං= පාප යෙක්; න උපලිප්පති= නො ඇලේ.

181. චෙ= ඉදින්; සකා බුඩි= සවකිය බුඩිය හෝ; සුසික්කිතෝ= (ආචාර්‍යයන් ඇසුරු කොට) මොනොවට හික්මුණාවූ; විනයෝ වා= ආචාරවිනය හෝ; නෝ අස්ස= නො වන්නේ ද; එකල්හි වනෙ= වන යෙහි; අඩ්ඣමගිසෝව= අදම්වකු මෙන්; බහුකා ජනා= බොහෝ ජනතෙම; වරෙය්‍ය= හැසිරෙන්නේය.

182. යසමා ච පනි'ඛෙ'ත්‍ථවෙව - ආචාරමහි සුසික්ඛිතා
නත්‍ථමා විනිතවිනයා - චරන්ති සුසමාහිතා" ති.

ඉක්බිති වෙදෙහ තවුස් තෙම "නො දූන මා විසින් කරන ලදූ' සි ගන්ධාරරාජාපසඝන් ක්ෂමා කරවිය. ඔවුහු දෙදෙනම තපස්රැකා බඹලොව ගියාහුය. මෙසේ තථාගතයන්ගේ බොධිසත්ව කාලයෙහි ද බොහෝ කලක් ආජීවඝ්මකසිලය පිරිසුදු වී.

සඳ්ධාපබ්බජිතෙනා අයමායසමා භික්ඛූ යසං පතෙනා= මේ ආයුෂ්මත් වූ අපගේ ශාස්තෘ වූ භික්ෂු තෙම දන්නාබවට ප්‍රසිඛබවට ප්‍රකට බවට පැමිණියේ ද් හෝ, යශසට පරිවාරසම්පත්තියට ත් පැමිණියේ ද් හෝ නො පැමිණියේ ද් හොත්,සි මොහුගේ ප්‍රසිඛබවට පැමිණි බැවින් ද යශසින් යුක්ත බැවින් ද කිම ඒ ඇතැම් ආදීනවයෝ දක්නා ලැබෙත් ද? නොහොත් නැද්දූ?සි, මෙසේ විමසාව,සි දක්වන සේක. න නාව භික්ඛවෙ!= යම්තාක් මහණ රාජ-රාජ මහාමාත්‍යාදීන් කෙරෙහි ප්‍රසිඛබවට හෝ පරිවාරසම්පත්තියට හෝ නො පැමිණියේ වේ ද, ඒතාක් මානාතිමානාදි ඇතැම් ආදීනවයෝ නො දක්නා ලැබෙත්; අතිශයින් උපශාන්තවූයේ ස්‍රොතාපන්නයකු මෙන් ද සකෘදාගාමියකු මෙන් ද විඃය කෙරෙයි; ආර්‍යයෙක් ද් හෝ පෘථග්ජනයෙක් ද් හොත්,සි කියා ත් දූනගන්ට නො හැකි වෙයි යතො ච ඛො භික්ඛවෙ!= නැවත යම්සේ මේ ශාසනයෙහි ඇතැම් මහණෙක් ප්‍රසිඛ වූයේ හෝ පරිවාරයෙන් යුක්ත වූයේ හෝ වේ ද, එකල්හි තියුණු හඟින් ගවසමූහයාට අනින්නා වූ දුඟ ගොණකු මෙන් ද, මෘගසමූහයා මඬනා වූ දිවියකු මෙන් ද, අන්‍ය භික්ෂූන් ඒ ඒ තැන්හි විදිමින් ගෞරව රහිත වූයේ අසමාන පැවතුම් ඇත්තේ අගපයින් බිම සපයී කරමින් මෙන් හැසිරෙයි; යම් ඇතැම් කුලපුත්‍රයෙක් යම් යම් පරිද්දෙකින් ප්‍රසිඛ වූයේ යශස් ඇත්තේ වේ ද, ඒ ඒ පරිද්දෙන් පලබරින් බරවූ හැල්මෙන් ඉතා මැනවින් පහතට නැමෙයි; රජ-රජ මහඇමති ආදීන් සම්පයට එළුඛෙන කල්හි නිදොස් බව ප්‍රත්‍යවෙක්ෂා කොට ශ්‍රමණසංඥව එළවා සිදුඹුඅං ඇති ඛාහයකු මෙන් ද සැඩොල් දරුවකු මෙන් ද සුරත වූ පහත් පැවතුම් ඇත්තේ පහත් සිත් ද ඇති,ව භික්ෂු සඞ්ඝයාගේ ද දෙවියන් සහිත ලොකයාගේ ද හිතයට සුවයට පිළිපදී; මෙබඳු පිළිවෙත සඳහා නාසස ඉඛෙකවෙම් ආදීනවා සි වදාළහ. තථාගතයන් වහන්සේ වනාහි අටලෝදහම්හි නාදී සේක; යම්හෙයකින් ඒ තථාගත ලාභයෙහි ත් නාදී වූයේ අලාභ

---

182. ච- නැවත; යසමා පන= යම් හෙයකින්; ඉධ= මේ ලෙව්හි; එකවෙව= ඇතැම් කෙනෙක්; ආචාරමහි= ආචාරවිනයෙහි; සුසික්ඛිතා= මොනොවට හික්මුණාහු වෙත් ද; (එහෙයින්) විනිතවිනයා= හික්මවන ලද විනය ඇති; ධීරා= ඒ ප්‍රාඥයෝ; සුසමාහිතා= එකඟ වූ සිත් ඇති ව; චරන්ති= හැසිරෙත්.

යෙහි ත් තාදී වූයේ යශස්හි ත් තාදී වූයේ අයශස්හි ත් තාදී වූයේ නින්දා වෙහි ත් තාදී වූයේ ප්‍රශංසාවෙහි ත් තාදී වූයේ සැපයෙහි ත් තාදී වූයේ දුකෙහි ත් තාදී වූයේ ද, එහෙයින් සියලු ආකාරයෙන් ම ඒ තථාගත යන්ගේ මෙලෙවිහි ඇතැම් ආදීනවයෝ විද්‍යමාන නො වෙත්. අභයූපරතා= නිර්භය ව අතිභයෙන් ඇලුනේ නිරතුරු ඇලුනේ ද්‍රෝ හෝ යන අර්ථ යි; නොහොත් භයින් නො ඇලුනේ නුයි ද අභයූපරත නම් වෙයි; ඒ එසේ මැයි- භය සතරක් වෙති, කෙලෙසහය වතීතභය දුගතිභය උපවාදභය යි; පුහුදුන් තෙම සතරබියෙන් ම බිය වෙයි. ශෛක්ෂයෝ තුනකින් බියවෙයි, යම්හෙයකින් ඔවුන්ට දුගතිභය ප්‍රහීණ ද, එහෙයින් සප්තශෛක්ෂයෝ භයූපරත (= භයින් ඇලුනාහු) වෙති, ක්ෂීණාශ්‍රව අභයූපරත නම්; සැබව- ඔහුට එක ද භයක් නැත්තේය. පරවාදභය නැද්ද? යත්:- පරානුකම්පාව නිසා වැළි "මා වැනි ක්ෂීණාශ්‍රවයකු නිසා සත්ත්වයෝ නො නැසෙත්ව" යි උපවාදය රකී. මූලුපපලවාපි විහාර වැසි තෙරුන් මෙනි—

මූලුපලෑවෙහෙර තෙරුන් වහන්සේ.

තෙරුන් වහන්සේ වනාහි මූලුපලෑගම් පිඬු පිණිස පිවිසියහ; එකල උපසථාගකකුලදෙරව පැමිණි ඒ තෙරුන්ගේ පාත්‍රය ගෙන එණ්ඩිලපිසි කාව (= පිල්කඩ) ඇසුරු කොට අසුනක් පැනවූහ; ඇමතිදූ ද ඒ පිල ම ඇසුරු කොට පරහාගයෙහි ඉතා පහත් අසුනක් පනවා හිඳගත. එක් නෙවාසික භික්ෂුවක් පසුව පිඬු පිණිස පිවිසියේ දෙර සිට ම බලන්නේ "තෙරුන් වහන්සේ ඇමතිදුවණ්ය සමඟ එක ඇදෙහි හුන්හ" යි සලකා "මේ පාංශුකූලික විහාරයෙහි ඉතා සන්සිදුනකු මෙන් වෙසෙයි. එහෙත් ඇතුළුගම් උපසථාගිකාවන් සමඟ එක් ඇදෙහි හිඳිය" යි සිතා "කිමෙක් ඇදූ හෝ මා විසින් වරදවා දක්නා ලද දූ" යි නැවත නැවත බලා එසේ නොදැනි ම නික්මගියේය. තෙරුන් වහන්සේත් බත්කිස කොට විහාරයට හොස් වසන තැනට පිවිස දෙර වසා වැඩහුන්හ. නෙවාසික තෙමේ ද කළු බත්කිස ඇත්තේ විහාරයට අවුත් ඒ පාංශුකූලික තෙරුන් නිග්‍රහ කොට විහාරයෙන් බැහැර කරන්නෙමි, අසංවර ලෙසින් තෙරුන් වසන තැනට හොස් පරිභොග දිගකළයෙන් කෙනෙස්සෙන් ජලය ගෙන මහත් ශබ්ද කෙරෙමින් පා සේදීය. තෙරුන් වහන්සේ "මේ අසංවර ව හැසිරෙන තෙනැත්තේ කවරෙක් ද්‍රෝ හෝ" යි විමසන්නාහු සිඟල්ල දුන "මේ තෙම මා කෙරෙහි සිත දූෂ්‍ය කොට අප යුට පැමිණෙන්නෙක් නො වේව" යි අහසට පැනනැඟී කැණීමඩල සම්පයෙහි පලගින් වැඩහුන්හ; නෙවාසික තෙම දුෂ්ටාකාරයෙන් යතුර ඔසොවා දෙර හැර ඇතුළත පිවිසියේ වන්නේ ය,යි බලා එහි ද නො දක්නේ නික්මගන්ට පවන්ගත; තෙරුන් වහන්සේ කැරැහ; අනිත් තෙනැත්තේ උඩ බලමින් දූක ඉවසන්ට නො හැකි වන්නේ මෙසේ කිය— "ඇවැත්නි! පාංශුකූලිකය! වෙසේ මහත් අනුභාවයෙන් යුක්ත වූ

තොපට උපස්ථායිකාව සමග එක් ඇදෙහි හිඳින්ට සුදුසු දැ?" යි; "සවාමීනි! පැවිද්දෝ නම් මාගමක් සමග එක් ඇදෙහි නො හිඳිති, වැළි ඔබ විසින් මේ වරදවා දක්නා ලදැ" යි. මෙසේ ක්ෂීණාශ්‍රවයෝ පරාතු කම්පාවෙන් උපවාදය රකිත්. **ධාරාගතස්ස= රාගය ක්ෂයවීමෙන් ම** ජීත රාගී හෙයින් කාමයන් සෙවීතය නො කෙරෙති, ප්‍රත්‍යවෙක්ෂා කොට වළකා නො වේ යයි; **ඛෝ එව= මෙසේ** තථාගතයන්ගේ කෙලෙසප්‍රහාණය දැන ඒ ඒ තැන්හි උන්-සිටිකාලාදියෙහි ද සිවුපිරිස් මැද අලඞ්කෘත ධර්මාසනයෙහි හිඳ ද මෙසේ ත් ශාස්තෘන් වහන්සේ පහවූ රාග ඇතියහ, පහවූ වෙෂ ඇතියහ, පහවූ මොහ ඇතියහ, වමනය කළ කෙලෙස් ඇති යහ, ප්‍රහීණ වූ මල ඇතියහ, මෙසෙයින් මීදුණු පුන්සඳ සෙයින් පරිශුඛයහ,යි මෙසේ තථාගතයන්ගේ කෙලෙසප්‍රහාණයෙහි ගුණ කියන්නාවූ වීමංසකමහණ අන්‍යයෝ ඉදින් මෙසේ පුළුවුස්සාහු නම් යහ අපි යි.

ආකාරඤ්ඤා= කාරණයෝ; අඤ්ඤා= අනුබුඩිහු; සඞ්ඝෂ වා විහරණතා= එක් කලෙක අපරිවර්ජිත්‍ය වූ භික්ෂුසඞ්ඝයා මැද වාසය කරන්නේ නමුදු; **එකෂා වා විහරණතා= "ඉච්ඡාමහං භික්ඛවෙ! අඩ්ඪමාසං පතිසල්ලි සිතුං" "නෙමාසං පතිසල්ලිසිතුං"** යි මෙසේ විවෙක ව වාසය කරන්නේ, හා පාරිලෙය්‍යක වනලැහැබෙහි ද එකලා වැ වාසය කරන්නේ; **සුඝතා=** මොනොවට ගියාහු, සුපිළිපන් වූවාහු, කාරක වූවාහු, යුක්ත ප්‍රයුක්ත වූවාහු; ඒ එසේ මැයි- මෙබඳු වූ ද ඇතැම් භික්ෂූහු ඇති; **දුඝතා=** වරදවා ගියාහු, දුෂ්ප්‍රතිපන්න වූවාහු, ශරීරයාගේ දැඩිබැව් බොහෝ කොට ඇත්තාහු, හළ කමටහන් ඇත්තාහු; මෙබඳු වූ ද ඇතැම් භික්ෂූහු ඇති; **ගණමනුසාසනති=** ගණබන්ධනයෙන් බැඳුනාහු, ගණයා කෙරෙහි ඇලුනාහු ගණයා කෙරෙහි බහුල පැවතුම් ඇත්තාහු වැ ගණයා පරිහරණය කෙරෙති; මෙබඳු වූ ද ඇතැම් භික්ෂූහු ඇති; ඔවුන්ට ප්‍රතිපක්ෂ වූ ගණයා කෙරෙන් නික්මුණා වූ පහවූ සංසර්ගී ඇති, වෙන්ව වාසය කරන්නාහු ද ඇති. **ආමිසෙසු සංදිස්සන්ති= ආමිෂයෙහි** ගිජුවූවාහු **ආමිෂයෙහි** ලොල්වූවාහු සිවුපස **ඝඩ්ඛ්‍යාත ආමිෂය** සඳහා ම ඇවිදිනාහු **ආමිෂයෙන්** පැනෙන්නාවූ භික්ෂූහු ද ඇති; ආමිෂයෙන් අනුපලිප්ත (=නො ඇලුණා)වූ සිවුපසයෙන් නැවතුණු සිත්ඇති මෙෂයෙන් නික්මුණු සඳ මෙන් ව වාසය කරන්නාහු ද ඇති; **නායස්මාගස්මා තං භොන්ත අවජානාති=** මේ ආයුෂ්මත් ශාස්තෘ තෙම ඒ ඒ පිළිවෙතින් ඒ ඒ පුද්ගලයා අවමන් කෙරෙයි; මේ තෙම සුපිළිපන් ගැ කාරක ගැ, මේ තෙම ගණයා කෙරෙන් නික්මුණේ ගැ පහවූ සංසර්ගී ඇත්තේ ගැ, මේ තෙම ආමිෂයෙන් අනුපලිප්ත ගැ ප්‍රත්‍යයන්ගෙන් නැවතුණු සිත් ඇත්තේ ගැ, මෙෂයෙන් මීදුණු සඳ මෙන, යි මෙසේ ඔහුගේ ගෘහශ්‍රිත වශයෙන් උසස් කිරීමකු දු නැති; මේ තෙම දුෂ්ප්‍රතිපන්න ගැ අකාරක ගැ ශරීරයාගේ දැඩිබැව් බහුල කොට ඇත්තේ ගැ හළ කමටහන් ඇත්තේ ගැ, මේ තෙම ගණබැඳුමෙන් බඳනා ලද ගැ, මේ තෙම ආමිෂයෙහි ගිජු ගැ ලොල් ගැ ආමිෂයෙහි ලූ

ඇස් ඇත්තේය,යි මෙසේ ඔහුගේ ගෘහශ්‍රිත (= තෘෂ්ණා) වශයෙන් බැහැර කිරීමකු දූ නැත යන අර්ථ යි. මෙයින් කුමක් කියන ලද වේ ද? තථාගතයන්ගේ සත්‍යයන් කෙරෙහි තාදීභාව කියන ලද වෙයි සැබවැ— මේ තථාගත—

183. **"වඩ්ඪකස්ස දෙවදත්තස්ස - වොරස්සඩ්ගුලිමාලිනෝ**
ධනපාලකෙ රාහුලෙ ච - සබ්බඝං සමණෝ මුනී" යි.

තත්‍ර භික්ඛවෙ!= ඒ වීමංසකයන් දෙදෙනා අතුරෙන් යම් මේ **"යෙ පනා'යස්මන්තො ආකාරා"** යන ප්‍රශ්නයෙන් ආ ශ්‍රාවිවීමංසකයෙකු ත් වේ ද, **"අහඤ්ඤපරෙනා අඤ්ඤාඝම්මා** යන (ප්‍රශ්නයෙන්) ආ මූලවීමංසක යෙකු ත් වේ ද, ඔවුනතුරෙහි මූලවීමංසකයා විසින් තථාගත තෙමේ මත්තෙහි නො විචාළ යුත්තේය; යම්හෙයකින් හෙතෙම පළමු අන්‍ය යාගේ ම කථාවෙන් නිෂ්ඨාවට ගියේ ද, තවද- අන්‍යයෙක් නම් දූන ද නො දූන ද කියන්නේය, මෙසේ ඔහුගේ කථාව සත්‍ය වූවා ත් අසත්‍ය වූවා ත් වේ ද, එහෙයින් අන්‍යයාගේ ම කථාවෙන් නිෂ්ඨාවට නො ගොස් එයින් මත්තෙහි තථාගත තෙමේ ම විචාළ යුත්තේය යන අර්ථ යි. **ව්‍යාකරමානෙ** යන මෙහි යම්හෙයකින් තථාගතයන්ගේ මිථ්‍යාප්‍රකාශයක් නම් නැද්ද. එහෙයින් "සම්මා, මිච්ඡා" යි නො කියා "ව්‍යාකරමානෙ" යි ම කියන ලදී; **එනපථෙ'හමස්මි එනගොචරෝ**= මාගේ ආජීවඵලකසිලය පිරිසුදු යෑ, මේ තෙම මාගේ මාර්ගය, මේ තෙම ගොචරය යන අර්ථ යි. **එනාපාථෙ** යි ද පාඨ යි, එහි අර්ථ නම්:- මාගේ ආජීවඵලකසිලය පිරිසුදු යෑ, ඒ මම ඒ ශීලයාගේ පිරිසුදුබැවින් වීමංසක භික්ෂුහුගේ "එනාපාථෙ"= මෙසේ ආපාථයට එමී, කියන ලද වෙයි. **නො ච තන්හ තම්මයෝ**= තවද- මම ඒ පිරිසුදු සීලයෙන් "න තම්මයෝ"= තෘෂ්ණා සහිත නො වෙමි, පිරිසුදු සිල් ඇතිබැවින් ම මම තෘෂ්ණාරහිත වෙමි, දක්වන සේක.

උත්තරුත්තරිං පණීතපණීතං= අතිශයින් ශ්‍රෙෂ්ඨ ද අතිශයින් ප්‍රණීත ද කොට දෙශනා කරති; **කණ්හසුක්කසප්පටිභාගං**= අකුශලය ද කුශලය ද, හෙ ද වනාහි සප්‍රතිභාග කොට සවිපාක කොට අකුශලය ශ්‍රුතිබාහනය කොට කුශලය, කුශලය ප්‍රතිබාහනය කොට අකුශලය යයි මෙසේ සප්‍රතිභාග කොට කුශලාකුශලය දෙශනා කෙරෙති; තවද- අකුශලය දෙශනා කරන්නාහු ද උත්සාහ සහිත ව විපාක සහිත ව දෙශනා

---

183. **වඩ්ඪකස්ස**= වඩක වූ; **දෙවදත්තස්ස**= දෙවිදත්හට ද; **අඩ්ගුලිමාලිනෝ**= ඇඟිලි මාලා ඇති; **වොරස්ස**= සොරහට ද; **ධනපාලකෙ**= ධනපාලක ඇතු කෙරෙහි ද; **රාහුලෙ ච**= රාහුල පුත්කුමරුන් කෙරෙහි ද යන; **සබ්බඝං**= සියල්ලන්ට; **මුනී**= සර්ව්‍වඥමුනි තෙම; **සමණෝ**= සමාන පැවතුම් ඇත්තේ වී.

කෙරෙති; කුශලය දෙශනා කරන්නාහු ද උතුසාහ සහිත ව විපාක සහිත ව දෙශනා කෙරෙති. **අභිඤ්ඤාය ඉමෙසඤ්ච ධම්මං ධම්මෙසු නිඤ්ඤං ගච්ඡති**= ඒ දෙශනා කළ ධර්මයෙහි ඇතැම් ප්‍රතිවෙධ ධර්මයක් විශිෂ්ට ඥානයෙන් දැන ඒ අභිඥාත වූ ප්‍රතිවෙධ ධර්මයෙන් දෙශනාධර්මයෙහි නිෂ්ඨාවට පැමිණෙයි; **සඤ්ඤී පසීදති**= මෙසේ ධර්මයෙහි නිෂ්ඨාවට ගොස් අති ශයින් "භාග්‍යවත්හු සම්‍යක් සම්බුධයහ" යි ශාස්තෘන් කෙරෙහි පහදී; යළි ඒ භාග්‍යවතුන් විසින් යම් ධර්මයෙක් ප්‍රකාශ කරන ලද ද, භාග්‍ය වතුන් විසින් ඒ ධර්මය ද සවාකඛාත යැ, නෛර්‍යාණික බැවිනි; යමෙක් ඒ ධර්මය පිළිපන්නේ වේ ද, ඒ (සඞ්ඝ තෙමේ ද) සුප්‍රතිපන්න යැ, (කාය) වඞ්කාදි වූ දෙස් රහිත පිළිවෙතට පිළිපන් බැවිනැ,යි මෙසේ ධර්මය හ, සඞ්ඝයා කෙරෙහි ද පහදී; **තං චෙ**= ඒ මෙසේ පහන්වූ ඒ ඒ තැන තුනු රුවන් ගුණ කියන මහණ; **ඉමෙහි ආකාරෙහි**= මේ ශාස්තෘන් විමසන කරුණුවලින්; **ඉමෙහි පදෙහි**= මේ අක්ෂරසම්පිණ්ඩන සඛ්‍යාත පද වලින්; **ඉමෙහි බ්‍යඤ්ජනෙහි**= මේ මෙහි කී අකුරුවලින්; **සඛා නිව්ඨා**= ඔසපනා ශ්‍රද්ධාව පිහිටියා වෙයි; **මූලජාතා**= සෝවාන්මඟ විසින් හටගත් මුල්ඇත්තී වෙයි; **සැබව- සෝවාන්මඟ ශ්‍රද්ධාවගේ මූලය නම්; ආකාර වති**= කාරණය විමසා ගත්බැවින් කරුණු සහිත වූ; **දස්සනමූලිකා**= සෝවාන්මඟ මුල් කොට ඇති; සැබව- ඒ සෝවාන්මඟ දර්ශන යයි කියනු ලැබේ. **දළහා**= ස්ථිර වූ; **අසංහාරියා**= හරින්ට නො හැකි; **සමණෙන වා**= සන්සිඳවූ පව්ඇති මහණකු විසින් හෝ; **බ්‍රාහ්මණෙන වා**= බහාතැබූ පව්ඇති බමුණකු විසින් හෝ; **දෙවෙන වා**= උතුපතති දෙවියකු විසින් හෝ; **මාරෙන වා**= වසවත්මරු විසින් හෝ; ඒ **එසේ** මැයි- සෝවාන්වූවහුගේ ශ්‍රද්ධාව වසවත්මරු විසිනුදු නො **නැසිය** හැක්කී වෙයි; සූරම්බඨයාගේ මෙනි.

ඒ සූරම්බඨ වනාහී ශාස්තෘන්ගේ ධර්මදෙශනාව අසා සෝවාන් වැ හෙට හිඳේය; එකල මාර තෙම මාත්‍රාංශද්වරලක්ෂණප්‍රතිමණ්ඩිත වූ බුඩරූපය මවා ඔහුගේ ගෙදොරසිට "ශාස්තෘන් වහන්සේ ආ සේකැ" යි හසුනක් යැවීය. සූරම්බඨ මෙසේ සිතී:— "මම දැන් ම ශාස්තෘන් වහන්සේ සමීපයෙන් බණ අසා ආවෙමි, කුමක් වන්නේ දෝ හෝ" යි එළඹ ශාස්තෘහු යැ යන සංඥාවෙන් වැඳ සිටියේය, මාර තෙම කියා:- "අම්බඨය! මා විසින් නුඹට රූපය අනිත්‍යය —පෙ— විඥානය අනිත්‍යය,යි යමක් කියන ලද ද, එය වරදවා කියන ලද; යම්හෙයකින් නො විමසා මා විසින් මෙසේ කියන ලද ද, එහෙයින් නුඹ රූපය නිත්‍යය —පෙ— විඥානය නිත්‍ය යයි ගනුව" යි. සූර තෙම සිතී— "බුදුවරයෝ නො විමසා ප්‍රත්‍යක්ෂ නො කොට කිසිවක් කියන්නාහුය යන යමක් ඇද්ද, මෙය කරුණු රහිතය; එකාන්තයෙන් මේ මාරතෙම මට නො සතුටු උපදවනු පිණිස ආයේය" යි

සූරම්බඨයාගේ ශ්‍රද්ධාව.

ඉක්බිති "නුඹ මාරයා නො වෙහි දෑ" යි කියා; හෙතෙම බොරුකියන්ට නො හැකි විය; එසේය මාරයා වෙමි, ප්‍රතිඥා කෙළේය; කුමක් හෙයින් ආයෙහි දෑ? යි; නුඹගේ ශ්‍රද්ධාව වලනය කරන්නට යයි කියා; "කෘෂ්ණ! පව්ඇතියා! නුඹ වැළි එකෙක් සිටුව, තාබඳු මරුන් සියයකු දු දහසකු දු මාගේ ශ්‍රද්ධාව සොලොවාලන්ට අසමර්ථය; මාගීයෙන් පැමිණි ශ්‍රද්ධාව නම් ගල්පොළොවෙහි පිහිටි මහමෙර මෙන් අවල වෙයි; නුඹ මෙහි කුමක් කෙරේ දෑ?" යි අසුර ගැසී. හේ සිටින්ට නො හැකිවන්නේ එහි ම අතුරුදහන්වී. බ්‍රහ්මුනා වා= බ්‍රහ්මකායිකාදීන් අතුරෙහි එක්තරා බඹකු විසින් හෝ; කෙනචි වා ලොකස්මිං= මේ ශ්‍රමණාදීන් තබා ලෙව්හි අන් කිසිවකු විසිනු දු හෝ හරින්ට නො හැක්කා; ධම්මසම්භෙනසනා= ශුභාවය සෙවීම; ධම්මනාසුසම්නනිඤ්ඤා= ධර්මතාවෙන් මොනොවට චිමසන ලද්දේ, සුභාවයෙන් ම මනාකොට පරීක්ෂා කරන ලද්දේ වෙයි යන අර්ථ යි, සෙස්ස සියලු තැන්හි නො ගැඹුරු අර්ථ ඇත්තේ මැයි.

විමංසක සූත්‍ර වණ්ණනා නිමි. (7)

———:÷:———

කොසම්බක සූත්‍ර වර්ණනා.

———:×:———

එවං මෙ සුතං යි කොසම්බක සූත්‍ර යයි. **එහි කොසම්බියං=** එනම් **ඇති නගරයෙහි;** යම්කෙයකින් ඒ නුවර අරම්-පොකුණු ආදි වූ ඒ ඒ තැන්හි කොසඹ ගස් ම අධික වූවා හු ද, එහෙයින් "කොසම්බි" යයි ප්‍රසිද්ධියට ගියේය; "කුසුම්බ" නම් ඍෂිහුගේ අසපුවෙන් නුදුරු තැන්හි ගොඩනගන ලද බැවිනැයි ද ඇතැම් කෙනෙක් කියත්. **කොසම්බියා=** කොසිතසිටුහු විසින් කරවන ලද ආරාමයෙහි; මේ අසනු ලැබේ:— පෙර "අදිල" නම් රටක් විය; එරටින් "කොතුහල" නම් දිලින්දෙක් දුර්භික්ෂභය හෙතු කොටගෙන අඹුදරුවන් සහිත ව කුඹුරුවලින් ගැවසීගත් රටකට යන්නේ පුත්‍රයා උසුලන්ට නො හැකි ව හැරදමා ගියේය; මවු තොමෝ නැවතී ඔහු ගෙන ගියා; ඔවුහු එක් ගොපලුගමකට පිවිසියාහුය; ගොපල්ලන්ට ද එදින බොහෝ කිරිබත් පිළියෙල කරන ලද්දේ විය; (ඔවුහු) එයින් කිරිබත් ලැබ වැළඳුහ; එකල ඒ පුරුෂ බොහෝ කිරිබත් වැළඳුයේ දිරවන්ට නො හැකි ව රාත්‍රියෙහි කලුරිය කොට එහි ම බැල්ලන කුස පිළිසඳ ගෙන බලුපැටියෙක් විය; හේ ගොපල්ලාට ප්‍රිය වූයේ මනාප වූයේ විය; ගොපලු ද පසේබුදු කෙනෙකුට උවටැන් කෙරෙයි, පසේබුදුන් වහන්සේ ත් වළඳන කල බලුපැටියාට එක් පිඬක් දෙති; හෙතෙම පසේබුදුන් කෙරෙහි සෙනහ උපදවා ගොපල්ලා සමඟ පන්සලට ද යයි; හෙතෙම ගොපල්ලා නැති කල්හි බත්වේලාවෙහි තෙමේ ම ගොස් කල් දන්වනු සඳහා පන්සල දෙර සිට බුරයි, අතරමඟ ද වණ්ඩමෘගයන් දැක බුරා පලවාපියයි; හෙතෙම පසේබුදුන් කෙරෙහි මෘදු සිතින් කලුරිය කොට දෙව්ලොව උපන; එහි දී ඕහට සොෂකදිව්‍යපුත්‍ර යි ම නම් විය; හෙතෙම දෙව්ලොවින් චුතව කොසඹැනුවර එක් කුලගෙයක උපන; අපුත්තක නම් සිටුකෙනෙක් ඔහුගේ මවුපියන්ට ධනය දී ඔහු පුත්‍රයකු කොට ගත්තේ ලු. නැවත තමහට පුතකු උපන් කල සත්වරක් මරවන්ට වැයම් කෙළේය; හෙතෙම පින්වත් බැවින් සත්තැන දී ම මරණයට නො පැමිණ අවසානයෙහි එක් සිටුදුවණියකගේ ව්‍යක්ත භාවයෙන් ලත් දිවි ඇත්තේ මැතකාලයෙහි පියාගේ ඇවැමෙන් සිටු තනතුරට පැමිණ සොෂිත නම් සිටු වූයේය. කොසඹැනුවර අන්‍ය වූ ද කුක්කුටසිටු ඇ පාවාරිකසිටු ඇයි සිටුවරු දෙදෙනෙක් ඇති; මොහු සමඟ තිදෙනෙක් වූවාහුය.

තවද- එසමයෙහි ඒ යහළු සිටුවරුන්ගේ කුලූපග වූ පන්සියයක් තාපසයෝ පවුපාගෙහි විසූහ. ඔවුහු කලින් කල ලුණු-ඇඹුල් සෙවුනා පිණිස මිනිස්පියට එන්නාහුය; එකල එක් වරක් ග්‍රීෂ්ම කාලයෙහි මිනිස්පියට එන්නාහු නිරුදක වූ මහාකන්තාර යක් ඉක්මවා කතර කෙළවර මහත් නුගගසක් දැක මේලෙස සිතූහ:— "යම්බඳු වූ මේ රුකෙක් වේ ද, එකාන්තයෙන් මේහි මහානුභාව ඇති දෙවතාවකු වියයුතු ය; ඉදින් අපට පැන් හෝ පරිභොගජලය හෝ දෙන්නේ නම් ඉතා යහපත් වන්නේය" යි; දෙව තාවා තවුසන්ගේ අදහස් දැන මොවුන්ට සඞ්ග්‍රහ කරන්නෙමි, තමාගේ අනුභාවයෙන් වෙලෙප්අතරින් නහුලිසක් පමණ ජලධාරාවක් පැවැත් වීය. සෘෂිසමූහයා රිදීකඳක් බඳු දියවැටිය දැක තමන්ගේ බඳුන් වලින් ජලය ගෙන පරිභොග කොට මෙසේ සිතීය- "දෙවතාවා විසින් අපට පරිභොගජලය දෙන ලද, මේ වනාහී ගම් නැති මහවනයෙකැ, ඉදින් අපට ආහාරයකුත් දෙන්නේ නම් ඉතා යෙහෙකැ" යි; දෙවතා තොමෝ තවුසන්ට ලැබීම් වශයෙන් දිව්‍යමය වූ කැඳ-අවුලු ආදිය දී පිණවීය; සෘෂිහු මෙසේ සිතූහ:— "දෙවතාවා විසින් අපට පරිභොගජලය ද හොජන ද යන සියල්ල දෙන ලද, අපට තමන් දක්වන්නේ නම් ඉතා යහපත් වන්නේය" යි; දෙවතා තොමෝ ඔවුන්ගේ අදහස් දැන ශරීරයෙන් අඬක් දැක්වී; ඔවුහු මෙසේ කීහු:— "දෙවතාවෙනි! තොපගේ සම්පත් මහත් වෙයි, කුමන කැමියක් කොට මේ සැපතට පැමිණියා වෙහි ද?" යි; "සවාමිනි! ඉතා මහත් වූවක් නො වෙයි, ඔද වූ කැමියක් කොට" යයි. ඒ එසේ මැයි— අධි උපොෂිතකැමිය නිසා දෙවතාවා විසින් ඕ සැපත් ලද්දීය; ඒ මෙසේ යැ- අනේපිඬු සිටාණන්ගේ ගෙයි මේ දෙව්පුත් කම් කරුවෙක් විය; සිටාණන්ගේ ගෙයි පොහෝදිනයන්හි යටත්පිරිසෙයින් දස්කම්කරුවන් පටන් සියලු ජන තෙමේ පෙහෙවස් ඇත්තේ වෙයි; එක් දිනක් මේ කම්කරු එකලාව ම උදැසන නැගිට වැඩව ගියේය; මහසිටාණෝ වැටුප් ලබන මිනිසුන් සලකන්නාහු එකලා වූ මොහු ම වන යට ගියබැව් දැන සවස බතට වැටුප් දුන්හ. බත්පිසන දැසිය එකෙ කුට ම බත් පිස වනයෙන් ආවහුට බත් වඩා දින; කම්කරු මෙසේ කීය. "අන් දිනයන්හි මේ වේලෙහි ගෙය එකශබ්ද වෙයි, අද ඉතා ම සන්හුන, මේ කිමෙක් දෝ හො" යි; ඕහට ඒ දැසිය මෙසේ කිව- "අද මේ ගෙයි සියලු මනුෂ්‍යයෝ පෙහෙවූවාහුය, මහසිටාණෝ එකලා නුඹට ම වැටුප් දුන්හ" යි; අම්ම! එසේ දැ? යි; එසේය සවාමිනි! "මෙකල්හි පෙහෙවස් සමාදන් වූවහුට පොහොකම් වේ ද? නො වේ දැ? යි අම්ම! මහසිටාණන් විචාරව" යි; ඈ විසින් ගොස් විචාරනලද්දාවූ මහසිටාණෝ මෙසේ කීහ:- "සියලු උපොෂිතකැමිය නො වෙයි, එහෙත් අධිකැමිය වෙයි, පෙහෙවස් සමාදන්වූයේ වේව" යි; කම්කරු බත් නො වළඳ මුඛය සෝදා පෙහෙවස් සමාදන් වැ වසන තැනට ගොස් වැද හොත්තේය; රාත්‍රියෙහි

අඛපෙහෙවස්රැකි මිනිසෙක්.

ආහාරයෙන් ක්ෂය වූ කයඇති ඔහුගේ වාතය කිපියේය; අලුයම් කාලයෙහි, කලුරිය කොට අඩොපොෂිත කම්යාගේ ආනිශංසයෙන් මහා වත්තානි නම් වනදෙර නුගරුකෙහි දිව්‍යපුත්‍රයෙක් ව උපන. හෙතෙම ඒ පුවත තවුසන්ට දන්වියැ; තාපසයෝ- "තොප විසින් බුඬ යැ ධම් යැ සඞ්ඝ යැ යන නො ඇසුවිරැ බසක් ඇපි අස්වන ලද්දේ වෙමු, බුදුහු ලෙවිහි උපන්නාහු දැ?" සි; එසේය සවාමීනි! උපන්හු යසි; දැන් කොහි වසන සේක් දැ? සි; සැවත්නුවර නීසා දෙව්රම්හි ය සවාමීනි; තාපසයෝ දැන් තෙපි සිටිනුමැනව, ඇපි ශාස්තෘන් වහන්සේ දක්නෙමු,සි තුටුපහටුව නික්මගොස් පිළිවෙළින් කොසඹැනුවරට පැමිණියාහුය. මහසිටුවරු සෘෂිහු ආවාහුය,සි පෙරගමන් කොට "සවාමීනි! සෙට අපගේ භික්ෂාව ගනුමැනවැ" සි පවරා දෙවන දවස් තාපසසමූහයාට මහදන් දුන්හ; තාපසයෝ වළඳා ම යමු,සි විචාළාහුය; "සවාමීනි! නුඹ වහන්සේ අන්‍යකාලයෙහි එක් මසකු ත් දෙමසකු ත් තුන්මසකු ත් සාරමසකු ත් වාසය කොට ම යන්නහුය, එහෙත් මෙ වර ඊයේ අවුත් අද ම යමු,සි කියන්නහුය, මේ කිමෙක් දැ?" සි; "එසේය ගෘහපතිවරුනි! බුදුහු ලොව උපන්හ, වැළි ජීවිතාන්තරය දුනහන්ට නො හැක්ක, එහෙයින් ඇපි වහා යන්නෙමු" සි; "එසේ වී නම් සවාමීනි! ඇපිත් යමු, අප හා සමග ම ගියමැනවැ" සි; "තෙපි ගිහිගෙවැස්සෝ නම් මහඅවුල් ඇත්තෝය, තෙපි සිටිවු, ඇපි ඉතා පළමු යන්නෙමු" සි නික්ම එක් තැන දෙදවසකු වූ නො වැස තුරිතගමනින් ම සැවැත්නුවරට පැමිණ දෙව්රම් වෙහෙර ශාස්තෘන් වහන්සේ සම්පයට ම ගියාහුය; එහි දී මධුර වූ ධම්කථාව අසා සිඟල්ලෝ ම පැවිදිව රහත්බවට පැමිණියාහුය. ඒ සිටුවරු තුන්දෙන ද පන්සියයක් පන්සියයක් ගැල්වලින් ගිතෙල්-මී-උක්සකුරු ආදිය ද පවදුහුල් ආදිය ද ගෙන කොසඹැනුවරින් නික්ම පිළිවෙළින් සැවැත්නුවරට පැමිණ දෙව්රම සම්පයෙහි කඳවුරු බැඳ ශාස්තෘන් වහන්සේ සම්පයට ගොස් වැඳ පිළිසඳර කතා කොට එක් පසෙක හුන්නාහුය; ශාස්තෘන් වහන්සේ යහළුවන් තිදෙනාට ම මධුර වූ ධම්කථාව වදාළ සේක. ඔවුහු උපන් බලවත් සොම්නස් ඇතිව ශාස්තෘන් වහන්සේ පවරා දෙවන දවස් මහදන් දුන්නාහුය; නැවත් පවරා දෙවනදවස්හි දූයි මෙසේ අඞ්මසක් දන් දී "සවාමීනි! අපගේ ජන පදයට ඊම පිණිස ප්‍රතිඥ දුනමැනවැ" සි පාමුල වැදහොත්හ; භාග්‍යවතුන් වහන්සේ "ගෘහපතිවරුනි! තථාගතයෝ ශූන්‍යාගාරයෙහි සිත් අලවා වෙසෙති" වදාළහ. මෙතෙකින් ප්‍රතිඥව දෙන ලද්දී නම් වේ යයි ගෘහපතිහු සලකා "භාග්‍යවතුන් විසින් අපට ප්‍රතිඥ දෙන ලදුයි දශබල යන් වැඳ නික්මගොස් අතරමඟ ගොදුනක් පාසා විහාරයක් කරවා පිළිවෙළින් කොසඹැ නුවරට පැමිණ "ලොකයෙහි බුදුහු උපන් සේකැ" සි කිවාහුය; තිදෙන ම තම තමන්ගේ ආරාමයෙහි මහත් ධනපරිත්‍යාග කොට භාග්‍යවතුන්ගේ වාසය පිණිස විහාර කරවූහ; එහි කුක්කුටසිටුහු

විසින් කරවන ලද්දේ "කුක්කුවාරාම" නම් විය; පාවාරිකසිටුහු විසින් අඹවෙනෙහි කරවන ලද්දේ "පාවාරිකම්බවන" නම් විය; සොසිතසිටුහු විසින් කරවන ලද්දේ "සොසිතාරාම" නම් විය; ඒ සඳහා කියන ලදි- "සොසිතසිටුහු විසින් කරවන ලද ආරාමයෙහි" යනු.

භණ්ඩනජාතා යනාදියෙහි කලහයාගේ පූර්වභාගය "භණ්ඩන" නම්; එය හටගත්තේ මොවුන්ට නුයි= භණ්ඩනජාතා; භගවාපරාමශීාදි වශයෙන් මුදුන් පැමිණි කලහය උපන්නේ මොවුන්ට නුයි= කලහජාතා; විරුඬවාදය වූ විවාදයට පැමිණියාහු නුයි= විවාදාපන්නා; මුඛසත්තීහි= වචනනමැති සැත්වලින්; විතුදන්තා= විදින්නාහු; නෙ න වෙව අඤ්ඤං මඤ්ඤං සඤ්ඤාපෙන්ති න ච පඤ්ඤත්තිං උපෙන්ති= ඔවුහු අර්ථය ද කාරණය ද දක්ඛා ඔවුනොවුන්ට නො ම දන්වති, යළි ඉදින් දන්වන්ට ආරම්භ කෙරෙත් ද, එතකුදු වුවත් දනගැනීමට නො පැමිණෙති, දන හැනීමට නො කැමති වෙත් යන අර්ථ යි. "නිජ්ඣත්තිං" යෙහි දු මෙ ම නයයි; මෙහි ද නිජ්ඣත්තිං යන මෙය සඤ්ඤත්තිවෙවචනයෙක් මැයි. යළි කුමක් හෙයින් මොවුහු හටගත් කලහඇත්තෝ වූවාහු ද? යත්:— අල්පමාත්‍ර වූ කාරණයකිනි. ඒ මෙසේයි— එක් ආවාසයක විනයධර වූ ද සූත්‍රාන්තික වූ ද භික්ෂූහු දෙදෙනෙක් වෙසෙති; ඔවුනතුරෙන් සූත්‍රාන්තික මහණ එක් දිනක් වස්කිරියට පිවිසියේ පරි

කොසම්බිය භොගයෙන් ඉතිරි වූ ජලය බදුනෙහි තබා ම නික්ම ගියේය;
භික්ෂූහු. විනයධර තෙම පසුව පිවිසියේ ඒ ජලය දැක නික්ම ගොස් ඒ මහණ විවාළේය- "ඇවැත්නි! තොප විසින් මේ ජලය තබන ලද දෑ?" යි; එසේය ඇවැත්නි; නෙපි මේ කරුණෙහි ඇවැත් බව නො දනිවු දැ? යි; එසේය නො දනිමි; ඇවැත්නි! මෙහි ඇවැත් වේ යයි, ඉදින් (ඇවැත්) වේ නම් දෙසන්නෙමි; යළි ඉදින් ඇවැත්නි! තොප විසින් නො දැන සිහි නො කිරීමෙන් කරන ලද නම්, තොපට ඇවැත් නැකැයි; හෙතෙම් ඒ ඇවතෙහි ඇවැත් නැතැයි යන් දැමූ ඇති විය; විනයධර තෙම තමා ඇසුරු කළවුන්ට "මේ සූත්‍රාන්තික තෙම ඇවතට පැමිණෙන්නේ ද නො දනී යයි දැන්විය; ඔවුහු ඒ භික්ෂූවගේ අතැවැසියන් දැක තොපගේ උපාධ්‍යාය තෙම ඇවතට පැමිණ ද ඇවැත්බව නො දනී,යයි කිවාහුය; ඔවුහු ගොස් තුමන්ගේ උපාධ්‍යාය යන්ව දැන්වූහ; හෙතෙම මෙසේ කීය. මේ විනයධරතෙම් පළමු ඇවැත් නැතැයි කියා දැන් ඇවැත් වේ යයි කියයි, මේ තෙම මුසාවාදියෙකැයි; ඔවුහු ගොස් තොපගේ උපාධ්‍යාය තෙම මුසාවාදියෙකැයි මෙසේ ඔවු නොවුන් කලහ වැඩූහ; ඒ සඳහා මේ කියන ලදී. භගවතෝ එතදවොච= මේ "සවාමිනි! මෙහි කොසඹැනුවර භික්ෂූහු හටගත් භණ්ඩන ඇත්තාහුය" යනාදි වචනය කියය හෙ ද ප්‍රියවීම කැමති බැවින් නො ම වෙයි බිදුවන අදහසින් නො වෙයි; වැළි වැඩකැමති බැවින් හිත කැමති බැවින් වේ. යම්හෙයකින් මේ මහණ සමගිකරන්නෙක් වී ද,

එහෙයින් ඔහුට මේ සිත විය:- "යම්සේ මේ භික්ෂූහු විවාදය පටන්ගත් නාහු ද, (එසේ) මා විසින් සමගි කළ නො හැක්ක, අන් මහණක් විසිනුදු සමගි කරන්ට නො හැක්ක; දෙවියන් සහිත ලොකයෙහි අග්‍ර පුද්ගල වූ භාග්‍යවතුන් වහන්සේ තමන් වහන්සේ හෝ හොස් තමන්ගේ සමීපයට හෝ කැඳවා මේ භික්ෂූන්ට ක්ෂාන්ති මෛත්‍රී ප්‍රතිසංයුක්ත වූ සාරණීය (= සිහිකළයුතු) ධර්මදේශනාවක් වදාරා සමගි කරන්නාහු නම් ඉතා යෙහෙකැ" යි වැඩ කැමති බැවින් හිත කැමති බැවින් හොස් කියේයි.

ඡයිමෙ භිකඛවෙ! ධම්මා සාරණීයා= යට කලහ - භණ්ඩන වශයෙන් දෙශනාව ආරබධ යෑ, මෙ තැන්හි ෂට්සාරණීය ධර්මයෝ ආවාහු නුයි මෙසේ මේ කොසම්බක සූත්‍රය අනුසන්ධි වූ ලෙසින් ම ගියේ වෙයි; එහි **සාරණීයා**= සිහි කළයුතු, කල් ඉක් ම ගිය කල්හි දු විසම්මරණය නො කටයුතු; යමෙක් ඒ ධර්මයන් පුරා ද, ඔහු සබ්‍රහ්මචාරීන්ට ප්‍රිය කෙරෙත් නුයි= **පියකරණා**; ගරු කෙරෙත් නුයි= **ගරුකරණා**; **සඞඝහායෂ**= සඞග්‍රහ කිරීම පිණිස; **අවිවාදායෂ**= විවාද නො කිරීම පිණිස; **සාමඟ්ගියා**= සමගිබව පිණිස; **එකීභාවායෂ**= එක්බව පිණිස; නො වෙත් කාරණය පිණිස; **සංවත්තන්ති**= වෙත්; **මෙත්තං කායකම්මං**= **මෙත්සිතින් කටයුතු කායකර්මය**; වාක්කර්මී මනඃකර්මයන්හි දු මේ ම නයයි. යළි මොවුහු භික්ෂූන්ගේ වශයෙන් ආවාහු ගිහීන් කෙරෙහි ද ලැබෙත්; ඒ එසේ මැයි. භික්ෂූන්ගේ මෙත්සිත් වශයෙන් ආභිසමාචාරික ධර්මයන් පිරීම මෛත්‍රීකායකර්ම නම්; ගිහීන් ගේ චෛත්‍ය වැඳීම පිණිස බොධි වැඳීම පිණිස සඞඝනිමන්ත්‍රණය පිණිස යෑමය, ගමට පිඬු පිණිස පිවිසි භික්ෂූන් දැක පෙරගමන් කිරීමය, පාත්‍ර පිළිගැනීමය, අසුන් පැනවීමය, පසුගමන් කිරීමය යන මේ ආදිය මෛත්‍රීකායකර්මය නම්; භික්ෂූන්ගේ **මෙත්සිතින්** ආචාරප්‍රඥප්තිය භික්මවීමය, කර්මවහන් කිරීමය, ධර්මදේශනාය තෙවළා බුදුවදන් කීමය, (යන මේ) මෛත්‍රීවාක්කර්ම නම්; ගිහීන්ගේ ද "චෛත්‍ය වැඳීමට යමු, බොධි වැඳීමට යමු, ධර්මශ්‍රවණය කරන්නෙමු, පහන් - මල්පූජා කරන්නෙමු, ත්‍රිවිධසුචරිතයන් සමාදන් ව පවත්නෙමු, උඟබත් ආදිය දෙන්නෙමු, වස්සාවාසික (සිවුරු) දෙන්නෙමු, අද සඞඝයාට සිවුපසය දෙන්නෙමු, සඞඝයා පවරා ඛාද්‍ය-භෝජ්‍යාදිය දෙවු, අසුන් පනවවු, පැන් එළවාතබවු, සඞඝයාට පෙරගමන් කොට වැඩමවවු, පැනවූ අස් නෙහි හිඳුවවු, හවගත් ඡන්දය ඇති ව හවගත් උත්සාහය ඇති ව වතා වත් කරවු යනාදිය කියන කල්හි මෛත්‍රීවාක්කර්මය නම්; භික්ෂූන්ගේ උදෑසන ම නැගිට සිරැරුපිළිදුගුම් සෑමළුවත් ආදිය කොට විවෙක අසුනක හිඳ "මේ විහාරයෙහි භික්ෂූහු සුවපත් වෙත්වා, අවෙරී වෙත්වා ව්‍යාබාධ (= චෛතසිකදුක්) රහිත වෙත්ව" යි සිතීම මෛත්‍රීමනඃකර්ම නම්; ගිහීන්ගේ ආර්ය්‍යයන් වහන්සේ සුවපත් වෙත්වා, අවෙරී

වෙත්වා, ව්‍යාබාධ රහිත වෙත්ව,යි සිතීම මෛත්‍රීමනඃ කම් නම; **ආවි වෙව රහෝ** ච= සම්මුඛයෙහි ද පරාඞ්මුඛයෙහි ද; **එහි නවකයන්ගේ** ඔවුරු කිරීම් ආදියෙහි සභාගබවට යෑම සම්මුඛයෙහි මෛත්‍රීකායකම් නම; යළි තෙරුන්ගේ පාසෙදීම් පවන්සැලීම් ආදි හෙද වූ සියලු ම සාමීචිකම්ය සම්මුඛයෙහි මෛත්‍රීකායකම් නම; (**සථවිර - නවක**) දෙප ක්‍ෂය විසින් ම වරදවා තබන ලද දූවඩු ආදිය ඔවුන් කෙරෙහි අවඥ නො කොට තමා විසින් වරදවා තබන ලද්දවුන් මෙන් සසස්කිරීම පරාඞ්මුඛයෙහි මෛත්‍රීකායකම් නම; දෙවසථවිර යෑ තිෂ්‍යසථවිර යෑයි මෙසේ දූඩිකොට කිම හමුවෙහි මෛත්‍රීවාක්කම් නම; යළි විහාරයෙහි අවිද්‍යමාන වූවකු විචාරන්නහුගේ "කොහි යෑ අපගේ දෙවසථවිර? කොහි යෑ අපගේ තිෂ්‍යසථවිර? කවදා එන්නේ දෝ හො" යි මෙසේ මමත්වය කරන වචනය නො හමුවෙහි මෛත්‍රීවාක්කම් නම; යළි මෛත්‍රී සෙනහයෙන් සිනිදු වූ ඇස් දල්වා පහන් මුහුණින්බැලීම හමුවෙහි මෛත්‍රී මනඃකම් නම; දෙවසථවිර තිෂ්‍යසථවිර අරොග වේවා, අල්පාබාධ වේව,යි සිත්හි එලවීම නො හමුවෙහි මෛත්‍රීමනඃකම් නම්.

ලාභා= චීවරාදි ලද ප්‍රත්‍යයෝ; **ධම්මිකා**= කුහනාදි හෙද වූ මිථ්‍යා ජීවය හැර දූහැමෙන් සෙමෙන් භික්ෂාචාරවෘතයෙන් උපන්; **අනනවයෙ පත්තපරියාපන්නමත්තමපි**= පශ්චිම කොටියෙන් (= ඔවත්පිරිසෙයින්) පාත්‍රයෙහි පර්‍යාපන්න වූ පාත්‍රයට ඇතුළත් වූ දෙතුන් සැන්දක් පමණ භික්ෂාව ද; **අප්පටිහතචිත්තෙන පරිභුඤ්ජිතබ්බා**= මෙහි ප්‍රතිහතතා යෝ (= බෙදීම්) දෙකක් වෙති, ආමිෂප්‍රතිහතතය ද පුද්ගලප්‍රතිහතතය දැයි කියා යි. එහි "මෙතෙක් දෙන්නෙමි, මෙතෙක් නො දෙන්නෙමි" මෙසේ සිතින් බෙදීම ආමිෂ ප්‍රතිහතත නම; "අසවලාට දෙන්නෙමි, අසවලාට නො දෙන්නෙමි" මෙසේ සිතින් බෙදීම වනාහි පුද්ගලප්‍රතිහතත නම; ඒ දෙක ම නො කොට යමෙක් නො බෙදෙන ලද(ප්‍රත්‍යය)වළඳුද මේ තෙම "අප්පටිහත්ත භොගී" (= නො බෙදූ වළඳනසුලු වූයේ) නම් වෙයි; **සීලවනෙහනි සබ්‍ර හ්මචාරීහි සාධාරණභොගී**= මෙහි සාධාරණභොගීහුගේ මේ ලක්ෂණ යෑ:- යම් යම් ප්‍රණීත වූවක් ලබා ද ඒ ඒ දෙය ලාභයෙන් ලාභය සෙවීම වාරයෙන් ගිහින්ට නො ම දෙයි, තමා පරිභොග නො කෙරෙයි; පිළි ගන්නේ ම සඞ්ඝයා හා සාධාරණ වේව,යි ගෙන ගොඩිය ගසා පරිභොග කටයුතු සහ්‍යතු දෙයක් මෙන් දකී. මේ සාරාණීයධම්ය වනාහි කවරෙක් පුරා ද? කවරෙක් නො පුරා ද? යත්:- දුශ්ශීලයා වූ කලි නො පුරයි, ඒ එසේ මැයි- ඔහු අයත් දෙය සිල්වත්හු නො ගනිත්. යළි පිරිසුදු සිල් ඇති වත නො කඩන තෙනැත්තේ පුරයි. එහි මේ වත යෑ- යමෙක් වනාහි නියම කොට මවට හෝ පියාට හෝ ආචාර්‍යෝපා

සාරාණීයවත ධ්‍යායාදීන්ට හෝ දෙන්නේ ද, හෙතෙම දියයුත්ත දෙන් නේ වේවා; එහෙත් ඔහට සාරාණීයධම්ය නො වෙයි; පළිබොධ පිළිදූගීම නම් වෙයි, සැබව- සාරාණීයධම්ය මිදුණු පළිබොධ

ඇත්තහුට ම වටනේය; යළි නියම කොට දෙන්නාවූ ඔහු විසින් ගිලාන – ගිලානොපස්ථායක – ආගන්තුක - ගම්කරුවන්ට ද අලුත පැවිදිවූ සහල සිවුරු පාත්‍ර ගැනීම නො දන්නහුට ද දියයුතුයි; මොවුන්ට දී සෙස්ස සඨවිරසතයෙහි පවත් මද මද නො දී යමෙක් යම් පමණ ගනීද, ඔහුට එපමණ දියයුතුයි. ඉනිරි වුවක් නැති කල්හි නැවත පිඬු පිණිස හැසිර සඨවිරසතයෙහි පවත් යමක් යමක් ප්‍රණීත නම් ඒ ඒ දෙය දී සෙස්ස වැළඳිය යුතුයි. **ඕලවණෙනහි** යි කී හෙයින් දුශ්ශීලයාහට නො දෙන්ට ද වටී; යළි මේ සාරාණීයධර්මය නො භික්ෂුණී පිරිසෙහි නො පිරිය හැකි වෙයි; ඒ එසේ මැයි- භික්ෂුණී පිරිසෙහි යමෙක් අන්තැනකින් ලබා ද, හෙතෙම නො ගනී; අන්තැනකින් නො ලබන තෙනැත්තේ ද ප්‍රමාදයෙන් යුක්ත ව ම ගනී, වැඩියක් නො ගනී; තවද- මේ සාරාණීය ධර්මය නැවත නැවත පිඬු පිණිස හැසිර ලත් ලත් දෙය දෙන්නහුට ද දෙළොස් වසකින් පිරෙයි; ඉන් මෙපිට නො පිරේ. ඒ එසේ මැයි— ඉදින් දෙළොස්වෙනි වස සාරාණීයධර්මපූරක තෙම පිණ්ඩපාතපිරූ පාත්‍රය ආසනශාලාදෙහි තබා නාන්ට යේ ද, සඞ්ඝසඨවිරයන් වහන්සේ ත් මේ පාත්‍රය කවරෙකුගේ ද? සාරාණීය ධර්මය පුරන්නහුගේ යයි කී කල්හි එය ගෙනෙව,යි සියලු පිණ්ඩපාතය බෙදා වළඳා භික්ෂු පාත්‍රය තබත් ද; එකල්හි ඒ මහණ භික්ෂූන් දැක "මට ඉනිරි නො කොට ම වැළඳූහ" යි දෙම්නස් උපදවා ද, (එකල්හි) සාරාණීය ධර්මය බිඳෙයි; නැවත දෙළොස්වසක් පිරියයුත්තේ වෙයි. ඒ එසේ මැයි- මේ සාරාණීය ධර්මය නිත්‍යකපරිභෝගය හා සමාන යැ, වරක් කඩවූ කල නැවත පිරිය යුත්තේ මය. වැළි යමෙක් "එකානනයෙන් මට ලාභයෙක, මා විසින් මොහොතක්වත් ලබන ලද, යම්බදු මාගේ පාත්‍රගත (පිණ්ඩය) නො විචාරම සබ්‍රහ්මචාරීහු වළඳති" සොම්නස් උපදවා ද, ඔහුට පිරුණේ නම් වේ. යළි මෙසේ පුරන ලද සාරාණීයධර්මය ඇත්තහුට ඊර්ෂ්‍යාවක් නොම වෙයි, මාත්සර්‍යයෙක් නො වේ; මිනිසුන්ට ප්‍රිය වෙයි, සුලභ වූ ප්‍රත්‍යය ඇත්තේ වෙයි, ඔහුගේ පාත්‍රගත වූ දෙය දෙතුළ බන්නේ ද ක්ෂය නො වෙයි, බෙදියයුතු භාණ්ඩ ඇතිතැන්හි අග්‍රභාණ්ඩය ලබයි; හයක් හෝ දුර්භික්ෂයක් හෝ පැමිණි කල්හි දෙවියෝ උත්සාහයට පැමිණෙත්. එහි මේ වස්තුහු වෙත්:—

ලුණ්ඩගල නිස්සතෙර.

ලොණගිරි (= ලුණුගල) වැසි නිස්සතෙරුන් වහන්සේ වනාහි මාකිරිගම ඇසුරු කොට වාසය කෙරෙති; පනසක් පමණ සඨවිරවරු සෑය වඳනා පිණිස නාගදිපයට යන්නාහු කිරිගම පිඬු පිණිස හැසිර කිසිවක් නො ලැබ නික්මුණාහුය; තෙරුන් වහන්සේ (ගමට) පිවිසෙන්නාහු ඒ භික්ෂූන් දැක "සවාමීනි! ලද දැ?" යි විචාළහ; "ඇවැත්නි! හැසුරුනෙමු" යි; උන් වහන්සේ නො ලත්බව දැන මෙසේ කිහ- "සවාමීනි! යම්තාක් මම (පෙරළා) එමි ද, ඒතාක් මෙහි ම වැඩසිටිය මැනවැ" යි; "ඇවැත්නි! ඇපි පනස් දෙන පාත්‍රය තෙමෙන පමණකුත් නො ලැබිමහ" යි; "සවාමීනි! නෙවා

සිකයෝ නම් ප්‍රතිබල වෙති, කො ලබන්නාහු නමුදු පිඬු පිණිස හැසිරෙන මාගීයාගේ සවභාවය දනිති" සථවිරවරු නැවතිහුන්හ; (නෙවා සික) තෙරුන් වහන්සේ ගමට පිවිසියහ; සම්පගෙයි ම මහාඋපාසිකා නොමෙ කිරිබතක් සකස් කොට තෙරුන් බලමින් සිටියා දෙරට පැමිණියා වූ ම තෙරුන්ගේ පාත්‍රය පුරවා දුන; උන් වහන්සේ එය ගෙන තෙරුන්ගේ සමීපයට ගොස් "සවාමීනි! ගනු මැනවැ" සි සඞඝසථවිර යන්ට කිහ; තෙරුන් වහන්සේ අප මෙතෙක්දෙනා විසින් කිසිවක් නො ලද, මේ තෙම වහා ම ගෙන ආයේය, කිමෙක් දෝ හො" සි සෙසු භික්ෂූන්ගේ මුහුණ බැලූහ; තෙරුන් වහන්සේ බලන ආකාරයෙන් ම දුන "සවාමීනි! දූහැමෙන් සෙමෙන් ලද පිණඩපාතය යැ, කුකුස් රහිතවැ ගනුමැනවැ" සි මුල පටන් සියල්ලන්ට යැපෙන පමණ දී තමා ද යැපෙන පමණ වැළඳූහ. ඉක්බිති තෙරුන් වහන්සේ බත්කිස අවසානයෙන් උන් වහන්සේ විවාළහ:- "ඇවැත්නි! කවදා ලොවුතුරුදහම් ප්‍රතිවෙධ කෙළෙහි දැ?" සි; "සවාමීනි! මට ලොකොතතර ධම්යෙක් නැතැ" සි "ඇවැත්නි! ධ්‍යානලාභියි දැ?" සි; "සවාමීනි! මෙ ද නැතැ" සි; "ඇවැත්නි! ප්‍රාතිහාය්‍යයක් නො වේ දැ?" සි; "සවාමිනි! මා විසින් සාරණීය ධම්ය පුරන ලද, පිරූ කල පටන් ඉදින් භික්ෂූන් දහසක් වේද, ඒ මාගේ පාත්‍රගත (පිණඩය) ක්ෂය නො වේ ය" සි; "සාධු! සාධු! සත්පුරුෂය! ඔබට මේ සුදුසු ය" සි. මේ වනාහි "ඔහුගේ පාත්‍රගත වූ දෙය ක්ෂය නො වෙසි" යන මෙහි වසතුව සි.

නැවත මේ තෙරුන් වහන්සේ ම සැගිරියෙහි ගිරිහණඩ මහාපූජා වෙහි දුනසථානයට ගොස් "මේ දුනයෙහි උතුම් භාණඩය කුමක් දැ?" සි කිහ; සවාමීනි! සළු දෙකෙකැ" සි; "ඒ දෙක මට පැමිණෙන්නාහු ය" සි; ඒ අසා ඇමති තෙම රජුට දැන්වීය- "එක් තරුණ භික්ෂුවක් මෙසේ කියා ය" සි; "තරුණ භික්ෂුවගේ සිත මෙබඳු යැ, මහතෙරුන්ට සියුම්සළු වටිති" කියා මහතෙරුන්ට දෙන්නෙමි, නැතිය; භික්ෂුසඞඝයා පිළිවෙළින් සිටිකල්හි මුදුනෙහි තබන ලද්දාවූ ද සළු දෙක දෙන්නාවූ ඔහුගේ අතට නො නැහෙති, එහෙත් තරුණ භික්ෂුවට දෙන කල්හි අතට නැංගාහුය; හෙතෙම ඒ තෙරුන්ගේ අතෙහි තබා ඇමතියාගේ මුහණ බලා තරුණ භික්ෂුව හිඳුවා දන් දී සඞඝයා හැර තරුණ භික්ෂුව වෙත හිඳ "සවාමීනි! මේ ධම්ය කවදා ප්‍රතිවෙධ කළහු දැ?" සි කිහ. ඒ තෙරුන් වහන්සේ පරියායයෙනුදු නැතිගුණය නො කියන්නාහු "මහරජ! මට ලොවුතුරු දහමෙක් නැතැ" සි කිහ. "සවාමීනි! පළමු ම කිවහු නො වේ දැ?" සි; "එසේය මහරජ! මම සාරණීය ධම්ය පිරූ වෙක්මි, ඒ ධම්ය පිරූ කල පටන් මට බෙදනතැන්හි අග්‍රභාණඩය පැමිණේය" සි; "සාධු! සාධු! සවාමීනි! මේ නුඹ වහන්සේට සුදුසුය" සි වැද නික්මගියේය. මෙය "බෙදියයුතු භාණඩ ඇති තැන්හි අග්‍රභාණඩය පැමිණෙසි" යන මෙහි වසතුව සි.

තවද- වණ්ඩාලතියහය ඇතිකල්හි භාතරගම්වැසියෝ නාගසථවිරීන්ට නො දන්වා ම පලාගියාහුය; සථවිරී තොමෝ අලුයම්කාලයෙහි

නාගසථවිරීන් වහන්සේ.

"ගම ඉතා ම නිශ්ශබ්ද යැ, පළමු කොට විමසවු" යයි තරුණ භික්ෂුණීන්ට කියා; ඔවුහු ගොස් සියල්ලන් ගිය බැවි දැන අවුත් සථවිරීන්ට දැන්වූහ; ඕ තොමෝ ඒ අසා "තෙපි ඔවුන් ගියබැව් නො සිතවු, තමන්ගේ උදෙසීම-පිළිවිසීම- නුවණින් මෙතෙහි කිරීම යන මෙහි ම වැයම් කරව" යි කියා භික්ෂාචාරවෙලාවෙහි සිවුරු පොරොවා තොමෝ දෙළොස්වෙනි කොට ඇත්තී ගම්දෙර නුගරුක්මූල සිටියා; වෘක්ෂයෙහි අධ්‍යුෂිත වූ දෙවතා තොමෝ භික්ෂුණීන් දෙළොස්දෙනාට ම පිණ්ඩපාත දී "ආර්‍යාවෙනි! අන්තැනක නො ගියමැනව, නිතොර මෙහි ම වැඩියමැනවැ" යි කිව.

තවද- සථවිරීන්ගේ කනිටු බැවූ නාග නම් සථවිරකෙනෙක් ඇත්තී; ඒ තෙරුන් වහන්සේ "භය මහත් යැ, යැපෙන්ට නො හැක්ක, පරතෙරයන්නෙමු" යි තුමූ දෙළොස්වෙනි කොට ඇත්තාහු ම තමන් වහන්තැනින් නික්මෙන්නාහු "සථවිරීන් දැක යන්නෙමි" භාතරගමට පැමිණියහ. සථවිරී තොමෝ තෙරුන් වහන්සේ ආවාහ,යි අසා ඔවුන් සමීපයට ගොස් "කිම සවාමිනී!" විචාළා; ඒ සථවිර එ පුවත කියා; ඕ තොමෝ "අද එක් දවසක් වෙහෙර වැස සෙට වැඩියමැනවැ" යි කිව; සථවිරවරු විහාරයට ගියහ; සථවිරී තොමෝ දෙවන දවස් රුක්මූල පිණ්ඩපාත පිණිස හැසිර තෙරුන් කරා එළඹ "මේ පිණ්ඩපාතය වළඳනු මැනවැ" යි කිව; තෙරුන් වහන්සේ "සථවිරිනි! වවතේ දැ?" යි කියා නො බැණ සිටියහ; "සහොදරය! පිණ්ඩපාතය ධාම්මික යැ, කුකුසක් නො කොට වැළඳුව මැනවැ" යි; "සථවිරිනි! වවතේ දැ?" යි; ඕ තොමෝ පාත්‍රය ගෙන අහසැ දැමූ, පාත්‍රය අහසෙහි සිටියේය; තෙරුන් වහන්සේ "සථවිරිනි! සත්තලකින් මත්තෙහි සිටිය ද භික්ෂුණීභාවය ම ය" යි කියා "භය නම් හැම කල නො වෙයි, භය සන්සිඳුනු කල ආර්‍යවංශ කියමින්- එම්බා පිණ්ඩපාතිකය! භික්ෂුණියගේ බත වළඳ කල් යැවුව" යි සිතින් උපවාද කරනු ලබන්නේ පිහිටාසිටින්ට නො හැකි වන්නෙමි, සථවිරිනි! අප්‍රමාදවව" යි මහව පිළිපන්හ, වෘක්ෂදෙවතා ද "ඉදින් තෙරුන් වහන්සේ සථවිරීන්ගේ අතින් පිණ්ඩපාතය වළඳන්නාහු ද උන් වහන්සේ නො නවත්වන්නෙමි, ඉදින් නො වළඳන්නාහු නම් නවත්වන්නෙමි" සිතමින් සිට තෙරුන්ගේ ගමන දැක රුකින් බැස "සවාමිනී! පාත්‍රය දුන මැනවැ" යි පාත්‍රය ගෙන තෙරුන් රුක්මූලට ම කැඳවා අසුනක් පනවා පිණ්ඩපාත දී කළ බත්කිස ඇත්තහු ප්‍රතිඥ කරවා දෙළසක් භික්ෂුණීන් ද දෙළසක් භික්ෂූන් ද සත්වසක් උපස්ථාන කළා. මේ "දෙවියෝ උත්සාහවත්බවට පැමිණෙත්" යන මෙහි වස්තුව යි. එහි වනාහී සථවිරී තොමෝ සාරණීයධම්මය පූරණය කළා විය.

අඛණ්ඩානි යනාදි නැන්හි- යමෙකුගේ සප්පාපත්තිසඤ්ඤියන් අතුරන් ආදියෙහි හෝ අන්තයෙහි හෝ ශික්ෂාපදයක් බිඳුණේ වේ ද, ඔහුගේ ශීලය කෙළවර සිඳුණු සළුවක් මෙන් "ඛණ්ඩ" නම්; යළි යමෙකුගේ ශීලය මධ්‍යයෙහි බිඳුණේ ද, ඔහුගේ ශීලය මැද සිදුරු වූ සළුවක් මෙන් "ඡිද්‍ර" නම් වෙයි; යමෙකුගේ පිළිවෙළින් දෙතුන් ශික්ෂාපද තෙනෙක් බිඳුණාහු ද, ඔහුගේ ශීලය පිටෙහි හෝ කුසෙහි හෝ හටගත් කා වූ අසමාතවණ්ණයෙන් කළු - රතු ආදීන් අතුරෙන් එක්තරා පැහැයක් ඇති දෙනසා මෙන් "ශබල" නම් වෙයි; යමෙකුගේ අතරින් අතර බිඳුණාහු වෙත් ද, ඔහුගේ ශීලය අතරින් අතර අසමානබිඳුවෙන් චිත්‍ර වූ දෙනසා මෙන් "කල්මාෂ" නම් වෙයි; යළි යමෙකු සියල්ලෙන් සියල්ල අනිත්‍ය වූවාහු වෙත් ද, ඔහුගේ ඒ ශීලයෝ අඛණ්ඩ වූවාහු අවිච්ඡිද්‍ර වූවාහු අශබල වූවාහු අකල්මාෂ වූවාහු නම් වෙත්. තවද- ඒ මේ ශීලයෝ තෘෂ්ණාදාසභාවයෙන් මුදා භුජිස්සභාවයෙන් (= දාසබැවින් මිදුණු) බව කරන හෙයින්= **භුජිස්සානි**; බුද්ධාදි විඥයන් විසින් ප්‍රශස්ත හෙයින්= **විඤ්ඤුපසත්ථානි**; තෘෂ්ණා - දෘෂ්ටීන් විසින් පරාමෂ්ඨ නො කළ හෙයින් මේ නම් (ඇවතට) නොවී පැමිණි විරූ යයි කිසිවකු විසින් පරාමෂ්ඨ කරන්ට නො හැකි බැවින් ම= **අපරාමට්ඨානි**; උපචාරසමාධිය හෝ අර්පණාසමාධිය හෝ පවත්වත්නුයි= **සමාධිසංවත්තනිකානි** යි කියනු ලැබෙත්. **සීලසාමඤ්ඤගතෝ විහරති**= ඒ ඒ දිශාභාගයන්හි වාසය කරන භික්ෂූන් සමඟ සමානබවට පැමිණි සිල්ඇති ව වෙසෙයි; ඒ එසේ මැයි- ස්‍රෝතාපන්නාදීන්ගේ ශීලය සමුද්‍රුන්තරයෙහි ද දෙව්ලොව ද වසන අන්‍ය ස්‍රෝතාපන්නාදීන්ගේ ශීලය හා සමාන ම වෙයි; මාගීයෙන් පැමිණි ශීලයෙහි නානාත්වයෙක් නැති; ඒ සඳහා මේ කියන ලදි. **සා'ඝං දිට්ඨි**= මාගීඵසම්ප්‍රයුක්ත වූ සම්‍යග්දෘෂ්ටිය; **අරියා**= නිර්දෝෂ වූ; **නිය්‍යානිකා**= **නිය්‍යානිකා**; **තක්කරස්ස**= යමෙක් එසේ කරන්නේ වේ ද; **දුක්ඛක්ඛයාය**= සියලු දුක් ක්ෂය කිරීම පණිස; **දිට්ඨිසාමඤ්ඤගතෝ**= සමානදෘෂ්ටිබවට පැමිණියෙක් ව වෙසෙයි; **අගමා**= දෙවූයේ; සියලු ගොනැස් සඬහන කෙරේ නුයි= **සඬගාහිකං**; සියලු ගොනැස් රැස්වීම කෙරේනුයි= **සඬඝානනිකං**; රැස්කිරීම (= ගැවීම) යන අර්ථ යි. **යදිදං කූටං**= යම් මේ කූටාගාරයාගේ කැණීම්බඳක් කූටය නම් වේ ද, යම්හෙයක්කින් පඤ්චභූමකාදි ප්‍රාසාදයෝ කූටයෙන් බඳනා ලද්දාහු ම සිටිත් ද; එය වැටුණු කල්හි මැටි ආදි කොට සියල්ල වැටෙත් ද, එහෙයින් මෙසේ **භීත එවමේව බෝ**= කූටය කූටාගාරය යම්සේ ද, එපරිද්දෙන් මේ සාරණීය ධර්මයන්ට ද යම් මෝ ආර්‍යදෘෂ්ටියක් වේ ද අග්‍ර වූවා ද සඬ්ගාහ කරන්නී ද= රැස් කරන්නී ද වේ යයි දතයුත්තීය. **තඤ්ච භික්ඛවෙ! සා'ඝං දිට්ඨි** යන මෙහි "මහණෙනි! නිර්දෝෂ වූ නෛර්‍යාණික වූ යම් මෝ ස්‍රෝතාපත්තිමාගීදෘෂ්ටියක් එසේ කරන්නහුගේ මනා කොට දුක් ක්ෂයවීමට පමුණුවන්නේ ය" යි ඕ තොමෝ කෙසේ පමුණු

වා ද? කවර කරුණකින් පමුණුවා ද? යන අර්ථ යි. **පරියුට්ඨානචිත්තෙනාව හොති**= මෙතෙකිනු දු මඛනා ලද සිත්ඇත්තේ ම නම් වෙයි යන අර්ථ යි. සියලු තැන්හි මේ නයයි.

සුපසන්නේහිනං මේ මානසං= මාගේ සිත මතා කොට තබන ලද; **සත්තානං ඔඩාය**= සතර සත්‍යයන්ගේ අවබොධය පිණිස; **අභිඤ්ඤා** යනාදියෙහි ඒ ඥානය ධර්මතෙයකින් ආර්‍යයන්ට වේ ද, පෘථග්ජනයන්ට නො වේ ද, එහෙයින් අභිඤ්ඤා යි කියන ලදැ; යළි ධර්ම කෙතෙකුන්ට ලෞකොත්තර ධර්මය ඇද්ද, ඔවුන්ට ම වේ ද, අන්‍යයන්ට නො වේ ද, එහෙයින් **ලොකුත්තරං** යි කියන ලදැ; නැවත පෘථග්ජනයන්ට නැති හෙයින් **අසාධාරණං පුථුජ්ජනෙහි** යි කියන ලදැ; සියලු වාරයන්හි මේ නයයි. **ලභාමි පවත්තනං සමථං**= තමාගේ සිතෙහි ශමථය ලබමි යන අර්ථ යි; "**නිබ්බුති**" යෙහි ද මෙ ම නයයි. මෙහි ද **සමථ** නම් එකඟබව ය; **නිබ්බුති** නම් කෙලෙස් සන්සිඳීම ය; **තථාරූපාය දිට්ඨියා**= මෙබඳු වූ ස්‍රොතාපත්තිමාර්ගදෘෂ්ටියෙන්; **ධම්මතාය**= සවභාවයෙන්; **ධම්මතා එසා**= මේ තෙම සවභාව ය; **වුට්ඨානං පඤ්ඤපෙති**= සඞ්ඝකර්ම වශයෙන් හෝ දෙශනාවෙන් හෝ නැගිසිටීම දක්නා ලැබේ, යම්හෙයකින්- ආර්‍යශ්‍රාවක ඇතැත අවදනේ ගරුකාපත්තීන් අතුරෙහි කුටිකාරය වැනි වූ ද ලහුකාපත්තීන් අතුරෙහි සහසෙය්‍යාදිය වැනි වූ ද අච්චන්තක ඇතැතකට ම පැමිණේ ද; හෙ ද නො දනය; දුන නො පැමිණේ ද, අවන් ඇතැත ප්‍රතිවේධඥානය නො කෙරේ ද, එහෙයින් අර්ථ බොහෝ ය. ඛිප්පමෙව යනාදිය වදළහ.

දහරෝ= තරුණ වූයේ; **කුමාරෝ**= මහලු නො වූයේ; **මණ්ඩෙ**= ඇස්-කන් ආදීන්ගේ මනහාවයෙන් මනා වූයේ; **උත්තානසෙය්‍යකෝ**= ඉතා තරුණ බැවින් උඩුකුරු ව හෝනේ; **දකුණු** හෝ **වම්** හෝ පසින් හෝනට නො හැකි වේයි; **අඞ්ගාරං අක්කමිත්වා**= ඔබ්නොබ් දිගුකරන ලද අතින් හෝ පයින් හෝ ස්පර්ශ කොට; යම්හෙයකින් මේසේ ස්පර්ශ කරන මිනිසුන්ගේ අත වහා නො දවා ද, ඒ එසේ මැයි— ඇතැම් කෙනෙක් අඟුරු ගෙන පෙරළමින් දුරට ද යෙති; වැළි තරුණයාගේ අත්-පා සියුමැලි වෙති; හෙතෙම ස්පර්ශ කළ ඇසිල්ලකින් ම දවමින් "චිරි" යි ශබ්ද කරමින් වහා හකුළුවා ද; එහෙයින් මෙහි තරුණයෙක් ම දක්වන ලද. තවද- මහලු තෙනැත්තේ දවසු ලබන්නේ ස්වල්ප ඉවසැයි; වැළි මේ තෙම ඉවසන්ට නො හැකි වෙයි; එහෙයින් ද තරුණයෙක් ම දක්වන ලද. **දෙසෙති**= ඇවත පිළිගන්නා සහාග පුද්ගලයකු ඇති කල්හි එක් දවසක් හෝ රැයක් හෝ නො ඉවසා රාත්‍රියෙහි චතුරඞ්ගසමන්විත කාරණයෙහි පවා සහාගහිස්සූව වසන තැනට ගොස් දෙසනා කෙරේ මැයි. **උට්ඨාවට්ඨානි**= උස්-පහත් වූ; **කිඞ්කරණීයානි**= "කුමක් කෙරේම ද?" යි

මෙසේ කියා කළයුතු කමියෝ; එහි උවව (= උසස්) කම් නම්, සිවුරු කිරීම රැඳීම සෑයෙහි සුණුකම් පොහොගේ – සෑගේ – බෝගෙවල කළයුතු කම්ය යන මේ ආදීහු යෑ; අවව (= පහත්) කම් නම්, පාසේදීම් – තෙල් ගැල්වීම් ආදි කුඩා කටයුතු යෑ; නොහොත් සෑයෙහි සුණුකම් ආදිය උවවකම් නම්; එහි ම කසට ඉසිම දිය වත්කිරීම, කොසු කිරීම ඉනිමං බැඳීමාදිය අවවකම් නම්. **උස්සුකතං ආපජ්ජනා හොති**= උත්සුකබවට කටයුතුබවට පිළිපන්නේ වෙයි; **තිබ්බා'පෙකඛා හොති**= බහුල වූ ප්‍රාර්ථනා වෙයි; **එමහසඤ්ඤං ආලුම්පති**= තණ ද කඩමින් කයි; **වචජ්ඣඤ්ඤං අපවිනති**= වසු ද බලයි; ඒ එසේ මැයි- තරුණ වස්සකු ඇති දෙන් තොමෝ වනයෙහි එක්ව ආ වස්සා එක් තැනක හොත්තහු හැර දුරට නො යයි, වස්සාට නුදුරු තැන හැසිරෙමින් තණ කඩාගෙන ගෙල ඔසොවා එකාන්තයෙන් වස්සා ම බලයි; එපරිද්දෙන් ශ්‍රෝතාපන්න තෙම උස්පඤ්ඤ වූ විචාරය කළයුතු කිස කරමින් ඊට නැමුණේ ම නො ලිහිල් ව පුරන්නේ වෙයි; තීව්‍ර වූ ඡන්දය ඇති ව බහල වූ ප්‍රාර්ථනා ඇති ව ම කෙරෙයි. එහි මේ වස්තුවකි.

ආර්‍යශ්‍රාවකයාගේ කුශලවර්ණය.

මහසෑයෙහි සුණුකම් කරන කල්හි එක් ආර්‍යශ්‍රාවකයෙක් එක් අතකින් සුණුබදුන හා එක් අතකින් කොස්ස ගෙන සුණුකම් කරන්නෙමි, සෑමළුවට නැංගේය. එක් කායදෘඪවය බහුල වූ මහ ශෛක්ෂ ගොස් තෙරුන් සමීපයෙහි සිටියේය; තෙරුන් වහන්සේ අනිකෙක් ඇතිකල්හි ප්‍රමාද වේ යයි එතැනින් අන් තැනකට ගියහ; ඒ මහණ ද එහි ම ගියේය; තෙරුන් වහන්සේ යළි අන් තැනකට ගියහ,යි මෙසේ තුන්වෙනි තැන්හි අවුත් සිටියහුට "සත්පුරුෂය! සෑමළුව ඉහත් ය, කිම් අන් තැනක අවකාශ නො ලබවු දැ?" යි කීහ. එකල්හි අනිත් මහණ නික්ම ගියේය,යි. **බලානුභාවසම්භූතාගමනතෝ**= බලයෙන් යුක්ත වූයේ; **අඞ්ගකථා**= ආර්ථික කථා කොව, ප්‍රයෝජන ඇතියෙක් ව යන අර්ථයි. **මානසිකථා**= සිත්හි කොව; **සඞ්ඛවෙනසෝ සම්භාවනාගරුතා**= මද පමණ වූත් විශේෂයක් නො කරමින් සියලු සිකින් එළවා; **ඔහීනහොතෝ**= තැබූ කනඇත්තේ; යම්හෙයකින් ආර්‍යශ්‍රාවකයෝ ප්‍රිය වූ ධර්මශ්‍රවණය ඇත්තාහු වෙත් ද, බණ අසන තැනට ගොස් නිදමින් හෝ කිසිවකු සමඟ කථා කරමින් හෝ වික්ෂිප්ත සිත් ඇති ව හෝ නො හිඳිත් ද, වැළි අංශුවක් වළඳන්න වුන් මෙන් ධර්මශ්‍රවණයෙන් තෘප්තියට නො පැමිණියාහු ම වෙත් ද, එකල්හි අරුණ නගී ද, එහෙයින් මෙසේ වදළහ. **ධම්මතා සුසමත්තා ඛා හොති**= සවභාවය මනා කොට විමසන ලද්දේ වෙයි; **සොතාපත්තිඵලසච්ඡිකිරියාය** යනු කරණවචන යෑ; සෝවාන්ඵලය පසක්කළ නුවණින් යන අර්ථයි.

එවං සත්තඛීණාසවසමණානාගතෝ= මෙසේ මේ මහාප්‍රත්‍යවෙක්ෂාඥාන ඇතීන් යුක්තවූයේ; මේ පළමු දක්වන්නී ආචාර්‍යයන්ගේ සමාන කථා යෑ; එනම්:- ලොකොත්තරමාර්ගය බහුචිත්තක්ෂණික වූයේ නම් නැති. එහෙත් විරුඬවාදී තෙම "එකචිත්තක්ෂණික වූ මාර්ගයෙක් නම් නැති, ඒ එසේ මැයි- "**එවං භාවෙථ සත්තවස්සානි**" යි වදාළ හෙයින් සත් වසකුදු මාර්ගභාවනාව වෙයි; වැළි කෙලණයෝ එහා සිදෙන්නාහු "යථා ඥානයකින් සිදෙති" කියයි. හෙතෙම "සූත්‍රයක් එළවව" යි කිය යුතු, එකාන්තයෙන් අනිකක් නො දක්නේ "**ඉදමස්ස පඨමං ඣානං අධිගතං හොති, ඉදමස්ස දුතියං ඣානං —පෙ— ඉදමස්ස සත්තමං ඣානං අධිගතං හොති**" මෙය ම එළවා දක්වන්නේය; නැවත කියයුතුයි, කිමෙක මේ සූත්‍රය නොයෑමී ද? නීතාමී ද? යි; අනතුරු නීතාමී යැයි කියන්නේය; සූත්‍රය යමසේ ද අර්ථය එසේ ම වේ යයි; හෙතෙම මෙසේ කිය යුතුයි. "**ඛම්මනා සුසමනනීඛා හොති, සොතාපත්තිඵලසච්ඡිකිරියාය**" යන මෙහි අර්ථය කවරේ ද? යි; එකාන්තයෙන් "**සෝවාන්ඵලය පසක්කිරීම පිණිස ය**" යි කියන්නේය; ඉක්බිති කියයුතුයි- "මාර්ගයෙන් යුක්ත වූයේ ඵලය පසක් කෙරේ ද? ඵලයෙන් යුක්ත වූයේ (මාර්ගය) ද?" යි; (හෙතෙම) දන්නේ "ඵලයෙන් යුක්ත වූයේ පසක් කෙරේය" යි කියන්නේය; ඉක්බිති කිය යුතුයි- "**එවං සත්තඛීණාසවසමණානාගතෝ බහූ භික්ඛවේ! අරියසාවකෝ සොතාපත්තිඵල සමණනාගතෝ හොති**" යි හොපව මෙහි මාර්ගය නො වඩා මඬුවකු මෙන් පැන ආර්‍ය ශ්‍රාවක ඵලය ම ගත්තේ ද? "මා විසින් සූත්‍රයක් ලදැයි යම් ඒ (මූඛාරූඪ) දෙයක් නො කියව; පැන විසඳන්නහු විසින් නම් ඇදුරන් සමීපයෙහි වැස බුදුවදන් ඉගෙන අරුත්රස විඳ කියයුතු වෙයි; මේ සප්තඥානයෝ ආර්‍යශ්‍රාවකයාගේ ප්‍රත්‍යවෙක්ෂා ඥානයෝ මැයි; ලොකොත්තර මාර්ගය බහුචිත්තක්ෂණික වූයේ නම් නැති; එකචිත්තක්ෂණික වූයේ ම යයි කැඟ විය යුත්තේය; ඉදින් භඟනේ නම් භගීවා, ඉදින් නො භඟනේ නම් සව් උදෑසන ම විහාරයට පිවිස කැඳ බොව,යි යැවිය යුත්තේය, සෙස්ස සියලු කැන්හි ප්‍රකට වූ අර්ථ ඇත්තේ මැයි.

කොසම්බක සූත්‍ර වණ්ණනා නිමි. (8)

———:÷:———

බ්‍රහ්මනිමන්තණික සූත්‍ර වර්ණනා.

———:o:———

එවං මෙ සුතං යි බ්‍රහ්මනිමන්තණික සූත්‍ර යයි. එහි **පාපණං දිට්ඨි ගතං**= ලාමක වූ ශාශ්වත දෘෂ්ටිය; **ඉදං නිච්චං**= මේ අවකාශ සහිත වූ අනිත්‍ය වූ බ්‍රහ්මස්ථානය නිත්‍ය යයි කියයි; **ධුවං** යනාදීහු ඊට ම වෙවච නයෝ යි. **එති ධුවං**= ස්ථිර ය; **සස්සතං**= ඇමනල්හි විද්‍යමාන ය; **කෙවලං**= අඛණ්ඩ ය, සකල ය; **අවවනධම්මං**= චුත නො වන සභාව ය; **ඉදං හි න ජායති** යනාදියෙහි මෙ තැන්හි කිසිවෙක් උපදින්නේ හෝ මියන්නේ හෝ ප්‍රතිසන්ධි වශයෙන් පැමිණෙන්නේ හෝ නැත යනු **සඳහා** කියයි; **ඉමෙනා ච පනාකාරෙන**= මේ අවකාශ සහිත වූ බ්‍රහ්මස්ථාන යෙන් මත්තෙහි අන්‍ය නිස්සරණයෙක් නම් නැත, යි මෙසේ ඔහුට ශ්‍රුතියට පැමිණි ශාශ්වතදෘෂ්ටිය උපන්නා වෙයි; **තවද**- මෙසේ කියන ලද්දා වූ **ඉමෙතෙම** මත්තෙහි තුන් ධ්‍යානභූමිහු ය, **සතර මාඝියෝ** ය, **සතර ඵලයෝ** ය, **නිබ්බාණය** ය යන සියල්ල ප්‍රතිබාහනය කෙරෙයි; **අවිජ්ජාගතෙනා**= අවිද්‍යාවට ගියේ යුක්ත වූයේ අඥානී වූයේ අඬ වූයේ; **ඝත්‍ර හි නාම**= යමෙක් නම්; **අථ ඛො භික්ඛවෙ! මාරො පාපිමා** යනු මාර තෙම කෙසේ හා ගය වතුන් දුටුවේ ද? යත්:—

මාරයා බුදුන් අතරට පැමිණීම.

ඉමෙතෙම වනාහි තමාගේ භවනයෙහි හිඳ කලින් කල **ශාස්තෘන්** වහන්සේ ආවර්ජනා කෙරෙයි- "අද මහණ ගොයුම් කවර ගමෙ හෝ නියම්ගමෙ හෝ වෙසේ දෑ" යි; මෙකල වනාහි ආවර්ජනා කරන්නේ උකඤ්ඤානුවර නිසා සුභගවනයෙහි වාසය කෙරෙති, දැන "කොඤ්ඤ ගියේ ඒ හො" යි බලන්නේ බඹලොවට යන්නවුන් දැක "මහණ ගොයුම් බඹලොවට යෙයි, ඝම්භාක් **එහි දහම් දෙසා බ්‍රහ්මසමූහයා** මාගේ විෂය නො ඉක්මවා ද ඒතාක් ගොස් ධම්දෙශනාවට විඝ්නය (= කැමැත්ත නැතිබව) **කරන්නෙමි**" **ශාස්තෘන්ගේ** පදානුපදික ව ගොස් බ්‍රහ්මසමූහයා අතර නො පෙනෙන **ශරීරයෙන්** යුක්ත ව සිටියේය. **ඉමෙතෙම ශාස්තෘන්** විසින් බඹබ්‍රහ්ම **තෙම් ප්‍රතිබාහනය** කරන ලද්දැයි දැන බ්‍රහ්මයාට උපස්ථම්භක ව සිටියේය. **එයින්** කියන ලදි- **අථ ඛො භික්ඛවෙ! මාරො පාපිමා** යනු. **බ්‍රහ්මපාරිසජ්ජං අබ්‍රවි**= බ්‍රහ්මපාරිසද්‍යයෙහිවූ එක් බ්‍රහ්මයකුගේ ශරීරයට පිවිස්; එහෙත් මහාබ්‍රහ්මයන්ට හෝ බ්‍රහ්මපුරෝහිතයන්ට ආවෙසවන්ට නො හැකි වෙයි; **මෙනමාසඳ්දෙ**= මොහුට නිදහස් නො කරව; **අහිහූ**= මැඩගෙන සිටියේ, දෙටුවූයේ; **අනහිභූතනා**= අන්‍යයන් විසින් නො මැඩපවත්වන ලද්දේ; **අඤ්ඤදත්‍රු** යනු එකාන්ත වචනයෙහි නිපාත ය; **දසීම් වශයෙන්**= **දසො**; සියල්ල දකී යයි දක්වයි; **වසවත්තී**= සියලු ජනයා වශයෙහි පවත්වයි; **ඉස්සරො**= ලොවට ඉසුරු වූයේ; **කත්තා නිම්මාතා**= ලොකය පිළිබඳ කතෘ ද නිර්මාතෘ (= මවන්නා) ද වූයේ; පෘථිවි-හිමවත්-සිනෙරු - චක්‍රවාට - මහාසමුද්‍ර - චන්ද්‍ර - සූර්‍යාදීන් වොහු විසින් මවන ලද්දාහු යයි

දක්වයි; **සෙය්‍යථා සජ්ජිනා**= මේ තෙම ලොවට උතුම්වූයේ ද, සකස්කරන්නේ ද වෙයි; "නුඹ ක්‍ෂත්‍රිය නම් වෙව, නුඹ බ්‍රාහ්මණ නම්, නුඹ වෛශ්‍ය නම්, ශූද්‍ර නම්, ගෘහස්ථ නම්, ප්‍රව්‍රජිත නම් (වෙව,) යටත්පිරිසෙයින් ඔටුවෙක් වෙව, ගොණෙක් වෙව" යි මෙසේ මේ තෙම සත්‍වයන් විසඳන්නා යයි දක්වයි **වසී පිතා භූතභව්‍යානං**= මේ තෙම පුරුදුකළ වශීභාවය ඇතිබැවින්වසියැ; මේ තෙම භූතයන්ට ද භව්‍යයන්ට ද පිතෘ යයි කියයි; එහි **අණ්ඩජ - ජරායුජසත්ත්වයෝ** ඇතුළුබිජුවවෙහි ද ඇතුළුවඤ්ඤි යෙහි ද භව්‍යයෝ නම් වෙති; පිටත නික්මුණු කල පටන් භූතයොය; **සංසෙවදජයෝ** ප්‍රථමචිත්තක්ෂණයෙහි භව්‍යයෝ යැ, දෙවෙනි චිත්තක්ෂණය පටන් භූතයෝ යැ; ඕපපාතිකයෝ පළමු ඉරියව්වෙහි භව්‍යයෝ යැ; දෙවෙනි ඉරියව්වෙහි පටන් භව්‍යයෝ යැයි දතයුත්තාහුය **ඔහු සියල්ලෝම මොහුගේ පුත්‍රයෝ යැ යන සංඥුවෙන් පිතා භූත-භව්‍යානං** යි කීය. **පඨවිගරහකා**= යම්සේ තෙපි මෙ කල්හි අනිත්‍ය යැ දුඃඛ යැ අනාත්ම යැයි පෘථිවිය ගහිං කෙරෙහි ද පිළිකුල් කෙරෙහි ද, එසේ ඔවුහු ද පෘථිවිය ගරහන්නෝ වූහ; හුදෙක් තෙපි ම නො වෙති දක්වයි. **ආපොගරහකා** යනාදියෙහි ද මෙ ම නයයි. **යතෝ කායෙ පතිඨිතා**= සතර අපායෙහි උපන්නාහුය; **පඨවිපසංසකා**= යම්සේ තෙපි ගහිං කෙරෙයි ද එසේ නො ගරහා නිත්‍ය යැ ස්ථිර යැ ශාශ්වත යැ නො සිඳිය හැකි යැ නො බිඳිය හැකි යැ ක්ෂය නො වේ යයි මෙසේ පෘථිවියට ප්‍රශංසා කරන්නාහු දෘෂ්ටිවිසේ ගුණ කියන්නාහු වූහ,යි කියයි; **පඨවාභිනන්දිනෝ**= තෘෂ්ණා - දෘෂ්ටි වශයෙන් පෘථිවියට සතුටු වන්නාහු; යෙසු පදයන්හි ද මෙ ම නයයි. **පණීතෙ කායෙ පතිඨිතා**= බඹලොව උපන්නාහුය; **කිං නා'හං**= කවර කරුණකින් තා මම; **ඉඞ්ඝ** යනු වොදනාවීයෙහි නිපාත යැ; **උපාතිවතතිසෙට්ඨා**= ඉක්මව; "උපාතිවත්තිතෝ" යි ද පාඨ යි, මේ අර්ථ මැයි. **දණ්ඩෙන පවිජ්ඣණාමෙය්‍ය**= සතරරියන් මුගුරුදණ්ඩකින් තළා පලවා හරින්නේය; **නරකප්පපාතෙ**= සියඇත් පුරුෂප්‍රමාණ වූ මහහෙබක; **විරූළෙය්‍ය**= අතින් ගතයුතුතැන හෝ පයින් සිටියයුතු තැන හෝ ගැනීම් සිටීම් දෙක කරන්ට නො හැකි වන්නේ ද; **නනු ත්වං ගිකඛු පඤඤි**= මහණ තෙපි රැස්ව සිට දිලිසෙන්නා වූ බබළන්නා වූ මේ බඹපිරිස නො දක්නෙහි ද? යි බ්‍රහ්මයාගේ අවවාදයෙහි සිටියවුන්ගේ ඍද්ධානුභාවය දක්වයි. **ඉති බො මං ගිකඛවෙ! මාරො පාපිමා බ්‍රහ්මං පරිසං උපනෙසි**= මහණෙනි! මාරපාපි තෙම "මහණ! තෙපි යශසින් ද ශ්‍රීයෙන් ද බබළන්නා වූ බඹ පිරිස නො දක්නෙහි ද? තෙපි ත් මහාබ්‍රහ්මයාගේ වචනය නො ඉක්මවා නුඹට යම්ක් ම බ්‍රහ්මතෙම් කියා ද, එය කරන්නෙහි නුඹ ත් මෙපරිද්දෙන් යශසින් ද ශ්‍රීයෙන් ද බබළන්නෙහි යයි කියමින් මා බඹපිරිසට එළවූයේය, එක් කෙළේය. **මා තවං මඤ්ඤිත්ථො**= තෙපි නහමක් සිතව; **මාරෝ'ධවසි පාපිම**= නුඹ මහාජනයා මරණහෙයින් මාර නම්, මහාජනයාට පව්වි වූ ලාමක වූ අයස කරන හෙයින් පාපිමත් නමැයි තා දනිමි.

කසිණං ආයුං= සියලු ආයුෂ; **තෙ වො එවං ජානෙය්‍යුං**= ඔවුහු මෙසේ මහත් වූ තපස්කම්යෙන් යුක්තයෝ ය, තෙපි වැළිත් පළමු දින යෙහි උපන්නේ කුමක් දන්නෙහි ද? යම්බදු තොපගේ මුඛයෙහි අද ත් කිරිසුවඳ හමා යයි ගවමින් කියයි; **පඨවිං අජ්ඣොසිස්සසි**= පෘථිවිය ඇතුළත් කොට ගිල නිමවා **තණ්හා - මාන - දිට්ඨීන්** ගන්නෙහි; **ඔපසාසිකො මෙ භවිස්සසි**= මා සමීපයෙහි වසන්නෙක් වන්නෙහි, මා යන්නහු අනුව යන්නෙහි, සිටියහු සමීපයෙහි සිටින්නෙහි, හුන්නහු අනුව හිඳිනෙහි, හොත්තහු අනුව හෝනෙහි යන අර්ථයි. **වඤ්ඣාසි මෙ**= මාගේ වසතුවෙහි සයනය කරන්නේ; **ඡට්ඨකාමකරණීයො බාහිතෙ භවිස්සසි**= මා විසින් තමාගේ කැමැත්තෙන් යමක් කැමති වෙම් ද, එය කළයුතු වූයේ යළි යටපත් කොට ද, ගිරිහිකොළලැහැබ කට ත් වඩා ඉතා පහත්වූවෙක් ඉතා මිටිවූවෙක් කළයුතු වන්නෙහි යන අර්ථයි. මෙයින් මේ තෙම භාග්‍යවතුන් නළවන්නේ හෝ අවමන් කරන්නේ හෝ වෙයි; නළවා නම් "මහණ! ඉදින් තෙපි **තණ්හා - දිට්ඨීන්** පෘථිවිය ඇතුළත් කොට ගන්නෙහි නම්, මට අනුව වසන්නෙක් වන්නෙහි, මා යන කල යන්නෙහි, සිටිනා කල සිටිනෙහි, හිඳිනා කල හිඳිනෙහි, හෝනා කල හෝනෙහි, මම තා සෙසු ජනයා පිළිබහා විස් වැසියෙක් ඇතුළත් වූයෙක් කරන්නෙමි" මෙසේ පළමු කොට නළවා නම; යළි සෙසු පදයන්ගෙන් නිහු කරන්නේ නම්, මෙ ද මෙහි අදහස යැ:- "ඉදින් තෙපි පෘථිවිය ඇතුළත් කොට ගන්නෙහි නම්, මාගේ විෂයසඞ්ඛ්‍යාත වසතුවෙහි හෝනේ වන්නෙහි, මාගේ ගමනාදිය බලා යන්නෙහි හෝ සිටින්නෙහි හෝ හිඳින්නෙහි හෝ නිදන්නෙහි හෝ වෙහි, මාගේ වසතුවෙහි මට අරක් ගන්නෙහි, වැළි මම තා කැමති සේ යටපත් කොට ද ගිරිහිකොළලැහැබකට ත් වඩා ඉතා මිටිවූවෙක් කරන්නෙමි" මෙසේ නිහු කරන්නේ නම; යම්හෙයකින් මේ බ්‍රහ්ම මාන නිශ්‍රිත වී ද, එහෙයින් මෙහි නිහුව ම අදහස් කරන ලද්දීය. **ආපං** යනාදියෙහි ද මෙ ම නයයි. **අපි ච තෙ අහං බ්‍රහ්මෙ!** සී මෙවිට භාග්‍යවතුන් වහන්සේ "මේ බ්‍රහ්ම මානනිශ්‍රිත යැ, මම දනිමි හඟි, තමාගේ යස සින් මත් යැ, ශරීරය පහරනට ද නිසි වූ කිසිවෙක් නො දකි, මදක් නිගන්නට වටනේ ය"යි සිතා මේ දෙශනාව ආරම්භ කළහ. **එහි ගතිං ච පජානාමි**= නිෂ්පත්තිය ත් දනිමි; **ඉතිං ච**= අනුභාව ත් දනිමි; **එවං මහෙසක්ඛෙ**= මෙසේ මහායශස් ඇත්තේ, මහාපරිවාර ඇත්තේ.

ඡාවනා චඤ්චමසුරිසා පරිහරන්ති= යම් පමණ තැන්හි සඳ - හිරු හැසිරෙත් ද; **දිසා හන්ති විරොචනා**= දිශාවන්හි බබළමින් දීපතිමත් වෙත් ද; **නොහොත් ඔවුන් කරණ** කොට දිශාවෝ බබළමින් දීපතිමත් වෙත් ද; **තාව සහස්සධා ලොකො**= එපමණකින් සහස්‍රධාලෝකය යැ, මේ සක්වළ සමග සක්වළදහසෙක යන අර්ථයි. **එත්ථ තෙ වත්තතී වසෙ**= මේ සක්වළදහසෙහි තාගේ වශය පවතී; **පරොවරං ච ඤාණාදී

යන මෙහි සක්වළ දහසෙහි පරාවර වූ උසස් - පහත් වූ හීන - ප්‍රණීත වූ සත්ත්වයන් දන්නෙහි; **අථෝ රාගවිරාගිනං**= හුදෙක් මේ තෙම සම්බන්ධයෙක, මේ තෙම පියවිමිනිසෙකැ,යි පරාවරබව නො වෙයි, යළි මේ තෙම රාගසහිතයෙක, මේ තෙම පහවූ රාගඇත්තෙකැ,යි රාගවිරාගී ජනයා ද දන්නෙහි; **ඉඤ්ජිතාවඤ්ඣිතාභාවං** යන මෙහි "භාව" නම් මේ සක්වළ යැ, "අඤ්ඣිතාභාව" නම් මෙයින් ශෙෂ වූ එකූන්දහසක් සක්වළ යැ; **සත්තානං ආගතිං ගතිං** යන මෙහි සක්වළ දහසෙහි පිළිසඳ විසින් සත්ත්වයන්ගේ ඒම ද ව්‍යුති විසින් යෑම ද දන්නෙහි; එහෙත් තුඹට "මම ඉතා මහත් එකෙක්මී" හැඟීම් වෙයි, තුඹ සහශ්‍රීබ්‍රහ්ම නම; යළි තව වැඩිසිටි අන්‍ය වූ ද්විසහශ්‍රී ත්‍රිසහශ්‍රී චතුස්සහශ්‍රී පඤ්චසහශ්‍රී දශසහශ්‍රී ශතසහශ්‍රී වූ ද බ්‍රහ්මයන්ගේ පමණෙක් නැති; තුඹ සතරරියන් කඩක පමණ ගන්නට වැයම් කරන්නකු මෙන් මහත්මී, හහනේවෙහි නිහන්නා සේක.

ඉඞ්ඝපපනෙනා= මෙහි පළමුවන දෑහැන්බිමැ උපන්නේ; **නෙන නං තවං න ජානාසි**= එකරුණෙන් ඒ සය තුඹ නො දන්නෙහි; **නෙව නෙ සමසමෙමා**= දතයුතු තැනට පැමිණ ත් තා හා සමසමයෙක් නො වෙමි; **අභිඤ්ඤෙය**= ප්‍රඥවෙන්; **කුතො නිවෙඡ්‍යං**= තුඹට වඩා ඉතා පහත් බවක් වනාහි මව නොයින් ද? මේ බ්‍රහ්ම වනාහි (උඩ බඹලොවින් චුතව යට බඹලොව උපදනා) හෙළුපපත්තිකයෙක:- බුඩොත්පාදය නො පැමිණි කල්හි තවුස්පැවිද්දෙහි පැවිදිව කිසුණුපිරියම් කොට සමවත් උපදවා නො පිරිහුණු ධ්‍යාන ඇති ව කලුරිය කොට චතුර්ථධ්‍යානභූමියෙහි වෘහත් ඵලබ්‍රහ්මලොකයෙහි පන්සියක් කල්පයට ආයු ගෙන උපන; එහි ආයු ඇතිතෙක්සිට යට බඹලොව උපදනට නිසි වූ තෘතීයධ්‍යානය ප්‍රණීත කොට වඩා ශුභකිණ්හබ්‍රහ්මලොකයෙහි සුසැටකපක් ආයු ගෙන උපන; එහි දී ද්විතීයධ්‍යානය වඩා ආභස්සරයෙහි අටකපක් ආයු ගෙන උපන; එහි දී ප්‍රථමධ්‍යානය වඩා ප්‍රථමධ්‍යාන භූමියෙහි කපක් ආයුඇතිව උපන; හෙතෙම ප්‍රථමකාලයෙහි තමා කළ කර්මය ද උපන් තැන ද දනගත; එහෙත් කල් යන් යන් දෙක ම සඳහන් නො කොට ශාශ්වතදෘෂ්ටිය ඉපදවී. එහෙයින් භාග්‍යවත්හු- **නං ත්වං න ජානාසි** —පෙ— **කුතො නිවෙඡ්‍යං** යි වදළහ. එකල බ්‍රහ්ම මෙසේ සිතී- "ශ්‍රමණහෙතුම මාගේ ආයු ද උපන් තැන ද පෙර කළ කර්මය ද දනී, මැනව මම පෙර කළ කර්ම පුළුවුස්මී" ශාස්තෘන් තමාගේ පෙර කළ කර්මය පිළිවිත. ශාස්තෘන් වහන්සේ වදළහ:—

බඹබ්‍රහ්මජාතකය.

පෙර මේ බ්‍රහ්ම කුලගෙයක ඉපද කාමයෙහි ආදීනව දැක "ජාති-ජරා-ව්‍යාධි-මරණ කෙළවර කරන්නෙමී" ගිහිගෙන් නික්ම තවුස් පැවිද්දෙහි පැවිදිව, සමවත් උපදවා අභිඥාපාදක ධ්‍යානලාභී වැ ගංඉවුරක පන්සලක් කරවා ධ්‍යානයෙහි ඇලීමෙන් කල්යැවී; එසමයෙහි ද කලින් කල සාර්වාහකයෝ පන්සිගක් ගැලින් මරුකතරට පිළිපදිත්. මරුකතර වනාහි දවල් යන්ට

නො හැක්ක, රාත්‍රියෙහි ගමින් වෙසි; එකල පළමුගැල අග්‍රියෙහි යෙදූ ගවයෝ යෙමින් යෙමින් නැවතී ආමඟට ම අභිමුඛවූහ; සියලු ගැල් එසේ ම නැවතුණාහ. අරුණු නැගිකල්හි (ගැල්) නැවතිබැව් දැනගත්හ; තවද- ඔවුන්ට එදා කතර ඉක්මවන දවස විය; සියලු දර-දිය පිරිහී ගියේය; එහෙයින් "මෙවිට අපගේ දිවි නැත" යි සිතා ගොනුන් ගැල් සක බැඳපියා මනුෂ්‍යයෝ ගැල්සෙවණට පිවිස වැදහොත්තාහ. තාපස තෙමේ ද කලින් ම පන්සලින් නික්ම පන්සල්දොර හුන්නේ ඟඩගාව බල මින් ගඟ මහවතුරෙන් පුරමින් පෙරළීඑන මිණිකදක් මෙන් එන්නා දුටුවේය; දැක- "මෙලෙවිහි මෙබදු මිහිරිදිය නො ලැබීමෙන් වෙහෙසට පැමිණෙන සත්වයෝ ඇද්දෝ හො" යි සිතී. හෙතෙම් මෙසේ ආවජ්ජනා කරන්නේ මරුකතර ඒ ගැල් සාර්ථය දැක "මේ සත්වයෝ නො නැසෙත් ව,යි මෙයින් මහදියකඳ සිදී මරුකතර සාර්ථයන්ට අභිමුඛ ව සේව" යි අභිඥවිත්තයෙන් ඉපිය. විතෙනාත්පාදය සමඟ ඇළකව නැඟිකලක් මෙන් වතුර එනි ගියේය; මනුෂ්‍යයෝ දියඟඩින් නැඟිව ජලය දැක තුටු පඟටුවූවාහු තා බී ගොනුන්ට ද පොවා සුවසේ කැමතී තැනට ගියාහුය. ශාස්තෘන් වහන්සේ බ්‍රහ්මයාගේ ඒ පූර්වකර්මය දක්වන සේක්-

184. "යං තවං අපායෙසි ඛත්තූ මනුස්සෙ
පිපාසිතෙ සම්මනි සම්පරෙතෙ,
තං තෙ පුරාණං වතසීලවත්තං
සුත්තප්පබුද්ධොව අනුස්සරාමි" යි- මේ ගාථාව වදාළහ.

මෑතකාලයෙක්හි ද තාපස තෙම ගංතෙර පන්සලක් කොටගෙන වනගමක් නිසා වෙසෙයි; එකල්හි සොරු ඒ ගම පැහැර ගසනසාරය ගෙන දෙනුන් ද බලාත්කාරයෙන් ගත් මිනිසුන් ද ගෙන යෙති; දෙන්නු ද බල්ලෝ ද මිනිස්සු ද මහඟඩින් ඔඩත්. තාපස ඒ ශබ්දය අසා "මේ කිමෙක් දෝ හො" යි ආවජ්ජනා කරන්නේ මිනිසුන්ට භයක් උපන්නැයි දැන "මා දක්නා කල්හි මේ සත්ත්වයා නො නසිත්ව" යි අභිඥාපාදක ධ්‍යානයට සමවැද නැඟිසිට අභිඥවිත්තයෙන් සොරුන්ගේ පෙරමඟ යුද කිරීමට සැරසී එන සිවුරඟ සෙසඟක් මැවී; සොරු ඒ දැක "රජ ආවනැ" යි හැඟ පැහැරගත් බඩු දමාපියා පලාගියහ. තාපස "යමක් යමකුට අයිති නම් එය ඔහුට ම වේව" යි ඉටී; ඒ එසේ ම විය; මහා ජනයා සැපතට පැමිණි. ශාස්තෘන් වහන්සේ ඔහුගේ මේ පූර්වකර්මය ත් දක්වන සේක්—

---

184. තවං= නුඹ; පිපාසිතෙ= හටගත් පවස්ඇති; සම්මනි සම්පරෙතෙ= ග්‍රීෂ්මයෙන් අතිශයින් පීඩිත වූ (කලාතන වූ;) ඛත්තූ මනුස්සෙ= බොහෝ මිනිසුන්; අපායෙසි= (පැන්) පෙවූයෙහි යන; යං= යම්ක් වේ ද; තෙ= තා විසින් කරන ලද; පුරාණං= පැරණි වූ; තං වත සීලවත්තං= ඒ ව්‍රතසමාදානය හා ශීලව්‍රතය; සුත්තප්පබුද්ධොව= නිදා පිබිදියේ අලුයම්කාල දුටු සිහිනයක් මෙන්; අනුස්සරාමි= සිහි කරමි.

185. "යං එණිකූලස්මිං ජනං ගහිතං
අමොචයි ගයහක්ඛනිය්‍යමානං,
තං තෙ පුරාණං වතසීලවත්තං
සුත්තප්පබුද්ධොව අනුස්සරාමි" යි- මේ ගය වදුළහ.

ඒ ගාථාවෙහි එණිකූලස්මිං= ගඩගාතීරයෙහි.

නැවත එක් කලෙක උඩුගඟවැසි කුලයෙක් යටගඟවැසි කුලයක් හා සමග මිත්‍රසන්ථව කොට නැව්ගතුළු බැඳ බොහෝ කහ – බොත දෑ ද ගඳ මල් ආදිය ද තෙලාගෙන ගඟදියෙන් එයි; මිනිස්සු කමින් බොමින් නට මින් ගයමින් දෙව්විමනකින් යන්නවුන් මෙන් බලවත් සොම්නස් ඇති වූහ; ගඟ වසන නාරජ දූක කිපියේ "මොහු මා කෙරෙහි සිතකුදු නො කෙරෙති, දැන් මොවුන් මුහුදට ම පමුණුවන්නෙමි" මහත් වූ අත්බැවක් මවා දිය දෙකක් කොට බිදෙයියා නැඟී පෙනය කොට සුස්මමින් සිටියේය; මහාජන තෙම දූක බියවූයේ මහඟඬින් හැඬී. තාපස පන්සල හුන්නේ (ඒ හඬ) අසා "මොහු ගයමින් නටමින් හටගත් සොම්නස ඇති ව එති, එහෙත් දැන් බියඟඬින් හැඬුහ, කිමෙක් දෝ හෝ" යි විමසන්නේ නාරජු දූක "මා බලාසිටිද්දී සත්ත්වයෝ නො නැසෙත්ව" යි අභිඥාපාදකධ්‍යානයට සමවැද අත්බැව හැරදමා ගුරුළුවෙසක් මවාගෙන නාරජුට දක්ෂී. නාරජ බියවූයේ ඵපන ඔකුළා ජලයට පිවිසියේ; මහාජනයා සැපයට පැමිණියේය. ශාස්තෘන් වහන්සේ ඔහුගේ මේ පූර්වකර්මය ත් දක්වන සේක්—

186. "ගඩගාය සොතස්මිං ගහිත නාවං
ලුද්දන නාගෙන මනුස්සකම්‍යා
අමොචයිත්ථ බලසා පසය්හ
තං තෙ පුරාණං වතසීලවත්තං
සුත්තප්පබුද්ධොව අනුස්සරාමි" යි- මේ ගය වදුළහ.

අන් කලෙක්හි දූ මේ තෙම ඉසි පැවිද්දෙහි පැවිදි ව "කෙසව" නම් තවුසෙක් විය. ඒ සමයෙහි අපගේ බෝසත් වූ "කප්ප" නම් මානවක කෙසවතාපසයන්ගේ බඩවර වූ අතැවැසි ව සිට ආචාර්‍යයන්ගේ කළයුතු

---

185. එණිකූලස්මිං= එණි නම් නදීතීරයෙහි; ගහිතං= සොරුන් විසින් ගන්නා ලද; ගය්හක්ඛනිය්‍යමානං= කරමරග්‍රාහයෙන් කෙවිත් බලාත්කාරයෙන් අල්වා ගෙනයනු ලබන්නාවූ; ජනං= ජනයා; අමොචයි= මිදවී (සෙස්ස යට ගාථාවෙහි මෙසේ ය.)

186. ලුද්දන= කර්කශ වූ; නාගෙන= නාගයා විසින්; මනුස්සකම්‍යා= මිනිසුන් නසනු කැමති බැවින්; ගඩගාය සොතස්මිං= ගඩගා ස්‍රොතයෙහි; ගහිතනාවං= ගන්නාලද නැව් ඇති ජනයා; බලසා= (ඍර්ධියෙන්) බලයෙන්; පසය්හ= (ඒ නාරජු) අභිභවනය කොට; අමොචයිත්ථ= මිදවී–

කිමැයි මුහුණ බලමින් හැසිරෙන සුලුවූයේ මනාපයක් කරනුසුලු වූයේ නුවණැත්තේ වැඩකරු වූයේ විය; කෙසවතාපස ඔහුගෙන් වෙන් ව වෙනෙක්ට නො හැකි විය; ඔහු නිසා ම ජීවිකාව කෙළේයි. ශාස්තෘන් වහන්සේ ඔහුගේ මේ පුර්‍වකර්‍මයත් දක්වන සේක්-

187. "කපෙපා ච නෙ බබවරෝ අහොසි
නං බුද්ධිමන්තං වතිනං අමඤ්ඤි
නං නෙ පුරාණං වනසිලවන්තං
සුනන්තපබ්බඩෝව අනුස්සරාමි" යි- මේ ගය වදළහ.

මෙසේ බඹහු නොයෙක් අත්බැව්හි කළ කර්‍මය ශාස්තෘන් වහන්සේ ප්‍රකාශ කළ සේක. ශාස්තෘන් වදරත් ම බ්‍රහ්ම තෙම සැලකී; පහන් දහසක් දැල්වෙන කල්හි රූපයන් මෙන් ඔහුට සියලු කර්‍මයෝ ප්‍රකට වූහ හෙතෙම පහන්සිත් ඇත්තේ මේ ගාථාව කීය-

188. "අඩා පජානාසි මමෙතමායුං
අඤ්ඤම්පි ජානාසි තථාහි බුද්ධෝ
තථාහි නා'ඝං ජලිතා'නුභාවෝ
ඔභාසයං තිඨති බ්‍රහ්මලොකං" යි-

එකල ඕහට භාග්‍යවතුන් වහන්සේ මත්තෙහි ත් අසම්බව ප්‍රකාශ කරන සේක්- පඨවිං ඛෝ අහං බ්‍රහ්ම! යනාදිය වදළහ.

එහි පඨවියා පඨවිත්තෙනන අනනුභූතං= පෘථිවිධාතුව විසින් පෘථිවි සවභාවයෙන් අනනුභූත ය, නො පැමිණෙන ලද; වැළි ඒ කුමක් ද? යත්:- නිර්‍වාණයයි. ඒ නිවන වූ කලි සියලු සංස්කාරයන්ගෙන් නික්මුණු බැවින් පෘථිවිභාවයෙන් අප්‍රාප්ත නම්; තදභිඤ්ඤෙය්‍යං= ඒ නිවන දැන පසක්කොට; පඨවිං නාභොසිං= පෘථිවිධාතුව තෘෂ්ණා - දෘෂ්ටි - මාන ග්‍රහණයෙන් නො ගත්තෙමි; ආපං යනාදියෙහි ද මේ ම නයයි. විසන රය වනාහී මූලපරියායයෙහි කී නියෙන් ම දතයුතු. සචෙ බොතෙ මාරිස! සබ්බස්ස සබ්බත්තෙනන යි වෙය මේ බ්‍රහ්ම තෙම වාදිබැව්න් "සබ්බං" යි අක්ෂර නිර්දේශ කොට අක්ෂරයෙහි දෙස් දක්වමින් කීය.

---

187. කපෙපා ච= කපප නම් වූ; නෙ= කුඹහේ; බබවරෝ= අතැ වැසියෙක්; අහොසි= විය; නං= ඔහු; බුද්ධිමන්තං= නුවණැත්තහු; වතිනං= ව්‍රතයෙන් සම්පූර්ණ වූවහු යයි; අමඤ්ඤි= සිතී

188. අඩා= එනානතයෙන්; මම= මාගේ; එතං ආයුං= මේ ආයු ෂය; පජානාසි= දන්නෙහි; අඤ්ඤම්පි= එයින් අන්‍ය වූ දතයුතු දෙය ද; ජානාසි= දන්නෙහි; තථාහි= එහෙයින් ම; බුද්ධෝ= ඔබ බුදුවූයෙහි; තථාහි= සියලු ධර්‍මයන් අවබෝධ කළ හෙයින් ම; නෙ= ඔබගේ; අඝං ජලිතානුභාවෝ= මේ දිලියෙන ශරීරප්‍රභාව; බ්‍රහ්මලොකං= මේ සියලු බඹලොව ද; ඔභාසයං= බබුළුවමින්; තිඨති= සිටිනේයි.

ශාස්තෘන් වහන්සේ වනාහි සතකාය සඳහා "සබ්බං" යි වදාරති; බ්‍රහ්ම තෙම සප්‍රියස්වීය සඳහා කියයි; "ඔබ සියල්ල යයි කියව, සප්‍රියභාවයෙන් අනනුභූත (= නො පැමිණෙන ලද) යි කියව; ඉදින් සියල්ල (සප්‍රියභාව යෙන්) පැමිණෙන ලද්දේ නො වන්නේ ද, එකල්හි ඔහුගේ අනනුභූත (= නො පැමිණීම) ඇති; **මා හෙව තෙ දිට්ඨකමෙව අභොසි තුවඤ්ච මෙව අභොසි=** ඔබගේ වචනය සිස් නො වේවා, තුවජ් නො වේව" යි ශාස්තෘන් මුසාවාදයෙන් නිග්‍රහ කෙරෙයි; ධර්මයෙනින් ශාස්තෘන් වහන්සේ මේ බ්‍රහ්මයාට වඩා සියගුණයෙන් දහස්ගුණයෙන් වාදිතර සේක් ද, එහෙයින් "මම සියල්ල ද කියන්නෙමි, අප්‍රාප්තය ද කියන්නෙමි, මාගේ වචනය අසව" යි ඔහුගේ වාදමර්දනය පිණිස කරුණු එළවන සේක්- **විසෙසකුණං** යනාදිය වදාළහ. එහි **විසෙසකුණං=** විශෙෂයෙන් දතයුත්ත; **අනිදස්සනං=** චක්ෂුර්විඥානයාගේ ආපාථයට නො පැමිණෙන හෙයින් "අනිදස්සන" නම්; දෙපදයෙන් ම **අනනනං=** ඒ මේ (නිවන) උත්පාදව්‍යය අන්තරහිත බැවින් අනන්ත නම්; මේ කියන ලද මැයි—

189. **"අනනවනනානි භූතානි – අසම්භූතං අනනනකං**
අභූතෙ අනනා න දිස්සනති – භූතෙ අනනා පකාසිතා" යි-

සබ්බසො පහං= සර්ප්‍රකාරයෙන් ප්‍රහාසම්පන්න වූ; ඒ එසේ මැයි- නිවනට වඩා අන් දහමෙක් අතිශයින් ප්‍රභාසහිත වූයේ හෝ අතිශයින් ජ්‍යොතිමත් වූයේ හෝ අතිශයින් පරිශුද්ධවූයේ හෝ අතිශයින් පණ්ඩර වූයේ හෝ නැති; සියලු තැන්හි ප්‍රභු වූයේ හෝ එය ම හෝ කිසි තැනක නැත්තේ නො වේ නුයි= **සබ්බසො පහං;** සැබව- පූර්වදිශාදීන් අතුරෙහි අසවල් දිශාවෙහි නම් **නිබ්බානය** නැතැයි නො කියයුතු. **නොහොත් පහං** යි නිර්වචන නම් යැ; සියලු තැන්හි නොව ඇත්තේ මොහට නුයි= **සබ්බසොපහං; නිබ්බානයට** වකාහි- ධර්මයේ මහමුහුදට යම් යම් තැනකින් බසිනු කැමැත්තාහු වෙත් ද, ඒ ඒ තැන ම නොව ඒ ද, අනෙ නොවක් නම් නැද්ද; එපරිද්දෙන් අවතිස් කම්ටහන් අතුරෙහි යම් යම් මුඛයකින් නිවනට බසිනු කැමැත්තාහු වෙත් ද, ඒ ඒ කම්ටහන ම නිවනට නොව වෙයි, නො නොව වූ කම්ටහනක් නම් නැති; එහින් වදාරන ලදි- **සබ්බසො පහං** යනු. **නං පඨවිධාතා පඨවිසභාවෙනන=** ඒ නිවන පෘථිවිධාතුහුගේ පෘථිවි සභාවයෙන්; එහින් අන්‍ය වූ අබ්ධාත්වාදීන්ගේ අප්ආදි සභාවයෙන් ද අප්‍රාප්ත යැ, මෙසේ නොප වැන්නවුන්ට විෂය වූ යම් සියලු ත්‍රෛභූමක

---

189. **භූතානි=** භූතයෝ; **අනනවනනානි=** උත්පාදව්‍යය සඞ්ඛ්‍යාත අන්තය ඇත්තාහුය; **අනනනකං=** අන්තරහිත වූ නිවන; **අසම්භූතං=** ප්‍රත්‍යයෙන් අනුත්පන්න යැ; **අභූතෙ=** නුපන් වස්තුවෙහි; **අනනා=** උත්පාදව්‍යය අන්තයෝ; **න දිස්සනති=** නො දක්නා ලැබෙත්; **භූතෙ=** භූතයෙහි; **අනනා=** අන්තයෝ; **පකාසිතා=** ප්‍රකාශ කරන ලද්දාහුයි.

ධම්ජාතයක් වේ ද, ඒ සියල්ලට සමීභාවයෙන්- දතයුතු වූ අනිදර්ශන (= චක්ෂුර්විඥානයට ආපාථ නොවූ) වූ උත්පාදව්‍යයඅන්තරහිත වූ සමීප්‍රකාරයෙන් ප්‍රභාසම්පන්න වූ ඒ නිවන අප්‍රාප්ත යයි වාදය පිහිට වූ සේක. ඉක්බිති බ්‍රහ්ම තෙම ගත් ගත් වාදය ශාස්තෘන් විසින් විසඳවන ලද්දේ ගතයුතු කිසිවක් නොදැක ලජ්ජිතයක් කරනු කැමති ව **හඤ්ඤ වරකි තෙ මාරිස! අන්තරධායාමි** යි කීය. **එහි අන්තරධායාමි**= අදෘශ්‍යමාන ප්‍රාතිහාර්‍යයක් කෙරෙමි; **සචෙ විසහසි**= ඉදින් මට අතුරුදහන් වන්ට හැකි වෙහි නම්, අතුරුදහන් වෙහි, පෙළහර කරව; **මනවසසු මෙ සංකප්පාසි අන්තරධායිතුං**= මට අතුරුදහන් වන්ට නොම හැකි වෙහි; යළි මේ බ්‍රහ්ම කුමක් කරනු කැමැත්තේ වී ද? යත්:- මූලප්‍රතිසන්ධියට යනු කැමති විය. යම්හෙයකින් බ්‍රහ්මයන්ගේ මූල ප්‍රතිසන්ධියෙහි ආත්මභාවය සියුම් වූයේ අන්‍යයන්ට ආපාථ නොවේද; නිර්මිත කයින් ම සිටිත්ද; ශාස්තෘන් වහන්සේ

බකබ්‍රහ්මයා දමනයවීම.

ඔහුට මූලප්‍රතිසන්ධියට යන්ට නුදුන් සේක් ද; මූලප්‍රතිසන්ධියට හෝ නොගොස් යම් අධිකාරයකින් තමා වතුරාර්‍ය අදෘශ්‍යමානයෙක් වන්නේ නම් ශාස්තෘන් වහන්සේ ඒ අදුර දුරුකළ සේක් ද; එහෙයින් අතුරුදහන් වන්ම නොහැකි විය. හෙතෙම නොහැකි වන්නේ විමානයෙහි සැඟවෙයි, කප්රුකෙහි සැඟවෙයි, උක්කුටික ව හිඳී; බඹපිරිස පරිහාස කෙළේය- "මේ බකබ්‍රහ්ම විමානයෙහි සැඟවෙයි, කප්රුකෙහි සැඟවෙයි, උක්කුටික ව හිඳී, බ්‍රහ්මය! නුඹ අතුරුදහන් වීමී, සිතූයෙහි දැ?" යි; හෙතෙම බඹපිරිස විසින් පරිහාස කරන ලද්දේ මකුවිය. **එවං වුත්තෙ අහං හිකබවෙ!**= මහණෙනි! බකබ්‍රහ්ම විසින් "නිදුකාණෙනි! එසේ නම් ඔබට අතුරුදහන් වෙමි" මෙසේ කී කල්හි ඔහු අතුරුදහන් වන්ට නොහැකි වන්නහු දැක මම මෙසේ කිමි; **ඉමං ඨානං අභාසිං**= කුමක්හෙයින් භාග්‍යවත්හු ඨානවක් වදාළහ? යත්:- "ශ්‍රමණ ගෞතමයන් මේ තැන්හි ඇතිබවහෝ නැතිබව හෝ දැනගන්ට කෙසේ හැකි දැ?" යි මෙසේ බ්‍රහ්ම සමූහයාගේ වචනයට අවකාශයෙක් නොවේවයි අතුරුදහන් වූවාහු ඨානය වදාළහ. එහි—

. භවෙ චා'හං භයං දිස්වා= මම භවයෙහි භය දැක ම; **භවං ච විභවෙසිනං**= මේ කාමභවාදි ත්‍රිවිධ වූ ම සත්ත්වයා ද, **විභවෙසිනං**= විභව (= නිර්‍වාණ) ය ගවේෂණය කරන්නහු සොයන්නහු ත් නැවත නැවත භවයෙහි ම (සිටියහු) දැක; **භවං නාභිවදිං**= තෘෂ්ණාදෘෂ්ටි වශයෙන් කිසි භවයක් න + අභිවදිං= නොගත්තෙමි, යන අර්ථයි. **නන්දිං ච න උපාදිඩිං**= භවතෘෂ්ණාවට නොපැමිණියෙමි, නොගත්තෙමි, යන අර්ථයි. මෙසේ චතුරාර්‍යසත්‍යයන් ප්‍රකාශ කරමින් ශාස්තෘන් වහන්සේ ධර්ම දෙශනාව දෙශනා කළ සේක. දෙසුන් කෙළවර දෙශනානුසාරයෙන් විදසුන් ගැබ් ගන්වා දසදහසක් පමණ බ්‍රහ්මයෝ මගඵල අමාපැන් පානය කළාහුය.

අවජ්ජියබහුනා විඤ්ඤූජාතා= උපන් ආශ්‍රයයී ඇත්තාහු උපන් අද්භූත ඇත්තාහු උපන් සතුටු ඇත්තාහු ම වූහ; **සමූලං භවං උදබ්බහි**= බෝමැඩ තමන් වහන්සේගේ ද ඒ ඒ දම්දෙස්නෙන් අන් බොහෝ දෙව්මිනිසුන්ගේ ද මුල්සහිත වූ භවය උදබ්බහි= ඉදිරි; උතුපාවනය කෙළේය යන අර්ථ යි. තවද- එසමයෙහි මාරපාපි තෙම ක්‍රොධයෙන් මඩනා ලදු ව "මා හැසිරෙත් හැසිරෙත් ම ශ්‍රමණ ගෞතමයන් විසින් බණ වදුරා දසදහසක් පමණ බ්‍රහ්මයෝ මාගේ වශය ඉක්මවනු ලැබුවාහු ය" යි ක්‍රොධාභිභූත බැවින් එක්තරා බ්‍රහ්මපාරිසද්‍යයකුගේ ශරීරයෙහි ආවෙශ විය. එය දක්වන්ව- **අථ ඛෝ භික්ඛවෙ!** යනාදිය වදළහ. **එහි සවෙ තුවං එවමනුබ්බඩෝ**= ඉදින් ඔබ මෙසේ තමා විසින් ම වතුසස තෘයන් අවබෝධ කළහු නම්; **මා සාවකෙ උපනෙසි**= ගිහිසව්වන් හෝ පැවිදිසව්වන් හෝ ඒ දහමට නො පමුණුව; **ගිනෙ කාමෙ පහිණිතා**= සතර අපායෙහි පිහිටියාහු; **පණීනෙ කාමෙ**= බඹලොව පිහිටියාහු; මේ කවුරුන් සඳහා කියා ද? යත්:- බාහිරපැවිද්දෙහි පැවිදිවූ තවුස්පිරිවැජියන් සඳහා ය; ඒ එසේ මැයි- නො පැමිණි බුඩොත්පාදය ඇති කල්හි කුලපුත්‍රයෝ තවුස්පැවිද්දෙහි පැවිදිව කිසිවකුගේ කිසිවක් නො විමසා එකවර වැ සමවත් උපදවා බඹලොව උපන්නාහුය; ඔවුන් සඳහා මෙසේ කීය—

අනාකඩානං කුසලංහි මාදිස= **නිදුකාණෙති! අත්‍යයන්ව** නො කිම අවවාද නො කිරීම ධම්කථාව නො දෙසීම මැනව, මෙය ශ්‍රෙෂ්ඨ ය; **මා පරං බවදුහි**= කලෙක මිනිස්ලොව කලෙක දෙව්ලොව කලෙක බඹලොව කලෙක නාලොව ඇවිදිමින් නො හැසිරෙනු මැනව, එක් තැනක හුන්නේ ධ්‍යාන-මාර්ග-ඵලසැපයෙන් කල්ගවනු මැනවැ,යි **අනාලපන නාය**= කථා නො කරන බැවින්; **බ්‍රහ්මුනො ච අභිනිමන්තණනාය**= බ්‍රහ්මයාගේ ද **"ඉදං භි මාදිස! නිවවං"** යනාදි නයින් අවකාශ සහිත බ්‍රහ්මස්ථානයෙන් නිමන්ත්‍රණ වචනයෙන් ද; **නසමා**= එ කරුණෙන්; මේ වෙය්‍යාකරණ (= ධර්ම) ය ට "බ්‍රහ්මනිමන්තණික" යි ම නම සඞ්ඛ්‍යාව සංඥව ප්‍රඥප්තිය උපන. සෙස්ස සියලු තැන්හි ප්‍රකට අර්ථ ඇත්තේ මැයි.

බ්‍රහ්මනිමන්තණික සූත්‍ර වණ්ණනා නිමි. (9)

———:÷:———

මාරතජ්ජනිය සූත්‍ර වණ්ණනා.

—:+:—

එවං මේ සුතං යි මාරතජ්ජනික සූත්‍ර යයි. **එහි කොඤ්ඤමනුපවිට්ඨෝ=** කුසට පිවිස අතුනු ඇතුළත ප්‍රවිෂ්ට වූයේ පක්වාසයසථානයෙහි හුන්නේ; **ගරුගරු විය=** අතිශයින් බර වූවෙක් මෙන්, තද වූයේ ගල්රැසක් වැනි වූයේ; **මාසාචිතං මඤ්ඤේ=** උදුඹත් කැවහුගේ කුස මෙන් ද, උදු පිරූ පසිම්බුවක් මෙන් ද, තෙත් උදු මෙන් ද යන අර්ථ යි. **විහාරං පවිසිත්වා=** ඉදින් ආහාරදෙෂයෙන් මේ බරබව වී නම් අභ්‍යවකාශයෙහි සක්මන් කරන්ට නො පහසු යයි සක්මනින් බැස පන්සලට පිවිස පියවින් පැනවූ අස්නෙහි හුන්හ; **පවත්තනං සොතිසෝ මනසාකාසි=** මේ කිමෙක් දෝ හොඳැයි අවජ්ඣින් තමන් විසින් ම උපායයෙන් මෙනෙහි කළහ; ඉදින් තෙරුන් වහන්සේ තමන්ගේ ශීලය ආවජ්ජනා කොට ඒ දවස් හෝ පෙරදවස් හෝ වැළඳූ නො පැසුණු යමක් ඇත්නම් අන් කිසි විෂභාග දෙෂයෙක් හෝ ඇත් නම්, සියල්ල දිරා වා පාසු වේවා,යි අතින් කුස පිරිමැදි සේක් නම්, මාරපාපි තෙම විලිනව යන්නේය; වැලි තෙරුන් වහන්සේ එසේ නො කොට උපායයෙන් මෙනෙහි කළහ. **මා තථාගතං විහෙසි=** ඔම්සේ පුතුන් වෙහෙස කළ කල්හි මවු පිය දෙදෙන වෙහෙසන ලද්දාහු ම වෙත් ද, සඞ්ඝාරික – අන්‍යෙනවාසිකයන් වෙහෙස කළ කල්හි ආචාර්‍ය්‍ය – උපාධ්‍යායයෝ වෙහෙසන ලද්දාහු ම වෙත් ද, ජනපදය වෙහෙසූ කල රජ තෙම වෙහෙසන ලද්දේ ම වේ ද, එපරිදෙන් තථාගත ශ්‍රාවකයකු වෙහෙසූ කල තථාගතයන් වහන්සේ වෙහෙසන ලදාහු ම වෙති, එයින් කිහ- **මා තථාගතං විහෙසි** යනු. **පවත්තඵලෙ අඤ්ඤාසි=** දෙරකවුළුවෙහි සිටියේය; **අඤ්ඤාල** යි කවුළුව කියනු ලැබේ; මුඛයෙන් උඩට නැඟී පන්සලින් නික්ම පන්සලෙහි කවුළුව නිසා සිටියේය යන අර්ථ යි.

වසවත්තරූ මුගලන් තෙරුන් වෙහෙසීම.

සුතපුබ්බං මාරිස! යි කුමක් හෙයින් මේ දෙශනාව ආරම්භ කළහු ද? තෙරුන් වහන්සේ වනාහි මෙසේ සිතූහු- "ආකාශසථ දෙවියන්ට වූ කලි මිනිස්ගඳ යොදුන් සියයක සිටියවුන්ට පීඩා කරයි; මේ කියන ලද මැය- **"සොජනසතා ඛො රාජසෙට්ඨ! මනුස්සගන්ධෝ දෙවෙ උබ්බහති"** යි. එහෙත් මේ මාර නාගරක (= සියුමැලි) වූ හාත්පසින් පවිත්‍ර වූ මහෙශාක්‍ය වූ අනුභාවසම්පන්න වූ දෙව්රජෙක් වූයේ මාගේ කුසට පිවිස අතුනු ඇතුළත පක්වාසය පිහිටි අවකාශයෙහි හුන්නේ ඉතා ම දුෂ්ට වූයේ වන්නේය; මෙබදු නම් පිළිකුල් කවයුතු වූ විපරීත වූ පෙදෙසට පිවිස හිඳින්ට හැකි වූවහුට අන් කුමක් නො කවයුතු වන්නේ ද, අන් කුමක් ලජ්ජා වන්නේ ද; වැළි "නුඹ මාගේ නෑයෙකැ"යි කී කල්හි මොළොක් බවට නො පැමිණෙන්නාහු නම් නැති; එබැවින් ඔහුට නෑයෙකැයි

අවබොධ කරවා ඔහු මෘදු වූ උපායකින් ම හරිමි, සිතා මේ දෙශනාව ආරම්භ කළහ. **සෝ මේ සුවං භාගිනෙය්‍යෝ හෝ'සි=** ඒ නුඹ එකල්හි මාගේ බෑනා වූයෙහි; මෙය ප්‍රවේණිවශයෙන් කියන ලද; දෙව්ලොව වූ කලි මාගේ පියවංශය මුතුවංශයයි රජ කරන්නෙක් නම් නැති; පුණ්‍ය යාගේ වශයෙන් දෙව්ලොව දෙව්රජ වැ උපන්නේ ආයු ඇතිතෙක් සිට චුත වෙයි, අනෙකෙක් තමා කළ කර්මයෙන් එතැන්හි අධිපතිව උපදී; මෙසේ මේ මාර ද එකල ඉන් චුතව නැවත කුසල් කොට මෙකල එහි අධිපති තැන්හි උපනැයි දතයුතු.

විධුරෙ විධුරෝ= විගතධුර වූයේ විගතධුර වූයේ; අත්‍යයන් හා සමඟ අසමාන වූයේ යන අර්ථ යි. **අජජඣාසිරෙන= නිදුකින්; පසුපාලකා= එළු - බැටලුවන් රක්නාහු; පථාවිනෝ= මහට පිළිපන්නාහු; ඛායෙ උපවිනිච්චා= භාත්පසින් සැයක් බැඳ; අඟඟිං දච්චා පක්කමිංසු=** මේතෙකින් ශරීරය ක්‍ෂයවීමට යන්නේය,යි චිතකයාගේ පමණ සලකා සතරදිග ගිනි දී නික්මගියාහුය; සැය පහන්සිළුවක් මෙන් දැල්විණි; තෙරුන්ට දියලෙනකට පිවිස වැඩහුන් කලක් මෙන් විය; **විවරුනි පපෙළොටෙච්චා=** සම්මසින් නැඟිට පහවූ දුම් ඇති කැලමල් පැහැඇති අඟුරු මඩිමින් සිවුරු සලා; වැළි උන්වහන්සේගේ සිරුරෙහි උණුසුම් පමණකු දු නො වියැ, සිවුරෙහි රැලක්පමණකු දු නො දැවී; සම්පත්ති බලය නම් මේ යැ.

අක්කොසථ= දශආක්‍රොශ වස්තුවෙන් ආක්‍රොශ කරවු; **පරිභාසථ=** වචනයෙන් පරිභව කරවු; **රුප්පථ=** ගවවු; **විහෙසථ=** දුක්උපදවවු; මේ සියල්ල වචනයෙන් ගැටීමට ම නම් යැ; **යථා න දූසිමාරෙ=** යම්සේ මොවුන්ට දූසිමාරතෙම; **ලභථ ඔකාසං=** සිදුරක් ලබා නම්; කෙලෙස් ඉපදීමට ආරම්මණප්‍රත්‍යය ලබන්නේ නම් යන අර්ථ යි. **මුණ්ඩකා යතූ** දියෙහි මුඩුවූවන්ට "මුණ්ඩ" යි ද ශ්‍රමණයන්ට "**සමණ**" යි ද කියන්ට වටනේය; මොවුහු වැළි අනදර කෙරෙමින් **මුණ්ඩකා සමණකා** යි කීහු; **ඉඛභා=** ගෘහපතියෝ යැ; **කිණභා=** කෘෂණයෝ යැ, කළුවූවෝ යැ යන අර්ථ යි. **බන්ධුපාදූපචචා=** මෙහි බන්ධු යි බ්‍රහ්මයා අදහස්කරන ලද; සැබව- බ්‍රාහ්මණයෝ ඔහු "පිතාමහ" (=මුත්තා) යයි ව්‍යවහාර කෙරෙති; පාදයන්ගේ **අපත්‍යයෝ= පාදූපචචා,** බඹහුගේ පිපිපත්ලෙන් උපන්නාහු යන අදහසයි. මේ වූ කලි ඔවුන්ගේ ලබ්ධිය යැ:- බඹුණෝ බඹහුගේ මුවින් නික්මුණාහුය, ක්ෂත්‍රියයෝ ළයින්, වෛශ්‍යයෝ තැබින්, ශූද්‍රයෝ දණින්; ශ්‍රමණයෝ පිටිපසින් නික්මුණාහු යයි. **ඣායිනොසම්ඣායිනොසම්= ඇපි ධ්‍යාන ඇත්තමෝ යැ ඇපි ධ්‍යාන ඇත්තමෝ යැයි; මඤ්ඤරකජාතා=** හවගත් අලස බැව් ඇත්තාහු; **ඣායතනිං=** සිතත්; **පජ්ඣායතනිං** යනාදිය උපසර්ග වශයෙන් වැඩිවූවාහුයි. **මූසිකං මඝය මානෙ=** සවස ගොදුරු පිණිස රැස්සිදුරින් නික්මුණු ගස අත්තෙහි

සිවි මියකු සොයමින්; හේ වනාහි අතිශයින් ශාන්තයකු මෙන් නිශ්චලව සිටී, පෑමිණි කල්හි මියා වහා අල්ලාගනී; **කොඤ්චු**= සිවල්; උකුසු යයි ද කියති. **සඤ්ඡිසම්ලසඛකදීරෙ**= ගෘහසන්ධියෙහි ද මලනික්මෙන ඇළෙහි ද කසළගොඩෙහි ද; **එහි සඤ්ඡි නම්**, ගෘහසන්ධි යයි; **සම්ල නම්** අසුචි නික්මෙන ඇළ යැ; **සඛකවීර නම්**, කසළගොඩ යැ; **වහවජි නනා**= කන්තාරමයන් නික්මුණු සිදුණු කඳඇති; **සඤ්ඡිසම්ලසඛකදීරෙ**= ගෘහසන්ධියෙහි හෝ මලවැහෙන තැන්හි හෝ කසළගොඩෙහි හෝ හෙතෙම් අඩක් වැසූ සිරුරු ඇත්තකු මෙන් නිශ්චලව සිටියිලි සිතයි;

නිරයං උපපජ්ජන්ති= ඉදින් මාර මිනිසුන්ගේ සිරුරෙහි ආවෙශ ව මෙසේ කරන්නේ නම් මිනිසුන්ට අකුසල් නො වන්නේය, මරහට ම වන්නේය; එහෙයින් සිරුරෙහි ආවෙශ නො වැ විෂභාග වසතුවක් විපිළිසිස (උපදින) අරමුණක් දක්වයි; එකල වනාහි හෙතෙම භික්ෂූන් කෙමින්නක් ගෙන මසුන් මිරිකන්නවුන් මෙන් ද, දූලක් ගෙන මසුන් ගන්නවුන් මෙන් ද, ලෙපයෂ්ටිය (= ලාවුතැවරු දණ්ඩ) ක් ඛහා ලිහිණීන් බඳින්නවුන් මෙන් ද, බල්ලන් සමඟ වනයෙහි මුවදඩ හැසිරෙන්නවුන් මෙන් ද, මාගමුන් ගෙන අවන්කිම හුන්නවුන් මෙන් ද, නටන්නවුන් මෙන් ද, ගයන්නවුන් මෙන් ද, භික්ෂුණීන්ගේ රාත්‍රිසථාන - දිවාසථානයන්හි විෂභාග මිනිසුන් හුන්නවුන් මෙන් ද, සිටියවුන් මෙන් ද, කොට දක්වී; මිනිස්සු අරණ්‍යයට ගියාහු ද වලට ගියාහු ද වෙහෙරට ගියාහු ද විපිළිසර (උපදින) අරමුණු දැන අවුත් අන්‍යයන්ට කියත්:— "ශ්‍රමණයෝ මෙබඳු වූ අශ්‍රාමණක දෙය නො සුදුසු දෙය කෙරෙති, මොවුන්ට දුන් කල කුසල් කොයින් ද? මොවුන්ට කිසිවක් නො දෙව" යි; මෙසේ ඒ මනුෂ්‍යයෝ දුටු දුටු තැන ගිල්වතුන්ට ආක්‍රොශ කරන්නාහු අකුසල් රැස්කොට අපාය පුරන්නෝ වූහ. එයින් කියන ලදි- **නිරයං උපපජ්ජන්ති** යනු.

දූසිමාරයාගේ දුෂ්ට ක්‍රියා.

අඩ්ඩාවිඤ්ඤා= ආවිෂ්ට වූවාහු; **එකච්චා විහරිංසු**= හුදෙක් පතුරුවා වාසය කළාහු නො වෙති, යළි කකුසඳ භාග්‍යවතුන්ගේ අවවාදයෙහි සිට මේ සතරබ්‍රහ්මවිහාරයන් උපදවා ධ්‍යානපදස්ථාන කොට විදසුන් රහත් බැවිහි පිහිටියාහුය; **ආගතිං වා ගතිං වා**= පිළිසඳ විසින් පැමිණෙන තැනක් හෝ ගති විසින් යන තැනක් හෝ නො දනිමි; **ඉඤ්ඣා චිත්තනයස අඤ්ඤදත්ථං**= සොමනස් වශයෙන් අන්‍යථාභවයක් වන්නේ නම්; **සඟහං ලොකං උපපජ්ජන්ති** යන මෙහි ද පළමු නයින් ම අර්ථ දතයුතු. යම්සේ පළමු විපිළිසර උපදනා අරමුණ දැක්වී ද, එසේ මෙවිට ප්‍රසාදකර වූ අරමුණ දැක්වී. හෙතෙම එකල්හි මිනිසුන්ට පෙනෙන තැන භික්ෂූන් අහසෙහි යන්නවුන් මෙන් සිටියවුන් මෙන් පලඟින් හුන්නවුන් මෙන් අහසෙහි හිදිකම් (= මැසීම) කරන්නවුන් මෙන් පොත් කියවන්නවුන් මෙන් අහසැ සිවුර දිගහැර යෑතු හන්වන්නවුන් මෙන් මහලු පැවිද්දන්

අහසෙහි හැසිරෙන්නවුන් මෙන් තරුණ සාමණේරයන් අහස සිට මල් නෙලන්නවුන් මෙන් කොට දැක්වී. මනුෂ්‍යයෝ අරණ්‍යයට ගියාහු ද වලව ගියාහු ද වෙහෙරට ගියාහු ද පැවිද්දන්ගේ පිළිවෙත් දැක අවුත් අන්‍යයන්ට කියති:- "භික්ෂූන් අතුරෙහි යටත්පිරිසෙයින් සාමණේරයෝ පවා මෙසේ මහත් සෘඞ්ඞි ඇත්තාහුය, මහානුභාව ඇත්තාහුය, මොවුන්ට දෙනලද්ද, මහත්ඵල වෙයි, මොවුන්ට දන්දෙවු, සත්කාර කරවයි; එකල්හි මනුෂ්‍යයෝ භික්ෂුසඞ්ඝයාට සිවුපසයෙන් සත්කාර කරන්නාහු බොහෝ පින්කොට සඟමඟ පුරන්නෝ වූහ. එයින් කියන ලදි- **සඟඟං ලොකං උපපජ්ජන්ති** යනු.

එථ තුමෙඝ භික්ඛවෙ! අසුභානුපස්සි කායෙ විහරථ= භාග්‍යවතුන් වහන්සේ මූළු දඹදිව ඇවිදිමින් භික්ෂූන් දෙතුන් දෙනෙකුන් වසන තැනට ගොස් "මහණෙනි! අශුභසංඥාව පුරුදුකළ සිතින් බහුල ව වසන භික්ෂුහුගේ සිත මෛථුනධර්මය හා යුක්ත බැවින් සැඟවෙයි, හැකිළෙයි, පෙරළෙයි, නො පැතිරෙයි; උපෙක්ෂාව හෝ පිළිකුල්බව හෝ එළඹ සිටී; මහණෙනි! ආහාරයෙහි ප්‍රතිකූලසංඥාව පුරුදු කළ සිතින් බහුල ව වසන භික්ෂුහුගේ සිත රස තෘෂ්ණාවෙන් සැඟවෙයි, හැකිළෙයි, පෙරළෙයි, නො පැතිරෙයි; උපෙක්ෂාව හෝ පිළිකුල්බව හෝ එළඹසිටී. මහණෙනි! සියලු ලොකයෙහි අනභිරතසංඥාව පුරුදු කළ සිතින් බහුල ව වසන භික්ෂුහුගේ සිත (ඇත් - අස් ආදි වූ ද අරම් ආදි වූ ද) ලොකයෙහි චිත්‍ර - විචිත්‍ර වස්තූන්හි සැඟවෙයි, හැකිළෙයි, පෙරළෙයි, නො පැතිරෙයි; උපෙක්ෂාව හෝ පිළිකුල්බව හෝ එළඹසිටී. මහණෙනි! අනිත්‍යසංඥාව පුරුදුකළ සිතින් බහුල ව වසන භික්ෂුහුගේ සිත ලාභ-සත්කාර-ප්‍රශංසාවෙහි සැඟවෙයි, හැකිළෙයි, පෙරළෙයි, නො පැතිරෙයි; උපෙක්ෂාව හෝ පිළිකුල්බව හෝ එළඹසිටියි" යි ද මෙසේ අනුසස් දක්වා **"එථ තුමෙඝ භික්ඛවෙ! අසුභානුපස්සි කායෙ විහරථ, ආහාරෙ පටිකූල සඤ්ඤිනො, සබ්බලොකෙ අනභිරතසඤ්ඤිනො, සබ්බසඞ්ඛාරෙසු අනිච්චානුපස්සිනො"** යි මේ සූතර කමටහන් වදාළ සේක. ඒ භික්ෂුහු ද මේ සූතර කර්මස්ථානයන්හි කර්ම කරන්නාහු විදසුන් වඩා සියලු ආශ්‍රවයන් ක්ෂය කොට රහත්බැව්හි පිහිටියාහුය. මේ සූතර කර්මස්ථානයෝ ද රාගය සන්සිඳුවන්නාහු දෙස - මොහයන් සන්සිඳුවන්නාහු රාගය නසන්නාහු දෙස - මොහයන් නසන්නාහු ම වෙති.

සඞ්ඛරං ගහෙත්වා= මිට ඇතුලෙහි සිටින පමණ පහණ (= ගල) ක් ගෙන; මේ මාර වතාහි බමුණු - ගැහැවියන් ලවා භික්ෂූන්ට ආක්‍රොශ කරවා ද බමුණු - ගැහැවියන්ගේ වශයෙන් භික්ෂුසඞ්ඝයාට ලාභසත්කාර උපදවා ද සිදුරක් නො ලබන්නේ දැන් සියතින් උපක්‍රම කරනු කැමතිව එක්තරා කුමාරයකුගේ ශරීරයෙහි ආවෙශ ව මේබදු ගලක් ගත්තේය.

ඒ සඳහා කියන ලදි- **සකඛරං ගහෙත්වා** යනු. **සිඝං වොහිඤ්ඤි**= හිස බිඳුණේය; මහසම සිදී මස් දෙකඩ විය; ගල වනාහි හිස්කබල නො බිඳ ඇවයට හැපී ම නැවැත්ත. **නාගාපලොකිනං** නාගාපලොකනය. **අපලොකෙසි**= මහාශබ්දය අසා යම්සේ නම් හස්ති නාග ඇත හෝ මැත හෝ බලනු කැමැත්තේ ගෙල නො පෙරළා සියලු සිරුරින් ම නැවතී ආපසු බලා ද, එපරිද්දෙන් සියලු සිරුරින් ම නැවති ආපසු බැලූසේක. යම්හෙයකින් යම්සේ මහාජන යාගේ ඇව කොතින් කොත හැපී සිටියාහු ද, පසේබුදුවරුන්ගේ අඛණ්ඩ සයෙන් ලැගුනාහු වෙත් ද, බුදුවරුන්ගේ එසේ නො වෙති; යළි බුදුවරුන්ගේ හැකිල්ලක් මෙන් එකාබද්ධ,ව සිටියාහුද; එහෙයින් පිටිපස බලන කල්හි ගෙල පෙරළන්ට නො හැකි වෙයි; වැළි යම්සේ හස්තිනාග පිටිපස බලනු කැමැත්තේ සියලු සිරුරින් ම හැරේ ද, එසේ පෙරලා හැරියයුතු වෙයි; එහෙයින් භාග්‍යවතුන් වහන්සේ යන්ත්‍රයකින් පරිවර්තනය කළ රන්පිළිමයක් මෙන් සියලු සිරුරින් ම නැවති බැලූ සේක. යළි බලා සිටි සේක්- **න වා'ඝං දූසිමාරෝ මත්තමඤ්ඤසි** යි වදළහ. එහි අර්ථ නම්:- මේ දූසිමාර පව් කරන්නේ පමණ නො මැ දන්නේය, පමණ ඉක්මෙන සේ කෙළේය. **සහාපලොකනා**= කකුසඳ භාග්‍යවතුන් වහන්සේගේ බැලීම සමග එ කෙණෙහි ම; **තම්හා ච ඨානා චුඃ**= ඒ දිව්‍යස්ථානයෙන් ද චුත වූයේ මහානරකයෙහි උපන්නේය යන අර්ථ යි. චුත වන්නේ ද යම් කිසි තැනක නො ගොස් වශවර්ත්තී දිව්‍ය ලොකයට ම අවුත් චුත විය. **සහාපලොකා** යන වචනයෙන් භාග්‍යවතුන් විසින් බැලූ බැවින් චුත වී යයි නො දතයුතු, මේ වනාහි ව්‍යුති කාලය දැක්වීම් මාත්‍රයක් මැයි. වැළි උදුර වූ මහාශ්‍රාවකයන් කෙරෙහි වරදනා ලද බැවින් පොරොවෙන් ගසන ලද්දක් මෙන් ඔහුගේ ආයු එහි ම සිදීගියේ ය යි දතයුතු.

නගෝ නාමධෙය්‍යා භොන්තු= නම් තුනක් වෙත්; **ඡප්පඤ්ඤත්තිනිස්සිතා**= ඡවිඤ්ඤාණාදියතනකයන් අතුරෙහි වෙන ම වෙදනාවට ප්‍රත්‍යය වූ **ඡඵස්සසමාහතෙහි**= ඡහුල්වලින් විදින ලද්දේ; **පච්චත්තං වෙදනියෙහි**= තෙමේ ම වෙදනාව උපදවන්නේ; **ඡඵස්සෙනා ඡඵස්ස හදයෙ සමාහතෙඡ්ඣ**= ඡහුල සමග ඡහුල ළමැදි එක්වන්නේය; ඒ නිරයෙහි මහානිරය. උපන් සත්වයන්ගේ තුන්ගවු ආතමභාවය වෙයි; (දූසිමරු වූ) තෙරුන්ට ද එබඳු විය; එකල ඔහුගේ ඒ අත්බැව නිරය පාලයෝ තල්කඳ පමණ වූ ඇවිලගත්තාවූ ඝාත්පසින් දුල්වෙන්නාවූ ගිනිදුල් සහිත වූ ඡහුල් සියයක් ම ගෙන "තා විසින් මෙ තැනින් සිතා පව් කරන ලදැ" යි සුණුදෙණක සුණු කොටන්නවුන් මෙන් ළමැදි කොටා පහස්දෙනෙක් පයට අභිමුඛ ව ද පහස්දෙනක් හිසට අභිමුඛ ව ද කොටමින් යෙති; මෙසේ යෙමින් පන්සියක් අවුරුද්දකින් දෙකෙළවරට පැමිණ යළි නවතිමින් පන්සියක් අවුරුද්දකින් ළමැදට පැමි

ණෙත්. ඒ සඳහා මෙය කියන ලදි. වුඤාණිමං= විපාකයෙන් උපන් වෙදනාව; ඕ වනාහි මහානිරයෙහි වෙදනාවට වඩා අතිශයින් දුක්වෙයි; ඒ එසේ මැයි- යම්සේ තෙල් පානය කරන සතියට වඩා පරිහාර (= පථ්‍ය සෙවනය කරන) සතිය අතිශයින් දුක්වේ ද, එපරිද්දෙන් මහානිරයට වඩා උසදනිරයෙහි විපාක වුඤාණවෙදනාව දුෂ්කරයයි කියත්. සෙය්‍ය ථාපි මච්ඡස්ස= යම්හෙයකින් පුරුෂයාගේ හිස වට වේ ද, හුලින් පහර දෙන්නහුගේ පහර සිටීම නො ලබා ද, හිලිහේ ද, මත්ස්‍යයාගේ හිස දික්ව පුළුල් වේ ද, පහර සිටීම ලබා ද, නො වරදවා කම්කටවූ කිරීම පහසු වේද; එහෙයින් මෙබදු වූ හිස වේ.

විධුරං සාවකමාසජ්ජ= විධුර නම් ශ්‍රාවකයන් ගටා; පවත්තාවෙදනා= තෙමේ ම වෙන වෙන වෙදනා උපදවන; ඒදිසෝ නිරයෝ ආසි= මේ තැන්හි නිරය දෙවදූත සූත්‍රයෙන් දැක්වියයුතු. කණ්හ! දුක්ඛං නිගච්ඡසි= කළුවන! මාරය! දුක් විඳින්නෙහ; මහෝඝසරස්ස= මහමුහුදුමැද ජලය වසතු කොට උපන් විමානයෝ කල්පසථායි වූවාහු වෙති; ඒ විමාන යන්ගේ වෙරළුම්ණක මෙන් පැහැය වෙයි; පළිතයක් මුදුනෙහි දැල් වෙන තල (= ඔට) ගිනිකඳක් මෙන් ද ඒ විමානයන්ගේ රශ්මිහු ඔබලති පභස්සරා= ප්‍රභාසම්පන්න වූවාහු වෙති; ඒ විමානයන්හි නීලහෙදාදි වශයෙන් නානාත්තවණ්ණ වූ අපසරාවෝ නටති; යෝ එතමභිජානාති= යමෙක් මේ විමානවසතුව දනී ද යන අර්ථයි; මෙසේ මෙහි විමාන-ප්‍රේත වසතුවෙන් ම අර්ථ දැක්විය යුතු. පාදඛුණේන කම්මාසි= මෙය පාසාද කම්පන සූත්‍රයෙන් දැක්විය යුතු. සෝ වෙජ්ඣනතං= මෙය චූලතණ්හා සඞ්ඛයවිමුත්ති සූත්‍රයෙන් දැක්විය යුතු. සුක්කං සෝ පරිපුච්ඡති= මේ ද ඒ සූත්‍රයෙන් ම දැක්විය යුතු. සුධම්මාසභං අභිනෝ සභං= සුධර්මාසභාව සම්පයෙහි; මෝ වනාහි බඹලොව සුධර්මාසභාව ඇ, තව්තිසාභවනයෙහි නො වෙයි; ඒ එසේ මැයි- සුධර්මාසභාවක් රහිත වූ දෙව්ලොවෙක නම් නැති; බ්‍රහ්මලෝකෙ පභස්සරං= බ්‍රහ්මලොකයෙහි ශාරිපුත්‍ර මෞද්ගල්‍යායන මහාකාශ්‍යපාදි ශ්‍රාවකයන් විසින් පරිවරන ලද තෙජෝ ධාතුවට සම්වැද වැඩහුන් භාග්‍යවතුන් වහන්සේගේ ආලොකය; ඒ මෙසේ ඇ- එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ බඹලොව සුධර්මා දිව්‍යසභාවෙහි රැස්ව- "යමෙක් මෙහි පැමිණෙන්ට හැකි වන්නේ නම් එසේ මහත් සෘද්ධි ඇති කිසි මහණෙක් හෝ බමුණෙක් හෝ ඇද්දෝ හොත්" යි සිතන් නාවූ බ්‍රහ්මසමූහයාගේ සිත දැන එහි ගොස් බ්‍රහ්මසමූහයාගේ මස්තක යෙහි වැඩහුන් සේක් තෙජෝධාතුවට සම්වැද මහාමෞද්ගල්‍යායනාදීන් ගේ පැමිණීම සිතූ සේක; ඔවුහු ද ගොස් ශාස්තෘන් වහන්සේ වැද තෙජෝධාතුවට සම්වැද වෙන වෙන දිශාවන්හි වැඩහුන්හ; සියලු බ්‍රහ්ම ලොකය එකාලොක විය. ශාස්තෘන් වහන්සේ චතුස්සත්‍ය ප්‍රකාශක වූ ධර්මය දෙශනා කළ සේක. දෙසුම් කෙළවර තොගෙක් දහස්නණන්

බ්‍රහ්මයෝ මාගීඵලයන්හි පිහිටියාහුය. ඒ සඳහා මේ ගාථා කියන ලද්දෑ හුය. යළි ඒ මේ අර්ථ (=කාරණ) ය බ්‍රහ්මජාල සූත්‍රයෙන් දැක්විය යුතු. **විමොක්ඛෙන අපස්සයි**= ධ්‍යානවිමොක්ෂයෙන් සපගී කෙළේ ද; **වනං**= දඹදිව; **පුබ්බවිදෙහානං**= පූර්වවිදෙහයන්ගේ විජය ද; **යෙ ච භූමිසයා නරා**= බිම හෝනා මිනිස්සු නම් අපරගොයාන වාසීහු ද උත්තරකුරු වාසීහු ද වෙති, ඔවුන් සියල්ලන් ද සපගී කෙළේ යයි කියන ලද වේ. යළි මේ අර්ථය තණ්හෝපනන්ද දමනයෙන් දැක්විය යුතු වසතුව විශුද්ධිමාගී යෙහි ඍද්ධිකථාවෙන් විස්තර කරන ලදී. **අපුඤ්ඤං පසවි**= අකුසල් ලැබී; **ආසං මා'කාසි භික්ඛූසු**= "භික්ෂූන් රැස්වම්, වෙගෙසම්" මෙසේ ආශාව නො කරව. සෙස්ස සියලු තැන්හි ප්‍රකට වූ අර්ථ ඇත්තේ මැයි.

මාරතජ්ජනිය සූත්‍ර වර්ණනා නිමි. (10)

—————:×:—————

"ප්‍රපඤ්චදීපිකා" නම් වූ මැදුම්සඟි සිංහල අටුවාවෙහි පස්වැනි වූ

චූලයමකවග්ග වර්ණනා

මෙනෙකින් සමාප්තයි.

———————

"පපඤ්චසූදනි" මඣිමනිකායට්ඨකථානුදිත

ප්‍රපඤ්චදීපිකා

මැදුම්සඟි සිංහලඅටුවාවේ මූලපණ්ණාස වර්ණනා නිමි.

——:÷:——

ශිව මස්තු.

"පපඤ්චසූදනී" මූලපණ්ණාසපාළියා

ගාථාමූලපද සූචි.

ගාථා අඞ්ක.	මූලපද	පිට.
145	අගතිකඛඩ්ඩාසම්භෙදෝව-	454
78	අචෙතනායං පඨවී-	199
105	අඤ්ඤංඋපජ්ඣායමුපට්ඨෙත්වා-	281
41	අත්තා අත්තනියොචෙති-	46
60	අත්ථතොලක්ඛණාදීහි-	93
6	අත්ථපකාසනත්ථං-	2
109	අදාසසතෙනමොරස්ස-	323
188	අඞ්ගපච්චඞ්ගමෙතමාදුං-	706
94	අනිච්චාවතසඞ්ඛාරා-	251
189	අනන්තවන්තානිභූතානි-	707
8	අපනෙත්වාන තතොහං-	3
133	අපිඅතරමානානං-	364
169	අමොඝොනාමඛියංරුක්ඛා-	583
97	අලඞ්කතොවෙපියමං-	258
151	අවිහංඋපපන්නාසෙ-	502
17	අසිතිපදසහස්සානි-	5
127	අහංවහරියාවමනුස්ස-	362
75	ආගුංනකරොතිකිඤ්චි-	167
154	ආදිමහිසිලංදස්සෙසය්‍ය-	513
172	ආයුඋසමාචිඤ්ඤයුණං-	648
147	ආසීවිසොයථාඝොරෝ	478
16	ඉවෙවඛාතොං-	4
14	ඉතිපකතඛබ්බං-	4
4	ඉතිමෙපඤ්ඤාමතිතොං-	2
29	ඉධෙවතිඨමානස්ස	24
153	ඉධෙව ,, ,,	510
135	උච්ඡඤ්ඣසිනෙහමත්තනොං-	390
152	උපකොළඵගණ්ඩාව-	502
89	උභොපාදුනිහිදිත්වා-	249
119	උලූකකාමණ්ඩලකඛිකා-	337
61	උසභසෙසවතෙඛත්තා-	130
82	එකායනාඤ්ඤනිඛයන්තදඤ්ඤි-	244
117	එකූනසිංසොවයඤාසුභදද-	326
76	එකෙනඤාණෙනුපෙක්ඛස්ස-	145
70	එතංඛොසරණංඛෙමං-	146
115	එවංඛත්තූපසදිසා-	324
90	එවඤංචිත්තසිත්තාන-	249
84	එසෙවමඝඝාතත්ථෙකුසූ-	246
46	එසොසභාවොහෙතස්ස-	48
167	කතාවකාසාපුච්ඡිතානු-	578
187	කපෙපාවතෙබ්බවරෙ-	706
1	කරුණාසීතලහදයං-	1
92	කාමංඛාදතුමංව්‍යඝෙඤා-	250
180	කාමංරූපතුවාමාවා-	680
140	කාරණඤ්චංනිබ්බත්ථ-	435
123	කාලාවකංචගඞ්ගෙයය්‍යං-	347
52	කාලොඝසතිභූතානි-	67
126	කිංතෙවතංකිංපන-	362
125	කිනානුඝනන්තරමානොව-	358
148	කිමේමඅඤ්ඤතවෙසෙන-	489
129	කෙනපාණීකාමදදෙ-	363
166	කොණ්ඩඤ්ඤපඤ්ඤානි-	578
104	කොනාමඵත්ථසොඝතෙනා-	272
62	කොමෙවන්දතිපාදුනි-	140
142	කොඝම ,, ,,	440
55	කොසලානංපුරංරම්මං-	70
128	ඛීරොදනංඅහමද්දසිං-	338
186	ගඞ්ගායසොතසම්ංගතිත-	705
51	ගන්ත්වානසොඝත්තපදුනි-	56
136	ගරුපවාසොඋදෙදසො-	406
162	ගාමෙවායදිවාරඤ්ඤෙ-	556
107	චත්තාරොපඤ්චආලෝපෙ-	301
157	චාතුද්දිසොඅපපටිසොච-	522
86	චිත්තෙනානඞ්කිලිට්ඨෙන-	247
174	චීවරෙපිණ්ඩපාතෙච-	676
47	ඡින්නංපාපිමතොසොතං-	49

ගාථා අඞ්ක.	මූලපද.	පිට.
139	ජෙත්වානමොලිංවරගන්ධ-	413
160	ජීවිතංඅත්තභාවොච-	533
38	ජේගුවෙජ්ඝනිදුරොවායං-	46
22	තංතංඅත්ථමවෙක්ඛිත්වා-	13
128	තංමේවතංතංපත-	362
45	තංවොවදුම්හදද්දංතෙ-	47
168	තගඝතෙඅහමක්ඛිඝසං-	579
36	තමොතුදෙබුඩො-	41
25	තවෙවදෙවච්ජීතෙ-	15
74	තසමාවොහාරකුසලසස-	152
48	තසසඝම්මාවිමුත්තසස	51
156	තිවිවරංවපතෙනාව-	521
18	තීණිසඤ්ඤොඝසසානි-	5
130	තෙනපාණිකාමදදෙ-	363
137	දදුභායතිහදදංතෙ-	410
21	දිඝෙවඩමෙමයොඅත්ථො-	11
69	දුකඛංදුකඛසමුප්පාදං-	146
33	දුවිඩොවිනයොනාම-	27
31	දුවෙපුථුජ්ජනාවුත්තා-	25
72	දුවෙසවවානිඅකඛාසි-	151
159	දුවෙසතසහසසානි-	532
149	දූරෙඝත්තොපඝාඝෙනති-	491
121	දෙවලොකාවච්චිනාත-	338
178	ධම්මංහණාම්හදදංතෙ-	680
108	නමොතෙපුරිසාජඤ්ඤ-	313
88	නඝනාතිපුත්තානාණාය-	248
96	නාඤ්ඤත්‍රබොජ්ඣාඛඝතපසා-	253
102	නාවාමාලුතවෙගෙන-	271
95	නිචවංඋත්‍රසතම්දංචිත්තං-	252
40	නිචවසඤ්ඤංඅධිඨාය-	46
79	නිදෙසතෙථෙතනිදෙස-	231
141	නිඛම්බානපාපිවෙජ-	436
181	නොවේඅසසඝකාබුඩ-	680
143	පඛෙකාවකාමාපලිපොච-	440
59	පරවජ්ජානුපසසිසස-	74
158	පරොසහසසංහිඝබ්බතං-	529
165	පුවජ්මංඝහියපඤ්ඣං-	578

ගාථා අඞ්ක.	මූලපද	පිට.
163	පුවජ්වාඝවමංපඤ්ඣං-	577
144	පුණ්ණණ්පුරෙසිඝධම්මං-	452
80	පුත්තොඃයදුහොම්ජයදදිඝසස-	241
30	පුථුනංජනනාදීහි-	25
43	බහුංවිපථඳමංතොපි-	47
53	බහූනිනරසීඝානි-	68
164	බාවාරිසසවතුම්හංවා-	577
2	බුඩොපිබුඩභාවං-	1
138	බෙලලංනිපතිතංසුත්වා-	411
23	භතවානිවවතංසෙඨං-	13
63	භයෙකොඩෙපඝංසාඝං-	140
106	භවඩගවජ්ජිතංවෙව-	282
24	භාගෙයවාභගවායුත්තොනා-	14
93	භාසිතාංබුඩසෙඨසස-	251
83	මඝභාණඩඛිකොසෙඨො-	246
81	මඝොපත්තොපථො-	243
5	මජ්ඣිමපමාණසුත්ත-	2
15	මපෙඛවිසුඩිමඝොහා-	4
42	මඤඤතාතිවතාමෙතං-	47
131	මයංචභරියඃනාතිඝාකාමාම-	363
120	මසිචිත්තංපඝාදෙත්වා-	338
175	මහාවීරමහාපඤ්ඤ-	677
173	මිත්තොතජසසුකල්‍යාණෙ-	676
50	මුඛුත්තජනොවඝවමපති-	56
185	යංඑණිකූලසම්ජතං-	705
184	යංචිංඅපායෙසිබහූ-	704
98	යංපසසතිතතංදිඨං-	260
87	යංපුබෙබතංවිසොඩෙහි-	248
65	යත්ථවදිත්තාමිහපජ්ජලාහු-	142
100	යථාථමෙහනිබඤ්ඣෙය්‍ය	267
113	යථාභිඛජ්ජුපනකා-	223
101	යථාභිදිපිකොනාම-	268
49	යථෙවලොකමහිවිපසසි-	142
103	යන්නසුත්තවසෙඤෙව-	271
114	යදූවරසම්සමප්පත්තා-	324
112	යදූවසරසමපත්තොබුඩො-	323
110	යදූවසරසම්පත්තොමොරෙ-	323

ගාථා අඞ්ක.	මූලපද.	පිට.
170	යමේකරත්තිංපඨමං-	610
182	යසමාචපනිධෙකචෙව-	681
26	යසෙසතෙවතුරොධම්මා-	21
37	යාදිසොඑසසකඛාගයෝ-	45
34	යානිසොතානිලොකසම්-	28
111	යාවත්තුපපජ්ජන්තිබුද්ධා-	325
71	යෙකෙචිබුද්ධංසරණං-	147
179	යෙනකෙනචිවණ්ණෙන-	680
57	යෙනදෙවූපපත්තස්ස-	72
68	යොචබුද්ධංචධම්මංච-	146
32	යොවෙනත්තයඤ්ඤු-	26
99	යොසුඛංදුකඛතොඅද්ද-	264
161	රමණීයානිඅරඤ්ඤානි-	556
64	රාගච්ඡරාගමනෙජම්සොකං-	142
150	රාමොඩජොලකඛණෙන-	498
85	රූපෙනඅඞ්ගිලිඒන-	247
183	වඩ්ඪකිස්සදෙවදත්තස්ස-	684
19	විනාසයතිඅස්සඛං-	10
35	වුත්තමහිඑකඛමෙම-	36
56	වුඩ්ඪිංවෙපුල්ලතංපත්තං-	70
73	සඞ්ඛතවචනංසච්චං-	152
28	සඞ්ඛිත්තෙනපිදෙසෙති-	23
13	සච්චානිපච්චයාකාර-	4
118	සද්දහාසිසිගාලස්ස-	336

ගාථා අඞ්ක.	මූලපද.	පිට.
54	සබ්බදුඝබ්බූපසරණං-	70
12	සබ්බාචඅභිඤ්ඤෙයෝ-	3
9	සම්මංඅවිලොමෙනෙතා-	3
20	සම්මාසෙඛණෙකාලෙ-	11
124	සම්පත්තිඨංලකඛණෙච-	349
76	සම්පන්නංසාලිකෙදාරං-	168
27	සාධුඛම්මරූවිරාජ-	22
155	සිපිලඛනිතංවදීඝරස්සං-	513
11	සීලකථාධුතඛම්මා-	3
77	සීලදස්සනසම්පන්නං-	172
91	සීලවාවතසම්පන්නා-	250
7	සීහලදීපංපත-	2
134	සුඛෙපත්තනරජ්ජාම්-	370
3	සුගතස්සඕරසානං-	2
39	සුහතොසුඛතොවෙව-	46
146	සුඝානෙඝසිවස්සානි-	456
58	සෙඛස්සසිකඛමානස්ස-	74
44	සෙසොඝඝාකාඇමලලිතො-	47
66	ඝසාඅහංවිචරිස්සාම්-	144
176	හිත්වාගාමසහස්සානි-	679
177	හිත්වාඝඤ්ඣාරවිඝඨං-	679
10	හිත්වාපුනප්පුනාගත-	3
171	හිරිඔත්තපසම්පන්නා-	614
132	හීනෙනබ්‍රහ්මචරියෙන-	364

—:÷:—

"පපඤ්චසූදනී" මූලපණ්ණාස යෙහි

වණ්ණිතවිෂයසූචි.

විෂය.	පිටු.
"අගහ" ශබ්දය	150
"අඞ්ගන" ශබ්දය	153
අඞ්ගාරකාසූපමා	227
අඟුදනව්ව	612
අඟුදනව්වැසියෝ	612
අචලසථානයෝ	480
අජිතකෙසකම්බලී	541
අඤ්ඤාකොණ්ඩඤ්ඤතෙර	499
අටපිරිකර	521
අඩපෙහෙවස්රැකිම්නිසෙක්	688
අතෘපනිකරවසතු	454
අදත්තාදානය	212
අධිමානිකයා	197
අනඞ්ගණසූත්‍රවණ්ණනා	151-167
අනඳතෙර	553
අනිත්‍යය	600
අනුමානසූත්‍රවණ්ණනා	385-386
අනුරුත්තෙර	553
අනුසන්ධි-ත්‍රිවිධ	189
අනේපිඬුසිටාණෝ	71
අනෙකාචාරණිකශාසනයෙහි-	334
අනන්තරාගතිකධම්මයෝ	420
අඞ්ගවනය	438
අන්‍යනිමිත්තනපවීය	405
අප්‍රබඞ්කථා	559
"අභික්කන්ත"ශබ්දය	139, 440
අභිඤ්ඤා	215
අභිනිග්‍රහණපවීය	411
අභිවාදනය	195
අරියකොටියවාසී මහාදත්ත-	174
අරිෂ්ටභික්ෂුහුගේලබ්ධිය	423
අරූපකම්මට්ඨානය	295
අලගද්දසූත්‍රවණ්ණනා	420-436

විෂය.	පිටු.
අලෙපච්ඡයෝ-චතුර්විධ	455
අවිද්‍යාවණ්ණනා	237
අශුභදර්ශනවසතුව	274
අෂ්ටපඤ්චාභිඤ්ඤාලාභිභාවය	355
අසන්තපවීය	408
"අහොවත"ශබ්දය	158
ආඝාතවිඛයාදිසූත්‍රවණ්ණනා	168-179
ආගමනීයකථා	663
ආජීවය	616
ආතුමකාමීහු	544
ආදිමධ්‍යවසානය	512
ආදීනවපවීය	407
ආනාපානපවීය	268-270
ආමිසදායාදය හා ධම්මදායාදය	102
ආමිසදායාදයෙහි ආදීනව	103
ආලෝඞ්කිතය	140
ආයතනපවීය	306-308
ආර්‍යකාන්තශීලය	329
ආර්‍යයෝ	26
ආර්‍යශ්‍රාවකයාගේ කුශල-	698
ආර්‍යශ්‍රාවකයාගේසඤ්ඤාය	381
ආලාරකාලාමතවුසා	484
ආලින්දකවැසි මහාඵුස්ස-	277, 761
ආශ්‍රව	72
ආශ්‍රවක්ෂය	74
ආශ්‍රවවණ්ණනා	238
ආසභාවසථානය	348
ආහාරවණ්ණනා	220-228
ඉච්ඡාභෙද	454
"ඉධ"ශබ්දය	24, 510
ඉන්ද්‍රියයන්ගේ විෂය	639
ඉන්ද්‍රියසම්බර	310
ඊර්‍යාපථපවීය	270-273

විෂය.	පිට.
උක්කඨානගරය	14
උක්කවේලානගරය	569
"උක්කා" ශබ්දය	188
උතුරුමිනිස්දහම්- තථාගතයන්ගේ	346
උතුරුවඩමන්වැසි උපාසකයා	218
උත්තානගාමිනීවිදර්ශනාව	431
උද්ඝටිතඤ්ඤුපුද්ගලයෝ	493
උද්දෙශවාර (සතිපට්ඨාන)	258-265
උඩවකුක්කුච්චය	619
උපක්‍රීවකයා	501
උපමාදේශනා	180
උපාදානයෝ-ත්‍රිවිධ	470
උපාදානවර්ජනා	232
උපාසකවිධි -ප්‍රකීර්ණකකථා	148
උපෙක්ෂාවිහරණය	369
උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය	317
උරුවෙලා	486
එකායනමාර්ගය	254
එකායනමාර්ගය පිළිබඳ ධර්මාකාරය	245
එකායනමාර්ගය පිළිබඳ විරුඬමත	244
"එවං" ශබ්දය	6
එවමේසුතං	8
කක්කටූපමසූත්‍රවර්ණනා	413-419
කථිකලක්ෂණ	513
"කපප" ශබ්දය	441
කබලිඞ්කාරාහාර	222
කම්මාසධම්ම	240
කයමදකලක්පවත්නාබව	532
කර්මනියමය	668
කර්මපථවර්ණනා	211-220
කර්මස්ථාන-ත්‍රිවිධ	295
කලාදඤානිවාප	450
කල්‍යාණමිත්‍රොපනිශ්‍රය	674
කළාතුණ්ඩසන්නා	183
කළුබුඬරකඛිතතෙර	595
කළුවැල්මඩුලුවැසි මහානාග-	278
කාමච්ඡන්දය	618
කාමමිථ්‍යාචාරය	213
කාමාදීන්ගේප්‍රභාණය	375
"කාය"ශබ්දය	259
කායසමාචාරය	615
කායානුපස්සනා	265-294
කාලදෙවතෙර	133
"කාසු" ශබ්දය	358
කාළකාරාමසූත්‍රදේශනාව	596
කුක්කුටපොතකොපමාව	388
කුමරකසුප්තෙර	437
කුරුජ්ජනපදය	239
කුරුවැසියන්ගේ ඥානබලය	241
කුලපුත්‍රයෝ-ත්‍රිවිධ	122-193
කුශලවිභාගය	219
කෙත්හිමියෙක්	534
"කෙවල" ශබ්දය	441
කෙරාටිකයා	184
කොසම්බකසූත්‍රවර්ණනා	687-699
කොසම්බික භික්ෂූහු	690
කොසඹැතුවර	687
කොසලජනපදය	627
කොසියවසතුව	337
ක්‍රෝධය	447
ක්‍රෝධාදීක්ලේශාදිවශයෝ	117
ක්ලේශප්‍රභාණය	185
ක්ෂේත්‍රදෘෂ්ටතර	168
ගතපච්චාගතිකවත	277
"ගති" ශබ්දය	357
ගන්ධාරජාතකය	679
"ගබහ" ශබ්දය	610
ගම්දරුවකුගේඑසතුව	216
ගලඹතොට පන්සියයක්-	278
ගාඹගාඹකාදි පුද්ගලයෝ	461

විෂය.	පිට.
ගිහිසඳුකාවසථය	543
"ගුණ" ශබ්දය	376
ගෘහපතියා නිහතමානබව	514
ගොතමක සූත්‍රය	69
ගොදත්තතෙර	133
ගොපාල කොපමාව	400
ග්‍රන්ථප්‍රමාණය	5
ග්‍රන්ථාරම්භය	1-5
ඝොසිත සිටාණෝ	687
චකකනඋපාසකයා	218
"චකක" ශබ්දය	349
චතුයෝනි	356
චතුර්ධපවාරණය	104
චතුර්ධ සඞ්ග්‍රහ	527
චතුවෛශාරද්‍යය	304
චතුෂකාප්‍රමාණයෝ	321
චතුස්සත්‍යකම්ඨානිකයා	83, 637
චතුස්සත්‍ය පරීය	319
චිත්තානුපස්සනා	299
චිත්තෙකාග්‍රතාව	172
චිත්තොත්පාදය	205
චුල්ලපිණ්ඩපාතියතිස්සතෙර	461
චූලඅස්සපුර සූත්‍ර-	625-626
චූලගොපාලක සූත්‍ර-	569-571
චූලගොසිඞ්ග සූත්‍ර-	543-551
චූලනණ්හාසඞ්ඛය සූත්‍ර-	598-605
චූලදුක්ඛක්ඛන්ධ සූත්‍ර-	381-384
චූලධම්මසමාදාන සූත්‍ර-	667-669
චූලවෙදල්ල සූත්‍ර-	653-666
චූලසච්චක සූත්‍ර-	672-686
චූලසාරොපම සූත්‍ර-	540-542
චූලසිහනාද සූත්‍ර-	321-340
චූලහත්ථිපදොපම සූත්‍ර	505-526
චෙතොඛිල	387
චෙතොඛිල සූත්‍ර-	387-390
චෙතොවිනිබන්ධ	388
ජරා-ත්‍රිවිධ	230
ජරාමරණවණ්ණනා	229

විෂය.	පිට.
ජාතිභූමි	450
ජාතිවණ්ණනා	231
ජානුස්සොණී බමුණු	505
ජීවිතෙන්ද්‍රිය හා කම්ජතෙජස	647
ජෙතවනය	71
ඤානදර්ශන	343
"ඣාන" ශබ්දය	113
තථාගතයන්ගේ ඤාතිභූ	381
තථාගතයන්ගේ ත්‍රිවිධ-	677
තථාගතයන්ගේ ප්‍රඥා-	372
තථාගතයන්ගේ ප්‍රශන-	373
තථාගතයන්ගේ සනාතය	481
තථාගතයන් වාදනොකරන-	393
තථාගත ශබ්දය	54
තමා ඇතිබව සැකකිරීම	80
තමා නැතිබව සැකකිරීම	80
තරුණ භික්ෂුවක්	459
තලගුරුවැසි ධම්මදින්නතෙර	198
තිසක්භික්ෂුහු	250
තිස්සතෙර	249
තිස්සසාමණෙරවත	409
තිපිටකයන්ගේ විලාපය	324
තෘෂ්ණාවණ්ණනා	233
ත්‍රිපරිවර්තය	430
ත්‍රිවිද්‍යව	135
ත්‍රිවිධකථා	563
ත්‍රිවිධපරිඥ	35
ත්‍රිවිධප්‍රතිඥාපනිය	424
ත්‍රිවිධමණ්ඩලය	465
ත්‍රිවිධවිරතිය	217
ත්‍රිවිධශික්ෂාව	109
දිතම්බය	618
දණ්ඩපාණිශාක්‍යයා	392
දද්දභජාතකය	410
දරැගබ	610
දශඅකුසල කම්පථවිභාගය	216
දශකථාවස්තු	109
දශබල	347

විෂය.	පිට.
දශබලඥානය	350
දශවිධව්‍යඤ්ජන	513
දහම්දෙසියයුත්තන් විමසීම	498
දහම්දෙසීම පිළිබඳ චිතකීය	495
දිව්‍යලොක	632
දීඝපරජනයඝෝ	550
දීඝභාණක අභයතෙර	89
දුගීතිය - විවිධ	182
දුර්ගන්ධය, උපමා එළවීම	584
දුෂකර ක්‍රියාව	590
දුසිමාරයාගේ දුෂටක්‍රියා	712
දෘෂ්ටිනාශය	332
දෘෂ්ටිසමුදය	332
දෙවදතපාඝිකයෙක්	392
දෙවියන්ගේ කටයුතු	602
දෙවියන්ගේ මුළාබව	603
දෙවියෝ	39
දෙශනාකාලයෙහි භික්ෂූන්-	18
දෙශනාක්‍රමයක්	531
දෙශනා - චතුර්විධ	30
දෙශනා - විවිධ	151
දෙශනාප්‍රශංසා	141
මාරවිෂය	646
මෙඛාවිනඤ්ඣ සූත්‍ර -	398-404
ධම්මදායාදසූත්‍ර අවිොතපත්ති-	99
ධම්මදායාද සූත්‍රවර්ණනා	99-120
ධම්මදින්නාමෙථෙණ	653
"ධම්ම" ශබ්දය	21
ධම්මානුපස්සනා	300-320
ධර්මකථිකයෝ පැහැසුම් පම-	207
ධර්මගරුත්වය - සම්බුදයන්ගේ	451
ධර්මාභිසමයීය	487
ධර්මචක්‍රය	349
ධර්මදායාදයෙහි ආනිශංස	104
ධර්මය හා ආමිෂය	100
ධර්මරතනයට පූජාවක්	557
ධර්මවිවයසමෙඛාධ්‍යඛගය	309

විෂය.	පිට.
ධාතුමත්තසංකාරපරීක්ෂ	291-292
"ධූම" ශබ්දය	445
ධ්‍යානය - සතර	134
නවමහාවිතර්ක	92
නවාඛ්‍යශාසනය	423
"නාග" ශබ්දය	166
නාගසේවිරින් වහන්සේ	695
නාගාපලෝකනය	714
නාමරූපවවත්ථානා	236
නිගණ්ඨනාථපුත්‍ර	541
නිග්‍රොධ ධර්මිකසූත්‍රය	631
නිවාපමහාවූපමා	226
නිදානවර්ණනා	6- 19
නිරෝධය	600
නිරෝධසමාපත්තිය	649
නිරෝධසමාපන්නයා	660
නිර්දේශවාර (සතිපට්ඨාන)	265-320
නිර්වාණය	707
නිවාපතෘණ	474
නිවාප සූත්‍රවර්ණනා	474-477
නිෂද්‍යාලක්ෂණ	122
නීවරණපරීක්ෂ	300-306
නීවරණප්‍රහාණය	620
නො ඉවසීමෙහි දොෂ	416
නො වියත් ගොපල්ලා	963
පකුධකාත්‍යායන	541
පඬුර වෙහෙර තරුණ-	672
පඤ්චගති	357
පඤ්චවර්ණනපථය	417
පඤ්චඝටිකය සප්‍රත්‍යවේඛව	607
පඤ්චාඛ්‍යික තුර්‍ය	601
පධානීය තෙර	89
පධානීයතෙර - සිතුල්පව්ධැසි	90
පන්සියයක් තාපසයෝ	688
පරතෙරගියමහණ - මෙහෙ-	460
පරප්‍රවාදයෝ	326
පරමදෘෂ්ටධර්ම නිර්වාණය	44

විෂය.	පිට.
පරිමණ්ඩලකථා	558
"පරියාදාන" ශබ්දය	381
"පරියාය" ශබ්දය	21
පරුෂවචන	214
පව්වෙකය-ත්‍රිවිධ	458
පසඟුල්ලෙන්වැසි තිස්ස	459
පස්වග පැවිද්දෝ	499
පාසරාසි සුත්‍රවර්ණනා	478-504
පැවරීම	568
පැවිදිවතක්	481
පිණ්ඩපාත ප්‍රතික්ෂේපකළ-	107
පිණ්ඩපාතය නො ඇළඳිය-	106
පියගාමික වස්තුව	127
පිතම්ලුලතෙර	251
පුණ්ණමෙහෙණ	452
පුත්තමංසූපමා	225
පුද්ගලකථා	152
පුද්ගලයෝ-ත්‍රිවිධ	579
පුබ්බකොට්ඨකය	480
පූරණකාශ්‍යප	510
පූර්ණාරාමය	598
පෘථග්ජනයා-පඤ්චවිධ	634
පෘථග්ජනයා-ත්‍රිවිධ	628
පෘථග්ජනයා	25
පෘථිවිජූගුප්සක ඝණකයා	534
පෘථිවිය-චතුර්විධ	30
පෘථිවිය පිළිබඳ මඤ්ඤනා	31
පෘථිවිය මහත්බව	532
පෙශුන්‍ය	214
ප්‍රජාපති හෙවත් මාරයා	39
ප්‍රඥසකඛය	659
ප්‍රතිකූලමනසිකාරය	290-291
ප්‍රතිපන්නකයෝ	453
ප්‍රතීත්‍යසමුත්පාදය	63
ප්‍රත්‍යවෙක්ෂා ඥානය	137
ප්‍රථමබෝධියෙහි භික්ෂූහු	415
ප්‍රශ්‍රබ්ධිසම්බෝධ්‍යඞ්ගය	316

විෂය.	පිට.
ප්‍රහාණවිනය	28
ප්‍රාණඝාතය	212
ප්‍රාප්තා-ත්‍රිවිධ	49
ප්‍රීතිසම්බෝධ්‍යඞ්ගය	312
ඵස්සාහාරය	223
බකබ්‍රහ්මජාතකය	704
බකබ්‍රහ්මයා දමනයවීම	708
බාලගොපල්ලා	569
බුදුනටපැනවූ අස්න	482
බුදුරජුන්ගේ ශබ්දය	601
බුදුවරයන්ගේ චාරිකාව	463
බුදුවරයන්ගේ විරවාසය	463
බුදුහු දෙසුම් නො නිමවා වි-	110
"බොධි" ශබ්දය	64
බොධිසත්ව	124
බොධ්‍යඞ්ගපරිච්ඡේදය	308-319
බොධ්‍යඞ්ගවර්ණනා	93
"බ්‍රහ්මචරිය" ශබ්දය	361
බ්‍රහ්මනිමන්තනාකාර්ෂ සූත්‍ර	700-709
"බ්‍රහ්ම" ශබ්දය	40
බ්‍රහ්මාරාධනාව	490
බ්‍රාහ්මණධම්මිකපැවිද්ද	476
"භගවා" යන පදය	13
භයභෛරව සූත්‍ර-	121-150
භවවර්ණනා	232
භාග්‍යවත්හු දෙවිමිනිසුන් මි-	121
"භාක්ඛු" ශබ්දය	17
"භූතා" ශබ්දය	37
මකුලිගොසාල	540
"මග" ශබ්දය	130
මඝමානවක	603
මජ්ඣන්තිකතෙර	455
මධුපිණ්ඩික සූත්‍රවර්ණනා	392-397
මධ්‍යමප්‍රතිපදාව හෙදෙදි වශ-	119
මනසිකාරය	615
මන්ධාතිපුත්තපුණ්ණතෙර	453
මහකස්සපතෙර	553

විෂය.	පිට.
මහතෙරවත	285
මහමුගලන්තෙර	552
මහලුපැවිද්ද	27
මහසත්හුගේ විතකෝතප-	399
මහාඅස්සපුර සූත්‍ර-	612-624
මහාගොපාලක සූත්‍ර-	563-568
මහාගොසිඟ සූත්‍ර-	552-562
මහාතණ්හාසඞ්ඛයසූත්‍ර-	606-611
මහාතිස්සභූති තෙර	77
මහාදුක්ඛක්ඛන්ධ සූත්‍ර-	375-380
මහාධම්මසමාදාන සූත්‍ර-	670-673
මහානිරය	714
මහාප්‍රාඥයෝ	534
මහාභිනිෂ්ක්‍රමණය	484
මහාමිත්ත තෙර	312
මහාවනය	572
මහාවිකෘත භොජනය	367
මහාසමයසූත්‍ර-	634-652
මහාසච්චක සූත්‍ර-	587-697
මහාසාරෝපම සූත්‍ර-	539
මහාසිහනාද සූත්‍ර-	341-374
මහාහත්ථිපදෝපම සූත්‍ර-	527-538
"මානස" ශබ්දය	49
මාදනජාතිය සූත්‍ර	710-716
මාරයා බුදුන්අතරට පැමි-	700
මාලුවාලතා	667
මැදුම්පියස	510
මිථ්‍යාදෘෂ්ටිය	215
මුලුපුලැවෙහෙර තෙරුන්-	682
මූලපරියාය ජාතකය	67
මූලපරියාය සූත්‍ර-	6- 69
මූලපරියාය සූත්‍රයෙහි අර්ථ-	20
මූලශබ්දය	16
මෘතශරීරය	618
මෘෂාවාදය	213
"මෙ" ශබ්දය	7
මෛත්‍රිය	691

විෂය.	පිට.
මෛත්‍රීකාරකකර්මාදිය	546
යක්ෂවෙස්ගත් සක්දෙවිරජ	581
යහළුවෙක්	443
"යොනි" ශබ්දය	356
රථය-විවිධ	505
රථවිනීත සූත්‍රවර්ණනා	450-473
රමණීයත්වය	555
රාජගහ	450
රාජපුත්‍රෝපමාව	529
රෙවතතෙර	553
ලක්ෂණහාරය	36
ලුණුගලතිස්සතෙර	693
ලුබතා-ත්‍රිවිධ	163
ලෝකය	510
ලෝකොත්තරශරණාගමන-	146
ලෝමසනාගතෙර	88
ලෞකිකශරණගමනානිසංස	147
"වණ්ණ" ශබ්දය	411
වත්ථ සූත්‍ර වර්ණනා	180-194
වනපත්ථ සූත්‍රවර්ණනා	391
වනවැසි තිස්සසාමණේර	464
වප්මගුල	592
වම්මික සූත්‍රවර්ණනා	437-449
වසවත්මරු මුගලන් තෙ-	710
වසනුවිශද ක්‍රියා	398
වාක්සමාචාරය	615
"වා" ශබ්දය	78
වැද්දකු රැවටීම	520
විකාලභොජනය	415
විචිකිච්ඡා	619
විඥානය සප්‍රත්‍යයබව	607
විඥානවර්ණනා	236
විතක්කසණ්ඨාන සූත්‍ර-	405-412
විතර්කනිග්‍රහය	398
විතර්කමූලභේදපරීය	409
විතර්කෝත්පාදය	405
විනය-විවිධ	27

විෂය.	පිට.
විරාගය	600
විෂකණ්ටකවාණිජයා	170
විසාඛ උපාසකයා	653
විසාඛාව	598
විහිංසාදීන්ගේ දුරලීම	206
වීමංසක සූත්‍රවර්ණනා	674–686
වියත්සමෙබාධ්‍යඞ්ගය	311
"වුත්ත" ශබ්දය	106
වෙදනානුපස්සනා	294–298
වෙදනාවර්ණනා	235
"වෙද" ශබ්දය	187
වෙරඤ්ජක සූත්‍රවර්ණනා	–633
"වෙලා" ශබ්දය	413
වෙසාලිනගරය	341
වෛනෙයයන් දැකීම	492
"වෝ" ශබ්දය	22
වොස්සග්ගය	600
ව්‍යාපාද	215
ව්‍යාපාදය	618
ශක්‍රයා බුදුන්කරාළඹීම	599
ශය්‍යා–ත්‍රිවිධ	616
ශීලදෘෂ්ඨතර	169
ශීලස්කන්ධය	658
ශීලාදියෙන් අනුග්‍රහීතවූ–	645
ශුක්‍රකවෘත්තිය	594
ශූන්‍යතාදිසපර්‍යා	662
ශෛක්ෂයා	48
ශ්‍රමණකරණ ධර්ම	613
ශ්‍රමණයෝ–චතුර්විධ	325
ෂඩායතන වර්ණනා	235
සංඥීන්ගේවිශේෂය දැක්වා–	643
සංඥා–විඥාන–ප්‍රඥාවන්ගේ–	642
සංවරය	73
සංවර්ත්තය	28
සංවේග වස්තු	317
සංඝයා–පඤ්චවිධ	459
සංස්කාරවර්ණනා	237

විෂය.	පිට.
සකුණෝපමාව	523
සක්කායදිට්ඨි	656
සක්දෙවිරජ	252
"සඞ්ඛා" ශබ්දය	85
සච්චක අස්සජිතෙරුන්කරා–	574
සච්චක එකලාව බුදුන්කරා–	587
සච්චක නිගණ්ඨපුත්‍ර	572
සච්චකනුවටහුගේ අනාගත–	595
සච්චක බුදුන්කරා පැමිණීම	576
සච්චක මහවනවෙහෙරව–	576
සච්චකයාගේ වාදබිඳීම	580
සඤ්ජයබෙලඬිපුත්‍ර	541
සඤ්ජීවතෙර	662
සණදෙවුන්කෙළි	575
සතරකම්වහන්	713
සතිපට්ඨාන	255
සතිපට්ඨාන සූත්‍රවර්ණනා	239–320
සත්තිසකාහතූපමා	227
සත්පුරුෂයෝ	26
සත්‍යවර්ණනා	229
සත්‍යාභිඥා–වාදශවිධ	457
සඞ්ඛ්‍යාවක්	554
සප්තානුපස්සනා	171
සබබඤ්ඤුතඥානලාභය	487
"සබබ" ශබ්දය	21
සබබාසව සූත්‍රවර්ණනා	70–98
සමගිරසය	543
"සමය" ශබ්දය	11
සමාධිසමෙබාධ්‍යඞ්ගය	316
සමාධිස්කන්ධය	658
"සමපජ්ඤ" ශබ්දය	168
සම්පප්‍රලාප	214
සම්ප්‍රජන්‍යය–චතුර්විධ	273–290
සම්මාදිට්ඨි සූත්‍රවර්ණනා	210–239
සම්‍යග්දෘෂ්ටිකයා	210
සම්‍යග්දෘෂ්ටිය	210
සරණගමනය කෙලෙසීම–	148

විෂය.	පිට.
සරණගමන ප්‍රභෙද	143
සරණය සරණගමනය හා-	143
සවීඳයන් දුරාසදබැවි	478
සලෙලඛය	200
සලෙලඛ සූත්‍රවණ්ණනා	195-219
සහධාම්මිකයෝ	329
සහමපති	490
සැරියුත්තෙර	552
සැවැත්නුවර	70
සැවැත්නුවර විහාරය	480
සෘතිඝ්‍රාවගේ දෘෂ්ටිය	606
"සාධුක-සාධු" ශබ්දවය	22
සාරම්භය	184
සාරාණීයවත	692
"සාල" ශබ්දය	15
සාලෙය්‍යක සූත්‍රවණ්ණනා	627-633
සිංහනාදය	348
සිතුල්පව්වැසිතෙර	294
"සිය" ශබ්දය	105
සිහිය-දෙවැදෑරුම්	128
සිවටන්මෙතෙහිකලසුවි-	242
සිවථිකපඥය	292-293
සුගතිය-විවිධ	182
"සුත" ශබ්දය	7
සුනකඛත්තයාගේකොපය	345
සුබ්‍රහ්මදෙව්පිත්	252
සුභගවනය	15
සුරාපානයකළ සිවලා	336
සූත්‍රනික්ෂේපය	19
සූරම්බඨයාගේ ශ්‍රද්ධාව	685
සෙනානිගම	486
සෙනාසනපරිග්‍රහය	266
සකාකිපඥය	305-306
සපගීවණ්ණනා	235
සම්මතිසමෙබාධ්‍යඞ්ගය	308
හරණපච්චාහරණවතුක්කය	275
හත්ථිපදෙපමාව	509
හිරි-ඔතප්	613

———:÷:———

"ප්‍රපඤ්චසූදනී" මහාටීකායෙහි

උද්ධෘතපද සූචි.

—:÷:—

උද්ධෘතපද.	පිට
අංසවට්ටකං	339
අකථංකථිං	393, 526
අකාමිකාකං	484
අකාලවාදී	631
අකාලෙන	,,
අකුක්කුකජාතං	582
අකුපථා	651
අකුපථා වෙතොවිමුත්තිං	539
අකුපථා මේ විමුත්තිං	487
අකුසලානං ධම්මානං පහා-	383
අක්කොසථ	711
අක්කොසන්ති	434, 533
අඛණ්ඩානි	696
අගරුං කත්වා	395
අගාරං අජ්ඣාවසතා	515
අගහං	696
අගහමක්ඛායති	527, 651
අගහළං ආකොටෙසි	482
අගිංදත්වා පක්කාමිංසු	711
අග්ගිපරිචරියාය	372
අග්ගිමාසිතෝ	369
අඞ්ගණං	386
අඞ්ගමඞ්ගානුසාරිතෝ	536
අඞ්ගාරං අක්කමිත්වා	697
අඞ්ගාරකාසූපමා	421
අඞ්ඝස්ස	612
අවවනධම්මං	700
අවිරපක්කතෙන	539
අවිරපක්කතෙනා	343
අවෙලකෝ	365
අවවත්තනිඩෝ	599
අවවත්තපරිභෝගානෙ	599

උද්ධෘතපද.	පිට.
අවවත්තාබ්‍රහ්මචාරී	599
අවවත්තායොගක්ඛෙමී	,,
අවවසරා	665
අවවාඩාය	617
අවවිංපටිවව	647
අවජ්ජරිය	374
අවජ්ජරියබහුතවිත්තතා-	605, 709
අජඩුකං	592
අජානං අපස්සං	539
අජිතො කෙසකම්බලී	541
අජිනං	366
අජිනක්ඛිපං	,,
අජ්ඣගමං	487
අජ්ඣත්තං	513, 530
අජ්ඣත්තමෙව	401, 407, 594
අජ්ඣත්තික පඨවිධාතු	531
අජ්ඣාපන්නා	504
අජ්ඣුපෙක්ඛිස්සාම	475
අපෙක්ඛනං	492, 537
අපෙක්ඛාගාහති	355
අපෙක්ඛාසාය තිඨති	611
අපෙක්ඛාසිතා	331
අපෙක්ඛාසිතෝ	582
අපෙක්ඛාසෙතබ්බං	394
අඤ්ජලිං පණාමෙත්වා	576
අඤ්ඤං ආරාධෙති	353
අඤ්ඤතරා දෙවතා	440
අඤ්ඤතරෙ	393, 428
අඤ්ඤතිත්ථියා	328
අඤ්ඤත්‍ර අසිතපීතඛායිතසා-	373
අඤ්ඤථත්තං	712
අඤ්ඤදත්ථු	508, 700

උඩානපද.	පිට.
අසුසුමසුසුසස	646
අසුසුතසුසුතරස	605
අසුසුතසුසුං පටිවරති	385
අවට්ඨෙයය	408
අසිකඛල්ලූම	421
අසිකත්තා	698
අණුං වා ථූලං වා	419
අණ්ඩකා	631
අණ්ඩජ	356
අතඛකාවවරා	487
අතරමානානං	364
අතිපාතෙය්‍ය	372
අතීබාළ්හං බො	604
අතිරෙකපූජාය	565, 568
අතීවෙලං	413
අතිසිඤ්චා	395
අත්තකාමරූපා	544
අත්තනා	516
අත්තනියෙන වා	651
අත්තනි වා රූපං	657
අත්තව්‍යාබාධාය	380, 399
අත්තහෙතු වා පරහෙතුවා	630
අත්තෙන වා	651
අත්ථං න උපපරික්ඛන්ති	424
අත්ථවසං	507
අත්ථසංහිතං	518
අත්ථසංහිතෙන	417
අත්ථස්ස නිජ්ඣත්තා	395
අදෙතෙන	516
අදෝ රාගවිරාගිනං	703
අදයාපත්තො	629
අදස්සනං ගතො පාපිමතො	476
අදින්නං	629
අදාසුං	475
අදුවලෙපනා උපකාරියො	378
අඩදණ්ඩකෙහි	378
අඩමාසිකං	366

උඩානපද.	පිට.
අඩා	384
අඩානමගඝපටිපන්නං	500
අධම්මචරියා විසමචරියා	629
අධම්මචාරී විසමචාරී	633
අධම්මවාදී	631
අධිකරණමපිකරොති	413
අධිගතො	487
අධිචිත්තමනුයුත්තෙන	405
අධිමත්තකසිමානං	370
අධිමත්තඝතිමනෙතා	374
අධිවාසෙතු	585
අධිසයිතානි	388
අඩොගමා වාතා	536
අනක්ඛාතංකුසලංභිමාරිස	709
අනචරියා	364, 488
අනණ	492
අනත්තමනවාචං	417
අනත්තාධිතො	618
අනත්ථවාදී	631
අනත්ථසංහිතං	,,
අනනුවජ්ජා	433
අනන්තං	707
අනපදෙසං	631
අනභිභූතො	700
අනභිරඩි	434
අනභිසම්බුඩො	354
අනයව්‍යසනං	569
අනලඞ්කරිත්වා	486
අනලසා	416
අනවසෙසදෙහි	565, 568
අනාදීනවදස්සාවිතො	504
අනාපුච්ඡා	391
අනාලපනතාය	709
අනාවට්ටි කාමෙසු	382
අනාවිලො	623
අනාහාරා	536
අනිච්චතා	532

උඩෘතපද.	පිට.
අනිච්චානුපස්සී	600
අනිච්චුච්ඡාදන-ධම්මස්ස	445
අනිඤ්ජමානෝ	384
අනිදස්සනං	707
අනිදස්සනෝ	418
අනිධානවතිං	631
අනිබ්බානසංවත්තනිකා	399
අනිමිත්තා	651
අනිමිත්තාය ච ධාතුයාමන-	649
අනිස්සරණපඤ්ඤා	504
අනියානිකා	335
අනුක්කමං උපාදාය	484, 587
අනුගහීතා	644
අනුච්ඡවිකමත්තෝ	623
අනුච්ඡවිකම්මානෝ	342
අනුත්තරං සන්තිපදවරං	484
අනුත්තරස්ස	388
අනුත්තරා	537
අනුපධජ්ජ	474
අනුපනීතකායසක්ඛී	611
අනුපනීතා	391
අනුපසමසංවත්තනිකා	335
අනුපාදාපරිනිබ්බානත්ථං	470
අනුපාදියං	340, 601
අනුපාදෘතා	517
අනුමංසං අනුමංසං	463, 472
අනුමිනිතබ්බං	386
අනුයුත්තෝ	388
අනුයෝග	519
අනුයෝගාය	387
අනුරුඛපටිවිරුඛස්ස	331
අනුරෝධවිරෝධං	611
අනුවිචරත්තෝ	623
අනුවිචරිතං මනසා	427
අනුසංසාවෙත්වා	550
අනුසයසමුග්ඝාතාය	559
අනුස්සාවෙසුං	551

උඩෘතපද.	පිට.
අනෙකධාතුං	350
අනෙකසතං බ්‍රාහ්මණපරිසං	356
නෙත්තමසෝ මාලාගුණපරි-	630
අන්තරඤ්ඤා	368
අන්තරධායාම්	708
අන්තරාකථා	483
අන්තරා ච ගයං අන්තරා ච-	500
අන්තරාසික	420
අන්තරාසිකා ධම්මා	354
අන්තානිමුග්ගපොසිනී	493, 622
අන්තිමකාසි මාරං	476
අන්තිවනෙ	438
අන්තියා	683
අන්තාවිකා	712
අන්තෙසං	433
අපක්කමිං	485
අපචායමානෝ	417
අපඤ්ඤං	418
අපදං වධිත්වා මාරවක්ඛුං	476
අපදානෙ	385
අපාඩෙ	582
අපරාපරවෙදනියෝ	584
අපරාමට්ඨානි	696
අපරිතස්සං	340
අපරිභින්නං	537
අපරිහානධම්මං	631
අපරිහාදිත්වා	373
අපරිසෙසං ඤාණදස්සනං-	383
අපසාදෙති	385
අපායං	357
අපාරුතා	494
අපිපනුජ්ජමානෙනපි	391
අපිස්සු	488
අප්පඤ්ඤං පසවි	716
අපපං වා	515
අපකසිරෙන	372, 711
අපචචයෝ	434

උඛාහපද.	පිට.
අපසඤ්ඤුතා	539
අපපටිහාණෙ	422, 583
අපපටිවිභත්තභොගී	692
අපපටිසඩ්ඛා පිවෙය්‍ය	671
අපපදක්ඛිණගහාගී	585
අපපබඩෙහි	559
අපපමත්තස්ස	398
අපපමාණවෙඨ සා	611
අපපමිය්‍යා	418
අපපරජක්ඛජාතික්ඛා	490, 498
අපපරජක්ඛ	492
අපපවිභත්තභාගී	692
අපපස්සාදෙ	382
අපපාණකං	591
අපපාතඩ්කතං	415
අපපාබාධතං	,,
අපපිච්ඡා	454
අපෙපවනාම	478
අපෙපාකඩා	539
අපෙපාස්සුක්කතාය	489
අඵලෙ	377
අබබූළෙහාසික	432
අබභඤ්ඤිංසු	541
අබභඤ්ඤං ගච්ඡති	400
අබභනුමොදති	463
අබභාචික්ඛනති	434
අබහුගහණතා	628
අබහුත	374
අබහුතධම්ම	424
අබෙභාකාස	515, 525
අබෙභාකාසිකස්ස	625
අබෙභාකාසෙ	368
අබ්‍යාපජ්ඣත	418
අබ්‍යාපාදවිතක්ක	398
අබ්‍යාසෙකසුඛං	523
අබ්‍රහ්මචරියං	516
අභයූපරතො	682

උඛාහපද.	පිට.
අභික්කන්තවණ්ණා	441
අභික්කන්තාය රත්තියා	440
අභික්කන්තෙන පටික්කන්තෙන–	523
අභික්කමථ	545
අභිජානාති	600
අභිඤ්ඤාතා හොති	631
අභිඤ්ඤාය චිත්තං පරිසො–	525
අභිඤ්ඤෙය්‍ය	644
අභිඤ්ඤෙහි	552
අභිඤ්ඤෙය්‍ය 512, 685,	703
අභිණ්හං කිත්තයමානා	468
අභිදෙසකාලකතා	498
අභිනන්දති	611
අභිනන්දිතබ්බං	394
අභිනන්දිත්වා	695
අභිනිබ්බත්තෙති	539
අභිනිබ්බිජ්ජ ජායන්ති	356
අභිනිබ්භිදාය	388
අභිනිවජ්ජය්‍ය	407
අභිනිවිස්ස වොහරති	421
අභිනිහනෙය්‍ය	407
අභිනීතා	630
අභිනීහරෙය්‍ය	,,
අභිභූ	700
අභිවදිතබ්බං	394
අභිවිඤ්ඤවව	672
අභිසන්තාපෙය්‍යං	591
අභිසඤ්ඤෙති	621
අභිසමෙච්ච	601
අභිහටං	365
අභිහඤ්ඤං පවාරෙන්ති	568
අභිභූතෙන	434
අභූතවාදී	631
අමතදුන්දුභිං	501
අමතචාර	571
අමතස්ස දාතා	395
අමතස්ස චාරං	491, 494

උඛානපද.	පිට.
අමිතපපහො	324
අමූසං හෙදය	630
අම්බිලකඤ්ඡිකං	339
අයං දුක්ඛසමුදයො	636
අයමනතිමා ජාති	487
අයොගක්ඛෙමකාමො	403
අරඤ්ඤං	524
අරඤ්ඤගතං	629
අරඤ්ඤෙ	403
අරහතං	628
අරියා	696
අරියා පරියෙසනා	483
අරියෙන	523
අරියො	432, 624
අරියො වා තුණ්හිභාවො	483
අරූපී	418
අලං	541
අලං වත	487
අලගද්දූපමො	424
අලභමානො	417
අලමරියඤාණදස්සන වි-	371
අලමරියඤාණදස්සන-	343, 549
අලම්දං පධානාය	487
අලලක්ඛං	589
අලීනා	331
අලීයෙථ	608
අවකුජ්ජා පථවී	571
අවක්කන්ති හොති	610
අවක්කාරපාතිං	548
අවජානාති	683
අවණ්ණා	613
අවණ්ණං භාසති	413
අවරපුරෙ	342
අවාපුරෙතං	490
අවිඝාතපක්ඛිතො	401
අවිජ්ජා	432
අවිජ්ජාගතො	670

උඛානපද.	පිට.
අවිජ්ජාපගතා හොති	340
අවිජ්ජාවිරාගා	645, 700
අවිනයවාදී	631
අවිවාදාය	691
අවිසංවාදකො ලොකස්ස	517
අවිසයහං	548
අවිහිංසාවිතක්ක	398
අවුපකට්ඨො	589
අවෙක්ඛස්සූ	491
අවෙරෙන	417
අසංහාරියා	685
අසතා	434
අසතිඅමනසිකාරෙ ආපජ්ජි-	408
අසම්පෙක්ඛිත්වා	569
අසමයවිමොක්ඛං	539
අසමාධිසංවත්තනිකා	631
අසම්මාසම්බුද්ධප්පවෙදිත	335
අසාධාරණං පුථුජ්ජනෙහි	697
අසිවම්මං	378
අසිසූනා	443, 448
අසිසූනූපමා	421
අසීතිකො මෙ වයො වත්තති	372
අසුභානුපස්සිකාගෙවිහරථ	713
අසෙසවිරාගනිරොධා-	609
අසම්මාතො	432
අස්සදම්මසාරථී	416
අස්සපුරං නාම අඞ්ගානං-	612
අස්සමණාව සමානා	508
අස්සවණතා	490
අස්සාසො	328, 536
අස්සුමුඛානං	484
අස්සොසි ඛො	345
අස්සොසුං	627
අහාසථ	323
අහිකුණ්ඩෙන	408
අහිවගෙහන	378
අහොරත්තානුසික්ඛිනා	386

උඛානපද.	පිට.
අහොවත	631
ආකඩ්ඪිය්‍ය	575
ආකාරවතී	685
ආකාරා	683
ආකාසගතතමහතං	672
ආකාසානඤ්චායතනං නෙ–	643
ආකාසොපරිවාරිතෝ	536
ආකිඤ්චඤ්ඤං	652
ආකිඤ්චඤ්ඤූ	650
ආකිඤ්චඤ්ඤායතනං පවෙ–	484
ආකොටෙය්‍ය	400
ආගතිං වා	475, 712
ආගමයමානෝ	482
ආගමෙහි	484
ආඝාතෝ	434
ආචයාපචයෝ හොති	588
ආචාම	366
ආජඤ්ඤරථෝ	415
ආජානිස්සති	498
ආතපපාය	387
ආතාපිනෝ	378
ආතුරං	380
ආදිත්තං	418, 581
ආදීනවං	332, 401
ආදීනවෝ	382
ආනණ්‍ය	620
ආනඤ්ජූ	434
ආනිසංසං	401
ආපජ්ජිස්සතීති	474
ආපානීයකංසෝ	671
ආපායිකානං ඨානානං	625
ආපොගතං	535
ආබාධික	617
ආබාධිතං	380
ආභං පටිච්ච අච්චි	647
ආභානං දෙවානං	632
ආභුජිත්වා	525

උඛානපද.	පිට.
ආමකවණ්ණෙනා	371
ආමකඛඤ්ඤපටිගහහනා	519
ආමකමංසපටිගහහනා	,,
ආමනෙතානි	414
ආමනෙතානි	414
ආමිසකිඤ්චික්ඛහෙතු	630
ආමිසෙසු සන්දිස්සතීති	683
ආයතිං	645
ආයතිං දුක්ඛවිපාකං	667
ආයමුඛං	622
අයසමා	437, 634
ආයසමා අස්සජි	574
ආයු	649
ආයු උණ්හා ච විඤ්ඤාණං	648
ආයුං පටිච්ච	647
ආයුසඞ්ඛාරා	648
ආයොගපථවං	339
ආරක්ඛාධිකරණං	377
ආරඤ්ඤිතානි	509
ආරඤ්ඤිකෝ	367, 560
ආරඩ්ඩිරියෝ	462
ආරා	461
ආරාචාරී	516
ආරාමදෙවතා	667
ආරොචයාමි	615
ආලය	537
ආලයරතා	487
ආලයරාමා	,,
ආලයසමුදිතා	487
ආලොකසඤ්ඤී	526
ආලෝප	521
ආවතෙතාබාහුල්ලාය	502, 593
ආවාසෙන සුඤ්ඤ	371
ආවීවෙව රහෝ ච	546
ආසංමාසාසිහික්ඛූසු	716
ආසජ්ජ	595
ආසජ්ජ උපනීය	589

උඩෘතපද.	පිට.
ආසභං ඨානං	348
ආසයං කප්පයාම	475
ආසවානං ඛයා	626
ආසාවිකං සාවෙතා	563, 566
ආසාදෙතබ්බං	585
ආසීතිකපබ්බානි වා කාළ-	370
ආසෙවනකං	397
ආසෙවනා	659
ආහාරෙන සුඩි	370
ආළාරෝ කාළාමෝ	484
ඉඞඝ	701
ඉඤ්ඡති	363
ඉඪා	376
ඉණං ආදාය	617
ඉති අනුත්තරෙසු	664
ඉති විඤ්ඤාණාය	674
ඉතිවුත්තක	423
ඉතෝ ච පනඤ්ඤං	700
ඉතෝ බහිඩා	326
ඉතෝ වා පන සුත්වා	376, 444
ඉත්ථභාවඤ්ඤථාභාවං	703
ඉත්ථිකුමාරිකපටිග්ගහණා	519
ඉදං දුක්ඛන්ති තපපජානාති	636
ඉදං නිච්චං	700
ඉදං නිස්සිතං	433
ඉදංසු මේ	370
ඉදප්පච්චයතාපටිච්චසමු-	488
ඉඩානුභාවා	474
ඉඩාභිසඞ්ඛාරං	604
ඉඩිමන්තා	475
ඉධ	375, 510, 563, 610
ඉධූපපන්නා	703
ඉඬෙව	325
ඉන්ද්‍රියපරොපරියත්තං	351
ඉන්ද්‍රියානි විපසන්නානි	649
ඉබ්භා	711
ඉමං කුසලං ධම්මං	678
ඉමමෙව කායං	621
ඉමිස්සායෙව අරියාය පඤ්ඤාය	371
ඉමේ ඛො පනාවුසො	330
ඉමෙසං භෙදාය	630
ඉමෙහි ආකාරෙහි	397, 685
ඉමෙහි පදෙහි	,, ,,
ඉරියාය	503
ඉසිගිලිපස්සෙ	383
ඉසිපතනෙ මිගදායෙ	500
ඉස්සත්ථ	377
ඉස්සරෝ	700
ඊදිසොනීරයොආසි	715
උක්කචේලාය	569
උක්කුටිකපධානමනු-	366
උක්කොචනං	520
උක්කීත්තපලිඝ	432
උච්චාකණ්ණෙරුකා	509
උච්චාකාළාරිකා	,,
උච්චා ච නීසෙවිතං	,,
උච්චාවචානි	697
උච්චාසයන	519
උජුං කායං පණිධාය	525
උජ්ඣාපෙසි	417
උඪතො	377
උඪෙහි	492
උතූනි හොති	610
උත්තරසෙතු	426
උත්තරිං ච විඤාතං	376
උත්තරිමනුස්සධම්මා	343, 549
උත්තරුත්තරිං	684
උත්තානසෙය්‍යකො	697
උත්තානෝ	615
උදකං අච්චුග්ගම්ම තිඨන්ති	493
උදකණ්ණවං	426
උදකන්තං	636
උදකානුග්ගතානි	622
උදක්කොරොහකස්ස	625

උඛෘතපද.	පිට.
උදපත්තෙන	386
උදබබඤ්ඤි	709
උදරච්ඡවිං යෙව පරිහණ්ණහාමි	371
උදරාවදෙහකං	388
උදුන	423
උදුනං උදුනෙසි	508
උදුසිසකඩං	365
උද්‍රහෙය්‍යුං	667
උබ්බහමා වාතා	536
උඛවකුඤ්ඤවව	526
උබ්බාසිකං	443
උපඤ්ඤමනති	378
උපගතා	331
උපවිඤනති	588
උපඩාය	369
උපනීතා	609
උපනීතෙහි	595
උපරිපාසාදවරගතො	560
උපසන්නා	416
උපාතිවත්තිත්ථා	701
උපාදුනකඛන්ධා	655
උපාදින්නං	531
උපාරම්භානිසංසා	424
උපාහනං	339
උපෙක්ඛාවිහාරසම්ං හොති	369
උපපජ්ජිතබ්බි	611
උපපත්තියා සුඛි	371
උපපන්නා ඛො මෙ අයං	533
උපපලිනියං	493
උපපලිනී	622
උබ්බිල්ලාවිතත්තං	434
උබහඨකස්ස	625
උබහඨකා හොන්ති	383
උබහඨකෙ	366
උබ්භිතොදකො	522
උභතොපක්ඛං	589
උභතො විසූළහං	378

උඛෘතපද.	පිට.
උභතො ලොහිතකූපධානෙ	359
උරත්තාළිං	377
උරුවෙලා	486
උලූකපක්ඛකං	366
උල්ලිත්තාවලිත්තං	359
උසුසු	378
උසම්කතොපි	422
උසභං පටිච්ච	647
උසසාදෙන්ති	426
උසසුක්කං ආපත්තෙ	698
උසෙසාළසිපත්තාරසඞ්ගසම-	388
උළාරානි	588
උළාරාය	485, 506
ඌරුක්ඛමෙහා	587
ඌහසෙදාදිය්‍ය	401
ඌහතො ඔකවරෙ	404
එකං ව පන මසෙඤ්ඤ විත්තං	547
එකං භාණං	398
එකං සමයං	415
එකජ්ඣං සංසඨං	672
එකන්තදුක්ඛා	358
එකන්තපරිපුණ්ණං	515
එකන්තසුඛපටිසංවෙදී	384
එකන්තසුඛාවෙදනා	360
එකභත්තිකො	518
එකමන්තං අඨාසි	442
එකමන්තං නිසීදි	586
එකාගාරිකං	378
එකාගාරිකො	366
එකානිඨා	330
එකායනෙන මග්ගෙන	358
එකාලොපිකො	366
එකාසනභොජනං	415
එකාහිකං	366
එකිස්සාපි දත්තියා	,,
එකිහාවාය	691
එකූනතිංසො	326

උඩෘතපද.	පිට.
එකොදිං කරෙම්	401
එණිකූලසම්ං	705
එණෙය්‍යකං	379
එතං මම	427
එතදවොච 374,442,451,506,545	
එතදවොචුං	628
එතපථො	684
එතපරමො	370
එතරහි 432, 583	
එතෙ ධම්ම	402
එත්තකම්පි නො නපපටිහා-	473
එත්ථ තෙ චිත්තනී වසො	702
එසාවත්තිකං	379
එලාලුකං	339
එවං අධිප්පායා	670
එවංකාමා	,,
එවංඡන්දු	,,
එවංජානාති	678
එවං මහෙසක්ඛා	702
එවංව්‍යාඛො	421
එවං සන්තා	383
එවං සම්පදම්දං 353, 395	
එවං හෙතං භික්ඛවෙ හොති	335
එවමාහංසු 370, 667	
එවමෙවඛො 348,360,389,415,509	
එවරූපෙන	559
එසනාපසුතො	369
එසෙවන්තා	394
එහිභදන්තිකො	365
ඵලකමන්තරං	365
ඔකචාරිකං	403
ඔකප්පනියමෙතං	594
ඔකාරං	401
ඔක්කාසිකා	371
ඔගච්ඡන්ති	535
ඔඝනං ජනෙය්‍ය	668
ඔවරකා	419

උඩෘතපද.	පිට.
ඔඨපදං	370
ඔඨපහතමත්තෙන	484
ඔඩ්ඩෙය්‍ය	418
ඔතිණ්ණා	539
ඔදනකුම්මාසූපචයසස	445
ඔදසඨපතොදෙ	415
ඔදහෙය්‍ය ඔකචරං	403
ඔදුතෙන වත්ථෙන	622
ඔබ්බතෙය්‍ය	575
ඔනීතපත්තපාණිං	586
ඔකපපම්කා 383, 590	
ඔපපාතිඝ	356
ඔපසාසිකො මෙ හවිස්සසි	702
ඔපානභූතං	362
ඔහාසෙව්වා	442
ඔරමහාගියානි	432
ඔලීනවුත්තිකො	542
ඔවාදක	462
ඔසධිතිණවනප්පතීසු	667
ඔසාවනෙ	536
ඔහිතසොතො	698
ඕළාරිකං ආණිං	407
කංසථාලෙ	621
කඞ්කඝා	631
කඞ්කාරුකං	339
කඞ්කළං	530
කඩ්ගියාපනීයං	546
කඤ්ඤිදෙවදෙසං	577
කට්ඨකා	358
කඨං	536
කණ	366
කණටකාපසසයිකො	367
කණෙඩ ආසත්තෙන	408
කණණසුඛා	517
කණහ දුකඛං නිගච්ඡසි	715
කණහසුක්කසපටිභාගං	684
කතපරපවාදෙ	507

උඛෘතපද.	පිට.
කතඤ්ඤූ	372
කතූපාසනෝ	,,
කත්තා නිම්මාතා	700
කථාසල්ලාපෝ	463
කදාචිකරහචි	,,
කන්තාරඛාතමගහං	618
කන්දති	377
කන්දරං	524
කපිලවත්ථුස්මිං	381
කබරවණ්ණායෝ	359
කම්මති	534
කම්මසමාදානං	350
කම්මාරගඝහරියා	591
කයවික්කයා	519
කලන්දකනිවාපෙ	450
කලභ	394
කලභජාතා	690
කල්‍යාණෙ	628
කල්ලනනු තං සම්පු-	430, 582
කසිණං ආයු	702
කසිරෙන සම්මදගවජ්ජනති	391
කහාපණකං	379
කළෙපිම්බා	365
කාදලිමිගපවරපච්චත්ථර-	359
කාමගුණා	376
කාමදදෙ	363
කාමනිදානා	377, 378
කාමභවෝ	645
කාමවණ්ණිනී	339
කාමවිතක්කා	398, 399
කාමහෙතු	377, 378
කාමාධිකරණං	,, ,,
කාමානං ආදිනවෝ	377
කාමානං පරිඤ්ඤං	375
කාමානමේව හෙතු	377, 378
කාමූපසංහිතා	376
කාමූපාදානස්ස පරිඤ්ඤං	333, 336

උඛෘතපද.	පිට.
කාමේ	382, 388
කාමෙහි	393, 589
කායපරිහාරිකෙන	522
කායපටිබඛා	661
කායච්චයං	587
කායබන්ධනං	339
කායභාවනා	587
කායසඞ්ඛාරා	649, 650
කායස්ස අධිවචනං	444
කාසිසා	663
කාසෙ	388
කාසෙ උපචිනිත්වා	711
කාසෙන	629
කාරණ්ඩවං	435
කාලවාදි	518
කාලුසිතං	338
කාලෙන	417, 518
කාලෙන කාලං	405, 622
කාසිනං පුරං	501
කාසු	358
කාළසිලායං	383
කිං අනුසයෝ අනුසෙති	663
කිංකරණීයානි	697
කිංකුසලගවෙසි	484
කිංකුසලානුසෙසි	326
කිංජාතික	339
කිංතාහං	701
කිංනෙය්‍යං	643
කිං පටිසරණං	646
කිංපභව	339
කිංවාදී	392
කිංසමුදය	339
කිච්චකාරී	426
කිච්ඡන	488
කිඤ්චාපි තස්සා කුක්කුටියා	389
කිඤ්ඤබාධෙ	400
කිණාහා	711

උඛානපද.	පිට.
කිත්තාවතා නු ඛො	334
කිත්තිසද්දො	416, 628
කිනති	577
කිනන්තිදූතා	339
කිම්කඛාසී	392
කිම්පියා	644
කිලමති	377
කිසබලපොා	570
කීසො සඞ්කිලෙවා	558
කුවජ්ජපරිහාරිකොා	522
කුවජ්ජිසයා වාතා	536
කුසතා නීවෙය්‍යං	703
කුමාරකස්සපොා	437
කුමාරො	697
කුමුදං	390
කුමුහිමුඛා	365
කුම්මං	443
කුම්මගහං	403
කුරුරකම්මන්තා	383
කුලපුත්තොා	539
කුලලං බන්ධිත්වා	426
කුලලුපමං	426
කුසචිරං	566
කුසලා ධම්මා	527
කුසලූපසංහිතං	405, 407
කුසලෙසු ධම්මෙසු	526
කූවං	520
කෙවට්ටිනොා	475
කෙනචිදෙව කරණීයෙන	633
කෙනචි වා ලොකස්මිං	686
කෙවලං	514, 700
කෙවලකපපං	441
කෙවලපරිපුණ්ණං	514
කෙවලස්ස	609
කෙසකම්බලං	336
කෙළායෙථ	608
කොා අධිපපායසොා	330
කොා චාහං හොා	506
කොණ්ඩඤ්ඤපවිජොා	710
කොණ්ඩසයා වාතා	536
කොත්‍රු	712
කොධනොා	345
කොධසාමන්තා	631
කොධූපායාස	448
කොා නාමොා ආයස්මා	472
කොලම්බකම්ං	370
කොලාපං	590
කොලෙහි	370
කොලොදකං	,,
කොසම්බියං	687
කොසලෙසු	627
කොසිය	337
ඛජ්ජූපනකා	323
ඛණ්ඩදන්තං	380
ඛත්තියකඤ්ඤා	379
ඛත්තියපරිසා	355
ඛමනීයං	516
ඛයධම්මිතා	532
ඛයා රාගස්ස	683
ඛරිගතං	530
ඛලිතසිරං	380
ඛලූ	627
ඛාරූපතවජ්ජකං	379
ඛීරොදකීභූතා	516
ඛීරොදනං	338
ඛෙත්ත	519
ඛෙමං	571
ඛෙමපපත්තොා	354
ඛෙමොා මගෙහා	404
ගණනා	367
ගණමනුසාසනාති	683
ගණාවරියා	510
ගණීනොා	,,
ගති	357-372

උඛෘතපද.	පිට.
ගතිඤ්ච පජානාමි	702
ගතියෝ	357
ගත්තානි පුබ්බාපයමානෝ	481
ගථිතා	504
ගඩ්ඩාදිපුබ්බස්ස	420
ගන්ධං	519
ගන්ධබ්බා	610
ගබ්භස්ස	,,
ගම්භීරා	418
ගම්භීරෝ	487
ගරුකරොනෙතා	417
ගරුගරුච්ච	710
ගරුකරණා	691
ගවෙසන්ති	536
ගහපතානී	416
ගහපති වා	514
ගාථා	423
ගාමගතං	629
ගාමධම්මා	516
ගාමන්තසම්භවෙසු	402
ගාම්මපි වහති	536
ගාහෙන්ති	588
ගිජ්ඣකූටෙ පබ්බතෙ	383
ගිද්ධාකාවසථෙ	543
ගිරිගුහං	525
ගෙය්‍ය	423
ගෙහසිතා	414
ගොගණං	563
ගොචරකුසලෝ	565
ගොචරගාමං	487
ගොචරවිසයං	646
ගොඨා	367
ගොතකත්ථතෝ	359
ගොපරිනායකා	565
ගොපානසිවඞ්කං	380
ගොපිතරෝ	565
ගොමණ්ඩලා	369

උඛෘතපද.	පිට.
ගොරතක	377
ගොසිඞ්ගසාලවනදයෙ	543, 552
ඝටතෝ	377
ඝටිකා	611
ඝටෙවඝඝනති	475
ඝම්මපරෙතෝ	358
ඝාතෙතායං වා ඝාතෙතුං	580
ඝොසිතාරාමේ	687
චක්කං	349
චක්ඛුඤ්චාවුසෝ	396
චක්ඛුතා රූපං දිස්වා	523
චක්ඛුභූත	395
චක්ඛුවිඤ්ඤෙය්‍යා	376
චඞ්ගවාරං	443, 448
චණ්ඩී	417
චතුකුණ්ඩිකෝ	367
චතුත්ථෝ	325
චතුරඞ්ගසමන්නාගතං	364
චත්තාරි පදානි	507
චාතුම්මහාපථෙ	415
චාතුම්මහාභූතිකස්ස	444
චාරිකං චරමානෝ	463, 467, 627
චිඞ්ගුලකං	611
චිත්තං සමාධියති	626
චිත්තපටිබද්ධා	661
චිත්තවිසුද්ධත්ථා	470
චිත්තසඞ්ඛාරා	649, 660
චිත්තෙකග්ගතා	646
චිරකවාසිකං	379
චිවරානි පපෙපාථෙත්වා	711
චෙතසා චිත්තං	411, 591
චෙතසා චෙතෝ පරිච්ච	550
චෙතසිකා	663
චෙතසෝ විනිබ්බා	387
චෙතොඛිලා	,,
චෙතොපරියායං	674
චෙතොවිමුත්තී	644

උඛෘතපද.	පිට.
චෙතොවිමුත්තති පරිහායති	476
චෙතොවිමුත්තිඵලානිසංසා	644
චෙලණ්ඩුකෙන	472
චොදිතො	338
ඡන්ද	537
ඡන්දරාගවිනයො ඡන්ද-	379, 537
ඡන්දසමාධි	388
ඡන්දා	414
ඡන්නූපසංහිතා	405
ඡඵස්සායතනිකො	714
ඡවසික්කානි	369
ඡවඩ්ඩස්සානි	366
ඡාදෙස්සති	672
ජිද්දවා	615
ජිත්තාකුකුච්චං	393
ජිත්තාපිලොතිකො	435
ජිත්තාභබහරා	419
ජිත්තාසස්සරා	419
ජෙදන	521
ජඞ්ගලානං	527
ජඞ්ගාවිහාරං	392
ජරසාලාය ඔපානසියො	370
ජරාධම්මො	483
ජරීයති	535
ජලාබුජ-	356
ජාගරියමනුයුත්තෙනා	616
ජාතක	424
ජාතමේව නං	625
ජාතරූපං	519
ජාතරූපරජතං	483
ජාතිධම්මො	,,
ජාතිභූමකා	450
ජාතිසංසාරො	430
ජානං ජානාති	395
ජානතා	328–571
ජානන්තා	609
ජාපෙතායං වා ජාපෙතුං	580

උඛෘතපද.	පිට.
ජීගුච්ඡිය්‍ය	408
ජීණණං	380
ජීණෙණා	372
ජීවිතපරික්ඛාරා	391
ජුතිංව	702
ජෙගුච්ඡිසම්මිං	367
ජෙගුච්ඡී	365
ජෝතිමාලිකං	378
ඣානවිමොක්ඛසමාධිසමා-	351
ඣායතො	647
ඣායන්ති	711
ඣායිනොසම	711
ඤත්තඤ්ඣාපත්තො	68
ඤණං ච පන මෙ	487, 498
ඤණදස්සනං	539
ඤණභූත-	395
ඤණවාදං	484
ඤණෙණා	338
ඤතඤඤතරෙන	575
ඤතා	540
ඤති පරිවට්ට-	515
ඤතිමජ්ඣගතො	630
ඤයස්ස ධම්මස්ස	326
ඤානං	348
ඤානං ඛො පනෙතං විජ්ජති	328
ඤානං ච ඤානතො	350
ඤානසො ඛෙතුසො	,,
ඩංස-	377
ඩෙති	523
තංකිස්සහෙතු	333
තං ඛො පන	628
තං ධම්මං	484, 514
තං එවං අපපඤාය	353
තං විජානාති	610
තක්කපරියාහතං	343
තක්කාරස්ස	344, 696
තඟඤ	546

උඛෘතපද.	පිට.
තජෙජා සම්භාහාරෝ	537
තණ්හක්ඛයෙ විමුත්තෝ	500
තණ්හක්ඛයෝ	488
තණ්හාතිදුනා	339
තණ්හානිරොධා	646
තණ්හාසඞ්ඛයවිමුත්තෝ	599
තණ්හුපාදින්නාසස	532
තතියෝ	325
තතොනිදුනං 396, 400, 401,	617
තත්ර 368, 414, 417, 434,	670
තත්රතත්රාභිනන්දනා	645
තත්රවත	354
තථත්තාය	379
තථාගතනිසෙවිතං	526
තථාගතපදං	,,
තථාගතබලානි	346
තථාගතාරක්ඛිතං	526
තථාතථා	400
තථාභූතෝ	534
තථාරූපානං අරහතං	628
තථාරූපාය දිට්ඨියා	697
තථූපමං	491
තදනුත්තරං	508
තදභිඤ්ඤාය	706
තදවසරි 486,	627
තදායතනං	664
තදාරම්මණං	417
තදාහාරසම්භවං	607
තදුපාදානං	611
තනුපත්තපලාසෝ	359
තපසසි	364
තපෝ	388
තමෙව කාසං	371
තමොක්ඛන්ධෙන ආවටා	489
තරණාය	585
තසිතෝ	358
තසමා 397, 414, 416, 425, 435,	709

උඛෘතපද.	පිට.
තසමා ඉමෙ ධම්මා	640
තසමාතිහ ත්වං	374
තසස තං	672
තාණං ගවෙසී	582
තාදිසකෝ මයඤ්ච සරෝ–	356
තාලාවත්ථුකතා	432
තාව මහලලීකාය	532
තාවසහසසධා ලොකෝ	702
තික්ඛින්ද්රිය–	492
තිණ්හදසනතිකෝ	365
තිණං	536
තිණුකූපමා	421
තිණ්ණවිචිකිච්ඡෝ	526
තිණ්ණං සඞ්ගතිඵසසෝ	396
තිණ්ණෝණා	585
තිණ්ණෝණා ලොකෙ විසත්තිකා–	476
තිත්තකාලාබු	671
තිත්ථං 564,	567
තිත්ථකරා	540
තිපපා	358
තිබබරාගජාතිකෝ	668
තිබබාපෙක්ඛා	698
තිමබරුසකං	339
තිරච්ඡානයොනි	357
තිරීටානි	366
තිලකාහතගත්තං	380
තිවිධං	629
තිවිසාඛං	393
තුච්ඡා	434
තුලිතෝ හොමි	370
තුවං තුවං	394
තුලිනී	419
තෙජොගතං	535
තෙන භගවතා	328
තෙන හි 470,	629
තෙසංයෙව ධම්මානං	659
ථමභක්ඛ ආලුමපති	698

උඩෘතපද.	පිට.
ථලෙනිකඛිත්තං	590
ථාමසා	421
ථිනමිඛ-	526
ථුසොදකං	365
ථෙතතො	430
ථෙතො	516
ථෙනො	629
ථෙය්‍යසඞ්ඛාතං	629
ථෙරවාදං	484
දකඛා	416
දකෙඛා	621
දණ්ඩපරායනං	380
දණ්ඩපාණී	392
දණ්ඩමොලුබහ	392–393
දණ්ඩවාකරාඡි	475
දණ්ඩවාගුරාඡි	475
දණ්ඩදානං	394
දණ්ඩන පටිපණාමෙය්‍ය	701
දදුල-	366
දධි ච මධු ච	672
දනෙතාභිදනනමාඛාය	411, 591
දනෙතා	585
දබබජාතිකො	397
දමථාය	585
දමමගාවො	570
දයාපන්නා	516
දසො	700
දසසනං	628
දසසනමූලිකා	685
දසසනානුත්තරියං	584
දහරා	372, 424, 697
දළහධමමා ධනුගහො	372
දළහා	685
දුගපාලො	544
දුසවයා	618
දුසීදුසපටිගහනා	519
දිඨං	427

උඩෘතපද.	පිට.
දිඨිං	608
දිඨිගතං	606
දිඨිඨානාධිඨාන-	429
දිඨිඨානානි	427
දිඨියා සුපපටිවිඛා	558
දිඨිසාමඤඤගතො	696
දිඨෙව ධමෙම	353
දිනනාපාවිකඛි	516
දිනනාදුයී	,,
දිබබා මඤඤෙ ගනධා සම්පව-	556
දිවා උඨාසි	416
දිවා කමමනෙත	445
දිවාතරං උඨාසි	417
දිවාදිවසස	506
දිවාවනසණ්ඩ	368
දිවාවිහාරං	469
දිවාවිහාරාය	392
දීඝරත්තං	381
දීඝො (පරජනො)	550
දුක්කරකාරිකාය	503
දුකඛං අලලීනො	582
දුකඛකඛයාය	696
දුකඛකඛණස්ස	609
දුකඛකඛනෙඛා	377
දුකඛබහුලො	359
දුකඛිත-	617
දුකඛිතං	380
දුග්ගහා	683
දුග්ගති	357
දුග්ගතිවෙදනියානං	625
දුනියං භාගං	398
දුනියො	325
දුද්දසො	487
දුපපඤඤජාතිකො	569
දුපපඤඤ	634
දුබබලො	385
දුම්මුඛා	583

උඛානපද.	පිට.
දුරක්ඛාතෙ	335
දුරනුබොධො	487
දුස්සුතං	575
දූතෙය්‍යං	519
දෙවඤ්ඤතරෝ වා	388
දෙවතා	591
දෙවධම්මා	614
දෙවා	356
දෙවෙ	672
දෙවෙන වා	685
දෙවෝ	622
දෙවෝ වා භවිස්සාමි	388
දෙසෙති	697
දෙහිනිම්මජ්ජනිං	339
දෙවවස්සකරණෙහි	385
දෙසනතරා	417
දෙසිතා	556
මාගාරිකො	366
වෙ අගාරා	623
වෙඨා කත්වා වෙඨා කත්වා	398
වෙඨාපථො	448
ධංසී	585
ධතා	558
ධනාගෙථ	608
ධනුකං	611
ධනුකලාපං සන්නාගහිත්වා	378
ධම්මඤ්ඤව සක්කරෝ-	417
ධම්මතාය	697
ධම්මතාසුසමන්නිඤා	698
ධතම්මතාසුසමන්නිඤො	686
ධම්මදායදෙ	330
ධම්මදින්නා	653
ධම්මදෙසනාය වා ධම්මදෙස-	375
ධම්මපදබ්‍යඤ්ජනං	373
ධම්මභූත-	395
ධම්මමයං	491
ධම්මරාජා	323

උඛානපද.	පිට.
ධම්මවාදී	518
ධම්මවිනයෙ	334, 337
ධම්මසම්මොසතා	686
ධම්මසමාදානං	670
ධම්මසමාදානානි	667
ධම්මානුසාරිනො	571
ධම්මාපි වො පහාතබ්බා	426
ධම්මිකා	692
ධම්මියා කථාය	468, 482
ධම්මී වා කථා	483
ධම්මෙ	387, 396
ධම්මෙ පසාදෙ	329, 330, 335, 337
ධම්මො	487
ධම්මො දෙසිතො	354
ධාතාරම්මණමෙව	533
ධාරං	622
ධිති	372
ධුවං	700
ධුපායනා	445
ධුමං කත්වා	564, 567
න අනුසාසනීකරණීයා	415
න කෙනචි ලොකෙ විග්ගහ-	393
නගෙහා	369
න වග්ගිමාසිනො	,,
න ච ලබ්භා ඉමෙසං ධම්මා-	638
න වෙව සම්පායිස්සන්ති	376
නවගීතවාදිතවිසූකදස්ස-	519
නවජ්ජාදෙය්‍ය	617
නවජ්ජාදෙස්සති	671
න ජ්‍ඣං ජනෙති	542
නත්ථි අයං ලොකො	632
නත්ථි කාමෙසු විපාකො	667
නත්ථිදානි පුනබ්භවො	487
නත්ථි දින්නං	632
නදිං ච සන්දනතිං	486
න දෙසනතරෙ	414
න නිජ්ඣානං ඛමන්ති	424

උඛානපද.	පිට.
නනු ත්වං භික්ඛු පස්සසි	701
නන්දිං ච න උපාදියිං	708
නන්‍දෙ වචෙඡා	588
න පටික්කොසිංසු	375
න පරිතස්සති	428
නපජානාති	636
නමො කරොහි නාගස්ස	443, 449
නරකපපපාතෙ	701
නවං	582
න සමපායති	385
න සසති වත-	490
නහාතක-	624
නහාරුදද්‍දුලෙන	536
නළාටිකං	393
නාගං	443
නාගවනීකො	507
නාගසමාලො	374
නාගාපලොකිතං අපලො-	714
නාදිකෙ	543
නාධිමුච්චති	387
නානථා වෙව නානා බ්‍ය-	651
නානාධාතුං	351
නානාහෙසජෙජහි	672
නානුපවෙජෙඡය්‍ය	622
නාභිනිපඵජ්ජති	377
නාමගොතතං	577
නිකති	521
නිගච්ඡසි	671
නිගණ්ඨා නාථපුත්තෙතා	541
නිග්‍රොධාරාමෙ	381
නිච්චකපපං	594
නිජෙඡාදෙය්‍ය	575
නිජ්ඣත්ති	690
නිජ්ඣානං ඛමන්ති	425
නිඨං ගච්ඡති	509
නිඨං ගතො	526
නිට්ඨරණත්ථාය	426, 608

උඛානපද.	පිට.
නිඩුතෙය්‍ය	575
නිධානවතිං	518
නින්‍දෙතතා	395
නිපුණෙ	487, 507
නිබබාන-	488
නිබබානපත්තියා	571
නිබබානපරායනං	665
නිබබානපරියොසානං	666
නිබබානසංවත්තනිකො	401
නිබබානොගධං	665
නිබබිජ්ජ	485, 593
නිබබිදාය	485
නිබබින්‍දති	431
නිබබුති	697
නිබබුතො	501
නිමන්තනං	365
නිමිත්තමෙතං	354
නිමිත්තානි	405
නිමඛමුඤං	339
නියාති	505
නියානිකා	696
නිරඝළ-	432
නිරයංඋපපජ්ජනති	712
නිරයො	357
නිරොධධම්මං	608
නිරොධානුපසසී	600
නිරොධො	609
නිලෙලාළෙතා	393
නිලෙලාපං	378
නිවාතා	416
නිවාපං	474
නිවුත්තං	474
නිසීදනං ආදාය	468
නිසසඤෙන	643
නිසසරණං	332
නිහිතදණ්ඩා	516
නිහිතසතථා	,,

උඛෘතපද.	පිට.
නීලං	418
නීලමපි සඤ්ඤානාති	641
නීවාර-	366
නෙකවස්සගණිකං	367
නෙක්ඛම්මං	401
නෙක්ඛම්මවිතක්ක-	398
නෙතං ඨානං විජ්ජති	423
නෙලා	517
නෙව අභිනන්දිංසු	375
නෙවාපිකෝ	474
නෝ	613
නෝ ච තෙන තම්මයෝ	684
පංසුකූලානි	266
පකාසිතුං	488
පකුධෝ කච්චායනෝ	541
පකුපති	532
පක්කඝියා	378
පක්ඛන්දනති	378
පක්ඛිසකුණෝ	523
පගබ්භා	585
පඝසරණී	622
පච්චගඝලෙ අඛ්ඛාසි	710
පච්චඤ්ඤසිං	382
පච්චත්තං යෙව පරි-	340, 601
පච්චත්තං යොනිසොමන-	710
පච්චත්තවෙදනා	715
පච්චත්තවෙදනීයෝ	714
පච්චභාසිං	494
පච්චයිකෝ	517
පච්චවෙක්ඛිතබ්බං	386
පච්චාජ්ජතෝ	515
පච්චාරොපෙති	385
පච්චාසාරෙය්‍ය	416
පච්චුපඨිත-	593, 610
පච්චුපත්‍යාසුඛං	667
පච්ඡාභත්තං	525
පජහ අවිජ්ජං	447

උඛෘතපද.	පිට.
පජහාමෙව	400
පජා	511
පජ්ඣායනති	711
පඤ්චහි තූරියසතෙහි	601
පඤ්චාභිඤං	549
පඤ්ඤතෙන ආසනෙ	482
පඤ්ඤවක්ඛුනා පජානාති	644
පඤ්ඤාතිරොධිකෝ	399, 608
පඤ්ඤුපෙසස	470
පඤ්ඤු භාවෙතබ්බා	610
පඤ්ඤුය	382, 462
පඤ්ඤුය දුබ්බලීකරණෙ	526
පඤ්ඤුසිස්සසි	422
පඤ්ඤුයෙතං	446
පඤ්ඤුවිමුත්තා	644
පඤ්ඤුවුඩ්ඪිකෝ	401
පඤ්ඤුවෙය්‍යත්තියං	372
පඤ්ඤුවෙය්‍යත්තියෙන	372
පඤ්හං අභිසඞ්ඛරොතනි	508
පඤ්හාපටිභාණං	373
පටලිකත්ථතෝ	359
පටිකත්ථතෝ	,,
පටිඝං තෙන පජහති	664
පටිච්ඡාදෙතා	564
පටිඩාවෙය්‍යාථ	609
පටිනිවත්තිත්වා	550, 604
පටිනිස්සඟ්ගානුප්පත්තියා	600
පටිපදං	350, 357
පටිපදුත්තානරියං	584
පටිපදුය	503
පටිපුච්ඡිස්සාමි	384
පටිපණාමෙත්වා	602
පටිපස්සඞ්ඛියා	549
පටිපථරති	385
පටිහංසු	488
පටිහාතු තං	579
පටිහාසි	369

උඩෘතපද.	පිට.
පටිවිස්සකානං	417
පටිවෙදයාමි	615
පටිසරනති	670
පටිසල්ලාණරත-	559
පටිසල්ලාණාරාම-	,,
පටිසල්ලාණා වුඨි-	479, 554, 634
පටිසොතගාමිං	489
පඨමං උපපජ්ජති විත්ත-	662
පඨිතගාවෝ	367
පඨමෙන වයසා	372, 484
පඨමාභිනන්දිනෝ	701
පඨවිං අජ්ඣාසිස්සසි	702
පඨවිං නාභොසිං	760
පඨවිගරහකා	701
පඨවිධාතුරෙවෙසා	531
පඨවිපසංසකා	701
පඨවියා පඨවිත්තෙන අත-	706
පණිධාය	358, 388
පණිතෙ කායෙ පති-	701, 709
පණිතෙන	586
පණිතෝ	487
පණ්ඩිතවාදෙ	574
පණ්ඩිතවෙදනීයෝ	487
පණ්ඩිතා	666
පණ්ඩිතෙ	507
පණ්ඩිතෝ	397, 498
පණ්ඩිතෝ මඤ්ඤති	506
පතාරෙසි	569
පතිඨිතං	575
පතිඨිතගාවෝ	367
පතිස්සතා	436
පත්තං	427
පත්තකඛන්ධා	422, 583
පත්තපරියාපන්නාමත්තකම්පි	692
පත්තාළහකං	611
පථාවිතෝ	711
පදහතානි	527

උඩෘතපද.	පිට.
පදහෙය්‍යං	485
පදාලෙය්‍ය	668
පදුඤ්මනසඞ්කපෙපා	632
පදුම-	522
පදෙසවත්තී	326, 327
පදෙස-	525
පධානපහිතත්තං	498
පධානවිබහනෙතා	502
පධානාය	387
පධානාභිතුන්නස්ස	591
පන්නත්තං	536
පන්නඩ්ජෙ	432
පන්නහාරෙ	,,
පන්නරසවස්සුද්දෙසිකා	379
පපඤ්චරති	331
පපඤ්චසඤ්ඤාසඞ්ඛා	394, 396
පපඤ්චාරම්-	331
පපතාම්	367
පබ්බජෙය්‍යං	515
පබ්බතං	524
පබ්බතසඞ්ඛපෙ	623
පබ්බාජෙතාඨං වා පබ්බා-	580
පභඞ්කරෙ	323, 324
පභස්සරා	715
පමාදං	474
පමුඤ්චනතු සඞ්ඛං	494
පරකට්ඨකා	631
පරජනා	475
පරතොඝොසෙ	644
පරපුග්ගලානං	351
පරපෙමාදෙ	326
පරමතපසසි	364
පරමාඨ	372
පරලොකවජ්ජභයදස්සාවී	432
පරවිත්තූපකරණං	629
පරසන්තානකං	351
පරාජිනිංසු	603

උඛානපදං.	පිට.
පරාධීනො	618
පරාභිසජ්ජනී	631
පරාමාස	421
පරිකඛෙඤ්ඤය්‍ය	575
පරිකෙඛපෙච්චා	582
පරිගාහං	429
පරිචාරිකායෝ	604
පරිවාරෙති	602
පරිජානාති	600
පරිජානෙය්‍ය	582
පරිඤ්ඤං පඤ්ඤපෙනති	667
පරිඤ්ඤත්ථා	644
පරිඩයහති	535
පරිණාමං ගච්ඡති	,,
පරිත්තවෙතසො	611
පරිදෙවති	377
පරිනිබ්බුතො	585
පරිපතෙපි තිඨනති	378
පරිපූරෙති	621
පරිපථරති	,,
පරිපෙථාසකා	,,
පරිබ්බාජකා	328
පරිබ්බාජකානං ආරාමෝ	375
පරිහාසථ	711
පරිහාසනති	434, 533
පරිමණ්ඩලෙහි පදබ්‍යඤ්ජ-	558
පරිමුඛං සතිං උපඨපෙත්වා-	525
පරිමුච්චති දුක්ඛසමා	332
පරියන්තවතීං	518
පරියාදාය	381, 589
පරියාපුණනති	423
පරියාපුණීං	484
පරියායභත්තභොජනං	366
පරියායභත්තිකස්ස	625
පරියායමකාසි	602
පරියායෙන	562
පරියුට්ඨිතචිත්තොව හොති	697

උඛානපදං.	පිට.
පරිශෙසිතං	427
පරියොසානං	539
පරිසගහතො	630
පරිසතිං	340
පරිසණ්ඨති	621
පරිසාසු	348
පරිසිඤ්චිතුං	480
පරිසුඛං	514, 608
පරිසුඛෙන	622, 643
පරිසුඛො මෙ කායසමා-	615
පරිස්සයානං	523
පරිහරිතුං	563
පරෙ	434
පරෙවරං ච ජානාසි	702
පලගණ්ඩකො	407
පලාපෙ	435
පලාලපිණ්ඩිකං	379
පලාලපුඤ්ජං	525
පලිඝපරිවත්තිකං	379
පලිතකෙසං	380
පලලඛකං	525
පවත්තඵලභොජී	366
පවත්තා	395
පවත්තනී හොති	560
පවත්තෙ	403
පවාරෙති	385
පවිවිත්තභාසුදං හොම්	395
පවිවිත්තෙතා	458
පවෙධමානං	380
පසන්නපසත්ථා	506
පසීදති	534
පසුපාලකා	711
පස්සං පස්සති	395
පස්සතා	328
පස්සමහති	626
පස්සසුඛං	388
පස්සාසො	536

උඩානපද.	පිට.
පහාතත්ථා	644
පහාසි නෙක්ඛම්මචිතක්කං	400
පහිණගමන-	519
පහිතත්තස්ස	398
පහියනති	408
පහොති	384
පාණාතිපාතං පහාය	516, 632
පාණිසමඵස්සෙන	534
පාණිනං	527
පාතව්‍යතං ආපජ්ජනති	667
පාතුරහොසි	490
පාදෙන පාදං	617
පාදෙ පක්ඛාලෙසි	545
පාපකංදිට්ඨිගතං	710
පාපිකානං ඉච්ඡානං	385
පාමුජ්ජං ජායති	626
පාරං	570
පාසාදිකඤ්ච වතසණ්ඩං	486
පාසාදෙ	359
පිඩඉලකොවෙජා	540
පිඤ්ඤික-	366
පිඹිකණ්ටකං යෙව	371
පිඹිතො	468
පිණ්ඩපාතපටික්කක-	345, 525
පිණ්ඩාය පටික්කමති	548
පිණ්ඩාය පවිසිංසු	375
පිදහෙය්‍ය	403
පිපාසිතො	358
පියකරණා	691
පියචක්ඛූහි	546
පියරූපා	376
පිලොතිකං පරිබ්බාජකං	506
පිහපපච්චයා දෙමනස්සං	664
පීතං	564, 567
පීතනිසිතං	625
පීති	646
පීතිගමනියො	403

උඩානපද.	පිට.
පීතිමනස්ස කායො	626
පීතිසුඛං	382
පුඤ්ඤමති	586
පුණ්ඩරීක-	522
පුත්තහරියං	483
පුථුකමුණ්ඩිං	339
පුථුසමණබ්‍රාහමණපරපප-	672
පුථුසමණබ්‍රාහමණෙ	323
පුනබ්භවාභිනිබ්බත්ති	645, 646
පුබ්බකොඨෙක	480
පුබ්බන්තං	609
පුබ්බාරාමෙ	598
පුබ්බෙ ච	434
පුබ්බෙව අභිසඞ්ඛාරො	650
පුබ්බෙව සම්බොධා	382
පුරක්ඛත්වා	604
පුරතො පාතුරහොසි	490
පුගමජ්ඣගතො	630
පුජාය	485
පූතිකුණපෙ වා	356
පූතිමුත්තං	672
පූතිමූලානි	371
පූරණො කස්සපො	540
පෙතවිසයො	357
පෙමනීයා	517
පෙසුඤ්ඤ-	394
පොනොභවිකො	432
පොරී	517
එරිත්වා	417, 418
එරිත්වා විහරිංසු	712
එලං විපාකො	632
එලාසා	364
එලෙය්‍ය	667
එසසපඤ්ඤත්තිං පඤ්ඤ-	396
එසෙසා අනිවෙවා	533
ඵාණිතං	339
ඵාතිකාතුං	563

උඩෘතපද.	පිට.
ඵාරුසකං	339
ඵාසුවිහාරං	415
ඵුසනති	417, 587
ඵුසිතඝඝලං	359
බඬ-	521
බබ්බුජාදුපච්චා	711
බලං	328
බලකරණීයා	579
බලතාය සම්පන්නාගතො	698
බලමත්තා	617
බලවගාවෝ	570
බලවා පුරිසෝ	411
බලවිරියං	475
බලිසමංසිකං	379
බහලපත්තපලාසෝ	359
බහිඩා අසති	428
බහිඩා කථං අපනාමෙති	385
බහිනගරෙ	342
බහුකතං	537
බහුකාරා	498
බහුකිච්චා බහුකරණීයා	602
බහුජනකන්තා	518
බහුජනමනාපා	,,
බහුජනස්ස	540
බහුදුක්ඛා	382
බහුලමකාසි	400
බහුස්සුතෝ	558
බහූපායාසා	382
බාවෙරූ	323
බාහිරා ච රූපා	537
බාහුලිකෝ	502, 593
බාළහගිලානං	380, 617
බිම්බිසාර-	384
බිලඬඨාලිකං	378
බිළාරහස්තා	419
බීජගාමභූතගාමසමාරම්භා	518
බුබ්බකබ්බුනා	492

උඩෘතපද.	පිට.
බුඬෝ	585
බෙලුවලඛිකාය	392
බෝධාය	585
බ්‍යඤ්ජනෙඛි	397
බ්‍යත්තෝ	498
බ්‍යඤනිකරෙය්‍ය	617
බ්‍යාපජ්ජති	611
බ්‍යාපන්නාවිත්තෝ	632
බ්‍යාපාද-	525
බ්‍යාපාදචිතකෝ	398, 400
බ්‍රහ්මකායිකානං දෙවානං	632
බ්‍රහ්මචක්කං පවත්තෙතී	348
බ්‍රහ්මචරියං	361, 363, 388, 514
බ්‍රහ්මචරියපරියොසානං	508
බ්‍රහ්මචාරී	516
බ්‍රහ්මපාරිසජ්ජං අභිවිසිත්වා	700
බ්‍රහ්මභූත-	395
බ්‍රහ්මලොකෙ පභස්සරං	715
බ්‍රහ්මුනා වා	686
බ්‍රාහ්මණ-	624
බ්‍රාහ්මණං	393
බ්‍රාහ්මණගාමෙ	627
බ්‍රාහ්මණෙන වා	685
බ්‍රූහෙනති	588
භගවංනෙත්තිකා	670
භගවංපටිසරණා	,,
භගවංමූලකා	,,
භගවන්තං යෙව පටිභාතු	670
භගෙහසු	385
භජිතබ්බ	670
භණ්ඩනජාතා	690
භත්තාභිහාරං අභිහරිංසු	586
භද්‍රෙන යොබ්බනෙන	372, 484
භබ්බා	388
භයභොගා	475
භවං ච විභවෙසිනං	708
භවං නාභිවදිං	,,

උඛෘතපද.	පිට.
භවදිට්ඨි	331
භවාභවෙ	393
භවිස්සනති	490
භවෙවාඛංභයංදිස්වා	708
භස්සපපවාදිකො	574
භාසතෙ ච-	672
භිංසනකතසම්ං	368
භික්ඛූනං සික්ඛාසාජීව-	515
භින්නානං වා අනුප්පදාතා	630
භින්නානං වා සන්ධාතා	517
භුජිස්සානි	696
භුජිස්සො	618
භුඤ්ජිංසු	475
භූතතාවිං	586
භූතම්දං	607, 608
භූතවාදී	518
භූතෙන	417
මහසකලාවනෙ	385
මහා	627
මහාගෙ	424
මොගහං	380
මංසපෙසිං	443
මංසපෙසූපමා	421
මකස-	377
මක්කලීගොසාලො	540, 588
මගහං	357
මඞ්කුභූතො	422, 583
මඤ්ඤරවාභිවි	592
මවුඩෙඝ්‍යං	570
මවිඝුම්බ-	623
මඤ්චකෙන වෙපි මං	374
මණ්ඩුජ්ජභාණ්ඩිනො	323
මතජං	625
මත්තඤ්ඤු	616
මත්තඨකස්ස	532
මත්තිකං	536
මදෙඩ්ඩසරස්ස	715

උඛෘතපද.	පිට.
මධුපිණ්ඩිකං	397
මධුරකජාතා	711
මධුස්සවෙ	363
මනං	396
මනං ච පටිච්ච	607
මනං වත භො අනස්සාම	508
මනසානුපෙක්ඛිතා	558
මනසි කත්වා	698
මනසි කරිත්වා	582
මනාපා	376
මනුස්සා	357
මනොපටිසරණං	646
මනොවිඤ්ඤාණං	396
මනොවිඤ්ඤාණෙන	643
මන්නානිප්පතෙතා	454, 472
මන්‍ෙදු	697
මමායෙථ	608
මරණධම්මො	483
මසාණානි	366
මහගගතෙන	417
මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං	627
මහපඵලා මහානිසංසා	613
මහල්ලකො	372
මහාකොඨිතො	634
මහාජානියො	498
මහාතණ්හාජාලතණ්හා-	611
මහානාමො	381
මහාපඤ්ඤා	666
මහාපඤ්ඤා	397
මහාවනං	392
මහාවනෙ කූටාගාරසාලා-	572
මහාවිකටභොජනසම්ං	368
මහාසයන-	519
මාගධකො	569
මාඝඩො	384
මාතඵාගතං විහෙඨි	710
මාතාපෙත්තිකසම්භවස්ස	445

උඩෘතපද.	පිට.
මාතු ගොරවකෙන	570
මාතුරක්කිතා	629
මා තෙසං අථාසුකමකාසි	544
මා නිං මඤ්ඤිත්ථෝ	701
මා නාගං ඝට්ටෙසි	443
මාරධෙය්‍ය	570
මාරපරිසා	355
මාරෙන වා	685
මාරෝ තිමසි පාපිම	701
මාලා	519
මාලුවාසිපාවිකා	667
මා වා අහෙසුං	632
මාසාවිතං මඤ්ඤති	710
මාහං බුද්ධකෙ පාණෙ-	367
මාහෙව තෙ රිත්තකමෙව-	707
මිගජාතා	474
මිගදායෙ	385
මිගවාහිනී	411
මිගාරමාතු පාසාදෙ	479
මිච්ඡාදිට්ඨිකො	632
මිඩසුඛං	388
මියමානො	377
මුඛනිමිත්තං	386
මුඛසත්තිහි	690
මුවජිතා	474, 504
මුණ්ඩිකා	711
මුතං	427
මුත්තාචාරෙ	365
මුද්ධා	376
මුද්ධාවසිත්තෙන	372
මුනී	369
මුසා	434
මුසාවාද-	394
මූලකං	339
මූලජාතා	685
මූසිකං මඟයමානො	711
මෙතමාසදෙ	700

උඩෘතපද.	පිට.
මෙත්තං කායකම්මං	546, 691
මෙත්තචිත්තා	417
මෙථුකා	516
මෙදෙනති	588
මෙධාවී	498
මොක්ඛචිත්තං	611
මොඝං	377
මොඝපුරිසො	345
මොදකං	339
මොරහත්ථං	,,
මොලිබද්ධාහි	667
මොලියඵග්ගුණෝ	413
යං කිඤ්චි වෙදනං	600
යං තං පරස්ස	629
යකෙඛා	581
යඤ්ඤදත්ථ	372
යතො ව ඛො	340, 681
යතො නිදානං	394
යත්ථස්ස තෙ පාපකා-	611
යත්‍රහි නාම	490, 700
යථා	393
යථාකාමකරණීයා භවිස්ස-	474
යථාකාමකරණීයෙ ඛාහි-	702
යථාතං	335, 376, 604, 666
යථාතං අවිද්දසුනො	670
යථාතං විද්දසුනො	,,
යථාපටිපන්නෝ	357, 379
යථාපච්චයං වා කරෙය්‍ය	435
යථාහතංනික්කීතෙනා	353
යථාභිරන්තං	463
යථාභූතං	532
යථාභූතං න පජානන්ති	332
යථාභූතං පජාන-	350, 351, 526
යථා වො ඛමෙය්‍ය	384
යදූනඛඛසි	577
යදිදං	330, 488, 584, 696
යම්පි	350, 377

උඛෘතපද.	පිට.
යසසසිතො	540
යස්ස ඛො පන තෙ අත්ථාය	354
යස්ස ච ඛවාස්ස අත්ථාය-	344
යාචිතකූපමා	421
යාදං අරියා	371
යාදං දිසි	696
යාව උදකඛින්ධුමහිපි	367
යාවකීවඤ්ච මෙ	368
යාවජීවං	391
යාවතා චන්දිමසුරියා	702
යාවදත්ථං	388
යාවදෙව	549, 594
යාවබ්‍රහ්මලොකා	551
යාවස්සු මෙ සාරිපුත්ත	371
යිඨං	632
යුවා	372
යෙන කාමංගමො	618
යෙන තුමෙහ	328
යෙන භගවා	467, 628
යෙනිවජ්ජකං	416
යෙහි බලෙහි සමන්නාගතො	348
යොගක්ඛෙමස්ස	388
යොගාචරියො	416
යොනියො	356
යොනිසොමනසිකාරො	644
යො මතොපදොසෙය්‍ය	419
යො සත්ථරි පසාදෙ සො න-	334
රජං	386
රජතං	519
රජනීයා	376
රජාපථො	515
රජොජල්ලං	676
රජොජල්ලිකස්ස	625
රත්තිභාගං වා දිවසභාගං-	391
රතනූපරතො	518
රථකං	611
රමණීයං	486, 536, 555
රසම්සම්පත්තෙනා	324
රාගජං දුක්ඛං-	668
රාගරත්තා	489
රාගදොසපරෙතෙහි	489
රාගො ඛො ආවුසො අකි-	651
රාජකුලමජ්ඣගතො	630
රාජගහෙ	450
රාජපොරිස-	377
රාහුමුඛං	378
රිඤ්චිස්සනති	475
රිත්තං	548
රිත්තා	582
රිසසමානො	377
රුක්ඛදෙවතා	667
රුක්ඛථුලූපමා	421
රුක්ඛමූලං	524
රුක්ඛමූලිකස්ස	625
රුදන්තානං	484
රූපං	537
රූපං අත්තතො සමනු-	656
රූපඤ්ඤූ	563, 566
රූපත්තා	579
රූපසම්මං වා අත්තානං-	657
රූපෙ	388
රූපෙ පතිට්ඨාය	579
රොසෙථ	711
රොසෙන්ති	434, 533
ලක්ඛණකුසලො	563, 566
ලඞ්ගිං	443
ලජ්ජී	516
ලපිතලාපනමත්තෙන	484
ලභාමි පවත්තනං සම්ථං	697
ලභෙථ ඔතාරං	711
ලභෙථ පාමොජ්ජං	617
ලහුකෙන අසතෙන	372
ලහුඨානං	415
ලාභා	485, 551, 692

උඛෘතපද.	පිට.
ලාභො	539
ලිච්ඡවිපුත්තො	343
ලූඤ	353
ලූඥ	629
ලූඛස්සුදං භොමි	364
ලෙණං	582
ලොක-	510
ලොකං	351, 417
ලොකුත්තරං	697
ලොභධම්මා	381
ලොමහංසජාතං	605
ලොහිතපාණිනො	383
ලොහිතපාණී	629
වගහනරණිං වාචං	630
වගහනන්දී	,,
වගහරත	,,
වගහාරාම	,,
වඞ්කකං	611
වචනපථෙහි	595
වචනීයොමහි	385
වචසා පරිචිතා	588
වචීසඞ්ඛාරා	649
වචීසඞ්ඛාර-	660
වචෙඝවං	548
වචෝසඤ්ච අපච්චනීකී	698
වච්ඡකෙ	570
වච්ඡතරෙ	,,
වජිරපාණී	581
වඤ්ඣනතු	632
වඤ්චනං	520
වට්ටං තෙසං නත්ථි පඤ්ඤු-	436
වට්ටනාවලී	370
වණිජ්ජා	377
වණ්ණනිභා	380
වණ්ණසමපත්තියා	672
වණ්ණා හෙසො සාරිපුත්ත-	346
වතං	388

උඛෘතපද.	පිට.
වතකුතූහලමඞ්ගලානි	609
වත්තා	395
වත්තිතුං ව	580
වත්ථු	519
වත්ථුසාභිකො	702
විදනතු	385
වධ-	521
වනං	716
වනකම්මික-	367, 667
වනදෙවතා	667
වනපත්ථං	391, 525
වනපත්ථපරියායං	391
වනසණ්ඩ	342
වනෙන වනං	367
වම්මිකො	443
වයධම්මතා	532
වයො අනුපපත්තෙතා	372
වලිනං	380
වලිං	536
වසවත්තී	700
වසී පිතා භූතභව්‍යානං	701
වස්සං වුත්ථා	450
වළභිරථෙන	505
වාචාවිලාපං	584
වාදං ආරොපෙස්සාම	508
වාදපමොක්ඛානිසංසා	424
වාදෙන වාදං සමාරඩ්ඩා	674
වාමනිකා	509
වායමතො	377
වාලං	575
වාලකම්බලං	366
වාලවෙධිරූපෙ	507
වලිපක්කං	339
විකාලභොජනා	518
විකිරෙය්‍ය	418
විගතවලාහකෙ	672
විගතාභිජ්ඣෙන	525

උඩානපද.	පිට.
විගහයහ	394
විඤාතපඤ්හිකො	399
විචාර-	646
විච්කිච්ඡති	387
විජානාති	640, 642
විජිතසඞ්ගාම-	492
විජ්ජා උපජ්ඣා	340
විජ්ජාගතො	671
විජ්ජුප්පාද	645
විජ්ජොතලනෙතසු	378
විඤ්ඤාණං	707
විඤ්ඤාණං පරිඤ්ඤෙය්‍යං	640
විඤ්ඤාණං විඤ්ඤාණං	638
විඤ්ඤාණභාගස්ස	537
විඤ්ඤාතං	427
විඤ්ඤාපක-	462
විඤ්ඤාපනාදීනි	696
විඤ්ඤාණං	395
විටපිං කරෙය්‍ය	668
විතක්ක-	646
විතක්කපරියායපථෙසු	412
විතක්කසඞ්ඛාරසණ්ඨානං	409
විදූසුනො	331
විඛුදන්නා	668, 690
විඛෙ	672
විධුරෙ	711
විධූපනං	339
විධූපනෙන	536
විනයවාදී	518
විනළීකතං	571
විනිපාත-	357
විනෙති	574
විනොදෙමෙව	400
විපක්කබ්‍රහ්මචරියොසම්	364
විපරාමාස-	521
විපරිණතං	414
විපරිණාමධම්මං	430
විපරිණාමධම්මතා	532

උඩානපද.	පිට.
විපරිභින්නානි	649
විපරීතදස්සනො	632
විපස්සනා	644
විපුලෙන	417
විපක්කතා	438
විපච්චනීතානි	584
විභවදිට්ඨි	331
විභවදිට්ඨියා තෙ පටිවිරුඬා	331
විහෙසිතං	708
විමුච්චති	543
විමුත්තාතුත්තරියං	584
විමුත්තති	462
විමුත්තිඤ්ඤාණදස්සනං	,,
විමොක්ඛනඅපස්සයි	716
විරාගානුපස්සී	600
විරාධෙය්‍ය	701
විරියා	485
විරියාරම්භස්ස	446
විලම්බිනී	667
විලූනං	380
විලෙපනං	519
විවටං	671
විවතො	615
විවරිංසු	482
විවරෙය්‍ය	403
විවාද-	394
විවාදුප්පන්නා	690
විවෙච්චෙව කාමෙහි	542
විවිත්තං	524
විවෙකනිස්සිත-	663
විවෙකපබ්භාර-	,,
විවෙකපොණ-	,,
විසංයුත්තෙනා	432
විසත්තිකා	477
විසහසි	708
විසාඛො උපාසකො	653
විසුද්ධිමත්තානං	626

උඩෘතපද.	පිට.
විසූකදස්සන-	518
විසූකායිකානි	584
විසෙන සංසඨො	671
විසෙවිතානි	584
විසොධෙය්‍ය	416
විස්සජ්ජෙථ	504
විහරන්ති	543
විහාරසමාපත්තියා	560
විහිංසාචිතකෙකා	398, 400
විහෙසෙථ	711
විහෙසෙන්ති	434, 533
වීජමානො	374
වීතවච්කානං වීතඩ්ඩමානං	358
වීතිමිස්සා	678
වීථිං	568
වීමංසකෙන	674
වීමංසානුචරිතං	344
වීර-	492
වුඨානං	351
වුඨානං පඤ්ඤපෙති	648, 697
වුඨානිමං	715
වුඩ්ඪිං	387
වුඩ්ඪො	372
වෙදගූ	624
වෙදනතො	579
වෙදනා වෙදනා	640
වෙදනීයාඛම්මා	648
වෙදයිතං	663
වෙදල්ලං	424
වෙදියකෙ	337
වෙදෙති	642
වෙදෙහිකා	416
වෙනයිකො	434
වෙය්‍යාකරණ-	423
වෙරඤ්ජකා	633
වෙසාරජ්ජප්පතෙතා	584
වෙසාරජ්ජානි	354

උඩෘතපද.	පිට.
වෙසාලියං	341
වෙසාලී	342
වෙස්සවණො	604
වේළුවනෙ කලන්දකනිවාපෙ	450
වෝ	546, 547
වොදානා	678
වොදානං	351
වොහින්දනතා මඤ්ඤෙ චර-	507
වොසානං	539
ව්‍යඤ්ජනෙනෙව නං අකාසිං	400
ව්‍යාධිධම්මො	483
සංවත්තනති	591
සංවිග්ගං	505
සංවිජ්ජන්ති	678
සංවුතො	615
සංසඨා	638
සංසඨො	413
සංසයෙන	610
සංසාදෙන්ති	560
සංසාරෙන සුඛි	371
සංසෙදජ-	356
සඋත්තරච්ඡදෙ	359
සඋද්‍රයා	613
සඋපාදානස්ස	331
සකං ආවරියකං	484
සකසම්මං විජිතෙ	580
සකාකාරො	323, 539
සකෙකාසු	381
සක්කරං ගහෙත්වා	713
සක්කරකඨල	623
සක්කිපුඨො	630
සක්‍යපුත්තෙතා	628
සඞ්කිණ්ණපරිඛ-	432
සඞ්කිත්තිසු	365
සඞ්කිලිඨා	676
සඞ්කිලෙසං	351, 401
සඞ්කිලෙසධම්මා	483

උඛානපද.	පිට.
සඞ්කුලිකං	339
සඞ්කුසම්භතො	714
සඞ්ඛතො	658
සඞ්ඛමුණ්ඩිකං	378
සඞ්ඛලිඛිතං	515
සඞ්ඛාත-	376
සඞ්ඛාපි	391
සඞ්ඛාරනිරොධො	609
සඞ්ඛාරා	537
සඞ්ගහං ගච්ඡන්ති	527, 537
සඞ්ගහාය	691
සඞ්ගහො	537
සඞ්ගාහිකං	696
සඞ්ඝාටිකං	625
සඞ්ඝාටියා	,,
සඞ්ඝාතනියං	696
සඞ්ඝිනො	540
සඤ්ඤ කඞ්ඛති	387
සඤ්ඤ වා විහරන්තො	683
සච්චකො නිගණ්ඨපුත්තො	572
සච්චතො	430
සච්චවාදී	516
සච්චසඤ්ඤ-	,,
සච්චානං බොධාය	697
සච්ඡිකත්වා	512
සච්ඡිකිරියාය	542
සජොතිභූතං	531
සඤ්ඤයො බෙලට්ඨපුත්තො	541
සඤ්ජානාති	642
සඤ්ඤතනිං	690
සඤ්ඤු	393, 641
සණඩොවිකං	575
සණිකං	409
සණ්ඨපෙසුං	502
සණ්ඩසණ්ඩචාරිනී	365
සණ්හන	417
සතණ්හස්ස	331

උඛානපද.	පිට.
සතතං	383
සති	372
සතිකරණීයමෙව හොති	402
සතො සම්පජානො	526
සත්තඞ්ගසමන්නාගතො	699
සත්තරථවිනීතා	470
සත්තාහං ආගතිංගතිං	703
සත්තිසූලූපමා	421
සත්ථරි කඞ්ඛති	387
සත්ථරිපසාදෙ	329, 337
සත්ථරි පසීදති	685
සත්ථවාහ-	492
සත්ථාදන-	394
සත්ථුකප්පෙන සත්ථු වෙව සංවණ්ණිතො	395
සදෙවකං	511
සදෙවකෙ	376
සදෙවමනුස්ස-	511
සද්දං සුත්වා	551
සද්දහාසි	336
සඬං පවිලඹති	515
සඬා	414, 485
සඬා නිවිඨා	685
සඬාමත්තකෙන	484
සඛාරා	623
සනන්තරං	382
සනාපත්තිකා	362
සන්තප්පෙත්වා	586
සන්තරබාහිරා	621
සන්තරමානොව	358
සන්තාසං ආපජ්ජිස්සථ	667
සන්නිමග්ගමෙව	390
සන්තුට්ඨො	456, 521
සන්තෙත්තා	487, 585
සන්ථාගාරෙ	575
සන්දච්ඡායො	358
සන්දස්සක-	462

උඛානපද.	පිට.
සන්දිඨිකො	377
සන්ධිම්පි ඡින්දනති	378
සන්ධිසම්ලසඞ්කටිරෙ	712
සන්නිපාතා	610
සන්නිපාතො	537
සන්නිරුම්භිය්‍ය	400
සන්නිවාරෙය්‍ය	,,
සන්නිසාදෙම්	401
සන්නිසින්නාපුබ්බං	356
සන්නෙය්‍ය	621
සපරිදණ්ඩා	630
සපපටිභයං	426
සපසිරූපමා	421
සඵලා	613
සබ්බං ජහො	500
සබ්බචෙතසො සම්පස්සා–	698
සබ්බඤ්ඤු සබ්බදස්සාවී	383
සබ්බතොපහං	707
සබ්බත්ථගාමිනිං	350
සබ්බනිමිත්තානං	649
සබ්බපාණභූතහිතානුකම්පී	516
සබ්බපාලිඵුල්ලා	556
සබ්බවිදූ	500
සබ්බසඞ්ඛාරසමථාය	429
සබ්බසඞ්ඛාරසමථො	488
සබ්බාභිභූ	500
සබ්බාවතො කායස්ස	621
සබ්බාවන්තං	417
සබ්බූපධිපටිනිස්සග්ගෙහා	488
සබ්බූපාදානපරිඤ්ඤවාදී	333
සම්බබ්සු ධම්මෙසූ අනුප–	500
සම්භමකං	511
සහගතො	630
සම්ඵගතකරණිං වාචං භාසිතා	517
සම්ඵගතනන්දී	,,
සම්ඵගරතො	,,
සම්ඵගානං වා හෙතුනා	630

උඛානපද.	පිට.
සම්ඵගහාරාමො	517
සම්බහිභූතො	602
සම්මණකරණා	612
සම්මණකසටං–	625
සම්මණදණ්ඩෙස–	,,
සම්මණමුල–	,,
සම්මණසම්මිඤ්ජිතපදා	625
සම්මණෙන්ත වා	685
සම්මණො	325, 624
සම්මණො ආවුසො	375
සම්මතික්කමාය	549
සම්මථ–	614
සම්මථාය	595
සම්මුඛාභාවනති	421
සම්මුඛූපට්ඨානති	428
සම්මුඛූපට්ඨාතුං	582
සම්මුඛාසනති	421
සම්මුමොදිංසු	473
සම්මුයුඤ්ජනති	421
සම්මෙන්නාසනා	674
සම්පතො	602
සම්මෙහි විනතිතො	490
සම්වායො	587
සමාදපක–	462
සමාදභාම්	401
සමාදුයෙව පක්කමති	522
සමාධි	462
සමාධිකානි	326
සමාධිමහා	401
සමාධිසංවත්තනිකානි	696
සමාරකං	511
සමිතං	383
සමූතෙනජක–	462
සමූදයං ච	332
සමූදාචරති	394, 534
සමූදානෙතබ්බා	391
සමූපබ්බූළෙහා	603

උඩෘතපද.	පිට.
සමූලං භවං උදබ්බහි	709
සමොධානං ගච්ඡන්ති	527
සම්පජානමුසා භාසිතා-	630
සම්පජ්ජලිතං	581
සම්පරායිකො	379
සම්පරිඝඩ්ඩෙය්‍ය	575
සම්පලිවෙඨිතං	625
සම්පවාරෙන්ති	586
සම්පාරුතං	625
සම්බහුලා	375, 606
සම්බහුලෙහි	552
සම්බාධො ඝරවාසො	515
සම්බොධාය	388
සම්භාවිතො	454
සම්මා	328
සම්මා අධිසයිතානි	388
සම්මාදිට්ඨියා උපපාදාය	644
සම්මා දුක්ඛක්ඛයාය	344
සම්මා පරිභාවිතානි	388
සම්මා පරිසෙදිතානි	,,
සම්මා පරිහරෙය්‍ය	416
සම්මාසම්බුද්ධස්ස තෙ පටිජා-	354
සම්මාසම්බුද්ධො	501
සම්මුඛා	413
සම්මොහං ආපජ්ජති	377
සම්මොහවිහාරසමිං	595
සයං අභිඤ්ඤාය	500
සයං අභිඤ්ඤා සච්ඡිකත්වා-	632
සයං පටිහාණං	344
සරණං	582
සරසමපත්තෙනා	323
සරාගස්ස	331
සල්ලපිතපුබ්බං	356
සසෙනාහං	589
සස්සතං	700
සස්සමණබ්‍රාහමණිං	511
සස්සාමිකා	630

උඩෘතපද.	පිට.
සහත්ථා	586
සහධම්මිකං	581
සහධම්මිකා බො පන	329
සහධම්මිකෙසු	335, 338
සහධම්මෙන	354
සහම්පතිස්ස	490
සඛ්‍යතං උපපජ්ජ්‍යං	632
සඛාසා අප්පටිසඛ්‍ඛා	384
සඛස්සං ලොකාතං	559
සඛස්සතෙතෙනා	413
සඛාපලොකනා	714
සඛාපි දුක්කඨන	671
සාකච්ඡා	356
සාකඛකෙඛා	366
සාකමුඛිං	339
සාඛාපලාසං	539
සාචියොගො	521
සාණානි	366
සාතං	663
සාතවචාය	387
සාත්ථං සබ්‍යඤ්ජනං	513
සාථලිකො	542
සාධිකපොරිසං	358
සාධු	478, 547
සාධු බො පන	628
සාධුසම්මත	540, 574
සාපදෙසං	518
සාමං ඤතං	609
සාමං දිඨං	,,
සාමං වා කාමෙ පරිජානි-	379
සාමං විදිතං	609
සාමඤ්ඤා	691
සාමාකඛකෙඛා	366
සායතතියක-	367
සාරං	539
සාරජ්ජති	611
සාරදිකං	390

උඛෘතපද.	පිට.
සාරඩෝ	591
සාරුණ්ණියා	691
සාරිපුත්තෙනා	472
සාරෙන සාරකරණ්ණියං	539
සාරෙය්‍ය	416
සාලමූලෙ	667
සාවනා සම්පජ්ජන්ති	508
සාසඞ්කං	426
සාසනකරෙ	419
සාහසකිරියා	521
සික්ඛිතෝ	372
සිඛිනෝ	323
සිපප්පඤ්ඤතර-	377
සිපපියානං	336
සිපපිසම්බුක-	623
සිරිංසප-	377
සිලෝකෝ	539
සීතස්සපුරක්ඛතෝ	377
සීත වාරිධාරා	622
සීතිභූතෝ	501
සීනපත්තෙනා	583
සීලං	388, 462
සීලවන්තෙහි සබ්‍රහ්මචාරීහි-	692
සීලසම්පන්නෝ	353, 462
සීලසාමඤ්ඤගතෝ විහරති	696
සීලානුග්ගහිතා	644
සීලෙසු	330
සීලෙසු පරිපූරකා-	329, 335, 338
සීවථිකාය ඡඩ්ඩිතං	380
සීසංවොහිඤ්ඩි	714
සීසවේඨං	591
සීසවේදනා	,,
සීහානුලොකී	468
සීහනාදං	328
සීහනාදං නදති	348
සීහසෙය්‍යං	616
සුංසුමාරගිරෙ	385
සුකවට්ටකකවාතං	632

උඛෘතපද.	පිට.
සුක්කධම්මසමාහිතා	614
සුඛ-	646, 663
සුඛං වෙදෙති	626
සුඛානිපි විජානාති	634
සුඛබහුලා වෙදනා	359
සුඛම්පි වෙදෙති	640
සුඛවිහාරිතරෙ	384
සුඛාරුහී	589
සුඛී අස්ස	672
සුඛුම්‍රාය ආණියා	407
සුඛෙන ච හාවුසෝ	384
සුඛෝ ඉමිස්සා	667
සුගතා	683
සුවිභූතෙන	516
සුජාතා	416
සුසුදතෝ එසෙසා	662
සුසුඛු	326
සුණාතු ධම්මං විම්මලෙ-	491
සුතං	427, 644
සුතධරෙ	558
සුතස්සනිවයෝ	,,
සුත්තං	423
සුදං	368
සුධම්මායං අභිතෝ සභං	715
සුනක්ඛත්තෙනා	343
සුනඛෙහිපි	379
සුපණිහිතං මෙ මානසං	697
සුපතිට්ඨං	486
සුපිනකූපමා	421
සුපසන්නායිතා	571
සුභූමියං	415
සුමද්දිතා	419
සුමෙධ	491
සුරාපිතස්ස	336
සුලද්ධලාභා	462
සුවණ්ණවණ්ණකාය	583
සුවිඤ්ඤපය-	492

උඛානපදං	පිට.
සුවිදෙහානං	569
සුසංවිහිතකම්මන්තා	416
සුස්සකාළකෙසෝ	372, 484
සෙඨෝ	599
සෙඨෝ සජ්ජිතා	701
සෙතකං	486
සෙනානිගමෝ	,,
සෙනාසනං	524
සෙනාසනං සංසාමෙත්වා	466
සෙනියෝ	384
සෙය්‍යං	367
සෙය්‍යථාපි	388, 400
සෙය්‍යථාපිමච්ඡස්ස	715
සෙය්‍යසුඛං	388
සෙලන්තං	536
සෙවිතබ්බ	670
සෝකධම්මා	483
සෝචති	377
සෝණ්ඩිකාකිලඤ්ජං	575
සෝණ්ඩිකාධුත්තෝතා	,,
සෝතතෝතා	369
සෝතසමඵස්සජා	533
සෝතාපත්තිඵලසච්ඡිකිරි-	698
සෝතාභිය-	624
සෝ පෙචචහච්ඡසාමි	428
සෝ මම්සස කිලමථෝ	488
සෝරතසෝරතෝ	417

උඛානපදං	පිට.
සෝරතා	416
සෝවත්තිකෝ	403
සෝසීතෝ	369
සෙනාහපරෙතා	621
සෙනාහානුගතා	,,
සඛාකාර-	492
සඛාකඛාතෝ	435
සඛාතනාය	585
හඤ්ඤදනතු	632
හව-	366
හතපහතෙ නිච්චෝ	629
හත්ථපජ්ජානිකං	379
හත්ථිකාරෙන	548
හත්ථාපලෙඛතෝ	365
හත්ථිපදෙපමෝ	509
හදයඞගමා	517
හරායෙය්‍ය	408
හරිතන්තං	536
හලං	488, 592
හලිද්දිං	418
හිතානුකම්පී	414
හිරොත්තපෙන	613
හිතෙ කායෙ පතිඨිතා	701, 709
හිතෙන බ්‍රහ්මචරියෙන	364
හුතං	632
හූවෙය්‍යපාවුසෝ	501
හෙජෙකාලි	416

දැන් වීම යි.

හෙළටුවා සුලභ කිරීමේ අදහසින් අප ආරම්භ කළ "ප්‍රජාසුඛ දීපිකා" වේ තෘතීයභාගය මූලපණ්ණාසවණ්ණනා අවසන් කොට මෙසේ ප්‍රසිද්ධ කරවීමට අවසථාව ලැබීම අපට මහත් ප්‍රීතියකි. මෙහි ඉතිරි කොටස හා අවශෙෂ අථකථා ද ඉතා ඉක්මනින් ම හෙළටුවාචාරයෙන් ශාසනාභිවෘද්ධියෙහි යෙදෙන්වයි අපගේ ආශංසනය වේ.

මේ ම තෘතීයභාගය සම්පාදනයෙහි හා මුද්‍රණයකිරීමෙහිදී ද පෙර සේ ම "ප්‍රවවතොදය" පරිවෙණාධිපතීන් වහන්සේ ප්‍රමුඛ අප ආචාර්‍යොත්තමයන්ගේ අනුශාසනය ද, එසේ ම අප ප්‍රියසබ්‍රහ්මචාරීභූත මොල්ලිගොඩ පියරතන ආයුෂ්මතාණන් වහන්සේගේ දැඩතර උපස්ථම්භය ද, හොරණ විද්‍යුශෙඛර යන්ත්‍රාලය ස්වාමී වූ ඒ. ඩී. බර්නාඩ් අප්පුහාමිගේ උපකාරය ද අතිශයින් හෙතු වූ බැවි කෘතඥතා පූර්වක වැ සඳහන් කරම්හ.

ලබුගම ලඞ්කානන්ද.

ශ්‍රී බුඛ වර්ෂ 2482 ක් වැ ඇෂාඪමස පුරපසළොස්වක්ලත්
ක්‍රි: වර්ෂ 1939 ක්වැ ජූලි මස 30 වෙනි රිවි දින
මොල්ලිගොඩ "ප්‍රවවතොදය" පිරිවෙන්හිදිය.

සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු